
A
GAME OF
THRONES

වදන් මාලාව

අ

අයන්වුඩ් - (Ironwood) ගස් වර්ගයකි.

අනෙක් එවුන් - (The Others) ප්‍රාකාරයට ඔබ්බෙන් සදාකල්හිම හිමෙන් මිදුනු දේශයේ ජීවත් වූ දැන් වඳවී ගොස් ඇතැයි සැලකෙන (මානව?) ජීවී කොට්ඨාසයකි.

අන්දාල්වරුන් - (Andals) එස්සොස්හි සිට වෙස්ටෙරෝස්වලට සංක්‍රමණය වූ ජන කොට්ඨාසයකි.

ආර්කන් - (Archon) ටයිරෝෂ් නගරයේ නගර පාලක තනතුර.

අෂයි - (Asshai) එස්සොස්හි නැගෙනහිර දෙසට වන්නට පිහිටි ගුප්ත දේශයකි.

ඇම - (The Bite) වෙස්ටෙරොස්හි නැගෙනහිර මුහුදු තීරයේ ඇති මුහුදු බොක්කකි.

අසරු පොරය - (Jousting) නයිට්වරුන් දෙදෙනෙකු අසුන් අරා ලන්සයෙන් සටන් කිරීම.

--------------------------------------------------

ඉ

ඉත්ත වැල් - (Ivy)

ඉබ්න් - (Ibben) එස්සොස්වලට උතුරින් පිහිටි දූපතකි.

--------------------------------------------------

එ

එස්සොස් - (Essos) වෙස්ටෙරෝස්වලට නැගෙනහිරින් පිහිටි මහද්වීපයකි.

--------------------------------------------------

ඔ

ඔරොක්ස් - (Aurochs) සුවිශාල වල් හරක් විශේෂයක්.

--------------------------------------------------

ක

ඛලසාර් - (Khalasar) ඩොත්රැකි හමුදාවක් මෙනමින් හැඳින්වේ. මෙයට සෙබළුන් ද, ඔවුන් ගේ බිරියන්, දරුවන්, සතුන් රංචු සියල්ලක්ම අයත් ය.

ඛාල් - (Khal) ඛලසාර් ඒකක නායකයා.

ඛලීසි - (Khaleesi) ඛාල් කෙනෙකු ගේ බිරිඳ.

කවට කුරුල්ලා - (Mockingbird)

---------------------------------------------------

ග

ඝෝරවෘකයා - (Direwolf) සාමාන්‍ය වෘකයෙකුට වඩා විශාලව වැඩෙන වෘක විශේෂයකි. අතීතයේ බහුලව සිටියද දඩයම් කිරීම නිසා වඳ වී ගොස් ඇතැයි සැලකේ.

ගංගා ත්‍රිශූලය - (The Trident) ගංගා තුනක් (කොළ ගංගාව, නිල් ගංගාව හා රතු ගංගාව) එක් වන තැනකි.

ගිම්හාන දූපත් - (Summer Isles) වෙස්ටෙරෝස්වලට දකුණින් පිහිටි දූපත් සමූහයකි.

ගරාදි පැලැල්ල - (Portcullis) බලකොටු දොරටුවල ආරක්ෂාව පිණිස ඇත.

---------------------------------------------------

ජ

ජේඩ් මුහුද - (Jade Sea) එස්සොස් වලට දකුණු පසින් පිහිටි මුහුදකි.

---------------------------------------------------

ට

ටයිරෝෂ් - (Tyrosh) එස්සොස්හි බටහිර සීමාවේ පිහිටි නිදහස් වෙළෙඳ නගරයකි.

---------------------------------------------------

ඩ

ඩොත්රකි - (Dothraki) එස්සොස්හි වෙසෙන සංචාරක ජන කොට්ඨාසයකි. රණකාමීන් ය. අස් හිමියන් ය. සටන්වලින් පරදිනවුන් වහලුන් වශයෙන් විකුණති.

ඩනේරිස් ස්ටෝර්ම්බෝර්න් - (Daenerys Stormborn) ඇය ඉපදුනේ කුණාටුවක් මධ්‍යයේ නිසා ඇයට මෙම නම ව්‍යවහාර කෙරේ.

ඩොෂ් ඛලීන් - (Dosh Khaleen) වයෙස් ඩොත්රක්වල වාසය කරන සැමියන් මියගිය ඛලීසින්ගෙන් සැදුනු කණ්ඩායමකි. පේන කියන්නියන් හා නිමිති තෝරන්නියන් වශයෙන් සේවය කරති.

ඩොක්රකි මුහුද - (Dothraki Sea) ඩොත්රකි තැනිතලාව.

----------------------------------------------------

ද

දෙව්වනය - (Godswood) බලකොටුවක් තුළ පිහිටි කුඩා වනරොද. දෙවියන්ට යාඥා කිරීම සඳහා උතුරුකරයේ වැසියන් විසින් භාවිත කෙරෙති.

දඩබල්ලා - (The Hound) සැන්ඩෝර් ක්ලිගේන් ගේ අන්වර්ථ නාමය

----------------------------------------------------

න

නිශා රැකුම් බලකාය - (Night's Watch) ආරක්ෂක බලකායකි.

නිදහස් නගර - (Free Cities) එස්සොස්හි බටහිර සීමාවේ පිහිටා ඇති වෙළෙඳ නගර නවයකි. බ්‍රාවොස්, පෙන්ටොස්, නොර්වොස්, ලෝරාත්, ක්වොහොර්, ම(ර්), ටයිරොෂ්, ලයිස් හා වොලන්ටිස්.

නිකැලැල් බලකාය - (The Unsullied) නපුංසක සෙබළුන්ගෙන් සැදි යුධ බලකායකි. පක්ෂපාතීත්වය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලයි.

----------------------------------------------------

ප

ප්‍රාකාරය - (The Wall) අඩි හත්සීයක් උසැති අයිස්වලින් සැදුනු තාප්පයකි. රාජධානියේ උතුරු මායිම ආරක්ෂා කරයි.

පටු මුහුද - (The Narrow Sea) වෙස්ටෙරෝස් හා එස්සොස් අතර වූ මුහුදු තීරය.

පොපි යුෂ - (Milk of the Poppy) වේදනාව සමනය කිරීම පිනිස දෙන ඔසුවකි.

පෙන්ටොස් - (Pentos) එස්සොස්හි බටහිර සීමාවේ පිහිටි නිදහස් වෙළෙඳ නගරයකි.

----------------------------------------------------

බ

බෙල්ල - (The Neck) වෙස්ටෙරොස්හි උතුර හා දකුණ වෙන් කෙරෙන පටු ගොඩබිම් තීරුව.

බේලර් ගේ සප්තකය - (The Great Sept of Baelor) කිංග්ස් ලැන්ඩින්ග්හි ප්‍රධානම සප්තක දේවස්ථානය.

--------------------------------------------------

ම

මුරකරු වෘක්ෂය - (Sentinel Tree) ගස් වර්ගයකි.

මේස්ටර් - (Maester) උපදේශනය, වෙදකම, ලේඛන කටයුතු වැනි දේ සඳහා මාලිගා, බලකොටුවල ඇති වෘත්තියකි.

මැජිස්ටර් - (Magister) පෙන්ටොස් නගරයේ නගර පාලක තනතුර.

ම(ර්) - (Myr) එස්සොස්හි බටහිර සීමාවේ පිහිටි නිදහස් වෙළෙඳ නගරයකි.

මකරාවාටය - (Dragonpit) මකරාධිපතියන් විසින් සිය මකරුන් ගාල් කල ස්ථානය.

--------------------------------------------------

ය

යකඩ සිංහානය - (Iron Throne) යකඩින් තැනුනු තියුණු අසිපත් රැසක් එකතු කොට තනන ලද සිහසුනකි.

--------------------------------------------------

ර

රාජධානි සප්තකය - (Seven Kingdoms) වෙස්ටෙරෝස් මහද්වීපය රාජධානි හතකින් සැදී ඇත. වර්තමානයේ මේ හතම එකතු කර තනි රාජධානියක් ලෙසින් පාලනය කෙරේ.

රතු පූජකයින් - (Red Priests) ආලෝකයේ දෙවිඳු (R'hllor) අදහන පූජකවරුන් පිරිසකි. ඔවුනට අනුව අන් සියළු ආගම් මිත්‍යාදෘෂ්ටික ආගම් වේ.

රුධිරාරක්ෂකයින් - (Bloodriders) ශරීරාක්ෂකයින්, මිතුරන් හා සමීපතම සගයින් වශයෙන් ඛාල් කෙනෙකුට සේවය කරති.

--------------------------------------------------

ව

වනචාරීන් - (Wildlings) ප්‍රාකාරයෙන් එපිට දිවිගෙවන මිනිසුන්.

වැලීරියාව - (Valyria) එස්සොස් මහද්වීපයේ දකුණු පස පිහිටි රාජ්‍යයකි. මුහුද ගොඩ ගැලීමක් නිසා සියවස් කිහිපයකට පෙර එහි පැවැති ශිෂ්ටාචාරය විනාශ වී ගොස් ඇත.

වෙස්ටෙරෝස් - (Westeros) ප්‍රමාණයෙන් දකුණු අමෙරිකාව තරම් වන මහද්වීපයකි.

වනාන්තරයේ දරුවන් - (Children of the Forest) වෙස්ටෙරෝස්වල අතීතයේ ජීවත් වූ දැන් වඳවී ගොස් ඇතැයි සැලකෙන මානව කොට්ඨාසයකි.

වයර්වුඩ් - (Weirwood) ගස් වර්ගයකි.

වයෙස් ඩොත්රක් - (Vaes Dothrak) ඩොත්රකි තැනිතලාවේ අගනුවර.

විස හාදු - (Poison kisses) අලංකාර මල් පිපෙන විෂ සහිත පැලැටියකි.

---------------------------------------------------

ස

සෙර් - (Ser) නයිට්වරයකුගේ නමට ඉදිරියේ යෙදෙන ගෞරව පදය. මධ්‍යකාලීන යුරෝපයේ Sir හා සමානය.

සප්තක දේවස්ථානය - (The Sept) සත්‍ය ලබ්ධිය අදහන්නන් විසින් දෙවියන් යැදීම සඳහා භාවිත කෙරෙති.

සත්‍ය ලබ්ධිය - (The Faith) රාජධානි සප්තකයේ නිල ආගමයි. ඔවුන්ට අනුව දෙවියන් ගේ සප්තාකාරයක් ඇත.

සෙප්ටා - (Septa) සත්‍ය ලබ්ධික පූජකවරිය. වංශවත් පවුල්වල දැරියන් හැදී වැඩෙන්නේ හා අධ්‍යාපනය ලබන්නේ මොවුන් ගේ භාරයේ ය.

සුළැඟිල්ලා - (Littlefinger) පෙටයර් බේලිෂ්. මූල්‍ය කටයුතු පිළිබඳ ඇමති හා භාණ්ඩාගාරයේ ප්‍රධානියා.

සිංහ-කටුස්සා - (Lizard-lion) කිඹුලකු වැනි සත්ත්වයෙකි.

සුලුප්පුව - (Sloop) නොගැඹුරු මුහුදු තරණයට භාවිත වන යාත්‍රාවකි.

සොයුරියන් තිදෙනා - (Three Sisters) Sweetsister, Littlesister, Longsister ධවල වරායට පහළින් ඇම නම් මුහුදු බොක්කේ පිහිටි දූපත් තුනකි.

---------------------------------------------------

හ

හොල්මන් කැලෑව - (The Haunted Forest) ප්‍රාකාරයෙන් එපිට ඇති හිමෙන් වැසුනු වනයකි.

හදවෘක්ෂය - (Heart Tree) මේ ගස්වල මුහුණු කොටා ඇත. වැඳුම් පිදුම් කිරීමට භාවිත කරති.

**හම්බාන - (Galley) කුඹගස් දෙකකින් යුතු කුඩා රුවල්නැවකි.**

**හංස නෞකා - (Swan ship) මේවායේ ඇති දැවැන්ත සුදු පැහැ රුවල් නිසා මේ නම ලැබී ඇත.**


A Song of Ice and Fire Speculative World Map
Version 1.0 – Released. February 2012
This work is licensed under the Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 Unported License.
You are free:
to Share – to copy, distribute and transmit the work.
to Remix – to adapt the work.
Under the following conditions:
Attribution – You must attribute the work to its original creators theMountainGoat and Tear with copyright attributed to George RR Martin.
Noncommercial – You may NOT use this work for commercial purposes.
Share Alike – If you alter, transform, or build upon this work, you may distribute the resulting work only under the same or similar license to this one.
This map was created as a fan project and may be used in other fan based projects under the terms of the Creative Commons licence. Thank you.
BY NC SA


A Song of Ice and Fire Speculative World Map
Version 1.0 – Released. February 2012
This work is licensed under the Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 Unported License.
You are free:
to Share -
to Remix -
BY NC SA
Under the following conditions:
Attribution -
Noncommercial - You may NOT use this work for commercial purposes.
Share Alike -
This map was created as a fan project and may be used in other fan based projects under the terms of the Creative Commons licence. Thank you.



A Song of Ice and Fire
Speculative World Map
Numbered locations
The Wall
1. Westwatch-by-the-Bridge
2. Shadow Tower
3. Sentinel Stand
4. Greyguard
5. Stonedoor
6. Hoarfrost Hill
7. Icemark
8. Nightfort
9. Deep Lake
10. Queensgate
11. Castle Black
12. Oakenshield
13. Woodswatch-by-the-Pool
14. Sable Hall
15. Rimegate
16. Long Barrow
17. Torches
18. Greenguard
19. Eastwatch-by-the-Sea
The Riverlands
20. BWB hideout
21. Inn of the Kneeling Man
22. Lord Harroway's Town
23. Inn (They Lay with Lions)
24. Unnamed village
25. Lord Lychester's Keep
26. Lady of the Leaves
27. Sallydance
28. Lord Goodbrook's Village
29. Pennytree
Other areas
30. Old Stone Bridge Inn
31. Lord Hewett's Town
32. Shandystone
Confirmed locations
City
Town
Castle
Ruin
Other
Speculative locations
City
Town
Castle
Ruin
Other
miles
Note about map scale
Notes about the speculative parts of this map
The Shivering Sea
Ibben
N
Bay of Ice
Bay of Seals
Blazewater Bay
Iron Islands
The Narrow Sea
The Sunset Sea
The Flatlands
The Disputed Lands
The Dothraki Sea
Essos
Westeros
Summer Sea
Summer Islands
The Red Waste
Sothoryos
The Jade Sea
A Song of Ice and Fire Speculative World Map
Version 1.0 – Released: February 2012
This work is licensed under the Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 Unported License.
You are free:
to Share – to copy, distribute and transmit the work.
to Remix – to adapt the work.
Under the following conditions:
Attribution –
Noncommercial – You may NOT use this work for commercial purposes.
Share Alike –
This map was created as a fan project and may be used in other fan based projects under the terms of the Creative Commons licence. Thank you.
BY NC SA



A Song of Ice and Fire
Speculative World Map
Confirmed locations
City
Town
Castle
Ruin
Other
Speculative locations
City
Town
Castle
Ruin
Other
miles
Note about map scale
Notes about the speculative parts of this map
Numbered locations
The Wall
1. Westwatch-by-the-Bridge
2. Shadow Tower
3. Sentinel Stand
4. Greyguard
5. Stonedoor
6. Hoarfrost Hill
7. Icemark
8. Nightfort
9. Deep Lake
10. Queensgate
11. Castle Black
12. Oakenshield
13. Woodswatch-by-the-Pool
14. Sable Hall
15. Rimegate
16. Long Barrow
17. Torches
18. Greenguard
19. Eastwatch-by-the-Sea
The Riverlands
20. BWB hideout
21. Inn of the Kneeling Man
22. Lord Harroway's Town
23. Inn (They Lay with Lions)
24. Unnamed village
25. Lord Lychester's Keep
26. Lady of the Leaves
27. Sallydance
28. Lord Goodbrook's Village
29. Fennytree
Other areas
30. Old Stone Bridge Inn
31. Lord Hewett's Town
32. Shandystone
The Shivering Sea
Bay of Ice
Bay of Seals
Ibben
N
Iron Islands
The Narrow Sea
The Sunset Sea
Westeros
Summer Sea
Summer Islands
The Flatlands
The Disputed Lands
The Dothraki Sea
Essos
The Red Waste
Sothoryos
The Jade Sea
A Song of Ice and Fire Speculative World Map
Version 1.0 – Released. February 2012
Intellectual property of A Song of Ice and Fire this map and all locations copyright George RR Martin
This work is licensed under the Creative Commons Attribution-NonCommercial-ShareAlike 3.0 Unported License.
BY NC SA
This map was created as a fan project and may be used in other fan based projects under the terms of the Creative Commons licence. Thank you.

# වෙස්ටෙරොස් හි ඉතිහාසයට එබී බැලීමක්

මෙම කාල වකවානු විස්තරය මගින් වෙස්ටෙරෝස් හා එස්සොස් හි ඉතිහාසයේ සිදුවුනු ප්‍රධාන සිදුවීම් ගැන අවබෝධයක් කියවන්නාට ලබා ගත හැකි වනු ඇත.

ප්‍රවාදවලට අනුව වෙස්ටෙරොස්හි ඉතිහාසය වසර දොළොස්දහසකට එහා දිවයයි. එනමුදු එහි ලිඛිත ඉතිහාසයක් ඇරඹෙන්නේ අන්දාල් ආක්‍රමණවලින් පසුව ය. මෙහි ඇති බොහෝ සිදුවීම් ඒවා සිදුවීමෙන් වසර දහස් ගණනකට පසු ග්‍රන්ථාරූඪ වූ ඒවා බැවින් නිවැරැදි කාල වකවානු පිළිබඳ යම් යම් මතභේද ඇත.

ජයග්‍රාහක ඒගන් වෙස්ටෙරොස්වලට ගොඩබට වර්ෂය වසර **1** ලෙස සලකා ඇත. ඊට පෙර සිදුවූ සිද්ධීන් හි කාලය (-) ලකුණක් මගින් පෙන්නුම් කෙරේ.

උදා යුගය ---------------------------------------------------------------------

ප්‍රාග් ඓතිහාසික යුගය

මිනිසුන් පැමිණීමට පෙර. වෙස්ටෙරොස්වල වනාන්තරයේ දරුවන් නමින් හැඳින්වෙන සිරුරින් කුඩා මානව කොට්ඨාසයක් සහ යෝධයන් හා වෙනත් මායාකාරී ජීවි විශේෂ දිවි ගෙවූහ.

## -12,000 පමණ

මුල් මිනිසුන් ගේ ආක්‍රමණ. එස්සොස් හා වෙස්ටෙරොස් යා කරන පටු ගොඩබිම් තීරුව ඔස්සේ මුල්ම මානව ආක්‍රමණ සිදුවිය. මෙය නැවැත්වීම සඳහා වනාන්තරයේ දරුවන් විසින් සිය මායා බලය යොදවා මෙම ගොඩබිම් තීරුව විනාශ කර දමන ලදී. එය අදටත් 'ස්ටෙප්ස්ටෝන්' නමැති කුඩා දූපත් සමූහය ලෙසින් පටු මුහුදු තීරයේ දැකිය හැක.

කෙසේ නමුදු වඩා විශාල, බලවත්, දියුණු තාක්ෂණයෙන් යුක්ත වූ මුල් මිනිසුන් එස්සොස් හි සිට නැවු මාර්ගයෙන් සිය ආක්‍රමණ දිගටම සිදු කල අතර වෙස්ටෙරොස් හි වඩ වඩාත් ගැඹුරට පැළපදියම් වී රාජධානි පිහිටවූහ.

## -10,000 පමණ

සහජීවනය පිළිබඳ වූ සාම ගිවිසුම. වසර ගණනාවක් පැවැති යුද්ධ අවසානයේ මුල් මිනිසුන් හා වනාන්තරයේ දරුවන් අතර මුහුණු දූපතේ දී සාම ගිවිසුමක් අත්සන් කෙරින. මේ ගිවිසුම මගින් මුල් මිනිසුන්ට විවෘත තැනිතලා බිම්වල පාලනයත් වනාන්තරයේ දරුවන්ට වන බිම්වල පාලනයත් වශයෙන් බෙදා වෙන් කර දෙනු ලැබින.

කාලාන්තරයක් ගෙවී යද්දී මුල් මිනිසුන් විසින් වනාන්තරයේ දරුවන් ගේ දෙවිවරුන් වූ 'වනාන්තරයේ නමක් හා මුහුණක් නැති දෙවිවරුන්' ඇදහීමට හුරු වින.

වීරයින් ගේ යුගය ------------------------------------------------------------

## -10,000 පමණ

වීරයින් ගේ යුගය. සාමය, සහජීවනය හා සමෘද්ධිය රජයූ කාලයකි. මුල් මිනිසුන් හා වනාන්තරයේ දරුවන් අතර වූ සාම ගිවිසුම වසර හාරදහසක් පමණ කල් පැවතුනු අතර මේ වනවිට ඔවුන් දෙපිරිසම වඩා වඩාත් එකිනෙකාට ලංවූහ. මුල් මිනිසුන් සිය සම්ප්‍රදායික මතිමතාන්තර හා ඇදහිලි බොහොමයක් ඉවත දමා වනාන්තරයේ දරුවන් ගේ සම්ප්‍රදායයන් හා බැඳිනි.

වෙස්ටෙරොස් හි බොහෝ වංශාධිපති පෙළපත් සිය මූලය මේ සමය දක්වා ඇදගෙන යති. ස්ටාර්ක් වංශය හා වින්ටර්ෆෙල් ගොඩනැගූ 'බ්‍රැන්ඩන් නම් ගොඩනගන්නා', ලැනිස්ටර් වංශය හා කාර්ස්ටලී රොක් ගොඩනැගූ 'දක්ෂ ලැන්', රීච් හි ගාර්ඩිනර් වංශය ගොඩනැගූ 'ගාර්ත් ග්‍රීන්හැන්ඩ්' මේ අතර වෙති. ඊට අමතරව ස්ටෝර්ම්ලැන්ඩ් හි කුණාටු රජ පරපුර හා ස්ටෝර්ම්ස් එන්ඩ් ගොඩනැගූ 'ඩුරාන්' සහ යකඩ දූපත්වල පළමු රජු වූ 'අළු රජා' ද මීට අයත් ය.

## -8,000 පමණ

දීර්ඝ රාත්‍රිය. වෙස්ටෙරොස්වලට මෙතෙක් උදාවූ දිගම, ශීතලම හා අඳුරුම ශීතකාලය. උතුරේ සිට පැමිණි 'අනික් එවුන්' රාජධානිය ආක්‍රමනය කර මිනිසුන් සමූල ඝාතනය කරමින් එය සිය විනාශයේ මුව විටටම රැගෙන ආහ. 'හිරු උදාවේ සටන' නමින්

හැඳින්වෙන අවසන් සටනේදී එකට එක්වූ මුල් මිනිස්සු හා වනාන්තරයේ දරුවෝ අනික් එවුන් පරාජය කර ඔවුන්ව ඈත උතුරටම පළවා හැරියහ. 'අවසන් විරුවා' සහ 'ලයිට්බ්‍රින්ගර්' නම් අසිපතකින් සටන් වැදුනු 'අසෝර් අහායි' මේ කාලයේ නම කියැවෙන පුද්ගලයින් ය.

ප්‍රාකාරය පිහිටුවීම. අනික් එවුන් පරාජය කිරීමෙන් පසු බ්‍රැන්ඩන් නම් ගොඩනගන්නා විසින් මුල් මිනිසුන් ගේ, වනාන්තරයේ දරුවන් ගේ හා යෝධයින් ගේ ආධාරය ඇතුව ප්‍රාකාරය ගොඩ නැංවී ය. උතුරින් එන ආක්‍රමණවලින් වැළකීම සඳහා මෙය ගොඩනැංවීමේදී අයිස්වලට අමතරව මන්ත්‍ර ශාස්ත්‍රයද ප්‍රයෝජනයට ගන්නා ලදී.

ප්‍රාකාරය රැකීම පිනිස 'නිශා රැකුම් බලකාය' පිහිටුවන ලදී.

නිශා රජු. නිශා රැකුම් බලකායේ දහතුන්වන අණ දෙණ නිළධාරියා සිය දිවුරුම බිඳ දමා බලකාය සිය පෞද්ගලික හමුදාවක් මෙන් භාවිත කරමින් කැරැල්ලක් ඇරඹී ය. වින්ටර්ෆෙල්හි ස්ටාර්ක්වරුන් හා ප්‍රාකාරයට එහා රජු වූ ජොරාමන් එක්ව සටන් මෙහෙයවා නිශා රජුව පැරදවී ය.

අන්දාල් ආක්‍රමණ ------------------------------------------------------------

**-6,000** පමණ

සත්‍ය ලබ්ධිය පිහිටුවීම. එස්සොස් හි බටහිර මායිමේ ඇති 'අන්දලෝස් කඳු පන්ති' අතරේ දී 'සප්තකයේ සත්‍ය ලබ්ධිය' එළි දකින ලදී. මේ දෙවියන් විසින් අන්දාල් වරුන්ට පටු මුහුදෙන් එතෙර වෙස්ටෙරොස් ආක්‍රමණය කිරීමට මඟ පෙන්වන ලදී.

අන්දාල් ආක්‍රමණය. අන්දාල් වරුන් වෙස්ටෙරොස් හි නැගෙනහිර මායිමේ 'අතැඟිලි' නමින් හඳුන්වනු ලබන (දැන් ඊරින් මිටියාවත) බිමට ගොඩබැස්සහ. සප්තාග්‍ර තරු කෙටූ පපු සහිතව සප්තකයේ සත්‍ය ලබ්ධික ධජ යටතේ වානේමය ආයුධවලින් සන්නද්ධ වී පැමිණි ඔවුහු මුල් මිනිසුන් හා වනාන්තරයේ දරුවන් යන දෙකොටසම සමඟින් යුධ වැදුනහ.

සියවස් ගණනාවක් පැවැති යුද්ධ අවසානයේ දකුණුකරයේ රාජධානි හය එකින් එක අන්දාල් වරුන්ට යටත් විය. උතුර පමණක් මුල් මිනිසුන් ගේ පාලනයට නතුව පැවතුනි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ උපාය මාර්ගිකව වැදගත් බලකොටුවක් වන 'මෝට් කේය්ලින්' මගින් බෙල්ල හරහා උතුරට ඇතුළුවීම වැළැක්වීමයි.

නමුත් මේ සටන්වල ප්‍රතිඵලයක් ලෙස වනාන්තරයේ දරුවන් කෙමෙන් කෙමෙන් මිනිසුන්ගෙන් ඈත් වී තව තවත් වනාන්තර තුළට හා ප්‍රාකාරයෙන් ඔබ්බට පසු බැසීමට පටන් ගති.

**-4,000 පමණ**

යකඩ දූපත් අන්දාල් පාලනයට නතු වීම. 'උරොන් රෙඩ්හෑන්ඩ්' ගෙන් ඇරඹී වසර දහසකටත් වඩා කල් පැවැති යකඩ දූපත්වල පළමු රාජ පරම්පරාව මෙයින් අවසන් විය. එනමුදු අනිකුත් පෙදෙස්වලට වෙනස්ව මෙහිදී අන්දාල් වරුන් එහි පැවැති 'ගිලුනු දෙවියා ගේ' ආගමට හා සම්ප්‍රදායික  සිරිත් විරිත් වලට අනුගත වූහ.

වැලීරියානු යුගය --------------------------------------------------------------

**-5,000 පමණ**

වැලීරියානු රාජධානියේ ආරම්භය. එස්සොස් හි දකුණු දිග වැලීරියන් අර්ධද්වීපයේ විසූ සාමකාමී බැටළු එඬේරුන් විසින් අර්ධද්වීපය මුදුනේ වූ දැවැන්ත ගිනිකඳු වළල්ල ආශ්‍රිතව මකරුන් සැරිසරන බව සොයාගැනිනා. සිය මායා බලය භාවිත කල ඔවුහු මකරුන් හීලෑ කලහ. මෙම මකරුන් ගේ ශක්තිය මතින් නැගී සිටි ඔවුහු යාබද ප්‍රදේශ එකින් එක නතුකර ගන්නට වූහ.

සිස්කාර් යටත් කිරීම. එස්සොස් හි පැවැති බලසම්පන්නම රාජධානිය වූ 'සිස්කාරි අධිරාජ්‍යය' සමග සටන් වැදුනු වැලීරියානුවෝ දැවැන්ත යුද්ධ පහක් අවසානයේ සිය මකරුන් ගේ සහයෙන් පූර්ණ ජයක් ලැබූහ. අවසාන යුද්ධයේදී සිය මකරුන් ගේ මකරාග්නියෙන් සිස්කාරි අගනුවර බිමටම සමතලා කල වැලීරියානුවෝ සියලුම මිනිසුන් මරා දැමූහ. අධිරාජ්‍ය බිඳී ගියේ ය. 'වහල් වෙළෙඳුන්ගේ මුහුදු බොක්ක' ආශ්‍රිතව පැවැති සෙසු සිස්කාරි නගර වැලීරියානු ආධිපත්‍යයට නතු විය.

**-700 පමණ**

රොයිනාර් ආක්‍රමණය. නැගෙනහිර යටත් කිරීමෙන් පසු වැලීරියානුවෝ කෙමෙන් කෙමෙන් බටහිර දෙසට විහිදුනහ. නමුත් රොයින් නදිය අසබඩ පිහිටි රොයිනිෂ් නගර හා ගැටීමට මේ ගමන අතරතුරේ දී ඔවුනට සිදු විය. 'ශ්‍රේෂ්ට ගැරින් කුමරු' යටතේ එක් රැස් වූ මිලියන කාලක රොයිනාර් හමුදාවක් වැලීරියානුවන්ට එරෙහිව සටන් වැදුනද ඔවුන් ගේ මකරුන් හමුවේ මුලුමනින්ම පරාජයට පත් වූහ.

රොයිනාර් පසුබැසීම. රණකාමී රොයිනාර් රැජිණක වූ 'නයිමේරියා', ගැරින් ගේ සටනින් ඉතුරු වූ මිනිසුන්, ගැහැණුන් හා ළමයින් නැවු දසදහසක පුරවාගෙන පටු මුහුදින් එතෙර වී වෙස්ටෙරොස් හි දකුණු දිග අර්ධද්වීපය වන ඩෝර්න් හි සරණාගත රැකවරණ පැතී ය. 'මෝර්ස් මාර්ටෙල්' උතුමානන් හා විවාහ වූ ඇය ඩෝර්න් එක්සේසත් කිරීම ඇරඹී ය. ඔවුන් දෙදෙනා විසින් ඩෝර්න් හි රජ පෙළපත වන 'මාර්ටෙල් වංශය' පිහිටවන ලද අතර මෝර්ස් උතුමානන් බොහෝ රොයිනිෂ් සම්ප්‍රදායයන් සිය රාජධානිය තුළට ඇතුළු කරගත්තේ ය.

**-500 පමණ**

නිරිතදිග එස්සොස් යටත් කිරීම. වැලීරියානුවන් විසින් දැනට නිදහස් වෙළෙඳ නගර තිබෙන නිරිතදිග එස්සොස් ප්‍රදේශ සහමුලින්ම පාගේ යටත් කරන ලදී. මෙයින් මිදී උතුරට පලා ගිය දහස් ගණනක් වූ සරණාගතයින් විසින් කඳුවලින් වටවූ කුඩා කලපුවක් ආශ්‍රිතව රහසිගත 'බ්‍රාවොස්' නගරය පිහිටුවන ලදී.

**-200 පමණ**

ඩ්‍රැගන්ස්ටෝන් පිහිටුවීම. වැලීරියානුවන් විසින් වෙස්ටෙරොස් හි නැගෙනහිර මුහුදු සීමාවේ 'කළුදිය බොක්ක' ආශ්‍රිතව පිහිටි කුඩා දිවයිනක් යටත් කලහ. ටාර්ගේරියන් නම් වූ වැලීරියානු වංශාධිපති පවුලක් එහි බලකොටුවක් ගොඩනංවා පාලනය ආරම්භ කලහ.

**-100 පමණ**

වැලීරියාවේ විනාශය. මෙයට පැහැදිළි හේතුවක් නොදන්නා නමුත් අර්ධද්වීපය මුදුනේ වූ ගිනිකඳු වළල්ල විදාරනය වීම හා එමගින් වූ මුහුද ගොඩගැලීම බලපාන්නට ඇති බව පොදු

මතය යි. අගනුවර මුලුමනින්ම පාහේ විනාශ වූ අතර වැලීරියානු මකරුන් සම්පූර්ණයෙන්ම අතු ගැවී ගියේ ය. අධිරාජ්‍යය බිඳ වැටින. එහි කොලණි එකින් එක සිය නිදහස ප්‍රකාශ කරන ලද අතර නිදහස් වෙළෙඳ නගර හා වහල් වෙළෙඳුන්ගේ මුහුදු බොක්ක ආශ්‍රිත නගර වශයෙන් අද දක්වා පවතී.

බ්‍රාවොස් එළිදරවු කිරීම. සිය සුවිසල් නාවික බලය හා දැවැන්ත ආර්ථික ශක්තිය නිසා නිදහස් වෙළෙඳ නගර අතුරින් බලසම්පන්නම නගරය වීමට මොවුනට හැකි විය. එස්සොස් හි දකුණුකරයේ නැවතත් සිස්කාරි බලය කෙමෙන් කෙමෙන් හිස ඔසවන්නට පටන් ගති. වැලීරියානුවන් විසින් මෙතෙක් යටපත් කර තිබුනු ඊසානදිග සුවිසල් තැනිතලාවල සිටි සංචාරක රණකාමී ම්ලේච්ඡයන් නිර්භය වීම ඇරඹී ය. ඔවුන් ගේ ප්‍රමුඛතම ගෝත්‍රය වන 'ඩොත්රැකියන්' යාබද ප්‍රදේශවලට කඩා පැනීම ඇරඹූහ.

ඩ්‍රැගන්ස්ටෝන් හි වසන ටාර්ගේරියන්වරු බටහිර අර්ධ ගෝලයේ සිටින අවසාන මකරුන් තිදෙනා සමගින් සිය නව රාජ්‍යය තුළ තව තවත් පැලපදියම් වූහ.

රාජධානි සප්තකය ------------------------------------------------------------

## -3,000 පමණ

රාජධානි හය පිහිටුවීම. අන්දාල් ආක්‍රමණයෙන් සියවස් ගණනාවක් ගෙවී යද්දී දකුණුකරයේ වූ මුල් මිනිසුන් ගේ රාජධානි බිඳ වැටී බලසම්පන්න අන්දාල් රාජධානි හයක් පිහිටවනු ලැබී ය.

වනචාරී ආක්‍රමණය. ප්‍රාකාරයෙන් එපිට රජුන් වූ 'ගෙන්ඩල් හා ගෝර්න්' සොයුරන් යටතේ එක් රැස් වූ වනචාරී සේනාවක් ප්‍රාකාරයට යටින් වූ උමං සමූහයක් ඔස්සේ පැමිණ රාජධානිය ආක්‍රමණය කලහ. නමුත් ස්ටාර්ක් රජතුමා යටතේ ඔවුන් පරාජය ලැබී ය.

## -700 පමණ

ස්ටාර්ක් වංශය විසින් සිය ප්‍රධානම ප්‍රතිවාදීන් වූ 'බෝල්ටන් වංශය' පරාද කිරීම. 'කාර්ලන් ස්ටාර්ක්' විසින් 'කාර්ස්ටාර්ක් වංශය' පිහිටුවීම.

යකඩ මිනිසුන් ගේ නැගීම. යකඩ දූපත්වල යකඩ මිනිස්සු සිය පාලනයේ උච්ඡතම කාලයේ දී දකුණේ 'ආර්බර්' හා 'ඕල්ඩ්ටවුන්' සිට උතුරේ වලස් දූපත දක්වා මුහුදුබඩ පෙදෙස් පාලනය කලහ.

**-350 පමණ**

හැරන්හෝල් පිහිටුවීම. ගංගා නිම්නය ආක්‍රමණය කල 'හැරන් හෝර්' නමැති යකඩ රජතුමා 'හැරන්හෝල්' බලකොටුව පිහිටවීය.

ටාර්ගේරියන් වංශය -----------------------------------------------------------

**-2 සිට 1 දක්වා**

ජයග්‍රහණයේ යුද්ධය. වෙස්ටෙරොස් ආක්‍රමණය කල 'ජයග්‍රාහක ඒගොන්' වසර දෙකක් වැනි කෙටි කලක් තුළ රාජධානි හතෙන් හයක් යටත් කලේ ය. මේ රාජධානි හය එක් කර තනි රාජධානියක් පිහිට වූ ඔහු 'කින්ග්ස් ලෑන්ඩින්ග්' වල නව අගනුවරක් තනා පාලනය ඇරඹී ය. ඔහුට ඩෝර්න් යටත් කිරීමට නොහැකි වූ අතර එය තව දුරටත් නිදහස් රාජ්‍යයක් වශයෙන් පැවතින.

අවසාන කුණාටු රජතුමා වූ 'උඩඟු ආර්ගිලැක්' විනාශ කිරීම නිසා ස්ටෝර්ම්ස් එන්ඩ් හි පාලනය සිය අවජාතක අර්ධ-සොයුරා වන 'ඔරිස් බරතියන්' ට පැවරී ය. රීච් හි අවසාන රජු මරාදැමීම නිසා 'හයිගාර්ඩන්' හි පාලනය 'හාර්ලන් ටිරල්'ට පැවරී ය. 'රිවර්රන්' හි 'එඩ්මින් ටලී' ගංගා නිම්නයේ පාලකයා වශයෙන් පත් කරන ලදී. 'පයික්' හි 'විකන් ග්‍රේජෝයි' යකඩ දූපත්වල පාලකයා ලෙස පිහිටුවන ලදී.

**37 සිට 48 දක්වා**

සත්‍ය ලබ්ධිකයින් ගේ නැගී සිටීම. ඒගොන් ගේ මරණයෙන් පසු ඔහු පුත් 'ඒනිස් I' සිහසුනට පත් විය. නමුත් ඔහු ගේ නීත්‍යානුකූල බව ප්‍රශ්න කල සප්තක පූජකයෝ ටාර්ගේරියන්වරුන්ට විරුද්ධව කැරැල්ලක් ඇරඹූහ. දුර්වල පාලකයකු වූ ඒනිස් විසින් සිය අර්ධ-සොයුරා වූ 'මේගර්', රජතුමා ගේ හස්තය බවට පත්කොට කැරැල්ල මැඩීම ඔහුට බාර දෙන ලදී. ඔහු ඉතා කුරිරු හා දුර්දාන්ත අයුරින් කැරැලිකරුවන් ඝාතනය කරන ලදී.

**48**

සංසිඳුවන ජහරිස්. 'කෘර මේගර්' ලෙසින් මේ වන විට නම් ලබා සිටි මේගර් රජතුමාගෙන් පසු 'ජහරිස් I' රජ විය. ඔහු කැරැලිකරුවන් ඝාතනය නවතා දමා සාම ගිවිසුමක් ඇති කලේ ය. ගිවිසුම අනුව රණකාමී පූජකයින් සිය ආයුධ බාර දී ටාර්ගේරියන් පාලනයට නතු විය යුතු විය. මොහු ගේ රාජ්‍ය කාලය සාමකාමී හා සෞභාග්‍යවත් එකක් ලෙස සැලකේ.

## 129 සිට 131 දක්වා

මකර නැටුම. රාජධානි සප්තකයේ පළමු සිවිල් යුද්ධය. 'ඒගොන් II' හා ඔහු ගේ අර්ධ-සොයුරිය 'රේනිරා ටාර්ගේරියන්' සිය පියා ගේ සිහසුන බෙදාගැනීම පිණිස සටන් වැදුනහ. මේ යුද්ධය නිසා ඔවුන් දෙදෙනා ද, ටාර්ගේරියන් වංශිකයන් බහුතරයක් ද, ඔවුන් සතුව සිටි අවසාන මකරුන් ද මිය ගියහ. රේනිරා ගේ පුත් ඒගොන් III රජකමට පත් විය.

## 131 සිට 157 දක්වා

අවසන් මකරා ගේ මරණය. ටාර්ගේරියන්වරුන් සතුව සිටි අවසන් මකරුන් එතරම් විශාල නොවූ දුර්වල එවුන් විය. අවසාන මකරා බිත්තර කිහිපයක් ඉතිරි කර තබා ගියද ඒවායින් පැටවුන් බිහි නොවුනි. පසු කාලීනව ඒවා නැති වී හෝ විනාශ වී හෝ ගියේ ය. මකරුන් වඳ වී ගිය සත්ත්ව කොට්ඨාසයක් ලෙස සැලකෙන්නට පටන් ගති.

## 157 සිට 161 දක්වා

ඩේරන් විසින් ඩෝර්න් යටත් කිරීම. වයස දහහතරේ දී සිහසුනට පත්වූ 'ඩේරන් I' ඒගොන් ඇරඹූ කාර්යය නිමා කලේ ය. එහෙත් අවාසනාවට ඔහු ඩෝර්න් හි පාලනය පිණිස තබා ආවේ මාර්ටෙල්වරුන් හා වසර දහස් ගණනක් පුරා පසමිතුරු ටිරල් කෙනෙකි. ඩෝර්න් ඔහුට හා යකඩ සිහසුනට එරෙහිව නැගී සිටියේ ය. අලුත් හමුදාවක් සමග නැවත පැමිණි ඩේරන් සටනේ දී මියගියේ ය. ඔහු ගේ ඥාති සොයුරු 'මකර නයිට්වර ඒමන්' සිරභාරයට ගැනුනු අතර හතලිස්දහසක් සෙබළු මියගියහ.

## 161 සිට 171 දක්වා

ආශීර්වාද ලැබූ බේලර්. ඩෝර්න් සමග සාම ගිවිසුමක් ඇති කරගත්තේ ය. සිය ඥාති සොයුරු මකර නයිට්වර ඒමන් නිදහස් කරගත්තේ ය. කින්ග්ස් ලැන්ඩින්ග් හි දැවැන්ත

සප්තක දේවස්ථානය ගොඩ නැංවී ය. මෙය පසුකාලීනව 'බේලර් ගේ සප්තකය' යනුවෙන් නැවත නම් කෙරින.

ඔහු ගේ සොයුරිය ඩේනා සිය ඥාතියකු වූ ඒගොන් (පසුව ඒගොන් IV) සමග ඇති කරගත් සබඳතාව නිසා අවජාතක 'ඩේමන් බ්ලැක්ෆයර්' බිහි විය.

**171 සිට 172 දක්වා**

විසේරිස් II රාජ්‍ය කාලය.

**172 සිට 184 දක්වා**

ඒගොන් IV රාජ්‍ය කාලය. 'නුසුදුසු ඒගොන්'. වෙස්ටෙරොස් ඉතිහාසයේ ඉතා නරකම රජු. සිය මරණ මංචකයේ දී තමා ගේ සියළුම අවජාතකයින් (හා ඔවුන් ගේ දරුවන් පවා) නීත්‍යානුකූල කලේ ය. ඩේමන් බ්ලැක්ෆයර්, ඒගර් රිවර්ස්, බ්‍රින්ඩන් රිවර්ස් හා ශීරා සීස්ටාර් මේ අතර වෙති.

**184 සිට 209 දක්වා**

ඩේරන් II රාජ්‍ය කාලය. ඒගොන් II ගේ පුතා වුවද සිය මව හා මකර නයිට්වර ඒමන් කුමරා අතර තිබුනු සමීප සම්බන්ධය නිසා මොහු ගේ නීත්‍යානුකූල බව ගැන ප්‍රශ්න කෙරින.

**195 සිට 196 දක්වා**

බ්ලැක්ෆයර් කැරැල්ල. රාජධානියේ දෙවන සිවිල් යුද්ධය. ඩේරන් II ගේ නීත්‍යානුකූල බව ප්‍රශ්න කල ඩේමන් බ්ලැක්ෆයර් තමාට පක්ෂපාතී වංශාධිපතියන් රැසක් සමග එක්ව කැරැල්ලක් ඇරඹී ය. සිය බලසේනා කින්ග්ස් ලැන්ඩින්ග් දෙසට මෙහෙය වූ නමුත් 'රතුතණ පිට්යේ යුද්ධයෙන්' පරාද විය. ඔහු මියගිය නමුත් ඔහු ගේ පුතුන් කිහිප දෙනෙක් නිදහස් නගරවලට පලා යන්නට සමත් වූහ.

**197**

ඩෝර්න් රාජධානි සප්තකයට එක් වීම. ඩේරන් II ගේ නැගනිය ඩනේරිස්, මාරන් මාර්ටෙල් හා විවාහ වීම මගින් ඩෝර්න් නිල වශයෙන් යකඩ සිහසුනට අවනත විය.

**209 සිට 221 දක්වා**

ඒරිස් I රාජ්‍ය කාලය. සිහසුනට උරුමකරු වූ බේලන් ටාර්ගේරියන්, තරගාවලියක් අතරතුර සිදු වූ අනතුරකින් මිය ගියා බැවින් ඩේරන් II ගේ දෙවෙනි පුතා ඒරිස් රජකමට පත් විය.

**212**

දෙවෙනි බ්ලැක්ෆයර් කැරැල්ල.

**221 සිට 233 දක්වා**

මේකර් I රාජ්‍ය කාලය. ඔහු ගේ රාජ්‍ය කාලය තුළ දී සිය වැඩිමල් පුතුන් දෙදෙනා ඩේරන් හා ඒරියන් දෙදෙනා මියගිය අතර තෙවන පුත් ඒමන් මේස්ටර්වරයකු බවට පත් විය. සටනක දී මේකර් රජු මියගිය අතර ඒමන් රජකම ප්‍රතික්ෂේප කලේ ය. එනිසා ඔහු ගේ සිවුවන පුත් ඒගන්, ඒගන් V නමින් කිරුළු පැළඳී ය.

**226**

වනචාරීන් ගේ නැගීසිටීම. ප්‍රාකාරයට එපිටින් වූ රජු රේමන් රෙඩ්බියර්ඩ් යටතේ එක් රැස් වූ වනචාරී සේනා ප්‍රාකාරයෙන් මෙපිටට පැන උතුර ආක්‍රමණය කලහ. නමුත් විලම් ස්ටාර්ක් යටතේ වූ උතුරු සේනාවක් විසින් 'දිගු විල අසබඩ සටනින්' මොවුන් පැරදවී ය.

**259**

සමර්හෝල් හි ශෝකාන්තය. ඒගොන් V හා ඔහු ගේ උරුමක්කරු ඩන්කන් කුමරු අනතුරකින් මිය යෑම.

**259 සිට 262 දක්වා**

ජහරිස් II රාජ්‍ය කාලය.

## 259-261 පමණ

පැන්ස නවයේ රජුන් ගේ යුද්ධය. මේලිස් බ්ලැක්ෆයර් ප්‍රමුඛ නවදෙනාගේ කණ්ඩායම ටයිරොෂ් නිදහස් වෙළෙඳ නගරය හා ස්ටෙප්ස්ටෝන් යටත් කර ගැනෙති. රාජධානි සප්තකයට එරෙහිව සිදුකරන යුද්ධයේ දී බැරිස්ටාන් සෙල්මි විසින් මේලිස් මරා දැමීය. බ්‍රින්ඩන් ටලී යුද්ධයෙන් වර්ණ දිනයි.

## 262 සිට 283 දක්වා

ඒරිස් II ගේ රාජ්‍ය කාලය. පිස්සු රජා. ඔහු ගේ හස්තය වන්නේ තරුණ කෲර ටයිවින් ලැනිස්ටර් ය.

## 276 (හෝ 277)

විවාහ ප්‍රතික්ෂේපය. ටයිවින් ලැනිස්ටර් සිය දියණිය සෙර්සි රේගාර් කුමරුට විවාහ කරදීමට අදහස් කලද ඒරිස් එය ප්‍රතික්ෂේප කරයි. රේගාර් ඩෝර්න් හි ඊලියා මාර්ටෙල් කුමරිය හා විවාහ වෙයි.

## 276 පමණ

ඩස්කන්ඩේල් හි විරෝධය. ඩාර්ක්ලින් වංශය යකඩ සිහසුනට බදු ගෙවීම ප්‍රතික්ෂේප කරයි. මෙය තමා විසින්ම විසඳීමට සිතා ඩස්කන්ඩේල් වලට යන ඒරිස් එහි සිරකරුවකු බවට පත්වෙයි. මාස හයක් තිස්සේ ඩස්කන්ඩේල් වටලනු ලබන අතර අන්තිමේදී බැරිස්ටාන් සෙල්මි විසින් රජුව බේරා ගනු ලැබේ. ඒරිස් ගේ උම්මත්තකබව ඇති වූයේ මෙම සිදුවීමෙන් පසු බැව් කියැවේ.

රොබර්ට් ගේ කැරැල්ල -----------------------------------------------------------

## 281

බොරු වසන්තයේ වසර. වෙන්ට් උතුමානන් විසින් හැරන්හෝල් හි දැවැන්ත තරගාවලියක් සංවිධානය කරනු ලැබේ. රේගාර් කුමරුද එම තරගාවලියට සහභාගි වී ජයග්‍රහණය කරයි. එනමුදු 'ආලයේ හා සුන්දරත්වයේ රැජිණ' වශයෙන් ඔහු නම් කරන්නේ

සිය බිරිඳ වන ඊලියා නොව රොබර්ට් බරතියන් විවාහ ගිවිසගෙන සිටින ලියානා ස්ටාර්ක් ව ය.

රජවනයේ සහෝදරත්වය. මෙනමින් යුතු අපරාධකරුවන් පිරිසක් ආතර් ඩේන් ප්‍රමුඛ රාජපාක්ෂික සේනාවක් විසින් මැඩලෙති. මේ සටන අතරතුරේ දී පෙන්වන දක්ෂකම් නිසා තරුණ සහචරයකු වන ජේමි ලැනිස්ටර් නයිට් පදවියට උසස් කෙරේ. ඔහු පසුව රාජ්‍යාරක්ෂක බලකායට බැඳෙන අතර එයින් කුපිත වන ටයිවින් ලැනිස්ටර් රජු ගේ හස්තය තනතුරෙන් ඉල්ලා අස් වී නැවත කාර්ස්ටලී රොක් බලා යයි.

## 282 සිට 283 දක්වා

රොබර්ට් ගේ කැරැල්ල. රේගාර් ටාර්ගේරියන් විසින් ලියානා ස්ටාර්ක්ව පැහැර ගනු ලැබේ. ඇගේ පියා හා වැඩිමල් සොයුරා යුක්තිය ඉටුකරන මෙන් ඒරිස් රජුගෙන් ඉල්ලන නමුදු පිස්සු රජා ඔවුන් දෙදෙනාව මරා දමයි. ඉන්පසු ඒරිස් විසින් ජොන් ඒරින් ගේ ආරක්ෂාව යටතේ පසුවන රොබර්ට් බරතියන් හා එඩාර්ඩ් ස්ටාර්ක් ගේ හිස් දෙක ඉල්ලනු ලැබේ. එහෙත් ඊට අවනත නොවන ඒරින් වංශය, ස්ටාර්ක් වංශය හා බරතියන් වංශය රජුට විරුද්ධව කැරැල්ලක් අරඹති. සිය අතීත මී-මුත්තකු වන ඒගොන් V අනුව යමින් තමාටද රජ කමට උරුමයක් ඇති බව රොබර්ට් ප්‍රකාශ කරයි.

හස්ටර් ටලී උතුමානන් ද කැරැල්ලට එක්වෙයි. ටිරල්වරුන් රාජපාක්ෂිකව සිටින අතර ඔවුහු රොබර්ට් ගේ සොයුරු ස්ටැනිස් පාලනය උසුලන ස්ටෝර්ම්ස් එන්ඩ් වටලති. රජු ගේ හස්තය ජොන් කොනින්ග්ටන් 'සණ්ටා සටනින්' පරාජය ලබයි. රජු ඔහුව නිදහස් නගර වෙත පිටුවහල් කරයි. ත්‍රිශූලය අසල සටනින් කැරැලිකාර හමුදා ජය ලබති. රේගාර් කුමරා රොබර්ට් අතින් මිය යයි. ඒරිස් රජු සිය ශරීරාක්ෂකයා වන ජේමි ලැනිස්ටර් අතින් මිය යයි. ලැනිස්ටර් හමුදා කින්ග්ස් ලැන්ඩින්ග් මංකොල්ල කති. ඊලියා මාර්ටෙල් කුමරිය හා ඇගේ දරුවන් වන ඒගොන් හා රේනිස් ටාර්ගේරියන් අමු අමුවේ මරා දැමෙති. මේ නිසා එඩාර්ඩ් හා රොබර්ට් අතර මත ගැටුමක් ඇති වේ.

ලියානාව සිරකාරියක් වශයෙන් තබා තිබෙන 'ප්‍රීතියේ බලකොටුවට' කඩා වදින එඩාර්ඩ් ස්ටාර්ක් හා හොව්ලන්ඩ් රීඩ් එහි ආරක්ෂාවට තබා තිබෙන රාජ්‍යාරක්ෂක නයිට්වරුන් මරා ලියානා නිදහස් කරගනිති. එනමුදු ඇය සිටින්නේ මිය යමිනි.

රොබර්ට් රාජධානි සප්තකයේ රජු වෙයි. ඔහු සෙර්සි ලැනිස්ටර්ව විවාහ කරගනියි. එඩාර්ඩ් සිය අවජාතක පුතනුවන් හා නැවත වින්ටර්ෆෙල් බලා පිටත්වෙයි. ටාර්ගේරියන් පාක්ෂිකයින් විසින් ඒරිස් ගේ බාල දරු දෙදෙනා විසේරිස් හා ඩනේරිස් හොර රහසේ නිදහස් නගර වෙත පිටත් කර හරිනු ලැබේ.

රොබර්ට් ගේ රාජ්‍ය සමය -----------------------------------------------------

## 289

ග්‍රේජෝයි කැරැල්ල. බේලන් ග්‍රේජෝයි යකඩ දූපත් වල රජු වශයෙන් නැගී සිටියි. ඔහුව පරදවන අතර ඔහු ගේ වැඩිමහල් පුතුන් දෙදෙනා මිය යයි. රොබර්ට් රජු ඔහු ගේ යටත් වීම පිළිගනියි. එඩාර්ඩ් ඔහු ගේ බාල පුත් තියන් ග්‍රේජෝයි සිය ආරක්ෂාව යටතට හා ප්‍රාණ ඇපකරුවකු බවට පත්කරයි.

## 297

පෙන්ටොස් හි මැජිස්ටර් ඉල්ලීරියෝ මොපාටිස්, විසේරිස් හා ඩනේරිස් ටාර්ගේරියන්ට සිය මන්දිරයේ වාසය කිරීමට ආරාධනා කරයි. රාජධානිය නැවත ලබාගැනීමට සිය උදවු ලබාදෙන බවට ඔහු පොරොන්දු වෙයි.

## 298

ගිනිසිසිලක ගීතය අන්දරය ඇරඹෙයි. වසර දහස් ගණනක නිහැඬියාවකට පසු නැවත මතුවන අනික් එවුන් නිශා රැකුමේ සෙබළුන්ට හා වනචාරීන් පිරිසකට පහර දෙති.

දස වසරක ගිම්හානයකට පසු ශීත කාලය කෙමෙන් කෙමෙන් වෙස්ටෙරොස් වෙත එළඹෙයි.

# සමාජ හා ජනකොටස්

## පුරාණ ජනකොටස්

### 1. වනාන්තරයේ දරුවෝ



වනාන්තරයේ දරුවෝ (සමහර අවස්ථාවලදී සරලව 'දරුවෝ' කියාද හැඳින්වෙති) යනු වසර දොලොස්දහසකට පෙරාතුව මුල් මිනිසුන් පැමිණීමට පෙර වෙස්ටෙරොස් මහද්වීපයේ විසූ මානව නොවන ජන කොට්ඨාසයකි. යෝධයින් විසින් මොවුන්ව 'පුංචි ලේන් ජනතාව' ලෙස හැඳින් වූ අතර ඔවුන් විසින් තමන්ව හඳුන්වා ගත්තේ 'පොළොවේ ගීතය ගයන්නන්' වශයෙනි.

**ඉතිහාසය**

මොවුන් වෙස්ටෙරොස්වලට පැමිණියේ කොහි සිට ද යන්න හෝ මොවුන් එහි කොපමණ කලක් විසුවා ද යන්න අභිරහසකි. එස්සොස් හි සිට පැමිණි මුල් මිනිසුන් මොවුන්ට හමු වූ මුල්ම පිටස්තරයෝ වෙති. වසර දෙදහසකට ආසන්න කාලයක් තිස්සේ වෙස්ටෙරොස්හි පාලනය උදෙසා මොවුන් හා මුල් මිනිසුන් අතර පැවැති යුද්ධය නිමා වූයේ මුහුණු දූපතේ දී අත්සන් කෙරුනු සාමගිවිසුමත් සමගිනි. එම ගිවිසුම මගින් විවෘත තැනිතලා බිම් මුල් මිනිසුන්ටත් වනාන්තර දරුවන්ටත් වශයෙන් බෙදා වෙන් කෙරින. කාලය ගෙවී යද්දී මිනිසුන් හා දරුවන් අතර වූ සබැඳියාව කෙමෙන් ගිලීහී යන්නට වූ අතර ඒගොන් ගේ ආක්‍රමණ සමය වන විට මිනිසුන් විසින් වනාන්තරයේ දරුවන් අවසාන වරට දැක වසර දහස් ගණනක් ගෙවී තිබින.

**විලාසය**

මොවුන්ව විස්තර කෙරෙන්නේ මානවාකාර සිරුරකින් හෙබි, තද දුඹුරු පැහැ සමින් යුත්, අලංකාර කුඩා ජනතාවක් වශයෙනි. ඔවුන් ගේ උසම පුද්ගලයා පවා සාමාන්‍ය මිනිස් දරුවෙකු තරම් විය. ඔවුන් ගේ ජීවිත කාලය දිගු ය. ප්‍රමාණයෙන් විශාල දෑස් හා දෙසවන් පිහිටා ඇති අතර මිනිසුන්ට නැසිය හැකි තරම් කුඩා ශබ්ද පවා ඇසීමේ හැකියාවක් ද, බළලුන්ට මෙන් මන්ද

ආලෝක තත්ත්ව යටතේ වුව හොඳින් දැකීමේ හැකියාවක් ද ඇත. ඔවුන් ගේ අත්වල මහපටැඟිල්ල හා තවත් ඇඟිලි තුනක් පමණක් ඇත.

**සංස්කෘතිය**

මොවුහු ලෝහ භාවිතයක්, රෙදි විවීමක් හෝ නගර ගොඩනැංවීමක් හෝ නොකලහ. ඒ වෙනුවට ගලින් කල මෙවලම් භාවිතයත්, ගස්වල පොතු හා කොළවලින් ගෙතූ ඇඳුම් ඇඳීමත්, ගුහාවල පොළොවේ පැලුම් අතර හා ගස් මත විසීමත් සිදු කලහ. පිරිමින් හා ගැහුණුන් දෙකොටසම උරෙන් උර ගැටී දඩයම් කලහ. ඔවුන්ට ලිඛිත භාෂාවක් නොවී ය. සටන් වලදී ඔබ්සිඩියන් ආයුධ හා බලගතු මන්ත්‍රශාස්ත්‍ර භාවිත කලහ.

මොවුන් අද්භූත ඉන්ද්‍රජාලික හැකියාවන්ගෙන් යුක්ත වූවෝ වෙති. මොවුන් සතුව තිබුනු මායා බල අතර වනයේ සතුන් හා කතාකිරීම, සතුන් ගේ මනස් තුළට ඇතුළු වී ඔවුන්ව පාලනය කිරීම, මළවුන්ට කතා කිරීම හා අතීතය අනාගතය දැකීම ආදිය වෙයි. වනාන්තරය තුළ සිදු වන දේ දැකීම සඳහා වයර්වුඩ් ගස්වල මුහුණ කෙටීම ඇරඹූයේ මොවුන් විසිනි.

## 2. මුල් මිනිසුන්



මුල් මිනිසුන් යනු වෙස්ටෙරොස්වලට මුලින්ම බාහිරින් සංක්‍රමණය වූ ජනතාවයි. ඔවුන් ගේ බලපෑම වෙස්ටෙරොස්හි අද දක්වාම (විශේෂයෙන් උතුරේ) දැකිය හැක.

**ඉතිහාසය**

මොවුහු එස්සොස් සහ වෙස්ටෙරොස් අතර වූ 'ඩෝර්න්හි අත' නමින් හැඳින්වුනු පටු බිම්තීරය ඔස්සේ පළමුව වෙස්ටෙරොස් වෙත සංක්‍රමණය වූහ. ලෝකඩ අසිපත් හා සම් පලිහවලින් සන්නද්ධ වී අසුන් අරා පැමිණි මොවුහු නව භූමියේ පදිංචි වී බලකොටු හා ගොවිබිම් ගොඩනැගූහ. වනාන්තරයේ දරුවන් විසින් පූජනීයත්වයෙන් සැලකූ වයර්වුඩ් ගස් කපා බිම හෙලීම නිසා මොවුන් හා දරුවන් අතර ගැටුම් ඇතිවිය. වනාන්තරයේ දරුවන් විසින් මෙම යුද්ධවලදී බලසම්පන්න ඉන්ද්‍රජාලික හා වෙනත් මායාකාරී දේවල් භාවිත කලද මුල් මිනිස්සු වඩා විශාල සිරුරැති, වඩා ශක්තිමත්, වඩා දියුණු තාක්ෂණයක් සහිත වූවන් වූහ. දරුවන් විසින් සිය ඉන්ද්‍රජාල භාවිත කරමින් ඩෝර්න්හි අත විනාශ කර දැමුවද මුල් මිනිස්සු දිගින් දිගටම නැවු

මාර්ගයෙන් සිය සංක්‍රමණ සිදු කලහ.

ඩෝර්න්හි අත විනාශ කලාක් මෙන් මුල් මිනිසුන් ගේ උතුරු ආක්‍රමණ හමුවේ දරුවන් විසින් සිය මායා බලය භාවිත කර බෙල්ල නම් වූ උතුර-දකුණ වෙන් කරන පටු ගොඩබිම් තීරය මුහුදෙන් යටකර විනාශ කර දැමීමට උත්සාහ කලහ. එනමුදු එය සාර්ථක වූයේ අඩ වශයෙන් වූ අතර මුහුද ගොඩගැලීම නිසා බෙල්ල ප්‍රදේශයේ අද පවතින වගුරු බිම් නිර්මාණය විය. කෙසේ වුවද දරුවන් ප්‍රදර්ශනය කල මෙම සුපිරි මායාබල හැකියාව නිසා ඔවුන් හා දිගින් දිගටම යුධ වැදීමට වඩා ඔවුන් සමග සහජීවනයෙන් විසීම සුදුසු යැයි මුල් මිනිස්සු තේරුම් ගත්හ.

ගංගා නිම්නයේ පිහිටි මුහුණු දූපතේ දී ඇතිකෙරුනු මෙම සාම ගිවිසුම මගින් දරුවන්ට වනාන්තරයේ භුක්තියත් මුල් මිනිසුන්ට අනිත් පෙදෙස්වල භුක්තියත් වශයෙන් භූමිය බෙදෙනු ලැබින. මීට අමතරව නැවත කිසි දිනෙක වයර්වුඩ් ගස් නොකපන පොරොන්දුවක්ද මුල් මිනිසුන්ගෙන් ලැබින.

ගිවිසුමෙන් පසු වසර හාරදහසක කාලය සාමය හා සමෘද්ධිය රජයූ සමයක් විය. මුල් මිනිස්සු සිය පැරණි ඇදහීම් ඉවත දමා වනාන්තරයේ දරුවන් ගේ නිර්නාමික දෙවිවරුන් ඇදහීමට පටන් ගත්හ. ඔවුහු ද දරුවන් මෙන් වයර්වුඩ් ගස්වල මුහුණු කෙටීමට පටන් ගත්හ. පණිවුඩ හුවමාරුව සඳහා කපුටන් භාවිතයද මුල් මිනිසුන් දරුවන් වෙතින් උගත්තකි. එනමුදු ඒ කාලයේ දී දරුවන්ට කපුටන් ගේ මනස් තුළට රිංගා කතා කිරීමේ හැකියාව තිබින.

වසර හයදහසකට පමණ පෙර අන්දාල්වරු එස්සොස්හි සිට පටු මුහුද ඔස්සේ පැමිණ වෙස්ටෙරොස් ආක්‍රමණය කලහ. සියවස් ගණනක් මුලුල්ලේ ඔවුන් හා මුල් මිනිසුන් අතර මහද්වීපයේ පාලනය උදෙසා සටන් පැවැති අතර අන්තිමේදී අන්දාල්වරු දකුණු ප්‍රදේශවල පාලනය සියතට ගැනීමට සමත් වූහ. එහෙත් මෝට් කේය්ලින්හි ආරක්ෂාව යටතේ බෙල්ලෙන් උඩ උතුරේ පාලනය දිගටම මුල් මිනිසුන් සතුව තිබින.

## සංස්කෘතිය

මුල් මිනිස්සු 'පුරාණ භාෂාව' නමින් හැඳින්වෙන රළු බසක් කතා කලහ. මේ භාෂාව අද දක්වාම සමහර වනචාරීන් විසිනුත් යෝධයින් විසිනුත් භාවිත කරති. මොවුහු සලකුණු වලින් නිර්මිත ලේඛන ක්‍රමයක් භාවිතයට ගත්හ.

මොවුහු ලෝකඩින් කල ආයුධ පරිහරණය කල අතර ගමනාගමනය පිනිස අසුන් භාවිත කලහ. ආගන්තුක සත්කාරය පිළිබඳ නීති පිළිපැද්දහ. සත්කාරකයින් විසින් ආගන්තුකයින් පිළිගෙන පාන් හා ලුණු පිරිනැමුවහොත් ඒ සත්කාරකයා ගේ ආරක්ෂාව ආගන්තුකයින්ට හිමිවිය යුතු විය. අපරාධ සඳහා දඬුවම රුධිර මිලෙන් ගෙවිය යුතු විය. මොවුහු සොහොන් ගොඩැලි තනා සිය මළවුන් ඒ තුළ තැන්පත් කලහ.

# 3. අන්දාල්වරුන්



වෙස්ටෙරොස්හි පැවැති මුල් මිනිසුන් ගේ රාජධානි බොහොමයක් බිඳ වැටීමට ප්‍රධානතම හේතුව අන්දාල්වරුන් ය. වෙස්ටෙරොස් වෙත සප්තකයේ සත්‍ය ලබ්ධිය රැගෙන ආවේද මොවුන් විසිනි.

## ඉතිහාසය

උතුරු දිග එස්සොස්හි බිහිවී පසුව වයඹ දිග එස්සොස්හි අන්දලෝස් කඳු ප්‍රදේශය වෙත සංක්‍රමණය වූ ජනතාවකි. ප්‍රවාදයන්ට අනුව ඔවුන් අභිමුවට පැමිණි සප්තකයේ දෙවිවරුන් ඔවුන් ගේ පළමු රජතුමා වන 'කඳුකරයේ හියුගෝ' ව අභිෂේක කරන ලදී. මොවුහු රොයින් ගඟබඩ විසූ රොයිනාර් වරුන්ගෙන් යකඩ සමග වැඩකරන අයුරු උගත්හ.

මොවුන් වෙස්ටෙරොස්වලට මුලින්ම පා තැබුවේ කෙදිනක දැයි ස්ථිරවම කිව නොහැකි වුවද ඒ මීට වසර හාරදහසකට පමණ පෙර බව පොදු මතය යි. වෙස්ටෙරොස්හි නැගෙනහිර වෙරළේ අතැඹිලි නම් වූ ප්‍රදේශයට මුලින්ම ගොඩබට මොවුහු මිටියාවතේ විසූ මුල් මිනිසුන් හා මුලින්ම යුධ වැදුනහ. වයර්වුඩ් වදුල් ගිනි තබමින්, වනාන්තරයේ දරුවන් දුටු තැන මරා දමමින් තම සප්තකයේ දෙවියන් වෙනුවෙන් පැරැණි දෙවියන් පැරදවී ය. කතාවලට අනුව මුල් මිනිසුන් ගේ ලෝකඩ ආයුධ හමුවේ වනාන්තරයේ දරුවන්ගෙන් අඩක් විනාශ වූ අතර ඉතිරි අඩ අන්දාල්වරුන් ගේ යකඩ ආයුධ හමුවේ මරු දුටහ.

සියවස් ගණනාවක් මුලුල්ලේ ඇවිලුනු යුද්ධ රැසකින් පසු මුල් මිනිසුන් විසින් දකුණුකරයේ පිහිටවනු ලැබූ රාජධානි හය එකින් එක අන්දාල්වරුන් සතු වූ අතර ඔවුහු එහි නව රාජධානි හයක් පිහිටවූහ. එනමුදු උතුරේ රජවරුන් මෝට් කයිලින් බලකොටුවේ සහායයෙන් සාර්ථක ලෙස අන්දාල්වරුන් ගේ උතුරු ආක්‍රමණ වැළැක්වූ අතර ඔවුන්ට කිසිදා උතුර ජය ගත නොහැකි විය.

## සංස්කෘතිය

අන්දාල් සංස්කෘතිය වෙස්ටෙරොස්හි සුවිසල් වෙනස්කම් රැසක් ඇති කිරීමට සමත් විය. එතෙක් පැවති ආගම වෙනුවට නවතම ආගමක් වූ සප්තකයේ සත්‍ය ලබ්ධිය වගා කිරීම, නයිට්වරුන්ගෙන් සුසැදි රණකාමී සම්ප්‍රදාය හඳුන්වා දීම, යකඩ භාවිතය හඳුන්වා දීම හා දියුණු ලේඛන ක්‍රමයක් හඳුන්වා දීම ඒ අතරින් ප්‍රධාන ය.

වෙස්ටෙරොස්හි සම්පූර්ණ පෙර ඉතිහාසයම ලේඛනගත කෙරුනේ අන්දාල්වරුන් අතිනි. එනිසා එහි අන්දාල්වරුන්ට පක්ෂග්‍රාහී ස්වරූපයක් දැකිය හැක.

## 4. රොයිනාර්වරුන්



නිරිත දිග එස්සොස්හි රොයින් නදී බඩ විසූ ජනතාවකි. වලීරියානු ආක්‍රමණ හමුවේ තම නිජබිම් හැරදා සරණාගතයින් ලෙස වෙස්ටෙරොස්වලට සංක්‍රමණය වූහ.

### ඉතිහාසය

මීට වසර හත්සියයකට පමණ පෙර වන විට වැලීරියානුවෝ නැගෙනහිර දිග එස්සොස්හි සිය ආධිපත්‍යය තහවුරු කරගැනීමට සමත් වූහ. ඉන්පසු ඔවුහු බටහිර දෙසට සිය ආක්‍රමණ ව්‍යාප්ත කල අතර නිරිත දිග එස්සොස්හි සුවිසල් රොයින් නදී බඩ පෞර-රාජ්‍ය සංකල්පය යටතේ විසූ රොයිනාර් ජනයා සමග ගැටීමට ඔවුන්ට සිදුවිය. ගැරින් කුමරු යටතේ සංවිධානය වූ මිලියන කාලක රොයිනාර් සේනාවක් වැලීරියානුවන් හා යුධ වැදුනද ඔවුන් ගේ මකරුන් හමුවේ සම්පූර්ණයෙන්ම පරාජය ලැබී ය. රණකාමී රැජිණක වූ නයිමේරියා ඉතිරි වූ පිරිසත් සමග නැවු දසදහසක නැගී පටු මුහුද තරණය කර දකුණු වෙස්ටෙරොස්හි ඩෝර්න් අර්ධද්වීපයට ගොඩ බැස්සා ය. සන්ස්පියර්හි විසූ ඩෝර්නිෂ් වංශාධිපතියකු වූ මෝර්ස් මාර්ටෙල් හා විවාහ වූ ඇය ඔහුට ඩෝර්න් එක්සේසත් කරනු පිණිස උදවු කලා ය.

රොයිනාර්වරුන් ගේ පලායාමෙන් පසු වැලීරියානුවන් විසින් රොයිනිෂ් අගනුවර වූ නි-සාර් සහ ඔවුන් ගේ අනෙකුත් ප්‍රධාන නගර වූ ක්‍රොයේන්, අර්-නොයි, සාර්-මෙල් සහ සොයාන්-ඩ්‍රෝහ් සහමුලින්ම විනාශ කර දැමීය.

### විලාසය

රොයිනාර්වරුන් ඔලිව් පැහැති සමින්, කළු පැහැ හිසකෙසින් හා අඳුරු පැහැ දෑස්වලින් යුත් හීන්දෑරි සිරුරු ඇත්තවුන් ය.

### සංස්කෘතිය

මහා සම්ප්‍රදාය වූ අන්දාල් සංස්කෘතිය හා සසඳන කල රොයිනාර්වරුන් සතුව වෙනස්ම වූ

සම්ප්‍රදායයන් රැසක් දැකිය හැක. ඔවුහු පිරිමින්ට හා කාන්තාවන්ට සමසේ සැලකූහ. එනම් ගැහැණු පිරිමි භේදයකින් තොරව වැඩිමහල් දරුවාට පවුලේ උරුමය පිරිනැමූහ. සමලිංගිකත්වය සාමාන්‍ය දෙයක් වශයෙන් පිළිගත්හ. පෞර-රාජ්‍ය සංකල්පය නිසා සිය පාලකයින්ට කුමරා-කුමරිය වශයෙන් ඇමතූහ. මොවුන් ගේ ආභාසය මත මේ සම්ප්‍රදායයන් ඩෝර්න්වලද පැතිර ගියේය.

ඔවුන් ගේ සමහර සම්ප්‍රදායයන් අන්දාල් සම්ප්‍රදායයන් හමුවේ යටපත් වී ගියේය. විශේෂයෙන්ම ඔවුන් ගේ පැරැණි ආගම වූ ගංගා මාතාව නමැදීම අහෝසි වී ගිය අතර ඒ වෙනුවට ඔවුහු සත්‍ය ලබ්ධිය වැළඳ ගත්හ.

## 5. ඝිස්කාරි අධිරාජ්‍යය



ලෝකයේ පැරැණිතම හා ප්‍රසිද්ධම ජනතාවන්ගෙන් එකකි. වැලීරියානුවන් අතින් විනාශ මුඛයට පත් වන තෙක් එය වසර දහස් ගණනක් තිස්සේ එස්සොස්හි ප්‍රමුඛතම රාජධානිය වශයෙන් පැවතින.

**ඉතිහාසය**

පුරාණ ඝිස් නගරයෙන් ඇරඹී කෙමෙන් වර්ධනය වූ ඝිස්කාරි අධිරාජ්‍යය එවකට පැවැති සංග්‍රාමික, ආර්ථික හා සංස්කෘතික යන සෑම අංශයකින්ම උපරිමයට පත්ව තිබින. සිය බලයේ උපරිමයේදී ඔවුන් විසින් මෙහෙයවනු ලැබූ මනා සංවිධානයකින් හා විනයකින් යුක්ත වූ යුධ සේනාංක අනභිභවනීය විය. වහලුන් විසින් ගොඩනගන ලද දැවැන්ත ගඩොල් පිරමීඩවලින් මොවුන් ගේ නගර අලංකාර විය.

වසර පන්දහසකට පෙරදී නැගී ආ නව බලය වූ වැලීරියානුවන් හමුවේ ඝිස්කාරිහි බලය කෙමෙන් පිරිහී යන්නට විය. මොවුන් හා වැලීරියානුවන් අතර ඇති වූ දැවැන්ත යුද්ධ පහක් අවසානයේ ඝිස්කාරි අධිරාජ්‍යය සම්පූර්ණයෙන්ම වැනසී ගිය අතර අවසන් සටනේ දී වැලීරියානුවන් විසින් සිය මකරුන් යොදවා අධිරාජ්‍යයේ අගනුවර වූ ඝිස් සහමුලින්ම ගිනි තබා බිමට සමතලා කර දමන ලදී. එමතුද නොව නැවත එහි මිනිසුන් පදිංචි වීම වලකනු වස් ඒ අවට භූමිය ගෙන්දගම් හා ලුණු දමා නිසරු කර දමන ලදී.

පෙර පැවැති සිස්කාරි කොලණී වූ අස්ටපොර්, යුනාකි හා මීරීන් යන නගර වහල් වෙළෙඳාම නිසා දැවැන්ත වෙළෙඳ නගර වශයෙන් නැගී සිටින්නට වූ අතර පලාගියවුන් විසින් ද්‍වපත් රාජ්‍යයක් වූ නව සිස් පිහිටවනු ලැබී ය. උතුරින් වූ සිස්කාරි කොලණී ඩොත්රැකි ආක්‍රමණ හමුවේ විනාශ වී ගියේ ය.

### උරුමය

පැරැණි සිස්කාරි සංස්කෘතිය, දෙවිවරුන් හා භාෂාව කාලයත් සමග කෙමෙන් වැලලී ගිය අතර ඔවුහු නව වැලීරියානු භාෂාව වැළඳගත්හ. අද වන විට ඔවුහු ශුද්ධ වැලීරියානු බසින් බිඳී ආ උප බසක් ව්‍යවහාර කරති. බිඳ වැටුනු දැවැන්ත ප්‍රාකාර, පිරමීඩ හා ගරුඬ ප්‍රතිමා ඔවුන් ගේ අතීත ශ්‍රී විභූතිය මොනවට පිළිබිඹු කරති. වහලුන්ගෙන් සැදි කුලී හමුදාවක් වන නිකැළැල් බලකාය සිය යුධ උපාය මාර්ග සහ විනය අනුව පුරාණ සිස්කාරි හමුදාවන් හා සම වෙති.

## 6. වැලීරියානු සමූහාණ්ඩුව



එස්සොස් මහද්වීපයේ සුවිසල් ප්‍රදේශයක් පුරා විහිද පැවති බලසම්පන්න රාජධානියකි. සිය බලයේ උපරිමයේ දී එය නැගෙනහිර එස්සොස් සිට වර්තමාන නිදහස් වෙළෙඳ නගර පිහිටා ඇති බටහිර වෙරළ තීරය දක්වාත්, වෙස්ටෙරොස්හි නැගෙනහිර වෙරළ තීරයේ වූ ඩ්‍රැගන්ස්ටෝන් දක්වාත් විසිර තිබින. එය එම යුගයේ පැවති බලසම්පන්නම යුධ බලයත්, සංස්කෘතික ප්‍රවාහයක් විය. මෙහි කිසිවිටෙකත් රජකු හෝ අධිරාජයකු නොසිටි අතර මකරාධිපතියන් නමින් හැඳින්වුනු වංශවතුන් අතින් පාලනය විය. මෙහි අගනුවර වැලීරියා නම් නගරය විය.

### ඉතිහාසය

කලකදී මොවුහු බැටළුවන් බලාගනිමින් එස්සොස්හි දකුණුදිග වැලීරියානු අර්ධද්වීපයේ විසූ සාමකාමී ජනතාවක් වූහ. අර්ධද්වීපය මුදුනේ වූ දැවැන්ත ගිණිකඳු වැටියක් ආශ්‍රිතව මකරුන් සැරිසරන බව සොයාගත් ඔවුහු සිය මායාබලය යොදා මකරුන් හීලෑ කරගත්හ. මෙම හීලෑ කරගත් මකරුන් මූලික කරගත් දැවැන්ත යුධ යාන්ත්‍රණයක් ගොඩ නැංවූ ඔවුහු වැලීරියා නගරය කේන්ද්‍ර කරගනිමින් සිය ව්‍යාප්තිය ඇරඹූහ. මේ සමගින් ඔවුන් ගේ මායාබලය ද කෙමෙන්

වර්ධනය වන්නට වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වැලීරියානු වානේ හා මායාබලය යොදා නිපදවූ සුපිරි ආයුධ තැනීමද ඇරඹූහ.

## නැගීම හා විනාශය

වසර පන්දහසකට පෙර වැලීරියාව කෙමෙන් නැගී ආ කාලයේ එස්සොස්හි පැවති සුපිරි බලය ඝිස්කාරි අධිරාජ්‍යය විය. ඔවුන් විසින් වැලීරියානු ව්‍යාප්තිය නැවැත්වීමට යත්න දැරුවද වැලීරියානු මකරුන් හා යුධ යාන්ත්‍රණය ඉදිරියේ පරාද විය. ඝිස්කාරි අධිරාජ්‍යය මුලුමනින්ම විනාශ වී ගියේ ය. නැගෙනහිර යටත් කිරීමෙන් පසුව බටහිර දෙසට සිය අවධානය යොමු කල වැලීරියානුවන්ට රොයිනාර් පෞර රාජ්‍ය හා ගැටීමට සිදුවිය. පුරුදු පරිදිම මකරුන් හමුවේ රොයිනාර් ප්‍රතිරෝධය බිඳ වැටුනු අතර සියළු රොයිනාර් හමුදා සමූලඝාතනය කෙරිනි. ඉතිරි වූ ගැහැණුන් හා දරුවන් නයිමේරියා රැජිණ යටතේ ඩෝර්න් හි සරණාගත රැකවරනය යටතට ගැනින.

සමූහාණ්ඩුව තවදුරටත් වැඩෙන්නට වූ අතර යටත් කරගත් ප්‍රදේශවලින් පැහැරගත් වහලුන් යොදවා සුවිසල් නගර, නගර යා කෙරෙන මංමාවත්, කොළණි තැනෙන්නට විය. ඕරොස්, මැන්ටරීස්, ටීරියා මෙන්ම දැනට නිදහස් වෙළෙඳ නගර වශයෙන් පවතින පෙන්ටොස්, ටයිරොෂ්, මර්, වොලැන්ටිස් ආදී සියල්ලක්ම (බ්‍රාවොස් හැර) වැලීරියානුවන් අතින් ගොඩනැගුනෝ වෙති.

වසර තුන්සීයයකට පෙර ගිණිකඳු වැටිය පුපුරා යාමත් එයින් ඇතිවූ මුහුද ගොඩ ගැලීමත් නිසා අර්ධද්වීපය කැබලි වී කුඩා දූපත් රැසකට බිඳී ගියේ ය. අගනුවර වූ වැලීරියාව මුලුමනින්ම පාහේ විනාශ වී ගිය අතර එහි බිඳ වැටීමත් සමග සමූහාණ්ඩුව දෙදරා ගියේ ය.

## සංස්කෘතිය

සමූහාණ්ඩුව කිසිදාකත් අධිරාජ්‍යයක් හෝ රාජධානියක් නොවූ අතර එහි කිසි විටෙකත් රජකු හෝ අධිරාජ්‍යයකු නොසිටියේ ය. සියළුම නිදහස් මිනිසුන් පාලනය වෙනුවෙන් වගකීමක් දැරුවහ. එනමුදු වඩා ප්‍රායෝගික වශයෙන් මේ බලය රැඳී පැවතුනේ උසස්, බලසම්පන්න හා ධනවත්, සුපිරි මායාබලයක් ඇති වංශාධිපති පවුල් හතලිහක් වටා විය. මකරුන් හීලෑ කිරීම, පාලනය කිරීම හා ඔවුන් පිට නැගී යුධට යෑම ප්‍රධාන වශයෙන් මෙම පවුල් අත රැඳී පැවතුනු අතර ඔවුන් මකරාධිපතියන් වශයෙන් හැඳින්වින. ටාර්ගේරියන්වරුන් මෙවැනි වංශවත් පවුලක් වූවද බලසම්පන්නම පවුල් අතරින් එකක් නොවී ය.

මොවුන් ගේ භාෂාව ශුද්ධ වැලීරියන් වශයෙන් හැඳින්වේ. මොවුන් ගේ මායාබලය අතිමහත් වූ අතර එය භාවිත කර මකරුන්ගෙන් වැඩගැනීම, මකරාග්නිය යොදා ලෝහයෙන් හා ගල්වලින් නොයෙකුත් නිමැවුම් කිරීම ආදිය සිදුකලහ. තවමත් එස්සොස් මහද්වීපය පුරා විසිර පවතින ගලින් නිමවුනු නගර, බලකොටු හා වැලීරියානු මාවත් මොවුන් ගේ සුපිරි තාක්ෂණය වෙනුවෙන් දෙස් දෙති.

වැලීරියානුවෝ යුද්ධවලින් පරදිනවුන් වහලුන් වශයෙන් අල්ලාගෙන ඒම හා ඔවුන් යොදා රන්, රිදී සහ අනිකුත් වටිනා දේ කැනීම සිදුකලහ. ඔවුහු බැලේරියන්, මෙරැක්සස්, වේගාර්, සයිරැක්ස්

වැනි විවිධ දෙවිවරුන් සමූහයක් ඇදහූහ. එනමුදු ඒගොන් හා ඔහු ගේ වෙස්ටෙරොස් අනුගාමිකයෝ සත්‍ය ලබ්ධියට හැරුනහ. සොයුරු-සොයුරියන් අතර විවාහය සාමාන්‍ය දෙයක් විය.

### උරුමය

විනාශයත් එයින් පසු සිදුවූ ම්ලේච්ඡ ආක්‍රමණත් සමගින් වැලීරියානු භාෂාවත්, මන්ත්‍ර ශාස්ත්‍රත්, සංස්කෘතියත් සහමුලින්ම පාහේ විනාශ වී ගියේ ය. එයින් මිදුනවුන් ලොව සතර අත විහිද ගියහ. වැලීරියානු කොළණී වෙන වෙනම නිදහස් රාජ්‍ය වශයෙන් නැගී සිටින්නට විය. ඔවුන්ගෙන් පැවතෙන්නෝ ශුද්ධ වැලීරියන් වලින් බිඳී ආ නොයෙකුත් ග්‍රාම්‍ය භාෂාවන් වහරන්නට වූහ. මකරුන් යුධ යාන්ත්‍රණයට යොදා ගැනීමත්, වැලීරියානු වානේ නම් වන මන්ත්‍රබලය භාවිතයෙන් සැදූ මිශ්‍ර ලෝහයකින් නිමවූ සුපිරි ආයුධත් සම්බන්ධයෙන් මොවුන් ගේ කීර්තිය තවමත් ලොව පුරා පවතී.

## රාජධානි සප්තකයේ ජනකොටස්

### 1. උතුරු මිනිසුන්



සියළුම උතුරු මිනිසුන් පාහේ මුල් මිනිසුන්ගෙන් පැවතෙන්නෝ වෙති. මොවුන් කෙලින් කතා කරන, කෙලින් වැඩ කරන, දැඩි, පහසුවෙන් නොනැමෙන මිනිස්සු වෙති. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් තවමත් පුරාණ දෙවිවරුන්ට හා හදවෘක්ෂයන්ට වැඳුම් පිදුම් කරති. නිරන්තර ශීතයත් ශීත කාලයේ දැඩි දුෂ්කරතාත් නිසා ඔවුහු දකුණේ මිනිසුන්ට වඩා වෙනස් අන්දමකින් හැඩගැසුනෝ වෙති. ඔවුන් ගේ මුළු දිවියම රඳා පවතින්නේ ශීත කාලය පැමිණෙන බව දැනීමත් ඒ කාලය තුළ සිය දිවි රැකගැනීම උදෙසා සූදානම් වීමත් යන කරුණු මතය.

සමහර උතුරුවාසීන් අනෙකුන්ගෙන් කෙතරම් දුරස්ව වෙසෙන්නේද යත් ඔවුන් වෙනමම ගෝත්‍ර ලෙස සැලකිය හැක. පොළෝ පැළුම් තුළ දිවිගෙවන සැඟවුනු මිනිසුන්, කඳුකර ගෝත්‍ර හා ස්කගෝසීන් ඔවුන්ටම ආවේණික සිරිත් විරිත් සම්ප්‍රදායයන් පිළිපදින අතර වින්ටර්ෆෙල්හි ස්ටාර්ක්වරුන්ට යටත් හා ලැදි මිනිස්සු වෙති. සිය ආගමික ඇදහිලි නිසා මොවුන් සත්‍ය ලබ්ධිය යටතේ දිවුරුම් දීම වැනි දෑ ප්‍රතික්ෂේප කරන අතර එනිසාම ඔවුන්ට නයිට්වරුන් වශයෙන්

සේවය කල නොහැක.

## 2. යකඩ මිනිසුන්



වෙස්ටෙරොස්හි බටහිර වෙරළ තීරයේ පිහිටි යකඩ දූපත්වල උපන්නෝ මෙසේ හැඳින්වෙති. මොවුහු නාවික ගමනාගමනය පිළිබඳ සුපිරි හැකියාවකින් යුතු රණකාමී ජන කොටසක් වෙති. මහද්වීපයට කඩා පැන ගම් පිටින් මංකොල්ල කා වනසා දැමීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලති.

**ඉතිහාසය**

යකඩ දූපත් ජනාවාස කරන ලද්දේ මුල් මිනිසුන් විසිනි. එනමුදු මෙම හුදෙකලා ජනාවාසයේ දී ඔවුහු අනිකුන් මෙන් පුරාණ දෙවිවරුන් වෙත නොහැරී 'ගිලුනු දෙවියන්' නම් ඔවුන් ගේ ම ආගමික සංස්ථාවක් පිහිටවනු ලැබූහ. පසුකාලීනව අන්දාල්වරුන් විසින් යටපත් කරගැනීම සිදුවුවද මෙහි පැවති සම්ප්‍රදායයන් වෙනස් වීමක් සිදු නොවී ය. සිවු සියවසකට පමණ පෙර හෝර් රජ පෙළපත යටතේ මොවුහු සිය බලයේ උපරිමයට පත් වූහ. වෙස්ටෙරොස්හි මුළු බටහිර වෙරළ කලාපයම හා ගංගා නිම්නය මොවුන් ගේ පාලනය යටතේ පැවතියද ටාර්ගේරියන් ආක්‍රමණ හමුවේ පැරදී සිය රජතුමා වූ 'කළු හැරන්' සමගින් සම්පූර්ණ රාජ වංශයම විනාශ කරගත්හ.

**සංස්කෘතිය**

මොවුහු 'පුරාණ විධි ක්‍රමය' එනම් මංකොල්ල කෑම අනුව ජීවත්වන්නන් වෙති. මිනිසකු ගේ වටිනාකම මැනෙන්නේ ඔහු මංකොල්ල කෑමට කෙතරම් ශූරයකු ද යන්න මතය. ඔවුහු භාණ්ඩ මිලදී නොගන්නා අතර 'යකඩ මිල' ගෙවති, එනම් සටන් කර මරා දැමූවන් ගේ භාණ්ඩ පමණක් ගනිති. සටන්වලදී අල්ලා ගන්නවුන් වහලුන් වශයෙන් යකඩ දූපත්වල ගොවිබිම් හා පතල්වල වැඩට යොදවති. යකඩ මිනිසුන් මෙවැනි පහත් වැඩ කිරීම අවනම්බුවක් වශයෙන් සැලකේ.

මොවුහු මුහුදු පතුලේ වෙසෙතැයි සැලකෙන ගිලුනු දෙවියන් නම් දෙවි කෙනෙකු අදහති. එම දෙවියන් ගේ නමින් මංකොල්ලකෑමටත්, අන් සතු දේ බලෙන් උදුරාගැනීමටත්, දූෂණය කිරීමටත් පසුබට නොවෙති. මොවුන් සතු සැහැල්ලු නොගැඹුරු කුඩා නැවු මගින් වෙරළබඩ

හා ගංගාශ්‍රිත රට මැද්දේ කොල්ලකෑම් සිදුකරති. යකඩ මිනිසෙකුට තවත් යකඩ මිනිසෙකු ගේ ලේ සෙලවීම තහනම් ය. එනිසා ඔවුහු මුහුදේ ගිල්වා මරාදැමීම භාවිත කරති.

### 3. ඩෝර්නිෂ්වරු



වෙස්ටෙරොස්හි දකුණු දිග ඩෝර්න් අර්ධද්වීපයේ වෙසෙති. ඉක්මනින් කිපෙන හා ශෘංගාරාත්මක ජනතාවක් වශයෙන් සැලකේ.

**ඉතිහාසය**

මුල් මිනිසුන් ගේ හා අන්දාල්වරුන් ගේ ආභාසය යන දෙකම මොවුන් තුළ ඇති මුත් ඔවුන්ට වැඩියෙන්ම බලපා ඇත්තේ රොයිනාර් ආභාසය යි. පැරැණි රොයිනාර් සම්ප්‍රදායයන් වූ ගැහැණු පිරිමි දෙකොටසම සමසේ උරුමය බෙදා දීම හා නිදහස් ලිංගික ආස්වාදනය පැහැදිළිවම දිස්වන වෙනස්කම් ය. විලාසය අනුව මොවුහු රොයිනාර්වරුන් මෙන් ඔලිව් පැහැ සිනිඳු සමින් හා කළු පැහැ හිසකෙසින් යුතු අඳුරු පැහැ දෑස් ඇතියවුන් වෙති. වඩා වැඩි අන්දාල් ආභාසයක් ඇතියවුන් අනිකුන්ට වඩා පැහැපත් සමකින් යුක්ත වෙති.

**සංස්කෘතිය**

යුද්ධය සඳහා සැහැල්ලු අශ්වාරෝහක බල ඇණි භාවිත කරති. රවුම් ලෝහමය පලිහත්, කෙටි හෙල්ලයත් ප්‍රිය කරන අතර දක්ෂ දුනුවායෝ වෙති. රාජධානි සප්තකය අතුරින් අඩුවෙන්ම ජනාවාස වී ඇති රාජධානිය යි. දැඩි උෂ්ණයත් ජල හිඟයත් මීට බලපා ඇත. අඩු ජනගහනය නිසාම විශාල හමුදාවන් නඩත්තු නොකරන අතර වේගවත් අසුන් මත හා ක්ෂණික පහරදීම් මත වැඩි විශ්වාසයක් තබති.

## ප්‍රාකාරයෙන් එපිට ජනකොටස්

### 1. නිදහස් මිනිසුන්



නිදහස් මිනිස්සු හෙවත් වනචාරීන් යනු ප්‍රාකාරයෙන් එපිට දිවිගෙවන ජන කොට්ඨාසයකි. හරියටම නියම ගණනක් නොදන්නා මුත් ලක්ෂ ගණනක් පමණ විය හැකි මෙම නිදහස් මිනිසු සිය ගණනක් වූ සංස්කෘතීන්, ගෝත්‍ර, වංශ, ගම්මාන, නඩ වලට බෙදී ජීවත් වෙති. මොවුන්ගෙන් සමහරෙක් යම් මට්ටමකට ශීලාචාර අය වුවද අනිකුන් අශිෂ්ට දාමරිකයන් වෙති.

**සංස්කෘතිය**

ප්‍රාකාරය මගින් වෙන් වීම නිසා නිදහස් මිනිසුන් සහ වෙස්ටෙරොස්හි අනිකුත් ජනකොටස් අතර පැහැදිලිව දැකිය හැකි වෙනස්කම් ඇතිවී ඇත. ඔවුහු රටක් නැති, පාලකයින් හෝ වංශවතුන් නැති, රජවරුන් නැති ඔවුන් විසින්ම තෝරා ගත් නීති රීති වලට යටත් මිනිසුන් වෙති. සමාජය සිය ගණනක් ගෝත්‍රවලට බෙදී ඇත. මේ සමහර ගෝත්‍රවල නායකයකු ඇති අතර සමහරක නැත. මෙම ගෝත්‍ර නිරන්තරයෙන්ම අනිකුන් හා යුධ වැදී සිටිති. තාක්ෂණික අතින් නොදියුණු ය. සමහරු අර්ධ සංචාරක ජීවිත ගතකරති.

නීති රීති හෝ දේපල අයිතිය පිළිබඳ සුළු උනන්දුවක් පමණක් ඇත. තමාට ලබාගත හැකි හා තමාට රැකගත හැකි දේ තමාගේ ය. විවාහය සමාජයේ එතරම් වැදගත් දෙයක් නොවේ. බහුතරය මුල් මිනිසුන් ගේ භාෂාව වූ පුරාණ භාෂාව ව්‍යවහාර කරති. ගැහැණුන්ටද පිරිමින් හා සම සමව ආයුධ අතැතිව සටන්වලට සහභාගි වීමේVඅයිතිය ඇත. විවාහය සඳහා අන් ගෝත්‍රවලින් ගැහැණුන් පැහැර ගැනීම සම්ප්‍රදායයකි. එහි අදහස වඩා ශක්තිවන්තයාට සුදුසු සහකාරියන් ලැබී ගෝත්‍රය ශක්තිමත් වීමයි.

ප්‍රාකාරය හරහා පැන උතුරේ මංකොල්ලකෑම් සිදු කිරීම මොවුන් ගේ සිරිතකි. ආයුධ, කුළුබඩු, සේද හා ලොම් සහ වෙනත් අතට හසුවන වටිනා ද්‍රව්‍ය ද ගැහැණුන් ද මෙසේ කොල්ලකනු ලබන භාණ්ඩවලට අයත් ය.

## 2. අනික් එවුන්



අනික් එවුන් හෙවත් ධවල යාත්‍රිකයන් යනු ප්‍රාකාරයට ඔබ්බෙන් ඈත උතුරේ ජීවත්වන මානවාකාර ජීවී විශේෂයකි. මේ වන විට මිනිසුන් විසින් අවසාන වරට මොවුන්ව දැක වසර අටදහසකටත් වඩා කල් ගතවී ඇත.

ඉතිහාසය

වසර අටදහසකට පමණ පෙර දීර්ඝ රාත්‍රිය නම් වූ දිගු ශීත කාලයකදී අනික් එවුන් විසින් දකුණ ආක්‍රමණය කරන ලදී. ඔවුන් මිනිසුන් මරා දමමින් රාජධානිය දැඩි විනාශ මුඛයකට ගෙන ගියද අවසානයේ දී පරදවනු ලැබී ය. ඔවුන්ට නැවත පැමිණිය නොහැකි වන පරිද්දෙන් ප්‍රාකාරය ගොඩ නැංවිනි. මේ වනවිට ඔවුන් සුරංගනා කතා වල චරිත බවට පමණක් පත් වී ඇත.

විලාසය

මොවුන්ට උස් වැරුනු සිරුරක් ඇති අතර සම කිරි මෙන් සුදුමැලි පැහැති ය. මිනිස් ඇසක නොදිටිය හැකි තරමේ ගැඹුරු නිල් පැහැ දෑස් ඇත. ස්පර්ශයට සීතල ය. ඔවුහු ආලෝකය පරාවර්තනය කරන සන්නාහ පළඳින අතර එම නිසා සෑම පියවරක් පාසාම එහි පැහැය වෙනස් වේ. කඩු හරඹයෙහි කෙල පැමිණියෝ ය. අයිස් වලින් නිමවූ පළිඟු මෙන් දිදුලන තුනී සීතල අසිපත් පළඳිති. හිම මත පිය සටහන් නොසෑදෙන තරම් සැහැල්ලුවකින් ඇවිදිති. චලනයන් ක්ෂණික ය. භාෂාව ආගන්තුක ය.

ප්‍රවාදයන්ට අනුව ඔවුන් ශීතය සමගින් පැමිණෙන අතර හෝ ඔවුන් සමගින් ශීතය පැමිණේ. ඔවුන් ආලෝකයෙන් සැඟවෙන අතර අඳුරත් සමග පැමිණෙති, නැතහොත් ඔවුන් සමග අඳුර පැමිණේ. ඔවුහු ගින්දරට එතරම් ප්‍රියමනාප නැති අතර 'ඔබ්සිඩියන්' හෙවත් 'මකර වීදුරු' හෙවත් 'මිදුනු ගින්දර' මගින් විනාශ කල හැක.

## එස්සොස්හි ජනකොටස්

### 1. ඩොත්රකියන්



එස්සොස්හි මධ්‍යයේ පිහිටි 'ඩොත්රැකි මුහුද' නම් වන සුවිසල් තණ බිම් ආශ්‍රිතව වෙසෙන සංචාරක රණකාමී ජනතාවකි. මොවුහු ඛලසාර් නමැති දැවැන්ත රංචු වශයෙන් දිවි ගෙවති. මොවුන්ට තඹ පැහැ සමක්, කළු පැහැ හිසකෙස් හා ආමන්ඩ් හැඩැති දෑස් ඇති අතර ප්‍රමාණයෙන් විශාල සිරුරකට හිමිකම් කියති.

### ඉතිහාසය

වසර දහස් ගණනක් පුරාවට මොවුහු කිසිදු වාසස්ථානයක් පිහිටුවා නැති අතර නිදහසේ සංචාරය කල ජනතාවකි. වැලීරියාවේ විනාශයත් සමග එතෙක් ඔවුන් අතින් මැඩ පැවැත්වී සිටි ඩොත්රැකියන් දකුණු, නැගෙනහිර හා නිරිත දිග පිහිටි නිදහස් නගර ආක්‍රමණය කරමින්, ඒවා මංකොල්ල කමින්, මිනිසුන් ඝාතනය කරමින් මහත් විනාශයක් සිදු කරන්නට වන්හ.

### සංස්කෘතිය

මොවුන් අස් හිමියන් වන අතර අශ්වයින් යනු ඔවුන් ගේ ජීවිතයේ වටිනාම වස්තුවයි. ආහාර, ගමනාගමනය, ඇඳුම් සහ අනිකුත් දේ නිපදවීමට යොදාගන්නා අමුද්‍රව්‍යයක් වශයෙන් අශ්වයින් මොවුන් ගේ දිවිය පුරා බැඳී පවතියි. මොවුන් ගේ ගෝත්‍රයක් ඛලසාර් එකක් වශයෙන් හැඳින් වේ. එහි නායකයා ඛාල් ය. ඛලසාරයක් ඛාස් නම් වූ කොටස් කිහිපයකට බෙදී ඇති අතර ඒ එක් එක් ඛාස් එකක් කොස් නමැති කපිතාන්වරයකු යටතේ පාලනය වේ. ඛාල් කෙනෙකු මියගිය පසු මොවුන් අතරින් කෙනෙකු නව ඛාල් වශයෙන් පත් වීම හෝ ඛාස් වෙන් වී නව ඛලසාර් බිහි වීම හෝ සිදු වේ.

සෑම ඛාල් කෙනෙකුටම රුහිරාරක්ෂකයින් සිටිති. මොවුහු අඩක් ශරීරාරක්ෂකයින්, අඩක් සොහොයුරන් හා සමීපතමයින් වෙති. පුරාණ සම්ප්‍රදායයන්ට අනුව ඛාල් කෙනෙකු සමගින් ඔහු ගේ රුහිරාරක්ෂකයින් ද මිය යා යුතු ය. ඛලසාරයක් සෑම විටම සංචාරය කරමින් වෙනත් ජනාවාස හෝ අනිකුත් ඛලසාර් කොල්ලකමින් හෝ සිටිති. මුදල් භාවිතයක් නොමැති අතර තෑගී දීම හා ගැනීම සිදු කරති. මොවුන්ට අගනුවර ලෙසින් සැලකෙන එක් නගරයක් ඇති අතර එය වයෙස් ඩොත්රැක් නමින් හැඳින්වේ. තැනිතලාවේදී කෙතරම් එකිනෙකාට පසමිතුරු වුවද මේ නගරය තුළ දී සැවොම සොයුරන් මෙන් හැසිරිය යුතු ය. නගරය තුළ ආයුධ ඇද ගැනීමක් හෝ තවෙකෙකු ගේ ලේ සෙලවීම හෝ තහනම් ය.

මොවුන්ට අනන්‍ය වූ රළු භාෂාවක් ඇත. මොවුහු මුහුදට බිය වෙති. අසුන් පිට යාම සමාජ

තත්ත්වය පෙන්වන්නකි. කරත්තයක ගමන් කිරීම ඊට වඩා පහත් සමාජ තත්ත්වයක් වන අතර පයින් ගමන් කිරීම නින්දාවකි. මොවුහු නගර වලට අකැමැති අතර මිනිසකු ගේ දිවියේ සෑම වැදගත් කටයුත්තක්ම විවෘත අහස යට සිදු විය යුතු යැයි විශ්වාස කරති. සමින් නිමවා වර්ණ ගැන්වූ උඩු කබා සහ අශ්ව ලොමින් නිමවූ කලිසම් හදිති. යුදට යද්දී සන්නාහ නොපළඳින්නේ එය බියගුලු ක්‍රියාවක් යැයි සිතන බැවිනි. සුපිරි අශ්වාරෝහක සටන් කරුවන් ය. අරබි නමැති වක් අසිපතත්, දුන්නත්, කසයත් ආයුධ වශයෙන් භාවිත කරති.

## සමාජ සංවිධාන

### 1. නිශා රැකුම් බලකාය

ප්‍රාකාරය රැකීම සඳහා බිහිකෙරුනු විශේෂ යුධ බලකායකි. රාජධානියේ තිබෙන පැරණිතම බලකායන්ගෙන් එකකි. මෙහි ඉතිහාසය වසර අටදහසකට එහා දිව යයි.

**ඉතිහාසය**

වසර අටදහසකට පෙර දීර්ඝ රාත්‍රියේ අනික් එවුන්ගේ ආක්‍රමණය මැඩලීමෙන් පසු නැවත එවැනි ආක්‍රමණයක් සිදු වීම වැළැක්වීමේ අරමුනින් ප්‍රාකාරය ගොඩ නංවන ලදී. නමුත් කාලය ගතවත්ම අනික් එවුන් ගේ පුනර්-ආක්‍රමණයක් සිදු නොවූ අතර වනචාරී ආක්‍රමණ කිහිපයකට මුහුණ දෙන්නට පමණක් බලකායට සිදු විය. මේ නිසා බලකාය පිළිබඳ රාජධානියේ ඇති උනන්දුව ද ක්‍රමෙන් අඩු වී ගිය අතර එහි සෙබළුන් ගේ සංඛ්‍යාවද ඒ හා සමගාමීව අඩු වී ගියේ ය.

ප්‍රාකාරය දිගේ ඇති බලකොටු දහනවයක් 'කළු බලකොටුව' වෙතින් පාලනය වේ. මේ වනවිට මේ බලකොටුවලින් තුනක පමණක් සෙබළුන් වෙසේ. ආරම්භයේ දී දසදහසක් පමණ වූ සෙබළුන් මේ වන විට දහසකටත් වඩා අඩු වී ඇත. මුලදී වංශවත් පවුල්වල ලාබාල සාමාජිකයින් බලකායට බැඳීමට කැමැත්තක් දැක්වූවද මේ වනවිට එයට අවශ්‍ය මිනිසුන් සොයාගැනීම ගැටළුවක්ව පවතී. ඒ නිසා රාජධානිය පුරා සිටින අපරාධකරුවන් - සොරුන්, මිනීමරුවන්, දූෂකයන්, හොර දඩයක්කරුවන් - බලකාය වෙත බාරදීම සිරිතක්ව පවතී.

**පරිපාලනය**

බලකාය ප්‍රධාන බලඇණි තුනකින් සමන්විතය.

**මුර සංචාරකයින්** :- ප්‍රධාන වශයෙන්ම ආරක්ෂාව බාරව සිටිති. ඊට අමතරව ප්‍රාකාරයෙන් එපිට මුර සංචාරවල යෙදීම ද සිදුකරති.
**ගොඩනංවන්නන්** :- ප්‍රාකාරය, එහි බලකොටු හා නිවාස, ගබඩා ආදියේ නඩත්තුව බාරව සිටිති.
**නිවාස බාරකරුවන්**: - එදිනෙදා කුදු මහත් කටයුත්තක්ම බාරව සිටිති. ආහාර නිපදවීම, ආහාර සැපයීම, සතුන් බලාගැනීම, ඇඳුම් පැළඳුම් සැපයීම, ආයුධ සැපයීම ආදී සෑම දෙයක්ම සිදු කරති.

හදිසි යුධමය තත්ත්වයකදී ගොඩනංවන්නන් හා නිවාස බාරකරුවන් ද අවි අතැතිව සටනට එළඹෙති. ඒ සඳහා ඔවුන්ට මූලික යුධ පුහුණුවක් ලබා දී ඇත.

බලකායේ නායකයා ප්‍රධාන අණදෙන නිළධාරියා ය. මොහු සෙබළුන් අතර ඡන්දයකින් පත් වන අතර මිය යන තෙක්ම සිය තනතුරේ රාජකාරි කරයි. බලකායේ ඉහළ තනතුරු සඳහා සාමාන්‍යයෙන් වංශවත් පවුල්වලින් පැමිණියවුන් තෝරාගන්නාමුත් හැකියාව හා සුදුසුකම් ඇත්නම් සාමාන්‍ය මිනිසෙකුට පවා ඉහළ තනතුරුවලට පත් විය හැක.

පුහුණු කාලය නිමා වූ පසු සියළුදෙනාම බලකායට සේවය කිරීම සඳහා දිවුරුම් දිය යුතුය. මෙම දිවුරුමෙන් පසු බලකාය හැර යාම තහනම් අතර දිවි ඇති තෙක් එහි සේවය කල යුතුය. සේවයෙන් පලා යාම මරණ දඬුවම ලැබිය හැකි වරදකි. දිවුරුම් දුන් සහෝදරයින්ට විවාහ වීම, දරුවන් සෑදීම හා දේපල අයිතිවාසිකම් අහිමිය. සම්ප්‍රදායික නිළ ඇඳුම තනි කළු පැහැයෙන් යුක්ත වේ. වංශ සලකුණු හෝ වෙන මොනයම් සලකුණක් හෝ භාවිතය තහනම්ය.

## 2. මේස්ටර්වරුන්



ශාස්ත්‍රඥයින්, සුවකරන්නන්, විද්‍යාඥයින්, දෛවඥයින් හා පණිවිඩ මෙහෙයුම්කරුවන් වශයෙන් සේවය කරන වෘත්තිකයින්ගෙන් සැදි නිකායකි. ඕල්ඩ්ටවුන් නගරයේ පිහිටි සිටඩේල් නමැති බලකොටුවේ දී සියළුම මේස්ටර්වරුන් පුහුණුව ලබති. පුහුණුව අවසානයේ දී මේස්ටර් තනතුරට පත් කරනු ලබන්නෝ රාජධානිය පුරා විසිරී ඇති වංශවත් පවුල්වලට අයත් මාලිගා, බලකොටු, නිවාස ආදියෙහි උපදේශක තනතුරක් ලබා පිටව යති. වංශාධිපතියන් සෑම වැදගත් කටයුත්තකදීම මේස්ටර්වරුන් ගේ උපදේශනය ලැබීම සිරිතකි.

මේස්ටර්වරයකු තම දේශපාලන දර්ශනය හා ලැදියාවන් සියල්ල ඉවත දමා තමා සේවය කරන බලකොටුවට හෝ මාලිගයට හෝ ඉත සිතින් සේවය කල යුතුය. එහි භාරකාරත්වය වෙනස් වුවද පැරණි භාරකරුවාට දැක්වූ සේවය නව භාරකරුවාටද එලෙසින්ම සැපයිය යුතුය. මෙම හේතුව නිසා මේස්ටර්වරයකු බවට පත් වුනු තැනැත්තා සිය පෙළපත් නාමය හැරපියා මුල් නමින් පමණක් පෙනී සිටිය යුතුය.

පරිපාලනය

නිකායේ ප්‍රධානියා 'ප්‍රධාන මේස්ටර්වරයා' ලෙසින් හැඳින්වේ. ඔහුව පත්කිරීම හා ඉවත්කිරීම රහස් සභාවේ ඡන්දය මගින් සිදුවේ. ප්‍රධාන මේස්ටර්වරයා රාජසභාවේ අසුන් ගෙන රජුට උපදෙස් දීම සාමාන්‍ය සිරිතයි. යම් ක්ෂේත්‍රයක පරතෙරට ඉගෙනගත් මේස්ටර්වරයකු 'ආර්ක්මේස්ටර්වරයකු' ලෙසින් හැඳින්වේ. මොවුන් සාමාන්‍ය මේස්ටර්වරයකුට වඩා තත්ත්වයෙන් ජ්‍යෙෂ්ට වන අතර රහස් සභාවේ වාඩිවීමට අවසරය ඇත්තේ මොවුන්ට පමණි.

නවකයකු යම් ක්ෂේත්‍රයක දැනුම හැදෑරූ පසු ඒ විෂයය සම්බන්ධයෙන් ඔහු ගේ දැනුම පරීක්ෂා කර බලා එයින් සමත් වී නම් යම් ලෝහ වර්ගයකින් සැදුනු දම්වැල් පුරුකක් ලබා දෙයි. ඒ ඒ විෂයය සම්බන්ධයෙන් වෙන වෙනම ලෝහ වර්ග ඇති අතර නවකයකු විෂයයන් ගණනාවක් හදාරා පරිනත වී මෙවැනි විවිධ දම්වැල් පුරුක් එකතු කර ගත යුතුය. කර වටා පැළඳිය හැකි තරම් මෙවැනි දම්වැල් පුරුක් එකතුවුනු පසු ඔහුව මේස්ටර්වරයකු බවට උසස් කරන අතර අදාල පුරුක් එක් කර තැනූ දම්වැල ඔහු සිය කර වටා පැළඳිය යුතුය. කර වටා පළඳින දම්වැල මගින් මේස්ටර්වරයකු රාජධානියේ සේවකයකු බව පෙන්වයි. ඔහු මෙය කිසිවිටෙකත් සිරුරෙන් ඉවත් නොකරයි.

අවශ්‍යනම් මේස්ටර්වරයකුට තව තවත් දැනුම හදාරා තවත් පුරුක් සිය දම්වැලට එකතු කරගැනීමේ හැකියාව තිබේ. එහි ඇති දමවැල් පුරුක් අනුව මේස්ටර්වරයා ලබා ඇති දැනුම පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක. මෙම සමහර ලෝහ වර්ග පහත පරිදි වේ.

කළු යකඩ - පණිවිඩ හුවමාරුව
ලෝකඩ - තාරකා ශාස්ත්‍රය
තඹ - ඉතිහාසය
කනකරජත - නක්ෂත්‍රය
කහ රන් - අර්ථ ශාස්ත්‍රය
යකඩ - යුධ ශාස්ත්‍රය
රිදී - වෙද හෙදකම
වැලීරියන් වානේ - මන්ත්‍ර ශාස්ත්‍රය හා ගුප්ත විද්‍යා

රාජධානිය පුරා පණිවිඩ හුවමාරුව සඳහා කපුටන් යොදාගැනෙන අතර මේස්ටර්වරයකු ගේ ප්‍රධානම රාජකාරියක් වන්නේ බලකොටුවක සිටින මෙම කපුටන් නඩත්තු කිරීමයි.

# කලාව, සංස්කෘතිය සහ ආගම

## ආගම්

### 1. පුරාණ දෙවිවරුන්

වනාන්තරයේ දරුවන් විසින් අදහන්නට යෙදුනු නිර්නාමික දෙවිවරුන් ය. තවමත් උතුරුකරයේ හා ප්‍රාකාරයෙන් එපිට මිනිසුන් විසින් අදහනු ලැබේ.

පුරාණ දෙවියන් යනු ස්වභාවික දේවවාදයක් ලෙස සැලකේ. එනම් වනාන්තරයේ ගස් ගල් වලට වන්දනා මාන කිරීම සිදු කරන ලදී. මෙහි පූජකයින් හෝ ශුද්ධ ග්‍රන්ථ හෝ ගීතිකා ගැයුම් හෝ වෙන මොන යම් අන්දමකවත් වත් පිළිවෙත් හෝ දකින්නට නොලැබේ. මෙයට ආසන්නම වතාවත වන්නේ හදවෘක්ෂයක් ඉදිරිපිට යාඥා කිරීම පමණි. හදවෘක්ෂ නමින් හැඳින්වෙන මුහුණු කෙටූ වයර්වුඩ් ගස් පූජනීය වශයෙන් සැලකේ. යාඥාවන්, දිවුරුම් දීම් හා විවාහයන් සාමාන්‍යයෙන් ඒ ඉදිරිපිට දී සිදු කෙරේ. වයර්වුඩ් වෘක්ෂවල මෙම මුහුණු කෙටීම වනාන්තරයේ දරුවන් අතින් සිදු කෙරුනකි. පුරාණ දෙවිවරුන් මෙම මුහුණු තුළින් පිටත ලෝකය හා සම්බන්ධ වන බවත් ඒවා නොමැති තැන ඔවුන් ගේ බලය හීන වන බවත් දරුවන් ගේ විශ්වාසය විය.

## 2. සප්තකයේ සත්‍ය ලබ්ධිය



රාජධානි සප්තකයේ ප්‍රමුඛ ආගමයි. පුරාණ දෙවියන්ගෙන් වෙන් කර දැක්වීම සඳහා සමහරවිට නව දෙවියන් නමින් ද හැඳින්වේ. සප්තකය යනු එක් දෙවියකු ගේ සප්තාකාරයකට යැදීමයි. අදහන්නන් විසින් ඒ ඒ අවස්ථාවලදී තම අවශ්‍යතාව අනුව පිහිටාධාර ඉල්ලා මේ එක් එක් ආකාරයකට යාඥා කරති.

පියා :- විනිශ්චය නියෝජනය කරයි. යුක්තිය උදෙසා මොහුට යාඥා කරති.
මව :- මාතෘත්වය හා පෝෂණය නියෝජනය කරයි. සරුභාවය හා දයානුකම්පාව උදෙසා මැයට යාඥා කරති.
යුධභටයා :- ශක්තිය නියෝජනය කරයි. ධෛර්යය හා ජයග්‍රහණය උදෙසා මොහුට යාඥා කරති.
කන්‍යාව :- අහිංසකබව හා පවිත්‍රතාව නියෝජනය කරයි. යුවතියක ගේ සදාචාරය රැකගැනීම උදෙසා මැයට යාඥා කරති.
ශිල්පියා :- ශිල්ප හා ශ්‍රමය නියෝජනය කරයි. යම් කිසි කාර්යයක් සාර්ථකව නිම කරගැනීමට අවශ්‍ය වූ විට මොහුට යාඥා කරති.
මැහැල්ල :- ප්‍රඥාව නියෝජනය කරයි. මග පෙන්වීම උදෙසා මැයට යාඥා කරති.
ආගන්තුකයා :- මරණය හා නොදන්නා දේ නියෝජනය කරයි. මොහුට යාඥා කරන්නෝ විරල

ය.

රාජධානියේ රාජ්‍යාගම වන අතර එහි නීති, සංස්කෘතිය හා අනිකුත් සෑම වැදගත් දෙයක්ම සමග බැඳී පවතී. ප්‍රධානතම ශුද්ධ ග්‍රන්ථය 'සප්තාග්‍ර තරුව' නම් වන අතර එය සප්තාකාරය වෙනුවෙන් වෙන වෙනම පොත් හතකට බෙදා ඇත. අංක හත ශුද්ධ වස්තුවක් ලෙසින් සැලකේ. සෑම දෙයක්ම සප්තාකාරයකය හුවා දැක්වීමට උත්සාහ දරා ඇත. සප්ත නිරයන්, සප්ත ආශ්චර්යයන්, සප්තාලේපනය, සප්තාග්‍ර තරු, සප්ත වර්ණ දේදුන්න. දේවස්ථාන සප්තක නමින් හැඳින්වේ.

නයිට්වරයකු වීමට නම් සහවරයකු සප්තක දේවස්ථානයේ දී සප්තාලේපනයෙන් අභිෂේක ලැබිය යුතු ය. විවාහ, දරුවන්ට නම් තැබීම ආදිය අල්තාර ඉදිරිපිටදී සිදු කෙරේ.

## 3. ර්'හ්ලොර්

ආලෝකයේ දෙවිඳුන්, ගිනි හදවත, දැවෙන දෙවියන් හෝ සෙවනැල්ල වශයෙන් ද හැඳින්වේ. එස්සොස්හි ප්‍රමුඛතම ආගම වන අතර වෙස්ටෙරොස්හි ද අදහන්නන් ස්වල්ප දෙනෙක් සිටිති. එහිදී මොහු රතු දෙවියන් නමින් හැඳින්වේ. ඔහු ගේ සලකුණ දැවෙන හදවතයි.

මෙය ද්වෛතවාදී දහමකි. ර්'හ්ලොර් හෙවත් ආලෝකයේ, උණුසුමේ හා ජීවයේ දෙවියා සහ ඔහු ගේ ප්‍රතිමල්ලවයා වන මහා අනිකා හෙවත් අඳුරේ, ශීතයේ හා මරණයේ දෙවියා ලෝකයේ පාලනය පිළිබඳ සදාතනික අරගලයක නියැලී සිටිති. අෂයි හි ග්‍රන්ථාරූඪ වී ඇති පුරාණ අනාවැකි අනුව මෙම සටන නිම වන්නේ සිය 'ලයිට්බ්‍රින්ගර්' නමැති දිදුලන අසිපත ලෙලවමින්, ශෛලමය මකරුන්ට පණ උපද්දවමින් පැමිණෙන 'අසෝර් අහායි' නමැති වීරයා විසිනි.

මෙහි පූජකයින් 'රතු පූජකයින්' වශයෙන් හැඳින්වෙති. ඔවුහු ලේ රතු පැහැති ලිහිල් ලෝගුවලින් සැරසී සිටිති. සෑම සන්ධ්‍යාවකම රතු පූජකයින් විසින් ගිනි දල්වා නැවත උදෑසන ඊගෙන වඩින මෙන් දෙවියන්ට යාඥා කරති. ර්'හ්ලොර් තෝරාගත් ලබ්ධිකයින්ට ගිනිදළු හරහා කතා කරන බව ඔවුහු විශ්වාස කරති. එබැවින් ගිනි මැලවල නටන ගිනිදළු හරහා අනාගතය දැකීමට සමහරු උත්සාහ කරති.

## 4. ගිලුනු දෙවියා

ගිලුනු දෙවියා හෙවත් මුහුදු රළ යට වැජඹෙන්නා යනු යකඩ දූපත්වල යකඩ මිනිසුන් විසින් වැඳුම් පිදුම් කරනු ලබන දෙවියෙකි. මෙම දෙවියන් විසින් යකඩ මිනිසුන් ගේ මුහුදු කොල්ලකාර ජීවිතයට ආශීර්වාද කරයි.

විශ්වාසයන්ට අනුව ගිලුනු දෙවියන් විසින් යකඩ මිනිසුන් මවා ඇත්තේ පැහැර ගැනීම් හා බලහත්කාර කම් සිදුකිරීමටත්, රාජධානි මුලිනුපුටා දැමීමටත් ය. තමා විසින්ම මුහුදු පතුලේ සිට අග්නිය රැගෙන එන මෙම දෙවියා ගින්නේ හා අසිපතේ බලයෙන් ලෝකය පාලනය කරයි. ගිලුනු දෙවියා ගේ සදාතනික පසමිතුරා කුණාටු දෙවියා වන අතර ඔවුන් දෙදෙනා වසර දහස් ගණනක සිට අරගලයක නියැලී සිටිති. යකඩ මිනිසකු වතුරේ ගිලී මියගියහොත් ඔහු සදාතනිකවම ගිලුනු දෙවියා ගේ ශාලාවේ පැවැත්වෙන භෝජන සංග්‍රහයට සහභාගි වන බව මොවුන් ගේ විශ්වාසය යි.

ළදරුවකු ඉපදුනු වහා මුහුදු වතුරේ ගිල්වා ආශීර්වාද ලබා දෙනු ලැබේ. එමෙන්ම සාමාන්‍යයෙන් මරණ දණ්ඩනය දෙනු ලබන්නේද මුහුදේ ගිල්වා මැරීමෙනි. පූජකයින් 'ගිලුනු මිනිසුන්' නමින් හැඳින්වේ. ඔවුහු දෙවියන් ගේ පැහැය වන කොළ, අළු හා නිල් පැහැ රළු ලෝගු පළඳිති.

# භාෂා

## 1. පොදු භාෂාව

වෙස්ටෙරොස්හි රාජ්‍ය භාෂාවයි. ප්‍රාකාරයෙන් එපිට යම් යම් ජනකොටස් හැර අන් සියල්ලෝම පොදු භාෂාව කතා කරති. යම් යම් ප්‍රදේශවලට විශේෂිත වූ උච්ඡාරණ වෙනස්කම් තිබිය හැක. පලපුරුද්ද ඇත්තෙකුට එම උච්ඡාරණය වෙනස අනුව අදාල පුද්ගලයා කුමන ප්‍රදේශයකින් පැමිණියෙක්දැයි බොහෝ දුරට නිවැරැදිව අනුමාන කල හැක. කතා විලාසයේ වැඩිම දෙබෙදුම ඇත්තේ උසස් වංශවතුන් හා සාමාන්‍ය ජනතාව අතරය. මීට හේතු විය හැක්කේ වංශවතුන් කුඩා කල සිටම දැඩි පාලනයකින් යුක්ත ආචාර්යවරුන් යටතේ ශිල්ප හැදෑරීම විය හැක.

## 2. පුරාණ භාෂාව

මුල් මිනිසුන් විසින් වසර දොළොස්දහසකට පෙර ඔවුන් සමග වෙස්ටෙරොස් වෙත රැගෙන ආ භාෂාවයි. මෙය රළු, නද දෙන භාෂාවකි. පුරාණ භාෂාවෙන් සැදුනු නම් කෙටි, සරල එමෙන්ම විස්තරාත්මක නම් වෙති. ප්‍රාකාරයෙන් එපිට බොහෝ වනචාරී ගෝත්‍ර හා යෝධයින් විසින් තවමත් මේ භාෂාව වහරනු ලැබේ. එනමුදු එයින් පිට රාජධානියෙන් තුරන් වී ගිය භාෂාවකි. මෙය සතුව සංඥා හා සලකුණු භාවිතයෙන් තැනුනු ලේඛන රටාවක් විය. කෙසේ වතුදු මුල්

මිනිසුන් මේ සලකුණු භාවිත කර පොත් නොලියූ අතර සෙල්ලිපි පමණක් කොටා තැබූහ.

### 3. ඩොත්රකි භාෂාව

මෙය ඩොත්රකි අස් හිමියන් විසින් භාවිත කරන ගොරෝසු ම්ලේච්ඡ භාෂාවකි. ඔවුන් ගේ බසින් 'ඩොත්රලාට්' යනු අසුන් පිට යන්නා ය. එයින් ඩොත්රකි යන්න බිඳී ආ බැව් සිතිය හැක. ඩොත්රකි බසෙහි 'ඔසවාගෙන යාම' වෙනුවෙන් වෙනස් ආකාරයේ වචන හතරක් ද, 'අදින්න' වෙනුවෙන් වචන තුනක් ද, 'තල්ලු කරන්න' වෙනුවෙන් වචන තුනක් ද, 'අශ්වයා' වෙනුවෙන් අඩුම ගණනේ වචන අටක් පමණ ද ඇති මුත් 'කරුනාකර' හෝ 'පසුපස එන්න' යන තේරුම දෙන කිසිදු වචනයක් නැත.

සාමාන්‍යයෙන් දන්නා දෙයක් හෝ ජනශ්‍රැතියේ සඳහන් වන දෙයක් හෝ ගැන කතා කරන විට "ඒක දන්න දෙයක්" යැයි පැවසීම සිරිතකි.

### 4. ශුද්ධ වැලීරියන්

වැලීරියාවේ ඉපිද වැලීරියානු සමූහාණ්ඩුව හරහා ලොව පුරා පැතිරුනු භාෂාවකි. විනාශයෙන් පසු එහි භාවිතය කෙමෙන් මැකී ගියේ ය. එනමුදු තවමත් එම බසින් ලියැවුනු ගීත, සැහැලි, පොත් දැකිය හැක. වෙස්ටෙරොස්හි උසස් වංශවත් පවුල්වල දරුවන්ට සිය අධ්‍යාපනයේ කොටසක් වශයෙන් (බොහෝවිට මෝස්තරයට මෙන්) ශුද්ධ වැලීරියන් ඉගැන්වෙයි. මෙය බෙහෙවින් ගීතවත් බසක් ලෙස සැලකේ.

"වලාර් මෝර්ගුලිස්" යනු "සියළු මිනිසුන් මිය යා යුතුය" යන අර්ථය දේ. "වලාර් ඩොහේරිස්" යන්න "සියළු මිනිසුන් සේවය කල යුතුය" ලෙසින් පරිවර්තනය කල හැක.

වැලීරියන් ලේඛනය රූපාක්ෂරවලින් සැදුනකි. සම්ප්‍රදායයක් වශයෙන් පොත් නොලියවුනු අතර ඒ වෙනුවට ලිපි වල ලියැවුනි. මොවුන් ගේ මන්ත්‍ර ශාස්ත්‍ර ශුද්ධ වැලීරියන් වලින් හෝ වෙනත් රහස් බසකින් හෝ ලියැවෙන්නට ඇතැයි විශ්වාස කෙරෙයි.

### 5. ග්‍රාම්‍ය වැලීරියන්

විනාශයෙන් පසුව නිදහස් වෙළෙඳ නගරවල හා වෙනත් වැලීරියානු කොළණිවල ඇති වුනු එකිනෙකට වෙනස් භාෂා පවුලයි. එනමුදු මේවායේ මූලය ශුද්ධ වැලීරියන් ය. ලේඛනය සඳහා එකිනෙක භාෂාවට වෙනස් වූ සලකුණු භාවිත කරයි. ශුද්ධ වැලීරියන් දන්නා කෙනෙකුට මේ භාෂාවන් කතා කරද්දී අසීරුවෙන් හෝ යම් තරමකට තේරුම් ගත හැකි වුවද කියවා තේරුම් ගැනීමට නොහැකි ය. වහල් වෙළෙඳුන් ගේ බොක්ක අසබඩ නගර වන යුනාකි, මීරීන් හා අස්ටපෝර් වල ග්‍රාම්‍ය වැලීරියන් භාෂාවලට සිස්කාරි බසේ ආභාසයද ලැබී ඇත.

## වෙස්ටෙරෝස්හි වංශාධිපති පවුල් හඳුනාගන්න

Stark

**ස්ටාර්ක් වංශය**




**වෙස්ටෙරෝස් වල සිටින පැරණිතම ප්‍රභූ වංශයකි. ඔවුන් ගේ ඉතිහාසය වසර අටදහසකට එහා විහිදේ. ටාර්ගේරියන් ආක්‍රමණයට පෙර 'ස්ටාර්ක් වංශික රජවරුන්' ලෙසින් උතුර පාලනය කලහ. වර්තමාන රජු යටතේ උතුරේ පාලකයින් හා ආරක්ෂකයින්, වින්ටර්ෆෙල්හි අධිපතියන් වශයෙන් උතුර පාලනය කරති.**

**වසම: උතුර**

**බලකොටුව: වින්ටර්ෆෙල්**

**වංශ සලකුණ: සුදු පසුබිමක සිටින අළු පැහැ සෝරවෘකයා**

**ආදර්ශ පාඨය: ශීත කාලය පැමිනෙයි**

එඩාර්ඩ් (නෙඩ්) ස්ටාර්ක් - වර්තමාන ප්‍රධානියා

>කැට්ලින් ටලී ස්ටාර්ක් - ඔහු ගේ ආර්යාව

>රොබ් ස්ටාර්ක් - ඔහු ගේ වැඩිමහල් පුතා (14)

>සන්සා ස්ටාර්ක් - ඔහු ගේ වැඩිමහල් දුව (11)

>ආර්යා ස්ටාර්ක් - ඔහු ගේ බාල දුව (9)

>බ්‍රැන්ඩන් (බ්‍රැන්) ස්ටාර්ක් - ඔහු ගේ මද්දුම පුතා (7)

>රිකන් ස්ටාර්ක් - ඔහු ගේ බාල පුතා (3)

>ජොන් ස්නෝව් - ඔහු ගේ අවජාතක පුතා (14) (ස්නෝව් යනු අවජාතකයින්ට උතුරේදී හිමිවන පොදු වාසගමයි)

බ්‍රැන්ඩන් ස්ටාර්ක් - ඔහු ගේ වැඩිමහල් සොයුරු (මියගොස් ඇත)

ලියානා ස්ටාර්ක් - ඔහු ගේ බාල සොයුරිය (මියගොස් ඇත)

බෙන්ජීන් ස්ටාර්ක් - ඔහු ගේ බාල සොයුරු (නිශා රැකුම් බලකායේ මුර සංචාරක බලඇණියේ ප්‍රධානියා)

අනිකුත් අය

මේස්ටර් ලුවින් - උපදේශක, වෙදැදුරු හා ගුරුවරයා

වයන් පූල් - ප්‍රධාන නිවාස බාරකරු

>ජේන් පූල් - ඔහු ගේ දුව

ජොරී කසල් - ගෘහාරක්ෂක බලමුළුවේ ප්‍රධානියා

>හැලිස් මොලන්, ඩෙස්මන්ඩ්, ජැක්ස්, පෝර්තර්, ක්වෙන්ට්, ඇලන්, ටොමාර්ඩ්, වාර්ලි, හේවර්ඩ්, කේන්, විල් - සෙබළුන්

සෙර් රඩ්‍රික් කසල් - ප්‍රධාන සටන් පුහුණුකරු

>බෙත් කසල් - ඔහු ගේ දුව

සෙප්ටා මෝර්ඩේන් - එඩාර්ඩ් උතුමානන්ගේ දියණියන්ට උගන්වන ගුරුවරිය

ෂේය්ල් පූජකතුමා - දේවස්ථානයේ හා පුස්තකාලයේ භාරකරු

හලන් - අසුන් බාරකරු

>හාර්වින් - ඔහු ගේ පුතා. සෙබළෙකි

>ජොසෙත් - ඉස්තාල බලාගන්නෙක් හා අසුන් පුහුණුකරුවෙකි

ෆාර්ලන් - සුනඛයන් බලාගන්නා

නාකි ආයම්මා - වයස්ගත සේවිකාවක්

>හොඩෝර් - ඇගේ මී මුණුබුරා. මන්දබුද්ධික ඉස්තාල කොලුවෙකි

ගේජ් - ප්‍රධාන කෝකියා

මික්කෙන් - කම්මල්කරු

ස්ටාර්ක් ධජ දරන්නන්

සෙර් හෙල්මන් ටෝල්හාර්ට්

රිකාර්ඩ් කාර්ස්ටාර්ක් - කාර්හෝල්ඩ්හි උතුමානන්

රූස් බෝල්ටන් - ඩ්‍රෙඩ්පෝර්ට්හි උතුමානන්

ජොන් (ග්‍රේට්ජොන්) අම්බර්

ගැල්බට් හා රොබර්ට් ග්ලවර්

වයිමන් මැන්ඩර්ලි - ධවල වරායේ උතුමානන්

මේජ් මෝර්මන්ට් - වලස් දූපතේ ආර්යාව

වින්ටර්ෆෙල්වලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

කාර්ස්ටාර්ක්, අම්බර්, ෆ්ලින්ට්, මෝර්මන්ට්, හෝර්න්වුඩ්, සර්වින්, රීඩ්, මැන්ඩර්ලි, ග්ලවර්, ටෝල්හාර්ට්, බෝල්ටන්

Baratheon

බරතියන් වංශය




වර්තමානයේ වෙස්ටෙරෝස්වල සිටින රාජ පරම්පරාවයි. ඔවුන් ගේ පරම්පරාව වසර තුන්සීයක පමණ කෙටි ඉතිහාසයක් ඇති, බලවත් එමෙන්ම උදාර ප්‍රභූ වංශයකි. ඔවුන් ගේ මුල් බිම ස්ටෝර්ම්ස් එන්ඩ් වුවද රජකම ලැබීමෙන් පසු ඩ්‍රැගන්ස්ටෝන් ද ඈදාගෙන ඇත. රජතුමා කින්ග්ස් ලැන්ඩින්ග් හි සිට රාජ්‍යය පාලනය කරයි.

වසම: ස්ටෝර්ම්ලැන්ඩ්

බලකොටුව: ස්ටෝර්ම්ස් එන්ඩ්

වංශ සලකුණ: රන්වන් පසුබිමක සිටින කිරුළ ලූ කළු පැහැ ගෝනා

ආදර්ශ පාඨය: වියරුව අපගේ ය

රොබර්ට් බරතියන් - වර්තමාන ප්‍රධානියා හා රටේ රජතුමා

>සෙර්සි ලැනිස්ටර් බරතියන් - ඔහු ගේ රැජිණ

>ජොෆ්රි බරතියන් - ඔහු ගේ වැඩිමහල් පුතා (12)

>මර්සෙලා බරතියන් - ඔහු ගේ දුව (8)

>ටමෙන් බරතියන් - ඔහු ගේ බාල පුතා (7)

ස්ටැනිස් බරතියන් - ඔහු ගේ බාල සොයුරු (ඩ්‍රැගන්ස්ටෝන්හි උතුමානන්)

>සෙලිසේ ෆ්ලොරන්ට් බරතියන් - ඔහු ගේ ආර්යාව

>ෂිරීන් බරතියන් - ඔහු ගේ දුව (9)

රෙන්ලි බරතියන් - ඔහු ගේ බාලම සොයුරු (ස්ටෝර්ම්ස් එන්ඩ්හි උතුමානන්)

රජු ගේ උපදේශකයින්

ප්‍රධාන මේස්ටර් පයිසෙල්

පෙටයර් බේලිෂ් (සුළැඟිල්ලා) - භාණ්ඩාගාරයේ ප්‍රධානියා

ස්ටැනිස් බරතියන් - නාවුක කටයුතු පිළිබඳ ඇමති

රෙන්ලි බරතියන් - නීති කටයුතු පිළිබඳ ඇමති

සෙර් බැරිස්ටාන් සෙල්මි - රාජ්‍යාරක්ෂක බලකායේ ප්‍රධානියා

වාරිස් (මකුළුවා) - පණ්ඩකයෙකි. රහස් ඔත්තු සේවයේ ප්‍රධානියා

අනිකුත් අය

සෙර් ඉලියන් පේයින් - රජු ගේ අළුගෝසුවා

සැන්ඩෝර් ක්ලිගේන් - ජොෆ්රි කුමරා ගේ අංගාරක්ෂකයා

ජේනස් ස්ලින්ට් - නගරාරක්ෂක බලකායේ ප්‍රධානියා

ජලාබාර් ක්ෂෝ - ගිම්හාන දූපත් වෙතින් පිටුවහල් කල කුමරෙකි

ලැන්සෙල් හා ටිරෙක් ලැනිස්ටර් - රජු ගේ සහචරයින්

සෙර් ආරොන් සැන්ටගාර් - ප්‍රධාන සටන් පුහුණුකරු

රාජ්‍යාරක්ෂක බලකාය

සෙර් බැරිස්ටාන් සෙල්මි - අණදෙන නිළධාරියා

සෙර් ජේමි ලැනිස්ටර් (රජුන් මරන්නා)

සෙර් බොරෝස් බ්ලොන්ට්

සෙර් මෙරින් ට්‍රැන්ට්

සෙර් ඒරිස් ඕක්හාර්ට්

සෙර් ප්‍රෙස්ටන් ග්‍රීන්ෆීල්ඩ්

සෙර් මැන්ඩන් මූර්

ස්ටෝර්ම්ස් එන්ඩ්වලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

සෙල්මි, විල්ඩ්, ට්‍රැන්ට්, පෙන්රෝස්, එරල්, එස්ටර්මන්ට්, ටාර්ත්, ස්වෝන්, ඩොන්ඩරියන්, කැරන්

ඩ්‍රැගන්ස්ටෝන්වලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

සෙල්ටිගාර්, වෙලරියන්, සීවර්ත්, බාර්-එමන්, සන්ග්ලාස්

Targaryen

**ටාර්ගේරියන් වංශය**




**වෙස්ටෙරෝස් වල කලින් සිටි රජ පරපුරයි. ඔවුන් වැලීරියාවේ සිට පැමිණි ආක්‍රමණිකයෝ වෙති. බරතියන් වරු සිහසුන අල්ලාගත්තාට පසු ඉතිරිව සිටින සාමාජිකයින් මුහුදෙන් එතෙරට පැන ගොස් ඇත.**

**වසම: නැත**

**බලකොටුව: නැත**

**වංශ සලකුණ: කළු පසුබිමක සිටින රතු පැහැ ඔළු තුනේ මකරා**

**ආදර්ශ පාඨය: ගින්න හා රුධිරය**

**ඒරිස් ටාර්ගේරියන් - පිස්සු රජා (මියගොස් ඇත)**

>රාඑල්ලා ටාර්ගේරියන් - ඔහු ගේ සොයුරිය/ රැජිණ (මියගොස් ඇත)

රේගාර් ටාර්ගේරියන් - ඔහු ගේ වැඩිමහල් පුතා (මියගොස් ඇත)

>ඊලියා මාර්ටෙල් ටාර්ගේරියන් - ඔහු ගේ බිරිඳ (මියගොස් ඇත)

>රේනිස් ටාර්ගේරියන් - ඔහු ගේ දුව (මියගොස් ඇත)

>ඒගොන් ටාර්ගේරියන් - ඔහු ගේ පුතා (මියගොස් ඇත)

විසේරිස් ටාර්ගේරියන් - ඔහු ගේ බාල පුතා

ඩනේරිස් ටාර්ගේරියන් - ඔහු ගේ දුව (13)

අනිකුත් අය

ඉල්ලීරියෝ මොපාටිස් - පෙන්ටොස් නිදහස් වෙළෙඳ නගරයේ වාසය කරන ධනවත් වෙළෙන්දෙකි. ටාර්ගේරියන්වරුන්ට උදවු සපයයි

ඛාල් ඩ්‍රෝගෝ - ඩනේරිස් ගේ ඩොත්රැකි සැමියා

සෙර් ජෝරා මෝර්මන්ට් - ඩනේරිස්ට සේවය කරන වෙස්ටෙරෝස්වලින් පිටුවහල් කල නයිට්වරයෙකි

ඉරී, ජික්වි, ඩෝරියා - ඩනේරිස් ගේ වහල් සේවිකාවන්

ජෝගෝ, ක්වෝරෝ - ඩ්‍රෝගෝ ගේ රුහිරාරක්ෂකයින් (සමීපතම ශරීරාක්ෂකයින්)

Tully

ටලී වංශය




**මුලදී එතරම් විශාල පෙළපතක් නුවූවද ටාර්ගේරියන් රජවරුන් විසින් මොවුන් ගේ තත්ත්වය උසස් කොට ගංගා ත්‍රිශූලයේ භාරකාරත්වය පවරන ලදී. ගංගා ත්‍රිශූලයේ හා ගංගා නිම්නයේ පාලකයින් ය.**

**වසම: ගංගා ත්‍රිශූලය**

**බලකොටුව: රිවර්රන්**

**වංශ සලකුණ: රතු/ නිල් පසුබිමක සිටින රිදී පැහැති ට්‍රවුට් මාළුවා**

**ආදර්ශ පාඨය: පෙළපත, රාජකාරිය, ගෞරවය**

**හස්ටර් ටලී - වර්තමාන ප්‍රධානියා**

>මිනයිසා වෙන්ට් ටලී - ඔහු ගේ ආර්යාව (මියගොස් ඇත)

>කැට්ලින් ටලී ස්ටාර්ක් - ඔහු ගේ වැඩිමහල් දුව

>ලයිසා ටලී ඒරින් - ඔහු ගේ බාල දුව

>සෙර් එඩ්මුයර් ටලී - ඔහු ගේ පුතා

සෙර් බ්‍රින්ඩන් ටලී (කළු මාළුවා) - ඔහු ගේ බාල සොයුරු

අනෙකුත් අය

මේස්ටර් වයිමන් - උපදේශක

සෙර් ඩෙස්මන්ඩ් ග්‍රෙල් - ප්‍රධාන සටන් පුහුණුකරු

සෙර් රොබින් රයිගර් - ගෘහාරක්ෂක බලකායේ ප්‍රධානියා

අදෙරිඩස් වේන් - ප්‍රධාන නිවාස බාරකරු

ටලී ධජ දරන්නන්

ජේසන් මැලිස්ටර් - සීගාර්ඩ්හි උතුමානන්

>පැට්‍රෙක් මැලිස්ටර් - ඔහු ගේ පුතා

වෝල්ඩර් ෆ්‍රේ - ක්‍රොසින්ග්හි උතුමානන්

ජොනෝස් බ්‍රැකන් - ස්ටෝන් හෙජ්හි උතුමානන්

ටයිටස් බ්ලැක්වුඩ් - රැවන්ට්‍රීහි උතුමානන්

සෙර් රේමන් ඩැරී

සෙර් කැරිල් වාන්ස්

සෙර් මාර්ක් පයිපර්

ෂෙලා වෙන්ට් - හැරෙන්හෝල්හි ආර්යාව

රිවර්රන්වලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

ඩැරී, ෆ්‍රේ, මැලිස්ටර්, බ්‍රැකන්, බ්ලැක්වුඩ්, වෙන්ට්, රයිගර්, පයිපර්, වාන්ස්

Arryn

**ඒරින් වංශය**




**වෙස්ටෙරෝස් වල සිටින පැරණිතම ප්‍රභූ වංශයකි. ටාර්ගේරියන් ආක්‍රමණයට පෙර 'කඳුකරයේ හා මිටියාවතේ රජවරුන්' ලෙසින් නැගෙනහිර පාලනය කලහ. වර්තමාන රජු යටතේ නැගෙනහිර පාලකයින් හා ආරක්ෂකයින්, මිටියාවතෙහි අධිපතියන් වශයෙන් නැගෙනහිර පාලනය කරති.**

**වසම: ඒරින් මිටියාවත**

**බලකොටුව: ඉයරි**

**වංශ සලකුණ: නිල් පසුබිමක සිටින සුදු පැහැති උකුස්සා හා අඩසඳ**

**ආදර්ශ පාඨය: ගෞරවය තරම් ඉහළින්**

ජොන් ඒරින් - වර්තමාන ප්‍රධානියා

>ලයිසා ටලී ඒරින් - ඔහු ගේ ආර්යාව

>රොබර්ට් ඒරින් - ඔහු ගේ පුතා (6)

අනෙකුත් අය

මේස්ටර් කෝල්මන් - උපදේශක

සෙර් වාර්ඩිස් ඊගන් - ගෘහාරක්ෂක බලකායේ ප්‍රධානියා

සෙර් බ්‍රින්ඩන් ටලී - වාහල්කඩ නායිට්වරයා

ඒරින් ධජ දරන්නන්

නෙස්ටර් රොයිස් - මිටියාවතේ ප්‍රධාන බාරකරු

>සෙර් ඇල්බාර් රොයිස් - ඔහු ගේ පුතා

>මියා ස්ටෝන් - ඔහු ගේ සේවයේ යෙදෙන අවජාතක දැරියකි

ඉයොන් හන්ටර්

සෙර් ලින් කෝබ්‍රේ

ආන්යා වේන්වුඩ්

>සෙර් මෝර්ටන් වේන්වුඩ් - ඇගේ පුතා

>සෙර් ඩොනල් වේන්වුඩ් -  ඇගේ පුතා

ඉයරිවලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

රොයිස්, බේලිෂ්, ඊගන්, වේන්වුඩ්, හන්ටර්, රෙඩ්ෆෝර්ට්, කෝබ්‍රේ, බෙල්මෝර්, මැල්කම්, හර්සි

Tyrrel

ටිරල් වංශය




නිරිතදිග වෙස්ටෙරෝස්හි අධික ජනගහනයෙන් යුත් සුවිසල් සාරවත් බිම් පෙදෙස් පාලනය කරති. ටාර්ගේරියන් ආක්‍රමණවලට එරෙහිව සටන් කල රීච් හි පැරැණි රජ පෙළපත වූ ගාර්ඩනර්වරුන් සමූල ඝාතනය වීමෙන් පසු ඔවුන් ගේ ප්‍රධාන සේවකයන් වූ ටිරල්වරු රාජ්‍යය ආක්‍රමණිකයන්ට බාර දුන්හ. ඊට කලගුණ සැලකීමක් වශයෙක් ටිරල් වංශිකයින්ව එතැනට ඔසවා තැබීමට ටාර්ගේරියන්වරු වග බලා ගත්හ.

වසම: රීච්

බලකොටුව: හයිගාර්ඩන්

වංශ සලකුණ: කොළ පසුබිමක තිබෙන රන්වන් රෝස මල

ආදර්ශ පාඨය: ශක්තිමත්ව වැඩෙමින්

මේස් ටිරල් - වර්තමාන ප්‍රධානියා

>ඇලරී හයිටවර් ටිරල් - ඔහු ගේ ආර්යාව

>විලාස් ටිරල් - ඔහු ගේ වැඩිමහල් පුතා

>සෙර් ගාර්ලන් (ගාර්ලන් දි ගැලන්ට්) ටිරල් - ඔහු ගේ මද්දුම පුතා

>සෙර් ලෝරාස් ටිරල් (කුසුම් නයිට්වරයා) - ඔහු ගේ බාල පුතා (16)

>මාර්ජරී ටිරල් - ඔහු ගේ දුව (14)

ඔලීනා රෙඩ්වින් ටිරල් (කටුඅතු රැජිණ) - ඔහු ගේ මව

මීනා ටිරල් රෙඩ්වින් - ඔහු ගේ සොයුරිය

ජානා ටිරල් ෆොසවේ - ඔහු ගේ සොයුරිය

ගාර්ත් ටිරල් (අසික්කිත ගාර්ත්) - ඔහු ගේ මාමා. හයිගාර්ඩ්න්හි ප්‍රධාන නිවාස බාරකරු

සෙර් මොරින් ටිරල් - ඔහු ගේ මාමා. ඕල්ඩ්ටවුන්හි නගරාරක්ෂක බලකායේ ප්‍රධානියා

මේස්ටර් ගෝර්මන් - ඔහු ගේ මාමා. සිටඩෙල්හි ශාස්ත්‍රඥයෙකි

අනිකුත් අය

මේස්ටර් ලොමිස් - උපදේශක

ඉගොන් වයර්වෙල් - ගෘහාරක්ෂක බලකායේ ප්‍රධානියා

සෙර් වෝර්ටිමර් ක්‍රේන් - ප්‍රධාන සටන් පුහුණුකරු

ටිරල් ධජ දරන්නන්

පැක්ස්ටර් රෙඩ්වින් - ආර්බර්හි උතුමානන්

>මීනා ටිරල් - ඔහු ගේ ආර්යාව. මේස් ගේ සොයුරිය

>සෙර් හොරාස් රෙඩ්වින් (සංත්‍රාසය) - ඔහු ගේ පුතා

>සෙර් හොබර් රෙඩ්වින් (කෙල හලන හොබර්) - ඔහු ගේ පුතා. හොරාස් ගේ නිවුන් සොයුරා

>ඩෙස්මේරා රෙඩ්වින් - ඔහු ගේ දූව (15)

රැන්ඩිල් ටාර්ලි - හෝර්න් හිල්හි උතුමානන්

>සැම්වෙල් ටාර්ලි - ඔහු ගේ වැඩිමල් පුතා. නිශා රැකුමේ ආධුනිකයෙකි

>ඩිකන් ටාර්ලි - ඔහු ගේ බාල පුතා

හයිගාර්ඩන්වලට පක්ෂපාතී අනෙකුත් වංශාධිපති පවුල්

වයර්වෙල්, ෆ්ලොරන්ට්, ඕක්හාර්ට්, හයිටවර්, ක්‍රේන්, ටාර්ලි, රෙඩ්වින්, රෝවන්, ෆොසවේ, මලන්ඩෝර්

Martell

මාර්ටෙල් වංශය




**වෙස්ටෙරෝස්හි දකුණු අන්තයේ ඩෝර්න් අර්ධද්වීපය පාලනය කරති. යකඩ සිහසුනට පක්ෂපාතී වුවද රාජධානියේ දේශපාලන කලබැගෑනිවලට එතරම් සම්බන්ධ නොවී හුදෙකලාව සිටීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරති.**

**වසම: ඩෝර්න්**

**බලකොටුව: සන්ස්පියර්**

**වංශ සලකුණ: තැඹිළි පසුබිමක තිබෙන රත් පැහැ හිරු පසා කල රන්වන් හෙල්ල**

**ආදර්ශ පාඨය: නොනැමුනු, යටත් නොවුනු, නොකැඩුනු**

**ඩෝරාන් නිමේරස් මාර්ටෙල් – වර්තමාන ප්‍රධානියා**

>නොර්වොස් හි මෙලාරියෝ - ඔහු ගේ ආර්යාව

>ආරියාන් මාර්ටෙල් - ඔහු ගේ දුව

>ක්වින්ටින් මාර්ටෙල් - ඔහු ගේ වැඩිමහල් පුතා

>ට්‍රිස්ටේන් මාර්ටෙල් - ඔහු ගේ බාල පුතා

ඔබෙරින් මාර්ටෙල් (රතු පොළඟා) - ඔහු ගේ බාල සොයුරු

ඊලියා මාර්ටෙල් - ඔහු ගේ සොයුරිය (මියගොස් ඇත)

අනෙකුත් අය

ඒරෝ හෝටාහ් - නොර්වෝෂි කුලී හේවායෙකි. ගෘහාරක්ෂක බලකායේ ප්‍රධානියා

මේස්ටර් කැලියට් - උපදේශක

මාර්ටෙල් ධජ දරන්නන්

එඩ්රික් ඩේන් - ස්ටාර්ෆෝල්හි උතුමානන්

සන්ස්පියර්වලට පක්ෂපාතී අනෙකුත් වංශාධිපති පවුල්

ජෝර්ඩේන්, සැන්ටගාර්, ඇලීරියන්, ටෝලන්ඩ්, අයර්න්වුඩ්, විල්, ෆව්ලර්, ඩේන්

Lannister

ලැනිස්ටර් වංශය




**වෙස්ටෙරෝස් වල සිටින පැරැණිතම, බලවත්ම හා ධනවත්ම ප්‍රභූ වංශයකි. ටාර්ගේරියන් ආක්‍රමණයට පෙර 'ලැනිස්ටර් වංශික රජවරුන්' ලෙසින් බටහිර පාලනය කලහ. වර්තමාන රජු යටතේ පාලකයින් හා ආරක්ෂකයින් වශයෙන් බටහිර පාලනය කරති. ඔවුන් ගේ නිල නොවන ආදර්ශ පාඨය, "ලැනිස්ටර්වරු සැමවිටම සිය ණය ගෙවා දමති" යන්න ඔවුන් ගේ චරිත ලක්ෂණ මනාව විදහා පායි.**

**වසම: බටහිර**

**බලකොටුව: කාර්ස්ටලී රොක්**

**වංශ සලකුණ: ලේ රතු පසුබිමක සිටින රන්වන් සිංහයා**

**ආදර්ශ පාඨය: අසන්න මා ගොරවන හඬ**

ටයිවින් ලැනිස්ටර් - වර්තමාන ප්‍රධානියා

>ජොආනා ලැනිස්ටර් - ඔහු ගේ ආර්යාව (මියගොස් ඇත)

>සෙර්සි ලැනිස්ටර් බරතියන් - ඔහු ගේ දුව

>සෙර් ජේමි ලැනිස්ටර් (රජුන් මරන්නා) - ඔහු ගේ වැඩිමහල් පුතා (සෙර්සි ගේ නිවුන් සොයුරා)

>ටිරියන් ලැනිස්ටර් (පුංචි යකා) - ඔහු ගේ බාල පුතා

සෙර් කෙවන් ලැනිස්ටර් - ඔහු ගේ බාල සොයුරු හා ප්‍රධාන උපදේශක

>ඩෝර්නා ස්විෆ්ට් ලැනිස්ටර් - ඔහු ගේ ආර්යාව

>ලැන්සල් ලැනිස්ටර් - ඔහු ගේ වැඩිමහල් පුතා. රජු ගේ සහචරයෙකි

>විලෙම් හා මාර්ටින් ලැනිස්ටර් - ඔහු ගේ නිවුන් පුතුන් දෙදෙනා

>ජැනී ලැනිස්ටර් - ඔහු ගේ බිළිඳු දියණිය

අනිකුත් අය

ජෙනා ලැනිස්ටර් - ඔහු ගේ සොයුරිය

සෙර් ස්ටැෆර්ඩ් ලැනිස්ටර් - ජොආනා ආර්යාවගේ සොහොයුරා

මේස්ටර් ක්‍රේලන් - උපදේශක

ලැනිස්ටර් ධජ දරන්නන්

ලියෝ ලෙෆර්ඩ්

සෙර් ඇඩම් මාර්බ්‍රෑන්ඩ්

සෙර් ග්‍රෙගර් ක්ලිගේන් (අසූ පිට යන කන්ද)

සෙර් හැරිස් ස්විෆ්ට්

ඇන්ඩ්‍රූස් බ්‍රැක්ස්

සෙර් ෆෝර්ලි ප්‍රෙස්ටර්

සෙර් අමොරි ලෝර්ක්

වාර්ගෝ හෝර්ට් - ක්වොහෝර්හි සිට පැමිණි කුලී හේවායෙකි

කාර්ස්ටලී රොක්වලට පක්ෂපාතී අනෙකුත් වංශවත් පවුල්

පේයින්, ස්විෆ්ට්, මාර්බ්‍රෑන්ඩ්, ලිඩින්, බේන්ෆෝර්ට්, ලෙෆර්ඩ්, ක්‍රැකර්හෝල්, සෙරට්, බෲම්, ක්ලිගේන්, ප්‍රෙස්ටර්, වෙස්ටර්ලින්ග්

Greyjoy

**ග්‍රේජෝයි වංශය**




**වෙස්ටෙරෝස්වලට බටහිර දෙසින් පිහිටි කර්කශ මුඩු දූපත් සමූහයක් වන යකඩ දූපත් පාලනය කරති. සම්ප්‍රදායිකව මොවුහු මුහුදු කොල්ලකරුවන් හා ආක්‍රමණිකයින් වන අතර මහද්වීපය ආක්‍රමණය කිරීමේ නොතිත් ආශාවෙන් පෙලෙති. වරක් යකඩ සිහසුනට එරෙහිව කැරැලි ගැසූවද දරුණු ලෙස මර්දනය කරන ලදී.**

**වසම: යකඩ දූපත්**

**බලකොටුව: පයික්**

**වංශ සලකුණ: කළු පසුබිමක සිටින රන්වන් ක්‍රාකනයා**

**ආදර්ශ පාඨය: අපි වපුරන්නන් නොවෙමු**

බේලන් ග්‍රේජෝයි - වර්තමාන ප්‍රධානියා

>ඇලානිස් හාර්ලොව් ග්‍රේජෝයි - ඔහු ගේ ආර්යාව

>රඩ්‍රික් ග්‍රේජෝයි - ඔහු ගේ වැඩිමහල් පුතා (මියගොස් ඇත)

>මාරන් ග්‍රේජෝයි - ඔහු ගේ මද්දුම පුතා (මියගොස් ඇත)

>ආශා ග්‍රේජෝයි - ඔහු ගේ දුව

>තියන් ග්‍රේජෝයි - ඔහු ගේ බාල පුතා

ඉයුරන් ග්‍රේජෝයි (කපුටු ඇස) - ඔහු ගේ බාල සොයුරු

වික්ටරියන් ග්‍රේජෝයි - ඔහු ගේ බාල සොයුරු (යකඩ නාවික බලඇණියේ අණ දෙන නිළධාරී)

ඒරන් ග්‍රේජෝයි - ඔහු ගේ බාල සොයුරු

පයික් වලට පක්ෂපාතී අනෙකුත් වංශාධිපති පවුල්

හාර්ලෝව්, ස්ටෝන්හවුස්, මර්ලින්, සන්ඩර්ලි, බොට්ලි, ටෝව්නි, වින්ච්, ගුඩ්බ්‍රදර්

Night's Watch

**නිශා රකුම් බලකාය**




**සදාකල්හිම හිමෙන් මිදුනු උතුරුකරයෙන් එන ආක්‍රමණ වලකනු වස් වසර අටදහසකට පෙර ප්‍රාකාරය ගොඩනැගුනු විට එය ආරක්ෂා කිරීම සඳහා පිහිටවනු ලැබූ යුධ බලකායකි. ප්‍රාකාරය යනු රාජධානියේ උතුරු මායිමයි. මෙහි සේවය කරන්නන් විවාහ වීමෙන්, දරුවන් සෑදීමෙන් හා දේපලවලට අයිතිවාසිකම් කීමෙන් වැලකීමේ දිවුරුමක් දිය යුතුය. රාජකාරියෙන් පලා යන්නන්ට හිමිවන දඬුවම මරණය යි. රාජකාරි ඇඳුම සම්පූර්ණයෙන්ම කළු පැහැ වන අතර ඒ නිසා 'කළු සොයුරන්' හෝ 'කපුටන්' යන නම් වලින්ද හැඳින්වේ.**

**නිශා රකුම් බලකාය රාජධානියේ කිසිම රජෙකුට යටත් නොවන ස්වාධීන බලකායකි. එය රාජධානියේ අභ්‍යන්තර දේශපාලන කලබැගෑනි සහ යුද්ධවලින් සම්පූර්ණයෙන්ම විනිර්මුක්ත ය. කළු බලකොටුව ප්‍රධාන කොට ප්‍රාකාරය පුරා විහිදී ඇති බලකොටුවලින් රාජකාරි ඉටු කෙරේ.**

**බලකාය ප්‍රධාන බල ඇණි තුනකින් සමන්විතය.**

1. මුර සංචාරක (Rangers) - ආරක්ෂාව හා සටන් කිරීම

2. ගොඩනැගීම් (Builders) - ප්‍රාකාරය රැකබලා ගැනීම හා අලුත්වැඩියාව

3. නිවාස බාරකරුවන් (Stewards) - ආහාර සැපයීම හා වෙනත් කටයුත

වසම: රාජධානියේ උතුරු මායිම හා එයින් එපිට

බලකොටුව: කළු බලකොටුව

සලකුණ: කළු කපුටා

ආදර්ශ පාඨය: නැත

කළු බලකොටුව

ජියර් මෝර්මන්ට් - වර්තමාන ප්‍රධාන අණ දෙන නිළධාරියා

බෙන්ජින් ස්ටාර්ක් - මුර සංචාරක බලඇණියේ ප්‍රධානියා

>සෙර් ජැරමි රයිකර්, සෙර් වේමාර් රොයිස්, ගැරඩ්, විල්, ඔතෝර්, ජැෆර් ෆ්ලවර්ස් - මුර සංචාරකයින්

සෙර් ඇලිසන් තෝර්න් - ප්‍රධාන සටන් පුහුණුකරු

මේස්ටර් ඒමන් - ප්‍රධාන උපදේශක

බොවෙන් මාර්ෂ් - ප්‍රධාන නිවාස බාරකරු

>හොබ් (ඇඟිලි තුනේ හොබ්) - ප්‍රධාන කෝකියා

>එඩිසන් ටොලට් (ඩොලරස් එඩ්)

ඔතෙල් යාර්වික් - ගොඩනංවන්නන් ගේ ප්‍රධානියා

>කෙග්ස්, ජැක් බුල්වර්, මොලී - ගොඩනංවන්නන්

යොරේන් - රාජධානිය පුරා සංචාරය කර බලකායට නවකයින් බඳවාගැනීම මොහු ගේ රාජකාරිය වේ

ජොන් ස්නොව්, සැම්වෙල් ටාර්ලි, පයිපර් (පිප්), හෝල්ඩර්, ටොඩර් (ටොඩ්), ග්‍රෙන්, ඩේරියන්, රැස්ට්, කාල්, මැතර්, බැලියන් - ආධුනිකයින්

සෙවනැලි කුළුණ

සෙර් ඩෙනිස් මැලිස්ටර් - අණ දෙන නිළධාරියා

ක්හෝරින් (අත කොට ක්හෝරින්) - මුර සංචාරකයින් ගේ ප්‍රධානියා

>හාකර්, බෝර්බා, ස්ටෝන්ස්නේක් - මුර සංචාරකයින්

නැගෙනහිර කුළුණ

කොටර් පයික් - අණ දෙන නිළධාරියා

බොර්කාස් - ප්‍රධාන නිවාස බාරකරු


Forest
Storro
Craster's Keep
Whitetree
The Wall
Castle Black
Eastwatch-by-the-Sea
Mole's Town
The Shadow
Tower
BRANDON'S GIFT
Queenscrown
THE NEW GIFT

# වසම් බෙදී ඇති ආකාරය



# ප්‍රස්තාවනාව

"අපි ආපහු යන්ට පටන් ගත්තනම් හොඳයි වගේ නේද?" ගැරඩ් ආයාචනාත්මක ස්වරයෙන් කීවේ ඔවුන් වටා වනාන්තරයේ අන්ධකාරය දැඩිවෙද්දීය. "වනචාරියො ඔක්කොම මැරිලා."

"උඹ මැරිච්ච මිනිස්සුන්ට බයද?" සෙර් වේමාර් රොයිස් ඇසුවේ කට කොනකට නැගුනු සියුම් සිනහවක්ද ඇතුවය.

ඒ ඇමට අසුවීමට තරම් ගැරඩ් මෝඩයෙක් නොවේ. වසර පනහකටත් වඩා වැඩි තම ජීවිත කාලය තුලදී මෙවැනි වංශාධිපතියන් ඇති පදම් යනු එනු ඔහු දැක තිබේ. "මැරිච්ච එවුන් මැරිලා. අපට මොකක්ද එවුන්ගෙන් ඇති වැඩේ?"

"උං ඇත්තටම මැරිලද?" රොයිස් මෘදු ස්වරයෙන් ඇසීය. "උඹට කොහොමද ඒ ගැන ඔච්චර සහතිකයෙන් කියන්ට පුළුවන්?"

"විල් උංව දැක්කා. ඒ සහතිකය මට හොඳටම ඇති."

කොයි වෙලාවක හෝ තමනුත් මේ විවාදයට ඇදෙන බව විල් දැන නොසිටියා නොවේ. නමුත් මේ තරම් වේලාසනින් එය සිදුවීම ඔහුගේ සතුටට හේතු වූයේ නැත. "මගේ අම්මා මට කිවුවෙ මැරිච්ච මිනිස්සුන්ගෙන් අපට කිසිම හානියක් වෙන්නෙ නෑ කියලයි."

"මගේ ආයම්මත් ඔය කතාවම කිවුවා විල්." රොයිස් පිළිවදන් දුනි. "ඔය ගෑනුන්ගෙ ඔඩොක්කුවෙ ඉඳන් අහන කතා කවදාවත් විශ්වාස කරන්ට එපා. මැරිච්ච මිනිස්සුන්ගෙනුත් අපට ඉගෙන ගන්ට පුළුවන් පාඩම් තියෙනවා." සැඳෑ අඳුරින් පිරෙන වනාන්තරය මැද්දේ ඔහුගේ කටහඬ දෝංකාර දුනි.

"අපට බොහොම දුර ගමනක් යන්ට තියෙනවා." ගැරඩ් තවත් උත්සාහයක් දැරීය. "දවස් අටක් නැත්තං නවයක්. කළුවරත් වැටෙනවා."

සෙර් වේමාර් අහස දෙස උනන්දුවකින් තොර බැල්මක් හෙලීය. "හැමදාම මේ වෙලාවට එහෙම වෙනවා. උඹ කළුවරට බයද ගැරඩ්?"

ගැරඩ්ගේ දෙතොල් තදින් පියවී යනුත්, හිස වැසූ කළු පැහැ සළුවට යටින් වූ දෙනෙතේ පැන නැගුනු, අමාරුවෙන් යටපත් කරගත් කේන්තියත් විල් පැහැදිලිවම දිටීය. ගැරඩ් මේ ගෙවා දමන්නේ 'නිශා රැකුම් බලකායට' එක්වී ගෙවන හතලිස් වන වසරයි. අනෙක් අතට ඔහු කියන දේ සැහැල්ලුවට ගන්නා අය ගැරඩ් විසින් නොඉවසන බවද විල් දනී. නමුත් මේ මහලු මිනිසා පෙලන්නේ ඒ කිසිවක් නොව වෙනත් කුමක් හෝ දෙයක් බවත්, බිඳවැටුනු ආත්මාභිනයට යටින් ඇත්තේ නොසන්සුන්කමක් හා බියක් බවත් ඔහුට දැනුනි.

මේ නොසන්සුන්කම විල් විසින්ද හඟින ලද්දකි. මේ ඔහු ප්‍රාකාරයේ ගෙවන සිවුවන වසරයි. ප්‍රාකාරයෙන් එහා ගිය මුල්ම වතාවේ පැරණි ජනකතා සියල්ල මතක් වී ඔහුගේ ඇඟේ ලේ වතුර වූ නමුත් ඔහු දැන් ඒ ගැන සිනාසෙයි. දැන් ඔහු මුර සංචාර සියයකට වඩා වැඩි පළපුරුද්දක් ඇති ප්‍රවීනයෙකි. දකුණුකරයේ වැසියන් විසින් 'හොල්මන් කැලෑව' නමින් හඳුන්වනු ලබන ඉමක් කොනක් නොපෙනෙන මේ මහා වනාන්තරය තවදුරටත් ඔහුව තැති නොගන්වයි.

එහෙත් අද රාත්‍රිය? අද රාත්‍රියේ කුමක්දෝ වෙනසක් තිබේ. දින නවයක් තිස්සේ ඔවුන් උතුරු හා වයඹ දෙසට - ප්‍රාකාරයෙන් ඈතට - මේ හඹායන්නේ වනචාරී ආක්‍රමණිකයන් පිරිසකගේ මං සලකුණුය. ගෙවුනු සෑම දිනයක්ම පෙරදාට වඩා අසීරු එකක් වූ මුත් අද අනිත් හැමදාටම වඩා අසීරු වූ දිනයකි. උතුරින් හමා ආ සීතල සුළඟ නිසා අවට ගස් සෙලවුනේ හරියටම පණ පිටින් සිටින්නාක් මෙනි. දවස පුරාම විල්ට දැනුනේ මොකක්දෝ දෙයක් තමන් දිහා විපරමෙන් බලා සිටින්නාක් වැනි හැඟීමකි. ගැරඩ්ටද මෙලෙසින්ම හැඟුනු බවත් ඔහු දනියි. මේ මොහොතේ විල්ට උවමනා වෙන කිසිත් නොව හැකි ඉක්මනින් නැවතත් ප්‍රාකාරයේ ආරක්ෂාව වෙත දිව යාමටය. නමුත් එය තමන්ගේ අණ දෙන නිළධාරියා සමග සාකච්ඡා කල හැකි අන්දමේ අදහසක් නොවේ.

විශේෂයෙන්ම මෙවැනි අණ දෙන නිළධාරියකු සමග.

සෙර් වේමාර් රොයිස් යනු උරුමක්කාරයන් බොහෝ ගණනක් සිටින පුරාණ වංශවත් පෙළපතක ලාබාලම පුත්‍රයා විය. ඔහු අඳුරු පැහැ දෑසක් හිමි, දහඅටවන වියේ වූ, හීන්දෑරි කඩවසම් තරුණයෙකි. තමන්ගේ කළු පැහැ සුවිසල් යුධ අශ්වයා පිට නැගුනු නයිට්වරයා කුඩා, කඳුකර අශ්වයන් දෙදෙනෙකු පිට නැගුනු විල් සහ ගැරඩ් අභිබවා දැවැන්ත පර්වතයක් මෙන් නැගී සිටියේය. ඔහු සැරසී සිටියේ කළු පැහැ ලොම් කලිසමකින්, කළු පැහැ ලොම් කමිසයක් මතින් හැඳි දිදුලන කළු පැහැ සන්නාහයකින් හා ඊටම ගැලපෙන අන්දමේ සමින් නිම වුනු කළු පැහැ උස් සපත්තු කුට්ටමකින් සහ අත්වැසුම් යුගලයකිනි. සෙර් වේමාර් නිශා රැකුම් බලකායට එක්වී තවමත් වසරකින් අඩක්වත් ඉක්ම ගොස් නැතත් ඔහු තම රාජකාරියට හොඳින් සූදානම් වූවකු බව - අඩුම තරමේ ඇඳුම් පැළැඳුම් වලින් හෝ - නොපිළිගෙන සිටිය හැක්කෙකු නොවේ.

මේ හැම එකකටම වඩා ඔහු සතු දැකුම්කළුම වස්තුව වූයේ ගත දවටාගත් දිගු සළුවයි. සිනිඳු, කළු පැහැ මුගටි ලොමින් නිමවූ එය බැරැක්කයේ සෙබළුන් සියළුදෙනාගේම කතාබහට ලක්වූ වස්තුවකි. "මං ඔට්ටුවක් දානවා මිනිහා ඔය මුගටියො ඔක්කොම මිනිහගෙ අතින්ම බෙල්ල කරකවලා මරලා දාන්ට ඇති කියලා. මිනිහා මහ රණශූරයා." මේ ගැරඩ් වයින් කෝප්පයක් පානය කරන අතරතුරේදී තම සහවර සෙබළුන් හා නිතර පැවසූ විහිළුවකි. ඔවුන් සැවොම එම විහිළුවට එක ලෙස සිනාසුනහ.

'තමන් විසින් විහිළුවට ලක් කරනා අණ දෙන නිළධාරියකු විසින් දෙනු ලබන අණ පිළිපැදීම අසීරුය.' විල් මෙසේ සිතුවේ සීතලේ ගැහෙමින් තම අශ්වයා පිට ගමන් කරන අතරතුරේදී ය. ගැරඩ් ද මෙලෙසම සිතනා බව ඔහු දනියි.

"මෝර්මන්ට් කිවුවෙ අපට උංව ලුහුබඳින්ට කියලා. අපි ඒක කලා." ගැරඩ් පැවසීය. "උං මැරිලා. උං තවත් අපට කරදර කරන්නෙ නෑ. අපට ඉස්සරහට බොහොම අමාරු ගමනක් තියෙන්නෙ. මේ කාලගුනේට මං කොහෙත්ම කැමැති නෑ. මෙහෙම හිම වැටුනොත් අපට ආපහු යන්ට සති දෙකක් වත් යයි. ඔබතුමා කවදාවත් හිම කුණාටුවක් දැකලා තියෙනවද මගෙ උතුමානෙනි?"

උතුමානන්ට ඔහු කී දේ ඇසුනු බවක් පෙනුනේ නැත. සෙර් වේමාර් දැඩිවෙමින් පවතින සැඳෑ අන්ධකාරය අධ්‍යයනය කරමින් සිටියේ උදාසීන බැල්මක් දෑසේ ඇතිවය. ඔහු මෙසේ

සිටිනා විට බාධා නොකල යුතු බව දිගු කලක් නයිට්වරයා සමග ගමන් කොට පළපුරුද්දක් ඇති විල් අත්දැකීමෙන්ම දනියි. "මට ආයෙමත් කියපං උඹ දැකපු දේ විල්. හැම දෙයක්ම. කිසිම දෙයක් මග අරින්නෙ නැතුව."

නිශා රැකුම් බලකායට බැඳෙන්නට පෙර විල් දඩයක්කරුවෙකු - ඇත්තෙන්ම කිවහොත් හොර දඩයක්කරුවෙකු - වූ අතර මැලිස්ටර් වංශාධිපතියාගේ සෙබළුන්ට ඔහුව හසු වූයේ මැලිස්ටර් වනාන්තරය තුළ ඔවුන්ට අයත් මුවෙකු මරා මස් කරමින් සිටියදී ය. අතක් අහිමි කරගැනීම හෝ නිශා රැකුමට බැඳීම යන දෙකෙන් එකක් තෝරාගැනීමට ඔහුට සිදු විය. ඔහු තරම් නිශ්ශබ්දව වනාන්තරය තුළ ගමන් කල හැකි වෙනෙකෙකු නොවුනු අතර වැඩි කලක් යාමට මත්තෙන් ඔහුගේ මේ දක්ශතාව අනාවරනය කරගැනීමට 'කළු සොයුරන්ට' හැකි විය.

"උංගෙ වාඩිය තිබුනෙ මීට හැතැප්ම දෙකකට එහා, අර කඳුවැටියෙන් එපිට දොළ පාරක් අයිනෙ." විල් පැවසීය. "මං පුළුවන් තරම් උංට ලං වුනා. උංගෙ අට දෙනෙක් හිටියා, ගෑනුයි පිරිමියි දෙගොල්ලොම. ළමයි ඉන්නවානං මං දැක්කෙ නෑ. උංගෙ වාඩිය හදලා තිබුනෙ ගල් පර්වතයට හේත්තු කරලා. දැන් නං ඒක හිමෙන් වැහිලා ගිහිල්ලා ඇති, ඒ වුනත් මට ඒක හොයාගන්ට පුළුවන්. ගිනිමැලයක් පත්තු වුනෙත් නෑ. කිසිම කෙනෙක් එහා මෙහා වුනෙත් නෑ. මං සෑහෙන වෙලාවක් බලාගෙන හිටියා. කිසිම පණ තියෙන මිනිහෙකුට එහෙම හෙලවෙන්නැතුව ඉන්ට බෑ."

"උඹ දැක්කද ලේ පැල්ලම් මොකුත්?"

"එහෙමනං දැක්කෙ නෑ."

"උං ගාව ආයුධ මොකුත් තියෙනවා උඹ දැක්කද?"

"කඩු දෙක තුනකුයි, දුනු කීපෙකුයි. එක මිනිහෙක් ගාව පොරොවක් තිබුනා. දෙපැත්තටම තල තියෙන, බොහොම බර එකක් වගෙයි පෙනුනෙ. ඒක මේ යකඩින් හදාපු ගමේ ගොඩේ බාණ්ඩයක්. ඒක තිබුනෙ මිනිහගෙ පැත්තකින් බිම, අතේ දුරින්."

"මළකඳන් තිබුනු විදිය ගැන එහෙම උඹ සැලකිල්ලෙන් බැලුවද?"

විල් දෙවුර ඇකිළුවේය. "දෙන්නෙක් පර්වතේට හේත්තු වෙලා වාඩි වෙලා හිටියා. අනිත් අය හැමෝම බිම වැතිරිලයි හිටියෙ. හරියට බිම වැටිලා වගේ."

"නිදාගෙන වෙන්ටත් පුළුවන්."

"මැරිලා." විල් තිර කොට කීය. "එක ගෑනියෙක් හිටියෙ අයන්වුඩ් ගහක් උඩ නැගලා, අතු අතරේ බාගෙට හැංගිලා වගේ. ඈත බලාගෙන හිටියෙ." ඔහු මඳ සිනාවක් පෑවේය. "ඒකිට නොපෙනෙන්ට තමා මම වාඩියට ලං වුනේ. ඒත් ලංවුනාට පස්සෙ තමා මං දැක්කෙ ඒකිත් හෙල්ලෙන්නෙවත් නෑ කියලා." විල් වෙවුලා ගියේය.

"උඹට හීතලද?"

"ටිකක්. ඒ මේ හුළඟ හින්දා මයෙ උතුමානෙනි."

තරුණ නයිට්වරයා නැවතත් තම හේවායා දෙසට හැරුනි. ඔවුන් වටා සෑම තැනම හිමෙන් වැසුනු ගස්වල කොළ සර සර හඬින් සුළඟේ ලෙල දුන් අතර රොයිස්ගේ යුධ අශ්වයා නොසන්සුන් ගමනකින් ඉදිරියට ඇදෙන්නට විය.

"මේ මිනිස්සු මැරෙන්ට ඇත්තෙ මොකක් නිසා කියලද උඹ හිතන්නෙ ගැරඩ්?" රොයිස් ඇසීය.

"ඒ හීතල හන්දා වෙන්ට ඕන." ගැරඩ් පිළිතුරු දුන්නේ දැඩි විශ්වාසයකිනි. "මං දැකලා තියෙනවා මිනිස්සු හීතලෙන් ගල් වෙලා මැරෙන හැටි පහුගිය සීත කාලෙදි. ඊට කලින් තිබ්බ සීත කාලෙත්, එතකොට මං පුංචි එකෙක්. හැමකෙනාම කතා කරන්නෙ අඩි හතලිහක් උස හිම ගොඩවල් ගැන, උතුරෙන් හමා ගෙන එන හිම කුණාටු ගැන. ඒ වුනාට හීතල තමා නියම හතුරා. මුලින්ම අපි වෙවුලනවා, දත් කිටි කිටි ගානවා. අපි අඩි එකට

හප්ප හප්පා කල්පනා කරනවා උණු වයිනුයි ගිනි ගොඩවලුයි ගැන. ඊට පස්සෙ දැනෙනවා නිකං දැවෙනවා වගේ. හීතල තරං වෙන කිසිම දේකින් එහෙම දැවෙන්නෙ නෑ. ඒත් ඒ ටික වෙලාවකට විතරයි. ඊට පස්සෙ හීතල ටිකෙන් ටික අපේ ඇඟ ඇතුලට රිංග ගන්නවා. ටික වෙලාවකින් අපේ ඇඟට ඒකත් එක්ක සටන් කරන්ට තරං ශක්තියක් නැතුව යනවා. සටන් කරනවාට වඩා ලේසියි එතනම ඉඳගෙන නින්දට යන එක. මිනිස්සු කියන්නෙ අන්තිම වෙද්දි අපට කිසිම වේදනාවක් දැනෙන්නෙ නෑ කියලයි. ඉස්සෙල්ලාම අපි දුර්වල වෙනවා, නිකං මත්වෙනවා වගේ වෙනවා, හැමදේම බොඳ වෙලා යන්ට පටන් ගන්නවා. හරියට අපි උණුසුම් කිරි මුහුදක කිමිදෙනවා වගෙයි. හරිම ශාන්තයි."

"උඹ කතාවට හරිම සූරයෙක් නෙ ගැරඩ්." සෙර් වේමාර් පැවසීය. "මං දැනගෙන හිටියෙ නෑ උඹට එච්චර හැකියාවක් තියෙනවා කියලා."

"හීතල හන්දා මාත් දුක් විඳලා තියෙනවා උතුමානෙනි." ගැරඩ් හිස වසා සිටි සළුව ඉවත් කලේ කලක් තම දෙකණ පිහිටි තැන්වල දැන් තිබෙන ඉතිරිව හිස් කුහර දෙක සෙර් වේමාර්ට හොඳින් පෙනෙනු පිනිසය. "කණ් දෙකයි, කකුලේ ඇඟිලි තුනයි, වම් අතේ සුලැඟිල්ලයි. මං මේ තරමින් බේරුනා. අපි මගේ සහෝදරයව හොයාගන්නකොට මිනිහා හිටියෙ රෑ මුරකාවලේදීම හීතලෙන් දරදඬු වෙලා, මූනෙ හිනාවකුත් එක්ක."

සෙර් වේමාර් දෙවුර ඇකිළුවේය. "උඹ මීට වඩා උණුසුමට ඇඳුම් අඳින්ට ඕන ගැරඩ්."

ගැරඩ් වංශාධිපතියා දෙස රවා බැලූ අතර ඔහුගේ කණ් කුහර දෙක වටා වූ තුවාල කැළැල් කේන්තියෙන් රතු වී ගියේය. "සීත කාලෙ ආවහම ඔබට කොච්චර උණුහුමට ඇඳුම් අඳින්ට පුළුවන්ද කියලා අපි බලමු." ඔහු නැවතත් සළුවෙන් හිස වසාගෙන කර බා ගති.

"ගැරඩ් කියනවානං ඒ හීතල හින්දා කියලා....." විල් කතාව ඇරඹීය.

"උඹ පහුගිය සතිය ඇතුළත මුරකාවල් කලාද විල්?"

"එහෙමයි, මයෙ උතුමානෙනි." මුරකාවල් දූසිමක්වත් නැති සතියක් විල්ට කවදාවත් නොතිබුනි. මේ මිනිහා මොකාටද මේ එන්ට හදන්නෙ?

"ප්‍රාකාරෙ කොහොමද තිබ්බෙ?"

"අඬනවා." අයිස් වලින් හැදූනු සුවිසල් ප්‍රාකාරය මත හිරු එළියේ උණුසුම නිසා ජලවාෂ්ප බැඳී ඇති ආකාරය ඔවුන් විග්‍රහ කලේ 'ප්‍රාකාරය අඬනවා' යන වැකිය යොදා ගනිමිනි. වංශාධිපතියා කියන්නට උත්සාහ කරන්නෙ කුමක්දැයි දැන් විල්ට වැටහේ. "ඒ මිනිස්සු හීතලෙන් ගල් වෙලා වෙන්ට බෑ. ප්‍රාකාරෙ අඬනවා කියන්නෙ ඒ තරං හීතලක් තියෙන්ට විදියක් නෑ."

රොයිස් හිස වැනුවේය. "මොළේ තියෙන කොල්ලා. පහුගිය සතියෙ එහෙං මෙහෙං හිම ටිකක් වැටුනා තමයි. ඒත් වැඩුනු මිනිස්සු අට දෙනෙක් මරලා දාන්ට තරං හීතලක් ඒකෙන් ඇති වෙයි කියලා හිතන්ට බෑ. හොඳට උණුහුමට ඇඳුම් ඇඳගත්ත මිනිස්සු, ඉහට උඩින් වහලක් තියෙන මිනිස්සු, ගිනිමැලයක් අවුලවා ගන්ට පුළුවන් මිනිස්සු." නයිට්වරයා විශ්වසනීය සිනහවක් පෑවේය. "විල්, අපිව එතනට එක්කං පලයං. මට මේ මැරිච්ච මිනිස්සු මගේ දැහින් බලාගන්ට ඕන."

ඉතින් තවත් කල හැක්කක් නොවීය. අණක් නිකුත් කර ඇති අතර ඊට අවනත වීම හැර වෙනතක් බලන්නට ඔවුන් බැඳී ඇති නීති රීති විසින් ඉඩක් නොදෙයි.

තමන්ගේ කඳුකර අශ්වයා පිට නැගුනු විල් පෙර පෙළ ගත්තේය. පෙරදා යාන්තමට වැටුනු හිම නිසා බිම ඇති කිසිදු දෙයක් - ගල්, මුල්, වල ගොඩැලි - නොපෙනේ. ගමන යා යුත්තේ බොහෝ පරෙස්සමිනි. සුවිසල් කළු පැහැ යුධ අශ්වයා පිට නැගුනු සෙර් වේමාර් රොයිස් ඒ පසුපසින් වැටිනි. මෙවැනි මුර සංචාර සඳහා මේ අශ්වයා නොගැලපෙන නමුත් ඒ ගැන නයිට්වරයාට කියා පලක් නැති බව කවුරුත් දනී. ගැරඩ් පසුපස්සෙන්ම පැමිණියේ තමන්ටම කටු කුටු ගාමිනි.

සැඳෑ අඳුර දැඩි වුනි. වළාකුළක්වත් නැති අහස පළමුව තද දම් පැහැයටත්, ඊට පසුව කළු පැහැයටත් හැරුනි. තරු එකින් එක මතු වන්නට විය. අඩ සඳක්ද නැග ආ අතර මේ ලැබුනු එළිය නිසා විල්ගේ සිතේ ඇති වූයේ සතුටකි.

"අපට මීට වඩා හයියෙන් යන්ට බැරිද?" රොයිස් ඇසීය.

"මේ අශ්වයත් එක්ක බෑ." විල් පිළිවදන් දුනි. බිය විසින් ඔහු ගරු සරු නැත්තෙකු බවට පත් කර තිබේ. "සමහරවිට මගෙ උතුමානන් කැමැති ඇති පෙර පෙළ ගන්ට?"

මෙයට පිළිතුරක් දීමට සෙර් වේමාර් රොයිස් උත්සාහයක් දැරුවේ නැත.

වනාන්තරයේ කොහේදෝ අස්සක සිට වෘකයෙක් උඩු බුරලන හඬ ඇසුනි.

ගැට සහිත පුරාණ අයන්වුඩ් ගසක් අසල නැවතුනු විල් තම අසු පිටින් බැස්සේය.

"උඹ මොකටද නැවතුනේ?" සෙර් වේමාර් ඇසීය.

"ඉතුරු ටික පයින් යන එක හොඳයි මයෙ උතුමානෙනි. ඒක අර පේන කඳුවැටියෙන් එහා."

රොයිස් මොහොතක් නැවතී සිටියේ ඈතට යොමු වුනු දෑසින් යුතුවය. මුහුණෙන් පෙනෙන්නේ ඔහු යමක් කල්පනා කරන බවකි. ගස් අතරින් සීතල සුළඟක් හමා ආ අතර නයිට්වරයාගේ සළුව සුළඟේ ලෙලදුන්නේ හරියට පණ ඇති වස්තුවක් මෙනි.

"මෙතැන මොකක්දෝ වැරැද්දක් තියෙනවා." ගැරඩ් කටු කුටු ගෑවේය.

තරුණ නයිට්වරයා ඔහු වෙත අවඥාසහගත සිනහවක් පෑවේය. "එහෙම එකක් තියෙනවද?"

"ඔබට ඒක දැනෙන්නෙ නැද්ද?" ගැරඩ් ඇසුවේය. "අන්ධකාරයට කණ් දීලා බලන්ට."

විල්ටත් කුමක්දෝ අමුතු හැඟීමක් දැනෙන්නට විය. අවුරුදු හතරක නිශා රැක්මේ ඔහු මෙතරම් බියපත් වූ වෙනත් අවස්ථාවක් නැති තරම්ය. ඔවුන්ව මෙතරම් බියපත් කරන ඒ අමුතු දේ මොකක්ද?

"හුළඟ. ගස් හෙලවෙනවා. වෘකයෙක් කෑ ගහනවා. ඔතනින් මොන සද්දෙ හින්දද උඹ මෙච්චර බය වෙලා ඉන්නෙ ගැරඩ්?" ගැරඩ්ගෙන් මීට පිළිතුරක් නොලද තැන රොයිස් තම අසු පිටින් බැස්සේය. අනිත් අසුන් දෙදෙනාගෙන් වෙන්ව ගසේ පහත අත්තක තම අශ්වයා ගැට ගැසූ ඔහු තම දිගු අසිපත කොපුවෙන් එළියට ගත්තේය. අසිපත් මිටෙහි වූ මැණික් දිදුලන්නට වූ අතර සඳ රැස් වැටීමෙන් අසිපත් තලය කාන්තිමත්ව බබලන්නට විය. පෙනුනු හැටියට නම් එය බලකොටුවක කම්මල්කරුවකු විසින් තැනූ තේජාන්විත අසිපතකි. මීට පෙර කිසිම විටෙක සටනක් සඳහා මේ අසිපත පාවිච්චි වී ඇත්දැයි විල් කල්පනා කරන්නට විය.

"මේ හරියෙ ගස් බොහොම ළඟින් ළඟින් තියෙන්නෙ." විල් අනතුරු ඇඟවීය. "කඩුව පැටලෙන්ට පුළුවන් මයෙ උතුමානෙනි. පිහියක් ගත්තොත් හොඳ නැද්ද?"

"මට උඹේ උපදෙස් ඕන වුනාම මං උඹෙන් අහන්නං." තරුණ වංශාධිපතියා පිළිතුරු දුනි. "ගැරඩ්, උඹ මෙතන ඉඳන් අශ්වයො ටික බලාගනින්."

ගැරඩ් අසු පිටින් බැස්සේය. "අපට ගින්නක් ඕන. මං ගිනි අවුළුවන්නං."

"උඹ කොච්චර ලොකු මෝඩයෙක්ද නාකියො? මේ කැලේ සතුරො ඉන්නවනං ගින්නක් තමා අපට ඕන නැතිම දේ."

"ගින්නෙන් එලවන්ට පුළුවන් සතුරොත් ඉන්නවා." ගැරඩ් පැවසීය. "වලස්සු, සෝරවෘකයො.... තවත් දේවල්...."

සෙර් වේමාර්ගේ දෙතොල තදින් ඇදී ගියේය. "ගිනි අවුළුවන්ට එපා."

හිස වැසූ සළුව නිසා ගැරඩ්ගේ මුහුණ පැහැදිලිව නොපෙනුනත්, නයිට්වරයා දෙස දැඩි බැල්මෙන් බලා සිටින ඔහුගේ දෑසේ ඇති දීප්තිය - කේන්තිය නිසා ඇති වූ දීප්තිය - විල් දිටීය. ඔහු මොහොතකට බිය වූයේ මහළු භේවායා තම අසිපත ඇදගනු ඇතැයි යන සිතුවිල්ලෙනි. එය කෙටි, අසෝබන, පාවිච්චිය නිසාම ගෙවී ගිය ආයුධයක් වුවත් ගැරඩ් තම අසිපත ඇදගතහොත් උතුමානන්ගේ ජීවිතය බොහොම කෙටි එකක් වනු ඇති බව විල් හොඳාකාරවම දනී.

නමුත් අන්තිමේදී ගැරඩ් බිම බලාගති. "ගිනි අවුළුවන්නෙ නෑ." ඔහු සෙමින් කෙඳිරුවේය.

එය තමාගේ තීරණය අනුමත කිරීමක් ලෙස පිලිගත් රොයිස් ආපසු හැරුනි. "පාර පෙන්නපං." ඔහු විල්ට පැවසීය.

අකුලින් ගැවසීගත් වනලැහැබ තුළින් විල් පහත් කඳුවැටිය දක්වා වූ නැග්ම තරණය කරන්නට විය. වැටුනු හිම නිසා බිම ලිස්සනසුළු මඩ සහිත වූ අතර සැඟවුනු ගස් මුල් ගල් ආදිය ඕනෑම වෙලාවක පා පැකිලවීමකට සූදානමින් බලා සිටියහ. තරණය අතරේදී විල් කිසිම ශබ්දයක් ඇති නොකල නමුදු ඔහුට පිටුපසින් උතුමානන්ගේ සන්නාහයේ මුදු දම්වැල් එකට ඇතිල්ලීමෙන් නැගෙන හඬත්, ගස් අතු පතරේ තම සළුව හා අසිපත පැටලීම නිසා කටුකුටු ගාමින් ඔහු සාප කරන හඬත් විල්ට ඇසේ.

කඳුවැටිය මුදුනේ වූ දැවැන්ත මුරකරු වෘක්ෂය පුරුදු පරිදිම එතන විය. එහි පහතම අතු වූයේ පොළොවට යාන්තම් අඩියක් උසිනි. ඊට යටින් පොළොවේ හිම හා මඩ මතින් වැතිරුනු විල් පහතින් තිබුනු හිස් භූමිය නිරීක්ෂණය කරන්නට විය.

එසැනින් ඔහුට දැනුනේ තම හදවත නතරවුනාක් මෙනි. තැතිගැන්ම කොපමනද යත් මොහොතකට ඔහුට හුස්ම ගැනීමත් අසීරු විය. සඳ එළිය නිසා පහතින් තිබුනු හිස් භූමිය බබළන්නට විය. ගිනිමැලයේ ඉතිරිවුනු අළු ගොඩ, හිමෙන් වැසුනු පියස්ස, ගල් පර්වතය, බාගෙට මිදුනු පුංචි දොළ පාර. මේ සියල්ලම මීට පැය කිහිපයකට පෙර තිබුනු පරිද්දෙන්ම ඒ ඒ තැන්වලම තිබේ.

නමුත්, ඔවුන් ගොසිනි. මලකඳන් සියල්ලම යන්ට ගොසිනි.

"දෙයියම්පා!" ඔහුට පිටුපසින් ඇසුනි. අසිපත අතකින් ගත් සෙර් වේමාර් රොයිස් සුළඟේ ලෙලදෙන සළුවත් සහිතව තරු එළියේ බබලමින් මුරකරු වෘක්ෂය පසෙකින් සිටගෙන සිටින්නේ හරියට මුළු ලෝකයටම පේන්නට මෙනි.

"පාත් වෙන්ට." විල් ඉක්මන් ස්වරයෙන් කෙඳිරුවේය. "මොකක් හරි වැරැද්දක් තියෙනවා."

රොයිස් සෙලවුනේවත් නැත. පහතින් ඇති හිස් භූමිය දෙස බැලූ ඔහු සිනාසුනි. "උඹේ මැරිච්ච මිනිස්සු වාඩිය අස්කරන් ගිහින් වගේ විල්."

විල් ආයාසයකින් තතන තතනා වචන සොයන්නට උත්සාහයක් දැරීය. අත් හැර දමන ලද වාඩියේ එහා මෙහා ගිය ඔහුගේ දෑස් බිම වැටී තිබුනු පොරොව මත නතරවිනි. විශාල, තල දෙකක් ඇති, සටනට භාවිත කරන පොරොවක්, ඔහු කලින් දුටු තැනම තවමත් එලෙසින්ම තිබේ. මෙවැනි වටිනා පොරොවක් අත්හැර දමන්නට....

"නැගිටපං විල්." සෙර් වේමාර් අණ දුනි. "මෙතැන මොකෙක්වත් නෑ. උඹ මොකාක්ද ඔය පඳුරක් අස්සෙ හැංගිලා කරන්නෙ?"

විල් අකැමැත්තෙන් නමුදු ඒ අණට කීකරු විය.

සෙර් වේමාර් ඔහු දෙස බැලුවේ පැහැදිලිවම පෙනුනු අප්‍රසාදයකිනි. "මගේ පළමුවෙනි මුර සංචාරයම අසාර්ථක එකක් කරගෙන ආපහු කළු බලකොටුවට යන්ට මට ඕනකමක් නෑ. අපි කොහොම හරි මේ මිනිස්සු හොයාගන්ට ඕන." ඔහු වටපිට බැලීය. "නැගපං මේ ගහ උඩට. ඉක්මනට නැගලා බලපං කොහෙ හරි ගින්නක් එහෙම පේන්ට තියෙනවද කියලා."

වචනයක්වත් කතා කර ගත නුහුනු විල් ආපසු හැරුනි. වාද කිරීමෙන් පලක් නැත. හමන සීතල සුළඟ ඔහුගේ ඇටමිදුළු පසා කලේය. මුරකරු වෘක්ෂය වෙතට ළඟා වූ ඔහු ගසට නගින්නට පටන් ගති. වැඩි වේලාවක් යන්නට පෙර ගසේ යුෂය නිසා ඔහුගේ දැත් ඇලෙන්නට වූ අතර ඉදිකටු වන් කොළ අතරේ ඔහු සැඟවී ගියේය. බිය විසින් ඔහුගේ උදරය පුරවා දැමූයේ දිරවා ගත නොහැකි අහරක් මෙනි. වනාන්තරයේ නම නොදන්නා සියළුම දෙවියන්ට නිහඩ යාඥාවක් කල විල් තම කිරිච්චිය කොපුවෙන් මෑත් කර ගෙන දත් අතරේ රඳවා ගත්තේ ගසට නැගීමට පහසුවන පරිදි දැත් නිදහස් කරගැනීම පිනිසය. සීතල යකඩය නිසා මුවට දැනුනු සිසිලස ඔහුට යම් සහනයක් ලබා දුනි.

පහළින් එකවරම ඇසුනේ උතුමානන් ගේ හඬගෑමයි. "කවුද ඔය යන්නේ?" ඒ කටහඬේ තිබුනු අවිනිශ්චිත බව විල්ට මැනවින් හැඟුනි. ඉහළ නැගීම නවතා දැමූ ඔහු ඇහුම්කණ් දෙන්නටත්, වටපිට පිරික්සා බලන්නටත් පටන්ගති.

උතුමානන්ගේ හඬගෑමට පිළිතුරු ලැබුනේ වනාන්තරයෙනි. කොළ වල සර සර ගෑමත්, දොළ පාරේ හඬත්, ඈතින් ඇසුනු හිම බස්සෙකුගේ නාදයත් ඒ පිළිතුරු විය.

එනමුදු 'අනෙක් එවුන්' කිසිම ශබ්දයක් නොකලහ.

විල් දෑස් කොනින් කිසියම් චලනයක් දුටුවේය. හරියටම කිවහොත් වනාන්තරය මැද්දෙන් පාවී එන අඳුරු ඡායාවන් රැසක් වැනි යමක්. හිස හරවා බැලූ ඔහුගේ ක්ෂණික දර්ශනයට හසු වූයේ අන්ධකාරය මැද්දේ සුදු පැහැ සෙවනැල්ලකි. නමුත් ඊළඟ මොහොතේ එය නැතිව ගියේය. අනතුරු ඇඟවීමක් සඳහා විල් මුව විවර කලත් වචන ඔහුගේ උගුරේ මිදී ගියාක් මෙනි. සමහරවිට ඔහුට වැරැදීමක් වෙලාවත්ද? සමහරවිට ඒ කුරුල්ලෙක් වෙන්ට ඇති, හිම උඩ පරාවර්තනය වූ මොකක් හෝ දෙයක්? සඳ එළිය නිසා ඇති වුනු මොකක් හෝ දෘෂ්ටි මායාවක්? ඇත්තෙන්ම ඔහු දුටුවේ මොකක්ද?

"විල් උඹ කොහෙද?" සෙර් වේමාර් උඩ බලා ඇසුවේය. "උඹට මොනා හරි පේනවද?" ඔහු අසිපතත් අතැතිව පරීක්ෂාකාරී ලෙස සෙමින් වටයක් කැරකුනේය. විල්ට 'උංව' දැනුනා මෙන් ඔහුටත් උංව දැනුනාවත්ද? පෙනෙන්නට නම් කිසිම දෙයක් නැත. "මට උත්තර දීපං. ඇයි මෙච්චර සීතල?"

ඇත්තෙන්ම ඔහුටත් දැඩි සීතලක් දැනෙන්නට විය. සීතලේ ගැහෙන්නට වූ විල් තවත් තදින් තමා නැග සිටි අත්ත බදා ගෙන මුහුණ ගසේ කඳට තදින් තෙරපා ගති.

වනයේ අන්ධකාරයෙන් මැත් වූ ඡායාවක් රොයිස් ඉදිරියේ සිට ගති. උස්, පැරණි ඇටකටුවක් මෙන් දැඩි එහෙත් වැරුනු ඔහුගේ මාංසය කිරි මෙන් සුදු පැහැ විය. ඔහු තබන තබන පියවරක් පාසා පැළැඳ සිටි සන්නාහයේ පැහැය වෙනස් වූයේ වරෙක අලුත වැටුනු හිම මෙන් සුදු පැහැයටත්, තවත් වරෙක සෙවනැල්ලක් මෙන් කළු පැහැයටත් ඒ අතරේ ගස්වල අඳුරු කොළ පැහැයටත් හැරෙමිනි.

සෙර් වේමාර් රොයිස් සර්පයෙකු පිඹින්නාක් මෙන් හුස්මක් පිට කරනු විල්ට ඇසුනි. "ඔයිට වඩා අඩියක්වත් ඉස්සරහට තියන්ට එපා." උතුමානන් අණක් දුන්නත් ඒ හඬ බිඳී ගියේ කුඩා කොල්ලෙකු ගේ මෙනි. සළුව උරහිසින් පස්සට පීරා හැර අත නිදහස් කරගත් ඔහු අසිපත දැතින්ම ගෙන සටනට සැරසුනි. සුළඟ නැවැතී තිබුනු මුත් සීතල අධික විය.

'අනිකා' නිශ්ශබ්ද පියවරින් ඉදිරියටම ඇදුනි. ඔහුගේ අතේ තිබුනු දිගු අසිපත වැන්නක් විල් කිසිදා දැක නොතිබූ අතර මේ නම් මිනිස් අතකින් නිමැවූවක් නොවන බව ඔහුට ප්‍රත්‍යක්ෂ විය. සඳ එළියේ එම අසිපත පෙනුනේ හරියටම සජීවී වස්තුවක් ලෙසිනි. විනිවිද පෙනෙන පළිඟු වැනි යමකින් නිර්මානය වී තිබුනු එය කෙතරම් තුනී දැයි කිවහොත් පැත්තෙන් බැලූ විට නොපෙනෙන තරම් විය. අසිපත් තලය දිදුලමින් තිබුනේ ලා නිල් පැහැයකිනි. මේ අසිපත අන් කිසිම අසිපතකට වඩා තියුණු බව විල්ට තේරුම් ගියත් එය දැන ගත්තේ කෙසේ දැයි ඔහුට කිසිදා විස්තර කර දීමට බැරි වනු ඇත.

සෙර් වේමාර් නිර්භීත අයුරින් ඔහුට මුහුණ දුනි. "වරෙන් එහෙනම් සටනට." ඔහු අසිපත දැතින්ම හිසට ඉහළින් ඔසවා ගත්තේය. අසිපතේ බර නිසා හෝ අධික සීතල නිසා හෝ ඒ දැත් වෙවුලනු විල්ට පෙනුනි. නමුදු ඒ එකම එක මොහොතේ ඔහු තවදුරටත් කොළුවකු නොව නිශා රැකුමට අයත් මිනිසකු බව විල්ට සිතුනි.

අනිකා නැවතුනු අතර විල් ඔහුගේ දෑස් දිටීය. නිල් පැහැයක්, මිනිස් ඇසක දැකිය හැකිවාට වඩා වෙනස්ම හා ගැඹුරුම නිල් පැහැයක්, හිම මෙන් දැවෙනා නිල් පැහැයක්. නැවැතුනු ඒ දෑස් බලා සිටියේ ඉහළට එසවී වෙවුලමින් තිබුනු දිගු අසිපත දෙසයි. එකම එක හදගැස්මක මොහොතකට විල්ට බලාපොරොත්තුවේ සේයාවක් පෙනුනි.

ඊළඟ මොහොතේ අන්ධකාරය තුළින් තවත් සේයාවන් මතු විය. දෙදෙනෙක් මුලින්ම.. තුන් දෙනෙක්.. සිවු දෙනෙක්. ඔවුන්ගේ පැමිණීම සෙර් වේමාර් නොදුටු නමුත් නොඇසූ නමුත් ඔවුන් සමග පැමිණි සීතල ඔහුට හොඳින්ම දැනුනි. හදිසියේම විල්ට මතක් වූයේ ඔහුගේ රාජකාරිය කෑ ගසා තම අණ දෙන නිළධාරියාට අනතුරු ඇඟවීම බවය. නමුත් ඒ සමගම ඔහුට තේරුම් ගියේ එසේ කලොත් ඔහුගේ මරණයත් නියත බවය. ඉතින් ඔහු දිගටම ගසේ කඳ බදාගෙන වෙවුලමින් දිගටම නිහඬතාව රැක්කේය.

සුදුමැලි අසිපත වාතය තුළ ප්‍රකම්පනය වෙමින් පහළට ඇදුනි.

සෙර් වේමාර් එයට මුහුණ දුන්නේ තම වානේ අසිපතිනි. අසිපත් තල දෙක එකිනෙක ගැටුනු විට සුපුරුදු ලෝහ මත ලෝහ ගැටෙන හඬ වෙනුවට ඇසුනේ කණට නෑසෙන අන්දමේ තියුණු ශබ්දයකි. හරියටම සතෙක් වේදනාවෙන් කෑ ගසන්නාක් වැනි හඬකි. පහරවල් දෙකක් තුනක් වැලකූ රොයිස් අඩියක් පස්සට ගති. තවත් දරුණු පහර කිහිපයකට පසු ඔහු තවත් අඩියක් පස්සට ගත්තේය.

ඔහුට පිටුපසින්, ඔහුට දකුණින්, ඔහුට වමින්, ඔහු වටාම මුහුණු නැති නරඹන්නන් නිශ්ශබ්දව, ඉවසිලිවන්තව බලා සිටියහ. ඔවුන්ගේ සන්නාහ මත ඇඳුනු රටාවන් නිසා වනාන්තරය තුළ ඔවුන් දැකීම අසීරු කටයුත්තක් විය. කෙසේ නමුදු ඔවුන් මේ සටනට සහභාගි වීමට කිසිදු උනන්දුවක් පෙන්වූයේද නැත.

නැවත නැවතත් අසිපත් එකිනෙක හා ගැටුනු අතර අන්තිමේදී තවදුරටත් ඒ හඬට සවන් දීමට නොහැකි වූ විල්ට තම දෙසවන් දෑතින් වසා ගැනීමට සිත් විය. නමුත් මේ වන විට සෙර් වේමාර් විඩාව නිසා හති දමමින් සිටියේය. ඔහුගේ අසිපත බැඳුනු හිම නිසා සුදු පැහැ වී තිබුනු අතර අනිකාගේ අසිපත නිල් පැහැ දීප්තියක් විහිදුවමින් එහා මෙහා නැටුවේය.

ඊළඟ මොහොතේ ප්‍රතිවාදියා එල්ල කල පහර වැළැක්මට රොයිස් දැරූ යත්නය තත්පරයකින් බිඳක් ප්‍රමාද විය. සුදුමැලි අසිපත ඔහුගේ බාහුවට යටින් සන්නාහය කපාගෙන ඇතුළට කිඳා බැස්සේය. තරුණ වංශාධිපතියා වේදනාවෙන් කෑ ගසද්දී මුදු යකඩ දම්වැල් අතරින් රුධිරය ගලා ආවේය. සීතල නිසා ඒ ගලා ආ රුධිරයෙන් වාෂ්පයක් පිටවූ අතර හිම මත වැටුනු රුධිර බින්දු ගින්දර මෙන් රතු පැහැයෙන් දිදුලන්නට විනි. සෙර් වේමාර් තම ළපැත්ත පිරිමැදි මුත් ඔහුගේ අත නැවත පැමිණියේ රුධිරයෙන් තෙත් බරිත වූ ලොම් අත්වැස්මත් සමගිනි.

අනිකා තම සගයින්ට විල් නොහඳුනන බසකින් යමක් පැවසූ අතර, ඒ කටහඬ ඇසුනේ හරියටම ශීත කාලයේ මිදුනු විලක හිම පුපුරන හඬක් ලෙසිනි. පැවසූ වදන් නොතේරුනත් එහි ගැබ්වී තිබුනු සමච්චලය විල්ට පැහැදිලිවම දැනුනි.

සෙර් වේමාර් රොයිස්ගේ වියරුව උපරිමයට නැංවුනි. ඔහු "රොබර්ට් වෙනුවෙන්!" යි කෑ ගසා ගොරවාගෙන ඉදිරියට පැන්නේ, අසිපත දැතින්ම ඔසවා තම සිරුරේ මුලු ශක්තියම යොදවා ප්‍රතිවාදියාට මාරාන්තික පැති ප්‍රහාරයක් එල්ල කලේය. අනිකා ඉතාම අලස ආකාරයෙන් එම පහර වැළැක්වීමට තම අසිපත එසවීය.

අසිපත් යුගල එකට ගැටුනු ඊළඟ මොහොතේ වානේ අසිපත කැබලි වලට බිඳී ගියේය.

වනය සිසාරා පැතිරී ගිය දෝංකාරයක් මැද්දේ වානේ අසිපත සිය ගණනක් කුඩා කැබලි වලට බිඳී යද්දී ඉදිකටු වැනි සියුම් වානේ කැබලි වර්ෂාවක් දසත පැතිරී ගියේය. රොයිස් මරහඬක් නගමින් දණින් වැටුනේ දැතින් තම දෑස් වසා ගනි. ඔහුගේ අතැඟිලි අතරින් රුධිරය විදින්නට විය.

ඊළඟ මොහොතේ නරඹන්නන් සියල්ල එකා වන්ව ඉදිරියට ඇදුනේ නිශ්ශබ්ද අණකට කීකරු වූ ලෙසිනි. මාරාන්තික නිහඬතාවකින් යුතුව අසිපත් ඉහළ පහළ ගිය අතර එය තනිකරම සීතල මනුශ්‍ය ඝාතනයක් විය. සුදුමැලි අසිපත් වානේ සන්නාහයේ මුදු දම්වැල් කපාගෙන බැස්සේ හරියටම ඒවා සේදවලින් නිමවූ තරම් පහසුවකිනි. තවත් බලා හිඳිය නොහැකි වූ විල් දෑස් පියාගත් අතර ඔහුට පහළින් කටහඬවල් හා සිනහාවල් ඇසුනේ හිම කැට පුපුරන්නාක් මෙනි.

තම දැස් විවර කරන්නට තරම් ධෛර්යයක් උපදවාගන්නට ඔහුට තවත් සෑහෙන වේලාවක් ගතවූ අතර ඒ වනවිට පහළ කඳු වැටිය හිස් වී තිබින.

අඩ සඳ අඳුරු අහසේ සෙමින් සෙමින් ඇදී යද්දී ඔහු තවදුරටත් ගස උඩම රැඳී සිටියේ හුස්ම හෙලන්නට පවා නොහැකි තරමේ බියකිනි. අන්තිමේදී මස්පිඩු වේදනා ගෙන දෙන්නට පටන්ගත්විට හා අතැඟිලි සීතලෙන් හිරි වැටී ගිය විට ඔහු ගසෙන් බැස්සේය.

රොයිස්ගේ මලකඳ හිම මත මුනින්තලා වැටී තිබුනු අතර එක් අතක් ඉදිරියට විහිදී තිබුනි. මුගටි සමින් කල සනකම් සළුව හරහා කැපුම් පහරවල් දුසිමක් පමණ දකින්නට හැකි විය. රොයිස් මිය ගොස් සිටින අයුරු දුටු යමෙකුට සිතෙනු ඇත්තේ ඔහු කෙතරම් තරුණ කුඩා කොලුවෙක්ද යන්නයි.

අඩි කිහිපයක් දුරින් වැටී තිබුනු බිඳුනු අසිපත් කැබැල්ල විල්ට හමුවිය. එහි අග්‍රය කැඩී බිඳී ඇඹරී ගොස් තිබුනේ හරියටම අකුණු පහරකට ලක් වූ ගසක කඳක් මෙනි. බිම දණ ගැසූ විල් පරීක්ෂාවෙන් වට පිට බලා හනික එය ඇහිඳ ගත්තේය. මේ කැඩුනු අසිපත ඔහුට තිබෙන හොඳම සාක්ෂියයි. මෙයින් කියැවෙන්නේ මොකක්දැයි වටහා ගන්නට ගැරඩ්ට හැකිවෙනවා ඇත. ඔහුට බැරි වුවහොත් අනිවාර්යයෙන්ම නාකි වලහා - මෝර්මන්ට් හෝ මේස්ටර් ඒමන් එය වටහා ගනු ඇත. ගැරඩ් තවමත් අශ්වයින් සමග ඔවුන් වෙනුවෙන් බලා සිටිනු ඇත්ද?

නැගී සිටිය විල් දුටුවේ සෙර් වේමාර් රොයිස් ඔහු පසෙකින් සිටගෙන සිටින ආකාරයයි.

ඔහුගේ වටිනා ඇඳුම් සියල්ල ඉරී වැරහැලිව ගොසිනි, ඔහුගේ මුහුණ නටඹුන් වී විරූපව ගොසිනි. ඔහුගේ අසිපතෙන් බිඳී විසිවී ගිය කැබලිත්තක් වම් ඇසේ කණිනිකාව පසා කරගෙන ගොසිනි.

එනමුදු ඔහුගේ දකුණු ඇස විවරව ඇත. එහි කණිනිකාව නිල් පැහැ දීප්තියකින් බබලයි. ඔහු ඒ ඇසින් දකියි.

අකර්මන්‍ය වූ අතැඟිලිවලින් ගිලිහී ගිය අසිපත් කැබැල්ල බිම වැටුනි. විල් දෑස වසා ගත්තේ දෙවියන්ට යාඥා කිරීමටය. දිගැටි ශෝබන අතැඟිලි ඔහුගේ කම්මුල් ස්පර්ශ කරමින් ගෙල වටා යදඬු මෙන් හිරවෙන බව ඔහුට දැනුනි. මේ අතැඟිලි වැසී තිබුනේ උසස්ම තත්ත්වයේ ලොමින් නිමවූ අත්වැසුම් වලින් වුවත්, ඒවා උණුසුම් රුධිරයෙන් තෙත්ව තිබුනත් විල්ට දැනුනේ තම ගෙල වටා හිම මෙන් වූ දැඩි සීතලක් ස්පර්ෂ කරනවා පමණි.

## බ්‍රැන්

එම උදෑසන කාලගුනය පැහැදිලි එමෙන්ම සීතල එකක් වූ අතර එහි තිබුනු ප්‍රසන්නභාවය ඉඟිකලේ ගිම්හානය නිමාවීමට ආසන්න බවය. පොළොවට හිරු එළිය පාත්වෙද්දී ඔවුන් පිටත්වුනේ මිනිසකුගේ හිස ගසා දමනු බැලීමටයි. විසිදෙනෙකුගෙන් යුක්ත වූ එම පිරිස අතරේ බ්‍රැන් ගමන් කලේ උද්‍යෝගය නිසා නොසන්සුන් වූ සිතිනි. රජතුමාගේ යුක්තිය ඉටුකරනු බැලීම් වස් තම වංශාධිපති පියා හා වැඩිමහලු සොහොයුරන් සමග පිටව යාමට ඔහුට අවසර ලැබුනු මුල්ම වතාව මෙයයි. මෙතෙක් කල් එවැනි දේකට මුහුණ දීමට තරම් ඔහු ලාබාල වැඩි යැයි පියා විසින් තීරණය කර තිබුනි. මේ ගෙවී යමින් තිබුනේ ගිම්හානයේ නව වැනි වසර වූ අතර බ්‍රැන්ගේ ජීවිතයේ සත් වැනි වසරයි.

මිනිසා අල්ලාගෙන තිබුනේ කඳුකරයේ වූ කුඩා බලකොටුවක් අසබඩදීය. රොබ් සිතුවේ ඔහු මැන්ස් රේඩර්ට - ප්‍රාකාරයට ඔබ්බෙන් වූ කැරළිකාර රජතුමාට - පක්ෂපාතී වනචාරියෙකු බවයි. මේ ගැන සිතද්දී බ්‍රැන් ගේ ඇඟේ හී ගඩු පිපුනේ නාකි ආයම්මා කියා දුන් කතන්දර මතක් වූ බැවිනි. ඇය කියා දුන් ආකාරයට වනචාරියන් යනු කුරිරු මිනිසුන් කොට්ඨාසයක් වූ අතර හොරුන් හා වහල් වෙළෙඳුන්ද වූහ. ඔවුන් යෝධයන් හා වේතාලයන් සමග සම්බන්ධතා ඇති කරගත් අතර මහ රෑ යාමයේ පැමිණ කුඩා ගැහැණු දරුවන් හොරකම් කිරීමද කලහ. ඔවුන්ගේ ගැහැණුන් 'අනික් එවුන්' හා සබඳතා පවත්වා බිහිසුණු අර්ධ-මිනිස් දරුවන් මෙලොවට බිහි කලහ.

එසේ නමුත් බලකොටුවේ පිටත බිත්තියට බැඳ දමා රජතුමාගේ යුක්තියට මුහුණ දෙනු පිණිස බලා සිටි මිනිසා බ්‍රැන් අපේක්ෂා කල අන්දමේ තැනැත්තෙක් නම් නොවීය. ඔහු මහළු, කැහැටු, සිය සොයුරු රොබ්ටත් වඩා උසින් අඩු සාමාන්‍ය මිනිසකු විය. අධික ශීතයට නිරාවරණය වීම නිසා ඔහුගේ කණ් දෙකත් අතැඟිල්ලකුත් අහිමි වී ගොස් තිබුනු අතර ඔහු සැරසී සිටියේ නිශා රැකුම් බලකායේ සොයුරන් පළඳින අන්දමේ සම්පූර්ණ කළු පැහැ ඇඳුම් කට්ටලයකි. වෙනසකට තිබුනේ ඔහුගේ ලොම් ඇඳුම් වැරහැලි වී තෙල් ගෑවී තිබීම පමණකි.

සිය වංශාධිපති පියා විසින් බැඳ තිබුන බැමි කපා දමා ඒ මිනිසා ඇදගෙන යද්දී තම අසුන් පිට නිසසලව බලා සිටින වැඩිමහලු සොයුරන් වන රොබ්ට හා ජොන්ට මැදිව තම පෝනියා මත සිටි බ්‍රැන් තම සත් වසරක වයසට වඩා වැඩිමහල් බැරෑරුම් පෙනුමක් මුහුණේ මවාගෙන බලා සිටියේ හරියටම ඔහු මීට පෙරත් මෙවැනි අත්දැකීම්වලට මුහුණ දී

ඇති බව අනායයන්ට පෙන්වන්නට මෙනි. බලකොටු ද්වාරය තුළින් මඳ සුළඟක් හමන්නට වූ බැවින් ඔවුන්ට ඉහළින් අහසේ වින්ටර්ෆෙල්හි ස්ටාර්ක් ධජය - සුදු පැහැයෙන් දිදුලන හිම මතින් දිවයන අළු පැහැ සෝරවෘකයා - මඳ සුළඟේ සැලෙන්නට විය.

බ්‍රැන් ගේ පියා ගරු ගාම්භීර අයුරින් අසු අරා සිටි අතර ඔහුගේ දිගු දුඹුරු පැහැ කෙහෙරැළි මඳ සුළඟේ නටන්නට විනි. කෙටි කර කපන ලද ඔහුගේ රැවුල තැනින් තැන සුදු පැහැ වී තිබුනු බැවින් ඔහුගෙන් දිස්වූයේ වසර පන්-තිසකට වඩා වැඩිමහලු පෙනුමකි. ඔහුගේ අළු පැහැ දෑසේ මෙදින දකින්නට තිබුනේ සැරපරුස පෙනුමකි. බ්‍රැන්ට හැඟුනේ වෙනදාට හැන්දෑ වරුවේ ගිනිඋඳුන අසල වාඩි වී මෘදු ස්වරයෙන් ඔවුන්ට වීරයන් ගැනත් වනාන්තරයේ දරුවන් ගැනත් කතා කියා දෙන පියා වෙනුවට අමුතුම මිනිසකු එතන පහළ වී ඇති බවකි. හරියට ඔහු පියාගේ මුහුණ ගලවා දමා වින්ටර්ෆෙල් බලකොටුවට අධිපති ස්ටාර්ක් උතුමානන්ගේ මුහුණ දමා ගත්තාක් මෙනි.

උදෑසන සීතල මධ්‍යයේ ප්‍රශ්න ඇසීම් හා පිළිතුරු දීම් රැසක් සිදුවූවත් අසන්නට ලැබුනු කිසිදු දෙයක් බ්‍රැන්ගේ මතකයේ රැඳුනේ නැත. අන්තිමේදී ඔහුගේ පියා විධානයක් දුන් අතර සෙබලුන් දෙදෙනෙකු විසින් වැරහැලි ඇඳගත් මිනිසාව චතුරස්‍රය මැද තිබුනු කපා දමන ලද අයන්වුඩ් කොටයක් වෙත ඇදගෙන යන ලදී. මිනිසාගේ හිස පහතට සිටින සේ කොටය මත තැබූ ඔවුහු ඔහුට සෙලවීමට නොහැකි වන පරිද්දෙන් තර කොට අල්ලා ගත්හ. එඩ්ඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් සිය අසු පිටින් බසිද්දී තියන් ග්‍රේජෝයි විසින් හිස ගසා දැමීම සඳහා භාවිත කරන දිගු අසිපත ඔහු වෙත ගෙන එන ලදී. 'අයිස්' යනුවෙන් නම් ලැබූ එම අසිපත මිනිසකුගේ අතක් තරම් පළල් වූ අතර රොබ්ටත් වඩා උසින් වැඩි විය. අසිපත් තලය නිමවී තිබුනේ දුම මෙන් අඳුරු පැහැ වූ වලීරියන් වානේ වලිනි. වලීරියන් වානේ තරම් වෙන කිසිවක් මුවහත් නැති බව බ්‍රැන් දනියි.

සිය අත්වැසුම් ගලවා තම ගෘහාරක්ෂක බලකායේ ප්‍රධානියා වූ ජොරී කසල් අතට දුන් ඔහුගේ පියා දැතින්ම අයිස් ඔසවාගෙන මරණ දන්ඩණය ලබාදීමට සූදානම් විය.

"අන්දාල් වරුන්ගේ ද, රයිනාර් වරුන්ගේ ද, මුල් මිනිසුන්ගේ ද රජු වන, රාජධානි සප්තකයේ ස්වාමියා හා ආරක්ෂකයා වන, බරතියන් වංශයේ රොබර්ට් නම් වූ එම නමින් යුත් පළමු රජතුමාගේ නාමයෙන්, වින්ටර්ෆෙල්හි අධිපති හා උතුරේ ආරක්ෂකයා වන ස්ටාර්ක් වංශයේ එඩ්ඩාර්ඩ් වන මම නුඹට මරණීය දන්ඩණය ප්‍රකාශ කරමි."

ඊළඟ මොහොතේ ඔහු දිගු අසිපත හිසට ඉහළින් එසවීය.

බ්‍රැන් ගේ අවජාතක සොහොයුරා වූ ජොන් ස්නෝව් ඔහු දෙසට නැඹුරු විය. "පෝනියාව හයියෙන් අල්ල ගන්ට." ඔහු කෙඳිරුවේය. "අනික අහක බලන්ට එපා. එහෙම කලොත් තාත්තා දැනගන්නවා."

බ්‍රැන් තම පෝනියාව දැඩිව අල්ලාගෙන සිටි අතර අහක බැලුවේද නැත.

ඔහුගේ පියා එකම එක තිර පහරකින් මිනිසාගේ හිස කඳින් වෙන් කලේය. හිම මත රුධිරය විසිර ගියේ හරියටම රතු පැහැ වයින් පරිද්දෙනි. බ්‍රැන්ට ඒ වෙතින් සිය දෑස් ඉවත් කර ගැනීමට අසීරු බවක් දැනුනු අතර ඔහු බලා සිටිද්දී එම රුධිරය උරා ගත් හිම රතු පැහැයෙන් බබලන්නට විය.

ගසේ මුලක් මත පතිත වූ හිස පෙරළී අවුත් ග්‍රේජෝයි ගේ දෙපා අසල නතර විය. හැම දෙයක්ම සැහැල්ලුවෙන් හා විහිළුවෙන් බාරගන්නා හීන්දෑරී අඳුරු පැහැ දහනව හැවිරිදි තරුණයෙකු වූ තියන් සිනාසී එම හිසට පා පහරක් එල්ල කලේ ඈතට විසි වී යන පරිද්දෙනි.

"බූරුවා." ජොන් සිහින් හඬින් මිමිනුවේ ග්‍රේජෝයිට නෑසෙන පරිද්දෙනි. ඔහු බ්‍රැන් ගේ උරහිස මත අතක් තැබූ අතර බ්‍රැන් සිය අවජාතක සොහොයුරා දෙස බැලුවේය. "ඔයා බොහොම හොඳට කලා." ජොන් සන්සුන් හඬින් කීය.

ඉර පෙරට වඩා අහසේ මුදුන් වී සුළඟද නැවතී තිබුනු නමුත් වින්ටර්ෆෙල් බලා ආපසු යන ගමනේදී බ්‍රැන්ට පෙරට වඩා සීතලක් දැනෙන්නට විය. ඔහු සිටියේ අනිත් පිරිසට පෙරාතුව යන තම සොයුරන් දෙදෙනාගේ අශ්වයන් හා තම කුඩා පෝනියා සමපාත කරගන්නට වෑයම් කරමිනි.

"මිනිහා බයනැතුව මරණයට මුහුණ දුන්නා." රොබ් කීවේය. ඔහු එන්න එන්නම ලොකු මහත් වෙන, ඔහු ගේ මව ගේ විලාසයන් - රිවර්රන් හි ටලීවරුන්ගේ පැහැපත් සම, රතු-

දුඹුරු කෙස් හා නිල් පැහැ දැස් - ඇති යෞවනයෙකි. "ඌට අඩුම ගානෙ නිර්භීතකමක් තිබුනා."

"නෑ." ජොන් ස්නෝව් සෙමින් කීය. "ඒක නිර්භීතකමක් නෙවෙයි. මිනිහා මැරෙන තරමට බය වෙලයි හිටියෙ. උඹට ඒක මිනිහගෙ ඇස් දෙකෙන් දකින්ට තිබුනා ස්ටාර්ක්." ජොන් ගේ දැස් කෙතරම් තද අළු පැහැතිද කිවහොත් ඒවා කළු පැහැයට වඩා ආසන්නය. නමුත් ඒ දැසට කිසිදු දෙයක් මග නොහැරේ. ඔහු වයස දහහතරක් වූ රොබ් හා සම වයසේ වූවත් ඔවුන් දෙදෙනා අතරේ පෙනුමෙන් නම් කිසිදු සමානකමක් නොතිබිනි. රොබ් ගේ වැඩුනු මස්පිඩු සහිත සිරුරට සාපේක්ෂව ඔහු හීන්දෑරී ය, රොබ් පැහැපත් සමකින් යුක්ත වෙද්දී ඔහු අඳුරු පැහැයට හුරුය, රොබ් ශක්තිමත් හා වේගවත් වෙද්දී ඔහු සුන්දර හා ක්ෂණික විය.

මේ අදහස රොබ් ගේ සිතට කා වැදුනු බවක් පෙනුනේ නැත. "අනික් එවුං උගෙ ඇස් දෙක කාපුවාවෙ. ඌ හොඳට මැරුනා. මොකද කියන්නෙ, තරගයක් තියමුද? පාලම ගාවට යනකං."

"හරි." ජොන් කීවේ පයින් ඇන තම අසු ඉදිරියට මෙහෙයවන ගමන් ය. මැසිවිල්ලක් ගුවනට මුසු කල රොබ් ඔහු පසුපසින් පැන්නුවේය. මොහොතකින් ඔවුන් දෙදෙනා පාරේ වේගයෙන් ඉදිරියට අසුන් මෙහෙයවද්දී - රොබ් සිනාසෙමින් හූ කියමිනුත්, ජොන් නිහඬවම එහෙත් උනන්දුවෙනුත් - අසු කුරවලට හසු වූ හිම වර්ෂාවක් මෙන් පසුපසට විසි විය.

බ්‍රැන් ඔවුන් පසුපසින් යාමට උනන්දුවක් නොදැක්වූයේ තම කුඩා පෝනියාට එවන් වික්‍රමයක් කල නොහැකි බැව් ඔහු හොඳාකාරවම දන්නා බැවිනි. ඔහු මියගිය මිනිසාගේ දැස් දැක තිබූ අතර මේ මොහොතේ ඒ ගැන සිතන්නට විය. මොහොතකට පසු රොබ් ගේ සිනා හඬ වියැකී ගිය අතර හාත්පස වන පෙත නැවතත් නිහඬ විය.

කෙතරම් තදින් කල්පනාවේ ගැලී සිටියාද කිවහොත් සෙසු පිරිස ඔහු අසලටම ළඟා වී ඇති බැව් බ්‍රැන් දැනගත්තේ සිය පියා ඔහුට සමගාමීව සිය අසු මෙහෙයවන්නට පටන් ගත් විටය. "ඔයා හොඳින්ද බ්‍රැන්?" ඔහු ඇසීය.

"ඔවු තාත්තේ." ඔහු ඉහළ බලා කීවේය. ලොමින් හා සමින් සැරසී සුවිසල් යුධ අසු අරා සිටි පියා ඔහුට පෙනුනේ යෝධයෙකු පරිද්දෙනි. "රොබ් කියනවා ඒ මිනිහා නිර්භීත විදියට මැරුන ලු. ජොන් කියනවා මිනිහා බයෙන් ලු හිටියෙ."

"ඔයා මොකක්ද හිතන්නෙ?"

බ්‍රැන් මොහොතක් සිතා බැලීය. "මිනිහෙකුට පුළුවන්ද බයවෙච්ච වෙලාවක නිර්භීත වෙන්ට?"

"ඒ තමා මිනිහෙකුට නිර්භීත වෙන්ට පුළුවන් එකම වෙලාව. බයවෙච්ච වෙලාව. ඔයා තේරුම් ගත්තද ඇයි මං ඒක කලේ කියලා?"

"ඌ වනචාරියෙක්." බ්‍රැන් පිළිවදන් දුනි. "උං ගෑනු උස්සන් ගිහිල්ලා 'අනික් එවුංට' විකුණනවා."

ඔහුගේ පියා සිනාසුනි. "නාකි ආයම්මා ආයෙමත් ඔයාගෙ ඔළුවට එක එක මනස්ගාත දානව වගේ. ඇත්තම කියනවානං, ඒ මිනිහා පොරොන්දු කඩකරපු එකෙක්. නිශා රැකුම් බලකායෙන් පැනල ආපු එකෙක්. වෙන කිසිම මිනිහෙක් ඌ තරම් භයානක නෑ. පැනලා යන එකා දන්නවා ආපහු අහුවුනොත් මිනිහගෙ ජීවිතේ එතනින් ඉවරයි කියලා. ඒ නිසා ඌ අහු නොවී ඉන්ට ඕනම අපරාධයක් කරන්ට ලෑස්තියි. ඒ වුනත් ඔයා මගේ ප්‍රශ්නෙ හරියට තේරුම් අරන් නෑ. මං ඇහුවෙ 'ඇයි ඒ මිනිහට මැරෙන්ට වුනේ' කියලා නෙවෙයි, 'ඇයි මමම ඒ මිනිහව මරන්ට තීරණය කලේ. කියලයි."

එම ප්‍රශ්නයට බ්‍රැන් ට පිළිතුරක් නොවීය. "රොබර්ට් රජ්ජුරුවන්ට අළුගෝසුවෙක් ඉන්නවා." ඔහු අතීරණාත්මක හඬින් කීය.

"ඔවු, ඒක ඇත්ත." ඔහු ගේ පියා එකඟ විනි. "ඒ විතරක් නෙවෙයි, එයාට කලින් හිටපු ටාර්ගේරියන් රජවරුන්ටත් හිටියා. ඒ වුනත් අපේ විදිය පුරාණයේ ඉඳන් එන විදියයි. ස්ටාර්ක්වරුන්ගේ නහරවල තාමත් මුල්ම මිනිස්සුන්ගේ ලේ දුවනවා. අපි විශ්වාස

කරන්නෙ මරණ දන්ඩණය ප්‍රකාශ කරන කෙනාම ඒක ක්‍රියාත්මක කරන්ටත් ඕන කියලයි. ඔයා මිනිහෙකුගෙ ජීවිතය නැති කරන්ට යනවානං ඒ මිනිහගෙ ඇස් දෙක දිහා බලලා එයාගෙ අන්තිම වචන ටික අහන්ට ඔයා බැඳිලා ඉන්නවා. ඔයාට ඒ දේ දරාගන්ට බැරි නං ඒකෙන් කියවෙන්නෙ එයා මැරෙන්ට සුදුසු නෑ කියලයි."

"එක දවසක් එනවා බ්‍රැන්, එදාට ඔයා තමා රොබ්ගෙ කොඩිය උස්සන් යන්නෙ. ඔයා එදාට ඔයාගෙ සහෝදරයගෙ නමිනුයි ඔයාගෙ රජ්ජුරුවන්ගෙ නමිනුයි බලකොටුවක් පාලනය කරාවි. අන්න එදාට ඔයාට සිද්ධවෙනවා යුක්තිය ඔයා අතට ගන්ට, මිනිස්සුන්ට දඬුවම් කරන්ට. එදාට ඔයාට අහක බලන්ට බෑ. ඒ වගේම ඔයා ඒ කරන දෙයින් සතුටක් ලබන්ට හදන්ටත් එපා. සල්ලි ගෙවලා අළුගෝසුවො තියාගෙන ඒ පිටිපස්සෙ හැංගිලා ඉන්න රජවරුන්ට ඉක්මනටම අමතක වෙනවා මරණය කියන්නෙ මොකක්ද කියලා."

ඒ මොහොතේ ඔවුන් ඉදිරියේ වූ කුඩා කඳුගැටය මුදුනෙන් ජොන් මතු විය. ඔහු පහළ බලා ඔවුන්ට අත වනා හඬ ගෑවේය. "තාත්තේ, බ්‍රැන්. ඉක්මනට එන්ට. ඇවිත් බලන්ට රොබ් මොකක්ද හොයාගත්තෙ කියලා." ඊළඟ මොහොතේ ඔහු නැවත නොපෙනී ගියේය. තම අසු විහිදූ ජොරී ඔවුන් අසලට පැමිණියේය. "මොකක් හරි ප්‍රශ්නයක්ද මගෙ උතුමානෙනි?"

"කිසිම සැකයක් නෑ. එන්ට ගිහිං බලමු මගේ පුතාලා මෙදා පාර මොකක්ද නටපු ජරමරේ කියලා." ඔහු අසුට හැල්මේ දුවන්නට සන් කල අතර ඒ පිටුපසින් බ්‍රැන්, ජොරී හා සෙසු පිරිස අසුන් විහිදූහ.

Theon Greyjoy: “There’s not been a direwolf sighted south of the Wall in two hundred years.”

Jon Snow: “I see one now.”

*වේතාලයන් = මළ මිනී කන භූතයන්, පිශාචයන්

පාලමට උතුරින් ගංඉවුරේ ඉන්නා රොබ් ද, ඒ අසලම තවමත් අසු පිට සිටින ජොන් ද ඔවුන්ට හමුවිය. මෙවර ගිම්හානන්තයේ හිම වෙනදාට වඩා වැඩියෙන් වැටී තිබින. දණක් උසට වැටුනු හිම ගොඩ අතරේ සිට ගෙන සිටි රොබ් කුමක්දෝ දෙයක් පපුවට තුරුළු කරගෙන සිටියේ ය. ඔවුන් දෙදෙනා උද්‍යෝගීමත් එහෙත් මැඩගත් ස්වරයෙන් කතා කරනු පැමිණි පිරිසට ඇසුනි.

පිරිමි ළමුන් දෙදෙනාට මුලින්ම සමීප වූයේ පිරිසේ ඉදිරියෙන්ම සිටි ජොරී කසල් හා තියන් ග්‍රේජෝයි විය. මෙතෙක් වේලා සිනාසෙමින් විහිළු කරමින් පැමිණි ග්‍රේජෝයි ගේ මුවින් විස්මයාකෘත හඬක් නැංවෙනු බ්‍රැන්ට ඇසුනි. "දෙයියනේ!" ඔහු කෑගැසුවේ තම අසු පාලනය කරගැනීමට යත්න දරන අතරේ අසිපත වෙතට අත යවමිනි.

ජොරීගේ අසිපත මේ වනවිටත් කොපුවෙන් පිටතට පැමිණ තිබිනි. "රොබ් උගෙන් ඈත් වෙන්ට." ඔහු කෑ ගැසීය.

තමා අතේ තිබුනු පොදියෙන් දෑස් ඉවතට ගත් රොබ් ඉහළ බලා විරිත්තුවේය. "ඌට අපට හානියක් කරන්ට බෑ. ඒකි මැරිලා ජොරී."

මේ වන විට කුතුහලය විසින් බ්‍රැන් ගිනිගෙන දැවෙමින් තිබිනි. ඔහුට සිය පෝනියා ඉදිරියට මෙහෙයවීමට උවමනා වුවත් පාලම අසල අසුන් නවතා පා ගමනින් යන්නැයි පියා ගෙන් විධානයක් ලැබිනි. අසුගෙන් බිමට පිනූ බ්‍රැන් ඉදිරියට දිව ගියේය.

ඒ වනවිට ජොන්, ජොරී හා තියන් යන සියල්ලෝම අසුන්ගෙන් බිමට බැස තිබින. "මොන අපා හතෙන් එකක්ද ඒ?" තියන් ඇසුවේය.

"වෘකයෙක්." රොබ් පිළිවදන් දුනි.

"විකෘතියක්. බලන්ට උගේ ලොකු."

ඉණ තෙක් උසැති හිම ගොඩ අතරින් තම සොයුරන් වෙත ලංවෙද්දී බ්‍රැන් ගේ හදවත මුවින් එළියට පනින තරමේ වේගයකින් ගැහුනේය.

රුධිරයෙන් රතු පැහැ වූ හිම ගොඩේ දැවැන්ත අඳුරු පැහැති වස්තුවක් අඩක් එරී තිබුනි. එහි අළු පැහැති දළ ලෝමයන් මත හිම මිදී තිබූ අතර එයින් යාන්තමට කුණුගඳක් වහනය විය. දැස් වල ඉහඳ පනුවන් පිරී තිබුනු අතර විශාල මුවේ කහ පැහැති දත් දෙපෙලක් දැකිය හැකි විය. නමුත් ඔහු තිගැස්සුනේ මේ කිසිවක් නිසා නොව එහි විශාලත්වය නිසාය. එය ඔහුගේ පෝනියාටත් වඩා විශාල විය, සිය පියාගේ දඩයම් බල්ලන් අතරින් විශාලතම එකාටත් වඩා දෙගුණයක් විශාල විය.

"ඌ විකෘතියක් නෙවෙයි." ජොන් සන්සුන් ස්වරයෙන් කීය. "ඌ සෝරවෘකයෙක්. උං සාමාන්‍ය වෘකයින්ට වඩා ලොකුවට හැදෙනවා."

"ප්‍රාකාරයෙන් මෙපිට සෝරවෘකයෙක් දැකලා නෑ අවුරුදු දෙසීයකින් මෙහා." තියන් කීය.

"මං දැන් ඉන්නෙ උං එකෙක් දිහා බලාගෙන තමා." ජොන් පිළිවදන් දුනි.

මේ රාක්ෂයාගෙන් දැස් ඉවතට ගත් බ්‍රැන් පළමු වරට රොබ් ගේ අතේ ඇති පොදිය පැහැදිලිව දුටුවේය. සතුටින් හඬක් නැගූ ඔහු රොබ් වෙතට සමීප විය. තවමත් දැස් නැරිය වෘක පැටවා පුංචි කළු-අළු පැහැ බෝලයක් මෙන් දිස් වුනි. ඌ සිහින් කෙඳිරියක් නගමින් තව තවත් රොබ්ට තුරුළු වී ඉව ඇල්ලුවේ හරියට ඔහුගෙන් කිරි බොන්නට තැත් කරන්නාක් මෙනි. බ්‍රැන් ආශාවෙන් එහෙත් දෙගිඩියාවෙන් එදෙසට අත දිගු කලේය. "එන්ට." රොබ් කීය. "ඔයාට ඌව අල්ලන්ට පුළුවන්."

වෘක පැටවා යාන්තමට අත ගෑ බ්‍රැන් ආපසු හැරුනේ ජොන් ගේ කටහඬ ඇසීමෙනි. "මෙන්න." ඔහුගේ අර්ධ-සොහොයුරා ඔහු අත තැබුවේ තවත් වෘක පැටවෙකි. එතැනම බිම හිමගොඩේ වාඩිවුනු බ්‍රැන් පැටවා තම මුහුණට තුරුළු කර ගති. උගේ ලෝම සිනිඳු උණුසුම් බවකින් යුතුව ඔහුගේ කම්මුලට දැනුනේය.

"අවුරුදු ගානකට පස්සෙ ආයෙමත් සෝරවෘකයො නිදැල්ලෙ යන්ට පටන් අරන්." හලන් - අසුන් බාරකරුවා - කටුකුටු ගෑවේය. "මං එච්චර කැමති නෑ මේ වැඩේට."

"ඒක සලකුණක්." ජොරී කීය.

"මේ මැරිච්ච සතෙක් ජොරී." පියා රැවුම් මුහුණකින් යුතුව කීවේය. එනමුත් ඔහුගෙන් දිස් වූයේ කරදරයකට පත් වූ පෙනුමකි. ඔහු පරීක්ෂාකාරී බැල්මෙන් සතා ගේ දේහය වටා ඇවිද්දේය. "අපට හොයාගන්ට පුළුවන්ද ඇයි මේකි මැරිලා තියෙන්නෙ කියලා?"

"උගේ උගුරෙ මොකක්දෝ ඇනිලා තියෙනවා." රොබ් කීය. "අර තියෙන්නෙ, යටි හනුවට පොඩ්ඩක් පහතින්..."

බිම දණ ඇනගත් පියා සතාගේ බෙල්ලට යටින් අත රිංගෙවුවේය. ඊළඟ මොහොතේ අත ගස්සා ඉස්සූ ඔහු සැමට පෙනෙන පරිද්දෙන් එය ඉහළට එසවීය. ඒ රුධිරය නිසා රත් පැහැ වූ, අඩියක් පමණ දිග මුව අං කැබැල්ලකි. පිරිස අතරේ පැතිර ගියේ හදිසි නිහඬතාවකි. සියළුදෙනාම නොසන්සුන් අයුරින් මුව අං කැබැල්ල දෙස බලාසිටිය මුත් එකෙකුවත් කතා කිරීමට කට ඇරියේ නැත. බ්‍රැන්ටත් ඔවුන්ගේ භීතිය හැඟුනත් ඒ ඇයි කියන්නට ඔහුට නොතේරින.

මුව අං කැබැල්ල ඉවතට වීසි කර දැමූ පියා හිමෙන් දෑත පිසදා ගත්තේය. "මට පුදුම මේකි පැටවු දානකං ජීවත් වෙච්ච එක ගැනයි."

"සමහරවිට එහෙම නොවෙන්ටත් පුළුවන්." ජොරී කීය. "මං කතා අහලා තියෙනවා.... සමහරවිට පැටවු එළියට එනකොටත් මේකි මැරිලා වෙන්ට ඇති."

"මළමිනියකින් ඉපදුන එවුන්." තවකෙකු කීවේය. "ඒක නරක ලකුණක්."

"මොනා වුනත් කමක් නෑ. උනුත් ඉක්මනටම මැරෙන්ටයි යන්නෙ." හලන් කීවේය.

බ්‍රැන් කැළඹුනු සිතින් අව්‍යක්ත හඬක් නැගීය.

"ඉක්මන් කරපු තරමට හොඳයි." තියන් ග්‍රේජෝයි අසිපත ඇදගත්තේය. "ඔය සතාව මෙහාට දෙන්ට බ්‍රැන්."

පැවසූ වදන් තේරුනාක් මෙන් පුංචි පොදිය නොසන්සුන්කමින් දැඟලුවේය. "බෑ!" බ්‍රැන් සැඩපරුෂ ස්වරයෙන් කෑ ගැසීය. "ඌ මගේ."

"උඹේ කඩුව පැත්තකට දාපං ග්‍රේජෝයි." රොබ් පැවසීය. මොහොතකට ඔහුගෙන් පළවුනේ පියාගේ බඳු විධානාත්මක ස්වරූපයකි. "අපි මේ පැටවු තියාගන්නවා."

"ඔයාට ඒ වැඩේ කරන්ට බෑ දරුවෝ." මෙසේ කීවේ හලන් ගේ පුතා හාර්වින්ය.

"උංව මරලා දාන එක උංට කරන උදවුවක්." හලන් කීය.

සහනයක් පතා බ්‍රැන් සිය පියා දෙස බැලූ මුත් ඔහුට හිමිවූයේ රැවුම් මුහුණක් පමණි. "හලන් කියන්නෙ ඇත්ත පුතා. උංට බඩගින්නෙයි සීතලෙයි මැරෙන්ට අරිනවට වඩා හොඳයි එකපාරින් මරලා දාන එක."

"නෑ!" තම දෑස් පුරා කඳුළු ගලා එන බව දැනුනු බ්‍රැන් ඉවත බලාගත්තේය. සිය පියා ඉදිරිපිට හැඬීමට ඔහුට අවශ්‍ය වූයේ නැත.

රොබ් මුරණ්ඩු අයුරින් විරුද්ධත්වය පෑවේය. "සෙර් රඩ්‍රික් ගෙ රතු බැල්ලි ගිය සතියෙ ආයෙමත් පැටවු දැම්මා. පැටවු දෙන්නයි ජීවත්වෙලා ඉන්නෙ. ඒකිට ඇතිවෙන්ට කිරි තියෙනවා."

"ඒකි මුංව කැලි කැලිවලට ඉරලා දායි."

"ස්ටාර්ක් උතුමානෙනි." ජොන් කීවේය. ඔහු සිය පියාට මෙසේ චාරිත්‍රානුකූලව අමතනු ඇසීම නුහුරු දෙයකි. බ්‍රැන් ඔහු දෙස බැලුවේ බලාපොරොත්තු සහගත දැසිනි.

"මෙතන පැටවු පස් දෙනෙක් ඉන්නවා. පිරිමි තුන්දෙනයි, ගෑණු දෙන්නයි."

"මොකක්ද එතන තියෙන විශේෂත්වය ජොන්?"

"ඔබට සහජාත දරුවො පස්දෙනෙක් ඉන්නවා. පුත්තු තුන්දෙනයි, දුවලා දෙන්නයි. සෝරවෘකයා කියන්නෙ ඔබේ වංශයේ සලකුණ. මේ පැටවු ඇවිල්ලා තියෙන්නෙ ඔබේ දරුවන්ට හිමි වෙන්ටමයි මගෙ උතුමානෙනි."

සිය පියාගේ මුහුණ වෙනස් වී යනුත් අනායයන් එකිනෙකා ගේ මුහුණු බලාගනුත් බ්‍රැන්ට පෙනුනි. ඒ මොහොතේ ඔහු තුළ ජොන් පිළිබඳ මුළු ලෝකයටත් වඩා ආදරයක් පහළ විය. වසර හතක් වැනි කුඩා වයසක දී වුවත් ඒ මොහොතේ තම අඩ-සොහොයුරා කල පරිත්‍යාගය ඔහුට තේරුනි. වෘක පැටවුනුත් ස්ටාර්ක් දරුවනුත් හරියටම සමපාත වූයේ ජොන් තමා විසින්ම තමාව පවුලෙන් ඉවත් කල බැවිනි. ඒ වෙනුවට ඔහු ගැහැණු දරුවන් හා පුංචි අත දරුවකු වන රිකන් පවා ඊට ඇතුළත් කලේය. එහෙත් ස්නෝව් වාසගම - අවජාතකයින්ට උතුරුකරයේ දී පොදුවේ ලැබෙන වාසගම - හිමි තමාව එයින් ඉවත් කලේය.

ඔවුන් ගේ පියා මේ සියල්ලම තේරුම්ගත් බවක් පෙනුනි. "ඔයාට පැටියෙක් ඕන නැද්ද ජොන්?" ඔහු මෘදු අයුරින් ඇසීය.

"සෝරවෘකයා සරසන්නෙ ස්ටාර්ක් වංශයෙ කොඩිය. මං ස්ටාර්ක් කෙනෙක් නෙවෙයි තාත්තෙ."

ජොන් පැවසූ දේ ගැන පියා ගැඹුරින් සිතා බලන බව පෙනෙන්නට විය. රොබ් ඒ නිහඬතාව බිඳ දැම්මේය. "මේ පැටියට මමම සාත්තු කරන්නං තාත්තෙ. මං පොඩි තුවා කෑල්ලක් උණු කිරිවලින් පොඟවලා මූට උරන්ට දෙන්නං." ඔහු පොරොන්දු විය.

"මාත් එහෙම කරනවා." බ්‍රෑන් ප්‍රතිරාව නැංවීය.

වංශාධිපතියා දිගු වේලාවක් සිය දෑසින් තම පුතුන් දෙදෙනා කිරා මැන බලන්නට විය. "කියන්ට ලේසියි, කරන්ට අමාරුයි. ඔයාලා මේ සත්තු වෙනුවෙන් සේවකයන්ගෙ කාලෙ නාස්ති කරනවා දකින්ට මට ඕන නෑ. ඔයාලට මේ පැටවු ඕන නං ඔයාලම උංට සාත්තු කරන්ට ඕන. තේරුනාද?"

බ්‍රෑන් උනන්දුවෙන් හිස සැලීය. ඔහුගේ දෑත තුළ එහා මෙහා වුන පැටවා තම උණුසුම් දිවෙන් ඔහුගේ මුහුණ ලෙව කෑවේය.

"ඒ වගේම ඔයාලා උංව පුරුදු කරන්ටත් ඕන. ඔයාලා විසින්ම උංව පුරුදු කරන්ට ඕන. බල්ලො බලාගන්න කෙනාව මේකට ගාවගන්ට බෑ. ඔයාලා උංව නොසලකා ඇරියොත් හරි උංට වද දුන්නොත් හරි උංව නරක විදියට පුරුදු කලොත් හරි මං ඒකත් බලාගන්නං. මුං බල්ලො නෙවෙයි. ඒක නිසා බල්ලො වගේ කෑමකට නැට්ට වනන්ටයි පයින් පාර කාලා දුවන්ටයි මුංව පුරුදු කරන්ටත් බෑ. සාමාන්‍ය බල්ලෙක් මීයෙක් මරලා දානවට වැඩිය ලේසියෙන් සෝරවෘකයෙකුට පුළුවන් මිනිහෙකුගෙ අතක් උරහිස ළඟින් වෙන් කරන්ට. ඔයාලට හොඳටම විශ්වාසද මුංව ඕන කියලා?"

"ඔව් තාත්තෙ." බ්‍රෑන් පැවසීය.

"ඔව්." රොබ් එකඟ විය.

"ඔයාලා කොහොම මොනා කලත් මේ පැටවු මැරෙන්ටත් පුළුවන්."

"උං මැරෙන්නෙ නෑ." රොබ් කීය. "අපි උංට මැරෙන්ට දෙන්නෙ නෑ."

"එහෙමනං උංව තියාගන්ට. ජොරී, ඩෙස්මන්ඩ්, අනිත් පැටවු ටික එකතු කරගන්ට. අපට වින්ටර්ෆෙල්වලට යන්ට කාලෙ හරි."

පාලමේ මැදක් හරිය පසුකරද්දී ජොන් හදිසියේම නැවතුනි.

"මොකක්ද ජොන්?" ඔවුන්ගේ පියා ඇසීය.

"ඔයාලට ඒක ඇහෙන්නෙ නැද්ද?"

සුළඟට ගස් සෙලවෙන හඬත්, පාලමේ අසු කුර ගැටෙන හඬත් තම වෘක පැටවා කුසගින්න නිසා නගන කෙඳිරියත් බ්‍රැන්ට ඇසුනි. නමුත් ජොන් කණ් දුන්නේ ඒ කිසිවකට නොවේ, වෙන මොන යම් හෝ දෙයකටය.

"අන්න අතන." ජොන් කීය. අසු ආපසු හරවාගත් ඔහු නැවතත් පැමිණි දිසාවටම පිම්මේ ගියේය. සෝරවෘකයා මිය ගොස් සිටි ස්ථානයේදී ඔහු අසු පිටින් බසිනවාත් හිම ගොඩේ දණ බිම ඇනගෙන කුමක්දෝ සොයනවාත් ඔවුන්ට පෙනිනි. මොහොතකට පසු ඔහු නැවත ඔවුන් වෙතට පැමිණියේ සිනහවෙමිනි.

"ඌ අනික් පැටවුන්ගෙන් ඈතට ගාටගෙන ගිහිල්ලා."

"එහෙමත් නැත්තං අනික් පැටවු ඌව එලවලා දාලා." ඔවුන්ගේ පියා කීවේ සයවැනි වෘක පැටවා දෙස බලමිනි. අනිත් පැටවුන් අඳුරු පැහැති වුවද මූ හිම මෙන් සුදු පැහැ විය. උගේ දෑස් රතු පැහැයෙන් දිලිසුනේ හරියටම අද උදෑසන ගෙල කපා දැමූ මිනිසාගෙන් ගැලූ රුධිරය මෙනි. අනිත් පැටවුන් තාමත් දෑස් හැර නැති විට මේ පැටවා පමණක් දෑස් හැර තිබීම ගැන බ්‍රැන් ගේ සිතේ ඇති වූයේ කුතුහලයකි.

"ඇලි එකෙක්." තියන් ග්‍රේජෝයි කීවේ කුරිරු සතුටකිනි. "මූ මැරෙයි අනිත් එවුන් හැමෝටම කලින්."

ජොන් ස්නෝව් ඔහු දෙසට හෙලුවෙ ඇඟ සීතල කරවන අන්දමේ බැල්මකි. "මං හිතන්නෙ නෑ එහෙම වෙයි කියලා ග්‍රේජෝයි. මේ පැටියා අයිති මටයි."

Jon Snow: “The direwolf graces the banners of House Stark. I am no Stark, Father.”

## කැට්ලින්

කැට්ලින් කිසිමදාක වින්ටර්ෆෙල් හි දෙව්වනය ප්‍රිය නොකලාය.

ඇය ඉපදුනේ ඈත දකුණේ, ගංගා ත්‍රිශුලයේ රතු ගංගාව අබියස පිහිටි, රිවර්රන් හි ටලී වරුන් අතරේය. ඔවුන්ට අයත් දෙව්වනය හිරුඑළියෙන් පිරුණු, මනා වාතාශ්‍රය ඇති උද්‍යානයක් විය. එහි උසැති රෙඩ්වුඩ් ගස් අතරේ කුඩා දිය පහරවල් කිංකිනි සරින් ගලා ගියේය. වාතය මල් සුවඳින් හා අතුපතර සැඟවී ගී ගයන සියොතුන්ගේ මිහිරි සරින් පිරී ගියේය.

නමුදු වින්ටර්ෆෙල් හි දෙව්වනය ඊට හාත්පසින්ම වෙනස්, අඳුරු, ආදිකල්පික අක්කර තුනක් පමණ වූ භූමියක් විය. මාලිගා බලකොටුව ඉදිකරද්දී නොකපා ඉතිරි කරන ලද, අවුරුදු දසදහසකටත් වඩා පැරණි වනාන්තරයේම කොටසක් වූ එහි දැනුනු එකම සුවඳ වූයේ තෙත් පසේ හා දිරාපත්වන කොළ රොඩු වල සුවඳ පමණි. එහි කිසිදු විටෙකත් රෙඩ්වුඩ් වැවුනේ ද නැති අතර ඒ තැන් අරක් ගෙන තිබුනේ ඉදිකටු වැනි පත්‍රයෙන් සන්නද්ධ වූ මුරකරු වෘක්ෂ සහ රාජධානිය තරමටම පැරණි යැයි සිතිය හැකි දැවැන්ත ඕක් හා අයන්වුඩ් ගස් ය. දැවැන්ත ගස් කඳන් එකිනෙකට ඉතා කිට්ටුවෙන් අහස උසට නැගුනු අතර එකිනෙක බැඳුනු තුරු වියන නිසා හිරුඑළිය බිමට වැටුනේද නැති තරම්. ගැඹුරු නිශ්ශබ්දතාවයෙන් පිරුණු තැනක් වූ මෙහි වැඩ වාසය කල දෙවියන් ද නිර්නාමික අයවලුන් විය.

එනමුදු අද රෑ සිය සැමියා සොයාගත හැකි එකම තැන මේ දෙව්වනය බව කැට්ලින් දැන සිටියාය. මිනිසකුගේ දිවි තොර කල සෑම විටකම මෙම දෙව්වනයේ නිහඬතාව මැද්දේ කාලය ගතකරන්නට ඔහු පුරුදුව සිටියේය.

කැට්ලින් වනාහී රිවර්රන් හි සප්තක දේවස්ථානයේ දී සප්තාලේපනයෙන් අභිෂේක ලද්දියක් වූවාය. ඇගේ පියා ද, පියා ගේ පියා ද, ඔහු ගේ පියා ද මෙන් ඇය ද ඇදහුයේ සත්‍ය ලබ්ධියයි. ඇයගේ දෙවියන්ට නම් තිබුනු අතර ඔවුන් ගේ මුහුණු ඇගේ දෙමවුපියන් ගේ මුහුණු තරමටම ඇයට හුරුපුරුදු ඒවා විය. ඇයට අනුවනම් දෙවියන් යැදීම යනු දුම්කබලක් අතකින් ගත් පූජකයා ද, දවන ලද සුවඳ ද්‍රව්‍යයන්හි සුවඳ ද, ආලෝකමත් සප්තාශ්‍රාකාර පළිඟුව ද, ගීතිකාවන්ගෙන් නැගෙන හඬ ද යන සියල්ලේ එකතුවකි. රාජධානියේ අනිකුත්

සියළුම වංශවත් පවුල් මෙන් ටලීවරුන්ද දෙව්වනයක් පවත්වාගෙන ගියද එය හුදෙක් ඇවිදීමටත් පොත් කියවීමටත් හිරු එළියේ වැතිරී සිටීමටත් පමණක් භාවිත කෙරුනකි. දෙවියන් යැදීමට ඔවුන් භාවිත කලේ සප්තක දේවස්ථානය යි.

ඇයට සිය දෙවියන්ගේ සප්තාකාරයට යැදීමට හා ගීතිකා ගැයීමට නෙඩ් විසින් කුඩා සප්තකයක් තනවා දී තිබින. එනමුදු ස්ටාර්ක්වරුන්ගේ නහර තුළ තවමත් ගලා ගියේ මුල් මිනිසුන් ගේ රුධිරය ය, ඔවුන් තවමත් වැඳුම් පිදුම් කලේ පුරාණ දෙවි දේවතාවන්ට ය, කාලයේ වැලි තලාවෙන් අතුරුදන් වූ වනාන්තරයේ දරුවන් ගේ නමක් හෝ මුහුණක් හෝ නොමැති දෙවියන්ට ය.

දෙව්වනය මධ්‍යයේ අඳුරු හා සීතල වතුරින් පිරි කුඩා පොකුණක් අසබඩ පෞරාණික වයර්වුඩ් වෘක්ෂයක් විය. නෙඩ් මෙය හැඳින්වූයේ 'හදවෘක්ෂය' යනුවෙනි. වයර්වුඩ් වෘක්ෂයේ පොත්ත ඇටකටුවක් මෙන් සුදු පැහැ වූ අතර එහි කොළ තද රතු පැහැයෙන් යුක්ත විය. ගස් කඳේ කොටා තිබුනු මුහුණ උකටලී පෙනුමකින් යුක්ත විය. එහි වියළී ගිය යුෂයෙන් පිරුනු ගැඹුරු රතු පැහැ දෑස් හරියටම විමසිල්ලෙන් ඔබ දෙස බලා සිටිනවා වැන්න. මේ දෑස් වින්ටර්ෆෙල් මාලිගයටත් වඩා පෞරාණික විය. ප්‍රවාදවලට අනුව නම් මාලිගය ගොඩ නැංවීමට මුල් ගල තබන ලද්දේ මේ දෑස් ඉදිරියේ ය. මේ මාලිගයේ ශෛලමය බිත්ති ඉහළට බැඳුනේ මේ දෑස් ඉදිරියේ ය. ප්‍රවාදවලට අනුව නම් වනාන්තරයේ දරුවන් විසින් ගස් වල මේ මුහුණු කැටයම් කරන ලද්දේ මුල්ම සියවස්වල එනම් මුල් මිනිසුන් පටු මුහුදෙන් එතෙර වී මෙහි එන්නටත් පළමුවය.

දකුණුකරයේ නම් අවසාන වයර්වුඩ් ගස් කපා බිම හෙලුවේ හෝ පුළුස්සා දමන ලද්දේ හෝ මෙයට වසර දහසකටත් පෙර නමුදු මේ උතුරුකරයේ තත්ත්වය හාත්පසින්ම වෙනස් එකක් විය. සෑම බලකොටුවකම, මාලිගයකම ඊටම වෙන්වූ දෙව්වනයක් විය. මේ දෙව්වනය මධ්‍යයේ හදවෘක්ෂයක් හා ඒ හදවෘක්ෂයේ කැටයම් කෙරුනු මුහුණක් විය.

කැට්ලින්ට සිය සැමියා හමුවෙද්දී ඔහු හදවෘක්ෂය පාමුල පෙඳපාසියෙන් ගැවසීගත් ගලක් මත වාඩිවී සිටියේ ය. අයිස් නම් වූ දිගු අසිපත ඔහුගේ උකුල මත තිබුනු අතර ඔහු පොකුණේ කාලවර්ණ ජලයෙන් එහි තලය පිරිසිදු කරමින් සිටියේ ය. "නෙඩ්." ඇය මෘදු ස්වරයෙන් ඔහු ඇමතීය.

ඔහු හිස ඔසවා ඈ දෙස බැලීය. "කැට්ලින්. කෝ ළමයි?"

"කුස්සියේ. වෘක පැටවුන්ට දාන නම් ගැන වාද කර කර ඉන්නවා." සිය සළුව බිම ඇතිරූ ඇය පොකුණ අසබඩ වයර්වුඩ් ගසට පිට දී හිඳගත්තා ය. "ආර්යා දැනටමත් උන්ට ආදරේ කරන්ට පටන් අරන්. සන්සා වශී වෙලා වගේ. රිකන් තමා තාමත් දෙගිඩියාවෙන් වගේ ඉන්නෙ."

"එයා බයෙන්ද?"

"චුට්ටක්. එයාට තාම වයස තුනයි නෙ."

නෙඩ් දෙබැම ඇකිළුවේය. "එයා ඉගෙනගන්ට ඕන බයට මුහුණ දෙන්ට. එයා හැමදාමත් අවුරුදු තුනේ රැඳිලා ඉන්නෙ නෑ. ශීත කාලෙ එනවා."

"ඔවු." කැට්ලින් එකඟ විය. හැමදාමත් පුරුදු පරිදි ඒ වචන ඇගේ සිරුර සීතලෙන් ගල් කරවීමට සමත් විය. 'ශීත කාලය එනවා' යනු ස්ටාර්ක් වරුන්ගේ ආදර්ශ පාඨයයි.

"මිනිහා නිර්භීත විදියට මැරුනා. ඒක කියන්ට ඕන." තෙල් තැවරූ සම් කැබැල්ලක් අතට ගත් නෙඩ් අසිපත් තලය සෙමින් පිරිමදිමින් ඔප දමන්නට විය. "එතන බ්‍රැනුත් හිටිය නිසා මට ඒක එහෙම වුන එක ගැන සන්තෝසයි. ඔයා බ්‍රැන් ගැන ආඩම්බර වෙන්ට ඕන."

"මං හැමදාමත් බ්‍රැන් ගැන ආඩම්බරයි." කැට්ලින් පිළිතුරු දුන්නේ ඔහු අසිපත පිරිමදින ආකාරය නරඹමිනි. කැට්ලින් අසිපත්වලට ආලය නොකලත් අයිස් යනු එයටම විශේෂිත සුන්දරත්වයකින් හෙබි අසිපතක් බැව් ඇයද පිළිගනියි. එය විනාශයට පෙර වැලීරියාවේ - කම්මල් කරුවන් මිටිය හා කිණිහිරය පමණක් නොව වශීකරණය හා මන්ත්‍ර ශාස්ත්‍රය ද යොදාගනිමින් සිය ආයුධ වාත්තු කරන ලද කාලයේ - තනන ලද්දකි. වසර හාර සියයක් පැරණි මුත් එය අදටත් එදා මෙන්ම තියුණු බවකින් යුක්ත ය. එය දරන නාමය - අයිස් - ඊටත් වඩා පැරණි, ස්ටාර්ක්වරුන් උතුරේ රජවරුන් ව සිටි වීරයන් ගේ කාලයේ සිට පැවතෙන පුරාවෘත්තයකි.

"මේ අවුරුද්දේ පැනලා යන්ට ගිහින් අහුවුන හතර වෙනියා මේ. ඒ මිනිහා බාගෙට පිස්සු වැටිලා වගෙයි හිටියෙ. මොකක් හරි දෙයක් නිසා මිනිහා හොඳටම බය වෙලා තියෙනවා. මං කිවුව කිසිම දෙයක් මිනිහට දැනුනෙවත් නෑ." ඔහු සුසුමක් හෙළී ය. "බෙන් ලියලා එවලා තියෙනවා නිශා රැක්මේ බලය දැන් මිනිස්සු දාහකටත් වඩා අඩු වෙලා තියෙනවා කියලා. පැනලා යන එවුන් විතරක් නෙවෙයි. මුර සංචාර නිසාත් මිනිස්සු නැති වෙනවා."

"වනචාරීන් ද?" ඇය ඇසීය.

"වෙන මොක්කුද?" අසිපත එසවූ නෙඩ් එහි දිගු තලය දෙස බැලීය. "තත්ත්වෙ එන්න එන්නම දරුණු වෙනවා. ළඟදිම දවසක් එනවා, එදාට මට යටත් රදළයො එක්කහු කරන් උතුරට ගිහිල්ලා ප්‍රාකාරෙන් එහා රජ්ජුරුවොත් එක්ක හැප්පෙනවා ඇර වෙන විකල්පක් ඉතුරු වෙන්නෙ නෑ."

"ප්‍රාකාරෙන් එහා පැත්තට?" මේ සිතුවිල්ල නිසා කැට්ලින් වෙවුලන්නට විය.

ඇගේ මුහුණේ පිළිබිඹු වූ භීතිය නෙඩ් දිටී ය. "මැන්ස් රේඩර් කියන්නෙ අපි එච්චර බයවෙන්ට ඕන දෙයක් නෙවෙයි."

"ඊට වඩා භයානක දේවල් ප්‍රාකාරෙන් එහා තියෙනවා."

ඔහු මෘදු සිනහවක් පෑවේය. "ඔයා නාකි ආයම්මගෙ කතාවලට ඕනවටත් වඩා ඇහුම්කන් දෙනවා. අනික් එවුනුත් වනාන්තරයේ දරුවො වගේම අවුරුදු අටදාහකට එහා නැති වෙලා ගියා. මේස්ටර් ලුවින්ගෙන් ඇහුවොත් කියයි එහෙම එවුන් කවදාවත් හිටියෙ නෑ කියලා. කිසිම මිනිහෙක් කවදාවත් එහෙම එකෙක් දැකලා නෑ."

"අද උදේ වෙනකං කිසිම මිනිහෙක් සෝරවෘකයෙක් දැකලා තිබ්බෙත් නෑ." කැට්ලින් ඔහුට සිහිපත් කර දුන්නා ය.

"ටලී කෙනෙක් එක්ක වාද කරන එකේ තේරුමක් නෑ කියලා මං දන්නවා." ඔහු අයිස් නැවත එහි කොපුවේ ලෑවේ ය. "ඔයා මෙතනට ආවෙ මට ඔය පුංචි එවුන්ගෙ කතා කියන්ට නෙවෙයි. ඔයා මෙතනට කැමැති නෑ කියලා මං දන්නවා. මොකක්ද ඔයාගෙ හිතේ තියෙන්නෙ?"

කැට්ලින් ඇගේ සැමියාගේ අත අල්ලාගත්තා ය. "අද හරිම කණගාටුදායක පනිවුඩයක් ලැබුනා මගෙ උතුමානෙනි. ඔයා පිරිසිදු වෙනකං ඔයාට කරදර කරන්ට මට ඕන වුනේ නෑ. මට බොහොම කණගාටුයි මගෙ වස්තුවෙ. ජොන් ඒරින් මැරිලා."

Catelyn Stark: “There are darker things beyond the Wall.”

නෙඩ්ගේ දෑස් ඇගේ දෑස් හා සම්මුඛ වුනු අතර ඇය බලාපොරොත්තු වුනු අයුරින්ම මේ ආරංචිය කෙතරම් දැඩි ලෙස ඔහුට දැනුනේද යන්න ඇය වටහා ගත්තා ය. සිය තරුණ වියේ දී නෙඩ් ඉයරී හි හැදී වැඩුනු අතර දරුවන් නොමැති ඒරින් වංශාධිපතියා ඔහුට හා එහි හැදීවැඩුනු අනෙක් තරුණයා, රොබර්ට් බරතියන්ට දෙවෙනි පියෙකු මෙන් ආදරය දැක්වී ය. පිස්සු රජා, ඒරීස් ටාර්ගේරියන් ඔවුන් දෙදෙනාගේ හිස් ගෙඩි දෙක ඉල්ලූ විට, තමා විසින් රැකවරණය දීමට පොරොන්දු වූ තරුණයන්ව පාවාදෙනවා වෙනුවට ජොන් ඒරින් රජුට විරුද්ධව කැරැල්ලක් ඇරඹීය.

අවුරුදු පහළොවකට පෙර දිනෙක මේ දෙවෙනි පියා ඔහු ගේ සොහොයුරෙක් බවට පත් විය. ඒ ඔහු හා නෙඩ් දෙදෙනා රිවර්රන් හි සප්තක දේවස්ථානයේ දී සොහොයුරියන් දෙදෙනෙකු - හස්ටර් ටලී වංශාධිපතියාගේ දියණියන් දෙදෙනා - විවාහ කර ගැනීමත් සමග ය.

"ජොන්....?? මේ පනිවුඩය ඇත්තක් කියලා සහතිකද?"

"රජතුමාගෙ මුද්‍රාව තිබ්බා. අනික ලියුමෙ අත් අකුරුත් රොබර්ට්ගෙමෙයි. රජතුමා කියනවා ජොන් ඒරින් අසනීප වුනේ හදිසියෙමලු. අඩුගානෙ මේස්ටර් පයිසෙල්ට වත් මොකුත් කරගන්ට ලැබුනෙ නැහැලු. ඒත් එයා පොපි යුෂ දුන්නලු. ඒ නිසා ජොන්ට ගොඩක් කාලයක් දුක් විඳින්ට ලැබුනේ නැහැලු."

"අඩුගානෙ ඒකවත් සැනසීමට කාරණයක්." ඔහු ගේ මුහුණේ තිබුනු ශෝකය ඇය පැහැදිලිවම දිටීය. "ඔයාගෙ සහෝදරී? ජොන් ගෙ පුතා? ඒ අය ගැන මොකද කියලා තියෙන්නෙ?"

"පනිවුඩයෙ තියෙන විදියට එයාලා හොඳින්ලු. එයාලා ඉයරී වලට ගියාලු. ඒ වෙනුවට එයාලා රිවර්රන් වලට ගියානං හොඳයි කියලයි මට හිතෙන්නෙ. ඉයරි කියන්නෙ තනිවෙච්ච තැනක්. අනික ඒක එයාගෙ තැන නෙවෙයි, එයාගෙ මනුස්සයගෙ තැන. ඒකෙ හැම ගලකින්ම මතුවෙන්නෙ ජොන් උතුමානන්ගෙ මතකය. මං දන්නවා මගේ සහෝදරී ගැන. එයාට මේ වෙලාවෙ ඕන කරන්නෙ එයා වටේ ඉන්න නෑදැයන්ගෙයි යාළුවන්ගෙයි සැනසිල්ල."

"ඔයාගෙ මාමා මිටියාවතේ ඉන්නවා නේද? මං අහපු හැටියට ජොන් එයාව වාහල්කඩ නයිට්වරයා විදියට ප්‍රකාශ කලා."

කැට්ලින් හිස සැලී ය. "බ්‍රින්ඩන් එයාට පුළුවන් හැමදෙයක්ම කරයි ඒ දෙන්නා වෙනුවෙන්. ඒක පොඩි සැනසිල්ලක්. ඒ වුනත්...."

"එයා ගාවට යන්ට." නෙඩ් උනන්දුකරවන හඬින් පැවසී ය. "ළමයිනුත් අරන් යන්ට. එයාගෙ ළමයට දැන් ඒ වයසෙ අනික් දරුවන්ගෙ ආශ්‍රය ඕන කරන කාලෙ. ලයිසාට තනියෙන් දුක්වෙන්ට දෙන්ට හොඳ නෑ. ළමයි කෑ ගහන, සිංදු කියන, සෙල්ලං කරන සද්ද බද්ද ඒ මාලිගාව ඇතුළෙ ඇහෙන්ට පටන් ගන්නකොට එයාගෙ තනිකම අඩුවෙලා යයි."

"එහෙම කරන්ට පුළුවන් නං කොච්චර හොඳද?" කැට්ලින් පැවසීය. "ඒ වුනාට ඒ ලියුමෙ තවත් දේවල් ලියලා තියෙනවා. රජතුමා වින්ටර්ෆෙල්වලට එනවා ඔයාව මුනගැහෙන්ට."

ඇගේ වදන් තේරුම් ගැනීමට නෙඩ් ට මඳ වේලාවක් ගතවූ නමුත් අවබෝධය පැමිණි විගස ඒ දෑසේ වූ අඳුර පහවී ගියේ ය. "රොබර්ට් මෙහෙ එනවා?" ඔවු කියන්නට ඇය හිස වැනූ විට ඔහුගේ මුහුණ පුරා සිනාරැල්ලක් විසිර ගියේ ය.

ඔහු ගේ සතුට තමාටත් විඳිය හැකි නම් කෙතරම් අගනේදැ යි කැට්ලින් ප්‍රාර්ථනා කලාය. එනමුදු සෙණ්ඩුවාලුවේ කෙරුනු කතාබහ ඇයට ඇසී තිබින. හිම මත මියගොස් සිටි සෝරවෘකයා හා උගේ උගුරේ ඇනී තිබුනු මුව අං කැබැල්ල. මේ ගැන සිතන්නට සිතන්නට බිය විසින් සර්පයෙකු පරිද්දෙන් ඇයව වෙලාගන්නට විය. එනමුදු එය යටපත් කරගෙන තමා ආලය කරන මේ මිනිසා දෙස සිනහමුසු බැල්මක් හෙලන්නට ඇය සමත් විය. "මං දන්නවා ඔයා ඒ පනිවුඩය නිසා සන්තෝස වෙනවා කියලා. අපි ප්‍රාකාරෙ ඉන්න ඔයාගෙ සහෝදරයටත් පනිවුඩයක් යවමු."

"ඇත්තෙන්ම." ඔහු එකඟ විය. "බෙන්ටත් මෙහේ එන්ට ඕන වෙයි. මම මේස්ටර් ලූවින් ට කියන්නං ලියුමක් එක්ක එයාගෙ වේගවත්ම කපුටා යවන්ට කියලා." නැගිට සිටි නෙඩ් ඇයට නැගිටීමට අත දුන්නේ ය. "හෙනම ගහපිය! අවුරුදු කීයක් ගෙවිලා ගියාද? මේ හාදයා අපට මීට කලින් දැනුම් දෙන්ට එපායැ. එයාගෙ පිරිස කොච්චර එනවද? ලියුමෙ ඒ ගැන මොකුත් කියලා තියෙනවද?"

"මං හිතන්නෙ අඩුම ගානෙ නයිට්වරු සීයක් වත් එයි. එතකොට එයාලගෙ සේවකයො, තවත් අශ්වාරෝහකයො. සෙර්සියි ළමයිනුයිත් එනවලු."

"එහෙමනං රොබර්ට් හෙමින් සැරේ ගමන් කරයි, ළමයි ඉන්න නිසා. ඒක හොඳයි එක අතකට. එතකොට අපට ලෑස්තිවෙන්ට කාලය ලැබෙනවා."

"රැජිනගෙ සහෝදරයොත් ඒ එන පිරිසෙ ඉන්නවලු."

මේ පුවත නිසා නෙඩ් මුහුණ පුළුටු කරගත්තේ ය. ඔහු හා රැජින ගේ පවුල අතර පැවැතියේ එතරම් යහපත් සම්බන්ධතාවක් නොවන බව කැට්ලින් දැන සිටියා ය. කාර්සලී රොක්හි ලැනිස්ටර් වරුන් රොබර්ට් ගේ සහයට පැමිණියේ අවසාන මොහොතේදී, ඔහු යුද්ධය ජයගන්නා බව තිර වූ පසු ය. මේ සම්බන්ධයෙන් ඔහු කිසිදා ඔවුන්ට සමාවක් නොදුනි.

"හොඳයි! රොබර්ට් ගෙ සමාගමයෙ ඉන්ට ඕන එකා ලැනිස්ටර්ලාව ඉවසන්ට පුරුදු වෙන්ට ඕන. ඒකට කරන්ට දෙයක් නෑ. කියන විදියටනං රොබර්ට් රාජසභාවෙන් බාගයක් මෙහෙ කැන්දන් එනවා වගේ."

"රජතුමා යන්නෙ කොහෙද, රාජධානිය ඒ පස්සෙන් යනවා."

"ඒ ළමයි ටික දකින්ට ලැබෙන එක ගැන සන්තෝසයි. පුංචිම එකා මං අන්තිමට දකිද්දි අර ලැනිස්ටර් ගෑනිගෙ ඔඩොක්කුවෙ කිරි බිබී යි හිටියෙ. දැන් එයාගෙ වයස කීයක් ද? පහක් විතර?"

"ටමෙන් කුමාරයට දැන් අවුරුදු හතක්. බ්‍රැන් ගෙ වයසමයි. අනේ කරුනාකරලා නෙඩ්, ඔයාගෙ කට පරිස්සං කරගන්ට. ඒ ලැනිස්ටර් ගෑනි අපේ රැජින. කියන විදියටනං එයාගෙ ආඩම්බරේ අවුරුද්දක් ගානෙ වැඩි වෙනවලු."

නෙඩ් ඇගේ අතක් මිරිකුවේ ය. "ලොකු භෝජන සංග්‍රහයක් තියන්ට වෙයි. ගායකයො ගෙන්නන්ටත් සිද්ධ වෙයි. රොබර්ට් ට දඩයමේ යන්ටත් ඕන වෙයි. මං ජොරීව රජමාවතේ පහළට යවන්ට ඕන එයාලව මුනගැහිලා එක්කරන් එන්ට, ගෞරවයක් විදියට. දෙයියනේ! අපි කොහොමද එච්චර ලොකු සෙනගකට කන්ට දෙන්නෙ? දැනටමත් පිටත්වෙලා කියලයි ඔයා කිවුවෙ නේද? මූ නං යකාටම යන්ට ඕන!"

ඩනේරිස්

ඇගේ සොහොයුරා ගවොම ඉහළට කර ඔසවාගෙන සිටියේ ඇයට එය හොඳින් දැක ගත හැකි වනු පිණිසය. "මේක හරිම ලස්සනයි. එන්ට අල්ලලා බලන්ට මේ රෙද්ද කොච්චර සිනිඳු ද කියලා."

ඩැනී එය අතගෑවාය. එය කෙතරම් සිනිඳු ද යත් ඇගේ අතැඟිලි අතරින් ලිස්සා ගියේ වතුර මෙනි. මෙතරම් සිනිඳු ඇඳුමක් ඈ මීට පෙර කිසිම දිනෙක ඇඳ නොසිටි අතර එය ඇයව බිය පත් කලේය. ඇය වහා තම අත පස්සට ඇද ගති. "මේක ඇත්තටම මට ද?"

"මැජිස්ටර් ඉල්ලීරියෝගෙන් තෑග්ගක්." විසේරිස් සිනාසෙමින් කීවේ ය. අද රෑ ඇගේ සොහොයුරා හොඳ මනෝභාවයකින් සිටී. "මේකෙ පාට නිසා ඔයාගෙ ඇස් දෙකේ දම් පාට තවත් තියුණු වෙලා පේනවා. ඔයාට තව රත්තරන් මුතු මැණික් හෙමත් ලැබෙයි. ඉල්ලීරියෝ පොරොන්දු වුනා. අද රෑ ඔයා කුමාරියක් වගේ පේන්ට ඉන්ට ඕන."

කුමාරියක්! කුමාරියක් යනු කවරාකාරයේ කෙනෙකුදැයි ඇයට අමතක වී ගොසිනි. සමහරවිට ඇය එවැන්නක් කිසිදා නොදැන ඉන්නට ඇත. "ඇයි එයා මෙච්චර දේවල් ගොඩක් අපට දෙන්නෙ? එයා මොනවද අපෙන් බලාපොරොත්තු වෙන්නෙ?" ඇය ඇසුවාය. වසර බාගයකට වඩා මදක් වැඩි කාලයක් තිස්සේ ඔවුහු ඉල්ලීරියෝගේ නිවසේ ජීවත්වෙමින් ඔහුගේ ආගන්තුක සත්කාර භුක්ති විඳිති. නමුදු පෙන්ටොස් නම් වූ මේ නිදහස් නගරයේ එවැනි තෑගි කිසිදු මිලක් හෝ යටි අදහසක් හෝ නොමැතිව නොපැමිණෙන බව තේරුම් ගැනීමට තරම් වසර දහතුනක් වයස් වූ ඩැනී මෝරා සිටියා ය.

"ඉල්ලීරියෝ මෝඩයෙක් නෙවෙයි." විසේරිස් කීය. ඔහු ඇවිස්සුනු එළ නිල් පැහැ දෑසකින් හා ස්නායු කම්පිත දෑතකින් හෙබි කෙට්ටු තරුණයෙකි. "මැජිස්ටර් දන්නවා සිංහාසනේට නැග්ගට පස්සෙ මං මගෙ යාළුවො අමතක කරන ජාතියෙ කෙනෙක් නෙවෙයි කියලා."

ඩැනී කිසිත් කීවේ නැත. මැජිස්ටර් ඉල්ලීරියෝ යනු කුළුබඩු, මුතු මැණික්, මකර අස්ථි සහ තවත් නොයෙකුත් දෑ වෙළෙඳාම් කරන්නෙකි. කට කතාවලට අනුව නම්, ඔහුට නිදහස්

නගර නවයේමත්, ඊට එපිටින් වූ වයෙස් ඩොත්රැක් හා ජේඩ් මුහුද අසබඩ ප්‍රදේශවල පවා මිතුරෝ සිටිති. එලෙසම කට කතාවලට අනුව, නියම මිල පැමිණි විට බොහොම කැමැත්තෙන් විකුණා නොදැමුනු මිතුරෙකුද ඔහුට කෙදිනකවත් නොසිටියේ ය. වීදි වල කෙරෙන කට කතා වලට ඩැනී සවන් දී තිබුනු අතර ඇය මෙවැනි දේ අසා තිබිණි. නමුත් තම සොහොයුරා සිහින ලෝකයේ සැරිසරන මෙවැනි වේලාවට එවැනි අනවශ්‍ය දේ පවසා ඔහුත් සමග වාද නොකිරීමට තරම් ඩැනී ඔහුව තේරුම් ගෙන සිටියා ය. අවදි වුනු විට ඔහු ගේ කෝපය තරම් නරක තවත් දෙයක් නැත. විසේරිස් එයට කීවේ 'මකරා ගේ අවදිවීම' යනුවෙනි.

ඇගේ සොහොයුරා ගවොම දොර පසෙකින් එල්ලුවේ ය. "ඉල්ලීරියෝ වහල්ලු එවයි ඔයාව නාවන්ට. ඔය ඉස්තාල ගඳ නැති කරගන්ට වග බලාගන්ට. ඛාල් ඩ්‍රෝගෝ ට අශ්වයො දාස් ගානක් ඉන්නවා. එයා අද රෑට බලාපොරොත්තු වෙන්නෙ වෙනස් විදියේ වෙළඹක්." ඔහු ඇයව තියුණු ලෙස නිරීක්ෂණය කලේ ය. "ඔයා මොකද ඔය තාමත් උරහිස් එල්ලන් ඉන්නෙ? කෙලින් හිටගන්නවා." ඔහු තම දැතින් ඇගේ උරහිස් පිටුපසට තල්ලු කලේ ය. "එයාලට පෙන්නන්ට ඔයා දැන් ගෑනියෙක් කියලා." ඇගේ වැඩෙන ළැම මතින් යාන්තමට ඇදී ගිය ඔහුගේ අතැඟිලි පයෝධර තුඩක් මත නතර විය. "හොඳින් මතක තියා ගන්ට ඔයා අද රෑ මාව අසමත් කරන්ට එපා. ඔයා එහෙම කලොත් ඒක ඔයාට බොහොම නරකට බලපාවි. ඔයාට මකරව නැගිට්ටවන්ට ඕන නෑ නේද?" ඔහු ඇඟිලි තදින් තෙරපූ අතර ඒ කෙනිත්තීම ඇගේ උඩු කබාය හරහා ඇයව කුරිරු ලෙස රිදවී ය. "ඔවුද නැද්ද?" ඔහු නැවතත් ඇසුවේ ය.

"නෑ." ඩැනී යටහත් පහත් ලෙස පිළිතුරු දුන්නා ය.

ඇගේ සොහොයුරා සිනාසුනි. "බොහොම හොඳයි. මතක තියාගන්ට මගේ ලස්සන නංගි, එයාලා මගේ රාජ්‍ය කාලය ගැන ඉතිහාසය ලියද්දි එයාලා කියයි අද රැයින් තමා ඒක පටන් ගත්තෙ කියලා."

ඔහු පිටව ගිය පසු තම කාමරයේ ජනේලය වෙත ගිය ඩැනී උකටලී ලෙසින් මුහුද බොක්ක දෙස බලා සිටින්නට විය. පෙන්ටොස් හි ගඩොලින් තැනුනු හතරැස් කුළුණු බැස යන හිරු පසුබිමේ කළු පැහැ ඡායා මෙන් දිස් විය. සිය නිශා ගින්න දල්වන රතු පූජකයින් ගේ ගීතිකා ගායනාවන් හා වැරහැලි ඇඳගත් කුඩා ළමුන් වීදියේ ක්‍රීඩා කරමින් නගන ඝෝෂාවත් ඩැනී ට ඇසුණි. නිරුවත් දෙපයින් හා වැරහැලි ඇවටුනු ගතින් යුතුව ඔවුන් හා

එක්වීමට ඇත්නම් කියා එක් මොහොතකට ඇය ප්‍රාර්ථනා කලා ය. අතීතයක් හෝ අනාගතයක් හෝ නැති, බාල් ඩ්‍රෝගෝ ගේ මන්දිරයේ භෝජන සංග්‍රහවලට සහභාගි වීමට නැති නිදහස් ජීවිතයක්!

බසින ඉරට එහා පටු මුහුදෙන් එතෙර කොහේ හෝ තැනක කොළ පැහැ හෙල් හා මලින් වැසී ගිය තැනිතලා හා විසල් ගංගාවන් ගහන, විභූතිමත් අඳුරු නිල් පැහැ කඳු අතරේ අහස උසට නැගුනු බලකොටුවලින් ගැවසීගත්, සන්නාහයෙන් සැරසී සිය වංශාධිපතියාගේ ධජය සෙවණේ යුදට යන නයිට්වරුන්ගෙන් පිරුණු සුන්දර දේශයක් ඇත. ඩොත්රැකිවරු එය රයෙෂ් අන්දාලි හෙවත් අන්දාල්වරුන්ගේ දේශය කියා හැඳින්වූහ. නිදහස් නගරවල මිනිස්සු වෙස්ටෙරෝස් හා හිරු බසින රාජධානි ගැන කතා කීහ. ඇගේ සොහොයුරා එය හැඳින්වූයේ 'අපේ භූමිය' යන සරල නමෙනි. "අපේ ලේ උරුමය. සටකපටි කමෙන් අපෙන් උදුරගත්තු අපේ උරුමය. ඒත් ඒක තාමත් අපටයි අයිති. ඒක හැමදාමත් අපටයි අයිති. කෙනෙකුට මකරුන්ගෙන් හොරකං කරන්ට බෑ. මකරුන්ට හැම දෙයක්ම මතක තියෙනවා." ඔහු කියන්නට පුරුදුව සිටියේ ය.

සමහරවිට මකරාට එය මතක ඇති, එනමුත් ඩැනීට ඒ කිසිවක් මතක නැත. සිය සොයුරා මේ කියන 'අපේ භූමිය' හෝ පටු මුහුදෙන් එතෙර රාජධානිය ඇය කිසිදා දැක නැත. කාර්ස්ටලී රොක් සහ ඉයරී, හයිගාර්ඩ්න් සහ ඒරින් මිටියාවත, ඩෝර්න් සහ මුහුණු දූපත, මේවා ඇයට නිකංම නිකං හිස් වචන ගොඩක් පමණි. කැරැලිකාර හමුදාවල ආගමනය හමුවේ ඔවුන් කින්ග්ස් ලෑන්ඩින්ග්වලින් පලා එද්දී විසේරිස් අට හැවිරිදි වූ අතර ඩනේරිස් ඇගේ මවගේ කුසේ වැඩෙන කලලයක් විය.

නමුත් ඇගේ සොහොයුරා බොහෝ විට ඇයට කියා ඇති විස්තර ඔස්සේ ඇය චිත්ත රූප මවාගන්නට පුරුදුව සිටියා ය. මැදියම් රැයේ ඩ්‍රැගන්ස්ටෝන් කරා පලා යෑම, නැවේ කළු පැහැ රුවල් මත සඳ එළිය වැටී දිලිසුණු සැටි. ඇගේ වැඩිමහලු සොහොයුරා රේගාර් ටාර්ගේරියන්, ගංගා ත්‍රිශූලයේ රුධිරයෙන් නැහැවී ගිය දිය කඳ මැද්දේ 'රාජ්‍යය පැහැර ගත් එකා' හා සටන් වැද තමා ආදරය කල කාන්තාව වෙනුවෙන් දිවි පිදූ සැටි. විසේරිස් විසින් 'රාජ්‍යය පැහැර ගත් එකාගේ බල්ලන්' යනුවෙන් හඳුන්වන ලැනිස්ටර් හා ස්ටාර්ක් වංශාධිපතියන් විසින් කින්ග්ස් ලෑන්ඩින්ග් කොල්ල කෑ සැටි. රේගාර් ගේ උරුමක්කරු වූ කුඩා කුමරුවා ඇගේ තුරුළින් උදුරාගෙන ඇගේ දෑස් ඉදිරියේ මරා දමද්දී ඩෝර්න් හි ඊලියා කුමරිය හඬා වැටුනු සැටි. සිහසුන් කාමරයේ දී රජුන්මරන්නා විසින් සිය රන්වන් අසිපතෙන් ඇගේ පියා ගේ බොටුව සිඳ දැමූ සැටි.

ඔවුන් ගේ පලායාමෙන් මාස නවයකට පසු ගිම්හාන කුණාටුවක් විසින් ඩ්‍රැගන්ස්ටෝන් දූපත උඩුයටිකුරු කිරීමට තැත් කරන අතරතුරේ දී ඇය මෙලොව එළිය දුටුවා ය. කුණාටුව කෙතරම් බලවත් වීද යත් ටාර්ගේරියන් නාවික බලඇණිය වරායේ නවත්වා තිබියදීම සම්පූර්ණයෙන්ම මුහුදුබත් විය. දරු උපතේ දී ඇගේ මව මෙලොව හැර ගිය අතර විසේරිස් ඒ වෙනුවෙන් ඇයට කිසිදා සමාව නොදුනි.

ඇයට ඩ්‍රැගන්ස්ටෝන් ගැන පවා හරිහමන් මතකයක් නැත. රාජ්‍යය පැහැර ගත්තා ගේ සොහොයුරා අලුතෙන් මුහුදු බට සිය නැවු කණ්ඩායමත් සමග දූපත වටලෑමට පෙර ඔවුන්ට එයින්ද පලා ඒමට සිදු විය. වරෙක ඔවුන්ට අයත් ව තිබූ රාජධානි සප්තකයෙන් ඒ වනවිට ඉතිරිව තිබුනේ ඩ්‍රැගන්ස්ටෝන් - ඔවුන්ගේ වංශයේ පෞරාණික මුල් බිම - පමණක් වූ නමුදු එයද වැඩි කලක් ඔවුන් අත රැඳුනේ නැත. බලකොටුවේ ආරක්ෂක භට කණ්ඩායම විසින් ඔවුන්ව මුදලට සතුරාට පාවා දීමට සැලසුම් සැකසෙමින් තිබින. එනමුදු එක් රැයක සෙර් විලෙම් ඩැරී හා තවත් පක්ෂපාතී පුද්ගලයන් සිවුදෙනෙකු රහසේම ඔවුන් දෙදෙනා හා ඔවුන්ගේ කිරි මව ද රැගෙන පලා ගියේ බ්‍රාවෝසියානු මුහුදු වෙරළේ රැකවරණය පතමිනි.

ඇයට සෙර් විලෙම් ගැන මීදුමක් වැනි මතකයක් තිබේ. දැස් අඩක් නොපෙනෙනමුත් සිය ලෙඩ ඇඳේ සිට මහහඬින් ගොරවමින් අන්‍යයන්ට විධාන නිකුත් කල වලසෙක් වැනි දැවැන්ත මිනිසා ඇයට යාන්තමින් මතකය. ඔහු සිය සේවකයින්ට බෙහෙවින් සැරපරුෂ වුවද ඩැනීට අතිශයින් කරුනාවන්ත විය. ඔහු නිතරම ඇය ඇමතූයේ 'පුංචි කුමාරි' නැතහොත් 'මගේ ආර්යාව' වැනි නම් වලිනි. ඒ ඔවුන් බ්‍රාවෝස් වල රතු දොරක් සහිත විසල් නිවසේ පදිංචිව සිටි කාලය යි. එහි ඩැනීට ඇගේම කියා කාමරයක් පවා තිබිනි. සෙර් විලෙම් මියගිය පසු ඔවුන් සතුව ඉතිරිව තිබූ සුළු මුදලත් සේවකයින් විසින් සොරකම් කරන ලද අතර වැඩි කලක් යන්නට මත්තෙන් ඔවුන්ව එම නිවසින් පලවා හැරිනි. එම රතු දොර ඔවුන් වෙනුවෙන් සදහටම වැසුනු දවසේ ඩැනී හැඬුවා ය. එදා පටන් ඔවුන් ගෙවූයේ අභිගුණ්ඨික දිවියකි. බ්‍රාවෝස් සිට ම(ර්) දක්වාත්, ම(ර්) සිට ටයිරෝෂ් දක්වාත්,එතැන් සිට කොහෝර් සහ වොලන්ටිස් සහ ලයිස් දක්වාත් ඔවුන් ගමන් කලේ ඒ කිසිදු තැනෙක වැඩි කලක් නොරැදෙමිනි. ඇයගේ සොහොයුරා එසේ කලේ රාජ්‍යය පැහැර ගත්තා ගේ කුලියට මිනී මරන්නන් ඔවුන් පසු පස එති යි යන තර්කය පදනම් කර ගනිමිනි.

මුලදී නම් මැජිස්ටර්වරුනුත්, වෙළෙඳ කුමාරවරුනුත් අනෙකුත් නගර නායකයනුත් ටාර්ගේරියන් වංශයේ අවසාන සාමාජිකයින් දෙදෙනාව තම නිවෙස්වල ආගන්තුක

සත්කාරයට කැඳවීමට පසුබට වූයේ නැත. නමුත් වසර ගනන් ගෙවී යද්දී, රාජ්‍යය පැහැර ගත්තා තම සිහසුනේ තව තවත් තැන්පත් වෙද්දී මේ දොරවල් එකින් එක වැසී යන්නට වූ අතර ඔවුන් ගේ ජීවිත ක්‍රමයෙන් දුෂ්කර වන්නට විය. වසර කිහිපයකට පෙර ඔවුන්ට තමා සතු අවසාන වස්තු කිහිපය පවා විකුණා දමන්නට සිදු විය. මේ වන විට සිය මවගේ කිරුළ විකුණා ලද මුදල් පවා සියල්ල සිඳී ගොසිනි. පෙන්ටොස්වල මුඩුක්කු, පටු මං හා වයින් සාප්පු වල ඇගේ සොහොයුරා හැඳින්වෙන්නේ 'හිඟන රජා' යනුවෙන් බව ඩැනී දනියි. ඔවුන් ඇයව අමතන්නේ කෙසේදැයි දැනගැනීමටවත් උවමනාවක් ඩැනී ට නැත.

"අපි දවසක ඒ ඔක්කොම ආපහු ගන්නවා මගේ නංගී." ඔහු ඇයට පොරොන්දු විය. "රත්තරන්, මුතු මැණික්, සේද, ඩ්‍රැගන්ස්ටෝන්, කින්ග්ස් ලෑන්ඩින්ග්, යකඩ සිංහාසනය, රාජධානි සප්තකය. අපෙන් ගත්ත මේ හැම දෙයක්ම අපි ආපහු ගන්නවා." විසේරිස් ජීවත් වූයේ ඒ දවස වෙනුවෙනි. ඩනේරිස්ට උවමනා වූ එකම දෙය නම් රතු දොරක් සහිත අර විසල් නිවසත්, ඇගේ කාමරයේ ජනේලයට පිටතින් තිබුනු ලෙමන් ගසත්, ඇයට අහිමිව ගිය ළමා කාලයත් පමණි.

Viserys Targaryen: "When they write the history of my reign, sweet sister, they will say that it began tonight."

දොරට පිටතින් මෘදු තට්ටු කිරීමක් ඇසින. "එන්ට." ඩැනී කීවේ ජනේලයෙන් ඉවතට හැරෙමිනි. ඉල්ලීරියෝ ගේ සේවකයෝ ඇතුළට පැමිණ ඇයට හිස නමා තම රාජකාරිවල නියැලෙන්නට වූහ. සැබැවින්ම නම් ඔවුහු මැජිස්ටර් සිය ඩොත්රැකි යහළුවන්ගෙන් තෑගි ලෙස ලද වහලුන් වූහ. පෙන්ටොස්වල නීත්‍යානුකූලව වහල් මෙහෙයක් නොමැති වුවද ඔවුහු වහලුන් වූහ. පුංචි අළු පැහැ මීයකු මෙන් වූ නාකි ගැහැණිය කිසිදු දිනෙක වචනයක් හෝ නොදෙඩුවත් නිල් දෑසක් හිමි දහසය හැවිරිදි වූ අනික් දැරිය වැඩ පල අතරේ දෙදෙනාටම ඇතිවන තරමට තොරතෝංචියක් නොමැතිව දෙඩෙවුවා ය.

නාන බාල්දිය උණු වතුරෙන් පිරවූ ඔවුහු එයට සුවඳ කැවූ තෙල් මුසු කලහ. දැරිය ඩැනීට නාන බාල්දියට බැසීමට උදවු කලාය. වතුර පිලිස්සෙන තරමට උණුසුම් වුවත් ඩනේරිස් ඇකිලුනේ හෝ වේදනාවෙන් කෑ ගැසුවේ හෝ නැත. ඇය උණුසුමට ප්‍රිය කල අතර එය ඇගේ සිතේ පිරිසුදු හැඟීමක් ඇති කරන ලදී. අනික් අතට ඇගේ සොහොයුරා නිතර කියා

ඇති පරිදි ටාර්ගේරියන්වරුන්ට කෙදිනකවත් උණුසුම දැඩි වූයේ නැත. "අපි පැවතෙන්නේ මකරුන් ගේ වංශයෙන්. අපේ ලේ වල තියෙන්නෙ ගින්දර." මේ ඔහු නිතර පැවසූ වදනකි.

නාකි ගැහැණිය කිසිදු කතා බහකින් තොරව ඩැනී ගේ දිගු රිදී පැහැ වරලස සෝදා පිරිසුදු කලාය. දැරිය ඇගේ පිට හා දෙපා අතුල්ලන අතරේ දෙඩෙව්වේ ඩැනී කෙතරම් වාසනාවන්තද යන්නයි. "ඩ්‍රෝගෝ කොච්චර පොහොසත් ද කියනවානං එයාගෙ වහල්ලු පළඳින්නෙත් රත්තරන් කර පටි. එයා ගෙ ඛලසාර් එකේ මිනිස්සු ලක්ෂයක් ඉන්නවා. වයෙස් ඩොත්රැක් වල තියෙන එයාගෙ මාලිගාවෙ කාමර දෙසීයක් තියෙනවා. ඒකෙ දොරවල් ඔක්කොම හදලා තියෙන්නෙ රිදියෙන්." ඇය තවත් මෙවැනි බොහෝ දේ දෙඩෙව්වා ය. ඛාල් කෙතරම් කඩවසම් ද, කෙතරම් උස ද, කෙතරම් ප්‍රචණ්ඩ ද, යුද්ධයේ දී කෙතරම් නිර්භීත ද, අසුන් මෙහෙයවීමට කෙතරම් දක්ෂ ද, ඔහු ගේ ධනු ශිල්පය කෙතරම් අපූරුද. ඩනේරිස් කිසිවක් නොකියා නිහඬවම සිටියා ය. ඇය සැමදාමත් සිතුවේ නිසි වයස් පැමිණි පසු ඇය විසේරිස් හා විවාහ වනු ඇති බවයි.

ජයග්‍රාහක ඒගොන් සිය සොයුරියන් දෙදෙනා විවාහ කර ගත් දා පටන් සියවස් ගණනාවක් තිස්සේ ටාර්ගේරියන්වරු විවාහ වූයේ සොයුරු සොයුරියන් සමගය. විසේරිස් ඇයට දහස් වරක් කියා ඇති පරිදි ඔවුන් සිය පරම්පරාව පිරිසුදුව තබා ගත යුතු විය. ඔවුන්ට තිබුනේ රාජකීය රුධිරය යි, වැලීරියාවේ රන්වන් රුධිරය යි, මකරුන් ගේ රුධිරය යි. මකරුන් කෙදිනකවත් වනාන්තරයේ අනෙකුත් සතුන් හා සහවාසයේ යෙදුනේ නැත. එලෙසින්ම ටාර්ගේරියන්වරුත් කෙදිනකවත් සිය රුධිරය වෙනත් මිනිසුන් ගේ රුධිරය හා මුසු කෙරුවේ නැත. එනමුත් දැන් විසේරිස් ඇයව නාඳුනන ම්ලේච්ඡයෙකුට විකිණීමට සැරසෙයි.

නා හමාර වූ පසු ඇයට නාන බාල්දියෙන් බැසීමට උදවු කල වහලුන් දෙදෙනා ඇයව පිසදාන්නට වූහ. ඉන්පසු දැරිය ඇගේ දිගු කෙහෙරැළි රිදී පැහැ දිය ඇල්ලක් මෙන් කඩා හැලෙන තෙක් පීරන්නට වූ අතර නාකි ගැහැණිය ඩොත්රැකි තැනිතලාවේ සුසන්ධ පුෂ්පයෙන් නිමවූ සුවඳ විලවුන් ඇගේ ගත ගැල්වූවා ය. අවසානයේ දී මැජිස්ටර් ඉල්ලීරියෝ විසින් එවන ලද ගවොම ඈ ගත දැවටූහ. කුඩා මිරිවැඩි සඟලකින් ඇගේ දෙපා වැසූ ඔවුහු හිස මත කුඩා ඔටුන්නක් රඳවා ඇමතේස්ත එබ්බවූ සණ රන් වළලු වලින් ඇගේ දෑත් සැරසූහ. ඒ සියල්ලටම පසු පුරාණ වැලීරියන් මිණියමින් සැරසූ රන්වන් කර පටියක් ඇයට පැලැන්දූහ.

"දැන් නං ඔබ නියමටම කුමාරිකාවක් වගේ." දැරිය පැවසුයේ මේ සැරසිලි සියල්ල හමාර වූ පසුව ය. දර්පණයෙන් පෙනෙන තම ප්‍රතිබිම්බය දෙස ඩැනී බැල්මක් හෙලුවා ය. කුමාරියක්! නමුත් ඇයට සිහිපත් වූයේ දැරිය කලින් පැවසූ වදන් ය. 'ඛාල් ඩ්‍රෝගෝ කොච්චර පොහොසත් ද කියනවානං එයාගෙ වහල්ලු පළඳින්නෙත් රත්තරන් කර පටි.' මේ ගැන සිතත්ම ඇගේ සිරුර පුරා සීතලක් දිවයන්නට වූ අතර නිරාවරණයවී තිබුනු දැත පුරා හී ගඩු පිපෙන්නට විය.

ඇගේ සොහොයුරා පිටත ශාලාවේ පොකුණු ගැට්ට මත වාඩි වී බලා සිටියේ ය. ඇය පිටතට පැමිනෙත්ම නැගී සිටිය ඔහු විමර්ශනාත්මක බැල්මෙන් ඇයව නිරීක්ෂණය කරන්නට විය. "ඔහොම හිටගන්ට. රවුමක් කැරකෙන්ට. අන්න එහෙම. නියමයි. ඔයා පේන්නෙ හරිම...."

"රාජකීය තාලෙට." මැජිස්ටර් ඉල්ලීරියෝ පැවසුයේ ආරුක්කු මගට අවතීර්ණ වෙමිනි. ඔහු ඇවිද්දේ සිය දැවැන්ත ශරීරයට නොගැලපෙන තරමේ විස්මයජනක ලාලිත්‍යයකිනි. "අද මේ වාසනාවන්ත දවසේ ආලෝකයේ දෙවියන් වහන්සේ ඔහුගේ ආශීර්වාදයෙන් ඔබව තෙමනු ලැබේවා ඩනේරිස් කුමරියනි!" මැජිස්ටර් පැවසුයේ ඇගේ අතකින් අල්ලා ගනිමිනි. ඔහු හිස මඳක් ඇල කර ඇයට ආචාර කලේ යාන්තමට මුව විවර කල සිනහවක්ද සමගිනි. "ඇය නිකං හීනයක් වගේ මගේ ස්වාමීනී. හීනයක් වගේ." ඔහු විසේරිස් අමතා කීය. "ඩ්‍රෝගෝ සන්තෝසයෙන් ප්‍රමුදිත වෙයි."

"එයා හරිම කෙට්ටුයි නේ." විසේරිස් කීය. ඉල්ලීරියෝ විසින් ඔහුට ලබා දුන් අසිපතේ මිට මත ඔහු තම අත රඳවාගෙන සිටියේ ය. "ඔයාට හොඳටම විශ්වාසද ඛාල් ඩ්‍රෝගෝ මෙච්චර තරුණ ගෑනියෙකුට කැමැති වෙයි කියලා?"

"එයා වැඩිවිය පැමිණි කෙල්ලක්. මේ හොඳටම වයස ඇති." ඉල්ලීරියෝ ඔහුගේ සැක දුරු කලේ මුල්ම වරට නොවේ. "බලන්ටකො එයා දිහා. මේ රිදී පාට කොණ්ඩෙ, මේ දම් පාට ඇස්... එයාගෙ ඇඟේ දුවන්නෙ පුරාණ වැලීරියාවෙ ලේ, ඒ ගැන කිසිම සැකයක් නෑ, කිසිම සැකයක් නෑ... උසස් උපතක්, පරණ රජතුමාගෙ දුව, අලුත් රජතුමාගෙ සහෝදරී. එයාට අපේ ඩ්‍රෝගෝව සතුටු කරන්ට බැරි වෙන එකක් නෑ." ඩැනී ට වැටහුනේ ඇගේ සිරුර වෙවුලමින් තිබෙන බවයි.

"මං හිතනවා." ඇගේ සොහොයුරා අතිරණාත්මක ස්වරයෙන් පැවසී ය. "ඔය ම්ලේච්ඡයන්ට තියෙන්නෙ අසාමාන්‍ය රුචියක්. පිරිමි ළමයි, අශ්වයො, බැටළුවො..."

"ඛාල් ඩ්‍රෝගෝ ඉස්සරහදී ඔහොම කතා කියන්නෙ නැතුව කට පරිස්සං කරන් ඉන්නවනං හොඳයි." ඉල්ලීරියෝ පැවසීය.

ඇගේ සොයුරා ගේ දෑස් කේන්තිය නිසා දීප්තිමත් විය. "මං මෝඩයෙක් කියලද හිතන්නෙ?"

මැජිස්ටර් මඳක් හිස නැමීය. "ඔබ රජෙක් කියලයි මං හිතන්නෙ. රජවරු සාමාන්‍ය මිනිස්සු දෙන අවවාද උපදෙස් පිළිපදින්නෙ නෑ නෙ. මට සමාවෙන්ට මං වැරැද්දක් කිවුවා නං." ආපසු හැරුනු ඔහු සේවකයන් කැඳවීම සඳහා අත්පොඩි තැළී ය.

ඔවුන් ඉල්ලීරියෝ ගේ දෝලාවේ නැගී පිටත්වන විට පෙන්ටොස් වල වීදි අඳුරෙන් පිරී තිබින. පන්දම් අතින් ගත් සේවකයින් දෙදෙනෙකු පෙරටුව ගමන් ගත් අතර තවත් දූසිමක් පමණ දෝලාව ඔසවාගෙන ඒ පසුපස්සෙන් වැටින. දෝලාවේ වැසුණු තිර වලට පිටුපසින් ඩැනී ට උණුසුම් බවක් දැනින.

පසෙකින් කොට්ට මත දිග ඇදී සිටි ඇගේ සොහොයුරා ගේ සිත තිබුනේ පටු මුහුදෙන් එහා ය. "අපට මිනිහගෙ මුළු ඛලසාර් එකම ඕන වෙන්නෙ නෑ." විසේරිස් කීවේ කඩු මිට මත ඇතැඟිලි දුවවමිනි. එනමුදු ඔහු කිසිදා සටනක් පිණිස කඩුවක් භාවිත නොකල බැව් ඩැනී දැන සිටියා ය. "දහදාහක්. ඒ ටික ඇති වෙයි. ඩොත්රැකි සොල්දාදුවො දහදාහක් එක්ක මට පුළුවන් රාජධානි සප්තකය අතු ගාලා දාන්ට. නියම උරුමක්කාරයා වෙනුවෙන් රාජධානිය නැගී හිටියි. ටිරල්, රෙඩ්වින්, ඩැරී, ග්‍රේජෝයි මේ මිනිස්සුන් ගෙ කිසිම ආදරයක් නෑ රජකම පැහැර ගත්ත එකා ගැන. ඩෝර්නිෂ්වරු බලාගෙන ඉන්නෙ ඊලියාගෙ යි එයාගෙ දරුවන්ගෙ යි පලිය ගන්ට. සාමාන්‍ය ජනතාවත් අපි එක්කයි. එයාලා බලාපොරොත්තුවෙන් ඉන්නෙ එයාලගෙ රජතුමා එනකං." ඔහු තැවිලි සහගත දෑසින් ඉල්ලීරියෝ දෙස බැලීය. "එහෙම නේද?"

"ඒ ඔබේ ජනතාව. ඔවුන් ඔබට ආදරෙයි." මැජිස්ටර් ඉල්ලීරියෝ මිත්‍රශීලී ලෙසින් පැවසී ය. "රාජධානිය පුරාවටම බලකොටුවල මිනිස්සු ඔබ වෙනුවෙන් හොර රහසේ සවුදිය පුරනවා. ගැහැණු මකර කොඩි මහලා හංගන් ඉන්නෙ ඔබ මුහුදෙන් එතෙර වෙලා එන දවස වෙනකං. මගේ ඒජන්තයො එහෙමයි කියන්නෙ."

ඩැනී ට කිසිදු ඒජන්තයෙකු නොවී ය. එමෙන්ම පටු මුහුදෙන් එහා සිදුවන දේ හෝ මිනිසුන් ගේ සිතුම් පැතුම් හෝ දැනගැනීමේ ක්‍රමයක් ද නොවී ය. නමුත් ඇය ඉල්ලීරියෝ සම්බන්ධ සියළු දේම සැක කලා මෙන් ඔහු ගේ මේ මිහිරි වදන් ද සැක කලා ය. එසේ වුවද ඇගේ සොහොයුරා ඒ සෑම වදනක්ම උරා බීවේ උනන්දුවෙන් හිස සලමිනි. "රජකම පැහැරගත්ත එකා මං මගේ අතින්ම මරලා දානවා." ඔහු පොරොන්දු විය. එනමුදු ඔහු මේ වන තෙක් කිසිදිනෙක කිසිවෙකු මරා දමා නොතිබිනි. "හරියට ඌ මගෙ සහෝදරයා රේගාර් මරලා දැම්මා වගේම. ලැනිස්ටර්වත් මරලා දානවා. රජුන්මරන්නා වත්, ඌ මගෙ තාත්තට කරපු දේට."

"ඒක තමා සුදුසුම දේ." ඉල්ලීරියෝ පැවසී ය. ඔහු ගේ දෙතොල් මත පොපියන සියුම් සිනාවක් ඩැනී දුටුවත් ඇගේ සොහොයුරා ඒ නොදිටී ය. හිස සැලූ ඔහු තිරය මෑත් කර පිටත රාත්‍රිය දෙස බලන්නට විය. ඔහු නැවතත් සිත ඇතුළෙන් ත්‍රිශූලය අසල සටන මෙනෙහි කරන බැව් ඩැනී දැන සිටියා ය.

Viserys Targaryen: "Do you take me for a fool?"

Illyrio Mopatis: "I take you for a king."

ඉත්ත වැලින් වැසී ගිය උස ප්‍රාකාරයකින් වට වුනු කුළුණු නවයකින් සන්නද්ධ වූ බාල් ඩ්‍රෝගෝ ගේ මන්දිරය මුහුදු බොක්ක අද්දර පිහිටියේ ය. ඉල්ලීරියෝ පැවසූ අන්දමට එය ඔහුට ලබා දී තිබුනේ පෙන්ටොස්හි මැජිස්ටර්වරුන් විසිනි. මේ නිදහස් වෙළෙඳ නගර සෑම විටම අස්හිමියන් වූ ඩොත්රකිවරුන්ට ත්‍යාගශීලී විය. "ඒකෙන් කියවෙන්නෙ නෑ අපි මේ ම්ලේච්ඡයන්ට බයයි කියලා." ඉල්ලීරියෝ සිනහ මුසු මුහුණින් පැහැදිළි කලේය. "රතු පූජකයො පොරොන්දු වෙන අන්දමට නං ආලෝකයේ දෙවිඳුන් අපේ නගර ප්‍රාකාර ආරක්ෂා කරනවා ඩොත්රකිවරු මිලියනයක් ආවත්.... ඒත් මොකටද නිකං අවදානමක්

ගන්නෙ, අපට බොහොම අඩු මුදලකට එයාලගෙ මිත්‍රත්වය සල්ලි දීලා ගන්ට පුළුවන් නං."

ගේට්ටුව අබියස දී ඔවුන් ගේ දෝලාව නවත්වනු ලැබූ අතර මන්දිරාරක්ෂක බලකායේ සෙබළෙකු විසින් දෝලාවේ තිරය දෙපසට අදිනු ලැබී ය. ඔහුට ඩොත්රකිවරුන්ට මෙන් තඹ පැහැ සමක් හා ආමන්ඩ් පැහැ දෑසක් තිබුනු මුත් ඔහු පැළඳ සිටියේ නිකැලැල් බලකායට අයත් උලක් සහිත පිත්තල හිස්වැසුමකි. සෙබළා මේ අමුත්තන් දෙස සීතල බැල්මක් හෙලුවේ ය. මැජිස්ටර් ඉල්ලීරියෝ ඔහුට රළු ඩොත්රකි බසින් යමක් පැවසූ අතර ඒ බසින්ම පිළිවදන් දුන් සෙබළා ඔවුන්ට ඇතුළුවන ලෙස සන් කලේ ය.

සිය සොහොයුරා කඩු මිට තරයේ අල්ලාගෙන සිටිනු ඩැනී දුටුවා ය. ඔහුද ඇය තරමටම බිය පත් වූ සෙයකි. "ගරු සරු නැති නපුංසකයා." විසේරිස් කටු කුටු ගෑවේ දෝලාව මන්දිරය දෙසට ඇදෙද්දී ය.

"අද රෑ භෝජන සංග්‍රහයට වැදගත් මිනිස්සු ගොඩ දෙනෙක් එනවා. එහෙම මිනිස්සුන්ට සතුරොා ඉන්නවා. බාල් එයාගෙ අමුත්තන්ට ආරක්ෂාව සපයන්ට ඕන. ඔබත් ඇතුළුව මගේ ස්වාමිනී. ඔබේ හිසට හොඳ මිලක් ගෙවන්ට රාජ්‍යය පැහැර ගත්ත එකා සූදානම්."

"ආ ඇත්තමයි! මිනිහා මීට කලිනුත් උත්සාහ කලා ඉල්ලීරියෝ. මිනිහගෙ කුලියට මිනී මරන එවුන් අපිව හැමතැනකම លුහුබැන්දා. මං තමා අන්තිම මකරා. මං ජීවත් වෙලා ඉන්නකං මිනිහට ලේසියෙන් නින්ද යන එකක් නෑ."

දෝලාව නතර විනි. තිරය දෙපසට මෑත් වූ අතර වහලෙක් ඩැනීට බිමට බැසීම පිණිස අත දිගු කලේ ය. වහල් දැරිය කියූ පරිදි ඔහු ගේ කරපටිය රනින් නොව පිත්තලින් නිමවුනු එකක් බව ඩැනී නිරීක්ෂණය කලාය. තවමත් අසිපත් මිට මත එක් අතක් රඳවා ගත් ඇගේ සොහොයුරා ඇය පසුපසින් බිමට බට අතර මැජිස්ටර් ඉල්ලීරියෝ ගේ දැවැන්ත ශරීරය නැවත දෙපයින් සිටවීම සඳහා ශක්තිමත් මිනිසුන් දෙදෙනෙකු ගේ සහය අවශ්‍ය විය.

මන්දිරය තුළ වාතය කුළුබඩු සුවඳින් ද, මිහිරි ලෙමන් හා කුරුඳු සුවඳින් ද බර විය. වැලීරියාවේ විනාශය දැක්වෙන වර්ණවත් වීදුරුවෙන් නිමවූ කැටයමකින් අලංකාර වූ

ඇතුළුවීමේ ශාලාවක් තුළින් ඔවුන්ව මන්දිරය තුළට කැඳවාගෙන යන ලදී. බිත්ති පුරා යකඩින් තැනූ ලන්තෑරුම් එල්ලා තිබුනු අතර ආරුක්කුවක් යට සිටගෙන සිටි නපුංසකයෙකු විසින් ඔවුන් ගේ පැමිණීම සභාවට දැනුම් දෙන ලදී. "අන්දාල් වරුන්ගේ ද, රයිනාර් වරුන්ගේ ද, මුල් මිනිසුන්ගේ ද රජු වන, රාජධානි සප්තකයේ ස්වාමියා හා ආරක්ෂකයා වන, ටාර්ගේරියන් වංශයේ විසේරිස්, එම නමින් යුත් තුන්වැනියා. ඔහුගේ සහෝදරිය හා ඩ්‍රැගන්ස්ටෝන්හි කුමරිය වන ඩනේරිස් ස්ටෝර්ම්බෝර්න්. ඔවුන් ගේ ගෞරවනීය සත්කාරකයා වන පෙන්ටොස් නිදහස් නගරයේ මැජිස්ටර් ඉල්ලීරියෝ මොපාටිස්."

නපුංසකයා පසු කල ඔවුහු ඉත්ත වැලින් වැසුනු කුළුණු සහිත අංගනයකට පිවිසුනහ. එහි සිටි අමුත්තන් බොහෝ දෙනෙකු රතු-දුඹුරු සමින් යුතු දැවැන්ත ඩොත්රැකි අස්හිමියෝ වූහ. ඔවුන් ගේ එල්ලී වැටෙන විශාල උඩුරැවුල් යකඩ මුදු වලින් වෙලා තිබුනු අතර මනාව තෙල් ගා දිගට ගොතන ලද ඔවුන් ගේ කේශ කලාප කුඩා සීනු වලින් අලංකාර විය. එනමුදු ඔවුන් අතරේ එහා මෙහා ගිය අනිකුන් අතර පෙන්ටොස් හා ම(ර්) හා ටයිරෝෂ් වලින් පැමිණි කුලී හේවායින් හා වණ්ඩින් ද, ඉල්ලීරියෝට ද වඩා මහත රතු පූජකයෙක් ද, ඉබ්න් තොටමුණෙන් පැමිණි ලොමින් වැසුනු මිනිසුන් ද, කළුවර මෙන් කළු පැහැ සමෙන් යුත් ගිම්හාන දූපත්වලින් පැමිණි වංශාධිපතියන් ද වූහ. ඔවුන් සියලු දෙනා දෙසම විස්මයෙන් ඇලලී බලා සිටි ඩනේරිස් ට හදිසියේම වැටහී ගියේ ඔවුන් අතර සිටි එකම කාන්තාව තමා පමණක් බවයි.

ඉල්ලීරියෝ කෙඳිරුවේ ය. "අර අතන ඉන්නෙ ඩ්‍රෝගෝ ගෙ ප්‍රධාන ආරක්ෂකයින් තුන්දෙනා. අර කණුව ගාව ඉන්නෙ බාල් මොරෝ එයාගෙ පුතා රොගොරෝ එක්ක. අර කොළ පාට රැවුලක් තියෙන කෙනා ටයිරෝෂ්වල ආර්කන් ගෙ සහෝදරයා. එයාට පිටිපස්සෙන් ඉන්නෙ සෙර් ජෝරා මෝර්මන්ට්."

මේ අවසාන නම ඩැනී ගේ අවධානය පැහැර ගත්තේ ය. "නයිට්වරයෙක්?"

"කිසිම අඩුවක් නැතුව." ඉල්ලීරියෝ සිනාසුනි. "ප්‍රධාන පූජකයාම සප්තාලේපනයෙන් අභිෂේක කරපු කෙනෙක්."

"එයා මොනවද මෙහෙ කරන්නෙ?" ඇය ඇසී ය.

"රජ්ජුරුවන්ට එයාගෙ ඔළු ගෙඩිය උවමනා වෙලා තියෙනවා. බොහොම සුළු නොවැදගත් දේකට. එයා අල්ලගත්ත හොර දඩයක්කාරයො කීප දෙනෙක් නිශා රැකුම් බලකායට බාරදෙන්නෙ නැතුව ටයිරෝෂි වහල් වෙළෙන්දන්ට විකුණලා තියෙනවා. ඒක මහ මෝඩ නීතියක්. මිනිහෙකුට එයාට අයිති බඩුබාහිරාදියට කැමැති දෙයක් කරන්ට පුළුවන්."

"අද රෑ ගෙවෙන්ට කලින් මට සෙර් ජෝරාට කතා කරන්ට ඕන." ඇගේ සොහොයුරා පැවසී ය. ඩැනී නයිට්වරයා දෙස කුතුහලයෙන් බැලුවා ය. ඔහු වයස හතලිහ ඉක්ම වූ, තට්ටය පෑදීගෙන එන එනමුදු ශක්තිමත් පුද්ගලයෙකි. සේද හා කපු පිළි වෙනුවට ඔහු ලොමින් හා සමින් කල ඇඳුම් වලින් සැරසී සිටියේ ය. ඔහු ගේ උඩු කබාය තද කොළ පැහැති වූ අතර එහි දෙපයින් සිට ගත් වලසෙකු ගේ රූපයක් ගෙත්තම් කර තිබින.

තමා කිසිදා නොදත් නොදුටු මවුබිමෙන් පැමිණි මේ ආගන්තුක පුද්ගලයා දෙස ඩැනී බලා සිටිය දී මැජිස්ටර් ඉල්ලීරියෝ ඇගේ උරහිස මත අතක් තැබී ය. "අන්න අර අතන ඉන්නෙ කුමරියනි, ඛාල් ඩ්‍රෝගෝ තමා." ඔහු කෙඳිරී ය.

මුලින්ම ඩැනීට උවමනා වූයේ දිව ගොස් කොහේ හෝ සැඟවීමට ය. නමුත් ඇගේ සොයුරා ඇ දෙස බලා සිටින අතර ඔහු අසතුටට පත් වුවහොත් මකරා අවදිවන බව ඈ දනී. තැවිලි සහගත සිතින් ආපසු හැරුනු ඈ විසේරිස් විසින් තමාව විවාහ කරදීමට සූදානම් වන පුද්ගලයා දෙස බැලීය.

වහල් දැරිය කියූ දේවල් වැරැදි නැති බව ඇයට සිතිනි. ඛාල් ඩ්‍රෝගෝ ශාලාවේ සිටි උසම මිනිසාටත් වඩා අඩියක් පමණ උස් විය. එනමුදු ඔහු කෙතරම් සැහැල්ලු ලෙසින් කෙතරම් සුනම්‍ය ලෙසින් ඇවිද්දේ ද යත් ඩැනී ට සිහි වූයේ අඳුන් දිවියෙකි. ඔහුට ඇය සිතූ තරම් වයසක්ද නැත, උපරිම වසර තිහක් පමණ. ඔහු ගේ සම දිදුලන තඹ පැහැති ය. ඔහු ගේ ඝණකම් උඩුරැවුල රන් හා පිත්තල මුදු වලින් බැඳ සරසා ඇත.

"මං ගිහින් එයාට කතා කරලා එන්නං." ඉල්ලීරියෝ පැවසී ය. "ඔයාලා මෙතනම ඉන්ට. මං එයාව ඔයාලා ගාවට එක්කන් එන්නං."

ඉල්ලීරියෝ බාල් වෙත යන අතරතුරේ දී විසේරිස් ඇගේ බාහුවෙන් අල්ලා ගත්තේ ය. "ඔයාට එයාගෙ දිග කොණ්ඩෙ පේනවද නංගී?"

ඩ්‍රෝගෝ ගේ දිග කොණ්ඩය රාත්‍රිය මෙන් කළු පැහැ වූ අතර සුවඳ තෙලින් නහවා තිබිනි. ඔහු ඇවිදින විට එහි රඳවා තිබුනු කුඩා සීනු මිහිරි නාද නැංවී ය. එය ඔහු ගේ ඉණ පටියෙනුත් පහළට දිගු වූ අතර අග්‍රය කලවයේ පසුපස ස්පර්ශ කලේ ය.

"ඔයාට පේනවද ඒක කොච්චර දිග ද කියලා?" විසේරිස් ඇසී ය. "ඩොත්රැකියෙක් යුද්ධෙන් පැරදුනොත් ඒ අවඥාව නිසා එයාලා කොණ්ඩෙ කපනවා. බාල් ඩ්‍රෝගෝ කවදාවත් යුද්ධෙකින් පැරදිලා නෑ. මකරාධිපති ඒගොන් ආයෙමත් ආවා වගෙයි. ඔයා එයාගෙ රැජිණ වෙන්නයි යන්නෙ."

ඩැනී බාල් ඩ්‍රෝගෝ දෙස බැලුවා ය. ඔහු ගේ මුහුණ දැඩි එමෙන්ම කුරිරු එකක් විය. ඒ දෑස් සීතල අගත්ති මෙන් තද පැහැ විය. ඇගේ සොහොයුරා සමහරවිට - විශේෂයෙන්ම ඇය ඔහු ගේ මකරා අවදි කල විට - ඇයට රිදවූවද බාල් ඩ්‍රෝගෝ ඇගේ සිත තුළ ඇති කල භීතිය තරම් බියක් ඔහු නිසා කෙදිනකවත් ඇගේ සිතේ ඇති නොවී ය. "මට එයාගෙ රැජිණ වෙන්ට ඕන නෑ." ඇය සිහින් බියපත් හඬින් කොඳුලා ය. "අනේ කරුනාකරලා විසේරිස්. මට නං බෑ. මට ගෙදර යන්ට ඕන."

"ගෙදර?" ඔහු කටහඬ පහත් කලද ඒ ස්වරයේ තිබුනු කේන්තිය ඇයට දැනුනි. "අපි කොහොමද ගෙදර යන්නෙ නංගී? උං අපේ ගෙදර අපෙන් උදුරගත්තා." අන්‍යයන්ට නොපෙනෙන අඳුරු සෙවනැල්ලක් යටට ඔහු ඇ ඇදගෙන ගියේ ය. ඔහු ගේ අතැඟිලි ඇගේ බාහුවේ සමට කා වැදී ඇයට රිද්දුවේ ය. "අපි කොහොමවද ගෙදර යන්නෙ?" ඔහු නැවත ඇසීය.

ඩැනී ගෙදර යනුවෙන් අදහස් කලේ කින්ග්ස් ලැන්ඩින්ග් හෝ ඩ්‍රැගන්ස්ටෝන් හෝ ඔවුන්ට අහිමි වූ රාජධානිය නොව ඉල්ලීරියෝ ගේ වතුයායේ ඔවුන්ට වෙන් කර තිබුනු කාමර පෙළ යි. නමුදු ඇගේ සොහොයුරාට එය ගෙදරක් නොවී ය. අඩුම ගනනේ රතු දොරකින් යුතු විසල් නිවස පවා ඔහුට ගෙදරක් නොවී ය. ඔහු ගේ අතැඟිලි තව තවත් තදින් ඇගේ මසට කා වැදින. "මං දන්නෙ නෑ." අවසානයේ දී ඇය කඳුළු පිරි දෑසින් හා බිඳුනු හඬින් කීවා ය.

"මං දන්නවා." ඔහු කීය. "අපි ගෙදර යන්නෙ හමුදාවක් එක්ක නංගී. ඛාල් ඩ්‍රෝගෝ ගේ හමුදාවත් එක්ක. අන්න එහෙම තමා අපි ගෙදර යන්නෙ. ඒ වෙනුවෙන් උඹට ඌව බඳින්ට වෙනවා නං, උඹට උගෙ ඇඳට නගින්ට වෙනවා නං උඹ ඒක කරනවා." ඔහු ඇය දෙස බලා සිනාසුනි. "මට මගෙ හමුදාව ලැබෙනවානං ඒ වෙනුවෙන් උගෙ මුළු බලසාර් එකම සතුටු කරන්ට වුනත් මං උඹව දෙනවා. හතලිස් දාහක් හමුදාවට යි ඕන වුනොත් උංගෙ අශ්වයින්ට යි හැමෝටම. උඹ සතුටු වෙයං උඹව දෙන්නෙ ඩ්‍රෝගෝට විතරක් නිසා. කාලයක් යද්දී උඹ ඌට කැමැති වෙන්ටත් පුළුවන්. දැන් ඔය කඳුළු පිහිදා ගනිං. අන්න ඉල්ලීරියෝ ඌත් එක්ක මෙහාට එනවා. උඹ අඬ අඬා ඉන්නවා ඌට පෙන්නන්ට මට ඕන නෑ."

ආපසු හැරුනු ඩැනී දුටුවේ එය සැබෑවක් බවයි. මැජිස්ටර් ඉල්ලීරියෝ මුව පුරා සිනාසෙමින්, හැකි සෑමවිටම දෙකට නැවෙමින් ඛාල් ඩ්‍රෝගෝව ඔවුන් සිටින දෙසට කැඳවාගෙන එමින් සිටියේ ය. ඇය දෑසේ කඳුළු බිඳු පිටි අත්ලෙන් පිසදා හැරියා ය.

"හිනාවෙයං." විසේරිස් කෙඳිරී ය. ඔහු ගේ අත අසිපත් මිට මතට ලිස්සා ගියේ ය. "අනික කෙලින් හිටගනිං. ඌට පෙන්නපං උඹට හොඳ හැඩ ඇඟක් තියෙනවා කියලා."

ආයාසයෙන් සිනහවක් මුවට නගා ගත් ඩනේරිස් කඳ කෙලින් කොට සිට ගත්තා ය.

Viserys Targaryen: "How are we to go home, sweet sister? They took our home from us!"

එඩාර්ඩ්

තුන්සියයක් පමණ වූ අමුත්තන් පිරිස - රජුගේ ධජපතාක දරන්නන් හා නයිට්වරුන්, රජුට පක්ෂපාතීවූවන් හා නිදහස් සටන් කාමීන් - බලකොටු වාහල්කඩින් ඇතුළුවූයේ හරියටම ඔප දැමූ රන් රිදී වානේ ගංගාවක් ගලන්නාක් පරිද්දෙනි. බරතියන් නිල ලාංඡනය වන 'කිරුළ ලූ ගෝනා' ගෙත්තම් කරන ලද රන්වන් ධජ දූසිමක් පමණ ඔවුන් ගේ හිස්වලට ඉහළින් උතුරු සුළඟේ වැනෙන්නට විය.

මේ පැමිණියවුන් බොහෝ දෙනෙක් නෙඩ් නමින් දැන සිටියවුන් වූහ. රන් පැහැ දීප්තිමත් කෙස් කළඹින් යුතු සෙර් ජේමි ලැනිස්ටර් හා පිළිස්සුනු මුහුණින් යුතු සැන්ඩෝර් ක්ලිගේන්. ඔහු පසෙකින් සිටින උස පිරිමි දරුවා වෙනෙකෙකු නොව ඔටුන්න හිමි කුමරා විය යුතුය. ඔවුන්ට පිටුපසින් සිටින පුංචි කුරු මිනිසා අනිවාර්යයෙන්ම ටිරියන් ලැනිස්ටර් - පුංචි යකා - වේ.

කෙසේ වුවද, පිරිසේ ඉදිරියෙන්ම සිටි, රාජ්‍යාරක්ෂක බලකායේ සුදු පැහැ සළුවෙන් වැසුනු නයිට්වරුන් දෙදෙනෙකු විසින් දෙපසින් පිරිවරන ලද, දැවැන්ත මිනිසා නෙඩ්ට පෙනුනේ නාඳුනන්නෙකු ලෙසිනි. එනමුදු නෙඩ් හොඳින් හඳුනන හඬකින් බෙරිහන් දෙමින් සිය යුධ අසු පිටින් බිමට පැන්න ඒ මිනිසා නෙඩ් ව වැළඳ ගත්තේ ඇට කටු කුඩු කරවන තරමේ ජවයකිනි. "නෙඩ්! ආහ්, උඹේ ඔය හීතලෙන් ගල් වෙච්ච මූන දකින්ට ලැබුන එක කොච්චර දෙයක්ද?" රජතුමා ඔහු ගේ හිසේ සිට දෙපතුල දක්වා බැල්මක් හෙලා මහ හඬින් සිනාසුනේ ය. "උඹ නං පොඩ්ඩක්වත් වෙනස් වෙලා නෑ."

නෙඩ් ටත් එලෙසම කියන්නට ලැබුනා නම් කෙතරම් හොඳද? අවුරුදු පහළොවකට පෙර, ඔවුන් දෙදෙනා එකතුව කිරුළක් දිනන්නට සිය අසුන් මෙහෙයවූ කාලයේ ස්ටෝර්ම් එන්ඩ් හි වංශාධිපතියා යනු හොඳින් රැවුල බෑ, පැහැදිලි දෑසින් යුක්ත, තරුණියන් වසඟ කරවන අන්දමේ හැඩිදැඩි සිරුරකින් හෙබි පුද්ගලයෙකු විය. අඩි හයහමාරක් උසැති ඔහු අන් සාමාන්‍ය මිනිසුන් හමුවේ කුළුණක් මෙන් නැගී සිටියේ ය. ආරක්ෂක සන්නාහය පැළඳ සිය වංශයේ සලකුණ වන ගෝන අං දෙකකින් අලංකාර වූ හිස්වැසුම දමා ගත් විට ඔහු සැබෑම යෝධයෙකු මෙන් දිස් විය. ඔහුට යෝධයෙකුට මෙන් ශක්තියක් ද තිබූ අතර ඔහු ගේ

ආයුධය වන කටු සහිත යගදාව නෙඩ්ට පවා එසවීමට බැරි තරම් බර එකක් විය. ඒ කාලයේ සම් ගඳ හා ලේ ගඳ ඔහුට ඇලී තිබුනේ හරියටම සුවඳ විලවුන් මෙනි.

නමුත් දැන්.... සුවඳ විලවුන් මෙන් ඔහුට ඇලී තිබුනේ සැබැවින්ම සුවඳ විලවුන්ම වූ අතර උසට සරිලන මහතකුත් ඔහුට උරුම වී තිබින. නෙඩ් අවසාන වරට සිය රජතුමා දුටුවේ බේලන් ග්‍රේජෝයි ගේ කැරැල්ල සමයේ ඔහුට විරුද්ධව ඔවුන් දෙදෙනා එක්ව සටන් මෙහෙයවූ කාලයේ දී ය. ඔවුන් දෙදෙනා ග්‍රේජෝයි ගේ බිඳවැටුනු බලකොටුව තුළ සිටි ඒ රාත්‍රියෙන් - රොබර්ට් කැරලිකාර වංශාධිපතියා ගේ යටත්වීම පිළිගත්, නෙඩ් එම වංශාධිපතියා ගේ පුත් තියන් ප්‍රාණ ඇපකරුවෙකු හා තම යටත් දරුවෙක් වශයෙන් පිළිගත් ඒ රාත්‍රියෙන් - පසු රජතුමා අඩුම ගනනේ ස්ටෝන් අටක වත් බර තම සිරුරට එකතු කර ගෙන ඇති සේ ය. එකට වෙළුණු යකඩ කම්බි මෙන් වූ කළු පැහැ ගොරහැඩි රැවුළක් විසින් ඔහු ගේ දෙබිඩි නිකට හා එල්ලා වැටුනු හණු ආවරණය කරනු ලැබී ය. එනමුදු ඔහු ගේ දැවැන්ත උදරය හෝ දෑසට යටින් වූ අඳුරු පැල්ලම් හෝ වසන් කරන්නට සමත් කිසිවක් නොවී ය.

නමුත් රොබර්ට් යනු තව දුරටත් නෙඩ් ගේ මිතුරා පමණක් නොවේ, ඔහු ගේ රජතුමා ද වේ. එම නිසා ඔහු මෙපමණක් තෙපලේ ය. "මගේ ස්වාමිනී, වින්ටර්ෆෙල් ඔබේය."

මේ වෙද්දී අනායයන්ද සිය අසුන් පිටින් බැසීමට පටන්ගෙන තිබින. රොබර්ට් ගේ බිසව සෙර්සි ලැනිස්ටර් සිය බාල දරුවනුත් සමග පා ගමනින් පැමිණියහ. ඔවුන් ගමනට යොදාගත් සුවිසල් අසුන් හතලිස් දෙනෙකු විසින් අදින ලද තට්ටු දෙකකින් යුක්ත වූ දැවැන්ත අශ්ව කරත්තය බලකොටු වාහල්කඩින් ඇතුළට ගැනීමට බැරි තරම් පළල් වැඩි විය. නෙඩ් හිම මත දණ ගසා බිසව පැළඳ සිටි මුද්ද සිඹිද්දී රොබර්ට් කැට්ලින්ව වැළඳගත්තේ දිගු කලක් නොදැක සිටි සොහොයුරියක් වැළඳගන්නා පරිද්දෙනි. මීට පසු දෙපසේම ළමයින් එකිනෙකා ඉදිරියට කැඳවා අඳුන්වා දීම සිදුකරන ලදී.

මේ සියළු ආචාර සමාචාර විධි හමාර වූ වහාම රජතුමා නෙඩ් දෙසට හැරුනේය. "මාව සොහොන් ගෙවල්වලට එක්ක යන්ට එඩ්ඩාර්ඩ්. මට එයාලට ගෞරව දක්වන්ට ඕන."

මෙතරම් වසර ගණනක් ගතවීත් ඔහුට 'ඈ' මතක තිබීම ගැන නෙඩ් තුළ මුළු හදින්ම ඔහු පිළිබඳ ආදරයක් ඇති විය. බිසව මීට විරෝධය දක්වන්නට පටන් ගත්තා ය. ඔවුන් හිරු

උදාවේ සිට ගමන් කර තිබුනු අතර සියළු දෙනාම පාහේ ගමන් විඩාවෙන් හා සීතලයෙන් පෙලින. මුලින්ම වෙහෙස නිවාගෙන සිටීම මනෝඥ නොවේද? මැරුනු මිනිස්සුන්ට තව ටිකක් වේලා බලා සිටිය හැක. නමුත් ඇයට ඊට වඩා කතා කරන්නට අවස්ථාවක් නොලැබින. රොබර්ට් ඇය දෙස එක් තියුණු බැල්මක් හෙලූ අතර ඇගේ නිවුන් සොහොයුරා ජේමි මෘදු ලෙස ඇගේ අතින් ඇල්ලී ය. ඇය ඊට වඩා වදනක් වත් නොදෙඩී ය.

ඔවුන් දෙදෙනා එක්ව සොහොන් ගෙට යාමට පහළට බැස්සහ. ගලින් නිමවූ පියගැට පෙළ පටු වූ නිසා ලන්තෑරුමත් අතකින් ගත් නෙඩ් ඉදිරියෙන් ගිය අතර රොබර්ට් ඔහු පසුපසින් පැමිණියේ ය. "මට හිතෙන්ට පටන් අරන් තිබුනෙ අපට කවදාවත් වින්ටර්ෆෙල්වලට එන්ට බැරි වෙයි කියලයි." රොබර්ට් කතාව ඇරඹී ය. "දකුණෙ මිනිස්සු මගේ රාජධානි හත ගැන කතා කරන විදියට මට අමතක වෙනවා උඹේ කොටස අනික් කොටස් හයම එක්කහු කරලා ගත්ත තරම්ම ලොකුයි කියලා."

"මං හිතනවා ඔබ ගමන රස විඳින්ට ඇති කියලා මගේ ස්වාමිනී?"

රොබර්ට් නහයෙන් හඬක් නැගී ය. "මඩ වගුරු යි, කැලෑ යි, කුඹුරු යි. බෙල්ලෙන් උඩ එක හොඳ තානායමක් නෑ. මේ වගේ දැවැන්ත පාළු යායක් මං ජීවිතේටම දැකලා නෑ. උඹේ මිනිස්සු ඔක්කොම කොහෙ ගිහිල්ල ද?"

"උං එළියට එන්ට ලැජ්ජාවෙන් ඇති." නෙඩ් විහිළුවක් කලේ ය. "උතුරුකරේදි රජ කෙනෙක් කියන්නෙ බොහොම දුර්ලභ දැක්මක්."

"මං හිතන්නෙ උං ඔක්කොම හිමෙන් වැහිලා ගිහිල්ලා ඇති කියලයි. හිම නෙඩ්!"

"ගිම්හානය අන්තිමේ හිම කියන්නෙ සාමාන්‍ය දෙයක්. මං හිතනවා ඒකෙන් ඔබේ ගමනට බාධාවක් වෙන්ට නැතුව ඇති කියලා. සාමාන්‍යයෙන් මේ හිම බොහොම මෘදුයි."

"උඹේ ඔය මෘදු හිම අනික් එවුංම අරන් ගියාවෙ. ශීත කාලෙට මෙහෙ කොහොම වෙයිද කියලා මට හිතාගන්ටත් බෑ."

"ශීත කාලෙ අමාරුයි තමා. ඒත් ස්ටාර්ක්ලා ඒවට ඔරොත්තු දෙනවා. අපි හැමදාමත් ඒකට ඔරොත්තු දුන්නා."

"උඹ දකුණට එන්ට ඕන. මේ ගිම්හානය නැති වෙලා යන්ට කලින් උඹ ඒක රස විඳින්ට ඕන. හයිගාර්ඩ්න්වල තියෙනවා රෝස යායවල්, ඉමක් කොණක් පේන්නෙ නෑ. පළතුරු කොච්චර ඉදිලද කියනවානං ඒවා උඹෙ කට ඇතුළෙ පුපුරලා යනවා - කොමඩු, පීච්, මිදි, උඹ එච්චර රසක් කවදාවත් විඳලා නැතුව ඇති. උඹ බලන්ට පුළුවන්, මං එද්දි උඹට ටිකක් අරන් ආවා. ස්ටෝර්ම්ස් එන්ඩ්වල වුනත්, අර මුහුදු බොක්කෙන් එන හුළං මැද්දෙ වුනත් රස්නෙ කොච්චරද කියනවනං එහා මෙහා යන්ටවත් බැරි තරං අමාරුයි. අනික් එක උඹ නගර දකින්ට ඕන නෙඩ්! වෙළෙඳපොළවල් කෑම බීම වලින් පිරිලා ඉතිරිලා ගිහිල්ලා. වයින් කොච්චර ලාබද කොච්චර හොඳද කියනවනං හුස්ම ගන්න ටික ඇති උඹ වෙරි වෙන්ට. හැම එකාම කාලා බීලා මහත් වෙලා ඉන්නෙ." සිනාසුනු ඔහු තම දැවැන්ත උදරයට අල්ලෙන් පහරක් දුන්නේ ය. "අනික් එක කෙල්ලො නෙඩ්! රස්නෙ වැඩි කමට උංගෙ හිරිඔතප් නැති වෙලා ගිහිල්ලා. උං අමු හෙළුවෙන් ගඟේ බැහැලා නානවා. පාරෙදි වුනත් රස්නෙ වැඩි කම නිසා වූල් නැත්තං ලෝම ඇඳුං අඳින්ට බෑ. ඉතිං හැම එකීම පාරෙ බැහැලා යන්නෙ කොට ගවුම් ඇඳන්. සල්ලි තියෙන එවුං සේද අඳිනවා, නැති එවුං කපු ඇඳුං අඳිනවා. ඒත් දාඩිය දාපු වෙලාවට ඒ දෙකම එකයි, හෙළුවෙන් ඉන්නවා වගෙම තමයි." ඔහු සතුටින් සිනාසුනි.

රොබර්ට් බරතියන් යනු සුවිසල් රුචියකින් හෙබි ජීවිතය රස විඳින්නේ කෙසේදැයි මනාව දත් පුද්ගලයකු විය. එනමුදු නෙඩ්ට පැහැදිලිවම දැක ගත හැකි වූයේ මේ සම්භෝගය රජුට දැඩි අයහපත් අයුරින් බලපා ඇති අන්දමයි. පඩිපෙළ බැස හමාර වන විට රොබර්ට් තදින් හති දමමින් සිටි අතර ඔහුගේ මුහුණ රතු වී තිබින.

"මගේ ස්වාමිනී." නෙඩ් ගෞරවපූර්වකව කීවේය. ලන්තෑරුම ඉහළට ඉස්සූ ඔහු අඩ වටයක් අත ගෙන ගියේ ය. දිදුලන එළියෙන් ඔවුන්ට දැක ගත හැකි වූයේ ඈතින් ඈතට අන්ධකාරය තෙක් විහිදුනු, ගලින් නිමවුනු කුළුණු දෙපේලියකි. මේ කුළුණු අතරේ වූ සොහොන් ගැබ් තුළ මලවුන් සැතපුනු අතර ගලින් කල ඔවුන් ගේ අනුරූ සොහොන් ගෙයි

බිත්තියට පිටදී ශෛලමය සිහසුන් අරා වාඩි වී සිටියහ. "ඈ ඉන්නෙ පේලියෙ අන්තිමට, තාත්තයි බ්‍රැන්ඩනුයි එක්ක."

කුළුණු අතරින් ඔහු ඉදිරියට ගමන් කල අතර රොබර්ට් ඔහු පිටුපසින් ගමන් කලේ උමග තුළ වූ අධික සීතල නිසා වෙවුලමිනි. ස්ටාර්ක් වංශයේ මලවුන් අතරේ ඇවිදිද්දී ගලින් කල බිම මත ගැටුනු ඔවුන් ගේ පියවර හඬ දෝංකාර දෙන්නට විය. උමග දෙපස අනන්තය තෙක් විසිර සිටි වින්ටර්ෆෙල්හි අතීත මුතුන් මිත්තෝ ශෛලමය අසුන් වල වාඩි වී සිය දෙපා අසල බිම වකුටු වී සිටිනා සෝරවෘකයින් ද සමග ඔවුන් දෙස බලා සිටින්නට වූහ. ලන්තෑරුමේ නටන ගිනි දළු නිසා ඔවුන් ගේ ඡායාවන් පෙනුනේ පණ ඇතියවුන් මෙනි. පුරාණ සිරිතට අනුව වින්ටර්ෆෙල්හි අධිපති වී සිටි මුතුන් මිත්තන් ගේ පිළිමවල උකුල මත යකඩින් කල දිගු අසිපතක් තැන්පත් කර තිබින. පැරණිතම සාමාජිකයින් ගේ අසිපත් මීට බොහෝ කලකට පෙරම දිරා ගොස් තිබුනු අතර ඒවා ඔවුන් ගේ උකුළ මත තැන්පත්ව තිබුනු ස්ථානවල රතු පැහැ මලකඩ පැල්ලම් පමණක් දැකිය හැකි විය. වින්ටර්ෆෙල්හි මුල්ම වංශාධිපතියෝ ඔවුන් විසින් පාලනය කරන්නට යෙදුනු භූමිය මෙන්ම දැඩි මිනිසුන් වූහ. මකරාධිපතියන් පැමිනීමට සියවස් ගණනාවකට පෙර විසූ මොවුහු කිසිවෙකුටත් දණ නොනැමූ උතුරුකරයේ රජවරුන් වූහ.

නැවතුනු නෙඩ් ලන්තෑරුම ඉහළට කර එසවී ය. දෝනාව අන්ධකාරය ඔස්සේ දිගටම ඉදිරියට විහිදුනු නමුදු මෙතනින් එහාට තිබුනේ හිස් සොහොන් ගැබ් පමණී. "මෙන්න මෙතැන." ඔහු රජුට පැවසී ය. නිහඬවම හිස වැනූ රොබර්ට් දණ බිම ඇන හිස නවා ගති.

එහි එක ළඟ වූ සොහොන් ගැබ් තුනක් තිබින. රිකාර්ඩ් ස්ටාර්ක්, නෙඩ් ගේ පියා සතුව දිගු පරුෂ මුහුණක් විය. ගල් වඩුවන් ඔහුව හොඳින් දැන සිටියා මෙනි. උදාර ලීලාවෙන් අසුන් ගෙන සිටි ඔහු දෙපසින් තවත් සොහොන් ගැබ් දෙකක් වෙන් වී තිබුනේ ඔහු ගේ දරුවන්ට ය.

බ්‍රැන්ඩන් මියයද්දී ඔහුට අවුරුදු විස්ස පිරුනා පමණී. පිස්සු රජා ඒරිස් ටාර්ගේරියන් ගේ අණින් ඔහුව ගෙල සිර කර මරා දමන විට රිවර්රන් හි කැට්ලින් ටලී හා විවාහ වීමට ඔහුට තිබුනේ දින කිහිපයක් පමණි. ඔහු මිය යන ආකාරය බලා සිටීමට පියාට බල කෙරිණි. බ්‍රැන්ඩන් යනු පාලනය කිරීමටම උපන් වින්ටර්ෆෙල්හි නියම උරුමක්කරුවා විය.

ලියානා ඒ වන විට දහසය වැනි වියේ පසු වූවා ය. පරම සුන්දරත්වයකට හිමිකම් කියූ ගැහැණියක බවට වැඩෙමින් සිටි දැරියක්. නෙඩ් ඇයට මුළු හදින්ම ආදරය කල අතර රොබර්ට් ඊටත් වඩා ඇයට ආදරය කලේ ය. ඇය රොබර්ට් ගේ බිරිය වීමට නියමිතව සිටියා ය.

"එයා මීට වඩා ලස්සනයි." රජතුමා නිහඬතාව බින්දේ ය. ඔහු ගේ දෑස් ඇගේ ශෛලමය වුවන මත රැඳී තිබුනේ හරියට ඒ බැල්මෙන් ඇයට නැවත පණ ඉපැද්දීමට හැකියාවක් ඇතැයි සිතන්නාක් මෙනි. අන්තිමේ දී ඔහු නැගිට්ටේ ය. "ආහ්! යකාට ගියාවෙ නෙඩ්! ඇයි උඹට එයාව මෙතනම වලදාන්ට ඕන වුනේ?" ඔහු ගේ කටහඬ බැරෑඩි වී තිබුනේ නැවත අලුත් වූ ශෝකය නිසා ය. "එයාට මේ අන්ධකාරයට වඩා සුදුසු තැන් තියෙනවා."

"එයා වින්ටර්ෆෙල්වල ස්ටාර්ක් කෙනෙක්. මෙතන තමා එයාගෙ තැන."

"එයා ඉන්න ඕන කොහේ හරි කඳු ගැටයක් මුදුනේ, පළතුරු ගහක් යට. එයාට උඩින් ඉර එළිය යි වළාකුළු යි තියෙන්ට ඕන. එයාට පිරිසුදු වෙන්ට වැස්ස තියෙන්ට ඕන."

"එයා මැරෙද්දි මං එයා ගාව හිටියා." නෙඩ් රජුට මතක් කර දුනි. "එයාට ඕන වුනා මෙතනට එන්ට. එයාට ඕන වුනා තාත්ත යි බ්‍රැන්ඩනු යි මැද්දෙන් නිදාගන්ට." තවමත් සමහර විට ඒ වදන් ඔහු ගේ දෙසවනේ දෝංකාර දෙයි. 'මට පොරොන්දු වෙන්ට,' ඇය මෙසේ කියමින් හැඩුවේ ලේ සුවඳින් හා රෝස මල් සුවඳින් පිරුණු කාමරයක දී ය. 'මට පොරොන්දු වෙන්ට නෙඩ්.' නැගුනු උණ විසින් ඇගේ ශක්තිය සිඳ දමා තිබුනු අතර ඇගේ කටහඬ කෙඳිරිල්ලක් තරම් සිහින් විය. නමුත් ඔහු සිය පොරොන්දුව දුන් විට ඇගේ දෑසේ තිබුනු බිය සම්පූර්ණයෙන්ම නැතිව ගියේ ය. ඇය ඒ වෙලාවේ සිනාසුනු සැටි, ඇගේ අතැඟිලි දැඩිව ඔහු ගේ අත අල්ලාගෙන සිටි සැටි, ඇගේ අත්ලෙන් ගිලිහී ගිය තැලී පොඩි වී ගිය රෝස මල් පෙති මේ සියල්ලක්ම නෙඩ් ට අද ඊයේ මෙන් මතක ය. එහෙත් එයින් පසුව සිදු වූ කිසිදු දෙයක් ඔහුට මතක නැත. ඔවුන් ඔහුව සොයාගන්නා විට ඔහු එතෙකුත් ඇගේ සිරුර බදාගෙන නිහඬවම සංතාපයේ ගැලී සිටි බව ඔවුහු කියති. "මං පුළුවන් වුන හැම වෙලාවෙම එයාට මල් ගෙනල්ලා දෙනවා." නෙඩ් කීය. "ලියාන්නා මල් වලට හරිම ආසා කලා."

රජු ගේ අතැඟිලි ඇගේ මුහුණ ස්පර්ශ කලේ ය. ඒ ඇඟිලි රළු ගල් මතින් ඇදී ගියේ හරියට සජීවී මුහුණක් ස්පර්ශ කරන්නාක් තරම් මෘදු අන්දමිනි. "මං පොරොන්දු වුනා මං රේගාර් ව මරණවා කියලා ඌ එයාට කරපු දේට."

"ඔබ එහෙම කලා." නෙඩ් ඔහුට සිහිපත් කර දුනි.

"එක පාරයි." රොබර්ට් කටුක අන්දමින් පිළිවදන් දුනි.

ඔවුන් දෙදෙන එකිනෙකා හමුවුනේ ගංගා ත්‍රිශූලයේ නොගැඹුරු තොටුපලේ දී ය. ඒ වන විට ඔවුන් වටා යුද්ධය ජයටම ඇවිලෙමින් තිබින. ගෝන අං සහිත හිස් වැස්මෙන් සැරසී යගදාව අතින් ගත් රොබර්ට් හා සම්පූර්ණ කළු පැහැ ඇඳුමින් සැරසුනු ටාර්ගේරියන් කුමරා. ඔහු ගේ පපු සන්නාහය මත සිය වංශයේ ලාංඡනය වූ හිස් තුනේ මකරා හිරු එළියේ ගින්දර මෙන් දිලිසුනු රතු මැණික් වලින් කැටයම් කර තිබින. ත්‍රිශූලයේ ගං දිය රතු පැහැයට හැරෙන තෙක් ඔවුහු එකිනෙකා වටා අසුන් මෙහෙයවමින් නැවත නැවතත් කා කොටා ගත්හ. අන්තිමේ දී රොබර්ට් ගේ යගදාවෙන් වැදුනු දරුණු පහරක් විසින් හිස් තුනේ මකරාත් ඊට යටින් වූ පපුවත් සුණුවිසුණු කර දමන ලදී. නෙඩ් එම ස්ථානයට පැමිණෙන විට රේගාර් දිය කඳ මැද මියගොස් සිටි අතර දෙපසේම සෙබළුන් ඔහු ගේ සන්නාහයෙන් ගිලිහී දියට වැටුනු රතු මැණික් වලට පොර බදිමින් සිටියහ.

"මගේ හීන වලදි මං හැමදාම ඊට ඌව මරනවා." රොබර්ට් කීය. "ඌව දහස් වතාවක් මැරුවත් ඒ වාඩුව ගන්ට බෑ."

මෙයට පිළිතුරක් වශයෙන් කීමට නෙඩ්ට කිසිවක් නොවී ය.

Eddard Stark: “The winters are hard, But the Starks will endure. We always have.”

මඳ වේලාවකට පසු නෙඩ් නිහඬ බව බිඳී ය. "අපට ආපහු යන්ට වෙලාව හරි මගේ ස්වාමිනී. බිසව ඔබතුමා එනකං බලාගෙන ඇති."

"අනික් එවුං මගේ බිසව අරං ගියාවෙ." නොරිස්සුම් ස්වරයෙන් මෙසේ කීවද ආපසු හැරුනු රොබර්ට් ඔවුන් පැමිණි මග දිගේ පිය මනින්නට විය. "අනිත් එක, උඹ තව එකපාරක් හරි ඔය 'මගේ ස්වාමිනී' කතාව කියනවා මට ඇහුනොත් මං උඹේ බෙල්ල කපලා රිටක හිටවනවා. අපි දෙන්නගෙ ආශ්‍රය ඊට වඩා බොහොම ළඟයි."

"ඒ බව මට අමතක වෙලා නෑ." නෙඩ් සෙමින් පිළිතුරු දුනි. "මට කියන්ට ජොන් ගැන."

රොබර්ට් හිස වැනුවේ ය. "ඔය තරං ඉක්මනින් මිනිහෙක් ලෙඩින් වැටෙනවා මං කවදාවත් දැකලා නෑ. මගෙ පුතාගෙ උපන්දිනේ වෙනුවෙන් අපි තරගාවලියක් තිබ්බා.උඹ එදා ජොන්ව දැක්කනං සැකයක් නෑ උඹ කියයි 'මේ මිනිහා තව අවුරුදු සීයක් ජීවත්වෙනවා' කියලා. සති දෙකකට පස්සෙ මෙන්න මිනිහා මැරුනා. අසනීපය හරියට ඇවිලෙන ගින්නක් වගේ මිනිහගෙ ඇඟ ඇතුළෙ පැතිරුනා." ඔහු කුළුණක් අසල මඳක් නැවතින. "මං ඒ නාකියට කොච්චර ආදරේ කලාද."

"අපි දෙන්නම එයාට ආදරේ කලා." නෙඩ් මොහොතකට නිහඬ විය. "කැට්ලින් එයාගෙ සහෝදරී ගැන වද වෙනවා. ලයිසා කොහොමද එච්චර දුකක් දරාගත්තෙ?"

රොබර්ට් ගේ දෙතොල් ඇඹරී ගියේය. "ඇත්තම කියනවනං එච්චර හොඳට නෙවෙයි. මං හිතන්නෙ ජොන් නැතිවුන එකෙන් ගෑනි පිස්සු වැටුනා නෙඩ්. එයා පුතාවත් අරන් ආයෙමත් ඉයරි වලටම ගියා. මගේ අකැමැත්තවත් සලකන්නෙ නැතුව. මං හිතාගෙන හිටියෙ පොඩි එකා කාර්ස්ටලී රොක් වල ටයිවින් ලැනිස්ටර් ගාව හදාගන්ට යවන්ට. ජොන්ට වෙන සහෝදරයොත් නෑ වෙන පුතාලත් නෑ. ඒ පොඩි එකා ගෑනු අස්සෙ හැදෙන්ට අරින්ටද මට කියන්නෙ?"

කුඩා දරුවකු ටයිවින් ලැනිස්ටර් සමීපයේ හැදී වැඩෙන්නට යවනවාට වඩා විසකුරු පොළඟෙකු සමීපයට යැවීම මැනවැයි නෙඩ් දැන සිටි නමුත් තම සිතුවිලි වදනට පෙරලන්නට ඔහු තැත් කලේ නැත. සමහර පරණ තුවාල කිසිදා සුව නොවන අතර පුංචිම පුංචි වචන වැරැදීමකින් පවා ඒවා නැවත ඇවිස්සීමට පුළුවන. "එයාට සැමියා නැතිවුනා. එයා බයවෙන්ට ඇති ළමයත් නැති වෙයි කියලා. ඒ ළමයා තාම බොහොම පුංචියිනෙ."

"අවුරුදු හයයි. අනික ලෙඩ ගානෙ. ඉයරි වල වංශාධිපතියා. දෙයියොම බලාගන්ට ඕන." රජතුමා කීවේ ය. "ටයිවින් මීට කලින් කිසිමදාක ළමයෙක් හදාගන්ට බාර අරන් නෑ. ලයිසාට ඒක ඇත්තටම ගෞරවයක්. ලැනිස්ටර්ලා කියන්නෙ බොහොම උදාර වංශවත් පවුලක්. ඒ වුනාට මෙයා ඒ ගැන අහන්ටවත් සතුටු වුනේ නෑ. මෙන්න ඊට පස්සෙ එයා කාටවත් කියන්නෙවත් නැතුවම මහ රැක පිටත් වෙලා ගිහිල්ලා. සෙර්සිට හොඳටම කේන්ති ගිහිල්ලයි හිටියෙ ඒ ගැන." රොබර්ට් ගැඹුරු සුසුමක් හෙළී ය. "උඹ දන්නවද? ඒ ළමයට තියලා තියෙන්නෙ මගෙ නමමයි. රොබර්ට් ඒරින්. එයාව ආරක්ෂා කරනවා කියලා මං දිවුරුම් දීලා පොරොන්දු වෙලා ඉන්නෙ. ඒත් දෙයියනේ මං කොහොමද ඒක කරන්නෙ අම්මා ළමයව හොරකං කරගෙන යනකොට?"

"ඔබ කැමැති නං මං ඒ ළමයව හදාගන්ට බාර ගන්නං." නෙඩ් කීය. "ලයිසා ඒකට එකඟ වෙයි. එයයි කැට්ලිනුයි එදා වගේම තාමත් හරිම සමීපයි. අනික එයාට ඕන වෙලාවක මෙහෙ ඇවිත් යන්ට පුළුවන්නෙ."

"ඒක නං හරිම කරුණාවන්ත යෝජනාවක් යාළුවා." රජතුමා කීවේ ය. "ඒ වුනත් දැන් පරක්කු වැඩියි. ටයිවින් උතුමානන් දැනටමත් ඒකට කැමැත්ත දීලයි තියෙන්නෙ. ළමයව වෙන කොහේ හරි හදාගන්ට දෙන එක එයාට මූනට දමලා ගැහුවා වගේ වෙයි."

"ලැනිස්ටර්ලාගෙ ආඩම්බරේ ගැන වද වෙනවට වැඩිය මට වැදගත් මගේ බෑනගෙ සුබසිද්ධිය ගැන හිතන එක."

"උඹට එහෙම හිතෙන්නෙ උඹ ලැනිස්ටර් කෙනෙක් එක්ක නිදාගන්නෙ නැති නිසා." රොබර්ට් සිනාසුනි. "ආහ් නෙඩ්! උඹ තාමත් ඕවා බැරෑරුම් විදියට ගනන් ගන්නවානෙ." ඔහු සිය දැවැන්ත අතක් නෙඩ් ගේ උරහිස වටා යැවී ය. "මං හිතන් හිටියෙ තව දවස් කීපයක් ගිහිල්ලා උඹට මේක කියන්ටයි. ඒත් මට දැන් පේනවා එහෙම කරන එකේ තේරුමක් නෑ කියලා. යමු, මගෙත් එක්කම ඇවිදන් යමු."

ඔවුන් නැවතත් කුළුණු පේළි අතරින් ආපසු ගමන ඇරඹූ අතර රජතුමා සිය අත දිගටම නෙඩ් ගේ උරහිස මත රඳවාගෙන සිටියේ ය. "උඹ කල්පනා කරන්ට ඇති මං මෙච්චර කාලෙකට පස්සෙ වින්ටර්ෆෙල්වලට ආවෙ ඇයි කියලා?"

නෙඩ් ගේ සිතේ යම් යම් සැකයන් මතු වී තිබුන ද ඔහු මේ අවස්ථාවේ දී ඒවා ප්‍රකාශ කරන්නට සිතුවේ නැත. "අනිවාර්යයෙන්ම මාව මුන ගැහෙන්ට වෙන්ට ඕන." ඔහු සැහැල්ලු ස්වරයෙන් කීය. "අනික ප්‍රාකාරෙ. ඔබ ඒක දකින්ටම ඕන මගේ ස්වාමිනී. ඒකෙ බලකොටුවල පොඩ්ඩක් ඇවිදලා ඒ මිනිස්සුත් එක්ක ටිකක් කතා කරන්ට ඕන. නිශා රැකුම දැන් ඉස්සර තිබ්බ විදියෙන් බාගයක් වත් නෑ. බෙන්ජින් කියනවා-"

"කිසිම සැකයක් නෑ, මට උඹේ සහෝදරයා කියන ඒවා ඉක්මනටම අහන්ට ලැබෙයි." රොබර්ට් හරස් කැපී ය. "ප්‍රාකාරෙ අවුරුදු අටදාහක් කෙලින් තිබ්බා. ඒකට තව දවස් කීපයක් බලන් ඉන්ට පුළුවන්. මට ඊට වඩා වැදගත් කාරනා ගැන හිතන්ට වෙලා තියෙනවා. මේක හරිම අමාරු කාලයක්. මට ඕන මගේ වටේ හොඳ මිනිස්සු ටිකක්. ජොන් ඒරින් වගේ මිනිස්සු. එයා සේවය කලා ඉයරිවල වංශාධිපතියා විදියට, නැගෙනහිර පලාතෙ ආරක්ෂකයා විදියට, රජ්ජුරුවන්ගෙ 'අත' විදියට. එයා වගේ කෙනෙක් හොයාගන්න එක ලේසි නෑ."

"එයාගෙ පුතා..." නෙඩ් කතාව ඇරඹී ය.

"එයාගෙ පුතාට ඉයරියි, ඒකෙන් එන ආදායම ඔක්කොමයි උරුමයෙන් ලැබෙයි." රොබර්ට් පරුෂ ලෙසින් කීය. "එයාට ඊට වඩා ලැබෙන්නෙ නෑ."

නෙඩ් මෙයින් විමතියට පත් විය. තිගැස්සුනු ඔහු ගමන නවත්වා රජු දෙස බැලීමට හැරුනු අතර අනාරාධනාත්මකවම ඔහු ගේ මුවින් වචන ගලන්නට විය. "ඒරින්ලා තමා හැමදාමත් නැගෙනහිර ආරක්ෂකයො වුනේ. ඒක ඒ වසමත් එක්ක යන තනතුරක් නෙ."

"සමහරවිට ළමයා නිසි වයසට ආවහම එයාට ඒ ගෞරවේ දෙන්ට පුළුවන් වෙයි." රොබර්ට් කීවේ ය. "මට ඒ ගැන හිතන්ට මේ අවුරුද්දයි ඊළඟ අවුරුද්දයි තියෙනවා. අවුරුදු හයක දරුවෙක් කියන්නෙ යුධ නායකයෙක් නෙවෙයි නෙඩ්."

"සාම කාලෙදි ඒ තනතුර නිකංම නිකං ගෞරව නාමයක් විතරනෙ. ළමයට ඒක තියාගන්ට දෙන්ට. එයා වෙනුවෙන් නෙවෙයි නං අඩුම ගානෙ එයාගෙ තාත්තා වෙනුවෙන්වත්. ජොන් කරපු සේවයට ඔබ ඒ තරම්වත් ණය ගැතියි."

මේ කතාව නිසා රජතුමා සතුටට පත් වූයේ නැත. ඔහු නෙඩ් ගේ උරහිස මතින් සිය අත ඉවතට ගත්තේ ය. "ජොන් ගෙ සේවය කියන්නෙ එයා එයාගෙ රජතුමාට කරන්ට බැඳිලා තිබුන දෙයක්. මං කලගුණ නොසලකා ඉන්නෙ නෑ නෙඩ්. අනිත් මිනිස්සු හැමෝටම වඩා උඹ ඒ ගැන දැනගෙන ඉන්ට ඕන. ඒ වුනාට පුතා කියන්නෙ එයාගෙ තාත්තා නෙවෙයි. නිකංම නිකං පුංචි ළමයෙකුට බෑ නැගෙනහිර පාලනය කරන්ට." ඔහු ගේ ස්වරය මෘදු විය. "මේ ගැන කතා කලා ඇති දැන්. ඊට වඩා වැදගත් දේවල් තියෙනවා සාකච්ඡා කරන්ට. අනික මට උඹත් එක්ක වාද විවාද කරන්ට බෑ." ඔහු නෙඩ් ගේ වැළමිටෙන් අල්ලා ගත්තේ ය. "මට දැන් උඹේ උදවු ඕන නෙඩ්."

"ඔබට අවශ්‍යා දේ කියන්ට මගේ ස්වාමිනී. මම හැමදාමත් ඔබේ සේවයේ." නෙඩ් සැකමුසු වෙමින් පැවසී ය.

"අපි දෙන්නා ඉයරිවල ගතකරපු කාලෙ... දෙයියම්පා ඒක නං නියමම කාලයක් තමා. උඹ ආයෙමත් මගේ පැත්තකින් ඉන්නවා මට දකින්ට ඕන නෙඩ්. මට ඕන උඹ කින්ග්ස් ලැන්ඩින්ග්වලට එනවා දකින්ට. උඹ මේ ඈත කෙලවරකට වෙලා ඉන්නවා කාටවත් වැඩක් නැති විදියට." රොබර්ට් අන්ධකාරය දෙසට බැල්මක් හෙළී ය. "මං දිවුරන්නං, සිංහාසනයක් දිනනවට වඩා දාස් ගුණයක් අමාරුයි ඒකෙ දිගටම වාඩි වෙලා ඉන්න එක. නීති ක්‍රියාත්මක කරනවා කියන්නෙ ඔළුවෙ කැක්කුම හැදෙන වැඩක්. රට කරවන්ට සල්ලි හොයනවා කියන්නෙ ඊටත් වඩා අමාරු දෙයක්. එතකොට මිනිස්සු... මිනිස්සුන්ගෙ ඕනෑඑපාකම්වල කෙලවරක් නෑ. මං අර මලමගුල් යකඩ පුටුවෙ වාඩිවෙලා පස්ස හිරි වැටෙනකං, මොළේ කොලොප්පං වෙනකං මිනිස්සුන්ගෙ පැමිණිලි අහන් ඉන්ට ඕන. ඒ හැමෝටම මොකක් හරි දෙයක් ඕන, සල්ලි නැත්තං ඉඩකඩම් නැත්තං යුක්තිය. ඒ මදිවට උං කියන බොරු... මගේ වංශාධිපතියොයි ආර්යාවොයි ඊට හපන්. මාව වටකරන් ඉන්නෙ චාටුකාරයො යි මෝඩයො යි. මේ දේවල් ඇති මිනිහෙක්ව පිස්සු වට්ටන්ට නෙඩ්. උංගෙන් බාගෙට බාගයක් මට ඇත්ත කියන්ට බයයි, අනිත් බාගෙට ඇත්ත මොකක්ද කියලා හොයාගන්ට බෑ. සමහර දාට රෑට  මට හිතෙනවා අපි ත්‍රිශූලෙ ළඟ යුද්ධෙ පැරදුනානං කියලත්. ඇත්තටම ඒ විදියටම නෙවෙයි, ඒ වුනත්...."

"මට ඔබව තේරෙනවා." නෙඩ් මෘදු ස්වරයෙන් පැවසී ය.

රොබර්ට් ඔහු දෙස බැලීය. "මං හිතනවා උඹට තේරෙනවා කියලා. උඹට තමා මාව හරියටම තේරුම් ගන්ට පුළුවන්. මගේ පරණ මිත්‍රයා." ඔහු සිනාසුනේ ය. "එඩ්ඩාර්ඩ් ස්ටාර්ක් වංශාධිපතියානනි, මම ඔබව 'රජතුමාගේ හස්තය' ලෙසින් පත් කරමි."

නෙඩ් දණ බිම නැමීය. මේ පිරිනැමීම ඔහු බලාපොරොත්තු නොවූවක් නොවීය. රොබර්ට් මේ තාක් දුර ගෙවා ඔහු බැහැ දැකීමට පැමිණීමට වෙනත් හේතුවක් ඇද්ද? රජතුමා ගේ හස්තය යනු රාජධානි සප්තකයේ සිටිනා දෙවෙනි බලවත්ම පුද්ගලයා ය. ඔහු රජු ගේ නමින් ජනතාවට කතා කරයි, රජු ගේ හමුදාවන්ට අණ දෙයි, රජු ගේ නීති කෙටුම්පත් කරයි. සමහර අවස්ථාවලදී - රජතුමාට පැමිණීමට නොහැකි වූ විට, රජතුමා අසනීප වූ විට, රජතුමා පැමිණීමට අකැමැති වූ විට - ඔහු යකඩ සිංහාසනයේ වාඩි වී රජතුමා ගේ යුක්තිය පවා පසිඳලයි. රොබර්ට් මේ ඔහුට පවරන්නේ රාජධානිය තරමටම විශාල වගකීමකි.

මුළුමහත් ලෝකයෙන්ම නෙඩ්ට උවමනා වන අවසානම දෙය මේ තනතුර යි.

"මගේ ස්වාමිනී, මම මේ ගෞරවයට සුදුසු නෑ."

රොබර්ට් නොඉවසිල්ලෙන් මෙන් නමුත් හාස්‍යජනක අන්දමින් ගෙරෙවුවේ ය. "මට ඕන නං උඹට ගෞරවයක් දක්වන්ට, මං කරන්නෙ උඹව විශ්‍රාම යවන එකයි. මට ඕන කරන්නෙ උඹ මං වෙනුවට මේ රට පාලනය කරන්ට යි මගේ යුද්ධ මෙහෙයවන්ට යි. එතකොට මට පුළුවන් මං කැමැති විදියට කාලා බීලා ගෑනු පස්සෙ ගිහිල්ලා මගේ ජීවිතේ විඳින්ට." සිය උදරයට අල්ලෙන් පහරක් දුන් ඔහු සිනහවක් පෑවේ ය. "උඹ දන්නවනෙ, රජ්ජුරුවොයි එයාගෙ අතයි ගැන තියෙන කියමන."

"රජතුමා සිහින දකිද්දී රජතුමාගේ හස්තය ඒ සිහින සැබෑ කරයි."

"එක පාරක් මගෙත් එක්ක ඇඳට නැග්ග මාළු කාරයෙක්ගෙ ගෑනියෙක් ඔයිට වඩා හොඳ විදියකට මට ඕක කියලා දුන්නා. උං කියන විදියට 'රජතුමා කද්දී රජතුමාගෙ අත පස්ස හෝදයි'." රොබර්ට් හිස පසුපසට ඇළ කර කොක් හඬලා සිනාසුනේ ය. අන්ධකාරය පුරා ඔහුගේ සිනා හඬ රැවු දුන් අතර ඔවුන් වටා සිටි වින්ටර්ෆෙල්හි මලගිය මී මුත්තෝ සීතල නොපහන් දෑසින් ඔවුන් දෙස බලා සිටියහ.

අන්තිමේ දී සිනා හඬ නතර විනි. නෙඩ් තවමත් දණ බිම ඇන හිස ඔසවා ඉහළ බලා සිටියේ ය. "උඹ නං යකාට යන්ට ඕන නෙඩ්. පොඩ්ඩක් හිනා වෙයංකො."

"අපේ කියමනක් තියෙනවා, මේ උතුරේ සීත කාලෙ කොච්චර දරුණුද කියනවනං මිනිහෙක්ගෙ හිනාව උගුරෙම ගල් වෙලා ඒ මිනිහා හුස්ම හිර වෙලා මැරෙන්ට පුළුවන් කියලා." නෙඩ් කීය. "සමහරවිට ඒක වෙන්ට ඇති ස්ටාර්ක්වරු එච්චර හිනාවෙන්නෙ නැත්තෙ."

"මාත් එක්ක දකුණට වරෙන්. මං උඹට උගන්නනන්නං කොහොමද ආයෙමත් හිනාවෙන්නෙ කියලා." රජතුමා පොරොන්දු විය. "උඹ මට උදවු කලා මේ මලඉලවු සිංහාසනේ දිනන්ට. දැන් මට උදවු කරපං ඒක පාලනේ කරන්ට. අපි දෙන්නා ඉපදිලා ඉන්නෙ එකට එක්කහු වෙලා පාලනේ කරන්ටයි. ලියාන්නා ජීවත් වෙලා හිටියානං අපි මේ වෙනකොට ලේ වලින් එකට බැඳිච්ච සහෝදරයො නෙඩ්. අනිත් එක අපි තවම ඒකට එච්චරම පරක්කුත් නෑ. උඹට දුවෙක් ඉන්නවා. මගේ ජොෆ්‍රි උඹේ සන්සායි අපේ පෙළපත් දෙක එකට එක්කහු කරයි, හරියට මායි ලියාන්නායි එක පාරක් කරන්ට හිටියා වගේ."

මේ යෝජනාව ඔහුව පුදුමයට පත් කලේය. "සන්සාට තාම එකොළහයි."

රොබර්ට් නොඉවසිල්ලෙන් අතක් වැනී ය. "විවාහ ගිවිසගන්ට තරම් ඒ හොඳටම වයස ඇති. විවාහ උත්සවය තව අවුරුදු කීපෙකට කල්දාන්ට පුළුවන්. දැන් වත් දෙයියංගෙ නාමෙට නැගිටලා 'ඔවු' කියලා කියපං."

"මීටත් වඩා සතුටක් මට තවත් නෑ මගේ ස්වාමිනී." නෙඩ් පිළිතුරු දුනි. ඔහු මඳක් තැතනුවේ ය. "මේ ගෞරව හැම එකක්ම මං කොහෙත්ම බලාපොරොත්තු නූන එකක්. මට මේ ගැන හිතා බලන්ට පොඩි කාලයක් දෙන්ට පුළුවන්ද? මට මගේ බිරිඳට මේ ගැන කියන්ට...."

"ඔවු ඔවු. අනිවාර්යයෙන්ම. කැට්ලින්ට කියන්ට. උඹට ඕන තරං ඒ ගැන හිතා බලපං." පහතට නැඹුරු වූ රජතුමා නෙඩ් ගේ අතකින් අල්ලා ඇද ඔහුව දෙපයින් සිටවී ය. "හැබැයි මට ගොඩක් කල් බලන් ඉන්ට සිද්ධ කරන්ට එපා. මං එච්චර ඉවසිලිවන්ත මිනිහෙක් නෙවෙයි."

එක් මොහොතකට එඩාර්ඩ් ස්ටාර්ක්ට අනතුරක පෙර නිමිත්තක් පෙනී නොපෙනී ගියේ ය. වින්ටර්ෆෙල් යනු ඔහුට හිමි ස්ථානය යි. තමා වටා නැගී සිටින ශෛලමය පිළි රූ දෙස මොහොතක් බලා සිටි ඔහු සොහොන් ගැබ තුළ සීතල නිහඬතාව මධ්‍යයේ ගැඹුරු හුස්මක් ඉහළට ඇද්දේය. මලගිය මුතුන් මිත්තන් ගේ සීතල දෑස් ඔහු දෙස බලා සිටින ආකාරය ඔහුට දැනුනි. ඔවුන් සියල්ලෝම කණ් දී ගෙන සිටිති. ශීත කාලය පැමිණෙයි.

Robert Baratheon: "I swear to you, sitting a throne is a thousand times harder than winning one."

ජොන්

සිය අවජාතක භාවය පිළිබඳ ජොන් සතුටු වූ අවස්ථාවන් වේ නම් ඒ අතේ ඇඟිලි වලින් ගණනය කල හැකි තරම් ස්වල්පයකි. වයින් ගුරුලේත්තුවකින් තවත් වයින් වඩියක් සිය කුසලාණට වත් කරගන්නා අතරේ ඔහු කල්පනා කලේ මෙයත් නිසැකයෙන්ම එවැනි අවස්ථාවක් බවයි. නයිට්වරුන් ගේ තරුණ සහචරයන් අතරට වී බංකුවක වාඩි ගෙන පානය කරමින් සිටි වයින් බඳුන ඔහු ගේ දිවට සුමිහිරි රසයකුත් මුවට සිනාවකුත් ගෙන ආවේ ය.

වින්ටර්ෆෙල්හි ප්‍රධාන ශාලාව ගිනිමැලවල දුමින් පිරී පැවති අතර වාතය පිළිස්සෙන මස් සුවඳින් හා උණු පාන් සුවඳින් බර වී තිබිනි. එහි අඳුරු ගල් බිත්ති සුදු පැහැ, රන් පැහැ, රතු පැහැ ධජවලින් සහ ස්ටාර්ක් සෝරවෘකයා, බරතියන් ගෝනා හා ලැනිස්ටර් සිංහයා ගෙත්තම් කල පතාක වලින් වැසී තිබිනි. ගායකයකු සිය වීණාව වාදනය කරමින් සැහැල්ලක් ගායනා කලද බුර බුරා නැගෙන ගිනිදළුවල හඬත්, පිඟන් කෝප්ප එකිනෙක ගැටෙන හඬත්, බීමතින් කෙරුනු සංවාද සිය ගණනක මුනුමුනුවත් අතරේ ශාලාවේ මෙහා කොණට ඒ ගායනය ඇසුනේ යන්තමිනි.

මේ ගෙවී යමින් තිබුනේ රජතුමා පිළිගනිමින් පැවැත්වෙන භෝජන සංග්‍රහයේ සිවු වන පැය යි. රජතුමා හා බිසව සහ ස්ටාර්ක් උතුමානන් හා එම ආර්යාව වෙනුවෙන් තැනුනු උස් වේදිකාව ශාලාවේ එක් කොණක විය. ඒ පසෙකින් ජොන් ගේ සොයුරු සොයුරියෝ රාජකීය දරුවන් සමග මේසයට වාඩි වී සිටියහ. උත්සව අවස්ථාවට සුදුසු අන්දමින් ඔහු ගේ පියා විසින් තම දරුවන්ට වයින් වීදුරුවක් පානය කිරීමට අවකාශ දී තිබුනද එයින් එහාට ඔවුන්ට යාමට බැරි බව ජොන් දැන සිටියේ ය. එනමුදු මේ බංකු අතරේ සිය පිපාසය නිවෙන තෙක් වයින් බිවුවද ඔහුව එයින් වලකන්නට කිසිවෙකුත් පැමිණියේ නැත.

ඔහු මුසු වී සිටියේ නියමම සමාගමකටය. ඔවුන් ගේ දිරිගැන්වීම් මධ්‍යයේ වයින් කුසලාණකට පසු තවෙකක් වශයෙන් හිස් කරමින් ඔහු ඔවුන් ගේ කතාවලට - යුද්ධ ගැන, ගැහැණුන් ගැන, දඩයම් ගැන කෙරුනු කතාවලට - ආසාවෙන් සවන් දෙමින් සිටියේ ය. සිය සගයින් රජතුමා ගේ දරුවන්ට වඩා හොඳ විනෝදකාමීන් බව ඔහුට නිසැක විය.

අමුත්තන් ශාලාවට ප්‍රවිශ්ට වූයේ ඔහු සිටි බංකුවට අඩි කිහිපයක දුරකින් නිසා ඔවුන් සියල්ලම හොඳින් දැක බලා ගැනීමේ වරම ඔහුට හිමි වුනි.

රැජිණ පිරිවරා ඔහු ගේ පියා මුලින්ම පැමිණියේ ය. මිනිසුන් කියන්නාක් පරිදිම ඇය අතිශයින් සුන්දර විය. ඇගේ දිගු කෙහෙරැළි අතර කුඩා මිණිකිරුළක් බැබලුනි. එහි සවි කර තිබුනු මරකත මැණික් වල කොළ පැහැය ඇගේ දෑසේ පැහැයට හරියටම ගැලපුනි. ඈ කිසිවිටෙකත් ඔහු ගේ පියා දෙස නොබැලූ අතර වසර දහහතරක කොලුවකු වූ නමුදු ඇගේ සිනා මුහුණට යටින් ඇති සැබෑ මුහුණ හඳුනා ගැනීමට ඔහුට අපහසු නොවී ය.

ඉන්පසු පැමිණියේ ස්ටාර්ක් ආර්යාව සමග අතිනත ගත් රොබර්ට් රජතුමා ය. රජතුමා ගේ දර්ශනය ජොන් ගේ බලාපොරොත්තු බිඳ දමන්නක් විය. ඔහු ගේ පියා රජතුමා ගැන නිතරම කතා කියා දී තිබින. අද්විතීය රොබර්ට් බරතියන්, ත්‍රිශූලයේ යක්ෂයා, රාජධානියේ සිටින බිහිසුණුම රණශූරයා, කුමරුන් අතර යෝධයා. නමුත් ජොන් දුටුවේ රතු වූ මුහුණින් යුතු දහඩියෙන් පෙඟී ගිය මහත මිනිසකු පමණි. ඔහු ඇවිද්දේ ද බාගෙට බීගත් මිනිසෙකු පරිද්දෙනි.

ඔවුන් පසුපසින් දරුවෝ පැමිණියහ. මුලින්ම පැමිණියේ වසර තුනක දරුවකුට හැකි උපරිම විලසින් උදාරම් අඩි තබමින් පිය නැඟූ පුංචි රිකන් ය. ඒ පසුපසින්ම වාගේ ස්ටාර්ක් වර්ණ වන අළු පැහැ හා සුදු පැහැ ලොමින් සැරසුණු රොබ් සහ ඔහු ගේ අතේ එල්ලුනු අට වියැති මර්සෙලා කුමරිය පැමිණියහ. ඔහු ගේ අර්ධ සොයුරියෝ රාජකීය කුමරුවන් පිරිවරා - ආර්යා තරබාරු ටමෙන් කුමරු සමගත් ඇයට වඩා දැවුරුද්දක් වැඩිමල් සන්සා කිරුළ හිමි ජොෆ්රි බරතියන් සමගත් - පිය නැගූහ. දොළොස් හැවිරිදි වූ ජොෆ්රි ජොන් හා රොබ් දෙදෙනාටම වඩා වයසින් බාල වුවද ඔවුන් දෙදෙනාටම වඩා උසින් වැඩි වූ අතර මෙය ජොන් ගේ සිතේ විශාල කැළඹීමක් ඇති කලේ ය. ඔහු ට රන් පැහැ කෙස් හා සිය මවට මෙන්ම කොළ පැහැ දෑසක් හිමිව තිබින. ඔහු ගේ පසෙකින් පිය නැගූ සන්සා කාන්තිමත්ව බබලන්නට වූ නමුදු ජොෆ් ගේ අමනාපයෙන් මෙන් උල් කරගත් දෙතොලත් වින්ටර්ෆෙල්හි ප්‍රධාන ශාලාව දෙස ඔහු හෙලූ අවඥාසහගත බැල්මත් ජොන් ගේ සිත් ගත්තේ නැත.

මේ හැමටම වඩා ඔහු උනන්දුවෙන් බැලුවේ ඔවුන්ට පසුපසින් පිය නැගූ දෙදෙනා දෙසය. රැජිණ ගේ සොයුරන් දෙදෙනා, කාර්ස්ටලී රොක්හි ලැනිස්ටර්වරුන් දෙදෙනා, සිංහයා සහ පුංචි යකා. ඔවුන් දෙදෙනා වෙන් කර හඳුනා ගැනීමට කිසිදු අපහසුවක් නොවී ය. සෙර්

ජේමි ලැනිස්ටර් සෙර්සි රැජිණ ගේ නිවුන් සොයුරා වූ අතර ඔහු උස, රන් පැහැ හිසකෙස්, දිදුලන කොළ පැහැ දැස් හා තියුණු සිනාවක් ඇත්තෙකු විය. ලේ රතු පැහැ සේද ඇඳුමින් සැරසී කළු පැහැ උස් සපත්තු යුගලක් හා කළු පට රෙද්දෙන් කල සළුවක් පැළඳ සිටි ඔහු ගේ කබායේ පපුව මත රන් පැහැ නූලින් සිය වංශයේ සලකුණ වූ ගොරවන සිංහයා ගෙත්තම් කොට තිබින. මිනිස්සු ඔහු ගේ මුහුණට 'ලැනිස්ටර් සිංහයා' යැයි කියූ අතර ඔහුට පසුපසින් 'රාජඝාතකයා' යැයි කෙඳිරූහ.

ඔහු ගේ දර්ශනයෙන් දැස් ඉවතට ගැනීම ජොන්ට අසීරු විය. රජෙකු සිටිය යුත්තේ මෙන්න මෙපරිද්දෙන් යැයි ඔහුට සිතින.

සිය සොයුරා පසෙකින් බාගෙට සැඟවී බකල ගසමින් යන අනිකා ජොන් මීලඟට දිටී ය. ටිරියන් ලැනිස්ටර්, ටයිවින් උතුමානන් ගේ දරුවන් අතරින් බාලම හා අවලස්සනම කෙනා. දෙවියන් විසින් සෙර්සිට හා ජේමිට ලබා දුන් හැම දෙයක්ම ටිරියන්ගෙන් වසන් කර තිබින. ඔහු සිය සොයුරාගෙන් අඩක් පමණ උස ඇති අඟුටුමිට්ටකු විය. ඔහු ගේ හිස සිරුරට සාපේක්ෂව විශාල වූ අතර මෘගයකු ගේ වැනි මුහුණක් ද, සුදු පැහැයට හුරු කෙස් රොදට යටින් එබිකම් කල එකක් කොළ පැහැ හා අනෙක කළු පැහැ වූ අසමාන දැසක් ද ඔහුට හිමිව තිබින. ජොන් ඔහු දෙස බලා සිටියේ වශී වූවාක් මෙනි.

අවසානයටම පැමිණි වංශාධිපතියන් දෙදෙනා වූයේ ඔහු ගේ බාප්පා, නිශා රැකුමේ බෙන්ජීන් ස්ටාර්ක් සහ සිය පියා ගේ භාරකාරත්වය යටතේ වැඩෙන තියන් ග්‍රේජෝයි වූහ. ජොන්ව පසුකරද්දී බෙන්ජීන් ඔහුට උණුසුම් සිනාවකින් සංග්‍රහ කල අතර පුරුදු පරිදි තියන් ඔහුව නොදැක්කා සේ සිටියේ ය. මේ සියල්ලන්ම වාඩි ගත් පසු, කෙලවරක් නැති සවුදිය පිරීම් හා ස්තූති කතා වලින් පසු සාදය ආරම්භ විය.

ජොන් සිය මධු පානය ඇරඹූයේ ඒ අවස්ථාවේ දී වූ අතර ඔහු තවමත් නවත්වා නොමැත.

මේසයට යටින් යමක් ඔහු ගේ පාදයේ දැවටුනි. පහත බැලූ ජොන් දුටුවේ ඔහු දෙස බලා සිටින රතු පැහැ දෑසකි. "උඹට ආයෙමත් බඩගිනි වෙලාද?" ඔහු ඇසීය. මේසය මත තිබුනු බදින ලද කුකුළා සිය පිහියා තුඩින් ගත් ජොන් එය දෙපා අතරින් බිම හෙලූ අතර ගෝස්ට් නිහඬවම තම සංග්‍රහය භුක්ති විඳින්නට විය. ඔහු ගේ සොයුරු සොයුරියන්ට සිය වෘකයන්ව සාදයට කැඳවාගෙන ඒමට අවසර ලැබී නොතිබින. එනමුදු ශාලාවේ මෙම

අන්තයේ මේස අතර ඕනෑ තරම් පර බල්ලන් සැරිසැරූ අතර ජොන් ගේ වෘක පැටවා ගැන කිසිවෙකුත් කිසිවක් නොකී ය. ඒ අතිනුත් තමා වාසනාවන්ත බව ඔහු තමාටම කියා ගති.

දුම නිසා ඔහු ගේ දෑස් දැවෙන්නට වූ අතර අල්ලෙන් දෑස් පොඩි කර තවත් වයින් උගුරක් ගිල දැමූ ජොන් දිගටම සිය වෘක පැටවා කුකුළාව ගිල දමන දෙස බලා සිටින්නට විය.

මේස අතර සැරිසරමින් සිටි කහ පැහැ දෑසින් යුතු කළු බැල්ලකට කුකුළා ගේ ඉව දැනින. නැවතුනු උෟ බංකුවට යටින් රිංගුවේ පහසු සංග්‍රහයක් භුක්ති විඳීමේ බලාපොරොත්තුවෙනි. කිසිවක් නොකල ජොන් මේ සට්ඨනය දෙස බලා සිටින්නට විය. උගුරට යටින් පහත් ගෙරවුම් හඬක් පිට කල බැල්ල සිය ගොදුරට කිට්ටු කලාය. ඉහළ බැලූ ගෝස්ට් නිහඬවම රත් පැහැ දෑසින් සිය ප්‍රතිමල්ලවයා මැන බැලී ය. උෟට වඩා තුන් ගුණයක් විශාල වූ බැල්ල අභියෝගාත්මක ගෙරවීමක් කලද ගෝස්ට් සෙලවුනේවත් නැත. ඒ වෙනුවට නැගිට සිටි උෟ මුව අයා දත් විලිස්සුවේ ය. තිගැස්සුනු බැල්ල, මේ සටන ගැන නැවත වරක් සිතා බලා දෝ ආපසු හැරී පරාජිත ලීලාවෙන් පසු බසින්නට වූ අතර ගෝස්ට් නැවතත් සිය ආහාරය වෙත අවධානය යොමු කලේ ය. සතුටින් නියවූ ජොන් පහතට නැඹුරු වී වෘක පැටවා ගේ සුදු පැහැ ලොම් පිරිමැද්දේ ය. හිස උස්සා ඔහු ගේ අත ලෙව කෑ පැටවා නැවත කෑම කන්නට විය.

"මේ ඉන්නෙ මට අහන්ට ලැබුන සෝරවෘකයෙක්ද?" සුපුරුදු හඬක් ඔහු අසලින් නැගුනි.

ඔහු වෘක පැටවා ගේ හිස අත ගෑ පරිද්දෙන්ම බෙන්ජින් ඔහු ගේ හිස අතගාද්දී ජොන් සතුටින් හිස ඔසවා බැලී ය. "ඔවු. උගේ නම ගෝස්ට්."

කකුල් දෙපසට දමා බංකුව මත වාඩි වුනු බෙන්ජින් ස්ටාර්ක් ජොන් ගේ අතේ තිබුනු වයින් කුසලාණ උදුරා ගත්තේ ය. "සමර්වයින්." උගුරක් තොල ගෑ ඔහු තෙපලී ය. "මේකට ගහන්ට දෙයක් නෑ. උඹ කෝප්ප කීයක් බිවුවද ජොන්?"

කිසිවක් නොකී ජොන් සිනාසුනි.

බෙන් ස්ටාර්ක් ද සිනහවක් පෑවේ ය. "හා! මං හිතුවා හරි එහෙනං. කොහොමවුනත් මට මතක හැටියට මං ඉස්සෙල්ලාම කණ පැලෙන්ට බීවෙ උඹටත් වඩා ලාබාල වයසෙදි." අසල තිබුනු පිඟානකින් බදින ලද එළු ගෙඩියක් ගත් ඔහු එය හපන්නට විය.

ඔහු ගේ බාප්පා තියුණු පෙනුමකින් යුත් කෙට්ටු පුද්ගලයකු විය. ඔහු ගේ අළු-නිල් පැහැ දෑසේ නිතරම සිනහවක සේයාවක් දක්නට හැකි විය. නිශා රැකුමේ සෙබළෙකුට ගැලපෙන පරිද්දෙන් ඔහු සම්පූර්ණ කළු පැහැ ඇඳුමින් සැරසී සිටියේ ය. කළු විල්ලූද, උස් හම් සපත්තු හා රිදී ගාංචුවක් සහිත පුළුල් ඉණ පටියක් පැළඳ සිටි ඔහු ගේ කරේ සණකම් රිදී දම්වැලක් එල්ලී තිබින. බෙන්ජීන් විමතියෙන් මෙන් ගෝස්ට් දෙස බලා සිටින්නට විය. "බොහොම නිශ්ශබ්ද වෘකයෙක්."

"ඌ අනිත් එවුං වගේ නෙවෙයි. ඌ කවදාවත් සද්ද කරන්නෙ නෑ. ඒකයි මං ඌ ගෝස්ට් කියලා නම දැම්මෙ. අනික ඌ සුදු පාට නිසා. අනිත් එවුං සේරම තද පාටයි, කළු නැත්තං අළු."

"ප්‍රාකාරෙන් එහා පැත්තෙ තාමත් සෝරවෘකයො ඉන්නවා. අපි මුරසංචාර යද්දී ඇහෙනවා උං කෑ ගහන සද්දෙ. උඹ සාමාන්‍යයෙන් උඹේ සහෝදරයොත් එක්ක මේසෙට වාඩි වෙලා නේද කන්නෙ?"

"ගොඩක් වෙලාවට. ඒ වුනාට අද රෑ ස්ටාර්ක් ආර්යාව හිතුවා අවජාතකයෙක් එයාලත් එක්ක එක මේසෙ වාඩිවෙන එක රජ පවුලට අවනම්බුවක් වෙයි කියලා"."

"මට තේරුනා." ඔහු ගේ බාප්පා උරහිසට උඩින් හිස හරවා ශාලාවේ ඈත කොණේ ඇති උස් වේදිකාව දෙස බැලී ය. "මගේ සහෝදරයා අද රෑ එච්චර උත්සවශ්‍රීයෙන් ඉන්නවා වගේ පේන්නෙ නෑ."

ජොන් මෙයද නිරීක්ෂණය කර තිබින. අවජාතකයෙකු හැම දෙයක්ම නිරීක්ෂණය කරන්නට ඉගෙන ගත යුතුය. මිනිසුන් ගේ දෑස් පිටුපස සැඟවී ඇති සත්‍යය වටහා ගැනීමට ඉගෙන ගත යුතුය. ඔහු ගේ පියා ආගන්තුක සත්කාර සියල්ලක් ගැනම සොයා බැලූ නමුදු ජොන් ඔහු වෙතින් කලාතුරකින් දැක ඇති අන්දමේ දැඩි ගතියක් අද රෑ ඔහු වෙතින්

විද්‍යාමාන විය. ඔහු වචන ස්වල්පයක් දෙඩූ අතර කිසිවක් නොදුටු දෑසින් ශාලාවට ඉහළින් බලා සිටින්නට විය.

ආසන දෙකකට එහායින් සිටි රජතුමා මුළු රෑ පුරාවටම නොනවත්වා සුරා පානය කරන්නට විය. ඔහු බොහෝ වාරයක් සවුදිය පිරූ අතර සෑම විහිළුවකටම මහ හඬින් සිනාසෙමින් හා කුසගින්නේ සිටින මිනිසෙකු මෙන් අතට එන සෑම කෑම පිඟානක්ම ගිල දමමින් සිටි නමුත් ඔහු පසෙකින් සිටි රැජිණ සීතල අයිස් ප්‍රතිමාවක් පරිද්දෙන් බලා සිටියා ය.

Jon Snow: “What do you know about being a bastard?”

"රැජිණත් තරහින් ඉන්නෙ." ජොන් සිය බාප්පාට කෙඳිරුවේ ය. "තාත්තා අද දවල් රජතුමා එක්කරන් ගියා පහළ සොහොන් ගෙවල් බලන්ට. රැජිණ ඒකට එච්චර කැමැති වුනේ නෑ."

බෙන්ජන් ජොන් දෙස පරීක්ෂාකාරී මැන බලන අන්දමේ බැල්මක් හෙළී ය. "උඹට කිසිම දෙයක් ලේසියෙන් මග ඇරෙන්නෙ නෑ නේද ජොන්? උඹ වගේ එකෙක් අපට ප්‍රාකාරෙදි ගොඩක් ප්‍රයෝජනවත් වෙයි."

ජොන් ආඩම්බරයෙන් පිරී ගියේ ය. "රොබ් ලන්සෙන් සටන් කරද්දි මට වඩා ගොඩක් ඉස්සරහින් ඉන්නෙ. ඒ වුනාට මං තමා කඩු හරඹෙට දක්ශයා. අනික හලන් කියනවා මං බලකොටුවෙ අනිත් ඕන කෙනෙක් තරම්ම හොඳින් අශ්වයා පිටේ යනවා කියලා."

"සැලකිය යුතු මට්ටමේ දෙයක්."

"ඔයා ආයෙමත් ප්‍රාකාරෙට යනකොට මාවත් එක්කරන් යන්ට. ඔයා ඇහුවොත් තාත්තා බෑ කියන එකක් නෑ. මං දන්නවා."

බෙන්ජින් ඔහු ගේ මුහුණ දෙස පරීක්ෂාවෙන් බැලී ය. "ප්‍රාකාරෙ කියන්නෙ කොල්ලෙකුට හරිම අමාරු තැනක් ජොන්."

"මං දැන් ගොඩක් දුරට වැඩුන මිනිහෙක්." ජොන් විරෝධය පෑවේ ය. "ඊළඟ උපන්දිනේට මට පහළොව ලබනවා. මේස්ටර් ලූවින් කියන්නෙ අවජාතකයො අනිත් සාමාන්‍ය ළමයින්ට වඩා ඉක්මනින් වැඩෙනවා කියලයි."

"ඒක ඇත්ත." මේසය මත තිබුනු ජොන් ගේ කුසලාණ අතට ගෙන නැවත වයින් පුරවා ගත් බෙන්ජින් ලොකු උගුරක් බීවේ ය.

"ඩෝර්න් යටත් කරද්දි ඩේරන් ටාර්ගේරියන්ට අවුරුදු දාහතරයි." ජොන් කීය. මේ තරුණ මකරා ජොන් ගේ ලෝකයේ එක් වීරයකු විය.

"මුළු ගිම්හානයක් පුරාවටම සිද්ධ වෙච්ච යුද්ධයක්. ඩෝර්න් අල්ලන්ට එයා මිනිස්සු දහදාහක් බිල්ලට දුන්නා. ඒක රැකගන්ට එයාට තව පනස්දාහක් බිලිදෙන්ට වුනා. කවුරු හරි එයාට කියන්ට තිබුනා යුද්ධය කියන්නෙ සෙල්ලමක් නෙවෙයි කියලා." ඔහු තවත් වයින් උගුරක් බීවේ ය. "අනිත් එක, ඩේරන් ටාර්ගේරියන් මැරෙද්දි එයාට යාන්තං දහඅටක් වුනා විතරයි. උඹට ඒ කෑල්ල අමතක වුනාද?"

"මට මොකුත් අමතක වෙලා නෑ." ජොන් කීය. පානය කරන්නට යෙදුනු වයින් විසින් ඔහුව එඩිතර කර ඇත. ඔහු කොන්ද කෙලින් කර හිඳගත්තේ වඩාත් උස් බවක් පෙන්වීමට ය. "මට නිශා රැකුම් බලකායෙ සේවය කරන්ට ඕන බාප්පෙ."

රාත්‍රියේ සිය සොයුරන් ඔහු අවට නිදා සිටිද්දී නිදි ඇඳේ සිටි ජොන් බොහෝ වාරයක් මේ ගැන තදින් සිතා බලා තිබින. මතු යම් දිනෙක රොබ් වින්ටර්ෆෙල්හි හිමිකරුවා වනු ඇත. උතුරේ අධිපතියා වශයෙන් ඔහු සුවිසල් හමුදාවන්ට අණ දෙනු ඇත. බ්‍රැන් හා රිකන් රොබ් ගේ ධජ ඔසවාගෙන යනු ඇති අතර ඔහු ගේ නමින් බලකොටු පාලනය කරනු ඇත. ඔහු ගේ සොයුරියන්, ආර්යා හා සන්සා, වෙනත් උසස් වංශවත් පවුල්වල උරුමක්කරුවන් හා විවාහ වී දකුණේ පිහිටි එම බලකොටුවල ස්වාමි දූන් මෙන් යනු ඇත. නමුදු ඔහු වැනි අවජාතකයෙකුට කවර නම් ස්ථානයක් හිමි වනු ඇත්ද?

"උඹ ඔය අහන්නෙ මොකක් ගැනද කියලා උඹට තවම හරියට තේරුමක් නෑ ජොන්. නිශා රැකුම කියන්නෙ දිවුරුම් දුන්න සහෝදරත්වයක්. අපට පවුල් නෑ. අපේ කිසිම කෙනෙකුට කවදාවත් ළමයෙකුට තාත්තා කෙනෙක් වෙන්ට බෑ. රාජකාරිය කියන්නෙ අපේ ගෑනි. ගෞරවය කියන්නෙ අපේ හොර ගෑනි."

"අවජාතකයෙකුට වුනත් ගෞරවයක් ලබන්ට පුළුවන්. මං සූදානම් නිශා රැකුම වෙනුවෙන් දිවුරන්ට."

"උඹ අවුරුදු දාහතරක කොල්ලෙක්. උඹ මිනිහෙක් නෙවෙයි. තාම මිනිහෙක් නෙවෙයි. උඹ ගෑනියෙක් එක්ක එකතු වෙනකං උඹට තේරෙන්නෙ නෑ උඹ ඔය මොකක්ද නැති කරගන්ට යන්නෙ කියලා."

"මං ඒ ගැන වදවෙන්නෙ නෑ."

"උඹ වදවෙයි, උඹ දන්නවනං මොකක්ද ඒකෙ තේරුම කියලා." බෙන්ජින් කීය. "ඒ දිවුරුම නිසා උඹට මොනා මොනා නැති වෙනවද කියලා උඹ දන්නවනං උඹ ඒකට ඔච්චර උනන්දු වෙන්නෙ නෑ පුතා."

සිය සිරුර තුළ කේන්තිය නැග එනු ජොන්ට දැනුනි. "මං උඹේ පුතා නෙවෙයි."

බෙන්ජින් ස්ටාර්ක් නැගිට්ටේ ය. "ඒක බොහොම කණගාටුවට කාරණයක්." ඔහු ජොන් ගේ උරහිස මත අතක් තැබී ය. "උඹේම අවජාතකයො කීප දෙනෙකුට තාත්තා වුනාට පස්සෙ ආයෙමත් ඇවිත් මාව හම්බ වෙයං. එතකොට අපි බලමු උඹට කොහොමද හිතෙන්නෙ කියලා."

ජොන් වෙවුලා ගියේ ය. "මං කවදාවත් අවජාතකයෙකුට තාත්තා වෙන්නෙ නෑ. කවදාවත් නෑ." ඔහු ගේ වදන් විෂ මෙන් පිටතට විද්දේ ය.

හදිසියේම ජොන්ට පෙනී ගියේ මුළු මේසයම සිය කතා නවත්වා ඔහු දෙස බලා සිටින බවයි. සිය දෑස් අගින් කඳුළු උනනු ඔහුට දැනුනු අතර ඔහු නැගී සිටියේ ය.

"මට සමාවෙන්ට." සිය අවසාන ගරුත්වය කැටි කර ගනිමින් ජොන් කීය. සැනෙන් ආපසු හැරුනු ඔහු ඉදිරියට යාමට පියවර එසෙවුවේ ඔවුන් ඔහු ගේ කඳුළු දකිනු ඇතැයි යන බියෙනි. සිතුවාට වඩා වැඩිපුර ඔහු වයින් බී ඇති සේ ය. දෙපා පැටලුනු ඔහු පැත්තකට ඇලවී ගොස් සේවිකාවක ගේ සිරුරේ හැපීම නිසා ඈ අත තිබුනු වයින් ගුරුලේත්තුවක් විසි වී ගොස් බිම වැටී බිඳුනි. ඔහු වටකර දසතින්ම සිනා හඬ ඇසෙන්නට වූ අතර සිය කම්මුල් දිගේ කඳුළු වැල් ගලා යනු ජොන්ට දැනින. කවුරුන් හෝ කෙනෙකු ඔහුව කෙලින් කිරීමට උත්සාහ කල අතර ඔහු ගේ ග්‍රහනයෙන් මිදුනු ජොන් අඩක් නොපෙනෙන දෑසින් යුතුව දොර දෙසට දිව ගියේ ය. ගෝස්ට් ද ඔහු පසුපසින් පිටත රාත්‍රී අන්ධකාරය වෙතට දිව ගියේ ය.

පිටත අංගනය හිස් සහ නිශ්ශබ්ද වූ අතර ඇතුළත ප්‍රාකාරය මුදුනේ තනි මුර සෙබළෙක් පමණක් මුරකාවලෙහි යෙදී සිටියේ ය. ඒ හැරෙන්නට බලකොටුව අඳුරු හා පාළු එකක් මෙන් පෙනින. ජොන් වරක් අත හැර දැමුනු බලකොටුවක් දැක තිබුනු අතර ඔහුට අද රාත්‍රියේ වින්ටර්ෆෙල් දුටු විට සිහි වූයේ එම බලකොටුව ය.

ඔහුට පිටුපසින් තිබුනු ජනේලයෙන් සංගීතය හා අනෙකුත් ශබ්ද පිටතට ගලා ආවේ ය. ජොන්ට අසන්නට අවශ්‍ය වූ අවසානම දෙය එය වූ අතර සිය කමිස අතින් දෑසේ කඳුළු පිස දැමූ ඔහු ආපසු යන්නට හැරුනි.

"කොල්ලා." කවුදෝ ඔහු ඇමතී ය. ජොන් හඬ ආ දෙසට හැරුනි.

ප්‍රධාන ශාලාවට ඇතුළුවන දොරටුවට ඉහළින් වූ ගැටිය මත ටිරියන් ලැනිස්ටර් වාඩි වී සිටියේ ය. කුරුමිට්ටා ඔහු දෙස බලා සිනාසුනි. "ඔය සතා වෘකයෙක්ද?"

"සෝරවෘකයෙක්. උගේ නම ගෝස්ට්." ඔහු කුඩා මිනිසා දෙස බලාගත්වනම සිටියේ ය. "ඔබ මොකද ඔතනට වෙලා කරන්නෙ? ඇයි ඔබ භෝජන සංග්‍රහයට සහභාගි වෙන්නෙ නැත්තෙ?"

"ඇතුළෙ හරි රස්නෙයි. සද්දෙත් වැඩියි. අනෙක මං ඕනවටත් වඩා වැඩිපුර වයින් බිව්වා. බොහොම කාලෙකට ඉස්සර මං ඉගෙනගත්ත දෙයක් තමා තමන්ගෙ සහෝදරයගෙ ඇඟට වමනෙ දාන එක හරිම අශෝබන දෙයක් කියලා. මට උඹේ වෘකයව ළඟට කිට්ටුවෙලා බලන්ට පුළුවන්ද?"

ජොන් තැතනුවේ ය. ඊට පසු හෙමිහිට හිස සැලීය. "ඔබට බිමට බහින්ට පුළුවන්ද? නැත්තං මං ඉණිමගක් අරන් එන්ටද?"

"අනේ පලයං බං යන්ට." කුඩා මිනිසා කීවේ ය. ඊළඟ මොහොතේ ඔහු හිඳ සිටි ගැටියෙන් පිටතට පැන්නේ ය. තිගැස්සුනු ජොන් මවිතයෙන් බලා සිටියේ බෝලයක් මෙන් වක ගැසී ගුවනට පිනූ ටිරියන් ලැනිස්ටර් සැහැල්ලු අන්දමින් සිය දෑත් මතින් පොළවට පතිත වී ඒ සැනින් දෙපයින් සිටගන්නා අන්දමය.

ගෝස්ට් නොසන්සුන් අයුරින් ඔහුගෙන් ඈත් වුනි.

සිය ඇඳුම්වල දූවිලි ගසා දැමූ කුරුමිට්ටා සිනාසුනි. "මං හිතන්නෙ මං උඹේ වෘකයා බය කලයි කියලා. මට සමාවෙන්ට."

"ඌ බය වෙලා නෑ." ජොන් පිළිතුරු දුන්නේ ය. බිම දණගැසූ ඔහු වෘකයා ඇමතී ය. "ගෝස්ට්. මෙහෙ වරෙන් හොඳ එකා වගේ. ආන්න එහෙම."

වෘක පැටවා හෙමිහිට විත් සිය හොම්බ ජොන් ගේ මුහුණේ ඇතිල්ලුවේ ය. එහෙත් ඌ ටිරියන් ලැනිස්ටර් දෙස පරීක්ෂාකාරී ඇසක් යොමාගෙන සිටියේ ය. කුරුමිට්ටා ඌ සුරතල් කිරීමට අත දිගු කල විට සැනෙන් පසුපසට ගිය ඌ නිහඬවම දත් විලිස්සී ය. "ඌ කුලැටියි නේද?" ලැනිස්ටර් කීය.

"ඉඳගනිං ගෝස්ට්." ජොන් අණ කලේ ය. "ආන්න හරි. හොඳ එකා. දැන් ඔහොම හෙල්ලෙන්නෙ නැතුව ඉඳපං." ඔහු කුරුමිට්ටා දෙස බැලුවේ ය. "ඔබට දැන් ඌව අල්ලන්ට පුළුවන්. ඌ මං කියනකං හෙල්ලෙන්නෙ නෑ. මං ඌ පුහුණු කරනවා."

"මට පේනවා." ලැනිස්ටර් කීය. ඔහු වෘක පැටවා ගේ හිස පිරිමැද්දේ ය. "හොඳ වෘකයා."

"මං මෙතන හිටියෙ නැත්තං ඌ ඔබේ බෙල්ල ඉරලා දාවි." ජොන් කීවේ ය. එය තවමත් සිදු විය නොහැකි දෙයක් වුවද පැටවා වැඩුන පසු අනිවාර්යයෙන්ම සිදු විය හැකි දෙයකි.

"එහෙමනං උඹ මගෙ කිට්ටුවෙන් ඉන්න එක කෝකටත් හොඳයි." කුරුමිට්ටා කීය. හිස පසෙකට ඇල කල ඔහු සිය අසමාන දෑසින් ජොන් දෙස බැලී ය. "මං ටිරියන් ලැනිස්ටර්."

"මං දන්නවා." ජොන් නැගිට්ටේ ය. ඔහු කුරුමිට්ටාට වඩා උස් වූ අතර එය ඔහු ගේ සිතේ අමුතුම හැඟීමක් ඇති කලේ ය.

"උඹ නෙඩ් ස්ටාර්ක්ගෙ අවජාතකයා නේද?"

සිය සිරුර පුරා සීතලක් දිව යනු ජොන්ට දැනුනි. සිය දෙතොල් තද කරගත් ඔහු කිසිවක් නොකීවේ ය.

"මං උඹෙ හිත රිද්දුවද? සමාවෙන්ට, කුරුමිට්ටො එච්චර නුවණැති එවුන් නෙවෙයි. පරම්පරා ගානක බම්මන්නො කරපු දේවල් නිසා මට කිසිම බයක් නැතුව ඕන කබල් ඇඳුමක් අඳින්ට පුළුවන්. කටට එන දෙයක් කියන්ට පුළුවන්." ඔහු නියෙවුවේ ය. "කොහොමවුනත් උඹ තමා අවජාතකයා නේද?"

"එඩ්ඩාර්ඩ් ස්ටාර්ක් උතුමාණන් කියන්නෙ මගෙ තාත්තා තමා." ජොන් පිළිගත්තේ ය.

ලැනිස්ටර් ඔහු ගේ මුහුණ අධ්‍යයනය කරන්නට විය. "ඔවු. මට ඒක පේනවා. උඹේ සහෝදරයන්ට වඩා උඹේ මූනෙ උතුරුකරේ පෙනුම තියෙනවා."

"මගේ අර්ධ සහෝදරයො." ජොන් ඔහුව නිවැරැදි කලේ ය. කුරුමිට්ටා කී දේ නිසා ඔහු ගේ සිතේ සතුටක් ඇතිවුවද ඒ බැව් නොපෙන්වීමට ඔහු තැත් කලේ ය.

"මං උඹට පොඩි අවවාදයක් දෙන්නං අවජාතකයො. උඹ කවුද කියන එක කවදාවත් අමතක කරන්ට එපා. මොකද අනිවාර්යයෙන්ම ලෝකයා ඒක අමතක කරන්නෙ නෑ. ඒක උඹේ ශක්තිය කරගනිං. එතකොට ඒක කවදාවත් උඹේ දුර්වල කම වෙන්නෙ නෑ. ඒකෙන් සන්නද්ධ වෙයං. එතකොට උඹට රිද්දන්ට ඒක පාවිච්චි කරන්ට පුළුවන් වෙන්නෙ නෑ."

ජොන් සිටියේ කිසිවෙකු ගේ අවවාදයක් පිළිගත හැකි මට්ටමේ මනෝභාවයක නොවේ. "ඔබ මොනාද දන්නෙ අවජාතකයෙක් වෙන එක ගැන?"

"හැම කුරුමිට්ටෙක්ම එයාගෙ තාත්තගෙ ඇස් දෙකට පේන්නෙ අවජාතකයෙක් වගේ."

"ඔබ ඔබේ අම්මාගෙ බඩෙන් නියම ආකාරයට ඉපදුන ලැනිස්ටර් කෙනෙක්."

"එහෙමද?" ටිරියන් පිළිතුරු දුන්නේ කර්කශ උපහාසයෙනි. "අනේ කරුනාකරලා ඒක ගිහිං කියපංකො මගෙ වංශාධිපති තාත්තට. මං ඉපදුනු ගමන් මගේ අම්මා මැරුනා. තාත්තා කවදාවත් ඒ කාරනේ ගැන විශ්වාසයක් තිබ්බෙ නෑ."

"මං දන්නෙ නෑ කවුද මගෙ අම්මා කියලවත්." ජොන් කීවේ ය.

"කවුරුහරි ගෑනියෙක්. කිසිම සැකයක් නෑ." ඔහු ජොන්ට දුක්බිත සිනහවකින් සංග්‍රහ කලේ ය. "මේක මතක තියාගනිං කොල්ලො. හැම කුරුමිට්ටෙක්ම අවජාතකයෙක් වෙන්ට පුළුවන්, ඒත් හැම අවජාතකයෙක්ම කුරුමිට්ටෙක් වෙන්ට ඕන නෑ." ඊළඟ

**මොහොතේ ආපසු හැරුනු ඔහු උරුවම් බාමින් අලස ලෙස ශාලාව දෙසට ඇවිද යන්නට විය. ඔහු ශාලාවේ දොර ඇරිය විටදී ඇතුළත ආලෝකය විසින් පිටත සෙණ්ඩුවාලුව පුරා ඔහු ගේ ඡායාව ඇඳ දැක්වී ය. එකම එක මොහොතකට ටිරියන් ලැනිස්ටර් රජෙකු තරම්ම උසට නැගී සිටියේ ය.**

Tyrion Lannister: "All dwarfs may be bastards, yet not all bastards need be dwarfs."

කැට්ලින්

වින්ටර්ෆෙල්හි මහ බලකොටුවේ සියළුම කාමර අතරින් උණුසුම්ම කාමර පෙළ වූයේ කැට්ලින් ගේ නිදන කාමරය යි. මේ කාමරය උණුසුම් කිරීම සඳහා ගින්නක් දැල්වීමට සිදුවූයේ ඉතා කලාතුරකිනි. බලකොටුව තනා තිබුනේ ස්වභාවික උණු දිය උල්පත් මත වූ අතර එයින් නැගුනු උණුසුම් වතුර බලකොටුවේ බිත්ති අතරින් දිව ගියේ හරියටම මිනිසකු ගේ සිරුරේ රුධිරය ගලන්නාක් මෙනි. මේ උණු දිය මගින් ගලින් කල කාමර හා ශාලා බිත්තිවල සහ ගෙබිමේ සීතල පලවා හැරිනි. උණුසුම් ගිම්හානයේ දී මෙය එතරම් වැදගත් දෙයක් නොවූවද ශීත කාලයේ දී එය ජීවිතයත් මරණයත් අතර වෙනස තීරණය කරන්නක් විය.

කැට්ලින් ගේ නාන බාල්දිය සෑම විටම උණු දියෙන් පිරී තිබුනු අතර ඇගේ කාමරයේ බිත්ති ඇල්ලූ විට උණුසුම අතට දැනින. මේ උණුසුම ඇයට සිහිපත් කලේ රිවර්රන්හි හිරු එළියේ ලයිසා හා එඩ්මුයර් සමග ඈ ගතකල අතීතය යි. නමුත් නෙඩ් කිසිමදාක මේ උණුසුමට ඔරොත්තු දුන්නේ නැත. ස්ටාර්ක්වරුන් නිර්මිතව ඇත්තේ සීතල වෙනුවෙන් බව ඔහු ඇට නිතරම කී දෙයක් වූ අතර එවිට ඇය සිනාසෙමින් කියන්නේ එසේනම් ඔවුන් සිය බලකොටුව ගොඩනංවා ඇත්තේ වැරැදි භූමිභාගයක බවයි.

කැට්ලින් ගේ සිරුරු මතින් ඉවත්ව ඇඳ මත රෝල් වී ගිය නෙඩ් එයින් බිමට බැස්සේ ය. කාමරය හරහා ඇවිද ගිය ඔහු සනකම් තිර රෙදි දෙපසට ඇද දමා උස් පටු කවුළු එකින් එක විවෘත කලේ රාත්‍රියේ සීතල වාතයට කාමරය තුළට වැදීමට අවකාශ සලසමිනි.

සීතය දුරු කරනු වස් සිය ලොම් පොරෝණාව නිකට තෙක් ඇදගත් කැට්ලින් නිහඬවම නෙඩ් දෙස බලා සිටින්නට විය. නිරුවතින් කවුළුව අසල සිට පිටත අන්ධකාරය දෙස බලා සිටි ඔහුව පෙනුනේ පමණට වඩා කුඩා දුර්වල පුද්ගලයකු, හරියටම මීට වසර පහළොවකට පෙර රිවර්රන්හි සප්තක දේවස්ථානයේ දී ඇගේ අතිනත ගත් තරුණයා මෙනි. ඔහු ගේ ඉක්මන් අනුරාගී හැසිරීම නිසා ඇගේ යටිකය තවමත් රිදුම් දුනි. එනමුදු එය මිහිරි වේදනාවක් විය. ඔහු ගේ දරුවකු කුස පිළිසිඳගන්නේ නම් යැයි ඇය ප්‍රාර්ථනා කලා ය. රිකන් ලැබී දැන් තුන් වසරකි. ඇය තවමත් වියපත් වී නැත. ඔහුට තවත් පුතෙකු ලබා දීමේ හැකියාව තවමත් ඇය සතුය.

"මං එයාගෙ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා." නෙඩ් පැවසුයේ ඇය දෙසට හැරෙමිනි.

කැට්ලින් ඇඳ මත වාඩි වූවා ය. "ඔයාට එහෙම කරන්ට බෑ. ඔයා එහෙම කරන්ට ඕනත් නෑ."

"මගේ රාජකාරි තියෙන්නෙ මේ උතුරේ. මට රොබර්ට් ගෙ අත වෙන්ට ඕනකමක් නෑ."

"එයා ඒක තේරුම් ගන්න එකක් නෑ. එයා දැන් රජ කෙනෙක්. රජවරු කියන්නෙ අනිත් මිනිස්සු වගේ ජාතියක් නෙවෙයි. ඔයා එයාගෙ යෝජනාව ප්‍රතික්ෂේප කලොත් එයා කල්පනා කරයි ඒ ඇයි කියලා. ඊට පස්සෙ එයා සැක කරන්ට පටන් ගනියි ඔයා එයාට විරුද්ධයි කියලා. ඔයාට පේන්නෙ නැද්ද එහෙම වුනොත් ඔයා අපි හැමෝවම කොච්චර ලොකු අනතුරකටද ඇදලා දාන්නෙ කියලා?"

නෙඩ් හිස වැනුවේ ඇය කියන දේ විශ්වාස නොකරන අන්දමිනි. "රොබර්ට් කවදාවත් මට වත්, ඔයාට වත්, අපේ ළමයින්ට වත් හානියක් කරන්නෙ නෑ. අපි දෙන්නා සහෝදරයො දෙන්නෙකුටත් වඩා ළඟින් ආශ්‍රය කලේ. මිනිහා මට ආදරෙයි. මං ඒ යෝජනාව ප්‍රතික්ෂේප කලොත් මිනිහා පොඩ්ඩක් ගොරවයි, මට සාප කරයි. ඒත් සතියකට පස්සෙ මිනිහා මගෙත් එක්කම හිනාවෙයි වෙච්ච වැඩේට. මං මිනිහව දන්නවා."

"ඔයා ඒ මිනිහව දැනගෙන හිටියා. ඒ වුනාට රජතුමා කියන්නෙ ඔයා නොදන්න අමුත්තෙක්." උගුරේ ඇනුනු මුව අං කැබැල්ලක් සහිතව හිම මත මියගොස් සිටි සෝරවෘකයා ඇයට සිහි විය. ඔහුට සත්‍යය වටහා දීම ඇගේ යුතුකමයි. "ආත්මාඩම්බරය කියන්නෙ රජෙකුට බොහොම වටිනා දෙයක් මගෙ උතුමානෙනි. රොබර්ට් මෙච්චර දුරක් ගෙවාගෙන ආවෙ ඔයාව දැකලා ඔයාට මේ ගෞරවය ලබාදෙන්ට. ඔයාට ඒක ආපහු එයාගෙ මූනට දමලා ගහන්ට බෑ."

"ගෞරවය?" නෙඩ් කටුක සිනහවක් පෑවේ ය.

"එයාට පේන විදියට ඒක ගෞරවයක් තමා."

"ඔයාට පේන්නෙ?"

"මටත් එහෙම තමා පේන්නෙ." කැට්ලින්ට මේ වනවිට කේන්ති එන්නට පටන් ගෙන තිබින. ඔහු මෙය හරිහැටි නොදකින්නේ ඇයි? "එයා එයාගෙ පුතා අපේ දුවට විවාහ කරලා දෙන්ට යෝජනා කරනවා. ඔයාට ඒක ගෞරවයක් වගේ නෙවෙයිද පේන්නෙ? සන්සා දවසක මේ රාජධානියෙ රැජිණ වෙයි. එයාගෙ පුතාලා දවසක මේ රාජධානිය පාලනය කරයි උතුරේ ප්‍රාකාරෙ ඉඳන් දකුණේ ඩෝර්න්වලට යනකං. මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද?"

"දෙයියම්පා කැට්ලින්, සන්සාට තාම එකොළහයි. අනික ජොෆ්රි... ජොෆ්රි කියන්නෙ..."

ඇය ඔහු වෙනුවෙන් වාක්‍යය සම්පූර්ණ කලාය. "ඔටුන්න හිමි කුමාරයා. යකඩ සිංහාසනයේ උරුමක්කාරයා. අනික මගේ තාත්තා මාව ඔයාගෙ සහෝදරයා බ්‍රැන්ඩන්ට පොරොන්දු වෙනකොට මට යාන්තං අවුරුදු දොළහයි."

මේ මතකය ඔහු ගේ මුවට තිත්ත රසක් ගෙන ආවේය. "බ්‍රැන්ඩන්. හරි බ්‍රැන්ඩන් නං දන්නවා මොකක්ද දැන් කරන්ට ඕන කියලා. එයා හැමදාමත් දැනගෙන හිටියා මොකක්ද කරන්ට ඕන කියලා. මේ හැම දෙයක්ම එයාටයි ලැබෙන්ට තිබුනෙ. ඔයා, වින්ටර්ෆෙල්, මේ හැම දෙයක්ම. එයා ඉපදුනේම රජෙකුගෙ හස්තය වෙන්ට, රැජිණකට තාත්තා කෙනෙක් වෙන්ට. මං කවදාවත් ඉල්ලුවෙ නෑ මේ කුසලාණ මට දෙන්ටයි කියලා."

"සමහරවිට නොඉල්ලන්ට ඇති. ඒත් දැන් බ්‍රැන්ඩන් මැරිලා. කුසලාණ ඔයාගෙ අතට ලැබිලා. ඔයා කැමැති වුනත් නැතත් දැන් ඒකෙන් බොන්ට ඕන."

නෙඩ් ඇයගෙන් ඉවතට, නැවතත් රාත්‍රිය දෙසට හැරුනේ ය. එසේ සිටගත්වනම පිටත අන්ධකාරය දෙස - සමහරවිට සඳ, තරු හෝ පවුරු මත සිටින මුර සෙබළුන් දෙස හෝ - බලා සිටින්නට විය.

ඔහු පෙලන වේදනාව තේරුම්ගත් කැට්ලින් ගේ සිත මොලොක් විය. චාරිත්‍රය විසින් නියම කෙරුනු අන්දමට බ්‍රැන්ඩන් වෙනුවට එඩ්ඩාර්ඩ් ස්ටාර්ක් ඈ හා විවාහ වූවද තවමත් ඔවුන් දෙදෙනා අතරට ඔහු ගේ මියගිය සොයුරා ගේ සෙවනැල්ල වැටී තිබිනි. ඔහු ගේ සෙවනැල්ල සහ අනෙක් කාන්තාව ගේ, ඔහු කිසිදා නම නොපවසන කාන්තාව ගේ, ඔහුට සිය අවජාතක පුත්‍රයා ලබා දුන් කාන්තාව ගේ සෙවනැල්ල වැටී තිබිනි.

ඔහු වෙතට යාමට ඇය සිතනවාත් සමග දොරට තට්ටු කරන අනපේක්ෂිත හඬ ඇසිනි. නෙඩ් රවාගත් මුහුණින් ආපසු හැරුනේ ය. "මොකක්ද ඒ ගමන?"

දොරට පිටින් ඩෙස්මන්ඩ් ගේ කටහඬ ඇසිනි. "මගේ උතුමානෙනි, මේස්ටර් ලුවින් ඇවිල්ලා ඉන්නවා ඉතාම ලොකු හදිසියකට ඔබතුමාව බැහැ දකින්ට අවශ්‍යයි කියලා."

"උඹ එයාට කිවුවද මට බාධා කරන්ට එපයි කියලා නියෝගයක් දීලා තියෙන්නෙ කියලා?"

"එහෙමයි මගෙ උතුමානෙනි. ඒත් එයා බල කර සිටිනවා."

"හොඳයි. එයාව ඇතුළට එවන්ට."

ඇඳුම් අල්මාරිය වෙත ගිය නෙඩ් ඝනකම් ලෝගුවක් හැඳ ගත්තේ ය. ශීතය කෙතරම් අධික වීදැයි හදිසියේ තේරුම් ගත් කැට්ලින් ඇඳ මත හිඳගෙන සිය ලොම් පොරෝණය නිකට තෙක් උස්සා ගත්තා ය. "අර ජනෙල් ටික වැහුවොත් හොඳ නැද්ද?" ඇය යෝජනා කලාය.

ඔහු නිහඬවම හිස සැලූ අතර මේස්ටර් ලුවින් කාමරය තුළට පිවිසියේ ය.

තමා පසුපසින් දොර වැසෙන තෙක් මේස්ටර් වදනකුදු නෙපලූයේ නැත. "මගේ උතුමානෙනි. ඔබතුමාගෙ විවේකයට බාධා කලාට සමාවෙන්ට. මට පණිවුඩයක් ලැබිලා තියෙනවා."

නෙඩ් ගේ මුහුණේ වූයේ පීඩාකාරී පෙනුමකි. "ලැබිලා තියෙනවා? කාගෙන්ද? අශ්වාරෝහකයෙක් ආවද? මට කවුරුවත් කිවුවෙ නෑ."

"අශ්වාරෝහකයෙක් ආවෙ නෑ මගේ උතුමානෙනි. මට පොඩි නින්දක් ගිහින් තියෙන අතරේ මගේ නිරීක්ෂණාගාරෙ මේසයක් උඩ කැටයම් කපපු ලී පෙට්ටියක් දාලා ගිහිල්ලා තියෙනවා. මගේ සේවකයො කවුරුවත් එනවා දැකලත් නෑ. ඒ වුනත් ඒක ගෙනල්ලා තියෙන්නෙ රජතුමාගෙ පිරිවරත් එක්ක ආපු කවුරු හරි වෙන්ට ඕන. අපට දකුණුකරෙන් වෙන අමුත්තො කවුරුවත් ආවෙ නෑ."

"ලී පෙට්ටියක්?" කැට්ලින් ඇසුවා ය.

"ඒක ඇතුළෙ තිබුනෙ නිරීක්ෂණාගාරයට උවමනා කරන අලුත් වීදුරු කාචයක්. පේන හැටියට නං ම(ර්) වලින් ගෙනාපු එකක්. ම(ර්) වල කාච හදන්නො තමා දැනට ඉන්න සුපිරිම වීදුරු වැඩකරුවො."

"කාචයක්? මොකක්ද මට ඒකෙන් ඇති වැඩේ?" නෙඩ් ඇසී ය.

"මාත් ඒ ප්‍රශ්නෙම ඇහුවා." මේස්ටර් ලූවින් පැවසී ය. "පැහැදිලිවම මේකෙ මතුපිටින් පේන දේට වඩා යමක් තියෙනවා."

සණකම් ලොම් රෙද්ද යට සිටියදී පවා කැට්ලින් වෙවුලුවා ය. "කාචයක් කියන්නෙ අපට බලන්ට උපකාරී වෙන දෙයක්."

"අනිවාර්යයෙන්ම." මේස්ටර් සිය කබායේ කර වටා ඇඟිල්ල කරකැවී ය. සිය නිකායේ සම්ප්‍රදායට අනුව එකිනෙකට වෙනස් ලෝහ වර්ග ගනනාවකින් සැදුනු පුරුක් ඇමිනූ ඝනකම් දම්වැලක් ඔහු ගේ ගෙල වටා විය.

සිය සිරුර පුරා භීතිය දිව යනු නැවතත් කැට්ලින්ට දැනින. "අපි මොකක් දිහා පැහැදිලිව බලන්ටද එයාලට ඕන?"

"ඒකම තමා මාත් ඇහුවෙ." මේස්ටර් සිය කබා අතේ රහස් සාක්කුවකින් දැඩිව රෝල් කල කඩදාසියක් පිටතට ගත්තේ ය. "ඒ කාවය දාපු පෙට්ටියෙ රහස් පතුලක හංගලා තිබිලා ඇත්ත පණිවුඩේ මට හම්බවුනා. ඒත් ඒක මගේ ඇස්වලට නෙවෙයි."

නෙඩ් අත දිගු කලේය. "මෙහෙ දෙන්ට ඒක."

මේස්ටර් සෙලවුනේ නැත. "සමාවෙන්ට මගෙ උතුමානෙනි. ඒත්, ඒ පණිවුඩය ඔබටත් නෙවෙයි. ඒකෙ සටහන් කරලා තියෙන්නෙ කැට්ලින් ආර්යාවගෙ ඇස්වලට පමණයි කියලා. මම ඒක දෙන්ටද ආර්යාවෙනි?"

වචනයක්වත් කියා ගත නුහුනු කැට්ලින් හිස වැනුවා ය. ඇඳ අසල වූ කුඩා මේසය මත පණිවුඩය තැබූ මේස්ටර් ඇයට හිස නමා නැවත පිටව යාමට සැරසුනේ ය. පණිවුඩය මුද්‍රා තබා තිබුනේ නිල් පැහැ ඉටි වලින් බව කැට්ලින් දුටුවා ය.

"නවතින්ට." මේස්ටර්ට කී නෙඩ් කැට්ලින් දෙස බැලී ය. "මොකක්ද ඒක? මගේ ආර්යාවෙනි, ඔයා වෙවුලනවා."

"මට බයයි!" කැට්ලින් කීවා ය. මේසය දෙසට නැඹුරු වූ ඇ වෙවුලන ඇඟිලි තුඩින් පණිවුඩය ගත්තා ය. නිල් පැහැ ඉටි මත මුද්‍රා තබා තිබුනු ඒරින් වංශයේ සලකුණ වන අඩ සඳ හා උකුස්සා දුටු ඇ සිය සැමියා දෙස බැල්මක් හෙලුවා ය. "ඒක ලයිසාගෙන්. මේක අපට සතුටුවෙන්ට පුළුවන් දෙයක් නෙවෙයි. මේ පණිවුඩයෙ බොහොම කණගාටුදායක දෙයක් හැංගිලා තියෙනවා නෙඩ්. මට ඒක දැනෙනවා."

නෙඩ් ගේ දෙබැම ඇකිළුනි. ඔහු ගේ මුහුණ අඳුරු විය. "ඒක කඩන්ට."

කැට්ලින් මුද්‍රාව කැඩුවා ය. වදන් පේළි අතර ඇගේ දෑස් දිවුවත් මුලදී ඒ කුමක්දැයි ඇයට වටහා ගත නොහැකි විය. ඊළඟ මොහොතේ ඇයට සියල්ල මතක් විය. "ලයිසා කිසිම අවදානමක් අරන් නෑ. අපි දෙන්නා පොඩි ළමයි කාලෙ අපට තිබුනා අපේම රහස් බාසාවක්, අපි දෙන්නට විතරක් තේරෙන බාසාවක්."

"ඔයාට ඒක කියවන්ට පුළුවන්ද?"

"ඔවු."

"ඉතිං එහෙනං අපට කියන්ට ඒ මොකක්ද කියලා."

"සමහරවිට මං මෙතනින් ගියා නං හොඳ වෙයි." මේස්ටර් ලුවින් කීය.

"නෑ. අපට ඔබේ අනුශාසනා ඕන මේ වෙලාවෙ." සිය පොරෝණය පසෙකට දැමූ කැට්ලින් ඇඳෙන් බැස්සා ය. සොහොන් ගැබක මෙන් සීතල සුළං සිය නිරුවත් සම මත දැවටෙනු ඇයට දැනුනි.

මේස්ටර් ලුවින් සිය දෑස් ඉවතට හරවා ගත්තේය. නෙඩ්ගෙන් පෙනුනේ ද තිගැස්සුනු බවකි. "ඔයා මොකක්ද ඔය කරන්නෙ?" නෙඩ් ඇසී ය.

"ගිනි මැලයක් ගහන්ටයි යන්නෙ." රාත්‍රී නිදන ඇඳුමක් සොයාගෙන එය තුළට රිංගාගත් ඇය උඳුන අසල බිම දණ නමා ගත්තා ය.

"මේස්ටර් ලුවින්-" නෙඩ් පටන් ගත්තේ ය.

"මේස්ටර් ලුවින් තමා මගේ හැම දරු ප්‍රසූතියක්ම කලේ. මේක බොරු ලැජ්ජාවට වෙලාවක් නෙමේ." කැට්ලින් කීවා ය. කුඩා දර පතුරු අතරේ පණිවුඩය ලියූ කඩදාසිය

ඇතිරූ ඇ ඊට උඩින් ලොකු දර කොට කිහිපයක් තැබීය. කාමරය හරහා ගිය නෙඩ් ඇගේ අතින් අල්ලා ඇද ඇයව දෙපයින් සිටවී ය. ඇගේ බාහුවලින් අල්ලා ගත් ඔහු ඇගේ මුහුණට අහල් කිහිපයක් ලං වන තෙක් එබුනේ ය. "මගේ ආර්යාවෙනි. මට කියන්ට. මොකක්ද මේ පණිවුඩය?"

"අනතුරු ඇඟවීමක්." ඇය සෙමින් තෙපලා ය. "අපට ඒක අහන්ට තරම් ධෛර්යයක් තියෙනවානං."

ඔහු ගේ දෑස් ඇගේ මුහුණ පුරා දිවගියේ ය. "කියන්ට."

"ලයිසා කියනවා ජොන් ඒරින්ගෙ මරණය මිනීමැරුමක් කියලා."

ඇගේ බාහු වටා වූ ඔහු ගේ අතැඟිලි තද විනි. "කවුද මිනීමරුවා?"

"ලැනිස්ටර් ලා. රැජිණ."

Eddard Stark: “My father went south once, to answer the summons of a king. He never came home again.”

නෙඩ් ඇගේ බාහු මුදා හැරිය අතර ඇඟිලි වලට තද වීම නිසා ඇතිවුනු දීප්තිමත් රතු පැහැ පැල්ලම් එහි දැකිය හැකි විය. "දෙයියනේ!" ඔහු කෙඳිරුවේ ය. "ඔයාගෙ සහෝදරී දුක නිසා පිස්සු වැටිලයි ඉන්නෙ. එයා කියන්නෙ මොනාද කියලා එයාම දන්නෙ නෑ."

"එයා දන්නවා.. ඇත්ත, ලයිසා ආවේගශීලී තමයි. ඒත් මේ පණිවුඩය බොහොම හොඳින් සැලසුම් කරලා, බොහොම හොඳට හංගලා එවපු එකක්. එයා දැනගෙන හිටියා මේක වැරදි අත්වලට ගියොත් ඒකෙ අවසාන ප්‍රතිඵලය මරණය කියලා. මෙච්චර අවදානමක් ගන්ට එයාට සාමාන්‍ය සැකයකට වඩා වැඩි හේතුවක් තියෙන්ට ඕන." කැට්ලින් ඇගේ

සැමියා දෙස බැලී ය. "ඇත්තෙන්ම, දැන් අපිට වෙන කිසිම තෝරාගැනීමක් නෑ. ඔයා රොබර්ට් ගෙ අත වෙන්ට ඕන. ඔයා එයත් එක්ක දකුණට ගිහිල්ලා මේකෙ ඇත්ත මොකක්ද කියලා හොයාගන්ට ඕන."

"මං දන්න ඇත්ත සේරම තියෙන්නෙ මෙහෙ. දකුණ කියන්නෙ වංචාකාරයොයි බොරුකාරයොයි පිරිච්ච කූඩුවක්. ඒක මග ඇරලා ඉන්ටයි මට ඕන."

ලූවින් සිය ගෙල වටා ඇති දම්වැල අතපත ගෑවේ ය. "රජතුමාගෙ හස්තය කියන්නෙ බොහොම බලසම්පන්න තනතුරක් මගෙ උතුමානෙනි. ඒරින් උතුමානන්ගෙ මරණය ගැන ඇත්ත හොයාගන්ට, එතුමාගෙ මිනීමරුවො නීතිය ඉදිරියට ගෙනියන්ට ඔබතුමාට ඒ බලතල පාවිච්චි කරන්ට පුළුවන්. වැඩේ නරකම අතට හැරුනොත් ඒරින් ආර්යාවයි එතුමියගෙ පුතාවයි ආරක්ෂා කරන්ට ඔබතුමාට ඒ බලතල පාවිච්චි කරන්ට පුළුවන්."

නෙඩ් පිළිසරණක් සොයන්නාක් වැනි බැල්මෙන් කාමරය සිසාරා බැලී ය. කැට්ලින්ට ඔහු ගැන දුක සිතුන නමුත් ඔහුව සැනසීමට වේලාව තවම පැමිණ නැති බව ඇය දැන සිටියා ය. පළමුව සිය දරුවන් වෙනුවෙන් ජයග්‍රහණය අත්පත් කරගෙන සිටිය යුතුය. "ඔයා කිවුවා ඔයා රොබර්ට්ට සහෝදරයෙකුට වගේ ආදරෙයි කියලා. ඔයා ඔයාගෙ සහෝදරයාව ලැනිස්ටර්ලාත් එක්ක තනි කරනවද?"

"අනික් එවුන් උඹලා දෙන්නවම අරන් යන්ට ඕන." ඔවුන්ගෙන් ඉවතට හැරුනු ඔහු කවුළුව වෙතට ගියේ ය. කැට්ලින් හෝ මේස්ටර් හෝ වදනකුදු නොදෙඩී ය. එඩ්ඩාර්ඩ් ස්ටාර්ක් විසින් තමා ආදරය කල භූමියට නිශ්ශබ්ද සමුගැන්මක් පිළිගන්වන ආකාරය දෙස ඔවුන් දෙදෙනා නිහඬවම බලා සිටියහ. අන්තිමේදී ඔහු කවුළුව වෙතින් මෑත්වී ඔවුන් දෙසට හැරුනු විට ඔහු ගේ කටහඬ වෙහෙසකාරී බවින් හා දුකින් පිරී තිබුනු අතර ඒ දෑස් අග කඳුළු බිඳු රැඳී තිබින. "රජෙකුගෙ නියෝගයට උත්තර දෙන්ට මගේ තාත්තා එක පාරක් දකුණට ගියා. එයා ආයෙ කවදාවත් ගෙදර ආවෙ නෑ."

"ඒ වෙනත් කාලයක්." මේස්ටර් ලූවින් කීවේ ය. "වෙනත් රජ කෙනෙක්."

"ඔවු." නෙඩ් ගිනිඋදුන අසල තිබුනු පුටුවේ වාඩි වුනේ ය. "කැට්ලින්, ඔයා වින්ටර්ෆෙල් වල නතර වෙන්ට ඕන."

ඒ වදන් ඇගේ හදවත හරහා ගිය පිහි පහරවල් වැනි විය. "නෑ." ඇයට හදිසියේම බියක් දැනින. මේ ඇගේ දඬුවමම ද? නැවත කිසිදා ඔහු ගේ මුහුණ නොදකින්නට, සිය බඳ වටා එතෙන ඒ දෑතේ පහස නැවත කිසිදා නොලබන්නට?

"ඔවු." නෙඩ් කීවේ කිසිදු විවාදයකට ඉඩ නොතබන අන්දමේ ස්වරයකිනි. "මං රජතුමාගෙ වැඩ ගැන හොයලා බලන අතරේ ඔයා මං වෙනුවෙන් උතුර පාලනය කරන්ට ඕන. වින්ටර්ෆෙල්වල හැම මොහොතකම ස්ටාර්ක් කෙනෙක් ඉන්ට ඕන. රොබ්ට දැන් දාහතරයි. බොහොම ඉක්මනට එයා වැඩුනු මිනිහෙක් වෙනවා. එයා ඉගෙනගන්ට ඕන කොහොමද පාලනය කරන්නෙ කියලා. ඒක එයාට උගන්නන්ට මං මෙහෙ ඉන්නෙ නෑ. ඒ නිසා එයාවත් ඔයාගෙ මන්ත්‍රණ සභාවෙ කොටස් කාරයෙක් කරගන්ට. එයාගෙ නිසි වයස එනකොට එයා මේ හැම දේකටම සූදානම් වෙලා ඉන්ට ඕන."

"දෙයියන්ගෙ පිහිටෙන් ඒකට වැඩි කාලයක් යන්නෙ නෑ." මේස්ටර් ලුවින් මිමිනී ය.

"මේස්ටර් ලුවින්, මගේ ලේ ඥාතියෙක්ව විශ්වාස කරන තරමටම මං ඔබවත් විශ්වාස කරනවා. ලොකු පුංචි හැම දේකදිම ඔබේ අනුශාසනාව මගේ බිරිඳට දෙන්ට. මගේ පුතාට උගන්නන්ට එයා දැනගන්ට ඕන හැම දෙයක්ම. ශීත කාලය එනවා."

මේස්ටර් ලුවින් බැරෑරුම් අන්දමින් හිස වැනුවේ ය. අන්තිමේදී දිරි වඩා ගත් කැට්ලින් ඇයව වඩාත්ම බියපත් කරන ප්‍රශ්නය ඇසීමට නිහඬතාව බින්දා ය. "එතකොට අනිත් ළමයින්ට මොකද වෙන්නෙ?"

නැගී සිටිය නෙඩ් ඇයව දෝතින් වැළඳගෙන ඇගේ මුහුණ සිය මුහුණට ලං කර ගත්තේ ය. "රිකන් තාම පුංචි බබෙක්. එයා මෙහෙ හිටපුවාවෙ ඔයයි රොබුයි එක්ක. අනිත් ළමයි මං අරන් යනවා."

"මට ඒක දරාගන්ට බෑ." කැට්ලින් වෙවුලුවා ය.

"ඔයාට එහෙම කරන්ට වෙනවා. සන්සා ජොෆ්රිව බඳින්ටම ඕන, ඒක බොහොම පැහැදිලියි. අපේ එයාලට තියෙන ඇල්ම ගැන සැකයක් උපද්දවගන්ට අපි කිසිම අවස්ථාවක් දෙන්ට නරකයි. දකුණුකරයේ ඇවතුම් පැවතුම් ගැන ඉගෙනගන්ට ආර්යාට දැනටමත් කාලෙ පහු වෙලා. තව අවුරුදු කීපෙකින් එයත් කසාද බඳින වයසට එනවා."

දකුණුකරයේ දී සන්සා සුවඳැති මලක් මෙන් දීප්තිමත්ව පිබිදෙනු ඇති බව කැට්ලින් සිතුවා ය. අනිත් අතට ආර්යාට ශිෂ්ට සම්පන්න ලෝකයේ ගති පැවතුම් ගැන ඉගෙනගැනීමට අවශ්‍ය බව දෙවියන් පවා දනියි. අසීරුවෙන් වුවද ඇයට ඔවුන්ව සිය හදවතින් ඉවත් කල හැක. එහෙත් බ්‍රැන්, ඇගේ ආදරණීය බ්‍රැන්! "ඔවු ඔයා හරි. ඒත් නෙඩ්, කරුනාකරලා අපි දෙන්නගෙ ආදරේ වෙනුවෙන් වත් බ්‍රැන්ව වින්ටර්ෆෙල්වල තියලා යන්ට. එයාට තාම හතයි."

"මගේ තාත්තා මාව ඉයරිවල හදාගන්ට යවනකොට මට අවුරුදු අටයි. "සෙර් රඩ්‍රික් මට කිවුවා රොබුයි, ජොෆ්රි කුමාරයයි අතරේ ඒ තරම් හොඳ හැඟීමක් නැහැයි කියලා. ඒක එච්චර ගුණදායක දෙයක් නෙවෙයි. බ්‍රැන්ට පුළුවන් ඒ පරතරය පියවන්ට. එයා හරිම හොඳ දරුවෙක්, හැම වෙලාවෙම හිනා වෙලා ඉන්න, හැම දෙනාම ආදරේ කරන කෙනෙක්. එයාට මේ තරුණ කුමාරවරුත් එක්ක එකට වැඩෙන්ට ඉඩ දෙන්ට. හරියට රොබර්ට් මගේ යාළුවා වුනා වගේ එයාත් කුමාරයින්ගෙ යාළුවෙක් වෙයි. ඒකෙන් අපේ වංශයට යහපතක් වෙයි."

ඔහු නිවැරැදි බව කැට්ලින් දැන සිටියා ය. එනමුදු වේදනාව අඩු කිරිමට එම දැනීම සමත් වූයේ නැත. ඇයට ඔවුන් සිවුදෙනාම අහිමි වී යනු ඇත. නෙඩ්, දැරියන් දෙදෙනාම සහ ඇගේ ආදරණීය පුංචි බ්‍රැන්. ඇයට ඉතිරිවනු ඇත්තේ රොබ් හා ලාබාල රිකන් පමණී. ඇයට දැනටමත් තනිකම දැනෙන්නට පටන්ගෙන තිබින. වින්ටර්ෆෙල් යනු සුවිසල් ස්ථානයකි. "එහෙනං එයාව තාප්ප බිත්ති වලින් ඈත් කරලා තියාගන්ට. ඔයා දන්නවනෙ බ්‍රැන් උස තැන්වලට නගින්ට කොච්චර ආසද කියලා."

ඇගේ දෑසේ නැගුනු කඳුළු බිඳු බිම වැටෙන්නට පෙර නෙඩ් ඒවා සිප ගත්තේ ය. "ඔයාට ගොඩක් ස්තූතියි මගේ ආර්යාවෙනි. මම දන්නවා මේක බොහොම අමාරු දෙයක් විත්තිය."

"ජොන් ස්නෝව් ගැන මොකද මගේ උතුමානෙනි?" මේස්ටර් ලූවින් ඇසී ය.

ඒ නම ඇසීමත් සමගම කැට්ලින් දරදඬු වී ගියා ය. ඇගේ කේන්තිය දැනුනු නෙඩ් ඇගෙන් මඳක් ඉවත් විය.

ඕනෑ තරම් මිනිසුන් අවජාතකයින් බිහි කර තිබේ. කැට්ලින් හැදූනේ වැඩුනේ ඒ අවබෝධයත් සමග ය. එම නිසා සිය විවාහයේ පළමු වසර තුළදී ම නෙඩ් යුධ මෙහෙයුමක් අතරතුරේදී අහම්බෙන් මුනගැසුනු කිසියම් කෙල්ලක හා එක්ව අවජාතක දරුවෙකුට පියා වීම යන ආරංචිය ඇයට එතරම් විස්මයක් ගෙන දුන්නේ නැත. මිනිසුන්ට ඔවුන් ගේ අවශ්‍යතා ඇත. අනිත් අතට ඒ අවුරුද්ද දෙදෙනා දෙපසක - ඔහු දකුණේ යුධ බිමේත්, ඇය රිවර්රන්හි සිය පියා ගේ බලකොටුවේත් - ගත කලෝය. ඇයට තාමත් හරිහැටි හඳුනාගන්නටවත් නොලැබුනු සිය සැමියාට වඩා ඇගේ සිතුවිලි අතර රැඳුනේ තම උකුළේ හිඳ කිරි උරා බොන අත දරුවා, රොබ් ගැනය. සටන් අතර ලැබෙන විවේකය ඔහුට රිසි අයුරින් ගත කරන්නට ඔහුට අවසර ඇත. ඉදින් අවජාතක දරුවෙකු බිහි වුවහොත් ඒ දරුවා ගේ ඕනෑ එපා කම් ගැන සොයා බලන්නටද ඔහුට අයිතියක් ඇත. කැට්ලින් සිතුවේ එලෙසිනි.

එහෙත් ඔහු ඊට වඩා වැඩි දෙයක් කලේ ය. ස්ටාර්ක්වරුන් යනු අන් මිනිසුන් වැනි අය නොවේ. නෙඩ් සිය අවජාතකයා ඔහුත් සමගම ගෙදර ගෙනා අතර මුළු උතුරුකරයටම පෙනෙන පරිදි ඔහුට 'පුතා' කියාද ඇමතී ය. අන්තිමේදී යුද්ධය අවසන් වී කැට්ලින් වින්ටර්ෆෙල් කරා ළඟා වූ විට ජොන් හා ඔහු ගේ කිරි මවු ඒ වනවිටත් එහි පැලපදියම් වී හමාර ය.

එය ඇයට වැදුනු දරුණුම පහරක් විය. නෙඩ් ඔහු ගේ මවු කවුද යන වග කිසිදා නොකීවේ ය, අඩුම ගනනේ ඇය ගැන වචනයක්වත් නොකීවේ ය. නමුත් බලකොටුවක් තුළ රහස් නොමැති අතර ඇගේ සේවිකාවන් සිය සැමියා ගේ සෙබළුන් මාර්ගයෙන් දැනගත් ඕපාදූප එකිනෙකා අතර රහසේ කොඳුරනු ඇයට ඇසී තිබිනා. එම ඕපාදූප අතරේ ඔවුන් ගේ තරුණ

උතුමානන් විසින් තනිව සටන් කර සෙර් ආතර් ඩේන් හෙවත් උදෑසනේ අසිපත හෙවත් ඒරිස් රජතුමා ගේ රාජ්‍යාරක්ෂක නයිට්වරුන් හත්දෙනා අතරින් බිහිසුණුම නයිට්වරයාව මරා දැමූ අයුරු විශේෂයෙන්ම කියැවින. එපමණක්ද නොව සටනින් පසු සෙර් ආතර් ගේ අසිපත රැගත් නෙඩ් ඔහු ගේ සුන්දර තරුණ සොයුරිය වූ මනබඳිනා දම් පැහැ දෑසින් යුත් අශාරා ඩේන් ආර්යාව වෙත එම අසිපත බාර දීම සඳහා ගිම්හාන මුහුදු තීරයේ පිහිටි ස්ටාර්ෆෝල් බලකොටුව වෙත ගිය අන්දමත් කැට්ලින්ට අහුලා ගත හැකි විය. ඇගේ ධෛර්යය වඩවා ගැනීමට ඇයට සති දෙකක් පමණ ගත වූ මුත් අන්තිමේදී එක්තරා රැයක නිදි ඇඳේ දී කැට්ලින් ඇගේ සැමියාගෙන් කෙලින්ම මේ ගැන විමසා සිටියා ය.

ඔවුන් ගේ මුළු විවාහ දිවිය තුළදී නෙඩ් ඇයව බියපත් කල එකම මොහොත එය විය. "කවදාවත් මගෙන් ජොන් ගැන අහන්ට එපා." ඔහු පිළිතුරු දුන්නේ හිම මෙන් සීතල ස්වරයෙනි. "එයා මගේ ලේ. එච්චරයි ඔයා දැනගන්ට ඕන. ඉතින් දැන් මට කියන්ට ඔයා කොහෙන්ද ඔය නම දැනගත්තෙ කියලා මගේ ආර්යාවෙනි." ඇය එය ඔහුට කී අතර එදායින් පසු මාලිගයේ සියළුම රහස් කීම් හා ඕපාදූප නැවතින. අශාරා ඩේන් ගේ නම නැවත කිසිදා වින්ටර්ෆෙල්හි නොකියවින.

ජොන් ගේ මව කවුරු වුවත් නෙඩ් ඇයට අසීමිතව ආදරය කල බව නම් නිසැක ය. මක්නිසාද යත් කැට්ලින් පැවසූ කිසිම දෙයක් මේ දරුවා බලකොටුවෙන් පිටකර හරින්නට සමත් නොවූ බැවිනි. ඇය ඔහුට කිසිදා සමාවක් නොදුන් එකම එක දෙය එය විය. සිය සැමියාට මුළු හදින්ම පෙම් කරන්නට කැට්ලින් සමත් වුවත් ජොන්ට ආදරය කරන්නට ඇයට කිසිදා නොහැකි විය. නෙඩ්ට ඇති ආදරය නිසා සිය ඇසට නොපෙනෙන මානයේ සිටීනම් අවජාතකයින් දුසිමක් වුවත් අමතක කරන්නට ඇය සූදානම් වුවද ජොන් කිසිදා ඇගේ ඇස් මානයෙන් පිට ගියේ නැත. අනිත් අතට ඔහු වයසින් වැඩෙද්දී නෙඩ්ට දාව උපන් අනෙකුත් සියළුම සහජාත දරුවන්ට වඩා ඔහු පියා ගේ විලාසයට සමානකම් පෑ අතර තත්ත්වය මේ නිසා තවත් දරුණු අතට හැරින.

"ජොන් මෙහෙන් යන්ට ඕන." ඇය කීවාය.

"එයයි රොබුයි හරිම කිට්ටුයි." නෙඩ් කීය. "මං හිතුවේ...."

"එයාට මෙහෙ නවතින්ට බෑ." කැට්ලින් ඔහුව කපා හැරියා ය. "එයා ඔයාගෙ පුතා. මගෙ පුතා නෙවෙයි. මට එයාව තියාගන්ට බෑ." එය දැඩි පහරක් බව ඇය දැන සිටියා ය. එනමුදු ජොන්ව වින්ටර්ෆෙල්හි දමා යෑම ඔහුට කරන කරුනාවක්ද නොවේ.

නෙඩ් ඇය දෙස හෙලූ බැල්ම ඔහු ගේ කටුක වේදනාව මැනවින් පෙන්වී ය. "ඔයා දන්නවනෙ මට එයාව දකුණට අරන් යන්ට බෑ කියලා. රාජසභාවෙ එයාට ඇති තැනක් නෑ. අවජාතක නමක් ඇති ළමයෙකුට... ඔයා දන්නවනෙ මිනිස්සු එයා ගැන මොනවා කියයිද කියලා. හැමෝම එයාව මග අරියි."

සිය සැමියා ගේ බැල්මේ ඇති නිහඬ ආයාචනයට එදිරිව ඇය සිය හදවත ගල් කරගත්තා ය. "මිනිස්සු කියන්නෙ ඔයාගෙ යාළුවා රොබර්ට් අවජාතකයො දූසිමක් විතර බිහි කලා කියලයි."

"ඒ වුනාට ඒ එක්කෙනෙක් වත් රාජසභාවට ගෙනල්ලා නෑ. ලැනිස්ටර් ගෑනි ඒකට අවශ්‍ය පියවර අරන් තියෙන්නෙ. ඔයා කොහොමද මෙච්චර නපුරු වෙන්නෙ කැට්ලින්? එයා තාම පුංචි ළමයෙක්. එයා-"

දැඩි කේන්තිය නිසා ඔහු තවත් බොහෝ දේ, තවත් නරක දේ පැවසීමට ඉඩ තිබුනත් මේස්ටර් ලුවින් මැද්දට පැන්නේ ය. "තවත් උත්තරයක් තියෙනවා. ඔබේ සහෝදරයා බෙන්ජින් ටික දවසකට කලින් මගේ ගාවට ආවා ජොන් ගැන අහන්ට. ජෙන හැටියට මේ දරුවා කළු අඳින්ට කැමැත්තෙන් ඉන්නවා."

නෙඩ් දිස් වූයේ හදිසි කම්පනයකට ලක් වූවෙක් මෙනි. "එයා නිශා රැකුමට බැඳෙන්ට ඇහුවා?"

කැට්ලින් කිසිත් නොකීවා ය. නෙඩ් මේ ප්‍රශ්නය විසඳා ගත්තාවේ. එනමුදු ඇයට දැනුනේ මේස්ටර්ව අල්ලා සිපගත හැකි තරමේ ප්‍රීතියකි. මෙය ප්‍රශ්නයට කදිම පිළිතුරකි. බෙන්ජින් ස්ටාර්ක් යනු දිවුරුම් දුන් කළු සහෝදරයෙකි. ජොන් ඔහුට පුතකු මෙන් - ඔහුට කිසිදා ලබන්නට බැරි පුතා මෙන් - වනු ඇත. නිසි කල පැමිණි විට කොලුවාද දිවුරුම් දෙනු ඇත.

මතුයම් දවසක කැට්ලින් ගේ මුණුබුරන් හා හරි හරියට වින්ටර්ෆෙල්වලට උරුමකම් කියන්නට හැකි පුතුන් ලබන්නට ඔහුට කිසිදා නොහැකි වනු ඇත.

"ප්‍රාකාරයෙ සේවය කරනවා කියන්නෙ බොහොම උසස් ගෞරවයක් මගෙ උතුමානෙනි." මේස්ටර් ලුවින් කීය.

"අනික නිශා රැකුම් බලකායෙදි අවජාතකයෙකුට වුනත් ඉහළ නගින්ට පුළුවන්." නෙඩ් සිතා බැලූ නමුත් ඒ ස්වරය ගැහැටට පත් වූ එකකි. "ජොන් තාම පොඩි වැඩියි. එයා ලොකු මිනිහෙක් වුන දාක මේ ගැන ඇහුවනං ඒක වෙනම දෙයක්. ඒත් අවුරුදු දාහතරක දරුවෙක්..."

"ඒක අමාරු පරිත්‍යාගයක්." මේස්ටර් ලුවින් එකඟ විය. "ඒ වුනත් මේක අමාරු කාලයක් මගේ උතුමානෙනි. ඔබතුමා හරි ආර්යාව හරි ගන්න මාර්ගයට වඩා එයා ගන්න මාර්ගය කටුක වෙන එකක් නෑ."

ඔවුන්ගෙන් ඉවතට හැරුනු නෙඩ් ජනේලයෙන් පිටත බැලී ය. මුහුණින් පෙනුනේ ඔහු දැඩි කල්පනාවක නිමග්න වී ඇති බවයි. අන්තිමේදී සුසුමක් හෙලූ ඔහු ආපසු හැරුනේ ය. "බොහොම හොඳයි." ඔහු මේස්ටර් ලුවින් ඇමතී ය. "මං හිතන්නෙ හැම දේම වෙන්නෙ හොඳකටයි කියලා. මං බෙන්ට කතා කරන්නං."

"අපි කවදද ජොන්ට කියන්නෙ?"

"ඒක කියන්ට ඕන දවස ආවහම. ගොඩක් දේවල් ලෑස්ති කරන්ට තියෙනවා. අපට පිටත් වෙන්ට ලෑස්ති වෙන්ට තව සති දෙකක්වත් යාවි. ජොන් මේ අන්තිම දවස් ටිකේ සතුටින් හිටියාවෙ. ඉක්මනටම ගිම්හානය ඉවර වේවි. ඒ එක්කම ළමා කාලෙත් ඉවර වේවි. නියම කාලෙ ආවහම මමම එයාට කියන්නං."

Eddard Stark: “I never asked for this cup to pass to me.”

Catelyn Stark: “Perhaps not, but the cup has passed, and you must drink from it, like it or not.”

ආර්යා

ආර්යා ගේ මැහුම නැවත වතාවක් අවුල් ජාලයක් විය.

ඒ දෙස වරක් රවා බැලූ ඇය සිය සොයුරිය සන්සා අනිකුත් ගැහැණු ළමයින් සමග වාඩි වී ඉන්නා දෙස බැලුවා ය. සන්සා ගේ මැහුම උත්කෘෂ්ට එකක් විය. හැමදෙනාම ඒ ගැන ඇට පැසසූහ. "සන්සාගෙ වැඩ එයා වාගෙම ලස්සනයි." සෙප්ටා මෝර්ඩේන් වරක් ඇගේ මවට පැවසුවා ය. "එයාට තියෙන්නෙ හොඳ සියුමැලි අත් දෙකක්." කැට්ලින් ආර්යාව ආර්යා ගැන විමසූ විට සෙප්ටා කීවේ මෙපමනකි. "ආර්යාට තියෙන්නෙ කම්මල්කාරයෙක්ගෙ අත් දෙකක්."

ආර්යා හෙමින් සැරේ කාමරය හරහා බැලුවේ ඇගේ සිතුවිලි සෙප්ටාට ඇසුනාදැයි යන සැකයෙනි. එනමුදු අද දවසේ සෙප්ටාට ඇය ගැන නිනවුවක් වත් නැති සේය. ඇය මර්සෙලා කුමරිය සමග වාඩි වී සිටියේ සිනහ පිරි මුහුණින් හා අගයකිරීම පිරි දෑසින් යුතුව ය. මැහුම් ගෙතුම් වැඩ ගැන රාජකීය කුමරියකට උපදෙස් දීමට සෙප්ටාට හැමදාම ඉඩ ලැබෙන්නේ නැත. මර්සෙලා ගේ මැහුම ද මදක් අවුල් වී ඇතැයි ආර්යා සිතුවත් සෙප්ටා එය වර්ණනා කල අන්දමට එවැන්නක් සිතා ගැනීමට වත් නොහැක.

ඇය සිය මැහුම දෙස නැවතත් බැලුවේ කුමක් හෝ දෙයක් කර එය ගොඩ දා ගැනීමට හැකිවෙතැයි යන බලාපොරොත්තුවෙනි. එනමුදු සුසුමක් හෙලා එය පසෙකින් තැබූ ඇය දුර්මුඛ මුහුණින් සිය සොයුරිය දෙස බැලුවා ය. සන්සා ගෙත්තම් කරන අතරේම බුහුටි ලෙස දෙඩුවා ය. සෙර් රඩ්‍රික් ගේ පුංචි කෙල්ල බෙත් කසල් ඇගේ දෙපා අසලින් වාඩි වී ඇය කියන සෑම දේකටම ඇහුම්කණ් දෙමින් සිටි අතර ජේන් පූල් සන්සා ගේ කණට ලංව ඇයට රහසක් කොඳුරමින් සිටියා ය.

"ඔයාලා මොනා ගැනද ඔය කතා කරන්නෙ?" ආර්යා හදිසියේම ඇසුවා ය.

ගැස්සී ඇය දෙස බැලූ ජේන් කැකිරි පලන්නට වූවා ය. සන්සා ලැජ්ජා සහගත බැල්මක් හෙලූ අතර බෙත් ගේ මුහුණ රතු විය. එනමුදු කිසිවෙකු පිළිතුරක් නොදුන්හ.

"මටත් කියන්ට." ආර්යා නැවත ඇසීය.

ජේන් හිස හරවා බැලුවේ සෙප්ටා මෝර්ඩේන් ඔවුන් ගේ කතාවට ඇහුම්කණ් නොදෙන බව සැක හැර ගැනීමට ය.

"අපි කතා කර කර හිටියෙ කුමාරයා ගැන." සන්සා ඇගේ මෘදු ස්වරයෙන් කීවා ය.

ඒ මොන කුමාරයාදැයි ආර්යා සැනෙන් වටහා ගත්තා ය. ජොෆ්රි, අනිවාර්යයෙන්ම. උස් කඩවසම් කෙනා. භෝජන සංග්‍රහය අතරතුරේ දී සන්සා ඔහු අසලින් වාඩි වී සිටි අතර විය යුතු පරිද්දෙන්ම ආර්යාට වාඩි වීමට සිදු වූයේ පුංචි මහත ටමෙන් සමග ය.

"ජොෆ්රි ඔයාගෙ අක්කට කැමැතියි." ජේන් ආඩම්බරයෙන් මිමිනුවේ හරියට ඈ ඒ සම්බන්ධයෙන් යම් වැදගත් කාර්යභාරයක් ඉටු කලා ලෙසිනි. ජේන් වින්ටර්ෆෙල්හි නිවාස බාරකරු ගේ දියණිය වූ අතර සන්සා ගේ හොඳම මිතුරියද වූවා ය. "එයා කිවුවා සන්සා හරි ලස්සනයි කියලා."

"එයා සන්සාව බඳින්ටයි යන්නෙ." බෙත් කීවේ සිහින ලොවක සැරිසරන්නාක් මෙනි. "එතකොට සන්සා තමා මේ රාජධානියෙ රැජිණ වෙන්නෙ."

සන්සා ඉතා සුන්දර අන්දමින් මුහුණ රතු කර ගත්තා ය. ඇත්තෙන්ම කිවහොත් ඇය හැම දෙයක්ම ඉතා සුන්දර අයුරින් කිරීමට දැන උන්නා ය. "බෙත්, ඔයා ඔය වගේ කතා කියන්ට හොඳ නෑ." සන්සා කුඩා දැරියට කීවේ යාන්තමින් ඇගේ කෙහෙරැළි පිරිමදිමිනි. ඇය ආර්යා දෙස බැලුවා ය. "ඔයා මොකක්ද ජොෆ් කුමාරයා ගැන හිතන්නෙ නංගී? එයා හරි නිර්භීතයි, එහෙම නේද?"

"ජොන් කියන්නෙ එයා හරියට කෙල්ලෙක් වගේ කියලා." ආර්යා කීවා ය.

සන්සා සුසුමක් හෙලුවා ය. "දුප්පත් ජොන්. එයා ඊරිසියා කරනවා එයා අවජාතකයෙක් නිසා."

"එයා අපේ සහෝදරයා." ආර්යා කීවේ මඳක් උස් ස්වරයෙනි. නිහඬතාවයේ ගැලී තිබුනු කාමරය තුළ ඇගේ කටහඬ තියුණු අන්දමින් රැවු දුනි.

සෙප්ටා මෝර්ඩේන් රැවුම් මුහුණින් යුතුව හිස ඔසවා බැලුවා ය. "ඔයාලා මොකක් ගැනද කතා කරන්නෙ ළමයිනේ?"

"අපේ අර්ධ සහෝදරයා." සන්සා මෘදු ස්වරයෙන් කීවා ය. ඉන්පසු සෙප්ටා දෙසට හැරී සුන්දර සිනහවක් පෑවා ය. "ආර්යායි මායි කතා කර කර හිටියෙ කුමාරි අද අපිත් එක්ක එකතු වෙච්ච එක කොච්චර හොඳ දෙයක්ද කියලයි."

සෙප්ටා හිස වැනුවා ය. "ඇත්තෙන්ම. අපට ලොකු ගෞරවයක්. ආර්යා, ඇයි ඔයා වැඩ කරන්නෙ නැත්තෙ?" නැගී සිටි ඇය සාය හරිගස්සාගෙන කාමරය හරහා ඇවිද ආවාය. "කෝ බලන්ට මට ඔයාගෙ මැහුම."

ආර්යාට යටිගිරියෙන් කෑ ගැසීමට සිතින. ඔය සන්සා ඔහොම්මයි, මොකක් හරි කරලා සෙප්ටාගෙ අවධානය හරවා ගන්නවා. "මෙන්න." ඇය සිය මැහුම දෙමින් කීවා ය.

සෙප්ටා රෙදි කැබැල්ල අධ්‍යයනය කලාය. "ආර්යා ආර්යා ආර්යා. මේක නං හරියන්නෙ නෑ. මේක නං කොහෙත්ම හරියන්නෙ නෑ."

සැමදෙනාම ඇය දෙස බැලූහ. සිය සොයුරියට වුනු අකරතැබ්බය ගැන සිනා නොවී සිටීමට තරම් සන්සා හොඳ පුරුදු ඇති කරගෙන සිටි නමුත් ඇයටත් හරියන්නට මෙන් ජේන් නියෙවුවා ය. මර්සෙලා කුමරිය පවා ඈ දෙස හෙලුවේ අනුකම්පාසහගත බැල්මකි. සිය දෑසේ කඳුළු පුරාගෙන එනු ආර්යාට දැනින. පුටුවෙන් නැගී සිටි ඇය ඊයක් මෙන් දොර දෙසට දිව ගියා ය.

සෙප්ටා මෝර්ඩේන් ඇය පසුපසින් කෑ ගැවාය. "ආර්යා වහාම ආපහු එන්ට. තව එක අඩියක්වත් තියන්ට එපා. ඔයාගෙ අම්මට මේ ඔක්කොම දැනගන්ට ලැබෙයි. අපේ රාජ කුමාරිය ඉස්සරහ ඔයා අපි හැමෝවම ලැජ්ජාවට පත් කරනවා."

දොරකඩ නැවතුනු ආර්යා තොල විකාගෙන ආපසු හැරුනා ය. මේ වනවිට ඇගේ කම්මුල් දිගේ කඳුළු වැල් ගලායමින් තිබින. ඇය යාන්තමින් හිස නමා මර්සෙලා කුමරියට ආචාර කිරීමට සමත් වූවා ය. "පිටව යන්ට ඔබේ අවසරය මගේ ආර්යාවෙනි."

ඇසිපිය ගැසූ මර්සෙලා උපදෙසක් පතා ඇගේ පරිවාර කාන්තාවන් දෙස බැලී ය. "ඔයා හිතන්නෙ ඔයා ඔය කොහෙ යනවා කියලද ආර්යා?" සෙප්ටා කෑ ගැසුවා ය.

ආර්යා ඇය දෙස රවා බැලුවා ය. "මට අශ්වයෙකුට ලාඩමක් ගහන්ට තියෙනවා." ඇය මිහිරි ස්වරයෙන් කීවේ ලද පිළිතුර නිසා සෙප්ටා ගේ මුහුණේ ඇඳුනු කම්පනයෙන් කුරිරු සතුටක් ලබමිනි. ආපසු හැරුනු ඇය සිය දෙපයට හැකි උපරිම වීරියෙන් පඩිපෙළ පහළට දිවුවා ය.

එය කොහෙත්ම සාධාරණ නැත. සන්සාට හැමදෙයක්ම හිමිව තිබින. සන්සා වසර දෙකක් වැඩිමහලු වූ අතර සමහරවිට ආර්යා ඉපදෙන කල වන විට ඈට දෙන්නට කිසිම දෙයක් ඉතිරි වී නොතිබෙන්නට ඇත. සන්සාට ලස්සනට මහන්නට, නටන්නට, ගී ගයන්නට හැක. ඇය කවිද ලියයි. ඇය ලස්සනට අඳින්නට පළඳින්නට ද දනී. ඇයට වීනාව වයන්නට ද හැක. මේ හැමටම වඩා ඇය රූමත් ය. සන්සාට ඔවුන් ගේ මවට මෙන් උස් දෙකම්මුල් හා ටලීවරුන් සතු රතු දුඹුරු කෙහෙරැළි හිමිව තිබින. අනිත් අතට ආර්යා සිය පියා ගේ විලාසය පෑ ය. ඇයට තිබුනේ කිසිදු ප්‍රභාවක් නැති දුඹුරු පැහැ කෙස් කළඹක් හා දිගැටි මුහුණකි. ජේන් ඇයට 'අශ්ව මුහුණක් ඇති ආර්යා' කියා කියූ අතර ඇය අසලකට එන සැමවිටම හේශාරවය කරන්නට පුරුදුව සිටියා ය. එය ඇයට වඩාත් රිදුම් දුන්නේ සිය සොයුරියට වඩා හොඳින් ඇයට කල හැකි වූ එකම දෙය අසුන් පිට යාම පමණක් වූ බැවිනි. එය සහ නිවසක් පාලනය කිරීම. සන්සාට කවදාවත් ගනන් මිනුම් ගැන තේරුම් ගන්නට තරම් මොළයක් නොතිබුනු අතර ඇය ජොෆ් කුමරා හා විවාහ වන්නේ නම් ඔහු සතුව හොඳ නිවාස බාරකරුවෙකු සිටීම මැනවැයි ආර්යා කල්පනා කලා ය.

පඩිපෙළ පාමුල මුරකුටියට වී නයිමේරියා ඇය එනතෙක් බලා සිටියා ය. ආර්යා දුටු සැනින් ඇය නැගිට සිටි අතර ආර්යා සතුටින් සිනාසුනා ය. වෘක පැටවා ඇයට සැබැවින්ම ආදරය කලා ය. ඔවුන් දෙදෙනා යන යන සෑම තැනකම එකටම සිටි අතර නයිමේරියා නිදාගත්තේ ඇගේ කාමරයේ ඇගේ ඇඳ පාමුල ය. ඇගේ මව විසින් තහනම් නොකරන්නට ආර්යා ඇයව මැහුම් කාමරයටත් රැගෙන යනවා නිසැක ය. එසේනම් සෙප්ටා මෝර්ඩේන් ඇගේ මැහුම් වැඩ ගැන කෙතරම් පැමිණිලි කලත් ඇයට කම් නැත.

ආර්යා ඇයව බැඳ තිබුනු බැම්ම ලිහද්දී නයිමේරියා ඇගේ අත ලෙව කෑවා ය. ඇයට කහ පැහැ දෑසක් තිබුනු අතර හිරු එළියේ දී ඒවා රන්කාසි දෙකක් මෙන් බැබලිනි. ආර්යා ඇයට නම තබා තිබුනේ මුහුදින් මෙතෙරට සිය ජනතාව මෙහෙයවූ රණකාමී රයිනාර් රැජිණ අනුව ය. විය යුතු පරිද්දෙන්ම සන්සා ඇගේ පැටවාට නම් තබා තිබුනේ 'ලේඩි' කියා ය.  සිනහවක් පෑ ආර්යා වෘක පැටවා තදින් බදාගත් අතර ඌ ඇගේ කණ ලෙව කෑවා ය.

මේ වනවිට සෙප්ටා මෝර්ඩේන් නිසැකවම සිය මව වෙත පණිවුඩය යවා ඇති අතර ඇය සිය කාමරයට ගියහොත් ඔවුන් ඇයව සොයා ගනු ඇත. එනිසා ඇය ඊට වඩා හොඳ උපායක් ගැන කල්පනා කලා ය. පිරිමි ළමයින් සෙණ්ඩුවාලුවේ සරඹ පුරුදු වෙමින් සිටි අතර රොබ් විසින් අර නිර්භීත ජොෆ් කුමරා බිම හෙලනු දැකීමට ඇයට උවමනා විය. "එන්ට." වෘක පැටවාට කොඳුල ඇය නැගිට එළියට දිව ගියා ය.

Arya Stark: “I hate needlework! It’s not fair!”

Jon Snow: “Nothing is fair.”

යුධ ආයුධ ගබඩාව හා මාලිගාවේ ප්‍රධාන බලකොටුව අතර ඉදිකර තිබුනු ආවරණය කල පාළමේ වූ එක් කවුළුවක් තුළින් මුළු සෙණ්ඩුවාලුවම මනාව නිරීක්ෂණය කල හැකි විය. ආර්යා වෘක පැටවාද සමග දිව ගියේ මේ කවුළුව වෙතට ය.

රතු වූ මුහුණින් යුතුව හතිලමින් දිව ආ ඔවුන් දුටුවේ ජොන් ජනෙල් පඩිය මත වාඩි වී දණ නමා ඒ මත නිකට රුවාගෙන පහළ බලා සිටින ආකාරය යි. ඔහු කෙතරම් තදින් සටන් කෙරෙහි අවධානය යොමු කර තිබුනාදැ යි කිවහොත් සුදු වෘක පැටවා නැගිට ඔවුන්

පිළිගන්නට ඉදිරියට එනතෙක් ඇ පැමිණි බව ඔහු නොදත්තේ ය. නයිමේරියා සෙමින් ඉදිරියට ඇදුනු අතර ඇ වෙතට පැමිණ ඇයව ඉව කර බැලූ ගෝස්ට් නැවත පෙර සිටි තැනට ගොස් වක ගසා ගත්තේ ය. ජොන් ඇ දෙස විමර්ශනාත්මක බැල්මක් හෙළී ය. "ඔයා මේ වෙලාවෙ මැහුම් කාමරේ නෙවෙයිද ඉන්ට ඕන පුංචි නංගී?"

ආර්යා මුහුණ ඇද කලා ය. "මට ඕන වුනා එයාලා සටන් කරනවා බලන්ට."

ඔහු සිනාසුනේ ය. "එහෙනං ඉතින් එන්ට."

ජනෙල් පඩිය මතට නැගුනු ආර්යා ඔහු පසෙකින් වාඩි ගත්තා ය. නොයෙකුත් ගැටුම් හා ගෙරවිලි හඬ පහළින් ඇසෙන්නට විය.

ඇගේ බලාපොරොත්තු බිඳ දමමින් මේ වෙලාවේ සරඹ පුරුදු වෙමින් සිටියේ බාල දරුවන් විය. බ්‍රැන් ගේ සිරුර වසා කෙතරම් ආරක්ෂක කොට්ට ඔතා තිබුනා දැයි කිවහොත් හරියට ඔහුව පිහාටු මෙට්ටයක එතුවා වැනි විය. මහත ඇඟක් ඇති ටමෙන් කුමාරයා මේ කොට්ට නිසා බෝලයක් මෙන් දිස් විය. ඔවුන් හතිලමින් ලී කඩුවලින් එකිනෙකාට කොටා ගනිමින් සිටියේ විභූතිමත් සුදු පැහැ උඩු රැවුලක් ඇති, දැවැන්ත පීප්පයක් මෙන් තරබාරු හා ශක්තිමත් වූ මාලිගයේ සටන් පුහුණු ආචාර්යවරයා වන නාකි රඩ්‍රික් කසල් ගේ අධීක්ෂණය යටතේ ය. ළමුන් හා වැඩිහිටියන්ගෙන් සැදි දුසිමක් පමණ වූ ප්‍රේක්ෂකයින් පිරිසක් ඔවුන්ට අනුබල දෙමින් බලා සිටියහ. සියල්ලන්ටම වඩා හයියෙන් කෑ ගසමින් සිටි රොබ් පසෙකින් තියන් ග්‍රේජෝයි සිටගෙන සිටිනු ආර්යා දුටුවා ය.

"මැහුම් වැඩවලට වඩා බොහොම අමාරු වැඩක්." ජොන් කීවේ ය.

"මැහුම් වැඩවලට වඩා බොහොම විනෝදජනක වැඩක්." ආර්යා ඔහුට පිළිතුරු දුන්නා ය. සිනාසුනු ජොන් ඇ දෙසට නැඹුරු වී ඇගේ කෙහෙරැළි අවුල් කර දැම්මේ ය. ආර්යා ගේ මුහුණ රතු වී ගියේ ය. ඔවුන් දෙදෙනා සැමවිටම එකිනෙකාට බෙහෙවින් සමීප විය. ඇට මෙන්ම ජොන්ටද තිබුනේ සිය පියා ගේ මුහුණුවර වූ අතර ඒ අතින් ඔවුන් දෙදෙනා අනෙකුන්ගෙන් වෙනස් වූහ. රොබ්, සන්සා හා බ්‍රැන් පමනක් නොව පුංචි රිකන් පවා ගොස් තිබුනේ ටලී ආරට ය. මේ වෙනස නිසා තමාද අවජාතකයකු වන්නට ඇතැයි කියා

ආර්යා පුංචි කාලයේ බියපත් වූවා ය. ඒ ගැන විචාරන්නට ඇය තෝරාගත්තේ ජොන් වූ අතර ඔහු ඇගේ බිය නැති කර දැමී ය.

"ඇයි ඔයා පහළ සටන් පුහුණුවට යන්නෙ නැත්තෙ?" ආර්යා විචාලා ය.

ජොන් අඩ සිනාවක් පෑවේ ය. "ලාබාල කුමාරවරුන්ව තුවාල කරන්ට අවජාතකයන්ට අවසර නෑ. සරඹ පිටියෙදි එයාලට වෙන හැම තුවාලයක්ම වෙන්ට ඕන සහජාත කඩුවලින්."

"ආහ්!" ආර්යා ට ලැජ්ජාවක් දැනුනි. ඇය එය තේරුම් ගත යුතුව තිබ්න. දවසේ දෙවෙනි වතාවටත් ආර්යා තේරුම් ගත්තේ ජීවිතය සාධාරණ නොවන බවයි.

සිය සොහොයුරා ටමෙන්ට තලන ආකාරය දෙස ඇය බලා සිටියා ය. "මටත් පුළුවන් බ්‍රෑන් තරම්ම හොඳින් සටන් කරන්ට. එයාට හතයි. මට නවයක්."

ජොන් ඈ දෙස බැලී ය. "ඔයා කෙට්ටු වැඩියි." ඇගේ අතක් අල්ලාගත් ඔහු එහි මාංශපේශීන් පිරික්සා බැලී ය. ඉන්පසු සුසුමක් හෙලා හිස වැනී ය. "මං හිතන්නෙ නෑ ඔයාට පුළුවන් වෙයි කියලා අඩුම ගානෙ දිග කඩුවක් උස්සන්ටවත් පුංචි නංගී. ඉතින් කොහොමද ඔයා ඒකෙන් සටන් කරන්නෙ?"

සිය අත ඇදගත් ආර්යා ඔහු දෙස රවා බැලුවා ය. ජොන් නැවත වතාවත් ඇගේ කෙහෙරැළි අවුල් කර දැමූ අතර ඔවුන් දෙදෙනා නැවතත් සටන කෙරෙහි සිය අවධානය යොමු කලහ.

"ඔයා දැක්කද ජොෆ්රි කුමාරයා?" ජොන් ඇසී ය.

ආර්යා මුලින්ම ඔහුව දුටුවේ නැත. නමුත් නැවත වතාවක් පරීක්ෂාවෙන් බලද්දී පිරිස පිටුපසට වී ගල් බිත්තියකට හේත්තු වී සිටින ඔහුව ඇය දුටුවා ය. ඔහුව වටකරගෙන සිටියේ ඇය නාඳුනන, ලැනිස්ටර් හා බරතියන් නිළ ඇඳුමින් සැරසුනු තරුණ සහචරයින්

විසිනි. ඒ අතර සිටි වැඩිමහලු පිරිමින් කිහිපදෙනා නයිට්වරුන් වන්නට ඇතැයි ඇය අනුමාන කලා ය.

"එයාගෙ උඩුකබායෙ තියෙන ලාංඡනය දිහා බලන්ටකො." ජොන් කීවේ ය.

ආර්යා එදෙස බැලුවා ය. ජොෆ්රි ගේ උඩු කබායේ අලංකාර පලිහක් ගෙත්තම් කොට තිබින. එහි එක් පසෙක බරතියන් නිල ලාංඡනය වූ කිරුළු ලූ ගෝනා ද අනෙක් පස ලැනිස්ටර් නිල ලාංඡනය වූ සිංහයා ද ගෙත්තම් කර තිබින.

"ලැනිස්ටර්ලා කියන්නෙ බොහොම ආඩම්බර සත්තු ජාතියක්. ඔයාට හිතෙන්ට පුළුවන් රාජකීය සලකුණ ඇතියි කියලා. නෑ. ඒ වෙනුවට එයා එයාගෙ අම්මගෙ වංශයත් රාජකීය වංශය මට්ටමටම උසස් කරලා."

"ගැහැණු කියන්නෙ වැදගත් ජාතියක් තමා." ආර්යා විරෝධය පෑවා ය.

ජොන් කෙකර සිනාවක් පෑවේ ය. "ඔයත් ඒ වැඩේම කලොත් හොඳ නැද්ද පුංචි නංගී? ඔයාගෙ සලකුණේ ටලීවරුයි ස්ටාර්ක්වරුයි එකතු කරන්ට."

"මාළුවෙක් කටින් ගත්ත වෘකයෙක්?" ඇයට සිනහ පහල විය. "ඒක මහ මෝඩ පෙනුමට හිටියි. අනෙක ගෑනු ළමයෙකුට සටන් කරන්ට බැරි නම් මොකටද එයාට වංශ සලකුණක්?"

ජොන් දෙවුර ඇකිලී ය. "ගෑනු ළමයින්ට වංශ සලකුණ ලැබෙනවා ඒත් එයාලට කඩු ලැබෙන්නෙ නෑ. අවජාතකයින්ට කඩු ලැබෙනවා ඒත් එයාලට වංශ සලකුණ ලැබෙන්නෙ නෑ. නීති හදන්නෙ මම නෙවෙයි පුංචි නංගී."

පහළ සෙණ්ඩුවාලුවෙන් කෑ ගැසීමක් ඇසෙන්නට විය. ටමෙන් කුමරා බිම වැටී නැවත නැගී සිටීමට උත්සාහ කරමින් සිටි අතර ඔහුව පෙනුනේ උඩු බැලි අතට පෙරලුනු

කැස්බෑවෙකු මෙනි. බ්‍රැන් ඔහුට උඩින් ලී අසිපත අමෝරා බලා සිටියේ නැවත නැගී සිටිය වහා ඔහුට තැලීමට ය. මිනිස්සු සිනාසීමට පටන් ගති.

"ඇති." සෙර් රඩ්‍රික් කීවේය. ඔහු කුමරාට නැගී සිටීමට අත දිගුකලේ ය. "හොඳට සටන් කලා. ලූ, ඩොනිස් මෙයාලගෙ සන්නාහ අයින් කරන්ට උදවු කරන්ට." ඔහු වටපිට බැලී ය. "ජොෆ්රි කුමරුනි, රොබ්, ඔයාලා ආයෙමත් වටයක් යන්ට කැමැතිද?"

පෙර සටන නිසා තවමත් දහඩියෙන් පෙඟී සිටි රොබ් උනන්දුවෙන් ඉදිරියට පිය මැනී ය. "මම ලෑස්තියි."

සෙර් රඩ්‍රික් ගේ කැඳවීම අනුව ජොෆ්රි ඉදිරියට පැමිණියද ඔහු ගේ මුහුණේ තිබුනේ උදාසීන පෙනුමකි. "මේක ළමයින්ගෙ සෙල්ලමක් සෙර් රඩ්‍රික්."

තියන් ග්‍රේජෝයි මහ හඬින් සිනාසුනේ ය. "ඔයාලා තාම ළමයි තමා." ඔහු සරදම් විලාසයෙන් කීය.

"රොබ් නං ළමයෙක් වෙන්ට ඇති. මම කුමාරයෙක්. සෙල්ලං කඩුවකින් ස්ටාර්ක්ලව තලලා මට එපා වෙලා තියෙන්නෙ."

"තැලුවට වඩා ඔයා ගුටි කෑවනෙ ජොෆ්." රොබ් කීය. "ඔයා බයේ ද?"

"අපොයි ඔවු. මං මේ බයේ වෙවුලනවා. ඔයා මට වඩා කොච්චර වයසද." ලැනිස්ටර්වරුන් කිහිප දෙනෙක් සිනා පහල කලෝ ය.

ජොන් මේ සිදුවීම දෙස බලා සිටියේ රවා ගත් මුහුණිනි. "අර ජොෆ් නං ඇත්තටම මහ කක්කා ගොඩක්." ඔහු ආර්යාට කීය.

සෙර් රඩ්‍රික් කල්පනාකාරීව සිය උඩුරැවුල අත ගෑවේ ය. "ඔයා මොකක්ද දැන් කියන්ට හදන්නෙ?" ඔහු ජොෆ්රිගෙන් ඇසී ය.

"ඇත්ත කඩු."

"හරි." රොබ් කීවේ ය. "ඔයාට කණගාටු වෙන්ට වෙයි."

සෙර් රඩ්‍රික් රොබ් ගේ උරහිස මත අත තැබුවේ ඔහුව සන්සුන් කිරීමට ය. "ඇත්ත කඩු භයානකයි. මම අවසර දෙනවා තරගවලට පාවිච්චි කරන මොට්ට කඩුවලින් සටන් කරන්ට."

ජොෆ්රි කිසිවක් කීවේ නැත. නමුත් ආර්යා නාඳුනන, කළු පැහැ හිසකෙස් හා මුහුණේ පිළිස්සුම් කැළැල් ඇති උස නයිට්වරයෙක් ඉදිරියට පැමිණියේ ය. "මේ ඉන්නෙ ඔබේ කුමාරයා. එයාගෙ කඩුවෙ මුවහත ඇති නැති එක ගැන කතාකරන්ට ඔබ කවුද?"

"මම වින්ටර්ෆෙල්වල සටන් පුරුදු කරන ගුරුවරයා. ක්ලිගේන්, ඔබ ඒක අමතක කරන්ට එපා."

"ඔබලා මෙතන ගෑනුන්වද පුරුදු කරන්නෙ?"

"මම පුරුදු කරන්නෙ නයිට්වරුන්ව." සෙර් රඩ්‍රික් පිළිතුරු දුනි. "එයාලා නියම වයසට ආවාහම එයාලට ඇත්ත කඩු ලැබෙයි."

පිළිස්සුනු මුහුණ ඇත්තා රොබ් දෙසට හැරුනි. "ඔයාට වයස කීයද කොල්ලො?"

"දාහතරයි."

"මම වයස දොළහෙදි මිනිහෙක් මැරුවා. ඒක මොට්ට කඩුවක් නෙවෙයි."

මේ වදනින් රොබ් කිපෙනු ආර්යා දුටුවා ය. ඔහු සෙර් රඩ්‍රික් දෙසට හැරුනි. "මට ඒක කරන්ට ඉඩ දෙන්ට. මට එයාව පරද්දන්ට පුළුවන්."

"එහෙමනං මොට්ට කඩුවකින් එයාව පරද්දන්ට." සෙර් රඩ්‍රික් පිළිතුරු දුනි.

ජොෆ්රි දෙවුර ඇකිළී ය. "නියම වයස ආපුවම ඇවිත් මාව හම්බවෙන්ට ස්ටාර්ක්." ලැනිස්ටර් මිනිසුන් අතරින් සිනහ හඬ නැගුනි.

රොබ් ගේ සාපකිරීම්වල හඬ මුළු සෙණ්ඩුවාලුව පුරාම රැවු දුනි. බියපත් ආර්යා අතකින් මුව වසා ගත්තා ය. තියන් ග්‍රේජෝයි රොබ් ගේ අතින් අල්ලා ගත්තේ ඔහුව කුමරාගෙන් ඈත් කර තබා ගැනීම පිණිසය. සෙර් රඩ්‍රික් සිතේ කැළඹීම වසන් කරන්නට මෙන් රැවුල් ගස්වලින් අදින්නට විය.

ජොෆ්රි ඈනුමක් යටපත් කරගෙන සිය බාල සොහොයුරා දෙසට හැරුනි. "එන්ට ටමෙන්. සෙල්ලං කලා ඇති. පුංචි ළමයින්ට එයාලගෙ සෙල්ලං කරගන්ට ඉඩදෙන්ට."

මේ වදන් නිසා ලැනිස්ටර් සිනා හඬ තවත් උස්ව නැගෙන්නට විය. රොබ් ගේ මුවින් තව තවත් සාප කිරීම් පිටවන්නට විය. කෝන්තිය නිසා සෙර් රඩ්‍රික් ගේ මුහුණ රත් පැහැ විය. තියන් සිය යකඩ වැනි ග්‍රහනයෙන් රොබ්ව අල්ලාගෙන සිටියේ කුමරා හා පිරිස පරෙස්සම් සහිත දුරකට යන තුරුය.

ජොන් ඔවුන් පිටව යන දෙස බලා සිටි අතර ආර්යා ජොන් දෙස බලා සිටියා ය. අන්තිමේ දී ඔහු ජනෙල් පඩිය උඩින් බිමට බැස්සේ ය. "නාටකේ ඉවරයි." පහතට නැඹුරු වුනු ඔහු ගෝස්ට් ගේ කණ පිටුපස කැසී ය. නැගිට සිටි වෘක පැටවා ඔහු ගේ ඇඟේ වෙලුනේ ය. "ඔයත් ආපහු ඔයාගෙ කාමරේට දිවුවනං හොඳයි පුංචි නංගී. සෙප්ටා මෝර්ඩේන් අනිවාර්යයෙන්ම රැකගෙන ඇති ඔයා එනකං. ඔයා හැංගිලා ඉන්න කාලෙ වැඩි වෙන්ට වැඩි වෙන්ට ඔයාගෙ දඬුවමත් වැඩි වෙනවා. ඔයාට මුළු සීත කාලෙ පුරාම මහ මහ ඉන්ට

වෙයි. වසන්තය ආවහම එයාලා ඔයාගෙ මලකඳ හොයාගනියි ගල් වෙච්ච ඇඟිලි අතරේ හිරවුන ඉදිකට්ටත් එක්කම."

මෙය විහිළුවක් බව ආර්යාට සිතුනේ නැත. "මම ආසා නෑ මැහුම් වැඩවලට. ඒක කොහෙත්ම සාධාරණ නෑ."

"කිසිම දෙයක් සාධාරණ නෑ." ජොන් කීවේ ය. නැවත වරක් ඇගේ කෙහෙරැළි අවුල් කල ඔහු ඇයට පිටුපා යන්නට විය. ගෝස්ට් නිහඬවම ඔහු පසුපසින් යන්නට විය. නයිමේරියා ද ඒ පසුපස යන්නට සැරසුනද ආර්යා නොඑන බව දුටු විට නැවතී ආපසු හැරුනා ය.

නොකැමැත්තෙන් මෙන් ආපසු හැරුනු ආර්යා විරුද්ධ දිශාවට පිය මැන්නා ය.

තත්ත්වය ජොන් කිවුවාටත් වඩා නරක එකක් විය. ඇය එනතෙක් ඇගේ කාමරයේ බලා සිටියේ සෙප්ටා මෝර්ඩේන් පමණක් නොවේ. ඇගේ මවද ඒ සමග බලා සිටියා ය.

Arya Stark: "If a girl can’t fight, why should she have a coat of arms?"

බ්‍රැන්

දඩයක්කාර නඩය උදෑසනින් ම වින්ටර්ෆෙල් වෙතින් පිටත් වී තිබිනි.

රජතුමාට අද රාත්‍රියේ පැවැත්වෙන භෝජන සංග්‍රහය වෙනුවෙන් වල් ඌරු මස් උවමනා වී තිබිනි. ජොෆ්රි කුමරාද සිය පියා සමග පිටත් වූ අතර එනිසාම රොබ්ට ද කණ්ඩායමට එක්වීමට අවසර ලැබිනි. බෙන්ජින් බාප්පා, ජොරී, තියන් ග්‍රේජෝයි, සෙර් රඩ්‍රික් හා රැජිණ ගේ අඟුටුමිටි සොහොයුරා පවා ඔවුන් සමග පිටත් වූහ. මේ අවසන් දඩයම් සවාරිය වූ අතර හෙට උදෑසන ඔවුන් සියලු දෙනාම දකුණුකරය බලා පිටත් වීමට නියමිතව තිබිනි.

කෙසේ වෙතත් බ්‍රැන්ට ඔවුන් සමග නොගොස් ගැහැණු ළමයින් හා පුංචි රිකන් - සහ අනිවාර්යයෙන්ම ජොන් - සමග මාලිගයේ නතර වීමට සිදු විය. එනමුදු රිකන් පුංචි බබෙක් වූ අතර ගැහැණු ළමයින් ගැහැණු ළමයින්ම වූ නිසා බ්‍රැන්ට ඔවුන් සමග සෙල්ලමට යාම කොහෙත්ම කල හැක්කක් නොවී ය. ජොන් හා ඔහු ගේ වෘක පැටවා ඇසට හසුවන මානයේ නොසිටි අතර බ්‍රැන් එතරම් උනන්දුවෙන් ඒ ගැන සොයා බැලීමටද සිතුවේ නැත. මේ දවස්වල ජොන් හැමදෙනාම සමග අමනාපයෙන් පසු වන නමුදු ඒ ඇයි දැයි සිතා ගැනීමට බ්‍රැන්ට හැකි වූයේ නැත. ඔහු නිශා රැකුමට බැඳීම පිනිස බෙන් බාප්පා සමග ප්‍රාකාරය වෙත යාමට නියමිතව තිබිනි. එය රජතුමා සමග දකුණුකරයට යෑම හා සමානම හොඳ දෙයකි. ඔවුන් මෙහි තනිකර දමා යන්නේ රොබ්ව මිස ජොන්ව නොවේ.

දවස් ගනනාවක් පුරා බ්‍රැන් පුල පුලා බලා සිටියේ පිටත්වන දිනය පැමිණෙන තෙක් ය. ඔහු සිය සුපුරුදු පෝනියා වෙනුවට ඇත්තම ඇත්ත අශ්වයකු පිට නැගී රජමාවතේ ගමන් කරන්නට යයි. සිය පියා රජතුමා ගේ හස්තය බවට පත්වීමට නියමිත අතර ඔවුහු කින්ග්ස් ලැන්ඩින්ග්හි රතු බලකොටුවේ ජීවත්වීමට යති. මේ බලකොටුව මකරාධිපතියන් විසින් ගොඩ නැගූවකි. නාකි ආයම්මා කියන අන්දමට නම් එය හොල්මන්, දඟගෙවල් හා බිත්ති දිගට එල්ලූ මකර හිස්වලින් පිරී ඇත. මේ ගැන සිතද්දී පවා සිය සිරුර වෙවුලා යනු බ්‍රැන්ට දැනිනි. සිය පියාට අමතරව රජතුමා ද ඔහු ගේ සියලුම නයිට්වරුන් ද රජුට පක්ෂපාතී සියලුම සෙබළුන් ද යන සැවොම එහි සිටිති.

බ්‍රැන් ද කෙදිනක හෝ නයිට්වරයකු වීමට සිතා ගෙන සිටියි. රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරයකු නම් වඩාත් හොඳය. නාකි ආයම්මා කියන්නේ මුළු රාජධානියේම සිටින දක්ෂතම සටන්කරුවන් ඔවුන් බවය. ඔවුන් සැමවිටම සුදු පැහැ සන්නාහ පැළැඳි සත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විය. ඔවුන් කිසිදා විවාහ නොවූ අතර රජුට සේවය කිරීම වෙනුවෙන්ම පමණක් ජීවත්වූවෝ වූහ. ඔවුන් ගැන ලියැවුනු හැම කතාවක්ම පාහේ බ්‍රැන් දැන සිටියේ ය. ඔවුන් ගේ නම් ඔහු ගේ කණට සංගීතයක් බඳු විය. දර්පණ පලිහේ සර්වින්, සෙර් රයම් රෙඩ්වින්, මකර නයිට්වර ඒමන් කුමරා, කවීන් විසින් 'මකර නැටුම' යනුවෙන් හඳුන්වනු ලබන වසර සිය ගණනකට පෙර සිදුවුනු ඒ යුද්ධයේ දී එකිනෙකාට එරෙහිව සටන් වැද මියගිය නිවුන්නු දෙදෙනා සෙර් එරික් හා සෙර් ඇරික්. සුදු ගොනා - සෙර් ජෙරල්ඩ් හයිටවර්, උදෑසනේ අසිපත - සෙර් ආතර් ඩේන්, නිර්භීත බැරිස්ටාන්.

රාජ්‍යාරක්ෂක බලකායේ සෙබළුන් දෙදෙනෙක් රොබර්ට් රජු සමග උතුරට පැමිණ සිටියහ. බ්‍රැන් වශීකරණයකින් මෙන් ඔවුන් දෙදෙනා දෙස බලා සිටි මුත් ඔහුට ඔවුන් සමග කතා කිරීමට තරම් ධෛර්යයක් උපදවා ගත නොහැකි විය. සෙර් බොරෝස් මහත ගෙලකින් යුතු තට්ට හිසැත්තෙකු වූ අතර සෙර් මෙරින්ට මැලවුනු දෑසක් හා මලකඩ පැහැ රැවුලක් තිබින. මේ සැමටම වඩා පුරාණ කතාවල සිටි නයිට්වරුන්ට වඩාත්ම සමාන වූයේ සෙර් ජේමි ලැනිස්ටර් ය. ඔහු ද රාජ්‍යාරක්ෂක බලකායේ සේවය කල නමුත් රොබ් කියා සිටියේ ඔහුව ගණන් ගත නොහැකි බවය. මක්නිසාද යත් ඔහු කලින් සිටි පිස්සු රජතුමා සිය දෑතින්ම මරා දමා තිබුනු බැවිනි. එනමුදු දැනට ජීවතුන් අතර සිටින ශ්‍රේෂ්ටතම නයිට්වරයා වන්නේ රාජ්‍යාරක්ෂක බලකායේ අන දෙන නිළධාරී, නිර්භීත බැරිස්ටාන් ලෙසින් හඳුන්වන සෙර් බැරිස්ටාන් සෙල්මි ය.

ඔවුන් කින්ග්ස් ලෑන්ඩින්ග්වලට ළඟා වූ පසු සෙර් බැරිස්ටාන් මුන ගස්සවන බවට පියා ඔහුට පොරොන්දු වී තිබින. බ්‍රැන් පුල පුලා බලා සිටියේ මෙතෙක් කල් ඔහු සිහිනයෙන් පමණක් දුටු මේ නව ලෝකය සැබැවින්ම දකින්නට ය, එහි ජීවත් වන්නට ය. නමුත් දැන් ඒ දවස ළඟා වී ඇති මොහොතේ බ්‍රැන්ට හදිසියේම අතරමං වූ බවක් දැනෙන්නට විය. ඔහු හැමදාමත් දැන සිටි එකම නිවහන වින්ටර්ෆෙල් පමනක්ම විය.

සිය සමුගැනීම් සියල්ලක්ම අද දවස ඇතුළත නිමා කරන්නැයි පියා ඔහුට පවසා තිබුනු අතර ඔහු ඒ වෙනුවෙන් උත්සාහයක් දරා තිබින. දඩයක්කාර පිරිස පිටව ගිය පසු ඔහු සිය වෘක පැටවාද සමග බලකොටුව පුරා අයාලේ ගියේ ඔවුන් මෙහි දමා යන සැමට ආයුබෝවන් කියන අදහසිනි. නාකි ආයම්මා, ගේජ් නමැති කෝකියා, කම්මල්කරු මික්කන්, ඉස්තාලය බලාගන්නා හොඩෝර් සහ තවත් බොහෝ අය.

නමුත් එය එතරම් පහසු කටයුත්තක් නොවී ය. ඔහු පළමුවෙන්ම ඉස්තාලය බලා ගියේ තම පෝනියාට කතා කරන්නට නමුත් ඔහුට මතක් වූයේ තව දුරටත් ඌ තම පෝනියා නොවන බවත්, තමා ඇත්ත අශ්වයකු පිට නැගී හෙට උදෑසන පිටවී යන බවත් ය. මෙම සිතුවිල්ලත් සමග වෙන කිසිදු දෙයකට වඩා ඔහුට උවමනා වූයේ බිම වාඩිවී ඉකිබිඳ හඬන්නට ය. ඔහු වහා ආපසු හැරී දොරින් එළියට දිව ගියේ හොඩෝර් හා අනෙකුත් ඉස්තාල සේවකයින්ට සිය කඳුළු නොපෙනෙනු පිනිස ය. ආයුබෝවන් කීමේ අවසානය එය වූ අතර ඔහු මුළු උදය කාලයම ගෙවුවේ දෙව්වනය තුළ සිය වෘක පැටවා හා සමාගමයෙනි.

ඔහු තවමත් සිය වෘක පැටවාට නමක් තබා තිබුනේ නැත. රොබ් සිය පැටවාට 'ග්‍රේ වින්ඩ්' කියා නම් තැබුවේ ඌ වේගයෙන් දුවන බැවිනි. සන්සා ගේ පැටවා 'ලේඩි' නම් වූ අතර ආර්යා පරණ කතන්දර වල කියැවෙන කවුදෝ මායාකාර රැජිණකගේ නමක් සිය පැටවාට තබා තිබින. රිකන් ගේ පැටවා නිකම්ම නිකං 'ෂැගී ඩෝග්' වූ අතර එය වෘක පැටවෙකුට නොගැලපෙන මහ මෝඩ නමකැයි බ්‍රැන් සිතුවේ ය. තමා මුලින්ම 'ගෝස්ට්' යන නම නොසිතුවේ මන්දැයි ඔහු කල්පනා කලේ ය. පසුගිය සති දෙක තුළ ඔහු නම් සිය ගණනක් සිතා තිබුනු නමුත් ඒ එකක්වත් සිතට ගැලපුනේ නැත.

අන්තිමේදී දෙව්වනයේ සිටීම එපා වූ බ්‍රැන් වහළට නැගීමට තීරණය කලේ ය. බිඳවැටුනු කුළුණට නැගීමට ඔහුට සති ගණනාවකින් නොහැකි වූයේ මෙතෙක් දවස් මාලිගයේ පැවැති කලබලය නිසා ය. මේ ඔහුට ලැබෙන අවසාන අවස්ථාව විය හැක.

ඔහු දෙව්වනය හරහා දිව ගිය අතර වෘක පැටවාද ඔහු ගේ දෙපා අසලින්ම ලුහුබැඳ ආවේ ය. ආයුධ ගබඩාවේ බිත්තිය අසල මුරකරු වෘක්ෂය පාමුල නැවතුනු ඔහු වෘක පැටවාට කතා කලේ ය. "ඔයා මෙතන ඉන්ට. බිම වාඩිවෙන්ට, අන්න හරි. ඔහොමම ඉන්ට."

වෘක පැටවා අණට කීකරු විය. උගේ කණ පිටුපස කැසූ බ්‍රැන් ආපසු හැරී උඩ පැන ගසේ පහතම අත්ත අල්ලාගෙන ඉහළට ඇදුනේ ය. ඔහු ඉතා පහසුවෙන් අත්තෙන් අත්ත අල්ලාගෙන ගසේ අඩක් පමන නැග්ග පසු නැගිට සිටි වෘක පැටවා උඩුබුරලන්නට පටන් ගති. බ්‍රැන් පහත බැලුවේ ය. පැටවා නිහඬ වූ නමුත් සිය දිදුලන කහ පැහැති දෑසින් දිගටම ඔහු දෙස බලා සිටින්නට විය. අමුතු සීතලක් සිය සිරුර පුරා දිව යනු බ්‍රැන්ට දැනුනි. ඔහු

නැවත නැඟීම ඇරඹූ අතර පැටවාද නැවත උඩුබුරලන්නට විය. "සද්ද කරන්ට එපා." බ්‍රැන් ඌට තරවටු කලේ ය. "වාඩි වෙන්ට. වාඩි වෙලා ඔහොමම ඉන්ට. ඔයා අම්මටත් වඩා හපන් නෙ." එනමුදු ඔහු ගසේ ඉහළටම නගින තුරුත්, එයින් ආයුධ ගබඩාවේ වහළට නැග උගේ දර්ශන පථයෙන් නොපෙනී යන තුරුත් ඒ උඩුබුරලෑම ඔහු පසුපසින් හඹා ආවේ ය.

වින්ටර්ෆෙල්හි වහළවල් හා පියැසි බ්‍රැන් ගේ දෙවැනි නිවහන මෙන් විය. සිය මව නිතරම පැවසූ දෙයක් වූයේ බ්‍රැන් ඇවිදින්නට පෙර නගින්නට පටන් ගත් බවයි. තමා ඇවිදින්නට පටන්ගත්තේ කවදාදැයි බ්‍රැන්ට මතක නැත. එලෙසම තමා මෙසේ නගින්නට පටන්ගත්තේ කවදාදැයි කියාද ඔහුට මතක නැත. සමහරවිට මව කියන කතාව සත්‍යයක් විය හැක.

ඔහු වැනි කුඩා පිරිමි ළමයෙකුට වින්ටර්ෆෙල් යනු සතර අතටම විහිදී ගිය ගලින් නිමවුනු බිත්ති, කුළුණු, අංගන හා උමං පිරි වංකගිරියක් බඳු විය. මාලිගයේ පැරණිතම කොටස්වල ශාලාවන් කෙතරම් ඉහළ පහළ විහිදී ගියාදැයි කිවහොත් තමා සිටින්නේ කුමන තට්ටුවේදැයි පවා යමෙකුට සිතා ගැනීම අසීරු විය. මේස්ටර් ලුවින් වරක් ඔහුට කියා ඇති පරිදි මේ මාලිගය සියවස් ගණනාවක් පුරා ගලින් කල වෘක්ෂයක් මෙන් සෙමින් සෙමින් වැඩුනකි.

නමුදු මේ වංකගිරියෙන් මිදී ඉහළ නැගුනු පසු බ්‍රැන්ට මුළු වින්ටර්ෆෙල් මාලිගයම එකවර දැක ගත හැකි විය. ඔහුට පහළින් මාලිගයේ ජීවිතය පුරුදු පරිදි ගලා යද්දී ඔහුට ඉහළින් සිටියේ කුරුල්ලන් පමණි. මේ දෙස බලමින් පළමු බලකොටුවේ වහළ මතට වී පැය ගණන් ගතකිරීමට ඔහුට හැකියාව තිබින. සෙබළුන් සෙණ්ඩුවාලුවේ යුධ සරඹ පුරුදු වෙන අයුරු, වීදුරු උද්‍යානයේ එළවළු පැළවලට සාත්තු කරන කෝකියන්, බලු කූඩු තුළ නිනවුවක් නැතිව මෙන් එහා මෙහා දුවන බල්ලන්, ළිඳ ලඟ ඕපාදූප දොඩවන වැඩකාර කෙල්ලන්. මෙසේ ඉහළ සිට බලා සිටිද්දී ඔහුට හැඟුනේ තමා රොබ්ට පවා කිසිදා සිතා ගැනීමටවත් නොහැකි අන්දමකින් වින්ටර්ෆෙල්වල පාලකයා වී ඇති බවයි.

යම් දිනයක බ්‍රැන් වහළකින් ලිස්සා බිම වැටී මිය යනු ඇතැයි ඔහු ගේ මව දැඩි බියකින් සිටියා ය. එය කවදාවත් සිදු නොවන දෙයක් බව ඔහු ඇයට පුන පුනා කියූවත් ඇය එය විශ්වාස නොකලා ය. වරක් ඇය ඔහුගෙන් පොරොන්දුවක් ගන්නට ද සමත් වූවා ය. ඔහු

සති දෙකක් පමණ ඉතා අමාරුවෙන් මෙම පොරොන්දුව රැක්කද අන්තිමේදී එක්තරා රාත්‍රියක සිය සොයුරන් සුව නින්දේ පසුවෙද්දී ජනේලයෙන් පිටව ගියේ ය.

වරදකාරී හැඟීම නිසාම පසුදින ඔහු සිය අපරාධය පාපොච්චාරණය කලේ ය. එඩාර්ඩ් උතුමානන් ඔහුව දෙව්වනයට යැවුවේ දෙවියන් ඉදිරියේ හිඳ සිය අකීකරුකම ගැන පශ්චාත්තාප වීම පිණිස ය. ඔහුට මුළු රාත්‍රියම එසේ සිටීමට නියම වුනු අතර ඔහු පිටව ඒම වැළැකීමට දොරටු වලට මුර සෙබළුන් යෙදවිනි. පසුදින උදයේ ඔහු කොතැනකවත් දකින්නට නොසිටි අතර අන්තිමේදී ඔහුව සොයාගත්තේ වනවදුලේ තිබුනු උසම මුරකරු වෘක්ෂයේ උඩම අත්තක සුව නින්දේ පසුවෙද්දී ය.

කෙතරම් තදින් කේන්ති ගොස් තිබුනද ඔහු ගේ පියාට සිනාව නවතා ගත නොහැකි වින. "උඹ නං මගෙ පුතෙක් නෙවෙයි." ඔහු බ්‍රැන්ට කීවේ ය. "උඹ ලේනෙක්. වෙන කරන්ට දෙයක් නෑ. උඹට උඩ නගින්ට ඕනම නං නැගපං. ඒත් දෙයියන්ගෙ නාමෙට අම්මගෙ ඇස්වලට පේන්ට එහෙම කරන්ට එපා."

බ්‍රැන් ඔහුට හැකි උපරිම අයුරින් මේ අවවාදය පිළිපැද්ද ද සිය මව මුලා කල හැකි විනැයි ඔහු කිසිදා නොසිතී ය. පියා එය තහනම් නොකල බැවින් ඇය උදවු පතා අන් අය වෙත හැරුනා ය. නාකි ආයම්මා ඔහුට වරක් කතාවක් කියා දුන් අතර එහි වූයේ ඉහළ නගින්නට ආශා කල නරක පිරිමි ළමයෙකු අකුණක් වැදීමෙන් බිම පතිත වූ සැටි ය. ඔහු වැටුනු පසු කපුටන් ඔහු ගේ දෑස් උගුල්ලාගත් අයුරුද ඇය විස්තර කලා ය. බිඳුනු කුළුණේ ඉහළ ඇත්තෙන්ම කපුටු කූඩු තිබුනු අතර සමහර දිනවල බ්‍රැන් ඔවුන් වෙනුවෙන් සිය සාක්කු ඉරිඟු ඇටවලින් පුරවා ගති. කපුටන් මේ ඉරිඟු ඇට ඔහු ගේ අතින්ම අනුභව කල නමුදු කිසිදු දවසක ඔහු ගේ දෑස් උගුල්ලා ගැනීමට තැත් කලේ නැත.

පසු දිනෙක මැටියෙන් කුඩා පිරිමි ළමයෙකු ගේ රුවක් ඇඹූ මේස්ටර් ලූවින් එයට බ්‍රැන් ගේ පරණ ඇඳුමක් අන්දවා පවුර මුදුනේ සිට එය බිමට අත හරිනු ලැබුවේ බිම වැටුනොත් කෙසේ විය හැකිදැයි බ්‍රැන්ට පෙන්වා දීම පිනිස ය. එය ඇත්තටම විනෝද ජනක දෙයක් වූ අතර මේස්ටර් දෙස බැලූ බ්‍රැන් මෙසේ කීය. "මාව හැදිලා තියෙන්නෙ මැටියෙන් නෙවෙයි. අනෙක කොහොම වුනත් මම කවදාවත් වැටෙන්නෙ නෑ."

එයින් පසු ටික කාලයක් යනතෙක් ඔහු වහළ උඩ සිටින බව දුටහොත් සෙබළු ඔහුව හඹා ඒමට හා එයින් බිමට බස්සවා ගැනීමට යත්න දැරූහ. ඒ නම් නියමම කාලයක් වූ අතර එය හරියටම සිය සොයුරන් හා හැංගිමුත්තම් සෙල්ලම් කරනවා වැනි විය. කිසිම සෙබළෙකුට බ්‍රැන් තරම් හොඳින් ඉහළ නැගීමට නොහැකි විය. අනෙක බොහෝ අවස්ථාවල ඔවුන් ඔහුව දැක්කේම නැත. මිනිස්සු සාමාන්‍යයෙන් කිසිවිටෙකත් උඩ නොබලති. බ්‍රැන්ට දැනුනේ හරියටම තමා අදෘශ්‍යමාන පුද්ගලයකු වැනි හැඟීමකි.

Jaime Lannister: "Give me honorable enemies rather than ambitious ones, and I'll sleep more easily by night."

මේ ඉහළ නැගීමට බ්‍රැන් ආසා කිරීමට තවත් හේතු බොහෝ විය. බිත්තියේ ඇති කුඩා පැලුම් අතරට අතැඟිලි හා පා ඇඟිලි රිංගවමින් සිය සිරුර අඟලින් අඟල ඉහළට ඇදගනිද්දී දැනෙන හැඟීමට ඔහු ප්‍රිය කලේ ය. මේ වෙහෙසීම නිසා මාංශ පේශීන්වල ඇති වන ඒ ගැඹුරු මිහිරි වේදනාවට ඔහු ප්‍රිය කලේ ය. එතරම් ඉහළ උසකදී හමන සුළඟේ ඇති සීතල රසයට ඔහු ප්‍රිය කලේ ය. මේ සියල්ලටම අමතරව ඔහු කුරුල්ලන්ට - බිඳුනු කුළුණේ සිටින කපුටන්, ගල් අතර පැලුම් තුළ කූඩු සදාගෙන සිටින පුංචි ගේ කුරුල්ලන්, පරණ ආයුධ ගබඩාවට උඩින් ඇති අට්ටාලයේ නිදා වැටෙන නාකි බස්සා - ප්‍රිය කලේ ය. මේ සියළුදෙනාම ඔහු ගේ මිතුරන් වූහ.

මේ හැමටත් වඩා අන් කිසිවෙකුටත් යා නොහැකි තැන්වලට යාමටත්, අන් කිසිවෙකුටත් කිසි දිනෙක දැක ගත නොහැකි අන්දමින් වින්ටර්ෆෙල් දැක ගැනීමටත් බ්‍රැන් ප්‍රිය කලේ ය. ඔහු ගේ ප්‍රියතම ස්ථානය වූයේ බිඳුනු කුළුණ ය. කලෙකදී එය වින්ටර්ෆෙල්හි උසම කුළුණ වූ අතර මුර අට්ටාලයක් ලෙසින් භාවිතයට ගැනින. නමුත් ඔහු ගේ පියා උපදින්නටත් වසර සිය ගණනකට පෙරාතුව සිදු වූ අකුණු ගැසීමකින් ඇති වූ ගින්නක් නිසා එහි තුනෙන් පංගුවක් පමණම බිඳ වැටී තිබින. එය නැවත කිසිදා අලුත්වැඩියා නොකෙරුනු අතර බ්‍රැන් හා කපුටන් හැර වෙන කිසිවෙක් එහි මුදුනට නොනගිති.

එහි යා හැකි හොඳම විදිය වූයේ දෙව්වනයෙන් ආරම්භ කර, මුරකරු වෘක්ෂයෙන් ඉහළට නැග, ආයුධ ගබඩාවේ හා මුර සෙබළුන්ගේ ශාලාව උඩින් වහලවල් මතින් පැන පැන යාම විය. මෙය ඔබව මාලිගයේ පැරණිතම කොටස වන පළමු බලකොටුව (එහි දැන්

ජීවත්වන්නේ මීයන් හා මකුළුවන් පමණි) වෙත ගෙන එන අතර එහි පිටතට විහිදී ඇති දිය පිටකරන නළ වල එල්ලී වඳුරෙකු මෙන් පැද්දී යාමෙන් ඔබට බලකොටුවේ උතුරු දෙසට ළඟා විය හැක. එතැන සිට අත දිගු කල විට ඔබට බිඳුනු කුළුණ අල්ලා ගත හැකි අතර එයින් පසු ඇත්තේ අඩි දහයක පමණ සුළු නැග්මකි.

මෙසේ සිය හුරුපුරුදු දැතින් නළයෙන් නළයට පැද්දෙමින් යද්දී බ්‍රැන්ට කටහඬක් ඇසුනි. ඔහු කෙතරම් තැතිගැනුනාදැයි කිවහොත් තව ටිකකින් ග්‍රහණය ගිලිහී යාමටත් තිබින. සිය ජීවිත කාලය පුරාම පළමු බලකොටුව හිස් ව තිබුනකි.

"මම ඒකට කැමැති නෑ." ගැහැණියක ගේ හඬ ඇසුනි. ඔහුට පහළින් කවුළු පේළියක් තිබුනු අතර හඬ ඇසුනේ එහි අන්තිම කවුළුවෙනි. "ඔයයි හරි නම් රොබර්ට්ගෙ අත වෙන්ට ඕන."

"දෙයියන්ගෙ නාමෙට, ඒක මට උවමනා ගෞරවයක් නෙවෙයි." පිරිමියෙකු ගේ හඬ පිළිතුරු දුනි. "ඒක මහ අමාරු වැඩ ගොඩක් තියෙන රාජකාරියක්."

බ්‍රැන් අත්දෙකෙන් එල්ලී නිසලව සිටියේ ඉදිරියට යාමට බියෙනි. කවුළුව පසු කර යාමට තැත්කලහොත් ඔවුන් ඔහු ගේ දෙපා දකිනු ඇත.

"ඔයාට පේන්නෙ නැද්ද මේකෙන් අපි කොච්චර ලොකු අනතුරකද වැටෙන්නෙ කියලා." ගැහැණිය කීවා ය. "රොබර්ට් මේ මිනිහට සහෝදරයෙකුට වගේ ආදරෙයි."

"රොබර්ට්ට එයාගෙ සහෝදරයො කොහොමත් දිරවන්නෙ නෑ. මං ඒකට මිනිහට වැරැද්දක් කියන්නෙත් නෑ. ස්ටැනිස්ව දැක්කහම ඇති කෙනෙකුට බඩේ අමාරුව හැදෙන්ට."

"මෝඩයෙක් වගේ කතා කරන්ට එපා. ස්ටැනිසුයි රෙන්ලියි කියන්නෙ එක දෙයක්, එඩාර්ඩ් ස්ටාර්ක් කියන්නෙ තව දෙයක්. ස්ටාර්ක් කියන දේ රොබර්ට් අහනවා. උං

දෙන්නම යකාට යන්ට ඕන. මට තිබුනෙ ඔයාට මේ තනතුර දෙන්ටයි කියලා බලකරලා කියන්ට. මම හිතුවෙ ස්ටාර්ක් මේ යෝජනාව ප්‍රතික්ෂේප කරයි කියලා."

"අපි හිතාගන්ට ඕන අපි වාසනාවන්තයි කියලා." පිරිමියා කීය. "රජ්ජුරුවන්ට තිබ්බා මේ තනතුරට එයාගෙ සහෝදරයෙක්ව නම් කරන්ට, එහෙම නැත්තං සුළැඟිල්ලාව. එහෙම වුනානං අපට දෙයියන්ගෙම පිහිටයි. ඉහළ නගින්ට බලාපොරොත්තුවෙන් ඉන්න සතුරෙකුට වඩා ගෞරවනීය සතුරෙකුට මම කැමැතියි. මට එතකොට රෑට ලේසියෙන් නිදාගන්ට පුළුවන්."

ඔවුන් කතා කරමින් ඉන්නේ තාත්තා ගැනය. බ්‍රැන්ට තව දුරටත් මේ කතාවට කණ් දීමට උවමනා විය. තව අඩි කීපයක්... නැත එසේ කලහොත් ඔවුන් ඔහුව දකිනු ඇත.

"අපට එයා දිහා බොහොම පරෙස්සමෙන් ඇහැ ගහගෙන ඉන්ට වෙයි." ගැහැණිය කීවා ය.

"මම ඊට වඩා කැමැතියි ඔයා දිහා ඇහැ ගහගෙන ඉන්න." පිරිමියා ගේ ස්වරයෙහි වූයේ උදාසීන බවකි. "මෙන්න මෙහාට එන්ට."

"බෙල්ලෙන් පහළ දකුණුකරයෙ සිද්ධවෙච්ච කිසිම දෙයක් ගැන එඩාර්ඩ් උතුමානන් කවදාවත් කිසිම උනන්දුවක් පෙන්නුවෙ නෑ." ගැහැණිය කීවා ය. "කවදාවත්ම නෑ. මම ඔයාට කියන්නම්, එයා මේ අපට විරුද්ධව නැගිටින්ට තමා යන්නෙ. එහෙම නැත්තම්, එයා මෙහෙම එයාගෙ බල වසම අත ඇරලා දාලා යන්ට හේතුව මොකක්ද?"

"හේතු සිය ගානක් තියෙන්ට පුළුවන්. රාජකාරිය. ගෞරවය. එයාගෙ නම ඉතිහාස පොතේ ලොකුවට ලියාගන්ට ඕන වෙලා. එයාගෙ බිරිඳගෙන් ටිකක් ඈත්වෙන්ට ඕන වෙලා. මේ හේතු දෙකම වෙන්ටත් පුළුවන්. එහෙමත් නැත්තම් එයාට ටිකක් උණුහුම් වෙන්ට ඕන වෙලා වෙන්ටත් පුළුවන්."

"එයාගෙ බිරිඳ කියන්නෙ ඒරින් ආර්යාවගෙ සහෝදරී. පුදුමයි ලයිසා අපි එද්දි මෙහෙ හිටිය නැති එක, එයාගෙ අර චෝදනා පත්තරෙත් එක්ක."

බ්‍රැන් පහත බැලුවේ ය. කවුළුවට ඉහළින් අඟල් කිහිපයක් පළල ගැට්ටක් විය. ඔහු ඒ මතට පහත් වීමට උත්සාහ කලද එය දුර වැඩි විය.

"ඔයා ගොඩාක් දුර හිතනවා වැඩියි. ලයිසා ඒරින් කියන්නෙ බයවෙච්ච එළදෙනක් විතරයි."

"ඒ බයවෙච්ච එළදෙන ජොන් ඒරින් එක්ක එක ඇඳේ නිදාගත්තා."

"එයා මොනව හරි දන්නවනං කින්ග්ස් ලැන්ඩින්ග් වලින් පැනලා යන්ට කලින් එයාට රොබර්ට්ව මුනගැහෙන්ට තිබුනා."

"රොබර්ට් එයාගෙ පුතාව කාර්ස්ටලී රොක්වල හදාගන්ට යවන්ට පොරොන්දු වෙලා ඉන්දැද්දී? මං හිතන්නෙ නෑ. එයා දැනගෙන හිටියා ළමයගෙ ජීවිතේ ප්‍රාණ ඇපයට අරන් එයාට කටවහන් ඉන්ට කියයි කියලා. දැන් බොහොම පරෙස්සමට ඉයරි වලට වෙලා ඉන්න නිසා එයා බය සැක නැතිවෙයි."

"දෙයියම්පා මේ අම්මලාගෙ හැටි! මම හිතන්නෙ ළමයි බිහි කලාට පස්සෙ ඔයාලාට මොකක් හරි වෙනවා. ඔයාලා හැමෝටම පිස්සු." ඔහු සිනාසුනේ ය. "ඒරින් ආර්යාව එයාට ඇති පදම් බය සැක නැති වෙච්චාවෙ. එයා මොනවා දැනගෙන හිටියත්, එයා මොනවා දන්නවද කියලා එයා හිතාගෙන හිටියත් එයාට ඒකට සාක්කි නෑ. එහෙම නේද?"

"ඔයා හිතනවද රජතුමාට සාක්කි ඕන වෙයි කියලා?" ගැහැණිය කීවා ය. "මම ඔයාට කියන්නෙ, එයා තව දුරටත් මට ආදරේ නෑ."

"ඉතිං ඒක කාගෙ වැරැද්ද ද සහෝදරී?"

බ්‍රැන් සැලකිල්ලෙන් ගැට්ට දෙස බැලී ය. ඔහුට ඒ මතට පැන්න හැකිය. නමුත් ශබ්දයක් ඇසුනහොත් අර දෙදෙනා කවුළුව අසලට පැමිණෙනු ඇත. තමා මේ ඇහුම්කන් දෙන්නේ කුමකටදැයි ඔහුට හරියටම නොතේරුනත් එය සිය දෙසවනේ පතිත විය යුත්තක් නොවන බව ඔහු දැන සිටියේ ය.

"ඔයත් රොබර්ට් තරම්ම අන්ධයි." ගැහැණිය කීවා ය.

"ඔයා ඒකෙන් අදහස් කරන්නෙ මමත් ඒ දේම දකිනවා කියලද? ඔවු. මට පේන්නෙ තමන්ගෙ රජතුමාගෙ විශ්වාසය කඩකරන්ට කලින් මැරෙන්ට වුනත් සූදානම් මිනිහෙක්."

"එයා දැනටමත් එක්කෙනෙක් පාවා දීලයි තියෙන්නෙ. ඔයාට අමතක වුනාද? මම කියන්නෙ නෑ එයා රොබර්ට්ට පක්ෂපාතී නෑ කියලා. මොකද වෙන්නෙ රොබර්ට් මැරිලා ජොෆ් සිංහාසනේට නැග්ගහම? ඒ වැඩේ ඉක්මන් වෙන තරමට අපි හැමෝටම ආරක්ෂාවයි. රජතුමා දවස ගානෙ තව තවත් කලබල වෙනවා. ස්ටාර්ක් එයාගෙ පැත්තකින් ඉන්නවා කියන්නෙ ඒක තවත් නරක අතට හැරෙනවා කියන එකයි. රොබර්ට් තාමත් එයාගෙ සහෝදරීට ආදරෙයි. එයා මාව පැත්තකට දාලා අලුත් ලියානා කෙනෙක් හොයාගන්ට තව කොච්චර කල් යයි කියලද ඔයා හිතන්නෙ?"

හදිසියේම බ්‍රැන්ට දැඩි බියක් දැනෙන්නට විය. වෙන කිසිම දෙයකටවත් වඩා ඔහුට උවමනා වූයේ පැමිණි දිසාවටම ආපසු ගොස් සිය සොයුරන් සොයාගැනීමට ය. නමුත් ඔහු ඔවුන්ට කියන්නේ කුමක්ද? ඔහු මීට වඩා කිට්ටු විය යුතුය. මේ කතා කරන්නේ කවරෙක්දැයි දැක බලා ගත යුතු ය.

පිරිමියා සුසුමක් හෙලී ය. "ඔයා අනාගතේ ගැන අඩුවෙන් හිතලා මේ මොහොතේ සතුට ගැන වැඩියෙන් හිතන්ට ඕන."

"ඕක නවත්තන්ට." අතුල් පහරක හඬත් පිරිමියා සිනාසෙන හඬත් බ්‍රැන්ට ඇසුනි.

ඉහළට ඇදුනු බ්‍රැන් දිය බටයට ගොඩවී එයින් වහළයට නැග්ගේ ය. මෙය තමා පහසුම ක්‍රමය. ඔහු කවුළුවට වහාම ඉහළින් තිබුනු ඊළඟ දිය බටය වෙතට ගියේ ය.

"මේ කතා හරිම හිරිහැරදායකයි සහෝදරී. මෙන්න මෙහාට ඇවිල්ලා කට වහගෙන ඉන්ට."

දිය බටය මත දෙපා දෙපසට දමා වාඩිවුනු බ්‍රැන් ඒ වටා දෙපා තදකර ගත්තේ ය. ඉන්පසු හෙමින් සැරේ හිස පහතට සිටින සේ පහතට නැමුනේ ය. උඩු යටිකුරු වූ ලෝකය අමුතුම ආකාරයකින් පෙනෙන්නට විය. ඔහුට බොහෝ පහළින් දියවුනු හිම නිසා තෙතබරිත වූ ගලින් සැදුනු අංගනයක් විය. සිය දෙපාවලින් බටයේ එල්ලුනු බ්‍රැන් ගෙල දික්කර, හෙමින් හිස හරවා, කවුළුව තුළින් බැලුවේ ය.

කාමරය තුළ පිරිමියෙක් හා ගැහැණියක් නිරුවතින් පොර බදමින් සිටියහ. ඔවුන් කවුරුදැයි බ්‍රැන්ට හඳුනාගත නොහැකි විය. පිරිමියා ඔහුට පිටුපා සිටි අතර ඔහු ගේ සිරුර මගින් බිත්තියට හේත්තු වී සිටි ගැහැණිය ආවරණය වී තිබින.

බ්‍රැන් විසල් දෑසින් හා අයාගත් මුවින් යුතුව බලා සිටියේ ය. ඔවුන් දෙදෙනා සිප ගනිමින් සිටි අතර පිරිමියා ගේ අත ඇගේ දෙපා අතරේ රැඳී තිබින. ඔහු ඇයට රිදවූවාක් මෙන් ඇය කෙඳිරි ගාන්නට පටන් ගත්තා ය. "ඕක නවත්තන්ට." ඈ කීවාය. "නවත්තන්ට... නවත්තන්ට කරුණාකරලා." ඇගේ හඬ පහත් හා දුර්වල විය. එහෙත් ඇය ඔහු ඉවතට තල්ලු නොකළා ය. ඔහු ගේ රන්වන් කෙහෙරැළි අතරේ සිය අතැඟිලි රැඳවූ ඇය සිය ළයමඬල දෙසට ඔහු ගේ හිස සෙමින් ඇදගත්තා ය.

ඒ අවසරයෙන් බ්‍රැන් ඇගේ මුහුණ දැක්කේ ය. ඇගේ දෑස් වැසී තිබුනද, කෙඳිරිය නිසා ඇගේ මුව විවරව තිබුනද, රන් පැහැ කෙහෙරැළි එහා මෙහා විසිර තිබුනද බ්‍රැන්ට ඉතා පහසුවෙන්ම රැජිණව හඳුනාගත හැකි විය.

විමතිය නිසා ඔහු යම් ශබ්දයක් කලා වන්නට ඇත. රැජිණ හදිසියේම දෑස් විවර කල අතර ඒ දෑස් එක එල්ලේ යොමු වී තිබුනේ බ්‍රැන් දෙසට ය. ඊළඟ මොහොතේ ඇය කෑ ගැසුවා ය.

එක් මොහොතක් තුළ බොහෝ දේ සිදුවිය. රුජිණා වියරුවෙන් මෙන් පිරිමියාව පසෙකට තල්ලු කර ඔහු දෙසට ඇඟිලි දික්කරමින් කෑ ගසන්නට විය. බ්‍රැන් ඉහළට ඇදෙන්නට උත්සාහ කලේ දිය බටය අල්ලා ගැනීමට අත දිගු කරමිනි. හදිසිය නිසා ඔහුට හසුවූයේ සුමට ගල් බිත්තිය පමණක් වූ අතර සන්ත්‍රාසය නිසා දෙපා ලිස්සුවේ ය. ඊළඟ මොහොතේ ඔහු පහළට වැටිනි. විදුලි වේගයෙන් කවුළුව පසුකරද්දී අතක් දිගු කල ඔහු කවුළු පඩියේ එල්ලුනේ ය. ඔහුව තදින් පැද්දී ගොස් ගල් බිත්තියේ හැපුනු අතර සට්ටනය නිසා හුස්ම හිරවුනාක් බඳු විය. එක් අතකින් කවුළු පඩියේ එල්ලීගත් බ්‍රැන් හතිලන්නට විය. ඔහුට ඉහළින් කවුළුව තුළින් මුහුණු දෙකක් මතු විය. රුජිණා. ඒ මොහොතේ ඇයට පසෙකින් සිටි පිරිමියා කවුදැයි බ්‍රැන් හඳුනා ගත්තේ ය. ඔවුන් දෙදෙනා  දර්පණයකින් පෙනෙන ප්‍රතිබිම්බයක් මෙන් එකිනෙකාට සමාන විය.

"එයා අපිව දැක්කා." රුජිණා විනිවිද යන ස්වරයකින් කීවා ය.

"ඔවු." පිරිමියා කීවේ ය.

බ්‍රැන් ගේ අතැඟිලි ලිස්සන්නට විය. ඔහු අනිත් අතින් කවුළු පඩිය අල්ලා ගත්තේ ය. පිරිමියා පහතට නැඹුරු විය. "ඔයා වැටෙන්ට කලින් මගේ අතින් අල්ලගන්ට."

ඔහු ගේ අත අල්ලාගත් බ්‍රැන් හැකි උපරිම ශක්තියෙන් එහි එල්ලුනේ ය. පිරිමියා ඔහුව කවුළු පඩිය මතින් ඉහළට ඇද ගත්තේ ය. "ඔයා මොනවද ඔය කරන්නෙ?" රුජිණා ඇසුවා ය.

පිරිමියා ඇයව නොතකා හැරියේ ය. ඔහු බ්‍රැන්ව ඔසවා කවුළු පඩිය මත සිටවී ය. "උඹට වයස කීයද කොල්ලො?"

"හතයි." බ්‍රැන් කීවේ ලද සහනය නිසා වෙවුලමිනි. ඔහු ගේ අතැඟිලි පිරිමියා ගේ යටිබාහුවට දැඩිව කා වැදී තිබින. ඒ දුටු ඔහු බියසුලු ලෙස එය අත හැරියේ ය.

**පිරිමියා හිස හරවා රැජිණ දෙස බැලී ය. "ආදරේ හන්දා මම කරන දේවල්." ඔහු පිළිකුලින් යුතුව කීය. ඊළඟ මොහොතේ ඔහු බ්‍රැන්ව පිටතට තල්ලු කලේ ය.**

**මරහඬක් නගමින් බ්‍රැන් කවුළුවෙන් පිටත සීතල සුළඟ වෙත විසි වී ගියේ ය. අල්ලා ගැනීමට කිසිවක්ම නොතිබුනු අතර ඔහුව පිළිගැනීමට අංගනය වේගයෙන් ඉදිරියට පැමිණියේ ය.**

**ඈත කොහේදෝ තැනක වෘකයෙක් උඩුබුරලන්නට විය. කපුටෝ ඉරිඟු ඇට බලාපොරොත්තුවෙන් බිඳුනු කුළුණ වටා පියා සලන්නට වූහ.**

Bran Stark: “I'm not made of clay. And anyhow, I never fall.”

ටිරියන්

ශෛලමය වංකගිරියක් වූ වින්ටර්ෆෙල්හි කොහේදෝ තැනක සිට වෘකයෙක් උඩුබුරලෑමට පටන්ගති. එය මාලිගය සිසාරා පැතිර ගියේ ශෝකාලාපයක් මෙනි.

හොඳින් ආවරණය වූ උණුසුම් පුස්තකාලය තුළ පොතක් කියවමින් සිටි ටිරියන්ට සිය සිරුර වෙවුලා යනු දැනින. වෘකයා ගේ උඩුබුරලෑම විසින් ඔහුව සිටින ස්ථානයෙන් එපිටට ගෙන ගොස් අඳුරු වනයක බහා තිබින. තමා කුසගින්නෙන් පෙලෙන වෘක රංචුවකට ඉදිරියෙන් පණ බේරා ගැනීමට දිවයන නිරුවත් මිනිසෙකු මෙන් ඔහුට හැඟුනි.

වෘකයා නැවත වරක් උඩුබුරලෑම ඇරඹූ විට ටිරියන් මෙතෙක් වේලා කියවමින් සිටි සමින් බැඳුනු සනකම් පොත වසා දැමීය. පිටි අත්ලෙන් ඇනුමක් මුවා කල ඔහු වට පිට බැලුවේ ය. උසැති කවුළු අතරින් හිමිදිරි ආලෝකය එබෙමින් තිබුනු අතර තෙල් මඳකම නිසා පහන නිවී යාමට ආසන්නව තිබින. ඔහු මුළු රැයම නොනිදා පොත් කියවමින් සිට ඇත, නමුත් මෙය අලුත් දෙයක් නොවේ. ටිරියන් ලැනිස්ටර් යනු කවදාවත් නින්දට ලොබ බැඳගත්තෙකු නොවී ය.

ඔහු ගේ දෙපා හිරි වැටී තිබුනු අතර බංකුවෙන් බිමට බට ටිරියන් දෙපා මඳක් සම්බාහනය කර, අසල මේසයක් මත දිගහැර තිබුනු පොතක් මත ගොරවමින් නිදා සිටි පූජකයා අවදි කරවන්නට ගියේ ය. "ෂේය්ල්." ඔහු මෘදුව ඇමතී ය. තරුණ පූජකයා සැනෙන් නැගිට සිටියේ අන්දමන්දව වටපිට බලන්නට විය. "මම යනවා උදේ කෑම කන්ට. පොත් ටික ඔක්කොම ආපහු රාක්කවලට දාන්ට. අර වැලීරියන් ලියවිලි ටික බොහොම පරෙස්සමෙන් අතට ගන්ට. ඒකෙ කඩදාසි හොඳටෝම වේලිලා තියෙන්නෙ. අයර්මිඩන් ගේ 'යුද්ධ යන්ත්‍ර' කියන්නෙ බොහොම දුර්ලභ පොතක්. මම දැකපු එකම සම්පූර්ණ පොත තියෙන්නෙ ඔබලා ළඟ." ෂේය්ල් තවමත් නින්ද පහව නොගිය දෑසින් යුතුව ඔහු දෙස මුව අයා බලා සිටියේ ය. බොහෝ ඉවසිලිවන්තව තවත් වරක් ඔහුට සිය උපදෙස් මාලාව ලබා දුන් ටිරියන් එතනින් පිටත් වීය.

පිටතට පැමිණි ළය පුරා සීතල හුස්මක් ගත් ඔහු පුස්තකාල කුළුණ වටා සර්පිලාකාරව විහිදුනු ගල් පඩිපෙළ බසින්නට විය. ගල් පඩි උස් හා පටු වූ අතර ඔහු ගේ දෙපා කෙටි හා

බකල් වූ නිසා බැස්ම සෙමින් සිදු විය. උදා හිරු එළිය තවමත් වින්ටර්ෆෙල්හි උසැති පවුරුවලින් මෙපිට ආක්‍රමණය කර නොතිබුනු නමුදු සෙබළුන් ඒ වනවිටත් සෙණ්ඩුවාලුවේ සිය සරඹ පුහුණුවීම අරඹා තිබින. සැන්ඩෝර් ක්ලිගේන් ගේ රළු හඬ ඔහු වෙත ගලා ආවේ ය. "මේ කොල්ලා මැරෙන්ට සෑහෙන කාලයක් ගන්නවා. මම කැමැතියි ඒක ඉක්මනට සිද්ධවෙනවා නම්."

පහත බැලූ ටිරියන් දුටුවේ සිය සහචරයින් පිරිවරා දඩබල්ලා සමග සිටගෙන සිටින ජොෆ්රි ය. "අඩු ගානෙ එයා සද්දයක් නොකර මැරෙනවා." කුමරා පිළිතුරු දුනි. "වෘකයා තමා ඔය සද්ද කරන්නෙ. මට ඊයෙ රෑ පොඩ්ඩක්වත් ඇහැ පියාගන්ට ලැබුනෙ නෑ."

ක්ලිගේන් ගේ සහචරයා ඔහු ගේ සන්නාහයේ හිස් වැස්ම පැළඳවී ය. "මට ඒ සතාව නිශ්ශබ්ද කරන්ට පුළුවන්. ඔබ ඒකට සතුටු නම්." ඔහු සිය විවර වුනු මුව වැස්ම තුළින් පැවසී ය. සහචරයා ඔහු අතට දිගු අසිපතක් ලබා දුන් අතර ඔහු වාතය පෙති ගසමින් එහි සමබරතාව මැන බැලී ය. ඔහුට පිටුපසින් සෙණ්ඩුවාලුව පුරා වානේ ආයුධ එකට ගැටෙන හඬින් ගිගුම් දුනි.

මේ කල්පනාව නිසා කුමරා ප්‍රීතියට පත් වූ බව පෙනින. "බල්ලෙක්ව මරන්ට තව බල්ලෙක් යවන්ට!" ඔහු කෑ ගැසුවේ ය. "වින්ටර්ෆෙල් වෘකයන්ගෙන් පිරිලා ගිහිල්ලා තියෙන්නෙ. එකෙක් අඩු වුනා කියලා ස්ටාර්ක්ලට ඒක දැනෙන එකක් නෑ."

ටිරියන් අවසාන පඩියෙන් බිමට පැන්නේ ය. "මම නම් හිතන්නෙ වෙන විදියකට බෑනො. ස්ටාර්ක්ලට හයට වැඩියෙන් ගණන් කරන්ට පුළුවන්. මම දන්න සමහර කුමාරවරු ඉන්නවා ඒකවත් බැරි."

ජොෆ්රි ගේ මුහුණ රතු විය.

"කොහෙන්ද ඒ කටහඬක් ඇහුනෙ?" සැන්ඩෝර් ඇසී ය. ඔහු සිය හිස් වැස්ම තුළින් එහා මෙහා බැලී ය. "හොල්මන්ද?"

සිය ශරීරාක්ෂකයා මේ විහිළුව කරන සෑම විටෙකදීම මෙන් මෙවරද කුමරා සිනාසුනේ ය. ටිරියන් ඇති පදම් මෙය අත්විඳ තිබින. "මෙතන පහළ."

පහළට එබී බැලූ උස් මිනිසා ටිරියන්ව පළමු වරට දුටුවාක් මෙන් ඇඟවී ය. "ටිරියන් පුංචි උත්තමයා. මට සමාවෙන්ට. මම දැක්කෙ නෑ ඔබතුමා ඔතන හිටගෙන ඉන්නවා."

"ඔය අහංකාරකම් වලට උත්තර දෙන්ට මට අද ඕනෑකමක් නෑ." ටිරියන් සිය බෑනනුවන් දෙසට හැරුනි. "ජොෆ්රි, එඩාර්ඩ් උත්තමයයි ආර්යාවයි මුනගැහෙන්ට ගිහිල්ලා එයාලට ඔයාගෙ කණගාටුව ප්‍රකාශ කරන්නෙ නැද්ද? ඔයා දැනටමත් පරක්කු වැඩියි."

ජොෆ්රි නොරිස්සුම් මුහුණක් හදාගත්තේ ය. "මගේ කණගාටුවෙන් එයාලට ඇති වැඩේ මොකක්ද?"

"මොකුත් නෑ." ටිරියන් කීවේ ය. "ඒ වුනත් ඔයා එහෙම කරයි කියලා හැමෝම බලාපොරොත්තු වෙනවා. ඔයා ගියේ නෑ කියලා හැමෝම දන්නවා."

"ඔය ස්ටාර්ක් කොල්ලාගෙන් මට ඇති වැඩක් නෑ. අනික මට රුස්සන්නෙ නෑ ඔය ගෑනුන්ගෙ ඇඬිලි වැලපිලි."

ඉහළට එසවුනු ටිරියන් ලැනිස්ටර් සිය බෑනනුවන් ගේ මුහුණ පුරා දැඩි අතුල් පහරක් දුන්නේ ය. ළමයා ගේ කම්මුල රත් පැහැ වින.

"තව එක වචනයක්වත් කිවුවොත් මම උඹට ආයෙමත් ගහනවා."

"මම අම්මට කියනවා." ජොෆ්රි කෑ ගැසුවේ ය.

ටිරියන් තවත් අතුල් පහරක් දුන්නේ ය.

"උඹට ඕනම නම් ගිහින් අම්මට කියපං. හැබැයි ඊට කලින් උඹ ගිහිල්ලා ස්ටාර්ක් උතුමානනුයි ඒ ආර්යාවයි ඉස්සරහ දණින් වැටිලා කියන්ට ඕන මේ සිද්ධවෙච්ච දේ ගැන උඹ කොච්චර කණගාටු වෙනවද, මේ දුෂ්කර වෙලාවෙ එයාලා වෙනුවෙන් කරන්න පුළුවන් පුංචිම පුංචි උදව්වක් වුනත් කරන්ට පුළුවන් නම් උඹ හැකි උපරිමයෙන් ඒක ඉටු කරනවය, උඹ හැම වෙලාවෙම එයාලා වෙනුවෙන් යාඥා කරනවය කියලා. උඹට තේරුනා ද?"

ළමයා ගේ මුහුණින් පෙනුනේ ඔහු හැඩීමට ආසන්න බවකි. එහෙත් එය යටපත් කරගත් ඔහු සෙමින් හිස වැනී ය. ඉන්පසු වහා ආපසු හැරුනු ඔහු කම්මුල අල්ලාගෙන සෙණ්ඩුවාලුවෙන් පිටතට දිව ගිය අතර ටිරියන් ඒ දෙස බලා සිටියේ ය.

සිය මුහුණ වසා සෙවනැල්ලක් වැටෙනු දැනී ආපසු හැරුනු ඔහු දුටුවේ ඔහු අසලින් කන්දක් මෙන් උසට උසේ සිටගෙන සිටිනා ක්ලිගේන් වය. ඔහු සිය හිස් වැස්මේ මුව ආවරණය පහත් කොට තිබින. එය නිමකර තිබුනේ දැකීමට බිහිසුණු දත් විලිස්සාගෙන සිටින බල්ලෙකු ගේ ස්වරූපයෙන් මුත් ටිරියන් සෑමවිටම සිතුවේ ක්ලිගේන් ගේ පිළිස්සී විරූපී වුනු මුහුණට වඩා මේ වෙස්මුහුණ ලස්සන බව ය.

"කුමාරයා ඕක මතක තියාගෙන ඉඳියි, පුංචි උතුමානෙනි." දඩබල්ලා ඔහුට අනතුරු ඇඟවී ය.

"මම හිතනවා එයා ඒක මතක තියාගනියි කියලා." ටිරියන් පිළිතුරු දුන්නේ ය. "එයාට ඒක අමතක වුනොත් උඹ හොඳ බල්ලෙක් වගේ එයාට ඒක මතක් කරලා දීපං." ඔහු සෙණ්ඩුවාලුව සිසාරා බැල්මක් හෙළී ය. "උඹ දන්නවද මගේ සහෝදරයා කොහෙද කියලා?"

"රැජිණත් එක්ක උදේ කෑම ගන්නවා."

"ආහ්!" ටිරියන් කීවේ ය. සැන්ඩෝර් ක්ලිගේන් වෙත නොසැලකිලිමත් අයුරින් හිස වැනූ ඔහු සියුරුහඬලමින් ඉවතට ඇවිද ගියේ ය. අද දින දඩබල්ලාත් සමග සරඹ පුරුදු වීමට පැමිණෙන පළමු නයිට්වරයා ඉතා අවාසනාවන්තයෙකු වනු ඇත.

Tyrion Lannister: "Death is so terribly final, while life is full of possibilities."

අමුත්තන් ගේ ශාලාවේ ආහාර ගන්නා මේසය මත සීතල කෑම වේලක් පිළියෙල වී තිබිනි. ජේමි එහි වාඩි වී සෙර්සි හා ළමයින් සමග පහත් ස්වරයෙන් කතා කරමින් සිටියේ ය.

"රොබර්ට් තාම නිදිද?" ටිරියන් ඇසුවේ අනාරාධිතවම මේසයට වාඩිවෙමිනි.

සිය සොහොයුරිය ඔහු උපන් දා පටන් ඔහු දෙස හෙලනු ලබන ඒ අප්‍රසාදාත්මක බැල්ම හෙලුවා ය. "රජතුමා කොහෙත්ම නිදාගත්තෙ නෑ. එයා එඩ්ඩාර්ඩ් උතුමානන් එක්ක ඒගොල්ලන්ගෙ දුක බෙදාගන්නවා."

"එයාට බොහොම උදාර හදවතක් තියෙන්නෙ, අපේ රොබර්ට්." ජේමි කීවේ අලස සිනාවක්ද සමග ය. ජේමි බැරෑරුම්ව සැලකූ කාරනා වූයේ ඉතා ස්වල්පයකි. ටිරියන් සිය සොයුරා ගේ මෙම ස්වභාවය දැන සිටි අතර ඒ වෙනුවෙන් ඔහුට සමාව දුන්නේ ය. ඉතා දුක්ඛදායක එකක් වූ ඔහු ගේ මුළු ළමා කාලය පුරාවටම ඔහුට යම් තරමකට හෝ ආදරය ගෞරවය දැක්වූ අයෙක් වේ නම් ඒ ජේමි පමනි. ඒ වෙනුවෙන් ටිරියන් ඔහු කරන ඕනෑම දෙයකට සමාව දීමට සූදානමින් සිටියේ ය.

සේවකයෙක් ඔහු වෙතට නැඹුරු විය. "පාන්, අර පුංචි මාළු දෙන්නෙකුත් එක්ක. බියර් කෝප්පෙකුත් ගේන්ට. ආ! බේකන් ටිකකුත්. ඒවා හොඳට කළු පාට වෙනකම් බදින්ට." හිස නැමූ සේවකයා පිටව ගියේ ය. ටිරියන් නැවතත් සිය සහෝදර නිඹුල්ලුන් දෙදෙනා දෙසට හැරුනි. ඔවුන් දෙදෙනා සෑම අතින්ම එකිනෙකාට සමාන වූ අතර අද උදෑසන ගැලපෙන තද කොළ පැහැ ඇඳුමින් සැරසී සිටියහ. තමාටත් නිවුන් සොහොයුරෙකු සිටියා නම් යැයි ටිරියන් සිතුවේ ය. නැත මේ අන්දමින් සිටීම වඩා යහපත් ය. සැමදා උදෑසනින්

දර්පණයෙන් දකින තම ප්‍රතිබිම්බය පමනටත් වඩා ඇත. ඔහු වැනි තවත් අයෙකු සිටීම දරා ගත නොහැකි දෙයක් වනු ඇත.

ටමෙන් කුමරා කතාව ඇරඹී ය. "බ්‍රැන් ගැන මොකුත් ආරංචියක් තියෙනවද මාමෙ?"

"මම අසනීප කාමරේට ගියා ඊයෙ රෑ, පොඩ්ඩක් බලන්ට කියලා. තත්ත්වයේ වෙනසක් නෑ. මේස්ටර් හිතන්නෙ ඒක සුබදායක ලකුණක් කියලා."

"මට ඕන නෑ එයා මැරෙනවා දකින්ට." ටමෙන් බියසුලු ස්වරයෙන් කීය. සිය සොයුරා මෙන් නොව ඔහු ඉතා කරුනාවන්ත කුඩා දරුවකු විය.

"එඩ්ඩාර්ඩ් උතුමානන්ට හිටියා සහෝදරයෙක් බ්‍රැන්ඩන් කියලා." ජේමි කීවේ ය. "ටාර්ගේරියන් රජ්ජුරුවො මරලා දාපු එක ප්‍රාණ ඇපකාරයෙක්. ඒක බොහොම අවාසනාවන්ත නමක් වගෙයි පේන්නෙ."

"අපොයි! ඒක එච්චරම අවාසනාවන්ත නමක් වෙන්ට බෑ." ටිරියන් පිළිතුරු දුන්නේ ය. සේවකයා ඔහු ගේ කෑම පිඟාන ගෙන ආ අතර ඔහු පාන් කැබැල්ලක් කඩා ගත්තේ ය.

සෙර්සි ඔහු දෙස පරීක්ෂාකාරී බැල්මක් හෙලී ය. "ඔයා මොකක්ද කියන්ට හදන්නෙ?"

ටිරියන් ඇය වෙත වංචාකාරී සිනාවක් පෑවේ ය. "ඇයි, මම කියන්නෙ ටමෙන්ට එයා බලාපොරොත්තු වෙන දේ ලැබෙයි. මේස්ටර් හිතන්නෙ ළමයා ජීවත්වෙයි කියලයි." ඔහු බියර් බඳුන තොල ගෑවේ ය.

මර්සෙලා සතුටින් හඬක් නැගූ අතර ටමෙන් නොසන්සුන් සිනහවක් පෑවේ ය. එනමුදු ටිරියන් බලා සිටියේ ළමුන් දෙස නොවේ. සෙර්සි හා ජේමී අතර හුවමාරු වූ බැල්ම තත්පරයකට වඩා නොපැවතියද ඔහුට එය මග හැරුනේ නැත. ඊළඟ මොහොතේ ඔහු ගේ

සොයුරිය නැවත සිය බැල්ම මේසය මත රැඳවී ය. "ඒක හරිම අකරුනාවන්තයි. මේ උතුරුකරේ දෙවියො හරිම නපුරුයි ඒ දරුවට ඒ වගේ වේදනාවක් විඳවන්ට දෙන එක."

"මේස්ටර් මොකක්ද හරියටම කිවුවෙ?" ජේමි ඇසී ය.

බේකන් කැබැල්ලක් මුවේ රුවා ගත් ටිරියන් මොහොතක් කල්පනාකාරීව එය සැපී ය. "එයා හිතන්නෙ ළමයා මැරෙන්ට නියමිත නම් දැනටමත් ඒක වෙලා තියෙන්ට ඕන කියලා. දැන් දවස් හතරක් වෙනවා කිසිම වෙනසක් වෙන්නෙ නැතුව."

"බ්‍රෑන්ට හොඳවෙයිද මාමෙ?" පුංචි මර්සෙලා ඇසී ය. ඇයට සිය මව ගේ රූමත් බව සම්පූර්ණයෙන්ම උරුම වී තිබුනද ඒ අකරුනාවන්ත ගතිගුණ උරුම වී නොතිබින.

"එයාගෙ කොන්ද කැඩිලා පුංචි එකෝ." ටිරියන් පිළිතුරු දුන්නේ ය. "එයාගෙ කකුල් දෙකත් කැඩිලා පොඩිවෙලා ගිහිල්ලා. එයාලා දරුවගෙ ජීවිතේ රැකගෙන ඉන්නෙ මීපැණියි වතුරයි දීලා. සමහරවිට එයා නැගිට්ටොත් එයාටත් අපට වගේ සාමාන්‍ය විදියට කෑම කන්ට පුළුවන් වෙයි. ඒත් එයාට ආයෙ කවදාවත් ඇවිදින්ට ලැබෙන එකක් නෑ."

"එයා නැගිට්ටොත්." සෙර්සි පුනරුච්චාරණය කලා ය. "ඒක වෙන්ට පුළුවන්ද?"

"දෙයියො තමා දන්නෙ." ටිරියන් කීවේ ය. "මේස්ටර්ටත් බලාපොරොත්තුවක් විතරයි තියෙන්නෙ. මම කියන්නෙ එයාගෙ අර වෘකයා තමා ඒ දරුවව ජීවත් කරලා තියාගන්නෙ. ඒ සතා එයාගෙ කාමරේ ජනේලෙට පිටතින් රෑ දවල් නැතුව ඉන්නවා, උඩු බුර බුරා. කවුරුහරි ඌව එලෙව්වුවත් ඌ ආපහු එනවා. මේස්ටර් කියනවා එයාලා එක පාරක් ජනේලෙ වැහුවලු සද්දෙ නවත්තන්ට, එතකොට බ්‍රෑනුත් දුර්වල වුනාලු. එයාලා ආයෙමත් ජනේලෙ ඇරියහම එයාගෙ හදගැස්ම වැඩි වුනාලු."

රැජිණ වෙවුලා ගියා ය. "මේ සත්තුන්ගෙ මොකක්දෝ අස්වාභාවික දෙයක් තියෙනවා. උං හරිම භයානකයි. අපිත් එක්ක දකුණට උං එකෙක්වත් අරන් යන්ට මම ඉඩ දෙන්නෙ නෑ."

"ඒක හරිම අමාරු වැඩක් වෙයි සහෝදරී. ඌං අර කෙල්ලො දෙන්නා යන යන තැන පස්සෙන් එනවා." ජේමි කීවේ ය.

ටිරියන් මාළුවෙකු අතට ගත්තේ ය." ඒ කියන්නෙ ඔයාලා ඉක්මනටම යනවා."

"ඇතිතරම් ඉක්මනටම නෙවෙයි." සෙර්සි කීවා ය. ඊළඟ මොහොතේ ඇය දෙබැම ඇකිළුවා ය. "අපි යනවා? එතකොට ඔයා? දෙයියම්පා මට නම් කියන්ට එපා ඔයා මෙහෙ නවතින්ට යනවයි කියලා."

ටිරියන් දෙවුර ගැස්සී ය. "බෙන්ජීන් ස්ටාර්ක් එයාගෙ සහෝදරයගෙ අවජාතක පුතත් එක්ක ආයෙමත් නිශා රැකුමට යනවා. මටත් හිතක් තියෙනවා එයාලත් එක්ක ගිහිල්ලා මේ හැමෝම කතාකරන ප්‍රාකාරෙ මොන වගේ එකක්ද කියලා බලන්ට."

ජේමී සිනාසුනේ ය. "මම හිතන්නෙ නෑ ඔයත් කළු සහෝදරයෙක් වෙන්ට යනවා කියලා."

ටිරියන් කොක්හඬ ලෑය. "මොකක්? මේ මම? බ්‍රහ්මචාරී වෙන්ට? ඩෝර්න්වල ඉඳන් කාර්ස්ටලී රොක් වෙනකම් ඉන්න ඔක්කොම වේස ගෑනුන්ට හිඟාකන්ට යන්ට වෙයි. නෑ නෑ, මට ඕන කරන්නෙ ප්‍රාකාරෙ උඩ ඉඳන් ලෝකාන්තයට චූ කරන්ට විතරයි."

සෙර්සි හදිසියෙන් නැගිට සිටියා ය. "ළමයින්ට මේ ජරා කතා අහන්ට දෙන්ට බෑ. ටමෙන්, මර්සෙලා, එන්ට." ඇය හනිකට කෑම කාමරයෙන් ඉවත්ව ගියා ය.

ජේමි ලැනිස්ටර් සිය කොළ පැහැ දෑසින් සොහොයුරා දෙස බලා සිටියේ ය. "ස්ටාර්ක් වින්ටර්ෆෙල් දාලා යන්ට තීරණය කරයි කියලා හිතන්ට බෑ එයාගෙ පුතා මරණයේ එළිපත්තෙ ඉන්න මේ වෙලාවෙ."

"රොබර්ට් අණ කලොත් එයා ඒක කරයි." ටිරියන් කීවේ ය. "රොබර්ට් අනිවාර්යයෙන්ම අණ කරයි. අනිත් එක එඩාර්ඩ් උතුමානන් නැවතුනා කියලා එයාට දරුවා වෙනුවෙන් මොකුත් කරන්ට දෙයක් නෑ."

"එයාට පුළුවන් දරුවා දුක්විඳින එක නවත්තන්ට. ඒ මගේ පුතා නම් මම ඒ වැඩේ කරනවා. ඒක ඇත්තටම කරුනාවක්."

"ඔය කතාව එඩාර්ඩ් උතුමානන්ට කියන්ට යන්ට නම් එපා. එයා ඒක එච්චර හොඳින් බාරගන්න එකක් නෑ."

"ඒ ළමයා ජීවත්වුනත් එයා නිකංම අබ්බගාතයෙක් වෙයි. ඊටත් වඩා නරකයි, එයා විකෘතියක් වෙයි. ඊට වඩා එකපාරින් මැරෙන එක හොඳ නැද්ද?"

ටිරියන් දෙවුර ඇකිළුවේ ය. "විකෘති ගැන කතා කරනවනම් මම ඒ අදහසට විරුද්ධයි. මරණය කියන්නෙ නිකංම නිකං අවසානයක්. ජීවත්වෙනවා කියන්නෙ එයාට ඕන තරම් අවස්ථාවන් ලැබෙන්ට පුළුවන්."

ජේමි සිනාසුනේ ය. "උඹ නම් හරිම මුරණ්ඩු පුංචි යකෙක්. එහෙම නේද?"

"අනිවාර්යයෙන්ම." ටිරියන් පිළිගත්තේ ය. "මම බලාපොරොත්තු වෙනවා ඒ දරුවා නැගිටියි කියලා. මම බොහොම උනන්දුවෙන් බලන් ඉන්නෙ එයාට මොනවද කියන්ට තියෙන්නෙ කියලා."

ඔහු ගේ සොයුරා ගේ සිනහව එසැනින්ම මිදී ගියේ ය. "ටිරියන් මගේ පුංචි මල්ලී," ඔහු නපුරු ස්වරයෙන් කීවේ ය. "සමහර වෙලාවට උඹ කියන දේවල් නිසා මට හිතාගන්ට බෑ උඹ ඇත්තටම කාගෙ පැත්තෙද කියලා."

ටිරියන් ගේ මුව පාන් හා මාළු වලින් පිරී තිබුනු අතර ඔහු ලොකු බියර් උගුරක් මගින් ඒ සියල්ල සෝදා හැරියේ ය. ඉන්පසු ජේමී වෙත දරුණු නියවීමක් කලේ ය. "ඇයි ජේමි, මගේ ආදරණීය ලොකු අයියේ, උඹ ඇත්තටම මාව රිදෙව්වා. උඹ දන්නවනෙ මම කොච්චර මගෙ පවුලට ආදරෙයි ද කියලා."

Sandor Clegane: “The prince will remember that, little lord.”

Tyrion Lannister: “I pray he does, If he forgets, be a good dog and remind him.”

ජොන් -

ජොන් සෙමින් සෙමින් පඩිපෙළ නැග්ගේ මේ ඔහු මෙම පඩිපෙළ නගින අවසාන වතාව විය හැකි බව නොසිතා සිටීමට උත්සාහ දරමිනි. ඔහුට පිටුපසින් ගෝස්ට් නිහඬවම අඩි තබමින් හුන්නේ ය. පිටත බලකොටු දොරටු හරහා හිම කුණාටුව කස හඬ නංවමින් හමා ගිය අතර සෙණ්ඩුවාලුව එකම කාලගෝට්ටියක් විය. එනමුදු මේ ඝනකම් ගල් බිත්තිවලින් ඇතුළත තවමත් උණුසුම හා නිහඬ බව රැඳී තිබින.

පඩිපෙළ මුදුනට ළඟා වූ ඔහු සිතේ බිය සමහන් වන තුරු මොහොතක් එහි නැවතී සිටියේ ය. පෙරට යන්නැයි කියන්නාක් මෙන් ගෝස්ට් සිය නාසයෙන් ඔහු ගේ අත පිරිමැදි අතර එයින් දිරි උපදවාගත් ජොන් කාමරය තුළට ඇතුළු විය.

කාමරය තුළ ඇඳ පසෙකින් ස්ටාර්ක් ආර්යාව වාඩි වී සිටියා ය. දැන් සති දෙකකට ආසන්න කාලයක් තිස්සේ දිවා රෑ නොබලා ඈ මෙසේ රැඳී සිටින්නේ එක් මොහොතකටවත් බ්‍රෑන් අසලින් ඈත් වීමට අකැමැත්තෙන් මෙනි. ඇය සිය ආහාරපාන සියල්ලක්ම කාමරය තුළටම ගෙන්වා ගත් අතර නිදාගැනීම පිණිස කුඩා ඇඳක් පවා එහි තබා ගත්තා ය. එනමුදු ඔවුන් පවසන්නේ ඇය කිසි විටෙක නිදා ගත් බවක් කවුරුත් නොදන්නා බව ය. බ්‍රෑන් ගේ ජීවිතය රඳවා තබා ගැනීම සඳහා අවශ්‍ය මී පැණි හා වතුරත්, ඖෂධීය පානයනුත් ඇය සිය අතින්ම ඔහුට පෙවූ අතර සුළු මොහොතකට හෝ කාමරයෙන් ඉවත්ව නොගියා ය. මේ නිසා ජොන් මෙතෙක් කල් මේ කාමරය මග හැර සිටි නමුත් තව දුරටත් ඔහුට එසේ කල නොහැක.

කතා කිරීමට හෝ තව ඉදිරියට යාමට හෝ බියෙන් ජොන් තව මොහොතක් දොර අසල තැවරෙමින් සිටියේ ය. කවුළුව විවරව තිබුනු අතර පිටතින් වෘකයෙක් උඩු බුරලමින් සිටියේ ය.

ස්ටාර්ක් ආර්යාව හිස ඔසවා බැලූ අතර එක මොහොතකට ඇයට ඔහුව හඳුනාගත නොහැකි විය. "උඹ මොකද මෙතන කරන්නෙ?" ඇය ඇසුවේ කිසිදු හැඟීමකින් තොර ස්වරයකිනි.

"මම ආවෙ බ්‍රැන්ව බලන්ට. මම යනවා කියලා එයාට කියන්ට."

පසුගිය දින කිහිපය තුළ ඇය විසි වසරකින් වයසට ගියාක් මෙනි. "හරි, උඹ දැන් කිවුවනෙ. දැන් ඉතින් මෙතනින් පලයං."

ආපසු හැරී දිව යන්නට සිතුනත් එසේ කලහොත් තමාට නැවත කිසිදා බ්‍රැන්ව දකින්නට නොලැබෙන බව ජොන් දැන සිටියේ ය. ඔහු බයාදු අන්දමින් කාමරය තුළට අඩියක් තැබී ය. "අනේ, කරුනාකරලා."

"මම උඹට කිවුවෙ මෙතනින් යන්ටයි කියලා. අපට උඹව මෙතනට ඕන නෑ."

එක් කලෙක නම් මෙවැනි වදන් ඇසුනු සැනින් එතැනින් පලායන්නට ඔහු පුරුදුව සිටියේ ය. එක් කලෙක මෙවැනි වදන් ඔහුව හඬවන්නට සමත් විය. එනමුදු මේ වෙලාවේ නම් එයින් සිදු වුයේ ඔහු ගේ තරහ ඇවිස්සීම පමණි. ඉක්මනින්ම ඔහු නිශා රැකුම් බලකායේ දිවුරුම් දුන් සොහොයුරකු වන්නට යන අතර කැට්ලින් ටලී ස්ටාර්ක්ට වඩා බිහිසුනු දේට මුහුණ පාන්නට ඔහුට සිදු වනු ඇත. "එයා මගේ සහෝදරයා."

"මම සෙබළුන්ට කතා කරන්ටද?"

"ඕන කෙනෙකුට කතා කරන්ට. ඔයාට මාව නවත්තන්ට බෑ." කාමරය හරහා ඇවිද ගිය ඔහු ඇඳ මත වැතිර සිටින බ්‍රැන් දෙස බැලී ය.

මේ නම් ජොන් දැක පුරුදු බ්‍රැන් නොවී ය. ඔහු ගේ සිරුරේ මාංශය දියවී ගොස් ඇටකටු පෑදී තිබුනු අතර දෙපා අස්වාභාවික අයුරින් ඇඹරී ගොස් තිබින. කළු පැහැ කුහර තුළට ගිලී ගොස් තිබුනු ඒ දෑස් විවරව තිබුනත් බ්‍රැන් එයින් කිසිවක් නොදිටී ය. ඔහු දිස් වූයේ හරියටම හමන පළමු සුළඟින්ම ගැලවී මිනීවල කරා පාවී යාමට නියමිත වියලී ගිය කොළයක් මෙනි.

එනමුදු ඒ සිදී බිදී ගිය ඇටකටු ගොඩට යටින් ඔහු ගන්නා සෑම හුස්මක් පාසාම පපුව සෙමින් උස් පහත් විය.

"බ්‍රෑන්... මට සමාවෙන්ට කලින් ඔයාව බලන්ට එන්ට බැරි වුනාට. මට බය හිතුනා." තම දෙකම්මුල් දිගේ කඳුළු වැල් ගලා යන බැව් ජොන්ට දැනුනත් ඔහු තව දුරටත් ඒ ගැන තැකීමක් නොකලේ ය. "අනේ මැරෙන්ට එපා බ්‍රෑන්. අපි හැමෝම බලන් ඉන්නෙ ඔයා නැගිටිනකම්. මම, රොබ්, ගෑනු ළමයි, අපි හැමෝම...."

ස්ටාර්ක් ආර්යාව බලා සිටිය මුත් සෙබළුන් කැඳවීමට කෑ ගැසුවේ නැති අතර එය තමාව ප්‍රතික්ෂේප නොකිරීමක් ලෙස ජොන් සිතා ගත්තේ ය. කවුළුවට පිටතින් බ්‍රෑන් ගේ සෝරවෘකයා, ඔහුට තවමත් නමක් තැබීමට නොහැකි වූ වෘකයා නැවතත් උඩුබුරලන්නට විය.

"මම දැන් යන්ට ඕන." ජොන් දිගටම කතා කරන්නට විය. "බෙන්ජින් බාප්පා බලන් ඉන්නවා. මම එයත් එක්ක උතුරෙ ප්‍රාකාරෙට යන්ටයි යන්නෙ. හිම වැටෙන්ට කලින් යන්ට ඕන නිසා අපි අද පිටත්වෙනවා." බ්‍රෑන් මේ ගමන ගැන කෙතරම් උනන්දුවෙන් බලා සිටියාදැයි ජොන් ට මතක් විය. ඔහුව මේ අයුරින් හැරදා යාම දරා ගත හැක්කක් නොවනු ඇත. සිය කඳුළු පිසදා හල ජොන් ඉදිරියට නැවී හෙමිහිට බ්‍රෑන් ගේ මුව සිප ගත්තේ ය.

"මට ඕන වුනා එයාව මෙහෙ මගෙත් එක්ක නවත්ත ගන්ට." ස්ටාර්ක් ආර්යාව මෘදු හඬින් තෙපලා ය.

ජොන් පරීක්ෂාකාරී අයුරින් ඇය දෙස බැලී ය. ඈ ඔහු දෙස බලා නොසිටි අතර ඔහුට කතා කරනවාට වඩා තමාටම කතා කරගත්තා මෙනි. එය හරියටම ඔහු මේ කාමරය තුළ නොසිටින්නාක් බඳු විය.

"මම ඒ වෙනුවෙන් යාඥා කලා." ඇය දිගටම කතා කලා ය. "එයා මගේ සුවිශේෂීම දරුවා. නෙඩ්ගෙ අදහස වෙනස් වෙලා එයාව මෙහෙ දාලා යන්ටයි කියලා මම දේවස්ථානයට ගිහිල්ලා හත් වතාවක් දෙවියන්ට යාඥා කලා. සමහර වෙලාවට දෙවියො මේ යාඥාවලට උත්තර දෙනවා වෙන්ටැති."

කුමක් කිව යුතු දැයි ජොන්ට සිතා ගත නොහැකි විය. "ඒක ඔයාගෙ වැරැද්දක් නෙවෙයි."

ඇගේ දෑස් ඔහු දෙසට එල්ල වූ අතර ඒවා ද්වේශයෙන් පිරී තිබින. "මට උඹේ පවු සමාව ඕන නෑ අවජාතකයො."

ජොන් දෙනෙත් පහත් කර ගති. කුරුල්ලකු ගේ ඇට කටුවක් මෙන් සැහැල්ලු වූ බ්‍රැන් ගේ අතක් අල්ලා ගත් ඔහු එය සෙමින් මිරිකී ය. "ආයුබෝවන් මල්ලී!"

දොර අසලදී ඇගේ කටහඬ ඇසුනු ඔහු ආපසු හැරුනේ ය. "ජොන්." ඇය කිසිදා මෙසේ ඔහුව නමින් අමතා නොතිබින. ආපසු හැරුනු ඔහු දුටුවේ ඇය එක එල්ලේ ඔහු ගේ මුහුණ දෙස බලා සිටින අයුරු ය.

"ඔවු?"

"මේ දේ උඹටයි වෙන්ට තිබුනෙ." නැවතත් බ්‍රැන් දෙසට හැරුනු ඇය වැළපෙන්නට ගත්තා ය.

පිටත සියල්ල එකම කලබැගෑනියක් විය. තැනෙක කරත්තවලට බඩු පැටවෙන අතර මිනිසුන් එකිනෙකාට බෙරිහන් දුනි. අශ්වයින්ට කටකලියා හා සෑදල පළඳා ඉස්තාලවලින් පිටතට ගැනුනි. සිහින් හිම වැස්සක් වැටෙමින් තිබුනු අතර සියළුදෙනාම කලබලයෙන් වැඩ කලේ හැකි ඉක්මනින් ගමන ඇරඹීමට ය.

මේ සියළු කලබල මැද රොබ් සිටගෙන සිටියේ ඔහුට හැකි උපරිමයෙන් මිනිසුන්ට විධාන නිකුත් කරමිනි. ඔහු ගේ වෘකයා ග්‍රේ වින්ඩ් ඔහු පසෙකින් විය. බ්‍රැන් ගේ ඇද වැටීමත් සිය මව ගේ මානසික බිඳ වැටීමත් හමුවේ පසුගිය දින කිහිපය තුළ ඔහු වයසට වැඩියෙන් පරිණත වී ඇත්තාක් මෙන් පෙනින.

"බෙන්ජීන් බාප්පා ඔයාව හොයනවා." ඔහු ජොන්ට පැවසී ය. "එයාට මීට පැයකට කලින් පිටත් වෙන්ට ඕන වුනා."

"මම දන්නවා. මම ඉක්මනට යනවා." තමා වටා ඇති කලිකලහයත් ඝෝෂාවත් දෙස ජොන් බැල්මක් හෙලී ය. "පිටත් වෙලා යන එක මම හිතුවට වඩා අමාරුයි."

"මටත් එහෙමයි. ඔයා එයාව බලන්ට ගියාද?"

ජොන් ඔවු කියන්නට මෙන් හිස වැනී ය.

"එයා මැරෙන්නෙ නෑ. මම ඒක දන්නවා."

"ස්ටාර්ක්ලා මරන්ට හරි අමාරුයි." ජොන් එකඟ විය. ඔහු ගේ කටහඬ වෙහෙසින් පිරී තිබිනි. බ්‍රෑන්ව බලන්නට ගිය ගමන විසින් ඔහු ගේ මුළු ශක්තියම සිඳ දමා තිබිනි.

කොතැනක හෝ වැරැද්දක් ඇති බව රොබ්ට තේරුනි. "අම්මා මොකුත්...."

"එයා.... හරිම කරුනාවන්ත වුනා." ජොන් පිළිතුරු දුනි.

"ඒක හොඳයි." රොබ් සිනාසුනි. "ඊළඟ පාර මම ඔයාව දකිද්දි ඔයා මුළුමනින්ම කළු පාටින් ඇඳගෙන ඉඳියි නේද?"

සිනහවක් මුවට නගා ගැනීමට ජොන් යත්න දැරී ය. "ඒක තමා හැමදාමත් මට උරුම වෙන්ට තිබුන පාට. ඒකට තව කොච්චර කල් යයි කියලද ඔයා හිතන්නෙ?"

"බොහොම ඉක්මනට." ජොන්ව තමා දෙසට ඇදගත් රොබ් ඔහුව තරයේ වැළඳගත්තේ ය. "ආයුබෝවන් ස්නෝව්!"

"ඔයාටත් ආයුබෝවන් ස්ටාර්ක්! බ්‍රැන්ව පරෙස්සමින් බලාගන්ට."

"අනිවාර්යයෙන්ම." ග්‍රහනයෙන් මිදුනු ඔවුහු මොහොතක් එකිනෙකා දෙස බලා හුන්හ. අන්තිමේදී රොබ් හඬ අවදි කලේ ය. "බෙන්ජීන් බාප්පා කිවුවා ඔයාව දැක්කොත් ඉස්තාලෙට එවන්ටයි කියලා."

"මට තව එක්කෙනෙකුට ආයුබෝවන් කියන්ට තියෙනවා." ජොන් කීවේ ය.

"එහෙමනං ඉතින් මම ඔයාව දැක්කෙ නෑ." රොබ් පිළිතුරු දුන්නේ ය.

රොබ්ව කරත්ත, අශ්වයින් හා වෘකයින් මැද තනිකල ජොන් යුද්ධායුධ ගබඩාව දෙසට පිය මැන්නේ ය. එහි තමා එනතෙක් බලා සිටි පොදිය අතට ගත් ඔහු ප්‍රධාන බලකොටුව වෙතට වැටී ඇති පාළම වෙතට පිළිපන්නේ ය.

……………………………………

ආර්යා සිය කාමරය තුළ ඇයටත් වඩා විශාල පෙට්ටියකට ඇඳුම් අසුරමින් සිටි අතර නයිමේරියා ඇයට උදවු කරමින් සිටියා ය. ආර්යා ඇඳුමක් දෙසට අත දිගු කල විට කාමරය හරහා ගොස් එය ඩැහැගන්නා වෘකයා එය ඇය වෙත ගෙනැවිත් දෙයි. එනමුදු ගෝස්ට් ගේ ඉව දැනුනු ඇය බිම වාඩි වී ඔවුන් දෙසට බුරන්නට පටන් ගත්තා ය.

ආපසු හැරී බැලූ ආර්යා ජොන් දැක උඩ පැන නැගිට්ටා ය. ඊළඟ මොහොතේ ඇගේ කෙසඟ දෑත් ඔහු ගේ ගෙල වටා කිටිකිටියේ තද වුනි. "මම හිතුවෙ ඔයා ගිහිල්ලා කියලා. ඔයාට ආයුබෝවන් කියන්ට එළියට යන්ට එයාලා මට ඉඩ දුන්නෙ නෑ."

"ඔයා මොකක්ද මේ පාර දාගත්ත ලෙඩේ?"

ඔහුව සිය ග්‍රහණයෙන් මුදා හල ආර්යා මුහුණ බෙරි කර ගත්තා ය. "මම මොකුත් කලේ නෑ. මම ඔක්කොම හරියට අඩුක් කරලයි තිබුනෙ." තුනෙන් පංගුවක් පමණ පිරී තිබුනු දැවැන්ත පෙට්ටියත්, කාමරය පුරා එහා මෙහා විසිර තිබුනු ඇඳුම් රාශියත් දෙස ඇය ඇඟිල්ල දිගු කලා ය. "සෙප්ටා මෝර්ඩේන් කියනවා මට ආයෙමත් ඒක කරන්ටලු. එයා කියනවා මගේ ඇඳුම් හරියට නවලා නෙවෙයිලු පෙට්ටියට දාලා තියෙන්නෙ. එයා කියනවා නියම දකුණුකරේ ආර්යාවක් එයාගෙ ඇඳුම් නිකංම නිකං වැරහැලි වගේ පෙට්ටියකට වීසි කරලා දාන්නෙ නැතිලු."

"ඉතින් ඔයා එහෙමද කරලා තිබුනෙ පුංචි නංගී?"

"ඉතින් ගමන යද්දී ඒවා කොහොමත් එහා මෙහා වෙලා අවුල් වෙලා යනවනෙ. ඒවා නවලා තියෙන්නෙ කොහොමද කියලා කවුද වදවෙන්නෙ?"

"වෙන කවුද ඉතින් සෙප්ටා මෝර්ඩේන්ම මිසක්. අනික මම හිතන්නෙ නෑ නයිමේරියා ඔයාට උදවු කරන එකටත් එයා එච්චර කැමැති වෙයි කියලා." වෘක පැටවා සිය අඳුරු රන් පැහැ දෑසින් ඔහු දෙස බලා සිටියා ය. "එහෙම වෙච්ච එකත් එක අතකට හොඳයි. ඔයාට ගෙනියන්ට දෙන්ට දෙයක් මා ගාව තියෙනවා. ඒක බොහොම පරෙස්සමින් අහුරන්ට ඕන දෙයක්."

ඇගේ මුහුණ දැල්වුනි. "තෑග්ගක්?"

"ඔයාට එහෙමත් කියන්ට පුළුවන්. දොර වහන්ට."

ආර්යා පරීක්ෂාවෙන් පිටත ශාලාව දෙස බැලුවා ය. "නයිමේරියා, මෙහාට එන්ට. මෙතනට ඇවිත් මුර කරන්ට." අමුත්තන් ගේ පැමිනීම ගැන අනතුරු අඟවන්නට වෘක පැටවා දොරට පිටතින් නැවතූ ඈ දොර වසා දැම්මා ය. මේ වනවිට තමා ගෙනා පොදිය දවටා තිබුනු කඩමාළු ඉවත් කල ජොන් එය ඇයට පිරි නැමීය.

ආර්යා ගේ දෙනෙත් විසල් විය. ඔහු ගේ වැනිම වූ අඳුරු පැහැ දැස්. "කඩුවක්!" ඇය විස්මයෙන් කෙඳිරුවා ය.

අසිපත් කොපුව අළු පැහැ සමින් නිම වී තිබින. තලයේ තද නිල් පැහැ කාන්තිය ඇයට පැහැදිලිව පෙනෙන පරිදි ජොන් අසිපත සෙමින් කොපුවෙන් එළියට ගත්තේ ය. "මේක සෙල්ලම් බඩුවක් නෙවෙයි. පරෙස්සම් වෙන්ට, නැත්තං ඔයා ඔයාවම කපා ගනියි. මේකෙ මුවහත රැවුල බාන්ට තරම් තියුණුයි."

"ගෑනු ළමයි රැවුල බාන්නෙ නෑ." ආර්යා කීවා ය.

"එයාලත් එහෙම කරනවානම් හොඳයි. ඔයා කවදාහරි සෙප්ටාගෙ කකුල් දෙක දැකලා තියෙනවද?"

ඇය ඔහු දෙස බලා විරිත්තුවා ය. "මේක හරි කෙට්ටුයි නේ."

"ඉතින් ඔයත් එහෙමනෙ. මම මේක මික්කෙන්ට කියලා විශේෂයෙන්මයි හදවගත්තෙ. මේ වගේ කඩු පාවිච්චි කරනවා පෙන්ටොස් වලයි, ම(ර්) වලයි අනිත් නිදහස් නගර වලයි. ඇත්ත, මේකෙන් මිනිහෙකුගෙ බෙල්ල වෙන්වෙන්ට කපලා දාන්ට බෑ තමයි. ඒත් ඔයා වේගවත් නම් ඔයාට පුළුවන් මේකෙන් මිනිහෙක්ව හිල් කූඩයක් කරලා දාන්ට."

"මට වේගවත් වෙන්ට පුළුවන්." ආර්යා කීවා ය.

"ඒකට ඔයාට දවස ගානෙ පුහුණුවීම් කරන්ට වෙනවා." අසිපත ඇගේ සුරතේ තැබූ ඔහු එය හරිහැටි අල්ලාගන්නා ආකාරය ඇයට කියා දුනි. "කොහොමද ඔයාට දැනෙන්නෙ? ඒක හරියට සමබරයි කියලා හිතෙනවද?"

"මම හිතන්නෙ ඔව්."

"පළමුවෙනි පාඩම. ඒකෙ උල් පැත්තෙන් තමා අනින්නෙ."

ආර්යා අසිපතේ පැතැළි පැත්තෙන් ඔහු ගේ අතට පහරක් එල්ල කලා ය. එය වේදනා ගෙන දුන්නත් ජොන් මෝඩයෙකු මෙන් නියවන්නට විය. "මම දන්නවා මොන පැත්තෙන්ද අනින්ට ඕන කියලා." ආර්යා කීවා ය. ඇගේ මුහුණේ සැකයක සේයාවක් ඇඳී ගියේ ය. "සෙප්ටා මෝර්ඩේන් මේක මගෙන් අරගනියි."

"එයා දන්නෙ නැත්තම් ඔයා ළඟ මෙහෙම දෙයක් තියෙනවා කියලා එයාට ඒක ගන්ට බෑ."

"මම කාත් එක්කද පුහුණුවීම් කරන්නෙ?"

"ඔයා කාව හරි හොයාගනියි. කින්ග්ස් ලැන්ඩින්ග් කියන්නෙ ලොකු නගරයක්. ඒක වින්ටර්ෆෙල් වගේ දාස් ගුණයක් විශාලයි. ඔයාට පුහුණුවෙන්ට කෙනෙක් හම්බ වෙනකම් ඔයා බලා ඉන්ට කොහොමද සෙබළු සෙණ්ඩුවාළුවෙ සටන් පුරුදුවෙන්නෙ කියලා. දුවන්ට, අශ්වයො පදින්ට. ඔයාගෙ ඇඟ ශක්තිමත් කරගන්ට. හැබැයි, ඔයා මොනවා කලත්...."

ඊළඟට එන්නේ කුමක්දැයි ආර්යා දැන සිටියා ය. ඔවුන් දෙදෙනාම එකවර එය කීවෝ ය.

"සන්සාට.. නම්.. කියන්ට.. එපා!"

අතක් දිගු කල ජොන් ඇගේ කෙහෙරැළි අවුල් කලේය. "මට ඔයා නැතුව පාළු දැනෙයි පුංචි නංගී."

හදිසියේම ආර්යාට දැනුනේ ඇය හඬා වැටීමට ආසන්න බවය. "ඔයාටත් අපිත් එක්ක දකුණට එන්ට තිබුනා නම්."

"වෙන වෙන පාරවල ගියත් සමහරවිට අන්තිමට වැටෙන්නෙ එකම බලකොටුවටලු. කවුද දන්නෙ?" ඔහුට සහනයක් දැනෙන්නට විය. "මම දැන් ගියොත් හොඳයි. බෙන් බාප්පාව තවත් පරක්කු කලොත් ප්‍රාකාරෙ ඉන්න මුල් අවුරුද්දම මට වැසිකිළි පෝච්චි ඇද ඇද තමා ඉන්ට වෙන්නෙ."

අවසන් වැළඳගැනීමක් වෙනුවෙන් ආර්යා ඔහු දෙසට දිව ගියා ය. "ඉස්සෙල්ලා කඩුව පැත්තකින් තියලා ඉන්ට." ජොන් සිනාසෙමින් ඇයට අනතුරු ඇඟවී ය. පරෙස්සමින් අසිපත පැත්තකින් තැබූ ඈ ඔහුව වැළඳගෙන හාදු වරුසාවකින් ඔහුව තෙමන්නට විය.

දොර අසලදී ඔහු ආපසු හැරෙන විට ඇය නැවතත් අසිපත සුරතින් ගෙන එය සමබර කරමින් උන්නා ය. "මට තව පොඩ්ඩෙන් අමතක වෙනවා. හැම හොඳ කඩුවකටම නමක් තියෙනවා."

"හරියට අයිස් වගේ." සිය සුරතේ ඇති අසිපත දෙස ඇය බැලුවා ය. "මේකටත් නමක් තියෙනවද? අනේ කියන්ටකෝ."

"ඔයාට හිතාගන්ට බැරිද?" ඔහු ඇයට සමච්චල් කලේ ය. "ඔයාගෙ ප්‍රියතම උපකරණෙ."

ආර්යා ගේ මුහුණේ ප්‍රහේලිකාත්මක බැල්මක් ඇඳී ගියේ ය. එහෙත් ඊළඟ මොහොතේ ඇයට එය වැටහුනි. ඇය එතරම්ම දීප්තිමත් එකියක් වූවා ය.

"ඉදිකට්ට." ඔවුන් දෙදෙනාම එකවර කීවෝ ය.

සීතල උතුරුකරය වෙත යන මුළු ගමන පුරාවටම ඇගේ කිංකිණි සිනහවේ මතකය ඔහු ගේ සිත උණුසුම් කරන්නට සමත් විය.

Catelyn Stark: "Sometimes prayers are answered."

ඩනේරිස්

භීතියෙන් හා ම්ලේච්ඡ උත්කර්ෂයෙන් පිරි මංගලෝත්සවයක් මධ්‍යයේ ඩනේරිස් ටාර්ගේරියන් ඛාල් ඩ්‍රෝගෝ සමගින් විවාහ වූවා ය. උත්සවය සඳහා පෙන්ටොස්හි ප්‍රාකාරයට පිටතින් වූ හිස් භූමි භාගයක් තෝරා ගැනුනේ මිනිසකු ගේ ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක්ම විවෘත ආකාශය යට සිදුවිය යුතු යැයි යන ඩොත්රැකි විශ්වාසය අනුව යමිනි.

තමා හා එක්වන්නැයි ඩ්‍රෝගෝ ගෙන් ලද ආරාධනයට අනුව ඔහු ගේ බලසාරය විවාහ මංගලෝත්සවය සඳහා පැමිණ සිටියහ. හතලිස් දහසක් වූ ඩොත්රැකි රණකාමීන් හා ගිනිය නොහැකි තරම් වූ ගැහැණුන්, දරුවන් හා වහලුන්! සිය සතුන් රංචුද සමගින් නගර ප්‍රාකාරයට පිටතින් කඳවුරු බැඳගත් ඔවුහු වියූ තණවලින් සෑදූ නිවාස වලට වී අතට හසුවන සෑම දෙයක්ම කමින් බොමින් සතුටු වන්නට වූහ. ගෙවෙන සෑම දිනක් පාසාම පෙන්ටොස්හි යහපත් පුරවැසියන් සියල්ලන්ම දිවි ගෙවන්නට වූයේ තැවිලි සහගත සිතිනි.

"මගේ සහායක මැජිස්ටර්වරුන් නගරයේ ආරක්ෂාව දෙගුන කරලයි තියෙන්නෙ." ඉල්ලීරියෝ දිනෙක පැවසූයේ ඩ්‍රෝගෝට අයත්ව තිබූ මන්දිරයේ රාත්‍රි භෝජනයකට සහභාගි වෙමිනි. ඛාල් සිය බලසාරය සමග එක්වී තිබුනු අතර ඔහු ගේ චතුයාය මංගල උත්සවය පැවැත්වෙන දා වන තෙක් ඩනේරිස් හා ඇය ගේ සොහොයුරා ගේ පෞද්ගලික පරිභෝජනය වෙනුවෙන් වෙන් කර දී තිබින.

"නගර වැසියො තමන්ගෙ නගරෙ වස්තුවෙන් බාගයක් කුලී හේවායින්ටයි වන්ඩින්ටයි දීලා දාන්ට ඉස්සෙල්ලා ඩනේරිස් කුමාරිව බන්දලා දෙන එක හොඳයි කියලයි මම නම් හිතන්නෙ." සෙර් ජෝරා මෝර්මන්ට් විහිළු ස්වරයෙන් කීවේ ය. ඩැනීව ඛාල් ඩ්‍රෝගෝට විකිණුනු දා රැයේ මේ පිටුවහල් වුනු නයිට්වරයා සිය අසිපත ඇගේ සොහොයුරා ගේ සේවය වෙනුවෙන් පුදකර තිබින. විසේරිස් එය මහත් කැමැත්තෙන් බාර ගත්තේ ය. එදා පටන් මෝර්මන්ට් නිතරම ඔවුන් ගේ සමාගමයේ ගැවසෙන්නෙකු විය.

මැජිස්ටර් ඉල්ලීරියෝ මඳ සිනහවක් පෑ නමුදු විසේරිස් එපමණවත් සිනාසුනේ නැත. "ඌ කැමැතිනම් ඌට හෙට වුනත් එයාව ගන්ට පුළුවන්, ඌ නියමිත මිල ගෙවන්ට සූදානම් නං." විසේරිස් ඈ දෙස බැල්මක් හෙලූ අතර ඩැනී දෙනෙත බිමට නැඹුරු කරගත්තා ය.

ඉල්ලීරියෝ කුසීත අයුරින් අතක් වැනුවේ ය. "මම ඔබට කිවුවනේ. හැම දෙයක්ම පිළියෙල වෙලයි තියෙන්නෙ. මාව විශ්වාස කරන්ට. ඛාල් ඔබට සිංහාසනයක් පොරොන්දු වෙලයි තියෙන්නෙ. ඒක ඔබට ලැබෙයි."

"ඒක හරි. ඒත් කවදද?"

"ඛාල් තීරණය කරපු දවසට." ඉල්ලීරියෝ කීය. "මුලින්ම මිනිහට දැරිවිව දීලා ඉමුකෝ. ඒ දෙන්නා බැන්දට පස්සෙ ඛාල් එයාගෙ පිරිවරත් එක්ක තැනිතලාව හරහා ගිහිල්ලා ඈයව ඉදිරිපත් කරන්ට ඕන වයෙස් ඩොත්රාක්වල ඉන්න ඩොෂ් ඛලීන්ට. ඊට පස්සෙ සමහරවිට. නිමිති කාරයො කිවුවොත් යුද්ධෙට යන්ටයි කියලා."

නොඉවසිල්ල නිසා විසේරිස් ගේ කෝපය නැග ආවේ ය. "මේ ඩොත්රකි නිමිති කාරයන්ගෙන් මට පඩයක් වත් වැඩක් නෑ. රාජ්‍යය පැහැරගත්ත එකා මගේ තාත්තගෙ සිංහාසනයෙ වාඩි වෙලා ඉන්නවා. මම තව කොච්චර කල් ඉවසන්ටද?"

ඉල්ලීරියෝ දෙවුර ඇකිළුවේය. "ඔබ ජීවිත කාලයෙන් වැඩිහරියක් ඒ වෙනුවෙන් බලා හිටියා. ඉතින් තව මාස කීපයක්, නැත්තම් තව අවුරුදු කිපයක් ඉවසගෙන ඉන්න එක මහ වැඩක්ද?"

වයෙස් ඩොත්රාක් තරම් ඈතට සංචාරය කර අත්දැකීම් ඇතිව සිටි සෙර් ජෝරා එකඟතාව පලකරන අන්දමින් හිස වැනී ය. "මම උපදෙස් දෙනවා ඔබට පොඩ්ඩක් ඉවසලා ඉන්ටයි කියලා මගේ ස්වාමිනී. ඩොත්රකියො කියාපු වචනයක් ඇත්නම් ඒක ඒ විදියටම ඉටු කරනවා. ඒත් එයාලා ඒක කරන්නෙ එයාලට උවමනා වෙලාවටයි. සාමාන්‍ය මිනිහෙකුට ඛාල්ගෙන් අනුග්‍රහයක් ඕන කියලා යටහත්ව ඉල්ලා හිටින්ට පුළුවන්. ඒත් එයාට ඒ වෙනුවෙන් කරදර කරන්ට, බැන වදින්ට යන්ට හොඳ නෑ."

විසේරිස් කේන්තියෙන් පිම්බේ ය. "උඹේ කට පරිස්සම් කරගනින් මෝර්මන්ට්. නැත්තම් මම උඹේ දිව එළියට ඇදලා දානවා. මම සාමාන්‍ය මිනිහෙක් නෙවෙයි. මම තමා රාජධානි සප්තකයේ නියම උරුමක්කාරයා. මකරු කවදාවත් කාගෙන්වත් යටහත්ව ඉල්ලා හිටින්ට යන්නෙ නෑ."

සෙර් ජෝරා ගරුසරු ඇති අයුරින් සිය දෑස් බිමට හරවා ගති. ගුප්ත සිනහවක් පෑ ඉල්ලීරියෝ අත දිගුකර පළහන ලද තාරාවාගේ තටුවක් ගලවා ගත්තේ ය. 'තව දුරටත් මේ ලෝකෙ මකරු නෑ' සිය සොයුරා දෙස බලමින් ඩැනී සිතුවා ය. එනමුදු එය වදන්වලට පෙරලන්නට ඇයට උවමනා වූයේ නැත.

එනමුදු එම රැයේ ඇය සිහිනෙන් මකරෙකු දුටුවා ය. විසේරිස් ඇයට තලමින් ඇයට රිදවමින් සිටියේ ය. ඇය සිටියේ නිරුවතින් හා බියෙන් ගැහෙමිනි. ඔහු වෙතින් ඉවතට දිව යෑමට ඇය යත්න දැරුවද සිය සිරුර ස්ථූල හා අශෝබන මෙන්ම තමන්ට අවනත නොවන බැව් ඇයට හැඟිනි. ඔහු නැවතත් ඇයට තැලී ය. දෙපා පැටලුනු ඇය බිම ඇද වැටුනා ය. "උඹ මකරාව නැගිට්ටෙවුවා." ඇයට පා පහර එල්ල කරන අතරතුරේ ඔහු කෑ ගැසීය. "උඹ මකරාව නැගිට්ටෙවුවා. උඹ මකරාව නැගිට්ටෙවුවා." ඇගේ කලවා රුධිරයෙන් පෙඟී ගොස් තිබින. දෑස් වසා ගත් ඇය වේදනාවෙන් ඉකිබිඳින්නට වූවා ය. ඇගේ හැඬුමට පිළිතුරක් මෙන් මහ හඬින් යමක් ඉරෙන හඬත් බුර බුරා නැගෙන ගින්නක හඬත් ඇයට ඇසින. ඇය නැවත සිය දෑස් විවර කල විට විසේරිස් පෙනෙන්නට නොසිටියේ ය. දැවැන්ත ගිනි වළල්ලක් ඇය වටා නැගෙන්නට වූ අතර ඒ ගින්දර මැද මකරා සිටියේ ය. ඌ සිය දැවැන්ත හිස සෙමින් හරවා ඈ දෙස බැලී ය. උගේ ගිනිගෙන දැවෙන දෑස ඇගේ දෑස් හා සම්මුඛ වූ මොහොතේ ඇය වෙවුලමින් දහදියෙන් පෙඟී ගිය ගතින් යුතුව අවදි වූවා ය. ඇය වෙන කිසිදු දිනෙක එතරම් බියපත් නොවීය........

........ අන්තිමේදී ඇගේ විවාහ මංගල දිනය පැමිනි දා තෙක්, එතරම් බියපත් නොවීය.

හිරු උදාවේ ඇරඹුනු උත්සවය හිරු අවරට යන තෙක්ම නිමා නොවී ය. ඩොත්රැකියන් ගේ තෘණමය නිවාස අතරේ පස්වලින් දැවැන්ත වේදිකාවක් ඉදිවී තිබුනු අතර ඩැනී එහි ඛාල් ඩ්‍රෝගෝ සමගින් අසුන් ගෙන සිටියා ය. ඇය කිසි දිනෙකත් මෙතරම් මිනිසුන් සමූහයක් එක් රැස් වී සිටින ආකාරය දැක නොතිබින. එමෙන්ම කිසි දිනෙකත් මෙතරම් ආගන්තුක මෙතරම් බියජනක මිනිසුන් සමූහයක් ද දැක නොතිබින. මේ ඩොත්රැකි අස් හිමියෝ නිදහස් නගරවල සැරි සරද්දී සාමාන්‍ය මිනිසුන් පරිද්දෙන් වර්ණවත් සළුපිළියෙන් සැරසී

විලවුන් ගත දවටා සිටිය ද සිය බලසාරය සමගින් සිටින විට ඔවුන්ට හුරුපුරුදු පැරණි රටාවටමම ඇඳුම් පැළඳුම් කලහ. ගැහැණුන් හා පිරිමින් සැවොම පොදුවේ වර්ණවත් සම්වලින් නිමවූ කබාවලින් උඩුකය වැසූ අතර අශ්ව ලොමින් කල කලිසම් හැඳ සිටියහ. රණකාමීන් සිය ගොතන ලද දිගු වරලස තෙල් ගල්වා අලංකාර කර තිබින. ඔවුහු මී පැණියේ හා ගම්මිරිස්වල බහා පලහන ලද අශ්ව මාංශ ගිල දමමින්, පැසවන ලද වෙළෙඹි කිරෙන් නිපදවූ මධ්‍යසාරය හා ඉල්ලීරියෝ විසින් ගෙන එන ලද වයින් බොමින්, ගිනිමැල වටා වාඩි වී උස් හඬින් නර්මාලාප දොඩමින් සිටියහ.

ඇයට පහතින් වූ අසුනක විසේරිස් වාඩි වී සිටි අතර ඔහු පසෙකින් ඉල්ලීරියෝ හා සෙර් ජෝරා අසුන් ගෙන සිටියහ. එය බාල් ගේ රුධිරාරක්ෂකයින්ට වහාම පහළින් තිබුනු ගෞරවනීය ආසනයක් වුවද සිය සොයුරා ගේ එළ නිල් පැහැ දෑසේ වූ කේන්තිය ඩැනී පැහැදිලිවම දුටුවා ය. ඇයට පහළින් වාඩි වී සිටීම ඔහු නුරුස්සන්නක් බැව් ඇය දැන සිටියා ය. වහලුන් විසින් සෑම ආහාර පලඟානක්ම පළමුව බාල්ට හා ඔහු ගේ මනාලියටත්, ඉන්පසු තමන් වෙතටත් පිරිනමනු දකින විසේරිස් කේන්තියෙන් පිඹිනු ඈ දුටුවා ය. එනමුදු සිය අමනාපයට හා කේන්තියට පොහොර දමනු මිස වෙනෙකක් කරන්නට ඔහුට ඉඩක් නොවී ය. ගතවන සෑම පැයක් පාසාම, ඔහු ගේ ගරුත්වයට හානි වන සෑම දෙයක් පාසාම ඒ අමනාපය කෙමෙන් දළු ලා වැඩෙනු ඈ දුටුවා ය.

මේ සුවිසල් ඩොත්රැකි රංචුවට මැදි වී අසුන් ගෙන සිටිද්දී දැනුනු තනිකම තරම් තනිකමක් ඩැනී කෙදිනකවත් අත් විඳ නොතිබින. සිනාවකින් මුව සරසා සිටින්නැයි ඇගේ සොයුරා ඇයට උපදෙස් දී තිබුනු අතර මුහුණ ඇඳුම් කද්දී වේදනාව නිසා සිය දෑසට කඳුළු පුරා එද්දී පවා ආයාසයෙන් මුවට නගා ගත් සිනාව නවතා ගැනීමට ඇය වෑයම් නොකලා ය. හැකි උපරිම අන්දමින් සිය දෑසට නැගුනු කඳුළු වසන්කර ගැනීමට ඩැනී යත්න දැරුවේ ඇය හඬනු දුටුවොත් විසේරිස් කොපමණ කේන්ති ගන්නේ දැයි දැන සිටි බැවිනි. එමෙන්ම බාල් ඩ්‍රෝගෝ ඊට කෙසේ ප්‍රතිචාර දක්වනු ඇත්දැයි නොදැන සිටි බැවිනි. ඇය වෙත නොයෙකුත් රසමසවුළු පිළිගැන්වුනු නමුදු ඇය අත වනා ඒ සියල්ල ප්‍රතික්ෂේප කලා ය. අද දිනයේ කිසිදු කෑමක් සිය උගුරෙන් පහළට යැවිය නොහැකි බැව් ඇය දැන සිටියා ය.

ඇයට කතා කිරීමටවත් කිසිවකු නොවී ය. බාල් ඩ්‍රෝගෝ මහ හඬින් විධාන නිකුත් කරමින්, සිය රුධිරාක්ෂකයින් සමග විහිළු තහළු කරමින්, ඔවුන් ගේ සරදම්වලට සිනහවෙමින් දවස ගතකලද තමා පසෙකින් සිටි ඩැනී දෙස එකදු බැල්මක්වත් නොහෙළී ය. කතා කිරීමට අවශ්‍ය වුවද ඔවුන් දෙදෙනාට කතා කල හැකි පොදු භාෂාවක් ද නොවී ය. ඩොත්රැකි යනු ඇයට කිසිසේත්ම තේරුම්ගත නොහැකි රළු බසක් විය. නිදහස් නගරවල

ව්‍යවහාර වුනු වැලීරියන් මූලයක් සහිත ග්‍රාම්‍ය භාෂාවේ වචන කිහිපයක් පමණක් බාල් දැන සිටි අතර රාජධානි සප්තකයේ භාවිත වුනු පොදු භාෂාව කිසිසේත්ම නොදත්තේ ය. ඉල්ලීරියෝ සහ සිය සොයුරා සමග කතා කිරීමට ඉඩක් ලද්දේනම් එය සතුටින් භාර ගැනීමට ඇය සූදානම් වුවද ඔවුන් සිටියේ ඇයට පහතින් ඇයව නැසෙන මානයේ වූ බැවින් ඊටද ඉඩක් නොවී ය.

ඉදින් මනාළි ඇඳුමින් සැරසුනු ඩනේරිස් කෑම කටක් කෑමට පවා බියෙන්, මී පැණි මුසු කල වයින් කුසලානක් තොලගාමින්, බිය නැති කරගැනීම පිනිස තමාටම නිහඬව කතා කරමින් සිය මංගල දිනය ගතකලා ය. 'මම තමා මකරාගේ රුධිරය' ඇය නිහඬව මිමිනුවා ය. 'මම තමා ඩනේරිස් ස්ටෝර්ම්බෝර්න්, ඩ්‍රැගන්ස්ටෝන්හි කුමරිය', 'මම ජයග්‍රාහක ඒගන් ගේ ලෙයින් හා බීජයෙන් ඉපදුන කෙනෙක්'. ඇය දිගින් දිගටම මිමිනුවා ය.

Daenerys Targaryen: “Tell Khal Drogo that he has given me the wind.”

දවසේ පළමු මිනිසා මිය යනු ඇ දකිද්දී හිරු අහසේ අඩක්වත් ගමන්කර නොතිබින. වේගවත් බෙර වාදනයක් මධ්‍යයේ ගැහැණුන් කණ්ඩායමක් සිය බාල් වෙනුවෙන් නැටුමක් ඉදිරිපත් කරමින් සිටියහ. ඩ්‍රෝගෝ එතරම් උනන්දුවකින් නැටුම දෙස බලා නොසිටියද විටින් විට ගැහැණුන්හට අහුලා ගැනීම සඳහා ලෝකඩ පදක්කමක් ඔවුන් දෙසට වීසි කලේ ය.

රණකාමීහුද මේ නැටුම දෙස බලා සිටියහ. අන්තිමේදී ඉන් එකෙක් ඉදිරියට පිය මැන නටමින් සිටි ගැහැණියකගේ අතින් අල්ලා ඇයව එතනම බිම හොවා පිරිස මධ්‍යයේම ඇය හා සංවාසයේ යෙදෙන්නට විය. එය හරියටම සෛන්ධවයෙක් වෙළඹක් මත නැගුනා හා සමාන විය. මංගලෝත්සවය මැද්දේ මෙවැනි දේ සිදුවිය හැකි යැයි ඉල්ලීරියෝ ඩැනීට කලින්ම අනතුරු හඟවා තිබින. "ඩොත්රකියො සංවාසයෙ යෙදෙන්නෙ හරියට උංගෙ රංචුවල ඉන්න සත්තු වගේම තමයි. ඛලසාර් එකක් ඇතුළෙ පුද්ගලිකත්වයක් කියලා දෙයක් නෑ. අනික උංට අපට වගේ ලැජ්ජා-බය පින්-පවු කියන දේවල් තේරෙන්නෙ නෑ."

සිදුවන්නේ කුමක්දැයි වටහාගත් ඩැනී බියෙන් ඉවත බැලුවා ය. නමුත් මොහොතක් ගතවෙද්දී තවත් රණකාමියෙකු ඉදිරියට පැමිණි අතර ඉන්පසු තවත් එකෙක්! වැඩි

වේලාවක් යන්නට පෙර ඩැනීට සිය දෑස් ඉවත හැරවිය හැකි මගක් නොවී ය. ඊළඟ මොහොතේ දෙදෙනෙකු විසින් එකම ගැහැණිය ඩැහැගැනින. මහ හඬින් කල මුරගැමක්, තල්ලුවක් හා ඇසිපිය හෙලන පමනින් ඇරැබ් දෙකක් එළියට ඇදුනි. ඩොත්රැකියන් භාවිත කරන මේ අසිපත් දෑකැත්තක් මෙන් වක් වූ, දිගැටි, තියුණු මුවහත් තලයක් ඇති දරුණු ආයුධයක් විය. මරණය අබියස කෙරුනු නැටුමක් ඇරඹිනි. රණකාමීන් දෙදෙනා වටයට යමින්, හිසට ඉහළින් ඇරැබ් ලෙලවමින්, වහසිබස් දොඩමින් එකිනෙකා වෙත පහර එල්ල කරන්නට වූහ. කිසිවෙකුත් මේ සටනට මැදිහත් වීමට සිතූ බවක්වත් නොපෙනින.

ඩැනීට සිතාගැනීමටවත් නොහැකි තරම් වේගයකින් ඇරැබ් ගැටුනු නමුදු ගැටුම ඇරඹුනු තරම්ම ඉක්මනින් එය නිමාව දුටුවේ ය. එකෙකු ගේ පියවරක් වැරදුන අතර අනිකා ලද අවසරයෙන් මාරාන්තික පැති පහරක් එල්ල කලේ ය. ඩොත්රැකියා ගේ ඉණට මඳක් ඉහළින් සිරුරට කා වැදුනු පහරින් ඔහු ගේ පිටකොන්දේ සිට උදරය මැදක් වන තෙක් විවර වී ගොස් අතුණුබහන් පිටතට පැන්නේ ය. පරාජිතයා මියයද්දී ජයග්‍රාහකයා තම අතට හසුවුනු පළමු ගැහැණිය - අඩුම තරමේ ඔවුන් දෙදෙනා සටන් වැදි ගැහැණිය නොව වෙනත්ම එකියක් - එතැනම බිම හොවා ඇගේ සිරුර මත නැග්ගේ ය. වහලුන් විසින් මළකඳ ඉවත රැගෙන ගිය අතර නැවතත් නැටුම ආරම්භ විය.

මැජිස්ටර් ඉල්ලීරියෝ මේ ගැනත් ඩැනීට අනතුරු හඟවා තිබින. "ඩොත්රැකි මංගල උත්සවයක් මැද්දෙ අඩුම ගානෙ තුන්දෙනෙක් වත් මැරුනෙ නැත්තං ඒක මහ නීරස එකක් විදියටයි පිළි ගැනෙන්නෙ." තම විවාහය විශේෂයෙන්ම ආශීර්වාද ලද්දක් බැව් ඩැනීට සිතුනි. එම දිනය නිමා වීමට පෙරාතුව මිනිසුන් දුසිමක්වත් මිය ගොස් තිබින.

පැයෙන් පැය ගෙවී යද්දී ඩැනී තුළ වූ භීතිය කෙමෙන් කෙමෙන් වැඩි වන්නට වූ අතර අන්තිමේදී භීතිය නිසා කෑ ගැස්සෙනු වැළැක්වීමට ඇයට දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු විය. මිනිසුන් නොව මිනිස් සම් පොරවාගෙන සිටින සතුන් පිරිසක් බඳු වූ මේ ඩොත්රැකියන් ගේ ආගන්තුක ම්ලේච්ඡ ජීවන රටාවන් දෙස බලා සිටි ඇයට බියක් දැනින. යම් හෙයකින් තම සොහොයුරා ගේ බලාපොරොත්තු ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහු තමාට කුමක් කරනු ඇත්දැයි ඇයට බියක් දැනින. මේ හැමටත් වඩා තමා පසෙකින් හිඳ සුරා පානය කරමින් සිටින කුරිරු මුහුණකින් යුතු මේ දැවැන්තයා සමග ගෙවන්නට සිදුවන අද රාත්‍රිය ගැන සිතත්ම ඇයට බියක් දැනින.

'මම තමා මකරාගේ රුධිරය' ඇය නැවතත් තමාටම කියා ගත්තාය.

අන්තිමේදී හිරු බටහිර අහසේ බැස යාමට සැරසෙද්දී ඛාල් ඩ්‍රෝගෝ ගේ අත්පුඩි තැලීමෙන් ලත් අණ අනුව සියලුම නැටුම් ද බෙර වාදන ද භෝජන සංග්‍රහ ද සියල්ල එක වර නතර විය. නැගිට සිටි ඩ්‍රෝගෝ ඩැනීවද දැතින් අල්ලා නගා සිටුවී ය. ඒ ඇය සිය විවාහ තෑගි ලබන අවස්ථාව විය.

ඇගේ සොයුරා විසේරිස් ඇයට සේවිකාවන් තිදෙනෙකු තෑගි වශයෙන් ලබා දුනි. ඔහුට ඒ වෙනුවෙන් කිසිදු වියදමක් සිදු නොවූ බවත් ඉල්ලීරියෝ විසින් ඔවුන් සපයන්නට ඇති බවත් ඩැනී දැන සිටියා ය. ඉරී හා ජික්වී තඹ පැහැ සමෙන් කළු කෙසින් හා ආල්මන්ඩ් දෑසින් යුත් ඩොත්රැකියන් වූහ. ඩෝරියා ලා පැහැ කෙසින් හා නිල් දෑසින් යුත් ලයිසෙනී කෙල්ලක් වූවා ය. "මේ නිකංම නිකං වැඩකාර කෙල්ලො නෙවෙයි මගේ ආදරණීය නංගී." ඇගේ සොහොයුරා පැවසී ය. "ඉල්ලීරියොයි මායි පෞද්ගලිකවමයි ඔයා වෙනුවෙන් එයාලා තෝරගත්තෙ. ඉරී ඔයාට අශ්වයො පදින්ට උගන්නයි. ජික්වී ඔයාට ඩොත්රැකි භාෂාව උගන්නයි. ඩෝරියා ඔයාට උගන්නයි කොහොමද පිරිමියෙක්ව සතුටු කරන්නෙ කියලා." ඔහු සියුම් සිනාවක් පෑවේ ය. "එයා ඒ ගැන බොහොම හොඳට දන්න ගුරුවරියක්. ඉල්ලීරියොයි මායි දෙන්නම ඒ ගැන සහතික වෙනවා."

සෙර් ජෝරා සිය ත්‍යාගය පුද කලේ ය. "මේක බොහොම පුංචි දෙයක් මගේ කුමරියනි. ඒත් මේ දුප්පත් පිටුවහලාට මීට වඩා දෙයක් දෙන්ට බෑ." පැරණි පොත් මිටියක් ඇය ඉදිරියේ තබමින් ඔහු ප්‍රකාශ කලේ ය. ඒ රාජධානි සප්තකයේ ඉතිහාසය හා ගී පබැඳුම් අඩංගු පොදු බසින් ලියැවුනු පොත් බැව් ඩැනී දුටුවා ය. ඇය සෙර් ජෝරාට මුලු හදින්ම ස්තූතිවන්ත විය.

මැජිස්ටර් ඉල්ලීරියෝ අණක් නිකුත් කල අතර වහලුන් සිවුදෙනෙක් ලෝකඩින් වැඩ දැමූ දැවැන්ත සීඩාර් පෙට්ටගමක් ඔසවාගෙන ඉදිරියට පැමිණියහ. එහි පියන ඇරිය ඩැනී දුටුවේ නිදහස් නගරවල නිමැවුනු ඉස්තරම්ම විල්ලූදවලින් පෙට්ටිය පිරී ඇති බවයි. ඒ විල්ලූද මතුයෙහි බහා තිබුනේ දැවැන්ත බිත්තර තුනකි. ඩැනී මවිතයෙන් හුස්මක් ඉහළට ඇද ගත්තා ය. ඇය සිය ජීවිත කාලයටම දැක ඇති අලංකාරම දේ එය විය. ඒවා කෙතරම් වෛවර්ණයෙන් බැබළුනේද යත් ඩැනී මුලින් සිතුවේ ඒවායේ මැණික් ඔබ්බවා ඇති බවකි. ඒවා කෙතරම් විශාලදැයි කිවහොත් එක් බිත්තරයක් එසවීම සඳහා ඩැනීට සිය දෑතම යොදා ගත යුතු විය. ඇය පරිස්සමින් බිත්තරය එසෙවුවේ එය පිහන් මැටියෙන් හෝ වීදුරුවලින් නිමැවූවක් බව සිතමිනි. එනමුදු ඇය සිතුවාට වඩා එය බර විය. බිත්තර කටුවේ මතුපිට වැසී තිබුනේ සියුම් කොරපොතුවලිනි. ඇය සිය අත්ල මත බිත්තරය එහා මෙහා

කරද්දී බැස යන හිරු රැස් වැටීමෙන් එය ඔප දැමූ ලෝහයක් මෙන් දිදුලන්නට විය. එක් බිත්තරයක් තද කොළ පැහැයෙන් යුක්ත වූ අතර පෙරලද්දී ලෝකඩ පැහැයෙන් දිස්නය දෙන්නට විය. දෙවැන්න දීප්තියෙන් අඩු ක්‍රීම් පැහැ වූ අතර එහි රන්වන් වයිරම් වැටී තිබින. අවසාන එක මැදියම් රෑ මුහුදක් මෙන් තද කළු පැහැයෙන් ද යුක්ත වූ අතර ලේ රත් පැහැ රැල්ළෙන් හා සුළියෙන් අලංකාර විය. "ඒ මොනාද ඒ?" ඩැනී ඇසුවේ විස්මය මුසු වූ කෙඳිරිලි හඬකිනි.

"මකර බිත්තර. අෂයි වලට එහායින් තියෙන සෙවනැලි දේශයෙන් ගෙනාපු මකර බිත්තර." මැජිස්ටර් ඉල්ලීරියෝ කීවේ ය. "කල්ප කාලාන්තරයක් තිස්සේ තිබිලා ඒවා දැන් ගල්වෙලා. ඒත් ඒවා තාමත් ලස්සනට දිස්නෙ ගහනවා."

"මේවා මට හැමදාමත් වටින තෑග්ගක් වේවි." මෙවැනි බිත්තර ගැන ඇය අසා තිබුනු නමුදු එවැන්නක් දකින්නට හැකි වේයැයි ඇය කිසිදා නොසිතුවා ය. එය ඇත්තෙන්ම විශිෂ්ට තෑග්ගක් වුවද ඉල්ලීරියෝට එවැනි වියදමක් දැරිය හැකි බැව් ඩැනී දැන සිටියා ය. ඇයව ඛාල් ඩ්‍රෝගෝට විකිණීමේ ඔහු ගේ පංගුව වෙනුවෙන් ඔහු අශ්වයින් හා වහලුන් මගින් සුවිසල් ධනස්කන්ධයක් උපයා තිබින.

ඛාල් ගේ රුධිරාරක්ෂකයින් විසින් සම්ප්‍රදායික ආයුධ තුන ඇය වෙත පුද කර සිටින ලදී. හග්ගෝ ඇයට රිදී මිටකින් සමන්විත සම් කසයක් තෑගි කලේ ය. කොහොල්ලෝ රනින් වැඩ දැමූ විභූතිමත් ඇරැඛ් එකක් ද, ක්වෝතෝ මකර අස්ථියෙන් නිමැවුනු ඇයටත් වඩා උස දුන්නක් ද පිරිනැමූහ. සම්ප්‍රදායට අනුව මේ තෑගි ප්‍රතික්ෂේප කරන්නේ කෙසේදැයි මැජිස්ටර් ඉල්ලීරියෝ සහ සෙර් ජෝරා ඇයට උගන්වා තිබින. "මේ තෑගි සුදුසු වෙන්නේ ශ්‍රේෂ්ට රණකාමියෙකුටයි, මගේ රුහිරෙන් උපන් රුධිරය! මම ගැහැණියක් පමණයි. එනිසා මා වෙනුවට මගේ ස්වාමි උතුමානන් මේ පිරිනැමීම බාරගනීවා."

අනිතුක් ඩොත්රැකියෝ ඇයට නොයෙකුත් තෑගි තොග පිටින් පිරිනමන්නට වූහ. පාවහන්, මැණික්, ඇගේ වරළස වෙනුවෙන් රිදියෙන් කල මුදු, ඉණපටි, වර්ණ ගැන්වූ කමිස හා සුමුදු ලොම් ඇඳුම්, සේද හා සුවඳ ද්‍රව්‍ය පිරවූ බඳුන්, ඉඳිකටු හා පිහාටු සමගින් තවත් නොයෙකුත් දේ ද, මීයන් දහසක ගේ සමින් මැසූ ගවුමක්ද ඇයට තෑගි ලැබින. "බොහොම අගනා තෑග්ගක් ඛලීසි." මේ අවසාන තෑග්ග ගැන ඇයට විස්තර කරදෙමින් ඉල්ලීරියෝ පැවසී ය. "බොහොම වාසනාවන්තයි." මේ සියලු තෑගි ඇය වටා පොදි ගැසෙන්නට විය. ඇයට සිතා

ගැනීමටවත් නොහැකි තරම් තෑගි ගොඩක්! ඇයට කිසිදා පාවිච්චි කර නිමකිරීමට නොහැකි තරම් තෑගි ගොඩක්!

Illyrio Mopatis: “You have waited most of your life. What is another few months, another few years?”

අන්තිමේදී බාල් ඩ්‍රෝගෝ ඇයට තෑගි පිරිනමන මොහොත උදා විය. නැගී සිටි ඔහු ඈ වෙතින් නික්ම යද්දී බලාපොරොත්තුවේ නිහැඬියාවක් මුළු බලසාරය පුරා කෙමෙන් පැතිරෙන්නට විය. ඔහු ආපසු පැමිණි විට තෑගි දෙන්නට පැමිණ සිටි ඩොත්රකියෝ දෙපසට වී ඔහුට ඉඩ දුන්හ. ඔහු ඇය වෙත අශ්වයකු රැගෙන ආවේ ය.

ඈ ජීවයෙන් පිරි තේජාන්විත තරුණ වෙළඹක් වූවා ය. මේ නම් සාමාන්‍ය අන්දමේ සත්ත්වයකු නොවන බව තේරුම් ගැනීමට තරම් ඩැනී අශ්වයින් ගැන දැන සිටියා ය. ඇය තුළ කෙනෙකු මන්මත් කරවන අන්දමේ කුමක්දෝ ගතියක් තිබින. ඇය ශීත කාලයේ මුහුදක් මෙන් අළු පැහැ වූ අතර රිදී පැහැයෙන් දිදුලන කේශර පොකුරකට හිමිකම් කීවා ය.

දෙගිඩියාවකින් මෙන් අත දිගු කල ඩැනී අශ්වයා ගේ ගෙල අතගෑවා ය. ඇගේ කේශර තුළින් සිය අතැඟිලි දිවෙවුවා ය. බාල් ඩ්‍රෝගෝ ඩොත්රකි බසින් යමක් පැවසූ අතර ඉල්ලීරියෝ එය පරිවර්තනය කලේ ය. "බාල් කියනවා ඔබේ කෙස්කළඹේ රිදී පැහැයට ඔහුගෙන් රිදී තෑග්ගක් කියලා."

"එයා හරිම ලස්සනයි." ඩැනී මිමිනුවා ය.

"එයා තමා බලසාරයේ ආඩම්බරය. චාරිත්‍රානුකූලව ඛලීසි තමන්ගෙ තත්ත්වයට ගැලපෙන අශ්වයෙක් පිටේ නැගලා බාල් පසෙකින් ගමන් කරන්ට ඕන."

ඉදිරියට පැමිණි ඩ්‍රෝගෝ සිය දෑත ඇගේ ඉණ දෙපසින් තැබුවේ ය. කුඩා දැරියක තරම් පහසුවෙන් ඇයව එසවූ ඔහු ඇයව සෑදලය මත තැබී ය. එය ඇයට හුරුපුරුදු සෑදලයකට වඩා කුඩා, ඩොත්රකියන් භාවිත කරන අන්දමේ එකක් විය. ඩැනී අතීරණාත්මක අයුරින් මොහොතක් සිටියා ය. දැන් කල යුත්තේ කුමක්දැයි කිසිවෙකුත් ඇයට කියා දී නොතිබින. "මම මොකක්ද කරන්ට ඕන?" ඇය ඉල්ලීරියෝගෙන් ඇසුවා ය.

සෙර් ජෝරා මෝර්මන්ට් පිළිතුරු දුන්නේ ය. "තෝන් ලණුව ඇදලා අශ්වයාව ධාවනය කරන්ට. ඔබ වැඩිය දුර යන්ට ඕන නෑ."

සැකසහිත අන්දමින් තෝන් ලණුව අතට ගත් ඩැනී කෙටි පාපටිය තුළට දෙපා රිංගෙවුවා ය. අශ්වයින් ධාවනය සම්බන්දයෙන් ඇයට තිබුනේ යන්තම් දැනුමක් පමණි. අසුන් පිට යාමට වඩා ඇය සිය ගමනාගමනයට භාවිත කර තිබුනේ නැවු, කරත්ත හෝ දෝලාවන් විය. තමා බිම වැටී අවමානයට ලක් නොවේවායි ප්‍රාර්ථනා කල ඩැනී සිය දණහිසෙන් සියුම්ව වෙළඹ ස්පර්ශ කලා ය.

පැය කිහිපයකට පසු ප්‍රථම වතාවට ඇයට බියවන්නට අමතක විය. සමහරවිට ඒ ඇගේ ජීවිත කාලය තුළ ප්‍රථම වතාවට විය හැක. රිදී පැහැ වෙළඹ සුනමාය සුමුදු ගමන් විලාසයකින් ඉදිරියට ඇදෙන්නට වූවා ය. පිරිස දෙපසට වී ඇයට ඉඩ ලබාදුන් අතර සෑම දෙනෙතක්ම ඇය දෙස යොමු වී තිබින. තමා අදහස් කලාටද වඩා වැඩි වේගයකින් අසු ඉදිරියට ඇදෙන බැව් ඇයට වැටහුනද එය කිසිසේත්ම බියවීමට කරුණක් නොවී ය. වෙළඹ හැල්මේ දුවන්නට පටන්ගත් අතර ඇය සිනාවක් පෑවා ය. ඇගේ දෙපයින් දෙනු ලබන ඉතාම සියුම් තෙරපුමට හා තෝන් ලණුවෙන් දෙනු ලබන සැහැල්ලුම ඇදීමට වෙළඹ ප්‍රතිචාර දැක්වූවා ය. ඇය වෙළඹට පිම්මේ යාමට සැලැස්සුවා ය. ඩොත්රකියන් සිනහසෙමින්, කෑ ගසමින්, හූ කියමින් ඇය යන මාර්ගයෙන් ඉවත්වීමට පොර කෑහ. ආපසු යාමට අසු හැරවූ ඩැනී දුටුවේ තමා යන මාවත මැද ඇති ගිනි මැලයයි. දෙපසම පිරී සිටි ඩොත්රකියන් නිසා අසු නවතාගැනීමට තැනක් නොවී ය. ඇය කිසිදා නොදැන සිටි සාහසික බවක් ඇගේ සිරුර පුරා පිරී යන බැව් ඇයට දැනින. ඇය වෙළඹට සන් කලා ය.

රජතමය වෙළඹ ගිනිගොඩට උඩින් පැන්නේ හරියටම ඇයට පියාපත් තිබෙන්නාක් වැනි සැහැල්ලුවකිනි.

මැජිස්ටර් ඉල්ලීරියෝ ඉදිරියේ අසු නැවතූ ඇය මෙසේ කීවා ය. "බාල් ඩ්‍රෝගෝට කියන්ට ඔහු මට දීලා තියෙන්නෙ සුළඟක් කියලා." මහත පෙන්ටෝෂියා සිය කහවන් රැවුල අතගාමින් එය ඩොත්රැකි බසට පෙරළී ය. සිය නව සැමියා සිනාසෙන'යුරු ඩැනී පළමුවැනි වතාවට දුටුවා ය.

මේ වන විට බැස යන හිරු ගේ අවසන් රැස් දහර පෙන්ටොස්හි උසැති පවුරුවලට ඔබ්බෙන් සැඟව ගොස් තිබින. තම අසු ගෙනෙන්නැයි බාල් ඩ්‍රෝගෝ සිය රුධිරාරක්ෂකයින්ට සන් කලේ ය. රතු පැහැ සෙන්ධවයාට බාල් විසින් සැදල දමද්දී විසේරිස් හෙමින් සීරුවේ රජතමය අසු පිට හුන් ඩැනී වෙත කිට්ටු විය. සිය ඇඟිලිවලින් ඇගේ පාදය තදින් මිරිකාගත් ඔහු මෙසේ කීය. "එයාව සතුටුකරන්ට වග බලාගනිං, මගෙ ආදරණීය නංගී. එහෙම නැත්තං උඹ මීට කලින් කවදාවත් දැකලා නැති තරම් දරුණු විදියට මකරා අවදිවෙනවා උඹට බලාගන්ට පුළුවන් වෙයි."

සිය සොයුරා පැවසූ මේ වදන් සමග භීතිය නැවතත් ඇගේ සිතට රිංගා ගත්තා ය. ඇයට නැවතත් හැඟුනේ තමා අන් කිසිවකුත් නොව මුහුණපෑමට ඇති කිසිදු දෙයකට සූදානම් නොවුනු, සියල්ලන් විසින් තනි කර දැමුනු, වසර දහතුනක දැරියක පමණක් බවයි.

තරු නැග එද්දී බලසාරයත්, තෘණමය නිවාසයෙන් සැදි කඳවුරත් ඔවුන් පිටුපසින් අතහැර දැමූ ඔවුන් දෙදෙනා අසුන් ඉදිරියට මෙහෙය වූහ. කිසිදු වදනක් නොදෙඩූ බාල් ඩ්‍රෝගෝ දැඩිවන අඳුර මධ්‍යයේ සිය අසුට හැල්මේ දුවන්නට ඉඩ හැරියේ ය. ඔහු ගේ හිස රැඳි පුංචි රිදී සීනු මෘදු හඬින් රැවු දෙනු ඇයට ඇසින. බිය නැති කර ගැනීමටත් සිය ධෛර්‍ය වඩවා ගැනීමටත් ගමන අතරතුරේදී ඩැනි සෙමින් තමාටම කොඳුරා ගත්තා ය. "මම තමා මකරාගේ රුධිරය. මම තමා මකරාගේ රුධිරය. මම තමා මකරාගේ රුධිරය." මකරුන් කිසිදිනෙකත් බියපත් නොවූහ.

ඔවුන් මෙසේ කෙතරම් දුරක් හෝ කෙතරම් වේලාවක් හෝ ගමන් කලාදැයි ඩැනීට නිසැක වශයෙන්ම කිව නොහැකි විය. එනමුදු අන්තිමේදී කුඩා දිය පාරක් අසබඩ පිහිටි තණ බිමකදී ඔවුන් අසුන් නවතන විට සම්පූර්ණයෙන්ම අඳුර වැටී තිබින. සිය අසු පිටින් බිමට පිනූ ඩ්‍රෝගෝ ඇයව ඔසවා බිමින් තැබීය. ඔහුගේ ශක්තිමත් දෑතට මැදි වී සිටිද්දී තමා වීදුරු මෙන් බිඳෙනසුලු බවත් සිය අතපය ජලය මෙන් අප්‍රාණික බවත් ඩැනීට සිතුනි. ඇය කිසිදු පිළිසරණක් නොමැති අයුරින් වෙවුලමින් සිටගෙන සිටි අතර ඔහු තමා දෙස හැරුනු විට ඉකිබිඳ හඬන්නට පටන් ගත්තා ය.

ඛාල් ඩ්‍රෝගෝ කිසිදු හැඟීමක් නොමැති මුහුණින් ඇගේ කඳුළු දෙස බලා සිටියේ ය. "නෑ." ඔහු කීවේ ය. සිය අත එසවූ ඔහු ගොරහැඩි මහපටැඟිල්ලකින් ඒ කඳුළු පිසදා හැරියේ ය.

"ඔබ පොදු භාෂාව කතා කරනවද?" ඇය පුදුමයෙන් ඇසුවා ය.

"නෑ." ඔහු නැවතත් කීවේ ය.

සමහරවිට ඔහු දන්නේ මේ එකම එක වචනය පමණක් වන්නට ඇතැයි ඩැනී සිතුවා ය. එනමුදු කිසිවක්ම නොදැන සිටීමට වඩා එය හොඳ දෙයක් වුනු අතර ඩැනී ගේ සිත මඳක් සැහැල්ලු විය. ඩ්‍රෝගෝ සිය අතැඟිලි අතරට මැදි කරගත් කෙස් රොදවල් පිරිමදිමින් මෘදු හඬින් ඩොත්රැකි බසින් මුමුනමින් හෙමින් සීරුවේ ඇගේ කෙහෙරැළි ස්පර්ශ කලේ ය. ඔහු කියූ කිසිදු වදනක් ඩැනීට නොතේරුනද ඒ ස්වරයේ ඇති උණුසුම ඇයට හොඳින්ම දැනින. එය ඇය මේ මිනිසාගෙන් කිසිදා බලාපොරොත්තු නොවූ මොළොක් බවක් හා කරුනාවන්තකමක් විය.

ඇගේ නිකටට යටින් ඇඟිල්ලක් තමා ඇගේ මුහුණ එසවූ ඔහු ඇගේ දෑස දෙස බලා සිටින්නට විය. ඔහු ඇය අසලින් සිටගෙන සිටියේ උසැති කුළුණක් මෙනි. ඇගේ බාහුවලට යටින් දෑත් යවා සෙමින් ඇයව ඔසවා ගත් ඩ්‍රෝගෝ දියපහර අසබඩ තිබුනු වටකුරු ගලක් මත ඇයව හිඳුවී ය. ඉන්පසු ඔහු දෙකකුල් පටලවා ඇයට මුහුණ ලා වාඩි වුනු අතර අන්තිමේදී ඔවුන් දෙදෙනා ගේ මුහුණු එක මට්ටමකට සමපාත විය. "නෑ." ඔහු කීවේ ය.

"ඔබ දන්න එකම වචනය එච්චරද?" ඇය ඇසුවා ය.

ඩ්‍රෝගෝ පිළිතුරක් දුන්නේ නැත. ඔහු ගේ දිගු ගෙතූ කොණ්ඩය ඔහු පසෙකින් දරණ ගැසී බිම වැටී තිබින. සිය දකුණු උරහිසට ඉහළින් එය ඇදගත් ඔහු එහි එල්ලා තිබුනු පුංචි රිදී සීනු එකින් එක සෙමින් ගලවන්නට වන්නේ ය. මඳ වේලාවකට පසු ඩැනී ද ඉදිරියට නැමී ඔහුට උදවු කරන්නට වූවා ය. මේ සියල්ල නිමා වූ පසු ඩ්‍රෝගෝ ඇයට අතින් සන් කලේ ය. ඩැනී එය වටහාගත්තා ය. ඇය ඔහු ගේ ගෙතූ කෙස්කළඹ ලිහන්නට විය.

එය බොහෝ වේලාවක් ගතවූ කාර්යයක් විය. ඇය එය නිමකරන තෙක් ඔහු ඉවසිලිවන්තව බිම වාඩි වී ඇය දෙස බලා සිටියේ ය. සියල්ල ලිහා දැමූ පසු ඔහු හිස ගස්සා සෙලවූ අතර ඒ කේශකලාපය කළු පැහැ ගංගාවක් මෙන් ඔහු පිටුපසින් ඇද හැලින.

ඉන්පසු පැමිණියේ ඔහු ගේ වාරය යි. ඔහු ඇගේ ඇඳුම් ඉවත් කරන්නට වූයේ ය. ඔහු ගේ අතැඟිලි කඩිසර මෙන්ම පුදුමාකාර අන්දමින් මෘදු වූ අතර ඩැනී නිහඬව නොසෙල් වී ඔහු ගේ දෑස් දෙස බලා සිටියදී ඔහු ඉතා ප්‍රවේශමෙන් ඇගේ සේද ඇඳුම් එකින් එක ඉවත් කලේ ය. ඔහු ඇගේ ළපටි තිසරුන් නිරුවත් කල විට ඩැනීට තමාව පාලනය කරගත නොහැකි බවක් දැනුනු අතර සිය දෑස් ඔහු ගෙන් මුදවා ගත් ඈ දෑතින් ළය වසා ගත්තා ය. "නෑ." ඩ්‍රෝගෝ කීය. ඔහු සිය දෑතින් මෘදුව එහෙත් තිර අන්දමින් ඇගේ දෑත් දෙපසට කලේ ය. ඉන්පසු ඇගේ මුහුණ ඔසවා ඇගේ දෑසට එබුනේ ය. "නෑ." ඔහු නැවතත් කීවේ ය.

"නෑ." ඇය ද එයම ප්‍රතිරාව නැංවී ය.

ඇයව දෙපයින් සිටවා තමා අසලට ඇදගත් ඔහු ඇගේ අවසාන ඇඳුම් කිහිපය ඉවත් කලේ ය. රාත්‍රී වාතය ඇගේ නිරුවත් සමට සීතලක් ගෙන ආ අතර ඇය වෙවුලුවා ය. ඇගේ දෑත් හා දෙපා වල හී ගඩු පිපෙන්නට විය. ඊට පසු කුමක් සිදු වේදැයි ඇය බියෙන් බලා සිටි මුත් මඳ වේලාවක් යන තෙක් කිසිවක්ම සිදු නොවී ය. ඛාල් ඩ්‍රෝගෝ බිම වාඩි වී ඇය දෙස බලා සිටියේ ඒ සිරුරේ රූ සිරිය සිය දෑසින් උරා බොමිනි.

මඳ වේලාවකට පසු ඔහු ඇයව ස්පර්ෂ කරන්නට පටන් ගත්තේ ය. පළමුව මෘදුවත් ඉන්පසුව මඳක් දැඩිවත් ස්පර්ෂ කරන්නට පටන් ගත්තේ ය. ඔහු ගේ දෑතේ ඇති සාහසික ශක්තිය ඇයව වැටහී ගියද ඔහු කිසි විටෙකත් ඇයට රිදවූයේ නැත. සිය දෑතින් ඇගේ අත අල්ලා ගත් ඔහු ඇගේ අතැඟිලි එකින් එක පිරිමදින්නට විය. ඔහු ගේ අතක් මෘදු අන්දමින් ඇගේ කකුල මතින් ඇදී ගියේ ය. ඇගේ කණ් පෙති පිරිමදිමින් ඇගේ දෙතොල් වටා පිරිමදිමින් ඔහු ඇගේ මුහුණ ස්පර්ෂ කලේ ය. සිය අතැඟිලි ඇගේ කෙහෙරැලි අතරට රිංගවූ ඔහු ඇඟිලි වලින් කෙස්කළඹ පීරන්නට විය. ඇයව අනික් පස හරවා ඇගේ උරහිස හා කොඳු ඇට පෙළ දිගේ පහළට පිරිමදින්නට විය.

මේ අයුරින් බොහෝ වේලාවක් ගෙවී ගිය අතර අන්තිමේදී ඒ දෑත ඇගේ පයෝධර වෙතට පිවිසියේ ය. ඔහු පළමුව සිනිඳු යටි සම පොපියන තෙක් සෙමින් අතගෑවේ ය. සිය මහපටැඟිලි ආධාරයෙන් පයෝධර තුඩු වටා කවාකාරව පිරිමැද්දේ ය. මහපටැඟිල්ල හා දබරැඟිල්ල අතරට පියයුරු තුඩු මැදි කරගෙන ඒවා සෙමින් තද කලේ ය. පළමුව සෙමිනුත් ඉන්පසු මදක් දැඩි බවකිනුත් ඒවා ඇද්දේ ය. අන්තිමේදී ඇගේ පයෝධර තුඩු දැඩි වී ඇදුම් දෙන තුරු නොනවත්වාම ඒවා ඇද්දේ ය.

අන්තිමේදී මෙය නතර කර දැමූ ඔහු ඩැනීව සිය උකුළ මතින් වාඩි කරවා ගත්තේ ය. ඩැනීගේ හද වේගයෙන් ගැහෙන්නට වූ අතර සිය හුස්ම හිරවෙන්නාක් මෙන් ඇයට දැනින. සිය විසල් දෑතට ඇගේ මුහුණ මැදි කර ගත් ඔහු ඇගේ දෑසට එබී බැලී ය. "නෑ." ඒ ස්වරයේ තිබුනු ප්‍රශ්නාර්ථය ඩැනීට වැටහින.

ඔහු ගේ අතින් අල්ලා ගත් ඇය සිය තෙත් වූ යටිකය වෙත ඒ අත සෙමින් රැගෙන ගියා ය. "ඔවු!" ඇ කෙඳිරුවා ය.

Illyrio Mopatis: “The khal has promised you a crown, and you shall have it.”

Viserys Targaryen: “Yes, but when?”

Illyrio Mopatis: “When the khal chooses.

එඩාර්ඩ්

අරුණෝදයටත් පෙරාතුව රජතුමා ගේ කැඳවීම ලැබෙද්දී නෙඩ් පසු වූයේ සුව නින්දේ ය.

ඇලන් විසින් අවදි කරන්නට යෙදුනු නෙඩ් අන්දමන්දව දැස් පිසදා වටපිට බැලී ය. ඒ වනවිටත් ඔහු ගේ අසුට සෑදල පළඳා තිබුනු අතර රජතුමා අසු පිට නැග ඔහු එනතෙක් පොරොත්තු වෙමින් සිටියේ ය. දුඹුරු පැහැ සනකම් අත්වැසුම් හා බර ලොම් කබායකින් සැරසී සිටි රොබර්ට් දිස් වූයේ හරියටම අසු පිට සිටිනා වළසෙකු පරිද්දෙනි. "නැගිටහං ස්ටාර්ක්!" ඔහු ගෙරවී ය. "නැගිටහං, නැගිටහං. අපට රාජ්‍යයේ වැඩ කටයුතු ගැන සාකච්ඡා කරන්ට තියෙනවා."

"මම මුළුමනින්ම ඔබෙයි මගේ ස්වාමිනී. ඇතුළට යහපත් වෙන්ට." නෙඩ් කීය. ඇලන් රජතුමා වෙනුවෙන් කූඩාරමේ දොර පත්ත එසවී ය.

"නෑ නෑ නෑ. මේ කඳවුර ඇතුළෙ කී දෙනෙක් අපට කණ් දීගෙන ඉන්නවද? අනිත් එක මට උවමනායි ටිකක් එළියට ගිහිල්ලා රටතොට පොඩ්ඩක් බලන්ට." රජුට පිටුපසින් සෙර් බොරෝස් හා සෙර් මෙරින් තවත් සෙබළුන් දුසිමක් සමග බලා සිටින අයුරු නෙඩ් දුටුවේ ය. ඉදින් සිය දෑසේ නිදිමත පිසදා හැර, හැඳ පැළඳ අසු පිට නැගීම හැර වෙනත් විකල්පයක් නෙඩ්ට නොවී ය.

රොබර්ට් සිය දැවැන්ත යුධ අශ්වයා පිම්මේ ඉදිරියට පැන්නවූ අතර නෙඩ් ඔහුට සමපාත වීමට උත්සාහ කරමින් ඔහු පසෙකින් අසු මෙහෙයවී ය. වරක් නෙඩ් රජුගෙන් යමක් විමසූ මුත් සුළඟ නිසා රොබර්ට්ට එය නෑසින. මඳ වේලාවකින්ම ඔවුහු රජමාවතින් බැහැර වී මීදුමෙන් පිරුනු තැනිතලා බිම් හරහා සිය අසුන් මෙහෙයවමින් සිටියහ. ඒ වනවිට ආරක්ෂකයින් ඔවුන්ගෙන් සෑහෙන තරම් දුරස් වී තිබුනු මුත් රොබර්ට් අසු නැවතීමට උත්සාහයක් නොදැරුවේ ය.

අරුණෝදය උදාවෙද්දී ඔවුන් කුඩා කඳු වැටියක් තරණය කරමින් සිටි අතර අන්තිමේදී රොබර්ට් සිය අසු නැවැත්වී ය. මේ වනවිට ඔවුහු ප්‍රධාන කඳවුරෙන් සැතපුම් ගනනාවක්

දුරස් වී සිටිය හ. "දෙයියම්පා! නියම මිනිහෙක් වගේ මෙහෙම අශ්වයෙක් පිටේ නැගලා යන එක කොච්චර ප්‍රබෝධමත්ද." රොබර්ට් සිනාසුනේ ය. "ඇත්තමයි නෙඩ්, පාර දිගේ අර කරත්තෙන් බඩ ගාන එකම ඇති මිනිහෙක්ව පිස්සු වට්ටන්ට." රොබර්ට් බරතියන් යනු කිසි දිනෙකත් ඉවසිලිවන්ත මිනිසකු නොවී ය. "අර බඩකඩුත්තුව  පාර දිගේ කෙඳිරි ගගා යනකොට, කන්දක් නගිනවා වගේ පුංචි ගලක් උඩින් යනකොට මට මාරයා නගිනවා... ඕක තව එක පාරක් කැඩුනොත් සහතිකයි මම ඕකට ගිනි තියනවා! සෙර්සිට බැරිය පයින් යන්ට."

නෙඩ් සිනාසුනේ ය. "මම බොහොම සන්තෝසෙන් පන්දමක් අවුළුවලා දෙන්නම්."

"හොඳ හාදයා." රජතුමා ඔහු ගේ දසරුවට අතින් ගැසී ය. "මට හිතෙනවා උං ඔක්කෝම ටික මෙතන දාලා මෙහෙම්මම ඉස්සරහට යන්ට."

"මට හොඳ විශ්වාසයි ඔබ ඒක කිවුවෙ ඇත්තටමයි කියලා."

"අනිවාර්යයෙන්ම. මොකද කියන්නෙ නෙඩ්? උඹයි මායි විතරක් යමුද? රජමාවතේ දඩාවතේ යන රස්තියාදුකාර නයිට්වරු දෙන්නෙක්. අපි දෙන්නට මේ කඩු දෙක තියෙනවා. අපට ඉස්සරහට මොනවා හම්බවෙයිද කියලා දෙයියො දනී. අපට රෑට ඇඳට ගන්ට ඔය ගමරාළ කෙනෙක්ගෙ දූවක් හරි තැබෑරුමක කෙල්ලෙක් හරි හොයාගන්ට බැරිය."

"එහෙම පුළුවන්නම් කොච්චර හොඳද. ඒ වුනත් අපට දැන් වගකීම් තියෙනවා මගේ ස්වාමිනී... රාජධානියට, අපේ දරුවන්ට, මට මගේ ආර්යාව වෙනුවෙන්, ඔබතුමාට රැජිණ වෙනුවෙන්. අපි දැන් ඉස්සර හිටපු පුංචි කොල්ලො නෙවෙයි."

"උඹ ඒ කාලෙත් පුංචි කොල්ලෙක් නෙවෙයි නෙ. ඒක තමා කණගාටුවට කාරනය. ඒ වුනත් මට මතකයි එක පාරක්... මොකක්ද ඒකිගෙ නම? උඹේ අර කෙල්ලගෙ නම? බෙක්කා? නෑ නෑ, ඒකි මගේ කෙල්ලන්ගෙන් එකියක්. ඒකිට දෙයියන්ගෙම පිහිටයි. කළු කොණ්ඩෙයි, ලොකු ලස්සන ඇසුයි. උඹට ඒ ඇස්වල කිමිදෙන්ට පුළුවන්. උඹේ

කෙල්ලගෙ නම... ඇලීනා? නෑ, උඹ මට එක පාරක් කිවුවා මතකයි. මෙරිල් ද? උඹ දන්නවනෙ මම මේ කා ගැනද කතා කරන්නෙ කියලා? උඹේ අර අවජාතකයගෙ අම්මා...

"එයාගෙ නම විල්ලා." නෙඩ් ආචාරශීලී අයුරින් පිළිතුරු දුනි. "ඒත් මම ඒ ගැන කතා කරන්ට කැමැති නෑ."

"අන්න හරි, විල්ලා. ඒකි හරිම ලස්සන කෙල්ලක් වෙන්ට ඕන. නැත්තං ඉතිං එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන්ට එයාගෙ උදාරභාවයයි, පතිව්‍රතාවයි අමතකවෙයියැ. උඹ මට කවදාවත් කියලා නෑ ඒකි කොයි වගේ කෙල්ලක්ද කියලා..."

කේන්තිය නිසා නෙඩ් ගේ දෙතොල් තද විය. "මම ඒ ගැන කියන්නෙත් නෑ. ඔබේ හිතේ මං ගැන තියෙනවයි කිවුව ආදරේ ඇත්තනම් ඕක අමතක කරලා දාන්ට රොබර්ට්. මම මගේ ගෞරවය නැති කරගත්තා, මම කැට්ලින් ගේ ගෞරවයත් නැති කලා."

"දෙයියම්පා! උඹ කැට්ලින්ව යාන්තං අඳුරගත්තා විතරයි."

"එයා මගේ බිරිඳ වෙලයි තිබුනෙ. එයා මගේ දරුවා කුසේ දරාගෙනයි හිටියෙ."

"උඹ නොසෑහෙන්ට උඹටම වද දීගන්නවා නෙඩ්. උඹ හැමදාමත් එහෙමයි. යකාටම පලයං!" ඔහු සිය දණහිසට අතුල් පහරක් දුන්නේ ය. "ඒත්, උඹ ඒ ගැන ඔච්චර තදට හිතනවානම් මම ඒ ගැන තවත් හාරාවුස්සන්නෙ නෑ."

අරුණෝදයේ මීදුම අතරින් උදා හිරු කිරණ ගලා එන්නට වූ අතර ඔවුන් ඉදිරියේ මුඩු, දුඹුරු පැහැ විසල් තැනිතලා බිමක් විද්‍යාමාන විය. එහි සමතල බව තැනින් තැන බිඳී ගොස් තිබුනේ පහත් කඳු හා ගොඩැලි වලිනි. නෙඩ් එදෙසට අත දිගු කලේ ය. "අර තියෙන්නෙ මුල් මිනිස්සුන් ගේ සොහොන් ගොඩැලි."

රොබර්ට් දෙබැම ඇකිළුවේ ය. "අපි මේ සොහොන් පිට්ටනියකටද ඇවිල්ලා තියෙන්නෙ?"

"උතුරුකරේ හැම තැනම මෙහෙම සොහොන් ගොඩැලි තියෙනවා මගේ ස්වාමිනී. මේක බොහොම පුරාණ භූමියක්."

"ඒ වගේම සීතල භූමියක්." රොබර්ට් කීවේ සිය ගත දැවටූ සළුව තව තවත් තද කර ගනිමිනි. "හරි, මම උඹව මෙතනට එක්කන් ආවෙ සොහොන් පිට්ටනි ගැන කතා කරන්ටවත්, උඹේ අවජාතකයා ගැන භාරාවුස්සන්ටවත් නෙවෙයි. ඊයෙ රෑ අශ්වාරෝහකයෙක් ආවා. කින්ග්ස් ලැන්ඩින්වල ඉඳලා වාරිස් උතුමානන්ගෙන් පණිවුඩයක් අරන්. මෙන්න." ඉණ බැඳි පටියෙන් කොළයක් ඇද ගත් රජතුමා එය නෙඩ් දෙසට දිගු කලේ ය.

වාරිස් නම් පණ්ඩකයා රජු ගේ ඔත්තුකරුවන් ගේ නායකයා විය. කලෙකදී ඒරීස් ටාර්ගේරියන්ට සේවය කල අයුරින්ම දැන් ඔහු රොබර්ට්ට සේවය කරයි. නෙඩ් චකිතයකින් මෙන් කඩදාසිය දිග හැරියේ ලයිසා හා ඇගේ සැකය ගැන යම් කිසිවක් එහි ලියැවී ඇත්දැයි සිතමිනි. එනමුදු එහි ඒරින් ආර්යාව ගැන කිසිදු සඳහනක් නොවී ය. "කොහෙන්ද මේ තොරතුරු ලැබුනෙ?"

"උඹට මතකද සෙර් ජෝරා මෝර්මන්ට්?"

"මට ඌව කවදාවත් අමතක වෙන්නෙ නෑ." නෙඩ් නොසැලකිල්ලෙන් කීවේ ය. වලස් දූපතේ මෝර්මන්ට්වරුන් වනාහී ගෞරවනීය මෙන්ම මාන්නක්කාර පුරාණ වංශවත් පෙළපතක් විය. එහෙත් ඔවුන් සතු භූමිය සීතලින් පිරි, දුරස්ථ එමෙන්ම වැඩි ආදායමක් ගෙන දුන්නක් නොවී ය. සිය පවුලේ ආදායම වැඩි කර ගැනීමට සිතූ සෙර් ජෝරා හොර දඩයක්කරුවන් පිරිසකට නිසි අයුරින් දඬුවම් පැමිනවීම වෙනුවට ඔවුන්ව ටයිරෝෂි වහල් වෙළෙඳුන්ට විකුණන ලදී. මෝර්මන්ට්වරුන් යනු ස්ටාර්ක් ධජ දරන්නන් වූ නිසා මේ නොමනා ක්‍රියාව මගින් ඔවුන් මුළු උතුරම අපකීර්තියට ලක් කර තිබිනි. ඔහුට දඬුවම් කිරීම පිනිස නෙඩ් දුරුකතර ගෙවා වලස් දූපතට ගියමුත් ඒ වන විටත් සෙර් ජෝරා රජු ගේ නීතියෙන් මිදී නැවු නැග පලා ගොස් තිබිනි. ඒ මීට වසර පහකට පෙරයි.

"සෙර් ජෝරා දැන් ඉන්නෙ පෙන්ටොස් වල. මිනිහා බොහොම උනන්දුවෙන් බලාගෙන ඉන්නෙ රාජකීය සමාවක් ලබලා පිටුවහලෙන් මිදිලා ආයෙමත් මෙහාට එන්ට." රොබර්ට් පැහැදිලි කලේ ය. "වාරිස් උතුමානන් මිනිහව හොඳට පාවිච්චි කරනවා."

"හා හා හා. ඒ කියන්නෙ වහල් වෙළෙන්දා දැන් ඔත්තුකාරයෙක් වෙලා." නෙඩ් අප්‍රිය ස්වරයෙන් කීවේ ය. ඔහු ලිපිය නැවත රජතුමා දෙසට දිගු කලේ ය. "මම වැඩිය කැමැතියි මිනිහා මළකඳක් වෙනවනං."

"වාරිස්නං කියන්නෙ මළකඳන්වලට වඩා ඔත්තුකාරයො ප්‍රයෝජනවත් කියලයි. හරි, ජෝරාව පැත්තකට දාපංකො. උඹ මොකක්ද මේ ලියුමෙන් තේරුම් ගන්නෙ?"

"ඩනේරිස් ටාර්ගේරියන් ඩොත්රකි නායකයෙක්ව කසාද බැඳලා. මොකක්ද ඒකෙන් අපට ඇති වැඩේ? අපි එයාට තෑග්ගක් යවන්ට ඕනද?"

රජතුමා රවා බැලී ය. "පිහියක් යැවුවොත් කොහොමද? හොඳ මුවහත් පිහියක්? ඒක පාවිච්චි කරන්ට දන්න හොඳ සාහසික මිනිහෙකුත් යවන්ට ඕන."

ටාර්ගේරියන්වරුන් කෙරෙහි රොබර්ට් තුළ ඇති වෛරය පිස්සුවක් තරමටම උග්‍ර එකක් විය. සිය ස්වාමිභක්තිය ඔප්පු කරනු වස් ටයිවින් ලැනිස්ටර් විසින් රේගාර් කුමරා ගේ බිරිඳ ගේ හා දරුවන් ගේ මළකඳන් රොබර්ට් වෙත පුද කල දා තමා හා රජු අතර ඇති වූ දරුණු වාග් ප්‍රහාරය නෙඩ් ට මතක් විය. එය මනුශ්‍ය ඝාතනයක් ලෙස නෙඩ් විසින් අර්ථ දැක්වූ අතර රොබර්ට් කීවේ යුද්ධය යනු එය බවයි. පුංචි කුමරා හා කුමරිය අත දරුවන් බව නෙඩ් පෙන්වා දුන් විට රජතුමා කීවේ 'මට මෙතන පුංචි දරුවො පේන්නෙ නෑ, මට පේන්නෙ මකර බිත්තර විතරයි.' කියා ය. එතැන පැන නැගුනු කුණාටුව සන්සිඳුවීමට ජොන් ඒරින්ටවත් නොහැකි වූ අතර එඩාර්ඩ් ස්ටාර්ක් බලවත් ප්‍රකෝපයෙන් යුතුව එතැනින් පිට වී ගියේ ය. ඔවුන් දෙදෙනා නැවත එකමුතු කරන්නට සමත් වූයේ තවත් මරණයක් - ලියානා ගේ මරණය - වීම දෛවයේ සරදමක් මෙනි.

මේ වතාවේ තම කෝපය සඟවා ගැනීමට නෙඩ් වග බලා ගති. "මගේ ස්වාමිනී, මේ කෙල්ල දරුවෙකුට වඩා යාන්තං පොඩ්ඩක් වැඩිමල්. අහිංසකයො ඝාතනය කරන්ට ඔබ

ටයිවින් ලැනිස්ටර් නෙවෙයි." ඔවුන් කියන අන්දමට සෙබළුන් විසින් රේගාර් ගේ පුංචි දූ කුමරිය ඇය සැඟවී සිටි ඇඳ යටින් එළියට අදිද්දී ඇය හඬා වැලපී ඇත. පුංචි කුමරා කිරි බොන අත දරුවකු වුවද මව ගේ ඇකයෙන් ඔහුව උදුරාගත් ටයිවින් උතුමානන් ගේ සෙබළු දෙපයින් අල්ලා බිත්තියක ගැසීමෙන් ඔහු ගේ හිස සුණුවිසුණු කලහ.

"උඹේ මේ පුංචි කෙල්ල තව කොච්චර කාලයක් අහිංසක විදියට ඉඳියි කියලා උඹ හිතනවද? මේ කෙල්ල වැඩි කල් යන්ට කලින් කකුල් දෙක පළල් කරලා මකර බිත්තර බෝ කරන්ට පටන් ගනියි. එතකොට මොකද වෙන්නෙ?"

"ඒ කොහොමවුනත්, ළමයි මරනවා කියන්නෙ මහ නීච, අධම වැඩක්."

"අධම වැඩක්?" රජතුමා ගෙරෙවුවේ ය. "ඒරිස් උඹේ සහෝදරයා බ්‍රැන්ඩන්ට කරපු දේ අධම වැඩක්. උඹේ තාත්තව මරපු විදිය, අන්න ඒක අධම වැඩක්. එතකොට රේගාර්... උඹ හිතන්නෙ ඒ පරයා උඹේ නංගිව කී පාරක් දූෂණය කරන්ට ඇති කියලද?" ඔහු ගේ කටහඬ කෙතරම් බිහිසුණු වී ද යත් බියට පත් අශ්වයා හේශාරවය කරන්නට විය. "මගෙ අතට අහුවෙන හැම ටාර්ගේරියන් කෙනෙක්වම මම මරනවා. උංගෙ මකරු වගේ උනුත් මේ ලෝකෙන් වඳ වෙලා යනකං මම උංව මරනවා. ඊට පස්සෙ උංගෙ මිනී වලට කෙල ගහනවා."

ඔහු ගේ ක්‍රෝධය අධික වූ මෙවැනි අවස්ථාවන්හිදී ඔහු සමග වාද කිරීමෙන් පලක් නොවන බව නෙඩ් අත්දැකීමෙන්ම දැන සිටියේ ය. මෙතරම් වසර ගණනකට වුවත් රොබර්ට්ගේ පලිගැනීමේ පිපාසය සන්සිඳවීමට නොහැකි විනි නම් ඔහු ගේ වදන් වලින් එය කෙසේ කරන්ටද?

Robert Baratheon: “What did any Targaryen ever know of honor?”

"ඔබට මේ මකරාට අත තියන්ට බැහැ, එහෙම නේද?"

රජතුමා ගේ මුහුණ පුළුටු වී කට ඇදවී ගියේ ය. "බෑ. දෙයියන්ට සාප වෙන්ට ඕන. කාලකන්නි පෙන්ටොෂි වෙළෙන්දෙක් ඒකියි, ඒකිගෙ සහෝදරයවයි උගෙ වතුයායෙ හංගන් ඉන්නවා. ඒ මදිවට උංගෙ ආරක්ෂාවට නපුංසක හමුදාවකුත් දාලා. දැන් ඔන්න ඌ ඒකිව බාර දීලා ඩොත්රැකි එවුන්ට. මම උං දෙන්නවම මරන්ට තිබුනෙ මීට අවුරුදු ගානකට කලින්. ඒ කාලෙ මෙච්චර අමාරුවක් තිබුනෙ නෑ. ඒ වුනාට ජොන් උඹ වගේම මට හරහට හිටියා. මම තමයි ලොකුම මෝඩයා. මම ඌට ඇහුම්කණ් දුන්නා."

"ජොන් ඒරින් කියන්නෙ බොහොම ඥානවන්ත මිනිහෙක්. හොඳ 'අතක්'."

රොබර්ට් මහ හඬින් හුස්මක් පිට කලේ ය. ඔහු ගේ ක්‍රෝධය පැමිණි වේගයෙන්ම බැහැරවෙමින් තිබින. "කියන විදියටනං මේ බාල් ඩ්‍රෝගෝට ලක්ෂයක හමුදාවක් ඉන්නවලු. ඒ ගැන ජොන් මොකක් කියයිද?"

"එයා කියයි මුහුදෙන් එහා පැත්තෙ ඉන්නකං ලක්ෂයක් නෙවෙයි, ලක්ෂ දහයක ඩොත්රැකි හමුදාවක් වුනත් අපේ රාජධානියට තර්ජනයක් නෙවෙයි කියලා." නෙඩ් පිළිතුරු දුන්නේ ය. "මේ ම්ලේච්ඡයන්ට නැවු නෑ. උං මුහුදට බයයි."

රජතුමා නොසන්සුන් අයුරින් සිය සෑදලය මත හැරුනේ ය. "සමහරවිට එහෙම වෙන්ට පුළුවන්. ඒ වුනත් මේ නිදහස් නගරවල ඕන තරම් නැවු තියෙනවා. උඹට මම මේ කියන්නෙ නෙඩ්, මම කැමැති නෑ මේ කසාදෙට. මේ රාජධානි සප්තකයේ තාමත් මිනිස්සු ඉන්නවා මට 'රජකම පැහැර ගත්ත එකා' කියලා කියන. උඹට අමතකද කොච්චරනං වංශාධිපති පවුල් යුද්ධෙදි ටාර්ගේරියන්ලා වෙනුවෙන් සටන් කලාද කියලා? දැනට උං කල් මර මර ඉන්නවා. ඒත් අවස්ථාවක් ආවොත් උං මාව නිදි ඇඳේදිම මරලා දායි. මගේ ළමයිනුත් මාත් එක්කම මරලා දායි. හිඟන රජා ඩොත්රැකි හමුදාවකුත් එක්ක මෙහාට ගොඩ බැස්සොත් මෙහෙ ඉන්න ද්‍රෝහියො ඔක්කොම ටික ඌට එකතු වෙයි."

"මිනිහට මෙහාට ගොඩ බහින්ට හම්බවෙන්නෙ නෑ. මොකක් හරි ක්‍රමේකින් ආවොත් අපි මිනිහව ආපහු මුහුදටම තල්ලු කරලා දාමු. අපි නැගෙනහිරට ආරක්ෂකයෙක් පත් කරගත්තට පස්සෙ -"

රජතුමා ගෙරවී ය. "මේ අන්තිම වතාවටයි කියන්නෙ. මම අර ඊරින් කොල්ලව ආරක්ෂකයා විදියට පත් කරන්නෙ නෑ නෑ නෑමයි. මම දන්නවා ඒ කොල්ලා උඹේ බෑනා කියලා. ඒ වුනත් මේ ටාර්ගේරියන්ලා ඩොත්රැකියොත් එක්ක ඇඳට නගින වෙලාවෙ, රාජධානියෙන් හතරෙන් පංගුවක් ලෙඩ ගානෙ ඉන්න පුංචි කොල්ලෙකුට බාර දෙන්ට තරං මට පිස්සු නෑ."

"ඒක හරි. ඒත් දැන් අපට කොහොමහරි නැගෙනහිරට ආරක්ෂකයෙක් උවමනායි. රොබර්ට් ඊරින් ඒ තනතුරට ගැලපෙන්නෙ නැත්තම් එතනට ඔබේ සහෝදරයෙක් නම් කරන්ට. අපි දැක්කනෙ ස්ටෝර්ම්ස් එන්ඩ් වටලපු වෙලාවෙ ස්ටැනිස් කොච්චර හොඳට සටන් මෙහෙයෙවුවද කියලා."

සිය අදහස රජතුමා ගේ සිතට කිඳා බසින තෙක් නෙඩ් මදක් නිහඬව සිටියේ ය. රජතුමා රැවුම් මුහුණින් යුතුව බලා සිටිමුත් කිසිවක් නොකීවේ ය. පෙනුනු හැටියට නම් ඔහු යම් අපහසු තත්ත්වයකට මුහුණ දුන්නා වැන්න.

"ඒ කියන්නෙ..," නෙඩ් පරීක්ෂාකාරී අයුරින් රජු දෙස බලමින් කීවේ ය. "ඔබ දැනටමත් වෙන කාටවත් ඒ තනතුර දෙන්ට පොරොන්දු වෙලා නැත්තම්."

"මම එහෙම කරලා නම්?"

"ඒ ජේමි ලැනිස්ටර්. එහෙම නේද?"

සිය අසුට සන් කල රොබර්ට් කන්ද දිගේ පහළට, සොහොන් ගොඩැලි දෙසට අසු මෙහෙයවන්නට විය. නෙඩ් ඔහුට සමගාමීව අසු පැන්නවූ අතර රජතුමා දිගටම ඉදිරියට දෑස් දල්වා බලා සිටියේ හරියට ඔහු දෙස කෙලින් බලන්නට බැරුවාක් මෙනි. "ඔවු." ඔහු අන්තිමේදී කීවේ මේ සංවාදය අවසන් බව හඟවන්නට මෙනි.

"රජුන් මරන්නා." නෙඩ් කීවේ ය. සවනට වැටුනු ආරංචි සියල්ල ඇත්ත එහෙනම්! තමා මේ සිටින්නේ බෙහෙවින් අන්තරායදායක අඩියක බව ඔහුට තේරුනි. "එයා බොහොම

දක්ෂ, ඒ වගේම ධෛර්යසම්පන්න කෙනෙක්. ඒ ගැන සැකයක් නෑ." නෙඩ් ඉතා පරෙස්සමින් වචන තෝරා බේරාගෙන කතා කලේය. "ඒ වුනත් රොබර්ට්, එයාගෙ තාත්තා තමා බටහිර පැත්තේ ආරක්ෂකයා. නියම කාලෙ ආවහම තාත්තාගෙන් පස්සෙ සෙර් ජේමී ඒ තනතුරට පත් වෙයි. එක මනුස්සයෙක් නැගෙනහිරයි බටහිරයි දෙකම පාලනය කරන එක සුදුසු නෑ නේද?" සිය සිතේ කලබලයක් ඇති කිරීමට මූලික වූ ඇත්තම කාරණය නෙඩ් නොකියා හැරියේ ය. මෙම පත්කිරීම මගින් රාජධානියේ හමුදාවලින් බාගයකම පාලනය ලැනිස්ටර්වරුන් සතු වනු ඇත.

"සතුරා යුද්ධ භූමියට එන්ට කලින් යුද්ධය පටන්ගන්ට ඕන නෑ." රජතුමා මුරණ්ඩු අයුරින් කීවේ ය. "දැනට ටයිවින් උතුමානන් හරියට කාර්ස්ටලී රොක් වගේම බොහොම සනීපෙන් ජීවත්වෙනවා. මම හිතන්නෙ නෑ ජේමී ඒ තරම් ඉක්මනින් ඒ තනතුරට පත් වෙයි කියලා. මේ කාරණය ගැන මට තවත් කරදර කරන්ට එපා නෙඩ්. මම තීරණයක් අරන් ඉවරයි."

"මගේ ස්වාමිනී. මම අවංකවම මගේ අදහස කියන්ටද?"

"මට උඹව නවත්තන්ට බෑ."

"ඔබට ජේමී ලැනිස්ටර්ව විශ්වාස කරන්ට පුළුවන්ද?"

"එයා මගේ බිරිඳ ගේ නිවුන් සහෝදරයා. රාජ්‍යාරක්ෂක බලකායෙ දිවුරුම් දීපු සාමාජිකයෙක්. මිනිහගෙ ජීවිතය, වස්තුව, ගෞරවය මේ හැම එකක්ම බැඳිලා තියෙන්නෙ මටයි."

"හරියට ඒ කාලෙ ඒවා ඒරිස් ටාර්ගේරියන්ට බැඳිලා තිබුනා වගේ." නෙඩ් සිහිපත් කර දුනි.

"ඇයි මම මිනිහව අවිශ්වාස කරන්නෙ? හැමදාමත් මම කියපු හැම දෙයක්ම එයා කලා. මම දැන් වාඩිවෙලා ඉන්න සිංහාසනය මට ලබා දුන්නෙ මිනිහගෙ කඩුවෙ උදවුවෙන්."

'ඔබ වාඩි වෙලා ඉන්න සිංහාසනය කෙලෙසුවේ ඒ කඩුවෙ උදව්වෙන්.' නෙඩ් සිතූ මුත් ඒ වදන් මුවින් පිට නොකිරීමට පරෙස්සම් විය. "එයා දිව්හිමියෙන් පොරොන්දුවක් දුන්නා එයාගෙ රජතුමාගෙ ජීවිතය ආරක්ෂා කරනවා කියලා. ඊට පස්සෙ එයා තමන්ගෙ කඩුවෙන් ඒ රජතුමාගෙ බෙල්ල කපලා මැරුවා."

"උඹ අපා හතෙන් එකකටම පලයං! ඒ වෙලාවෙ කවුරු හරි කෙනෙක් ඒරිස්ව මරන්ට ඕන." රජතුමා කීවේ හදිසියේම අසු නවතමිනි. "ජේමි ඒ වැඩේ කලේ නැත්තම් ඒක කරන්ට වෙන්නෙ එක්කො උඹට නැත්තම් මට."

"ඒක වෙනස් දෙයක්. අපි රාජ්‍යාරක්ෂක බලකායෙ දිවුරුම් දීපු සාමාජිකයො වෙලා හිටියෙ නෑ." සිදුවූ සියළුම දේ ගැන සම්පූර්ණ සත්‍යය දැන ගැනීමට රොබර්ට්ට අවස්ථාව පැමිණ ඇති බව නෙඩ් සිතුවේ ය. "මගේ ස්වාමිනී! ඔබට මතකද ත්‍රිශූලයේ සටන?"

"මම මගේ ඔටුන්න දිනුවෙ එතැනදිනෙ. මම කොහොමද එතන අමතක කරන්නෙ?"

"රේගාර් ගෙ පහරක් නිසා ඔබට තුවාල වුනා." නෙඩ් සිහිපත් කර දුනි. "ඒක නිසා ටාර්ගේරියන් හමුදාව සී සී කඩ වෙලා පලා යද්දි උංව ලුහුබඳින්ට ඔබ බාර දුන්නෙ මටයි. රේගාර් ගෙ හමුදාවෙ වැඩි හරිය පලා ගියේ කින්ග්ස් ලෑන්ඩින්ග් වලටයි. අපිත් ඒ පස්සෙන්ම එලෙව්වා. ඒරිස් හිටියෙ රතු බලකොටුව ඇතුළෙ, එයාට පක්ෂපාතී දාස් ගානක පිරිසකුත් එක්ක. මම බලාපොරොත්තු වුනේ බලකොටුවෙ දොරටු හැම එකක්ම වහලා තියෙයි කියලයි."

රොබර්ට් නොඉවසිලිවන්ත ලෙසින් හිස සෙලවී ය. "ඒ වෙනුවට උඹට දකින්ට ලැබුනෙ අපේ සෙබළු ඒ වෙනකොටත් නගරය අත් පත් කරන් ඉන්න විදියයි. මොකක්ද එතන තියෙන ප්‍රශ්නය?"

"අපේ සෙබළු නෙවෙයි. ලැනිස්ටර් සෙබළු. බලකොටු පවුරු වලින් එල්ලිලා තිබුනෙ ලැනිස්ටර් සිංහ කොඩි. ඔටුන්න දාපු ගෝනා නෙවෙයි. අනික උං නගරය අත් පත් කරන් තිබුනෙ වංචාවෙන්."

මේ යුද්ධය වසරකට ආසන්න කාලයක් ඇවිලී ගියේ ය. ලොකු කුඩා වංශාධිපති පවුල් රැසක් රොබර්ට් ගේ ධජය සෙවනේ එක් වූ අතර තවත් පවුල් බොහොමයක් ටාර්ගේරියන් රජ පවුලට පැවැති පක්ෂපාතීත්වය එලෙසින්ම පවත්වාගෙන ගියහ. කාර්ස්ටලී රොක්හි ලැනිස්ටර්වරුන් මෙම යුද්ධයට සහභාගී නොවී දුරස්ව සිටියේ දෙපසින්ම කෙරුනු ආරාධනාවන් බැහැර කරමිනි. ඉදින් ටයිවින් ලැනිස්ටර් උතුමානන් සෙබළුන් දොලොස් දහසක හමුදාවක්ද සමග කින්ග්ස් ලැන්ඩින්ග්හි දොරටු අසල පෙනී සිට රජතුමාට තමා ගේ පක්ෂපාතීත්වය ප්‍රකාශ කල විට තමා දෙවියන්ට කල යාඥා ප්‍රතිඵලදායක වී යැයි ඒරිස් ටාර්ගේරියන් සිතුවේ ය. ඒ අනුව පිස්සු රජා සිය අවසාන පිස්සු නියෝගය නිකුත් කලේ ය. ඔහු සිය නගරයේ දොරටු සිංහයන්ට විවර කර දුන්නේ ය.

"වංචාව කියන්නෙ ටාර්ගේරියන්ලා හොඳට දන්න කියන දෙයක්." රොබර්ට් තුළ නැවතත් කේන්තිය ඇවිලෙමින් තිබින. "ලැනිස්ටර්ලා උංට අනිත් පැත්තට උංගෙ බෙහෙතම දුන්නා. ඒක උංට නුසුදුසු දෙයක් නෙවෙයි. ඔය ගැන හිත හිතා නින්ද කඩාගන්නෙ මොකටද?"

"ඔබ එතන හිටියෙ නෑ." නෙඩ් කීවේ දොම්නස් ස්වරයෙනි. නින්ද නොයාම ඔහුට නුහුරු දෙයක් නොවේ. ඔහු පසුගිය වසර දහහතර තිස්සේ ජීවත් වූයේ බොරු ගොඩක් මධ්‍යයේ ය. එනමුදු ඒ බොරු තවමත් රාත්‍රියට ඔහු ගේ මනසේ හොල්මන් කරයි. "ඒ යුද්ධය දිනුව විදියෙ කිසිම ගෞරවනීය බවක් තිබුනෙ නෑ."

"උඹේ ඔය ගෞරවනීය බව අනික් එවුන්ම අරන් ගියාවෙ!" රොබර්ට් මැසිවිලි නැගී ය. "ටාර්ගේරියන්ලා කවදද ගෞරවය කියන එක ගැන දැනගෙන හිටියෙ? උඹේ සොහොන් ගුහාවට ගිහිල්ලා අහපං ලියානාගෙන් කොහොමද මකරාගෙ ගෞරවය කියලා."

"ඔබ ත්‍රිශූලයේ දී ලියානා වෙනුවෙන් පලිය ගත්තා." නෙඩ් කීවේ රජතුමා අසලින් අසු නවතමිනි. 'මට පොරොන්දු වෙන්ට නෙඩ්.' ඇගේ මිමිනීම ඔහුට තවමත් ඇසේ.

"එහෙම කලා කියලා එයා ආපහු ආවෙ නෑ." රොබර්ට් දුරකට දෑස් දල්වාගෙන කීවේ ය. "දෙයියන්ට සාප වෙන්ට ඕන. මට ලැබුනෙ නිකංම නිකං හිස් ජයග්‍රහනයක් විතරයි. ඔටුන්නක්.... මම යාඥා කලේ මට ඒ කෙල්ලව ආපහු ලබා දෙන්ට කියලයි. උඹේ නංගි, පරෙස්සමින්.. ආයෙමත් මගේ වෙලා.. ඒක එහෙම නේද වෙන්ට තිබුනෙ? මම උඹෙන්

අහන්නෙ නෙඩ්, මොකක්ද මේ ඔටුන්නෙන් ඇති පලේ? අපි රජෙක් වුනත් ගොපල්ලෙක් වුනත් අපේ යාඥාවලට දෙයියො කණ් දෙන්නෙ නෑ."

"දෙවියන් කරන දේ ගැන මට උත්තර බඳින්ට බෑ මගේ ස්වාමිනී... එදා මම සිහසුන් ශාලාවට ගියාම මට දකින්ට ලැබුන දේ. ඒරිස් බිම ලේ විලක් මැද මැරිලා හිටියා. ලැනිස්ටර් සෙබළු හැමතැනම. ජේමී එයාගෙ රත්තරන් පාට සන්නාහයට උඩින් රාජ්‍යාරක්ෂක බලකායෙ සුදු සළුව පැළඳගෙන හිටියා. මිනිහා එයාගෙ නයිට්වරු හැමෝටම ඉහළින් යකඩ සිංහාසනයෙ වාඩි වෙලයි හිටියෙ. එයා පැළඳගෙන හිටියෙ සිංහයෙකුගෙ ඔළුවක හැඩේට හදාපු හිස්වැස්මක්. අහ්! ඒ වෙලාවෙ මිනිහා දිස්නෙ ගහපු හැටි."

"මේක හැමෝම දන්න දෙයක්නෙ."

"මම ඒ වෙනකොටත් අශ්වයා පිටෙයි හිටියෙ. මම ශාලාව දිගටම අශ්වයා පිටින්ම ගියා. ගිහිල්ලා සිංහාසනය ඉස්සරහ නැවතිලා ඉහළ බැලුවා, මිනිහා දිහාව. මිනිහගෙ රත්තරන් කඩුව දණිස් දෙක උඩ තියාගෙනයි හිටියෙ. ඒකෙ එතකොටත් රජතුමාගෙ ලේ තැවරිලා තිබුනා. මගේ මිනිස්සු මට පිටිපස්සෙන් කාමරේට පිරෙන්ට පටන් ගත්තා. එතකොට ලැනිස්ටර් සෙබළු අයින් වුනා. මම වචනයක්වත් කිවුවෙ නෑ. දිගටම එයා දිහා බලාගෙන නැවතිලා හිටියා. අන්තිමේදී ජේමී හිනාවෙලා නැගිට්ටා. හිස්වැස්ම ගලවලා අතට අරන් මිනිහා මට මෙන්න මෙහෙම කිවුවා. "බයවෙන්ට එපා ස්ටාර්ක්. අපේ රොබර්ට් එනකං මම ඒක උණුහුම්ව තියාගන්ට හැදුව විතරයි. අනික ඒක එච්චර සැපපහසුත් නෑ."

හිස පස්සට ගැස්සූ රජතුමා මහහඬින් සිනාසුනේ ය. "උඹ කියන්නෙ ලැනිස්ටර් මගෙ සිංහාසනේ ටික වෙලාවකට වාඩි වෙලා හිටිය නිසා මම මිනිහව අවිශ්වාස කරන්ට ඕනැයි කියලද? ජේමීට එතකොට අවුරුදු දාහතයි නෙඩ්. කොළුවෙකුට වඩා යාන්තං පොඩ්ඩක් වැඩිමල්."

"කොල්ලෙක් හරි මිනිහෙක් හරි, එයාට ඒ සිංහාසනේට අයිතියක් නෑ."

"සමහරවිට මිනිහට ටිකක් මහන්සි දැනෙන්ට ඇති. රජවරු මරනවා කියන්නෙ හරිම වෙහෙසකර වැඩක්. දෙයියො දනී. ඒ මලමගුල් කාමරේ පස්ස තියාගන්ට වෙන තැනක් තියෙනවයැ. අනික මිනිහා කිවුවෙ සම්පූර්ණ ඇත්ත. ඒක කිසිම සැපපහසුවක් තියෙන පුටුවක් නෙවෙයි." රජතුමා හිස දෙපසට වැනී ය. "හරි, දැන් මම දන්නවා මොකක්ද ජේමිගෙ රහස් පාපය කියලා. ඒක අමතක කරලා දාන්ට පුළුවන්. වරෙන් නෙඩ්, අපි ඉස්සරහට යමු. උඹට මතකනෙ අපි කොහොමද ඒ කාලෙ අශ්වයො පැද්දෙ කියලා. මට ආයෙමත් විඳගන්ට ඕන හුළඟ මගෙ කෙහෙරැළි අස්සෙන් යනකොට දැනෙන සනීපය කොහොමද කියලා." අසුට සන් කල ඔහු සොහොන් ගොඩැල්ලට ඉහළින් පිම්මේ අසු පැන්නවූ අතර පස් හා මඩ වර්ෂාවක් මෙන් අසු කුරවලට යටින් විහිදුනි.

මොහොතක් යනතෙක් නෙඩ් ඔහු පසුපසින් අසු විහිදුවේ නැත. තවත් කීමට දෙයක් ඉතිරිව නොතිබුනු අතර ඔහුට විශාල බලාපොරොත්තු විරහිත භාවයක් දැනෙන්නට විය. තමා මේ ගමන පැමිනියේ මන්දැයි හා තමා මෙතැන සිටින්නේ මන්දැයි ඔහු දහස්වන වරටත් සිතා බැලී ය. සිය රජු ගේ දැස් පාදා ඔහුට ඥානය පහල කරවීමට ඔහු ජොන් ඒරින් නොවේ. හැමදාමත් පුරුදු පරිදි රොබර්ට් තම සිතැඟි අනුව කටයුතු කරනු ඇත. නෙඩ් කියන කරන කිසිම දෙයකින් ඒ අදහස් වෙනස් නොවනු ඇත. ඔහු සිටිය යුතු වන්නේ වින්ටර්ෆෙල් වල ය. ඔහු සිටිය යුතු වන්නේ බ්‍රැන් පසෙකින් සිට වැලපෙනා කැට්ලින් සමග ය.

එතෙකුදු වුව, මිනිසෙකුට හැමදාමත් තමා සිටිය යුතු ස්තානයේ සිටින්නට ලැබෙන්නේ නැත. සුසුමක් හෙලූ එඩාර්ඩ් ස්ටාර්ක් අසුට සන් කර සිය රජතුමා පසුපසින් අසු පන්නවන්නට විය.

Eddard Stark: “So the slaver has become a spy. I would rather he become a corpse.”

Robert Baratheon: “Spies are more useful than corpses.”

ටිරියන්

ප්‍රාකාරය කරා යන ගමන ඉතා දිගු වෙහෙසකාරී එකක් විය.

ටිරියන් ලැනිස්ටර් අන් ඕනෑම කෙනෙකු මෙන් භූමි සිතියම් ගැන දැන සිටියේ ය. නමුත් තව දුරටත් රජමාවතක් නොව පටු කැලෑ පාරක් වූ මේ 'රජමාවතේ' දෙසතියක් ගත කල පසු ඔහු අවබෝධ කරගත් කරුණක් වූයේ සිතියම් යනු එක් දෙයක් වන අතර එයින් නිරූපනය වන සැබෑ භූමිය යනු ඊට ඉඳුරාම වෙනස් දෙයක් බවයි.

ඔවුන් වින්ටර්ෆෙල්වලින් පිටත් වූයේ රජතුමා දකුණ බලා පිටත් වූ දිනයේමය. එදින සිහින් හිම වර්ෂාවක් වැටුනු අතර බලකොටුවට හා ඊට පිටින් වූ නගරයට ඔබ්බෙන් රජමාවතේදී සියළුම ධජ දරන්නන්, නයිට්වරුන්, අනිකුත් අශ්වාරෝහකයින් හා බඩු පැටවූ කරත්ත සැවොම දකුණු දෙසට හැරුනු අතර ටිරියන් සිය ගමන් සගයින් වූ බෙන්ජින් ස්ටාර්ක් හා ඔහු ගේ බැනනුවන් සමග උතුරු දෙසට හැරුනි.

එතැන් පටන් කාලගුනය ක්‍රමයෙන් සීතල වන්නට පටන්ගත් අතර අවට පරිසරය වඩ වඩාත් නිහඬ වන්නට විය.

පාරේ බටහිර දෙස අඳුරු රළු මිටි කඳුගැටවලින් සමන්විත වූ අතර එම කඳු මුඳුන් උසැති ආරක්ෂක මුරකුළුණු වලින් ගැවසී ගත්තේ ය. නැගෙනහිර දෙසට වූ භූමිය ක්‍රමයෙන් පහළට බෑවුම් වී ගොස් ඉමක් නොපෙනෙන තැනිතලාවකින් කෙලවර විය. පටු ගංගාවල වේගයෙන් ගලා යන දිය පහරට ඉහළින් ගලින් බැඳුනු පාලම් විසින් ඉවුරු දෙපස යා කෙරින. ගලින් හා දැවයෙන් නිමවූ බලකොටු වටා කුඩා ගොවිබිම් හා ගම්මාන විසිර තිබ්න. පාරේ ගමනාගමනය යහපත් තත්ත්වයක පැවති අතර රාත්‍රිය ගත කිරීමට ග්‍රාමීය මට්ටමේ තානායමක් සොයාගැනීම අසීරු කරුණක් නොවී ය.

එනමුදු වින්ටර්ෆෙල් සිට දවස් තුනක ගමනකින් පසු මෙම ගොවිබිම් තුනී වී ගොස් ඒ වෙනුවට වනාන්තරය මතුවන්නට විය. ඔවුන්ට අමතරව රජමාවතේ ගමන් කරන්නෙකු සොයාගැනීම උගහට විය. ගෙවෙන සෑම සැතපුමක් පාසාම කඳු වල උස ක්‍රමයෙන් වැඩි

වන්නට වූ අතර පස් වන දවස වෙද්දී ඒවා හිමෙන් වැසුනු මුදුන් සහිත දැවැන්ත කඳු බවට පරිවර්තනය වී තිබින.

රජමාවත මේ වන විට වනාන්තරය මැද්දෙන් වැටී තිබුනු අතර ටිරියන් කිසිදා නොදුටු තරම් පැරණි අඳුරු පැහැ වූ ඕක් සහ සදාහරිත ගස් වලින් ද, කටුපඳුරු හා ගොකටුවෙන්ද මේ වනය ගැවසී ගත්තේ ය. බෙන්ජීන් එය නම් කලේ 'වෘක කැලෑව' ලෙසිනි. එම නමටම ගැලපෙන පරිද්දෙන් රාත්‍රිය පුරාවටම ඔවුනට වෘක රංචුවල උඩුබුරලෑම අසන්නට ලැබින. ජොන් ස්නෝව් ගේ ඇලි වෘකයා මේ උඩුබුරලෑම් හඬට තියුණුව සවන් දුන්නද කිසි විටෙකත් පිළිතුරු හඬක් නගන්නට උත්සාහයක් නොදැරී ය. මේ සතා ගේ කිසියම් අපූර්වත්වයක් ඇතැයි ටිරියන්ට හැඟෙන්නට පටන්ගෙන තිබින.

මේ වන විට ඔවුන් ගේ කණ්ඩායමේ සාමාජිකයින් ගණන අටක් දක්වා වැඩි වී තිබින. ටිරියන් සිය සහය පිනිස ලැනිස්ටර් මිනිසුන් දෙදෙනෙකු කැඳවාගෙන ගිය අතර බෙන්ජීන් ස්ටාර්ක් සතුව සිය බෑනා හා නිශා රැකුම් බලකාය වෙනුවෙන් නව අශ්වයින් කිහිප දෙනෙක් සිටියහ. නමුත් වෘක කැලෑව ආසන්නයේ වූ කුඩා වනගත බලකොටුවක් සමීපයේ දී ඔවුන්ට තවත් කළු සොහොයුරෙක් එකතු විය. සිය ගත දැවටුනු ඇඳුම් තරමටම කළු පැහැ වූ රැවුලකින් මුව වසාගත් යොරේන් වක ගැසුනු, අප්‍රසන්න මිනිසකු වුවද ගලක් මෙන් දැඩි දරදඬු මිනිසකු විය. ඔහු සමග පැමිණි පිටිසර කොල්ලන් දෙදෙනා ස්ත්‍රී දූෂණය වෙනුවෙන් වරදකරුවන් වී ලද කප්පාදු කිරීමේ දඬුවම වෙනුවට නිශා රැකුමට සේවය කිරීම තෝරාගත්තවුන් වූහ.

මිනිසුන් පස්දෙනෙක්, කොල්ලන් තිදෙනෙක්, සෝරවෘකයෙක් හා අශ්වයන් විසිදෙනෙක්. මේස්ටර් ලුවින් විසින් බෙන්ජීන් ස්ටාර්ක් හට ලබා දුන් කපුටන් පිරි කූඩුවද සමගින් ගත් විට රජමාවතේ ගමනට එක් වූ අපූරුතම පිරිසක් මෙසේ ඉදිරියට ඇදෙන්නට වූහ.

ජොන් ස්නෝව් විසින් කැළඹුනු මුහුණින් යුතුව වරින් වර යොරේන් සහ ඔහු ගේ බුම්මාගත් ගමන් සගයින් දෙදෙනා දෙසට හෙලනු ලබන බැල්ම ටිරියන් නිරීක්ෂණය කර තිබින. යොරේන් ගේ එක් උරහිසක් ඇඹරී තිබුනු අතර ඔහු වෙතින් දැඩි දුගඳක් වහනය විය. ඔහු ගේ කොණ්ඩය හා රැවුල හැඩපළු ගෙතී තිබුනු අතර එහි උකුණන් පිරී තිබින. ඔහු ගේ අණ්ඩ දැමූ පරණ ඇඳුම් කලාතුරකින්වත් සේදූ බවක් පෙනෙන්නට නොතිබින. ඔහු ගේ තරුණ ගමන් සගයින් දෙදෙනා වෙතින් ඔහුටත් වඩා දුගඳ වහනය වූ අතර ඔවුන් ගේ කෲර මුග්ධ භාවය පැහැදිලිවම දකින්නට හැකි විය.

නිශා රකුම සැදී තිබෙන්නේ සිය මාමා වැනි පුද්ගලයින්ගෙන් බවට මේ කොළුවා වැරැදි උපකල්පනයක් කර ඇති බවට කිසිදු සැකයක් නොවී ය. එසේ නම් යොරේන් සහ ඔහු ගේ ගමන් සගයින් දෙදෙනා ඔහුව ඒ සිහිනයෙන් අවදි කිරීමක් බඳු විය. ටිරියන්ට සැබැවින්ම මෙම කොළුවා ගැන කණගාටුවක් දැනෙන්නට විය. ඇත්තෙන්ම ඔහු තෝරාගෙන තිබුනේ දුෂ්කර ජීවිතයකි... එසේ නැතහොත් කවුරුන් හෝ කෙනෙකු විසින් ඔහු වෙනුවෙන් මෙම දුෂ්කර ජීවිතය තෝරා තිබ්බ.

එනමුදු බෙන්ජින් ස්ටාර්ක් කෙරෙහි නම් ඔහු ගේ මේ අනුකම්පාව යොමු වූයේ මඳ වශයෙනි. සිය සොහොයුරා මෙන්ම ලැනිස්ටර්වරුන් කෙරෙහි නුරුස්නා බවක් බෙන්ජින් තුළද තිබ්බ. ප්‍රාකාරය වෙත යාමේ සිය අභිප්‍රාය ටිරියන් විසින් මුලින්ම හෙළි කල මොහොතේ ඔහු කිසිසේත්ම සතුටට පත් වූයේ නැත. "මම දැන්මම ඔබට අනතුරු අඟවනවා ලැනිස්ටර්. ප්‍රාකාරෙට ගිහින් තානායම් හොයන්ට ලැස්ති වෙන්ට එපා." ඔහු ටිරියන් දෙස බලා කීවේ ය.

"ආහ්! මට නම් කිසිම සැකයක් නෑ ඔබ මට ඉන්ට ඔය කොහේ හරි තැනක් හොයලා දෙයි." ටිරියන් පිළිතුරු දුන්නේ ය. "ඔබට පේනවනෙ මම කොච්චර පොඩි එකෙක්ද කියලා."

කෙසේ වුවද රජිණ ගේ සොහොයුරාට බැහැයි කියන්නට තරම් කිසිවෙකුත් එඩිතර නොවුනු අතර එම ගැටළුව එතැනම විසඳී ගියේ ය. එනමුදු මේ ඇතිවුනු තත්ත්වය ගැන ස්ටාර්ක් කොහෙත්ම සතුටු නොවී ය. "මම සහතිකයෙන්ම කියනවා, ඔබ මේ ගමන නිසා කිසිම විනෝදයක් ලබන්නෙ නෑ කියලා." පැවසූ වදන් සනාථ කරන්නට මෙන් ගමන ඇරඹූ මොහොතේ සිට ටිරියන්ට ගමන එපා කරවීමට කල හැකි සෑම දෙයක්ම සිදු කිරීමට බෙන්ජින් වග බලා ගත්තේ ය.

ගමනේ පළමු සතිය නිමා වන විට නිරන්තර අසු ධාවනය නිසා ටිරියන් ගේ කළවා හිරි වැටී තිබුනු අතර දෙපා ඇදුම් කමින් තිබ්බ. මේ සියල්ලටත් වඩා ඔහු ඇටකටු වලට යන තෙක්ම සීතලෙන් මිදී තිබ්බ. එසේ වතුදු ඔහු කිසිදු අවලාදයක් නොනගා සියල්ල උසුලා ගත්තේ බෙන්ජින් ස්ටාර්ක්ට සතුටු විය හැකි කාරණයක් ලබා නොදීමට තීරණය කරමිනි.

මේ සියල්ල අතරේ ටිරියන් විසින් ස්ටාර්ක්ට එරෙහිව සියුම් ජයක්ද ලබා තිබින. නිශා රැකුමේ නිර්භීත කම හා ආගන්තුක සත්කාරය නමින් ස්ටාර්ක් විසින් ඔහුට පරණ, පුස් ගඳ හමන, වලස් සමින් කල ඇතිරිල්ලක් පිරිනැමූයේ ඔහු එය ප්‍රතික්ෂේප කරතියි යන බලාපොරොත්තුවෙනි. වින්ටර්ෆෙල් සිට එන ගමනේ දී ටිරියන් සිය උණුසුම්ම ඇඳුම් රැගෙන විත් තිබුනද වැඩි දිනක් යන්නට මත්තෙන්ම ඔහුට අවබෝධ වූයේ ඒවා ප්‍රමාණවත් නොවන බවයි. උතුරේ ශීතය අධික වූ අතර දිනෙන් දිනම එය තව තවත් වැඩි විය. රාත්‍රියේ උෂ්ණත්වය සෑමවිටම හිම මිදෙන මට්ටමෙන් පහත බැස තිබින. සුළං හමද්දී ශීතය ඇටමිදුළු පසා කරගෙන ගියේ හරියටම පිහියෙන් අනින්නාක් මෙනි. සිය ධීර වීර පරිත්‍යාගය ගැන ස්ටාර්ක් දැන් බෙහෙවින් පසු තැවෙනවා නිසැක ය. ඔහු නොදැන සිටි පාඩම වූයේ ලැනිස්ටර්වරු කිසිදා දයාන්විතව හෝ වෙන මොනයම් අයුරකින් හෝ තමා වෙත පිදුනු දෙයක් ප්‍රතික්ෂේප කර නොමැති බවයි.

මෙසේ වෘක කැලෑව තුළින් උතුරට යද්දී බලකොටු හා ගොවිබිම් ක්‍රමයෙන් අඩු වී ගොස් අන්තිමේදී නැත්තටම නැති වී ගියේය. තවදුරටත් හිසට වහළක් වෙනුවෙන් ඔවුනට අනුන් මත යැපිය නොහැකි වූ අතර තමන් ගෙන ආ කූඩාරම් වල පිහිට පතන්නට සිදු විය.

මෙවැනි වේලාවට ස්ටාර්ක්, යොරේන් හා අනිකුත් මිනිසුන් විසින් කඳවුර ඉදිකර, අශ්වයින්ට සාත්තු කර අනිකුත් වැඩ කටයුතුවල නියැලෙද්දී අතකින් ගත් පොතක් හා වයින් බඳුනක් ඇතිව විවේක ගන්නට ටිරියන් පුරුදුව සිටියේ ය. මේ දේවල් සඳහා අනිකුන් ඔහුගෙන් උදවු බලාපොරොත්තු නොවූ අතර එසේ කරන්නට ගියහොත් උදවුවලට වඩා තමාගෙන් ඔවුනට ලැබෙන්නේ බාධා බව ටිරියන් ද අත්දැකීමෙන් දැන සිටියේ ය. එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් ගේ අනුමැතිය යටතේ ඔහු වින්ටර්ෆෙල්හි පුස්තකාලයෙන් දුර්ලභ පොත් කිහිපයක් ඉල්ලාගෙන තිබින. ඉදින් අද දිනයේ දී මකරුන් ගේ ඉතිහාසය හා ගතිගුණ ගැන ලියැවුනු පොතක් ද ගිම්හාන දූපත්වල නිපදවන ලද සුමිහිරි වයින් බඳුනක් ද අතින් ගත් ටිරියන් කඳවුරේ කලිකලහයෙන් පිටමන් වී නිදහස් තැනකට පිය මැන්නේ ය.

හිම මෙන් සීතල සුපිරිසුදු දිය පහරක් අසබඩ පිහිටි පැරණි ඕක් ගසක් සෙවනේ සිය වලස් සම් ඇතිරිල්ල එලූ ටිරියන් වයින් උගුරක් පානය කර මකරුන් ගැන කියවන්නට විය.

----------------------------------------------

ටිරියන් තුළ මකරුන් කෙරෙහි කිසිදා නොසන්සිඳෙන ඇල්මක් තිබින. එය හරියටම වශීකරණයක් බඳු විය. සිය සොයුරිය හා රොබර්ට් බරතියන් ගේ විවාහ මංගලෝත්සවය වෙනුවෙන් මුල්ම වරට කින්ග්ස් ලැන්ඩින්ග්වලට පැමිණි දා ඔහු ගේ ඒකායන බලාපොරොත්තුව වී තිබුනේ ටාර්ගේරියන් රාජසභාවේ බිත්තිවල එල්ලා තිබුනු මකර හිස්කබල් දැකගැනීම විය. එනමුදු ඒ වනවිට රොබර්ට් රජතුමා ඒ හිස්කබල් ඉවත් කර ඒ වෙනුවට ධජපතාක වලින් බිත්ති සරසා තිබින. කෙසේවුවද මාළිගයේ අඳුරු ගබඩා කාමරයක ගොඩගසා තිබුනු මකර හිස්කබල් රැස දැසින් දකින තෙක් ටිරියන් සිය උත්සාහය අත් නොහැරියේ ය.

එම හිස්කබල් සිත්ගන්නාසුළු හා තැතිගන්වනසුළු වෙතැයි ටිරියන් බලාපොරොත්තු වුවද ඒවා මෙතරම් අලංකාර වෙතැයි ඔහු කිසිදා සිතා නොතිබින. අගත්ති මෙන් කළු පැහැ වූ ඒවා කෙතරම් සිනිඳුවට ඔප දමා තිබිනි ද යත් පන්දම් එළියේ දීප්තියෙන් බබලන්නට විය. ඔහුට හැඟුනු අන්දමට නම් ඒ හිස්කබල් ගින්දර ප්‍රිය කලා වන්නට ඇත. විශාල හිස්කබලක දත් විලිස්සාගත් මුව තුළ සිය පන්දම බලා ලූ ටිරියන් තමාට පසුපසින් වූ බිත්තිය මත ඒ සෙවනැලි නටන'යුරු දෙස බලා සිටියේ ය. මකර දත් කළු දියමන්තියෙන් තැනුනු දිගු උල්පිහියා මෙන් දිලිසුනු අතර පන්දමේ ගිනිදැල්ල ඒවාට නොදැනුනු තරම් විය. ඒවා මීට වඩා සියදහස් ගුණයකින් ප්‍රබල අග්නි ජාලාවන්ට මුහුණ දී පුරුදු ඇතියවුන් විය. ඔහු පිටව යන ආකාරය දෙස ඒ හිස් දැස් කුහර බලා සිටි බව ටිරියන්ට දිවුරා කියත හැකි විය.

එහි හිස්කබල් දහනවයක් තිබුනි. වයස්ගතම ඒවා වසර තුන්දහසකට වඩා පැරණි වූ අතර ලාබාලම ඒවා යාන්තම් සියවස් එකහමාරක් වයස් විය. මේ ලාබාලම හිස්කබල් දෙක යාන්තම් මැස්ටිෆ් බල්ලකුගේ හිස්කබලක් තරම් විශාල වූ අතර අස්වාභාවික අයුරින් විකෘති වී තිබින. ඩ්‍රැගන්ස්ටෝන්හි ඉපැදුනු අවසාන මකර පැටවුන් දෙදෙනා - සමහරවිට මේ මුලු ලෝකයේම අවසාන මකර පැටවුන් දෙදෙනා - එතරම් දිගුකලක් ජීවත්වන්නට වාසනාව ලද්දවුන් නොවූහ.

එතැන් පටන් ක්‍රමයෙන් විශාල වී ගිය මකර හිස්කබල් පේළිය අවසාන වූයේ අනවරත කතන්දර හා සැහැලිවලට මුල් වූ දැවැන්තයින් තිදෙනෙකුගෙනි. මේ වනාහි ජයග්‍රාහක ඒගොන් හෙවත් ඒගොන් ටාර්ගේරියන් සිය සොයුරියන් දෙදෙනා හා එක්ව රාජධානි සප්තකයට එදිරිව මෙහෙය වූ මකරුන් තිදෙනා විය. කවීන් විසින් ඔවුන්ට දෙවිවරුන් ගේ නම් තමා තිබින. බැලේරියන්, මෙරැක්සිස් හා වේගාර්. විදහාගත් ඒ දැවැන්ත හනු මධ්‍යයේ ටිරියන් සිටගෙන සිටියේ විස්මය හා බිය නිසා වදනකුදු දොඩා ගත නොහැකිව ය. වේගාර් ගේ උගුර දිගේ යමෙකුට අසෙකු පිට නැගී ගමන් කල හැකි වූ අතර මෙරැක්සිස් ඊටත් වඩා

විශාල විය. එනමුදු ඒ හැමටම වඩා විශාල වූ බැලේරියන් හෙවත් කළු රෞද්‍රයා, ඔරොක්සයකු නැතහොත් ඉබින් තොටමුණට එහායින් සැරිසරතියි කියැවෙන මැමතයකු එක උගුරට ගිලිය හැකි තරමේ දැවැන්තයකු විය.

බැලේරියන් ගේ මේ දැවැන්ත හිස්කබල දෙස බලාගත්වනම සිටි ටිරියන් සිය පන්දමේ එළිය අඩු වී යන තෙක් බොහෝ වේලාවක් ඒ අඳුරු ගොහොරු ගබඩාවේ ගත කලේ ය. ඌ පණපිටින් සිටියා නම් කෙසේ වන්නට ඇත්දැයි සිතමින්, සිය දැවැන්ත කළු අත්තටු විදහා අහසේ පියාඹමින් මුවින් ගිණිදැල් විහිදමින් සිටි අයුරු මනසේ ඇඳගන්නට තැත් කරමින් ඔහු බොහෝ වේලාවක් ගත කලේ ය.

ඔහු ගේ පුරාණ මී මුත්තා, කාර්ස්ටලී රොක්හි ලොරේන් රජතුමා ඒ බව සියැසින්ම දැක තිබින. රීච්හි රජතුමා වූ මර්න් හා එක්ව ටාර්ගේරියන් ආක්‍රමණයට විරුද්ධව සටන් කල ඔහු ඒ ගිනිදැල්වල බලය අත් විඳ තිබින. ඒ වනාහි මීට වසර තුන්සියයකට පෙර, රාජධානි සප්තකය යනු විශාල රාජ්‍යයක ප්‍රාන්තයන් නොව සත්‍ය රාජධානි සප්තකයක් වූ කාලය විය. මේ රජවරුන් දෙදෙනා යටතේ වංශවතුන් හයසියයක්, අශ්වාරෝහක නයිට්වරුන් පන්දහසක් හා එමෙන් දසගුණයක් පමණ වූ සෙබළුන් පිරිසක් යුධට බැස තිබින. ප්‍රවාදවලට අනුව මකරාධිපතියන් සතුව සිටියේ එයින් පහෙන් එකකටත් අඩු හමුදාවක් විය. එයිනුත් වැඩි පිරිස ඒගොන් විසින් ඊට පෙර මරාදමන ලද රජතුමා ගේ සෙබළුන් වූ අතර මකරාධිපතියන් කෙරෙහි ඔවුන් ගේ පක්ෂපාතීත්වය අවිනිශ්චිත විය.

රීච්හි සුවිසල් තැනිතලා භූමියේ රන්වන් කරළින් පිරි තිරිඟු යායවල් මධ්‍යයේ මේ හමුදා දෙක එකිනෙක සම්මුඛ වූහ. රජුන් දෙදෙනා සිය ඒකාබද්ධ ප්‍රහාරය එල්ල කල විට තැතිගත් ටාර්ගේරියන් හමුදා සීසීකඩ දුවන්නට පටන් ගත්හ. ප්‍රවාද වලට අනුව එක් ස්වල්ප මොහොතකට ඒකාබද්ධ හමුදා සටනින් ජයගත් බැව් පෙනින. ඒගොන් ගේ ආක්‍රමණයේ අවසානය එය වූ බැව් පෙනින. එහෙත් ඒ එක් මොහොතකට පමණි. ඊළඟ මොහොතේ ඒගොන් ටාර්ගේරියන් සිය සොයුරියන් දෙදෙනා සමග සටන් බිමට පිළිපන්නේ ය.

වේගාර්, මෙරැක්සීස් හා බැලේරියන් මකරුන් තිදෙනාම එකවර සටනක් වෙනුවෙන් යෙදවූ මුල්ම හා එකම අවස්ථාව එය විය. කවීන් විසින් එය 'ගිනිගත් කෙත' යනුවෙන් හඳුන්වනු ලබන අතර ඒ වෙනුවෙන් ගී හා සැහැලි රැසක් බිහිවී ඇත.

භාරදහසකට ආසන්න පිරිසක් එදින පිළිස්සී මියගියහ. රීච්හි මර්න් රජතුමා ද ඒ මියගියවුන් අතර විය. පැරැදී පළා ගිය ලොරේන් රජතුමා ටාර්ගේරියන්වරුන්ට යටත් භාවය ප්‍රකාශ කර සිටියේ තව බොහෝ කලක් - තම වංශය නොනැසී පවත්වාගෙන යාමට පුතකු ලබන තෙක් - යටත් පාලකයකු වශයෙන් කාර්ස්ටලී රොක්හි අධිපති බව දැරීය. ඒ වෙනුවෙන් ටිරියන් සිය මී මුත්තාට බෙහෙවින් කෘතඥ විය.

-----------------------------------------------

"ඇයි ඔබ ඔච්චර පොත් කියවන්නෙ?"

හිස ඔසවා බැලූ ටිරියන් දුටුවේ අඩි කිහිපයක් දුරින් සිටගෙන තමා දෙස කුතුහලයෙන් බලා සිටිනා ජොන් ස්නෝව් ය. "මා දිහා බලලා කියහං බලන්ට උඹට මොනවද පේන්නෙ කියලා."

කොළුවා ඔහු දෙස සැකමුසු බැල්මක් හෙලීය. "මේක මොකක් හරි විහිළුවක්ද? මට ඔබව පේනවා. ඔබ ටිරියන් ලැනිස්ටර්."

ටිරියන් සුසුමක් හෙලී ය. "උඹ බොහොම ආචාරසම්පන්නයි ස්නෝව්. උඹට පේන්නෙ කුරුමිට්ටෙක්. උඹේ වයස කීයද? දොලහක්?"

"දාහතරයි."

"දාහතරයි. හරි. උඹ දැනටමත් මට වඩා උසයි. මට කවදාවත් යන්න බැරි තරම් උසයි. මගේ කකුල් කොටයි, බකලයි. මට ඇවිදින්ට අමාරුයි. මගේ අශ්වයගෙ පිටෙන් නොවැටී ඉන්ට මම විශේෂයෙන් හදපු සැදලයක් පාවිච්චි කරන්ට ඕන. උඹට ඇත්තම කියනවානම් ඒකත් මගේම සැලසුමකට අනුව හදවගත්ත එකක්. එහෙම කලේ නැත්තම් මට පෝනියෙක් පිටේ තමා යන්ට වෙන්නෙ. මගේ අත් දෙක ශක්තිමත් තමා, ඒත් ඒවත් කොටයි. මට කවදාවත් කඩු හරඹ කාරයෙක් වෙන්ට බෑ. මම පිටිසර ගැමියෙක් විදියට ඉපදුනානම් උං මාව මැරෙන්ට ඇරලා කොහේ හරි දාලා යන්ට තිබ්බා. එහෙමත් නැත්තම්

මිනිස්සුන්ට විනෝදය සපයන්ට කියලා වහල් වෙළෙන්දුන්ට විකුණන්ට තිබ්බා. ඒත් අවාසනාවට මම ඉපදුනේ කාර්ස්ටලී රොක්වල ලැනිස්ටර් කෙනෙක් විදියට. ඉතිං මිනිස්සු මගෙන් යමක් බලාපොරොත්තු වෙනවා. මගේ තාත්තා අවුරුදු විස්සක් රජ්ජුරුවන්ගෙ හස්තය විදියට සේවය කලා. මගේ සහෝදරයා පස්සෙ ඒ රජ්ජුරුවන්ව මරලා දැම්මා. මගේ සහෝදරී අලුත් රජ්ජුරුවන්ව කසාද බැන්දා. මගේ කැත බෑනා ඊළඟට රජ වෙයි. ඉතිං උඹට හිතෙන්නෙ නැද්ද මමත් මගේ පරම්පරාවෙ ගෞරවය වෙනුවෙන් යමක් කරන්ට ඕනැයි කියලා? ඒත් කොහොමද? මගේ කකුල් දෙක පොඩි වුනාට මගෙ ඔළුව ලොකුයි. මට හොඳ පැහැදිලි අවබෝධයක් තියෙනවා මොනවද මගෙ හැකියාවන්, මොනවද මගෙ දුර්වලකම් කියන එක ගැන. මගේ මනස තමා මගේ ප්‍රධානම ආයුධය. මගේ සහෝදරයට එයාගෙ කඩුව තියෙනවා. රොබර්ට් රජ්ජුරුවන්ට එයාගෙ යගදාව තියෙනවා. මට මගේ මනස තියෙනවා... කඩුවක් මුවහත් කරන්ට ගිනිගලක් තියෙන්ට ඕන වගේ මනසක් මුවහත් වෙන්ට පොත් තියෙන්ට ඕන." ටිරියන් සිය අතේ ඇති පොතේ සමින් බැඳුනු කවරයට තට්ටුවක් දැම්මේ ය. "අන්න ඒකයි මම මෙච්චර පොත් කියවන්නෙ ජොන් ස්නෝව්."

කොළුවා මේ සියල්ල නිශ්ශබ්දව අවබෝධ කරගත්තේ ය. ඔහුට ස්ටාර්ක් නාමය ලැබී නොතිබුනු නමුදු ඒ දිගැටි, සන්සුන් ස්ටාර්ක් මුහුණුවර ලැබී තිබින. සිත ඇතුළේ ඇත්තේ කුමක්දැයි පිටතට නොපෙන්වා සියල්ල සඟවාගන්නා මුහුණක්! ඔහු ගේ මව කවරෙකු වුනත් ඇගෙන් ඔහුට කිසිවක් ලැබී නැතිවා සේ ය. "ඔබ මොකක් ගැනද ඔය කියවන්නෙ?" ඔහු ඇසීය.

"මකරුන් ගැන."

"මොකක්ද ඒ ගැන කියවන එකෙන් ඇති වැඩේ? මේ ලෝකෙ තවදුරටත් මකරු ඉතිරිවෙලා නෑ."

"මිනිස්සු එහෙම තමා කියන්නෙ." ටිරියන් පිළිතුරු දුනි. "හරිම දුකයි, එහෙම නේද? මම උඹේ වයසෙ ඉන්නකොට හීන දැක්කා මගේම මකරෙක් අයිති කරගැනීම ගැන."

"ඔබ එහෙම කලාද?" කොළුවා සැකමුසු ස්වරයෙන් ඇසීය. සමහරවිට ටිරියන් ඔහුට විහිළු කරනවා වනැයි ඔහු සිතන්නට ඇත.

"ඇත්තටම. කුරු, බකල ගැහිච්ච, කැත කොල්ලෙකුට වුනත් මකරෙකුගෙ පිටේ නැග්ගහම ලෝකය දිහා උඩ තැනක ඉඳන් බලන්ට පුළුවන්." පොරවාගෙන සිටි ඇතිරිල්ල පසෙකට කල ටිරියන් නැගිට සිටියේ ය. "මම කාර්ස්ටලී රොක් ඇතුළෙ ගිනි ගොඩවල් ගහලා ඒ දිහා පැය ගනන් බලා ඉන්ට පුරුදුවෙලා හිටියා. මම හිතුවා ඒ තියෙන්නෙ මකරාග්නිය කියලා. සමහර වෙලාවට මම හිතේ මවාගත්තා මගේ තාත්තා ගිනිගන්න විදිය. සමහර වෙලාවට මගේ සහෝදරී." ජොන් ස්නෝව් ඔහු දෙස බලාගෙන සිටියේ අඩක් භීතිය හා අඩක් විමතිය මුසු වූ බැල්මකිනි. ටිරියන් කොක්හඬලා සිනාසුනේ ය. "ඔය විදියට මා දිහා බලන්ට එපා කොල්ලො. මම දන්නවා උඹේ රහස. උඹත් මේ විදියෙ හීන දකින්ට පුරුදුවෙලා හිටියා නේද?"

"නෑ! මම එහෙම...."

"නෑ? කවදාවත්ම?" ටිරියන් ඇහි බැම ඉස්සී ය. "කිසිම සැකයක් නෑ එහෙමනම් ස්ටාර්ක්ලා උඹට බොහොම හොඳට සලකලා තියෙනවා. මට විශ්වාසයි ස්ටාර්ක් ආර්යාව උඹට එයාගෙම දරුවෙක් විදියට සලකන්ට ඇති. එතකොට උඹෙ සහෝදරයා රොබ්, උඹට හැම තිස්සෙම කරුනාවන්ත වෙන්ට ඇති. එහෙම වෙන්ට එපැයි. එයාට වින්ටර්ෆෙල් හිමිවෙනවා, උඹට ප්‍රාකාරෙ හිමිවෙනවා. එතකොට උඹෙ තාත්තා... එයාට බොහොම හොඳ හේතුවක් තියෙන්ට ඇති උඹව මෙහෙම නිශා රැකුමට පටවලා එවලා අත පිහිදගන්ට."

"ඕක නවත්තන්ට!" ජොන් ස්නෝව් කේන්තිය නිසා රතු වූ මුහුණෙන් යුතුව පැවසී ය. "නිශා රැකුම කියන්නෙ බොහොම උදාර දෙයක්."

ටිරියන් මහ හඬින් සිනාසුනේ ය. "ඒ කියමන විශ්වාස කරන්ට තරම් උඹ මෝඩයෙක් නෙවෙයි. නිශා රැකුම කියන්නෙ රාජධානියෙ ඉන්න ඔක්කොම නරක එවුන් එකට එකතු වෙන තැනක්. මම දැක්කා උඹ යොරේනුයි උගෙ අර කොල්ලො දෙන්නයි දිහා බලන විදිය. ඔය තමා උඹෙ අලුත් සහෝදරයො ජොන් ස්නෝව්. උඹට මොකක්ද ඒ ගැන හිතෙන්නෙ? බුම්මගත්ත ගැමියොයි, ණයකාරයොයි, හොර දඩයක්කාරයොයි, ස්ත්‍රී දූෂකයොයි, හොරුයි, උඹ වගේ අවජාතකයොයි. මේ හැමෝම ප්‍රාකාරෙ එකතු වෙලා යක්කුයි, පිශාචයොයි උඹලගෙ ආයම්මලා කියලා දීපු අනිත් භූතයො හැම එකාමයි එනකං

රක ගෙන ඉන්නවා. එක හොඳකට තියෙන්නෙ ඔය යක්කුයි පිශාචයොයි ඇත්ත එවුන් නෙවෙයි. ඒක නිසා ඒ රාජකාරිය එච්චර භයානක එකක් නෙවෙයි. නරකකට තියෙන්නෙ උඹලා හීතලෙන් ගල් වෙලා මැරිලා යන එකයි."

"ඕක නවත්තපං!" කොළුවා බෙරිහන් දුන්නේ ය. මිට මොලවා ගත් දෑතින් හා හැඩුම්බර මුහුණින් යුතුව ඔහු අඩියක් ඉදිරියට තැබීය. ටිරියන්ට වරදකාරී හැඟීමක් දැනෙන්නට විය. ඔහු ද පෙරට පියවරක් තැබුවේ සැනසුම් සහගත වදනක් කියා කොළුවාව අස්වැසීමේ අරමුනිනි.

ඔහු කිසිවිටෙකත් වෘකයාව නොදිටී ය. ඌ සිටියේ කොහේද, ඔහු වෙතට පැමිණියේ කෙසේද යන්න නොදත්තේ ය. එක් මොහොතක ඔහු ස්නෝව් දෙසට පිය මනිමින් සිටි අතර ඊළඟ මොහොතේ බිම උඩු බැල්ලෙන් වැටී සිටියේ ය. අතින් පොත විසිවී ගිය අතර හදිසි කම්පනය නිසා හුස්ම හිරවී ගියේ ය. ඔහු ගේ මුව පස්, ලේ හා වියළි කොළ වලින් පිරී ගියේ ය. ටිරියන් නැගී සිටීමට උත්සාහ කල නමුත් වේදනාත්මක අයුරින් කොන්ද ඇදුම් කන්නට විය. වැටීම නිසා කොන්ද උළුක්කු වුනා වන්නට ඇත. දත්මිටි කමින් ගසක මුලක් අල්ලාගත් ටිරියන් අඩක් ඉස්සුනේ ය. "මට උදවු කරන්ට." ඔහු කීවේ කොළුවා දෙසට අතක් දිගු කරමිනි.

එසැනින් වෘකයා ඔවුන් දෙදෙනා මැදට පැන්නේ ය. ඌ ගෙරෙවුවේ නැති අතර දත් විලිස්සා සිය දීප්තිමත් රතු පැහැ දෑසින් ඔහු දෙස බලා සිටියා පමණි. අමනාපයෙන් උගුරෙන් හඬක් පිටකල ටිරියන් නැවත පොළොවේ දිගා වුනේ ය. "හරි හරි. මට උදවු කරන්ට ඕන නෑ. උඹ මෙතනින් යනකං මම මෙහෙමම ඉන්නම්."

ජොන් ස්නෝව් සිනාසෙමින් ගෝස්ට් ගේ සුදු පැහැ ලොම් පිරිමැද්දේ ය. "උදවු ඕන නම් හොඳින් අහන්ට."

සිත තුළ කේන්තිය නැග එනු ටිරියන්ට දැනුනු මුත් ඔහු මහත් වෑයමකින් එය යටපත් කර දැමීය. සිය ජීවිතයේ මෙසේ අවඥාවට භාජනය වූ මුල්ම අවස්ථාව මෙය නොවන අතර අවසන් අවස්ථාවද මෙය නොවනු ඇත. සමහරවිට ඔහු මීට සුදුසු වන්නට ඇත. "ඔබ මට කරුනාවෙන් උදවු වෙනවා නම් මම කෘතඥ වෙනවා ජොන්." ඔහු මෘදු ස්වරයෙන් කීවේ ය.

"ගෝස්ට්. වාඩිවෙන්ට." කොළුවා කීවේ ය. සෝරවෘකයා සිය පසුපස දෙපා මතින් වාඩි වූ මුත් ඒ රතු පැහැ දෑස් කිසිවිටෙකත් ටිරියන් වෙතින් මෑත් වූයේ නැත. ඌ වටා පැමිණි ජොන් ටිරියන් ගේ කිහිලි යටින් දෑත් දමා ඔහුව දෙපයින් නැගිට්ටෙවුවේ ය. ඉන්පසු බිම වැටී තිබුනු පොත අහුලා දුන්නේ ය.

"ඇයි ඌ මට පහර දුන්නෙ?" ටිරියන් ඇසුවේ වෘකයා දෙස හොරෙන් බැල්මක් හෙලමිනි. ඔහු සිය පිටි අත්ලෙන් මුවේ තැවරී තිබුනු පස් හා ලේ පිස දැමී ය.

"සමහරවිට ඌ හිතුවද දන්නෙ නෑ ඔබ පිශාචයෙක් කියලා."

"දෙයියම්පා! මම හිතන්නෙ මාව පිශාචයෙක් වගේ තමා පේනවා ඇත්තෙ. ඌ යක්කුන්ට මොකක්ද කරන්නෙ?"

ඔබට ඒක දැනගන්ට ඕන වෙන එකක් නෑ." වයින් පිරුනු සම් මල්ල අහුලාගත් ජොන් එය ටිරියන්ට දිගු කලේ ය.

මූඩිය විවර කල ටිරියන් හිස ඇල කර දීර්ඝ වයින් උගුරක් බීවේ ය. සීතල වයින් උගුර කිති කවමින් පහළට ගලා ගොස් උදරය උණුසුම් කලේ ය. ඔහු මල්ල ජොන් දෙසට දිගු කලේ ය. "පොඩ්ඩක් ගන්නවද?"

මල්ල අතට ගත් කොළුවා පරිස්සමෙන් උගුරක් බීවේ ය. "ඒක ඇත්ත. එහෙම නේද? ඔබ නිශා රැකුම ගැන කියාපු දේ."

ටිරියන් හිස වැනී ය.

ජොන් ස්නෝව් කට ඇද කලේ ය. "ඒක එහෙම නම්, ඒක එහෙම වෙච්චාවෙ."

ටිරියන් ඔහු දෙස බලා විරිත්තී ය. "ඒක හොඳයි කොල්ලො. ගොඩක් මිනිස්සු කැමැතියි ඇත්තට මූන දෙන්නෙ නැතුව හැංගෙන්ට. ඒක බොරුයි කියලා කියන්ට."

"ගොඩක් මිනිස්සු. ඒත් ඔබ එහෙම කරන්නෙ නෑ."

"නෑ. මම එහෙම කරන්නෙ නෑ." ටිරියන් බිම වැටී තිබුනු සම් ඇතිරිල්ල අහුලා ගත්තේ ය. "යමු. උඹේ මාමා අපිව හොයන්ට එන්ට කලින් කඳවුරට යමු."

කඳවුර දැකීමම ඇසට සතුටක් ගෙන ආවේ ය. අත්හැර දැමූ පැරැණි බලකොටුවක බිඳ වැටුනු තාප්පයට එදිරිව කඳවුරු ගසා තිබුනු නිසා එයට සීත සුළඟින් මුවාවක් ලැබින. අශ්වයින්ට සාත්තු කර තිබුනු අතර ගින්න බුර බුරා ඇවිළුනි. යොරේන් ගලක් අසල වාඩි වී සිටියේ ලේනෙකු හම ගසමිනි. කටට කෙල උනන ඉස්ටුවක සුවඳ ටිරියන් ගේ නැහැ පුඩුවලට දැනුනි.

බෙන්ජින් ස්ටාර්ක් සිය කූඩාරම තුළින් පිටතට ආවේ ය. "මේ ඉන්නෙ. ජොන් උඹ නං යකාට යන්ට ඕන. ඔහොම තනිපංගලමේ යන්ට එපා. මම හිතුවෙ අනික් එවුන් උඹව අරන් ගිහින් කියලා."

"අනික් එවුන් නෙවෙයි, පිශාචයො." ටිරියන් සිනාසෙමින් කීවේ ය. ජොන් ස්නෝව් මඳ සිනාවක් මුවට නගා ගත්තේ ය. ස්ටාර්ක් අන්දමන්ද වූ බැල්මක් යොරේන් දෙසට හෙලූ අතර මහළු මිනිසා උගුරෙන් හඬක් නිකුත් කර, දෙවුර අකුලා නැවතත් කරමින් සිටි කාර්යයට ඇස යෙදවී ය.

ඒ රැයේ ගිනිමැලය වටා වාඩි වූ ඔවුහු ඉස්ටුවත් සමග කළු පාන් හා දැඩි චීස් අනුභව කලහ. ටිරියන් සිය වයින් සම් මල්ල සියල්ලන් සමගම හුවමාරු කරගත්තේ ය. ඉන්පසු රාත්‍රියේ පළමු මුරකිරීම භාර වී තිබුනු ජොන් ස්නෝව් පමණක් අවදිව සිටිද්දී එකින් එකා නින්දට වැදීම පිනිස සිය කූඩාරම් තුළට වන්හ.

සුපුරුදු පරිදි සියල්ලන්ටම පසුව නින්දට ගියේ ටිරියන් වූ අතර සිය කූඩාරම වෙතට පිය මනිද්දී ඔහු මොහොතක් නැවතී ජොන් දෙස බැල්මක් හෙලී ය. ගිනිමැලය අසල සිටගෙන සිටි කොළුවා බුර බුරා නැගෙන ගිනි දැල් දෙස දැඩි කරගත් මුහුණින් හා ගැඹුරු බැල්මක් ඇති දෑසින් බලාගෙන සිටියේ ය.

දුක්මුසු සිනහවක් පහළ කල ටිරියන් ලැනිස්ටර් නින්දට වන්නේ ය.

Tyrion Lannister: “Most men would rather deny a hard truth than face it.”

කැට්ලින්

නෙඩ් සහ දරුවන් පිටව ගොස් දින අටකට පසු රාත්‍රියේ මේස්ටර් ලුවින් ඇය හමුවීම පිනිස පැමිණියේ ය. ඔහු ගේ එක් අතක පහනක් ද අනිත් අතේ ආදායම් වියදම් වාර්තාවක් ද විය. "මේ ගනන් මිනුම් ටික ගැන බලන්ට ඕන කාලෙ හොඳටම පහුවෙලා මගේ ආර්යාවනි. ඔබ සතුටු ඇති මේ රාජකීය සංචාරය නිසා අපට කොච්චර වියදම් වෙලා තියෙනවද කියලා දැනගන්ට."

ලෙඩ ඇඳේ වැතිරී සිටිනා බ්‍රැන් දෙස බැල්මක් හෙලූ කැට්ලින් ඔහු ගේ නළලට වැටී තිබුනු කෙස් රොදක් අතින් පිසදා හැරියා ය. ඔහු ගේ කොණ්ඩය දිගට වැවී තිබුනු අතර ඉක්මනින්ම එය කපා දැමිය යුතු යැයි ඇය සිතුවා ය. "මට ඔය ගනන් මිනුම් ගැන බලන්ට කිසිම ඕනකමක් නෑ මේස්ටර් ලුවින්." ඇය පිළිතුරු දුන්නේ බ්‍රැන් වෙතින් දෑස් මැත් නොකර ය. "මම දන්නවා ඒ සංචාරය නිසා අපට මොනවද වියදම් වුනේ කියලා. ඔය පොත් ටිකත් අරන් යන්ට."

"මගේ ආර්යාවනි, රජතුමාගෙ පිරිවර සෑහෙන්න කාලා බීලා තියෙනවා. අපි ඉක්මනටම ආයෙමත් අපේ ගබඩා පුරවගන්ට ඕන-"

"මම කිවුවෙ ඔය පොත් ටිකත් අරන් මෙතනින් යන්ට කියලයි. නිවාස බාරකාරයා ඔය දේවල් ගැන හොයලා බලයි."

"අපට නිවාස බාරකාරයෙක් නෑ. පූල් දකුණට ගියා එඩාර්ඩ් උතුමානන් එක්ක කින්ග්ස් ලැන්ඩින්ග්වල එතුමාගෙ නිවාස රාජකාරි බාරගන්ට."

"ආහ්! ඔවු. මට දැනුයි මතක් වුනේ." බ්‍රැන් බොහෝ සෙයින් සුදුමැලි වී ඇතැයි ඈ සිතුවා ය. ඔවුන් ඔහු ගේ ඇඳ කවුළුව අසලට ගෙන ගියහොත් සමහරවිට ඔහුට උදා හිරු එළිය ලැබෙනු ඇත.

දොර අසල තිබුනු පහන් රඳවනයක සිය පහන රැඳවූ මේස්ටර් ලුවින් මඳක් තාවර වුනේය. "අපි හැකි ඉක්මනින් කරන්ට ඕන පත්කිරීම් වගයක් තියෙනවා මගේ ආර්යාවනි. නිවාස බාරකාරයාට අමතරව අපට ඕන ජොරී වෙනුවට මාලිගාරක්ෂක බලකායට අලුත් ප්‍රධානියෙක්. එතකොට, අස්හලට අලුත් ප්‍රධානියෙක්-"

"අස්හලට ප්‍රධානියෙක්?"

"එහෙමයි මගේ ආර්යාවනි. හලන් දකුණට ගියා එඩාර්ඩ් උතුමානන් එක්ක. ඒ නිසා-"

"මගේ පුතා මෙතන අත පය බිඳිලා මැරෙන්ට වැටිලා ඉන්නවා ලුවින්. ඒ අස්සෙ ඔබ එනවා අලුත් නිවාස බාරකාරයෙක් පත්කරන එක ගැන කතාකරන්ට. ඔබ හිතනවද ඉස්තාලවල මොකක් වුනත් ඒකෙන් මට වැඩක් තියෙනවය කියලා? වින්ටර්ෆෙල්වල ඉන්න හැම අශ්වයෙක්ම මම බොහොම සන්තෝසයෙන් මගෙ අතින්ම මරලා දාන්නම් ඒකෙන් බ්‍රැන්ට සනීප වෙනවනම්. ඔබට ඒක තේරුනාද?"

ඔහු හිස පහත් කලේ ය. "එහෙමයි මගේ ආර්යාවනි. ඒ වුනත් මේ පත්කිරීම්-"

"මම ඒ පත්කිරීම් ගැන බලන්නම්." රොබ් කීවේ ය.

ඔහු ඇතුළුවන හඬ කැට්ලින්ට නොඇසුනද රොබ් දොරකඩ සිට ඈ දෙස බලා සිටියේ ය. තමා මහහඬින් ලුවින්ට කෑ ගැසුවා වන්නට ඇතැයි කැට්ලින් ලැජ්ජාවෙන් කල්පනා කලා ය. ඇයට මේ කුමක් සිදු වී ද? ඇයට නිතරම දැඩි විඩාවක් දැනෙන්නට වූ අතර සැමවිටම දැඩි හිසරදයකින් ද පෙලුනා ය.

කැට්ලින් දෙසින් හිස හැරවූ මේස්ටර් ලුවින් රොබ් දෙස බැලී ය. "මම ලැයිස්තුවක් හැදුවා, මේ තනතුරුවලට අලුතෙන් පත් කරන්ට සුදුසුයි කියලා මම හිතපු." ඔහු කීවේ සාක්කුවකින් ගත් කොළ කැබැල්ලක් රොබ් වෙතට පිරි නමමිනි. ඇගේ පුතා ඒ ලැයිස්තුව දෙස බැල්මක් හෙලී ය. "මේ අය හොඳ මිනිස්සු. අපි මේ ගැන හෙට කතා කරමු." ඔහු ලැයිස්තුව නැවත මේස්ටර් අතට බාර දුනි.

"බොහොම හොඳයි මගෙ උතුමානනි."

"ඔබ දැන් පිටවෙලා යන්ට." රොබ් කීය. හිස නැමූ මේස්ටර් ලුවින් පිටවී ගියේ ය. ඔහුට පිටුපසින් දොර වැසූ රොබ් ඈ දෙසට හැරුනේ ය. ඔහු ඉණ පැළැඳි අසිපත ඇය නිරීක්ෂණය කලා ය. "අම්මා! ඔයා මොකක්ද මේ කරන්නෙ?"

රොබ් ගේ විලාසය තමා වැනිම වී යැයි කැට්ලින් සෑමවිටම කල්පනා කලා ය. ඔහුටත් ටලී වරුන්ට මෙන් රතු-දුඹුරු කෙස් හා නිල් ඇස් තිබින. එනමුදු සිය දිවියේ ප්‍රථම වරට අද දින ඈ ඔහු ගේ මුහුණුවර තුළින් එඩාර්ඩ් ස්ටාර්ක් දිටී ය. උතුර මෙන්ම දැඩි පරුෂ මුහුණක්! "මම මොකක්ද කරන්නෙ? ඔයා කොහොමද එහෙම දෙයක් අහන්නෙ? ඔයා මොකක්ද හිතන්නෙ මම මොනවා කරනවා කියලා? මම ඔයාගෙ සහෝදරයා ගැන හොයා බලනවා. මම බ්‍රැන් ගැන හොයා බලනවා."

"ඔයා හිතන්නෙ ඔයා එහෙම කරනවා කියලද? බ්‍රැන්ට තුවාල වුන දවසෙ ඉඳන් ඔයා මේ කාමරෙන් පිටවුනේ නෑ. තාත්තලයි නංගිලයි දකුණට පිටත්වෙලා යද්දී ඔයා අඩු ගානෙ ගේට්ටුව ගාවට ආවෙවත් නෑ."

"මම එයාලට මෙතන ඉඳන් ආයුබෝවන් කිවුවා. එයාලා පිටත් වෙලා යන හැටි කාමරේ ජනේලෙන් බලන් හිටියා." දකුණුකරය බලා පිටත් වී නොයන්නැයි ඇය නෙඩ් ගෙන් බැගෑපත්ව අයැද සිටියා ය. විශේෂයෙන්ම මේ සිදුවීමෙන් පසු සෑම දෙයක්ම වෙනස් නොවී ද? ඔහු එය නොදකින්නේ මන්ද? එනමුදු තමා ගත් තීරණය වෙනස් කල නොහැකි බවත් තමාට වෙනත් විකල්පයක් නොමැති බවත් නෙඩ් ඇයට කියා සිටියේ ය.

"මට එයාව තනියම මෙතන දාලා යන්ට බෑ. මොහොතකටවත් බෑ. ගතවෙන හැම මොහොතක්ම එයාගෙ අන්තිම මොහොත වෙන්ට පුළුවන්. මට මෙතන ඉන්ට ඕන එයා.. එයා.." සිය පුත්‍රයා ගේ අප්‍රාණික අත සිය සුරතින් ගත් ඇය එහි ඇඟිලි අතර සිය ඇඟිලි රුවා ගත්තා ය. ඔහු කෙතරම් කෙට්ටුද. කෙතරම් දුර්වලද. ඔහු ගේ සිරුරේ ශක්තිය බිඳක්වත් ඉතිරිව නැත්තා සේ ය. එනමුදු ඔහු ගේ සම තුළින් ගලා එන ජීවයේ උණුසුම ඇගේ අතට දැනින.

රොබ් ගේ ස්වරය මෘදු විය. "එයා මැරෙන්ට යන්නෙ නෑ අම්මෙ. මේස්ටර් ලූවින් කිව්වනෙ අනතුරුදායක කාල සීමාව පහුකරලයි තියෙන්නෙ කියලා."

"මේස්ටර් ලූවින් වැරදිනම් මොකද කරන්නෙ? බ්‍රෑන්ට මාව ඕන වුන වෙලාවක මම මෙතන නොහිටියොත් මොකද වෙන්නෙ?"

"රිකන්ටත් ඔයාව ඕන." රොබ් තියුණු හඬින් කීවේ ය. "එයාට තවම අවුරුදු තුනයි. එයාට මෙලෝ දෙයක් තේරෙන්නෙ නෑ මොනවද මේ වෙන්නෙ කියලා. එයා හිතන්නෙ හැමෝම එයාව දාලා ගිහිල්ලා කියලයි. ඉතින් එයා දවස තිස්සෙම මා පස්සෙන් එල්ලීගෙන එනවා, අඬ අඬා මගෙ කකුලෙන් ඇද ඇද. මම දන්නෙ නෑ එයත් එක්ක මොනා කරන්ටද කියලා." මඳකට නැවතුනු ඔහු යටි තොල හපාගත්තේ ය. "ඒ විතරක් නෙවෙයි අම්මෙ, මටත් ඔයාව ඕන. මම උත්සාහ කරනවා. ඒත් මට බෑ.. මට බෑ මේ හැම දෙයක්ම තනියෙන් කරන්ට." හැඟුම්බර වීම නිසා ඔහු ගේ හඬ බිඳී ගියේ ය. ඔහු තවමත් අවුරුදු දහහතරක කොළු ගැටයෙකු බව කැට්ලින්ට සිහිපත් විය. නැගිට ඔහු වෙතට යාමට උවමනා වුවත් ඇගේ අතැඟිලි බ්‍රෑන් ගේ අතැඟිලි හා පැටලී තිබින.

කවුළුවට එපිටින් වෘකයෙකු උඩුබුරලන්නට විය. එක් තත්පරයකට කැට්ලින් වෙවුලා ගියා ය.

"ඒ බ්‍රෑන්ගෙ එකා." කවුළුව විවර කල රොබ් සීතල රාත්‍රී වාතයට කාමරය තුළට ඒමට අවකාශ සලසා දුන්නේ ය. උඩුබුරලෑම වඩාත් වැඩි හඬකින් නැගෙන්නට විය. එය තනිකම, සීතල, දුක හා බලාපොරොත්තු විරහිත බව යන සියල්ල එකට කැටි වූ හඬක් විය.

"අනේ එපා. බ්‍රෑන්ට උණුසුම තියෙන්ට ඕන."

"උං සින්දු කියන හඬ එයාට ඇහෙන්ට ඕන." රොබ් කීවේ ය. වින්ටර්ෆෙල්හි කොහේදෝ සිට තවත් වෘකයෙක් පළමුවැන්නා ගේ හඬ ගැමට එක් විය. ඊළඟට තුන්වැන්නෙක්. "ෂැගී ඩෝගුයි ග්‍රේ වින්ඩ්‍ුයි. ඔයා පරිස්සමෙන් අහන් හිටියොත් ඔයාට වෙනස තේරෙයි."

කැට්ලින් වෙවුලන්නට විය. දුක, සීතල හා වෘකයින් ගේ උඩුබුරලෑම විසින් ඇයව අඩපණ කොට තිබින. ගතවුනු සෑම රැයක් පාසාම මේ උඩුබුරලෑමත්, සීත සුළඟත්, හිස් අඳුරු බලකොටුවත් විසින් ඇගේ පීඩනය මුව විට තෙක් පුරවා තිබින. ඇගේ කොළු පැටියා සිදී බිඳී ගොස් මැරෙන්නට වැටී සිටියි. ඇගේ දරුවන් අතරින් ආදරණීයම හා කරුනාවන්තම දරුවා. සිනාසෙන්නටත් ඉහළ නගින්නටත් ආසා කල බ්‍රැන්. නයිට්වරයකු වීමට සිහින මැවූ බ්‍රැන්. මේ හැම දෙයක්ම දැන් ඉතින් නැති වී ගොසිනි. ඔහු සිනාසෙන හඬ ඇයට නැවත කිසිදා අසන්නට නොලැබෙනු ඇත. ඉකි බිඳිමින් සිය දෑත් බ්‍රැන් ගේ දෑතින් මුදා ගත් කැට්ලින් උඩුබුරලෑම් නෑසෙන සේ සිය දෙසවන් දෑතින් වසා ගත්තා ය. "උංව නවත්තන්ට." ඇය හඬමින් කීවා ය. "අනේ උංව නවත්තන්ට. මට ඒක උහුලන් ඉන්ට බෑ. උං ඔක්කොම මරලා දැම්මත් කමක් නෑ. කොහොම හරි කරලා උංව නවත්තන්ට."

ඇය බිම ඇද වැටෙනු කැට්ලින් නොදත්තා ය. ඊළඟ මොහොතේ රොබ් සිටියේ ඇයව ඔසවා කාමරය කෙලවර වූ ඇගේ ඇඳ වෙතට රැගෙන යමිනි. "බය වෙන්ට එපා අම්මා. උං එයාට අනතුරක් කරන්නෙ නෑ. ඔයාගෙ ඇස් දෙක පියාගන්ට. පොඩ්ඩක් විවේක ගන්ට. මේස්ටර් ලුවින් මට කිවුවා බ්‍රැන් වැටුනට පස්සෙ ඔයා නිදා ගත්තෙම නෑ කියලා."

"මට බෑ." ඇය හඬා වැටුනා ය. "දෙයියො මට සමාව දෙන්ට ඕන රොබ්. මට නිදාගන්ට බෑ. මම නිදි අතරෙ එයා මැරුනොත්? එයා මැරුනොත්, එයා මැරුනොත්..." වෘකයෝ තවමත් උඩුබුරලමින් සිටියහ. ඇය යටි ගිරියෙන් කෑ ගසමින් නැවතත් දෙසවන් වසා ගත්තා ය. "අනේ! දෙයියන්ගෙ නාමෙට ජනේලෙ වහන්ට."

"ඔයා මට පොරොන්දු වෙන්ට ටිකක් නිදාගන්නවා කියලා." රොබ් කවුළුව වෙතට ගියේ ය. නමුත් ඒ මොහොතේ වෘකයින් ගේ උඩුබුරලෑමට තවත් හඬක් එකතු විය. "බල්ලො." ඔහු කීවේ ඊට සවන් දෙමිනි. "ඔක්කොම බල්ලො බුරනවා. මේක කවදාවත් වෙලා නැති දෙයක්..." ඔහු අමාරුවෙන් හුස්මක් අදිනු ඇයට ඊළඟ මොහොතේ ඇසිනි. "ගින්නක්." ඔහු මිමිනුවේ ය.

ගින්නක්? බ්‍රැන්! "අනේ මට උදවු කරන්ට." ඇය ඇඳ මත හිඳගත්තා ය. "බ්‍රැන්ව බේරගන්ට මට උදවු කරන්ට."

රොබ්ට ඇයව ඇසුනු බවක් නොපෙනිනි. "පුස්තකාල කුළුණ ගිනි ගන්නවා." ඔහු කීවේ ය.

විවර වූ කවුළුව තුළින් බුර බුරා නැගෙන ගිනි දළු වල රත් පැහැ ආලෝකය කැට්ලින් දුටුවා ය. ඇය සැනසුම් සුසුමක් හෙලුවා ය. බ්‍රැන්ට අනතුරක් නැත. පුස්තකාලය ඇත්තේ තාප්පයට එහායිනි. ගින්න මේ දෙසට පැතිරීමට අවස්ථාවක් නැත. "දෙයියන්ට ස්තූති වේවා!" ඇය මිමිනුවා ය.

රොබ් ඇය දෙස බැලුවේ ඇයට පිස්සු හැදීගෙන එනවාදැයි වැනි බැල්මකිනි. "අම්මෙ, මෙතනම ඉන්ට. මම ඉක්මනටම එනවා ගින්න නිවපු ගමන්ම." කාමරයට පිටතින් සිටි ආරක්ෂක භටයින්ට කෑගසමින් කාමරයෙන් පිටවූ රොබ් අඩියට දෙකට පඩිපෙළ බැස අතුරුදන් විය.

පිටත අංගනයේ කෑගැසීම් ඇසෙන්නට විය. කෑගැසීම්, දිව යන අඩි ශබ්ද, බියපත් වූ අශ්වයින් ගේ හේෂාරවය, බල්ලන් ගේ බිරුම් හඬ. එනමුදු මේ කලබැගෑනිය අස්සේ යම් දෙයක් මග හැරී ඇති බව ඇයට දැනුනි. වෘකයින් සිය උඩුබුරලෑම නවතා තිබින.

දෙවියන් ගේ සප්තාකාරයට ස්තූතිපූර්වක යාඥාවක් මිමිනූ ඈ කවුළුව වෙතට ගියා ය. තාප්පයට එහායින් පුස්තකාල කුළුණේ කවුළු තුළින් ගිනිදැල් විහිදෙමින් තිබින. සියවස් ගනනාවක් තිස්සේ ස්ටාර්ක්වරුන් විසින් එකතු කරන ලද පොත් සම්භාරය ගැන ඇය දුකින් කල්පනා කලා ය. ඉන්පසු කවුළුව වසා දැමුවා ය.

ඇය කවුළුව වෙතින් ආපසු හැරුනු විට මිනිසකු කාමරය තුළ සිටගෙන සිටියේ ය.

"උඹ මෙතන ඉන්ට විදියක් නෑ." ඔහු නොරිස්සුම් මුහුණින් මිමිනී ය. "මෙතන කිසිම කෙනෙක් ඉන්ට විදියක් නෑ."

ඔහු වැරහැලි හැඳගත් අපිරිසුදු කුඩා මිනිසකු වූ අතර ඔහු වෙතින් දැඩිව අශ්ව ගඳ හැමී ය. ඉස්තාලවල වැඩකරන සියළුම මිනිසුන් කැට්ලින් දැන සිටි මුත් මේ එයින් එකෙකු

නොවන බව ඇයට සහතික විය. ඔහුට තඹවන් කෙස් කළඹක් ද වැහැරුනු කෙට්ටු සිරුරක්ද හිමිව තිබූ අතර ඇට පෑදුනු මුහුණේ මලානික ගිලී ගිය ඇස් යුගලක් දැකිය හැකි විය. මේ සියල්ලටම අමතරව ඔහු ගේ අතේ කිනිස්සක් තිබින.

කිනිස්ස දෙස එක්වරක් බැලූ කැට්ලින් බ්‍රැන් දෙස බැලීය. "නෑ." ඇය කීවා ය. එනමුදු ඒ වදන් ඇගේ උගුරේ හිරවුනු අතර පිටතට ඇසුනේ කෙඳිරියක් පමණි.

ඔහුට ඇය ඇසුනා වන්නට ඇත. "ඒක සහනයක් වේවි. ඌ දැනටමත් මැරිලයි ඉන්නෙ."

"නෑ." කැට්ලින් පෙරට වඩා උස් ස්වරයෙන් කීවාය. "උඹට එහෙම කරන්ට බෑ." සැනෙන් ආපසු හැරුනු ඇය කවුළුව වෙතට දිවුවේ උදවු ඉල්ලා කෑගසනු පිනිසය. එනමුදු ඇය සිතුවාටත් වඩා වේගයෙන් මිනිසා ක්‍රියාත්මක විය. මුව වටා තරයේ සිරවී ගිය අතක් විසින් ඇගේ හිස පිටුපසට ඇද්ද අතර අනිත් අතේ වූ කිනිස්ස ඇගේ උගුරුදණ්ඩ කරා පැමිණියේ ය. මිනිසා වෙතින් හැමූ දුර්සන්ධය ඉවසිය නොහැකි තරම් විය.

දැත් විහිදා කිනිසි තලය අල්ලාගත් කැට්ලින් සිය මුළු වැර යොදා එය උගුරෙන් ඈතට තල්ලු කලා ය. කැපුනු අතැඟිලි වලින් සිය දැත් තෙත්වී යනු දැනුනද ඇය සිය ග්‍රහණය බුරුල් නොකලා ය. මුව වටා සිරවුනු අත තව තවත් තද වුනු අතර ඇයට හුස්ම ගැනීම අසීරු වන්නට විය. හිස පසෙකට හැරවූ ඈ මුව අයා සිය දත් අතරට අතේ මාංසය සිරකරගෙන තදින් සැපුවා ය. මිනිසා වේදනාව නිසා උගුරෙන් හඬක් පිට කලේය. කැට්ලින් සිය දත් දෙපෙළ තවත් තද කල අතර ඊළඟ මොහොතේ ඔහු අත අත්හැරියේ ය. මුවට දැනුනු ලේ රස අතරින් ලය පුරා හුස්මක් ගත් කැට්ලින් මහ හඬින් කෑ ගැසුවා ය. ඇගේ කෙස් කළඹින් අල්ලා ගත් මිනිසා ඇයව තමා වෙතින් ඉවතට ඇද්ද අතර පා පැකිළුනු කැට්ලින් බිම ඇද වැටින. මිනිසා තදින් හුස්ම ගනිමින් වෙවුලමින් ඇය අසලින් සිටගෙන සිටි අතර ලෙයින් පෙඟී ගිය තලයෙන් යුතු කිනිස්ස තවමත් ඔහු ගේ සුරතේ සිරවී තිබින. "උඹ මෙතන ඉන්ට විදියක් තිබුනෙ නෑ." ඔහු නැවත නැවතත් කීය.

ඔහුට පිටුපසින් දොර වෙතින් මැත් වූ සෙවනැල්ල කැට්ලින් දුටුවා ය. එය සිහින් කෙඳිරියක් බඳු කණට නෑසෙන තරමේ සියුම් ගෙරවීමක් වූ නමුදු මිනිසාට යමක් ඇසුනා වන්නට ඇත. මක්නිසාද යත් වෘකයා සිය පිම්ම පනින මොහොතේදීම ඔහු ආපසු හැරුනු බැවිනි. ඔවුන් දෙදෙනා බිම වැටී සිටි කැට්ලින් ගේ සිරුරට උඩින් එක පොදියට පෙරලී

ගියහ. යටිගිරියෙන් කල මිනිසා ගේ කෑගැසීම තත්පරයකින් මොහොතක් පමණ ඇසුනු නමුදු ඊළඟ මොහොතේ වෘකයා හිස ගස්සා පස්සට ඇද්දේ මිනිසාගේ උගුරින් අඩක් රැඳී මුවින් යුතුව ය.

ඔහුගෙන් විසිරුනු රුධිරය උණුසුම් වර්ෂාවක් මෙන් සිය මුහුණ තෙමනු කැට්ලින්ට දැනුනා ය.

වෘකයා ඈ දෙස බලා සිටියේ ය. උගේ හොම්බ රත් පැහැ වී තිබුනු අතර මඳ අඳුරු කාමරය තුළ ඒ දෑස් රන්වන් පැහැයෙන් බැබලින. මේ බ්‍රෑන් ගේ වෘකයා බව ඇය හඳුනා ගත්තා ය. "උඹට ස්තූතියි!" ඇය සෙමින් මිමිනුවා ය. ඉන්පසු වෙවුලමින් සිය දෑත් ඉහළට එසෙවුවා ය. සෙමින් සෙමින් ඇය වෙතට පැමින ඇගේ අතැඟිලි ඉව කර බැලූ වෘකයා සිය රළු තෙත් දිවෙන් අතැඟිලිවල වූ රුධිරය ලෙව කන්නට විය. ඇගේ අතැඟිලිවල වූ සියළු රුධිරය ලෙව කා පිරිසිදු කල ඌ නිහඬවම ආපසු හැරී බ්‍රෑන් නිදන ඇඳට නැග ඔහු පසෙකින් වැතිරුනේ ය. කැට්ලින් උන්මාදයකින් මෙන් සිනාසෙන්නට පටන් ගත්තා ය.

Rob Stark: “I need you too. I’m trying but I can’t do it all by myself.”

රොබ්, මේස්ටර් ලුවින් හා සෙර් රඩ්‍රික් සමගින් වින්ටර්ෆෙල්වල සෙබළ මුලුවෙන් බාගයක් කාමරයට කඩා වදිද්දී ඇය සිටියේ දිගටම මෙසේ සිනාසෙමිනි. අන්තිමේදී ඇගේ මුවින් සිනහව තුරන් වී ගිය අතර ඇයව උණුසුම් ඇතිරිලිවල එතූ ඔවුහු මහ බලකොටුවේ ඇගේ නිදන කාමරය වෙත ඇයව කැඳවාගෙන ගියහ. ඇගේ ඇඳුම් ඉවත්කර ඇයව උණුසුම් දියෙන් පිරි නාන තටාකයට බහා ලූ නාකි ආයම්මා තෙත් රෙදි කැබැල්ලකින් ඇගේ සිරුරේ ඇලී තිබුනු රුධිරය පිසදා හැරියා ය.

ඉන්පසු පැමිණි මේස්ටර් ලුවින් විසින් ඇගේ තුවාලවලට ප්‍රතිකාර කරන ලදී. ඇගේ අතැඟිලි වල වූ කැපුම් ඇටය දක්වාම ගැඹුරට විහිද ගොස් තිබින. මිනිසා විසින් ඇගේ හිසකෙස්වලින් ඇදීම නිසා හිස්කබල තුවාල වී ලේ ගලමින් තිබින. වේදනාව අඩු වීම පිනිස හා ඇයට නින්ද යාම පහසු වීම පිනිස මේස්ටර් ලුවින් විසින් ඇයට පොපි යුෂ ලබා දෙන ලදී.

අන්තිමේදී ඇය සිය දෑස් පියා ගත්තා ය.

ඇය නැවතත් දෑස් විවර කල විට ඔවුන් ඇයට පැවසුයේ ඇය එකදිගටම දවස් හතරක් නිදා ගත් බවය. හිස වැනු කැට්ලින් ඇඳ මත හිඳ ගත්තා ය. පසුගිය දින කිහිපය තුළ, බ්‍රැන් වැටුනු දා සිට සිදුවූ සියල්ල සිහිනයක් මෙන් ඇයට හැඟින. එනමුදු දෑතේ නැගුනු වේදනාව ඇයට කීවේ ඒ කිසිවක් සිහිනයක් නොවන බවයි. සිය සිරුරේ බෙලහීන බවක් හා හිසේ අන්දමන්ද ගතියක් දැනුනු නමුදු පුදුමාකාර අන්දමින් ඇයට හැඟුනේ යම් තිරසාර බවක් තම සිත තුළ පැන නැගී ඇති බවයි. එය හරියටම ඈ මත පටවා තිබුනු යම් කිසි බරක් ඉවතට ගත්තාක් මෙනි.

"මට කන්ට පානුයි මී පැණියි අරන් එන්ට." ඇය සිය සේවකයින්ට අණ කලාය. "මේස්ටර් ලුවින්ට පණිවුඩයක් යවන්ට මගේ තුවාලවල වෙළුම්පටි අලුත් කරන්ට කාලෙ හරි කියලා." ඇය දෙස පුදුමයෙන් බැලූ ඔවුහු ඊළඟ මොහොතේ අණ ඉටු කරනු වස් කඩිමුඩියේ පිටව ගියහ.

තමා පසුගිය දින කිහිපය ගෙවූ අයුරු සිහි වූ කැට්ලින් ලැජ්ජාවෙන් ඇකිළී ගියා ය. ඇය ඔවුන් සියලුදෙනාගේම බලාපොරොත්තු සිඳ දමා ඇත. සිය දරුවන් ගේ, සිය සැමියා ගේ, සිය වංශයේ, මේ සියල්ලම! එය නැවත කිසිදා සිදු නොවනු ඇත. අසීරු අවස්ථාවන්හි දී රිවර්රන්හි ටලී වරුන්ට කෙතරම් ශක්තිමත් විය හැකි දැයි ඇය මේ උතුරුකරයේ මිනිසුන්ට පෙන්වා දෙනු ඇත.

ආහාර වලට පළමුවෙන් රොබ් පැමිණියේ ය. ඔහුත් සමග සෙර් රඩ්‍රික් කසලුත් තියන් ග්‍රේජෝයිත් පැමිණියහ. මේ සියල්ලටම පසුව අලුතෙන් පත්කෙරුනු මාලිගාරක්ෂක බලකායේ ප්‍රධානී හැලිස් මොලන් පැමිණියේ ය. සිය පුත්‍රයා සමින් හා මුදු දම්වැල් සන්නාහයෙන් සැරසී අසිපතක් ඉණ පැළඳ සිටින බව ඇය නිරීක්ෂණය කලා ය.

"කවුද ඒ මිනිහා?" කැට්ලින් ඇසුවා ය.

"කවුරුවත්ම ඒ මිනිහගෙ නම දන්නෙ නෑ." හැලිස් මොලන් පිළිතුරු දුනි. "ඌ වින්ටර්ෆෙල්වල මිනිහෙක් නම් නෙවෙයි මයෙ ආර්යාවනි. ඒත් සමහරුනම් කියනවා පහුගිය සති කීපයෙදි මේ මිනිහා බලකොටුවෙ ඉන්නවා දැකලා තිබ්බා කියලා."

"රජතුමාගෙ මිනිහෙක් එහෙමනම්." ඇය කීවා ය. "එහෙමත් නැත්තම් ලැනිස්ටර්ලාගෙ. අනිත් අය පිටවෙලා ගියාට පස්සෙ මිනිහා වහන් වෙලා ඉන්ට ඇති."

"වෙන්ට ඇති." හැලිස් කීවේ ය. "පහුගිය ටිකේ මෙහෙ හිටිය අමුත්තො කන්දරාවෙ හැටියට අපට හරියටම කියන්ට බෑ මේ මිනිහා කාගෙ එකෙක්ද කියලා."

"ඌ ඉස්තාලෙ ඇතුළෙයි හැංගිලා ඉඳලා තියෙන්නෙ." තියන් කීය. "උගෙ ළඟ තිබුනු ගඳෙන් ඒක කියන්ට පුළුවන්."

"කොහොමද කිසිම කෙනෙක් මේ මිනිහව දැක්කෙ නැත්තෙ?" කැට්ලින් තියුණු ස්වරයෙන් ඇසුවා ය.

හැලිස් ලැජ්ජාවට පත් වූ බවක් පෙනින. "එඩාර්ඩ් උතුමානන් දකුණට යද්දි අරන් ගිය අශ්වයොයි අපි නිශා රැකුමට බාරදුන්න අශ්වයොයි ගත්තහම දැන් අපේ ඉස්තාල බාගෙට බාගයක් හිස් වෙලා. ඉතින්, ඉස්තාලෙ වැඩ කරන කොල්ලන්ගෙන් වහංවෙලා ඉන්න එක ඒ හැටිම අමාරු වැඩක් නෙවෙයි."

"අපි හොයාගත්තා ඌ කොහෙද නිදාගෙන හිටියෙ කියලා." රොබ් ද කතාවට සහභාගි විය. "හම් පසුම්බියක දාලා එතන පිදුරු අස්සෙ හංගලා තිබුනු රිදී කාසි අනූවක් අපට හම්බවුනා."

"මගේ පුතාගෙ ජීවිතේ ඒ තරම්ම ලාබ නැති බව දැනගත්ත එක ගැන සතුටුයි." කැට්ලින් අම්හිරි ස්වරයෙන් කීවා ය.

හැලිස් මොලන් ඇය දෙස හෙලුවේ ව්‍යාකූල බැල්මකි. "සමාවෙන්ට මයෙ ආර්යාවනි. ඔබතුමී කියන්නෙ ඌ ආවෙ දරුවගෙ ජීවිතේ උදුරගන්ට කියලද?"

ග්‍රේජෝයි සැකමුසු බැල්මක් හෙළී ය. "ඒක පිස්සුවක්."

"ඌ ආවෙ බ්‍රැන් වෙනුවෙන් තමා." කැට්ලින් තිර කොට කීවා ය. "ඌ ආයෙ ආයෙමත් කියපු දෙයක් තමා මම එතන ඉන්ට විදියක් නෑ කියලා. මිනිහා පුස්තකාල කුළුණ ගිනි තියලා හිතන්ට ඇති කලබලේ මැද්දෙ මාත් සෙබළුන් එක්ක ඒ පැත්තට දුවයි කියලා. මම දුක නිසා බාගෙට පිස්සු වැටිලා නොහිටියානම් මිනිහගෙ උපාය වැඩ කරන්ටත් තිබුනා."

"ඇයි කාටවත් බ්‍රැන්ව මරන්ට ඕන වෙන්නෙ?" රොබ් ඇසී ය. "දෙයියනේ! එයා කිසිම පිළිසරණක් නැති නිදාගෙන හිටපු පුංචි ළමයෙක්..."

කැට්ලින් සිය පුත්‍රයා දෙසට අභියෝගාත්මක බැල්මක් හෙලුවා ය. "ඔයා උතුර පාලනය කරන්ට යනවනම් මේ වගේ දේවල් ගැන දිගින් දිගට හිතන්ට පුරුදුවෙන්ට ඕන රොබ්. ඇයි කාටහරි මේ නිදාගෙන ඉන්න පුංචි දරුවෙක්ව මරන්ට ඕන වෙන්නෙ?"

ඔහු පිළිතුරක් දීමට ආහාර රැගත් සේවකයින් පැමිණියහ. ඔවුන් ඇය ඇසුවාටත් වඩා ආහාර රසක් රැගෙන පැමිණ තිබින. උණු පාන්, බටර්, මී පැණි හා බ්ලැක්බෙරි, බේකන් සහ බාගෙට තැම්බූ බිත්තර, චීස් හා තේ පිරවූ පෝච්චියක්. මේ සියල්ල සමගින් මේස්ටර් ලුවින් ද කාමරයට ඇතුළු විය.

"මගෙ පුතාට දැන් කොහොමද මේස්ටර්?"

මේස්ටර් ලුවින් බිම බලා ගත්තේ ය. "කිසිම වෙනසක් නෑ මගෙ ආර්යාවනි."

එය ඈ බලාපොරොත්තු වූ පිළිතුරම විය. තත්ත්වය හොඳ නොවූ මුත් තත්ත්වය නරක් වීද නැත. සේවකයින් ඉවත යැවූ ඇය රොබ් දෙසට හැරුනා ය. "ඔයා තාමත් ප්‍රශ්නෙට උත්තරේ හොයාගත්තෙ නැද්ද?"

"කවුරුහරි බය වෙලා තියෙනවා බ්‍රැන් නැගිට්ටියි කියලා." රොබ් කීවේ ය. "බයවෙලා තියෙනවා එයා නැගිටලා මොනවා කියයිද මොනවා කරයිද කියලා. එයා දැනගත්ත මොකක් හරි දෙයක් නිසා කවුරුහරි බය වෙලා තියෙනවා."

"බොහොම හොඳයි." කැට්ලින් මාලිගාරක්ෂක බලකායේ නව ප්‍රධානියා දෙසට හැරුනා ය. "අපි බ්‍රැන්ව ආරක්ෂා කරන්ට ඕන. එක මිනීමරුවෙක් ආවා කියන්නෙ තවත් අය එන්ට පුළුවන්."

"ආරක්ෂකයින් කී දෙනෙක් යොදවන්ට ඕනද මයෙ ආර්යාවනි?" හැල් ඇසී ය.

"එඩාර්ඩ් උතුමානන් බැහැර ගිහින් ඉන්න තාක් කල් මගේ පුතා තමා වින්ටර්ෆෙල්වල ප්‍රධානියා."

රොබ් කඳ කෙලින් කොට සිටගත්තේ ය. "එක්කෙනෙක් කාමරේ ඇතුළෙ තියන්ට. රෑ දවල් දෙකේම. එක්කෙනෙක් දොරට පිටතින්. තව දෙන්නෙක් පඩිපෙළ පාමුල. මගෙවත් අම්මගෙවත් අවසරය නැතුව කිසිම කෙනෙකුට ඒ කාමරේට යන්ට බෑ."

"ඔබ කියන විදියටම කරන්නම් මයෙ උතුමානෙනි."

"ඒක දැන්ම කරන්ට." කැට්ලින් උපදෙස් දුන්නා ය.

"අනිත් එක, බ්‍රැන්ගෙ වෘකයාට ඒ කාමරේ ඇතුළෙ ඉන්ට ඉඩ දෙන්ට." රොබ් කීවේ ය.

"ඔවු." කැට්ලින් සිතා බැලී ය. "ඔවු. ඒක හොඳයි."

හිස නැමූ හැලිස් මොලන් කාමරයෙන් පිටව ගියේ ය.

"ස්ටාර්ක් ආර්යාවනි." සෙර් රඩ්‍රික් කතාව ඇරඹී ය. "මිනීමරුවා පාවිච්චි කරපු කිනිස්ස දිහා බලන්ට ඔබට අවස්ථාවක් ලැබුනද?"

"ඒක ළඟින් අධ්‍යයනය කරන්ටනම් මට වෙලාවක් ලැබුනෙ නැහැ. ඒත් ඒක හොඳට මුවහත ඇති එකක් කියලානම් සහතිකෙන්ම කියන්ට පුළුවන්." කැට්ලින් වියළි සිනාවක් ඇතිව පිළිතුරු දුන්නා ය. "ඇයි ඔබ එහෙම ඇහුවෙ?"

"මිනිහා ඒ වෙනකොටත් අතේ තදකරන් හිටිය කිනිස්ස අපට හම්බවුනා. දැක්ක ගමන් මට තේරුනා ඒ කිනිස්ස ඒ වගේ මිනිහෙක් ගාව තියෙන්ට බැරි තරම් හොඳ එකක් කියලා. ඉතින් මම ඒක තව ටිකක් හොඳට අධ්‍යයනය කරලා බැලුවා. ඒකෙ තලේ වැලීරියන් වානේ. මිට හදලා තියෙන්නෙ මකර ඇටවලින්. ඒ වගේ මිනිහෙක් ගාව මෙහෙම බඩුවක් තියෙන්ට කොහෙත්ම හැටියක් නෑ. කවුරුහරි ඒක ඌට දීලා තියෙනවා."

කැට්ලින් කල්පනාකාරීව හිස වැනුවා ය. "රොබ්, ඔය දොර වහන්ට."

රොබ් ඈ දෙස විමතියෙන් මෙන් බැලූ මුත් ඇය කී පරිදි කලේ ය.

"මම මේ දැන් ඔබලාට කියන්ට යන දේවල් මේ කාමරෙන් පිටට යන්ට බෑ. ඒ ගැන මට ඔබලා හැමෝගෙන්ම දිවුරුමක් ඕන. මම හිතන දෙයින් පොඩි කොටසක් හරි ඇත්තනම් නෙඩ්යි මගෙ කෙල්ලො දෙන්නයි පත්වෙලා තියෙන්නෙ බොහොම භයානක තත්ත්වයකටයි. එක වචනයක් වැරදි කණකට ගියොත් එයාලා හැමෝගෙම ජීවිත නැතිවෙන්ට පුළුවන්."

"එඩාර්ඩ් උතුමානන් කියන්නෙ මට දෙවෙනි තාත්තා කෙනෙක් වගේ." තියන් ග්‍රේජෝයි කිවේ ය. "මම දිවුරනවා."

"මමත් දිවුරනවා." මේස්ටර් ලුවින් කීය.

"මමත්, මගේ ආර්යාවනි." සෙර් රඩ්‍රික් කීය.

ඇය සිය පුත්‍රයා දෙස බැලුවා ය. "එතකොට ඔයා රොබ්?"

ඔහු හිස සැලීමෙන් කැමැත්ත පල කලේ ය.

"මගේ සහෝදරී, ලයිසා, හිතන්නෙ එයාගෙ සැමියා ඒරින් උතුමානන්ගෙ මරණය මිනීමැරුමක් කියලයි. එයා සැක කරන්නෙ ලැනිස්ටර්වරුන්වයි. මට දැන් මතක් වෙනවා, බ්‍රැන් වැටුන දවසේ දඩයක්කාර නඩයත් එක්ක ජේමි ලැනිස්ටර් පිටත් වෙලා ගියේ නෑ. එයා බලකොටුවෙ නතර වුනා." කාමරය නිහඬතාවයේ ගැලී පැවතින. "මම හිතන්නෙ නැහැ බ්‍රැන් අර කුළුණෙන් වැටුනා කියලා. මම හිතන්නෙ එයාව ඒකෙන් තල්ලු කලා."

ඒ මුහුණු මත ඇඳුනු කම්පනය පැහැදිලිවම දැකිය හැකි විය. "මගේ ආර්යාවෙනි. ඒකනම් මහ භයානක අනුමාන කිරීමක්." සෙර් රඩ්‍රික් කතා කලේ ය. "රජුන් මරන්නා වුනත් අහිංසක පුංචි දරුවෙක් මරන එක පිළිකුල් කරයි."

"ආහ්! එයා එහෙම පිළිකුල් කරයිද?" තියන් ග්‍රේජෝයි ඇසුවේ ය. "මට විශ්වාස නෑ."

"ලැනිස්ටර් ආඩම්බරේට සීමාවක් නෑ. ඒ වගේම ඉහළ නගින්ට තියෙන්ට ආසාවටත් සීමාවක් නෑ." කැට්ලින් කීවාය.

"මේ දරුවා හැමදාමත් බොහොම හුරුපුරුදු වෙලා හිටියෙ ඉහළ නගින්ට. එයාට කවදාවත් අත වැරදුනේ නෑ" මේස්ටර් ලුවින් කල්පනාකාරීව කීය. "එයා වින්ටර්ෆෙල්වල හැම ගල්කැටයක් ගානෙම දන්නවා."

"දෙයියනේ!" රොබ් කීවේ ය. කේන්තිය නිසා ඔහු ගේ මුහුණ කළු පැහැ විය. "මේක ඇත්තනම් ඌට ඒ වෙනුවෙන් ගෙවන්ට වෙයි." ඔහු සිය අසිපත කොපුවෙන් මෑත් කරගත්තේ ය. "මම ඌව මගෙ අතින්ම මරලා දානවා."

සෙර් රඩ්‍රික් කිපුනු ස්වරයෙන් කතා කලේ ය. "ඕක පැත්තකට දානවා! ලැනිස්ටර්වරු ඉන්නෙ ලීග සිය ගානක් ඈත. කඩුව පාවිච්චි කරන්ට ඕනකමක් නැත්තම් ඒක කවදාවත් කොපුවෙන් එළියට ගන්ට එපා. මම කී වතාවක් ඔය කතාව කියලා දෙන්ට ඕනද මෝඩ කොල්ලා?"

රොබ් ලැජ්ජාසහගත මුහුණින් යුතුව අසිපත නැවත කොපුවේ ලෑවේ ය. කැට්ලින් සෙර් රඩ්‍රික් දෙස බැලුවා ය. "මට පේනවා මගේ පුතා නියම ආයුධ අතට අරන් ඉන්නවා."

"මම හිතුවා සුදුසු කාලෙ ඇවිල්ලා කියලා."

රොබ් තැවිලි සහගත සිතින් ඈ දෙස බැලුවේ ය. "සුදුසු කාලෙ පහුවෙලා." කැට්ලින් කීවාය. "වින්ටර්ෆෙල්වල හැමෝටම ආයුධ අතට ගන්ට කාලෙ එයි බොහොම ඉක්මනට."

සිය අසිපත් මිට මත අතක් රුවා ගත් තියන් ග්‍රේජෝයි කතා කලේ ය. "මගේ ආර්යාවනි. එහෙම තත්ත්වයක් ආවොත් මගේ පවුල හැමදාමත් ඔබට පක්ෂපාතීයි."

මේස්ටර් ලුවින් සිය කර වටා වූ දම්වැල අතපත ගෑවේ ය. "අපට තවමත් තියෙන්නෙ අනුමානයක් විතරයි. අපි මේ සැක කරන්නෙ රැජිණගෙ සහෝදරයා ගැනයි. රැජිණ මේක හොඳින් බාරගන්න එකක් නෑ. අපට සාක්කි ඕන. එහෙම නැත්තම් හැමදාමත් කට වහගෙන ඉන්ට ඕන."

"ඔබේ සාක්කිය තමා කිනිස්ස." සෙර් රඩ්‍රික් කීවේ ය. "මේ වගේ ඉහළ ගනයේ ආයුධයක් එහෙම ලේසියෙන් නැතිවෙන්ට බෑ. කෙනෙකුට ඒක මතක තියෙන්ට ඕන."

මෙහි සැබෑ සත්‍යය සොයා ගත හැකි තැන් ඇත්තේ එකම එකක් බැව් කැට්ලින්ට තේරුම් ගියා ය. "කවුරුහරි කින්ග්ස් ලැන්ඩින්ග්වලට යන්ට ඕන."

"මම යන්නම්." රොබ් කීවේ ය.

"නෑ." ඇය වැළකුවා ය. "ඔයාගෙ තැන මෙතනයි. වින්ටර්ෆෙල්වල හැමවෙලාවෙම ස්ටාර්ක් කෙනෙක් ඉන්ට ඕන." ඇය මාරුවෙන් මාරුවට සෙර් රඩ්‍රික්, මේස්ටර් ලුවින් හා තියන් ග්‍රේජෝයි දෙස බැලුවා ය. මෙයට සුදුස්සා කවරෙක්ද? විශ්වාසය තැබිය හැක්කේ කා කෙරෙහිද? අන්තිමේදී ඇයට සුදුසුම පුද්ගලයා සිහියට නැගින. "මමයි මේකට යන්ට ඕන."

"මගේ ආර්යාවනි." මේස්ටර් ලුවින් කතා කලේ ය. "ඒක ඥානවන්තද? ඔබේ පැමිණීම දිහා ලැනිස්ටර්වරු සැකෙන් බලයි."

"එතකොට බ්‍රැන්ට මොකද වෙන්නෙ?" රොබ් ඇසුවේ වියවුලට පත් වූ ස්වභාවයෙනි. "ඔයා එයාව දාලා යන්ටද යන්නෙ?"

"මම මට පුළුවන් හැම දෙයක්ම  බ්‍රැන් වෙනුවෙන් කරලයි තියෙන්නෙ. එයාගෙ ජීවිතෙ දැන් රැඳිලා තියෙන්නෙ දෙවියන්ගෙයි මේස්ටර් ලුවින්ගෙයි අත් දෙක උඩයි. ඔයා මට මතක් කරලා දුන්නා වගේම රොබ්, මම අනිත් ළමයින් ගැනත් හිතන්ට ඕන."

"ඔබත් එක්ක යන්ට හොඳ ශක්තිමත් පරිවාර සේනාවක් ඕන වෙයි මගේ ආර්යාවනි." තියන් කීය.

"මම හැල්ව එවන්නම් සෙබළ මුලුවකුත් එක්ක." රොබ් කීවේ ය.

"එපා." කැට්ලින් පිළිතුරු දුන්නා ය. "ලොකු පිරිසක් යනකොට අනිත් අයගෙ අවධානය ලැබෙනවා. මම එන බව ලැනිස්ටර්ලා දැනගන්නවට මම කැමැති නෑ."

සෙර් රඩ්‍රික් විරෝධය පෑවේ ය. "මගේ ආර්යාවනි. එහෙමනම් අඩුම ගානෙ මමවත් එන්නම් ඔබත් එක්ක යන්ට. රජමාවත කියන්නෙ ගෑනු කෙනෙකුට තනියෙන් යන්න සුදුසු තැනක් නෙවෙයි."

"මම රජමාවතේ යන්නෙ නැහැ." කැට්ලින් මොහොතක් සිතා බැලී ය. "එක්කෙනෙක් තරම් ඉක්මනින් දෙන්නෙකුටත් යන්ට පුළුවන්. අශ්ව කරත්තයි, වෙන වෙන ආම්පන්නයි පිරිච්ච සේනාවකට වඩා ඉක්මනින් දෙන්නෙකුට කොහොමත් යන්ට පුළුවන්. ඔබ එහෙමනම් මගෙත් එක්ක එන්ට සෙර් රඩ්‍රික්. අපි සුදු ගඟ දිගේ පහළට ගිහිල්ලා ධවල වරායෙන් පොඩි නැවක් කුලියට ගමු. හොඳ වේගවත් අශ්වයොයි හොඳ හුළං පාරකුයි ලැබුනොත් අපට පුළුවන් ලැනිස්ටර්ලායි නෙඩ්යි යන්ට කලින් කින්ග්ස් ලෑන්ඩින්ග්වලට ළඟාවෙන්ට."

ඊට පස්සෙ, ඇය සිතුවා ය. අපි බලමු ඊට පස්සෙ මොකක් වෙයිද කියලා.

Catelyn Stark: “It’s good to know my son’s life was not sold cheaply.”

සන්සා

එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් හිමිදිරියටත් පෙරාතුවම පිටත් වී ගිය බැව් සෙප්ටා මෝර්ඩේන් විසින් උදෑසන ආහාරය අතරතුරේදී සන්සාට දැනුම් දුන්නා ය. "රජතුමා පණිවුඩයක් එවලා තිබ්බා. තවත් දඩයම් සවාරියක් මම හිතන්නෙ. තාමත් මේ හරියෙ ඔරොක්ස්ලා ඉන්නවා කියලයි මිනිස්සු කියන්නෙ."

"මම කවදාවත් ඔරොක්ස් එකෙක් දැකලා නෑ." සන්සා කීවේ මේසයට යටින් ලේඩිට බේකන් කැබැල්ලක් කවමිනි. සෝරවෘකයා එය ඇගේ අතින් ඩැහැගත්තේ රැජිණක තරම් කෝමල අන්දමිනි.

සෙප්ටා මෝර්ඩේන් අප්‍රසාදය හඟවන්නට මෙන් මුහුණ ඇඹුල් කරගත්තා ය. "වංශවත් ආර්යාවක් කවදාවත් එයාගෙ කෑම මේසෙදි බල්ලන්ට කෑම කවන්නෙ නෑ."

"එයා බල්ලෙක් නෙවෙයි, සෝරවෘකයෙක්." සන්සා පෙන්වා දුන්නා ය. "අනික, තාත්තා කියලා තියෙන්නෙ අපට ඕනනම් එයාලා අපි ගාව තියාගන්ටයි කියලා."

මේ වදනින් සෙප්ටා සතුටු වූ බවක් පෙනුනේ නැත. "ඔයා බොහොම හොඳ දරුවෙක් සන්සා. ඒත් ඔය සතා ගැන කතාකරද්දී ඔයත් ඔයාගෙ නංගී ආර්යා තරම්ම හිතුවක්කාරයි. අනිත් එක, කෝ දැන් ආර්යා?"

"එයාට බඩගිනි නෑ කිවුවා." සන්සා කීවාය. ආර්යා මීට බොහෝ වේලාවකට පෙරාතුවම හොර රහසේ කුස්සියට රිංගා කුස්සියේ වැඩකරන කොල්ලෙකු ලවා බඩ පිරෙන්නට ආහාර වේලක් ලබාගෙන ඇති බැව් ඇය හොඳින්ම දැන සිටියා ය.

"එයාට මතක් කරන්ට අද හොඳට අඳින්ටයි කියලා. අපි හැමෝටම අද ආරාධනාවක් තියෙනවා රැජිණයි මර්සෙලා කුමාරියි එක්ක අශ්ව කරත්තෙන් ගමන් කරන්ට. ඉතින් අපි හැකි උපරිමෙන් හොඳට ඇඳලා ඉන්ට ඕන."

සන්සා මේ වනවිටත් ඇයට හැකි උපරිමයෙන් සැරසී සිටියා ය. දිගු රතු-දුඹුරු කෙස්කළඹ දිස්නය දෙන තෙක් පීරූ ඇය සිය ප්‍රියතම නිල් පැහැ සේද ඇඳුමින් සැරසුනා ය. ගෙවුනු සතියක් පුරාවටම ඇය අද දවස වෙනුවෙන් පෙරුම් පුරා බලා සිටියා ය. රැජිණ සමගින් ගමන් කිරීමට ලැබීම විශාල ගෞරවයක් වන අතර එහි සිය අනාගත වල්ලභයා වන ජොෆ්රි කුමරාද සිටිනු ඇත. ඔහු ගැන සිතත්ම නුපුරුදු චංචල බවකින් සිය සිරුර වෙලී යනු ඇයට දැනින. එනමුදු ඔවුන් දෙදෙනා විවාහ වීමට තවත් වසර ගනනාවක් ගතවනු ඇත. සන්සා තවමත් ජොෆ්රිව හරිහැටි හඳුනාගෙන නොතිබුනු නමුදු දැනටමත් ඇය ඔහු හා පෙමින් වෙලී සිටියා ය. ඇය හැමදාමත් සිහින මැවූ සිහින කුමරාට ඔහු සෑම අතින්ම සමාන විය. උස්, කඩවසම්, ශක්තිමත්, රන්වන් පැහැ කෙස් කළඹින් යුතු කුමාරයෙක්! ඔහු හා ගත කිරීමට ලැබෙන සෑම කුඩා මොහොතක්ම ඇය සතුටින් පිළිගත්තා ය.

එනමුදු අද දිනය ගැන සිතත්ම ඇයට බියවීමට එක් කාරණයක් ඇත. ආර්යා! සෑම හොඳ දෙයක්ම නැතිභංගස්ථාන කර දැමීමට ආර්යාට උපන්ගෙයි හපන්කමක් තිබින. ඇය කරන්නට යන්නේ කුමක්දැයි කිසිවෙකුටත් සිතා ගත නොහැක. "මම එයාට කියන්නම්." සන්සා අස්ථිර හඬින් කීවා ය. "ඒ වුනාට එයා අඳින්නෙ එයාට ඕන විදියට. මම යන්නද?"

"හොඳයි." සෙප්ටා අවසර දුන්නා ය. නැගී සිටිය සන්සා තමා පසුපස එන ලේඩි ද සමගින් කෑම කාමරයෙන් පිටව ගියා ය.

පිටත මිනිස්සු කූඩාරම් හා මණ්ඩප ගලවමින් තවත් දවසක ගමනට සැරසෙමින් උන්හ. තානායම ගලින් තැනූ තට්ටු තුනක් උස ගොඩනැගිල්ලක් වුවද එය ප්‍රමාණවත් වූයේ රජු ගේ නඩයෙන් තුනෙන් එකකටත් වඩා අඩු පිරිසකට සෙවන දීමට පමණි. සිය පියා විසින් කැඳවාගෙන පැමිණි පිරිසත්, ඔවුන් එන අතරමඟදී එකතුවුනු අශ්වාරෝහකයිනුත් එක්වූ විට මේ පිරිස හාරසියයකටත් වඩා වැඩි වී තිබින.

ගංගා ත්‍රිශූලයේ ඉවුරේ ඉන්නා ආර්යා සොයාගැනීමට ඇයට හැකි විය. නයිමේරියාව එක් අතකින් අල්ලා ගත් ඈ උගේ ලොම්වල ඇලී තිබුනු වියළි මඩ පිසදා හැරීමට උත්සාහ දරමින් උන්නා ය. සෝරවෘකයා මේ ක්‍රියාව ගැන එතරම් කැමැත්තකින් සිටින බවක් පෙනෙන්නට නොතිබින. සුපුරුදු පරිදි ආර්යා හැඳගෙන සිටියේ ඇය සෑමවිටම අසු පිට යාමට අඳින සම් ඇඳුම් කට්ටලයයි.

"ඔයා ඔයිට වඩා හොඳ ඇඳුමක් ඇඳගන්නවානම් හොඳයි." සන්සා ඇයට කීවා ය. "සෙප්ටා මෝර්ඩේන් තමා කිවුවෙ. අපි අද මර්සෙලා කුමාරිත් එක්ක රැජිණගෙ අශ්ව කරත්තෙ ගමන්කරන්ටයි යන්නෙ."

"මම එන්නෙ නෑ." නයිමේරියා ගේ ලොම්වල ඇලී ඇති මඩ කැබැල්ලක් පිසදා හැරීමට තැත් කරමින් ආර්යා කීවා ය. "මයිකා යි මායි අද ගඟේ උඩහට යන්නයි ඉන්නෙ, රතු කැට හොයන්ට."

"රතු කැට? මොන රතු කැටද?"

ආර්යා ඇය දෙසට හෙලූයේ 'මේ මොන මෝඩියෙක්ද' යි අසන්නාක් වැනි බැල්මකි. "රේගාර් ගේ රතු කැට. මෙතැන තමා රොබර්ට් රජ්ජුරුවො එයාව මරලා සිංහාසනේ දිනාගත්ත තැන."

ආර්යා කියන දේ විශ්වාස කල නොහැකි විලසින් සන්සා ඈ දෙස බැලුවා ය. "ඔයාට රතු කැට හොයන්ට යන්ට බෑ. කුමාරි අපි දෙන්නව බලාපොරොත්තු වෙනවා. රැජිණ අපි දෙන්නටමයි ආරාධනා කලේ."

"ඉතින් මට මොකද? ඒ අශ්ව කරත්තෙ අඩු ගානෙ ජනේලයක්වත් නෑ. ඔයාට එළියෙ තියෙන කිසිම දෙයක් බලන්ට බෑ."

"ඔයාට මොනවද බලන්ට තියෙන්නෙ." සන්සා තරහ හඬින් ඇසුවා ය. ඇය සිතූ පරිද්දෙන්ම මේ මෝඩ ආර්යා අද දවස විනාශ කිරීමට යන්නී ය. "තැනිතලායි, ගොවි බිමුයි, බලකොටුයි."

"ඔයා මොනවද දන්නෙ?" ආර්යා මුරණ්ඩු ස්වරයෙන් ඇසුවා ය. "ඔයා අපිත් එක්ක එනවනම් අපි ඔයාට පෙන්නන්නම්."

"මම ආසම නෑ අශ්වයො පිටේ යන්ට. දූවිල්ලයි, මඩයි ඇඟේ අමාරුවයි විතරයි."

ආර්යා දෙවුර ඇකිළුවා ය. "ඔහොම ඉන්ට. මම ඔයාට රිද්දන්නෙ නෑ." ඇය නයිමේරියාට සැරකලා ය. ඉන්පසු සන්සා දෙසට හැරුනා ය. "අපි බෙල්ල පහුකරන් එන ගමනෙදි මම ගනන් කලා මීට කලින් දැකලා නැති මල් ජාති තිස්හයක්. මයිකා මට පෙන්නුවා සිංහ-කටුස්සෙක්."

සන්සා වෙවුලුවා ය. බෙල්ල නමින් හැඳින්වූ උතුරත් දකුණත් වෙන් කරන පටු ගොඩබිම් තීරය පසුකිරීමට ඔවුනට දවස් දොළහක් ගතවී තිබින. එය ඉමක් කොණක් නොපෙනෙන මඩවගුරක් මැද පිහිටි කැඩී බිඳී ගිය මංකඩක් ඔස්සේ ඇදී ඇදී ගිය වෙහෙසකර ගමනක් විය. ඒ ගතවූ සෑම දිනකටම සන්සා සාප කලාය. එහි වාතය තෙත්බරිත හා ඇලෙනසුළු විය. මංකඩ කෙතරම් පටු එකක් වී ද යත් ඔවුනට රාත්‍රියේ නියමිත අන්දමින් කඳවුරක් අටවාගැනීම පවා අපහසු විය. පෙඳ පාසියෙන් වැසුනු අඩක් දියේ ගිලී ගිය ගස් ඔවුන් වඩා අතුපතර විහිදූ අතර ගස් අතුවල එල්ලුනු සර්පයෝ ඔවුන් දෙස බලා සිටියහ. මඩ ගොහොරුවල හා පල් වී ගිය දියකඩිති මත සුවිසල් මල් වර්ගයන් පිපී දිලුනු නමුදු ඒවා කඩා ගැනීමට සිතා මංකඩින් බැහැර යන කෙනෙකු ගිල ගැනීමට බොරුවැල්ල සූදානමින් සිටියේ ය. මේ සියල්ලටමත් වඩා දියකඩිති වල අඩක් ගිලී පාවෙන කොට මෙන් සිංහ-කටුස්සෝ පීනා ගියහ.

එනමුදු මේ කිසිම දෙයකට ආර්යාව නැවැත්විය නොහැකි විය. එක් දිනෙක ඇය අවුල් වී ගිය හිසකෙසින් හා මඩ වැකුනු ඇඳුමින් යුතුව ඇගේ අර වංචාකාරී අශ්ව හිනාවත් පාමින් පැමිණියේ පියා වෙනුවෙන් කඩාගත් දම්-කොළ පැහැ මල් පොකුරක්ද සමගිනි. මේ විකාර නවතා දමා උසස් වංශවත් ආර්යාවක් මෙන් හැසිරෙන්න යැයි පියා ඇයට දොස් පවරනු ඇසීමට සන්සා බලාපොරොත්තු වූවත් ඔහු කලේ ආර්යාව බදා වැළඳගෙන අර මල්වලට ස්තූති කිරීම පමණි. එය සන්සා ගේ තත්ත්වය තවත් නරක් කලේ ය.

පසුව දැනගන්නට ලැබුනු අන්දමට ඒ දම් පැහැ මල් 'විස හාදු' නම් වූ විෂ සහිත පැළෑටියක් වූ අතර ආර්යා ගේ අත්වල කැසිල්ලක් හට ගති. මෙයින් වත් ආර්යා පාඩමක් ඉගෙනගනීවි යැයි සන්සා සිතුවත් ඈ ඒ ගැන සිනාසුනා පමණි. පසුදින ඇගේ මිතුරු මයිකා ගේ උපදෙස් පරිදි ඇය සිය අත්වල කැසිල්ල නවත්වන්නට ගමේ ගොඩේ ගැහැණියක මෙන් දෑත පුරා මඩ තවරා ගත්තා ය. ඇගේ දෑත්වල හා උරහිස්වල ඇති අනන්ත කැපුම් කෙටුම් සීරීම්

තැලීම් සන්සා විසින් නිරීක්ෂණය කොට තිබින. ඇයට ඒවා කොහෙන් කොහොම ලැබුනාදැයි දන්නේ දෙවියන්ම පමණි.

ආර්යා තවමත් සිය වෘකයා ගේ මඩ පිසදමමින් දකුණට එන ගමනේදී ඇය දුටු දේ ගැන කියවමින් සිටියා ය. "පහුගිය සතියෙ අපට හම්බවුනා හොල්මන් තියෙන මුර කුළුණක්. ඊට කලින් දවසෙ අපි වල් අශ්ව රංචුවක් පස්සෙ පන්නං ගියා. උංට නයිමේරියාගෙ ඉව දැනුනම උං දුවපු හැටි ඔයා දැක්කනම්." ඇගේ ග්‍රහනයෙන් මිදීමට වෘකයා දැඟලූ අතර ඇය ඌට බැන වැදුනා ය. "ඔහොම ඉන්ට පොඩ්ඩක්. මට අනිත් පැත්තත් සුද්ද කරන්ට තියෙනවා."

"ඔයාට මේ යන පිරිසෙන් වෙන් වෙන්ට බෑ." සන්සා මතක් කර දුන්නා ය. "මතක නැද්ද තාත්තා කිවුවා?"

ආර්යා දෙවුර ඇකිළුවා ය. "මම එච්චර ඈත යන්නෙ නෑ. අනිත් එක නයිමේරියා හැම වෙලාවෙම මාත් එක්ක ඉන්නවා. මම හැමදාම එහෙම එළියට යන්නෙත් නෑ. සමහරවෙලාවට කරත්තවල යන මිනිස්සුත් එක්ක කතා කර කර යන එකත් හරිම විනෝදජනකයි."

ආර්යා මේ කතා කරමින් යන උදවිය කුමන අන්දමක අය දැයි සන්සා මනාව දැන සිටියා ය. නයිට්වරුන් ගේ සහචරයන්, කුදිර කාරයන්, වැඩකාර කෙල්ලන්, නාකි මිනිසුන් හා නිරුවත් දරුවන්, ජාතකය මොකක්දැයි නොදන්නා අයාලේ යන අශ්වාරෝහකයන්. ආර්යා මේ ඕනෑම කෙනෙකු සමග පහසුවෙන් මිතුරු වූවා ය. මේ මස්කාරයා ගේ පුතා වන මයිකා අන් සියල්ලන්ටම වඩා නරක එකෙකු විය. ඔහුව දැකීම පවා සන්සා පිළිකුල් කල මුත් ආර්යා නිතරම ඔහු ගේ සමාගමය පැතුවා ය.

සන්සා ගේ ඉවසීම එහි අන්තයට පැමිණ තිබින. "ඔයාට මගෙත් එක්ක එන්ට වෙනවා. ඔයාට රැජිණට බෑ කියන්ට බෑ. සෙප්ටා මෝර්ඩේන් ඔයාව බලාපොරොත්තු වෙනවා." සන්සා තදින් කියා සිටියා ය.

ආර්යා ඇයව නොතකා හැරියා ය. ඇගෙන් මිදුනු නයිමේරියා අනෙක් පසට හැරුනා ය. "මෙහාට එන්ට."

"අපට ලෙමන් කේකුයි තේයි ලැබෙයි." නයිමේරියා පසුපස දුවන ආර්යා දෙස බලමින් සන්සා කීවා ය. "ඇයි ඔයාට මේ ගඳ ගහන අශ්වයෙක් පිටේ නැගලා දාඩිය දාගෙන යන්ට ඕන, අගේට පිහාටු කොට්ට උඩ වාඩිවෙලා කේක් කකා රජිණත් එක්ක යන්ට පුළුවන්කම තියෙද්දි?"

"මම රජිණට කැමැති නෑ." ආර්යා සැහැල්ලුවෙන් කීවා ය. සන්සා හුස්ම ඉහළට ඇදගත්තේ ආර්යා මෙවැනි දෙයක් කීම අදහාගත නොහැකි පරිද්දෙනි. "එයා අඩුම ගානෙ මට නයිමේරියාව එක්කන් එන්ට දෙන්නෙත් නෑ."

"රාජකීය අශ්ව කරත්තයක් කියන්නෙ වෘකයෙකුට ඉන්ට පුළුවන් තැනක් නෙවෙයි. අනෙක, මර්සෙලා කුමාරි උංට බයයි. ඔයා හොඳටම දන්නවා ඒක."

"මර්සෙලා කියන්නෙ පුංචි බබෙක් නෙ." ආර්යා ප්‍රවේසමෙන් වෘකයා ගේ ගෙල වටා අත යවා ඌව අල්ලා ගත්තා ය. නමුත් මඩ පිසදැමීම සඳහා බුරුසුව අතට ගත් සැනින් ඇගෙන් මිදුනු ඌ ඉවතට දිව ගියා ය. සිය වෑයම නිශ්ඵල වූ ආර්යා බුරුසුව විසිකර දැමුවා ය. "නරක වෘකයා." ඈ කෑ ගැසුවා ය.

සන්සාට සිනා පහළ විය. බල්ලන් බාරකරු වරක් ඇයට කියා ඇති පරිදි සතා සැමවිටම සිය ස්වාමියා අනුව යයි. සන්සා ගේ සිනාව ඇසුනු ආර්යා රවා ගත් මුහුණින් යුතුව ඇය දෙසට හැරුනා ය. "ඔයා මොනවා කිවුවත් මට කමක් නෑ. මම යනවා අශ්වයො පිටේ."

"දෙයියම්පා ආර්යා! ඔයා සමහර වෙලාවට පොඩි ළමයෙක් වගේ. ඉතින් එහෙනම් මම තනියෙන් යන්නම්. ඒක තවත් හොඳ වෙයි. ලේඩියි මායි ලෙමන් කේක් කකා තේ බිබී හොඳට කාලෙ ගතකරලා එන්නම්."

ආපසු හැරුනු ඇය ඇවිද යන්නට පටන් ගත්තා ය. එනමුදු ඇයට පිටුපසින් ආර්යා කෑ ගැසුවා ය. "ඔයාට ලේඩිව අරන් යන්ට එයාලා ඉඩ දෙන එකක් නෑ." සන්සා මෙයට පිළිතුරක් සිතා ගැනීමට පළමු ආර්යා නයිමේරියාව ලුහුබදිමින් ගංගාව දෙසට දිව ගියා ය.

අවමානයට පත්වුනු සන්සා නැවත කඳවුර බලා පිටත් වූවා ය. ලේඩි නිහඬ අඩි තබමින් ඈ පසෙකින් පැමිණියා ය. ඇගේ දෑසට කඳුළු පුරා තිබින. ඇයට උවමනා වූ එකම දෙය වූයේ සැමදෙයක්ම ලස්සනටත් පිළිවෙලටත් සිදුවෙනවා දැකීම පමණි. හරියටම අර වීර කාව්‍යවල කියැවෙන්නාක් මෙන් සුන්දරව සැම දෙයක්ම සිදුවන්නට බැරි ඇයිද? ආර්යාටත් මර්සෙලා කුමරියට මෙන් සුකොමල හා කාරුණික වන්නට බැරි ඇයිද? එවැනි සොයුරියක් ඇත්නම් යැයි ඈ කල්පනා කලා ය.

වසර දෙකක් තරම් සුළු පරතරයක් ඇතිව ඉපදුනු සොයුරියන් දෙදෙනෙකු මෙසේ එකිනෙකාට සම්පූර්ණයෙන්ම අසමාන වීම සන්සාට අදහාගත නොහැකි දෙයක් විය. ආර්යාත් සිය අර්ධ-සොහොයුරු ජොන් මෙන් අවජාතකයෙකු වූවා නම් එය තේරුම් ගත හැක. වරක් ඇය කුඩා කාලයේදී සන්සා මේ ගැන ඇගේ මවගෙන් විමසා තිබින. සමහරවිට කුමක් හෝ වැරැදීමක් සිදුවන්නට ඇත. එසේ නැතහොත් පිශාචයින් විසින් ඇගේ නියම සොයුරිය පැහැරගෙන ගියා වන්නටත් බැරි නැත. එහෙත් මහ හඬින් සිනාසුනු ඇගේ මවු සන්සා ගේ සැකය දුරු කලා ය.

කඳවුර මධ්‍යයට ආසන්න වෙද්දී සන්සා ගේ මේ සියළු දෝමනස්සයන් අමතක වී යන්නට පටන් ගෙන තිබින. රැජිණ ගේ අශ්ව කරත්තය වටා පිරිසක් රැස්ව සිටියහ. ඔවුන් උනන්දුසහගත හඬින් කරන කතාබහ ඇසුනේ හරියටම මීවදයකින් නැගෙන මුනුමුනුව මෙනි. අශ්ව කරත්තයේ දොරවල් විවරව තිබුනු අතර ලීයෙන් කල පියගැට පෙළ මුදුනේ රැජිණ සිටගෙන සිටියා ය. ඇය පහළ සිටි යමෙකු දෙස බලා සිනාසුනා ය. "රාජසභාව අපට බොහොම ලොකු ගෞරවයකුයි කරලා තියෙන්නෙ මගේ උතුමානෙනි." ඇය කාටදෝ පවසනු සන්සාට ඇසුනා ය.

"මොකක්ද සිද්ද වෙන්නෙ?" මඳක් දැනහැඳුනුම්කම් ඇති නයිට්වරයකු ගේ සහචරයකුගෙන් සන්සා ඇසුවා ය.

"ගමනේ ඉතිරි කොටස අපව පිරිවරන් යන්ට රාජසභාවෙන් අශ්වාරෝහකයො පිරිසක් එවලා. ඒක රජතුමා වෙනුවෙන් කරපු ගෞරවයක්."

කුතුහලයට පත් සන්සා පිරිස අතරින් ඉදිරියට ගියා ය. සෝරවෘකයා දුටු මිනිසුන් ඇකිලෙමින් දෙපසට වීම නිසා මාර්ගය පාදා ගැනීම ඇයට අසීරු නොවී ය. පෙරට ගිය ඈ දුටුවේ අලංකාර ප්‍රභාවත් සන්නාහයෙන් සැරසුනු නයිට්වරුන් දෙදෙනෙකු රැජිණ ඉදිරියේ දණ නමාගෙන සිටින ආකාරය යි.

එක් නයිට්වරයකු සැරසී සිටියේ අලුත වැටුනු හිම මෙන් සුදෝසුදු වානේ කොරපොතු වලින් හා රජතමය ගාංචුවලින් සැදුනු සන්නාහයකිනි. ඔහු තමා පැළැඳි සන්නාහය තරමටම සුදු කේශකලාපයකින් යුත් මහළු පුද්ගලයකු බැව් ඔහු සිය හිස්වැසුම ඉවත්කල විට සන්සා දුටුවා ය. එනමුදු ඔහු ශක්තිමත් සුන්දර ශරීරයකින් හෙබියකු විය. ඔහු ගේ උරහිසෙන් පහතට එල්ලී වැටුනේ රාජ්‍යාරක්ෂක බලකායට අයත් ධවල සළුවකි.

ඔහු ගේ සගයා විසිවන වියේ පමණ වූ අතර වනාන්තරයේ තද කොළ පැහැයෙන් යුතු සන්නාහයකින් සැරසී සිටියේ ය. සන්සා සිය ජීවිත කාලය පුරාවටම දැක තිබූ කඩවසම්ම පිරිමියා ඔහු විය. උස්, මනාව වැඩුනු ශක්තිමත් දේහයකින් හෙබි, උරහිස තෙක් වැටුනු තද කළු පැහැ කෙහෙරැල්ලෙන් හා මනාව රැවුල බෑ ශෝබන මුහුණකින් යුක්ත වූ ඔහු සතුව සිය සන්නාහයටම ගැලපෙන අන්දමේ සිනාසෙන කොළ පැහැ දෑසක් විය. ඔහු එක් අතකින් රඳවාගෙන සිටි ගෝන අං තට්ටුවකින් හැඩකල විභූතිමත් හිස්වැස්ම රනින් වැඩ දමා තිබින.

ඔවුන් සමග සිටි තුන්වැන්නා පළමුව සන්සා ගේ නිරීක්ෂණයට හසු වූයේ නැත. ඔහු අන්‍යයන් සමග රැජිණ අභිමුව දණනොනැමූ අතර ඒ වෙනුවට පසෙකට වී සිය අසුන් පසෙකින් සිටගෙන සිටියේ ය. සිදුවන සියල්ල දෙස නිහඬවම බලා සිටි කෙසඟ සැරපරුෂ මිනිසකු වූ ඔහු සතුව කිසිදු හැඟීමක් නොපෙන්වූ මුහුණක් හා ගැඹුරු දෑසක් විය. සමින් කල උඩු කබායක් මත්තෙහි පැළඳ සිටි මුදු දම්වැලින් කෙරුනු වාම් සන්නාහය කාලයක් තිස්සේ පාවිච්චි කල එකක් බැව් පැහැදිලිවම පෙනෙන්නට තිබින. ඔහු සිය පිටේ පැළඳ සිටි දිගු අසිපතේ - දෑතින්ම එසවිය යුතු, එහි දිග නිසාම ඉණෙහි පැළඳිය නොහැකි දිගු අසිපතේ - මිට දකුණු උරහිසට උඩින් දැකිය හැකි විය.

"රජතුමා දඩයමේ ගිහිල්ලා. ඒත් මට විශ්වාසයි එතුමා ආපහු ආවහම ඔබලාව දැකීමෙන් සතුටු වෙයි කියලා." රැජිණ තමා ඉදිරියේ දණ නමා සිටි නයිට්වරුන් දෙදෙනාට කීවා ය. එනමුදු සන්සාට තුන්වැන්නා කෙරෙන් දෑස් ඉවතට ගැනීම අපහසු බව හැඟුනි. තමා වෙත එල්ල වී ඇති දෑසක බර දැනුනු නිසාදෝ ඔහු සෙමින් හිස හරවා බැලුවේ ය. ලේඩි ගොරවන්නට වූවා ය. ඈ කිසිදා නොදැන සිටි අන්දමේ බියක් හදිසියේම සන්සා තුළ නැග එන්නට විය. පසුපසට අඩියක් තැබූ ඈ කිසිවකු ගේ ඇඟේ හැපින.

ශක්තිමත් දෑතක් විසින් ඇගේ උරහිසින් අල්ලා ගැනින. ඒ සිය පියා විනැයි සන්සා පළමුව සිතුවත් ආපසු හැරුනු ඇය දුටුවේ තමා දෙස බලා සිටින සැන්ඩෝර් ක්ලිගේන් ගේ පිළිස්සුනු මුහුණ ය. ඔහු ගේ මුහුණේ ඇඳී තිබුනේ සමච්චල් සහගත සිනහවකි. "ඔයා වෙවුලනවා කෙල්ලේ. මම ඔයාව එච්චරටම බය කලාද?"

ඇත්තෙන්ම, ඇය ඒ පිළිස්සුනු මුහුණ දුටු දා පටන් ඊට බිය වූවද අර අනිත් තැනැත්තා ඇ තුළ ඇති කල බිය හා සසඳා බලද්දී එය නොතකා හැරිය හැකි තරම් විය. සිය උරහිස වැරෙන් ඇද්ද සන්සා ඔහුගෙන් ගැලවුනු අතර ඔහු මහ හඬින් සිනාසෙන්නට විය. ඔවුන් දෙදෙනා අතරට පිනූ ලේඩි අනතුරු හඟවන හඬින් ගොරවන්නට වූ නමුදු බිම දණ ගැසූ සන්සා වෘකයා වටා දෑත් යවා ඌ වැළඳගත්තා ය. පිරිස ඔවුන් වඩා කවයක් සැදෙන්නට වූ අතර අතරින් පතර කෙරුනු කටුකුටුවත් සිනා හඬත් ඇයට ඇසෙන්නට විය.

"වෘකයෙක්!" එක් මිනිසෙක් කීවේ ය. "අපායටම පලයං! ඒ සෝරවෘකයෙක්." දෙවැන්නෙක් කීය. "ඌ මොකක්ද මේ කඳවුර ඇතුළෙ කරන්නෙ?" පළමුවැන්නා ඇසී ය. දඩබල්ලා සිය ගොරෝසු ස්වරයෙන් ඊට පිළිතුරු දුනි. "ස්ටාර්ක්ලා උංව පාවිච්චි කරනවා දරුවන්ගෙ ආයම්මලා හැටියට." ආගන්තුක නයිට්වරුන් දෙදෙනා ඇද ගත් අසිපත්වලින් යුතුව තමා සහ ලේඩි දෙස බලා සිටින ආකාරය සන්සා දුටුවා ය. ඇය නැවතත් බිය පත් වූවා ය. ඇගේ දෑසට කඳුළු පුරා එන්නට විය.

Cersei Lannister: “If the wicked do not fear the King’s Justice, you have put the wrong man in the office.”

"ජොෆ්රි, එයා ළඟට යන්ට." රැජිණ කියනු ඇයට ඇසින.

ඊළඟ මොහොතේ ඇගේ කුමරා ඈ අසලට පැමිණියේ ය.

"එයාට ඉන්ට දෙන්ට." ජොෆ්රි කීවේ ය. සිය අත දිගු කල ඔහු ඇයව දෙපයින් සිටවී ය. "මොකක්ද ප්‍රශ්නෙ මගේ සුන්දර ආර්යාවනි? ඇයි ඔබ බය වෙලා ඉන්නෙ? කවුරුවත් ඔබට හිරිහැර කරන්නෙ නෑ. ඔය කඩු පහත දාපල්ලා. හැමෝම. මේ වෘකයා එයාගෙ පුංචි හුරතලා. එච්චරයි." ඔහු සැන්ඩෝර් ක්ලිගේන් දෙස බැලීය. "උඹත් බල්ලො. මෙතනින් අහකට පලයං. උඹ මගේ කුමාරිව බය කරනවා."

පක්ෂපාතී වූ දඩබල්ලා හිස නමා ආචාර කොට සෙනග අතරින් රිංගා නොපෙනී ගියේය. තමාව නිශ්චල කරගැනීමට සන්සා දැඩි උත්සාහයක් දැරුවාය. තමා මහ මෝඩියක යැයි ඇයට හැඟෙන්නට විය. ඇය වින්ටර්ෆෙල්වල ස්ටාර්ක් කෙනෙකු වූ අතර වංශවත් ආර්යාවක් ද වූවා ය. යම් දිනෙක ඇය මේ රාජධානියේ රැජිණ වීමට යන්නී ය. "ඒ එයා නිසා නෙවෙයි මගේ ආදරණීය කුමරුනි. ඒ අර අනිත් කෙනා නිසා."

ආගන්තුක නයිට්වරුන් දෙදෙනා වික්ෂිප්ත බැල්මක් හුවමාරු කරගත්හ. "පේන්?" කොළ පැහැ සන්නාහයෙන් සැරසුනු තරුණ මිනිසා සරදම් හඬින් ඇසී ය.

ධවල වර්ණයෙන් සැරසුනු මහළු මිනිසා ඇයට කරුනාවෙන් ඇමතී ය. "සෙර් ඉලියන් සමහර වෙලාවට මාවත් බය කරනවා ආර්යාවනි. එයාට මහ භයානක පෙනුමක් තියෙනවා තමා."

"එයා එහෙම වෙන්ට ඕන." රැජිණ අශ්ව කරත්තයෙන් බැස ඔවුන් දෙසට ඇවිද ආවා ය. පිරිස දෙපසට වී ඇයට අවකාශ සලසා දුන්හ. "රජතුමාගෙ අළුගෝසුවට අපරාධකාරයො බයවෙන්නෙ නැත්තම් එතනට පත්කරලා තියෙන්නෙ වැරැදි මිනිහව."

"ඒ කියන්නෙ ඔබ ගැලපෙනම පුද්ගලයයි තෝරගෙන තියෙන්නෙ උත්තමාවනි." සන්සා කීවා ය. පිරිස අතරින් සිනා හඬක් මතු විය.

"නියම උත්තරයක් දරුවා." සුදු ඇඳුමින් සැරසුනු මහළු මිනිසා කීය. "එඩාර්ඩ් ස්ටාර්ක් ගෙ දූවෙකුට ගැලපෙන විදියටම උත්තර දුන්නා. ඔබව අඳුනාගන්නට ලැබීම ගෞරවයක්. මම රාජ්‍යාරක්ෂක බලකායේ සෙර් බැරිස්ටාන් සෙල්මි." ඔහු හිස නැමී ය.

සන්සා ඒ නම දැන සිටියා ය. වසර ගණනාවක් පුරා සෙප්ටා මෝර්ඩේන් ඇයට උගන්වා තිබුනු ආචාරශීලීත්වය ඇයට මතක් විය. "රාජ්‍යාරක්ෂක බලකායේ අණ දෙන නිළධාරිතුමා. අපේ රොබර්ට් රජතුමා ගේ හා ඊට කලින් ඒරිස් ටාර්ගේරියන් රජතුමා ගේ රාජ්‍ය උපදේශකයා. ඔබ මුනගැසීම ඇත්තෙන්ම මට ලොකු ගෞරවයක් නයිට්වරයානනි. අපි ඉන්න උතුරුකරයේ පවා නිර්භීත බැරිස්ටාන් ගේ වික්‍රමයන් ගැන ගීත ඇහෙනවා."

කොළ පැහැ නයිට්වරයා සිනාසුනි. "මම හිතන්නෙ ඔබ අදහස් කරන්ට ඇත්තෙ නාකි බැරිස්ටාන් කියලයි. එයාව ඔච්චරටම මුරුංගා අත්තෙ තියන්ට එපා දරුවා. මිනිහා දැනටමත් එයා ගැන බොහොම ලොකු අධිතක්සේරුවකින් ඉන්නෙ. හොඳයි වෘක කෙල්ලෙ, දැන් ඔබට පුළුවන්නම් කියන්ට මගෙ නමත්. එතකොට මම පිළිගන්නම් ඔබ ඇත්තටම එඩාර්ඩ් උතුමානන්ගෙ දූවක් කියලා."

ඇය පසෙකින් සිටගෙන සිටි ජොෆ් දරදඬු විය. "ඔබ කොහොමද ඔය තාලෙන් කතා කරන්නෙ මගේ අනාගත රැජිණට?"

"මට පුළුවන් උත්තර දෙන්ට." සන්සා වහා කීවේ සිය කුමරාගේ කේන්තිය නිවන්නට මෙනි. කොළ පැහැ නයිට්වරයා දෙස බැලූ ඇය මඳ සිනාවක් පෑවා ය. "ඔබේ හිස්වැස්මෙ රත්තරන් අං තට්ටුවක් හයිකරලා තියෙනවා මගෙ උතුමානනි. ගෝනා කියන්නෙ රාජකීය පෙළපතේ සළකුණයි. රොබර්ට් රජතුමාට සහෝදරයින් දෙන්නෙක් ඉන්නවා. නමුත් ඔබේ අතිශය තරුණ බව නිසා මට නිසැකයෙන්ම කියන්ට පුළුවන් ඔබ තමා ස්ටෝර්ම් එන්ඩ්වල උතුමානන් සහ රජතුමාගෙ උපදේශකයා වන රෙන්ලි බරතියන් කියලා."

සෙර් බැරිස්ටාන් කෙකර සිනහවක් පහළ කලේ ය. "එයාගෙ අතිශය තරුණ බව නිසා මට සැක නැතුව කියන්ට පුළුවන් එයා වෙන කවුරුත් නෙවෙයි උඩඟු ජේත්තුකාරයෙක් විතරයි කියලා."

සැම අතින්ම සිනා හඬ නැගෙන්නට වූ අතර රෙන්ලි උතුමානන්ද ඔවුන්ට එක් විය. මොහොතකට පෙර එහි තිබුනු නොඉවසුම්බව පහවී ගිය අතර සන්සාට සැහැල්ලුවක් දැනෙන්නට පටන්ගත්තා ය. එනමුදු ඒ මොහොතකට පමණි. ඇය ඉදිරිපිට සිටි මිනිසුන් දෙදෙනා දෙපසට කල සෙර් ඉලියන් පේයින් කිසිදු සිනාවක් නොමැති මුවෙන් යුතුව ඇය ඉදිරියේ සිටගත්තේ ය. ඔහු කිසිදු වදනක් දෙඩුවේ ද නැති අතර දිගටම සන්සා දෙස බලා සිටින්නට විය. දත් විලිස්සූ ලේඩි ගොරවන්නට පටන් ගත් අතර උගේ හිසට සෙමින් තට්ටු කල සන්සා ඌ නිහඬ කරන්නට සමත් විය. "මම කියපු දෙයින් ඔබට අපහසුතාවක් වුනා නම් මට සමාවෙන්ට සෙර් ඉලියන්." ඇය කීවා ය.

පිළිතුරක් බලාපොරොත්තුවෙන් ඇය මොහොතක් නැවතී සිටි නමුදු කිසිදු පිළිතුරක් ලැබුනේ නැත. ඔහු තමා දෙස බලා සිටි ආකාරය දුටු විට ඒ සුදුමැලි දෑස් විසින් තමා හැඳ සිටින සළුපිළි ගලවා ඉවත්කොට, තමාව හම ගසා, තම ආත්මය නිරුවත් කොට ඔහු ඉදිරියේ සිටුවා තැබුවාක් වැනි හැඟීමක් ඇයට දැනෙන්නට විය. ඔහු කිසිදු වදනක් නොදොඩාම ආපසු හැරී ඉවතට ඇවිද ගියේ ය.

අන්දුන් කුන්දුන් වූ සන්සා සිය කුමරා දෙස බැලී ය. "මම මොකක් හරි වැරැදි දෙයක් කිවුවද ස්වාමිනී? ඇයි එයා මට කතා නොකලේ?"

"පහුගිය අවුරුදු දාහතර තිස්සෙම සෙර් ඉලියන් කතා කරන්ට එච්චර උනන්දුවක් පෙන්නුවෙ නෑ." රෙන්ලි උතුමානන් කීවේ මුවේ රැඳුනු දඟකාර සිනහවක්ද ඇතිවය.

ජොෆ්රි සිය මාමා වෙත පිළිකුල මුසු බැල්මක් හෙලී ය. ඉන්පසු සන්සා ගේ අතින් අල්ලාගත්තේ ය. "ඒරිස් ටාර්ගේරියන් ගිනියම් අඬුවකින් එයාගෙ දිව උගුල්ලලා දැම්මා."

"ඒ වුනාට එයා බොහොම ව්‍යක්ත විදියට එයාගෙ කඩුවෙන් කතා කරනවා." රැජිණ ද කතාවට සම්බන්ධ වූවා ය. "අනිත් එක අපේ රාජධානිය වෙනුවෙන් එයාගෙ තියෙන ඇල්ම ගැන කිසිකෙනෙකුට සැක කරන්ට බෑ." ඇය සන්සා දෙස බලා සුන්දර සිනහවක් පෑවා ය. "සන්සා, ඔයාගෙ තාත්තයි රජතුමායි ආපහු එනකම් මම මේ හොඳ උපදේශකයො දෙන්නත් එක්ක ටිකක් කතා කරන්ට ඕන. බොහොම කනගාටුයි, ඒත් අපට මර්සෙලා කුමාරිත් එක්ක දවස ගෙවන එක වෙන දවසකට කල්දාන්ට වෙනවා.

කරුනාකරලා ඔයාගෙ සහෝදරීට කියන්ට මම සමාව ඉල්ලුවයි කියලා. ජොෆ්රි, සමහරවිට ඔයා කැමතිවෙයි එයත් එක්ක ටිකක් කාලය ගතකරන්ට."

"බොහොම සතුටින් කරන්නම් අම්මෙ." ජොෆ්රි කීවේ ය. ඇගේ අතින් අල්ලාගත් ඔහු අශ්ව කරත්තය වෙතින් ඉවතට ඇවිද ගියේ ය. සන්සා ගේ සිත සතුටින් ඉපිල යන්නට විය. සිය කුමරාත් සමග මුළු දවසක්ම ගතකරන්නට! ඇය ජොෆ්රි දෙස වන්දනීය බැල්මක් හෙලුවා ය. ඔහු කෙතරම් ශූර වීර ගුන ඇත්තෙක්ද! ඔහු ඇයව සෙර් ඉලියන් හා දඩබල්ලාගෙන් බේරාගත් අයුරු. එය හරියටම වීර කාව්‍යයන්හි කියැවෙන්නාක් මෙනි. දර්පණ පලිහේ සෙර්වින් විසින් ඩේරිස්සා කුමරියව යෝධයින්ගෙන් ගලවා ගත්තාක් වැනිය. නැත නැත, එය හරියටම මකර නයිට්වර ඒමන් කුමරා විසින් නපුරු සෙර් මෝර්ගිල් ගේ අපහාස උපහාස වලින් නේරිස් රැජිණ ගේ ගෞරවයට හානි නොවී ගලවාගත්තාක් වැනිය.

ජොෆ්රි ගේ අත සිය බාහුවේ ගැටුනු විට ඇගේ හෘදස්පන්දනය සියගුනයකින් ඉහළ ගියේ ය. "ඔබ මොකක් කරන්නටද කැමැති?"

ඔබත් එක්ක ඉන්ට, සන්සා සිතුවා ය. "ඔබ කැමැති ඕනම දෙයක් මගේ කුමරුනි."

ජොෆ්රි මොහොතක් කල්පනා කලේ ය. "අපි අශ්වයො පිටේ යමු."

"ආහ්! මම හරිම ආසයි අශ්වයො පිටේ යන්ට."

ජොෆ්රි පසුපස හැරී ඔවුන් ගේ දෙපා අසලින්ම පැමිණෙන ලේඩි දෙස බැලුවේ ය. "ඔබේ වෘකයා නිසා අශ්වයො බයවෙන්ට පුළුවන්. අනිත් අතට ජේන විදියටනම් මගේ බල්ලා නිසා ඔබ බයවෙනවා. ඉතිං ඒ දෙන්නවම දාලා අපි දෙන්නා විතරක් යමු. ඔබ මොකද හිතන්නෙ?"

සන්සා තැතනුවා ය. "ඔබේ කැමැත්තක්." ඇය අතිරණාත්මක හඬින් කීවා ය. "මම හිතන්නෙ මට ලේඩිව ගැටගහලා එන්ට වෙයි. මම දැනන් හිටියෙ නෑ ඔබට බල්ලෙක් ඉන්නවා කියලා..."

ජොෆ්රි සිනාසුනේ ය. "ඒ ඇත්තටම මගේ අම්මගෙ බල්ලා. අම්මා එයාට බාර දීලා තියෙන්නෙ මාව ආරක්ෂා කරන්ට."

"ආහ්! ඔබ මේ කියන්නෙ දඩබල්ලා ගැන." එය තේරුම් ගැනීමට මෙතරම් පමා වීම ගැන ඇයට තමා ගැනම කේන්තියක් ඇති විය. "එයාව දාලා යන එක ආරක්ෂාකාරීද?"

ඇය මෙවැන්නක් ඇසීම ගැන ජොෆ්රි ගේ සිතේ තරහක් ඇති වූ බවක් පෙනින. "බයවෙන්ට එපා මගේ ආර්යාවනි. මම වැඩුනු මිනිහෙක් හා සමානයි. මම ඔබේ සහෝදරයො වගේ ලී කඩුවලින් සෙල්ලම් කරන්නෙ නෑ. මට මෙන්න මෙච්චරයි ඕන කරන්නෙ." ඔහු සිය අසිපත ඇද ඇයට පෙන්වී ය. එය වසර දොළසක ළමයෙකුට ගැලපෙන අන්දමින් දිග අඩු කල, දිදුලන නිල් පැහැ වානේවලින් තැනුනු, රනින් නිමවූ සිංහ හිසකින් සැරසූ මිටකින් සමන්විත සුන්දර වස්තුවකි. සන්සා අගය කරන බැල්මෙන් ඒ දෙස බැලූ අතර ජොෆ්රි සතුටු සිනාවක් පෑවේ ය. "මම ඒකට කියන්නෙ 'සිංහ දත' කියලයි." ඔහු කීය.

ඉදින් සිය ආරක්ෂාව පිණිස සිටි සෝරවෘකයාත් ශරීරාක්ෂකයාත් දෙදෙනාම අතහැර දැමූ ඔවුන් දෙදෙනා, සිංහ දත පමණක් අතැතිව ගංගා ත්‍රිශූලයේ උතුරු ඉවුර ඔස්සේ ඇවිදින්නට ගියහ.

------------------------------------

එය ඉතා සුන්දර මායාවී දවසක් විය. වාතය උණුසුම් වූ අතර මල් සුවඳින් පිරී ඉතිරී ගියේ ය. සන්සා උතුරුකරයේ වනාන්තරවල කිසිදා නොදුටු අමුතුම සුන්දරත්වයක් මේ දකුණේ වනාන්තරවල තිබින. ජොෆ්රි කුමරා ගේ අශ්වයා සුළඟ මෙන් වේගවත් රතු-දුඹුරු පැහැ එකෙකු වූ අතර ඔහු ඉතා සාහසික නොසැලකිලිමත් ස්වභාවයකින් අසු මෙහෙයවී ය. ඔහු කෙතරම් වේගයකින් අසු පැන්නුවාද යත් සන්සාට ඔහු හා සමපාත වීමට දැඩි උත්සාහයක්

දැරිය යුතු විය. ඔවුහු පළමුව ගංඉවුරේ වූ ගල්ගුහා නිරීක්ෂණය කලහ. ඉන්පසු දිවියකු ගේ පියසටහන් ඔස්සේ උගේ ලෙන සොයා ගියහ. කුසගිනි දැනුනු කල අසල තිබුනු කුඩා බලකොටුවක් සොයාගත් ජොෆ් ඔවුන්ට කෑම සපයන මෙන් එහි විසූවන්ට අණ කලේය. සන්සා පෙර කිසිදු දිනක නොකල තරම් වයින් පානය කලා ය. "මගේ තාත්තා අපට බොන්ට දෙන්නෙ එක වයින් කෝප්පයක් විතරයි. ඒකත් උත්සව දවස්වලට." ඇය සිය කුමරාට පාපොච්චාරණයක් කලා ය.

"මගේ කුමාරිට එයා කැමැති තරම් වයින් බොන්ට පුළුවන්." ජොෆ් කීවේ ඇගේ කුසලාණ නැවත පුරවමිනි.

ආහාර ගැනීමෙන් පසු ඔවුහු පෙරට වඩා සෙමින් ගමන් කරන්නට වූහ. ජොෆ් ඇය වෙනුවෙන් ගායනා කල අතර ඔහු ගේ හඬ මිහිරි හා ජීවමය බවකින් පිරී තිබින. වයින් නිසා සන්සා සිටියේ තරමක මත් ගතියකිනි. "අපි ආපහු යන්ට පටන් ගන්ට ඕන නැද්ද?" ඇය ඇසුවා ය.

"ඉක්මනටම. යුද්ධභූමිය තියෙන්නෙ තව ටිකක් ඉස්සරහ. ගඟේ නැම්ම තියෙන තැන. එතන තමා මගේ තාත්තා රේගාර් ටාර්ගේරියන්ව මරලා දැම්මෙ. ඔබ දන්නවනෙ පපුවට දුන්නු එකම එක පාරකින්, සන්නාහය ඔක්කොම පොඩිපට්ටම් වුනා. ඊටපස්සෙ මගෙ මාමා ජේමි නාකි ඒරිස්ව මරලා දැම්මා. මගෙ තාත්තා රජවුනා... මොකක්ද ඒ ඇහෙන සද්දෙ?"

සන්සාටත් එය ඇසී තිබින. වනය ඇතුළතින් නැග ආ ලී දෙකක් එකට වදින හඬක්. "මම දන්නෙ නෑ." ඇගේ සිතට බියක් දැනෙන්නට විය. "ජොෆ්රි, අනේ අපි ආපහු යමු."

"මට බලන්ට ඕන මොකක්ද ඒ සද්දෙ කියලා." ශබ්දය ඇසුනු දෙසට ජොෆ් සිය අසු හැරවී ය. ඔහු පසුපසින් වැටීම හැර වෙන විකල්පයක් සන්සාට නොවී ය. ශබ්දය වඩාත් වැඩි වන්නට වූ අතර වඩා පැහැදිලිද විය. ලීයක් තවත් ලීයක් මත තදින් වදින හඬක්. තව තවත් ලංවෙද්දී කිසිවෙකු තදින් හුස්ම ගන්නා හඬත් යමෙකු වේදනාව නිසා උගුරෙන් පිට කල හඬත් ඔවුනට ඇසෙන්නට විය.

"කවුරුහරි අතන ඉන්නවා." සන්සා වියවුල් සිතින් කීවා ය. සිය සෝරවෘකයා සිටියානම් යැයි ඇයට සිතින.

"මගෙත් එක්ක ඉන්නකං ඔබ ආරක්ෂාකාරීයි." ජොෆ්රි සිය අසිපත කොපුවෙන් මැත් කරගත්තේ ය. "මේ පැත්තෙන්." ඔහු කීවේ තුරු ගොමුවක් අතරින් අසු මෙහෙයවමිනි.

තුරු ගොමුවට එහායින් ගංඉවුරට මුහුණ ලා හිස් බිමක් විය. කුඩා කෙල්ලක් හා කොල්ලෙක් එහි සටන් පුහුණු වෙමින් සිටියහ. අසිපත් වෙනුවට ලී දඬු දෙකක් නැතහොත් කොසු මිටවල් දෙකක් යොදාගත් ඔවුන් දෙදෙනා තණකොළ උඩින් එහා මෙහා පනිමින් එකිනෙකාට වැරෙන් පහර එල්ලකරමින් සටන් කලහ. කොළුවා සිය සගයාට වඩා වයසිනුත්, උසිනුත්, ශරීර ශක්තියෙනුත් වැඩි එකෙකු විය. දැරිය හමගිය සම් ඇඳුමකින් සැරසුනු කෙසඟ එකියක් වූවා ය. ඇය එහාට මෙහාට පනිමින්, දෙකට නැවෙමින් කොළුවා එල්ල කරන පහරවල් සිය කොසුම්ටෙන් වැලැක්වීමට උත්සාහ කරමින් සිටියද එය සැමවිටම සාර්ථක නොවී ය. ඉදිරියට පැන කොළුවාට පහරක් එල්ල කිරීමට ඇය යත්නයක් දැරූ අතර පහසුවෙන්ම එම පහර වැලකූ කොළුවා ඇගේ අතැඟිලි වලට පහර දුන්නේ ය. ඇය වේදනාවෙන් කෑ ගැසූ අතර අවිය පසෙකට විසි විය.

ජොෆ්රි කුමරා මහ හඬින් සිනාසුනි. තැතිගෙන විසල් වූ දෑසින් ආපසු හැරි බැලූ කොළුවා සිය දණ්ඩ බිම අත හැරියේ ය. දැරිය ඔවුන් දෙස රවා බැලුවා ය. භීතිය නිසා සන්සා ගේ කට ඇරුනි. "ආර්යා!" ඇය විශ්වාස නොකරන ස්වරයෙන් මුර ගෑවා ය.

"යනවා යන්ට." ආර්යා පෙරලා කෑ ගැසුවා ය. කේන්තිය නිසා ඇගේ දෑසට කඳුළු පුරා තිබින. "ඔයාලා මොනවද මෙතන කරන්නෙ? අපට ඉන්ට දීලා යනවා යන්ට."

ජොෆ්රි ආර්යා දෙසත්, සන්සා දෙසත් නැවත ආර්යා දෙසත් බැලී ය. "මේ ඔබේ සහෝදරීද?" ඇය ලජ්ජාවෙන් හිස වැනුවා ය. ජොෆ්රි කොළුවා දෙස නිරීක්ෂණාත්මක බැල්මක් හෙලුවේ ය. "එතකොට උඹ කවුද කොල්ලො?" ඔහු ගේ හඬ අධිකාරී බවකින් පිරී තිබින.

"මයිකා." කොළුවා සෙමින් මිමිනී ය. කුමරාව හඳුනා ගත් ඒ දෑස් බිමට නැමුරු විය. "මයෙ උතුමානනි."

"එයා මස්කාරයගෙ පුතා." සන්සා කීය.

"එයා මගෙ යාළුවා." ආර්යා තියුණු හඬින් කීවා ය. "එයාට ඉන්ට දෙන්ට."

"මස්කාරයගෙ කොල්ලට නයිට්වරයෙක් වෙන්ට හිතිලා ඒ?" ජොෆ්රි අසිපත අතැතිව අසු පිටින් බිමට පැන්නේ ය. "උඹේ කඩුව අහුලගනින් මස්කාරයගෙ කොල්ලො. අපි බලමු උඹ කොච්චර දක්ෂ සටන්කාරයෙක්ද කියලා."

භීතිය නිසා ගල්ගැසුනු මයිකා එතනම සිටගෙන සිටියේ ය.

ජොෆ්රි ඔහු දෙසට පිය මැන්නේ ය. "ඉතිං බලා ඉන්ට එපා අහුලගනින්. එහෙමත් නැත්තං උඹ සටන් කරන්නෙ කෙල්ලොත් එක්ක විතරද?"

"එයයි මගෙන් ඇහුවෙ මයෙ උතුමානනි. එයා තමයි මට කිවුවෙ."

ආර්යා දෙස හෙලූ එක් බැල්මකින්ම ඔහු කියන්නේ සත්‍යයක් බැව් සන්සා වටහාගත්තා ය. එනමුදු ජොෆ්රි සිටියේ ඇහුම්කන් දෙන මට්ටමක නොවේ. වයින් මත නිසා ඔහු ඇවිස්සී සිටියේ ය. "උඹ කඩුව අහුලගන්නවද නැද්ද?"

මයිකා හිස වැනී ය. "ඒක නිකංම දණ්ඩක් විතරයි මයෙ උතුමානනි. ඒක කඩුවක් නෙවෙයි. දණ්ඩක් විතරයි."

"උඹත් මස්කාරයෙකුගෙ පුතා විතරයි. නයිට්වරයෙක් නෙවෙයි." සිය අසිපත එසවූ ජොෆ්රි එහි තුඩ මයිකා ගේ කම්මුලක් මත තැබී ය. කොළුවා බිය නිසා වෙවුලන්නට විය.

"උඹ දන්නවද උඹ ඔය පහරදුන්නෙ මගෙ කුමාරිගෙ සහෝදරීට?" අසිපත් තුඩ මසට තදවුනු තැනින් රුධිර බිඳුවක් මතුව ආ අතර කම්මුල දිගේ රත් පැහැ රුධිර ධාරාවක් පහළට ගලන්නට පටන්ගත්තේ ය.

"ඕක නවත්තනවා." ආර්යා කෑ ගැසුවා ය. බිම වැටී තිබුනු සිය දණ්ඩ ඇය අහුලා ගත්තා ය.

සන්සා බියපත් වූවා ය. "ආර්යා, ඔයා මේකෙන් අයින් වෙලා ඉන්ට."

"මම ඌට රිද්දන්නෙ නෑ... වැඩිය." ජොෆ්රි ආර්යාට කීවේ මයිකා වෙතින් දෑස් මුදා නොගනිමිනි.

ආර්යා ඔහු දෙසට පිනී ය.

සන්සා සිය වෙළඹ පිටින් රූටා පහළට බැස්සද ඇය පමා වූවා වැඩි විය. දණ්ඩ දෑතින්ම අල්ලා ගත් ආර්යා ජොෆ්රිට පහරක් එල්ල කලා ය. එය මහ හඬක් නංවමින් කුමරා ගේ හිසේ පිටුපස වැදී දෙකට කැඩිනි. ඊළඟ මොහොතේ සන්සා ගේ බියපත් දෑස් ඉදිරියේ දහසක් දේවල් එකවර සිදුවිය. විස්මයට පත් ජොෆ්රි අවලාද නගමින් ආපසු හැරුනේ ය. සිය දෙපයට තමා සතු මුළු වෙර යෙදූ මයිකා තුරුගොමුව තුළට පලාගියේ ය. ආර්යා නැවත වරක් කුමරාට පහරක් එල්ල කල නමුදු ඔහු සිය අසිපතෙන් එය පහසුවෙන්ම වැලකී ය. ඈ අත වූ දණ්ඩ පසෙකට විසි වී ගියේ ය. ඔහු ගේ හිස පිටුපස රුධිරය නිසා රත් පැහැ වී තිබුනු අතර ඒ දෑස් වියරුවෙන් පිරී තිබ්න.

සන්සා බියෙන් බිරුසන් දුන්නා ය. "එපා. එපා. අනේ නවත්තන්ට. ඔය දෙන්නම ඕන නවත්තන්ට. ඔයාලා ඔක්කොම විනාශ කරලා දානවා." එනමුදු කිසිවෙකු ඇයට ඇහුම්කන් දුන් බවක් පෙනෙන්නට නොවී ය.

ගලක් අහුලාගත් ආර්යා ජොෆ්රි වෙත දමා ගැසුවා ය. එනමුදු ඉලක්කය වැරැදී ගිය ගල වැදුනේ ඔහු ගේ අශ්වයාට වූ අතර කුලප්පු වූ සත්ත්වයා වනය තුළට දිව ගියේ ය.

"අනේ නවත්තන්ට. අනේ ඕක නවත්තන්ට." සන්සා කෑ ගැසුවා ය.

ජොෆ්රි නොසරුප් බසින් බනිමින් ආර්යා වෙත සිය අසිපතෙන් පහරක් එල්ල කල අතර ආර්යා එයින් බේරීමට පසුපසට පැන්නා ය. ඇය දැන්නම් සැබවින්ම බියපත්ව සිටියා ය. එනමුදු ඇයට මගහැරීමට ඉඩක් නොදුන් ජොෆ්රි දිගටම පහර එල්ලකරමින් ඇයව තුරුගොමුව දෙසට හඹාගියේ ය. කුමක් කරන්නදැයි සන්සාට සිතා ගත නොහැකි විය. ඇය කිසිදු පිළිසරණක් නොමැතිව කඳුළු පිරි දෑසින් ඔවුන් දෙස බලා සිටියා ය.

ඊළඟ මොහොතේ ඇයව පසුකරමින් අඳුරු පොදියක් ඉදිරියට පැන්නේ ය. දත් විලිස්සාගත් නයිමේරියා පිම්මක් පැන ජොෆ්රි ගේ අසිපතැති අත හණු අතරට තදකර ගත්තා ය. අවිය අතින් ගිලිහී ගිය අතර ප්‍රහාරයේ දැඩි බව නිසා ඔහු ගේ සමබරතාව බිඳී ගියේ ය. ඔවුන් දෙදෙනාම එක පොදියට බිම පෙරලිනි. වෘකයා ගොරවමින් දත් විලිස්සමින් ජොෆ්රි ගේ සිරුර මත නැග සිටි අතර ඔහු වේදනාවෙන් කෑ ගැසීය. "ඌව අයින් කරගන්ට. ඌව අයින් කරගන්ට."

ආර්යා ගේ හඬ කසයක් මෙන් නැග ආවේ ය. "නයිමේරියා."

කුමරාව අත හැර දැමූ සෝරවෘකයා ආර්යා පසෙකින් සිටගත්තා ය. තණබිම මත වැතිර සිටි කුමරා වේදනාවෙන් ඉකිබිඳිමින් සිය තුවාල වූ අත අල්ලාගෙන සිටියේ ය. ඔහු ගේ කමිසය ලෙයින් පෙඟී තිබින. "ඌ ඔබට රිද්දෙවුවෙ නෑ... වැඩිය." ආර්යා කීවා ය. සිංහ දත වැටී තිබුනු තැනින් අහුලාගත් ඇය එය දෑතින්ම ඔසවාගෙන ඔහු පසෙකින් සිටගත්තා ය.

ඇ දෙස බැලූ ඔහු කුඩා බලු පැටවෙකු මෙන් බියෙන් ඉකිබිඳින්නට විය. "එපා. අනේ මට රිද්දන්ට එපා. මම අම්මට කියනවා."

"ඔයා එයාට ඉන්ට දෙන්ට." සන්සා සිය සොයුරියට කෑ ගැසුවා ය.

ආපසු හැරුනු ආර්යා සිය මුලු වැර යොදා අසිපත වීසිකලා ය. අසිපත හිරු එළියේ නිල් පැහැයෙන් දිදුලමින් ගංගාව දෙසට කරකැවී ගොස් ජලතලය මතට වැටී නොපෙනී ගියේ ය. ජොෆ්රි වේදනාත්මක හඬක් නැගී ය. ආර්යා සිය අශ්වයා දෙසට දිව ගිය අතර නයිමේරියා ඈ පසුපසින් වැටුනා ය.

ඔවුන් ගිය පසු සන්සා ජොෆ්රි වෙතට ගියා ය. වේදනාව නිසා ඔහු ගේ දෑස් පියවී තිබුනු අතර ඔහු අමාරුවෙන් හුස්ම ගත්තේ ය. සන්සා ඔහු පසෙකින් දණ ගැසුවා ය. "ජොෆ්රි." ඇය ඉකිබින්දා ය. "අනේ බලන්ට එයාලා කරපු දේ. බලන්ට එයාලා කරපු දේ. මගේ අහිංසක කුමාරයා. බයවෙන්ට එපා. මම අර බලකොටුවට ගිහිල්ලා උදවු අරගෙන එන්නම්." සෙමින් අත දිගු කල ඇය ඔහු ගේ රන්වන් කෙහෙරැළි පිරිමැද්දා ය.

සැනෙන් විවර වූ ඒ දෑස් ඇය දෙස බැලී ය. ඒ දෑස් පිරී තිබුනේ පිළිකුලෙන් හා අධම දුෂ්ට අවමානයෙන් මිස අන්කිසිවකින් නොවී ය. "එහෙනං පලයං." ඔහු ඈ දෙසට කෙල ගැසී ය. "මාව අල්ලන්ට විතරක් එපා."

Arya Stark: “I don’t like the queen.”

එඩාර්ඩ්

"එයාලා ඇයව හොයාගෙන මගෙ උතුමානනි."

නෙඩ් සැනින් නැගිට සිටියේ ය. "අපේ මිනිස්සුද නැත්තං ලැනිස්ටර්ලාද?"

"ඒ ජොරී." ඔහු ගේ නිවාස බාරකරු වූ වයෝන් පූල් පිළිතුරු දුන්නේ ය. "ඇයට අනතුරක් නෑ."

"දෙයියන්ට ස්තූති වේවා!" නෙඩ් කීවේ ය. ඔහු ගේ මිනිසුන් ආර්යාව සොයන්නට පටන් ගෙන දැනට සිවු දිනකි. එනමුදු රැජිණ ගේ මිනිස්සු ද ඇයව 'දඩයම්' කරමින් සිටියහ. "කෝ දැන් එයා? ජොරීට කියන්ට මේ දැන්ම එයාව මගෙ ළඟට එක්කන් එන්ට කියලා."

"මට සමාවෙන්ට උතුමානනි. ගේට්ටුවෙ හිටපු මුරසෙබළු ලැනිස්ටර් මිනිස්සු. ජොරී ඇයව එක්කන් ආපු ගමන්ම උං රැජිණට පණිවුඩයක් යැවුවා. ඇයව කෙලින්ම රජතුමා ළඟට එක්කන් ගියා..."

"මේ ගෑනිව යකාට ගියාවෙ." නෙඩ් පැවසුයේ දොර දෙසට ඉක්මන් පියවර තබමිනි. "සන්සාව හොයාගෙන එයත් එක්ක එන්ට සභාශාලාවට. එයා කියන දේත් අහන්ට අවශ්‍ය වෙයි." නැග එන කෝපයෙන් යුතුව ඔහුව පඩිපෙළ බැස්සේ ය. පසුගිය දින තුන තිස්සේම ඔහු සෙවුම් කණ්ඩායමට නායකත්වය දුන්නේ ය. ආර්යා අතුරුදන් වූ දිනයේ සිට ඔහුට පැයකට වඩා නිදා ගැනීමට අවස්ථාවක් ලැබී නොතිබින.අද උදෑසන වනවිට ඔහු කෙතරම් විඩාවකින් හා වේදනාවකින් පෙලුනේ ද යත් ඔහුට සිටගෙන සිටීමටවත් හැකියාවක් තිබුනේ නැත. එනමුදු දැන් නැවතත් ඔහු තුළ කෝපය නැග ආ අතර එයම ඔහුට ශක්තියක් ගෙන දුනි.

බලකොටු අංගනය හරහා ගමන් කරද්දී කිහිප දෙනෙකුම ඔහු අමතා කතා කල මුත් කඩිනම නිසා නෙඩ් ඔවුන්ව නොතකා හැරියේ ය. ඔහුට දිව යන්නට සිතුනු මුත් ඔහු

තවමත් රජතුමා ගේ හස්තය වූ අතර කෙතරම් ලොකු හදිසියකදී වුව ඔහු සිය තනතුරේ ආනුභාවය රැක ගත යුතු විය.

බලකොටුව වනාහි ගංගා ත්‍රිශූලයට දකුණින් වූ දවසකින් අඩක පමණ ගමනකින් ළඟා විය හැකි සාමාන්‍ය මට්ටමේ එකක් විය. රාජකීය පිරිස එහි උතුමානන් වූ සෙර් රේමන් ඩැරී ගේ අනාරාධිත අමුත්තන් බවට පත්ව සිටියේ ගංඉවුර දෙපසම ආර්යා සහ මස්කාරයා ගේ පුතා වෙනුවෙන් වූ දඩයම් සංචාර මෙහෙයවමින් තිබුනු බැවිනි. ඔවුන් කිසිවෙකුත් සාදරයෙන් පිළිගත් අමුත්තෝ නොවූ හ. සෙර් රේමන් මේ වනවිට රජතුමා හා සමාදානයෙන් විසූවද ඔහු ගේ පවුල රේගාර් ගේ මකර ධජය යටතේ ත්‍රිශූලය අසල සටනට සහභාගි වී තිබින. ඔහු ගේ වැඩිමහල් සොයුරන් තිදෙනාම මිය ගොස් තිබුනේ මෙම සටනිනි. මේ සත්‍යය රොබර්ට් ගේ හෝ සෙර් රේමාර් ගේ හෝ සිතින් කිසිවිටෙකත් බැහැර වී නොතිබින. රජු ගේ මිනිසුන්, ඩැරී මිනිසුන්, ලැනිස්ටර් මිනිසුන් හා ස්ටාර්ක් මිනිසුන් යන මේ සියල්ලෝම තමන්ට කිසිසේත් ප්‍රමාණවත් නොවන තරමේ මෙම කුඩා බලකොටුව තුළ එක් රැස් වී සිටි අතර එය ඕනෑම මොහොතක පුපුරා යා හැකි පීඩනයක් විය.

රජතුමා විසින් සෙර් රේමන් ගේ සභාශාලාව සිය පාවිච්චියට ගෙන තිබුනු අතර ඔහු ඇතුළුවන විට එය මිනිසුන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබින. එය ඕනෑවටත් වඩා පිරී තිබිනැයි නෙඩ්ට සිතුනි. ඔහු හා රජතුමා පමණක් මීට මැදිහත් වූයේ නම් මෙම ප්‍රශ්නය සමගියෙන් හා මිත්‍ර ලීලාවෙන් විසඳා ගත හැකි වේ යැයි නෙඩ් විශ්වාස කලේ ය.

රොබර්ට් බුම්මාගත් මුහුණින් යුතුව සභාශාලාව කෙලවරක වූ ඩැරී උතුමානන් ගේ උස් ආසනයේ වාඩි වී සිටියේ ය. ඔහු පසෙකින් සෙර්සි ලැනිස්ටර් හා ඇගේ වැඩිමහල් පුත්‍රයා සිටගෙන සිටියහ. රැජිණ ජොෆ්රි ගේ උරහිස මත අතක් රඳවාගෙන සිටි අතර ඔහු ගේ අත තවමත් වෙළුම් පටිවලින් වෙලා තිබින.

ආර්යා ඇගේ තනියට සිටි එකම පුද්ගලයා වූ ජොරී කසල් සමගින් ශාලාව මැද සිටගෙන සිටියා ය. "ආර්යා." උස් හඬින් ඇමතූ නෙඩ් ඇ දෙසට පිය මනින්නට විය. ඔහු දුටු ඇ වැලපෙන්නට පටන් ගත්තා ය.

ඇ පසෙකින් දණක් නමා පහත්වුනු නෙඩ් ඇයව දෝතින් වැළඳ ගත්තේ ය. ඇ වෙවුලමින් සිටින බව ඔහුට දැනින. "මට සමාවෙන්ට!" ඇය දිගින් දිගටම ඉකිබින්දා ය. "මට සමාවෙන්ට, මට සමාවෙන්ට."

"ඒ ඔක්කොම හරි." ඔහු කීය. ඇය කෙතරම් පුංචි කැහැටු අසරණ දැරියක් ද! මෙතරම් පුංචි දැරියක මෙතරම් කරදර ගොඩක් ඇති කරන්නේ කෙසේ දැයි යන්න නෙඩ්ට සිතා ගත නොහැකි කරුණක් විය. "ඔයාට තුවාල වුනාද?"

"නෑ." ඇගේ මුහුණ කුණු දූලියෙන් වැසී තිබින. "පොඩ්ඩක් බඩගිනියි. මම කැලෑ ගෙඩි ජාති වගයක් කෑවා. ඒත් එච්චරයි මට හොයාගන්ට පුළුවන් වුනේ."

"අපි ඉක්මනටම ඔයාට කෑම දෙන්නම්." නෙඩ් පොරොන්දු විය. නැගී සිටි ඔහු රජතුමා ගේ මුහුණ දෙස බැලී ය. "මොකක්ද මේකෙ තේරුම?" ඔහු ගේ දෙනෙත් ශාලාව සිසාරා ගියේ මිත්‍රශීලී මුහුණක් බලාපොරොත්තුවෙනි. එනමුදු ඔහු ගේ මිනිසුන් හැරෙන්නට ඔහු වෙනුවෙන් මිත්‍රශීලී වූ වෙනත් මුහුණු තිබුනේ අල්පයකි. සෙර් රේමන් ඩැරී ඉතා දක්ෂ අයුරින් සිය හැඟීම් සඟවාගෙන සිටියේ ය. රෙන්ලි උතුමානන් ගේ මුවේ මන්දස්මිතයක් රැඳී තිබුනද එහි අරුත කුමක්දැයි වටහා ගැනීම අසීරු විය. සෙර් බැරිස්ටාන් සන්සුන් හා ගම්භීර මුහුණින් සිටි අතර එහි සිටි අනිත් සියල්ලෝම එදිරිවාදී ලැනිස්ටර් මිනිසුන් වූහ. එකම හොඳකට තිබුනේ ත්‍රිශූලයට උතුරින් දඩයම් මෙහෙයවමින් සිටි සෙර් ජේමි ලැනිස්ටර් හා සැන්ඩෝර් ක්ලිගේන් යන දෙදෙනාම මෙහි නොමැති වීම පමණකි. "ඇයි මට දැනුම් දුන්නෙ නැත්තෙ මගේ දූව හොයාගත්තා කියලා." නෙඩ් උස් හඬින් විමසී ය. "ඇයි එයාව කෙලින්ම මගේ ළඟට අරන් ආවෙ නැත්තෙ?"

ඔහු ප්‍රශ්නය ඇසුවේ රොබර්ට් වෙතින් වුවද පිළිතුරු පැමිණියේ සෙර්සි ලැනිස්ටර් වෙතිනි. "උඹ කොහොමද උඹේ රජතුමාට ඔය විදියට කතා කරන්නෙ?"

මේ වදනින් රජතුමා ඇවිස්සුනේ ය. "කට වහගනිං ගෑනියෙ." ඔහු ගෙරෙවුවේ ය. ඔහු ආසනයේ කෙලින් විය. "මට සමාවෙන්ට නෙඩ්. මම කොයිවෙලාවකවත් දරුවාව බය කරන්ට හිතුවෙ නැහැ. මම හිතුවෙ එයාව මෙතනට ගෙනල්ලා ඉක්මනටම රාජකාරිය ඉවර කරලා දැම්මානං හොඳයි කියලයි."

"මොකක්ද ඒ රාජකාරිය?"

රැජිණ ඉදිරියට පිය තැබුවා ය. "උඹ හොඳින්ම දන්නවා ඒ මොකක්ද කියලා ස්ටාර්ක්. උඹේ මේ කෙල්ල මගේ පුතාට පහර දීලා තියෙනවා. ඒකියි, ඒකිගෙ අර මස්කාර කොල්ලයි. ඒකිගෙ අර මෘගයා මගෙ දරුවගෙ අත කඩාගන්ට හදලා තියෙනවා."

"ඒක බොරුවක්." ආර්යා කෑ ගැසුවා ය. "වෘකයා එයාගෙ අත යාන්තං හැපුවා විතරයි. එයා මයිකාට තුවාල කලා."

"ජොෆ් අපට කිවුවා මොකක්ද සිද්ධවුනේ කියලා." රැජිණ කීවා ය. "උඹයි අර මස්කාරයගෙ කොල්ලයි එයාට පොලු මුගුරුවලින් තැලුවා. උඹ අර වෘකයාව එයාව හපන්ට උසිගැන්නුවා."

"ඒක එහෙම නෙවෙයි වුනේ." ආර්යා කීවේ නැවතත් කඳුළු පුරා එන දැස් අතරිනි. නෙඩ් ඇය ගේ උරහිස මත අතක් තැබුවේ ය.

"එහෙම තමයි ඒක සිද්ධ වුනේ." ජොෆ්රි කුමරා කතාවට පැන්නේ ය. "එයාලා ඔක්කොමලා මට තැලුවා. ඊට පස්සෙ එයා සිංහ දත අරගෙන ගඟ මැද්දට වීසි කලා." මෙවදන් පවසද්දී ඔහු ආර්යා දෙස එකදු බැල්මක් නොහෙලන්නට යෙදුනු බව නෙඩ් නිරීක්ෂණය කලේ ය.

"බොරුකාරයා." ආර්යා මුරගැසුවා ය.

"කට වහගන්නවා." කුමරා පෙරලා කෑ ගැසීය.

"ඇති." රජතුමා ගෙරෙවුවේ ඇවිස්සුනු කෝපයෙන් යුතුව අසුනින් නැගිටිමිනි. ශාලාව පුරා නිහඬතාව රජයන්නට විය. ඔහු රැවුම් මුහුණින් යුතුව ආර්යා දෙස බැලුවේ ය. "හොඳයි දරුවො. දැන් ඔයා මට කියන්ට සිද්ධවෙච්ච් දේ මොකක්ද කියලා. හැම දෙයක්ම කියන්ට.

ඇත්ත කතාව කියන්ට. රජතුමාට බොරු කියන එක ලොකු වැරැද්දක්." ඉන්පසු ඔහු සිය පුත්‍රයා දෙසට හැරුනේ ය. "එයා කතා කරලා ඉවර වුනාට පස්සෙ ඔයාට කතා කරන්ට පුළුවන්. එතකං කට වහන් ඉන්නවා."

ආර්යා සිය කතාව අරඹද්දී තමාට පිටුපසින් දොර ඇරෙනු නෙඩ්ට ඇසින. හිස මදක් හරවා බැලූ ඔහු දුටුවේ සන්සා සමගින් කාමරයට ඇතුළුවන වයොන් පූල් වය. ආර්යා කතාව නිමවන තෙක් ඔවුහු නිහඬවම ශාලාව පසුපස සිටගෙන සිටියහ. ආර්යා තමා ජොෆ්රි ගේ අසිපත ත්‍රිශූලයේ ගං දිය මැද්දට විසි කල අයුරු විස්තර කරද්දී රෙන්ලි බරතියන්ට සිනහව නවතා ගත නොහැකි විය. රජතුමා කේන්තියෙන් පිම්බේ ය. "සෙර් බැරිස්ටාන්, මගේ මල්ලි හුස්ම හිරවෙලා මැරෙන්ට කලින් කරුනාකරලා එයාව ශාලාවෙන් එළියට එක්කන් යන්ට."

රෙන්ලි උතුමානන් අමාරුවෙන් සිය සිනහව යටපත් කර ගත්තේ ය. "මගේ අයියා හරිම කරුනාවන්තයි. මට පුළුවන් තනියෙන් දොර හොයාගන්ට." ඔහු ජොෆ්රි දෙසට හිස නැමී ය. "සමහරවිට පස්සෙ වෙලාවක ඔබව පුළුවන් වෙයි මට විස්තර කරන්ට, කොහොමද මේ තෙමිච්ච මී පැටියෙක් වගේ ඉන්න අවුරුදු නවයක කැහැටු කෙල්ල කොසුමිටක් විතරක් අතේ තියාගෙන ඔබව නිරායුධ කරලා ඔබේ කඩුව ගඟ මැද්දට වීසි කලේ කියලා." තමාට පිටුපසින් දොර වැසෙද්දී රෙන්ලි තවත් වරක් සිනාසෙනු නෙඩ්ට ඇසින. "සිංහ දත." ඔහු අපහාසාත්මක ස්වරයෙන් කීය.

ජොෆ්රි කුමරා සුදුමැලි මුහුණින් යුතුව හාත්පසින්ම වෙනස් කතාන්තරයක් කියන්නට පටන් ගත්තේ ය. සිය පුත්‍රයා කතාව නිමා කල විට රජතුමා අසුනෙන් නැගිට්ටේ ය. ඔහුගෙන් දිස් වූයේ මේ මොහොතේ මෙම ශාලාව තුළ හැර වෙන ඕනෑම තැනක සිටින්නට ඔහු කැමැත්තෙන් සිටි බවකි. "දැන් මොන අපා හතෙන් එකක් ද මම කරන්ට ඕන? මෙයා එකක් කියනවා, අරයා තව එකක් කියනවා."

"ඒ දෙන්නා විතරක් නෙවෙයි එතන හිටපු එකම අය." නෙඩ් කීවේ ය. "සන්සා මෙහාට එන්ට. අපට කියන්ට මොකක්ද සිද්ධ වුනේ කියලා." සිදුවූ සියළුම දේ ආර්යා අතුරුදහන් වූ රැයේ ඔහු සන්සාගෙන් අසා දැනගෙන තිබින. ඇත්තෙන්ම සිදු වූයේ කුමක්දැයි ඔහු මැනවින් දැන සිටියේ ය.

ඔහු ගේ වැඩිමහල් දියණිය අතීරණාත්මක අයුරින් ඉදිරියට පිය මැන්නා ය. ඇය නිල් පැහැ විල්ලුදයෙන් සැරසී සිටි අතර ගෙල වටා රජතමය දම්වැලක් පැළඳ සිටියා ය. ඇගේ සනකම් රතු-දුඹුරු පැහැ කෙස් කළඹ දිස්නය දෙන තෙක් පීරා තිබින. ඇය වේගයෙන් ඇසිපිය හෙලමින් පළමුව සිය සොයුරිය දෙසත් ඉන්පසු තරුණ කුමරා දෙසත් බැලුවා ය. "මම දන්නෙ නෑ." ඇය කඳුළු පිරි දෙනෙතින් යුතුව කීවා ය. පෙනුනු අන්දමට නම් ඇයට හැකි විගසින් මෙතනින් පලායාමට උවමනා වූ සෙයකි. "මට මොකුත් මතක නෑ. ඒ හැම දෙයක්ම බොහොම ඉක්මනින් සිද්ධ වුනේ. මම දැක්කෙ නෑ..."

"උඹ නං මහ කුණු ගොඩක්." ආර්යා යටිගිරියෙන් මොරදුන්නා ය. ඇය මිට මොලවා ගත් දැතින් යුතුව ර්යක් මෙන් සිය සොයුරිය දෙසට පිනූ අතර සට්ටණය නිසා සන්සා බිම ඇද වැටින. "බොරුකාරි, බොරුකාරි, බොරුකාරි, බොරුකාරි."

"ආර්යා ඕක නවත්තන්ට." නෙඩ් කෑ ගැසීය. ඇය දඟලද්දී ජොරී ඇයව සන්සා වෙතින් ඉවතට ඇදගත්තේ ය. සුදුමැලි වූ සන්සා වෙවුලමින් සිටි අතර නෙඩ් ඇයව නැවත දෙපයින් සිටෙවුවේ ය. "ඔයාට තුවාල වුනා ද?" නෙඩ් ඇසූ මුත් ඇයට එය ඇසුනු බවක් නොපෙනින. ඇය සිටියේ දිගටම ආර්යා දෙස හෙලා ගත් බැල්මෙනි.

"මේ කෙල්ල ඒකිගෙ අර ජරා සතා වගේම ම්ලේච්ඡයි." සෙර්සි ලැනිස්ටර් කීවා ය. "රොබර්ට්, මට ඕන ඒකිට දඬුවම් කරන්ට."

"යකාට පලයං!" රොබර්ට් මැසිවිලි නැගී ය. "සෙර්සි, බලනවා එයා දිහා. එයා තාම පුංචි ළමයෙක්. මම මොකක්ද කරන්ට ඕන? ඒ දරුවට කස පාර දිදී වීදි දිගේ එක්කරන් යන්ටද? හෙණ ගහපං! පොඩි ළමයි රණ්ඩු වෙනවා තමා. ඒවා එච්චර දුර දිග යන්ට ඕන දේවල් නෙවෙයි. මේක මෙතනින් ඉවරයි. කිසිම කෙනෙකුට ලොකු හානියක් වුනේ නෑ නෙ."

රැජිණ ගේ ස්වරය කෝපාවිෂ්ට විය. "මේ තුවාල කැළැල් ජොෆ්ගෙ ඇඟේ මුළු ජීවිත කාලය පුරාවටම තියේවි."

රොබර්ට් බරතියන් සිය වැඩිමහල් පුතු දෙස බැල්මක් හෙළී ය. "එහෙම වුනාවෙ. එතකොට මිනිහා ඒකෙන්වත් පාඩමක් ඉගෙන ගනීවිනෙ. නෙඩ්, උඹ උඹේ කෙල්ල හොඳට හැසිරෙනවද කියලා වග බලාගනිං. මම මගේ පුතා ගැන වග බලාගන්නම්."

"මම සතුටින් ඒක කරන්නම් මගේ ස්වාමිනී." නෙඩ් කීවේ සිතේ ඇති වූ මහත් සහනයකින් යුතුව ය.

රොබර්ට් පිටව යන්නට හැරුනි. නමුත් රැජිණ එය එතරම් පහසුවෙන් අත හැරීමට සූදානම් නැති බැව් පෙනින. "එතකොට වෘකයා ගැන මොකද කරන්නෙ?" ඇය පිටුපා යන රජු දෙසට හැරී ඇසුවා ය. "ඔබේ පුතාව දරුණු විදියට හපා කාලා තුවාල කරපු සතා ගැන මොකද කරන්නෙ?"

නැවතුනු රජතුමා රැවුම් මුහුණින් යුතුව ආපසු හැරුනේ ය. "මට ඒ යක්ෂ වෘකයා ගැන අමතකම වෙලා ගියානෙ."

ජොරී ගේ දැත් තුළ සිරවී සිටි ආර්යා ගැතිගැන්වෙනු නෙඩ් දුටුවේ ය. ජොරී වහා සිය හඬ අවදි කලේ ය. "අපට සෝරවෘකයා ගැන හෝඩුවාවක්වත් හොයාගන්ට බැරි වුනා මගේ ස්වාමිනී."

මේ ලැබුනු පිළිතුරෙන් රොබර්ට් අසතුටු වූ බවක් නොපෙනින. "නෑ? හොඳයි, එහෙනං ඒක එච්චරයි."

රැජිණ සිය හඬ අවදි කලා ය. "මට උගෙ හම ගෙනත් දෙන කෙනෙකුට රන්කාසි සීයක් දෙනවා."

"බොහොම වටින හමක්නෙ." රොබර්ට් අවලාද ස්වරයෙන් ගෙරෙවුවේ ය. "මේකට මාව ගාවගන්න එපා ගෑනියෙ. ඕවට ලැනිස්ටර් රත්තරන් වලින්ම ගෙවාගන්න එකයි ඇත්තෙ."

රැජිණ ඔහු දෙසට නොසැලකිලිමත් බැල්මක් හෙලුවා ය. "මම හිතුවෙ නෑ ඔබ ඔච්චරටම මසුරෙක් කියලා. මම හිතාගෙන හිටියෙ මම කසාද බැන්ද රජතුමා ඉර බහින්ට කලින් මගේ ඇඳ උඩින් වෘක හමක් එලන්ට ලෑස්ති කෙනෙක් කියලා."

කේන්තිය නිසා රොබර්ට් ගේ මුහුණ කළු විය. "ඒක හරිම ලස්සන උපායක්. ඒ වුනත් අපට වෘකයෙක් නෑ."

"අපට වෘකයෙක් ඉන්නවා." සෙර්සි ලැනිස්ටර් කීවා ය. ඇගේ ස්වරය ඉතා මෘදු එකක් වුවද ඒ කොළ පැහැ දෑස් ජයග්‍රහනයේ දීප්තියෙන් බබලමින් තිබින.

ඇය කී දේ අරුත වටහාගැනීමට ඔවුන් සැමටම ටික මොහොතක් ගත වුනි. රජතුමා අප්‍රියජනක ස්වරයෙන් දෙවුර ඇකිලී ය. "ඕන දෙයක් කරගන්නවා. සෙර් ඉලියන්ට ඒක කරන්ට කියනවා."

"රොබර්ට්, ඔබ ඇත්තටමද මේ දේ කියන්නෙ?" නෙඩ් විරෝධාත්මක හඬින් ඇසී ය.

රජතුමා සිටියේ තවදුරටත් වාද කිරීමට තරම් මනෝභාවයකින් නොවේ. "ඇති නෙඩ්. මට තවත් මේ ගැන අහන්ට ඕන නෑ. සෝරවෘකයෙක් කියන්නෙ බොහොම දරුණු සතෙක්. වැඩි කල් යන්ට කලින් ඌ අද මගේ පුතාට පැන්නා වගේ උඹේ දුවටත් කඩන් පනින්ට පුළුවන්. එයාට බල්ලෙක් අරන් දෙන්ට. එයා ඒකට වැඩියෙන් සතුටු වෙයි."

සිදුවන්නට යන්නේ කුමක්දැයි අන්තිමේදී සන්සාට අවබෝධ විය. ඇය බියපත් දෑසින් සිය පියා දෙස බැලුවා ය. "එයා කියන්නෙ ලේඩි ගැනද? අනේ එහෙම නෙවෙයි නේද?" පියා ගේ මුහුණ මත සටහන් වී ඇති කතාව ඇය වටහා ගත්තා ය. "නෑ. අනේ එපා. ලේඩිව මරන්ට එපා. ලේඩි කාවවත් හපන්නෙ නෑ. එයා හොඳයි..."

"ලේඩි එතන හිටියෙත් නෑ." ආර්යා කුපිත වූ ස්වරයෙන් කෑ ගැසුවා ය. "එයාව අත අරින්ට."

"අනේ එයාලව නවත්තන්ට." සන්සා බැගෑපත් වූවා ය. "එයාලට ඒක කරන්ට දෙන්ට එපා. අනේ! අනේ! ඒ ලේඩි නෙවෙයි නෙ. නයිමේරියා තමා ඒක කලේ. ආර්යා තමා ඒක කලේ. ලේඩි නෙවෙයි. ඔයාලට එහෙම කරන්ට බෑ. අනේ එයාලට ලේඩිට රිද්දන්ට දෙන්ට එපා. මම එයාට නරකට හැසිරෙන්ට දෙන්නෙ නැතුව බලාගන්නම්. මම පොරොන්දු වෙන්නම්. මම පොරොන්දු වෙන්නම්..." ඇය හඬන්නට පටන් ගත්තා ය.

නෙඩ්ට කල හැකි එකම දෙය වූයේ හඬන සන්සාව දෝතින් වැළඳගෙන ඇයව සැනසීම පමණි. ඔහු කාමරය හරහා රොබර්ට් දෙස බැලී ය. ඔහු ගේ පැරණි මිත්‍රයා. සොයුරකුටත් වඩා ළඟින් සිටි ඔහුව හොඳින් දන්නා ඔහු ගේ ප්‍රාණ සම මිත්‍රයා. "අනේ කරුනාකරලා රොබර්ට්. ඔබේ හිතේ මා ගැන ඇති ආදරේ වෙනුවෙන්වත්. අඩුමගානෙ ඔබ මගේ නංගිට දක්වපු ආදරේ වෙනුවෙන්වත්. කරුනාකරලා."

රජතුමා ඔවුන් දෙස බොහෝ වේලාවක් බලා සිටියේ ය. ඉන්පසු සිය බිරිඳ දෙසට බැල්මක් හෙලුවේ ය. "උඹට හෙණම ගහපං සෙර්සි." ඔහු පිළිකුල මුසු ස්වරයෙන් කීය.

හෙමින් සැරේ සන්සා ගේ ග්‍රහණයෙන් මිදුනු නෙඩ් රජුට මුහුණ ලා සිට ගත්තේ ය. පසුගිය සිවු දින පුරාවටම ඔහුට දැනුනු විඩාව නැවත ඔහු සොයා පැමිණ ඇති සේය. "එහෙමනම්, ඔබම ඒ වැඩේ කරන්ට රොබර්ට්." ඔහු වානේ මෙන් සීතල තියුණු ස්වරයෙන් කීවේ ය. "අඩුමගානෙ ඒ දේවත් කරන්ට ධෛර්යය උපද්දාගන්ට."

රොබර්ට් කිසිවක් නොදුටු අජීවී දෑසින් නෙඩ් දෙස බැලීය. වදනක්වත් නොදෙඩූ ඔහු බරැති අඩි තබමින් ශාලාවෙන් පිටව ගියේ ය. ශාලාව පුරා නිහඬතාව රජයන්නට විය.

"කෝ දැන් සෝරවෘකයා?" සිය සැමියා පිටව ගිය පසු සෙර්සි ලැනිස්ටර් ඇසුවා ය. ඇය පසෙකින් සිටි ජොෆ්රි කුමරා ගේ මුවේ සිනාවක් රැඳී තිබින.

"සතාව දම්වැල් දාලා ගැටගහලා ඉන්නෙ ගේට්ටුවට පිටතින් මගේ ස්වාමිනී." සෙර් බැරිස්ටාන් සෙල්මි නොකැමැත්තෙන් මෙන් පිළිතුරු දුනි.

"ඉලියන් පේයින්ට එන්ට කියන්ට."

"එපා." නෙඩ් කීවේ ය. "ජොරී, දරුවො දෙන්නා එයාලගෙ කාමරවලට ඇරලවලා, මට මගේ කඩුව 'අයිස්' අරන් එන්ට." වචන ඔහු ගේ උගුරේ හිරවුනු අතර මුවට තිත්ත රසයක් දැනෙන්නට විය. ඔහු ආයාසයකින් වචන පිට කලේ ය. "ඒක කරන්ටම ඕන නම් මමයි ඒක කරන්නෙ."

සෙර්සි ලැනිස්ටර් ඔහු දෙස සැකමුසු බැල්මක් හෙලුවා ය. "උඹ ස්ටාර්ක්? මොකක්ද, මේක මොකක්හරි උපායක්ද? ඇයි උඹ එහෙම දෙයක් කරන්නෙ?"

ඔවුන් සියලුදෙනාම ඔහු දෙස බලාසිටින්නට වූහ. ඒ සැමටම වඩා ඔහුට උහුලාගැනීම අසීරු වූයේ සන්සා ගේ බැල්මයි. "එයා උතුරෙ කෙනෙක්. එයාට මේ සාමාන්‍ය මස්වැද්දෙකුගෙ අතින් මැරෙනවාට වඩා වැඩි දෙයක් හිමියි."

දැවෙන දෑසින් හා සිය දූවරුන් ගේ අඳෝනා රැවු දෙන දෙසවනින් යුතුව ඔහු ශාලාවෙන් පිට විය. ගේට්ටුව අසල රැකවල් මුරකුටියට පිටතින් බැඳ දමා සිටි වෘක පැටවා ඔහුට හමු විය. නෙඩ් ඇය අසල වාඩි වී මොහොතක් ගත කලේ ය. "ලේඩි." ඔහු පැවසූයේ ඒ නම ආස්වාදනය කරමිනි. සිය දරුවන් වෘක පැටවුන්ට තෝරා ගත් නම් ගැන ඔහු කිසිදිනෙකත් වැඩි අවධානයක් නොදැක්වී ය. එනමුදු මේ මොහොතේ ඇය දෙස බලද්දී ඔහුට අවබෝධ වූයේ සන්සා ඇයට ගැලපෙනම නම තෝරාගෙන ඇති බවය. ඇය පැටවුන් අතර සිටි කුඩාම, ලස්සනම, විශ්වාසවන්තම හා ආචාරසම්පන්නම පැටවා විය. ඇය සිය රන්වන් පැහැ දීප්තිමත් දෑසින් ඔහු දෙස බලා සිටි අතර ඔහු ඇගේ සනකම අළු පැහැ ලෝම අතරින් ඇඟිලි යවා පිරිමදින්නට විය.

මඳ වේලාවකට පසු අයිස් රැගත් ජොරී ඔහු වෙත පැමිණියේ ය.

කාර්යය නිමා වූ පසු ඔහු මෙසේ කීය. "මිනිස්සු හතරදෙනෙක් තෝරගෙන එයාලත් එක්ක මේ සතාගෙ මළකඳ උතුරට යවන්ට. එයාව වින්ටර්ෆෙල්වල වළදාන්ට කියන්ට."

"වින්ටර්ෆෙල්වලට? ඒ මුළු දුරම?" ජොරී ඇසුවේ විස්මයකෘත ස්වරයෙනි.

"ඒ මුළු දුරම." නෙඩ් තහවුරු කලේ ය. "අර ලැනිස්ටර් ගෑනිට මෙයාගෙ හම ලැබෙන්ට බෑ."

අන්තිමේදී ඔහු මෙතෙක් දිනක් ලබන්නට බැරි වූ නින්ද ලබනුවස් අංගනය හරහා සිය කාමර පෙළ දෙසට යන්නට විය. දඩයම් සවාරිය නිමා කල සැන්ඩෝර් ක්ලිගේන් සිය සහචරයිනුත් සමග බලකොටු ද්වාරයෙන් ඇතුළුවිය.

ඔහු ගේ යුධ අශ්වයා පිට ලේ වැකුණු රෙද්දකින් එතූ බරැති පොදියක් විය. "උඹේ දුව ගැන කිසිම ආරංචියක් නෑ ස්ටාර්ක්." ඔහු අසු මත සිට පහළ බලා සිය ගොරෝසු හඬින් කීවේ ය. "ඒ වුනත් දවස එච්චරටම අපතේ ගියෙත් නෑ. අපි එයාගෙ පුංචි හුරතලා හොයාගත්තා." පිටුපස හැරුනු ඔහු අසු පිට තිබුනු පොදිය තල්ලු කරදැමීය. එය හඬක් නගමින් නෙඩ් ඉදිරියේ බිම පතිත විය.

පහතට නැමුනු නෙඩ් රෙදි කඩ දෙපසට ඇද්දේ ආර්යාට මේ ආරංචිය කෙසේ කියම්දෝයි සිතමිනි. එනමුදු ඒ නයිමේරියා ගේ සිරුර නොවී ය. එහි තිබුනේ වියළී ගිය රුධිරයෙන් වැසුනු මයිකා ගේ, මස්කාරයා ගේ පුතා ගේ සිරුර විය. ඉහළක සිට එල්ල කරන ලද දරුණු කඩු පහරක් විසින් ඔහුව උරහිසේ සිට ඉණ දක්වා දෙපළු කර තිබින.

"උඹ ඒ කොල්ලා පස්සෙන් පන්නලා ඌව යට කලා." නෙඩ් කීය.

සුනඛ මුහුණකින් යුතු හිස්වැස්මේ වූ සිදුරු තුළින් දඩබල්ලා ගේ දෙනෙත් දිලිසෙනු පෙනින. "ඌ දිවුවා." නෙඩ් ගේ මුහුණ දෙස බැලූ ඔහු මහ හඬින් සිනාසුනි. "ඒ වුනත් එච්චර හයියෙන් නෙවෙයි."

Eddard Stark: “She is of the north. She deserves better than a butcher.”

බ්‍රැන්

පෙනුනු අන්දමට නම් ඔහු වසර ගණනාවක් තිස්සේ පහළට ඇද වැටෙමින් තිබින.

පියාඹන්ට. අඳුරේ සිටි කටහඬක් කෙඳිරුවේ ය. එනමුදු පියෑඹීම යනු බ්‍රැන් දැනසිටි දෙයක් නොවී ය. එමනිසා ඔහුට කල හැකි වූ එකම දෙය නම් පහළට වැටීම පමණි.

මේස්ටර් ලුවින් මැටියෙන් කුඩා දරුවකු ගේ රුවක් ඇඹී ය. ඉන්පසු එය දැඩි බිඳෙනසුළු තත්ත්වයට පත්වන තුරු උඳුනක ලා පිළිස්සුවේ ය. එයට බ්‍රැන් ගේ ඇඳුම් ඇන්දවූ ඔහු වහළය උඩ සිට එය පහළට වීසිකලේ ය. ඒ මැටි රුව සිඳී බිඳී ගිය අයුරු බ්‍රැන්ට තවමත් හොඳින් මතක ය. "ඒ වුනත් මම කවදාවත් වැටෙන්නෙ නෑ." ඔහු පහළට වැටෙමින් පැවසී ය.

පොළොව ඔහුට කෙතරම් පහළින් හා කෙතරම් ඈතින් තිබුනේ ද යත් ඔහු වටා ඇති ඝන මීදුම අතරින් එය හඳුනා ගැනීම දුෂ්කර කරුනක් විය. එනමුදු ඔහු කෙතරම් වේගයෙන් වැටෙමින් සිටියාද යන්න ඔහුට හැඟින. පහළ ඈත ඈත දුරින් ඔහු වෙනුවෙන් බලා සිටින්නේ කුමක්දැයි ඔහු හොඳින් දැන සිටියේ ය. සිහිනයක් තුළදී පවා යමෙකුට එක දිගටම වැටෙමින් සිටිය නොහැක. පොළොව මත පතිත වන්නට මොහොතකට පෙර සිහිනයෙන් අවදිවන බව ඔහු දැන සිටියේ ය. සාමාන්‍යයෙන් කවදාත් සිදුවන්නේ එයයි. ඔබ පොළොවේ හැපෙන්නට ඔන්න මෙන්න තිබියදී ඔබ අවදිවෙයි.

ඒක එහෙම නොවුනොත්? කටහඬ ඇසීය.

දැන් ඔහු පොළොවට වඩා සමීප ය. තවමත් සැතපුම් දහස් ගණනක් ඈත වුවද පෙරට වඩා සමීප ය. මෙහි අවට අඳුරු වූ අතර වාතය සීතල විය. ඔහුට ඉහළින් හිරු හෝ තරු හෝ නොමැති අතර අඳුරු මීදුම සහ ඔහුව සුනුවිසුනු කර දැමීමට වේගයෙන් ඉහළට එන පොළොව පමණක් ඇත. මේ සියල්ල හා අර කොඳුරන කටහඬ. ඔහුට හඬන්නට උවමනා විය.

අඬන්ට එපා. පියාඹන්ට.

"මට පියාඹන්ට බෑ." බ්‍රැන් කීවේ ය. "මට බෑ. මට බෑ."

ඔබ කොහොමද දන්නෙ? ඔබ මීට කලින් කවදාවත් උත්සාහ කර තියෙනවාද?

එම කටහඬ උස් තියුණු ස්වරයක් විය. බ්‍රැන් අවට බැලුවේ එය පැමිනෙන්නේ කොහේ සිට දැයි දැනගැනීමට ය. කපුටෙක් ඔහුත් සමග කවාකාර මගක පහළට පියාඹමින් සිටින බව ඔහු දුටුවේ ය. ඌ ඔහු ගේ අත පොවන නොපොවන මානයේ ඔහු වැටෙන වේගයෙන්ම පහළට පියාඹමින් ඔහු ව ලුහුබඳිමින් සිටිනු දුටුවේ ය. "මට උදවු කරන්ට." ඔහු කීය.

මම උත්සාහ කරනවා. කපුටා පිළිතුරු දුනි. ඔබ ළඟ ඉරිඟු ඇට ටිකක් එහෙම නැතුව ඇති නේද?

බ්‍රැන් සිය සාක්කුවට අත දැමී ය. ඔහු අත එළියට ගනිද්දී අතැඟිලි අතරින් වැටුනු ඉරිඟු ඇට අහස පුරා විසිරින. ඒවා ඔහුත් සමගම පහළට වැටෙන්නට විය.

ඔහු ගේ අත මත වැසූ කපුටා ඉරිඟු ඇට කන්නට පටන් ගති.

"ඔබ ඇත්තටම කපුටෙක් ද?" බ්‍රැන් ඇසීය.

ඔබ ඇත්තටම වැටෙමින්ද ඉන්නෙ? කපුටා පෙරලා ඇසීය.

"මේක හීනයක් විතරයි." බ්‍රැන් කීවේ ය.

එහෙමද? කපුටා ඇසීය.

"පොළොවෙ වදිනකොටම මාව ඇහැරෙයි." බ්‍රැන් කීය.

පොළොවෙ වැදුනම ඔබ මැරෙයි. කපුටා කීය. ඌ නැවතත් ඉරිඟු කන්නට පටන් ගති.

බ්‍රැන් පහත බැලුවේ ය. සුදෝ සුදු හිමෙන් වැසුනු මුදුන් ඇති කඳු දැන් ඔහුට හඳුනාගත හැක. අඳුරු වනාන්තර මැදින් ගලන රිදී රේඛාවන් බඳු ගංගාවන්ද දැන් ඔහුට හඳුනාගත හැක. දෑස් පියාගත් ඔහු හඬන්නට පටන් ගත්තේ ය.

ඒකෙන් එච්චර වැඩක් වෙන්නෙ නැති වෙයි. කපුටා කීවේ ය. මම ඔබට කිවුවනේ. එකම උත්තරය පියාඹන එකයි. අඩන එක නෙවෙයි. ඒක එච්චරම අමාරුද? මේ බලන්ට මමත් පියාඹනවා. අහසට පිනූ කපුටා බ්‍රැන් ගේ හිස වටා පියාඹන්නට විය.

"ඔබට පියාපත් තියෙනවා." බ්‍රැන් පෙන්වා දුනි.

සමහරවිට ඔබටත් තියෙනවා ඇති.

බ්‍රැන් සිය උරහිස් දෙපස අත ගා බැලුවේ පියාපත් සොයාගන්නට වැයම් කරමිනි.

වෙනස් විදියේ පියාපත් ජාති තියෙනවා. කපුටා කීය.

බ්‍රැන් සිය දෑත් හා දෙපා දෙස බැලුවේ ය. ඔහු කෙතරම් කෙසඟද යත් ඇටකටුවලට උඩින් තිබුනේ සම පමණකි. ඔහු හැමදාමත් මෙතරම් කෙසඟද? බ්‍රැන් සිහියට නගාගන්නට වැයම් කලේ ය. අඳුරු මීදුම අතරින් ඔහු ඉදිරියේ මුහුණක් පාවෙන්නට විය. ආලෝකයේ දිදුලන රන්වන් පැහැති මුහුණක්. "ආදරේ හන්දා මම කරන දේවල්." ඒ මුහුණ කීවේ ය.

බ්‍රැන් යටිගිරියෙන් කෑ ගැසීය.

කපුටා නැවතත් අහසට නැගින. ඒක නෙවෙයි. ඌ ඔහුට කෑ ගැසුවේ ය. ඒක අමතක කරන්ට. ඔබට දැන් ඒක උවමනා නැහැ. ඒක පැත්තකට දාන්ට. ඒක අයින් කරලා දාන්ට. බ්‍රැන් ගේ උරහිස මත වැසූ කපුටා ඔහුට කොටන්නට විය. දිදුලන රන්වන් පැහැ මුහුණ අතුරුදන් විය.

බ්‍රැන් දැන් පෙරටත් වඩා වේගයෙන් පහළට වැටෙමින් සිටියේ ය. ඔහු වටා තිබෙන අඳුරු මීදුම ඔහු ගේ දෙසවනෙහි දෝංකාර දෙන්නට විය. "ඔබ මොකක්ද ඔය මට කරන්නෙ?" ඔහු කඳුළු පිරි දෑසින් යුතුව කපුටාගෙන් ඇසීය.

පියාඹන්නෙ කොහොමද කියලා ඔබට උගන්නනවා.

"මට පියාඹන්ට බෑ!"

ඔබ දැනටමත් පියාඹමින් තමා ඉන්නෙ.

"මම වැටෙනවා!"

හැම පියෑඹීමක්ම පටන් ගන්නෙ වැටීමකින් තමා. කපුටා පිළිතුරු දුනි. පහළ බලන්ට.

"මට බයයි..."

පහළ බලන්ට.

බ්‍රැන් පහළ බැලුවේ ය. ඔහු ගේ ඇඟේ ලේ වතුර වී යනු ඔහුට දැනුනි. මේ වනවිට පොළොව ඔහු කරා වේගයෙන් ළඟාවෙමින් තිබින. මුළුමහත් ලෝකයම සුදු දුඹුරු හා කොළ පැහැ ගෙත්තමක් මෙන් ඔහුට පහළින් විසිර තිබින. ඔහුට සෑම දෙයක්ම කෙතරම් පැහැදිළිව පෙනුනා ද යත් මොහොතකට ඔහුට බියවීමටත් අමතක විය. ඔහුට මුළුමහත් රාජධානියම පමණක් නොව එහි සිටින සියල්ලන්ම ද දැකිය හැකි විය.

රාජාලියකු අහසේ සිට දකින අයුරින් ඔහු වින්ටර්ෆෙල් දිටීය. පැතළි කොට කුළුණු හා කුඩා ඉරක් මෙන් දිස් වූ බලකොටු ප්‍රාකාර ඔහු දිටීය. සිය සඳළුතලයේ සිට ඔපදමන ලද පිත්තල බටයක් තුළින් අහස නිරීක්ෂණය කරන මේස්ටර් ලූවින් ඔහු දිටීය. සිය සොයුරු රොබ්, ඔහු දැක පුරුදු රොබ්ට වඩා වෙනස් උසින් හා ශක්තිමත්ව වැඩී සිටි රොබ් ඇත්තම අසිපතක් අතැතිව සෙණ්ඩුවාලුවේ කඩු සරඹ පුහුණු වනු ඔහු දිටීය. ඉස්තාලයේ වැඩ කරන යෝධ කොළුවා හොඩෝර්, කම්මල්කරු මික්කෙන්ට බාර දීම සඳහා කිනිහිරයක් කරේ තබාගෙන යන අයුරු ඔහු දිටීය. දෙව්වනය මධ්‍යයේ වූ දැවැන්ත සුදු පැහැ වයර්වුඩ් ගස කළුපොකුණේ දිස්වන සිය ප්‍රතිබිම්බය දෙස බලා සිටියේ ය. එහි රත් පැහැ කොළ සීතල සුළඟේ හෙමිහිට සැලිනි. බ්‍රැන් වැටෙනු දැනුනු එය සිය දෑස් ඔසවා අවබෝධාත්මක බැල්මකින් ඔහු දෙස බැලීය.

ඔහු නැගෙනහිර දෙස බැලුවේ ය. කුඩා රුවල් නැවක් 'ඇම' නමින් හැඳින්වෙන මුහුදු බොක්ක හරහා ගමන් කරන අයුරු ඔහු දිටීය. නැව තුළ කුඩා කුටියක සිටි සිය මව ඇය ඉදිරියේ වූ මේසය මත ඇති ලේ වැකුනු පිහියක් දෙස බලා සිටින'යුරු ඔහු දිටීය. හබල්ගාන්නන් සිය හබල් සමග පොර බදිද්දී සෙර් රඩ්‍රික් නැවු තට්ටුව මත අත්වැටට වාරු වී වෙවුලමින් සිටින අයුරු ඔහු දිටීය. ඔවුනට ඉදිරියෙන් කුණාටුවක් වැඩෙමින් තිබින. නමුදු මොනයම් හෝ කාරනයක් නිසා ඔවුන් එය නොදිටීය.

ඔහු දකුණු දෙස බැලුවේ ය. ගංගා ත්‍රිශූලයේ කොළ-නිල් පැහැ ගං දිය වේගයෙන් ගලන'යුරු ඔහු දිටීය. සොවින් බරවූ මුහුණින් යුතු සිය පියා රජතුමාගෙන් යමක් බැගෑපත්ව ඉල්ලා සිටිනු ඔහු දිටීය. රාත්‍රියේ දී සන්සා සිය කොට්ටය තෙමෙන තෙක් කඳුළු වගුරනු ඔහු දිටීය. ආර්යා නිහඬවම සෑම දෙයක් දෙසම බලන අයුරුත් සිය රහස් සැමට හොරා සිය හදට තුරුළු කරගන්නා අයුරුත් ඔහු දිටීය. ඔවුන් වටා සෑම තැනම සෙවනැලි විසිර තිබින. එක් සෙවනැල්ලක් අළු මෙන් අඳුරු පැහැ වූ අතර එයට භයංකර සුනඛ මුහුණක් තිබින. තවෙකක් හිරු මෙන් සුන්දර රන්වන් පැහැයෙන් බැබලුනේ ය. මේ සෙවනැලි දෙකටම ඉහළින් ගලින් කල සන්නාහයක් පැළැඳි යෝධයෙක් සිටියේ ය. එනමුදු ඔහු සිය

හිස්වැසුමේ මුව ආවරණය විවර කල විට ඒ තුළ අන්ධකාරය හා කළු පැහැ කැටි ගැසුනු රුධිරය හැර අන් කිසිවක් නොවීය.

සිය දෑස් එසවූ ඔහු පටු මුහුදට එහා බැලුවේ ය. නිදහස් වෙළෙඳ නගර හා ඊට එපිටින් ඇති කොළ පැහැ ඩොත්රැකි මුහුද ද, කඳු පාමුල ප්‍රෞඪව නැගී සිටි වයෙස් ඩොත්රැක් ද, ජේඩ් මුහුදුබඩ පිහිටි මායාවී දේශයන් ද, මකරුන් සරනා සෙවනැලි දේශයේ අෂයි ද ඔහු දිටීය.

අන්තිමේදී ඔහු උතුරු දෙස බැලුවේ ය. නිල් පැහැ පලිඟුවක් මෙන් දිදුලන ප්‍රාකාරය ඔහු දිටීය. සිය අවජාතක සොයුරා ජොන් සීතල ඇඳක තනිව නිදනා අයුරුත්, උණුසුම පිළිබඳ වූ සියලු මතකයන් කෙමෙන් ඔහු වෙතින් මැකී යන අතර ඔහු ගේ සම කෙමෙන් සුදුමැලි පැහැ වන අයුරුත් ඔහු දිටීය. ඉන්පසු ඔහු ප්‍රාකාරයෙන් එහා ඉමක් කොණක් නොදැකිය හැකි හිමෙන් වැසුනු වනාන්තර, මිදුනු මුහුදු වෙරළ හා අයිස් ගංගාවන්, කිසිදු සතකු නොසරන කිසිදු දෙයක් නොවැවෙන හිම කාන්තාර දෙස බැලුවේ ය. උතුරට උතුරට හා තව තවත් උතුරට බැලුවේ ය. ලෝකාන්තයේ ඇති ආලෝක තිරයත් එයින් එපිටටත් බැලුවේ ය. ඔහු ශීත ඍතුවේ ගැඹුරටම, එහි හදවතටම එබී බැලුවේ ය. එහි දුටු දෙයින් බියපත්වූ ඔහු හඬන්නට විය. ඔහු ගේ කඳුළුවල උණුසුමින් දෙකොපුල් දැවෙන්නට විය.

දැන් ඔබ දන්නවා. ඔහු ගේ උරහිස මත වසා සිටි කපුටා කෙඳිරුවේ ය. දැන් ඔබ දන්නවා ඔබ ජීවත් විය යුත්තේ ඇයි කියලා.

"ඇයි?" කිසිවක් තේරුම් ගත නුහුනු බ්‍රැන් ඇසුවේ ය.

ශීත කාලය එන හින්දා.

සිය උරය මත වසා සිටි කපුටා දෙස බ්‍රැන් හිස හරවා බැලූ අතර කපුටා ද ඔහු දෙස බැලී ය. ඌට ඇස් තුනක් තිබුනු අතර ඒ තෙවන ඇස ඇදහිය නොහැකි තරම් දරුණු ඥානාවබෝධයකින් පිරී තිබින. බ්‍රැන් පහළ බැලුවේ ය. හිම සහ ශීතය සහ මරණය හැර මේ වනවිට ඔහුට පහළින් අන් කිසිවක් නොවී ය. අයිස්වලින් නිර්මිත හෙලි රැසක් මෙන් උල් වූ කොත් සහිත රළු මිදුනු කාන්තාරයක් ඔහුව වැළැඳගන්නට සූදානමින් බලා සිටියේ ය. මේ කොත් වටා විසිර පැවති ඔහු මෙන් වූ තවත් සිහින දකින්නන් දහස් ගණනක ගේ

ඇටසැකිලි ඔහු දිටීය. ඔහු ඉතාම බලාපොරොත්තු විරහිත ස්වභාවයකින් බිය පත් වී සිටියේ ය.

"මිනිහෙකුට පුළුවන්ද බයවෙච්ච වෙලාවක නිර්භීත වෙන්ට?" ඔහු ගේ ම කටහඬ කොහේදෝ ඈතක සිට සිහින් ස්වරයෙන් අසනු ඔහුට ඇසින.

සිය පියා ගේ කටහඬ ඊට පිළිතුරු දුන්නේ ය. "ඒ තමා මිනිහෙකුට නිර්භීත වෙන්ට පුළුවන් එකම වෙලාව."

දැන් බ්‍රැන්. කපුටා උනන්දුකරවන හඬින් කීය. ඔයා තෝරගන්ට. පියාඹනව ද මැරෙනව ද?

මරණය බියකරු කෑගැසීමක් සමගින් ඔහු වෙත ළඟාවෙමින් තිබින.

සිය දෑත් විහිදූ බ්‍රැන් පියාඹන්නට පටන්ගති.

අදිසි පියාපත් යුගලක් විසින් සුළඟට එදිරිව ඔහුව ඉහළට එසෙවුවේ ය. භයංකාර අයිස් ඉදිකටු රැස ඔහුට පහළින් පසු බැස ගියහ. ඔහුට ඉහළින් අහස විවර වින. එය ඉහළ නැගීමට වඩා සොඳුරු දෙයක් විය. එය අන් කිසිදු දෙයකට වඩා සොඳුරු දෙයක් විය. ඔහුට පහළින් ලෝකය නැවතත් කුඩා වන්නට පටන් ගත්තේ ය.

"මම පියාඹනවා." ඔහු සතුටින් කෑ ගැසුවේ ය.

මට පේනවා. ඇස් තුනක් ඇති කපුටා කීය. ඌ නැවතත් අහසට නැංගේ සිය විහිදන ලද පියාපත් මගින් ඔහු ගේ දර්ශන පථයට අවහිර කලේ ය. උගේ පියාපත් සිය දෙකොපුල් මත වදින අතරේ බ්‍රැන්ට දැනුනේ තමා අහස මැද නතර වී සිටින්නාක් මෙනි. කපුටා ප්‍රචණ්ඩ අයුරින් සිය හොටයෙන් නොනවත්වාම ඔහුට ඇන්නේ ය. සිය දෑසට මැදින් නළල මත තියුණු වේදනාවක් බ්‍රැන්ට දැනෙන්නට විය.

"ඔබ මොකක්ද ඔය කරන්නේ?" ඔහු වේදනාවෙන් බෙරිහන් දුන්නේ ය.

සිය හොටය විවර කල කපුටා විනිවිද යන තියුණු හඬකින් කෑ ගැසුවේ ය. බ්‍රැන් වටා වූ අඳුරු මීදුම දෙපසට ඉරී යන තිරයක් මෙන් කෙමෙන් අතුරුදන් වූ අතර කපුටා ඇත්තටම කපුටකු නොව ගැහැණියක බව, කළු පැහැ දිග වරලසකින් යුතු සේවිකාවක බව ඔහු දිටීය. ඇය මීට පෙර කොහේ දී හෝ දැක පුරුදු ඇති බව ද බ්‍රැන් ට වැටහුනි. ඔවු! ඒ වින්ටර්ෆෙල් වල සිටි සේවිකාවකි. ඊළඟ මොහොතේ ඔහුට වැටහුනේ තමා සිටින්නේ වින්ටර්ෆෙල්වල සීතල කාමරයක් තුළ ඇති ඇඳක් මත බව ය. සිය අතේ තිබුනු දිය පිරුනු බේසම මහ හඬක් නංවමින් බිම අත හැර දැමූ සේවිකාව කෑ ගසමින් පඩිපෙළ පහළට දිව ගියා ය. "එයා නැගිටලා, එයා නැගිටලා, එයා නැගිටලා."

බ්‍රැන් සිය දෑස් මැදින් නළල පිරිමැද්දේ ය. කපුටා ඔහුට කෙටූ ස්ථානය තවමත් වේදනාවෙන් පුපුරු ගසමින් තිබින. එනමුදු එහි කිසිදු තුවාලයක් හෝ රුධිරය හෝ වෙන කිසිදු සලකුණක් හෝ නොවී ය. ඔහුට දැඩි විඩාවක් හා ක්ලාන්ත බවක් දැනෙන්නට විය. ඇඳෙන් නැගිට සිටීමට ඔහු උත්සාහයක් දැරුවද කිසිවක් සිදු නොවී ය.

ඊළඟ මොහොතේ ඇඳ පසෙකින් යම් චලනයක් සිදු වූ අතර යම් කිසිවක් ඔහු ගේ දෙපා මතට නැග්ගේ ය. එනමුදු ඔහුට ඒ ගැන කිසිදු හැඟීමක් නොදැනින. හිරු මෙන් දිදුලන කහ පැහැ දෑසක් ඔහු ගේ දෑසට එබී බලන්නට විය. කවුළුව විවරව තිබුනු අතර කාමරය තුළ වාතය සීතල විය. එනමුදු වෘකයා ගේ සිරුරෙන් නැගුනු උණුසුම විසින් උණු දිය තටාකයක් මෙන් ඔහුව උණුසුම් කරනු ලැබීය. ඒ ඔහු ගේ වෘක පැටවා බැව් බ්‍රැන් හැඳින ගත් නමුදු ඌ දැන් කෙතරම් විශාලදැයි කිවහොත් බ්‍රැන්ට එය එක්වරම විශ්වාස කිරීම පවා අසීරු විය. සිය වෙවුලන අත ඉදිරියට දිගු කල බ්‍රැන් වෘක පැටවා සුරතල් කරන්නට විය.

හුස්ම ගැනීමට පවා අසීරු තරමට හතිලමින් රොබ් කාමරයට කඩා වදින විට වෘක පැටවා සිය දිවෙන් බ්‍රැන් ගේ මුහුණ ලෙවකමින් සිටියේ ය. බ්‍රැන් සන්සුන් අයුරින් දෑස් ඔසවා සිය සොයුරා දෙස බැලුවේ ය. "එයාගෙ නම සමර්." ඔහු කීවේ ය.

Now Choose. Fly or die!

කැට්ලින්

"අපට තව පැයක් ඇතුළත කින්ග්ස් ලැන්ඩින්ග් වලට ගොඩ බහින්ට පුළුවන් උත්තමාවනි."

ගරාදි වැටෙන් මෑත් වී ආපසු හැරුනු කැට්ලින් ආයාසයෙන් මුවට සිනහවක් නගා ගත්තා ය. "ඔබේ හබල්කාරයො බොහොම හොඳට අපට සේවය කලා කපිතාන්. මගේ කෘතඥතාව වෙනුවෙන් ඒ හැමදෙනාටම රිදී කාසියක් පිරිනමන්ට මම අදහස් කරගෙන ඉන්නවා."

කපිතාන් මොරියෝ ටර්නිටිස් දුන්නක් මෙන් දෙකට නැමී ඇයට ආචාර කලේ ය. "ඔබතුමී ඕනවටත් වඩා ත්‍යාගශීලීයි ස්ටාර්ක් ආර්යාවනි. ඔබතුමී වගේ උසස් උත්තමාවක් කැටුව යන්ට ලැබිච්ච ගෞරවේම ඇති එවුන්ට තෑග්ගක් විදියට."

"ඒ වුනත් එයාලා මේ රිදී කාසි බාරගනියි."

මොරියෝ සිනහවක් පෑවේ ය. "ඔබතුමී කියනවානං." ඔහු ව්‍යක්ත අන්දමින් පොදු භාෂාව කතා කල අතර එහි යාන්තමට මෙන් ටයිරෝෂී උච්චාරණයක් තැවරී තිබින. ඔහු ඇයට පැවසූ අන්දමට නම් හබල්කරුවෙකු, සුක්කානම හසුරුවන්නෙකු හා අන්තිමේදී තමාගේම වෙළෙඳ නෞකාවක් හිමි කපිතාන්වරයෙකු වශයෙන් ඔහු වසර තිහක් පුරාවට පටු මුහුද තරණය කර තිබින. කුඹගස් දෙකකින් හා හබල් සැටකින් යුක්ත හම්බානක් වූ 'ස්ටොන් ඩාන්සර්' ඔහු විසින් සතුකරගත් සිවුවන මෙන්ම වේගවත්ම නෞකාව විය.

නිසැක වශයෙන්ම කැට්ලින්ට හා සෙර් රඩ්‍රික් කසල්ට ධවල වරායෙන් සොයා ගත හැකි වූ වේගවත්ම නෞකාව එය විය. ටයිරෝෂිවරුන් ගේ මුදල් වලට ඇති කෑදරකම මනාව දැන සිටි සෙර් රඩ්‍රික් මුලින්ම එයට විරෝධය පල කර සිටියේ ය. ඒ වෙනුවට 'සොයුරියන් තිදෙනා' වෙතින් මසුන් මරන්නන් ගේ සුලුප්පුවක් කුලියට ගනිමුයැයි ඔහු යෝජනා කර සිටියේ ය. එනමුදු කැට්ලින් හම්බාන පිළිබඳ සිය මතයේම එල්බ ගෙන සිටි අතර ඒ අදහස ඵලදායක වූ බැව් පසුව ඔවුන්ට වැටහුනි. ගමන පුරාවටම පාහේ සුළඟ ඔවුන්ට එදිරිව සිටි

අතර හම්බාන සතු හබල් නොමැති වී නම් මේ වනවිටත් ඔවුන් අතැඟිලි සමීපයේ ගාටමින් සිටිනා බැව් නිසැක ය.

තමා කින්ග්ස් ලැන්ඩින්ග් වලට කෙතරම් ලඟ දැයි කැට්ලින් කල්පනා කලා ය. ඇගේ අතැඟිලි වෙලා තිබුනු හණ වෙලුම්පටිවලට යටින් තුවාල තවමත් පුපුරු ගැසුවේ ය. ඇගේ වමතේ අවසන් ඇඟිලි දෙක තව දුරටත් නවන්නට කොහෙත්ම නොහැකි වූ අතර සෙසු ඇඟිලිද නැවත කිසිදාකත් පෙර පැවති තරම් නම්‍යශීලී නොවනු ඇත. එනමුදු බ්‍රැන් ගේ ජීවිකය බේරා ගැනීම වෙනුවෙන් එය ඉතා සුළු මිලක් වනැයි ඇය සිතුවා ය.

ඒ මොහොතේ සෙර් රඩ්‍රික් නැවු තට්ටුව මත ප්‍රාදුර්භූත විය. "මගේ හොඳ මිත්‍රයා," මොරියෝ සිය කොළ පැහැ ගැන්වූ රැවුල අතරින් කීවේ ය. "ඔබ මෙහෙම හොඳ සනීපෙන් ඉන්නවා දකින්නට ලැබීමත් සතුටක්."

"ඔවු." සෙර් රඩ්‍රික් එකඟ විය. "පහුගිය දවස් දෙකක් පුරාවටම මට මැරෙන්ට උවමනා නැති වෙලයි තිබුනෙ." ඔහු කැට්ලින් දෙසට හිස නැමී ය. "මගේ ආර්යාවනි."

සැබැවින්ම ඔහු ගේ පෙනුම යහපත් විය. ඔවුන් ධවල වරායෙන් පිටත් වද්දී සිටියාට වඩා මඳක් කෙට්ටු වී තිබුනද ඔහු නැවතත් සුපුරුදු තත්ත්වයට පැමිණ තිබින. ඇමේ දැඩි සුළඟත් පටු මුහුදේ රළු බවත් ඔහුට ඔරොත්තු දී නොතිබින. ඩ්‍රැගන්ස්ටෝන් සමීපයේදී අනපේක්ෂිත අයුරින් කුණාටුවකට මුහුණ දීමට සිදු වූ මොහොතේ ඔහු නැවු තට්ටුව මතින් මුහුදට වැටෙන්නට ගිය අතර මොරියෝ ගේ මිනිසුන් තිදෙනෙකු විසින් බේරාගන්නා තෙක් කඹයක එල්ලී යන්තම් දිවි බේරා ගෙන සිටීමට ඔහුට හැකි විය.

"කපිතාන් මට කිය කියා හිටියෙ අපේ ගමන ඉවර වෙන්ට කිට්ටුයි කියලා." කැට්ලින් කීවා ය.

සෙර් රඩ්‍රික් ආයාසයෙන් වියළි සිනහවක් මුවට නගා ගත්තේ ය. "මෙච්චර ඉක්මනට?" ඒ විභූතිමත් උඩු රැවුල නොමැති කල ඔහු ගේ මුහුණ විසුළු පෙනුමක් ගෙන තිබින. එමෙන්ම වඩා කුඩා, සාහසික බවින් අඩු, වසර දහයකින් පමණ වැඩිමල් පෙනුමක් ඔහුට ලැබී තිබින. එනමුදු, ඇමේ වූ දැඩි සුළං නිසා අත්වැට මතින් නැමී මුහුදට ඔක්කාරය කරමින් සිටි

තෙවතාවකදීම සිය රැවුළ වමනයෙන් තෙමා ගත්තාට පසුව සේලරුවකු ගේ දැලිපිහියට රැවුළ බිලි දෙනු හැර වෙනත් විකල්පයක් ඔහුට ඉතිරි වී නොතිබින.

"ඔබලාට කතා කරගන්ට ඉඩ දීලා මම යන්නම්." කපිතාන් මොරියෝ කිවේ ය. ඔවුන් දෙදෙනාට හිස නමා ආචාර කල ඔහු පිටව ගියේ ය.

නෞකාව මුහුදු ජලය මතින් බත්කූරෙකු මෙන් ඉගිල ගියා ය. ඇගේ හබල් රිද්මයානුකූල ලතාවකට මෙන් ඉහළ පහළ ගියේ ය. ගරාදි වැට දැතින් අල්ලාගත් සෙර් රඩ්‍රික් ඔවුන් පසුකරමින් යන වෙරළ තීරය දෙස බලා සිටින්නට විය. "මට ඔබට නියම විදියේ ආරක්ෂකයෙක් වෙන්ට බැරි වුනා."

කැට්ලින් ඔහු ගේ අත යන්තමින් ස්පර්ෂ කලා ය. "අපි අපට අවශ්‍ය තැනට පරිස්සමින් ඇවිල්ලා තියෙනවා. ඒකයි වඩා වැදගත් සෙර් රඩ්‍රික්." සිය සළුව පසෙකින් අත දැමූ කැට්ලින් ඉණෙහි පැළඳ සිටි කිනිස්ස අත ගෑවා ය. ධෛර්යය වඩවා ගනු පිණිස වරින් වර එය අත ගා බැලීමට ඇය පසුගිය දින කිහිපය තිස්සේ පුරුදුව සිටියා ය. "දැන් අපට තියෙන්නෙ රජ මාළිගාවෙ ප්‍රධාන සටන් පුහුණුකාරයා මුනගැහෙන එකයි. එයා විශ්වාස කරන්ට පුළුවන් කෙනෙක් වෙන්ටයි කියලා අපි යාඥා කරමු."

"සෙර් ආරොන් සැන්ටගාර් කියන්නෙ හරිම අහංකාර මිනිහෙක්. ඒත් එයා අවංක මිනිහෙක්." සිය උඩුරැවුල අත ගෑම පිණිස ඔහු අත ඉහළට එසවූ නමුත් නැවත වතාවත් එය ඔහුට මතක් කර දුන්නේ ඔහු ගේ විභූතිමත් උඩුරැවුල තවදුරටත් ඔහු සතු නොවන බවයි. ඔහුගෙන් දිස් වූයේ අන්දුන් කුන්දුන් වූ ස්වභාවයකි. "එයාට සමහරවිට පුළුවන් වේවි මේ ආයුධය අඳුරගන්ට. ඔවු... ඒත්, මගේ ආර්යාවනි, වෙරළට ගොඩ බැහැපු ගමන් අපි ලොකු අවදානමක් ගන්නවා. අනික, රාජසභාවෙ ඉන්න සමහරුන්ට ඔබව දැක්ක ගමන් අඳුරගන්ට පුළුවන් වේවි."

කැට්ලින් ගේ මුව තදින් පියැවී ගියේ ය. "සුළැඟිල්ලා." ඇය මිමිනුවා ය. ඇය ඉදිරියේ ඔහු ගේ මුහුණ පෙනී නොපෙනී ගියේ ය. කුඩා කොලුවකු ගේ මුහුණක්. එනමුදු ඔහු තව දුරටත් කුඩා කොලුවකු නොවී ය. ඔහු ගේ පියා මීට වසර කිහිපයකට පෙර මිය ගොස් තිබුනු අතර ඔහු දැන් බේලිෂ් උතුමානන් විය. එනමුදු තවමත් බොහෝ දෙනෙක් සුළැඟිල්ලා යනුවෙන් ඔහු හඳුන්වන්නට පුරුදුව සිටියහ. මීට බොහෝ කලකට පෙර

රිවර්රන්හිදී ඇගේ සොයුරු එඩ්මුයර් විසින් ඒ නම ඔහුට තබා තිබින. ඔහු ගේ පවුල සතු වූ කුඩා බලකොටුව අතැඟිලිවල කුඩාම ඇඟිල්ලේ පිහිටා තිබුනු අතර පෙටයර්ද සිය වයසට වඩා ප්‍රමාණයෙන් කුඩා කොලුවකු විය. මේ නිසාම ඒ නම ඔහුට මැනවින් ගැලපුනි.

සෙර් රඩ්‍රික් උගුර පෑදුවේ ය. "බේලිෂ් උතුමානන් වරක්.. ආහ්!" කියාගන්නට සුදුසු වචනයක් සොයමින් ඔහු මඳක් තැතනුවේ ය.

කැට්ලින් මේ වනවිට ඒ සුකුමාලකමින් මිදී සිටියා ය. "එයා මගේ තාත්තගෙ ආරක්ෂාව යටතේ හැදුන දරුවෙක්. අපි හැමෝම රිවර්රන්වල එකටයි හැදුනෙ වැඩුනෙ. මම එයා ගැන හිතුවෙ සහෝදරයෙක් හැටියටයි. ඒත් එයාගෙ හිතේ මා ගැන... සහෝදරකමකට වඩා වැඩි දෙයක් තිබුනා. මාව බ්‍රැන්ඩන් ස්ටාර්ක්ට පොරොන්දු වුනා කියලා කිවුව ගමන් පෙටයර් මගේ අත ගන්ට එයාට ඇති අයිතිය වෙනුවෙන් සටන් කරන්ට සූදාණම් වුනා. ඒක මහ පිස්සුවක්. බ්‍රැන්ඩන්ට එතකොට විස්සක්, පෙටයර්ට යාන්තං පහළොව පිරුනා විතරයි. පෙටයර්ගෙ ජීවිතේ බේරන්ට කියලා බ්‍රැන්ඩන්ට බැගෑපත්වෙන්ට මට සිද්ධවුනා. ඉතින් බ්‍රැන්ඩන් එයාව නොමරා තුවාලයක් විතරක් කරලා එයාව ඉතුරු කලා. ඒ සිද්දියෙන් පස්සෙ මගෙ තාත්තා එයාව ආපහු යැවුවා. එදායින් පස්සෙ මම තාමත් එයාව දැකලා නෑ." පින්නක් මෙන් විසිරෙන මුහුදු දියට ඇය සිය මුහුණ එසෙවුවේ හමන සුළඟින් සියලු මතකයන් පලවා හැරිය හැකියැයි සිතන්නාක් මෙනි. "බ්‍රැන්ඩන් මැරුනට පස්සෙ එයා මට රිවර්රන් වලට ලියුමක් එවුවා. ඒත් මම ඒක කියවන්නෙවත් නැතුව පුච්චලා දැම්මා. ඒ වෙද්දි මම දැනගෙන හිටියා නෙඩ් එයාගෙ සහෝදරයා වෙනුවට මාව කසාද බඳිනවා කියලා."

සෙර් රඩ්‍රික් ගේ අතැඟිලි නැවත වතාවක් ඔහුට අහිමි උඩුරැවුල පිරිමදින්නට ඉහළට එසවුනි. "සුළැඟිල්ලා දැන් රාජසභාවෙ උපදේශකයෙක්."

"මම දැනගෙන හිටියා එයා දවසක ඉහළටම නගිනවා කියලා." කැට්ලින් පිළිතුරු දුනි. "එයා හරි සූරයි. පුංචි කොල්ලෙක් කාලෙ වුනත්. ඒ වුනත් සූරකම කියන්නෙ එකක්, ඥානවන්තකම කියන්නෙ තව එකක්. මට හිතාගන්ට බෑ මේ අවුරුදු ගාන ඇතුළත එයා කොච්චර වෙනස් වෙලා ඇද්ද කියලා."

ඔවුන්ට ඉහළින් කුඹගස මත රඳවා සිටි සේලරුවා නෞකාවේ ගමනාන්තය ළඟා වූ බව හඬ ගෑවේ ය. කඩිනම් ගමනින් නැවු තට්ටුව මතට පැමිණි කපිතාන් මොරියෝ සේලරුවන්ට විධාන නිකුත් කරන්නට විය. කුඩා කඳුගැට තුනක් මුදුනේ පිහිටි කින්ග්ස් ලෑන්ඩින්ග් කෙමෙන් කෙමෙන් ඔවුන් ගේ දර්ශන පථයට හසුවෙද්දී ඔවුන් වටා ස්ටොන් ඩාන්සර්හි නැවු තට්ටුව කඩිගුලක් මෙන් ඇවිස්සී ගියේ ය.

වසර තුන්සීයකට පෙර මේ කඳු ගැට වැසී තිබුනේ වනාන්තරයෙන් බව කැට්ලින් දැන සිටියා ය. කළුදියදහර නම් වූ ඒ ගැඹුරු වේගවත් ගංගාව මුහුදට ගලාබසිනා මෝය කටේ උතුරු ඉවුරේ පදිංචි වී සිටි මසුන් මරන්නන් ස්වල්පයක් හැරෙන්නට එවකට එහි අන් කිසිවෙකුත් නොවී ය. ඩ්‍රැගන්ස්ටෝන්හි සිට නැවු නැගී ජයග්‍රාහක ඒගොන් සිය හමුදාවත් සමග ගොඩ බැස්සේ මෙතැනටය. දැවයෙන් හා මැටියෙන් නිමකල සිය පළමු බලකොටුව ඔහු විසින් ගොඩනංවන ලද්දේ මේ කඳුගැට තුනෙන් උසම කඳුගැටය මුදුනේ ය.

එනමුදු දැන් මේ නගරය වෙරළ තීරයේ ඇසට හසුවන මානය ඉක්මවා පැතිර තිබින. මන්දිර හා ලතා මණ්ඩප හා ධාන්‍යාගාර, ගඩොලින් තැනූ ගබඩා හා දැවමුවා තානායම් හා වෙළෙඳුන් ගේ සල්පිල්, සුරාසල් හා සොහොන් පිටි හා ගණිකා මඩම් යනාදී මේ සියල්ල එකට වෙලී පැවතින. මාළු වෙළෙඳපළේ කලිකලහය මෙතරම් ඈතක සිටි කැට්ලින්ට පවා ඇසිය හැකි විය. මේ ගොඩනැගිලි මධ්‍යයේ ගස්වලින් සෙවන වුනු පුළුල් මාවත්, අතුරු වීථි හා දෙදෙනෙකුට මාරු වීමට අසීරු තරම් පටුමං දසත විහිද පැවතින. විසෙන්යා ගේ කඳුගැටය මුදුනේ සිය පළිඟු කුළුණු හතෙන් විභූතිමත් වූ බේලර් ගේ සප්තකය පිහිටා තිබින. නගරයේ අනෙක් පස රේනිස් ගේ කඳුගැටය මුදුනේ කළු පැහැ බිත්තිවලින් යුත් 'මකරාවාටය' දැකිය හැකි විය. එහි දැවැන්ත ශිඛර ගෝලාර්ධය මේ වනවිට නටඹුන් වී තිබුනු අතර සියවසක් මුළුල්ලේ එහි ලෝකඩ දොරවල් වසා දමා තිබින. මේ දෙකට මැද්දෙන් පිහිටා තිබුනු 'සොයුරියන් ගේ වීථිය' ඊයක් මෙන් හරි කෙලින් වැටී තිබින. මේ සියල්ල වට කල නගර ප්‍රාකාර උස්ව ශක්තිමත්ව නැගී සිටියේය.

වෙරළ තීරය පුරා තොටුපළ සිය ගණනක් විසිරී පැවති අතර වරාය නැවු වලින් තදබද වී පැවතින. ගැඹුරු දියේ මසුන් අල්ලන බෝට්ටු හා ගංදියේ දුවන බෝට්ටු මත නැගී සිටි හබල් කරුවන් කළුදියදහර හරහා සිය බෝට්ටු එහා මෙහා පැදවූහ. බ්‍රාවොස් හා පෙන්ටොස් හා ලයිස් වෙතින් පැමිණි වෙළෙඳ නෞකා සිය භාණ්ඩ ගොඩබාමින් සිටියහ. ඉබ්න් තොටමුණේ සිට පැමිණි තාර මෙන් කළු පැහැ බඳින් යුත් තල්මස් දඩයම් නැවක් සමීපයේ නැංගුරම් ලා තිබුනු රැජිණ ගේ අලංකාර විනෝද පාරුව කැට්ලින් නිරීක්ෂණය

කලා ය. ගඟේ තරමක් ඉහළට වන්නට රුවල් ඇකිලූ රන්වන් පැහැ සිහින් බඳකින් යුතු යුධ නෞකා දුසිමක් පමණ නවතා තිබිනි.

මේ සියල්ලටම ඉහළින් ඒගොන් ගේ කඳුගැටය මුදුනේ වූ රතු බලකොටුව පහතින් තිබෙන කලිකලහය දෙස රවාගත් බැල්මෙන් බලා සිටියේ ය. එහි වූ දැවැන්ත සිලින්ඩරාකාර කුළුණු සත, මුදුනේ තිබුනු යකඩින් තැනූ පවුරු හා අටලුවලින් ආරක්ෂා විය. සුවිසල් මුරකපොලු, කවාකාර ආරුක්කුවලින් හැඩවුනු ශාලා හා ආවරණය කෙරුනු පාලම්, බැරැක්ක හා දඟගෙවල් හා ධාන්‍යාගාර, දුනුවායන් ගේ අට්ටාලවලින් පිරුනු සද්දන්ත රැකවල් පවුරු යන මේ සියල්ලම රතු පැහැ ගලින් නිම කෙරුනේ විය. ජයග්‍රාහක ඒගොන් විසින් එය තැනවීම ආරම්භ කල අතර ඔහු ගේ පුත් ක්‍රෑර මේගර් විසින් එහි නිමාව දුටුවේ ය. බලකොටුව තනා නිමවීමෙන් පසු මේගර් විසින් එය තැනීමට දායකවුනු ගල් වඩුවන්, ලී වඩුවන් හා අනිකුත් සියලුම කම්කරුවන් ගේ හිස ගසා මරා දැමී ය. මකරාධිපතියන් විසින් නිමවුනු මෙම බලකොටුවේ රහස් දැනගත හැක්කේ මකර රුධිරය ඇත්තවුන්ට පමණක් බවට ඔහු සපථ කලේ ය.

එනමුදු දැන් මේ බලකොටුවේ පවුරු මුදුනේ දිදුලමින් තිබුනු ධජ කළු පැහැති ඒවා නොව රන් පැහැ ඒවා විය. කලෙකදී එහි සිටි ගිනිපිඹින හිස් තුනේ මකරා වෙනුවට එහි දැන් උඩඟු ලෙසින් බලා සිටින්නේ බරතියන් වංශයේ ලාංඡනය වන කිරුළ ලූ ගෝනා ය.

විසල් සුදු පැහැ රුවලින් යුතු, උස් කුඹගස් සහිත, ගිම්හාන දූපත්වලට අයත් හංස නෞකාවක් වරායෙන් පිටත් වෙමින් තිබිනි. ඒ පසෙකින් වරායට ඇතුළු වූ ස්ටොන් ඩාන්සර් සිය නැවතුම් තොටුපළ වෙත ඇදෙන්නට වූවා ය.

"මගේ ආර්යවනි, අසනීපෙන් ඇඳට වෙලා ඉන්න දවස් ටිකේ මම ටිකක් කල්පනා කරලා බැලුවා කොහොමද මේ වැඩේ කරන්ට හොඳම විදිය කියලා. ඔබ බලකොටුවට ඇතුළුවෙන්ට එපා. ඒ වෙනුවට මම ගිහිල්ලා සෙර් ආරොන්ව මුනගැහිලා එයාව එක්කන් එන්නම් වෙන රහස් තැනකට."

කැට්ලින් මහළු නයිට්වරයා දෙස නිරීක්ෂණාත්මක බැල්මක් හෙලුවා ය. හම්බාන මේ වන විට ජැටිය වෙත ළඟාවෙමින් තිබුනු අතර කපිතාන් මොරියෝ නිදහස් නගරවල භාවිත වන

ග්‍රාමා වැලීරියන් බසින් බෙරිහන් දෙමින් සිය සේලරුවන්ට විධාන නිකුත් කරමින් සිටියේ ය. "ඔබත් මං තරම්ම අවදානමක් ගන්නවා නේ." ඇය කීවා ය.

සෙර් රඩ්‍රික් සිනහවක් පෑවේ ය. "මම හිතන්නෙ නෑ. අද උදේ වතුර තලියකින් මගේ මූන දැකපු වෙලාවෙ මටවත් ඒක අඳුරගන්ට බැරි වුනා. උඩුරැවුල නැතුව මාව දැකපු අන්තිම කෙනා මගේ අම්මා. එයා මැරිලා දැන් අවුරුදු හතලිහක් වෙනවා. මම විශ්වාස කරනවා මට පරෙස්සමින් මේ වැඩේ කරගන්ට පුළුවන් වෙයි කියලා මගේ ආර්යාවනි."

මොරියෝ ගේ හඬ නැවතත් ගිගුම් දුනි. එකාවන්ව ගංදියෙන් ඉහළට එසවුනු හබල් හැට ආපස්සට හබල් ගෑවේ නෞකාවේ වේගය අඩුකරලනු පිණිස ය. තවත් අණක් නිකුත් වුනු අතර එවර හබල් සියල්ල නැවු බඳ තුළට රුවාගෙන ගියේ ය. නෞකාව ජැටියේ පසෙක වදිද්දී ටයිරෝෂි සේලරුවන් කඹ ගැටගසනු පිණිස පිටතට පැන්නහ. මොරියෝ කලබල ගමනින් ඔවුන් වෙත පැමිණියේ මුව පුරා රුඳුනු විසල් සිනාවක්ද ඇතුව ය. "කින්ග්ස් ලැන්ඩින්ග් මගේ ආර්යාවනි, ඔබතුමී අණදුන්නු විදියටම. කිසිම නැවක් මේ තරම් ඉක්මනින් මේ ගමන ඉවර කරන්ට නැතුව ඇති. ඔබතුමීගෙ බඩු බාහිරාදිය බලකොටුවට උස්සන් යන්ට මොකුත් උදවුවක් එහෙම ඕනද?"

"අපි බලකොටුවට යන්නෙ නෑ. ඔබට සමහරවිට කියන්ට පුළුවන් වෙයි අපට නවතින්ට හොඳ තානායමක් ගැන එහෙම. ගඟෙන් වැඩිය දුර නැති, නිදහස් පිරිසුදු සැපපහසු තැනක්."

ටයිරෝෂියා සිය කොළ පැහැ රැවුල පිරිමැද්දේ ය. "මං හිතනවා. ඔබතුමන්ලා ගේ උවමනාකම්වලට ගැලපෙන විදියේ තැන් දෙකතුනක්ම මං දන්නවා. ඒත් ඊට කලින්.. සමාවෙන්ට මං මෙහෙම කියනවට.. අපේ පොරොන්දු වෙච්චි ගාස්තුවෙ ඉතුරු බාගෙ ගෙවලා ඉන්නවද. ඒත් එක්කම ඔබතුමී අර පොරොන්දු වෙච්චි අමතර රිදී කාසි ටිකත්. රිදී කාසි හැටක් මං හිතන්නෙ."

"හබල්කාරයින්ට." කැට්ලින් ඔහුට මතක් කර දුන්නා ය.

"ආහ්! ඔවු, අනිවාර්යයෙන්ම." මොරියෝ කීය. "ඒ වුනත් අපි ආපහු ටයිරොෂ්වලට යනකං ඒ ටික මගෙ බාරෙ තිබ්බනං හොඳයි කියලයි මං හිතන්නෙ. නැත්තං උංගෙ ගැනුන්ටයි ළමයින්ටයි දෙවි පිහිට තමා. ඔය රිදී කාසි ටික උංට මෙහෙදිම දුන්නොත් මගේ ආර්යාවනි, උං එක රැකින් ඒක නාස්ති කරගනියි, සූදු කෙලලා හරි ඔය වෙන මොනාට හරි වියදං කරලා හරි."

"සල්ලි නාස්ති කරන්ට ඊටත් වඩා නරක ක්‍රම තියෙනවා." සෙර් රඩ්‍රික් කතාවට මැදිහත් විය. "සීත කාලෙ එනවා."

"මිනිහෙකුට පුළුවන් එයා වෙනුවෙන් තමන්ම තීරණ ගන්ට." කැට්ලින් කීවා ය. "මේ මිනිස්සු ඒ රිදී කාසි උපයගත්තා. උං ඒක කොහොම වියදම් කරනවද කියන එක මට අයිති වැඩක් නෙවෙයි."

"ඔබතුමී කියන විදියකට මගේ ආර්යාවනි." මොරියෝ දෙකට නැවෙමින් සිනාමුවින් යුතුව පිළිතුරු දුන්නේ ය.

නිසැක වනු පිණිස හබල්කරුවන් ගේ රිදී කාසි කැට්ලින් විසින් සියතින්ම ඔවුන්ට ගෙවා දැමුවා ය. මොරියෝ විසින් විසෙන්යා ගේ කඳුගැටයේ මැදක පිහිටි තානායමක් ඔවුන්ට නිර්දේශ කර තිබින. එය ආඳ පටුමගෙහි වූ පැරණි ගොඩනැගිල්ලක් විය. එහි අයිතිකාරිය නොරිස්සුම් මුහුණකින් හෙබි මැහැල්ලක් වූ අතර ඇය සිය ආගන්තුකයින් දෙස සැකමුසු බැල්මක් හෙලුවා ය. එනමුදු ඇගේ කාමර හොඳින් වාතාශ්‍රය ලැබෙන විශාල ඒවා වූ අතර මොරියෝ දිවුරා කියූ පරිදි නම් ඇගේ මාළු ඉස්ටුව මුළු රාජධානි සප්තකයේම ඇති රසවත්ම ඉස්ටුව විය. මේ හැමටම වඩා වැදගත් වූයේ ඇය සිය ආගන්තුකයින් ගේ නම්ගම් විමසා නොසිටීම ය.

"ඔබ අමුත්තන් ගේ ශාලාවෙන් ඈත් වෙලා ඉන්න තරමට හොඳයි, මම හිතන්නෙ." කාමරය තුළ සිය බඩුබාහිරාදිය තැන්පත් කර අවසන් වූ පසු සෙර් රඩ්‍රික් කීවේ ය. "මේ වගේ තුට්ටු දෙකේ තැනක වුනත් අපි දන්නෙ නෑ කවුරු අපි දිහා බලාගෙන ඉන්නවද කියලා." ඔහු මුදු දම්වැල් වලින් සැදුනු සන්නාහයක් හැඳ කිනිස්සක් හා දිගු අසිපතක් පැළඳ සිටි අතර ඊට උඩින් හිස වැසිය හැකි අන්දමේ අඳුරු කබායක් හැඳ සිටියේ ය. "මම

සෙර් ආරොන් එක්ක රෑ වෙන්ට ඉස්සෙල්ලා එන්නම්." ඔහු පොරොන්දු විය. "ඔබ දැන් ටිකක් විවේක ගන්ට මගේ ආර්යාවනි."

කැට්ලින්ට දැඩි විඩාවක් දැනෙන්නට විය. මුහුදු ගමන දිගු මෙන්ම වෙහෙස ගෙන දෙන්නක් විය. එමෙන්ම, ඇය දැන් පෙර සිටි තරුණිය ද නොවේ. කාමරයේ කවුළු පිටත පටුමගට හා පියැසි වලට විවර වූ අතර මදක් ඈතින් ගංගාව දැකිය හැකි විය. තානායමෙන් පිට වූ සෙර් රඩ්‍රික් ඉක්මන් ගමනින් මාවතේ සෙනග අස්සේ නොපෙනී යන දෙස ඇය බලා සිටියා ය. ඉන්පසු ඔහු දුන් උපදෙස අනුව කෙටි විවේකයක් ලබන්නට අදහස් කලා ය. ඇඳේ මෙට්ටය ඇය පුරුදුව සිටි අන්දමේ පිහාටු මෙට්ටයක් නොව පිදුරු අතුරා සකස්කරන ලද්දක් වුවද සුව නින්දකට වැටෙන්නට එය කිසිසේත්ම බාධාවක් නොවී ය.

ඇය නැවත පිබිදුනේ කිසිවකු කාමරයේ දොරට මහ හයියෙන් තඩිබාන හඬිනි.

Catelyn Stark: “A wife is allowed to yearn for her husband, and if a mother needs her daughters close, who can tell her no?”

කැට්ලින් සැනෙකින් නැගිට සිටියා ය. කවුළුවට පිටතින් වූ පියැසි බැස යන හිරු ගේ රක්තවර්ණ රැස් දහරින් සේයා වී තිබින. ඇය අදහස් කරගෙන සිටියාට වඩා වැඩි වේලාවක් නින්දට වැය වී ඇති සේය. නැවත වරක් ඇගේ දොරට තඩි බෑ කිසිවෙක් මහ හඬින් කතා කලේ ය. "රජතුමාගෙ නාමයෙන් දොර අරින්ට."

"පොඩ්ඩක් ඉන්ට." ඇය පිළිතුරු දුන්නා ය. සිය සළුව ගතෙහි දවටාගෙන ඇඳ අසල මේසය මත තිබුනු කිනිස්ස සුරතින් ගත් ඇය දොර දෙසට පිය මැන්නා ය.

කාමරය තුළට කඩා වැදුනු මිනිස්සු නගරාරක්ෂක බලකායට අයත් කළු පැහැ සන්නාහයෙන් හා රන්වන් සළුවෙන් සැරසී සිටියහ. ඇය අතේ ඇති කිනිස්ස දුටු ඔවුන් ගේ

ප්‍රධානියා සිනහවක් පලකලේ ය. "ඕක ඕන වෙන එකක් නෑ මයෙ ආර්යාවනි. අපි ආවෙ ඔබතුමීව බලකොටුවට එක්කරන් යන්ටයි."

"කාගෙ අධිකාරි බලයක් පිටද?"

ප්‍රධානියා ඇයට පිත්තපටියක් පෙන්වී ය. සිය හුස්ම උගුරේ සිරවී යනු කැට්ලින්ට දැනුනි. එහි තිබුනේ අළු පැහැ ඉටියෙන් සලකුණු තැබූ කවට කුරුල්ලෙකි. "පෙටයර්." ඇය මිමිනුවා ය. මෙතරම් ඉක්මනට? සෙර් රඩ්‍රික්ට යම්කිසි අකරතැබ්බයක් සිදු වූවා සේය. ඇය ප්‍රධානියා දෙස බැලුවා ය. "උඹ දන්නවද මම කවුද කියලා?"

"නෑ මයෙ ආර්යාවනි. මයෙ උතුමානන් කිවුවෙ ඔබතුමීව එතුමා ළඟට එක්කරන් එන්ට කියලා විතරයි. ඔබතුමීට කිසිම විදියකින් නරකට සලකන්ට එපාය කියලත් කිවුවා."

කැට්ලින් හිස වැනුවා ය. "මම ලෑස්ති වෙනකං උඹලට එළියට වෙලා ඉන්ට පුළුවන්."

සිය දෑත් ජලයෙන් සේදූ ඇය තුවාල නැවත පිරිසුදු හණ රෙදිවලින් වෙලුවා ය. තුවාල වූ අතැඟිලි නුහුරු ලෙස නවමින් ඇඳුම් ඇඳගන්නා අතරේ ඇය කල්පනා කරන්නට වූවා ය. ඇය මෙහි සිටින බව සුළැඟිල්ලා දැනගත්තේ කෙසේද? සෙර් රඩ්‍රික් එය ඔහුට කිසිදා නොකියනු ඇත. ඔහු මහල්ලෙක් වුවද මුරණ්ඩු, තමාට ලැදි අයෙකි. ඔවුන් දැනටමත් ප්‍රමාද වැඩිද? ලැනිස්ටර්වරුන් ඔවුන්ට පෙර කින්ග්ස් ලැන්ඩින්ග්වලට එන්නට සමත් වීද? නැත, එසේ වී නම් නෙඩ් මෙහි පැමිණ සිටිය යුතු අතර අන් කිසිවෙකුටත් කලින් ඔහු ඇය වෙතට පැමිණෙනු ඇත. කෙසේද....?

මොරියෝ! මේ ටයිරෝෂියා ඔවුන් කවුරුන්ද යන්නත්, ඔවුන් නැවතී සිටින්නේ කොහේද යන්නත් දැන සිටියේ ය. ඒ තොරතුරු සැපයීම වෙනුවෙන් ඔහු හොඳ මිලක් ලබන්නට ඇත.

ඔවුන් ඇය වෙනුවෙන් අසෙකු ගෙනැවිත් තිබින. තානායමෙන් පිටත් වෙද්දී මාවත් දෙපස පහන් දැල්වෙන්නට පටන්ගෙන තිබුනි. නගරාරක්ෂක සෙබළුන් පිරිවරා අසුපිට යන තමා

දෙසට එල්ල වී ඇති නගර වැසියන් ගේ දෑස් ඇයට දැනෙන්නට විය. ඔවුන් රතු බලකොටුව වෙත ළඟා වන විට ගරාදි පැලැල්ල පහත දමා තිබුනු අතර රාත්‍රිය වෙනුවෙන් සුවිසල් දොරටු වසා දමා තිබින. එනමුදු බලකොටුවේ කවුළු ආලෝකවත්ව බබලමින් තිබින. සිය අසුන් ප්‍රාකාරයට පිටතින් නැවැත්වූ නගරාරක්ෂකයෝ කුඩා පැති දොරටුවක් හරහා ඇතුළු වී නිමක් නැති පඩිපෙළ ඔස්සේ ගොස් බලකොටු කුළුණක් වෙතට ඇයව කැඳවාගෙන ගියහ.

පෙටයර් බේලිෂ් කාමරය තුළ තනිවම බරසාර මේසයක් අසල අසුන් ගෙන සිටියේ ය. මේසය මත පහනක් දැල්වෙමින් තිබුනු අතර ඔහු යමක් ලියමින් සිටියේ ය. ඔවුන් ඇයව කාමරය තුළට කැඳවාගෙන පැමිණි විට ලියමින් සිටි පෑන පසෙකින් තැබූ ඔහු ඇය දෙස බැලී ය. "කැට්." ඔහු මිමිනී ය.

"මාව මෙහෙම මෙතනට එක්කන් ආපු එකේ තේරුම මොකක්ද?"

නැගී සිටි ඔහු ආරක්ෂකයින්ට රළු ලෙස සංඥා කලේ ය. "පිටවෙයල්ලා." ඔවුහු පිටව ගියහ. "මම හිතනවා උං ඔයාට කිසිම නරක අන්දමකින් සැලකුවෙ නෑ කියලා. මම බොහොම දැඩි විදියට අණ කලා." ඇගේ දෑතේ වෙලුම්පටි ඔහු දුටුවේ ය. "ඔයාගෙ අත් දෙක..."

කැට්ලින් ප්‍රශ්නය නොතකා හැරියා ය. "වැඩකාර කෙල්ලක් වගේ මෙහෙම විධාන දීලා එක්කන් එන්ට මම පුරුදුවෙලා නෑ." ඇය අමනාප ස්වරයෙන් කීවා ය. "පොඩි කොල්ලෙක් කාලෙ වුනත් ඔබ ආචාරශීලීත්වය ගැන දැනගෙන හිටියා."

"මම ඔයාව කේන්ති ගැස්සුවද මගේ ආර්යාවනි. මම කොහෙත්ම එහෙම දෙයක් කරන්ට බලාපොරොත්තු වුනේ නෑ." ඔහුගෙන් දිස්වූයේ පසුතැවෙන ස්වභාවයකි. ඒ බැල්ම විචිත්‍ර මතකයන් රැසක් කැට්ලින් ගේ සිතට ගෙන ඒමට සමත් විය. ඔහු කපටි ප්‍රයෝගකාර කොලුවකුව සිටියේ ය. එනමුදු තමා කල සෑම මැරවරකමක්ම අවසානයේ කල වරද ගැන පසුතැවෙන මුහුණක් පෙන්නුම් කිරීමට ඔහු සමත් විය. එය ඔහු ලැබූ ත්‍යාගයක් බඳු විය. මෙතරම් වසර ගණනාවකට පසුවවත් ඔහු එතරම් වෙනස් වී නොමැත. පෙටයර් සිරුරින් කුඩා කොලුවකුව සිටි අතර මේ වනවිට කුඩා මිනිසකු බවට වැඩී තිබින. කැට්ලින්ට වඩා අඟලක් හෝ දෙකක් මිටි, සිහින් සිරුරැති, සුනම්‍ය එමෙන්ම ඇයට මතක ඇති පරිද්දෙන්ම

තියුණු හැඩහුරුකම් හා නිතර සිනාසෙන අළු-කොළ පැහැ දෑස් ඇති මිනිසකු බවට පත්වී තිබින. ඔහු ගේ නිකටේ දැන් පුංචි උල් රැවුලක් වවා තිබූ අතර කළු හිසකෙස් අතරින් පතර රිදී පැහැ කෙස් දැකිය හැකි විය. එනමුදු ඔහුට තවමත් වයස තිහක් නොවී ය. ඔහු ගේ සළුව උර වටා රැඳවූ රජතමය කවටකුරුල්ලා ඒ රිදී හිසෙකෙස් හා මනාව ගැලපුනි. කුඩා දරුවකුව සිටියදී පවා පෙටයර් සිය රිදීවලට ආශා කලේ ය.

"ඔබ කොහොමද දැනගත්තෙ මම නගරයේ ඉන්නවා කියලා?"

"වාරිස් උතුමානන් හැමදෙයක්ම දන්නවා." පෙටයර් කපටි සිනාවක් ඇතුව කීය. "එයා ඉක්මනින්ම අපිත් එක්ක එකතු වෙයි. ඒ වුනත් මට ඕන වුනා ඊට කලින් තනියම ඔයාව මුනගැහෙන්ට. කොච්චර කාලයක්ද කැට්. අවුරුදු කීයක්ද."

කැට්ලින් මේ දැනඇඳුනුම්කම් නොතකා හැරියා ය. "එහෙනම් රජතුමාගෙ මකුළුවයි මාව හොයාගත්තෙ."

සුළැඟිල්ලා වේදනාවෙන් ඇකිළුනි. "එයාට මූනට එහෙම කියන්ට එපා. එයා හරි සංවේදී කෙනෙක්. වාරිස්ට නොදැනී මේ නගරයේ කිසිම දෙයක් වෙන්නෙ නෑ. සමහර වෙලාවට යම් යම් දේවල් සිද්දවෙන්ටත් කලින්ම එයා දැනගන්නවා. එයාට හැම තැනින්ම තොරතුරු ගලාගෙන එනවා. එයා උංට කියන්නෙ එයාගෙ පුංචි කුරුල්ලො කියලා. එයාගෙ මේ පුංචි කුරුල්ලෙකුට දැනගන්ට ලැබුනා ඔයා නගරෙට ඇවිල්ලා කියලා. වාසනාවට වගේ මේ ආරංචියයත් අරන් වාරිස් මුලින්ම ආවෙ මා ගාවටයි."

"ඇයි ඔබ?"

ඔහු දෙවුර ඇකිළුවේ ය. "ඇයි මම නොවෙන්නෙ? මම තමා භාණ්ඩාගාරයේ ප්‍රධානියා. රජතුමාගෙ උපදේශකයෙක්. සෙල්මියි රෙන්ලි උතුමානනුයි උතුරට ගියා රොබර්ට්ව එක්කන් එන්ට. ස්ටැනිස් උතුමානන් ඩ්‍රැගන්ස්ටෝන්වලට ගියා. ඉතින් දැන් නගරයේ ඉන්නෙ මායි මෙස්ටර් පයිසෙලුයි විතරයි. ඉතින් මම තමා පැහැදිළි තෝරාගැනීම නේද? අනික මම ඔයාගෙ සහෝදරී ලයිසා ගෙ යාළුවා. වාරිස් ඒකත් දන්නවා."

"වාරිස් දන්නවද...."

"වාරිස් උතුමානන් හැම දෙයක්ම දන්නවා... ඔයා මෙහෙ ආවෙ ඇයි කියන එක ඇරෙන්ට." ඔහු ඇහි බැමක් එසෙවුවේ ය. "ඇයි ඔයා මෙහාට ආවෙ?"

"බිරිඳකට සැමියා නැති පාළුව දැනෙන්ට පුළුවන්. අනික අම්මා කෙනෙකුට එයාගෙ දූවලට ලංවෙලා ඉන්ට ඕන වුනොත් කාටද පුළුවන් එයාව නවත්තන්ට?"

සුළැඟිල්ලා සිනාසුනේ ය. "හා! හරිම අපූරුයි මගේ ආර්යාවනි. ඒ වුනත් හිතන්ට එපා මම ඒක විශ්වාස කරයි කියලා. මම ඔයාව බොහොම හොඳින් දන්නවා. මොකක්ද ටලීවරුන්ගෙ ආදර්ශ පාඨය?"

ඇගේ උගුර වියළි ගොස් තිබිනි. "පෙළපත, රාජකාරිය, ගෞරවය." ඇය දරදඬු ස්වරයෙන් තෙපලා ය. ඔහු ඕනෑවටත් වඩා හොඳින් ඇයව දැන සිටියා ය.

"පෙළපත, රාජකාරිය, ගෞරවය." ඔහු පුනරුච්චාරණය කලේ ය. "මේ හැම එකක්ම කියන්නෙ ඔයා දැන් වින්ටර්ෆෙල්වල, ඒ කියන්නෙ අපේ රජතුමාගෙ හස්තය ඔයාව දාලා ආපු තැන ඉන්ට ඕන කියලයි. නෑ මගෙ ආර්යාවනි. මොකක් හරි දෙයක් සිද්දවුනා. ඔයාගෙ මේ අනපේක්ෂිත සංචාරයෙන් පේන්නෙ මොකක් හරි හදිසි තත්ත්වයක් උද්ගත වෙලා තියෙනවා කියලයි. මම බැගෑපත්ව ඉල්ලා ඉන්නවා, මට උදවු කරන්ට ඉඩ දෙන්ට. පරණ ළඟ යාළුවො එකිනෙකාගෙන් උදවු ඉල්ලන්ට අකැමැති වෙන්ට හේතුවක් නෑ." මෘදු ලෙසින් දොරට තට්ටු කරන හඬක් ඇසිනි. "ඇතුල්වෙන්ට." සුළැඟිල්ලා කීය.

දොරින් ඇතුළු වූයේ තර, සුවඳ විලවුන් ගත දැවටූ, බිත්තරයක් මෙන් වූ තට්ට හිසැත්තෙකි. දම් පැහැ ලිහිල් සේද ගවොමකින් සැරසී රන් හුයෙන් වියන ලද උඩු කබායක් හැඳ සිටි ඔහු ගේ දෙපයෙහි විල්ලූදයෙන් නිමවුනු සෙරෙප්පු යුවලක් පැළඳ සිටියේ ය. "ස්ටාර්ක් ආර්යාවනි." ඔහු පැවසුයේ ඇගේ සුරත සිය දෑතින්ම ගනිමිනි. "මේ තරම් අවුරුදු ගානකට පස්සෙ ඔබව නැවත දකින්ට ලැබීම ලොකු සතුටක්." ඔහු ගේ සම සුමුදු තෙත් බවක් දැනවූ අතර ඔහු වෙතින් ලයිලැක් මල් සුවඳක් හැමී ය. "ආහ්! ඔබේ අත් දෙක. ඔබ මොනවට හරි

පිච්චුනාද ආර්යාවනි? ඇඟිලි කියන්නෙ බොහොම සියුමැලි දෙයක්... අපේ හොඳ මේස්ටර් පයිසෙල් බොහොම විශිෂ්ට ආලේපයක් හදනවා. මම ඒකෙන් භාජනයක් ගෙන්නන්නටද?"

කැට්ලින් සිය අතැඟිලි ඔහු ගේ ග්‍රහණයෙන් මුදා ගත්තා ය. "බොහොම ස්තූතියි උතුමානනි! ඒ වුනත් අපේ මේස්ටර් ලුවින් දැනටමත් ඒ තුවාලවලට බෙහෙත් කරලයි තියෙන්නෙ."

වාරිස් හිස සෙලෙව්වුවේ ය. "ඔබේ පුතා ගැන අහන්ට ලැබුනු ආරංචිය ගැන අපට බොහොම දුකයි. මේ තරම් පුංචි කාලෙකදි. දෙවියන් වහන්සේ හරිම දරුණු කෙනෙක් වෙන්ට ඕන."

"ඒ ගැන නම් අපට එකඟවෙන්ට පුළුවන් වාරිස් උතුමානනි." ඇය කීවා ය. මේ ගරු නාමය ඔහු රාජසභාවේ තනතුරක් දරන නිසා ලද කරුනාවකි. වාරිස් යනු සිය මකුළුදැළේ උතුමානන් මිස අන් කිසිවක උතුමානන් නොවේ. සිය රහස්වල ස්වාමියා මිස අන් කිසිවක ස්වාමියා නොවේ.

පණ්ඩකයා සිය මෘදු දැත් විදහුවේ ය. "ඊටත් වඩා දේ ගැන අපට එකඟවෙන්ට පුළුවන් කියලා මම හිතනවා ආර්යාවනි. ඔබේ සැමියා, අපේ අලුත් හස්තය ගැන මගෙ බොහොම ලොකු ගරුසරුවක් තියෙනවා. අනික මම දන්නවා අපි දෙන්නම රොබර්ට් රජතුමාට ආදරෙයි කියලා."

"ඔවු. අනිවාර්යයෙන්ම."

"අපේ රොබර්ට්ට තරම් වෙන කිසිම රජෙකුට මිනිස්සු මෙච්චර ආදරේ වුනෙ නෑ." සුළැඟිල්ලා කතාව මැද්දට පැන්නේ ය. ඔහු කපටි සිනහවක් පෑවේ ය. "අඩුම ගානෙ වාරිස් උතුමානන්ට ඇහෙන මානයේදී වත්."

"මගෙ හොඳ ආර්යාවනි." වාරිස් මහත් සැලකිල්ලකින් කතාව පටන් ගත්තේ ය. "නිදහස් නගරවල ඉන්නවා බොහොම අද්භූතජනක සුවකිරීමේ හැකියාවන් තියෙන මිනිස්සු. ඔබේ වචනය දෙන්ට. ඔබේ ආදරණීය බ්‍රැන් වෙනුවෙන් මම කෙනෙක්ව ගෙන්නන්නම්."

"මේස්ටර් ලුවින් එයාට කරන්ට පුළුවන් හැම දේම කරනවා බ්‍රෑන් වෙනුවෙන්." ඈය පැවසුවා ය. ඈයට මෙහි, මේ මිනිසුන් සමග බ්‍රෑන් ගැන කතා කිරීමට උවමනා නොවී ය. ඈය සුළැඹිල්ලාව යන්තම් විශ්වාස කල අතර වාරිස්ව කොහෙත්ම විශ්වාස නොකලා ය. ඔවුන්ට ඈය ගේ ශෝකය පෙන්වීමට ඈයට අවශ්‍ය වූයේ නැත. "බේලිෂ් උතුමානන් කියනවා මාව මෙහාට ගෙනාපු එකට මම ඔබටයි ස්තූති කරන්ට ඕන කියලා."

වාරිස් කුඩා දැරියක මෙන් කැකිරි පැලුවේ ය. "ආහ්! ඔවු. මම හිතනවා මම තමා වැරැදිකාරයා කියලා. මම බලාපොරොත්තු වෙනවා ඔබ මට සමාව දෙයි කියලා, කරුනාවන්ත ආර්යාවනි." අසුනක් මත වාඩි වූ ඔහු දෙඅත් බැඳගත්තේ ය. "මම කල්පනා කරන්නේ ඔබ අපට අර කිනිස්ස පෙන්නයි කියලා."

කැට්ලින් ස්ටාර්ක් අවිශ්වාසයෙන් ගල් ගැසී පණ්ඩකයා දෙස බැලුවා ය. 'මේ නම් මකුළුවෙක්ම තමා'යි ඈය සිතුවා ය. එහෙමත් නැත්තම් විජ්ජාකරුවෙක් හෝ ඊටත් වඩා වැඩි බලයක් ඇති කෙනෙක්! කිසිම කෙනෙකුට දැනගන්නට ලැබේ යැයි සිතන්නට වත් බැරි දේ මොහු දනියි. එසේත් නැතිනම්... "ඔබ මොකක්ද සෙර් රඩ්‍රික්ට කලේ?" ඈය විමසුවා ය.

සිදුවන්නේ කුමක්දැයි සුළැඹිල්ලාට හාංකවින්සියකවත් වැටහීමක් නොවී ය. "මට දැනෙන්නෙ හරියට ලන්සෙ ගෙදර අමතක කරලා දාලා යුද්ධෙට ගිය නයිට් කෙනෙක් වගේ. මොන කිනිස්සක් ගැනද අපි මේ කතා කරන්නෙ? කවුද සෙර් රඩ්‍රික්?"

"සෙර් රඩ්‍රික් කසල් කියන්නෙ වින්ටර්ෆෙල්වල ප්‍රධාන සටන් පුහුණුකරුවා." වාරිස් ඔහුව දැනුවත් කලේ ය. "මම ඔබට සහතිකයෙන්ම කියා ඉන්නවා ස්ටාර්ක් ආර්යාවනි, අපේ හොඳ නයිට්වරයා කිසිම අතුරු ආන්තරාවක් නැතුව ඉන්නවා. එයා අද දවාලෙ බලකොටුවට ආවා. ඇවිල්ලා ආයුධ ගබඩාවට ගිහිල්ලා සෙර් ආරොන් සැන්ටගාර්ව මුනගැහුනා. ඒ දෙන්නා එක්තරා කිනිස්සක් ගැන කතා කලා. ඉර බහින්ට කිට්ටු කරලා ඒ දෙන්නාම බලකොටුවෙන් පිටවෙලා ඔබලා නැවතිලා ඉන්න අර ජරා පැලට ගියා. එයාලා තාමත් එහෙ ඉන්නවා, අමුත්තන්ගෙ ශාලාවට වෙලා වයින් බිබී, ඔබ එනකං බලාගෙන. ඔබේ මේ අතුරුදහන් වීම ගැන සෙර් රඩ්‍රික් බොහොම තෝන්තුවෙන් ඉන්නෙ."

"ඔබ කොහොමද මේ හැම දෙයක්ම දන්නෙ?"

"පුංචි කුරුල්ලන්ගෙ මිමිනීම් තමා." වාරිස් සිනාසෙමින් කීය. "මම දේවල් දන්නවා ආර්යාවනි. ඒක තමා මට පැවරිලා තියෙන රාජකාරිය." ඔහු දෙවුර ඇකිළුවේ ය. "ඔබ ළඟ ඒ කිනිස්ස තියෙනවා, ඔවු නේද?"

සිය සළුවට යටින් තිබුනු කිනිස්ස ඇදගත් කැට්ලින් එය ඔවුන් ඉදිරිපිට ඇති මේසය මතට දැමුවා ය. "ඔය තියෙන්නෙ. සමහරවිට ඔබේ ඔය කුරුල්ලන්ට මුමුනන්ට පුළුවන් වෙයි ඕකෙ අයිතිකාරයගෙ නම මොකක්ද කියලා."

ඕනෑවටත් වඩා වැඩි මෘදු මොළොක් බවකින් යුතුව කිනිස්ස අතට ගත් වාරිස් එහි තලය දිගේ සිය මහපටැඟිල්ල ගෙන ගියේ ය. ඇඟිල්ලෙන් රුධිරය මතු විය. මීයකු මෙන් බියෙන් කෑ ගැසූ වාරිස් කිනිස්ස නැවත මේසය මතට වීසි කර දැම්මේ ය.

"පරිස්සම් වෙන්ට. ඒක හරිම තියුණුයි." කැට්ලින් ඔහුට කීවා ය.

"වැලිරියන් වානේ තරම් වෙන කිසිම දෙයක් මෙච්චර මුවහත් නෑ." සුළැඟිල්ලා කියද්දී වාරිස් සිය ලේ ගලන මහපටැඟිල්ල මුවේ දමාගෙන බුම්මාගත් මුහුණින් කැට්ලින් දෙස බලා සිටියේ ය. සුළැඟිල්ලා කිනිස්ස අතට ගෙන එහි බර හා මිටෙහි ග්‍රහණය පිරික්සා බැලුවේ ය. එය උඩ වීසිකල ඔහු නැවත අනිත් අතින් එය අල්ලා ගත්තේ ය. "කොච්චර හොඳ සමබරතාවක්ද. ඔයාට මේකෙ අයිතිකාරයා හොයාගන්ටයි ඕන. ඒකද මේ ගමනෙ අරමුන? ඔයාට ඒකට සෙර් ආරොන් ළඟට යන්ට ඕන නෑ මගේ ආර්යාවනි. ඔයා එන්ට තිබුනෙ මගේ ගාවටයි."

"ඉතින් මම ආවනම්, ඔබට මොකක්ද මට කියන්ට තියෙන්නෙ?"

"එහෙනම් මම ඔයාට කියනවා 'මේ මුළු කින්ග්ස් ලැන්ඩින්ග්වලම මේ වගේ එකම එක කිනිස්සයි තියෙන්නෙ', කියලා." කිනිසි තලය මහපටැඟිල්ලත් දබරැඟිල්ලත් අතරේ සිරකර ගත් ඔහු උරහිසට උඩින් අත උස්සා පලපුරුදු මැණික්කටු චලනයකින් එය කාමරය

හරහා පියඹා යැවුවේ ය. කිනිස්ස දොරෙහි සනකම් ඕක් ලීයේ යටට ඇමිණී ගියේ ය. "ඒක මගේ."

"ඔබේ?" එය තේරුම් ගැනීමට අසීරු දෙයකි. පෙටයර් කිසිදිනෙකත් වින්ටර්ෆෙල්වලට පා තබා නැත.

"ජොෆ්රි කුමාරයගෙ උපන්දිනය වෙනුවෙන් පවත්වපු තරගාවලිය දා වෙනකම්." ඔහු කීවේ දොරෙහි ඇමිණී ගිය කිනිස්ස ගලවාගැනීම සඳහා කාමරය හරහා පිය මනිමිනි. "අසරු පොරේ වෙනුවෙන් මම සෙර් ජේමිට ඔට්ටු තිබ්බා. මම විතරක් නෙවෙයි, රාජ සභාවෙන් බාගයක්ම." පෙටයර් ගේ මුවේ ඇඳුනු ලැජ්ජාසහගත නියවීම ඔහුට නැවතත් කොලුවෙකු ගේ පෙනුමක් ලබා දී තිබිනි. "ලෝරාස් ටිරල් ජේමිව පරද්දපු එකෙන් අපි ගොඩ දෙනෙක් ටිකක් විතර දුප්පත් වුනා. සෙර් ජේමි රන්කාසි සීයක් පැරදුනා. රැජිණ මරකත පෙන්ඩනයක් පැරදුනා. මම මගෙ කිනිස්ස පැරදුනා. රැජිණට නම් පුළුවන් වුනා එයාගෙ මරකත ආපහු ඉල්ලගන්ට. ඒත් අනිත් වස්තුව ඔක්කොම ඔට්ටුව දිනපු කෙනා තියාගත්තා."

"කවුද ඒ?" කැට්ලින් විමසුවා ය. බිය නිසා ඇගේ මුව වියළි ගොස් තිබිනි. නැවත අලුත් වූ වේදනාව නිසා ඇගේ අතැඟිලි ඇදුම් කන්නට විය.

"පුංචි යකා." සුළැඟිල්ලා කීවේ වාරිස් උතුමානන් ඇගේ මුහුණ දෙස බලා සිටියදී ය. "ටිරියන් ලැනිස්ටර්."

Catelyn Stark: "I thought of him as a brother, but his feelings for me were... more than brotherly."

ජොන් 03-1

අංගනය පුරා අසිපත් එකට ගැටෙන හඬ රැවු දුන්නේ ය.

හැඳ සිටි කළු ලොම්, හම් සහ යකඩ සන්නාහයට යටින් පපුව දිගේ සීතලට දහදිය ගලා යනු ජොන්ට දැනින. එනමුදු ඔහු දිගටම සිය ප්‍රහාරය කරගෙන ගිය අතර ග්‍රෙන් පැකිලෙමින් පස්සෙන් පස්සට ඇදුනේ අදක්ෂ ලෙස පහර වැළකුවේ ය. ඔහු පහරක් සඳහා අසිපත එසවූ විට ඊට යටින් පැති පහරක් එල්ල කල ජොන් ප්‍රතිවාදියාව විස්මයට පත් කරමින් ඔහු ගේ පාදය පසුපසට පහරක් එල්ල කලේ ය. ග්‍රෙන් ගේ යටිකැපුමට පිළිතුරක් වශයෙන් ඉහළින් එල්ල වූ පහරින් ඔහු ගේ හිස් ආවරණය පළුදු විය. ඔහු ගේ පැති කැපුම සිය අසිපතින් පිසදා හැරි ජොන් සන්නාහය ලූ අතින් ප්‍රතිවාදියා ගේ පපුවට පහරක් දුන්නේ ය. කකුල පැටලී ගිය ග්‍රෙන් හිම මත ඉන්දවුනි. ග්‍රෙන් ගේ සුරතින් අසිපත විසි වී යන සේ ජොන් විසින් ඔහු ගේ මැණික්කටුවට පහරක් එල්ල කල අතර ග්‍රෙන් වේදනාවෙන් කෑගැසුවේ ය.

"ඇති." සෙර් ඇලිසර් තෝර්න් ගේ ස්වරය වැලීරියන් වානේ මෙන් තියුණු විය.

ග්‍රෙන් සිය අත බදාගත්තේ ය. "අවජාතකයා මගේ අත කැඩුවා."

"අවජාතකයා උඹේ කකුල කපලා දැම්මා, උඹේ ඔලුව දෙපලු කලා, උඹේ අත කපලා දැම්මා. මේ කඩුවල මුවහත තිබ්බනං ඒක තමා වෙන්නෙ. උඹලගෙ වාසනාවට නිශා රැකුමට මුර සංචාරකයො වගේම ඉස්තාල බලාගන්න කොල්ලොත් ඕන." සෙර් ඇලිසන් ජෙරන් හා ටොඩ් දෙසට සංඥාවක් කලේ ය. "ඔරොක්ස්ව කකුල් දෙකෙන් නැගිට්ටවපල්ලා. ඌට උගෙ අවමගුල් උත්සවේට ලෑස්ති වෙන්ට තියෙනවා."

අනිත් කොල්ලන් දෙදෙනා ග්‍රෙන්ව දෙපයින් නැගිට්ටවද්දී ජොන් සිය හිස් ආවරණය ඉවත් කලේ ය. මුහුණට වැදුනු උදෑසන සිසිල් සුළං විසින් ඔහුට සහනයක් ගෙන දුන්නේ ය. අසිපතට බර වුනු ඔහු ලය පුරා දිගු හුස්මක් ගත්තේ මොහොතකට සිය ජයග්‍රහණය ආස්වාදනය කරනු පිණිස ය.

"ඕක දිග කඩුවක්. නාකි මිනිහෙක්ගෙ හැරමිටියක් නෙවෙයි." සෙර් ඇලිසන් සැරෙන් කීවේ ය. "උඹේ කකුල් රිදෙනවද ස්නොව් උතුමානනි."

ජොන් මේ නමට වෛර කලේ ය. පුහුණුව පිණිස පැමිණි පළමුදාම සෙර් ඇලිසන් විසින් මේ විහිළු නම ඔහුට පට බැඳ තිබින. අනික් කොල්ලන් ඉතා ඉක්මනින් ඒ නමට හුරු වූ අතර දැන් ඔහු යන යන තැනදී ඒ නම අසන්නට ලැබින. ජොන් දිගු අසිපත කොපුවේ ලෑවේ ය. "නෑ." ඔහු පිළිතුරු දුනි.

තෝර්න් දිගු පියවර තබමින් ඔහු වෙත ආවේ ය. ඔහු වසර පනහක් පමණ වයස් වූ දැඩි ගතිගුණ ඇත්තෙකි. ඔහු ගේ කළු හිසකෙස් තැනින් තැන අව පැහැ වෙමින් තිබුනු අතර දෑස් අගත්ති මෙන් තද පැහැයෙන් බැබලින. "හරි, දැන් ඇත්ත කියපං." ඔහු අණ කලේ ය.

"මට මහන්සියි." ජොන් පිළිගත්තේ ය. සැබැවින්ම දිගු අසිපතේ බර නිසා ඔහු ගේ අත ඇදුම් කමින් තිබූ අතර සටන නිමවී තිබුනු හෙයින් දැන් ඔහුට වැදුනු පහරවල වේදනාවද දැනෙන්නට පටන්ගෙන තිබින.

"උඹ දුර්වලයි."

"මම දිනුවා."

"නෑ. ඕරොක්ස් පැරදුනා."

එක් කොල්ලෙක් අවඥාවට මෙන් හිකි හිකි ගා සිනාසුනේ ය. මෙයට පිළිතුරක් දීමට වඩා නිහඬව සිටීම මැනවැයි ජොන් දැන සිටියේ ය. සෙර් ඇලිසන් ඔහුට එදිරිව එවන ලද සෑම ප්‍රතිවාදියෙකුම ඔහු අතින් පැරදුනු නමුදු එයින් ඔහුට අත්වුනු සුගතියක් නැත. ප්‍රධාන සටන් පුහුණුකරුවාගෙන් ඔහුට හැමදාමත් ලැබුනේ සමච්චලයක් පමණි. තෝර්න් ඔහුට වෛර කරන බව අවසානයේ දී ජොන් පැමිණුනු නිගමනය විය. ඊටත් වඩා ඔහු අනිකුත් කොල්ලන්ට වෛර කරනවා වන්නට ඇත.

"හරි. අදට එච්චරයි." තෝර්න් ඔවුන්ට පැවසී ය. "මට එක දවසකදි මූන දෙන්ට පුළුවන් මෝඩකම්වල සීමාවක් තියෙනවා. අනික් එවුන් කවදා හරි අපිව හොයාගෙන ආවොත් උං ගාව දුනුවායො ඉන්ටයි කියලා මං යාඥා කරනවා. මොකද උඹලා ඔක්කොමල්ලා ගැලපෙන්නෙ ඊතල එකතු කරන්ට පඹයො වගේ හිටවලා තියන්ට විතරයි."

ජොන් සෙසු කොල්ලන්ට පසුව තනිවම ආයුධ ගබඩාව දෙසට ඇවිද ගියේ ය. මෙහිදී ඔහු නිතරම පාහේ ඇවිද්දේ තනිවම ය. ඔහු පුහුණු වෙමින් සිටින මේ කණ්ඩායමේ විස්සකට ආසන්න පිරිසක් සිටියද ඒ අතරින් මිතුරකු යැයි කිවහැකි කිසිවකු නොවී ය. ඔවුන්ගෙන් බොහෝදෙනකු ජොන්ට වඩා වසර දෙකතුනකින් වැඩිමහලු වුවද ඒ කිසිවෙකුත් දහහතර හැවිරිදි රොබ්ගෙන් අඩක් තරම්වත් දක්ෂ සටන්කරුවන් නොවී ය. ඩේරියන් ක්ෂණික වුවද පහර වැදෙනවාට බිය ඇත්තෙකි, පිප් ඔහු ගේ අසිපත භාවිත කරන්නේ කිනිස්සක් පාවිච්චි කරන්නාක් මෙනි, ජෙරන් කෙල්ලකු මෙන් දුර්වල ය, ග්‍රෙන් අලසයකු හා අදක්ෂයෙකි. හෝල්ඩර් ගේ පහරවල් මාරාන්තික දැඩි බවකින් යුක්ත වුවද ඔහුව පහසුවෙන්ම ඔබ ගේ ප්‍රහාරය තුළට කැඳවා ගත හැක. ඔවුන් සමග ගතකරන කාලය වැඩිවන්නට වැඩිවන්නට ජොන් ඔවුන්ව ගර්හා කරන ප්‍රමාණයද වැඩි විය.

ආයුධ ගබඩාව තුළට වැදුනු ජොන් තමා අවට සිටින්නන් නොතකා හැර සිය අසිපත හා කොපුව බිත්තියෙහි වූ කොක්කක එල්ලුවේ ය. ඉන්පසු ක්‍රමයෙන් සිය සන්නාහයත්, සම් ආවරණත්, දහදියෙන් පෙඟී ගිය ලොම් ආවරණයත් ඉවත් කලේ ය. දිගු ශාලාව දෙකෙලවරෙහිම ගිනි අඟුරුකබල් දෙකක් තබා තිබුනද ජොන් සීතලයෙන් වෙවුලන්නට විය. මෙහිදී සීතල නිරන්තරයෙන්ම ඔහු සමග විය. තවත් වසර කිහිපයක් ගතවන විට උණුසුම යනු කුමක්දැයි ඔහුට අමතක වනු ඇත.

ඔවුන් එදිනෙදා භාවිත කරන කළු පැහැ රළු ඇඳුම් ඇඳගනිද්දී ඔහුට හදිසියේම දැඩි විඩාවක් දැනින. එතැනම තිබුනු බංකුවක් මත අසුන් ගත් ඔහු වෙවුලන ඇඟිලිවලින් සිය කබාය ගැට ගසා ගත්තේ ය. ඔහුට වින්ටර්ෆෙල්හි උණුසුම් ශාලා, මිනිසකු ගේ සිරුරේ රුධිරය ගලන්නාක් මෙන් බිත්ති අතරින් උණු දිය දිවයන කාමර සිහියට නැගින. කළු බලකොටුවේ දී උණුසුම යනු අසීරුවෙන් සොයාගත යුත්තක් විය. එහි බිත්ති සීතල වූ අතර මිනිස්සු ඊටත් වඩා සීතල අයවලුන් වූහ.

නිශා රැකුම යනු මෙවැන්නක් බව කිසිම කෙනකු ඔහුට කියා දී නොතිබින. ටිරියන් ලැනිස්ටර් හැර අන් කිසිම කෙනකු ඒ බව ඔහුට කියා නැත. ඔවුන් උතුරට එන ගමනේදී කුරුමිට්ටා විසින් ඔහුට ඇත්ත ඇති සැටියෙන් පෙන්වා දී තිබින. නමුත් ඒ වන විට ඔහු පමා වූවා වැඩිය. ප්‍රාකාරයේ තත්ත්වය මෙබන්දක්යැයි සිය පියා දැන සිටියේදැයි ජොන් විමතියෙන් කල්පනා කරන්නට විය. ඔවු, ඔහු අනිවාර්යයෙන්ම දැන සිටින්නට ඇත. මේ සිතුවිල්ල ඔහු ගේ වේදනාව තවත් වැඩිකලේ ය.

මේ සීතල ලෝකාන්තයේ දී ඔහු ගේ බාප්පා පවා ඔහුව අත හැර දමා තිබින. ඔහු දැන සිටි නිතරම සිනහ මුහුණින් පසුවන බෙන්ජීන් ස්ටාර්ක් වෙනුවට මේ උතුරේ දී වෙනත් පුද්ගලයකු පහල වී තිබින. ඔහු මුර සංචාරකයින් ගේ ප්‍රධානියා වූ අතර සිය දහවල් හා රාත්‍රී කාලයන් ගෙවා දැමූයේ ප්‍රධාන අණදෙන නිළධාරි මෝර්මන්ට්, මේස්ටර් ඒමන් හා අනෙකුත් උසස් නිළධාරීන් අතරේ ය. ඒ අතර ජොන්ව සෙර් ඇලිසන් තෝර්න් ගේ අකාරුණික භාරයට පත් කර තිබින.

ඔවුන් මෙහි පැමිණ දින තුනකට පසුව බෙන්ජීන් ස්ටාර්ක් තවත් මිනිසුන් අඩ දුසිමක් සමග මුර සංචාරය පිණිස හොල්මන් කැලෑවට යන බව ජොන්ට දැනගන්නට ලැබින. ඒ රාත්‍රියේ කෑම කන ශාලාවේ දී සිය බාප්පා මුනගැසුනු ජොන් තමාවද මෙම ගමනට සහභාගි කරගන්නා මෙන් බැගෑපත්ව ඉල්ලා සිටියේ ය. බෙන්ජීන් එකහෙලාම ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කලේ ය. "මේ වින්ටර්ෆෙල් නෙවෙයි. ප්‍රාකාරයෙදි මිනිහෙකුට ලැබෙන්නෙ තමන් උපයාගත්ත දේ විතරයි. උඹ මුර සංචාරකයෙක් නෙවෙයි ජොන්. කිසිම පළපුරුද්දක් නැති පොඩි කොල්ලෙක් විතරයි."

ජොන් තකතීරු අන්දමින් තවතවත් වාද කලේ ය. "ඊළඟ උපන්දිනේට මට පහළොවක් පිරෙනවා. මමත් දැන් වැඩුන මිනිහෙක්."

බෙන්ජීන් ස්ටාර්ක් රවා බැලුවේ ය. "උඹ කොල්ලෙක්. උඹලා නිශා රැකුමට බැඳෙන්ට තරම් සුදුසු මිනිස්සු කියලා සෙර් ඇලිසන් සහතික කරනකං උඹ කොල්ලෙක්. උඹේ ඇඟේ දුවන ස්ටාර්ක් ලේ නිසා මෙහෙදි උඹට වාසි අත්පත් වෙයි කියලා හිතනවානං උඹට ලොකු වැරැදීමක් වෙලා. අපි අපේ පොරොන්දුව දිවුරුවාට පස්සෙ අපේ පරණ පවුල් අත ඇරලා දානවා. උඹේ තාත්තා හැමදාමත් මගේ හදවතේ ඉන්නවා තමා, ඒත් මෙයාලා තමා දැන් මගේ සහෝදරයො." තමා වටා සිටින කළු පැහැ ඇඳුමින් සැරසුනු දැඩි, සීතල මිනිසුන් දෙස ඔහු ඇඟිල්ල දිගු කලේ ය.

ජොන් පසුදින හිමිදිරියෙන්ම පිබිදුනේ සිය බාප්පා පිටත්වනු දැකීමට ය. ඔහු ගේ සෙබළෙක් සිය කඳුකර අසුට සැදල පළඳවන අතරේ ග්‍රාම්‍ය ගීයක් ගයමින් සිටියේ ය. බෙන් ස්ටාර්ක් එයට සිනාසුනු නමුදු සිය බෑනා වෙනුවෙන් සිනාවක් වෙන් වී නොතිබිනි. "මම උඹට කී වතාවක් කියන්ට ඕන ද ජොන්? අපි මේ ගැන කතාකරමු මම ආපහු ආවට පස්සෙ."

බාප්පා පිටවීමේ උමග වෙතට සිය අසු මෙහෙයවන දෙස බලා සිටින අතරේ උතුරට එන අතරමගදී ටිරියන් ලැනිස්ටර් විසින් රජමාවතේ දී පවසන ලද දේවල් ජොන්ට මතක් විය. හිම මත රතු පැහැ ලේ විලක් මැද මියගොස් සිටින සිය බාප්පා ගේ රූපය ඔහු ගේ සිතේ ඇඳින. ඒ සිතුවිල්ල නිසා ඔහුට තමා ගැනම දැඩි අප්‍රසාදයක් දැනෙන්නට විය. ඔහුට මේ කුමක් සිදුවී ද?

මඳ වේලාවකට පසු ඔහු සිය පාලු තනිකඩ කුටියේ දී ගෝස්ට්ව තුරුළු කරගෙන උගේ ඝනකම් සුදු පැහැ ලොම් අතරේ මුහුණ සඟවාගෙන සිටිනු දක්නට ලැබිනි.

ඔහුට තනිවන්නට සිදු වීම හැර වෙනත් විකල්පයක් නැතිනම් ඔහු තනිකම සිය සන්නාහය කරගනු ඇත. කළු බලකොටුව සතු දෙව්වනයක් නොවී ය. ඒ වෙනුවට කුඩා සප්තක දේවස්ථානයක් හා හැමවිටම බීමත්ව සිටින පූජකයෙක් පමණක් එහි සිටියේ ය. එනමුදු පැරණි හෝ නව හෝ දෙවිවරුන්ට යාඥා කිරීමට තම සිත නම්මා ගන්නට ජොන්ට නොහැකි විය. දෙවිවරුන් සැබැවින්ම සිටිත් නම් ඔවුන් ශීත කාලය තරම්ම ක්‍රෑර හා සමා නොදෙනසුළු යැයි ඔහු කල්පනා කලේ ය.

ඔහුට සිය සැබෑ සොහොයුරන් නැති පාළුව තදින්ම දැනුනි. පුංචි රිකන්, දීප්තිමත් දෑසින් යුතුව රසකැවිලි ඉල්ලා හඬාවැටෙන රිකන්. රොබ්, ඔහු ගේ ප්‍රතිවාදියා හා ඔහු ගේ ළඟම මිතුරා හා ඔහු ගේ අනවරත සගයා. බ්‍රැන්, මුරණ්ඩු, කුතුහලයෙන් පිරි, ඔහු හා රොබ් කරන කියන සෑම දෙයක්ම පසුපසින් එන, ඒ සෑම දෙයකටම සහභාගි වීමට උත්සාහ කරන බ්‍රැන්. ඔහුට ගැහැණු ළමයින් පවා මගහැරී තිබුනි. සන්සා පවා, 'මගේ අර්ධ-සහෝදරයා" කියා මිස අන් කිසිදු අයුරකින් ඔහුව අමතන්නේ නැති සන්සා පවා. ආර්යා... ඔහුට වෙන කිසිවෙකුටත් වඩා ආර්යා නැති අඩුව තදින්ම දැනුනි. නිතරම දණහිසේ සීරීම් තුවාල ඇතිව, අවුල් වී ගිය කෙහෙරැල්ලෙන් යුතුව, ඉරී ගිය ඇඳුම්වලින් සැරසී සිටින පුංචි කෙසඟ

කෙල්ල. සාහසික, තම හිතුමනාපය අනුව වැඩකරන ආර්යා. ආර්යා කිසිදු විටෙක තම පවුලට ගැලපෙන එකියක් නොවූවා ය. අඩුම තරමේ ජොන් තරම්වත්... එනමුදු ඇයට ඕනෑම විටෙක ජොන්ව සිනා ගැස්වීමේ හැකියාවක් තිබින. මේ මොහොතේ දී ඇ සමග සිටීමට, තව එක වරක් ඇගේ හිසකෙස් අවුල් කර ඇ මුහුණ ඇද කරන සැටි බලා සිටින්නට, ඇයත් සමග එකතුව වාක්‍යයක් අවසාන කරන්නට, මේ දේවල් වෙනුවෙන් තමා සතු ඕනෑම දෙයක් පුද දෙන්නට ඔහු සූදානම් ය.

"උඹ මගෙ අත කැඩුවා අවජාතක කොල්ලො."

මේ හදිසි කටහඬ නිසා ජොන් හිස ඔසවා බැලුවේ ය. ග්‍රෙන් රතු වී ගිය මුහුණින් යුතුව ඔහු අසල සිටගෙන සිටි අතර ඒ පසුපසින් ඔහු ගේ මිතුරන් තිදෙනෙක් වූහ. ටොඩර්, කොට අවලස්සන කොලුවකු වූ ඔහුට දැන් කවුරුත් අමතන්නේ ටොඩ් කියා ය. අනෙක් දෙදෙනා යොරේන් සමග උතුරට පැමිණියවුන් බව ජොන්ට මතක් වුනි. අතැඹිලිවල සිට පැමිණි ස්ත්‍රී දූෂකයින් දෙදෙනා. ඔහුට ඔවුන් ගේ නම් මතක නැති අතර අවශ්‍යම අවස්ථාවක දී හැර ඔවුන් සමග කතා කලේ වත් නැත. මේ සියළු දෙනාම ගෞරවය කියා දෙයක් ඇත්දැයි වත් නොදන්නා අමු තිරිසන් දාමරිකයෝ වූහ.

ජොන් නැගිට සිටියේ ය. "උඹට ඕන නං මම අනිත් අතත් කඩලා දාන්නම්." ග්‍රෙන්ට වයස දහසයක් වූ අතර ජොන්ට වඩා අඩියක් පමණ උස් විය. ඔවුන් සිවුදෙනාම ඔහුට වඩා විශාල අයවලුන් වූ නමුදු ඔහුට බියක් නොදැනින. ඔහු මේ සියළුදෙනාවම සරඹ අංගනයේ දී පරදවා තිබින.

"සමහරවිට අපට උඹව කඩලා දාන්ටත් පුළුවන් වෙයි."

"උත්සාහ කරලා බලපං." ජොන් සිය අසිපත වෙත අත යැවූ නමුත් එකෙක් ඔහු ගේ අතින් අල්ලා පිටුපසට කර ඇඹරවී ය.

"උඹ නිසා අපිව මහ මෝඩ විදියට පේන්නෙ." ටොඩ් පැමිණිලි කලේ ය.

"මට උඹලව මුනගැහෙන්ටත් කලින් ඉඳලම උඹලා මහ මෝඩයො වගේ තමා පෙනුනෙ." ජොන් පිළිතුරු දුනි. ඕහුව අල්ලාගෙන සිටි කොල්ලා අත තවත් තදින් ඇඹරුවේ ය. වේදනාව සිරුර සිසාරා පැතිරගිය නමුත් ජොන් කෑ ගැසුවේ නැත.

ටොඩ් ඉදිරියට අඩියක් තැබී ය. "අපේ පුංචි උත්තමයට ලොකු කටක්නං තියෙනවා. ඒ උඹේ අම්මගෙ කටද අවජාතකයො? මොකෙක්ද ඒකි? මොකෙක් හරි වේස ගෑනියෙක් ද? අපටත් කියහංකො ඒකිගෙ නම මොකක්ද කියලා. සමහරවිට මමත් ඒකි එක්ක නිදිවැදලා තියෙනවද දන්නෙ නෑ." ඕහු මහ හඬින් සිනාසුනි.

ආදෙකු මෙන් ඇඹරුනු ජොන් ඕහුව අල්ලාගෙන සිටි කොල්ලා ගේ පිටිපතුල මතට සිය විළුඹෙන් දැඩි පහරක් එල්ල කලේ ය. වේදනාත්මක කෑ ගැසීමක් සමග ඕහු ගේ ග්‍රහණය බුරුල් විය. ටොඩ් දෙසට පිනූ ජොන් බංකුවකුත් පෙරලාගෙන ඕහුත් සමග බිම ඇද වැටින. ටොඩ් ගේ පපුව උඩ නැග ඕහු ගේ ගෙල දැතින් සිරකරගත් ජොන් ටොඩ් ගේ හිස වැරෙන් පොළොවේ ගැසුවේ ය.

ඕහුගෙන් ජොන්ව ඇදගත් අතැඹිලිවලින් පැමිණි කොල්ලන් දෙදෙනා ඕහුව බිම දමා ගැසී ය. ග්‍රෙන් ඕහුට පා පහර එල්ල කරන්නට පටන් ගති. මේ පහරවලින් වැලකීමට ජොන් රෝල් වී යද්දී ආයුධ ගබඩාවේ මඳ අන්ධකාරය සිසාරා ගැඹුරු කටහඬක් රැව් දුන්නේ ය. "ඕක නවත්තපියවු. දැන්මම."

ජොන් දෙපයින් නැගිට සිටගත්තේ ය. ඩොනල් නොයේ රවා ගත් දෑසින් යුතුව ඕවුන් දෙස බලා සිටියේ ය. "උඹලට සටන් කරන්ට ඕන නං එලියෙ අංගනය තියෙනවා." ආයුධ ගබඩාවේ භාරකරුවා ගිගිරුවේ ය. "උඹලගෙ රණ්ඩු ආයුධ ගබඩාවෙන් පිටදී විසඳගනිල්ලා. එහෙම නැත්තං මම ඒවා මගෙ රණ්ඩු කරගන්නවා. උඹලා ඒකට කැමැති වෙන එකක් නෑ."

බිම වාඩි වූ ටොඩ් සෙමින් සිය හිස පිටුපස පිරිමැද්දේ ය. ඕහු ගේ අතැඹිලිවල රුධිරය තැවරී තිබින. "මූ මාව මරන්ට හැදුවා."

"ඒක ඇත්ත. මාත් දැක්කා." තවත් කොල්ලෙක් සාක්කියට ඉදිරිපත් විය.

"ඌ මගෙ මැණික්කටුව කැඩුවා." ග්‍රෙන් කීවේ නොයේට පෙනෙන පරිදි අත ඔසවමිනි.

නොයේ ඒ දෙස කෙටි බැල්මක් හෙලුවේ ය. "පොඩි තැල්මක් විතරයි. සමහරවිට ඇමැට්ටියක් වෙන්ට ඇති. මේස්ටර් ඒමන් ඕකට ගාන්ට බෙහෙතක් දෙයි. ඌත් එක්ක උඹත් පලයන් ටොඩර්. ඔළුවට බෙහෙත් ටිකක් දාගන්ට වෙයි. අනිත් එවුන් තම තමන්ගෙ කාමරවලට පලයල්ලා. නෑ, උඹ නෙවෙයි ස්නොව්. උඹ නැවතියං."

ජොන් ලී බංකුවේ අසුන් ගත්තේ අනිත් කොලුවන් පිටව යන අතර ඔහු දෙස හෙලූ බැලුම්, ඉදිරියේදී ඔහුට මුහුණ පෑමට සිදුවන විපාක පිළිබඳ ඉඟිකෙරුනු බැලුම් නොතකා හැරියේ ය. ඔහු ගේ අත ඇදුම් කමින් තිබින.

"බලකායට ඒකට බඳවගන්ට පුළුවන් හැම මිනිහම උවමනායි." ඔවුන් දෙදෙනා තනි වූ විට ඩොනල් නොයේ කතාව ආරම්භ කලේ ය. "ටොඩ් වගේ එවුන් පවා. ඌව මරලා දැම්මා කියලා උඹට කිසිම ගෞරවයක් අත්වෙන්නෙ නෑ."

ජොන් ගේ කේන්තිය දෙගොඩ තලා ගියේ ය. "ඌ කිවුවා මගේ අම්මා-"

"වේසියෙක් කියලා. මම අහගෙන. ඉතින් මොකද?"

"එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් කියන්නෙ වේසියොත් එක්ක නිදාගන්න ජාතියෙ මිනිහෙක් නෙවෙයි. එයාගෙ ගෞරවය-"

"එයාව නැවැත්තුවෙ නෑ අවජාතකයෙක් බිහිකරන එකෙන්. එහෙම නේද?"

ජොන් ගේ ප්‍රකෝපය ඉහවහා ගියේ ය. "මට යන්ට පුලුවන් ද?"

"උඹට යන්ට පුලුවන් මම උඹට යන්ට කිවුවට පස්සෙ."

ජොන් ගිනිකබලෙන් නගින දුම් දෙස බුම්මාගත් මුහුණින් යුතුව බලා සිටියේ ය. නොයේ සිය මහත ඇඟිල්ලක් ඔහු ගේ නිකට යටින් තබා ඔහු ගේ හිස එසෙවුවේ ය. "මම උඹට කතා කරනකොට මා දිහා බලපං කොල්ලො."

ආයුධ ගබඩාවේ භාරකරුවා පීප්පයක් මෙන් පුළුල් පපුවකින් හා ඊටම සරිලන තරම් උදරයකින් හෙබි දැවැන්ත මිනිසකු විය. ඔහු හැඳ සිටි කළු ලොම් කබායේ වමත උරහිස අසලින් එකතුකර තිබුනේ දිගු අසිපතක හැඩය ගත් රජතමය කටුවක් මගිනි. "වචනවලට බෑ උඹේ අම්මව වේසියෙක් කරන්ට. එයා එයාමයි, ටොඩ් කියන කිසිම දේකට බෑ ඒක වෙනස් කරන්ට. උඹ දන්නවනෙ මේ ප්‍රාකාරෙ සේවය කරන සමහර මිනිස්සුන්ගෙ අම්මලා ඇත්තටම ගනිකාවො කියලා."

'මගේ අම්මා එහෙම නෙවෙයි', ජොන් මුරණ්ඩු අයුරින් සිතුවේ ය. ඔහු සිය මව පිළිබඳ කිසිදු තොරතුරක් දැන නොසිටියේ ය. එඩාර්ඩ් ස්ටාර්ක් කිසි විටෙකත් ඒ ගැන වදනකුදු කතා නොකලේ ය. එනමුදු ඔහු ඇය ගැන සිහින දකින්නට පුරුදුව සිටි අතර ඒ නිසාම ඇගේ මුහුණුවර ඔහු දැන සිටියාක් මෙනි. ඔහු ගේ සිහින තුළ දී ඇය සුන්දර කුලවත් කාන්තාවක් වූ අතර ඇයට කාරුණික දෑසක් හිමිව තිබින.

"ලොකු වංශාධිපතියෙක්ගෙ අවජාතකයෙක් වුනාම හරි අමාරුයි කියලා උඹ හිතනව ද?" නොයේ දිගටම කතා කලේ ය. "අර කොල්ලා ජෙරන්, පූජකයෙක්ගෙ අවජාතකයෙක්. එතකොට කොටර් පයික් කියන්නෙ තැබෑරුමක ගනිකාවකගෙ අවජාතක පුතෙක්. ඒත් දැන් එයා නැගෙනහිර බලකොටුවෙ අණ දෙන නිළධාරියා."

"මට ඒකෙන් වැඩක් නෑ." ජොන් කිවුවේ ය. "මට උංගෙන් වැඩකුත් නෑ, උඹෙන් වැඩකුත් නෑ, තෝර්න්ගෙන් වත් බෙන්ජීන් ස්ටාර්ක්ගෙන් වත් වෙන මොකෙක්ගෙන් වත් වැඩක් නෑ. මට මෙතන එපා වෙලා තියෙන්නෙ. මෙතන හරිම... හරිම සීතලයි."

"ඔවු. සීතලයි, අමාරුයි, අධමයි. ඒ තමා ප්‍රාකාරෙ හැටි. ඒ තමා මෙතන ඉන්න මිනිස්සුන්ගෙ හැටි. ඒක උඹ පුංචි කාලෙ උඹේ ආයම්මා කියලා දුන්න කතන්දර වගේ

නෙවෙයි. ඒ කතන්දර යකාට ගියාවෙ, උඹේ ආයම්මත් යකාට ගියාවෙ. මේ තමා මෙතැන හැටි. උඹත් අනිත් හැමෝම වගේ ජීවිත කාලෙම මෙතන ගෙවන්ටයි ඇවිල්ලා ඉන්නෙ."

"ජීවිතේම." ජොන් අම්හිරි ස්වරයෙන් පුනරුච්චාරනය කලේ ය. ඩොනල් නොයේට එසේ කතා කිරීම පහසු විය හැක. ඔහුට ජීවිතයක් තිබ්බ. ඔහු ඒ ජීවිතය විඳ තිබ්බ. ඔහු නිශා රැකුමට බැඳුනේ ස්ටෝර්ම් එන්ඩ්හි වටලෑමෙන් සිය අතක් අහිමි වී ගිය පසුව ය. ඊට පෙර ඔහු රජු ගේ සොහොයුරා වන ස්ටැනිස් බරතියන් වෙනුවෙන් කම්මල්කරුවකු වශයෙන් සේවය කර තිබ්බ. ඔහු රාජධානි සප්තකය පුරා, එක් කෙලවරක සිට අනික් කෙලවර දක්වා සංචාරය කර තිබ්බ. ඔහු හොඳින් කා බී, ගැහැණුන් හා යහන් ගතවී, යුද්ධ සිය ගණනක සටන් වැදී ඇත. ප්‍රවාදවලට අනුව, ගංගා ත්‍රිශූලයේදී රේගාර් ටාර්ගේරියන් ගේ ජීවිතය උදුරාගත් රොබර්ට් රජතුමා ගේ යගදාව තැනුවේ ඩොනල් නොයේ විසිනි. ජොන්ට කිසිදා කල නොහැකි වන මේ සියල්ලක්ම නොයේ විසින් සිදු කර ඇත. මේ සියල්ලටම පසු, ඔහුට වයස තිස් ගණනක් වූ පසු, කෙටේරි පහරකින් සිය අත අහිමි වී ආබාධිතයකු වූ පසු ඩොනල් නොයේ ප්‍රාකාරයේ සේවය පිණිස පැමිණියේ ය.

"ඔවු. ජීවිතේම." නොයේ කීවේ ය. "ඒක දිග ජීවිත කාලයක් ද නැත්තං කෙටි ජීවිත කාලයක් ද කියන එක තීරණය කරන්ට ඕන උඹයි ස්නොව්. පේන විදියට නං උඹ ඔය යන විදියට වැඩි කල් යන්ට කලින් උඹේ සහෝදරයෙක් එක රෑක උඹේ බෙල්ල කපලා දායි."

"උං මගේ සහෝදරයො නෙවෙයි." ජොන් කඩා පැන්නේ ය. "උං මට වෛර කරනවා මම උංට වඩා හොඳ හින්දා."

"නෑ. උං උඹට වෛර කරන්නෙ උඹ උංට වඩා හොඳයි කියලා උඹ පෙන්නන්ට යන හින්දා. උං උඹ දිහා බැලුවම උංට පේන්නෙ තමන් මහ ලොකු වංශාධිපතියෙක් කියලා හිතන් ඉන්න බලකොටුවක හැදූන වැඩුන අවජාතකයෙක් විතරයි." නොයේ ජොන්ට සමීප විය. "උඹ වංශාධිපතියෙක් නෙවෙයි. ඒක මතක තියාගනිං. උඹ ස්නොව් කෙනෙක්, ස්ටාර්ක් කෙනෙක් නෙවෙයි. උඹ අවජාතකයෙක්. උඹ දාමරිකයෙක්."

Tyrion Lannister: “There’s much to be said for taking people unawares. You never know what you might learn.”

"දාමරිකයෙක්?" තමන් ගේ වචන උගුරේ හිරවූවාක් මෙන් ජොන්ට දැනින. මෙය නම් ඔහු සිහිනයෙන් වත් නොසිතූ අසාධාරණ චෝදනාවකි. "උනුයි මං පස්සෙන් ආවෙ මට ගහන්ට. උං හතර දෙනෙක්."

"උඹ සරඹ අංගනයෙදි ලැජ්ජාවට පත්කරපු හතර දෙනෙක්. උඹට බය හතර දෙනෙක්. උඹ සටන් කරන හැටි මම බලන් ඉඳලා තියෙනවා. ඒක උඹට පුහුණුවක් නෙවෙයි. උඹේ කඩුවට හොඳ මුවහතක් තිබ්බනං අරුං මෙලහට මළකඳන්. උඹ ඒ බව දන්නවා, මම ඒ බව දන්නවා, උනුත් ඒ බව දන්නවා. උඹ උංට කිසිම අවස්ථාවක් දෙන්නෙ නෑ. උඹ උංව ලැජ්ජාවට පත්කරනවා. උඹ ඒකෙන් ආඩම්බර වෙනවද?"

ජොන් තැතනුවේ ය. සටනකින් දිනූ විට ඔහුට ඇත්තෙන්ම ආඩම්බර දැනී තිබිනි. ඔහු ආඩම්බර නොවිය යුත්තේ මන්ද? එනමුදු ඩොනල් නොයේ දැන් එයත් ඔහුගෙන් ඉවත් කිරීමට සැරසෙන සෙයකි. හරියට ඔහු වැරැදි දෙයක් කරන්නාක් මෙනි. "ඒ හැමෝම මට වඩා වයස වැඩි අය." ඔහු විරෝධාත්මක ස්වරයෙන් කීවේ ය.

"ඔවු. වයසයි. ලොකුයි. ශක්තිමත්. ඒක ඇත්ත. ඒ වුනත් මට කැට තියලා කියන්ට පුළුවන් වින්ටර්ෆෙල්වලදි උඹේ සටන් පුහුණු ගුරුවරයා උඹට උගන්නලා තියෙනවා කියලා කොහොමද උඹට වඩා ලොකු මිනිස්සුත් එක්ක සටන් කරන්නෙ කියලා. කවුද එයා? කවුරු හරි වයසක නයිට්වරයෙක් ද?"

"සෙර් රඩ්‍රික් කසල්." ජොන් උදාසීන අයුරින් කීවේ ය. මෙතැන කුමක් හෝ උගුලක් ඇති අතර එය තමා වටා සිරවනු ජොන්ට දැනින.

ඩොනල් නොයේ ඉදිරියට නැමී ජොන් ගේ මුහුණට බර විය. "දැන් මෙන්න මේ ගැනත් හිතපං කොල්ලො. මේ අනිත් එක කොල්ලෙකුටවත් සෙර් ඇලිසර් මුනගැහෙනකං සටන් පුහුණු ගුරුවරයෙක් ඉඳලා නෑ. උංගෙ තාත්තලා ගොවියො, කරත්තකාරයො, හොර දඩයක්කාරයො, කම්මල්කාරයො, පතල්වල වැඩ කරන එවුං, නැවු වල හබල් ගාන එවුං.

උං සටන්කිරීම ගැන මොනා හරි දන්නවනං ඒ දැනගෙන තියෙන්නෙ නැවු තට්ටුවෙ වැඩ කරන අතරතුරේදී. එහෙමත් නැත්තං ඕල්ඩ්ටවුන්වල හරි ලැනිස්පෝර්ට්වල හරි මුඩුක්කු අස්සෙ ජීවත්වෙන ගමන්. රජමාවතේ තියෙන ගනිකා මඩම්වලයි, තැබෑරුම්වලයි ඉන්න ගමන්. මෙහාට එන්ට කලින් උං දෙතුන් වතාවක් ඔය කාත් එක්ක හරි හරඹ කරලා ඇති. ඒත් මම සහතිකෙන් කියන්නම්, ඔය අතරින් විස්සෙන් එකෙකුටවත් තමන්ගෙම කියලා ඇත්ත කඩුවක් අයිති කරගන්ට තරම් කවදාවත් සල්ලි තිබ්බෙ නෑ. ඉතිං, දැන් කොහොමද උඹට ඔය දිනුම්වල රසය දැනෙන්නෙ ස්නොව් උතුමානනි?"

"මට ඔය නමින් කතා කරන්ට එපා." ජොන් තියුණු හඬින් කීවේ ය. එනමුදු මේ වනවිට ඔහු ගේ කෝපය නිවී යමින් තිබිනි. හදිසියේම ඔහුට අතිමහත් ලැජ්ජාවක් හා වරදකාරී හැඟීමක් දැනෙන්නට විය. "මම කවදාවත්... මම හිතුවෙ නෑ..."

"උඹ හිතන්ට පටන් ගන්නවානම් හොඳයි." නොයේ ඔහුට අවවාද කලේ ය. "එහෙම නැත්තං, නිදාගන්නකොට උඹේ ඇඳ ළඟින් කිනිස්සක් තියාගන්ට පුරුදු වෙයං. දැන් පලයං."

ජොන් ආයුධ ගබඩාවෙන් පිටවන විට මධ්‍යහ්නය එළැඹී තිබිනි. වළාකුළු අතරින් හිරු එබී බලමින් සිටියේ ය. ඔහු හිස ඔසවා හිරු එළියේ නිල් පැහැ පළිඟු මෙන් බබලන ප්‍රාකාරය දෙස බැලුවේ ය. මේ තරම් සති ගණනකට පසුව වුවත් ඒ දර්ශනය ඔහු ගේ සිරුර වෙවුලවා හැරීමට සමත් විය. සියවස් ගනනාවක් තිස්සේ සුළඟ විසින් රැගෙන ආ කුණු දූවිලි ඒ මත තට්ටුවක් මෙන් බැඳී තිබුනු අතර එය සමහරවිටෙක වැහිබර අහසක් මෙන් අළුරු පැහැයක් ගත්තේ ය. එනමුදු අහස පැහැදිලි දිනයක ඒ මත හිරු එළිය පතිත වූ විට එය බැබලුනේ අහස සිපගන්නා සුදු-නිල් පැහැ කඳුවැටියක් මෙනි.

"මේ තමා මිනිසුන් ගේ දෑතින් ගොඩනැංවූ විශාලතම ඉදිකිරීම." රජමාවතේ ඉහළට එද්දී මුල්ම වරට ඈතින් ප්‍රාකාරය දුටු වේලේ බෙන්ජන් ස්ටාර්ක් ඔහුට කියා තිබිනි. "ඒ වගේම, වැඩකටම නැති ඉදිකිරීම, සහතිකයෙන්ම." ටිරියන් ලැනිස්ටර් නියවීමක් සමගින් ඊට එකතු කලේ ය. එනමුදු ප්‍රාකාරයට වඩ වඩා ලංවෙද්දී ටිරියන් පවා සිය මුව වසා ගත්තේ ය. කෙනෙකුට එය සැතපුම් ගනනාවක් එපිට සිට පවා උතුරුදිග ක්ෂිතිජයේ දිස්වන අළුරු නිල් පැහැ ඉරක් මෙන් දැකිය හැකි විය. එය නැගෙනහිර සිට බටහිර දෙසට විහිදී ගිය අතර අනන්තයට ඈදී ගොස් නොපෙනී ගියේ ය. එය අවිච්ඡින්න සුවිසල් ප්‍රවාහයක් මෙන් දෑස් ඉදිරිපිට නැගී සිටියේ ය. හරියටම එය 'මේ තමා ලෝකාන්තය' කියන්නාක් වැනි විය.

ඔවුන් අන්තිමේදී කළු බලකොටුව දුටු විට, එහි දැවයෙන් නිම කල ගොඩනැගිලි හා ගලින් කල කුළුණු දැවැන්ත අයිස් ප්‍රාකාරය අභිමුවේ කුඩා දරුවකු ගේ සෙල්ලම්බඩු මෙන් දිස් විය. මෙය වින්ටර්ෆෙල් හෝ වෙනයම් බලකොටුවක් හෝ මෙන් නොවී ය. එහි කිසිදු ප්‍රාකාරයක් නොතිබුනු අතර දකුණින්, නැගෙනහිරින් හෝ බටහිරින් එය ආරක්ෂා කල හැකි මගක් නොවී ය. එනමුදු, නිශා රැකුම් බලකාය සිය අවධානය යොමු කල එකම දිශාව උතුර වූ අතර එම දිශාවෙන් ප්‍රාකාරය නැගී සිටියේ ය. අඩි හත්සියයක් පමණ උස් වූ එය සිය පාමුල නැගී සිටි ගොඩනැගිලි අතර තිබුනු උසම කුළුණ මෙන් තුන් ගුනයක් උස් විය. ඔහු ගේ බාප්පා පැවසූ අන්දමට එහි මුදුන කෙතරම් පුළුල් ද යත්, සන්නාහයෙන් සැරසුනු නයිට්වරුන් දුසිමකට කිසිදු අපහසුවකින් තොරව උරිනුර ගැටෙමින් එහි සිය අසුන් මෙහෙයවිය හැකි විය. එහි මුදුනේ වූ දැවයෙන් කල දැවැන්ත කැටපෝල හා සුවිසල් දොඹකර විශාල කුරුල්ලකු ගේ ඇටකටු මෙන් දිස් වූ අතර කුහුඹුවන් තරම් කුඩා මිනිස්සු ඒ අතර එහා මෙහා ඇවිද්දහ.

මේ මොහොතේ ආයුධ ගබඩාව පිටත සිට ප්‍රාකාරය දෙස බලා සිටිද්දී, එදා රජමාවතේදී මුල්ම වරට එය දුටු අවස්ථාවේදී මෙන්ම ජොන්ට තමා හුදු ක්ෂුද්‍ර ප්‍රාණියකු මෙන් හැඟිනි. ප්‍රාකාරය එවැන්නක් විය. සමහර අවස්ථාවලදී එය එතැන ඇති බව කෙනෙකුට අමතක වී යා හැක. හරියට ඉහළින් ඇති අහස හෝ පා තබා සිටින පොළොව හෝ කෙනෙකුට අමතක වී යන්නාක් මෙනි. නමුත්, තවත් සමහර අවස්ථාවලදී එය කෙතරම් ප්‍රබල ලෙසින් නැගී සිටින්නේද යත් මේ ලෝකයේ මීට වැඩි වෙනත් කිසිදු දෙයක් නැත්තාක් මෙනි. එය රාජධානි සප්තකයටත් වඩා පැරණි විය. ඒ දෙස බලා සිටි ජොන්ට තමා ක්ලාන්ත වී යන්නාක් මෙන් හැඟින. තමා ඉදිරිපිට ඇති මේ සුවිසල් අයිස් කඳ හරියට කොයි මොහොතක හෝ කඩා වැටීමට යන්නාක් මෙනි. එනමුදු, එය කඩා වැටුනහොත් මේ මුළුමහත් ලෝකයම කඩා වැටෙන බව ජොන් දැන සිටියේ ය.

"ඒකෙන් එහා පැත්තෙ තියෙන්නෙ මොනවද කියලා කල්පනා කරනවද?" හුරුපුරුදු කටහඬක් ඇසුවේ ය.

ජොන් වටපිට බැලී ය. "ලැනිස්ටර්. මම දැක්කෙ නෑ- මම කියන්ට ගියෙ, මම හිතුවෙ මම විතරයි තනියම මෙතන ඉන්නෙ කියලා."

ටිරියන් ලැනිස්ටර් කෙතරම් ලොම් ඇඳුම් ප්‍රමාණයක් හැඳ සිටියා ද යත් ඔහුව දිස් වූයේ කුඩා වලසෙකු මෙනි. "මිනිස්සුන්ට නොදැනෙන්නට එයාලා දිහා බලන් ඉන්න එක හරි අපූරු දෙයක්. උඹ දන්නෙවත් නෑ උඹට මොනා මොනා ඉගෙනගන්ට ලැබෙයිද කියලා."

"ඔබට මගෙන් නම් කිසිම දෙයක් ඉගෙනගන්ට ලැබෙන එකක් නෑ." ජොන් පැවසී ය. සිය ගමනාන්තයෙන් පසු ඔහුට ටිරියන් මුනගැසුනේ කලාතුරකිනි. රැජිණ ගේ සොහොයුරා වශයෙන් ටිරියන්ට නිශා රකුමේ ගරු ආගන්තුකයකු ගේ ස්ථානය හිමිව තිබින. ප්‍රධාන අණ දෙන නිළධාරිතුමා ඔහුට 'රජතුමා ගේ කුළුණේ' නවාතැන් දී තිබූ අතර ඔහු මෝර්මන්ට් ගේ මේසයේ හිඳ ආහාර ගත්තේ ය. ඔහු සිය දිවා කාලයන් ප්‍රාකාරයේ ඇවිදිමිනුත්, රාත්‍රි කාලයන් සෙර් ඇලිසර්, බොවෙන් මාර්ෂ් හා අනෙකුත් ඉහළ නිළධාරින් සමග දූ කෙලියෙන් හා මත්පැන් පානයෙනුත් ගෙවා දැමී ය.

"ආහ්! මම යන යන තැන මොනවා හරි ඉගෙනගන්නවා." ටිරියන් සිය අතේ ඇති බස්තම ප්‍රාකාරය දෙසට දිගු කලේ ය. "මම කිය කියා හිටපු විදියට.. ඇයි එක මිනිහෙක් තාප්පයක් හදපු ගමන් ඊළඟ මිනිහට ඒ තාප්පෙන් එහා පැත්තෙ මොනවද තියෙන්නෙ කියලා දැනගන්ට ඕන?" ඔහු හිස ඇල කර සිය අසමාන දෑසින් ජොන් දෙස බැලී ය. "ඒක එහා පැත්තෙ තියෙන්නෙ මොනවද කියලා දැනගන්ට උඹට ඕන නේද? එහෙම නැද්ද?"

"ඒකෙ මොකුත් විශේෂ දෙයක් නෑ." ජොන් පැවසී ය. ඔහුට බෙන්ජින් ස්ටාර්ක් හා එක්ව හොල්මන් කැලෑවේ මැද්දට මුර සංචාරය සඳහා යාමට උවමනා වී තිබින. මේන්ස් රේඩර් ගේ වනචාරීන් හා සටන් වැදීමට උවමනා වී තිබින. අනික් එවුන් හා සටන් කර රාජධානිය බේරා ගැනීමට උවමනා වී තිබින. එනමුදු ඔහුට උවමනා කුමක්දැයි නොකියා සිටීම ගුනදායක ය. "මුර සංචාරකයො කියන්නෙ කැලේයි, කඳුයි, මිදුන විලුයි විතරයි එහෙ තියෙන්නෙ කියලා."

"ඒවයි, යක්කුයි පිශාචයොයි. අපි උංව අමතක කරන්ට හොඳ නෑ ස්නොව් උතුමානනි. එහෙම නැත්තං මොකටද මේ මහ විශාල දේ මෙතන තියෙන්නෙ?"

"මට ස්නොව් උතුමානන් කියලා කතා කරන්ට එපා."

කුරුමිට්ටා ඇහිබැමක් එසවී ය. "උඹ මොකටද කැමති එහෙනං? පූංචි යකා කියනවට ද? උඹ උංට පෙන්නුවොත් උංගෙ වචනවලට උඹට කොච්චර රිද්දන්ට පුළුවන් ද කියලා, උඹට කවදාවත් උංගෙ සමච්චලෙන් බේරෙන්ට බැරි වෙයි. උංට ඕනනං උඹට නමක් හදන්ට, ඒ නම අරගනිං. ඒ නම උඹේ නම කරගනිං. එතකොට උංට ආයෙමත් ඒක පාවිච්චි කරලා උඹට රිද්දන්ට බැරුව යයි." ඔහු සිය බස්තම වැනුවේ ය. "වරෙන්, මගෙත් එක්ක යමු. දැන් අරුං මොකක් හරි අලුගුත්තේරු ඉස්ටුවක් බෙදන වෙලාව කිට්ටුයි. මට මොනා හරි උණු දෙයක් බඩට දාගන්ට ඕන."

ජොන්ට ද කුසගිනි දැනෙන්නට පටන්ගෙන තිබිනි. එමනිසා ඔහු ටිරියන් හා එක පෙළට වැටුනේ කුරුමිට්ටා ගේ බකල ගසන පියවරවලට සමානුපාත වන පරිදි සිය ගමන බාල කලේ ය. සුළඟ හමන වේගය වැඩි වන්නට වූ අතර ඔවුන් වටා පැරණි දැවමය ගොඩනැගිලි කිරි කිරි හඬ නැංවී ය.

"මම උඹේ වෘකයාව දැක්කෙ නෑ."

"අපි සරඹ පුරුදු වෙන වෙලාවට මම එයාව පරණ ඉස්තාලෙ ගැට ගහලා දානවා. එයාලා දැන් ඔක්කොම අශ්වයො ගාල් කරන්නෙ නැගෙනහිර ඉස්තාලෙ. ඉතිං ඒක නිසා කවුරුවත් එයාට බාධා කරන්නෙ නෑ. අනිත් වෙලාවට එයා මාත් එක්ක තමා ඉන්නෙ. මම නිදාගන්න කාමරේ තියෙන්නෙ හාර්ඩින්ගෙ කුළුණෙ."

"ඒක නේද අර බිඳිච්ච කොටුපවුරක් තියෙන එක? පහළ මිදුලෙ කැලි වලට කැඩිච්ච ගලක් තියෙන්නෙ. මම හිතුවෙ ඒ ගොඩනැගිලි සේරම අත ඇරලා දාලා කියලයි."

ජොන් දෙවුර ඇකිලී ය. "කවුරුත් හොයන්නෙ නෑ තව කෙනෙක් නිදාගන්නෙ කොහෙද කියලා. පරණ බලකොටු ගොඩක් හරිය හිස්. අපට ඕන එකක් තෝරගන්ට පුළුවන්." එක් කලෙකදී කළු බලකොටුව පන්දහසක් සෙබළුන්ටත්, ඔවුන් ගේ අශ්වයින්ට, සේවකයින්ට හා ආයුධවලටත් සෙවන දුන්නේ ය. දැන් එහි සිටින්නේ එමෙන් දහයෙන් පංගුවකටත් අඩු ප්‍රමාණයකි. බලකොටුවේ සමහර කොටස් මේ වනවිට නටඹුන් බවට පත්වෙමින් තිබිනි.

ටිරියන් ලැනිස්ටර් ගේ සිනාව අවට පැතිරී ගියේ ය. "මම උඹේ තාත්තට පණිවුඩයක් දෙන්නම්, උඹ නිදාගන්න කුළුණ කඩන් වැටෙන්ට ඉස්සෙල්ලා ඉක්මනටම තව ගල්වඩුවො ටිකක් අත්අඩංගුවට අරන් මෙහාට එවන්ටයි කියලා."

මෙහි ඇති හාස්‍යය ජොන් පවා රසවින්දද ඊට යටින් ඇති කටුක සත්‍යය ඔහුට ද නොවැටහී නොගියේ ය. නිශා රැකුම විසින් ප්‍රාකාරය දිගේ බලකොටු දහනවයක් ගොඩනංවා තිබුනද මේ වනවිට භාවිත කෙරෙන්නේ එයින් තුනක් පමණි. නැගෙනහිර මුහුද අද්දර පිහිටි නැගෙනහිර කුළුණ, බටහිර දෙසින් කඳු පන්ති අතරේ ප්‍රාකාරය නිමා වන ස්ථානයේ පිහිටි සෙවනැලි කුළුණ සහ ඒ දෙක අතරමැද පිහිටි කළු බලකොටුව ඒ තුනයි. අනිකුත් සියළුම බලකොටු කාලයත් සමග කෙමෙන් කෙමෙන් අතහැර දැමුනු අතර දැන් ඒවා පාළු, ජනශූන්‍ය ස්ථානයන් පමණි. ඒවායේ දැන් සරන්නේ මලවුන් පමණි.

"මම විතරක් තනියම ඉන්න එක වඩා හොඳයි." ජොන් මුරණ්ඩු ස්වරයෙන් පැවසී ය. "අනික් අය ගෝස්ට්ට බයයි."

"මොළේ තියෙන කොල්ලො." ටිරියන් කීවේ ය. ඔහු මාතෘකාව වෙනස් කලේ ය. "කට්ටිය කියන්නෙ උඹේ බාප්පා ගිහින් එන්ට කල් ගියා ගොඩක් වැඩියි කියලයි."

කේන්තිය නිසා තමා කල ප්‍රාර්ථනාව ජොන්ට මතක් විය. බෙන්ජින් ස්ටාර්ක් හිම ගොඩක් මත මියගොස් සිටින අයුරු ඔහු ගේ දෑස් ඉදිරියේ පෙනී නොපෙනී ගියේ ය. ඔහු වහා අහක බැලුවේ ටිරියන්ට සිය මුහුණ නොපෙන්වනු පිනිසය. කුරුමිට්ටාට යම් යම් දේ ඉවෙන් මෙන් දැනගැනීමේ හැකියාවක් තිබුනු අතර සිය දෑසේ වූ වරදකාරී ස්වභාවය ඔහුට පෙන්වන්නට ජොන්ට උවමනා නොවී ය. "එයා කිවුවා මගේ උපන්දිනේ දවසට එනවා කියලා." සති දෙකකට පෙරාතුව ඔහු ගේ උපන්දිනය කාටත් හොර රහසේ පැමිණ කිසිඳු විශේෂත්වයක් නැතිවම යන්නට ගියේ ය. "එයාලා සෙර් වේමාර් රොයිස් ගැන හෝඩුවාවක් හොයාගන්ටයි ගියේ. එයාගෙ තාත්තා ඒරින් උතුමානන්ගෙ යටත් වංශාධිපතියෙක්. බෙන්ජින් බාප්පා කිවුවා එයාලා සෙවනැලි කුළුණ තරම් දුරට හොයන්ට යනවා කියලා. ඒ කියන්නෙ අර ඈත කඳුවැටිය පැත්තට යනකම්."

"මට අහන්ට ලැබුනා පහුගිය කාලෙ මුර සංචාරකයො සැහෙන දෙනෙක් අතුරුදහන් වුනා කියලා." ටිරියන් කෑම කන ශාලාවට ඇතුළුවන දොර විවර කලේ ය. "සමහරවිට යක්කුන්ට මේ අවුරුද්දෙ ගොඩක් බඩගිනි වෙලා වෙන්ට ඇති."

ඔවුන් ඇතුළු වූ ශාලාව සුවිසල් එකක් වූ අතර එහි වූ දැවැන්ත උඳුනේ ගින්නක් බුර බුරා ඇවිලෙමින් තිබින. එහි උස් සිවිලිමේ හරහට දැමූ බාල්කවල කපුටු කූඩු දැකිය හැකි විය. කෝකියා වෙත ගිය ජොන් ඉස්ටු පුරවන ලද කෝප්පයක් හා කළු පාන් කැබැල්ලක් ලබා ගත්තේ ය. ග්‍රෙන් හා ටොඩ් තවත් කොල්ලන් කිහිපදෙනෙකුත් සමග උඳුන සමීපයේ වාඩි වී මහ හඬින් විහිළු තහළු දොඩමින් සිටියහ. ජොන් කල්පනාකාරීව ඔවුන් දෙස මොහොතක් බලා සිටි මුත් ඉන්පසු ශාලාව ඈත කොණේ වූ හුදෙකලා මේසයක් වෙත පිය නැගුවේ ය.

මේසයේ අනික් පසින් වාඩි වුනු ටිරියන් ලැනිස්ටර් සැකමුසු අන්දමින් ඉස්ටුව ඉව කර බැලුවේ ය. "බාර්ලි, ලූනු, කැරට්." ඔහු කටුකුටු ගෑවේ ය. "කවුරුහරි මේ කෝකියට කියලා දෙන්ට ඕන ටර්නිප් කියන්නෙ මස් ජාතියක් නෙවෙයි කියලා."

"ඒක බැටළු මස් ඉස්ටුවක්." සිය අත්වැසුම් ගැලවූ ජොන් ඉස්ටුවෙන් නැග එන හුමාලයෙන් දෑත් උණුසුම් කලේ ය. එහි සුවඳ නිසා ඔහු ගේ කටට කෙල උනා ආවේ ය.

"ස්නොව්."

ජොන් ඇලිසර් තෝර්න් ගේ කටහඬ හඳුනාගත්තද එහි පෙර නොවූ විරූ කුතුහලාත්මක ස්වරයක් රැඳී තිබින. ඔහු ආපසු හැරුනි.

"අණදෙන නිළධාරිතුමාට උඹව මුනගැහෙන්ට ඕනලු. මේ දැන්මම."

මොහොතකට ජොන්ට සෙලවීමටවත් නොහැකි තරමේ බියක් දැනින. අණදෙන නිළධාරිතුමාට ඔහු මුනගැසීමට ඇති උවමනාව කුමක්ද? ඔවුන්ට බෙන්ජින් ගැන යම්

තොරතුරක් ලැබී ඇත් ද? ඔහු මියගොස් ද? ඔහු ගේ ප්‍රාර්ථනාව ඉෂ්ට වීද? "ඒ මගේ බාප්පා ගැනද?" ජොන් තැතනුවේ ය. "එයා පරෙස්සමින් ආපහු ඇවිල්ලද?"

"අණදෙන නිළධාරිතුමා සුනංගු වෙවී ඉන්ට කැමැති නෑ." සෙර් ඇලිසර් ගේ පිළිතුර විය. "අනික මම කැමැති නෑ මගේ නියෝග ගැන අවජාතකයො ප්‍රශ්න කරනවට."

ටිරියන් ලැනිස්ටර් සිය බංකුවෙන් නැගිට සිටියේ ය. "ඕක නවත්තනවා තෝර්න්. තමුසෙ මේ කොල්ලව බය කරනවා."

"තමුසෙට වැඩක් නැති දේට කට නොදා ඉන්නව ලැනිස්ටර්. තමුසෙට මෙතන තැනක් නෑ."

"ඒ වුනාට මට රාජසභාවෙ තැනක් තියෙනවා." කුරුමිට්ටා සිනාසෙමින් කීවේ ය. "හරි කණකට වචනෙ දාන්ට විතරයි මට තියෙන්නෙ. තව එක කොල්ලෙක් හරි පුහුණු කරන්ට නොලැබී අසරණ නාකියෙක් වගේ මැරිලා යන්ට තමුසෙට සිද්දවෙයි. දැන් කියනව ස්නොව්ට, ඇයි නාකි වලහට එයාව මුනගැහෙන්ට ඕන කියලා. එයාගෙ බාප්පා ගැන මොකුත් ආරංචියක් ද?"

"නෑ. මේක වෙනමම කාරණයක්. අද උදේ වින්ටර්ෆෙල්වල ඉඳන් කපුටෙක් ආවා. එයාගෙ සහෝදරයා ගැන ආරංචියක්." ඔහු වහාම තම වරද හරි ගැස්සුවේ ය. "එයාගෙ අර්ධ-සහෝදරයා ගැන."

"බ්‍රැන්." ජොන් තෙපලූයේ වහා දෙපයින් නැගී සිටිමිනි. "බ්‍රැන්ට මොකක් හරි සිද්දවෙලා."

ටිරියන් ලැනිස්ටර් ඔහු ගේ බාහුව මත අතක් තැබී ය. "ජොන්. මට බොහොම කණගාටුයි."

ජොන්ට ඔහු කී දේ නෑසුනාක් මෙනි. ටිරියන් ගේ අත පිස දා හැරිය ඔහු ශාලාව හරහා දිව ගියේ ය. අංගනයේ හිම මතින් දිව ගොස් අණදෙන නිළධාරි නිවස්නයේ මුර සෙබළුන් පසු කල ජොන් වරකට පඩි දෙක බැගින් නගිමින් ඉහළ මාලයට පිවිසියේ ය. අණදෙන නිළධාරිතුමා ඉදිරිපිටට පැමිනෙන විට ඔහු ගේ සපත්තු මුළුමනින්ම දියෙන් පෙඟී තිබුනු අතර ඔහු විසල් දෑසින් යුතුව හති දමමින් සිටියේ ය. "බ්‍රැන්. මොනවද බ්‍රැන් ගැන කියලා තියෙන්නෙ?"

නිශා රකුමේ අණදෙන නිළධාරී ජියර් මෝර්මන්ට් උතුමානන් වනාහි විසල් තට්ට හිසකින් හා අළු පැහැ දළ රැවුලකින් හෙබි කර්කශ මහළු පුද්ගලයකු විය. ජොන් කාමරයට ඇතුළුවන විට ඔහු සිය සුරතේ වසා හුන් කපුටෙකුට ඉරිඟු ඇට කවමින් උන්නේ ය. "මම දන්න විදියට නම් උඹට අකුරු කියවන්ට පුළුවන්." ඔහු සිය අත ගැස්සූ අතර කපුටා ඉවතට පියඹා ගොස් කවුළු පඩිය මත වසා මෝර්මන්ට් සිය ඉණ පටියෙන් ගත් රෝල් කරන ලද කඩදාසියක් ජොන්ට දෙන අයුරු දෙස බලා සිටියේ ය. "ඉරිඟු." ඌ රළු හඬින් කෑගැසුවේ ය. "ඉරිඟු. ඉරිඟු."

කඩදාසිය මුද්‍රා තබා තිබුනු සුදු පැහැ ඉටි මත වූ සෝරවෘකයා ජොන් සිය ඇඟිලි තුඩින් පිරිමැද්දේ ය. ඔහුට රොබ් ගේ අත්අකුරු හඳුනාගත හැකි වුවද සිය දෑස් ඉදිරියේ අකුරු බොඳ වී යන සෙයක් ඔහුට දැනින. සිය දෙකම්මුල් දිගේ කඳුළු ගලා යන අයුරු ඔහුට දැනින. එහෙත්, ඊළඟ මොහොතේ කඳුළු අතරින් පණිවුඩය කියවා තේරුම් ගන්නට ඔහු සමත් විය. "එයා නැගිටලා. දෙවියන්වහන්සේ අපට එයාව ආපහු දීලා."

"අබ්බගාතයෙක් විදියට." මෝර්මන්ට් කීවේ ය. "මට කණගාටුයි කොල්ලො. පණිවුඩේ ඉතිරි ටිකත් කියවන්ට."

ජොන් නැවත ලිපිය දෙස බැලුවේ ය. එහි තව කුමක් තිබුනත් ඔහුට කම් නැත. කිසිම දෙයක් වැදගත් නැත. වැදගත්වන එකම දේ නම් බ්‍රැන් ජීවත්වීමට යන බැව් පමණි. "මගේ සහෝදරයා ජීවත්වෙන්ට යනවා." ඔහු මෝර්මන්ට්ට පැවසුවේ ය. අණදෙන නිළධාරිතුමා හිස වනා ඉරිඟු අහුරක් අතට ගෙන සියුරුහඬ ලෑවේ ය. කපුටා පියඹා විත් ඔහු ගේ උරහිසේ වෑසුයේ නැවතත් රළු හඬින් කෑගැසුවේ ය. "ජීවත්වෙන්ට! ජීවත්වෙන්ට!"

මුවේ රුදුනු සිනාවක් හා අතේ රුදුනු රොබ් ගේ ලිපිය ඇතිව ජොන් පඩිපෙළ පහළට දිව ගියේ ය. "මගේ සහෝදරයා ජීවත්වෙන්ට යනවා." ඔහු මුර සෙබළුන්ට පැවසූ අතර ඔවුහු මුහුණින් මුහුණ බලාගත්හ. ආපසු කෑම කන ශාලාවට දිව ගිය ඔහු දුටුවේ ටිරියන් ලැනිස්ටර් සිය කෑම පිඟාන නිම කරමින් සිටින අයුරු ය. කුරුමිට්ටා ගේ දෑත් යටින් අත් දමා ඔහුව ඔසවා ගත් ජොන් ඔහුව වටයට කරකැවී ය. "බ්‍රෑන් ජීවත්වෙන්ට යනවා!" ඔහු කෑගැසුවේ ය. ටිරියන්ගෙන් දිස් වූයේ තැතිගැන්වුනු පෙනුමකි. ඔහුව බිම තැබූ ජොන් ලිපිය ඔහු අතට දුන්නේ ය. "මෙන්න. කියවලාම බලන්ට."

මේ වනවිට අන්‍යයන් ද කුතුහලය පිරුනු මුහුණුවලින් යුතුව ඔවුන් වටා රැස් වී සිටියහ. අඩි කිහිපයක් දුරින් සිටි ග්‍රෙන් ජොන් ගේ දර්ශනයට හසු විය. ඔහු ගේ අත වටා ඝනකම් වෙළුම් පටියක් ඔතා තිබින. ඔහු වෙතින් දිස් වූයේ උනන්දුසහගත එමෙන්ම අපහසුකාරී පෙනුමකි. එනමුදු එහි කිසිදු තර්ජනාත්මක ස්වභාවයක් නොතිබින. ජොන් ඔහු වෙතට ගියේ ය. ග්‍රෙන් පසුපසට බර වූයේ තමාට ඉදිරියෙන් දෑත් එසවී ය. "උඹ මගෙන් ඈත් වෙලා හිටපං අවජාතකයො."

ජොන් ඔහු දෙස බලා සිනාසුනේ ය. "උඹේ මැණික්කටුවට වෙච්ච දේ ගැන මට සමාවෙයං. රොබ් එකපාරක් ඔය දේම මට කලා. හැබැයි ඒක ලී කඩුවක්. ඒ වුනත් ඒක හෙණ ගහන තරමට රිදුනා. උඹට ඊටත් වඩා අමාරු ඇති. මේ බලහං, මට සමාවෙයං. උඹට ඕන නම් මම උඹට උගන්නනන්නම් කොහොමද ඒ පාර වළකන්නෙ කියලා."

ඇලිසර් තෝර්න්ට මෙම දෙබස ඇසින. "ස්නෝව් උතුමානන්ට මගේ තැන ගන්ට ඕන වෙලා වගේ." ඔහු අපහාසාත්මකව විරිත්තී ය. "උඹ මේ ඔරොක්ස්ට සටන් පුහුණු කරනවාට වඩා ලේසියෙන් මට පුළුවන් වෘකයෙකුට සර්කස් උගන්නන්ට."

"මම ඒ ඔට්ටුව බාරගන්නම් සෙර් ඇලිසර්." ජොන් කීවේ ය. "මම හරිම ආසයි ගෝස්ට් සර්කස් පෙන්නනවා බලන්ට."

තිගැස්මෙන් මෙන් ග්‍රෙන් ගේ හුස්ම හිරවෙනු ජොන්ට ඇසින. ඔවුන් අවට සෑම තැනම නිහඬතාව පැතිර ගියේ ය.

ඊළඟ මොහොතේ ටිරියන් ලැනිස්ටර් කොක් හඬලා සිනාසුනේ ය. ඉන්පසු අසල මේසයක සිටි කළු සොයුරන් තිදෙනෙක් ඒ සිනාවට එක් වූහ. මේසයෙන් මේසයට සිනාව බෝවී ගොස් අන්තිමේදී කෝකියෝ පවා සිනාවට එක් වූහ. සිවිලිමේ බාල්ක අතර සිටි කුරුල්ලෝ නොසන්සුන්තාවයෙන් දඟලන්නට වූහ. අන්තිමේදී ග්‍රෙන් පවා කෙකර සිනා පාන්නට පටන් ගති.

සෙර් ඇලිසර් කිසි විටෙකත් සිය දෑස් ජොන් වෙතින් මුදා නොගත්තේ ය. ඔහු අවට සිනා හඬ නැගෙන්නට නැගෙන්නට ඔහු ගේ මුහුණ කේන්තියෙන් කළු වී ගිය අතර අත මිට මෙලෑවී ගියේ ය. "ඒක බොහොම බරපතල අත්වැරැද්දක් ස්නොව් උතුමානනි." සතුරෙකුට හිමි කුරිරු කටුක ස්වරයෙන් ඔහු අන්තිමේදී කීවේ ය.

Benjen Stark: “On the Wall, a man gets only what he earns.”

එඩාර්ඩ් 04-1

වෙහෙසින් මිරිකුනු, කුසගින්නෙන් පෙලුනු, නොරිස්සුම් මුහුණින් යුතු එඩාර්ඩ් ස්ටාර්ක් රතු බලකොටුවේ දැවැන්ත ලෝකඩ දොරින් ඇතුළට සිය අසු මෙහෙයවී ය. උණුසුම් ජල ස්නානයක්, පැළඹු කුකුළෙකු හා පිහාටු මෙට්ටයක් මත සැප නින්දක් ගැන සිහින මවමින් සිය අසු පිට සිටි ඔහු වෙත ළඟා වූ රජතුමා ගේ මාලිගා බාරකරුවා දන්වා සිටියේ ප්‍රධාන මේස්ටර් පයිසෙල් විසින් රාජසභාවේ හදිසි රැස්වීමක් කැඳවා ඇති බවය. රජතුමා ගේ හස්තය ඔහුට පහසු හැකි උපරිම ඉක්මනින් ඊට සිය ගෞරවනීය සහභාගිත්වය ලබාදෙන්නේ නම් මැනවැයි එම පණිවුඩයෙන් වැඩි දුරටත් කියැවින.

"හෙට උදේ නම් මට පහසු වෙයි." නෙඩ් කඩාපැන්නේ සිය අසු පිටින් බිමට බසිමිනි.

මාලිගා බාරකරුවා දෙකට නැමුනි. "මම උපදේශකයින්ට කියන්නම් ඔබතුමාට එන්ට වෙන්නෙ නෑ කිවුවා කියලා, මගේ උතුමානනි."

"එපා." නෙඩ් කීවේ ය. ඔහු හරිහැටි සිය රාජකාරි අරඹන්නටත් පෙරම රාජසභාවේ උපදේශකයින් හා ගැටුම් ඇති කර ගැනීම නොමනා ය. "මම එයාලව හම්බවෙන්නම්. ඒත් මට ටික වෙලාවක් දෙන්ට අඩු ගානෙ හොඳ ඇඳුමක් මාරු කරගන්ටවත්."

"එහෙමයි මගෙ උතුමානනි. ඊරින් උතුමානන් කලින් පාවිච්චි කරපු 'හස්තයේ කුළුණ' අපි ඔබතුමා වෙනුවෙන් වෙන් කරලා තියෙන්නෙ. ඔබතුමා සතුටුනම්. ඔබතුමාගෙ බඩු ඔක්කොම එහාට යවන්ට මම වග බලාගන්නම්."

"බොහොම ස්තූතියි!" නෙඩ් කීවේ සිය අත්වැසුම් ගලවා ඉණ පටියට යටින් ඔබ්බන අතරේදී ය. ඔහුට පිටුපසින් අනෙකුත් පිරිස ගේට්ටුවෙන් ඇතුළුවෙමින් සිටියහ. සිය නිවාස බාරකරුවා වූ වයොන් පූල් දුටු නෙඩ් ඔහුට කතා කලේ ය. "රාජසභාවට මාව හදිසියේම උවමනා වෙලා තියෙනවා. මගේ දුවලාට එයාලගෙ නිදන කාමර පෙන්නන්ට. ජොරීට කියන්ට එයාලා කාමර ඇතුළෙම තියාගන්ටයි කියලා. ආර්යාට එහා මෙහා ඇවිදින්ට යන්ට දෙන්ට එපා." පූල් හිස නැමී ය. නෙඩ් නැවතත් රාජකීය මාලිගා බාරකරුවා දෙසට

හැරුනේ ය. "මගේ කරත්ත තාමත් නගරෙ මැද්දෙන් එන ගමන්. මට ගැලපෙන ඇඳුම් ටිකක් හොයාගන්ට වෙයි."

"මම බොහොම සන්තෝසෙන් ඒක කරන්නම්."

මෙලෙස අත්‍යන්තයෙන්ම වෙහෙසුනු, අනෙකෙකු ගේ ඇඳුම්වලින් සැරසුනු නෙඩ් ඉක්මන් පියවර තබමින් රාජසභාව වෙත ළඟා වෙද්දී රාජසභිකයින් සිවුදෙනෙක් ඔහු වෙනුවෙන් පොරොත්තු වෙමින් සිටියහ.

ශාලාව ඉතා උසස් අන්දමින් සරසා තිබින. බිමට ම'රිෂ් බුමුතුරුණු එලා තිබුනු අතර එක් කොණක ගිම්හාන දූපත්වලින් ගෙනා දිදුලන වර්ණයෙන් සිතුවම් කල කඩතිරයක් දක්නට ලැබින. බිත්ති පුරා නොර්වොස් හා ක්වොහොර් හා ලයිස් වලින් ගෙනා තිර රෙදි එල්ලා අලංකාර කර තිබින. කළු පැහැ කිරිගරුඬින් නිමවා දෑස්වලට ඔප දැමූ ගානට එබ්බවූ නරසිංහ රූප දෙකක් මගින් දොරටුව දෙපස අලංකාර කෙරින. රාජසභිකයින් අතරින් නෙඩ් අකැමැතිම පුද්ගලයා, වාරිස් නම් පණ්ඩකයා නෙඩ් දොරින් ඇතුළුවත්ම ඔහුට ආචාර කලේ ය. "ස්ටාර්ක් උතුමානනි, රජමාවතේදී ඔබට මුහුණ දෙන්ට වුන කරදර ගැන මට බොහොම දුකයි. අපි හැමෝම සප්තක දේවස්ථානයට ගියා ජොෆ්රි කුමාරයා වෙනුවෙන් ඉටිපන්දම් පත්තු කරන්ට. එයාගෙ සුවය වෙනුවෙන් මම යාඥා කලා."

"ඔබේ දෙවියන්ට ඔබව ඇහිලා තියෙනවා." නෙඩ් උදාසීන නමුදු ආචාරශීලී අයුරින් පිළිතුරු දුන්නේ ය. "කුමාරයා ගතවෙන හැම දවසක් ගානෙම ශක්තිමත් වෙනවා." පණ්ඩකයා ගේ ග්‍රහණයෙන් සිය අත මුදා ගත් ඔහු තිරයක් අසල සිටගෙන සිටි රෙන්ලි උතුමානන් වෙත කාමරය හරහා ඇවිද ගියේ ය. ඔහු සමග සිහින් ස්වරයෙන් කතා කරමින් සිටි මිටි පුද්ගලයා අනෙකෙකු නොව සුළැඟිල්ලා විය යුතුය. රොබර්ට් සිය සිහසුන දිනන විට රෙන්ලි අට හැවිරිදි කොලුවකු විය. එනමුදු ඔහු මේ වනවිට තරුණයකු බවට වැඩී සිටියේ සෑම අතින්ම පාහේ සිය වැඩිමල් සොයුරාට සමාන විය. ඔහු දකින වාරයක් පාසා නෙඩ්ට දැනුනේ ත්‍රිශූලයේ සටන දිනූ රොබර්ට් තමා අසල සිටිනු වැනි හැඟීමකි.

"ඔබ පරෙස්සමින් ඇවිල්ලා කියලා පේනවා ස්ටාර්ක් උතුමානනි." රෙන්ලි කීවේ ය.

"ඔබත්." නෙඩ් පිළිතුරු දුන්නේ ය. "මට සමාවෙන්ට මෙහෙම කියනවට. ඒත් සමහර වෙලාවට ඔබව පේන්නෙ ඔබේ අයියා රොබර්ට්ගෙ රූපයක් වගේ."

"බොහොම නරක කොපියක්." රෙන්ලි දෙවුර ඇකිළී ය.

"හැබැයි ඊට වඩා බොහොම හොඳට ඇඳලා ඉන්නවා." සුළැඟිල්ලා උපහාසයෙන් කීවේ ය. "රාජසභාවෙ ඉන්න ආර්යාවන්ගෙන් බාගෙකට වඩා හොඳට අපේ රෙන්ලි උතුමානන් එයාගෙ ඇඳුම් පැළඳුම්වලට වියදම් කරනවා."

එය සැබැවින්ම සත්‍යයක් විය. රෙන්ලි උතුමානන් රන්වන් ගෝනුන් දුසිමක් පමණ එම්බ්‍රොයිඩර් කරන ලද තද කොළ පැහැ විල්ලුද ඇඳුමකින් සැරසී සිටියේ ය. රන්වන් පැහැ රෙද්දෙන් කල, එක් උරහිසක් උඩින් පැළඳ සිටි අඩ-කබාය අලංකාර මරකත හාරිච්චියකින් තද කර තිබිනි. "මීට වඩා භයානක අපරාධ තියෙනවා." රෙන්ලි සිනාවකින් යුතුව කීවේ ය. "උදාහරණෙකට ගත්තොත් ඔබ ඔය ඇඳගෙන ඉන්න විදිය."

සුළැඟිල්ලා මෙම සමච්චලය නොතකා හැරියේ ය. ඔහු අහංකාරකම තැවරුනු සිනාවකින් වැසුනු මුවින් යුතුව නෙඩ් දෙස බැලුවේ ය. "ඔබව මුනගැහෙන්ට මම අවුරුදු ගානක ඉඳන් බලන් හිටියා ස්ටාර්ක් උතුමානනි. කිසිම සැකයක් නෑ කැට්ලින් ආර්යාව මං ගැන ඔබට කියලා ඇති."

"ඇත්තෙන්ම." නෙඩ් පිළිතුරු දුන්නේ කේන්තිය මුසු ස්වරයකිනි. සුළැඟිල්ලා ගේ ප්‍රකාශයේ ඇති කපටි අධිමානය ඔහු ගේ සිතේ අමනාපයක් ඇති කලේ ය. "මම හිතන්නෙ ඔබ මගේ සහෝදරයා බ්‍රැන්ඩන්වත් හොඳට දැනගෙන හිටියා."

රෙන්ලි බරතියන් මහ හඬින් සිනාසුනේ ය. කතාවට සවන් දීම පිණිස වාරිස් ද එදෙසට ඇදුනේ ය.

"බොහොම හොඳට දැනගෙන හිටියා." සුළැඟිල්ලා පිළිතුරු දුන්නේ ය. "එයාගෙ ගරු සැලකිල්ලෙ සංකේතයක් තාමත් මගෙ ළඟ තියෙනවා. බ්‍රැන්ඩනුත් මං ගැන කතාකලාද?"

"නිතරම වගේ. අනික බොහොම උණුසුම් විදියට තමා එයා ඒ ගැන කතා කලේ." නෙඩ් කීවේ එය මේ සංවාදයට නැවතීමේ තිත තබතැයි යන බලාපොරොත්තුවෙනි. ඔවුන් කරන මේ ක්‍රීඩාව, වදන්වලින් කරන ද්වන්ද්ව යුද්ධ ඔහුට නුහුරු නුපුරුදු දෙයකි.

"මම හිතාගෙන හිටියෙ උණුසුම කියන්නෙ ස්ටාර්ක්වරුන්ට ගැලපෙන්නෙ නැති දෙයක් කියලයි." සුළැඟිල්ලා කීවේ ය. "මෙහෙ මේ දකුණුකරේ උදවිය කියන්නෙ ඔබලා හැමෝම හැදිලා තියෙන්නෙ අයිස් වලින්, ඔබලා බෙල්ලෙන් පහළට ආපු ගමන් දියවෙලා වැක්කෙරෙනවා කියලයි."

"ඒ තරම් ඉක්මනින් දියවෙන්ට මගෙ කිසිම අදහසක් නෑ බේලිෂ් උතුමානනි. ඔබ ඒ ගැන බයවෙන්ට දෙයක් නෑ." නෙඩ් සාකච්ඡා මේසය දෙසට ඇදුනි. "මේස්ටර් පයිසෙල්, මම හිතනවා ඔබ බොහොම හොඳින් කියලා."

මේසය පාමුල උස් අසුනක වාඩි වී සිටි ප්‍රධාන මේස්ටර්වරයා මෘදු ලෙසින් සිනාසුනි. "මගේ මේ නාකි වයසට ගැලපෙන තරම් හොඳින් ඉන්නවා මගෙ උතුමානනි. ඒ වුනත්, කියන්ට කණගාටුයි, මට බොහොම ඉක්මනට මහන්සි දැනෙනවා." ඔහු ගේ තට්ට හිස වටා සුදු හිසකෙස් රිදී පැහැ වැටියක් මෙන් බැබලුනේ ය. ඔහු පැළඳ සිටි මේස්ටර්වරුන් ගේ කරපටිය සාමාන්‍ය ලෝහ දම්වැලක් නොවී ය. දුසිම් බාගයක් පමණ වූ ලෝහ දම්වැල් එකිනෙක පාස්සා බරපතල මාලයක් සාදා තිබූ අතර එය ඔහු ගේ ගෙලේ සිට පපුව දක්වා පැතිරින. මේ දම්වැල් පුරුක් සාදා තිබුනේ මිනිසා විසින් දැන සිටි සෑම ලෝහයක්ම; කළු යකඩ හා රතු රන්, දිදුලන තඹ හා ඊයම්, වානේ හා ටින්, පිත්තල හා ලෝකඩ හා ප්ලැටිනම් ආදිය භාවිත කරමිනි. ගාර්නට්, අමතේස්ත හා කළු මුතුවලින් මෙම මාලය හැඩ කෙරුනු අතර අතරින් පතර මරකත හා රතු කැටද දැකගත හැකි විය. "අපි ඉක්මනටම පටන් ගත්තොත් හොඳයි." ප්‍රධාන මේස්ටර්වරයා පැවසුයේ සිය දැවැන්ත උදරය මත දෑත් බැඳ ගනිමිනි. "අපි තවත් වෙලා බලන් හිටියොත් මට නින්ද යයිද දන්නෙත් නෑ."

"ඔබ කියන විදියකට." මේසය මුදුනෙහි වූ රජතුමා ගේ ආසනය හිස්ව පැවතුනි. රජු ගේ හස්තය වශයෙන් නෙඩ් ඊට දකුණුපසින් තිබුනු අසුනෙහි වාඩි වුනේ ය. "මගේ උතුමනි, ඔබලාව පොරොත්තු කරන්ට සිදු වීම ගැන මට කණගාටුයි." ඔහු චාරිත්‍රානුකූලව පැවසී ය.

"ඔබ තමා රජතුමාගෙ හස්තය." වාරිස් පැවසී ය. "ඔබ සතුටු විදියට වැඩ කරන්ට අපි සූදානම්, ස්ටාර්ක් උතුමානනි."

අනිකුන් තම තමාට හිමි අසුන්වල වාඩි ගනිද්දී හදිසියේම නෙඩ්ට වැටහී ගියේ තමා මෙතැනට, මෙම කාමරයට, මෙම මිනිසුන් අතරට නොගැලපෙන්නෙකු බවය. වින්ටර්ෆෙල්වල සොහොන් ගැබ් තුළදී රොබර්ට් ඔහුට පැවසූ දේවල් ඔහුට නැවත සිහියට නැගින. 'මාව වට කරන් ඉන්නෙ වංචාකාරයොයි මෝඩයොයි' රජතුමා පවසා තිබින. සාකච්ඡා මේසය වටා අසුන් ගෙන සිටි පිරිස දෙස බැලූ මෙයින් කවරෙකු වංචාකාරයින් ද කවරෙකු මෝඩයින් ද යි කල්පනා කර බැලී ය. "මෙතැන අපි පස්දෙනයිනෙ ඉන්නෙ."

"රජතුමා උතුරට ගියාත් එක්කම වගේ ස්ටැනිස් උතුමානන් ඩ්‍රැගන්ස්ටෝන්වලට ගියා." වාරිස් කීවේ ය. "සෙර් බැරිස්ටාන් රජතුමාගෙ පැත්තකින් එනවා ඇති."

"අපි රජතුමායි සෙර් බැරිස්ටානුයි එනකං හිටියනං හොඳයි වගේ." නෙඩ් කීවේ ය.

රෙන්ලි බරතියන් මහ හඬින් සිනාසුනෝ ය. "මගේ සහෝදරයා මෙතනට එනකං බලන් ඉන්ට ගියොත් අපට තව කාලාන්තරයක් බලන් ඉන්ට වෙයි."

"අපේ රොබර්ට් රජතුමාට තවත් ගොඩක් දේවල් ගැන බලන්ට තියෙනවා." වාරිස් කීවේ ය. "ඒ බර අඩු කරන්ට උවමනා නිසා පුංචි පුංචි දේවල තීරණය අපට ගන්ට බලය දීලයි තියෙන්නෙ."

"වාරිස් උතුමානන් ඇත්තටම අදහස් කරන්නෙ මුදල් හදල්, බදු, අස්වැන්න, යුක්තිය වගේ දේ ගැන මගේ අයියා එච්චර උනන්දුවක් දක්වන්නෙ නෑ කියලයි." රෙන්ලි උතුමානන් කතාව ඇරඹී ය. "ඒ නිසා මේ රාජධානිය පාලනය කරන එක අපි පිට තමා වැටිලා තියෙන්නෙ. රජතුමා සැරින් සැරේ අපට පණිවුඩ එවන එක තමා කරන්නෙ." සිය කමිස අත තුළින් පිටතට ගත් රෝල් කරන ලද ලිපියක් ඔහු මේසය මත තැබී ය. "අද උදේ එයා මට අණ කලා හැකි ඉක්මනින් මෙහාට ඇවිල්ලා ප්‍රධාන මේස්ටර් පයිසේල්ට කියන්ටය කියලා හැකි ඉක්මනින් රාජසභාව රැස් කරන්ටය කියලා. එයා අපට බොහොම හදිසි රාජකාරියක් පවරලා තියෙනවා."

සුළැඟිල්ලා සිනාවක් සමගින් ලිපිය නෙඩ් වෙත දිගු කලේ ය. එහි තිබුනු රාජකීය මුද්‍රාව සිය මහපටැඟිල්ලෙන් කැඩූ නෙඩ් එය මේසය මත ඇතිරුවේ රජතුමා ගේ හදිසි නියෝගය කියවනු පිණිස ය. ඔහුට සිය දෑස් අදහාගත නොහැකි විය. රොබර්ට් ගේ මෝඩකම්වල සීමාවක් නැතිද? අනෙක මේ සියල්ලම ඔහු ගේ නමින් සිදු කිරීම අඬන්නට සිටින මිනිසාට ඇඟැට ඇඟිල්ලෙන් ඇන්නා හා සමාන ය. "දෙයියන්ටමම ඔප්පු වෙච්චාවෙ!"

"එඩාර්ඩ් උතුමානන් කියන්ට හදන්නෙ," රෙන්ලි උතුමානන් නිවේදනය කලේ ය. "අපේ රජතුමාට උවමනා වෙලා තියෙනවා තරගාවලියක් පවත්වන්ට අපේ අලුත් හස්තය පත්කිරීමට කරන ගෞරවයක් වශයෙන්."

"සල්ලි කොච්චරක් ද?" සුළැඟිල්ලා මෘදු ස්වරයෙන් ඇසුවේ ය.

නෙඩ් ලිපිය කියැවී ය. "තරගාවලියේ ශූරයාට රන්කාසි හතලිස්දාහක්. අනුශූරයාට විසිදාහක්. මිශ්‍ර සටනේ ජයග්‍රාහකයාට තවත් විසිදාහක්. දුනුවායන්ගෙ තරගයේ ජයග්‍රාහකයාට දහදාහක්."

"රන්කාසි අනූදාහක්." සුළැඟිල්ලා සුසුමක් හෙලී ය. "ඒත් එක්කම අපි අනිත් වියදම් ගැනත් අමතක කරන්ට නරකයි. රොබර්ට්ට බොහොම විශාල භෝජන සංග්‍රහයකුත් පවත්වන්ට ඕන වෙයි. ඒ කියන්නෙ අපට හොයාගන්ට වෙනවා කෝකියො, වඩුවො, වැඩකාර කෙල්ලො, ගායකයො, සර්කස්කාරයො, විහිළුකාරයො..."

"විහිළුකාරයො නම් අපට ඕන පදං ඉන්නවා." රෙන්ලි උතුමානන් කීවේ ය.

ප්‍රධාන මේස්ටර් පයිසෙල් සුළැඟිල්ලා දෙස බැලුවේ ය. "භාණ්ඩාගාරය මේ වියදම් දරනවද?"

"මොන භාණ්ඩාගාරයක් ගැනද ඔබ ඔය කතා කරන්නෙ?" සුළැඟිල්ලා පිළිතුරු දුන්නේ ඇදවී ගිය දෙතොලින් යුතුව ය. "මෝඩ කතා කියන්ට එපා මේස්ටර්. මං තරම්ම ඔබත්

දන්නවා භාණ්ඩාගාරය හිඳිලා ගිහිල්ලා දැන් අවුරුදු ගානක් වෙනවා කියලා. මට සල්ලි ණයට ගන්ට තමා වෙන්නෙ. කිසිම සැකයක් නෑ ලැනිස්ටර්ලා අපට මේ පාරත් උදවු කරාවි. දැනට අපි ටයිවින් උතුමානන්ට රන්කාසි මිලියන තුනක් ණයයි. තවත් ලක්ෂයක් ඉල්ලගත්තා කියලා මොකක්ද සිද්දවෙන වෙනස?"

පුදුමය නිසා නෙඩ් තෝන්තු වී ගිය අතර ඔහු ගේ මුව ඇරී ගියේ ය. "ඔබ කියන්නෙ රජය දැනට රන්කාසි මිලියන තුනක් ණයයි කියලද?"

"රජය දැනට රන්කාසි මිලියන හයකට වඩා ණයයි එඩාර්ඩ් උතුමානනි. ලැනිස්ටර්ලට තමා ඒකෙන් වැඩිම කොටසක් අයිති. ඒත් එක්කම අපි ණයට අරන් තියෙනවා ටිරල් උතුමානන්ගෙන්, බ්‍රාවොස්වල යකඩ බැංකුවෙන්, ටයිරෝෂි වෙළෙඳ ගිවිසුම් කීපයකින්. අන්තිම කාලෙ වෙද්දි මට සත්‍ය ලබ්ධියෙනුත් ණයට ගන්ට වුනා. ප්‍රධාන පූජකතුමා කේවල් කරන්නෙ හරියට ඩෝර්නිෂ් මාළුකාරයෙකුටත් වඩා අන්ත විදියට."

නෙඩ් ත්‍රස්ත වී ගියේ ය. "ඒරිස් ටාර්ගේරියන් රන්කාසිවලින් පිරිච්ච භාණ්ඩාගාරයක් අපට ඉතුරු කරලා ගියා. ඔබලා කොහොමද මෙහෙම දෙයක් වෙන්ට ඉඩඇරියෙ?"

සුළැඟිල්ලා දෙවුර ඇකිළී ය. "භාණ්ඩාගාරයේ ප්‍රධානියා සල්ලි හොයනවා. රජතුමායි එයාගෙ හස්තයයි සල්ලි වියදම් කරනවා."

"මම විශ්වාස කරන්නෙ නෑ ජොන් ඒරින් රොබර්ට්ට ඉඩදුන්නය කියලා රජය මෙහෙම හිඟමනට දාන්ට." නෙඩ් උණුසුම් ස්වරයෙන් කීවේ ය.

ප්‍රධාන මේස්ටර් පයිසෙල් සිය තට්ට හිස දෙපසට වැනී ය. "ඒරින් උතුමානන් කියන්නෙ බොහොම දූරදර්ශී මනුස්සයෙක්. ඒ වුනත් කණගාටුයි කියන්ට අපේ රජතුමා සමහර වෙලාවට ඥානවන්ත උපදෙස්වලට ඇහුම්කන් දෙන්නෙ නෑ."

"මගේ සහෝදරයා බොහොම කැමැතියි තරගාවලිවලටයි භෝජන සංග්‍රහවලටයි." රෙන්ලි බරතියන් කීවේ ය. "ඒත් එක්කම එයාට මේ, එයා කියන විදියට 'සල්ලි ගනං කරන වැඩ' හරි පිළිකුල්."

"මම රජතුමාත් එක්ක මේ ගැන කතා කරන්නම්." නෙඩ් කීවේ ය. "මේ තරගාවලිය රජයට දරන්ට බැරි තරම් අනවශ්‍ය දෙයක්."

"ඔබට කැමැති විදියකට එයාට කතා කරන්ට." රෙන්ලි උතුමානන් කීවේ ය. "ඒත් අපි මේ ගැන සැලසුම් කරන එකත් කලා නම් හොඳයි."

"වෙන දවසක." සමහරවිට ඔහු ගේ ස්වරය මදක් උස්වන්නට ඇත. ඔවුන් ඔහු දෙසට එල්ල කල බැලුම් වලින් ඒ බැව් තහවුරු විය. තමා තවදුරටත් සිටින්නේ වින්ටර්ෆෙල්වල නොවන බව ඔහු සිහියේ තබා ගත යුතුය. එහිදී නම් ඔහුට ඉහළින් සිටියේ රජතුමා පමණි. එනමුදු මෙහිදී ඔහු සමානයන් අතර තවත් එක් අයකු පමණි. "මට සමාවෙන්ට මගේ උතුමනි." ඔහු වඩා මෘදු ස්වරයකින් කීවේ ය. "මට හොඳටම මහන්සියි. අපි අදට නවත්තලා, මම ටිකක් ගිමන් නිවුවට පස්සෙ ආයෙමත් පටන් ගමු." ඔවුන් ගේ අනුමැතිය වෙනුවෙන් පමා නොවුනු ඔහු සැනෙන් නැගිට සිටියේ පිරිස වෙත හිස සලා දොර දෙසට පිය මැන්නේ ය.

පිටත තවමත් කරත්ත හා අශ්වාරෝහකයින් බලකොටු ද්වාරයෙන් ඇතුළුවෙමින් පැවතින. බලකොටු අංගනය කෑ ගසන මිනිසුන් ගේ හා අශ්වයින් ගේ කලිකලහයෙන් පිරී එකම මඩ ගොහොරුවක් විය. ඔහුට දැනගන්නට ලැබුනු අන්දමට රජතුමා තවමත් පැමිණ නොසිටියේ ය. ත්‍රිශූලයේ සිදු වූ අභාග්‍ය සම්පන්න සිදුවීමෙන් පසු ස්ටාර්ක්වරුන් හා ඔවුන් ගේ පිරිස ප්‍රධාන කණ්ඩායමෙන් බැහැරව ඔවුන්ට වඩා ඉක්මනින් ගමන් කොට තිබින. නැගී එන ආතතිය මගහරිනු වස් ලැනිස්ටර්වරුන්ගෙන් හැකි තරම් ඈත් වී ගමන් කිරීමට නෙඩ් තීරණය කර තිබින. මේ කාලය තුළ රොබර්ට් පෙනෙන්නට සිටියේ නැති තරම්. පිරිස අතර කෙරුනු කතාබහ අනුව නම් ඔහු නිතරම බීමත්ව අශ්ව කරත්තයේ ගමන් කරමින් සිටියේ ය. ඔහු මෙහි පැමිණීමට තවත් පැය ගණනාවක් ගත විය හැකි නමුදු එතරම් ඉක්මනට ඔහු ගේ මුහුණ බැලීමට නෙඩ් ගේ සිතේ කැමැත්තක් නොතිබින. සන්සා ගේ දුක්මුසු මුහුණ දකින වාරයක් පාසා සිය සිතේ ද්වේශය කැකැරෙමින් නැග එනු නෙඩ්ට දැනින. ගමනේ අවසාන සති දෙක එකම දුක් ප්‍රවාහයක් විය. මිය යා යුතුව තිබුනේ ලේඩි නොව නයිමේරියා බව පවසමින් සන්සා ආර්යාට චෝදනා කලා ය. අනිත් අතට

මස්කාරයා ගේ පුතාට සිදු වූ දේ අසන්නට ලැබුනු පසු ආර්යා සම්පූර්ණයෙන්ම පාහේ මේ ලෝකයෙන් බැහැර වූ බවක් පෙනින. සන්සා සැමදාම නින්දට යද්දී සිය කොට්ටය තෙමෙන තෙක් හැඩූ අතර ආර්යා දවස පුරාම කිසිදු කතාවක් බහක් නොමැතිව බලා ගත් අත බලා සිටිනු දක්නට ලැබින. වින්ටර්ෆෙල්හි ස්ටාර්ක්වරුන්ටම වෙන් වූ සීතල අපායක් එඩාර්ඩ් ස්ටාර්ක් සිහිනයෙන් දුටුවේ ය.

---------------------------

පිටත අංගනය හරහා ගොස් අභ්‍යන්තර පවුර පසුකර සිය නවාතැන වන 'හස්තයේ කුළුණ' වෙත ඇවිදිමින් යන අතරේ නෙඩ් ඉදිරියෙන් සුළැඟිල්ලා ප්‍රාදූර්භූත වීය. "ඔබ ඔය යන්නෙ වැරැදි පැත්තට ස්ටාර්ක්. එන්ට මගෙත් එක්ක."

අතීරණයෙන් වුවද නෙඩ් ඔහු පසුපස වැටින. සුළැඟිල්ලා ඔහුව කැඳවාගෙන කුළුණක් තුළින්, පඩිපෙළක් පහළට, අන්තර්භෞම අංගනයක් හරහා අතහැර දමන ලද බරාඳයක් දිගේ දිගටම ගියේ ය. මේ බරාඳය දිගටම පැරණි හිස් සන්නාහ සිටවා තිබුනේ මුරකරුවන් පරිද්දෙනි. කළු පැහැ වානේවලින් නිමවා මකර කොරපොතුවලින් හැඩගැන්වූ, දැන් අමතක කර දමා ධූලි බැඳී තිබුනු මේවා ටාර්ගේරියන්වරුන් ගේ කෞතුක වස්තු විය. "මේ මගේ නවාතැනට යන පාර නෙවෙයි." නෙඩ් කීවේ ය.

"මම එහෙම කිවුවද? මම ඔබව එක්කරන් යන්නෙ වධකාගාරවලට, ඔබේ බෙල්ල කපලා මළකඳ කොහේ හරි බිත්තියක් පිටිපස්සෙ හංගන්ට." සුළැඟිල්ලා පිළිතුරු දුනි. ඔහු ගේ කටහඬ සෝපාහාසයෙන් පිරී තිබින. "අපට සෙල්ලම් කර කර ඉන්ට වෙලාවක් නෑ ස්ටාර්ක්. ඔබේ බිරිඳ බලන් ඉන්නවා."

"මොකක්ද මේ නටන්ට හදන නාඩගම? කැට්ලින් ඉන්නෙ වින්ටර්ෆෙල්වල. මෙතන ඉඳන් ලීග සිය ගානක් ඈත."

"ආහ්!" සුළැඟිල්ලා ගේ අළු-කොළ පැහැ දැස් දීප්තිමත්ව බැබලින. "ඒ කියන්නෙ එහෙනම් තව කවුරු හරි බොහොම දක්ෂ විදියට වෙස් වලා ගෙන තියෙනවා. මේ අන්තිම

වතාවටයි කියන්නෙ. එන්ට. එහෙම නැත්තං එන්ට එපා. මම එයාව මටම තියාගන්නම්." ඔහු ඉක්මනින් පඩිපෙළ පහළට ඇවිදගෙන ගියේ ය.

නෙඩ් පරීක්ෂාකාරී අයුරින් ඔහු පසුපසින් වැටුනේ අද දවස කෙදිනක නිමා වන්නේදැයි කල්පනා කරමිනි. මෙවැනි කුමන්ත්‍රණ ගැන ඔහු තුළ කිසිදු පැහැදීමක් නොවී ය. එනමුදු සුළැඟිල්ලා වැනි මිනිසකුට එවැනි දේ කජු කන්නාක් මෙන් පහසු බව ඔහුට අවබෝධ වෙමින් තිබින.

පඩිපෙළ පාමුල ඕක් දැවයෙන් හා යකඩින් නිම කල බරැති දොරක් විය. අගුල එසවූ පෙටයර් බේලිෂ් නෙඩ්ට සන් කලේ ය. දොරින් පිට වූ ඔවුන් පා තැබුයේ බැස යන හිරු ගේ රත් පැහැයෙන් නැහැවුනු, ගඟට ඉහළින් පිහිටි දැඩි බෑවුම් සහිත පර්වතයක් මුදුනට ය. "අපි ඉන්නෙ බලකොටුවෙන් පිටත." නෙඩ් කීවේ ය.

"ඔබව මුලා කරන්ට හරි අමාරුයි ස්ටාර්ක්." සුළැඟිල්ලා බොරු නියවීමක් ඇතිව කීවේ ය. "ඉර නිසාද ඒක අහුවුනේ? නැත්තම් අහස නිසාද? මගේ පස්සෙන් එන්ට. ගලේ පඩි කපලයි තියෙන්නෙ. පරිස්සමෙන්. පහළට වැටෙන්ට එපා. කැට්ලින් කවදාවත් ඒක පිළිගන්න එකක් නෑ." ප්‍රපාතයෙන් ඔබ්බට ගිය ඔහු වඳුරකු මෙන් කඩිසරව පහළ බසින්නට විය.

නෙඩ් මඳ වේලාවක් පර්වත මුහුණත අධ්‍යයනය කලේ ය. ඉන්පසු වඩා සෙමින් පහළ බසින්නට පටන් ගත්තේ ය. සුළැඟිල්ලා පොරොන්දු වූ පරිද්දෙන්ම ගලේ නොගැඹුරු කැපුම් කපා තිබුනේ පහත සිට බලන්නෙකුට නොපෙනන පරිද්දෙනි. ඔහුට බොහෝ පහළින් බොහෝ ඈතින් ගඟ ගලායමින් තිබින. සිය මුහුණ පර්වතයට සමීපව තබා ගත් ඔහු උවමනාවට වඩා පහළ නොබැලීමට වග බලා ගත්තේ ය.

අන්තිමේදී නෙඩ් පර්වතය පාමුල වූ ගඟට සමාන්තරව ඇදී ගිය පටු, මඩ වැකුනු අඩි පාරකට පා තැබුවේ ය. සුළැඟිල්ලා ගලක් මත වාඩි වී ඇපල් ගෙඩියක් කමින් සිටියේ ය. "ඔබ බොහොම නාකි වෙලා ස්ටාර්ක්." ඔහු කීවේ ඇපල් ගෙඩියේ මදය අලස ලෙස ගංදියට විසි කරමිනි. "ප්‍රශ්නයක් නෑ. ගමනේ ඉතුරු ටික අපි අශ්වයො පිටේ යමු." ඔහු සතුව අසුන් දෙදෙනෙකු පොරොත්තුවෙන් සිටි අතර අසු පිට නැගුනු නෙඩ් සුළැඟිල්ලා පසු පස අඩි පාර දිගේ ගොස් නගරයට අවතීර්ණ විය.

Eddard Stark: “You would be the last man I would willingly include in any party, Lord Baelish.”

අන්තිමේදී සුළැඟිල්ලා දැවයෙන් නිමකල, ගරාවැටුනු, තුන්මහල් ගොඩනැගිල්ලක් සමීපයේ සිය අසු නැවැත්වීය. වැඩිවන අඳුර මධ්‍යයේ එහි කවුළු පහන් එළියෙන් දීප්තිමත්ව බැබලින. සංගීතය හා රළු සිනහ හඬ එයින් පිටතට ඇසෙන්නට විය. දොර පසෙකින් අලංකාර පහනක් දම්වැලකින් එල්ලා තිබින.

නෙඩ් ස්ටාර්ක් කෝපයෙන් යුතුව සිය අසු පිටින් බැස්සේ ය. "ගනිකා මඩමක්." ඔහු කීවේ සුළැඟිල්ලාව උරහිසෙන් අල්ලා රළු අයුරින් තමා දෙසට හරවමිනි. "උඹ මෙච්චර දුර මාව එක්කන් ආවෙ ගනිකා මඩමකටද?"

"ඔබේ බිරිඳ ඇතුළෙ ඉන්නවා." සුළැඟිල්ලා කීවේ ය.

ඒ අවසාන අවමානය විය. "බ්‍රැන්ඩන් උඹට කරුනාවන්ත වුනා වැඩියි." නෙඩ් කීවේ කුඩා මිනිසාගේ ගෙලින් ඔසවා වැරෙන් බිත්තියේ ගසමිනි. සිය කිනිස්ස ඇදගත් ඔහු එහි තුඩ කුඩා එළු රැවුලට පහළින් ගෙලට තද කලේ ය.

"මගේ උතුමානනි එපා." කටහඬක් කෑ ගැසුවේ ය. "එයා ඇත්ත කියන්නෙ." ඔහුට පිටුපසින් අඩි ශබ්දයක් ඇසෙන්නට විය.

කිනිස්ස අතේ ඇතිව ආපසු හැරුනු නෙඩ් තමා දෙසට ඉක්මනින් එන සුදු පැහැ හිසකෙසින් යුතු මහලු මිනිසකු දුටුවේ ය. දුඹුරු පැහැ රළු ඇඳුමක් හැඳ සිටි ඔහු දුවන අතරේ ගෙලට යටින් වූ රැළි ලෙළ දුන්නේ ය. "මේක උඹට අයිති වැඩක් නෙවෙයි." නෙඩ් කීවේ ය. එනමුදු ඊළඟ මොහොතේ ඔහු ඒ පුද්ගලයාව හඳුනා ගත්තේ මවිතයට පත්ව කිනිස්ස පහත් කලේ ය. "සෙර් රඩ්‍රික්?"

රඩ්‍රික් කසල් හිස වැනුවේ ය. "ඔබතුමාගෙ ආර්යාව උඩුමහලේ බලන් ඉන්නවා."

නෙඩ් ට මුළා වූ සෙයක් දැනින. "කැට්ලින් ඇත්තටම මෙහෙ ඉන්නවා? මේක සුළැඟිල්ලාගෙ විහිළුවක් නෙවෙයිද එහෙනම්?" ඔහු කිනිස්ස නැවත කොපුවේ ලෑවේ ය.

"ඒක එහෙම වුනා නම් කොච්චර හොඳද නේද ස්ටාර්ක්?" සුළැඟිල්ලා කීය. "මගෙ පස්සෙන් එන්ට. පුළුවන් තරං රජතුමාගෙ අත නෙවෙයි, නිකං සාමාන්‍ය ගෑනු සොඬෙක් වගේ පේන්ට ඉන්ට. ඒ කාටවත් ඔබව අඳුරගන්ට බැරිවෙන්ටයි. සමහරවිට ඔය යන ගමන් කෙල්ලෙක්ගෙ තනයක් දෙකක් මිරිකුවත් කමක් නෑ."

ඔවුහු ගොඩනැගිල්ල තුළට වැදුනහ. මිනිසුන්ගෙන් පිරී ගිය ප්‍රධාන ශාලාවේ මහත ගැහැණියක් ග්‍රාම්‍ය ගීත ගයමින් සිටියා ය. හන හා සේද රෙද්දෙන් සැරසුනු ලස්සන තරුණ කෙල්ලෝ සිය ආදරවන්තයින් ගේ උකුළ මතට වී තොදොල් වෙමින් උන්හ. කිසි කෙනෙක් නෙඩ් වෙත සුළු හෝ අවධානයක් නොදැක්වූහ. සෙර් රඩ්‍රික් පහත මාලයේ නතර වූ අතර නෙඩ් ව තෙවන මහලට කැඳවා ගෙන ගිය සුළැඟිල්ලා බරාඳය දිගේ ගොස් දොරක් විවර කලේ ය.

කාමරය තුළ කැට්ලින් බලාපොරොත්තුවෙන් සිටියා ය. ඔහු දුටු ඈ කෑ ගසමින් ඔහු වෙත දිව විත් ඔහුව දැඩිව බදා ගත්තා ය.

"මගේ ආර්යාවනි." නෙඩ් විස්මයෙන් කොඳුලේ ය.

"ආහ්! බොහොම හොඳයි. ඔබ එහෙනම් එයාව අඳුරගත්තා." සුළැඟිල්ලා කීවේ කාමරයේ දොර වසමිනි.

"මම බයේ හිටියෙ ඔයා කවදාවත් එන එකක් නෑ කියලා මගේ උතුමානනි." ඔහු ගේ පපුවට හේත්තු වී ඇය මිමිනුවා ය. "පෙටයර් මට හැම විස්තරයක්ම ගෙනාවා. එයා මට කිවුවා ආර්යායි කුමාරයායි අතර සිද්දවෙච්ච ප්‍රශ්න ගැන. මගේ කෙල්ලො දෙන්නා කොහොමද?"

"දෙන්නම තවම දුක් වෙනවා. ඒ වගේම දෙන්නම තවම තරහින් ඉන්නෙ. කැට් මට තේරෙන්නෙ නෑ. ඔයා මොනවද මේ කින්ග්ස් ලෑන්ඩින්ග්වල කරන්නෙ?මොකක්ද සිද්දවුනේ? ඒ බ්‍රැන් ද? එයා..." ඔහු ගේ මුවට නැගුනු වචනය 'මැරිලාද' යන්න වුවද ඔහුට එය කියා ගත නොහැකි විය.

"ඒ බ්‍රැන් ගැන තමා. ඒත් ඔයා හිතන දේ නෙවෙයි."

නෙඩ්ට අතරමං වූ සෙයක් දැනින. "එහෙනම් මොකක්ද? ඇයි ඔයා මෙහෙ ඉන්නෙ මගෙ වස්තුවෙ? මොකක්ද මේ තැන?"

"ඔබට පේන දේම තමා." සුළැඟිල්ලා කීවේ කවුළුව අසල වූ පුටුවකට බරවෙමිනි. "ගනිකා මඩමක්. ඔබට හිතාගන්ට පුළුවන්ද කැට්ලින් ටලී වගේ කෙනෙක් හංගන්ට මීට වඩා හොඳ තැනක්? කවුරුවත් විශ්වාස කරන්නෙ නෑ එයාව දැක්කත්. ඇත්තම කියනවා නම් මට තමා මෙතැන අයිති. ඒක නිසා ඒ වැඩ ටික සූදානම් කරන එක එච්චර අමාරුවක් වුනේ නෑ. මට වැඩියක්ම ඕන වුනේ කැට් මෙහෙ කින්ග්ස් ලෑන්ඩින්ග්වල ඉන්නවා කියන එක ලැනිස්ටර්ලාගෙන් වසන් කරන්ටයි."

"ඇයි?" නෙඩ් ඇසුවේ ය. ඊළඟ මොහොතේ ඔහු ඇයගේ දෑත් දුටුවේ ය. ඇය ඔහුව බදා සිටින නුහුරු විලාසය, ඇඟිලි වල ඇති ගැඹුරු රතු පැහැ තුවාල කැළැල්, වමතේ නැමිය නොහැකි අවසාන ඇඟිලි දෙක, මේ සියල්ල දුටුවේ ය. "ඔයාට තුවාල වෙලා." ඇගේ දෑත් සිය සුරතින් ගත් ඔහු ඒවා හරවා බැලී ය. "දෙයියනේ! මේවා බොහොම ගැඹුරු කැපුම්... කඩු පාරකින් වෙච්චි එකක්ද නැත්තං... කොහොමද මේක වුනේ මගේ ආර්යාවනි?"

සිය සළුව තුළින් කිනිස්සක් ඇද ගත් කැට්ලින් එය ඔහු ගේ අත්ල මත තැබුවා ය. "මේ කිනිස්ස එවලා තිබුනෙ බ්‍රැන්ගෙ උගුරු දණ්ඩ කපලා දාන්ට."

"ඒත්... කවුද... ඇයි එහෙම..."

ඇය ඔහු ගේ දෙතොල් මත ඇඟිල්ලක් තැබුවා ය. "ඉන්ට මම ඔක්කොම විස්තරේ කියන්නම් මගෙ වස්තුවෙ. ඔයා අහගෙන ඉන්ටකො. එතකොට ඉක්මන්."

ඉදින් ඔහු නිහඬව අසා සිටියදී ඇය සම්පූර්ණ විස්තරයම කීවා ය. පුස්තකාල කුළුණේ ගින්න, වාරිස්, සෙබළුන්, සුළැඟිල්ලා මේ හැම දෙයක්ම කීවා ය. ඇය කතාව නිම කල පසු තෝන්තු වී ගිය හිසින් යුතු එඩාර්ඩ් ස්ටාර්ක් කිනිස්සද අතැතිව මේසය අසලින් වාඩි විය.

'එහෙනම් බ්‍රැන් ගේ වෘකයා දරුවාගේ ජීවිතය බේරුවා' ඔහු නොපැහැදිළි මනසින් යුතුව කල්පනා කලේ ය. හිම මත වෘක පැටවුන් සොයාගත් දිනයේ ජොන් පැවසූයේ කුමක් ද? 'මේ පැටවු ඇවිල්ලා තියෙන්නෙ ඔබේ දරුවන්ට හිමි වෙන්ටමයි මගෙ උතුමානෙනි.' ඒත් ඔහු සන්සා ගේ පැටවා මරා දැම්මේය. ඌ කුමන වරදක් කලාට ද? ඔහුට මේ දැනෙන්නේ වරදකාරී හැඟීමක් ද නැතිනම් බියක් ද? මේ වෘක පැටවුන් සැබැවින්ම එවන ලද්දේ දෙවියන් විසින් නම් ඔහු මේ සිදු කර ඇත්තේ කවර නම් මුග්ධ ක්‍රියාවක් ද?

අසීරුවෙන් මුත් නෙඩ් කිනිස්ස හා එහි කතාව ගැන සිය සිත යොමු කලේ ය. "පුංචි යකාගෙ කිනිස්ස." නමුත් ඔහුට කිසිදු දෙයක් තේරුම් ගත හැකි වූයේ නැත. ඔහු ගේ අතැඟිලි මකරාස්ථියෙන් කල සිනිඳු මිට වටා තදින් එතුනි. ඔහු එයින් වැරෙන් මේසයට ඇන්න අතර තලය ලීය තුළ ගැඹුරට ඇනී ගියේ ය. "ඇයි ටිරියන් ලැනිස්ටර්ට බ්‍රැන්ව මරන්ට ඕන? ඒ දරුවා එයාට කිසිම හානියක් කරලා නෑ?"

"ස්ටාර්ක්ලාගෙ කණ් දෙක මැද්දෙ හිම ඇරෙන්ට වෙන මොකුත් නැද්ද?" සුළැඟිල්ලා ඇසී ය. "පුංචි යකා මේක තනියෙන් කලා වෙන්ට බෑ."

නැගිට සිටි නෙඩ් කාමරය තුළ එහා මෙහා සක්මන් කලේ ය. "රැජිණට මේකෙ සම්බන්ධයක් තියෙනවා නම්, නැත්තම් රජතුමාට... දෙයියන්ටම පෙනිච්චාවෙ. මට ඒක විශ්වාස කරන්ට බෑ." එනමුදු මේ වදන් පවසද්දී ඔහුට සිහිපත් වූයේ එක්තරා දිනෙක, උතුරුකරයේ සීතල උදෑසනකදී රොබර්ට් පැවසූ වදන් ය. ටාර්ගේරියන් කුමරිය ඝාතනය කිරීමට මිනීමරුවකු යැවීම ගැන ඔහු නෙඩ් හා දොඩා තිබින. ඔහුට රේගාර් ගේ බිළිඳු කුමරා මතක් විය. සුනුවිසුනු වී ගිය හිස්කබලෙන් යුතු කුඩා කුමරා සහ රජතුමා ඒ නොදුටුවාක් මෙන් ඉවත හැරුනු අයුරු. ඒ විලසින්ම එදා ඩැරී උතුමානන් ගේ සභා ශාලාවේදී ඔහු ඉවත හැරුනු අයුරු. අතීතයේ එක්තරා දිනෙක ලියානා බැගැපත්ව

ආයාචනා කල පරිද්දෙන්ම එදා සන්සා ආයාචනා කල අයුරු ඔහුට මේ දැනුත් ඇසෙන්නාක් මෙනි.

"ගොඩක් වෙලාවට අපට හිතන්ට පුළුවන් රජතුමා මේ ගැන දන්නෙ නෑ කියලා." සුළැඟිල්ලා කීය. "මේ පළමුවෙනි වතාව නෙවෙයි. අපේ හොඳ රොබර්ට් පුරුදුවෙලා ඉන්නවා එයාට දකින්ට ඕන නැති දේ දැක්කෙ නෑ වගේ අහක බලන් ඉන්ට."

මීට දිය යුතු පිළිතුරත් නෙඩ් සතුව නොවී ය. දෙපළු කර දමන ලද මස්කාරයා ගේ පුතා ගේ අහිංසක මුහුණ ඔහු ඉදිරියේ මැවී පෙනෙන්නට විය. රජතුමා මේ ගැන වදනකුදු නොදෙඩී ය. නෙඩ් ගේ හිස බමන්නට විය.

සුළැඟිල්ලා අලස ගමනින් මේසය අසලට අවුත් ලීයේ ඇමිනී තිබුනු කිනිස්ස ගලවා ගත්තේ ය. "අනිත් එක, මේ සැක කිරීම වුනත් රාජද්‍රෝහී ක්‍රියාවක්. රජතුමාව සැක කරනවා කියන්නෙ, ඔබේ කටින් වචන ටික පිටවෙන්ටත් කලින් ඔබට සිද්දවෙනවා ඉලියන් පේයින් එක්ක හැප්පෙන්ට. රැජිණ... ඔබට සාක්කි හොයාගන්ට පුළුවන් වුනොත්.. ඔබට පුළුවන් වුනොත්, රොබර්ට් ඔබට ඇහුම්කන් දුන්නොත්.. එහෙම වුනොත් සමහරවිට.."

"අපට සාක්කි තියෙනවා." නෙඩ් කීය. "අපට මේ කිනිස්ස තියෙනවා."

"මේක? බොහොම ලස්සන වානේ කෑල්ලක්. ඒ වුනාට මේක දෙපැත්තම කැපෙනවා මගේ උතුමානනි. කිසිම සැකයක් නෑ පුංචි යකා දිවුරයි එයා වින්ටර්ෆෙල්වල ඉන්දැද්දි මේක නැතිවුනා නැත්තං හොරකම් කලා කියලා. එයා කුලියට ගත්ත මිනීමරුවාත් මැරිච්ච එකේ කවුද ඉන්නෙ එයා කියන්නෙ බොරුයි කියලා කියන්ට? මම දෙන උපදේශය මේක ගඟට විසිකරලා දාලා එහෙම එකක් තිබුනා කියලා අමතක කරලා දාන්ට කියලයි."

නෙඩ් ඔහු දෙස සීතල බැල්මක් හෙලුවේ ය. "බේලිෂ් උතුමානනි. මම වින්ටර්ෆෙල්වල ස්ටාර්ක් කෙනෙක්. මගේ පුතා අබ්බගාතයෙක් වෙලා වැටිලා ඉන්නවා. සමහරවිට එයා මැරෙන්ට වැටිලා ඉන්නවා වෙන්ටත් පුළුවන්. අපට හිම ගොඩක ඉඳලා හම්බවුන වෘක පැටියෙක් නොවෙන්ට එයයි කැට්ලිනුයි දෙන්නම මෙලහට මැරිලා. ඔබ ඇත්තටම විශ්වාස

කරනවානම් මට ඒක අමතක කරලා දාන්ට පුළුවන්ය කියලා, මට කියන්ට තියෙන්නෙ ඔබ එදා මගේ සහෝදරයත් එක්ක සටන් කරන්ට ආ දවසේ වගේම තාමත් මෝඩයි කියලයි."

"මම මෝඩයෙක් වෙන්ට පුළුළුන් ස්ටාර්ක්... ඒ වුනත් මම තාමත් ජීවතුන් අතර ඉන්නවා. ඔබේ සහෝදරයා දැන් අවුරුදු දාහතරක් තිස්සෙ එයාගෙ සීතල මිනී වලේ දිරාපත් වෙනවා. ඔබටත් ඕන නම් එයාගෙ පැත්තකට වෙලා දිරාපත් වෙන්ට, මම ඒක වළක්වන්ට යන්නෙ නෑ. ඔබට ඕන ඒක නම්, බොහොම ස්තූතියි, මම ඔබේ පැත්තට නැවිත් ඉන්නම්."

"මම, මගේ කැමැත්තෙන්, මගේ පැත්තට එක්කහු කරගන්න අවසානම කෙනා ඔබයි බේලිෂ් උතුමානනි."

"ඔබ මට බොහොම තදින් රිද්දනවා." සුළැඟිල්ලා හදවත මතුයෙහි අතක් තැබී ය. "මට හැමදාමත් දැනුන දෙයක් තමා ස්ටාර්ක්ලා කියන්නෙ හරිම හිරිහැරදායක කට්ටියක් කියන එක. ඒ වුනත් මට තේරුම් ගන්ට බැරි මොනවදෝ මන්දා හේතු ගොඩක් නිසා කැට් ඔබට ආදරය කරනවා. එයා වෙනුවෙන් මම ඔබව පණ පිටින් තියාගන්ට උත්සාහ කරන්නම්. මට පිළිගන්ට වෙනවා ඒක මහ මෝඩ උත්සාහයක්. ඒ වුනත් මට කිසිමදාක ඔබේ බිරිඳට කිසිම දේකට බෑ කියන්ට බෑ."

"ජොන් ඒරින්ගෙ මරණය ගැන අපට තියෙන සැකය මම පෙටයර්ට කිවුවා." කැට්ලින් කීවා ය. "එයා පොරොන්දු වුනා ඇත්ත මොකක්ද කියලා හොයාගන්ට ඔයාට උදවු කරන්ට."

මේ ප්‍රවෘත්තිය එඩාර්ඩ් ස්ටාර්ක් ගේ සිතට සතුටක් ගෙන ආවේ නැත. එනමුදු සත්‍යවශයෙන්ම බැලුවහොත් ඔවුන්ට උදවු උවමනා වී තිබුනු අතර එක් කලෙකදී සුළැඟිල්ලා කැට්ලින්ට සහෝදරයකු තරම් කිට්ටුවන්තයකු වී සිටියේ ය. තමා විසින් ගර්හා කොට සලකනු ලබන මිනිසුන් සමග එකට එක්වී වැඩ කිරීමට නෙඩ්ට බලකෙරුනු පළමු අවස්ථාව මෙය නොවේ. "හොඳයි." නෙඩ් කීවේ කිනිස්ස සිය බඳපටියේ රුවා ගනිමිනි. "ඔයා වාරිස් ගැනත් කිවුවා. ඒ නපුංසකයත් මේ හැම දෙයක් ගැනම දන්නවද?"

"මගේ කටින් නම් දැනගන්ට ලැබුනේ නෑ." කැට්ලින් කීවා ය. "ඔයා කසාද බැන්දෙ මෝඩයෙක් නෙවෙයි එඩාර්ඩ් ස්ටාර්ක්. ඒ වුනාට වාරිස්ට තියෙනවා අරුම පුදුම හැකියාවක් අනිත් මිනිස්සු නොදන්න දේවල් දැනගන්ට. එයාට මොකක් හරි මායා බලයක් තියෙනවා නෙඩ්. මම දිවුරනවා."

"එයාට හැමතැනම ඔත්තුකාරයො ඉන්නවා. ඒක කවුරුත් දන්න දෙයක්නෙ." නෙඩ් කීවේ ඇගේ මතය බැහැර කරමිනි.

"ඒක ඊට වඩා වැඩි දෙයක්." කැට්ලින් තිර ස්වරයෙන් කීවා ය. "සෙර් රඩ්‍රික් සෙර් ආරොන් සැන්ටගාර්ව හොර රහසෙම මුනගැහිලා කතා කලා. ඒ වුනත් මකුළුවා කොහොමහරි දැනගත්තා ඒ කතා වුන දේ ගැන. මට බයයි ඒ මිනිහා ගැන."

සුළැඟිල්ලා සිනාසුනේ ය. "වාරිස් උතුමානන් ගැන වද වෙන එක මට බාරදෙන්ට ආර්යාවනි. මට පුළුවන් මිනිහව අල්ලෙ නටවන්ට. මම ඔබ නම් වාරිස්ට වඩා මම වදවෙන්නෙ ලැනිස්ටර්ලා ගැනයි."

ඒ බව නෙඩ්ට කියාදීමට සුළැඟිල්ලා අවශ්‍ය නොවිනි. ගංගා ත්‍රිශූලයේදී ආර්යාව සොයා ගත් දිනය ඔහු ගේ සිහියට නැගින. 'අපට වෘකයෙක් ඉන්නවා' යැයි මෘදු ස්වරයෙන් තෙපලද්දී රැජිණගේ මුහුණේ තිබුනු බැල්ම, මස්කාරයා ගේ පුතා වූ මයිකා, ජොන් ඒරින් ගේ හදිසි මරණය, බ්‍රැන් වැටී සිටි ආකාරය, පිස්සු රජා ඒරිස් ටාර්ගේරියන් සිය සිහසුන් කාමරය තුළම මියගොස් සිටි අන්දම යන මේ සියල්ල ඔහු ගේ සිහියට නැගින. "මගේ ආර්යාවනි." ඔහු කැට්ලින් දෙසට හැරෙමින් කීවේ ය. "ඔයාට තවදුරටත් මෙහෙ කරන්ට දෙයක් ඉතුරුවෙලා නෑ. මට ඕන ඔයා ඉක්මනින්ම වින්ටර්ෆෙල්වලට ආයෙමත් පිටත් වෙලා යන්ටයි. එක මිනීමරුවෙක් ආවා කියන්නෙ තව මිනීමරුවො එන්ට පුළුවන් කියන එකයි. බ්‍රැන් මැරෙනවා දකින්ට ඕන වුනේ කාට වුනත් එයාලා ඉක්මනටම දැනගනීවි දරුවා තාමත් ජීවතුන් අතර කියලා."

"මම හිතාගෙන හිටියෙ මගේ කෙල්ලො දෙන්නව බලන්ට..."

"ඒක ලොකු මෝඩ වැඩක්." සුළැඟීල්ලා කීවේ ය. "රතු බලකොටුවෙ හැමතැනම ඇස් තියෙනවා. අනික දරුවො දන්නෙ නෑ මොනාද කියන්ට ඕන මොනාද කියන්ට ඕන නැත්තෙ කියලා."

"එයා කියන්නෙ ඇත්ත මගේ වස්තුව." නෙඩ් කීවේ ඇයව වැළඳගනිමිනි. "සෙර් රඩ්‍රික් එක්ක ආපහු වින්ටර්ෆෙල්වලට යන්ට. මම කෙල්ලො දෙන්නව බලාගන්නම්. ඔයා ගෙදර ගිහිල්ලා අපේ පුතාලව පරෙස්සමින් බලාගන්ට."

"ඔබ කියන විදියට මගේ උතුමානනි." ඇය හිස එසවූ අතර නෙඩ් ඇගේ දෙතොල් සිප ගත්තේ ය. ඇගේ තුවාල වුනු අතැඟිලි දැඩිව ඔහුගේ පිට බදාගත්තේ සදහටම සිය දෑත් තුළ ඔහුව සඟවා රැකවරණය දීමට මෙනි.

"උතුමානනුයි ආර්යාවයි කැමතිද නිදන කාමරයක් පාවිච්චි කරන්ට?" සුළැඟිල්ලා ඇසුවේ ය. "ඒ වුනත් මම ඔබට අනතුරු අඟවන්ට කැමතියි ස්ටාර්ක්. මෙහෙදි අපි ඒ වගේ දේ වෙනුවෙන් ගාස්තුවක් අය කරනවා."

"අපට ටික මොහොතක් තනිවෙන්ට දෙන්ට. එච්චරයි මම ඉල්ලන්නෙ." කැට්ලින් කීවා ය.

"හොඳයි." සුළැඟිල්ලා දොර දෙසට ගියේ ය. "ගොඩක් වෙලා ගන්ට එපා. රජතුමාගෙ අතයි මමයි බලකොටුවෙ නැහැයි කියලා කවුරුහරි දැනගන්ට කලින් අපි පිටත් වෙන්ට ඕන."

ඔහු වෙත ගිය කැට්ලින් සිය දෑතින් ඔහු ගේ දෑත් අල්ලා ගත්තා ය. "ඔබ මට කරපු උදවු මම අමතක කරන්නෙ නෑ පෙටයර්. ඔබේ සෙබළු මාව හොයාගෙන ආපු වෙලාවෙ මම දැනගෙන හිටියෙ නෑ මම යන්නෙ යාළුවෙක් ගාවටද නැත්තම් සතුරෙක් ගාවටද කියලවත්. මට මුනගැහුනෙ යාළුවෙක්. නෑ, මට මුනගැහුනෙ මට නැතිවුනයි කියලා මම හිතාගෙන හිටපු සහෝදරයෙක්."

පෙටයර් බේලිෂ් මඳ සිනහවක් පෑවේ ය. "මට ඇඹුම් යන්ට එනවා වගේ මගේ ආර්යාවනි. කාටවත් කියන්ට එපා. මම අවුරුදු ගානක් රාජසභාවට ඒත්තු ගන්නන්ට හැදුවෙ මම බොහොම නපුරු, කෲර කෙනෙක් කියලයි. ඒ ඔක්කොම උත්සාහය වතුරෙ යනවා දකින්ට මට ඕන නෑ."

ඔහු ගේ මේ වදන්වලින් බිඳක්වත් නෙඩ් විශ්වාස නොකලේ ය. එනමුදු සිය ස්වරය ආචාරශීලී මට්ටමක පවත්වා ගැනීමට ඔහු උත්සාහ කලේ ය. "ඔබට මගෙත් ස්තූතිය බේලිෂ් උතුමානනි."

"ආහ්! අන්න ඒක නම් හරිම වටිනා දෙයක්." සුළැඟිල්ලා කීවේ දොරින් පිටවෙමිනි.

ඔවුන්ට පිටුපසින් දොර වැසුනු පසු නෙඩ් සිය බිරිඳ දෙසට හැරුනේ ය. "ඔයා ගෙදර ගිය ගමන්ම මගේ මුද්‍රාව යටතේ පනිවුඩ යවන්ට හෙල්මන් ටෝල්හාර්ට්ටයි, ගැල්බට් ග්ලවර්ටයි. ඒ දෙන්නම දුනුවායො සීය ගානෙ එකතු කරලා මෝට් කේය්ලින් බලකොටුවට යවන්ට ඕන. හොඳ මුරණ්ඩු දුනුවායන් දෙසීයකට පුළුවන් හමුදාවක් ආවත් 'බෙල්ල' අල්ලන් ඉන්ට. මැන්ඩර්ලි උතුමානන්ට දන්වන්ට ධවල වරායෙ තියෙන ලොකු පොඩි බලකොටු හැම එකක්ම අලුත්වැඩියා කරලා ආරක්ෂාව තර කරන්ටයි කියලා. ඒත් එක්කම මට ඕන අද ඉඳන් තියන් ග්‍රේජෝයි ගැන ඇහැ ගහගෙන ඉන්ට. යුද්ධයක් ඇතිවුනොත් අපට එයාගෙ තාත්තාගෙ නැව් ටික උවමනා වෙනවා."

"යුද්ධයක්?" කැට්ලින් ගේ මුහුණේ ඇඳුනු බිය පැහැදිලිව විද්‍යාමාන විය.

"ඒක එහෙම නොවෙන්ටත් පුළුවන්." නෙඩ් ඇයට පොරොන්දු වූයේ එසේ නොවේවායැයි පතමිනි. ඔහු නැවතත් ඇයව සිය දෝතට මැදිකර ගත්තේ ය. "දුර්වල තැනක් දැක්කොත් ලැනිස්ටර්ලාගෙන් කිසිම සමාවක් හම්බවෙන්නෙ නෑ. ඒරිස් ටාර්ගේරියන් ඒක තේරුම් ගත්තා, ඒත් අවාසනාවට එතකොට පරක්කු වැඩියි. ඒ වුනත් මම හිතන්නෙ නෑ රාජධානියෙ බලය ඔක්කොම තමන් අතට ගන්නකම් එයාලා උතුරට පහරදෙන්ට ලෑස්ති වෙයි කියලා. ඒක එයාලට නොලැබෙන තැනට තමා අපි වැඩ කරන්ට ඕන. කිසිම දෙයක් වෙනස් නොවිච්ච ගානට මම දිගටම මේ කෝලම නටන්නම්. අමතක කරන්ට එපා ඇයි මම මෙහාට ආවෙ කියලා මගේ වස්තුව. ජොන් ඒරින්ව මරලා දැම්මෙ ලැනිස්ටර්ලායි කියලා මට සාක්කි හොයාගන්ට පුළුවන් වුනොත්..."

සිය දැත් තුළ කැට්ලින් වෙවුලනු නෙඩ්ට දැනින. "එහෙම වුනොත්?" ඇය ඇසුවා ය. "ඊට පස්සෙ මොකක්ද කරන්නෙ මගෙ වස්තුව?"

වඩාත්ම අන්තරාදායක කොටස එය වනු ඇති බව නෙඩ් දැන සිටියේ ය. "හැම යුක්තියක්ම ගලන් එන්නෙ රජතුමාගෙනුයි." ඔහු ඇයට කීවේ ය. "ඇත්ත මොකක්ද කියලා මම හොයාගත්තට පස්සෙ මම රොබර්ට් මුනගැහෙන්ට යන්ට ඕනමයි." ඒත් එක්කම මම ප්‍රාර්ථනා කරන්ට ඕන රොබර්ට් තාමත් මම දැනගෙන හිටපු මිනිහමයි කියලා. මම ප්‍රාර්ථනා කරන්ට ඕන මම හිතා ඉන්න අන්දමට රොබර්ට් වෙනස් වෙලා නැහැයි කියලා. ඔහු නිහඬවම තමාටම තෙපලුවේ ය.

Petyr Baelish: “The master of coin finds the money. The king and the Hand spend it.”

ටිරියන් 03-1

"ඔබට හොඳටම විශ්වාසද මෙච්චර ඉක්මනට අපිව දාලා ආපහු යන්ට ඕනයි කියලා?" ප්‍රධාන අණදෙන නිළධාරිතුමා ඇසුවේ ය.

"කාලෙ පහුවෙලා මෝර්මන්ට් උතුමානනි." ටිරියන් පිළිතුරු දුනි. "මගේ සහෝදරයා ජේමි කල්පනා කරනවා ඇති මට මොකද වුනේ කියලා. එයා හිතයි නිශා රැකුමට බැඳෙන්ටයි කියලා ඔබ මට ඒත්තු ගැන්නුවා කියලා."

"මට එහෙම කරන්ට පුළුවන් නම් කොච්චර දෙයක්ද?" කකුළු අඬුවක් අතට ගත් මෝර්මන්ට් එය අතින් පොඩි කලේය. කෙතරම් මහලු මිනිසකු වුවද ඔහු තවමත් වලසෙකු මෙන් ශක්ති සම්පන්න විය. "ඔබ බොහොම උපාය දක්ෂ මනුස්සයෙක් ටිරියන්. ඔබ වගේ මිනිස්සු අපට ප්‍රාකාරෙට බොහොම තදින් උවමනා කරනවා."

ටිරියන් නියෙවුවේ ය. "එහෙමනම් මම රාජධානි සප්තකය පීරලා, කුරුමිට්ටො හොයලා, නැවක පටවලා ඔබලාට එවන්නම් මෝර්මන්ට් උතුමානනි." අවට සිටි සියල්ලන් සිනාසෙද්දී ඔහු කකුළු අඬුවක මාංසය සූප්පු කර තවත් එකක් ගැනීමට අත දිගු කලේ ය. මේ රසවත් මාංසල කකුළුවන් අද උදෑසන නැගෙනහිර කුළුණ වෙතින් ලැබුනකි.

මේසය වටා සිටි පිරිස අතරින් සිනාවක් නොපෑ එකම පුද්ගලයා සෙර් ඇලිසර් තෝර්න් විය. "ලැනිස්ටර් අපට සමච්චල් කරනවා."

"ඔබට විතරයි සෙර් ඇලිසර්." ටිරියන් කීවේ ය. මෙවර මේසය වටා නැගුනු සිනාහඬ වෙනස්ම එකක් විය.

තෝර්න් ගේ කළු පැහැ දෑස් පිළිකුල මුසු බැල්මකින් ටිරියන් දෙසට එල්ල වින. "මිනිහෙකුගෙන් බාගයක්වත් උස නැති වුනාට ඔබට බොහොම නිර්භීත දිවක් නම් තියෙනවා. කොහොමද අපි දෙන්නා සෙණ්ඩුවාලුව පැත්තෙ ගියොත්?"

"ඇයි? මෙතනනෙ කකුළුවො තියෙන්නෙ?"

මේ ප්‍රකාශය අන්‍යයන් වෙතින් තවත් කොක්හඬලෑම් මතුකරලන්නට සමත් විය. සෙර් ඇලිසර් නැගිට සිටිය අතර අමනාපය නිසා ඔහු ගේ මුව ඇද වී තිබින. "ආයුධයකුත් අතේ ඇතිව ඇවිල්ලා ඔය විහිළු කලොත් කොහොමද?"

ටිරියන් සිය සුරත දෙස බැලුවේ ය. "ඇයි! ඇත්තටම මගේ අතේ ආයුධයක් තියෙනවා සෙර් ඇලිසර්. අවාසනාවට ඒක ගෑරුප්පුවක් විතරයි. අපි දෙන්නා ද්වන්ද්ව සටනක් කරමුද?" සිය පුටුව මත සිටගත් ටිරියන් කුඩා ගෑරුප්පුවෙන් තෝර්න් ගේ පපුවට සෙමින් අනින්නට පටන් ගත්තේ ය. ශාලාව පුරා සිනා හඬින් පිරී ගියේ ය. සිනාව නිසා අණදෙන නිළධාරිතුමා ගේ ආහාර ඉස්මොල්ලේ ගිය අතර ඔහු ගේ කපුටා ද කවුළුව උඩ සිට කරව් කරමින් මීට සහභාගි වන්නට විය. "ද්වන්ද්ව සටන! ද්වන්ද්ව සටන! ද්වන්ද්ව සටන!"

සෙර් ඇලිසර් තෝර්න් මෝල්ගසක් ගිල්ලාක් මෙන් දරදඬු අයුරින් කාමරයෙන් පිටතට ඇවිද ගියේ ය.

මෝර්මන්ට් තවමත් සිය හුස්ම අල්ලා ගැනීමට වෑයම් කරමින් සිටියේ ය. ටිරියන් ඔහු ගේ පිට මතට වැරෙන් පහර කිහිපයක් එල්ල කලේ ය. "තරගයේ වාසිය ජයග්‍රාහකයාට යන්ට ඕන." ඔහු කීවේ ය. "ඒ නිසා තෝර්න්ගෙ කකුළුවො පංගුව මටයි අයිති වෙන්ට ඕන."

අන්තිමේදී අණදෙන නිළධාරිතුමා යථා තත්ත්වයට පත් වූ බැව් පෙනින. "ඔබ බොහොම නපුරු මනුස්සයෙක්. අපේ හොඳ සෙර් ඇලිසර්ව ඔහොම අවුස්සන්ට." ඔහු චෝදනා මුඛයෙන් පැවසී ය.

අසුනේ වාඩි වූ ටිරියන් වයින් උගුරක් බීවේ ය. "කෙනෙක් තමන්ගෙ පපුවෙ ඉලක්කයක් ඇඳ ගෙන එහා මෙහා යනවානම් එයා බලාපොරොත්තුවෙන් ඉන්ට ඕන කොයි වෙලාවක හරි කවුරුහරි කෙනෙක් එයාට ඊයකින් විදියි කියලා. ඔබලා ගේ ඔය සෙර් ඇලිසර්ට වඩා හාස්‍යය දකින්ට පුළුවන් මැරුන මිනිස්සු මම දැකලා තියෙනවා."

"එහෙමමත් නෙවෙයි." ප්‍රධාන නිවාස බාරකරු වූ බොවෙන් මාර්ෂ් සිය විරුද්ධත්වය ප්‍රකාශ කලේ ය. ඔහු දෙළුම් ගෙඩියක් මෙන් තර, රතු පුද්ගලයකු විය. "එයා පුහුණු කරන කොල්ලන්ට මිනිහා දාලා තියෙන විකට නම් ඔබ අහන්ට ඕන."

ටිරියන් මේ සමහර විකට නම් අසා තිබින. "මම කැට තියනවා ඒ කොල්ලොත් මිනිහට හොඳ හොඳ විකට නම් පදබැඳලා ඇති. ඔබලා ගේ ඇස් වල තියෙන දූවිලි පිහදාලා බලන්ට උතුමනි. සෙර් ඇලිසර් ගැලපෙන්නෙ ඔබලාගෙ ඉස්තාල සුද්ද කරන්ටයි. ඔබලාගෙ තරුණ සෙබළු පුහුණු කරන්ට නෙවෙයි."

"අපට ඉස්තාල කොල්ලන්ගෙන් කිසිම අඩුවක් නෑ." මෝර්මන්ට් උතුමා මැසිවිලි නැගුවේ ය. "මේ දවස්වල අපට එවන්නෙම ඒ වගේ අය විතරයි ජේන හැටියට. ඉස්තාල කොල්ලොයි, හොරුයි, ස්ත්‍රී දූෂකයොයි. සෙර් ඇලිසර් කියන්නෙ නයිට්වරයෙක්. මම ප්‍රධාන අණදෙන නිළධාරියා වුනාට පස්සෙ නිශා රැකුමට බැඳිච්ච නයිට්වරු ටික දෙනාගෙන් එක්කෙනෙක්. එයා කින්ග්ස් ලැන්ඩින්ග් සටනෙදි බොහොම නිර්භීතව සටන් කලා."

"වැරදි පැත්තෙ." සෙර් ජැරමි රයිකර් වියළි ඇනුම්පදයක ස්වරයෙන් කීවේ ය. "මමත් ඒ යුද්ධෙදි එයාගෙ පැත්තකින් සටන් කලා. ටයිවින් ලැනිස්ටර් අපට බොහොම හොඳ තෝරාගැනීමක් තමා දුන්නෙ. නිශා රැකුමට බැදෙන්ට, නැත්තං හැන්දෑ වෙන්ට කලින් අපේ ඔළු ගෙඩි ටික රිටක අමුනනවා කිවුවා. මම මේ අමනාපයකින් කියනවා නෙවෙයි ටිරියන්."

"කිසිම ප්‍රශ්නයක් නෑ සෙර් ජැරමි. මගේ තාත්තා හරිම ආසයි රිටි වල ගහපු ඔළු ගෙඩිවලට. විශේෂයෙන්ම එයාව කොයියම්ම විදියකින් හරි අමනාපයට පත් කරපු අයගෙ ඔළු ගෙඩිවලට. අනෙක ඔබේ වගේ හරිම මහේශාක්‍ය මූනක්. එයා හිතන්ට ඇති ඒක රාජ ද්වාරයට ඉහළින් පවුරේ හයි කලාම හරි ලස්සනට තියෙයි කියලා."

"බොහොම ස්තූතියි!" සෙර් ජැරමි කර්කශ උපහාසාත්මක සිනාවකින් යුතුව පිළිතුරු දුන්නේ ය.

අණදෙන නිළධාරි මෝර්මන්ට් උගුර පෑදුවේ ය. "සමහර වෙලාවට මට හිතෙනවා සෙර් ඇලිසර් ඔබ ගැන කිවුව දේ ඇත්තක් කියලා ටිරියන්. ඔබ අපිවත්, මෙතන අපි කරන උදාර කාර්යයත් සමච්චලයට ලක් කරනවා."

ටිරියන් දෙවුර ඇකිළී ය. "අපි හැමෝම සැරින් සැරේ සමච්චලයට ලක්වෙන්ට ඕන මෝර්මන්ට් උතුමානනි. එහෙම නැත්තං අපි අපිව බොහොම බැරෑරුම් විදියට ගන්ට පටන් ගන්නවා. කරුනාකරලා තව වයින් ටිකක්." ඔහු සිය කුසලාන එසෙවුවේ ය.

රයිකර් ඔහු ගේ කුසලාන පුරවද්දී බොවෙන් මාර්ෂ් කතාව ඇරඹී ය. "පුංචි මිනිහෙක් වුනාට ඔබට ලොකු පිපාසයක් තියෙන්නෙ."

"ආහ්! මම නම් හිතන්නෙ ටිරියන් උතුමානන් බොහොම ලොකු මිනිහෙක් කියලා." මේස්ටර් ඒමන් මේසය ඈත කෙලවරේ වූ සිය අසුනේ හිඳ කීවේ ය. ඔහු මෘදු ස්වරයෙන් කතා කල අතර මහලු මිනිසා කියන දේ මැනැවින් ශ්‍රවනය කිරීම පිණිස නිශා රැකුමේ උසස් නිළධාරින් සැවොම නිහඬ වූහ. "මම හිතන්නෙ එයා මේ ලෝකාන්තයේ ඉන්න අපි අතරට ආපු යෝධයෙක් කියලා."

ටිරියන් ආචාරශීලී අයුරින් පිළිතුරු දුන්නේ ය. "මාව ගොඩක් නම්වලින් අමතලා තියෙනවා මගේ උතුමානනි. ඒ වුනත් යෝධයෙක් කියන එක නම් එහෙම ලේසියෙන් ඇහුන දෙයක් නෙවෙයි."

මේස්ටර් ඒමන් සිය අන්ධ, කිරි-සුදු පැහැ දෑස් ටිරියන් දෙසට හැරෙවුවේ ය. "ඒ කොහොම වුනත් මම හිතන්නෙ මම කියපු දේ ඇත්තක් කියලයි."

පළමු වතාවට මීට පිළිතුරු වශයෙන් කියා ගැනීමට සුදුසු යමක් නොමැතිව ටිරියන් වද වූයේ ය. අන්තිමේදී ඔහු ආචාරශීලී අයුරින් හිස නමා මෙසේ කීය. "ඔබ බොහොම කරුනාවන්තයි මේස්ටර් ඒමන්."

අන්ධ මිනිසා මඳ සිනාවක් පෑවේ ය. ඔහු වසර සියයකටත් වඩා වයසැති කුඩා, රැළි වැටුනු සිරුරින් හා තට්ට හිසකින් යුතු මහල්ලෙකු විය. ඔහු කර වටා පැළැඳි මේස්ටර් දම්වැල බුරුල් අයුරින් ගෙල වටා එල්ලුනි. "මාව ගොඩක් නම්වලින් අමතලා තියෙනවා මගේ උතුමානනි. ඒ වුනත් කරුනාවන්ත කියන එක නම් එහෙම ලේසියෙන් ඇහුන දෙයක් නෙවෙයි." මේ වතාවේ ටිරියන් කොක්හඬලෑම ඇරඹුවේ ය.

බොහෝ වේලාවකට පසු, ආහාර අනුභවයෙන් අනතුරුව පිරිස පිටව ගිය පසු, මෝර්මන්ට් හා ටිරියන් ගිනිඋඳුන සමීපයෙහි අසුන් ගෙන උණුසුම් මත්පැන් බඳුනක් පානය කරමින් උන්හ. "මේ උතුරෙදි රජමාවත කියන්නෙ ටිකක් පරෙස්සම් මදි තැනක්." මෝර්මන්ට් කීවේ ය.

"මගෙත් එක්ක ජයික්, මොරෙක් දෙන්නම යනවනෙ. අනිත් එක යොරේනුත් ආපහු දකුණට යනවා."

"යොරේන් කියන්නෙ එක මිනිහෙක් විතරයි. නිශා රැකුම ඔබව වින්ටර්ෆෙල්වලට යනකම් පිරිවරා යන්ට ඕන." මෝර්මන්ට් කිසිදු වාදයකට ඉඩක් නොමැති ස්වරයෙන් කීවේ ය. "මම ඔබට මිනිස්සු තුන්දෙනෙක් දෙන්නම්."

"ඔබ බලකරනවා නම් ඉතින් කමක් නෑ මගේ උතුමානනි. අර ස්නොව් කොල්ලව එවුවොත් මොකද? එයා සතුටුවෙයි සහෝදරයො ටික දැකගන්ට අවස්ථාවක් ලැබුනොත්."

මෝර්මන්ට් දෙබැම ඇකිළී ය. "ස්නොව්? ආහ්! ස්ටාර්ක් අවජාතකයා. මම හිතන්නෙ නෑ. අලුත් කොල්ලො එයාලා කලින් ගතකරපු ජීවිතෙයි, සහෝදරයොයි, අම්මලායි හැමදේම අමතක කරලා දාන්ට පුරුදුවෙන්ට ඕන. ආයෙමත් ගෙදර ගියා කියන්නෙ ඒ මතක ඔක්කොම අලුත් වෙනවා. මම දන්නවා මේ දේවල් ගැන. මගේම ලේ නෑයො පවා... මගේ පුතා අපකීර්තියට පත්වුනාට පස්සෙ මගෙ නංගි මේජ් තමා දැන් වලස් දූපත පාලනය කරන්නෙ. මට ඉන්නවා මම කවදාවත් දැකලා නැති ලේලිලා." ඔහු මත්පැන් උගුරක් තොලගෑවේ ය. "අනිත් එක, ජොන් ස්නෝව් කියන්නෙ තාම පොඩි කොල්ලෙක්. ඔබව ආරක්ෂාකාරීව එක්කරන් යන්ට උවමනා කරන්නෙ ශක්තිමත් සෙබළු තුන්දෙනෙක්."

"ඔබේ මේ සැලකිල්ල මට හරියට හිතට වැදුනා මෝර්මන්ට් උතුමානනි." සැර මධ්‍යසාරය නිසා ටිරියන් ගේ හිස බමන්නාක් මෙන් දැනින. එනමුදු නාකි වලහා ඔහුගෙන් යමක් බලාපොරොත්තු වන බව වටහා නොගැනීමට තරම් ඔහු බීමත් නොවී ය. "මම හිතනවා ඔබේ මේ කරුනාවට ප්‍රතිඋපකාර කරන්ට මට අවස්ථාවක් ලැබෙයි කියලා."

"ඔබට පුළුවන්." මෝර්මන්ට් ඍජුවම පැවසී ය. "ඔබේ සහෝදරිය රජතුමාගෙ බිසව. ඔබේ සහෝදරයා උසස් මට්ටමේ නයිට්වරයෙක්. ඔබේ තාත්තා තමා මේ රාජධානි සප්තකයෙ ඉන්න බලවත්ම වංශාධිපතියා. අපි වෙනුවෙන් එයාලට කතා කරන්ට. එයාලට කියන්ට අපට උවමනා වෙලා තියෙන දේ. ඔබ ඔබේ දෑහින්ම දැක්කනෙ මගෙ උතුමානනි. නිශා රැකුම ටිකෙන් ටික පණ අදිමිනුයි ඉන්නෙ. අපේ ශක්තිය දැන් මිනිස්සු දාහකටත් අඩුයි. මෙතන හයසීයක් විතර, සෙවනැලි කුළුණෙ දෙසීයක් විතර, නැගෙනහිර කුළුණෙ ඊටත් අඩුවෙන්. එයිනුත් තුනෙන් එකක් විතර තමා සටන් කරන්ට පුළුවන් සෙබළු ඉන්නෙ. ප්‍රාකාරය ලීග සීයක් දිගයි. පොඩ්ඩක් හිතන්ට ඒ ගැන. බැරිවෙලාවත් ප්‍රහාරයක් ආවොත් ප්‍රාකාරෙ හැම හැතැප්මකටම මිනිස්සු තුන්දෙනයි ඉන්නෙ."

"තුනයි තුනෙන් එකයි." ටිරියන් ඇනුමක් යවමින් පැවසී ය.

මෝර්මන්ට්ට ඔහු කී දේ ඇසුනු බවක් නොපෙනින. මහලු මිනිසා සිය දෑත් ගිනිඋඳුන දෙසට දිගු කොට උණුසුම් කරගත්තේ ය. "මම බෙන්ජින් ස්ටාර්ක්ව යැවුවා යොන් රොයිස්ගෙ පුතාව හොයාගන්ට. ඒ කොල්ලා එයාගෙ පළමුවෙනි මුරසංචාරයෙදිම අතුරුදහන් වුනා. එයා නවකයෙක්. ඒත් එයා බලකරලා ඉල්ලලා හිටියා එයාට අණ දෙන්ට ඉඩදෙන්ටය කියලා, නයිට්වරයෙක් විදියට ඒක එයාගෙ අයිතිය කියලා. මට එයාගෙ තාත්තව තරහ කරගන්ට ඕන වුනේ නෑ. ඉතින් ඒ නිසා මම ඒකට ඉඩ දුන්නා. මම එයත් එක්ක බලකායෙ හිටපු හොඳම සෙබළු දෙන්නෙක්ව යැවුවා. ඒක තමා මම කරපු ලොකුම මෝඩ වැඩේ."

"මෝඩයා." කපුටා ද පුනරුච්චාරණය කලේ ය. ටිරියන් ඉහළ බැලුවේ ය. කපුටා ද පිහාටු පුම්බමින් සිය කළු පැහැ දෑසින් ඔහු දෙස බලා සිටියේ ය. "මෝඩයා." ඌ නැවතත් කෑ ගැසුවේ ය.

මෝර්මන්ට්ට කපුටා ගේ හිරිහැරය දැනුනු බවක් නොපෙනින. "ගැරඩ් මටත් වඩා නාකියි. මටත් වඩා කල් ප්‍රාකාරෙ ඉඳලා තියෙනවා." ඔහු දිගටම කතා කරගෙන ගියේ ය. "ඒ වුනත් ජේන විදියට නම් මිනිහා දිවුරුම අත ඇරලා පැනලා ගිහිල්ලා. ඒ මිනිහා එහෙම දෙයක් කරයි කියලා මට නම් විශ්වාස කරන්ටත් බෑ. ඒ වුනත් එඩාර්ඩ් උතුමානන් වින්ටර්ෆෙල්වල ඉඳන් ඒ මිනිහගෙ ඔළුගෙඩිය එවලා තිබුනා. රොයිස් ගැන කිසිම ආරංචියක් නෑ. එකෙක් පැනලා ගිහිල්ලා, දෙන්නෙක් අතුරුදන් වෙලා. දැන් බෙන් ස්ටාර්කුත් ආගිය අතක් නෑ." ඔහු ගැඹුරු සුසුමක් හෙළී ය. "එයාව හොයාගෙන එන්ටයි කියලා මම කාවද යවන්නෙ? තව අවුරුදූ දෙකකින් මට හැත්තෑවක් වෙනවා. මම මේ උහුලන බර උහුලන්ට බැරි තරම් මම නාකි වැඩියි, දූර්වල වැඩියි. ඒ වුනත් මම මේක පැත්තකින් තිබ්බොත් කවුද ඒක බාරගන්නෙ? ඇලිසර් තෝර්න් ද? බොවෙන් මාර්ෂ් ද? එයාලා මොන විදියෙ පුද්ගලයොද කියන එක නොදැක ඉන්ට නම් මම මේස්ටර් ඒමන් තරමටම අන්ධයෙක් වෙන්ට ඕන. නිශා රැකුම දැන් බුම්මගත්ත කොල්ලන්ගෙයි වෙහෙසට පත්වෙච්ච නාකින්ගෙයි හමුදාවක් වෙලයි තියෙන්නෙ. අද රෑ මගේ මේසෙ වටේ හිටිය කට්ටිය අත ඇරියම මට තව ඕනනං අකුරු කියවන්ට පුළුවන් මිනිස්සු විස්සක් හොයාගන්ට පුළුවන් වෙයි. හිතන්ට පුළුවන්, සැලසුම් කරන්ට පුළුවන්, නායකත්වය දෙන්ට පුළුවන් මිනිස්සු ඊටත් අඩුයි. කාලයක් තිබ්බා නිශා රැකුම මුළු ගිම්හානෙ පුරාවටම ගොඩනැගීම් කලා, හැම අණදෙන නිළධාරියෙක්ම ප්‍රාකාරෙ තිබ්බට වඩා උඩට උස්සන්ට මහන්සි ගත්තා. දැන් අපට ජීවිකේ රැකගන්ට නම් එච්චර තමා කරන්ට වෙන්නෙ."

ඔහු මේ කතා කරන්නේ අතිශය බැරෑරුම් ස්වරයෙන් බැව් ටිරියන්ට වැටහින. ඔහුට මේ මහලු මිනිසා පිළිබඳ සියුම් කණගාටුවක් දැනෙන්නට විය. මෝර්මන්ට් උතුමානන් සිය දිවියෙන් සැහෙන කලක් ප්‍රාකාරය මත ගත කර තිබින. එමෙන්ම ඒ ගතකල කාලය අර්ථවත්ව ගතවිනැයි ඔහුට විශ්වාස කරන්නට උවමනා වී තිබින. "මම පොරොන්දු වෙනවා රජතුමාට ඔබ කියාපු දේවල් අහන්ට සලස්සනවා කියලා." ටිරියන් බැරෑරුම් හඬින් කීවේ ය. "ඒ වගේම මම මගේ තාත්තටයි සහෝදරයා ජේමිටයි කතා කරන්නම්." ඔහු සැබෑවටම ඒ බව කතා කරන්නට සිතා ගත්තේ ය. ටිරියන් ලැනිස්ටර් සැබෑවටම අවංක පුද්ගලයකු විය. එනමුදූ ඔහු සෙසු කොටස නොකියා ගිලගත්තේ ය. රොබර්ට් රජතුමා ඔහුව නොතකා හරිනු ඇත, ටයිවින් උතුමානන් ඔහුට පිස්සු හැදී ඇත්දැයි විමසනු ඇත, ජේමි ඔහුට සිනාසෙනු ඇත. එපමණකි.

"ඔබ තරුණ මිනිහෙක් ටිරියන්. ඔබ ශීත කාල කීයක් දැකලා තියෙනවද?"

ටිරියන් දෙවුර ඇකිළී ය. "අටක්. නවයක්. මට හරියටම මතක නෑ."

"ඒ ඔක්කොම බොහොම කෙටි ඒවා?"

"ඔවු මගේ උතුමානනි." ඔහු මෙලොවට බිහි වූයේ තුන් වසරක් පුරා පැවැති, දරුණු, කටුක ශීත කාලයක් මධ්‍යයේ විය. එනමුදු ටිරියන් ගේ මුල්ම මතක වසන්තය ගැන විය.

"මම පොඩි කාලෙ අහලා තියෙන විදියට දිග ගිම්හානයක් කියන්නෙ ඊට පස්සෙ දිග ශීත කාලයක් එනවා. මේ ගිම්හානය අවුරුදු නවයක් තිබ්බා ටිරියන්. දහවෙනි අවුරුද්දත් ලං වෙනවා. ඒ ගැන පොඩ්ඩක් හිතන්ට."

"මම පොඩි කාලෙ මගේ ආයම්මා කිවුවා, මිනිස්සු හොඳට හිටියොත් දෙවිවරු ඒ ගැන පැහැදිලා ලෝකෙට කවදාවත් ඉවර වෙන්නෙ නැති ගිම්හානයක් දෙනවා කියලා. සමහරවිට අපි හිතුවට වඩා අපි හොඳට හැසිරෙන්ට ඇති. දෙවිවරු අපට ඒ මහා ගිම්හානෙ දීලද දන්නෙ නෑ අන්තිමේදී." ටිරියන් නියෙවුවේ ය.

මෝර්මන්ට් මෙයින් විමතියට පත් වුනු බවක් නොපෙනින. "ඒ කතාව විශ්වාස කරන්ට තරම් ඔබ මෝඩයෙක් නෙවෙයි මගේ උතුමානනි. දැනටමත් දවස් කෙටි වෙන්ට පටන් අරන්. ඒකෙ කිසිම සැකයක් නෑ. ඒමන්ට සිටඩෙල්වලින් ලියුම් ලැබුනා. ඒවා එයාගෙ සොයාගැනීම් එක්ක ගැලපෙනවා. ගිම්හානයේ අවසානය තමා මේ තියෙන්නෙ." සිය අත දිගු කල මෝර්මන්ට් ටිරියන් ගේ අත තදින් ග්‍රහනය කරගත්තේ ය. "ඔබ ඔවුන්ට අවබෝධ කරලා දෙන්ට ඕනමයි. මම ඔබට කියන්නෙ මගේ උතුමානනි, අන්ධකාරය එනවා. වනාන්තරයේ බොහොම නරක, භයානක දේවල් තියෙනවා. සෝරවෘකයො, මැමත්ලා, ඔරොක්ස්ලා තරම් ලොකු හිම වලස්සු. මගේ හීනවලදි මට අඳුරු ඡායා පේනවා."

"ඔබේ හීනවලදි." ටිරියන් පුනරුච්චාරණය කලේ තවත් සැර මත්පැන් වඩියක් තිබුනා නම් කෙතරම් අගේ දැයි සිතමිනි.

ඔහු ගේ වදන්වල තිබුනු ගනන් නොගන්නා ස්වරය මෝර්මන්ට් නොතකා හැරියේ ය. "නැගෙනහිර කුළුණ ළඟ ඉන්න මාළුකාරයො දැකලා තියෙනවා මුහුදු වෙරළෙ ඉන්න ධවල යාත්‍රිකයො."

මේ වතාවේ නම් ටිරියන්ට කට පියාගෙන සිටීමට බැරි විය. "ලැනිස්පෝර්ට්වල ඉන්න මාළුකාරයො නිතරම දකිනවා දියකිඳුරො."

"ඩෙනිස් මැලිස්ටර් ලියලා එවලා තියෙනවා කඳුකරයේ ඉන්න මිනිස්සු දකුණට යනවා කියලා. වෙන කවදාටත් වැඩියෙන් සෙවනැලි කුළුණ පහුකරන් පහළට යනවා කියලා. ඒ මිනිස්සු පැනලා යනවා මගේ උතුමානනි... ඒ වුනත් මේ මිනිස්සු පැනලා යන්නෙ මොකකට බයේද?" කවුළුව වෙතට පිය නැගූ මෝර්මන්ට් උතුමානන් පිටත රාත්‍රිය දෙස බලා සිටින්නට විය. "මේවා බොහොම නාකි ඇටකටු ලැනිස්ටර්. ඒ වුනත් ඒවට කවදාවත් මෙහෙම සීතලක් දැනිලා නෑ. මම ඔබෙන් ඉල්ලා සිටිනවා, කරුනාකරලා රජතුමාට කියන්ට මම කියාපු දේවල්. සීත කාලෙ එනවා. දිග රෑ කාලෙ එළඹුනාම ඈත උතුරෙන් එන නපුරු බලවේගයි රාජධානියයි අතරෙ ඉන්න එකම දේ නිශා රැකුම විතරයි. අපි ඒ වෙනකොට ලෑස්ති වෙලා හිටියෙ නැත්තං අපට දෙයියන්ගෙම පිහිට තමා."

"අද රෑ මට නිදාගන්ට බැරිවුනොත් මටත් දෙයියන්ගෙම පිහිට තමා. යොරේන් හිතාගෙන ඉන්නෙ යාන්තමට එළිය වැටිච්ච ගමන්ම පිටත් වෙන්නයි." ටිරියන් නැගිට සිටියේ ය. වයින් නිසා ඔහුට නිදිමතක් දැනෙමින් තිබින. "මට කරපු ආගන්තුක සත්කාර හැමදේටම බොහොමත්ම ස්තූතියි මෝර්මන්ට් උතුමානනි."

"එයාලට කියන්ට ටිරියන්. එයාලට විශ්වාස කරන්ට සලස්සන්ට. ඒ තමා ඔබට මා වෙනුවෙන් කරන්ට පුළුවන් ලොකුම ස්තූතිය." ඔහු සියුරුහඬ ලෑ අතර කපුටා පියාඹා විත් ඔහු ගේ දසරුවෙහි වැසුවේ ය. මඳ සිනහවක් පෑ මෝර්මන්ට් සිය සාක්කුවකින් ගත් ඉරිඟු ඇට ඌට කවන්නට විය. ඒ ටිරියන් ඔහුට සමුදෙද්දී ඔහු දුටු අවසාන දර්ශනය විය.

Tyrion Lannister: “Most of my kin are bastards, but you're the first I've had to friend.”

පිටත අතිශයින්ම සීතල විය. සිය ලොම් කබාය තදින් ඇඳගත් ටිරියන්, අත්වැසුම් දමාගෙන පිටත මුරකාවලෙහි ශීතයෙන් වෙවුලමින් සිටි මුර සෙබළුන්ට හිස වැනී ය. ඉන්පසු තම බකල දෙපාවලට හැකි උපරිම වේගයෙන් අංගනය හරහා සිය නවාතැන පිහිටි රජතුමා ගේ කුළුණ වෙත පිය මනින්නට විය. ඔහු ගේ සපත්තුවලට පෑගුනු අලුතින් වැටුනු හිම කර කර හඬින් බිඳී ගියේ ය. ඔහු ගේ ප්‍රාශ්වාසය මුහුණ ඉදිරියෙන් මිදී ගියේ ය. ඔහු කිසිලිවලට යටින් සිය දෑත් යවා ගමන තවත් ඉක්මන් කලේ මොරෙක්ට සිය ඇඳ උණුසුම් කිරීමට අමතක නොවේවායි පතමිනි.

රජතුමා ගේ කුළුනට පිටුපසින් ප්‍රාකාරය සඳ එළියේ බැබලෙමින් තිබිනි. එය උත්තුංග මෙන්ම ගුප්ත දර්ශනයක් විය. ටිරියන් මොහොතක් නැවතී ඒ දෙස බලා සිටි අතර සීතය නිසා ඔහු ගේ දෙපා ඇදුම් කන්නට විය.

හදිසියේම මෙන් ඔහු ගේ සිතේ විකාර සිතුවිල්ලක් පැනනැගිනි. ප්‍රාකාරයට නැඟ තව එකම එක වතාවක් ලෝකාන්තය දෙස බලන්නට ඇත්නම් යැයි ඔහුට සිතිනි. මේ ඔහු ගේ අවසාන අවස්ථාව බව ඔහුට දැනිනි. හෙට උදෑසන ඔහු දකුණුකරය බලා පිටත්ව යන අතර නැවත කිසිදා මේ සීතල ජනශූන්‍ය අපාය වෙත පැමිණීමේ උවමනාවක් ඇතිවෙතැයි සිතිය නොහැක. ඉදින් රජතුමා ගේ කුළුණේ උණුසුම හා සිය සැපදායක ඇඳ මොහොතකට අමතක කර දැමූ ඔහු ප්‍රාකාරය දෙසට පිය නැගී ය.

ප්‍රාකාරයේ ඉහළ නැගීම පිණිස දැවයෙන් තැනූ පඩිපෙළක් අයිස් තුළට කාවද්දා සවි කර තිබිනි. කළු සොයුරන් විසින් එය පෙනෙනවාට වඩා ශක්තිමත් බව ඔහුට ඒත්තු ගන්වා තිබුනද මේ මොහොතේ ඔහු ගේ දෙපා කෙතරම් රිදුම් දුන්නේ දැයි යත් ඔහු ඉහළ නැගීමක් ගැන සිතන්නටවත් අකැමැති විය. ඒ වෙනුවට ඔහු පසෙකින් තිබුනු යකඩ කූඩුව වෙතට ගොස්, එයට ඇතුළු වී දොර වසාගෙන සීනු ලණුව තෙවරක් තදින් ඇද්දේ ය.

ඔහුට අනන්තය මෙන් දැනුනු වේලාවක් ඒ තුළ ගත කරන්නට සිදු විය. මෙසේ ප්‍රාකාරයට පිටුපා සීතල යකඩ කූඩුව තුළ තුළ බලා සිටියදී තමා මේ මොන විකාරයක් කරන්නේ දැයි ටිරියන්ට විමතියක් දැනිනි. අන්තිමේදී සිය හදිසි ආසාව අමතක කර දමා ඇඳට යන්නට ඔහු සිතනවාත් සමගින් හදිසි ගැස්සීමක් සමගින් කූඩුව ඉහළ නගින්නට විය.

පළමුව මඳක් ගැස්සෙමිනුත් ඉන්පසු වඩා මෘදුවත් ඔහු කෙමෙන් ඉහළ නගින්නට විය. කූඩුව එහා මෙහා පැද්දෙන්නට වූ අතර ඔහු යකඩ කූරු වටා දැත් යවා තදින් අල්ලා ගත්තේ ය. සිය අත්වැසුම් අතරින් පවා යකඩ කූඩුවේ ලෝහවල සීතල ඔහු ගේ අත්වලට දැනෙන්නට විය. මොරෙක් විසින් සිය කාමරයේ ගින්නක් දල්වා තිබුනු නමුදු අණදෙන නිළධාරිතුමා මේ වන විටද නින්දට ගොස් ඇති බැව් ඔහු ගේ අඳුරු කාමරය දෙස බැලූ ටිරියන් වටහා ගත්තේ ය.

ඊළඟ මොහොතේ ඔහු කුළුණුවලට ඉහළින් උඩට ඇදෙමින් සිටියේ ය. ඔහුට පහළින් සඳ එළියේ නැවුනු කළු බලකොටුව පැහැදිලිව දර්ශනය විය. එය කෙතරම් දරදඬු ද, කෙතරම් හිස් ද යන්න මෙහි සිට මනාව නිරීක්ෂණය කල හැකි විය. කවුළු නොමැති මුර අට්ටාල, බිඳ වැටෙමින් පවතින බිත්ති, කැඩී බිඳී ගිය ගල්වලින් පිරුනු අංගන ආදී මේ සියල්ලක්ම ඔහු හොඳින් දුටුවේ ය. ඈතින්, රජමාවතේ ලීග බාගයක් දුරින් පිහිටි මෝල්ස් ටවුන් නම් කුඩා ගම්මානයේ එළි ඔහු දුටුවේ ය. සඳ එළියේ රිදී පැහැයෙන් දිදුලන අතරින් පතර කඳු මුදුන්වලින් ඇරඹී පහළට ගලා යන දියදහරා ඔහු දුටුවේ ය. මේ හැරුනු විට අන් සියල්ල සීතල සුළං හමන කඳුවලින් හා ගලින් පිරීගිය භූමියෙන් යුතු වූ අතර ඒ සියල්ල හිමෙන් වැසී තිබින.

අන්තිමේදී ඔහුට පිටුපසින් ගොරෝසු කටහඬක් ඇසින. "දෙයියන්ටම ඔප්පු වෙච්චාවෙ! ඒ කුරුමිට්ටා." කූඩුව ඉහළ නැගීම නැවතුනු අතර සුළඟ නිසා ඉදිරියටත් පසුපසටත් පැද්දෙමින් නැවතී තිබින.

"ඉතින් එයාව එළියට ගනිං මෝඩයෝ." අමනාපයෙන් කල ගෙරවිල්ලක් හා මහත් ශබ්ද රැසකින් පසු කූඩුව පැත්තකට ගමන් කර ප්‍රාකාරය මත නතර විය. කූඩුවේ සෙලවීම නතර වූ පසු දොර ඇරිය ටිරියන් හිම මතට පිනී ය. කළු ඇඳුමින් සැරසුනු රුවක් දඹරය වෙතට බර වී සිටි අතර තවත් කෙනෙක් කූඩුව අල්ලාගෙන සිටියේ ය. ඔවුන් ගේ මුහුණු ලොම් රෙදි කඩකින් වැසී තිබුනු අතර දෑස් පමණක් පිටතට දිස් විය. "ඔබට මොකක්ද ඕන කරලා තියෙන්නෙ මේ මහ රෑ ජාමෙ?" දඹරය අසල සිටි තැනැත්තා ඇසී ය.

"අන්තිම පාරට ප්‍රාකාරය බලන්ට."

මිනිසුන් දෙදෙනා බැල්මක් හුවමාරු කරගත්හ. "ඕන දෙයක් ඕන තරමක් බලාගන්න එකයි ඇත්තෙ. ඒ වුනාට පරෙස්සමින් පුංචි මිනිහෝ! වැරදිලාවත් පහළට වැටෙන්ටනං එපා. නාකි වලහා අපේ හම ගලවයි." විශාල දොඹකරය පාමුල දැවයෙන් නිම කල කුඩා මඩුවක් විය. මිනිසුන් විසින් එහි දොර ඇරිය විට ගිනිකබලකින් නික්මුනු දීප්තියක් නොමැති ආලෝකයක් දිස් වූ අතර කුඩා උණුසුම් සුළං රැල්ලක් පිටතට හමා ආවේ ය. ඊළඟ මොහොතේ ඔවුන් දෙදෙනා මඩුව ඇතුළට ගිය අතර ප්‍රාකාරය මත ඉතිරිව සිටියේ ටිරියන් පමණි.

ප්‍රාකාරය මුදුනේ අත්‍යන්තයෙන්ම සීතල වූ අතර සුළඟ ද අතිශයින් දැඩි විය. එය රජමාවතටද වඩා පුළුල් වූ නිසා බිමට වැටීම ගැන ටිරියන්ට බිය වීමට හේතුවක් නොවීය. එනමුදු එය ලිස්සන සුළු වූ අතර අනතුරුදායක විය. කළු සොයුරන් විසින් ඇවිදීම පහසු වීම පිණිස ගල් කැබලිති ඒ මත අතුරා තිබුනු නමුදු අනවරත පිය ගැටීම නිසා ඒවා ගිලා බැස ගොස් ඒ මත අයිස් බැඳී තිබින. එසේ වුවද එය ඇවිදීමට නොහැකි තරමේ නරක තත්ත්වයක් නොවී ය. යා යුත්තේ කවර පැත්තකටදැයි නිශ්චය කරගනු වස් ඔහු වරක් නැගෙනහිර දෙසත් ඉන්පසු බටහිර දෙසත් බැලුවේ ය. ඒ දෙපසටම ප්‍රකාරය අගක් මුලක් නැති සුදු පැහැති මාවතක් මෙන් අනන්තය දක්වා ඇදී ගොස් දෑස් මානයෙන් නොපෙනී ගියේ ය. කිසිදු විශේෂිත හේතුවක් නැතිවුවද බටහිර දෙසට යාම තෝරා ගත් ටිරියන් උතුරු පැත්තට බරව අලුතින් ගල් අතුරා තිබුනු අඩි පාර ඔස්සේ සෙමින් පිය මැනී ය.

අධික ශීතය නිසා ඔහු ගේ නිරාවරණ දෙකම්මුල් රත් පැ වූ අතර තබන තබන පියවරක් පාසා දෙපා කෙඳිරිලි හඬ නගන්නට විය. එනමුදු ටිරියන් එය නොතකා හැරියේ ය. හිටිහැටියේම කටහඬක් හඬගෑවේ ය. "කවුද ඔය යන්නෙ? ඔහොම නවතිනවා."

"ටිරියන් නැවතුනේ ය. "ගොඩක් වෙලා මෙහෙම නැවතිලා හිටියොත් මාව මෙතනම ගල් වෙයි ජොන්." ඔහු කීවේ ය. අඳුරු පැහැ පොදියක් නිහඬවම ඔහු දෙසට පිය මැන ඔහුව ඉව කර බැලී ය. "හෙලෝ ගෝස්ට්!"

ජොන් ස්නොව් ඉදිරියට ආවේ ය. සිරුර වටා ඔතන ලද සම් හා ලොම් ඇඳුම් නිසා ඔහු වඩා විශාල මිනිසකු ලෙසින් පෙනින. "ලැනිස්ටර්." ඔහු කිවේ මුව වසා සිටි රෙදි කඩ පහළට අදිමිනි. "මේ තමා මම ඔබව දකින්ට බලාපොරොත්තු නොවෙච්චම තැන." ඔහු තමන්ටත් වඩා උසැති හෙල්ලක් අතින් දරා සිටි අතර ඉණෙහි අසිපතක් ද පැළඳ සිටියේ ය. ඔහු ගේ පපුව හරහා කළු පැහැ යුධ හොරණෑවක් එල්ලා තිබින.

"මේ තමා මමත් මාව දකින්ට බලාපොරොත්තු වෙන අන්තිම තැන. මට හදිසි ආසාවක් ආවා උඩට ඇවිල්ලා බලන්ට. මම ගෝස්ට්ව ඇල්ලුවොත් ඌ මගේ අත හපයි ද?"

"මම මෙතන ඉන්න නිසා එහෙම වෙන එකක් නෑ."

ටිරියන් වෘකයාගේ කණ පිටුපසින් වූ සුදු පැහැ ලොම් අතගෑවේ ය. ඒ රතු පැහැ දෑස් උදාසීන අයුරින් ඔහු දෙස බලා සිටියේ ය. මේ සතා මේ වන විට ඔහු ගේ පපුව තරම් උසට වැඩී තිබින. තවත් අවුරුද්දක් ගිය තැන ඌ දෙස බැලීමට තමාට උඩ බැලීමට සිදු වනු ඇතැයි ටිරියන් කල්පනා කලේ ය. "උඹ මොනාද මේ මහ රෑ මේක උඩට වෙලා කරන්නෙ?" ඔහු ඇසී ය.

"මට මුර සංචාර කරන්ට සිද්දවුනා. ආයෙමත්. සෙර් ඇලිසර් මට බොහොම ආදරෙන් ඒ ගැන හොයලා බලනවා. එයා හිතනවා ඇති මම රැයෙන් බාගයක් ඇහැරිලා හිටියහම උදේ සරඹ පුරුදු වෙද්දී නිදා කිරා වැටෙයි කියලා. තවම නං මට එයාගෙ බලාපොරොත්තු ඉෂ්ට කරන්ට බැරි වුනා."

ටිරියන් නියෙවුවේ ය. "ගෝස්ට් තාම සර්කස් ඉගෙන ගත්තෙ නැද්ද?"

"නෑ." ජොන් සිනාසුනේ ය. "ඒ වුනත් අද උදේ ග්‍රෙන්ට පුළුවන් වුනා හෝල්ඩර් එක්ක සටන් කරද්දී තනියම අල්ලන් ඉන්ට. අනික පිප් ඉස්සර වගේ දැන් නිතරම එයාගෙ කඩුව වට්ටගන්නෙ නෑ."

"පිප්?"

"එයාගෙ ඇත්ත නම පිපර්. අර ලොකු කණ් දෙකක් තියෙන පුංචි කොල්ලා. එයා දැක්කා මම ග්‍රෙන්ට උදවු කරන හැටි. ඉතිං එයා මගෙන් උදවු ඉල්ලුවා. තෝර්න් එයාට උගන්නලා නෑ කොහොමද හරියට කඩුවක් අල්ලන්නෙ කියලවත්." ඔහු උතුරු දෙස බැලුවේ ය. "මට හැතැප්මක් මුර කරන්ට තියෙනවා. ඔබට පුළුවන්ද මගෙත් එක්ක ඇවිදින්ට?"

"උඹ හෙමින් ඇවිදිනවා නං."

"මුරේ අණදෙන නිළධාරියා කිවුවා මම අනිවාර්යයෙන්ම ඇවිදින්ට ඕනයි කියලා. ඒකෙන් මගේ ලේ මිදෙන්නෙ නැතුව තියෙනවලු. හැබැයි එයා කිවුවෙ නෑ කොච්චර හයියෙන් ඇවිදින්ට ඕනද කියලා."

සුදු පැහැ සෙවනැල්ලක් මෙන් පසෙකින් පිය මනිනා ගෝස්ට් ද සමගින් ඔවුහු ඇවිදින්නට වූහ. "මම හෙට උදේ යනවා." ටිරියන් කීවේ ය.

"මම දන්නවා."

"දකුණට යන අතරමගදි වින්ටර්ෆෙල්වල නවතින්ට මම හිතාගෙන ඉන්නවා. ඔබට මොනා හරි පණිවුඩයක් එහෙම දෙන්ට තියෙනවා නං..."

"රොබ්ට කියන්ට මම නිශා රැකුමෙ අණදෙන නිළධාරියා වෙලා එයාව ආරක්ෂා කරනවා කියලා. ඒක නිසා එයාට පුළුවන් ගෑනු ළමයි එක්ක එකතුවෙලා මැහුම් ගෙතුම් වැඩ කරගෙන ඉන්ට. මික්කෙන්ට පුළුවන් එතකොට එයාගෙ කඩුව උණු කරලා අශ්ව ලාඩං හදන්ට."

"උඹේ සහෝදරයා මට වඩා ගොඩක් විශාලයි." ටිරියන් සිනා මුසු මුහුණින් යුතුව කීවේ ය. "මට මරණය ගෙන දෙන්ට පුළුවන් විදියේ පණිවුඩ බාර දෙන එක මම ප්‍රතික්ෂේප කරනවා."

"රිකන් අහයි මම කවදද ආපහු එන්නෙ කියලා. ඔබට පුළුවන් නම් එයාට තේරුම් කරලා දෙන්ට මම කොයි වගේ තැනකටද ගිහින් තියෙන්නෙ කියලා. එයාට කියන්ට මම නැති නිසා එයාට මගේ දේවල් හැම එකක්ම ගන්ට පුළුවන් කියලා. එයා ඒකට කැමැති වෙයි."

අද දිනයේ මිනිසුන් ඔහුගෙන් බොහෝ දේ ඉල්ලා සිටින බව ටිරියන්ට සිතින. "උඹ දන්නවද? උඹට පුළුවන් ඔය ඔක්කොම ලියුමක ලියන්ට."

"රිකන්ට තාම අකුරු කියවන්ට බෑ. බ්‍රැන්..." ඔහු හදිසියේම නැවතින. "මට තේරෙන්නෙ නෑ බ්‍රැන්ට මොන වගේ පණිවුඩයක්ද යවන්ට ඕන කියලා. එයාට උදවු කරන්ට ටිරියන්."

"මම කොහොමද එයාට උදවු කරන්නෙ? එයාගෙ වේදනාව නැති කරන්ට මම මේස්ටර් කෙනෙක් නෙවෙයි. එයාගෙ කකුල් දෙක ආපහු දෙන්ට මම මන්තර දන්නෙ නෑ."

"මට උදවු ඕන වුන වෙලාවෙ ඔබ මට උදවු කලා."

"මම උඹට මොකුත් දුන්නෙ නෑ. වචන විතරයි."

"එහෙමනං ඉතිං, බ්‍රැන්ටත් ඔබේ වචන වලින් උදවු කරන්ට."

"උඹ ඔය කියන්නෙ කොර ගහන මිනිහෙකුට ගිහිල්ලා අබ්බගාතයෙකුට නැටුම් පුරුදු කරන්ට කියලයි. පාඩම කොච්චර අවංක වුනත් බලන් ඉන්න එකාට පේන්නෙ ඒක හරි විකාරයක් කියලා. කොහොම වුනත් මම දන්නවා සහෝදරයෙක් ගැන තියෙන ආදරේ කොහොම එකක් ද කියලා ස්නෝව් උතුමානනි. මට පුළුවන් විදියෙ හැම උදවුවක්ම මම බ්‍රැන්ට දෙන්නම්."

"බොහොම ස්තූතියි ලැනිස්ටර් උතුමානනි." සිය අත්වැසුම ගැලවූ ජොන් අත දිගු කලේ ය. "යාළුවො." ටිරියන්ට සිය සිතේ කුමක්දෝ අනුකම්පාවක් ඇති වෙනු දැනින. "මගේ නෑයො ගොඩක් එවුන් අවජාතකයො තමා. ඒ වුනත් උඹ තමා මගේ පළවෙනි අවජාතක යාළුවා." දතින් සපා සිය අත්වැසුමක් ගැලවූ ටිරියන් ස්නොව්ට අතිනත දුන්නේ ය.

ඔවුන් දෙදෙනා නැවත ඇවිදින්නට පටන් ගත්හ.

ප්‍රාකාරයේ සිට අඩ මයිලයක දුරක් යන තෙක් උතුරු දෙසට වූ වනාන්තරය කළු සොයුරන් විසින් ආරක්ෂාව උදෙසා සුද්ද කිරීම සිරිතක් විය. සියවස් ගණනාවක් තිස්සේ අයන්වුඩ්, මුරකරු හා ඕක් වදුලු කපා බිම හෙලා තිබුනෙන් කිසිදු සතුරෙකුට නොපෙනී පැමිණිය නොහැකි හිස් අවකාශයක් නිර්මානය වී තිබින. එනමුදු ප්‍රධාන බලකොටු තුන අතරතුර මේ හිස් අවකාශය වනාන්තරය විසින් නැවත ආක්‍රමණය කෙරෙමින් පවතින බැව් ටිරියන්ට අසන්නට ලැබී තිබින. එසේ වුවද කළු බලකොටුවේ දැව අවශ්‍යතාව අතිමහත් වූ නිසා කළු සොයුරන් ගේ පොරෝ පහරින් වනාන්තරය තව දුරටත් ප්‍රමාණවත් තරමින් මැඩී තිබින.

කෙසේ වුවද වනාන්තරය එතරම් ඈතක නොවී ය. ප්‍රකාරය මුදුනේ සිටි ටිරියන්ට විවෘත අවකාශයෙන් එහා තවත් ප්‍රාකාරයක් මෙන් නැගී සිටි අඳුරු තුරුලතා පේළිය මනාව දැකගත හැකි විය. ඒ අඳුරු වනාන්තරය තුළ පොරොවක් ලෙල දී තිබුනේ ඉතා කලාතුරකිනි. එය කෙතරම් ඝනකම් තුරු වියනක් සැදුවේද යත් සඳඑළියට පවා එය පසා කර යා නොහැකි විය. මේ දැවැන්ත වෘක්ෂයෝ කිසිදිනෙකත් මිනිසකු දැක සිටියවුන් හෝ දැන සිටියවුන් හෝ නොවූහ. නිශා රකුමේ සෙබළුන් එය හොල්මන් කැලෑව යනුවෙන් නම් කලේ නිකමට නොවේ.

ප්‍රාකාරය මුදුනේ සිට මේ කිසිදු ආලෝක පුංජයක් නොමැති, ඉදිකටු තුඩු වැනි සීත සුළං හමනා අන්ධකාර වනාන්තරය දෙස බලා සිටි ටිරියන්ට සිතුනේ අනික් එවුන් පිළිබඳ කියැවෙන කතන්දර මුළුමනින්ම අසත්‍ය විය නොහැකි බවකි. යක්ෂයන් හා පිශාචයන් ගැන ඔහු කරන ලද විහිළු තවදුරටත් කවට බස් නොවන බැව් ඔහුට හැඟුනි.

"මගේ බාප්පා එහෙ කොහෙ හරි ඉන්නවා." ජොන් ස්නොව් මෘදු ස්වරයෙන් තෙපලේ හෙල්ලයට වාරු වී අන්ධකාරය දෙස නෙත් යොමා සිටිමිනි. "එයාලා මුර කරන්ට මේක උඩට මාව එවපු පළවෙනි රෑ මම හිතුවා, 'අද රෑ බෙන්ජින් බාප්පා ආපහු එයි. මම තමා එයාව මුලින්ම දැකලා හොරණෑව පිඹින්නෙ' කියලා. ඒ වුනත් එයා කවදාවත් ආපහු ආවෙ නෑ. එදා රෑ ආවෙත් නෑ. වෙන කිසිම රෑක ආවෙත් නෑ."

"එයාට තව ටික කාලයක් දෙන්ට." ටිරියන් තෙපලේ ය.

ඈත උතුරේ කොහේදෝ තැනක සිටි වෘකයෙක් උඩුබුරලෑමට පටන් ගති. මඳ වේලාවකින් තවකෙක් ඊට එක් විය. ඉන්පසු තවත් එකෙක්. ගෝස්ට් සිය හිස ඇල කර ඒ හඬට සවන්

දුන්නේ ය. "එයා ආයෙමත් ආවෙම නැත්තං, ගෝස්ට්‍රුයි මමයි යනවා එයාව හොයන්ට." ජොන් ස්නොව් සිය වෘකයා ගේ හිස අතගාමින් පැවසී ය.

"මම විශ්වාස කරනවා උඹ එහෙම දෙයක් කරයි කියලා." ටිරියන් පැවසී ය. 'ඒත් ඊට පස්සෙ කවුද යන්නෙ උඹව හොයන්ට?' ඔහු වෙවුලමින් තමාටම කියා ගත්තේ ය.

Jeor Mormont: “The Night’s Watch has become an army of sullen boys and tired old men.”

ආර්යා 02

ඇගේ පියා නැවතත් රාජසභාව සමග ගැටුම් ඇති කරගෙන තිබින.

පසුගිය දිනවලදී ඔහු නිතරම කරන්නට පුරුදුව සිටි අන්දමින් අද දිනයේ ද ප්‍රමාද වී කෑම මේසයට පැමිණි ඔහු ගේ මුහුණින් ආර්යා මේ බැව් අවබෝධ කරගත්තා ය. නෙඩ් ස්ටාර්ක් කුඩා ශාලාවට ඇතුළුවෙද්දී භෝජනයේ පළමු වටය මේ වනවිටද මේසයෙන් අස් කොට තිබින. මෙයට කුඩා ශාලාව කියා නම් තබා තිබුනද එය මිනිසුන් දෙසීය දෙනෙකුට කිසිදු අපහසුවකින් තොරව අසුන් ගත හැකි, උස් ආරුක්කුමය  සහිත දිගු ශාලාවක් විය.

"මගේ උතුමානනි." ජොරී කීවේ අසුනෙන් නැගිටිමිනි. අනිකුත් සෙබළුන්ද ඔහු අනුව සිය අසුන්වලින් නැගී සිටියහ. මේ සෙබළුන් සියළුදෙනාම තම නව නිළ ඇඳුම වන සුදු පැහැ පට රෙද්දෙන් කල වාටියක් ඇති තද අළු පැහැ ලොම් සළු පැළැඳ සිටියහ. රිදියෙන් නිමකල අතක හැඩය ගත් හාරිච්චියක් මගින් උරහිස අසලින් මෙම සළුවල දෙපට එක්කර තිබුනේ ඔවුන් ගේ තනතුර වන රජතුමා ගේ හස්තයේ නිවාසාරක්ෂකයින් බව උපුටා දැක්වීමට ය. එහි සිටියේ සෙබළුන් පනස් දෙනෙකුන් පමණක් වූ නිසා ශාලාවේ වූ අසුන් බොහොමයක් හිස් ව තිබින.

"වාඩි වෙන්ට." එඩාර්ඩ් ස්ටාර්ක් කීවේ ය. "මට පේනවා ඔබලා මම නැතුවම කෑම කන්ට පටන් අරන් කියලා. මේ නගරේ තාමත් සිහි කල්පනාව තියෙන මිනිස්සු ටික දෙනෙක් හරි ඉතුරුවෙලා ඉන්න එක ගැන සන්තෝසයි." ආහාර ගෙන එන්නැයි ඔහු සන් කල අතර සේවකයින් විසින් සුදුලූණු හා සුවඳකාරක යොදා පළහන ලද බැටළු මස් සහිත දීසි ඔසවාගෙන පැමිණෙන්නට විය.

"සෙණ්ඩුවාලුවේ කෙරෙන කතාවල හැටියට නං තරගාවලියක් තියන්ටයි යන්නෙ මගේ උතුමානනි." ජොරී කීවේ සිය අසුනේ නැවත වාඩි වෙමිනි. "එයාලා කියනවා ඔබතුමාගෙ පදවි ප්‍රාප්තියට කෙරෙන ගෞරවයක් විදියට රාජධානිය පුරාම ඉන්න නයිට්වරු ඇවිල්ලා සටන්වලට සහභාගි වෙන්ට යනවලු."

සිය පියා ඒ සම්බන්ධයෙන් කිසිදු කැමැත්තක් නොපෙන්වූ බැව් ආර්යාට ඔහු ගේ මුහුණින් පැහැදිලි විය. "එයාලා කියන්නෙ නැද්ද මේක තමා පදවි ප්‍රාප්තිය වෙනුවෙන් මට මේ ලෝකෙ උවමනා කරන්නෙ නැතිම දේ කියලා?"

සන්සා ගේ දෑස් විසල් විය. "තරගාවලියක්!" ඇය හුස්මක් ඉහළට ඇදගත්තා ය. ඇය ආර්යාගෙන් හැකිතරම් ඈත්ව සෙප්ටා මෝර්ඩේන් හා ජේන් පූල් අතරින් අසුන් ගෙන සිටියා ය. "අපටත් යන්ට පුළුවන්ද තාත්තෙ?"

"ඔයා දන්නවනෙ මම කොහොමද මේ ගැන හිතන්නෙ කියලා, සන්සා. ජෙන විදියටනම් මම රොබර්ට් වෙනුවෙන් විකාර සෙල්ලම් ලෑස්ති කරලා ඒකෙන් මට ගෞරවයක් ලැබෙනවා කියලා ලෝකෙට පෙන්නන්ට ඕන. ඒකෙන් කියැවෙන්නෙ නෑ මගේ දූවලත් ඔය විකාරවලට සහභාගි වෙන්ට ඕනයි කියලා."

"අනේ! මට ඒක බලන්ට ඕන." සන්සා අයැදුවා ය.

සෙප්ටා මෝර්ඩේන් ද කතාවට සහභාගි විය. "මර්සෙලා කුමාරිත් ඒකට සහභාගි වෙයි මගේ උතුමානනි. එයා සන්සා ආර්යාවටත් වඩා ලාබාලයි. මේ වගේ විශාල උත්සවයකට රාජසභාවෙ හැම වංශාධිපතිනියක්ම සහභාගි වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. අනික, මේ තරගාවලිය පවත්වන්නෙ ඔබතුමාට ගෞරව කරන්ට නිසා ඔබතුමාගෙ පවුලෙ උදවිය ඒකට සහභාගි වුනේ නැත්තං ඒක ටිකක් හොඳ මදි නේද?"

පියා ගේ මුහුණේ වූ වේදනාව පැහැදිලිවම දිස් විය. "ඒකත් ඇත්ත තමා. බොහොම හොඳයි. මම ඔයා වෙනුවෙන් තැනක් වෙන් කරන්ටයි කියලා කියන්නම් සන්සා." පසෙකින් සිටි ආර්යා දුටු ඔහු මෙසේ එකතු කළේ ය. "ඔයාලා දෙන්නටම."

"මට ඔය මලඉලවු තරගාවලියෙන් වැඩක් නෑ." ආර්යා කීවා ය. ජොෆ්රි කුමරා එහි සිටිනු ඇති බව ඇය දැන සිටියා ය. ඇය මේ වනවිට ජොෆ්රිට වෛර කරන්නට පටන් ගෙන තිබින.

සන්සා හිස එසෙවුවා ය. "ඒක හරිම ලස්සන තේජාන්විත උත්සවයක් වෙයි. ඔයාව කොහොමත් ඕන වෙන එකක් නෑ."

පියා ගේ මුහුණ කේන්තියෙන් පිරී ගියේ ය. "ඇති! සන්සා. ඔයා තව දුර ගියොත් මම මගේ අදහස වෙනස් කරගන්නවා. ඔය දෙන්නගෙ ඔය කෙලවරක් නැති යුද්දෙ නිසා මට දැන් එපා වෙලයි තියෙන්නෙ. ඔයාලා දෙන්නා සහෝදරියො. ඔයාලා සහෝදරියො වගේ හැසිරෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. තේරුනාද?"

සිය තොල සපාගත් සන්සා හිස වැනුවා ය. ආර්යා හිස පහත් කරගත්තේ බුම්මා ගත් මුහුණින් සිය කෑම පිඟාන දෙස බැලුවා ය. සිය දෑසට කඳුළු පුරා එනු ඇයට දැනින. ඇයට හැඬීමට කිසිසේත්ම අවශ්‍ය නොවුනු අතර කේන්තියෙන් මෙන් පිටි අත්ලෙන් කඳුළු පිස දා හැරියා ය.

මේසයෙන් නැගුනු එකම ශබ්දය වූයේ හැඳි ගෑරුප්පු ගැටෙන හඬ පමණි. "මට සමාවෙන්ට." ඇගේ පියා නැගිට සිටියේ ය. "මට අද රෑ කන්ට පිරියක් නෑ." ඔහු ශාලාවෙන් පිටතට ඇවිද ගියේ ය.

ඔහු පිටව ගිය පසු සන්සා රහසින් එහෙත් උද්‍යෝගිමත් ස්වරයෙන් ජේන් පූල් හා කොඳුරන්නට පටන් ගත්තා ය. මේසය එහා කොණේ හුන් ජොරී කාගේ හෝ විහිළුවකට සිනාසුනි. හලන් අශ්වයින් ගැන කතා කරන්නට පටන් ගති. ඔවුන් සැවොම ඔහු ගේ මේ කතා සියල්ලම කලින් අසා පුරුදු නිසා ඩෙස්මන්ඩ්, ජැක්ස් හා හලන් ගේ පුත් හාර්වින් ඔහුට බාධා කරන්නට වන්හ. තවත් වයින් ගෙනෙන ලෙස පෝර්තර් සේවකයින්ට අණ කලේ ය.

එනමුදු කිසිවෙකුත් ආර්යාට කතා කිරීමට උනන්දු නොවිනි. ඇය ඒ ගැන තැකීමක් ද නොකලා ය. ඇත්තෙන්ම ඇය ඒ විදියට වඩාත් කැමැති විය. ඔවුන් ඇයට ඉඩ දෙන්නේ නම් සිය කුටියට වී තනිවම ආහාර ගැනීමට ඇය වැඩියමත් ඇළුම් කලා ය. පියා රජතුමා සමග හෝ වෙනයම් වංශාධිපතියකු සමග හෝ භෝජන සංග්‍රහවලට සහභාගි වූ විට ඔවුහු ඇයට ඒ වෙනුවෙන් ඉඩ දුන්හ. අනිත් වේලාවට ඔවුහු - ඔහුත් ඇයත් සන්සාත් පමණක් - පියා ගේ කුටියට වි ආහාර ගත්හ. මෙවැනි වෙලාවට ආර්යාට සිය සොහොයුරන් නැති අඩුව අන් කවර මොහොතකදීටත් වඩා වැඩියෙන් දැනින. බ්‍රැන්ට සරදම් කරන්නට, පුංචි

රිකන් සමග සෙල්ලම් කරන්නට, රොබ් තමා දෙස බලා සිනාසෙන'යුරු දකින්නට. මේ හැමටත් වඩා ජොන් 'පුංචි නංගී' කියා තමා ගේ කෙහෙරැළි අවුල් කර දමනු විඳින්නට. ඇයත් සමග එකතුව වාක්‍යයක් අවසන් කරන්නට. එහෙත් ඔවුන් සියල්ලන්ම නැතිව ගොසිනි. ඇයට ඉතිරිව ඇත්තේ සන්සා පමණි. එනමුදු පියා බලකරනු ලැබුවහොත් හැරෙන්නට සන්සා දැන් ඇය හා වදනකුදු නොදොඩයි.

වින්ටර්ෆෙල්වලදී නම් ඔවුන් බොහෝ විට ආහාර ගත්තේ ප්‍රධාන ශාලාවේ සිටය. ඇගේ පියා පැවසූ අන්දමට වංශාධිපතියකු සිය පිරිස තමා වෙතම රඳවා ගැනීමට අදහස් කරන්නේ නම් ඔවුන් සමග එක්ව ආහාර ගත යුතු විය. "ඔයාගෙ පිටිපස්සෙන් එන මිනිස්සු අඳුරගන්ට." ඔහු වරක් රොබ්ට පවසනු ඇය අසා සිටියා ය. "ඒ වගේම එයාලට ඉඩ දෙන්ට ඔයාව අඳුරගන්ට. ඔයාගෙ මිනිස්සුගෙන් බලාපොරොත්තු වෙන්ට එපා එයාලා නාඳුනන මිනිහෙක් වෙනුවෙන් එයාලා ජීවිතේ දෙන්ට ලෑස්තියි කියලා." වින්ටර්ෆෙල්හිදී ඔහු ගේ මේසයේ සෑම දිනකම අතිරේක අසුනක් වෙන් වී තිබුනු අතර ඔහු සෑම දිනකම සිය මිනිසුන්ගෙන් කෙනෙකුට ඔහුත් සමග ආහාර ගැනීමට ආරාධනා කලේ ය. එක් රැයක ඒ වයොන් පූල් වූ අතර එදින කතා බහ මුදල් පාලනය හා පාන් හා සේවකයින් ගැන විය. ඊළඟ දිනයේ ඒ මික්කෙන් වූ අතර ඔහු අතොරක් නැතුව කඩු හා සන්නාහ ගැනත්, වානේ පදම් කල යුතු හොඳම ආකාරය ගැනත් දොඩවන අයුරු පියා අසා සිටියේ ය. තවත් දිනෙක ඒ සිය නිමක් නැති අශ්ව කතා සමගින් පැමිණි හලන් හෝ ෂේය්ල් පූජකතුමා හෝ ජොරී හෝ සෙර් රඩ්‍රික් හෝ නාකි ආයම්මා හෝ ඕනෑම අයෙක් විය.

සිය පියා පසෙකින් අසුන් ගෙන මොවුන් ගේ කතාබහට සවන් දීමට ආර්යා බෙහෙවින් ප්‍රිය කලා ය. එසේම බංකු අතරේ හිඳ අනිකුත් සෙබළුන් අතරේ කෙරෙන කතාබහට සවන් දීමටද ඇය ප්‍රිය කලා ය. දරදඬු අශ්වාරෝහකයින්, ආචාර සම්පන්න නයිට්වරුන් හා තරුණ සහචරයින්, තෙම්පරාදු වූ මහළු සෙබළුන්. ඇය ඔවුන් සමග හිමබෝල සෙල්ලම් කල අතර කුස්සියෙන් පොඩි පොඩි කෑම සොරකම් කිරීමට ඔවුන්ට සහාය වූවා ය. ඔවුන් ගේ බිරින්දෑන් ඇයට කැවිලි පිරිනැමූහ. ඇය ඔවුන් ගේ බිළිඳුන්ට නම් තැබීමට උදවු වූ අතර ඔවුන් ගේ කුඩා දරුවන් සමගින් සෙල්ලම් කලා ය. මහත ටොම් ඇයට කීවේ 'කකුල යට ඉන්නා ආර්යා' කියා ය. 'අශ්ව මුහුණක් ඇති ආර්යා' ට වඩා ඇය මේ නමට කැමැති විය.

එනමුදු ඒ වින්ටර්ෆෙල් විය. ඒ වෙනමම ලෝකයක් විය. දැන් සෑම දෙයක්ම වෙනස් වී තිබින. කින්ග්ස් ලෑන්ඩින්ග්වලට පැමිණීමෙන් පසු සෙබළුන් සමග එක් වී ඔවුන් ආහාර ගත් පළමු අවස්ථාව මෙය විය. ආර්යා මෙය පිළිකුල් කලා ය. ඇය දැන් ඔවුන් ගේ කටහඬවලට වෛර කලා ය. ඔවුන් සිනාසෙන ආකාරයට, ඔවුන් ගේ කතාවලට වෛර

කලා ය. ඔවුහු ඇගේ මිතුරන්ව සිටියහ. ඔවුන් සමග සිටින විට ඇයට ආරක්ෂාවක් දැනින. එනමුදු ඒ සියල්ලක්ම බොරුවක් බව ඇය දැන් වටහාගෙන සිටියා ය. ඔවුහු රැජිණට ලේඩිව මරන්නට ඉඩ දුන්හ. එපමණක් ද? නැත. ඔවුහු දඩබල්ලාට මයිකාව මරා දමන්නට ඉඩ දුන්හ. ජේන් පූල් ආර්යාට පැවසූ අන්දමට දඩබල්ලා මයිකාව කෑලි කෑලිවලට කැපූ අතර ඔවුන්ට ඔහුව උරයක දමා ඔහු ගේ පියාට බාර දීමට සිදු විය. ඒ අසරණ මිනිසා මුලින්ම සිතුවේ ඒ කැබලි කරන ලද ඌරකු ගේ සිරුර කියා ය. එනමුදු කිසිවෙකුත් ඊට විරුද්ධව කතා කලේ හෝ අසිපතක් එසවූයේ හෝ නැත. හැමවිටම මහත් නිර්භීත ස්වරයෙන් කතා කල හාර්වින් හෝ නයිට්වරයකු වීමට සිතා සිටින ඇලන් හෝ සෙබළුන් ගේ ප්‍රධානියා වන ජොරී හෝ අන් කිසිවෙකු හෝ කිසිවක් නොකලහ. අඩුම ගනනේ ඇගේ පියාවත්!

"එයා මගේ යාළුවා." ආර්යා කිසිවෙකුටත් නොඇසෙන සේ සිය පිඟානට කොඳුලා ය. අතවත් නොගැසූ ඇගේ කෑම සීතල වෙමින් පිඟානේ එලෙසින්ම තිබින. ඒ දෙස බැලූ ආර්යාට අසනීප බවක් දැනින. පිඟාන පසෙකට තල්ලු කල ඇය මේසයෙන් නැගිට සිටියා ය.

"ඔයා ඔය කොහෙ යනවා කියලද හිතන්නෙ ආර්යාවනි?" සෙප්ටා මෝර්ඩේන් ඇසුවා ය.

"මට බඩගිනි නෑ." සිය ආචාරශීලීත්වයන් මතක් කර ගැනීමට ඇයට මඳ වේලාවක් ගතවිය. "කරුනාකරලා මට යන්ට අවසරද?" ඇය දරදඬු ලෙසින් ඇසුවා ය.

"ඔයාට යන්ට බෑ." සෙප්ටා පැවසුවා ය. "ඔයා කෑම එකට අත ගහලාවත් නෑ. ඔයා ඔය පුටුවෙ වාඩිවෙලා පිඟානෙ තියෙන කෑම ටික ඉවර කරන්ට ඕන."

"ඔයාට ඕන නං ඒක ඉවර කරන්ට." කිසිවෙකු ඇයව නැවැත්වීමට ප්‍රථම ඇය දොර දෙසට පියඹා ගියා ය. සෙප්ටා මෝර්ඩේන් ආපසු එන්නයැයි ඇයට කෑ ගැසූ අතර සෙබළු සිනහවෙන්නට පටන්ගති.

මහත ටොම් තමාට නියමිත ස්ථානය වන හස්තයේ කුළුණට ඇතුළුවන දොරකඩ මුරකරමින් සිටියේ ය. ආර්යා තමා දෙසට දිව එන ආකාරය ඔහු නිරීක්ෂණය කල අතර

සෙප්ටා ගේ හඬගැමද ඇසී තිබින. "මෙහාට එන්ට පුංචි එකී. ඔහොම ඉන්ට." ඔහු පැවසුයේ ඇයව අල්ලාගැනීමට නැඹුරු වෙමිනි. එනමුදු දෙකට නැවී ඔහු ගේ දෙපා අතරින් රිංගූ ආර්යා සර්පිලාකාර පඩිපෙළ දිගේ කුළුණ ඉහළට නැංගා ය. මහත ටොම් හති දමමින් තමා පසුපස ලුහුබැඳ එන හඬ ඇයට ඇසින.

කින්ග්ස් ලැන්ඩින්ග්වල ඇය ප්‍රිය කල එකම ස්ථානය වූයේ ඇගේ නිදන කාමරයයි. කළු පැහැ යකඩින් පිරිද්දූ සනකම් ඕක් ලීයෙන් කල එහි දොරට ඇය විශේෂයෙන්ම කැමැති වූවා ය. ඒ දොර වසා දමා බරැති හරස් පොල්ල පහත දැමූ පසු කිසිවෙකුටත් ඇගේ කාමරයට ඇතුළු වීමට නොහැකි විය. සෙප්ටා මෝර්ඩේන් හෝ මහත ටොම් හෝ සන්සා හෝ ජොරී හෝ දඩබල්ලා හෝ අන් කිසිවෙකුටත්! අදත් ඇය දොර වසා හරස් පොල්ල පහත දැමුවා ය. අන්තිමේදී ඇයට හඬන්නට සුදුසු ආරක්ෂිත ස්ථානයක් ලැබී තිබින.

කවුළුව වෙතට ගිය ඇය එහි වූ අසුනේ වාඩි වී ඉකි බිඳින්නට වූවා ය. ඇය ඔවුන් සියලුදෙනාටමත්, ඒ සියල්ලන්ටම වඩා තමන්ටමත් වෛර කරන්නට වූවා ය. සිදුවූ සියලුම වැරැදිවලට මූලිකම හේතුව ඇයයි. සන්සා එසේ කියා තිබුනා ය. ජේන් ද එසේ කීවා ය.

මහත ටොම් දොරට තට්ටු කරන්නට විය. "ආර්යා, දරුවො. මොකක්ද ප්‍රශ්නෙ? ඔයා ඔහෙ ඉන්නවද?"

"නෑ." ඇය මහ හඬින් පිළිතුරු දුන්නා ය. දොරට තට්ටු කිරීම නැවතුනු අතර මොහොතකට පසු ඔහු පිටත්ව යන ආකාරය ඇයට ඇසින. ඔහුව මුලා කිරීම හැමවිටම පහසු දෙයක් විය.

ආර්යා ඇඳ පාමුල තිබුනු සිය ඇඳුම් පෙට්ටගම වෙතට ගියා ය. බිම දණ නැමූ ඇය පියන උස්සා පෙට්ටගම අවුස්සන්ට විය. දෝතින්ම ගත් සිය සේද, පට රෙදි, විල්ලූද, ලොම් රෙදි සියල්ලක්ම බිම දසත විසිරුවා හැරිය ඇය අන්තිමේදී තමන්ට උවමනා වූ දෙය සොයා ගත්තා ය. එය පෙට්ටගම පතුලේ ඇය සැඟවූ තැන එලෙසින්ම සුරක්ෂිතව තිබින. ඉතා පරෙස්සමින් එය ඉහළට එසවූ ආර්යා පටු අසිපත් තලය හෙමිහිට කොපුවෙන් මෑත් කලා ය.

ඉදිකට්ට!

ඇයට නැවතත් මයිකා සිහි වූ අතර ඇගේ දෑසට නැවතත් කඳුළු පුරා එන්නට විය. ඒක ඇගේ වැරැද්ද! ඇගේ වැරැද්ද! ඇගේ වැරැද්ද! කඩුහරඹ පුහුණු වන්නට එන්න යැයි ඇය කිසිදා ඔහුගෙන් විමසා නොසිටියා නම්...

නැවතත් දොරට තඩිබාන හඬ ඇසින. මෙවර පෙරටත් වඩා සැරෙන්. "ආර්යා ස්ටාර්ක්! වහාම මේ දොර අරින්ට. ඔයාට මාව ඇහෙනවද?"

ඉදිකට්ට අතින් ගත් ආර්යා සැනින් ආපසු හැරුනා ය. "ඔයා ඇතුළට නැවිත් ඉන්නවානං හොඳයි." ඇය දැඩිව අසිපත වැනුවා ය.

"ඔයාගෙ තාත්තාට මේක අහන්ට ලැබෙයි." සෙප්ටා මෝර්ඩේන් කේන්තියෙන් බෙරිහන් දුන්නා ය.

"මට කමක් නෑ." ආර්යා ද පෙරලා මුරගෑවා ය. "යනවා යන්ට මෙතනින්."

"ඔයාගෙ මේ නරක හැසිරීම ගැන ඔයාට බොහොම පසුතැවෙන්ට වෙයි ආර්යාවනි. මම පොරොන්දු වෙනවා ඔයාට එහෙම වෙනවයි කියලා."

සෙප්ටා ගේ පියවර හඬ මැකී යනතෙක් ඇය දොර දෙසට කණ් දුන්නා ය.

අසිපතත් අතැතිව නැවත කවුළුව වෙතට ගිය ඇය පහළ ඇති අංගනය දෙස බැලුවා ය. ඇයටත් බ්‍රැන්ට මෙන් නැගීමට පුළුවන්කමක් තිබුනා නම්, ඇය සිතුවා ය. එසේ නම් ඇයට මේ කවුළුවෙන් පැන, කුළුණ දිගේ පහතට බඩ ගා, මේ ජරා අසික්කිත ස්ථානයෙන් පිටව පලායන්නට තිබින. සන්සා, සෙප්ටා මෝර්ඩේන්, ජොෆ්රි කුමරා, මේ සියල්ලන්නේම මිදී පලායන්නට තිබින. කුස්සියෙන් කෑම ටිකක් සොරකම් කරගෙන, ඉදිකට්ට හා උණුසුම් ඇඳුම් ටිකක් හා ඇගේ හොඳ සපත්තු කුට්ටමද රැගෙන පලායන්නට තිබින. ගංගා ත්‍රිශූලය

අසබඩ කැලෑවක සිටිනා නයිමේරියා ද ඇයට සොයා ගත හැකි වනු ඇත. එවිට ඔවුන් දෙදෙනාට එක්ව නැවත වින්ටර්ෆෙල්වලට යාමට හෝ ප්‍රාකාරයේ සිටින ජොන් වෙත පලායාමට හෝ හැක. ජොන් ඇයත් සමග මෙහි සිටියා නම්... එසේ නම් ඇයට මෙතරම් තනිකමක් නොදැනෙනු ඇත.

දොරට කෙරුනු මෘදු තට්ටු කිරීමක් නිසා ඇගේ සිහින ලොව බිඳවැටුනු අතර ඇය කවුළුව වෙතින් ආපසු හැරුනි. "ආර්යා." ඇගේ පියා ගේ කටහඩ ඇසින. "දොර අරින්ට දරුවො. අපි දෙන්නා කතා කරන්ට ඕන."

කාමරය හරහා පියමැන්න ආර්යා දොරේ හරස් පොල්ල එසවූවා ය. පියා එතැන තනිවම සිටගෙන සිටියේ ය. ඔහු වෙතින් දිස්වූයේ කේන්ති ගිය පෙනුමකට වඩා දුක්මුසු බවකි. එය ආර්යා ගේ මනෝභාව තවත් නරක අතට පෙරලූයේ ය. "මම ඇතුළට එන්න ද?" හිස සැලූ ආර්යා ලැජ්ජාවෙන් බිම බලා ගත්තා ය. පියා ඔහුට පිටුපසින් දොර වැසී ය. "කාගෙද ඔය කඩුව?"

"මගේ." ඇයට අතේ ඇති ඉදිකට්ට මුළුමනින්ම පාහේ අමතකව තිබින.

"ඒක මට දෙන්ට."

ආර්යා සිය අසිපත අකැමැත්තෙන් මෙන් පියාට බාරදුන්නේ නැවත කිසිදා එය දකින්නට නොලැබේ යැයි දුක් වෙමිනි. ඇගේ පියා එය ආළෝකයට අල්ලා තලයේ දෙපසම පිරික්සා බැලී ය, එහි තුඩ මහපටැඟිලි අගින් පිරික්සා බැලී ය. "බ්‍රාවොස්වල පාවිච්චි කරන ජාතියෙ කඩුවක්. ඒ වුනත් මම හිතන්නෙ මට පුළුවන් ඒක හදපු කෙනාගෙ සලකුණ අඳුරගන්ට. මේක මික්කෙන්ගෙ වැඩක්."

ඔහුට බොරුවක් කියා ගත නුහුනු ඇ දෑස් බිමට හරවා ගත්තා ය.

එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් සුසුමක් හෙලී ය. "මගේ අවුරුදු නවයේ දුවට මට අයිති කම්මලේම හදාපු කඩුවක් තියෙනවා. ඒත් මම ඒ ගැන දන්නෙ නෑ. රජතුමාගෙ හස්තය

රාජධානි සප්තකය පාලනය කරන්ට ඕන. ඒ වුනත් ජේන හැටියට නම් මට මගේ ගෙදරවත් පාලනය කරගන්ට බෑ. ඔයා කොහොමද කඩුවක් අයිති කරගත්තෙ ආර්යා? ඔයාට කොහෙන්ද මේක ලැබුනෙ?"

කිසිවක් නොකී ආර්යා දෙතොල සපා ගත්තා ය. සිය පියාට වුව, ජොන් කල දේ පාවාදීමට ඇයට උවමනා නොවී ය.

මොහොතකට පසු පියා නැවතත් කතාව ඇරඹුවේ ය. "ඇත්තටම, මම හිතන්නෙ නෑ ඒක එච්චර වැදගත් වෙයි කියලා." ඔහු නැවත වරක් සිය අතේ ඇති අසිපත දෙස බැල්මක් හෙළී ය. "මේක පොඩි ළමයින්ට ගැලපෙන සෙල්ලම් බඩුවක් නෙවෙයි. විශේෂයෙන්ම ගෑණු ළමයින්ට. ඔයා කඩුත් එක්ක සෙල්ලම් කරනවා කියලා දැනගත්තොත් සෙප්ටා මෝර්ඩේන් මොනවා කියාවිද?"

"මම ඒකත් එක්ක සෙල්ලම් කලේ නෑ. මට සෙප්ටා මෝර්ඩේන් ජේන්ට බෑ."

"ඔය ඇති." පියා ගේ ස්වරය දැඩි විය. "සෙප්ටා කරන්නෙ එයාගෙ රාජකාරිය. ඔයා නිසා ඒ අහිංසකීට ඒ රාජකාරිය කොච්චර එපාවෙලාද කියලා දෙයියොම තමා දන්නෙ. ඔයාගෙ අම්මයි මමයි එයාට කියලා තියෙන්නෙ ඔයාව ආර්යාවක් කරන්ට උගන්නන්ටයි කියලා."

"මට ආර්යාවක් වෙන්ට ඕන නෑ."

"මම හරිනං දැන් මේ කඩුව දණහිසේ ගහලා දෙකට කඩලා දාන්ට ඕන. මේ විකාර නවත්තන්ට ඕන."

"ඉදිකට්ට එහෙම ලේසියෙන් දෙකට කැඩෙන්නෙ නෑ." ආර්යා කීවද ඇගේ ස්වරයෙන් එය ඇත්තක් නොවන බැව් තහවුරු විය.

"ඒකට නමකුත් තියෙනවා එහෙනං ආ!" ඇගේ පියා නැවතත් සුසුමක් හෙලුවේ ය. "අනේ ආර්යා! ඔයාගෙ මහ පිස්සු දඩබ්බර ගතියක් තියෙනවා කෙල්ලෙ. 'වෘක ලේ' මගේ තාත්තා එහෙමයි ඕකට කිවුවෙ. ලියානාටත් ඕක චුට්ටක් විතර තිබුනා. මගේ අයියා බ්‍රැන්ඩන්ට ඊට වඩා ඕක තිබුනා. ඒ වුනත්.. ඒ නිසාම ඒ දෙන්නම බොහොම ඉක්මනට මිනීවලට ගියා." ඔහු ගේ ස්වරයේ ඇති දුක්මුසු බව ආර්යාට මැනවින් වැටහින. ඔහු සිය පියා ගැන කතා කලේ ඉතා කලාතුරකිනි. එමෙන්ම ඇය ඉපදීමටත් පෙර මියගිය සිය සොහොයුරා හා සොයුරිය ගැන කතා කලේ ද ඉතා අඩුවෙනි. "මගේ තාත්තා අවසර දුන්නානං ලියානාත් මේ වගේ කඩුවක් පාවිච්චි කරන්ට තිබුනා. ඔයා නිසා මට සමහර වෙලාවට එයාව මතක් වෙනවා. ඔයාගෙ පෙනුමත් එයාට සමානයි."

"ලියානා ලස්සනයි." ආර්යා කීවේ විස්මයෙනි. සැමදෙනාම ඒ බැව් කියා තිබින. එනමුදු ඒ වචනය කිසිදා ආර්යා වෙනුවෙන් භාවිත නොවුනකි.

"එයා ලස්සනයි තමා." එඩාර්ඩ් ස්ටාර්ක් එකඟ විය. "ලස්සනයි. ඒ වගේම මුරණ්ඩුයි. ඒ වගේම නියමිත කාලෙට කලින් මිනීවලට ගියා." ඔහු අසිපත ඔවුන් දෙදෙනා මැදින් එසවූයේ ය. "ආර්යා. ඔයා මොකක්ද මේ... ඉදිකටටෙන් කරන්ට බලාපොරොත්තු වෙන්නෙ? ඔයා කාටද මේකෙන් අනින්ට බලාපොරොත්තු වෙන්නෙ? ඔයාගෙ අක්කටද? සෙප්ටා මෝර්ඩේන්ටද? ඔයා දන්නවද කඩු සටන්වල පළවෙනි පාඩමවත්?"

ඇයට සිතා ගත හැකි වුනු එකම දේ ජොන් විසින් ඇයට කියා දුන් දේ පමණි. "ඒකෙ උල් පැත්තෙන් තමා අනින්ට ඕන." ඇය කීවා ය.

ඇගේ පියා සිනාවක් මැඩගත්තේ ය. "මං හිතනවා ඒක තමා මූලිකම දේ කොහොම වුනත්."

ආර්යාට සියල්ල සිය පියාට විස්තර කිරීමට දැඩිව උවමනා විය. සිදුවූ සියල්ලම ඔහුට පැහැදිලිව පෙන්නා දීමට උවමනා විය. "මම ඉගෙනගන්ට උත්සාහ කලා. ඒ වුනත්..." ඇගේ දෑසට නැවතත් කඳුළු පුරා ආවේ ය. "මම ඇහුවා මයිකාගෙන් මාත් එක්ක පුහුණුවෙන්ට කියලා." හදිසියේම නැවත අලුත් වූ දුක පිටාර ගලන්නට විය. ඇය ගැහෙමින් අනික් පසට හැරුනා ය. "මමයි එයාගෙන් ඇහුවෙ." ඇය හඬන්නට පටන් ගත්තා ය. "ඒක මගේ වැරැද්ද. ඒක මගේ..."

පියා ගේ දෑත් ඇ වටා ගියේ ය. ඔහු මෘදු ලෙසින් ඇයව බදා වැළඳගෙන සිටි අතර ආපසු හැරුනු ඇය ඔහු ගේ පපුවට තුරුළු වී වැළපෙන්නට වූවා ය. "නෑ මගේ රත්තරනේ." ඔහු මිමිනී ය. "ඔයාගෙ යාළුවා ගැන ඇතිතරම් දුක්වෙන්ට. ඒ වුනත් එයාට සිද්දවෙච්ච් දේ ගැන වැරැද්ද ඔයා පිට පටවගන්ට එපා. ඔයා නෙවෙයි ඒ මස්කාරයගෙ පුතා මැරුවෙ. ඒ මිනීමැරීම වැටෙන්නෙ දඩබල්ලා පිටටයි. එයාටයි, එයා සේවය කරන අර නපුරු ගෑනි පිටටයි."

"මම එයාලට වෛර කරනවා." ආර්යා රතු වූ මුහුණින් යුතුව ඉකිබිඳිමින් පාපොච්චාරණය කලා ය. "දඩබල්ලයි, රැජිණයි, රජ්ජුරුවොයි, ජොෆ්රි කුමාරයයි. මම ඒ හැමෝටම වෛර කරනවා. ජොෆ්රි බොරු කිවුවා. ඒක සිද්ද වුනේ එයා කියපු විදියට නෙවෙයි. මම සන්සටත් වෛර කරනවා. එයාට හැම දෙයක්ම මතකයි. ඒත් එයා බොරු කිවුවා. එයා හිතුවා එතකොට ජොෆ්රි එයාට කැමැති වෙයි කියලා."

"අපි හැමෝම බොරු කියනවා." ඇගේ පියා කීවේ ය. "ඔයා හිතනවද මම ඇත්තටම විශ්වාස කරනවා කියලා නයිමේරියා පැනලා ගිය කතාව?"

ආර්යා වරදකාරී අයුරින් රතු වූවා ය. "ජොරී පොරොන්දු වුනා කාටවත් ඒ ගැන කියන්නෙ නෑ කියලා."

"ජොරී එයාගෙ පොරොන්දුව රැක්කා." ඇගේ පියා සිනාවක් රැඳුනු මුවින් යුතුව කීවේ ය. "සමහර දේවල් තියෙනවා, මට නොකිවුවත් තේරුම් ගන්ට පුළුවන් දේවල්. ඒ වෘකයා එයාගෙ තනි කැමැත්තෙන් ඔයාව අත ඇරලා පැනලා යන්ට හිතන්නෙවත් නෑ කියලා අන්ධයෙකුට වුනත් පේනවා."

"අපට සිද්ද වුනා එයාට ගල්වලින් ගහන්ට." ඇය දුක්ඛිත ස්වරයෙන් කියා සිටියා ය. "මං කිවුවා එයාට දුවන්ටයි කියලා. නිදහස් වෙලා යන්ටයි කියලා. මං එයාට කිවුවා මට එයාව ආයෙමත් ඕන නෑ කියලා. එයාට තව ඕන තරම් වෘකයො කැලේ ඉන්නවා සෙල්ලම් කරන්ට. අපට ඇහුනා උං උඩුබුරලන සද්දෙ. ජොරී කිවුවා කැලේ ඕන තරම් සත්තු ඉන්නවා කියලා. ඒ නිසා එයාට පුළුවන් මුවෝ දඩයම් කරන්ට. ඒ වුනත් එයා ඒ කියන

කිසිම දෙයක් අහන්නෙ නැතුව අපි පස්සෙන්ම එන්ට ගත්තා. ඉතින් අන්තිමේදි අපට සිද්ද වුනා එයාට ගල්වලින් ගහලා එලවලා දාන්ට. මම එයාට දෙපාරක්ම ගැහුවා. එයා ඒ වුනත් කෙඳිරි ගගා මා දිහාම බලන් හිටියා. මට හරි ලැජ්ජා හිතුනා මම කරපු දේ ගැන තාත්තෙ. ඒ වුනත් ඒක හරි නේද? එහෙම නේද? එයා හිටියානං රජිණ එයාව මරලා දායි."

"ඔයා කරපු දේ හරි." ඇගේ පියා කීවේ ය. "ඒ කිවුව බොරුව වුනත්.. ගෞරවනීය බොරුවක්." ඇයව වැළඳගැනීම පිණිස පසෙකින් තබන ලද ඉදිකට්ට නැවත අතට ගත් ඔහු කවුළුව වෙතට ඇවිද ගොස් එහි සිට මඳ වේලාවක් පහත අංගනය දෙස බලා සිටින්නට විය. ඔහු නැවත හැරුනු විට ඒ දෑසේ කල්පනාකාරී බැල්මක් තිබින. කවුළුව අසල වූ අසුනේ වාඩි ගත් ඔහු ඉදිකට්ට උකුළ මත තබා ගත්තේ ය. "ආර්යා වාඩිවෙන්ට. මට ඔයාට පුංචි පුංචි දේවල් කීපයක් විස්තර කරලා දෙන්ට තියෙනවා."

ආර්යා තැවිලි සහගත සිතින් ඇඳ අද්දර වාඩි වූවා ය. "මගේ හිතේ තියෙන දුක් කරදර ඔක්කෝම කියන්ට තරං ඔයා පුංචි වැඩියි. ඒ වුනත් ඔයා වින්ටර්ෆෙල්වල ස්ටාර්ක් කෙනෙක්. ඔයා දන්නවනෙ අපේ වචන."

"සීත කාලය එනවා." ආර්යා මිමිනුවා ය.

"නරක නපුරු කාලෙ. අපට ඒකෙ හැටි කොහොමද කියලා පොඩ්ඩක් විතර විඳින්ට සිද්ද වුනා ත්‍රිශූලයේදි. ඒ වගේම බ්‍රැන් වැටුන වෙලාවෙ. ඔයා ඉපදුනෙ දිග ගිම්හාන කාලෙක මැද්දෙ රත්තරනේ. ඔයා වෙන කිසිම දෙයක් ගැන දැනගන්ට විදියක් නෑ. ඒ වුනත් දැන් ඇත්තටම සීත කාලෙ එනවා. ඔයාට මතකයිනෙ අපේ වංශ සලකුණ ආර්යා."

"සෝරවෘකයා." ඇය පිළිතුරු දුන්නේ නයිමේරියා ගැන කල්පනා කරමිනි. ඇය සිය දණහිස් පපුවට තද කර ගත්තා ය. ඇයට හදිසියේම දැඩි බියක් දැනෙන්නට විය.

"මං ඔයාට කියලා දෙන්නං දරුවො වෘකයො ගැන පොඩි දෙයක්. හිම වැටෙන්ට පටන් ගත්තම, සීතල හුළං හමන්ට පටන් ගත්තම තනිවෙච්ච වෘකයා මැරෙනවා. ඒ වුනත් වෘක රංචුව පණ බේරගන්නවා. ගිම්හාන කාලෙදි පුංචි පුංචි රණ්ඩු දබර කරගත්තට කමක් නෑ. ඒ වුනත් සීත කාලෙදි අපි එකිනෙකාව ආරක්ශා කරගන්ට ඕන. එකිනෙකාව උණුහුමට

තියාගන්ට ඕන. අපේ ශක්තිය බෙදාහදා ගන්ට ඕන. ඉතින් ඒ නිසා වස්තුවෙ, ඔයාට වෛර කරන්ටම ඕන නං අපට ඇත්තටම නපුරක් කරන අයට විතරක් වෛර කරන්ට. සෙප්ටා මෝර්ඩේන් කියන්නෙ හොඳ ගෑනු කෙනෙක්. එතකොට සන්සා... සන්සා කියන්නෙ ඔයාගෙ අක්කා. ඔයාලා දෙන්නා ඉරයි හඳයි වගේ වෙනස්ම දෙන්නෙක් වෙන්ට පුළුවන්. ඒ වුනත් ඔයාලා දෙන්නගෙම හදවත්වලින් ගලන්නෙ එකම ලේ. ඔයාට එයාව ඕන, එයාට ඔයාව ඕන... දෙයියො මට පිහිටවෙන්ට, මට ඔයාලා දෙන්නවම ඕන."

ඔහු ගේ ස්වරයේ කෙතරම් දැඩි වෙහෙසක් තිබිනද යත් ආර්යාට ඔහු ගැන දුකක් දැනින. "මම සන්සාට වෛර කරන්නෙ නෑ. ඇත්තටම නෑ." එය අර්ධ-බොරුවක් විය.

"මම මේ ඔයාව බය කරන්ට යනවා නෙවෙයි. ඒ වුනත් මට ඔයාට බොරුවක් කියන්ටත් ඕන නෑ. අපි මේ ඇවිල්ලා ඉන්නෙ බොහොම අඳුරු, බොහොම භයානක තැනකට දරුවො. මේ වින්ටර්ෆෙල් නෙවෙයි. අපට නපුරක් කරන්ට බලාඉන්න සතුරො මෙහෙ ඉන්නවා. ඒ නිසා අපට අපි අතරෙම යුද්ධයක් කරන්ට බෑ. ඔයාගෙ මේ මුරණ්ඩුකම්, පැනලා යන ඒවා, තරහෙන් බනින ඒවා, අකීකරුකම්... ගෙදරදි නම් ඒවා පොඩි දරුවෙකුගෙ ගිම්හාන කාලෙ සෙල්ලම් කියලා අමතක කරලා දාන්ට පුළුවන්. ඒ වුනත් මෙතැන, මේ කාලෙ, සීත කාලෙ අපි උඩට වැටිලා තියෙන කාලෙ ඒක වෙනමම ප්‍රශ්නයක්. දැන් ඔයාට ලොකු දරුවෙක් වෙන්ට කාලෙ හරි."

"මම එහෙම කරන්නම්." ආර්යා පොරොන්දු විය. මේ මොහොතේ සිය පියා ගැන ඇගේ සිතේ ඇතිවුනු ආදරය බඳු ආදරයක් මින් පෙර කිසිදා ඇතිවී නොතිබින. "මට ශක්තිමත් වෙන්ටත් පුළුවන්. මට පුළුවන් රොබ් තරම්ම ශක්තිමත් වෙන්ට."

ඔහු මීට ඉදිරියට සිටින සේ ඉදිකට්ට ඇය දෙසට දිගු කලේ ය. "මෙන්න.. අරගන්ට.."

ඇය විස්මය මුසු වූ දිදුලන දෑසින් අසිපත දෙස බැලුවා ය. මොහොතකට ඇයට එයට අත ගැසීමට බියක් දැනින. ඇය එයට අත ගැසුවහොත් නැවතත් එය ඇගෙන් උදුරා ගනු ඇතැයි බියක් දැනින. එනමුදු ඇගේ පියා නැවත කතා කලේ ය. "ඒක ගන්ට. ඒක ඔයාගෙ." ඇය අසිපත අතට ගත්තා ය.

"මට ඒක තියාගන්ට පුළුවන් ද?" ඇය ඇසුවා ය. "ඇත්තටම ද?"

"ඇත්තටම ඇත්ත." ඔහු සිනා මුවින් යුතුව කීවේ ය. "මේක ඔයාගෙන් අරගත්තොත්, කිසිම සැකයක් නෑ තව සති දෙකක් යන්ට කලින් මට ඔයාගෙ කොට්ටෙ යට තිබිලා කටු යගදාවක් හම්බවෙයි. ඔයාගෙ අක්කට ඕකෙන් අනින්නෙ නැතුව ඉන්න උත්සාහ කරන්ට. එයා කොච්චර ඔයාව ඇවිස්සුවත්."

"මම එහෙම කරන්නෙ නෑ. මම පොරොන්දු වෙනවා." පියා කාමරයෙන් නික්මෙද්දී ඇය අසිපත පපුවට තුරුළු කරගත්තා ය.

පසුදා උදෑසන ආහාරය අතරතුරේදී ඇය සිදුවූ දේ සම්බන්ධයෙන් සෙප්ටා මෝර්ඩේන්ගෙන් සමාව අයැද සිටියා ය. සෙප්ටා ඇය දෙසට සැකමුසු බැල්මක් හෙලුවද ඇගේ පියා එකඟතාව පලකරන බැල්මකින් හිස සැලුවේ ය.

--------------------------------

දින තුනකට පසු මධ්‍යාහ්නයේදී නිවාස බාරකරු වූ වයොන් පූල් විසින් ආර්යාව කුඩා ශාලාව වෙත පිටත් කර හරින ලදී. ශාලාවේ මේස සියල්ල අකුලා තිබුනු අතර බංකු බිත්තිය අයිනේ අසුරා තිබින. ශාලාව මුළුමනින්ම හිස්ව තිබින. එනමුදු නුහුරු කටහඬක් ඇයව ඇමතී ය. "ඔයා ප්‍රමාදයි කොල්ලො." තට්ට හිසකින් හා උකුස්සකු ගේ මෙන් වක් වූ දිගැටි නාසයකින් හෙබි කෙට්ටු මිනිසෙක් සෙවනැලි මුවාවේ සිට ඉදිරියට පිය මැන්නේ ය. ඔහු ගේ අතේ ලීයෙන් කල අසිපත් දෙකක් තිබින. "හෙට ඔයා හරියටම මද්දහනේ මෙතනට එන්ට ඕන." ඔහු ගේ උච්චාරණය අනුව ඔහු නිදහස් නගරවලින්, සමහරවිට බ්‍රාවොස් හෝ ම(ර්)වලින් පැමිණියකු වන්නට ඇතැයි ආර්යා අනුමාන කලා ය.

"ඔයා කවුද?" ආර්යා ඇසුවා ය.

"මම තමා ඔයාගෙ නැටුම් ගුරුවරයා." ඔහු එක් අසිපතක් ඇය දෙසට වීසි කලේ ය. ඇය එය අල්ලා ගැනීමට නැඹුරු වූවද අතින් ගිලිහී ගිය එය හඬක් නගමින් බිම පතිත විය. "හෙට ඔයා ඒක අල්ලගන්ට ඕන. දැන් ඒක අහුලගන්ට."

එය නිකංම නිකං ලී දණ්ඩක් නොව මනාව හැඩගසන ලද, මිටකින් හා ආවරණයකින් යුක්ත වූ නියම ලී අසිපතක් විය. එය අහුලා ගත් ආර්යා සැකසහිත අයුරින් එය දෑතින්ම අල්ලාගෙන තමාට ඉදිරියෙන් එසවූවා ය. එය පෙනුනාට බර විය. ඉදිකට්ටටද වඩා බර විය.

තට්ට මිනිසා දත් එකට වද්දා 'ටික් ටික්' හඬක් නැංවී ය. "ඔහොම නෙවෙයි ඕක අල්ලන්නෙ කොල්ලො. මේක අත්දෙකින්ම අල්ලගන්ට ඕන දිග කඩුවක් නෙවෙයි. ඒක එක අතකින් අල්ලගන්ට."

"ඒක හරි බරයිනෙ."

"ඒක බරකරලා තියෙන්නෙ ඒක සමබර වෙන්ට ඕන නිසා. අනික ඔයාව ශක්තිමත් කරන්ට ඕන නිසා. ඒක ඇතුළෙ හිලක් විදලා ඊයම් පුරවලයි තියෙන්නෙ. හරි දැන්, එක අතකින් අල්ලගන්ට."

සිය දකුණත මිටෙන් ඉවත් කල ආර්යා දහදිය වැකි අත්ල කලිසමේ පිසදා හැර වමතින් අසිපත ඔසවාගත්තා ය. මිනිසා එයින් සතුටු වූ බවක් පෙනින. "වමත වඩා හොඳයි. හැමදේම අනිත් පැත්ත ගැහෙනවා. ඒක ඔයාගෙ සතුරන් තවත් ව්‍යාකූල කරනවා. දැන් ඔයා ඔය හිටගෙන ඉන්න විදිය වැරැදියි. ඔයාගෙ ඇඟ පැත්තට හරවන්ට. අන්න හරි. ඔයා දන්නවද, ඔයා හරියට හෙලලක් වගේම කෙට්ටුයි. ඒකත් හරිම හොඳ දෙයක්. ඒ කියන්නෙ සතුරාගෙ ඉලක්කය පොඩියි. හොඳයි, දැන් මිට. කෝ බලන්ට." ළඟට පැමිණි ඔහු අසිපත් මිට අල්ලාගෙන සිටින ඇගේ ග්‍රහණය නිවැරැදි කලේ ය. "ආන්න හරි. එහෙම තමා. ඒක මිරිකන්ට එපා. බුරුලට අල්ලන්ටත් එපා. නියම ගානට අල්ලන්ට."

"ඒක වැටුනොත් මොකද වෙන්නෙ?" ආර්යා ඇසුවා ය.

"කඩුව ඔයාගෙ අතේම කොටසක් වෙන්ට ඕන. ඔයාට ඔයාගෙ අතේ කොටසක් වට්ටන්ට පුළුවන් ද? බෑ. සිරියෝ ෆොරල් අවුරුදු නවයක් බ්‍රාවොස්වල ප්‍රධාන නැවු හිමියගෙ නායක සෙබලා වෙලා හිටියා. එයා දන්නවා මේ දේවල් ගැන. ඒ නිසා එයා කියන දේවල් අහන්ට කොල්ලො."

ඒ ඔහු ඇයට කොල්ලා කියා ඇමතූ තෙවන අවස්ථාව විය. "මම කෙල්ලෙක්." ආර්යා විරෝධාත්මක ස්වරයෙන් කීවා ය.

"කොල්ලෙක්. කෙල්ලක්. ඔයා කඩුවක්. එච්චරයි වැදගත්." ඔහු නැවතත් දත් එකට වද්දා ටික් ටික් හඬ නැංවී ය. "කොහොම හරි, එහෙම තමා කඩුව අල්ලගන්ට ඕන. ඔයා ඔය පොරවක් නෙවෙයි උස්සගෙන ඉන්නෙ. ඔයා උස්සගෙන ඉන්නෙ-"

"ඉදිකට්ටක්." ආර්යා ඔහු වෙනුවෙන් වාක්‍යය අවසන් කලා ය.

"කොහොම හරි. දැන් අපි නැටුම පටන් ගමු. මතක තියාගන්ට දරුවො, වෙස්ටෙරොස්වල නයිට්වරු නටන විදියෙ යකඩ නැටුමක් නෙවෙයි අපි මේ පුරුදුවෙන්ට යන්නෙ. ඒකෙ කැපිලි කෙටිලි නෑ. මේකට කියන්නෙ බ්‍රාවොස් නැටුම කියලා. දිය නැටුම. වේගවත්, ක්ෂණිකයි. ඔයා දන්නවද, හැම මිනිහෙක්ම හැදිලා තියෙන්නෙ වතුරවලින්. ඔයා එයාලට ඇනලා පසාරු කලොත් ඒ වතුර කාන්දු වෙලා එයාලා මැරෙනවා." අඩියක් පසුපසට ගත් ඔහු සිය අසිපත එසවී ය. "හොඳයි, දැන් ඔයා උත්සාහ කරන්ට මට පහරදෙන්ට..."

ආර්යා ඔහුට පහරදීමට උත්සාහ කලා ය. පැය හතරක් පුරා උත්සාහ කලා ය. අන්තිමේදී ඇගේ සිරුරේ සෑම මාංශපේෂියක්ම වේදනාවෙන් ඇදුම් කන්නට පටන් ගති. සිරියෝ ෆොරල් සෑම විටකම සිය ටික් ටික් හඬ නංවමින් කුමක් කලයුතු දැයි ඇයට උපදෙස් දුන්නේ ය.

ඊළඟ දිනයේ ඔවුන් ගේ පුහුණුවීම් සැබෑවටම ඇරඹින.

Eddard Stark: “When the snows fall and the white winds blow, the lone wolf dies, but the pack survives.”

ඩනේරිස් 03-1

"මේ තියෙන්නෙ ඩොත්රැකි මුහුද." සෙර් ජෝරා මෝර්මන්ට් පැවසූයේ කඳු වැටිය මුදුනේ සිටි ඇය අසලින් සිය අසු නතර කරමිනි.

ඔවුන්ට පහලින් වූ තැනිතලාව, අනන්තය දක්වා විහිදී පැතිරින. එය ඈතින් පෙනුනු ක්ෂිතිජය දක්වාත් ඉන් ඔබ්බටත් දිවගිය සුවිසල්, සමතලා ප්‍රදේශයක් විය. 'ඒක නම් ඇත්තටම මුහුදක් තමා' ඩැනී සිතුවා ය. මෙතැනින් එහාට කුඩා කඳු ගැට, කඳු වැටි, ගස්කොළන්, නගර හෝ පාරවල් වැනි කිසිවක් නොවීය. එහි තිබුනු එකම දෙය කෙළවරක් නොවූ තණබිම් පමණි. උසට වැඩුනු තණගස් සුළඟේ රිද්මයට අනුව එහා මෙහා පැද්දුනේ නගින බහින රළපෙලක් පරිද්දෙනි. "ඒක හරිම කොළපාටයි" ඇය පැවසුවා ය.

"දැනට නම් කොළපාටයි තමා." සෙර් ජෝරා එකඟ විය. "ඒ වුනත් මෙතන බලන්ට තියෙන්නේ මල් පිපෙන කාලෙට. අර කොණේ ඉඳන් මේ කොණ වෙනකම්ම තද රතුපාට මල් පිපිලා. හරියට ලේ පිරිච්ච මුහුදක් වගේ. පායන කාලෙ ආවහම මුලු ලෝකෙම තඹපාටට හැරෙනවා. අනික මෙතන තියෙන්නේ 'හ්රානා' තණකොළ විතරයි දරුවෝ. ඒත් ඇතුළට යන්ට යන්ට තව සිය ගානක් තණකොළ වර්ග තියෙනවා. ලෙමන් ගෙඩි වගේ කහ පාට තණකොළ, තද නිල්-දම් පාට තණකොළ, නිල් පාට, තැඹිලි පාට, දේදුන්නක් වගේ පාට පාට තණකොළ. මිනිස්සු කියනවා අෂයිවලට එහා සෙවණැලි දේශයේ තියෙනවාලු සාගරයක් තරම් පැතිරිච්ච 'හොල්මන් තණකොළ' කියලා තණකොළ වර්ගයක්. ඒවා අසරුවෙකුටත් වඩා උසට වැවෙනවලු. ඒවායේ තල වීදුරුවලටත් වඩා සුදුමැලිලු. මේවා ශාපලත් ආත්ම වගේ අඳුරේ දිලිසෙනවලු. මේ හොල්මන් තණකොළ අනිත් තණකොළ ජාති ඔක්කොම මරාදාමින් ඒවා යට කරගෙන පැතිරෙනවලු. ඩොත්රැකියෝ කියන්නේ කවදාහරි මේ තණකොළවලින් ලෝකයම වැහිලා යනවලු. එදාට මේ මුලු ලෝකයමත්, ඒකෙ ඉන්න ජීවීන් හැමෝමත් විනාස වෙලා යනවලු."

ඒ සිතුවිල්ල ඩැනීගේ සිරුර සලිත කරවීය. "මට ඒ වගේ දේවල් ගැන දැන් කතා කරන්ට උවමනා නෑ." ඇය කීවා ය. "මෙතන හරිම ලස්සනයි. මේ හැමදේම මැරිලා යනවා කියලා හිතන්ට මට උවමනා නෑ."

"ඔබ කැමැති විදියක් ඛලීසි." සෙර් ජෝරා ගරුසරු ඇතිව කීය.

ඔවුන්ට පිටුපසින් කටහඬවල් ඇසුනෙන් ඇය ආපසු හැරී බැලුවා ය. මෝර්මන්ට් හා ඇය විසින් පසුකර ආ ඔවුන්ගේ කණ්ඩායමේ ඉතිරි පිරිස ඔවුන් සිටි කඳු ගැටය නගිමින් සිටියහ. ඇගේ සේවිකාව වූ ඉරී සහ අනෙක් තරුණ දූනුවායෝ නරාශ්වයන් තරම් මටසිළුටු අන්දමින් සිය අසුන් මෙහෙයවමින් සිටියහ. එහෙත් විසේරිස් සිටියේ තවමත් ඔහුට නුහුරු කෙටි පා පටි හා කුඩා පැතලි සැදලයත් සමගින් තරග වදිමිනි. ඇගේ සොයුරා ගේ පෙනුම අතිශයින්ම දුක්ඛිත විය. සැබැවින්ම නම් ඔහුට තිබුනේ මෙම ගමන නැවිත් සිටින්නට ය. ඔහුට පෙන්ටොස් වල නවතින්නට යැයි මැජිස්ටර් ඉල්ලීරියෝ බල කර කියා සිටියේ ය. ඔහුට තමාගේ මන්දිරයේ ආගන්තුක සත්කාර පුද කර සිටියේ ය. එහෙත් ඒ කිසිවකට කණ් දුන්නේ විසේරිස් නොවේ. තම ණය පියවෙන තුරු, තමාට පොරොන්දු වූ සිහසුන හිමිවන තුරු අත් නොහරින සෙවනැල්ලක් මෙන් ඩ්‍රෝගෝ පසුපස යාමට ඔහුට උවමනා විය. "ඌ මට බොරු කලොත් මකරා නැගිට්ටවීමේ විපාක ඌ දැනගනීවි." විසේරිස් දිවුරා පොරොන්දු වූයේ මැජිස්ටර්ගෙන් ඉල්ලාගත් අසිපත මත අත තබාගෙන ය. වේගයෙන් ඇසිපිය ගැසූ ඉල්ලීරියෝ ඔහුට වාසනා වේවා යැයි සුබ පැතීය.

මේ සුන්දර මොහොතේ තම සොහොයුරාගේ නොනවතින කන්දොස්කිරියාවට සවන්දීමට තමාට නුවුමනා බව ඩැනීට වැටහින. එය කදිම දවසක් විය. අහස තද නිල් පැහැ වූ අතර ඈත ඉහළ දඩයම් උකුස්සකු රවුමට රවුමට පියාඹනු පෙනින. හමන සුළඟේ සැම හුස්මක් පාසාම තෘණ සාගරය රිද්මයකට මෙන් එහා මෙහා පැද්දුනේ ය. ඇගේ මුහුණ මත ගැටුනු වාතය උණුසුම් විය. ඇයට දැනුණේ සැනසීමකි. මේ ශාන්ත බව විනාශ කිරීමට විසේරිස්ට ඉඩ නොදිය යුතුය.

"මෙතන ඉන්ට." ඩැනී සෙර් ජෝරාට කීවාය. "හැමෝටම මෙතන නවතින්ට කියන්ට. මම අණ කලා කියලා කියන්ට."

නයිට්වරයා සිනාසුනේ ය. සෙර් ජෝරා කඩවසම් මිනිසෙකු නොවී ය. ඔහුට ගවයකුට මෙන් මසින් පිරුනු ගෙලක් හා උරහිස් පිහිටා තිබින. ඔහුගේ පපුව හා දෑත් පුරාම රළු මවිල් පිරී තිබුනු අතර හිසේ එක කෙස් ගසකුදු ඉතිරි වී නොතිබින. එනමුදු ඔහුගේ සිනහව ඩැනී තුල ඇතිකලේ සතුටකි. "ඔබ රැජිණක් වගේ කතා කරන්ට ඉගෙන ගන්නවා ඩනේරිස්."

"රජිණක් නෙමේ. බලීසි කෙනෙක්." තමාගේ අසු හරවාගත් ඇය තනිවම ගැටිය පහලට පිම්මේ අසු පැන්නුවා ය.

බැස්ම අධික බෑවුම් සහිත හා ගල්කුලු පිරුනු එකක් විය. එහෙත් ඈ නොබියව අසු මෙහෙයවූවා ය. එහිවූ බියමුසු සතුට ඇගේ හදෙහි ගී රාව නැංවී ය. ඇගේ මුලු ජීවිත කාලය පුරාම විසේරිස් පැවසුවේ ඇය කුමාරිකාවක බවය. එහෙත් සිය වෙළඹ වන සිල්වර් පිටෙහි නැගී යනතුරු කුමරියක් යනු කවරාකාරයේ කෙනකුදැයි ඩනේරිස් නොදැන සිටියා ය.

මුලදී නම් එය එතරම් පහසු කාර්යයක් නොවීය. මංගලෝත්සවයට පසුදින බලසාරය සිය කඳවුර ගැලවූයේ, නැගෙනහිර දෙසට එනම් වයෙස් ඩොත්රාක් දෙසට යන දීර්ඝ සවාරිය ඇරඹී ය. ගමනේ තෙවැනි දිනය වන විට ඩැනී සිතුවේ තමා මියයෑමට ආසන්න බවකි. ඇගේ පසු පෙදෙසෙහි සෑදලය නිසා තුවාල හටගති. ඒවා ලේ තැවරුණු ඉතා අප්‍රසන්න ඒවා විය. අනවරතයෙන් අසු ගේ ගොරෝසු පිට මත ඇතිල්ලීම නිසා ඇගේ කලවා මහත් වේදනා දුනි. තෝන් ලණුව නිසා ඇගේ දෑත්වල කරගැට නැගින. කකුලේ මස්පිඩු හා පිට පැත්ත වේදනාවෙන් පිරී තිබූ අතර, ඇයට හිඳගැනීමට පවා අපහසු විය. අඳුරු වැටී එද්දී අසුපිටින් බැසීමට ඇගේ සේවිකාවන් ගේ සහාය අවශ්‍ය විය.

එනමුදු රාත්‍රී කාලයන්ද ඇයට සැනසීමක් ගෙන නොආවේ ය. මඟුල් දිනයේදී මෙන් ගමන පුරාවටම පාහේ ඛාල් ඩ්‍රෝගෝ ඇයව නොතකා හැරියේ ය. ඔහු ගේ සැඳෑ කාලයන් ගෙවී ගියේ සිය යුධ භටයින් සහ රුධිරාක්ෂකයින් සමග එක්ව මත්පැන් පානයෙනි. තමාගේ වටිනා අසුන් පැදීමෙනි. ගැහැනුන් ගේ නැටුම් හා පිරිමින් මියයන සැටි බැලීමෙනි. ඔහුගේ ජීවිතයේ මෙම අංශයන්හි ඩැනීට තැනක් නොතිබින. ඇය තනිවම හෝ සෙර් ජෝරා සහ ඇගේ සොහොයුරා සමග හෝ රාත්‍රී ආහාරය ගත්තා ය. ඉන්පසු අඩමින් නින්දට වැටුනා ය. එහෙත් සෑම රාත්‍රියකම හිරු උදාවට හෝරා කිහිපයකට පෙර ඩ්‍රොගෝ ඇගේ කූඩාරම වෙත පැමිණුනේ, අඳුරේම ඇයව අවදි කර, තම අසු පදින තරම් නිර්දය අයුරින් ඇය හා එක්වූවේ ය. ඩොත්රැකි ක්‍රමයට අනුව ඔහු සැමවිටම ඇය හා එක්වූයේ පසුපසිනි. ඩැනී මීට බෙහෙවින් කෘතඥවූයේ සිය සැමියාට කඳුළෙන් තෙමුනු මුහුණ නොපෙන්වීමටත්, වේදනාවෙන් නැගෙන කෙඳිරීම් කොට්ටය මත මුහුණ ඔබා මැඩලීමටත් හැකිවූ බැවිනි. එය නිමාවූ පසු දෑස් පියාගන්නා ඔහු සිහින් හඬින් ගොරවන්නට පටන් ගන්නා අතර ඩැනී ඔහු අසලින් වැතිරගන්නී ය. එහෙත් ඇගේ සිරුර කෙතරම් තදින් තැලී පොඩිවී රිදුම් දුන්නේ ද යත් බොහෝ වේලාවක් යන තෙක් නින්ද ඇය සොයා නොආවේ ය.

මෙසේ දිනෙන් දින හා රාත්‍රියෙන් රාත්‍රිය ගෙවී ගිය අතර අන්තිමේදී එක්තරා රාත්‍රියක් එළඹුනේ තව එක් මොහොතකටවත් මෙය උහුලාගත නොහැකි බව ඇයට අවබෝධ කරවමිනි. මෙසේ සිටිනවාට වඩා දිවි හානිකර ගැනීම මැනැවැයි ඇය තීරණය කලාය.

එහෙත් එදා රෑ නින්දේදී ඇය නැවතත් සිය මකර සිහිනය දුටුවා ය. මෙවර එහි විසේරිස් නොවූ අතර ඇය හා මකරා පමණක් එහි සිටියහ. උගේ කොරපොතු රිය මෙන් කළු පැහැ විය. රුධිරයෙන් - ඇගේ රුධිරයෙන් - තෙත්ව ලිස්සන සුලු විය. ඒ දෑස් ගිනිගෙන දැවෙන ලාවා විල් දෙකක් මෙන් බැබලුනේ ය. ඌ සිය මුව විවර කල විට උණුසුම් වායු දහරා මෙන් ගිනිදලු පිටවී ය. ඒවා තමාට ගී ගයන්නාක් මෙන් ඇයට හැඟින. දෑත් දිගුකොට ගිනිදලු වැළැඳගත් ඇය ඊට තමාව මුලුමනින් ගිල ගැනීමට, තමාව පිරිසිදු කිරීමට, තමාව පණ ගැන්වීමට, තමාව ශුද්ධ කිරීමට ඉඩ දුන්නාය. සිය සිරුරේ මාංශය පිලිස්සී කළු පැහැ වී හැව ඉවත්වනු ද, ලේ උණු වී නටමින් වාෂ්ප බවට පත්වනු ද ඇයට දැනින. එහෙත් එහි කිසිදු වේදනාවක් නොතිබින. තම සිරුර ශක්තිමත් බවකින්, නවතාවයකින් හා නිර්භීත බවකින් වෙලී යනු ඇයට දැනින.

පුදුමයකට මෙන් ඊලඟ දිනයේ ඇයට පෙර තරම් වේදනාවක් නොදැනින. හරියටම දෙවියන් ඇගේ දුකට සවන් දී, ඇය ගැන අනුකම්පා කලාක් මෙනි. ඇගේ සේවිකාවන්ට පවා මේ වෙනස විද්‍යාමාන විය. "ඛලීසි, මොනවද ඔබට වෙලා තියෙන්නේ? ඔබට අසනීපයක්වත්ද?" ජික්වි ඇසුවා ය.

"අසනීප වෙලා හිටියා. ඒත් දැන් සනීපයි." ඇය පිළිතුරු දුන්නේ සිය මඟුල් දිනයේ ඉල්ලිරියෝ විසින් තෑගි දුන් මකර බිත්තර අබියස සිටගනිමිනි. ඈ ඒ තුනෙන් විශාලම බිත්තරය ස්පර්ශ කලා ය. අනතුරුව එහි කටුව මත සෙමින් අත ගෙන ගියාය. 'කළු සහ ලේ රතු පාට, හරියට මගේ සිහිනයේ මකරා වගේ' ඇය කල්පනා කලා ය. ඇගේ අතැඟිලිවලට යටින් මේ ගල් වී ගිය බිත්තරය පුදුමාකාර අයුරින් උණුසුම් බවක් දැනවී ය... නැතහොත් ඇය තවමත් ඉන්නේ සිය සිහිනය තුළ ද? කලබලයෙන් මෙන් ඇය වහා තම අත ඉවතට ඇදගත්තා ය.

එදා ඒ පැයේ සිට ගෙවුනු සෑම දවසක්ම කලින්දාට වඩා පහසු විය. ඇගේ දෙපා වඩා ශක්තිමත් විය. දෑත්වල වූ කරගැට පිපිරී ගොරෝසු විය. ඇගේ මුදු කලවා පෙදෙස් රළු වී සමක් මෙන් සුනම්‍ය විය.

ඩැනීට ඩොත්‍රැකි ක්‍රමයට අසුන් පිට යෑම උගන්වන මෙන් ඛාල් විසින් ඇගේ සේවිකාවක වූ ඉරීට අණ කර තිබින. එහෙත් ඩැනීගේ සැබෑම ගුරුවරයා වූයේ ඇගේ වෙළඹ විය. ඈ ඩැනීගේ වෙනස්වෙන ඉරියව් හොඳින් දැන සිටියේ හරියටම දෙදෙනාටම එකම මනසක් තිබුනාක් මෙනි. දින ගෙවී යත්ම ඩැනීට තම අසුන් ධාවනය ගැන වඩ වඩාත් විශ්වාසය තැබිය හැකි විය. ඩොත්‍රැකියන් යනු හැඟීම් දැනීම් නොමැති රළු මිනිසුන් පිරිසක් වූ අතර තමන්ගේ සතුන්ට නම් තැබීමේ පුරුද්දක් ඔවුනට නොවී ය. එනිසා ඩැනී තම වෙළඹ ගැන සිතුවේ 'සිල්වර්' යන සරල වදනිනි. ඇය පෙර කිසි දිනෙක අන් කිසිදු දෙයකට මෙතරම් ආදරය කර නොතිබින.

අසුපිට යාම බරපතල කාර්යයක් නොවූ දා සිට තමා පෙර නොදුටු වටපිටාවේ සුන්දරත්වය ඇයට පෙනෙන්නට පටන් ගති. ඇය බලසාරය පෙරමුණේ ඩ්‍රෝගෝ හා ඔහු ගේ රුධිරාරක්ෂකයින් සමගින් ගමන් කල බැවින් සැමවිටම සැමතැනටම නැවුම්ව හා නවමුව ඇතුළු වීමේ භාග්‍යය වින්දා ය. ඔවුන් පිටුපසින් ගමන් කල සුවිසල් සතුන් රංචුව විසින් මහ පොළොව තලා, ගංගාවන් මඩකොට, හුස්ම හිරකරවනසුළු ධූලි වලාවන් ඉහල නැංවූවද ඔවුනට ඉදිරියෙන් වූ භූමිය නිතරම කොළ-නිල් පැහැයෙන් නැවී තිබින.

ඔවුන් නොර්වොස්හි කඳු පන්තීන් තරණය කර නිමක් නැති හෙල්මළු ගොවිබිම් හා කුඩා ගම්මාන පසු කල අතර ඒවායේ විසූ මිනිස්සු සිය සුදු පැහැ ප්‍රාකාර පසුපස සැඟවී ඔවුන් දෙස තැවිලි සහගත බැලුම් හෙලූහ. ඔවුහු නිසල පුළුල් ගංගාවන් ත්‍රිත්වයක් හා පටු ප්‍රචණ්ඩ දිය පහරින් යුත් සිවුවන ගංගාවක්ද තරණය කලහ. නිල් පැහැ උස් දිය ඇල්ලක් සමීපයේ කඳවුරු ලා ගත්හ. කළු පැහැ කිරිගරුඬින් කල කුළුණු අස්සේ මළවුන් ගේ අඳෝනා නැගෙතැයි කියැවෙන අතහැරදමන ලද පාළු විසල් නගරයක් අද්දරින් ගමන් කලහ. ඩොත්‍රැකි ඊයක් මෙන් හරි කෙලින් විහිදුනු වසර දහස් ගණනක් පැරණි වැලීරියන් මාවත් ඔස්සේ පිම්මේ අසුන් විහිදූහ. කොහෝර් හි වනාන්තරය පසු කිරීමට ඔවුනට අඩ මසක් ගතවී තිබින. මෙහි වූ වෘක්ෂ නගර ද්වාර තරම් උත්තුංග කඳන් සහිත වූවන් වූ අතර ඔවුනට බොහෝ ඉහළින් සිය අතුපතර එකට වියා රන්වන් පැහැ තුරු වියනක් නිමකර තිබින. මේ වනාන්තරයේ එල්ක් ගෝනන්, දිවියන් සහ විසල් දම් පැහැ දෑසින් හා රජතමය ලොමින් වැසුනු උණහපුළුවන් වෙසෙතැයි කියුවද ඉදිරියට එන බලසාරය හමුවේ ඒ

සැවොම බියෙන් සැඟව පලා ගිය අතර ඩැනීට ඔවුන්ව දැකගැනීමේ භාග්‍යය අහිමිව ගියේ ය.

මේ වෙද්දී ඇගේ වේදනාවන් හා දුක්ඛ දෝමනස්සයන් අතු ගෑවී යන මතකයන් පමණක් වී තිබින. අසු පිට යාම නිසා තවමත් දිනය අවසානයේ ඇගේ සිරුර රිදුම් දුන්නද එය දැන් මිහිරි වේදනාවක් පමණක්ම විය. එමෙන්ම සෑම උදෑසනකම ඇය කැමැත්තෙන්ම සෑදලයට ගොඩ වූයේ අද දිනයේ කවර නම් ආශ්චර්යයන් ඈ එනතෙක් බලා සිටී දැයි යන බලාපොරොත්තුවෙනි. සිය රාත්‍රී කාලයන්හි පවා සතුට උකහා ගැනීමට දැන් ඇය පුරුදු වී සිටියා ය. ඩ්‍රෝගෝ පෙර පරිද්දෙන්ම නිර්දය අයුරින් ඈ හා එක්වූවද, ඒ සෑමවිටම ඇය කඳුළු සලා හැඬූවද ඒ වැළැපීම් වේදනාවෙන් කල වැළැපීම් පමණක්ම නොවී ය.

කඳු වැටියේ පහළින් වූ තණකොළ ඇය වටා උස්ව හා සුනම්‍ය ලෙස නැගී සිටියේ ය. ඩැනී වෙළඹට හැල්මේ යාමට සන් කර ඇයව තැනිතලාව තුළට මෙහෙයූවේ තනිකමේ ආශිර්වාදය ද ඇතිව නිල්වන් තෘණ සාගරයේ කිමිද ගියා ය. ඛලසාරය තුළදී ඇයට කිසිවිටෙකත් තනිවීමට ඉඩක් නොවින. ඛාල් ඩ්‍රෝගෝ ඇය වෙත පැමිණියේ හිරු බැස ගිය පසු මුත් ඇගේ සේවිකාවෝ සෑමවිටම ඇය හා සිටියහ. ඔවුහු ඇයට කවා පොවා නහවා ඇගේ කූඩාරම් දොරටුව අසල නිදාගත්හ. ඩ්‍රෝගෝ ගේ රුධිරාරාක්ෂකයින් හා අනෙකුත් සෙබළුන් නිතරම අතේ දුරින් ගැවසුනහ. එමෙන්ම ඇගේ සොහොයුරා දිවා රැයේ ඈ අත්හැර නොයන අප්‍රියජනක සෙවණැල්ලක් මෙන් විය. මේ වනවිට කඳුවැටිය මුදුනට ළඟා වී සිටි ඔහු කේන්තියෙන් සෙර් ජෝරාට බැනවදින කටුක හඬ ඇයට ඇසින. වෙළඹට සන් කල ඇය ඩොත්රැකි මුහුදේ තව තවත් ගැඹුරට කිමිදුනා ය.

තණබිම ඇයව ගිලගත්තේ ය. ඇය අවට වාතය පස් හා තෘණ සුවඳ, අශ්ව ගඳ, ඩැනීගේ දහදිය ගඳ හා ඈ හිසේ ගැල්වූ තෙල් සුවඳ එක්ව තැනූ අමුතුමු පුසුඹකින් පිරී තිබින. එය ඩොත්රැකියන්ටම පමණක් වෙන් වූ ඩොත්රැකි සුවඳක් විය. එය අන් කිසි තැනකට නොව මෙතැනට, මේ ඩොත්රැකි මුහුදට පමණක් අයත් සුවඳක් විය. ඩැනී සිනාසෙමින් ඒ සියල්ල ගැඹුරු හුස්මකින් තමා තුළට ඇද ගත්තාය. තමාට පහළින් වූ පොළොව අල්ලා බැලීමට, ඒ තද කළු පසෙහි සිය පා ඇඟිලි තුඩු රිංගවා ආස්වාදනය කිරීමට ඈ තුළ හදිසි ආශාවක් පැන නැංගේ ය. සෑදලයෙන් බිමට බට ඇය සිල්වර් තණ කෑම සඳහා මුදා හැර සිය උස් බූට්ස් සපත්තු කුට්ටම ගලවා දැමුවා ය.

විසේරිස් ඇය වෙත කඩා පැන්නේ අනපේක්ෂිත ගිම්හාන කුණාටුවක් මෙනි. තෝන්ලණුව තදින් ඇදීම නිසා ඔහුගේ අසු මිරිකී ගොස් තිබින. "උඹ මට තර්ජනය කරනවා?" ඔහු කෑගැසී ය. "උඹ මට අණ දෙනවා? මේ මට?" නුහුරු ලෙස අසු පිටින් බැසීමට තැත් කරද්දී ඔහු පය පැකිල ඇද වැටුනේ ය. අමාරුවෙන් මෙන් නැවත සිට ගනිද්දී ඔහුගේ මුහුණ කේන්තිය නිසා රතු වී ගොස් තිබින. ඔහු කේන්තියෙන් ඇයව තදින් අල්ලා සෙලවී ය. "උඹට අමතක වුනාද උඹ කවුද කියන එක? බලපං උඹ දිහා. බලපං උඹේ හැටි!"

ඩැනීට ඈ දෙස බැලීමට අවශ්‍යතාවක් නොවීය. ඇය පාවහන් රහිතව, තෙල් ගෑ හිසකෙසින් යුතුව, ඩොත්රැකියන් අසුන් පැදීමේදී භාවිත කරන සමින් හා මනාළි තෑග්ගක් වශයෙන් ලද වර්ණවත් බැනියමක් හැඳ සිටියා ය. ඇය දිස්වූයේ එම පරිසරයට අයත් එකියක විලසිනි. විසේරිස් හැඳ සිටි සේද හා මුදු දම්වැල් සන්නාහයෙන් සැදි නාගරික ඇඳුම කිලුටුව පැල්ලම් ගැසී තිබිණි.

"උඹට බෑ මකරාට අණදෙන්ට. උඹට තේරුණාද? මම තමා රාජධානි සප්තකයේ අධිපතියා. මේ කොහෙවත් ඉන්න අශ්ව හොරෙකුගෙ වේස බැල්ලියකගෙන් අණ ලබන්ට මම සූදානම් නෑ. උඹට ඇහුනද?" ඔහු ගේ අතැඟිලි ඇගේ බැනියම යටින් රිංගුයේ ඇගේ පියයුරු පහුරු ගා ඇයට රිද්දුවේ ය. "උඹට මාව ඇහෙනවද?"

ඩැනී වෙර යොදා ඔහුව තල්ලු කර දැමුවා ය.

විස්මයට පත් විසේරිස් සිය එළ-නිල් පැහැ දෑසින් ඇය දෙස බලා සිටියේ ය. ඇය මින් පෙර කිසිදා ඔහුට විරෝධය පා නොතිබින. මින් පෙර කිසිදා පෙරලා සටන් කොට නොතිබින. කෝපය නිසා ඔහුගේ මුහුණ විකෘති වී ගියේ ය. දැන්නම් ඔහු ඇයට තදින්ම රිදවන්නට යන බැව් ඇයට තේරුම් ගියේ ය.

Jorah Mormont: “The common people pray for rain, healthy children, and a summer that never ends, It is no matter to them if the high lords play their game of thrones, so long as they are left in peace.”

ක්‍රැක්!

කස හඬ හෙණ පහරක් මෙන් ඇසින. විසේරිස් ගේ බොටුව වටා දරණුවක් මෙන් එතී ගිය කසය ඔහුව පසුපසට ඇද දැමී ය. ඔහු හතර ගාතයෙන් බිම ඇද වැටුනේ තෝන්තුවාවෙන් හුස්ම ගත නොහී දඟලන්නට විය. එයින් නිදහස් වීමට ඔහු කරන වෑයම දුටු ඩොත්රකි අසරුවෝ හූ තලමින් සිනාසුනහ. කසය අතැතිව සිටි තරුණ ජෝගෝ ප්‍රශ්නයක් ඇසී ය. ඩැනීට ඔහුගේ ප්‍රශ්නය නොතේරුනු මුත් මේ වනවිට ඉරී ද සෙර් ජෝරා ද අනෙකුත් සෙබළුන් ද එහි ළඟා වී සිටියහ. "ජෝගෝ අහනවා ඔබට එයාව මරලා දාන්ට ඕනිද කියලා බලීසි?" ඉරී කීවා ය.

"නෑ." ඩැනී පිලිතුරු දුන්නාය. "නෑ."

ජෝගෝ එය තේරුම් ගත්තේ ය. තවෙකෙකු පැවසූ යම් විහිළුවකට ඔවුන් සැවොම හඬ නගා සිනාසුනහ. "ක්වෝරෝ හිතනවා ඔබට ගරු කරන්නෙ කොහොමද කියලා උගන්නන්ටත් එක්ක එයාගෙ කණක් කපමුයි කියලා." ඉරී පහදා දුන්නා ය.

ඇගේ සොහොයුරා දණින් වැටී සිටියේ අතැඟිලිවලින් සම් දරණුව අදිමින්, හුස්ම ගැනීමට දඟලමින්, ආකූල ලෙසකින් හැඬී ය. කසය ඔහු ගේ උගුරුදණ්ඩ වටා තදින් එතී තිබින.

"එයාලට කියන්ට මට එයාට කිසිම කරදරයක් කරන්ට උවමනා නැහැයි කියලා." ඩැනී කීවා ය.

ඉරී ඇගේ වදන් ඩොත්රකි භාෂාවට පෙරලුවා ය. ජෝගෝ කසය ගස්සා ඇද්දේ විසේරිස් නූලකින් එල්ලෙන රූකඩයක් මෙන් කරකවමිනි. හම් දරණුවෙන් ගැලවුනු ඔහු නැවතත් හතර ගාතයෙන් ඇද වැටුනේ ය. කසයට තියුණුව කැපුනු ඔහු ගේ නිකට යටින් සිහින් රුධිර ධාරාවක් ගලන්නට විය.

"මේක මෙහෙම වෙයි කියලා මම එයාට අවවාද කලා මගේ ආර්යාවනි." සෙර් ජෝරා මෝර්මන්ට් පැවසී ය. "ඔබ අණ කරපු විදියට කඳුගැටය මුදුනෙම ඉන්ටයි කියලා මම එයාට කිවුවා."

"ඔබ එහෙම කරපු බව මම දන්නවා." ඩැනී විසේරිස් දෙස බලාගෙන පිළිතුරු දුන්නා ය. හඬනගා හුස්ම ගනිමින්, රතු වූ මුහුණෙන් යුතුව, ඉකිබිඳිමින් ඔහු බිම වැතිර සිටියේ ය. ඔහුගෙන් දිස්වූයේ බැගෑපත් කාලකණ්ණියෙකු ගේ පෙනුමකි. ඔහු සැමදාමත් එවැන්නකු විය. ඇයට එය මීට පෙර නොපෙනුනේ මන්ද? වෙනදා ඔහු නිසා ඇ තුළ ඇතිවන බිය වෙනුවට අද එතැන තිබුනේ කුමක්දෝ හිස් බවක් පමණි.

"එයාගෙ අශ්වයා ගන්ට." ඩැනී සෙර් ජෝරාට අණ කලා ය. විසේරිස් මුව අයාගෙන ඇය දෙස බලා උන්නේ ය. තමාට මේ ඇසෙන දේ ඔහුට විශ්වාස කල නොහැකි විය. තමා මේ කියන්නේ කුමක්දැයි ඩැනීටද විශ්වාස කල නොහැකි විය. එනමුදු ඇයටත් නොදැනීම එවදන් මුවින් පිටවිය. "මගේ සහෝදරයා අපේ පිටිපස්සෙන් ඇවිදගෙන ආපුවාවෙ." අසු පිට නොයන මිනිසා මිනිසකු නොවේයයි මතයක් ඩොත්රැකියන් අතර විය. එවැන්නකු කිසිදු ආත්ම අභිමානයක් හෝ ගෞරවයක් නොමැති පහත්ම පහත් පුද්ගලයකු ලෙස සැලකින. "හැමෝම දැකගත්තාවෙ එයා ඇත්තටම කොයි වගේ කෙනෙක්ද කියලා."

"නෑ!" විසේරිස් කෑගැසුවේ ය. ඔහු සෙර් ජෝරා දෙසට හැරී, ඩොත්රැකියන්ට නොතේරෙන ලෙස පොදු භාෂාවෙන් ආයාචනා කලේ ය. "ඒකිට ගහපං මෝර්මන්ට්. ඒකිට රිද්දපං. උඹේ රජතුමයි මේ අණදෙන්නෙ. මේ ඩොත්රැකි බල්ලො ටික මරලා දාලා මේකිට පාඩමක් උගන්නපං."

පිටුවහල් වූ නයිට්වරයා ඩැනී දෙසද ඇගේ සොහොයුරා දෙසද බැලී ය. පාවහන් රහිත, කුණු පිරුණු පා ඇඟිලි හා හිසේ තෙල් ගැල්වූ ඇය සහ සේද රෙද්දෙන් හා සන්නාහයෙන් සැරසුනු ඔහු. ඔහු තීරණයකට එළැඹි බැව් ඩැනී ඔහු ගේ මුහුණින් දුටුවාය. "එයා ඇවිදියි බලීසි." ඔහු ඇගේ සොහොයුරා ගේ අසු ගන්නා අතර ඩැනී නැවත සිල්වර් මත නැග්ගා ය.

බිම කුණු ගොඩේ හිඳ සිටි විසේරිස් ඔවුන් දෙස මුව අයා බලා උන්නේ ය. ඔහු නිසලව සිටි තැනම හිඳ ඔවුන් පිටව යන අයුරු බලා සිටි අතර ඒ දෑස් ද්වේෂයෙන් පිරී තිබින. ඉක්මණින්ම උස් තණ ගස් අතර ඔහුව නොපෙනී ගියේ ය. ඔවුන්ට ඔහුව කිසිසේත්ම

දැකිය නොහැකි වූ විට ඩැනී බියපත් වූවාය. "එයාට ආපහු එන්ට පාර හොයාගන්ට පුලුවන් වෙයිද?" අසුන් මෙහෙයවන අතරතුරේදී ඇය සෙර් ජෝරාගෙන් ඇසුවා ය.

"ඔබේ සොහොයුරා වගේ අන්ධයෙකුට වුනත් අපේ අඩි පාර හොයාගෙන එන්ට පුළුවන්."

"එයා ආඩම්බරයි. එයා ආපහු එන්ට ලැජ්ජා වෙන්ට පුලුවනි."

ජෝරා සිනාසුනේ ය. "එයා වෙන කොහේ කියලා යන්ටද? එයාට බලසාර් එක හොයාගන්ට බැරි වුනොත් බලසාර් එක එයාව හොයාගනීවි. ඩොත්රැකි මුහුදේ ගිලෙන එක හරි අමාරු වැඩක් දරුවෝ."

එහි ඇති සත්‍යය ඩැනී දුටුවා ය. බලසාරය යනු ගමනේ යෙදෙන නගරයක් බඳු විය. එහෙත් එය අපරීක්ෂාකාරීව ඉබාගාතේ ගමන්ගත්තක් නොවී ය. නිතරම පාහේ ප්‍රධාන කණ්ඩායමට ඉදිරියෙන් ගමන් කල චරපුරුෂයෝ දඩයම්, ගොදුරු හෝ සතුරන් හෝ ගැන අවධානයෙන් පසුවූහ. තවත් හට කණ්ඩායම් දෙකක් ඔවුන් ගේ දෙපස ආරක්ෂා කලහ. ඔවුනට කිසිදු දෙයක් මග නොහැරින. විශේෂයෙන්ම මෙතැන, ඔවුන් ඉපැදුනු, ඔවුන් හැදුනු වැඩුනු මෙම භූමියෙහි සෑම බිම අඟලක්ම ඔවුහු මනාව දැන සිටියහ. මේ තැනිතලාව ඔවුන් ගේ ජීවිතයේ කොටසක් විය... දැන්, ඇගේ ජීවිතයේ ද කොටසක් විය.

"මම එයාට ගැහුවා!" ඩැනී මවිතයෙන් පැවසුවා ය. දැන්, හැමදේම  අවසාන වූ පසු ඇයට දැනුනේ ඒ සියල්ල තමා දුටු අද්භූත සිහිනයක් බවය. "සෙර් ජෝරා, ඔබ හිතනවාද... ආපහු ආවට පස්සේ එයාට ගොඩක් තරහ යයි නේද?" ඇගේ සිරුර වෙව්ලීය. "මම මකරාව නැගිට්ටෙව්වා. එහෙම නේද?"

සෙර් ජෝරා උගුරෙන් හඬක් නැගීය. "ඔබට මළගියවුන් නැගිට්ටවන්ට පුලුවන්ද දරුවා? ඔබේ සහෝදරයා රේගාර් තමා අන්තිම මකරා. ඒත් එයා ගංගා ත්‍රිශූලයේදී මැරුනා. විසේරිස් කියන්නෙ සර්පයෙකුගෙ හෙවනැල්ලටත් වඩා පහත් කෙනෙක්."

ඔහුගේ සෘජු වදන් නිසා ඇය තිගැස්සුනා ය. එය හරියටම ඇය මෙතෙක් කල් සත්‍යයැයි විශ්වාස කල සෑම දෙයක්ම ප්‍රශ්නකාරී වුවාක් මෙනි. "ඔබ.. ඔබ ඔහුට සේවය කරනවා කියලා දිවුරුවා.."

"මම එහෙම කලා තමා දරුවෝ. ඒත් ඔබේ සොහොයුරා සර්පයෙකුගේ හෙවනැල්ලකටත් වඩා පහත් නම් එයාගේ සේවකයන් ගැන මොනවද කියන්ට තියෙන්නෙ?" ඔහු අමිහිරි ස්වරයෙන් කීවේ ය.

"ඒත් එයා තමා තාමත් ඇත්ත රජතුමා. එයා තමා..."

අසූ නැවතූ ජෝරා ඇය දෙස බැලීය. "ඇත්ත කියන්ට. විසේරිස් සිංහාසනයක ඉඳගෙන ඉන්නවා දකින්ට ඔබට ඕනද?"

ඩැනී ඒ පිලිබඳව මදක් සිතා බැලුවා ය. "එයා හොඳ රජෙක් වෙන එකක් නෑ. එහෙම නේද?"

"ඔයිට වඩා නරක අයත් හිටියා... ඒත් මහ ගොඩක් නෙවෙයි." අසූට සන් කල ඔහු නැවත ගමන ආරම්භ කලේ ය.

ඩැනී ඔහුට ආසන්නයෙන් අසූ මෙහෙයුවා ය. "ඒ වුනත්... සාමාන්‍ය මිනිස්සු එයා එනකම් බලා ඉන්නවා. මැජිස්ටර් ඉල්ලීරියෝ කියන විදියට එයාලා මකර කොඩි මහනවා. විසේරිස් පටු මුහුද තරණය කරලා එයාලා බේරගන්ට එන්ටයි කියලා යාඥා කරනවා."

"සාමාන්‍ය මිනිස්සු යාඥා කරනවා වැස්ස ලැබෙන්ටයි කියලා. නිරෝගී ළමයි ලැබෙන්ටයි කියලා. කවදාවත් ඉවරවෙන්නෙ නැති ගිම්හානයක් ලැබෙන්ටයි කියලා. නිදහසේ සමාදානෙන් ඉන්ට තියෙනවනං උන්ට වගක් නෑ කවුද රටේ රජකරන්නෙ, මොන උත්තමයද සිහසුනට තරග වදින්නෙ කියලා." ඔහු දෙවුර ඇකිළී ය. "ඒත් උන්ට කවදාවත් එහෙම සාමයෙන් ඉන්ට ලැබෙන්නෙ නෑ."

ඩැනී ටික මොහොතක් නිහඬවම අසු ධාවනය කලේ ඔහු ගේ මේ වදන් ප්‍රහේලිකා විසඳීමට තැත් කරමිනි. විසේරිස් ඇයට කියා තිබුනු සෑම දෙයකටම වඩා මෙය වෙනස් විය. තමන්ව පාලනය කරන්නේ සැබෑ රජෙක් ද නැතහොත් රජකම පැහැරගත් එකෙක් ද යන්න සාමාන්‍ය ජනතාවට වැදගත් දෙයක් නොවන බව! එනමුදු ජෝරා ගේ වචන ගැන සිතා බලන්නට බලන්නට එය සැබෑවක් බව ඇයට තේරින.

"ඔබ යාඥා කරන්නේ මොනව ලැබෙන්ටයි කියලද සෙර් ජෝරා?"

"ගෙදර යන්ට ලැබෙන්ටයි කියලා." ඔහුගේ වදන් ලාලසාවෙන් පිරී තිබින.

"මමත් යාඥා කරන්නේ ඒකමයි."

සෙර් ජෝරා සිනාසුනේ ය. "එහෙමනම් පොඩ්ඩක් අවට බලන්ට බලීසි."

අවට බැලූ ඩැනී දුටුවේ තැනිතලා නොව කින්ග්ස් ලැන්ඩින්ග් සහ  ජයග්‍රාහක ඒගොන් විසින් තනවන ලද රතු බලකොටුව ය. ඇය ඉපදුනු ඩ්‍රැගන්ස්ටෝන් ය. ඇගේ මනසේ ඇඳුනු මේ රූ පහන් දහසක එළියෙන් බැබලින. සෑම කවුළුවකම පහනක් දැල්වුනු අතර සෑම දොරක්ම රතුපාට විය.

"මගේ සහෝදරයා කවදාවත් රාජධානි සප්තකය ආයෙමත් අල්ලගන්නේ නෑ." බොහෝ කලෙක සිට තමා හදවතින් මේ බව දැන සිටි බැව් ඇය තේරුම් ගත්තා ය. සිය මුලු ජීවිත කාලය පුරාවටම ඒ බැව් දැන සිටියා ය. එනමුදු ඒ බව වදනින් නොව කෙඳිරිල්ලකින්වත් පිට නොකිරීමට ඇය වග බලාගෙන තිබින. එහෙත් දැන් ඇය සෙර් ජෝරාටත් මුලුමහත් ලෝකයටමත් ඇසෙන සේ ඒ බව ප්‍රකාශ කලා ය.

සෙර් ජෝරා ඇයව මැන බලන අන්දමේ බැල්මක් හෙලී ය. "ඔබ හිතන්නේ එහෙමද?"

"මගේ සැමියා හමුදාවක් දුන්නත් එයාට ඒ හමුදාව මෙහෙයවන්ට හැකියාවක් නෑ. එයාට සල්ලි නෑ. එයාගෙ පස්සෙන් යන එකම එක නයිට්වරයත් එයා සර්පයෙකුගේ හෙවනැල්ලටත් වඩා පහත් කියලා එයාට අපහාස කරනවා. ඩොත්රැකියො එයාගෙ දුර්වලකම් ගැන හිනාවෙනවා. එයා කවදාවත් අපිව ගෙදර ගෙනියන්නේ නෑ."

"නුවණක්කාර දරුවා." නයිට්වරයා මඳ සිනහවක් පෑවේ ය.

"මම දරුවෙක් නෙමෙයි." ඩැනී පරුෂ ස්වරයෙන් කීවා ය. ඇය වෙළඹ ගේ ඇළපතට විළුඹින් සන්කලෙන් සිල්වර් පිම්මේ දුවන්නට වූවා ය. ජෝරා, ඉරී සහ අනිකුත් අය පසු කරමින් ඇය වේගයෙන් ඉදිරියට ඇදුනා ය. උණුසුම් සුළං ඇගේ කෙහෙරැළි අතරින් රිංගා ගිය අතර බැස යන හිරු ගේ රත්පැහැය ඇගේ මුහුණ සිප ගති. ඇය බලසාරය වෙත ළඟා වන විට සන්ධ්‍යාව එළඹ තිබින.

වහලුන් විසින් උල්පත් දියෙන් පෝෂණය වූ පොකුණු ඉවුරක ඇගේ කූඩාරම අටවා තිබින. උස් බිමක පිහිටුවා තිබුනු තෘණ මාලිගාව තුළින් රළු කටහඬවල් ඇසින. අද දින තැනිතලාවේදී සිදු වුනු දේ ඇගේ ඛාස් එකේ සෙබළුන්ගෙන් අසා දැනගත් විට එතුළින් සිනා හඬ නැගෙනු නොඅනුමානය. විසේරිස් බකල ගසමින් ඔවුන් අතරට නැවත පැමිණෙන මොහොත වන විට කඳවුරේ ඉන්නා සෑම මිනිසෙකුම, ගැහැණියකම හා ළමයෙකුම ඔහුගේ පා ගමන ගැන දැනගන්නවා ඇත. බලසාරය තුළ කෙදිනකවත් රහස් නොවීය.

සිල්වර් පිරිසිදු කිරීම වහලුන්ට පැවරූ ඩැනී සිය කූඩාරමට ඇතුළු වූවා ය. සේදයෙන් තැනූ කූඩාරම් රෙද්ද යට වූයේ සිසිලසක් හා මඳ අඳුරු බවකි. තමාට පිටුපසින් දොර පියල්ල වසා දමද්දී ඇයට දකින්නට ලැබුනේ කූඩාරම හරහා ඇදුනු ධූලිමය රතු ආලෝක දහරාවක් ඇගේ මකර බිත්තර ස්පර්ශ කරන අයුරු ය. එක් නිමේෂයකදී ලේ රතු පැහැ ගිනි දල්ලක දහසක් ලේ බිඳු ඇගේ දෑස ඉදිරියේ පිහිනන්නාක් මෙන් ඇයට දැනින. ඈ ඇසිපිය හෙලූ අතර ඊළඟ මොහොතේ ඒ සියල්ල නොපෙනී ගියේ ය.

"ගල්." ඈ තමාටම කියාගත්තා ය. "ඒවා නිකංම නිකං ගල් විතරයි." ඉල්ලීරියෝද ඒ බැව් පැවසී ය. සියලුම මකරුන් මියගොස් ඇත. ඇය කළු පැහැ බිත්තරය මත අත තබා කටුවේ නැම්ම ඔස්සේ අතැඟිලි විහිදෙවුවා ය. ගල තරමක් උණුසුම්, සැබැවින්ම නම් රත් වූ ගලක්

මෙන් උණුසුම් විය. "ඉර!" ඈ මිමිනුවා ය. "ගමන අතරතුරේදී ඉරේ රස්නෙ නිසා ඒවා රත් වෙනවා."

ස්නානයට සූදානම් කරන මෙන් ඇය සේවිකාවන්ට අණ කලා ය. ඩෝරියා කූඩාරමින් පිටත ගිනි මැලයක් දැල්වූ අතර තවත් මංගල තෑග්ගක් වූ විශාල තඹ නාන ඔරුව තවලම් අසුන් පිටින් බාගත් ඉරී හා ජික්වී ඊට පොකුණෙන් ගෙනා ජලය පිරවූහ. ජලය උණු වෙද්දී ඇයව ඔරුවට නැගීමට උදවු වුනු ඉරී ඒ පසුපසින් නාන ඔරුවට ඇතුළු වූවා ය.

"ඔබලා කවදා හරි මකරෙක් දැකලා තියෙනවද?" ඉරී ඇගේ පිට අතුල්ලන අතරේ, ජික්වී හිසේ වූ වැලි සෝදා හරින අතරේ ඩැනී ඇසුවාය. මුල්ම මකරුන් නැගෙනහිර දෙසින්, අශයිවලට එහායින් වූ සෙවනැලි දේශයෙන් හා ජේඩ් මුහුදුබඩ දූපත්වලින් පැමිණියවුන් බව ඇය අසා තිබින. සමහරවිට ඔවුන් තවමත් මේ අද්භූත වනචාරී දේශයන්හි ජීවත්වනු විය හැක.

"මකරු වඳ වෙලා ගිහිල්ලා බලීසි." ඉරී කීවාය.

"මැරිලා. ගොඩක් කාලෙකට කලින්." ජික්වී එකඟ විය.

විසේරිස් ඇයට කියා දී තිබුනු අන්දමට නම් අවසන් ටාර්ගේරියන් මකරුන් මියගොස් තිබුනේ මීට සියවස් එකහමාරකට ඉහතදී, මකරවිනාශක ඒගොන් ගේ රාජ්‍ය සමයේදී විය. එය එතරම් දිගු කාලයක් ලෙස ලෙස ඩැනීට සිතුනේ නැත. "හැම තැනකම?" ඈ බලාපොරොත්තු කඩවූ ලීලාවෙන් ඇසුවා ය. "නැගෙනහිර පැත්තෙත්?" වැලීරියාවේ සහ දිගු ගිම්හාන දේශයේ විනාශයත් සමගින් බටහිර දිශාවේ වූ මායාබල සහමුලින්ම මෙන් නැති වී ගොස් තිබින. මන්ත්‍රශාස්ත්‍රයෙන් පන්නරය තැබූ වැලීරියන් වානේවලට හෝ කුණාටු ගායකයින්ට හෝ මකරුන්ටවත් මේ බිඳවැටීම නතර කල නොහැකි විය. එහෙත් නැගෙනහිර ඊට වඩා වෙනස් බව ඩැනී නිතර අසා තිබින. ප්‍රවාද වලට අනුව ජේඩ් මුහුදුබඩ දූපත්වල මැන්ටිකෝරයන් සෙවිල්ලෙන් ඇවිදිති. යිටීහි වනාන්තර තුළ බෝදිලිමුන් රැස් කති. අශයීහි හදි හූණියම්කරුවන්, ඉන්ද්‍රජාලිකයන් සහ ගුප්ත විද්‍යාධරයන් එළිපිටම තම මායාශාස්ත්‍ර ප්‍රගුණ කරති. සෙවනැලිබන්ධකයන් සහ රුහිරුමායාකරුවන් රාත්‍රි අන්ධකාරයේ සැඟවී සිය බිහිසුණු යන්ත්‍රමන්ත්‍ර හා කොඩිවිණ සිදුකරති. එසේනම් එහි මකරුන් නැතිවිය හැක්කේ කෙසේද?

"මකරු නෑ." ඉරී කීවාය. "නිර්භීත මිනිස්සු උන්ව මරලා දැම්මා. මකරු කියන්නේ දරුණු, දුෂ්ට සත්තු ජාතියක්. ඒක හැමෝම දන්න දෙයක්."

"ඒක දන්න දෙයක්." ජික්වී එකඟ වූවා ය.

"බාර්ත් වලින් ආපු වෙළෙන්දෙක් මට කීවා මකරු ඇවිත් තියෙන්නෙ හඳෙන් කියලා." ගින්නට ඉහළින් අල්ලා තුවායක් උණුසුම් කරමින් ඩෝරියා පැවසුවා ය. ජික්වී සහ ඉරී ඩැනී ගේ වයසේම වූ ඩොත්රකි දැරියන් වූහ. ඩ්‍රෝගෝ විසින් ඔවුන් ගේ පියා ගේ බලසාරය විනාශ කල පසු ඔවුන් වහලුන් ලෙස අත්අඩංගුවට ගෙන තිබින. ඩෝරියා ඊට වඩා වයසින් වැඩි අවුරුදු විස්සක පමණ කෙල්ලක වූ අතර මැජිස්ටර් ඉල්ලීරියෝ විසින් ඇයව සොයාගෙන තිබුනේ ලයිස් හි ගණිකා මඩමක සිටියදී ය.

ඩැනී කුතුහලයෙන් හිස හරවා ඈ දෙස බලද්දී, රිදීවන් තෙත් කෙහෙරැළි ඇගේ දැස් හරහා වැටින. "හඳෙන්?"

"එයා මට කීවේ හඳ කියන්නේ බිත්තරයක් කියලයි ඛලීසි." ලයිසෙනී තරුණිය පැවසුවා ය. "එකමත් එක කාලෙක අහසේ හඳවල් දෙකක් තිබුණලු. ඒකෙන් එකක් ඕනවට වඩා ඉරට කිට්ටුවෙන්ට ගිහින් ඒකේ රස්නෙන් පිපිරුණාලු. එතනින් දාස් ගානක් මකරු එළියට ඇවිල්ලා ඉරෙන් ගින්දර උරා බිවුවලු. ඒක හන්දා තමා මකරු හුස්ම ගන්නකොට ගින්දර පිට කරන්නේ. කවදහරි දවසක අනිත් හඳත් ඉරට කිට්ටු වෙනවලු. එදාට ඒකත් පුපුරලා තවත් මකරු එයි." ඩොත්රකි තරුණියන් දෙදෙනා කිචිබිචි ගාමින් සිනාසුනහ. "ඔයා නම් ඔළුවෙ පිදුරු පිරිච්ච මෝඩ වහලියක්." ඉරී කීවාය. "හඳ කියන්නේ බිත්තරයක් නෙමේ. හඳ කියන්නෙ දෙවියෙක්. හිරු දෙවියා ගේ බිරිඳ. ඒක හැමෝම දන්න දෙයක්."

"ඒක දන්න දෙයක්." ජික්වී එකඟ වූවාය.

ඩැනී නාන ඔරුවෙන් පිටතට එද්දී ඇගේ සම ප්‍රමුදිතව, රෝස පැහැයෙන් බැබලින. ගතේ තෙල් තැවරීමට හා සමේ කුඩා සිදුරු හොඳින් පිරිසිදු වී කුණු ඉවත්වන සේ සම්බාහනය කිරීම සඳහා ජික්වී ඇයව බිම වැතිරවූවා ය. ඉන්පසු ජික්වී කුරුඳු හා වෙනත්

සුගන්ධකාරකයන් ඇගේ සිරුර පුරා ඉස්සා ය. ඇගේ කෙහෙරැළි සේද මෙන් දිදුලන තුරු ඩෝරියා ඇගේ හිස පීරද්දී ඇය හඳ, බිත්තර සහ මකරුන් ගැන කල්පනා කලා ය.

ඇගේ රාත්‍රී ආහාර වේල පළතුරු, චීස් සහ බදින ලද පාන්ද, මී පැණි මුසු වයින්වලින්ද සමන්විත වූ සරල එකක් විය. "ඩෝරියා, මගෙත් එක්ක ඉඳලා කෑම කන්ට." අනෙකුත් සේවිකාවන් ඉවත යවමින් ඇය අණ කලා ය. මේ ලයිසෙනී තරුණියට පැණි පැහැ කෙස්කළඹක් හා ගිම්හානයේ අහසක් මෙන් නිල්වන් දෑසක් හිමිව තිබින.

ඔවුන් දෙදෙනා තනි වූ විට ඈ සිය නිල් දෑස් බිමට හරවා ගත්තා ය. "මේක මට විශාල ගෞරවයක් ඛලීසි." ඇය කීවා ය. එහෙත් එය ගෞරවයක් නොව රාජකාරියක් පමණක්ම විය. සඳ නැග බොහෝ වේලා ගතවන තුරු ඔවුහු බිම හිඳගෙන කතා කරමින් හුන්හ.

එදා රයෙහි ඛාල් ඩ්‍රෝගෝ පැමිණෙන විට ඩැනී පොරොත්තුවෙන් බලා උන්නාය. ඔහු කූඩාරමේ දොර අසල නැවතී ඇය දෙස පුදුමයෙන් බැලීය. සෙමෙන් නැගිට සිටි ඇය සිය රාත්‍රී ඇඳුම විවරකොට ඒවා බිම වැටෙන්නට ඉඩ හැරියාය. "අද රෑ අපි එළියට යන්නට ඕන මගේ ස්වාමිනී." ඈ ඔහුට කීවාය. මිනිසකු ගේ ජීවිතයේ සෑම වැදගත් දෙයක්ම විවෘත ආකාශය යට සිදු කල යුතු බව ඩොත්රැකි විශ්වාසය විය.

ඛාල් ඩ්‍රෝගෝ ඇය පසුපසින් හඳ එළිය වෙත පියවර මැන්නේ ය. ඔහුගේ කෙස්කළඹෙහිවූ කුඩා සීනු මෘදු හඬින් අනුනාද නැංවී ය. ඇගේ කූඩාරමට යාර කීපයක් දුරින් මුදු තණගොල්ලක් වූ අතර ඩැනී එහිදී ඔහුව බිමට ඇද ගත්තා ය. ඔහු ඇයව අනිත් පස හැරවීමට තැත් කරද්දී ඇය ඔහු ගේ පපුව මත අතක් තබා ඔහුව නතර කලාය. "නෑ. අද රෑ මට ඔබේ මූන බලන්ට ඕන."

ඛලසාරය මධ්‍යයේ කිසිදු පුද්ගලිකත්වයක් නොවීය. ඔහුව නිරුවත් කරද්දී තමන් වෙත යොමුවූ දෑස් රැසක බැල්ම ඇයට දැනින. ඩෝරියා විසින් කියාදුන් දේ එකින් එක ක්‍රියාවට නගද්දී මෘදු හඬින් කල ඔවුන් ගේ මිමිනීම් ඇයට ඇසින. එනමුදු ඇය මේ සියල්ල නොතකා හැරියා ය. ඇය ඔවුන් ගේ ඛලීසි නොවේද? ඇයට වැදගත්වූ එකම දෙය ඔහු ගේ දෑස් පමණක් නොවේද? ඇය ඔහු ගේ සිරුර මත නගිද්දී ඒ දෑස්වල මින් පෙර කිසිදා නොදුටු යමක් ඇය දිටීය. සිය රජතමය වෙළඹ පදින තරම් සැහැසි අයුරින් ඇය ඔහු හා

එක්වුනා ය. අවසානයේ ඔහු සුරතාන්තයට පත්වෙද්දී ඛාල් ඩ්‍රෝගෝ ඇගේ නම කියමින් කෑ ගැසීය.

ඔවුන් ඩොත්රැකි මුහුදේ අනික් පසට ළඟා වූ පසු එක් දවසක් ජික්වී ඩැනීගේ මඳක් ඉදිරියට නෙරා ආ උදරය මෘදු ලෙස තම අතැඟිලිවලින් පිරිමැද්දා ය. "ඛලීසි, ඔබේ කුසේ දරුවෙක්."

"මං දන්නවා." ඇය පිළිතුරු දුන්නා ය.

ඒ ඇගේ දහහතරවන උපන් දිනය විය.

Daenerys Targaryen: “What do you pray for, Ser Jorah?”

Jorah Mormont: “Home.”

Daenerys Targaryen: “I pray for home too.”

බ්‍රැන් 04-1

පහළ අංගනයේ රිකන් වෘකයින් සමගින් සෙල්ලම් කරමින් හුන්නේ ය.

කවුළුව අසල අසුනකට බර දුන් බ්‍රැන් එදෙස බලා සිටින්නට විය. ග්‍රේ වින්ඩ් කුඩා දරුවා යන යන පැත්තට හැරෙමින් ඔහු ගේ ගමනට හරස් කපයි. ඔහුව දකින රිකන් සතුටින් උඩ පැන අන් දෙසකට දිව යයි. ඔහු පසුපසින් දුවන ෂැගී ඩෝග් අන් වෘකයින් පමණට වඩා රිකන්ට ලං වුවහොත් ඔවුන්ට කඩා පනියි. උගේ ලොම් කෙමෙන් අඳුරු පැහැයකට හැරී තිබුනු අතර දැන් ඒවා මුළුමනින්ම කළු පැහැ විය. උගේ දෑස් කොළ පැහැ ගින්දර මෙන් බැබලින. අළු හා රිදී පැහැති වූ බ්‍රැන් ගේ සමර් අන්තිමටම පැමිණියේ ය. උගේ රන්වන් පැහැති දෑසට හසු නොවූ කිසිදු දෙයක් නොවී ය. ඌ ග්‍රේ වින්ඩ්ට වඩා ප්‍රමාණයෙන් කුඩා වුවද බෙහෙවින් පරීක්ෂාකාරී සතෙකු විය. පැටවුන් අතරින් දැකුම්කළුම එකා ඌ යැයි බ්‍රැන් කල්පනා කලේ ය. සිය ළදරු දෙපා වලින් පොළොව මත උඩ පනිමින් එහා මෙහා දුවන පුංචි රිකන් ගේ සිනාහඬ දසතම පැතිර ගියේ ය.

සිය දෑස් දැවෙන්නාක් මෙන් බ්‍රැන්ට දැනින. ඔහුටද පහළ අංගනයේ සිනාසෙමින් එහා මෙහා දුවන්නට උවමනා විය. සිය බොළඳ සිතුවිල්ල ගැන කේන්තියෙන් මෙන් ඔහු දෑසට නැගුනු කඳුළු බිමට වැටෙන්නට පෙර පිටි අත්ලෙන් පිසදා හැරියේය. ඔහුගේ අටවන උපන්දිනය ගෙවී ගියේ මේ නොබෝදා ය. ඔහු දැන් හඬන්නට තරම් නොවන ලොකු මිනිසෙකි.

"ඒක නිකංම නිකං බොරුවක් විතරයි." ඔහු අමිහිරි ස්වරයෙන් කීවේ සිය සිහිනය හා එහි උන් කපුටා ගැන මතක් කරමිනි. "මට පියාඹන්ට බෑ. මට අඩුමගානෙ දුවන්ටවත් බෑ."

"කපුටො ඔක්කොම බොරුකාරයො තමා." නාකි ආයම්මා එකඟ විය. ඇය කාමරයේ පුටුවක් මත වාඩි වී ගෙත්තමක් ගොතමින් සිටියා ය. "මං දන්නවා කපුටෙක් ගැන කතන්දරයක්."

"මට තවත් කතන්දර අහන්ට ඕන නෑ." බ්‍රැන් නොරිස්සුම් ස්වරයෙන් කඩා පැන්නේ ය. එක් කලෙකදී නම් ඔහු නාකි ආයම්මාටත් ඇගේ කතන්දරවලටත් ආදරය කලේ ය. එනමුදු දැන් තත්ත්වය වෙනස්ම එකක් විය. ඔහුට සාත්තු සප්පායම් කිරීමටත්, ඔහුට තනි රැකීමටත් ඔවුන් දවස පුරාම ඇයව ඔහු සමීපයේ රඳවා තබා තිබින. එහෙත් මෙය තත්ත්වය තවත් නරක අතට හැරවී ය. "මට උඹේ ඔය කතන්දර එපා වෙලා තියෙන්නෙ."

මැහැල්ල සිය දත් නැති සිනහව පෑවා ය. "මගේ කතන්දර? නෑ, පුංචි උතුමානනි. ඒවා මගේ කතන්දර නෙවෙයි. මේ කතන්දර මටත් ඔබතුමාටත් කලින් ඉඳලා තියෙන ඒවා. අපි නැතිවෙලා ගියාට පස්සෙත් ඒවා තියේවි."

'මැය නම් මහාම මහා අවලස්සන නාකි අම්මණ්ඩියෙක්'යැයි බ්‍රැන්ට සිතින. රැළි වැටුනු, කුදු වුනු, යාන්තමට දැස් පෙනෙන, දූර්වල, හිසේ සුදු පැහැ කෙස්ගස් කිහිපයක් පමණක් ඉතිරිව ඇති අවලස්සන මැහැල්ලක්. ඇය ගේ වයස කීයදැයි කිසිවෙකුත් හරියටම නොදැන සිටියහ. එනමුදු ඔහු ගේ පියා කියන අන්දමින් නම් ඔහු කුඩා කොලුවකු කාලයේ පවා කවුරුත් ඇයව ඇමතූයේ නාකි ආයම්මා යන නමිනි. ඇය වින්ටර්ෆෙල්වල ජීවත් වූ වයස්ගතම පුද්ගලයා බව නම් නිසැකවම කිව හැකි විය. සමහරවිට මේ මුලුමහත් රාජධානි සප්තකයේම සිටින වයස්ගතම පුද්ගලයා ඇය වන්නට ඇත. ඇය මාලිගයට පැමිණ තිබුනේ දරු ප්‍රසූතියේදී මව මියගිය බ්‍රැන්ඩන් ස්ටාර්ක් කෙනෙකු බලා ගැනීම පිණිස ය. ඒ රිකාර්ඩ් උතුමානන් ගේ එනම් බ්‍රැන් ගේ සීයා ගේ වැඩිමහලු සොහොයුරකු විය. නැතිනම් බාල සොහොයුරකු විය. එසේත් නැත්නම් රිකාර්ඩ් උතුමානන් ගේ පියා ගේ සොහොයුරකු වන්නට ඇත. නාකි ආයම්මා එක එක වේලාවට ඒ ගැන එක එක දේ කියයි. එහෙත් ඒ සෑම කතාවකටම අනුව එම කුඩා දරුවා වයස අවුරුදු තුනේදී උණ රෝගයකට ගොදුරුව මියගිය අතර නාකි ආයම්මා සිය දරුවන් සමගින් දිගටම මාලිගයේ රැඳුනා ය. ඇගේ පුතුන් දෙදෙනාම මියගොස් තිබුනේ රොබර්ට් රජතුමා සිය කිරුළ දිනූ යුද්ධයට සහභාගි වී සිටියදී ය. ඇගේ මුණුබුරා මැරුම් කෑවේ බේලන් ග්‍රේජෝයි ගේ කැරැල්ල සමයේ පයික් හි ප්‍රාකාර අතර යුද්ධ කරමින් සිටියදී ය. ඇගේ දූවරුන් මීට බොහෝ කාලයකට පෙරාතුවම විවාහ වී බැහැර ගොස් සිටි අතර ඔවුන් ද මේ වනවිට මිය ගොස් ඇති බැව් නිසැක වශයෙන්ම සිතා ගත හැක. ඇයගේ ඥාතියකු වශයෙන් දැන් මාලිගයේ ඉතිරිව සිටින්නේ ඉස්තාල බලාගන්නා, නොවැඩුනු මනසකින් යුතු යෝධයකු වන හොඩෝර් පමණි. එනමුදු නාකි ආයම්මා ඇගේ මැහුම් ගෙතුම් වැඩ කරමින්, සිය කතන්දර කියමින් දිගින් දිගටම ජීවත් වුනා ය.

"ඒවා කාගෙ කතන්දර වුනත් මට වැඩක් නෑ. මට ඒවා එපාවෙලයි තියෙන්නෙ." ඔහුට නාකි ආයම්මාගෙන් හෝ කතන්දරවලින් හෝ පලක් නැත. ඔහුට උවමනා එකම දෙය සිය මව හා පියා පමණි. ඔහුට උවමනා එකම දෙය තමා පසෙකින් දුවන සමර් සමගින් අංගනයේ දිව යන්නට ය. ඔහුට උවමනා එකම දෙය බිඳුනු කුළුණට නැග එහි සිටින කපුටන්ට ඉරිඟු ඇට දීමට ය. ඔහුට උවමනා එකම දෙය සිය පෝනියා පිට නැගී සොයුරන් සමගින් ඇවිදීමට යාමට ය. ඔහුට උවමනා එකම දෙය සෑම දෙයක්ම නැවත පෙර පැවති තත්ත්වයෙන් සිදුවනු දැකීමට ය.

"මං දන්නවා කතන්දර එපා වෙච්ච ළමයෙක් ගැන කතාවක්." නාකි ආයම්මා සිය මෝඩ සිනහව පාමින් නැවත කීවා ය. ඇගේ ගෙතුමේ ඉදිකටු නොනවත්වාම ක්ලික් ක්ලික් හඬින් නද දුන් අතර අන්තිමේදී බ්‍රෑන්ට එය කන්දොස්කිරියාවක් බවට පත් විය.

නැවත කවදාවත් පෙර සිටි තත්ත්වයට පත්වීමට බැරි බැව් බ්‍රෑන් දැන හුන්නේ ය. ඔහුට පියාඹන්නට හැකි යැයි කියමින් අර හොර කපුටා සම්යක්ප්‍රයෝගයක් කල බව නිසැක ය. එහෙත් ඔහු අවදි වූ විට මුලුමහත් ලෝකයම වෙනස් වී තිබුනු අතර ඔහු අබ්බගාතයෙක් බවට පත්ව සිටියේ ය. අනිත් සැවොම ඔහුව මෙහි අතැරදමා පිටව ගොස් තිබින. ඔහු ගේ පියා, මව, සොයුරියන්, ඔහු ගේ අවජාතක සොයුරා ජොන් පවා පිටව ගොස් තිබින. ඇත්තම ඇත්ත අශ්වයකු පිට නැගී බ්‍රෑන්ටද කින්ග්ස් ලෑන්ඩින්ග් වලට යා හැකි යැයි ඔහු ගේ පියා පොරොන්දු වී තිබින. එනමුදු ඔවුන් ඔහුව හැර දමා යන්නට ගොසිනි. මේස්ටර් ලුවින් ඔහු ගේ පිබිදීම ගැන දන්වා ඔහු ගේ පියාට, මවට හා ජොන්ට කපුටන් අතේ පණිවුඩ යැවූ නමුත් ඒ කිසිවකට පිළිතුරු ලැබී නොතිබින. "සමහර වෙලාවට කුරුල්ලො වල්මත් වෙනවා දරුවො." මේස්ටර් ඔහුට කීවේ ය. "මෙතැන ඉඳන් කින්ග්ස් ලෑන්ඩින්ග් වලට බොහොම දුරයි. මග උවදුරු තියෙනවා, උකුස්සො ඉන්නවා. සමහරවිට එයාලට පණිවුඩේ ලැබිලා නැතිවා වෙන්ට ඇති."

එනමුදු බ්‍රෑන්ට දැනුනේ ඔහු නිදි අතරේ ඔවුන් සියල්ලක්ම මියගොස් ඇති බවකි... එසේ නැතහොත් ඔහු මියගොස් ඔවුන්ට ඔහුව අමතකව ගොසිනි. එපමණක් ද නොව ජොරී, සෙර් රඩ්‍රික් හා වයොන් පූල් පවා යන්ට ගොසිනි. හලන්, හාර්වින් හා මහත ටොම් සමගින් සෙබළ මුලුවෙන් කාලක්ම යන්ට ගොසිනි.

ඉතිරිව ඇත්තේ රොබ් හා පුංචි රිකන් පමණි. එහෙත් රොබ් දැන් පෙර සිටි රොබ් නොවේ. ඔහු දැන් වංශාධිපතියෙකි. ඔහු දැන් ඇත්තම අසිපතක් පැළඳ සිටින අතර කිසි විටෙකත්

සිනා නොවෙයි. ඔහු ගේ දිවා කාලයන් ගෙවෙන්නේ සෙබළුන් සමග සෙණ්ඩුවාලුවේ සටන් පුහුණුවෙනි. රාත්‍රියේදී ඔහු මේස්ටර් ලුවින් හා එක්ව කතා කරමින් හෝ ගිනුම් පොත් පරීක්ෂා කරමින් හෝ කාලය ගෙවයි. සමහර දිනවල ඔහු හැලිස් මොලන් හා එක්ව ඈත ඇති බලකොටු පරීක්ෂාව පිණිස යන අතර දවස් ගණන් ගෙදර නොපැමිණෙයි. ඔහු දවසකට වඩා පිටව ගොස් සිටියහොත් පුංචි රිකන් ඔහු නැවත එන-නොඑන බව ගැන විමසමින් හඬා වැටෙයි. ඔහු වින්ටර්ෆෙල්වල සිටින දිනවල පවා රොබ් උතුමානන්ට සිය සොහොයුරන් හා කාලය ගත කිරීමට වඩා හැලිස් මොලන් හා තියන් ග්‍රේජෝයි සමග කාලය ගතකිරීම වැදගත් වී ඇති සේය.

"මට පුළුවන් ඔයාට බ්‍රැන් දි බිල්ඩර් ගැන කතාව කියන්ට." නාකි ආයම්මා ඇසුවා ය. "ඒකනෙ ඔයාගෙ ආසම කතන්දරේ."

මීට අවුරුදු දහස් ගණනකට පෙර බ්‍රැන් දි බිල්ඩර් විසින් වින්ටර්ෆෙල් ගොඩනංවා තිබින. සමහර ප්‍රවාදවලට අනුව නම් ප්‍රාකාරය ගොඩ නංවන ලද්දේද ඔහු විසිනි. බ්‍රැන් මේ කතන්දරය දැන සිටි නමුදු එය කිසිවිටෙකත් ඔහු ගේ ප්‍රියතම කතන්දරය නොවින. සමහරවිට අර අනිත් බ්‍රැන්ඩන් කෙනෙකු ගේ ප්‍රියතම කතන්දරය එය වන්නට ඇත. සමහරවිට නාකි ආයම්මා ඔහුට කතා කරන්නේ හරියට ඔහු ඇගේ බ්‍රැන්ඩන්, මීට අවුරුදු බොහෝ ගණනකට පෙර ඇය රැක බලාගත් මියගිය ඒ දරුවා ඔහු යැයි සිතමිනි. තවත් සමහර වෙලාවට ඇය ඔහුව ඔහු ගේ මාමා, ඔහු ඉපදීමටත් කලින් පිස්සු රජා විසින් මරා දැමුනු බ්‍රැන්ඩන් හා පටලවා ගනියි. ඔහු ගේ මව ඔහුට වරක් කියා ඇති පරිදි නාකි ආයම්මා කෙතරම් කලක් මෙලොව වාසය කර ඇතිද යත් ඇයට මේ සියලුම බ්‍රැන්ඩන්ලා පෙනෙන්නේ එක් අයකු මෙනි.

"ඒක මගේ ආසම කතන්දරේ නෙවෙයි. මම ආස බය හිතෙන කතන්දර වලට." පහළ කිසියම් කලබලයක් ඇසුනු බ්‍රැන් කවුළුවෙන් පිටත බැලුවේ ය. රිකන් අංගනය හරහා ගේට්ටුව දෙසට දුවමින් හුන් අතර වෘකයෝ ඔහු පසුපසින් වැටී සිටියහ. එනමුදු එතනින් එහාට කුමක් සිදුවිනිදැයි බ්‍රැන්ට බලාගත නොහැකි වූයේ කුළුණ වැරැදි පැත්තට මුහුණ ලා තිබුනු බැවිනි. ඉච්ඡාභංගත්වය නිසා ඔහු සිය කලවට මිටින් පහරක් දුන් නමුදු ඔහුට එහි කිසිදු හැඟීමක් නොදැනින.

"අනේ මගේ අහිංසක ගිම්හාන දරුවා. ඔයා මොනාද දන්නෙ බය ගැන? බය කියන්නෙ සීත කාලෙට අයිති දෙයක් මගේ පුංචි උතුමානනි. අඩි සියගානක් උසට හිම වැටෙන

කොට, සීතල හුළං උතුරෙන් කෑ ගහගෙන එනකොට තමා බය හිතෙන්නෙ. බය කියන්නෙ දිග රෑ කාලෙට අයිති දෙයක්. ඉර අවුරුදු ගානක් එළියට එන්නෙ නැතුව හැංගිලා ඉන්නකොට, පුංචි ළමයි අන්ධකාරෙ ඉපදිලා අන්ධකාරෙ ජීවත්වෙලා අන්ධකාරෙම මැරිලා යනකොට, සෝරවෘකයින් බඩගිනි දැනෙනකොට, වනාන්තරේ අස්සෙ ධවල යාත්‍රිකයන් ඇවිදිනකොට තමා බය හිතෙන්නෙ."

"ඔය කියන්නෙ අනික් එවුන්." බ්‍රෑන් අවලාද ස්වරයෙන් කීවේ ය.

"අනික් එවුන් තමා." නාකි ආයම්මා එකඟ විය. "මීට අවුරුදු දාස් ගානකට එපිටදි සීත කාලයක් ආවා, මිනිස්සු මීට කලින් කවදාවත් අහලා දැකලා නැති තරම් සීතල, කටුක, අවසානයක් පේන්ට නැති. පරම්පරාවක් තිස්සේ පැවතිච්ච රෑ කාලයක් ආවා. රජවරු සීතලෙන් වෙවුලලා එයාලගෙ මාලිගාවලම මියැදුනා හරියට ඌරු කොටු කාරයො උංගෙ පැල්පත් අස්සෙ මියැදෙනවා වගේ. තමන්ගෙ දරුවො බඩගින්නෙ ඉන්නවා බලන් ඉන්න බැරි තැන ගෑනු එයාලගෙ බෙල්ල මිරිකලා මරලා දැම්මා. එයාලා ඇඬුවහම ඒ කඳුළු කම්මුල්වලම ගල් වුනා." ඇගේ ඉදිකටුවල ක්ලික් ක්ලික් ශබ්දය නැති වී ගිය අතර ඇය සිය මලානික දෑසින් බ්‍රෑන් දෙස බැලුවා ය. "ඉතින් දරුවො, ඔයාට ඕන ඒ වගේ කතන්දර ද?"

"හ්ම්ම්..." බ්‍රෑන් අනීරණාත්මක හඬින් කීවේ ය. "ඔවු. ඇත්තටම....."

මහලු ස්ත්‍රිය හිස වැනුවා ය. "මෙන්න මේ අන්ධකාරෙ තමා අනික් එවුන් ඉස් ඉස්සෙල්ලාම ආවෙ." ඇගේ ඉදිකටු නැවතත් ක්ලික් ක්ලික් හඬින් එකට ගැටෙන්නට විය. "උං හරිම සීතල එවුන්. මැරිච්ච එවුන්. උං යකඩවලටයි, ගින්දරටයි, ඉර එළියටයි, උණුසුම් ලේ නහර අස්සෙ දුවන හැම සතෙකුටමයි වෛර කලා. උං බලකොටු, නගර, රාජධානි එකින් එක යටත් කලා. වීරයොයි හමුදායි බුරුතු පිටින් උං අතින් මැරුම් කෑවා. උං ආවෙ තමන්ගෙ මැරිච්ච සුදුමැලි අස්සයො පිටේ නැගලා තමන් අතින් මැරුම් කාපු එවුන්ගෙන් හැදිච්ච හමුදාවකුත් එක්කයි. උංගෙ ඉදිරි ගමන නවත්තන්ට කාටවත්ම බැරි වුනා. උං කිසිම කෙනෙකුට කරුනාවක් පෙන්නුවෙ නෑ, අඩුම ගානෙ පුංචි අත දරුවන්ටවත්."

ඇගේ ස්වරය කෙමෙන් පහත් වී ගොස් මිමිනුමක් බවට පත්ව තිබිනි. ඇයට ඇහුම්කණ් දෙනු පිණිස තමා ඉදිරියට නැඹුරු වී ඇති බැව් බ්‍රෑන්ට වැටහුනි.

"ඉතින්, මේ කියන්නෙ අන්දාල්වරුන් එන්ටත් ගොඩක් ඉස්සර. රොයින් නගරවලින් ආපු ගැනු පටු මුහුද තරණය කරලා මෙහාට එන්ට ගොඩාක් ඉස්සර. ඒ කාලෙ තිබ්බ රාජධානි සියගානක්, ඒවා හැම එකක්ම මුල් මිනිස්සුන්ගෙ රාජධානි. එයාලා මේ බිම උදුරගෙන තිබුනෙ වනාන්තරයේ දරුවන්ගෙන්. ඒ වුනත් තාමත් වනාන්තරයේ දරුවො අන්ධකාර වනාන්තර මැද්දෙ තිබුන එයාලගෙ කැලෑ නගරවලයි, කඳුවැටි අස්සෙයි ජීවත්වුනා. වයර්වුඩ් ගස්වල තිබුන මූනු මේ හැමදෙයක්ම දිහා බලාගෙනයි හිටියෙ. ඉතින්, සීතලයි මරණයයි මේ ලෝකෙ වහගෙන ඉන්දැද්දි 'අවසාන වීරයා' තීරණය කලා මේ වනාන්තරයේ දරුවන් හොයාගෙන යන්ට. එයා බලාපොරොත්තු වුනා මිනිස්සුන්ගෙ හමුදාවලට දිනන්ට බැරි වෙච්ච මේ යුද්ධෙ දරුවන්ගෙ පුරාණ මායාබලය පාවිච්චි කරලා දිනන්ට පුළුවන් වෙයි කියලා. ඉතින් එයා කඩුවකුයි, අස්සයෙකුයි, බල්ලෙකුයි අරගෙන, එයාගෙ සහයට තවත් මිනිස්සු දුසිමක් විතර එක්කහු කරගෙන ගමන පිටත් වුනා. එයා අවුරුදු ගානක් මෙහෙම හොයමින් ඇවිද්දා. එයාට අන්තිමේදි හිතෙන්ට පටන්ගත්තා දරුවන්ගෙ සැඟවිච්ච නගර එයාට කවදාවත්ම හොයාගන්ට බැරි වෙයි කියලා. එයාගෙ සගයො එකින් එකා මියැදුනා. ඊටපස්සෙ එයාගෙ අස්සයා. අන්තිමේදී එයාගෙ බල්ලා. එයාගෙ කඩුව කොච්චර තදට සීතලෙන් මිදුනද කිවුවොත් එයා ඒක පාවිච්චි කරන්ට හැදුවම කඩුව දෙකට කැඩිලා ගියා. අනික් එවුන්ට දැනුනා එයාගෙ ලේ වල උණුසුම් පුසුඹ. උං බොහොම නිස්සද්දව එයාගෙ අඩි පාරෙ පන්නන්ට පටන්ගත්තා. එයාව දඩයං කරන්ට බල්ලෙක් තරම් විසාල සුදුමැලි සුදුපාට මකුළු රංචු එයා පස්සෙන් එවන්ට ගත්තා-"

මහ හඬක් නගමින් දොර විවෘත විය. හදිසි බිය නිසා බ්‍රැන් ගේ හදවත කටින් පනින තරම් තදින් ගැස්සින. එනමුදු ඒ පැමිණ තිබුනේ මෙස්ටර් ලුවින් විය. ඔහු පසුපසින් පඩිපෙළ අසල සිටගෙන සිටියේ ඉස්තාල කොලුවා හොඩෝර් විය. "හො-ඩෝ-ර්." පුරුදු පරිදි ඔහු සිය දැවැන්ත සිනාවත් සමගින් තම ආගමනය සැමට දැනුම් දුන්නේ ය.

"අපට අමුත්තො වගයක් ඇවිල්ලා තියෙනවා." මෙස්ටර් ලුවින් සිනාවක් නොමැති මුවින් යුතුව කීවේ ය. "ඔයාව එතනට ඕන බ්‍රැන්."

"මම දැන් කතන්දරයක් අහන ගමන් ඉන්නෙ." බ්‍රැන් පැමිණිලි ස්වරයෙන් කීවේ ය.

"කතන්දරේට බලා ඉන්ට පුළුවන් පුංචි උතුමානනි. ඔබ ආපහු එනකං එයාලා බලන් ඉඳියි." නාකි ආයම්මා කීවා ය. "ඒ වුනාට අමුත්තො එහෙම ඉවසිල්ලෙන් බලන් ඉන්නෙ නෑ. අනික සමහර වෙලාවට එයාලා එයාලගෙම කතන්දරත් අරන් එනවා."

"කවුද ඒ?" බ්‍රැන් මේස්ටර් ලුවින්නේ ඇසී ය.

"ටිරියන් ලැනිස්ටර්. තව නිශා රැකුමෙ සෙබළු කීපදෙනෙක්. එයාලා ඔයාගෙ සහෝදරයා ජොන්ගෙන් පණිවුඩයක් අරන් ඇවිත් තියෙනවා. රොබ් දැන් එයාලව පිළිගන්නවා. හොඩෝර්, උඹ බ්‍රැන්ට ශාලාවට යන්ට උදවු කරනවද?"

"හො-ඩෝ-ර්." හොඩෝර් සතුටින් එකඟ විය. පහතට නැමුනු ඔහු දොරින් ඇතුළු විය. හොඩෝර් අඩි හතකට ආසන්න උසකින් යුතු දැවැන්තයෙකු විය. ඔහු ඇකිළුනු, කුදුගැසුනු නාකි ආයම්මා ගේ ඥාතියකු යැයි සිතීමට පවා නොහැකි දෙයක් විය. ඔහු ද මහලු වූ පසු නාකි ආයම්මා මෙන් ඇකිළී යනු ඇත්දැයි බ්‍රැන් විමතියෙන් කල්පනා කලේ ය.

පිදුරු මිටියක් ඔසවන තරම් පහසුවෙන් බ්‍රැන්ව ඔසවා ගත් හොඩෝර් ඔහුව සිය පපුවට තුරුළු කරගත්තේ ය. ඔහු ළඟින් නිතරම පාහේ යාන්තමින් අශ්ව ගඳක් හැමූ මුත් එය ඉවසා සිටීමට නොහැකි තරම් දරුණු දුර්සන්ධයක් නොවී ය. දුඹුරු පැහැ රෝමයෙන් ගැවසීගත් ඔහු ගේ දෑත්වල දැවැන්ත මස් පිඩු බෙරි පෙනින. "හො-ඩෝ-ර්." ඔහු නැවතත් කීවේ ය. තියන් ග්‍රේජෝයි වරක් පැවසූ පරිදි ඔහු කිසිම දෙයක් නොදත් මුත් නිසැකවම සිය නම දැන සිටියේ ය. බ්‍රැන් මේ බැව් පැවසූ විට නාකි ආයම්මා කිකිළියක් මෙන් අමනාපයෙන් කෙකර ගෑවා ය. ඇය පැවසූයේ ඔහු ගේ නම හොඩෝර් නොව වෝල්ඩර් බවයි. මේ හොඩෝර් යන නම කොහෙන් පැමිණි එකක්දැයි කිසිවෙකුත් නොදැන සිටි අතර සමහරවිට ඒ ඔහු සිය නම උච්චාරණය කරන ආකාරය අනුව සැදුනක් විය හැක. කෙසේ වුවද ඔහු දන්නා එකම වචනය එය විය.

නාකි ආයම්මා සිය කතන්දර හා ඉඳිකටු සමගින් කාමරයේ තනිකර දැමූ ඔවුහු පිටව ගියහ. බ්‍රැන්ව වඩාගත් හොඩෝර් පසුපසින් එන මේස්ටර් ලුවින් ද ඇතිව පඩිපෙළ බැස ශාලාව දෙසට යන්නට විය.

සමින් කල කබායක් හා ඊට උඩින් මුදු දම්වැලින් කල සන්නාහයක් පැළඳි රොබ්, 'රොබ් උතුමානන්' ගේ තද පරුෂ මුහුණද ඇතිව සිය පියා ගේ උස් ආසනයේ වාඩි වී සිටියේ ය. තියන් ග්‍රේජෝයි හා හැලිස් මොලන් ඔහු පසුපසින් සිටගෙන සිටි අතර මුර සෙබලුන් දුසිමක් පමණ ශාලාව දෙපස සීරුවෙන් සිටගෙන සිටියහ. ශාලාව මධ්‍යයේ කුරුමිට්ටා සිය සේවකයින් සමග සිටි අතර ඔවුන් සමග නිශා රැකුමේ සෙබළු සිවුදෙනෙකු ද වූහ. හොඩෝර් ඔහුව ඔසවාගෙන දොරින් ඇතුළු වූ වහාම ශාලාව තුළ තිබුනු නුරුස්නා කේන්ති සහගත මනෝභාවය ඔහුට හොඳින්ම දැනින.

"නිශා රැකුමේ ඕනෑම මිනිහෙකුට එයා කැමැති කාලයක් වින්ටර්ෆෙල්වල ඉන්ට පුළුවන්." රොබ් සිය රොබ් උතුමානන් ගේ ස්වරයෙන් කියමින් සිටියේ ය. සැමටම පැහැදිලිව පෙනෙන පරිද්දෙන් ඔහු ගේ උකුළ මත අසිපත තබා තිබින. කොපුවක නොලෑ අසිපතක් අතැතිව අමුත්තකු පිළිගැනීම මගින් දෙනු ලබන පනිවුඩය කුමක්දැයි කුඩා දරුවකු වූ බ්‍රැන් පවා දැන සිටි කරුණක් විය.

"නිශා රැකුමේ ඕනෑම මිනිහෙකුට. " කුරුමිට්ටා පුනරුච්චාරණය කලේ ය. "ඒ වුනාට මට නෙවෙයි. එහෙමද ඒකෙ තේරුම කොල්ලො?"

නැගී සිටි රොබ් කුඩා මිනිසා දෙසට සිය අසිපත් තුඩ දිගු කලේ ය. "මගේ තාත්තයි අම්මයි බැහැර ගිහින් ඉන්න වෙලාවෙ මමයි මෙතන ප්‍රධානියා ලැනිස්ටර්. මම උඹේ කොල්ලා නෙවෙයි."

"උඹ වංශාධිපතියෙක් නම් උඹ දැනගෙන ඉන්ට ඕන වංශාධිපතියෙකුගෙ ආචාරශීලීත්වය කියන්නෙ මොකක්ද කියලා." කුඩා මිනිසා සිය මුහුණ දෙසට එල්ල වී ඇති අසිපත් තුඩ ගැන නොතකා හරිමින් පිළිතුරු දුන්නේ ය. "පේන විදියට නම් උඹේ අවජාතක සහෝදරයාට උඹේ තාත්තගෙ ශිෂ්ට සම්පන්න කම ඔක්කොම ගිහිල්ලා තියෙනවා."

"ජොන්." හොඩෝර් ගේ දෑත් තුළ සිරවී සිටි බ්‍රැන් හුස්මක් ඇද්දේ ය.

ශබ්දය ඇසුනු කුරුමිට්ටා හැරී ඔහු දෙස බැලුවේ ය. "එහෙනම් ඒක ඇත්ත. කොලුවා ජීවත් වෙනවා. මේ ස්ටාර්ක්ලා කියන්නෙ මරන්ට හරිම අමාරු ජාතියක් වගේ."

"උඹලා ලැනිස්ටර්ලා ඒක මතක තියාගෙන හිටියොත් හොඳයි." ඔහු අසිපත පහත් කලේ ය. "හොඩෝර්, මගේ මල්ලිව මෙහාට ගෙනෙන්."

"හො-ඩෝ-ර්." ඔහු පිළිතුරු දුන්නේ ය. සිනාමුසු මුහුණින් යුතුව ඉදිරියට පිය මැන්න ඔහු බ්‍රැන්ව ස්ටාර්ක්වරුන්ගේ උස් ආසනය මතින් තැබුවේ ය. මේ ආසනය වනාහි ස්ටාර්ක්වරුන් රජවරුන් මෙන් උතුර පාලනය කල කාලයේ සිට ඔවුන් විසින් භාවිතයට ගැනුනු එකක් විය. ගලින් නිමවුනු එය අනවරත පාවිච්චිය නිසා හොඳින් මැදී මටසිලුටු වී තිබින. එහි අත් ඇඳි දෙක දත් විලිස්සාගත් සෝරවෘක මුහුණු දෙකක කැටයමකින් හැඩ කර තිබින. පුටුවේ වාඩි වුනු බ්‍රැන් ඇඳි දෙක දැතින් අල්ලා ගත් අතර ඔහු ගේ වැඩකට නැති දෙපා පුටුවේ පහළට එල්ලී වැටින. මේ අසුනේ දැවැන්ත කම නිසා ඔහුට දැනුනේ තමා කුඩා බිළිඳෙකු පරිද්දෙනි.

රොබ් ඔහු ගේ උරයට අතක් තැබී ය. "උඹ කිවුවා උඹට බ්‍රැන්ව මුණගැහෙන්ට ඕනයි කියලා. හරි, මෙන්න එයා ඉන්නවා ලැනිස්ටර්."

Tyrion Lannister: “I have a tender spot in my heart for cripples and bastards and broken things.”

බ්‍රැන් අපහසුතාවට පත්වෙමින් ටිරියන් ලැනිස්ටර් ගේ අසමාන දෑස් දෙස බැලී ය. එක් ඇසක් කොළ පැහැ වූ අතර අනික කළු පැහැ විය. මේ දෑසම දැන් ඔහු දෙසට යොමුව ඔහුව නිරීක්ෂණය කරමින්, ඔහුව කිරා මනිමින් සිටියි. "එයාලා මට කිවුව විදියට නම් ඔයා බොහොම දක්ෂයි ඉහළ නගින්ට බ්‍රැන්." කුඩා මිනිසා අන්තිමේදී කතාව ඇරඹී ය. "මට කියන්ට, ඔයා කොහොමද එදා ඔය විදියට වැටුනෙ?"

"මම වැටුනෙ නෑ." බ්‍රැන් අවධාරණය කර සිටියේ ය. ඔහු කවදාවත්ම, කවදාවත්ම, කවදාවත්ම වැටී නැත.

"ඒ දරුවට වැටීම ගැන කිසිම දෙයක් මතක නෑ. අඩුමගානෙ එයා එදා ඒ කුළුණට නැගපු හැටිවත් මතක නෑ."මෙස්ටර් ලුවින් පිළිතුරු දුන්නේ ය.

"හරිම පුදුමයි!" ටිරියන් ලැනිස්ටර් කීය.

"මගේ මල්ලි මෙතනට ඇවිල්ලා ඉන්නෙ උඹේ ප්‍රශ්නවලට උත්තර දෙන්ට නෙවෙයි ලැනිස්ටර්." රොබ් කීවේ ය. "උඹ ආපු වැඩේ ඉවරකරලා මෙතැනින් පිටවෙලා පලයන්."

"මගේ ළඟ ඔයාට තෑග්ගක් තියෙනවා." කුරුමිට්ටා බ්‍රැන්ට කීවේ ය. "ඔයා කැමතිද අශ්වයො පිටේ යන්ට කොල්ලො?"

මෙස්ටර් ලුවින් ඉදිරියට පැමිණියේ ය. "මගේ උතුමානනි. මේ දරුවගෙ කකුල් සම්පූර්ණයෙන්ම පණ නැතිව ගිහින් තියෙන්නෙ. එයාට අශ්වයෙක් පිටේ වාඩිවෙන්ට බෑ."

"මොන විකාරද?" ලැනිස්ටර් කීවේ ය. "නියම විදියේ අශ්වයෙකුයි නියම විදියේ සෑදලයකුයි ලැබුනා නම් අබ්බගාතයෙකුට වුනත් අශ්වයො පිටේ යන්ට පුළුවන්."

මේ වදන් පිහි පහරවල් මෙන් සිය හදවත පසා කරගෙන යනු බ්‍රැන්ට දැනින. සිය දෑසට කඳුළු පුරා එනු ඔහුට දැනින. "මම අබ්බගාතයෙක් නෙවෙයි!"

"එහෙමනම් ඉතින් මම කුරුමිට්ටෙකුත් නෙවෙයි." කුරුමිට්ටා කට ඇදකරමින් කීවේ ය. "මගේ තාත්තා බොහොම සන්තෝස වෙයි ඒක අහන්ට." ග්‍රේජෝයි සිනාසුනි.

"මොන විදියෙ අශ්වයෙකුයි සෑදලයකුයි ද ඔබ යෝජනා කරන්නෙ?" මෙස්ටර් ලුවින් ඇසී ය.

"මොලේ තියෙන අශ්වයෙක්. මේ කොලුවට එයාගෙ කකුල් පාවිච්චි කරන්ට බෑ අශ්වයට අණ දෙන්ට. ඒ නිසා ඔබට සිද්දවෙනවා අශ්වයාව පුරුදු කරන්ට අසරුවාට ගැලපෙන විදියට. ඌට උගන්නන්ට තෝන් ලණුවට ප්‍රතිචාර දක්වන්ට, කටහඬට ප්‍රතිචාර දක්වන්ට. තාමත් පුහුණු කරන්ට ගත්තෙ නැති අශ්වයෙක්ගෙන්ම වැඩේ පටන්ගන්නවා නම් තවත් ලේසියි. එතකොට ඌට පරණ පුරුදු අත්අරින්ට වෙන එකක් නෑ." ඔහු සිය ඉණපටියෙන් රෝල් කරන ලද කඩදාසියක් එළියට ගත්තේ ය. "මෙන්න මේක ඔබලාගෙ සෑදල හදන මනුස්සයාට දෙන්ට. එයා ඉතුරු ටික බලාගනීවි."

මේස්ටර් ලුවින් කුතුහලයෙන් පිරි මුහුණින් යුතුව කුරුමිට්ටා අතින් කඩදාසිය ගත්තේ ය. එය දිගහැරිය ඔහු එහි ඇඳ තිබුනු රූපසටහන අධ්‍යයනය කලේ ය. "හ්ම්ම්... ඔබ බොහොම අගේට ඇඳලා තියෙනවා මගේ උතුමානනි. මේක හරියන්ට පුළුවන්. පුදුමයි මීට කලින් මට මේ බවක් කල්පනා වුනේ නැති එක."

"මට ඒක වඩා ලේසි වුනා මේස්ටර්. ඒක ගොඩක් දුරට මගේ සෑදලවලට සමානයි."

"මට ඇත්තටම අශ්වයො පිටේ යන්ට පුළුවන් වෙයිද?" බ්‍රැන් ඇසී ය. ඔහුට ඔවුන්ව විශ්වාස කිරීමට උවමනා විය. එහෙත් ඒ සමගින්ම ඔහුට බියක් ද දැනෙන්නට විය. සමහරවිට මෙයත් තවත් එක් බොරුවක් වන්නට ඇත. අර හොර කපුටා ඔහුට පියාඹන්නට පුළුවන් වනු ඇතැයි පොරොන්දු විය.

"අනිවාර්යයෙන්ම." කුරුමිට්ටා කීවේ ය. "මම ඔයාට දිවුරලා පොරොන්දුවෙනවා කොලුවො, අශ්වයා පිටේ ඉන්දැද්දි ඔයත් අනිත් අය තරම්ම උසට ඉඳියි."

රොබ් ස්ටාර්ක් ගේ මුහුණේ ප්‍රශ්නාර්ථයක් ඇඳී ගියේ ය. "මේක මොකක් හරි උගුලක්ද ලැනිස්ටර්? උඹ මොකටද බ්‍රැන්ට උදවු කරන්නෙ? එයා උඹේ කවුරුවත් නෙවෙයි?"

"උඹේ සහෝදරයා ජොන්, මගෙන් ඇහුවා මට ඒ දේ කරන්ට පුළුවන්ද කියලා. අනිත් එක, මගේ හදවතේ පොඩි ආදරයක් තියෙනවා අබ්බගාතයින්ටයි, අවජාතකයින්ටයි, ඔය අනිත් කැඩිලා බිඳිලා ගිය දේවලටයි." සිය හදවත මතුයෙහි අතක් තැබූ ටිරියන් ලැනිස්ටර් නියවී ය.

අංගනය දෙසට විහිදුනු දොර මහ හඬක් නගමින් විවර විය. සූර්යාලෝකය ශාලාව තුළට ඇතුළු වූ අතර ඒ සමගින් හති දමමින් දිව ආ රිකන්ද ඇතුළු විය. ඔහුට පිටුපසින් සෝරවෘකයෝද ඇතුළු වූහ. විසල් කර ගත් දෑසින් යුතු දරුවා දොරකඩ නතර වූ නමුදු වෘකයින් තිදෙනා දිගටම ඉදිරියට එන්නට වූහ. ඔවුන් ලැනිස්ටර් දූටුවා වන්නට ඇත, නැත්තම් ඔහු ගේ ඉව වැටුනා වන්නට ඇත. සමර් මුලින්ම ගොරවන්නට පටන් ගත්තේ ය. ග්‍රේ වින්ඩ් ඊට එක් විය. ඔවුන් දෙදෙනා සෙමින් සෙමින් එකෙක් දකුණෙන් ද අනිකා වමෙන් ද වශයෙන් ඔහු දෙසට පියවර මනින්නට වූහ.

"වෘකයො උඹේ ගඳට කැමැති නෑ ලැනිස්ටර්." තියන් ග්‍රේජෝයි කීවේ ය.

"මම හිතන්නෙ දැන් මට යන්ට වෙලාව හරි." ටිරියන් කීවේ ය. ඔහු පියවරක් පසුපසට ගත්තේ ය... එනමුදු ඔහුට පිටුපසින් සෙවනැලි අතරින් මෑත් වූ ෂැගී ඩෝග් දත් විලිස්සන්නට විය. ලැනිස්ටර් ආපසු පැන්න අතර සමර් එදෙසින් ඔහුට කඩා පැන්නේ ය. ඔහු සමබර නැති අයුරින් වටයක් කැරකුනු අතර අනිත් පසින් පැමිණි ග්‍රේ වින්ඩ් ඔහු ගේ අත සපාකෑවේ ය. උගේ දත්පහරට හසු වූ ඔහු ගේ කමිස අත ඉරී ගියේ ය.

"එපා!" බ්‍රැන් කෑ ගැසුවේ ලැනිස්ටර් මිනිසුන් සිය ආයුධ වෙතට අත යවන අතරතුරේදී ය. "සමර් මෙහෙ. සමර්, මගේ ළඟට එන්ට."

සෝරවෘකයා අතීරණයකින් මෙන් වරක් බ්‍රැන් දෙස ද වරක් ටිරියන් දෙස ද බැලී ය. කුඩා මිනිසාගෙන් මෑත්ව පසුපසට ඇදුනු ඌ බ්‍රැන් ගේ අප්‍රාණික දෙපා අසලින් බිම වැතිර ගත්තේ ය.

රොබ්ට හුස්ම ගන්නට පවා අමතකව තිබින. අන්තිමේදී ඔහු සැනසුම් සුසුමක් හෙලී ය. "ග්‍රේ වින්ඩ්." ඔහු ගේ සෝරවෘකයා ක්ෂණිකව එහෙත් නිහඬව ඔහු අසලට පැන්නේ ය. ඉතිරිව සිටියේ සිය කොළ පැහැ ගිනි මෙන් දිදුලන දෑසින් ටිරියන් දෙස බලා සිටි ෂැගී ඩෝගි පමණි.

"රිකන්, එයාට කතා කරන්ට." බ්‍රැන් කෑ ගැසුවේ ය. මෙතෙක් වේලා ගල්ගැසී සිටි රිකන් වහා සිහි එලවා ගත්තේ ය. "ෂැගී ගෙදර. දැන් ගෙදර යමු." ලැනිස්ටර් වෙතට අවසාන දත් විලිස්සීමක් කල කළු පැහැ වෘකයා රිකන් වෙතට පිය මැන්න අතර රිකන් උගේ ගෙල වටා දෑත් යවා ඌව බදාගත්තේ ය.

සිය ගෙල වටා පැළඳ සිටි ලේන්සුව ගැලවූ ටිරියන් ලැනිස්ටර් දහදියෙන් තෙත් වී තිබුනු නළල පිසදා හැරියේ ය. "හරිම පුදුමයි!" ඔහු අව්‍යක්ත ස්වරයෙන් කීවේ ය.

"ඔබතුමා හොඳින්ද මගේ උතුමානනි?" අසිපත අතැතිව සිටි ඔහු ගේ මිනිසෙක් ඇසී ය. ඔහු නොසන්සුන් අයුරින් සෝරවෘකයින් දෙසට බැල්මක් හෙලී ය.

"මගේ කමිස අත ටිකක් ඉරුනා. මගේ කලිසම තෙමුනා. ඒ වුනත් මගේ ගෞරවය ඇරෙන්ට වෙන කිසිම දේකට හානියක් වුනේ නෑ."

රොබ් පවා තවමත් තැති ගැන්වී සිටියේ ය. "වෘකයො... මම දන්නෙ නෑ ඇයි උං එහෙම දෙයක් කලේ කියලා..."

"කිසිම සැකයක් නෑ, උං හිතන්ට ඇති මම උංගෙ රෑ කෑම වේලයි කියලා." ලැනිස්ටර් දරදඬු අයුරින් බ්‍රැන් දෙසට හිස නැමී ය. "උංට කතා කරපු එකට බොහොම ස්තූතියි උතුමානනි. උන්ට මාව දිරවගන්ට බැරි කෑමක් වෙන්ට තිබුනා, මට විශ්වාසයි. හරි, කොහොමවුනත්, දැන් ඇත්තටම මට පිටවෙලා යන්ට කාලෙ හරි."

"පොඩ්ඩක් ඉන්ට මගේ උතුමානනි." මේස්ටර් ලූවින් රොබ් වෙතට ළඟා වී ඔහුට රහසින් යමක් කියන්නට විය. ඔවුන්ට සවන් දීමට බ්‍රැන් උත්සාහ කලද එය සාර්ථක නොවී ය.

රොබ් ස්ටාර්ක් අන්තිමේ දී සිය අසිපත කොපුවේ ලෑවේ ය. "මම.. මම පොඩ්ඩක් ඉක්මන් වුනා වැඩියි. ඔබ බ්‍රැන්ට කරුනාවන්ත වුනා. ඉතින්.. ඒ නිසා.." රොබ් වචන සෙවීමට තතනමින් උත්සාහයක් දැරී ය. "ඔබ කැමැති නම් වින්ටර්ෆෙල්වල සත්කාරය ඔබට හිමියි ලැනිස්ටර්."

"උඹේ ඔය බොරු ආචාරශීලීත්වය අහකට දාපං කොල්ලෝ. උඹ මට කැමැතිත් නෑ මම මෙතන ඉන්නවට කැමැතිත් නෑ. මම දැක්කා මේ ප්‍රාකාරවලට පිටින් වින්ටර් ටවුන් එකේ තානායමක් තියෙනවා. මට එහෙන් ඇඳක් හොයාගන්ට පුළුවන්. එතකොට අපි දෙන්නටම සැනසිල්ලෙ නිදාගන්ට පුළුවන්. තව තඹ කාසි කීපයක් වියදම් කලාම මගේ ඇඳට ගන්ට ලස්සන කෙල්ලෙකුත් හොයාගන්ට බැරුවයැ." ඇඹරුනු කොන්දකින් හා හැඩපලු ගෙතුනු රැවුලකින් යුතු මහලු කළු සොහොයුරකුට ඔහු කතා කලේ ය. "යොරේන්, අපි උදෙන්ම දකුණට යනවා. උඹට අපව පාරෙදි මුනගැහෙයි." ආපසු හැරුනු ඔහු සිය බකල කකුල් වලින් ශාලාව හරහා ගොස් දොරකඩ සිටි රිකන්ව ද පසු කොට එළියට පිලිපන්නේ ය. ඔහු ගේ මිනිස්සු ඔහු පිටුපසින් වැටුනහ.

නිශා රැකුමේ සොයුරන් නැවතී බලා සිටියහ. රොබ් අතිරණාත්මක අයුරින් ඔවුන් දෙසට හැරුනි. "මම ඔබලාට කාමර ලෑස්ති කරන්ට කියන්නම්. උණු වතුරත්. මම හිතනවා ඔබලා අපිත් එක්ක රෑ කෑම මේසෙට වාඩි වෙලා අපට ගෞරව දක්වයි කියලා." ඔහු කෙතරම් අදක්ෂ අයුරින් ඒ වදන් පැවසී ද යත් ඒවා ඔහු ගේ හදවතින් පැන නැගි වදන් නොව නිකංම කටපාඩම් කල යමක් කියාපෑමක් බව බ්‍රැන්ට පවා වැටහිනි. කෙසේවුවද කළු සොයුරෝ ඔහුට පෙරලා ස්තූති කලහ.

හොඩෝර් බ්‍රැන්ව ඔසවාගෙන නැවත නිදන කාමරයට යනු පිණිස කුළුණට නගිද්දී සමර් ද ඔවුන් පසුපසින් වැටින. නාකි ආයම්මාට සිය පුටුවේම නින්ද ගොස් තිබින. "හො-ඩෝ-ර්." කියූ හොඩෝර් බ්‍රැන්ව ඇඳ මතින් තමා ඇයව ඔසවාගෙන කාමරයෙන් පිටව ගියේ ය. බ්‍රැන් කල්පනාවේ නිමග්න විය. ඔහුටත් අද රෑ ප්‍රධාන ශාලාවේ අසුන් ගෙන කළු සොයුරන් හා භෝජන සංග්‍රහයට සහභාගි විය හැකි යැයි රොබ් පොරොන්දු වී තිබින. "සමර්." ඔහු කී අතර වෘකයා ඇඳ මතට පැන්නේ ය. බ්‍රැන් ඌව තදින් බදා වැළඳගත්තේ ය. "මට දැන් අශ්වයො පිටේ යන්ට පුළුවන්." ඔහු වෘකයා ගේ කණට කෙඳිරුවේ ය. "ඔන්න බලන්ටකො. අපි දෙන්නටම එකතු වෙලා කැලේ දඩයමේ යන්ට පුළුවන්." මඳ වේලාවකට පසු නින්ද ඔහු සොයා ආවේ ය.

ඔහු ගේ සිහිනය තුළ ඔහු නැවතත් කිසිදු කවුළුවක් නැති පැරණි කුළුණක් දිගේ ඉහළ නගිමින් සිටියේ ය. ඔහු ගේ අතැඟිලි, අල්ලාගැනීමට සුදුසු කුහරයක් සොයමින් ගල් අතර එහා මෙහා දිවගිය අතර ඔහු ගේ දෙපා පා තැබීමට සුදුසු තැනක් සොයමින් වෙහෙසුනේ ය. ඔහු ඉහළටම ඉහළටම, වළාකුළුවලටත් ඉහළින් අඳුරු රාත්‍රී අහස දෙසට නගිමින් සිටියේ ය. එනමුදු කුළුණ තවමත් ඔහුට ඉහළින් බොහෝ දුර විහිදුනි. මඳක් නැවතී පහළ

බැලූ ඔහු ගේ හිස බමන්නට වූ අතර අතැඟිලි ලිස්සන්නට විය. කෑ ගැසූ බ්‍රැන් සිය ජීවිතය වෙනුවෙන් තදින් කුළුණ බදා ගත්තේ ය. පොළොව ඔහුට සැතපුම් දහස් ගණනක් පහතින් වූ අතර ඔහුට පියාඹන්නට හැකියාවක් ද නොවින. සිය හද ගැහීම සාමාන්‍ය තත්ත්වයට පත්වන තෙක්, හුස්මක් අල්ලා ගත හැකි වන තෙක් ඔහු මඳක් නැවතී බලා සිටියේ ය. ඉන්පසු නැවතත් ඉහළ නගින්නට පටන් ගත්තේ ය. ඉහළට යනු හැර වෙනත් යා හැකි දිසාවක් නොවී ය. මඳ සඳ එළියේ ඔහුට බොහෝ ඉහළින් පිහිටි දිය පිට කිරීමට තැනූ නළවල හැඩය ඔහු දුටුවේ ය. ඔහු ගේ දෑත් වේදනාවෙන් ඇදුම් කන්නට වූ නමුදු ඔහුට නැවතී විවේක ගන්නට හැකියාවක් නොවී ය. වඩ වඩාත් වේගයෙන් ඉහළ නගින්නට ඔහු තමාවම උනන්දු කර ගත්තේ ය. ඔහු ඉහළ නගින දෙස දිය නළ බලා සිටින්නට විය. ඒවායේ දැස් ගිනිකබලක ගිනිඅඟුරු මෙන් රත් පැහැයෙන් දිදුලන්නට විය. සමහරවිට, කලෙකට පෙරදී ඒවා සිංහයින් ගේ හැඩහුරුකම ගත්තද දැන් ඒවා ඇඹරී විකෘත වී ගොස් තිබින. ඒවා මෘදු රහස් ස්වරයෙන් එකිනෙකාට කොඳුරාගන්නා හඬ බ්‍රැන්ට ඇසින. ඊට ඇහුම්කන් දීමෙන් වැළකිය යුතු යැයි ඔහු තමාටම කියා ගත්තේ ය. ඊට ඇහුම්කන් නොදෙන තාක් කල් ඔහු සුරක්ෂිත ය. එනමුදු මේ දිය නළ ඔවුන් සවි කර තිබුනු ගල්වලින් මිදී බ්‍රැන් වෙතට, කුළුණේ පහළට එන්නට පටන් ගත් විට තමා තවදුරටත් සුරක්ෂිත නැතැයි ඔහුට හැඟුනි. "මට මොකුත් ඇහුනෙ නෑ." ඔවුන් වඩා වඩාත් ළංවෙද්දී බ්‍රැන් වැලපෙන්නට විය. "මට ඇහුනෙ නෑ. මට ඇහුනෙ නෑ."

තැතිගත් ඔහු නින්දෙන් අවදි විය. අන්ධකාරයේ අතරමං වූ ඔහු දෙසට දැවැන්ත සෙවනැල්ලක් නැඹුරු වෙමින් තිබින. "මට ඇහුනෙ නෑ." ඔහු මිමිනුවේ බියෙන් වෙවුලමිනි. එනමුදු ඒ සෙවනැල්ල "හො-ඩෝ-ර්." කියා ඇඳ පසෙකින් තිබුනු ඉටිපන්දම පත්තු කලේ ය. බ්‍රැන් සැනසුම් සුසුමක් හෙලුවේ ය.

උණුසුම් තෙත් රෙදි කැබැල්ලකින් ඔහු ගේ ඇඟ පිස දැමූ හොඩෝර් කඩිසර අතැඟිලි වලින් ඔහුට ඇඳුම් ඇන්දවී ය. ඉන්පසු ඔහුව පහළ ප්‍රධාන ශාලාවට ඔසවාගෙන ගියේ ය. මේසයේ මුලින්ම තිබුනු ප්‍රධානියා ගේ උස් පුටුව හිස්ව තිබුනු අතර රොබ් එහි දකුණු පසින් අසුන් ගෙන සිටියේ ය. අනික් පසින් බ්‍රැන් අසුන් ගත්තේ ය. ඔවුන් රාත්‍රී ආහාරය වශයෙන් ඌරු පැටවුන්, පරෙවි පයි එකක් හා බටර් දමා බැදපු ටර්නිප් අනුභව කල අතර අතුරුපස වෙනුවෙන් අරක්කැමියා මී වද පොරොන්දු වී තිබින. සමර් මේසය යටට වී බ්‍රැන්ගෙන් ලැබෙන කෑම අනුභව කල අතර ග්‍රේ වින්ඩ් හා ෂැගී ඩෝග් ශාලාවේ මුල්ලක ඇටකටුවක් වෙනුවෙන් පොර වැදී හුන්හ. වින්ටර්ෆෙල්හි සුනඛයන් මේ වනවිට ප්‍රධාන ශාලාව මග හැර සිටීමට ඉගෙන උන්හ.

කළු සොයුරන් අතරින් ජෝෂ්ටයා වූ යොරේන්, රොබ් හා මේස්ටර් ඒමන් අතරින් අසුන් ගෙන සිටියේ ය. මේ මහලු මිනිසා වෙතින් දැඩි දුගඳක් වහනය වූයේ හරියටම ඔහු දිගු කලක් නොනා සිටි පරිද්දෙනි. ජොන් ස්නොව් ගැන ඇසූ විට ඔහු දෙවුර ඇකිලී ය. "සෙර් ඇලිසර්ගෙ විනාසෙ." ඔහු අමනාපයෙන් මෙන් ගෙරවූ අතර ඔහු ගේ සගයින් දෙදෙනෙක් බ්‍රැන් නොදන්නා කුමක් හෝ දෙයකට සිනාවක් හුවමාරු කරගත්හ. එනමුදු රොබ් සිය බාප්පා වූ බෙන්ජීන් ස්ටාර්ක් ගැන විමසූ විට ඔවුන් සියල්ලෝම නිහඬ වූහ.

"මොකක්ද?" බ්‍රැන් ඇසී ය.

යොරේන් ඉඳුල් වැකුනු සිය අතැඟිලි කමිසයේ පිසදා හැරියේ ය. "නරක ආරංචි මයෙ උතුමනි. ඔබතුමන්ලාගෙ ආගන්තුක සත්කාරවලට කලගුණ සලකන්ට අපට කියන්ට වෙලා තියෙන්නෙ නපුරු ආරංචි. ඒ වුනත් ඔබලාට මේවා කියන්ට අපි බැඳිලා ඉන්නවා. ස්ටාර්ක් නැතිවෙලා."

ඔහු ගේ සගයෙක් ද කතාවට එක් විය. "නාකි වලහා එයාව යැවුවා වේමාර් රොයිස්ට මොකද වුනේ කියලා හොයලා බලන්ට. එයා එන්ට පරක්කුයි මගෙ උතුමානනි."

"පරක්කු වුනා වැඩියි." යොරේන් කීය. "සමහරවිට එයා මැරිලා ඇති."

"මගේ බාප්පා මැරිලා නෑ." රොබ් ස්ටාර්ක් මහ හඬින් කීවේ ය. ඔහු ගේ කටහඬේ කේන්තිය පිරී තිබිනි. අසුනෙන් නැගී සිටි ඔහු සිය අසිපත් මිට මත අත රැඳෙවුවේ ය. "උඹලාට ඇහුනද? මගේ බාප්පා මැරිලා නෑ." ඔහු ගේ හඬ ශාලාව සිසාරා පැතිර ගිය අතර බ්‍රැන්ට හදිසියේම බියක් දැනෙන්නට විය.

මහලු යොරේන් කිසිදු හැඟීමක් නැති ස්වරයෙන් රොබ් දෙස බලා සිටියේ ය. "ඔබතුමා කියන දෙයක් මයෙ උතුමානනි." ඔහු කීය.

කළු සොයුරන් අතර ලාබාලතමයා අපහසුතාවට පත් වූ අයුරින් සිය අසුනේ හැරුනි. "බෙන්ජින් ස්ටාර්ක් තරම් හොඳින් හොල්මන් කැලේ ගැන දන්න වෙන කිසිම මිනිහෙක් ප්‍රාකාරෙ නෑ. එයා කොහොමහරි ආපහු එයි."

"ඔවු." යොරේන් කීය. "සමහරවිට එයා ආපහු එයි. සමහරවිට එන එකක් නෑ. හොඳ දක්ෂ මිනිස්සු කී දෙනෙක් මීට කලින් ඔය කැලේට ගිහින් ආපහු ඇවිල්ලා නැද්ද."

බ්‍රැන්ට සිතාගත හැකි වුනු එකම දෙය නම් නාකි ආයම්මා ගේ කතන්දරයි. අනික් එවුන්, අන්තිම වීරයා, වනාන්තරය තුළ ඔහු පසුපසින් පන්නන මළගිය මිනිසුන් හා බල්ලන් තරම් විශාල මකුළුවන්. ඔහුට මොහොතකට බියක් දැනුනු මුත් ඒ කතාව අවසන් වන්නේ කෙසේදැයි ඔහුට සිහිපත් විය. "දරුවො එයාට උදවු කරයි." ඔහු දෙඩෙව්වේ ය. "වනාන්තරයේ දරුවො."

තියන් ග්‍රේජෝයි අවඥාවෙන් සිනාසුනේ ය. "බ්‍රැන් වනාන්තරයේ දරුවො මැරිලා නැතිවෙලා ගිහිල්ලා දැන් අවුරුදු දාස් ගානක් වෙනවා. එයාලගෙන් ඉතුරුවෙලා තියෙන එකම දේ ගස්වල තියෙන මූනු විතරයි." මේස්ටර් ලුවින් කීය.

"මේ පහළදි ඒ කතාව ඇත්ත වෙන්ට පුළුවන් මේස්ටර්." යොරේන් පිළිතුරු දුන්නේ ය. "ඒ වුනත්, ඒ උතුරෙදි, ප්‍රාකාරෙන් එහාදි... කවුද දන්නෙ? එහෙදි මිනිහෙකුට හරියටම කියන්ට බෑ මොකක්ද මැරිලා තියෙන්නෙ මොකක්ද පණපිටින් ඉන්නෙ කියලා."

භෝජන සංග්‍රහය නිමා වූ පසු රොබ් සිය දෑතින්ම බ්‍රැන්ව ඔසවාගෙන නිදන කාමරය වෙත ගියේ ය. ග්‍රේ වින්ඩ් ඔවුන්ට ඉදිරියෙන් ගමන් කල අතර සමර් පසුපසින් පැමිණියේ ය. ඔහු ගේ සොයුරා ශක්තිමත් කොලුවකු වූ අතර බ්‍රැන් රෙදි බෝනික්කකු මෙන් සැහැල්ලු විය. එනමුදු ඒ පඩිපෙළ සීඝ්‍ර නැග්මකින් යුතු වූ අතර ඔවුන් කාමරයට ළඟා වන විට රොබ් ගේ හුස්ම ගැනීම ආයාසාත්මක වී තිබින.

බ්‍රැන්ව ඇඳ මත තබා පොරෝණුවලින් වැසූ රොබ් ඉටිපන්දම නිවා දැමීය. මඳ වේලාවක් යනතෙක් ඔහු නිහඬවම ඇඳ පසෙකින් වාඩි වී සිටියේ ය. ඔහු හා කතා කිරීමට බ්‍රැන්ට

උවමනා වූ නමුදු කුමක් කියන්නදැයි ඔහුට සිතා ගත නොහැකි විය. "අපි ඉක්මනටම ඔයාට අශ්වයෙක් හොයා ගමු. මම පොරොන්දු වෙනවා." අන්තිමේදී රොබ් මිමිනී ය.

"ඒගොල්ලො කවදාවත් ආපහු එන්නෙ නැද්ද?"

"එයාලා එනවා." රොබ් පිළිතුරු දුනි. ඔහු ගේ කටහඬේ වූ බලාපොරොත්තු සහගත බව නිසා මේ කතාකරන්නේ රොබ් උතුමානන් නොව සිය සහෝදරයා වූ රොබ් බව බ්‍රැන්ට වැටහුනි. "අම්මා ඉක්මනටම ගෙදර එයි. සමහරවිට අපට පුළුවන් වෙයි එයා එනකොට මගට ගිහිල්ලා එයාව පිළිගන්ට. ඔයා අශ්වයා පිටේ ඉන්නවා දැක්කහම එයාට පුදුම හිතෙයි නේද?" අන්ධකාරය මධ්‍යයේ වුව සිය සොයුරා ගේ සිනහව හඳුනාගන්නට බ්‍රැන් සමත් විය. "ඊටපස්සෙ, අපි උතුරට යමු, ප්‍රාකාරෙට. අපි ජොන්ට අපි එනවයි කියලා නොකියම යමු. අපි දවසක එහෙ යමු. ඔයයි මායි. ඒක හරිම වික්‍රමයක් වෙයි නේද?"

"වික්‍රමයක්." බ්‍රැන් උකටලී ලෙසින් එය පුනරුච්චාරණය කලේ ය. සිය සොයුරා ඉකිබිඳින හඬ ඔහුට ඇසින. කාමරය කෙතරම් අඳුරු වීද යත් රොබ් ගේ මුහුණෙහි වූ කඳුළු ඔහුට දැකිය නොහැකි විය. එබැවින් සිය අත දිගු කල ඔහු රොබ් ගේ අතින් අල්ලා ගත්තේ ය. ඔවුන් ගේ අතැඟිලි තරයේ එකට වෙලී ගියේ ය.

Robb Stark: “I am the lord here while my mother and father are away.”

එඩාර්ඩ් 05

"ඒරින් උතුමානන්ගෙ මරණය අපි හැමෝටම කණගාටුවට කාරණයක් මගේ උතුමානනි." ප්‍රධාන මේස්ටර් පයිසෙල් කීවේ ය. "එතුමන්ගෙ මරණය ගැන දන්න ඕනම දෙයක් ඔබට කියන්ට මම බොහොම සතුටින් සූදානම්. කරුනාකරලා වාඩිවෙන්ට. පුංචි සංග්‍රහයක් මොකුත් ගේන්ටද? රටඉඳි ටිකක්? මගේ ගාව හරි ෂෝක් පර්සිමොන් වගේකුත් තියෙනවා. සමාවෙන්ට, දැන් වයින් මගේ සෞඛ්‍යයට එච්චරම හොඳ නෑ. ඒ වුනත් මට පුළුවන් මී පැණි දාලා රස කරපු හොඳ සීතල කිරි කෝප්පයක් ගෙන්නන්ට. මේ රස්නෙ දවස්වල මට නං ඒක හොඳට අල්ලලා යනවා."

දැඩි උණුසුම පිළිබඳව නම් කිසිදු විවාදයක් නොවී ය. සිය සේද කබාය දහදිය නිසා පපුවට ඇලී ඇති අයුරු නෙඩ්ට දැනෙන්නට විය. සනකම්, තෙත්බරිත වාතය මුලු නගරයම වසා සිටියේ හරියටම තෙත් ලොම් ඇතිරිල්ලක් මෙනි. සිය උණුසුම්, හුස්ම ගැනීමට අපහසු නිවාස හැර දමා සිසිල් වාතය ආශ්වාස කල හැකි එකම තැන වූ ගංගාව වෙත පිය මනින ජනයාගෙන් ගංඉවුරු පිරී තිබින. "බොහොම ස්තූතියි!" නෙඩ් කීවේ අසුනකට බර දෙමිනි.

කුඩා රිදී සීනුවක් එසවූ පයිසෙල් එය මිහිරි සරින් සෙලෙවුවේ ය. තරුණ සේවිකාවක් කාමරය තුළට පිවිසියා ය. "කරුනාකරලා රජතුමාගෙ හස්තයටයි මටයි සීතල කරපු කිරි අරන් එන්ට දරුවා. හොඳට රසකරන්ට."

දැරිය ඔවුන් ගේ පානයන් රැගෙන ඒමට පිටව ගිය අතර ප්‍රධාන මේස්ටර් උදරය මතින් දෑත් පටලා පුටුවේ හරිබරි ගැසුනේ ය. "සාමාන්‍ය මිනිස්සු කියන්නෙ ගිම්හානයේ අන්තිම අවුරුද්ද තමා උණුසුම් වැඩිම කියලා. ඒක එහෙම නෙවෙයි, ඒත් ගොඩක් වෙලාවට එහෙම තමා දැනෙන්නෙ. එහෙම නේද? මේ වගේ දවස්වලට මට ඇත්තටම ඊරිසියා හිතෙනවා ඔබලාගෙ උතුරුකරයේ ගිම්හාන හිම වැටෙන එක ගැන." ඔහු අසුනේ හැරෙන වාරයක් පාසා ගෙල වටා වූ මැණික් එබ්බවූ බැරැති මේස්ටර් දම්වැල නද දුන්නේ ය. "ඇත්තටම බැලුවොත් මේකර් රජතුමාගෙ ගිම්හානය මීට වඩා රස්නෙ වුනා. ඒකත් මේ තරම්ම දිගයි. ඒ තමා මහා ගිම්හානය, කවදාවත් ඉවර වෙන්නෙ නැති ගිම්හානය කියලා විශ්වාස කරපු මෝඩයො සිටඩෙල්වලත් හිටියා. ඒ වුනත් හත්වෙනි අවුරුද්දෙ ඒක එකපාරටම නැවතුනා. පොඩි සිසිරයක් ආවා, ඊට පස්සෙ බොහොම දරුණු දිග සීත

කාලයක් ආවා. ඒ වුනත් ඒ රස්නෙ නම් බොහොම දරුණුවටම තිබුනා. ඕල්ඩ් ටවුන් දාඩියෙන් පෙඟිලා ගිහිල්ලායි තිබුනෙ. නගර වැසියො එළියට ආවෙ රෑ කාලෙ විතරයි. මට තාමත් මතකයි ඒ රෑ කාලෙ මගේ උතුමානනි - සුවඳ විලවුනුයි දාඩියයි, පුපුරන්ට තරම් තදට ඉදිච්ච කොමඩු, පීච්, දෙළුම්. ඒ කාලෙ මම මගේ දම්වැලට පුරුක් එකතු කර කර හිටපු තරුණයෙක්. ඒ උණුසුම මේ තරම්ම මාව මරලා දැම්මෙ නෑ." පයිසෙල් ගේ ඇසිපිය අඩක් පියවී තිබුනු අතර ඔහු නිදා සිටින්නාක් මෙන් පෙනින. "මට සමාවෙන්ට එඩාර්ඩ් උතුමානනි. ඔබ මෙහාට ආවෙ ඔබතුමාගෙ තාත්තා ඉපදෙන්ටත් කලින් සිද්දවෙච්ච ගිම්හානයක් ගැන විකාර අහන්ට නෙවෙයි නෙ. මේ නාකි මනුස්සයාගෙ කල්පනාවලට සමාවෙන්ට. හිත කියන්නෙ හරියට කඩුවක් වගේ, පරණ ඒවා මලකඩ කනවා. ආහ්! මෙන්න එනවා අපේ කිරි." සේවිකාව ඔවුන් දෙදෙනා අතරින් බන්දේසිය තැබූ අතර පයිසෙල් ඇයට සිනාවක් පෑවේ ය. "හොඳ දරුවා." කුසලාන එසවූ ඔහු උගුරක් පානය කර හිස සැලීය. " බොහොම ස්තූතියි! ඔබට දැන් යන්ට පුළුවන්."

දැරිය නික්මී ගිය පසු පයිසෙල් සිය තෙත් මලානික දෑස්වලින් නෙඩ් දෙස බැලී ය. "හොඳයි! අපි කොයි හරියෙද හිටියෙ? ආ හරි, ඔබ අහ අහ හිටියෙ ඒරින් උතුමානන් ගැන..."

"ඔවු." නෙඩ් කිරි උගුරක් තොල ගෑවේ ය. එය ඉතා හොඳින් සිසිල් කර තිබුනු නමුදු උවමනාවටත් වඩා පැණි මුසු කර තිබින.

"ඇත්තම කිවුවොත්, ටික කාලෙක ඉඳන් එතුමා එච්චර හොඳින් නෙවෙයි හිටියෙ. අපි දෙන්නා රාජසභාවෙ අවුරුදු ගානක් එකට වැඩ කලා. ඒ සලකුණු ටික ටික මතු වෙමින් තබා තිබ්බෙ. ඒ වුනත් මම හිතුවා ඒ එතුමා ගොඩක් කල් ඉඳන් කරමින් හිටිය රාජකාරි කන්දරාව නිසයි කියලා. රාජධානියෙ ඔක්කොම බර ඒ උරහිස් උඩටයි වැටිලා තිබුනෙ. ඒත් එක්කම එයාගෙ පුතාත් හැම වෙලාවෙම අසනීපෙන් හිටියෙ. එතුමාගෙ ආර්යාව කොච්චර බය වෙලාද හිටියෙ කියනවා නම් කොයි වෙලාවකවත් ඒ දරුවව තමන්ගෙ ඇස් මානෙන් පිට යැවුවෙ නෑ. මේ ටික හොඳටෝම ඇති ඕනම ශක්තිමත් මිනිහෙක් වුනත් වට්ටන්ට. ජොන් උතුමානන් කියන්නෙ තරුණයෙක් නෙවෙයි. එතුමා වෙහෙසට පත්වෙලා උකටලී වෙලා ඉන්නවා දකින්ට ලැබුන එක පුදුමයක් නෙවෙයි. මම ඒ කාලෙ එහෙම තමා හිතුවෙ. ඒත් දැන් මට තේරෙනවා." ඔහු බරපතල ලෙස හිස සෙලවී ය.

"එයාගෙ අන්තිම අසනීපය ගැන ඔබට මොනවද කියන්ට පුළුවන්?"

පයිසෙල් සිය පිළිසරණක් නොමැති අයුරින් සිය දෑත් දෙපසට විහිදී ය. "එයා එක දවසක් ආවා මාව හම්බවෙන්ට මොකක්දෝ පොතක් හොයාගෙන. බොහොම සෞඛ්‍ය සම්පන්නව, බොහොම ශක්ති සම්පන්නව. ඒ වුනත් මට පෙනුනා මොකක්දෝ දෙයක් එයාට බොහොම ගැඹුරින් වදදෙනවා. පහුවෙනිදා උදේ එයා ඇඳෙන් නැගිටගන්ටත් බැරි තරම් අමාරුවෙන් තමයි අවදි වුනේ. මෙස්ටර් කෝල්මන් හිතුවෙ ඒක මොකක් හරි බඩේ සීතල ගතියක් කියලයි. මේ රස්නෙ වැඩිකම නිසා එතුමා නිතරම වගේ එයාගෙ වයින් සීතල කරලා ගන්ට පුරුදු වෙලා හිටියා. ඒක සමහර වෙලාවට ආහාර දිරවන එකට බාධා කරනවා. ඒත් ජොන් උතුමානන් දිගින් දිගටම දුර්වල වෙද්දී මමත් ගියා එයාව බලන්ට. ඒ වුනත් දෙවියන් මට අවස්ථාවක් දුන්නෙ නෑ එයාව බේරගන්ට."

"මට අහන්ට ලැබුනා ඔබ මෙස්ටර් කෝල්මන්ව ඉවත යැවුවා කියලා."

ප්‍රධාන මෙස්ටර් සෙමින් හිස සැලී ය. "මම එහෙම කලා. මම දන්නවා ලයිසා ආර්යාව මට ඒකට කවදාවත් සමාව දෙන්නෙ නෑ. සමහරවිට මම වැරදි වෙන්ට ඇති. ඒ වුනත් ඒ වෙලාවෙ මම හිතුවා ඒක තමා කරන්ට ඕන හොඳම දේ කියලා. මෙස්ටර් කෝලමන් කියන්නෙ මට පුතෙක් වගේ. අනික එයාගෙ හැකියාව ගැන මට කිසිම ප්‍රශ්නයක් නෑ. ඒ වුනත් එයා තරුණයි. තරුණයො සමහර වෙලාවට තේරුම් ගන්නෙ නෑ මහලු සිරුරක තියෙන දුර්වලකම. එයා ඒරින් උතුමානන්ට එක එක බෙහෙත් දියර ජාති පොව පොවා හිටියා. මට බය හිතුනා එයා මේ මනුස්සයාව මරලා දාවි කියලා මේ බෙහෙත් ජාති පොවලාම."

"ඒරින් උතුමානන් එයාගෙ අන්තිම පැය කීපයෙදි ඔබට මොනවා හරි කිවුවද?"

පයිසෙල් නළල රැළි කලේ ය. "අන්තිම කාලෙ එයා රොබර්ට් කියන නම කීප විටක්ම කිවුවා. ඒක් එයා ඒකෙන් අදහස් කලේ එයාගෙ පුතා ද නැත්තම් රජතුමා ද කියන එක මට හරියටම කියන්ට බෑ. ලයිසා ආර්යාව දරුවාට අසනීප කාමරේට යන්ට ඉඩ දුන්නෙම නෑ. එයා බයවුනා ඒකෙන් ඒ දරුවත් අසනීප වෙයි කියලා. ඒ වුනත් රජතුමා ආවා. ඇවිල්ලා ඇඳ ගාවින් වාඩි වෙලා පැය ගණන් ගත කලා, ඉස්සර කාලෙ සිද්දවෙච්චි දේවල් ගැන කතා කර කර විහිළු කර කර. එතුමාට ඕන වුනා ජොන් උතුමානන්ගෙ හිත හොඳින් ශක්තිමත්ව තියාගන්ට."

"වෙන කිසිම දෙයක් නැද්ද? අවසාන වචනයක් මොකුත්?"

"ඔක්කොම බලාපොරොත්තු වතුරෙ ගියා කියලා දැනගත්තම මම එතුමාට පොපි යුෂ දුන්නා. එයාගෙ වේදනාව අඩුවෙන්ටයි, දුක් විඳින එක අඩුවෙන්ටයි කියලා. අන්තිම වතාවට ඇස් පියාගන්ට කලින් එතුමා රජතුමාටයි එතුමගෙ ආර්යාවටයි මොනවද මිමිනුවා. දරුවට මොකක් හරි ආශීර්වාදයක්. 'බීජය බොහොම ශක්තිමත්' එයා එහෙමයි කිවුවෙ. අන්තිම වෙද්දි එතුමාගෙ වචන තේරුම්ගන්ට අමාරු තරම් පැටලිලි සහගත වුනා. පහුවෙනිදා උදේ වෙනකම් මරණය ළඟා වුනෙ නෑ. ඒ වුනත් එතුමා බොහොම ශාන්තව නිදාගත්තා. ආයෙමත් කතා කලේ නෑ."

නෙඩ් තවත් කිරි උගුරක් බීවේ එහි ඇති අම්හිරි පැණි රස නොතකා හරින්නට වෑයම් කරමිනි. "ඒරින් උතුමානන්ගෙ මරණය ගැන මොකුත් අසාමාන්‍ය දෙයක් ඔබ දැක්කෙ නැද්ද?"

"අසාමාන්‍ය?" මහලු මේස්ටර් ගේ කටහඬ කෙඳිරියක් තරම් සිහින් විය. "නෑ. මට එහෙම මොකුත් කියන්ට බෑ. ඇත්තටම කණගාටුවට කාරණයක් තමා. ඒත්, මරණය කියන්නෙ බොහොම සාමාන්‍ය දෙයක් එඩාර්ඩ් උතුමානනි. ජොන් ඒරින් සමාදානයේ සැතපෙනවා. එයාගෙ දුක් කරදර ඔක්කොම අන්තිමේදී අහක් කරලා."

"එයාගෙ මේ අසනීපය. ඒ වගේ දෙයක් ඔබ මීට කලින් දැකලා තියෙනවද?"

"අවුරුදු හතලිහක් පුරාවට මම රාජධානි සප්තකයේ ප්‍රධාන මේස්ටර් වෙලා හිටියා. අපේ රොබර්ට් රජතුමා යටතේ, ඊට කලින් ඒරිස් ටාර්ගේරියන් යටතේ, ඊටත් කලින් එයාගෙ තාත්තා දෙවෙනි ජහරිස් යටතේ. ඒ ඔක්කොටම කලින් මාස කීපයක් එයාගෙත් තාත්තා පස්වෙනි ඒගොන් යටතෙත්. මට මතක තියාගන්ටවත් බැරි තරම් ලෙඩ රෝග කන්දරාවක් මම දැකලා තියෙනවා මගේ උතුමානනි. මම ඔබට කියන්නෙ, හැම ලෙඩක්ම එකිනෙකින් වෙනස්, ඒත් හැම ලෙඩක්ම එකිනෙකට සමානයි. ජොන් උතුමානන්ගෙ මරණය වෙන මරණයකට වඩා අසාමාන්‍ය වුනේ නෑ."

"ඒ වුනත් එයාගෙ බිරිඳ හිතන්නෙ වෙන විදියකට."

පයිසෙල් හිස වැනී ය. "මට දැන් මතක් වෙනවා. එතුමිය ඔබතුමාගෙ ආර්යාවගෙ සහෝදරී නේද. මේ නාකි මනුස්සයගෙ මොට්ට කතාවලට සමාවෙන්ට. ඒ වුනත් මම කියන්නෙ ශක්තිමත්ම, හොඳින්ම පාලනය කරපු මනසක් වුනත් දුක නිසා වැරැදි තීරණ ගන්ට පුළුවන්. ලයිසා ආර්යාව කියන්නෙ ඒ දෙකටම අයිති නැති එක්කෙනෙක්. එයාගෙ අන්තිම මළදරු උපතින් පස්සෙ එයා හැම හෙවනැල්ලකම සතුරො දකින්ට පටන්ගත්තා. එයාගෙ සැමියගෙ මරණය නිසා එයා කැලිවලට බිඳිලා අතරමං වෙලා ගියා."

"එහෙනම් ඔබට හොඳටම විශ්වාසයි ජොන් ඒරින්ගෙ මරණය සිද්දවුනේ මේ හදිසි අසනීපය නිසයි කියලා?"

"ඇත්තෙන්ම. අසනීපය නෙවෙයි නම් මගේ උතුමානනි, වෙන මොකක්ද ඒකට හේතු වෙන්ට පුළුවන්?"

"වස."

පයිසෙල් ගේ නිදිමත දෑස් සැනෙන් විවර විනි. මහලු මේස්ටර්වරයා අපහසුවට පත් වූ අයුරින් සිය අසුනේ ඒ මේ අත ඇඹරුනේ ය. "බොහොම භයානක සිතුවිල්ලක්. අපි මේ ඉන්නෙ නිදහස් නගරවල නෙවෙයි. එහෙ තමා මේ වගේ දේවල් සිද්දවෙන්නෙ. ප්‍රධාන මේස්ටර් ඇල්තමුයර් ලියලා තියෙනවා 'හැම මනුස්සයෙක්ම තමන්ගෙ හදවතේ මිනීමැරීමට ඇති රහස් ආසාවක් හංගගෙන ඉන්නවයි' කියලා. ඒ වුනත්, වස දෙනවා කියන්නෙ බොහොම අවඥාසහගත දෙයක් නෙ." ඔහු මොහොතක් නිහඬව සිතුවිල්ලේ ගැලී සිටියේ ය. "ඔබ ඔය කියන දේ වෙන්ට බැරි දෙයක් නෙවෙයි මගේ උතුමානනි. ඒ වුනත් මම හිතන්නෙ නෑ එහෙම වුනයි කියලා. ඕනෑම අඩුම මට්ටමේ මේස්ටර් කෙනෙක් වුනත් දන්නවා එදිනෙදා පාවිච්චි කරන සාමාන්‍ය වස ජාති ගැන. ඒරින් උතුමානන් ඒ වගේ රෝග ලක්ෂණ මොකුත් පෙන්නුම් කලේ නෑ. අනිත් එක එතුමාට හැමෝම වගේ ආදරේ කලා. මොන වගේ අමනුස්සයෙක්ද ඒ වගේ උදාර වංශාධිපතියෙකුට වස දෙන්නෙ?"

"මම අහලා තියෙන විදියට නම් වස කියන්නෙ ගෑනුන්ගෙ ආයුධයක්."

පයිසෙල් කල්පනාකාරීව සිය රැවුල පිරිමදින්නට විය. "එහෙම කියනවා. ගැනු, බයගුල්ලො... නපුංසකයො." ඔහු උගුර පෑදුවේ ය. "ඔබ දන්නවද? වාරිස් උතුමානන් ඉපදුනේ ලයිස්වල, වහලෙක් විදියට. මකුළුවන්ව විශ්වාස කරන්ට එපා මගේ උතුමානනි."

මෙය නෙඩ්ට අමුතුවෙන් කිවයුත්තක් නොවී ය. වාරිස් ගැන මතක්වන වාරයක් පාසා ඔහු ගේ ඇඟේ මාළු නටන්නාක් මෙන් දැනින. "මම ඒක මතක තියාගන්නම් මේස්ටර්. ඔබේ උදවුවලට බොහොම ස්තූතියි! මම දැනටමත් ඔබේ වටිනා කාලයෙන් ඕනෑවටත් වඩා අරන් තියෙන්නෙ." ඔහු නැගිට සිටියේ ය.

සෙමින් සිය අසුනෙන් නැගී සිටි ප්‍රධාන මේස්ටර් නෙඩ්ව දොර වෙතට කැඳවාගෙන ගියේ ය. "මම හිතනවා මම කියපු දේවලින් ඔබට පුංචි හරි උදවුවක් වෙන්ට ඇති කියලා. තවත් මොනවා හරි වෙන්ට ඕන නම් ඔබට අහන පරක්කුව විතරයි තියෙන්නෙ."

"ඇත්තටම එක දෙයක් තියෙනවා. ජොන් ඒරින් අසනීපෙන් වැටුන දවසේ එයා ඔබෙන් ඉල්ලන් යන්ට ආපු පොත පොඩ්ඩක් බලන්ට මම සතුටුයි."

"ඒක එච්චරම වැඩකට ඇති පොතක් කියලා මම හිතන්නෙ නෑ. ඒක මේ ප්‍රධාන මේස්ටර් මැලියන් ලියපු වංශාධිපති පවුල්වල ඉතිහාසය ගැන කියැවෙන පොතක්."

"ඒ වුනත් මම කැමැතියි ඒක පොඩ්ඩක් බලන්ට."

මහලු මිනිසා දොර හැරියේ ය. "ඔබේ කැමැත්තක්. ඒක මේ කොහේ හරි ඇති. ඒක හොයාගත්තු හැටියෙම මම ඔබේ නවාතැනට එවන්නම්..."

"ඔබ බොහොම කාරුණිකයි." නෙඩ් කීය. ඔහු ගේ සිතට හදිසි සිතුවිල්ලක් පහළ විය. "ඔබ අහිතක් හිතන්නෙ නැත්තම් තව එක ප්‍රශ්නයක්. ඔබ කිවුවා ජොන් ඒරින් මැරෙද්දි රජතුමා ඇඳ ගාව හිටියයි කියලා. මම මේ කල්පනා කලේ, එතන රැජිණත් හිටියද?"

"අපොයි නෑ. එතුමියයි, දරුවනුයි කාර්ස්ටලී රොක්වලට යම්නුයි හිටියෙ එතුමියගෙ තාත්තත් එක්ක. ටයිවින් උතුමානන් එතුමගෙ පිරිවරත් එක්ක නගරෙට ඇවිල්ලා හිටියෙ ජොෆ්රි කුමාරයගෙ උපන්දිනේ වෙනුවෙන් තිබුන තරගාවලිය බලන්ට. කිසිම සැකයක් නෑ එතුමා බලාපොරොත්තු වෙන්ට ඇති එතුමාගෙ පුතා, සෙර් ජේමි ඒ තරගාවලියෙ ශූරයා වෙයි කියලා. ඒත් එතුමාට බලාපොරොත්තු කඩ කරගන්ට සිද්ද වුනා. ඒරින් උතුමානන්ගෙ හදිසි මරණය ගැන එතුමියට පණිවුඩේ යවන්ට වුනේ මටයි. ඒ තරම් දුකින් පිරිච්ච හදවතක් ඇතුව මම වෙන කිසිම පණිවුඩයක් යවලා නෑ."

"කළු පියාපත්, නපුරු පණිවුඩ." නෙඩ් මිමිනී ය. ඒ ඔහු කුඩා කල නාකි ආයම්මා කියා දුන් ප්‍රස්ථා පිරුළකි.

"එහෙම තමා මාළුකාරයන්ගෙ ගැනු කියන්නෙ." පයිසෙල් එකඟ විය. "ඒ වුනත් අපි දන්නවා හැම වෙලාවෙම එහෙම නෙවෙයි කියලා. මේස්ටර් ලුවින්ගෙ කපුටා බ්‍රැන් ගැන අර සතුටුදායක ආරංචිය අරන් ආපු වෙලාවෙ අපි හැමෝටම ඒකෙන් ලොකු සන්තෝසයක් දැනුනා. එහෙම නේද?"

"ඇත්ත තමා මේස්ටර්."

"දෙවියන් කරුනාවන්තයි." පයිසෙල් හිස නැමී ය. "ඔබට උවමනා ඕනෑම වෙලාවක මෙහාට එන්ට එඩාර්ඩ් උතුමානනි. මම මෙතන ඉන්නෙ සේවය කරන්ට."

'ඔවු.' දොර වැසෙද්දී නෙඩ් කල්පනා කලේ ය. 'ඒ වුනත් උඹ කාටද සේවය කරන්නෙ නාකියො?'

සිය කාමර කරා ආපසු යන ගමනේදී පඩිපෙළ ඉහළ සිටි ආර්යා ඔහුට මුනගැසින. එක් පයකින් සිටගෙන සිටි ඈ දෑත් දෙපසට විහිදමින් සමබරතාව රැකගන්නට වෑයම් කරමින් හුන්නා ය. නැවතුනු නෙඩ් ඈ දෙස බැලී ය. "ආර්යා, ඔයා මොකක්ද ඔය කරන්නෙ?"

"සිරියෝ කියනවා දිය නැට්ටුවෙකුට කකුලෙ ඇඟිල්ලකින් පැය ගානක් වුනත් හිටගෙන ඉන්ට පුළුවන් කියලා." සමබරතාව රැකගැනීමට වෑයම් කරමින් ඇගේ දෑත් එහා මෙහා පියෑඹී ය.

නෙඩ්ට සිනහවක් පහළ විය. "කොයි ඇඟිල්ලෙන්ද?" ඔහු සරදම් ස්වරයෙන් ඇසීය.

"ඕන ඇඟිල්ලකින්." මේ ප්‍රශ්නය නිසා ඇගේ කේන්තිය ඇවිස්සුනු බවක් පෙනින. උඩ පැන දකුණු කකුලෙන් වම් කකුලට මාරු වුනු ඇ භයානක ලෙස වැනෙන්නට වූ නමුදු සිය සමබරතාව රැකගැනීමට සමත් වූවා ය.

"ඉතින් ඔයාට ඒ වැඩේ මෙතන ඉඳන්ම කරන්ට ඕනද? වාරු නැතුව ගියොත් ඔයා මේ පඩිපෙළ පහළට පෙරලිලා වැටෙයි. බලන්ට ඒක කොච්චර උසද කියලා."

"සිරියෝ කියනවා දිය නැට්ටුවෙක් කවදාවත් වැටෙන්නෙ නෑ කියලා." ඇය සිය දකුණු පාදය පහත් කර දෙපයින් සිට ගත්තා ය. "තාත්තෙ, දැන් බ්‍රැන්ට පුළුවන්ද ඇවිත් අපිත් එක්ක නවතින්ට?"

"තව ගොඩක් කල් යනකම් එයාට එහෙම කරන්ට බැරි වෙයි වස්තුවෙ. එයාගෙ ඇඟේ ශක්තිය ආපහු ලබාගන්ට ඕනනෙ."

ආර්යා තොල සපා ගත්තා ය. "එයා වැඩුන මිනිහෙක් වුනාම එයාට මොකක්ද කරන්ට වෙන්නෙ?"

නෙඩ් ඇය පසෙකින් බිම දණ ඇන ගත්තේ ය. "ඒකට උත්තරේ හොයාගන්ට එයාට තව අවුරුදු ගානක් තියෙනවා ආර්යා. එයා ජීවත්වෙන්ට යනවා කියන එක දැනගෙන හිටියාම දැනට හොඳටම ඇති." සුබ පණිවුඩය රැගත් කපුටා වින්ටර්ෆෙල්වල සිට පැමිණි දිනයේ නෙඩ් දැරියන් දෙදෙනාද කැටුව බලකොටුවේ දෙව්වනය වෙත ගියේ ය. එය ගඟට මුහුණ ලා පිහිටි එල්ම්, ඇල්ඩර් හා වෙනත් නොයෙක් ගස් පිරුනු අක්කරයක පමණ භූමි භාගයක් විය. මෙහි මධ්‍යයේ වූ හදවෘක්ෂය සිය පැරණි අතුපතර පුරා බෙරි වැල් එල්ලා ගත්

දැවැන්ත ඕක් ගසක් විය. වයර්වුඩ් ගසක් ඉදිරිපිට මෙන් ඔවුන් එය ඉදිරිපිට දණින් වැටුනේ දෙවියන්ට සිය කෘතඥපූර්වක බව දැක්වීමට ය. සඳ නැග එද්දී සන්සා නින්දට වන් අතර පැය කීපයකට පසු ආර්යාද තණ බිස්සේ සිය පියා ගේ සළුව යට වකුටු විය. එනමුදු නෙඩ් මුලු රෑ පුරාම නිදි වර්ජිතව කල් ගෙවී ය. අරුණළු පැතිරෙද්දී සන්සා සිනාමුසු මුවින් යුතුව නැගිට සිටියා ය. "මම බ්‍රැන්ව හීනෙන් දැක්කා." ඇය ඔහුට කොඳුලා ය. "මම දැක්කා එයා හිනාවෙනවා."

"එයා හිතාගෙන හිටියෙ නයිට්වරයෙක් වෙන්ට." ඔහු ගේ සිතුවිලි බිඳ දමමින් ආර්යා කීවා ය. "රාජ්‍යාරක්ෂක බලකායට බැඳෙන්ට. එයාට තාමත් නයිට්වරයෙක් වෙන්ට පුළුවන් ද?"

"බෑ මගෙ වස්තුවෙ." නෙඩ් කීය. ඇයට බොරු කියා තේරුමක් නොමැති බව ඔහුට වැටහින. "ඒත් දවසක එයා ලොකු බලකොටුවක උසස් වංශාධිපතියෙක් වෙලා රජතුමාගෙ උපදේශක සභාවෙ වාඩි වෙයි. එයත් බ්‍රැන්ඩන් දි බිල්ඩර් වගේ ලොකු බලකොටු ගොඩනගයි. එහෙමත් නැත්තම් නැවක නැගලා මුහුදු තරණය කරයි. නැත්තම් ඔයාගෙ අම්මගෙ සත්‍ය ලබ්ධියට බැඳිලා උසස් පූජකයෙක්, සමහරවිට නායක පූජකයා වෙයි." එනමුදු ඔහුට කෙදිනකවත් සිය වෘකයා සමගින් දිව යා නොහැකි වනු ඇත; ගැහැණියක හා යහන් ගතවීමට නොහැකි වනු ඇත; තමාගේම දරුවකු දෝතින් ගෙන සුරතල් කිරීමට නොහැකි වනු ඇත; නෙඩ් දුකින් කල්පනා කලේ ය.

ආර්යා හිස පසෙකට ඇල කලා ය. "මටත් පුළුවන්ද රජතුමාගෙ උපදේශකයෙක් වෙන්ට? බලකොටු හදන්ට? නායක පූජකයා වෙන්ට?"

"ඔයා." ඔහු කීවේ සෙමින් ඇගේ නළලත සිප ගනිමිනි. "රජ කෙනෙක්ව කසාද බැඳලා එයාගෙ මාලිගාව පාලනය කරයි. ඔයාගෙ පුත්තු නයිට්වරු වෙයි, කුමාරයො වෙයි, වංශාධිපතියො වෙයි. සමහරවිට නායක පූජකයා වෙන්ටත් පුළුවන්."

ආර්යා කට ඇද කලාය. "නෑ... ඒවා ගැලපෙන්නෙ සන්සාට." නැවතත් දකුණු කකුල නමාගත් ඇය සිය සමබරතා අභ්‍යාසය පටන් ගත්තා ය. සුසුමක් හෙලූ නෙඩ් ඇයව එතැන තනි කර දමා ඉදිරියට පිය මැන්නේ ය.

කාමරය තුළදී දහදියෙන් පෙඟුනු සේද කමිසය ගලවා වීසි කල නෙඩ් ඇඳ අසල බේසමක තිබුනු සිසිල් දියෙන් මුහුණ අතපය සෝදා ගත්තේ ය. ඔහු මුහුණ පිස දමමින් සිටින අතරතුරේදී ඇලන් කාමරයට ඇතුළු විය. "මගේ උතුමානනි. බේලිෂ් උතුමානන් ඇවිත් ඔබතුමාව මුනගැහෙන්ට ඕනයි කියනවා."

"එයාව මගේ පුස්තකාල කාමරයට එක්කන් යන්ට." නෙඩ් කීවේ සැහැල්ලු හණ රෙද්දෙන් කල අලුත් කමිසයක් වෙත අත යවමිනි. "මම ඉක්මනට එන්නං කියන්ට."

නෙඩ් කාමරයට ඇතුළු වන විට සුළැඟිල්ලා කවුළුව අසල අසුනකට බර දී පහළ අංගනයේ රාජ්‍යාරක්ෂක බලකායේ සෙබළුන් සරඹ පුහුණු වන අයුරු බලා සිටියේ ය. "නාකි සෙල්මිගෙ හිතත් එයාගෙ කඩුව වගේ කඩිසර නම් රාජසභා රැස්වීම් මීට වඩා රසවත් වෙන්ට තිබුනා." ඔහු උකටලී ස්වරයෙන් කීය.

"සෙර් බැරිස්ටාන් කියන්නෙ මේ කින්ග්ස් ලෑන්ඩින්ග්වල ඉන්න අනික් ඕනෑම කෙනෙක් තරම්ම වික්‍රමාන්විත, ගෞරවාන්විත මනුස්සයෙක්." රාජ්‍යාරක්ෂක බලකායේ ප්‍රධානියා වූ සුදු පැහැ හිසකෙසින් යුත් මේ මහල්ලා කෙරෙහි නෙඩ්ගේ සිතෙහි වූයේ ගැඹුරු ගෞරවාදරයකි.

"ඒ වගේම හරිම හිරිහැරදායකයි. ඒ වුනත් මම හිතන්නෙ මේ එන තරගාවලියෙදි එයා හොඳට සෙල්ලම් කරයි කියලයි. පහුගිය අවුරුද්දෙ එයා දඩබල්ලාව පැරැද්දුවා. අවුරුදු හතරකට කලින් එයා තමා ශූරයා වුනේ."

තරගාවලියේ ශූරයා කවුරුන් විය හැකිදැයි යන්න නෙඩ් ගේ සිටත කිසිසේත්ම වද දුන් කරුණක් නොවී ය. "මේ පැමිණීමට මොකුත් හේතුවක් තියෙනවද පෙටයර් උතුමානනි? එහෙම නැත්තම් ඔබ ආවෙ නිකංම මගෙ කවුළුවෙන් පේන දර්ශනය රස විඳින්ට ද?"

සුළැඟිල්ලා සිනාසුනි. "මම පොරොන්දුවක් වුනා කැට් ට ඔබේ පරීක්ෂණවලට උදවු කරනවා කියලා. ඉතින් ඔන්න මම කලා."

මෙය නෙඩ් ගේ සිතේ විමතියක් ඇති කලේ ය. පොරොන්දුවක් වූවා හෝ නොවූවා හෝ පෙටයර් බේලිෂ් උතුමානන් යනු විශ්වාස කටයුතු පුද්ගලයකු නොවන බැව් ඔහු මනාව දැන සිටියේ ය. ඔහු උවමනාවටත් වඩා ශූර පුද්ගලයකු බවද නෙඩ් දැන සිටියේ ය. "ඔබ මොකක් හරි දෙයක් හොයා ගත්තද?"

"කෙනෙක්." සුළැඟිල්ලා නිවැරැදි කලේ ය. "ඇත්තම කියනවා නම් හතර දෙනෙක්. ඔබ හිතුවාද ඒරින් උතුමානන්ගෙ සේවකයින්ගෙන් ප්‍රශ්න කරන්ට?"

නෙඩ් බැම ඇකිළී ය. "මට ඒක කරන්ට පුළුවන් නම් කොච්චර දෙයක්ද. ඒරින් ආර්යාව එයාගෙ සේවක කණ්ඩායමේ හැමෝම ඉයරිවලට අරන් ගියානෙ." ලයිසා ඔහු ගේ කාර්යය කිසිසේත්ම පහසු කොට නොතිබින. ඇය කින්ග්ස් ලෑන්ඩින්ග් වලින් පලා යද්දී සිය සැමියාට කිට්ටුවන්ත සැවොම ඇයත් සමග රැගෙන ගොස් තිබින. ජොන් ගේ මේස්ටර්වරයා, නිවාස බාරකරු, ආරක්ෂක බලකායේ ප්‍රධානියා, නයිට්වරුන් හා අනිකුත් සෙබළුන්, මේ සැවොම රැගෙන ගොස් තිබින.

"හැමෝම වගේ අරන් ගියා." සුළැඟිල්ලා කීය. "ඒත් හැමෝම නෙවෙයි. කීපදෙනෙක් නැවතුනා. රෙන්ලි උතුමානන්ගෙ සේවකයෙකුට කඩිමුඩියේ බන්දලා දුන්න බඩදරු කුස්සි අම්මා කෙනෙක්, නගරාරක්ෂක බලකායට බැඳුන ඉස්තාල සේවකයෙක්, හොරකමකට අහුවෙලා සේවයෙන් නෙරපුව වැඩකාර කොල්ලෙක්, ඒරින් උතුමානන්ගෙ සහවරයා."

"එයාගෙ සහවරයා?" නෙඩ් සැබැවින්ම විමතියට පත් විය. කෙනෙකු ගේ සහවරයා යනු ඔහු ගේ ගමන් බිමන් ගැන මනාව දැන සිටින පුද්ගලයෙකි.

"මිටියාවතේ සෙර් හියු. රජතුමා ඒරින් උතුමානන්ගෙ මරණයෙන් පස්සෙ ඒ කොල්ලව නයිට්වරයෙක් කලා."

"මම එයාට එන්ටයි කියලා පණිවුඩයක් යවන්ට ඕන. එයාටයි අර අනිත් අයටයි."

සුළැඟිල්ලා වේදනාවෙන් මෙන් ඇකිළුනි. "මගේ උතුමානනි, කරුනාකරලා මේ කවුළුව ගාවට පොඩ්ඩක් එන්ට."

"ඇයි?"

"එන්ට. එතකොට මම පෙන්නන්නම්."

රවාගත් මුහුණින් යුතු නෙඩ් කවුළුව සමීපයට ගියේ ය. පෙටයර් බේලිෂ් ඕනෑවට එපාවට මෙන් ඇඟිල්ල දිගු කලේ ය. "අතන, අංගනයෙන් එහා පැත්තෙ, අර යුද්ධායුධ ගබඩාවෙ දොර ළඟ. ඔබට පේනවද අර කොල්ලෙක් පඩිපෙළේ වාඩි වෙලා තෙල්ගලකින් කඩුවක් මුවහත් තිය තියා ඉන්නවා?"

"ඉතින්?"

"ඌ රපෝර්තු කරන්නෙ වාරිස්ට. මකුළුවා ඔබ ගැනයි ඔබ කරන දේවල් ගැනයි බොහොම ලොකු උනන්දුවකින් බලාගෙනයි ඉන්නෙ." ඔහු අසුනේ හැරුනේ ය. "දැන් බලන්ට ප්‍රාකාරෙ දිහා. තව බටහිර පැත්තට, ඉස්තාලවලට ඉහළින්. පේනවද අර ප්‍රාකාරෙන් එබිලා බලන් ඉන්න මුරභටයා?"

නෙඩ් ඔහුව දුටුවේ ය. "නපුංසකයාගෙ තවත් ඔත්තුකාරයෙක්ද?"

"නෑ. මූ අයිති රැජිණට. පේනවනෙ. ඌට බොහොම හොඳට පේනවා මේ කුළුණට ඇතුළුවෙන දොර. ඇතුළුවෙන්නෙ, පිටවෙන්නෙ කවුද කියලා ඌ හොඳට ඇහැ ගහගෙනයි ඉන්නෙ. තවත් උන් ඉන්නවා. ඒ සමහරු ගැන මංවත් දන්නෙ නෑ. රතු බලකොටුවෙ හැමතැනම ඇස් තියෙනවා. මම කැට්ව ගනිකා මඩමක හැංගුවෙ ඇයි කියලද ඔබ හිතන්නෙ?"

මෙවැනි රහස් කුමන්ත්‍රණ සම්බන්ධයෙන් නෙඩ් ගේ සිතේ කිසිදු ඇල්මක් නොවී ය. "අපා හතටම පලයං!" නෙඩ් කවුළුව අසලින් මෑත් විය. "මේ සාපලත් නගරෙ ඉන්න හැම එකාම තවත් කාගෙ හරි ඔත්තුකාරයෙක්ද?"

"එහෙම නැති අය බොහොම හිඟයි." ඔහු සිය අතැඟිලි නවමින් ගණන් කරන්නට වන්නේ ය. "ඇයි මම ඉන්නවා. ඔබ ඉන්නවා. රජතුමා... ඒත්, කල්පනා කරලා බැලුවොත්, රජතුමා රැජිණට හැමදේම වගේ කියනවා. ඕන එකයි එපා එකයි හැමදේම. අනික මට ඔබ ගැනත් හරියටම විශ්වාස නෑ." ඔහු නැගිට සිටියේ ය. "ඔබේ සේවයේ ඉන්නවද මිනිහෙක් ඔබට මුලුමනින්ම වගේ විශ්වාස කරන්ට පුළුවන්?"

"ඔවු." නෙඩ් කීවේ ය.

"ඒක ඇත්තනම් ඉතින් මට තියෙනවා වැලීරියාවෙ මාළිගාවක්, මම බොහොම කැමැත්තෙන් ඉන්නවා ඒක ඔබට විකුණන්ට." ඔහු සමච්චල් සිනහවකින් යුතුව කීවේ ය. "ඒ ප්‍රශ්නෙට ඥානවන්ත උත්තරේ 'නෑ' කියන එකයි මගේ උතුමානනි. හරි කොහොම වුනත් කමක් නෑ. ඔබේ මේ බොහොම වටිනා පුද්ගලයාව යවන්ට සෙර් හියුවයි අනිත් අයවයි මුන ගැහෙන්ට. ඔබේ ගමන් බිමන් ගැන ඇහැ ගහගෙනයි ඉන්නෙ. ඒ වුනත් වාරිස්ටවත් බෑ ඔබේ සේවයේ ඉන්න හැම කෙනෙක් ගැනම දවස පුරාම ඇහැ ගහගෙන ඉන්ට." ඔහු දොර දෙසට පියවර මැන්නේ ය.

"පෙටයර් උතුමානනි." නෙඩ් ඔහු ඇමතී ය. "මම... බොහොම ස්තූතිවන්ත වෙනවා ඔබ කරපු උදවුවට. සමහරවිට මම වැරැදි වෙන්ට ඇති ඔබව මෙහෙම අවිශ්වාස කරන එක."

සුළැඟිල්ලා සිය පුංචි උල් රැවුල අතගෑවේ ය. "ඔබ මොනවා හරි දෙයක් තේරුම් ගන්ට බොහොම ප්‍රමාද වෙනවා එඩාර්ඩ් උතුමානනි. ඔබ මේ නගරෙට ඇවිල්ලා අශ්වයා පිටින් බැස්සට පස්සෙ කරපු ඥානවන්තම දෙයක් තමා මාව අවිශ්වාස කරන එක."

Grand Maester Pycelle: “Death is the most natural thing of all.”

ජොන් 04-1

නිශා රැකුමට අලුතෙන්ම බැඳුනු නවකයා සරඹ පුහුණු පිටියට ඇතුළුවෙද්දී ජොන් සිටියේ පැති පහරක් හොඳින්ම එල්ල කරන්නේ කෙසේදැයි ඩේරියන්ට උගන්වමිනි. "උඹේ කකුල් දෙක තවත් ඈත් වෙන්ට ඕන. උඹේ සමබරතාව නැතිවෙන්ට දෙන්ට එපා. ආන්න හරි. පහරත් එක්කම උඹ ඇඟ හරවන්ට ඕන. උඹේ ඇඟේ බර හොඳට පහරට මුහු කරන්ට ඕන." ඔහු උනන්දුකරවන හඬින් කියා සිටියේ ය. පුහුණුව අතරමග නවතා දැමූ ඩේරියන් සිය දැස් ආවරණය එසවී ය. "දෙයියන්ටමයි ඔප්පු වෙච්චාවෙ!" ඔහු මිමිනී ය. "ජොන් මේක පොඩ්ඩක් බලන්ටකො."

ජොන් ආපසු හැරුනේ ය. සිය දැස් ආවරණයේ සිදුරු අතරින් ඔහු දුටුවේ තමා මෙතෙක් දැක ඇති මහතම පිරිමි ළමයා ආයුධ ගබඩාවේ දොරටුව ඉදිරිපිට සිටගෙන සිටිනා අයුරු ය. පෙනුමේ හැටියට නම් ඔහු ස්ටෝන් විස්සක් වත් බර වන්නට ඇත. ඔහු ගේ ගෙත්තම් කරන ලද පිට කබායේ ලොම් කොලරය මහත නිකටට යටින් සැඟවී තිබිනි. සඳක් මෙන් වටකුරු මුහුණේ වූ මලානික දැස් නොසන්සුන් අයුරින් එහා මෙහා දිවුවේ ය. ඔහු සිය මහත අතැඟිලිවල තිබුනු දහදිය කබායේ පිසදා හැරියේ ය. "එයාලා... එයාලා කිවුවා මට මෙහාට එන්ටයි කියලා... පුහුණුවෙන්ට." ඔහු හිස් අවකාශයට කතා කලේ ය.

"පුංචි උතුමානන් කෙනෙක්." පිප් ජොන්ට කොඳුරා කීය. "දකුණුකරේ. ගොඩක් වෙලාවට හයිගාර්ඩ්න් කිට්ටුව වෙන්ට ඕන." පිප් නාට්‍යකාරයන් කණ්ඩායමක් සමග රාජධානි සප්තකය පුරා සංචාරය කර තිබිනි. කෙනෙකු කතා කරන උච්චාරණය අනුව ඔහු කොහේ ඉපදුනු කෙනෙක් ද, කෙවැනි කෙනෙක් ද යන්න තමාට තිර වශයෙන් කිව හැකි බවට ඔහු පාරම් බා තිබිනි.

මේ මහත කොලුවා ගේ ලොමින් නිමැවුම් කල පිට කබායේ පපුව මත ලේ රතු පැහැ නූලෙන් වැඩ දැමූ දෙපා විහිදා ගත් දඩයක්කරුවකු ගේ රූපය ගෙත්තම් කොට තිබිනි. ජොන්ට මේ සලකුණ කවර වංශයකට අයත්දැයි හඳුනා ගත නොහැකි විය. සෙර් ඇලිසර් තෝර්න් මේ අලුත් පක්ෂියාගේ හිස් මුදුනේ සිට පාදාන්තය දක්වා බැලුමක් හෙලී ය. "පේන විදියට නම් දකුණුකරේ හොර දඩයක්කාරයොයි, හොරුයි ඉවර වෙලා වගෙයි. උන් දැන් අපට ඌරො එවන්ට පටන් අරන්. ලොමුයි විල්ලුදයි කියන්නෙ උඹේ සන්නාහයද මගේ හැම් උතුමානනි?"

වැඩි වේලා යන්නට පෙර දැන ගන්නට ලැබුනේ මේ අලුත් සගයා තමාගේම සන්නාහයක්, සම් හා ලොම් ආවරණ, හිස් ආවරණ පමණක් නොව තම වංශ සලකුණ සහිත දැවැන්ත පලිහක් පවා රැගෙන විත් ඇති බවය. එනමුදු මේ එකක්වත් කළු පැහැ ඒවා නොවූ අතර ආයුධ ගබඩාවෙන් තමාට ගැලපෙන නව ඇඳුම් ආයිත්තම් සොයාගන්නා ලෙස සෙර් ඇලිසර් ඔහුට බල කර කියා සිටියේ ය. ඒ වෙනුවෙන් උදේ වරුවෙන් බාගයක් ගත විය. ඔහු ගේ වට ප්‍රමාණය කෙතෙක් වී ද යත් ඩොනල් නොයේ ට මුදු දම්වැල් කවචයක් දෙකට කපා අමතර කෑලි එකතු කර නැවත පුරුද්දන්නට සිදු විය. ඔහුට ගැලපෙන පරිදි සකස් කිරීම සඳහා හිස්වැසුමක ඇස් ආවරණ ඉවත් කිරීමට සිදු විය. ඔහු ගේ සම් ආවරණ දෑත් හා දෙපා වලට කෙතරම් තදින් බැඳ තිබුනද යත් ඔහුට එහා මෙහා යාම පවා අසීරු විය. යුද්ධයට ගැලපෙන පරිදි සැරසූ මේ අලුත් කොලුවා දිස් වූයේ හරියටම පිපිරෙන්නට ආසන්න වන තෙක් බැද්ද ලිංගුස් එකක් මෙනි. "අපි ප්‍රාර්ථනා කරමු ජේන තරම්ම උඹ මෝඩයෙක් නෙවෙයි කියලා." සෙර් ඇලිසර් කීය. "හෝල්ඩර්. බලපං සෙර් පිගීට මොකක්ද කරන්ට පුළුවන් කියලා."

ජොන් ස්නොව් වේදනාවෙන් ඇකිළුනි. හෝල්ඩර් වනාහි ගල් කොරියක ඉපිද ගල් වඩුවකු ගේ ගෝලයකු වශයෙන් පුහුණුව ලත් අයෙකි. දහසය වැනි වියේ වූ ඔහු උස්, මනාව වැඩුනු මස්පිඩුවලින් යුත් ශක්තිමත් කොලුවකු විය. ඔහු ගේ අසිපත් පහරවල් ජොන් මෙතෙක් මුහුණ දී ඇති ප්‍රබලම පහරවලින් එකක් විය. "මේ සටන වේස ගෑනියෙක්ගෙ පස්සා පැත්තටත් වඩා කැත එකක් වෙන්ටයි යන්නෙ." පිප් කටුකුටු ගෑවේ ය. එය එසේම සිදු විය.

සටන පැවතුනේ මිනිත්තුවකටත් වඩා අඩු කාලයකි. අලුත් කොලුවා බිම වැටී සිටි අතර ඔහු ගේ මුලු සිරුරම ගැහෙන්නට විය. කැඩී ගිය හිස්වැසුම අතරින් හා ඔහු ගේ මහත ඇතැඟිලි අතරින් රුධිරය ගලා එන්නට විය. "මම යටත් වෙනවා." ඔහු වේදනාවෙන් මුර ගෑසී ය. "තවත් නං එපා. මම යටත් වෙනවා. අනේ මට ගහන්ට එපා." රැස්ට් හා තවත් කොල්ලන් කිහිප දෙනෙක් සිනාසෙන්නට පටන් ගත්හ.

එසේ වුවද, සෙර් ඇලිසර් මේ සටන ලේසියෙන් අත හැර දැමීමට සූදානම් නොවී ය. "නැගිටපං සෙර් පිගී. නැගිටලා උඹේ කඩුව අහුලගනින්." ඔහු කෑ ගැසුවේ ය. කොලුවා දිගටම බිම බදාගෙන සිටි විට ඔහු හෝල්ඩර්ට සන් කලේ ය. "ඌ නැගිටිනකං උඹේ කඩුවෙ පැතලි පැත්තෙන් ඌට ගහපං." හෝල්ඩර් ඕනෑවට එපාවට මෙන් බිම වැටී සිටි කොලුවා ගේ පස්සා පැත්තට පහරක් එල්ල කලේ ය. "උඹට ඔයිට වඩා හයියෙන් ගහන්ට

පුළුවන්." තෝර්න් ඇනුම්පදයක ස්වරයෙන් කීය. සිය දිගු අසිපත දෑතින්ම ගත් හෝල්ඩර් කෙතරම් තදින් පහර එල්ල කලාද යත් සම් ආවරණය පැලී ගියේ ය. මහත කොලුවා වේදනාවෙන් මුර ගසන්නට විය.

ජොන් ස්නොව් අඩියක් ඉදිරියට තැබී ය. පිප් අතක් දිගුකර ඔහු ගේ අතින් අල්ලා ගත්තේ ය. "එපා ජොන්." කුඩා කොලුවා සෙමින් මිමිනුවේ සෙර් ඇලිසර් තෝර්න් දෙස තැවිලි සහගත බැල්මක් හෙලමිනි.

"නැගිටපං." තෝර්න් නැවතත් කෑ ගැසී ය. නැගිට සිටීමට උත්සාහ කල මහත කොලුවා පය ලිස්සා නැවත බිම ඇද වැටින. "අන්තිමේදී සෙර් පිගී තේරුම්ගත්තා වගේ මොකක්ද වෙන්ට ඕන කියලා." සෙර් ඇලිසර් කීවේය. "ගහපං ආයෙත්."

තවත් පහරක් සඳහා හෝල්ඩර් අසිපත එසවී ය. "අපට හැම් කෑල්ලක් කපපං." රැස්ට් සිනාසෙමින් කීය.

පිප් ගේ අත ගසා දැමූ ජොන් ඉදිරියට පිය මැන්නේ ය. "හෝල්ඩර්. ඔය ඇති."

හෝල්ඩර් සෙර් ඇලිසර් දෙස බැලී ය.

"අවජාතකයා කතා කලාම මේ මෝඩ ගම්මු ටික වෙවුලනවා." සෙර් ඇලිසර් සිය තියුණු අවඥාසහගත ස්වරයෙන් කීය. "මම උඹට මතක් කරලා දෙන්ට කැමැතියි මමයි මෙතන සටන් පුහුණුකාරයා කියලා ස්නොව් උතුමානනි."

"එයා දිහා බලපං හෝල්ඩර්." ජොන් කීවේ තමාට හැකි උපරිමයෙන් සෙර් ඇලිසර්ව නොතකා හරිමිනි. "බිම වැටුන සතුරෙකුට දිගින් දිගටම ගහන එකේ කිසිම ගෞරවනීය බවක් නෑ. එයා යටත් වුනා." ඔහු බිම වැටී සිටි මහත කොලුවා අසලින් දණ නමා වාඩි විය.

හෝල්ඩර් සිය අසිපත පහත් කලේ ය. "ඇත්ත. එයා යටත් වුනා." ඔහු පුනරුච්චාරණය කලේ ය.

සෙර් ඇලිසර් ගේ අගත්ති පැහැ දැස් ජොන් දෙසට එල්ල වින. "පේන විදියට නම් අපේ අවජාතකයා ආදරෙන් බැඳිලා වගෙයි." ඔහු කීවේ ජොන් මහත කොලුවාට නැගිට සිටීමට උදවු කරද්දී ය. "මට උඹේ කඩුව පෙන්නහං ස්නොව් උතුමානනි."

ජොන් සිය දිගු අසිපත ඇද ගත්තේ ය. ඔහු සාමාන්‍යයෙන් සෙර් ඇලිසර්ට අවනත නොවූයේ එක්තරා මට්ටමකට යනතෙක් පමණි. නමුත් අද තමා ඒ සීමාව ඉක්මවා ඇති බැව් ඔහුට හැඟුනි.

තෝර්න් සිනහවක් පෑවේ ය. "අවජාතකයා ලැස්තියිලු එතුමන්ගෙ ආදරණිය ආර්යාව ආරක්ෂා කරන්ට. ඉතිං අපි එයාට ඒ වෙනුවෙන් ඉඩ දෙන්ට ඕන. එහෙම නේද? රට්, පිම්පල්. අපේ ගල් වඩුවට උදවු කරපං." රැස්ට් හා ඇල්බට් හෝල්ඩර්ට සහය පිණිස එකතු වූහ. "පිගී ආර්යාවට තලන්ට උඹලා තුන්දෙනෙක් ඇතිවෙයි. උඹලාට කරන්ට තියෙන එකම දේ අවජාතකයව පහුකරන එකයි."

"මගේ පිටිපස්සට වෙලා ඉන්ට." ජොන් මහත කොලුවාට කීවේ ය. බොහෝ වේලාවට සෙර් ඇලිසර් ඔහුට විරුදුව එකවර ප්‍රතිවාදීන් දෙදෙනෙකු එවා ඇතත් කිසි දිනෙකත් එකවර තිදෙනෙකු එවා නොතිබින. ඈහේ තැලුම් හා තුවාල දුසිමක් සමගින් තමාට අද රෑ නින්දට යන්නට සිදුවනු ඇති බැව් ජොන්ට සිතුනි. ඔහු සටනට සැරසින.

එක් සැනෙකින් පිප් ඔහු ගේ පසෙකින් විය. "තුන්දෙනෙකුට විරුද්ධව දෙන්නෙක් කියන්නෙ බොහොම හොඳ සෙල්ලමක්." කුඩා කොලුවා උද්‍යෝගිමත් ස්වරයෙන් කීය. සිය ඇස් ආවරණය පහත හෙලූ ඔහු අසිපත ඇද ගත්තේ ය. ජොන් මෙයට විරුද්ධව යමක් කියන්නට තබා සිතන්නටත් පෙර අනිත් පසින් ග්‍රෙන් ඔවුන්ට එකතු විය.

අංගනය මීයට පිම්බාක් මෙන් නිහඬතාවයේ ගැලී ගියේ ය. සෙර් ඇලිසර් ගේ දෑසෙහි වූ ද්වේෂය ජොන්ට පැහැදිලිවම දැකිය හැකි විය. "උඹලා මොකටද තවත් බලා ඉන්නෙ?" ඔහු රැස්ට් හා අනෙකුන්ගෙන් ඇසූ මුත් ඒ කටහඬේ සැරපරුෂ බව පෙරට වඩා බෙහෙවින්

අඩු වී තිබින. එනමුදු කිසිවෙකුටත් පෙර ජොන් ක්‍රියාත්මක වූ අතර හෝල්ඩර්ට සිය අසිපත එසවීමටවත් අවස්ථාවක් නොලැබින.

පහර පිට පහර එල්ල කරමින් ජොන් ප්‍රතිවාදියාව පසුපසට තල්ලු කර හැරියේ ය. සිය ප්‍රතිවාදියා හඳුනාගන්නැයි සෙර් රඩ්‍රික් වරක් ඔහුට උගන්වා තිබින. ජොන් හෝල්ඩර්ව මනාව දැන සිටියේ ය. ඔහු අතිශය ශක්තිසම්පන්න හා සාහසික වූ නමුදු ඉවසීම ප්‍රගුන කල කෙනෙකු නොවී ය. එමෙන්ම පහර වැළකීම ගැනද එතරම් විශ්වාසයක් හෝ අවධානයක් දැක්වූවෙකු නොවී ය. ඔහු ගේ පහරදීමේ උත්සාහයන් ව්‍යර්ථ කල සැනින් කෝපාවිෂ්ට වන ඔහු පහසුවෙන්ම ප්‍රතිවාදියාට තමාව ගොදුරු කරගැනීමට ඉඩප්‍රස්ථා සලසා දෙන බව ජොන් අත්දැකීමෙන් දැන සිටියේ ය. ඔවුන් දෙදෙනා වටා අනිත් ප්‍රතිවාදී යුගල් දෙකද සටන් වැද සිටි අතර අවි එකට ගැටෙන හඬින් අංගනය පිරී ගියේ ය. හිසට එල්ල වූ දරුණු පහරක් වැලැක්වූ ජොන්ට පහරේ දරුණු කම නිසා ඇති වූ කම්පනය සිය අත පුරා දිව යනු දැනින. එනමුදු හෝල්ඩර් ගේ ඉළඇටවලට පැති පහරක් එල්ල කිරීමට ඔහු සමත් වූයේ ප්‍රතිවාදියා වේදනාවෙන් නැගූ කෙඳිරිය නිසා පිනා ගියේ ය. හෝල්ඩර් ගේ ප්‍රතිප්‍රහාරය ජොන් ගේ උරහිස මතට එල්ල වින. සිය මුදු දම්වැල් සන්නාහය තැලී යනුත් දැඩි වේදනාවක් ගෙල පුරා පැතිර යනුත් ජොන්ට දැනින. එනමුදු ඒ සුළු මොහොතේ හෝල්ඩර් ගේ සමබරතාව ගිලිහී ගොස් තිබුනු අතර අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ජොන් ඔහු ගේ පාදයට යටි පහරක් එල්ල කලේ ය. මුවින් නැගුනු අවලාදයක්ද සමගින් හෝල්ඩර් මහ හඬක් නගමින් බිම පතිත විය.

ජොන් විසින් ග්‍රෙන්ට උගන්වා තිබූ පරිද්දෙන්ම ඔහු සිය ස්ථානය රැක ගෙන සිටියේ ය. එය ඇල්බට් බලාපොරොත්තු වූවාටත් වඩා වැඩි ප්‍රතිචාරයක් විය. එහෙත් පිප්ට දරුණු පහරවල් එල්ලවෙමින් තිබින. රස්ට් ඔහුට වඩා අවුරුදු දෙකක් වයසින් වැඩි වූ අතර රාත්තල් හතලිහක් බරින් ද වැඩි විය. ඔහු පසුපසින් පිය මැන්න ජොන් රස්ට් ගේ හිස් ආවරණයට පහරක් එල්ල කලේ ය. රස්ට් වටයක් කැරකී ඔහුට මුහුණ දෙද්දී ඔහු ගේ ප්‍රහාරයට යටින් රිංගූ පිප් ඔහුව බිම හෙලා ගෙලට අසිපත තද කලේ ය. ඒ වනවිට ජොන් ග්‍රෙන්ට සහාය පිණිස ගොස් තිබින. අසිපත් දෙකකට මුහුණ පෑ ඇල්බට් පසුබැස්සේ ය. "මම යටත් වෙනවා." ඔහු දැත් ඔසවා කෑ ගැසී ය.

සෙර් ඇලිසර් තෝර්න් අප්‍රසාදය රැඳි මුහුණින් යුතුව ජවනිකාව නිරීක්ෂණය කලේ ය. "මේ විගඩම අද ගිය දුර හොඳටෝම ඇති." ඔහු අංගනයෙන් පිටව ගියේ ය. සටන් පුහුණුව නිමා විය.

ඩේරියන් හෝල්ඩර්ට නැගිට සිටීමට උදවු කලේ ය. සිය හිස් ආවරණය ගැලවූ ඔහු එය අංගනය හරහා විසි කර දැමී ය. "එක මොහොතකට මම හිතුවා අද නම් මම උඹව කම්මුතු කලා කියලා ස්නොව්."

"එක මොහොතකට උඹ එහෙම කලා." ජොන් පිළිතුරු දුන්නේ ය. මුදු දම්වැල් සන්නාහයට හා සම් ආවරණයට යටින් ඔහු ගේ උරහිස වේදනා ගෙන දෙමින් තිබින. සිය අසිපත කොපුවේ ලෑ ඔහු හිස් ආවරණය ගැලවීමට සූදානම් විය. එනමුදු අත එසවූ විට දැනුනු වේදනාව නිසා ඔහුට දත්මිටි කැවුනි.

"ඉන්ට. මම උදවු කරන්නම්." මහත අතැඟිලි විසින් බැඳුම් බුරුල් කර හිස් ආවරණය පරෙස්සමින් ඉවත් කෙරින. "එයා ඔබට රිද්දුවද?"

"මීට කලිනුත් මට තුවාල වෙලා තියෙනවා." සිය උරහිස අත ගෑ ඔහු වේදනාවෙන් ඇකිළුනේ ය. ඔවුන් වටා අංගනය හිස් වෙමින් පැවතින.

හෝල්ඩර් විසින් හිස් ආවරණය දෙපලු කල තැන කොලුවාගේ හිසකෙස් ලෙයින් පෙඟී තිබින. "මගේ නම සැම්වෙල් ටාර්ලි. මම හෝර්න්..." කතාව නැවතූ ඔහු දිවෙන් දෙතොල් පෙහෙවුවේ ය. "මම කියන්ට ගියෙ මම ආවෙ හෝර්න් හිල් වල ඉඳන් කියලයි. මම ආවෙ නිශා රැකුම් බලකායට බැඳෙන්ට. මගේ තාත්තා රැන්ඩිල් ටාර්ලි උතුමානන්. හයිගාර්ඩන්වල ටිරල් උතුමානන්ගෙ යටත් වංශාධිපතියෙක්. මම තමා එයාගෙ උරුමක්කාරයා. ඒ වුනත්....." ඔහු ගේ හඬ බිඳී ගියේ ය.

"මම ජොන් ස්නොව්. වින්ටර්ෆෙල්වල නෙඩ් ස්ටාර්ක්ගෙ අවජාතකයා."

සැම්වෙල් ටාර්ලි හිස වැනී ය. "මම.. මගේ අම්මා මට කතා කරන්නෙ සැම් කියලා."

"උඹට එයාට කතා කරන්ට පුළුවන් ස්නොව් උතුමානන් කියලා." පිප් කීවේ ඔවුන්ට එකතු වීමට පැමිණෙමිනි. "එයාගෙ අම්මා එයාට කතා කරන්නෙ කොහොමද කියලා උඹට දැනගන්ට ඕන වෙන එකක් නෑ."

"මේ දෙන්නා ග්‍රෙනුයි, පිපරුයි." ජොන් කීය.

"ග්‍රෙන් තමා කැත එකා." පිප් කීවේ ය.

ග්‍රෙන් මුහුණ පැඟිරි කරගත්තේ ය. "උඹ මට වඩා කැතයිනෙ. මට අඩුගානෙ වවුලෙක්ගෙ වගේ ලොකු කණ් දෙකක් නෑ."

"ඔබලා හැමෝටම ස්තූතියි." මහත කොලුවා කීවේ ය.

"ඇයි උඹ නැගිටලා සටන් කලේ නැත්තෙ?" ග්‍රෙන් ඇසී ය.

"මට ඕන වුනා.. ඇත්තටම.. ඒ වුනත් මට.. මට බෑ. මට ඕන වුනේ නෑ එයා දිගින් දිගටම මට පහර දෙනවට." ඔහු බිම බලාගති. "මගේ තාත්තා හැම වෙලාවෙම එහෙමයි කිවුවෙ."

ග්‍රෙන් ත්‍රස්ත වූවාක් මෙන් පෙනින. පිප්ට පවා කිසිවක් කියාගැනීමට නොහැකි විය. සාමාන්‍යයෙන් පිප්ට ඕනෑම දේකට කියන්නට දෙයක් තිබින. තමා බියසුල්ලෙකු බැව් ප්‍රකාශ කර සිටින්නේ කවර නම් මෝඩයෙක්ද?

ඔවුන් ගේ මුහුණුවල ඇඳුනු හැඟීම් සැම්වෙල් ටාර්ලි විසින් පැහැදිලිව කියවා ගත් බැව් පෙනින. ජොන් ගේ දෑස් වෙතට යොමු වූ ඔහු ගේ දෑස් බියපත් මුවෙකු මෙන් ඉවත බලා ගත්තේ ය. "මට.. මට සමාවෙන්ට." ඔහු කීය. "මට කිසිම ඕනකමක් තිබුනෙ නෑ.. මේ වගේ කෙනෙක් වෙන්ට." ඔහු බරැති අඩි තබමින් ආයුධ ගබඩාව දෙසට පිය මනින්නට විය.

ජොන් ඔහු පිටුපා යන ඔහුට කතා කලේ ය. "උඹට තුවාල වෙලා. හෙට උඹ මීට වඩා හොඳට සටන් කරයි."

සැම් දුක්මුසු අයුරින් උරහිසට උඩින් බැලුවේ ය. "නෑ. මම හිතන්නෙ නෑ එහෙම වෙයි කියලා." ඔහු කීවේ කඳුළු සඟවා ගන්නට වෑයම් කරමිනි. "මම කිසිමදාක හොඳට සටන් කරලා නෑ."

ඔහු නොපෙනී ගිය පසු ග්‍රෙන් රවා බැලී ය. "බයගුල්ලන්ට කවුරුවත් කැමැති නෑ. අපි මිනිහට උදවු නොකලානං හොඳයි කියලා මට දැන් හිතෙනවා. අනිත් එවුන් හිතුවොත් අපිත් බයගුල්ලො කියලා මොකද වෙන්නෙ?"

"බයගුල්ලෙක් වෙන්ට තරං උඹ මෝඩ වැඩියි." පිප් ඔහුට කීවේ ය.

"මම මෝඩ නෑ."

"ඔවු උඹ බයයි. කැලේදි වලහෙක් උඹට පහර දෙන්ට ආවොත් දුවගන්ටවත් බැරි තරම් උඹ මෝඩයි."

"මම එහෙම මෝඩ නෑ. මම උඹටත් වඩා හයියෙන් දුවනවා." ග්‍රෙන් ගේ නියවීම දුටු ඔහු තමා කී දේ අරුත වටහා ගත්තේ හදිසියේම කතාව නැවැත්වී ය. ලැජ්ජාව හා කේන්තිය නිසා ඔහුව රතු වී ගියේ ය. ඔවුන් දෙදෙනාට වාද කරගැනීමට ඉඩ හල ජොන් ආයුධ ගබඩාව වෙත ගොස් සිය අසිපත හා තැලී ගිය සන්නාහය ඉවත් කර දැමීය.

කළු බලකොටුවේ දවස් ගෙවී ගියේ එක්තරා රටාවකට අනුව ය. උදය කාලය ආයුධ පුහුණුව සඳහා වෙන්ව තිබුනු අතර සැන්දෑ කාලය අනෙකුත් වැඩ කටයුතුවලට වෙන් කර තිබින. නවකයින් සතු හැකියාවන් හඳුනාගැනීම උදෙසා කළු සොයුරන් විසින් ඔවුන්ව විවිධ රාජකාරිවල යොදවනු ලැබී ය. තමා පසෙකින් දුවන ගෝස්ට් ද සමග දඩයම් සවාරි සඳහා පිටව යන දවස් ජොන් වැඩියෙන්ම රස විඳි ඒවා විය. එනමුදු මේ දඩයම් පිනිස යන දවසක් පාසා ඔහු තවත් දවස් දුසිමක්වත් ඩොනල් නොයේ සමගින් ආයුධ ගබඩාවේ ගත කලේ ය. පාවිච්චිය නිසා ගෙවී ගිය පොරෝ මුවහත් කිරීමට නැතිනම් නව අසිපතක් තැනීම සඳහා නොයේට උදවු දීම ඔහු ගේ රාජකාරිය විය. තවත් සමහර දිනවල ඔහු පණිවුඩ එහා මෙහා ගෙන ගියේය, මුර සෙබළෙකු වශයෙන් සිටියේ ය, ඉස්තාල සුද්ද

කලේ ය, ඊතල සෑදුවේ ය, කපුටන් සම්බන්ධ වැඩ කටයුතු වෙනුවෙන් මේස්ටර් ඒමන්ට උදවු කලේ ය නැතිනම් ගණන් බැලීම් හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහා බොවෙන් මාර්ෂ්ට උදවු කලේ ය.

එදින දහවලේ මුරයේ අණදෙන නිළධාරියා විසින් ඔහුව අලුත කැබලි කරන ලද ගල් කැට පිරවූ පීප්ප හතරක්ද සමගින් ප්‍රාකාරය මුදුනට යවා තිබුනේ පා ලිස්සීම වැළැක්වීමේ අරමුනින් ප්‍රාකාරය මත ඒවා අතුරනු පිණිස ය. එය තනිවම සිදු කල යුතු අලස රාජකාරියක් වූ නමුදු ඔහු එය එතරම් ගණන් ගත්තේ නැත. ඔහු ගේ තනියට මෙන් පසෙකින් ගෝස්ට් සිටියේ ය. අහස පැහැදිලි දිනෙකදී ප්‍රාකාරය මත සිට මුලු ලෝකයම දැකිය හැකි විය. මේ තරම් ඉහළකදී හමන සුළං පවා සිසිල් සුවදායක බවක් දැනවී ය. මෙවැනි අවස්ථාවන් ඔහු විසින් කල්පනාකිරීම සඳහා භාවිත කරන ලදී. අද දිනයේ ඔහු සෑම්වෙල් ටාර්ලි හා පුදුමයකට මෙන් ටිරියන් ලැනිස්ටර් පිළිබඳ කල්පනා කරමින් සිටියේ ය. මේ මහත කොලුවා වෙනුවෙන් ටිරියන් කවර නම් ක්‍රියාමාර්ගයක් ගනු ඇත්දැයි ඔහු සිතා බැලී ය. කුරුම්ට්ටා ඔහුට කියා තිබුනු පරිදි බොහෝ මිනිස්සු තිත්ත ඇත්තට මුහුණ දීමට වඩා එය නොතකා හැරීමට කැමැති වෙති. තමන් වීරයන් බව මවා පෙන්වීමට උත්සාහ දරන බියගුල්ලන්ගෙන් මේ ලෝකය පිරී ඇති අතර තමන් සැබැවටම බියගුල්ලෙකු යැයි පිළිගැනීමට කෙනෙකුට අමුතුම ආකාරයේ ධෛර්යයක් තිබිය යුතු යැයි ජොන් කල්පනා කලේ ය.

ඔහු ගේ රිදුම් දෙන උරහිස නිසා වැඩ කිරීමට උවමනාවටත් වඩා වැඩි කාලයක් ගත වූ අතර වැඩ නිමවන විට සැන්දෑ කාලය එළඹ තිබින. බටහිර අහස ලේ රත් පැහැයට හරවමින් හිරු බැසයන ආකාරය බලා සිටිනු පිණිස ඔහු ප්‍රාකාරය මත මඳක් සුනංගු විය. අන්තිමේදී උතුරුකරයට ගොම්මන් කලුවර වැටෙමින් තිබෙද්දී හිස් පීප්ප හතර යකඩ කූඩියට පැටවූ ජොන් දඹරය බාරව සිටි සෙබළුන්හට සන් කලේ ය.

ගෝස්ට් පසෙකින් ඇතුව ඔහු ප්‍රධාන ශාලාවට ළඟා වනවිට රාත්‍රී ආහාරය නිමාවීමට ආසන්නව තිබින. ගිනිමැලය අසළ එක්වූ කළු සොයුරන් කිහිපදෙනෙක් දාදු දමමින් සිටියහ. ඔහු ගේ මිතුරන් බටහිර පැත්තේ බිත්තියට ආසන්න බංකුවකට වී සිනහසෙමින් සිටි අතර පිප් ඔවුන්ට විහිළු කතාවක් පවසමින් සිටි බැව් පෙනෙන්නට තිබින. පෙර කල නාට්‍ය කණ්ඩායමකට එක් වී සිටි බැවින් ඔහුට විවිධ කටහඬවල් අනුකරණයට අපූරු හැකියාවක් හිමිව තිබින. නිකංම නිකං කතන්දර කියනවාට වඩා වරෙක රජ කෙනෙකු, විටෙක ඌරු කොටුවක් බලාගන්නකු වශයෙන් විවිධ චරිත රඟපාමින් කතන්දරයක් ඉදිරිපත් කිරීමට ඔහු වඩාත් කැමැති විය. තැබෑරුමක කෙල්ලක නැතහොත් බලකොටුවක

කුමරියක මෙන් ඔහු කතා කරන ආකාරය කෙතරම් අපූරුවීද යත් ඔවුන් සැවොම දෑසින් කඳුළු පනින තෙක් සිනා ගස්වන්නට එය සමත් විය. ඔහු ගේ කතාවල එන පණ්ඩකයන් හැමවිටම සෙර් ඇලිසන් කතා කරන ආකාරයට බෙහෙවින් සමාන ආකාරයකින් කතා කලහ. ඔහු ගේ අනෙකුත් මිතුරන් මෙන් පිප් ගේ මේ විකාර බැලීමට ජොන්ද බෙහෙවින් ඇලුම් කල මුත් අද රාත්‍රියේ ඔහු ඔවුන්ගෙන් වෙන්ව ඈත මේසයක තනිව අසුන් ගෙන ආහාර ගනිමින් සිටි සැම්වෙල් ටාර්ලි කරා පිය නැගුවේ ය.

ඔහුට මුහුණ ලා ජොන් අසුන් ගන්නා විට සැම්වෙල් සිය රාත්‍රී ආහාරය බොහෝ දුරට අවසන් කර තිබින. ගෝස්ට් දැකීමෙන් මේ කොලුවා ගේ දෑස් පීරිසි දෙකක් මෙන් විසල් විය. "ඌ වෘකයෙක් ද?"

"සෝරවෘකයෙක්. එයාගෙ නම ගෝස්ට්. මගේ තාත්තගෙ වංශ සලකුණ සෝරවෘකයා."

"අපේ සලකුණ දඩයක්කාරයා."

"ඔබ දඩයම් කරන්ට කැමැති ද?"

මහත කොලුවා දෙවුර ඇකිළී ය. "මට ඒක පේන්ට බෑ." ඔහුගෙන් දිස් වූයේ නැවතත් හඬන්නට යන්නාක් වැනි පෙනුමකි.

"දැන් මොකක්ද ප්‍රශ්නෙ?" ජොන් ඇසී ය. "ඇයි ඔබ හැමවෙලාවෙම බයවෙලා වගේ ඉන්නෙ?"

කතා කිරීමට පවා බියෙන් මෙන් සිය පිඟාන දෙස බලාගත් සැම් දුබල ලෙස හිස සැලී ය. පිප් විහිළු ස්වරයෙන් යමක් පවසමින් සිටි අතර ශාලාව සිනාහඬින් පිරී ගියේ ය.

Jon Snow: "I scream that I’m not a Stark, that this isn’t my place, but it’s no good, I have to go anyway."

ජොන් නැගිට සිටියේ ය. "අපි යමු එළියට."

රවුම් මුහුණ සැකසහිත අයුරින් ඔහු දෙස බැලී ය. "ඇයි? අපි මොනවද එළියෙ කරන්ට යන්නෙ?"

"කතා කරන්ට. ඔබ ප්‍රාකාරෙ දැකලා තියෙනවද?"

"මම මහතයි තමා. ඒ වුනත් අන්ධ නෑ." සැම්වෙල් ටාර්ලි පිළිතුරු දුනි. "ඇත්තම මම ඒක දැකලා තියෙනවා. ඒක අඩි හත්සීයක් උසයි." කෙසේ වුවද නැගී සිටි ඔහු ගෙල වටා ලොම් කබායක් දවටාගත්තේ ජොන් පසුපසින් ශාලාවෙන් පිටවිය. එහෙත් තමා එනතෙක් බලා සිටින කිසියම් නපුරු උපායක් පිටත රාත්‍රියේ ඇතැයි සිතන්නාක් වැනි පරීක්ෂාකාරී බවක් ඔහු වෙතින් දිස් විය. ඔවුන් දෙදෙනා පසෙකින් ගෝස්ට් ද සෙමින් සෙමින් අඩි තබන්නට විය. "මම කවදාවත් හිතුවෙ නෑ මෙහෙම වෙයි කියලා." සැම් කීවේ ය. ඇවිදීම නිසා දැනටමත් විඩා වැටී ඇති අයුරින් ඔහු හති දමන්නට විය. "ඔක්කොම ගොඩනැගිලි කඩන් වැටෙන්ට පටන් අරන්. අනික ඒක හරිම... හරිම..."

"සීතල ද?" බලකොටුව වසමින් සිහින් තුෂාරයක් ඇද වැටෙමින් තිබුනු අතර සීතලෙන් මිදුනු තණපත් පයට පෑගී නගන හඬ ඔහුට ඇසෙන්නට විය.

සැම් දුක්බිත අයුරින් හිස වැනුවේ ය. "මට සීතල පෙන්නන්ට බෑ. ඊයේ රෑ මට නින්දෙන් ඇහැරිලා බැලුවාහම ගින්න නිවිලා ගිහිල්ලා. මං හිතුවා උදේ වෙද්දී මාව සීතලෙන් ගල් ගැහිලා යයි කියලා."

"ඔබ ආපු පැත්තෙ මෙච්චර සීතල නැතුව ඇති."

"පහුගිය මාසෙ වෙනකං මම හිම දැකලා තිබ්බෙ නෑ. අපි, ඒ කියන්නෙ මායි, මගෙත් එක්ක උතුරට එන්ට කියලා තාත්තා එවපු මිනිස්සුයි, අපි මුඩු බිම් පහුකරමිනුයි හිටියෙ. එකපාරටම පුංචි පොද වැස්සක් වගේ මේ සුදු පාට දේ වැටෙන්ට පටන්ගත්තා. මුලින්ම මම හිතුවා ඒවා හරිම ලස්සනයි කියලා, හරියට අහසෙන් වැටෙන පිහාටු වගේ. ඒ වුනත් මේවා දිගින් දිගටම වැටෙන්ට පටන්ගත්තා. අන්තිමේදී මාව ඇටකටුවලට යනකංම සීතලෙන් මිදිලා ගියා. මම බයේ හිටියෙ ඒක කවදාවත් ඉවරවෙන එකක් නෑ කියලා."

ජොන් මඳ සිනහවක් පෑවේ ය.

අඩ සඳ එළියේ දිදුලමින් ප්‍රාකාරය ඔවුන් අබියස නැගී සිටියේ ය. ඉහළ ආකාශයේ තාරකා දීප්තිමත්ව පැහැදිලිව බබළමින් තිබින. "එයාලා මට අරක උඩට නගින්ට කියයි ද?" ලීයෙන් තැනුනු දැවැන්ත පඩිපෙළ දෙස බලද්දී ඔහු ගේ මුහුණ ඇද වී ගියේ ය. "අර පඩිපෙළ නගින්ට වුනොත් නම් මාව මැරිලා යයි."

"දබරයක් තියෙනවා." ජොන් කීවේ එදෙසට ඇඟිල්ල දිගු කරමිනි. "එයාලට ඔබව කූඩුවෙ දාලා ඉහළට අදින්ට පුළුවන්."

සැම්වෙල් ටාර්ලි හුස්මක් ඉරුවේ ය. "මම උස තැන්වලට ආස නෑ."

ජොන්ට තවත් නම් ඉවසා සිටිය නොහැකි විය. "උඹ හැමදේටම බයද? මට තේරෙන්නෙ නෑ. උඹ ඇත්තටම ඔච්චර බයගුල්ලෙක් නම් ඇයි මෙහාට ආවෙ? ඇයි මේ වගේ බයගුල්ලෙකුට නිශා රැකුමට බැඳෙන්ට ඕන වුනේ?"

සැම්වෙල් ටාර්ලි දිගු වේලාවක් ඔහු දෙස බලා සිටියේ ය. ඔහු ගේ වටකුරු මුහුණ කෙමෙන් ඇකිළී යනු පෙනින. තුෂාරයෙන් වැසුනු බිම වාඩි වූ ඔහු හඬන්නට පටන් ගත් අතර ඉකිබිඳුම් නිසා ඒ මුලු සිරුරම ගැස්සෙන්නට විය. ජොන් ස්නොව්ට කල හැකි වූ එකම දෙය එතැන සිටගෙන ඒ දෙස බලාසිටීම පමණි. මුඩු බිම්හි වූ හිමපතනය මෙන් මේ හැඬුමත් කිසිදා අවසන් නොවන්නක් මෙන් පෙනින.

කල යුතු කුමක්දැයි දැන සිටි එකම තැනැත්තා ගෝස්ට් විය. සෙවනැල්ලක් මෙන් නිසලව ඉදිරියට ඇදුනු සෝරවෘකයා සැම්වෙල් ටාර්ලි ගේ කම්මුල් දිගේ ගලාහැලෙන උණු කඳුළු ලෙව කන්නට විය. තැතිගැනුනු මහත කොලුවා බියෙන් මෙන් කෑ ගැසුවද මොහොතක් තුළ ඔහු ගේ හැඬුම් සිනාවක් බවට පරිවර්තනය විය.

ජොන් ස්නෝව් ද සිනාසෙන්නට පටන් ගත්තේ ය. මොහොතකට පසු ඔවුන් දෙදෙනා සිය කබා තරයේ පොරවාගෙන ඔවුන්ට මැදිව සිටි ගෝස්ට් ද සමගින් මිදුනු බිම වාඩි වී සිටිනු දක්නට ලැබින. ගිම්හානාන්තයේ හිම අතරින් ඔහු හා රොබ් විසින් මෙම වෘක පැටවුන් සොයාගත් ආකාරය ජොන් විස්තර කරන්නට විය. එය සිදුවී වසර දහස් ගණනක් ගෙවී ඇතැයි ඔහුට හැඟෙන්නට විය. වැඩි වේලාවක් යන්නට පෙර තමා වින්ටර්ෆෙල් ගැන කතා කරමින් සිටිනු ජොන්ට දැනින.

"සමහර වෙලාවට මට ඒක හීනෙන් පේනවා." ජොන් කීවේ ය. "මම මේ දිග මොකුත් නැති හිස් ශාලාවෙ ඇවිදගෙන යනවා. මට කටහඬ හැමතැනම දෝංකාර දුන්නට කවුරුවත් උත්තර දෙන්නෙ නෑ. ඉතින් මම දොරවල් ඇර ඇර කට්ටියගෙ නම් කිය කියා කෑ ගගහා තවත් හයියෙන් ඇවිදිනවා. මම මේ කාවද හොයන්නෙ කියලා මම දන්නෙත් නෑ. ගොඩක් වෙලාවට ඒ මගේ තාත්තා. සමහර වෙලාවට රොබ්. එහෙමත් නැත්තං මගේ පුංචි නංගී, ආර්යා. නැත්තං මගේ බාප්පා." බෙන්ජින් ස්ටාර්ක් ගැන සිතද්දී ඔහුට දැඩි දොම්නසක් දැනෙන්නට විය. ඔහු ගේ බාප්පා තවමත් අතුරුදහන් වී සිටියි. නාකි වලහා ඔහුව සොයා ගෙන ඒම සඳහා මුර සංචාරක කණ්ඩායම් කීපයක්ම පිටත් කර හැරියේ ය. සෙර් ජැරමි රයිකර් දෙවතාවක්ම ඔහුව සොයා ගොස් තිබින. සෙවනැලි කුළුණේ සිට අත කොට ක්හෝරින් ද මුර සංචාර දියත් කොට තිබින. සිය ගමන් මාර්ගය ලකුණු කිරීම් වස් බාප්පා විසින් ගස්වල කල සලකුණු කිහිපයක් හැරෙන්නට අන් කිසිවක් ඔවුන්ට සොයා ගත නොහැකි විය. ගිරි ශිඛරයෙන් ගැවසී ගත් වයඹ දිග කඳු අතරේදී මේ සලකුණු එක්වරම නැති වී ගොස් තිබුනු අතර බෙන් ස්ටාර්ක් මුළුමනින්ම අතුරුදහන්ව සිටියේ ය.

"ඔබේ හීනවලදී ඔබ කාව හරි හොයාගන්නවද?" සෑම් ඇසී ය.

ජොන් හිස සැලුවේ ය. "කවුරුවත්ම නෑ. බලකොටුව හැමවෙලාවම සම්පූර්ණයෙන්ම හිස්." මේ සිහින ගැන ඔහු මින් පෙර අන් කිසිවකුටවත් කියා නොතිබින. තමා දැන් එය සෑම්ට කියන්නේ මන්දැයි ඔහුට නොවැටහුනු නමුදු ඒ ගැන කතා කිරීම සිතට සහනයක් ගෙන දුන්නේ ය. "බලකොටුවෙ කපුටො හිටන් යන්ට ගිහිල්ලා. ඉස්තාලවල ඇටකටු

ගොඩගැහිලා තියෙනවා. ඒක හැමවෙලාවෙම මාව බය කරනවා. මම දුවන්ට පටන් ගන්නවා. දොරවල් ඇර ඇර, පඩිපෙළේ පඩි තුන තුන එකපාර පැන පැන දුවනවා. කවුරුහරි ඉන්නවද කියල කෑ ගහ ගහ. ඊට පස්සෙ මට තේරෙනවා මම දැන් ඉන්නෙ සොහොන් ගෙවල්වලට යන දොරටුව ඉස්සරහා කියලා. ඒක ඇතුළෙ අන්ධකාරයි. මට පේනවා පඩිපෙළ සර්පයෙක් වගේ පහළට විහිදිලා තියෙනවා. කොහොමහරි මම දන්නවා දැන් මම පහළට යන්ට ඕනයි කියලා. ඒ වුනත් මට ඕන නෑ යන්ට. ඒක ඇතුළෙ මම එනකං බලන් ඉන්නෙ කවුද කියලා මම බයවෙනවා. පුරාණ සීත කාලෙ රජවරු තමා ඒක ඇතුළෙ ඉන්නෙ. එයාලගෙ සිංහාසනවල වාඩිවෙලා, කකුල් දෙක ගාව ඉන්න වෘකයොයි, උකුළ උඩ තියාගත්ත යකඩ කඩුයි එක්ක. ඒ වුනත් එයාලට නෙවෙයි මම බය වෙන්නෙ. මම කෑගහලා කියනවා මම ස්ටාර්ක් කෙනෙක් නෙවෙයි, මේක මට අයිති තැනක් නෙවෙයි කියලා. ඒ වුනත් ඒකෙන් වැඩක් වෙන්නෙ නෑ. මට පහළට යන්ටම වෙනවා. ඉතින් මම බිත්ති අත ගගා හෙමින් හෙමින් පහළ බහිනවා. මගේ අතේ පන්දමකුත් නෑ. ඒක එන්ට එන්ටම අන්ධකාර වෙනවා. අන්තිමේදී මට මේක දරාගන්ට බැරුව කෑගහන්ට හිතෙනවා. එතැනදි තමා මට හැමදාම ඇහැරෙන්නෙ." සීතල තෙත්බරිත වී ගිය සිරුරෙන් යුතුව සිය කුටියේ අන්ධකාරය මැද්දේ ගැහෙමින් ඔහු අවදි වෙයි. ඒ හැමවිටම ගෝස්ට් ඔහු පසෙකට පනින අතර උගේ සිරුරේ උණුසුම උදා හිරුඑළිය මෙන් ඔහුව ප්‍රබෝධමත් කරයි. සෝරවෘකයා සුදු පැහැ දළ ලොම් අතර මුහුණ සඟවාගන්නා ඔහු නැවත නින්දට වැටේ. "ඔබත් හෝර්න් හිල් ගැන හීන දකිනවද?" ජොන් ඇසී ය.

"නෑ." සැම් ගේ දෙතොල් තදින් පියැවී ගියේ ය. "මම එතැනට වෛර කරනවා." ඔහු ඝෝස්ට් ගේ හිස පිටුපස කසමින් කල්පනා කරන්නට වූ අතර ජොන් මේ නිහැඬියාවට වැඩෙන්නට ඉඩ දුන්නේ ය. දිගු වේලාවකට පසු සැම්වෙල් ටාර්ලි කතා කරන්නට පටන් ගත්තේ ය. ජොන් නිහඬවම ඔහුට සවන් දුන්නේ මේ බියගුල්ලා ප්‍රාකාරයේ සේවය පිණිස මෙහි පැමිණියේ කෙසේ දැයි වටහා ගත්තේ ය.

ටාර්ලිවරුන් යනු හයිගාර්ඩන්හි වංශාධිපතිතුමන් හා දකුණුකරයේ ආරක්ෂකයානන් වූ මේස් ටිරල් උතුමානන්ගේ ධජ දරන්නන් වූ පුරාණ වංශවත් පෙළපතක් විය. රැන්ඩිල් ටාර්ලි උතුමානන්ගේ වැඩිමහල් පුතනුවන් වූ සැම්වෙල් උපන්නේ සාරවත් ගොවිබිම්, සුවිසල් ශක්තිසම්පන්න බලකොටුවක් හා ප්‍රවාදවල කියැවෙන, වසර පන්සීයක් තිස්සේ පියාගෙන් පුතාට වශයෙන් උරුමවෙමින් පැමිණි 'හදවතේ විනාශය' නම් වූ දැවැන්ත වැලීරියන් අසිපතක් යන මේ සියල්ලේ උරුමක්කරුවා වශයෙනි.

එනමුදු ඔහු කෙමෙන් කෙමෙන් තර, මෘදු, අදක්ෂ දරුවකු වශයෙන් වැඩෙද්දී සිය වැඩිමහල් පුතා ගේ උපතේදී ඔහු ගේ පියාට දැනුනු ආඩම්බරය නැතිවී යන්නට විය. සෑම් වඩාත්ම ප්‍රිය කලේ සංගීතයට හා තමාගේම ගීත ලිවීමට ය. සුමුදු විල්ලූදයෙන් සැරසීමට ය. බලකොටුවේ කුස්සියට වී කෝකියන් හා එක්ව ඉවුම් පිහුම් කිරීමට ය. ලෙමන් කේක් හා බ්ලූබෙරි ටාර්ට් ගිලදැමීමට ය. ඔහු ගේ ලැදියාවන් වූයේ පොත්, පූස් පැටවුන් හා නර්තනය, ඔහු කිසිසේත්ම දක්ශ නොවූ නර්තනය පමණක් විය. එනමුදු ඔහු රුධිරය දැකීමෙන් පවා අසනීප විය. කුකුළු පැටවකු මරන අයුරු දැකීමම ඔහුව හැඬවීමට සමත් විය. හෝර්න් හිල් වෙත පැමිණි සටන් පුහුණු ආචාර්යවරුන් දුසිමක් පමණ ආපසු හැරී ගියේ සිය පුත්‍රයා දක්ශ නයිට්වරයකු වනු දැකීමට ඔහු ගේ පියා දුටු සිහිනය සපුරාලීමට අසමත් වෙමිනි. මේ කුඩා කොලුවාට සාපකිරීම් හා අවලාදවලට මුහුණ පෑමට, වේවැල් පහර කෑමට, කම්මුල් පහර කෑමට, නිරාහාරව සිටීමට වැනි විවිධ දඬුවම්වලට මුහුණ දීමට සිදු විය. ඔහුව නිර්භීත රණකාමියකු කිරීමේ අරමුණින් එක් මිනිසෙක් ඔහුව සන්නාහය පිටින් නින්දට යැවුවේ ය. තවෙකෙකු ඔහුව සිය මවගේ ඇඳුම් වලින් සරසා බලකොටු තාප්පය පුරා ඇවිද්දෙවුවේ ඔහුව ලජ්ජාවට පත් කර එමගින් හෝ ඔහු තුළ ධෛර්යය වඩවනු පිණිස ය. එනමුදු සිදුවූයේ ඔහු තව තවත් තර හා බියසුළු කොලුවකු මෙන් වැඩීම පමණය. අන්තිමේදී රැන්ඩිල් උතුමානන් ගේ සිතෙහි වූ බලාපොරොත්තු කඩවීමේ වේදනාව කෝන්තියක් බවටත් එතැනින් පිළිකුලක් බවටත් පෙරළින. "එක පාරක්," සෑම් කීවේ කෙඳිරියක් තරමේ සිහින් හඬකිනි. "මිනිස්සු දෙන්නෙක් ආවා බලකොටුවට. ඒ ඛාර්ත්වලින් ආපු සුදුමැලි හමක් තිබ්බ ඉන්ද්‍රජාලිකයො දෙන්නෙක්. උං ඔරොක්ස් එකෙක්ව මරලා මාව ඒ උණු ලේ වලින් නෑවුවා. ඒ වුනත් උං පොරොන්දු වුන විදියට ඒකෙන් මාව නිර්භීත ළමයෙක් වුනේ නෑ. තාත්තා උංට සබුක්කුවෙන් තලලා එලවලා දැම්මා."

අන්තිමේදී, වසර තුනක් තුළ දියණියන් තිදෙනෙකු ප්‍රසූත කිරීමෙන් අනතුරුව ටාර්ලි ආර්යාව සිය වංශාධිපති සැමියාට දෙවන පුතෙකු ලබා දුන්නා ය. එදායින් පසු රැන්ඩිල් උතුමානන් සෑම්ව සහමුලින්ම අමතක කර දැමී ය. ඒ වෙනුවට ඔහුට උවමනා වූ පරිද්දෙන්ම සාහසික, හැඩිදැඩි දරුවකු වූ සිය ලාබාල පුත්‍රයා වෙත තම උපරිම අවධානය හා කාලය වෙන් කලේ ය. සෑම්වෙල්ට තම සංගීතය හා පොත් අතරට වී, තමා සෙවූ සංහිඳියාවේ ගැලී වසර කිහිපයක් නිදහසේ සිටීමට අවස්ථාව උදා වින.

එහෙත් ඒ ඔහු ගේ පහළොස්වන උපන්දිනය වන තෙක් පමණි. ඔහුව එදින උදෑසනින්ම අවදි කරවනු ලැබූ අතර ඔහු ගේ අශ්වයාට සෑදල පළඳා ගමනට සූදානම් කොට තිබින.

සෙබළුන් තිදෙනෙක් හෝර්න් හිල් සමීපයේ වූ වනාන්තරය වෙත ඔහුව කැඳවාගෙන ගියහ. එහි ඔහු ගේ පියා මුවකු මරා හම ගසමින් සිටියේ ය. "උඹ දැන් වැඩුනු මිනිහෙක්. ඒ වගේම මගේ උරුමක්කාරයා." රැන්ඩිල් ටාර්ලි උතුමානන් සිය වැඩිමහල් පුතුට පැවසුයේ දිගු පිහිය ලෙලවමින් මළකඳ හම ගසමිනි. "උඹ මගේ පුත්‍රභාවයෙන් අයින් කරන්ට තරම් වැරද්දක් උඹ මෙච්චර කාලෙකට කරලා නෑ. ඒ වුනත්, ඩිකන්ට අයිති මේ වතුපිටියි, වංශාධිපති තනතුරයි උඹට ලැබෙන්ට මම ඉඩ තියන්නෙත් නෑ. හදවතේ විනාශය අයිති වෙන්ට ඕන ඒක ලෙලවන්ට තරම් නිර්භීත ශක්තිමත් කෙනෙකුටයි. උඹ ඒකෙ මිට අතින් අල්ලන්ටවත් සුදුසු එකෙක් නෙවෙයි. ඉතින් ඒක නිසා මම තීරණය කලා උඹ අද ලෝකෙටම ඇහෙන්ට නිවේදනය කරන්ට ඕන උඹ නිශා රැකුම් බලකායට බැඳෙන්ට යනවයි කියලා. අද හැන්දෑ වෙන්ට කලින් උඹ උඹේ උරුමක්කාරකම් ඔක්කොම උඹේ මල්ලිට පවරලා උතුරුකරේ බලා යන්ට ඕන."

"උඹ එහෙම කලේ නැත්තං, එහෙමනං හෙට උදේ අපි යනවා දඩයම් සවාරියක්. මේ කැලේ මැද්දෙ කොහෙදි හරි උඹේ අශ්වයාගෙ කකුල් පැටලිලා ඇදගෙන වැටේවි. උඹ අශ්වයා පිටෙන් වැටිලා මැරේවි... එහෙම හරි කොහොම හරි, ඒක තමා මම උඹේ අම්මට කියන්ට යන්නෙ. උඹ මැරුනේ ඒ විදියටයි කියලා. එයාට තියෙන්නෙ ගෑනියෙකුගෙ හදවතක්, එයා උඹ වගේ දුබලයෙක් වුනත් රැක බලාගන්ට සූදානම්. අනික මට උවමනා නෑ එයාගෙ හිතට දුකක් දෙන්ට. උඹ මට අකීකරු වෙලා මාව නොමග යවන්ට හිතනවානං කීයටවත් හිතන්ට එපා ඒක ලේසි වැඩක් වෙයි කියලා. ඌරෙක් ලුහුබඳිනවා වගේ උඹව ලුහුබැඳලා මරලා දාන එක තරම් මට වෙන සන්තෝසයක් නෑ." වැලිමිටි දෙක දක්වාම රතු වී ගිය දෑතින් යුතුව ඔහු සිය පිහිය පසෙකින් තැබී ය. "ඉතින්, ඔන්න තියෙනවා උඹේ තෝරාගැනීම. නිශා රැකුම..." මළකඳ තුළට අත රිංගවා මුවා ගේ හදවත කඩා ගත් ටාර්ලි උතුමානන් ලේ ගලන, රත් පැහැ හදවත සිය අත්ල මත තබා ඔහුට පෑවේ ය. "නැත්තං මෙන්න මේක."

සන්සුන්, අජීව් ස්වරයකින් යුතුව සෑම් මේ කතාව කියා පෑවේ හරියටම ඔහුට නොව අන් කවරෙකුට හෝ සිදුවූ දෙයක් කියාපාන පරිද්දෙනි. එමෙන්ම, පුදුමයකට මෙන් කතාව අතරතුරේදී ඔහු එක්වරක් හෝ හඬා නොවැලපුනු බව ජොන් නිරීක්ෂණය කලේ ය. කතාව නිම වූ පසු ඔවුන් දෙදෙන බිම වාඩි වී සුළඟේ හඬට සවන් දෙමින් නිහඬවම මොහොතක් ගත කලහ. මේ මුලු ලොවෙහිම අන් කිසිදු හඬක් නොවී ය. අන්තිමේදී ජොන් හඬ අවදි කලේ ය. "අපි ආපහු ප්‍රධාන ශාලාවට යන්ට ඕන."

"ඇයි?" සෑම් ඇසී ය.

ජොන් දෙවුර ඇකිළී ය. "අපට බොන්ට හොඳ උණුසුම් සයිඩර් ටිකක් හොයාගන්ට පුළුවන් වෙයි. ඔබ කැමති නම් උණු වයින් ටිකක් හරි. සමහරදාට රැට ඩේරියන් අපි වෙනුවෙන් සින්දු කියනවා. හැබැයි ඉතින් ඌටම හිතෙන්ට ඕන. මිනිහා ඉස්සර ගායකයෙක්... ඇත්තටම නෙවෙයි, ආධුනික ගායකයෙක්."

"එයා කොහොමද මෙහාට කඩන් පාත් වුනේ?" සෑම් ඇසී ය.

"ගෝල්ඩන්ග්‍රෝව් වල රෝවන් උතුමානන්ට මිනිහව අතටම අහුවුනා එයාගෙ දුවත් එක්ක ඇඳේ දපලා ඉන්දැද්දි. ඒ කෙල්ලට මූට වඩා අවුරුදු දෙකක් වයසයි. අනික ඩේරියන් දිවුරලා කියනවා ඒකිම තමා මූව ජනේලෙන් ඇතුළට ගත්තෙ කියලා. ඒ වුනත් තාත්තගෙ බලකිරීමට ඒ කෙල්ල කිවුවා එයාව දූෂණය කලා කියලා. ඔන්න ඔහොමයි වුනේ. මූ සින්දු කියන එක ඇහුනම මේස්ටර් ඒමන් කිවුවෙ ඒ කටහඬ හරියට අකුණු උඩට මී පැණි වක්කලා වගෙයි කියලා." ජොන් මඳ සිනාවක් පෑවේ ය. "ටොඩුත් සමහර වෙලාවට සින්දු කියනවා. ඒකට සින්දු කියනවා කියලා කියන්ට පුළුවන් නම්. උගෙ තාත්තගෙ වයින් තැබැරුමෙදි ඉගෙනගත්ත බේබද්දන්ගෙ සින්දු. පිප් කියන්නෙ උගෙ කටහඬ හරියට පඩයක් උඩට මුත්‍රා වක්කලා වගෙයි කියලා." ඔවුන් දෙදෙනාම හඬනගා සිනාසුනහ.

"ඒ දෙන්නම සින්දු කියනවා අහන්ට මං ආසයි." සෑම් පිළිගත්තේ ය. "ඒ වුනත් එයාලට මාව එතැනට ගන්ට ඕන වෙන එකක් නෑ." ඔහු ගැටළුවකට මැදි වූ සේයාවක් පෙනින. "එයා හෙටත් මාව සටන් කරන්ට දායි නේ. එහෙම නේද?"

"අනිවාර්යයෙන්ම." ජොන්ට බොරුවක් කියා ගත නොහැකි විය.

සෑම් අපහසු අන්දමින් සිය දෙපා මතින් නැගිට සිටියේ ය. "එහෙනම් ඉතිං මම ටිකක් නිදාගන්න එක හොඳයි." සිය කබාය තරව පොරවා ගත් ඔහු එතැනින් පිටව ගියේ ය.

තමා පසුපස එන ගෝස්ට් සමගින් ජොන් නැවතත් ප්‍රධාන ශාලාවට ඇතුළු වද්දී සෙසු පිරිස තවමත් එහි වූහ. "උඹ කොහෙද අතුරුදහන් වුනේ?" පිප් ඇසීය.

"සැම් එක්ක කතා කර කර හිටියා."

"ඌ නං මාරම බයගුල්ලෙක්." ග්‍රෙන් කීවේ ය. "රෑ කෑම වෙලාවෙ අපේ බංකුවෙ ඕන තරම් ඉඩ තිබුනා. ඒත් ඌ ඇවිත් අපිත් එක්ක වාඩිවෙන්ට බය වුනා."

"හැම් උතුමානන් හිතනවද දන්නෙ නෑ අපි වගේ එවුන් එක්ක වාඩි වෙලා කෑම කන එක අවනම්බුවක් කියලා." පේරන් කීය.

"මං දැක්කා ඌ ඌරුමස් පයි එකක් කනවා." ටොඩ් කීවේ මුවේ ඇඳුනු නියැවීමක් ද සහිතවය. "උඹලා හිතන්නෙ ඒ උගෙ සහෝදයෙක් කියලද?" ඔහු ඌරෙකු මෙන් ශබ්ද කරන්නට පටන් ගත්තේ ය.

"ඕක නවත්තපල්ලා." ජොන් කේන්තියෙන් කඩා පැන්නේ ය.

ඔහු ගේ මේ හදිසි වියරුව නිසා අන්දමන්ද වූ අනිත් කොලුවන් නිහඬ වූහ. "පොඩ්ඩක් ඇහුම්කන් දීපල්ලා." සිදු විය යුත්තේ කුමක්දැයි ජොන් ඔවුන්ට පහදා දුන්නේ ය. ඔහු සිතූ පරිද්දෙන්ම පිප් සැනෙන් ඒ අදහසට එකඟ විය. නමුත් පුදුමයට කරුණ වූයේ හෝල්ඩර් ඊ්ට කැමැති වීමය. ග්‍රෙන් මුලදී මඳක් අදිමදි කලද ඔහුව නම්මා ගත හැකි වදන් ජොන් මනාව දැන සිටියේ ය. ඉන්පසු එකින් එකා කැමැත්ත පල කරන්නට වූහ. ජොන් සමහරුන්ට ඒත්තු ගැන්වූ අතර සමහරුන්ව බොරුවෙන් මුලා කලේ ය. තවෙකෙකු ලැජ්ජාවට පත් කල අතර තර්ජනය අවැසි තැන තර්ජනය භාවිත කලේ ය. අන්තිමේදී සියල්ලන්ම මෙන්, රස්ට් හැර අන් සියල්ලෝම ඔහු ගේ අදහසට එකඟ වූහ.

උඹලා කෙල්ලෝ, උඹලාට ඕන දෙයක් කරගනිල්ලා." රස්ට් කීය. "ඒත් තෝර්න් මාව පිගී ආර්යාවට විරුද්ධව සටන් කරන්ට යැවුවොත් මං බේකන් කෑල්ලක් කපාගෙන තමා පස්ස බලන්නෙ." ජොන් ගේ මුහුණට සිනාසුනු ඔහු එතැනින් නික්ම ගියේ ය.

පැය කිහිපයකට පසු මුලු බලකොටුවම නින්දේ පසුවද්දී ඔවුන් තිදෙනෙක් රස්ට් ගේ නිදන කුටිය වෙත පිය නැගූහ. ග්‍රෙන් ඔහු ගේ දෑතින් අල්ලාගෙන සිටි අතර පිප් ඔහු ගේ දෙකකුල් උඩ නැග ගත්තේ ය. ගෝස්ට් ඔහු ගේ පපුව උඩට නගිද්දී තැති ගත් රස්ට් ගේ වේගවත් ආශ්වාස ප්‍රශ්වාසය ජොන්ට ඇසින. යාන්තමට රුධිරය මතුවන සේ සෝරවෘකයා රස්ට් ගේ ගෙලෙහි සුමුදු සම සිය දතින් කොනහද්දී උගේ දෑස් ගිනිඅඟුරු මෙන් රත් පැහැයෙන් බැබලුනේ ය. "මතක තියා ගනිං. අපි දන්නවා උඹ කොහෙද නිදාගන්නෙ කියලා." ජොන් මෘදු ස්වරයෙන් අනතුරු ඇඟවී ය.

තමා රැවුල බාද්දී දැලිපිහිය ලිස්සා ගිය බව රස්ට් විසින් ඇල්බට්ට හා ටොඩ්ට පවසනු ජොන්ට පසුදා උදෑසන ඇසුනි.

එයින් පසු කිසිම දිනෙක රස්ට් හෝ අන් කිසිවෙකු හෝ සෑම්ට රිදවන්නට උත්සාහ කලේ නැත. සෙර් ඇලිසර් ඔවුන්ව ඔහුට විරුදුව මෙහෙය වූ විට සෑම් ගේ මන්දගාමී, අදක්ෂ පහරවල් වලකනු මිස ප්‍රති ප්‍රහාරයක් එල්ල කිරීමට ඔවුන් සැරසුනේ නැත. පහර දෙන්නැයි සටන් පුහුණුකරුවා බෙරිහන් දුන් විට පමණක් ඉදිරියට පිනූ ඔවුහු සෑම් ගේ පපු ආවරණයට හෝ හිස් ආවරණයට හෝ පා ආවරණයට හෝ යාන්තමට මෙන් පහරක් එල්ල කලහ. සෙර් ඇලිසර් කේන්තියෙන් දත්මිටි කමින් ඔවුන් බියගුල්ලන්, ගැහැණුන් හා ඔහුට සිතා ගත හැකි අන් කවරෙකු හෝ යැයි කියමින් බැන වැදුනද සෑම්ට රිදවීමට කිසිවකුත් ඉදිරිපත් නොවී ය. දින කිහිපයකට පසු ජොන් ගේ බලකිරීම මත ඔහු ඔවුන් හා එක්ව ඒක මේසයක වාඩි වී රෑ කෑම ගන්නට ඉදිරිපත් විය. ඔවුන් ගේ කතාබහට හරිහැටි සහභාගි වනු පිණිස දිරි වඩාගන්නට ඔහුට තවත් සති දෙකක් පමණ ගතවුනද ඒ කාලය තුළ ඔහු පිප් ගේ විකාරවලට සිනහවෙමින් ග්‍රෙන්ට සමච්චල් කරන විට ඊට සහභාගිවෙමින් ක්‍රමයෙන් මේ පරිසරයට හුරුවන්නට විය.

කෙතරම් අදක්ශ, මහත, බියගුල්ලකු වූවද සෑම්වෙල් ටාර්ලි යනු මෝඩයකු නොවී ය. එක් රැයක ඔහු ජොන් ගේ නිදන කුටියට පිවිසියේ ය. "මම දන්නෑ උඹ මොකක්ද කලේ කියලා." ඔහු ජොන්ට පැවසී ය. "ඒ වුනත් මම දන්නවා උඹයි ඒක කලේ කියලා." ඔහු ලැජ්ජාවෙන් මෙන් අහක බැලී ය. "මට කවදාවත් යාළුවෙක් ඉඳලා නෑ."

"අපි යාළුවො නෙවෙයි." ජොන් කීවේ ය. ඔහු සෑම් ගේ පුළුල් දසරුව මත අතක් තැබී ය. "අපි සහෝදරයො."

ඇත්තෙන්ම ඔවුහු සොහොයුරන් වූහ. සෑම් පිටව ගිය පසු ජොන් මේ ගැන වැඩිමනත් කල්පනා කලේ ය. රොබ් සහ බ්‍රැන් සහ රිකන් සිය පියා ගේ පුතුන් වූ අතර ඔහු ඔවුන්ට සැබැවින්ම ආදරය කලේ ය. එනමුදු තමා කිසිදිනෙකත් ඔවුන්ගෙන් එකෙකු නොවන බැව් ජොන් මනාව දැන සිටියේ ය. කැට්ලින් ටලී ස්ටාර්ක් ඒ වෙනුවෙන් අවශ්‍ය සෑම පියවරක්ම ගැනීමට පසුබට වී නොතිබින. වින්ටර්ෆෙල්හි අඳුරු බිත්ති තවමත් ඔහු ගේ සිහින තුළ හොල්මන් කලද දැන් ඔහු ගේ මුලුමහත් ජීවිතයම වන්නේ කළු බලකොටුව බැව් ඔහුට තේරුම් ගියේ ය. එමෙන්ම ඔහු ගේ සොහොයුරන් වූයේ සෑම් සහ ග්‍රෙන් සහ හෝල්ඩර් සහ පිප් සහ නිශා රැකුමේ කළු නිළ ඇඳුම් ඇඳි අන් සියල්ලක්ද වූහ.

"මගේ බාප්පා කිවුවෙ ඇත්ත තමා." ඔහු ගෝස්ට් ට කෙඳිරී ය. මේ බව බෙන්ජීන් ස්ටාර්ක්ට කියනු පිණිස නැවත කවදා තමාට ඔහු මුනගැසෙනු ඇත්දැයි ඔහු දුකින් කල්පනා කලේ ය.

(සෙර් බුර් ර්යේ කොත්තමල්ලි පාර්ටියකින් එයාගේ සුබ උපන්දිනේ සැමරුවලු. සිහසුනට තරග වැද ඉන්න අපි ඔක්කොමත් මේ වෙලාවේ එයාට සුබ උපන්දිනයක් පතමු.)

විශේෂ ස්තුතිය: පැය හතක් නිදි මරාගෙන, බුර්ට මේ ඇඳුම් ඇඳලා, කේක් හදලා මහන්සි වුනු PoM ට.

Samwell Tarly: “I... My mother calls me Sam.”

Pyp: “You can call him Lord Snow, You don’t want to know what his mother calls him.”

එඩාර්ඩ් 06-1

ජේනස් ස්ලින්ට්

ජේනස් ස්ලින්ට් - නගරාරක්ෂක බලකායේ ප්‍රධානී

"මේ හස්තයේ තරගාවලිය නිසා තමා මේ හැම අවුලක්ම ඇතිවෙන්නෙ මගේ උතුමනි." නගරාරක්ෂක බලකායේ අණදෙන නිළධාරියා රාජසභාවට පැමිණිලි ස්වරයෙන් කියා සිටියේ ය.

"රජතුමාගෙ තරගාවලිය." නෙඩ් ඔහුව නිවැරැදි කලේ ය. "මම බොහොම විශ්වාසයෙන් කියන්නෙ, රජතුමාගෙ හස්තයට ඔය මලඉලවුවත් එක්ක කිසිම සම්බන්ධයක් නෑ."

"ඔබතුමාට කැමැති විදියකට කියන්ට මගේ උතුමානනි. මේකට සහභාගිවෙන්ට රාජධානියෙ හතරදිග් බාගෙන්ම නයිට්වරු මෙහාට එන්ට පටන් අරන්. මේ එන හැම නයිට්වරයෙක් ගානෙම අපට එනවා නිදහස් අශ්වාරෝහකයො දෙන්නෙක්, ශිල්පියො තුන්දෙනෙක්, සෙබළු හයදෙනෙක්, වෙළෙන්දො දුසිමක්, වේස ගෑනු දුසිම් දෙකක්, තව ගනංකරන්ට බැරි තරම් හොරුයි ගැටකපන්නොයි රංචුවක්. මේ හෙණගහන රස්නෙ නිසා නගරවැසියො කොහොමත් ලේ රත් වෙලා වගෙයි හිටියෙ. දැන් මේ පිටින් එන අමුත්තො නිසා... ඊයෙ රෑ අපට වාර්තා වුනා දියේ ගිලීමක්, තැබෑරුමක රණ්ඩුවක්, පිහි ඇනුම් තුනක්, ස්ත්‍රී දූෂණයක්, ගිනි තැබීම් දෙකක්, හොරකම් බර ගානක්. ඒ මදිවට හොඳටම බීපු අශ්වයෙක් සහෝදරියන්ගෙ වීදිය මැද්දෙන් පිම්මේ දුවලා තියෙනවා. ඊට කලින්දා රෑ, මහා සප්තකයෙ දේදුනු පොකුණෙ පාවි පාවි තිබිලා හම්බවුනා ගෑනියෙකුගෙ ඔළුවක්. කවුරුවත් දන්නෙ නෑ කවුද මේ මැරිච්ච ගෑනි කියලාවත්, ඒක කොහොමද එතැනට ආවෙ කියලාවත්."

"කොච්චර භයංකාරද." වාරිස් වෙවුලමින් කීවේ ය.

රෙන්ලි බරතියන් උතුමානන් එතරම් අනුකම්පාසහගත වූයේ නැත. "උඹට රජතුමාගෙ සාමය රකින්ට බැරිනං ජේනස්, ඒ දේ කරන්ට පුළුවන් එකෙක්ව නගරාරක්ෂක බලකායෙ අණදෙන නිළධාරියා විදියට පත් කරන්ට සිද්දවෙනවා."

තරබාරු, මහත ගෙලකින් යුතු ජේනස් ස්ලින්ට් කේන්ති ගිය ගෙම්බෙකු මෙන් පිම්බේ ය. ඔහු ගේ තට්ට හිස් මුදුන රත් පැහැ වී තිබින. "මකරාධිපති ඒගොන්ටවත් මේ නගරෙ සාමය රකින්ට බෑ රෙන්ලි උතුමානනි. මට තව මිනිස්සු උවමනායි."

"කොච්චර ඕනද?" නෙඩ් ඉදිරියට නැඹුරුවෙමින් ඇසුවේ ය. සුපුරුදු පරිදිම මෙම රාජසභා රැස්වීමට සහභාගිවීමට රජතුමා කරදර වූයේ නැත. එමනිසා ඔහු වෙනුවෙන් කතා කිරීමට ඔහු ගේ හස්තයට සිදු වී තිබින.

"හොයාගන්ට පුළුවන් හැකි උපරිමයෙන්, හස්තයේ උතුමානනි."

"අලුතෙන් මිනිස්සු පනහක් බඳවගන්ට." නෙඩ් ඔහුට කීය. "බේලිෂ් උතුමානන් වග බලා ගනියි උඹට උවමනා සල්ලි හොයලා දෙන එක."

"මම එහෙම කරයිද?" සුළැඟිල්ලා ඇසුවේ ය.

"අනිවාර්යයෙන්ම. තරගාවලියෙ ජයග්‍රාහකයාට තෑගි දෙන්ට රන්කාසි හතලිස්දාහක් හොයාගත්ත ඔබට රජතුමාගෙ සාමය වෙනුවෙන් තව තඹ කාසි ටිකක් හූරගන්ට බැරිවෙන එකක් නෑ." නෙඩ් නැවතත් ජේනස් ස්ලින්ට් දෙසට හැරුනි. "මම උඹට මගේ ගෘහාරක්ෂක බලකායෙන් තව හොඳ සෙබළු විසිදෙනෙක් දෙන්නම්. තරගාවලිය ඉවරවෙලා මිනිස්සු විසිරිලා යනකම් උන්ට පුළුවන් නගරාරක්ෂක බලකායට උදවු කරන්ට."

"ඔබතුමාට බොහොමත්ම ස්තූතියි හස්තයේ උතුමානනි." ස්ලින්ට් දෙකට නැවෙමින් කීය. "මම ඔබතුමාට පොරොන්දු වෙනවා එයාලව බොහොම හොඳින් පාවිච්චි කරනවා කියලා."

අණදෙන නිළදාරියා පිටව ගිය පසු එඩාර්ඩ් නැවත සෙසු රාජසභිකයින් දෙසට හැරුනි. "මේ විකාරෙ ඉක්මනට ඉවරවෙන තරමට මම බොහොම කැමැතියි." වියදම් සහ සාමය

බිඳවැටීම් නිසා පැන නැගී ඇති ගැටළුවලට අමතරව ඔහුට තව දුරටත් රිද්දන්නට මෙන් නගරයේ සැමදෙනාම මීට 'හස්තයේ තරගාවලිය' කියා අමතන්නට පුරුදු වී සිටියේ හරියටම එය ඔහු ගේ උවමනාවට සිදු වූ දෙයක් ලෙස සලකා මෙනි. අනිත් අතට රජතුමා අවංකවම සිතුවේ මේ සියල්ල ඔහුට කරන ගෞරවයක් ලෙසිනි.

"මේ වගේ උත්සව නිසා රාජධානිය සමෘධිමත් වෙනවා මගේ උතුමානනි." ප්‍රධාන මේස්ටර් පයිසෙල් කීවේ ය. "මේ දේවල් නිසා උසස් පන්තියට පුළුවන් වෙනවා තමන්ගෙ කීර්තිය, සම්මාන, පාරට්ටුව වැඩි කරගන්ට. අනිත් අතට පහත් පෙළේ එවුන්ට තමන්ගෙ දුක් කරදරවලින් මොහොතකට හරි විරාමයක් ලැබෙනවා."

"අනිත් එක සාක්කු ගොඩකට කාසි වැටෙනවා." සුළැඟිල්ලා එක් කලේ ය. "නගරෙ හැම තානායමක්ම පිරිලා ඉතිරිලා ගිහිල්ලා. වේස ගෑනුන්ට කොච්චර වැඩ වැඩිද කියනවානම් උං ඇවිදින්නෙ බකල ගගහ. උං තියන තියන අඩියක් ගානෙ සාක්කුවල කාසි සිලිං බිලිං ගානවා."

රෙන්ලි බරතියන්

රෙන්ලි බරතියන්

රෙන්ලි උතුමානන් සිනාසුනේ ය. "මගේ අයියා ස්ටැනිස් මෙහෙ නැති එක අපට හරිම වාසනාවක්. මතකද මිනිහා ගනිකා මඩම් නීතිවිරෝධී කරන්ටයි කියලා යෝජනාවක් ගෙනාපු වෙලාව? රජතුමා එයාගෙන් ඇහුවා එතකොට එයාට කෑම කන එක, වැසිකිළි යන එක, හුස්ම ගන්න එක එහෙමත් නීතිවිරෝධී කරන්ට උවමනායිද කියලා. ඇත්තම කියනවා නම්, මම සමහර වෙලාවට පුදුමෙන් වගේ කල්පනා කරනවා එයාගෙ අර පුංචි කැත දෝණියන්දෑ හම්බවුනේ කොහොමද කියලා. මිනිහා ඇඳට යන්නෙ හරියට සෙබළෙක් යුද්ධෙට යනවා වගෙයි."

මේසය වටා සිටියවුන්ගෙන් සිනහවට සහභාගී නොවූයේ නෙඩ් පමණි. "මමත් ඔබේ සහෝදරයා ස්ටැනිස් ගැන කල්පනා කරනවා. මම කල්පනා කරන්නෙ එයා කවදා ඩ්‍රැගන්ස්ටෝන්වල සංචාරය ඉවරකරලා ආයෙමත් රාජසභාවෙ වාඩිවෙන්ට එයිද කියලයි."

"අපි අර වේස ගැනූ ටික ඔක්කොම මුහුදට තල්ලු කරලා දාපු දාට එයා ආපහු එයි, කිසිම සැකයක් නෑ." සුළැඟිල්ලා කීවේ තවත් සිනා වටයක් අරඹමිනි.

"අද දවසට මට වේස ගැනූ ගැන අහන්ට ලැබුනා හොඳටම ඇති." නෙඩ් කීවේ අසුනෙන් නැගිටිමිනි. "හෙට හම්බවෙමු."

නෙඩ් නැවත හස්තයේ කුළුණ වෙත පැමිණෙන විට හාර්වින් දොරකඩ මුරකාවලෙහි යෙදී සිටියේ ය.

"ජොරීට මගේ කාමරේට එන්ට කියන්ට. උඹේ තාත්තට කියන්ට මගේ අශ්වයට සෑදල දාන්ටයි කියලා."

"එහෙමයි මගේ උතුමානනි."

රතු බලකොටුව හා හස්තයේ තරගාවලිය නිසා තමා නිතරම කෝපයෙන් ඇවිස්සෙන බව පඩිපෙළ නගින අතරේදී නෙඩ් කල්පනා කලේ ය. කැට්ලින් ගේ දෑතේ නැවත වෙලෙන්නට, රොබ් හා ජොන් අංගනයේ කඩු සරඹ පුරුදුවන හඬ නැවත අසන්නට, උතුරුකරයේ සිසිල් දිවා කාලයන් හා සීතල රාත්‍රීන් නැවත විඳින්නට ඇත්නම් යැයි ඔහු මහත් ආශාවෙන් හුල්ලන්නට විය.

සිය කාමරය තුළදී රාජසභාවට ඇඳි සේද ඇඳුම් ගලවා දැමූ නෙඩ් ජොරී එනතෙක් පොත අතට ගත්තේ ය. ප්‍රධාන මේස්ටර් මැලියන් විසින් ලියන ලද 'රාජධානි සප්තකයේ උදාර වංශවත් පවුල්වල ඉතිහාසය හා පෙළැන්තිය: බොහෝ උසස් වංශාධිපතියන්, කුලීන ආර්යාවන් හා ඔවුන් ගේ දරුවන් ගේ විස්තර සමගින්'. පයිසෙල් පවසා තිබුනේ සැබෑවකි. එය ඉතා බරපතළ පොතක් විය. එනමුදු ජොන් ඒරින් විසින් වෙසෙසින්ම මේ පොත ගැන විමසා තිබුනු එතර ඊට හේතුභූත වූ යම්කිසි කාරණාවක් තිබෙන්නට ඇතැයි නෙඩ් සැක කලේ ය. මෙහි, මේ කහගැසුනු, කැඩී බිඳී යනසුළු පොත් පිටු අතරේ කුමක් හෝ රහසක් සැඟවී තිබිය යුතු විය. එහෙත් ඒ රහස කුමක්ද? මේ පොත සියවසකටත් වඩා පැරණි

එකක් විය. මැලියන් විසින් මෙම උපත්, මරණ හා විවාහ ගැන කියැවෙන මහා පතරංගය ලියන කාලයේදී අද ජීවත්වන කිසිවකුත් ඉපදී තබා ඉපදෙන්නට සිතාවත් නොතිබින.

ලැනිස්ටර් වංශය ගැන ලියැවුනු කොටස නැවත වරක් පෙරලූ ඔහු සෙමින් සෙමින් පොත කියවන්නට වූයේ යම්කිසි දෙයක් ඔහු ගේ දෑස් ඉදිරියට පනිනු ඇතැයි ප්‍රාර්ථනා කරමිනි. ලැනිස්ටර්වරුන් වනාහී වසර දහස් ගණනක් අතීතයේ සිට පැවතෙන උදාර ප්‍රභූ වංශයක් විය. ඔවුන් ගේ මී මුත්තා ස්ටාර්ක් වංශයේ ආදිතමයා වන බ්‍රැන් දි බිල්ඩර් මෙන් 'වීරයින් ගේ යුගයේ' විසූ, දක්ෂ ලැන් නමැති, ප්‍රවාදවල නම කියැවෙන ප්‍රයෝගකාරී කපටියෙකි. නිමක් නැති ගී හා සැහැලිවල කියැවෙන අන්දමට ඔහු කිසිදු ආයුධයක් අත නොමැතිව සිය බුද්ධිය හා බුහුටිකම පමණක් භාවිත කර කාර්ස්ටලී රොක්හි සිටි කාර්ස්ටලීවරුන් එයින් නෙරපා දමා ඇත. එමෙන්ම සිය අක්බමරු කෙහෙරළි රන්වන් පාට කිරීම සඳහා හිරුගෙන් රත්රන් සොරාගෙන ඇත. මේ මලඉලවූ පොතෙන් තමාට අවශ්‍ය සත්‍යය නෙරපාගැනීම සඳහා ඔහු මේ මොහොතේ තමා අසල සිටීනම් කෙතරම් අගනේදැයි නෙඩ් ප්‍රාර්ථනා කලේ ය.

දොරට පිටතින් ජොරී කසල් ගේ තට්ටු කිරීම ඇසින. පොත වසා දැමූ නෙඩ් ඔහුට ඇතුළුවන්නට අණ කලේ ය. "මේ තරගාවලිය ඉවරවෙනකම් නගරාරක්ෂක බලකායට සෙබළු විස්සක් දෙන්ට මම පොරොන්දු වුනා. උඹ තමා කට්ටිය තෝරන්ට ඕන. ඇලන්ට කණ්ඩායමේ නායකකම දෙන්ට. ඒ වගේම ඒ මිනිස්සුන්ට පැහැදිලිව කියන්ට උන්ගෙන් බලාපොරොත්තු වෙන්නෙ ගැටුම් නවත්තන එක, ගැටුම් පටන්ගන්න එක නෙවෙයි කියලා." නැගී සිටිය නෙඩ් සීඩර් පෙට්ටගමක් විවෘත කර එතුළින් සැහැල්ලු හණ යටි කමිසයක් එළියට ගත්තේ ය. "උඹට අර ඉස්තාල කොලුවාව හොයාගන්ට පුළුවන් වුනාද?"

"දැන් ඌ මුරභටයෙක් මගේ උතුමානනි. ඌ දිවුරනවා 'ආයෙනං කවදාවත් අශ්වයින්ට අතක් වත් තියන්නෙ නෑ' යි කියලා."

"ඌට මොනාද කියන්ට තියෙන්නෙ?"

"ඌ කියනවා ඒරින් උතුමානන්ව ළඟින්ම දැනගෙන හිටියා කියලා. බොහොම කිට්ටු යාළුවො තරම් ළඟින්. ඌ කියනවා ඒරින් උතුමා කොල්ලන්ගෙ උපන්දිනේ දාට උන්ට

සල්ලි දුන්නා කියලා. අශ්වයින්ට ආදරෙන් හිටියා, කවදාවත් උන්ට පීඩා වෙන විදියට අශ්වයො පැද්දෙ නෑ කියලා. උන්ට කැරට්වුයි ඇපලුයි ගෙනත් දෙන නිසා එතුමා එනකොට අශ්වයො පවා සතුටු වුනාලු."

"කැරට්වුයි ඇපලුයි." පෙනෙන හැටියට නම් මේ කොලුවාගෙන් ලැබෙන විස්තර අනිත් සැමටම වඩා නොවටින්නේ ය. සුළැඟිල්ලා පැවසූ සිවුදෙනාගෙන් මේ කොලුවා අන්තිමයා විය. ජොරී මේ සිවුදෙනාටම කතා කර තිබින. සෙර් හියු දඬබ්බර, අලුත ලැබුනු නයිට් පදවිය නිසා අහංකාරයෙන් ඔළුව උදුම්මාගත් අයකු වූ අතර ඔහුගෙන් කිසිදු තොරතුරක් ලබාගැනීම උගහට විය. 'රජතුමා ගේ හස්තයට ඔහු සමග කතා කිරීමට උවමනා නම් මුන ගැසීමට සූදානම් නමුදු මේ නිකංම නිකං දෙකයි පණහේ ආරක්ෂක බලමුළුවක කපිතාන් කෙනකු ගේ ප්‍රශ්නකිරීම් වලට මුහුණ දීමට තමා සූදානම් නැත' යි ඔහු වහසිබස් දොඩා තිබින... එතෙකුදු වුවත් මේ දෙකයි පණහේ කපිතාන්වරයා නයිට්වරයාට වඩා වසර දහයකින් වැඩිමහල් වූ අතර ඔහුට වඩා සිය ගුණයකින් දක්ෂ කඩු සරඹ ශූරයෙකු විය. වැඩකාර කෙල්ල ඇත්තෙන්ම ඊට වඩා සුහදශීලී විය. ඇය පැවසූ පරිදි ජොන් උතුමානන් ඔහුට දරාගත නොහැකි තරමට පොත් කියෙවුවේ ය. සිය පුත්‍රයා ගේ අසනීප තත්ත්වය හා දුර්වලකම නිසා ඔහු දුකින් සිටියේ ය. සිය ආර්යාව කෙරෙහි කර්කශ විය. වැඩකාර කොලුවා කිසිදිනෙක ජොන් උතුමානන් සමග වදනකුදු දොඩා නොතිබුනු නමුදු කුස්සියේ ඇසුනු ඕපාදූප රැසක් දැන සිටියේ ය. උතුමානන් රජතුමා සමග නිතරම දබර කලේ ය. එතුමා ආහාර පිඟන්වලට යන්තම් අත ගැසුවා පමණි. එතුමන් සිය පුතණුවන්ව ඩ්‍රැගන්ස්ටෝන්හි හදාවඩා ගැනීමට යැවීමට සිතමින් සිටියේ ය. එතුමා දඩයම් බල්ලන් බෝ කිරීම ගැන විශේෂ උනන්දුවක් දැක්වී ය. නව සන්නාහයක් සාදාගැනීමේ අරමුණින් එතුමා ප්‍රධාන ආයුධ තනන්නෙකු හමුවීමට ගොස් තිබින. මේ සන්නාහය රිදියෙන් තැනූවක් වූ අතර එහි පපු තහඩුව නිල් පැහැ උකුස්සකු හා මුතුවලින් කල අඩ සඳකින් අලංකාර විය. මෝස්තරය තෝරාගැනීමට උදවු වනු පිණිස රජතුමා ගේ සොහොයුරාද උතුමානන් සමග ගිය බව මේ කොලුවා කියා සිටියේ ය. නැත නැත.. ඒ රෙන්ලි උතුමානන් නොවේ, අනිත් කෙනා, ස්ටැනිස් උතුමානන් විය.

"මේ කොලුවා තව මොනවා හරි වැදගත් දෙයක් කිවුවද?"

"කොලුවා දිවුරලා කියනවා ජොන් උතුමානන් එයාගෙ වයසෙන් බාගයක් වයසැති මිනිහෙක් තරම් හොඳ ශරීර සෞඛ්‍යයෙන් ශක්ති සම්පන්නව හිටියලු. ඌ කියනවා එතුමා නිතරම ස්ටැනිස් උතුමානන් එක්ක අශ්වයො පිටේ එහෙ මෙහෙ ගියාලු."

'ආයෙමත් ස්ටැනිස්!' නෙඩ් කල්පනා කලේ ය. මෙය ඔහු ගේ සිතේ කුතුහලයක් ඇති කිරීමට සමත් විය. ජොන් ඒරින් හා ස්ටැනිස් එකිනෙකාට ආචාර සම්පන්න වුවද කිසි දිනෙකත් මිතුරන් නොවූහ. අනිත් අතට රොබර්ට් උතුර බලා, වින්ටර්ෆෙල් බලා ගමන් ගනිද්දී ස්ටැනිස් ඩ්‍රැගන්ස්ටෝන් වෙත, සිය සොයුරා ගේ නමින් තමා දිනූ ටාර්ගේරියන් බලකොටුව වෙත ස්වයං පිටුවහල් වීමක් සිදුකර තිබිනි. නැවත කවදා කින්ග්ස් ලැන්ඩින්ග්වලට එන්නේ දැයි ඔහුගෙන් කිසිදු වදනක් ලැබී නොතිබිනි. "මේ සංචාරවලදී මෙයාලා කොහෙටද ගිහිල්ලා තියෙන්නෙ?" නෙඩ් ඇසීය.

"කොලුවා කියනවා මෙයාලා එක ගනිකා මඩමකට ගියා කියලා."

ස්ටැනිස් බරතියන්

ස්ටැනිස් බරතියන්

"ගනිකා මඩමකට? ඉයරිවල වංශාධිපතියයි රජතුමාගෙ හස්තයයි වුන ජොන්, ස්ටැනිස් බරතියන් එක්ක ගනිකා මඩමකට ගියා?" ඔහු විමතියෙන් හිස වැනීය. මේ බව ඇසුවහොත් රෙන්ලි උතුමානන් කුමක් කියනු ඇත්දැයි ඔහු කල්පනා කලේ ය. රොබර්ට් ගේ ආදර කතා හා ප්‍රේමාලිංගන රාජධානිය පුරා නිමක් නැති ඕපාදූපවල මූලයන් වූ නමුදු ස්ටැනිස් වනාහි වෙනස්ම පුද්ගලයකු විය. ඔහු රජතුමාට වඩා යාන්තම් වසරකින් බාල වූ නමුදු රොබර්ට්ට වඩා හාත්පසින්ම වෙනස්, තදපරුෂ, කිසිදු හාස්‍යයක් නොහඳුනන, සමා නොදෙනසුළු, දරුණු ලෙස රාජකාරියට කැපවූවෙකු විය.

"කොලුවා දිවුරලා කියනවා ඒක ඇත්තක් කියලා. ජොන් උතුමානන් එයත් එක්ක සෙබළු තුන්දෙනෙක් අරන් ගියා. ඉතින් මේ කොලුවා එවුන්ගෙ අශ්වයො ගන්ට ගියාම උන් මේ ගැන විහිළු කතා කියනවා ඌට ඇහිලා තියෙනවා."

"මොන ගනිකා මඩමද?"

"කොලුවා ඒක දන්නෙ නෑ. ඒ ගිය සෙබළු දන්නවා ඇති."

"ලයිසා මේ හැමෝම මිටියාවතට එක්කරන් ගිය එක හරිම අපරාධයක්." නෙඩ් අමිහිරි හඬින් කීවේ ය. "දෙවියො අපට පීඩා කරන්ට පුළුවන් උපරිම උත්සාහය දරනවා. ලයිසා ආර්යාව, මේස්ටර් කෝල්මන්, ස්ටැනිස් උතුමානන්... ජොන් ඒරින්ට ඇත්තටම මොකක්ද වුනේ කියලා දන්න හැමදෙනාම අපට ලීග් දාස්ගානක් දුරින් ඉන්නෙ."

"ස්ටැනිස් උතුමානන්ව ඩ්‍රැගන්ස්ටෝන්වලින් ආපහු කැඳවන්ටද ඔබතුමා යන්නෙ?"

"තාම නෑ. හැමදෙයක් ගැනම හොඳට තේරුම් ගන්නකම්, එයා මේ කතාවෙ කොතනටද සම්බන්ධ වෙන්නෙ කියලා හරියටම දැනගන්නකම් එයාව ගෙන්නන එකේ තේරුමක් නෑ." මේ ප්‍රශ්නය දිගින් දිගටම ඔහුට පීඩා කලේ ය. ස්ටැනිස් හදිසියේම පිටව ගියේ මන්ද? ජොන් ඒරින් ගේ මිනීමැරුම සම්බන්ධයෙන් ඔහුත් යම් කාර්යභාරයක් ඉටුකලාද? එසේත් නැතිනම් ඔහු බිය වූවාද? ස්ටැනිස් බරතියන් වැනියකු බියපත් කල හැකි තරමේ හේතුවක් සිතාගැනීම නෙඩ්ට උගහට විය. ඔහු වරක් සතුරු හමුදාවල වටලෑම හමුවේ වසරක් පුරාවට ස්ටෝර්ම්ස් එන්ඩ් බලකොටුව රැකගෙන සිටියේ ය. ඔහු ගේ ප්‍රාකාරවලට පිටතින් වටලාගත් ටිරල් හා රෙඩ්වින් උතුමන් ගේ හමුදා, භෝජන සංග්‍රහ පවත්වද්දී ඔහුට ආහාරය පිණිස තිබුනේ බලකොටුවේ සිටි මීයන් හා සපත්තු හම් පමණි. ස්ටැනිස් එවැනියකු විය.

"මගේ පිට කබාය ගේන්ට. අර අළු පාට එක. සෝරවෘකයා ගේ සලකුණ තියෙන එක. මේ ආයුධ වෙළෙන්දා දැනගන්ට ඕන මම කවුද කියන එක. එතකොට මිනිහගෙ දිව තව හොඳට බුරුල් වෙයි."

ජොරී ඇඳුම් අල්මාරිය වෙත ගියේ ය. "රෙන්ලි උතුමානන් කියන්නෙ රජතුමාගෙ වගේම ස්ටැනිස් උතුමානන්ගෙත් සහෝදරයා."

"ඒ වුනත් පේන විදියට නම් එයාට මේ සංචාරවලට ආරාධනා ලැබිලා නෑ." පහසුවෙන් සිනාසෙන, මිත්‍රශීලී රෙන්ලි කවරාකාරයේ පුද්ගලයකුදැයි නෙඩ්ට තවමත් සිතාගත නොහැකිව තිබින. දින කිහිපයකට පෙරාතුව නෙඩ්ව පසෙකට කැඳවාගෙන ගිය ඔහු උත්කෘෂ්ට, කනකමය මාල පෙත්තක් පෙන්වා සිටියේ ය. එය විවර කල විට එතුළ වූයේ මුව ඇස් හා සිනිඳු දුඹුරු පැහැ හිසකෙසින් යුත් රූමත් තරුණ දැරියක ගේ කුඩා සිතුවමකි. මේ රුව ඔහු දන්නා හඳුනන කෙනෙකුට සමානදැයි දැනගැනීම රෙන්ලි ගේ මහත් අභිලාෂය විය. එහෙත් පිළිතුරක් නොමැති නෙඩ් දෙවුර ඇකිළූ විට ඔහු ගේ

බලාපොරොත්තු සුන් වූ බැව් පෙනින. මේ යුවතිය සෙර් ලෝරාස් ටිරල් ගේ බාල සොයුරිය වන මාර්ජරී බැව් ඔහු පාපොච්චාරණයක් කලේ ය. එමෙන්ම සමහර මිනිසුන් විසින් ඇගේ පෙනුම ලියානාට සමාන යැයි පවසන බවද ඔහු වැඩි දුරටත් කියා සිටියේ ය. "නෑ. කොහෙත්ම නෑ." නෙඩ් විමතියෙන් කීවේය. රොබර්ට් ගේ තරුණ කල පෙනුමට බෙහෙවින් සමාන රෙන්ලි උතුමානන් ලියානා ගේ පෙනුමට සමාන යැයි ඔහු විසින් සිතන යුවතියක් හා පෙමින් වෙලුනාවත්ද? මෙය සාමාන්‍ය විකාරයකට වඩා වැඩි දෙයක් මෙන් නෙඩ් ගේ සිතට වැදුනේ ය.

ජොරී කබාය ඔසවා අල්ලාගෙන සිටින අතර නෙඩ් එතුළට දෑත් රිංගෙවුවේ ය. "සමහරවිට ස්ටැනිස් උතුමානන් රොබර්ට්ගෙ තරගාවලියට සහභාගී වෙන්ට එයි." නෙඩ් කීවේය.

"ඒක බොහොම ලොකු වාසනාවක් වෙන්ට ඕන මගේ උතුමානනි."

නෙඩ් සිය දිගු අසිපත සහිත පටිය තද කරගත්තේ ය. "ඒ කියන්නෙ ඒක වෙන්ට පුළුවන් දෙයක් නෙවෙයි." ඔහු කර්කශ සිනාහවක් පෑවේය.

නෙඩ් ගේ සළුව උර වටා දැවටූ ජොරී එහි පොට දෙක එක්කර හස්තයේ සලකුණ සහිත හාරිච්චියක් ගැසුවේ ය. "ආයුධ වෙළෙන්දා ජීවත්වෙන්නෙ එයාගෙ සාප්පුව උඩුමහලෙ. ඒක වානේ වීදියෙ තියෙන ලොකු ගෙයක්. ඇලන් පාර දන්නවා මගේ උතුමානනි."

නෙඩ් හිස සැලීය. "මේ කොල්ලා මාව මිරිඟුවක් පස්සෙ නම් යවන්නෙ ඌට දෙයියන්ගෙම පිහිටයි." මෙය එල්ලෙන්නට සිතාගත නොහැකි තරම් කුඩා පිදුරු ගසක් විය. එනමුදු නෙඩ් ස්ටාර්ක් විසින් දැන සිටි ජොන් ඒරින් වනාහි රිදියෙන් කල, මාණික්‍යයෙන් වැඩ දැමූ සන්නාහ පැළැඳියෙකු නොවීය. වානේ යනු වානේ වූ අතර සන්නාහ යනු ආරක්ෂාව පිණිස පළඳින දෙයක් මිස ආභරණයක් නොවේ. අනිත් අතට ඔහු සිය දැක්ම වෙනස් කරගත්තා වන්නටද පුළුවන. රාජසභාවේ රාජකාරි සඳහා පැමිණීමෙන් පසු වසර කීපයක් තුළ වෙනස්ම මිනිසකු බවට පත්වූ පළමුවැන්නා ඔහු නොවේ... එනමුදු එසේ වී නම් මේ වෙනස නෙඩ්ට පුදුමයෙන් කල්පනා කරන්නට බලකරන අන්දමේ වෙනසක් විය.

Tobho Mott: “The boy is crude as new steel, and like new steel would profit from some beating.”

"මගෙන් කෙරෙන්ට ඕන තවත් මොකුත් සේවයක් තියෙනවාද මගේ උතුමානනි?" ජොරී ඇසීය.

"මම හිතන්නෙ උඹ ගනිකා මඩම්වලට යන්ට පටන් ගත්තානම් හරි."

"බොහොම අමාරු රාජකාරියක් මගේ උතුමානනි." ජොරී නියවී ය. "කට්ටිය බොහොම කැමැත්තෙන් උදවු කරන්ට ලෑස්ති වෙයි. පෝතර් දැනටමත් ඒ වැඩේ පටන් අරන් තියෙන්නෙ."

සෑදල පැළැඳූ නෙඩ් ගේ ප්‍රියතම අසු අංගනයේ නවතා තිබ්බ. ඔහු අසු පිට නැගුනු අතර වාර්ලි හා ජැක්ස් ඔහු ගේ පසුමුණ ගත්හ. පැළැඳ සිටි වානේ හිස් ආවරණ හා මුදු දම්වැල් සන්නාහ නිසා ඔවුන් දහදියෙන් පෙඟී සිටිය යුතු නමුදු ඒ ගැන වදනකින් වත් පැමිණිලි කලේ ඔවුන් නොවේ. රාජ ද්වාරයෙන් පිටවී නගරයේ පල් ගඳ හා මුසුවෙද්දී තමා දෙස බලා සිටින දහසක් නෙත් යුගල් ඔහු නිරීක්ෂණය කලේ ය. හැල්මේ යන්නැයි ඔහු සිය අසුට සන් කල අතර ආරක්ෂක සෙබළුන් දෙදෙනා ඔහු පසුපසින් වැටුනහ.

සෙනඟින් පිරුනු නගර වීදි දිගේ යද්දී ඔහු නැවත නැවතත් පසුපස හැරී බැලුවේ ය. උදේ පාන්දරින්ම බලකොටුවෙන් පිටත් වූ ටොමාර්ඩ් හා ඩෙස්මන්ඩ් ඔවුන් යන මේ මාර්ගයේ ස්ථානගතව සිටියේ යම් හෙයකින් කිසිවකු ඔවුන් පසුපස එත්නම් හඳුනාගැනීම සඳහා ය. එසේ වුවද නෙඩ් සැකසහිත විය. රජු ගේ මකුළුවා හා ඔහු ගේ පුංචි කුරුල්ලන් පිරිස නිසා ඔහු ගේ සිතෙහි නොසන්සුන් බවක් ඇතිවී තිබ්බ.

වානේ වීදිය ඇරඹුනේ ගංගා ද්වාරය – නැතහොත් පොදු ජනයා කියන පරිදි මඩ ද්වාරය – අසල පිහිටි වෙළෙඳපළ චතුරශ්‍රයෙනි. දිගු බොරුකකුල් පැළැඳ සිටි කෝලමකු තෙරපෙමින් සිටි සෙනඟ අතරින් රිංගා ගියේ අඩු දිග කුරුම්ණියකු පරිද්දෙනි. නිරුවත් දෙපයින් යුතු පාදඩ කොල්ලන් රංචුවක් හූ තලමින් ඒ පිටුපසින් වැටී හුන්හ. තවත්

තැනෙක වැරහැළි ඇඳගත් බ්‍රැන් ගේ වයසෙහි පමණ වූ කුඩා කොලුවන් දෙදෙනෙක් ලී මිටිවලින් කඩුසරඹ කරමින් සිටියහ. සමහරෙක් ඔවුන් දෙදෙනාට ජයඝෝෂා නගමින් සිටි අතර සමහරෙකු ඔවුන්ට බැන වදිමින් තර්ජනය කරමින් හුන්හ. කවුළුවකින් එබුනු මහළු ස්ත්‍රියක් සිය අතෙහි වූ ඉඳුල් වතුර කොරහ යුද වැදුනවුන් දෙදෙනා මතට හැලූයෙන් මේ ද්වන්ද්ව සටන එතෙකින් නිමා විය. ප්‍රාකාර සෙවනැල්ල යට සිය කරත්ත නැවතූ ගොවීහු කැගසමින්, දිනයේ වෙළෙඳාම් කටයුතු සිදු කරමින් සිටියහ. "ඇපල් ඇපල්! හොඳම ඇපල්! ලාබයි ඇපල්!", "කොමඩු! පැණි කොමඩු! මී පැණි වගේ රහ කොමඩු!", "ටර්නිප්, ලූණු, අල ජාති, මුල් ජාති! එන්ට ගන්ට!"

මඩ ද්වාරය විවෘතව පැවති අතර නගරාරක්ෂක බලකායේ භට පිරිසක් අලස ලෙස සිය දිගු හෙල්ලයන්ට වාරු වී එහි මුරකාවලේ නියුතුව සිටියහ. බටහිර දෙසින් එන අසරු පිරිසක් දුටු මේ සෙබළුන් වහා ක්‍රියාශීලී වී කරත්ත හා පදිකයින් දෙපසට කර ඒ එන නයිට්වරයාට හා පිරිසට නගරයට ඇතුළුවීමට ඉඩප්‍රස්ථා සලසා දුන්හ. ද්වාරයෙන් ඇතුළු වූ පළමු අසරුවා අත දිගු කළු පැහැ ධජයක් රැඳී තිබින. සේද රෙද්දෙන් සැදි ධජය සුළඟේ ලෙලදුන්නේ පණ ඇතියකු පරිද්දෙනි. එහි ගෙත්තම් කර තිබුනේ රාත්‍රී අහස පසුබිමේ ඇති දම් පැහැ අකුණක සලකුණකි. "බෙරික් උතුමානන්ට ඉඩ දෙන්ට." අසරුවා නිවේදනය කලේය. "බෙරික් උතුමානන්ට ඉඩ දෙන්ට." ඔහුට වහාම පිටුපසින් මෙන් තරුණ වංශාධිපතියා - රතු-රන් හිසකෙසින් යුතු, තරු රටාවකින් අලංකාර වූ කළු පැහැ සළුවක් පැළැඳ, කළු පැහැ සෛන්ධවයකු පිට නැගුනු, උජාරු බෙරික් ඩොන්ඩරියන් - නගරයට ඇතුළු විය. "හස්තයේ තරගාවලියට සහභාගිවෙන්ටද ආවෙ මගේ උතුමානනි?" එක් සෙබළෙක් ඇසීය. "හස්තයේ තරගාවලිය දිනන්ටයි ආවෙ." බෙරික් උතුමානන් පිළිතුරු දුන් අතර සෙනග ප්‍රීතිඝෝෂා නගන්නට වන්හ.

චතුරශ්‍රයෙන් ඉවතට හැරුනු නෙඩ් වානේ වීදිය දිගේ කඳුගැටය උඩට නගින්නට විය. සිය විවෘත ආචාරි පට්ටල අසල සිටගත් කම්මල්කරුවන් වැඩෙහි නිරතව හුන්හ. නිදහස් අසරුවෝ මුදු දම්වැල් සන්නාහ මිලදී ගැනීම සඳහා කේවල් කරමින් සිටියහ. යකඩ බඩු වෙළෙන්දන් කරත්තවල තබාගෙන පැරැණි අසිපත් හා වෙනත් අවි ආයුධ විකුණමින් උන්හ. ඉහළ නගින්නට නගින්නට නිවෙස් වඩ වඩාත් විශාල වන්නට විය. ඔවුන්ට අවශ්‍ය පුද්ගලයා විසූයේ කඳුගැටය මුදුනේම පිහිටි, වීදියට නෙරා ආ උඩුමහල් තලයකින් යුතු, විසල් දැවමුවා නිවසේ ය. එහි වූ දැවැන්ත දොරපළු දෙක කළුවර හා වයර්වුඩ් ලීයෙන් කල කැටයමකින් අලංකාර විය. දොර දෙපස සිටුවා තිබුනු සෙල්මුවා නයිට්වරුන් දෙදෙනා ඔපදැමූ රතු වානේ වලින් කල සන්නාහයෙන් සරසා තිබින. සිය අසු ජැක්ස්ට බාරදුන් නෙඩ් දොර විවර කර නිවස ඇතුළට වන්නේ ය.

බෙරික් ඩොන්ඩරියන්

බෙරික් ඩොන්ඩරියන්

තරුණ සේවිකාව නෙඩ් පැළඳ සිටි ලාංඡනය හා කබායේ තිබුනු වංශ සලකුණ නිරීක්ෂණය කර තිබුනු අතර පණිවුඩය ලැබුනු ගෙහිමියා දෙකට නැවෙමින් මුව පුරා සිනාසෙමින් ලහිලහියේ පිටතට පැමිණියේ ය. "රජතුමාගෙ හස්තයට බොන්ට වයින් අරන් වරෙන්." සේවිකාවට අණ කල ඔහු නෙඩ් ට අසුන් ගන්නා මෙන් සන් කලේ ය. "මම ටොබ්හෝ මොට් මගේ උතුමානනි. කරුනාකරලා සැපපහසුව ඇඳිගන්ට." ඔහු පැළැඳ සිටි කළු විල්ලූද කබායේ දැත්වල රිදී නූලෙන් මිටිවල රූප ගෙත්තම කර තිබින. ගෙල වටා වූ ඝනකම් රජතමය දම්වැලේ පරෙවි බිජුවක් තරම් විශාල නිල්මිණක් එල්ලෙමින් තිබින. "ඔබතුමාට හස්තයේ තරගාවලිය වෙනුවෙන් අලුත් ආයුධ මොකුත් උවමනා කරලා තියෙනවා නම් ඔබතුමා නියමම තැනටයි ඇවිත් තියෙන්නෙ." නෙඩ් ඔහුව නිවැරැදි කිරීමට උත්සාහ නොදැරී ය. "ඇත්ත මගේ වැඩ ටිකක් විතර වියදම් වැඩියි තමා. ඒත් ඒකට සමාව ඉල්ලන්ට උවමනා නෑ." ඔහු පැවසුයේ රිදී කුසලාණ දෙකකට වයින් පුරවමිනි. "මම ඔබතුමාට දිවුරලා කියනවා, මගේ වැඩ තරම් ශිල්පීය නිපුනතාවෙන් කරපු වැඩ මේ රාජධානි සප්තකයේ වෙන කොහොන්වත් හොයාගන්ට බෑ. ඔබතුමා කැමැති නම් කින්ග්ස් ලැන්ඩින්ග්වල තියෙන හැම කම්මලකටම ගිහිල්ලා ඒවායෙ තියෙන බඩු මගේ ඒවත් එක්ක සංසන්දනය කරලා බලන්ට. ඕනැම ගොඩේ කම්මල්කාරයෙකුට වුනත් පුළුවන් සන්නාහයක් හදන්ට. ඒ වුනත් මම කරන්නෙ ඒ වගේ දෙකයි පනහෙ වැඩ නෙවෙයි. මම කරන්නෙ චිත්‍රයක් අඳිනවා වගේ සියුම් වැඩ."

මේ මිනිසාට සිය පුරාජේරුව පවසන්නට ඉඩහැරි නෙඩ් වයින් කුසලාණ සෙමින් තොලගාන්නට විය. පුෂ්ප නයිට්වරයා හෙවත් සෙර් ලෝරාස් ටිරල් ඔහු ගේ සෑම සන්නාහයක්ම මිලදී ගත්තේ තමාගෙනි. එපමණක්ද, තවත් බොහෝ උසස් වංශාධිපතින්. නියම වානේ යනු කුමක්දැයි හඳුනන උදවිය. එපමණක් නොව රජතුමා ගේ සහෝදරයා වන රෙන්ලි උතුමානන් පවා. සමහරවිට ඔබතුමා රෙන්ලි උතුමානන් ගේ රනින් වැඩ දැමූ තද කොළ පැහැ අලුත් සන්නාහය දකින්නට ඇත. මේ නගරයේ සිටින අන් කිසිදු ආයුධ ශිල්පියෙකුට එතරම් තද කොළ පැහැයක් ලබාගත නොහැක. වානේ තුළට වර්ණ කැවීමේ සියළුම රහස් ඔහු දන්නේ ය. පාට ආලේප කිරීම හා පිටත වර්ණවත් සිවියක් සෑදීම වැනි දේ දෙකේ පන්තියේ ආචාරීන් ගේ වැඩය. සමහරවිට රජතුමා ගේ හස්තයට නව අසිපතක් උවමනා වනවා වන්නට ඇත. ටොබ්හෝ කුඩා කොලුවකු කල ක්වොහෝර්වල කම්මල්වලදී වැලීරියන් වානේ සමගින් වැඩ කිරීමේ කලාව උගෙන ඇත. මේ පැරැණි ආයුධ රැගෙන නැවත අලුතින් ඒවා තැනිය හැක්කේ වැලීරියන් මන්ත්‍ර ශාස්ත්‍රය දත් අයෙකුට පමණි. "සෝරවෘකයා කියන්නෙ ස්ටාර්ක් වංශයෙ සලකුණ. එහෙම නේද? මම

සෝරවෘකයෙකුගෙ ඔළුවෙ හැඩේට හිස් වැස්මක් හදලා දෙන්නම්. ඒක දැක්කහම පුංචි එවුන් බයවෙයි." ඔහු පාරම් බෑවේ ය.

නෙඩ් මඳ සිනහවක් පෑවේ ය. "උඹ ඒරින් උතුමානන්ට උකුස්සෙකුගෙ හැඩයේ හිස් වැස්මක් හදලා දුන්නද?"

දිගු වේලාවක් කතා නොමැතිව නැවතී බලා සිටි ටොබ්හෝ මොට් සිය වයින් කුසලාණ පසෙකින් තැබී ය. "එතුමා ස්ටැනිස් උතුමානනුත් එක්ක මාව මුන ගැහෙන්ට ආවා. ඒ වුනත් මට බොහොම කණගාටුයි කියන්ට එයාලා මගෙන් මොකුත් මිලදී ගත්තෙ නෑ."

නෙඩ් නිහඬව, දිගටම මේ මිනිසා දෙස කෙලින් බලාගෙන සිටියේ ය. ප්‍රශ්න කිරීම්වලට වඩා නිහඬතාව බොහෝ තොරතුරු එළියට ගන්නට සමත් බැව් ඔහු වසර ගණනක පළපුරුද්දෙන් දැන සිටියේ ය. ඒ උපාය මෙවරද වැඩ කලේ ය.

"එයාලා ඇහුවා කොලුවාව බලන්ට පුළුවන්ද කියලා." ආයුධ වෙළෙන්දා කීවේ ය. "ඉතින් මම එයාලව එක්කරන් ගියා කම්මලට."

"කොලුවා." නෙඩ් ප්‍රතිරාව නැංවී ය. මේ කියන කොලුවා කවරෙකුදැයි ඔහුට කිසිදු නිනවුවක් නොවීය. "මමත් කැමතියි ඒ කොලුවාව බලන්ට."

ටොබ්හෝ මොට් ඔහු දෙසට පරීක්ෂාකාරී බැල්මක් හෙලීය. "ඔබතුමාගෙ කැමැත්තක් මගේ උතුමානනි." ඔහු ගේ කටහඬේ පෙර පැවැති මිත්‍රශීලී ස්වරය නැතිව ගොස් තිබ්බ. නෙඩ්ව පසුපස දොරින් කැඳවාගෙන ගිය ඔහු පටු අංගනයක් හරහා ගොස් කම්මල් වැඩ කෙරෙමින් තිබුනු, ගුහාවක් වැනි පැරැණි ගබඩාවකට ඇතුළු විය. ආයුධ වෙළෙන්දා ගබඩාවේ දොර ඇරිය විට එයින් පිටව ආ උණුසුම් වායු දහර නෙඩ් ට සිහිපත් කලේ මකරෙකු ගේ මුව තුළට ඇවිද යන්නාක් වැනි හැඟීමකි. ඇතුළත සෑම මුල්ලකම ආචාරි පට්ටලවල ගිනි දැල්වෙමින් තිබ්බ. වාතය දුමින් හා ගෙන්දගම් සුවඳින් පිරී තිබ්බ. පුහුණුවන ශිල්පීන් සිය මිටි හා කෝච අඬු මොහොතකට අමතක කර දමා ඔහු දෙස බැලුවේ නළලේ නැගී දහදිය පිස දමා නැවත වැඩට බටහ. නිරුවත් පපුවෙන් යුතු ආධුනිකයෝ තමන්ට හිමි මයිනහමේ රාජකාරි ඉටුකරමින් සිටියහ.

ප්‍රධානියා රොබ් ගේ වයසේ වූ කොලුවෙකුට හඬ ගැසුවේ ය. ඔහු ගේ බාහු හා පපුව ශක්තිමත් පුළුල් මස් ගොබයෙන් ගැවසී ගත්තේ ය. "මේ ඉන්නෙ ස්ටාර්ක් උතුමානන්. රජතුමාගෙ අලුත් හස්තය." ඔහු මෙසේ කියද්දී කොලුවා නිල් පැහැ බුම්මාගත් දෑසින් නෙඩ් දෙස බලා සිය නළලට වැටුනු කෙස් රොදක් පිසදා හැරියේ ය. ඔහු ගේ කෙහෙරැළි තීන්ත මෙන් තද කළු පැහැති වූ අතර අපිළිවෙල, ඝනකම් ලෝම රැසක් මෙන් දිස් විය. අලුත වැවුන රැවුලක් ඔහු ගේ මුහුණ හැඩ කලේ ය. "මේ ඉන්නෙ ජෙන්ඩ්‍රි. එයාගෙ වයසට වඩා ශක්තිමත්. මිනිහා සෑහෙන මහන්සි වෙලා වැඩ කරනවා. උඹ අර හදපු ශිරස්කය උතුමානන්ට පෙන්නපං කොල්ලො." සිය වැඩ බංකුව වෙත ඔවුන් කැඳවාගෙන ගිය කොලුවා ගොනෙකු ගේ හිසේ හැඩයට තැනූ වානේ ශිරස්කයක් ඔවුන්ට පෙන්නුවේ ය. මේ ශිරස්කයයෙන් දිගු අං දෙකක් පිටතට නෙරා විත් තිබින.

නෙඩ් ශිරස්කය සිය දෑතේ එහා මෙහා පෙරලා බැලීය. එය වානේ වලින් සාදා තවම ඔප දමා නොතිබුනු නමුදු දක්ෂ අයුරින් නිමවූවක් බව පෙනින. "මේක බොහොම අගනා නිර්මානයක්. උඹ මට මේක මිලට ගන්ට දෙනවා නම් මම බොහොම සතුටුයි."

කොලුවා ශිරස්කය ඔහු ගේ අතින් උදුරා ගත්තේ ය. "ඒක විකුණන්ට නෙවෙයි තියෙන්නෙ."

ටොබ්හෝ මොට් බියෙන් ත්‍රස්ත වී ගියේ ය. "කොල්ලො, මේ ඉන්නෙ රජතුමාගෙ හස්තය. උන්නාන්සෙට මේක ඕනයි කියනවා නම් ඒක එතුමාට තෑගි කරපං. එතුමා එහෙම අහපු එකම උඹට ලොකු ගෞරවයක්."

"මං ඒක හැදුවෙ මට පාවිච්චි කරන්ට." කොලුවා මුරණ්ඩු අයුරින් පැවසී ය.

"සියදාස් වතාවක් සමාව භජනය කරන්ට මගේ උතුමානනි." ප්‍රධානියා නෙඩ්ට කීවේය. "මේ කොලුවා හරියට අලුත් වානේ වගේ ගොරහැඩියි. අලුත් වානේවලට වගේ මේ කොලුවටත් තලලා තමා හදන්ට වෙන්නෙ. ඒ ශිරස්කය පුහුණුවෙන ශිල්පියෙකුගෙ වැඩක් නෙව කොහොම වුනත්. ඌට සමාවෙන්ට. මම පොරොන්දු වෙනවා ඔබතුමා මීට කලින් කවදාවත් දැකලා නැති විදියේ ශිරස්කයක් හදලා දෙනවයි කියලා."

"සමාව දෙන්ට එයා වැරැද්දක් කලේ නෑ. ජෙන්ඩ්‍රි, ඒරින් උතුමානන් උඹව හම්බවෙන්ට ආපු වෙලාවට උඹලා මොනවා ගැනද කතා කලේ?"

"එයා මගෙන් එකේක ප්‍රශ්න ඇහුවා මයෙ උතුමානනි."

"මොන වගේ ප්‍රශ්නද?"

කොලුවා දෙවුර ඇකිළී ය. "මම හොඳින් ඉන්නවද. මට හොඳින් සලකනවද. මේ වැඩවලට කැමැතිද. මගේ අම්මා ගැනත් ඇහුවා. එයා කවුද. එයාගෙ පෙනුම කොයි වගේද වගේ ඒවා."

"ඉතිං උඹ මොනවද එයාට කිවුවෙ?"

කොලුවා නැවත වරක් නළලට වැටුනු කළු කෙස් රොදක් පිසදා හැරියේ ය. "මම පුංචිම කාලෙ එයා මැරුනා. එයාට තිබුනෙ කහපාට හිසකෙස්. එයා සමහර වෙලාවට මට සින්දු කියන්ට පුරුදුවෙලා හිටියා. මට මතකයි, එයා වැඩකලේ තැබෑරුමක."

"ස්ටැනිස් උතුමානනුත් උඹෙන් ප්‍රශ්න ඇහුවද?"

ජෙන්ඩ්‍රි

ජෙන්ඩ්‍රි

"අර තට්ටෙ තියෙන එක්කෙනාද? නෑ නෑ. එයා මගෙන් මොකුත් ඇහුවෙ නෑ. එයා කවදාවත් වචනයක්වත් කතා කලේ නෑ. මගේ දිහා රවාගෙන බලන් හිටියා විතරයි. හරියට මම එයාගෙ දුවව උස්සන් යන්ට ආපු ස්ත්‍රී දූෂකයෙක් වගේ."

"උඹේ කට පරිස්සම් කරගනිං." ප්‍රධානියා කඩා පැන්නේ ය. "මේ ඉන්නෙ රජතුමාගෙ හස්තය." කොලුවා දෙනෙත් බිමට නැඹුරු කරගත්තේ ය. "දක්ෂ කොලුවෙක්. ඒ වුනාට හරිම මුරණ්ඩුයි. අර ශිරස්කය... වැඩකරන අනිත් එවුං කියන්නෙ මූ ගොනෙක් වගේ මුරණ්ඩුයි කියලා."

නෙඩ් කොලුවා ගේ කළු පැහැ කෙස් කැරළි අතරින් ඇඟිලි විහිදෙවුවේ ය. "මා දිහා බලපං ජෙන්ඩ්‍රි." කොලුවා හිස එසවූ අතර නෙඩ් ඔහු ගේ හණුවල හැඩය හා තද නිල් පැහැ දෑස් මනාව අධ්‍යයනය කලේය. 'ඔවු!' ඔහු කල්පනා කලේය. 'මට පේනවා මේ කවුද කියලා.' "ගිහින් උඹේ වැඩ කරගනිං කොලුවො. උඹට මෙහෙම කරදර කරන්ට සිද්ද වෙච්ච එක ගැන කනගාටුයි." ඔහු ප්‍රධානියා සමගින් නැවත නිවස දෙසට පිය මැන්නේ ය. "මේ කොල්ලාව ආධුනිකයෙක් විදියට බඳවගන්ටයි කියලා ගාස්තුව ගෙවුවෙ කවුද?"

මොට් නොසන්සුන් විය. "ඔබතුමා දැක්කනෙ කොලුවාව. ඒ වගේ ශක්තිමත් කොලුවෙක්. ඒ වගේ අත් දෙකක්. ඒවා මිටියක් අල්ලන්ටමම කියාපු අත්. ඌට හොඳ අනාගතයක් තියෙනවා. මම කිසිම ගාස්තුවක් ගන්නෙත් නැතුවමයි ඌව බඳවගත්තෙ."

"හරි. දැන් ඇත්ත කියපං." නෙඩ් බලකරන ස්වරයෙන් කීය. "ශක්තිමත් කොල්ලො දූසිම් ගානට පාරෙන් හොයාගන්ට පුළුවන්. උඹ ගාස්තුවක් අය කරන්නෙ නැතුව ආධුනිකයෙක් බඳවගත්තොත් එදාට ප්‍රාකාරෙත් කඩන් වැටෙයි. කවුද එයා වෙනුවෙන් ගෙවුවෙ?"

"උතුමානන් කෙනෙක්." ප්‍රධානියා අකැමැත්තෙන් මෙන් කීය. "එතුමා නමක් කීවෙ නෑ. කබායෙ කිසිම සලකුණක් ගහලා තිබ්බෙත් නෑ. රත්තරන් වලින් ගෙවුවා, නියම ගාස්තුව වගේ දෙගුණයක්. එතුමා කිවුවා එකපාරක් ගෙවන්නෙ කොලුවා වෙනුවෙන්, දෙවෙනි පාර ගෙවන්නෙ මගේ නිශ්ශබ්දතාව වෙනුවෙන් කියලා."

"එයාව විස්තර කරන්ට."

"තරබාරුයි. වටකුරු උරහිස්. ඔබතුමා තරම්ම උස නෑ. දුඹුරු පාට රැවුලක්. ඒකෙ යාන්තමට රතු පාටකුත් තිබ්බා. එතුමා ඇඳලා හිටියෙ බොහොම වටිනා කබායක්, ඒක මට හොඳට මතකයි. රිදී පාට නූලෙන් වැඩ දාපු, දම් පාට, ඝනකම විල්ලූද කබායක්. ඒ වුනත්

මූන අඳුරු වෙන විදියට සළුවෙන් ඔළුව වහගෙනයි හිටියෙ. ඒ නිසා මට හරියට මූන බලාගන්ට බැරිවුනා." ඔහු මදක් තැතනී ය. "මගේ උතුමානනි. මට අනවශ්‍ය ප්‍රශ්නවලට මැදිවෙන්ට උවමනා නෑ."

"අපි කාටවත්ම ප්‍රශ්නවලට මැදිවෙන්ට උවමනා නෑ. ඒ වුනත් මේක ප්‍රශ්න අධික කාලයක්. කරන්ට දෙයක් නෑ මාස්ටර් මොට්." නෙඩ් කීය. "උඹ දන්නවා මේ කොලුවා කවුද කියලා."

"මම නිකංම නිකං ආයුධ වෙළෙන්දෙක් විතරයි මගේ උතුමානනි. මම දන්නෙ මට කියපු දේ විතරයි."

"උඹ දන්නවා මේ කොලුවා කවුද කියලා." නෙඩ් ඉවසිලිවන්තව නැවත කීය. "ඒක ප්‍රශ්නයක් නෙවෙයි මාස්ටර් මොට්."

"මේ කොලුවා මගේ ආධුනිකයා." ප්‍රධානියා කීවේය. ඔහු පැරණි යකඩයක් මෙන් මුරන්ඩු අයුරින් නෙඩ් ගේ දෑස් දෙස කෙලින් බැලීය. "මගේ ගාවට එන්ට කලින් ඌ කවුද කියන එකෙන් මට ඇති වැඩක් නෑ."

නෙඩ් මේ පිළිතුරෙන් සතුටු වූවාක් මෙන් හිස වැනීය. මේ ආයුධ වෙළෙන්දා, ටොබ්හෝ මොට්ට තමා කැමැති යැයි ඔහු තීරණය කලේ ය. "කවදාහරි දවසක ජෙන්ඩ්‍රිට කඩු හදන්ට නෙවෙයි, කඩුව අතට ගන්ට සිද්දවුනොත් එදාට එයාව මා ගාවට එවපං. ඌට හොඳ රණකාමියෙකුගෙ පෙනුම තියෙනවා. එතෙක් උඹට බොහොම ස්තූතියි මාස්ටර් මොට්. මම පොරොන්දු වෙනවා, කවදාහරි මට පොඩි ළමයි බයකරන්ට ශිරස්කයක් හදාගන්ට උවමනා වුනොත් මම මෙහාට මුලින්ම තමා එන්නෙ."

ඔහු ගේ සෙබළුන් දෙදෙනා අසුන් සමග පිටත නැවතී බලා සිටියහ. "ඔබතුමා මොනාහරි හොයාගත්තද මගේ උතුමානනි?" නෙඩ් අසු පිට නගිද්දී ජැක්ස් ඇසීය.

"ඔවු. මම යමක් හොයාගත්තා." නෙඩ් පිළිතුරු දුනි. 'රොබර්ට් රජතුමා ගේ අවජාතකයෙකු සමග ජොන් ඒරින්ට තිබුනු ගනුදෙනුව කුමක්ද? එය ඔහු ගේ දිවි තොරවීමට තරම් හේතුවක් වූයේ කෙසේද?' නෙඩ් විමතියෙන් කල්පනා කලේය.

Grand Maester Pycelle: “The realm prospers from such events, my lord. They bring the great the chance of glory, and the lowly a respite from their woes.”

කැට්ලින් 05

කැට්ලින් හා සෙර් රඩ්‍රික් කසල්

"මගේ ආර්යාවනි. ඔබ ඔළුව වහගන්නවා නම් හොඳයි." සිය අසුන් සෙමින් සෙමින් උතුරු දෙසට ඇදෙන අතරේ සෙර් රඩ්‍රික් ඇයට කීවේය. "ඔබට හෙම්බිරිස්සාවක්වත් හැදෙයි."

"ඒ නිකංම වතුර විතරයි සෙර් රඩ්‍රික්." කැට්ලින් පිළිතුරු දුන්නා ය. ඇගේ හිසකෙස් තෙත් බරිතව ඇඟට ඇලී තිබින. තමා කෙතරම් අශිෂ්ට අන්දමින් කෙනෙකුට පෙනිය හැකිදැයි ඇයට සිතාගත හැකි වුවද ඇය ඒ ගැන තැකීමක් නොකලා ය. දකුණුකරයේ වර්ෂාව යනු උණුසුම් හා සෞම්‍යදායක දෙයක් විය. මවක ගේ උණුසුම් චුම්බනයන් මෙන් වැහිබිඳු ඇගේ මුහුණ සිපගන්නා විට දැනෙන හැඟීමට ඇය ප්‍රිය කලාය. එය ඇගේ ළමා කාලය, රිවර්රන්හි ගෙවුනු අඳුරු වැහිබර දිනයන් ඇගේ මතකයට ගෙන ඒමට සමත් විය. රිවර්රන්හි දෙව්වනය, වැස්සෙන් තෙත්බරිත වූ ගස්වල අතුරිකිළි, තෙත් කොළ ගොඩවල් මතින් ඇයව ලුහුබැඳ එන ඇගේ සොයුරා ගේ සිනා හඬ. ඇගේ සොයුරිය ලයිසා සමග එක්ව මැටි කේක් සැදූ හැටි, ඔවුන් ගේ ඇඟිලිකරු අතරින් පෙරී ආ දුඹුරු පැහැ මඩ. ඔවුන් දෙදෙනා එක්ව කැකිරි පලමින්, සාදාගත් මැටි කේක් සුළැඟිල්ලාට පිරිනැමූ අතර, ඔහු ඒවා කෑම නිසා සතියක් තිස්සේ අසනීපයෙන් පසුවන්නට සිදු විය. ඔවුන් සැවොම කෙතරම් ලාබාලව, කෙතරම් වගකීම් විරහිතව සිටියාද?

මේ හැම දෙයක්ම කැට්ලින්ට මුළුමනින්ම පාහේ අමතකව ගොස් තිබින. උතුරුකරයේ වර්ෂාව යනු දැඩි, සීතල දෙයක් වූ අතර ඇතැම්විට රාත්‍රියේදී එය අයිස් බවට පත් විය. එය වගාවන් පෝෂණය කිරීමට මෙන්ම වගාවන් නසා දැමීමටද එකලෙස හැකියාවක් ඇත්තෙක් විය. එය වැඩුනු මිනිසුන් ළඟම ඇති ආවරණ සොයා දුවවන්නට සමතෙක් විය. එය කුඩා දැරියන්ට තෙමෙමින් ක්‍රීඩා කිරීමට සුදුසු ආකාරයේ වර්ෂාවක් නොවීය.

"මාව මුළුමනින්ම තෙමිලා ගිහිල්ලා." සෙර් රඩ්‍රික් පැමිනිල්ලක ස්වරයෙන් කීය. "මගේ ඇටකටු හිටන් තෙමිලා වගේ." ඔවුන් ගේ දෙපසින්ම වනාන්තරය නැගී සිටි අතර ගස්වල කොළ මතට වැහිබිංදු වැටෙන රිද්මයානුකූල හඬ හා අසු කුර මඩ වූ පොළොව මත

ගැටෙන හඬ හැරෙන්නට අන් කිසිදු හඬක් ඇසෙන්නට නොවීය. "අද රෑට නම් අපට ගිනිමැලයක් ඕන වෙනවා මගේ ආර්යාවනි. ඒකයි උණුසුම් කෑම වේලකුයි තිබ්බා නම් අපි දෙන්නටම හොඳයි."

"ඉස්සරහ හතරමං හන්දියෙ තානායමක් තියෙනවා." ඇගේ තරුණ කාලයේ සිය පියා සමග ගමන් යද්දී ඇය අනන්ත වූ රාත්‍රීන් එහි ගතකර තිබුනා ය. ඒ කාලයේ හස්ටර් ටලී උතුමානන් ජවයෙන් පිරුනු, නිතරම ගමන් බිමන්වල යෙදුනු වංශාධිපතියෙකු විය. ඇයට තවමත් එහි තානායම්පතිනිය මතකයට නගා ගත හැක. මාෂා හෙඩ්ල් නම් වූ ඒ තරබාරු ගැහැණිය දිවා රෑ නොබලා විට සපමින් සිටි අතර කුඩා දරුවන් සමග සිනාසෙමින්, ඔවුන්ට කේක් දුන්නා ය. මේ කේක් මී පැණි වලින් නහවා තිබුනු අතර දිවට සුමිහිරි රසයක් ගෙන ආවේය. එනමුදු නිතරම විට සැපීම නිසා ඇගේ දත් තද රතු පැහැයක් ගෙන තිබුනු අතර ඇය සිනාසෙන විට බැලීම භයංකාර විය.

"තානායමක්." සෙර් රඩ්‍රික් කල්පනාවෙන් බර වූ ස්වරයෙන් කීවේය. "ඒ වුනත්... අපි අවදානමක් ගන්න එක හොඳ නෑ නේද? කාටවත් ඇහැ නොගැහී ඉන්ට ඕන නම් හොඳම වැඩේ පුංචි බලකොටුවක් හොයාගන්න එකයි..." පාරේ ඉදිරියෙන් ඇසුනු ශබ්දයක් නිසා ඔහු කතාව අතරමග නැවැත්වීය. වතුර කැලැත්තෙන හඬ, මුදු දම්වැල්වල ක්ලින්ක් හඬ හා අශ්වයෙකු ගේ හේෂාරවය ඔවුන්ට ඇසින. "අශ්වාරෝහකයො." ඔහු ගේ අත සිය අසිපත් මිට වෙත නිතැනින් ඇදී ගියේය. රජමාවතේදී වුව පෙර පරිස්සම වටී.

පාරේ වංගුවකින් හැරුනු ඔවුන්ට ශබ්දයට හේතුව දැක ගත හැකි විය. ආයුධ සන්නද්ධ අශ්වාරෝහකයින් පිරිසක් වැසි දියෙන් පිරී ඉතිරී ගිය කුඩා දොළ පහරකින් එතෙර වෙමින් සිටියහ. ඔවුන්ට පාර ඉඩ දීම සඳහා කැට්ලින් සිය අසු නතර කර ගත්තා ය. පළමුවෙන්ම පැමිණි අශ්වාරෝහකයා අත තිබුනු ධජය වැසි දියෙන් පෙඟී පහළට බරවී තිබුනු නමුදු සෙබළුන් සැවොම දම් පැහැ සළු පැළඳ සිටි බවත් ඔවුන් ගේ උරහිසේ තිබුනු සීගාර්ඩ්හි රිදී පැහැති රාජාලියා ගේ සලකුණත් ඔවුන්ට පැහැදිළිව දැකිය හැකි විය. "මැලිස්ටර්ලා." සෙර් රඩ්‍රික් ඇයට කෙඳිරුවේ ය. "මගේ ආර්යාවනි. ඔබ සළුව ඇදලා ඔළුව වහගත්තා නම් හොඳයි."

කැට්ලින් ඊට කිසිදු උත්සාහයක් නොදැරුවා ය. සිය තරුණ පුත්‍රයා වන පැට්‍රික් මැලිස්ටර් පසෙකින් ඇතිව, පසුපසින් පැමිණෙන ඔවුන් ගේ සහචරයන් හා නයිට්වරුන් පිරිවැරූ ජේසන් මැලිස්ටර් උතුමානන් මෙම පිරිසේ නායකත්වය දැරීය. ඔවුන් හස්තයේ

තරගාවලියට සහභාගි වීම පිණිස කින්ග්ස් ලැන්ඩින්ග්වලට යමින් සිටින බැව් ඇය තේරුම් ගත්තා ය. පසුගිය සතිය පුරාවටම රජමාවත මෙවැනි මිනිසුන්ගෙන් පිරී තිබින. නයිට්වරුන් සහ නිදහස් අසරුවන්, සිය නලා හා බෙර ඔසවාගෙන යන ගායකයින්, බීර හෝ ඉරිඟු හෝ මී පැණි පීප්ප හෝ පැටවූ බර කරත්ත, වෙළෙන්දන් සහ ශිල්පීන් සහ වෙසඟනන්, මේ සැවොම දකුණුකරය බලා යමින් සිටියහ.

ඇය බිය සැක නැති අයුරින් ජේසන් උතුමානන් දෙස හොඳින් බැලුවා ය. අවසාන වරට ඇය විසින් ඔහුව දකින ලද්දේ ඇගේ විවාහ මංගලෝත්සව භෝජන සංග්‍රහයේදී සිය මාමා වන බ්‍රින්ඩන් ටලී හා අල්ලාප සල්ලාපයෙන් සිටියදී ය. මැලිස්ටර්වරුන් වනාහී ටලීවරුන් ගේ ධජ ඔසවාගෙන යන්නවුන් වූහ. කාලය විසින් ඔහු ගේ දුඹුරු පැහැ හිසකෙස් තැනින් තැන සුදු පැහැ කර තිබුනු අතර මුහුණ වැරී ගොස් තිබින. එනමුදු එය ඔහු ගේ ආත්මාඩම්බරයට කිසිදු හානියක් සිදු කර නොතිබුනු අතර ඔහු කිසිදු බියක් සැකක් නොමැති සාහසික බවකින් සිය අසු මෙහෙයවීය. අසරුවන් ඔවුන්ව පසු කර යද්දී ජේසන් උතුමානන් දරදඬු අයුරින් කැට්ලින් හා සෙර් රඩ්‍රික් දෙසට හිස නැමීය. එනමුදු එය උසස් වංශාධිපතියකු විසින් මඟතොටදී හමුවන නන්නාඳුනන්නෙකුට පෙන්වන ආචාරශීලිත්වයක් පමණක්ම විය. ඒ සාහසික දෑස්වල කිසිදු හඳුනාගැනීමේ සංඥාවක් නොවූ අතර ඔහු ගේ පුත්‍රයා ඔවුන් දෙස බැලීමටවත් පමා වූයේ නැත.

"එයා ඔබව අඳුරගත්තෙ නෑ." සෙර් රඩ්‍රික් විමතියෙන් මෙන් කීවේය.

"එයා දැක්කෙ පාර අයිනෙ ඉන්න මඩ නාපු ආගන්තුකයො දෙන්නෙක් විතරයි. එයා හීනෙන්වත් සැක කරන්ට නැතුව ඇති ඒ දෙන්නගෙන් එක්කෙනෙක් තමන්ගෙ වංශාධිපති උතුමානන්ගෙ දුව කියලා. මම හිතන්නෙ අපි තානායමේ නවතින එක එච්චරම ප්‍රශ්නයක් වෙන එකක් නෑ සෙර් රඩ්‍රික්."

ගංගා ත්‍රිශූලයේ දෙමෝදරට උතුරින් සතරමංසන්ධියක පිහිටි තානායමට ඔවුන් ළඟා වන විට සන්ධ්‍යාව එළඹ තිබින. මාෂා හෙඩ්ල් කැට්ලින්ට මතක තිබුනාටද වඩා තරබාරු වී සිටි අතර ඇය පුරුදු පරිදි විට සපමින් සිටියා ය. එනමුදු ඇය ඔවුන් දෙසට හෙලූයේ එක් නොසැලකිලිමත් බැල්මක් පමණි. "පඩිපෙළ උඩම කාමර දෙකක් තියෙනවා. එච්චරයි අපට දැනට තියෙන්නෙ. ඒවා තියෙන්නෙ සීණ්යා කුළුණට පහළින්. සමහරු නම් කියන්නෙ ඒ කාමරවල සද්දෙ වැඩියි කියලා. ඒ වුනත් ඔබලට කෑම වෙලාව මඟහැරෙන

එකක් නෑ. කරන්ට දෙයක් නෑ. අපි කට ගාවටම පිරිලා. ඒ කාමර දෙක ගන්ට, නැත්තං පාරෙ තමා ඉන්ට වෙන්නෙ."

මංසන්ධි තානායම

පඩිපෙළට ඉහළින් වූ කුඩා, පහත් සිවිලමකින් යුතු ඒ කාමර දෙක ඔවුන් වෙනුවෙන් වෙන් කෙරින. "ඔබලාගෙ සපත්තු මෙහෙන් තියලා යන්ට." මුදල් ගැනීමෙන් පසු මාෂා කියා සිටියා ය. "වැඩකාර කොල්ලා ඒවා සුද්ද කරලා තියයි. මට ඕන නෑ ඔබලා මගේ පඩිපෙළ දිගේ මඩ ගාගෙන යනවට. සණ්ඨා සද්දෙ අහගන්ට. කෑම වෙලාව පරක්කු වුනොත් කෑම නැතුව තමා ඉන්ට වෙන්නෙ." කැට්ලින්ට මතක තිබුනු ආකාරයේ සිනහවක් හෝ කේක් ගැන හෝ සඳහනක්වත් නොවීය.

ඔවුන් ගේ සවන් බිහිරි කරවන තරමේ මහ හඬකින් රාත්‍රී ආහාරය සඳහා වූ සීනුව නාද වන්නට විය. කැට්ලින් මේ වන විට සිය තෙත් ඇඳුම් මාරු කර තිබින. ඇය කවුළුව අසල අසුනක වාඩි වී ජනෙල් පියන හරහා දිය බිඳු ගලා යන ආකාරය දෙස බලා සිටියා ය. වැහි බිඳු නිසා වීදුරුවෙන් පිටත දිස් වූයේ බොඳවුනු සිත්තමක් මෙනි. පිටත අන්ධකාරය බෝ වෙමින් තිබුනු අතර ප්‍රධාන මාර්ග දෙක හමුවන ස්ථානයේ සතරමංසන්ධිය ඇයට යාන්තමින් මෙන් හඳුනාගත හැකි විය.

මේ මංසන්ධිය ඇගේ සිතේ දෙගිඩියාවක් ඇති කරලන්නට සමත් වී තිබින. ඔවුන් මෙතැනින් බටහිර දෙසට හැරුනහොත් එය රිවර්රන් දක්වා වූ පහසු ගමනක් විය. ඇගේ පියා ඕනෑම අසීරු අවස්ථාවකදී ඇයට මහඟු ඔවදන් දුන් පුද්ගලයකු විය. එමෙන්ම ඇයට මේ මොහොතේ ඔහුත් සමග කතා කිරීමට හා ඉදිරියේදී පැමිණිය හැකි අන්තරායදායක තත්ත්වය ගැන ඔහුට අනතුරු ඇඟවීමට බලවත් උවමනාවක්ද ඇති වී තිබින. වින්ටර්ෆෙල්වලට යුද්ධය පිණිස සූදානම් වීම අවශ්‍ය නම් මේ කින්ග්ස් ලැන්ඩින්ග් අතේ දුරින් පිහිටි, බටහිර දෙසින් කාස්ටර්ලී රොක්හි දැවැන්ත සෙවනැල්ල හිස මත වැටී ඇති රිවර්රන්වලට එමෙන් දසගුණයක සූදානමක් අවශ්‍ය විය. ඇගේ පියා තවමත් පෙර මෙන් ශක්ති සම්පන්නව සිටියා නම් ඇය සමහරවිට ඒ තීරණය ගැනීමටත් ඉඩ තිබින. එනමුදු, හස්ටර් ටලී උතුමානන් දැන් වසර දෙකක සිට අසනීපයෙන් ඇඳට වැටී ඇති අතර සිය දුක් කරදර කියා පෑමෙන් ඔහුව තවත් අවුල් කරන්නට ඇයට සිත දුන්නේ නැත.

නැගෙනහිර දෙසට විහිදුනු මාවත වඩා වනගත හා වඩා අන්තරායදායක ගමනක් විය. එම මාවත ගිරිදුර්ග, වනාන්තර, කඳුකර මුරකපොලු හා ගැඹුරු නිම්න භූමි මැද්දෙන් ඒරින් මිටියාවත දක්වාත්, එතැනින් එහාට ගල්කුළුවලින් ගහන අතුඹිලි දක්වාත් විහිද තිබිනි. මේ මිටියාවත මැද්දේ, උත්තුංග, කිසිවෙකුටත් තරණය කල නොහැකි අහස උසට නැගුනු කුළුණුවලින් යුත් ඉයරි බලකොටුව පිහිටා තිබිනි. එහිදී ඇයට ඇගේ සොයුරිය සොයාගත හැකි වනු ඇත... ඇගේ සොයුරිය මෙන්ම නෙඩ් විසින් හඹා යන ප්‍රශ්න රැසකට පිළිතුරු එහිදී සොයාගත හැකිවනු ඇත. ඇයට එවා තිබුනු ලිපියේ සඳහන් කල නොහැකි මට්ටමේ බොහෝ කරුණු ලයිසා නිසැකයෙන්ම දැන සිටිනවා විය හැක. ලැනිස්ටර්වරුන්ව බිඳ දැමීම සඳහා නෙඩ්ට උවමනා කරන ප්‍රධානම සාක්ෂි ඇය සතුව පවතිනවා ඇත. එමෙන්ම, යුද්ධයක් ඇතිවීමට යන්නේ නම් ඒරින්වරුන් හා ඔවුන්ට යටත් නැගෙනහිරදිග වංශාධිපතියන් ගේ සේවය ඔවුන්ට තදින්ම උවමනා වනු ඇත.

එනමුදු මේ කඳුකර මාර්ගය බෙහෙවින් උපද්‍රව සහිත එකක් විය. කපොලුවල කඳු සිංහයින් ගැවසුනු අතර නාය යෑම්ද සුලබ විය. ඒ හැමටම වඩා කඳුකරයේ ම්ලේච්ඡ ගෝත්‍ර වැසියන් බෙහෙවින්ම අන්තරායදායක විය. කඳුකරයෙන් පහළට බැස මංකොල්ලකෑම් හා මිනීමැරීම් සිදුකරන ඔවුහු තමා සොයා මිටියාවත දෙසින් සෙබළුන් එන විට සැඟව ගැනීමේ අති දක්ෂයන් වූහ. ජොන් ඒරින් වැනි උසස්ම ගනයේ ප්‍රභූවරයකු පවා මේ මාවතේ යන විට ආරක්ෂාව පතා සෙබළුන් රැසක් පිරිවරා යාමට පුරුදුව සිටියේ ය. එහි යන්නේ නම් කැට්ලින්ට ඇති එකම ආරක්ෂාව වනු ඇත්තේ ලැදි බව පමණක් සන්නාහය කොට ගත් මහලු නයිට්වරයකු පමණි.

නැත. මේ මොහොතේ රිවර්රන් හා ඉයරි වෙනුවෙන් ඇගේ කාලය වැය කල නොහැක. ඇගේ මාවත විහිදෙනු ඇත්තේ උතුරු දෙසට, වින්ටර්ෆෙල්වලට, ඇගේ පුතුන් හා ඇගේ වගකීම් ඇය එන තෙක් බලා සිටින ස්ථානය දෙසටය. ආරක්ෂාකාරීව බෙල්ල පසුකල පසු ඇගේ සැමියා ගේ යටත් වංශාධිපතියෙකු හමුවී ඒ මගින් රජමාවත හරහා පණිවුඩ යැවීම වඩාත්ම සුදුසු ක්‍රියාමාර්ගය වනු ඇත.

සතරමංසන්ධියෙන් එහා වූ භූමිය වැස්ස නිසා පැහැදිලිව නොපෙනුනද කැට්ලින්ට එය මනාව සිය සිතේ ඇඳ ගත හැකි තරමට ඇය ඒ ගැන දැන සිටියා ය. පාරට එපිටින් වෙළෙඳපළ පිහිටා තිබුනු අතර ඊට සැතපුමක් පමණ ඈතින් ගම්මානය පිහිටියේ ය. එකල එහි වූ ගලින් කල කුඩා සප්තක දේවස්ථානය වටා සුදු හුණු පිරියම් කල කුඩා පැල්පත් පනහක් පමණ තිබුනු අතර පැවැති දිගු සාමකාමී ගිම්හානය නිසා ඒවා දැන් ඊට වඩා වැඩි වී ඇති බැව් නිසැකය. මෙතැනින් උතුරේදී රජමාවත ගංගා ත්‍රිශූලයේ කොළ ගංගාව හා

සමගාමීව වැටී තිබින. ඒ වනාහි සාරවත් මිටියාවත් හා නිල්වන් වනාන්තරයෙන් වැසුනු, ඉමක් නැති ජනාකීර්ණ නගර හා ගංගා නිම්නයේ වසන වංශාධිපතීන් සතු ශක්තිමත් මාලිගා බලකොටුවලින් පිරුනු සුන්දර දේශයක් විය.

කැට්ලින් මේ සියල්ලක්ම අතැඹුලක් මෙන් දැන සිටියා ය. සදා එකිනෙකාට එරෙහිව යුද වැදී සිටි බ්ලැක්වුඩ්වරුන් හා බ්‍රැකන්වරුන්. හැරෙන්හෝල්හි ඇගේ හොල්මන් ගුහාවේ තනිව දිවිගෙවන, සිය වංශයේ අවසාන පුරුක වන වෙන්ට් ආර්යාව. තමා හා විවාහ වූ භාර්යාවන් සත්දෙනෙකුටම වඩා වැඩි කලක් ජීවත්වීමේ භාග්‍යය හිමි කරගත්, සිය බලකොටු යුග්මය අනන්ත දරුවන්, මුණුබුරන්, මී-මුණුබුරන්, අවජාතකයන් හා අවජාතක මුණුබුරන්ගෙන් පුරවා ලූ වහා කිපෙනසුළු ෆ්‍රේ උතුමානන්. මේ සියලුදෙනාම ටලී ධජ දරන්නන් වූ අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක රිවර්රන්හි සේවය පිණිස ප්‍රතිඥා දී සිටියවුන් වූහ. එනමුදු යුද්ධයක් ඇති වුවහොත් මේ සහාය ප්‍රමාණවත් වනු ඇත්දැයි කැට්ලින් කල්පනා කලාය. ඇගේ පියා මිහිමත වෙසෙන දැඩිම මිනිසා වූ අතර අවශ්‍යතාවක් ඇති වුවහොත් ඔහු නොපැකිලවම සිය වංශාධිපතියන් කැඳවනු ඇති බැව් ඇය ඉඳුරා දැන සිටියා ය... එහෙත් මේ කැඳවීමට පිළිතුරු වශයෙන් මේ වංශාධිපතීන් පැමිණෙනු ඇත්ද? ඩැරීවරුන්, රයිගර්වරුන් හා මූටන්වරුන් රිවර්රන්වලට පක්ෂපාතී පවුල් වුවද ගංගා ත්‍රිශූලයේ යුද්ධයේදී ඔවුන් රේගාර් ටාර්ගේරියන් ගේ පාර්ශ්වය ගෙන සටන් වැද තිබින. එමෙන්ම ෆ්‍රේ උතුමානන් සිය සෙබළුන් කැටුව යුදට බටුයේ සටන් නිමා වී බොහෝ වේලාවකට පසුව විය. මේ ක්‍රියාව මගින් ඔහු කුමන හමුදාවක් හා සම්බන්ධ වීමේ අරමුණින් පැමිණියාදැයි යන කහට බොහෝ දෙනෙකු ගේ සිතේ සැක උපදවන්නට සමත්ව තිබින. තමා පැමිණියේ ඔවුන් හා එක්වීමට යැයි යුද්ධයේ ජයග්‍රාහකයින්ට ඔහු දිවුරා සපථ කලද එදායින් පසු ඇගේ පියා ඔහුව හැඳින්වූයේ 'පරක්කු වෙන ෆ්‍රේ උතුමානන්' යන නමිනි. යුද්ධයක් ඇති නොවනු ඇතැයි කැට්ලින් උනන්දුවෙන් ප්‍රාර්ථනා කලාය. එවැන්නක් ඇති වීමට කොහෙත්ම ඉඩ දිය නොහැක.

සීනු නාදය මැකී යද්දී සෙර් රඩ්‍රික් ඇය අසලට ආවේය. "අපට අද රෑ කන්ට ඕන නම් ඉක්මන් කරලා යන්ට වෙයි මගේ ආර්යාවනි."

"අපි බෙල්ල පහු කරනකම් ඔය නයිට්-ආර්යාව කතාව නැවැත්තුවොත් හොඳයි. සාමාන්‍ය සංචාරකයො විදියට ගියාම අවධානය ලැබෙන්නෙ අඩුවෙනුයි. අපි කියමු පවුලේ මොකක් හරි වැඩකට ගමනක් යන තාත්තෙකුයි දුවෙකුයි කියලා. මොකද කියන්නෙ?"

"ඔබ කැමැති විදියක් මගේ ආර්යාවනි." සෙර් රඩ්‍රික් එකඟ විය. එනමුදු කැට්ලින් ගේ සිනාහඬ නිසා තමා සිදු කල අත්වැරැද්ද ඔහුට අවබෝධ විය. "පරණ පුරුදු එහෙම ලේසියෙන් නැතිවෙලා යන්නෙ නෑ මගේ- මගේ දුවේ." සුපුරුදු ලෙස සිය උඩුරැවුල අතගෑමට ගියද එය දැන් අහිමිව ගිය බැව් මතක් වූයෙන් ඔහු කෝපයෙන් මෙන් සුසුමක් හෙලීය.

කැට්ලින් ඔහු ගේ බාහුව යටින් අතක් දැමුවා ය. "එන්ට තාත්තෙ. ඔයාට දකින්ට පුළුවන් වෙයි මාෂා හෙඩ්ල් බොහොම රහ කෑම මේසයක් ලෑස්ති කරලා තියෙන විදිය. හැබැයි වැඩිය එයාට ප්‍රශංසා කරන්ට යන්ට එපා. එයා හිනාවෙන විදිය දකින්ට ඔයා ආසා නැති වෙයි."

ආහාර ගන්නා ප්‍රධාන ශාලාව දිගු එකක් වූ අතර එහි එක් කෙලවරක දැවැන්ත පීප්ප රැසක් ද අනික් පස ගිනිඋඳුනක් ද විය.. වැඩකාර කොලුවෙක් දුම් දමන මස් දීසි ඔසවාගෙන එහාට මෙහාට දිව ගිය අතර මාෂා විට සපමින් පීප්ප වලින් බීර පුරවමින් සිටියා ය. නගර වැසියන්, ගැමියන් හා සියලුම ආකාරයේ සංචාරකයන්ගෙන් සැදි ජන සමූහයකින් බංකු පිරී ඉතිරී ගොස් තිබින. මෙවැනි මංසන්ධි තානායම් සෑමවිටම පාහේ විවිධාකාරයේ මිනිසුන් එකට හමුවන අපූරු ස්ථාන විය. කළු දම් පැහැ දෑත්වලින් යුතු රෙදි වර්ණ ගන්වන්නන් හා පිළි ගඳ හමන මාළුකාරයින්, හැඩිදැඩි මාංශපේශීන්ගෙන් හෙබි කම්මල්කරුවෙක් හා කෙට්ටු මහලු පූජකයෙක්, දරදඬු කුලී භේවායින් හා තරබාරු වෙළෙන්දන්, මේ සැවොම බංකු මත තෙරපී අසුන් ගෙන එකිනෙකා වෙත ඕපාදූප හුවමාරු කරගනිමින් උන්හ.

කැට්ලින් බලාපොරොත්තු වූවාටද වඩා වැඩි සෙබළුන් ප්‍රමාණයක්ද එහි අසුන් ගෙන සිටියහ. ගිනිමැලය අසල අසුන්ගෙන සිටි තිදෙනෙක් බ්‍රැකන් නිළ ලාංඡනය වන රතු පැහැ සෙන්ධවයාගේ සලකුණ පළඳා සිටියහ. නිල් පැහැ මුදු දම්වැල් සන්නාහයෙන් සැරසී රිදී පැහැ වානේ ශිරස්ක පැළැඳ සිටි විශාල කණ්ඩායමක් තවත් පසෙක වූහ. ඔවුන් ගේ උරහිසේ වූයේ තවත් සුපුරුදු සලකුණක් වූ ෆ්‍රේ වංශයේ ද්විත්ව බලකොටුව විය. ඇය පරීක්ෂාවෙන් ඔවුන් ගේ මුහුණු පිරික්සා බැලුවද ඇයව හඳුනා ගැනීමට තරම් ඔවුන් ලාබාල වැඩි විය. ඇය උතුරට යද්දී ඔවුන් අතර සිටි ජ්‍යෝෂ්ඨතම සෙබළා යාන්තම් බ්‍රැන් ගේ වයසේ වන්නට ඇත.

සෙර් රඩ්‍රික් විසින් කුස්සිය අසලට වන්නට පිහිටි මේසයක හිස් ඉඩක් සොයාගෙන තිබින. මේසයේ අනිත් පස වූ කඩවසම් තරුණයෙක් වීණාවක් සුසර කරමින් හුන්නේ ය. "ඔබලාට සප්තකයේම පිහිටයි! මගේ හොඳ මගියනි." ඔවුන් අසුන් ගනිද්දී තරුණයා කීවේය. ඔහුට ඉදිරියෙන් මේසය මත හිස් වයින් වීදුරුවක් විය.

"ඔබටත් එසේම වේවා!" කැට්ලින් පිළිතුරු දුන්නා ය. සෙර් රඩ්‍රික් පාන්, මස් හා බීර ගෙන එන්නැයි ඉල්ලා සිටියේ ය. ගායකයා, වසර දහඅටක පමණ වූ තරුණයා, ඔවුන් දෙස කෙලින් බලා ප්‍රශ්න රැසක් එකවර විචාලේ හරියට ඔහු ඒ කිසිවකට පිළිතුරක් බලාපොරොත්තු නොවන්නාක් තරම් ඉක්මනිනි. ඔවුන් පැමිණියේ කොහේ සිටද? ඔවුන් යන්නේ කොහේද? ඔවුන් දන්නා නවතම පුවත් මොනවාද? "අපි මීට සති දෙකකට විතර කලින් තමා කින්ග්ස් ලෑන්ඩින්ග්වලින් පිටත් වුනේ." කැට්ලින් මේ අතරින් පහසුම පැණයට මුලින්ම පිළිතුරු දුන්නා ය.

"මම එහාට තමා යන්නෙ." තරුණයා කීවේය. ඇය සැකකල පරිද්දෙන්ම ඔහු අනුන් ගේ විස්තර ඇසීමට වඩා තමන් ගේ විස්තර පැවසීමට වැඩි අභිරුචියක් දැක්වූවකු විය. ගායකයින් වනාහි අන් සියලුම දෙයට වඩා තමන් ගේ කටහඬ ඇසීමේ ආශාවෙන් පෙලෙන්නෝ වෙති. "හස්තයේ තරගාවලිය කියන්නෙ හොඳට සල්ලි තියෙන උසස් වංශාධිපතියන් එක් රැස් වෙන තැනක්. අන්තිම වතාවෙ මම එහෙන් පිටවෙලා ආවෙ උස්සන් යන්ටත් බැරි තරම් රිදී කාසි තොගයක් පුරවගෙනයි... ඇත්තෙන්ම කියනවා නම් මට එහෙම අරන් එන්ට තිබුනා මම ඒ ඔක්කොම රජුන් මරන්නා වෙනුවෙන් ඔට්ටු ඇල්ලුවෙ නැත්තං."

"සුදු කෙලින එකා දිහා දෙයියොවත් බලන්නෙ නෑ." සෙර් රඩ්‍රික් දැඩි ස්වරයෙන් කීවේය. ඔහු උතුරේ මිනිසකු වූ අතර ස්ටාර්ක්වරුන්ට මෙන්ම ඔහුටද තරගාවලීන් යනු අපථ්‍ය දෙයක් විය.

"දෙයියො මං දිහා රැවුවා තමා. ඒකනං ඇත්ත. ඔබේ නපුරු දෙයියොයි, කුසුම් නයිට්වරයායි තමා මගේ දවස කෑවෙ."

"කිසිම සැකයක් නෑ ඒක උඹට හොඳ පාඩමක් වෙන්ට ඇති." සෙර් රඩ්‍රික් කීය.

"ඇත්තෙන්ම. මම ඒකෙන් හොඳ පාඩමක් ඉගෙනගත්තා. මෙදා පාර මම ඔට්ටු අල්ලන්නෙ සෙර් ලෝරාස්ට."

සෙර් රඩ්‍රික් නැවත වතාවත් තමන්ට තවදුරටත් අහිමි උඩුරැවුල අතගෑමට තැත් කළේය. නමුදු මේ මොහොතේදී වැඩකාර කොලුවා කෑම දීසිද සමගින් ඔවුන් අභිමුවට පැමිණියේ ය. පාන් කැබලි සහිත පිඟන් ඔවුන් ඉදිරියෙන් තැබූ ඔහු ඒ මතට උණුසුම් මස් හා හොදි බෙදුවේ ය. තවත් දීසියක ලූණු, ගම්මිරිස් හා බදින ලද බිම්මල් විය. ඔවුන්ට බීර රැගෙන එන්නට කොලුවා නැවත පිටව ගිය අතර සෙර් රඩ්‍රික් මහත් අභිරුචියෙන් වැඩට බැස්සේ ය.

මැරිලියන්

"මගේ නම මැරිලියන්." ගායකයා කීවේ සිය වීණාවේ තතක් පිරිමදිමිනි. "කිසිම සැකයක් නෑ, ඔබලා මීට කලින් මම සෙල්ලම් කරනවා අහලා ඇති."

ඔහු ගේ මේ විසුළු කතා ස්වරූපය කැට්ලින්ව සිනා ගැන්වීමට සමත් විය. වින්ටර්ෆෙල් වැනි ඈත උතුරට ගායකයින් පැමිණියේ ඉතා කලාතුරකින් නමුදු රිවර්රන්හි ගෙවූ ළමා කාලය නිසා මෙවැනි ඉබාගාතේ යන ගායකයින් කෙබඳු අයදැයි මනා දැනුමක් ඈ සතු විය. "කනගාටුයි. අපට අහන්ට ලැබිලා නෑ."

ඔහු වීණාවේ තතක් පිරිමැද මෘදු රාවයක් නැංවීය. "ඒක බොහොම අවාසනාවන්ත දෙයක්. ඔබලා අහලා තියෙන හොඳම ගායකයා කවුද?"

"බ්‍රාවොස්වල ආලියා." සෙර් රඩ්‍රික් සැනෙන් කීවේය.

"ආහ්! ඒ නාකි හෝන්තුවට වඩා මම බොහොම ඉස්සරහින් ඉන්නෙ. ඔබලා ළඟ රිදී කාසියක් හෙම තියෙනවා නම් මට ඒක ඔප්පු කරලා පෙන්නන්ට පුළුවන්."

"මගේ ගාව තඹ කාසි කීපයක් නං ඇති. ඒත් උඹේ උඩුබිරීම් අහන්ට ඒක වියදම් කරනවාට වඩා ළිංපතුලකට වීසි කරලා දාන එක හොඳයි." සෙර් රඩ්‍රික් නෝක්කඩු ස්වරයෙන් කීවේය. ගායකයින් කෙරෙහි ඔහු තුළ ඇති අමනාපය ප්‍රකට කරුණක් විය. සංගීතය වනාහි ගැහැණු දරුවන්ට ගැලපෙන දෙයක් වන අතර මනා සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන ඕනෑම තරුණයෙක් අසිපතක් වෙනුවට වීණාවක් අතට ගන්නේ මන්දැයි යන්න ඔහුට සිතා ගත නොහැකි කරුණක් විය.

"ඔබේ සීයාට හරිම ඉක්මනට තරහ යනවනෙ." මැරිලියන් කැට්ලින්ට කීවේය. "මම හැදුවෙ ඔබට ගෞරවයක් කරන්ටයි. ඔබේ ලස්සන රූපයට පූජාවක් කරන්ටයි. ඇත්තෙන්ම කියනවා නම් මම ගැලපෙන්නෙ රජවරුන්ටයි උසස් වංශාධිපතීන්ටයි සිංදු කියන්ට."

"අපොයි! ඇත්තෙන්ම. මටත් ඒක පේනවා." කැට්ලින් කීවාය. "මං අහලා තියෙනවා ටලී උතුමානන් සිංදු අහන්ට හරිම මනාපයි කියලා. කිසිම සැකයක් නෑ ඔබ රිවර්රන්වලට ගිහිල්ලා ඇති."

"සියපාරක් විතර ගිහිල්ලා තියෙනවා. එයාලා එහෙ මං වෙනුවෙන් කාමරයක් වෙන් කරලා තියාගෙන ඉන්නෙ. තරුණ උතුමානන් හරියට මගේ සහෝදරයෙක් වගේ මට ආදරෙයි."

කැට්ලින්ට සිනා ගියේය. මේ කියමන ගැන එඩ්මුයර් කුමක් කියනු ඇත්දැයි ඇයට සිතුනි. ඇගේ සොයුරා ආදරය කල කාන්තාවක වරක් ගායකයෙකු විසින් සිය වසඟයට ගෙන තිබුනු අතර එදා සිට ඔහුට සියලුම ගායකයින් අරහං විය. "එතකොට වින්ටර්ෆෙල්?" ඇය ඇසුවා ය. "ඔබ උතුරේ සංචාරය කරලා නැද්ද?"

"ඒ මොකටද? එහෙ පිරිලා තියෙන්නෙ හිම කුණාටුවලිනුයි, වලස් හම් පොරවගත්තු මිනිස්සුන්ගෙනුයි විතරයි. වෘකයින්ගෙ උඩුබිරීම්වලට වඩා හොඳ සංගීතයක් රස විඳින්ට ස්ටාර්ක්ලා දන්නෙ නෑ."

කාමරයේ අනිත් පස වූ දොර මහ හඬක් නගමින් ඇරෙනු ඇයට යාන්තමින් මෙන් ඇසින.

"තානායම්කාරයො." ඇයට පිටුපසින් සේවකයකු ගේ හඬක් නැගින. "අපේ අශ්වයින්ට ඉස්තාලෙ සූදානම් කරන්ට. මගේ ස්වාමියා, ලැනිස්ටර් උතුමානන්ට කාමරේකුයි හොඳ උණුසුම් නාන බාල්දියකුයි ලෑස්ති කරන්ට."

"අනේ දෙයියනේ!" සෙර් රඩ්‍රික් ගේ මුවින් පිටවුනු අතර කැට්ලින් වහා අතක් විහිදා ඔහුව නිහඬ කලාය. ඇගේ අතැඟිලි ඔහු ගේ යටි බාහුව තදින් බදාගත්තේ ය.

මාෂා හෙඩ්ල් දෙකට නැවෙමින් සිනාසෙමින් ඉදිරියට ආවාය. "මට සමාවෙන්ට මයේ උතුමානනි. ඇත්තෙන්ම අපි සම්පූර්ණයෙන්ම පිරිලා. හැම කාමරයක්ම ගිහිල්ලා ඉවරයි."

එතැන මිනිසුන් සිවුදෙනෙකු සිටි බැව් කැට්ලින් දුටුවා ය. නිශා රැදුමේ කළු ඇඳුමින් සැරසුනු මහලු මිනිසෙක්, සේවකයින් දෙදෙනෙක්... සහ ඔහු. සිරුරින් කුඩා වුවද නිර්භීතව සිටගෙන සිටි ඔහු. "මගේ මිනිස්සුන්ට පුළුවන් උඹේ ඉස්තාලෙ නිදාගන්ට. මං ගැන බැලුවොත්, ඇත්තෙන්ම උඹට පේනවනෙ, මට එච්චර ලොකු ඉඩක් යන්නෙ නෑ." ඔහු සමච්චල් සහගත ස්වරයෙන් නියවී ය. "ගින්න උණුසුම් නං, පිදුරු මෙට්ටෙ මකුණෝ නැත්තං මට ඒ හොඳටම ඇති."

මාෂා හෙඩ්ල් මේ වන විට කැට්ලින් සමීපයෙන් සිටගෙන උන්නා ය. "මයෙ උතුමානනි. කිසිම ඉඩක් නෑ. ඒක මේ තරගාවලිය හන්දා. මම මොනවා කරන්නද?ආහ්..."

සිය පසුම්බියෙන් කාසියක් ඇදගත් ටිරියන් ලැනිස්ටර් එය හිසට ඉහළින් උඩ දමා නැවත අල්ලා ගත්තේ ය. කැට්ලින් අසුන් ගෙන සිටි මේ ඈත අන්තයේ වුව රන්කාසියේ දිස්නය පැහැදිලිව දිස් විය.

ගෙවී ගිය නිල් පැහැ සළුවක් පැළැඳසිටි නිදහස් අසරුවෙක් නැගිට සිටියේ ය. "ඔබතුමාව මගේ කාමරේට සාදරයෙන් පිළිගන්නවා මයෙ උතුමානනි."

"අන්න ඉන්නවා මොළේ තියෙන මනුස්සයෙක්." රන්කාසිය කාමරය හරහා පියාඹා ගිය අතර නිදහස් අසරුවා අත දිගුකර එය අල්ලා ගත්තේ ය. "ඒ වගේම බොහොම කඩිසර

මිනිහෙක්." කුරුමිට්ටා නැවත මාෂා හෙඩ්ල් දෙසට හැරුනි. "මම විශ්වාස කරනවා උඹට කෑම සපයන එක ප්‍රශ්නයක් වෙන එකක් නෑ කියලා?"

"ඔබතුමා කැමැති ඕනෑම දෙයක් මයෙ උතුමානනි. ඕනෑම දෙයක්." තානායම්පතිනිය පොරොන්දු වූවාය.

ලැනිස්ටර් යාබද මේස දෙස බැල්මක් හෙලුවේ ය. "උඹ මේ මිනිස්සුන්ට දෙන දේවල්ම මගේ මිනිස්සුත් කයි. දෙගුණයක් වැඩියෙන් ගෙනෙං. අපි බොහොම දුරකතර ගෙවාගෙනයි එන්නෙ. මට ගෙනෙං බැදපු වළිකුකුළෙක්, තාරාවෙක්, පරෙවියෙක් ඔය ඕන දෙයක්. ඒත් එක්කම උඹේ තියෙන හොඳම වයින් ගුරුලේත්තුවකුත් එවපං. යොරේන්, උඹ මගෙත් එක්ක වාඩිවෙලා කෑම කනවද?"

"එහෙමයි මයෙ උතුමානනි." කළු සොයුරා පිළිවදන් දුනි.

කුරුමිට්ටා ඔවුන් අසුන් ගෙන සිටි කාමරයේ ඈත කෙලවර දෙස බැලීමටවත් පමා නොවීය. තමන් දෙදෙනා අතර මිනිසුන්ගෙන් පිරුනු මේස කිහිපයක් පිහිටා තිබීම ගැන ඇය දෙවියන්ට පින් දෙද්දී මැරිලියන් හදිසියේම නැගිට සිටියේ ය. "මගේ ලැනිස්ටර් උතුමානනි." ඔහු කෑ ගැසුවේ ය. "ඔබතුමා කෑම කන අතරේ ඔබතුමාව පිනවන්ට මට අවසර දෙන්ට. ඔබතුමාගෙ පියාණන් කින්ග්ස් ලැන්ඩින්ග්වලදි ලබපු ජයග්‍රහණය ගැන කියැවෙන සිංදුවක් මම ගයන්නං."

"මගේ රෑ කෑම වේල විනාශ කරලා දාන්ට ඊට වඩා හපන් තවත් දෙයක් නෑ." කුරුමිට්ටා වියළි ස්වරයෙන් කීය. ඔහු ගේ අසමාන දෑස් මේ ගායකයාව මොහොතක් මැන බැලූයේ ඉවතට හැරී යන්නට ගොස්... කැට්ලින් මත නතර විය. ඔහු ප්‍රහේලිකාවකට මැදි වුනු ස්වරූපයෙන් මොහොතක් ඈ දෙස බලා සිටියේ ය. ඇය වහා සිය මුහුණ ඉවතට හරවා ගත්තද ඒ වන විට පමා වැඩි විය. කුරුමිට්ටා සිනහවක් පෑවේය. "ස්ටාර්ක් ආර්යාවනි. මේකනං කොහෙත්ම බලාපොරොත්තු නොවිච්ච සතුටක්." ඔහු කීය. "ඔබ වින්ටර්ෆෙල්වල හිටියෙ නෑ කියලා දැක්කම මට බොහොම කණගාටු දැනුනා."

මැරිලියන් මුව අයාගත්වන ඇ දෙස බැලුවේ ය. කැට්ලින් හෙමින් සීරුවේ සිය දෙපයින් සිට ගනිද්දී ඔහු ගේ මුහුණේ වූ ව්‍යාකූල බව නැතිව ගොස් ඒ වෙනුවට කෝපය එතැනට පැමිණියේ ය. සෙර් රඩ්‍රික් අවලාද ස්වරයෙන් මුමුනනු ඇයට ඇසින. 'මේ මිනිහා ප්‍රාකාරයේම නැවැතී සිටියානම්...' ඇය සිතුවේ ය.

"ස්ටාර්ක්... ආර්යාව...?" මාෂා හෙඩ්ල් ගොත ගැසුවා ය.

"මම අන්තිම වතාවෙ මෙහෙ නිදාගනිද්දි මට කිවුවෙ කැට්ලින් ටලී කියලා." ඇය තානායම්පතිනියට කීවා ය. සෙනඟ අතරින් නැඟුනු කටුකුටුවත්, තමා දෙසට එල්ල වූ දෑස් සමූහයත් ඇයට දැනින. කැට්ලින් කාමරය පුරා බැල්මක් හෙලුවා ය. නයිට්වරුන් හා අනිකුත් සෙබළුන් ගේ මුහුණු පරීක්ෂාවෙන් විමසා බැලුවා ය. සිය හද ගැහෙන වේගය අඩුකරලීමට මෙන් ගැඹුරු හුස්මක් ගත්තා ය. ඇයට එම අවදානම ගැනීමට අවශ්‍ය ද? ඇය ඊට සූදානම් ද? ඒ ගැන සිතා මතා කල් මැරීමට තරම් දැන් කාලයක් නොමැත. ඇයට ඇත්තේ මොහොතක් පමණි. ඇගේම කටහඬ සිය දෙසවන් තුළ රැවු දෙනු ඇයට ඇසින. "ඔබ, ඔය කෙලවරේ වාඩි වෙලා ඉන්න කෙනා." ඇය මෙතෙක් වේලා නොදුටු පසෙක සිටි මහලු මිනිසකු ඇමතුවා ය. "ඔබේ කබායෙ ඔය ගෙත්තම් කරලා තියෙන්නෙ හැරෙන්හෝල්වල කළු වවුලාද සෙර්?"

මහලු මිනිසා නැඟිට සිටියේ ය. "එහෙමයි මගේ ආර්යාවනි."

"වෙන්ට් ආර්යාව තවමත් මගේ තාත්තගෙ, රිවර්රන්වල හස්ටර් ටලී උතුමානන්ගෙ අවංක මිතුරියක්ද?"

"අනිවාර්යයෙන්ම." මිනිසා නිර්භීත තිර ස්වරයෙන් පිළිතුරු දුනි.

නිහඬවම නැගිට සිටි සෙර් රඩ්‍රික් සිය අසිපත කොපුවෙන් බුරුල් කලේ ය. කුරුමිට්ටා කිසිවක් සිතා ගත නොහැකි බැල්මෙන් ඇසිපිය ගසමින් ඔවුන් දෙස බලා සිටියේ ය. ඔහු ගේ අසමාන දෑස්වල ඇති ප්‍රහේලිකාත්මක බැල්ම ඇය දුටුවා ය.

"රතු සෙන්ධවයා කියන්නෙ රිවර්රන්වලට බොහොම ආදරයෙන් පිළිගන්න සලකුණක්." ඇය ගිනිමැලය අසල අසුන්ගෙන සිටි තිදෙනා අමතා කීවාය. "මගේ තාත්තා, ජේනස් බ්‍රැකන්ව පිළිගන්නෙ එයාගෙ බොහොම පැරණි, බොහොම පක්ෂපාතී යටත් වංශාධිපතියෙක් විදියටයි."

මිනිසුන් තිදෙනා අවිනිශ්චිත බැලුම් හුවමාරු කරගත්හ. "එතුමන්ගෙ විශ්වාසය ගැන අපේ උතුමානන් බොහොම සතුටු වේවි ආර්යාවනි." ඔවුන්ගෙන් එකෙක් අතීරණාත්මක ස්වරයෙන් පැවසී ය.

"ඔබේ තාත්තට මේ වගේ හොඳ යාළුවො ගොඩක් ඉන්න එක ඇත්තටම ඊරිසියා හිතෙන වැඩක්." ටිරියන් උපහාසාත්මක ස්වරයෙන් කීය. "ඒ වුනත් ඔබ මේ කරන්ට යන්නෙ මොකක්ද කියලානම් මට තේරෙන්නෙ නෑ ස්ටාර්ක් ආර්යාවනි."

ඔහුව නොතකා හැරි ඇය නිල්-අළු පැහැයෙන් සැරසී සිටි කණ්ඩායම වෙත හැරුනා ය. වඩාත්ම වැදගත් වන්නේ ඔවුන් බව ඇය දැන සිටියා ය. එතැන මිනිස්සු විස්සකට වඩා සිටියහ. "ඔබේ සලකුණත් මම හොඳට අඳුරනවා. ෆ්‍රේ උතුමානන්ගෙ ද්විත්ව බලකොටුව. ඔබලාගෙ උතුමානන් හොඳින්ද මහත්වරුනි?"

කණ්ඩායමේ කපිතාන් නැගිට සිටියේ ය. "වෝල්ඩර් උතුමානන් බොහොම හොඳ සනීපෙන් මගේ ආර්යාවනි. එතුමන්ගෙ අනූ වෙනි උපන්දිනේට අලුත් භාර්යාවක් සරණපාවා ගන්ටයි එතුමගෙ අදහස. ඒකට ඔබේ පියාටත් ආරාධනා කරලයි තියෙන්නෙ. එතුමා විවාහ මංගල උත්සවයට සහභාගි වෙලා අපට ගෞරව දක්වයි කියලා අපි බලාපොරොත්තු වෙනවා."

ටිරියන් ලැනිස්ටර් අවඥාවෙන් මෙන් හිකි හිකි ගා සිනාසුනි. ඔහු තමාට අයත් වූ බැව් කැට්ලින් ඒ මොහොතේ වටහා ගත්තා ය. "මේ මිනිහා ආගන්තුකයෙක් වගේ මගේ ගෙදරට ආවා. ඊට පස්සෙ, එහෙ ඉන්න ගමන් මගේ පුතාව, අවුරුදු හතක පොඩි කොල්ලාව මරන්ට කුමන්ත්‍රණය කලා." ඇය ටිරියන් දෙසට අතක් දිගුකරගෙන මුලු කාමරයටම ඇසෙන සේ නිවේදනය කලා ය. සෙර් රඩ්‍රික් අසිපත අතැතිව ඇය පසෙකින් සිට ගත්තේ ය. "රොබර්ට් රජතුමාගෙ නාමයෙන් හා ඔබලා සේවය කරන වංශාධිපති උතුමන්ගේ නාමයෙන් මම ඉල්ලා හිටිනවා, එයාව අත්අඩංගුවට අරන්, රජතුමාගෙ

**යුක්තිය ඉෂ්ට කරන්ට, වින්ටර්ෆෙල්වලට එයාව ආපහු අරන් යන්ට මට උදවු කරන්ටයි කියලා."**

**ඒ මොහොතේ ඇයට වඩාත්ම සතුට ගෙනාවේ එකාවන්ව කොපුවෙන් පිටතට ඇදුනු අසිපත් දුසිමක නාදය ද නොඑසේ නම් ටිරියන් ලැනිස්ටර් ගේ මුවේ ඇඳී තිබුනු බැල්ම ද යන්න ඇයට සිතා ගත නොහැකි විය.**

Ser Rodrik Cassel: “I might have a copper or two, but I’d sooner toss it down a well than pay for your howling.”

සන්සා 02-1

සන්සා, සෙප්ටා මෝර්ඩේන් සහ ජේන් පූල් සමගින් හස්තයේ තරගාවලිය නැරඹීම පිණිස පිටත් වූවාය. දෝලාව ආවරණය කර තිබුනු කහ පැහැ සේද තිර රෙදි කෙතරම් සිනිඳු වූවාද යත් ඇයට ඒ හරහා පිටත බැලිය හැකි විය. අවට බැලූ ඇයට මුලු ලෝකයම රනින් නිමවා ඇත්තාක් මෙන් පෙනෙන්නට විය. නගර ප්‍රාකාරවලට පිටින් ගංඉවුරේ මණ්ඩප සිය ගණනක් ගොඩනංවා තිබුනු අතර සාමානය වැසියන් දහස් ගණනක් පොදි කමින් තරග නැරඹීමට පැමිණ සිටියහ. මේ සියල්ලේ විභූතිය විසින් සන්සාට හුස්ම ගැනීමට පවා අමතක කර තිබින. ඉරඑළියේ දිදුලන සන්නාහ, රනින් හා රිදියෙන් අලංකෘත සෛන්ධවයන්, නරඹන්නන් ගේ ඔල්වරසන්, සුළඟේ ලෙලදෙන ධජපතාක… සහ නයිට්වරුන්. අන් සියල්ලටම වඩා නයිට්වරුන් ගේ දර්ශනය ඇයව වශීකෘත කොට තිබින.

"ඒක සින්දුවල කියැවෙනවාටත් වඩා ලස්සනයි." සිය පියා විසින් උසස් වංශවතුන් හා වංශාධිපතිනියන් අතරේ ඔවුන්ට වෙන් කර තිබුනු අසුන් මත තැන්පත් වෙමින් ඇය මිමිනුවා ය. සිය කෙහෙරැළිවල රතු-දුඹුරු පැහැය කැපී පෙන්වන අන්දමේ අලංකාර කොළ පැහැ ගවුමකින් ඇය එදින සැරසී සිටි අතර සැමදෙනාම තමා දෙස බලන බව වැටහුනු ඇය සතුටින් පිනා ගියාය. එකෙකුට එකෙක් නොපරදින තරමේ වීරයන්, ගී සැහැලි සිය ගණනක නම් කියැවෙන වීරයන් රැසක් පිටියට බසිනු ඔවුහු බලා සිටියහ. රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරුන් සත් දෙනාගෙන් ජේමි ලැනිස්ටර් හැරෙන්නට අන් සියල්ලෝම කිරි පැහැ කොරපොතු සන්නාහයෙන් හා අලුත වැටුනු හිම මෙන් සුදෝ සුදු පැහැ වූ සළුවලින් සැරසී උන්හ. සෙර් ජේමිද සුදු පැහැ සළුවක් පැළැඳ සිටි නමුදු හිසේ සිට දෙපතුලටම යනතෙක් රන් පැහැයෙන් සැරසී සිටියේ ය. ඔහු ගේ ශිරස්කය සිංහ හිසක හැඩයට සාදා තිබුනු අතර ඔහු ගේ අසිපත පවා රනින් නිමවී තිබින.

අසු පිට යන කන්ද හෙවත් සෙර් ග්‍රෙගර් ක්ලිගේන් ගිරිහිම නිපාතයක් මෙන් ගිගිරුම් දෙමින් ඔවුන් පසුකර ගියේය. මීට වසර දෙකකට පෙරාතුව වින්ටර්ෆෙල්හි ආගන්තුකයෙක් වශයෙන් පැමිණි යොන් රොයිස් උතුමානන් හෙවත් ලෝකඩ යොන් හඳුනාගැනීමට සන්සාට හැකි විය. "එයාගෙ සන්නාහය හදලා තියෙන්නෙ ලෝකඩින්. ඒක අවුරුදු දාස් ගානක් පැරණියි. ඒකෙ මායාකාරී අකුරු වගයක් කොටලා තියෙනවා එයාට සිද්දවෙන විපත්වලින් ආරක්ෂාව ලබා දෙන්ට." ඇය ජේන්ට කෙඳිරුවා ය. ඇඹිල්ල දිගු කල සෙප්ටා මෝර්ඩේන් රිදී හා දම් පැහැයෙන් සැරසුනු, සිය ශිරස්කයේ රාජාළි

පියාපත් දෙකක් සවි කරගත් ජේසන් මැලිස්ටර් උතුමානන්ව ඔවුන්ට පෙන්වූවා ය. ගංගා ත්‍රිශූලය අසල සටනේදී ඔහු විසින් රේගාර් ගේ ධජ දරන්නන් තිදෙනෙකු කපා බිම හෙලා තිබින. මුඩු කල හිසකින් යුත් සුළඟේ ලෙලදෙන රතු ලෝගුවකින් සැරසුනු රණකාමී පූජකයකු වූ ම(ර්)හි තොරෝස් දුටු දැරියන් දෙදෙනා කැකිරි පලන්නට වූහ. එහෙත් වරක් ජ්වලිත අසිපතක් අතින් ගත් ඔහු පයික් හි ප්‍රාකාර මත සිට සිය සතුරන් සමූල ඝාතනය කල අයුරු විස්තර කල සෙප්ටා ඔවුන් දෙදෙනාව නිහඬ කරන්නට සමත් වූවාය.

එහි ගමන්ගත් තවත් බොහෝ අසරුවන් සන්සා කොහෙත්ම දැන සිටියවුන් නොවූහ. අතැඟිලි සහ හයිගාර්ඩ්න් සහ ඩෝර්න් හි කඳුකරයේ සිට පැමිණි දෙවන පන්තියේ නයිට්වරුන්, නම නොදන්නා නිදහස් අසරුවන් හා අලුත උසස් කෙරුනු සහවරයින්, උසස් වංශාධිපතීන් ගේ බාල පුතුන් හා පහළ මට්ටමේ වංශාධිපති පවුල්වල උරුමක්කරුවන්. තරුණ මිනිසුන්. මේ අතරින් බොහොමයක් දෙනා මේ වනතෙක් තම නම කියැවෙන අන්දමේ දෙයක් කර නොතිබුනවුන් වූහ. එහෙත් මතු යම් දිනෙක රාජධානි සප්තකය පුරා ඔවුන් ගේ නම් කියැවෙනු ඇති බවට සන්සා හා ජේන් එකඟවූහ.

ග්‍රෙගර් ක්ලිගේන්

සෙර් බේලන් ස්වෝන්, බ්‍රයිස් කැරන් උතුමානන්, ලෝකඩ යොන් ගේ උරුමක්කරු වන සෙර් ඇන්ඩාර් රොයිස් හා ඔහු ගේ බාල සොයුරු සෙර් රොබාර්. සිය පියාණන් ගේ සන්නාහය හැඩ කල ඒ පුරාණ මායා අක්ෂර ඔවුන් දෙදෙනා ගේ රජතමය සන්නාහ මතද ලෝකඩින් කොටා තිබින. රෙඩ්වින් වංශ සලකුණ වන නිල් පසුබිමේ දම් පැහැ මිදි පොකුරකින් හැඩ කෙරුනු පලිස් දැරූ නිවුන් සොයුරන් දෙදෙනා, සෙර් හොරාස් සහ සෙර් හොබර්. ජේසන් උතුමානන් ගේ පුතණුවන් වන සෙර් පැට්‍රික් මැලිස්ටර්. ක්‍රොසින්ග් සිට පැමිණි ෆ්‍රේ වරුන් සයදෙනෙක්; සෙර් ජැරඩ්, සෙර් හොස්ටීන්, සෙර් ඩැන්වෙල්, සෙර් එමන්, සෙර් තියෝ සහ සෙර් පර්වින්. මේ සියලු දෙනාම වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් ගේ පුතුන් හා මුණුබුරන් වූහ. ඔහු ගේ අවජාතක පුතු මාර්ටින් රිවර්ස්ද ඒ අතර වූහ.

ගිම්හාන දූපත්වලින් පිටුවහල් කෙරුනු කුමරෙකු වන ජලබාර් ක්ෂෝ දුටු ජේන් පූල් බියපත් වූවාය. රාත්‍රිය මෙන් කළු පැහැ සිරුරකින් හෙබි ඔහු කොළ හා ලේ රතු පැහැ පිහාටුවලින් කෙරුනු කබායක් හැඳ සිටියේ ය. එනමුදු, කළු පසුබිමේ අකුණක සලකුණක් ඇති පලිසක් දැරූ, රතු රන් පැහැ හිසකෙසින් යුතු කඩවසම් තරුණ බෙරික් ඩොන්ඩරියන්

උතුමානන් දුටු ඈ එසැනින් ඔහු හා පෙමින් බැඳුනේ අද මේ මොහොතේ වුව ඔහු හා විවාහ වීමට තමා සූදානම් බැව් විලියෙන් රතුවෙමින් කියා සිටියා ය.

දඩබල්ලා ද තරගාවලියට ඇතුළත්ව සිටියේ ය. එමෙන්ම රජු ගේ සොයුරා වන ස්ටෝර්ම් එන්ඩ්හි උරුමක්කරු කඩවසම් රෙන්ලි බරතියන් උතුමානන්ද ඊට සහභාගි වූයේය. ජොරී, ඇලන් හා හාර්වින් වින්ටර්ෆෙල් සහ උතුර නියෝජනය කරමින් ඊට සහභාගි වූහ. "මේ අනිත් අයත් එකක් බලපුවහම ජොරී නිකං හිඟන්නෙක් වගේ." ඔහු ඔවුන් ඉදිරියෙන් යද්දී සෙප්ටා මෝර්ඩේන් හැඬුම් ස්වරයෙන් කීවාය. සන්සාට ඊට එකඟ නොවීමට හැකියාවක් නොවීය. ජොරී කිසිඳු අලංකාරයක් හෝ ආයිත්තමක් නොමැති චාම් නිල්-අළු පැහැ සන්නාහයක් පැළැඳ වැරහැල්ලක් මෙන් දිස් වූ සිනිඳු අළු පැහැ සළුවක් උරහිසේ දවටාගෙන සිටියේ ය. එනමුදු ඔහු මනාව සටන් වැදුනු අතර තම පළමු අසරු පොරයේදී සෙර් හොරාස් රෙඩ්වින් ද, දෙවන වටයේදී ෆ්‍රේ වරයෙක්ද අසුපිටින් බිම හෙලන්නට සමත් වූවේය. තෙවන වටයේදී ඔහු නිදහස් අසරුවෙකු වූ ලොතෝර් බෘන් හා තෙවරක් පොර වැටුනේ ය. දෙදෙනාගෙන් කිසිවෙකුත් තරගය පරාද නොවූ නමුදු ලොතෝර් ගේ ලන්ස පහරවල් වඩා හොඳින් ස්ථානගත වී තිබුනු බැවින් රජතුමා ඔහුට ජයග්‍රහණය පිරිනැමුවේ ය. ඇලන් හා හාර්වින් එතරම් සාර්ථකත්වයක් ලබන්නට සමත් වී නොතිබින. රාජ්‍යාරක්ෂක බලකායේ සෙර් මෙරින් විසින් මුල් වටයේදීම හාර්වින්ව අසුපිටින් බිම දැමූ අතර ඇලන් සෙර් බේලන් ස්වොන් හමුවේ පරාද විය.

අසරු පොරය මුලු දවස පුරාමත් සන්ධ්‍යාකාලය දක්වාත් ඇදී ගියේය. ඇවැන්ත යුධ සෛන්ධවයින් ගේ කුර පහරට හසුවූ තරග පිටිය දිනය නිමාවේදී මඩ ගොහොරුවක් මෙන් දිස් විය. අසරුවන් එකිනෙකාට එරෙහිව පොර වදිද්දී, ඔවුන් ගේ ලන්ස කැබලි වී යද්දී සන්සා හා ජේන් කිහිප වරක්ම එකාවන්ව බියෙන් කෑ ගැසූහ. තරගකරුවකු අසු පිටින් බිම වැටෙන සෑමවිටෙකම ජේන් කුඩා දැරියක මෙන් බියෙන් සිය සුරතින් දෑස් මුවා කරගත්තා ය. එනමුදු සන්සා සෑදී තිබුනේ ඊට වඩා දැඩි හැදියාවකින් වූ අතර උසස් කුලීන වංශාධිපතිනියක තරගාවලියකදී හැසිරිය යුත්තේ කෙසේදැයි ඇය දැන උන්නා ය. ඇගේ මේ තැන්පත් බව සෙප්ටා මෝර්ඩේන් ගේ පවා නිරීක්ෂණයට ලක් වී තිබුනු අතර ඇය ඊට අනුකූලතාව දක්වන අයුරින් හිස වැනුවා ය.

රජුන් මරන්නා අතිදක්ෂ අන්දමින් සිය අසු මෙහෙයෙවුවේ ය. ඔහු පුහුණුවීම්වල නියැලී සිටින්නාක් තරම් පහසුවෙන් සෙර් ඇන්ඩාර් රොයිස් හා බ්‍රයිස් කැරන් උතුමානන්ව අසු පිටින් බිම දැම්මේ ය. තෙවන වටයේදී ඔහුට මුනගැසුනේ පෙර වටයන්හිදී තමාට වඩා වසර තිහ හතලිහක් ලාබාල තරුණයන් පහසුවෙන්ම පරදවා තිබුනු සෙර් බැරිස්ටාන්

සෙල්මි විය. තරගය තියුණු මුහුණුවරක් ගත් නමුදු අවසන සෙර් ජේමි ජය ලබන්නට සමත් විය.

ජේමි ලැනිස්ටර්

සැන්ඩෝර් ක්ලිගේන් හා ඔහු ගේ දැවැන්ත සොයුරා සෙර් ග්‍රෙගර්ද කිසිවෙකුටත් නැවැත්විය නොහැකි තරගකරුවන් දෙදෙනෙකු වූහ. ඔවුන් දෙදෙනාම එකෙකුට එකෙක් නොපරදින තරම් දරුණු චණ්ඩ අයුරින් සිය ප්‍රතිවාදීන් බිම දැමීමට සමත් වී තිබින. දිනයේ අවාසනාවන්තම සිදුවීම සෙර් ග්‍රෙගර් ගේ දෙවන තරගයේදී සිදුවිය. ඔහු ගේ ලන්සය සිය ප්‍රතිවාදියා වූ මිටියාවතේ සිට පැමිණි තරුණ නයිට්වරයෙකු ගේ ශිරස්ක පටියට යටින් එල්ල වූ අතර පහරේ දැඩිකම කෙතරම් වීද යත් ගෙල පසා කරගෙන ගිය ලන්සය ඔහුට ක්ෂණික මරණයක් ගෙන දුන්නේ ය. තරුණයා ඇදවැටුනේ සන්සා අසුන් ගෙන සිටි තැනට අඩි දහයක වත් නොවූ දුරකිනි. සෙර් ග්‍රෙගර් ගේ ලන්සයේ කැඩුනු තුඩ ඔහු ගේ ගෙලේ ඇමිනී තිබුනු අතර හෘද ස්පන්දනය කෙමෙන් වියැකී යද්දී ඔහු ගේ ජීවන රුධිරය ඒ හා සමගාමීව සෙමින් පිටතට ගලා ආවේය. අලුතෙන්ම වැඩ නිමකල ඔහු ගේ සන්නාහය ගිනිදළු මෙන් හිරු එළියේ දිදුලන්නට වූයේය. ඔහු ගේ සළුව ගිම්හානයේ අහසක් මෙන් තද නිල් පැහැ වූ අතර එහි වාටි සුදු පැහැ අඩසඳ හැඩවලින් වැඩ දමා තිබින. එනමුදු කෙමෙන් රුධිරයෙන් තෙත්වද්දී මේ සළුව අඳුරු පැහැ ගැන්වුනු අතර අඩසඳවල් එකින් එක රත් පැ ගැන්වින.

ජේන් පූල් කෙතරම් තදින් හඬා වැටුනාද යත් ඇයව සැනසීම පිණිස පිටතට රැගෙන යන්නට සෙප්ටා මෝර්ඩේන්ට සිදු විය. එනමුදු සිය උකුළ මත දෑත් බැඳගත් සන්සා වශීකරණයකින් මෙන් ඒ දෙස බලා සිටින්නට විය. මිනිසකු මිය යන ආකාරය ඇය මින් පෙර කිසිදා දැක නොතිබින. තමාද හැඬිය යුතුයැයි ඇයට කල්පනා වුවද සිය දෑසට කඳුළු පුරවා ගන්නට ඇය අසමත් විය. සමහරවිට සිය කඳුළු සියල්ල ඇය ලේඩි හා බ්‍රැන් වෙනුවෙන් වැය කර තිබුනා වන්නට ඇත. සමහරවිට ඒ ජොරී හෝ සෙර් රඩ්‍රික් හෝ සිය පියා වූවා නම් තත්ත්වය වෙනස් වන්නට තිබුනු බැව් ඇය තමාටම කියා ගත්තා ය. මේ තරුණ නයිට්වරයා ඇය නොදන්නා ආගන්තුකයකු විය. ඔහු ගේ නම පවා ඇයට අමතකව ගොසිනි. හෙට වන විට මුලුමහත් ලෝකයටම ඒ නම අමතකව යන බැව් සන්සා වටහා ගත්තා ය. ඔහු ගේ නමින් කිසිවෙකු කවදාවත් ගීයක් නොලියනු ඇත. ඔහු ගේ නමින් කිසිවකු කවදාවත් ගීයක් නොගයනු ඇත. එය සැබැවින්ම දුක්බර අවසානයක් විය.

සේවකයින් විසින් මළකඳ ඉවත ගෙන ගිය පසු ඉස්කෝප්පයක් රැගෙන පැමිණි කොලුවකු විසින් ඔහු වැටී සිටි තැන රුධිර පැල්ලම් මැකෙන සේ ඒ උඩින් පස් දමන ලදී. ඉන්පසු සුපුරුදු පරිදි අසරු තරග නැවත ආරම්භ කෙරින.

සෙර් බේලන් ස්වෝන්, ග්‍රෙගර්ට ගොදුරු වුනු අතර රෙන්ලි උතුමානන් දඩබල්ලාට පරාද විය. රෙන්ලි කෙතරම් තදින් තම අසු පිටින් වැටුනාද යත් ඔහු පසුපසට පියාඹා යන්නාක් මෙන් දිස් විය. ඔහු ගේ හිස යමක් බිඳී යන 'ක්‍රැක්' හඬක් නගමින් බිම වැදුනු අතර නරඹන්නෝ ඉහළට ඇදගත් හුස්ම පහළ හෙලා ගැනීමට නොහැකිව ත්‍රාසයෙන් ඒ දෙස බලා සිටියහ. එනමුදු ඒ කැඩී ගොස් තිබුනේ ඔහු ගේ ශිර්ස්කයේ සවි කර තිබුනු රන්වන් ගෝන අඟක් පමණක් වූ අතර ඔහු දෙපයින් නැගී සිටිද්දී තරග නැරඹීමට පැමිණ සිටි සාමාන්‍ය ජනයා ප්‍රීතියෙන් ඔල්වසරන් දුන්හ. රොබර්ට් රජු ගේ කඩවසම් බාල සොයුරා මිනිසුන් අතර බෙහෙවින් ජනප්‍රිය අයකු විය. කැඩී ගිය රන්වන් අං දළුව ඔහු දයාන්විත හිස නැමීමක් සමගින් ජයග්‍රාහී දඩබල්ලාට පිරිනැමූයේ ය. උගුරෙන් හඬක් නැගූ දඩබල්ලා ඒ අං දළුව මිනිසුන් අතරට වීසි කර දැමූයෙන් එය අහුලා ගැනීම සඳහා නරඹන්නන් අතර ගැටුමක් ඇති විය. අන්තිමේදී රෙන්ලි උතුමානන්ටම ඔවුන් අතරට ගොස් ඒ ගැටුම සන්සිඳවන්නට සිදු විය. මේ වනවිට සෙප්ටා මෝර්ඩේන් නැවතත් පැමිණ සිටියා ය. ජේන් ගේ තත්ත්වය අයහපත් වූයෙන් ඇයව නැවත බලකොටුව වෙත පිටත් කර හැරීමට සිදුව තිබින. එනමුදු මේ වනවිට සන්සාට ජේන්ව සහමුලින්ම අමතකව ගොස් තිබින.

තොරෝස්

බෙරික් ඩොන්ඩරියන් ගේ අසු දෙවන පෙළ නයිට්වරයකු අතින් මරණයට පත් වූ අතර ඒ නිසා ඔහු අවමානයට පත් වූ අතර තරගාවලියෙන් ඉවත් කර දැමිනි. සිය සෑදලය නව අසකු පිටට මාරු කරගත් බෙරික් උතුමානන් නැවත තරග බිමට ප්‍රවිශ්ට වූ නමුදු ම(ර්)හි තොරෝස් අතින් පරාජයට පත් විය. සෙර් ආරොන් සැන්ටගාර් හා ලොතෝර් බෲන් ජයපැරදුමක් නොමැතිව තෙවරක් පොර වැටුනහ. ඉන්පසු වටයේදී සෙර් ආරොන්, ජේසන් මැලිස්ටර් උතුමානන් අතින් පැරදුනු අතර ලොතෝර් බෲන් යොන් රොයිස් ගේ බාල පුතණුවන් වන රොබාර්ට ගොදුරු විය. අවසානයේදී තරගකරුවන් සිවුදෙනෙක් ඉතිරි වූහ; දඩබල්ලා සහ ඔහු ගේ දැවැන්ත සොහොයුරා ග්‍රෙගර්, සෙර් ජේමි ලැනිස්ටර් හා සෙර් ලෝරාස් ටිරල් ඒ සිවුදෙනා වූහ.

කුසුම් නයිට්වරයා නමින් හැඳින්වෙන සෙර් ලෝරාස් වනාහි හයිගාර්ඩන්හි උතුමානන් සහ දකුණේ ආරක්ෂකයා වන මේස් ටිරල් ගේ බාලම පුතණුවන් විය. දහසය වැනි වියේ පසු වූ ඔහු පිටියට බට තරගකරුවන් අතරින් ලාබාලතමයා වුවද එදා උදෑසන සිය පළමු තරග වට තුනේදීම රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරුන් තිදෙනෙකු පරදවන්නට සමත්ව තිබින. මෙතරම් ලස්සන තරුණයකු සන්සා මින් පෙර කිසිදිනෙක දැක නොතිබින. ඔහු ගේ සන්නාහය සංකීර්ණ ලියවැලින් හා මල්කමින් සරසා තිබුනු අතර ඔහු ගේ හිම මෙන් සුදු පැහැ සෙන්ධවයා රතු හා සුදු පැහැ රෝස මල් ගවසා හැඩ කල පොරෝණයකින් ආවරණය කර තිබින. සෑම තරග ජයග්‍රහනයකින්ම පසුව සිය ශිරස්කය ඉවත් කල සෙර් ලෝරාස් සෙමින් පිටිය වටා ගොස් අන්තිමේදී පිරිස අතර සිටින තෝරාගත් රූමත් තරුණියකට එයින් ගලවාගත් සුදු පැහැ රෝස මලක් පරිත්‍යාග කලේය.

ඔහු ගේ අවසන් ප්‍රතිවාදියා වූයේ රොබාර් රොයිස් විය. සෙර් රොබාර් ගේ සන්නාහයේ කොටා තිබුනු පුරාණ මායා අක්ෂර ලෝරාස් ගේ ප්‍රහාරයෙන් ඔහුව ගලවා ගන්නට අසමත් විය. ඔහු ගේ පලිහ දෙපළු කල සෙර් ලෝරාස් ඔහුව කෙතරම් තදින් අසු පිටින් ඇද දැමුයේද යත් රොබාර් මහත් හඬක් නගමින් බිම හොත්තේ ය. ලෝරාස් සිය සුපුරුදු වටය යාම ඇරඹූ අතර රොබාර් කෙඳිරිගාමින් බිම වැටී සිටියේ ය. අන්තිමේදී ගිලන් මැස්සක හොවා ඔහුව සිය කූඩාරමට ඔසවාගෙන යාමට සේවකයින්ට සිදු විය. සන්සා මේ කිසිවක් නොදුටු අතර ඇගේ දෑසේ වශියකින් මෙන් සෙර් ලෝරාස් මත ඇලී තිබින. අන්තිමේදී සුදු පැහැ සෙන්ධවයා ඇ ඉදිරිපිට නතර වූ විට සිය හදවත පුපුරා යන්නට එතැයි ඇය බියපත් වූවාය.

අනිකුත් තරුණියන්ට සුදු රෝස මල් තිළිණ කල නමුදු මෙවර ඇය වෙනුවෙන් ඔහු තෝරාගත්තේ රතු රෝස මලකි. "ආදරණීය ආර්යාවනි, මේ කිසිම ජයග්‍රහණයක් ඔබෙන් අඩක් තරම්වත් ලස්සන නෑ." ඔහු ගේ නිර්භීත බව නිසා ගොළු වී ගිය මුවින් යුතු සන්සා බයාදු ලෙසින් රෝස මල අතට ගත්තා ය. ඔහු ගේ කැරළි ගැසුනු කෙහෙරැළි දුඹුරු පැහැයෙන් දිදුල අතර ඒ දෑස් රන්වන් දියරයක් මෙන් බැබලින. සෙර් ලෝරාස් පිටව ගොස් බොහෝ වේලාවක් යනතුරුත් ඇය රෝස මලේ සුවඳ විඳිමින් උන්නා ය.

ලෝරාස් ටිරල්

අන්තිමේදී සන්සා හිස එසවූ විට මිනිසෙක් ඇය අසලින් සිටගෙන ඇ දෙස බලා සිටියේ ය. ඔහු කොට, උල් යටි රැවුලක් ඇති, හිසකෙස් මත රිදී පැහැ වයිරමක් සහිත සිය පියා තරම්

වයස්ගත පුද්ගලයකු විය. "ඔබ එයාගෙ දුවෙක් වෙන්ට ඕනමයි." ඔහු කීවේ ය. ඔහු සිනාසුනු නමුදු ඒ අළු-කොළ පැහැ දෑසේ එම සිනාවේ සේයාවකදු දැකිය නොහැකි විය. "ඔබට තියෙන්නෙ ටලී පෙනුම."

"මම සන්සා ස්ටාර්ක්." ඇය නොසන්සුන් ස්වරයෙන් කීවාය. මේ මිනිසා පැළැඳ සිටි ලොම් කොලරයක් සහිත සනකම් සළුව රිදියෙන් කල කවට කුරුල්ලකු ගේ රූපයක් මගින් උරහිසේ රඳවා තිබින. එමෙන්ම ඔහුට උසස් වංශාධිපතියකුට අනායාසයෙන්ම හිමිවන අන්දමේ ගාම්භීර පෙනුමක්ද හිමිව තිබින. එනමුදු මේ කවුදැයි සන්සා නොදැන සිටියා ය. "මට සමාවෙන්ට. ඒ වුනත් ඔබතුමාව මුනගැහීමේ ගෞරවය මට හිමිවෙලා නෑ උතුමානනි."

සෙප්ටා මෝර්ඩේන් විගසින් ඇයව ගලවා ගත්තා ය. "ඇයි දරුවෝ, මේ ඉන්නෙ රජතුමාගෙ උපදේශක සභාවෙ පෙටයර් බේලිෂ් උතුමානන්."

"ඔබේ අම්මා වරක් මගේ සුන්දරත්වයේ රැජිණ වෙලා හිටියා." මිනිසා මෘදු ස්වරයෙන් කීවේය. "ඔබට තියෙන්නෙත් එයාගෙ කෙස් කළඹමයි." ඇගේ දුඹුරු පැහැ කෙස් රොදක් ස්පර්ශ කරද්දී ඔහු ගේ අතැඟිලි කම්මුලේ ගැටින. හිටි අඩියේම ආපසු හැරුනු ඔහු පිටව ගියේ ය.

මේ වනවිට සඳ නැග තිබුනු අතර නරඹන්නෝ වෙහෙසට පත්ව සිටියහ. එමනිසා අවසන් අසරු තරග තුන හෙට උදෑසන මිශ්‍ර සටනට පෙරාතුව පැවැත්වෙන බැව් රජතුමා නිවේදනය කලේය. සාමාන්‍ය ජනතාව අද දවසේ අසරු පොර හා හෙට පැවැත්වීමට නියමිත සටන් ගැන කතාබහ කරමින් නිවෙස් බලා යද්දී වංශාධිපතීන් ගංඉවුරේ රාත්‍රී භෝජන සංග්‍රහය වෙනුවෙන් රැස් වූහ. දැවැන්ත ඔරොක්සයන් සයදෙනෙකු පැය ගනනාවක් තිස්සේ සෙමින් සෙමින් බැදෙමින් තිබුනු අතර සේවකයෝ ඒ මත බටර් හා අනිකුත් සුවඳකාරකයන් තවරමින් සිටියහ. මණ්ඩපවලට පිටතින් දිග මේස හා බංකු පෙළ ගස්වා තිබුනු අතර ඒ මත අලුත බදින ලද පාන්, ස්ට්‍රෝබෙරි, ස්වීට්ග්‍රාස් සහ තවත් නොයෙකුත් දෑ ගොඩගසා තිබින.

රජතුමා සිය රැජිණ සමගින් අසුන් ගෙන සිටි උස් වේදිකාවේ ඔවුන්ට වම්පසින් සන්සා හා සෙප්ටා මෝර්ඩේන් වෙනුවෙන් අසුන් පිළියෙල වී තිබින. ඇගේ දකුණුපසින් ජොෆ්රි

කුමරා අසුන් ගත් විට සිය හුස්ම හිරවී යන්නාක් මෙන් ඇයට දැනින. ගංගා ත්‍රිශූලයේ සිදු වූ අවාසනාවන්ත සිදුවීමෙන් ඔහු තවමත් ඇය හා එක වදනක්වත් දොඩා නොතිබුනු අතර ඔහුට කතා කිරීමට තරම් දිරි වඩා ගැනීමට ඇයට හැකියාවක් නොවීය. ඔවුන් ලේඩිට සිදු කල දේ නිසා කමා ඔහුට වෛර කරන්නේ යැයි සන්සා මුලින් සිතුවා ය. එනමුදු සිය දෑසේ කඳුළු සිඳී යනතෙක් හැඬූ පසු සිදු වූ දේ සම්බන්ධයෙන් ජොෆ්රි අත වරදක් නැතැයි ඇය තමාටම කියා ගත්තා ය. ඇත්තෙන්ම ඔහු අත වරදක් නැත. ඒ සැමෙකක්ම රැජිණ විසින් සිදු කරන ලද ඒවාය. වෛර කල යුත්තේ ජොෆ්රිට නොව රැජිණටය. ඇයට හා ආර්යාට ය. ආර්යා නොසිටියා නම් මේ කිසිවක් සිදු වන්නේ නැත.

අද රෑ නම් ඇයට කෙසේවත්ම ජොෆ්රිට වෛර කරන්නට හැකියාවක් නොතිබින. ඔහු එතරම්ම ලස්සන වූයේය. ඔහු අද රෑ රන්වන් සිංහ හිස් ගෙත්තම් කොට අලංකාර කරන ලද තද නිල් පැහැ කබායක් හැඳ සිටියේ ය. ඔහු ගේ හිස වටා රනින් හා ඉඳුනිල් මිණෙන් නිමවූ කුඩා ඔටුන්නක් විය. ඔහු ගේ කෙහෙරැළි ඔප දැමූ වානේ මෙන් දීප්තිමත් විය. ඔහු දෙස බැලූ සන්සා වෙවුලා ගියේ, ඔහු තමාව නොතකා හරිනු ඇතැයි හෝ තමාට නැවතත් නපුරු අයුරින් සලකනු ඇතැයි හෝ යන බියෙනි.

එහෙත් ජොෆ්රි, ගී සැහැලි වල කියැවෙන අනිත් ඕනෑම කුමරුවෙකු තරම්ම නිර්භීත අයුරින් සිනාසී ඇගේ අත සිපගත්තේ ය. "සෙර් ලෝරාස්ට ලස්සන දකින්ට පුළුවන් බොහොම හොඳ ඇහැක් තියෙනවා මගේ ආදරණීය ආර්යාවනි."

"එයා ඕනවටත් වඩා කරුනාවන්ත වුනා." සන්සා විරෝධාත්මක ස්වරයෙන් මෙන් කීවේ විනීත වීමට උත්සාහ දරමිනි. එනමුදු ඇගේ හදවත ගී ගයමින් නටමින් සිටියේ ය. "සෙර් ලෝරාස් නියමම නයිට්වරයෙක්. ඔබ හිතනවාද හෙට තරගයෙන් එයා දිනාවි කියලා මගේ ස්වාමිනී?"

"නෑ." ජොෆ්රි කීවේය. "මගේ බල්ලා එයාව පරද්දයි. නැත්තං මගේ මාමා ජේමි. තව අවුරුදු කීපයක් ගියාම, මටත් තරගවලට ඇතුළුවෙන්ට පුළුවන් වුනාම මම ඔය හැමෝවම පරද්දනවා." අත ඔසවා සේවකයෙකුට සන් කල ඔහු සමර්වයින් ගුරුලේත්තුවක් ගෙන්වාගෙන ඇය වෙනුවෙන් කුසලාණක් පිරෙවුවේ ය. ඇය වියවුල් සිතින් සෙප්ටා මෝර්ඩේන් දෙස බැලුවා ය. එනමුදු ඇ දෙසට නැඹුරු වූ ජොෆ්රි ඇගේ කුසලාණද පිරවූයෙන් සෙප්ටා ජොෆ්රිට ස්තූති කර අන් කිසිවක් නොකියා නිහඬ වූවාය.

Sandor Clegane: “I am no knight. I spit on them and their vows.”

සේවකයින් මුලු රය පුරාම ඔවුන් ගේ කුසලාණ පිරවූහ. එනමුදු තමා කෙතරම් වයින් බිවුවාද නැතිනම් නොබිවුවාද යන්න සන්සාට සිතා ගත නොහැකි කරුනක් විය. ඇයට සැබැවින්ම මත් වීම පිණිස වයින් අවශ්‍ය නොවීය. අද රාත්‍රියේ තිබුනු මායාවී බව නිසාම ඇ මත් වී සිටියා ය. එහි අලංකාරය නිසාම තෝන්තු වී සිටියා ය. සිය ජීවිත කාලය පුරාම සිහින දුටු එහෙත් කිසිදා තමාට සහභාගි වීමට අවස්ථාවක් ලැබෙයැයි නොසිතූ මේ ආනන්දජනක උත්කර්ෂය නිසා මෝහනය වී සිටියා ය. රජතුමා ගේ මණ්ඩපය ඉදිරියේ වාඩිගත් ගායකයෝ හා වාදකයෝ සන්ධ්‍යාව මධුර මනෝහර සංගීතයෙන් පුරවාලමින් හුන්හ. විජ්ජාකරුවෙක් ගිනි පන්දම් රැසක් උඩ දමමින් වටයට කරකවමින් සිටියේ ය. රජතුමා ගේ විහිළුකාරයා වන නොවැඩුනු මනසකින් යුත් මූන් බෝයි, බම්මනෙකු ගේ ඇඳුමකින් සැරසී සැමටම විහිළු කරමින් සිටියේ ය. ඔහු කෙතරම් නිපුන අන්දමින්, කෙතරම් කුරිරු අන්දමින් මිනිසුන්ව සරදමට ලක් කලේද යත් ඔහු ඇත්තටම මන්දබුද්ධිකයෙකුදැයි සන්සා සැක කලාය. සෙප්ටා මෝර්ඩේන් පවා ඔහු ගේ විකාර නිසා විනෝද වූවාය. ඔහු නායක පූජකතුමා ගැන කී විහිළු සින්දුව අසා ඇය කෙතරම් තදින් සිනාසුනාද යත් සුරතෙහි වූ වයින් කුසලාණද සිරුර මත හලාගත්තා ය.

එමෙන්ම ජොෆ්රි සංග්‍රහශීලීත්වයේ උල්පත බඳු විය. ඔහු සන්සා සමග කතා කරමින් මුලු රැයම ගෙවා දැමීය. ඇයව ප්‍රශංසා සහ වර්ණනාවලින් නහවමින්, ඇයව සිනා ගස්සමින්, රාජසභාවේ ඕපාදූප ඇයට කියමින්, මූන් බෝයි ගේ විහිළුවල අරුත ඇයට පහදමින් ඇයව කුල්මත් කලේය. මේ සියල්ල අතරට මැදි වූ සන්සාට සිය ආචාරශීලීත්වය පවා අමතකව ගොස් තිබුනු අතර තමාට වම්පසින් අසුන් ගෙන සිටි සෙප්ටා මෝර්ඩේන්ව මුලුමනින්ම මෙන් නොතකා හැරියා ය.

මේ සියල්ල අතරමැද ආහාර බඳුන් එකින් එක යමින් එමින් තිබ්බින. බාර්ලි හා මුව මස්වලින් සැදුනු සූපයක්. ස්වීට්ග්‍රාස්, නිවිති හා වියළි මිදි මිශ්‍ර කර ඒ මත්තෙහි රටකජු කුඩු ඉස සකස්කල සලාදයක්. මී පැණියෙහි හා සුදුලූණුවල බහා ලූ ගොළුබෙල්ලන්. සන්සා මීට පෙර කිසිදිනෙක ගොළුබෙල්ලන් අනුභව කර නොතිබ්බින. ගොළුබෙල්ලාව කටුවෙන් වෙන් කරගන්නේ කෙසේදැයි ජොෆ්රි ඇයට පෙන්වා දුන් අතර පළමු රසවත් කට සියතින්ම ඇයට කැවුවේ ය. මැටිවල බහා පිළිස්සූ ගඟෙන් අල්ලාගත් ට්‍රවුට් මසුන් ඉන්පසු

පැමිණියේ ය. සනකම් වූ පිටත මැටි කටුව බිඳ ඇතුළත සුදු මස පාදාගැනීමට ඇගේ කුමරුවා ඇයට උදවු කලේය. අන්තිමේදී මාංශ පලංගාන පැමිණිවිට සියතින්ම කැපූ විශාල මස් කුට්ටියක් ඔහු සිනාසෙමින් ඇගේ පිඟානට බෙදුවේ ය. ඔහු ගේ දකුණු අත තවමත් හොඳින් සුව වී නොමැති බව ඔහු සුරත පාවිච්චි කරන ආකාරයෙන් ඇය වටහා ගත්තා ය. එනමුදු ඒ ගැන ඔහු වදනකිනුදු පැමිණිලි නොකලේ ය.

මේ හැමටම පසුව අතුරුපස පැමිණියේ ය. සීනි තැවරූ ලෙමන් කේක්, කුරුඳු යොදා සුවඳවත් කරන ලද පැළඟු ඇපල්, පරෙවි පයි සහ තවත් නොයෙකුත් දේ ඒ අතර විය. එනමුදු මේ වනවිට සන්සාගේ උදරය කෙතරම් පිරී තිබුනේද යත්, ඇය කෙතරම් ආසා කලද කුඩා ලෙමන් කේක් දෙකකට වඩා යමක් ඇයට අනුභව කල නොහැකි විය. තවත් ලෙමන් කේක් කැබැල්ලකට වග කියම්දෝ නොකියම්දෝයි දෙගිඩියාවෙන් මෙන් ඇය වදවෙමින් සිටියදී රජතුමා කෑ ගසන්නට පටන් ගති.

පැමිණෙන සෑම ආහාර වේලක් පාසාම රොබර්ට් රජතුමා ගේ හඬ වඩවඩාත් උස් වෙමින් පැවතිනි. විටින් විට ඔහු කිසියම් විහිළුකට මහහඬින් සිනාසෙන හඬ හෝ යම් අණක් නිකුත් කරන හඬ හෝ පිඟන් මත හැඳි ගැරුප්පු ගැටෙන හඬ හෝ සන්සාට ඇසී තිබින. එනමුදු ඔහු කියන දෙය වටහාගැනීමට තරම් ළඟක ඇය නොසිටියේ ය.

එසේ වුවද, දැන් ඔහුව සෑම දෙනාටම ඇසින. "නෑ." අන් සියළු හඬවල් මැකී යන ගර්ජනාවකින් ඔහු බිරුසන් දුන්නේ ය. රතු වී ගිය මුහුණින් යුතුව, දෙපසට වැනෙමින් දෙපයින් සිටගෙන සිටි රජතුමා දුටු සන්සා ත්‍රාසයට පත් වූවාය. ඔහු ගේ එක් අතක වයින් පූකුරුවක් තිබුනු අතර ඔහු මිනිසකුට විය හැකි උපරිම අන්දමින් බීමත්ව සිටියේ ය. "මං කරන්ට ඕන මොකක්ද කරන්ට ඕන නැත්තෙ මොකක්ද කියලා උඹ කියලා දෙන්ට ඕන නෑ ගෑනියෙ." ඔහු සෙර්සි රැජිණට කෑ ගැසුවේ ය. "මමයි මෙතන රජා. උඹට තේරුනාද? මමයි මෙතන පාලනය කරන්නෙ. මම කියනවානං මම හෙට සටන් කරනවා කියලා මම හෙට සටන් කරනවා!"

සැමදෙනාම ඒ දෙස බලා සිටියහ. සෙර් බැරිස්ටාන්, රජු ගේ සොහොයුරා රෙන්ලි, ඇයට අද සවස අමුතු අන්දමින් කතා කල අර කොට මිනිසා ආදීන් එහි වුවද ඒ කිසිවෙකුත් සිද්දියට මැදිහත් වන්නට සිතූ බවක් නොපෙනින. රැජිණ ගේ මුහුණ හිමෙන් කල කැටයමක් පරිද්දෙන් ලේ සිඳී ගොස් සුදුමැලිව ගොස් තිබින. මේසයෙන් නැගිට සිටි ඇය

සිය දිගු සායද ඔසවාගෙන, පිටුපසින් පිරිවරාගත් සේවකයින්ද කැටුව, නිහඬවම පිටව ගියාය.

ජේමි ලැනිස්ටර් රජතුමා ගේ උරහිස මත අතක් තැබූ අතර රජතුමා ඔහුව වැරෙන් තල්ලු කර දැමීය. පා පැකිළුනු ලැනිස්ටර් බිම ඇද වැටින. රජතුමා කොක්හඬලා සිනාසුනේ ය. "මහ ලොකු නයිට්වරයා. මට තාමත් උඹව බිම දාන්ට පුළුවන්. ඒක මතක තියාගනිං රජුන් මරන්නො." ඔහු අතේ තිබුනු පූකුරුවෙන් පපුවට ගසාගත් අතර පටරෙදි කමිසය පුරා වයින් ඉහිර ගියේය. "මගේ යගදාව අතට ගත්තොත් මේ මුලු රාජධානියෙම ඉන්න එකෙකුටවත් බෑ මගෙත් එක්ක හැප්පෙන්ට!"

නැගිට සිටි ජේමි ලැනිස්ටර් සිය ඇඳුම්වල වූ දූවිලි පිස දා හැරියේ ය. "එහෙමයි මගේ ස්වාමිනී." ඔහු දරදඬු ස්වරයෙන් පිළිතුරු දුන්නේ ය.

රෙන්ලි උතුමානන් සිනාසෙමින් ඉදිරියට පැමිණියේ ය. "වයින් ටික ඔක්කොම හැලිලා ගිහිල්ලා රොබර්ට්. දෙන්ට මං අලුත් පූකුරුවක් ගේන්නං."

ජොෆ්රි ඇගේ බාහුව මත අත තැබූ අතර අනපේක්ෂිතව සිදු වූ මේ දේ නිසා සන්සා තැති ගත්තා ය. "පරක්කු වෙනවා." කුමරා කීවේය. ඔහු ගේ මුහුණේ අසාමාන්‍ය පෙනුමක් විය. හරියටම ඔහු ඇයව කිසිසේත්ම නොදකින්නාක් මෙනි. "ඔබව ආපහු බලකොටුවට එක්කන් යන්ට කවුරුහරි එවන්ටද?"

"ඕන නෑ." සන්සා කීවාය. ඇය සෙප්ටා මෝර්ඩේන් දෙස හැරී බැලුවද, මේසය මත හිස ගසාගෙන සිහින් හඬින් ගොරවමින් නිදා සිටි සෙප්ටා දුටු විට බියෙන් ගැස්සුනා ය. "මම කියන්ට හැදුවෙ... ඔවු. බොහොම ස්තූතියි! ඒක හරිම කරුනාවන්තයි. මට මහන්සියි. ඒ වගේම පාර කරුවලයි. මට මොකක් හරි ආරක්ෂාවක් තිබ්බනං හොඳයි."

ජොෆ්රි කෑ ගැසුවේ ය. "බල්ලෝ!"

එසැනින් සැන්ඩෝර් ක්ලිගේන් ප්‍රාදූර්භූත විය. ඔහු සිය සන්නාහය ඉවත් කර ඒ වෙනුවට පපුවේ බල්ලෙකු ගේ හිසක් ගෙත්තම් කර තිබුනු රතු ලොම් කංචුකයක් හැඳ සිටියේ ය. පන්දම් එළිය නිසා ඔහු ගේ පිළිස්සුනු මුහුණ රතු පැහැයකින් බැබලින. "මගේ ස්වාමිනී."

"මගේ කුමාරිකාව පරිස්සමෙන් බලකොටුවට එක්කන් පලයං. එයාට කිසිම අනතුරක් වෙන්ට දෙන්ට එපා." කිසිදු සමුගැනීමේ වදනකුදු නොමැතිව නැගී සිටි ජොෆ්රි කුමරා ඇයව එතැන තනිකර දමා පිටව ගියේය.

දඩබල්ලා තමා දෙස බලා සිටින'යුරු සන්සාට දැනින. "ඔබ හිතුවද ජොෆ් එයාම ගිහිල්ලා ඔබව ඇරලයි කියලා?" ඔහු සිනාසුනි. "ඒක වෙයි කියලා මමනං හිතන්නෙ නෑ." ඔහු ඇයව අතින් ඇද නැගිට්ටෙවුවේ ය. "එන්ට. නිදාගන්ට ඕනකරන එකම එක්කෙනා ඔබ විතරක් නෙවෙයි. මම බිවුවා හොඳටෝම වැඩියි. අනෙක සමහරවිට හෙට මට මගේ සහෝදරයාව මරලා දාන්ටත් වෙයිද දන්නෙ නෑ." ඔහු නැවතත් සිනාසුනි.

හදිසියේම සිතේ බියක් හටගත්තෙන් සන්සා සෙප්ටා මෝර්ඩේන්ව අවදි කරන අටියෙන් ඇගේ උරහිසෙන් අල්ලා සෙලවූවා ය. එනමුදු ඇය වඩාත් හයියෙන් ගොරවන්නට වීම හැර අන් යමක් සිදු වූයේ නැත. රොබර්ට් රජතුමාද වැනී වැනී යන්නට ගොස් තිබුනු අතර බංකුවලින් අඩක්ම මේ වන විට හිස්ව තිබින. භෝජන සංග්‍රහය අවසන් වී තිබුනු අතර ඇගේ සුන්දර සිහිනයද ඒ සමගින් අවසන් වී තිබින.

සිය මාර්ගය එළිය කරනු වස් දඩබල්ලා පන්දමක් ගලවා ගත්තේ ය. සන්සා ඔහු පිටුපසින් ඔහුට සමීපයෙන් ගමන් ගත්තා ය. භූමිය අසමතුලිත හා ගලින් ගහන වූ අතර සුළඟට සැලෙන පන්දම් දැල්ල නිසා ගමන තවත් ව්‍යාකූල විය. ඇය දෑස් බිමට හරවාගත්තී තබන තබන පියවරක් පාසා සුපරීක්ෂාකාරී වූවාය. ධජපතාක වලින් සරසා තිබුනු මණ්ඩප පසුකරමින් ඔවුන් ඉදිරියට ඇදෙන්නට වූ නමුදු සෑම මොහොතක්ම තව තවත් නිහඬතාවයෙන් බර විය. දඩබල්ලා ගේ දර්ශනය සන්සාට ඉවසා සිටිය නොහැකි තරම් විය. ඔහු ඇයව බිය ගැන්වූයේ ය. එනමුදු ඇය හැදී වැඩී තිබුනේ සියළුම ආකාරයේ ආචාරශීලීත්වයන් මැද්දේ වූ අතර නියම කුලීන ආර්යාවක් නම් කිසිවිටෙකත් ඔහු ගේ මුහුණේ අවලස්සන ගැන තැකීමක් නොකරතියි ඇය තමාටම කියා ගත්තා ය. "ඔබ අද බොහොම නිර්භීත විදියට පොර වැදුනා සෙර් සැන්ඩෝර්." ඇය අමාරුවෙන් මෙන් කියාගත්තා ය.

සැන්ඩෝර් ක්ලිගේන් දත් නියෙවුවේ ය. "උඹේ ඔය මෝඩ ප්‍රශංසා නවත්තගනින් කෙල්ලෙ... ඔය 'සෙර්' කෑල්ලත් නවත්තගනින්. මම නයිට් කෙනෙක් නෙවෙයි. මම නයිට්වරුන්ටයි උංගෙ අර මලඉලවු දිවුරුමටයි කෙල ගහනවා. මගේ සහෝදරයානං නයිට් කෙනෙක්. උඹ දැක්කද අද එයා පොර වදිනවා?"

"ඔවු." සන්සා වෙවුලමින් මිමිනුවා ය. "එයා හරිම..."

"නිර්භීතයිද?" දඩබල්ලා වාක්‍යය අවසන් කලේය.

ඔහු තමාට සමච්චල් කරන බැව් ඇය වටහා ගත්තාය. "එයාගෙ ශක්තිය ඉදිරියෙ බිඳ වැටෙන්නෙ නැතුව ඉන්ට කාටවත් බෑ." ඇය අන්තිමේදී කියා ගත්තාය.

සැන්ඩෝර් ක්ලිගේන් හදිසියේම අන්ධකාරය මැද්දේ එතැනම නතර විය. ඔහු පසෙකින් නතරවනු හැර ඇයට අන් විකල්පයක් නොවීය. "සෙප්ටා උඹව බොහොම හොඳට පුරුදු කරලා තියෙනවා. උඹත් හරියට අර ගිම්හාන දූපත්වල ඉන්න ලස්සන කුරුල්ලෙක් වගෙයි. එහෙම නේද? කතාකරන පුංචි ලස්සන කුරුල්ලෙක්. උං උඹට උගන්නපු ලස්සන ලස්සන වචන තේරුමක් නැතුව දොඩව දොඩව ඉන්න ලස්සන පුංචි කුරුල්ලෙක්."

"ඒක හරිම නපුරුයි." සිය හදවත පපුව තුළ වේගයෙන් ගැහෙන අයුරු ඇයට දැනින. "ඔබ මාව බය කරනවා. මට දැන් ගෙදර යන්ට ඕන."

"එයාගෙ ශක්තිය ඉදිරියෙ බිඳ වැටෙන්නෙ නැතුව ඉන්ට කාටවත් බෑ." දඩබල්ලා අමිහිරි ස්වරයෙන් කීවේය. "ඒක ඇත්ත. කිසිම කෙනෙකුට කවදාවත් ග්‍රෙගර් ඉස්සරහදි බිඳ වැටෙන්නෙ නැතුව ඉන්ට බැරිවුනා. අද අර කොල්ලා, එයාගෙ දෙවෙනි පොරය. ආහ්! ඒකනං හරිම ලස්සන වැඩක්. උඹත් ඒක දැක්කා එහෙම නේද? මෝඩ කොල්ලෙක්. ඌට කිසිම අයිතියක් නෑ මේ වගේ සමාගමකට වැටිලා පොර අල්ලන්ට. සල්ලි නෑ, සහචරයෙක් නෑ, සන්නාහය හරියට අන්දන්ට කවුරුවත් නෑ. පටිය හරියට තද වෙලා තිබුනෙ නෑ. උඹ හිතනවද ග්‍රෙගර් ඒක දැක්කෙ නෑ කියලා? උඹ හිතනවද සෙර් ග්‍රෙගර්ගෙ ලන්සෙ එතනට වැදුනෙ අහම්බෙන් කියලා? ලස්සන පුංචි දොඩවන කෙල්ල. උඹ ඒ කතාව විශ්වාස කරනවා. උඹනං ඇත්තටම කුරුල්ලෙක් වගේම මැටි ඔළුවක් තියෙන

කෙනෙක්. ග්‍රෙගර්ගෙ ලන්සෙ යන්නෙ ග්‍රෙගර්ට ඕන තැනට. මා දිහා බලපන්. මා දිහා බලපන්!" සිය සුවිසල් අත්ල ඇගේ නිකට යටින් තැබූ ඔහු බලෙන්ම ඒ මුහුණ එසවූයේ ය. ඔහු ඇය ඉදිරියේ උක්කුටියෙන් හිඳ ගත්තේ පන්දම තවත් ළං කර ගත්තේ ය. "මෙන්න තියෙනවා උඹට ලස්සන මූනක්. හොඳට බලාගනින්. මම දැක්කා උඹ රජමාවත දිගටම මගේ මූන දිහා නොබලා අහක බලන්ට ලොකු උත්සාහයක් දරන විදිය. යකාට පලයං. හොඳට බලාගනින්."

ඔහු ගේ අතැඟිලි යදඬු මෙන් ඇගේ හණුවලින් තරයේ අල්ලාගෙන සිටියේ ය. ඒ දැස් ඇගේ දැස් අධ්‍යයනය කලේය. බීමත් දැස්, කේන්තියෙන් පිරුනු දැස්. ඇයට ඒ දෙස බලා සිටීම හැර වෙනත් කල හැක්කක් නොවීන.

ඔහු ගේ මුහුණේ දකුණු පස වැරී ගොස් තිබ්න. උස් කම්මුල් ඇට හා සනකම් ඇහිබැම යට අඳුරු අළු පැහැ ඇසක් පිහිටා තිබ්න. ඔහු ගේ නාසය වක් වූ ලොකු නාසයක් විය. ඔහු ගේ තුනී හිසකෙස් කළු පැහැයක් ගත්තේ ය. ඔහු දිගට වැවූ හිසකෙස් පැත්තට පීරා තිබුනේ හිසේ වම්පස කිසිදු හිසකෙසක් වැවී නොතිබුනු බැවිනි.

ඔහු ගේ මුහුණේ වම් පස නටඹුන් වී තිබ්න. වම් කණ සම්පූර්ණයෙන්ම පිළිස්සී ගොස් තිබුනු අතර එහි ඉතිරිව තිබුනේ කණ් කුහරය පමණි. වම් ඇස හොඳින් ක්‍රියා කලද ඒ වටා වූ මස වියළී ගිය සමක් මෙන් කළු පැහැ හා දැඩි වූයේය. එහි තිබුනු ආවාට හා ගැඹුරු පැළුම් ඔහු සෙලවෙන විට රත් පැහැයෙන් දිස්නය දුනි. හණුවේ මස් පිළිස්සී ගිය තැනක ඇටකටුව යාන්තමින් දැකිය හැකි විය.

සන්සා හඬන්නට පටන්ගත්තා ය. ඔහු ඇයව අත හැර පන්දම පොළොවේ ඔබා නිවා දැමුවේ ය. "ඒ ගැන කියන්ට මොකුත් ලස්සන වචන නැද්ද කෙල්ලෙ? සෙප්ටා උඹට උගන්නලා නැද්ද ඒ වගේ වෙලාවට කියන්ට මොකක් හරි බොරු ප්‍රශංසාවක්?" පිළිතුරක් නොමැති තැන ඔහු නැවත කතාව පටන් ගත්තේය. "ගොඩක් එවුන් හිතන්නෙ ඒක යුද්ධෙකදි ඇති වුන එකක් කියලා. වැටලීමක්, ගිනිගන්න කුළුණක්, සතුරෙකුගෙ පන්දමක්. එක මෝඩයෙක් එක පාරක් ඇහුවා ඒ මකරාග්නියද කියලත්." ඔහු ගේ සිනහව මෙවර වඩා මෘදු වුවද එහි තවමත් පෙර පරිදිම අමිහිරි ගතිය තැවරී තිබ්න. "මං උඹට

කියන්නං ඒක වුනේ කොහොමද කියලා කෙල්ලෙ." ඔහු ඇයට කෙතරම් සමීප වී සිටියාද යත් ඔහු ගේ ප්‍රශ්වාසයේ ඇති අම්හිරි වයින් පුසුඹ පවා ඇයට දැනින. "මම එතකොට උඹටත් වඩා ලාබාලයි. හයක් නැත්තං හතක් විතර ඇති. ලී කැටයං කාරයෙක් අපේ ගමේ පොඩි සාප්පුවක් ඇරියා. මගේ තාත්තගෙ බලකොටුවට පහළින්. තාත්තගෙ ප්‍රසාදය දිනාගන්ට ඕන හින්දා මිනිහා අපට තෑගි එවුවා. ඒ නාකි මිනිහා බොහොම ලස්සන සෙල්ලම් බඩු හදන්ට දක්ෂයා. මට මතක නෑ හරියටම මොකක්ද මට හම්බවුනේ කියලා. ඒත් මට ඕන වුනේ ග්‍රෙගර්ට හම්බවෙච්චි සෙල්ලම් බඩුව ගන්ටයි. ඒක ලීයෙන් හදාපු නයිට් කෙනෙක්. ලස්සනට පාට ගාලා. ඇඟේ හැම කොටසක්ම වෙන වෙනම හදලා නූල්වලින් පුරුද්දලා. හරියට රූකඩයක් වගේ, සෙල්ලම් කරන්ට පුළුවන්. ග්‍රෙගර්ට මට වඩා අවුරුදු පහක් වයසයි. මේ සෙල්ලම් බඩුවෙන් එයාට එතකොට ඇති වැඩක් නෑ. එයා එතකොටත් නයිට්වරයෙක්ගෙ සහචරයෙක්. එතකොටත් අඩි හයකට කිට්ටුවෙන්ට උසයි, ගොනෙක් වගේ මස්පිඩු හැදිලා, ගොනෙක් වගේ ශක්තිමත්. ඉතින් මං එයාගෙ අර සෙල්ලම් නයිට්ව ගත්තා. ඒ වුනත් ඒකෙ කිසිම සතුටක් තිබුනෙ නෑ. මම හොඳටම බයවෙලයි හිටියෙ, මං කරපු වැඩේ එයාට අහුවෙයි කියලා. ඒ වගේම එයාට මාව අහුවුනා. ග්‍රෙගර් වචනයක්වත් කිවුවෙ නෑ. මාව බෙල්ලෙන් අල්ලගෙන, කාමරේ උණුහුම් කරන්ට කියලා තියලා තිබ්බ ගිනිඅඟුරු කල්දේරම ගාවට මාව ඇදගෙන ගියා. ගිහිල්ලා මගේ මූන එබුවා අර ගිනිගන්න ගල්අඟුරු ගොඩේ. ඔබලා මාව එහෙමම අල්ලගෙන හිටියා. මම කෑ ගැහුවා, කෑ ගැහුවා. උඹ දැක්කනෙ එයා කොච්චර ශක්තිමත්ද කියලා. ඒ කාලෙත් එහෙමයි. මාව එයාගෙන් ගලවගන්ට වැඩුනු මිනිස්සු තුන්දෙනෙක් ඕන වුනා. පූජකයො බොරුවට කෑ ගහනවා අපා හතක් ගැන. උං මොනාද දන්නෙ? ඇත්තටම ගින්නෙන් පිච්චුන මිනිහෙක් විතරයි ඇත්තටම අපාය කොහොම එකක්ද කියලා."

"මගේ තාත්තා හැමෝටම කිවුවෙ මගේ නිදන කාමරේ ගිනි ගත්තා කියලයි. අපේ මේස්ටර් මගේ තුවාලවල තෙල් ජාති ගාලා සාත්තු කලා. තෙල් සාත්තුව! ග්‍රෙගර්ටත් එයාගෙ තෙල් සාත්තුව හම්බවුනා. අවුරුදු හතරකට පස්සෙ උං එයාව සප්තාලේපයෙන් අභිෂේක කලා. එයා එයාගෙ නයිට් දිවුරුම කියෙවුවා. රේගාර් ටාර්ගේරියන් එයාගෙ උරහිසේ කඩුව තියලා මෙහෙම කිවුවා. ' නැගිටින්ට සෙර් ග්‍රෙගර්'."

ඔහු ගේ ගොරෝසු හඬ බිඳී ගියේය. ඔහු නිහඬවම ඇය ඉදිරියේ උක්කුටියෙන් වාඩි වී බලා සිටියේ ය. ඇගේ දෑසෙන් වසන්වුනු දැවැන්ත කළු පැහැ ඡායාවක් මෙන් බලා සිටියේ ය. ඔහු හුස්ම ගන්නා හඬ ඇයට ඇසෙන්නට විය. තමා තුළ ඔහු ගැන අනුකම්පාවක් ඇතිවෙමින් තිබෙන බැව් ඇයට තේරුම් ගියේය. ඇගේ සිතේ පෙර පැවති බිය නැතිවී ගොස් අනුකම්පාවක් නැග එන්නට විය.

නිහඬතාව දිගින් දිගටම ඇදී ගියේය. එය කෙතරම් දිගු වේලාවක් ඇදී ගියාදැයි කිවහොත් ඈ තුළ නැවතත් බියක් මතු වන්නට විය. එහෙත් ඒ බිය ඇය ගැන ඇති වූ බියක් නොව ඔහු ගැන ඇතිවූ බියක් විය. අත දිගු කල ඇය ඔහු ගේ සද්දන්ත උරහිස මත අත තැබුවා ය. "එයා නියම නයිට් කෙනෙක් නෙවෙයි." ඇය ඔහුට මිමිනුවා ය.

හිස පසුපසට ගැස්සූ දඬබල්ලා මහහඬින් සිනාසෙන්නට විය. පැකිළුනු සන්සා ඔහුගෙන් ඈත් වූවාය. එනමුදු ඔහු ඇගේ අතින් අල්ලා නවත්වා ගත්තේ ය. "නෑ. නෑ පුංචි කිරිල්ලියේ. ඌ නියම නයිට් කෙනෙක් නෙවෙයි."

ගමනේ ඉතුරු කොටසේදී සැන්ඩෝර් ක්ලිගේන් වදනකුදු නොදෙඩීය. කරත්ත නවතා ඇති ස්ථානයට ඇය කැටුව ගිය ඔහු, ඇයව කරත්තයක නංවා ඔහුද එයට ඇතුළු වූයේ තමන් රතු බලකොටුව කරා රැගෙන යන මෙන් රියැදුරුට අණ කලේය. ඔවුහු නිහඬවම රාජ ද්වාරය තුළින් හා රාත්‍රී පහන් දැල්වුනු වීථි ඔස්සේ ගමන් කලහ. බලකොටුවේ කුඩා රහස් දොරක් හරහා ඊට ඇතුළු වූ ඔහු හස්තයේ කුළුණ දක්වාත්, ඇගේ නිදන කාමරවලට පිවිසෙන කොරිඩෝරය දක්වාත් ඇය පසුපසින්ම පැමිණියේ ආරක්ෂාකාරීව ඇයව නිවෙසට ඇරලුවේ ය.

"ඔබට බොහොම ස්තූතියි මගේ උතුමානනි!" ඇය බයාදු අන්දමින් මිමිනුවාය.

ඇගේ අතින් අල්ලාගත් දඬබල්ලා ඇයට සමීප විය. "අද රෑ මම උඹට කියාපු දේවල්..." ඔහු ගේ කටහඬ සාමාන්‍ය අවස්ථාවන්ටත් වඩා ගොරෝසු විය. "උඹ කවදාහරි ඒ කතාව ජොෆ්රිට හරි.. උඹේ නංගිට හරි.. උඹේ තාත්තට හරි.. වෙන කාටහරි කියලා තිබ්බොත්..."

"මම එහෙම කරන්නෙ නෑ." සන්සා කෙඳිරුවාය. "මම දිවුරලා පොරොන්දු වෙනවා."

එනමුදු ඔහුට එය ප්‍රමාණවත් නොවීය. "උඹ කවදාහරි කාටහරි කියලා තිබුනොත් මම උඹව මරනවා."

Petyr Baelish: “Your mother was my queen of beauty once, you have her hair.”

එඩාර්ඩ් 07-1

"එයාගෙ අවසාන කටයුතු මගෙ අතින්ම සිද්ද කරලා දැම්මා." ඔවුන් දෙදෙනා එක්ව කරත්තය පසුපස හොවා තිබුනු මළකඳ පිරික්සා බලන අතරේ සෙර් බැරිස්ටාන් සෙල්මි කීවේය. "ඒක කරන්ට වෙන කවුරුවත් හිටියෙ නෑ. මට අහන්ට ලැබුන විදියට එයාගෙ අම්මා ඉන්නෙ ඒරින් මිටියාවතේ."

අරුණෝදයේ ආලෝකයෙන් මේ තරුණ නයිට්වරයා දිස් වූයේ නිදාගෙන සිටින්නාක් මෙනි. ඔහු එතරම් කඩවසම් තැනැත්තකු නොවූවද මරණය විසින් ඒ දරදඬු විලාසය අඩු කොට ඔහුව මෘදු තැනැත්තෙක් බවට පෙරලා තිබින. නිහඬ සොයුරියන් විසින් ඔහු සතුව තිබුනු හොඳම විල්ලුද කබායෙන් සිරුර සරසා තිබුනු අතර ලන්සය මගින් ගෙලේ ඇති වූ තුවාලය උස් කොලරයක් මගින් වසා දමා තිබින. ඔහු ගේ මුහුණ දෙස බැලූ එඩාර්ඩ් ස්ටාර්ක්, මේ කොලුවාට මරණයට මුහුණ දීමට තමා හේතුවක් විනිදැයි කල්පනා කලේය. ඔහුට කතා කරන්නට නෙඩ්ට අවස්ථාවක් ලැබෙන්නට පෙර ලැනිස්ටර් ධජ දරන්නෙකු අතින් මියයාම අහඹු සිද්දියක්ද? එය ඔහුට කිසිදා දැනගන්නට නොලැබෙනු ඇතැයි නෙඩ් කල්පනා කලේය.

"හියු අවුරුදු හතරක් ජොන් ඒරින්ගෙ සහචරයා වෙලා හිටියා." සෙල්මි දිගටම කතා කලේය. ජොන්ට කරන උපහාරයක් විදියට රජතුමා උතුරට යන්ට කලින් මේ කොල්ලාව නයිට්වරයට එසෙවුවා. මේ කොල්ලාට ඒ ගෞරවය තදින්ම උවමනා කරලා තිබුනා. ඒ වුනත් මම හිතන්නෙ නෑ එයා ඒකට ලෑස්තිවෙලා හිටියයි කියලා."

පසුගිය රැයේ නෙඩ්ට හරිහැටි නින්දක් නොලැබුනු අතර ඔහුට වයසට වඩා වෙහෙසක් දැනෙන්නට විය. "අපි කිසිකෙනෙක් කවදාවත් ලෑස්තිවෙලා ඉන්නෙ නෑ."

"නයිට්වරයට ද?"

"මරණයට." නෙඩ් හෙමිහිට කොලුවා ගේ සළුවෙන් ඔහු ගේ සිරුර වසා දැමීය. ඔහු මියගියේ මන්දැයි ඔහු ගේ මව ඇසූ විට රජතුමා ගේ හස්තය වන එඩාර්ඩ් ස්ටාර්ක්ට ගරු

බුහුමන් දක්වනු පිණිස ඔහු සටන් වැදුනා යැයි ඔවුන් කියනු ඇත. "මේක මහ අපරාධයක්. යුද්ධය කියන්නෙ මේ වගේ සෙල්ලමකට ගන්ට ඕන දෙයක් නෙවෙයි." නෙඩ් කරත්තය පසෙකින් සිටගෙන සිටි කාන්තාව දෙසට හැරුනේය. ඇය අඳුරු පැහැ ඇඳුමින් සැරසී, දෑස් හැරෙන්නට මුලු මුහුණම වසා සිටියාය. නිහඬ සොයුරියන් යනු මළසිරුරු සකස්කරන්නියන් වූ අතර ඔවුන් ගේ මුහුණ බැලීම අසුභ දෙයක් මෙන් සැලකින. "එයාගෙ සන්නාහය මිටියාවතට යවන්ට. එයාගෙ අම්මට ඒක ඕන වෙයි."

"ඒක රිදී බරගානක් වටිනවා." සෙර් බැරිස්ටාන් කීවේය. "මේ කොල්ලා ඒක තරගාවලිය වෙනුවෙන්ම විශේෂයෙන්ම හදවගත්ත එකක්. චාම්, ඒත් හොඳට හදලා තියෙනවා. මම දන්නෙ නෑ එයා කම්මල්කාරයට නියමිත ගාස්තුව ගෙවලා ඉවරද කියලාවත්."

"එයා ඊයෙ ඒකට ගෙවුවා මගේ උතුමානනි. එයා බොහොම නොවටිනා විදියට ඒකට ගෙවුවා." නෙඩ් පිළිතුරු දුන්නේ ය. "අම්මට සන්නාහය යවන්ට. කම්මල්කාරයත් එක්ක මම බලාගන්නම්." ඔහු නිහඬ සොයුරියට කීවේය. ඇය හිස නැමුවා ය.

මේ සියළු රාජකාරි අවසන් වූ පසු සෙර් බැරිස්ටාන් නෙඩ් සමගින් රජතුමා ගේ මණ්ඩපය වෙතට ඇවිද ගියේය. කඳවුර මේ වන විට නිදිගැට හැර අවදි වීමට පටන්ගෙන තිබින. ගිනිඋදුන්වලට උඩින් සොසේජස් නටමින් බැදුනේ මුලු කඳවුර පුරාම සුදුලූණු හා ගම්මිරිස් සුවඳ පතුරන්නට විය. අලුත් දිනයකට මුහුණ දීම පිණිස සිය ස්වාමියන් නිදි ඇඳෙන් නැගිට, ඇඟමැලි කඩමින්, ඇනුම් යවමින් සූදානම් වෙද්දී ඔවුන් ගේ තරුණ සහචරයෝ දහසකුත් එකක් කුඩුමහත් රාජකාරි ඉටු කිරීම පිණිස කඩිසරව එහා මෙහා දිවගියහ. සිය කිහිල්ල යට පාත්තයෙකු රඳවාගත් සේවකයෙක් මේ උතුමන් දෙදෙන දුටුවේ දණක් නමා ඔවුන්ට ආචාර කලේය. සෑම කූඩාරමකම පිටතින් එහි හිමිකරුවා ගේ පලිහ රඳවා තිබින. සීගාර්ඩ්හි රජත රාජාලියා, බ්‍රයිස් කැරන් ගේ නයිටින්ගේල් කුරුලු රංචුව, රෙඩ්වින්ලා ගේ මිදිපොකුර, වයිරම් වැටුනු වල් ඌරා, රතු නරියා, ගිනිගත් වෘක්ෂය, සුදු බැටළුවා, සර්පිල ත්‍රිත්වය, දම්පැහැ කඟවේනා, නර්තනයේ යෙදෙන කන්‍යාව, බලකොටු ද්විත්වය, අං සහිත බස්සා සහ රාජ්‍යාරක්ෂක බලකායේ තනි සුදු පැහැ පලිස්. මේ සියල්ලක්ම උදාවන හිරු මෙන් දිස්නය දෙමින් තිබින.

"රජතුමා බලාපොරොත්තු වෙනවා අද මිශ්‍ර සටනෙදි තරග වදින්ට." සෙර් මෙරින් ගේ පලිහ පසු කරමින් යන අතරේ සෙර් බැරිස්ටාන් කීවේය. ඊයේ දිනයේදී වැදුනු සෙර් ලෝරාස් ටිරල් ගේ ලන්ස පහර නිසා ඔහු ගේ පලිහ ගැඹුරටම තුවාල වී තිබින.

"ඔවු." නෙඩ් කීවේය. ඊයේ රෑ ඔහුව අවදි කල පොරී මේ පුවත ඔහුට දැනුම් දී තිබින. ඔහුට නින්ද නොයාම පුදුමයක් නොවේ.

බැරිස්ටාන් සෙල්මි

සෙර් බැරිස්ටාන් ගැටළුවකට මැදි වී ඇති සෙයක් පෙනෙන්නට තිබින. "කතාවටනම් කියන්නෙ 'රාත්‍රියෙ ලස්සන උදේ වෙනකොට මැකෙනවා, වයින් මතෙන් දෙන පොරොන්දු උදේ වෙනකොට කැඩෙනවා' කියලයි."

"එහෙම කියනවා තමා. ඒ වුනත් රොබර්ට්ට ඒක අදාල නෑ." වෙරිමතේ තමන් විසින් කල කතා හා දුන් පොරොන්දු ගැන අන් මිනිසුන් දෙවරක් සිතා බැලූවද රොබර්ට් යනු එවන් මිනිසෙකු නොවීය. ඔහුට තමා කල කී දේ සියල්ල මතක තිබෙන අතර එයින් පලා යාමටද නොසිතන්නේ ය.

රජතුමා ගේ මණ්ඩපය ගඟට සමීපයෙන්ම අටවා තිබුනු අතර උදෑසන ගංදිය මීදුම විසින් එය වටලා තිබින. රන්වන් සේද රෙද්දෙන් නිමවුනු එය කඳවුරේ තිබුනු විශාලතම මෙන්ම අලංකාරම මණ්ඩපය විය. මණ්ඩප දොරටුව පසෙකින් බරතියන් වංශ ලාංඡනය වන කිරුළු ලූ ගෝනා කැටයම් කල දැවැන්ත යකඩ පලිහක් හා රොබර්ට් ගේ යමුගුර ප්‍රදර්ශනය කර තිබින.

වයින් මතින් තවමත් නිදාසිටින රජතුමා ගේ දර්ශනය දැකීම නෙඩ් ගේ බලාපොරොත්තුව වූ නමුදු වාසනාව ඔහු සමග නොවීය. ඒ වෙනුවට ඔවුන්ට දැකගත හැකි වූයේ තමන්ට සන්නාහය පැළැඳවීමට තැත් දරන තරුණ සහවරයින් දෙදෙනෙකුට බැන වදිමින්, ඔප දැමූ අඟකින් බීර පානය කරමින් සිටින රජතුමා විය. "මගේ ස්වාමිනී," එක් සහවරයෙක් කීවේය. ඔහු ගේ ස්වරය හැඬුම්බර විය. "ඒක හරියන්නෙ නෑ. ඒක බොහොම පුංචියටනෙ හදලා තියෙන්නෙ." ඔහු අදක්ෂ අයුරින් අතපත ගෑ අතර රජතුමා ගේ මහත ගෙල වටා පැළඳවීමට තැත් කරමින් සිටි ශිරස්ක පටිය ගිලිහී බිම වැටින.

"අපා හතටම පලයං!" රොබර්ට් අවලාද නැගීය. "ඒක මගෙ අතින්ම කරගන්ටද ඕන? තොපි දෙන්නම යකාට පලයවු! ඒක අහුල ගනිං. ඔතන ඔහොම කට ඇරන් බලා ඉන්ට එපා ලැන්ස්, ඒක අහුල ගනිං!" කොලුවා උඩ වීසිවුනු අතර තමා හමුවට පැමිණ සිටින සමාගමය රොබර්ට් දුටුවේ ය. "මේ මෝඩ බූරුවො දෙන්නා දිහා බලාපං නෙඩ්. මගේ ගැනි බලකරනවා මේ ගොබ්බයො දෙන්නා ගන්ටයි කියලා මගේ සහචරයො විදියට. ඒ වුනාට මුං දෙන්නා කිසිම වැඩකට ඇති එවුන් නෙවෙයි. හරියකට මිනිහෙකුගෙ සන්නාහය පළන්දන්ටවත් දන්නෙ නෑ. සහචරයො. ආච්චිගෙ රෙද්ද! මුං දෙන්නා සේද ඇඳුම් ඇඳපු ඌරුකොටු කාරයො දෙන්නෙක්."

ප්‍රශ්නය කුමක්දැයි නෙඩ් එක් බැල්මකින්ම වටහාගත්තේ ය. "ඒ කොල්ලන්ගෙ වැරැද්දක් නෑ. ඔබ ඔබේ සන්නාහයට වඩා මහත් වෙලා රොබර්ට්."

ලොකු බිර උගුරක් පානය කල රොබර්ට් බරතියන්, හිස් අඟ සිය ඇඳ ඇතිරිලි මතට විසිකර පිටි අත්ලෙන් මුව පිසදැමීය. "මහතයි? මහතයි? ඔහොමද උඹ උඹේ රජතුමාට කතා කරන්නෙ?" ඔහු ගිගිරුම් කුණාටුවක් මෙන් මහහඬින් සිනාසුනි. "ආහ්! යකාටම පලයං නෙඩ්! ඇයි හැමවෙලාවම උඹ හරි?"

සහචරයින් දෙදෙන බයාදු අයුරින් සිනාසුනු අතර රජතුමා ඔවුන් දෙසට හැරින. "තොපි. ඔවු යකෝ, තොපි දෙන්නම තමයි. උඹලාට ඇහුනා නෙව හස්තයේ උතුමානන් කියාපු දේ. තොපේ රජතුමා එයාගෙ සන්නාහයට වැඩිය මහත් වෙලාලු. ගිහින් හොයාගනින් සෙර් ආරොන් සැන්ටගාර්ව. එයාට කියාපං මට සන්නාහයෙ පපු තහඩුව ලොකු කරන අඬුව ඕනයි කියලා. දැන්මම පලයවු. තවත් මොනාද බලා ඉන්නෙ."

කූඩාරමෙන් කඩිමුඩියේ පිටවීමට ගත් උනන්දුව නිසා කොලුවන් දෙදෙනා පා පැකිළී එකා පිට එකා වැටුනහ. ඔවුන් දෙදෙන පිටව යන තෙක් රොබර්ට් සිය පරුෂ මුහුණ රඳවා ගැනීමට සමත් විය. ඊළග මොහොතේ ඔහු මහහඬින් සිනාවෙමින් පුටුවකට බර දුන්නේ ය.

සෙර් බැරිස්ටාන් සෙල්මි ද රජු හා එක්ව මහහඬින් සිනාසෙන්නට විය. එඩාර්ඩ් ස්ටාර්ක්ට පවා යාන්තම් සිනාවක් ගියේය. එනමුදු, සෑම විටෙකම මෙන් දැනුදු ඔහු ගේ සිතට නපුරු සිතුවිලි ගලා ඒම නැවැත්විය නොහැකි විය. රජු ගේ සහචරයින් දෙදෙනා වූ අර කඩවසම්,

වැදගත් පවුලක හැදුනු වැඩුනු බව පෙන්වන කොලුවන් දෙදෙන ඔහු ගේ සිතේ හොල්මන් කරන්නට විය. එකෙකු රන්වන් හිසකෙසින් යුතු, සන්සා ගේ වයසේ වූවෙකු වූ අතර අනිකා පහළොස් හැවිරිදි පමණ වූ, ලා දුඹුරු පැහැ හිසකෙස් හා රැජිණ ගේ මෙන් මරකත කොළ පැහැ දෙනෙතක් හිමි යෞවනයෙකු විය.

"ආහ්! සැන්ටගාර්ගෙ මූන දකින්ට මට එතන ඉන්ට තිබුනා නං." රොබර්ට් කීවේය. "ඌටත් හොඳ හාස්‍ය රසයක් තියෙනවානං ඌ මේ කොල්ලො දෙන්නව තව කා ගාවට හරි යවයි. උන් දෙන්නව දවස පුරාම එහාටයි මෙහාටයි දුවවන්ට තිබ්බා නං තමා වැඩේ."

"මේ කොල්ලො දෙන්නා ලැනිස්ටර්ලා ද?" නෙඩ් ඇසීය.

ලැන්සල් ලැනිස්ටර්

රොබර්ට් ඔවු කියන්නට මෙන් හිස වැනුවේ දෙනෙතේ කඳුළු පිස දමමිනි. "ඥාතියො. ටයිවින් උතුමානන්ගෙ සහෝදරයාගෙ පුතාලා. එයාගෙ මැරුන සහෝදරයින්ගෙ. එහෙමත් නැත්තං ජීවත්වෙන එක්කෙනාගෙ. මට දැන් හරියටම මතක නෑ. මගේ ගෑනි එන්නෙ බොහොම ලොකු පවුලකින් නෙඩ්."

'බොහොම ලොකු අපේක්ෂා තියෙන පවුලකින්', නෙඩ් සිතුවේ ය. මේ සහචරයින් දෙදෙනා ගැන නෙඩ් ගේ සිතේ කිසිදු කහටක් නැති වුවද, රොබර්ට් නිදන, අවදියෙන් සිටින සෑම විටෙකම ලැනිස්ටර්වරුන් විසින් වටකරනු ලැබ සිටීම ඔහු ගේ සතුටට හේතු වූයේ නැත. තනතුරුවලට හා ගෞරවයට ලැනිස්ටර්වරුන් තුළ ඇති කෑදරකමෙහි සීමාවක් නොවීය. "කට්ටිය කියනවා ඊයෙ රෑ ඔබයි රැජිණයි අතර පොඩි වචන හුවමාරුවක් වුනාලු."

රොබර්ට් ගේ මුවෙහි වූ සරදම් සිනහව මැකී ගියේය. "මේ ගෑනි හැදුවා මම මිශ්‍ර සටනට සහභාගි වෙන එකෙන් වළක්වන්ට. දැන් ඒකි බලකොටුවට වෙලා බුම්මගෙන ඇති. ඒකි යකාටම ගියාදෙන්. උඹේ නංගි නං කවදාවත් මාව එහෙම ලැජ්ජාවට පත් කරන්නෙ නෑ."

"ඔබ කවදාවත් මං තරම් හොඳින් ලියානාව දැනන් හිටියෙ නෑ රොබර්ට්. ඔබ දැක්කෙ එයාගෙ ලස්සන විතරයි. ඒ වුනාට ඒ ලස්සන පිටිපස්සෙ හිටිය යකඩ කෙල්ල ඔබ දැකලා නෑ. එයා ඔබට කියයි මිශ්‍ර සටනට සහභාගි වෙන්ට ඔබට කිසිම අයිතියක් නෑ කියලා."

"උඹත්?" රජතුමා රවා බැලුවේ ය. "උඹ මහ ඇඹුල් මිනිහෙක් ස්ටාර්ක්. උඹ උතුරුකරේ හිටිය කාලෙ බොහොම වැඩියි. උඹෙ ඇඟේ සාරය ඔක්කොම මිදිලා ගිහිල්ලා. ඒ වුනාට මගේ ඇඟේ නං සාරය තාම දුවනවා." ඔහු සිය පපුවට දැඩි අතුල් පහරක් දී ගත්තේ ය.

"ඔබයි රජතුමා." නෙඩ් ඔහුට සිහිපත් කර දුන්නේ ය.

"අර මලඉලවු යකඩ පුටුවෙ වාඩිවෙලා ඉන්ට ඕන නං මම ඒක කරනවා. ඒ වුනාට ඒකෙන් කියවෙනවද මට අනිත් මිනිස්සුන්ට තියෙන ආසාවන් නැහැයි කියලා? ඉඳලා හිටලා වයින් ටිකක් බොන්ට. හොඳ හුරුබුහුටි කෙලි පොඩිත්තියක් ඇඳට ගන්ට. අශ්වයෙක්ගෙ පිටේ නැගලා යන්ට. අපා හතටම පලයං! නෙඩ්, මට ඕන කාටහරි ගහන්ට."

"මගේ ස්වාමිනී." සෙර් බැරිස්ටාන් සෙල්මි කතා කලේය. "රජතුමා මිශ්‍ර සටනට සහභාගි වෙන්ට යන එක එච්චර හොඳ දෙයක් නෙවෙයි. එතකොට ඒක සාධාරණ සටනක් වෙන්නෙ නෑ. කවුද එඩිතර වෙන්නෙ ඔබතුමාට පහර දෙන්ට?"

රොබර්ට් අවංකවම පුදුමයට පත් වූ බැව් පෙනින. "ඇයි? උං හැම එකාම එයි. යකාට පලයං. උන්ට පුළුවන් නං උං එයි. අන්තිමට සටන දිනන එකා..."

"...වෙන්නෙ ඔබයි." නෙඩ් කීවේය. සෙල්මි ඉලක්කයටම පහර දී ඇති බැව් ඔහු සැනෙන් වටහා ගත්තේ ය. මිශ්‍ර සටනේ ඇති අනතුරුදායක බව රොබර්ට්ව එහි කැඳවන මී බඳුනක් වැන්න. එනමුදු මේ ඔහු ගේ ආත්මාභිමානය පිළිබඳ ගැටළුවකි. "සෙර් බැරිස්ටාන් හරි. මේ රාජධානි සප්තකයේ කිසිම මිනිහෙක් නෑ ඔබට රිද්දලා ඔබේ අප්‍රසාදයට පත්වෙන්ට කැමැති."

රජතුමා නැගිට සිටියේ ය. ඔහු ගේ මුහුණ කේන්තියෙන් රතු වී ගොස් තිබින. "උඹ කියන්නෙ එතකොට මේ ජේත්තුකාර බයගුල්ලො මට තරගෙ දිනන්ට ඉඩ දෙයි කියලද?"

"අනිවාර්යයෙන්ම." නෙඩ් කීවේය. සෙර් බැරිස්ටාන් නිහඬ එකඟවීමකින් හිස නැමීය.

රොබර්ට් ගේ සිතේ පැනනැගුනු කේන්තිය කෙතෙක් වීද යත් මොහොතක් යනතුරු ඔහුට කතාකර ගැනීමටවත් නොහැකි විය. ඔහු කළු කරගත් මුහුණින් යුතුව කූඩාරමේ එහා මෙහා වේගයෙන් ඇවිද්දේ ය. බිම වැටී තිබුනු පපු තහඩුව අහුලාගත් ඔහු එයින් සෙර් බැරිස්ටාන් සෙල්මිට දමා ගැසීය. සෙල්මි වහා පහත් විය. "පලයල්ලා. මම උඹලාව මරන්ට කලින් මෙතනින් පිටවෙලා පලයල්ලා."

සෙර් බැරිස්ටාක් සැනෙන් පිටව ගියේය. නෙඩ් ද ඔහු අනුව යන්නට සැරසුනු අතර රජතුමා නැවතත් කටහඬ අවදි කලේය. "නෑ, උඹ නැවතියං නෙඩ්."

නෙඩ් ආපසු හැරුනේ ය. බිම වැටී තිබුනු අඟ අහුලාගත් රොබර්ට් මුල්ලක තිබුනු පීප්පයකින් ඊට බීර වත් කර නෙඩ් අතට දුන්නේ ය. "බීපං." ඔහු දඩබ්බර ස්වරයෙන් කීය.

"මට තිබහක් නෑ-"

"ඕක බීපං. උඹේ රජතුමා අණ කරනවා."

අඟ අතට ගත් නෙඩ් බීර ස්වල්පයක් තොල ගෑවේය. බීර කළු පැහැ ඉතා සැර එකක් වූ අතර ඔහු ගේ දැසට කඳුළු පුරා ආවේය.

රොබර්ට් නැවතත් පුටුවේ වාඩිවිය. "යකාටම පලයං නෙඩ් ස්ටාර්ක්! උඹයි ජොන් ඒරිනුයි දෙන්නම. මම උඹලා දෙන්නටම ආදරේ කලා. උඹලා මොකක්ද මට මේ කලේ? උඹයි රජවෙන්ට තිබුනෙ. උඹ හරි ජොන් හරි."

"ඔබට අපට වඩා වැඩි උරුමයක් තිබුනා මගේ ස්වාමිනී."

"මම උඹට කිවුවෙ බොන්ට කියලා. වාද කරන්ට කියලා නෙවෙයි. උඹයි මාව රජ කෙනෙක් කලේ. යකාටම පලයං! අඩුම ගානෙ මම කතාකරන කොට අහන් ඉන්ට තරම්වත් ආචාරශීලී වෙයං. බලපං මං දිහා නෙඩ්. බලපං මේ රජකම මට කරලා තියෙන දේ. මගේ සන්නාහයටත් වඩා මං මහත් වෙලා. දෙයියනේ! කොහොමද මම මෙහෙම තත්ත්වෙකට පත්වුනේ?"

"රොබර්ට්..."

"කට වහගෙන ඕක බීපං. උඹේ රජතුමයි මේ කතා කරන්නෙ. මම මේ උඹට දිවුරලා කියන්නෙ නෙඩ්, මම සිංහාසනේ දිනුව දා තරං වෙන කිසිමදාක එච්චර සන්තෝස වෙලා නෑ. දැන් මම ඒකෙ වාඩිවෙලා ඉන්නකොට තරං වෙන කිසිමදාක මෙච්චර මට ජීවිතේ එපා වෙලා නෑ. එතකොට සෙර්සි... ඒකට ස්තූති කරන්ට ඕන ජොන් ඒරින්ටයි. ලියානාව මගෙන් උදුරගත්තට පස්සෙ ආයෙමත් කසාද බඳින්ට මගේ අදහසක් තිබුනෙ නෑ. ඒ වුනත් ජොන් තමා කිවුවෙ රාජධානියට උරුමක්කාරයෙක් ඉන්ට ඕනයි කියලා. ඌ කිවුවා සෙර්සි ලැනිස්ටර් මට හොඳට ගැලපෙනවා කියලා. විසේරිස් ටාර්ගේරියන් උගෙ තාත්තගෙ සිංහාසනේ ආපහු ගන්ට ආවොත් සෙර්සි නිසා ටයිවින් ලැනිස්ටර් මට බැඳෙයි කියලා ඌ කිවුවා." රජතුමා හිස දෙපසට වැනීය. "මම දිවුරලා කියන්නෙ, මම ඒ නාකියාට ආදරේ කලා. ඒ වුනත් මට දැන් හිතෙනවා ඌ මූන් බෝයිටත් වඩා ලොකු මෝඩයෙක් කියලා. ආහ්! ඇත්තටම සෙර්සි පිටින් බලනකොට ලස්සනයි තමා. ඒ වුනාට ඒකි හරිම උදාසීනයි, ඇල් මැරිලා... ඒකි ඒකිගෙ *** ආරක්ෂා කරන්නෙ හරියට කාර්ස්ටලී රොක්වල තියෙන තරම් රත්තරන් ඔක්කොම ඒකිගෙ කකුල් දෙක මැද්දෙ හංගලා තියෙනවා වගෙයි. උඹ ඔය බීර එක බොන්නෙ නැත්තං ඕක මෙහෙ දියං." අඟ අතට ගත් ඔහු හිස පසුපසට ඇල කලේ, බීර සියල්ල එක උගුරට බී මුව පිස දැමීය. "මට උඹේ කෙල්ල ගැන හරිම කණගාටුයි නෙඩ්. ඇත්තටම. මම කියන්නෙ අර වෘකයා ගැන. මගේ පුතා බොරු කිවුවා. ඒ ගැන සැකයක් නෑ, ඕනනං මම මගෙ ආත්මෙ උකසට තියන්නම්. මගේ පුතා... උඹ උඹේ දරුවන්ට ආදරෙයි. එහෙම නේද?"

"මගේ මුලු හදවතින්ම."

"මම උඹට පොඩි රහසක් කියන්නං නෙඩ්. ගොඩාක් සැරයක් මම හීන දැකලා තියෙනවා මේ රජකම අත ඇරලා දාන්ට. මගේ අශ්වයයි මගේ යගදාවයි අරන් නැවක නැගලා නිදහස් නගරවලට යන්ට. මගේ ඉතුරු ජීවිත කාලෙ යුද්ධ කර කර, ගෑනු පස්සෙ ගිහිල්ලා ගෙවලා දාන්ට. මම ඉපදිලා තියෙන්නෙ ඒකටයි. කොහොමද ගායකයො මං ගැන සින්දු හදනකොට. 'කුලී භේවා රජතුමා', උං මට එහෙම කියයි නේද? උඹ දන්නවද මොකක්ද මාව ඒකෙන් නවත්තන්නෙ කියලා. මගේ පුතා ජොෆ්රි සිංහාසනේ වාඩිවෙලා ඉන්නවා කියන සිතුවිල්ල. එයාගෙ කණට කොඳුරලා උපදෙස් දෙන්ට සෙර්සි ඉන්නවා නේද කියන සිතුවිල්ල. මගේ පුතා! කොහොමද මට ඒ වගේ පුතෙක් හම්බවුනේ නෙඩ්?"

"එයා තාම කොල්ලෙක්නෙ." නෙඩ් කීය. ජොෆ්රි කුමරා ගැන ඔහු ගේ සිතේ කිසිදු පැහැදීමක් නොවීය. එහෙත් රොබර්ට්ගේ වදන්වල, ඒ ස්වරයේ තිබුනු වේදනාව ඔහු හඳුනාගත්තේ ය. "ඔබට අමතකද ඔය වයසෙදි ඔබ කොච්චර නම් දඩබ්බරයෙක්ද කියලා."

රොබර්ට් බරතියන්

"මේ කොල්ලා දඩබ්බරයෙක් නම් ඒක මෙච්චර මගේ හිතට වද දෙන්නෙ නෑ නෙඩ්. මං ඌව දන්න තරම් උඹ ඌව දන්නෙ නෑ." දිගු සුසුමක් හෙලූ ඔහු හිස දෙපසට වැනීය. "ආහ්! සමහරවිට උඹ හරි වෙන්ට ඇති. ජොන් මං නිසා කොච්චර නම් බලාපොරොත්තු නැති තත්ත්වෙට පත් වුනාද. ඒ වුනත් මම හොඳ රජෙක් වුනා නෙව." නෙඩ් දෙස බැලූ රොබර්ට් ඔහු ගේ නිහඬතාව නිසා මුහුණ පැඹිරි කරගත්තේ ය. "උඹ දන්නවද, දැන් උඹට කරන්ට තියෙන්නෙ කට ඇරලා ඔවු කියලා මගෙත් එක්ක එකඟ වෙන එකයි."

"මගේ ස්වාමිනී..." නෙඩ් පරෙස්සමින් කතාව ඇරඹී ය.

රොබර්ට් නෙඩ් ගේ පිටට අතුල් පහරක් දුන්නේ ය. "ආහ්! කියපං මම අඩුගානෙ ඒරිස්ට වඩා හොඳ රජ කෙනෙක් නේද කියලා. මම දන්නවා උඹ කවදාවත් බොරු කියන්ට අකැමැතියි කියලා නෙඩ් ස්ටාර්ක්. මම තාම තරුණයිනෙ. අනිත් එක දැන් උඹත් මගෙ ගාව ඉන්න එකේ තත්ත්වය ඉස්සරහට වෙනස් වෙයි. අපි දෙන්නා එකතුවෙලා මේ රාජ්‍ය කාලය සුඛිත මුදිත එකක් කරමු. එතකොට කවියො ඒ ගැන සිංදු ලියයි. ගායකයො ඒ ගැන සිංදු කියයි. අර මලඉලවු ලැනිස්ටර්ලා ටික අපායටම එලවලා දාමු. හ්ම්ම්ම්..... මට

බේකන් සුවඳක් එනවා. අද කවුරු ජයග්‍රාහකයා වෙයි කියලද උඹ හිතන්නෙ? උඹ දැක්කද අර මේස් ටිරල්ගෙ කොල්ලා සටන් කරන හැටි? උං එයාට කියන්නෙ කුසුම් නයිට්වරයා කියලා. අන්න ඉන්නවා පුතෙක් ඕනෑම තාත්තා කෙනෙකුට ආඩම්බර වෙන්ට පුළුවන් ජාතියෙ. පහුගිය තරගාවලියෙදි ඌ ජේමිව තට්ටමෙන් ඉන්දවෙන්ට බිම වැට්ටුවා. උඹ දකින්ට තිබුනෙ ඒ වෙලාවෙ සෙර්සිගෙ මූනෙ හැටි. හිනාවෙලා හිනාවෙලා මගෙ ඉළඇටත් රිදෙන්ට ගත්තා. රෙන්ලි කියනවා ඌට ඉන්නවාලු නංගි කෙනෙක්. උදේ වැටුන පින්නක් වගේ ලස්සන අවුරුදු දාහතරක කෙල්ලක්..."

ඔවුහු ගඟ අද්දර සූදානම් කරන ලද මේසයකට වාඩි වී උදෑසන ආහාරය වෙනුවෙන් කළු පාන්, තැම්බූ පාත්ත බිත්තර, බේකන් සහ ලූණුත් සමග බැදපු මාළු අනුභව කලහ. රජතුමා ගේ සිතේ පිරී තිබුනු උකටලී බව උදෑසන පින්නත් සමගින් අතුරුදන්ව ගොස් තිබින. වැඩිවේලා යන්නට පෙර රොබර්ට් දොඩම් ගෙඩියක් රස විඳිමින් කොලු කාලයේ ඔවුන් ඉයරිහි ගතකල අවධිය ගැන මහත් අභිරුචියෙන් කතා කරමින් හුන්නේ ය. "...ජොන්ට දොඩම් පිරිච්ච පීප්පයක් ගෙනත් දුන්නා උඹට මතකද? එකම වැරැද්ද ඒවා නරක් වෙලා තිබ්බ එකයි. ඉතිං මම මගේ දොඩම් ගෙඩිය මේසේ හරහා එල්ල කරා කෙලින්ම ඩැක්ස්ගෙ නාහෙට. මතකනෙ ඩැක්ස්? අර රෙඩ්ෆෝර්ට්ගෙ සහවරයා. ඌත් අනිත් පැත්තට මට එකක් එවුවා. ජොන්ට පඩයක් අරින්ටවත් වෙලාවක් යන්ට කලින් ප්‍රධාන ශාලාව පුරාම එහාටයි මෙහාටයි දොඩම් ගෙඩි පියාඹන්ට පටන්ගත්තා." ඔහු කොක්හඬලමින් සිනාසෙන්නට විය. මේ සුන්දර මතකයන් නෙඩ් ගේ ද මුවේ සිනාවක් මතුකරන්නට සමත් විය.

මේ වනාහි ඔහුත් සමග හැදුනු වැඩුනු කොලුවා විය. මේ වනාහි ඔහු ආදරය කල, ඔහු දැන සිටි නියම රොබර්ට් බරතියන් විය. බ්‍රැන්ට සිදු වූ ප්‍රහාරය පිටුපස ලැනිස්ටර්වරුන් ඇති බව ඔප්පු කරගත හැකි වුවහොත්, ඔවුන් විසින් ජොන් ඒරින් මරා දමන ලද බව ඔප්පු කරගත හැකි වුවහොත් මේ මිනිසා ඊට ඇහුම්කන් දෙනු ඇත. එවිට සෙර්සි ලැනිස්ටර් ගේ බලපරාක්‍රමය බිඳී යනු ඇත. ඇයත් සමගින් රජුන් මරන්නාද බිඳවැටෙනු ඇත. ටයිවින් ලැනිස්ටර් බටහිර පැත්තේ කැරළි ගැසීමට සූදානම් වුවහොත් ගංගා ත්‍රිශූලයේදී රේගාර් ටාර්ගේරියන්ව පාගා දැමුවාක් මෙන් රොබර්ට් විසින් ඔහුවද පාගා චප්ප කර දමනු ඇත. මේ සියල්ල නෙඩ් ගේ සිතේ පැහැදිලිව ඇඳී ගියේය.

Petyr Baelish: “Even hungry dogs know better than to bite the hand that feeds them.”

මේ සුබදායක සිතුවිලි විසින් අද උදෑසන ආහාරය එඩාර්ඩ් ස්ටාර්ක් බොහෝ කලකට පසු ගත් රසවත්ම අහර වේලක් බවට පත්කලේ ය. ඔහු ගේ සිනාවද පෙරට වඩා ප්‍රබෝධවත් හා නිතර දැකිය හැක්කක් විය. අඩුම ගනනේ තරගාවලිය ඇරඹෙන තෙක් වත් එය එසේ විය.

නෙඩ් රජුත් සමග තරග පිටියට ඇවිද ගියේය. අවසන් සටන් කිහිපය නැරඹීමට ඇය හා එක්වන බවට ඔහු සන්සාට පොරොන්දු වී තිබින. සෙප්ටා මෝර්ඩේන් අසනීප තත්ත්වයෙන් සිටි අතර අසරු පොරයේ අවසානය කෙසේ හෝ නැරඹීමට සන්සා දැඩිව අදිටන් කරගෙන තිබින. රජතුමාව ඔහුට හිමි ආසනය වෙත කැඳවාගෙන යන අතර අද දිනයේ තරග නැරඹීමට සෙර්සි ලැනිස්ටර් පැමිණ නොමැති බැව් ඔහු නිරීක්ෂණය කලේය. රජු ගේ අසුනට අනිත් පසින් වූ අසුන හිස්ව තිබින. මෙයද නෙඩ් ගේ සිතේ යහපත් බලාපොරොත්තු ඇතිකරලීමට සමත් විය.

සෙනග පීරාගෙන සිය දියණිය අසුන් ගෙන සිටි ස්ථානයට පිවිසුනු නෙඩ් අසුනේ වාඩි වෙද්දීම වාගේ දිනයේ පළමු අසරු පොරය සඳහා හොරණෑ නාද විය. සන්සා ගේ සිත කෙතරම් දුරට තරගය කෙරෙහි ඇදී ගොස් තිබුනාදැයි කිවහොත් ඔහු ගේ පැමිණීම පවා ඇය නොදත්තා ය.

සැන්ඩෝර් ක්ලිගේන් පළමුව පිටියට අවතීර්ණ විය. සිය දැළි පැහැති සන්නාහයට උඩින් ඔහු ඔලිව් කොළ පැහැ සළුවක් පැළැඳ සිටියේ ය. එය සහ ඔහු ගේ සුනඛ හිස් ශිරස්කය හැරෙන්නට අන් කිසිදු අලංකරණ ආයිත්තමක් ඔහු පැළැඳ නොසිටියේ ය.

"රජුන් මරන්නා වෙනුවෙන් රන්කාසි සීයයි!" සිය උත්තුංග ලේ රතු පැහැ සෛන්ධවයා පිට නැගුනු ජේමි ලැනිස්ටර් තරග පිටියට ඇතුළුවෙද්දී සුළැඟිල්ලා මහහඬින් නිවේදනය කර සිටියේ ය. ඔහු ගේ සෛන්ධවයා රන් ආලේපිත මුදු දම්වැල් සන්නාහයකින් සරසා තිබූ අතර ජේමි හිසේ සිට දෙපතුල දක්වාම රන් පැහැයෙන් බැබලින. ඔහු ගේ ලන්සය පවා ගිම්හාන දූපත්වලින් ගෙන්වන ලද රන් පැහැ දැවයෙන් නිම කෙරුනක් විය.

"ඔට්ටුයි!" රෙන්ලි උතුමානන් අභියෝගය බාරගත්තේ ය. "දඩබල්ලාගෙ අද උදේ බොහොම බඩගිනිකාර පෙනුමක් තියෙන්නෙ."

"බඩගිනිකාර බල්ලො වුනත් දන්නවා තමන්ට කන්ට දෙන අත හපාකන්ට හොඳ නෑ කියලා." සුළැඟිල්ලා ඇනුම්පද ස්වරයෙන් පිළිතුරු දුන්නේ ය.

හඬක් නැගෙන අයුරින් සිය දැස්වැස්ම පහත හෙලාගත් දඩබල්ලා සිය තරගාරම්භක ස්ථානයට ප්‍රවිශ්ට විය. නරඹන්නන් අතර සිටි කවුරුන් හෝ කෙල්ලකට චුම්බනයක් පා කර හැරි සෙර් ජේමී සෙමෙන් සිය දැස්වැස්ම පහත් කරගත්තේ තමා ගේ අන්තය ගත්තේ ය. මිනිසුන් දෙදෙනාම සිය ලන්ස තිරස්ව හරවා ගත්තෝ ය.

ඔවුන් දෙදෙනාම පරදිනු දැකීම තරම් අන් සතුටක් නෙඩ් ගේ සිතේ නොවීය. එනමුදු සන්සා තෙත් වූ දෑසින් හා දැවෙන උද්‍යෝගයකින් යුතුව සටන දෙස ඇසිපිය නොහෙලා බලා සිටියා ය. සෙන්ධවයින් දෙදෙනා කෙමෙන් සිය වේගය වැඩිකර ගනිමින් පිම්මේ ඉදිරියට ඇදෙද්දී සිය අසුන් අග්ගිස්සෙහි කෙලින් වාඩි වී, නිය සපමින් නොසන්සුන්ව බලා හුන් ප්‍රේක්ෂක ජනතාව අතර වෙවුලීමක් පැතිර ගියේය. නොසැලෙන දැඩි අතකින් සිය ලන්සය තිරස්ව තබා ගත් දඩබල්ලා මදක් ඉදිරියට නැඹුරු වූ මුත් ගැටුමට ඔන්න මෙන්න කියා තිබියදී ජේමී සිය අසු මත මදක් එහා මෙහා වූයේය. ක්ලිගේන් ගේ ලන්සය කිසිදු අනතුරක් නොකොට සිංහ රුවකින් සැරසුනු පලිහ මතින් ලිස්සා යද්දී ජේමී ගේ ලන්සය හරි ඉලක්කයටම වැදුනේ ය. දැවයෙන් නිම වූ තරග ලන්සය කීතු කීතු වී යද්දී සිය අසු මත රැඳී සිටීම සඳහා දඩබල්ලාට මහත් වෙහෙසක් දැරීමට සිදු විය. සන්සා අමාරුවෙන් හුස්මක් අල්ලාගත් අතර සාමාන්‍ය ජනයා අතර ඔල්වරසන් හඬ පැතිර ගියේය.

"මම මේ කල්පනා කරන්නෙ කොහොමද ඔබේ රන්කාසි ටික වියදම් කරන්නෙ කියලා." සුළැඟිල්ලා රෙන්ලි උතුමානන්ට ඇසෙන්නට කීවේය.

කෙසේ වුවද සිය අසු මත රැඳී සිටීමට දඩබල්ලා සමත් විය. වැරෙන් සිය අසු හරවාගත් ඔහු දෙවන වටය සඳහා තරගාරම්භක ස්ථානයට ප්‍රවිශ්ට විය. කැඩුනු ලන්සය වීසිකර දැමූ ජේමී ලැනිස්ටර් සිය සහචරයා සමග විහිළු කරමින් අලුත් ලන්සයක් ලබා ගත්තේ ය. දඩබල්ලා මෙවර වේගවත් පිම්මකින් අසු ඉදිරියට මෙහෙයවීය. ලැනිස්ටර් ඔහු හමුවීමට ඉදිරියට

ගියේය. මෙවර ජේමී සිය අසුනේ එහා මෙහා වූ විට දඩබල්ලා ඒ අනුව සිය ලන්සයද එහා මෙහා කලේය. ලන්ස දෙකම එකිනෙක ඉලක්කය මත හැප්පුනේ මහත් හඬක් නැගීය. අසු කුර මගින් නැගුනු දූහුවිල්ල මැකී යද්දී දක්නට ලැබුනේ ලේ රතු පැහැ අසෙකු ඉවතට දිවයද්දී සෙර් ජේමි ලැනිස්ටර් බිම වැතිර සිටින ආකාරයයි.

"මම දැනන් හිටියා දඩබල්ලා දිනනවා කියලා." සන්සා උද්දාමයෙන් කෑගැසුවා ය.

සුළැඟිල්ලාට මෙය ඇසින. "ඔබ දන්නවානම් කවුද දෙවෙනි තරගෙන් දිනන්ට යන්නෙ කියලා, දැන්ම කියන්ට. නැත්තං රෙන්ලි උතුමානන් මාව සුද්ද කරයි." ඔහු ඇයට කීවේය. නෙඩ් සිනහවක් පෑවේය.

"පුංචි යකා අද මෙතැන නැති එක කණගාටුවට කාරණයක්." රෙන්ලි උතුමානන් කීය. "එහෙමනං මට දෙගුණයක් සල්ලි හොයන්ට තිබුනා."

ජේමි ලැනිස්ටර් දෙපයින් නැගිට සිටියේ ය. එනමුදු වැටීම නිසා ඔහු ගේ සිංහ හිස් ශිරස්කය තැලී ඇදවී ගොස් තිබුනු අතර එය ගලවාගැනීම කල හැක්කක් නොවීය. සාමාන්‍ය ජනතාව එදෙසට ඇඟිලි දිගුකරමින් හූ තලමින් සිනාසුනු අතර වංශාධිපතීන් හා වංශාධිපතිනියන් සිය සිනා මැඩගැනීමට අසාර්ථක උත්සාහයක නිරත වූහ. මේ සියලු හඬවල් අභිබවමින් රොබර්ට් රජතුමා කොක්හඬලා සිනාසෙන අන්දම නෙඩ්ට අසන්නට ලැබින. අන්තිමේදී ඔවුන්ට ලැනිස්ටර් සිංහයා කම්මල්කරුවකු වෙත කැඳවාගෙන යාමට සිදුවිය.

මේ වනවිට සෙර් ග්‍රෙගර් ක්ලිගේන් සිය තරගාරම්භක ස්ථානයට වාර්ථා කර තිබින. ඔහු දැවැන්ත, එඩාර්ඩ් ස්ටාර්ක් මෙතෙක් කලකට දැක ඇති දැවැන්තම මිනිසා විය. රොබර්ට් බරතියන් හා ඔහු ගේ සොයුරන් සැවොම දැවැන්ත මිනිසුන් වූහ. දඩබල්ලාද දැවැන්තයෙකු විය. වින්ටර්ෆෙල්හි සිටින හොඩෝර් නමැති මන්දමානසික ඉස්තාල කොලුවා මේ සැවොම පරදවන දැවැන්තයකු විය. එනමුදු 'අසු පිට යන කන්ද' යන නමින් හැඳින්වෙන මේ නයිට්වරයා හොඩෝර්ටද වඩා උසැති යෝධයකු විය. ඔහු අඩි අටකට ආසන්න උසකින් යුතු, උත්තුංග දසරුවකින් හා ගස් කඳන් සිහි ගන්වන අන්දමේ අතපය ඇති යෝධයකු විය. ඔහු ගේ ප්‍රමාණය කෙතරම්ද යත් ඔහු නැග සිටි යුධ සෛන්ධවයා පෝනියකු මෙන් දිස් වූ අතර සුරතේ රැඳි ලන්සය කොසුම්ටක් මෙන් දිස් විය.

ග්‍රෙගර් ක්ලිගේන්

සෙර් ග්‍රෙගර් ඔහු ගේ සොයුරු සැන්ඩෝර් මෙන් රාජසභාවේ දිවි ගෙවූවකු නොවීය. යුද්ධ හා තරගාවලින්ට සහභාගි වීම පිණිස හැර සිය වතුපිටිවලින් බැහැර නොගිය ඔහු හුදෙකලා මිනිසකු විය. කින්ග්ස් ලැන්ඩින්ග් වැටෙද්දී ඔහු ටයිවින් උතුමානන් සමීපයේ සේවය කල දහහත් හැවිරිදි නවක නයිට්වරයකු වූ අතර ඒ වනවිටද සිය ශරීර ශක්තිය, ශරීර ප්‍රමාණය හා සාහසික රෞද්‍රභාවය නිසා නමක් දිනා සිටියකු විය. රේගාර් ගේ බිළිඳු පුත් කුමරුවා වූ ඒගොන් ටාර්ගේරියන් දෙකකුලින් ගෙන බිත්තියක ගසා හිස සුනුවිසුනු කර දැම්මේ ග්‍රෙගර් බව මිනිසුන් අතර පැවැති කතාබහ විය. එයින් පසු රේගාර් ගේ බිරිඳ හා කුඩා කුමරුවා ගේ මව වූ ඩෝර්නිෂ් කුමරියක වන ඊලියා මාර්ටෙල්ව දූෂණය කල ඔහු ඇගේ ගෙල කපා මරා දැමූ බවද මිනිසුන් අතර කතාකෙරුනු පොදු ඕපාදූපයක් විය. කෙසේ වුවද මේ කිසිවක් ග්‍රෙගර්ට ඇසෙන මානයේ දී කතානොකිරීමට මිනිස්සු පරෙස්සම් වූහ.

මේ මිනිසා සමග තමා කිසිදා කතාබහ කර ඇති බවක් නෙඩ් ගේ මතකයේ නොවීය. බේලන් ග්‍රේජෝයි ගේ කැරැල්ල සමයේ ඔවුන් එක්ව යුධ පිණිස ගොස් තිබුනද ග්‍රෙගර් යනු දහසක් නයිට්වරුන් අතරින් එක් අයකු පමණක් විය. ඔහු ග්‍රෙගර් දෙස නොඉවසිලිවන්ත බැල්මක් හෙළීය. නෙඩ් සාමාන්‍යයෙන් ඕපාදූපවලට සවන් දෙන්නකු නොවූවද සෙර් ග්‍රෙගර් සම්බන්ධයෙන් පැවසුනු බොහෝ දේ සාමාන්‍ය අසුභ කතාවලට වඩා වැඩි දෙයක් විය. ඔහු නුදුරු අනාගතයේදීම තෙවන වතාවටද විවාහ වීමට නියමිතව සිටි අතර ඔහු ගේ මුල් බිරින්දෑවරුන් දෙදෙනා ගේ මරණ පිළිබඳ නපුරු රහස් කෙඳිරීම් රැසක් අසන්නට ලැබී තිබිනි. ඔහු ගේ බලකොටුව ක්‍රෑර භයානක ස්ථානයක් වූ අතර එහි විසූ සමහර සේවකයින් හදිසියේම අතුරුදන් වීම සාමාන්‍ය දෙයක් විය. ඔහු ගේ ප්‍රධාන ශාලාවට ඇතුළුවීමට නිවැසි සුනඛයින් පවා බිය වූහ. ඔහු ගේ සොයුරිය ලාබාල වියේදීම මියගොස් තිබුනේ අස්වාභාවික තත්ත්ව යටතේ විය. එමෙන්ම ඔහු ගේ බාල සොයුරාව විරූපී කල ඒ ගින්න ගැන මෙන්ම ඔවුන් ගේ පියා මියගිය, දඩයම් සවාරියක් අතරතුරේදී සිදූ වූ ඒ අනතුර ගැනද සැක මතුවී තිබිනි. පියා ගේ වියොවත් සමගින් ග්‍රෙගර්ට බලකොටුවද, රත්රන්ද, වතුපිටි සියල්ලද උරුම විය. එදිනම සිය නිවෙසින් පිට වූ ඔහු ගේ බාල සොයුරා සැන්ඩෝර් ලැනිස්ටර්වරුන් සමීපයේ සේවයට බැඳුනේ ය. එදා එදායින් පසු ඔහු මේ වනතෙක්, අඩුම තරමේ සංචාරයක් සඳහාවත් සිය නිවෙසට ගොඩ නොවැදුනු බව ප්‍රසිද්ධ රහසකි.

කුසුම් නයිට්වරයා සිය තරග අන්තය වෙත අසු මෙහෙයවද්දී නරඹන්නන් අතර මුනුමුනුවක් පැතිර ගියේය. "අනේ! එයා හරිම ලස්සනයි!" සන්සා ගේ උද්‍යෝගීමත් මිමිනීමද නෙඩ්ට ඇසින. සෙර් ලෝරාස් ටිරල් බටගසක් මෙන් හීන්දැරී වූ අතර එකට ගෙතුනු වයින් රිකිලි හා කුඩා ෆොර්ගෙට්-මී-නොට් මල්වලින් අලංකාර කල අනන්තයටම ඔප දැමූ සුන්දර රජතමය සන්නාහයකින් සැරසී සිටියේ ය. මේ නිල් පැහැ මල් සෑදී තිබුනේ සිය ගණනක් ඉඳුනිල් මිණෙන් බැව් නෙඩ් මෙන්ම අනිකුත් ජනයාද එකවර වටහාගත්තේ දහසක් මුවින් එකවර අසීරු හුස්මක් ඉහළට ඇදින. මේ කොලුවා ගේ උරහිසේ දැවටී තිබුනු බරැති සළුව නිමාවී තිබුනේ සනකම් ලොම් රෙද්දකට තබා මසන ලද සිය ගණනක් වූ සැබෑ ෆොර්ගෙට්-මී-නොට් මල්වලිනි.

ඔහු නැගී සිටියේද අසරුවා මෙන්ම හීන්දැරී, වේගය වෙනුවෙන්ම නිර්මානය කෙරුනු, සුන්දර අළු පැහැ වෙළඹක් මත විය. ඇගේ ඉව වැටුනු සෙර් ග්‍රෙගර් ගේ දැවැන්ත යුධ සෙන්ධවයා මහ හඬින් හේෂාරවය කරන්නට විය. හයිගාර්ඩන්හි සිට පැමිණි කොලුවා වෙළඹට පයින් ඇන සන් කල අතර ඇය සුන්දර නර්තන ලීලාවකින් උජාරු අඩි තබමින් පැත්තෙන් පැත්තට ඇවිද යන්නට වූවාය. සන්සා නෙඩ් ගේ සුරතේ එල්ලුනා ය. "අනේ තාත්තෙ, සෙර් ග්‍රෙගර්ට එයාට හානියක් කරන්ට දෙන්ට එපා." ඇය කීවාය. සෙර් ලෝරාස් විසින් ඇයට පුදදුන් රතු රෝසමල ඇය අද දිනයේ පැළැඳගෙන සිටින බැව් ඔහු නිරීක්ෂණය කලේය. ජොරී මේ සෑම විස්තරයක්ම ඔහුට පවසා තිබින.

"මේවා තරගවලට පාවිච්චි කරන ලන්ස. ඒවා හැප්පුනාම පතුරු යන්ටයි හදලා තියෙන්නෙ. ඒ නිසා කාටවත් හානියක් වෙන්නෙ නෑ." එනමුදුඅද උදැසන කරත්තයේ බහා තිබුනු, අඩසඳ හැඩවලින් හැඩ කෙරුනු සළුවකින් වැසුනු, තරුණයා ගේ මළකඳ ඔහුට සිහිපත් වූ අතර වදන් උගුරේ සිරවී ගියේය.

සෙර් ග්‍රෙගර් මේ වනවිට සිය අසු පාලනය කරගැනීමේ අසීරුතාවකින් පෙළෙමින් සිටියේ ය. සෙන්ධවයා මහහඬින් හේෂාරවය කරමින්, හිස දෙපසට වනමින්, කුරයෙන් බිම පහුරුගාමින් සිටියේ ය. නයිට්වරයා සිය අසුට සන්නාහය ලූ පයින් වැරෙන් පහරක් දුන් අතර අසු ඇකිළී ගියේ ඔහුව පිටමතින් වීසිකර දැමීමට තැත් කලේය.

රජුට ආචාර කල කුසුම් නයිට්වරයා තරගපිටියේ ඈත කොණට ගොස් සිය ලන්සය පහත් කරගත්තේ ය. සෙර් ග්‍රෙගර් තවමත් සිය අසු පාලනය කරගන්නට දඟලමින් උන්නේ ඌව සටන් පථයට රැගෙන ආවේය. ඊළඟ මොහොතේ සටන ඇරඹින. ග්‍රෙගර් ගේ

සෙන්ධවයා චණ්ඩ අයුරින් පිම්මේ ඉදිරියට පිනූ අතර ලෝරාස් ගේ වෙළඹ සේද මෙන් සුමුදුව අඩි තබමින් පියාඹා ආවාය. සෙර් ග්‍රෙගර් සිය පලිහ නියමිත අයුරින් ස්ථානගත කරගෙන ලන්සය ඉදිරියට දිගු කරගෙන හුන් නමුදු සිය වියරු වැටුනු අසු තනි රේඛාවක ධාවනය කරවීමට නොතිත් උත්සාහයක් දරමින් හුන්නේ ය. ඊළඟ මොහොතේ ලෝරාස් ටිරල් ඔහු මත කඩාපැන්නේ සිය ලන්ස තුඩ හරියටම නියමිත ඉලක්කය මත ස්ථානගත කල අතර ඇසිපිය ගසන පමාවෙන් කන්ද කඩා හැලෙන්නට විය. සෙර් ග්‍රෙගර් කෙතරම් විසල් දැවැන්තයෙකු වීද යත් ඔහු බිම වැටුනේ තනිවම නොවීය. ඒ සමගින් ඔහු ගේ අසුද සන්නාහය හඬ නංවමින් දැවැන්ත මාංශ පොදියක් මෙන් බිම පතිත විය.

අත්පොළසන්, ඔල්වරසන්, ප්‍රීතිඝෝෂා, සියුරුහඬලෑම්, මිමිනීම් මේ සියල්ලෙන් තරගපිටිය වැසී ගියේය. එනමුදු මේ සැමට ඉහළින් දඩබල්ලා ගේ ගොරෝසු සිනාහඬ පැහැදිලිව ඇසෙන්නට විය. කුසුම් නයිට්වරයා පිටියේ සිය තරග අන්තයේ අසු නවත්වා නරඹන්නන්ට ආචාර කලේය. ඔහු ගේ පහරදීම කෙතරම් හුරුබුහුටි වීද යත් පහර නිසා ලන්සයට කිසිදු හානියක් සිදු වී නොතිබින. ඔහු සිනාසෙමින් සිය දැස් ආවරණය ඉවත් කරද්දී ගත පැළැඳි ඉඳුනිල් මිණි හිරු එළියේ බැබලින. සාමාන්‍ය ජනතාව වියරුවෙන් මෙන් ඔහුට සුබ පතන්නට, ඔහු වෙනුවෙන් ජයඝෝෂා නගන්නට වූහ.

තරග පිටිය මැද්දේ අසුට යටවී සිටි සෙර් ග්‍රෙගර් අසුගෙන් සිය දෙපා මුදවා ගත්තේ නැගිට සිටියේ ය. සිය ශිරස්කය ගැලවූ ඔහු එය වැරෙන් බිම ගැසීය. ඔහු ගේ මුහුණ ක්‍රෝධය නිසා කළු පැහැ ගැන්වී තිබින, ඔහු ගේ කෙහෙරැලි වියරු වෙසින් දෑස වසමින් මුහුණට වැටී තිබින. "මගේ කඩුව ගෙනෙං." ඔහු සිය සහචරයාට කෑගැසූ අතර කොලුවා අසිපතත් රැගෙන ඔහු වෙත දිව ගියේය. මේ වනවිට බිම වැටුනු ඔහු ගේ යුධ සෙන්ධවයාද නැවත සිවුපා මතින් නැගිට සිටියේ ය.

ග්‍රෙගර් ක්ලිගේන් සිය අසුට එල්ල කල එකම එක පහර කෙතරම් දරුණු කෙතරම් ප්‍රබල එකක් වීද යත් අසු ගේ ගෙල අඩක් කැපී වෙන්වී ගියේය. එක් හදගැස්මක කාලය තුල ප්‍රීතිඝෝෂා සියල්ල භීතියෙන් කල කෑගැසීම් වලට පෙරලින. අසු දණින් වැටුනේ වේදනාවෙන් කෑගසමින් මියයන්නට විය. ඒ වනවිටත් සෙර් ග්‍රෙගර් ලේ වැකුනු අසිපත සුරතින් දරා දිගු පියවර තබමින් සෙර් ලෝරාස් ටිරල් වෙත යමින් සිටියේ ය. "ඌව නවත්තපල්ලා!" නෙඩ් කෑගැසීය. එනමුදු පිටිය පුරා නැගෙමින් තිබුනු ඝෝෂාව මධ්‍යයේ ඔහු ගේ හඬ ගිලී ගියේය. සැමදෙනාම කෑගසන්නට පටන්ගෙන තිබින. සන්සා හඬන්නට පටන් ගත්තාය.

සෑම දෙයක්ම විදුලි වේගයෙන් සිදු විය. කුසුම් නයිට්වරයා සිය අසිපත ඉල්ලා කැගසද්දී ඔහු ගේ සහචරයා පසෙකට වීසිවන සේ පහරක් දුන් සෙර් ග්‍රෙගර් වෙළඹ ගේ තෝන් ලණුව අල්ලාගැනීමට උත්සාහ කලේය. ලේ ගඳ දැනුනු සත්ත්වයා පස්සෙන් පස්සට ගියාය. ලෝරාස් ටිරල් තවමත් සිය වෙළඹ මත රැඳී සිටියද තත්ත්වය අවදානම් විය. දැතින්ම සිය අසිපත එසවූ සෙර් ග්‍රෙගර් දරුණු පහරක් එල්ල කල අතර කොලුවා ගේ පපුවට වැදුනු එම පහරින් ඔහු අසු පිටින් විසි වී බිම පතිත විය. සෙර් ලෝරාස් තෝන්තුවාවෙන් මෙන් බිම වැටී සිටියදී ඔහු ගේ වෙළඹ තැතිගත්තී ඉවත දිව ගියාය. මාරාන්තික පහර එල්ල කිරීම සඳහා සෙර් ග්‍රෙගර් අසිපත එසවීය.

"ඌට ඉන්ට දීපං." ගොරෝසු හඬක් කෑගැසීය. සන්නාහයෙන් වැසුනු හස්තයක් විසින් සෙර් ග්‍රෙගර්ව ලෝරාස් වෙතින් ඇද ඉවත දැමීය.

කන්ද, උතුරාගිය වියරුවෙන් වටයක් කරකැවුනේ, සිය සිරුරේ මුලුමහත් අමානුෂික ශක්තිය යොදවා මාරාන්තික අසිපත් ප්‍රහාරයක් එල්ල කලේය. එනමුදු පහර වැළැකූ දඩබල්ලා ප්‍රති පහරක් එල්ල කලේය. අනන්තයක් මෙන් දිස් වූ කාලාන්තරයක් තුළ සොයුරන් දෙදෙනා එකිනෙකා සමගින් මෙසේ ඇනකොටා ගනිද්දී කිහිපදෙනෙක් එකතුව තෝන්තුවාවෙන් වැටී සිටි ලෝරාස් ටිරල්ව ආරක්ෂිත ස්ථානයක් කරා රැගෙන ගියහ. තෙවතාවක්ම සෙර් ග්‍රෙගර් විසින් දඩබල්ලා ගේ ශිරස්කයට දරුණු පහර එල්ල කලද සැන්ඩෝර් එක්වරක් වත් සිය සොයුරා ගේ අනාරක්ෂිත හිසට පහර එල්ල කිරීමට තැත්කරනු නොඩ නොදිටී ය.

අන්තිමේදී මේ සටනට නැවැතීමේ තිත තැබීමට රජු ගේ අණට හැකිවිය... රජ අණට හා තවත් අසිපත් විස්සකට හැකිවිය. ජොන් ඒරින් වරක් ඔවුන්ට උගන්වා තිබුනු පරිදි හොඳ අණදෙන නිළධාරියකුට සුපිරි මට්ටමේ යුධබිම් හඬක් තිබිය යුතු විය. රොබර්ට් ඒ බැව් ගංගා ත්‍රිශූලයේදී ඔප්පු කර තිබින. ඔහු මේ මොහොතේද ඒ සුපිරි හඬ භාවිතයට ගත්තේ ය. "මේ විකාරෙ නවත්තපියවු දැන්මම!" ඔහු ගිගුම් දුන්නේ ය. "තොපේ රජතුමායි මේ අණ කරන්නෙ."

දඩබල්ලා අඬදණින් වැටුනේ ය. සෙර් ග්‍රෙගර් එල්ල කල පහර ඔහු ගේ හිසට ඉහළින් වාතය කපාගෙන ඇදී ගියේය. අන්තිමේදී කන්දට ප්‍රකෘති සිහිය ලැබින. සිය අසිපත පහත් කල ඔහු රාජ්‍යාරක්ෂක බලකාය හා තවත් දුසිමක් පමණ නයිට්වරුන් සහ සෙබළුන් පිරිවරා සිටි රජතුමා දෙස රවා බැලීය. වදනකුදු නොදෙඩූ ඔහු අනිත් පස හැරී සෙර් බැරිස්ටාන් සෙල්මි ගේ සිරුරේ හැපීගෙන ඉක්මන් ගමනින් එතැනින් ඉවත් වූයේය. "ඌට යන්ට දීපල්ලා." රොබර්ට් කීය. එතැනින් ඒ නාටකය හමාර විය.

"දැන් එතකොට දඩබල්ලාද තරගාවලියෙ ජයග්‍රාහකයා වෙන්නෙ?" සන්සා නෙඩ්ගෙන් ඇසුවා ය.

"නෑ. තව අවසාන වටයක් තියෙනවා. දඩබල්ලයි ලෝරාසුයි අතරේ."

එනමුදු සන්සා නිවැරැදි වූවාය. මඳ වේලාවකට පසු සාමාන්‍ය ඇඳුමින් සැරසී පිටියට බට සෙර් ලෝරාස් ටිරල් දඩබල්ලා වෙත ගමන් කලේය. "මම ඔබට මගේ මුලු ජීවිතයෙන්ම ණයගැතියි. අද දවසේ ජයග්‍රාහකයා ඔබයි සෙර්."

"මම සෙර් කෙනෙක් නෙවෙයි." දඩබල්ලා පිළිතුරු දුනි. එනමුදු ඔහු ජයග්‍රහනය බාරගත් අතර ජයග්‍රාහකයා ගේ තෑගි මල්ලද ඔහුට හිමිවිය. එමෙන්ම - සමහරවිට ඔහු ගේ දිවියේ පළමුවරට - ඔහුට පොදුජනයා ගේ ආදරයද හිමිවිය. ඔහු තරග පිටියෙන් නික්ම සිය මණ්ඩපය බලා යද්දී සාමාන්‍ය ජනයා ඔහු වෙනුවෙන් ජයඝෝෂා නැගූහ.

නෙඩ් සන්සාත් සමග දුනුපිටිය වෙත ගමන් කරද්දී සුළැඟිල්ලා, රෙන්ලි උතුමානන් හා තවත් කිහිප දෙනෙක් ඔවුන්ට එක් වූහ. "ටිරල් අනිවාර්යයෙන්ම දැනගෙන ඉන්ට ඇති ඒ වෙළඹ මදකිපෙන කාලෙ ඉන්න එකියක් කියලා." සුළැඟිල්ලා පැවසීය. "මම දිවුරලා කියන්නම්, ඒ කොල්ලා මේ හැමදේම සැලසුම් කරලයි කරන්ට ඇත්තෙ. ග්‍රෙගර් හැමවෙලාවෙම වගේ සිහිබුද්ධිය තියෙන අශ්වයින්ට වඩා ප්‍රචණ්ඩ අශ්වයින්ට කැමැතියි."

සෙර් බැරිස්ටාන් සෙල්මි මෙයින් සතුටට පත් වූයේ නැත. "වංචා කරලා දිනන එකේ කිසිම ගෞරවනීය බවක් නෑ." ඔහු දරදඬු ස්වරයෙන් කීය. "ගෞරවයක් නැතිවුනාට එතන රන්කාසි විසිදාහක් තියෙනවනෙ." රෙන්ලි උතුමානන් සිනාසුනේ ය.

ඩෝරිනිෂ් වගුරුබිම් වලින් පැමිණි, මින් පෙර කිසිදා කිසිවෙකු නම අසා නොතිබුනු, ඇන්ගයි නම් වූ සාමාන්‍ය තරුණයෙක් දුනුවායන් ගේ තරගය ජයග්‍රහනය කලේය. අන්තිම වටයට පැමිණි අනිත් තරගකරුවන් දෙදෙනා වූ සෙර් බේලන් ස්වෝන් හා ජලබාර් ෂෝ ඉක්මවා පියවර සියයක දුරකින් තරගය දිනන්නට ඔහුට හැකිවිය. නෙඩ් විසින් හස්තයේ ආරක්ෂක බලමුළුවේ තනතුරක් වෙනුවෙන් ඔහුව බඳවාගනු පිණිස ඇලන්ව ඔහු සොයා පිටත්කර හැරිය නමුදු වයින් මතින් හා ජයග්‍රහනයෙන් උද්දාම වී සිටි මේ කොළුවා ඔහුව නොතකා හැරියේ ය.

මිශ්‍ර සටන තුන් පැයක් පුරා ඇදීගියේය. හතලිහක් පමණ වූ නිදහස් අසරුවන්, දෙවන පෙළ නයිට්වරුන් සහ අලුත පත්කෙරුනු සහවරයින් සිය වාසනාව උරගාබැලීමේ හා තමන් ගේ නම පතළ කරගැනීමේ අරමුණින් යුධ වැදී සිටියහ. ඔවුහු මොට්ට ආයුධ රැගෙන, වරෙක කුඩා කණ්ඩායම් සාදාගෙන අන් කණ්ඩායම්වලට විරුද්ධව ද, ඉන්පසු එකම කණ්ඩායමේ සාමාජිකයින් අතර ද වශයෙන් නොනවතින සටනක නියැලී හුන්හ. ඔවුහු මිත්‍ර සන්ධාන ඇතිකර ගනිමින්, නැවත ඒවා බිඳ දමමින් අන්තිමේදී එක් මිනිසකු ඉතිරිවන තුරු එකාට එකා මරාගත්හ. මේ තරගයේ ජයග්‍රාහකයා වූයේ හිස මුඩුකොට, ජ්වලිත අසිපතක් රැගෙන උමතුවෙන් මෙන් සටන් වැදි රණකාමී රතු පූජකයකු වූ මර්හි තොරෝස් විය. ඔහු මීට පෙරද මිශ්‍ර සටන් දිනා පුරුදු ඇත්තෙකු විය. ඔහු ගේ ගිනිඇවිලෙන අසිපත නිසා අන් තරගකරුවන් ගේ අසුන් බිය වූ අතර ඔහු කිසිවෙකුටත් බිය නැත්තෙකු විය. කැඩුනු ඉළඇට තුනක්, බිඳුනු අකුඇටයක්, තැලී පොඩිවී ගිය අතැඟිලි දුසිමක් පමණ, තුවාල සිදුවීම නිසා මරාදැමිය යුතු වූ අසුන් දෙදෙනෙක් සහ ගිනිය නොහැකි තරම් වූ කැපුම්, කෙටුම්, තැලීම් පෙලීම්, සීරීම් උළුක්කු වීම් මේ සටනේ අවසාන ගණනය විය. රජතුමා මේ සටනට සහභාගි නොවීම නෙඩ් ගේ ඉමහත් අස්වැසිල්ලට හේතු විය.

Varys: “The Red Keep shelters two sorts of people, those who are loyal to the realm, and those who are loyal only to themselves.”

එදා රාත්‍රියේ පැවැති භෝජන සංග්‍රහය අතරතුරේදී එඩාර්ඩ් ස්ටාර්ක් අන් කවරදාටත් වඩා බලාපොරොත්තු සහගතව උන්නේය. රොබර්ට් ඉතා ඉහළ මට්ටමේ මනෝභාවයකින් සිටි

අතර සෑමකෙනෙකු සමගම විහිළු කරමින් සිනාසෙමින් කාලය ගෙවීය. කිසිදු ලැනිස්ටර්වරයකු පෙනෙනතෙක් මානයේ වත් නොසිටි අතර ඔහු ගේ දූවරුන් දෙදෙනද යහපත් හැසිරීමෙන් යුක්ත වූහ. ජොරී විසින් ආර්යා කැටුව පැමිණි අතර සන්සා ඇයත් සමග සුහදව පිළිසඳරේ යෙදුනා ය. "තරගාවලිය වචනෙන් කියලා ඉවරකරන්ට බැරිතරම් ලස්සනයි." ඇය සුසුමක් හෙලුවා ය. "අපරාදෙ, ඔයත් එන්ටයි තිබුනෙ. ඔයාගෙ නැටුම් පාඩම් කොහොමද?"

"මගේ ඇඟේ ගන්ට දෙයක් නෑ." ආර්යා සතුටින් පැමිණිලි කලාය. ඇය සිය පාදයේ වූ දම්පැහැ ගැන්වුනු විශාල තැලුමක් ඔවුන්ට පෙන්වූවා ය. "ඔයා බොහොම නරක නැට්ටුවෙක් වෙන්ට ඇති." සන්සා සැකසහිත ස්වරයෙන් කීවාය.

භෝජන සංග්‍රහයෙන් පසුව, සන්සා ගායක කණ්ඩායමක් විසින් ගයන්නට යෙදුනු 'මකර නැටුම' නමින් හැඳින්වෙන සැහැල්ලකට සවන් දෙමින් සිටියදී නෙඩ් ආර්යා ගේ තැල්ම පිරික්සා බැලීය. "ෆොරෙල් ඕනෑවටත් වඩා ඔයාව මහන්සි කරන්නෑ කියලා මම හිතනවා." ඔහු කීය.

ආර්යා තනි කකුලෙන් සිටගත්තා ය. ඇය මේ වනවිට මනා අයුරින් සමබරතාව රැකගැනීමට උගෙන සිටියා ය. "සිරියෝ කියන්නෙ හැම වේදනාවක්ම පාඩමක් කියලා. හැම පාඩමකින්ම මාව තව තවත් හොඳ වෙනවා කියලා."

නෙඩ් බැම ඇකිළීය. සිරියෝ ෆොරල් වනාහි ඉහළම තත්ත්වයේ නමක් සාදාගෙන තිබුනු සුපිරි සටන් ශිල්පියෙකු විය. එමෙන්ම ඔහු ගේ විචිත්‍ර බ්‍රාවොසි සටන් විලාසය ආර්යා ගේ කෙට්ටු අසිපත හා මනාව ගැලපින. එසේ වුව... දින කිහිපයකට පෙර ඇය කළු පැහැ රෙදි පටියකින් දෑස් බැඳගෙන සෑම තැනම ඇවිදිමින් සිටියා ය. සිරියෝ තමාට කණින්, නාසයෙන් හා සමින් දකින්නේ කෙසේදැයි උගන්වමින් සිටින බැව් ඒ ගැන විමසූ විට ඇය කීවාය. ඊට පෙර ඇය වටයට කරකැවීම් හා පසු පිනුම් පුහුණුවෙමින් සිටියා ය. "ආර්යා, ඔයාට හොඳටම විශ්වාසද ඔයාට මේක දිගටම කරගෙන යන්ට ඕන කියලා?"

ඇය හිස වැනුවා ය. "හෙට අපි යනවා බළල්ලු අල්ලන්ට."

"බළල්ලු!" නෙඩ් සුසුමක් හෙලුවේ ය. "සමහරවිට මේ බ්‍රාවොසියාව ගෙන්නගත්ත එක අත්වැරැදීමක් වෙන්ට ඇති. ඔයා කැමැතිනම් මම ජොරීට කියන්නම් ඔයාට උගන්නන්ටයි කියලා. එහෙමත් නැත්තං මම හෙමින් සැරේ සෙර් බැරිස්ටාන්ගෙන් අහලා බලන්නම්. එයා තරුණ කාලෙ මේ රාජධානි සප්තකයෙම හිටපු දක්ශම කඩුහරඹ කාරයා."

"මට ඒ කවුරුවත් ඕන නෑ. මට ඕන සිරියෝ."

නෙඩ් සිය කෙහෙරැළි අතරින් ඇඟිලි දිවෙවුවේ ය. ඕනෑම හොඳ සටන් පුහුණුකරුවකු මේ විකාර වෙනුවට ආර්යාට පහරදීම් හා පහර වැළැක්වීම් උගන්වනු ඇත. එනමුදු සිය බාල දියණියව මනාව දැන සිටි ඔහු ඒ මුරණ්ඩු මුහුණින් කියැවෙන්නේ කුමක්දැයි හොඳින් වටහාගත්තේ ය. "ඔයාගෙ කැමැත්තක් එහෙනම්." අනිවාර්යයෙන්ම ඇයට ටික දිනක් යනවිට මේවා එපා වනු ඇත. "ඒ වුනාට ඔයා පරිස්සම් වෙන්ට වස්තුවෙ."

"මම එහෙම කරන්නම්." ඇය උඩ පැන දකුණු පයින් වම් පයට මාරුවෙමින් පැවසුවා ය.

බොහෝ වේලාවකට පසුව, සිය දියණියන් දෙදෙනාව නැවත ආරක්ෂාකාරීව නිවෙසට කැඳවාගෙන විත් ඔවුන්ව නින්දට යැවූ පසු නෙඩ් ඉහළම මාලයේ වූ සිය කාමරය වෙත පිළිපන්නේ ය. දවස උණුසුම් වූ අතර කාමරය තුළ වාතාශ්‍රය මඳ විය. කවුළුව වෙතට ගිය නෙඩ් බරති පැලැලි පසෙකට කරදැමුවේ කාමරය තුළට සීතල සුළං බිඳක් ලබාගැනීමේ අරමුනිනි. විශාල අංගනයට එහායින් සුළැඟිල්ලා ගේ කාමරවල දිදුලන ඉටිපන්දම් දැල්ල ඔහුට දිස්විය. මේ වනවිට මධ්‍යම රාත්‍රියත් පසුවී තිබුනු අතර ගංඉවුරේ මධුපානෝත්සවය අවසන් වීම ඇරඹී තිබින.

නැවත කිනිස්ස එළියට ගත් ඔහු එය අධ්‍යයනය කලේය. සුළැඟිල්ලාගේ සිරිය, ඔට්ටුවකින් ටිරියන් ලැනිස්ටර් විසින් දිනාගත් සිරිය, බ්‍රැන්ව නින්දේදීම මරා දැමීම පිණිස යැවූ සිරිය. ඇයි? කුරුමිට්ටාට බ්‍රැන් මියයනු දැකීම අවශ්‍ය වූයේ ඇයි? කවරෙකුට හෝ බ්‍රැන් මියයනු දැකීම අවශ්‍ය වූයේ ඇයි?

මේ සිරිය, බ්‍රැන් ගේ වැටීම, මේ සියල්ල කෙසේ හෝ ජොන් ඒරින් ගේ මරණය හා සම්බන්ධකමක් තිබිය යුතුය. ඔහුට එය ඉවෙන් මෙන් හැඟින. එනමුදු ජොන් ඒරින් ගේ

මරණය තවමත් අභිරහසක්ව පවතී. ඔහු තවමත් පටන්ගත් තැනමය. ස්ටැනිස් උතුමානන් තරගාවලිය වෙනුවෙන් කින්ග්ස් ලැන්ඩින්ග්වලට නොපැමිණියේ ය. ලයිසා ඒරින් ඉයරීහි උස් ප්‍රාකාර පිටුපසට වී නිහඬව සැඟවී සිටියි. ජොන් ගේ සහවරයා මියගියේය. ජොරී තවමත් ගනිකා මඩම් පිරික්සමින් සිටියි. රජු ගේ අවජාතකයා හැර ඔහුට තවත් කිසිවක් වෙත්ද?

අර ආයුධ වෙළෙන්දා ගේ බුම්මාගත් ආධුනිකයා රජු ගේ පුතෙකු බවට නෙඩ්ට කිසිදු සැකයක් නොවීය. බරතියන් පෙනුම ඒ මුහුණේ, ඒ දෑසේ, ඒ හණුවල, ඒ තද කළු පැහැ කේශ කලාපයේ හොඳින්ම සටහන් වී ඇත. ඒ වයසේ කොලුවකුට පියා වීමට රෙන්ලි තරුණ වැඩිය. ස්ටැනිස් එවැනි නොහොබිනා ක්‍රියාවක් කිසිදිනෙකත් සිදු නොකරනු ඇත. ජෙන්ඩ්‍රි අනිවාර්යයෙන්ම රොබර්ට් ගේ පුතකු විය යුතුය.

එනමුදු මෙය දැනගත්තා කියා ඔහු සොයාගත් රහස කුමක්ද? රජු ගේ තවත් අවජාතකයින් රැසක් රාජධානි සප්තකය පුරා විසිරී සිටිති. ඔහු විවෘතව පිළිගත්, ඔහු නිසා උසස් කුලීන කාන්තාවකගේ කුසින් බිහිවූ, බ්‍රැන් ගේ වයසේ වූ අවජාතක පුතෙකු මේ වනවිට රෙන්ලි උතුමානන් ගේ නිවාස භාරකරු ගේ රැකවරණය යටතේ ස්ටෝර්ම්ස් එන්ඩ් හි හැදී වැඩෙයි.

රොබර්ට් ගේ පළමු අවජාතක දරුවාද නෙඩ්ට හොඳින් මතකය. ඒ රොබර්ට් කොලුවකුට වඩා යාන්තම් වැඩිමල් වූ වියේදී ඒරින් මිටියාවතේ ඉපදුනු දැරිවියකි. ඇය කෙතරම් සුන්දර සුකොමළ දැරිවියක් වූවාද යත් රොබර්ට් දිනපතාම පාහේ ඇයත් සමග සෙල්ලම් කිරීම පිණිස යාම පුරුද්දක් කරගෙන තිබින. දැරිය ගේ මවත් සමග ඔහු ගේ ඇසුර නැවතීමෙන් පසුව පවා ඔහු එහි යාම පුරුද්දක් කරගෙන සිටියේ ය. කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ නෙඩ්ටද මේ ගමන්වලට සහභාගී වීමට සිදු වී තිබින. දැරියට මේ වනවිට දහහතක් හෝ දහඅටක් විය යුතු බැව් ඔහුට මතක් විය. රොබර්ට් ඇයට පිය පදවිය පුදකරන විට ඔහු ඊටත් වඩා ලාබාල වියේ පසුවිය.

පැහැදිලිවම සෙර්සි සිය සැමියා ගේ අවජාතක දරුවන් නිසා සිත කරදර කරගන්නට ඇත. එනමුදු ඔහුට අවජාතකයින් එකකු සිටියද දහසක් සිටියද එයින් කිසිදු අනතුරක් වන්නේ නැත. නීතිය හා චාරිත්‍ර වාරිත්‍ර අනුව අවජාතකයින්ට සමාජයේ හිමිවූයේ ඉතා පහත් ස්ථානයකි. ජෙන්ඩ්‍රි, මිටියාවතේ දැරිය, ස්ටෝර්ම්ස් එන්ඩ්හි සිටින කොලුවා, මේ කිසිවෙකු රොබර්ට් ගේ සහජාත දරුවන්ට තර්ජනයක් වන්නේ නැත.

ඔහු ගේ කල්පනාවලිය බිඳ දමමින් දොරට පිටතින් කෙරුනු මෘදු තට්ටු කිරීමක් ඇසින. "මිනිහෙක් ඇවිල්ලා ඉන්නවා ඔබතුමාව මුනගැහෙන්ට මගේ උතුමානනි." හාර්වින් කීය. "එයා නම කියන්නෙ නෑ."

"එයාව ඇතුළට එවන්ට."

මේ අමුත්තා තර, අබලන් මඩ තැවරුනු බූට්ස් සපත්තු දෙකකින් දෙපා වසාගත්, රළු දුඹුරු පැහැ ලෝගුවක් හැඳියකු විය. ඔහු හිස වසා ජටාවක් පැළැඳ සිටි අතර ලෝගුවේ දිගැති අත් අතරේ දෑත් සැඟවී ගොස් තිබින.

"උඹ කවුද?" නෙඩ් ඇසීය.

"යාළුවෙක්." අමුත්තා අමුතු පහත් ස්වරයකින් පිළිතුරු දුන්නේ ය. "අපි තනියම කතා කරන්ට අවශ්‍යයි ස්ටාරක් උතුමානනි."

සුපරීක්ෂාකාරීබව මැඩ කුතුහලය නැග ආවේය. "හාර්වින්, පිටවෙන්ට." ඔහු අණ කලේය. ඔවුන් දෙදෙනා දොර පිටුපස තනිවන තෙක් අමුත්තා සිය ජටාව ගැලවූයේ නැත.

"වාරිස් උතුමානනි." නෙඩ් විමතියෙන් කීවේය.

"ස්ටාර්ක් උතුමානනි." වාරිස් කීවේ අසුනකට බර දෙමිනි. "තරහ නැතුව මට බොන්ට මොනවා හරි දෙනවද?"

කුසලාන දෙකකට සමර්වයින් පිරවූ නෙඩ් එකක් වාරිස් අතට දුන්නේ ය. "ඔබට අඩියක් දුරින් පියමං කරලා ගියත් මම ඔබව අඳුරගන්න එකක් නෑ." ඔහු පුදුමයෙන් කීය. පණ්ඩකයා සේද, විල්ලූද හා දමස්ක හැරෙන්නට අන් කිසිවකින් සැරසී සිටිනු ඔහු කිසිදා

දැක නොතිබින. නිතරම ඔහු වෙතින් හැමූ ලයිලැක් සුවඳ වෙනුවට දැන් ඔහු වෙතින් දහදිය ගඳ හමමින් තිබින.

"ඒක තමා මගේ බලාපොරොත්තුව වුනෙත්. අපි දෙන්නා මෙහෙම රහසේ කතා කලා කියලා සමහර උදවිය දැනගන්න එක එච්චර හොඳ දෙයක් නෙවෙයි. රැජිණ බොහොම තදින් ඔබ ගැන ඇහැ ගහගෙනයි ඉන්නෙ. මේ වයින් බොහොම හොඳයි. බොහොම ස්තූතියි!"

"ඔබ කොහොමද මගේ අනිත් ආරක්ෂකයින්ගෙන් ගැලවිලා ආවෙ?" නෙඩ් ඇසීය. පෝර්තර් හා කේයින් ප්‍රධාන දොරටුවට පිටතිනුත්, ඇලන් පඩිපෙළත් රකිමින් සිටින බැව් ඔහු දැන සිටියේ ය.

"රතු බලකොටුව ඇතුළෙ තියෙනවා හොල්මනුයි මකුළුවොයි විතරක් දන්න පාරවල්." වාරිස් සමාව අයැදින අන්දමේ සිනහවක් පෑවේය. "මම වැඩි වෙලාවක් ගන්නෙ නෑ මගේ උතුමානනි. ඔබ දැනගතයුතු දේවල් කීපයක් තියෙනවා. ඔබ රජතුමාගෙ හස්තය. අනිත් එක, රජතුමා මහ මෝඩයෙක්. මම දන්නවා එයා ඔබේ යාළුවා, ඒ වුනත් එයා මහ මෝඩයෙක්... ඒ වගේම එයා විනාශයට කිට්ටු වෙලයි ඉන්නෙ. ඔබ එයාව බේරගත්තෙ නැත්තම්. අද එයා බොහොම කිට්ටුවට ගියා. උං බලාපොරොත්තු වෙලා හිටියෙ මිශ්‍රසටන අතරෙදි රජතුමාව මරන්ට."

සන්ත්‍රාසය නිසා නෙඩ්ට මොහොතක් ගතවන තෙක් කතා කරගත නොහැකි විය. "කවුද?"

වාරිස් සිය වයින් බඳුන තොලගෑවේය. "මම ඔබට ඒකත් කියන්ට ඕනනම් ඔබ රොබර්ට්ටත් වඩා මෝඩයෙක්. ඒ වගේම මම ඉන්නෙ වැරැදි පැත්තෙ."

"ලැනිස්ටර්ලා? රැජිණ? නෑ.... මම ඒක විශ්වාස කරන්නෙ නෑ. සෙර්සි වුනත් එහෙම කරයි කියලා මම හිතන්නෙ නෑ. එයා රොබර්ට්ට කිවුවා සටනට යන්ට එපයි කියලා."

"එයා රොබර්ට්ට තහනම් කලා සටනට යන්ට. එයාගෙ සහෝදරයයි, එයාගෙ නයිට්වරුයි, එයාගෙ රාජසභාවෙන් බාගයකුයි ඉස්සරහා. මට කියන්ට, රොබර්ට්ව මිශ්‍ර සටනට යවන්ට බලකරන්ට ඊට වඩා හොඳ විදියක් තියෙනවද?"

නෙඩ් ගේ බඩ දහලන්නාක් මෙන් දැනින. පණ්ඩකයා හරියටම නියම ඇණයට මිටිපහර ගසා තිබින. යමක් කල නොහැකියැයි, කිරීම සුදුසු නැතැයි, කල යුතු නැතැයි කවරෙකු හෝ රොබර්ට් බරතියන්ට කියන්නේ නම් ඔහු ඒ වැඩය අනිවාර්යයෙන්ම කරනු ඇත. "එයා සටන් වැදුනත් කවුද එඩිතර වෙන්නෙ රොබර්ට්ට පහරදෙන්ට?"

වාරිස් දෙවුර ඇකිලීය. "එතන සටන්කරුවො හතලිහක් හිටියා. ලැනිස්ටර්ලාට හැමතැනම යාළුවො ඉන්නවා. අර ඔක්කොම කලබල අස්සෙ, අශ්වයො කෑ ගහන අස්සෙ, ඇටකටු පොඩිවෙන අස්සෙ, තොරෝස් මිනිහගෙ අර විකාර ගිනිකඩුව වනන අස්සෙ කාගෙ හරි පහරකින් රජතුමා මළොත් කාටද කියන්ට පුළුවන් ඒක මිනීමැරුමක් කියලා? වැඩේ වුනාට පස්සෙ මිනීමරුවා බොහොම ලස්සනට රඟපායි. මට ඇහෙනවා ඇහෙනවා වගේ මිනිහා දුකෙන් වැළපෙන සද්දෙ. ඒ වුනත් මට කිසිම සැකයක් නෑ රජතුමාගෙ දුප්පත් වැන්දඹුව ඒ අහිංසකයට සමාව දෙයි. අපේ හොඳ රජතුමා ජොෆ්රි ඒ අහිංසකයාට රාජකීය සමාවක් ප්‍රදානය කරයි. එහෙමත් නැත්තං සෙර්සි සෙර් ඉලියන්ට කියයි අරුගෙ බෙල්ල කපන්ටයි කියලා. ඒක ලැනිස්ටර්ලාගෙ අවදානම තවත් අඩු කරනවා. එයාලගෙ අහිංසක යාළුවටනම් ඒක ලොකු පුදුමයක් වෙයි."

සිය කේන්තිය නැග එනු නෙඩ්ට දැනින. "ඔබ මේ කුමන්ත්‍රණය ගැන දැනගෙන හිටියා. ඒ වුනත් ඔබ කිසිම දෙයක් කලේ නෑ."

"මම අණදෙන්නෙ රහස් කොඳුරන එවුන්ට. රණකාමීන්ට නෙවෙයි."

"ඔබ මීට කලින් මාව මුනගැහෙන්ට එන්ට තිබුනා."

"හරි මම එහෙම කලා කියමුකො. එතකොට ඔබ මොකක්ද කරන්ට යන්නෙ? ඔබ පණිවුඩෙත් අරන් දුවලා යයි රජතුමා ගාවට. ඔවු නේද? රොබර්ට්ට මේක අහන්ට ලැබුනහම එයා මොනා කරයිද?"

නෙඩ් මොහොතක් සිතා බැලීය. "එයා කියයි උං හැමෝම යකාට ගියාවෙ කියලා. ඊටපස්සෙ එයා සටනට යයි එයා උංට බය නෑ කියලා පෙන්නන්ට."

'මම කිවුවා නේද' යි අසන්නාක් මෙන් වාරිස් දෑත් දිගහැරියේ ය. "මම තව කාරණයක් කියන්නම් එඩාර්ඩ් උතුමානනි. මට කුතුහලයක් තිබුනා ඔබ මොකක් කරයිද කියලා බලාගන්ට. ඔබ මගෙන් ඇහුවා 'ඇයි කලින් මගේ ගාවට ආවෙ නැත්තෙ' කියලා. ඒ මොකද කියනවා නම් මම ඔබව විශ්වාස කලේ නැහැ මගේ උතුමානනි."

"ඔබ මාව විශ්වාස කලේ නෑ?" නෙඩ් අවංකවම තුශ්නීම්භූත වී ගියේය.

"රතු බලකොටුවෙ ජාති දෙකක මිනිස්සු ඉන්නවා එඩාර්ඩ් උතුමානනි. රාජධානියට පක්ෂපාතී අයයි, තමන්ට විතරක් පක්ෂපාතී අයයි. අද උදේ වෙනකම් මම දැනගෙන හිටියෙ නෑ ඔබ කොයි ජාතියෙ කෙනෙක්ද කියලා... ඉතින් ඒ නිසා මම නැවතිලා බලන් හිටියා... ඉතින් දැන් මම සැකයක් නැතුවම දන්නවා." ඔහු පුළුල් සිනහවක් පෑවේය. "මට තේරුම් යන්ට පටන් අරන් තියෙනවා ඇයි රැජිණ ඔබට මෙච්චර බය කියලා."

"ඇය වැඩියෙන්ම බයවෙන්ට ඕන ඔබටයි." නෙඩ් කීය.

"නෑ. මම මම විතරයි. රජතුමා මාව පාවිච්චි කරනවා. ඒත් එයා ඒ ගැන ලැජ්ජා වෙනවා. අපේ රොබර්ට් කියන්නෙ බොහොම ප්‍රබල රණශූරයෙක්. ඒ වගේ කෙනෙක් ඔත්තුකාරයින්ටයි, රහස් කෙදිරිලිවලටයි, නපුංසකයින්ටයි කැමැත්තක් දක්වන්නෙ නෑ. එක දවසක සෙර්සි කෙඳිරිගෑවොත් 'අරූව මරන්ට' කියලා ඊළඟ තත්පරේ ඉලියන් පේයින් මාව හොයන් ඇවිත් මගේ ඔළුව රිටක අමුනයි. එතකොට කවුද මේ දුප්පත් වාරිස් ගැන කණගාටු වෙන්නෙ? උතුරෙවත් දකුණෙවත් කවුරුවත් මකුළුවො ගැන සින්දු කියන්නෙ නෑ." අත දිගු කල ඔහු නෙඩ්ව ස්පර්ෂ කලේය. "ඒ වුනත් ඔබ ස්ටාර්ක් උතුමානනි... මම හිතනවා... නෑ, මම සහතිකෙන්ම දන්නවා... එයා කොහොමවත් ඔබව මරන්නෙ නෑ. එයාගෙ රැජිණ වෙනුවෙන් වත්. අන්න එතැනයි අපේ ගැලවීම තියෙන්නෙ."

මේ සෑම දෙයක්ම ඔනෑවටත් වඩා වැඩිවිය. එක් මොහොතකට එඩාර්ඩ් ස්ටාර්ක්ට නැවත උතුර බලා යාමට සිතින. සරල, වාමි, අවංක, ශීතකාලය හා ප්‍රාකාරයෙන් එහා වසන වනචාරීන් පමණක් තමන් ගේ සතුරන් වන ආදරණීය උතුර. "කිසි සැකයක් නෑ රොබර්ට්ට තවත් ළඟ යාළුවො ඇති." නෙඩ් විරෝධය පෑවේය. "එයාගෙ සහෝදරයො, එයාගෙ-"

"-බිරිඳ?" වාරිස් උපහාසාත්මක සිනහවකින් යුතුව වාක්‍යය අවසන් කලේය. "ඇත්ත, එයාගෙ සහෝදරයො ලැනිස්ටර්ලාට වෛර කරනවා. ඒ වුනත් රැජිණට වෛර කරනවා කියන එකයි රජතුමාට ආදරය කරනවා කියන එකයි දෙකක්. එහෙම නේද? සෙර් බැරිස්ටාන් එයාගෙ ගෞරවයට ආදරය කරනවා. ප්‍රධාන මේස්ටර් පයිසෙල් එයාගෙ තනතුරට ආදරය කරනවා. සුළැඟිල්ලා සුළැඟිල්ලාට ආදරය කරනවා."

"රාජ්‍යාරක්ෂක බලකාය?"

"ඒක නිකංම නිකං කඩදාසිවලින් හදාපු පලිහක් විතරයි. ඔච්චරම පුදුමවෙන්ට එපා ස්ටාර්ක් උතුමානනි. ජේමි ලැනිස්ටර් කියන්නෙත් දිවුරුම් දුන්න සුදු සළුවක්. ඒ වුනත් අපි හැමෝම දන්නවා එයාගෙ දිවුරුම කොච්චර වටිනවද කියලා. රයම් රෙඩ්වින් නැත්තං මකර නයිට්වර ඒමන් කුමාරයා වගේ අය සුදු සළු ඇඳපු කාලෙ ගියා. දැන් එහෙම අය ඉන්නෙ සින්දුවල විතරයි. මේ හත්දෙනාගෙන් සෙර් බැරිස්ටාන් සෙල්මි විතරයි හරිහමන් රාජ්‍යාරක්ෂක නයිට්කෙනෙක් කියන්ට ඉන්නෙ. ඒ වුනත් සෙල්මි දැන් නාකියි. සෙර් බොරෝස්සුයි සෙර් මෙරින්නුයි ඇටකටුවලට යනකම්ම රැජිණගෙ මිනිස්සු. අනිත් අය ගැනත් මට ලොකු සැක තියෙනවා. නෑ මගේ උතුමානනි, අන්තිමේදී කට්ටියම කඩු ඇදගන්න වෙලාව ආවහම ඔබ විතරයි රොබර්ට් බරතියන්ට ඇත්ත යාළුවෙක් කියලා ඉන්නෙ."

"මේ දේවල් රොබර්ට්ට කියන්ට ඕනමයි. ඔබ කියන මේ දේවල් ඇත්තක් නම්, ඔබ කියන දේවලින් කොටසක් හරි ඇත්ත නම්, රජතුමා මේ ගැන දැනගන්ටම ඕන."

"මොනාද අපි එයා ඉස්සරහට අරන් යන සාක්කි? එයාලට විරුද්ධව මගේ වචනද? රැජිණටයි, රජුන් මරන්නාටයි, රජතුමාගෙ සහෝදරයින්ටයි, රාජසභාවටයි, බටහිරයි නැගෙනහිරයි ආරක්ෂකයින්ටයි, කාර්ස්ටලී රොක්වල බලයටයි විරුද්ධව මගේ පුංචි කුරුල්ලො දාන්ටද? ඊට වඩා හොඳයි කෙලින්ම ඉලියන් ජේයින්ට එන්ට කියලා යවනවා.

ඒකෙන් අපි හැමෝටම කාලෙ ඉතිරි වෙයි. මම දන්නවා ඔය පාර කොහෙන්ද ඉවර වෙන්නෙ කියලා."

"ඒ වුනත්, ඔබ කියපු දේවල් ඇත්තනම් උං කල් මර මර ඉඳලා තවත් උත්සාහයක් ගනියි."

"අනිවාර්යයෙන්ම. වැඩිකල්යන්ට කලින්ම ඒක වෙයි කියලා මට බයයි. ඔබ නිසා උං දැන් තවත් නොසන්සුන් වෙලයි ඉන්නෙ එඩාර්ඩ් උතුමානනි. ඒ වුනත් මගේ පුංචි කුරුල්ලො කණ් දීගෙනයි ඉන්නෙ. අපි දෙන්නා එකතුවුනොත් උං හැරෙනකොට අපට කියන්ට පුළුවන් වෙයි." නැගී සිටි ඔහු නැවත ජටාව පැළැඳ ගත්තේ ය. "වයින් වලට බොහොම ස්තූතියි! අපි ආයෙමත් වෙලාවක කතා කරමු. ඊළඟ පාර රාජසභාවෙදි මාව මුනගැහුනම ඔබ හැමදාම කරන විදියට අවඥාවෙන් මා දිහා බලන්ට. ඒක ඔබට අමාරුවක් වෙන එකක් නෑ."

ඔහු දොර අසලට යද්දී නෙඩ් කතා කලේය. "වාරිස්." පණ්ඩකයා ආපසු හැරින. "කොහොමද ජොන් ඒරින් මැරුනෙ?"

"මම කල්පනා කර කර හිටියෙ ඔබ කොයිවෙලාවෙ ඔතැනට එයිද කියලා."

"කියන්ට."

"ඒකට කියන්නෙ 'ලයිස් වල කඳුළු' කියලයි. බොහොම දුර්ලභ, බොහොම මිල අධික වස වර්ගයක්. වතුර වගේ, පාටක් නෑ රසක් නෑ. කිසිම සලකුණක් ඉතුරු කරන්නෙත් නෑ. මම ඒරින් උතුමානන්ගෙන් බැගෑපත්ව ඉල්ලලා හිටියා කෑම පරීක්ෂා කරන කෙනෙක් පත්කරගන්ටයි කියලා. මේ කාමරේ ඉඳන්ම මම ඉල්ලා හිටියා. ඒ වුනත් ඒ ගැන හිතන්ටවත් එයා කැමැති වුනේ නෑ. එයා කිවුවෙ මිනිහෙකුට වඩා බොහොම පහත් එකෙක් ඇරෙන්ට වෙන කෙනෙක් එහෙම දෙයක් ගැන හිතන්නෙ නෑ කියලයි."

නෙඩ්ට සැම සෙයක්ම දැනගැනීමට අවශ්‍ය විය. "කවුද එතකොට එයාට වස දුන්නෙ?"

"කිසිම සැකයක් නෑ, එයත් එක්ක එකට කෑම කාපු, එකට බීම බීපු ළඟම යාළුවෙක්. ආහ්! ඒත් කවුද? එහෙම අය ගොඩක් හිටියා. ඒරින් උතුමානන් කියන්නෙ බොහොම කරුනාවන්ත, හැමදෙනාවම විශ්වාස කරපු කෙනෙක්." පණ්ඩකයා සුසුමක් හෙලීය. "එක කොල්ලෙක් හිටියා. එයාට තිබුනු හැම දෙයක්ම වෙනුවෙන් එයා ජොන් ඒරින්ට ණයගැතියි. ඒ වුනත් වැන්දඹු ඒරින් ආර්යාව එයාගෙ සේවකයින් එක්ක ඉයරිවලට පැනලා යද්දී එයා කින්ග්ස් ලෑන්ඩින්ග්වල නැවතුනා. එයා බොහොම ඉහළට ගියා. මේ ලෝකෙ තරුණයො ඉහළ නගින එක දැකීම මට හැමවෙලාවෙම ලොකු සතුටක්." ඔහු ගේ සෑම වදනක්ම කස පහරක් මෙන් ලෙලදුනි. "එයා තරගාවලියෙදි බොහොම නිර්භීත විදියට සටන් කරන්ට තිබුනා. එයාගෙ අලුත් දිලිසෙන සන්නාහයයි, අර අඩසඳවල් ගෙත්තම් කරපු සළුවයි. ඔබ එයාට කතා කරන්ට කලින් එයා නොහිතපු විදියට මැරුන එක බොහොම ලොකු කනගාටුවට කාරණයක්..."

තමාටත් වස දී ඇත්තාක් මෙන් නෙඩ්ට දැනින. "එයාගෙ සහචරයා. සෙර් හියු." ඇතුළත් ගැට, පිටත් ගැට. මේ සෑම වටකරමින් තවත් ගැට. ඔහු ගේ හිස බමන්නට විය. "ඇයි? ඇයි දැන්? ජොන් ඒරින් අවුරුදු දාහතරක් තිස්සෙ රජතුමාගෙ හස්තය වෙලා හිටියා. උංට එයාව මරලා දාන්ට තරම් එයා මොකක්ද කලේ?"

"එයා ඕන නැති ප්‍රශ්න අහන්ට පටන්ගත්තා." වාරිස් කීවේ දොරින් පිටවෙමිනි.

Eddard Stark: “None of us is ever ready.”

Barristan Selmy: “For knighthood?”

Eddard Stark: “For death.”

ටිරියන් 04-1

අරුණෝදයේ ශීතය අතරේ සිටගෙන, චිගන් විසින් සිය අසු මරා මස්කරනු බලා සිටි ටිරියන් ලැනිස්ටර් ස්ටාර්ක්වරුන් ගේ ණය ගොඩට තවත් එක් ණයක් එක් වූ බැව් සිතේ සනිටුහන් කරගත්තේ ය.

උක්කුටියෙන් වාඩි වී සිටි මේ කුලී හේවායා සිය සතුන් හමගසන පිහියෙන් අසු ගේ උදරය කපා විවෘත කරද්දී ශීතය නිසා මළසිරුරේ උණුසුම වාශ්පයක් මෙන් ඉහළ නැග්ගේ ය. ඔහු ගේ අතැඟිලි දක්ෂ කඩිසර අයුරින් එහා මෙහා දිවුවේ කිසිදු මස් කැබැල්ලක් ඉවත නොයන අයුරින් සතාව හම ගැසුවේය. ලේ ගඳ දැනී කඳු සිංහයින් පැමිණීමට ප්‍රථම වැඩය අහවර කල යුතු විය.

"අපි කාටවත් අද රෑ බඩගින්නෙ ඉන්ට වෙන එකක් නෑ." බ්‍රොන් කීය. මේ කුලී හේවායා ඇටකටු පෙනෙන තරම් කෙට්ටු, දරදඬු සිරුරකින් හෙබි අතර කළු පැහැ දෑස්, කළු පැහැ හිසකෙස් හා කළු පැහැ කෙටි රැවුලකින් යුතු වූයේය.

"සමහරු බඩගින්නෙ ඉදියි." ටිරියන් පිළිතුරු දුන්නේ ය. "මම ආස නෑ අශ්ව මස් කන්ට. විශේෂයෙන්ම මගේම අශ්වයාගෙ මස්."

"මස් කියන්නෙ මස්." බ්‍රොන් දෙවුර අකුළමින් කීය. "ඩොත්රැකියො හරක් මස්, ඌරු මස්වලට වඩා අශ්ව මස්වලට කැමැතියි."

"උඹ හිතන්නෙ මාත් ඩොත්රැකියෙක් කියලද?" ටිරියන් මුහුණ ඇඹුල් කරගනිමින් ඇසීය. සැබැවින්ම ඩොත්රැකියන් අශ්ව මාංසය අනුභව කලද ටිරියන් ඔවුන් ගේ ගති පැවැතුම් පිළිකුල් කලේය.

තුනී මස් පෙත්තක් කපාගත් චිගන් එය ඉහළට අල්ලා පිරික්සා බැලීය. "රස බලන්ට කෑල්ලක් දෙන්ටද කුරුමිට්ටො?"

"මගේ අයියා ජේමී, ඔය වෙළඹ මට දුන්නෙ මගේ විසිතුන්වෙනි උපන්දිනේට තෑග්ගක් විදියට." ටිරියන් වියළි ස්වරයෙන් කීය.

"එහෙනං එයාට අපි වෙනුවෙන් ස්තූති කරහං. උඹට ආයෙ කවදාහරි එයාව දකින්ට ලැබුනොත්." චිගන් සිය කහ පැහැ දත් පෙනෙන සේ නියැවීය. ඔහු අමු මස් පෙත්ත කටවල් දෙකකින් ගිල දැමීය. "හොඳට හැදිච්ච අශ්වයෙක්ගෙ රහ තියෙනවා."

"ඒක ලූණුත් එක්ක බැදලා ගත්තනං ඔයිට වඩා රහයි." බ්‍රොන් කීවේය.

වදනකුදු නොදෙඩූ ටිරියන් බකල ගසමින් එතැනින් ඉවත්ව ගියේය. ශීතය ඔහු ගේ ඇටමිදුළු වලටම කා වැදී තිබුනු අතර දෙපා කෙතරම් තදින් රිදුම් දුන්නේද යත් ඔහුට ඇවිදගත හැකි වූයේ යාන්තමිනි. සමහරවිට මියගිය වෙළඹ ඔහුට වඩා වාසනාවන්ත වූවා විය හැක. ඔහුට තවත් හෝරා කිහිපයක් මෙසේ ඉදිරියට යාමට තිබුනු අතර ඉන්පසු කුඩා අහර කටවල් කිහිපයකින් සෑහීමකට පත් වී සීතල තද පොළොවේ පැය කිහිපයක නින්දක් ලබන්නට තිබින. ගෙවුනු සෑම රැයක්ම මෙසේ වූ අතර ඉදිරියට තිබෙන සෑම රැයක්ම මෙසේ වනු ඇති බැව් ඔහු දැන සිටියේ ය. මෙය කෙසේ අවසන් වනවාදැයි දන්නේ දෙවියන් පමණි. "ඒකි යකාටම ගියාදෙන්." ඔහු කෝපයෙන් කටුකුටු ගෑවේ සිය කණ්ඩායමට එක් වීම පිණිස ඇවිද යන අතරය. "ඒකියි ස්ටාර්ක්ලා ඔක්කොමයි යකාටම ගියාදෙන්."

ඒ මතකය තවමත් අම්හිරි විය. එක මොහොතකදී ඔහු සිය රාත්‍රී ආහාරය ඇනැවුම් කරමින් සිටි අතර ඇසිපිය හෙලන මොහොතක පමාවෙන් අසිපත් ඇදගත් සෙබළුන් පිරිසකට මුහුණ දීමට ඔහුට සිදුවිය. ජයික් සිය අසිපත වෙත සුරත යවමින් හුන් අතර තානායම්පතිනිය යටි උගුරෙන් කෑ ගැසුවා ය. "කඩු ඇදගන්ට එපා. අනේ මෙතන නම් කඩු ඇදගන්ට එපා. කරුනාකරලා මයෙ උතුමනි."

ඔවුන් දෙදෙන කැලි කැලිවලට කැපී යන්නට පළමු ජයික් ගේ අසිපත රැගත් සුරත සෙමින් පහත් කරන්නට ටිරියන්ට හැකි විය. "කෝ උඹේ ආචාරශීලීත්වය ජයික්? අපේ හොඳ තානායම්පතිනිය කියනවා කඩු ඇදගන්ට එපයි කියලා. එයා කියන විදියකට කරපන්." සිය මුවේ සිනාවක් ඇඳ ගැනීමට ඔහු යත්න දැරුවද එය සාර්ථක උත්සාහයක් නොවූ බව

ඔහුටම වැටහින. "ඔබ බොහොම බරපතල අත්වැරැද්දක් කරන්නෙ ස්ටාර්ක් ආර්යාවනි. ඔබේ පුතාට කෙරුනු කිසිම අනතුරකට මගේ සම්බන්ධයක් නෑ. මම දිවුරනවා මගේ ගෞරවය-"

"ලැනිස්ටර් ගෞරවය." ඇය කීවේ එපමනකි. මුලු කාමරයටම පෙනෙන පරිදි ඇය සිය දෑත් එසෙවුවා ය. "උගෙ කිනිස්සෙන් තමා මේ තුවාල කැළැලි ඇති වුනේ. ඒ කිනිස්ස එවලා තිබුනෙ මගේ පුතාගෙ බෙල්ල කපන්ටයි."

ස්ටාර්ක් ආර්යාවගේ දෑතේ ඇති ගැඹුරු තුවාල කැළැල් දැකීමෙන් පිරිස තුළ නැග ආ ක්‍රෝධය දුමාරයක් මෙන් තමා වටා පිරෙනු තමාව සිරකරනු ටිරියන්ට දැනින. "ඌව මරාපං." පිටිපස්සේ සිටි කවුරුන් හෝ බේබද්දෙක් මුරගා කීය. ඊළඟ මොහොතේ ඔහුට යමක් සිතාගන්නටවත් ඉඩක් ලැබෙන්නට පෙර තවත් හඬවල් එයට එක් විය. මීට මොහොතකට පෙර මිත්‍රශීලී වූ ඒ හඬවල් දැන් සතෙකු ගේ ඉව පාරේ පන්නන බලු රැනක් මෙන් ඔහු ගේ රුධිරය ඉල්ලා මුරගාමින් තිබින.

ටිරියන් හඬ නගා කතා කලේ සිය ස්වරයේ ඇති වෙවුලිල්ල මකා දැමීමට උත්සාහ දරමිනි. "ස්ටාර්ක් ආර්යාව විශ්වාස කරනවා නම් මම මොකක්හරි අපරාධයක් වෙනුවෙන් වගකියන්ට ඕනැයි කියලා මම සූදාණම් එයත් එක්ක ගිහිල්ලා ඒකට උත්තර දෙන්ට."

කල හැකි වූ එකම දෙය එය පමණක් විය. මිනිසුන් කපා හෙලා මෙතැනින් පිටව යාමට තැත් කිරීම නිසැක මරණය කැඳවන්නක් විය. ස්ටාර්ක් ආර්යාව ගේ ආයාචනයට පිළිතුරු දීම් වස් අසිපත් දුසිමක් පමණ කොපුවලින් එළියට ඇදී තිබින. හැරෙන්හෝල්හි සෙබළා, බ්‍රැකන්වරු තිදෙනා, ඔහුව ඕනෑම මොහොතක මරා දැමීමට සූදාණම් යැයි පෙනුනු කුලී හේවායින් දෙදෙනෙක් හා සිදුවන්නේ කුමක්දැයි කිසිදු අවබෝධයක් නොමැති මෝඩ ගොවීන් පිරිසක් ඒ අතර වූහ. ඔවුන්ට එදිරිව ටිරියන් සතුව තිබුනේ සිය ඉණපටියේ රැඳී සිරිය හා තවත් මිනිසුන් දෙදෙනෙකු පමණි. ජයික් හොඳ සටන්කරුවකු වුවද මොරෙක් ගණන් ගත හැක්කෙකු නොවීය. ඔහු අඩක් කෝකියකු, අඩක් සේවකයකු මිස සෙබළකු නොවීය. අනිත් අතට කළු සොයුරන් රාජධානියේ අභ්‍යන්තර කලබැගෑනිවලට අත පොවන්නන් නොවන බැවින් යොරේන් කිසිවක් නොකරනු ඇත.

එය එසේම සිදුවිය. කැට්ලින් පසෙකින් සිටි මහළු නයිට්වරයා "උංගෙ ආයුධ ගනින්" යැයි පවසද්දී යොරේන් නිහඬවම පසෙකට විය. ඉදිරියට පියමැන්න බ්‍රොන් ජයික් ගේ සුරතේ රැඳි අසිපතත් ඔවුන් දෙදෙනා ඉණ බැඳි කිනිසිත් ගලවාගත්තේ ය. "හොඳයි." ශාලාව තුළ පැවැති නොසන්සුන් බව කෙමෙන් අඩු වී යද්දී මහළු මිනිසා කීවේය. "නියමයි." ටිරියන් මේ රළු කටහඬ හඳුනාගත්තේ ය. සිය රැවුල බෑ වින්ටර්ෆෙල්හි සටන් පුහුණු ගුරුවරයා, සෙර් රඩ්‍රික්.

"එයාව මෙතැනදි මරන්ට එපා." තානායම්පතිනිය කැට්ලින්ගෙන් අයැද සිටියාය.

"එයාව කොහෙදිවත් මරන්ට එපා." ටිරියන් උනන්දුකරවන ස්වරයෙන් කීය.

"එයාව වෙන කොහාට හරි අරන් යන්ට, මයෙ උත්තමාවනි. මෙතන ලේ හොල්ලන්ට එපා. උතුමන් ගේ රණ්ඩුදබර මේක ඇතුළෙ වෙනවා දකින්ට මට උවමනා නෑ."

"අපි එයාව ආපහු වින්ටර්ෆෙල්වලට අරන් යනවා." කැට්ලින් කීවාය. 'හොඳයි, එක අතකට...' ටිරියන් සිතුවේය. කාමරය පුරා දෑස් කරකවා තත්ත්වයේ ස්වභාවය ගැන වටහාගන්නට මේ වනවිට ඔහුට අවස්ථාවක් ලැබී තිබින. දකින්නට ලැබුනු දෙයින් ඔහු වඩාත්ම අසතුටට පත් වූයේද නැත. ස්ටාර්ක් ආර්යාව දක්ෂ වූවාය. ඒ ගැන සැකයක් නැත. ඔවුන් සේවය කරන වංශාධිපතීන් සිය පියාට ඇති පක්ෂපාතීත්වය ගැන මුලු ශාලාවම ඉදිරියේ දිවුරුම් ප්‍රකාශයක් ලබාගත්තාට පසුව ඇය ඔවුන් ගේ ආධාරය ඉල්ලා සිටියාය. ඇත්තෙන්ම එය සුන්දර උපායයක් විය. එනමුදු ඇගේ උත්සාහය ඇය බලාපොරොත්තු වූ තරමටම සාර්ථක වූ එකක් නොවීය. ඔහු ගේ හදිසි ගණනයට අනුව ඒ වනවිට කාමරය තුළ පනහකට ආසන්න පිරිසක් වූහ. කැට්ලින් ස්ටාර්ක් ගේ ආයාචනයට අනුව ඇයට සහය පිණිස නැගී සිටියේ එයින් දුසිමක් පමණි. අනිකුන් එක්කෝ වියවුල් සිතින්, එක්කෝ බියෙන් නැතහොත් දෙකට දෙවාරේ වැනෙමින් බලා සිටියහ. ෆ්‍රේවරුන් අතරින් දෙදෙනෙකු පමණක් නැගිට සිටි අතර සිය කපිතාන් නොසෙල්වෙන බැව් දුටු ඔවුහු වහා නැවත අසුන් ගත්හ. හැකියාවක් තිබිනි නම් ඔහු සිනාසෙනු නිසැකය.

"හොඳයි එහෙමනම්, වින්ටර්ෆෙල්." ටිරියන් කීය. එහි සිට මේ දැන් පැමිණ සිටි ඔහු ඒ වනතෙක් කෙතරම් දුරක් ඇත්දැයි මනාව දැන සිටියේ ය. ගමන අතරතුර අනේක දෑ සිදුවිය හැක. "මගේ තාත්තා කල්පනා කරයි මට මොනවා වෙලාද කියලා." ඔහු එකතු කලේ

ඔහුට සිය කාමරය පුදකරන්නට නැගී සිටි කුලී භේවායා ගේ දෑස සිය දෑසින් මුනගැසෙමිනි. "අද මෙතන මොනවද වුනේ කියන එක ගැන විස්තරයක් එයාට දන්නන්ට පුළුවන් කෙනෙකුට මගේ තාත්තා හොඳ සන්තෝසමක් දෙයි." ටයිවින් උතුමානන් එවැන්නක් සිදු නොකරනු ඇති නමුදු නිදහස් වීමට හැකියාවක් ලැබුනහොත් ටිරියන් ලැනිස්ටර් ඒ ගැන වග බලා ගනු ඇත.

සෙර් රඩ්‍රික් සිය ආර්යාව දෙස බැලීය. ඔහු ගැටළුකාරී තත්ත්වයකට මැදි වී ඇති සෙයක් දිස්විය. "එයාගෙ මිනිස්සුත් එයත් එක්ක එයි." මහලු නයිට්වරයා නිවේදනය කලේය. "අනිත් අයට අපි බොහොම ස්තූතිවන්ත වෙනවා අද මෙතැන සිද්දවෙච්චි දේ ගැන කට පියාගෙන ඉන්නවානම්."

සිය සිනහව නවත්වාගැනීමට ටිරියන්ට මහත් උත්සාහයක් දැරීමට සිදුවිය. 'කට පියාගෙන ඉන්ට?' නාකි මෝඩයා. මුලු තානායමේම සිටින පිරිස අත්අඩංගුවට ගෙන රැගෙන යන්නේ නම් මිස ඔවුන් මෙතැනින් පිටව ගිය වහාම මේ ආරංචිය ලැව්ගින්නක් මෙන් පැතිර යනු නිසැකය. සිය රන්කාසිය පිළිගත් කුලී භේවායා මේ ආරංචිය රැගෙන ඊයක් මෙන් කාර්ස්ටලී රොක් වෙත පියාඹා යනු ඇත. ඔහු නැතහොත් වෙනෙකෙකු. යොරේන් මේ පුවත දකුණ බලා රැගෙන යනු ඇත. අර මෝඩ ගායකයා මේ ගැන සැහැල්ලක් සාදා ගයනු ඇත. ෆ්‍රේවරුන් සිය ස්වාමියා වෙත මේ ආරංචිය රැගෙන යනු ඇති අතර ඔහු කුමක් කරනු ඇතිදැයි දන්නේ දෙවියන් පමණි. වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් යනු රිවර්රන්වලට පක්ෂපාති වංශාධිපතියකු විය. එනමුදු ඔහු මෙතරම් වයස්ගත වන තෙක් දිවි රැකගැනීමට සමත් වී ඇත්තේ පරික්ෂාකාරීව හිඳ සෑමවිටම ජයග්‍රාහකයා ගේ පැත්ත ගැනීමට සමත් වීම නිසාය. අඩුම තරමේ ඔහු පණිවුඩය රැගත් පක්ෂීන් දකුණේ කින්ග්ස් ලැන්ඩින්ග් වෙත යවනු ඇත. සමහරවිට ඔහු ඊට වඩා වැඩි දෙයක් කරනු ඇත.

කැට්ලින් ස්ටාර්ක් කාලය අපතේ නොහැරියා ය. "අපි දැන්මම පිටත් වෙන්ට ඕන. අපට අලුත් අශ්වයොයි ගමනට කෑමයි ඕන කරනවා. මිනිස්සුනේ, දැනගන්ට ඔබලාට ස්ටාර්ක් පෙළපතේ කෘතඥතාව හැමදාමත් හිමිවෙනවා. මේ හිරකාරයො මුරකරලා පරෙස්සමින් වින්ටර්ෆෙල්වලට අරන් යන්ට අපට උදවු කරන්ට කෙනෙක් කැමැති නම් එයාලට බොහොම හොඳට තෑගි ලැබේවි. මම ඒක පොරොන්දු වෙනවා." එපමණකි. මිනිස්සු නොපැකිල ඉදිරියට එන්නට වන්හ. ටිරියන් ඉතා පරෙස්සමින් මේ සෑම මිනිසකුගේම මුහුණ අධ්‍යයනය කර මතකයේ තබා ගත්තේය. මේ සෑම කෙනෙකුටම හොඳට තෑගි ලැබෙනු ඇත. ටිරියන් තමාටම පොරොන්දු වූයේය. එනමුදු ඒ ඔවුන් බලාපොරොත්තු වූ අයුරින් නොවනු ඇත.

එනමුදු තානායමෙන් පිටතදී ඔවුන් ඔහු ගේ දෑත් බැඳ දමද්දී, වර්ෂාව මධ්‍යයේම අසුන් සූදානම් කරද්දී ටිරියන් ලැනිස්ටර් ගේ සිතට බියක් නොදැනින. ඔවුන්ට ඔහුව කෙසේවත් වින්ටර්ෆෙල්වලට ගෙනයා නොහැකි වනු ඇත. ටිරියන් ඒ ගැන පරදු තබන්නට පවා සූදානමින් උන්නේ ය. දවස නිමා වීමට ප්‍රථම අසරුවන් ඔවුන් හඹා එනු ඇත. පණිවුඩ රැගත් පක්ෂීන් එහා මෙහා පියාඹනු ඇත. සිය පියා ගේ හොඳ හිත දිනාගැනීමේ ආශාවෙන් පසුවන ගංගා නිම්නයේ වසන කිනම් හෝ වංශාධිපතියෙක් නිසැකයෙන්ම ඔවුන්ට අත පොවනු ඇත. සිය විචක්ෂණභාවය ගැන ටිරියන් මෙසේ සතුටුවෙමින් සිටිද්දී කෙනෙක් ඔහු ගේ දෑස් වැසෙන සේ හිස් ආවරණයක් පළඳවා ඔහුව අසෙකු පිටට නැග්ගුවේය.

ඔවුහු වර්ෂාව මධ්‍යයේම පිම්මේ සිය අසුන් ඉදිරියට පැදවූහ. වැඩි වේලාවක් යන්නට පෙරම ටිරියන් ගේ කලවා ඇදුම් කන්නට පටන්ගත් අතර පශ්චාත්භාගය වේදනා ගෙන දෙන්නට පටන් ගති. ඔවුන් තානායමෙන් ආරක්ෂාකාරී දුරකට ඈත් වූ පසු කැට්ලින් ඔවුන් ගේ අසුන් හැල්මේ දුවන තරම් වේගය අඩු කලද එය රූක්ෂ භූමියක් මතින් කෙරුනු හැලහැප්පීම්වලින් පිරුනු දුක්ඛිත ගමනක් විය. ඔහු ගේ දෑස් බැඳ තිබීම තත්ත්වය තවත් නරක අතට හරවන්නක් විය. සෑම ඇඹරීමක්ම, සෑම හැරවීමක්ම ඔහුව අසු පිටින් බිමට ඇද දමන්නට උත්සාහ කලේය. මුහුණ වැසූ ආවරණය නිසා තමා අවට කෙරෙන කිසිදු කතාබහක් ශ්‍රවණය කිරීමේ හැකියාවක්ද ඔහුට නොවීය. රෙද්දට උරාගත් වැසි දිය නිසා එය මුහුණටම ඇලී ගියේ අවසානයේදී ඔහු ගේ ආශ්වාස ප්‍රශ්වාසයටද බාධා කරන්නට විය. දෑත් බැඳ දමා තිබුනු ලණු පොට නිසා ඔහු ගේ දෑත් කැපී ගිය අතර රාත්‍රිය ගෙවී යද්දී ඒවා තවත් තද වන බැව් ඔහුට හැඟෙන්නට විය. 'මම ගිනිමැලයක් ගාව වාඩිවෙලා පුච්චපු වළිකුකුළෙක් කන්ටයි ලෑස්ති වුනේ. මේ කාලකන්නි ගායකයා උගෙ අර බෝක්කු කට ඇරියා.' ටිරියන් පැමිණිලි ස්වරයෙන් කල්පනා කරන්නට විය. ඒ කාලකන්නි ගායකයාද ඔවුන් සමග පැමිණ තිබින. "මේ සිදුවීමෙන් හොඳ ලස්සන සින්දුවක් හැදෙන්ට පුළුවන්ය කියලා මට හිතෙනවා. ඉතින් මමම තමා ඒක හදන්ට ඕන." මේ කදිම වීර චාරිකාව නිමවන්නේ කෙසේදැයි දැනගැනීම තම අභිප්‍රාය බව ඔවුන්ට එක්වීමට හේතුව වශයෙන් ඔහු කැට්ලින්ට කියා සිටියේ ය. ලැනිස්ටර් අසරුවන් ඔවුන් මත කඩා පාත් වන මොහොතේ මේ වීර චාරිකාව කෙතරම් කදිම එකක්දැයි ඔහුට තේරුම් යනු ඇතැයි ටිරියන් කල්පනා කලේය.

අන්තිමේදී වර්ෂාව නැවතී උදා හිරු කිරණ ඔහු ගේ මුහුණ වැසූ තෙත් රෙදිකඩ හරහා විත් ඔහු ගේ දෑස් සිපගනිද්දී කැට්ලින් ස්ටාර්ක් අසුන් නැවැත්වීමට විධාන කලාය. කාගේ හෝ දෑතක් රළු අයුරින් ඔහුව අසු පිටින් බිමට ඇද දමා, ඔහු ගේ මැණික්කටු බැම්වලින් මුදා,

මුහුණ වසා තිබුනු රෙදිකඩ ඉවත් කලේය. ඔහු පළමු වරට පටු, රළු මාවත දුටු විට, ඔවුන් වට කරමින් සිටි වනයෙන් වැසුනු මිටි කඳු දුටු විට, හිමෙන් වැසුනු මුදුන් සහිත දැවැන්ත කඳු ශිඛර ඈත ක්ෂිතිජයේ දුටු විට ඔහු තුළ පැවති බලාපොරොත්තු සියල්ලක්ම හිරු දුටු පිනි මෙන් සැනෙන් නැතිවී ගියේය. "මේ 'කඳුකර පාර නේ'." ඔහු මවිතයෙන් හුස්මක් අල්ලා ස්ටාර්ක් ආර්යාව දෙස සැකමුසු බැල්මක් හෙළීය. "නැගෙනහිර පාර. ඔබ කිවුවෙ අපි වින්ටර්ෆෙල්වලට යනවයි කියලා!"

කැට්ලින් ස්ටාර්ක් ඔහුට කෙටි සිනහවකින් සංග්‍රහ කලාය. "ඔවු. කාටත් ඇහෙන්ට බොහොම හයියෙන්." ඇය එකඟ වූවාය. "කිසිම සැකයක් නෑ අපේ පස්සෙන් එන උඹේ යාළුවො සේරම ඒ පැත්තට යයි. උන්ට බොහොම වේගෙන් යන්ට ලැබෙන්ටයි කියලා මම ප්‍රාර්ථනා කරනවා."

දවස් බොහෝ ගණනකට පසු මේ දැන් පවා ඒ මතකය ඔහු ගේ සිත කර්කශ වියරුවකින් පුරවාලන්නට සමත් විය. මුලු ජීවිත කාලය පුරාවටම ටිරියන් ලැනිස්ටර් සිය කපටි තීක්ෂණ ඥානය ගැන උදම් වෙමින් සිටියේ ය. සෑම දෙයක්ම අභිමිවෙද්දී දෙවියන් විසින් ඔහුට ලබා දුන් එකම ත්‍යාගය එය විය. එනමුදු, මේ සත්වරක් යකාට ගිය වෘක බැල්ලිය, කැට්ලින් ස්ටාර්ක් විසින් සෑම අංශයකින්ම ඔහු ගේ ඒ තීක්ෂණ බව පරදවන්නට සමත්ව තිබින. ඔහුව පැහැරගැනීමකට ලක්වූවාය යන සත්‍යයටත් වඩා මේ කරුන දැනගැනීම කටුක හා ඛේදජනක අයුරින් ඔහුට රිදවීය.

අසුන්ට කෑම හා වතුර දීමට පමණක් ප්‍රමාණවත් වේලාවක් නැවතුනු ඔවුහු නැවත ගමන් ඇරඹූහ. මේ වතාවේ ටිරියන් ගේ දෑස් වැසීමට උත්සාහයක් නොදැරින. දෙවන රාත්‍රියෙන් පසු ඔහු ගේ දෑත් බැඳීමද නැවතින. කඳුකරයේ ඉහළට නැගුනු පසු කිසිවෙකුත් ඔහුව මුර කිරීමටවත් උනන්දු නොවූහ. ඔහු ගේ පලායාමක් ගැන ඔවුන් බිය නොවූ අතර එසේ වීමටද අවශ්‍ය නොවීය. මේ ඉහළ කඳුකරයේ භූමිය රළු ගිරි ශිඛරයෙන් හා වනයෙන් වැසුනු අතර මාවත ගලින් වැසුනු අඩි පාරකට වඩා යාන්තම් පුළුල් විය. ඔහු පලා ගියද තනිවම, කිසිදු කෑමක් බීමක් නොමැතිව කෙතරම් දුරක් නම් යා හැකිවේද? කඳු සිංහයින් ඔහුව රසවත් අතුරුපසක් වශයෙන් භාවිත කරනු ඇත. එමෙන්ම මේ කඳුකරයේ වසන වනචාරී ගෝත්‍රික රංචු අසිපතට මිස අන් කිසිදු නීතියකට හිස නොනමන පල්හොරුන් හා මිනීමරුවන් වූහ.

එනමුදු ස්ටාර්ක් ආර්යාව කිසිදු නැවතීමක් නොමැතිව ඔවුන්ව ඉදිරියට මෙහෙයෙවුවා ය. ඔවුන් ගේ ගමනාන්තය වන්නේ කුමක්දැයි ඔහු දැන සිටියේ ය. ඔහු ගේ හිස වැසූ ආවරණය ඉවත් කල මොහොතේම ඔහු එය දැනගත්තේ ය. මේ කඳුකරය වනාහි ඒරින් වංශයේ රාජධානිය විය. මියගිය හස්තයේ හෙවත් ජොන් ඒරින් ගේ ආර්යාව ටලී වරියක, කැට්ලින් ටලී ස්ටාර්ක් ගේ සොයුරිය වූවාය... එමෙන්ම ලැනිස්ටර්වරුන් ගේ මිතුරකුද නොවූවා ය. ලයිසා ආර්යාව කින්ග්ස් ලැන්ඩින්ග්හි සිටි සමයේ ටිරියන් ඇයව යාන්තමින් හඳුනාගෙන සිටි නමුදු ඒ දැනහැඳුනුම්කම් නැවත අලුත් කරගැනීමේ කිසිදු ආශාවක් ඔහු තුළ නොවීය.

ඔහු ගේ පිරිස මාවතට නුදුරු කුඩා දියපහරක් අසබඩ නැවතී සිටියහ. අසුන් කුස් පුරා දිය බී තණ උලාකමින් සිටියහ. ජයික් හා මොරෙක් එක ළඟින් වාඩි වී දැත් පොරවාගෙන බුම්මාගත් මුහුණින් බලා සිටි අතර මොහෝර් සිය දිගු හෙල්ලයට වාරු වී ඔවුන් අසලින් සිටගෙන සිටියේ ය. ඒ අසලින් බිම වාඩි වී සිටි මැරිලියන් සිය වීණාවේ තත්වල තෙල් ගල්වමින් සිටියේ මේ කඳුකරයේ තෙත් වාතය සිය වීණා තත්වලට සිදුකරන හානිය ගැන මැසිවිලි නැගුවේ ය.

"අපි පොඩි විවේකයක් ගන්ට ඕනමයි මගේ ආර්යාවනි." දෙවන පෙළ නයිට්වරයකු වූ සෙර් විලිස් වෝඩ් කැට්ලින්ට පවසනු ළඟාවන ටිරියන්ට ඇසින. වෙන්ට් ආර්යාව ගේ සේවයේ යෙදී සිටි දරදඬු මිනිසකු වූ ඔහු තානායමේදී කැට්ලින් ගේ සහාය පිනිස නැගී සිටි පළමුවැනියා විය.

"සෙර් විලිස් කියන්නෙ ඇත්ත මගේ ආර්යාවනි." සෙර් රඩ්‍රික් එකඟතාව පල කලේය. "මේ අපට නැතිවෙච්ච තුන්වෙනි අශ්වයා-"

"ලැනිස්ටර්ලාට අපිව අල්ලගන්ට පුළුවන් වුනොත් අපට අශ්වයින්ට වඩා දේවල් නැතිවෙන්ට පුළුවන්." ඇය ඔවුන්ට මතක් කර දුන්නා ය. නිරන්තර ශීත සුළඟට හසු වූ ඇගේ මුහුණ වැරී ගොස් තිබුනු නමුදු එහි පෙර තිබූ අධිෂ්ඨානය හා මුරණ්ඩු බව බිඳකුදු අඩු නොවීය.

"ඒක දැන්නම් කොහෙත්ම වෙන්ට විදියක් නෑ." ටිරියන් කතාවට මැදිහත් විය.

"ආර්යාව උඹෙන් මොකුත් ඇහුවෙ නෑ කුරුමිට්ටො." කර්ලිකට් කඩා පැන්නේ ය. කෙටි කර කපන ලද හිසකෙසින් හා ඌරු මුහුණකින් හෙබි මහත මෝඩයකු වූ ඔහු ජොනෝස් බ්‍රැකන් උතුමානන් යටතේ සේවය කල සෙබළෙකු විය. මොවුන් සැමදෙනාගේම නම් හා මුහුණුවර මතකයේ තබා ගැනීමට ටිරියන් විශේෂ උනන්දුවකින් කටයුතු කලේ පසුව ලැබෙන අවස්ථාවකදී තමාට සිදුකරනු ලබන මේ සත්කාර සංග්‍රහවලට ස්තූති කිරීමට පහසුවනු පිණිසය. ලැනිස්ටර්වරු සැමවිටම සිය ණය ගෙවා දමනු ලබන බැව් කර්ලිකට් දිනෙක වටහා ගන්නවා ඇත. ඔහු මෙන්ම ඔහු ගේ යහළුවන් වන ලාරිස් හා මොහෝර් ද, සෙර් විලිස් ද, කුලී හේවායින් දෙදෙනෙකු වූ බ්‍රොන් හා චිගන් ද මේ බැව් වටහා ගන්නවා ඇත. ඔහු මැරිලියන් වෙනුවෙන් විශේෂ වූ සංග්‍රහයක් සිතේ සනිටුහන් කර ගත්තේ ය.

"එයාට කතා කරන්ට දෙන්ට." ස්ටාර්ක් ආර්යාව අණ කලාය.

ටිරියන් ලැනිස්ටර් ගලක් මත වාඩි ගත්තේ ය. "මේ වෙනකොට අපිව ලුහුබැඳන් එන එවුන් ඔබේ බොරුව විශ්වාස කරලා බෙල්ලත් පහුකරන් රජමාවතේ උතුරට යනවා ඇති... ඒ කියන්නෙ ලුහුබැඳීමක් සිද්දවෙනවා නම්. ඒක අනිවාර්යයෙන්ම වෙන්ට පුළුවන් දෙයක් නෙවෙයි. ආහ්! කිසිම සැකයක් නෑ මේ වෙනකොට මගේ තාත්තාට පණිවුඩේ ගිහින් ඇති... ඒ වුනත් මගේ තාත්තා මට එහෙමට ආදරේ එක්කෙනෙක් නෙවෙයි. ඒ නිසා මට විශ්වාස නෑ එයා එච්චරම ක්‍රියාශීලී වෙලා මගේ පස්සෙන් මිනිස්සු එවයි කියලා." මෙය ඇත්තෙන්ම අර්ධ-බොරුවක් විය. ටයිවින් ලැනිස්ටර් උතුමානන් සිය අංගවිකල පුත්‍රයා ගැන කිසිදු ආදරයක් නොදැක් වූ බව සත්‍යයකි. එනමුදු සිය වංශයේ ගෞරවයට එරෙහිව සිදුකෙරෙනු ලබන ඕනෑම කටයුත්තක් ඔහු විසින් නොඉවසන ලදී. "මේක බොහොම කුරිරු භූමියක් ස්ටාර්ක් ආර්යාවනි. ඔබට මිටියාවතට ළඟා වෙනකම් පිටතින් කිසිම ආධාරයක් බලාපොරොත්තු වෙන්ට බෑ. නැතිවෙන අශ්වයෙක් ගානෙ අනිත් එවුන්ට තියෙන අමාරුකම් වැඩිවෙනවා. ඒකටත් වැඩිය නරකයි, ඔබට මාවත් නැතිවෙන්ට පුළුවන්. මම බොහොම පුංචි එකෙක්. මම ශක්තිමත් නෑ. මම මැරුනොත් මොකක්ද මේ ගමනින් ඇති ප්‍රයෝජනේ?" එය කිසිසේත්ම බොරුවක් නොවීය. මේ ගමන් වේගයට තව කෙතෙක් දුරක් යනතෙක් ඔරොත්තු දී සිටිය හැකිදැයි ටිරියන් නොදත්තේ ය.

Tyrion Lannister: “I never bet against my family.”

"මේ ගමනේ ප්‍රයෝජනේ උඹේ මරණය තමා ලැනිස්ටර්." කැට්ලින් පිළිතුරු දුන්නා ය.

"මම හිතන්නෙ නෑ. ඔබට මාව මැරෙනවා දකින්ට ඕන නම් කරන්ට තියෙන්නෙ ඔබේ මේ ගඳගහන යාළුවෙකුට නිකමට මතක් කරන්ට විතරයි. උං කියන පමාවෙන් ඒ වැඩේ කරයි."

"ස්ටාර්ක්ලා නිදි ඇඳේ ඉන්න මිනිස්සු මරන්නෙ නෑ."

"මම එහෙම කරන්නෙත් නෑ. මම ආයෙමත් මේ ඔබට කියන්නෙ, ඔබේ පුතාව මරන්ට කෙරුන කුමන්ත්‍රණයත් එක්ක මගේ කිසිම සම්බන්ධයක් නෑ."

"මිනීමරුවා ගාව තිබුනෙ උඹේ කිනිස්ස."

සිය කේන්තිය නැග එනු ටිරියන්ට දැනින. "ඒක මගේ කිනිස්ස නෙවෙයි. කී පාරක් මම ඒක කියලා දිවුරන්ට ඕනද? ස්ටාර්ක් ආර්යාවනි, ඔබ මා ගැන මොනා හිතාගෙන හිටියත් මම මෝඩයෙක් නෙවෙයි. මේ දෙකයි පනහෙ කුලී මිනීමරුවෙකුට තමන්ගෙම ආයුධය දීලා මිනීමරන්ට එවන්නෙ මෝඩයෙක් විතරයි."

එක් මොහොතකට ඇගේ දැස් තුළ සැකයක් ඇඳී ගියේ යැයි දුටු බව ඔහු සිතුවේ ය. එනමුදු ඇය කීවේ වෙනකකි. "ඇයි පෙටයර් මට බොරු කියන්නෙ?"

"අයි වලහෙක් කැලේ මැද්දෙ ජරා කරන්නෙ? ඒක උගේ සාමාන්‍ය ස්වභාවය. සුළැඟිල්ලා වගේ මිනිහෙකුට බොරු කියනවා කියන්නෙ හුස්ම ගන්නවා වගේ සාමාන්‍ය දෙයක්. අනිත් හැමෝටම වඩා ඔබ ඒක දැනගෙන ඉන්ට ඕන."

ඇය දැඩි කරගත් මුහුණින් යුතුව ඔහු දෙසට පියවරක් තැබුවා ය. "උඹ මොකක්ද ඒකෙන් අදහස් කරන්නෙ ලැනිස්ටර්?"

ටිරියන් හිස පසෙකට ඇල කලේය. "ඇයි! රාජසභාවෙ ඉන්න හැමකෙනාටම ඇහෙන්ටයි එයා පාරම්බෑවෙ කොහොමද එයා ඔබේ කන්‍යාභාවය උදුරගත්තෙ කියලා, මගේ ආර්යාවනි."

"ඒක බොරුවක්!" කැට්ලින් ස්ටාර්ක් කීවාය.

"ආහ්! නපුරු පුංචි යකා." මැරිලියන් කම්පාවෙන් යුතුව කීය.

කර්ලිකට් සිය කිනිස්ස ඇද ගත්තේය. එය යකඩින් තැනූ කුරිරු ආයුධයක් විය. "ඔබ අවසර දෙනවනං මයෙ ආර්යාවනි, මුගේ මේ බොරු කියන දිව කපලා ඔබේ පාමුල දාන්නම්." ඔහු ගේ ඌරු ඇස් උනන්දුව නිසා බැබලින.

කැට්ලින් ස්ටාර්ක්, ටිරියන් විසින් කිසිදා ඇගේ මුහුණින් නුදුටු අමුතු බැල්මකින් ඔහු දෙස බලා සිටින්නට විය. "පෙටයර් බේලිෂ් එකපාරක් මට ආදරය කලා. එයා එතකොට පොඩි කොලු ගැටයෙක්. එයාගෙ ආදරේ අපි හැමෝටම ශෝකාන්තයක් වුනා තමයි. ඒ වුනත් ඒක ඇත්ත, පිරිසුදු ආදරයක්. ඒ ආදරේ ගැන ඔය වගේ කැත කතා කියන එක සුදුසු නෑ. එයාට මගේ අතගන්ට ඕන වුනා. ඒකයි ඇත්ත කතාව. උඹනං ඇත්තෙන්ම මහා හරුම මිනිහෙක් ලැනිස්ටර්."

"ඒ වගේම ඔබනං ඇත්තෙන්ම මහා මෝඩියක් ස්ටාර්ක් ආර්යාවනි. සුළැඟිල්ලා කවදාවත් වෙන කාටවත් ආදරේ කලේ නෑ, සුළැඟිල්ලාටම මිසක්. ඒ වගේම මම මේ බොහොම විශ්වාසයෙන් ඔබට කියන්නෙ, ඔබේ අත ගැන නෙවෙයි ඒකා පුරසාරම් දෙඩෙව්වෙ. ඔබේ ඔය නාඹර තන් දෙක ගැන, ඔබේ තෙත් තොල් පෙති දෙක ගැන, ඔබේ කකුල් දෙක මැද්දෙ තියෙන උණුසුම ගැන."

කර්ලිකට් ඔහු ගේ කෙස් රොදකින් අල්ලා හිස වැරෙන් පසුපසට නැවීය. සිය නිකටට යටින් කිනිසි තලයේ සීතල සිපගැනීම ටිරියන්ට දැනින. "මම මූව මරන්ටද මයෙ ආර්යාවනි?"

"මාව මැරුවොත් ඒත් එක්කම ඇත්තත් මැරිලා යයි." ටිරියන් අමාරුවෙන් පැවසීය.

"ඌට කතාකරන්ට දෙන්ට." කැට්ලින් කීවාය.

කර්ලිකට් අකැමැත්තෙන් මෙන් ටිරියන් ගේ කෙහෙරොද අත හැරියේ ය.

ටිරියන් දීර්ඝ හුස්මක් ගත්තේය. "සුළැඟිල්ලා කිවුවෙ කොහොමද මට එයාගෙ මේ කිනිස්ස අයිති වුනේ කියලා? මට ඒකට උත්තර දෙන්ට."

"උම ඒක එයාගෙන් ඔට්ටුවකින් දින්නා. ජොෆ්රි කුමාරයාගෙ උපන්දිනේ වෙනුවෙන් තිබ්බ තරගාවලියෙදි."

"ඒ කියන්නෙ මගේ සහෝදරයා සෙර් ලෝරාස් අතින් පැරදුන තරගෙදි නේ? එහෙම නේද?"

"ඔවු! එහෙම තමා." කැට්ලින් පිළිගත්තා ය.

"අශ්වාරෝහකයො එනවා!"

හඬගැම පැමිණියේ ඔවුන්ට ඉහළින් තිබුනු ගල්වැටිය මුදුනෙනි. ඔවුන් විඩා නිවාගන්නා අතරතුරේදී මාර්ගය පිරික්සා බලනු පිණිස සෙර් රඩ්‍රික් විසින් ලාරිස්ව එය මුදුනට යවා තිබින.

එක් දිගු තත්පරයකට කිසිවෙකුත් නොසෙල්වින. පළමුවෙන්ම ප්‍රතික්‍රියා දැක්වූ පුද්ගලයා කැට්ලින් ස්ටාර්ක් වූවාය. "සෙර් රඩ්‍රික්, සෙර් විලිස්, අශ්වයො පිටට යන්ට. අනිත් අශ්වයො ටික අපට පිටිපස්සෙන් තියාගන්ට. මොහෝර්, හිරකාරයො ආරක්ෂා කරන්ට."

"අපටත් ආයුධ දෙන්ට." උඩපැන නැගිට සිටි ටිරියන් ඇගේ අතේ එල්ලුනේ ය. "ඔබලාට හැම කඩුවක්ම උවමනා වෙනවා."

ඔහු නිවැරැදි බව ඇය දැන සිටියාය. ඇය දෙස හෙලූ එක් බැල්මකින් ටිරියන් මේ බැව් වටහා ගත්තේය. උසස් වංශාධිපතීන් ගේ කෝන්තර හා ආරවුල් පිළිබඳව මේ කඳුකර වාසීන් කිසිදු තැකීමක් නොකලහ. ඔවුන් තමතමන් අතරේ කුලල් කා ගන්නා තරම්ම උනන්දුවකින් යුතුව ස්ටාර්ක් හා ලැනිස්ටර් දෙවර්ගයම සාතනය කර දමනු ඇත. කෙසේ වුවද ඔවුන් කැට්ලින් ස්ටාර්ක්ව පමණක් නොමරා ඉතිරි කරනු ඇත. ඇය තවමත් දරුවන් වැදීමට තරම් සුදුසු තරුණ වයසක පසු වූවාය. එනමුදු ඇය තවමත් සිය සිරකරුවන් අතට ආයුධ දීම පිළිබඳව දෙගිඩියාවකින් පෙලුනා ය.

"මට උන්ව ඇහෙනවා." සෙර් රඩ්‍රික් කීය. ටිරියන් හිස හැරවූ අතර ඔහුටද ඒ හඬ - තමන් වෙත ළඟාවන දුසිමක් හෝ ඊටත් වැඩි අසුන් ගේ කුර ගැටෙන හඬ - ඇසින. හදිසියේම සැමදෙනාම ලහිලහියේ එහාමෙහා දුවන්නට වූයේ තම ආයුධ හා අසුන් වෙතට ළඟා වූහ.

ලාරිස් ගල්වැටිය මුදුනේ සිට රූටාගෙන පහළට බසිද්දී ඔවුන් වටා ගල්කැට වර්ෂාවක් මෙන් විසි වී ගියේය. "මිනිස්සු විස්සක්, නැත්තං විසිපහක් විතර." ඔහු හුස්මක් කටක් ගැනීමටවත් ඉස්පාසු නොවී පැවසීය. "මම හිතන්නෙ 'ක්ෂීර සර්පයො' නැත්තං 'චන්ද්‍ර සොහොයුරෝ'. උංගෙ ඔත්තුකාරයො මේ අවට කොහෙ හරි හැංගිලා ඉන්නවා වෙන්ට ඕන මයෙ ආර්යාවනි... උං දන්නවා අපි මෙතන ඉන්නවා කියලා."

සිය දිගු අසිපත සුරතින් ගත් සෙර් රඩ්‍රික් මේ වනවිටත් අසු පිට නැග සිටියේ ය. සිය දත් අතරේ කිනිස්සක් රුවාගත් මොහෝර් දැතින්ම අල්ලාගත් හෙල්ලද ඇතිව ගල් කුට්ටියකට මුවා විය. "ඒයි ගායකයො, මගේ මේ පපු තහඩුව දාගන්ට උදවු කරපං." සෙර් විලීස් කෑ ගැසීය. සිය වීණාව දැතින් බදාගත් මැරිලියන් සුදුමැලි වී ගිය මුහුණින් යුතුව ගල් ගැසී බලා සිටියේ ය. එනමුදු වහා නැගිට සිටි ටිරියන් ගේ සේවකයා මොරෙක් නයිට්වරයාට උදවු පිණිස ගියේය.

ටිරියන්, කැට්ලින් ගේ අත බදා සිටි සිය ග්‍රහණය බුරුල් නොකලේ ය. "ඔබට වෙන විකල්පයක් නෑ. අපි තුන්දෙනෙක්.. තවත් අපිව මුරකරන්ට එක්කෙනෙක්.. ඔබ ආයුධ

ගන්ට පුළුවන් අය හතර දෙනෙක් නාස්ති කරනවා. මිනිස්සු හතරදෙනෙක්ගෙ වෙනස කියන්නෙ මෙතනදි ජීවිතයත් මරණයත් අතර වෙනස වෙන්ට පුළුවන්."

"උඹ මට පොරොන්දු වෙනවද, සටනින් පස්සෙ අතට ගත්තු ආයුධේ ආයෙමත් බිමින් තියනවා කියලා?"

"මගේ පොරොන්දුව?" මේ වනවිට අසු කුර හඬ ලංවී තිබින. "ටිරියන් වංචාකාරී අයුරින් නියෙවුවේ ය. "ආහ්! ඔබට ඒක ලැබෙනවා මගේ ආර්යානි.. ලැනිස්ටර් කෙනෙක් විදියට මගේ තියෙන ගෞරවයේ නාමයෙන්."

ඇය ඔහු ගේ මුහුණට කෙල ගසනු ඇතැයි මොහොතකට ඔහුට සිතින. එනමුදු ඇය එසේ නොකලාය. "මුන්ටත් ආයුධ දීපල්ලා." සෙර් රඩ්‍රික් සිය අසිපත සහිත කොපුව ජයික් වෙතට වීසි කලේ සතුරා මුනගැසෙනු පිණිස ඉදිරියට අසු මෙහෙයවීය. දුන්නක් හා හියොවුරක් අතින් ගත් මොරෙක් මාර්ගය පසෙකින් දණ නමා ගත්තේ ය. ඔහු කඩු හරඹයට වඩා ධනු ශිල්පයේ දස්කම් පෑවෙකු විය. ඉදිරියට පැමිණි බ්‍රොන් ටිරියන් වෙතට තල දෙකකින් යුතු පොරොවක් දිගු කලේය.

"මම කවදාවත් පොරොවකින් සටන් කරලා නෑ." මේ ආයුධය ඔහු ගේ දෑතට නුහුරු නුපුරුදු එකක් විය. එයට කෙටි මිටක්, බර තලයක් හා මුදුනේ නපුරු උලක් පිහිටා තිබින.

බ්‍රොන්

"උඹ ඕකෙන් දර කපනවා කියලා හිතපං" බ්‍රොන් කීය. සිය පිටේ එල්ලාගෙන සිටි කොපුවෙන් අසිපත ඇදගත් ඔහු සෙර් රඩ්‍රික් හා චිගන් සමග එක්වීම පිණිස අසු විහිදුවේය. සෙර් විලිස් අසු පිට නැගුනේ සිය ශිරස්කය පළඳාගනිමින් ඔවුන්ට එක්වීමට ඉදිරියට ගියේය.

"දරකොට වලින් ලේ ගලන්නෙ නෑ නෙ." ටිරියන් පෙරලා පිළිතුරු දුන්නේ ය. සන්නාහය නොමැති බැවින් තමා නිරුවතින් සිටිනවා වනැයි ඔහුට හැඟෙන්නට විය. මුවා වීමට සුදුසු

ගල් පර්වතයක් සොයමින් වටපිට බැලූ ඔහු මැරිලියන් සැඟවී සිටි ගල් කුට්ටිය වෙත දිවගියේය. "එහාට වෙයං."

"උඹ වෙන කොහාට හරි පලයං." කොලුවා පෙරලා මුරගෑවේය. "මම ගායකයෙක්. මට ඔය සටන් එක්ක කිසිම සම්බන්ධයක් නෑ."

"මොනවා! උඹට දැනටම වික්‍රමාන්විත වැඩවලට තිබුන ආසාව නැතිවෙලා ගිහිල්ලද?" කොලුවා එහාට වන තුරු ටිරියන් ඔහුට නොනවත්වාම පයින් ඇන්නේය. ඔහු ගල් කුට්ටියට මුවා වනවාත් සමගින් සතුරෝ ඔවුන් මතට කඩාපිනූහ.

එහි කිසිදු පෙරමුණු දූතයෙක්, ධජ දරන්නෙක්, හොරණෑ හෝ බෙර හඬක් නොවීය. අසන්නට ලැබුනු එකම හඬ වූයේ මොරෙක් හා ලාරිස් ගේ දුනුවලින් නැගුනු 'ට්වැන්ග්' හඬ පමණි. ඊළඟ මොහොතේ අඩ ශිරස්කවලින් හිස් ආවරණය කරගත්, පදම්කල සමින් හා අනේකවිද සන්නාහයෙන් ගත වසාගත්, කෙට්ටු, අඳුරු පැහැති සමින් යුතු ගෝත්‍රිකයන් පිරිස හෙණපහරක් මෙන් සටනට අවතීර්ණ වූහ. ඔවුන් ගේ වැසුම් ලූ අත්වල සෑම ආකාරයකම ආයුධ දැකිය හැකි විය; දිගු අසිපත් හා ලන්ස, තියුණු මහ දෑකැති, කටු යගදා හා කිනිසි හා බරැති යකඩ මුගුරු ආදී සියල්ලක්ම එහි වූහ. නඩයේ ඉදිරියෙන්ම පැමිණි ඉරිවැටුනු සළුවක් ගත පැළැඳූ දැවැන්ත මිනිසා දෑතින් එසවිය යුතු සුවිසල් අසිපතකින් සන්නද්ධ වී සිටියේ ය.

"වින්ටර්ෆෙල්!" යනුවෙන් කෑ ගැසූ සෙර් රඩ්‍රික් ඔහු මුනගැසීම පිණිස ඉදිරියට ගියේය. බ්‍රොන් හා චිගන් රණහඬ නංවමින් ඔහු දෙපසින් අසුන් විහිදූහ. සෙර් විලිස් වෝඩ් කටු යගදාවක් හිස වටා කරකවමින් ඔවුන් පසුපසින් ගියේ "හැරෙන්හෝල්! හැරෙන්හෝල්!" යනුවෙන් කෑ ගැසීය. සිය පොරොව වනමින් ඉදිරියට පැන "කාස්ටර්ලී රොක්!" යැයි කෑ ගැසීමට ටිරියන් ගේ සිතේ හදිසි ආවේගයක් පැනනැගුනු නමුදු මේ පිස්සුව පැමිණි වේගයෙන්ම පිටවී ගියෙන් ඔහු ගල් කුට්ටිය පිටුපස තවතවත් ගුලි විය.

බියට පත් අසුන් ගේ හේෂාරවයත්, ලෝහ එකට ගැටී රැවුදෙන හඬත් ඔහුට ඇසින. චිගන් ගේ අසිපත  ගෝත්‍රිකයකු ගේ ආවරණයක් රහිත මුහුණ පසා කරගෙන ගිය අතර බ්‍රොන් වමටත් දකුණටත් කඩුගාමින් සුළිසුළඟක් මෙන් නඩය අතරින් අසු මෙහෙයවීය. සෙර් රඩ්‍රික් ඉදිරියෙන්ම පැමිණි දැවැන්තයා හා පැටලුනු අතර සිය අසුන් දෙදෙනා වටයට

නටද්දී ඔවුන් දෙදෙන එකිනෙකාට පහර පිට පහර එල්ල කලහ. අසෙකු පිට නැගගත් ජයික් ද පොරයට එක්වීම සඳහා පිම්මේ අසු පැන්නවීය. ඉරි සහිත සළුවක් පැළැඳ සිටි දැවැන්තයා ගේ උගුර පලාගෙන ඊයක් මතුවී තිබුනු අතර ඔහු කෑ ගැසීම සඳහා මුව විවර කල විට හඬක් වෙනුවට එයින් රුධිරය පිටවිය. ඔහු බිම වැටෙන විටත් සෙර් රඩ්‍රික් තවකෙකු හා සටනට එළඹ තිබින.

හදිසියේම බියෙන් කෑ ගැසූ මැරිලියන් සිය වීණාවෙන් හිස ආවරණය කරගත්තේ ඔවුන් සැඟව සිටි ගල් කුට්ටියට ඉහළින් අසරුවෙකු පිනූ බැවිනි. කටු යගදාවක් වැනූ අසරුවා නැවත ඔවුන් වෙතට ඒමට අසු හැරවූ අතර ටිරියන් දෙපයින් නැගී සිටියේ ය. ඔහු දැතින්ම අල්ලා පොරොව වැනුයේ ඉදිරියට එන අසු ගේ ගෙලට වැරෙන් උඩු කැපුමක් දුන්නේ ය. වියරු හඬක් නැගූ සතා පා පැකිළී විසි වී ගිය අතර ටිරියන් අතින් පොරොව අත් නොහැරුනා පමණි. කෙසේ වුවද පොරොව ඉවතට ඇදගත් ඔහු අලස අයුරින් සතා ගේ මාර්ගයෙන් ඉවත් වීමට සමත් විය. එනමුදු මැරිලියන් එතරම් වාසනාවන්ත නොවීය. අසු හා අසරුවා ගායකයාව යට කරමින් පොළොවට පතිත වූහ. බිම වැටී සිටි අසරුවා ගේ පාදය සෑදල පටියට සිර වී තිබුනු අතර පසුපසින් පිනූ ටිරියන් සිය පොරොව ඔහු ගේ ගෙල මුලට කිඳා බැස්සුවේය.

පොරොව තලය නිදහස් කරගැනීම සඳහා ඔහු යත්න දරන අතරේ සිරුරු දෙකට යටවී සිටි මැරිලියන් කෙඳිරි ගෑවේය. "කවුරුහරි මට උදවු කරන්ට. දෙයියන්ගෙ නාමෙට. මගෙන් ලේ ගලනවා."

"මට හොඳටම විශ්වාසයි ඒ අශ්වයාගෙ ලේ කියලා." ටිරියන් කීය. අසු ගේ සිරුර යටින් මකුළුවෙකු මෙන් පිටතට ඇදී ආ මැරිලියන් ගේ අතක් බිම පහුරු ගාන්නට විය. ටිරියන් ඒ අත මතින් සිය විළුඹ තබා පෑගූයේ අතැඟිලි බිඳෙන මධුර හඬට සවන් දුන්නේය. "උඹේ ඇස් දෙක වහගෙන මැරිලා වගේ හිටපං." ගායකයාට උපදෙස් දුන් ඔහු පොරොව අතට ගෙන හැරුනේ ය.

උදෑසන වාතය මුරගෑසීම්වලින් හා වේදනාත්මක කෑ ගැසීම්වලින් පිරී තිබුනු අතර ලේ සුවඳින් බරවී තිබින. ලෝකය එකම අවුල්ජාලයක් බවට පෙරළී තිබින. ඔහු ගේ කණ අසලින් පියාඹා ගිය ඊතල ගල්වල හැපී ක්ලැන්ග් හඬ නංවමින් බිම වැටින. මේ වනවිට සිය අසු අහිමි වී සිටි බ්‍රොන් දැතින් ගත් අසිපත් දෙකක් ඇතිව සටන් වැදී සිටින'යුරු ඔහු දිටීය. ටිරියන් ගලින් ගලට පැන සැඟවෙමින්, සෙවනැලි මුවාවේ සිට මතුවෙමින් තමා අවට දුවන

අසුන් ගේ දෙපාවලට පොරෝ පහර එල්ල කරමින් සටනට සිය දායකත්වය ලබාදුන්නේ ය. තුවාල වී වැටී සිටි ගෝත්‍රිකයකු දුටු ටිරියන් ඔහුව පරලොව යැවූවේ ඔහු පැළැඳ සිටි අඩ ශිරස්කය හිසේ ලා ගත්තේය. එය ඔහු ගේ හිස හොඳින්ම ආවරණය නොකල නමුදු කිසිවක් නැතිව සිටීමට වඩා යම් ආරක්ෂාවක් ඇතුව සිටීමට ලැබීම ගැන ටිරියන් සතුටු විය. ජයික් තමාට ඉදිරියෙන් වූ මිනිසා හා සටන් කරද්දී තවකෙකු ඔහුව පසුපසින් කපා හෙලා දමා තිබින. තවත් මොහොතකට පසු ටිරියන් කර්ලිකට් ගේ මළසිරුරේ හැපී පා පැකිළී ඇද වැටින. මුගුරු පහරක් විසින් ඔහු ගේ ඌරු මුහුණ සුණුවිසුණු කරදමා තිබුනද ඒ අතැඟිලි අතර සිරවී තිබුනු කිනිස්ස හඳුනාගන්නට ටිරියන් සමත් විය. ඒ කිනිස්ස ගලවාගෙන සිය ඉණපටියේ රුවාගන්නා අතරේ ඔහුට ගැහැණියක ගේ කෑ ගැසීමක් ඇසින.

කැට්ලින් ස්ටාර්ක් ගල්කන්ද සහ මිනිසුන් තිදෙනෙකු අතරට මැදිව සිටියා ය. එකෙකු අසකු පිට නැගී සිට අතර අනෙක් දෙදෙනා පා ගමනින් සෙමෙන් සෙමෙන් ඈ වෙතට ලංවන්නට වූහ. ඇය සිය තුවාල වූ අතේ නුහුරු ලෙස අල්ලාගෙන සිටි කිනිස්සක් ලෙලවූ නමුදු මිනිසුන් තිදෙනා තුන් පැත්තකින් ඇයව වටකර සිටියහ. 'අන්න හරි! අල්ලගනිල්ලා ඔය බැල්ලිව.' යැයි ටිරියන් සතුටින් සිතූ නමුදු ඔහුටද නොතේරුනු කුමක් හෝ හේතුවක් නිසා දෙපා ඔහුව ඒ දෙසට ඇද්දුවේ ය. තමා එහි සිටින බැව් ඔවුන් දැනගන්නටත් පෙර එතැනට පිනූ ටිරියන් පළමු මිනිසා ගේ දණහිසට ඉහළින් පහරක් එල්ල කල අතර බර පොරෝතලය දිරූ ලීයක් කපන්නාක් තරම් පහසුවෙන් මස් හා ඇට කපාගෙන ඇතුළට කිඳා බැස්සේය. 'ලේ ගලන ලී කොට' ටිරියන් විමතියෙන් සිතද්දී දෙවන මිනිසා ඔහු වෙතට කඩා පැන්නේ ය. ඔහු ගේ අසිපත් පහරට යටින් දෙකට නැවුනු ටිරියන් පෙරලා සිය පොරව ඔහු දෙසට වැනීය. එයින් බේරීමට මිනිසා පසුපසට පිනූ අතර පසුපසින් පැමිණි කැට්ලින් මිනිසා ගේ උගුරු දණ්ඩ සිඳ දැමුවා ය. හදිසියේම වෙනත් තැනක රාජකාරියක් සිහිපත් වුනු අසරුවා සිය අසු පිම්මේ ඉවතට පැන්නුවේ ය.

ටිරියන් අවට බැලීය. සියලුම සතුරන් අභිභවනය කර හෝ පලා ගොස් හෝ තිබින. ඔහු ඉවත හැරුනු මොහොතට සටන් අවසන් වී තිබින. මියයමින් සිටි අසුන් හා තුවාල වුනු මිනිසුන් ගේ වේදනාත්මක කෙඳිරියෙන් පරිසරය පිරී ගියේය. ඔහු ගේ මහත්ම පුදුමයට මෙන් ඔහු කිසිදු අනතුරක් නොමැතිව සුරක්ෂිතව සිටියේ ය. අතැඟිලි දිගහැරි ඔහු 'තන්ක්' හඬක් නංවමින් පොරොව බිම හෙලීය. ඔහු ගේ සුරත රුධිරයෙන් පෙඟී ඇලෙමින් තිබින. ඔවුන් දවස් බාගයක් පමණ සටන් වැද සිටි බැව් ඔහුට දිවුරා පැවසිය හැකි වුවද හිරු අහසේ දශමයකුදු සෙලවී නොතිබින.

"මේ උඹේ පළවෙනි සටනද?" මඳ වේලාවකට පසු ජයික් ගේ මළසිරුර වෙත නැඹුරු වී ඔහු ගේ බූට්ස් සපත්තු යුගල ගලවමින් සිටි බ්‍රොන් ඇසුවේ ය. සනකම් සමින් නිමකර මැනවින් තෙල් ගා ඔප දමා තිබුනු ඒවා ඔහු පැළැඳ සිටි සපත්තුවලට වඩා බෙහෙවින් ඉහළ විය.

ටිරියන් හිස වැනීය. "මගේ තාත්තා බොහොම ආඩම්බර වෙයි." ඔහු ගේ දෙපා කෙතරම් තදින් රිදුම් දුන්නේද යත් ඔහුට සිටගෙන සිටීම පවා අපහසු විය. එනමුදු සටන අතරතුරේ කොයි මොහොතකදීවත් ඔහුට ඒ බවක් දැනී නොතිබින.

"උඹට දැන් උවමනා කරන්නෙ ගෑනියෙක්." බ්‍රොන් කීවේ සිය කළු පැහැ දෑසේ බැබලීමක්ද ඇතුවය. ඔහු ගලවාගත් බූට්ස් සපත්තු සිය සෑදල මල්ලට එබීය. "මං කියන දේ විශ්වාස කරපන්, සටනකින් පස්සෙ ගෑනියෙක් තරම් රසවත් තවත් දෙයක් නෑ."

මළසිරුරු කොල්ලකමින් සිටි චිගන් මොහොතකට නැවතුනේ මහහඬින් නහයෙන් හුස්මක් පිටකර තොල කට ලෙවකෑවේ ය.

ස්ටාර්ක් ආර්යාව සෙර් රඩ්‍රික් ගේ තුවාලවලට වෙලුම්පටි යොදමින් සිටි දෙස ටිරියන් බැල්මක් හෙලීය. "මමනං කැමැතියි, එයත් කැමැතිනං." ඔහු කීවේය. නිදහස් අසරුවන් දෙදෙනා කොක්හඬලා සිනාසෙන්නට වූහ. 'අන්න හොඳ ආරම්භයක්!' ටිරියන් නියවමින් තමාටම කියාගත්තේ ය.

දියපහර අසල ඇනබාගත් ඔහු සිය මුහුණේ ගෑවී තිබුනු රුධිරය අයිස් මෙන් සීතල වතුරෙන් සෝදා හැරියේ ය. නැවත අනෙක් පිරිස වෙත බකල ගසමින් යන අතර ඔහු වැටී තිබුනු මළකඳන් දෙස නෙත් හැරවීය. මේ මියගිය ගෝත්‍රිකයින් සෑමදෙනාම කෙට්ටු, වැරී ගිය, වැරහැලි ඇඳගත්තවුන් වූහ. ඔවුන් ගේ අසුන් පවා ඇටකටු පෙනෙන තරම් වැහැරුනු, නොවැඩුනු සත්තු වූහ. බ්‍රොන් හා චිගන් විසින් ඔවුන්ට ඉතිරිකර තිබුනු ආයුධද කිසිදු වැඩකට ගත හැකි ඒවා නොවීය. කුළුගෙඩි, මුගුරු, දෑකැති... දැවැන්ත අසිපතක් රැගෙන සෙර් රඩ්‍රික් හා සටන් වැදුනු සුවිසල් මිනිසා ඔහුට සිහිපත් විය. එනමුදු ටිරියන් විසින් ඒ මළසිරුර සොයාගන්නා විට ඔහු පැළැඳ සිටි සුදු ඉරි වැටුනු සනකම් කළු ලොම් සළුව ගලවාගෙන තිබුනු අතර මිනිසා ද සිතූ තරම් දැවැන්තයෙකු නොවීය. ඒ අසිපතද බාල

වානේවලින් නිමවුනු, තැනින් තැන මල කෑ එකක් විය. මේ ගෝත්‍රිකයින් සිය සගයින් නව දෙනෙකු සටන වෙනුවෙන් බිලි දී තිබීම පුදුමයක් නොවේ.

ඔවුන් ගේ පිරිසෙන් තිදෙනෙකු මිය ගොස් තිබ්බින. බ්‍රැකන් සෙබළුන් දෙදෙනෙකු, කර්ලිකට් හා මොහෝර් සහ ටිරියන් ගේ මිනිසා වූ ජයික් ඒ අය වූහ. පසුපසින් කිසිදු ආරක්ෂක සන්නාහයක් නොමැතිව සටනට වැදුනු ජයික් මහත් නිර්භීත ක්‍රියාවක් සිදු කොට තිබ්බින. 'අන්තිම මෝඩයෙක්!' ටිරියන් සිතුවේ ය.

"ස්ටාර්ක් ආර්යාවනි, මම ඔබෙන් ඉල්ලන්නෙ, අපි හැකි ඉක්මනින් මෙතනින් පිටත් වෙන්ට ඕන." සෙර් විලිස් වෝඩ් කීය. සිය ශිරස්කයේ දැස් කවුළු තුළින් ඔහු අවට කඳුමුදුන් සිසාරා බැලීය. "අපි උංව එකපාරක් එලවලා දැම්මා තමා. ඒ වුනාට උං වැඩිය ඈත ගියේ නෑ."

"අපි අපේ මැරිච්ච අය වලලන්ටඕන සෙර් විලිස්." කැට්ලින් කීවාය. "මෙයාලා නිර්භීත මිනිස්සු. එයාලගෙ මළසිරුරු කපුටන්ටයි කඳු සිංහයින්ටයි කන්ට දාලා අපට යන්ට බෑ."

"මේ පොළොව වලවල් හාරන්ට තරම් තද වැඩියි." සෙර් විලිස් කීය.

"එහෙමනම් අපි ගල් ගොඩවල් එකතු කරලා ඒවා වහලා දාමු."

"ඔබට ඕන නම් ගල් ගොඩවල් එකතු කර කර ඉන්ට." බ්‍රොන් ඇයට කීය. "ඒ වුනාට ඒකට මාවයි චිගන්වයි ගාවගන්ට එපා. මැරිච්ච මිනිස්සුන්ගෙ මළකඳන් උඩින් ගල් තිය තියා ඉන්නවට වඩා මට කරන්ට දේවල් තියෙනවා." ඔහු පිරිස සිසාරා බැල්මක් හෙලීය. "අද රෑ වෙනකොට පණපිටින් ඉන්ට ඕන අය අපිත් එක්ක එන්ට."

"මගේ ආර්යාවනි, එයා කියන්නෙ ඇත්ත." සෙර් රඩ්‍රික් එකඟ විය. මේ මහලු නයිට්වරයා සටනින් තුවාල ලබා සිටියේ ය. ඔහු ගේ වමතේ ගැඹුරු කැපුමක් හා ගෙලේ හෙලි පහරකින් ඇති වූ සීරීමක් තිබුනු අතර ඔහු ගේ කටහඬ වෙහෙසින් බරව තිබ්බින. "අපි

මෙතන තැවරි තැවරි හිටියොත් උං අනිවාර්යයෙන්ම ආයෙමත් අපි පිට කඩන් පනීවි. අපි දෙවෙනි ප්‍රහාරයකට සූදානම් නෑ."

කැට්ලින් ගේ මුහුණේ ඇඳුනු කේන්තිය ටිරියන් පැහැදිලිවම දුටුවේ ය. එනමුදු ඇයට වෙනත් විකල්පයක් නොවින. "දෙයියො අපට සමාව දෙන්ට ඕන. එහෙනම් අපි දැන්ම පිටත් වෙමු."

තවදුරටත් ඔවුන්ට අසුන් ගේ අඩුවක් නොවීය. සිය සැදලය ගලවාගත් ටිරියන් අඩුම ගනනේ තව දවස් දෙක තුනක් හෝ ජීවත්වීමට ශක්තිය ඇතැයි පෙනුනු ජයික් ගේ අසු වෙත මාරු විය. ඔහු අසු මතට නැගීමට සැරසෙද්දී ලාරිස් ඔහු වෙත පියමැන්නේ ය. "මම දැන් ඔය කිනිස්ස ගන්නම් කුරුමිට්ටො."

"එයාට ඒක තියාගන්ට දෙන්ට." කැට්ලින් ස්ටාර්ක් සිය අසු මත සිට කීවාය. "ඒ වගේම එයාගෙ පොරොවත් ආපහු දෙන්ට. ආයෙමත් පහරදීමක් සිද්දවුනොත් අපිට ඒක උවමනා වෙයි."

"ඔබට බොහොම ස්තූතියි ආර්යාවනි!" ටිරියන් අසු පිට නගිමින් කීය.

"ස්තූතිය තියාගනින්." ඇය නොසැලකිල්ලෙන් මෙන් කීවාය. "කලින්ට වඩා දශමයක්වත් වැඩියෙන් මම උඹව විශ්වාස කරන්නෙ නෑ." ඔහු එයට සුදුසු පිළිතුරක් සිතා ගැනීමට පෙර ඇය පිටව ගියාය.

සිය ශිරස්කය හොඳින් හිසේ හරිබරි ගසාගත් ඔහු බ්‍රොන්ගෙන් නැවත පොරොව ඉල්ලාගත්තේ ය. එකට කර ගැට ගැසූ දැතින් හා මුහුණ වැසූ රෙදි කඩකින් යුතුව තමා මේ ගමන ඇරඹූ හැටි ඔහුට සිහිපත් විය. මෙය සැබැවින්ම තත්ත්වයේ නියත වැඩි දියුණුවක් විය. ඔහු අත පොරොව තිබෙන තාක් කල් ස්ටාර්ක් ආර්යාව ඇගේ විශ්වාසය ඇය ළඟම තබාගත්තාවේ. තමා දැන් මේ තරගයේ ඇයට වඩා ඉදිරියෙන් සිටින බැව් ඔහුට හැඟෙන්නට විය.

සෙර් විලිස් වෝඩ් පෙරමුණ ගත්තේ ය. බ්‍රොන් පසුමුණ ගත් අතර සෙවනැල්ලක් මෙන් තමාව පිරිවැරූ සෙර් රඩ්‍රික් පසෙකින් ඇතිව කැට්ලින් ස්ටාර්ක් පිරිස මධ්‍යයේ ආරක්ෂාකාරීව ගමන් ගත්තා ය. ගමන අතරතුරේදී මැරිලියන් විසින් වරින් වර ටිරියන් දෙස බුම්මා ගත් බැලුම් හෙලන්නට විය. ඔහු ගේ වීණාව ද, ඉළඇට කිහිපයක් ද, සූරතේ ඇඟිලි හතරක් ද බිඳී ගොස් තිබින. එනමුදු දිනය ඔහුට මුලුමනින්ම නරක් වූවක් නොවීය. ඔහු කොහෙන් හෝ අලංකාර, කළු පැහැ ලොම් මත සුදු ඉරි වැටුනු සනකම් සළුවක් සොයාගෙන තිබින. ඔහු මේ සළුව තුළ ගුලිවී නිහඬවම ගමන් කලේ තම දිවියේ පළමු වරට කීමට කිසිවක් සොයාගත නුහුනාක් මෙනි.

අඩ මයිලයක් යාමටත් මත්තෙන් කඳු සිංහයින් ගේ ගෙරවිලි ද තවත් නොබෝ වේලාවකින්ම ඔවුන් හැරදා පැමිණි මළසිරුරු බෙදාගැනීමට උන් කරන අරගලද ඔවුන්ට අසන්නට ලැබින. මැරිලියන් පැහැදිලිවම හැමටම දිස්වන පරිදි සුදුමැලි වී ගියේය. ටිරියන් ඔහු පසෙකට අසු විහිදීය. "බයගුල්ලා!" ඔහු කීවේය. අසුට පයින් ඇන්න ඔහු ගායකයා පසු කර කැට්ලින් හා සෙර් රඩ්‍රික් වෙතට ළඟා විය.

ඇය තදකරගත් දෙතොලින් යුතුව ඔහු දෙස බැලුවා ය.

"බොහොම අවාසනාවන්ත විදියට අපේ කතාව අතරමග නවත්තන්ට වෙද්දි මම ඔබට කිය කියා හිටියෙ," ටිරියන් කතාව ඇරඹී ය. "සුළැඟිල්ලා ගේ ඔය කතන්දරේ ලොකු වැරැද්දක් තියෙනවා. මම මොකෙක් කියලා ඔබ විශ්වාස කරන් හිටියත් මට කමක් නෑ මගේ ආර්යාවනි. මම ඔබට බොහොම පැහැදිළිව කියන්නෙ... මම කවදාවත්, කවමදාවත් මගේ පවුලෙ කෙනෙකුට විරුද්ධව ඔට්ටු අල්ලන්නෙ නෑ."

Tyrion Lannister: “Why does a bear shit in the woods? Because it is his nature. Lying comes as easily as breathing to a man like Littlefinger.”

ආර්යා 03-1

කණක් කොට කළු බළලා තමාගේ පිටකොන්ද ආරුක්කුවක් මෙන් නමාගත්තේ ඇයට පිම්බේ ය.

පාවහන් නොලූ දෙපතුල් සෙමින් බිම තබමින්, තමාගේ සැලෙන හදවතට සවන් දෙන අතර ගැඹුරු ලෙස හුස්ම ගනිමින් ආර්යා පටුමග ඔස්සේ හෙමිහිට ගමන් කලාය. 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට ඕන', 'පිහාටුවක් වගේ සැහැල්ලු වෙන්ට ඕන' ඇය තමාටම කියාගත්තා ය. බිළාලයා ඇය එන දෙස පරීක්ෂාවෙන් බලා සිටියේ ය.

බළලුන් ඇල්ලීම බෙහෙවින් අසීරු කාර්යයක් විය. ඇගේ දෑත් අඩක් සුව වූ සීරීම්වලින් පිරී තිබින. හදිසි පිනුම් වැටීම් නිසා ලෙලි ගැහුනු දණහිස් දෙකම තුවාල කබොලුවලින් වැසී තිබින. මුලදී නම් මුළුතැන්ගෙයි සිටින අරක්කැමියාගේ තරබාරු අලස බළලාට පවා ඇයව පහසුවෙන්ම මඟහැරිය හැකිවිය. එහෙත් සිරියෝ දිවා රෑ නොබලා ඇයව එහිම යෙදවූ අතර ලේ වැගිරෙන දෑතින් යුතුව ඇය ඔහු කරා දිවයද්දී පවා ඇයට කෑගැසුවේ ය. "මෙච්චර හෙමින්? ඉක්මන් කරහන් කෙල්ලේ. උඹේ සතුරො උඹට සීරිම් තුවාල ටිකක් විතරක් දීලා නිකා ඉන්නෙ නෑ." ඔහු ඇගේ තුවාලවල මරිෂ් ගින්දර නමින් හැඳින්වෙන සැර බෙහෙතක් තැවරී ය. ඉන් කෙතරම් දැඩි දැවිල්ලක් ඇතිවූවාද යත් කෑගැස්සීම නවත්වා ගැනීම සඳහා ඇයට තොල් සපා ගැනීමට සිදුවිය. එනමුදු මේ බෙහෙත් සාත්තුවෙන් පසු ඔහු තවත් බළලුන් සෙවීම සඳහා ඇයව පිටත් කර හැරියේ ය.

රතු බලකොටුව බළලුන්ගෙන් පිරී තිබින. හිරුඑළියේ නිදි කිරන නාකි අලසයින්, බිහිසුණු ඇස් ඇති, වල්ගා නටවමින් එහා මෙහා යන දඩයක්කරුවන්, ඉදිකටු වන් තියුණු නිය ඇති කඩිසර බළල් පැටවුන්, ආර්යාවන්ට අයත් මනාව පීරූ ලොම් සහිත ශෝභන සුරතලුන්, කසල ගොඩවල කෑම සොයමින් සෙවිල්ලෙන් ඇවිදින කෙසඟ බළලුන් වැනි සෑම ආකාරයකම බළල්ලු එහි වූහ. ඔවුන් එකිනෙකා පසුපස ලුහුබැඳ ගොස් ඩැහැගත් ආර්යා සිය ජයග්‍රහණ ආඩම්බරයෙන් ඔසවාගෙන විත් සිරියෝ ෆොරල්හට පෙන්වීය. මේ කණක් කොට කළු යක්ෂයා හැර බලකොටුවේ සිටි සෑම බළලෙකුම මේ වන විට ඇගේ ග්‍රහණයට හසු වී තිබින. "මූ තමා මේ බලකොටුවෙ නියම රජා!" නගරාරක්ෂක සෙබළෙකු වරක් ඇයට පවසා තිබින. "පාපයටත් වඩා නාකි, ඒ වගේ දෙගුණයක ජඩයෙක්. එක පාරක්

රජතුමා, රැජිණ ගේ තාත්තා වෙනුවෙන් භෝජන සංග්‍රහයක් පවත්වද්දි මේ කළු අවජාතකයා මේසෙට පැනලා, ටයිවින් උතුමානන් අතේ තිබුන පුළුස්සපු වටුවෙක් ඩැහැගත්තා. රොබර්ට් රජතුමා හිනාවෙලා දෙකට පැලුන්නැති ටික විතරයි. උගෙන් ඈත්වෙලා ඉන්ට දරුවෝ!"

මේ බළලා ඇයව බලකොටුව පුරා දුවවන්නට සමත් වී තිබින. දෙවරක් හස්තයේ කුළුණ වටා, ඇතුළත තාප්පය හරහා, ඉස්තාල මැදින්, සර්පිලාකාර පඩිපෙළ පහළට, කුඩා මුළුතැන්ගෙය, ඌරු කොටුව හා නගරාරක්ෂක සෙබළුන් ගේ බැරැක්ක පසුකරමින්, ගංගාවට මුහුණ ලෑ ප්‍රාකාරයේ පාදස්ථය දිගටම, තවත් පඩිපෙළවල ඉහළට, ද්‍රෝහියා ගේ සක්මනෙහි එහාට මෙහාට, නැවතත් පහළට ගේට්ටුවක් අතරින්, ළිඳක් වටා, ආගන්තුක ගොඩනැගිලි තුළට හා එයින් පිටතට ආදී වශයෙන් ඔවුන් දෙදෙනා නොනවතින තරගයක යෙදී හුන්හ. මේ වනවිට තමා සිටින්නේ කොහේදැයි ආර්යාට කිසිදු දැනීමක් නොවීය.

අන්තිමේදී ඇයට ඌව හසුවින. උස් බිත්ති දෙපසින්ම තද වී තිබුනු අතර ඉදිරියෙන් වූයේ කවුළු විරහිත, ගලින් කල තාප්පයකි. 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට ඕන', 'පිහාටුවක් වගේ සැහැල්ලු වෙන්ට ඕන' ඉදිරියට ලිස්සා යන අතර ඈ නැවතත් කීවාය.

ඔවුන් දෙදෙනා අතර පියවර තුනක දුරක් තිබියදී ඌ ඊයක් මෙන් ඉවතට පැන්නේ ය. ඌ වමට හා දකුණට පැන්න අතර ඒ සමගාමීව ආර්යාද දකුණට හා වමට පැන්නී උගේ මඟ අවහිර කලාය. ඌ නැවතත් ඇයට පිඹ ඇගේ දෙකකුල් අතරින් පැනයෑමට වෙර දැරීය. 'සර්පයෙක් වගේ ක්ෂණික වෙන්ට ඕන' ඇය සිතුවාය. ඇගේ දෑත් ඌ වටා වෙලී ගියේ ඌව ඔසවා පපුවට තුරුළු කරගත්තා ය. ඌ ඇගේ සමින් තැනුණු කොට කබායේ ඉදිරිය සූරද්දී ඇය මහහඬින් සිනාසෙමින් වටයට කැරකුනා ය. ඇය ක්ෂණිකවම උගේ දෑස් මැද නළල සිප ගත් අතර ඒ සමගම උගේ නියපහුරෙන් බේරීම සඳහා හිස පසුපසට ඇද ගත්තා ය. බළලා වේදනාවෙන් කෑගසමින් පිම්බේ ය.

"මොකක්ද ඌ මේ බළලාට කරන්නේ?"

තිගැස්සුනු ආර්යා බළලාව බිම දමා හඬ ආ දෙසට හැරුනා ය. ඇගෙන් ගැලවුණු ඌ ඇසිපිය හෙලන පමාවෙන් අතුරුදහන් විය. බෝනිකෙකු මෙන් සුන්දරව නිල් පැහැ පට රෙද්දෙන් කල ඇඳුමකින් සැරසුනු, රන්වන් කේශකලාපයකින් යුත් දැරියක් පටුමග

කෙලවර සිටගෙන උන්නා ය. ඇය පසෙකින් තර, පැණි පැහැ කෙස්සකින් යුත් කොල්ලෙක් සිටියේ ය. ඔහුගේ කබායේ ඉදිරිපස උඩඟු ලීලාවෙන් හිස ඔසවා සිටින ගෝනකු මුතුවලින් ගෙත්තම් කර තිබූ අතර බඳපටියේ කුඩා කඩුවක් එල්ලී තිබිනි. 'මර්සෙලා කුමාරියයි ටමෙන් කුමාරයයි' ආර්යා සිතුවා ය. අශ්වයෙකු තරම් විශාල සප්තක පූජකවරියක් ඔවුන් අසලින් සිටගෙන සිටි අතර ඇයට පිටුපසින් ලේ රතු පැහැ සළුවලින් සැරසුනු ලැනිස්ටර් මුර සෙබළුන් දෙදෙනෙක් වූහ.

"උඹ මොකක්ද ඒ බළලට කලේ කොල්ලෝ?" මර්සෙලා පරුෂ ස්වරයෙන් නැවතත් ඇසුවා ය. "කඩමාලු ඇඳගත්ත කොල්ලෙක්නේ. බලන්ටකො උගෙ හැටි." සිය සොහොයුරාට පැවසූ ඇ මෝඩ සිනාවක් පෑවාය.

"වැරහැලි ඇඳගත්ත, ජරා, ගඳගහන කොල්ලෙක්." ටමෙන් එකඟ විය.

තමා කවුරුදැයි ඔවුන් නොදන්නා බව ආර්යා තේරුම් ගත්තා ය. අඩුම ගනනේ තමා කෙල්ලක් යන බවවත් ඔවුන් නොදන්නා බව ඇයට වැටහින. එය ඇත්තෙන්ම පුදුම වීමට කරුණක් නොවීය. ඇය පාවහන් රහිතව, අපිරිසිදුව, අවුල්ව ගිය කෙහෙරැල්ලෙන් යුතුව සිටි අතර බළලා ගේ නිය පහරින් සීරුනු කෙටි කබායකින් හා දණහිසට උඩින් කපන ලද රළු දුඹුරු පැහැ කලිසමකින් සැරසී සිටියා ය. බළලුන් අල්ලනවිට සේද ඇඳුමින් හෝ සායකින් හෝ සැරසී සිටීම කල නොහැක්කකි. හනික හිස නැමූ ඇය දණක් නමා ආචාර කලාය. සමහරවිට ඔවුන් ඇයව කොහෙත්ම හඳුනා නොගනු ඇත. වැරැදීමකින් හෝ ඔවුන් ඇයව හඳුනාගතහොත් එය ලෙහෙසියෙන් කෙලවර වන්නක් නොවන බැව් ඇය ඉඳුරා දැන සිටියා ය. සෙප්ටා මෝර්ඩේන් තදින්ම කෝප වනු ඇත. ලැජ්ජාව නිසා සන්සා නැවත කිසිදා තමා හා කතා නොකරනු ඇත.

මහලු, තරබාරු සෙප්ටා ඉදිරියට පා තැබුවා ය. "උඹ කොහොමද කොලුවෝ මෙහාට ආවෙ? උඹලා වගේ එවුන්ට බලකොටුවෙ මේ පැත්තේ කරක් ගහන්ට තහනම් කියලා දන්නෙ නැද්ද?"

"මේ ජාතියෙ එවුන් නවත්තන්ට බෑ." එක් සෙබළෙක් පැවසී ය. "ඒක හරියට මීයෝ නවත්තන්ට හදනවා වගේ වැඩක්."

"උඹ කා ළඟ වැඩ කරන එකෙක්ද කොලුවෝ?" සෙජ්ටා ප්‍රශ්න කලාය. "මොකද වෙලා තියෙන්නේ. කතා කරපන්. උඹ ගොළුද?"

ආර්යා ගේ උගුර හිරවින. ඇය කතා කලහොත් මර්සෙලා හා ටමෙන් නිසැකවම ඇයව හඳුනාගන්නවා ඇත.

"ගොඩ්වින්, ඕකව මෙහාට ගෙනෙන්." සෙජ්ටා පැවසුවා ය. වඩා උස්වූ මුරභටයා පටුමග ඔස්සේ ඇය වෙත පියවර මැන්නේ ය.

බිය විසින් යෝධ හස්තයක් මෙන් ඇගේ උගුර හිර කලේය. සිය ජීවිතය බිලිවුවද ආර්යා ඒ අවස්ථාවේදී නම් කොහෙත්ම කතා නොකරනු ඇත. 'නිශ්චල ජලය වගේ සන්සුන් වෙන්ට ඕන' ඇය තොල මතුලා ය.

ගොඩ්වින් ඇයව අල්ලාගැනීමට ලංවනවිට ආර්යා ඉවතට පැන්නා ය. 'සර්පයෙක් වගේ ක්ෂණික වෙන්ට ඕන', මේ ඇය සිරියෝගෙන් උගත් පාඩම් විය. ඔහු ගේ අතැඟිලි ඇගේ බාහුවේ ගෑවෙද්දී වම් පසට පිනූ ඇය සෙබළා ගේ සිරුර වටා කැරකී ඔහුගෙන් මිදුනා ය. 'ගිම්හානයේ සේද රෙද්දක් වගේ සුමට වෙන්ට ඕන.' සෙබළා නැවත හැරෙන විට ඇය පටු මාවත ඔස්සේ දුවන්නට පටන්ගෙන තිබින. 'මුවෙක් වගේ වේගවත් වෙන්ට ඕන.' සෙජ්ටා යටි උගුරින් කෑගැවාය. කිරිගරුඬ කුලුණු දෙකක් තරම් මහත් වූ ඇගේ දෙකකුල් මැද්දෙන් රූටා ගොස් නැවත නැගී සිටි ආර්යා ඇගේ සිරුරේ හැපී බිම වැටුනු ටමෙන්ට උඩින් පැන්නා ය. වටයක් කරකැවී දෙවන මුර භටයාද මග හැරි ඈ ඔවුන් සියල්ල පසුකලේ සිය දෙපාවලට මුලු ජවයම දුන්නා ය.

තමා පසුපසින් කෑගසන හඬ හා ළඟ ළඟම එන පිය ගැටෙන හඬ ඇයට ඇසින. බිම වැතිරුනු ඇය රෝල් වූ අතර ඇගේ සිරුරේ හැපුනු මුර සෙබළා පා පැකිලී ඇයට උඩින් විසි වී ගියේය. ආර්යා විගස නැවත නැගිට්ටා ය. තමාට ඉහළින් වූ ඊ විදින පටු සිදුරකට වඩා යාන්තම් පුළුල් වූ උස් පටු කවුළුවක් ඇය දුටුවා ය. උඩ පැන කවුළු පඩිය ඩැහැගත් ඇය ඉහළට නැගුනී දිගු හුස්මක් අල්ලාගෙන කවුළුවෙන් රිංගුවා ය. 'ආඳෙක් වගේ ලිස්සන්ට ඕන.' බිම පිරිසුදු කරමින් සිටි සේවිකාවක තිගස්සවමින් කවුළුවේ අනිත් පසින්

බිමට බට ඇය උඩ පැන නැගිට, ඇඳුම් ගසා දමා, නැවතත් දුවන්නට පටන් ගත්තා ය. දොරටුවෙන් එළියට, දිගු ශාලාවක් ඔස්සේ, පඩිපෙළක පහළට, සැඟවුනු අංගනයක් හරහා, මුල්ලකින් හැරී, තාප්පයකට උඩින් හා පහත් පටු කවුළුවක් තුළින් ගිය ඇය තිත්ත කලුවර බිම්ගෙයකට වැදුනා ය. අන්තිමේදී ශබ්ද සියල්ලම ඇයට පසුපසින් ඇයට දුරස්ව ගියේය.

වෙහෙස නිසා ඇය හතිලමින් සිටි අතර මුලුමනින්ම මෙන් අතරමංව ද සිටියා ය. ඔවුන් ඇයව හඳුනාගත්තේනම් තත්ත්වය බොහෝසෙයින් නරක් විය හැකි බැව් ඈ දැන සිටියද එවැන්නක් සිදුවීමට ඉඩක් නැතැයි ඇය කල්පනා කලාය. ඔවුන්ට ඇයව හඳුනාගැනීමට අවස්ථාවක් නොලැබෙන තරම් වේගයෙන් ඇය ක්‍රියා කලාය. 'මුවෙක් වගේ වේගවත් වෙන්ට ඕන.'

අඳුරේ ගුලි වී, තෙත් ගල් බිත්තියකට හේත්තු වූ ඇය තමා ලුහුබඳින්නන් ගේ හඬට ඇහුම්කන් දුන් නමුදු තමාගේම හදවත ගැහෙන හඬත්, ඈත කොහේදෝ දිය බිඳු කාන්දුවන හඬත් හැරෙන්නට අන් කිසිදු හඬක් නැසින. 'හෙවනැල්ලක් වගේ නිහඬවෙන්ට ඕන', ඇය සිතුවා ය. තමා මේ සිටින්නේ කොහේදැයි ඇය විමතියෙන් කල්පනා කලාය. ඔවුන් කින්ග්ස් ලැන්ඩින්ග්වලට පැමිණි මුල් කාලයේ මේ බලකොටුවේ තමා අතරමං වන අන්දම ගැන ඈ නිතරම නපුරු සිහින දැක තිබින.

රතු බලකොටුව වින්ටර්ෆෙල් වලට වඩා ප්‍රමාණයෙන් කුඩා බව ඇගේ පියා පවසා තිබින. එනමුදු ඇගේ සිහිනවලදී එය උත්තුංග, ඉමක් කොණක් නොමැති ශෛලමය වංකගිරියක් වූ අතර ඇගේ පිටුපසින් වූ බිත්ති නිතරම එහා මෙහා වෙමින් තත්ත්වය තවත් නරක් කලේය. මේ සිහිනවලදී ඇය පාට වියැකී ගිය තිරරෙදි පසු කරමින්, අඳුරු ශාලා ඔස්සේ ඇවිද්දා ය. නිමක් නැති කවාකාර තරප්පු බැස්සා ය. අංගන අතරින් හෝ පාලම් උඩින් හෝ කඩිනමින් ඇවිද්දා ය. ඇගේ කෑ ගැසීම්වලට ලැබුනු එකම ප්‍රතිචාරය වූයේ එහි දෝංකාරය පමණි. සමහර කාමරවල රතු ගලින් නිමවූ බිත්ති තුලින් ලේ වැගිරෙන්නාක් මෙන් ඇය දුටුවා ය. මේ කිසිදු තැනෙක කවුළුවක් සොයාගත නොහැකි විය. සමහර අවස්ථාවලදී ඇයට පියා ගේ හඬ ඇසුනු නමුදු එය ඉතා දුරස්ථ හඬක් විය. ඇය කෙතෙක් ඒ හඬ පසුපස දිවගියද එය කෙමෙන් තුනීව ගොස් අන්තිමේදී නැතිවම ගියේය. ඇය අඳුරේ තනිවූවා ය.

අවට තදින්ම අඳුරු බව ඇය තේරුම් ගත්තා ය. ඇය තම නිරුවත් දෙදණ පපුවට තුරුළුකරගත් අතර ඇගේ සිරුර වෙව්ලුවේ ය. නිසලව සිට දසදහස දක්වා ගණන් කල යුතුය. එය හමාර වන විට මෙතනින් රිංගා ගොස් ආපසු යෑම ආරක්ෂාසහිත වනු ඇත.

ඇය අසුභතට ගැන හමාර වන විට ඇගේ දෑස අඳුරට හුරු වූ අතර කාමරය වඩා ආලෝකවත් විය. ඇය වටාවූ වස්තූන්හි බාහිර ස්වරූපය දැන් ඇයට හඳුනාගත හැකි විය. විසල්, හිස් දෑස් කුහර අන්ධකාරය අතරින් කුසගින්නේ ඈ දෙස බලා සිටි අතර දිගු උල් දත්වල කඩතොලු සහිත සෙවනැලි ඈ අපැහැදිලිව දුටුවා ය. ඇගේ ගැනීම මුලුමනින්ම නතර වී ගියේය. දෑස් වසාගෙන තොල් සපාගත් ඇය බිය පලවා හැරීමට තැත් කලාය. ඇය නැවතත් දෑස් විවර කරන විට මේ යක්ෂයින් පලාගොස් සිටිනු ඇත. ඔවුන් සිටි බවක්වත් නොදැනෙනු ඇත. සිරියෝ අඳුරේ ඇය අසල හිඳ ඇගේ කණට කොඳුරන්නේ යැයි ඇය තමාට අඟවා ගත්තාය. 'නිශ්චල ජලය වගේ සන්සුන් වෙන්ට ඕන', ඇය තමාටම කියාගත්තා ය. 'වලහෙක් වගේ ශක්තිමත් වෙන්ට ඕන'. 'වුල්වරින් එකෙක් වගේ රෞද්‍ර වෙන්ට ඕන'. ඇය නැවත දෑස් විවර කලාය.

යක්ෂයින් තාමත් සිටි නමුදු බිය අතුරුදහන්ව තිබින.

නැගිට සිටි ඇය පරීක්ෂාවෙන් එහා මෙහා වූවාය. ඇය වටාම හිස්කබල් පිරී තිබින. මේ ඇත්තක්දැයි දැනගැනීමට ඇය කුතුහලයෙන් මෙන් එයින් එකක් අල්ලා බැලූ අතර ඇගේ ඇඟිලි තුඩු විශාල හණුවක් ස්පර්ෂ කරමින් ඇදී ගියේය. ඇටකටුව සිනිඳු වූ අතර එහි ස්පර්ශය දැඩි හා සීතල එකක් විය. අන්ධකාරයෙන් නිමවන ලද කිනිස්සක් මෙන් කළු පැහැ හා තියුණු වූ දතක් ඔස්සේ ඇය අතැඟිලි දිවෙවුවා ය. ඇගේ සිරුර කිලිපොලා ගියේය.

"මේක මැරිලා." ඇය හඬනගා කීවාය. "මේක නිකංම නිකං හිස්කබලක් විතරයි. මේකට බෑ මට හානි කරන්ට." එනමුදු ඇය එහි සිටින බව යක්ෂයින් දැන සිටියාක් මෙනි. ඒ හිස් දෑස් අඳුර තුළින් තමා දෙස බලා සිටිනු ඇයට දැනින. එම අඳුරු ගුහාවක් වැනි කාමරය තුළ ඇයට ආදරය නොකරන යම් දෙයක් ඇති බව ඇයට හැඟින. ඇය ඒ හිස්කබල වෙතින් ඉවත්වූයේ මුල් එකටත් වඩා විශාලවූ දෙවන හිස්කබලක හැපුනා ය. එක් මොහොතකට එහි දත් තම උරහිස් තුලට කිඳා බසින්නාක් මෙන් ඇයට දැනින. හරියටම ඇගේ මස් කැබැල්ලක් කන්නට ඊට අවශ්‍යවූවාක් මෙනි. ආර්යා සැනෙන් වටයක් හැරුනු අතර දිගු දත් අතර පැටලුනු ඇගේ කබාය ඉරී යනු ඇයට දැනින. ඊළඟ මොහොතේ ඇය දුවන්නට පටන්ගත්තා ය. තවත් හිස්කබලක්, අන් සැමටම වඩා විශාල යක්ෂයෙක් ඇය ඉදිරියේ දෘශ්‍යමාන වූ නමුදු ආර්යා දිවීම බාල නොකලා ය. අසිපත් තරම් උස් වූ, කළු පැහැ දත් වැටියක් උඩින් පිනූ ඈ බඩගිනිකාර හණු අතරින් වේගයෙන් දිවගියේ, දොරක හැපුනා ය.

ඇගේ දෑතට දොරෙහි වූ යකඩ වළල්ල හසු වූ අතර ඇය වෙර යොදා එය ඇද්දා ය. දොර මොහොතකට විරෝධය පෑ මුත් සෙමින් කාමරය තුළට ඇරින. එය නැගූ හඬ කෙතරම් මහත් වී ද යත් එම හඬ මුලුමහත් නගරයටම ඇසෙන්නට ඇතැයි ආර්යා බිය වූවා ය. ඉදිරියෙන්වූ ශාලාවට රිංගා ගැනීමට තරම් ඉඩ විවරයක් ලැබෙන තෙක් ඇය දොර විවර කලාය.

යක්ෂයින් සිටි කාමරය අන්ධකාර වී නම්, මෙම ශාලාව සප්ත අපායන්හි වූ කළුටකළු පාතාලයක් වැනි විය. 'නිශ්චල ජලය වගේ සන්සුන් වෙන්ට ඕන', ආර්යා තමාටම කියාගත්තා ය. මොහොතකට සිය දෑසට අඳුරට හුරුවීමට ඇය ඉඩ හැරියද පිටතට පැමිණි දොරේ අපැහැදිලි අළු පැහැ රාමුව හැර අන් කිසිවක් පෙනෙන්නට නොවීය. ඇය තමාගේ මුහුණ ඉදිරියේ ඇඟිලි නැටවූ අතර වාතය එහා මෙහා වන බව දැනුනු මුත් කිසිවක් නොදිටී ය. හරියට ඇය අන්ධ වී ඇත්තාක් මෙනි. 'දිය නැට්ටුවෙක් ඇස් දෙකෙන් විතරක් නෙවෙයි අනිත් හැම ඉන්ද්‍රියයකින්ම දකින්ට ඕන', ඇය සිහිපත් කරගත්තා ය. දෑස් පියා හුස්ම පාලනය කරගත් ඇය අනතුරුව අඳුරේ අතපත ගෑවාය.

ඇගේ අතැඟිලි වම්පසින් වූ රළු, කපරාරු නොකල ගල් බිත්තියෙහි ගැටින. ඇය බිත්තිය මතින් අතැඟිලි දුවවමින්, පාවෙන්නාක් මෙන් සැහැල්ලුවෙන් අඩි තබමින් අන්ධකාරය තුළ ඉදිරියට පිය මැන්නා ය. 'හැම ශාලාවක්ම කොහෙන් හරි කෙලවර වෙන්ට ඕන.' 'ඇතුළට එන්ට ක්‍රමයක් තියෙනවා නම් පිටවෙන්ටත් ක්‍රමයක් තියෙන්ට ඕන.' 'බය කඩුවට වඩා තියුණුයි.' සිරියෝගෙන් ඇය ඉගෙනගත් සියල්ල ඇයට මෙනෙහි වන්නට විය. ආර්යා බිය වන්නේ නැත. මෙසේ තමා බොහෝ වේලාවක් ඇවිද්දායැයි ඇයට හැඟුනු පසු එක්වරම බිත්තිය හමාර වී, සීත සුළඟක් ඇගේ කම්මුලේ දැවටින. සුළඟට හසු වූ කෙස් රොදක් යාන්තමින් නැටුවේ ය.

ඈත පහළ කොහේදෝ තැනකින් ඇයට ශබ්දයක් ඇසින. බූට්ස් සපත්තු පොළොවේ ඇතිල්ලෙන හඬක් හා දුරස්ථ කටහඬවල් ඇයට ඇසින. දුබල එළියක් යාන්තමට මෙන් බිත්තියේ තැවරී ගියේය. තමා විශාල කළු පතලයක් අබියස සිටගෙන සිටිනු ඇයට පෙනින. එය අඩි විස්සක පමණ විශ්කම්භයකින් යුතු වූ අතර පතුළ තෙරක් නොපෙනෙන තෙක් ගැඹුරට කිඳා බැස තිබින. පඩිපෙළක් මෙන් භාවිත කිරීම පිණිස කවාකාර බිත්තියට කාවද්දා තිබුනු විශාල ගල් වටයට වටයට පහළට ඇදී ගියේය. එය හරියටම නාකි ආයම්මා

කියා දුන් කතන්දරවල තිබුනු නිරයට යාමට තැනූ අඳුරු පියගැටපෙළක් මෙන් විය. මේ පොළෝ කුහරය තුළින් අන්ධකාරයෙන් මිදුනු කුමක්දෝ දෙයක් එළියට එමින් තිබින...

ආර්යා ගැට්ටට උඩින් එබී බැලූ අතර මුහුණේ දැවටෙන සීත පවන් රැළි ඇයට දැනින. ඈත පහළ ඉටිපන්දම් දැල්ලක් තරම් කුඩා පන්දමක් එළියක් ඈ දුටුවා ය. පඩිපෙළ නැග ඉහළට එන මිනිසුන් දෙදෙනෙකු ඇය හඳුනාගත්තා ය. ඔවුන් ගේ සෙවනැලි යෝධයින් තරම් උසට බිත්ති අද්දර නැටීය. ඔවුන් ගේ හඬ පාතාලය ඔස්සේ රැව් දෙමින් ඇසින.

"...එක අවජාතකයෙක් හොයාගත්තා." එකෙක් පැවසී ය. "අනෙක් උනුත් ඉක්මනින්ම එයි. දවසකින්, දෙකකින්, සුමාන දෙකකින්..."

"ඇත්ත දැනගත්තාම එයා මොනවා කරන්ට යයිද?" නිදහස් නගරවල සෞමය උච්චාරණයකින් යුතු දෙවන හඬක් ඇසීය.

"දෙයියෝම තමා දන්නේ." මුල් හඬ කීවේය. පන්දමේ අළු පැහැ දුම් රැල්ලක් සර්පයෙකු මෙන් දඟලමින් ඉහළ නැග්ගේ ය. "අර මොට්ටයෝ ටික එයාගෙ පුතා මරන්ට තැනුවා. ඒ මදිවට ඒක අන්තිම විකාර අවුල් ජාලයක් කරගත්තා. එයා මේවා ලේසියෙන් අත්ඇරලා දාන කෙනෙක් නෙවෙයි. මම උඹට අනතුරු අඟවන්ටයි මේ කියන්නෙ. අපි කැමති වුනත් නැතත් කොයිවෙලාවක හරි වෘකයයි සිංහයයි එකාට එකා මරාගන්ට යනවා."

"ඉක්මන් වැඩී. ඉක්මන් වැඩී." අමුතු උච්චාරණයක් සහිත හඬ පැමිණිලි ස්වරයෙන් කීවේය. "මේ වෙලාවේ යුද්ධෙකින් ඇති පලේ මොකක්ද? අපි තාම සූදානම් නැහැ නේ. පරක්කු කරපං."

"උඹ කියන්නේ මට කාලය නතර කරන්ට කියලද යෝධයෝ? මම මැජික්කාරයෙක් කියලා හිතුවද?"

අනෙකා කෙකර සිනාවක් පෑවේය. "වැඩි වෙනසක් නැහැනේ." ගිනිදළු සීතල සුලඟේ නැටුවේ ය. මේ වනවිට උසැති සෙවනැලි ඇය මතටම වාගේ වැටී තිබින. ඊළඟ

මොහොතේ පන්දම අතින් ගත් පුද්ගලයා පසුපසින් සිටි ඔහුගේ සගයා ද සමගින් ඇගේ ඇසට හසුවන මානයට නැංගේය. බඩගාමින් පතල් මුවවිටින් ඇත් වූ ආර්යා මුනින් තලා වී බිත්තියට හේත්තු වූවාය. මිනිසුන් පඩිපෙළ මුදුනට එද්දී ඇය හුස්මක් අල්ලා සිරකරගත්තා ය.

Desmond: “Wizards die the same as other men, once you cut their heads off.”

"උඹ මට මොනවද කරන්ට කියන්නේ?" සමින් කල අඩ කබායක් හැඳ සිටි තරබාරු පන්දම්කරු ඇසීය. බරැති බූට්ස් සපත්තු පැළැඳ සිටියද ඔහුගේ පියවර හඬක් නොනගාම පොළොව මත ගලා යන්නාක් මෙන් පෙනින. අඳුරු රැවුල් කොටවලින් වැසුනු රවුම් කැළැල් සහිත මුහුණක් ඔහු පැළැඳ සිටි වානේ තොප්පියට යටින් දිස්විය. පදම්කල සම් ආවරණ උඩින් සන්නාහයක් පැළඳ සිටි ඔහු ගේ ඉණේ කිනිස්සක් හා කෙටි කඩුවක් විය. ඔහු කොහේදී හෝ තමා විසින් දැක පුරුදු අයෙකු බැව් ආර්යාට හැඟින.

"එක හස්තයකට මැරෙන්ට පුළුවන් නම් තව එකෙකුට බැරි මොකද?" කහ පැහැ දෙබල් රැවුලක් හිමි අමුතු උච්චාරණයක් ඇත්තා පිළිතුරු දුන්නේ ය. "උඹ ඔය නැටුම මීට කලිනුත් නටලා තියෙනවා, මගේ මිත්‍රයා." ඔහු තමා විසින් මින් පෙර නොදුටුවකු බව ආර්යාට සහතික විය. ඔහු අධික ලෙස තරබාරු වුවද දිය නැට්ටුවකු මෙන් සැහැල්ලුවෙන්, විළුඹට බරදෙමින් ගමන් කලේය. ඔහු සෑම ඇඟිල්ලකම පාහේ - ඇතැම් ඇඟිලිවල දෙක බැගින්ද - මුදු පැළැඳ සිටියේ ය. රතු කැට, නිල්කැට හා වෛරෝඩි ඔබ්බවා නිමවා තිබුනු මේ මුදු පන්දම් එළියෙන් රතු රන් හා රිදී පැහැයෙන් බැබලින.

"මේ කාලේ කියන්නේ ඒ කාලේ නෙවෙයි. මේ හස්තය කියන්නෙ පරණ හස්තය නෙවෙයි." ශාලාවට ඇතුල් වෙමින් කැළැල් මුහුණා පැවසීය. 'ගලක් වගේ නිසොල්මන් වෙන්ට ඕන', ආර්යා තමාටම කියාගත්තා ය. 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට ඕන.' තමන් ගේ පන්දමේ දීප්තියෙන් ගිනිකණ වැටුනු ඔවුහු අඩි කිහිපයක් දුරින් බිත්තියට ඇලී සිටි ආර්යාව නොදුටුවෝ ය.

"සමහර විට එහෙම වෙන්ට පුළුවන්." දිගු ඉහළ නැග්මෙන් පසු හුස්මක් ගැනීම සඳහා නතරවෙමින් දෙබල් රැවුලා පැවසීය. "කොහොම වුනත් අපට කාලය ඕන. කුමාරි ඉන්නෙ දරුවෙක් ලැබෙන්ට. එයාගේ පුතා ඉපදෙන කල් බාල් ක්‍රියාකාරී වෙන එකක් නෑ. උඹ දන්නවනේ මේ ම්ලේච්ඡයන්ගේ හැටි."

පන්දම්කරු යමක් තල්ලු කලේය. යම් කිසි දෙයක් තවත් කුමක හෝ ගැටෙන ගැඹුරු ගෙරවිලි හඬක් ඇයට ඇසින. පන්දම් එළියේ රතු පැහැයෙන් දිලිසුනු දැවැන්ත ගල් කැබැල්ලක් සිවිලිමේ සිට මහත් හඬක් නගමින් බිමට පහත් වූ අතර ත්‍රාසය නිසා ආර්යාට කෑගැසෙන්නට ගියේය. පතලයට ඇතුළුවන විවරය සන, නොකැඩුනු ගලකින් වැසී ගොස් තිබින.

"එයා දැන්මම ක්‍රියාකාරී වුනේ නැත්නම් පස්සේ පමා වැඩිවෙන්ට පුලුවන්." මහත, වානේ තොප්පිකාරයා පැවසීය. "මේක තවදුරටත් දෙන්නෙක්ගේ තරගයක් නෙවෙයි. ඒක කවදාවත් එහෙම තිබුනා කියලා මම හිතන්නෙත් නෑ. ස්ටැනිස් බරතියනුයි ලයිසා ඒරිනුයි මගේ අතට අහුවෙන මානෙන් පිටට පැනලා ගිහින්. ඇහෙන කතාවලට අනුව නම් එයාලා තමන් වටේ සෙබළු රැස් කරනවා. කුසුම් නයිට්වරයා හයිගාර්ඩන්වලට ලියනවා, එයාගෙ තාත්තාට ආයාචනා කරනවා එයාගෙ සහෝදරීව රාජ සභාවට යවන්ට කියලා. මේ කෙල්ල අවුරුදු දාහතරක මිහිරි, සුන්දර, හීලෑකරගන්ට පුළුවන් ජාතියෙ කෙල්ලක්. රෙන්ලි උතුමානනුයි සෙර් ලෝරාසුයි හිතන්නේ රොබර්ට් එයාව කසාද බැඳලා, ඇඳට අරන් අලුත් රැජින කරගන්ට ඕනයි කියලා. එතකොට සුළැඟිල්ලා.... දෙයියෝම තමා දන්නේ සුළැඟිල්ලා මොන සෙල්ලමක්  කරනවද කියලා. ඒ වුනත් මගේ නින්දට බාධා කරන්නේ මේ කවුරුවත් නෙවෙයි, ස්ටාර්ක් උතුමානන්. එයා අවජාතකයව හොයාගත්තා, පොත හොයාගත්තා. එයා ඉක්මනින්ම ඇත්තත් හොයාගනී. සුළැඟිල්ලගේ ඇඟිලි ගැඹිල්ලට පින්සිද්ධවෙන්ට එයාගෙ බිරිඳ ටිරියන් ලැනිස්ටර්ව පැහැරගෙන ගිහින්. ටයිවින් උතුමානන් මේක ලොකු අවනම්බුවක් විදියට සලකයි. අනිත් එක ජේමිගෙත් විකාර ආදරයක් තියෙනවා පුංචි යකා ගැන. ලැනිස්ටර්ලා උතුරට හමුදා මෙහෙයවුවොත් ටලීවරුනුත් මේකට පැටලෙනවා. උඹ කියනවා පරක්කු කරපං කියලා. මම කියනවා ඉක්මන් කරන්ට ඕනැයි කියලා. හොඳම විජ්ජාකාරයෙකුටත් බෑ බෝල සීයක් හැමදාම අහසේ රඳවන් ඉන්ට. "

"උඹ විජ්ජාකාරයෙකුටත් වඩා දක්ෂයෙක් මගේ මිත්‍රයා. උඹ ඇත්තම ඇත්ත මන්තරකාරයෙක්. මම උඹෙන් ඉල්ලන්නේ ඔය මායා බන්ධන වැඩ ටික තව ටික

කාලෙකට කරගෙන යන්ට කියලයි." ඔවුහු ශාලාව හරහා යක්ෂයන් සිටි කාමරය පසුකොට ආර්යා පැමිණි දිශාවට පිය නගන්නට වූහ.

"මට කරන්ට පුලුවන් දෙයක් තියෙනවා නම් මම කරනවා." පන්දමා මෘදු ස්වරයෙන් පැවසීය. "මට තව රත්තරන් ඕන. ඒ වගේම තව කුරුල්ලෝ පනහක් විතරවත්."

ඇය ඔවුන්ට තරමක් දුර යෑමට ඉඩ හැර, සෙවනැල්ලක් මෙන් නිහඬව ඔවුන් පසුපසින් බඩගෑවා ය. 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට ඕන.'

"එච්චර ගොඩක්?" ආලෝකය අඩුවන්නා හාම ඔවුන් ගේ කටහඬවල්ද දුර්වල විය. "උඹට උවමනා උන් නම් හොයාගන්ට අමාරු වෙයි... ලාබාල, අකුරු දන්න එවුන්... කොහොමද ටිකක් වයස වැඩි උන්... ලේසියෙන් මැරෙන්නෙ නැති එවුන්..."

"නෑ. ලාබාල එවුන් වඩා ආරක්ෂාවයි... උන්ට අනුකම්පාවෙන් සලකන්ට..."

"... උන් කට මැත නොදොඩා ඉන්නවනං..."

"...අවදානම..."

ලුහුබඳින්නට ඇරයුම් කරන දුම් දමන තරුවක් බඳු පන්දම් එළිය ඔවුන් ගේ කටහඬවල් මැකී ගොස් බොහෝ වෙලාවක් ගතවනතුරුත් ආර්යාට දිස් විය. දෙවරක්ම මේ එළිය මැකී ගියද කෙලින්ම ඉදිරියට ගිය ආර්යා පටු සෝපානයකින් බැස පහළට ගමන් කරමින් තිබුනු එළිය සොයා ගත්තී එය ලුහුබැඳ පහළටම ගියාය. වරෙක ගලක පය පැකිලී වැටෙන්නට ගොස් බිත්තියට අත තැබූ ඇයට වැටහුනේ මුලදී ඔපමට්ටම් කල ගලින් සෑදී තිබුනු උමං බිත්තිය මේ වනවිට දැවයෙන් සුරක්ෂිත කල පසින් සෑදී ඇති බවය.

ඇය ඔවුන් පසුපසින් සැතපුම් ගණනක් ගමන් කර ඇති සෙයකි. අන්තිමේදී පන්දම් එළිය ද නොපෙනී ගියේය. එහෙත් ඉදිරිය හැර යා හැකි අන් මගක් නොතිබින. නැවතත් බිත්තිය

අල්ලා ගත් ඇය අඳුරේම, තමා පසෙකින් නයිමේරියාගේ සුමුදු පා හඬ නැගෙන්නේ යැයි සිතින් මවා ගනිමින් ඉදිරියටම ගියාය. උමගේ අවසානය වන විට ඇයට දණක් උස පල් ගඳ ගසන ජලයේ බැස යාමට සිදුවිය. සිරියෝට මෙන් තමාටද මේ ජලය මතින් ඇවිදීමට හැකි විනි නම් යැයි ඇය පැතුවාය. නැවත කිසිදිනෙක හිරු එළිය දක්නට නොලැබෙතැයි ඇය සිතුවාය. අන්තිමේදී ඇය නැවුම් වාතය සහිත එළිමහනට පැමිණෙන විට රාත්‍රී අන්ධකාරය වැටී තිබින.

ගඟට වැටෙන කුණු කානුවක මුවවිට තමා සිටගෙන සිටින බව ඇයට වැටහින. තමා ගේ සිරුරින් නිකුත්වන කුණුගඳ උහුලා ගත නුහුනු ඇය එතැනම ඇඳුම් ගලවා දමා ගැඹුරු අඳුරුවන් ගංදියට පැන්නාය. පිරිසිදු යැයි හැඟෙන තෙක් ගංදියේ පිහිනූ ඇය සීතල නිසා වෙවුලමින් ගොඩට බඩගෑවාය. ඇඳුම් සෝදමින් සිටින අතරතුර ඇය පසු කර අසරුවන් කිහිප දෙනෙකු ගමන් කලද, සඳඑළියේ කඩමලු සෝදමින් සිටින නිරුවත් කැහැටු කෙල්ලක ගැන සොයා බැලීමට ඒ කිසිවෙකුටත් උවමනාවක් නොවීය.

ඇය මේ වනවිට බලකොටුවෙන් සැතපුම් ගණනක් ඈත්ව සිටියා ය. එනමුදු කිංග්ස් ලැන්ඩින්ග්හි ඕනෑම තැනකට දිස්වන ඒගොන් ගේ කඳුගැටයේ පිහිටි රතු බලකොටුව නිසා ඇයට මග වරදින්නට හැකියාවක් නොතිබින. වාහල්කඩ සමීපයට ළඟා වනවිට ඇගේ ඇඳුම් බොහෝ සෙයින් වියළී තිබින. කටු දොරටුව පහත දමා සියලු ගේට්ටු වසා දමා තිබුනු බැවින් ඇය පැති දොරක් කරා හැරුනා ය. ඇතුළට යන්නට දෙන්ට යැයි ඇය ඉල්ලූ විට මුරය භාරව සිටි නගරාරක්ෂකයෝ ඇයට එරවූහ. "පලයන් යන්ට මෙතනින්. කුස්සියේ ඉතුරු ඔක්කොම ඉවරයි. අනික මෙහෙ රෑ වෙලා හිඟා කන්ට දෙන්නේ නෑ."

"මම හිඟන්නියක් නෙවෙයි. මම මෙහෙ තමා ඉන්නේ."

"දැන් එක පාරක් කීවාම පලයන්. කණ පැලෙන්ට දෙකක් දෙන්ට කලින්."

"මට මගේ තාත්තව මුනගැහෙන්ට ඕන."

නගරාරක්ෂයකයෝ මුහුණින් මුහුණ බලාගත්හ. "ඉතින් මොකද? මට රැජිණව ඇඳට ගන්ට ඕන. ඔය හිතලුවලින් කාටවත් වැඩක් වෙනවද? පලයන් යන්ට."තරුණ භටයා පැවසීය.

"දැන් කවුද තොගේ ඔය තාත්තා කොල්ලො? කාණුවල මීයෝ අල්ලන එකාද?"

"රජ්ජුරුවන්ගේ හස්තය." ආර්යා පැවසුවා ය.

මිනිසුන් දෙදෙනා සිනහවූහ. බල්ලෙකුට නිකමට පහරක් එල්ල කරන්නාක් මෙන් වැඩිමහලු මිනිසා ඇය වෙත පහරක් එල්ල කළේය. එනමුදු පහර පටන් ගන්නටත් පෙර එය එන බව දුටු ආර්යා නර්තනකාරී ඉරියව්වකින් මෙන් එමගින් ඉවත්වූවා ය. "මම කොල්ලෙක් නෙවෙයි." ඇය ඔවුන් වෙත කඩා පැන්නා ය. " මම වින්ටෙර්ෆෙල්වල ආර්යා ස්ටාර්ක්. මගේ ඇඟට අතක් තිබ්බොත් මගේ තාත්තා උඹලගේ ඔලු රිටි දෙකක ගහයි. මාව විශ්වාස නැත්තම් හස්තයේ කුළුණෙන් ජොරී කසල් හරි වයොන් පූල් හරි එක්ක වරෙන්." දැත ඉණේ ගසාගත් ඇය බෙරිහන් දුන්නාය. "දැන් ඔය දොර ඇරපන් කණ පැලෙන්ට දෙකක් දෙන්ට කලින්."

හාර්වින් සහ මහත ටොම් ඇයව පියා අබිමුවට පමුනුවන විට ඔහු පුස්තකාල කාමරයේ තනිව අසුන් ගෙන සිටියේ ය. මේසය මත දැල්වෙමින් තිබුනු පහනක එළියෙන් ඔහු ආර්යා සිය ජීවිතයට දුටු ලොකුම පොත දෙසට නැඹුරුව එය කියවමින් උන්නේ ය. පාට වියැකී ගිය ඝන හම් කවරයෙන්, කහ පැහැ ගැහුණු කොළවලින් සහ රළු අකුරින් යුතු පොත වසා දමා හාර්වින් ගේ වාර්තාවට සවන් දුන් ඔහු මිනිසුන් දෙදෙනාට ස්තුතිකර පිටත්කර හැරියේ ය. ඉන්පසු දැඩි බවක් ආරූඪ කරගත් මුහුණින් යුතුව ආර්යා දෙසට හැරුනේ ය.

"ඔයා දන්නවද මගේ ආරක්ෂක බලකායෙන් බාගයක්ම ඔයාව හොයන්ට යැව්වා කියලා? සෙප්ටා මෝර්ඩේන් බයෙන් පිස්සු වැටිලා ඔයා ගැන හිතලම. එයා අන්න සප්තක දේවස්ථානයේ යාඥා කරනවා ඔයාව පරෙස්සමින් ආයෙත් හම්බවෙන්ටයි කියලා. ආර්යා, මගේ අවසරයක් නැතුව බලකොටු ගේට්ටුවෙන් පිටට යන්ට තහනම් කියලා ඔයා දන්නවා නේද?"

"මම ගේට්ටුවෙන් පිටට ගියේ නෑ " ඇය දෙඩෙවුවා ය. "මම ඒක හිතල කලේ නෑ . මම පහළ බිංගේ හිටියේ, ඒත් උන් උමගකට හැරුනා. ඒක හරිම කළුවරයි. මගේ ළඟ පන්දමක්වත්, ඉටිපන්දමක්වත් තිබුනේ නෑ. ඉතින් මට ඒ පස්සෙන් යන්ට වුනා. අර යක්ෂයෝ හින්ද මට ගිය පාරෙන් ආපහු එන්ටත් බෑනේ. තාත්තෙ, උන් කතා කර කර හිටියේ ඔයාව මරන හැටි! නෑ නෑ, යක්ෂයෝ නෙවෙයි, මිනිස්සු දෙන්නා. උන් මාව දැක්කේ නෑ . මම ගලක් වගේ හෙලවෙන්නෙ නැතුව හෙවනැල්ලක් වගේ සද්ද නැතුව හිටියා. එත් මට උන් දෙන්නව ඇහුනා. උන් කීවා ඔයා ළඟ පොතක් තියනවලු, අවජාතකයෙක් ඉන්නවලු. එක හස්තයක් මැරුනානම් තව හස්තයක් මැරෙන්ට බැරි නැහැල්ලු. අරකද පොත? මං හිතන්නෙ ජොන් වෙන්ට ඇති අවජාතකයා."

"ජොන්? ආර්යා මොනවද ඔයා මේ දොඩවන්නෙ? කවුද ඕවා කිවුවේ?"

"උන් තමා කීවේ. එතන හිටියා කහපාට දෙබල් රැවුලක් එක්ක  මහත එකෙක්, මුදු ගොඩාක් දාගත්තු. තව හිටියා මුදු සන්නාහයක් ඇඳලා වානේ තොප්පියක් දා ගත්ත එකෙක්. මහත එකා කීවා තව පරක්කු කරන්ට ඕනලු. ඒත් අනිකා කීවා හැමදාම බෝල උඩ දදා ඉන්ට බැරිලු. වෘකයයි සිංහයයි එකාට එකා කා ගනීලු. ඒක විකාර ගොඩක්ලු." ඇය සියල්ල මතක් කර ගැනීමට ය උත්සාහ කලාය. අසන්නට ලැබුනු සියල්ල ඇයට හරියටම නොතේරුනු අතර දැන් සියල්ලම හිස තුල පැටලී ගොස් ඇති සෙයකි. "මහත එකා කීවා කුමාරිට දරුවෙක් ලැබෙන්ට ඉන්නවලු. තොප්පිය දාගෙන හිටපු එකා – එයා අතේ තමා පන්දම තිබ්බේ – කීවා වැඩේ ඉක්මන් කරන්ට ඕනලු. මම හිතන්නේ එයා මන්තරකාරයෙක්."

"මන්තරකාරයෙක් ඈ!" සිනහවකින් තොරව නෙඩ් ඇසුවේ ය. "ඉතින් එයාට දිග සුදු රැවුලකුයි, තරු වැටුන උල් තොප්පියකුයි තිබ්බේ නැද්ද?"

"නෑ! ඒක අර නාකි ආයම්මගේ කතන්දරයක් වගේ නෙවෙයි. එයා මන්තරකාරයෙක් වගේ පෙනුනේ නෑ. ඒත් මහත එකා එහෙම තමයි කිවුවෙ."

"ආර්යා, ඔයා මේ මහා බොරු ගොඩක් නේද ඇද බාන්නේ?"

" නෑ, මම ඔයාට කිවුවනෙ. ඒක උනේ බිංගේ ඇතුළෙදි. අර රහස් දොරක් තියන තැන. මම හිටියේ බළලෙක් පස්සේ පන්න පන්නා. ඊට පස්සේ..." ඇය මුහුණ ඇඹුල් කරගත්තාය. ටමන් කුමරා පෙරලාගෙන දිවූ සැටි කිවුවොත් ඔහුට සැබැවින්ම තරහ යනු ඇත. "...ඊට පස්සේ, මම කවුළුවකින් රිංගල ගියා. එතන තමයි අර යක්ෂයෝ ටික හිටියේ."

"යක්ෂයොයි මන්තරකාරයොයි!" පියා පැවසීය. "ඔයා හොඳ ත්‍රාසජනක ගමනක් ගිහින් වගේ. ඔයා කීවා මේ මිනිස්සු දෙන්න බෝල උඩ දාන ඒවයි සෙල්ලම් ගැනයි කතා කලා කියලා?"

"ඔවු." ආර්යා පිළිගත්තා ය. "ඒ වුනත්..."

"ආර්යා උන් නාට්‍යකාරයෝ. තරගාවලිය බලන්ට එන මිනිස්සුන්ගෙන් ගානක් කඩා ගන්ට ආපු ඒ වගේ කාණ්ඩ දූසිමක් විතර මේ දවස්වල නගරයේ ඉන්නවා. උන් දෙන්නෙක් බලකොටුවේ මොනවා කරනවද මම දන්නේ නෑ. සමරවිට රජ්ජුරුවෝ සංදර්ශනයක් බලන්ට ඕන කියන්ට ඇති."

"නෑ." ඇය මුරණ්ඩු ලෙස පැවසුවා ය. "එහෙම නෙවෙයි."

"ඔයා මිනිස්සු පස්සේ ගිහින් ඔත්තු බලන එක නතර කරන්ට ඕනේ වහාම. මගේ දුව ඉබාගාතෙ යන බළල්ලු පස්සෙ පන්නලා අනුන්ගෙ කවුළුවලින් රිංගනවටත් මම කැමැති නෑ. බලන්ට පැටියෝ ඔයාගෙ හැටි. අතපය හූරගෙන, තුවාල කරගෙන. මේක දැන් දුරදිග ගියා හොඳටම ඇති. සිරියෝ ෆොරෙල්ට කියන්ට මට එයත් එක්ක කතා කරන්ට ඕනේ කියලා-"

හදිසි දොරට ගසන හඬකින් ඔහු ගේ කතාව අතරමග නැවතින. "මට සමාවෙන්ට උතුමානනි." දොර යාන්තමින් විවර කල ඩෙස්මන්ඩ් කීවේය. "කළු සහෝදරයෙක් ඔබතුමාව හමුවන්ට ඇවිත්. හදිසි කාරණයක්ලු."

"නිශා රැකුම් බලකායට මගේ දොර හැම තිස්සෙම ඇරලා." පියා පැවසුවේ ය.

හැඩපළු ගෙතුනු රැවුලකින් යුතු, කිලිටි ඇඳුමෙන් සැරසුනු, කුදු ගැසුනු අවලස්සන මිනිසකුව ඩෙස්මන්ඩ් විසින් කැඳවාගෙන ආවේය. එනමුදු සුහද ලෙස ඔහුව පිළිගත් ඇගේ පියා ඔහුගේ නම විමසීය.

"මම යොරේන් උතුමානනි. මේ අවෙලාවේ ආවට සමාවෙන්ට." ඔහු ආර්යා දෙසට හිස නැමීය. "මේ ඔබතුමා ගේ පුතා වෙන්ට ඇති. ඔබතුමාගෙ පෙනුමමයි තියෙන්නෙ."

"මම කෙල්ලෙක්!" ආර්යා කෑ ගැසුවාය. මේ මිනිසා ප්‍රාකාරයේ සිට පැමිණියා නම් වින්ටෙර්ෆෙල් හරහා එන්නට ඇත. "ඔබ මගේ සහෝදරයන්ව දන්නවද?" ඇය උනන්දුවෙන් විමසුවා ය. "රොබ්බුයි, බ්‍රෑනුයි ඉන්නේ වින්ටෙර්ෆෙල් වල, ජොන් ඉන්නේ ප්‍රාකාරේ. ජෝන් ස්නොව්. එයත් ඉන්නේ නිශා රැකුම් බලකායේ තමා. ඔබ එයාව දන්නවා ඇති. එයාට සුදු පාට සෝරවෘකයෙකුත් ඉන්නවා. ජොන් තාම මුර සංචාරකයෙක් වුනේ නැද්ද? මම ආර්යා ස්ටාර්ක්." ගඳ ගසන ඇඳුමින් යුත් මහල්ලා ඇය දෙස අමුතු බැල්මක් හෙලාගෙන සිටියේය. එහෙත් ආර්යාට සිය කතාව නවතා ගැනීමට හැකි නොවින. "මම ලියුමක් ලියලා දුන්නොත් ඔබ ආපහු ප්‍රාකාරේට යනකොට ඒක ජොන්ට ගිහින් දෙන්ට පුලුවන්ද?" ජොන් දැන් මෙහි සිටියා නම් යැයි ඇය සිතුවා ය. ඔහු සිටියා නම් බිංගෙවල් ගැන ද, වානේ තොප්පි දැමූ මන්තරකාරයන් ගැන ද විශ්වාස කරනු ඇත.

"මගේ දුවට ගොඩක් වෙලාවට හොඳ හැසිරීම් අමතක වෙනවා." මඳ සිනාවකින් යුතුව එඩාර්ඩ් ස්ටාර්ක් පැවසුවේ ය. "මට සමාවෙන්ට යොරේන්, ඔබව එවුවේ මගේ මල්ලි බෙන්ජින් ද?"

"නාකි මෝර්මන්ට් ඇරෙන්ට වෙන කවුරුවත් මාව එවුවේ නෑ උතුමානනි. මම මෙහෙ ආවේ ප්‍රාකාරේට මිනිස්සු එකතු කරන්ට. ඊළඟ රාජ සභාවේදී මම දණ ගහල රජතුමාගෙන් ඉල්ලා හිටිනවා අපේ ඕනෑකම. එතුමාටයි එතුමාගෙ හස්තයටයි පුළුවන්ද හිරගෙවල් වල ඉන්න ජරා ගොඩවල් ටිකක් අපිට දෙන්ට කියලා. අපි දැන් කතා කරන්නේ බෙන්ජින් ස්ටාර්ක් ගැන නම් එයාගෙ ලේ කළු පාටයි, මගේ වගේම. ඒ නිසා එයා ඔබතුමාගෙ වගේම මගෙත් සහෝදරයෙක්. ඒ හින්ද තමයි මම අස්සයව මැරෙන තරමට වේගෙන් ආවේ අනික් උනුත් මග දාල."

"අනික් උන්?"

"කුලී හේවායෝ, නිදහස් අසරුවෝ වගේ වැඩකට නැති උන්. උන්ගෙන් අර තානායම පිරිලයි තිබ්බේ. මට පෙනුනා උන් ඉව අල්ලන හැටි. ලේ සුවඳට හරි රත්තරන් සුවඳට හරි. ඔය දෙකේම අන්තිමට තියෙන්නේ එකම සුවඳ තමයි. උන් හැමෝම මෙහාට ආවෙත් නෑ . සමහර එවුන් පිම්මේ ගියා කාස්ටර්ලි රොක්වලට. ඒක අත ළඟමයි තියෙන්නෙ. මෙලහටත් ටයිවින් උතුමානන්ට ආරංචිය ලැබිල ඇති. ඒකෙ දෙකක් නෑ."

"මොකද්ද දැන් ඔය ආරංචිය?"

යොරේන් ආර්යා දෙස බැලුවේ ය. "මට සමාවෙන්ට උතුමානනි. මේවා ප්‍රසිද්ධියේ කියන්ට පුළුවන් කතා නෙවෙයි."

"ඔබ කියන එක හරි. ඩෙස්මන්ඩ්, මගේ දුවව එයාගේ කාමරේට එක්ක යන්ට." ඔහු ඇගේ නළල සිපගති. "අපි අපේ කතාව හෙට ඉවර කරමු."

ආර්යා සිටි තැන මුල් ඇද්දාක් මෙන් නැවතී සිටියා ය. "ජොන්ට මොකුත් නරකක් වෙලා නෑ නේද?" ඇය යොරේන්ගෙන් ඇසුවාය. "බෙන්ජීන් බාප්පට?"

"ස්ටාර්ක් ගැන නම් මම කියන්ට දන්නේ නෑ . ස්නොව් කොල්ලා නම් මම එනකොට හොඳින් හිටියා. මේ කාරණාව එයාලා ගැන නෙවෙයි.

ඩෙස්මන්ඩ් ඇගේ අතින් අල්ලා ගත්තේ ය. "එන්ට ආර්යාවෙනි, තාත්තා කියපු දේ ඇහුන නේද?"

ඔහුත් සමග යාම හැර වෙනත් විකල්පයක් ආර්යා සතු නොවීය. 'ඩෙස්මන්ඩ් වෙනුවට ටොම් සිටියා නම්' යැයි ඇය සිතුවා ය. ටොම් සිටියානම් කිසියම් උපායක් යොදා දොර

අසල දැවටී යොරේන් කියන්නක් අසා ගන්නට තිබින. එහෙත් ඩෙස්මන්ඩ් එසේ පහසුවෙන් රැවටිය හැක්කෙක් නොවීය. "මගේ තාත්තට කොච්චර ආරක්ෂකයෝ ඉන්නවද?" නිදන කුටිය වෙත පිවිසෙන පියගැටපෙළ බසින අතර ඇය ඇසුවාය.

"කිංග්ස් ලැන්ඩින්ග් වල ද? පනස් දෙනෙක් ඉන්නවා."

"කාටවත් එයාව මරන්ට ඔයාලා ඉඩ දෙන්නේ නෑ නේද?"

ඩෙස්මන්ඩ් සිනාසුනේ ය. "බය වෙන්ට එපා පුංචි ආර්යාවෙනි. එයාට කිසිම දෙයක් වෙන්ට ඉඩ දෙන්නේ නෑ. අපි එඩාර්ඩ් උතුමානන්ව රෑ දවල් දෙකේම රැකගෙන ඉන්නේ."

"ලැනිස්ටර්ලට සෙබළු පනහකට වඩා ඉන්නවා." ආර්යා පෙන්වා දුන්නා ය.

"ඔව් ඒක හරි. ඒත් උතුරේ එක මිනිහෙක් මේ වැඩකට නැති දකුණුකරේ උන් වගේ දහයක් වටිනවා. ඔබතුමී බය නැතුව නිදාගන්ට."

"එයාව මරන්ට මන්තරකාරයෙක් එහෙම එවුවොත්?"

"එහෙම උනොත් නේද?" සිය දිගු අසිපත කොපුවෙන් අදින අතර ඩෙස්මන්ඩ් පිළිතුරු දුන්නේ ය. "ඔළුව කපල දාපුවහම අනික් මිනිස්සු වගේම මන්තරකාරයොත් මැරිලා වැටෙනවා."

Eddard Stark: “My door is always open to the Night’s Watch.

එඩාර්ඩ් 08

"රොබර්ට්, කරුනාකරලා." නෙඩ් අයැද සිටියේ ය. "ඔබ මොකක්ද මේ කියන්නෙ කියලා හිතලා බලන්ට. ඔබ මේ දරුවෙක් මරන්ටයි කතා කරන්නෙ."

"මේ බැල්ලි බඩදරු වෙලා!" රජතුමා මීට මෙලවූ අතින් මේසයට වැරෙන් පහරක් දුන්නේ ය. "මම උඹට කිවුවා මේක මේ විදියට වෙයි කියලා නෙඩ්. එදා අර උතුරෙ සොහොන් බිමේදී මම උඹට කිවුවා නෙඩ්. ඒ වුනත් උඹ මට ඇහුම්කණ් දුන්නෙ නෑ. ඉතින් ඒක නිසා දැන්වත් මට ඇහුම්කණ් දීපන්. මට ඕන උන්ව මරන්ට. අම්මවයි දරුවවයි දෙන්නම. ඒත් එක්කම අර විසේරිස් කියන බූරුවවත් මරන්ට ඕන. ඒක පැහැදිලිද? මට ඕන උන් ඔක්කොම මරන්ට."

අනිකුත් රාජසභිකයින් සියලුදෙනාම හරියටම ඔවුන් මෙහි නැතැයි හඟවන්නට මෙන් වෙනතක බලමින් හෝ කිසිදු හැඟීමක් නොපෙන්වන මුහුණින් යුතුව හෝ සිටියහ. ඔවුන් සියලුදෙනාම ඔහුට වඩා ඥානවන්ත වූ බවට කිසිදු සැකයක් නැත. එඩාර්ඩ් ස්ටාර්ක්ට මෙවැනි තනිකමක් මීට පෙර කිසිදු දිනෙක දැනී නොතිබින. "ඔබ මේ දේ කලොත් ඔබේ නම හැමදාටම අපකීර්තියට පත්වෙයි."

"එහෙමනම් එහෙම වෙච්චාවෙ. මේ වැඩේ කෙරෙනවානම් මට ඒ ඇති. මගේ බෙල්ල කෙලින් එල්ලවෙලා තියෙන පොරොවක හෙවනැල්ල නොදැක ඉන්ට තරම් මම අන්ධයෙක් නෙවෙයි."

"එහෙම කිසිම පොරොවක් නෑ." නෙඩ් රජතුමාට කීවේය. "ඔබ ඔය දකින්නෙ මීට අවුරුදු විස්සකට කලින් නැතිකරලා දාපු හෙවනැල්ලකත් හෙවනැල්ල... එහෙම එකක් තියෙනවා නම්."

"තියෙනවා නම්?" වාරිස් සිය පුයර දැමූ දෑත් එකට අඹරවමින්, මෘදු ස්වරයෙන් ඇසීය. "මගේ උතුමානනි, ඔබ හිතන්නෙ මම වැරැදියි කියලයි, එහෙම නේද? මම රජතුමාටයි රාජ සභාවටයි වැරැදි ආරංචි ගේනවද?"

නෙඩ් පණ්ඩකයා දෙස නොපහන් බැල්මක් හෙළීය. "ඔබ අපට ගේන්නෙ ලෝකෙ අනිත් පැත්තෙ ඉන්න රාජද්‍රෝහියෙකුගෙ කෙඳිරීම් මගේ උතුමානනි. සමහරවිට මෝර්මන්ට් වැරදි ඇති. සමහරවිට ඌ බොරු කියනවා වෙන්ට ඇති."

"සෙර් ජෝරා මාව රවට්ටන්ට හිතන්නෙ නෑ." වාරිස් කපටි සිනහවක් රැඳුනු මුවින් යුතුව කීවේය. "ඒක ගැන අවිශ්වාස කරන්ට එපා මගේ උතුමානනි. කුමාරි ඉන්නෙ දරුවෙක් ලැබෙන්ටයි."

"ඔබ කියන විදියට. ඔබ වැරදි නම් අපට බයවෙන්ට හේතුවක් නෑ. මේ දැරිවිට ගබ්සාවක් වුනොත් අපට බයවෙන්ට හේතුවක් නෑ. එයා පුතෙක් වෙනුවට දුවෙක් ප්‍රසූත කලොත් අපට බයවෙන්ට හේතුවක් නෑ. ඒ උපදින දරුවා බිළිඳු කාලෙම මැරුනොත් අපට බයවෙන්ට හේතුවක් නෑ."

"ඒත් ඌ පිරිමි දරුවෙක් වුනොත්? ඌ ජීවත් වුනොත්?" රොබර්ට් විරෝධාත්මක හඬින් ඇසුවේ ය.

"ඒ වුනත් පටු මුහුද අපි දෙගොල්ල අතරේ තියෙනවා. ඩොත්රැකියො උන්ගෙ අශ්වයින්ට වතුර උඩ ඇවිදින්ට පුරුදු කරපු දාට තමා මම බයවෙන්නෙ."

වයින් උගුරක් තොල ගෑ රජතුමා මේසයේ අනෙක් පස සිටි නෙඩ් දෙස රවා බැලුවේ ය. "ඒ කියන්නෙ, උඹ මට කියන්නෙ මකරපැටියා මගේ රටේ වෙරළට ගොඩබහිනකම් මම මොකුත් නොකර කට ඇරන් බලන් ඉන්ට ඕනයි කියලද?"

"මේ මකරපැටියා තාම ඉන්නෙ එයාගෙ අම්මගෙ බඩ ඇතුළෙ." නෙඩ් කීය. "අඩුම ගානෙ ජයග්‍රාහක ඒගොන්වත් කිරිවරනකම් කිසිම දෙයක් කරන්ට හැදුවෙ නෑ."

'දෙයියම්පා! උඹ නම් ඔරොක්ස් එකෙක් වගේ මුරණ්ඩුයි ස්ටාර්ක්." රජතුමා මේසය වටා පිරික්සා බැලීය. "උඹලා අනිත් එවුන්ගෙ දිවවල් නැති වෙලාද? මේ මොළේ ගල්වෙච්චි මෝඩයගෙ ඔළුවට හරි නුවණ දාන්ට එකෙක් නැද්ද?"

වාරිස් රජතුමා දෙසට චාටු සිනහවක් පෑවේ නෙඩ් ගේ කමිස අතින් ඇල්ලී ය. "ඔබතුමාගෙ මනස්තාපය මට තේරෙනවා එඩාර්ඩ් උතුමානනි. ඇත්තෙන්ම මට තේරෙනවා. මේ කණගාටුදායක ප්‍රවෘත්තිය රාජසභාවට ගෙනාවා කියලා මට දැනෙන කිසිම සන්තෝසයක් නෑ. අපි මේ කරන්ට අදහස් කරන්නෙ බොහොම නරක වැඩක් තමා. හරිම අධම දෙයක්. ඒ වුනත් අපි මේ රාජධානිය පාලනය කරනවා නම්, රාජධානියේ යහපත වෙනුවෙන් අධම දේවල් වුනත් කරන්ට අපට සිද්දවෙනවා, ඒක අපේ හිතට කොච්චර වේදනාවක් දුන්නත්."

රෙන්ලි උතුමානන් දෙවුර ඇකිළීය. "මේක බොහොම සරල ප්‍රශ්නයක් වගෙයි මට නම් පේන්නෙ. හරි නම් අපි මීට අවුරුදු ගානකට කලිනුයි විසේරිසුයි එයාගෙ සහෝදරීවයි මරලා දාන්ට තිබුනෙ. ඒ වුනත් අපේ රජතුමා, මගේ සහෝදරයා බොහොම ලොකු අත්වැරැද්දක් කලා ජොන් ඒරින්ට කණ් දීලා."

"සමාව දීම කියන්නෙ අත්වැරද්දක් නෙවෙයි රෙන්ලි උතුමානනි." නෙඩ් පිළිතුරු දුන්නේ ය. "මෙතන ඉන්න සෙර් බැරිස්ටාන්, ත්‍රිශූලයේ සටනෙදි රොබර්ට්ගෙයි මගෙයි හොඳ යාළුවො කී දෙනෙක් කපලා බිම දැම්මද? හොඳටම තුවාලවෙලා මරනාසන්න වෙලා හිටපු එයාව අපි ගාවට අරන් ආවහම රූස් බෝල්ටන් බලකරලා අපට කිවුවා එයාගෙ බොටුව කපලා දාන්ටයි කියලා. ඒ වුනත් ඔබේ සහෝදරයා මොකක්ද දන්නවද කිවුවෙ? 'කෙනෙකුගෙ පක්ෂපාතීභාවය නිසා හරි එයා යුද්ධයෙදි දක්ෂ විදියට සටන් කරපු නිසා හරි එයාව මරලා දාන්ට මට ඕන නෑ.' කියලයි. ඊටපස්සෙ එයා, එයාගෙම මේස්ටර්ව යැවුවා සෙර් බැරිස්ටාන්ගෙ තුවාල වලට සාත්තු කරන්ට." ඔහු රජතුමා දෙසට දිගු බැල්මක් හෙලුවේ ය. "ඒ මනුස්සයා අද මෙතැන හිටිය නම්?"

ලැජ්ජාව නිසා රොබර්ට් ගේ මුහුණ රතු වී ගියේය. "ඒක වෙනස් දෙයක්." ඔහු පැමිණිලි ස්වරයෙන් කීය. "සෙර් බැරිස්ටාන් එතකොටත් රාජ්‍යාරක්ෂක බලකායෙ සෙබළෙක්."

"ඒ වගේම ඩනේරිස් කියන්නෙ අවුරුදු දාහතරක පුංචි කෙල්ලක්." තමා ඕනෑවටත් වඩා මේ සම්බන්ධයෙන් රජුට බලකරමින් සිටින බැව් නෙඩ් දත්තේ ය. එනමුදු ඔහුට නිහඬව

සිටීමට හැකියාවක් නොවීය. "රොබර්ට්, මම ඔබෙන් අහන්නෙ, මේ වගේ පුංචි දරුවො මරන එක නවත්තන්ට නෙවෙයි නම්, මොකක් නිසාද අපි ඒරිස් ටාර්ගේරියන්ට විරුද්ධව නැගී හිටියෙ?"

"ටාර්ගේරියන්වරු නවත්තන්ට." රොබර්ට් ගුගුලේ ය.

"මගේ ස්වාමිනී, මම කවදාවත් දැනගෙන හිටියෙ නෑ ඔබ රේගාර්ට මෙච්චර බයයි කියලා." සිය ස්වරයේ ඇති අවඥාව මකා දැමීමට නෙඩ් අසීරු උත්සාහයක නිරත විය. "තාම ඉපදුනේවත් නැති දරුවෙකුගෙ හෙවනැල්ල දැකලා බයෙන් වෙවුලන්ට තරම් මේ අවුරුදු ගාන ඇතුළත ඔබේ පිරිමිකම නැතිවෙලා ගිහිල්ල ද?"

කේන්තිය නිසා රොබර්ට් දම් පැහැ ගති. "තව වචනයක්වත් කතා කරන්ට එපා නෙඩ්." ඔහු ඇඟිල්ල උරුක් කරමින් තර්ජනය කලේය. "තව එක වචනයක්වත් කතා කරන්ට එපා. උඹට අමතක වුනාද කවුද මෙතන රජ්ජුරුවො කියලා?"

"නෑ මගේ ස්වාමිනී." නෙඩ් පිළිතුරු දුන්නේ ය. "ඔබතුමාට අමතක වුනාද?"

"ඇති!" රජතුමා බිරුසන් දුන්නේ ය. "මේ කතා කිරිල්ල මට තිත්ත වෙලා. මේක ඉවරයක් කරලා දාමු නැත්තං සේරමල්ලා යකාට යමු. උඹලා මොකද කියන්නෙ?"

"ඒකිව මරන්ට ඕනමයි." රෙන්ලි උතුමානන් නිවේදනය කලේය.

"අපට වෙන විකල්පයක් නෑ." වාරිස් මිමිනුවේ ය. "බොහොම කණගාටුයි, බොහොම කණගාටුයි..."

සෙර් බැරිස්ටාන් සෙල්මි මෙතෙක් වේලා මේසය වෙත ඇලී තිබුනු සිය ලා නිල් පැහැ දෑස් එසෙවුවේ ය. "මගේ ස්වාමිනී, සතුරෙකුව යුද්ධභූමියෙදි මුනගැහෙන එකේ ගෞරවනීය බවක් තියෙනවා. ඒ වුනත් එයාව අම්මගෙ බඩේ ඉන්දැද්දිම මරලා දාන එක එහෙම

නෙවෙයි. මට සමාවෙන්ට, ඒ වුනත් මෙතැනදි මම ඉන්නෙ එඩාර්ඩ් උතුමානන්ගෙ පැත්තෙ."

ප්‍රධාන මේස්ටර් පයිසෙල් මිනිත්තු කිහිපයක් යනතෙක් සිය උගුර පෑදුවේය. "මගේ නිකාය සේවය කරන්නෙ රාජධානියටයි. රජතුමාට නෙවෙයි. මම දැන් රොබර්ට් රජතුමාට උපදෙස් දෙනවා වගේම වරක් ඒරිස් රජතුමාටත් උපදෙස් දුන්නා. ඒ නිසා එයාගෙ මේ පුංචි ගෑනු දරුවා ගැන මගේ හිතේ කිසිම කහටක් නෑ. ඒ වුනත් මම මේක ඔබලාගෙන් අහන්ට ඕන. ආයෙමත් පාරක් යුද්ධයක් ආවොත්, සොල්දාදුවො තව කී දාහක් මැරෙයිද? තව නගර කීයක් ගිනිබත් වෙයිද? තව දරුවො කී දෙනෙක් තමන්ගෙ අම්මලාගෙ තුරුල්ලෙන් උදුරලා අරන් හෙලිවල අමුනයිද?" ඔහු මුවට නගාගත් කණගාටුදායක හා වෙහෙසකාරී පෙනුමක් සහිතව හෙමින් හෙමින් තම දිගු රැවුල පිරිමැද්දේ ය. "ඒක වඩා ඥානවන්ත නැද්ද, වඩා කරුනාවන්ත නැද්ද ඩනේරිස් ටාර්ගේරියන් දැන් මැරිලා ඒක නිසා තවත් දසදහස් ගානකගෙ ජීවිත බේරෙනවා නම්?"

"කරුනාවන්තයි." වාරිස් එකඟ විය. "ආහ්! ඔබතුමා නියම විදියටම කතා කලා ප්‍රධාන මේස්ටර්තුමනි. ඒකනම් ඇත්තම ඇත්තයි. දෙයියො ඩනේරිස් ටාර්ගේරියන්ට පුතෙක් දුන්නොත් මේ රාජධානිය ආයෙමත් පාරක් ලේ වලින් පෙඟිලා යයි."

අන්තිමටම කතා කල තැනැත්තා සුළැඟිල්ලා විය. නෙඩ් එදෙස බලද්දී ඔහු ආයාසයෙන් ඈනුමක් වළක්වා ගැනීමට තැත් කලේය. "ඔබට කැත ගෑනියෙක් එක්ක ඇඳට නගින්ට සිද්දවුනොත් කරන්ට තියෙන හොඳම දේ තමා ඇස් දෙක පියාගෙන වැඩේ අහවරයක් කරලා දාන එක." ඔහු තම මතය ප්‍රකාශ කලේය. "නැවතිලා බලන් හිටියා කියලා ඒ ගෑනි ලස්සන වෙන්නෙ නෑ. ඒකිව ඉඹලා වැඩේ ඉවරයක් කරලා දාන්ට."

"ඒකිව ඉඹලා?" සෙර් බැරිස්ටාන් ත්‍රස්තවෙමින් ඇසුවේ ය.

"වානේවලින් හදාපු හාදුවක්." සුළැඟිල්ලා පිළිතුරු දුන්නේ ය.

රොබර්ට් සිය හස්තය දෙසට හැරුනේය. "හරි, ඔන්න තියෙනවා නෙඩ්. මේ ප්‍රශ්නෙදි අනිත් පැත්තට ඉන්නෙ උඹයි සෙල්මියි විතරයි. දැන් අපට තියෙන එකම ප්‍රශ්නෙ කාවද යවන්නෙ මේකිව මරන්ට කියන එක විතරයි."

"මෝර්මන්ට් රාජකීය සමාවක් බලාපොරොත්තුවෙන් ඉන්නවා." රෙන්ලි ඔහුට සිහිපත් කර දුන්නේ ය.

"බොහොම ලොකු ඕනෑකමකින්." වාරිස් කීය. "ඒ වුනත් එයා එයාගෙ ජීවිතේටත් ඒ වගේම ලොකු ආදරයක් තියෙනවා. මේ වෙනකොට කුමාරි වයෙස් ඩොත්රැක්වලට ලංවෙලයි ඉන්නෙ. ඒක ඇතුළෙදි ආයුධයක් අදිනවා කියන්නෙ මැරුම් කන වැඩක්. තමන්ගෙ බලීසිව මරන්ට ආයුධයක් අදින එකාට උන් කරන්නෙ මොකක්ද කියලා මම කිවුවොත් ඔබලා කාටවත් අද රෑ නිදාගන්ට ලැබෙන එකක් නෑ." ඔහු පුයර දැමූ කම්මුලක් පිරිමැද්දේ ය. "වස කොහොමද... අපි හිතමු 'ලයිස්වල කඳුළු' කියලා. ඒක සාමාන්‍ය මරණයක් නෙවෙයි කියලා ඛාල් ඩ්‍රෝගෝට දැනගන්ට ලැබෙන්ට ඕන නෑ."

ප්‍රධාන මේස්ටර් පයිසෙල් ගේ නිදිමත දැස් සැනෙන් විවර විය. ඔහු පණ්ඩකයා දෙස සැකමුසු බැලුම් හෙලන්නට විය.

"වස කියන්නෙ බයගුල්ලෙකුගෙ ආයුධයක් නේ." රජතුමා පැමිණිලි කලේය.

නෙඩ්ට තවත් ඉවසා සිටිය නොහැකි විය. "අවුරුදු දාහතරක පුංචි කෙල්ලක් මරන්ට කුලී මිනීමරුවො යවන්ට සූදානම් වෙන අතරේ ඔබලා ගෞරවය ගැනත් වදවෙනවද?" සිය පුටුව පසුපසට කල ඔහු නැගී සිටියේ ය. "ඒක ඔබම කරන්ට රොබර්ට්. මරණ දඬුවම නියම කරන කෙනාම කඩුව වනන්ටත් ඕන. ඒකිව මරන්ට ඉස්සෙල්ලා ඒකිගෙ ඇස් දෙක දිහා කෙලින් බලන්ට. ඒකිගෙ ඇස්වල තියෙන කඳුළු දකින්ට, ඒකිගෙ අවසාන වාක්‍යය අහන්ට. ඔබ අඩුම ගානෙ ඒ ටික කරන්ටවත් බැඳිලා ඉන්නවා."

"දෙයියම්පා!" රජතුමා අවලාද ස්වරයෙන් කෑගැසුවේ ය. ඔහුට සිය වියරුව තවත් ඉවසා දරා සිටීමට නොහැකි සෙයක් පෙනින. "උඹ ඇත්තටමද ඔය කිවුවෙ? උඹ යකාටම පලයං." සිය වැලමිට සමීපයේ තිබුනු වයින් කුසලාණ වෙතට නැඹුරු වූ ඔහු එය හිස් බව

දුටුවේ කුසලාණ ඔසවා බිත්තියේ වැදෙන සේ විසි කර දැමීය. "මගේ වයිනුත් ඉවරයි, ඉවසීමත් ඉවරයි. මේ ඇති. මේක අභවරයක් කරලා දාපල්ලා."

"මිනීමැරුමක කොටස් කාරයෙක් වෙන්ට මට ඕනකමක් නෑ රොබර්ට්. ඔබට ඕන දෙයක් කරන්ට. ඒ වුනත් මගේ මුද්‍රාව ඕකට තියන්ටයි කියලා නම් කියන්ට එපා."

නෙඩ් පැවසූයේ කුමක්දැයි රජතුමාට මොහොතක් යනතෙක් වැටහී ගිය බවක් නොපෙනින. විරෝධය පෑම වනාහී ඔහු නිතර මුහුණදෙන්නට පුරුදුව සිටි දෙයක් නොවීය. අවබෝධය පැමිනෙද්දී ඒ මුහුණ කෙමෙන් වෙනස් විය. ඔහු ගේ දෑස් පටු වී ගිය අතර ගෙල රත් පැහැ වී ගියේය. ඔහු කේන්තියෙන් නෙඩ් දෙසට ඇඟිල්ලක් දිගු කලේය. "උඹ රජතුමාගෙ හස්තය ස්ටාර්ක් උතුමානනි. මම උඹට අණකරන දේ උඹ කරන්ට ඕන. එහෙම බැරිනම් කරන්ට පුළුවන් ජාතියෙ හස්තයක් මම හොයාගන්නම්."

"එයා කවුරු වුනත් එයාගෙ වැඩ සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන්ටයි කියලා මම ප්‍රාර්ථනා කරනවා." සිය තනතුර හුවා දක්වනු පිණිස සළු දෙපොට එක්කර ගසා තිබුනු අතක හැඩය ගත් රජතමය හාරිච්චිය ඔහු ගලවා අතට ගත්තේ ය. නෙඩ් ස්ටාර්ක් ඒ හාරිච්චිය රජතුමා ඉදිරිපිට මේසය මතින් තැබුයේ එය ඔහු වෙත පුදකල මිනිසා, තමා ආදරය කල තම ප්‍රාණසම මිත්‍රයා ගැන ඇති මතකය නිසා සිතේ උපන් සොවින් යුතුවය. "මම හිතාගෙන හිටියෙ ඔබ මීට වඩා උසස් මිනිහෙක් කියලයි රොබර්ට්. මම හිතාගෙන හිටියෙ අපි උදාර උත්තම රජකෙනෙක් පත්කර ගත්තා කියලයි."

රොබර්ට් ගේ මුහුණ දම් පැහැ ගැන්වින. "පලයං." දැඩි වියරුව නිසා ඔහු ගේ වදන් උගුරේ හිරවින. "පලයං. යකාටම පලයං. උඹත් එක්ක මට ඇතිවෙලයි තියෙන්නෙ. තවත් මොනාද නැවතිලා බලන් ඉන්නෙ? පලයං. උඹේ මහලොකු වින්ටර්ෆෙල්වලටම ආපහු දුවපං. ආයෙ කවදාවත් ඔය මූන මට පෙන්නන්නෙ නැතුව ඉන්ට පරෙස්සම් වෙයං. එහෙම වුනොත් මම උඹේ ඔළුව කපලා රිටක අමුනනවා!"

ඔහුට හිස නැමූ නෙඩ් වදනකුදු නොදොඩා ආපසු හැරින. තමා පිටුපසින් එල්ල වී ඇති රොබර්ට් ගේ දෑස් ඔහුට දැනෙන්නට විය. ඔහු රාජසභා ශාලාවෙන් පිටවෙද්දී සාකච්ඡාව නැවත ආරම්භ විය. "බ්‍රාවොස්වල ඉන්නවා කණ්ඩායමක් 'මූන නැති මිනිස්සු' කියලා." ප්‍රධාන මේස්ටර් පයිසෙල් කතාව ඇරඹීය.

"ඔබ දන්නවාද උන්ගෙ වැඩ කොච්චර ගනන්ද කියලා?" සුළැඟිල්ලා පැමිණිලි ස්වරයෙන් කීය. "ඒ ගානෙන් බාගෙකට සාමාන්‍ය කුලී භේවායො හමුදාවක් ගන්ට පුළුවන්. අනික ඒ ගාන අහන්නෙ සාමාන්‍ය වෙළෙන්දෙක් මරන්ට. කුමාරියක් මරන්ට උං කොච්චරක් ඉල්ලයිද කියලා හිතාගන්ටවත් බෑ."

ඔහුට පිටුපසින් දොර වැසුනු අතර හඬ නැසී ගියේය. රාජ්‍යාරක්ෂක බලකායේ සුදු පැහැ සළුවකින් හා සන්නාහයකින් සැරසුනු සෙර් බොරෝස් බ්ලොන්ට් ශාලාවට පිටතින් මුරකරමින් සිටියේ ය. ඔහු නෙත් කොණින් නෙඩ් දෙස කුතුහලයෙන් පිරි බැල්මක් හෙලූ නමුදු කිසිවක් නොවිමසී ය.

අංගනය පසුකර නැවත හස්තයේ කුළුණ වෙත යද්දී අද දවස දුෂ්කර පීඩාකාරී එකක් ලෙස ඔහුට හැඟෙන්නට විය. වාතයේ ඇති වැහිබර ගතිය ඔහුට දැනී ගියේය. නෙඩ් මේ වර්ෂාව ඉතසිතින් බලාපොරොත්තු විය. ඒ නිසා තමා ගේ කුණු, ධූලි, පවු සියල්ල සේදී පෙඟී යනු ඇතැයි ඔහු සිතන්නට විය. සිය කාමරයට වැදුනු ඔහු වයොන් පූල්ව කැඳවීය. නිවාස බාරකරුවා සැනෙන් ඔහු අභිමුවට පැමිණියේ ය. "ඔබතුමා මාව කැඳෙව්වද මගේ හස්තයේ උතුමානනි?"

"මම තවදුරටත් හස්තය නෙවෙයි. රජතුමායි මායි දබරවුනා. අපි ආපහු වින්ටර්ෆෙල්වලට යනවා."

"මම දැන්මම සූදානම් වෙන්ට පටන් ගන්නම් මගෙ උතුමානනි. ගමනට උවමනා කරන හැමදේම ලෑස්ති කරන්ට අපට අඩුගානෙ සුමාන දෙකක්වත් යයි."

"අපට සුමාන දෙකක් තියෙන එකක් නෑ. සමහරවිට අපට දවසක්වත් තියෙනවද දන්නෙ නෑ. රජතුමා කිව්වා මගේ ඔළුව රිටක අමුනන කතාවක්." නෙඩ් බැම ඇකිළීය. රොබර්ට් ඔහුට හානියක් කරනු ඇතැයි ඔහු කොහෙත්ම විශ්වාස නොකලේ ය. ඔහු දැන් කෝන්තියෙන් සිටියද නෙඩ් ආරක්ෂාකාරීව දෑසට නොපෙනෙන දුරින් සිටින විට අන් සෑමවිටෙකම මෙන් ඔහු ගේ වියරුව නිවී යනු ඇත.

සැම විටෙකම මෙන්? හදිසියේම ඔහුට රේගාර් ටාර්ගේරියන් සිහිපත් විය. ඔහු මියගොස් දැනට වසර පහළොවක් ගෙවී ගොස් ඇති නමුදු රොබර්ට් එදා තරමටම අදත් ඔහුට වෛර කරයි. එය ඔහු ගේ සිතේ නොසන්සුන්කමක් ඇතිකරලන්නට සමත් වූ සිතුවිල්ලක් විය... එමෙන්ම මේ අනිත් ගැටළුව. යොරේන් විසින් පෙරදා රෑ ඔහුට දැනුම් දුන් කැට්ලින් හා කුරුමිට්ටා සමබන්ධ ගැටළුව. මෙය වැඩි කල් නොයවාම එළියට එනු ඇත. එය හිරු උදාව තරමටම සහතික කල හැකි දෙයකි. එමෙන්ම රජතුමා දැඩි වියරුවෙන් සිටින මේ මොහොතේ... රොබර්ට් ගේ සිතේ ටිරියන් ලැනිස්ටර් ගැන ඉදිඇටයක තරම්වත් ඇල්මක් නැති බැව් ඔහු දත්තේය. එහෙත් මේ සිදුවීම ඔහු ගේ ආත්මාඩම්බරයට හානි පමුනුවනු ඇත. අනිත් අතට, මේ සම්බන්ධයෙන් රැජිණ කුමක් කරනු ඇත්දැයි දන්නේ දෙවියන්ම පමණි.

"මම අනිත් අයට කලින් පිටත්වුනොත් ඒක වඩා ආරක්ෂාකාරී වෙයි." ඔහු පූල්ට කීය. "මම දුවලා දෙන්නවයි ආරක්ෂක භටයො කීපදෙනෙකුයි අරන් යන්නම්. අනිත් කට්ටියට ලැස්තිවෙලා ඉවරවුනාම පිටත්වෙන්ට පුළුවන්. ජොරීට කියන්ට, ඒත් වෙන කාටවත් කියන්ට එපා. ඒ වගේම මායි කෙල්ලො දෙන්නයි පිටත්වෙලා යනකම් මොකුත් ලැස්ති කරන්ට පටන්ගන්ට එපා. මේ බලකොටුවෙ හැමතැනම ඇස් කණ් තියෙනවා. මගේ සැලසුම් කාගෙවත් කණට යන්නෙ නැත්තම් මම කැමැතියි."

"ඔබ කියන විදියකට මගේ උතුමානනි."

පූල් පිටව ගිය පසු කවුළුව අසලට ගොස් වාඩිගත් නෙඩ් කල්පනාවේ නිමග්න විය. පෙනෙන අන්දමින් නම් රොබර්ට් ඔහුට අන් කිසිදු විකල්පයක් ඉතුරු කර නොමැත. ඇත්තෙන්ම ඔහු රොබර්ට්ට ස්තූතිවන්ත විය යුතුය. වින්ටර්ෆෙල් වෙත නැවත යාම හොඳ දෙයක් වනු ඇත. ඔහු කිසිදින එයින් පිටමං නොවූයේ නම් වඩාත් හොඳය. ඔහු ගේ පුතුන් ඔහු එනතෙක් එහි බලාසිටිනු ඇත. නැවත ගියපසු සමහරවිට ඔහුටත් කැට්ලින්ටත් එක්ව තවත් පුතෙකු සදන්නට හැකි වනු ඇත. ඔවුන් දෙදෙනාම තවමත් වයස්ගත වූවන් නොවේ. මෑතක සිට ඔහු හිම ගැනත්, රාත්‍රිකාලයේදී වෘකවනයේ ඇති දැඩි නිහඬතාව ගැනත් සිහින දකින්නට පුරුදුව සිටියේ ය.

එනමුදු මේ පිටව යාමේ සිතුවිල්ල ඔහුව කේන්ති ගස්වන්නටද සමත් වී තිබින. අහවර කර දැමිය යුතු වූ රාජකාරි බොහොමයක් විය. කිසිවෙකු මැදිහත් නොවන්නේ නම් රොබර්ට් සහ බියගුල්ලන් හා වංචාකාරයන් පිරි ඔහු ගේ රාජසභාව මේ රාජධානිය සිඟමනට ඇද

දමනු ඇත... නැතහොත්, ඊටත් වඩා නරක අන්දමින්, ලැනිස්ටර්වරුන්ට ගෙවිය යුතු ණය පියවීම වෙනුවෙන් රාජධානිය ඔවුන්ට විකුණා දමනු ඇත. එමෙන්ම ජොන් ඈරින් ගේ මරණයද තවමත් ඔහු ගේ සිතේ හොල්මන් කලේය. ඇත්ත, ඔහු මේ ප්‍රහේලිකාවේ යම් යම් කොටස් කිහිපයක් සොයාගත් බව සැබැවි. ජොන් ඈරින් සැබැවින්ම මරා දැමුනු බැව් එයින් තහවුරු වූ බව සැබැවි. එහෙත් එය වනයේ සරන සතෙකු ගේ ඉවපාර දැනුනා හා සමානය. ඔහු තවම සතා දැක නොතිබුනු අතර ඌ වනයේ සැඟවී, කල්මරමින්, ප්‍රයෝගකරමින් සිටින බව පමණක් දැන සිටියේ ය.

හදිසියේම ඔහුට සිතුනේ වින්ටර්ෆෙල් බලා යන ගමන මුහුදු මාර්ගයෙන් කලොත් යෙහෙකිය යනුවෙනි.

නෙඩ් මුහුදු යාත්‍රිකයෙකු නොවූ අතර සාමාන්‍යයෙන් නම් ගමන වෙනුවෙන් කැමැත්තෙන්ම රජමාවත තෝරාගනු ඇත. එනමුදු මුහුදු මාර්ගය තෝරාගතහොත් ඔහුට ඩ්‍රැගන්ස්ටෝන්හි නැවතී ස්ටැනිස් බරතියන් හා කතා කිරීමේ අවස්ථාවක් හිමිවනු ඇත. ස්ටැනිස් උතුමානන්ට නැවත කින්ග්ස් ලැන්ඩින්ග්වලට පැමිණ ඔහුට හිමි රාජසභික ධූරයේ වැඩ කරගෙන යන මෙන් ආචාරශීලීව ඉල්ලා සිටිමින් නෙඩ් විසින් ලියන ලද පණිවුඩයක් පයිසෙල් විසින් පක්ෂියකු මාර්ගයෙන් යවා තිබින. එසේ වුවද එයට තවමත් පිළිතුරක් ලැබී නොතිබුනු අතර මේ නිහැඩියාව නෙඩ් ගේ සැක තවතවත් වැඩි කරවන්නට සමත් විය. ජොන් ඈරින් සිය දිවි පුද දුන් ඒ අභිරහස ස්ටැනිස් විසින්ද දැන සිටින බව නෙඩ්ට නිසැක විය. ඔහු විසින් හඹා යන මේ ප්‍රහේලිකාවේ විසඳුම මේ පුරාණ ටාර්ගේරියන් දූපත් බලකොටුවේ ඔහු එනතෙක් බලාසිටිනු විය හැක.

එහෙත්, ඔහු ඒ විසඳුම සොයාගත්තාට පසු? ඉන්පසු කුමක් කරන්ටද? සමහර රහස් සඟවා තැබීම වඩා සුදුසු වනු ඇත. සමහර රහස් අනෙකුන්ට පැවසීම, ඒ ඔබ ආදරය කරන විශ්වාස කරන අය වුව, අනතුරුදායක වනු ඇත. කැට්ලින් විසින් ඔහු වෙත ගෙන එනු ලැබූ කිනිස්ස ඔහු සිය බඳ පටියෙන් ඇදගත්තේ ය. පුංචි යකා ගේ කිනිස්ස. කුරුමිට්ටාට බ්‍රැන් මියයනු දැකීම අවශ්‍ය වූයේ ඇයි? අනිවාර්යයෙන්ම ඒ ඔහුව නිහඬ කිරීමට විය යුතුය. මේ තවත් රහසක් ද නැතිනම් විශාල මකුළු දැළේම තවත් එක් පොටක් ද?

රොබර්ටුත් මේ අභිරහසේ කොටස් කරුවෙක් ද? එය ඔහුට විශ්වාස කිරීමට අසීරු කරුනක් විය. එහෙත් රොබර්ට් විසින් ගැහැණුන් හා කුඩා දරුවන් මරා දැමීමට අණ දෙනු ඇතැයි යන්නද ඔහු එක් කලෙක නම් විශ්වාස නොකල, කරුනු හරිහැටි නොදන්නේ නම් දැන්

පවා විශ්වාස නොකරනු ඇති කාරනයක් විය. කැට්ලින් ඔහුට අනතුරු ඇඟවීමට උත්සාහයක් දරා තිබින. 'ඔයා ඒ මිනිහව දැනගෙන හිටියා. ඒත් රජතුමා කියන්නෙ ඔයා නාඳුනන ආගන්තුකයෙක්.' ඇය එසේ පවසා තිබින. කින්ග්ස් ලෑන්ඩින්ග්වලින් හැකිතරම් ඉක්මනින් පිටව යන තරමට වඩා හොඳ වනු ඇත. උතුර බලා යාත්‍රා කරන නැවක් හෙට වුව පිටත්වන්නේ නම් එයට නැගීම ගුණදායක වනු ඇත. නැවතත් වයොන් පූල්ව කැඳවූ ඔහු වරාය වෙත ගොස් හෙමින් සීරුවේ එහෙත් හැකි ඉක්මනින් නෞකාවක් ගැන තොරතුරු සොයා එන්නැයි ඔහුව පිටත් කර හැරියේ ය. "හොඳ දක්ෂ කපිතාන් කෙනෙක් ඉන්න වේගවත් නැවක් හොයාගන්ට. නැවේ කාමර ලොකුද ඒවායෙ තත්ත්වය හොඳද වගේ අනවශ්‍ය විස්තර ගැන වදවෙන්ට එපා. ඒක වේගවත් නම්, ආරක්ෂාකාරී නම් එච්චරයි. මට හැකි ඉක්මනින් පිටත් වෙලා යන්ට ඕන."

පූල් පිටව ගිය සැනින්ම වාගේ ටොමාර්ඩ් අමුත්තකු ගේ පැමිණීම ගැන දැන්වූයේ ය. "බේලිෂ් උතුමානන් ඔබතුමාව මුනගැහෙන්ට ඇවිල්ලා ඉන්නවා මයෙ උතුමානනි."

ඔහුව ආපසු හරවා යැවීමට නෙඩ්ට මොහොතකට සිතුනද ඔහු නැවත ඒ සිතුවිල්ල වෙනස් කරගත්තේ ය. ඔහු තවමත් මේ මකුළුදැළෙන් නිදහස් වී නැත. එසේ වනතුරු ඔවුන් ගේ සෙල්ලමට සහභාගි වී ඔවුන් රවටීම වඩා සුදුසුය. "එයාට එන්ට කියන්ට ටොම්."

අද උදැසන අමුතු කිසිත් සිදු නොවූවාක් වැනි සාමාන්‍ය අන්දමින් සුළැඟිල්ලා කාමරයට ඇතුළු විය. ඔහු ක්‍රීම් හා රිදී පැහැ ඉරි වැටුනු විල්ලුද පිට කබායක්, කළු පැහැ නරි ලොමින් පෝරු දැමූ අළු පැහැ සේද සළුවක් හා සුපුරුදු වංචාකාරී සිනාව පැළැඳ සිටියේ ය.

නෙඩ් නොපහන් අන්දමින් ඔහුව පිළිගත්තේ ය. "මේ පැමිණීමට හේතුව මොකක්ද කියලා මට දැනගන්ට පුළුවන්ද බේලිෂ් උතුමානනි?"

"මම ඔබව ගොඩක් වෙලා පොරොත්තු කරන්ට බලාපොරොත්තු වෙන්නෙ නෑ. මම මේ ටන්ඩා ආර්යාවත් එක්ක භෝජන සංග්‍රහයකට සහභාගි වෙන්ට යන ගමන්. ආඳා මාළු පයි එකකුයි බැදපු ඌරු පැටවුනුයි. එයාගෙ අදහසක් තියෙනවා මාව එයාගෙ බාල දුවට බන්දලා දෙන්ට. ඉතිං එයාගෙ කෑම මේසෙ හැම වෙලාවෙම වගේ හරිම විස්මයජනකයි. ඇත්තම කියනවා නම් එයාගෙ දුව බැඳගන්නවාට වඩා මම කැමතියි ඊරියෙක්ව බැඳගන්ට. ඒ වුනත් එයාට ඒක කියන්ට එපා, මම හරිම ආසයි ආඳා මාළු පයි එකට."

"මං හින්දා ඔබේ ආදා මාළු පයි එක පරක්කු කරගන්ට උවමනා නෑ මගේ උතුමානනි." නෙඩ් අවඥාවෙන් යුතුව කීය. "මේ වෙලාවෙ ඔබේ සමාගමයට වඩා එපා කරපු වෙන කිසිම සමාගමයක් මට හිතාගන්ට බෑ."

"ආහ්! ඇත්තෙන්ම ඔබ ටිකක් හොඳින් කල්පනා කලොත්, නම් දෙකතුනක් හිතාගන්න එක එච්චර අමාරු වෙන්නෙ නෑ. අපි කියමු වාරිස්.. නැත්තම් සෙර්සි, නැත්තම් රොබර්ට්. අපේ මහරජතුමානන්ට ඔබත් එක්ක බොහොම සැරේට කේන්ති ගිහිල්ලයි තියෙන්නෙ. ඔබ අද උදේ අපිව දාලා පිටවෙලා ආවට පස්සෙ එතුමා සෑහෙන වෙලාවක් යනකම් ඔබ ගැන කියෙවුවා. මට මතක විදියට එතුමා 'අහංකාර' 'ගුනමකු' වගේ වචන සෑහෙන්න පාවිච්චි කලා."

නෙඩ් මෙයට කිසිදු පිළිතුරක් දෙන්නට නොසිතී ය. එමෙන්ම සිය අමුත්තාට අසුන්ගන්නට යැයිද නොකීවේ ය. එනමුදු එය නොතැකූ සුළැඟිල්ලා අසුනකට බර දුන්නේ ය. "ඔබ පිටවෙලා ආවට පස්සෙ මා පිටට තමා වැටුනෙ එයාලට ඒත්තු ගන්නන්ට 'මූනු නැති මිනිස්සු' කුලියට ගන්න එක එච්චර හොඳ වැඩක් නෙවෙයි කියලා.ඒ වෙනුවට වාරිස් හෙමින් සීරුවේ ආරංචියක් පතුරලා අරියි ටාර්ගේරියන් කෙල්ල මරන කවුරුහරි කෙනෙකුට අපි වංශාධිපති පදවියක් පිරිනමනවා කියලා."

නෙඩ් බලවත් සේ කලකිරුනේ ය. "ඒ කියන්නෙ අපි දැන් කුලියට මිනීමරන එවුන්ටත් පදවි තානාන්තර දෙනවා?"

සුළැඟිල්ලා දෙවුර ඇකිළී ය. "පදවි තානාන්තර කියන්නෙ බොහොම ලාබ දෙයක්. මූනු නැති මිනිස්සු කියන්නෙ බොහොම මිල අධික දෙයක්. ඇත්තම කියනවා නම් ඔබේ අර ගෞරවය ගැන කරපු කතාවට වඩා මම කරපු දෙයින් ටාර්ගේරියන් කෙල්ලට හොඳක් වුනා. වංශාධිපතිකමක් ගැන හීන මවන ඔය කොහෙ හරි ඉන්න මෝඩ කුලී හේවායෙක් ඒකිව මරන්ට හදයි. කිසිම සැකයක් නෑ ඌ වැඬේ වල් කරගනියි. ඊටපස්සෙ ඩොත්රැකියො කෙල්ලට දාලා තියෙන මුරකාවල් තවත් වැඩි කරයි. අපි මූනු නැති මිනිහෙක් ඒ කෙල්ල පස්සෙන් යැවුවා කියන්නෙ ඒකි මැරුනා වගේ තමා."

නෙඩ් බැම ඇකිළී ය. "ඔබ රාජසභාවෙ වාඩිවෙලා කැත ගැනුයි වානේ හාදුයි ගැන කතා කරනවා. දැන් ඔබ මට කියන්නෙ ඔබ ඒ කෙල්ලව ආරක්ෂා කරන්ට උත්සාහ කලා කියන එක විශ්වාස කරන්ටයි කියලද? ඔබ හිතන්නෙ මම කොච්චර විතර ලොකු මෝඩයෙක් කියලද?"

"ඇත්තෙන්ම කියනවා නම් බොහොම ලොකු දැවැන්ත මෝඩයෙක් විදියට." සුළැඟිල්ලා සිනාසුනේ ය.

"මිනීමැරීම කියන්නෙ බොහොම හාස්‍යජනක දෙයක් කියලද ඔබ හැම වෙලාවෙම හිතන්නෙ බේලිෂ් උතුමානනි?"

"මට හාස්‍යජනක දෙයක් විදියට පේන්නෙ මිනීමැරීම නෙවෙයි ස්ටාර්ක් උතුමානනි. ඔබවයි. ඔබ වැඩ කරන්නෙ හරියට දිය වෙවී යන අයිස් කුට්ටියක් උඩ නටන මිනිහෙක් වගේ. මම මේ කියන්නෙ ඔබ බොහොම ලස්සන 'ජබුඃ' සද්දයකුත් එක්ක වතුරට වැටෙයි. මං හිතන්නෙ, අද උදේ මට අහන්ට ලැබුනා අයිස් කුට්ටිය කැඩෙන පළවෙනි සද්දෙ."

"පළවෙනි එක වගේම අන්තිම එකත්. මට දැන් ඇතිවෙලයි තියෙන්නෙ."

"ඔබ කවදද ආපහු වින්ටර්ෆෙල්වලට යන්ට හිතන් ඉන්නෙ මගේ උතුමානනි?"

"මට හැකි ඉක්මනින්. ඔබට මොකක්ද ඒකෙ තියෙන වැඩේ?"

"මොකුත් නෑ... ඒත් බැරිවෙලාවත් අද හැන්දෑ වෙනකනුත් ඔබ මෙහෙ ඉන්නවානම්, මම බොහොම සන්තෝසෙන් ඔබව එක්කරන් යන්නම් ඔබේ ඔය ජොරී කිසිම ප්‍රතිඵලයක් නැතිව හොය හොයා යන ඒ ගනිකා මඩමට." සුළැඟිල්ලා මඳ සිනහවක් පෑවේය. "බයවෙන්ට එපා, මම ඒ ගැන කැට්ලින් ආර්යාවට නොකියා ඉන්නම්."

Varys: “Yet we who presume to rule must do vile things for the good of the realm, however much it pains us.”

කැට්ලින් 06-1

ඒරින් මිටියාවත

"මගේ ආර්යාවනි, ඔබතුමී එනවා කියලා අපට දැනුම් දෙන්ට තිබුනනෙ." සිය අසුන් කඳුකර කපොල්ල නගින අතරේ සෙර් ඩොනල් වේන්වුඩ් කීය. "එහෙමනං අපට තිබුනා පරිවාර සේනාවක් ඉස්සරහට එවන්ට. මේ වගේ පොඩි පිරිසකට උස් මාවත දැන් ඉස්සර තරම් ආරක්ෂාකාරී නෑ."

"බොහොම කණගාටුදායක විදියට අපටත් ඒක තේරුම්ගන්ට හම්බවුනා සෙර් ඩොනල්." කැට්ලින් කීවාය. සිය හදවත ගලක් බවට පත් වී ඇත්දැයි ඇය සමහර වේලාවලදී විමතියෙන් කල්පනා කලාය. ඇයව මෙතෙක් දුර කැඳවාගෙන ඒම පිණිස නිර්භීත මිනිසුන් සයදෙනකු සිය දිවි පුදකර තිබුනු නමුදු ඔවුන් වෙනුවෙන් කඳුළක් සැලීමේ හැකියාවක් පවා ඇය තුළ නොවීය. ඔවුන් ගේ නම් පවා මතකයෙන් මැකී යමින් තිබින. "ගෝත්‍රිකයො රෑ දවල් දෙකේම අපට කරදර කලා. පළවෙනි ප්‍රහාරයෙන් අපට මිනිස්සු තුන්දෙනෙක් නැතිවුනා. දෙවෙනි ප්‍රහාරයෙන් තව දෙන්නෙක්. ඒත් එක්කම ලැනිස්ටර් සේවකයා එයාගෙ තුවාල පැසවලා ඒ උණෙන් නැතිවුනා. ඔබේ මිනිස්සු එන සද්දෙ අපට ඇහුනම මම හිතුවා මෙදා පාර නම් අපි ඉවරෙටම ඉවරයි කියලා." සිය අසිපත් සූරතට ගත් ඔවුහු ගල් පර්වතයකට හේත්තු වී, 'මියෙම්වා රැකෙම්වා' යැයි සිතමින්, අවසාන බලාපොරොත්තු විරහිත ප්‍රහාරයට සූදාණම් වී සිටියහ. කුරුමිට්ටා සිය පොරොව මුවහත් කරමින්, අව්‍යක්ත විහිළුවක් කරමින් සිටියදී, අසරුවන් පිරිස ඔවුන් ඉදිරියෙන් ඔසවාගෙන පැමිණි ධජය බ්‍රොන් විසින් නිරීක්ෂණය කරන ලදී. අහස් නිල් පැහැයෙන් හා සුදු පැහැයෙන් ගෙත්තම් කෙරුනු ඒරින් වංශයේ ලාංඡනය වන අඩ සඳ හා උකුස්සා මීට පෙර කිසිදු විටෙක නොදැනුනු තරම් සැනසීමක් කැට්ලින් ගේ සිතට ගෙන එන්නට සමත් වී තිබින.

"ජොන් උතුමානන් නැතිවුනාට පස්සෙ මේ ගෝත්‍රිකයින්ගෙ බයසැක තවත් අඩුවෙලා." සෙර් ඩොනල් කීය. ඔහු විසිවැනි වියෙහි පසුවූ, පුළුල් නාසයකින් හා ඝනකම් දුඹුරු පැහැ කේශකලාපයකින් හෙබි, අවංක වාම් තරුණයකු විය. "මට හැකියාවක් තිබ්බානං මම මිනිස්සු සීයක් අරන් යනවා කඳුකරයට. ගිහිල්ලා උන්ගෙ කඳවුරුවලට පහර දීලා උන්ට හොඳ මතක හිටින පාඩමක් උගන්නනවා. ඒ වුනත් ඔබේ සහෝදරී ඒ වැඩේ තහනම් කරලයි තියෙන්නෙ. එයා අඩුම ගානෙ එයාගෙ නයිට්වරුන්ට අවසර දුන්නෙ නෑ හස්තයේ තරගාවලියට සහභාගි වෙන්ටවත්. එයාට ඕන අපේ සෙබළු ඔක්කොම කිට්ටුවෙන්

තියාගන්ටයි, මිටියාවත ආරක්ෂා කරගන්ට කියලා... ඒත් ඒ කාගෙන් ආරක්ෂා කරගන්ටද කියලා කවුරුවත් දන්නෙ නෑ. සමහරු කියනවා හෙවනැලිවලින් ලු." ඇය කවුරුන්දැයි හදිසියේම සිහිපත් වුනාක් මෙන් ඔහු ඈ දෙස වියවුල් බැල්මක් හෙළීය. "මම හිතනවා මගේ කටින් මොකුත් වැරැදි දෙයක් කියැවුනේ නැහැයි කියලා මගේ ආර්යාවනි. මම කාටවත් විරුද්ධ වෙන්ට හිතුවෙ නෑ."

"ඇත්ත කතා කරන අය ගැන මගේ කිසිම විරුද්ධත්වයක් නෑ සෙර් ඩොනල්." සිය සොයුරිය බිය වී සිටින්නේ කුමකටදැයි කැට්ලින් දැන සිටියා ය. 'හෙවනැලිවලට නෙවෙයි, ලැනිස්ටර්ලට,' ඇය සිතුවේ ආපසු හැරී බ්‍රොන් සමීපයෙන් ගමන් කරන කුරුමිට්ටා දෙස බලමිනි. චිගන් මියගිය දා සිට ඔවුන් දෙදෙනා බෙහෙවින් සමීප වී තිබිනි. කුරුමිට්ටා ඇය සිතුවාට වඩා බොහෝ කපටි මිනිසකු විය. ඔවුන් කඳුකරයට ඇතුළුවන මොහොතේ දී ඔහු දැත් දෙපය බැඳ දැමූ, හිස වැසූ, කිසිදු පිළිසරණක් නැති සිරකරුවකු විය. දැන්? ඔහු තවමත් ඇගේ සිරකරුවකු බව සැබෑවි. එහෙත් දැන් ඔහු අසු පිට නැගී, ඉණපටියෙහි ඇමිනූ සිරියක් ද, සෑදලයේ රුවා තිබුනු පොරොවක් ද ඇතිව, චිගන් ගේ මළසිරුරෙන් ගලවා ගත් මුදු දම්වැල් කවචයෙන් හා දූ කෙලියෙහි යෙදී ගායකයා වෙතින් දිනාගත් ලොම් සළුවෙන් සැරසී සිටියේ ය. සිය සොයුරිය ලයිසා හා ජොන් ගේ ළදරු පුත්‍රයා ගේ සේවයේ නියුතු නයිට්වරුන් හා සෙබළුන්ගෙන් සැදි පිරිසක් විසින් වටකර ගමනේ යෙදුනේ වී නමුදු ටිරියන් ගේ මුහුණේ බියක සේයාවකුදු නොවීය. 'මම ඇත්තටම වැරැදිද?' කැට්ලින් විමතියෙන් කල්පනා කලේ පළමු වතාවට නොවීය. බ්‍රැන් හා ජොන් ඒරින් හා අනිකුත් සෑම දෙයක්ම සම්බන්ධයෙන් ඔහු සැබැවින්ම අහිංසකද? එසේ වී නම් ලෝකයා ඇයට කුමක් කියනු ඇත් ද? ඔහුව මෙහි ගෙන එන්නට මිනිසුන් සයදෙනකු සිය දිවි පුද දී තිබිනි.

ඇය තිරසාර අයුරින් මේ අවිනිශ්චිතභාවයන් සිය සිතෙන් ඈත් කර දැමුවාය. "අපි ඔබේ බලකොටුවට ළඟාවුනාට පස්සෙ හැකි ඉක්මනින් මේස්ටර් කෝල්මන්ට එන්ටයි කියලා පණිවුඩයක් යවන්ට පුළුවන් නම් බොහොම කරුනාවයි. සෙර් රඩ්‍රික්ගෙ තුවාල නිසා එයාට හොඳටම උණ." මේ නිර්භීත මහලු නයිට්වරයා ගමන කෙලවර වනතෙක් ජීවත් නොවනු ඇතැයි ඇය කිහිපවිටකම බියපත් වී තිබුනා ය. ගමනේ අවසානය ලංවද්දී ඔහු සිය අසු පිට වාඩි වී සිටිය නොහැකි තත්ත්වයට පත් වී තිබිනි. ඔහුව මියයන්නට හැරදා යමු යැයි බ්‍රොන් කිහිපවරක්ම පැවසූවද කැට්ලින් ඒ ගැන සිතන්නටවත් අකැමැති විය. ඒ වෙනුවට ඔවුන් ඔහුව සෑදලයට තබා ගැට ගැසූ අතර ඔහු ගැන ඇස ගසාගෙන ඉන්නැයි කැට්ලින් විසින් මැරිලියන්ට අණ කලාය.

සෙර් ඩොනල් මොහොතක් දෙගිඩියාවෙන් මෙන් තැතනුවේ ය. "ලයිසා ආර්යාව අණ කරලා තියෙන්නෙ මේස්ටර් කෝල්මන්ට හැමවෙලාවෙම ඉයරීවලට වෙලා ඉන්ට කියලයි. රොබර්ට් උතුමානන් ගැන හොයාබලන්ට උවමනා නිසා. අපේ වාහල්කඩ ඉන්නවා සප්තක පූජකයෙක් තුවාල වෙච්ච අය ගැන බලන්ට. එයාට පුළුවන් වෙයි ඔබේ තුවාලකාරයා ගැන බලන්ට."

පූජකයා ගේ යාඥාවලට වඩා මේස්ටර් ගේ ඖෂධ ගැන කැට්ලින් තුල විශ්වාසයක් විය. ඇය මේ බැව් පැවසීමට සූදානම් වද්දී තමන්ට ඉදිරියෙන් නැගී සිටි බලකොටු ද්වාරය දුටුවාය. ඔවුන්ට දෙපසින් වූ කඳුගැට දෙක යා කරමින් ගලින් කල දිගැති ප්‍රාකාර දෙකක් නිමවී තිබින. ඒ මැද වූ පටු දොර කපොල්ල මිනිසුන් සිවුදෙනකුට අසු පිට නැගී යාන්තමින් මෙන් පෙළට ගමන් කල හැකි තරමේ කුඩා එකක් විය. දෙපස කඳු බෑවුම් දෙකේ ගලින් කල මුර කුළුණු දෙකක් සාදා තිබුනු අතර මාවතට ඉහළින් ආරුක්කුවක් මෙන් නිමැවුනු, ආවරණය කෙරුනු ගල් පාලමක් මගින් මේ කුළුණු දෙක සම්බන්ධ කෙරින. නිහඬ මුහුණු සමූහයක් මේ මුර කුළුණු දෙකේ පිහිටි ඊ විවරවලින් ද, පවුරු මුර අට්ටාල මතින් ද, ගල් පාලමේ සිට ද ඔවුන් දෙස එබිකම් කරන්නට වූහ. ඔවුන් ද්වාරය වෙත ළඟාවෙද්දී ඔවුන් මුනගැසීම පිණිස නයිට්වරයෙක් ඉදිරියට පැමිණියේ ය. ඔහු ගේ සන්නාහය අසු මෙන්ම අඳුරු අළු පැහැති වූ නමුදු පැළැඳ සිටි සළුව රිවර්රන්හි නිල් හා රතු පැහැයෙන් ඉරි වැටී තිබින. රනින් හා ඔබ්සිඩියන් වලින් නිමැවුනු කළු පැහැ දිදුලන මාළුවෙකු මගින් මේ සළුව උරහිස අසලින් අමුනා තිබින. "කවුද මේ රතු වාහල්කඩ පහුකරන් යන්ට එන්නෙ?" ඔහු ඇසීය.

"සෙර් ඩොනල් වේන්වුඩ්, කැට්ලින් ස්ටාර්ක් ආර්යාව හා එයාගෙ පිරිස." තරුණ නයිට්වරයා පිළිතුරු දුනි.

වාහල්කඩ නයිට්වරයා සිය ශිරස්කයේ දැස් ආවරණය එසවීය. "මං හිතුවා, මේ ආර්යාව මට හොඳට දැකලා පුරුදුයි. ඔයා ගෙදරින් බොහොම ඈත පුංචි කැට්."

"ඔයත් එහෙමයි බාප්පේ." ඇය කීවාය. මෙතෙක් විඳි දුක්ගැහැට සියල්ලක්ම මධ්‍යයේ වුව ඇගේ මුවට සිනාහවක් නැගුනේය. මේ ගොරෝසු බැරෑඩි කටහඬ විසින් ඇයව වසර විස්සකට එහා ඇගේ ළමා කාලයට නැවත කැඳවාගෙන ගොස් තිබින.

"මගේ ගෙදර තමා මගේ පිටිපස්සෙන් තියෙන්නෙ." ඔහු කර්කශ අයුරින් කීය.

"ඔයාගෙ ගෙදර තියෙන්නෙ මගේ හදවත ඇතුළෙ." කැට්ලින් ඔහුට කීවාය. "ඔයාගෙ ශිරස්කය ගලවන්ට බාප්පෙ. මට ආයෙමත් ඔයාගෙ මූන බලන්ට ඕන."

සෙර් ඩොනල් වේන්වුඩ්

"අවුරුදු ගානක් ගිහිල්ලත් ඒක ලස්සන වෙලා නම් නෑ." බ්‍රින්ඩන් ටලී කීවේය. එනමුදු ඔහු සිය ශිරස්කය ගලවද්දී එය බොරුවක් බැව් කැට්ලින්ට වැටහින. ඔහු ගේ මුහුණ ඇදී ගොස් අවුවෙන් වැස්සෙන් බැට කෑමෙන් පදම් වී තිබුනු අතර කාලය විසින් ඒ කෙහෙරැළිවල රතු-දුඹුරු පැහැය සොරාගෙන ඔහුට අළු පැහැය පමණක් ඉතුරු කර තිබින. එනමුදු ඒ සිනහව බිඳක් වත් වෙනසක් නැති ඇය දැන හඳුනන ඒ පුරුදු සිනහවම විය. එමෙන්ම දළඹුවන් මෙන් මහත් වූ ඒ ගොරෝසු ඇහිබැම ද, ඒ තද නිල් පැහැ දෑසේ වූ සිනහවද එලෙසින්ම විය. "ලයිසා දන්නවද ඔයා එනවා කියලා?"

"කලින් පණිවුඩයක් එවන්ට තරම් වෙලාවක් තිබුනෙ නෑ බාප්පෙ." කැට්ලින් පිළිතුරු දුන්නා ය. මේ වනවිට අනිකුත් පිරිස ඔවුන්ට ලං වී සිටියහ. "කණගාටුයි කියන්ට, ඒත් අපි ලොකු හදිසියකිනුයි ආවෙ. අපේ පිටිපස්සෙන් සැර කුණාටුවක් හමන්ට ඔන්න මෙන්න."

"අපි මිටියාවතට ඇතුළුවෙන්ටද?" සෙර් ඩොනල් ඇසීය.

"ඉයරීහි උතුමානන් වන, මිටියාවතේ ආරක්ෂකයානන් වන, නැගෙනහිර දිශාවේ සත්‍ය අධිපතියා වන රොබර්ට් ඒරින් ගේ නාමයෙන් ඔබට මෙහි ඇතුළුවීමට අවසර ලබාදෙන අතර එතුමන්ගේ සාමයට බාධා නොකරන මෙන් අණකරමි." සෙර් බ්‍රින්ඩන් පැවසීය. "එන්ට."

ඉදින් ඇය ඔහු පසුපසින් රතු වාහල්කඩ පසුකර, වීරයින් ගේ යුගයේදී හමුදාවන් දුසිම් ගණනක් සුනුවිසුනු වී ගිය ඒ චිරප්‍රසිද්ධ රතු වාහල්කඩේ සෙවනැල්ල පසුකර මිටියාවතට ඇතුළු වූවාය. මේ ශෛලමය ප්‍රාකාර පසුකර මඳක් තැන් ගිය පසු දෙපස කඳු බැවුම් හිටි

අඩියේම නැතිව ගොස් කොළ පැහැයෙන් දිදුලන ගොඩබිම්වලින් ද නිල් පැහැ අහසින් ද හිමෙන් වැසුනු මුදුන් සහිත කඳු පන්තීන්ගෙන් ද යුතු මනරම් දසුනක් දෑස් ඉදිරියේ මැවී ගියේය. ඒරින් මිටියාවත උදාසන හිරු එළියේ නැහැවෙමින් තිබින. මේ දර්ශනය කෙතරම් සුන්දර ද, කෙතරම් මනෝඥ ද යත් කැට්ලින්ට හුස්ම ගැනීම පවා අමතකව ගියේය.

එය සරුසාර කළු පසින් පිරුනු, සෙමින් ගලන්නා වූ පුළුල් ගංගාවන් ගහන, හිරු එළියේ කැඩපත් මෙන් දිදුලන කුඩා විල් සිය ගණනකින් සමන්විත, සෑම අතින්ම උස් කඳු පන්තීන්ගෙන් ආරක්ෂා වූ සන්සුන් නිසල භූමියක් විය. එහි වූ ගොවිබිම්වල තිරිඟු, ඉරිඟු හා බාර්ලි සරුවට වැවී තිබින. එහි වැවුනු එළවළු හා පළතුරු හයිගාර්ඩ්න්වල වැවෙන ඒවාටද වඩා රසවත් හා ප්‍රමාණයෙන් විශාල විය. ඔවුන් සිටගෙන සිටියේ මිටියාවතේ බටහිර අන්තයේ ය. සිය අවසන් කපොල්ල මෙහිදී පසුකරන උස් මාවත, මෙතැන් පටන් පුළුල් වෙමින්, ක්‍රමයෙන් පහළට බෑවුම් වෙමින් සැතපුම් දෙකක් පමණ පහළින් තිබුනු නිම්නය දෙසට ඇදී ගියේය. මේ අන්තයේදී නිම්නය පටු වූ අතර අඩ දවසක ගමනකින් එය තරණය කල හැකි විය. උතුරුදිග කඳු පන්තීන් මෙහිදී කෙතරම් සමීපව දිස් වූවාද යත් තම අත දිගු කලේ නම් ඒවා ඇල්ලිය හැකියැයි කැට්ලින්ට සිතෙන්නට විය. එනමුදු මේ සියල්ලම පරයමින් ඔවුන් ඉදිරියේ නැගී සිටි 'යෝධයා ගේ ලන්සය' නමින් හැඳින්වෙන කන්ද කෙතරම් උස් වීද යත් සෙසු කඳු සියල්ලම ඒ හමුවේ කුරුමිට්ටන් බඳු විය. නිම්න භූමියේ සිට සැතපුම් තුන හමාරක් උසට නැගුනු එහි මුදුන මීදුමින් වැසී ගොස් තිබින. එහි දැවැන්ත බටහිර බෑවුමේ ඇදහැලෙන 'ඇලයිසා ගේ කඳුළු' නම් දියඇල්ල මෙතරම් ඈතක සිට පවා කළු පැහැ පසුබිමේ රිදී ඉරක් මෙන් කැට්ලින්ට නිරීක්ෂණය කල හැකි විය.

ඇය නැවතුනු බව දුටු ඇගේ බාප්පා සිය අසු ඈ අසලට මෙහෙයවීය. "ඒක තියෙන්නෙ අතන, ඇලයිසාගෙ කඳුළුවලට පැත්තකින්. ඉරඑළිය හොඳට වැටිලා ඒකෙ ප්‍රාකාර දිලිසෙන කොට ඔයාට මෙතන ඉඳන් ඒ එළිය දකින්ට පුළුවන් යාන්තමට." ඔහු ඇඟිල්ල දිගු කොට පෙන්වීය.

නෙඩ් ඇයට කියා තිබුනු පරිදි එහි අහස් කුසට අනින ලද කිනිසි හතක් වැනි උසැති කුළුණු හතක් විය. ඒවා කෙතරම් උස් වී ද යත් එහි ප්‍රාකාර මත සිට කෙනෙකුට පහතින් ඇති වළාකුළු දෙස බැලිය හැකි විය. "ගමනට කොච්චර වෙලාවක් යනවද?" ඇය ඇසුවාය.

"අපට අද හැන්දෑ වෙද්දි කඳු පාමුලට ළඟාවෙන්ට පුළුවන්. ඒ වුනාට කන්ද නගින්ට තවත් දවසක් යනවා."

ඔවුන්ට පසුපසින් සෙර් රඩ්‍රික් හඬ අවදි කලේය. "මගේ ආර්යාවනි. අද දවසේ මට මීට වඩා නම් යන්ට පුළුවන් වෙයි කියලා හිතන්ට බෑ." ඔහු ගේ අලුත වැවුනු රැවුලට යටින් ඒ මුහුණ එල්ලා වැටී තිබින. ඔහු කෙතරම් දුබල වී ද යත් මේ දැන් අසු පිටින් ඇද වැටෙතැයි කැට්ලින් බියපත් වූවාය.

"ඔබ එහෙම ගමන් කරන්ට ඕනත් නෑ." ඇය කීවාය. "ඔබෙන් බලාපොරොත්තු වුනාටත් වඩා සිය ගුනයක් ඔබ මේ වෙනකොට ඉෂ්ටකරලා තියෙනවා. ඉයරිවලට යන්ට තියෙන ඉතුරු දුර මගේ බාප්පා මාව එක්ක යයි. ලැනිස්ටර් මගෙත් එක්ක එයි. ඒත් අනිත් අය මගෙත් එක්ක එක්කරන් යන්ට හේතුවක් නෑ. එයාලට පුළුවන් මෙහෙ නතරවෙලා ඉන්ට, නැතිවෙලා ගිය ශක්තිය ආපහු ලැබෙනකං."

"එයාලව ආගන්තුකයො විදියට බාරගන්ට ලැබෙන එක අපට ලොකු ගෞරවයක්." සෙර් ඩොනල් ආචාරශීලී අයුරින් පැවසීය. මංසන්ධි තානායමෙන් ඇයත් සමග පිටත් වූ පිරිසෙන් මේ වනවිට ඉතුරුව සිටියේ සෙර් රඩ්‍රික් හැරුනු විට, බ්‍රොන්, සෙර් විලිස් වෝඩ් හා මැරිලියන් පමණි.

"මගේ ආර්යාවනි." මැරිලියන් කීවේ සිය අසු ඉදිරියට මෙහෙයවමිනි. "ඔබතුමීත් එක්ක ඉයරිවලට එන්ට මටත් ඉඩ දෙන්ටයි කියලා මම බැගෑපත්ව ඉල්ලනවා. මේ කතාවෙ මුල දැක්කා වගේ අවසානයත් දකින්ට මට ඉඩදෙන්ට." මේ කොලුවා අන්තයටම වෙහෙසී සිටි නමුදු ඒ දීප්තිමත් දෑසේ දැඩි අධිෂ්ටානයක් දැකිය හැකි විය.

ඔවුන්ට එක්වන්නැයි කැට්ලින් විසින් කිසිවිටෙකත් ඔහුගෙන් අසා නොතිබුනු අතර එය තනිකරම ඔහු ගේ තීරණයක් විය. මෙතරම් නිර්භීත හැඩිදැඩි මිනිසුන් මියයද්දී මේ කොලුවා ගමනාන්තය වන තෙක් කෙසේ පණ රැකගත්තාදැයි යන්න ඇයට කොහෙත්ම සිතාගත නොහැකි කරුණක් විය. සමහරවිට ඇයත් සමග මෙතෙක් දුර පැමිණීම වෙනුවෙන් ඇය ඔහුට ණයගැති වූවා වන්නට ඇත. "හොඳයි. එන්ට." ඇය කීවාය.

"මාත් එනවා." බ්‍රොන් නිවේදනය කලේය.

මේ ගැන ඇගේ වැඩි කැමැත්තක් නොවීය. ඔහු නොමැති වී නම් ඇයට කෙදිනකවත් මිටියාවතට ලංවීමට නොහැකි වනු ඇති බැව් ඇය හොඳින්ම දැන සිටියා ය. මේ කුලී භේවායා ඇය දැක ඇති නිර්භීතම සටන් කරුවකු වූ අතර සතුරන් පරදා මෙතෙක් දුරක් ඇයව රැගෙන ඒමට ඒ අසිපත මහඟු මෙහෙයක් ඉටු කොට තිබින.

එනමුදු මේ සියල්ල තිබියදී පවා කැට්ලින් මේ මිනිසාට අකැමැති වූවාය. ධෛර්යය හා ශූරවීරභාවය කෙතරම් අධික වූ නමුදු ඔහු ගේ කරුනාවන්ත කම හෝ පක්ෂපාතීත්වය ගැන එලෙසින්ම සිතිය නොහැකි විය. එමෙන්ම ඔහු නිතරම ලැනිස්ටර් සමීපයෙන් ගමන් කරමින්, ඔහු හා පහත් හඬින් දොඩමින්, ඔවුන් දෙදෙනා අතර කෙරුනු කිසියම් විහිළුවකට ඔහු හා එක්ව සිනාසෙමින් සිටිනු ඇය නිරීක්ෂණය කර තිබින. ඔහුව මේ මොහොතේ සිට කුරුමිට්ටාගෙන් වෙන් කිරීමට ඇය වඩා කැමැත්තෙන් සිටියා ය. එනමුදු මැරිලියන්ට තමාත් සමග ඉයරිවලට පැමිණීමට අවසර දුන් පසු බ්‍රොන්පගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට සුදුසු හේතුවක් ඇයට සිතා ගත නොහැකි විය. "ඔබේ කැමැත්තක්." ඇය කීවාය. එනමුදු, ඔහු නිසි අයුරින් ඇගේ අවසරය ඉල්ලා නොසිටි බව ඇය නිරීක්ෂණය කලාය.

සෙර් විලිස් වෝඩ් ද සෙර් රඩ්‍රික් හා නැවැතුනු අතර සප්තක පූජකයකු විසින් ඔවුන් ගේ තුවාල ගැන සොයා බලන්නට විය. අන්තයටම කැහැටු ගැසී සිටි ඔවුන් ගේ අශ්වයින් ද මෙහි අතහැර දැමුනු අතර ගමනට වඩාත් සුදුසු, ලොමින් වැසී ගිය කඳුකර අශ්වයින් ඉස්තාලවලින් ලබාගන්නා ලදී. ඔවුන් ගේ පැමිණීම ගැන දන්වා ඉයරීවලට හා චන්ද්‍ර වාහල්කඩට කපුටන් අතේ පණිවුඩ යවන්නෙමැයි සෙර් ඩොනල් පොරොන්දු විය. පැයක් ඇතුළත ඔවුන් නැවතත් ගමනට පිටත් වී තිබින. මිටියාවත කරා පහළ බසිද්දී කැට්ලින් සිය බාප්පාත් සමග ගමන් කල අතර ඔවුන් පසුපසින් බ්‍රොන්, ටිරියන් ලැනිස්ටර්, මැරිලියන් හා බ්‍රින්ඩන් ගේ මිනිසුන් සයදෙනෙක් ගමන් ගත්හ.

බ්‍රින්ඩන් ටලී

කඳුකර මාර්ගයේ ගමනින් තුනෙන් එකක් පමණ ගෙවූ පසු, ඔවුන් දෙදෙන අනිකුන්ට ඇසෙන මානයේ නැතැයි සැකහැර ගත් පසු බ්‍රින්ඩන් ටලී සිය ලේලිය දෙසට හැරුනේය. "ඉතින් දරුවො, මට කියන්ට මොකක්ද ඔයාගෙ මේ කුණාටුව කියලා."

"මට අවුරුදු බර ගානකින් කවුරුවත් දරුවෙක් කියලා කතා කරලා නෑ බාප්පෙ." ඇය සිනාසුනාය. එනමුදු ඇය ඔහුට සියල්ල පැවසුවා ය. ලයිසා ගේ ලිපිය, බ්‍රැන් ගේ වැටීම, මිනීමරුවා ගේ කිනිස්ස, සුළැඟිල්ලා, මංසන්ධි තානායමේදී සිදුවූ ටිරියන් ලැනිස්ටර් ගේ අහඹු හමුවීම. මේ සියල්ලම කියා නිමවනවිට ඇය සිතුවාටද වඩා වැඩි වේලාවක් ගතවී තිබින.

ඇගේ බාප්පා මේ මුලු කාලය තුළදීම නිහඬව ඇයට සවන් දුන්නේ ය. බ්‍රින්ඩන් ටලී සැමවිටම හොඳ සවන් දෙන්නකු විය... ඇගේ පියාට හැරෙන්නට අන් සෑම දෙනකුටම හොඳ සවන් දෙන්නකු විය. ඔහු හස්ටර් ටලී උතුමානන් ගේ බාල සොහොයුරා විය. බ්‍රින්ඩන් ඔහුට වඩා වසර පහක් බාල වූ අතර කැට්ලින්ට මතක ඇති කාලයේ සිටම ඔවුන් දෙදෙනා එකිනෙකාට එරෙහිව ගැටුනහ. කැට්ලින් අට හැවිරිදි වියේ වූ කාලයේ ඇති වූ මෙවැනි එක් දරුණු වාග් හුවමාරුවක් අවසානයේ කේන්තියෙන් පුපුරා ගිය හස්ටර් උතුමානන් බ්‍රින්ඩන්ට 'ටලී රංචුවේ කළු එළුවා' කියා බැන වැදුනේය. බ්‍රින්ඩන් සිනාසෙමින් ඔහුට කියා සිටියේ ඔවුන් ගේ වංශ සලකුණ ට්‍රවුට් මාළුවකු මිස එළුවකු නොවන අතර, එමනිසා වඩාත් ගැලපෙන නම 'කළු මාළුවා' බවය. එදා පටන් ඔහු ගේ අන්වර්ථ නාමය කළු මාළුවා විය.

ඇය සහ ලයිසා විවාහ වූ දිනය දක්වාම හස්ටර් හා බ්‍රින්ඩන් අතර වූ මේ ගැටුම් පැවතින. විවාහමංගලෝත්සව භෝජන සංග්‍රහය අතරතුරේදී බ්‍රින්ඩන් සිය සොයුරාට කියා සිටියේ තමා රිවර්රන්වලින් පිටවී ලයිසා හා ඇගේ නව සැමියා වන ඉයරීහි උතුමානන්ට සේවය කිරීම පිණිස පිටව යන බවයි. ඇගේ සොහොයුරා එඩ්මුයර් විසින් ඇයට එවන්නට යෙදුනු ලිපි අනුව එදා පටන් හස්ටර් උතුමානන් සිය සොහොයුරා ගේ නම මුවින් පිට නොකලේ ය.

කෙසේවුවද, ඇගේ ළමා කාලය පුරාවටම හස්ටර් ටලී උතුමානන් ගේ දරුවන් සිය ගැටළු, කඳුළු, කතන්දර සියල්ලක්ම රැගෙන ගියේ බ්‍රින්ඩන් ටලී හමුවට විය. ඔවුන් ගේ පියා සැමවිටම පාහේ වැඩ රාජකාරිවලට මැදිවී සිටි අතර මව ගිලන්ව සිටියා ය. කැට්ලින්, ලයිසා, එඩ්මුයර් පමණක් නොව පියා ගේ භාරයේ හැදුනු වැඩුනු පෙටයර් බේලිෂ් පවා. මේ දැන් ඇයට සවන් දෙමින් සිටින්නාක් මෙන් ඔහු එකලද ඔවුන් සියල්ලන්ටම ඉවසිල්ලෙන් සවන් දුන්නේ ය. ඔවුන් ගේ ජයග්‍රහණ හමුවේ ඔවුන් හා එක්ව සිනාසුනේ ය. පරාජයන් හා අවාසනාවන් හමුවේ ඔවුන් හා එක්ව කඳුළු සැලුවේය.

ඇගේ කතාව නිමවූ පසු ඔහු බොහෝ වේලාවක් තිස්සේ නිහඬව කල්පනාවේ ගැලී හුන්නේ ය. "ඔයාගෙ තාත්තට මේක කියන්ට ඕනමයි." අන්තිමේදී ඔහු හඬ අවදි කලේය. "ලැනිස්ටර්ලා හමුදාවත් එක්ක පාරට බැස්සොත් වින්ටර්ෆෙල් තියෙන්නෙ ගවු ගානක් ඈත. මිටියාවත ඒකෙ කඳුපන්තිවලින් ආරක්ෂා වෙලයි තියෙන්නෙ. ඒත් රිවර්රන් තියෙන්නෙ ඒකට අතේ දුරින්."

"මටත් ඒ බයම තියෙනවා." කැට්ලින් එකඟ වූවාය. "අපි ඉයරිවලට ගියාට පස්සෙ මම මේස්ටර් කෝල්මන්ට කියන්නම් පණිවුඩයක් යවන්ටයි කියලා." ඇයට තවත් බොහෝ පණිඩුව යැවීමට තිබින. නෙඩ් විසින් ඇයට කියූ පරිදි ඔහු ගේ ධජ දරන්නන් වෙත උතුරේ ආරක්ෂාව තර කරන්නැයි ඉල්ලා පණිවුඩ යැවිය යුතුව තිබින. "මොකක්ද මිටියාවතේ තත්ත්වය? එයාලා මොනාද හිතන්නෙ?"

"හැමෝම කේන්තියෙනුයි ඉන්නෙ. ජොන් උතුමානන්ට හැමෝම ආදරේ කලා. ඒත් එක්කම ඒරින්වරුන් අවුරුදු තුන්සීයක් තිස්සෙ දරාපු තනතුරකට රජතුමා ජේමි ලැනිස්ටර්ව පත්කලාම ඒ අපහාසෙ මේ හැමෝටම තදින්ම දැනුනා. ලයිසා අපට අණකරලා තියෙන්නෙ එයාගෙ පුතාට 'නැගෙනහිර දිශාවේ සත්‍ය ආරක්ෂකයා' කියලා කතා කරන්ටයි කියලා. ඒ වුනත් මිනිස්සු මෝඩයො නෙවෙයි. අනික ඔයාගෙ සහෝදරී විතරක් නෙවෙයි ජොන් උතුමානන්ගෙ මරණය සිද්දවුන විදිය ගැන සැක කරන්නෙ. කවුරුවත් එළිපිට කියන්නෙ නෑ එයාව මරා දැම්මා කියලා. ඒ වුනත් සැකය බොහොම ගැඹුරට මුල් බැහැලයි තියෙන්නෙ." ඔහු තදින් පියැවුනු දෙතොලින් යුතුව කැට්ලින් දෙස බැල්මක් හෙලුවේ ය. "ඒත් එක්කම මේ කොලුවා."

"කොලුවා? මොකක්ද එයාගෙ වැරැද්ද?"

Catelyn Stark: “I was born a Tully and wed to a Stark, I do not frighten easily.”

බ්‍රින්ඩන් ගේ කටහඬ වෙහෙසින් බරවී තිබින. "රොබර්ට් උතුමානන්!" ඔහු දිගු සුසුමක් හෙලීය. "අවුරුදු හයයි. හැම වෙලාවෙම ලෙඩ ගානෙ. එයාගෙ බෝනික්කෙක් කවුරුහරි අරගත්තත් අඬන්ට බලාගෙනයි ඉන්නෙ. ජොන් ඒරින්ගෙ සහජාත උරුමක්කාරයා. ඒ වුනත් සමහරු කියනවා එයා එයාගෙ තාත්තගෙ ආසනයේ වාඩිවෙන්ට තරම් දුර්වල

වැඩියිලු. මේ පහුගිය අවුරුදු දාහතරටම ජොන් උතුමානන් කින්ග්ස් ලෑන්ඩින්ග්වල රජතුමාගෙ හස්තය විදියට වැඩ කරද්දි නෙස්ටර් රොයිස් උතුමානන් තමා මිටියාවතේ බාරකාරයා විදියට වැඩ රාජකාරි කලේ. ගොඩක් උදවිය හොර රහසේ කතාවෙනවා කොලුවා නිසිවයස එනකං නෙස්ටර් මේ මිටියාවත පාලනය කරනවානං හොඳයි කියලා. තවත් අය හිතනවා ලයිසා ආයෙමත් ඉක්මනටම කසාද බැන්දොතින් හොඳයි කියලා. දැනටමත් විවාහාපේක්ෂකයො වැලගෙඩියට වහන කපුටො වගේ මිටියාවතේ පිරෙන්ට පටන් අරන්.

"ඒක බලාපොරොත්තු වෙන්ට පුළුවන් දෙයක්." කැට්ලින්ට එහි ලොකු අරුමයක් නොදැනුනාය. ලයිසා තවමත් තරුණ කාන්තාවක් වන අතර ඒරින් මිටියාවත හා කඳුකර රාජධානිය යනු අගනා දායාදයක් විය. "ලයිසා තවත් සැමියෙක් කසාද බඳින්ට කැමැතිද?"

"එයා කියනවා ඔවු කියලා. එයාට හරියට ගැලපෙන ස්වාමි පුරුෂයෙක් හම්බවුනොත්. ඒ වුනත් එයා දැනටමත් නෙස්ටර් උතුමානන්වයි තවත් හොඳට ගැලපෙන සහකරුවො කීපදෙනෙක්මයි ප්‍රතික්ෂේප කරලයි තියෙන්නෙ. එයා දිවුරලා කියනවා මෙදා පාරනම් එයා එක්කෙනෙක්ව තෝරගන්නවමයි කියලා."

"අනිත් හැමෝටම වඩා ඔයා ඒ දේට එයාට දොස් කියන එක වැරැදියි නේ."

සෙර් බ්‍රින්ඩන් හුස්මක් පිම්බේය. "මම එහෙම කරන්නෙ නෑ.. ඒ වුනත්.. මට පේන්නෙ ලයිසා මේක නිකං සෙල්ලමකට හරවගෙනයි ඉන්නෙ. එයා මේ ඇතිවෙලා තියෙන තත්ත්වය නිසා විනෝද වෙනවා. ඒ වුනත් මම විශ්වාස කරන විදියට එයා බලාපොරොත්තු වෙනවා දරුවා නිසි වයසට එනකං එයා විසින්ම මේ මිටියාවත පාලනය කරන්ට."

"ගෑනියෙකුට පුළුවන් පිරිමියෙක් තරම්ම ඥානවන්ත විදියට පාලනය කරන්ට."

"දැඩි ගෑනියෙකුට පුළුවන්." ඇගේ බාප්පා ඇ දෙස නෙත් කොණින් බැල්මක් හෙලුවේය. "පටලවගන්ට එපා කැට්. ලයිසා කියන්නෙ ඔයා නෙවෙයි." ඔහු මොහොතක් අතීරණයෙන් තැතනුවේය. "ඇත්තම කියනවානම්, ඔයාගෙ සහෝදරී ඔයා හිතන තරං මේ ප්‍රශ්නෙදි උදවු උපකාර කරන්නෙ නැතිවෙන්ට පුළුවන්."

"ඔයා මොකක්ද ඔය කියන්ට හදන්නෙ?"

"කින්ග්ස් ලැන්ඩින්ග්වල ඉඳන් ආපහු ආපු ලයිසා කියන්නෙ ජොන් උතුමානන් එක්ක දකුණට ගිය ලයිසා නෙවෙයි. ඒ අවුරුදු ගාන එයාට බොහොම දුෂ්කර වුනා. ඔයා මේවා දැනගන්ට ඕන. ජොන් ඒරින් කියන්නෙ නියම විදියට යුතුකම් ඉටුකරපු ස්වාමිපුරුෂයෙක් තමා. ඒ වුනත් එයාලගෙ කසාදෙ සිද්දවුනේ දේශපාලන හේතු උඩ. ඒක ආදරේ හින්දා සිද්දවුන දෙයක් නෙවෙයි."

"ඉතින් මගෙ කසාදෙත් එහෙම එකක්නෙ."

"ඒ දෙකම පටන්ගත්තෙ එකම විදියට තමා. ඒත්, ඔයාගෙ කසාදෙ එයාගෙ එකට වඩා බොහොම සතුටුදායක එකක් වුනා. මළදරු උපත් දෙකක්, ගබ්සාවීම් දෙකක්, ඒරින් උතුමානන්ගෙ මරණය... කැට්ලින්, දෙයියො අන්තිමට ඔයාගෙ සහෝදරිට දුන්නෙ එකම එක දරුවයි. ඒ දූප්පත් කොලුවා තමා ලයිසාට දැන් ජීවත්වෙන්ට තියෙන එකම බලාපොරොත්තුව, එකම සැනසිල්ල. ඒ කොලුවාව ලැනිස්ටර්ලාට බාරදෙන්නෙ නැතුව එයාවත් උස්සන් පැනලා ආපු එක පුදුමයක් නෙවෙයි. ඔයාගෙ සහෝදරී බයවෙලයි ඉන්නෙ දරුවො. එයා වැඩියෙන්ම බය ලැනිස්ටර්ලාට. එයා කින්ග්ස් ලැන්ඩින්ග්වලින් පැනලා ආවෙ හරියට හෙරක් වගේ, මහ රෑ ජාමෙ. ඒ වෙන මොකුත් නිසා නෙවෙයි, එයාගෙ පුතාව සිංහ කටින් බේරගන්ට ඕන නිසයි... ඉතින් දැන් ඔයා එයාගෙ දොරකඩට සිංහයෙක් අරන් ඇවිත් තියෙනවා."

"දම්වැල්වලින් බැඳලා. ඒ සිංහයා මගේ හිරකාරයෙක්"

"ආහ්!" ඇගේ බාප්පා ආපසු හැරුනේ ඔවුන්ට පිටුපසින් ටිරියන් ලැනිස්ටර් පහත බසින දෙස බැලුවේය. "මට පේනවා එයාගෙ සෑදලේ පොරොවක්, එයාගෙ ඉණේ සිරියක්, එයාගෙ හෙවනැල්ල වගේ එයාගෙ පස්සෙන්ම යන කුලී හේවායෙක්. කෝ එයාගෙ දම්වැල් වස්තුවෙ?"

කැට්ලින් අපහසුවෙන් මෙන් අසුපිට එහාමෙහා වූවාය. "කුරුමිට්ටා මෙහාට ඇවිල්ලා තියෙන්නෙ එයාගෙ කැමැත්තෙන් නෙවෙයි. දමවැල් ඇතුවා හරි නැතුවා හරි එයා මගෙ හිරකාරයා. මට වගේම ලයිසාටත් එයාව ඕන එයා කරපු අපරාධ ගැන විභාග කරන්ට. ලැනිස්ටර්ලා මරලා දැම්මෙ එයාගෙම සැමියාව. එයාගෙම ලියුමක් නිසා තමා අපිත් මේ ගැන මුලින්ම දැනගත්තෙ."

බ්‍රින්ඩන් ටලී ඈ දෙස වෙහෙසකාරී සිනහවක් පෑවේය. "මම හිතනවා ඔයා හරියි කියලා දරුවෝ." ඔහු සුසුමක් හෙලීය. එහෙත් ඒ ස්වරයෙන් කියැවුනේ ඇය වැරැදි බවකි.

පාරේ බෑවුම් සහගතබව අඩු වී යන්නට පටන්ගනිද්දී ඉර හැරී සෑහෙන වේලාවක් ගොස් තිබ්න. මාවත වඩ වඩාත් පුළුල් වන්නට වූ අතර වඩා කෙලින් විහිදෙන්නට ද විය. එමෙන්ම මුල්ම වතාවට කැට්ලින් මාවත දෙපස වැවී ඇති තණකොළ හා කැලෑ මල් නිරීක්ෂණය කලාය. නිම්නයේ පතුළට ළඟා වූ පසු ඔවුන් ගේ ගමන වඩා වේගවත් විය. අසුන්ට හැල්මේ යාමට සන් කල ඔවුහු නිල්වන් වන රොදවල්, අලස සුවයෙන් පසුවන කුඩා ගම්මාන, උයන් වතු හා රන්වන් තිරිඟු යායවල්, හිරුඑළියේ දිදුලන සුපිරිසිදු දියෙන් පිරි කුඩා දොළ පහරවල් පසු කරමින් හොඳ වේගවත් බවකින් යුතුව සිය ගමනේ යෙදෙන්නට සමත් වූහ. බ්‍රින්ඩන් ඔවුන්ට ඉදිරියෙන් ධජ දරන්නෙකු යැවූ අතර ඔහු අඩසඳ හා උකුස්සා සහිත ඒරින් වංශයේ සලකුණත්, ඊට පහළින් බ්‍රින්ඩන් ගේ කළු මාළුවා සලකුණත් සඳහන් වුනු ද්විත්ව ධජයක් ඔසවාගෙන ගියේය. යන මග ඉදිරියෙන් හමුවූ ගොවිපළ කරත්ත, වෙළෙඳ කරත්ත හා දෙවන මට්ටමේ වංශාධිපතීන්ට අයත් අසරුවන් මාර්ගයේ පසෙකට වී ඔවුන්ට යාමට අවකාශ සලසා දුන්හ.

එනමුදු ඔවුන් යෝධයාගේ ලන්සය පාමුල පිහිටා තිබුනු දැවැන්ත බලකොටුවට ළඟාවන විට සම්පූර්ණයෙන්ම පාහේ අඳුරු වැටී තිබ්න. එහි පවුරු මත්තෙහි වූ මුර අට්ටාල වල පන්දම් දැල්වෙමින් තිබුනු අතර දියඅගලේ කළු පැහැ දිය මත අඩසඳේ ඡායාව දිදුලමින් තිබ්න. පාලම ඔසවා කටු දොරටුව පහතට දමා තිබුනු නමුදු ගේට්ටුවේ මුරකුටි තුළ හා ඊට පිටුපසින් තිබුනු සතරැස් කුළුණුවල කවුළු තුළ දැල්වෙමින් තිබුනු පහන් එළිය කැට්ලින්ට දැකිය හැකි විය.

"ඔන්න තියෙනවා චන්ද්‍ර වාහල්කඩ." පිරිස අසුන් නවතද්දී සෙර් බ්‍රින්ඩන් කීය. ඔහු ගේ ධජ දරන්නා දියඅගල අද්දරට ගියේ ගේට්ටු මුරකුටියේ සිටි සෙබළුන්ට සංඥා කරනු

පිණිසය. "නෙස්ටර් උතුමානන්ගෙ වසම. එයා අපිව බලාපොරොත්තුවෙන් ඇති. අර උඩ බලන්ට."

කැට්ලින් ඉහළට, ඉහළට හා තවතවත් ඉහළට සිය දෑස් එසෙවුවා ය. මුලින්ම ඇය දුටුවේ තරු නොමැති රැයක් තරම් අන්ධකාරයෙන් පිරුනු දැවැන්ත ගල් පර්වත, ගස්වැල් හා ඒ පසුබිමේ යෝධයකු මෙන් නැගී සිටි මහ කන්ද පමණි. ඊළඟ මොහොතේ ඔවුන්ට ඉතා ඉහළින් දුර ඈත දිදුලන දුබල ආලෝක පුංජයක් ඇගේ නෙත ගැටින. කන්දේ ගැඹුරු බෑවුමක තනන ලද ඒ කුඩා බලකොටුවේ දිදුලන ආලෝකය තැඹිලි පැහැ දෑසක් මෙන් ඉහළ සිට පහත සිටි ඔවුන් දෙස බලා සිටින්නට විය. ඊට ඉහළින් තවත් දුරස්ථව පිහිටි තවත් කුඩා බලකොටුවක එළිය ඉන්පසු ඇගේ ඇස ගැසුනු අතර ඊටත් ඉහළින් පිහිටි තෙවන බලකොටුවක ආලෝකය ඈත දිදුලන තරුවක් මෙන් යාන්තමින් දැක ගත හැකිවිය. මේ හැමටම ඉහළින්, අහස සිඹින මානයේ, උකුස්සන් පියාසලන මානයේ සඳඑළිය වැටීමෙන් දිදුලන සුදු පැහැ ආලෝකයක් විය. මේ අහස සිඹින මානයේ වූ බලකොටු පවුරු හා කුළුණු සත දෙස බලා සිටි ඇගේ හිස බමන්නට විය.

"ඉයරී." විස්මයෙන් මුසපත් වුනු මැරිලියන් ගේ හඬ ඇයට ඇසින.

ටිරියන් ලැනිස්ටර් ගේ තියුණු හඬ ඊළඟට ඇසෙන්නට විය. "ඒරින්ලා අමුත්තො එනවට වැඩි මනාපයක් නෑ වගේ. මේ අන්ධකාරෙ මැද්දෙ ඔය කන්ද නගින්ට ඔබ අදහස් කරගෙන ඉන්නවානං ඊට වඩා ලේසියි මාව මෙතැනම මරලා දාන්ට."

"අපි අද රෑ මෙතන නතරවෙලා හෙට උදේම කන්ද නගින්ට පටන්ගන්නවා." බ්‍රින්ඩන් පිළිතුරු දුනි.

"මට ඉවසිල්ලක් නෑ." කුරුමිට්ටා කීවේය. "අපි කොහොමද එච්චර උඩට යන්නෙ? මට එළුවො පිටේ ගිහිල්ලා කිසිම පුරුද්දක් නෑ."

"කොටළුවො." බ්‍රින්ඩන් සිනාසෙමින් කීය.

"කන්දට අල්ලලා කපාපු පඩි තියෙනවා." කැට්ලින් කීවාය. ජොන් ඒරින් ගේ භාරකාරත්වය යටතේ රොබර්ට් බරතියන් සමගින් මෙහි සිය තරුණ කාලය ගෙවූ නෙඩ් මේ ගැන ඇයට කියා දී තිබින.

බ්‍රින්ඩන් හිස වැනීය. "දැන් අන්ධකාරෙ වැඩි නිසා ඒවා පේන්නෙ නෑ. ඒ වුනත් පඩි තියෙනවා. ඒවා අශ්වයින්ට නගින්ට තරම් පටු වැඩියි, උස වැඩියි. ඒ වුනත් කොටළුවන්ට ඒවයෙ යන්ට පුළුවන්. මේ පාර පුංචි බලකොටු තුනකින් ආරක්ෂා වෙනවා. 'ගල් බලකොටුව', 'හිම බලකොටුව', 'අහස් බලකොටුව'. කොටළුවො අපිව අහස් බලකොටුවට යනකං අරන් යයි."

ටිරියන් ලැනිස්ටර් සැකමුසු බැල්මක් කන්දේ ඉහළට හෙලීය. "ඊට පස්සෙ?"

බ්‍රින්ඩන් සිනහවක් මුවට නගාගත්තේ ය. "ඊට පස්සෙ පාර කොටළුවන්ටත් යන්ට බැරි තරම් පටුයි. ගමනෙ ඉතුරු ටික අපි පයින් යන්ට ඕන. එහෙම නැත්තං ඔබ කැමැති ඇති කූඩෙක නැගලා යන්ට. ඉයරී පිහිටලා තියෙන්නෙ කෙලින්ම අහස් බලකොටුවට උඩින් කඳු මුදුනෙ. ඒකෙ ගබඩා කාමරවල තියෙනවා දැවැන්ත දබර හයක්, යකඩ දම්වැල් දාලා පහළ ඉඳන් අවශ්‍ය කරන බඩු බාහිරාදිය ගෙන්නගන්ට. ඔබ කැමැතිනං මගේ ලැනිස්ටර් උතුමානනි, මට පුළුවන් ඔබට ඉඩ සලස්සලා දෙන්ට පානුයි, බීරයි, ඇපලුයි එක්ක උඩට යන්ට."

කුරුමිට්ටා කොක්හඬලා සිනාසුනේය. "මම වට්ටක්කා ගෙඩියක් කියලා හිතුවද. අයියෝ! මගේ තාත්තා බොහොම තදින් උරණ වෙයි එයාගෙ පුංචි ලැනිස්ටර් පුතා තමන්ගෙ දෛවයට මුහුණ දෙන්ට නිකං ටර්නිප් උතුමානන් කෙනෙක් වගේ ගියා කියලා ඇහුවොත්. ඔබලා යන්නෙ පයින් නං මාත් පයින් එන්නම්. අපි, ලැනිස්ටර්ලාට පුංචි පහේ අභිමානයක් තියෙනවා."

"අභිමානයක්?" කැට්ලින් කඩා පැන්නා ය. කුරුමිට්ටා ගේ අවමන් සහගත ස්වරය හා සැහැල්ලු කතා විලාසය විසින් ඇගේ කේන්තිය අවුස්සා තිබින. "සමහරුනං ඒකට කියන්නෙ මාන්නය කියලා. උඹලාට තියෙන්නෙ මාන්නයයි, ධන තණ්හාවයි, බලයට ඇති කෑදරකමයි."

"කිසිම සැකයක් නෑ මගේ අයියානං මාන්නක්කාරයි." ටිරියන් ලැනිස්ටර් පිළිතුරු දුනි. "මගේ තාත්තා තමා ධන තණ්හාවෙ උල්පත. එතකොට මගේ ලස්සන අක්කා සෙර්සි, ජීවත්වෙන හැම මොහොතක්ම ගත කරන්නෙ බලයට කෑදරකමින් තමා. ඒ වුනත් මම! මමනං පුංචි බැටළු පැටියෙක් වගේ අහිංසකයි. මම 'බෑ බෑ' කියලා පෙන්නන්ටද?" ඔහු නියවීය.

ඇය මීට පිළිතුරක් දෙන්නට පෙර පාලම මහහඬක් නංවමින් පහත් වූ අතර කටු දොරටුව ඉහළට ඔසවන දම්වැල් හඬ සවනේ වැකින. දැල්වෙන පන්දම් අතින් ගත් සෙබළු පිටතට පැමිණ ඔවුනට මාර්ගය පෙන්වූහ. බ්‍රින්ඩන් ටලී ඔවුන්ව දියඅගල හරහා අනිත් පසට කැඳවාගෙන ගියේය. මිටියාවතේ භාරකරු හා චන්ද්‍ර වාහල්කඩෙහි අධිපතියා වූ නෙස්ටර් රොයිස් උතුමානන් සිය නයිට්වරුන් පිරිවරා ඔවුන් පිළිගන්නට බලකොටු අංගනයෙහි සැදී පැහැදී සිටියේය. "ආයුබෝවන් ස්ටාර්ක් ආර්යාවනි!" ඔහු හිස නවමින් කීය. ඔහු දැවැන්ත, පීප්පයක් තරම් විසල් පපුවකින් යුතු පුද්ගලයකු වූ නිසා ඒ හිස නැමීම එතරම් සාර්ථක නොවීය.

සිය අසුපිටින් බිමට බට කැට්ලින් ඔහු අබියස සිටගත්තා ය. "ආයුබෝවන් නෙස්ටර් උතුමානනි!" ඇය මේ මිනිසා නාමමාත්‍රිකව හැඳින සිටියේ ඔහු ගේ කීර්තිය හා ප්‍රසිද්ධිය නිසා පමණි. මොහු ලෝකඩ යොන් ගේ ඥාතිවරයකු හා රොයිස් වංශයේ එතරම් වැදගත් නැති ශාඛාවකින් පැනනැගුනු පුද්ගලයකු වුවද භයානක බැරුරුම් වංශාධිපතියකු ලෙසින් තමාගේම නමක් දිනා සිටියේය. "අපි බොහොම දුර, බොහොම වෙහෙසකර ගමනකුයි ඇවිත් තියෙන්නෙ. අද රෑ ඔබේ වහල යට ආගන්තුක සත්කාර දෙන්ට පුළුවන් නම් බොහොම කරුනාවයි."

"මගේ වහල ඔබෙයි මගේ ආර්යාවනි." නෙස්ටර් උතුමානන් රළු හඬින් පිළිතුරු දුන්නේය. "ඒ වුනත්, ඔබේ සහෝදරී ලයිසා ආර්යාව ඉයරිවල ඉඳන් අපට පණිවුඩයක් එවලා තියෙනවා. ඇයට ඔබව වහාම මුනගැහෙන්ට උවමනායිලු. ඔබේ කණ්ඩායමේ අනිත් අයට අද රෑ මෙහෙ නැවතිලා හෙට උදේ පාන්දරින්ම ගමනට පිටත්වෙන්ට පුළුවන්."

ඇගේ බාප්පා සිය අසුපිටින් බිමට පැන්නේය. "මොන විකාරයක්ද ඒ?" ඔහු නොසැලකිලිමත් ස්වරයෙන් ඇසීය. බ්‍රින්ඩන් ටලී වනාහී කිසිදිනෙක සිය අසිපතේ මුවහත

ගැන නොසැලකිල්ලක් දැක්වූවෙකු නොවීය. "රට කන්දට නගින්ට? මේ හඳ එළියත් එච්චර නැති දවසෙ? ලයිසා වුනත් දැනගන්ට ඕන ඒක නිකං බෙල්ල කඩාගන්ට කරන ආරාධනයක් කියලා."

"කොටළුවො පාර දන්නවා සෙර් බ්‍රින්ඩන්." කෙට්ටු, ශක්තිමත් සිරුරකින් හෙබි වයස දහහතක් හෝ දහඅටක් පමණ විය හැකි යුවතියක් නෙස්ටර් උතුමානන් පසෙකින් සිටගත්තා ය. ඇගේ තද කළු පැහැ කෙස්කළඹ කෙටි කර කපන ලද්දේ වීය. ඇය අසුපිට යාමට පළඳින සමින් නිමකල කලිසමක් හා රිදී පැහැ සැහැල්ලු මුදු දම්වැල් කමිසයක් හැඳ සිටියාය. ඇය සිය වංශාධිපතියාට වඩා මනෝඥ අයුරින් හිස නමමින් කැට්ලින්ට ආචාර කලාය. "මම පොරොන්දු වෙනවා මගේ ආර්යාවනි, ඔබතුමීට කිසිම අනතුරක් වෙන්නෙ නැහැයි කියලා. ඔබතුමීව ඉහළට එක්කරන් යන්ට ලැබීම මට ලොකු ගෞරවයක්. මම සිය සැරයක් විතර රෑ ජාමෙ ඔය ගමන ගිහිල්ලා තියෙනවා. මයිකල් කියනවා මගේ තාත්තා එළුවෙක් වෙන්ට ඇති ලු."

ඇගේ කටහඬේ තිබුනු ආඩම්බර බව නිසා කැට්ලින්ට සිනා පහල විය. "ඔබට නමක් තියෙනවාද දරුවො?"

"මම මයා ස්ටෝන්, ඔබතුමී සතුටුනම් මගේ ආර්යාවනි."

කැට්ලින් එයින් සතුටට පත් වූයේ නැත. සිය මුවේ නැගුනු සිනහව එලෙසින්ම පවත්වා ගැනීමට ඇයට ආයාසයක් දරන්නට සිදුවිය. ස්ටෝන් වනාහි මිටියාවතේ අවජාතකයින්ට භාවිත කෙරුනු වාසගම විය. හරියටම උතුරේ ස්නොව් හෝ හයිගාර්ඩ්න්හි ෆ්ලවර්ස් වූවාක් මෙනි. රාජධානි සප්තකයේ පැවැති සම්ප්‍රදාය අනුව නියමිත වාසගමක් නොමැතිව උපදින දරුවන්ට පොදු වාසගමක් භාවිත කෙරුනු අතර එය රාජධානියෙන් රාජධානියට වෙනස් විය. කැට්ලින් ගේ සිතේ මෙම දැරිය පිළිබඳ කිසිදු කහටක් නැති විය. එනමුදු ඒ නම විසින් ඇයට ප්‍රාකාරයේ වෙසෙන නෙඩ් ගේ අවජාතකයා සිහියට නැගුනු අතර එය එකවර කේන්තියක් හා වරදකාරී හැඟීමක් ඇගේ සිතේ ජනිත කරවන්නට සමත්ව තිබිනි. දැරියට සුදුසු පිළිතුරක් දෙනු පිණිස වචන සෙවීමට ඇය තැතනුවාය.

නෙස්ටර් උතුමානන් නිහඬතාව බිඳදැමීය. "මයා බොහොම දක්ෂ කෙල්ලක්. එයා පොරොන්දු වෙනවනං ඔබව පරෙස්සමින් ලයිසා ආර්යාව ගාවට එක්කරන් යනවා කියලා මම එයාව විශ්වාස කරනවා. එයා මෙච්චර කාලෙකට මාව අසමත් කරලා නෑ."

"එහෙමනම්, මම මාව ඔබේ අත් දෙකට බාර කරනවා මයා ස්ටෝන්." කැට්ලින් කීවාය. "නෙස්ටර් උතුමානනි, මගේ හිරකාරයව පරෙස්සමින් බලාගන්න එක මම ඔබට බාරකරනවා."

"ඒ වගේම මම ඔබට බාර කරනවා ඒ හිරකාරයා බඩගින්නෙන් මැරෙන්ට කලින් වයින් ටිකකුයි පුච්චපු කුකුළෙකුයි ගෙනත් දෙන්ටයි කියලා." ටිරියන් කීය. "කෙල්ලෙකුත් හිටියානම් තවත් හොඳයි. ඒත් මට තේරෙනවා ඒ වගේ දෙයක් ඔබෙන් ඉල්ලන එක ඕනවට වඩා වැඩියි කියලා." බ්‍රොන් මෙයට හඬනගා සිනාසුනි.

නෙස්ටර් උතුමානන් මේ සමච්චලය නොතකා හැරියේය. "ඔබ කැමැති විදියකට මගේ ආර්යාවනි. ඒක ඒ විදියටම සිද්ද වෙයි." ඔහු කුරුමිට්ටා දෙස බැල්මක් හෙලුවේ ය. "අපේ ලැනිස්ටර් උතුමානන්ව බලකොටුවෙ හිරකුටියකට දාන්ට. එයාට කෑම බීම ගෙනිහින් දෙන්ට."

ටිරියන් ලැනිස්ටර්ව සෙබළුන් විසින් කැඳවාගෙන යද්දී කැට්ලින් සිය බාප්පාගෙන් හා අනිකුත් අයගෙන් සමුගත්තා ය. අවජාතක දැරිය පසුපසින් වැටුනු ඇය බලකොටුව හරහා ඇවිද ගොස් එහි පිටුපසට පිවිසියාය. ඉහළ අංගනයේ ඔවුන් වෙනුවෙන් සැදල ලූ කොටළුවන් දෙදෙනෙකු සූදානම් වී තිබින. මයා ඇයට එකකු පිට නැගීමට උදවු කරන අතරේදී අහස් නිල් පැහැ සළුවක් පැළැඳ සිටි සෙබළෙක් පටු පසුපස ගේට්ටුව විවර කලේය. එයින් එපිට පයින් හා ස්පෲස් ගසින් වැසුනු ඝන වනය ද, කළු පැහැ තාප්පයක් මෙන් අහස උසට නැගුනු කන්ද ද විය. එමෙන්ම ගලේ ගැඹුරට කපා තිබුනු, ඉහළට විහිදුනු පඩිපෙළ ද එහි විය. "සමහර උදවිය ඇස් වහගන්නවා. ඒක එයාලට ලේසියි." මයා කීවේ ගේට්ටුව තුළින් කොටළුවන් දෙදෙන ඝන වනය තුළට කැඳවාගෙන යන අතරතුරේදී ය. "එයාලා බයවුනොත් නැත්තං කලන්තෙ ගතියක් වගේ ආවොත් කොටළුවන්ව තදින් අල්ලගන්නවා. උං ඒකට කැමැති නෑ."

"මම ඉපදුනෙ ටලී කෙනෙක් විදියට. මම කසාද බැන්නෙ ස්ටාර්ක් කෙනෙක්." කැට්ලින් කීවාය. "මම එහෙම ලේසියෙන් බයවෙන්නෙ නෑ. ඔබ පන්දමක් පත්තු කරන්නෙ නැද්ද?" පඩිපෙළ රාත්‍රි අන්ධකාරය තරම්ම කළු පැහැ විය.

දැරිය මුහුණ ඇද කර ගත්තාය. "පන්දම් එළියෙන් ඔබ අන්ධ වෙනවා. මේ වගේ පැහැදිලි රෑක හඳ එළියයි තරු එළියයි හොඳටම ඇති. මයිකල් කියන්නෙ මට බස්සෙකුගෙ වගේ ඇස් දෙකක් තියෙනවා ලු." සිය කොටළුවා පිට නැගුනු ඇය ඉදිරියට යන්නැයි ඌට සන් කලාය. කැට්ලින් ගේ කොටළුවා පුරුද්ද අනුව ඌ පසුපසින් වැටින.

"ඔබ මීට කලිනුත් මයිකල් ගැන කිවුවා." කොටළුවන් දෙදෙනා උන්ට උවමනා පරිදි සෙමින් එහෙත් ඒකාකාර ගමනක යෙදෙන්නට වූහ. ඇය ඒ ගැන බෙහෙවින් සෑහීමකට පත් වූවාය.

"මයිකල් කියන්නෙ මගෙ ආදරවන්තයා." මයා පැහැදිලි කලාය. "මයිකල් රෙඩ්ෆෝර්ට්. එයා සෙර් ලින් කෝබ්‍රේගෙ සහචරයෙක්. එයා නයිට් වරයෙක් වුන ගමන් අපි කසාද බඳින්ටයි ඉන්නෙ. ඊළඟ අවුරුද්දෙ නැත්තං ඊට පස්සෙ අවුරුද්දෙ."

ඇය බොහෝ සෙයින්ම සන්සාට සමාන වූවාය. අහිංසක, සැමවිටම සතුටින් සිටින, සුන්දර සිහින දකින්නියක්. කැට්ලින් ගේ මුවට සිනාවක් නැගුනු නමුදු එහි සන්තාපයක් ගැබ්වී තිබින. රෙඩ්ෆෝර්ට්වරුන් යනු මුල් මිනිසුන් ගේ රුධිරය තම නහරවල දුවන, මිටියාවතේ සිටින ඉපැරණිම වංශවත් පවුලක් බව ඇය දැන සිටියා ය. ඇය ඔහු ගේ ආදරවන්තිය බව සැබෑවක් විය හැකි නමුදු කිසිදු රෙඩ්ෆෝර්ට්වරයකු කෙදිනකවත් අවජාතකයෙකු හා විවාහ නොවනු ඇත. ඔහු ගේ පවුලේ උදවිය වඩාත් සුදුසු සහකාරියක් ඔහුට සොයා දෙනු ඇත. කෝබ්‍රේ කෙනකු හෝ වේන්වුඩ් කෙනකු හෝ රොයිස් කෙනකු. නැතිනම් මිටියාවතෙන් පිටත වෙනත් වංශවත් පවුලක දියණියක්. මයිකල් රෙඩ්ෆෝර්ට් මේ කෙල්ලත් සමග යහනට නැග්ගොත් එය නිසැකයෙන්ම විවාහයෙන් බාහිර දෙයක් වනු ඇත.

කැට්ලින් බියෙන් බලාපොරොත්තු වූවාට වඩා නැග්ම පහසු විය. දෙපසින්ම ළඟ ළඟින් වැවුනු ගස් පාරට ඉහළින් එක්ව කොළ පැහැ වියනක් සෑදූයේ සඳ එළිය මුලුමනින්ම මකා දැමුවේය. එය හරියටම දිගු අඳුරු කළු පැහැ උමගක් තුළින් යන්නාක් හා සමාන විය.

එනමුදු කොටළුවන් සිය මාර්ගය දැන සිටි විඩා නොදැනෙන සතුන් වූ අතර මයා ස්ටෝන්ට ඇත්තෙන්ම බස්සෙකු ගේ දැස් පිහිටා තිබින. ඔවුහු කන්දේ එහාටත් මෙහාටත් පඩිපෙළ වංගු ගැසෙන අයුරින් වටයට ගියේ කෙමෙන් කෙමෙන් ඉහළට නැගුනහ. ගස්වලින් වැටුනු ඉඳිකටු වැනි සිහින් පත්‍ර බිමට පාවඩ එලා තිබුනු නිසා කොටළුවන් ගේ කුර ගල්පරයේ වැදී නැංවෙන හඬ පවා කණට නැසෙන කරම් විය. මේ නිහඬතාව ඇයව සන්සිඳුවන්නට සමත් වූ අතර සෙමින් කෙරෙනු ලබන ගමන නිසා ඇය සෑදලය මතම සෙමින් දෙපසට පැද්දෙන්නට විය. වැඩි වේලා යන්නට පෙර ඇයට නිදිමත පලවා හැරීම සඳහා සටන් වදින්නට සිදුව තිබින.

සමහරවිට ඇය මොහොතක් නිදිකිරා වැටුනා වන්නට ඇත. මක්නිසාද යත් හදිසියේම මෙන් යකඩින් නිමකල දැවැන්ත ගේට්ටුවත් ඔවුන් ඉදිරියේ ප්‍රාදුර්භූත වූ බැවිනි. "ගල් බලකොටුව." සතුටින් නිවේදනය කල මයා කොටළුවා පිටින් බැස්සාය. ගලින් නිමකල පවුරු මුදුනත දිගටම යවුල් වලින් සෙවුනු අතර තර කවාකාර කුළුණු දෙකකින් එයට ආරක්ෂාව සැලසින. මයා ගේ පැමිණීමේ නිවේදනය ඇසුනු ගේට්ටුව ඔවුන් වෙනුවෙන් විවර විය. ඇතුළතට පිවිසි පසු බලකොටුවට අණදෙන තරබාරු නයිට්වරයා විසින් ඔවුන්ට ආචාර කර ආහාර පිඟන් දෙකක් පිරිනැමීය. පිඟන්වල මේ දැන් උඳුනෙන් පිටතට ගන්නා ලද උණු උණු පිළිස්සූ මස් හා ලූණු පුරවා තිබින. තමාට කෙතරම් කුසගිනිදැයි කැට්ලින්ට මේ වනතෙක් කිසිදු හැඟීමක් නොතිබින. ඉස්තාල කොලුවන් ඔවුන් ගේ කොටළුවන් මාරු කර අලුත් එවුන් සූදාණම් කරද්දී කැට්ලින් බලකොටු අංගනයේ සිටගෙනම සිය පිඟාන හිස් කර දැමුවාය.

Lysa Arryn: “Even if they could bring an army through the mountains and past the Bloody Gate, the Eyrie is impregnable.”

ඊළඟ මොහොතේ අලුත් කොටළුවන් පිට නැගුනු ඔවුහු නැවතත් තරුඑළියෙන් පිරුණු රාත්‍රියට මුසු වූහ. මේ දෙවන නැග්ම පළමු එකට වඩා අනතුරුදායක බැව් කැට්ලින්ට හැඟෙන්නට විය. මාවත වඩාත් පටු වූ අතර ගල්පඩි අනවරත පයට පෑගීම් නිසා ගෙවී ගොස් තිබින. ඒ අතරම තැනින් තැන කැඩී ගිය ගල් කැබැලි හා බොරළු ද දකින්නට හැකි විය. කිහිපවරක්ම සිය කොටළුවා පිටින් බිමට බට මයා, පාරට වැටී තිබුනු මෙවැනි ගල් ඉවත් කර දැමීය. "මේ වගේ තැනකදි කොටළුවෙක්ගෙ කකුලක් කඩාගන්ට අපට ඕන

නෑ." ඇය කීවාය. කැට්ලින්ට ඊට එකඟ නොවී සිටිය නොහැකි විය. ඇයට මේ වන විට මඳින් මඳ උන්නතාංශය දැනෙන්නට පටන් ගෙන තිබින. මෙහි වෘක්ෂ සනත්වය අඩු වූ අතර සුළඟද වඩා ප්‍රචණ්ඩ විය. හමන සුළඟ විසින් ඇගේ ඇඳුම් බඳා ඇයව වීසිකරන්නට මෙන් තැත් කල අතර කෙහෙරැළි විසිරුවා ඇගේ දර්ශනයට බාධා එල්ලකලේය. විටින් විට ඔවුන්ට පහතින් ඇති ගල් බලකොටුව ද, ඊටත් වඩා පහතින් පිහිටි චන්ද්‍ර ද්වාරය ද ඇයට දැකගත හැකි විය. එහි පන්දම් ආලෝකය ඉටිපන්දම් දැල්ලකටත් වඩා දීප්තියෙන් අඩුවිය.

හිම බලකොටුව, ගල් බලකොටුවට වඩා කුඩා වූ අතර එක් මුරකුළුණක්, දැවමුවා බලකොටුවක් හා මිටි ගල් තාප්පයක මුවාවේ සැඟව ගත් ඉස්තාලයකින් සමන්විත විය. එනමුදු එහි පිහිටීම අනුව එය ගල් බලකොටුවේ සිට ඉහළ නගින පඩිපෙළ සම්පූර්ණයෙන්ම පාහේ ආවරණය කල හැක්කක් විය. ඉයරී අත්පත් කරගැනීමට පැමිණෙන සතුරෙකු ගල් බලකොටුවේ සිට පඩියක් පඩියක් පාසා සටන් කරමින් ඉහළ නැගිය යුතු වූ අතර හිම බලකොටුවේ සිටින සෙබළුන්ට පහසුවෙන්ම ඔවුන්ට ගල් ප්‍රහාර හා ඊ ප්‍රහාර එල්ල කල හැකි විය. එහි අණදෙන නිළධාරියා වූ තරුණ නයිට්වරයා ඔවුන්ට පාන් හා චීස් පිරිනැමූ අතර ගිනිමැලය අසලට විත් මඳක් ගත උණුසුම් කරගන්නැයි පැවසීය. එනමුදු මයා ආරාධනය ප්‍රතික්ෂේප කලාය. "අපි දිගටම යන්ට ඕන මගේ ආර්යාවනි." කැට්ලින් හිස වැනීය.

නැවත වරක් ඔවුන් ගේ කොටළුවන් මාරු කෙරින. ඇයට මෙවර ලැබී තිබුනු සතා සුදු පැහැති එකකු වූ අතර ඌ දුටු මයා සිනහවක් පෑවාය. "වයිටි හරිම හොඳ සතෙක් මගේ ආර්යාවනි. කවදාවත් කකුල වැරදිලා, ලිස්සලා නෑ. අයිස්වල වුනත්. ඒ වුනත් ඔබතුමී චුට්ටක් පරෙස්සම් වෙන්ට. ඌ ඔබට කැමැති නැති වුනොත් පයින් ගහයි."

දෙවියන්ට පින්සිඳුවන්නට වයිටී ඇයට අකැමැත්තක් නොපෙන්වූ අතර පයින් ගැසීමක් ද සිදු නොවීය. මාවතේ මිදුනු අයිස් ද නොවූ අතර ඇය ඒ වෙනුවෙන් දෙවියන්ට බෙහෙවින් කෘතඥ වූවාය. "මගේ අම්මා කියනවා මීට අවුරුදු සියගානකට ඉස්සෙල්ලා මෙතන ඉඳන්ම හිම පටන්ගත්තලු." මයා කීවාය. "මෙතනින් උඩ හැමදාම සුදු පාටින්ලු තිබ්බෙ. කවදාවත් අයිස් දියවෙලා ගියේ නැහැල්ලු." ඇය දෙවුර ඇකිළීය. "මට නම් මතක නෑ කවදාවත් කන්දෙ මෙච්චර පහතින් හිම තියෙනවා. කවුද දන්නෙ? සමහරවිට ආදි කාලෙ එහෙම වෙන්ට ඇති තියෙන්ට ඇත්තෙ."

'කොච්චර තරුණ දරුවෙක්ද.' කැට්ලින් සිතුයේ ඇය කෙදිනකවත් මෙලෙස සැහැල්ලුවෙන් සිටියාදැයි මතකයට නගාගන්නට යත්න දරමිනි. දැරිය සිය දිවියෙන් අඩක්ම ගිම්හානයේ ගෙවා දමා තිබූ අතර ඇය දැන සිටි සියල්ල එය පමණක්ම විය. 'සීත කාලය එනවා දරුවෝ!' ඇයට දැරිය අමතා පවසන්නට අවශ්‍ය විය. එවදන් මුව අගටම ආ අතර මුවින් නොගිලිහුනා පමණි. සමහරවිට අන්තිමේදී ඇය ස්ටාර්ක් කෙනෙකු බවට පත්වෙමින් සිටිනවා වන්නට ඇත. හිම බලකොටුවෙන් ඉහළදී සුළඟ යනු සජීවී සත්ත්වයකු බඳු විය. එය වරෙක වෘකයකු මෙන් උඩුබුරලමින් ප්‍රචණ්ඩ අයුරින් ඔවුන් වටා හැමූ අතර ඊළඟ මොහොතේ සැනෙන් නැතිව ගියේ ඔවුන්ව මුලා කර තමන් තුළට කැඳවන්නට මෙනි. තාරකා කෙතරම් දීප්තිමත්ව, කෙතරම් ආසන්නයෙන් පිහිටියාදැයි යත් අත දිගුකොට ඇල්ලිය හැකි තරම් විය. එමෙන්ම අඩසඳ ද අඳුරු කළු පැහැ අහසේ විසල්ව පායා තිබිනි. උඩට නගිද්දී පහත බැලීමට වඩා දිගටම ඉහළ බලාගෙන සිටීම වඩා මැනවැයි කැට්ලින්ට අවබෝධ විය. සියවස් ගණනක් තිස්සේ හිම මිදීම හා දියවීමත්, අනන්ත වාරයක් කොටළු කුර හා ගැටීමත් නිසා මෙහි ගල් පඩිපෙළ තැනින් තැන කැඩී බිඳී ගොස් තිබිනි. අන්ධකාරය මධ්‍යයේ කිසිවක් දැකිය නොහැකි වුවද මේ නැඟුනු උස නිසා ඇගේ හදවත මුවින් පිටතට පනින තරම් විය. ඔවුන් ගල්කුළු පේළි දෙකක් අතර පිහිටි විවෘත බිම්කඩකට පැමිණි විට මයා සිය කොටළුවා පිටින් බැස්සා ය. "මේ ටිකේ බිමට බැහැලා කොටළුවා අල්ලගෙන යන එක හොඳයි මගේ ආර්යාවනි. මෙතන හුළං පාර පොඩ්ඩක් සැර වැඩියි."

කැට්ලින් ගල්කුලින් මඳක් මෑත්වී ඉදිරියෙන් ඇති මාවත දෙස බැලුවා ය. එය අඩි විස්සක පමණ දුරක් වූ අතර අඩි තුනක පමණ පළලින් යුතු විය. එනමුදු දෙපසටම දැඩි බෑවුමක් තිබුනු එහි අන් කිසිදු ආවරණයක් නොවීය. සුළඟ වියරුවෙන් මෙන් මොරගසන හඬ ඇයට ඇසින. මයා සැහැල්ලුවෙන් ඉදිරියට පිය නැගූ අතර ඇගේ කොටළුවා ඇ පසුපසින් ගියේ හරියටම ඔවුන් බලකොටු අංගනයක් තුළ ගමන් කරන්නාක් වැනි සුරක්ෂිත හැඟීමෙනි. ඇගේ වාරය පැමිණියේ ය. එනමුදු ඇය පළමු පියවර තැබූ වහාම බිය විසින් සිය යෝධ හණුවලින් ඇයව ඩැහැගත්තා ය. තමා වටා පොදිකන අන්ධකාර වායු දහරාත්. තමා වටා ඇති දැවැන්ත හිස් අවකාශයත් ඇයට හැඟෙන්නට විය. ඇය අඩියක්වත් ඉදිරියට එසවීමට අසමත්ව, බියෙන් වෙවුලමින්, සිටිපිය නැවතුනාය. ඇගේ මුහුණට සමීප වී මොරගැසූ සුළඟ පැළැඳ සිටි සළුව බදාගත්තේ ඇයව ප්‍රපාතයෙන් පහළට පෙරලීමට තැත් කලාය. කැට්ලින් ඉතා සෙමින් සිය පාදය පසුපසට ගත්තද ඇයට වහාම පිටුපසින් සිටි කොටළුවා නිසා පසුබැසීම කල නොහැක්කක් විය. 'මම මෙතැන මැරෙන්ටයි යන්නෙ,' ඇය සිතුවා ය. පිට දිගේ සීතල දහදිය බිඳු රූටාගෙන යන අයුරු ඇයට දැනින.

"ස්ටාර්ක් ආර්යාවනි!" මයා අගාධයේ එහා කොණේ සිට කෑගැසුවා ය. ඇගේ හඬ කෙතරම් සිහින් වී ද යත් එය ලීග දහස් ගණනක් ඈත සිට ඇසෙන්නාක් මෙන් විය. "ඔබතුමී හොඳින්ද?"

කැට්ලින් ටලී ස්ටාර්ක් ඇය තුළ ඉතිරිව පැවැති ආත්මාඩම්බරයේ අන්තිම ශේෂයත් ගිලගත්තා ය. "මට... මට මේ වැඩේ කරන්ට බෑ දරුවො." ඇය පෙරලා කෑගැසුවා ය.

"ඔබට පුළුවන්. මම දන්නවා ඔබට පුළුවන්. බලන්ට ඒක කොච්චර පළල්ද කියලා."

"මට බලන්ට ඕන නෑ." තමා වටා මුලු ලොවම භ්‍රමණය වෙන්නාක් මෙන් ඇයට දැනින. කඳු, අහස, කොටළුවන් මේ සියල්ලම තුඩා දරුවකු ගේ බමරයක් මෙන් කරකැවෙමින් තිබින. සිය දෑස් තදින් පියාගත් කැට්ලින් හුස්ම තිර කරගැනීම සඳහා යත්න දැරුවාය.

"මම ආයෙමත් එන්නම්. ඔබතුමී හෙලවෙන්නෙවත් නැතුව ඔහොමම ඉන්ට මගේ ආර්යාවනි."

සෙලවීම යනු කැට්ලින් මේ මොහොතේ කරන්නට නොසිතූම දේ විය. ඊළඟ මොහොතේ එතැනට පැමිණි මයා ඇගේ අතකින් අල්ලාගත්තා ය. "ඔබතුමී කැමැතිනම් දිගටම ඇස් වහගෙන ඉන්ට. ඔය ලණුව අත අරින්ට. වයිට් එයා ගැන වග බලාගනීවි. අන්න හොඳයි මගේ ආර්යාවනි. මම ඔබතුමීට පාර පෙන්නන්නම්. ඒක හරි ලේසියි. ඔන්න බලන්ටකො. දැන් අඩියක් ඉස්සරහට තියන්ට. අන්න හරි. කකුල වැඩිය උස්සන්ට ඕන නෑ. නිකංම ඉස්සරහට දික් කරන්ට. දැන් අනිත් එක. හිමීට. ආයෙමත් එකක්. අන්න හරි." මෙලෙස අඩියෙන් අඩිය, පියවරෙන් පියවර මේ අවජාතක දැරිය දෑස් පියාගෙන බියෙන් වෙවුලමින් සිටි කැට්ලින්ව අගාධයේ අනිත් පසට රැගෙන ගියාය. කොටළුවා සුපුරුදු මන්ද ස්වරයෙන් ඔවුන් පසුපසින් ගැටුවේ ය.

අහස් බලකොටුව වනාහි කන්දේ පසෙකින් සාදන ලද, අඩසඳාකාර, ගලින් නිමවුනු, උස් ප්‍රාකාරයකට වැඩි යමක් නොවීය. එනමුදු වැලීරියාවේ ශෛලමය ප්‍රාකාරවත් මෙතරම් සුන්දරව කැට්ලින්ට පෙනෙනු නැති බව නිසැක විය. අන්තිමේදී මෙතැන් සිට හිමවැටිය

ආරම්භ විය. අහස් බලකොටුවේ ගල්බිත්ති මත අයිස් බැඳී තිබුනු අතර ඉහළින් පිහිටි බැවුම් වලින් දිගු, කේතුරූපාකාර අයිස් හෙල්ලයන් පහතට එල්ලෙමින් තිබින.

මයා බලකොටුවේ මුරභටයින්ට කෑගසද්දී නැගෙනහිර දෙසින් අරුණාළෝකය වැටෙන්නට පටන්ගෙන තිබින. ඔවුන්ට ඉදිරියෙන් බලකොටුවේ ගේට්ටු විවර විය. ප්‍රාකාරවලට ඇතුළතින් අසුරා තිබුනු හැඩපෝරු රැසක් සහ එහා මෙහා ගොඩ ගසා තිබුනු ලොකු කුඩා ගල්කුට්ටි රැසක් හැරෙන්නට අන් කිසිවක් නොවීය. මෙතැන සිටින සෙබළුන්ට ගිරිහිම නිපාතයක් ඇති කිරීම කජු කන්නාක් වැනි පහසු කටයුත්තක් විය. ඔවුන්ට ඉදිරියෙන් වූ පර්වත මුහුණතේ විවරයක් දක්නට ලැබින. "ඉස්තාලයි බැරැක්කයි ඒක ඇතුළෙ තමා තියෙන්නෙ." මයා කීවාය. "අන්තිම ටික යන්ට තියෙන්නෙ කන්ද ඇතුළෙන්. ඒක ඇතුළෙ චුට්ටක් අඳුරු ගතියයි. ඒ වුනත් අඩුමගානෙ ඔබතුමී හුළං මුවාවෙනෙ ඉන්නෙ. මේ තමා කොටළුවන්ට යන්ට පුළුවන් අන්තිම දුර. මෙතනින් පස්සෙ ඒක නිකං දුම් කවුළුවක් වගේ. පඩිපෙළක් නෙවෙයි, හරියට ගල් ඉණිමගක් වගේ. ඒ වුනාට ඒක එච්චරම නරක දෙයක් නෙවෙයි. ඕන්නං තව පැයක් යයි. ඊටපස්සෙ අපි එතන."

කැට්ලින් ඉහළ බැලුවාය. ඔවුන්ට වහාම ඉහළින්, අරුණෝදයේ මද ආළෝකයෙන් ඇයට ඉයරීහි අත්තිවාරම් නිරීක්ෂණය කල හැකි විය. එය ඔවුන්ට වඩා අඩි හයසියයක් පමණ උසකින් පිහිටා තිබුනු අතර පහළ සිට බලන විට කුඩා, සුදු පැහැ මීවදයක් මෙන් දිස්විය. කූඩා හා දඹර ගැන සිය බාප්පා පැවසූ දේ ඇයට සිහිපත් විය. "ලැනිස්ටර්ලාට උන්ගෙ ආඩම්බරේ තියෙනවා වෙන්ට පුළුවන්." ඇය මයාට කීවාය. "ඒ වුනාට ටලීලා ඉපදිලා තියෙන්නෙ ඊට වඩා සිහි කල්පනාව ඇතුවයි. මම ඊයෙ දවසමයි, මුලු රැමයි අස්සයො පිටෙයි, කොටළුවො පිටෙයි ගමන් කලා. එයාලට කියන්ට කූඩයක් පහළට එවන්ටයි කියලා. මම ටර්නිපුත් එක්ක උඩට යන්නම්."

අන්තිමේදී කැට්ලින් ස්ටාර්ක් ඉයරීවලට පා තබද්දී හිරු කඳු මුදුන්වලින් සෑහෙන දුරක් ඉහළට නැගී තිබින. අහස් නිල් පැහැ සළුවකින් සහ අඩසඳ හා උකුස්සා පපුවේ කොටා තිබුනු සන්නාහයකින් සැරසුනු, තරබාරු, රිදී පැහැ හිසකෙසින් යුතු මිනිසෙක් ඇයට කූඩයෙන් බිමට බැසීමට උදවු කලේය. ඒ සෙර් වාර්ඩිස් ඊගන් හෙවත් ජොන් ඇරින් ගේ මාලිගාරක්ෂක බලමුලුවේ ප්‍රධානියා විය. ඔහු පසෙකින් කෙට්ටු, නොසන්සුන් පෙනුමක් ඇති, තට්ට හිසකින් හා මහත ගෙලකින් යුතු මේස්ටර් කෝල්මන් සිටගෙන සිටියේ ය. "ආයුබෝවන් ස්ටාර්ක් ආර්යාවනි!" සෙර් වාර්ඩිස් කීය. "ඔබතුමීගෙ පැමිණීම බලාපොරොත්තු නොවුන එකක් වුනාට අපට හරිම සන්තෝසයි." මේස්ටර් කෝල්මන්

එකඟතාව පලකරන අන්දමින් හිස නැමීය. "ඇත්තෙන්ම මගේ ආර්යාවනි, ඇත්තෙන්ම. මම ඔබේ සහෝදරීට පණිවුඩය යැවුවා.එයා අණකරලා තිබුනෙ ඔබ ආපු ගමන්ම එයාව නැගිට්ටවන්ටයි කියලා."

"මම හිතනවා එයාට ඊයෙ රෑ හොඳට නින්ද යන්ට ඇතියි කියලා." කැට්ලින් ඇනුම්පදයක ස්වරයෙන් කී මුත් ඔවුන්ට එය වැටහුනු බවක් නොපෙනින.

මිනිසුන් දෙදෙන දබර කාමරයේ සිට සර්පිලාකාර පඩිපෙළක් ඔස්සේ ඇයව ඉහළට කැඳවාගෙන ගියහ. එදවස පැවැති අනෙකුත් වංශවත් මාලිගා හා සසඳන විට ඉයරී යනු ප්‍රමාණයෙන් කුඩා මාලිගා බලකොටුවක් විය. මේ දැවැන්ත කඳුවැටිය මුදුනේ කෙට්ටු මාලිගා කුළුණු සතක් හියවුරක හී මෙන් එකිනෙකට ලංලංව පිහිටා තිබින. එයට ඉස්තාලවලින් හෝ කම්මල්වලින් හෝ බලු කූඩුවලින් හෝ පලක් නොවීය. එනමුදු නෙඩ් ඇයට පවසා තිබුනු අන්දමට එහි ධාන්‍යාගාරය වින්ටර්ෆෙල්වල එක තරමටම විශාල විය. එමෙන්ම මේ කුළුණු තුළ මිනිසුන් පන්සීය දෙනකුට විසිය හැකි විය. එනමුදු දැන් එහි ශාලාවන් පසුකරමින් ගමන්ගනිද්දී කැට්ලින්ට හැඟී ගියේ එය අසාමාන්‍ය අන්දමින් හිස් හා නිහඬ බවයි.

ලයිසා තවමත් නිදන ඇඳුමින් සැරසී, සිය කාමරය තුළ බලා උන්නා ය. ඇගේ දිගු රතු-දුඹුරු කෙහෙරැළි ඇයට පිටුපසින් කඩා හැලෙමින් තිබුනු අතර සේවිකාවක් එහි අවුල් කඩා පීරමින් සිටියාය. එනමුදු කැට්ලින් කාමරයට ඇතුළු වූ විට ඇය සිනාමුසු මුවින් යුතුව අසුනින් නැගිට්ටා ය. "කැට්!" ඇය කීවාය. "අනේ කැට්! ඔයාව දකින්ට ලැබුන එක කොච්චර දෙයක්ද මගේ ආදර අක්කේ." කාමරය හරහා දිවගිය ඇය සිය සොයුරිය බදාගත්තා ය. "කොච්චර කාලෙකට පස්සෙද. කොච්චර දිග කාලෙකට පස්සෙද."

එය වසර පහක් විය. ඇත්තෙන්ම බැලුවහොත් ලයිසා කෙරෙහි එය ක්‍රෑර වසර පහක කාලයක් විය. එය ඇයට දැඩිව බලපා තිබින. ඇගේ සොයුරිය වසර දෙකක් බාල වුවද දැන් ඇ වඩා වයස්ගත පෙනුමකින් යුක්ත වූවාය. ඇය කැට්ලින්ට වඩා මිටි වූ අතර සිරුර මහත් වී, මුහුණ සුදුමැලි වී පිම්බී තිබින. ඇයටද ටලීවරුන් ගේ නිල් පැහැ දෑස් පිහිටා තිබුනු නමුදු ඒවා වඩා ලා පැහැයක් ගත් අතර දියාරු විය. ඇගේ කුඩා මුඛය නොරිස්සුම් ගතියකට පෙරැලී තිබින. කැට්ලින් ඇයව මෙලෙස බදා සිටියදී, මීට වසර ගනනාවකට පෙර ඒ සොඳුරු දිනයේ, රිවර්රන්හි සප්තක දේවස්ථානයේ තමා පසෙකින් සිටගෙන සිටි හීන්දෑරී, උස් වූ ළැමකින් යුතු දැරිය ඇගේ මතකයට නැගෙන්නට විය. ඇය කෙතරම් ආදරණීයව,

කෙතරම් බලාපොරොත්තු සහගතව සිටියාද. ඇගේ සොයුරිය ගේ රුමත්කමින් ඉතුරුව තිබුනු එකම දෙය වූයේ ඉණ තෙක් කඩා හැලෙන රතු-දුඹුරු පැහැ කෙස් කළඹ පමණි.

"ඔයා හොඳින් ඉන්න බව පේනවා." කැට්ලින් බොරුවක් කීවාය. "ඒත්... වෙහෙස පාටයි."

ඇගේ සොයුරිය ග්‍රහණය ලිහිල් කලාය. "වෙහෙසයි. ඔවු! අපොයි ඔවු!" ඇය පළමු වරට අනිත් පිරිස නිරීක්ෂනය කලාය. ඇගේ සේවිකාව, මේස්ටර් කෝල්මන්, සෙර් වාර්ඩිස්. "පිටවෙන්ට." ඇය ඔවුන්ට කීවාය. "මගේ අක්කත් එක්ක තනියම කතා කරන්ට ඕන." ඔවුන් පිටව යන තෙක් ඇය කැට්ලින් ගේ අතින් අල්ලාගෙන සිටියා ය...

...නමුත් ඔවුන්ට පිටුපසින් දොර වැසුනු සැනින් ඒ අත අත්හැරියා ය. ඇගේ මුහුණ වෙනස් වෙනු කැට්ලින්ට පෙනින. එය හරියටම හිරු වළාකුළක් පසුපස සැඟවුනාක් මෙනි. "ඇත්තටම ඔයාගෙ මොළේ කොලොප්පං වෙලාද?" ලයිසා ඈ වෙත කඩා පැන්නා ය. "අරූව මෙහාට ගේන්ට. මගෙන් කිසිම අවසරයක් නැතුව. කිසිම දැනුම්දීමක් නැතුව. ලැනිස්ටර්ලාත් එක්ක ඔයාගෙ තියෙන රණ්ඩුවලට අපිවත් පටලවගන්ට..."

"මගේ රණ්ඩුවලට?" මේ ඇසෙන්නේ කුමක්දැයි කැට්ලින්ට සිතාගැනීමටවත් නොහැකි විය. උඳුනේ ගින්නක් බුර බුරා ඇවිලුනු නමුදු ලයිසා ගේ ස්වරයේ කිසිදු උණුසුම් බවක් නොතිබින. "ඒවා මුලින්ම ඔයාගෙ රණ්ඩු නංගී. ඔයයි මුලින්ම මට අර මලඉලවු ලියුම එවුවෙ. ඔයයි ලිවුවෙ ලැනිස්ටර්ලා ඔයාගෙ සැමියාව මරලා දැම්මා කියලා."

"ඒ ඔයාට අනතුරු අඟවන්ට. උංගෙන් ඈත් වෙලා ඉන්ටයි කියලා ඔයාට කියන්ට! උං එක්ක සටන් කරන්ට මම කවදාවත් හිතුවෙ නෑ. දෙයියනේ! කැට්, ඔයා දන්නවද ඔයා මොකක්ද මේ කලේ කියලා?"

"අම්මා!" කුඩා කටහඬක් පැවසීය. ලයිසා ආපසු හැරුනාය. රොබර්ට් ඒරින් හෙවත් ඉයරීහි උතුමානන් රෙදි බෝනික්කකු අතින් බදාගෙන, දොරකඩ සිට, විසල් කරගත් දෙනෙතින් යුතුව ඔවුන් දෙස බලා සිටියේය. ඔහු සිය වයසට ප්‍රමාණවත් තරම් නොවැඩුනු, ඉතාම

කෙට්ටු ලෙඩ දරුවකු විය. එපමණක් ද නොව ඔහු විටින් විට වෙවුලුවේ ය. 'වෙවුලන ලෙඩේ' මේස්ටර්වරුන් එය හැඳින්වූ නාමය විය. "මට කටහඬවල් ඇහුනා."

'ඒක මහ පුදුමයක් යැ' කැට්ලින් සිතුවාය. ලයිසා ඇයට කෑ නොගැසුවා පමණි. එනමුදු ලයිසා ඈ දෙසට පිහි පහරවල් වැනි බැල්මක් හෙලුවා ය. "පැටියෝ, මේ ඉන්නෙ ඔයාගෙ ලොකු අම්මා කැට්ලින්. මගේ අක්කා. ස්ටාර්ක් ආර්යාව. ඔයාට මතකයි නේද එයාව?"

කොලුවා ඇය දෙසට හිස් බැල්මක් හෙලුවේ ය. "මං හිතන්නෙ." ඔහු ඇසිපිය ගසමින් කීය. එනමුදු කැට්ලින් අවසන් වරට ඔහුව දකින විට මේ දරුවාට අවුරුද්දක් වත් වයස් නොවීය.

ලයිසා ගිනිඋඳුන අසල අසුනක වාඩි ගත්තා ය. "අම්මා ගාවට එන්ට මගෙ වස්තුවෙ." ඔහු ගේ නිදිඇඳුම හරිගැස්සූ ඇය ඒ දුඹුරු පැහැ කෙහෙරැළි ඇඟිලිවලින් පිරිමැද්දා ය. "එයා ලස්සනයි නේද? ඒ වගේම ශක්තිමත්. ඔයාට ඇහෙන්ට ලැබෙන දේවල් විශ්වාස කරන්ට එපා. ජොන් දැනගෙන හිටියා. 'බීජය බොහොම ශක්තිමත්' එයා මට කිවුවා. ඒ එයාගෙ අන්තිම වචන ටික. එයා දිගින් දිගටම රොබර්ට්ගෙ නම කිවුවා. එයාලට කියන්ට, බීජය බොහොම ශක්තිමත්. එයාගෙ බීජ. මගේ පැටියා කොච්චර ශක්තිමත් දරුවෙක් වගේ හැදෙනවද කියලා හැමෝටම කියන්ට එයාට ඕන වුනා."

"ලයිසා. ලැනිස්ටර්ලා ගැන ඔයා කියාපු දේ හරිනම්, ඒ නිසාමයි අපි වඩාත් ඉක්මනින් ක්‍රියාත්මක වෙන්ට ඕන. අපි-"

"මේ චුට්ටා ඉස්සරහ ඕවා කියන්ට එපා. එයාට බොහොම සියුම් මනසක් තියෙන්නෙ. එහෙම නේද පුංචි පැටියෝ?"

"මේ කොලුවා තමා ඉයරීවල උතුමානන්. නැගෙනහිර දිශාවෙ ආරක්ෂකයා." කැට්ලින් ඇයට මතක් කර දුන්නා ය. "මේක සුකුමාර ළඳබොළඳ වෙන්ට වෙලාවක් නෙවෙයි. නෙඩ් හිතන්නෙ යුද්ධයක් ඇතිවෙන්ටයි යන්නෙ කියලා."

"කට වහගන්නවා." ලයිසා කඩාපැන්නා ය. "ඔයා චූටියාව බය කරනවා." සිය උරහිසට උඩින් කැට්ලින් දෙස එක් කෙටි බැල්මක් හෙලූ පුංචි රොබර්ට් වෙවුලන්නට පටන්ගත්තේ ය. ඔහු ගේ අතේ සිටි බෝනික්කා බිම වැටුනු අතර ඔහු තවතවත් සිය මවට තුරුළු වූවේය. "ඔයා බයවෙන්ට එපා මගේ රත්තරන් පැටියෝ." ලයිසා මිමිනුවා ය. "අම්මා මෙතන ඉන්නවනෙ. කාටවත් බෑ ඔයාට රිද්දන්ට." සිය නිදිකබාය විවර කල ඇය බරැති පයෝධරයක් එළියට ගත්තා ය. මහත් උනන්දුවෙන් එය ඩැහැගත් දරුවා, මවගේ ළයමඩලේ සිය මුහුණ හංගාගෙන තණපුඩුව උරන්නට පටන් ගත්තේය. ලයිසා ඔහු ගේ කෙහෙරැළි පිරිමදින්නට විය. කැට්ලින්ට කතා කිරීමට වදන් සොයාගැනීම පවා උගහට විය. 'ජොන් ඒරින් ගේ පුතා' ඇය විමතියෙන් කල්පනා කලාය. තමාගේ බිළිඳු දරුවා, වසර තුනක් වයසැති පුංචි රිකන් ඇයට සිහිපත් විය. ඔහු මේ දරුවාගේ වයසට වඩා අඩක් ලාබාල වූ අතර මොහුට වඩා පස් ගුනයක් සාහසික විය. මිටියාවතේ වංශාධිපතීන් නොසන්සුන් වී සිටීම පුදුමයක් නොවේ. රජතුමා මේ දරුවා සිය මවගෙන් වෙන්කර ලැනිස්ටර්වරුන් භාරයේ හදා වඩා ගැනීමට යවන්නට යත්න දැරුවේ ඇයිද යැයි ඇයට පළමු වතාවට තේරුම් ගියේය.

"අපට මෙතන පරෙස්සම්." ලයිසා කීය. එනමුදු එය පැවසූයේ තමාට ද නැතිනම් දරුවාට ද යන්න කැට්ලින්ට සිතා ගත නොහැකි විය.

"මෝඩියෙක් වෙන්ට එපා." කැට්ලින් කීවාය. තමා තුළ කේන්තිය නැග එනු ඇයට දැනින. "කවුරුවත් පරෙස්සම් නෑ. ඔයා හිතනවා නම් මෙතන මෙහෙම හැංගිලා හිටියම ලැනිස්ටර්ලාට ඔයාව අමතක වෙලා යයි කියලා, ඔයාට ලොකු වැරැදීමක් වෙලා."

ඇය කියන දේ නෑසෙන පරිදි ලයිසා සිය අතින් දරුවා ගේ කණ වැසීය. "උං කඳුකරය හරහා හමුදාවක් අරන් ආවත්, රතු වාහල්කඩ පහුකරලා ආවත් උන්ට ඉයරි ජයගන්ට බෑ. ඔයාම දැක්කනෙ ඒක. කිසිම සතුරෙකුට මෙතනට ළඟාවෙන්ට බෑ."

ඇයට අතුල් පහරක් දෙන්නට කැට්ලින්ට උවමනා විය. බ්‍රින්ඩන් බාප්පා තමාට අනතුරු හඟවන්නට උත්සාහ කල බව ඇයට වැටහී ගියේය. "කිසිම බලකොටුවක් හැමදාමත් අනභිභවනීය නෑ."

"මේක අනභිභවනීයයි." ලයිසා තිර කොට කියා සිටියාය. "හැමෝම එහෙම කියනවා. මට තියෙන එකම ප්‍රශ්නෙ, ඔයා මේ අරන් ආපු පුංචි යකාට මොකක්ද කරන්නෙ කියලයි."

"එයා නරක මිනිහෙක්ද?" ඉයරීහි උතුමානන් ඇසීය.

"හරිම නරක මිනිහෙක්." ලයිසා කීවේ සිය ඇඳුම හරිගස්සා ගන්නා අතරේදී ය. "ඒ වුනත් අම්මා එයාට ඉඩ දෙන්නෙ නෑ මගෙ රත්තරන් පැටියාට හානියක් කරන්ට."

"එයාව පියාඹලා යවමු." රොබර්ට් දැඩි උනන්දුවෙන් කීය.

ලයිසා සිය පුතණුවන් ගේ හිස අතගෑවාය. "සමහරවිට අපි එහෙම කරයි." ඈය මිමිනුවා ය. "සමහරවිට, ඇත්තටම අපි ඒක තමා කරන්ට යන්නෙ."

Brynden Tully: “My home is at my back.”

Catelyn Stark: “Your home is in my heart.”

එඩාර්ඩ් 09

සුළැඟිල්ලා ඔහු එනතෙක් වෛශ්‍යා ගෘහයේ ප්‍රධාන ශාලාවේ පොරොත්තු වෙමින් පිහාටු ගවුමක් හැඳි, උසැති, රූමත්, කළු පැහැ සමින් යුතු ගැහැණියක හා මිත්‍රශීලී අයුරින් දොඩමින් සිටියේ ය. හේවර්ඩ් ගිනිඋඳුන අසල තරබාරු, ප්‍රසන්න කෙල්ලක හා අහිම්වීමේ ක්‍රීඩාව කරමින් සිටියේ ය. පෙනුනු අන්දමට නම් ඔහුට ඉණපටිය, සළුව, සන්නාහ කමිසය හා දකුණු කකුලේ බූට්ස් සපත්තුව අහිමි වී තිබුනු අතර දැරිය ඉණ දක්වාම නිරුවත්ව සිටියා ය. කවුළුවක් අසල සිටගෙන මේ ක්‍රීඩාව දෙස බලාසිටි ජොරී ගේ මුවේ වියළි සිනහවක් පහළ වී තිබින.

පඩිපෙළ පාමුල නැවතුනු නෙඩ් ඉණපටියෙන් සිය අත්වැසුම් යුගළ ඇදගත්තේ ය. "අපට යන්ට වෙලාව හරි. මගේ රාජකාරිය ඉවරයි."

සිය ඇඳුම් ආයිත්තම් සුරතට ගත් හේවර්ඩ් සැනින් නැගිට සිටියේ ය. "ඔබේ කැමැත්තක් මගේ උතුමානනි." ජොරී කීය. "මම විල්ට උදවු කරන්නම් අශ්වයො ටික අරන් එන්ට." ඔහු දොර දෙසට පිය මැන්නේ ය.

සුළැඟිල්ලා සිය සමුගැනීම් වෙනුවෙන් සෑහෙන වේලාවක් වැය කලේය. ඔහු කළු පැහැති ගැහැණිය ගේ අත සිඹ ඇගේ කණට කර යම් විහිළුවක් කල අතර ඇය කොක්හඬලා සිනාසුනා ය. "ඔබේ රාජකාරිය." නෙඩ් දෙසට අලස ලෙස ඇවිද එන අතරේ ඔහු කීය. "එහෙමත් නැත්තම් රොබර්ට්ගෙ රාජකාරියද? මිනිස්සු නම් කියන්නෙ හස්තය රජතුමාගෙ හීන දකිනවා කියලා, රජතුමාගෙ කටහඬින් කතා කරනවා කියලා, රජතුමාගෙ අසිපතින් රාජ්‍ය පාලනය කරනවා කියලා. ඒ කියන්නෙ ඔබ ගැනියෙක් එක්ක ඇඳට නැග්ගහමත් රජතුමාගෙ-"

"බෙලීෂ් උතුමානනි." නෙඩ් බාධා කලේය. "ඔබ බොහොම දුරදිග යනවා වැඩියි. ඔබේ උදවුවට මම කෘතඥ නොවී ඉන්නෙ නැහැ. ඔබ නැත්තං මේ ගනිකා මඩම හොයාගන්ට අපට තව අවුරුදු ගානක් යන්ට තිබුනා. ඒ වුනත් ඒකෙන් අදහස් වෙන්නෙ නෑ මම මෙහෙම ඔබේ සමච්චලයට ලක්වෙන්ට සූදානම් කියලා. අනිත් එක මම තවදුරටත් රජතුමාගෙ හස්තය නෙවෙයි."

"සෝරවෘකයා කියන්නෙ හරිම හිරිහැරදායක සතෙක් වෙන්ට ඕන." සුළැඟිල්ලා ඇද වී ගිය මුවින් යුතුව කීය.

ඔවුන් ඉස්තාල වෙත පියමනිද්දී උණුසුම් පොද වැස්සක් ඇද හැලෙන්නට වන. නෙඩ් සිය සළුව ඇද හිස වසා ගත්තේ ය. ජොරී ඔහු ගේ අසු රැගෙන පිටතට ආ අතර එකතකින් සුළැඟිල්ලා ගේ අසු හා අනිත් අතින් සිය ඉණපටිය හා කලිසම අල්ලාගත් තරුණ විල් ඔහු පසුපසින් පිටතට ආවේය. නිරුවත් දෙපයින් යුතු වෛශ්‍යාවක් ඉස්තාල දොරට හේත්තු වී ඔහු දෙස බලමින් කැකිරි පලන්නට වූවාය.

"අපි දැන් ආපහු බලකොටුවට යනවද මගේ උතුමානනි?" ජොරී ඇසීය. හිස සැලූ නෙඩ් සෑදලයට නැග්ගේ ය. ඔහුට පසෙකින් සුළැඟිල්ලා ද තම අසු පිට නැගුනු අතර අනෙකුන් ඔවුන් පසුපසින් වැටුනහ.

"ෂතායා හරිම කදිම තැනක් තමා කරගෙන යන්නෙ." සුළැඟිල්ලා කතාව ඇරඹීය. "මට සමහර වෙලාවට හිතෙනවා ඒක සල්ලි දීලා ගන්ටත්. ගනිකා මඩම් කියන්නෙ නැවුවලට වඩා බොහොම හොඳ ආයෝජනයක්. ගනිකාවො ලේසියෙන් මුහුදු පතුලට කිඳා බහින්නෙ නෑ. ඒ වගේම ඒවාට මුහුදු කොල්ලකාරයො ගොඩවුනාම උනුත් අනිත් අය වගේම හොඳට සල්ලි ගෙවනවා." සිය විහිළුවට ඔහුම සිනාසුනේ ය.

ඔහුට දොඩවන්නට ඉඩ දී නෙඩ් නිහඬවිය. මොහොතකට පසු සුළැඟිල්ලා සිය දෙඩවීම නැවැත්වූයෙන් ඔවුහු නිහඬවම අසුන් ඉදිරියට මෙහෙයවූහ. කින්ග්ස් ලැන්ඩින්ග්හි වීදි අඳුරු හා පාළු මුහුණුවරක් ගති. වර්ෂාව විසින් සෑම කෙනකුවම වහළයක් යටට යවා තිබින. වැහිබිඳු නොකඩවාම නෙඩ් ගේ හිසට තදින් පහර දුන් අතර ඒවා රුධිරය මෙන් උණුසුම් විය, පැරණි වරදකාරී සිතුවිලි මෙන් නපුරු විය.

"රොබර්ට් කවදාවත් එක ගෑනියෙකුගෙන් සෑහීමකට පත්වෙන්නෙ නෑ." ලියානා වරක් වින්ටර්ෆෙල්හිදී ඔහුට කියා තිබින. ඒ මීට වසර බොහෝ ගණනකට පෙරාතුව ඔවුන් ගේ පියා විසින් ස්ටෝර්ම්ස් එන්ඩ්හි තරුණ උතුමානන්ට ඇගේ විවාහය ස්ථිර කල දා රැයේ විය. "මම අහලා තියෙනවා එයාට මිටියාවතේ කාගෙදෝ කෙල්ලෙක් ගෙන් හම්බවෙච්ච දුවෙක් ඉන්නවා කියලා." නෙඩ් විසින් මේ බිළිඳා සිය සුරතින්ම වඩාගෙන තිබුනු අතර

ඇයගේ කතාව ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවක් ඔහුට නොවීය. එමෙන්ම සිය සොයුරියට බොරු කීමේ හැකියාවක් ද ඔහුට නොවීය. එනමුදු ඔහු ඇයව අස්වසමින් කියා සිටියේ ඔවුන් ගේ විවාහ ගිවිසුමට පෙර රොබර්ට් විසින් කල දේ එතරම් වැදගත් නොවන අතර ඔහු හොඳ මිනිසකු හා ඇයට මුලු හදින්ම ආදරය කරන බවත් ය. ලියානා මීට සිනාසුනා පමණි. "ආදරේ සුන්දරයි තමා මගේ ආදරණීය නෙඩ්. ඒ වුනත් ඒකට බෑ මිනිහෙකුගෙ ගති පැවතුම් වෙනස් කරන්ට."

දැරිය කෙතරම් ලාබාල වූවාද යත් නෙඩ් ඇගේ වයස විමසීමට පවා නොසිතුවේ ය. ඇය කන්‍යාවක් වූවාට සැක නැත. හොඳින් මුදල් විසිකල හැකි නම් ඉහළ මට්ටමේ වෛශ්‍යා ගෘහයකට කන්‍යාවක් සොයාගැනීම අසීරු කරුනක් නොවේ. ඇයට ලා රත් පැහැ හිසකෙස් තිබුනු අතර නාසය දිගට ලප වැටී තිබින. "එයාට මම නම දැම්මෙ බරා කියලා." දැරිය බිළිඳියට කිරිදෙමින් පැවසුවා ය. "එයාගෙ පෙනුම එතුමන් වගේමයි. එහෙම නේද මයෙ උතුමානනි? එයාට තියෙන්නෙ එතුමන්ගෙම නහය, එතුමන්ගෙම හිසකෙස්..."

"ඇත්තෙන්ම." එඩාර්ඩ් ස්ටාර්ක් බිළිඳිය ගේ සිනිඳු, අඳුරු පැහැ හිසකෙස් අතගෑවේ ය. ඒවා ඔහු ගේ අතැඟිලි අතරින් ලිස්සා ගියේ කළු පැහැ සේද මෙනි. රොබර්ට් ගේ පළමු අවජාතක දැරියට ද තිබුනේ මෙවැනි කළු පැහැ සිනිඳු හිසකෙස් බව ඔහුට සිහිපත් විය.

"එතුමන්ව මුනගැහුනම ඒ ගැන කියනවද මයෙ උතුමානනි. ඒක... ඒකට ඔබතුමාගෙ අසතුටක් නැත්තම්. එතුමන්ට කියන්ට එයා කොච්චර ලස්සනද කියලා."

"මම එයාට කියන්නම්." නෙඩ් ඇයට පොරොන්දු විය. නෙඩ් ගේ දුර්වලතාව එය විය. නොමියන ආදරය ගැන අනන්ත පොරොන්දු දී දිනය හමාරවීමටත් පෙර ඒවා අමතක කර දැමීමට රොබර්ට්ට අපූරු හැකියාවක් තිබින. එනමුදු නෙඩ් ස්ටාර්ක් සැමවිටම සිය පොරොන්දු රැක්කේ ය. ලියානා මියයමින් සිටියදී තමා ඇයට වුනු පොරොන්දු ගැනත්, ඒ පොරොන්දු ඉටුකිරීම වෙනුවෙන් තමාට ගෙවීමට සිදුවුන මිල හා කරන්නට සිදුවුනු කැපකිරීම් ගැනත් නෙඩ්ට සිහිපත් විය.

"ඒ එක්කම එතුමන්ට කියන්ට මම ඊටපස්සෙ වෙන කාත් එක්කවත් හිටියෙ නැහැයි කියලා. මම ඒ ගැන දිවුරනවා මයෙ උතුමානනි. අලුත් දෙවියන්ගෙයි පැරැණි දෙවියන්ගෙයි නාමෙන්. ෂතායා මට කිවුවා අවුරුදු බාගයක් නිවාඩු ගන්ට පුළුවන් කියලා

දරුවා වෙනුවෙන්. ඒ එක්කම එතුමන් ආයෙමත් එයි කියලා හිතලා. ඉතින් ඒ නිසා ඔබතුමා එතුමන්ට කියන්ට මම එතුමන් වෙනුවෙන් බලන් ඉන්නවා කියලා. ඔබතුමා ඒක කරනවා නේද? මට රත්තරන් මුතුමැණික් වෙන මොකුත් ඕන නෑ. මට ඕන එතුමන්ව විතරයි. එතුමන් මට හැමවෙලාවෙම කරුනාවන්ත වුනා, ඇත්තෙන්ම.

"මම එයාට කියන්නම් දරුවො. මම පොරොන්දු වෙනවා. බරාට අඩුපාඩුවක් වෙන්ට දෙන්ට හොඳ නෑ."

එය ඇසූ දැරිය සිනාසුනා ය. එය කෙතරම් සුන්දර, සැලෙන සිනාවක් ද වී ද යත් ඔහු ගේ හදවත පසාරු වී ගියේය. වැහිබර රැයේ අසු ඉදිරියට මෙහෙයවද්දී නෙඩ් ඉදිරියේ ජොන් ස්නොව් ගේ මුහුණ මැවී ගියේය. එය ඔහු ගේ තරුණ කල පෙනුම හා සමාන පෙනුමක් ගත්තේ ය. දෙවියන් විසින් අවජාතකයින්ට මෙතරම් නරක අන්දමින් සලකන්නේ නම් ඔවුන් මිනිසුන්ව මෙතරම් කාමුක ආශාවන්ගෙන් පුරවාලන්නේ මන්දැයි නෙඩ් විපිලිසර සිතින් සිතුවේය. "බේලිෂ් උතුමානනි, ඔබ මොනවද දන්නෙ රොබර්ට්ගෙ අවජාතකයො ගැන?"

"හරි, මුලින්ම බැලුවොත් එයාට ඉන්නවා ඔබට වඩා අවජාතකයො."

"කී දෙනෙක්ද?"

සුළැඟිල්ලා දෙවුර ඇකිළීය. ඔහු ගේ කබායේ පිට දිගේ කුඩා දිය පහරවල් ගලා බැස්සේය. "ඒක එච්චරම වැදගත් දෙයක්ද? ඔබ ගැනු ගොඩදෙනෙක් එක්ක ඇඳට නැග්ගොත් ඒ අතරින් සමහර උං ඔබට තෑගි දෙයි. අපේ රජතුමා ඒ අතින් කවදාවත් පස්සෙන් හිටියෙ නෑ නෙව. මම දන්නවා එයා පිළිගත්තා අර ස්ටෝර්ම්ස් එන්ඩ්වල ඉන්න කොලුවාව. ස්ටැනිස් උතුමානන්ගෙ විවාහ උත්සවේ දවසෙ රෑ එයා තාත්තා වුන දරුවා. එයාට එහෙම කරනවා ඇරෙන්ට වෙන විකල්පයක් තිබුනෙ නෑ. ඒ දරුවගෙ අම්මා ෆ්ලොරන්ට් කෙනෙක්, සෙලිසෙ ආර්යාවගෙ ලේලි කෙනෙක්. රෙන්ලි කියනවා භෝජන සංග්‍රහය අතරතුරේදි රොබර්ට් ඒ කෙල්ලව උස්සගෙන උඩුමහළට ගියයි කියලා. ස්ටැනිසුයි එයාගෙ අලුත් මනමාලියි පහළ මාලෙ නට නටා ඉන්දැද්දි රොබර්ට් එයාලගෙ මංගල යහන ඉඳුල් කලයි කියලා. ස්ටැනිස් උතුමානන් හිතුවා මේ සිද්දිය එයාගෙ බිරිඳගෙ පවුලේ ගෞරවයට කැළැලක් කියලා. ඉතින් ඒක නිසා මේ කොලුවා ඉපදුනාම එයාව නැවු නග්ගලා එවුවා

රෙන්ලි ගාවට." ඔහු නෙඩ් දෙස නෙත් කොණින් බැලීය. "මට තව පොඩි රහසක් අහන්ට ලැබුනා රොබර්ට් නිසා කාස්ටර්ලි රොක්වල වැඩකාර කෙල්ලෙකුට නිවුන්නු දෙන්නෙක් හම්බවුනා කියලා. අවුරුදු තුනකට කලින් එයා ටයිවින් උතුමානන්ගෙ තරගාවලියට ගිය වෙලාවෙ. සෙර්සි ඒ ළමයි දෙන්නව මරවලා දාලා අම්මව වික්කලු ඒ අහලින් පහලින් ගිය වහල් වෙළෙන්දෙකුට. ඒක ලැනිස්ටර් ආඩම්බරේට ලොකු හානියක් වුනාලු ගෙදරට එච්චර ළඟ දි එහෙම දෙයක් වුන එක."

නෙඩ් මුහුණ පුළුටු කරගත්තේ ය. රාජධානියේ විසූ ඕනෑම උසස් වංශාධිපතියෙක් ගැන මෙවන් කතා ගෙතී තිබින. සෙර්සි ලැනිස්ටර් මෙවැනි දෙයක් කරනු ඇතැයි යන්න ඔහු කිසිසේත්ම සැක කල කරුනක් නොවීය... එනමුදු රජතුමා මෙය දැක දැකත් එය සිද්දවීමට ඉඩ හැරියාද? ඔහු දැන සිටි රොබර්ට් එවැන්නක් කිසි දිනෙකත් නොකරනු ඇත. එනමුදු ඔහු දැන සිටි රොබර්ට් යනු තමන් දැකීමට අකැමැති දේ නොදකිනු පිනිස දෑස් වසා ගත්තෙකුද නොවීය. "ඇයි ජොන් ඒරින් එකපාරටම රජතුමාගෙ අවජාතකයො ගැන උනන්දුවක් පෙන්නන්ට පටන් ගත්තෙ?"

සුළැඟිල්ලා නැවත වරක් දෙවුර ඇකිළීය. "කවුද දන්නෙ? එයා රජතුමාගෙ හස්තය. සමහරවිට රජතුමා ඇහුවද දන්නෙ නෑ එයාට ගිහින් ඒ දරුවන්ට අවශ්‍ය දේවල් ලැබෙනවද කියලා බලන්ටයි කියලා?"

"ඒක ඊට වඩා වැඩි දෙයක් වෙන්ට ඕන. එහෙමනම් ඇයි එයාව මරලා දැම්මෙ?"

සිය හිසකෙස්වල රැඳී තිබුනු දිය ගසා දැමූ සුළැඟිල්ලා සිනාසුනේය ය. "මම දන්නවා. ඒරින් උතුමානන්ට දැනගන්ට ලැබුනා රජතුමා වේස ගෑනුයි මාළුකාර ගෑනුයි කීපදෙනෙක්ගෙ බඩවල් පුරවලා දාලයි කියලා. ඒ නිසා එයාව නිශ්ශබ්ද කරන්ට සිද්දවුනා. ඒක පුදුමයක් නෙවෙයිනෙ. ඒ වගේ රහසක් දැනගත්තට පස්සෙ මිනිහෙක්ව ඉතුරු කරන්ට බෑ නෙව. ඊළඟ පාර මිනිහා ඒක රට පුරාම පතුරවලා අරියි."

මෙයට දියයුතු පිළිතුරක් නෙඩ්ට සිතාගත නොහැකි විය. එමනිසා ඔහු රවා බැලුවේ ය. වසර ගනනාවකට පසු ඔහුට රේගාර් ටාර්ගේරියන්ව සිහිපත් වන්නට විය. රේගාර්ද නිතරම ගනිකා මඩම්වලට යන්නට ඇත්දැයි ඔහු විමතියෙන් කල්පනා කලේය. එනමුදු එවැන්නක් සිදු නොවන්නට ඇතැයි ඔහු ගේ යටි සිත ඔහුට කීවේය.

මේ වනවිට වර්ෂාව වැඩි වී තිබින. වැහිබිඳු ඉඳිකටු මෙන් දෑසට වැදුනු අතර හඬ නංවමින් බිම පතිත විය. පාර දිගේ කළු දිය දහරාවන් ගලායන අතරේ එකවරම ජොරී කෑගැසීය. "මගේ උතුමානනි!" ඔහු ගේ කටහඬේ අන්තරාය පිරී තිබින. එක මොහොතකදී පාර පුරා සොල්දාදුවන් පිරී ගියේය.

සම් ආවරණ උඩින් පැළැඳි මුදු දම්වැල් සන්නාහත්, යකඩ අත් ආවරණ හා කලවා ආවරණ සහ රන්වන් සිංහයින් මුදුනේ ඇති වානේ ශිරස්ක නෙඩ් නිරීක්ෂණය කලේය. වැසිදියෙන් පෙඟුනු ඔවුන් ගේ සළු පිටට ඇලී තිබින. ඔහුට හරිහැටි ගණනය කරගැනීමට තරම් කාලයක් නොලැබුනු නමුදු එහි සෙබළුන් දසදෙනකු පමණ සිටියහ. දිගු අසිපත් හා හෙලිවලින් සන්නද්ධ වූ පාබල සෙබළුන් පේළියක් පාර අවහිර කරමින් හුන්හ. "පිටිපස්සෙන්." විල් කෑගසනු ඔහුට ඇසින. අසු හැරවූ නෙඩ් ඔවුන් ගේ පසුබැස්ම වළකමින් පිටුපසින් සිටි තවත් සෙබළුන් පිරිසක් නිරීක්ෂණය කලේය. ජොරී ගේ අසිපත සැනෙන් කොපුවෙන් එළියට ඇදී ආයේය. "පාර ඉඩදියවු, නැත්තං මැරියවු!"

"වෘකයො උඩුබුරනවා." සෙබළ මුලුවේ නායකයා පැවසීය. "ඒ වුනාට ඒක බොහොම පුංචි වෘක රංචුවක්."

සුළැඟිල්ලා පරීක්ෂාකාරීව සිය අසු ඉදිරියට ධාවනය කලේය. "මොකක්ද මේ විකාරෙ තේරුම? මේ ඉන්නෙ රජතුමාගෙ හස්තය."

"රජතුමාගෙ හිටපු හස්තය." පාරෙහි වූ මඩ විසින් ලේ රතු පැහැ සෙන්ධවයා ගේ කුර හඬ යටපත් කර තිබින. ඔහු ඉදිරියෙන් වූ සෙබළ මුලුව දෙපසට වූහ. රන්වන් පැහැ සන්නාහ පපු තහඩුවක ලැනිස්ටර් සිංහයා ගොරවමින් නැගී සිටියේ ය. "දැන්, ඇත්තටම කියනවා නම්, මම දන්නෙ නෑ ඌ දැන් මොකෙක්ද කියලා."

"ලැනිස්ටර්, මේක මහ පිස්සුවක්." සුළැඟිල්ලා කීය. "අපට යන්ට දෙන්ට. අපි ආපහු බලකොටුවට යන්ට ඕන. ඔබ මේ මොනවා කරනවා කියලද හිතන්නෙ?"

"එයා දන්නවා එයා මොකක්ද මේ කරන්නෙ කියලා." නෙඩ් ශාන්ත ස්වරයෙන් පැවසීය.

ජේමි ලැනිස්ටර් සිනාසුනේ ය. "හරියටම හරි! මම මේ මගේ මල්ලිව හොයනවා. උඹට මතකයි මගේ මල්ලි. එහෙම නේද ස්ටාර්ක් උතුමානනි? එයා අපිත් එක්ක වින්ටර්ෆෙල්වල හිටියා. ලා පාට කොණ්ඩෙ, අසමාන ඇස්, මුබරි කටක්. පුංචි මනුස්සයෙක්."

"මට එයාව බොහොම හොඳට මතකයි." නෙඩ් පිළිතුරු දුන්නේ ය.

"ජේන විදියට නම් එයාට පාරෙදි පොඩි අකරතැබ්බයක් වෙලා. මගේ වංශාධිපති තාත්තගෙ හිත හොඳටම රිදිලා. උඹ නිකමටවත් දන්නවද දන්නෙ නෑ කාටද මගේ මල්ලිට අනතුරක් කරන්ට ඕන වෙලා තියෙන්නෙ කියලා, දන්නවද?"

"ඔබේ සහෝදරයාව අත්අඩංගුවට ගත්තෙ මගේ නියෝගය පිටයි. එයා කරපු අපරාධවලට වගඋත්තර බඳින්ට." නෙඩ් කීවේය.

සුළැඟිල්ලා බියෙන් කෑගැසීය. "මගේ උතුමනි-"

සිය දිගු අසිපත කොපුවෙන් මෑත් කරගත් සෙර් ජේමි අසු ඉදිරියට මෙහෙයවීය. "උඹේ ආයුධෙ ඇදගනිං එඩාර්ඩ් උතුමානනි. මට ඕනවුනොත් මම උඹව මරනවා ඒරිස්ව මැරුවා වගේ. ඒ වුනත් මම කැමැතියි උඹේ අතේ ආයුධයක් තියෙද්දි මරන්ට." ඔහු සුළැඟිල්ලා දෙස සාවඥ සිනාවක් පෑවේය. "බේලිෂ් උතුමානනි, මම ඔබනං හැකි ඉක්මනින් මෙතනින් පිටවෙලා යනවා මගේ වටිනා ඇඳුම් ආයිත්තම්වල ලේ ගෑවිලා නාස්තිවෙන්ට කලින්."

සුළැඟිල්ලාට තවත් දිරිමත් කිරීමක් අවශ්‍ය නොවීය. "මම නගරාරක්ෂකයො එක්කරන් එන්නම්." ඔහු නෙඩ්ට පොරොන්දු විය. ඔහුට යාම පිණිස දෙපසට වුනු ලැනිස්ටර් සෙබළ මුල ඔහුට පසුපසින් නැවත එකතුවුණ. සිය අසුට සන්කල සුළැඟිල්ලා විදුලි වේගයෙන් වංගුවෙන් හැරී නොපෙනී ගියේය.

නෙඩ් ගේ මිනිසුන් මේ වනවිට සිය අසිපත් ඇදගෙන සිටිමුත් එය විසිදෙනෙකුට එදිරිව තිදෙනෙකු විය. නුදුරෙන් වූ දොරවලින් හා කවුළුවලින් දෑස් යුගල් එබී බලන්නට වූ නමුදු

කිසිවකුත් මීට මැදිහත් වන්නට නොසිතූහ. ඔහු ගේ පිරිස අසු පිට නැගී හුන් අතර ජේමී හැරෙන්නට අන් ලැනිස්ටර් සෙබළුන් සතුව අසුන් නොවීය. වේගයෙන් අසුන් ඉදිරියට ධාවනය කලේ වී නම් ඔවුනට ගැලවී ගත හැකිවනු නොඅනුමාන ය. එනමුදු ඊට වඩා විශ්වාසදායක, ආරක්ෂාකාරී උපායයක් නෙඩ් ගේ සිතට ආයේය. "උඹ මාව මැරුවොත් කිසිම සැකයක් නෑ කැට්ලින් ටිරියන්ව මරලා දායි." ඔහු රජුන් මරන්නාට අනතුරු ඇඟවීය.

ජේමී ලැනිස්ටර් නෙඩ් ගේ පපුවට සිය අසිපත් තුඩ තැබීය. "එයා එහෙම දෙයක් කරයිද? රිවර්රන්වල උදාර කැට්ලින් ටලී තමන්ගෙ ප්‍රාණ ඇපකාරයෙක්ව මරලා දායිද? මම හිතන්නෙ නෑ." ඔහු සුසමක් හෙලීය. "ඒ වුනත්, ගැනියෙක්ගෙ ගෞරවය උඩ මගේ මල්ලිගෙ ජීවිතේ පරදුවට තියන්ට මට ඕන නෑ." ජේමී කනකමය අසිපත නැවතත් කොපුවේ ලෑවේය. "ඉතින්, මම හිතන්නෙ මම උඹට ඉඩදෙනවා රොබර්ට් ගාවට දුවලා ගිහිල්ලා මම කොහොමද උඹව බයගැන්නුවෙ කියලා කෙඳිරිගාන්ට. මම කල්පනා කරන්නෙ එයා ඒක ගනන් ගනීවිද කියලයි." සිය තෙත් හිසකෙස් ඇඟිලිවලින් පීරා හැරි ජේමී අසුට සන් කර නැවත හරවාගත්තේ ය. සෙබළ මුල පසුකල පසු ඔහු නැවත හැරී සෙබළ නායකයා ඇමතීය. "ට්‍රෙගාර්, ස්ටාර්ක් උතුමානන්ට කිසිම අනතුරක් නොකරන්ට වග බලාගනින්."

"එහෙමයි මයෙ උතුමානනි."

"ඒ වුනත්... එයාට කිසිම රිදවීමක් නොකර මෙතනින් පිටවෙලා යන්ට දෙන්ටත් බෑ. ඒ නිසා..." රාත්‍රී අන්ධකාරය හා වර්ෂාව මධ්‍යයේ වුව ජේමී ගේ සිනහව පැහැදිලිව දිස් විය. "උගෙ මිනිස්සු ටික මරපං."

"නෑ!" නෙඩ් ස්ටාර්ක් සිය අසිපත වෙත අත යවමින් මුරගෑවේ ය. විල් කෑගසන හඩ ඇසෙන විටත් ජේමී වීදිය දිගේ සිය අසු හැල්මේ දුවවමින් සිටියේ ය. සෙබළු දෙපසින්ම ඔවුන්ව තෙරපන්නට වූහ. එකෙකු අසු මගින් පාගා යටකල නෙඩ් ඔහුට දෙපසින් වූ රතු පැහැ සෙවනැලිවලට එකපිට එක අසිපත් පහර එල්ල කලේය. සිය අසුට සන්කල ජොරී කසල් පිම්මේ ඉදිරියට පැන්නේ ය. ලාඩම් ලූ අශ්ව කුර පහරක් වැදුනු ලැනිස්ටර් සෙබළකු ගේ මුහුණ පොඩි පට්ටම් වී ගියේය. තවත් මිනිසකු කරකැවී පසෙකට පැන්න අතර ඊළඟ මොහොතේ ජොරී පිරිසෙන් නිදහස් විය. සෙබළුන් විසින් විල්ව සිය අසු පිටින් බිමට අදින අතරේ ඔහු අවලාද හඬක් නැගීය. වර්ෂාව මධ්‍යයේ අසිපත් උස් පහත් විය. ඒ දෙසට පිම්මේ

අසු පැන්න වූ නෙඩ් ට්‍රෙගාර් ගේ ශිරස්කය මතට සිය දිගු අසිපතින් පහරක් එල්ල කලේය. පහරේ වේගය කෙතරම් වී ද යත් ඔහුට දත්මිටි කැවුනු අතර මුහුණින් ලේ විදිමින් ට්‍රෙගාර් දණින් වැටින. සිය අසු ගේ කටකලියාව අල්වාගත් දැත්වලට හේවර්ඩ් විසින් අසිපත් පහර දෙද්දී ඔහු ගේ උදරය හරහා හෙල්ල පහරක් එල්ල විය. හදිසියේම රත් පැහැ ගත් අසිපත වනමින් ජෝරී නැවතත් ඔවුන් මැදට පැන්නේ ය. "එපා!" නෙඩ් කෑ ගැසීය. "ජෝරී දුවපාං!" ඊළඟ මොහොතේ පය ලිස්සූ නෙඩ් ගේ අසු පාරේ මඩ මත ඇද වැටින. දැස් ගිනිකණ වට්ටන වේදනාවක් සමගින් ඔහු ගේ මුවට ලේ රස දැනෙන්නට විය.

ජෝරී ගේ අසු ගේ පාද කපා දැමූ සෙබළු ඔහුව බිමට ඇදගත්හ. පිරිස ඔහුව වටකරගත් අතර අසිපත් ඉහළ පහළ ගියේය. නෙඩ් ගේ අසු නැවතත් නැගිට ගත්තේ ඔහුද ඒ සමග දෙපයින් සිට ගැනීමට තැත් කල මුත් නැවත බිම ඇද වැටින. වේදනාව නිසා මුවින් නැග ආ මුරගැසීම උගුරේ සිරවිය. කැඩුනු අස්ථිය සිය කළව පසා කරගෙන මතු වී තිබෙනු ඔහු දිටීය. ඒ ඔහු දුටු අවසාන දර්ශනය විය. වර්ෂාව දිගටම ඇද හැලෙන්නට විය. නොනැවතීම ඇද හැලෙන්නට විය.

නැවත සිහි ලද එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් දැස් විවර කරද්දී ඔහු සිය මළවුන් සමගින් වීදියේ තනි වී සිටියේ ය. අසු ඔහුට ලං වූ මුත් ලේ ගඳ දැනුනේ පිම්මේ ඉවත දිවගියේ ය. සිය කකුලෙන් නැගෙන වේදනාව නිසා දත්මිටි කමින් නෙඩ් පාරේ වූ මඩ මතින් බඩගාන්නට විය. එයට වසර ගනනාවක් ගතවනු මෙන් ඔහුට දැනින. ඉටිපන්දම් එළියෙන් ආලෝකවත් වුනු කවුළු පිටුපසින් මුහුණු බලා සිටින්නට විය. දොරවල් අතරින් හා පටු මාවත් වලින් මිනිසුන් මතුවන්නට විය. එනමුදු ඔහුට සහය වනු පිණිස ඒ කිසිවකුත් ඉදිරිපත් නොවීය.

සුළැඟිල්ලා හා නගරාරක්ෂක සෙබළුන් විසින් ඔහුව සොයා ගනිද්දී නෙඩ් වීදිය මධ්‍යයේ ජෝරී ගේ සිරුර වැළඳගෙන වැලපෙමින් හුන්නේය.

නගරාරක්ෂක සෙබළුන් විසින් කොහෙන් හෝ දෝලාවක් සොයා ගෙනැවිත් තිබින. එනමුදු බලකොටුව දක්වා වූ ආපසු ගමන වේදනාවෙන් පිරි අඳුරු මතකයක් පමණක්ම විය. ගමන අතරතුරේදී නෙඩ් කිහිපවරක්ම සිහිසුන් විය. අරුණෝදයේ පළමු මඳ එළියෙන් ඉදිරියෙන් උත්තුංගව නැගී සිටි රතු බලකොටුව ඔහුට දිස්විය. දැවැන්ත ප්‍රාකාරවල ලා රෝස පැහැ ගල් වර්ෂාව නිසා පෙඟී ලේ රතු පැහැ ගැන්වී තිබින.

ඊළඟ මොහොතේ ප්‍රධාන මේස්ටර් පයිසෙල් ඔහුට උඩින් නැමී සිටියේය. කුසලාණක් අතින් ගත් ඔහු සෙමින් මිමිනීය. "මේක බොන්ට මගේ උතුමානනි. වේදනාව නැතිවෙන්ට මේ පොපි යුෂ ටික බොන්ට." ඔහු සෙමින් පොපි යුෂ පානය කලේය. වයින් නටන තුරු රත්කරන ලෙසත් තමා වෙත පිරිසුදු සේද රෙදි කැබැලි ගෙනෙන ලෙසත් පයිසෙල් කිසිවකුට අණ දෙනු ඔහුට ඇසින. ඒ ඔහු දැන සිටි අවසාන දෙය විය.

Lyanna Stark: “Love is sweet, dearest Ned, but it cannot change a man’s nature.”

ඩනේරිස් 04

වයෙස් ඩොත්රැක්හි තුරඟ ද්වාරය පසුපාදවලින් සිටගත් දැවැන්ත ලෝකඩ අසුන් දෙදෙනෙකුගෙන් නිමවී තිබින. අඩි සියයක් පමණ ඉහළින් උන්ගේ පෙර පාද එකිනෙක ගැටී කවාකාර ආරුක්කුවක් නිමැවුනේ ය.

ඇසට හසුවන මානයේ කිසිදු ගොඩනැගිල්ලක් හෝ ප්‍රාකාරයක් නැති නගරයකට දොරටුවක් කුමකට දැයි ඩැනීට සිතා ගත නොහැකි විය. එහෙත් ඈතින් පෙනෙන දම් පැහැ කඳු වැටිය රාමු කරමින් එය තේජමානව නැගී සිටියේය. රුධිරාරක්ෂකයින් පිරිවැරූ බාල් ඩ්‍රෝගෝ තම බලසාරය ලෝකඩ කුර අතරින් දෙවියන්ගේ මාවත ඔස්සේ මෙහෙයවද්දී සන්ධ්‍යාව එළැඹී තිබුනු අතර ලෝහමය අසුන්ගේ දැවැන්ත සෙවනැල්ල නැලවෙන තණබිම් හරහා  විහිදී තිබින.

රිදීවන් වෙළඹ පිට නැගුනු ඩැනී යලිත් අසුපිට යාමට වරම් ලබා සිටි විසේරිස් සහ සෙර් ජෝරා මෝර්මන්ට් පිරිවරා ඒ පසුපස ගමන් කලාය. ඩැනී විසින් විසේරිස්ව තණබිමේ තනිකර දැමූ දින සිට, ඔහුට බලසාරය වෙත පයින්ම ගාටන්නට සිදුවූ දින සිට ඩොත්රැකියෝ ඔහුට 'ඛාල් රේ මා' හෙවත් කොර කකුල් රජා යැයි උසුළු විසුළු කලහ. ඊළඟ දිනයේ ඩ්‍රෝගෝ විසින් ඔහුට කරත්තයක නැග ගමන් කිරීමට අවස්ථාවක් ලබා දුන් අතර ඔහු සතුටින් බාර ගත්තේය. ඛාල් විසින් තමාව විහිළුවට ලක්කරන බව මේ මුරණ්ඩු මෝඩයා නොදත්තේ ය. ඩොත්රැකි සමාජය තුළ කරත්ත වල ගමන් කරන්නේ ගැබිණි මවුන්, නපුංසකයන්, ආබාධිතයන්, මහල්ලන් සහ ළදරුවන් පමණක් බව ඔහු දන සිටියේ නැත. එදා පටන් ඔහුට 'ඛාල් රාසට්' හෙවත් කරත්ත රජා යනුවෙන් තවත් විසුළු නමක් පටබැඳින. එනමුදු ඩැනීගේ මෝඩ සොහොයුරා සිතුවේ මේ ඇය කල වරදට ඛාල් ඔහුගෙන් සමාව අයදින ආකාරය බවය. ඔහුට සත්‍ය පහදා දී ලජ්ජාවට පත් නොකරන ලෙස සේර් ජෝරාගෙන් අයැද සිටීමට ඇයට සිදුවිය. ලැජ්ජාවට පත් වීම ඔහුට සිදුවන හොඳක් බව සිතුවද ජෝරා ඇයට එකඟ විය. දින ගණනාවක් තිස්සේ කල අයැදීම් සහ ඩෝරියා විසින් කියාදුන් ශිල්ප සියල්ල භාවිතයෙන් පසු විසේරිස්ට නැවත බලසාරයේ ඉදිරි පෙළට එක් වී ඔවුන් අසලින් කරන්නට ඉඩදීම වෙනුවෙන් ඛාල් එකඟ කරවාගැනීමට ඇයට හැකිවිය.

"කෝ නගරය?" ලෝකඩ ආරුක්කුව පසු කරන අතර ඇය ඇසුවාය. කිසිදු ගොඩනැගිල්ලක් හෝ මිනිස් පුලුටක් හෝ නොමැති තණබිම මැදින් වැටී තිබුනු මාවත දෙපස ඩොත්රකියන් විසින් සියවස් ගනනාවක් තිස්සේ යටත් කරගත්, කොල්ල කෑ, විනාශ කර දැමූ නගරවල පෞරාණික සිහිවටන පමණක් විසිරී තිබින.

"ඉස්සරහ." සෙර් ජෝරා පිළිතුරු දුන්නේය. "කන්ද පාමුල."

තුරඟ ද්වාරයට ඔබ්බෙන් මාවත දෙපස සොරකම් කල විරුවෝ සහ මංකොල්ල කෑ දෙවිවරු උත්තුංගව නැගී සිටියහ. බිඳී ගිය අකුණු සර අහසට එල්ලකර ගෙන සිටි, මළගිය නගරවල අමතක වූ දෙවිවරුන් ගේ දෙපා පසු කරමින් ඩැනී ඇගේ රිදීවන් අසු ධාවනය කලාය. කැඩී බිඳී ගිය පැල්ලම් වැකුනු මුහුණු ඇති, ශෛලමය නරපතියෝ ඔවුන් ගේ සිහසුන් වල සිට ඇය දෙස තුච්ඡ ලෙස බලා සිටියහ. ඔවුන් ගේ නම් පවා කාලයේ වැලිතලාවෙන් වැසී ගොස් තිබින. මලින් පමණක් ගත වසා ගත් සුලලිත අංගනාවෝ කිරිගරුඬ එලක මත රංගනයේ යෙදුනහ, නැතිනම් බිඳුනු බඳුන් බිමට නමා සිටියහ. කලකට ඉහතදී නම් මේ බඳුන්වලින් දිය වැස්සෙන්නට ඇත. දිදුලන මිණි ඇසින් යුත් කළු යකඩ මකරු, ගොරවන නරසිංහයෝ, පහරදීම පිණිස තුඩු සහිත වල්ගා අමෝරාගත් මැන්ටිකෝරයින් සහ ඇය නම් නොදන්නා වෙනත් බොහෝ රාක්ෂසයයෝ මග දෙපස රැක සිටියහ. සමහර ප්‍රතිමා කෙතරම් මනබඳිනසුළු වීද යත් ඒ වෙතින් දෑස් ඉවතට ගැනීම පවා අපහසු වූ අතර තවත් සමහරක් බැලිය නොහැකි තරමට විරූපී හෝ හඳුනාගත නොහැකි තරමට කැඩී බිඳී ගොස් තිබින. සෙර් ජෝරාට අනුව නම් ඒවා අෂයිවලට ඔබ්බෙන් වූ සෙවනැලි දේශයෙන් ගෙන ආ ප්‍රතිමා විය.

"මෙච්චර ගොඩක්!" සිය රිදී අසු සෙමෙන් සෙමෙන් ඉදිරියට මෙහෙයවමින් ඩැනී මිමිනුවාය. "එච්චර ගොඩක් රටවලින්!"

විසේරිස් නම් ඒවායින් එතරම් පුදුමයට පත් වූ බවක් නොපෙනින. "මැරිච්ච නගරවලින් ගෙනාපු පරණ කහල ගොඩවල්!" ඔහු නියැවීය. ඩොත්රකියන්ට නොතේරෙන පරිදි පොදු බසින් කතාකිරීමට තරම් ඔහු පරෙස්සම් සහගත විය. එනමුදු සිය ඛාස්වරුනට ඒවා නොඇසුනු බව සහතික කරගැනීමට ඩැනී ඔවුන් දෙස හැරී බැලුවාය. "මේ ම්ලේච්ඡයින්ට තේරෙන එකම දේ තමන්ට වඩා උසස් මිනිස්සු හදපු දේවල් හොරකම් කරන්ටයි... මිනීමරන්ටයි විතරයි." ඔහු සිනාසෙමින් කියාගෙන ගියේය. "හොඳ වෙලාවට උන් මිනීමරන්ට දන්නවා, නැත්තම් මට මුන්ගෙන් මෙලෝ වැඩක් නෑ."

"එයාලා දැන් මගේ මිනිස්සු." ඩැනී විරුද්ධ වූවාය. "එයාලට ම්ලේච්ඡයෝ කියන්ට එපා."

"මකරාට ඕනේ එකක් මකරා කියනවා." ඔහු තමා පසුපසින් ගමන් කරමින් සිටි ඒගෝ සහ රඛාරෝ වෙත සමච්චල් සිනාවකින් සංග්‍රහ කලේය. "ජේනවනෙ, මුන්ට ශිෂ්ට භාෂාවක්වත් තේරුම්ගන්ට තරම් බුද්ධියක් නැති හැටි." ඔවුන් ඉදිරියෙන් වූ අඩි පනහක් පමණ උසැති, පෙඳ පාසියෙන් වැසීගිය ගල් කණුවක් දෙස ඔහු උදාසීන නෙතින් බැලුවේය. "මේ කහල ගොඩේ තව කොච්චර කල් ලැගල ඉන්ට වෙයිද මගේ හමුදාව දෙනකල්? මට මේකේ ඉඳල එපාවෙලයි තියෙන්නේ."

"කුමාරිව ඩොෂ් ඛලීන්ලාට පෙන්නන්ට ඕන..."

"ඔවු ඔවු අර නාකිච්චියෝ ටිකනේ." ඔහු කඩා පැන්නේ ය. "ඊට පස්සෙ ඕකිගෙ බඩේ ඉන්න එකා ගැන අනාවැකි කියන්ට තවත් මොකද්ද මල කෝලමක් තියනවා කියලා උඹ මට කලින් කිවුවා නේද? ඒකෙන් මට වැඩක් නෑ. අශ්ව මස් කාල කාල මට දැන් ඇති වෙලා තියෙන්නේ. මේ ම්ලේච්ජයන් ගේ ගඳත් මට ඉවසන්ට බෑ." ඔහු සුවඳ කුඩු පසුම්බියක් රඳවා තබාගෙන සිටි කබා අත සිම්බේ ය. එනමුදු එයින් කිසිදු ඵලක් ඇති නොවූයේ ඔහුගේ කබාය එකම කුණු ගොඩක් වී තිබුනු බැවිනි. පෙන්ටොස්වලින් පිටත්වද්දී ඔහු ඇඳ සිටි බර ලොම් ඇඳුම් හා සේද රෙදි සියල්ල දිරාගොස් දහඩියෙන් ජරා වී ගොස් තිබින.

"ඛටහිර වෙළෙඳපලේ කටට රහ කෑම තියෙයි මගේ ස්වාමිනී. නිදහස් නගරවල වෙළෙන්දෝ උන්ගෙ බඩු විකුණගන්ට එහාට එනවා. ඛාල් එයාගේ පොරොන්දුව හරි වෙලාවට ඉටු කරයි." සෙර් ජෝරා පැවසුවේ ය.

"එහෙම කලොත් හොඳයි." ඔහු සාහසික ලෙස පැවසීය. "ඌ මට ඔටුන්නක් පොරොන්දු වුනා, ඒක මම කොහොමහරි ගන්නවා. මකරත් එක්ක විහිළු බෑ." පියයුරු හයක් සහ මුගටි හිසක් තිබුණු විශාල ප්‍රතිමාවක් දුටු ඔහු එය වඩා හොඳින් නිරීක්ෂණය කිරීම පිණිස එදෙසට අසු මෙහෙයවූයේය.

ඩැනීට සැහැල්ලුවක් දැනුනද ඇගේ සිතේ වූ වියවුල් බව මුලුමනින්ම මැකී නොගියේ ය. "මගේ ඉරයි-තරුයි එයාව ගොඩක් කල් මෙහෙ තියාගන්නෙ නැතිවෙන්ටයි කියලා මම ප්‍රාර්ථනා කරනවා." ඔහු නැසෙන මානයට ගියපසු ඇය සෙර් ජෝරාට පැවසුවා ය.

නයිට්වරයා ඇගේ සොහොයුරා දෙස සැකමුසු බැල්මක් හෙලුවේ ය. "ඔබේ සහෝදරයට තිබුනෙ පෙන්ටොස්වල නතරවෙලා ඉන්ටයි. බලසාරයක් කියන්නෙ එයාට හරියන තැනක් නෙවෙයි. ඉල්ලිරියෝ ඕක කියන්ට උත්සාහ කලා."

"එයාගෙ සෙබළු දහදාහ හම්බවුන හැටියේ එයා මෙහෙන් යයි. මගේ ස්වාමියා එයාට රත්තරන් ඔටුන්නක් පොරොන්දු උනා නේ."

සේර් ජොරා අමනාපයෙන් මෙන් ගෙරවීය. " ඔවු බලීසි. ඒ වුනත්... ඩොත්රැකියෝ මේවා දිහා බලන්නේ බටහිර අපි බලන විදියට නෙවෙයි, උන්ගේම විදියකට. මම ඕක පැහැදිලි කරන්ට උත්සාහ කලා, ඉල්ලිරියෝ ඕක පැහැදිලි කරන්ට උත්සාහ කලා. ඒත් ඔබේ සහෝදරයා ඕව කණකට ගන්නෙ නෑ නෙව. මේ අශ්වහිමියො කියන්නෙ වෙළෙන්දෝ නෙවෙයි. විසේරිස් හිතාගෙන ඉන්නේ එයා ඔබව විකුණුවා කියලයි. දැන් එයා බලාගෙන ඉන්නේ ඒකෙ මිල ලැබෙනකල්. ඒත් ඛාල් ඩ්‍රෝගෝ හිතන්නේ ඔබ තෑග්ගක් කියලයි. එයා විසේරිස්ට ආපහු තෑග්ගක් දෙයි. ඇත්ත... හැබැයි එයාට ඕන වෙලාවට. තෑගි ඉල්ලලා බලකරන්ට බෑ නෙව. ඛාල් කෙනෙක්ගෙන් නම් මොනවත්ම බල කරලා ගන්ට බෑ."

"ඒත් එයාව මෙහෙම තියාගෙන ඉන්න එක හරි නෑ." තමා මෙසේ සිය සොයුරාව ආරක්ෂා කරන්නේ මන්දැයි ඩැනී නොදත්තා ය. "විසේරිස් කියනවා රණකාමියෝ දහදාහකින් එයාට මුලු රාජධානි සප්තකයම පිහදාලා යටත් කරගන්ට පුළුවන් කියලා."

සෙර් ජෝරා උපහාසයෙන් හඬක් නැගීය. "විසේරිස්ට කොසු දහදාහකින් අස්ස ගාලක්වත් අතුගාගන්ට බෑ."

ඔහුගේ උපහාසාත්මක ස්වරය ඩැනීව විශ්මයට පත් කිරිමට අසමත් විය. "කොහොමද... කොහොමද ඒ විසේරිස් නැතුව වෙන කෙනෙක් වුනා නම්? වෙන කෙනෙක් උන්ව

මෙහෙයෙවුවොත්? වඩා ශක්තිමත් කෙනෙක්? එහෙම වුනොත් ඩොත්‍රැකියන්ට ඇත්තටම රාජධානි සප්තකය අල්ලගන්ට පුළුවන් වෙයිද?"

සෙර් ජෝරාගේ මුහුණ බැරෑරුම් හා කල්පනාකාරී විය. "මම පිටුවහලෙක් විදියට මුලින්ම මෙහාට ආපු කාලේ මට මුන්ව පෙනුනේ බාගෙට හෙළුවෙන් ඉන්න වැද්දෝ ටිකක් වගේ. උන්ගෙ අශ්වයින් වගේම වනචාරියො ටිකක් වගේ. ඒ කාලේ ඔය ප්‍රශ්නය මගෙන් ඇහුවානම් කුමාරි, මම කියයි හොඳ දක්ෂ නයිට්වරුන් දාහකට මුන් ලක්ෂයක් එක්ක වුනත් ලේසියෙන්ම සටන් කරන්ට පුළුවන් කියලා."

"ඒත් මම දැන් ඇහුවොත්?"

"දැන්?" නයිට්වරයා පිළිතුරු දුන්නේ ය. "දැන්නම් මට ඒක එච්චරම විශ්වාස නෑ. මුන් අපේ ඕනම නයිට් කෙනෙකුට වඩා හොඳ අසරුවො. යකාටවත් බය නෑ. අනික මුන්ගේ දුනු වලින් අපේ ඒවාට වඩා ඈතට විදින්ට පුළුවන්. රාජධානි සප්තකයේ නම් දුනුවායෝ සටන් කරන්නේ බිම ඉඳන්. නැත්තම් පලිහ පිටිපස්සේ හැංගිලා. එහෙමත් නැත්නම් උල් රිටිවලින් හදාපු බාධකයක් ඉස්සරහින් තියාගෙන. ඩොත්‍රැකියෝ විදින්නේ අශ්වයො පිටේ යන ගමන්මයි. පහරදෙනව ද නැත්තම් පහුබහිනව ද කියලා වෙනසක් නෑ. අනික කිසිම වැරදීමක් නැතුව ඉලක්කෙටම විදින්ට උන්ට පුළුවන්... ඒත් එක්කම උන් මහා ගොඩක් ඉන්නවා මගේ ආර්යාවනි. ඔබේ සැමියා ගේ ඛලසාර් එකේම රණකාමී අසරු සෙබළු හතලිස් දාහක් ඉන්නවා."

"ඒක ඇත්තටම ලොකු ගානක් ද?"

"ඔබේ සහෝදරයා රේගාර්, ගංගා ත්‍රිශූලයේ සටනටත් ඒ තරමම ගානක් ගෙනාවා." සෙර් ජෝරා පිළිගත්තේ ය. "ඒත් ඒකෙන් දහයෙන් එකක් විතරයි නයිට්වරු හිටියේ. අනික් උන් ඔක්කොම දුනුවායොයි, නිදහස් සටන් කාරයොයි, හෙල්ලෙනුයි කුන්තානියෙනුයි සටන් කරන පාබල හමුදාවයි විතරයි. රේගාර් වැටුනයින් පස්සේ උන්ගෙන් හුඟදෙනෙක් ආයුධ ඔක්කොම විසිකරලා පැනල ගියා. ඒ වගේ පඹයො ටිකක් ලේ පිපාසිත ඩොත්‍රැකියො හතලිස් දාහක් එක්ක කොච්චර වෙලා සටන් කරයි කියලද ඔබ හිතන්නෙ? වැස්සක් වගේ ඊතල වැටෙනකොට ඔය හම් කබාවලටයි, මුදු දම්වැල් සන්නාහවලටයි කොච්චර වෙලාවක් ඔරොත්තු දීගෙන ඉන්ට පුළුවන් වෙයිද?"

"එච්චර වෙලාවක් නෙවෙයි. එච්චර හොඳටත් නෙවෙයි."

ඔහු හිස වැනීය. "මේක තේරුම් ගන්ට කුමාරි. රාජධානි සප්තකයේ පාලකයින්ට මොළේ කළඳක්වත් තියෙනවා නම් මේකෙන් වලකින්ට පුළුවන්. මේ ඩොත්රැකියන්ට ඔය බලකොටු වටලෑම් ගැන දැනුමක් නෑ. ඒක උන්ට අල්ලන්නෙත් නෑ . රාජධානි සප්තකයෙ තියෙන දුර්වලම බලකොටුවවත් මුන්ට අල්ලගන්ට පුළුවන් වෙයි කියලා මම හිතන්නෙ නෑ. ඒත් රොබර්ට් බරතියන් මෝඩයා වගේ මුනුත් එක්ක මූනට මූන සටන් කරන්ට ගියොත් නම්..."

"එයා එහෙම කෙනෙක් ද?" ඩැනී ඇසුවාය. "ඒ කීවේ මෝඩයෙක් ද?"

නයිට්වරයා මොහොතක් කල්පනා කලේය. "රොබර්ට් ඉපදෙන්ට තිබ්බේ ඩොත්රැකියෙක් වෙලා." ඔහු අන්තිමේදී පිළිතුරු දුන්නේය. "ඔබේ ඛාල්ගෙන් ඇහුවොත් එයා කියයි කඩුවක් අතින් අරන් සතුරාට මුහුණ දෙන්නෙ නැතුව ප්‍රාකාර අස්සේ හැංගිලා සටන්කරන්නෙ බයගුල්ලෝ කියලා. රොබර්ටුත් ඒකට එකඟ වෙයි. එයා බොහොම ශක්තිමත් නිර්භීත මිනිහෙක්. එයාට පුළුවන්නම් එයා ඩොත්රැකියොත් එක්ක එළිමහනෙම සටන් කරයි. ඒත්, එයාගෙ වටේ ඉන්න නලාකාරයෝ ගහන්නෙ වෙනමම පදයක්. එයාගේ මල්ලි ස්ටැනිස්, ටයිවින් ලැනිස්ටර් උතුමානන්, එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් වගේ අය." ඔහු බිමට කෙල පහරක් ගැසුවේය.

"ඔබට මේ ස්ටාර්ක් උතුමානන්ව පේන්ට බෑ නේද?"

"ඌ මාව මම ආදරේ කරපු හැම දේකින්ම වෙන් කලා. ජරා හොර දඩයක්කාරයො ටිකකුයි, උගෙ මලඉලවු ගෞරවයයි නිසා." සෙර් ජෝරා අමිහිරි හඬකින් පිළිතුරු දුන්නේ ය. ඒ ස්වරයේ ගැබ් වූ වේදනාව කොතෙක්ද යන්න වටහා ගන්නට ඩැනීට හැකිවිය. ඔහු වහාම කතාව වෙනතකට හැරවූයේ ය. "අන්න, අර තියෙන්නෙ." ඔහු ඇඟිල්ල දිගුකොට පෙන්වීය. "වයෙස් ඩොත්රැක්, අශ්වාධිපතියන් ගේ නගරය. "

ඛාල් ඩ්‍රෝගෝ සහ ඔහුගේ රුධිරාරක්ෂකයෝ බටහිර වෙළෙඳපලෙහි යස කඩ වීදි ඔස්සේද, ඉන් ඔබ්බෙහිවූ පුළුල් මාවත් දිගේද සිය බලසාරය මෙහෙයවූහ. ඊට පිටුපසින් රිදීවන් අසු පිට ගමන් කල ඩැනී වටපිට වූ අමුතු දසුන් දෙස දෑස් අයා බලමින් ගමන් කලාය. වයෙස් ඩොත්‍රැක් ඇය දුටු විශාලතම නගරය මෙන්ම කුඩාම නගරය ද විය. එය පෙන්ටොස් මෙන් දස ගුණයක් විශාල වන්නට ඇතැයි ඈ සිතුවාය. එය නගර ප්‍රාකාරවලින් හෝ අන් කිසිවකින් සීමා නොවූ සුවිසල් තැනක් විය. එහි වූ නිතරම වේගවත් සුළං හමන පුළුල් මංපෙත් තණකොල, මඩ සහ කැලෑමලින් වැසී තිබින. බටහිර දේශයේ පිහිටි නිදහස් නගර වනාහි මාලිගා, කුළුණු, පැල්පත්, පාලම් සහ වෙළෙඳසල් යන සියල්ලම එකිනෙකට තදබද වුනු සීමිත ප්‍රදේශයන් විය. එහෙත් වයෙස් ඩොත්‍රැක් තම පෞරාණිකබව පෙන්වමින්, ආඩම්බරයෙන් හා හිස් බවින් යුතුව, හිරු එළියේ නැහැවෙමින් සිටියාය.

මෙහි වූ ගොඩනැගිලි පවා අමුතු විලාසයක් ගත්තේය. කැටයම් කරන ලද පාෂාණමය මණ්ඩප, වියන ලද තණපත් වලින් නිම කල බලකොටු තරම් විශාල මන්දිර, දැවයෙන් කරන ලද දුර්වල කුළුණු, කිරිගරුඬ අල්ලන ලද පඩි සහිත පිරමීඩ, වහලක් රහිත ගස් කඳන් වලින් තැනුනු ශාලා ආදී සෑම දෙයක්ම එහි විය. සමහර මන්දිර ප්‍රාකාර වෙනුවට කටු වැටින් වට කර තිබුණි. "එක වගේ දෙකක් හොයාගන්ට නෑ!" ඇය පුදුමයෙන් පැවසුවා ය.

"ඔබේ සහෝදරයා කියාපු දේවලින් බාගයක් ඇත්ත." සෙර් ජෝරා පිළිගත්තේ ය. "ඩොත්‍රැකියෝ කිසිම දෙයක් ගොඩනගන්නේ නෑ . අවුරුදු දාස් ගානක් තිස්සෙ උං පුරුදුවෙලා ඉන්නෙ ඉහට උඩින් වහළක් ඕන නම් බිම වලක් හාරලා උඩින් වියාපු තණකොළ වලින් වහල දාන්ටයි. මේවා හදල තියෙන්නේ උං කොල්ල කාපු එකේක රටවලින් අල්ලගෙන ආපු වහල්ලු. උන් ඉතින් තම තමාගේ රටේ විදිහට තමයි හදන්නේ."

බොහෝ මන්දිර, විසල් ඒවා පවා පාළුවට ගොස් තිබින. "කෝ මෙහෙ ජීවත්වෙන මිනිස්සු?" ඩැනී ඇසුවාය. වෙළෙඳපල කෑ ගසන මිනිසුන්ගෙන් හා එහා මෙහා දුවන දරුවන්ගෙන් පිරී තිබින. එහෙත් අනෙක් තැන්වල ඇය දුටුවේ තම තමන්ගේ වැඩ කටයුතු සඳහා එහා මෙහා යන නපුංසකයින් කිහිපදෙනෙකු පමණි.

"ඩොෂ් ඛලීන් මැහැලියො ටික විතරයි මේ පූජනීය නගරේ ස්ථිරවම ජීවත් වෙන්නෙ. උනුයි උන්ගෙ වැඩකාරයොයි, වහල්ලු ටිකයි." සෙර් ජෝරා පිළිතුරු දුන්නේ ය. "ඒ වුනත් හැම බලසාර් එකකම ඉන්න හැම මිනිහෙකුටම ඉන්ට තරම් ඉඩ මෙතන තියෙනවා. ඔක්කොම ඛාල්ලා තම තමන්ගෙ බලසාරුත් එක්ක එක මොහොතේ මෙතනට ආවත් ඉඩ

තියෙනවා. මේ මැහැලියන්ගෙ අනාවැකි අනුව කවදා හරි දවසක ඒ දේ ඇත්තටම සිද්ද වෙනවලු. ඉතින් වයෙස් ඩොත්රැක් හැමවෙලාවෙම තමන්ගෙ දරුවො සේරම එකපාර පිළිගන්ට ලෑස්ති වෙලා ඉන්ට ඕනලු."

අන්තිමේදී නැගෙනහිර වෙළෙඳපල අසල යිටී, අෂයී හා සෙවනැලි දේශයෙන් වෙළෙඳාම පිණිස මෙහි පැමිණ සිටි තවලම් අසලදී ඛාල් ඩ්‍රෝගෝ විසින් පිරිසට නැවතීමට සන්කලේය. 'කඳුවැටිවල මාතාව' නමින් හැඳින්වුනු උසැති කන්ද ඔවුන්ට ඉහළින් උත්තුංගව නැගී සිටියාය. මැජිස්ටර් ඉල්ලීරියෝ ගේ වහල් දැරිය විසින් සඳහන් කරන්නට යෙදුනු, රිදී දොරවල් සහිත කාමර දෙසීයේ මාලිගාව සිහිවූ ඩැනීට සිනහවක් පහළ විය. මේ 'මාලිගාව' වනාහි දැවයෙන් නිමකල, ගුහාවක් වැනි උත්සව ශාලාවක් පමණක් විය. එහි බිත්ති අඩි හතලිහක් පමණ උසට විහිදුනු, කපන ලද රළු ලීයෙන් නිමවිය. වහල එකට තබා මසන ලද දිගැති සේද රෙද්දකින් නිම වූයේ, කලාතුරකින් වැටෙන වැස්සෙන් ආරක්ෂාවීම සඳහා ඉහළට එසවීමට හෝ අනන්ත ආකාශය පිළිගැනීම සඳහා පහත් කිරීමට හෝ හැකි කූඩාරමක් බඳු විය. ශාලාව වටා උස් වූ වැටින් යුත් තණින් වැසුනු අස් අංගනය, ගිණි වලවල් සහ කුඩා කඳුගැට මෙන් උඩට නෙරා ආ, මැටියෙන් තනා තෘණ සෙවිලි කල සිය ගණනක් වූ නිවාස පිහිටා තිබින.

ඛාල් ඩ්‍රෝගෝ ගේ පැමිණීමට සූදානම් වීම පිණිස වහලුන් කණ්ඩායමක් කලින්ම එහි ගොස් සිටියහ. අසරුවන් එකිනෙකා තම සැදලවලින් බැස්සේ ඉණෙහි පැළැඳ සිටි ඇරඛ් ගලවා, තමන් සතු අනෙක් ආයුධත් සමගින් එහි බලාසිටි වහලුන් අතට දුන්නහ. ඛාල් ඩ්‍රෝගෝට පවා මීට යටත්වීමට සිදුවිය. වයෙස් ඩොත්රැක්වලදී ආයුධ ගෙනයෑමත්, නිදහස් මිනිසෙකුගේ ලේ වැගිරීමත් තහනම් දෙයක් බව සෙර් ජෝරා විස්තර කලේය. එකිනෙකාට එරෙහිව යුධ වැදී සිටි ඛලසාර් පවා කඳුවැටිවල මාතාව ඉදිරියේ තම අමනාපකම් ඉවත දමා එකට කෑම් බීම් කලහ. ඩොෂ් ඛලීන් මැහැල්ලන් විසින් නියෝග කරන ලද පරිදි මේ නගරය තුළදී සෑම ඩොත්රැකියෙක්ම එකම ලෙයක්, එකම ඛලසාරයක් හා එකම රංචුවක් වූහ.

ඉරී සහ ජික්වී විසින් සිල්වර් පිටින් බැසීම සඳහා ඩැනීට උදව් කරද්දී කොහොල්ලෝ එතැනට පැමිණියේ ය. ඔහු ඩ්‍රෝගෝ ගේ රුධිරාරක්ෂකයින්ගෙන් වයසකම තැනැත්තා වූ අතර තරබාරු සිරුරක්, ඇද වූ නාසයක් හා කැඩුනු දතින් පිරි මුවක් හිමිවූයේය. විසිවසකට පෙර ඒවා යගදා පහරකින් කැඩී ගොස් තිබුනේ කුලී හේවායින් විසින් ලාබාල ඛලබාව ඔහු ගේ පියා ගේ සතුරන්හට විකිණීමට යාම වළක්වන්නට කල උත්සාහයේදී ය. ඔහු ගේ ජීවිතය ඩ්‍රෝගෝ ගේ ජීවිතය හා බැඳුනේ ඇගේ සැමියාගේ උපතත් සමග විය.

සෑම ඛාල්වරයෙකුටම ඔහුට වෙන්වූ රුධිරාරක්ෂකයෝ වූහ. මුලදී ඩැනී සිතුවේ ඔවුන් රාජ්‍යාරක්ෂක මුර සෙබළුන් මෙන් සිය ස්වාමියා රැකීම සඳහා දිවුරුම් දුන් කොටසක් වශයෙනි. එනමුදු එය ඉන් එහා ගිය යමක් විය. රුධිරාරක්ෂකයින් යනු සාමාන්‍ය අංගාරක්ෂකයින්ට වඩා වැඩි දෙයක් බව ජික්වී ඇයට කියාදුන්නා ය. ඔවුහු ඛාල් ගේ සොහොයුරන්, සෙවනැල්ල මෙන් ළඟින් සිටින්නන් හා සැහැසි මිතුරෝ වූහ. ඛාල් ඔවුන් නම් කලේ 'මගේ රුධිරයෙන් උපන් රුධිරය' කියාය. එසේ කීවාක් මෙන්ම ඔවුන් භුක්ති වින්දේද එක් ජීවිතයක් විය. මොවුන් ගේ පුරාණ චාරිත්‍රවලට අනුව, ඛාල් කෙනෙකු මියයනවිට ඔහුගේ රුධිරාරක්ෂකයින් ද ඔහු සමග මිය යා යුතු විය. මක්නිසාද යත් මරණින් මතු ඔවුන් සෑම යන 'නිශා දේශයේදී' ඔහුත් සමග පසෙකින් යාමට පිරිසක් සිටිය යුතු වූ බැවිනි. යම් හෙයකින් ඛාල් සතුරෙකු අතින් මියගියේ නම් ඔහු ගේ පලිය ගැනීම සඳහා පමණක් ජීවත්ව ඉන්පසු සතුටින් තම මිනීවල කරා යා යුතු විය. ජික්වී ඇයට කියා දුන් පරිදි සමහර බලසාර්වල රුධිරාරක්ෂකයෝ ඛාල් ගේ වයින්, ඔහු ගේ කූඩාරම පමණක් නොව ඔහුගේ බිරින්දන් පවා බෙදා හදා ගත්තෝ ය. එහෙත් කිසිදිනක ඔහු ගේ අසුන් බෙදාගැනීමක් සිදු නොවින. මිනිසකු ගේ අසු යනු ඔහු පමණක් සන්තක වස්තුවක් විය.

ඛාල් ඩ්‍රොගෝ මේ පුරාණ ක්‍රම අනුගමනය නොකිරීම ගැන ඩැනී අතිශයින් සතුටුවූවා ය. තමාව ඔවුන් අතර බෙදාදීමට ඇය කිසිසේත්ම කැමැති නොවනු ඇත. මහලු කොහොල්ලෝ ඇයට කරුනාවෙන් සැලකුවද ඇය සෙස්සන්ට බිය වූවාය. දැවැන්ත එමෙන්ම නිහඬ හග්ගෝ ඇය කවුදැයි අමතක වූවාක් මෙන් ඇයට නිතර රැව්ය. බෝතෝට නපුරු දෑසක් හා අනුන්ට රිදවීමට කැමැති දෑතක් තිබින. ඔහු ඩෝරියාව අල්ලන සෑම විටකදීම ඇගේ සුමුදු සුපු පැහැ සම මත සලකුණු තැබීය. එමෙන්ම සමහර රාත්‍රීන්හිදී ඉරීව හැඩවීය. ඔහු ගේ අශ්වයෝ පවා ඔහුට බියවූහ.

එනමුදු ඔවුන් ඛාල් ඩ්‍රෝගෝට දිවියෙන් හා මරණයෙන් බැඳී සිටි අතර ඔවුන්ව ප්‍රතික්ෂේප කිරීම ඩනේරිස්ට කල නොහැක්කක් විය. සමහර අවස්ථාවලදී තම පියාටත් මෙවැනි ආරක්ෂකයින් සිටියා නම් යන සිතුවිල්ල ඇගේ සිත තුළට ඇතුළුවිය. ගී සැහැලිවල කියැවෙන පරිදි නම් රාජ්‍යාරක්ෂක බලකායේ ධවල නයිට්වරුන් සියලුදෙනා ඉතා නිර්භීත, උදාර ගතිගුණ ඇති විශිෂ්ට රණවිරුවන් වුවද එවැනි එක් අයෙකු අතින්ම ඇගේ පියාව ඝාතනය විය. එවකට කඩවසම් කොලුවෙකු වූ ඔහුට දැන් සියල්ලෝම රජුන් මරන්නා යයි කියති. තවෙකෙකු වන නිර්භීත සෙර් බැරිස්ටාන් සිහසුන උදුරාගත් එකාගේ පැත්තට පැන තිබින. රාජධානි සප්තකයේ සියළුම මිනිසුන් මෙබඳු චපලයන්දැයි ඇය මවිතයෙන්

කල්පනා කලාය. ඇගේ පුත්‍රයා යම් දිනයක යකඩ සිහසුන අරා හිඳිනා විට ඔහුගේ ආරක්ෂාවට රුධිරාරක්ෂකයන් යෙදවීමට ඇය ඉටා ගත්තාය.

"ඛලීසි," කොහොල්ලෝ ඩොත්රකි බසින් ඇයව ඇමතුවේ ය. "ආපසු ගමනට ආසිරි පතලා දෙවියන්ට පුදපූජා කරන්ට අද රෑ කඳුවැටිවල මාතාව තරණය කරන්ට යනවයි කියලා ඔබට කියන්ටයි කියලා මගේ රුධිරයෙන් උපන් රුධිරය වන ඩ්‍රෝගෝ අණ කළා."

මවුතුමිය වෙත පියනැගිය හැක්කේ පිරිමින්ට පමණක් බව ඩැනී දැන සිටියා ය. බාල්ගේ රුධිරාරක්ෂකයින් ද ඔහු සමග ගොස් හිරු උදාවත් සමග ආපසු එනු ඇත. "මගේ හිරු-සහ-තාරකාවන්ට කියන්ට මම එයා එනතුරු කාංසාවෙන් බලන් ඉන්නවා කියලා." ඇය ඔහුට පැවසූයේ ඩ්‍රෝගෝට සිතින් කෘතඥ වෙමිනි. කුසෙහි වූ දරුවා වැඩෙත්ම ඩැනීට වැඩි වැඩියෙන් වෙහෙස දැනෙන්නට පටන්ගෙන තිබින. ඇත්තෙන්ම මෙසේ එක් රයක් හෝ නිස්කලංකව ගත කරන්නට ලැබීම ඇය සතුටින් බලපොරොත්තු වූ දෙයක් විය. දරුගැබ නිසා බාල්ගේ කාමුක ආශාවන් තව තවත් ඇවිස්සුනාක් මෙන් පෙනුනු අතර ඔහු හා ගෙවුනු පසුගිය රාත්‍රීන් කිහිපය නිසා ඇගේ ශක්තිය මුලුමනින්ම නැතිවී ගොස් තිබින.

ඇය සහ බාල් වෙනුවෙන් පිලියෙල කර තිබූ හෙල කුහරය වෙත ඩෝරියා ඇයව කැඳවාගෙන ගියාය. ඒ තුළ මැටියෙන් කල කූඩාරමක මෙන් අඳුරු හා සීතල විය. "ජික්වී, මට නාන්ට ලෑස්ති කරන්ට." ඇය අණ කලාය. ගමන පුරාවටම තැවරනු දූහුවිලි සෝදා හැරීමට හා වෙහෙසට පත් ඇඟපත තෙමා ගැනීමට ඇයට උවමනා විය. ඔවුන් මෙම ස්ථානයේ මඳ කලක් නැවතෙන බව ද, හෙට දවසේ නැවතත් සිල්වර් පිට නැගීමට සිදු නොවන බව ද දැනගැනීම ඇත්තෙන්ම සුන්දර විය.

වතුර ඇය කැමති අන්දමට දැවෙන තරම් උණුසුම් වූයේය. "මම අද රෑ මගේ සහෝදරයට එයාගේ තෑගි දෙන්ට ඕන." ජික්වී ඇගේ හිසකෙස් සෝදන අතර ඇය තීරණය කලාය. "මේ පූජනීය නගරයේ එයා රජෙක් වගේ පේන්ට ඉන්ට ඕනි. ඩෝරියා, දුවලා ගිහින් මම එයාට අද රෑ කෑමට ආරාධනා කලා කියලා කියන්ට." විසේරිස් ඇගේ ඩොත්රකි සේවිකාවන්ට වඩා මෙම ලයිසෙනී කෙල්ලට කරුනාව දැක්විය. සමහරවිට පෙන්ටොස්වලදී, ඉල්ලීරියෝ විසින් ඇයව ඇඳට ගෙනයෑමට ඉඩ දුන් නිසා වන්නට ඇත. "ඉරී, කඩවීදියට දුවලා මසුයි, පළතුරුයි ගේන්ට. අශ්ව මස් නැතුව වෙන ඕනම දෙයක්."

"අශ්ව මස් තමා හොඳම." ඉරී පැවසුවා ය. "ඒවයින් මිනිහෙකුට හයිය හත්තිය ලැබෙනවා."

"විසේරිස්ට අශ්ව මස් පෙන්නන්ට බෑ."

"ඔබ කියන විදියක් බලීසි."

ඇය එළු ගාතයක්ද, එළවළු හා පළතුරු කූඩයක්ද ගෙනාවා ය. ජික්වී මස් ගාතය වරින්වර මී පැණියෙන් තෙත් කරමින්, ස්වීට්ග්‍රාස් හා සුවඳ පැළෑටි වර්ග මුහු කරමින් පිලිස්සුවාය. ඒ සමග කොමඩු, දෙළුම්, ප්ලම් හා ඩැනී නම නොදන්නා, නැගෙනහිර පෙදෙසේ වැවෙන අමුතු පළතුරු වර්ගයක්ද විය. සේවිකාවන් රෑ කෑම වේල පිලියෙල කරන අතර ඩැනී සිය සොයුරා ගේ මිම්මට අනුව ඇය විසින් නිම කල ඇඳුම් අතුරා හැඩ බැලුවා ය. සුමුදු සුදු හණ රෙද්දෙන් නිමවුනු කබායක් හා කලිසමක්, දණිස්ස තෙක් පටි ගොතා බඳින හම් පාවහන් යුගලක්, තඹ පදක්කමකින් අලංකාර කෙරුනු ඉණ පටියක් සහ ගිණි පිඹින මකරුන් පින්තාරු කරන ලද බැනියමක් ඒ අතර විය. සිඟන්නෙකු සේ නොපෙනේ නම් ඩොත්රකියන් ඔහුට ගරු කරනු ඇතැයි ඈ සිතුවාය. එමෙන්ම එදා තණපිටියේදී ඔහුට ලජ්ජා කිරීම ගැන ඔහු ඇයට සමාව ද දෙනු ඇත. ඔහු තවමත් ඇගේ රජු මෙන්ම ඇගේ සහෝදරයා ද විය. ඔවුන් දෙදෙනාම මකර රුධිරයෙන් බිහිවූවන් වූහ.

ඔහු වෙනුවෙන් නිම වූ තෑගිවලින් අවසාන එක වන, ඔහුගේ හිසේ රිදී පැහැය කැපී පෙන්වන, ලා අළු පාට වාටියකින් හෙබි තණකොල පැහැ සේද සළුවක් ඇය විසින් අතට ගනිද්දී විසේරිස් කූඩාරමට ඇතුළු විය. ඒ නිකම්ම නොව, තමා පසුපසින් ඇදගෙන ආ ඩෝරියා ද සමග විය. ඔහු පහරකෑමට ලක් වීම නිසා ඇගේ ඇසක් රතුවී තිබින. "උඹ කොහොමද මේ පරට්ට වේසිව එව්වේ මට අණ කරන්ට?" ඔහු ඇසුවේ ය. ඔහු සේවිකාව රළු ලෙස පලස මතට තල්ලු කලේය.

ඔහුගේ මේ කෝපය ඇයව මුලුමනින්ම පුදුම කරවී ය. "මට ඕනේ කලේ... ඩෝරියා උඹ මොනවද එයාට කිවුවේ?"

"මට සමාවෙන්ට බලීසි. ඔබ කිවුව විදියට මම එයාව හොයාගෙන ගියා. ගිහින් කිවුවා රෑ කෑමට ඔබත් එක්ක එක්වෙන්ටයි කියලා ඔබ අණ කලා කියලා."

"මකරට කවුරුත් අණ දෙන්නේ නෑ!" විසේරිස් පිම්බේ ය. "මම උඹේ රජ්ජුරුවෝ! මට තිබුනේ උඹට මේකිගේ ඔළුව ආපහු එවන්ට."

ලයිසෙනී කෙල්ල බියෙන් ඇකිලුනු මුත්, ඩැනී ඇය අල්වා නිසල කලාය. "බයවෙන්ට එපා. එයාගෙන් උඹට කරදරයක් වෙන්නෙ නෑ. මගේ හොඳ අයියා, වැරැදියට කතාකලාට මේකිට සමාවෙන්ට. මම කීවේ ඔබතුමා කැමැති නම් අද රෑ කෑම මාත් එක්ක ගන්ට පුළුවන් කියලයි." ඔහුගේ අතින් අල්ලාගත් ඇය ඔහුව කාමරය තුළට කැඳවූවා ය. "මේ බලන්ට. මේවා ඔයාට."

විසේරිස් සැකයෙන් බැම ඇකිළීය. "මේ මොනවද?"

"අලුත් ඇඳුම්. මමමයි ඔයාට හැදුවේ." ඇ ලජ්ජාසහගත සිනාවක් පෑවාය.

ඔහු ඇය දෙස බලා මුව ඇද කලේය. "ඩොත්රැකි කඩමලු! උඹ ඒ පාර මට ඇඳුම් අන්දන්ටත් හදනවද?"

"අනේ... මම හිතුවේ ඒවයින් ඔයාට රස්නෙ අඩුවෙලා හොඳ සනීපයක් දැනෙයි කියලා. මම හිතුවේ... සමහරවිට, ඔයා එයාලගෙ විදියට ඇන්දොත්, ඩොත්රැකියො..." මකරා අවුස්සා නොගෙන එය කියන්නේ කෙසේදැයි ඩැනී නොදැන සිටියා ය.

"ඊලඟට උඹට ඕනවෙයි මගේ කොන්ඩෙත් ගොතන්ට!"

"මම කවදාවත් එහෙම කරන්නේ නෑ..." ඔහු සැමවිටම මෙතරම් නපුරු වන්නේ මන්ද? ඇයට උවමනා වූයේ උදව්වක් කිරීමට පමණි. “ඔයා තාම කිසිම සටනකින් දිනලා නැති හන්දා කොණ්ඩේ ගොතන්ට අවසර නෑ නේ."

එය වැරදි කතාවක් විය. ඔහුගේ එළ නිල් දෑස කෝපයෙන් දිලිසින. එහෙත් ඇගේ සේවිකාවන් බලා සිටිද්දී, ඇගේ බාස් සෙබළුන් පිටත මුරකාවලේ යෙදී සිටිද්දී ඇයට පහරදීමේ හැකියාවක් ඔහුට නොවීය. විසේරිස් සළුව අතට ගෙන ඉව කලේය. "ගොම ගඳයි. සමහරවිට මට මේක පාවිච්චි කරන්ට පුලුවන් වෙයි අශ්ව කම්බිලියකට."

"මම මේක ඩෝරියාට කියලා මැස්සුවේ ඔයා වෙනුවෙන්මයි." ඇය රිදුනු සිතින් කීවාය. "මේවා ඛාල් කෙනෙකුට ගැලපෙන ඇඳුම්."

"මම රාජධානි සප්තකයේ අධිපතියා. කොන්ඩේ සීනු එල්ල ගත්ත, ඇඟ පුරා තණකොළ ඉස්ම තැවරිච්ච ම්ලේච්ඡයෙක් නෙමෙයි." විසේරිස් ඇය දෙසට කෙළ ගැසීය. ඔහු ඇගේ අත තදින් මිරිකා අල්ලාගත්තේ ය. "උඹට උඹවම අමතක වෙලා ගිහිල්ලා පරට්ටියෙ. උඹ හිතනවද මකරා නැගිට්ටොත් උඹේ ඔය ලොකු බඩ උඹව බේර ගනී කියලා?"

ඔහුගේ අතැඟිලි ඇගේ හස්තය මිරිකමින් තවතවත් තදවී ගියේය. එක් මොහොතකට ඩැනීට දැනුනේ ඇය නැවතත් ඔහුගේ කෝපය ඉදිරියේ බියෙන් ඇකිළෙන කුඩා දැරිය බවට පත් වී ඇතුවාක් මෙනි. නිදහස් අතින් අතපත ගෑ ඇය අතට හසු වූ පළමු දේ අල්ලාගත්තා ය. ඒ ඇය ඔහුට තෑගි දීමට සිතූ අලංකාර පදක්කම් සහිත බර ඉණපටිය විය. එය තදින් අල්ලාගත් ඩැනී හැකි උපරිම වීරියෙන් එයින් දමා ගැසුවාය.

එය ඔහුගේ මුහුණ හරහා එල්ලවින. විසේරිස් ඇයව අත් හලේය. පදක්කමකට කැපී විවරවූ තැනකින් ඔහුගේ කපොල ඔස්සේ රුධිරය රූරා බසින්නට විය. "උඹට තමා තමන් කවුද කියලා මතක නැත්තේ." ඩැනී පැවසුවා ය. "උඹ එදා තණගොල්ලෙදි මොකුත්ම ඉගෙනගත්තෙ නැද්ද? මෙතැනින් දැන්මම පිටවෙයන්. මගේ ඛාස්ලට එන්ට කියන්ට කලින්. මම ප්‍රාර්ථනා කරනවා ඛාල් ඩ්‍රෝගෝ මේ ගැන දැනගන්න එකක් නෑ කියලා. නැත්තම් එයා උඹේ බඩ කපලා බඩවැල් ටික උඹටම කවයි"

විසේරිස් නැවත නැගී සිටියේය. "මට මගේ රාජධානිය ලැබුන දාට උඹ මේ දවස ගැන පසුතැවිලි වෙයි වේසියේ!" සිය තුවාල වුනු මුහුණ අල්ලාගත් හේ ඇගේ තෑගි සියල්ලම එහි තිබියදී පිටව ගියේය.

ඔහුගේ ලේ බිඳු කිහිපයක් අලංකාර සේද සළුව පුරා විසිර තිබිනි. ඇය සුමුදු සළුව තම මුහුණට තද කරගනිමින් නිදන මෙට්ටය මත දෙදණ නමා හිඳ ගත්තාය.

"ඔබේ කෑම ලෑස්තියි ඛලීසි." ජික්වී පැවසුවා ය.

"මට බඩගිනි නෑ!" ඩැනී කණගාටුවෙන් පැවසුවාය. හදිසියේම ඇයට දැඩි වෙහෙසක් දැනෙන්නට විය. "මේ කෑම උඹලාම බෙදාගන්ට. කැමැති නම් සෙර් ජෝරාටත් ටිකක් යවන්ට." මොහොතකට පසු ඇය නැවත හඬ අවදිකලා ය. "කරුනාකරලා මට මට මකර බිත්තරයක් ගෙනත් දෙන්ට."

ඉරී ඇය වෙත කොළ පැහැ කටුව සහිත බිත්තරය ගෙනාවා ය. තමාගේ කුඩා අත්වලින් බිත්තරය ඒ මේ අත හරවන විට ඒ කොරපොතු මැද්දේ තඹ පැහැති තිත් තිත් දිලෙනු ඩැනී දුටුවා ය. ඇය පැත්තට හැරී ගුලිවූයේ සේද සළුව තම සිරුර වැසෙන සේ දමාගෙන නෙරා ආ උදරයට හා ඇඳුම් කන කුඩා පයෝධරයන්ට මැදින් බිත්තරය තබා ගත්තාය. මෙසේ මකර බිත්තර ළඟ තබාගෙන අල්ලාගෙන සිටීමට ඇය ප්‍රිය කලාය. ඒවා ඉතා මනහර විය. එමෙන්ම සමහර වේලාවට ඒවා ළඟින් තබාගත් විට තමා වඩා නිර්භීත හා වඩා ශක්තිමත් වන්නාක් මෙන් ඩැනීට දැනින. හරියටම ඇය විසින් ඒ බිත්තර තුළ සිර කෙරුනු මකරුන් ගේ ශක්තිය උරාගන්නාක් මෙනි. මෙසේ ඇලවී සිටිද්දී සිය බිළිඳා කුස තුළ හැරෙන ආකාරය ඇයට දැනින. එය හරියටම... සොහොයුරෙකුට සොහොයුරෙක් බැඳෙන්නාක් මෙන් නැතහොත් ලෙයට ලෙයක් ඇඳෙන්නාක් මෙන් බිළිඳා බිත්තරය දෙසට දෑත් දිගු කලාක් බඳු විය. "ඔයා තමයි මකරා!" ඩැනී ඔහුට ඇසෙන සේ මිමිනුවා ය. "ඇත්තම මකරා. මම ඒක දන්නවා. මම ඒක හොඳින්ම දන්නවා!" ඈ සිනාසුනා ය. ඉන්පසු නිවෙස ගැන සිහින දකිමින් නින්දට වැටුනා ය.

Daenerys Targaryen: “Viserys says he could sweep the Seven Kingdoms with ten thousand Dothraki screamers.”

Ser Jorah Mormont: “Viserys could not sweep a stable with ten thousand brooms.”

බ්‍රැන් 05-1

සිහින් හිම වර්ෂාවක් ඇද හැලෙමින් තිබුනු අතර මුහුණ මතට වැටෙන හිම පියලි සෙමින් දියවී යන අන්දම බ්‍රැන්ට දැනුනි. සිය අසු මත කොන්ද කෙලින් කරගෙන වාඩි වී සිටි ඔහු යකඩ කටු දොරටුව අඟලින් අඟල ඉහළට එසවෙන අන්දම බලා සිටියේ ය. කෙතරම් තමාව සන්සුන් කරගැනීමට උත්සාහ කලද ඔහු ගේ පපුව තුළ හදවත උඩ පනිමින් සිටියේ ය.

"ඔයා ලෑස්තිද?" රොබ් ඇසීය.

බ්‍රැන් හිස වැනුවේ සිත තුළ පැනනැගුනු බිය නොපෙන්වීමට යත්න දරමිනි. කුළුණෙන් වැටුනු දවසේ සිට මේ වනතෙක් ඔහු වින්ටර්ෆෙල්වලින් පිටතට පා තබා නොතිබින. එනමුදු මේ පළමු ගමන නයිට්වරයකු තරම් උදාර අන්දමින් පිටත්වීමට ඔහු අදිටන් කරගෙන තිබින.

"අපි එහෙනම් පිටත්වෙමු." රොබ් සිය අළු හා සුදු පැහැ අසුට විළුඹින් සන් කල අතර සත්ත්වයා කටු දොරටුව පසුකරමින් ඉදිරියට ගියේය.

"යන්ට." බ්‍රැන් සිය අසු ගේ කණට කෙඳිරුවේ ය. ඔහු අසු ගේ ගෙල යාන්තමින් ස්පර්ෂ කල අතර චෙස්නට් පැහැ වෙළඹ සෙමින් ඉදිරියට පා තැබුවා ය. බ්‍රැන් ඇයට ඩාන්සර් යනුවෙන් නම් තබා තිබින. ඇය වසර දෙකක් පමණ වයසැති වූ අතර ජොසෙත් පැවසූ අන්දමට නම් අන් සියලු අසුන්ට වඩා බුද්ධිමත් වූවාය. අසරුවා ගේ කටහඬින් දෙන විධානයන්ට, තෝන්ලණුව ඇදීමට හා ස්පර්ෂයට ප්‍රතිචාර දක්වන අයුරින් ඔවුන් ඇයව වෙසෙසින්ම පුහුණු කර තිබින. මේ වනතෙක් බ්‍රැන් අසු ධාවනය කර තිබුනේ බලකොටු අංගනය තුළ පමණක් විය. මුලදී නම් බ්‍රැන් කුරුමිට්ටා ගේ සැලසුමකට අනුව තමා වෙනුවෙන් විශේෂයෙන්ම නිමකරන ලද සෑදලය මත පටිවලින් බැඳී වාඩි වී සිටියදී ජොසෙත් හෝ හොඩෝර් විසින් අසු ගේ කටකලියාව අල්ලාගෙන ඌව ඉදිරියට මෙහෙයවීය. එනමුදු පසුගිය සති දෙක තුළ ඔහු විසින්ම සිය අසු මෙහෙයවීම අරඹා තිබූ අතර ඇවිදින සෑම වටයක් වටයක් පාසාම ඔහු ගේ විශ්වාසය තවතවත් වැඩි විය.

ඔවුහු ගේට්ටුව අසල වූ මුරකුළුණත්, දිය අගලට උඩින් පාලමත්, පිටත පවුරත් පසුකරමින් එළිමහනට පිවිසියහ. ඔවුන් දෙපසින් සමර් හා ග්‍රේ වින්ඩ් අවට වාතය ඉවකරමින් පිය මැන්නහ. ඔහුට වහාම පසුපසින් සිය දිගු දුන්නත්, හියොවුරත් පැළැඳි තියන් ග්‍රේජෝයි පැමිණියේ ය. තමා මුව දඩයමක් කරන්නට අදහස් කරගෙන සිටින බැව් ඔහු පවසා තිබින. ඔහු ගේ පසුපසින් සෙබළුන් සිවුදෙනෙක් හා ජොසෙත් - හලන් පිටවයාමෙන් පසු අස්හලේ නායකයා වශයෙන් රොබ් විසින් පත්කරන්නට යෙදුනු කෙට්ටු ඉස්තාල සේවකයා - පැමිණියහ. මේ සැමටම පසුපසින් මේස්ටර් ලුවින් බූරුවකු පිට නැගී පැමිණියේ ය. තමා හා රොබ් පමණක් තනිව මේ ගමනේ යෙදෙන්නට බ්‍රැන් වඩාත් කැමැත්තෙන් සිටියේ ය. එනමුදු හැලිස් මොලන් ඒ ගැන අසන්නටවත් කැමැති නොවූ අතර මේස්ටර් ලුවින් ද ඔහු සමග එකඟ විය. බ්‍රැන් අසුපිටින් වැටුනොත් හෝ ඔහුට වෙනත් අනතුරක් තුවාලයක් සිදුවවහොත් තමා ඔහු අසල සිටිය යුතු බැව් ලුවින් කීය.

බලකොටුවට ඔබ්බෙන් වෙළෙඳපල චතුරශ්‍රය පිහිටා තිබුනු අතර එහි වූ වෙළෙඳසල් මේ වනවිට පාළුවට ගොස් තිබින. ඔවුහු ගලින් හා දැවයෙන් නිම කෙරුනු කුඩා නිවාස පේළි පසුකරමින් ගම්මානයේ මඩ වැකි වීදි දිගේ ඉදිරියට පිය නගන්නට වූහ. මේ නිවාසවලින් දැනට ජනාවාස වී තිබුනේ පහෙන් එකකටත් අඩු ප්‍රමාණයක් විය. ශීතය මඳින් මඳ වැඩිවෙද්දී ඉතුරු නිවාස එකින් එක පිරෙනු ඇත. නාකි ආයම්මා ඔහුට කියා දුන් පරිදි හිම වැටෙන්නට පටන්ගත්තාට පසු, උතුරින් සීත සුළං හමාඑන්නට පටන්ගත්තාට පසු, දුරින් දුරින් පිහිටි සිය සීතලෙන් මිදුනු වගාබිම් හා කුඩා බලකොටු අතහැර දමන ගොවීන් තමන් සතු දේ කරත්තවලට පුරවාගෙන මෙහි එනු ඇත. එවිට වින්ටර් ටවුන් ජීවයෙන් පිරී යනු ඇත. මේ දේ සිදුවනු බ්‍රැන් විසින් සිය ජීවිතකාලය තුළදී දැක නොතිබුනු නමුදු මේස්ටර් ලුවින්ට අනුව නම් ඊට සුදුසු කාලය ළඟාවෙමින් තිබින. දිගු ගිම්හානයේ අවසානය අත ළඟම පැමිණෙමින් තිබින. ශීතකාලය ලංවෙමින් තිබින.

අසරුවන් ඔවුන් පසුකර යද්දී ගම්මුන් කිහිපදෙනෙකු සෝරවෘකයින් දෙස වියවුල් බැලුම් හෙලූ අතර එකෙකු පමණක් තමා අත තිබූ දරමිටියද බිම දමා බියෙන් පලාගියේය. එනමුදු බහුතරයක් ගම්වාසීන් මේ වනවිට ඔවුන් ගේ දර්ශනයට හුරු වී සිටියහ. සිය වංශාධිපති උතුමන් දුටු ඔවුන් දණනමා ආචාර කල අතර රොබ් උදාර අයුරින් හිස සැලීමෙන් ඔවුන් සැමදෙනාටම පෙරලා ආචාර කලේය.

සිය දෙපාවලින් කිසිවක් ග්‍රහණය කරගැනීමට නොහැකි වීම නිසා මුලදී නම් අසුපිට යන විට සිදුවන දෙපසට වැනීම බ්‍රැන්ව අස්ථාවර කිරීමට සමත් විය. එනමුදු සාමාන්‍ය

ප්‍රමාණයට වඩා විශාල සෑදලයත්, එහි ඉදිරියෙන් වූ දෑතින් අල්ලාගැනීමට හැකිවන පරිදි සවිකර තිබුනු මහත අඟත්, පසුපසින් කොන්ද හේත්තු කරගන්නට පහසුවන පිණිස සෑදූ ආධාරකයත් නිසා ගමන එතරම් අසීරු දෙයක් නොවීය. මේ සැමටම අමතරව ඔහු ගේ පපුව හා කළවා හරහා බැඳී ගිය සම් පටි නිසා ඔහු කෙසේවත් අසු පිටින් බිම නොවැටෙනු ඇත. මඳ වේලාවකට පසු ඔහු මේ වැනෙන රිද්මයට කෙතරම් හුරු වූවාද යත් එය සාමාන්‍ය තත්ත්වයක් මෙන් දැනෙන්නට විය. ඔහු ගේ සිත තුළ වූ නොසන්සුන් බව හා ව්‍යාකූල බව කෙමෙන් කෙමෙන් පහව යන්නට වූ අතර මුහුණ පුරා පුළුල් සිනහවක් ඇඳෙන්නට විය.

ගම්මානයේ පිහිටි එකම තැබෑරුම වූ ස්මොකින්ග් ලොග්හි දැන්වීම් පුවරුව යට එහි සේවය කරන කෙල්ලන් දෙදෙනෙක් සිටගෙන සිටියහ. තියන් ඔවුන් දෙසට යමක් කියා කෑගැසූ අතර මුහුණ රතු වී ගිය ලාබාල දැරිය දෝතින් මුහුණ වසාගත්තා ය. සිය අසුට සන් කල තියන් රොබ් සමීපයට ළඟා වූයේය. "ඒකි හරි ෂෝක් කෙල්ල, කයිරා." ඔහු සිනාසෙමින් කීය. "ඒකි ඇඳට නැග්ගහම මුගටියෙක් වගේ දඟලනවා. ඒ වුනාට පිටදි උඹ මොනා හරි කිවුවොත් කන්‍යාවක් වගේ මූන රතු කරගන්නවා. මම උඹට කිවුවද එක දවසක් රෑ ඒකියි, බෙසායි-"

"මගේ මල්ලිට ඇහෙන්ට ඕවා කියන්ට එපා තියන්." රොබ් බ්‍රැන් දෙසට බැල්මක් හෙලමින් අනතුරු ඇඟෙවුවේ ය.

වහා ඉවත බැලූ බ්‍රැන් තමාට ඒ කිසිවක් නෑසුනාක් මෙන් හැඟෙවුවේ ය එනමුදු තමා දෙසට එල්ල වී ඇති තියන් ගේ දෑස් ඔහු හඟින්නට විය. ඔහු සිනාසෙමින් සිටිනවා විය යුතුය, ඒ ගැන කිසිදු සැකයක් නැත. ඔහු නිතරම සිනාසෙමින් සිටියේ හරියට ඔහු පමණක් දන්නා රහසක් රස විඳිමින් සිටින්නාක් මෙනි. රොබ් විසින් තියන් කරන කියන සෑම දෙයක්ම මහත් උතුම් කොට සැලකූ මුත් බ්‍රැන් ගේ සිතේ ඔහු ගැන එතරම් පැහැදීමක් නොතිබිනි.

රොබ් ඔහු අසලට ළඟා විය. "ඔයා හොඳට කරගෙන යනවා බ්‍රැන්."

"මට මීට වඩා හයියෙන් යන්ට ඕන." බ්‍රැන් පිළිවදන් දුනි.

රොබ් සිනාසුනේ ය. "ඔයාගෙ කැමැත්තක්." ඔහු සිය අසුට හැල්මේ යන්නැයි සන් කලේය. වෘකයින් ඔහු පසුපසින් හඹා යන්නට වූහ. බ්‍රැන් සිය තෝන්ලණුව තදින් ඇද්දෙන් ඩාන්සර් ද සිය වේගය වැඩි කලාය. ඔවුන්ට පිටුපසින් තියන් කෑ ගසන හඬ ද අසුන් ගේ කුර ගැටෙන හඬ ද ඔහුට ඇසින.

සුළඟ විසින් බ්‍රැන් ගේ සළුව ලෙලවමින් පසුපසට විහිදා හැරි අතර හිම වර්ෂාව දැඩිව ඔහු ගේ මුහුණට වැද්දුවේ ය. රොබ් මේ වනවිටද බොහෝ දුරක් ඉදිරියට ගොස් තිබුනේ විටින් විට පසුපස හැරී බැලුවේ බ්‍රැන් සහ අන්‍යයන් තමා ලුහුබැඳ එන්නේදැයි දැනගැනීම පිණිස විය. බ්‍රැන් තවත් වරක් තෝන්ලණුව ඇද්ද අතර ඩාන්සර් සුමුදු අයුරින් සිය වේගය වැඩි කරගනිමින් පිම්මේ දුවන්නට වූවාය. දෙදෙනා අතර පරතරය කෙමෙන් අඩු වී ගියේය. බ්‍රැන් විසින් නගරයෙන් සැතපුම් දෙකක් පමණ ඈතින් වෘකවනය අද්දරදී රොබ් හා සමපාත වන විට ඔවුන් දෙදෙන අන්‍යයන් පසුකර බොහෝ දුරක් ගෙවා තිබ්න. "මට අශ්වයො පදින්ට පුළුවන්." බ්‍රැන් සතුටින් සිනාසෙමින් කෑගැසීය. එය පියෑඹීම තරම්ම අගනා දෙයක් විය.

"ඕනනං මට තරගෙකට එන්ට පුළුවන්. ඒත් මට බයයි ඔයා දිනයි කියලා." රොබ් සැහැල්ලු සරදම් ස්වරයෙන් කීය. එනමුදු ඒ සිනහවට යටින් කුමක් හෝ දෙයක් සිය සොයුරාට වදදෙමින් තිබෙන බැව් බ්‍රැන්ට දැකගත හැකි විය.

"මට තරගෙකට යන්ට ඕන නෑ." සෝරවෘකයින් කොහේදැයි සොයන්නට බ්‍රැන් අවට බැලුවේ ය. එනමුදු දෙදෙනාම වනය තුළට වැදී අතුරුදහන් වී තිබ්න. "ඔයාට ඇහුනද ඊයේ රෑ තිස්සෙ සමර් උඩුබුරලන සද්දෙ?"

"ග්‍රේ වින්ඩුත් හරිම නොසන්සුන්කමෙන් තමා හිටියෙ." රොබ් කීය. ඔහු ගේ රතු-දුඹුරු පැහැති හිසකෙස් දිගට වැවී තිබුනු අතර මුහුණ දෙපස ලා රත් පැහැ යෞවන රැවුලක් වැවෙන්නට පටන්ගෙන තිබ්න. මේ නිසා ඔහුට අවුරුදු පහළොවකට වඩා වැඩි වයසක පෙනුමක් ලැබී තිබ්න. "මට සමහරවෙලාවට හිතෙනවා එයාලා ඉවෙන් වගේ දේවල් දැනගන්නවා කියලා... දේවල් හඟිනවා කියලා." රොබ් සුසුමක් හෙලීය. "මම දන්නෙ නෑ ඔයාට කොච්චරක් දේවල් කියන්ට ද, කොච්චරක් දේවල් කියන්ට එපා ද කියලා බ්‍රැන්. ඔයා මීට වඩා වයස වැඩි වුනානං..."

"මට දැන් අටක්. අට කියන්නෙ පහළොවට වඩා ගොඩක් ලාබාලයි නෙවෙයි. අනික ඔයාගෙන් පස්සෙ මම තමා වින්ටර්ෆෙල්වල උරුමක්කාරයා."

"ඔයා හරි." රොබ් ගේ ස්වරයේ දුක්මුසු බවක් හා බියක් රැඳී තිබින. "බ්‍රෑන් මට ඔයාට කියන්ට කාරණයක් තියෙනවා. ඊයෙ රෑ කපුටෙක් ආවා. කිංග්ස් ලෑන්ඩින්ග්වල ඉඳන්. මේස්ටර් ලුවින් මාව නැගිට්ටෙවුවා."

හදිසියේම බ්‍රෑන්ට බියක් දැනෙන්නට විය. 'කළු පියාපත්-නපුරු පණිවුඩ', නාකි ආයම්මා සැමවිටම කියන්නට පුරුදුව සිටියේ ය. එමෙන්ම පසුගිය කාලය පුරාවටම පණිවුඩ ගෙන ආ කපුටන් ඒ පිරුළ සැබෑවක්යැයි සනාථ කරන්නට සමත් වී තිබින. රොබ් නිශා රැකුමේ ප්‍රධාන අණදෙන නිළධාරිතැනට යැවූ ලිපියට ලැබුනු පිළිතුර වූයේ බෙන්ජින් බාප්පා තවමත් අතුරුදහන් වී ඇති බවය. ඉන්පසු ඉයරීහි සිට ඔවුන් ගේ මව පණිවුඩයක් එවමින් කියා සිටියේ ඇය නැවත පැමිණෙන දිනයක් හරියටම කියත නොහැකි බවය. ඇය පුංචි යකාව සිරකරුවකු වශයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවත් එයින් වැඩි දුරටත් කියැවින. බ්‍රෑන් ගේ සිතේ මේ පුංචි මිනිසා ගැන කුමක්දෝ කැමැත්තක් ඇති වී තිබින. එනමුදු ලැනිස්ටර් යන නාමය ඇසෙන වාරයක් පාසා ඔහු ගේ පිටකොන්ද දිගේ සියුම් හිරියක් පැතිරයන්නට විය. ලැනිස්ටර්වරුන් ගැන ඔහු දන්නා යම් දෙයක්, ඔහු මතක තබාගත යුතු යම් දෙයක් තිබින. එනමුදු ඒ කුමක්දැයි සිහිපත් කරන්නට වෑයම් කරන සෑම විටකදීම ඔහුට ක්ලාන්ත ගතියක් දැනෙන්නට වූ අතර උදරය ගලක් මෙන් දැඩි වී ගියේය. මව ගේ පණිවුඩය පැමිණි දිනය පුරාවටම පාහේ රොබ්, මේස්ටර් ලුවින්, තියන් ග්‍රේජෝයි හා හැලිස් මොලන් සමග එක්ව කාමරයකට වී දොර වසාගෙන රහස් මන්ත්‍රණයක් පැවැත්වීය. ඉන්පසු රොබ් ගේ නියෝග රැගත් අසරුවන් මුලු උතුරුකරය පුරාවටම පිටත්කර හැරින. මුල් මිනිසුන් විසින් බෙල්ල ආරක්ෂාකරනු වස් පිහිටුවා තිබුනු පුරාණ මෝට් කේය්ලින් බලකොටුව ගැන ඔවුන් කතා කරනු බ්‍රෑන් ගේ සවනත වැකී තිබින. සිදුවන්නේ කුමක්දැයි කිසිවෙකුත් කිසිවක් කියා නොතිබුනු නමුදු තත්ත්වය එතරම් හොඳ නැති බව ඔහුට වැටහී ගියේය.

ඉතින් දැන් තවත් පණිවුඩයක් රැගෙන තවත් කපුටකු පැමිණ ඇත. "පණිවුඩේ අම්මගෙන්ද? එයා ගෙදර එනවලුද?"

"පණිවුඩේ කිංග්ස් ලෑන්ඩින්ග්වල ඉඳන් ඇලන්ගෙන්. ජොරී කසල් මැරිලා. විලුයි හේවර්ඩුයිත් ඒ එක්කම මැරිලා. රජුන් මරන්නා තමා මෙයාලව මරලා තියෙන්නෙ." රොබ්

මුහුණ ඉහළට එසවූ අතර හිම පියලි ඔහු ගේ මුහුණ මත පතිත වී දියව ගියේය. "දෙයියො එයාලට සමාදානෙන් සැතපෙන්ට දෙන්ට ඕන."

කුමක් කිවයුතුදැයි බ්‍රැන්ට සිතාගත නොහැකි විය. සිය මුහුණ හරහා මුෂ්ටි ප්‍රහාරයක් එල්ලවූවාක් වැනි තෝන්තුවාවක් ඔහුට දැනින. ජොරී වින්ටර්ෆෙල්වල මාලිගාරක්ෂක බලකායේ නායකයා වශයෙන් කටයුතු කරන්නට පටන්ගත්තේ බ්‍රැන් ඉපදීමටත් පෙර සිට විය. "උං ජොරීව මරලා දැම්මා?" තමාව වහළ මතින් බිමට බස්සවන්නට ජොරී විසින් ඔහුව ලුහුබැඳ පැමිණි අවස්ථා බ්‍රැන්ට සිහිපත් විය. සන්නාහය පැළඳ අංගනය හරහා දිගු පියවර තබමින් ඔහු යන සැටි, ප්‍රධාන ශාලාවේ ඔහු සැමදාම අසුන්ගන්නා තැන වාඩි වී කෑම කන අතර විහිළු කතා කියන ආකාරය බ්‍රැන් ඉදිරියේ මැවී පෙනෙන්නට විය. "ඇයි කාටවත් ජොරීව මරන්ට ඕනවෙන්නෙ?"

රොබ් නිහඬවම හිස වැනීය. ඔහු ගේ දෑසේ වූ වේදනාව පැහැදිලිව විද්‍යාමාන විය. "මම දන්නෙ නෑ. අනික... බ්‍රැන්, ඒක නෙවෙයි නරකම දේ. මේ සටනෙදි තාත්තා වැටෙන අශ්වයෙකුට යටවෙලා. ඇලන් කියනවා එයාගෙ කකුල කැඩිලයි කියලා. මේස්ටර් පයිසෙල් එයාට පොපි යුෂ දුන්නලු. ඒ වුනත් එයාලට විශ්වාස නෑ කවදද... කවදද එයා..." තියන් සහ අනිකුන් පැමිණෙන අසු කුර හඬ ඔවුන් ගේ පසුපසින් ඇසෙන්නට විය. "කවදද එයා නැගිටින්නෙ කියලා." මේ වනවිට ඔහු ගේ සුරත සිය අසිපතේ මිට මත රැඳී තිබුනු අතර ඔහු ගේ කටහඬේ ස්වරය වංශාධිපති රොබ් ගේ ගැඹුරු කටහඬ බවට පරිවර්තනය වී තිබින. "බ්‍රැන් මම ඔයාට පොරොන්දු වෙනවා. මොන දේ සිද්දවුනත් මේ වුන දේවල් එහෙම ලේසියෙන් අමතක වෙන්ට මම ඉඩ තියන්නෙ නෑ."

ඔහු ගේ ස්වරයේ තිබුනු යම් දෙයක් නිසා බ්‍රැන් වඩාමත් බියපත් විය. "ඔයා මොනවද කරන්ට යන්නෙ?" තියන් ඔවුන් පසෙකින් අසු නවතන අතරේ ඔහු ඇසීය.

"තියන් හිතන්නෙ මම යටත් වංශාධිපතියන්ට පණිවුඩ ඇරලා සෙබළු රැස්කරන්ට පටන්ගන්ට ඕනයි කියලා." රොබ් පිළිතුරු දුනි.

"ලෙයට ලෙය." තියන් ග්‍රේජෝයි සිනහනොවනු බ්‍රැන් දුටු මුල්ම අවස්ථාව මෙය විය.

"වංශාධිපතියෙකුට විතරයි එහෙම කරන්ට පුළුවන්." බ්‍රැන් කීය.

"ඔයාගෙ තාත්තා මැරුනොත්," තියන් කීවේය. "රොබ් තමා වින්ටර්ෆෙල්වල උතුමානන් වෙන්නෙ."

"එයා මැරෙන්නෙ නෑ." බ්‍රැන් මොර දුන්නේ ය.

රොබ් ඔහු ගේ අතින් අල්ලාගත්තේ ය. "එයා මැරෙන්ට යන්නෙ නෑ." ඔහු සන්සුන් ස්වරයෙන් කීය. "ඒ වුනත්... උතුරේ ගෞරවය දැන් මගෙ අත උඩයි තියෙන්නෙ. අපේ තාත්තා පිටවෙලා යන්ට කලින් මගෙන් ඉල්ලා හිටියා ඔයයි රිකනුයි වෙනුවෙන් ශක්තිමත්ව ඉන්ටයි කියලා. මම දැන් බොහොමදුරට වැඩුන මිනිහෙක් බ්‍රැන්."

බ්‍රැන් වෙවුලා ගියේය. "අම්මා හිටියානං." ඔහු දුක්ඛිත අයුරින් කීවේය. මේස්ටර් ලුවින් කොහේදැයි දැනගන්නට ඔහු අවට බැලීය. ඔහු ගේ බූරුවා ඈත බකල ගසමින් පැමිණෙමින් සිටියේය. "මේස්ටර් ලුවිනුත් කියනවද සෙබළු රැස්කරන්ටයි කියලා?"

"මේස්ටර් නාකි අම්මණ්ඩි කෙනෙක් වගේ බයගුල්ලෙක්." තියන් පිළිතුරු දුන්නේය.

"තාත්තා හැමවෙලාවෙම එයාගෙ උපදෙස්වලට කණ් දුන්නා." බ්‍රැන් සිය සොයුරාට සිහිපත් කර දුනි. "අම්මත්."

"මම එයාට ඇහුම්කණ් දෙනවා." රොබ් තිර ස්වරයෙන් කීය. "මම හැම කෙනාටම ඇහුම්කණ් දෙනවා."

මෙම ගමන නිසා බ්‍රැන් ගේ සිතේ ඇතිවී තිබුනු ප්‍රීතිය ඔහු ගේ මුහුණට වැටුනු හිම පියළි මෙන්ම දියව ගියේය. පෙර කල නම් රොබ් තමාට යටත් වංශාධිපතියන් කැඳවාගෙන සටනට යනවා ඇත යන සිතුවිල්ල ඔහු ගේ සිත ආහ්ලාදයෙන් පුරවාලන්නට සමත් වනු

ඇත. එනමුදු දැන් ඒ වෙනුවට ඔහු ගේ සිතේ ඇති වූයේ භීතියක් පමණි. "අපට දැන් ආපහු යන්ට පුළුවන්ද? මට සීතලයි." ඔහු ඇසීය.

රොබ් වටපිට බැලීය. "අපට වෘකයො දෙන්නව හොයාගන්ට වෙනවා. ඔයාට තව ටික වෙලාවක් ඉවසන් ඉන්ට පුළුවන්ද?"

"ඔයා ඉන්න තරම්ම වෙලාවක් මටත් ඉන්ට පුළුවන්." මේ ගමන කෙටි එකක් කරන්නැයි මේස්ටර් ලුවින් අනතුරු අඟවා තිබුනේ සෑදලයට කැපීම නිසා ඔහුට වේදනා දැනෙනු ඇතැයි බියෙනි. එනමුදු සිය සොයුරා ඉදිරිපිටදී තම බැරි අමාරුකම් ගැන කතා කරන්නට ඔහුට සිත් නොදින. හැමදෙනාම සෑමවිටම ඔහු හොඳින් දැයි විමසීමත්, ඔහු ගැන සොයා බැලීමත් බ්‍රැන්ට මහත් හිසරදයක් වී තිබින.

"හරි. එහෙනං එන්ට අපි යමු දඩයක්කාරයො දඩයම් කරන්ට." රොබ් කීය. සිය අසුන් විහිදූ ඔවුහු රජමාවතෙන් ඉවත්ව වෘකවනය තුළට වැදුනහ. ඔවුන් දෙදෙනාට ඉදිරියෙන් යන්නට ඉඩ හල තියන් සෙබළුන් හා කතා කරමින්, විහිළු කරමින් ඔවුන් පසුපසින් වැටින.

ගස් යට සෙවන ප්‍රියජනක විය. තෝන්ලණුව සැහැල්ලුවෙන් අල්ලාගත් බ්‍රැන්, ඩාන්සර්ට නිදහසේ ඉදිරියට ඇවිද යන්නට ඉඩ හැරියේ තමා අවට වනය පිරික්සා බලන්නට විය. ඔහු මෙම වනය මනාව දැන සිටියේ ය. එනමුදු වින්ටර්ෆෙල්වලට වී සෑහෙන කාලයක් ගතකිරීම නිසා එය මුල්ම වරට දකින්නාක් මෙන් ඔහුට හැඟින. ඔහු ගේ නාසය වනයේ සුවඳින් පිරීගියේය. ඉඳිකටු වැනි පයින් කොළවල තියුණු, සැර සුවඳ, දිරායන කොලරොඩුවලින් හමන තෙත් පස් පුසුඹ, සතුන් ගේ ගඳ හා ඇතින් නැගෙන කඳවුරු ගිනිමැලවල ඉවුම් පිහුම් සුවඳ ආදී සැමෙකක්ම එහි විය. හිමෙන් වැසුනු ගස් අතුපතර අතරින් පැන පැන යන කළු ලේනකු ඔහු ගේ නෙත ගැටුනු අතර රිදී පැහැයෙන් දිදුලන විශාල මකුළුදැලක් නිරීක්ෂණය පිණිස ඔහු අසු මඳක් නැවැත්වීය.

තියන් හා අනෙකුන් තවතවත් පසුවිය. අන්තිමේදී බ්‍රැන්ට ඔවුන් ගේ කටහඬ නැසී ගියේය. ඔවුන්ට ඉදිරියෙන් දියපහරක සියුම් හඬ ඇසෙන්නට විය. ඔවුන් කෙමෙන් කෙමෙන් එයට සමීපවෙද්දී හඬ ක්‍රමයෙන් වැඩි විය. බ්‍රැන් ගේ දෑස කඳුළින් පෙඟී ගියේය.

"බ්‍රෑන්! මොකක්ද ප්‍රශ්නෙ?"

බ්‍රෑන් හිස සැලීය. "මට එකපාරටම දෙයක් මතක් වුනා. මතකද එකපාරක් ජොරී අපිව මෙතනට එක්කරන් ආවා. ට්‍රවුට් මාළු අල්ලන්ට. ඔයයි, මායි, ජොනුයි. ඔයාට මතකද ඒක?"

"මට මතකයි." රොබ් ගේ ස්වරයට වේදනාව මුසු වී තිබින.

"මට එක මාළුවෙක්වත් අල්ලගන්ට බැරිවුනා. ඒ වුනත් අපි ආපහු වින්ටර්ෆෙල්වලට යන අතරමගදි ජොන් මට එයාගෙ මාළුවා දුන්නා. අපට ආයෙමත් ජොන්ව දකින්ට ලැබෙයිද?"

"රජතුමා මෙහෙ ආපු වෙලාවෙ අපට බෙන්ජීන් බාප්පාව දකින්ට ලැබුනනෙ. ජොන්ටත් ඒ වගේ එන්ට පුළුවන් වෙයි. බලමුකො."

දියපහර වේගයෙන් ගලාබසිමින් තිබින. අසුපිටින් බිමට බට රොබ් නොගැඹුරු තොටුපළ හරහා දියපහරින් එතෙර විය. සිය අසු ගසකට ගැට ගැසූ ඔහු නැවතත් බ්‍රෑන් හා ඩාන්සර් වෙනුවෙන් මෙගොඩට පැමිණියේ ය. ගල්වල හා ගස්මුල්වල හැපෙමින් විසිරෙන පෙණ පිඩු ගඟ තරණය කරන බ්‍රෑන් ගේ මුහුණට විසිවුනු අතර එය ඔහු ගේ මුවේ සිනාවක් මතුකරලන්නට සමත් විය. එක මොහොතකට තමා නැවතත් ශක්තිසම්පන්න, සම්පූර්ණ පුද්ගලයකු ලෙස ඔහුට දැනින. අවට බැලූ ඔහු උසැති ගස්වල මුදුනටම නගින අයුරු සිහින දකින්නට විය. ගස මුදුනටම, අන්තිම රිකිල්ලටම නැංග පසු තමාට පහළින් වනය විහිදී ඇති සැටි ඔහු ගේ සිතේ මැවෙන්නට විය.

දියපහරේ එගොඩට ගිය පසු ඔවුන්ට පළමු වරට වෘකයින් ගේ උඩුබුරලෑම ඇසින. එම හඬ සීතල සුළඟක් මෙන් ගස් අතරින් පෙරී ආයේය. හිස එසවූ බ්‍රෑන් ඒ හඬට සවන් දුනි. "ඒ සමර්." ඒ සමගින්ම දෙවන හඬක් මුල් උඩුබිරීමට එකතු විය.

"එයාලා සතෙක්ව දඩයම් කරලා." නැවතත් සිය අසු පිට නගින අතරේ රොබ් කීවේය. "මම ගිහින් උංව එක්කරන් එන එක හොඳයි. ඔයා මෙතනට වෙලා ඉන්ට. තියනුයි, අනිත් අයයි ඉක්මනටම එයි."

"මටත් ඔයත් එක්ක එන්ට ඕන." බ්‍රෑන් කීය.

"මම විතරක් ගියොත් ඉක්මනටම උන්ව හොයාගන්ට පුළුවන් වෙයි." සිය අසුට සන් කල රොබ් වනයේ ගස් අතර සැඟව ගියේය.

ඔහු පිටව ගිය පසු තමා වටා වූ වනය කෙමෙන් කෙමෙන් ලංවන්නාක් මෙන් බ්‍රෑන්ට දැනින. හිම වර්ෂාව තද කරන්නට පටන්ගෙන තිබින. ඔහු වටා සැමතැනම, ගස් අතු, ගල්, මුල් සැමෙකක්ම හිමෙන් වැසී සුදු පැහැ වී ගියේය. තමා ගේ තත්ත්වය බෙහෙවින් අසතුටුදායක බැව් ඔහුට හැඟී ගියේය. සැදල පටි මත එල්ලෙමින් තිබුනු දෙපාවලට කිසිදු හැඟීමක් දැනීමක් නොවීය. ඔහුව සැදලයට බැඳ දමා තිබුනු පටි පපුව හරහා තද වී වේදනා ගෙනදුන්නේ ය. දියවන හිම ඔහු ගේ අත්වැසුම් තුළට රිංගා දෑත තෙත් කලේය. තියන්, මේස්ටර් ලුවින්, ජොසෙත් හා අනිකුත් පිරිස මෙතරම් පමාවන්නේ මන්දැයි ඔහු විමතියෙන් කල්පනා කරන්නට විය.

තමා පසුපසින් කොළ සර සර හඬ නංවනු ඇසුනු ඔහු අසු හැරෙවුවේ සිය පිරිස දකිනු රිසියෙනි. එනමුදු ගංඉවුර වෙත පියමැන්න වැරහැලි ඇඳගත් මේ මිනිසුන් ඔහු කිසිදා දැක නොමැති ආගන්තුකයෝ වූහ.

Maester Luwin: “Folly and desperation are ofttimes hard to tell apart.”

"ඔබලාට සුබ දවසක් වේවා!" බ්‍රෑන් නොසන්සුන් සිතින් කීය. මේ වනයේ මුර සංචාරකයින් හෝ ගොවීන් හෝ නොවන බව දැනගැනීමට ඔහුට එකම එක බැල්මක් ප්‍රමාණවත් විය. තමා කෙතරම් වටිනා ඇඳුම් ආයිත්තම්වලින් සැරසී සිටින්නේදැයි ඔහුට

හදිසියේම වැටහී ගියේය. ඔහු ගේ පිටකබාය රිදී පැහැ බොත්තම් ඇල්ලූ, අඳුරු අළු පැහැ ලොමින් නිමවුනු අලුත්ම එකක් විය. වාටිය ලොමින් සැරසූ ඔහු ගේ සනකම් සළුව බරැති රිදී හාරිච්චියකින් උරහිස අසලදී එක්කොට තිබින. ඔහු ගේ බූට්ස් සපත්තු හා අත්වැසුම් පවා ලොම්වලින් වැඩ දමා තිබින.

"උඹ තනියෙම්ම නේද?" පිරිසේ වූ දැවැන්තයා ඇසීය. ඔහු අවුවැසිවලින් බැට කෑ මුහුණක් ඇති තට්ට හිසැත්තෙකු විය. "වෘක වනාන්තරේ අතරමං වෙලා. අසරණ දරුවා."

"මම අතරමං වෙලා නෑ." මේ ආගන්තුකයින් තමා දෙස බලන ආකාරය ගැන බ්‍රැන් කැමැත්තක් නොදැක්වීය. පිරිසේ සිවුදෙනෙකු සිටි අතර හිස හරවා බලද්දී තමා පිටුපසින් සිටගෙන සිටින තවත් දෙදෙනකු බ්‍රැන් දුටුවේය. "මගේ අයියා පොඩ්ඩකට කලින් ටිකක් එළියට ගියා. මගේ ආරක්ෂක සෙබළු දැන් මෙතනට එනවා ඇති."

"උඹේ ආරක්ෂක සෙබළු ඒ." තවත් මිනිසකු කීය. ඔහු ගේ වැරුනු මුහුණ අඳුරු රැවුල් කොටයෙන් වැසී තිබින. "ඉතින්, උං මොනාද ආරක්ෂා කරන්නෙ මගේ පුංචි උතුමානනි? උඹේ සළුවෙ ඔය ගහලා තියෙන්නෙ රිදී හාරිච්චියක්ද?"

"ඒක හරිම ලස්සනයි." ගැහැණු කටහඬක් කීය. ඇය ගැහැණියක මෙන් හඳුනාගැනීම අසීරු කරුණක් විය. උස, කෙට්ටු මේ ගැහැණියට අන් අයට මෙන්ම අවුවැසිවලින් බැට කෑ දැඩි මුහුණක් තිබූ අතර ඇගේ දිගු හිසකෙස් අඩ ශිරස්කයක් යට සැඟවී තිබින. ඇය අත දරා සිටි හෙල්ලය අඩි අටක් දිගැති ඕක් ලීයෙන් නිමැවී තිබුනු අතර මල කෑ යකඩ තලයකින් සමන්විත විය.

"අපි පොඩ්ඩක් බලමු." දැවැන්තයා කීය.

බ්‍රැන් වියවුල් සිතින් ඔහු දෙස බලා සිටියේය. මේ මිනිසා පැළැඳ සිටි කඩමාලු වූ ඇඳුම් අන්තයටම දිරා ගොස් තිබින. එහි තැනින් තැන විවිධ වර්ණයෙන් අණ්ඩ දමා තිබුන ද, පැහැය සම්පූර්ණයෙන්ම මෙන් වියැකී ගොස් තිබුන ද එය එක් කලෙක කළු පැහැයෙන් තිබූ බැව් සිතාගත හැකි විය. අඳුරු රැවුල් කොටයෙන් මුහුණ වැසුනු මිනිසාද එවැනිම පාට වියැකී ගිය කළු පැහැ ඇඳුමක් හැඳ සිටින බැව් ඔහුට පෙනී ගියේය. ඔවුන්ට වෘක පැටවුන්

හමුවුනු දිනයේ සිය පියා අතින් හිස්ගැසුම් කෑ මිනිසා බ්‍රෑන්ට හදිසියේම සිහිපත් විය. ඔහු හැඳ සිටියේද කළු පැහැ ඇඳුමකි. ඔහු නිශා රැකුමෙන් පළා යන්නෙකු බැව් පියා ඔහුට කියා දී තිබින. 'වෙන කිසිම මිනිහෙක් ඌ තරම් භයානක නෑ' සිය පියා පවසනු ඔහුට මතක් විය. 'පැනලා යන එකා දන්නවා ආපහු අහුවුනොත් මිනිහගෙ ජීවිතේ එතනින් ඉවරයි කියලා. ඒ නිසා ඌ අහු නොවී ඉන්ට ඕනම අපරාධයක් කරන්ට ලෑස්තියි.'

"හාරිච්චිය දියං කොල්ලො." දැවැන්තයා අත පෑවේය.

"අපි අස්සයත් ගන්නවා." තවකෙක් කීය. ඇය මහත මුහුණකින් හා කහ පැහැ කෙස් කළඹකින් හෙබි මිටි ගැහැණියක වූවාය. "බිමට බැහැපං. ඉක්මන් කරපං." ඇය සිය කමිස අත අස්සෙන් පිහියක් ඇදගත්තා ය.

"නෑ." බ්‍රෑන් කීවේය. "මට බෑ."

ඩාන්සර්ව හරවාගෙන මෙතැනින් පලායාමට බ්‍රෑන් සිතන්නටත් මත්තෙන් අත දිගුකල දැවැන්තයා අසු ගේ කටකලියාවෙන් අල්ලාගත්තේ ය. 'උඹට පුළුවන් පුංචි උතුමානනි.. උඹ ඒක කරයි. උඹ දන්නවානං මොකක්ද දැන් කරන්ට ඕන හොඳම දේ කියලා."

"ස්ටිව්, බලපං ඌව පටිවලින් ගැටගහලා තියෙන විදිය." උස ගැහැණිය සිය හෙල්ල දිගු කර පෙන්නුවා ය. "සමහරවිට ඌ කියන්නෙ ඇත්ත වෙන්ට ඇති."

"පටි ඒ." ස්ටිව් කීය. ඔහු සිය ඉණපටියෙන් සිරියක් ඇදගත්තේ ය. "පටි ගැන වගබලාගන්ට ක්‍රම තියෙනවා."

"උඹ මොකෙක් හරි අබ්බගාතයෙක් ද?" මිටි ගැහැණිය ඇසුවා ය.

බ්‍රෑන් ගේ මුහුණ කේන්තියෙන් රතු වී ගියේය. "මම වින්ටර්ෆෙල්වල බ්‍රෑන්ඩන් ස්ටාර්ක්. මගේ අශ්වයාව අත ඇරපං. නැත්තං තොපි ඔක්කොටම මැරුම් කන්ට වෙයි."

අඳුරු පැහැ රැවුලින් යුතු මිනිසා සිනාසුනේ ය. "ඒක ඇත්ත. මේ කොල්ලා ස්ටාර්ක් කෙනෙක් තමා. සාමාන්‍ය සිහිමොළේ තියෙන මිනිස්සු ජීවිතදානය ඉල්ලලා බැගෑපත් වෙන මේ වගේ වෙලාවලදි මෙහෙම වහසිබස් දොඩවන්නෙ ස්ටාර්ක්ලා වගේ මෝඩයොම තමා."

"උගෙ පුංචි *** කපලා කටේ ඔබහං." මිටි ගැහැණිය කීවාය. "එතකොට උගෙ කට වැහෙයි."

"උඹ කැතයි වගේම මහ මෝඩයි හාලි." උස ගැහැණිය කීවාය. "මේ කොල්ලා මැරුනොත් කිසිම වටිනාකමක් නෑ. පණපිටින් ඉන්දැද්දියි වටින්නෙ... දෙයියම්පා! පොඩ්ඩක් හිතපං, බෙන්ජින් ස්ටාර්ක්ගෙ ලේ නෑයෙක් ප්‍රාණ ඇපකාරයෙක් විදියට තියාගන්ට තිබ්බොත් මැන්ස් මොනවා නොදී ඉදියි ද?"

"මැන්ස් යකාට ගියාවෙ." දැවැන්තයා අවලාද නැගුවේය. "උඹට ආයෙමත් එහාට යන්ට ඕනද ඕෂා? උඹ ඒකිට වඩා ලොකු මෝඩියෙක්. උඹ ගාව ප්‍රාණ ඇපකාරයෙක් ඉන්නවා කියලා 'අනික් එවුං' උඹව නොමරා ඉදියිද?" නැවත හැරුනු ඔහු බ්‍රැන් ගේ කළවා හරහා බැඳ තිබුනු සම් පටිය හරහා පිහිය ඇද්දේ ය. පටිය සැනෙන් දෙකඩ විය.

පිහිපහර ඉක්මන් හා සැහැල්ලු එකක් වූ අතර මස යටට කැපී ගියේය. පහත බැලූ බ්‍රැන් සිය ලොම් කලිසම කැපුනු තැනින් සම නිරාවරණය වී ඇති සැටි දුටුවේය. ඊළඟ මොහොතේ එතැන රුධිරය පිරෙන්නට පටන් ගති. රතු පැල්ලම පැතිරී යද්දී, ඔහු ගේ හිසේ ක්ලාන්ත ගතියක් ඇතිවූ නමුදු තුවාලයේ කිසිදු වේදනාවක් හෝ හැඟීමක් නොවීය. දැවැන්තයා විමතියෙන් මෙන් උගුරෙන් හඬක් නැගීය.

"දැන් උඹලගෙ ආයුධ බිම දාපල්ලා. මම පොරොන්දු වෙනවා හැමෝටම ඉක්මන්, වේදනා දැනෙන්නැති මරණයක්." රොබ් ගේ හඬ ඇසින.

බ්‍රැන් බලාපොරොත්තු පිරුනු දෑසින් එදෙස බැලීය. රොබ් ගංඉවුරේ සිටගෙන සිටියේය. ඔහු ගේ ස්වරයේ තිබුනු ආතතිය නිසා ඒ වදන්වල තිබුනු සැහැසිබව අඩු වී ගොස් තිබින.

අසු පිට නැග සිටි ඔහුට පිටුපසින් අසු මත එල්ක් මුවකු ගේ මළකඳක් විය. ඔහු ගේ සුරතේ අසිපත ලෙලදුනි.

"උගෙ අයියා." අඳුරු රැවුලකින් යුතු මිනිසා කීය.

"ඌ හරිම භයංකාර එකෙක් නේ." හාලි නමින් හැඳින්වුනු මිටි ගැහැණිය සමච්චල් ස්වරයෙන් කීවාය. "උඹ අපිත් එක්ක හටන් කරන්ටද හිතාගෙන ඉන්නෙ කොල්ලො?"

"මෝඩයෙක් වෙන්ට එපා කොල්ලො. අපි හයදෙනෙකුට විරුද්ධව තනි උඹ විතරයි ඉන්නෙ." උස ගැහැණිය ඊෂා සිය හෙල්ලය උරුක් කලාය. "අස්සයා පිටෙන් බැහැලා කඩුව විසි කරපං. අස්සයාටයි, මුව මස්වලටයි බොහොම ස්තූතියි! උඹටයි උඹේ මල්ලිටයි යන තැනක යන්ට පුළුවන්."

රොබ් සියුරුහඬ ලැවේය. තෙත් කොළ මත ඇවිදින මෘදු පියවර හඬ ඔවුන්ට ඇසින. වනයේ යටිවගාව දෙබෑ වී ගිය අතර ගස්වල පහත් අතුවල වූ හිමකැටි බිම වැටින. ග්‍රේ විජ්ඩ් හා සමර් වනයේ හරිත පැහැය අතරින් මැත් වූහ. අවට ඉව අල්ලා බැලූ සමර් ගොරවන්නට විය.

"වෘකයො!" හාලි මවිතයෙන් හුස්මක් ඇදගත්තා ය.

"සෝරවෘකයො." බ්‍රැන් කීය. වෘකයින් දෙදෙනා තවමත් සම්පූර්ණයෙන්ම වැඩී නොතිබුනු නමුදු ඔහු දැක ඇති අන් ඕනෑම වෘකයෙකුට වඩා උන් දැනටමත් විශාල වූහ. එහෙත් සාමාන්‍ය වෘකයකු හා සෝරවෘකයකු අතර වෙනස, දන්නා අයෙකුට නම් පැහැදිලිවම විද්‍යාමාන විය. මේස්ටර් ලුවින් හා සුනඛයින් ගේ භාරකරු වූ ෆාර්ලන් මේ ගැන ඔහුට උගන්වා තිබින. සෝරවෘකයෙකුට සිය සිරුරට සාපේක්ෂව විශාල හිසක් හා දිගු පාද පිහිටා ඇත. එමෙන්ම උන් ගේ හොම්බ හා හණුව වඩා සිහින් විය. මේ හිම වර්ෂාව මධ්‍යයේ ඔවුන් එසේ සිටගෙන සිටි ආකාරයේ අමුතු බිහිසුණු බවක් පෙනෙන්නට තිබින. ග්‍රේ වින්ඩ් ගේ හොම්බ පුරා අලුත් ලේ තැවරී තිබින.

"බල්ලො." දැවැන්තයා අවමන් ස්වරයෙන් කීය. "ඒ වුනත් මම අහලා තියෙනවා රට මිනිහෙක්ව උණුහුමට තියාගන්ට වෘක හමෙන් හදපු සළුවක් තරම් ජාති භාණ්ඩයක් තවත් නෑ කියලා. උංව මරාපියවු!"

"වින්ටර්ෆෙල්!" කෑ ගැසූ රොබ් අසුට සන්කලේය. වැරහැලි හැඳගත් මිනිසුන් වටවෙද්දී අශ්වයා ගංඉවුර දිගේ පහළට දිව ආවේය. පොරොවක් ඔසවාගත් මිනිසෙක් කෑ ගසමින්, අපරීක්ෂාකාරී අන්දමින් මුලින්ම දිවගියේය. රොබ් ගේ අසිපත සිය මුලු බලයම යොදා මිනිසා ගේ මුහුණ හරහා වැදුනේ ඇඟ හිරිවට්ටන හඬක් සමගින් රුධිරය දස අත විසිවිය. වැරුනු, අඳුරු පැහැ රැවුලක් ඇත්තා අසු ගේ කටකලියාව අල්ලාගන්නට තැත් කල අතර ඒ වැයම තත්පර බාගයකට සාර්ථක විය... ඊළඟ මොහොතේ ග්‍රේ වින්ඩ් ඔහු මත කඩා පැන්නේ ඔහුව බිම හෙලීය. මිනිසා කෑ ගසමින් දියපහරට වැටුනේ වියරු වැටුනාක් මෙන් හිසට ඉහළින් පිහිය වනන්නට විය. ඔහු අනුව වෘකයා ද දියට පැන්න අතර ඔවුන් දෙදෙන නොපෙනී ගිය දියපහරේ ජලය රත් පැහැ ගැනින.

රොබ් හා ඕෂා පොර වැටුනහ. ඇගේ දිගු හෙල්ලය යකඩ සර්පයෙකු මෙන් කිහිපවරක්ම රොබ් ගේ පපුව කරා ඇදී ගියද ඒ හැමවරෙකම රොබ් සිය දිගු අසිපතින් පහර පිසදා හැරියේය. ඊළඟ පහරේදී ඕනෑවටත් වඩා ඉදිරියට නැඹුරු වූ ගැහැණිය අසමතුලිත වූයේ ඇගේ පා පැකිළුනි. ඒ තත්පරයේදී සිය අසු ඉදිරියට පැන්න වූ රොබ් ඇයව යටකර දැම්මේය.

ඊට අඩි කිහිපයක් නුදුරින් දත් විලිස්සාගත් සමර් හාලි වෙත ඊයක් මෙන් කඩා පැන්නේ ය. පිහිය උගේ සිරුරේ පැත්තකට වැදුනු අතර කරකැවී පසෙකට පිනූ සමර් නැවතත් ඇයට කඩා පැන්නේ ය. මෙවර උගේ හණු ගැහැණිය ගේ කළවය ඩැහැගත්තේ ය. දෑතින්ම පිහිය බදාගත් ඇය එය වැරෙන් පහළට ගෙන ආ මුත් වෘකයා එය ඉවෙන් මෙන් දුටු බව පෙනින. ඌ හිස ගස්සා පස්සට පිනූයේ ගැහැණිය හැඳ සිටි ඇඳුමේ කොටස් හා ඇගේ කළවයේ කොටස් පිරි මුවින් යුතුවය. හාලි පය පැකිළී ඇද වැටෙද්දී නැවතත් ඇය මතට පිනූ සමර් ඇයව පිටුපසට පෙරලා දමා, ඇගේ සිරුර මත නැග උදරය කීතු කීතු කර දමන්නට විය.

සයවන මිනිසා මේ සමූලඝාතනයෙන් මිදී පලායන්නට විය. එනමුදු ඔහුට වැඩි දුරක් යන්නට හැකි නොවීය. ඔහු අසීරුවෙන් මෙන් දියපහරේ අනිත් පස ඉවුර වෙත ළඟාවද්දී ග්‍රේ වින්ඩ් තෙත්බරිත සිරුරින් යුතුව දියපහර මැදින් මතුවිය. සිරුරේ රැඳි වතුර ගසා දැමූ

ඌ පලායන්නා පසුපස හඹා ගියේ ඔහු ගේ කළවය පසුපසින් සපා කෑවේය. මිනිසා කෑ ගසමින් නැවත දියට වැටෙද්දී වෘකයා ඔහු ගේ උගුරු දණ්ඩට පැන්නේ ය.

ඊළඟ මොහොතේ එතැන ඉතුරු වී සිටියේ දැවැන්තයා, ස්ටිව් පමණි. බ්‍රැන් ගේ පපුව හරහා බැඳ තිබුනු පටිය කපා දැමූ ඔහු අතකින් අල්ලා බ්‍රැන්ව ඇද්දේය. ඊළඟ මොහොතේ බ්‍රැන් බිම ඇද වැටින. ඔහු හතරගාතයෙන් බිම ඇදවැටුනු අතර සිරුරට යටින් දෙපා පරඬැල් මෙන් ඇද වී තිබුනේය. එක් පයක් දියපහරට වැටී තිබුනු නමුදු ඔහුට කිසිදු සීතලක් නොදැනින. එනමුදු ස්ටිව් සිය සිරිය බ්‍රැන් ගේ ගෙලට තබා තදකරද්දී එහි සීතල ඔහුට හොඳින්ම දැනින. "පස්සට පලයං!" මිනිසා අනතුරු ඇඟවීය. "නැත්තං මං මේ කොල්ලගෙ බොටුව කපනවා. මම දිවුරනවා, මං ඒක කරනවා."

රොබ් හතිලමින් සිය අසු ගේ තෝන්ලණුව ඇද ඌව නතර කලේය. ඔහු ගේ දෑසේ වූ වියරුව කෙමෙන් මැකී ගිය අතර අසිපත රැගත් සුරත පහත් විය.

ඒ මොහොතේ බ්‍රැන් සියල්ල දුටුවේය. සමර් හාලිව කීතු කීතු කරමින් සිටියේ නිල් පැහැ සර්පයන් බඳු අතුණුබහන් ඇගේ උදරයෙන් එළියට අදිමිනි. ඇගේ දෑස් විවරව තිබූ නමුදු ඇය ජීවතුන් අතරදැයි නැතහොත් මියගොස්දැයි නිශ්චිතවම කිව නොහැකි විය. අළු රැවුලා හා පොරෝධාරියා නිසොල්මන්ව බිම වැටී හුන්හ. එනමුදු ඕෂා දණින් වැටී සිටියේ බිම වැටී තිබුනු සිය හෙල්ලය වෙත අසීරුවෙන් දණගාමින් යන්නට වූවාය. තෙත්බරිත සිරුරෙන් යුතු ග්‍රේ වින්ඩ් ඈ වෙත පිය මනින්නට විය. "ඌට ආපහු කතා කරපං!" දැවැන්තයා අණ දුන්නේය. "උං දෙන්නටම කතා කරපං. නැත්තං මේ අබ්බගාතයා මැරෙයි."

"ග්‍රේ වින්ඩ්, සමර්. මගේ ළඟට වරෙල්ලා." රොබ් කීය.

නැවතුනු වෘකයින් දෙදෙන හිස් හරවා බැලූහ. ග්‍රේ වින්ඩ් රොබ් දෙසට පියමැන්න නමුදු සමර් බ්‍රැන් සහ ඔහු අසල සිටින මිනිසා දෙස නෙත් හෙලාගෙන සිටි පියවර නැවතී සිටියේය. ඌ පහත් හඬින් ගොරවන්නට විය. උගේ හොම්බ රුධිරයෙන් රත් පැහැ ගැන්වී තිබුනු අතර ඒ දෑස් කෝපාග්නියෙන් බැබලුනේ ය.

සිය හෙල්ලයට වාරු වුනු ඕෂා අසීරුවෙන් නැගිට සිටගත්තා ය. රොබ් ගේ අසිපත් පහරකට ගොදුරු වුනු ඇගේ උඩු බාහුවෙන් රුධිරය ගලමින් තිබින. දැවැන්ත මිනිසා ගේ මුහුණ දිගේ දහදිය ගලන අයුරු බ්‍රැන් දුටුවේය. ස්ටිව් ද තමා තරමම බියපත් වී ඇති බැව් ඔහුට අවබෝධ විය. "ස්ටාර්ක්ලා. යකාටම ගිය ස්ටාර්ක්ලා." මිනිසා කටුකුටු ගෑවේය. ඔහු හඬ උස් කලේය. "ඕෂා වෘකයො දෙන්නව මරලා උගෙ කඩුව අරගනිං."

"උඹට ඕනනං උංව මරාපං. මමනං ඔය යක්ෂයින්ට කිට්ටු වෙන්ටවත් යන්නෙ නෑ." ඇය පිළිතුරු දුන්නා ය.

දැන් කුමක් කල යුතුදැයි ස්ටිව්ට එක් මොහොතකට සිතා ගත නොහැකි විය. ඔහු ගේ අත වෙවුලූ අතර සිය ගෙලට තද වී තිබුනු පිහිය මදක් සෙලවී එතැනින් ලේ බිඳු ගලා එනු බ්‍රැන්ට දැනින. මිනිසාගෙන් හැමූ දුර්සන්ධය ඔහුට දැඩි ලෙස හමා ආ අතර එහි තැවරී තිබුනේ බිය මිස අන් කිසිවක් නොවීය. "උඹ." ඔහු රොබ් ඇමතීය. "උඹට නමක් තියෙනවද?"

"මම තමා රොබ් ස්ටාර්ක්. වින්ටර්ෆෙල්වල උරුමක්කාරයා."

"මේ ඉන්නෙ උඹේ මල්ලිද?"

"ඔවු."

"උඹට ඌව පණපිටින් ඕනනං මං කියන විදියට වැඩ කරපං. දැන් අස්සයා පිටින් බැහැපං."

රොබ් මොහොතක් අතීරණයෙන් පෙළුනේ ය. ඊළඟ මොහොතේ සෙමින් සිය අසු පිටින් බැස අසිපත අමෝරාගෙන සිට ගත්තේ ය.

"දැන් ඔය වෘකයින්ව මරපං."

රොබ් සෙලවුනේවත් නැත.

"ඒක කරපං. වෘකයො එහෙම නැත්තං මේ කොල්ලා."

"එපා." බ්‍රැන් යටිගිරියෙන් මොරගැසීය. මිනිසා කියන දේ කලොත් වෘකයින් මරා දැමූ වහාම ස්ටිව් විසින් ඔවුන් දෙදෙනාව මරා දමනු ඇත.

සිය නිදහස් අතින් ඔහු ගේ හිසකෙස් ඩැහැගත් මිනිසා කුරිරු අන්දමින් හිස පසුපසට නැමීය. බ්‍රැන් වේදනාවෙන් කඳුළු සලන්නට විය. "උඹ කටවහගනිං අබ්බගාතයො. උඹට ඇහෙනවද?" ඔහු හිස තවතවත් නැමීය. "උඹට මාව ඇහෙනවද?"

ඔවුන්ට පසුපසින් වූ වනය තුළින් පහත් 'ත්‍රම්' හඬක් නැගුනි. ස්ටිව් එක් සැනෙකින් හුස්මක් අල්ලා ඉහළට ඇදගැනීමට තැත් කල අතර තියුණු කටු වැකුණු තලයකින් යුතු ඊයක් ඔහු ගේ පපුව පලාගෙන අඩි බාගයක් පමණ ඉදිරියට මතුවිය. ඊතලය රුධිරයෙන් පින්තාරු කලාක් මෙන් රත් පැහැ ගැන්වී තිබින.

බ්‍රැන් ගේ ගෙලට තද වී තිබුනු සිරිය ලිස්සා බිම වැටින. දැවැන්ත මිනිසා පැත්තකට ඇල වී ගියේ මුනින්තලාවී දිය පහරට ඇද වැටින. ඔහු ගේ සිරුරට යටවීම නිසා ඊමුණ කැඩී ගිය අතර ජලපහර හා මුසුවෙමින් ඔහු ගේ ජීවය සැහව යන අයුරු දෙස බ්‍රැන් බලා සිටියේ ය.

ආයුධ ගත් සෙබළුන් ගස් අතරින් මැත්වෙද්දී ඕෂා වටපිට බැලුවා ය. සිය හෙල්ලය ඉවත විසිකර දැමූ ඇය දණින් වැටුනාය. "මයෙ උතුමානනි, මට අනුකම්පා කරන්ට. මට ජීවිතදානය දෙන්ට." ඇය අයැද සිටියා ය.

මෙතැන සිදු වී තිබුනු ඝාතනය පිරික්සා බලද්දී සෙබළුන් ගේ මුහුණු සුදුමැලි වී ගියේය. ඔවුහු අතීරණයකින් හා බියකින් මෙන් වෘකයින් දෙදෙනා දෙස බැලුම් හෙලූහ. තමා භුක්ති විඳිමින් සිටි භෝජන සංග්‍රහය අවසන් කිරීම සඳහා සමර් හාලි ගේ මළසිරුර වෙත පිය මනිද්දී සිය පිහිය පසෙකට විසිකර දැමූ ජොසෙත් වමනය නවත්වා ගැනීමට තැත් කරමින්

වනය දෙසට දිව ගියේය. ගසක් මුවාවේ හිඳ මැත් වූ මේස්ටර් ලුවින් පවා මේ දසුනෙන් කම්පනයට පත් වූ බැව් පෙනින. එහෙත් ඒ මොහොතකට පමණි. හිස වැනූ ඔහු සැනෙන් දියපහර තරණය කර බ්‍රැන් ගේ උදවුවට ආයේය. "ඔයාට තුවාලද?"

"ඌ මගේ කකුල කැපුවා. ඒ වුනත් මට ඒකෙ කිසිම දෙයක් දැනෙන්නෙ නෑ." බ්‍රැන් පිළිතුරු දුන්නේ ය.

තුවාලය පිරික්සා බැලීම සඳහා මේස්ටර්වරයා බිම දණ ඇනගද්දී බ්‍රැන් හිස හරවා අවට බැලීය. දුන්න අතින් ගත් තියන් ග්‍රේජෝයි මුරකරු වෘක්ෂයක් පසෙකින් සිටගෙන සිටි අතර සෑමවිටම මෙන් සිනාසෙමින් සිටියේ ය. ඔහු ගේ දෙපා අසල පසෙහි ඊතල අඩ දුසිමක් පමණ සිටුවා තිබුනු නමුදු ඔහුට එයින් පාවිච්චියට ගන්නට අවැසි වී තිබුනේ එක් ඊයක් පමණි. "මැරිච්ච සතුරෙක් කියන්නෙ කොච්චර සුන්දර දර්ශනයක් ද." ඔහු කීය.

"ජොන් හැමවෙලාවෙම කිවුවා උඹ මහ බූරුවෙක් කියලා ග්‍රේජෝයි." රොබ් මහහඬින් කීවේය. "උඹව අංගනයේ දම්වැල්වලින් බැඳලා දාලා බ්‍රැන්ට කියන්ට ඕන දුන්නෙන් විදින්ට පුරුදුවෙන්ට උඹව පාවිච්චි කරන්ටයි කියලා."

"උඹේ මල්ලිව මරණයෙන් බේරගත්තට හරිනං උඹ මට ස්තූති කරන්ටයි ඕන."

"උඹට ඉලක්කෙ වැරදුනා නම් මොකද වෙන්නෙ?" රොබ් ඇසීය. "ඌට පොඩි තුවාලයක් විතරක් වෙලා බේරුනා නම් මොකද වෙන්නෙ? උගේ අත ලිස්සුවා නම් මොකද වෙන්නෙ? ඒ ඊතලේ බ්‍රැන්ට වැදුනා නම් මොකද වෙන්නෙ? ඒ මිනිහා සන්නාහයක් ඇඳලා හිටියා නම් මොකද වෙන්නෙ? උඹට පෙනුනෙ උගෙ සළුවෙ පිටිපස්ස විතරයි. එහෙම වුනා නම් මොකක්ද මගෙ මල්ලිට වෙන්නෙ? උඹ ඒ ගැන මොකුත් හිතලා බැලුවද ග්‍රේජෝයි?"

තියන් ගේ සිනහව මැකී ගියේය. බුම්මාගත් මුහුණින් යුතුව දෙවුර ඇකිළූ ඔහු බිම සිටුවා තිබුනු ඊතල එකින් එක ගලවා සිය හියොවුරෙහි බහාලන්නට විය.

රොබ් සිය සෙබළුන් දෙස රවා බැලීය. "උඹලා මොන ඉලව්වකද ගිහිල්ලා හිටියෙ? උඹලා අපි පස්සෙන්ම වගේ ආවා කියලා මට හොඳටම විශ්වාසයි."

සෙබළු එකිනෙකා දෙස හොරැහින් බලන්නට වූහ. "අපි පස්සෙන්ම ආවා මයෙ උතුමානනි." ඔවුන්'තරින් ලාබාලතමයා වූ ක්වෙන්ට් කීය. "අපි මුලින් පොඩ්ඩක් නැවතිලා බලන් හිටියා මේස්තර් ලුවිනුයි එයාගෙ බූරුවයි එනකං. අපට දාස් වාරයක් සමාදෙන්ට.. ඊට පස්සෙ.. මේ.. මේ.." ඔහු හොරැහින් තියන් දෙස බලා නැවත සැනෙන් ඉවත බලාගත්තේ ය.

"මම කළුකුමෙක්ව දැක්කා." තියන් කීවේ මේ ප්‍රශ්නය නිසා ගැහැටක් පැමිනුනු බැව් හඟවන කේන්තිය පිරි ස්වරයෙනි. "මම කොහොමද දන්නෙ උඹ කොල්ලාව තනියෙන් දාලා යයි කියලා?"

තියන් දෙස බැලීම පිණිස රොබ් නැවත වරක් හිස හැරවීය. ඔහුට මෙතරම් තදින් කේන්ති ගොස් තිබෙනු බ්‍රැන් කිසිදා දැක නොතිබින. එනමුදු රොබ් කිසිවක් නොකියා නිහඬ විය. අන්තිමේදී ඔහු මේස්තර් ලුවින් පසෙකින් දණ ඇනගත්තේ ය. "එයාට ගොඩක් තුවාලද?"

"යාන්තං කැපිලා විතරයි. ඒක එච්චර අමාරුවක් නෑ." දියපහරේ ජලයෙන් රෙදි කැබැල්ලක් පෙඟවූ මේස්තර්වරයා තුවාලය පිස දමන්නට විය. "උංගෙ දෙන්නෙක් කළු ඇඳලා ඉන්නෙ." සිය කාර්යය අතරතුර ඔහු රොබ්ට පැවසීය.

දියපහරේ හතරගාතයෙන් වැටී සිටි ස්ටිව් දෙස රොබ් බැල්මක් හෙලුවේ ය. ඔහු ගේ වැරහැලි වී ගිය කළු සළුව දියපහරේ තරඟ අනුව සැලෙමින් නටමින් තිබින. "නිශා රැකුමෙන් පැනලා යන එවුන්. උං මහ මෝඩයො වෙන්ට ඕන, මෙච්චර වින්ටර්ෆෙල් කිට්ටුවට එන්ට."

"මිනිස්සු කිසිම බලාපොරොත්තුවක් නැති තත්ත්වෙට පත්වුනාම ඕනතරම් මෝඩ වැඩ කරනවා." මේස්තර්වරයා පිළිතුරු දුනි.

"අපි උංව වළලන්ටද මයෙ උතුමානනි?" ක්වෙන්ටි ඇසීය.

"උන් නම් අපිව වළලන එකක් නෑ." රොබ් පිළිතුරු දුන්නේ ය. "උන්ගෙ ඔළුගෙඩි දෙක කපාගනින්. අපි ඒවා ප්‍රාකාරෙට යවන්ට ඕන. මළකඳන් ටික කපුටන්ට කන්ට කියලා ඔහොම්මම තියපන්."

"එතකොට මෙකි?" ක්වෙන්ටි ඕෂා දෙසට ඇඟිල්ලක් දිගුකලේය.

රොබ් ඇය දෙසට ඇවිද ගියේය. ඇය ඔහුට වඩා අඩියක් පමණ උස් වූ නමුදු ඔහු ගේ ආගමනය හමුවේ නැවතත් දණින් වැටුනා ය. "මට ජීවිතදානය දෙන්ට මයෙ ස්ටාර්ක් උතුමානනි. මං ඔබතුමාට යටත්වෙනවා."

"මට යටත්වෙනවා? පොරොන්දු කඩකරපු එකෙක්ගෙන් මට ඇති වැඩේ මොකක්ද?"

"මං පොරොන්දු කඩපු එකියක් නෙවෙයි. ස්ටිවුයි වොලනුයි තමා ප්‍රාකාරෙන් පැනලා ආවෙ. මං නෙවෙයි. කළු කපුටන්ගෙ හමුදාවෙ ගෑනුන්ට තැනක් නෑ."

ත්‍රියන් ග්‍රේජෝයි ඔවුන්ට සමීප විය. "ඒකිව වෘකයින්ට කන්ට දාපන්." ඔහු උනන්දුකරවන ස්වරයෙන් රොබ්ට කීය. හාලි ගේ සිරුරේ ශේෂ වී ඇති කොටස් දෙස බැල්මක් හෙලූ ගැහැණිය වහා ඉවත බලාගත්තා ය. ඇය වෙවුලා ගියාය. සෙබළුන් පවා අප්‍රිය අසනීප තත්ත්වයෙන් පසුවන්නාක් මෙන් පෙනින.

"මේ ගෑනියෙක්." රොබ් පිළිතුරු දුන්නේ ය.

"ඒකි වනචාරියෙක්." බ්‍රැන් ඔහුට පැවසීය. "ඒකි කිවුවා මාව පණපිටින් තියාගත්තොත් මැන්ස් රේඩර්ට ගෙනිහින් දෙන්ට පුළුවන් කතාවක්."

"උඹට නමක් තියෙනවද?" රොබ් ඇසීය.

"ඕෂා මයෙ උතුමානනි." ඇය පහත් හඬින් පැවසුවා ය.

මෙස්ටර් ලුවින් නැගිට සිටියේය. "අපි ඒකිව ප්‍රශ්න කරන්ට අරන් ගියානම් හොඳයි."

සිය සොයුරා ගේ මුහුණේ ඇඳුනු සහනදායි හැඟීම බ්‍රැන්ට පැහැදිලිව විද්‍යමාන විය. "ඔබ කියන විදියක් මෙස්ටර්. වේන්, ඒකිගෙ අත් දෙක බැඳපං. ඒකි අපිත් එක්ක ආපහු වින්ටර්ෆෙල්වලට යයි... ඒකි අපට කියන්නෙ ඇත්තද බොරුද කියන එක උඩ තීරණය වෙයි ඒකි ජීවත්වෙනවද මැරෙනවද කියලා."

Robb Stark: “I never know how much to tell you, Bran. I wish you were older.”

Bran Stark: “I’m eight now! Eight isn’t so much younger than fifteen, and I’m the heir to Winterfell, after you.”

ටිරියන් 05-1

"උඹට කන්ට ඕනද?" මෝඩ් ඇසීය. ඔහු මහත අතැඟිලිවලින් අල්ලාගත් තෙල් දැමූ බෝංචි පිඟානක් ඉදිරියට දිගුකලේ ය.

ටිරියන් ලැනිස්ටර් බඩසායින් පෙළෙමින් සිටියේ ය. එනමුදු මෙම වධකයාට යටහත් පහත්කම් පෙන්වීමට වඩා මියයෑම මැනවැයි ඔහු අදිටන් කරගෙන සිටියේ ය. "බැටළු ගාතයක් තිබ්බානං හොඳයි." සිරමැදිරියේ කොණක තිබුනු තෙත් පිදුරු ගොඩ මත හිඳ සිටි ඔහු කීය. "එහෙමත් නැත්තං මෑ ඇටයි, ලූණුයි. අලුත පුච්චපු පාන් ටිකක් බටරුත් එක්ක. ඒ ටික හෝදලා දාන්ට හොඳ උණුසුම් වයින් ගුරුලේත්තුවක්. ඒක අමාරුනං බියර් වුනත් කමක් නෑ, වැඩියම කරදර කරන්ට මම කැමැති නෑ."

"ඒ බෝංචි." මෝඩ් කීය. "මෙන්න." ඔහු නැවත පිඟාන ඉදිරියට දිගුකලේය.

ටිරියන් සුසුමක් හෙලීය. මේ මුරභටයා දුඹුරු පැහැ ගැනුනු දත්ලින් හා හීනි අඳුරු පැහැ දෑසින් යුතු ස්ටෝන් විස්සක් බරැති අන්ත මුග්ධයකු විය. පොරෝ පහරක් නිසා ඔහුගේ වම් කණ හා කම්මුලේ කොටසක් කැපී ගොස් තිබුනු අතර ඒ නිසා මුහුණේ වම්පස බැලිය නොහැකි තරම් අප්‍රිය තුවාල කැළැලක් විය. ඔහු විරූපී තරම්ම මෝඩ එමෙන්ම සිය සිරකරුවන්ට රිදවා සතුටුවන්නකු විය. එනමුදු ටිරියන් දැඩි ලෙස කුසගින්නෙන් පෙළෙමින් සිටියේ ය. ඔහු අත දිගුකර පිඟාන ගැනීමට නැඹුරු විය.

මෝඩ් නියවමින් එය ආපසු ඇදගත්තේ ය. "මෙන්න." ටිරියන්ට අත දිගු කල නොහැකි දුරින් පිඟාන අල්ලාගත් ඔහු නැවත කීවේය.

කුරුමිට්ටා අසීරුවෙන් දෙපයින් නැගිට සිටියේය. ඔහුගේ සිරුරේ සෑම සන්ධියක්ම ඇඳුම් කමින් තිබින. "අපි හැම කෑම වේලක් ගානෙම මේ මෝඩ සෙල්ලම කරන්ට ඕනද?" ඔහු නැවත වරක් පිඟාන දෙසට අත පෙවුවේ ය.

සිය දුඹුරු පැහැ ගැහුනු දත් අතරින් සිනාවෙමින් මෝඩ් පසුපසට ඇදුනේ ය. "ඒක මෙතන කුරුම්ට් මිනිහෝ." අත දිගුකල ඔහු සිරමැදිරියේ බිත්තිය අවසන් වී විවෘත ආකාශය ඇරඹෙන සීමාවෙන් පිඟාන ඔසවා අල්ලාගත්තේ ය. "උඹට කන්ට ඕන නැද්ද? මෙන්න. ඇවිත් අරගනිං."

පිඟාන දෙසට ලංවීමට තරම් ටිරියන් ගේ අත් දිගු නොවීය. එමෙන්ම සිරමැදිරියේ සීමාවට ළඟාවීමට තරම් ධෛර්යයක්ද ඔහුට නොවීය. මෝර්ඩ් ගේ දැවැන්ත සුදු පැහැ උදරයෙන් වැදෙන එකම එක පහරකින් ඔහුව පහළට වීසි වී ගොස් අහස් බලකොටුවේ ගල් ගොඩවල් අතර වැටී මස් වැදැල්ලක් වනු ඇත. සියවස් ගනනාවක් පුරාවටම ඉයරීහි සිටි සිරකරුවන් බොහෝ දෙනකුට එම ඉරණම අත් වී තිබින. "මම හිතන්නෙ, මට එච්චර බඩගිනි නෑ වගේ." නැවතත් සිරමැදිරියේ සිය අන්තය වෙත ළඟාවෙමින් ඔහු පැවසීය.

උගුරෙන් හඬක් පිටකල මෝඩ් සිය මහත අතැඟිලි දිගහලේය. සුළං පහරට හසු වූ පිඟාන උඩු යටිකුරු වී අතින් ගිලිහින. අහර සියල්ල දෑස් මානයෙන් ඉවතට ගසාගෙන යද්දී බෝංචි ඇට ස්වල්පයක් පමණක් ඔවුන් දෙසට විසිවිය. මුරභටයා කොක්හඬලා සිනාසෙද්දී ඔහු ගේ උදරය දැවැන්ත පුඩිමක් මෙන් උස්පහත් වන්නට විය.

සිය සිත තුළ ක්‍රෝධය හා වියරුව නැග එනු ටිරියන්ට දැනුනි. "තෝ අලුගුත්තේරු වේස බැල්ලිගෙ පුතා. තොට සන්නිපාතෙ හැදිලා මැරිලා යන්ට ඕන!" ඔහු බිමට කෙලගැසී ය.

මේ අවලාද නැගීම වෙනුවෙන් මෝඩ් ගේ යකඩ අඩිවලින් යුතු බරැති බූට්ස් සපත්තුවලින් සිය ඉළඇටවලට වැදුනු පහරක් විඳ දරාගැනීමට ටිරියන්ට සිදුවිය. "මම ඒ කියපුවා ආපහු ගන්නවා." සිය පිදුරු මෙට්ටය මත වේදනාවෙන් දෙකට නැවෙමින් ටිරියන් කීය. "ඒ වෙනුවට මම උඹව මගේ අත් දෙකෙන්ම මරලා දානවා. මම ඒක දිවුරලා පොරොන්දු වෙනවා." බලකොටුව තුළට විහිදෙන දොර වැසී යතුරු අගුළු වැටෙනු ටිරියන්ට ඇසින.

තමා වැනි කුඩා මිනිසකුට මෙතරම් දරුණු, භයානක මුවක් ලැබුනේ කෙසේදැයි ටිරියන් විමතියෙන් කල්පනා කලේය. සිරකුටියේ සිය සුපුරුදු මුල්ලට වැදුනු ඔහු සීතලට එදිරිව තමා සතුව ඇති එකමෙක තුනී පොරෝනය පොරවාගෙන සිරකුටියට එහායින් අනන්තය තෙක් විහිදුනු නිල් අහස් තලයත්, ඈත ක්ෂිතිජයේ දක්නට ලැබෙන කඳුවැටි පෙළත් දෙස බලා සිටින්නට විය. තමා දූ කෙලියෙන් මැරිලියන් වෙතින් දිනූ සණකම් ලොම් සළුව

තවමත් ඇත්නම් යැයි ඔහු කල්පනා කලේය. එය දහදියෙන් හා ලේ ගඳින් අපවිත්‍ර වී තිබුනද උණුසුම් සුවදායක පොරෝණයක් විය. එනමුදු සළුව ඇස ගැටුනු සැනින් මෝඩ් එය ටිරියන් වෙතින් උදුරාගෙන තිබුනි.

සුළඟ විසින් ඔහු ගේ පොරෝණය හරහා සීතල ඉඳිකටුවලින් අනින්නට විය. ඔහු වැනි කුරුම්ට්ටෙකුට වුව මේ සිරමැදිරිය අතිශයින්ම කුඩා එකක් වූ අතර එහි දිග අඩි පහක්වත් නොවීය. එතනින් එහාට සාමාන්‍ය සිරමැදිරියක මෙන් බිත්තියක් නොවූ අතර පොළොව අවසන් වූ තැනින් අහස ඇරඹින. ඔහුට ඇතිතරම් වාතාශ්‍රයත්, දිවාකල හිරු එළිය, රාත්‍රියේ සඳ එළිය හා තරු එළියත් ලැබින. එනමුදු කාර්ස්ටලී රොක්හි අඳුරු අභ්‍යන්තරයේ ඇති අන්ධකාරම, භයංකාරම සිරමැදිරිය වෙනුවෙන් මේ සියල්ල හුවමාරු කරගැනීමට ටිරියන් සූදාණමින් සිටියේ ය.

"උඹ පියාඹයි." ඔහුව මේ සිරමැදිරිය තුළට මුල්ම වරට තල්ලුකරද්දී මෝඩ් සපථ කර කියා සිටියේ ය. "දවස් විස්සක්. තිහක්. නැත්තං පනහක්. ඒත් අන්තිමේදි උඹ පියාඹයි."

සිරකරුවන්ට තමන් කැමැති වේලාවක නිදහස් වී යා හැකි මේ මුලුමහත් රාජධානි සප්තකයේම ඇති එකම සිරමැදිරි පෙළ ඒරින්වරුන් සතු විය. ඒ මුල්ම දිනයේ පැය ගනනාවක් තිස්සේ සිය ධෛර්යය වඩවා ගත් පසු, කුටියේ මායිමට බඩගාගෙන මෙන් ගිය ටිරියන්, මුනින් තලා වී, ගෙල දිගුකර පහතට එබී බැලීය. අහස් බලකොටුව ඔහුට අඩි හය සියයක් පහතින් වූ අතර මේ සිරකුටියත්, ඒ බලකොටුවත් අතර හිස් වාතය මිස අන් කිසිවක් නොවීය. ඔහු තමාට හැකි තරම් දුරට ගෙල දිගුකර එබී බැලුවේ නම් ඔහුට වමින්, දකුණින් හා උඩින් තිබුනු මේ හා සමාන තවත් සිරමැදිරි දැකගත හැකි වනු ඇත. ඔහු හරියටම ගලින් කල මී වදයක සිටින මී මැස්සකු බඳු විය. ප්‍රශ්නයකට තිබුනේ කවුරුන් හෝ ඔහු ගේ තටු සිඳ දමා තිබීමය.

සිරකුටිය තුළ අතිශයින්ම සීතල විය. දිවා රෑ නොතකා සුළඟ තදින් හැමීය. මේ හැමටම වඩා නරක දෙය වූයේ කුටියේ පොළොව බෑවුම් සහිත වීමයි. එය දැනෙන නොදැනෙන තරමේ සියුම් බෑවුමක් වුවද සැමවිටම සිතට වධයක් විය. මොහොතකටවත් සිය දෑස් පියාගැනීමට ටිරියන් බිය වූයේ නින්දේදී තමා රෝල් වී ගොස් සිරකුටියෙන් පිටතට වීසි වී යනු ඇතැයි සිතේ නැගුනු භීතිය නිසාය. මේ අහස් සිරකුටි මිනිසකුව පිස්සු වැට්ටවීමට සමත්වීම මහා ලොකු පුදුමයක් නොවීය.

'දෙවියනි මා බේරාගන්ට! නිල්පාට මා කැඳවයි.' මීට පෙර මෙම කුටියේ විසූවකු විසින් බිත්තියේ ලියා තිබිනි. ඔහු ඒ සඳහා භාවිත කරන්නට ඇත්තේ කුමක්දැයි සැක සහිත නමුදු ඒ බොහෝවිට ඔහුගේම රුධිරය විය හැක. මුලදී නම් ඒ කවුරුන් විය හැකිද, ඔහුට කුමක් සිදුවීද යනුවෙන් කල්පනා කරන්නට ටිරියන් පුරුදුව සිටියේ ය. එනමුදු කල් යද්දී ඒ ගැන නොදැන සිටීම වඩා මැනවැයි ඔහු තීරණය කලේය.

ඔහු සිය හැකර කට වසාගෙන සිටියානම්...

මේ සියල්ල සිදු වූයේ අර ගොබ්බ කොලුවා නිසාය. ඒරින් වංශයේ අඩසඳ හා උකුස්සා ගෙත්තම් කල ධජපතාක යට වයර්වුඩ් සිහසුනක අසුන් ගෙන තමා දෙස බලා සිටි අර අමන කොලුවා නිසාය. මිනිසුන් උඩ සිට ඔවුන්ට පහළින් සිටින තමා දෙස හෙලන බැලුම් විඳදරා ගන්නට ටිරියන් සිය ජීවිතකාලය පුරාවටම හුරුපුරුදුව සිටියේ ය. එනමුදු පුටු කොට්ට ගොඩක් මත හිඳගෙන, තෙත් වූ දෑසින් තමා දෙස පහළ බලා සිටින සය හැවිරිදි දරුවකු ගේ බැල්ම ඔහු මත පතිත වූ මුල්ම අවස්ථාව මෙය විය. "මෙයාද ඒ නපුරු මිනිහා?" සිය රෙදි බෝනික්කා තුරුළුකරගත් දරුවා ඇසීය.

"එයා තමා." පසෙකින් වූ කුඩා සිංහාසනයේ අසුන් ගෙන සිටි ලයිසා ආර්යාව කීවාය. ශාලාව පිරෙන්නට පැමිණ සිටි, ඇගේ අතගන්නට කැමැත්තෙන් පසුවන වංශවතුන් ගේ සිත් සනහන්නට මෙන් ඇය මුලුමනින්ම නිල් පැහැයෙන් සැරසී, පූයර දමා, සුවඳ විලවුන් ගත ගල්වා සිටියා ය.

"එයා හරි චූටියි නේ." ඉයරිහි උතුමානන් කැකිරි පලමින් කීය.

"මේ තමා ඔයාගෙ තාත්තාව මරා දාපු, ලැනිස්ටර් වංශයේ ටිරියන්, පුංචි යකා." ඇය සිය ස්වරය උස් කල අතර එය කිරි සුදු පැහැ බිත්ති හා සිහින් ආරුක්කු කුළුණුවලින් පිරි ප්‍රධාන ශාලාව පුරා පැතිර ගියේ එහි සිටි සෑම මිනිසකුගේම සවනට ළඟා විය. "එයා තමා රජතුමාගෙ හස්තය මරලා දැම්මෙ."

"ආ! දැන් එතකොට මම එයාවත් මරලා දැම්මද?" ටිරියන් මෝඩයකු මෙන් කට ඇරියේ ය.

එය සිය මුව තරයේ වසාගෙන, හිස පහත් කරගෙන සිටීමට වඩා සුදුසු අවස්ථාවක් විය. ඔහුට දැන් එය වඩා හොඳින් අවබෝධ වී ඇත. 'මාව අපා හතටම පලයං!' ඔහුට එය ඒ අවස්ථාවේදීම අවබෝධ විය. ඒරින්වරුන් ගේ ප්‍රධාන ශාලාව වනාහි නිල් පැහැ වයිරම් වැටුනු සුදු කිරිගරුඬින් කල සීතල බිත්තිවලින් යුතු දිගු, වාම් එකක් විය. එනමුදු මේ මොහොතේ ඔහුව වටකරමින් ශාලාව පුරා පිරී සිටි පිරිසේ මුහුණු ඊටත් වඩා සීතල විය. කාර්ස්ටලී රොක්හි බලය සැතපුම් දහස් ගණනක් දුරින් වූ අතර ඒරින් මිටියාවතේ කිසිදු ලැනිස්ටර් මිතුරකුද නොවීය. යටහත්පහත් බව හා නිහඬතාව යනු මේ මොහොතේ භාවිත කරන්නට වඩාත්ම සුදුසු ආරක්සක පියවර විය.

එනමුදු ටිරියන් සිටියේ මේ සියල්ල ගැන කල්පනා කල හැකි තරමේ යහපත් මනෝභාවයකින් නොවේ. ඔහු ගේ අතිමහත් ලැජ්ජාවට හේතුවන පරිදි දවස පුරා ඉයරි වෙත සිදුකල නැග්මේ අවසාන පියවරේදී ඔහු අසාර්ථක වී තිබින. ඔහු ගේ බකල කකුල් විසින් තවදුරටත් ඉහළ නැගීම පිණිස ඔහුට සහායවීම ප්‍රතික්ෂේප කර තිබුනු අතර බ්‍රොන්ට ඔහුව ඔසවාගෙන යාමට සිදුවිය. මේ ලැජ්ජාව ඔහු ගේ සිතේ දැවෙමින් තිබුනු කේන්තියට තවතවත් පිදුරු දමන්නට සමත් වී තිබින. "ජේන හැටියට නම් මම බොහොම අවිවේකී කුරුමිට්ටෙක් වගේ." ඔහු කටුක ඇනුම්පදයක ස්වරයෙන් කීය. "මම මේ පුදුමෙන් කල්පනා කරන්නෙ මම කොහොමද මෙච්චර කාල වෙලාව හොයාගත්තෙ ඔය ඔක්කොම මිනීමැරුම් කරන්ට කියලයි."

තමා මේ මුහුණ දී සිටින්නේ කාටදැයි ඔහු විසින් මතක තබාගත යුතුව තිබින. ලයිසා ඒරින් හා ඇගේ බාගෙට පිස්සු හැදුනු කොලුවා රාජසභාවේ නම් දරා සිටියේ හාස්‍යරසය නොහඳුනන්නන් වශයෙනි. විශේෂයෙන්ම හාස්‍යය ඔවුන් දෙසට එල්ලවුනු විට එය දරාගැනීම ඔවුන්ට කොහෙත්ම අසීරු කරුනක් විය.

"පුංචි යකා." ලයිසා සීතල සැරපරුෂ ස්වරයෙන් කතාව ඇරඹීය. "උඹේ ඔය හැකර කට පරෙස්සමින් පාවිච්චි කරපන්. ඒ වගේම මගේ පුතාට ආචාරශීලී විදියට කතා කරපන්. එහෙම නැත්තම් මම පොරොන්දු වෙනවා උඹට ඒ ගැන පසුතැවෙන්ට සිද්දවෙයි කියලා. මතක තියාගනින් උඹ මේ කොහෙද ඉන්නෙ කියලා. මේ ඉයරි. මේ උඹව පිරිවරාගෙන ඉන්නෙ මිටියාවතේ නයිට්වරු. එයාලා හැමෝම ජොන් ඒරින්ට ආදරේ කරපු අවංක මිනිස්සු. මේ හැම කෙනෙක්ම මං වෙනුවෙන් මැරෙන්ට වුනත් සූදානම් උදවිය."

"ඒරින් ආර්යාවනි, ඔබලා අතින් මට මොකක්හරි අනතුරක් සිද්දවුනොත් මගේ අයියා ජේමී බොහොම සතුටින් එයාලට ඒ දේ උදාකරලා දේවි." මේ වදන් පවසද්දීම එය කෙතරම් අනුවණ කතාවක්දැයි ඔහුට වැටහින.

"උඹට පියාඹන්ට පුළුවන්ද, මගේ ලැනිස්ටර් උතුමානනි?" ලයිසා ඇසුවා ය.
"කුරුමිට්ටන්ට පියාපත් තියෙනවද? එහෙම නැත්තං, ඊළඟට උඹේ හිතට එන තර්ජනය කටින් එළියට දාන්නෙ නැතුව හිත ඇතුළෙම තියාගත්තොත් හොඳයි."

"මම මේ තර්ජනය කරනවා නෙවෙයි." ටිරියන් පිළිතුරු දුන්නේ ය. "මම මේ දුන්නෙ පොරොන්දුවක්."

පුංචි රොබර්ට් උතුමානන් අසුනින් බිමට පැන්නේ ය. ඔහු කෙතරම් අවුල් වී සිටියාදැයි යත් අතේ සිටි රෙදි බෝනික්කා බිම වැටුනි. "උඹට බෑ අපට රිද්දන්ට." ඔහු මොරගැසීය. "කාටවත්ම බෑ අපට රිද්දන්ට. ඌට කියන්ට අම්මා. ඌට කියන්ට මෙතන ඉන්නකං ඌට අපට රිද්දන්ට බෑ කියලා." කොලුවා ගැහෙන්නට පටන්ගති.

"ඉයරි කියන්නෙ බිඳ හෙලන්ට බැරි තැනක්." ලයිසා ඒරින් සන්සුන් ස්වරයෙන් කීවාය. පුත්‍රයාව තමා දෙසට ඇදගත් ඇය සිය මහත සුදු දෑත් අතරේ ඔහුව ආරක්ෂාකාරී ලෙස රඳවා ගත්තා ය. "පුංචි යකා ඔය අපිව බය කරන්ටයි හදන්නෙ මගෙ වස්තුවෙ. ලැනිස්ටර්ලා ඔක්කොම අමු බොරුකාරයො. කාටවත් බෑ මගෙ චූටි පැටියාට රිද්දන්ට."

ඇයව යකාට ගියාවේ! ඇය පැවසූ සෑම වදනක්ම සත්‍ය විය. මෙතැනට ළඟාවීමට අසීරු ගමනක නිරත වී සිටි ටිරියන්ට සන්නාහයෙන් සැරසුනු සතුරු නයිට්වරයකුට එය කෙතරම් අසීරු ගමනක් වනු ඇත්දැයි සිතාගැනීම අපහසු කරුනක් නොවීය. ඉහළ සිට ගල් හා ඊතල වර්ෂාවක් මෙන් ඔහු මත පතිත වනු ඇති අතර තබන තබන සෑම පියවරක් පාසාම සතුරන් ඔහු හා ගැටෙනු ඇත. එය ඇත්තෙන්ම නපුරු සිහිනයක් වනු ඇත. ඉයරී බලකොටුව ඉතිහාසයේ කිසිදා සතුරකු අතට පත්නොවීම මහ පුදුමයක් නොවේ.

එනමුදු ටිරියන්ට සිය මුව වසාගෙන සිටීම අසීරු විය. "බිඳ හෙලන්ට බැරි තැනක් නෙවෙයි. බිඳ හෙලන්ට ටිකක් අමාරු තැනක්."

පුංචි රොබර්ට් වෙවුලන ඇඟිල්ල ඔහු දෙසට දිගුකලේය. "උඹ බොරුකාරයෙක්. අම්මා, මට ඕන මේකා පියාඹනවා බලන්ට." අහස් නිල් පැහැ සළුවෙන් සැරසුනු මුර සෙබළුන් දෙදෙනෙක් ටිරියන් දෙපසින් සිට ඔහු ගේ දෑතින් අල්ලා එසවූහ.

කැට්ලින් ස්ටාර්ක් ඒ මොහොතේ එතැන නොසිටියා නම් කුමකින් කුමක් සිද්දවන්නට තිබුනා දැයි දන්නේ දෙවියන් පමණි. "සහෝදරී." සිංහාසනය පාමුල තමා සිටි ස්ථානයේ සිට ඇය කතා කලාය. "මම මතක් කරන්ට කැමැතියි මේ ඉන්නෙ මගේ හිරකාරයෙක් කියලා. එයාට අනතුරක් කරන්ට මට ඉඩදෙන්ට පුළුවන්කමක් නෑ."

ලයිසා ඒරින් නොපහන් දෑසින් සිය සොයුරිය දෙස මොහොතක් බලා සිටියා ය. ඊළඟ මොහොතේ අසුනින් නැගී සිටි ඇය ටිරියන් දෙසට පියමන් කලාය. ඇය තමාට පහර දෙනු ඇතැයි ටිරියන් මොහොතකට බියපත් විය. එනමුදු ඔහුව නිදහස් කරන ලෙස ඇය මුර සෙබළුන්ට අණ කලාය. සෙබළු ඔහු ගේ දෑත් අත්හැරිය අතර පා පැකිළි ගිය ටිරියන් බිම ඇද වැටුනි.

නැවත සිය දෙපා මතින් නැගී සිටින්නට ඔහු දැරූ වෑයම හාස්‍යජනක දර්ශනයක් විය. ඔහු ගේ දකුණු කකුල වේදනාවෙන් ඇඹරී ගිය අතර ඔහු නැවතත් හතරගාතයෙන් පොළොව මත ඇද වැටුනි. ඒරින්ලාගේ ප්‍රධාන ශාලාව පුරා කොක්හඬලෑම් මතුවන්නට විය.

"මගේ අක්කගෙ පුංචි අමුත්තට කෙලින් හිටගෙන ඉන්ටත් බැරිතරම් අමාරුයි වගේ." ලයිසා කීවාය. "සෙර් වාඩිස්, එයාව දඟගෙයි දාන්ට. අපේ අහස් සිරමැදිරියක ටික කාලයක් විවේක ගත්තහම එයාට හොඳ වෙයි."

මුර සෙබළුන් නැවතත් ඔහුව දෑතින් ඇද ඉහළට එසවූහ. ටිරියන් ලැනිස්ටර් ඔවුන් මැදින් එල්ලී සිටියේ, ලැජ්ජාව නිසා රතු වී ගිය මුහුණින් යුතුව දෙපා ගසන්නට විය. "මම මේක අමතක කරන්නෙ නෑ." ඔවුන් ඔහුව ඇදගෙන යද්දී ටිරියන් ඔවුන්ට පැවසීය.

ඔහු තවමත් එය අමතක කර දමා නැත.

මුලදී නම් මේ දඟගෙයි දැමීම එතරම් කාලයක් පවතින එකක් නොවේයැයි සිතමින් ඔහු සිත සනසාගත්තේ ය. ලයිසා ඒරින්ට ඔහු ගේ මාන්නය බිඳ දැමීමට අවශ්‍ය විය. එපමණකි. ඈය නැවතත් ඉක්මනින්ම ඔහුව රැගෙන එන්නට පණිවුඩ එවනු ඇත. ඈය නොවෙතත්, කැට්ලින් ස්ටාර්ක්ට ඔහුගෙන් ප්‍රශ්න කිරීමට අවශ්‍ය වනු ඇත. මේ වතාවේ ඔහු වඩා ප්‍රවේශමෙන් සිය දිවට මුරගුළු දමා ගනු ඇත. ඔවුන් කිසිදු හේතුවක් නොමැතිව නිකම්ම ඔහුව මරා දමන්නට තරම් එඩිතර නොවනු ඇත. ඔහු තවමත් කාර්ස්ටලී රොක්හි ලැනිස්ටර්වරයකු වන අතර ඔවුන් ඔහු ගේ ලේ සෙලෙවුවොත් එය යුද්ධයක ඇරඹුම වනු ඇත. ඔහු තමාටම කියා ගනිමින් සිත සනසාගත්තේ ය.

එනමුදු ඔහුට තවදුරටත් ඒ ගැන එතරම් විශ්වාසයක් නැත.

සමහරවිට ඔහු දිරා යනතෙක්ම, ඔහු වලපල්ලට යනතෙක්ම මෙහි රඳවා තබාගන්නට ඔහුව අල්ලාගත්තවුන් කල්පනා කරනවා විය හැක. එනමුදු එපමණ කලක් අල්ලා සිටීමට තරම් තම සිරුරට හැකියාවක් නොමැති බැව් ඔහු දැන සිටියේ ය. ගෙවී යන සෑම දිනක් පාසාම ඔහු ගේ ශක්තිය කෙමෙන් පිරිහෙමින් තිබුනු අතර මෝඩ් ගේ පා පහරවල් හා මුෂ්ටි පහරවල් නිසා ඔහුට විශාල අනතුරක් සිදුවන දිනය වැඩි ඈතක නොවේ. එමෙන්ම එසේ වනු ඇත්තේ මේ මුරකරුවා පළමුව ඔහුව නිරාහාරයෙන් මරා නොදැමුවහොත් පමණි. මෙසේ සීතලයෙන් හා කුසගින්නෙන් පෙළෙමින් තවත් රාත්‍රීන් කිහිපයක් මෙහි ගතකිරීමට සිද්දවුවහොත් නිල්පැහැය ඔහුටද හඬගාන දිනය වැඩි ඈතක නොවන බැව් ඔහුට හැඟුනි.

සිය සිරකුටියෙන් පිටත මේ මොහොතේ කුමක් සිද්දවනු ඇත්දැයි ටිරියන් කල්පනා කරන්නට විය. ටයිවින් උතුමානන් වෙතට පණිවුඩය ලැබුනු සැනින් ඔහු අසරුවන් පිටත් කර හරිනු ඇති බැව් නිසැකය. සමහරවිට ජේමී දැනටමත් කඳුකරය ඔස්සේ හමුදාවක් රැගෙන ඔහු සොයා එනු ඇත... ඔහු උතුරුකරයේ වින්ටර්ෆෙල් බලා නොයන්නේ නම් පමණක්. කැට්ලින් ස්ටාර්ක් ඔහුව පැහැරගෙන වින්ටර්ෆෙල් හැර අන් කොයිබක ගියාදැයි මිටියාවතෙන් පිටත කිසිවකුත් සැකකරනු ඇතිද? මේ පුවත අසන්නට ලැබුනු විට සෙර්සි කුමක් කරනු ඇතිදැයි ඔහු කල්පනා කලේය. රජතුමා නිසැකවම ඔහුව නිදහස් කරන මෙන් අණක් නිකුත් කරනු ඇත. එනමුදු රොබර්ට් කණ් දෙනු ඇත්තේ සිය රැජිණට ද නැතහොත් සිය හස්තයට ද? රජතුමා තුළ සිය සොයුරිය කෙරෙහි ඇති ආදරයේ තරම ගැන ටිරියන් හොඳාකාරවම දැන සිටියේ ය.

සෙර්සි මේ මොහොතේ සිය තීක්ෂ්ණ නුවණ මෙහෙයවා කල්පනා කරන්නේ නම් ටිරියන් සම්බන්ධ ගැටළුව රජතුමා විසින්ම විසඳිය යුත්තක් යැයි ඇය රොබර්ට්ට බල කරනු ඇත. නෙඩ් ස්ටාර්ක්ට පවා ඊට එරෙහි විය නොහැක. ඔහු එසේ කලොත් එය රජතුමාට කරන නිග්‍රහයක් වනු ඇත. නිදහස් නඩු විභාගයක් වෙත යන්නට ටිරියන් තුළ කිසිදු අකැමැත්තක් නොවීය. තමන්ට එරෙහිව ස්ටාර්ක්වරුන් කෙතරම් මිනීමැරුම් චෝදනා ගෙන ආවද දැනට අබමල් රේණුවක තරම්වත් සාක්ෂි ඔවුන් සතුව නොමැති බව ටිරියන් හොඳාකාරවම දනියි. ඔවුන් සිය නඩුව යකඩ සිහසුන හා භූමියේ අධිපතියන් ඉදිරියට ගෙනගියාවේ. එය ඔවුන් ගේ අවසානය වනු ඇත. මේ බව කල්පනා කරන්නට තරම් මොළයක් සෙර්සි සතුව තිබේ නම්...

ටිරියන් ලැනිස්ටර් සුසුමක් හෙලීය. ඇත්ත, ඔහු ගේ සොයුරිය සතුව යම් මට්ටමක කපටි බුද්ධියක් ඇත. එනමුදු ඇයගේ මාන්නය විසින් ඇයව අන්ධ කරනු ඇත. ඇය මේ සිදුවීමෙන් තමන්ට සිදුවුනු අවමානය මිස මෙයින් තමන්ට සිදුවන වාසි හා ඇතිවන ඉඩප්‍රස්ථා නොදකිනු ඇත. ජේමී ඊටත් වඩා නරකය. ඔහු මුරණ්ඩු, ඉක්මනින් කේන්ති යන කලහකාරයෙක් පමණි. සිය අසිපතින් ගැටයක් දෙකට කපා දැමිය හැකිනම් තම සොහොයුරා කෙදිනකවත් ඒ ගැටය ලිහා දමන්නට උත්සුක නොවන්නකු බැව් ටිරියන් හොඳින් දැන සිටියේ ය.

ස්ටාර්ක් කොලුවා මරාදමනු පිණිස අර මෝඩයා අතට කිනිස්සක් දී පිටත්කර හැරියේ මේ දෙදෙනාගෙන් කවරෙකු විය හැකිදැයි ටිරියන් විමතියෙන් කල්පනා කලේය. එමෙන්ම ඔවුන් දෙදෙනා ඇත්තෙන්ම ජොන් ඒරින් ගේ මරණය ගැන කුමන්ත්‍රණය කලාද? රජතුමා ගේ පැරණි හස්තය ඇත්තෙන්ම මරාදැමුනා නම් එය බෙහෙවින් දක්ෂ මෙන්ම විචක්ෂණ සැලසුමකි. ඔහු ගේ වයසේ වූවන් හදිසි අසනීපවලින් මියයාම සාමාන්‍ය දෙයකි. අනිත් අතට බ්‍රැන්ඩන් ස්ටාර්ක් මරාදැමීමට සොරාගත් කිනිස්සක් අතට දී දෙකයි පනහේ කුලී ඝාතකයකු යැවීම විශ්වාස කල නොහැකි තරමේ අමුම අමු ගොන්කමකි. ඒ ගැන සිතන්නට සිතන්නට එය අසාමාන්‍ය දෙයක් බව ඔහුට කල්පනා විය...

ටිරියන් වෙවුලා ගියේය. එය බෙහෙවින් භයංකර සිතුවිල්ලකි. බෙහෙවින් අන්තරායදායක සැකයකි. සමහරවිට වනාන්තරයේ සිටින එකම සත්ත්ව වර්ගය සිංහයින් හා සෝරවෘකයින් පමණක් නොවනු ඇත. එය සැබෑවක් නම් යම් කිසිවකු ඔහුව බළල් අතක් මෙන් භාවිත කරමින් සිටියි. මේ ලෝකයේ ටිරියන් අකැමැතිම වන එක් දෙයක් නම් කිසිවකු විසින් ඔහුව බළල් අතක් මෙන් යොදාගැනීමයි.

ඔහු මෙතැනින් පිටව යා යුතුය. ඉක්මනින්ම පිටව යා යුතුය. එනමුදු මෝඩ් සමග පොර බදා මෙතැනින් ගැලවී යාම සිහිනයක් පමණි. එමෙන්ම ඔහුට අඩි හයසියයක් දිග ලණුවක් ගෙනත් දෙන්නට හැකි කිසිවකුද මෙහි නොමැත. එබැවින් ඔහුට කල හැකි එකම දෙය සිය මුඛරි කට භාවිතකර මෙතැනින් පිටවීම පමණි. ඔහු මේ සිරකුටියට වැටීමට හේතු වූයේ සිය හැකර කට වූ අතර එයින් පිටවීමේ හැකියාව ද ඇත්තේ ඒ හැකර කට මතම ය.

Lysa Arryn: “You want a trial, my lord of Lannister. Very well, a trial you shall have.”

පිදුරු මෙට්ටයෙන් නැගිට සිටගත් ටිරියන් දොරට තඩි බාන්නට විය. "මෝඩ්." ඔහු බෙරිහන් දෙන්නට විය. "මුරකාරයො. මෝඩ්. මට උඹව ඕන." මෙසේ මිනිත්තු දහයක් පමණ නොකඩවා දොරට තඩි බෑමෙන් පසු අන්තිමේදී දොරට එහායින් පියවර හඬ ඇසෙන්නට විය. ටිරියන් වහා අඩියක් පසුපසට ගත් අතර ඊළඟ මොහොතේ මහහඬක් නගමින් දොර විවර විය.

"උඹ කෑ ගහනවා වැඩියි." මෝඩ් කේන්තිය පිරුනු දෑසින් යුතුව කීය. ඔහු ගේ මහත දැවැන්ත අතක මිට මොලවාගත් සනකම සම් පටියක් විය.

'කවදාවත් උඹ බය වුනා කියලා පෙන්නන්ට එපා.' ටිරියන් තමාටම කියාගත්තේ ය. "උඹ කැමැතිද පොහොසත් වෙන්ට?" ඔහු ඇසීය.

මෝඩ් අලස අයුරින් පැතිපහරක් එල්ල කල අතර සම්පටිය ටිරියන් ගේ උඩුබාහුව කපාගෙන ගියේය. පහරේ වේගය නොසිතූ තරම් අධික වූ අතර වේදනාව නිසා ඔහුට දත්මිටි කැවින. "කටවහගනිං කුරුමිට්ටි මිනිහෝ." මෝඩ් අනතුරු ඇඟවීය.

"රත්තරන්." ටිරියන් කීවේ සිනාසෙන්නට උත්සාහයක් දරමිනි. "කාර්ස්ටලී රොක්වල රත්තරන් පුරෝලා තියෙනවා... ආහ්!" මෙවර පහරට මෝඩ් වඩා වැඩි ජවයක් කවා

තිබිනි. ටිරියන් ගේ ළපැත්තට වැදුනු මෙම පහර ඔහුව කෙදිරිගාමින් දණගස්සවන්නට සමත් වීය. එනමුදු දැඩි උත්සාහයක් දරා මේ වේදනාව මැඩපවත්වාගෙන මුරභටයා ගේ මුහුණ දෙස බලන්නට ඔහු සමත්වූයේ ය. "ලැනිස්ටර්ලා තරම්ම පොහොසත් වෙන්ට. උං එහෙමයි කියන්නෙ මෝර්ඩ්-"

මෝඩ් උගුරින් නුරුස්නා හඬක් පිටකලේ ය. කීං හඬ නංවමින් වාතය කපාගෙන ආ සම්පටිය ටිරියන් ගේ මුහුණ හරහා වැදිනි. වේදනාව කෙතරම් අධික වීද යත් තමා බිම වැටෙන බවවත් ටිරියන් නොදත්තේ ය. එනමුදු නැවත දැස් හැර බලද්දී ඔහු සිය සිරකුටියේ සීතල පොළොව මත හතරගාතයෙන් වැටී සිටියේ ය. ඔහු ගේ කණ කීං ගාමින් තිබුනු අතර මුවේ ලේ පිරී තිබිනි. බිමට අත තබා නැඟී සිටින්නට ඔහු උත්සාහ කල අතර ඔහු ගේ අතැඟිලි කිසිවක නොදැවැටී හිස් අවකාශයේ ඇදී ගියේය. රත් වූ යකඩයක අත ගැවුනාක් මෙන් වහා ආපසු අත ඇදගත් ටිරියන් හුස්ම අල්ලාගෙන, නිශ්චල වීමට හැකි උපරිම උත්සාහය දැරුවේය. ඔහු වැටී තිබුනේ සිරකුටියේ සීමාවට යාන්තම් මෙහායින්, නිල් පැහැයට අඟල් කිහිපයක් මෙහායින් විය.

"තවත් කියන්ට දේවල් තියෙනවද?" දැතින් සම්පටිය අල්ලාගත් මෝඩ් එය වැරෙන් දෙපසට ඇද්දේය. එයින් නැගුනු තියුණු හඬ ටිරියන්ව තිගැස්සුවේ ය. මුරභටයා කොක්හඬලා සිනාසෙන්නට විය.

'ඌ මාව එළියට තල්ලුකරලා දාන එකක් නෑ.' සිරකුටියේ මායිමෙන් ඇතුළට බඩගාන අතරේ ටිරියන් කල්පනා කලේය. 'කැට්ලින් ස්ටාර්ක්ට මාව පණපිටින් උවමනායි. ඒක නිසා මේ යකා මාව මරලා දාන්ට තරම් එඩිතර වෙන්නෙ නෑ.' සිය මුවේ තැවරී තිබුනු රුධිරය පිටි අත්ලෙන් පිසදා හැරි ඔහු නියෙවුවේ ය. "ඒක බොහොම හයිය හම් පටියක් මෝඩ්." තමාව සමච්චලයට ලක්වීදෝ නොවීදෝ යැයි සිතාගන්නට බැරිවුනු මුරභටයා මුග්ධ අන්දමින් ඔහු දෙස බලාසිටියේ ය. "උඹ වගේ ශක්තිමත් මිනිස්සු තමා මටත් ඕනකරලා තියෙන්නෙ." සම්පටිය නැවත වරක් ඔහු දෙසට පියාඹා ආවේය. එනමුදු මෙවර ඇකිලී පසෙකට පනින්නට ටිරියන් සමත්විය. පහර උරහිසේ යාන්තම් ගැවිගෙන ගිය නමුදු එය එතරම් ගණන් ගතයුත්තක් නොවීය. "රත්තරන්." ඔහු නැවතත් කීවේ සෙමින් පිටුපසට පිය මනිමිනි. "උඹේ මුලු ජීවිත කාලෙටම දකින්ට බැරිතරම් රත්තරන්. ඇතිතරම් රත්තරන්. උඹට ඉඩම් ගන්ට පුළුවන්. උඹට ගෑනු ගන්ට පුළුවන්. අශ්වයො ගන්ට පුළුවන්... උඹට උතුමානන් කෙනෙක් වගේ ජීවත්වෙන්ට පුළුවන්. මෝඩ් උතුමානන්."

"රත්තරන් නෑ." මෝඩ් කීය.

'දැන් ඌ මට ඇහුම්කණ් දෙනවා.' ටිරියන් සිතුවේය. "ඌං මාව අල්ලගත්ත වෙලාවෙ මගේ පසුම්බිය මගෙන් අරගත්තා. ඒ වුනත් ඒ රත්තරන් තාමත් මටයි අයිති. කැට්ලින් ස්ටාර්ක්ට පුළුවන් මිනිහෙක්ව හිරබාරයට ගන්ට. ඒ වුනත් ඒ මිනිහගෙ සල්ලි මංකොල්ලකන්ට එයා කවදාවත් හිතන්නෙ නෑ. ඒක ගෞරවනීය දෙයක් නෙවෙයි. මට උදවු කරපං! එතකොට ඒ රත්තරන් ඔක්කොම උඹටයි." මෝඩ් ගේ සම්පටිය නැවතත් ඉදිරියට පිනූ නමුදු එය එතරම් ලොකු ජවයකින් එල්ල කෙරුනු, දැඩි පහරක් නොවීය. අතින් අල්ලා සම්පටිය නැවතූ ටිරියන් එය සිය මිට මොලවාගත් අතේම සිර කරගත්තේ ය. "උඹට කිසිම අවදානමක් නෑ. උඹට කරන්ට තියෙන එකම දේ පණිවුඩයක් ගිහින් දෙන එක විතරයි."

අත ගැස්සූ මුරභටයා සිය සම්පටිය ටිරියන් ගේ ග්‍රහනයෙන් මුදවා ගත්තේ ය. "පණිවුඩයක්." ඔහු කීවේ හරියට මින් පෙර කිසිදා ඒ වචනය අසා නැතුවාක් මෙනි. ඔහු ගේ බැම ඇකිළී නළලේ රැළි නැගුනේ ය.

"උඹට මාව ඇහුනනෙ, මගෙ උතුමානනි. මගේ පණිවුඩේ උඹේ ආර්යාව ළඟට අරන් පලයන්. එයාට කියාපන්..." කුමක්ද? ලයිසා ඒරින් ගේ තදගතිය අඩුකරලන්නට ඔහු කුමක් කිව යුතුද? එසැනින් ටිරියන් ලැනිස්ටර් ගේ සුපුරුදු විචක්ෂණශීලීභාවය නැගී ආයේය. "එයාට කියාපන්, මම සූදානම් කියලා මම කරපු අපරාධ ගැන පාපොච්චාරණය කරන්ට."

මෝර්ඩ් නැවත වතාවක් අත එසවූ අතර ටිරියන් තවත් පහරක් සඳහා සූදානම් විය. එනමුදු මුරභටයා අතීරණයකින් පෙළුනා වැන්න. සැකය සහ ධන තණ්හාව මාරුවෙන් මාරුවට ඔහු ගේ දෑසේ රඟන්නට විය. ඔහුට අර රත්තරන් තදින්ම උවමනා විය. එහෙත් මෙහි කිසියම් වංචාවක් වෙතැයි ඔහු බියෙන් පෙළුනේය. මීට පෙර බොහෝ වාරයක් රැවටිලිවලට හසුවූවකු ගේ සාධාරණ සැකය මෙවරද ඔහු වෙත එළඹ තිබින. "ඒක බොරු." ඔහු කටුකුටු ගෑවේය. "කුරුමිට්ටි මිනිහා මට වංචා කරනවා."

"මම මගේ පොරොන්දුව ලියලා දෙන්නම්." ටිරියන් සපථ කලේය.

සමහර නුගත්තු අකුරු යනු පිළිකුල් කටයුතු දෙයක්, අවඥාවෙන් බැහැර කලයුතු දෙයක් ලෙස සලකති. තවත් සමහරු අකුරු යනු අරුම පුදුම මායා බලයකින් හෙබි, අදහාගත නොහැකි දෙයක් මෙන් සලකති. වාසනාවකට මෙන් මෝඩ් අයත් වූයේ මේ දෙවන ගනයට විය. මුරභටයා සම්පටිය පහත් කලේය. "රත්තරන් ලියලා දීපං. ගොඩක් රත්තරන්."

"ඔවු. ගොඩක් රත්තරන්." ටිරියන් ඔහුව අස්වැසුවේ ය. "මගේ පසුම්බිය කියන්නෙ බොහොම පොඩි දෙයක් යාළුවෙ. මගේ අයියා පළඳින සන්නාහය තනිකර රත්තරන් වලිනුයි හදලා තියෙන්නෙ." ඇත්තෙන්ම කිවහොත් ජේමි ගේ සන්නාහය වානේවලින් සාදා රන් ආලේප කල එකක් වූ නමුදු මේ මොට්ටයාට ඒ දෙකේ වෙනස වටහා ගත නුහුනු ඇත.

මෝඩ් කල්පනා කරමින් මොහොතක් ගතකලේ ය. එනමුදු අන්තිමේදී ආපසු හැරුනු ඔහු කඩදාසියක් හා තීන්ත ගෙන එනු පිණිස පිටත් වී ගියේය. ලිපිය ලියා නිමවුනු පසු ඔහු සැකසහිත බැල්මෙන් ඒ දෙස ඔරවාගෙන බලා සිටියේය. "දැන් මගේ පණිවුඩය ගිහින් කියාපන්." ටිරියන් උනන්දුසහගත හඬින් කීවේය.

එදින මහ රෑ යාමයේ, ඔහු සීතලේ වෙවුලමින් නිදා සිටින අතරේ ඔවුහු ඔහු සොයා පැමිණියහ. මෝඩ් ඔවුන් වෙනුවෙන් දොර විවර කල නමුදු නිහඬව පසෙකට වී බලා සිටියේය. සෙර් වාඩිස් ඊගන් විසින් සිය බූට්ස් සපත්තුවේ තුඩින් ඇන ටිරියන්ව අවදි කලේය. "නැගිටහං පුංචි යකෝ. මගේ උත්තමාවන්ට උඹව දකින්ට ඕනලු."

දැස් පොඩිකර නිදිමත පළවා හැරි ටිරියන් බොරුවට මුහුණ පුළුටු කරගත්තේ ය. "කිසිම සැකයක් නෑ එයාට මාව දකින්ට ඕන ඇති. ඒත් ඔබ ඇයි හිතන්නෙ මටත් එයාව දකින්ට ඕනයි කියලා?"

සෙර් වාඩිස් රවා බැලුවේ ය. රජතුමා ගේ හස්තයේ ගෘහාරක්ෂක සෙබළ මුළුවේ නායකයා වශයෙන් ඔහු කින්ග්ස් ලැන්ඩින්ග්හි සිටි කාලය ටිරියන් ගේ මතකයේ තැන්පත්ව තිබිනි. සතරැස් චාම් මුහුණක්, රිදී පැහැ හිසකෙස් හා හොඳින් වැඩුනු ශක්තිමත් සිරුරකින් හෙබි මේ මිනිසා හාස්‍යය නොහඳුනන්නකු විය. "උඹේ කැමැත්ත අකැමැත්තෙන් මට වැඩක් නෑ. නැගිටපං. නැත්තං උඹව උස්සගෙන යනවා."

ටිරියන් සිය දෙපා මතින් නැගී සිටියේ ය. "රෑ හරිම සීතලයි." ඔහු සාමාන්‍ය ස්වරයෙන් කීය. "ඒ වගේම ප්‍රධාන ශාලාව හරිම කටුකයි. මට හෙම්බිරිස්සාවක් හදාගන්ට උවමනාවක් නෑ. මෝඩ්, හොඳ එකා වගේ මගේ සළුව අරන් වරෙන්."

මුරභටයා සැකය රැඳී මුහුණින් යුතුව ඔහු දෙස බලා සිටින්නට විය.

"මගේ සළුව." ටිරියන් නැවත කීය. "උඹට මතකද? අර සනකම් ලොම් සළුව. මාව කුටියට දාද්දි උඹ පරිස්සමට කියලා අරන් තිබ්බෙ."

"උගෙ මේ මලඉලවු සළුව ගෙනත් දීපන්." සෙර් වාඩිස් ගුගුලේය.

අමනාපයෙන් හඬක් නැගීමට තරම් මෝඩ් එඩිතර වූයේ නැත. එනමුදු 'අපි පස්සෙ බලාගමු!' වැනි බැල්මක් ටිරියන් වෙත හෙලන්නට ඔහු සමත්විය. සළුව රැගෙන ආ ඔහු එය සිරකරුවා ගේ ගෙල වටා දැවටූ අතර ටිරියන් සිනාසුනි. "බොහොම ස්තූතියි! මේක පැළැඳගෙන ඉන්න හැම වෙලාවම මට උඹව මතක් වෙයි." දිගු සළුවේ අනිත් කොණ ඔහු දකුණු උරහිස උඩින් දමාගත් අතර දවස් ගනනාවකට පසුව ඔහුට උණුසුමක් දැනෙන්නට විය. "අපි යමු සෙර් වාඩිස්."

බිත්ති දෙපස දල්වා තිබුනු පන්දම් පනහකින් ඒරින්වරුන් ගේ ප්‍රධාන ශාලාව ආලෝකවත් විය. ලයිසා ආර්යාව කළු පැහැ සේද ඇඳුමින් සැරසී සිටි අතර ඇගේ ගවොමේ පපුව මුතුවලින් නිමා කල අඩසඳකින් හා උකුස්සකුගෙන් අලංකාර විය. ඇය නිශා රැකුමට බැඳීමට හැකියාවක් ඇත්තියක නොවූ බැවින් මේ පාපොච්චරණය වෙනුවෙන් ඇය ශෝකය ප්‍රකාශ කිරීමේ ඇඳුමින් සැරසෙන්නට ඇතැයි ටිරියන් අනුමාන කලේය. තනි කරලක් වන සේ ගෙතූ ඇගේ රතු-දුඹුරු පැහැ වරලස වම් උරහිසට උඩින් පපුව දිගේ වැක්කෙරෙමින් තිබිනි. ඇය පසෙකින් තිබුනු උස් සිහසුන හිස් වූ අතර කිසිදු සැකයකින් තොරව ඉයරිහි උතුමානන් වහන්සේ මේ වනවිට සිය සිරියහනේ ගැහෙමින් සැතපෙනවා වන්නට ඇත. ඒ වෙනුවෙන් ටිරියන් දෙවියන්ට ස්තූතිවන්ත විය.

හිස නමා ආචාර කල ටිරියන් ශාලාව පිරික්සා බැලීමට මොහොතක් ගතකලේය. ඔහු බලාපොරොත්තු වූ අයුරින්ම ඒරින් ආර්යාව විසින් ටිරියන් ගේ පාපොච්චාරණය ඇසීම සඳහා තමාට යටත් නයිට්වරුන් හා වංශාධිපතියන් සියළුදෙනාම මෙහි කැඳවා තිබින. සෙර් බ්‍රින්ඩන් ටලී හා නෙස්ටර් රොයිස් උතුමානන් ගේ මුහුණ ඔහු නිරීක්ෂණය කලේය. නෙස්ටර් පසෙකින් සිටගෙන සිටි, බිහිසුණු කළු උඩුරැවුලකින් හෙබි තරුණ මුහුණ නිසැකවම ඔහු ගේ උරුමක්කරු, සෙර් ඇල්බාර් විය යුතුය. මිටියාවතේ ප්‍රධාන වංශවත් නිවෙස් හැමෙකක්ම පාහේ නියෝජනය කරමින් පිරිස එහි පැමිණ සිටියහ. අසිපතක් මෙන් හීන්දැරී සෙර් ලින් කෝබ්‍රේ, වාතරක්තයෙන් පෙළෙන හන්ටර් උතුමානන්, සිය පුතුන් විසින් පිරිවැරූ වැන්දඹු වේන්වුඩ් ආර්යාව. එහි විසූ තවත් බොහොමයක ගේ වංශ සලකුණු ඔහු නොදත් ඒවා විය. දෙකට කැඩුනු ලන්සය, කොළ පොළඟා, ගිනිගත් කුළුණ, පියාපත් සහිත කුසලාණ හා තවත් නොයෙක් දෑ ඒ අතර විය.

මේ මිටියාවතේ වංශවතුන් අතරේ ඔහුත් සමග කඳුකර මාවතේ පැමිණි කිහිපදෙනාද වූහ. බාගෙට සුව වූ තුවාලවලින් යුතු සෙර් රඩ්‍රික් කසල් හා ඔහු පසෙකින් සිටගෙන සිටි සෙර් විලිස් වෝඩ්. ගායක මැරිලියන් අලුත් වීණාවක් සොයාගෙන තිබින. ටිරියන් සතුටු සිනහවක් පහල කලේය. අද රෑ මෙතැන කුමක් සිද්ද වූවද එය හොර රහසේ සිදුවනු දැකීමට ටිරියන් ගේ කැමැත්තක් නොවීය. පුවත් දස අත පැතිරවීම සඳහා ගායකයකු තරම් අගනා අන් කිසිවකු නොවීය. ශාලාවේ පසුපසටම වී සිටි බ්‍රොන් කුළුණකට හේත්තු වී බලා සිටියේ ය. මේ කුලී හේවායා ගේ කළු පැහැ දෑස් ටිරියන් දෙසට එල්ල වී තිබුනු අතර ඔහු ගේ අත සැහැල්ලු අයුරින් සිය අසිපත් මිට මත නැවතී තිබින. ටිරියන් කල්පනා කරමින් ඔහු දෙස දිගු බැල්මක් හෙලීය...

කැට්ලින් ස්ටාර්ක් මුලින්ම කතා කලාය. "අපට අහන්ට ලැබුනා උඹ උඹේ අපරාධ පාපොච්චාරණය කරන්ට ලෑස්තියි කියලා."

"එහෙමයි මගේ ආර්යාවනි."

ලයිසා ඒරින් සිය සොයුරිය දෙසට සිනහවක් පෑවාය. "ආකාස හිරකුටි හැමවෙලාවම මිනිස්සුන්ව මානසිකව වට්ටනවා. දෙයියන්ට ඒකෙ ඉන්න එවුන්ව පේනවා. ඒකෙ හැංගෙන්ට කියලා අන්ධකාරයක් නෑ."

"එයා බිඳවැටිලා කියලා මට නම් පේන්නෙ නෑ." කැට්ලින් ආර්යාව කීවාය.

ලයිසා මෙයට ඇහුම්කන් නොදුන්නා ය. "උඹට කියන්ට තියෙන දේ කියපං." ඇය ටිරියන්ට අණ දුන්නා ය.

'ඔන්න දැන් තමා දාදු කැටේ හරියට පෙරලන්ට ඕන.' ඔහු නැවත වතාවක් බ්‍රොන් දෙසට ඉක්මන් බැල්මක් හෙළීය. "හොඳයි! කොහෙන්ද පටන්ගන්ට ඕන? මම පාපොච්චාරණය කරනවා, මම බොහොම නපුරු පුංචි මිනිහෙක්. මම කරපු අපරාධ, මම කරපු පවු ගනං කරන්ටත් බැරි තරමයි මගේ උතුමනි, මගේ ආර්යාවනි. මම වේස ගෑනුත් එක්ක බුදියලා තියෙනවා. එක වතාවක් නෙවෙයි, සියදාස් වතාවක්. මගේ තාත්තා මැරුනා නම් කියලා මම හීන දැකලා තියෙනවා. ඒ වගේම මගේ සහෝදරී, අපේ ආදරණීය රැජිණත් මැරුනා නම් කියලා මම හිතලා තියෙනවා." ඔහුට පිටුපසින් යම් කිසිවෙක් කෙකර සිනාවක් පෑවේය. "මම මගේ සේවකයින්ට හැම වෙලාවෙම කරුනාවෙන් සැලකුවෙ නෑ. මම සූදු කෙලියා. මම වංචා කරලා තියෙනවා. රාජසභාවෙ ඉන්න උදාර වංශවතුන් ගැනයි, කුලීන ආර්යවන් ගැනයි මම අනන්ත නපුරු, නොහොබිනා කතා කියලා තියෙනවා." මෙය තව තවත් සිනා මතුකරලන්නට සමත් විය. "එක පාරක් මම-"

"කට වහපං." ලයිසා ඒරින් ගේ සුදුමැලි මුහුණ කේන්තිය නිසා රෝස පැහැ ගැන්වින. "උඹ මේ මොකක් කරනවා කියලාද හිතන් ඉන්නෙ කුරුමිට්ටො?"

ටිරියන් හිස පැත්තකට ඇල කලේය. "ඇයි! මම මේ මගේ අපරාධ පාපොච්චාරණය කරනවා මගේ ආර්යාවනි."

කැට්ලින් ස්ටාර්ක් පියවරක් ඉදිරියට තැබුවා ය. "මගේ පුතා බ්‍රෑන්ව මරන්ට උඹ කිනිස්සක් දීලා කුලී මිනීමරුවෙක් එවුවාය කියලා සැක පහල වෙලා තියෙනවා. රජතුමාගෙ හිටපු හස්තය, ජොන් ඒරින් උතුමානන්ව මරන්ට කුමන්ත්‍රණය කලැයි කියලා උඹව සැක කරනවා."

ටිරියන් දෙවුර ඇකිළීය. "ඒ අපරාධ ගැන මට පාපොච්චාරණය කරන්ට බෑ. බොහොම කණගාටුයි. මිනීමැරුම් ගැන මම කිසිම දෙයක් දන්නෙ නෑ."

ලයිසා ආර්යාව සිය වයර්වුඩ් සිහසුනෙන් නැගිට්ටා ය. "මාව සමච්චලේකට ගත්තද? උඹේ පුංචි විහිළුව ඔය හොඳටම ඇති කුරුමිට්ටො. මට විශ්වාසයි උඹ ඒක හොඳට රස විඳින්ට ඇති කියලා. සෙර් වාඩිස්, මූව ආයෙමත් දහගෙයි දාන්ට... ඒ වුනාට මේ ගමන ඌට කලින්ටත් වඩා පුංචි, කලින්ටත් වඩා බෑවුම තියෙන හිරකුටියක් දෙන්ට."

"මෙහෙමද මිටියාවතේ යුක්තිය පසිඳන්නෙ?" ටිරියන් ගෙරෙවුවේ ය. එය කෙතරම් ප්‍රකෝපකාරී වූවාද යත් සෙර් වාඩිස් මොහොතකට ගල් ගැසුනි. "ලේ වාහල්කඩ ගාවින් මෙහාට ගෞරවය කියලා එකක් නැද්ද? උඹලා සැක කරනවා මම අපරාධ කලයි කියලා. මම ඒක ප්‍රතික්ෂේප කරනවා. එතකොට උඹලා මාව හිරකුටියකට දානවා සීතලෙනුයි බඩගින්නෙනුයි මැරිලා යන්ට." මෝඩ් ගේ පහරවල් නිසා මුහුණේ ඇති වූ තැලීම් සීරීම් අන්‍යයන්ට පැහැදිලිව දිස්වන පරිදි ඔහු හිස එසවීය. "කෝ රජතුමාගෙ යුක්තිය? ඉයරි කියන්නෙ රාජධානි සප්තකයේ කොටසක් නෙවෙයිද? මම සැකකාරයෙක්ය කියලා උඹලා කියනවා. හරි. කමක් නෑ. මම නඩු විභාගයක් ඉල්ලනවා. මට කතාකරන්ට ඉඩ දියල්ලා. මම කියන්නෙ ඇත්තද බොරුද කියලා බලන්ට දෙවියනුයි මිනිස්සුයි ඉස්සරහ, විවෘතව විනිශ්චයක් දීපල්ලා."

ශාලාව පුරා පත් මිමිනීම් නැගෙන්නට විය. ඇය තමාගේ උගුලේ හසු වූ බැව් ටිරියන්ට තේරුම් ගියේය. ඔහු උසස් පෙලපතක ඉපදුනු කෙනෙකු මෙන්ම රාජධානියේ බලවත්ම වංශාධිපතියා ගේ පුත්‍රයා ද විය. ඔහු රැජිණ ගේ සොහොයුරා විය. ඔහු වෙනුවෙන් නඩු විභාගයක් පැවැත්වීම ප්‍රතික්ෂේප කල හැක්කක් නොවේ. අහස් නිල් පැහැ සළුවෙන් සැරසුනු මුර සෙබළුන් ඔහු දෙසට ළඟා වන්නට වූ නමුදු අතක් ඔසවා ඔවුන් නැවතූ සෙර් වාඩිස් ලයිසා ආර්යාව දෙස බැලුවේ ය.

ඇගේ කුඩා මුව නොරිස්සුම් සිනාවකින් ඇද වී ගොස් තිබින. "විවෘත නඩු විභාගයක් පවත්වලා උඹට එරෙහිව තියෙන චෝදනාවලට වැරැදිකාරයා වුනොත්, රජතුමාගෙ නීතිය අනුව උඹ ඒ වැරැදිවලට ජීවිතෙන් වන්දි ගෙවන්ට ඕන. අපි මේ ඉයරිවල අලුගෝසුවො තියාගෙන ඉන්නෙ නෑ මගේ ලැනිස්ටර් උතුමානනි. ඔය 'සඳ දොරටුව' ඇරපල්ලා."

නරඹන්නෝ දෙපසට වූහ. කෙට්ටු කිරිගරුඬ කුළුණු දෙකක් මධ්‍යයේ පටු වයර්වුඩ් දොරක් පිහිටා තිබින. දොරේ සුදු පැහැ ලීයේ අඩසඳක් කැටයම් කර තිබුනි. සෙබළුන් දෙදෙනෙක්

දොර දෙසට පිය මනිද්දී ඒ අසල වූ අය වහ වහා පසුපසට යන්නට වූහ. එක් සෙබළෙකු දොරෙහි වූ බරැති ලෝකඩ හරස් පොලු ඉවත් කල අතර අනෙකා දොර ඇද ඇතුළට විවර කලේය. ඇරුනු දොරින් ඇතුළට හැමූ වේගවත් සුළං පහර නිසා ඔවුන් දෙදෙනා ගේ සළු පිටුපසට පියාඹන්නට විය. මේ දොරට එහායින් වූනේ දහස් ගණන් තරු දිදුලන අනන්ත රාත්‍රී ආකාශය පමණි.

"ඔන්න බලාගනිං රජතුමාගෙ යුක්තිය." ලයිසා ඒරින් කීවාය. සුළඟට හසු වූ පන්දම් එළි දසත නටන්නට වූ අතර අතරින් පතර පන්දම් එකක් දෙකක් නිවී ගියේය.

"ලයිසා, මම හිතන්නෙ මේක එච්චර හොඳ වැඩක් නෙවෙයි." කැට්ලින් ස්ටාර්ක් කීවාය.

ඇගේ සොයුරිය ඇයව නොතකා හැරියා ය. "උඹට නඩු විභාගයක්නෙ ඕන මගේ ලැනිස්ටර් උතුමානනි. බොහොම හොඳයි! උඹට නඩු විභාගයක් ලැබෙයි. උඹට කියන්ට තියෙන හැම දේකටම මගේ පුතා ඇහුම්කණ් දෙයි. ඊටපස්සෙ උඹට පුළුවන් වෙයි එයාගෙ විනිශ්චය අහන්ට. ඊටත් පස්සෙ උඹට පිටවෙලා යන්ට පුළුවන් වෙයි... එක දොරකින් නැත්තම් අනිත් දොරින්."

ඇය බොහොම සතුටු සිතින් පසුවන බැව් ටිරියන්ට හැඟුනි. එය මහ ලොකු පුදුමයක් නොවේ. නඩු විභාගයකින් ඇයට අවැඩක් සිදුවන්නේ කෙසේද? විනිශ්චයකරු වනු ඇත්තේ ඇගේ මෝඩ, ලෙඩ ගානේ සිටින පුත්‍රයා වනු ඇත. හිස හැරවූ ටිරියන් සඳ දොරටුව දෙස බැලුවේ ය. 'අම්මා, මට ඕන ඌ පියාඹනවා දකින්ට.' කොලුවා කීවේය. මේ කාලකන්නි හොට්ටා මීට පෙර මිනිසුන් කීදෙනෙකු මෙම දොරටුවෙන් පියාඹා යවා ඇත්ද?

"බොහොම ස්තූතියි මගේ හොඳ ආර්යාවනි. ඒ වුනත් මට පේන්නෙ නෑ රොබර්ට් උතුමානන්ව කූද්දන්ට තරම් ඕනකමක් තියෙයි කියලා." ටිරියන් ආචාරශීලී අයුරින් පැවසීය. "දෙයියො දන්නවා මගේ අහිංසක කම ගැන. මම මිනිස්සුන්ගෙ විනිශ්චය නෙවෙයි, දෙයියන්ගෙ විනිශ්චය ඉල්ලා හිටිනවා. මම සටන් නඩු විභාගයක් ඉල්ලා හිටිනවා."

ඒරින් ප්‍රධාන ශාලාව කොක්හඬලෑම්වලින් පිරී ගියේය. නෙස්ටර් රොයිස් උතුමානන් උගුරෙන් හඬක් නැංවීය. සෙර් විලිස් කෙකර සිනා පෑවේය. සෙර් ලින් කෝබ්‍රේ සිය සිනහව ආයාසයෙන් යටපත් කරගත්තේ ය. එනමුදු අනිත් අය හිස් පසුපසට සලා, දෑස්වලින් කඳුළු පනින තෙක් සිනාසුනහ. මැරිලියන් සිය බිඳුනු අතැඟිලිවලින් වීණාව පිරිමැද්දේ ය. සුළඟ පවා පටු සඳ දොරටුවෙන් ඇතුළු වී සිනා හඬ නංවන්නට විය.

ලයිසා ඒරින් ගේ දියාරු නිල් පැහැ දෑසේ සැකයක සේයාවක් ඇඳී ගියේය. ඔහු ඇයව අමාරුවක හෙලා තිබින. "ඇත්තෙන්ම බැලුවොත් උඹට ඒ අයිතිය තියෙනවා."

සිය කබායේ කොළ පොළඟා ගෙත්තම් කර තිබුනු තරුණ නයිට්වරයා ඉදිරියට විත් දණ නැමීය. "මගේ ආර්යාවනි, ඔබතුමීගෙ පාර්ශ්වය වෙනුවෙන් සටන් වදින්ට මට අවසර දෙන්ට."

"ඒ ගෞරවය අයිතිවෙන්ට ඕන මටයි." මහලු හන්ටර් උතුමානන් කීය. "ඔබතුමීගෙ උදාර සැමියා ගැන මගේ හිතේ තියෙන ආදරය, ලැදියාව වෙනුවෙන් මම ඒ මිනීමැරුමෙ පලිය ගන්නම්."

"මගේ තාත්තා මිටියාවතේ බාරකාරයා විදියට ජොන් ඒරින් උතුමානන්ට මෙච්චර කාලයක් විශ්වාසවන්තව සේවය කලා." සෙර් ඇල්බා රොයිස් ගිගිරුවේ ය. "එයාගෙ පුතා විදියට මම ඒ වැඩේ බාරගන්නම්."

"සාධාරණ අරමුනකින් යමක් කරන්ට යනකොට දෙවියොත් ඒ මිනිහා දිහා බලනවා." සෙර් ලින් කෝබ්‍රේ කීය. "ඒ වුනත් ගොඩක් වෙලාවට ඒකට ගැලපෙන්නෙ හොඳම කඩුහරඹ සූරයයි. අපි හැමෝම දන්නවා ඒ කවුද කියලා." ඔහු සිනහවක් පහල කලේය.

තවත් කටහඬවල් දුසිමක් පමණ එකවර කතා කරන්නට විය. තමාව මරා දැමීමට මෙතරම් නාඳුනන්නන් පිරිසක් ඉදිරිපත් වීම ටිරියන් ගේ සිත නොසන්සුන් කරන්නට සමත් විය. සමහරවිට මෙය ඔහු සිතූ තරම්ම හොඳ සැලසුමක් නොවන්නේද?

ලයිසා ආර්යාව අතක් ඔසවා පිරිස නිහඬ කලාය. "ඔබලා හැමෝටම බොහොම ස්තූතියි මගේ උතුමනි! මගේ පුතා මේ වෙලාවෙ මෙතන හිටියානම් එයාත් ඔබලාට ස්තූතිවන්ත වෙයි. මේ මුලු රාජධානි සප්තකයේම ඉන්න වෙන කිසිම නයිට්වරයෙක් මිටියාවතේ නයිට්වරුන් තරම් නිර්භීත, අවංක, එඩිතර නෑ. ඔබලා හැමෝටම එකපාර මේ ගෞරවය පුදකරන්ට තිබුනා නම් කොච්චර දෙයක්ද. ඒ වුනත් මට තෝරගන්ට පුළුවන් එක්කෙනයි." ඇය අත දිගුකලා ය. "සෙර් වාඩිස් ඊගන්. ඔබ හැමදාමත් මගේ ස්වාමියාගෙ දකුණු අත වගේ හිටියා. ඔබ තමා අපේ පාර්ශවයෙ සටන්කරුවා වෙන්ට සුදුසුම කෙනා."

සෙර් වාඩිස් මොහොතක් නිහඬව සිටියේ ය. "මගේ ආර්යාවනි." ඔහු එක් දණකින් වැටෙමින් පැවසී ය. "කරුනාකරලා මේ රාජකාරිය වෙන කෙනෙකුට පවරන්ට. මට ඒ ගැන කිසිම කැමැත්තක් නෑ. මේ මිනිහා රණකාමියෙක් නෙවෙයි. බලන්ට උගෙ හැටි. කුරුම්ට්ටෙක්. මගෙ උසින් බාගයක් වත් නෑ. කකුල් දෙක බකලයි. මේ වගේ එකෙක්ව මරා දාලා ඒක යුක්තිය කියලා කියන්ට අපි ලැජ්ජා වෙන්ට ඕන."

'ආහ්! නියමයි.' ටිරියන් සිතුවේ ය. "ඇත්තෙන්ම. මාත් ඒකට එකඟවෙනවා."

ලයිසා ඔහු දෙස රවා බැලුවා ය. "උඹයි සටන් නඩු විභාගයක් ඉල්ලුවෙ."

"ඒ වගේම මම දැන් මා වෙනුවෙන් සටන්කරන්ට රණශූරයෙකුත් ඉල්ලා හිටිනවා. ඔබ ඔබේ පාර්ශ්වය වෙනුවෙන් තෝරගත්තා වගේම. මගේ අයියා, ජේමි බොහොම කැමැත්තෙන් ඒ තැන ගනීවි. ඒක මට විශ්වාසයි."

"උඹේ ඔය මහලොකු රජුන් මරන්නා ඉන්නෙ ලීග සිය ගානක් ඈත." ලයිසා කඩා පැන්නා ය.

"එයාට පණිවුඩයක් යවන්ට. එයා එනකං මම බලන් ඉන්නම්."

"උඹ හෙට සෙර් වාඩිස් එක්ක සටන් කරනවා."

"ගායකයො." ටිරියන්, මැරිලියන් දෙසට හැරෙමින් කීය. "උඹ මේකෙන් සැහැල්ලක් හැදුවම, උඹ කියපං කොහොමද ඒරින් ආර්යාව කුරුමිට්ටාට එයාගෙ සටන්කරුවා ලබන්ට තිබුන අයිතිය අහිමි කලේ කියලා. කොහොමද එයා මේ බකල ගහන, තුවාල වෙලා තියෙන කුරුමිට්ටාව එයාගෙ හොඳම නයිට්වරයාත් එක්ක සටනට යැවුවෙ කියලා."

"මම උඹට කිසිම අයිතියක් අහිමි කලේ නෑ!" ලයිසා ඒරින් මුරගෑසුවා ය. ඇගේ ස්වරය හිරිහැරදායී බවකින් පිරී තිබුනි. "උඹේ සටන්කරුවාගෙ නම කියපං කුරුමිට්ටො... උඹ වෙනුවෙන් මැරෙන්ට සූදානම් එකෙක් හොයාගන්ට පුළුවන්, එහෙම එකෙක් ඉන්නවා කියලා උඹ හිතනවා නම්."

"ඔබට එහෙම එකෙක් හොයාගන්ට පුළුවන් නම්, මමත් බොහොම ඉක්මනට මා වෙනුවෙන් මරන්ට පුළුවන් එකෙක් හොයාගන්නම්." ටිරියන් දිගු ශාලාව පුරා නිරීක්ෂණාත්මක බැල්මක් හෙලීය. කිසිවකුත් ඉදිරියට අඩියක් වත් නොතැබීය. තමා සැලසුම් කල හැම දෙයක්ම අන්තිමේදී මහා විහිළුවක් වී යැයි ටිරියන් විමතියෙන් කල්පනා කරන්නට විය.

ශාලාවේ පසුපසින් යම් සෙලවීමක් ඇසුනි. "මම කුරුමිට්ටා වෙනුවෙන් සටන් කරන්නම්." බ්‍රොන් නැගී සිටියේ ය.

Tyrion Lannister: “I wonder when I found the time to do all this slaying and murdering.”

එඩාර්ඩ් 10

ඔහු නැවතත් පැරණි සිහිනයක් දකිමින් හුන්නේය. සුදු සළුවෙන් ගත වැසූ නයිට්වරුන් තිදෙනෙක්, කැඩී බිඳී ගිය කුළුනක් හා ලෙයින් පෙඟී ගිය සයනයක් මත මරණය බලාපොරොත්තුවෙන් බලා සිටින ලියානා එම සිහිනයේ වූහ.

සැබෑ ජීවිතයේදී හා සමානවම මේ සිහිනය තුළදී ද ඔහු ගේ මිතුරු කැළ ඔහු හා අසුන් විහිදුවමින් උන්හ. මාන්නක්කාර මාර්ටින් කසල් හෙවත් ජොරී ගේ පියා. විශ්වාසවන්ත තියෝ වල්. බ්‍රැන්ඩන් ගේ සහචරයාව සිටි ඊතන් ග්ලවර්. මෘදු වදන් දොඩන, කරුනාවන්ත හදවතක් ඇති සෙර් මාර්ක් රයිස්වෙල්. වගුරු මිනිසා හොව්ලන්ඩ් රීඩ්. සිය දැවැන්ත යුධ සෛන්ධවයා පිට නැගුනු ඩස්ටින් උතුමානන්. එක්තරා කාලයකදී නම් ඔවුන් ගේ මුහුණු නෙඩ්ට සිය මුහුණ තරම් හොඳින් මතක තිබුනි. එනමුදු වසර ගනනාවක කාලය විසින් දැන් ඒවා කෙමෙන් කෙමෙන් මතකයෙන් ගිලිහී යමින් තිබුනි. ඔහු කිසිදා අමතක නොකරන්නෙමියි සපථ කල මුහුණු පවා මතකයෙන් ගිලිහී යමින් තිබුනි. ඔහු ගේ සිහිනය තුළ මේ සැමදෙනාම සෙවනැලි පමණක්ම විය. මීදුමින් සැදුනු අසුන් පිට නැගුනු අඳුරු අවතාර බඳු වූහ.

එහි ඔවුහු සත්දෙනෙකු වූහ. තිදෙනෙකුට එදිරිව සත්දෙනෙක්! සිහිනය තුළදී මෙන්ම සැබෑ ජීවිතයේදීත් එය එසේම විය. එනමුදු ඒ සාමාන්‍ය පුද්ගලයින් තිදෙනෙකු නොවීය. ඔවුහු රවුම් කුළුණ ඉදිරිපිටට වී ඔවුන් පැමිණෙන තෙක් බලා හුන්හ. ඩෝර්න්හි රත් පැහැ කඳුකරය ඔවුන් පිටුපසින් උත්තුංගව නැගී සිටියේය. ඔවුන් ගේ සුදු පැහැ සළු සුළඟේ ලෙලදෙමින් තිබින. එමෙන්ම ඔවුන් කිසිවෙකුත් සෙවනැලි නොවූහ. මේ දැන් පවා ඒ මුහුණු ඔහු ඉදිරියේ මැවී පෙනෙන්නට විය. දැවෙන ගිනිදළු මෙන් පැහැදිලිව මැවී පෙනෙන්නට විය. දුක්මුසු සිනහවක් තොල්පෙති මත තවරාගත් සෙර් ආතර් ඩේන් හෙවත් උදෑසනේ අසිපත. 'උදෑසන' නමින් හැඳින්වුනු ඔහු ගේ දැවැන්ත අසිපතේ මිට දකුණු උරහිසට ඉහළින් එබී බලන්නට විය. එක් දණක් නමා බිම වාඩිගත් සෙර් ඔස්වෙල් වෙන්ට් ගිනිගලකින් සිය අසිපත මුවහත් කරමින් හුන්නේ ය. ඔහු ගේ සුදු පැහැ ශිරස්කය මත සිය වංශ සලකුණ වූ කළු වවුලා පියාපත් විදහා බලා සිටියේ ය. ඔවුන් දෙදෙන මැදින් මහලු එනමුදු සාහසික, සෙර් ජෙරල්ඩ් හයිටවර් හෙවත් සුදු ගොනා, රාජ්‍යාරක්ෂක බලකායේ ප්‍රධානියා සිටගෙන සිටියේ ය.

"මම ඔබලාව ගංගා ත්‍රිශූලයේ හෙවුවා." නෙඩ් ඔවුන්ට පැවසීය.

"අපි එහෙ නෙවෙයි හිටියෙ." සෙර් ජෙරල්ඩ් පිළිතුරු දුන්නේ ය.

"අපි එහෙ හිටියා නම් රජකම පැහැරගත්තු එකාට දෙයියන්ගෙම පිහිට තමා." සෙර් ඔස්වෙල් කීය.

"කින්ග්ස් ලැන්ඩින්ග් වැටෙද්දී සෙර් ජේමි එයාගෙ රත්තරන් කඩුවෙන් ඔබලාගෙ රජතුමාගෙ බෙල්ල කපලා මරලා දැම්මා. මම පුදුමයෙන් කල්පනා කලා ඔබලා කොහෙද කියලා."

"අපි හිටියෙ බොහොම ඈත." සෙර් ජෙරල්ඩ් කීය. "එහෙම නොවුනා නම් ඒරිස් තවමත් යකඩ සිංහාසනයේ වාඩි වෙලා ඉන්නවා. එහෙම වුනා නම් අපේ බොරු සහෝදරයා මෙලහට අපා හතේ පැහෙනවා."

"මම පහළට ආවා ස්ටොර්ම්ස් එන්ඩ්වල වැටලීම අහවර කරන්ට." නෙඩ් ඔවුන්ට කීය. "ටිරල් උතුමානනුයි රෙඩ්වින් උතුමානනුයි එයාලගෙ ධජ අකුලගත්තා. එයාලගෙ යටත් නයිට්වරු සේරම දණ නවලා අපට පක්ෂපාතීත්වය ප්‍රකාශ කලා. මට බොහොම ලොකු විශ්වාසයක් තිබුනා ඔබලාත් එතැන ඉදියි කියලා."

"අපේ දණහිස් එහෙම ලේසියෙන් නැමෙන්නෙ නෑ." සෙර් ආතර් ඩේන් පැවසීය.

"සෙර් විලම් ඩැරී ඔබලාගෙ රැජිණයි, විසේරිස් කුමාරයයි එක්ක ඩ්‍රැගන්ස්ටෝන්වලට පැනලා ගියා. මම හිතුවා සමහරවිට ඔබලාත් එයාත් එක්ක යාත්‍රා කරන්ට ඇති කියලා."

"සෙර් විලම් හොඳ මිනිහෙක්. අවංක මිනිහෙක්." සෙර් ඔස්වෙල් කීය.

"ඒ වුනත් එයා රාජ්‍යාරක්ෂක බලකායෙ කෙනෙක් නෙවෙයි." සෙර් ජෙරල්ඩ් පෙන්වා දුන්නේ ය. "රාජ්‍යාරක්ෂක බලකාය එහෙම ලේසියෙන් පැනලා යන්නෙ නෑ."

"එදත් නෑ අදත් නෑ." සෙර් ආතර් ඩේන් සිය ශිරස්කය පැළැඳගත්තේ ය.

"අපි දිවුරුමක් දිවුරලයි තියෙන්නෙ." සෙර් ජෙරල්ඩ් පැහැදිලි කලේය.

සෙවනැලි අසිපත් සුරතින් දැරූ නෙඩ් ගේ අවතාර සගයෝ ඔහු වටා රැස් වූහ. එතැන තිදෙනෙකුට එරෙහිව සත්දෙනෙක් වූහ.

"ඉතින් දැන් ඒක පටන්ගන්ටයි යන්නෙ." සෙර් ආතර් ඩේන් පැවසීය. ඔහු සිය අසිපත, උදෑසන, කොපුවෙන් පිටතට ගෙන දෑතින් අල්ලා ගත්තේ ය. එහි තලය කිරිවීදුරු මෙන් සුදුමැලි පැහැයෙන් බැබලින. එය හිරුඑළියේ සජීවී වස්තුවක් මෙන් නැටීය.

"නෑ." නෙඩ් ශෝකය තැවරුනු ස්වරයෙන් කීය. "දැන් ඒක ඉවරවෙන්ටයි යන්නෙ." වානේ හා සෙවනැලි මහා හදිසියකින් එකිනෙක ගැටෙද්දී ලියානා කෑගසන හඬ ඔහුට ඇසුනි. "එඩාර්ඩ්!" ඇය කෑගැසුවා ය. මරණයේ දැස් මෙන් නිල් පැහැ වූ ආකාශය හරහා, ලේ වැකි අහස හරහා රෝස පෙති කුණාටුවක් හමා ගියේය.

"එඩාර්ඩ් උතුමානනි." ලියානා නැවතත් කෑගැසුවා ය.

"මම පොරොන්දු වෙනවා." ඔහු මිමිනුවේ ය. "ලියා, මම පොරොන්දු වෙනවා."

"එඩාර්ඩ් උතුමානනි." අඳුරේ සිටි මිනිසකු පුනරුච්චාරණය කලේය.

එඩාර්ඩ් ස්ටාර්ක් කෙඳිරිගාමින් සිය දෑස් විවර කලේය. හස්තයේ කුළුණේ වූ උසැති කවුළු හරහා සඳ රැස් කාමරයට වැටී තිබින.

"එඩාර්ඩ් උතුමානනි." සෙවනැල්ලක් ඇඳ සමීපයේ සිටගත්තේ ය.

"කොච්චර... කොච්චර කාලයක්ද?" ඔහු ගේ පාදය වෙළුම්පටිවලින් ඔතා, ලී පතුරු තබා ගැටගසා තිබිනි. ඔහු ගේ සිරුරේ පැත්තකින් වේදනාවක් නැග එන්නට විය.

"දවස් හයක්, රෑ හතක්." ඒ කටහඬ වයොන් පූල් ගේ විය. ඔහු නෙඩ් ගේ දෙතොලට කෝප්පයක් ලංකලේය. "බොන්ට මගේ උතුමානනි."

"මොනවද...?"

"වතුර. මේස්ටර් පයිසෙල් කිවුවා ඔබට පිපාසෙ දැනෙයි කියලා."

නෙඩ් දිය උගුරක් බීවේය. ඔහු ගේ දෙතොල් වියළී, ඉරිතලා තිබිනි. දිය මී පැණි මෙන් ප්‍රණීත විය.

"රජතුමා නියෝගයක් දුන්නා." දිය බී හමාර වූ පසු වයොන් පූල් පැවසී ය. "එතුමාට ඔබත් එක්ක කතා කරන්ට ඕනලු මගේ උතුමානනි."

"හෙට බලමු. එතකොට මම මීට වඩා ශක්තිමත් වෙලා ඉදියි." ඔහුට මේ මොහොතේ රොබර්ට්ට මුහුණ දිය නොහැක. දුටු සිහිනය විසින් ඔහුව බළල් පැටවෙකු මෙන් දුබල කර දමා තිබිනි.

"මගේ උතුමානනි. එතුමා නියෝග කලා ඔබතුමා ඇස් ඇරිය ගමන්ම එතුමාව බැහැ දකින්ට එවන්ටයි කියලා." පූල් ඇඳ පසෙකින් ඉටිපන්දමක් දැල්වූයේ ය.

නෙඩ් සිහින් හඬින් අවලාදයක් නැගුවේ ය. රොබර්ට් කිසිදා ඉවසීම යනු කුමක්දැයි දත්තෙකු නොවීය. "එයාට කියන්ට එයා ගාවට යන්ට තරම් මම දුර්වල වැඩියි කියලා. එයාට මගෙත් එක්ක කතා කරන්ට ඕන නම් මම සතුටුයි මෙතනදි එයාව මුන ගැහෙන්ට. මම හිතන්නෙ ඔබට එයාව හොඳ නින්දකින් නැගිට්ටවන්ට වෙයි. ඒත් එක්කම එන්ට කියන්ට..." ඔහු කියන්නට ගියේ ජොරී කියා නමුදු ඔහුට හදිසියේම සියල්ල සිහිපත් විය. "එන්ට කියන්ට මගේ ගෘහාරක්ෂක බලකායෙ ප්‍රධානියාට."

මඳ වේලාවකට පසු ඇලන් කාමරයට ප්‍රවිශ්ට විය. "මගේ උතුමානනි."

"පූල් කියනවා ඒක දවස් හයක් ලු. මට දැනගන්ට ඕන දැන් තත්ත්වය මොකක්ද කියලා."

"රජුන් මරන්නා නගරයෙන් පැනලා ගිහිල්ලා. අහන්ට ලැබෙන කතාවල හැටියට නම් එයා කාස්ටර්ලී රොක්වලට, එයාගෙ තාත්තා ගාවට ගිහිල්ලා. කැට්ලින් ආර්යාව පුංචි යකාව අත්අඩංගුවට ගත්ත එක තමා දැන් හැම කෙනාගෙම කටේ තියෙන්නෙ. ඔබතුමා සතුටු ඇති දැනගන්ට, මම අමතර ආරක්ෂාව යොදවලයි තියෙන්නෙ."

"ඒක හොඳයි. මගේ කෙල්ලො දෙන්නා?"

"ඒ දෙන්නා හැමදාම ඔබව බලන්ට ආවා මගේ උතුමානනි. සන්සා සද්ද බද්ද නැතුව යාඥා කර කර ඉන්නවා. ඒ වුනත් ආර්යා..." ඔහු මඳක් පැකිලුනේ ය. "ඔබව මෙහාට ගෙනාපු දා ඉඳන් ආර්යා වචනයක්වත් කතා කලේ නෑ. එයා හරිම බිහිසුණු පුංචි කෙල්ලක් මගේ උතුමානනි. මම කවදාවත් දැකලා නෑ ගෑනු ළමයෙක් එච්චර කේන්තියෙන් ඉන්නවා."

"මොන දේ සිද්දවුනත් මට ඕන මගේ කෙල්ලො දෙන්නව ආරක්ෂා කරගන්ට. මම හිතනවා, ඇත්තටම කියනවා නම් මට බයයි, මේක පටන්ගැන්ම විතරයි කියලා."

"එයාලට අනතුරක් වෙන්ට දෙන්නෙ නෑ එඩාර්ඩ් උතුමානනි. මම මගේ ජීවිතේ පරදුවට තියලා හරි එයාලාව රැක ගන්නවා."

"ජොරීයි අනිත් අයයි?"

"මම එයාලගෙ මළකඳන් නිහඬ සහෝදරියන්ට බාරදුන්නා. වින්ටර්ෆෙල්වලට අරන් යන්ටයි කියලා. ජොරී කැමැති වෙයි එයාගෙ සීයා ගාවින් මිහිදන් වෙන්ට."

ඒ ඔහු ගේ සීයා අසල විය යුතුය. මන්ද, ඔහු ගේ පියා මිහිදන් වී තිබුනේ ඈත දකුණේ විය. මාර්ටින් කසල්ද අනිකුන් සමගින් දිවි පුදා තිබින. සටනින් පසු කුළුණ බිඳ හෙලූ නෙඩ් එහි වූ ගල් භාවිත කර කඳුවැටිය පාමුළ සොහොන් අටක් ගොඩ නැංවීය. ප්‍රවාදවලට අනුව නම් රේගාර් මෙම ස්ථානයට 'ප්‍රීතියේ කුළුණ' යනුවෙන් නම් තබා තිබින. එනමුදු නෙඩ්ට නම් එය තිත්ත, කටුක මතකයක් පමණි. ඔවුන් සත්දෙනෙක් තිදෙනෙකුට එරෙහිව සටන් වැද තිබින. එනමුදු පණපිටින් එතැනින් පිටව යන්නට හැකියාව ලැබුනේ දෙදෙනකුට පමණි. එඩාර්ඩ් ස්ටාර්ක් හා ඔහු ගේ වගුරු මිතුරා හොව්ලන්ඩ් රීඩ්ට පමණි. මෙතරම් වසර ගනනාවකට පසුව නැවතත් එම සිහිනය දුටුවේ කිසියම් අසුබ නිමිත්තක් වශයෙන්දැයි ඔහුට සිතාගත නොහැකි විය.

"ඔබ බොහොම හොඳට වැඩ ටික කරලා තියෙනවා ඇලන්." වයොන් පූල් නැවත කාමරයට පැමිණියේ ය. "රජතුමා ඇවිල්ලා ඉන්නෙ මගෙ උතුමානනි. ඒ එක්කම රැජිණත් ඇවිල්ලා ඉන්නවා."

නෙඩ් ඇඳ වියනට හේත්තු වූයේ පාදයෙන් නැගුනු වේදනාව නිසා ඇකිළුනේ ය. සෙර්සිද මේ වෙලාවේ මෙහි පැමිණේයැයි ඔහු කිසිසේත් බලාපොරොත්තු නොවීය. එය එතරම්ම හොඳ දෙයක් නොවේ. "එයාලව ඇතුළට එවන්ට. ඊටපස්සෙ මෙතනින් පිටවෙලා යන්ට. අපි කතාකරන දේවල් මේ කාමරයෙන් පිටට යන්ට බෑ." හිස නැමූ පූල් නිහඬවම පිටව ගියේය.

රොබර්ට් සාමාන්‍ය ඇඳුමකින් සැරසෙන්නට අමතක කර නොතිබින. ඔහු, පපුවේ රන් නූලෙන් වැඩ දැමූ කිරුළු ලූ ගෝනකුගේ රුව සහිත කළු විල්ලුද කමිසයකින් හා රන්වන් පිට කබායකින් සැරසී සිටි අතර පැළැඳ සිටි සළුව රන් පැහැ හා කළු පැහැ කොටු මෝස්තරයකින් සමන්විත විය. ඔහු ගේ සුරතේ වයින් ගුරුලේත්තුවක් තිබුනු අතර දැනටමත් ඒ මුහුණ වෙරිමතින් රත් පැහැ වී තිබින. සෙර්සි ලැනිස්ටර් ඔහු පසුපසින් කාමරයට ඇතුළු වූ අතර ඇය මැණික් ඇල්ලූ කුඩා ඔටුන්නක් හිස පැළැඳ සිටියා ය.

"මගේ ස්වාමිනි. මට සමාවෙන්ට. ඒ වුනත් මට නැගිටගන්ට බෑ." නෙඩ් කීය.

"කිසි ප්‍රශ්නයක් නෑ. වයින් චුට්ටක් ගන්නවද? මේවා ආර්බර් වයින්. බොහොම හොඳ පරණ වයින් එකක්."

"පොඩි කෝප්පයක් ගමු එහෙනම්. මේ පොපි යුෂ නිසා මගේ ඔළුවත් ටිකක් බරයි."

"උඹේ තත්ත්වෙ ඉන්න මිනිහෙක් සන්තෝස වෙන්ට ඕන ඔය ඔළුව තාමත් උරහිස් දෙක උඩ තියෙන එක ගැන." රැජිණ කීවාය.

"කට වහපං ගෑනියෙ." රජතුමා කඩා පැන්නේය. ඔහු නෙඩ් වෙත වයින් කුසලානක් රැගෙන ආවේය. "කකුල තාමත් රිදෙනවද?"

"ටිකක්." නෙඩ් කීය. වේදනාව නිසා ඔහු ගේ හිස තෝන්තුවාවෙන් බර වී තිබින. එනමුදු රැජිණ ඉදිරියේ සිය දුබලතාව පෙන්වීමට ඔහුට උවමනා නොවීය.

"පයිසෙල් දිවුරලා කියනවා ඒක තිබුනු විදියටම සනීප වෙයි කියලා." රොබර්ට් බැම ඇකිළීය. "මම හිතන්නෙ උඹ දන්නවා කැට්ලින් කරපු දේ ගැන?"

"මම දන්නවා." නෙඩ් වයින් ස්වල්පයක් තොල ගෑවේය. "මගේ බිරිඳට දොස් කියන්ට බෑ මගේ ස්වාමිනී. එයා කරපු හැමදේම කලේ මගේ අණ නිසයි."

"ඒ ගැන මට සතුටු වෙන්ට බෑ නෙඩ්."

"මගේ ලේ නෑයින්ට අත තියන්ට තරම් උඹට ඔච්චර හයියක් ආවෙ කොහෙන්ද?" සෙර්සි කඩා පැන්නා ය. "උඹ කවුරුයි කියලාද උඹ හිතන් ඉන්නෙ?"

"රජතුමාගෙ හස්තය කියලා." නෙඩ් මවාගත් ආචාරශීලීත්වයකින් ඇයට කීවේය. "රජතුමාගෙ සාමය රකින්ටයි රජතුමාගෙ යුක්තිය පසිඳලන්ටයි කියලා ඔබතුමීගෙ සැමියාගෙන් ලැබුන අණ නිසා."

"උඹ හස්තය වෙලා හිටියා." සෙර්සි පටන්ගත්තා ය. "ඒ වුනත් දැන්-"

"කටවහගනින්!" රජතුමා ගුගුලේය. "උඹ ප්‍රශ්නයක් ඇහුවා, ඌ ඒකට උත්තර දුන්නා. එච්චරයි." කෝපයෙන් වියරු වැටී ගියද රැජිණ නිහඬවූවා ය. රජතුමා නැවතත් නෙඩ් දෙසට හැරුනි. "රජතුමාගෙ සාමය රකින්ටයි කියලා උඹ කිවුවෙ ඒ. මෙහෙමද උඹ රජතුමාගෙ සාමය රකින්නෙ නෙඩ්? මිනිස්සු හත්දෙනෙක් මැරිලා..."

"අටදෙනෙක්." රැජිණ ඔහුව නිවැරැදි කලාය. "ට්‍රෙගාර් අද උදේ මැරුනා. ස්ටාර්ක් උතුමානන් එයාට එල්ලකරපු පහර නිසා."

"රජමාවතේ මිනිස්සු පැහැරගන්න ඒවායි නගරෙ වීදිවල බීමතින් මරාගන්න ඒවායි. මට බෑ එහෙම දේවල් වෙන්ට දෙන්ට නෙඩ්." රජතුමා කීය.

"කැට්ලින්ට සාධාරණ හේතු තිබුනා පුංචි යකාව පැහැරගන්ට-"

"මම කිවුවෙ, එහෙම දේවල් වෙන්ට දෙන්ට බෑ කියලයි නෙඩ්. උඹ එයාට අණක් යවහං ඉක්මනටම කුරුමිට්ටාව නිදහස් කරන්ටයි කියලා. ඒ එක්කම උඹ ජේමිත් එක්ක සමාදාන වෙන්ට ඕන."

"මගේ මිනිස්සු තුන්දෙනෙක් මගේ ඇස් ඉස්සරහදිම මරලා දැම්මා. මොකද ජේමි ලැනිස්ටර්ට ඕන වුනා මට දඬුවම් කරන්ට. ඒක අමතක කරලා දාන්ට කියලාද මට කියන්නෙ?"

"මේ හුටපටේට හේතුව මගේ සහෝදරයා නෙවෙයි." සෙර්සි රොබර්ට්ට කීවාය. "ස්ටාර්ක් උතුමානන් ගනිකා මඩමක ඉඳලා බීගෙන ආපහු එන අතරමගදි උගෙ මිනිස්සු ජේමීටයි එයාගෙ සෙබළුන්ටයි පහර දුන්නා. හරියටම උගෙ ගෑනි ටිරියන්ට රජමාවතෙදි පහර දුන්නා වගේම."

"ඔබ ඊට වඩා හොඳට මා ගැන දන්නවා රොබර්ට්." නෙඩ් කීය. "මාව සැක නම් බේලිෂ් උතුමානන්ගෙන් අහන්ට. එයාත් එතන හිටියා."

"මම දැනටමත් සුළැඟිල්ලාට කතා කරලයි තියෙන්නෙ." රොබර්ට් පැවසීය. "ඌ කියනවා සටන පටන්ගන්ට කලින් ඌ නගරාරක්ෂකයො එක්කරන් එන්ට කියලා එතැනින් පිටවෙලා ආවයි කියලා. ඒ වුනත් ඌ පිළිගන්නවා උඹ ඔය කොහේදෝ ගණිකා මඩමක ඉඳන් තමා ආවෙ කියලා."

"කොහේදෝ ගණිකා මඩමක ඉඳලා? උඹේ ඇස් දෙකට හෙණ ගහපං රොබර්ට්. මම එතැනට ගියේ ඔබේ දුවව බලන්ටයි. එයාගෙ අම්මා එයාට නම දාලා තියෙන්නෙ බරා කියලා. එයා හරියටම ඔබේ පළවෙනි දරුවා වගේමයි. මතකද අපි කොල්ලො කාලෙ මිටියාවතේ ඉන්නකොට ඉපදුන කෙල්ල?" කතාව අතරතුර රැජිණ ගේ ප්‍රතික්‍රියාවන් කෙසේ වේදැයි දැනගන්නට මෙන් නෙඩ් ඇය දෙස බැල්මක් හෙළීය. ඇගේ මුහුණ වෙස් මුහුණක් මෙන් නිසල හා සුදුමැලි වූ අතර එයින් ඇගේ සිත තුළ ඇති කිසිදු හැඟීමක් පාවා නොදුන්නේ ය.

රොබර්ට් ගේ මුහුණ රතු වී ගියේය. "බරා!" ඔහු ගුගුලේය. "ඒකෙන් මාව සතුටු කරන්ටද? ඒ කෙල්ල යකාට ගියාදෙන්. මම හිතුවා ඒකිට ඔයිට වඩා මොළේ තියෙයි කියලා."

"ඒකිට පහළොවකට වඩා වැඩි නෑ. ගණිකාවක්. ඔබ හිතනවා ඒකිට මොළේ තියෙයි කියලා." නෙඩ් මවිතයෙන් කීය. ඔහු ගේ පාදය තවතවත් වේදනා ගෙනදෙන්නට පටන්ගෙන තිබින. සිය කේන්තිය පාලනය කරගැනීම ඔහුට තවදුරටත් අසීරු කරුණක් විය. "මේ මෝඩ කෙල්ල ඔබත් එක්ක ආදරෙන් බැඳිලා ඉන්නෙ රොබර්ට්."

රජතුමා සෙර්සි දෙසට බැල්මක් හෙළීය. "මේ මාතෘකාව රැජිණගෙ කණ්දෙකට වැටෙන්ට තරම් සුදුසු නෑ."

"එතුමිය මම කියන කිසිම දේකට කැමැති වෙන එකක් නෑ. මට අහන්ට ලැබුනා රජුන් මරන්නා නගරයෙන් පැනලා ගිහිල්ලායි කියලා. එයාව ආපහු නීතිය ඉදිරියට ගේන්ට යන්ට මට අවසර දෙන්ට."

සිය වයින් කුසලාණ මදක් සෙලවූ රජතුමා ඉන් උගුරක් බීවේය. "නෑ. මට ඕන නෑ මේක තවත් දුරදිග යනවා දකින්ට. ජේමි උඹේ මිනිස්සු තුන්දෙනෙක් මැරුවා. උඹ උගේ පස්දෙනෙක් මැරුවා. දැන් ඒක ඉවරයි."

"ඒකද ඔබේ යුක්තිය?" නෙඩ් ඇවිස්සුනු තරහින් යුතුව ඇසීය. "එහෙමනම් මට බොහොම සන්තෝසයි මම තවදුරටත් ඔබේ හස්තය නොවෙන එක ගැන."

රැජිණ සිය සැමියා දෙස බැලුවා ය. "මේ මිනිහා ඔබට කතාකරන විදියට වෙන මිනිහෙක් ටාර්ගේරියන්ලාට කතා කලා නම්-"

"උඹ හිතන්නෙ මම ඒරිස් කියලද?" රොබර්ට් ඇයට බාධා කලේය.

"මම හිතන්නෙ ඔබ රජෙක් කියලයි. ජේමියි ටිරියනුයි ඔබේ සහෝදරයො වගේ. ඔක්කොම කසාද නීතිත්, අපේ අනිත් බැඳීමුත් එක්ක ගත්තහම ඒක එහෙමයි. ස්ටාර්ක්ලා එයින් එක්කෙනෙක්ව පන්නලා දාලා අනිත් එක්කෙනාව හිරබාරයට අරන්. මේ මිනිහා ගන්න හුස්මක් හුස්මක් ගානෙ ඔබට අගෞරව කරනවා. ඒ වුනත් ඔබ මෙතනට වෙලා කිසිම දෙයක් කියන්නෙ නැතුව බුම්මට්ටා වගේ බලන් ඉන්නවා. උගෙ කකුල රිදෙනවද, තව වයින් ටිකක් දෙන්ටද කියලා අහ අහා."

කේන්තිය නිසා රොබර්ට් ගේ මුහුණ කළු පැහැ වී ගියේය. "උඹට කී පාරක් කියන්ට ඕනද කට වහගෙන ඉඳින් කියලා ගෑනියෙ?"

සෙර්සි ගේ මුහුණ සිදු වූ මදිපුංචිකම නිසා ඇකිළී ගියේය. "දෙයියො අපි දෙන්නට ලොකු සරදමක් කරලා තියෙන්නෙ. මේ හැම දෙයක්ම දිහා බැලුවම මට හිතෙනවා ඔබ ගවුම් අඳින්ට ඕන, මම සන්නාහය අඳින්ට ඕන කියලා."

වියරුවෙන් දම් පැහැ වී ගිය රොබර්ට් ඇය වෙත කඩාපැන්නේ ඇගේ හිසේ පැත්තකට කුරිරු අතුල් පහරක් දුන්නේය. පා පැකිලී මේසයේ හැපුනු ඇය බිම ඇද වැටුනි. එනමුදු සෙර්සි ලැනිස්ටර් සිහින් කෙඳිරියකුදු නොනැගුවා ය. සිය සුමුදු කම්මුල දැනටමත් රතුවන්නට පටන්ගෙන තිබුනු තැන ඇය සිහින් අතැඟිලි වලින් අතගෑවාය. හෙට වන විට මේ තැල්ම මුහුණෙන් අඩක් පුරා විහිදෙනු ඇත. "මම මේක බොහොම ගෞරවනීය සලකුණක් විදියට පළඳින්නම්." ඇය කීවාය.

"කට වහගෙන ඒක පැළැඳගෙන හිටපං. නැත්තං මම උඹට ආයෙමත් ගෞරව දක්වයි." රොබර්ට් දිවුලේය. ඔහු සෙබළෙකුට අඬගැසූ අතර සෙර් මෙරින් ට්‍රෙන්ට් කාමරයට ඇතුළු විය. "රැජිණට මහන්සියි. එයාව එයාගෙ නිදන කාමරේට එක්කන් යන්ට." වදනකුදු නොදෙඩූ නයිට්වරයා රැජිණව දෙපයින් නැගිට්ටුවා ඇයත් සමග කාමරයෙන් පිට විය.

වයින් ගුරුලේත්තුව වෙත ළඟා වූ රොබර්ට් නැවත වරක් සිය කුසලාණ පුරවා ගත්තේ ය. "බලහං ඒකි මට කරලා තියෙන දේ නෙඩ්. මගේ ආදරණීය බිරිඳ. මගේ දරුවන්ගෙ අම්මා." ඔහු ගේ වියරුව මේ වනවිට නැතිව ගොස් තිබින. ඒ වෙනුවට ඔහු ගේ දෑසේ ශෝකයක් හා බියක් දකින්නට තිබින. "මම ඒකිට ගහන්නෙ නැතුව ඉන්ට තිබුනා. ඒක... ඒක කරුනාවන්ත නෑ."ඔහු සිය දෑත් දෙස බැලීය. "මම හැමදාමත් ශක්ති සම්පන්නයි. මගෙත් එක්ක හැප්පෙන්ට කාටවත් බෑ. කාටවත්ම බෑ. උඹට කෙනෙකුට ගහන්ට බැරි නම් උඹ කොහොමද ඌත් එක්ක සටන් කරන්නෙ?" රජතුමා වියවුල් සිතින් හිස වැනීය. "රේගාර්... රේගාර් දිනුවා. ඌ යකාටම ගියාවෙ. මම ඌව මැරුවා නෙඩ්. උගෙ කළු පාට සන්නාහය පසාකරගෙන උගෙ කළු පාට හදවත කුඩුවෙන්ට මම යගදාවෙන් ගැහුවා නෙඩ්. ඌ මගේ කකුල් දෙක ගාව මැරුනෙ. උං ඒ ගැන සින්දුත් හැදුවා. ඒ වුනත් කොහොම හරි ඌයි අන්තිමට දිනුවෙ. දැන් ලියානා ඉන්නෙ ඌ ගාව. මට මේකිව ඉතුරු වුනා." ඔහු සිය වයින් කුසලාණ එක හුස්මට බී හමාර කලේය.

"මගේ ස්වාමිනී, අපි කතා කරන්ට ඕන..."

රොබර්ට් සිය ඇඟිලි තුඩු නළලට තබා තදකලේය. "කතා කරලා කරලා මම දැන් මැරෙන්ට තරම් මහන්සි වෙලා ඉන්නෙ නෙඩ්. හෙට මම රජවනයට යනවා දඩයම් කරන්ට. උඹට මොනා කියන්ට තිබුනත් මම ආපහු එනකම් ඒවාට බලාඉන්ට වෙනවා."

"දෙයියො කරුනාවන්ත වුනොත් ඔබ ආපහු එනකොට මම මෙහෙ ඉන්නෙ නැතිවෙන්ට පුළුවන්. ආපහු වින්ටර්ෆෙල්වලට යන්ටයි කියලා ඔබ මට අණ කලා. මතකද?"

රොබර්ට් නැගිට සිටියේ තමාව වාරු කරගැනීම සඳහා ඇඳ කකුලක් අල්ලා ගත්තේ ය. "දෙයියො එහෙම ලේසියෙන් කරුනාවන්ත වෙන්නෙ නෑ නෙඩ්. ඉඳා, මෙන්න මේක උඹේ." සිය කබායේ සාක්කුවකින් රජතමය හස්තයේ භාරිච්චිය පිටතට ඇදගත් ඔහු එය ඇඳ මතට විසි කලේය. "උඹ කැමැතිවුනත් නැතත් උඹ තමා මගෙ හස්තය. යකාටම පලයං. මම උඹට තහනම් කරනවා මේ නගරෙන් පිටවෙන්ට."

නෙඩ් රජතමය භාරිච්චිය අහුලාගත්තේ ය. පෙනෙන හැටියට නම් ඔහුට වෙනත් විකල්පයක් නොවීය. ඔහු ගේ පාදය තවත් තදින් රිදුම් දෙන්නට වූ අතර තමා දරුවකු තරම් අනාරක්ෂිත යැයි ඔහුට හැඟෙන්නට විය. "ටාර්ගේරියන් කෙල්ල-"

රජතුමා කේන්තියෙන් ගෙරෙවුවේ ය. "අපා හතටම පලයං. ඒකි ගැන ආයෙමත් පටන්ගන්ට එපා. ඒක ඉවරයි. ආයෙමත් ඒ ගැන කතාකරන්ට එපා."

"මගේ උපදෙස්වලට කණ් දෙන්නෙ නැත්තම් ඇයි ඔබට මාව ඕන හස්තය විදියට?"

"ඇයි?" රොබර්ට් සිනාසුනේය. "ඇයි නැත්තෙ? කවුරුහරි එකෙක් මේ මලඉලවු රාජධානිය පාලනය කරන්ට ඕන. ඕක දාගනින් නෙඩ්. ඒක උඹට ගැලපෙනවා. උඹ ආයෙමත් ඕක මගෙ මූනට දමලා ගැහුවොත්.. මම මේ දිවුරලා කියන්නෙ.. මම ඔය බඩකඩුත්තුව දෙනවා ජේමි ලැනිස්ටර්ට."

Cersei Lannister: “A man in your place should count himself fortunate that his head is still on his shoulders.”

කැට්ලින් 07-1

පෙරදිග අහස රෝස රන් පැහැ ගන්වමින් ඒරින් මිටියාවතට ඉහළින් හිරු උදාවිය. තම කාමරයේ කවුළුවට එහායින් වූ විසිතුරු කැටයමින් නිමකල අත්වැටට දෑත් බර දුන් කැට්ලින් ස්ටාර්ක් ආළෝකය පැතිරෙන දෙස බලා සිටියාය. අරුණාළෝකය ඇයට පහතින් වූ වනාන්තර හා තණබිම් ඔස්සේ හෙමිහිට පැතිරෙද්දී ලෝකය මෙතෙක් වසා සිටි කළු පැහැයෙන් තද නිල් පැහැයටත්, ඉන්පසු කොළ පැහැයටත් හැරුනේය. ඇලයිසාගේ කඳුළේ ජලකඳ, කඳු මුදුනේ සිට යෝධයාගේ හෙල්ලය ඔස්සේ තම දිගු ඇදහැලීම පටන්ගන්නා තැනදී ජලවාශ්ප තුනී, සුදුපැහැ මීදුමක් මෙන් අහසට නැගින. මේ සියුම් ජලබිඳිති තම මුහුණ යාන්තම් ස්පර්ශ කරනයුරු කැට්ලින්ට දැනුනි.

සිය සැමියා, සිය සොහොයුරන් සහ සිය දරුවන් සැවොම මරාදැමෙනු ඇලයිසා ඒරින් විසින් දැක තිබුනු මුත් ඇය කිසිදිනක ඒ වෙනුවෙන් එකදු කඳුළක් හලා නොතිබින. ඉදින් ඇගේ මරණයේදී සිය ආදරණීයයන් වැලලුනු මිටියාවතේ කළු පස ඇගේ කඳුළින් තෙමන තුරු ඇයට සාමයක් නොලැබෙන බවට දෙවියන් විසින් තීරණය කර තිබින. ඇලයිසා මියගොස් දැන් අවුරුදු හයදහසක් ගතවී ඇති නමුදු මේ ජලකඳේ එකදු බිඳුවක්වත් තවමත් පහළින් වූ මිටියාවතේ පොළොව මත පතිත වී නොමැත. තමා මියගිය පසු තම කඳුළුවලින් කෙතරම් විශාල දිය ඇල්ලක් සෑදේදැයි කැට්ලින් විමතියෙන් කල්පනා කලාය. "මට ඉතුරු ටිකත් කියන්ට." ඇය කීවාය.

"රජුන් මරන්නා කාර්ස්ටලි රොක්වල හමුදාවක් එකතු කරනවාලු." ඇගේ පිටුපසින් වූ කාමරය තුළ සිටි සෙර් රඩ්රික් කසල් පිළිතුරු දුන්නේ ය. "ඔබේ සහෝදරයා ලියලා තියෙනවා, එයා පණිවුඩකාරයො යැවුවලු කාර්ස්ටලි රොක්වලට ටයිවින් උතුමානන්ගෙ අභිප්‍රාය මොකක්ද කියලා දැනගන්ට. ඒත්, ඒකට පිළිතුරක් ලැබිලා නැහැල්ලු. එඩ්මුයර් අණ කරලා තියෙනවා වාන්ස් උතුමානන්ටයි පයිපර් උතුමානන්ටයි ගෝල්ඩන් ටූත් වලට යටින් තියෙන කපොල්ල ආරක්ෂා කරන්ටයි කියලා. එඩ්මුයර් දිවුරනවා ටලී බිමෙන් එක අඩියක්වත් ආපස්සට ගන්නේ නෑ ඊට කලින් ඒ බිම ලැනිස්ටර් ලේ වලින් තෙමන්නේ නැතුව කියලා."

කැට්ලින් හිරු උදාව වෙතින් පසෙකට හැරුනා ය. එහි සුන්දරත්වය ඇගේ හද සැහැල්ලු කිරීමට අසමත් වී තිබින. මෙතරම් කාලකණ්ණි ලෙස අවසාන වීමට යන දවසකට එතරම් සුන්දර හිරු උදාවක් තිබීම කිසිසේත්ම නොගැලපෙන්නක් විය. "එඩ්මුයර් පණිවුඩ යවනවා. එඩ්මුයර් දිවුරනවා. ඒ වුනත් රිවර්රන්වල අධිපතියා එඩ්මුයර් නෙවෙයි. මගේ තාත්තට මොකක්ද වෙලා තියෙන්නේ?"

"පණිවුඩයේ හස්ටර් උතුමානන් ගැන කිසිම සඳහනක් නෑ  මගේ ආර්යාවනි." සෙර් රඩ්‍රික් සිය රැවුලෙන් අදිමින් පැවසුවේ ය. ඔහු තුවාලවලින් සුවය ලබා යථා තත්ත්වයට පත්වෙමින් සිටි කාලය තුළ හිම මෙන් සුදු පැහැ, කටු පඳුරක් මෙන් රළු රැවුළක් වැඩී තිබින. දැන් ඔහු බොහෝදුරට පෙර සිටි සෙර් රඩ්‍රික් ගේ තත්ත්වයට නැවත පත් වී තිබින.

"මගේ තාත්තට ගොඩක්ම අසනීප නැත්තම් එයා එඩ්මුයර්ට රිවර්රන්වල ආරක්ෂාව බාර දෙන්නේ නෑ . ඔය ලියුම ආපු ගමන්ම මට නැගිට්ටවන්ටයි තිබුනේ."

"ඔබතුමීගේ නින්දට බාධා කරන්ට එපයි කියලා ඔබේ සහෝදරී කිවුවලු. මේස්ටර් කෝල්මන් තමා මට කිවුවේ."

"කොහොම වුනත් මට නැගිට්ටවන්ටයි තිබුනේ." ඇය අවධාරණය කලාය.

"මේස්ටර් මට කිවුවා සටනෙන් පස්සේ ඔබතුමීත් එක්ක කතා කරන්ට ඔබේ සහෝදරී අදහස් කරගෙන ඉන්නවා කියලා."

"ඒ කියන්නේ මේ විකාරේ කරන්ටමම ද එයා හිතාගන ඉන්නේ?" කැට්ලින් මුහුණ පුළුටු කරගත්තා ය. "කුරුමිට්ටා ගහන ගහන පදේට එයා නටනවා. තමන් නටනවා කියලවත් එයා දන්නේ නෑ. සෙර් රඩ්‍රික්, අපි මීට කලිනුයි මෙහෙන් පිටත්වෙලා යන්ට තිබුනෙ. අද උදේ මොකක් සිද්දවුනත් මට කමක් නෑ. මේ වෙලාවෙ මම මගේ පුත්තුත් එක්ක වින්ටෙර්ෆෙල්වලයි ඉන්ට ඕනෑ. ඔබට ගමන් කරන්ට තරම් ශක්තියක් තියෙනවා නම් අපිව ගල්ටවුන් වලට එක්ක යන්ට ආරක්ෂක බලකායක් දෙන්ටයි කියලා මම ලයිසාගෙන් ඉල්ලන්නම්. අපට එතැනින් නැවු නගින්ට පුළුවන්."

"තවත් නැවක්?" සෙර් රඩ්‍රික් යන්තමින් සුදුමැලි පැහැයකට හැරුනද ඔහු සිය වෙවුලුම සඟවාගෙන පිළිතුරු දුන්නේ ය. "ඔබ කැමැති විදියක් මගේ ආර්යාවනි."

කැට්ලින් විසින් ලයිසාගෙන් ලැබුනු සේවිකාවන් කැඳවූ අතර වියපත් නයිට්වරයා ඇගේ කාමරයේ දොරටුවට ඔබ්බෙන් රැඳී සිටියේ ය. ද්වන්ද්ව සටනට පෙර සිය සොහොයුරියට කතා කල හැකි වුවහොත් සමහරවිට ඇගේ සිත වෙනස් කල හැකිවනු ඇතැයි සේවිකාවන් විසින් ඇයව හැඩගන්වන අතරේ කැට්ලින් කල්පනා කලාය. ප්‍රශ්නයකට තිබුනේ ලයිසා ගේ ප්‍රතිපත්ති ඇගේ මනසේ ස්වභාවයත් සමග වෙනස් වන අතර ඇගේ මනසේ ස්වභාවය පැයෙන් පැයට වෙනස්වීමයි. රිවර්රන් හිදී ඇයත් සමග හැදී වැඩුනු ලජ්ජාශීලී දැරිය මේ වනවිට වරින්වර වෙනස් වන ආඩම්බර, බියපත්, කුරිරු, වියවුල්, නොදැමුනු, කීකරු, මුරණ්ඩු, අහංකාර සහ  මේ සියල්ල අබිබවූ අස්ථිර බවකින් යුතු කාන්තාවක බවට පත් වී සිටියා ය.

දුෂ්ට සත්වයෙකු වූ ඇගේ සිරපල්ලා විසින් ටිරියන් ලැනිස්ටර් පාපොච්චාරණයකට සූදානම් බව කියැවෙන පුවත ගෙන ආ විට ඔහුව පුද්ගලිකව හමුවිය යුතු බව කැට්ලින් අවධාරණයෙන් කියා සිටියා ය. එනමුදු එය නොසලකා හැරි ලයිසාට උවමනා වූයේ මුලු මිටියාවතටම පෙනෙන්නට ඔහුව ප්‍රදර්ශනයට තබා විනෝද වීමට මිස වෙන කිසිවක් නොවේ. එමෙන්ම දැන් මේ විකාරය...

"ලැනිස්ටර් තාමත් මගේ හිරකාරයා." පියගැට පෙළ බැස ඉයරි බලකොටුවේ සීතල ධවල ශාලා හරහා පිය නගන අතර කැට්ලින් සෙර් රඩ්‍රික්ට පැවසුවා ය. ඇය සරල අළු පැහැ ලොම් ඇඳුමක් හැඳ, රිදීවන් ඉණපටියක් පැළැඳ සිටියා ය. "මගේ නංගිට ඕක මතක්කරලා දෙන්ට ඕන."

ලයිසා ගේ කාමර වෙත යන දොරටුව අබියසදී කෝපයෙන් ඉන් පිටවන බ්‍රින්ඩන්ව ඔවුන්ට හමුවිය. "අර මල විකාරේ බලන්ට යනවද?" ඔහු කඩාපැන්නේ ය "හොඳක් වෙනවා නම් ඔයාගෙ නංගිට මොළේ පහළවෙන්ටයි කියලා අත පුරෝලා කණට දෙකක් දෙන්ට කියලයි මම ඔයාට කියන්නෙ. ඒත් වැඩක් වෙන එකක් නෑ, නිකම් බොරුවට අත හූරගන්න එක විතරයි වෙන්නෙ."

"රිවර්රන්වලින් ලියුමක් ඇවිල්ලා." කැට්ලින් කීවාය. "එඩ්මුයර් කියනවා..."

"මම දන්නවා දරුවෝ." ආභරණයක් ලෙස බ්‍රින්ඩන් පැළැඳ සිටි එකම වස්තුව වූයේ ලෝගුව එක්කර ගසන ලද කළු මත්ස්‍යයා පමණි. "මට ඒක ගැන දැනගන්ට ලැබුනෙත් මේස්ටර් කෝල්මන්ගෙනුයි. මම ඇහුව ඔයාගෙ නංගිගෙන් හොඳ සෙබළු දාහක් අරන් රිවර්රන්වලට යන්ටද කියලා. දන්නවාද ඒකි මට කියාපු දේ? මිටියාවතට සෙබළු දාහක් තියා එක්කෙනෙක් වත් වැඩිපුර අපතේ අරින්ට බැහැලු. වාහල්කඩ නයිට්වරයා විදිහට මට තියන වැඩක් බලාගෙන මෙහාට වෙලා ඉන්ටලු." ඔහුට පිටුපසින් විවරව තිබුනු දොර තුළින් ළදරු සිනාහඬක් පාවී ආවේය. ඇගේ බාප්පා උරහිසට උඩින් ඒ දෙස අඳුරු බැල්මක් හෙලීය. "මම ඒකිට කිවුවා අලුතෙන් වාහල්කඩ නයිට්වරයෙක් හොයාගන්ටයි කියලා. කළුමාළුවා හරි මොකා හරි උනත් මම තාමත් ටලී කෙනෙක්. මම අද රෑම යනවා රිවර්රන් වලට."

කැට්ලින් ගේ පුදුමය බොරු පුදුමයක් නොවීය. "තනියම? ඔයාට ඒ ගමන තනියම යන්ට බෑ බාප්පෙ. මම වගේම ඔයාත් හොඳටම දන්නවානේ කඳුකර මාර්ගයේ තනියෙන් යන්ට බැහැයි කියලා. මමයි සෙර් රඩ්‍රිකුයි වින්ටර්ෆෙල් වලට යනවා. බාප්පත් එන්ට අපිත් එක්ක. මම දෙන්නම් ඔයාගෙ මිනිස්සු දාහ. රිවර්රන් තනියම සටන්කරන්ට ඕන නෑ."

මොහොතක් සිතා බැලූ බ්‍රින්ඩන් රළු හිස සැලීමකින් එකඟතාව දැක්වී ය. "ඔයා කියන එක ඇත්ත. ඒ පාරෙන් ගෙදර ගියොත් ගොඩක් දුරයි. ඒත් සැකක් නැතුව මට එහෙට යාගන්ට පුලුවන් වෙයි. මම ඔයාලා එනකල් පහළට වෙලා ඉන්නම්." දිගු පියවර තබමින් ඔහු පිටව යද්දී සුළඟට හසු වූ සළුව ලෙලදුන්නේ ය.

කැට්ලින් හා සෙර් රඩ්‍රික් එකිනෙකා අතරේ බැල්මක් හුවමාරු කරගත්හ. ඊළඟ මොහොතේ ඔවුහු දොරින් ඇතුළු වී උස්ව නැගුනු ළමා සිනාහඬ දෙසට පියමැන්නහ.

ලයිසා ගේ කාමර පෙළ ධවල කුළුණුවලින් වට වූ, නිල් පැහැ මල් සහිත පඳුරින් පිරි කුඩා උද්‍යානයකට විවර විය. ගොඩනැගිලි නිර්මානකරුවන් එය දෙව්වනයක් ලෙස සැලසුම් කර තිබුනු නමුදු ඉයරි බලකොටුව පිහිටා තිබූ තද පාෂාණ මතට පහළ මිටියාවතෙන් කෙතරම් පස් ගෙන දැමුවද වයර්වුඩ් ගසක් කිසිදා එහි මුල් ඇද්දේ නැත. එමනිසා ඉයරි හි වංශාධිපතියන් විසින් එහි තැන් තැන්වල ප්‍රතිමාවන් සිටුවා, තණකොළ වැවුනු, මලින් පිරි බිම්කඩක් බවට පත් කර තිබින. සටන්කරුවන් දෙපල විසින් ඔවුන් ගේ සහ ටිරියන් ලැනිස්ටර් ගේ ජීවිත දෙවියන් වෙත භාරදීමට තෝරාගෙන තිබුනේ මෙම බිම්කඩයි.

හොඳින් නා පිරිසිදු වී, ක්‍රීම් පැහැ විල්ලුද හැඳ, කිරි සුදු ගෙල වටා නිල් මිණෙන් හා සඳකැන් මිණෙන් කල මාලයක් පැළඳ සිටි ලයිසා, සටන නැරඹීම සඳහා තම උපදේශකවරුන් හා ආරක්ෂකයින් සමග උද්‍යානයට ඉහළින් වූ වේදිකාවක හිඳ සිටියාය. ඇය පිරිවරා සිටි පිරිස අතර නයිට්වරුන්, අතවැසියන් සහ වංශාධිපතීන් රැසක් වූහ. ඔවුන්ගෙන් බොහෝදෙනෙකු ඇයව විවාහ කරගෙන, ඇයත් සමග එක්ව ඒරින් මිටියාවත පාලනය කිරීමේ බලාපොරොත්තුව තවමත් තම සිත්හි දරාසිටියවුන් වූහ.

එනමුදු තමා ඉයරි බලකොටුවේ නැවතී සිටි කාලය තුළ දුටු දේවල් අනුව එය බොරු බලාපොරොත්තුවක් බව කැට්ලින් මේ වනවිට තේරුම් ගෙන සිටියාය.

කුඩා රොබර්ට් ගේ අසුන උස්ව තැබීම සඳහා දැවමය වේදිකාවක් තනවා තිබින. ඉයරිහි වංශාධිපතියා එහි අසුන් ගෙන, නිල් සහ සුදු පැහැයෙන් සැරසුනු, කුදු ගැසුනු, රූකඩ සංදර්ශනකරුවෙකු විසින් රඟ දැක්වුනු රූකඩ නයිට්වරුන් ගේ පොරයක් බලමින්, මෝඩ ලෙස සිනහවෙමින්, අත්පොලසන් දෙමින් සිටියේය. උකු ක්‍රීම් පිරි කොතල හා බ්ලැක්බෙරි පිරවූ කුඩ අමුත්තන් වෙනුවෙන් සූදානම් කර තිබුනු අතර ඔවුහු කැටයම් කල රිදී කුසලානවල පුරවා ලූ, මිහිරි දොඩම් සුවඳක් විහිදවන, වයින් තොලගාමින් සිටියහ. එය මෝඩයින් ගේ මලඉලවු විකාරයක් යැයි බ්‍රින්ඩන් කීවේ නිකමට නොවේ.

වේදිකාවේ අනික් පස සිටි ලයිසා, හන්ටර් උතුමානන් ගේ විහිළුවකට කෙළිදෙලෙන් සිනහ වී සෙර් ලින් කෝබ්‍රේ විසින් සිය කිනිසි තුඩෙහි අමුනා ඇය වෙත පුද දුන් බ්ලැක්බෙරි ගෙඩියක් දතින් කොනහමින් සිටියා ය. ලයිසා ගේ අත පතන්නවුන් අතර ඉහළින්ම සිටියේ - අඩුම ගනනේ අද දවසටවත් - ඔවුන් දෙදෙනා විය. එනමුදු මේ දෙදෙනාගෙන් කවරෙකු වඩා නුසුදුසුදැයි කීම කැට්ලින් හට අපහසු කරුනක් විය. ඉයොන් හන්ටර් වනාහි ජෝන් ඒරින්ටත් වඩා වැඩිමහලු, රක්තවාතය නිසා බාගෙට අබ්බගාතවී සිටියෙකු විය. ඔහුට එකෙකුට එකෙක් නොපරදින තරමේ ධනලෝභී, නිතරම ගැටුම් ඇතිකරගන්නා, කරදරකාර පුතුන් තිදෙනෙක් ද වූහ. මේ අතර සෙර් ලින් වනාහි වෙනත් ආකාරයක නුසුදුස්සෙකු විය. ඔහු කෙට්ටු, කඩවසම් පුද්ගලයෙකු වූ අතර පෞරානික නමුදු දිළිඳු පෙළපතකට හිමිකම් කීවේය. එමෙන්ම ඔහු අහංකාර, පරිස්සමෙන් තොර, ඉක්මනින් කේන්ති යන සුළු පුද්ගලයකු විය... ඒ අතරම, රහස් ඕපාදූපවලට අනුව නම් රූබර ලලනාවන් ගේ සමාගමයට නොකැමැත්තෙකු ද විය.

කැට්ලින්ව දුටු ලයිසා ඇයව ආදරණීය අන්දමින් වැළඳගෙන හාදුවලින් දෙකම්මුල් තෙත්කලා ය. "අද හරිම ලස්සන උදෑසනක් නේද? දෙවිවරු අපිත් එක්ක හිනාවෙනවා වගේ. මෙන්න මේ වයින් චුට්ටක් බීලා බලන්ට මගේ අක්කේ. හන්ටර් උතුමානන් හරිම කරුනාවන්ත විදියට එතුමන් ගේ පුද්ගලික ගබඩාවෙන්මම ගෙනාපු එකක්."

"එපා. බොහොම ස්තුතියි! අපි කතා කරන්ට ඕන ලයිසා."

"පස්සේ." ඇගේ සොයුරිය පොරොන්දු වෙමින් ඉවතට හැරුනා ය.

"නෑ, දැන්." හිතුවාට වඩා ඇගේ හඬ උස් හා දැඩි විය. ඒ කුමක්දැයි බලන්නට මිනිස්සු හැරෙන්නට වූහ. "ලයිසා මේ මෝඩ විකාරෙ තවත් ඇදගෙන යන්නෙ නැතුව මෙතනින් නවත්තලා දාන්ට. පුංචි යකා පණපිටින් හිටියොත් එයාගෙ වටිනාකමක් තියෙනවා. මැරුනොත් වැඩක් තියෙන්නේ කපුටන්ට බඩ පුරවගන්ට විතරයි. අනිත් එක එයාගෙ සටන්කරුවා මේක දිනුවොත් එහෙම-"

"ඒක නම් කවදාවත් වෙන්නේ නෑ මගේ ආර්යාවනි." පැල්ලම් ගැසුනු අතකින් ඇගේ උරහිසට තට්ටු කරමින් හන්ටර් උතුමානන් ඇයට සහතික කලේය. " සෙර් වාර්ඩිස් දක්ෂ සටන්කාරයෙක්. එයා මේ කුලී හේවායව ඉක්මනටම ඉවර කරලා දායි."

"එහෙම වෙයිද මගේ උතුමානනි?" කැට්ලින් ශාන්ත අයුරින් ඇසුවා ය. "මට නම් විස්වාස නෑ." බ්‍රොන් සටන්කරන ආකාරය ගමන අතරමගදී ඇය විසින් දැක තිබුනි. අනෙකුත් මිනිසුන් මියයද්දී පණපිටින් සංචාරය අවසන් කිරීමට ඔහුට හැකි වුයේ අහම්බයකින් නොවේ. ඔහු දිවියකු තරම් සුනම්‍ය චලනයන් ඇත්තෙකු විය. ඒ අවලක්ෂණ අසිපත ඔහුගේ අතෙහිම කොටසක් බඳු විය.

ලයිසා ගේ පෙම්වත්තු මලක් වටා රැස් කන බමරුන් පරිද්දෙන් ඔවුන් වටා එක් රැස් වූහ. "ගෑනුන්ට මේවා තේරෙන්නේ නෑ." සෙර් මෝර්ටන් වේන්වුඩ් පැවසීය. "සෙර් වාර්ඩිස් කියන්නෙ නයිට්වරයෙක් මගේ ආර්යාවනි. අර අනික් එකා... කොහොමත් උන්ගෙ ජාතිය මහා බයගුල්ලෝ. ඒ වගේ දාස්ගානක් වටවෙලා ඉන්නකොට නම් යුද්ධෙකදි වටිනාකමක්

තියනවා. ඒ වුනත් තනියෙන් සටන්කරනකොට උන්ගේ පිරිමිකම නිකංම කාන්දු වෙලා යනවා."

"හොඳයි ඔය කතා ඇත්තම වුනා කියමුකෝ." කට ඇද නොකර ආචාරශීලීත්වය රැකගන්නට කැට්ලින්ට ආයාසයක් දැරිය යුතු විය. "කුරුමිට්ටාව මරන එකෙන් අපට ලැබෙන ලාබෙ මොකද්ද? අපි එයාව කන්දෙන් පහළට තල්ලුකරලා දාන්ට කලින් සාධාරණ නඩු විභාගයක් තිබ්බද නැද්ද කියන එක ගැන ජේමී වදවෙයි කියලා ඔබලා හිතනවද?"

"අපි මිනිහගෙ හිස ගසා දාමු." සෙර් ලින් කෝර්බ්‍රේ කීය. "රජුන් මරන්නාට පුංචි යකාගේ ඔළුව ලැබුනම ඌට පණිවුඩේ තේරෙන්නේ නැතැයි."

ලයිසා නොඉවසිල්ලෙන් මෙන් ඇගේ දිගු රතු-දුඹුරුවන් වරලස ගසා දැමුවා ය. "රොබර්ට් උතුමානන්ට ඕන ඌ පියාඹනවා බලන්ට." ඇය පැවසුයේ මෙයින් එහාට මේ පිළිබඳ කතාකිරීම අනවශ්‍ය බව හැඟවෙන ස්වරයකිනි. "අනිත් අතට, මේකට වගකියන්ට ඕන පුංචි යකාම තමයි. එයාමයි කිවුවෙ සටන් නඩු විභාගයක් තියන්ට ඕනයි කියලා."

"ලයිසා ආර්යාවට උවමනාවක් තිබ්බත්, එයාව ගෞරවනීය විදිහට ප්‍රතික්ෂේප කරන්ට විදිහක් තිබ්බේ නෑ." හන්ටර් උතුමානන් බරපතල ස්වරයෙන් පැවසුවේය.

මේ සියල්ලක් නොතකා හරිමින් කැට්ලින් සිය සම්පූර්ණ ජවය සිය සොයුරිය වෙත යොමු කලාය. "මම මතක්කරන්ට කැමැතියි, ටිරියන් ලැනිස්ටර් මගේ හිරකාරයෙක් කියන එක."

"ඒ වගේම මම මතක් කරන්ට කැමැතියි, මේ කුරුමිට්ටා මගේ ස්වාමිපුරුෂයව මරලා දැම්මා කියන එක!" ලයිසා ගේ හඬ උස් විය. "ඌ රජතුමාගේ හස්තයට වස දුන්නා. මගේ පුංචි හුරතල් කොලු පැටියට තාත්තෙක් නැතිකලා. දැන් ඌ ඒවාට වන්දි ගෙවන්ට ඕන!" ආපසු හැරුනු ලයිසා, තම සාය පද්දවමින්, ගස්සාගෙන, ඉවත ගියාය. සෙර් ලින්, සෙර් මෝර්ටන් හා අනෙකුත් විවාහාපේක්ෂකයෝ කැට්ලින් වෙත නොපහන් බැලුම් හෙලා ලයිසා පසුපසින් වැටුනහ.

"ඔබතුමී හිතනවද එයා එහෙම කරන්ට ඇතියි කියලා?" ඔවුන් දෙදෙනා නැවත තනිවුනු විට සෙර් රඩ්‍රික් පහත් හඬින් ඇගෙන් විමසීය. "මම කියන්නෙ, ජොන් ඒරින් උතුමානන්ව මරල දැම්ම එක? පුංචි යකා තවමත් ඒක ප්‍රතික්ෂේප කරනවා. බොහොම තදින්ම ප්‍රතික්ෂේප කරනවා..."

"මම විශ්වාස කරන්නේ, මේ මිනීමැරුම කලේ ලැනිස්ටර්ලා තමා." කැට්ලින් පිළිතුරු දුන්නා ය. "ඒත් ඒක කලේ ටිරියන් ද, ජේමි ද, රැජිණ ද නැත්තම් උන් ඔක්කොම එකතුවෙලා ද කියන එක නම් හිතාගන්ටත් බෑ." ලයිසා වින්ටර්ෆෙල් වෙත එවූ ලිපියෙහි ඒ සම්බන්ධයෙන් සෙර්සිට චෝදනා කර තිබුනද දැන් දැන් ඇය ටිරියන් වැරදිකරු කිරීමට උත්සාහ දරනා සැටියකි... ඒ සමහරවිට රැජිණ යොදුන් සිය ගණනක් ඈත දකුණේ රතු බලකොටුවේ සුරක්ෂිතව සිටින අතර ටිරියන් මෙහි ඇගේ බලය යටතේ සිටින නිසා විය හැක. සිය සොයුරියගේ ලිපිය කියවීමට පෙරම පුළුස්සා දැමුවා නම් යෙහෙකි යැයි කැට්ලින්ට සිතෙමින් තිබින.

සෙර් රඩ්‍රික් සිය රැවුලෙන් ඇද්දේය. "වස... ඔව් ඒක නම් කුරුමිට්ටාගේ නැත්තම් සෙර්සි ගේ වැඩක් වෙන්ට පුළුවන්. මට සමාවෙන්ට මෙහෙම කියනවට මගේ ආර්යාවනි, ඒත් වස කියන්නේ ගෑනුන්ගේ ආයුධයක්. අනිත් අතට රජුන් මරන්නා. ඇත්ත, මගේ ඒ මිනිහට කිසිම කැමැත්තක් නෑ. ඒත් එයා එහෙම කරන ජාතියේ කෙනෙක් නෙවෙයි. එයා වඩා කැමැතියි එයාගෙ අර රත්තරන් කඩුවේ ලේ ගෑවෙනවා බලන්ට. ඇත්තටම වස දීලද මගේ ආර්යාවෙනි?"

කැට්ලින් අවිනිශ්චිත භාවයෙන් යුතුව රවා බැලුවා ය. "වෙන කොහොමද ඉතින් ඒක ස්වභාවික මරණයක් වගේ පෙන්නන්නේ?" රූකඩ නයිට්වරයෙකු රතු ලී කුඩු පෙරමින් දෙකට කැපී වැටෙනු දුටු රොබර්ට් උතුමානන් යටිගිරියෙන් නැගූ විස්මිත ඝෝෂාව දෙස හැරී බැලූ කැට්ලින් සුසුමක් හෙලුවා ය. "මේ කොල්ලා කිසිම විනයානුකූල විදියකට නෙවෙයි හැදෙන්නෙ. අම්මගේ උකුළෙන් ඉක්මනට අයින් කලේ නැත්නම් එයාට කවදාවත් නිම්නය පාලනය කරන්ට තරම් ශක්තිමත් වෙන්ට බෑ."

'"එයාගේ තාත්තත් එකඟ උනා ඔය කතාවට." ඇගේ පසෙකින් කටහඬක් ඇසුනි. හැරී බැලූ ඇය දුටුවේ මේස්ටර් කෝල්මන් වයින් බඳුනක් අතැතිව ඇය දෙස බලා සිටින

ආකාරයයි. "ඔබ දන්නවද, එතුමා කොල්ලව හදාවඩාගන්ටයි කියලා ඩ්‍රැගන්ස්ටෝන්වලට යවන්ටයි සැලසුම් කරගන හිටියේ... අපොයි! මම අදාළ නැති දෙයක් නේද මේ කියවන්නේ? මට සමාවෙන්ට, මට ටිකක් වයින් වැඩි වෙලා වගේ. මේ ලේ හැලීම් ගැන හිතලම මට ටිකක් අමාරුයි වගේ."

"ඔබට වැරැදිලා මේස්ටර්." කැට්ලින් පැවසුවා ය. "කාර්ස්ටලි රොක්වලටයි යවන්ට හිටියේ, ඩ්‍රැගන්ස්ටෝන්වලට නෙවෙයි. ඒකත් සිද්දවුනේ ජොන් උතුමානන් මැරුනට පස්සේ. ඒ මගේ නංගි ගේ අනුදැනුමක් නැතුව ගත්ත තීරණයක්."

මේස්ටර් ගේ හිස ඔහුගේ දිග ගෙල මත කෙතරම් තදින් වැනුනේ ද යත් ඔහුද රුකඩයක් මෙන් දිස්විය. "නෑ. මට සමාවෙන්ට මගේ ආර්යාවනි. ඒත් එහෙම නෙමෙයි වුනේ. ජොන් උතුමානන්ම තමා-"

ඔවුන්ට පහළින් මහහඬින් සීනුවක් නාද විය. වංශාධිපතීන් ද සේවක සේවිකාවන් ද යන සියල්ලෝම තමතමන් කරමින් සිටි වැඩ කටයුතු පසෙක දා ගරාදි වැට වෙත රොක් වූහ. අහස් නිල් පැහැ සළු පැළැඳි මුර සෙබළුන් දෙදෙනෙකු විසින් ටිරියන් ලැනිස්ටර්ව උද්‍යානයට කැඳවාගෙන එනු ලැබින. ඉයරිහි මහත සප්තක පූජකවරයා විසින් උද්‍යානය මධ්‍යයේ වූ සුදු පැහැ කිරිගරුඬෙන් තැනුනු , ඇලයිසා ගේ යැයි සිතිය හැකි ප්‍රතිමාව වෙත ඔහුව කැඳවාගෙන ගියේය.

"නරක පුංචි මිනිහා." රොබට් උතුමානන් කැකිරි පැලීය. " අම්මා, මට එයාව පියාඹලා යවන්ට පුළුවන් ද? මට එයා පියාඹනවා බලන්ට ආසයි."

"තව චුට්ටකින් මගේ රත්තරන් පැටියෝ." ලයිසා ඔහුට පොරොන්දු වූවාය.

"මුලින්ම නඩුව." සෙර් ලින් කෝබ්‍රේ කෙඳිරුවේය. “ඊට පස්සේ මරණය."

Tyrion Lannister: “I presume that House Arryn remembers its own words, As High as Honour.”

මොහොතකට පසු සටන්කරුවන් දෙදෙනා උද්‍යානයේ ප්‍රතිවිරුද්ධ දොරටුවලින් ඇතුළු වූහ. නයිට්වරයා තරුණ සහවරයින් දෙදෙනෙකු සමග පැමිණි අතර කුලී හේවායා ඉයරිහි ප්‍රධාන සටන් පුහුණුකරු සමග පැමිණියේ ය.

සෙර් වාර්ඩිස් ඊගන් කේශාන්තයේ සිට පාදාන්තය තෙක් වානේවලින් වැසී සිටියේ ය. ඝනකම් යට කබායක් සහ මුදු සන්නාහයට පිටතින් බරැති එලක සන්නාහයෙන් සැරසී සිටි ඔහුගේ පපුව සහ උරහිස් අතර දුර්වල සන්ධිය ආවරණය කරමින් අඩසඳ සහ උකුස්සා කැටයම් කල සන්ධි ආවරණ පළඳවා තිබින. ගෙල වටා ඝනකම් ග්‍රීවාවරණයක් වූ අතර ඉණේ සිට කළවේ අඩක් දක්වා වැටුනු වානේ සායක් මගින් යටිකය ආවරණය විය. ශිරස්කයේ ඉහළින් උකුසු පිහාටු විහිදී ගිය අතර එහි මුහුණු ආවරණය අවට බැලීමට පටු විවරයක් සහිතව උල් වානේ හොටකින් යුතු උකුස්සෙකු මෙන් නිම කර තිබින.

බ්‍රොන් කෙතරම් සැහැල්ලු සන්නාහයෙන් සැරසී සිටියාද යත් නයිට්වරයා සමග සසඳන විට ඔහු නිරුවතින් සිටියා වැන්න . ඔහු පැළැඳ සිටියේ පදම් කල සම් කමිසයක් සහ කළු මුදු සන්නාහයක් පමණි. ඊට අමතරව හිස වසා පැළැඳි මුදු සන්නාහය හා ග්‍රීවාවරණයට පිටතින් නාසාවරණයක් සහිත වානේ හිස්වැස්මක් පැළැඳ සිටියේ ය. දෙපා වසා සිටි උස බූට් සපත්තු හා වානේ පා ආවරණයන්ගෙන් දෙපයට යම් ආරක්ෂාවක් සැපයුනු අතර කළු පැහැ යකඩ කැබැලි ඔහුගේ අත්වැසුම් වලට තබා මසා තිබුනි. එනමුදු කැට්ලින් හට පැහැදිලිව පෙනී ගිය පරිදි බ්‍රොන් නයිට්වරයාට වඩා වසර පහළොවක් පමණ තරුණ විය, අඩි බාගයක් පමණ උස් විය, ඔහුගේ අසිපත් පහර නයිට්වරයාට වඩා දුරකට එල්ල කල හැකි විය.

ප්‍රතිමල්ලවයින් දෙදෙන එකිනෙකා දෙස බලාගෙන, ටිරියන් ලැනිස්ටර්ව මැදි කරගෙන ප්‍රතිමාව අසල දණ නැමූහ. පූජකවරයා ඔප දැමූ පලිඟු ගෝලයක් සිය ඉණෙහි වූ සුමුදු සළුවක් තුලින් ඇදගත්තේ එය ඉහළට එසවූයේ ය. පළිඟු ගෝලය හරහා වර්තනය වූ ආලෝකය පුංචි යකාගේ මුහුණ හරහා දේදුනු රටා මැවීය. පූජකයා ගලායන උච්ච ගාම්භීර ගීතමය ස්වරයකින් අමතමින්, දෙවියන් මෙම සටනට සාක්ෂි දරන ලෙස ද, වූදිතයාගේ

මනස තුලට එබී බලන ලෙස ද, ඔහු වැරැදිකරු නම් මරණය ද නිවැරැදිකරු නම් නිදහස සහ ජීවිතය ද ලබා දෙන මෙන් ඉල්ලා සිටියේ ය. ඔහුගේ හඬ අවටවූ කුළුණු වටා දෝංකාර දෙන්නට විය.

අවසාන දෝංකාරයද නිමා වූ පසු පූජකවරයා පලිඟු ගෝලය පහත් කරගත්තේ ඉක්මනින්ම එතැනින් පිටව ගියේය. මුරසෙබළුන් විසින් ඉවතට කැටුව යාමට පෙර ටිරියන් ඉදිරියට නැමී බ්‍රොන් ගේ කණට යමක් කෙඳිරුවේ ය. සිය දණහිසේ ඇලුනු තණපතක් පිස දා හැර මහහඬින් සිනාසුනු බ්‍රොන් නැගී සිටියේ ය.

ඉයරිහි උතුමානන් සහ මිටියාවතේ ආරක්ෂකයා වන රොබර්ට් ඒරින් සිය අසුනේ ඇඹරෙමින් සිටියේය. "මෙයාල කොයි වෙලාවෙ ද සටන් කරන්නෙ?" ඔහු නොඉවසිලිමත් ස්වරයෙන් ඇසුවේය.

සෙර් වාර්ඩිස් ගේ සහවරයකු විසින් ඔහුට නැගී සිටීමට උදව් කරන ලදී. අනෙකා යකඩයෙන් සවිමත් කල, අඩි හතරක් පමණ උසැති, බරැති ඕක් ලීයෙන් නිමවුනු ත්‍රිකෝණාකාර පලිහක් ඔහු වෙත රැගෙන ආවේය. ඔවුන් දෙදෙන එක්ව එය සෙර් වාර්ඩිස් ගේ වම් අතට තබා පටි තද කර දැමූහ. ලයිසා ගේ ප්‍රධාන සටන් පුහුණුකරු විසින් බ්‍රොන් වෙතද එවැනිම පලිහක් ලබාදුන් විට ඔහු පසෙකට කෙල පහරක් ගසා එය ප්‍රතික්ෂේප කලේය. දින තුනක් පැරණි රැවුලක් ඔහුගේ ගෙල සහ කම්මුල් වසා පැතිර තිබුනි. ඔහු එය කපා නොදැමීමේ හේතුව කුමක් වුවත් ඒ තියුණු පිහියක් නොමැති කම නිසා නම් විය නොහැක. මක්නිසාද යත් ඔහුගේ අසිපත දැලි පිහියක් තරම් තියුණු මුවහතකින්, ස්පර්ශය පවා අනතුරුදායක වන තරමට දිනපතාම පැය ගණනක් තිස්සේ මුවහත් තබන බව බැලූ බැල්මටම පෙනෙන තරමේ මුවහතකින් යුක්ත වූ බැවිනි.

සෙර් වාර්ඩිස් වානේ අත්වැසුම් ලූ සුරත දිගු කල අතර ඔහුගේ සහවරයා විසින් දෙපැත්ත කැපෙන දිගු අසිපතක් ඔහුට ලබා දුන්නේ ය. එහි තලය සියුම් කඳුකර අහසක දර්ශනයකින් කැටයම් කර අලංකාර කොට තිබුනි. මිටෙහි අග කොටස උකුසු හිසක් ලෙස ද හරස් ආවරණය උකුසු තටු ලෙස ද නිමවා තිබින. "ඕක මම කිංග්ස් ලෑන්ඩින්ග්වලදී ජොන්ටම කියල හදවපු එකක්." සෙර් වාර්ඩිස් අසිපතින් වාතය පෙති ගසමින් පුහුණුවන අතරේ ලයිසා ආඩම්බර ස්වරයෙන් රැස්ව සිටි පිරිසට උදම් ඇනුවාය. "එයා රජතුමා වෙනුවට යකඩ සිංහාසනයේ වාඩිවෙන හැම වෙලාවේම ඒක පැළැඳුවා. ඒක හරි ලස්සනයි

නේද? මම හිතන්නේ ජොන් ගේ මරණයේ පලිය ජොන් ගේ කඩුවෙන්ම ගන්න එක හොඳට ගැලපෙනවා."

කැටයම් කල රිදීවන් අසිපත ඇත්තෙන්ම සුන්දර වස්තුවක් විය. එනමුදු කැට්ලින් හට සිතුනේ සෙර් වාර්ඩිස්ට ඔහුට හුරුපුරුදු ඔහු ගේ අසිපතෙන්ම සටන්කිරීමට ඉඩ හලේ නම් එය වඩා පහසු වීමට තිබුනු බවකි. නමුත් ඇය කිසිවක් නොකීමට වග බලා ගත්තා ය. සිය සොයුරිය සමග කිරීමට සිදුවුන නිෂ්ඵල වාද විවාද වලින් ඇය වෙහෙසට පත්ව සිටියාය.

"එයාලව සටන් කරවන්ටකෝ." රොබට් උතුමානන් කෑගැසුවේ ය.

සෙර් වාර්ඩිස් රොබර්ට් උතුමානන් දෙස බලා අසිපත ඔසවමින් ආචාර කලේය. "ඉයරි සහ මිටියාවත වෙනුවෙන්!"

ටිරියන් ලැනිස්ටර් උද්‍යානයෙන් එහා පිහිටි සඳලුතලයක මුර පිට හිදුවනු ලැබ සිටියේ ය. බ්‍රොන් ඔහු දෙසට සමච්චල් සහගත ආචාරයක් පුද කර සිටියේ ය.

"එයාලා බලාගෙන ඉන්නේ ඔයාගේ අණ ලැබෙනකල්." ලයිසා ඇගේ පුතුට පැවසුවා ය.

"සටන් කරන්ට." වෙවුලන දෑතින් අසුනේ ඇඳි අල්ලා ගත් කොලුවා කෑගැසුවේ ය.

පලිහ ඉහළට ඔසොවාගත් සෙර් වාර්ඩිස් කරකැවුනේ ය. බ්‍රොන් ඔහුට මුහුණ පෑවේය. එකිනෙකා පිරික්සන්නාක් මෙන් අසිපත් දෙක වරක් දෙවරක් එකිනෙක හා ගැටුනි. කුලී හේවායා අඩියක් පසු පසට තැබුවේය. පලිහ ඉස්සර කරගත් නයිට්වරයා ඔහු වෙත පැමිණියේ ය. ඔහු හරස් කැපුමක් එල්ල කලද බ්‍රොන් පසුපසට පැන්න අතර රිදීවන් තලය වාතය පමණක් කපා දමමින් ඇදී ගියේය. බ්‍රොන් කවාකාර අයුරින් දකුණු දෙසට යන්නට විය. සෙර් වාරිඩිස් ඔවුන් දෙදෙනා අතර පලිහ තබාගනිමින් බ්‍රොන්ව හඹායන්නට විය. අසමතුලිත භූමිය මත ප්‍රවේශමින් පා තබමින් නයිට්වරයා ඉදිරියට ඇදුනු අතර තොල් මත රැඳුනු සිහින් සිනහවක් සමගින් කුලී හේවායා පසුබැස්සේ ය. නැවතත් සෙර් වාර්ඩිස් එල්ල කල පහරට හසු නොවනු පිණිස බ්‍රොන් පාසි වලින් වැසුණු මිටි ගලක් උඩින් සැහැල්ලු

ලෙස පසෙකට පැන්නේ ය. ඊළඟ මොහොතේ බ්‍රොන් නැවතත් කවාකාර මගක යමින් නයිට්වරයා ගේ පලිහෙන් නොවැසුනු, අනාරක්ෂිත වම් පැත්තට ගමන් කලේය. සෙර් වාර්ඩිස් ඔහු ගේ පාදවලට පහරක් එල්ල කලද අසිපත් මානය ඊට දිගු මදි විය. බ්‍රොන් රිද්මයානුකූල අයුරින් තවදුරටත් වම් පැත්තට ගමන් කලේය. සෙර් වාර්ඩිස් එක තැන කැරකුනි.

"මේ යකා බයගුල්ලෙක්නෙ." හන්ටර් උතුමානන් ගුගුලේය. "එකතැනක ඉඳන් සටන් කරහං බයගුල්ලෝ!" තවත් කටහඬවල් එයම ප්‍රතිරාවය කලේය.

කැට්ලින් සෙර් රඩ්‍රික් දෙස බැලුවා ය. ඇගේ ප්‍රධාන සටන් පුහුණුකරුවා හිස සැලීය. "ඌට ඕනකරලා තියෙන්නෙත් සෙර් වාර්ඩිස්ව එයා පස්සෙන් පන්නගන්ට තමා. ඔය සන්නාහයේ බරටයි පලිහේ බරටයි මේ ලෝකේ ඉන්න ශක්තිමත්ම මිනිහා උනත් ඉක්මනින්ම වෙහෙසට පත්වෙනවා."

මිනිසුන් සටන් පුහුණුවන ආකාරය කැට්ලින් විසින් සිය දිවිය පුරා සෑම දිනකම පාහේ දැක තිබුනු හුරුපුරුදු දසුනක් විය. එමෙන්ම ඇය තරගාවලින් පනහක් පමණද නරඹා තිබින. එනමුදු දැන් ඇය ඉදිරියේ රඟදැක්වෙමින් තිබෙන්නේ වෙනස්ම ආකාරයේ රංගනයකි. මාරාන්තික රංගනයකි. වැරැදියට තබන එක පියවරකින් පවා නැට්ටුවාගේ මරණය තීරණය වනු ඇත. සටන නරඹමින් සිටින අතරේ වෙනත් සමයක සිදුකෙරුනු වෙනත් ද්වන්ද්ව සටනක මතකයන් හරියට අද ඊයේ සිදු වූවාක් මෙන් කැට්ලින් ස්ටාර්ක් ගේ මනස ඉදිරියේ දිගහැරෙන්නට විය.

ඔවුන් දෙදෙන එකිනෙක මුනගැසීමට තීරණය කර තිබුනේ රිවර්රන්හි පහළ සෙන්ඩුවාලුවේදී විය. පෙටයර් බේලිෂ් ශිරෂ්කය, පපු ආවරණය සහ මුදු සන්නාහය පමණක් ඇඳ සිටින අයුරු දුටු බ්‍රැන්ඩන් ඔහු ගේ සන්නාහයේ බොහෝ කොටස්ද ගලවා දැමුවේය. පෙටයර් සටන වෙනුවෙන් පැළැඳීම පිණිස ඇගේ ආශිර්වාදය සහිත යමක් ඉල්ලා සිටියද ඇය එය ප්‍රතික්ෂේප කලාය. ඒ වනවිටද ඇගේ පියා විසින් ඇයව බ්‍රැන්ඩන් ස්ටාර්ක්ට පොරොන්දු වී තිබින. එබැවින්, ඇගේ ආශීර්වාදය - ඇගේ අතින්ම ගෙත්තම් කල ඉපිලෙන ට්‍රවුට් මසුන් සහිත ලා නිල් පැහැ ලේන්සුව - ඇය බ්‍රැන්ඩන්ට ලබා දුන්නා ය. "අනේ! එයා මෝඩ පුංචි කොල්ලෙක්. ඒත් එයා මගේ සහෝදරයෙක් වගේ. එයා මැරුනොත් මට ගොඩක් දුක හිතෙයි." ලේන්සුව දෙන අතරේ ඇය බ්‍රැන්ඩන්ට ආයාචනා

කලාය. සීතල ස්ටාර්ක් දෙනෙතින් ඇය දෙස බැලූ ඇගේ අනාගත වල්ලභයා ඇයට ආදරය කල මේ කොලුවාගේ පණ බේරන බවට පොරොන්දු විය.

එම සටන පටන් ගන්නවාත් සමගම වාගේ අවසන් විය. වැඩුනු මිනිසකු වූ බ්‍රැන්ඩන් සුළැඟිල්ලාට පහර පිට පහර එල්ල කරමින් සෙන්ඩුවාලුවේ එක් කොණක සිට අනෙක් කොණ දක්වා හඹා ගියේ දියට බසින පියගැටපෙළ දිගේ පහළටද සිය ප්‍රහාරය මෙහෙයවීය. "යටත්වෙයන්!" යැයි කිහිපවරක්ම අණ ලැබුනද තුවාල දුසිමකින් පමණ ලේ පෙරමින් සිටි පෙටයර් හිස සලමින් දිගින් දිගටම සටන් වැදුනේ ය. අන්තිමේදී ඔවුන් දෙදෙනා වලළුකර තෙක් වූ දියේ බැස සටන්කරමින් සිටියදී පෙටයර් ගේ සන්නාහය සහ කබාය කපාගෙන ළපැත්තට කිඳා බසින්නට එල්ල කල දරුණු පැති පහරක් මගින් බ්‍රැන්ඩන් විසින් මෙම සටන නිමා කරන ලදී. එය කෙතරම් ගැඹුරු කැපුමක් වී ද යත් එය මාරාන්තික තුවාලයක් බව කැට්ලින්ට එක් සැනින් වැටහී ගියේය. ළපැත්තට තද කරගත් ඇඟිලි අතරින් රුධිරය වෑහෙද්දී බිම ඇද වැටෙමින් සිටි කොලුවා ඇ දෙස බලා 'කැට්' යනුවෙන් මිමිනීය. එය ඇයට අමතක වී යැයි ඇය විශ්වාස කලාය.

ඒ ඇ විසින් ඔහු ගේ මුහුණ දුටු අවසාන අවස්ථාව විය... එදා කින්ග්ස් ලැන්ඩින්ග්හි දී ඔහු ඉදිරියට ඇයව කැඳවාගෙන යන තුරු ඔහුව දුටු අවසාන අවස්ථාව විය.

රිවර්රන් හැරදා යන්නට තරමේ සුවයක් ලබන්නට සුළැඟිල්ලාට දෙසතියක් පමණ ගතවිය. එනමුදු ඒ කාලය තුළ ඔහු රඳවා සිටි කුළුණ වෙත යාම පියා විසින් ඇයට තහනම් කර තිබුනි. එවකට ලජ්ජාශීලී, මෘදු හදවතකින් යුතු දැරියක වූ ලයිසා ඔහුට සාත්තුකරන්නට මේස්ටර්වරයාට සහාය වූවාය. එඩ්මුයර් ද ඔහුව බලන්නට ගොස් තිබුනද පෙටයර් ඔහුව හමුවීම ප්‍රතික්ෂේප කර තිබින. ද්වන්ද්ව සටනේදී බ්‍රැන්ඩන්ගේ සහවරයා ලෙස ක්‍රියාකර තිබූ එඩ්මුයර්ට සමාව දීමට සුළැඟිල්ලාට අසීරු විය. ගමන් කිරීමට හැකි තරමට යාන්තම් සුව වූ වහාම පෙටයර්ව ආවරණය කල දෝලාවක බහා ලූ හස්ටර් ටලී උතුමානන් ඔහු ගේ උපන්බිම වූ අතැඟිලි වෙත ඔහුව නැවත පිටත්කර හැරියේය.

වානේ මත වානේ ගැටී නැගුනු රාවුදෙන හඬ කැට්ලින්ව නැවත වර්තමානයට කැඳවන්නට සමත් වීය. සෙර් වාර්ඩිස් මේ වනවිට බ්‍රොන්ට ඉතා තදින් පහරදෙමින් සිටියේ ය. කුලී හේවායා ඉතා සූර ලෙස ගස් මුල් මතින් පනිමින්, සියලු පහර වලකමින් පසුබැස්සේ සිය සතුරා කෙරෙන් කිසිවිටෙකත් දෑස් ඉවතට නොගත්තේ ය. ඔහු කඩිසර, බුහුටි සටන්කරුවකු බව කැට්ලින්ට වැටහින. නයිට්වරයා ගේ රිදීවන් අසිපත කිසිවිට ඔහු

අසලකටවත් නොපැමිණුනු නමුදු ඔහු ගේ කැත, අළුවන් අසිපතින් වැදුනු පහරක් නිසා සෙර් වාර්ඩිස් ගේ උරහිස් ආවරණයෙන් කොටසක් කැපී ගොස් තිබින.

මේ කෙටි බිහිසුණු ප්‍රහාරය පටන්ගත් සැනින්ම පාහේ අවසාන වූයේ බ්‍රොන් පැත්තකට පැන වැලපෙන කාන්තාව ගේ ප්‍රතිමාව පිටුපසින් අතුරුදන් වූ බැවිනි. සෙර් වාර්ඩිස් ඉදිරියට පැන එල්ලකල පහරින් සිදුවූයේ ඇලයිසා ගේ කිරිගරුඬින් කල කලවෙන් ගිනිපුපුරු මතුවීම පමණි.

"අපෝ! මෙයාලා හරියට සටන්කරන්නෙ නැනේ අම්මා." ඉයරිහි උතුමානන් මැසිවිලි නැගුවේය. "හරියට සටන් කරන්ට කියන්ටකො."

"එයාල එහෙම කරයි මගේ රත්තරන් පැටියෝ." ඔහු ගේ මව සැනසිලි බස් පැවසුවා ය. "ඔය කුලී හේවායට දවස පුරාම දුව දුවා ඉන්ට බෑ."

උද්‍යානයේ රැස්ව සිටි සමහර වංශාධිපතිවරුන් විකාර විහිළු තහළුවෙන් වයින් බඳුන් හිස් කල ද ටිරියන් ලැනිස්ටර් ගේ අසමාන දෑස් කිසිවිටෙකත් සටන්කරුවන් වෙතින් නොගිලිහුනේ ය. හරියටම මේ මුලු ලෝකයේම සිටියේ ඔවුන් දෙදෙනා පමණක් මෙනි.

ප්‍රතිමාව පිටුපස සිට වේගයෙන් පැන ආ බ්‍රොන් වම්පසට බරවෙමින් දැතින්ම වේගවත් පහරක් නයිට්වරයා ගේ අනාරක්ෂිත දකුණු පැත්තට එල්ලකලේ ය. සෙර් වාර්ඩිස් පහර වැලැක්වූ නමුදු එය සම්පූර්ණ වැලැක්වීමක් නොවීය. කුලී හේවායා ගේ අසිපත් තලය ඉහළට ඇදී ගොස් රැවුදෙමින් නයිට්වරයා ගේ ශිරස්කයේ ගැටුනේ එක් උකුසු තටුවක් කපා හෙලීය. අඩි බාගයක් පසුපසට තැබූ සෙර් වාර්ඩිස් සිය පලිහ එසවූ අතර බ්‍රොන් ගේ අසිපත ඒ මත වැදීමෙන් ලී පතුරු දසත විහිදී ගියේය. නැවත වරක් පලිහෙන් මෑත්ව වම් පැත්තට අඩියක් තැබූ කුලී හේවායා සෙර් වාර්ඩිස් ගේ උදරයට පහර දුන්නේ ය. දැලිපිහි මුවහතින් යුත් අසිපත එලක සන්නාහයේ දීප්තිමත් රිදී ඉරක් ඇන්දේය.

සෙර් වාර්ඩිස් පසු පය පෙරට තබා මාරාන්තික පහරක් සමගින් රිදීවන් අසිපත පහළට ගෙන ආවේය. පහර වැලකූ බ්‍රොන් වහා පැත්තට පැන්නේය. නයිට්වරයා මහහඬක් නංවමින් ප්‍රතිමාව හා ගැටුනෙන් එය තම පාදස්ථය මත සෙලවෙන්නට විය. අන්දමන්ද වූ

ඔහු වහා අඩියක් පස්සට ගෙන එහා මෙහා බලමින් සිය ප්‍රතිවාදියා කොහිදැයි සොයන්නට විය. ශිරස්කයේ පටු දැස් විවර විසින් ඔහු ගේ දර්ශනය සීමා කර තිබින.

"ඔන්න පිටිපස්සෙන් සෙර්!" හන්ටර් උතුමානන් හඬ නැගුවද ඒ ප්‍රමාද වැඩි විය. බ්‍රොන් දැතින්ම දුන් අසිපත් පහර සෙර් වාර්ඩිස් ගේ දකුණු අතේ වැලමිටෙහි වැදුනි. සන්ධිය ආවරණය කරමින් තිබුනු තුනී ලෝහ තහඩු පොඩි වී ගියේය. නයිට්වරයා ගොරවමින් ආපසු හැරුනේ සිය අසිපත ඉහළට එසවීය. මෙවර බ්‍රොන් පසුබැස්සේ නැත. අසිපත් යුගළ එකිනෙක සොයා පියඹද්දී ඔවුන්ගෙන් නැගුනු වානේමය සංගීතය උද්‍යානය පුරාමත් ඉයරීහි ධවල කුළුණු පුරාවටමත් නින්නාද විය.

"සෙර් වාර්ඩිස් ට තුවාලයි." සෙර් රඩ්‍රික් පැවසීය.

කැට්ලින්ට එය අමුතුවෙන් කීමට අවශ්‍ය නොවීය. නයිට්වරයා ගේ බාහුව ඔස්සේ ගලාහැලෙන දීප්තිමත් රතු පැහැ රුධිර ධාරාවත් තෙත් වූ වැලමිට සන්ධියත් ඇය පැහැදිලිවම දුටුවා ය. මේ වනවිට ඔහු එල්ල කරමින් සිටි සෑම වැලකුම් පහරක්ම කලින් එකට වඩා සෙමින් පැමිණියේ ය. සෙර් වාර්ඩිස් සිය සතුරා දෙසට පලිහ හරවමින් හැරුනු නමුදු බ්‍රොන් බළලෙකු මෙන් එතැනින් ලිස්සා නැවත වම් පැත්තට පැන්නේ ය. ගතවන මොහොතක් මොහොතක් පාසා කුලී භේවායා තවතවත් සවිමත් වන බව පෙනුනි. ඔහුගේ කැපුම් පැහැදිලිවම පෙනෙන සලකුණු ඉතුරු කරන්නට සමත් වී තිබින. සෙර් වාර්ඩිස් ගේ සන්නාහය, ඔහු ගේ දකුණු කළවය, ඔහු ගේ උල් හොට සහිත ශිරස්කය, පපු ආවරණය සහ ග්‍රීවාවරණය පුරාම ගැඹුරු කැපුම් පහරවල දිලිසුනි. අඩසඳ සහ උකුස්සා කැටයම් කල සන්ධි ආවරණ වලින් එකක් දෙකට කැපී පටියෙන් එල්ලී තිබින. ඔහු අසීරුවෙන් හුස්මගන්නා හඬ ශිරස්කයේ වා සිදුරු තුළින් පැහැදිලිවම ඇසෙන්නට විය.

උඩඟුකමින් අන්ධ වී සිටියද මිටියාවතේ සියළුම රදලයින්ට හා නයිට්වරුන්ට සිදුවන්නට යන දෙය පැහැදිලිවම තේරුම් ගත හැකිවිය. එය දැකගත නොහැකි එකම පුද්ගලයා වූයේ ඇගේ මෝඩ සොයුරිය පමණි. "දැන් ඇති සෙර් වාර්ඩිස්! ඔන්න ඕක ඉවර කරලා දාන්ට. මගේ චූටි පැටියට මහන්සියි වගේ දැන්." ඇය සටන්කරුවන් වෙත අණ කලාය.

සෙර් වාර්ඩිස් ඊගන් අවසානය දක්වාම සිය ආර්යාවගේ අණ අකුරටම පිළිපැදි බව නම් කිසිවෙකුටත් පිළිනොගත නොහැකි කරුනක් විය. එක් මොහොතක පලිහට මුවා වී

පසුබසිමින් සිටි ඔහු ඊළඟ මොහොතේ පෙරට පැන පහරදෙන්නට පටන් ගත්තේය. කුළු හරකෙක් මෙන් සිදුකල එම හදිසි කඩා පැනීම බ්‍රොන්ව අසමතුලිත කරවන්නට සමත් විය. කුලී හේවායා මතට කඩා වැදුනු සෙර් වාර්ඩිස් පලිහේ දාරයෙන් ඔහුගේ මුහුණට පහරක් දුන්නේ ය. බ්‍රොන් ලිස්සා වැටෙන්නටම ගිය නමුදු අන්තිම මොහොතේ පසුපසට අඩියක් තබා, ගලක පය පැකිලෙමින් වුවද ප්‍රතිමාවේ එල්ලී කෙලින් සිටීමට ඔහුට හැකි විය.

සිය පලිහ ඉවතට විසිකර දැමූ සෙර් වාර්ඩිස් බ්‍රොන් වෙත පිනුයේ මාරාන්තික පහරක් එල්ල කිරීම පිණිස අසිපත දැතින්ම අල්ලා එසවීය. ඔහු ගේ දකුණත වැලමිටේ සිට ඇඟිලිතුඩු දක්වාම ලෙයින් පෙඟී ගොස් තිබින. ඔහු එල්ලකල පහර බ්‍රොන් ගේ ගෙලේ සිට නාභිය දක්වා දෙපලු කර දමන්නට සමත් වූ දරුණු පහරක් වූ නමුදු... ඒ පහර පිළිගන්නට බ්‍රොන් එතැන නොසිටියේ ය.

බ්‍රොන් වහා පසුපසට පැන්නේ ය. ජොන් ඊරින් ගේ කැටයම් කල, පියකරු රිදී අසිපත කිරිගරුඬ ප්‍රතිමාවේ වැලමිටක වැදී දෙකට කැඩී ගියේය. බ්‍රොන් ප්‍රතිමාවේ පිටට සිය උරහිසේ බරදෙමින් තල්ලු කල අතර ඇලයිසා ඊරින් සෙර් වාර්ඩිස් ඊගන්වද යට කරමින් මහහඬක් නගා පෙරලි ගියේය.

බ්‍රොන් ක්ෂණයකින් සෙර් වාර්ඩිස් මතට පිනීය. කැපී ගිය සන්ධි ආවරණයට පයින් ගසා ඉවත්කල ඔහු නයිට්වරයා ගේ බාහුව සහ පපු ආවරණය අතර දුර්වල ස්ථානයක් අනාවරණය කරගත්තේ ය. සෙර් වාර්ඩිස් පැත්ත වැටී, වැලපෙන කාන්තාව ගේ උඩුකයටත් පොළොවටත් අතර සිර වී සිටියේ ය. දැතින්ම අසිපත ඔසවාගත් කුලී හේවායා සිය ගතේ මුළු බර සමගින් එය සෙර් වාර්ඩිස් ගේ ඉළඇට අතරින් ඇතුළුකරද්දී නයිට්වරයා ගේ උගුරෙන් නැගුනු වේදනාත්මක කෙඳිරිල්ල කැට්ලින්ට පැහැදිලිව ඇසුනි. සෙර් වාර්ඩිස් ඊගන් මදක් ගැස්සී ඊළඟ මොහොතේ නිසල වූයේය.

ඉයරි බලකොටුව පුරා නිහඬතාවක් පැතිර යන්නට විය. සිය ශිරස්කය ඇද ගලවාගත් බ්‍රොන් එය කණබිස්ස මත අත හැරියේ ය. පලිහ වැදුනු තැන ඔහු ගේ තොල පැලී බියකරු ලෙස ලේ ගලමින් තිබින. ඒ අඟුරුවන් කළු කේශ කලාපය දහදියෙන් තෙත්ව තිබින. ඔහු බිමට කෙල පහරක් ගැසූ අතර ඒ සමගින් කැඩුනු දතක් ද ඉවතට විසි විය.

"දැන් සටන ඉවරද අම්මා?" ඉයරිහි උතුමානන් විමසුවේ ය.

'නෑ!' ඔහුට පවසන්නට කැට්ලින්ට දැඩිව උවමනා විය. 'දැන් තමයි සටන හරියටම පටන්ගන්නේ.'

"ඔවු." ලයිසා දුක්බර හඬින් කීවාය. ඇගේ ස්වරය මියගිය ගෘහාරක්ෂක බලකා ප්‍රධානියා මෙන්ම සීතල, අප්‍රාණික එකක් විය.

"දැන් මට පුංචි මිනිහව පියාඹලා යවන්ට පුළුවන් ද?"

උද්‍යානයේ අනිත් පස අසුන්ගෙන සිටි ටිරියන් ලැනිස්ටර් නැගී සිටියේ ය. "මේ පුංචි මිනිහාව නම් නෙවෙයි. මේ පුංචි මිනිහා පහළට බහින්නේ ටර්නිප් ගෙනියන කූඩෙක නැගලා. බොහොමත්ම ස්තූතියි!"

"උඹ හිතාගන ඉන්නේ-" ලයිසා පටන්ගත්තා ය.

"මම හිතාගෙන ඉන්නේ, ඒරින් වංශයට තමන් කියාපු දේවල් මතක ඇති කියලයි." පුංචි යකා කීවේය. "ගෞරවය තරම් ඉහළින්!"

"අම්මා ඔයා කිවුවෙ මට එයාව පියාඹලා යවන්ට දෙනවා කියලා." ඉයරිහි උතුමානන් තම මවට කෑගැසී ය. "ඔයා පොරොන්දු උනා." ඔහු වෙවුලන්නට පටන්ගත්තේ ය.

වියරුව නිසා ලයිසා ගේ මුහුණ රතු වී ගියේය. "දෙයියො තීරණය කරලා තියනවා මේ මිනිහා නිර්දෝෂියි කියලා දරුවො. එයාට නිදහස දෙනවා ඇරෙන්ට අපට වෙන කරන්ට දෙයක් නෑ." ඇය ස්වරය උස් කලාය. "සෙබළුනි, මෙන්න මේ ලැනිස්ටර් උතුමානන්වයි, එයාගෙ මේ... මුර්ගයයි මගේ දෑහැට නොපෙනී මෙතනින් අරන් පලයල්ලා. උන්ව ලේ වාහල්කඩ ළඟට එක්කරන් ගිහින් මුදා හැරපල්ලා. උන්ට ගංගා ත්‍රිශූලයට ලංවෙන්ට ඇති තරම් කෑමබීමයි, අශ්වයොයි දෙන්ට වග බලාගනිල්ලා. උන්ගෙ ආයුධයි අනිත් ආම්පන්නයි හැම එකක්මත් ආපහු දීපල්ලා. කඳුකර පාරේ ආපහු යනකොට උන්ට ඒවා ඕනේ වෙයි."

"කඳුකර පාර!" ටිරියන් ලැනිස්ටර් ඇසුවේ ය. ලයිසා ගේ මුවේ සිහින් තෘප්තිමත් සිනාවක් ඇදී ගියේය. එය වෙනස්ම විදිහක මරණ දඬුවමක් බව කැට්ලින් වටහාගත්තා ය. ටිරියන් ලැනිස්ටර් ද අනිවාර්යයෙන්ම එය වටහාගත්තා විය යුතුය. එනමුදු කුරුමිට්ටා සමච්චල් සහගත අයුරින් හිස නමා ඒරින් ආර්යාවට ආචාර කලේය. "ඔබතුමිගෙ කැමැත්තක් මගේ ආර්යාවනි. මම හිතන්නේ අපි දන්නවා ආපහු යන පාර."

Brynden Tully: “Black fish or no, I am still a Tully!”

ජොන් 05

"මම මෙච්චර කාලෙකට පුහුණු කරපු අනිත් එවුන් වගේම උඹලත් කිසිම වැඩකට ඇති එවුන් ටිකක් නෙවෙයි." ඔවුන් සියල්ලන්ම අංගනයේ රැස් වූ පසු සෙර් ඇලිසර් තෝර්න් ඔවුන් අමතා කීය. "උඹලාගෙ අත් හැදිලා තියෙන්නෙ උදලු ගාන්ටයි, සවලෙන් හාරන්ටයි විතරයි. කඩු අල්ලන්ට නෙවෙයි. මට පුළුවන්කමක් තිබුනා නම් උඹලා හැමෝම යවනවා ඌරො බලාගන්ට. ඒ වුනත් ඊයෙ රෑ මට දැනගන්ට ලැබුනා ග'රින් තවත් අලුත් කොල්ලො පස්දෙනෙක් එක්කරන් රජමාවතේ උඩට එනවා කියලා. ඉතින් උන්ට ඉඩදෙන්ට ඕන නිසා මම කල්පනා කලා උඹලාගෙන් අටදෙනෙක් සමත් කරලා, අණදෙන නිළධාරිතුමා ඉස්සරහට යවන්ට, එයාට උඹලත් එක්ක ඕන මගුලක් කරගන්ටයි කියලා." ඔහු නම් එකින් එක කියැවීය. "ටොඩ්, ගල්ඔළුවා, ඔරොක්ස්, ආදරී, පිම්පල්, වඳුරා, පිස්සා, අවජාතකයා."

උද්දාමයෙන් හඬක් නැගූ පිප් සිය අසිපත ඉහළට එසවීය. සෙර් ඇලිසර් ඔහු දෙස නොපහන් බැල්මක් හෙලාගෙන මොහොතක් ගතකලේය. "උන් කියයි උඹලත් දැන් නිශාරැකුම් බලකායෙ මිනිස්සු කියලා. ඒ වුනත් උඹලා ඒ කතාව විශ්වාස කරන්ට යනවානං උඹලා අභිගුණ්ඨිකයගෙ වඳුරාටත් වඩා මෝඩ අමනයො ටිකක්. උඹලා තාමත් කොල්ලො. තාමත් ගිම්හානයේ ගඳගහන පොඩි කොල්ලො. සීත කාලෙ ආවහම උඹලා නිකං මැස්සො වගේ මැරිලා යයි." මෙතෙකින් සිය සුභාශිංසන කතාව හමාර කල සෙර් ඇලිසර් පිටව ගියේය.

අනික් කොලුවන් රැන වාසනාවන්තයින් අටදෙනා වටා රැස්කමින්, සිනාසෙමින් ඔවුනට සුබ පතන්නට වන්හ. "නිශාරැකුම් බලකායේ ටොඩ්!" කෑගැසූ හෝල්ඩර් සිය අසිපත් මිටින් ටොඩ්ට පහරක් එල්ල කලේය. කළු සොයුරෙකුට අශ්වයකු අනිවාර්යයෙන්ම උවමනා බව කියමින් පිප් ග්‍රෙන් ගේ කරේ නැග්ගේය. ඔවුන් දෙදෙනාම පා පැකිලී බිම වැටුනේ හූ කියමින්, එකිනෙකාට මිටින් අනිමින් බිම පෙරලෙන්නට වන්හ. යුද්ධායුධ ගබඩාව තුළට දිව ගිය ඩේරියන් රතු වයින් මල්ලක් රැගෙන නැවත පැමිණියේ ය. ඔවුන් සැමදෙනාම වයින් මල්ල අතිනත යවමින්, මෝඩයින් මෙන් සිනාසෙමින් සිටින අතරේ අංගනය කෙලවරේ වූ මැරුණු ගස්කඳ යට තනිවම සිටගෙන සිටින සැම්වෙල් ටාර්ලි ජොන් ගේ නෙත ගැටින. ජොන් ඔහු වෙත වයින් මල්ල දිගුකලේය. "උගුරක් ගහමුද?"

සැම් හිස වැනීය. "එපා. බොහොම ස්තූතියි ජොන්!"

"උඹ හොඳින්ද?"

"බොහොම හොඳින්, ඇත්තටම." මහත කොළුවා බොරුවක් ඇදබෑවේය. "මට හරිම සන්තෝසයි උඹලා හැමදෙනාම ගැන." ආයාසයෙන් මුවට සිනාවක් නගා ගැනීමට තැත් කරද්දී ඔහු ගේ රවුම් මුහුණ වෙවුලා ගියේය. "උඹත් කවදාහරි මුර සංචාරකයින්ගෙ ප්‍රධානියා වෙයි, උඹේ බාප්පා වෙලා හිටියා වගේ."

"වෙලා හිටියා වගේ නෙවෙයි, වෙලා ඉන්නවා වගේ." ජොන් ඔහුව නිවැරැදි කලේය. බෙන්ජින් ස්ටාර්ක් මියගොස් ඇතැයි යන්න ඔහු කිසිවිටෙකත් පිළි නොගත්තේ ය. ඔහු තවත් යමක් පැවසීමට පෙර හෝල්ඩර් කෑගසන්නට විය. "ඕක දීපං. උඹ ඕක තනියම ඉවර කරන්ටද කල්පනාව?" ඔහු ගේ අතින් වයින් මල්ල උදුරාගත් පිප් සිනාසෙමින් ඉවතට දිවුවේය. ග්‍රෙන් විසින් ජොන් ගේ දෑත් අල්ලාගෙන සිටින අතරේ පිප් වයින් මල්ල තදින් මිරිකුවේ ය. ජොන් ගේ මුහුණ පුරා වයින් දහරාවක් ගලා බසින්නට විය. වයින් නාස්ති කරන්නේ යැයි හෝල්ඩර් ඔවුන් සැමට බැන වදින්නට විය. ග්‍රෙන් ගේ ග්‍රහනයෙන් මිදීමට ජොන් තැත්කරන අතරේ තාප්පය උඩට නැගගත් මැතර් හා පෙරන් ඔවුන් සැමට හිමබෝල සංග්‍රහයක් පිරිනමන්නට වූහ.

හිසේ රැඳුනු හිම හා කමිසයේ රැඳුනු වයින් පැල්ලම්ද සමගින් අන්තිමේදී ජොන් සිය දෑත් මුදාගනිද්දී සැම්වෙල් ටාර්ලි පිටව ගොස් තිබින.

මේ විශේෂ අවස්ථාව සමරනු වස් එදින රාත්‍රියේ ඇඟිලි තුනේ හොබ් විසින් මේ කොලුවන්ට විශේෂයෙන් සකස්කල භෝජනයකින් සංග්‍රහ කලේය. ජොන් ප්‍රධාන ශාලාව වෙත ප්‍රවිශ්ට වූ විට ගොඩනංවන්නන් ගේ ප්‍රධානී බොවෙන් මාර්ෂ් විසින්ම ඔහුව ගිනිඋදුන සමීපයේ වූ මේසය වෙත කැඳවාගෙන ගියේය. ඔහු මේස පසුකරමින් යද්දී අනෙකුත් වැඩිමහලු කළු සොයුරන් සියල්ලෝම ඔහු ගේ පිටට හා අතට තට්ටු කරමින් සිය සතුට පලකරන්නට වූහ. ළඟදීම උසස් වීමට නියමිතව සිටි මේ කොලුවන් අටදෙනා වෙනුවෙන් සුදුලූණු හා සුවඳකාරකවල බහා පිළිස්සූ බැටළු මස්, ඒ මතින් ඉසින ලද මිංචි රිකිලි හා ඒ සැම වටකරමින් බටර්වල බහාලූ හොඳින් තම්බා පොඩිකරන ලද කහ පැහැති ටර්නිප්වලින් සැදි සුවිශේෂී භෝජනයක් පිළියෙල වී තිබින. "මේවා ආවෙ අණදෙන නිළධාරිතුමාගෙ

මේසෙන්මයි." බොවෙන් මාර්ෂ් ඔවුන්ට පැවසීය. මීට අමතරව නිවිති, කඩල හා ටර්නිප් කොළවලින් සැදුනු සලාදයක්ද මේසයට පැමිණියේ ය. මේ සැමටම පසු අතුරුපස වශයෙන් මිහිරි ක්‍රීම්වල බහාලූ සීතල බ්ලූබෙරි කෝප්ප ඔවුන් වෙත පිරිනැමින.

"උඹ හිතනවද අපි හැමෝටම එකට ඉන්ට පුළුවන් වෙයි කියලා?" සතුටින් මේ සංග්‍රහ ගිලදමන අතරේ පිප් ඇසීය.

ටොඩ් මුහුණ ඇද කරගත්තේ ය. "මං ප්‍රාර්ථනා කරනවා එහෙම වෙන්ට එපයි කියලා. උඹේ ඔය අලි කණ් දෙක දැකලා දැකලාම මට දැන් එපා වෙලයි තියෙන්නෙ."

"හා! මේ බලහල්ලකො කේතලේ කියනවා මුට්ටිය කළුයි කියලා. උඹනං අනිවාර්යයෙන්ම මුර සංචාරකයෙක් වෙයි ටොඩ්. උඹව පුළුවන් තරං බලකොටුවෙන් ඈත්කරලා තියාගන්ට උන්ට ඕනවෙයි. බැරිවෙලාවත් මැන්ස් රේඩර් පහරදෙන්ට ආවොත් එහෙම උඹ වෙන මොකුත් කරන්ට ඕන නෑ. ශිරස්කය ගලවලා උඹේ මූන ඌට පෙන්නහං. ඌ දුවයි පණ කඩාගෙන."

ග්‍රෙන් හැර අන් සියල්ලෝම සිනාසෙන්නට වන්හ. "මාව මුර සංචාරකයෙක් කරනවානං කොච්චර දෙයක්ද?"

"උඹ විතරක් නෙවෙයි, අපි හැමෝම එහෙම තමා හිතන්නෙ." මැතර් කීය. සැම කළු සොයුරෙක්ම ප්‍රාකාරය මත මුරසේවයේ නියැලිය යුතු වූ අතර එහි ආරක්ෂාව වෙනුවෙන් අවැසි ඕනෑම වෙලාවක ආයුධ අතට ගැනීමේ සූදානමින් සිටිය යුතු විය. එනමුදු නිශා රැකුම් බලකායේ මූලිකම, සත්‍ය සටන්කරුවන් පිරිස වූයේ මුර සංචාරකයින් විය. ප්‍රාකාරයෙන් එහා අසුන් විහිදීමට තරම් නිර්භීත වූයේත්, හොල්මන් කැලෑව තුළ හා හිමෙන් වැසුනු කඳුකරය පුරා සෙවීම් කටයුතුවල නිරත වූයේත්, වනචාරීන්, යෝධයින් හා දැවැන්ත හිමවලසුන් සමග සටන් වැදුනේත් මුර සංචාරකයින් විය.

"හැමෝම නෙවෙයි." හෝල්ඩර් කීය. "මට ඕන ගොඩනගන්නෙක් වෙන්ට. ප්‍රාකාරෙ කඩන් වැටුනොත් මුර සංචාරකයින්ගෙන් ඇති වැඩේ මොකක්ද?"

ගොඩනගන්නන් වනාහි සෑම දෙයකම නඩත්තුව භාරව සිටියවුන් විය. බලකොටු හා කුළුණු පිළිසකර කරන පෙදරේරුවන් හා වඩුවන්, උමං භාරන හා පාරවල් වෙනුවෙන් අවශ්‍ය ගල් කඩන පතල් කරුවන්, වනාන්තරය උවමනාවට වඩා ප්‍රාකාරයට ලංවන විට ඒවා එළිපෙහෙලි කර බිම් සුද්ද කරන ගස් කපන්නන් ආදී සැවොම ගොඩනගන්නන්ට අයත් වූහ. ප්‍රවාදයට අනුවනම් එක්තරා කාලයකදී ඔවුහු හොල්මන් කැලෑවේ මිදුනු විල්වලින් කපාගත් දැවැන්ත අයිස් කුට්ටි හිම මතින් ඇදගෙන විත් ප්‍රාකාරය තවතවත් උස් කිරීමද සිදුකලහ. එහෙත් ඒ මීට කාලාන්තරයකට පෙර, සියවස් ගනනාවකට පෙර විය. දැන් ඔවුන්ට කල හැකි එකම දෙය නැගෙනහිර කුළුණේ සිට සෙවනැලි කුළුණ වෙත ප්‍රාකාරය මතින් ඇවිද ගොස් අයිස් දියවීම්, ඉරිතැලීම් ආදිය පිරික්සා බලා ඒවා පිළිසකර කිරීම පමණි.

"නාකිවලහා මෝඩයෙක් නෙවෙයි." ඩේරියන් කීය. "උඹ අනිවාර්යයෙන්ම ගොඩනගන්නෙක් වෙයි. ජොන් අනිවාර්යයෙන්ම මුර සංචාරකයෙක් වෙයි. ඌ තමා අපි අතර ඉන්න හොඳම කඩුහරඹ කාරයා. හොඳටම අශ්වයො පදින්ට පුළුවන් එකා. ඒ වගේම එයාගෙ බාප්පා තමා මුර සංචාරකයින්ගෙ ප්‍රධානියා වෙලා හිටියෙ, එයා..." තමා මේ දොඩවන්නේ කුමක්දැයි වැටහුනු ඩේරියන් ගේ හඬ කෙමෙන් මැකී ගියේය.

"බෙන්ජීන් ස්ටාර්ක් තමා තාමත් මුර සංචාරකයින්ගෙ ප්‍රධානියා." ජොන් ඔහුට කීය. ඔහු සිය බ්ලූබෙරි කෝප්පය අතගාමින් සිටියා විනා එය අනුභවයට වැඩි උනන්දුවක් නොදැක්වීය. අන් සියල්ලන්ම ඔහු ගේ බාප්පා ගේ පුනරාගමනය පිළිබඳ බලාපොරොත්තු අත්හැර තිබුනද ඔහු එසේ යටත් වීමට කැමැති නොවීය. සිය බෙරි කෝප්පය පසෙකට තල්ලු කල ඔහු බංකුවෙන් නැගී සිටියේ ය.

"උඹ ඕක කන්නෙ නැද්ද?" ටොඩ් ඇසීය.

"උඹට ඕනනං ගනිං." හොබ් ගේ විශිෂ්ට භෝජන සංග්‍රහය ජොන් විසින් භුක්තිවිඳ තිබුනේ යාන්තමිනි. "මට තවත් එක කටක්වත් කන්ට බෑ." දොර අසල කොක්කක එල්ලා තිබුනු සිය සළුව පැළැඳගත් ඔහු ශාලාවෙන් පිටවිය.

පිප්ද ඔහු පසුපසින් වැටුනි. "ජොන්, මොකක්ද ප්‍රශ්නෙ?"

"සැම්. එයා අද රෑ කෑමට ආවෙ නෑ."

"ඌ ලේසියෙන් කෑමක් මඟඇරගන්න එකෙක් නෙවෙයි." පිප් කල්පනා කලේය. "උඹ හිතන්නෙ ඌ අසනීපෙන් කියලද?"

"ඌ බයවෙලා. අපි හැමෝම්ම ඌව දාලා යන්ටයි යන්නෙ." තමා වින්ටර්ෆෙල් හැරදා පැමිණි දිනය ජොන්ට සිහිපත් විය. මිහිර හා අමිහිර දෙකම මුසු වූ සමුගැනීම්, බිඳීගිය සිරුරින් යුතුව ලෙඩ ඇඳේ වැතිර හුන් බ්‍රැන්, හිසකෙස් අතර හිම රැඳි රොබ්, ඉඳිකට්ට තෑගි ලැබීමෙන් පසු ආර්යාගෙන් තිලිණ වූ හාදු වැස්ස, මේ හැමදෙයක්ම අද ඊයේ මෙන් විය. "අපේ දිවුරුම කිවුවට පස්සෙ අපි හැමෝටම තමතමන්ගෙ රාජකාරිවලට යන්ට වෙනවා. අපි සමහරු මෙහෙන් යන්ට යයි. නැගෙනහිර කුළුණට හරි හෙවනැලි කුළුණට හරි. සැම් මෙතන ඉතුරුවෙයි. රැස්ටුයි, කූගරුයි, මේ අලුතෙන් එන කොල්ලොයි එක්ක පුහුණුවීම් කර කර ඉන්ට වෙයි. දෙයියොම තමා දන්නෙ අලුතින් එන එවුන් කොයි වගේද කියලා. ඒ වුනත් උඹට කැට තියලා කියන්ට පුළුවන් සෙර් ඇලිසර් මිනිහට හම්බවෙන පළවෙනි අවස්ථාවෙම උන්ව යවනවා සැම් එක්ක සටනට."

පිප් මුහුණ පුළුටු කරගත්තේ ය. "උඹ කරන්ට පුළුවන් හැමදේම කලානෙ."

"කරන්ට පුළුවන් හැමදේම මදි නම්?"

ගෝස්ට්ව කැඳවාගෙන එනු පිණිස හාර්ඩින් ගේ කුළුණ වෙත යද්දී ඔහු ගේ සිත ගැඹුරු නොසන්සුන්තාවකින් පිරී තිබින. සෝරවෘකයා ඔහුත් සමග ඉස්තාලය වෙත ඇවිද ආවේය. උගේ ඉව දැනුනු සමහර අශ්වයින් කණ්පෙති පිටුපසට නවාගෙන සිය කූටි තුළ දඟලන්නට විය. සිය වෙළඹට සෑදල පැළැන්දූ ජොන් සඳ එළියෙන් නැහැවී ගිය රාත්‍රියේ කළු බලකොටුවෙන් පිටතට, දකුණු දෙසට ඌව මෙහෙයවීය. ඔහුට ඉදිරියෙන් දිවගිය ගෝස්ට් ඇසිපිය හෙලන පමාවෙන් දර්ශන පථයෙන් අතුරුදන් විය. ජොන් ඌට යන්නට ඉඩ හැරියේය. වෘකයෙකුට දඩයම් කිරීමට නිදහසක් තිබිය යුතුය.

යා යුත්තේ කොහාටදැයි ඔහුට කිසිදු නිනවුවක් නොවීය. ඔහුට උවමනා වූ එකම දෙය නිදහසේ අසු පිට යාම පමණක් විය. ඔහු මඳ වේලාවක් දිය කඳුරට සමාන්තරව අසු මෙහෙයවූයේ ගල්පර මතින් දිය බිඳු ගලහැලෙන හඬට කණ් දුන්නේය. ඉන්පසු නැවත හැරී රජමාවත වෙත අසු මෙහෙයවීය. ගල්වලින් හා වල්පැලෑටියෙන් වැසී ගිය පටු මාවත ඔහු ඉදිරියෙන් දිගින් දිගටම විහිද තිබින. මේ මාවත දැකීමෙන් ජොන් තුළ මෙතෙක් යටපත්ව පැවැති ආශාවන් හා බලාපොරොත්තු නැවත ලියලා වැඩී ආයේය. මේ මාවතේ දකුණු දෙසට යන්නෙකුට වින්ටර්ෆෙල් හමුවනු ඇත. එතැනින් තවත් පහළට ගියහොත් රිවර්රන්, කින්ග්ස් ලැන්ඩින්ග්, ඉයරි හා තවත් නොයෙක් තැන් බොහොමයක් හමුවනු ඇත. කාර්ස්ටලී රොක්, මුහුණු දූපත, ඩෝර්න්හි රතු කඳුවැටි, මුහුදින් එතෙර දූපත් සිය ගණනකින් සැදුනු බ්‍රාවොස්, පුරාණ වැලීරියාවේ දුම්දමන නටඹුන් ආදි සියල්ලක්ම එහි තිබෙනු ඇත. ජොන් කිසිදා නොදුටු, කිසිදා දක්නට ලැබෙතියිද සිතිය නොහැකි ස්ථාන බොහොමයක් එහි තිබෙනු ඇත. ඔහු කිසිදා නොදුටු අලුත් ලෝකයක් මේ මාවතේ පහළ තිබෙන අතර ඔහු මේ ස්ථානයට වී කාලය නාස්තිකරමින් බලා සිටියි.

ඔහු සිය දිවුරුම දුන් පසු මේ ප්‍රාකාරය ඔහු ගේ නිවහන වනු ඇත. මේස්ටර් ඒමන් මෙන් මහලු වී මියයන තෙක්ම ඔහු මෙහි වසනු ඇත. 'මම තාමත් දිවුරුම් දුන්නෙ නෑ.' ඔහු තමාටම කියාගත්තේ ය. කළු බලකායට බැඳීමට හෝ එසේ නොකලහොත් මරණයෙන් වන්දි ගෙවීමට හෝ ඔහු තවමත් ගිවිසුමකින් බැඳී නැත. ඔහු නිදහස් මිනිසකු වශයෙන් මෙහි පැමිණි අතර නිදහස් මිනිසකු වශයෙන් මෙයින් පිටවී යාමේ අවකාශයද ඇත. ඔහු සිය දිවුරුම දිවුරන තෙක් ඒ අවකාශය ඇත. ඔහු කල යුතු එකම දෙය වන්නේ දිගටම මේ මාවතේ පහළට යාම පමණි. මේ සෑම දෙයක්ම හැරදා යාම පමණි. නැවතත් පුරහඳ පායන කාලය වනවිට ඔහු වින්ටර්ෆෙල්හි සිය සොයුරන් හා එක්වනු ඇත.

'උඹේ අර්ධ සොයුරන් එක්ක.' ඔහු ගේ හිස තුළ වූ කටහඬක් විසින් මතක්කර දුන්නේ ය. 'ඒ වගේම ස්ටාර්ක් ආර්යාව උඹව සාදරයෙන් පිළිගන්න එකක් නෑ.' වින්ටර්ෆෙල්වල ඔහුට හිමි තැනක් නොවීය. කින්ග්ස් ලැන්ඩින්ග්වල පවා ඔහුට හිමි තැනක් නොවීය. ඔහුගේම මව සමීපයේ පවා ඔහුට හිමි තැනක් නොවීය. ඇය ගැන මතකය විසින් ඔහු ගේ සිත දුකින් පුරවාලන්නට සමත් විය. ඇය කවුරුන් විය හැකිදැයි, ඇය කෙබඳු කෙනෙක් විය හැකිදැයි ඔහු කල්පනා කරන්නට විය. ඔහු ගේ පියා ඇයව අත්හැර දැමූයේ මන්ද? ඇය ගණිකාවක් නැතිනම් පහත් පෙළේ එකියක් වීම නිසාද? එසේ නොමැති නම් එඩාර්ඩ් උතුමානන් ඇය ගැන කතාකරන්නට මෙතරම් මැලිවන්නේ මන්ද?

රජමාවතෙන් අසු හරවා ගත් ජොන් නැවත පසුපස බැලීය. කළු බලකොටුවේ පහන් එළි කුඩා කඳුගැටයකින් මුවා වී ගොස් තිබුනද ප්‍රාකාරය එතැන විය. සඳ එළියෙන් නැහැවී ගිය, සුදුමැලි, සීතල, උත්තුංග, එක් ක්ෂිතිජයක සිට අනිත් ක්ෂිතිජය දක්වා පැතිරුනු ප්‍රාකාරය සැමදාම මෙන් එතැන විය.

අසුට සන් කල ඔහු නැවත නිවස බලා අසු මෙහෙයවන්නට විය.

කුඩා කඳුගැටයක් පසුකරද්දී ගෝස්ට් නැවතත් ඔහු හා එක්විය. වෘකයා ගේ හොම්බ ලේ වලින් නැහැවී රත් පැහැ ගැන්වී තිබින. ඔහු නැවතත් සැම්වෙල් ටාර්ලි ගැන කල්පනා කරන්නට විය. ඉස්තාලය වෙත ළඟාවද්දී තමා හරියටම කුමක් කල යුතුදැයි පැහැදිලි හැඟීමක් ඔහු තුළ විය.

මේස්ටර් ඒමන් ගේ නවාතැන වශයෙන් භාවිත වූයේ කපුටන් රඳවා සිටි කුළුණේ පහතින් වූ දැවමුවා කාමර කිහිපයකි. මහලු, දුබල සිරුරකින් හෙබි මේස්ටර්වරයා සිය නවාතැන් කාමර තවත් තරුණ නිවාස බාරකරුවන් දෙදෙනෙකු හා හවුලේ බෙදාගෙන පරිහරනය කලේය. ඔවුන් දෙදෙන ඔහු ගේ කුදුමහත් කටයුත්තක්ම ඉටුකර දුන් අතර මේස්ටර්වරයා ගේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ඔහුට උදවු වූහ. ක්ලයිඩස් වනාහි මිටි, මහත, ඌරුමීයකු ගේ බඳු කුඩා දෑසකින් හා තට්ට හිසකින් යුතු තැනැත්තකු වූ අතර වෙට් කුරුලෑ පිරුනු රත් පැහැ මුහුණකින් හෙබියකු විය. ඔහු නිතරම කේන්තියෙන් සිටින්නාක් මෙනි දිස්විය.

ජොන් ගේ තට්ටු කිරීමට පිළිතුරු වශයෙන් වෙට් විසින් දොර අරිනු ලැබීය. "මට මේස්ටර් ඒමන්ට කතා කරන්ට ඕන." ජොන් පැවසීය.

"මේස්ටර් ඇඳට ගිහිල්ලා. උඹත් මේ වෙලාව වෙද්දි ඇඳෙයි ඉන්ට ඕන. හෙට උදේ වරෙන්. එතකොට සමහරවිට මේස්ටර් උඹව මුනගැහෙයි." ඔහු දොර වසන්නට තැත්කලේය.

ජොන් සිය බූට්ස් සපත්තුව ඔබා දොර අවහිර කලේය. "මට එයාට දැන් කතා කරන්ට ඕන. උදේ වෙනකොට පරක්කු වැඩිවෙන්ට පුළුවන්."

වෙට් මුහුණ පැහිරි කරගත්තේ ය. "මේස්ටර් කැමැති නෑ රෑ තිස්සෙ එක එකා ඇවිල්ලා එයාව ඇහැරවනවට. උඹ දන්නවනෙ එයා කොච්චර නාකිද කියලා."

"උඹට වඩා ආචාරශීලී විදියට අමුත්තො පිළිගන්ට තරම් නාකියි. එයාට කියහං මෙහෙම කරදර කලාට මට සමාවෙන්ටයි කියලා. මේක එච්චර හදිසි දෙයක් නෙවෙයිනං මම මෙහෙම කරදර කරන්ට එන්නෙ නෑ."

"මම ඒක ප්‍රතික්ෂේප කලොත්?"

"මට මෙහෙම මෙතන හිටගෙන මුලු රෑම වුනත් ඉන්ට පුළුවන්."

උගුරෙන් නොරුස්නා හඬක් පිටකල කළු සොයුරා ජොන්ට ඇතුළුවීම පිණිස දොර විවර කලේය. "පුස්තකාලෙට වෙලා වාඩිවෙලා හිටපං. එතැන දර ඇති. උඳුනේ ගින්නක් අවුලපං. උඹ නිසා මේස්ටර්ට හෙම්බිරිස්සාවක් හැදෙනවා දකින්ට මට ඕන නෑ."

වෙට් විසින් මේස්ටර් ඒමන්ව කැඳවාගෙන එනවිට ජොන් දැල්වූ ගින්න බුර බුරා නැගෙමින් තිබින. මහලු මිනිසා දිගු නිදන ලෝගුවකින් සැරසී සිටිමුත් ඔහු ගේ නිකායට අයත් මේස්ටර් දම්වැල තවමත් ගෙල වටා විය. මේස්ටර්වරයකු නිදීම පිණිසවත් සිය දම්වැල නොගැලවීම සම්ප්‍රදාය විය. "අපි උඳුන ගාව තියෙන පුටුවේ වාඩිවෙමු." සිය මුහුණට ගිනි උණුසුම දැනුනු ඔහු පැවසීය. ඔහු සැපපහසු අයුරින් පුටුවේ වාඩිගත් පසු ඔහු ගේ දෙපා ලොම් ඇතිරිල්ලකින් ආවරණය කර දැමූ වෙට් දොර අසලට ගොස් සිටගත්තේ ය.

"ඔබව මෙහෙම නැගිට්ටවන්ට සිද්දවෙච්ච එක ගැන බොහොම කණගාටුයි මේස්ටර්." ජොන් කීය.

"ඔබ මාව නැගිට්ටෙවුවෙ නෑ. නාකි වෙන්ට වෙන්ට නිදාගන්ට ඕන කාලෙ අඩුවෙනවා කියලා මට දැනිලා තියෙනවා. මම දැන් බොහොම නාකියි. ගොඩක් වෙලාවට මම රැයෙන් බාගයක්ම ඇහැරලා ඉස්සර කාලෙ, අවුරුදු පනහකට හැටකට ඉස්සර වෙච්චි දේවල් ගැන

කල්පනා කර කර ඉන්නවා. ඉතිං මේ මහ රෑ ජාමෙ අමුත්තෙක් මාව බලන්ට ආවා කියන එක හරිම හොඳ වෙනසක්. ඉතින්, මට කියන්ට ජොන් ස්නොව්. ඔබ මොකද මේ අවේලාවෙ මාව මුනගැහෙන්ට ආවෙ?"

"සැම්වෙල් ටාර්ලිව පුහුණුවෙන් අයින් කරලා එයාවත් කළු සහෝදරයෙක් විදියට බඳවගන්ට පුළුවන්ද අහන්ට."

"ඒක මේස්ටර් ඒමන්ට අයිති දෙයක් නෙවෙයි." වෙට් පැමිණිලි ස්වරයෙන් කීය.

"අපේ අණදෙන නිළධාරිතුමා නවකයින්ව පුහුණුකරන එකයි, එයාලව සමත්කරන එකයි බාරදීලා තියෙන්නෙ සෙර් ඇලිසර් තෝර්න්ට." මේස්ටර්වරයා මෘදු ස්වරයෙන් කීය. "ඔබත් හොඳටම දන්නවනෙ, එයාට විතරමයි කියන්ට පුළුවන් නවකයෙක් දිවුරුම් දෙන්ට තරම් නියම විදියට පුහුණුවෙලා තියෙනවද කියලා. ඇයි එහෙමනම් මාව හම්බවෙන්ට ආවෙ?"

"අණදෙන නිළධාරිතුමා ඔබ කියන දේ අහනවා." ජොන් පැවසී ය. "අනිත් එක නිශා රැකුමේ තුවාල වෙච්ච අයයි, අසනීප කාරයොයි ඉන්නෙ ඔබේ බාරෙ."

"ඉතින්, ඔබේ මේ යාළුවා සැම්වෙල් තුවාලවෙච්ච කෙනෙක්ද නැත්තං අසනීපවෙච්ච කෙනෙක්ද?"

"ඔබ උදවු කලේ නැත්තම් එයා එහෙම කෙනෙක් වෙයි." ජොන් කීය.

ඉදින් ඔහු ඔවුන්ට සෑම දෙයක් ගැනම විස්තර කලේය. එක්තරා රැයකදී ඔහු විසින් රැස්ට්ව බියකිරීම පිණිස ගෝස්ට්ව යොදාගත් අයුරු පවා විස්තර කලේය. සිය අන්ධ දෑස් ගිනිමැලය වෙත හරවාගත් මේස්ටර් ඒමන් නිහඬවම ඔහු කියන දෙයට සවන්දෙන්නට විය. එනමුදු මේ සෑම වදනක් පාසාම වෙට් ගේ මුහුණ කළු වී ගියේය. "එයාට උදවු කරන්ට අපි කවුරුවත් එතන නැත්තං සෑම්ට කිසිම අවස්ථාවක් ලැබෙන එකක් නෑ. එයාට කඩුහරඹ ගැන කිසිම දැනුමක් නෑ. මගේ පුංචි නංගි ආර්යාටත් පුළුවන් එයාව කැලි

කැලිවලට ඉරලා දාන්ට. ආර්යාට තාම අවුරුදු දහයක්වත් නෑ. සෙර් ඇලිසර් දිගින් දිගටම එයාව සටන් කරන්ට දැම්මොත් වැඩිකල් යන්ට කලින් එයාට තුවාල වෙයි. නැත්තං එයා මැරිලා යයි." ජොන් කතාව අවසන් කලේය.

වෙට්ට තවත් ඉවසා සිටිය නොහැකි විය. "මම දැකලා තියෙනවා මේ මහත කොල්ලාව කෑම කාමරේදි. ඌ ඌරෙක්. ඒ විතරක් නෙවෙයි උඹ කියන දේ ඇත්තනං ඌ කිසිම බලාපොරොත්තුවක් නැති බයගුල්ලෙක්."

"සමහරවිට එහෙම වෙන්ට පුළුවන්." මේස්ටර් ඒමන් කීය. "මට කියන්ට වෙට්. මේ වගේ කොල්ලෙක් එක්ක අපි මොකක් කරන්ට ඕනැයි කියලාද ඔබ හිතන්නෙ?"

"ඌට ඉන්න තැනම ඉන්ට දෙන එක. ප්‍රාකාරෙ කියන්නෙ දුබලයින්ට ගැලපෙන තැනක් නෙවෙයි. ඌ හරියට සූදානම් වෙනකං ඌට දිගටම පුහුණුවෙන්ට අරින්ට ඕන. ඒකට අවුරුදු ගානක් ගියත් කමක් නෑ. සෙර් ඇලිසර් උගෙන් මිනිහෙක් හදයි, නැත්තං ඌ මැරිලා යයි. ඒක දෙයියන්ගෙ කැමැත්ත."

"ඒක මහ මෝඩකමක්." ජොන් කීවේය. සිය සිතුවිලි එකලස් කරගැනීම පිණිස ඔහු ගැඹුරු හුස්මක් ගත්තේය. "මට මතකයි, එකපාරක් මම මේස්ටර් ලුවින්ගෙන් ඇහුවා ඇයි එයා කර වටේ දම්වැලක් දාගෙන ඉන්නෙ කියලා."

මේස්ටර් ඒමන් සිය කෙට්ටු අතැඟිලිවලින් කර වටා වූ දම්වැල අතගෑවේය. "කියන්ට."

"එයා කිවුවා මේස්ටර් කෙනෙකුගෙ කර වටේ දම්වැලක් තියෙන්නෙ එයා හැමවෙලාවෙම සේවය කරන්ට සූදානම් වෙලා ඉන්නවා කියන එක මතක්කරලා දෙන්ටයි කියලා. මම ඇහුවා එතකොට ඇයි මේ දම්වැලේ හැම පුරුකක්ම වෙනස් වෙනස් ලෝහවලින් හැදිලා තියෙන්නෙ කියලා. ඊට වඩා තනි රිදී දම්වැලක් තිබුනානං ඒක ලෝගුවෙ පාටත් එක්ක ගැලපෙන්නෙ නැද්ද කියලා මම ඇහුවා. මේස්ටර් ලුවින් හිනාවුනා. එයා කිවුවා මේස්ටර් කෙනෙකුගෙ දම්වැල හැදෙන්නෙ එයාගෙ අධ්‍යාපනයත් එක්ක කියලා. හැම වෙනස් දම්වැල් පුරුකක්ම වෙනස් වෙනස් ඉගෙනීම්වලට සම්බන්ධයි. රත්තරන් කියන්නෙ මුදල්, මූල්‍ය පරිපාලන කටයුතු ගැන. රිදී කියන්නෙ සුවකිරීම් ගැන. යකඩ කියන්නෙ යුද්ධ

ශාස්ත්‍රය ගැන. ඒ වගේම එයා තවත් දේ කිව්වා. මේ දම්වැල මේස්ටර් කෙනෙකුට මතක් කරලා දෙනවා එයා සේවය කරන රාජධානිය ගැන. එහෙම නෙවෙයිද? රත්තරන් කියන්නෙ වංශාධිපති උත්තමයො. වානේ කියන්නෙ නයිට්වරු. ඒ වුනත් පුරුක් දෙකකින් විතරක් දම්වැලක් හැදෙන්නෙ නෑ නෙව. ඒක නිසා අපට ඕන රිදී, යකඩ, ඊයම්, ටින්, තඹ, ලෝකඩ, තව ගොඩක් ජාති. ඒ තමා ගොවියො, කම්මල්කාරයො, වෙළෙන්දො වගේ අනිත් අය. දම්වැලකට මේ හැම ජාතියෙම ලෝහවර්ග උවමනායි වගේ රටකටත් හැමජාතියෙම මිනිස්සු ඕන."

මේස්ටර්වරයා ගේ මුවේ සිනහවක් පහළ විය. "ඉතින්?"

"ඒ වගේම, නිශා රැකුම් බලකායටත් මේ හැම ජාතියෙම මිනිස්සු උවමනායි. එහෙම නැත්තං අපි මොකටද මුර සංචාරකයොයි, ගොඩනගන්නොයි, නිවාස බාරකාරයොයි විදියට බෙදිලා ඉන්නෙ? රන්ඩිල් උතුමානන්ට බැරිවුනානං සැම්ව රණකාමියෙක් කරන්ට, සෙර් ඇලිසර් තෝර්න්ටත් ඒක කවදාවත් කරන්ට ලැබෙන්නෙ නෑ. ඔබ කොච්චර හයියෙන් තැලුවත් ටින් යකඩවලට හැරෙන්නෙ නෑ. ඒ වුනත් ඒකෙන් කියැවෙන්නෙ නෑ ටින් කියන්නෙ ප්‍රයෝජනයක් නැති දෙයක් කියලා. ඇයි සැම්ටත් බැරි නිවාස බාරකාරයෙක් වෙන්ට?"

වෙට් කේන්තියෙන් මුහුණ ඇඹුල් කරගත්තේ ය. "මම නිවාස බාරකාරයෙක්. උඹ හිතනවද ඒක ලේසි රස්සාවක් කියලා? බයගුල්ලන්ට ගැලපෙන ජාතියෙ එකක් කියලා? නිවාස බාරකාරයො තමා මේ නිශාරැකුම පණපිටින් තියාගන්නෙ. අපි වවනවා, දඩයං කරනවා, අශ්වයො බලාගන්නවා, කිරි දොවිනවා, දර එකතු කරනවා, කෑම උයනවා. උඹලා ඔය ඇඳගෙන ඉන්න ඇඳුම් වියන්නෙ, මහන්නෙ කවුරුයි කියලාද උඹ හිතාගෙන ඉන්නෙ? දකුණේ ඉඳන් කෑමයි අනිත් බඩුබාහිරාදියයි ගේන්නෙ කවුද? නිවාස බාරකාරයො."

මේස්ටර් ඒමන් මීට වඩා මෘදු විය. "ඔබේ මේ යාළුවා දඩයක්කාරයෙක් ද?"

"එයා දඩයම පිළිකුල් කරනවා." ජොන්ට පිළිගන්නට සිදුවිය.

"එයාට කුඹුරක් හාන්ට පුළුවන් ද? එයාට කරත්තයක් දක්කන්ට පුළුවන් ද? එයාට නැවක් යාත්‍රා කරවන්ට පුළුවන් ද? එයාට හරකෙක් මසට මරන්ට පුළුවන් ද?"

"බෑ..."

වෙට් අවඥාසහගත සිනහවක් පෑවේය. "මං දැකලා තියෙනවා ඔය වගේ සුකුමාර වංශාධිපති පැටවු වැඩකරන්ට දැම්මහම සිද්දවෙන දේ. උන්ව බටර් හැදිගාන්ට දැම්මොත් උන්ගෙ අත්වල දියපට්ටා එනවා. ලේ ගලනවා. උන්ට දර කපන්ටයි කියලා පොරොවක් දුන්නොත් උන් අතපය කපා ගන්නවා."

"මම දන්නවා අනිත් හැමෝටම වඩා හොඳට සෑම්ට කරන්ට පුළුවන් දෙයක්." ජොන් කීය.

"ඔවු?" මේස්ටර් ඒමන් ඇසීය.

දොර අසලට වී රතු වූ මුහුණින් යුතුව බලාසිටින වෙට් දෙස ජොන් පරීක්ෂාකාරී බැල්මක් හෙළීය. "එයාට පුළුවන් ඔබට උදවු කරන්ට. එයාට පුළුවන් එකතුකිරීම් අඩුකිරීම් කරන්ට. එයා දන්නවා ලියන්ට කියවන්ට. මම දන්නවා වෙට්ට අකුරු කියවන්ට බෑ කියලා. ක්ලයිඩස්ගෙ ඇස් දෙක දැන් දුර්වලයි. සෑම් එයාගෙ තාත්තගෙ පුස්තකාලෙ තිබ්බ හැම පොතක්ම කියවලයි තියෙන්නෙ. එයා කපුටන්ගෙ වැඩත් හොඳට කරයි. සත්තු එයාට කැමැතියි වගේ පේනවා. ගෝස්ට් එකපාරින්ම එයත් එක්ක යාළු වුනා. සටන්කරන එක පැත්තකින් තිබ්බොත් එයාට තව මහ හුඟක් දේවල් කරන්ට පුළුවන්. අනිත් එක, නිශාරැකුමට දැන් අනිත් හැමදාටමත් වඩා මිනිස්සු උවමනායි. ඒකට බඳවගන්ට පුළුවන් හැම මිනිහම උවමනායි. ඉතින් ඇයි නිරපරාදෙ එක්කෙනෙක්ව මරලා දාන්නෙ? ඊට වඩා හොඳ නැද්ද එයාගෙන් ගන්ට පුළුවන් වැඩක් ගන්න එක?"

මේස්ටර් ඒමන් දෑස පියාගත්තේ ය. ඔහු නින්දට වන්නේ යැයි ජොන් සුළු මොහොතකට බියපත් විය. එහෙත් අන්තිමේදී ඔහු මෙසේ කීය. "මේස්ටර් ලුවින් ඔබට බොහොම හොඳට උගන්නලා තියෙනවා ජොන් ස්නොව්. පේන විදියට නම් ඔබේ මොළෙත් ඔබේ කඩුව වගේම බොහොම බුහුටියි. බොහොම දක්ෂයි."

**"ඒ කියන්නෙ...?"**

**"ඒ කියන්නෙ ඔබ මේ කියාපු දේ ගැන මම තව දුරටත් හිතන්ට ඕන කියන එකයි. ඉතින් දැන්, මම හිතන්නෙ මම නින්දට යන්ට සූදානම් කියලා. වෙට්, අපේ මේ තරුණ සහෝදරයාව දොර ගාවට ඇරලවන්ට." මේස්ටර්වරයා මෘදු ස්වරයෙන් පැවසීය.**

**Jon Snow: “A chain needs all sorts of metals, and a land needs all sorts of people.”**

ටිරියන් 06

කඳුකර මාර්ගයෙන් මඳක් ඔබ්බට වන්නට පිහිටා තිබුනු ඇස්පන් ලැහැබක ඔවුහු කඳවුරු බැඳගත්හ. සිය අසුන් කඳුකර දිය පහරකින් පවස නිවාගන්නා අතරේ ටිරියන් වියළි දැව දඬු එකතුකරන්නට විය. බිම වැටී තිබුනු වියළි ගිය අතු කැබැල්ලක් අහුලාගන්නට පෙර ඔහු එය හොඳින් පිරික්සා බැලීය. "මේක හොඳයිද? මට ගිනිමැල අවුලවලා පුරුද්දක් නෑ. මොරෙක් තමා හැමදාමත් මං වෙනුවෙන් ඒක කලේ."

"ගින්නක්?" බ්‍රොන් ඇසුවේ ඉවතට කෙල ගසමිනි. "උඹ මැරෙන්ට ඔච්චරටම ආසද කුරුම්ට්ටො? එහෙමත් නැත්තං උඹට ඔල්මාදෙ හැදිලද? මෙතන ගින්නක් ඇවුලුවොත් හැතැප්මක දුරින් ඉන්න කඳුකර ගෝත්‍රිකයො හැමෝම මෙතනට කඩන් පනියි. මම හිතාගෙන ඉන්නෙ පණපිටින් මේ ගමන අහවරයක් කරන්ට."

"ඉතින් උඹ කොහොමද ඒක කරන්ට යන්නෙ?" ටිරියන් ඇසීය. දර අත්ත කිහිල්ලේ ගසාගත් ඔහු තවත් දැවදඬු සෙවීම සඳහා අවට පිරික්සා බැලීය. ඔවුහු දිනය උදාවේ සිට නොනවත්වාම අසුන් ධාවනය කර තිබුනු අතර දර අහුලාගැනීමට බිමට නැවෙන අතර ඔහු ගේ කොන්ද ඇදුම්කන්නට විය. එදින උදෑසන ලේ වාහල්කඩ දක්වා ඔවුන් දෙදෙන කැඳවාගෙන පැමිණි සෙර් ලින් කෝබ්‍රේ නැවත කෙදිනකවත් මෙහි නොඑන්නැයි අණකරමින් ඔවුන්ව පිටුවහල් කර තිබින.

"අපට සටන් කරලා බේරිලා යන්ට කිසිම විදියක අවස්ථාවක් නෑ. ඒ වුනත් දහදෙනෙකුට වඩා දෙන්නෙකුට පුළුවන් නිශ්ශබ්දව වැඩිදුරක් යන්ට. අපි මේ කඳුකරේ ගතකරන දවස් ගාන අඩුවෙන්ට අඩුවෙන්ට අපට පණපිටින් ගංගා නිම්නයට යාගන්ට තියෙන අවස්ථාව වැඩියි. මං කියන්නෙ අපි පුළුවන් උපරිම වේගෙන් යන්ට ඕන. රෑ තිස්සෙ ගමන් කරලා දවල්ට ඔය කොහෙට හරි වෙලා හැංගිලා ඉන්ට ඕන. පුළුවන් තරං පාරෙන් අයින්වෙලා ඉන්ට ඕන. පුළුවන් තරං සද්ද නොකර, ගිනි අවුලුවන්නෙ නැතුව ඉන්ට ඕන."

ටිරියන් ලැනිස්ටර් සුසුමක් හෙලීය. "ඒකනං මාරම මාර සැලැස්මක් බ්‍රොන්. උඹ කැමැතිනං ඒක උත්සාහ කරලා බලපං... හැබැයි උඹ මලාම වලදාන්ට මම සුනංගු වෙවී හිටියෙ නැත්තං ඒ ගැන මට දොස් කියන්ට එපා."

"උඹ හිතන්නෙ මට වඩා කල් ජීවත්වෙන්ටද කුරුමිට්ටො?" කුලී භේවායා නියවීය. සෙර් වාර්ඩ්ස් ර්ගන් ගේ පලිහ වැදීමෙන් දතක් කැඩුනු තැන සෑදුනු අඳුරු විවරය පැහැදිලිවම දැක ගත හැකි විය.

ටිරියන් දෙවුර ඇකිළීය. "රෑ තිස්සෙ පුළුවන් උපරිම වේගෙන් අශ්වයො පදිනවා කියන්නෙ කකුල පැටලිලා, කන්දක් පල්ලෙ දෙරිගැහිලා බෙල්ල කඩාගන්ට ලේසිම ක්‍රමයක්. මම ඊට වඩා කැමැතියි හෙමින් සැරේ පහසුවෙන් මේ ගමන යන්ට. මං දන්නවා උඹ අශ්වයින්ගෙ පිටේ ගමනට කැමැතියි කියලා බ්‍රොන්. ඒ වුනත් ඔහොම වේගයෙන් යන්ට ගිහිල්ලා අපේ අශ්වයො මැරුනොත් අපට කඳු සිංහයො පිටේ තමා සෑදල ගැටගහගන්ට වෙන්නෙ... අනිත් එක, ඇත්තම කියනවා නම් අපි මොනවා කලත් මේ කඳුකර ගෝත්‍රිකයො අපි දෙන්නව හොයාගන්නවා. ඒක සහතිකයි. මේ අවට හැමතැනම උන්ගෙ ඇස් තියෙනවා." ඔවුන්ව වටකරමින් නැගී සිටි උස් පර්වත කූට පෙන්වමින් ඔහු කීවේය.

බ්‍රොන් ගේ මුහුණ පුළුටු වී ගියේය. "ඒ කියන්නෙ අපි දෙන්නා මලා වගේ තමා ලැනිස්ටර්."

"එහෙනම් ඉතින් මම කැමැතියි සැප පහසුවෙන් මැරෙන්ට. අපට ගින්නක් ඕන. මෙහෙ රෑට සීතලයි. උණුවෙන් කෑම ටිකක් කන්ට ලැබුනොත් අපේ ඇඟත් උණුසුම් වෙයි. අපේ ආත්ම ශක්තියත් වැඩි වෙයි. උඹ හිතනවද මොකක් හරි දඩයමක් කරගන්ට පුළුවන් වෙයි කියලා? ලයිසා ආර්යාව බොහොම කරුනාවෙන් අපට ලුණු දාපු හරක් මසුයි, හයිය චීසුයි, ගල්වෙච්ච පානුයි දීලා තියෙනවා. ඒ වුනත් මේ ළඟපාත මේස්ටර් කෙනෙක් හොයාගන්ට නැති වෙලාවෙ දත් කඩාගන්ට මට ඕනකමක් නෑ."

"මට පුළුවන් මසක් හොයාගන්ට." බ්‍රොන් ගේ කළු පැහැ දෑස් සැකසහිත බැල්මකින් ටිරියන් වෙත එල්ලවිනි. "උඹට ගිනිමැලේ ගහගන්ට ඉඩ දීලා මං යන්නම්. මං උඹේ අශ්වයත් අරන් ගියොත් මෙතනින් පණපිටින් පිටවෙලා යන්ට මට දෙගුණයක අවස්ථාවක් තියෙනවා. එහෙම වුනොත් උඹ මොකක්ද කරන්ට යන්නෙ කුරුමිට්ටො?"

"මැරෙයි. මං හිතන්නෙ." ටිරියන් තවත් දර කැබැල්ලක් අහුලාගත්තේ ය.

"මං එහෙම දෙයක් කරයි කියලා උඹ හිතන්නෙ නැද්ද?"

"ඒකෙන් උඹේ ජීවිතේ බේරෙනවා නම් උඹ කිසිම පරක්කුවක් නැතුව ඒක කරනවා. උඹේ යාළුවා ව්ගන්ගෙ බඩට අර ඊතල පාර වැදුනම ඌව මරලා දාන්ට උඹ දෙපාරක් හිත හිතා හිටියෙ නෑ." ව්ගන් ගේ කෙහෙරොදින් අල්ලා හිස පසුපසට නැමූ බ්‍රොන් ඔහු ගේ කණට පහළින් සිය සිරිය ඇතුළුකලේ ය. ඔහු පසුව කැට්ලින්ට කියා සිටියේ අනිත් කුලී හේවායා සිය තුවාල නිසා මළ බවකි.

"ඌ මැරුනා වගේම තමා. අනික උගෙ කෑ ගැහිල්ලා නිසා අරුන්ට අපි ඉන්න තැන හොයාගන්ට පුළුවන් වෙනවා. ව්ගන් වුනත් ඒ දේම මටත් කරයි... අනික ඌ මගෙ යාළුවෙක් නෙවෙයි. මගෙත් එක්ක එකට ගමන්කරන එකෙක් විතරයි. වරද්දගන්ට එපා කුරුමිට්ටො. මං උඹ වෙනුවෙන් සටන් කලා තමා. ඒ වුනත් මම උඹට ආදරේ නෑ."

"උඹේ ආදරේ මට බම්බු ගහගන්ටද? උඹේ කඩුව තමා මට ඕන කලේ." ටිරියන් අහුලාගත් දර ගොඩ බිම හෙළීය.

බ්‍රොන් නියවීය. "උඹ වෙන ඕනම කුලී හේවායෙක් තරම්ම නිර්භීතයි. ඒක කියන්ට ඕන. උඹ කොහොමද දැනගත්තෙ මම උඹේ පැත්ත ගනියි කියලා?"

"දැනගත්තෙ?" ටිරියන් උක්කුටියෙන් වාඩිගත්තේ ගිනිමැලය දැල්වීම සඳහා සූදානම් විය. "දැනගත්තා නෙවෙයි, මම දාදු කැටේ හරියට විසි කලා. එදා අර තානායමේදී උඹයි ව්ගනුයි මාව අල්ලගන්ට උදවු වුනා. ඇයි? අනිත් එවුන් ඒක දැක්කෙ තමන්ගෙ රාජකාරියක් විදියට. තමතමන් සේවය කරන වංශාධිපතියන්ට කරන ගෞරවයක් විදියට. ඒ වුනත් උඹලා දෙන්නා එහෙම නෙවෙයි. උඹලාට වංශාධිපතියො නෑ. රාජකාරියක් නෑ. ගෞරවයක් කියලා දේකුත් නෑ. එහෙමනම්, ඇයි උඹලා දෙන්නා ඔය අවුලට අතදාන්ට ලෑස්ති වුනේ?" සිය පිහිය ඇද ගත් ඔහු දර කැබැල්ලකින් කුඩා සිහින් පතුරු කිහිපයක් කපාගත්තේ ය. "හොඳයි. ඇයි කුලී හේවායො මොකක් හරි දෙයක් කරන්නෙ? සල්ලි වලට. රත්තරන් වලට. උඹලා හිතුවෙ කැට්ලින් ආර්යාව උඹලා කරපු උදවුව වෙනුවෙන් මොකක් හරි ලොකු තෑග්ගක් දෙයි කියලා. සමහරවිට උඹලාව එයාගෙ සේවයට

බඳවගනියි කියලා. හරි! ඔන්න දර ටික හරි මම හිතන්නෙ. උඹ ගාව ගිනිගලක් තියෙනවද?"

සිය ඉණපටියේ වූ පසුම්බියට ඇඟිලි දෙකක් රුවා ගිනිගලක් එළියට ගත් බ්‍රොන් එය ටිරියන් දෙසට විසිකලේ ය. අත දිගුකල ටිරියන් එය අහසේදීම අල්ලාගත්තේ ය.

"බොහොම ස්තූතියි! වැඩේ කියන්නෙ උඹලා දන්නෙ නෑ ස්ටාර්ක්ලා ගැන. එඩාර්ඩ් උතුමානන් කියන්නෙ බොහොම මාන්නක්කාර, ගෞරවනීය, අවංක මනුස්සයෙක්. එයාගෙ බිරිඳ ඊට අන්තයි. ආහ්! කිසිම සැකයක් නෑ මේ ඔක්කොම ඉවරවුනාට පස්සෙ එයා උඹලාට දෙන්ට කාසි කීපයක් හොයාගනීවි. ඒ වගේම බොහොම අප්‍රසන්න බැල්මකින් උඹලා දිහා බලලා, ආචාරශීලී වචන ටිකක් දොඩවලා ඒ කාසි ටික උඹලගෙ අත මිට මොලවාවි. ඒ වුනත් උඹලට හම්බවෙන ලොකුම තෑග්ග තමා ඒ. ස්ටාර්ක්ලා තමන්ට සේවය කරන්ට තෝරගන්න මිනිස්සුන්ගෙන් ධෛර්‍යය, පක්ෂපාතීත්වය, ගෞරවනීය බව වගේ දේවල් බලාපොරොත්තු වෙනවා. ඇත්තම කියනවා නම් උඹයි විගනුයි කියන්නෙ බොහොම පහත් ජන්මයක් තියෙන කුණුකන්දල් දෙකක් විතරයි." ටිරියන් ගිනි පුලිඟුවක් මතුකරගැනීමේ අටියෙන් ගිනිගල සිය සිරියේ ගැටීය. එනමුදු කිසිවක් සිදුනොවීය.

බ්‍රොන් උගුරෙන් නොරිස්සුම් හඬක් පිටකලේය. "උඹට බොහොම නිර්භීත දිවක් තියෙන්නෙ පුංචි එකෝ. දවසක කවුරුහරි ඕක කපලා උඹටම කවයි."

"හැමෝම ඕක කියනවා." ටිරියන් කුලී භේවායා දෙස බැලීය. "මම උඹව තරහ ගැස්සුවද? එහෙමනම් සමාවෙයන්... ඒ වුනත් උඹ කුණුගොඩක්ම තමා. වරද්දගන්ට එපා බ්‍රොන්. රාජකාරිය, ගෞරවය, මිත්‍රත්වය, මොකක්ද මේවායින් උඹට ඇති වැඩේ? නෑ. ඒ ගැන හිතන්ට මහන්සිවෙන්ට එපා. අපි දෙන්නම දන්නවා ඒකට උත්තරේ මොකක්ද කියලා. ඒ කොහොමවුනත් උඹ මෝඩයෙක් නෙවෙයි. අපි මිටියාවතට ළඟාවුනාට පස්සෙ ස්ටාර්ක් ආර්යාවට උඹෙන් ඇති වැඩක් නෑ... ඒ වුනත් මට වැඩක් තියෙනවා. ලැනිස්ටර්ලාට කවදාවත් මදිපාඩුවක් නොවෙච්ච දෙයක් තියෙනවා නම් ඒ තමා රත්තරන්. ඉතින්, දාදු කැටේ දාන්ට වෙලාව ආවහම මම කල්පනා කලා උඹ වඩාත්ම හොඳින් ගැලපෙන්නෙ කොතැනටද කියලා තේරුම්ගන්ට තරම් උඹට මොළේ තියෙනවා කියලා. මට බොහොම සන්තෝස හිතුනා උඹට එහෙම මොළයක් තියෙනවා කියලා දැනගත්තහම." ඔහු නැවත වරක් ප්‍රතිඵලයක් රහිතව ගිනිගල හා සිරිය එකට ගැටීය.

"මෙහෙ දියං ඕක. මං කරන්නම්." බ්‍රොන් උක්කුටියෙන් ඉඳගනිමින් පැවසීය. ගිනිගල හා සිරිය ටිරියන් ගේ දෑතින් ගත් ඔහු පළමු උත්සාහයේදීම සාර්ථක ප්‍රතිඵල නෙලාගන්නට සමත් විය. කුඩා පතුරු කැබැල්ලක් දුම් දමමින් ඇවිලෙන්නට විය.

"නියමයි." ටිරියන් කීය. "උඹ කුණුගොඩක් වෙන්ට පුළුවන්. ඒ වුනත් උඹ හරිම ප්‍රයෝජනවත්. කඩුවක් අතේ තියෙනකොට උඹ මගේ අයියා ජේමි තරම්ම හොඳයි. උඹට මොනවද ඕන බ්‍රොන්? රත්තරන්? ඉඩකඩම්? ගෑනු? මාව පණපිටින් තියාගනින්. උඹට ඒ හැමදෙයක්ම ලැබෙයි."

බ්‍රොන් ගිනිදළුවලට සෙමින් පිම්බ අතර ගින්න තවත් ඉහළට නැගී ආයේය. "එතකොට උඹ මළොත්?"

"ඇයි වදේ! එතකොට මගේ මරණය වෙනුවෙන් අවංකවම වැළපෙන, අවංකවම දුක්වෙන එකෙක් හරි ඉතිරිවෙයි." ටිරියන් නියවීය. "මම නෑ කියන්නෙ රත්තරනුත් නෑ කියන එකයි."

ගින්න මේ වනවිට හොඳින් ඇවිලෙමින් තිබින. නැගී සිටි බ්‍රොන් සිය ගිනිගල නැවත පසුම්බියේ රුවාගෙන සිරිය ටිරියන් දෙසට විසි කලේය. "බොහොම හොඳයි. මගේ කඩුව උඹ වෙනුවෙන් සටන්කරයි එහෙනම්... ඒ වුනත් උඹ බලාපොරොත්තු වෙන්ට එපා මම දණනමලා, 'මයෙ උතුමානනි' වගේ විකාර කිය කියා උඹට ආචාර කරයි කියලා. මම කාගෙවත් පන්දම් කාරයෙක් නෙවෙයි."

"ඒ වගේම කාගෙවත් යාළුවෙකුත් නෙවෙයි. මට කිසිම සැකයක් නෑ උඹ කැට්ලින් ආර්යාව පාවාදුන්නා වගේම කොයිවෙලාවක හරි මාවත් පාවලා දෙයි කියලා. උඹට ඒකෙන් ලාබයක් වෙනවා නම් උඹ දෙපාරක් හිතන්නෙ නෑ. මාව සල්ලිවලට පාවලා දෙන්ට උඹට කවදාහරි හිතුනොත්, මෙන්න මේකත් මතක තියාගනිං බ්‍රොන්. උන් උඹට කීයක් දෙනවා කිවුවත්, මටත් ඒ ගානම උඹට දෙන්ට පුළුවන්. ඒක මොකක්වුනත් කමක් නෑ, මටත් ඒකම දෙන්ට පුළුවන්. මම කැමැතියි ජීවත්වෙන්ට. හොඳයි, දැන් උඹ හිතනවද අපට රෑට කන්ට යමක් හොයාගන්ට උඹට මොකුත් කරන්ට පුළුවන් වෙයි කියලා?"

"අශ්වයො ටික බලාගනින්." බ්‍රොන් කීවේ සිය උණේ පැළැඳ සිටි දිගු කිණිස්ස කොපුවෙන් පිටතට අදිමිනි. ඊළඟ මොහොතේ ඔහු දිගු පියවර තබමින් ගස් අතර නොපෙනී ගියේය.

පැයකට පමණ පසු අශ්වයින්ට හොඳින් කවා පොවා සාත්තුකර තිබුනු අතර ගිනිමැලයද යහමින් දැල්වෙමින් තිබින. ගිනිදළුවලට ඉහළින් කරකැවෙමින් පැළහෙමින් තිබුනු එළු ගාතය ගිනි රස්නය නිසා පුපුරමින් 'හිස්' හඬ නංවමින් තිබ්න. "අපට දැන් ඕන මේ ටික උගුරෙන් පල්ලෙහාට යවාගන්ට හොඳ වයින් ටිකක් විතරයි." ටිරියන් කීය.

"ඒකයි, ගැනියෙකුයි, තව සෙබළු දුසිමකුයි විතරයි." බ්‍රොන් කීය. ඔහු දෙපා හරස්කර ගිනිමැලය පසෙකින් වාඩි වී, තෙල් ගලකින් සිය දිගු අසිපත මුවහත් කරමින් සිටියේය. ඒ දිගු ඒකතානමය හඬේ කුමක්දෝ ආරක්ෂණකාරී ස්වරයක් ගැබ් වී තිබ්න. "තව ටිකකින් හොඳටම කළුවර වැටෙයි. මං පළවෙනි මුරේ කරන්නම්... ඒක වඩා හොඳ වෙයි. උං අපිව නින්දෙදිම මැරුවොත් ඒක ලොකු කරුනාවක් වෙයි."

"ආහ්! මම හිතන්නෙ අපට නින්ද යන්ට ගොඩක් වෙලාවකට කලින් උන් මෙකනට එයි." පැළහෙන මාංශයේ සුවඳ නිසා ටිරියන් ගේ තොල කට තෙත් වන්නට විය.

බ්‍රොන් ගිනිදළු හරහා ඔහු දෙස බැලීය. "උඹට මොකක් හරි සැලැස්මක් තියෙනවා වගේ." අසිපත මුවහත්කිරීම නොනවත්වාම ඔහු ඇසීය.

"මම ඒකට කියන්නෙ බලාපොරොත්තුවක් කියලා. දාදුකැටේ තව පාරක් උඩ දානවා."

"පරදුවට තියන්නෙ අපේ ජීවිත වෙන්ටැති."

ටිරියන් දෙවුර ඇකිළීය. "අපට වෙන මොකක් හරි තේරීමක් තියෙනවද?" ඉදිරියට නැමුනු ඔහු එළු ගාතයෙන් මස් පෙත්තක් කපාගත්තේ ය. "ආහ්හ්!" පළමු කට රස බලන අතරේ ඔහු සතුටින් සුසුමක් හෙළීය. මසෙහි වූ තෙල් ඔහු ගේ නිකට දිගේ රූරා හැලෙන්නට විය.

"මම කැමැති ගානට වඩා වුට්ටක් විතර හයියයි. අනික මේකට කුළුබඩුත් නෑ. ඒ වුනත් මම ඒ ගැන වැඩිය පැමිණිලි කරන්ට යන්නෙ නෑ. ඉයරිවලදි තම්බපු බෝංචි ටිකක් හම්බවෙනවා නම් මම කඳු පල්ලමක වුනත් සන්තෝසෙන් උඩ පැනලා නටන්ට තිබුනා."

"ඒ වුනත් උඹ අර මුරකාරයට උඹේ රත්තරන් ටික දුන්නා?"

"ලැනිස්ටර්ලා හැමවෙලාවම තමන්ගෙ ණය ගෙවනවා."

ටිරියන් විසින් සිය මුදල් පසුම්බිය මෝර්ඩ් වෙත විසිකල අවස්ථාවේ මේ මුග්ධ මුරභටයාට පවා එය විශ්වාස කිරීම අසීරු විය. පසුම්බිය විවර කර දිදුලන රන්කාසි රැස දෙස බලද්දී ඔහු ගේ දෑස් පීරිසි දෙකක් තරම් විසල් විය. "මම රිදී කාසි ටික තියාගත්තා." ටිරියන් සිය සුපුරුදු වංචාකාරී සිනහවත් සමගින් ඔහුට පැවසීය. "ඒ වුනත් මම උඹට පොරොන්දු වුනේ රත්තරන්. ඉතින් ඔන්න තියෙනවා රත්තරන්." මෝර්ඩ් වැනි මිනිසකුට එය සිය ජීවිතකාලය පුරාවටම උපයාගැනීමට තබා සිතන්නටවත් නොහැකි තරමේ ධනයක් විය. "ඒ වගේම මම කියාපුවත් මතක තියාගනින්. මේ වස්තුවෙන් කොටසක් විතරයි. උඹට කවදාහරි ඒරින් ආර්යාවට සේවය කිරිල්ල එපාවුනොත්, එදාට වරෙන් කාර්ස්ටලී රොක්වලට. උඹට ගෙවන්ට තියෙන වස්තුවෙ ඉතුරු ටික මම උඹට ගෙවන්නම්." සිය දෑතේ පුරවාගත් රන්කාසි ඇඟිලි අතරින් රූරා වැටෙද්දී දණින් වැටුනු මෝර්ඩ් තමා එය කරන බවට සපත කලේය.

සිය සිරිය ඇදගත් බ්‍රොන් මස්ගාතය ගින්නෙන් බාගත්තේ ය. ඔහු මස්කුට්ටි කපන අතරේ ටිරියන් පාන් ගෙඩි දෙකක් අතට ගෙන මස් පිරවීම පිණිස ඒවා සූදානම් කරන්නට විය. "අපි ගංගාවට ලංවුනොත්, ඊටපස්සෙ උඹ මොකක්ද කරන්ට බලාපොරොත්තු වෙන්නෙ?" මස් කපන අතරේ කුලී භේවායා විමසී ය.

"ආහ්! මුලින්ම වේස ගෑනියෙකුයි, පිහාටු ඇඳකුයි, වයින් ගුරුලේත්තුවකුයි හොයාගන්නවා." ටිරියන් සිය පාන් ගෙඩිය දිගු කල අතර බ්‍රොන් එය මසින් පිරෙවුවේ ය. "ඊට පස්සෙ මම හිතන්නෙ කාර්ස්ටලී රොක්වලට හරි කින්ග්ස් ලැන්ඩින්ග්වලට හරි යනවා. මට තියෙනවා ප්‍රශ්න වගයක් උත්තර හොයාගන්ට, කිනිස්සක් ගැන."

කුලී හේවායා අහර කටක් සපා ගිල්ලේය. "ඒ කියන්නෙ උඹ ඇත්තම තමා කියලා තියෙන්නෙ? ඒ කිනිස්ස උඹේ නෙවෙයි?"

ටිරියන් සිහින් සිනහවක් නැගුවේ ය. "මම බොරුකාරයෙක් වගේද උඹට පේන්නෙ?"

ඔවුන් ගේ කුස් පිරෙන අතරේ තරු එකින් එක අහසේ එබිකම් කරන්නට වූ අතර කඳුවැටියට ඉහළින් අඩසඳක් පායා ආවේය. සිය සනකම් ලොම් සළුව බිම අතුල ටිරියන් සෑදලය හිසට තබාගෙන බිම වැතිරුනේ ය. "අපේ යාළුවො එන්ට බොහොම පරක්කු වෙනවා වගෙයි."

"මම උං නං මම බයවෙනවා මේක මොකක් හරි උගුලක් කියලා. උංව උපායෙන් මෙතැනට ඇදගන්ට නෙවෙයිනං අපි මොකටද මෙච්චර විවෘතව ඉන්නෙ?"

ටිරියන් කෙකර සිනහවක් පලකලේය. "එහෙම නම් ඉතින් අපි සිංදුවක් කාරිය කියලා උංව බයකරලා පන්නලාම දාමු." ඔහු ගීයක් සියුරුහන් කිරීමට පටන්ගත්තේ ය.

"උඹටනං පිස්සුම තමා කුරුමිට්ටො." සිය නිය අග්ගිස්සේ රැඳි තෙල්, කුණු, ධූලි කිනිසි තුඩින් සුද්දකරන අතරේ බ්‍රොන් පැවසීය.

"කෝ උඹේ සංගීත රසය බ්‍රොන්?"

"උඹට සංගීතය ඕනනං අර ගායකයාගෙන් අහන්ට එපායැ උඹ වෙනුවෙන් සටන්කරන්ටයි කියලා."

ටිරියන් නියවීය. "ඒක හරිම ෂෝක් දෙයක් වෙයි නේද? මට නිකං මැවිලා පේනවා වගේ ඌ උගේ අර වීණාවත් අතින් අරන් සෙර් වාර්ඩිස් එක්ක සටන් කරනවා." ඔහු නැවතත් සියුරුහඬලෑමට පටන්ගත්තේ ය. "උඹ දන්නවද මොකක්ද මේ සින්දුව කියලා?"

"එහෙන් මෙහෙන් අහන්ට ලැබිලා තියෙනවා, තැබෑරුම්වලයි ගනිකා මඩම්වලයි."

"ම'රිෂ්. ඒකට කියන්නෙ 'මගේ ආදරයේ සෘතුන්' කියලා. හරිම ලස්සනයි, හරිම දුක්මුසුයි. උඹට වචන තේරුම්ගන්ට පුළුවන් නම්. මගෙත් එක්ක ඇඳට නැගපු මුල්ම කෙල්ල මේ සින්දුව නිතරම කියන්ට පුරුදුවෙලා හිටියා. එදායින් පස්සෙ මේ සින්දුව කවදාවත් මගේ ඔළුවෙන් අහක් වුනේ නෑ." ටිරියන් හිස ඔසවා අහස දෙස බැලීය. එය පැහැදිලි, සීතල රැයක් වූ අතර කඳුවැටියට ඉහළින් අහසේ තාරකාවෝ සත්‍යය මෙන් දීප්තිමත්ව, අකරුනාවන්ත අයුරින් දිදුලන්නට වූහ. "මට ඒකිව මුනගැහුනෙත් මේ වගේ රෑක තමා." ඔහු නොදැනුවත්වම මුවින් වදන් ගිලිහෙන්නට විය. "ජේමියි මායි ලැනිස්පෝර්ට්වල ඉඳලා ආපහු එන අතරේ අපට කෑගැහිල්ලක් ඇහුනා. එක පාරටම මේකි පාරට දුවගෙන ආවා. ඒකි පස්සෙන්ම වගේ මිනිස්සු දෙන්නෙකුත් දුවගෙන ආවා, ඒකිට කෑ ගහ ගහ. මගේ අයියා කඩුව ඇදගෙන උන් දෙන්නා පස්සෙන් පන්නගෙන ගියා. මම අශ්වයා පිටින් බැහැලා කෙල්ලව ආරක්ෂා කලා. ඒකි මට වඩා ඕන නම් යාන්තං අවුරුද්දක් වැඩිමල් ඇති. කළු පාට කොණ්ඩෙ, කෙට්ටුයි. ඒකිගෙ මූන දැක්කම ඕන කෙනෙක්ගෙ හදවත කඩන් හැලෙනවා. ඒක ඇත්තටම මගේ හදවත බින්දා. ඒකි පහත්, බාගෙට බඩගින්නෙ ඉන්න, දවස් ගානකින් නාලා නැති කෙල්ලක්... ඒ වුනාට ලස්සනයි. ඒකි ඇඳන් හිටපු වැරහැලිත් අරුන් දෙන්නා බාගෙට ඉරලා දාලයි තිබුනෙ. ඉතින් ඒක නිසා මම මගේ සළුව අරන් ඒකිව වැහුවා. ඔය අතරේ ජේමි අරුන් දෙන්නව කැලෑව ඇතුළටම පන්නගෙන ගියා. එයා ආපහු එන අතරේ මට පුළුවන් වුනා කෙල්ල ගැන විස්තර ටිකක් දැනගන්ට. ඒකි ඔය පොඩි කුඹුරුහිමියෙක්ගෙ දුවක්. තාත්තා උණ හැදිලා මැරිලා ගියාට පස්සෙ මේකි අනාථ වෙලා. ඉබාගාතේ ඇවිද ඇවිද ඉඳලා තියෙන්නෙ."

"ජේමිට හොඳටම ඕනකමක් තිබුනා මේ මිනිස්සු දෙන්නාව දඩයම් කරන්ට. කාර්ස්ටලී රොක් ළඟටම ඇවිල්ලා මංකොල්ලකාරයො මෙහෙම පාරෙ යන මිනිස්සුන්ට අඩම්තේට්ටම් කරන එක හැමදාම වෙන දෙයක් නෙවෙයි. ඒක ලොකු අවනම්බුවක් කියලයි ජේමි හිතුවෙ. ඒ වුනත් තනියම ආයෙමත් පාර දිගේ යවන්ට බැරි තරම් කෙල්ල බයෙන් ගැහිගැහියි හිටියෙ. ඉතින් ඒක නිසා මම කිවුවා ජේමි කාර්ස්ටලී රොක්වලට ගිහිල්ලා උදවුවට සෙබළු අඬගහගෙන එනකම් මම ඒ කෙල්ලව ළඟම තියෙන තානායමට එක්කරන් ගිහිල්ලා ඒකිට කෑම ටිකක් අරන් දෙන්නම් කියලා."

"මම හිතුවාටත් වඩා ඒකි බඩගින්නෙ ඉඳලා තියෙන්නෙ. අපි කුකුළො දෙන්නෙක් කාලා තුන්වෙනි එකාගෙත් බාගයක් විතර ඉවරකලා. කතා කර කර වයින් ගුරුලේත්තුවකුත් ඉවර කලා. මට එතකොට දහතුනක්. මං හිතන්නෙ මට වයින් බිවුවා වැඩිවුනා. මට මතක

තියෙන ඊළඟ දේ මම ඒකිත් එක්ක ඇඳට නගිනවා. ඒකි ලැජ්ජාවෙන් හිටියෙ. මම ඊටත් වඩා ලැජ්ජාවෙන් හිටියෙ. මම දන්නෙ නෑ කොහොමද ඒ වෙලාවෙ මට එච්චර ධෛර්යයක් ආවෙ කියලා. ඒකිගෙ කන්‍යාභාවය මගේ අතින් නැතිවුනාම ඒකි ඇඬුවා. ඒ වුනත් පස්සෙ ඒකි මාව ඉඹලා ඔය ලස්සන සින්දුව කියන්ට පටන්ගත්තා. ඉතින්, උදේ වෙද්දි මම ආදරෙන් වෙලිලා ඉවරයි."

"උඹ?" බ්‍රොන් ගේ ස්වරය විස්මයෙන් ඇලලී ගොස් තිබින.

"හරිම හාස්‍යජනකයි නේද?" ටිරියන් නැවත වතාවක් සින්දුව සියුරුහඬලෑමට පටන්ගත්තේ ය. "මම ඒකිව බැන්දා." ඔහු අන්තිමේදී පිළිගත්තේ ය.

"කාර්ස්ටලී රොක්වල ලැනිස්ටර් කෙනෙක් මේ සාමාන්‍ය ගොවියෙකුගෙ දූවක් බැන්දා? උඹ කොහොමද ඒ වගේ දෙයක් කලේ?"

"අයියෝ! පුංචි බොරු දෙකතුනකුයි, රිදී කාසි පනහකුයි, බේබදු පූජකයෙකුයි හොයාගන්ට පුළුවන් නම් පොඩි කොල්ලෙකුට කරන්ට පුළුවන් දේවල් ඇහුවොත් උඹ උඩ යයි. ඒ වුනත් මගේ මනමාලිව කාර්ස්ටලී රොක්වලට එක්කරන් යන්ට තරම් මම නිර්භීත වුනේ නෑ. ඉතින් මම පොඩි පැල්පතක් හොයාගෙන ඒකිව එහාට එක්කන් ගියා. අපි සති දෙකක් විතර මෙහෙම ගෑනියි මිනිහයි වගේ හිටියා. ඊටපස්සෙ අර පූජකයාගෙ වෙරි හිඳිලා, ඌ මගේ තාත්තා ගාවට ගිහින් සිද්දවෙච්ච හැම දෙයක්ම පාපොච්චාරණය කලා." මෙතරම් වසර ගනනාවකට පසුව වුවද මේ විස්තරය පවසද්දී තමාට දැනෙමින් තිබුනු අසරණ, අනාථ බව පිළිබඳ ටිරියන්ට පුදුමයක් ඇති විය. සමහරවිට ඔහු දැඩි විඩාවෙන් පෙලෙමින් සිටිනවා විය හැක. "ඉතින්, ඒ තමා මගෙ කසාදෙ අවසානය." නැගිට වාඩිගත් ඔහු ගිනිමැලයේ පණ අදිමින් සිටින ගිනිදළු දෙස ඇසිපිය ගසමින් බලාසිටින්නට විය.

"එයා කෙල්ලව පන්නලා දැම්මද?"

"එයා ඊට වඩා හොඳ දෙයක් කලා. ඉස්සෙල්ලාම එයා මගේ අයියාට කිවුවා ඇත්ත සිද්දිය මොකක්ද කියලා මට කියලා දෙන්ටයි කියලා. ඒ කෙල්ල වේසියක්. ජේමි තමා ඒ ඔක්කොම සූදාණම් කරලා තියෙන්නෙ. අපේ ගමන, අර මංකොල්ලකාරයො දෙන්නා,

හැමදේම. එයා හිතුවා මට ගෑනියෙක් එක්ක ඉන්ට කාලෙ හරි කියලා. ඒ මගේ මුල්ම වතාව නිසා එයා දෙගුණයක් ගෙවලා වැඩේට කන්‍යාවක්ම හොයාගත්තා."

"ජේමි මේ විස්තරේ කිවුවට පස්සෙ, ඇත්ත මොකක්ද කියලා මගේ මෝඩ මොළේට ගියාට පස්සෙ, ටයිවින් උතුමානන් මගේ බිරිඳව එක්කරන් ඇවිල්ලා එයාගෙ සෙබළුන්ගෙ පාවිච්චියට දුන්නා. උනුත් එයාට හොඳ ගානක් ගෙවුවා. එකාට රිදී කාසියක් ගානෙ. එච්චර ලොකු ගානක් කියන්ට පුළුවන් වේසියො කීයෙන් කී දෙනාද ඉන්නෙ? මේ වැඩේ ඉවරවෙනකම් බැරැක්කෙ කොණක වාඩිවෙලා ඒ දිහා බලන් ඉන්ටයි කියලා එයා මට නියම කලා. අන්තිමේදි ඒකිට කොච්චර රිදී කාසි ලැබුනද කිවුවොත් ඒවා ඒකිගෙ ඇඟිලි අතරින් රූටලා බිම වැටිලා රෝල්වෙන්ට පටන්ගත්තා. ඒකි..." දුම නිසා ඔහු ගේ දෑස් දැවෙන්නට පටන්ගති. උගුර පෑදූ ටිරියන් ගිනිමැලයෙන් ඉවතට දෑස් හරවාගෙන රාත්‍රියේ අන්ධකාරය දෙස බලා සිටින්නට විය. "ටයිවින් උතුමානන් අන්තිමේදී මටත් අවස්ථාවක් දුන්නා." ඔහු මෘදු ස්වරයෙන් කීය. "එයා මට රත්තරන් කාසියක් දුන්නා ඒකිට ගෙවන්ටයි කියලා. මොකද මම ලැනිස්ටර් කෙනෙක් නිසා සෙබළුන්ට වඩා මම ගෙවන්ට ඕන කියලා."

මඳ වේලාවකට පසු බ්‍රොන් නැවතත් සිය අසිපත මුවහත් කරන හඬ ඔහුට ඇසෙන්නට විය. "දහතුනක් හරි තිහත් හරි තුනක් හරි, වයස කීයක් වුනත් කමක් නෑ. මට ඒ වගේ දෙයක් කලානං මම ඒ මිනිහව මරනවා."

වහා හිස හැරවූ ටිරියන් ඔහු දෙස බැලීය. "උඹට ඒකට දවසක අවස්ථාවක් එයි. මම කියාපු දේ මතක තියාගනින්. ලැනිස්ටර්ලා හැමදාමත් තමන්ගෙ ණය ගෙවනවා." ඔහු ඈනුමක් හැරියේ ය. "මම හිතන්නෙ මම දැන් නිදාගන්ට පොඩි උත්සාහයක් දාලා බලන්නම්. අපි මැරෙන්ට කිට්ටුවුනාම මාව ඇහැරවපං."

සිය සළුව මත දිග ඇදී හරිබරි ගැහුනු ඔහු දෑස් පියාගත්තේ ය. පොළොව සීතල හා විෂම වුවද මඳ වේලාවකට පසු නිදි දෙව්දුව ටිරියන් ලැනිස්ටර් සොයා ආවාය. ඔහු නැවත වතාවක් අහස් සිරකුටිය සිහිනෙන් දිටීය. එනමුදු මේ වතාවේ ඔහු සිරකරුවා නොව මුරභටයා විය. දැවැන්ත සිරුරකින් හෙබි, සම්පටියක් අතින් ගත් ඔහු සිය පියාට පහරදෙමින් සිරකුටියේ සීමාවට, කිසිවක් නැති හිස් ආකාශයට ඔහුව පන්නමින් සිටියේය.

"ටිරියන්." බ්‍රොන් ගේ අනතුරු ඇඟවීම ක්ෂණික, සිහින් කෙඳිරිල්ලක් විය.

ඇසිපිය ගසන පමාවෙන් ටිරියන් අවදිවිය. ගිනිමැලය නිවී ගොස් ගිනිඅඟුරු පමණක් ඉතුරුව තිබුනු අතර ඔවුන් වටා සෑම තැනම සෙවනැලි එහා මෙහා යමින් තිබින. එක් අතකින් අසිපත ද අනිත් අතින් සිරිය ද ගත් බ්‍රොන් බිම දණක් නවා වාඩි වී සිටියේ ය. ටිරියන් අතක් එසවීය. 'සද්ද නොකර ඔහොම ඉන්ට', එයින් කියැවිනි. "වරෙල්ලා. ඇවිත් අපේ ගිනිමැලයෙන් උණුහුම් වෙයල්ලා. අද රෑ සීතලයි." ඔහු සෙවනැලිවලට කතා කලේය. "මට බොහොම කණගාටුයි උඹලාට දෙන්ට අපි ළඟ වයින් නම් නෑ. ඒත් එළුවෙක් ඉන්නවා, උඹලාට බඩකට පුරවගන්ට පුළුවන්."

සියළු චලනයන් වහා නැවතින. ලෝහ මත සඳඑළිය වැටී දිලිසෙන ආකාරය ටිරියන් දිටීය. "අපේ කඳුකරය." ගස් අතර අන්ධකාරය මැදින් කටහඬක් කතාකලේය. එය ගැඹුරු, ගොරතර, කිසිසේත්ම මිත්‍රශීලී නොවන හඬක් විය. "අපේ එළුවා."

"ඔවු. උඹලාගෙ එළුවා තමා." ටිරියන් එකඟවිය. "කවුද උඹලා?"

"උඹලාට උඹලගෙ දෙයියො මුනගැහුනම," වෙනත් කටහඬක් පිළිතුරු දුන්නේ ය. "කියාපල්ලා, ගල් කපුටන්ගෙ ගෝත්‍රයේ ගර්න් ගෙ පුතා ගන්තර් තමා උඹලාව එහාට එවුවෙ කියලා." පයට පෑගුනු වියළි කෝටු කැබැල්ලක් බිඳී ගිය අතර සෙවනැල්ල ආලෝකයට පිළිපන්නේ ය. ඒ, මුදුනේ උලක් සහිත ශිරස්කයක් පැළැඳ, දිගු පිහියකින් සන්නද්ධ වූ කෙසඟ මිනිසකු විය.

"ඒ වගේම ඩොල්ෆ් ගෙ පුතා ෂග්ගාත් එතැන හිටියයි කියපං." ඒ අර මුලින් ඇසුනු ගොරතර, ගැඹුරු කටහඬ විය. ඔවුන්ට වම්පසින් තිබුනු ගල් පර්වතයක් සෙලවුනු අතර ඒ පර්වතයක් නොව මිනිසකු බව පෙනින. ඔහු දැවැන්ත, මන්දගාමී නමුදු ශක්තිමත් මිනිසකු විය. මුලුමනින්ම පාහේ සම්වලින් ගත වසාගෙන සිටි ඔහු ගේ දකුණතේ මුගුරක් ද වමතේ පොරොවක් ද විය. ඔවුන් වෙත සෙමින් සෙමින් ලංවන අතරේ ඔහු ඒ දෙක එකට ගැටුවේ ය.

තවත් කටහඬවල් තවතවත් නම් හඬගා කියන්නට වූහ. කොන් සහ ටොරෙක් සහ ජැගට් සහ ඇසූ සැනින් ටිරියන්ට අමතකව ගිය තවත් නම් බොහෝ ගණනක් දසතින්ම ඇසෙන්නට විය. එතැන අඩුම තරමේ දසදෙනෙක් වත් වූහ. සමහරුන් අත අසිපත් හා පිහියා ද, තවත් අය අත මුල්ලු, දැකැති හා ලී හෙලි ද විය. ඔවුන් සැවොම තම නම් හඬගා අවසන්වන තුරු ටිරියන් නිහඬව සිටියේ ය. "මම ටයිවින් ගෙ පුතා ටිරියන්. ලැනිස්ටර් ගෝත්‍රයේ. අපි කාර්ස්ටලී රොක්වල සිංහයො. අපි කාපු එළුවා වෙනුවෙන් බොහොම සතුටින් අපි මිලක් ගෙවන්නම්."

"උඹට මොනවයින්ද අපට ගෙවන්ට පුළුවන්, ටයිවින් ගෙ පුතා ටිරියන්?" ගන්තර් ඇසීය. ඔහු මෙම පිරිසේ නායකයා බැව් පෙනින.

"මගේ පසුම්බියේ රිදී කාසි තියෙනවා. මම මේ ඇඳගෙන ඉන්න කබාය මට ලොකු වැඩියි. ඒත් මම හිතන්නෙ ඒක කොන්ට හොඳට ගැලපෙනවා. ඒ වගේම ෂග්ගා ඔය උස්සගෙන ඉන්න ලී පොරොවට වඩා මගේ මේ යුද්ධ පොරොව හොඳට ඒ අතට ගැලපෙනවා."

"මේ කුරුමිට්ටා අපේ සල්ලිවලින් අපටම ගෙවන්ට හදනවා." කොන් පැවසීය.

"කොන් කියන්නෙ ඇත්ත." ගන්තර් කීය. "උඹේ රිදී අපේ. උඹේ අස්සයො අපේ. උඹේ කබාය, උඹේ පොරොව, උඹේ පිහිය, උඹේ ඉණපටිය, ඔය ඔක්කොම අපේ. උඹලාගෙ ජීවිත ඇර වෙන මොකුත් නෑ අපට ගෙවන්ට. උඹ කොහොමද මැරෙන්ට කැමැති, ටයිවින් ගෙ පුතා ටිරියන්?"

"අවුරුදු අසූවක් නාකිවෙලා. මගේ ඇඳේ. හොඳ උණුසුම් වයින් බඩේ පිරිලා තියෙද්දි. හොඳ ලස්සන කෙල්ලක් මට තුරුල් වෙලා ඉන්දැද්දි." ටිරියන් පිළිතුරු දුන්නේ ය.

දැවැන්තයා, ෂග්ගා මහහඬින් සිනාසුනේ ය. අනිකුත් එතරම්ම විනෝදමත් වූ බවක් නොපෙනින. "කොන්, උංගෙ අස්සයො ගනින්." ගන්තර් අණකලේ ය. "අර අනිත් එකාව මරලා කුරුමිට්ටාව උස්සගනින්. ඌ හොඳයි එළුවන්ගෙන් කිරි දොවන්ටයි නාකි ආච්චිලා ටික විනෝදෙන් තියන්ටයි."

බ්‍රොන් විගසින් දෙපා මතින් නැගී සිටියේ ය. "මොකාටද ඉස්සෙල්ලාම මැරෙන්ට ඕන?"

"එපා!" ටිරියන් කෑගැසීය. "ගර්න් ගෙ පුතා ගන්තර්, මම කියන එක අහපන්. මගේ වංශය බොහොම බලසම්පන්නයයි, බොහොම පොහොසත්. ගල් කපුටන්ට පුළුවන් නම් අපි දෙන්නාව බොහොම පරිස්සමින් මේ කඳුකරයෙන් එහාට එක්කරන් යන්ට, මගේ තාත්තා උඹලාට නාන්ට තරම් රත්තරන් දෙයි."

"ඔය පහත්බිමේ උත්තමයින්ගෙ රත්තරන් මේ කුරුමිට්ටාගෙ පොරොන්දු වගේම තමා." ගන්තර් කීය.

"මම කුරුමිට්ටෙක් වෙන්ට පුළුවන්. ඒ වුනත් මට මගේ සතුරන්ට මූනදෙන්ට තරම් පිරිමිකමක් තියෙනවා. ඒ වුනත් ගල් කපුටො මොකද කරන්නෙ? මිටියාවතේ නයිට්වරු මේ පාරෙන් යනකොට උන් ගල්කුළු අස්සෙ හැංගිලා බයෙන් ගැහෙනවා."

කේන්තියෙන් මුර ගෑ ෂග්ගා සිය මුගුර හා පොරොව එකට ගැටීය. ජැගට් ගින්නෙන් පදම්කල උල් තලයකින් යුත් ලී හෙල්ලක් ටිරියන් ගේ මුහුණට තබා තදකලේ ය. වේදනාවෙන් නොඇකිළී ඉන්නට ටිරියන්ට උපරිම උත්සාහය දැරීමට සිදුවිය. "උඹලාට හොරකම් කරගන්ට පුළුවන් වුන හොඳම ආයුධ ද මේ?" ඔහු ඇසීය. "බැටළුවො මරන්ට නම් හොඳා... ඒකත් බැටළුවො ආපහු සටන්කරන්නෙ නැතුව ඔහේ බලන් හිටියොත් මිසක්. මගේ තාත්තගෙ කම්මල්කාරයො වැසිකිලි ගියත් ඔයිට වඩා හොඳ වානේ පිටවෙනවා."

"පුංචි කොලු-මිනිහෝ." ෂග්ගා ගෙරවීය. "මම උඹේ පිරිමි ඇඟ කපලා එළුවන්ට කන්ට දැම්මාට පස්සෙත් උඹ මගේ පොරොව ගැන ඔහොම සමච්චලේට කතාකරයිද කියලා බලමු."

එනමුදු ගන්තර් අතක් එසවීය. "නෑ. මං හිතන්නෙ අපි ඌ කියන එක අහන්ට ඕන. අම්මලා ඉන්නෙ බඩගින්නෙ. අනික රත්තරන්වලට වඩා වානේවලින් පුළුවන් ගොඩ දෙනෙක්ගෙ

**බඩවල් පුරවන්ට. උඹලාගෙ ජීවිත බේරුවොත් ඒ වෙනුවට උඹ අපට මොනාද දෙන්නෙ, ටයිවින් ගෙ පුතා ටිරියන්? කඩු? ලන්ස? සන්නාහ?"**

**"ඒ හැම දෙයක්ම. ඒ වගේම තවත් ගොඩක් දේවල්, ගර්න් ගෙ පුතා ගන්තර්." ටිරියන් ලැනිස්ටර් සිනහවක් රැඳි මුවින් යුතුව පිළිතුරු දුන්නේය. "මම උඹලාට දෙන්නම් මුලු ඒරින් මිටියාවතම."**

**Bronn: “Thirteen or thirty or three, I would have killed the man who did that to me.”**

**Tyrion : “You may get that chance one day. Remember what I told you. A Lannister always pays his debts.”**

එකොළොස්වැනි 11

යකඩ සිංහාසනය

රතු බලකොටුවේ සුවිසල් සිහසුන් කාමරයේ වූ උස්, පටු කවුළු තුළින් ගලා ආ සැඳෑ හිරු රැස් බිම මත අලංකාර කැටයම් අඳිමින් තිබිනි. ඒ හිරු රැස් විසින් කලෙකට පෙරදී දැවැන්ත මකර හිස්කබල් එල්ලා තිබුනු එහි ගල් බිත්ති මත තද රත් පැහැ තීරු රටා නිමවා තිබිනි. මකර හිස්කබල් වෙනුවට මේ ගල් බිත්ති මත දැන් එල්ලී තිබුනේ කොළ, නිල් හා දුඹුරු පැහැයෙන් වර්ණවත් කෙරුනු දඩයම් දර්ශනයන්ගෙන් හැඩවුනු තිර රෙදි විය. එනමුදු නෙඩ්ට සිතුනේ මේ ශාලාව පුරා පැතිර පැවතුනු එකම වර්ණය ලේ රතු පැහැය පමණක් බවයි.

ශාලාව කෙලවරක උස් වේදිකාවක් මත පනවා තිබුනු ජයග්‍රාහක ඒගොන් ගේ පෞරාණික, උත්තුංග යකඩ සිංහාසනය මත ඔහු අසුන් ගෙන සිටියේ ය. එය ඇත්තෙන්ම අශෝභන ලෙස එකට ගෙතුනු යකඩ උල් හා තියුණු දාරවලින් සමන්විත දැවැන්ත යකඩ පුටුවක් විය. රොබර්ට් ඔහුට අනතුරු අඟවා තිබූ පරිද්දෙන්ම එය කිසිදු සැපපහසුකමක් නැති, කටුක භාණ්ඩයක් වූ අතර අන් කවරදාටත් වඩා අද ඔහුට එහි කටුක බව දැනෙමින් තිබුනි. ගතවන සැම මොහොතක් පාසාම ඔහු ගේ බිඳුනු පාදය වඩවඩාත් වේදනා ගෙනදෙමින් තිබුනි. ගතවන සැම පැයක් පාසාම ඔහුට යටින් තිබුනු ලෝහ ගොඩ දරදඬුවෙමින් තිබුනු අතර පිටුපසින් වූ යකඩ උල් නිසා අසුනේ පසුපසට ඇලවීමට ද හැකියාවක් නොවිනි. 'රජෙකු කිසිවිටෙකත් සැපපහසුවෙන් අසුන් නොගත යුතුය', ජයග්‍රාහක ඒගොන් එසේ පවසා තිබුනේ සිය සතුරන් විසින් අතහැර දමන ලද අසිපත් සමූහය එක් කොට, එකට පාස්සා දැවැන්ත සිහසුනක් නිමවන්නැයි සිය කම්මල්කරුවන්ට අණ දුන් දවසේය. 'ජයග්‍රාහක ඒගොන් යකාටම ගියාවේ!', නෙඩ් බුම්මාගත් මුහුණින් යුතුව සිතුවේය. 'රොබර්ටුයි එයාගෙ මේ මලඉලවු දඩයම් සවාරිත් යකාටම ගියාවේ!'

"උඹලාට හොඳටම විශ්වාසද මේ නිකංම නිකං මංකොල්ලකාර පල්හොරු නෙවෙයි කියලා?" සිහසුනට පහළින් තිබුනු රාජසභා මේසයේ අසුන් ගෙන සිටි වාරිස් ඇසීය. ඔහු පසෙකින් සිටි ප්‍රධාන මේස්ටර් පයිසෙල් නොසන්සුන් අයුරින් සිය අසුන මත ඇඹරෙද්දී සුළැඟිල්ලා අතැඟිලි අතර පැනක් කරකවමින් සිටියේය. අද දින රාජසභාවට සහභාගී වී සිටි රාජසභිකයින් වූයේ ඔවුන් තිදෙන පමණකි. රජවනයේ සුදු පැහැ ගෝනකු සැරිසරන බවට ආරංචියක් පැතිර ගොස් තිබුනු අතර රෙන්ලි උතුමානන් හා සෙර් බැරිස්ටාන් ඌව

දඬයම් කිරීම පිණිස රජු විසින් සංවිධානය කෙරුනු දඬයම් සවාරියට එක්ව සිටියහ. ඔවුන් සමගින් ජොෆ්රි කුමරා, සැන්ඩෝර් ක්ලිගේන්, බෙලන් ස්වෝන් හා රාජසභාවෙන් බාගයක් පමණම පිටව ගොස් තිබින. ඉදින් රජතුමා වෙනුවට නෙඩ්ට යකඩ සිහසුනේ අසුන් ගැනීමට සිදුවී තිබින.

අඩුම තරමේ ඔහුට අසුන් ගැනීමට හෝ හැකියාව තිබින. මේ ශාලාව තුළදී රාජසභිකයින් හැරෙන්නට අනිත් සියල්ලන්ම නැගිට සිටීම හෝ බිම දණ නමා සිටීම චාරිත්‍රය විය. දොරවල් අසල පෙත්සම්කරුවෝ පොදිකමින් සිටියහ. නයිට්වරු, වංශාධිපතියෝ හා ආර්යාවෝ තිරරෙදි යට පේළි ගැසී සිටියහ. සාමාන්‍ය මිනිස්සු පිටත සක්මනෙහි රැඳී සිටියහ. සන්නාහ ලූ මුරභටයෝ - රන්වන් පැහැ සළු පැළැඳූ නගරාරක්ෂකයන් හෝ අළු පැහැ සළු පැළැඳූ ස්ටාර්ක් සෙබළුන් - සිය ආයුධ අතින් දරා මුරකාවලේ යෙදී සිටියහ. එනමුදු මේ සියල්ලන්ම නැගිට සිටීම අනිවාර්ය දෙයක් විය.

ඔහු ඉදිරියේ වූ ගැමියන් පිරිස බිම දණ නමා සිටියහ. පිරිමින්, ගැහැණුන් හා කුඩා දරුවන්, වෙහෙසින් මිරිකී ගිය, තුවාල වුනු, බියෙන් ඇලලී ගිය මුහුණින් යුතු මේ පිරිස ඇත්තෙන්ම දුක්ඛදායක දසුනක් විය. ඔවුන්ව මෙහි කැඳවාගෙන පැමිණි නයිට්වරුන් තිදෙනා ඔවුන් පසුපසින් සිටගෙන සිටියහ. "මංකොල්ලකාර පල්හොරු කියලද කිවුවෙ වාරිස් උතුමානනි?" සෙර් රේමන් ඩැරී ගේ ස්වරයේ අවඥාව හා පරිභවය ගැබ්ව තිබින. "ආහ්! ඔවු. කිසිම සැකයක් නෑ, උං පල්හොරු තමා. ලැනිස්ටර් පල්හොරු."

මේ කතාවට සවන් දීම පිණිස වංශාධිපතීන් හා ඔවුන් ගේ සේවකයන් ඇතුළු සියල්ලෝම මහත් උනන්දුවෙන් එදෙසට එබී බලද්දී ශාලාව තුළ පැතිර ගිය නොසන්සුන් බව නෙඩ්ට හොඳින් වැටහී ගියේය. කැට්ලින් විසින් ටිරියන්ව පැහැරගත් දා සිට මුළු බටහිර පළාතම ගිනි ඇවිලෙන්නට ඔන්න මෙන්න කියා තිබෙන ගිනිපුළුන් ගුලියක් මෙන් විය. රිවර්රන් හා කාර්ස්ටලී රොක් යන දෙකොටසම සිය ධජ කැඳවා තිබුනු අතර ගෝල්ඩන් ටූත්වලට පහළින් වූ කපොල්ල දෙපස හමුදා රැස්වෙමින් තිබින. රුධිර ගංගා ගලායන යුද්ධයක් ඇරඹෙන්නට යන බව නිශ්චිත කරුනක් වූ අතර එය කවදා කෙසේ ඇරඹේද යන්න පමණක් අවිනිශ්චිත විය. තිබුනු එකම ප්‍රශ්නය වූයේ මේ රුධිරය ගලායාම අඩු කල හැකි හොඳම ක්‍රමය කුමක්ද යන්නයි.

සෙර් කේරිල් වාන්ස් බිම දණනමා සිටි ගැමියන් දෙසට අත දිගුකලේ ය. "මේ තමා ෂෙරර් ගමෙයි බලකොටුවෙයි ඉතුරුවෙලා ඉන්න එකම පිරිස එඩාර්ඩ් උතුමානනි. අනිත් උං

ඔක්කොම මරලා දාලා. ඒ වගේම වෙන්ඩිෂ් ටවුන්වලයි, මමර්ස් ෆෝර්ඩ්වලයි මිනිස්සු හැමෝමත් මරලා දාලා."

"නැගිටපල්ලා." නෙඩ් ගැමියන්ට විධාන කලේය. බිම දණ ඇනගෙන සිටින කිසිවෙකු කියන්නක් විශ්වාස නොකල යුතු බැව් ඔහු අත්දැකීමෙන් දැන සිටියේ ය. "උඹලා හැමෝම නැගිටපල්ලා."

ෂෙරර්හි ගැමියෝ එකා දෙන්නා බැගින් නැගී සිටින්නට වූහ. එක් මහල්ලෙකුව නැගිට්ටුවීමට අනිකුන් ගේ සහය අවශ්‍ය වූ අතර ලෙයින් පෙඟී ගිය ගවොමක් හැඳ සිටි දැරියක් තවමත් බිම දණ ඇනගෙන කිසිත් නොදකින හිස් දෑසින් සෙර් ඒරිස් ඕක්හාර්ට් දෙස බලාගත්වනම සිටියාය.

"ජොස්." සෙර් රේමන් ඩැරී මහත, තට්ට හිසැති මිනිසකුට කතාකලේ ය. "ෂෙරර්වල මොකක්ද සිද්දවුනේ කියලා රජතුමාගෙ හස්තයට කියපං."

ජොස් හිස වැනීය. "මගේ ස්වාමීනි, ඔබතුමා සතුටුනං-"

"උඹේ ස්වාමීන් ගඟට එහා පැත්තෙ කැලේ දඩයම් කරනවා." නෙඩ් කීවේ රතු බලකොටුවේ සිට දවස් කිහිපයක දුරින් වෙසෙන්නෙකු පවා තමන් ගේ රජතුමා කවරාකාරයේ පුද්ගලයකුදැයි නොදැන සිටීම ගැන පුදුමවෙමිනි. "මම එඩාර්ඩ් ස්ටාර්ක්, රජතුමාගෙ හස්තය. මට කියපන් උඹ කවුද, මේ අශ්වාරෝහකයො ගැන උඹ මොනවද දන්න විස්තර කියලා."

"මයෙ උතුමානනි, මම ෂෙරර්වල ගල්පාලම ගාව තැබෑරුමක් පවත්වගෙන යනවා... පවත්වගෙන ගියා. බෙල්ලෙන් පහළ දකුණුකරේ තියෙන හොඳම ඒල්. හැමෝම කිවුවෙ එහෙමයි මයෙ උතුමානනි. මට සමාවෙන්ට මයෙ උතුමානනි. ඒකත් දැන් අනිත් හැමදෙයක්ම වගේ නැතිවෙලා ගිහිල්ලා මයෙ උතුමානනි. උං ඇවිල්ලා උංට ඇතිපදං බීලා අනිත් ඔක්කොම ටික හලලා දැම්මා මයෙ උතුමානනි. ඊටපස්සෙ උං තැබෑරුමට ගිනිතිබ්බා. උංට මාව අහුවුනානං මාවත් ඉවරයි මයෙ උතුමානනි."

"උං හැමතැනම ගිනිතිබ්බා." ඔහු පසෙකින් සිටි ගොවියෙක් කීය. "උං ආවෙ රෑ අන්ධකාරෙට මුවා වෙලා, දකුණුකරේ ඉඳන්. උං ගොවිපලවලටයි, ගෙවල්වලටයි හැමතැනටම ගිනිතිබ්බා. උංව නවත්තන්ට හදන එවුන්ව මරලා දැම්මා. ඒ වුනත් උං මංකොල්ලකාරයො නෙවෙයි මයෙ උතුමානනි. උංට අපේ සත්තු පැහැරගන්ට කිසිම උවමනාවක් තිබ්බෙ නෑ. උං මගේ කිරි එළදෙන එතැනම කපලා මරලා දැම්මා. ඊටපස්සෙ මළකඳ එහෙම්මම දාලා යන්ට ගියා."

"උං මගේ පුහුණුවෙන කොල්ලාව යටකරලා මරලා දැම්මා." කම්මල්කරුවකු ගේ දැවැන්ත මාංශ පේශීන්ගෙන් හෙබි, නළල වටා වෙළුම් පටියක් ඔතාගෙන සිටි තරබාරු මිනිසෙක් කතාකලේය. "උං අස්සයො පිටේ නැගලා, ලන්සවලින් ඇන ඇන ඒ කොල්ලාව ගොවිපලේ එහාටයි මෙහාටයි පැන්නුවා. ඌ වේදනාවෙන් කෑ ගගහා, බිම වැටී වැටී, එහාට මෙහාට දුවද්දි උං මේක නිකං සෙල්ලමක් වගේ අරන් මහ හයියෙන් හිනාවෙවී ඌ පස්සෙන් පැන්නුවා. අන්තිමේදි අර මහ දැවැන්ත මිනිහා කොල්ලාව මැරෙන්ටම ඇන්නා."

බිම දණ නමාගෙන සිටි දැරිය ඇයට ඉහළින් සිහසුනේ අසුන් ගෙන සිටින නෙඩ් දෙස ගෙල දිගුකර බැලුවාය. "උං මගේ අම්මාවත් මරලා දැම්මා මගේ ස්වාමීනී. ඊටපස්සෙ උං... උං..." ඇගේ හඬ බිඳී ගියේ කියන්නට සිටි දෙය අමතක වූවාක් මෙනි. ඇය ඉකිබිඳින්නට පටන්ගත්තා ය.

සෙර් රේමන් ඩැරී ඔවුන් කතාව නැවතූ තැනින් පටන්ගත්තේ ය. "වෙන්ට්ෂ් ටවුන්වල මිනිස්සු හැමෝම උංගෙ බලකොටුව අස්සට රිංගගත්තා. ඒ වුනත් ඒ බලකොටු ප්‍රාකාර හදලා තිබුනෙ ලී වලින්. මංකොල්ලකාරයො ඒ ප්‍රාකාරවලට පිදුරු මිටි හේත්තුකරලා ගිනිතිබ්බා. බාගෙට බාගයක් මිනිස්සු ඇතුළෙම පිච්චිලා මලා. අනිත් එවුන් ගින්නෙන් බේරෙන්ට ගේට්ටු කඩාගෙන එළියට පනිනකොට අරුන් ඊතලවලින් විදලා මිනිස්සු මැරුවා. කිරිදෙන ළමයි ඉන්න ගෑනියෙක්වවත් උන් ඉතුරු කලේ නෑ."

"කොච්චර හයංකාරද." වාරිස් මිමිනීය. "මිනිස්සු කොහොමද මෙච්චර කුරිරු වෙන්නෙ?"

"උං අපිටත් ඒකම තමා කරන්ට හැදුවෙ. ඒ වුනත් අපේ බලකොටු ප්‍රාකාරෙ හදලා තියෙන්නෙ ගල්වලින්." ජොස් කීවේය. "සමහර එවුන්ට ඕන වුනා මොකක් හරි කරලා

අපිව බලකොටුවෙන් එළියට ගන්ට. ඒ වුනත් අර දැවැන්ත මිනිහා කිවුවා මීට වඩා හොඳ ඒවා ගඟ ඉහළ තියෙනවා කියලා. ඊටපස්සෙ උං මමර්ස් ෆෝර්ඩ්වලට ගියා."

සිහසුන අල්ලාගෙන ඉදිරියට නැඹුරුවෙද්දී සීතල වානේවල පහස සිය අතැඟිලිවලට දැනෙනු නෙඩ්ට හැඟින. සෑම අතැඟිල්ලක්ම අතරින් අසිපත් තුඩක් මතුව තිබුනි. එකට අඹරා පාස්සන ලද අසිපත් සමූහයේ තුඩු නියපහුරු මෙන් සිහසුනේ අත්වාරුවලින් පිටට නෙරා තිබුනි. සියවස් තුනකට පසුව අද පවා මේ සමහර අසිපත් තුඩු අතක් පයක් කපාදැමීමට තරම් තියුණු මුවහතකින් යුතු විය. අපරීක්ෂාකාරී පුද්ගලයෙකුට යකඩ සිහසුන වනාහී මර උගුලක්ම විය. ගී සැහැලිවල කියැවෙන අන්දමට මේ සිහසුන තැනුනේ බැලේරියන් හෙවත් කළු රෞද්‍රයා ගේ මකරාග්නියෙන් උණුකර එකට පෑස්සූ අසිපත් දහසකිනි. ඒවා එකට තබා මිටිපහර ගසා පාස්සන්නට පනස් නව දවසක් ගතවී තිබින. එහි අවසන් ප්‍රතිඵලය වූයේ එකට ගෙතුනු යකඩ තුඩු, තියුණු දාරයන්, හා යකඩ පටිවලින් නිර්මිත මේ කළු පැහැ, බොකු ගැහුනු දැවැන්තයා විය. මේ පුටුවට මිනිසකු මරාදැමිය හැකි විය. ප්‍රවාද විශ්වාස කල හැකි නම් එය එසේ මිනිසුන් මරා දමා තිබුනි.

එඩාර්ඩ් ස්ටාර්ක් මේ මරඋගුලේ අසුන්ගෙන කුමක් කරන්නේදැයි යන්න ඔහුටද තේරුම්ගත නොහැකි ප්‍රහේලිකාවක් විය. එනමුදු ඔහු එහි අසුන්ගෙන සිටින අතර මේ මිනිස්සු ඔහුගෙන් යුක්තිය අපේක්ෂා කර සිටිති. "මේ මිනිස්සු ලැනිස්ටර්ලායි කියන්ට මොකක්ද උඹලාට තියෙන සාක්කිය?" ඔහු ඇසීය. සිය කේන්තිය සඟවාගනු පිණිස ඔහුට මහත් වෙහෙසක් දැරීමට සිදුවිය. "උන් ලේ රතුපාට සළු ඇඳන් හිටියද නැත්තම් සිංහ කොඩියක් උස්සගෙන ආවද?"

"ලැනිස්ටර්ලා වුනත් එච්චරටම මෝඩයො වෙයි කියලා හිතන්ට බෑ." සෙර් මාර්ක් පයිපර් කීවේය. ඔහු තරුණ මදයෙන් මත් වූ, වහා කිපෙන, ලේ රත්වනසුළු පුද්ගලයකු විය. නෙඩ් ගේ සිතේ මොහු ගැන එතරම් කැමැත්තක් නොතිබුනු නමුදු සෙර් මාර්ක් කැට්ලින් ගේ සොයුරා, එඩ්මුයර් ටලී ගේ අඹ යහළුවකු විය.

"ඒ හැම මිනිහෙක්ම අශ්වයො පිටේ නැගලා සන්නාහ ඇඳලයි හිටියෙ මගේ උතුමානනි." සෙර් කේරිල් සන්සුන් ස්වරයෙන් කීය. "උන් දිග කඩුයි, වානේ තල තියෙන ලන්සයි අරන් හිටියෙ. ඒ වගේම මිනිස්සු මරලා දාන්ට යුද්ධ පොරෝ අරන් ඇවිත් හිටියෙ." ඔහු ගැමියන් පිරිස අතර සිටි එක් පුද්ගලයකුට සංඥා කලේය. "ඒයි උඹ. ඔවු උඹ තමා.

කවුරුවත් මෙතැන උඹට හිරිහැර කරන්ට යන්නෙ නෑ. උඹ මට කියාපු දේ රජතුමාගෙ හස්තයටත් කියපං."

මහලු මිනිසා හිස නැමීය. "උංගෙ අස්සයො. උං නැගලා ආවෙ යුද්ධ අස්සයො පිටේ. මම නාකි සෙර් විලම්ගෙ ඉස්තාලවල අවුරුදු ගානක් වැඩකරලා තියෙනවා. ඒක නිසා මට පුළුවන් දැක්ක ගමන් වෙනස අඳුරගන්ට. මේ ආපු එක අස්සයෙක්වත් කවදාවත් නගුලක් ඇදපු එකෙක් නෙවෙයි. මං වැරැදිනං දෙයියොම බලාගන්ට ඕන."

"යුධ අශ්වයො පිටේ නැගපු මංකොල්ලකාරයො." සුළැඟිල්ලා නිරීක්ෂණය කලේය. "සමහරවිට උන් මංකොල්ලකාපු අන්තිම තැනින් මේ අශ්වයො පැහැරගන්ට ඇති."

"මේ මංකොල්ල කණ්ඩායමේ කොච්චර විතර මිනිස්සු හිටියද?" නෙඩ් විමසීය.

"අඩුම ගානෙ මිනිස්සු සීයක්වත්." ජොස් පිළිතුරු දුනි. ඒ සමගින්ම වෙළුම්පටියකින් නළල වැසූ කම්මල්කරුවාද පිළිතුරු දුනි. "පනහක් විතර." ඊට පිටුපසින් සිටි මැහැලියද කට ඇරියාය. "උං සියගානක් මයෙ උතුමානනි. උං හමුදාවක්."

"ඔබ හිතනවාටත් වඩා ඔබ හරි, මගෙ හොඳ අම්මෙ." එඩාර්ඩ් ඇයට කීය. "උඹලා කියනවා උන් කිසිම ධජයක් අරන් ආවෙ නෑ කියලා. උං ඇඳලා හිටිය සන්නාහ කොහොමද? උඹලා කවුරුහරි දැක්කද මොකක්හරි සලකුණක්? උංගෙ පලිහවල හරි උංගෙ ශිරස්කවල හරි?"

ජොස් හිස සැලීය. "සමාවෙන්ට මයෙ උතුමානනි. එහෙම එකක් තිබුනෙ නෑ. උංගෙ සන්නාහවල කිසිම සලකුණක් තිබ්බෙ නෑ. ඒ වුනත්... උංගෙ නායකයා. ඌත් ඇඳලා හිටියෙ අනිත් එවුන්ගෙ වගේ සන්නාහමම තමා. ඒ වුනත් ඌව හොඳටම වෙන්කරලා අඳුරගන්ට පුළුවන් වුනා. ඌ මහ විසාල දැවැන්තයෙක් මයෙ උතුමානනි. දැන් කාලෙ වෙනකොට යෝධයො ඔක්කොම මැරිලා කියන එවුන් මේකාව දකින්ට තිබ්බෙ. මම දිවුරනවා. ඌ කුළු හරකෙක් වගේ විසාලයි. උගෙ කටහඬ නිකං ගල් පෙරලෙනවා වගේ ගොරෝසුයි."

"කන්ද!" සෙර් මාර්ක් මහ හඬින් කීවේය. "කාටවත් ඒ ගැන සැකයක් තියෙනවද? මේක ග්‍රෙගර් ක්ලිගේන්ගෙ වැඩක්."

ශාලාවේ සෑම දෙසින්ම නැග ආ කටුකුටු හඬ නෙඬට ඇසෙන්නට විය. පිටත සක්මනේ පවා නොසන්සුන් කෙඳිරීම් ඇසෙන්නට විය. සෙර් මාර්ක් පයිපර් කී දේ සැබෑවක් නම් සිදුවිය හැකි දේ උසස් වංශාධිපතිවරුන් මෙන්ම සාමාන්‍ය ජනයාද දැන සිටි දෙයක් විය. සෙර් ග්‍රෙගර් ක්ලිගේන් වනාහි ටයිවින් ලැනිස්ටර් උතුමානන් ගේ ධජ දරන්නෙකු විය.

ගැමියන් ගේ බියෙන් මිරිකී තිබුනු මුහුණු නෙඩ් නිරීක්ෂණය කලේය. ඔවුන් මෙසේ බියෙන් ඇලලී සිටීම මහ පුදුමයක් නොවේ. ටයිවින් උතුමානන් ම්ලේච්ඡ මිනීමරුවකු බව ඔහු ගේ බෑණා වන රජතුමා ඉදිරිපිටදී ප්‍රකාශ කිරීමට තමන්ව මෙහි කැඳවාගෙන ආ බව ඔවුහු දැන සිටියහ. මේ නයිට්වරුන් ඔවුන්ට වෙනත් තෝරාගැනීමක් දුන්නාදැයි යන්න සැකසහිත විය.

ප්‍රධාන මේස්ටර් පයිසෙල් මහත් බරපතල අයුරින් රාජසභා මේසයෙන් නැගිට සිටගත්තේ ය. ඔහු ගේ ගෙලෙහි වූ මේස්ටර් දම්වැල ක්ලින්ග් හඬින් නද දෙන්නට විය. "සෙර් මාර්ක්, මෙහෙම කියනවට අමනාපවෙන්ට එපා. ඔබට හරියටම කියන්ට බෑ මේ පල්හොරා සෙර් ග්‍රෙගර් කියලා. මේ රාජධානියෙ තවත් ඕන තරම් දැවැන්ත මිනිස්සු ඉන්නවා."

"අශ්වයා පිටේ යන කන්ද තරම් දැවැන්ත මිනිස්සු?" සෙර් කේරිල් ඇසීය. "මටනං මෙච්චර කාලෙකට එහෙම කෙනෙක් මුනගැහිලා නෑ."

"මෙතන ඉන්න කිසිම මිනිහෙක් දැකලා නෑ." සෙර් රේමන් ද උණුසුම් අයුරින් වාදයට එක් විය. "ඌත් එක්ක බලද්දි උගෙ සහෝදරයා වුනත් නිකං බලු පැටියෙක් ගානයි. මගේ උතුමනි, ඔබලාගෙ ඇස් ඇරලා බලන්ට. ඔබලා බලන් ඉන්නෙ මේ මලකඳන්වල උගෙ වංශ සලකුණ පේනකම්ද? මේක ග්‍රෙගර්ගෙ වැඩක්."

"මොකටද සෙර් ග්‍රෙගර් මංකොල්ලකාරයෙක් වෙන්නෙ?" පයිසෙල් ඇසීය. "එයාගෙ වංශාධිපති උතුමානන්ගෙ අණසක යටතේ එයා බලකොටුවක් පාලනය කරනවා. එයාට

එයාගෙම වතුපිටි තියෙනවා. මේ මනුස්සයා සප්තාලේපනයෙන් අභිෂේක ලබාපු නයිට්වරයෙක්."

"ඌ බොරු නයිට්වරයෙක්." සෙර් මාර්ක් ගෙරෙවුවේ ය. "ටයිවින් උතුමානන්ගෙ පිස්සු බල්ලා."

"මගේ හස්තයේ උතුමානනි," පයිසෙල් දරදඬු ස්වරයෙන් කතාව ඇරඹීය. "මම ඔබතුමාගෙන් ඉල්ලා හිටිනවා අපේ මේ හොඳ නයිට්වරයාට මතක්කරලා දෙන්ටයි කියලා ටයිවින් ලැනිස්ටර් උතුමානන් කියන්නෙ අපේ කරුනාභරිත රාජෝත්තමියගෙ තාත්තා කියන එක."

"බොහොම ස්තූතියි මේස්ටර් පයිසෙල්!" නෙඩ් කීය. "ඔබ ඒක මේ වෙලාවෙ මතක්කරලා දුන්නෙ නැත්තම් අපට ඒ බව අමතක වෙන්ටත් තිබුනා."

ඉහළ වේදිකාවක තිබුනු සිංහාසනයේ සිටි නෙඩ්ට ශාලාවේ ඈත කොණේ සිටි සමහර මිනිසුන් හෙමින් සීරුවේ දොරින් ලිස්සා යන අයුරු නිරීක්ෂණය කල හැකි විය. 'ඔත්තු බලන හා පැටවු ආපහු දුවනවා', ඔහු සිතුවේය... එහෙමත් නැත්තම් 'රැජිණගෙ කේජු කැල්ල ලැටිගාන්ට දුවන මීයො.' පිටත සක්මනෙහි සිය දියණිය සන්සා සමග සිටින සෙප්ටා මෝර්ඩේන් ඔහු ගේ නිරීක්ෂණයට හසුවිය. මෙය නෙඩ් ගේ කෝපයට හේතුවක් විය. මෙය කුලීණ ගැහැණු ළමයෙකුට මෙහි පැමිණීමට සුදුසු අවස්ථාවක් නොවීය. එනමුදු සාමාන්‍යයෙන් සිදුවන පෙත්සම් ඉදිරිපත් කිරීම්, ඉඩම් ආරාවුල් විසඳීම් වැනි දේ හැරෙන්නට අද දිනයේ මෙවන් විශේෂ සිදුවීමක් සිදුවෙතැයි යන්න ඇය නොසිතූ, නොදැන සිටි කරුනක් විය.

පහළින් වූ රාජසභා මේසයෙහි අසුන්ගෙන සිටි පෙටයර් බේලිෂ් සිය පිහාටු පෑන වෙත යොමු කර තිබුනු අවධානය බැහැර කර ඉදිරියට නැමුනේ ය. "සෙර් මාර්ක්, සෙර් කේරිල්, සෙර් රේමන්, මටත් පොඩි ප්‍රශ්නයක් අහන්ට තියෙනවා. මේ බලකොටු හැම එකක්ම ඔබලාගෙ ආරක්ෂාව යටතෙයි තිබුනෙ. මේ මිනීමැරීම්, ගිනිතැබීම් සිද්ද වෙද්දි ඔබලා කොහෙද ගිහිල්ලා හිටියෙ?"

සෙර් කේරිල් වාන්ස් පිළිතුරු දුන්නේ ය. "මම ගෝල්ඩන් ටූත්වලට පහළින් තියෙන කපොල්ලෙ හිටපු මගේ තාත්තාව මුනගැහෙන්ට ගිහිල්ලයි හිටියෙ. සෙර් මාර්කුත් මගෙත් එක්කයි හිටියෙ. මේ සිද්දවෙච්චි විනාසෙ ගැන ඇහුවහම සෙර් එඩ්මුයර් ටලී අපට පණිවුඩයක් එවුවා සෙබළු ටිකක් අරන් හනිකට ගිහිල්ලා බේරිලා ඉන්න මිනිස්සු ඉන්නවානම් උන්ව හොයාගෙන ඉක්මන් කරලා රජතුමා ගාවට යන්ටයි කියලා."

සෙර් රේමන් ඩැරී කතාකරන්නට විය. "සෙර් එඩ්මුයර් මාව රිවර්රන්වලට කැඳෙවුවා මගේ සම්පූර්ණ ශක්තියත් එක්කම. මම ගඟට එහායින් රිවර්රන් ප්‍රාකාරවලට පිටින් කඳවුරු බැඳගෙන හිටියෙ එතුමාගෙ නියෝග ලැබෙනකම්. එතකොට තමා මට පණිවුඩේ ලැබුනෙ. මම හැකි උපරිම වේගෙන් ආපහු ගියත් ඒ වෙනකොටත් ග්‍රෙගර් උගෙ මඩපණුවො ටිකත් එක්ක රතු ගංගාවෙන් එතෙර වෙලා ලැනිස්ටර් කඳු පැත්තට යනවා."

සුළැඟිල්ලා කල්පනාකාරීව සිය උල් රැවුල පිරිමැද්දේ ය. "උන් ආයෙමත් ආවොත් ඔබ මොකක්ද කරන්ට හිතාගෙන ඉන්නෙ සෙර්?"

"උන් ආයෙමත් ආවොත් උන් ගිනි තියාපු ඉඩම් ටිකට වතුර දාන්ට උන්ගෙම ලේ ටික ගන්නවා." සෙර් මාර්ක් පයිපර් උණුසුම් ස්වරයෙන් කීය.

"වසම් මායිමේ ඉඳන් දවසක දුරින් තියෙන හැම ගමකටම, හැම බලකොටුවකටම සෙර් එඩ්මුයර් සෙබළු පිටත්කරලා ඇරියා." සෙර් කේරිල් පැහැදිලි කලේය. "ඊගාවට එන මංකොල්ල කණ්ඩායමට කලින් වතාවෙ වගේ ලේසි වෙන්නෙ නෑ."

'ඒක තමා මෝඩයො ටයිවින්ට ඕනකරලා තියෙන්නෙත්.' නෙඩ් තමාටම කියාගත්තේ ය. 'රිවර්රන්වල ශක්තිය තුනී කරලා දාන්ට. තමන්ගෙ සෙබළු හතරදිග්බාගෙටම යවලා විසුරුවලා දාන්ට මේ මෝඩ කොල්ලව පොළඹවන්ට.' ඔහු ගේ බිරිඳ ගේ සොහොයුරා තරුණ, ප්‍රඥාවට වඩා සාහසික බව ඇත්තෙකු විය. ඔහු සිය වසමේ සෑම බිම්අඟලක්ම රැකගන්නට, තමාගේ යටත්වැසියන් සියල්ලන්ම - පිරිමින්, ගැහැණුන්, ළමයින් - රැකගන්නට උත්සාහ දරනු ඇත. මේ බැව් දැනගන්නට තරම් ටයිවින් ලැනිස්ටර් කපටි ඥානය ඇත්තෙකු විය. "ඔබලාගෙ ගොවිබිමුයි, බලකොටුයි දැන් ආරක්ෂා සහිතනම්," සුළැඟිල්ලා ඇසීය. "ඔබලා දැන් මොනවද රජතුමාගෙන් ඉල්ලන්නෙ?"

"ගංගා නිම්නයේ වංශාධිපතියො රජතුමාගෙ සාමය රකිනවා." සෙර් රේමන් ඩැරී පැවසීය. "ලැනිස්ටර්ලා තමා සාමය කඩ කලේ. අපට අවසර ඕන ඒකට ප්‍රති-උත්තර දෙන්ට. ලෙයට-ලෙය, ආයුධවලට-ආයුධ. අපි ඉල්ලන්නෙ ෂෙරර්වලයි, වෙන්ඩිෂ් ටවුන්වලයි, මමර්ස් ෆෝර්ඩ්වලයි මිනිස්සු වෙනුවෙන් සාධාරණය."

"එඩ්මුයර් අපිත් එක්ක එකඟවෙනවා. අපි ග්‍රෙගර් ක්ලිගේන්ට උගේ ක්‍රමයෙන්ම ආපහු ගෙවන්ට ඕන." සෙර් මාර්ක් නිවේදනය කලේය. "ඒ වුනත් නාකි හස්ටර් උතුමානන් අපට අණකලා ආපිට පහර දෙන්ට කලින් මෙහාට ඇවිල්ලා රජතුමාගෙ අවසරය ඉල්ලා හිටින්ටයි කියලා."

'නාකි හස්ටර් උතුමානන් වෙනුවෙන් දෙවියන්ට ස්තූති වේවා!' නෙඩ් සිතුවේය. ටයිවින් ලැනිස්ටර් වනාහි සිංහයෙකු මෙන්ම කපටි නරියකුද විය. ඔහු සැබැවින්ම රිවර්රන් ගම්මාන විනාශ කිරීම සඳහා සෙර් ග්‍රෙගර් එවුවානම් - ඔහු එසේ එවූ බව ගැන නෙඩ් තුළ කිසිදු සැකයක් නොවීය - ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරෙස්සම ඔහු සපුරා තිබුනි. ඔවුන් පැමිණියේ රාත්‍රියේ අන්ධකාරයට මුවා වී, කිසිදු හඳුනාගැනීමේ සලකුණක් නොමැතිව, සාමාන්‍ය පල්හොරු කණ්ඩායමක් වශයෙනි. රිවර්රන් පෙරලා පහරදුන්නොත් සෙර්සිත් ඇගේ පියාත් දිවුරා පවසනු ඇත්තේ රජතුමා ගේ සාමය මුලින් කඩවූයේ ටලීවරුන් අතින් බවයි. ලැනිස්ටර්වරුන් අහිංසක බවයි. රොබර්ට් කාට කණ් දී කාව විශ්වාස කරනු ඇතිදැයි දන්නේ දෙවියන්ම පමණි.

ප්‍රධාන මේස්ටර් පයිසෙල් නැවතත් නැගී සිටියේය. "මගේ හස්තයේ උතුමානනි. මේ හොඳ මිනිස්සු විශ්වාස කරනවානම් සෙර් ග්‍රෙගර් එයාගෙ ශුද්ධ දිවුරුම පැත්තකට විසිකරලා දාලා මංකොල්ල කන්ටයි, බලහත්කාරකම් කරන්ටයි ගියා කියලා, එයාලට යන්ට කියන්ට සෙර් ග්‍රෙගර්ගෙ වංශාධිපති උතුමානන් ඉස්සරහට. එහෙට ගිහින් පැමිණිලි කරන්ටයි කියන්ට. මේ අපරාධ රජතුමාගෙ ඉදිරියට ගේන්ට අවශ්‍ය නෑ. එයාලා ටයිවින් උතුමානන්ගෙන් යුක්තිය ඉල්ලාගත්තාවෙ."

"මේ හැමදෙයක්ම රජතුමාගෙ යුක්තිය තමා." නෙඩ් ඔහුට කීවේය. "උතුර, දකුණ, නැගෙනහිර, බටහිර. මේ හැමතැනම අපි යමක් කරන්නෙ රජතුමාගෙ නාමෙන්."

"රජතුමාගෙ යුක්තිය." මේස්ටර් පයිසෙල් කීය. "එහෙමනම් එහෙම වෙච්චාවෙ. ඉතින්, අපි මේ ගැටළුව පැත්තකට දාමු රජතුමා ආපහු-"

"රජතුමා ගඟෙන් එහා පැත්තෙ දඩයමේ ගිහිල්ලා. එතුමා තව දවස් ගානකට ආපහු එන එකක් නෑ." එඩාර්ඩ් පැවසීය. "රොබර්ට් මාව මෙතන තියලා තියෙන්නෙ එයා වෙනුවෙන් පාලනය කරන්ට. එයාගෙ කණ් දෙකෙන් අහන්ට. එයාගෙ කටහඬින් අණදෙන්ට. ඒක නිසා මම ඒක තමා දැන් කරන්ට යන්නෙ... ඒ වුනත් මම එකඟවෙනවා අපි එයාට මේ විස්තරේ දැනුම් දෙන්ට ඕනයි කියලා." වංශවතුන් අතරේ හුරුපුරුදු මුහුණක් දුටු ඔහු කතා කලේය. "සෙර් රොබාර්."

ඉදිරියට පැමිණි සෙර් රොබාර් රොයිස් හිස නැමීය. "මගේ උතුමානනි."

"ඔබේ තාත්තා රජතුමාත් එක්ක දඩයමේ යෙදෙනවා. අද මෙතැන කතා වුන දේ ගැනයි, සිද්ද වෙච්ච දේ ගැනයි පණිවුඩයක් එයාලා ගාවට අරන් යන්ට පුළුවන්ද?"

"මම දැන්ම යන්නම් මගේ උතුමානනි."

"අපට සෙර් ග්‍රෙගර්ගෙන් පලිගන්ට යන්ට අවසර ලැබෙනවද?" මාර්ක් පයිපර් ඇසීය.

"පලිගන්ට?" නෙඩ් ඇසුවේය. "මම හිතුවෙ අපි කතා කර කර හිටියෙ යුක්තිය ඉටුකිරීම ගැන කියලයි. ක්ලිගේන්ගෙ කුඹුරු ගිනිතියලා, එයාගෙ මිනිස්සු මැරුවා කියලා රජතුමාගෙ යුක්තිය ඉෂ්ටවෙන්නෙ නෑ. ඒකෙන් වෙන්නෙ ඔබලාගෙ තුවාලවෙච්ච ආත්මාඩම්බරය ආයෙමත් ලැබෙන එක විතරයි." තරුණ නයිට්වරයා කෝපය නිසා නුසුදුසු යමක් කියා විරෝධය දැක්වීමට ප්‍රථම ඉවත බැලූ ඔහු ගැමියන් පිරිස ඇමතීය. "ෂෙරර්වල මිනිස්සුනේ. මට උඹලාගෙ ගෙවල් ආපහු දෙන්ට බෑ. උඹලාගෙ විනාශ වෙච්චි බවබෝග ආපහු දෙන්ට බෑ. උඹලාගෙ මැරිච්ච එවුන්ට ආපහු පණ දෙන්ටත් බෑ. ඒ වුනත් මට අපේ රජතුමා වෙන රොබර්ට්ගෙ නාමයෙන් යුක්තිය ඉෂ්ට කරන්ට පුළුවන් වෙයි සමහරවිට."

ශාලාව තුළ වූ සෑම දෑසක්ම ඔහු වෙත එල්ල වී බලාසිටින්නට විය. දෑතින් පුටු ඇන්දට බරදුන් නෙඩ් සෙමින් සිය දෙපා මතින් නැගිට සිටියේය. ඔහු ගේ කැඩුනු පාදය වේදනා ගෙන දෙන්නට විය. එනමුදු සිය වේදනාව මුහුණින් නොපෙන්වා සිටීමට ඔහු හැකි උපරිම උත්සාහය ගත්තේ ඔහු ගේ දුබලකම ඔවුන්ට පෙන්වීමට මෙය අවස්ථාවක් නොවූ බැවිනි. "මුල් මිනිස්සු විශ්වාස කලා මරණ දන්ඩණය නියම කරන විනිශ්චයකාරයාම කඩුව අතට අරන් මරණ දන්ඩණය දෙන්ටත් ඕන කියලා. උතුරේ ඉන්න අපි තාමත් ඒක විශ්වාස කරනවා. මා වෙනුවෙන් කෙනෙක්ව මරන්ට තවත් කෙනෙක් යවන්ට මම කොහෙත්ම කැමැති නෑ... ඒ වුනත් ජේන විදියට නම් මට වෙන විකල්පයක් නෑ." ඔහු කැඩුනු පාදය වෙත අත දිගුකලේය.

"එඩාර්ඩ් උතුමානනි." ශබ්දය නැගුනේ ශාලාවේ බටහිර පැත්තෙනි. කඩවසම් තරුණ කොලු ගැටයෙක් නිර්භීත අන්දමින් ඉදිරියට පිය මැන්නේය. සන්නාහය නැති මේ මොහොතේ සෙර් ලෝරාස් ටිරල් වෙතින් දිස්වූයේ වසර දහසයටත් වඩා අඩු ලාබාල පෙනුමකි. ඔහු ලා නිල් පැහැ සේද ඇඳුමින් සැරසී රන් රෝසවලින් නිමකල දම්වැලක් ඉණ පැළැඳ සිටියේය. "මම ඔබතුමාගෙන් ඉල්ලා හිටිනවා ඔබතුමා වෙනුවට යුක්තිය ඉෂ්ට කරන්ට මට යන්ට දෙන්ටයි කියලා. මම දිවුරලා පොරොන්දු වෙනවා මම ඔබතුමාව අසමත් කරන්නෙ නෑ කියලා."

සුළැඟිල්ලා කෙකර සිනහවක් පෑවේය. "සෙර් ලෝරාස්, අපි ඔබව තනියම යැවුවොත් සෙර් ග්‍රෙගර් ඔබේ ඔය ලස්සන කටේ රටඉඳි ගෙඩියක් ගහපු ඔළුව විතරක් ආපිට එවයි. කන්ද කියන්නෙ කිසිම මිනිහෙක්ගෙ යුක්තියට නැවෙන ජාතියෙ කෙනෙක් නෙවෙයි."

"මම ග්‍රෙගර් ක්ලිගේන්ට බය නෑ." සෙර් ලෝරාස් උදාරම් ස්වරයෙන් කීය.

නෙඩ් නැවතත් හෙමින් සීරුවේ සිහසුන මත වාඩිවිය. ඔහු ගේ දෑස් ශාලාවේ සිටි මුහුණු දෙස විපරමින් බලන්නට විය. "බෙරික් උතුමානනි." ඔහු තමන්ට අවැසි මිනිසුන් කැඳවන්නට විය. "ම'ර් වල තොරෝස්. සෙර් ග්ලැඩන්. ලෝතර් උතුමානනි." මේ නම් කියැවුනවුන් එකිනෙකා ඉදිරියට එන්නට විය. "ඔබලා එක් එක්කෙනා මිනිස්සු විස්සක් ගානෙ රැස්කරගන්ට. ඔබලා මගේ පණිවුඩයත් අරන් ග්‍රෙගර්ගෙ බලකොටුවට යන්ට ඕන. මම මගේ මිනිස්සු විස්සකුත් දෙන්නම්. බෙරික් ඩොන්ඩරියන් උතුමානනි, ඔබේ තත්ත්වයේ හැටියට ඔබ තමා මේ කණ්ඩායමේ නායකත්වය දරන්ට ඕන."

රතු-රන් හිසකෙසින් යුතු තරුණ උතුමානන් හිස නැමීය. "ඔබතුමා කියන විදියකට එඩාර්ඩ් උතුමානනි."

ශාලාවේ අන්තිම කෙලවරටද ඇසෙන සේ නෙඩ් සිය ස්වරය උස් කලේය. "අන්දාල් වරුන්ගේ ද, රොයිනාර් වරුන්ගේ ද, මුල් මිනිසුන්ගේ ද රජු වන, රාජධානි සප්තකයේ ස්වාමියා හා ආරක්ෂකයා වන, බරතියන් වංශයේ රොබර්ට් නම් වූ එම නමින් යුත් පළමු රජතුමාගේ නාමයෙන්, එතුමන් ගේ හස්තය වන ස්ටාර්ක් වංශයේ එඩාර්ඩ් වන මම නුඹලාට මෙසේ අණකරමි. නුඹළා රජතුමා ගේ ධජය යටතේ හැකි උපරිම වේගයෙන් බටහිර දෙසට ගමන්කර, ගංගා ත්‍රිශූලයේ රතු ගංගාවෙන් එතෙර වී, ව්‍යාජ නයිට්වරයකු වන ග්‍රෙගර් ක්ලිගෙන් හා ඔහුත් සමග අපරාධ කිරීමට හවුල්කාරයන් වූ සැමට රජතුමා ගේ යුක්තිය ඉෂ්ට කල යුතුය. මම ඔහුට ප්‍රසිද්ධියේ චෝදනාකර සිටින අතර ඔහුට හිමි සියළු ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කරමි. ඔහු ගේ සියළුම බලතල ද තනතුරු ද අහෝසි කරන අතර ඔහු සතු සියළුම ඉඩකඩම් ද, වස්තුව ද, ආදායම් මාර්ග ද ඔහුගෙන් ඉවත් කරමි. ඔහුට මරණ දණ්ඩනය ප්‍රකාශ කරමි. දෙවියන් ඔහු ගේ ආත්මයට සමාදානය ගෙන ඒවා!"

ඔහු ගේ කටහඬේ දෝංකාරය බිඳී යද්දී කුසුම් නයිට්වරයා වික්ෂිප්ත අයුරින් ඔහු දෙස බැලීය. "එඩාර්ඩ් උතුමානනි, මම මොකක්ද කරන්ට ඕන?"

නෙඩ් ඔහු දෙස පහළ බැලුවේය. මේ උස් ආසනයේ සිට බලන විට ඔහු රොබ් තරම්ම ලාබාල අන්දමින් දිස්විය. "ඔබේ නිර්භීතකම ගැන අපට කිසිම සැකයක් නෑ සෙර් ලෝරාස්. ඒ වුනත් අපි මෙතන කතාකරන්නෙ යුක්තිය ඉෂ්ට කිරීම ගැන. ඔබ ඔය හොයන්නෙ පලිගන්ට විදියක්." ඔහු නැවතත් බෙරික් උතුමානන් දෙස බැලුවේය. "හෙට උදේ එළිය වැටෙද්දීම පිටවෙන්ට. මේ දේවල් හැකි ඉක්මනින් කරපු තරමට හොඳයි." ඔහු අත එසවීය. "රාජසභාව අද දවසට වෙන මොකුත් පෙත්සම් බාරගන්නෙ නෑ."

පඩිපෙළ උඩට නැංග ඇලන් හා පෝර්තර් ඔහුට නැවත බිමට බැසීමට උදවු වූහ. ඔවුන් සෙමින් සෙමින් පඩිපෙළ බසිද්දී සෙර් ලෝරාස් බුම්මාගත් මුහුණින් යුතුව ඔහු දෙස බලා සිටින'යුරු ඔහුට දැනෙන්නට විය. එනමුදු නෙඩ් කාමරයේ බිමට බසින්නට පෙර කොලුවා එතැනින් පිටව ගොස් තිබින.

යකඩ සිහසුන පාමුල වාරිස් රාජසභා මේසය මත වූ ලිපිගොනු එක්රැස් කරමින් සිටියේය. සුළැඟිල්ලා හා මේස්ටර් පයිසෙල් මේ වනවිටද පිටව ගොස් තිබින. "ඔබ මට වඩා බොහොම නිර්භීත මිනිහෙක් මගේ උතුමානනි." පණ්ඩකයා මෘදු ස්වරයෙන් කීය.

"ඒ මොකද වාරිස් උතුමානනි?" ඔහු ගේ පාදය ඇදුම් කමින් තිබුනු අතර මෙවැනි වාග් සටන්වලට මුහුණ දීමට තරම් කැමැත්තක් ඔහු තුළ නොවීය.

"යකඩ සිංහාසනයේ වාඩිවෙලා හිටියෙ මම නම් ඔය ගමනට මම යවන්නෙ සෙර් ලෝරාස්වයි. එයාට බොහොම තදින් උවමනාව තිබුනා යන්ට... අනික මිනිහෙක් ලැනිස්ටර්ලාව තරහ කරගන්ට ලෑස්තිවෙනවා නම් එයා ටිරල්ලත් එක්ක යාළුකම් හදාගන්න එක ඇඟට ගුනදායක දෙයක්."

"සෙර් ලෝරාස් කියන්නෙ පොඩි කොල්ලෙක්. මිනිහා ඔය කලකිරීමෙන් ඉක්මනටම ගොඩ එයි."

"එතකොට සෙර් ඉලියන්?" පණ්ඩකයා පුයර දැමූ සිය කම්මුලකට තට්ටු කලේය. "කොහොම වුනත්, එයා තමා රජතුමාගෙ ප්‍රධාන චෝදකයා. එයාගෙ රාජකාරිය කරන්ට වෙච මිනිස්සු යවන එක... සමහරු හිතයි ඒක ලොකු අවනම්බුවක් කියලා."

"මෙතැන එහෙම කිසිම මදිපුංචිකමක් කරන්ට අදහස් කරලා නෑ." ඇත්තෙන්ම කියන්නේ නම් නෙඩ් මේ ගොළු නයිට්වරයා කෙරෙහි විශ්වාසයක් තැබූයේ නැත. සමහරවිට ඒ ඔහු පොදුවේ අළුගෝසුවන් කෙරෙහි අකැමැත්තක් දැක්වූ බැවින් වන්නට ඇත. "මම මතක්කරලා දෙන්ට කැමැතියි පේන්ලා කියන්නෙත් ලැනිස්ටර්ලාගෙ කොඩි උස්සන උදවිය කියලා. මම කල්පනා කලා ටයිවින් උතුමානන්ට කිසිම ස්වාමිභක්තියක්, පක්ෂපාතීත්වයක් නැති කෙනෙක් යවන එක හොඳයි කියලා."

"බොහොම දූරදර්ශීයි, කිසිම සැකයක් නෑ. ඒ වුනත් මට දකින්ට ලැබුනා ශාලාවෙ පිටිපස්සෙ ඉඳන් සෙර් ඉලියන් අපි දිහා බලන් ඉන්න විදිය. එයාගෙ කොහෙත්ම සතුටට පත්වෙච්ච් පෙනුමක් තිබුනෙ නෑ. ඇත්තම කියනවා නම් අපේ ගොළු නයිට්වරයාගෙ හිතේ

මොකක් තියෙනවාද කියන්ට අපි හරියටම දන්නෙ නෑ. මම ප්‍රාර්ථනා කරනවා එයත් ඔය කලකිරීමෙන් ඉක්මනට ගොඩ එයි කියලා. එයා හරි ආදරෙයි එයාගෙ රස්සාවට..."

**Eddard Stark: "Vengeance? I thought we were speaking of justice.**

සන්සා 03

"එයා සෙර් ලෝරාස්ව යවන්නෙ නෑ." එදින රාත්‍රියේ පහන් ආලෝකය යටට වී රෑ කෑම ගනිමින් ඉන්නා අතරේ සන්සා ජේන් පූල්ට පැවසුවා ය. "මම හිතන්නෙ ඒ එයාගෙ කකුල නිසා."

එඩාර්ඩ් උතුමානන් සිය නිදන කාමරයේදී ඇලන්, හාර්වින් හා වයොන් පූල් සමගින් එක්ව රාත්‍රී ආහාරය ගත්තේ ය. ඔහු ගේ කකුල සුව වීම පිනිස හොඳින් විවේකය අවශ්‍ය විය. රාජසභා ශාලාවට එපිටින් මුලු දවසම සිටගෙන සිටි නිසා තමාගේ කකුල් රිදෙන්නේයැයි පවසමින් සෙප්ටා මෝර්ඩේන් ද රෑ කෑම මඟහැර තිබිනි. ආර්යා ඔවුන් හා එක්වීමට නියමිතව තිබුනද ඇය තවමත් සිය නැටුම් පන්ති අහවර කර නොතිබුනා ය.

"එයාගෙ කකුල?" ජේන් අතීරණාත්මක ස්වරයෙන් ඇසීය. ඇය සන්සාගේම වයසේ වූ, කළු පැහැ හිසකෙසින් යුතු, රූමත් දැරියක විය. "සෙර් ලෝරාස්ගෙ කකුල තුවාල වෙලාද?"

"එයාගෙ කකුල නෙවෙයි මෝඩියෙ," කුකුළු අඬුවක් ලැටිගාමින් සන්සා කීය. "තාත්තගෙ කකුල. ඒක හැමවෙලාවෙම එයාට රිද්දනවා. ඒක නිසා එයා හැමවෙලාවෙම ඉන්නෙ තරහින්. එහෙම නෙවෙයිනං මම දන්නවා එයා අනිවාර්යයෙන්ම යවන්නෙ සෙර් ලෝරාස්ව."

ඇගේ පියා ගේ තීරණය ඇයව තවමත් වික්ෂිප්ත කරන්නට සමත්ව තිබිනි. කුසුම් නයිට්වරයා ඉදිරියට පැමිණි වේලාවේ නාකි ආයම්මා ගේ කතන්දරයක් සැබෑවන්නට යන්නේ යැයි ඇයට සහතික විය. සෙර් ග්‍රෙගර් යනු දුෂ්ට යක්ෂයා වන අතර සෙර් ලෝරාස් යනු ඒ නපුරා විනාශකර දමන වීරයා ය. කෙට්ටු, කඩවසම්, රන් රෝස ඉණපටියක් පැළැඳි, දැසට කඩාහැලෙන දුඹුරු පැහැ කෙහෙරැළි සහිත ඔහු ඇත්තෙන්ම සැබෑම වීරයෙකු මෙන් දිස්විය. එනමුදු ඊළඟ මොහොතේ තාත්තා ඔහු ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කලේය! ඇයට වදනින් පවසාගත නොහැකි තරමට ඇගේ සිත රිදවන්නට එය හේතු වී තිබිනි. ආපසු එන

අතරමගදී ඇය සෙප්ටාට ඒ බැව් කියා සිටියද සෙප්ටා කීවේ සිය පියා ගේ තීරණ විවේචනය කිරීම ඇයට අයත් කාර්යයක් නොවන බවය.

එනමුදු ඒ මොහොතේ එතැන සිටි බේලිෂ් උතුමානන් කතාවට මැදිහත් විය. "ආහ්! අනේ මම දන්නෙ නෑ සෙප්ටා. ඒ වුනත් මටත් හිතෙනවා එයාගෙ තාත්තගෙ සමහර තීරණ ගැන දෙපාරක් හිතලා බලන එක හොඳයි කියලා. මේ තරුණ ආර්යාව ලස්සන වගේම තමා බුද්ධිමත්." ඔහු සන්සා දෙසට හිස නැමීය. එනමුදු එය තමා වෙත එල්ල වූ ප්‍රශංසාවක් ද නැතහොත් සමච්චලයක් ද යන්න තෝරා බේරා ගත නොහැකි වූ ඇය විපිලිසර අන්දමින් බලා සිටියාය.

බේලිෂ් උතුමානන්ට තමන් දෙදෙනා ගේ දෙබස අසන්නට ලැබීම ගැන සෙප්ටා සිත් කරදරයට පත්වූවා ය. "මේ දැරිවි ඔහේ කටට එන දෙයක් කියවනවා මගේ උතුමානනි. මෝඩ දෙඩවීම්. ඒවා ගන්ට තරම් දෙයක් නෙවෙයි. එයා දන්නෙත් නෑ එයා මොනවා කිවුවද කියලා."

බේලිෂ් උතුමානන් සිය උල් යටිරැවුල පිරිමැද්දේ ය. "දෙඩවීම්? මට කියන්ට දරුවො. ඇයි ඔයා සෙර් ලෝරාස්ව යවන්ට හිතුවෙ?"

වීරයින් හා නපුරු යක්ෂයින් ගැන ඔහුට කියනවා ඇරෙන්නට සන්සාට වෙනත් විකල්පයක් නොතිබින. සුළැඟිල්ලා සිනාසුනේ ය. "අපොයි, මගේ හිතට ආපු හේතු නම් ඒවා නෙවෙයි. ඒ වුනත්..." ඔහු ඇගේ කම්මුලක් ස්පර්ෂ කලේය. "ජීවිතේ කියන්නෙ සින්දුවක් නෙවෙයි වස්තුවෙ. ඔයාටම දවසක ඒ ගැන තේරුම්ගන්ට ලැබෙයි."

කෙසේවුවද, මේ සැමදෙයක්ම ජේන්ට පවසන්නට සන්සාට උවමනා නොවීය. නැවත ඒ ගැන සිහිපත් කිරීම පවා ඇයව අපහසුතාවට පත්කරන්නට සමත්ව තිබින.

"සෙර් ඉලියන් තමා රජතුමාගෙ අළුගෝසුවා. සෙර් ලෝරාස් නෙවෙයි." ජේන් කීය. "එඩාර්ඩ් උතුමානන් එයාවයි යවන්ට තිබුනෙ."

සන්සා වෙවුලා ගියාය. ඇය සෙර් ඉලියන් දෙස බලන සෑම වාරයක් පාසාම ඇගේ සිරුර වෙවුලන්ට විය. ඔහු දෙස බලනවිට ඇයට දැනුනේ හරියටම සිය සමට යටින් කුමක්දෝ වස්තුවක් ලිස්සා යන්නාක් වැනි හැඟීමකි. "සෙර් ඉලියන් කියන්නෙත් තවත් යක්ෂයෙක් වගේනෙ. තාත්තා එයාව තෝරගත්තෙ නැති එක ගැන මට හරිම සතුටුයි."

"බෙරික් උතුමානනුත් සෙර් ලෝරාස් තරම්ම වීරයෙක්. එයාත් හරිම නිර්භීතයි, හරිම සූරවීරයි."

"මම හිතන්නෙ." සන්සා අතීරණාත්මක ස්වරයෙන් කීවාය. බෙරික් ඩොන්ඩරියන් කඩවසම් තරුණයකු බව ඇත්තකි. එනමුදු ඔහු වයස්ගත පුද්ගලයකු විය. ඔහුට දැනටමත් වයස විසිදෙකකි. ඇත්තෙන්ම කුසුම් නයිට්වරයා ඊට වඩා අත්‍යයෙන්ම හොඳය. ජේන් මුල්ම වරට තරගාවලිය දා බෙරික් උතුමානන්ව දුටු මොහොතේ පටන් ඔහු හා පෙමින් බැඳී සිටියා ය. සන්සා සිතුවේ ඇය මෝඩියක මෙන් හැසිරෙන බවකි. කොහොම නමුත්, ජේන් වනාහි නිකංම නිකං නිවාස බාරකරුවකු ගේ දියණියක පමණි. ඇය ඔහු ගැන කෙතරම් සිහින මැවුව ද, කෙතරම් ඔහු පසුපස ගියද ඔහු කෙදිනකවත් ඇය වැන්නියක් දෙස බලන්නේවත් නැති වනු ඇත. ඇය ඔහු ගේ වයසින් හරි අඩක් තරම් ලාබාල නොවූවද ඔහු එසේ නොබලනු ඇත.

එසේ වුවද මේ බැව් ඇයට කියා පෑම අකාරුණික දෙයක් වනු ඇත. එමනිසා සන්සා සිය කිරි වීදුරුවෙන් උගුරක් බී මාතෘකාව වෙනස් කලාය. "මම හීනයක් දැක්කා, ජොෆ්රි තමා සුදු ගෝනාව අල්ලගන්නෙ කියලා." එය ඇත්තෙන්ම ඇගේ සිත තුළ වූ බලාපොරොත්තුවක් පමණක් වූ නමුදු එයට සිහිනයකැයි කීම වඩා ලස්සන විය. සිහින යනු අනාගතය පෙන්වන කැඩපත් බව සෑමදෙනාම දනිති. සුදු ගෝනුන් වනාහි ඉතා දුර්ලභ, මායාවී සත්ත්ව විශේෂයක් වන අතර ඌව අල්ලාගැනීම සඳහා සිය නිර්භීත කුමරුවා ඔහු ගේ අර බේබදු පියාට වඩා සිය ගුණයකින් සුදුසු බව ඇය මුළු හදින්ම දැන සිටියාය.

"හීනයක්? ඇත්තටම? ජොෆ්රි කුමාරයා ඌ ළඟටම ගිහිල්ලා, ඌට කිසිම හානියක් කරන්නෙ නැතුව අතින් ඇල්ලුවද?"

"නෑ. එයා ඌට රත්තරන් ඊයකින් විදලා ඌව මගේ ළඟට අරන් ආවා." වීර කාව්‍යවලදී නම් නම් ශූරවීර නයිට්වරු කිසිවිටෙකත් මෙවැනි මායාකාරී සතුන්ට හානියක් නොකරති.

ඒ වෙනුවට ඔවුන් සතා අසලට ගොස් ඌ සමග මිතුරු වෙති. එනමුදු ජොෆ්රි දඩයමට කැමැති බව ඇය දැන සිටියාය. ඔහු විශේෂයෙන්ම සතාව මරන කොටසට වඩාත් කැමැතිය. එසේ වුවද ඒ සතුන් පමණි. ජොරී හා අනිත් අහිංසකයින් මරා දැමීමට ජොෆ්රි ගේ කිසිදු සම්බන්ධයක් නොමැති බව සන්සා නිසැකයෙන්ම දැන සිටියාය. ඒ ඔහු ගේ අර නපුරු කුරිරු මාමා, රජුන් මරන්නාය. ඇගේ පියා තවමත් ඒ සිදුවීම සම්බන්ධයෙන් කේන්තියෙන් සිටින බව ඇය දැන සිටියාය. එනමුදු ඒ සම්බන්ධයෙක් ජොෆ්රිට චෝදනා කිරීම සාධාරණ නොවේ. එය හරියටම ආර්යා කල කුමක් හෝ දෙයකට ඇයට චෝදනා කරන්නා හා සමානය.

"මම අද දවල් ඔයාගෙ නංගිව දැක්කා." සන්සා ගේ සිතුවිලි දුටුවාක් මෙන් ජේන් කියා සිටියාය. "එයා ඉස්තාලෙ ඇතුළෙ එයාගෙ අත්දෙකෙන් ඇවිද ඇවිද හිටියා. එයා මොකද එහෙම දෙයක් කරන්නෙ?"

"ආර්යා මොනවා කරත් ඒ ඇයි කියන්ට මම දන්නෙ නෑ." සන්සා ඉස්තාල පිළිකුල් කලාය. ඒවා අශ්ව බෙටි හා මැස්සන් පිරුනු ගඳගහන අපිරිසුදු තැන් විය. අසුන් පිට යන විට පවා ඉස්තාල කොලුවන් විසින් තමාගේ අසුට සෑදල පළන්දා අංගනයට රැගෙන එන්නේ නම් ඇය සතුටු වූවාය. "ඔයාට රාජසභාව ගැන විස්තර අහන්ට ඕනද නැද්ද?"

"මට ඕන."

"ඊට පස්සෙ ආව මේ කළු සහෝදරයා. ප්‍රාකාරය වෙනුවෙන් මොනාද ඉල්ලගෙන. නාකි, ගඳගහන මනුස්සයෙක්." ඇය එයට කිසිසේත්ම කැමැති නොවූවාය. ඇය සෑමවිටම සිතුවේ නිශාරකුම වනාහි සිය බාප්පා වන බෙන්ජින් ස්ටාර්ක් වැන්නන්ගෙන් සැදුනු තැනක් සැටියටය. වීර කාව්‍යවල ඔවුන් ගැන කියැවෙන්නේ ප්‍රාකාරයේ වසන කළු නයිට්වරුන් ලෙසිනි. එනමුදු මේ මිනිසා කුදුගැසුනු අසික්කිතයෙක් විය. ඔහු ගේ හිසේ උකුණන් ඉන්නා බවක් ද පෙනුනි. නිශාරකුමේ සැබෑ තත්ත්වය මෙය නම් ඇයට සිය අවජාතක අර්ධ සොහොයුරා ජොන් ගැන දුකක් ඇතිවිය. "තාත්තා ඇහුවා රාජසභාවෙන් එතන කවුරුවත් ඉන්නවද නිශාරකුමට බැඳිලා තමන්ගෙ වංශයට ගෞරව කරන්ට සූදාණම් කෙනෙක් කියලා. ඒ වුනත් කවුරුවත් ඉස්සරහට ආවෙ නෑ. ඉතින් තාත්තා මේ මනුස්සයාට කිව්වා හිරකාරයො අතරින් එයාට කැමැති එකෙක් තෝරගන්ටයි කියලා. ඔන්න ඊටපස්සෙ ආවා මේ සහෝදරයො දෙන්නා, ඩෝර්නිෂ් වගුරුබිම්වලින් ආපු කුලී

හේවායො දෙන්නෙක්. එයාලට ඕන වුනා රජතුමාගෙ සේවයට බැඳෙන්ට. ඉතින් තාත්තා එයාලගෙන් දිවුරුම් ගත්තා..."

ජේන් ඇනුමක් ඇරියාය. "ලෙමන් කේක් එහෙම නැතුව ඇති නේද?"

සිය කතාවට මෙසේ බාධා කරනු ලැබීම ගැන සන්සා කැමැති වූයේ නැත. එනමුදු අද දින රාජසභාවේ සිදුවූ සිදුවීම් වලට වඩා ලෙමන් කේක් අතිශයින්ම රසවත්ය. "යමු. අපි බලමු." ඇය නැගිට්ටා ය.

කුස්සියේ කොහෙන්වත් ලෙමන් කේක් සොයාගත නුහුනු නමුදු ඔවුන්ට අඩක් කා හමාර වූ ස්ට්‍රෝබෙරි පයි එකක් සොයාගන්නට හැකිවිය. ඔවුන් දෙදෙන කුළුණු පඩිපෙළේ වාඩි වී කැකිරි පලමින්, ඕපාදූප දොඩමින්, සිය රහස් හුවමාරු කරගනිමින් පයි එක කා හමාර කලෝය. එදා රැයේ සන්සා ආර්යා තරම්ම නපුරු සතුටකින් යුතුව නින්දට වන්නීය.

පසුදා අළුයමින්ම පිබිදුනු ඇය බෙරික් උතුමානන් විසින් සිය මිනිසුන් අංගනයේ රැස්කරනු බැලීමට නිදිමත බෙරෙන දෑසින් යුතුව සිය කවුළුව වෙතට දිවගියා ය. නගරයට ඉහළින් අරුණාලෝකය පැතිරෙද්දී ඔවුහු බලකොටුවෙන් පිටව ගියහ. ඔවුන්ට ඉදිරියෙන් ධජ ත්‍රිත්වයක් - රජතුමා ගේ සලකුණ වන කිරුළ ලූ ගෝනා සහ ඊට වඩා පහළින් එල්ලුනු ස්ටාර්ක් සෝරවෘකයා හා ඩොන්ඩරියන් ගේ දෙබල අකුණ - ඔසවාගෙන ගිය අතර එය ඇත්තෙන්ම සිත්ගන්නාසුළු දසුනක් විය. අසිපත්වල ලෝහමය නාදය, ගිනි පන්දම් සුළඟේ ලෙලදෙන අයුරු, සුළඟේ ලෙලදෙන ධජ, අශ්වයින් ගේ සුසුම් හෙලීම් හා හේෂාරවය, කවුපැලැල්ල ඉහළට එසැවෙද්දී ඒ අතරින් පෙරී ආ රන්වන් උදා හිරු රැස්, මේ සියල්ල හරියටම වීර කාව්‍යයක මෙන් අති සුන්දර විය. රිදීවන් සන්නාහයෙන් හා දිගු අළු පැහැ සළුවෙන් සැරසී සිටි වින්ටර්ෆෙල්හි සෙබළු අන් සැමටම වඩා මනෝඥ වූහ.

ඇලන් විසින් ස්ටාර්ක් ධජය ඔසවාගෙන යනු ලැබිනි. ඔහු යම්කිසිවක් කීම සඳහා බෙරික් උතුමානන් හා එක පෙළට අසු නවතනු දුටු සන්සා ගේ සිත ආඩම්බරයෙන් පිරී ගියේය. ඇලන් ජොරීට වඩා බෙහෙවින් කඩවසම් පුද්ලයකු විය. ඔහු යම් දිනෙක නයිට්වරයකු වීමේ බලාපොරොත්තුවෙන් පෙළෙමින් සිටියි.

සෙබළුන් ගේ පිටත්වීම නිසා හස්තයේ කුළුණ කෙතරම් ජනශූන්‍ය තැනක් ලෙස පෙනී ගියේද යත් උදෑසන ආහාරය පිණිස පහළට යද්දී සිය සොයුරිය ආර්යාව දැකීමෙන් පවා ඇය පිනාගියා ය. "කොහෙද මේ මිනිස්සු හැමෝම ගිහිල්ලා තියෙන්නෙ?" දොඩම් ගෙඩියක් ලෙලි ගසමින් ඇගේ සොයුරිය ඇසුවා ය. "තාත්තා එයාලව ජේමි ලැනිස්ටර්ව දඩයම් කරන්ට යැවුවද?"

සන්සා සුසුමක් හෙලුවා ය. "එයාලා බෙරික් උතුමානනුත් එක්ක පිටවෙලා ගියා, සෙර් ග්‍රෙගර් ක්ලිගේන්ගෙ බෙල්ල කපලා මරලා දාන්ට." ඇය කෑම කමින් සිටි සෙප්ටා මෝර්ඩේන් දෙසට හැරුනා ය. "සෙප්ටා, බෙරික් උතුමානන් සෙර් ග්‍රෙගර්ගෙ ඔළුව එයාගෙම බලකොටුවෙ ගේට්ටුවෙ ගහයි ද නැත්තම් රජතුමාට පෙන්නන්ට මෙහාට අරන් එයිද?" මේ කරුන සම්බන්ධයෙන් ඇය හා ජේන් පූල් අතර පෙරදා රැයේ විවාදයක් ඇතිව තිබින.

සෙප්ටා භීතියෙන් ඇලලී ගියාය. "කුලීන ආර්යාවක් කෑම ගන්න අතරේ ඔය වගේ දේවල් ගැන කතාකරන්නෙ නෑ. කෝ ඔයාගෙ ආචාරශීලීත්වය සන්සා? ඇත්තමයි, මේ පහුගිය දවස් ටිකේ ඉඳන් ඔයත් ඔයාගෙ සහෝදරී තරමම නරක්වෙලා."

"ග්‍රෙගර් මොකක්ද කරලා තියෙන්නෙ?" ආර්යා ඇසුවා ය.

"එයා ගමක් ගිනිතියලා මිනිස්සු ගොඩක් මරලා දාලා. ගෑණුයි ළමයිනුයි එක්කම."

ආර්යා මුහුණ බෙරි කරගත්තා ය. "ජේමි ලැනිස්ටර් ජොරීවයි, හේවර්ඩ්වයි, විල්වයි මැරුවා. දඩබල්ලා මයිකාව මැරුවා. කවුරුහරි මෙයාලගෙත් බෙල්ල කපලා මරලා දාන්ට ඕන."

"ඒක වෙනස්." සන්සා කීවාය. "දඩබල්ලා කියන්නෙ ජොෆ්රිගෙ ආරක්ෂකයා. ඔයාගෙ අර මස්කාර කොල්ලා තමා කුමාරයට ඉස්සෙල්ලාම පහරදුන්නෙ."

"බොරුකාරි." ආර්යා කෑගැසුවා ය. ඇගේ අතැඟිලි කෙතරම් තදින් දොඩම් ගෙඩිය මිරිකාගත්තේ ද යත් අතැඟිලි අතරින් ඉස්ම බේරී ආවේය.

"හා කමක් නෑ. ඕනතරම් නම් කියලා මට බනින්ට." සන්සා අධිපතිවාදී බවක් මවාගෙන කීවාය. "මම ජොෆ්රිව කසාද බැන්දදාටත් ඔයා එහෙම කරන්ට තරම් නිර්භීත වෙන්නෙ නෑ. ඔයාට එතකොට සිද්දවෙනවා මට ඔළුව නවලා 'මගේ උත්තමාවනි' කියලා කියන්ට." ආර්යා මේසය හරහා දොඩම් ගෙඩිය වැරෙන් දමා ගැසුයෙන් ඇය යටිගිරියෙන් කෑගැසුවා ය. හරියටම ඇගේ නළල මැදට වැදුනු දොඩම උකුළ මතට වැටින.

"ඔන්න ඔබතුමීගෙ මූනෙ ඉස්ම ගෑවිලා මගේ උත්තමාවනි." ආර්යා කීවාය.

දොඩම් ඉස්ම ඇගේ නාසය දිගේ රූරා වැටෙන්නට වූ අතර දෑස් තුළට ගොස් දෑස් දවන්නට විය. ඇය අත්පිස්නාවක් ගෙන මුහුණ පිස දැමුවාය. එනමුදු උකුළ මතට වැටුනු දොඩම විසින් ඇගේ ඇත්දළ පැහැ සේද ගවොමට කර ඇති හානිය දුටු සැනින් ඇයට නැවත වරක් කෑගැස්සින. "උඹ නම් මහ නරකාදියක්. ලේඩි වෙනුවට එයාලා උඹවයි මරන්ට තිබුනෙ." ඇය ආර්යාට මොරගැසුවා ය.

සෙප්ටා මෝර්ඩේන් සැනෙන් නැගිට සිටියා ය. "ඔයාලගෙ තාත්තාට මේක අහන්ට ලැබෙයි! යනවලා තම තමන්ගෙ කාමරවලට. දැන්මම. දැන්මම!"

"මාත්?" සන්සා ගේ දෑසට කඳුළු පුරා ආයේය. "ඒක හරිම අසාධාරණයි."

"ඒ ගැන ආය වචනයක්වත් කතා කරන්ට එපා. යනවලා!"

සන්සා කේන්තියෙන් හිස උස්සාගෙන කාමරයෙන් පිටවූවාය. ඇය රැජිණක් වන්නට යන අතර රැජිණක් කෙදිනකවත් කඳුළු නොසලන්නීය. අඩුම තරමේ මිනිසුන්ට පෙනෙන්නටවත් කඳුළු නොසලන්නීය. සිය නිදන කාමරයට ගිය ඇය දොර අගුළු දමා ගවොම ඉවත්කලා ය. දොඩම් ගෙඩිය විසින් ඇගේ සේද ගවොමේ රතු පැහැ පැල්ලමක් ඉතුරුකර තිබින. "මට එයාව පේන්ට බෑ!" ඇය නැවතත් කෑගැසුවා ය. ගවොම ගුලි කල

ඇය පෙරදා රැයේ ඇවිලුනු ගින්නෙන් ඉතුරු වූ අළු පිරුනු ගිනිඋඳුන තුළට එය විසිකර දැමුවාය. කහට පැල්ලම එතෙකින් නොනැවතී සිය යට ඇඳුම්වලටද උරාගෙන තිබෙනු දුටු විට මෙතෙක් වේලා ඇය අසීරුවෙන් නවතාගෙන සිටි කඳුළු දෙනෙතින් ඉවතට පැන්නේය. වියරුවෙන් මෙන් තමා හැඳ සිටි ඇඳුම් සියල්ල ගලවා විසිකල ඇය ඇඳට පැන කඳුළු සයුරේ කිමිදෙමින් නැවතත් නින්දට වන්නීය.

සෙප්ටා මෝර්ඩේන් ඇගේ දොරට තට්ටුකරන විට මධ්‍යාහ්නය වී තිබින. "සන්සා, ඔයාගෙ තාත්තාට ඔයත් එක්ක කතාකරන්ට ඕනලු."

සන්සා සැනෙන් නැගිට සිටියාය. "ලේඩි!" ඇය මිමිනුවා ය. එක් මොහොතකට ඇගේ වෘක පැටවා නැවතත් කාමරය තුළ, අර රන්පැහැ දෑසින් ඇය දෙස දුක්මුසු බැල්මක් හෙලාගෙන සිටින්නාක් බඳු විය. තමා සිහිනයක් දකිමින් සිටියා යැයි ඇයට ප්‍රත්‍යක්ෂ විය. ලේඩි ඇයත් සමගින් සිටි අතර ඔවුන් දෙදෙන තරගයට දුවමින් සිටියහ. එමෙන්ම... එමෙන්ම.. එය සිහියට නගාගැනීමට තැත්කිරීම ඇඟිලි තුඩින් වැස්ස අල්ලාගැනීමට තැත් කරන්නනාක් මෙන් විය. සිහිනය බොඳ වී ගිය අතර ලේඩි නැවතත් මියගොස් සිටියාය.

"සන්සා." දොරට තට්ටුකිරීම පෙරට වඩා තදින් ඇසුනි. "ඔයාට මාව ඇහෙනවද?"

"ඔවු සෙප්ටා. කරුනාකරලා, මට පොඩි වෙලාවක් දෙන්ට ඇඳුම් ඇඳගන්ට." හැඬීම නිසා ඇගේ දෑස් රත් පැහැ වී තිබුනු නමුදු ඇය හැකි උපරිමයෙන් අලංකාරව පෙනී සිටීමට යත්න දැරුවා ය.

සෙප්ටා මෝර්ඩේන් ඇයව විසිත්ත කාමරයට කැටුව යද්දී එඩාර්ඩ් උතුමානන් සම් බැම්මෙන් බැඳනු දැවැන්ත පොතකට හිස ඔබාගෙන සිටියේය. ඔහු ගේ පාදය තවමත් වෙළුම්පටිවලින් ඔතා තිබුනි. ඇගේ සොයුරිය කැඳවාගෙන එනු පිණිස සෙප්ටා පිටව ගිය පසු පියා ඇය ඇමතීය. "මෙහාට එන්ට සන්සා." ඒ ස්වරය කාරුනික විය. "ඇවිත් මගේ පැත්තකින් වාඩිවෙන්ට." ඔහු පොත වසා දැමීය.

සිය ග්‍රහණයෙන් බේරීම සඳහා තරයේ දඟලන ආර්යාව අතින් ඇදගත් සෙප්ටා නැවත කාමරයට ඇතුළුවූවාය. අලංකාර ලා කොළ පැහැ ගවොමක් හැඳ පසුතැවිලි සහගත

පෙනුමක් මුහුණේ රඳවාගන්නට සන්සා උත්සුක වී තිබුනද ආර්යා තවමත් උදැසන හැඳ සිටි හම් සහ කඩමාලුවලින් සැරසී සිටියා ය. "මෙන්න ඉන්නවා අනිත් එක්කෙනා." සෙප්ටා නිවේදනය කලාය.

"බොහොම ස්තූතියි සෙප්ටා මෝර්ඩේන්! මම කැමැතියි මගේ දුවලා දෙන්නත් එක්ක තනියෙන් කතාකරන්ට. ඔබේ අමනාපයක් නැත්තම්." හිස නැමූ සෙප්ටා කාමරයෙන් පිටව ගියාය.

"ආර්යා තමා ඒක පටන්ගත්තේ." සන්සා සැනෙන් කීවේ තරගයේ මුල් වාසිය තමන් සතුකරගැනීමේ අටියෙනි. "එයා මට බොරුකාරියෙක් කියලා බැනලා දොඩම් ගෙඩියකින් ගහලා මගේ ගවුම සවුත්තු කලා. අර ඇත්දළ පාට සේද ගවුම. රැජිණ ඒක මට දුන්නෙ මාව ජොෆ්රි කුමාරයට පොරොන්දු වුන දවසෙ. ආර්යා ඉරිසියයි මම ජොෆ්රිව කසාද බඳින්ට යන එකට. එයාට ඕන හැම දෙයක්ම විනාස කරලා, නැතිබංගස්තාන කරලා දාන්ට තාත්තෙ. එයාට කිසිම ලස්සන, හොඳ දෙයක් පේන්ට බෑ."

"ඔය ඇති සන්සා." එඩාර්ඩ් උතුමානන් ගේ ස්වරයේ නොඉවසිල්ල තැවරී තිබින.

ආර්යා මුව ඇරියාය. "මට සමාවෙන්ට තාත්තෙ. මම තමා වැරදිකාරයා. මගේ හොඳ අක්කාගෙන් සමාව ඉල්ලන්ට මම ලෑස්තියි."

සන්සා කෙතරම් අන්දුන් කුන්දුන් වූවා ද යත් ඇයට කීමට වදනක් සොයාගත නොහැකි විය. අන්තිමේදී ඇය තම කටහඬ සොයාගත්තා ය. "එතකොට මගෙ ගවුම?"

"සමහරවිට... මට ඒක හෝදලා දෙන්ට පුළුවන් වෙයි." ආර්යා අතීරණාත්මක ස්වරයෙන් කීවාය.

"ඒක හේදුවා කියලා වැඩක් වෙන්නෙ නෑ. ඔයා මුලු රෑ තිස්සෙමයි දවල් කාලෙ තිස්සෙමයි ඒක අතුල්ලලා හේදුවත් වැඩක් වෙන්නෙ නෑ. සේද රෙද්ද නාස්තිවෙලා ඉවරයි."

"එහෙමනං මම... ඔයාට අලුත් එකක් මහලා දෙන්නම්."

සන්සා අවඥාවෙන් යුතුව හිස පසුපසට ගැස්සුවා ය. "ඔයා? ඔයාට පුළුවන්ද අඩුමගානෙ ඌරු කොටු කාරයෙකුටවත් ගැලපෙන ජාතියෙ ඇඳුමක් මහන්ට?"

පියා සුසුමක් හෙළීය. "මම ඔයාලා දෙන්නට මෙතනට එන්ටයි කිවුවෙ ඇඳුම් ගැන කතාකරන්ට නෙවෙයි. මම ඔය දෙන්නම ආයෙමත් වින්ටර්ෆෙල්වලට යවනවා."

දෙවන වතාවටත් සන්සා කීමට යමක් සොයාගත නොහැකි වන තරමට තෝන්තු වී ගියාය. තම දෑස් තෙත් වී එන්නාක් මෙන් ඇයට දැනුනි.

"ඔයාට එහෙම කරන්ට බෑ." ආර්යා කීවාය.

"අනේ තාත්තේ!" සන්සා අන්තිමේදී ගොත ගැසුවා ය. "අනේ එපා තාත්තේ!"

එඩාර්ඩ් ස්ටාර්ක් සිය දියණියන් දෙදෙනා දෙසට විඩාබර සිනහවක් හෙළීය. "ඔන්න අන්තිමේදී අපට පුළුවන් වුනා ඔය දෙන්නම එකඟවෙන කාරනයක් හොයාගන්ට."

"මම කිසිම වැරැදි වැඩක් කලේ නැහැ." සන්සා ආයාචනාත්මක ස්වරයෙන් කියා සිටියාය. "මට ඕන නැහැ ආපහු යන්ට." ඇය සැබැවින්ම කින්ග්ස් ලෑන්ඩින්ග්වලට ආදරය කලාය. රාජසභාවේ උත්කර්ෂය, විල්ලුදයෙන් හා සේදයෙන් හා මිණිබරණින් සැරසුනු උසස් වංශාධිපතියන් හා කුලීන ආර්යාවන්, මිනිසුන්ගෙන් පිරුනු විසල් නගරය, මේ සියල්ල විසින් ඇගේ සිත ආහ්ලාදයකින් පුරවාලන්නට සමත් වී තිබින. නයිට්වරුන් ගේ තරගාවලිය ඇය සිය ජීවිතකාලය තුළ දුටු විස්මයජනකම දර්ශනය විය. එනමුදු ඇය තවමත් නොදුටු බොහෝ දේ එහි විය. අස්වනු නෙලීමේ උත්සව, බාල් නැටුම්, නාට්‍යකරුවන් ගේ සන්දර්ශන ආදි බොහෝ දේ එහි විය. මේ සියල්ල අහිමිව යාම ඇයට දරාගත නොහැකි දෙයක් වනු ඇත. "ආර්යාව යවන්ට. එයා තමා මේ ඔක්කොම පටන්ගන්නෙ තාත්තෙ. මම දිවුරනවා. මම හොඳ ළමයෙක් වගේ ඉන්නම්. ඔන්න

බලන්ටකො. මට ඉන්ට ඉඩදෙන්ට, මම රැජිණ තරම්ම උදාර විදියට, ආචාරශීලී විදියට හැසිරෙන්නම්. මම පොරොන්දු වෙනවා."

පියා ගේ මුව විකෘති වී ගියේය. "සන්සා මම ඔයාලව යවන්නෙ ඔයාලා රණ්ඩුකරගන්න නිසා නෙවෙයි. ඇත්තම කියනවානම් දෙයියො දන්නවා ඔයාලා දෙන්නගෙ රණ්ඩු දබර නිසා මට කොච්චර හිතේ වේදනයිද කියලා. මට ඔයාලව ආපහු වින්ටර්ෆෙල්වලට යවන්ට ඕන ඔයාලගෙම ආරක්ෂාවට. මගේ මිනිස්සු තුන්දෙනෙක් මෙතැන ඉදන් ලීග් එකක්වත් නැති දුරින් බල්ලො වගේ කපලා මරලා දැම්මා. ඒත් රොබර්ට් මොකක්ද කලේ? එයා දඩයමේ ගියා."

ආර්යා සිය දෙතොල් විකමින් බලාසිටියා ය. "අපට සිරියෝත් එක්කරන් යන්ට පුළුවන්ද?"

"ඔයාගෙ ඔය මෝඩ නැටුම් ගුරුවරයා ගැන කවුද වදවෙන්නෙ?" සන්සා කඩාපැන්නා ය. "තාත්තෙ, මට දැනුයි මතක් වුනේ. මට මෙහෙන් පිටවෙලා යන්ට බෑ. මම ජොෆ්රි කුමාරයාව කසාද බඳින්ටනෙ යන්නෙ." සිය කුමරුවා වෙනුවෙන් නිර්භීත සිනහවක් මවා ගැනීමට ඇය උත්සාහ දැරුවා ය. "මම එයාට ආදරෙයි තාත්තෙ. මම ඇත්තටම, ඇත්තටම එයාට ආදරෙයි. මම එයාට ආදරෙයි හරියට නේරිස් රැජිණ ඒමන් කුමාරයාට ආදරේ කලා වගේ. හරියට ජොන්ක්විල් සෙර් ෆ්ලෝරියන්ට ආදරේ කලා වගේ. මට ඕන එයාගෙ රැජිණ වෙලා එයාගෙ ළමයි හදන්ට."

"මගේ වස්තුවේ." පියා මෘදු ස්වරයෙන් කතාව ඇරඹීය. "මම කියන දේ අහන්ට. ඔයා නිසි වයස ආපුවහම මම ඔයාට ගැලපෙන, උසස් වංශාධිපතියෙක් හොයලා දෙන්නම්. හොඳ නිර්භීත, කරුනාවන්ත, ශක්තිමත් මනමාලයෙක්. ජොෆ්රිත් එක්ක කරපු මේ විවාහ ගනුදෙනුව බොහොම භයානක වැරැදීමක්. ඔයා මාව විශ්වාස කරන්ට. ඔය කොල්ලා ඒමන් කුමාරයා වගේ නෙවෙයි."

"එහෙම තමා!" සන්සා තිර ස්වරයෙන් කීවාය. "මට ඕන නෑ නිර්භීත කරුනාවන්ත වෙන කවුරුවත්. මට ඕන එයාවයි. අපි දෙන්නට පුළුවන් හැමදාමත් සතුටින් ඉන්ට. හරියට අර සින්දුවල තියෙනවා වගේ. ඔන්න ඔයා බලන්ටකො. මම එයාට දෙනවා රත්තරන් පාට හිසකෙස් තියෙන පුතෙක්. එතකොට එයා දවසක මේ රටේ රජතුමා වෙයි. ඉතිහාසයෙ හිටිය ශ්‍රේෂ්ටම රජතුමා. වෘකයෙක් වගේ නිර්භීත සිංහයෙක් වගේ උදාරම් රජෙක්."

ආර්යා මුව ඇදකලාය. "ජොෆ්රි එයාගෙ තාත්තානම් ඉතින් ඒ වැඩේ වෙන්නෙ නෑ. ජොෆ්රි කියන්නෙ බොරුකාරයෙක්, බයගුල්ලෙක්. අනික එයා සිංහයෙක් නෙවෙයි ගෝනෙක්."

සිය දෑසට කඳුළු පුරා එනු සන්සාට දැනුනාය. "එයා එහෙම කෙනෙක් නෙවෙයි! එයා කොහෙත්ම අර නාකි බේබදු රජතුමා වගේ කෙනෙක් නෙවෙයි." වියරුව නිසා සැමදෙයක්ම අමතකව ගිය ඇය ආර්යා දෙසට හැරී මුරගෑවාය.

පියා මවිතයෙන් මෙන් ඈ දෙස බැලීය. "දෙයියනේ! මේ පුංචි එවුන්ගෙ කටවල් වලින්..." ඔහු අවලාදාත්මක ස්වරයෙන් කෙඳිරීය. සෙප්ටා මෝර්ඩේන්ට පැමිණෙන්නැයි හඬගෑ ඔහු සිය දියණියන් දෙදෙනා දෙසට හැරුනි. "ඔයාලාව ගෙදර යවන්ට මම හොඳ වේගවත් වෙළෙඳ නැවක් හොයනවා. මේ දවස්වල රජමාවතෙන් යනවාට වඩා ආරක්ෂාවයි මුහුදෙන් යන එක. හොඳ නැවක් හම්බවුන ගමන්ම ඔයාලා මෙහෙන් පිටත්වෙයි. සෙප්ටා මෝර්ඩේනුයි, සෙබළු ටිකකුයි... ඔවු අපට සමහරවිට සිරියෝ ෆොරෙල්වත් එකතුකරගන්ට පුළුවන් වෙයි. හැබැයි ඉතින් ඒ එයා මගෙ සේවයට බැඳෙන්ට කැමැතිවුනොත් විතරයි. කොහොමවුනත්, මේ ගැන කාටවත්ම මොකුත් කියන්ට එපා. අපේ සැලසුම් ගැන කිසිකෙනෙක් මොකුත් නොදැන ඉන්න තරමට හොඳයි. අපි මේ ගැන හෙට තව කතාකරමු."

සෙප්ටා මෝර්ඩේන් විසින් ඔවුන් දෙදෙන පඩිපෙළ පහළට කැඳවාගෙන යන අතරතුරේ සන්සා ඉකිබිඳ වැලපෙන්නට වූවාය. ඔවුන් මේ සැමදෙයක්ම ඇගෙන් උදුරාගන්නට සැරසෙති. තරඟාවලීන් ද, රාජසභාව ද, ඇගේ කුමරුවා ද, සැම දෙයක්ම. ඔවුන් ඇයව නැවතත් ඇර අඳුරු මූසල වින්ටර්ෆෙල්වලට යවන්නට සැරසෙති. ඇයට සිය මුලු දිවියම එහි සිරවී ගතකරන්නට සිදුවනු ඇත. ඇගේ සුන්දර ජීවිතය හරිහැටි ඇරඹෙන්නටත් පෙරම නිමාවන්නට යයි.

"ඔය ඇඬිල්ල නවත්තගන්ට දරුවෝ." සෙප්ටා මෝර්ඩේන් තරවටු ස්වරයෙන් කීවාය. "මට හොඳටම විශ්වාසයි ඔයාගෙ තාත්තා හරි තීරණයක් තමා අරන් තියෙන්නෙ කියලා. ඔයාලට ගැලපෙන හොඳම දේ මොකක්ද කියලා එයානෙ දන්නෙ."

"ඒක එච්චරම නරක් වෙන එකක් නෑ සන්සා." ආර්යා කීවාය. "අපි නැවක නැගලා යන්ටයි යන්නෙ. ඒක හරිම හොඳ වීර චාරිකාවක් වෙයි. අනික අපට ආයෙමත් බ්‍රෑනුයි රොබුයි එක්ක ඉන්ට පුළුවන් වෙයි. එතකොට නාකි ආයම්මායි, හොඩෝර්රුයි අනිත් අයයි හැමෝම." ඇය සන්සා ගේ අතින් ඇල්ලුවා ය.

"හොඩෝර්!" සන්සා බෙරිහන් දුන්නා ය. "උඹ හොඩෝර්ව තමා කසාද බඳින්ට ඕන. උඹත් ඌ වගේම මෝඩයි, ගඳගහනවා, කැතයි." සිය සොයුරියගේ ග්‍රහනයෙන් අත ඇදගත් ඇය නිදන කාමරයට වැදී මහත් හඬින් දොර වසා දැමුවාය.

**Eddard Stark: “Three of my men were cut down like dogs not a league from where we sit, and what does Robert do? He goes hunting.”**

එඩාර්ඩ් 12

"වේදනාව කියන්නෙ දෙවියන්ගෙන් ලැබුන තෑග්ගක් එඩාර්ඩ් උතුමානනි." ප්‍රධාන මේස්ටර් පයිසෙල් කීවේය. "ඒකෙන් කියැවෙන්නෙ ඇටේ හයිවෙනවා කියලා. තුවාලෙ හොඳවෙනවා කියලා. ඒක නිසා ඒ ගැන ස්තූතිවන්ත වෙන්ට."

"මම ස්තූතිවන්ත වෙන්නම් මේ කකුල ඇදුම්කන එක නැවතුන දාට."

පයිසෙල් කට වැසූ ශරාවක් ඇඳ පසෙකින් වූ මේසය මත තැබීය. "පොපි යුෂ. වේදනාව උහුලන්ට බැරි තරම් වැඩිවෙච්ච වෙලාවට ගන්ට."

"මම දැනටමත් ඕනෑවටත් වඩා වැඩියෙන් නිදාගන්නවා."

"නින්ද තමා හොඳම වෙදනා."

"මම හිතාගෙන හිටියෙ ඔබ තමා හොඳම වෙදනා කියලයි."

පයිසෙල් පාණ්ඩු සිනහවක් පෑවේය. "ඔබතුමා ඔහොම මුරණ්ඩු විදියට ඉන්නවා දකින්ට ලැබීමත් සතුටක් මගේ උතුමානනි." ඔහු ඉදිරියට නැඹුරුව කටහඬ බාලකලේය. "අද උදේ කපුටෙක් ආවා. රැජිණට ලියුමක් එයාගෙ තාත්තාගෙන්. ඔබ දැනගත්තොත් හොඳයි කියලා මම හිතුවා."

"කළු පියාපත් - නපුරු පණිවුඩ." නෙඩ් සැඩපරුස ස්වරයෙන් කීය. "මොකක්ද ඒකෙ තිබුනෙ?"

"ඔබතුමා සෙර් ග්‍රෙගර් ක්ලිගේන් පස්සෙන් සෙබළු යවපු එක ගැන ටයිවින් උතුමානන්ට බොහොම තදේට කේන්ති ගිහිල්ලා. මම බයවුනා ඔය දේ වෙයි කියලා. ඔබට මතක ඇති මම ඕක රාජසභාවෙදි කිවුවා."

"එයාට ඕන නම් කේන්ති ගත්තාවෙ." නෙඩ් කීවේය. සිය කකුල ඇඳුම්කන සෑම විටෙකම ජේමි ලැනිස්ටර් ගේ සිනාසෙන මුහුණත් සිය දෑතේ මියගොස් සිටි ජොරී ගේ රුවත් ඔහු ගේ සිතේ ඇඳෙන්නට විය. "එයාට කැමැති තරමක් රැජිණට ලියුම් ලියාපුවාවෙ. බෙරික් උතුමානන් ගියේ රජතුමාගෙ ධජය යටතේ. ටයිවින් උතුමානන් උත්සාහ කරනවානම් රජතුමාගෙ යුක්තිය ඉෂ්ටකරන එකට බාධා කරන්ට, එයා ඒක රොබර්ට් එක්කම බලාගත්තාවෙ. අපේ රජතුමා දඩයම් කරන එක ළඟට වැඩියම ආසකරන දේ තමන්ට අවනත නොවෙන වංශාධිපතීන් එක්ක යුද්ධ කරන එක."

පයිසෙල් වහා පසුපසට වූ අතර ඔහු ගේ මේස්ටර් දම්වැල නද දුන්නේ ය. "ඔබ කියන විදියක්. මම ආයෙමත් හෙට ඔබව බලන්ට එන්නම්." සිය අඩුමකුඩුම ටික වහ වහා එකතුකරගත් මහල්ලා හනික කාමරයෙන් පිටවිය. රැජිණට රහස් කෙඳිරීම සඳහා ඔහු කෙලින්ම රාජකීය නිවස්නය වෙත යන බවට නෙඩ්ට කිසිඳු සැකයක් නොවීය. 'ඔබ දැනගත්තොත් හොඳයි කියලා මම හිතුවා.' ඇත්තෙන්ම... සිය පියා ගේ තර්ජන තමාට දැනුම්දෙන මෙන් සෙර්සි ඔහුට උපදෙස් දුන් බවටද ඔහුට කිසිඳු සැකයක් නොවීය. සිය ප්‍රතිචාරය නිසා ඇගේ දත්ඇඳි පූට්ටුවී යනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය. ඇත්තෙන්ම කියුවහොත්, නෙඩ් පයිසෙල්ට මවා පෙන්වූ තරම් විශ්වාසයක් රොබර්ට් ගේ ප්‍රතිචාරය පිළිබඳව ඔහු තුළ නොතිබිනි. එනමුදු සෙර්සිට එය දැනගැනීමට හැකියාවක් නොමැත.

පයිසෙල් පිටව ගිය පසු නෙඩ් මීපැණි දැමූ වයින් කෝප්පයක් ගෙන්වා ගත්තේ ය. එය වේදනාව මෙන්ම මනසද මඳක් මුවාකර දැමූවද එය එතරම්ම නරක නොවීය. ඔහුට සිතන්නට අවැසිව තිබිනි. දහස්වන වතාවටත් ඔහු තමාගෙන්ම ඇසුවේ මේ සම්බන්ධයෙන් ජොන් ඒරින් කුමක් කරන්නට ඇතිද යන්නයි. ඔහු තමා දැනගත් දේ මත ක්‍රියාකරන්නට පෙරම මැරුම් කෑවාද? නැතහොත් එසේ ක්‍රියාකරන්නට ගොස් මැරුම් කෑවාද?

සමහරවිටෙකදී වියපත් මිනිසකු ගේ දෑසට හසුනොවන දේ කුඩා දරුවකු ගේ අහිංසක ඇසට හසුවන සැටි විස්මයජනකය. යම් දිනෙක, සන්සා යමක් කමක් තේරුම්ගත හැකි තරම් වැඩුනු පසු, ඇගේ කතාව නිසා තමාට මෙතෙක් කලක් සිතාගත නුහුනු දේ පැහැදිලි වූ සැටි ඔහු ඇයට කියාදෙනු ඇත. 'එයා කොහෙත්ම අර නාකි බේබදු රජතුමා වගේ

කෙනෙක් නෙවෙයි' ඇය කීවාය. ඇය එය කීවේ කරුනු නොදැන හා තරහින් නමුදු ඒ තුළ ඇති සරල සත්‍යය ඔහුට වහා අවබෝධ විය. එය මරණය තරම්ම සීතල සත්‍යයක් විය. මේ වනාහි ජොන් ඒරින් මැරුම් කෑ කඩුව බව නෙඩ් වටහාගත්තේ ය. එමෙන්ම එය රොබර්ට්ව ද මරාදමනු ඇත. සෙමින් සෙමින් නමුදු නිසැකවම එය රොබර්ට්ව ද මරාදමනු ඇත. බිඳුනු පාදයක් කාලයත් සමග සුව වන නමුදු පාවාදීම් ඔබේ සිත ඇතුළේ පැසවමින් ඔබේ ආත්මය හලාහල විෂෙන් පුරවාලයි.

ප්‍රධාන මේස්ටර් පිටව ගොස් පැයකට පමණ පසු සුළැඟිල්ලා ඔහු හමුවීමට ආයේය. ඔහු කළු පැහැ නූලෙන් පපුව මත කවට කුරුල්ලකු ගේ රුවක් ගෙත්තම් කල දුඹුරු පැහැ කබායක් හා සුදු සහ කළු ඉරි වැටුනු සළුවක් පැළැඳ සිටියේය. "මට ගොඩක් වෙලා රැඳෙන්ට බැහැ මගේ උතුමානනි. ටන්ඩා ආර්යාව මාව දවල් කෑමට බලාපොරොත්තු වෙනවා. කිසිම සැකයක් නැහැ එයා හොඳ වහුපැටියෙක් රෝස්කරලා ඇති. එයාගෙ අර මහත දූව තරම්ම තරබාරු වස්සෙක් වුනොත් එහෙම නම් මම කාලා කාලා පැලිලා මැරෙයි. ඉතින්, කොහොමද ඔබේ කකුල?"

"හරිම දැවිල්ලයි, රිදෙනවා. ඒක කසනකොට මට නිකං පිස්සු වගේ."

සුළැඟිල්ලා ඇහිබැමක් එසවීය. "මීට පස්සෙවත් පරිස්සම් වෙන්ට, ඒක උඩට අශ්වයො වට්ටගන්නෙ නැතුව ඉන්ට. මම ඔබට අණකරනවා ඉක්මනින්ම සනීප වෙන්ටයි කියලා. රාජධානිය බොහොම අවිනීත තත්ත්වයකට පත්වේගෙනයි එන්නෙ. වාරිස්ට බටහිර පැත්තෙන් එන බොහොම අසුබ කෙඳිරීම් තමා අහන්ට ලැබිලා තියෙන්නෙ. කුලී හේවායොයි නිදහස් අසරුවොයි කාර්ස්ටලී රොක්වල පොදි ගැහෙනවලු."

"රජතුමාගෙන් මොකුත් පණිවුඩයක් තියෙනවද? එයා තව කොච්චර කාලයක් ඔහොම දඩයම් කර කර ඉන්ට බලාපොරොත්තු වෙනවද?"

"ඇතිවෙලා තියෙන තත්ත්වෙ හැටියට නම් මම හිතන්නෙ එයා කැලේටම වෙලා ඉඳියි ඔබයි රැජිණයි දෙන්නම නාකිවෙලා මැරිලා යනකම්. එහෙම නැත්තං එයා ඔය මොකෙක් හරි මරාගත්ත ගමන් ඉක්මනටම ආපහු එයි. අහන්ට ලැබෙන විදියට නම් එයාලට අර සුදු ගෝනා හම්බවෙලා... ඇත්තම කියනවා නම් ඒ සතාගෙ ඇටකටු ටික. අපේ රජතුමාට කලින් ඌව වෘකයො රංචුවකට මුනගැහිලා. උං ඉතුරුකරලා ගිහින් තියෙන්නෙ අං

තට්ටුවයි කුරයි විතරයිලු. රොබර්ට්ට හොඳටෝම කේන්ති ගිහිල්ලා. ඊටපස්සෙ එයාට අහන්ට ලැබිලා තියෙනවා වනාන්තරේ මැද්දෙ ඉන්න මහ විශාල වල් ඌරෙක් ගැන. ඊටපස්සෙ ඉතින් එයාව නවත්තන්ට ලැබෙන්නෙ නෑ නෙව. ජොෆ්රි කුමාරයා අද උදේ ආපහු ආවා රොයිස්ලයි, සෙර් බේලන් ස්වෝනුයි, කණ්ඩායමේ තව විසි දෙනෙකුයි එක්ක. අනිත් අය තාමත් රජතුමාත් එක්ක."

"දඩබල්ලා?" නෙඩ් රවුම් මුහුණින් යුතුව ඇසීය. සිය පියාට එක්වීම පිණිස ජේමි ලැනිස්ටර් නගරයෙන් පලා ගිය පසු මුලු ලැනිස්ටර් පිරිසෙන්ම නෙඩ් ගේ අවධානය වැඩිපුරම යොමුවූයේ සැන්ඩෝර් ක්ලිගේන් කෙරෙහි විය.

"ආහ්! මිනිහා ජොෆ්රිත් එක්ක ආපහු ආවා. ආව ගමන් කෙලින්ම ගිහින් තියෙන්නෙ රැජිණව මුනගැහෙන්ට. බෙරික් උතුමානන් එයාගෙ අයියාගෙ බෙල්ල කපලා මරලා දාන්ට ගියාය කියන කතාව මිනිහට අහන්ට ලැබෙන මොහොතෙදි ඒ පලාතෙවත් නොහිට කැරපොත්තෙක් වගේ දුවලා ගිහින් හැංගෙන්ට තියෙනවා නම් මම රිදී කාසි සීයක් දෙනවා."

"අන්ධ මිනිහෙක් වුනත් දන්නවා දඩබල්ලා එයාගෙ අයියාව පිළිකුල් කරනවා කියලා."

"ආහ්! ඒ වුනත් ග්‍රෙගර් ඉන්නෙ එයාට පිළිකුල් කරන්ට. ඔබට මරලා දාන්ට නෙවෙයි. අපේ ඩොන්ඩරියන් අර කන්ද අතුගාලා දැම්මට පස්සෙ ක්ලිගේන් ඉඩකඩම් ටිකයි ඔක්කොම ආදායමයි අයිතිවෙන්නෙ සැන්ඩෝර්ට. ඒ වුනත් මම නම් හිතන්නෙ නෑ මිනිහා අපට ස්තූති කරන්ටවත් හිතයි කියලා. එයා ඒ ජාතියෙ මිනිහෙක් නෙවෙයි. ඉතින් දැන් ඔබ මට සමාවෙන්ට ඕන. ටන්ඩා ආර්යාව එයාගෙ අර තර වස්සාත් එක්ක මම එනකම් බලන් ඉන්නවා."

දොර වෙතට යන අතරේදී මේසය මත තිබුනු ප්‍රධාන මේස්ටර් මැලියන් ගේ දැවැන්ත පුස්තක රත්නය සුළැඟිල්ලා ගෙ නෙත ගැටින. මොහොතකට නැවතුනු ඔහු නිකමට මෙන් කවරය පෙරලා බැලීය. "'රාජධානි සප්තකයේ උදාර වංශවත් පවුල්වල ඉතිහාසය හා පෙළැන්තිය: බොහෝ උසස් වංශාධිපතියන්, කුලීන ආර්යාවන් හා ඔවුන් ගේ දරුවන් ගේ විස්තර සමගින්.' මෙන්න තියෙනවා මම දැකලා තියෙන කියවන්ට අමාරුම පොතක්. නිදි බෙහෙතක්ද මගේ උතුමානනි?"

ඔහුට සියල්ලම කිවයුතු යැයි නෙඩ්ට එක් මොහොතකට සිතුනේය. එනමුදු සුළැඟිල්ලා ගේ මේ අනවශ්‍ය විහිළුවල ඔහුට හිරිහැරදායී යම් කිසිවක් තිබින. මේ මිනිසා ඕනෑවටත් වඩා ශූරයකු විය. ඔහු ගේ මුවේ නිතරම සමච්චල්සහගත සිනාවක් රැඳී පැවතින. "ජොන් ඒරින් අසනීප වෙද්දි කියව කියවා හිටියෙ ඔය පොත." නෙඩ් සුපරීක්ෂාකාරී ස්වරයකින් කීවේ සුළැඟිල්ලා ගේ ප්‍රතිචාරය කවරාකාර වේදැයි දැනගැනීමට ය.

සිතූ ලෙසින්ම ප්‍රතිචාරය නර්මාලාපයක් විය. "එහෙමනම් ඉතින් මරණය බොහොම සුන්දර සහනයක් වෙන්ට ඇති." හිස නැමූ පෙටයර් බේලිෂ් පිටව ගියේය.

එඩාර්ඩ් ස්ටාර්ක් තමාටම අවලාදයක් නගාගත්තේ ය. තමන්ගේ සෙබළුන් හා සේවකයින් හැරුනු විට මේ නගරයේ ඔහු විශ්වාසය තැබූ මිනිසුන් ගනණ අල්ප විය. සුළැඟිල්ලා කැට්ලින්ට සැඟව ගැනීමට උදවුකර නෙඩ් ගේ පරීක්ෂණවලට ද සහාය වූ බව සැබෑවකි. එනමුදු එදා රෑ ජේමි හා ඔහුගේ සෙබළ මුලුව තමා වට කල විට ඔහු තම ආරක්ෂාව පතා දිව ගිය අන්දම තවමත් නෙඩ් ගේ සිතේ රැවු දුන්නේ ය. වාරිස් ඊටත් වඩා අන්ත විය. පක්ෂපාතීත්වය ගැන ඔහු දොඩවන නන්දෙඩවිලි කෙතරම් වුවද මේ පණ්ඩකයා බොහෝ දේ දැන සිටි නමුදු ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වූයේ ඉතා අඩුවෙනි. ගතවන සෑම දිනක් පාසාම ප්‍රධාන මේස්ටර් පයිසෙල් රැජිණ ගේ මිනිසකු බව වඩ වඩාත් පැහැදිලි විය. සෙර් බැරිස්ටාන් කිසිදු බුරුලක් නැති, අනම්‍ය, මහලු මිනිසකු විය. සිය රාජකාරිය කරගෙන ඉන්නැයි ඔහු නෙඩ්ට පවසනු නොඅනුමානය.

කාලය අතිශයින්ම කෙටි විය. රජතුමා සිය දඩයම් සවාරිය නිම කර හැකි විගසින් නැවත පැමිණෙනු ඇති අතර නෙඩ් තමා සොයාගත් සියල්ල සමගින් ඔහු හමුවට යා යුතුය. තව තෙදිනකින් සන්සාට හා ආර්යාට මෙයින් පිටව යා හැකිවන පරිදි වින්ඩ් විච් නමැති බ්‍රාවොසි නෞකාවක් සොයාගන්නට වයොන් පූල් විසින් සමත්ව තිබින. අස්වනු නෙලීමේ උත්සවයට පෙර ඔවුන් වින්ටර්ෆෙල්වලට ගොස් සිටිනු ඇත. ඔහු ගේ පමාවට සමාවක් වශයෙන් ඔවුන් ගේ ආරක්ෂාව ගැන ඇති ප්‍රමුඛතාව නෙඩ්ට තවදුරටත් යොදාගත නොහැකි විය.

එනමුදු පෙරදා රැයේ ඔහු රේගාර් ගේ දරු දෙදෙනා සිහිනෙන් දුටුවේය. ටයිවින් උතුමානන් විසින් සිය සෙබළුන් දෙදෙනෙකු ගේ ලේ රතු පැහැ සළුවලින් එතූ මළකඳන් දෙක යකඩ සිහසුන පාමුල තබා තිබින. ඔහු ඇත්තෙන්ම කපටියකු විය. රත් පැහැ සළුව නිසා ලේ

පැල්ලම්වල භයානකත්වය දිස් වූයේ යාන්තමිනි. පුංචි කුමරිය පාවහන් කිසිත් නොමැතිව තවමත් රාත්‍රි නිදන ඇඳුම පිටින් සිටි අතර පුංචි කුමරා... පුංචි කුමරා...

නැවතත් එවැන්නක් සිදුවීමට ඉඩදීමට නෙඩ්ට කොහෙත්ම හැකියාවක් නොවීය. රාජධානියට තවත් පිස්සු රජෙක් නුවුමනාය. තවත් පලිගැනීමක් හා තවත් ලේ හැලීමක් නුවුමනාය. මේ දරුවන් රැකගන්නට ඔහු කුමක් හෝ කල යුතුය.

රොබර්ට් වනාහි සාමාන්‍යයෙන් සමාව දෙන සුළු පුද්ගලයකු විය. සෙර් බැරිස්ටාන් යනු ඔහුගෙන් සමාව ලද එකම සතුරා නොවේ. ප්‍රධාන මේස්ටර් පයිසෙල්, වාරිස්, බේලන් ග්‍රේජෝයි උතුමානන්. මේ හැම කෙනෙක්ම වරක් රොබර්ට් ගේ සතුරකුව සිටියහ. එනමුදු යටත් බව ප්‍රකාශ කිරීමෙන් පසුව මේ හැම කෙනෙකුටම රොබර්ට් ගේ මිත්‍රත්වයේ දෑත් දිගු වූ අතර ඔවුන් සතුව පැවැති තනතුරු, ගරුනම්බු එලෙසින්ම පවත්වාගෙන යාමේ අවස්ථාවද හිමිවිය. මිනිසකු අවංක සහ නිර්භීත වන තාක් රොබර්ට් ඔවුන්ට ගෞරවනීය සතුරකුට හිමි ගරු බුහුමන නොඅඩුවම ලබා දුන්නේය.

එනමුදු මෙය හාත්පසින්ම වෙනස් දෙයක් විය. මේ වනාහි අඳුරේ සිට විස කැවීමකි. ආත්මය පසාරුවන සේ පිහියෙන් ඇනීමකි. ඔහු මෙයට කිසිදා සමාවක් නොදෙනු ඇත. රේගාර්ට කලාක් මෙන් ඔහු මොවුන්ගෙනුත් පලිගනු ඇත. ඔහු මොවුන් සැවොම මරාදමනු ඇත.

එනමුදු ඔහුට නිහඬව සිටීමට හැකියාවක් නොමැත. ඔහුට රොබර්ට් වෙනුවෙන් යුතුකමක් තිබේ. රාජධානිය වෙනුවෙන් යුතුකමක් තිබේ. ජොන් ඒරින් ගේ මතකය වෙනුවෙන් යුතුකමක් තිබේ... බ්‍රැන් වෙනුවෙන් යුතුකමක් තිබේ. බ්‍රැන් නිසැකවම මේ සම්බන්ධයෙන් යමක් දැනගන්නට ඇත. එසේ නොමැතිනම් ඔවුන්ට ඔහුව මරා දැමීමට උවමනා වූයේ ඇයි?

අපරභාගයේදී ඔහු ටොමාර්ඩ්ව කැඳෙවුවේ ය. ලා දුඹුරු පැහැ පැති රැවුලකින් යුතු මේ තරබාරු සෙබළා ඔහු ගේ දරුවන් විසින් මහත ටොම් යනුවෙන් හැඳින්වූහ. ජොරී මියගිය පසු, ඇලන් බෙරික් උතුමානන් හා පිටව ගිය පසු ටොම් දැන් ගෘහාරක්ෂක බලකායේ නායකයා වශයෙන් කටයුතු කරමින් සිටියි. මේ දැනුම නෙඩ්ව මඳක් නොසන්සුන් කරවන්නට සමත් විය. ටොමාර්ඩ් වනාහි ශක්තිමත්, කාරුණික, පක්ෂපාතී, පහසුවෙන්

විඩා නොවැටෙන දක්ෂ සෙබළෙකු විය. එනමුදු දැන් ඔහු පනස්වන වියට ආසන්නව සිටියේය. තරුණ කාලයේදී පවා ඔහු එතරම් කඩිසර ක්‍රියාශීලී අයෙකු නොවීය. සමහරවිට නෙඩ් විසින් කඩිමුඩියේ තම සෙබළ මුලුවෙන් බාගයක් - ඔහු ගේ හොඳම සෙබළුන් - බෙරික් උතුමානන් හා පිටත්කර හැරීම මෝඩ ක්‍රියාවක් වන්නට ඇත.

"මට උඹේ උදවු ඕන." කාමරයට පැමිණි ටොමාර්ඩ් අමතා නෙඩ් පැවසීය. සිය ස්වාමියා ඉදිරියට කැඳවන සෑම විටෙකම මෙන් ඔහු දැනුත් යම් බිය මුසු හැඟීමකින් පෙලෙමින් සිටියේය. "මාව දෙව්වනයට එක්කරන් පලයන්."

"ඒක එච්චරම ඥානාන්විත වැඩක් නෙවෙයි නේද මයෙ උතුමානනි? ඔය කකුල තාම හොඳ නෑ නේද?"

"ඒක නම් එහෙම තමා. ඒත් මේ වැඩේ කරන්ටම ඕන."

ටොමාර්ඩ් වාර්ලිව කැඳෙවුවේ ය. දෙදෙනාගේම උරහිසට උඩින් අතක් දමාගත් නෙඩ් අසීරුවෙන් පඩිපෙළෙන් බැසගත්තේ ය. "මුරකාවල් දෙගුන කරන්ට මට ඕන." අංගනය හරහා පැන පැන යන අතරේදී නෙඩ් ටොමාර්ඩ් අමතා කීය. "මගේ අවසරයක් නැතුව කිසිම කෙනෙකුට හස්තයේ කුළුණෙන් පිටට යන්ටත් බෑ ඇතුළුවෙන්ටත් බෑ."

ටොම් ඇසිපිය සැලුවේය. "මයෙ උතුමානනි, ඇලනුයි අනිත් අයයි ගියාට පස්සෙ අපි ටිකක් අමාරුවෙන් තමා වැඩ කරන්නෙ-"

"ඒක පොඩි කාලෙකට විතරයි. මුර කාලෙ වැඩි කරපන්."

"ඔබතුමාගෙ කැමැත්තක් මයෙ උතුමානනි. මට අහන්ට පුළුවන්ද ඇයි-"

"එපා." නෙඩ් පිළිතුරු දුන්නේය.

දෙව්වනය කිසිවෙකුත් නැති පාළු ස්ථානයක් විය. දකුණුකරයේ දෙවිවරුන් ගේ වාසභවනක් වූ මේ නගරය තුළ එය මහ අරුමයක් නොවීය. සෙබළුන් දෙදෙනා විසින් නෙඩ්ව හදවෘක්ෂය අසල තණබිස්සේ වාඩි කරවද්දී ඔහු ගේ පාදය වේදනාවෙන් ගිනිගෙන දැවෙමින් තිබින. "බොහොම ස්තූතියි!" සිය වංශයේ සලකුණින් මුද්‍රා තැබූ ලිපියක් ඔහු කමිස අත තුළින් පිටතට ගත්තේය. "මේක හැකි ඉක්මනින් ගිහින් බාරදීපන්."

නෙඩ් විසින් ලිපි කවරයේ ලියා තිබුනු නම දුටු ටොමාර්ඩ් වියවුල් සිතින් සිය දිවෙන් දෙතොල් තෙමාගත්තේ ය. "මයෙ උතුමානනි..."

"මම කියපු විදියට කරපන් ටොම්."

ඔහු මෙසේ දෙව්වනයේ නිහඬතාව මැද්දේ කෙතරම් වේලාවක් ගතකලේදැයි නෙඩ්ට හරියටම නිච්චියක් නොවීය. එය ඉතා සාමකාමී තැනක් විය. ඝනකම් ප්‍රාකාර විසින් බලකොටුවේ කලිකලහය මුවා කොට තිබින. කුරුල්ලන් ගේ කිචිබිචිය ද, තණපත් අතර සැඟවුනු රැහැයියන් ගේ නාදය ද, මඳ සුළඟේ තුරු පත් නගන සිලි සිලි හඬ ද ඔහුව නිවා සනහන්නට විය. මෙහි වූ හදවෘක්ෂය කිසිදු මුහුණක් නොකෙටූ දැවැන්ත ඕක් ගසක් වුවද සිය දෙවිවරුන් ගේ ආමුඛය නෙඩ් ස්ටාර්ක් විසින් හඟින්නට විය. ඔහු ගේ පාදයේ වේදනාව පවා අඩු වූවාක් මෙන් දැනින.

සැඳෑ හිරු රැස් විසින් ප්‍රාකාර හා කුළුණුවලට ඉහළින් වූ වළාකුළු රත් පැහැ කරද්දී ඇය ඔහු සොයා පැමිණියා ය. ඔහු පවසා තිබුනු පරිදිම ඇය කිසිදු පිරිවරක් නොමැතිව තනිවම ඔහු සොයා පැමිණියා ය. අද ඇය ඉතාමත් සරල කොළ පැහැති ඇඳුමක් හැඳ සමින් කල බූට්ස් සපත්තු පැළැඳ සිටියාය. ඇය සිය දුඹුරු පැහැ කබායේ හිස්වැස්ම පහත්කල විට රජතුමා ගේ අතුල් පහරින් ඇගේ මුහුණේ ඇති වූ තැල්ම තවමත් පැහැදිලිවම දැකිය හැකි විය. එහි වූ රතු පැහැය මැකී ගොස් ඉදිමුම බැස තිබුනද එය දුටු කිසිවෙකුටත් ඒ කුමක්දැයි හඳුනාගැනීම අසීරුවක් නොවීය.

"ඇයි මෙතන?" ඔහු අභිමුව සිටගෙන සිටි සෙර්සි ලැනිස්ටර් ඇසුවා ය.

"දෙයියන්ට අපිව පේන්ට ඕන නිසා."

ඇය ඔහු පසෙකින් තණබිම මත වාඩිවුනාය. ඇගේ සෑම චලනයක්ම ඉතා මනෝඥ විය. ඇගේ කැරැළි ගැසුනු තඹවන් කෙහෙරැළි මඳ සුළඟේ නටන්නට විය. ඇගේ දෙනෙත් ගිම්හානයේ තුරු පත් මෙන් කොළ පැහැයෙන් බබළන්නට විය. ඇය මෙතරම් රූමත් බව නෙඩ් බොහෝ කලෙකින් දැක නොතිබින. එනමුදු ඔහු දැන් එය දුටුවේය. "මම දන්නවා ජොන් ඒරින් මැරුනෙ මොකක් නිසාද කියලා." ඔහු කීවේය.

"ඇත්තට?" රැජිණ බැළලියක් මෙන් පරීක්ෂාකාරී අයුරින් ඔහු ගේ මුහුණ නිරීක්ෂණය කලාය. "ඒකද උඹ මට මෙතැනට එන්ට කිවුවෙ ස්ටාර්ක් උතුමානනි? මට ප්‍රහේලිකා කියන්ටද? එහෙමත් නැත්තම් උඹේ බිරිඳ මගේ මල්ලිව පැහැරගත්තා වගේ උඹ මාවත් පැහැරගන්ටද යන්නෙ?"

"ඇත්තෙන්ම එහෙම දෙයක් හිතුවා නම් ඔබ මෙතැනට එන්නෙ නෑ." නෙඩ් මෘදු අයුරින් ඇගේ කම්මුල ස්පර්ශ කලේය. "එයා මීට කලිනුත් මෙහෙම ගහලා තියෙනවද?"

"එකපාරක් නැත්තම් දෙපාරක්." ඇය ඔහු ගේ ස්පර්ශයෙන් ඈත් වෙමින් පැවසුවා ය. "ඒ වුනාට මීට කලින් කවදාවත් මූනට ගහලා නෑ. ජේමි ඒක දැක්කානම් එයාව මරලා දාවි, ඒකෙන් එයාගෙ ජීවිතේට හානියක් වුනත් කමක් නෑ කියලා." සෙර්සි ඔහු දෙස විරෝධාත්මක බැල්මක් හෙලුවාය. "මගේ සහෝදරයා උඹේ යාළුවට වඩා සිය ගුණයක් හොඳයි."

"ඔබේ සහෝදරයා ද? නැත්තම් ඔබේ ආදරවන්තයා ද?"

"දෙකම." ඇය සත්‍යයෙන් පලායාමට තැත් නොකලාය. "අපි පුංචි එවුන් දෙන්නෙක් කාලෙ ඉඳන්ම. ඇයි බැරි? ටාර්ගේරියන්ලා අවුරුදු තුන්සීයක් තිස්සෙ සහෝදර සහෝදරියො කසාද බඳිනවා, එයාලගෙ ලේ පිරිසුදුව තියාගන්ට. අපි දෙන්නා සිරුරු දෙකක ජීවත්වෙන එක පුද්ගලයෙක්. අපි දෙන්නා එක ගර්භාෂයක් හවුලෙ බෙදාගෙන ජීවත්වුනා. එයා මේ ලෝකෙට ආවෙ මගෙ කකුලකින් අල්ලගෙන. එහෙමයි අපේ නාකි මේස්ටර් කිවුවෙ. එයා මං ඇතුළෙ ඉන්නකොට මට දැනෙන්නෙ හරියට... හරියට මම සර්වසම්පූර්ණයි කියලයි." ඇගේ මුවේ සිනාහවක් ඇඳී මැකී ගියේය.

"මගේ පුතා බ්‍රැන්..."

සෙර්සි ඉවත නොබැලුවා ය. ඇයට අඩුම තරමේ ඒ ගෞරවය දිය යුතු විය. "එයා අපි දෙන්නව දැක්කා. උඹ උඹේ දරුවන්ට ආදරෙයි. එහෙම නේද?"

තරගාවලිය දා උදෑසන රොබර්ට් ද මේ ප්‍රශ්නයම ඔහුගෙන් අසා තිබින. නෙඩ් ඇයට ද එම පිළිතුරුම දුන්නා ය. "මගේ මුලු හදවතින්ම."

"ඒ තරම්ම මමත් මගේ ළමයින්ට ආදරෙයි."

එතැනට ආවොත්, නෙඩ් සිතුවේය. රොබ්, සන්සා, ආර්යා, බ්‍රැන් හා රිකන් ගේ ජීවිතයට එදිරිව මම නොදන්නා දරුවකු ගේ ජීවිතය පරදුවට තබන්නට වුවහොත්, මම කුමක් කරාවිද? ඊටත් වඩා කැට්ලින් කුමක් කරාවිද? ඒ ඇගේ කුසින් උපන් දරුවන්ට එදිරිව ජොන් ස්නොව් වූවොත් ඇය කුමක් කරාවිද? ඔහුට එය සිතාගත නොහැකි විය. තමාට කිසිදා එවැන්නක් දැනගැනීමට ද නොලැබේවායි ඔහු පැතීය.

"ළමයි තුන්දෙනාම ජේමිගෙ." ඔහු කීවේය. එය ප්‍රශ්නයක් නොවීය.

"දෙයියන්ට ස්තුති වෙන්ට."

**'බීජය ශක්තිමත්'**, ජොන් ඒරින් මරණ මංචකයේ හිඳ කීවේය. එය එසේම විය. අර සියළුම අවජාතකයින්, රාත්‍රිය මෙන් කළු පැහැ හිසකෙසින් යුතු රොබර්ට් ගේ අවජාතකයින් ඊට සාක්ෂි විය. මීට වසර අනූවකට පමණ පෙර සිදු වූ ගෝනකු හා සිංහයකු අතර කෙරුනු අවසාන සහවාසය ප්‍රධාන මේස්ටර් මැලියන් ගේ පොතේ අපූරුවට විස්තර කර තිබින. ටියා ලැනිස්ටර් හා ගොවෙන් බරතියන්ට ලැබුනු එකම දරුවා, බිළිඳු වියේදීම මියගිය ඒ අතදරුවා, තද කළු පැහැ හිසකෙසින් යුතු පිරිමි දරුවකු විය. ඊටත් වසර තිහකට පෙරාතුව පිරිමි ලැනිස්ටර්වරයකු විසින් බරතියන් තරුණියක ආවාහයට ගෙන තිබින. ඇය ඔහුට දාව

දියණියන් තිදෙනකු හා එක් පුතකු ප්‍රසූත කර තිබුනු අතර ඔවුන් සියල්ලෝම කළු පැහැ හිසකෙසින් යුක්ත වූහ. මැලියන් ගේ පුස්තකය තුළ කෙතරම් ගැඹුරට, කෙතරම් අතීතයට හාරා බැලුවද, ඒ සැමවිටම ඔහුට සොයාගත හැකි වූයේ රන් පැහැය සැමවිටම කළු පැහැයට පරාද වූ වග විය.

"අවුරුදු දොළහක්! කොහොමද එච්චර කල් ඔබට රජතුමාගෙන් දරුවො ලැබුනෙ නැත්තෙ?"

ඇය නැවත වරක් විරෝධාත්මක අයුරින් හිස එසෙවුවා ය. "උඹේ රොබර්ට් නිසා මට එකපාරක් දරුවෙක් ලැබෙන්ට හිටියා." ඇගේ ස්වරය අවඥාවෙන් පිරී තිබින. "ජේමි හොයාගත්තා ගැනියෙක්ව, දරුගැබ ගබ්සා කරලා දාන්ට. රොබර්ට්ට කවදාවත් දැනගන්ටවත් ලැබුනෙ නෑ. ඇත්තටම කියනවා නම් එයාට මාව අල්ලන්ට දෙන එකවත් මට රිස්සුවෙ නෑ. මම දැන් අවුරුදු ගානකින් එයාට මගෙත් එක්ක එකතුවෙන්ට දුන්නෙ නෑ. එයාගෙ වේස ගැනු අමතක වෙලා එයා මගේ ඇඳට නැග්ගහම එයාව සතුටුකරන්ට පුළුවන් වෙන වෙන ක්‍රම මම දන්නවා. රජතුමා කොච්චර බීලාද ඉන්නෙ කියනවා නම් අපි මොනා මොනා කලාද කියන එක පහුවෙනිදා උදේට එයාට අමතකයි."

ඔවුන් සියල්ලන්ම මෙතරම් අන්ධව සිටියේ කෙසේද? සත්‍යය සැමදාමත් ඔවුන් ගේ දෑස් ඉදිරියේ විය. සත්‍යය සැමදාමත් අර දරුවන් ගේ මුහුණු මත සනිටුහන් වී තිබින. නෙඩ්ට අදහාගත නොහැකි විය. "රොබර්ට් සිංහාසනේට නැගපු දවස මට අද ඊයෙ වගේ මතකයි. එයා හැම අඟලක් ගානෙම රජෙක් වගේ හිටියෙ. කොච්චර තේජසක් ද. කොච්චර කඩවසම් ද. තව ගැනු දාහක් ගත්තොත් උන් හැමෝම එයාට පණ වගේ ආදරය කරයි. ඔබ එයාට මෙච්චර වෛර කරන්ට එයා මොකක්ද ඔබට කලේ?"

ඇගේ දෑස ගිනිගෙන දැවුනේය. හරියටම සැඳෑ අඳුරේ නටන කොළ පැහැ ගිනිදළු මෙන්, ඇගේ වංශ සලකුණ වන සිංහ ධේනුවක ගේ මෙන් ඒ දෑස් කොළ පැහැයෙන් දිලිසුනේ ය. "අපේ මංගල රෑ, අපි දෙන්නා එක ඇඳක නිදාගත්ත පළවෙනි රෑ, එයා මට කතාකලේ උඹේ නංගිගෙ නමින්. එයා මගේ ඇඟ උඩ, මගේ ඇතුළෙ ඉන්න ගමන් මට කෙඳිරුවා 'ලියානා' කියලා."

නෙඩ් ස්ටාර්ක් ගේ දෑස් ඉදිරියේ නිල් පැහැ රෝස මල් පෙති මැවී පෙනෙන්නට විය. මොහොතකට ඔහුට හඬන්නට උවමනා විය. "මම දන්නෙ නෑ ඔබලා දෙන්නාගෙන් කාටද මම වැඩියෙන් අනුකම්පා කරන්නෙ කියලා."

රැජිණ එයින් විස්මයට පත් වූ බැව් පෙනින. "උඹේ අනුකම්පාව උඹ ගාවම තියාගනිං ස්ටාර්ක් උතුමානනි. මට ඒකෙන් බිංදුවක්වත් ඕන නෑ."

"ඔබ දන්නවද මම දැන් මොකක්ද කරන්ට අවශ්‍ය කියලා?"

"අවශ්‍ය?" ඇය ඔහු ගේ පාදය මත, දණහිසට මඳක් ඉහළින් අතක් තැබුවා ය. "ඇත්ත මිනිහෙක් නම් කරන්නෙ එයාට කරන්ට උවමනා දේ. කරන්ට අවශ්‍ය දේ නෙවෙයි." ඇගේ අතැඟිලි සෙමින් සෙමින් ඔහු ගේ කළවෙහි පිරිමැදෙමින් ඔහුව පොළොඹවාලන්නට තැත් දැරීය. "මේ රාජධානියට දැන් හොඳ ශක්තිමත් හස්තයක් ඕන. ජොෆ් නිසි වයසට එන්ට තව අවුරුදු ගානක් යනවා. කාටවත්ම ආයෙමත් යුද්ධයක් උවමනා නෑ. මටත් උවමනා නෑ." ඇගේ අතැඟිලි ඔහු ගේ මුහුණ, ඔහු ගේ කෙහෙරැළි ස්පර්ශ කරන්නට විය. "මිතුරන්ට සතුරො වෙන්ට පුළුවන් නම් සතුරන්ටත් පුළුවන් මිතුරො වෙන්ට. උඹේ බිරිඳ ඉන්නෙ ලීග දාස් ගානක් ඈත. ජේමි නගරයෙන් පැනලා ගිහිල්ලා. මට කරුනාවන්ත වෙයන් නෙඩ්. මම දිවුරලා පොරොන්දු වෙනවා, උඹ ඒ ගැන කවදාවත් පසුතැවෙන එකක් නෑ."

"ඔබ ඔය පොරොන්දුවම ද ජොන් ඒරින්ට දුන්නෙත්?"

ඇය ඔහුට අතුල් පහරක් දුන්නාය.

"මම ඒක ගෞරවනීය සලකුණක් විදියට පළඳින්නම්." නෙඩ් වියළි ස්වරයෙන් කීය.

"ගෞරවය?" ඇය බිමට කෙල ගැසුවාය. "උඹ කොහොමද ඔය විදියට බොරුවට උදාර වංශවත් උතුමානන් කෙනෙක් විදියට රඟපාන්නෙ? උඹ හිතන්නෙ මම කවුරුයි කියලද? උඹටත් උඹේම කියලා අවජාතකයෙක් ඉන්නවා. මම ඌව දැක්කා. කවුද උගෙ අම්මා?

උඹ දූෂණය කරලා දාපු කවුරුහරි ඩෝර්නිෂ් ගැමි කෙල්ලක් ද? වේස ගෑනියෙක් ද? එහෙමත් නැත්තම් ඒ අර අවාසනාවන්ත සහෝදරී අශාරා ඩේන් ද? මම අහලා තියෙන විදියට ඒකි මුහුදට පැනලා මැරුනා. ඇයි ඒ? උඹ ඒකිගෙ අයියාව මරලා දාපු නිසා ද? එහෙමත් නැත්තම් උඹලා දෙන්නගෙ දරුවාව උඹ ඒකිගෙන් උදුරගත්තු නිසා ද? මට කියහං, මගේ උදාර එඩාර්ඩ් උතුමානනි, උඹ කොහොමද රොබර්ට්ට, මට නැත්තම් ජේමිට වඩා වෙනස් වෙන්නෙ?"

"මුලින්ම බැලුවොත්, මම දරුවො මරන්නෙ නෑ. මම මේ කියන දේ බොහොම පරිස්සමින් අහන් ඉන්ට මගේ ආර්යාවනි. මම මේක එකපාරයි කියන්නෙ. රජතුමා දඩයම් සවාරිය ඉවරකරලා ආපහු ආවට පස්සෙ මම හිතාගෙන ඉන්නවා එයා ඉස්සරහට ගිහිල්ලා මේ හැමදෙයක්ම කියන්ට. ඒ වෙද්දි ඔබ ගිහින් හිටියොත් හොඳයි. ඔබයි, ඔබේ දරුවො තුන්දෙනාමයි. හැබැයි කාර්ස්ටලී රොක්වලට නෙවෙයි. මම ඔබ නම් මම කරන්නෙ වහාම නැවක් අරන් නිදහස් නගරවලට පැනලා යන එක. සමහරවිට ඊටත් වඩා ඈතට. ගිම්හාන දූපත්වලට නැත්තම් ඉබ්න් තොටමුණට. හුළඟට ඔබව අරන් යන්ට පුළුවන් උපරිම දුරකට."

"පිටුවහල් වෙන්ට? ඒක බොන්ට බොහොම අමාරු තිත්ත කසායක් මගේ උතුමානනි."

"ඔබේ තාත්තා රේගාර් ගේ දරුවන්ට දුන්නාට වඩා බොහොම රසවත් පානයක්. අනික ඔබට නොවටින තරම් කාරුනික දෙයක්. ඔබේ තාත්තයි, ඔබේ සහෝදරයිනුයිත් ඔබත් එක්කම ගියානම් වඩා හොඳයි. ටයිවින් උතුමානන්ගෙ රත්තරන්වලට පුළුවන් වෙයි ඔබට අවශ්‍ය සැපපහසුව සපයන්ට. ඒ වගේම ඔබට ආරක්ෂාවට අවශ්‍ය සෙබළු සපයන්ට. ඔබට ඒක අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙයි. ඔබ කොයි ලෝකෙ ගියත් ඒ පස්සෙන්ම රොබර්ට්ගෙ උදහස, ද්වේෂය ඔබව හොයන් එයි."

රැජිණ නැඟිට සිටියාය. "එතකොට මගෙ උදහස ගැන මොකද කියන්නෙ ස්ටාර්ක් උතුමානනි?" ඇය මෘදු ස්වරයෙන් ඇසුවාය. ඇගේ දෑස් ඔහු ගේ මුහුණ පරීක්ෂාවෙන් පිරික්සා බැලීය. "උඹයි මේ රාජධානිය අයිතිකරගන්ට තිබුනෙ. ඒක උඹේ අතේ දුරින් තිබුනෙ. ජේමි මට කිවුවා කින්ග්ස් ලෑන්ඩින්ග් වැටුන දවසෙ උඹ කොහොමද එයාව යකඩ සිංහාසනයේ වාඩි වෙලා ඉන්දැද්දි හොයාගත්තෙ කියලා. කොහොමද උඹ එයාට යටත් කරගත්තෙ කියලා. ඒ තමා උඹේ අවස්ථාව. උඹට කරන්ට තිබුන එකම දේ ඒ පඩිපෙළ

නැගලා ගිහිල්ලා යකඩ සිංහාසනයේ වාඩි වෙන එක විතරයි. ඒක බොහොම ලොකු, බොහොම නරක අත්වැරැද්දක් මගෙ උතුමානනි."

"ඔබට හිතාගන්ටවත් බැරි තරම් අත්වැරැදි ගොඩක් මම කරලා තියෙනවා. ඒ වුනත් ඒක අත්වැරැද්දක් නෙවෙයි."

"ආහ්! ඒ වුනත් ඒක එහෙම තමා මගෙ උතුමානනි." සෙර්සි තිර ස්වරයෙන් කීවාය. "උඹ සිහසුන් ක්‍රීඩාව කරනවා නම් එක්කො උඹ දිනන්ට ඕන, නැත්තම් උඹ මැරෙන්ට ඕන. ඔය දෙක අතරමැද ඇති දෙයක් නෑ."

සිය මුහුණ වැසෙන සේ සළුවෙන් හිස පොරවා ගත් ඇය ඔහුව ඒ ඕක් වෘක්ෂය යට අන්ධකාරයේ තනිකර දා නික්ම ගියාය. දෙව්වනයේ නිහඬතාව මැද්දේ, නිල් කළු පැහැ අහස යට තනිකර දා නික්ම ගියාය. තරු එකින් එක නැග එන්නට පටන්ගෙන තිබින.

**Cersei Lannister: “When you play the game of thrones, you win or you die. There is no middle ground.”**

ඩනේරිස් 05-1

ඛාල් ඩ්‍රෝගෝ විසින් ඇය ඉදිරියේ තැබූ අමු, ලෙයින් වැකුනු අශ්ව හදවත සන්ධ්‍යාවේ සීතල සුළං මැද්දේ දුම් දමමින් තිබින. ඔහු ගේ දෑත් වැලමිටටම යනතෙක් රතු පැහැ වී තිබින. ඔහුට පිටුපසින් ඔහු ගේ රුධිරාරක්ෂයින් පිරිස ගලින් තැනූ පිහියා අතැතිව, මරා දමන ලද සෛන්ධවයා ගේ සිරුර වටා දණ බිම ඇනගෙන උන්හ. පතලේ උස් හුණුගල් බිත්ති මත්තෙහි සිට ලෙලදුන් තැඹිලි පැහැ පන්දම් ආලෝකය නිසා අසුගෙන් ගැලූ රුධිරය කළු පැහැයෙන් දිස්විය.

ඩැනී සිය ඉදිරියට නෙරා ආ උදරය පිරිමැද්දා ය. ඇගේ ගත පුරා ඩහබිඳු නැගී තිබුනු අතර නළලේ වූ දහදිය බැම දිගේ පහළට රූටාගෙන එමින් තිබින. මැහැල්ලන් තමා දෙස බලා ඉන්නා අයුරු ඇයට දැනුනි. වයෙස් ඩොත්රැක් වල අනාවැකි කියන්නියන් වූ මේ මැහැල්ලන් පිරිස සිය රැළි වැටුනු මුහුණේ වූ තද කළු පැහැ දෑස්වලින් ඇය දෙස අපේක්ෂා සහගතව බලා සිටින්නට වූහ. ඔවුන් ගේ දෑස් ඉදිරියේ ඇකිළී යාම බියෙන් පසු බැම කල නොහැක්කක් විය. 'මම තමා මකරාගේ රුධිරය.' ඇය තමාටම කියාගත්තා ය. දැතින්ම අසු ගේ හදවත ඔසවාගත් ඇය එය මුවට ලංකොට, දැඩි කෙඳි සහිත මාංශය දතින් සැපුවා ය.

ඇගේ මුව පුරා උණුසුම් රුධිරය පිරී ඉතිරී යන්නට වූ අතර මුව දෙපසින් බේරුනු රුධිරය නිකට දිගේ බේරෙන්නට විය. එහි අමු රසය නිසා ඇයට ඔක්කාරයක් ඇතිවූවද ආයාසයෙන් මාංශය විකා ගිලදමන්නට ඇයට හැකි විය. මේ සෛන්ධවයා ගේ හදවත විසින් ඇගේ පුතු ශක්තිමත්, වේගවත්, නිර්භීත අයකු කරනු ඇත. ඒ ඩොත්රැකියන් ගේ විශ්වාසයක් විය. එනමුදු එසේ වන්නේ මව කිසිදු පැකිළීමකින් තොරව මුළු හදවතම කා හමාර කලහොත් පමණි. ඇය ලේ නිසා තැති ගතහොත් නැතිනම් මාංශය නැවත වමාරා දැමුවහොත් අනාවැකි එතරම්ම යහපත් ඒවා නොවනු ඇත. දරුවා ගැබේදීම මියයන්නට, නැතිනම් දුබලයකු වන්නට, අංගවිකලයකු වන්නට හෝ ගැහැණු දරුවකු වන්නට හෝ පුළුවන.

මෙම උත්සව අවස්ථාවට මනාව සූදානම් වනු පිණිස ඇගේ සේවිකාවන් විසින් ඇයට මහත් සේ උදවු කර තිබින. පසුගිය මාස දෙකක කාලය පුරාවටම ඇයට හිංසා පීඩා කරනු ලැබූ, මවකට ස්වභාවයෙන්ම හිමිවන සුකොමළ ආහාර රුචිය නොතකා ඇය අඩක් මිදුනු

රුධිරයෙන් පිරුණු ආහාර බඳුන් හිස් කලේ මේ ලේ රසයට හුරුවනු පිණිස විය. එමෙන්ම ඉරී විසින් ඇගේ හණු රිදෙන තෙක් වියලන ලද අශ්ව මස් තීරු සපන්නට ඇයට උපදෙස් දී තිබින. උත්සවයට පෙර ඇය දින එකහමාරක් නිරාහාරව සිටියේ දැඩි කුසගින්න විසින් මෙම අමු මාංශය ගිල දමන්නට ඇයට සහාය වනු ඇතැයි යන විශ්වාසයෙනි.

අසු ගේ හදවත මුළුමනින්ම දැඩි මාංශයෙන් සෑදී තිබුනු අතර ඩැනීට සෑම කෑම කටක්ම සිය දතින්ම ඉරාගෙන බොහෝ වේලාවක් තිස්සේ සපා ගිලින්නට සිදුව තිබින. ශුද්ධ වූ වයෙස් ඩොත්රැක්හි සියළු කඳුමුදුන්වල මවුතුමිය ගේ සෙවනේදී වානේ ආයුධ භාවිතය සපුරා තහනම් දෙයක් විය. ඇයට තිබුනු එකම ආයුධ වූයේ සිය දත් හා නිය පමණි. ඇගේ උදරය පෙරලී එන්නාක් මෙන් ඇයට දැනුනු නමුදු ඇය කිසිවිටෙකත් කෑම නොනැවැත්වූවා ය. මසින් නැගුනු රුධිරයෙන් ඇගේ මුහුණ තෙමී ගොස් තිබින.

ලෝකඩ පලිහක් තරම් දැඩිකරගත් මුහුණෙන් යුතු ඛාල් ඩ්‍රෝගෝ ඇය අසලින් සිටගෙන ඇය දෙස බලා සිටියේය. ඔහු ගේ ගොතන ලද දිගු කේශ කලාපය තෙල් ගැල්වීම නිසා දිදුලන්නට විය. ඔහු සිය උඩුරැවුලේ රන් මුදු ද, කෙස්වැටියේ රන් සීනු ද, ඉණ වටා මහත රන් පදක්කම් එකතුකර නිමවූ සනකම පටියක් ද පැළැඳ සිටි අතර පපුව ආවරණය කර නොසිටියේ ය. සිය ශක්තිය ගිලිහී යතියි ඇයට වැටහුනු සෑමවිටම ඇය ඔහු දෙස බැලුවාය. ඔහු දෙස බලමින් නොනවත්වා සපමින් ගිල්ලා ය, සපමින් ගිල්ලා ය. කාර්යය අවසන් වීගෙන එද්දී ඇය ගැන ඔහු තුළ උපන් බිහිසුනු ආඩම්බරයක ලේශමාත්‍රයක් ඒ ආමන්ඩ් දෑස් තුළින් දැකගන්නට හැකිවිනැයි ඇය සිතුවාය. එනමුදු එය හරියටම සහතික කල නොහැක්කේ ඔහු කිසිවිටෙකත් සිය සිත තුළ ඇති හැඟුම් මුහුණින් නොපෙන්වන්නට පරිස්සම් වූ බැවිනි.

අන්තිමේදී එය හමාර විය. රුධිරය නිසා ඇගේ අතැඟිලි හා කම්මුල් ඇලෙන්නට විය. එය අවසන් වූ පසුව ඇය මැහැල්ලන් පිරිස, ඩොෂ් ඛලීන් මැහැල්ලන් පිරිස දෙස බැල්මක් හෙලුවා ය.

"ඛලාකා ඩොත්‍රේ මිරන්හා!" ඇය තමන්ට හැකි උපරිම හොඳ ඩොත්රැකි ස්වරයෙන් නිවේදනය කලාය. 'මගේ බඩේ ඉන්නේ කුමාරයෙක්!' එයින් කියැවිනි. ඇය සිය සේවිකාව වන ජික්වී සමගින් එක්ව දින ගනනාවක් පුරා මෙම වාක්‍යය නිසි අයුරින් කියන්නට පුහුණු වී තිබින.

මැහැල්ලන් අතර වූ වයසකම තැනැත්තිය, කළු පැහැ එක ඇසක් පමණක් ඇති, ඇකිළී රැළි වැටී ගිය නාකි ගැහැණිය සිය දෑත් ඉහළට එසෙවුවා ය. "බලාකා ඩොත්‍රේ!" ඇය මුර ගෑසුවා ය. 'කුමාරයා හොඳින් වැඩෙනවා!'

"එයා වැඩෙනවා!" අනිකුත් මැහැල්ලන් පිරිස ද හඬනැගූහ. "රාඛ්! රාඛ්! රාඛ් හාජ්!" ඔවුහු නිවේදනය කලහ. 'කොළුවෙක්! කොළුවෙක්! ශක්තිමත් කොළුවෙක්!'

සීනු නද දෙන්නට විය. ගැඹුරු හඬකින් යුතු යුධ හොරණෑවක් සිය ඒකතානමය නාදය නගන්නට විය. මැහැල්ලන් පිරිස ස්තෝත්‍ර ගායනාවක් ඇරඹූහ. ඔවුන්ට සේවය කරන නපුංසකයින් විසින් විශාල ලෝකඩ අඟුරු කබලකට වියළි තෘණ මිටි දමන්නට වූ අතර එයින් නැගුනු සුඟන්ධවත් දූමාරය වළාකුලක් මෙන් ඉහළින් වූ සඳ තරු පිරි අහස දෙසට නැගෙන්නට විය. ඩොත්රැකියන් ගේ විශ්වාසයට අනුව තාරකා යනු රාත්‍රි ආකාශය පුරා පිම්මේ දිවයන, ගින්නෙන් සැදුනු සුවිසල් අශ්ව රංචුවක් විය.

සුසන්ධ දූමාරය කෙමෙන් ඉහළ නගිද්දී ස්තෝත්‍ර හඬ කෙමෙන් තුනී වී ගියේය. නායක මැහැල්ල අනාගතය හොඳින් දකිනු පිණිස සිය තනි ඇස වසා ගත්තාය. ඔවුන් වටා පූර්ණ නිහඬතාවක් වැඩෙන්නට විය. එය කෙතරම් දැඩි නිහඬතාවක් වී ද යත් දුරින් නැගෙන නිශාචර පක්ෂීන් ගේ හඬ, පන්දම්වල ගිනිදළු නටන හඬ පමණක් නොව විලේ රැළි විසින් නගන මුදු හඬ පවා ඩැනීට ඇසෙන්නට විය. ඩොත්රැකියන් සියල්ලම ඇයගේ අනාවැකි ඇසීමට ඉවසිලිමත්ව බලා සිටියහ.

ඛාල් ඩ්‍රෝගෝ ඩැනී ගේ බාහුව මතින් අත තැබුවේය. ඔහු ගේ ඇඟිලිවල ඇති ආතතිය ඇයට හොඳින් දැනුනි. ඩොෂ් ඛලීන් මැහැල්ලන් අනාගතය දෙස දෑස් යොමන විට ඩ්‍රෝගෝ වැනි බලවත් ඛාල්වරු පවා බියෙන් වෙවුලති. ඔවුන්ට පිටුපසින් සිය සේවිකාවන් නොසන්සුන් අයුරින් ඇඹරෙන අන්දම ඇයට ඇසුනි.

අන්තිමේදී නායක මැහැල්ල සිය තනි ඇස විවර කලාය. ඇය සිය දෑත් අහසට එසවූවා ය. "මම එයාගෙ මූන දැක්කා. එයාගෙ අශ්වයාගෙ කුර හඬ ඇහුවා." ඇය සිහින් හඬින් නිවේදනය කලාය.

"එයාගෙ අශ්වයාගෙ කුර හඬ ඇහුවා!" අනිකුත් මැහැල්ලන් පිරිස අත්වැල් ඇල්ලූහ.

"එයා හුළඟ තරම් වේගයෙන් එයාගෙ අශ්වයා පැන්නුවා. ඊට පිටිපස්සෙන් එයාගෙ බලසාර් එක අශ්වයො පැන්නුවා. ගනන් කරන්ට බැරි තරම් මිනිස්සු. තණපත් වගේ දිලිහෙන අරක් අතින් ගත්තු මිනිස්සු. මේ කුමාරයා කුණාටුවක් වගේ නිර්භීත වෙනවා. එයාගෙ හතුරො එයා ඉස්සරහදි බයෙන් වෙවුලනවා. උංගෙ බිරින්දෑවරු දුකින් කඳුළු හල හලා තමන්ගෙ මැරිච්ච එවුන් වලලනවා. එයාගෙ කොණ්ඩෙ තියෙන රිදී සීනු හඬ එයා එන බව කලින්ම දැනුම් දෙනවා. ගලින් කරපු කූඩාරම්වල හැංගිලා ඉන්න දුර්වල මිනිස්සු එයාගෙ නම ඇහුවම බයෙන් වෙවුලනවා." වෙවුලා ගිය මැහැල්ල ඩැනී දෙස බැලුවාය. "මේ කුමාරයා අශ්වයා පිටේ නැගලා යනවා. එයා තමා මේ ලෝකය හොල්ලන සෙන්ධවයා."

"එයා තමා මේ ලෝකය හොල්ලන සෙන්ධවයා!" අනිකුත් මැහැලියෝ මෙන්ම බලා සිටියවුන් ද අත්වැල් ඇල්ලූහ. ඔවුන් ගේ හඬ රාත්‍රී අහස පුරා රැවු දෙන්නට විය.

නායක මැහැල්ල ඩැනී දෙස බැලුවාය. "එයාට අපි මොකක්ද දාන නම? ලෝකය හොල්ලන සෙන්ධවයාට අපි මොකක්ද දාන නම?"

ඩැනී නැගිට සිටියාය. "එයාට කියන්ට ඕන රේගෝ කියලා." ජික්වී ඇයට උගන්වා තිබුනු පරිදි ඇය පිළිතුරු දුන්නාය. ඇය ආරක්ෂාකාරී අයුරින් සිය උදරය මතින් දෑත් හොවද්දී ඩොත්රැකියන් පිරිස අතරින් ඝෝෂාවක් නැගී ආයේය. "රේගෝ!" ඔවුහු කෑගැසූහ. "රේගෝ, රේගෝ, රේගෝ!"

ඛාල් ඩ්‍රෝගෝ විසින් ඇයව පතලයෙන් පිටතට කැඳවාගෙන එද්දී පවා ඒ කෑගැසීම ඇගේ සවනේ රැවු දෙමින් තිබින. ඔවුන්ට පිටුපසින් පෙරහරක් ඇදෙන්නට විය. සිය නපුංසකයින් හා වහලුන් පිරිවැරූ ඩොෂ් ඛලීන් මැහැල්ලන් පිරිස පළමුව පැමිණියහ. සමහර මැහැල්ලන් සිය වාරු නැති දෙපාවලට ආධාර වශයෙන් සැරයටිවලට බරදී ඇවිද්ද අතර තවත් සමහරුන් ඕනෑම අශ්වාධිපතියකු තරම්ම උදාර අන්දමින් සිය දෙපා මතින් නැගී සිටියහ. මේ සෑම මැහැල්ලක්ම එක් කලෙකදී ඛලීසි කෙනෙකු විය. ඔවුන් ගේ සැමියන් මියගිය පසු, නව ඛාල් කෙනෙකු රංචුවේ පෙරමුණ ගත් පසු, ඔවුන් පසුපසින් නව ඛලීසි කෙනෙකු අසු පිට නැගුනු පසු ඔවුන්ව මෙහි එවා තිබින. ඔවුහු මුළු ඩොත්රැකි ජාතියටම නායකයින්

වූහ. බලවත්ම, සාහසිකම ඛාල්වරයා පවා ඩොෂ් ඛලීන් ගේ අධිකාරියට හා ඥානයට හිස නැමීය. මතු යම් දිනෙක තමාවද - සිය කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ - මෙහි එවනු ලබන බව මතක්වුනු විට ඩැනී වෙවුලා ගියාය.

මේ මැහැලියන් පිටුපසින් අනිකුන් පිය මැන්නහ. ඛාල් ඕගෝ හා ඔහුගේ පුත් බලකා ෆෝගෝ, ඛාල් ජොමෝ හා ඔහුගේ බිරින්දන්, ඩ්‍රෝගෝගේ බලසාරයේ ප්‍රධානීන්, ඩැනීගේ සේවිකාවන්, ඛාල්ගේ සේවකයින් හා වහලුන් හා තවත් බොහොමයක් එහි වූහ. ඔවුන් දෙව්මාවතේ පිය මනිද්දී සීනු නාදය හා බෙර හඬ උස්පහත් වෙමින් වැයුනේය. ඩොත්රැකියන් විසින් පැහැරගෙන එනු ලැබූ සිය ගණන් වීරයින් ද, දෙවියන් ද, අනිකුත් නමක් නොදන්නා අයවලුන් ද මාවත දෙපස අන්ධකාරයේ සිට ඔවුන් දෙස බලා සිටින්නට වූහ. මාවත දෙපස පෙරහරට ආලෝකය සැපයීම පිණිස පන්දම් ඔසවාගෙන යන වහලුන් ගේ නටන පන්දම් එළි මැද්දේ මේ ප්‍රතිමා සජීවී මිනිසුන් මෙන් දිස්විය.

"මොකක්ද තේරුම, රේගෝ නමේ?" ඇවිද යන අතර ඇය දෙසට හැරුනු ඩ්‍රෝගෝ රාජධානි සප්තකයේ පොදු භාෂාවෙන් ඇයගෙන් ඇසීය. ඇය ඇයට හැකි අයුරින් ඔහුට එම භාෂාවේ වදන් කිහිපයක් උගන්වා තිබින. ඔහු උනන්දුවක් දැක්වුවහොත් එය ඉක්මනින්ම අල්ලාගන්නා දක්ෂ සිසුවකු විය. එනමුදු ඔහු ගේ උච්චාරණය කෙතරම් ම්ලේච්ඡ, කෙතරම් පැටලිලි සහගත වී ද යත් සෙර් ජෝරාට හෝ විසේරිස්ට හෝ කිසි විටෙකත් ඔහු කියන්නක් වටහාගත නොහැකි විය.

"මගේ අයියා රේගාර් කියන්නෙ බොහොම නිර්භීත රණශූරයෙක් මගේ ඉරයි තරුයි. මම ඉපදෙන්ටත් ඉස්සෙල්ලා එයා මැරුනා. සෙර් ජෝරා කියනවා එයා තමා අන්තිම මකරා කියලා."

ඛාල් ඩ්‍රෝගෝ ඇය දෙසට බැල්මක් හෙලුවේය. ඔහුගේ මුහුණ ලෝකඩින් තැනූ වෙස් මුහුණක් මෙන් දැඩි විය. එනමුදු රන් මුදුවෙන් ගැවසුනු ඒ දිගු, කළු පැහැ උඩුරැවුලට යටින් සිනහවක සේයාවක් දකින්නට හැකිවිනැයි ඇයට සිතුනි. "ඒක හොඳ නම. ඩන් ඒරිස් බිරිඳ. මගේ ජීවිතේ හඳ." ඔහු කීවේය.

ඩොත්රැකියන් විසින් 'ලෝකයේ ගැබ' යනුවෙන් හඳුන්වනු ලබන විල වෙත ඔවුහු පිය මැන්නෝය. විල වටා පන් පඳුරින් සෙවන වී තිබුනු අතර එහි ජලය නිශ්චල හා ශාන්ත විය.

ජික්වී ඇයට කියා දී තිබූ පරිදි වසර දහස් ගනනාවකට පෙර මුල්ම මිනිසුන් මේ විල් පතුලෙන් උපත ලබා තිබුනි. ඔවුහු එයින්ම බිහිවූ මුල්ම අසුන් පිට නැගී විලෙන් පිටතට අවුත් ලෝකය පුරා විසිර ගියහ.

පෙරහර විල ඉවුරේ තණබිම මත නැවතුනු අතර ඩැනී සිය ලේ තැවරුනු ඇඳුම් බිමට උනා දැමුවාය. ඉන්පසු නිරුවතින්ම විලේ සීතල ජලයට බැස්සාය. මේ විලට පතුලක් නැතැයි ඉරී පවසා තිබුනද උසැති පන් ගස් පීරමින් හෙමිහිට අඩි තබා ඉදිරියට යද්දී සිය පා ඇඟිලි අතරින් මඩ මිරිකෙනු ඇයට දැනින. නිසල කළුපැහැ ජලතලය මත සඳ එළිය වැටී දිලිසුනු අතර ඇගේ චලනයන් අනුව දිය රැළි නැගෙද්දී ඒවා කැඩෙමින් නැවත හා වෙමින් අනන්ත රටා මැවීය. සීතල දිය සෙමින් සෙමින් ඇගේ කළවාත් දෙතොල් පෙතිත් තෙමද්දී ඇගේ නිරුවත් සම මත හී ගඩු පිපුනි. සෙන්ධවයා ගේ රුධිරය ඇගේ දෑතේත් ඇගේ මුව වටාත් මිදී තිබින. බාල් සහ අනිකුන් බලාසිටින අතරේදී දෝතට ගත් විලේ ශුද්ධ වූ ජලය හිස පිට වත්කරගනිමින් ඩැනී ඇයවත් සිය කුස තුළ සිටින බිළිඳාවත් පිරිසුදු කරගන්නට වූවාය. තමා දෙස බලා සිටින ඩොෂ් ඛලීන් මැහැල්ලන් එකිනෙකා අතර කොඳුරන හඬ ඇයට ඇසුනු අතර ඒ කුමක් විය හැකිදැයි ඇය විමතියෙන් කල්පනා කරන්නට විය.

ගතින් දිය බේරෙමින්, සීතලයෙන් වෙවුලමින් ඇය විලෙන් ගොඩ එද්දී ඩෝරියා වර්ණවත් සේද කබායක් රැගෙන හනික ඈ වෙත පැමිණියා ය. එනමුදු අතක් එසවූ බාල් ඩ්‍රෝගෝ ඇයව නැවැත්වීය. ඔහු ඩැනීගේ පිරුනු උදරයත් ඉදිමුනු පයෝධරයිනුත් දෙස කෑදර දෑසින් බලා සිටින්නට විය. රන් පදක්කමින් නිමැවූ සනකම් ඉණපටියට යටින්, අශ්ව සමින් කල කලිසම තද වී ඉදිරියට එසැවී ඇති අයුරු ඇගේ නිරීක්ෂණයට හසුවිය. සෙමින් සෙමින් ඔහු දෙසට පියමැන්න ඇය කලිසම මුදාලීමට ඔහුට උදවු කලාය.

ඊළඟ මොහොතේ ඇගේ දැවැන්ත බාල් කුඩා දැරියක ඔසවන්නාක් තරම් පහසුවෙන් ඉණෙන් අල්ලා ඇයව ඉහළට එසවීය. ඔහුගේ කේශ කලාපයේ ගවසා තිබුනු රිදී සීනු මෘදු හඬින් නදදෙන්නට විය.

ඔහු ඈ තුළට ප්‍රවිෂ්ට වද්දී ඇය සිය දෑත් ඔහුගේ උරහිස වටා යවමින් ඔහුගේ ගෙලේ මුහුණ සඟවාගත්තා ය. "ලෝකය හොල්ලන සෙන්ධවයා." ඩ්‍රෝගෝ ගොරෝසු හඬින් ඇගේ සවනට කෙඳිරීය. ඔහුගේ දෑත්වලින් තවමත් අශ්ව ලේ ගඳ හමමින් තිබින. වේගවත් පහර කිහිපයකින් පසු පැමිණි සුරතාන්තයේදී ඔහු දැඩිව ඇගේ ගෙල සැපුවේය. අන්තිමේදී ඔහු ඈ ඔසවා බිමින් තබද්දී ඈ තුළ පිරී තිබුනු ඔහුගේ බීජය කලවා දිගේ සෙමින් පහළට

ගලන්නට විය. මේ සැමෙකකින්ම පසු ඇයව සුගන්ධවත් සේද කබායෙන් වැසීමට ඩෝරියාටත්, ඇගේ දෙපයට පාවහන් යුගලක් පැළැන්දීමට ඉරීටත් අවසර ලැබුනි.

සිය කලිසම ඉහළට ඔසවාගත් බාල් ඩ්‍රෝගෝ නියෝගයක් නිකුත් කල අතර වීල් ඉවුරට අශ්වයින් රැගෙන එනු ලැබූහ. සිය රිදී වෙළඹ පිට නගිනු පිණිස කොහොලෝ ඩැනීට උදවු කලේය. සිය අසුට සන්කල ඩ්‍රෝගෝ සඳ හා තරු පිරි අහස යටින් දෙව්මාවත ඔස්සේ අසු විහිදීය. සිය රිදී පිට නැගුනු ඩැනී ද පහසුවෙන් ඔහු හඹා ගියාය.

බාල් ඩ්‍රෝගෝගේ ප්‍රධාන ශාලාවට සෙවන දුන් සේද කූඩාරම් රෙදි ඉහළට ඔසවා තිබූ අතර සඳ එළිය ශාලාව තුළට වැටී තිබින. ශාලාව තුළ වූ දැවැන්ත ගිනිමැල තුනක වූ ගිනිදළු අඩි දහයක් උසට බුර බුරා නැංගේය. ගින්නේ පැලහෙන මස්වල හා පැසවූ වෙළඹ කිරෙන් නිමැවූ මධ්‍යසාරවල සුවඳින් අවට වාතය බරව තිබුනි. ඔවුන් ඇතුළුවන විට ද ශාලාව සෙනඟින් හා කලිකලහයෙන් පිරි එකක් විය. පතලයේ පැවැති අනාගතය දැකීමේ උත්සවයට සහභාගී වීමට තරම් සමාජ තත්ත්වයක් හිමිව නොතිබුනු සැවොම මෙහි එක් රැස් වී සිටියහ. ආරුක්කු ද්වාරයෙන් ඇතුළු වී මැදි මහ ඔස්සේ සිය අසු විහිදුවද්දී ඔවුන් සැවොම තමා දෙස බලා සිටින අන්දම ඩැනී විසින් නිරීක්ෂණය කලාය. ඇගේ පිරුනු උදරය ගැනත්, ඇගේ ඉදිමුනු පයෝධරයන් ගැනත්, ඇය කුස දරා සිටින දරුවා ගැනත් ඔවුහු කතා කරන්නට වූහ. ඔවුන් පැවසූ කිසිවක් ඇයට වටහාගත නුහුනු නමුදු එක් දෙයක් පමණක් පැහැදිලිව ඇසුනි. "ලෝකය හොල්ලන සෛන්ධවයා!" දහසක් මුවින් ගැයෙනු ඇයට ඇසුනි.

මේ සැමටම අමතරව අවට බෙර නදින් හා හොරණෑ හඬින් පිරී තිබුනි. මිටි මේස මත පැලහූ මාංශ, වියළි මිදි, රටඉඳි හා දෙළුම් පිරවූ පලංගාන් පුරවා තිබුනු අතර ඒ මැද්දේ අඩ නිරුවත් නාටිකාංගනාවෝ නර්තන ලීලාවන් දක්වමින් සිටියහ. මිනිසුන් බහුතරයක් මේ වනවිටද මධ්‍යසාරය නිසා වෙරිමතින් පසු වූ බව ඩැනී නිරීක්ෂණය කලාය. එනමුදු අද රැයේ කිසිදු අරබ් එකක් පිටතට නොඇදෙන බවද ඇය දැන සිටියාය. මේ ශුද්ධ වූ නගරය තුළ ආයුධ ඇදගැනීම හෝ ලේ සෙලවීම සපුරා තහනම් දෙයක් විය.

**Viserys Targaryen: "I want the crown he promised me. He bought you, but he never paid for you."**

අසුපිටින් බට බාල් ඩ්‍රෝගෝ තමාට හිමි උස් අසුන කරා පියමැන්නේ ය. ඔවුන් ගේ බලසාරය නගරයට ඇතුළුවන විටත් එහි වාඩි ලා සිටි බාල් ජෝමෝ හා බාල් ඕගෝට ඩ්‍රෝගෝගේ දෙපසින් අසුන් පැනවී තිබින. ඔවුන්ට පහතින් මේ බාල්වරුන් තිදෙනා ගේ රුධිරාරක්ෂකයින් අසුන්ගෙන සිටි අතර ඔවුන්ටද පහතින් බාල් ජෝමෝ ගේ බිරින්දෑවරුන් තිදෙන අසුන් ගෙන සිටියහ.

වෙළඹ පිටින් බට ඩැනී තෝන්ලණුව සිය වහලෙකු අතට දුන්නාය. ඩෝරියා හා ඉරී ඇයට අසුන් ගනු පිණිස බිම මෘදු කොට්ට අසුරද්දී ඇය සිය සොයුරා සොයනු පිණිස අවට නිරීක්ෂණය කලාය. මේ දැවැන්ත ශාලාව තුළ, මේ අතිමහත් පිරිස මධ්‍යයේ වුව ඔහුගේ සුදුමැලි සමත්, රිදී පැහැ කේශ කලාපයත්, හැඳ සිටි වැරහිලිත් හඳුනාගැනීම අසීරුවක් නොවීය. එනමුදු ඇයට කොතැනකවත් ඔහුව සොයාගත නොහැකි විය.

ඇය නැවත වතාවක් බිත්ති අද්දර මිටි මේස අබියස අසුන්ගෙන සිටි, තත්ත්වයෙන් පහත් මට්ටමේ වූ මිනිසුන් පිරිස පවා පිරික්සා බැලුවාය. එනමුදු ඒ සෑම මුහුණක්ම තඹ පැහැ සමින් හා කළු පැහැ දෑසින් යුතු ඒවා විය. ශාලාව මැද්දේ වූ දැවැන්ත ගිනිමැලය අසල සිටින සෙර් ජෝරා ඇගේ නෙත ගැටින. එය උසස්ම අසුනක් නොවූ නමුදු ගෞරවාන්විත ආසනයක් විය. මේ නයිට්වරයා ගේ කඩුහරඹ හැකියාව ගැන ඩොත්රැකියන් උසස් කොට සැලකූහ. ඔහුව තම මේසයට කැඳවාගෙන එන්නැයි කියමින් ඩැනී විසින් ජික්වීව පිටත්කර හැරියාය. සෙර් ජෝරා සැනින් පැමිණියේ ඇය අසලින් දණක් නැමීය. "බලීසි. ඔබතුමීගෙ ඕනම අණක් කියන්ට."

ඇය තමා පසෙකින් තිබුනු කොට්ටයට තට්ටු කලාය. "මෙතැනින් වාඩිවෙලා මගෙත් එක්ක ටිකක් කතා කරන්ට."

"ඒක මට ලොකු ගෞරවයක්." ඔහු දෙපා හරස්කර කොට්ටය මත වාඩිවිය. ඔහු අසලින් දණ නැමූ වහලෙක් ඉදුනු ෆිග් පිරුනු තැටියක් ඔහු දෙසට පිරිනැමීය. ෆිග් ගෙඩියක් අතින් ගත් සෙර් ජෝරා ඉන් අඩක් මුවේ ලා සැපීය.

"කෝ මගේ අයියා?" ඩැනී ඇසුවාය. "මේ සංග්‍රහයට සහභාගි වෙන්ට එයා දැන් මෙතැනට ඇවිල්ලා ඉන්ට ඕන."

"මම අද උදේ එතුමන්ව දැක්කා. එයා මට කිවුවා වයින් ටිකක් හොයාගන්ට බටහිර වෙළෙඳපළ පැත්තට යනවා කියලා."

"වයින්?" ඩැනී විපිලිසරව ඇසුවාය. ඩොත්රැකියන් පානය කරන වෙළඹ කිරෙන් නිමැවූ මේ මධ්‍යසාරය විසේරිස්ට උහුලා ගත නොහැකි දෙයක් විය. ඇය එය මනාව දැන සිටියාය. එමෙන්ම විසේරිස් මේ දිනවල නිතරම වෙළෙඳපළ වෙතට ගොස් බටහිරින් හා නැගෙනහිරින් තවලම් රැගෙන පැමිණ සිටි වෙළෙඳ නායකයින් සමගින් මත්පැන් බොමින් කල් ගතකරන්නට පුරුදුව සිටියේය. ඇගේ සමාගමයට වඩා ඔවුන් ගේ සමාගමය ඔහුට වඩා හිතකර වූ බැව් පෙනෙන්නට තිබුනි.

"වයින්." සෙර් ජෝරා තිර කලේය. "ඒත් එක්කම එයාට පොඩි අදහසක් තියෙනවා මේ තවලම් මුරකරන කුලී හේවායින් එයාගෙ හමුදාවට බන්දාගන්ට." සේවිකාවක් ඔහු ඉදිරිපිටින් පයි එකක් තැබූ අතර ඔහු විගස වැඩට බැස්සේය.

"ඒක නුවණක්කාර වැඩක්ද? එයාට මේ සෙබළුන්ට ගෙවන්ට රත්තරන් නෑ. එයාව පාවලා දුන්නොත් මොකද වෙන්නෙ?" තවලම් මුරකරුවන් වනාහි ගෞරවය, ලැදිකම වැනි දෑ නාඳුනන්නෝ වූහ. කින්ග්ස් ලැන්ඩින්ග්හි සිටින රාජ්‍යය පැහැරගත්තා ඇගේ සොයුරා ගේ හිස් ගෙඩියට ඉහළම මිලක් ගෙවනු ඇත. "ඔබත් එයත් එක්ක යන්ටයි තිබුනෙ. එයාව ආරක්ෂා කරන්ට. ඔබ එයාගෙ දිවුරුම් දුන්න හේවායෙක්."

"අපි මේ ඉන්නෙ වයෙස් ඩොත්රැක්වලයි. මේක ඇතුළෙ කිසිම මිනිහෙක් ආයුධයක් ගෙනියන්නෙ නෑ. කිසිම මිනිහෙකුගෙ ලේ හොල්ලන්නෙ නෑ." ඔහු ඇයට සිහිපත් කරදුන්නේ ය.

"ඒ වුනත් මිනිස්සු මැරෙනවා. ජෝගෝ මට කිවුවෙ. මේ සමහර වෙළෙන්දො ගාව නපුංසක වහල්ලු ඉන්නවා. මහ දැවැන්ත එවුන්. උන් සේද රෙදි කැල්ලකින් හොරුන්ගෙ

බෙල්ල හිරකරලා මරලා දානවා. එහෙම කලාම ලේ හෙල්ලෙන්නෙ නැති හන්දා දෙවියො කෝපවෙන්නෙ නෑ."

"එහෙමනම් ඉතින් අපි ප්‍රාර්ථනා කරමු කිසිම දෙයක් හොරකම් නොකර ඉන්ට තරම් ඔබේ සහෝදරයා ඥානවන්ත වෙයි කියලා." සිය මුව වටා තැවරී තිබුනු මේදය පිටිඅත්ලෙන් පිසදා හල සෙර් ජෝරා මේසය හරහා ඇය දෙසට නැඹුරු විය. "එයා සැලසුම් කරගෙන හිටියා ඔබේ මකර බිත්තර ටික හොරකම් කරන්ට. ඒ වුනත් මම එයාට අනතුරු ඇඟෙවුවා එයා ඒවට අතවත් තිබ්බොත් මම එයාගෙ අත් දෙක කපලා දානවා කියලා."

මේ පුවතින් ඩැනී කෙතරම් අන්දුන් කුන්දුන් වී ද යත් මොහොතක් ගතවන තුරු ඇයට කතා කරන්නට වදන් සොයාගත නොහැකි විය. "මගේ බිත්තර... ඒ වුනත් ඒවා මගේනෙ. මැජිස්ටර් ඉල්ලීරියෝ ඒවා මට දුන්නෙ මනාලි තෑග්ගක් විදියටයි. ඇයි විසේරිස්ට ඒවා ඕන... ඒවා නිකංම නිකං ගල්නෙ..."

"රතුකැට, දියමන්ති, අනිත් මුතුමැණික් ගැනත් ඒ දේම කියන්ට පුළුවන් මගේ කුමාරි... අනික මකර බිත්තර කියන්නෙ ඊටත් වඩා දුර්ලභ වටිනා දෙයක්. එයාත් එක්ක බොන ඔය වෙළෙන්දො ඔය එක බිත්තරයක් වෙනුවෙන් තමන්ගෙ රහසඟත් කපලා විකුනයි. ඔය බිත්තර තුන වික්කොත් විසේරිස්ට පුළුවන් එයාගෙ කුලී හේවායින්ට ගෙවන්ට ඕන රත්තරන් හොයාගන්ට."

ඩැනී මේ බවක් නොදැන සිටියාය. මේ බවක් කිසිකලෙකත් සැක නොකලාය. "එහෙමනම් ඉතින්... එයාම ඒවා ගත්තාවෙ. ඒත් එයාට ඒවා හොරකම් කරන්ට ඕන නෑ. එයා මගෙන් ඇහුවානම් මම ඒවා එයාට දෙනවනෙ. එයා මගේ සහෝදරයා... මගේ ඇත්තම ඇත්ත රජා."

"එයා ඔබේ සහෝදරයා තමා." සෙර් ජෝරා එකඟවන ස්වරයෙන් කීය.

"ඔබට තේරෙන්නෙ නෑ සෙර්. මට උපත දීලා මගේ අම්මා මැරිලා ගියා. මගේ තාත්තයි අයියා රේගාරුයි ඊටත් කලින් මැරිලා ගියා. මට ඒවා ගැන කියලා දෙන්ට විසේරිස්

නොහිටියා නම් මට අඩුම ගානෙ එයාලගෙ නම්වත් දැනගන්ට ලැබෙන්නෙ නෑ. එයා තමා මට ඉතුරුවුන එකම එක්කෙනා. එකම එක්කෙනා. එයා තමා දැන් මට ඇති එකම දේ."

"ඔවු, ඒ එක කාලෙකදි. ඒ වුනත් දැන් ඒක තවදුරටත් එහෙම නෙවෙයි බලීසි. ඔබ දැන් අයිති ඩොත්රකියන්ට. ඔබේ ගර්භාෂයෙ ඉන්නවා මේ ලෝකය හොල්ලන සෙන්ධවයා." ඔහු සිය කුසලාණ එසවූ අතර වහලියක විසින් එය මධ්‍යසාරයෙන් පුරවාලීය.

ඩැනී අතක් වනා ඇයව පිටත්කර හැරියාය. එහි ඇති ඇඹුල් සුවඳ නිසා ඇයට අප්පිරියාවක් දැනෙන්නට විය. මහත් ආයාසයෙන් කුස තුළට එබූ අර අමු අශ්ව මාංශය නැවත වතාවක් පිටතට ගැනීමට ඇයට කොහෙත්ම අවශ්‍යතාවක් නොවීය. "මොකක්ද ඒකෙන් කියැවෙන්නෙ? කවුද මේ සෙන්ධවයා? හැමකෙනාම ඒක කියලා මට කෑගැහුවා. ඒත් ඒ කිසිදෙයක් මට තේරුනෙ නෑ."

"මේ සෙන්ධවයා තමා පුරාණ අනාවැකියක කියැවෙන ඛාල්ලාගෙත් ඛාල්. අනාවැකියෙ පොරොන්දු වෙන විදියට එයා මේ ඛලසාර් ඔක්කොම එකතුකරලා එක තනි ඛලසාර් එකක් හදලා ලෝකෙ කෙලවරටම යනකම් යනවා. මේ ලෝකෙ ඉන්න හැම මිනිහෙක්ම එයාගෙ යටත් වැසියෙක් වෙයි."

"ආහ්!" ඩැනි කෙඳිරුම් ස්වරයෙන් කීවාය. ඇගේ අත සිනිඳු සේද කබායට උඩින් උදරය මුදු ලෙස පිරිමදින්නට විය. "මම එයාට නම දැම්මෙ රේගෝ කියලා."

"ඒ නම ඇහුවහම රාජ්‍යය පැහැරගත්ත එකාගෙ ඇඟේ ලේ වතුර වෙයි."

හදිසියේම ඩෝරියා ඇගේ වැලිමිටින් අදින්නට විය. "මගේ උත්තමාවනි." ඇය හදිසි ස්වරයෙන් මිමිනුවා ය. "ඔබේ සහෝදරයා..."

ඩැනී ශාලාවේ අනිත් අන්තය දෙස බැලුවාය. ඔහු දිගු පියවර තබමින් ඔවුන් දෙසට පැමිණෙමින් සිටියේය. ඔහු අඩි තබන ආකාරයෙන්ම විසේරිස්ට ඔහු සෙවූ වයින් ලැබී ඇති බැව් ඇය වටහාගත්තා ය. ඒ වයින් සමගින්ම ඔහුට කතාවට අවැසි ධෛර්‍යය ද ලැබී තිබින.

විසේරිස් පාට වියැකී ගිය, ගමන නිසා වැරහැලි වී ගිය සිය ලේ රතු පැහැ සේද ඇඳුම්වලින් සැරසී හුන්නේය. ඔහු ගේ සළුවත් අත්වැසුමුත් හිරු එළියෙන් පාට වියැකුනු කළු පැහැ විල්ලුදයෙන් නිමවීය. ඔහුගේ බූට්ස් සපත්තු වියළී, ඉරිතලා ගොස් තිබුනු අතර ඒ රිදී පැහැ කෙස්කළඹ අවුල් වී ගැටගැසී තිබින. සමින් කල කොපුවක බහාලූ දිගු අසිපතක් ඉණෙහි එල්ලෙමින් තිබින. ඩොත්රැකියන් ගේ දෑස් ඒ දිගු අසිපත වෙත යොමුව තිබුනේය. සාපකිරීම් ද, අවලාද ද, මැසිවිලි හා කෝපසහගත කටුකුටු ගෑම් ද රැල්ලක් මෙන් ඇය වටා නැගෙන්නට විය. සංගීතය කෙමෙන් මැකී ගියේය.

ඇගේ හදවත වටකරමින් භීතිය නැග ආවේය. "එයා ගාවට යන්ට." ඇය සෙර් ජෝරාට අණකලාය. "එයාව නවත්තන්ට. එයාව මෙහාට ගේන්ට. එයාට කියන්ට එයාට ඕනනම් අර මකර බිත්තර ටික ගන්ට පුළුවන් කියලා." නයිට්වරයා සැනෙන් දෙපයින් නැගිට සිටියේය.

"කෝ මගේ නංගී?" විසේරිස් මුරගෑවේය. වයින් නිසා ඔහුගේ ස්වරය පැටලිලි සහගත විය. "ඔන්න මම ඒකිගෙ භෝජන සංග්‍රහයට ආවා. උඹලා කොහොමද මම එන්ට කලින් කෑම කන්ට පටන්ගන්ට තරම් නිර්භීත වුනේ? කිසිම කෙනෙක් රජ්ජුරුවන්ට කලින් කන්ට පටන්ගන්නෙ නෑ. කෝ ඒකි? ඔය වේසිට බෑ මකරාගෙ ඇස්වලින් වහන්වෙන්ට."

ගිනිමැල අතරින් විශාලතම එක අබියස නැවතුනු ඔහු ඩොත්රැකියන් ගේ මුහුණු පිරික්සා බලන්නට විය. මේ ශාලාව තුළ මිනිසුන් පන්දහසකට වඩා සිටි නමුදු ඒ අතරින් පොදු භාෂාව තේරුම් ගත හැකි පුද්ගලයින් වූයේ අතලොස්සකි. එනමුදු, ඔහු පවසන වදන් තේරුම් ගත නුහුනු නමුදු, ඔහු බීමතින් සිටින බව දැනගැනීමට ඒ දෙස හෙලන එක් බැල්මක්ම ප්‍රමාණවත් විය.

සෙර් ජෝරා සැනින් ඔහු වෙත ළඟාවිය. ඔහු විසේරිස් ගේ කණට යමක් කොඳුරා ඔහුගේ අතකින් අල්ලාගත්තේ ය. එනමුදු අත ගසාදැමූ විසේරිස් ඔහුගෙන් නිදහස් වූයේය. "උඹේ

ඔය ජරා අත මගෙන් අහකට ගනින්. කිසිම කෙනෙකුට බෑ අවසරයක් නැතුව මකරාව අල්ලන්ට."

ඩැනී වියවුල් සිතින් උස් ආසන පෙළ දෙස බැලුවාය. ඛාල් ඩ්‍රෝගෝ ඔහු පසෙකින් සිටි අනික් ඛාල්ලාට යමක් කියමින් සිටියේය. ඛාල් ජෝමෝ දත් විරිත්තූ අතර ඛාල් ඕගෝ කොක්හඩලා සිනාසෙන්නට විය.

මේ නැගුනු සිනා හඬ නිසා විසේරිස් දෑස් ඔසවා බැලීය. "ඛාල් ඩ්‍රෝගෝ." ඔහු ආචාරශීලී නමුදු පැටලිලි සහගත ස්වරයෙන් කීය. "ඔන්න මම ආවා ඔබේ භෝජන සංග්‍රහයට." සෙර් ජෝරාගෙන් ඈත්වුනු ඔහු ඛාල්වරුන්ට එක්වීම සඳහා එදෙසට පිය නගන්නට විය.

නැගී සිටි ඛාල් ඩ්‍රෝගෝ අත දිගුකර ඩැනීට වටහා ගත නුහුනු තරමේ වේගයකින් යමක් කීවේය. "ඛාල් ඩ්‍රෝගෝ කියනවා ඔබේ ස්ථානය එයාගෙ පැත්තකින් නෙවෙයි කියලා. ඛාල් ඩ්‍රෝගෝ කියනවා ඔබේ ස්ථානය අතනයි කියලා." සෙර් ජෝරා විසේරිස් වෙනුවෙන් පරිවර්තනය කලේය.

හිස හැරවූ විසේරිස් ඛාල් පෙන්වන දෙස බැලීය. ශාලාවේ ඈත කොණේ, බිත්තිය අසල මුල්ලක, අනිකුත් වැදගතුන් ගේ ඇස නොගැටෙන පරිද්දෙන් අඳුරු සෙවනැලි මුවාවේ ඩොත්රැකි සමාජයේ පහත්ම මිනිස්සු අසුන්ගෙන සිටියහ. තවමත් සටනක් සඳහා නොගිය කුඩා කොල්ලන්, කිසිවක් නොපෙනෙන දෑසින් යුත් හා වාතරක්තියෙන් පෙලෙන සන්ධිවලින් හෙබි මහල්ලන්, මන්ද බුද්ධිකයින් හා අංගවිකල වූවන් එහි වූහ. ඔවුහු මස් මාංශයෙන් ද සියළු ගෞරවයන්ගෙන් ද ඈත් කර තැබූවෝ වූහ. "ඒක රජෙකුට ගැලපෙන තැනක් නෙවෙයි." ඇගේ සොයුරා කීවේය.

"ඒක තැන." ඛාල් ඩ්‍රෝගෝ පොදු බසින් පිළිතුරු දුන්නේය. "කොර කකුල් රජාට." ඔහු අත්පොඩි සැලීය. "කරත්තයක්! කරත්තයක් ගෙනෙල්ලා ඛාල් රාසට්ට!"

පන්දහසක් ඩොත්රැකියන් සිනහවෙන්නටත් මහහඬින් කෑගසන්නටත් පටන්ගත්හ. සෙර් ජෝරා විසේරිස් පසෙකින් සිටගෙන ඔහුගේ කණට කෑගසමින් සිටිමුත් අධික ඝෝෂාව නිසා ඩැනීට ඔහු කියන්නක් නෑසින. ඇගේ සොහොයුරා පෙරලා නයිට්වරයාට කෑගසමින්

සිටි අතර ඔවුන් දෙදෙනා එකිනෙකා බදාගෙන ඉන්නාක් මෙන් පෙනින. ඊළඟ මොහොතේ පහරක් ගැසූ මෝර්මන්ට් විසේරිස්ව බිමදැමීය.

ඇගේ සොහොයුරා සිය අසිපත ඇදගත්තේ ය.

අසිපත් තලය ගිනිදළු නිසා රත් පැහැයෙන් බබලන්නට විය. "මගෙන් ඈත් වෙලා හිටපං!" විසේරිස් පිම්බෙය. සෙර් ජෝරා අඩියක් පසුපසට තැබූ අතර ඇගේ සොයුරා අව්‍යක්ත අයුරින් සිය දෙපා මතින් නැගිටගත්තේ ය. ඔහු සිය අසිපත - ඔහුව වඩා රාජකීය ලීලාවෙන් අන්‍යයන්ට පෙනෙන සේ මැජිස්ටර් ඉල්ලීරියෝ විසින් ඔහුට දුන් අසිපත - හිසට ඉහළින් ලෙලවීය. ඩොත්රැකියෝ සෑම දෙසින්ම ඔහුට සාප කරන්නටත් අවලාද නගන්නටත් පටන්ගත්හ.

ඩැනීගේ මුවින් නොදැනුවත්වම ත්‍රාසය භීතය මුසු කෑගැසීමක් නැගින. ඇගේ සොහොයුරා එය නොදැන සිටියද මේ නගරය තුළ අසිපතක් ඇදගන්නාගේ ඉරණම ඇය දැන සිටියාය.

ඇගේ කටහඬ නිසා හිස හරවා බැලූ විසේරිස් පළමු වරට ඇයව දැක්කේය. "ආ! අර ඉන්නෙ ඒකි." ඔහු සිනාසෙමින් කීය. ඔහු ඈ වෙතට දිගු පියවර තැබූයේ හරියටම සතුරන් රැනක් මැදින් මාර්ගය පාදා ගැනීමට තැත් කරන්නාක් මෙන් අසිපත වනමිනි. එනමුදු ඔහුට මග ඇහිරූ කිසිවෙකුත් නොවීය.

"ඔයාගෙ කඩුව... ඔයාට එහෙම කරන්ට බෑ." ඇය අයැද සිටියාය. "අනේ විසේරිස්! ඒක තහනම්. ඔය කඩුව පැත්තකින් දාලා එන්ට මගේ මේසෙට. මෙතැන බීම තියෙනවා, කෑමත්... ඔයාට ඕන මකර බිත්තරද? ඔයාට ඒවා ගන්ට පුළුවන්. අනේ ඔය කඩුව වීසිකරලා දාන්ට."

"එයා කියන විදියට කරපන් මෝඩයෝ!" සෙර් ජෝරා කෑගැසීය. "නැත්තං උඹ නිසා අපි ඔක්කොටම මැරුම්කන්ට වෙයි."

විසේරිස් කොක්හඬලා සිනාසුනේය. "උන්ට බෑ අපිව මරන්ට. උන්ට බෑ මේ පූජනීය නගරෙ ඇතුළේ ලේ හොල්ලන්ට... ඒ වුනත් මට පුළුවන්." ඩැනීගේ පියයුරු මැද්දෙන් සිය අසිපත් තුඩ තැබූ ඔහු එය සෙමින් පහළට, ඇගේ කවාකාර උදරය ඔස්සේ පහළට ගෙන ආවේය. "මට ඕන මම බලාපොරොත්තුවෙන් ආපු දේ." ඔහු ඇයට කීවේය. "මට ඕන ඌ මට පොරොන්දු වෙච්ච ඔටුන්න. ඌ උඹව සල්ලි දීලා ගත්තා, ඒ වුනත් තාම ඒකෙ මිල ගෙවුවෙ නෑ. ඌට කියාපන් ඌ මට පොරොන්දු වුන දේ දෙන්ටයි කියලා. නැත්තම් මම උඹව ආපහු අරන් යනවා. උඹයි උඹේ බිත්තර ටිකයි ඔක්කොම. ඌට පුළුවන් උගේ මලඉලවු අශ්ව පැටියාව තියාගන්ට. මම ඒ අවජාතකයාව කපලා එළියට අරන් ඌට තියලා යන්නම්." සේද කබාය හරහා තද වූ අසිපත් තුඩ ඇගේ නාභිය කිතිකැවුවේ ය. එක් කලෙක ඇගේ සොහොයුරා වූ මේ මිනිසා, විසේරිස්, හඬමින් නැත එක්වරම හඬමින් හා සිනාසෙමින් සිටි බැව් ඇය දුටුවාය.

සිය සේවිකාව වන ජික්වී බියෙන් ගැහෙමින් ඉකිබිඳින ආකාරය ඇයට සිහිනයකින් මෙන් ඇසුනි. විසේරිස් විසින් පැවසූ දෑ ඛාල් වෙනුවෙන් තමාට පරිවර්තනය කරන්නට බැරි යැයි ද, එසේ කලහොත් ඔහු තමාව අසුගේ ගැටගසා බිම දිගේ ඇදගෙන කන්ද මුදුනට යනු ඇතැයි ඇය වැලපුනාය. ඩැනී මේ දැරිය වටා අතක් යැවුවාය. "උඹ බයවෙන්ට එපා. මමම ඛාල්ට කියන්නම්."

විස්තර කරන්නට තරම් අවශ්‍ය වචන තමා දන්නේදැයි ඇයට විශ්වාස නැති විය. එනමුදු ඇය එය පවසා අවසානයේ ඛාල් ඩ්‍රෝගෝ ඩොත්රැකි බසින් යම් කිසිවක් කීවේය. එනයින් තමා කියූ දේ ඔහුට අවබෝධ වූ බැව් ඇයට වැටහිනි. ඇගේ ජීවිතයේ සූර්යයා සිය උස් ආසනයෙන් පහළට බැස්සේය.

"ඌ මොකක්ද කිවුවෙ?" ඇගේ සොහොයුරාව සිටි මේ මිනිසා ඇගෙන් ඇසීය.

ශාලාව කෙතරම් නිහඬතාවයේ ගැලී තිබුනා ද යත් ඩ්‍රෝගෝ තබන තබන පියවරක් පාසා ඔහුගේ කෙස්කළඹේ වූ සීනු රැවුදෙන හඬ පවා ඩැනීට ඇසෙන්නට විය. තඹ පැහැ සෙවනැලි තුනක් මෙන් ඔහුගේ රුධිරාරක්ෂකයින් තිදෙනා ද ඔහු පසුපසින් පැමිණෙන්නට වූහ. ඩනේරිස් ගේ සියොලඟම සීතල වී ගියේය. "එයා කියනවා මිනිහෙකුට පලඳින්ට බය හිතෙන තරම් ලස්සන ඔටුන්නක් ඔයාට දෙනවයි කියලා."

සිනාසුනු විසේරිස් අසිපත පහත්කලේ ය. දුක්මුසුම දර්ශනය එය විය. එදායින් පසු සැමදාමත් ඇයව රිදවූ, ඇයව හැඩවූ දර්ශනය එය විය... ඔහු සිනාසුනු ආකාරය විය. "එච්චරයි මට ඕන කරන එකම දේ. මට පොරොන්දු වෙච්ච දේ." ඔහු කිවේය.

ඇගේ සූර්යයා ඇය වෙත සමීප වූ පසු ඩැනී ඔහුගේ බඳ වටා අතක් යවා වැළඳගත්තා ය. ඛාල් වදනක් බිනූ අතර ඔහුගේ රුධිරාරක්ෂකයින් ඉදිරියට පිනූහ. ක්වොතෝ විසේරිස් ගේ අත්දෙකින් අල්ලාගත් අතර හග්ගෝ සිය දැවැන්ත අතින් අල්ලා ඇඹරීමෙන් ඔහුගේ මැණික්කටුව බිඳ දැමීය. කොහොලෝ ඔහුගේ අප්‍රාණික අතැඟිලිවලින් අසිපත මුදාගත්තේ ය. සිදුවන්නට යන්නේ කුමක්දැයි මේ වනතුරුත් විසේරිස්ට හැඟීමක් නොවීය. "නෑ." ඔහු මුරගෑවේය. "උඹලාට බෑ මාව අල්ලන්ට. මම තමා මකරා. මම තමා මකරා. මම අභිෂේක ලබන්ටයි යන්නෙ!"

ඛාල් ඩ්‍රෝගෝ සිය ඉණ බැඳි පටිය ගැලවීය. එහි වූ සෑම පදක්කමක්ම මිනිසකු ගේ අතක් තරම් විශාල, අලංකාර කැටයමින් සැරසුනු, තනි රනින් නිමැවුනු ඒවා විය. ඔහු අණක් නිකුත්කලේය. වහල් කෝකියන් විසින් ගිනිමැලයට ඉහළින් එල්ලා තිබුනු දැවැන්ත යකඩ හට්ටියක් ඔසවා එහි වූ ඉස්ටුව බිම හලා නැවතත් එම හට්ටිය ගින්නට උඩින් එල්ලූහ. සිය ඉණපටිය ඒ තුළට විසිකර දැමූ ඩ්‍රෝගෝ රත්රන් උණු වී රත් පැහැයට හැරෙන ආකාරය දෙස කිසිදු හැඟීමක් නැති දෑසින් බලා සිටියේය. ඔහුගේ අගත්ති පැහැ දෑසේ ගිනිදළු නටන'යුරු ඩැනී දුටුවාය. වහලෙකු විසින් ඔහුට අශ්ව ලොමින් කල ඝනකම් කෝකි අත්වැසුම් දෙකක් පිරිනැමූ අතර ඔහු හට්ටිය දෙස බලාගෙනම ඒවා පැළැඳගත්තේ ය.

මරණයට මුහුණදෙන බියගුල්ලෙකු ගේ මුවින් පිටවන ඒ කිසිදු තේරුමක් නොමැති, තියුණු, අදෝනාත්මක කෑගැසීම විසේරිස් ගේ මුවින් පිටවන්නට විය. ඔහු බිම දෙපය ගසමින්, ඇඹරෙමින්, බලු කුක්කෙකු මෙන් වේදනාවෙන් කෙඳිරිගාමින්, කුඩා දරුවෙකු මෙන් හඩන්නට විය. එනමුදු ඩොත්රැකියෝ ඔහුව තදින් අල්ලාගෙන සිටියහ. මේ වනවිට සෙර් ජෝරා නැවතත් ඩැනීගේ පසෙකට පැමිණ තිබින. ඔහු ඇගේ උරහිස මතින් අතක් තැබීය. "අහකට හැරෙන්ට මගේ කුමාරි. මම බොහොම බැගෑපත්ව ඉල්ලා හිටිනවා."

"මට බෑ." ඇය ආරක්ෂාකාරී අයුරින් සිය උදරයට උඩින් දෑත් බැඳගත්තා ය.

අන්තිමේදී විසේරිස් ඇය දෙස බැලීය. "නංගී, කරුනාකරලා... ඩැනී එයාලට කියාපන්... මගේ ආදරණීය නංගී..."

රත්රන් අඩක් උණු වී උකු තත්ත්වයට පත් වූ පසු එදෙසට නැඹුරු වූ ඩ්‍රෝගෝ හට්ටිය ඔසවාගත්තේ ය. "ඔටුන්න!" ඔහු ගුගුලේය. "මෙන්න. කරත්ත රජාට ඔටුන්නක්!" ඔහු උණු වූ රත්රන් සහිත හට්ටිය විසේරිස් ගේ - එක් කලෙක ඇගේ සොහොයුරාව සිටි පුද්ගලයා ගේ - හිසේ මුනින් අතට නැමීය.

මේ අතිභයානක යකඩ ශිරස්කයෙන් සිය හිස වැසී යද්දී විසේරිස් ටාර්ගේරියන් නැගූ හඬ අමානුෂික, වේදනාත්මක කෑගැසීමක් විය. දැඩි වේගයෙන් බිම ගැසූ ඔහුගේ දෙපා කෙමෙන් වේගය අඩු වී ගොස් අන්තිමේදී නිශ්චල විය. උනු රත්රන් දියර බිංදු පහළට වැස්සී ඔහුගේ කමිස කබාය මතට වැටුනු අතර එයින් දුම් දමන්නට විය... එනමුදු එහි එකදු ලේ පැල්ලමක්වත් දකින්නට නොවීය.

'එයා මකරෙක් නෙවෙයි!' පුදුමකරවන අන්දමේ ශාන්තභාවයකින් යුතුව ඩැනී සිතුවාය. 'ගින්දරට බෑ මකරෙක්ව මරන්ට.'

**Jorah Mormont: “We are in Vaes Dothrak, no one may carry a blade here or shed a man’s blood.”**

එඩාර්ඩ් 13-1

මීට පෙරදු දහස් වතාවක් කර ඇති පරිද්දෙන් ඔහු වින්ටර්ෆෙල්වලට යටින් වූ සොහොන් ගුහා තුළ ඇවිදිමින් සිටියේය. ශීත රජුන් ඔහු පියමැන යන ආකාරය දෙස සිය මිදුනු දැසින් බලා සිටි අතර ඔවුන් ගේ දෙපා අසල සිටි සෝරවෘකයෝ සිය ශෛලමය හිස් ඔසවා ඔහු දෙස බලා විලිස්සූහ. අන්තිමේදී ඔහු තමා දෙපසින් බ්‍රැන්ඩන් හා ලියානා සමගින් නිදාසිටින සිය පියාගේ සොහොන් ගැබ වෙත පැමිණියේ ය. "මට පොරොන්දු වෙන්ට නෙඩ්." ලියානා ගේ ප්‍රතිමාව කෙඳිරුවා ය. ඇගේ ගෙල වටා නිල් පැහැ රෝසමලින් කල මාලයක් පළඳා තිබුනු අතර ඇගේ දැසින් කඳුළු වෙනුවට රුධිර බිඳු වැහෙන්නට විය.

එඩාර්ඩ් ස්ටාර්ක් සැනෙන් නැගිට සිටියේය. ඔහුගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබුනු අතර ඇඳ ඇතිරිලි ඔහු වටා විසිරී තිබුනි. කාමරය අන්ධකාරයෙන් පිරී පැවතුනු අතර කවුදෝ මහහඬින් දොරට තඩිබාමින් හුන්නේය. "එඩාර්ඩ් උතුමානනි." කටහඬක් හඬගෑවේය.

"පොඩ්ඩක් ඉන්ට." අන්ධකාරය කාමරය තුළ නිදිමතේ වැනී වැනී මෙන් ඔහු දොර දෙසට පියමැන්නේ ය. ඔහු දොර විවර කල විට එතැන ටොමාර්ඩ් ද පන්දමක් අතින් ගත් කේන් ද ඒ දෙදෙන අතරින් රජතුමා ගේ නිවාස භාරකරුවා ද සිටගෙන සිටියහ.

මේ මිනිසා ගේ මුහුණ ගලින් කල පිළිමයක් මෙන් කිසිදු හැඟීමක් නොපෙන්වී ය. "මගේ හස්තයේ උතුමානනි. රජතුමා ඔබට මේ දැන්මම එන්ටයි කියලා අණ කලා."

'එහෙනම් රොබර්ට් දඩයම් සවාරිය නිමාකරලා ඇවිල්ලා.' ඔහු ඕනෑවටත් වඩා වැඩි කාලයක් ඒ වෙනුවෙන් වැයකර තිබුනි. "මට ඇඳුම් ඇඳගන්ට පොඩි වේලාවක් ඕන." මිනිසා පිටත සිටගෙන සිටියදී ඔහු කේන්ගේ උදවු ඇතිව ඇඳුම් හැඳගත්තේ ය. සුදු පැහැ හණ රෙද්දෙන් කල කමිසයක් හා අළු පැහැ සළුවක් පැළැන්දේ ය. වෙළුම් පටි යෙදූ පාදයට පහසු වනු පිණිස කලිසම් කකුල අඩක් පලා දමා තිබින. සිය තනතුරට හිමි සලකුණ ද බරැති රිදී දම්වැලින් නිම කල ඉණපටියක් ද පැළැඳි ඔහු වැලිරියන් කිනිස්ස ඉණේ රුවාගත්තේ ය.

අභ්‍යන්තර අංගනය ඔස්සේ ටොමාර්ඩ් හා කේන්ගේ උදවු ඇතිව ඔහු පියනගද්දී රතු බලකොටුව අන්ධකාරයේ හා නිහඬතාවයේ ගැලී පැවතින. ප්‍රාකාරයට ඉහළින් පුරපස සඳ පායා තිබින. පවුරු අටල්ලෙහි වූ රන් කබා පැළැඳි මුරසෙබළෙක් සිය මුර සක්මනෙහි යෙදෙමින් හුන්නේය.

රාජකීය නවාතැන වූයේ 'මේගර් ගේ බලකොටුව' නමින් හැඳින්වුනු රතු බලකොටුව මධ්‍යයේ පිහිටි දැවැන්ත චතුරස්‍රාකාර බලකොටුවක් විය. එහි බිත්ති අඩි දොලසක් ඝනකම් වූ අතර එය වටා යවුල් සිටවූ වියළි අගලක් පිහිටා තිබුනි. එය බලකොටුවක් තුළ පිහිටි තවත් බලකොටුවක් විය. අගලට ඉහළින් වූ පාලමේ එහා කොණේ සුදු පැහැ වානේ සන්නාහයෙන් සැරසුනු සෙර් බොරෝස් බ්ලොන්ට් මුරකාවලෙහි යෙදී සිටියේය. පඩිපෙළ පාමුල සෙර් ප්‍රෙස්ටන් ග්‍රීන්ෆීල්ඩ් මුරකාවල් කල අතර රජතුමා ගේ නිදන කාමරයේ දොරට පිටතින් සෙර් බැරිස්ටාන් සෙල්මි රැකවල් කලේය. සුදු ඇඳුමින් සැරසුනු නයිට්වරුන් තිදෙනෙක්! ඔහුට සිය සිහිනය මතක් විය. ඔහුගේ සිරුර පුරා අමුතුම සීතලක් දිවයන්නට විය. සෙර් බැරිස්ටාන් ගේ මුහුණ ඔහුගේ සන්නාහය තරම්ම සුදුමැලි විය. ඔහුගේ මුහුණ දෙස බැලූ එක් බැල්මකින්ම කොතැනක හෝ භයානක වැරැදීමක් සිදුව ඇති බැව් නෙඩ් වටහාගත්තේ ය. රාජකීය නිවාස භාරකරුවා දොර හැරියේය. "රජතුමාගේ හස්තය, එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන්." ඔහු නිවේදනය කලේය.

"එයාව මෙහාට ගෙනෙල්ලා." රොබර්ට් ගේ ස්වරය අසාමාන්‍ය අන්දමින් පැටලිලි සහගත විය.

කාමරයේ දෙකෙලවර වූ ගිනිඋඳුන් දෙකම දල්වා තිබුනු අතර එයින් නැගුනු ගිනිදළුවලින් කාමරය පුරා මලානික රත් පැහැයක් විහිද තිබුනි. එහි වූ උණුසුම හුස්ම හිරකරවනසුළු විය. රොබර්ට් වියන් ඇඳ මත වැතිර සිටියේය. ප්‍රධාන මේස්ටර් පයිසෙල් ඇඳ අසල එකල මෙකල වෙමින් සිටි අතර රෙන්ලි උතුමානන් වසා දැමූ කවුළු අසල නොසන්සුන් අයුරින් ඇවිදිමින් සිටියේය. සේවකයෝ කාමරය තුළ එහා මෙහා යමින්, උඳුනට දර දමමින්, වයින් උණුසුම් කරමින් සිටියහ. සෙර්සි ලැනිස්ටර් ඇඳේ කොණක සිය සැමියා පසෙකින් අසුන්ගෙන සිටියාය. නින්දේ සිටියාක් මෙන් ඇගේ කෙහෙරැළි අවුල්ව තිබුනු නමුදු ඒ දෑසේ කිසිඳු නිදිමත ගතියක් නොවීය. ටොමාර්ඩ් හා කේන්ගේ සහායෙන් නෙඩ් කාමරය හරහා ඇදෙද්දී ඒ දෑස් ඔහු දෙසට එල්ලවූයේ ය. ඔහු කෙතරම් සෙමින් ඇවිද්දේ ද යත් තවමත් සිහිනයෙන් ඇවිදින්නාක් මෙන් ඔහුට හැඟින.

රජතුමා තවමත් සිය බූට්ස් සපත්තු පැළැඳ සිටියේය. රොබර්ට්ව වසා තිබුනු පොරෝණයෙන් පිටතට විහිද තිබුනු දෙපාවල ඇලී තිබුනු වියළි මඩ හා තණපත් ඔහුට දිස්විය. කපා විවර කර තිබුනු කොළ පැහැ පිට කබායක් බිම වීසිකර දමා තිබුනි. එය රතු-දුඹුරු පැහැ පැල්ලමින් ගැවසියේ ය. කාමරය පුරා විහිද තිබුනේ දුම් සුවඳ, ලේ සුවඳ හා මරණයේ සුවඳයි.

"නෙඩ්." ඔහු දුටු රජතුමා කෙදිරීය. ඔහුගේ මුහුණ කිරි මෙන් සුදුමැලි වී තිබුනි. "වරෙන්... ළඟට වරෙන්."

ඔහුගේ මිනිසුන් දෙදෙන ඔහුව ඇඳ අසලට රැගෙන ආහ. ඇඳ කණුවක් අල්ලාගත් නෙඩ් සිරුර සමබර කරගත්තේ ය. රොබර්ට්ව දුටු මනතින්ම තත්ත්වය කෙතරම් බැරෑරුම්දැයි ඔහු වටහාගත්තේ ය. "මොන...?" ඔහු කතා කරන්නට උත්සාහ කලමුත් උගුර වියළී තිබින.

"වල් ඌරෙක්." රෙන්ලි උතුමානන් තවමත් දඩයමට හැඳි කොළ පැහැ ඇඳුමින් සැරසී සිටියේය. ඔහුගේ සළුව පුරා ලේ විසිවී තිබින.

"යකෙක්." රජතුමා කීය. "මගෙම වැරැද්ද. මාව යකාටම ගියාවෙ. මම ඕනවටත් වඩා වැඩිපුර වයින් බීලා හිටියෙ. මගේ හෙල්ල පාර වැරදුනා."

"එතකොට අනිත් අය කොහෙද හිටියෙ?" නෙඩ් රෙන්ලි උතුමානන් වෙතින් විමසීය. "කොහෙද සෙර් බැරිස්ටානුයි රාජ්‍යාරක්ෂක බලකායයි හිටියෙ?"

රෙන්ලි ගේ මුව ඇදවී ගියේය. "මගේ අයියා අණකලා අපි හැමෝටම පැත්තකට වෙලා එයාට තනියම ඌරාව දඩයම් කරන්ට දෙන්ටයි කියලා."

එඩාර්ඩ් ස්ටාර්ක් පොරෝණය ඔසවා බැලුවේය.

රජුගේ තුවාලය වසාදැමීම සඳහා ඔවුන් කල හැකි සියල්ලම කර තිබුනි. එනමුදු එය කිසිසේත් ප්‍රමාණවත් නොවීය. ඒ වල් ඌරා අති බිහිසුණු සත්ත්වයකු විය යුතුය. උගේ දළ පහරින් රජුගේ ඉකිලිවල සිට පපුව දක්වා ඉරී තිබින. ප්‍රධාන මේස්ටර් පයිසෙල් විසින් තුවාලය මතින් එලූ වයින් පෙඟවූ වෙළුම්පටි දැනටමත් රුධිරයෙන් පෙඟී කළු පැහැ ගැන්වී තිබින. තුවාලයෙන් නැගුනු දුර්සන්ධය ඉසිලිය නොහැකි තරම් විය. නෙඩ්ගේ උදරය පෙරළී ආයේය. ඔහු වහා පොරෝණය පහත දැමීය.

"ගඳයි නේද?" රොබර්ට් කීය. "මරණයේ ගඳ. මට ඒක දැනෙන්නෙ නැහැයි කියලා හිතන්ට එපා. අර අවජාතකයා මට හොඳ වැඩේ කලේ නේද? ඒ වුනත් මම... ඒ වුනත් මම ඌට වැඩේ දුන්නා නෙඩ්." රජුගේ සිනහව ඔහුගේ තුවාලය තරම්ම භයංකර විය. ඔහුගේ දත් රත් පැහැ වී තිබින. "මම උගේ ඇහැ හරහා කිනිස්සක් බැස්සුවා. අහපන් මුන්ගෙන් මම එහෙම කලේ නැද්ද කියලා. අහපන් මුන්ගෙන්."

"ඇත්තටම." රෙන්ලි උතුමානන් මිමිනුවේ ය. "මගේ අයියාගෙ අණ අනුව අපි උගෙ මළකඳත් ආපහු අරන් ආවා."

"භෝජන සංග්‍රහයට ගන්ටයි කියලා." රොබර්ට් කෙඳිරුවේ ය. "දැන් අපට ඉඩ දීලා කට්ටිය පිටවෙයල්ලා. උඹලා හැමෝම. මට නෙඩ් එක්ක කතා කරන්ට ඕන."

"රොබර්ට්, මගේ ආදරණීය උතුමානනි..." සෙර්සි කතාව පටන්ගත්තා ය.

"මම කිවුවෙ පිටවෙයල්ලා කියලා." රොබර්ට් සිය පැරණි බිහිසුණු බවේ ඡායාවක් තැවරුනු ස්වරයෙන් කීය. "ඒකෙන් මොන කෑල්ලද උඹට තේරෙන්නෙ නැත්තෙ ගැනියෙ?"

නැගිට සිය සාය මඳක් ඔසවාගත් සෙර්සි ආත්ම ගෞරවයද බේරාගෙන දොර දෙසට පියමැන්නා ය. රෙන්ලි උතුමානන් හා අනිකුන් ඒ පස්සේ වැටුනහ. ප්‍රධාන මේස්ටර් පයිසෙල් මඳක් තාවර වූයේ වෙවුලන අතින් රජු වෙත සුදු පැහැ දියරයක් පිරි කෝප්පයක් පිරිනැමීය. "පොපි යුෂ මගේ ස්වාමිනී. වේදනාව අඩුවෙන්ට බොන්ට."

පිටිඅත්ලෙන් පහරක් එල්ල කල රොබර්ට් කෝප්පය විසිකර දැමීය. "පලයන් යන්ට උඹත්. මම බොහොම ඉක්මනට නිදාගන්ට තමා යන්නෙ නාකි මෝඩයො. පලයන් යන්ට මෙතැනින්."

කාමරය හරහා ගාටමින් යද්දී පයිසෙල් නෙඩ් දෙසට දුක්ඛිත බැල්මක් හෙලුවේය.

"උඹ යකාටම පලයන් රොබර්ට්!" ඔවුන් දෙදෙන තනි වූ විට නෙඩ් රජු ඇමතීය. ඔහුගේ පාදයේ වේදනාව කෙතෙක් ද යත් ඔහු අන්ධවූවාක් මෙන් හැඟින. එසේ නැතහොත් ඔහුගේ දෑසේ පටලයක් බැඳුනේ දුක නිසා වන්නට ඇත. ඔහු හෙමිහිට ඇඳ පසෙකින්, සිය මිතුරා අසලින් වාඩි විය. "ඇයි උඹ හැමවෙලාවෙම ඔච්චර මුරණ්ඩු වෙන්නෙ?"

"ආහ්! පලයන් යන්ට නෙඩ්." රජු බැරෑඩි හඬින් කීවේය. "මම ඒ අවජාතකයාව මැරුවානෙ. හොඳයි නැද්ද?" නෙඩ් දෙස රවා බලද්දී ඔහුගේ දෑස් වසා කළු පැහැ කෙස් රොදක් වැටුනේය. "උඹටත් ඒකම තමා කරන්ට ඕන. මිනිහෙකුට නිදහසේ දඩයම් කරන්ටවත් දෙන්නෙ නෑ. සෙර් රොබාර් මාව මුනගැහෙන්ට ආවා. ග්‍රෙගර්ගෙ ඔළුව. බොහොම නරක කල්පනාවක්. මම දඩබල්ලාට කිවුවෙ නෑ. සෙර්සි මිනිහව පුදුම කරපුවාවෙ." තුවාලයෙන් නැගුනු වේදනාව නිසා ඔහුගේ සිනහව වේදනාත්මක කෙඳිරියක් බවට පෙරැලින. "දෙයියො මට සමාව දෙන්ට!" ඔහු වේදනාව සඟවාගනිමින් කෙඳිරුවේය. "අර කෙල්ල. ඩනේරිස්. උඹ හරි, ඒකි පුංචි දැරිවියක් තමා... ඒක තමා, දැරිවි... දෙයියො වල්ඌරාව එවුවෙ... මට දඬුවම් කරන්ට..." රජතුමා කැස්ස අතර මුවින් ලේ බිඳිති විසිවිය. වැරැදියි. ඒක වැරැදියි. මම... පුංචි කෙල්ලෙක්... වාරිස්, සුළැඹිල්ලා, මගේම මල්ලි වුනත්... කිසිම වැඩක් නෑ... ඒක මට කියන්ට උඹ ඇරෙන්ට වෙන කිසිම කෙනෙක් හිටියෙ නෑ නෙඩ්... උඹ විතරයි..." ඔහු දුබල අයුරින් සිය අත ඔසවා සන්කලේය. "තීන්තයි කොලයි. ඔන්න ඔතැන මේසෙ උඩ. මම කියන දේ ලියපන්."

කඩදාසිය සිය දණහිස මත අතුරාගත් නෙඩ් පිහාටු පෑනක් අතට ගත්තේය. "ඔබගෙ අණ මගේ ස්වාමිනී."

"මේ තමා රොබර්ට් බරතියන්ගෙ අන්තිම කැමැති පත්‍රය. ඒ නමින් වන පළමුවෙනියා වූ ද, අන්දාල්වරුන් ගේ රජු වූ ද, ඔය ඔක්කොම මලඉලවු තනතුරු ටික දාපන්. උඹ දන්නවනෙ ඒක කොහොමද යන්නෙ කියලා... මම මෙයින් අණකර ප්‍රකාශකර සිටින්නේ රජතුමා ගේ

හස්තය හා වින්ටර්ෆෙල්හි අධිපතියා වන ස්ටාර්ක් වංශයේ එඩාර්ඩ් මේ රාජධානියේ උපරාජයා ලෙසත් රාජධානියේ ආරක්ෂකයා ලෙසත් පත්කරන බවයි. මගේ... මරණයෙන් පසු මා වෙනුවට... මගේ පුත්‍රයා ජොෆ්රි නිසි වයස් පැමිණෙන තුරු ඔහු විසින් මේ රාජධානිය පාලනය කරනු ඇත..."

"රොබර්ට්..." ජොෆ්රි ඔබේ පුතා නෙවෙයි, ඔහුට කියන්නට උවමනා විය. එනමුදු ඒ වදන් මුවින් පිටතට ගලා ආවේ නැත. රොබර්ට්ට දැනෙමින් තිබුනු වේදනාව ඔහුගේ මුහුණින් පැහැදිලිවම දැකිය හැකි විය. ඔහුට තවදුරටත් රිදවන්නට නෙඩ්ට අවශ්‍ය නොවීය. එබැවින් ඔහු හිස පහත්කරගෙන දිගටම ලියන්නට විය. එහෙත් රජතුමා 'මගේ පුත්‍රයා ජොෆ්රි' යනුවෙන් පැවසූ තැන 'මගේ උරුමක්කරු' යනුවෙන් යොදන්නට ඔහු අතපසු නොකලේය. මේ කරනලද වංචාව නිසා ඔහුට මහත් වරදකාරී බවක් දැනෙන්නට විය. 'ආදරේ නිසා අපි කියන බොරු!' ඔහු කල්පනා කලේය. 'දෙවියන් මට සමාව දෙත්වා!'
"ඔබට තව මොනවද කියන්ට ඕන?"

"කියහන්... උඹට ඕන දෙයක්. රැක බලාගන්ට, ආරක්ෂා කරන්ට. පැරණි හා නව දෙවිවරුන් ගේ නාමයෙන්. උඹ දන්නවනෙ ඔය විකාර වචන ටික. ඒ ටික ලියහන්. මම අත්සන් කරන්නම්. මම මලාට පස්සෙ උඹ ඒක රාජසභාවට ඉදිරිපත් කරපන්."

"රොබර්ට්..." නෙඩ් දුකින් පීඩිත වූ ස්වරයෙන් කීය. "උඹට මේක මෙහෙම කරන්ට බෑ. මාව දාලා මෙහෙම මැරෙන්ට එපා. මේ රාජධානියට උඹව අවශ්‍යයි."

රොබර්ට් ඔහුගේ අතකින් අල්ලාගත්තේ ය. ඔහුගේ අතැඟිලි දැඩිව මසට කාවැදුනි.
"උඹනම්... මහ නරක බොරුකාරයෙක්, නෙඩ් ස්ටාර්ක්." රජතුමා වේදනාව මැඩගනිමින් කතාකලේය. "රාජධානිය... රාජධානිය දන්නවා... මම කොච්චර නරක රජෙක්ද කියලා. ඒරිස් වගේම නරක රජෙක්. දෙයියො මට සමාව දෙන්ට ඕන."

"නෑ. ඒරිස් තරම්ම නරක නෑ. මගේ ස්වාමිනී. කොහෙත්ම ඒරිස් තරමට නරක් වුනේ නෑ."

රොබර්ට් දුබල සිනහවක් පෑවේය. "අඩුමගානෙ... උන් කියයි... මේ අන්තිම දේ... ඒකවත් මම හරියට කලයි කියලා. උඹ මාව අසමත් කරන්නෙ නෑ කියලා මම දන්නවා.

උඹයි දැන් රාජ්‍යය විචාරන්නෙ. උඹ ඒකට වෛර කරයි. මටත් වඩා වෛර කරයි... ඒ වුනත් මම දන්නවා උඹ ඒ වැඩේ හොඳට කරයි. උඹ ඕක ලියලා ඉවරද?"

"එහෙමයි මගේ ස්වාමිනී." නෙඩ් ලිපිය රොබර්ට් වෙතට දිගුකලේය. රජතුමා කිසිවක් නොදකින දෑසින් සිය අත්සන යෙදීය. මේ උත්සාහය නිසා ඔහු ලිපිය පුරා ලොකු ලේ පැල්ලමක් තැවරුවේය. "මේකට මුද්‍රා තියන්ට සාක්කිකාරයො ඕන."

"මගේ අවමගුල් භෝජන සංග්‍රහය වෙනුවෙන් අර ඌරාව පාවිච්චි කරපන්." රොබර්ට් ගොරෝසු හඬින් කෙඳිරිගෑවේ ය. "කටේ ඇපල් ගෙඩියක් ගහලා, හොඳට හම පිපිරෙන ගානට රෝස් කරපන්. ඌව කාපන්. උඹේ හුස්ම හිරවෙනකම්ම කාපන්. මට පොරොන්දු වෙයන් නෙඩ්."

"මම පොරොන්දු වෙනවා." 'මට පොරොන්දු වෙන්ට නෙඩ්' ලියානා ගේ කටහඬ ඔහුගේ හිස තුළ දෝංකාර දෙන්නට විය.

"අර කෙල්ල... ඩනේරිස්... ඒකිට ජීවත්වෙන්ට දියන්. උඹට පුළුවන් නම්... දැනටමත් පරක්කු වැඩි නැත්තම්... උන්ට කතා කරපන්... වාරිස්ට, සුළැඟිල්ලාට... උන්ට එයාව මරන්ට දෙන්ට එපා. ඒවගේම මගේ පුතාට උදවු කරපන් නෙඩ්. එයාට උදවු කරපන්... මට වඩා හොඳ කෙනෙක් වෙන්ට." ඔහු වේදනාවෙන් ඇකිළුනේ ය. "දෙයියො මට සමාව දෙන්ට ඕන."

"දෙයියො උඹට සමාව දෙයි මගේ මිත්‍රයා. දෙයියො සමාව දෙයි."

රජතුමා දෑස් පියාගත් අතර ඔහුට සැහැල්ලුවක් දැනුනාක් මෙන් දිස්විය. "ඌරෙක්ගෙන් මැරුම් කන්ට." ඔහු කටුකුටු ගෑවේය. "මට හිනාවෙන්ට ඕන. ඒ වුනත් එතකොට හරියට රිදෙනවා."

නෙඩ්ට සිනාසිය නොහැකි විය. "මම එයාලට ආපහු කතාකරන්ට ද?"

රොබර්ට් දුබල අයුරින් හිස සෙලවීය. "උඹේ කැමැත්තක්. දෙයියම්පා! ඇයි මෙච්චර සීතල?"

නැවත කාමරයට පැමිණි සේවකයෝ විගස උඳුන්වල ගිනි අලුත් කරන්නට වූහ. රැජිණ පිටවගොස් තිබුනු අතර අඩුම තරමේ එය සැනසීමට කරුනක් විය. ඇයට මොළයක් කියා දෙයක් ඇත්නම් දැන් කල යුතු හොඳම දෙය දරුවනුත් රැගෙන එළිවන්නට පෙර මෙයින් පැනයාමයි. ඇය දැනටමත් ඕනෑවටත් වඩා වැඩි කාලයක් මෙහි ගතකර ඇත.

රොබර්ට් රජතුමාට ඇය නැති බවක් දැනුනේවත් නැත. සිය අන්තිම කැමැති පත්‍රයට මුද්‍රා තබද්දී සාක්කිකරුවන් වශයෙන් සිය සොයුරු රෙන්ලිට හා මේස්ටර් පයිසෙල්ට අසලින් සිටගෙන සිටින්නැයි ඔහු අණකලේය. "දැන් මට වේදනාව අඩුවෙන්ට මොකක් හරි දීපල්ලා. ඊටපස්සෙ මට මැරෙන්ට දීපල්ලා."

පයිසෙල් නැවත වරක් ලහිලහියේ ඔහු වෙනුවෙන් පොපි යුෂ කෝප්පයක් සූදාණම් කලේය. මේ වතාවේ රජතුමා ඒ සියල්ලම පානය කලේය. හිස් කෝප්පය පසෙකට විසිකරද්දී ඔහුගේ කළු රැවුල පුරා සුදු පැහැ බිඳිති විසිර ගියේය. "මට හීන පෙනෙයිද?"

නෙඩ් ඔහුට පිළිතුරු දුන්නේය. "එහෙමයි මගේ ස්වාමිනී."

"බොහොම හොඳයි." ඔහු සිනාසුනේ ය. "මම ලියානාට උඹේ ආදරේ දෙන්නම් නෙඩ්. මං වෙනුවෙන් මගේ දරුවො ටික බලාගනින්."

මේ වදන් පිහිපහරවල් මෙන් නෙඩ්ගේ පපුවේ ඇනෙන්නට විය. එක් මොහොතකට ඔහුට කිවයුත්තක් සිතාගත නොහැකි විය. ඔහුට බොරුවක් කියාගත නොහැකි විය. ඊළඟ මොහොතේ ඔහුට රොබර්ට්ගේ අවජාතකයින් සිහිපත් විය. සිය මවගේ ඇකයේ නිදාසිටින පුංචි බාරා, මිටියාවතේ සිටින මයා, කම්මලේ සිටින ජෙන්ඩ්‍රි සහ අනිකුත් සියල්ලන්ම. "මම එහෙම කරන්නම්... ඔබේ දරුවො මගේ දරුවන් තරම්ම හොඳින් බලාගන්නම්." ඔහු මුදු ස්වරයෙන් කීය.

හිස සැලූ රොබර්ට් දෙනෙත් පියාගත්තේ ය. පොපි යුෂ විසින් ඔහුගේ වේදනාව මකා දමද්දී සිය පැරණි ආදරණීය මිත්‍රයා කොට්ට තුළ මෘදු අයුරින් කිඳා බැස නිදාගන්නා ආකාරය නෙඩ් බලා සිටියේය.

මේස්ටර් පයිසෙල් නෙඩ් වෙතට ළඟාවද්දී ඔහුගේ බරැති දම්වැල නද දුන්නේය. "මට පුළුවන් උපරිමය මම කරනවා මගෙ උතුමානනි. ඒ වුනත් මේ තුවාල කුණුවෙලා. එතුමාව මා ගාවට අරන් එන්ට එයාලට දවස් දෙකක් ගිහිල්ලා තියෙනවා. මම එයාව දකිනකොට පරක්කු වැඩියි. මට එතුමන්ගෙ වේදනාව අඩුකරන්ට පුළුවන්. ඒ වුනත් එතුමන්ව දැන් සනීප කරන්ට පුළුවන් දෙවියන්ට විතරයි."

"කොච්චර කාලයක් යයිද?" නෙඩ් ඇසීය.

"හරි විදියට නම් එතුමා දැනටමත් මැරිලයි ඉන්ට ඕන. මම කවමදාවත් දැකලා නෑ කිසිම මිනිහෙක් මෙච්චර තදින්, මෙච්චර බිහිසුණු විදියට ජීවිතේ එල්ලිලා ඉන්නවා."

"මගේ අයියා හැමදාමත් ශක්තිමත්." රෙන්ලි උතුමානන් කීවේය. "සමහරවිට ඥානවන්ත නොවෙන්ට පුළුවන්. ඒ වුනත් ශක්තිමත්." නිදන කාමරය තුළ වූ හුස්ම හිරකරවනසුළු උණුසුම නිසා ඔහුගේ නළලින් ඩා බිඳු වෑහෙමින් තිබින. ඔහු හරියටම රොබර්ට් ගේ භූතාත්මයක් මෙන්, තරුණ, කඩවසම් රූපාකාරයකින් යුතුව එතැන සිටගෙන සිටියේය. "එයා අර ඌරාව මැරුවා. එයාගෙ බඩ ඇරිලා අතුණුබහන් එළියට ඇවිල්ලයි තිබුනෙ. ඒ වුනත් එයා කොහොමහරි ඌරාව මැරුවා." ඔහුගේ කටහඬ විමතියෙන් පිරී තිබින.

"රොබර්ට් කියන්නෙ තමන්ගෙ සතුරෙක් කෙලින් කටින් ඉන්නතාක්කල් කිසිමදාක සටන් බිමෙන් පිටවෙලා ගිය කෙනෙක් නෙවෙයි." නෙඩ් ඔහුට කීවේය.

දොරට පිටතින් සෙර් බැරිස්ටාන් සෙල්මි තවමත් මුරකාවලෙහි යෙදී සිටියේය. "මේස්ටර් පයිසෙල් රොබර්ට්ට පොපි යුෂ දුන්නා. මගේ අවසරයක් නැතුව කිසිම කෙනෙකුට එයාගෙ විවේකයට බාධා කරන්ට ඉඩදෙන්ට එපා." නෙඩ් ඔහුට පැවසීය.

"ඔබතුමාගෙ අණ ඒ විදියටම ඉටුවේවි මගෙ උතුමානනි." සෙර් බැරිස්ටාන් සිය වයසටත් වඩා මහලු වූවාක් මෙන් පෙනින. "මා ගැන තිබ්බ ගෞරවනීය විශ්වාසය රකින්ට මට බැරිවුනා."

"හොඳම නයිට්වරයෙකුටවත් බෑ රජතුමාව එයාගෙන්ම බේරගන්ට. රොබර්ට් වල් ඌරෙ දඩයම් කරන්ට බොහොම ආසා කලා. මම දැකලා තියෙනවා එයා ඌරො දාස්ගානක් දඩයම් කරන හැටි." ඔහු කිසිදු ඇසිපිය සැලීමකින්වත් තොරව සිටිපිය සිටගෙන සිටිනු ඇත. දෙපා පළල් කරගෙන, සිය දැවැන්ත හෙල්ලය දෑතින් රැගෙන බලාසිටිනු ඇත. එමෙන්ම ඌරා පිම්මේ ඔහු වෙතට පිඹගෙන එද්දී ඔහු ඌට අවලාද නගනු ඇත, ඌට දෙස් තබනු ඇත. නියම තත්පරය එළඹෙනතුරු බලා හිඳ, සතා ඔහු මතට පනින තෙක්ම බලා හිඳ, අවසන් මොහොතේ එකම එක මාරාන්තික තිර පහරකින් සතාව මරාදමනු ඇත. "කිසිම කෙනෙක් දැනගෙන හිටියෙ නෑ මූ එයාගෙ මාරයා කියලා."

"ඔබ එහෙම කියාපු එක බොහොම කරුනාවන්තයි එඩාර්ඩ් උතුමානනි."

"රජතුමාත් ඒකම තමා කිවුවෙ. එයා කිවුවෙ වයින් නිසා මේ දේ වුනයි කියලා."

නයිට්වරයා දුබල අයුරින් හිස වැනීය. "අපි ඌරාව උගේ ලෙනෙන් එලවන් එද්දිත් රජතුමා සැදලේ උඩ වැනි වැනියි හිටියෙ. ඒ වුනත් එතුමා අණකලා අපි හැමෝටම පැත්තකට වෙලා එයාට ඉඩදෙන්ටයි කියලා."

"මම මේ කල්පනා කරන්නෙ සෙර් බැරිස්ටාන්," වාරිස් මෘදු ස්වරයෙන් ඇසීය. "කවුද රජතුමාට වයින් දුන්නෙ?"

පණ්ඩකයා ගේ පැමිණීම නෙඩ්ට ඇසී නොතිබුනි. එනමුදු ඔහු හිස ඔසවා බලද්දී වාරිස් එතැන විය. ඔහු බිම ගෑවෙන තරම් දිග, කළු විල්ලුද කබායක් පැළැඳ, අලුතෙන් මුහුණට පූයර දමා තිබුනි.

"ඒ වයින් රජතුමාගෙම වයින් මල්ලෙන්." සෙර් බැරිස්ටාන් පිළිතුරු දුනි.

"එකම එක මල්ලක් විතරක්? දඩයම කියන්නෙ බොහොම තිබහ හැදෙන දෙයක්."

"මම ඒකනම් ගණන් කලේ නෑ. ඒ වුනත් කිසිම සැකයක් නෑ, එකකට වඩා වැඩිවෙන්ට ඕන. එයාට ඕන වුන හැමවෙලාවෙම එයාගෙ සහචරයා ඉක්මනටම අලුත් වයින් මල්ලක් ගෙනත් දුන්නා."

"කොච්චර හොඳ කීකරු කොලුවෙක්ද. තමන්ගෙ රජතුමාට විඩා වැටෙන්ට නොදී හැම වෙලාවෙම එහෙම සංග්‍රහ කරන්ට වගබලාගන්න එක." වාරිස් කීය.

නෙඩ්ගේ මුවට තිත්ත රසයක් දැනෙන්නට විය. රොබර්ට් ගේ සහචරයින් වශයෙන් සේවය කල තඹ පැහැ හිසකෙසින් යුතු අර ගැටවරයින් දෙදෙනා ඔහුගේ සිහියට නැගෙන්නට විය. "කොයි එක්කෙනා ද?"

"වැඩිමහලු එක්කෙනා." සෙර් බැරිස්ටාන් පිළිතුරු දුනි. "ලැන්සල්."

"මම දන්නවා ඒ කොලුවාව බොහොම හොඳට." වාරිස් පැවසීය. "බොහොම ශක්තිසම්පන්න කොලුවෙක්. සෙර් කෙවන් ලැනිස්ටර්ගෙ පුතා. ටයිවින් උතුමානන්ගෙ බෑණා. රැජිණගෙ ළඟම ඥාතියෙක්. මම ප්‍රාර්ථනා කරනවා මේ කොල්ලා රජතුමාගෙ මරණය ගැන තමන්ට දෙස් තියාගන්න එකක් නැහැයි කියලා. මේ තරුණ අහිංසක දරුවො කොච්චර ඉක්මනට අනතුරක වැටෙන්ට පුළුවන්ද. මට මා ගැනම මතක්වෙනවා."

සැබැවින්ම වාරිස්ට එක් කලෙක තරුණ වියක් තිබෙන්නට ඇත. එනමුදු ඔහු අහිංසකව සිටියාය යන කරුන සම්බන්ධයෙන් නෙඩ් තුළ කිසිදු විශ්වාසයක් නොවීය. "ඔබ දරුවො ගැන කතාකරපු නිසයි මට මේක මතක් වුනේ. රොබර්ට් ඩනේරිස් ටාර්ගේරියන් ගැන තිබුනු අදහස වෙනස් කරගත්තා. ඔබ මොන මොන විදියේ උපක්‍රම සූදාණම් කරලාද කියන්ට මම දන්නෙ නෑ. ඒ වුනත් ඒවා නවත්තන්ට ඕන. මේ දැන්මම."

"අයියෝ! මේ දැන්මම කිවුවට ප්‍රමාද වැඩියි. මට සමාවෙන්ට, ඒ වුනත් අර කුරුල්ලො දැනටමත් පියාඹලා ඇති. කොහොමවුනත් මම මට පුළුවන් උපරිමය කරන්නම්. ඔබේ අවසරය මගෙ උතුමානනි." හිස නැමූ ඔහු පඩිපෙළ දිගේ පහළට බැස අතුරුදන් විය.

**Petyr Baelish: “You’ll need someone to share your burdens. I assure you, my price would be modest.”**

කේන් හා ටොමාර්ඩ් විසින් පාලමෙන් එතෙර වීම පිණිස නෙඩ්ට උදවු කරමින් සිටින අතරේ මේගර් ගේ බලකොටුව තුළින් රෙන්ලි උතුමානන් මතුවිය. "එඩාර්ඩ් උතුමානනි." ඔහු කෑගැසීය. "ඔබතුමා අමනාපයක් නැත්තම් පොඩි මොහොතක් දෙන්ට පුළුවන්ද?"

නෙඩ් නැවතුනි. "ඔබේ කැමැත්තක්."

රෙන්ලි ඔහු සමීපයට ළඟා විය. "ඔබේ මිනිස්සු අහකට යවන්ට." ඔවුන් දෙදෙන වියළි අගලට ඉහළින් වූ පාලම මධ්‍යයේදී සම්මුඛ වූහ. අගල පතුලෙහි වූ යවුල් මතට සඳඑළිය වැටී රිදී පැහැයෙන් දිලිසුනි.

නෙඩ් අත ඔසවා සන් කල අතර ටොම් හා කේන් හිස නමා ගරුසරු ඇතුව පසුපසට ඇදුනෝය. රෙන්ලි උතුමානන් පාලමේ ඈත කෙලවරේ සිටි සෙර් බොරෝස් දෙසත් ඔවුන්ට පිටුපසින් වූ දොර අභිමුව සිටි සෙර් ප්‍රෙස්ටන් දෙසත් පරීක්ෂාකාරී බැලුම් හෙලීය. "අර ලියුම." ඔහු තවත් ලංවිය. "ඒක උපරාජ පදවිය ගැනද? මගේ අයියා ඔබව රාජධානියේ ආරක්ෂකයා කියලා නම් කලාද?" ඔහු පිළිතුරක් ලැබෙන තෙක් පමා නොවීය. "මගේ උතුමානනි. මගේ පෞද්ගලික ආරක්ෂක බලකායෙ සෙබළු තිහක් ඉන්නවා. ඒත් එක්කම තවත් වංශාධිපතියො, නයිට්වරු, යාළුවො ගොඩක් ඉන්නවා. මට පැයක් දෙන්ට. මම ඔබතුමාට කඩු සීයක් හොයලා දෙන්නම්."

"ඉතින්, කඩු සීයකින් මම මොකක්ද කරන්ට ඕන මගේ උතුමානනි?"

"පහරදෙන්ට! දැන්මම! බලකොටුව නිදාඉන්න වෙලාවෙ." නැවත වතාවක් හිස හරවා සෙර් බොරෝස් දෙස බැලූ රෙන්ලි සිය කටහඬ කෙඳිරුමක් තරමට පහත්කලේය. "අපි ජොෆ්රිව එයාගෙ අම්මගෙන් ඈත්කරලා අපේ අතට ගන්ට ඕන. උපරාජයා හරි මොකෙක් හරි රජතුමාව තමා ළඟ ඉන්න කෙනාට තමා මේ රාජධානිය පාලනය කරන්ට පුළුවන් වෙන්නෙ. අපි මර්සෙලාවයි ටමෙන්වයි අල්ලගන්ටත් ඕන. අපි එයාගෙ ළමයි ටික අල්ලගත්තට පස්සෙ සෙර්සි අපට විරුද්ධ වෙන්ට තරම් නිර්භීත වෙන එකක් නෑ. එතකොට රාජසභාව ඔබව උපරාජයා විදියට අභිෂේක කරලා ජොෆ්රිව ඔබේ බාරයට පත්කරයි."

නෙඩ් ඔහු දෙස නොපහන් බැල්මක් හෙලුවේය. "රොබර්ට් තාම මැරිලා නෑ. දෙයියො සමහරවිට එයාව නොමරා ඉතුරු කරයි. එහෙම නොවුනොත්, මම රාජසභාව කැඳවලා, එයාගෙ අන්තිම කැමැත්ත මොකක්ද කියලා එයාලට නිවේදනය කරලා, රාජකාරිය හරිහැටි බාරගන්නම්. එහෙම නැතුව එයාගෙ ජීවිතේ මේ අන්තිම පැය කීපය එයාගෙ මාලිගාවෙ ලේ හොල්ලලා, බයවෙච්ච දරුවො ඇඳන්වලින් ඇදන් ඇවිල්ලා බොහොම අගෞරවනීය තත්ත්වෙකට පත්කරන්ට මට ඕනකමක් නෑ."

රෙන්ලි උතුමානන් දුනුදියක් මෙන් ඇදී අඩියක් පස්සට තැබීය. "ඔබ ප්‍රමාද කරන හැම මොහොතක් ගානෙම සෙර්සිට සූදානම් වෙන්ට තවත් අවස්ථාව ලැබෙනවා. රොබර්ට් මැරෙන වෙලාව වෙනකොට පරක්කු වැඩිවෙන්ට පුළුවන්... අපි දෙන්නටම."

"එහෙමනම් අපි යාඥා කරමු රොබර්ට් නොමැරෙන්ටයි කියලා."

"ඒකට බොහොම පොඩි ඉඩක් තමා තියෙන්නෙ."

"සමහරවෙලාවට දෙයියො බොහොම අනුකම්පාසහගතයි."

"ඒ වුනාට ලැනිස්ටර්ලා එහෙම නෙවෙයි." ආපසු හැරුනු රෙන්ලි උතුමානන් අගල හරහා ගොස් සිය සොහොයුරා මරණාසන්නව වැතිර සිටින බලකොටුවට ඇතුළුවිය."

නෙඩ් නැවත සිය නවාතැන වෙත පැමිණෙන විට ඔහු වෙහෙසින් හා දුකින් පරිපීඩිතව සිටියේය. එනමුදු දැන් නැවත නින්දට යාමක් ගැන සිතන්නටවත් නොහැකි විය. 'ඔබ සිහසුන් ක්‍රීඩාව කරනවිට එක්කෝ ඔබ දිනන්නේය. නැතිනම් ඔබ මැරෙන්නේය.' සෙර්සි ලැනිස්ටර් දෙව්වනයේදී ඔහුට පවසා තිබුනි. රෙන්ලි උතුමානන් ගේ සහය ප්‍රතික්ෂේප කිරීමෙන් තමා කලේ නිවැරැදි දෙයක් දැයි ඔහු කල්පනා කරන්නට විය. මෙවැනි කුමන්ත්‍රණ සම්බන්ධයෙන් ඔහු තුළ කිසිදු කැමැත්තක් නොවීය. එමෙන්ම දරුවන් ප්‍රාණ ඇපයට ගැනීමේ කිසිදු ගෞරවනීය බවක් ද නොවීය. එනමුදු... සෙර්සි පලායාම වෙනුවට නැවතී සටන්කිරීම තෝරාගතහොත්, ඔහුට රෙන්ලි ගේ අසිපත් සියය උවමනා වනු ඇත. ඊටත් වඩා අසිපත් උවමනා වන ඇත.

"මට ඕන සුළැඟිල්ලා." ඔහු කේන්ට කීවේය. "එයා එයාගෙ නවාතැනේ හිටියෙ නැත්තම් උඹට ඕන තරමක් මිනිස්සු අරන් ගිහින් කින්ග්ස් ලැන්ඩින්ග්වල තියෙන හැම තැබෑරුමක්ම, හැම ගනිකා මඩමක්ම පෙරලලා බලලා හරි මිනිහව හොයාගනින්. හෙට එළිවෙන්ට කලින් එයාව මෙතැනට අරන් වරෙන්." හිස නැමූ කේන් පිටව ගියේය. නෙඩ් ටොමාර්ඩ් දෙසට හැරුනේය. "වින්ඩ් විච් හෙට හැන්දෑවෙ පිටත්වෙනවා. උඹ කණ්ඩායම තෝරගත්තද?"

"මිනිස්සු දහයක් තෝරගත්තා. පෝතර් අණදෙන නිළධාරියා."

"විස්සක් ගනින්. උඹයි අණදෙන නිළධාරියා." පෝතර් නිර්භීත මිනිසකු විය. එනමුදු ඔහු මුරණ්ඩු හිතුවක්කාරයකු විය. සිය දියණියන් දෙදෙන රැක බලාගැනීම සඳහා ඊට වඩා ස්ථිර, සිහිනුවණ ඇති අයකු නෙඩ්ට උවමනා විය.

"ඔබතුමාගෙ කැමැත්තක් මයෙ උතුමානනි. අවංකවම කියනවා නං මෙතැන දාලා යන්ට වෙන එක ගැන මට කිසිම දුකක් නෑ. මට ගැනි නැතුව පාළුයි."

"උඹලා උතුරට යද්දි ඩ්‍රැගන්ස්ටෝන් පහුකරගෙනයි යන්නෙ. උඹ මා වෙනුවෙන් ලියුමක් බාරදෙන්ට ඕන."

ටොම් ගේ මුහුණේ බියමුසු බවක් ඇඳී ගියේය. "ඩ්‍රැගන්ස්ටෝන්වලට මයෙ උතුමානනි?" ටාර්ගේරියන්වරුන් ගේ පුරාණ බලකොටුව වූ මේ දිවයින අශුභ ස්ථානයක් වශයෙන් නමක් දිනා සිටියේය.

කපිතාන් ක්වොස්ට කියාපන්, දූපත පේන මානෙට ආපු ගමන් මගේ කොඩිය උස්සන්ටයි කියලා. මොකද එයාලා සමහරවිට අනවශ්‍ය අමුත්තො ගැන ටිකක් සැකෙන් බලන්ට පුළුවන්. කපිතාන් එතැනට යන්ට පසුබට වුනොත් හරි අකැමැත්තක් පෙන්නුවොත් හරි එයා ඉල්ලන දෙයක් දීපන්. මම උඹට ලියුමක් දෙනවා. උඹ ඒක ගිහින් දෙන්ට ඕන ස්ටැනිස් බරතියන් උතුමානන්ට. වෙන කාටවත් නෙවෙයි. එයාගෙ නිවාස බාරකාරයාට නෙවෙයි. එයාගෙ ආරක්ෂක බලකායෙ අණදෙන නිළධාරියාට නෙවෙයි. එයාගෙ ආර්යාවට නෙවෙයි. ස්ටැනිස් උතුමානන් අතටම දෙන්ට ඕන."

"ඔබතුමා කියන විදියක් මයෙ උතුමානනි."

ටොමාර්ඩ් පිටව ගිය පසු එඩාර්ඩ් ස්ටාර්ක් තමා පසෙකින් මේසය මත ඇති ඉටිපන්දමේ දැල්ල දෙස බලාගත්වනම නිසොල්මනේ සිටියේය. එක් මොහොතකට ඔහුගේ දුක වාවාගත නොහැකි තරම් බලවත් විය. ඔහුට ඒ මොහොතේ අන් කිසිවකටත් වඩා දෙව්වනයට ගොස්, හදවෘක්ෂය ඉදිරිපිට දණින් වැටී රොබර්ට් බරතියන් වෙනුවෙන් යාඥා කරන්නට උවමනා විය. රොබර්ට් ඔහුට සහෝදරයෙකුටත් වඩා ලංවූ තැනැත්තෙකු විය. එඩාර්ඩ් ස්ටාර්ක් විසින් සිය රජතුමා ගේ මිත්‍රත්වය බිඳ දමා ඔහුගේ දරුවන් ගේ උරුමය උදුරාගත්තායැයි සමහරවිට පසුකාලයකදී මිනිසුන් විසින් රහස් කොඳුරනු ඇත. දෙවියන් ඊට වඩා හොඳින් තමාව තේරුම් ගනු ඇතැයි ඔහු ප්‍රාර්ථනා කලේය. එමෙන්ම මරණින් මතු ජීවිතයේදී රොබර්ට් විසින් සත්‍යය අවබෝධ කරගනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය. නෙඩ් රජතුමා ගේ අවසන් ලිපිය එළියට ගත්තේය. රන්වන් ඉටියෙන් මුද්‍රා තැබූ සිනිඳු සුදු පැහැ කඩදාසි රෝලක්. වචන කිහිපයක් හා ලේ පැල්ලමක්. ජයග්‍රහණය හා පරාජය අතර පරතරය කෙතරම් කුඩාද. ජීවිතය හා මරණය අතර පරතරය කෙතරම් කුඩාද.

අලුත් කඩදාසියක් ඇදගත් ඔහු පිහාටු පෑන තීන්ත කූඩුවේ බහාලුවේය. 'බරතියන් වංශයේ ස්ටැනිස් උතුමානන් වෙත ලියා දන්වන වග නම්.' ඔහු ලීවේය. 'ඔබ මෙම ලිපිය දකින මොහොත වන විට ඔබගේ සොහොයුරා, පසුගිය වසර පහළොව පුරා අපගේ රජතුමා වූ රොබර්ට් මියගොස් ඇත. රජවනයේ දඩයම් කරමින් සිටියදී ඔහු වල් ඌරකුගේ පහර කෑමට ලක්විය...'

කඩදාසිය මත වූ අකුරු ඇඹරෙමින් දඟලමින් සිටින්නාක් මෙන් පෙනුනි. ටයිවින් උතුමානන් හා සෙර් ජේමි යනු ලේසියෙන් පරාජය බාරගැනීමට සූදානම් අයවලුන් නොවෙති. පලායාමට වඩා ඔවුහු සටන් මග තෝරාගැනීමට වැඩි ඉඩක් තිබේ. ජොන් ඒරින් ගේ මරණයෙන් පසු ස්ටැනිස් උතුමානන් වඩා පරිස්සම් සහගත වීම පුදුමයට කරුනක් නොවේ. එනමුදු මේ මොහොතේ, ලැනිස්ටර්වරුන් කිංග්ස් ලෑන්ඩින්ග්වලට කඩා වදින්නට පෙර ඔහු සිය සම්පූර්ණ බලයද සහිතව මෙහි පැමිණීම අවශ්‍යම කරුනකි.

නෙඩ් පරිස්සමින් වචන තෝරාබේරාගෙන ලිපිය ලියා අවසන් කලේය. 'එඩාර්ඩ් ස්ටාර්ක්, වින්ටර්ෆෙල්හි අධිපති, රජතුමාගේ හස්තය හා රාජධානියේ ආරක්ෂකයා' යනුවෙන් ලිපියෙහි සිය අත්සන යෙදූ ඔහු තීන්ත පොඟවා දමා, කඩදාසිය දෙවරක් නවා, ඉටිපන්දම් දැල්ලේ ආධාරයෙන් ඉටි උණුකර ලිපියට මුද්‍රා තැබීය.

'උපරාජ පදවිය බොහෝ කෙටි එකක් වනු ඇත.' මුද්‍රාව කෙමෙන් සිසිල්වද්දී නෙඩ් කල්පනා කලේය. අලුත් රජතුමා තමාට හිතවත් නව හස්තයක් පත්කරගනු ඇත. නෙඩ්ට නැවතත් සිය නිවෙස බලා යාමට නිදහස ලැබෙනු ඇත. වින්ටර්ෆෙල් ගැන සිහිවත්ම ඔහුගේ මුහුණට පාණ්ඩු සිනාවක් නැගී ආයේය. ඔහුට නැවත වතාවක් බ්‍රැන්ගේ සිනහව අසන්නට උවමනා විය. රොබ් සමගින් දඩයමේ යාමට උවමනා විය. රිකන් සෙල්ලම් කරන දෙස බලාසිටීමට උවමනා විය. සිය ආර්යාව කැට්ලින් තුරුළු කරගෙන සිය නිදියහනේ සිහින නොදකින සුවබර නින්දක් නිදාගැනීමට උවමනා විය.

මෘදු සුදු පැහැ ඉටි උඩින් සෝරවෘකයාගේ ලාංඡනය තබද්දී කේන් නැවත පැමිණියේ ය. ඔහුත් සමග ඩෙස්මන්ඩ් ද සිටි අතර ඒ දෙදෙනා මැදින් සුළැඟිල්ලා පැමිණියේ ය. "මම හිතන්නෙ සතුට ප්‍රකාශ කිරීම් ටික නියම විදියට තියෙනවයි කියලා." පෙටයර් අසුනකට බර දුන්නේය.

නෙඩ් තරහෙන් රවා බැලුවේය. "රජතුමා තුවාලවෙලා වැටිලා ඉන්නවා මරණාසන්නව."

"මම දන්නවා. ඒ වගේම මම දන්නවා රජතුමා ඔබව රාජධානියේ ආරක්ෂකයා හැටියට නම්කරලා තියෙනවා කියලා."

මේසයේ පසෙක තිබුනු මුද්‍රා නොකැඩූ රජුගේ ලිපිය දෙසට නෙඩ් දෙනෙත් යැවුවේය. "ඉතින් ඔබ කොහොමද ඒක දැනගත්තෙ මගෙ උතුමානනි?"

"වාරිස් කිවුවා එහෙම දෙයක් වෙන්ට පුළුවන් කියලා. ඉතින් දැන් ඔබ ඒක ස්ථිර කලා."

කෝපය නිසා නෙඩ්ගේ මුව ඇදවී ගියේය. "වාරිසුයි උගේ පුංචි කුරුල්ලොයි යකාටම ගියාවෙ. කැට්ලින් කීවෙ ඇත්ත තමා. මේ මිනිහා මොනා හරි මායාබලයක් පාවිච්චි කරනවා. මම ඒ මිනිහව පොඩ්ඩක්වත් විශ්වාස කරන්නෙ නෑ."

"බොහොම හොඳයි. ඔබ ඉක්මනට ඉගෙනගන්නවා." සුළැඟිල්ලා ඉදිරියට නැඹුරුවිය. "ඒ වුනත් මම ඕන ඔට්ටුවක් දාන්ට ලෑස්තියි, ඔබ මේ මහ රෑ ජාමෙ මාව මෙතැනට ඇදගෙන ආවෙ වාරිස් ගැන සාකච්ඡා කරන්ට නෙවෙයි කියලා."

"නෑ." නෙඩ් පිළිගත්තේ ය. "මම දන්නවා ජොන් ඒරින්ට මැරුම්කන්ට තරම් හේතු වුන ඒ රහස මොකක්ද කියලා. රොබර්ට් එයාගෙන් පස්සෙ නියම උරුමක්කාරයෙක් ඉතුරුකරලා නෑ. ජොෆ්රියි ටමෙනුයි කියන්නෙ ජේමි ලැනිස්ටර්ගෙ අවජාතකයො. එයාගෙයි රැජිණගෙයි සම්බන්ධයෙන් උපන් අය."

සුළැඟිල්ලා ඇහිබැමක් එසැවීය. "හරිම පුදුමයි!" ඔහුගේ ස්වරයෙන් කියැවුනේ ඔහු කිසිසේත්ම පුදුමයට පත්නොවූ බවකි. "ගෑනු ළමයත්? කිසිම සැකයක් නෑ. ඒ කියන්නෙ රජතුමා මැරුනට පස්සෙ..."

"නීතිය අනුව රජකම යන්ට ඕන ස්ටැනිස් උතුමානන්ට. රොබර්ට්ගෙ සහෝදරයින්ගෙන් වැඩිමහලු එක්කෙනාට."

මේ ගැන සිතද්දී පෙටයර් උතුමානන් සිය එළු රැවුල පිරිමැද්දේ ය. "ඒ වගේ තමා පේන්නෙ. එහෙම නැත්තම්..."

"එහෙම නැත්තම්, මගේ උතුමානනි? එහෙම වෙන මොකුත් වෙන්ට විදියක් නෑ. ස්ටැනිස් තමා උරුමක්කාරයා. කිසිම දේකින් ඒක වෙනස් කරන්ට බෑ."

"ස්ටැනිස්ට සිංහාසනය ගන්ට බෑ ඔබෙ උදවු නැතුව. ඔබ ඥානවන්ත නම් ඔබ වගබලාගනියි ජොෆ්රි රජකරවන්ට."

නෙඩ් ඔහු දෙස දැඩි බැල්මක් හෙලීය. "ඔබ ළඟ ගෞරවය කියන දේ අංශුමාත්‍රයක්වත් නැද්ද?"

"ආහ්! ඇත්තෙන්ම. අංශුමාත්‍රයක් විතර තියෙනවා." සුළැඟිල්ලා නොසැලකිලිමත් අයුරින් පිළිවදන් දුනි. "මම කියන දේ අහන්ට. ස්ටැනිස් කියන්නෙ ඔබේ යාළුවෙක් නෙවෙයි. මගේ යාළුවෙකුත් නෙවෙයි. එයාගෙම සහෝදරයින්ටවත් එයාව දිරවන්නෙ නෑ. මේ යකා මහ යකඩ මනුස්සයෙක්. දැඩියි. සමාව දෙන්නෙ නෑ. කිසිම සැකයක් නෑ එයා අපට අලුත් හස්තයක්, අලුත් රාජසභාවක් දෙයි. කිසිම සැකයක් නෑ එයා ඔබට ස්තූති කරයි රජකම බාරදුන්නට. ඒ වුනත් ඒකෙන් කියැවෙන්නෙ නෑ එයා ඔබට ආදරේ කරයි කියලා. අනික එයා ආවා කියන්නෙ යුද්ධයක් ඇතිවෙනවා. සෙර්සියි එයාගෙ අවජාතකයොයි මැරෙනකම් ස්ටැනිස්ට සැනසීමෙන් රාජ්‍ය පාලනය කරන්ට බෑ. ඔබ හිතනවද ටයිවින් උතුමානන් නිකං වාඩිවෙලා බලන් ඉඳියි කියලා එයාගෙ දුවගෙ ඔළුව රිටක අමුනනකම්. කාර්ස්ටලී රොක් නැගිටියි. නැගිටලා ප්‍රතිප්‍රහාර දෙයි. තනියම නෙවෙයි. ඒරිස්ට සේවය කරපු මිනිස්සුන්ට රොබර්ට් සමාව දුන්නා එයාට පක්ෂපාතිත්වය පෙන්නලා දිවුරුම් දුන්නානම්. ඒ වුනත් ස්ටැනිස් එහෙම සමාව දෙන කෙනෙක් නෙවෙයි. එයා ලේසියෙන් අමතක කරන එකක් නෑ ස්ටෝර්ම්ස් එන්ඩ් වැටලීම ගැන. ටිරල් උතුමානන්වයි රෙඩ්වින් උතුමානන්වයි අමතක කරන එකකුත් නෑ. මකර කොඩිය යට සටන් කරපු අයටයි, බේලන් ග්‍රේජෝයි එක්ක එකතුවෙලා සටන් කරපු අයටයි බයවෙන්ට හොඳ හේතුවක් තියෙනවා. ස්ටැනිස් බරතියන්ව මේ සිංහාසනේ ඉන්දුවොත්, මම ඔබට පොරොන්දු වෙනවා, මේ රාජධානිය ලේ වලින් පෙඟිලා යාවි."

"දැන් අපි බලමු කාසියෙ අනිත් පැත්ත දිහා. ජොෆ්රිට තාම යාන්තම් දොළහයි. රොබර්ට් ඔබට උපරාජ පදවිය පිරිනැමුවා. ඔබ තමා රජතුමාගෙ හස්තය. ඒ වගේම රාජධානියෙ ආරක්ෂකයා. බලය තියෙන්නෙ ඔබේ අතේයි ස්ටාර්ක් උතුමානනි. ඔබට කරන්ට තියෙන

එකම දේ අත දික්කරලා ඒක ඩැහැගන්න එක විතරයි. ලැනිස්ටර්ලාත් එක්ක සමාදාන වෙන්ට. පුංචි යකා නිදහස් කරන්ට. ජොෆ්රිව ඔබේ සන්සාට බන්දලා දෙන්ට. ඔබේ බාල කෙල්ලව ටමෙන්ට බන්දලා දෙන්ට. ඔබේ උරුමක්කාරයාට මර්සෙලාව බන්දලා දෙන්ට. ජොෆ්රි නිසිවයස් එන්ට තව අවුරුදු හතරක් තියෙනවා. ඒ වෙද්දි ජොෆ්රි ඔබ දිහා දෙවෙනි තාත්තා කෙනෙක් වගේ බලාවි. එහෙම නොවුනොත්, හරි... අවුරුදු හතරක් කියන්නෙ බොහොම දිග කාලයක් මගේ උතුමානනි. ස්ටැනිස් උතුමානන්ව අහක්කරලා දාන්ට ඒ කාලෙ හොඳටෝම ඇති. ඊටපස්සෙ, ජොෆ්රි කරදර කරන්ට පටන්ගත්තොත්, අපට පුළුවන් එයාගෙ අර පුංචි රහස එළිදරවු කරන්ට. කරලා රෙන්ලිව සිහසුනට නග්ගන්ට."

"අපට?"

සුළැඟිල්ලා දෙවුර ඇකිළීය. "ඔබේ දුක් කරදර බෙදාගන්ට තව කවුරු හරි එපැයි. මම සහතික වෙනවා, මගේ මිල බොහොම සොච්චමයි."

"ඔබේ මිල." නෙඩ්ගේ ස්වරය හිම මෙන් සීතල විය. "බේලිෂ් උතුමානනි, ඔබ ඔය කතා කරන්නෙ රාජද්‍රෝහී වීමක් ගැනයි."

"එහෙම වෙන්නෙ අපි පැරදුනොත් විතරයි."

"ඔබට අමතක වෙලාද? ඔබට අමතක වෙලාද ජොන් ඒරින්? ඔබට අමතක වෙලාද ජොරී කසල්. ඔබට අමතක වෙලාද මේකත්?" කිනිස්ස ඇදගත් ඔහු ඔවුන් දෙදෙන අතරින් මේසය මත එය තැබීය. මකරාස්ථි හා වැලීරියන් වානේ. වැරැද්ද හා නිවැරැද්ද අතර වෙනස තරම් තියුණු. ඇත්ත හා බොරුව අතර වෙනස තරම් තියුණු. ජීවිතය හා මරණය අතර වෙනස තරම් තියුණු. "උන් මිනිහෙක්ව එවුවා මගේ පුතාගෙ බෙල්ල කපන්ට  බේලිෂ් උතුමානනි."

සුළැඟිල්ලා සුසුමක් හෙළීය. "සමාවෙන්ට, මට ඒ හැම එකක්ම අමතක වුනා මගේ උතුමානනි. මට සමාවෙන්ට. මොහොතකට මට අමතක වුනා මම මේ කතා කරමින් ඉන්නෙ ස්ටාර්ක් කෙනෙකුට කියලා." ඔහුගේ මුවේ උපහාසාත්මක සිනාරැල්ළක් නැගුනි. "එහෙමනම් ඒ ස්ටැනිස්. සහ යුද්ධය?"

"ඒක තෝරාගැනීමක් නෙවෙයි. ස්ටැනිස් තමා උරුමක්කාරයා."

"රාජධානියෙ ආරක්ෂකයාත් එක්ක අරගල කරන එක මට අයිති දෙයක් නෙවෙයි. එහෙමනම් ඔබ මොකක්ද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ? කිසිම සැකයක් නෑ ඒ මගේ නුවණනම් නෙවෙයි."

"ඔබේ... නුවණ අමතක කරලා දාන්ට මම උපරිම උත්සාහයක් දරන්නම්." නෙඩ් අප්‍රසාදයෙන් යුතුව කීවේය. "මම ඔබට එන්ටයි කිවුවෙ ඔබ කැට්ලින්ට පොරොන්දු වුන උදවුව ඉල්ලන්ටයි. මේක අපි හැමෝටම බොහොම උපද්‍රව සහිත වෙලාවක්. ඇත්ත, රොබර්ට් මාව රාජධානියෙ ආරක්ෂකයා විදියට නම් කලා තමයි. ඒ වුනත් ලෝකයාට ජොෆ්රි තාමත් එයාගෙ පුතා, එයාගෙ උරුමක්කාරයා. රැජිණ කියන ඕන දෙයක් ඕන වෙලාවක කරන්ට සූදානම් වෙච්ච නයිට්වරු දුසිමකුයි සෙබළු සීයක විතර බලමුළුවකුයි ඉන්නවා... මගේ ගෘහාරක්ෂක බලකායෙ ඉතුරුවෙලා ඉන්න එවුන් ටික දෙනාව යටපත් කරගන්ට උන්ට ලේසියෙන්ම පුළුවන්. අනික, අපි නොදන්නවට ජේමි ලැනිස්ටර් දැනටමත් හමුදාවකුත් එක්ක කින්ග්ස් ලැන්ඩින්ග්වලට එන්ට පිටත්වෙලා වෙන්ටත් පුළුවන්."

"ඉතින් ඔබ මෙතැන ඉන්නවා කිසිම හමුදාවක් නැතුව." සුළැඟිල්ලා මේසය මත වූ කිනිස්ස ඇඟිලි තුඩින් කරකවමින් මොහොතක් ගතකලේය. "රෙන්ලි උතුමානනුයි ලැනිස්ටර්ලායි අතර ලොකු ආදරයක් නෑ. ලෝකඩ යොන් රොයිස්, සෙර් බේලන් ස්වෝන්, සෙර් ලෝරාස්, ටන්ඩා ආර්යාව, රෙඩ්වින් නිවුන්නු... මේ හැමෝටම තම තමන්ට පක්ෂපාතී නයිට්වරුයි සෙබළු පිරිසකුයි රාජසභාවෙ ඉන්නවා."

"රෙන්ලිගෙ පුද්ගලික හමුදාවෙ තිහක් ඉන්නවා. අනිත් අයට එච්චරවත් නෑ. ඒ හැමෝම මට සහාය දෙයි කියලා උපකල්පනය කලත් ඒත් සෙනග මදි. මට නගරාරක්ෂකයො ටික මගෙ පැත්තට ගන්ට ඕන. ඒක අවශ්‍යමයි. නගරාරක්ෂක බලකායෙ සෙබළු දෙදාහක් ඉන්නවා. මේ බලකොටුව රකින්ට දිවුරුම් දීපු, නගරය රකින්ට දිවුරුම් දීපු, රජතුමාගෙ සාමය රකින්ට දිවුරුම් දීපු දෙදාහක්."

"අපොයි, ඒ වුනත් රැජිණ එක රජ කෙනෙක් ප්‍රකාශයට පත්කරද්දි, රජතුමාගෙ හස්තය තව රජ කෙනෙක්ව නම් කරද්දි උන් රකින්ට ඕන මොන රජතුමාගෙ සාමයද?" ඇඟිලි තුඩින් කිනිස්ස අල්ලාගත් සුළැඟිල්ලා එය වේගයෙන් කරකැවීය. අන්තිමේදී එහි වේගය බාල වී ගොස් කිනිස්ස නිසල වූ විට එහි තුඩ ඔහු දෙසට හැරී තිබින. "ඇයි! ඔන්න තියෙනවා ඔබේ උත්තරේ." ඔහු සිනාසෙමින් කීවේය. "උන් අහන්නෙ උන්ට පඩි ගෙවන කෙනාගෙ අණ." අසුනේ පසුපසට ඇලවුනු ඔහු නෙඩ්ගේ මුහුණ දෙස කෙලින් බැලුවේය. ඔහුගේ අළු-කොළ පැහැ දෑස් සමච්චලය නිසා දීප්තියෙන් බැබලින. "ඔබේ ගෞරවය ඔබ පළඳින්නෙ හරියට සන්නාහයක් වගේ ස්ටාර්ක්. ඔබ හිතන්නෙ ඒකෙන් ඔබට ආරක්ෂාවක් ලැබෙයි කියලයි. ඒ වුනත් ඇත්තටම ඒකෙන් වෙන්නෙ ඔබේ බර වැඩිවෙලා ඔබට ලේසියෙන් එහා මෙහා වෙන්ට බැරිවෙන එක විතරයි. දැන් බලන්ට ඔබ දිහා. ඔබ හොඳින්ම දන්නවා ඇයි ඔබ මාව මෙතැනට කැඳෙවුවෙ කියලා. ඔබ හොඳින්ම දන්නවා මට මොකක් කරන්ටයි කියලාද කියන්ට ඕන කියලා. ඔබ හොඳින්ම දන්නවා ඒ දේ කරන්ට ඕනමයි කියලා... ඒ වුනත් ඒ වැඩේ ගෞරවාන්විත නෑ. ඒ නිසා ඔබේ උගුරෙ වචන හිරවෙලා. ඔබ ඒ ටික කියාගන්ට බැරුව තටමනවා."

ආතතිය නිසා නෙඩ්ගේ ගෙල දෙපස තද වී ගියේය. ඔහුට කෙතරම් තද කේන්තියක් දැනෙන්නට වී ද යත් මොහොතක් ගතවෙන තෙක් වදනකුදු කතා නොකර සිටියේය.

සුළැඟිල්ලා කොක්හඬලා සිනාසුනේය. "මට තිබ්බෙ ඔබටම ඒක කියාගන්ට ඉඩ දෙන්ටයි. ඒ වුනත් ඒක බොහොම නපුරු වැඩක්... ඉතින් ඒ නිසා බයවෙන්ට එපා මගේ හොඳ උතුමානනි. කැට්ලින් ගැන මගේ හිතේ තියෙන ආදරේ වෙනුවෙන් මම දැන්මම යන්නම් ජේනස් ස්ලින්ට් මුනගැහෙන්ට. ගිහින් නගරාරක්ෂක බලකාය ඔබේ පැත්තට ගන්ට වග බලාගන්නම්. රත්තරන් කාසි හයදාහකට පුළුවන් ඒ වැඩේ කරන්ට. තුනෙන් එකක් අණදෙන නිළධාරියාට. තුනෙන් එකක් අනිත් නිළධාරීන්ට. තුනෙන් එකක් සෙබළුන්ට. ඇත්තම කියනවා නම් අපිට ඒ මුදලින් බාගෙකට උන්ව මිලදී ගන්ට පුළුවන් වෙයි. ඒ වුනත් මේ වෙලාවෙ අනවශ්‍ය අවදානමක් ගන්ට මම සූදානම් නෑ." ඔහු සිනාසෙමින් කිනිස්ස අතට ගෙන මිට පැත්ත ඉදිරියට සිටින සේ නෙඩ් වෙතට දිගුකලේය.

**Eddard Stark: “Even the truest knight cannot protect a king against himself.”**

## ජොන් 06

ජොන් උදෑසන ආහාරය වෙනුවෙන් ඇපල් කේක් හා සොසේජස් අනුභව කරමින් සිටිද්දී සැම්වෙල් ටාර්ලි ඔහු පසෙකින් බංකුව මත ඇද වැටුනේය. "මාව සප්තක දේවස්ථානෙට කැඳවලා තියෙනවා." ඔහු කලබලයෙන් මෙන් කසුකුසු ගෑවේය. "එයාලා මාවත් පුහුණුවීම්වලින් සමත් කරනවලු. උඹලා හැමෝම වගේම මාවත් කළු සහෝදරයෙක් කරන්ට යනවලු. උඹට විශ්වාස කරන්ට පුලුවන්ද?"

"නෑ...!? ඇත්තටම?"

"ඇත්තටම. මට තියෙන්නෙ පුස්තකාලෙයි, කුරුල්ලන්ගෙ වැඩයි බලාගන්ට, මේස්ටර් ඒමන්ගේ උදවුවට. එයාට ලියුම් කියවන්ට, ලියන්ට පුලුවන් කෙනෙක් උවමනාලු."

"උඹ ඒ වැඩේ හොඳින් කරයි." ජොන් සිනාසෙමින් පැවසීය.

සැම් උනන්දුවෙන් වටපිට බැලීය. "දැන් යන්ට වෙලාව හරිද? මම පරක්කු වෙන්ට නරකයි. එයාලා අදහස වෙනස් කරගන්ට ඉඩ තියෙනවා." ඔහු වල් වැදුනු අංගනය හරහා උඩ පනිමින් මෙන් ගමන්කලේය. එය උණුසුම්, හිරු එළිය සහිත කදිම දවසක් විය. ප්‍රාකාරයේ පැතිවලින් දියසීරා කාන්දු වුනු අතර ඒ නිසා අයිස් දීප්තිමත්ව බැබලෙන්නාක් මෙන් දිස්විය.

දකුණු දෙසට මුහුණ ලා තිබුනු කවුළුව තුළින් පෙරී ආ උදෑසන හිරු එළිය සප්තකය තුළ වූ විශාල පලිඟුව මත වැටී අල්තාරය මත දේදුන්නක් මැවීය. සැම් දුටු පිප්ගේ මුව විමතිය නිසා ඇරී ගිය අතර ටොඩ් ග්‍රෙන්ගේ ළපැත්තට ඇන්නේය. එනමුදු කිසිවෙක් කිසිවක් කීවේ නැත. සප්තක පූජකවරයා වූ සෙලඩාර් දුම් කබල වනමින් අවට වාතය සුවඳ දුමින් පුරවාලමින් සිටියේය. එය දුටු ජොන්ට ස්ටාර්ක් ආර්යාවගේ කුඩා සප්තකය සිහියට ආයේය. නිතරම බීගත්වන සිටින බේබදු සෙලඩාර් අද දිනයේවත් යාන්තම් සිහියක් පතක් ඇතිව සිටිනු පෙනුනි.

උසස් නිලධාරීන් සියලුදෙන එක පොදියට පැමිනියහ. ක්ලයිඩස්ට වාරු වූ මේස්ටර් ඒමන්, සීතල දෑසින් යුතු, කෲර සෙර් ඇලිසර් හා රිදී වලස් නිය ගාංචු සහිත කළු ලොම් කබායකින් සැරසුනු අණදෙන නිළධාරි මෝර්මන්ට් ඒ අතර වූහ. ඔවුන්ට පිටුපසින් අංශ තුනේ ප්‍රධාන නිළධාරීහු පැමිණියහ. ප්‍රධාන නිවාස බාරකරු වන රතු මුහුණැති බොවෙන් මාර්ෂ්, ප්‍රධාන ගොඩනංවන්නා ඔතෙල් යාර්වික් හා බෙන්ජීන් ස්ටාර්ක් ගේ අතුරුදන් වීමෙන් පසු මුරසංචාරකයින් ගේ ප්‍රධානියා වශයෙන් වැඩ බලන සෙර් ජැරමී රයිකර් ඒ තිදෙනා වූහ.

මෝර්මන්ට් අල්තාරය ඉදිරියේ නැගිට සිටියේය. ඔහුගේ පුලුල්, තට්ට හිස මත දේදුනු වර්ණ වැටී දිලිසුනි. "උඹලා අපි ගාවට ආවේ අපරාධකාරයින් හැටියට." ඔහු කතාව පටන්ගත්තේ ය. "හොර දඩයක්කාරයෝ, ස්ත්‍රී දූෂකයෝ, ණයගැතියෝ, මිනීමරුවෝ, ඒ වගේම හොරු විදියට අපි ගාවට ආවා. උඹලා අපි ලඟට ආවේ ළමයි විදියට. තනියම. දම්වැල්වලින් බැඳලා දාලා. යාලුවෙක්, ගරු නම්බුවක් නැතුව. සමහරු ආවේ පෝසත්තු විදියට. සමහරු දුප්පත්තු විදියට. සමහරුන්ට තියෙනවා බොහොම මාන්නක්කාර වංශවත් පවුල්වල නම්. අනිත් එවුන්ට තියෙන්නේ අවජාතක නම්. සමහරුන්ට නමක් ඇත්තෙම නෑ. ඒවායින් වැඩක් නෑ. ඒ ඔක්කොම පහුවුනු දේවල්. ප්‍රාකාරෙදි අපි ඔක්කොම එක පවුලක උදවිය."

"අද හැන්දෑවේ, ඉර බැහැගෙන යන වෙලාවේ, රෑ අඳුර වැටීගෙන එනකොට උඹලා තමන්ගෙ දිවුරුම දෙන්ට ඕන. ඒ මොහොතේ ඉඳන් උඹලා හැමෝම නිශා රැකුම් බලකායේ දිවුරුම් දුන්න සහෝදරවරු. උඹලා කරපු පවු ඔක්කොම හේදිලා යයි. උඹලාගෙ ණයතුරුස්වලට සමාව ලැබෙයි. ඒවගේම උඹලත් උඹලාගෙ පරණ හිතවත්කම් අත්ඇරලා දාන්ට ඕන. උඹලාගෙ තරහ-මරහ පැත්තකට දාන්ට ඕන. පරණ වැරැදි, පරණ ආදර කතා මේ හැම එකක්ම අමතක කරලා දාන්ට ඕන. මෙතන ඉඳන් උඹලා අලුතෙන්ම ජීවිතේ පටන්ගන්ට ඕන."

"නිශා රැකුම් බලකායේ එවුන් ජීවත්වෙන්නේ උන්ගේ රාජධානිය වෙනුවෙන්. රජ කෙනෙක් වෙනුවෙන් නෙවෙයි. වංශාධිපතියෙක් වෙනුවෙන් නෙවෙයි. අර පෙළපතේ ගෞරවය, මේ පෙළපතේ නම්බුව වෙනුවෙන් නෙවෙයි. රත්තරන්, මුතුමැණික්, වස්තුව, කීර්තිය, ගැනියෙක් ගේ ආදරය වගේ දේ වෙනුවෙනුත් නෙවෙයි. මේ රාජධානිය වෙනුවෙන්. ඒ වගේම ඒකෙ ඉන්න මිනිස්සු වෙනුවෙන්. නිශා රැකුමේ සහෝදරයෙකුට ගැනියෙක් ගන්ටවත්, පුත්තු හදන්ටවත් ලැබෙන්නේ නෑ. අපේ රාජකාරිය තමා අපේ ගෑනු.

අපේ ගෞරවය තමා අපේ හොර ගැනු. අපට ලැබෙන එකම පුත්තු උඹලා වගේ නවකයො විතරයි."

"උඹලා දිවුරුම කටපාඩම් කරලයි තියෙන්නේ. ඒක කියන්ට කලින් පරිස්සමින් හිතලා බලපල්ලා. මොකද කළු ඇඳුම් දාගත්තට පස්සේ උඹලාට ආපහු හැරෙන්ට බැහැ. රාජකාරියෙන් පැනලා ගියොත් දඬුවම මරණය." නාකි වලහා මඳකට නැවතුනේ ය. "අපිව දාලා යන්ට උවමනා එවුන් මෙතන ඉන්නවද? එහෙමනම් දැන්ම පලයල්ලා. අපි කවුරුවත් උඹලා ගැන අහිතක් හිතන්නේ නෑ."

කිසිවෙකුත් නොසෙල්වින.

"හොඳයි. බොහොම හොඳයි." මෝර්මන්ට් පැවසීය. " අද හැන්දෑවේ උඹලා සෙලඩාර් පූජකතුමයි, තම තමන්ගෙ අංශයෙ ප්‍රධානියොයි ඉස්සරහදි දිවුරුම්දෙන්ටයි යන්නෙ. මෙතන පරණ දෙවිවරු අදහන උදවිය ඉන්නවද?"

ජොන් නැගී සිටියේය. "මම, මගේ උතුමානනි."

"උඹේ බාප්පා වගේම, හදවෘක්ෂයක් ඉස්සරහදි දිවුරුම් දෙන්ට උඹ කැමති ඇති මම හිතන්නෙ." මෝර්මන්ට් ඇසීය.

"ඔවු මගේ උතුමානනි." ජොන් පැවසීය. ඔහුට සප්තක දෙවිවරුන්ගෙන් එලක් නැත. ස්ටාර්ක් නහරවල හැමදාමත් දිවුවේ මුල් මිනිසුන් ගේ රුධිරය විය.

තමාට පසුපසින් හුන් ග්‍රෙන් කොඳුරනු ඔහුට ඇසුනි. "මෙහේ දෙව්වනයක් තියෙනවද? මම කවදාවත් දෙව්වනයක් දැකලා නෑ."

"ඔරොක්ස් රංචුවක් ඇවිල්ලා උඹව හිම ගොඩේ ඔබලා පාගලා දානකං උඹට උන්ව පේන එකක් නෑ." පිප් පෙරලා කෙඳිරුවේ ය.

"නෑ, මට උංව පේනවා." ග්‍රෙන් අවධාරණය කලේය. "මට උංව ගොඩක් දුර ඉඳන් පෙනේවි."

මෝර්මන්ට් විසින්ම ග්‍රෙන්ගේ සැකය තහවුරු කරනු ලැබීය. "කළු බලකොටුවට දෙව්වනයකින් ඇති වැඩක් නෑ. ප්‍රාකාරයට එහා පැත්තේ හොල්මන් කැලෑව මීට අවුරුදු දාස්ගානකට කලින් උදා යුගයේ තිබුනා විදියටම තාමත් තියෙනවා. අන්දාල්වරු පටු මුහුද තරණය කරලා සප්තක ආගම මෙහාට අරන් එන්ට කලින් තිබුන විදියටම තියෙනවා. මෙතැන ඉඳන් ලීග බාගෙක දුරින් වයර්වුඩ් ගාලක් තියෙනවා උඹට හොයාගන්ට පුළුවන් වෙයි. සමහරවිට උඹේ දෙවිවරුනුත් එතැන ඇති කියලා මම බලාපොරොත්තු වෙනවා."

"මගේ උතුමානනි." ඇසුනු කටහඬ නිසා ජොන් පුදුමයෙන් පසුපස හැරී බැලුවේ ය. සැම්වෙල් ටාර්ලි නැගිට සිටියේය. මහත කොලුවා දහදියෙන් තෙත් වූ අත්ල සිය කමිසයේ පිසදැමීය. "මමත්... මමත් ඒ එක්ක යන්ටද? හදවෘක්ෂය ඉස්සරහදි මගේ දිවුරුම දෙන්ට?"

"ටාර්ලි වංශයත් තාම පරණ දෙවිවරු තියාගෙන ඉන්නවද?" මෝමර්න්ට් ඇසීය.

"නෑ. මගේ උතුමානනි." සැම් සිහින්, බියාදු හඬකින් පිළිතුරු දුන්නේ ය. ඉහල පෙලේ නිලධාරීන් විසින්, විශේෂයෙන්ම නාකි වලහා විසින් ඔහුව බියපත් කරන බැව් ජොන් දැන සිටියේ ය. "හෝර්න් හිල්වල සප්තක දේවස්ථානයේ සප්තාළෝකයෙදි තමා මට නම් තියලා තියෙන්නෙත්. හරියට මගේ තාත්තාටත්, එයාගෙ තාත්තාටත්, අවුරුදු දාස්ගානක් තිස්සේ අනිත් ටාර්ලිවරුන්ටත් නම් තියාපු විදියටම."

"උඹ මොකටද උඹේ තාත්තාගෙයි උඹේ වංශයෙයි දෙවිවරු අත් අරින්ට යන්නෙ?" සෙර් ජැරමි රයිකර් මවිතයෙන් ඇසුවේය.

"නිශා රැකුම තමා දැන් මගේ වංශය. සප්තක දෙවිවරු මගේ යාඥාවලට කවදාවත් ඇහුම්කන් දුන්නේ නෑ. සමහරවිට පැරණි දෙවිවරු ඇහුම්කන් දෙයි."

"උඹට කැමැති විදියක් කොලුවෝ." මෝර්මන්ට් කීය. ජොන් මෙන්ම සැම්ද නැවත අසුන් ගත්තේ ය. "උඹලාගෙ සුදුසුකම් අනුව, උඹලාගෙ දක්ෂකම් අනුව, ඒ වගේම අපේ අවශ්‍යතා අනුව අපි උඹලාව අංශවලට බෙදලා දාලා තියෙනවා." බොවෙන් මාර්ෂ් ඉදිරියට පැමිණ ඔහුට කඩදාසියක් පිරිනැමීය. අණදෙන නිලධාරීතුමා එය දිගහැර කියවීමට පටන්ගත්තේ ය. "හෝල්ඩර්, ගොඩ නංවන්නන්ට." හෝල්ඩර් එය අනුමත කරමින් දරදඬු ලෙස හිස සැලීය. "ග්‍රෙන් මුර සංචාරකයින්ට. ඇල්බට් ගොඩ නංවන්නන්ට. පයිපර් මුර සංචාරකයින්ට." පිප් ජොන් දෙස බලා සිය කණ් නැටවීය. "සැම්වෙල් නිවාස බාරකාරයින්ට." දහදියෙන් පෙඟුනු තම බැම සේද ලේන්සුවකින් පිස දමමින්, සැම් සැනසුම් සුසුමක් හෙලීය. "මැතර් මුර සංචාරකයින්ට. ඩේරියන් නිවාස බාරකාරයින්ට. ටොඩර් මුර සංචාරකයින්ට. ජොන් නිවාස බාරකාරයින්ට."

නිවාස බාරකරුවන්ට? මොහොතකට ජොන්ට මේ අසන්නට ලැබුනු දේ විශ්වාස කල නොහැකි විය. මෝර්මන්ට් එය වැරැදියට කිවුවා වන්නට ඇත. ඔහු නැගිට සිටීමට, යම් වැරැද්දක් සිදුව ඇතැයි කීමට තැත් කලේය... එනමුදු සෙර් ඇලිසර් ලෝදිය වැනි දිලිසෙන නිරීක්ෂණාත්මක දෑසින් තමා දෙස බලා සිටිනු දුටුවිට එය සත්‍යයක් බව පසක් කරගත්තේ ය.

නාකි වලහා තමා අතවූ කඩදාසිය රෝල් කලේය. "උඹලාගේ අංශ ප්‍රධානියෝ උඹලා කරන්ට ඕන වැඩ රාජකාරි කියලා දෙයි. දෙවිවරු උඹලාව ආරක්ෂා කරත්වා සහෝදරවරුනි!" ඔවුන් වෙත අඩක් හිස නැමූ අණදෙන නිළධාරීතුමා සභාවෙන් නික්ම ගියේය. සිහින් සිනාවක් මුවේ ඇඳුනු සෙර් ඇලිසර් ද ඔහු සමග පිටව ගියේය. ප්‍රධාන සටන් පුහුණකරුවා මෙතරම් ප්‍රීතිමත් අයුරින් සිටිනු ජොන් කිසිදා දැක නොතිබින.

"මුර සංචාරකයො මගෙත් එක්ක වරෙල්ලා." ඔවුන් පිටව ගිය පසු, සෙර් ජැරමි රයිකර් හඬ නැගීය.

පිප් ජොන් දෙස බලාගෙනම සෙමින් නැගිට්ටේ ය. ඔහුගේ දෙකණ් රතු වී තිබින. කොතැනක හෝ යම් වැරැද්දක් සිදු වී ඇති බව පුළුල් සිනහවකින් මුව සරසාගෙන සිටි ග්‍රෙන්ට තේරුම් ගිය බවක් නොපෙනින. මැට් සහ ටොඩ් ඔවුන් හා එක්වූ අතර ඔවුන් සැවොම සෙර් ජැරමි පසුපසින් සප්තකයෙන් පිටතට ගියෝය.

"ගොඩනගන්නෝ." ඔතෙල් යාර්වික් නිවේදනය කලේය. හෝල්ඩර් සහ ඇල්බට් ඔහු පසුපසින් වැටුනහ. ජොන් අම්හිරි අවිශ්වාසයකින් යුතුව හිස හරවා තමා අවට බැලුවේය. මේස්ටර් ඒමන්ගේ අන්ධ දෑස ඔහුට නොපෙනන ආලෝකය දෙසට හැරී තිබින. පූජකයා අල්තාරය මතවූ පලිඟු සකස්කරමින් සිටියේය. බංකුවල ඉතිරිව සිටියේ සෑම් හා ඩේරියන් පමණි; තරබාරු කොලුවෙක්, ගායකයෙක්... සහ ඔහු.

ප්‍රධාන නිවාස බාරකරු බොවෙන් මාර්ෂ් තම මහත දෑත් එකට ඇතිල්ලුවේ ය. "සැම්වෙල්, උඹ කපුටන්ගෙ වැඩවලටයි, පුස්තකාලෙ වැඩවලටයි මේස්ටර් ඒමන්ට උදවු කරන්ට ඕන. චෙට් යනවා බලු කූඩුවලට බල්ලෝ බලාගන්ට. උඹට එයාගෙ කුටිය ලැබෙයි. රෑ දවල් තිස්සෙම මේස්ටර් ලඟින්ම ඉන්ට. මම විශ්වාස කරනවා උඹ එයාව හොඳින් බලාගනියි කියලා. එයා ගොඩක් වයසයි. ඒ වගේම අපට ගොඩක් වැදගත් අත්‍යවශ්‍ය කෙනෙක්."

"ඩේරියන් මට දැනගන්ට ලැබිලා තියනවා උඹ උසස් වංශාධිපතියන් ගේ භෝජන සංග්‍රහවලදී සිංදු කියලා තියෙන බව. ඒ වගේම එයාලත් එක්ක කාපු බීපු එකෙක් බව. අපි උඹව යවනවා නැගෙනහිර කුළුණට. වෙළෙඳ නැවු වෙළෙඳාමේ ආවහම සමහරවිට උඹේ ඔය කට කොටර් පයික්ට ලොකු උදවුවක් වේවි. අපි දැනට ලුණු දාපු හරක් මස් වලටයි, මාලු අච්චාරුවලටයි ගිනිගණන් ගෙවනවා. ඒ වගේම දැනට අපට ලැබෙන ඔලිව් තෙලුත් අන්තිම නරකයි. උඹ එහාට ගිහින් බොර්කාස්ව හම්බවෙයන්. එයා උඹට කියලා දෙයි නැවු ගනුදෙනු අතරෙදි මොනවද කරන්ට ඕන කියලා."

මාර්ෂ් තම සිනහව ජොන් වෙත පෑවේය. "අණදෙන නිළධාරි මෝර්මන්ට් උතුමානන් ඉල්ලලා තියෙනවා උඹව එයාගෙ පුද්ගලික සහායකයා විදියට දෙන්ටයි කියලා ජොන්. අණදෙන නිළධාරිතුමාගෙ කුළුණේ, එයාගෙ කාමරවලට යටින් තියෙන කුටියේ උඹට නිදාගත්තු හැකි."

"එතකොට මගේ රාජකාරි වෙන්නේ?" ජොන් තදින් ඇසීය. "එතුමාගේ කෑම බෙදන එක, ඇඳුම් මාරුකරන එක, නාන්ට උණු වතුර ගේන එක වගේ දේවල්ද?"

"ඇත්තෙන්ම." ජොන්ගේ ස්වරය නිසා මාර්ෂ් රවා බැලීය. "ඒ වගේම, උඹට එයාගේ පණිවුඩ ගෙනියන්ට, එයාගෙ කාමරවල නිතරම ගිනි දල්වලා තියාගන්ට, එයාගේ ඇඳරෙදි

පොරෝණා දවස ගානෙ මාරුකරන්ට සිද්දවෙනවා. අණදෙන නිළධාරිතුමා කියන ඕනැම දෙයක් උඹට කරන්ට සිද්ධ වෙනවා."

"ඔබ හිතන් ඉන්නේ මම වැඩකාරයෙක් කියලද?"

"නැහැ." සප්තකයේ පිටුපස සිටි මේස්ටර් ඒමන් ගේ හඬ නැගී ආයේය. ක්ලයිඩස් ඔහුට නැගී සිටීමට උදව් කලේය. "අපි හිතන් ඉන්නෙ උඹ නිශා රකුමේ මිනිහෙක් කියලයි... ඒත් සමහරවිට අපි වැරැදි ඇති."

නැගිට එතැනින් පිටව යෑමේ උවමනාව ජොන් ආයාසයෙන් මැඩ ගත්තේ ය. කෙල්ලක මෙන් වෙඩරු පත්ගාමින්, කබා මසමින් සිය මුලු ජීවිත කාලයම මෙහි ගෙවීම ඔහුට හිමි ඉරණම ද? "මම යන්ට ද?" ඔහු දරදඬු ලෙස ඇසීය.

"උඹේ කැමැත්තක්." බොවෙන් මාර්ෂ් පිලිතුරු දුන්නේ ය.

ඩේරියන් සහ සෑම් ද ඔහු සමග පිටතට පැමිණියහ. ඔවුහු නිශ්ශබ්දව පහළ අංගනයට බැස්සෝය. සිහින් ඇඹිලි රැසක් මෙන් දියවී ගලායන හිම දියෙන් යුතුව හිරුඑළියේ දිලෙමින් තිබුනු ප්‍රාකාරය දෙස ජොන් බැලුවේය. ඔහු දැවෙමින් සිටි කෝපාග්නිය කෙතරම් ද යත් මේ දැවැන්ත ප්‍රාකාරය එක් මොහොතින් සුන්නද්ධූලි කරන්නට එය සමත්වනු නොඅනුමාන ය. එයින් මේ මුලුමහත් ලෝකයම යකාට ගියද ඔහුට කම් නැත.

"ජොන්." සැම්වෙල් ටාර්ලි උනන්දු සහගත ස්වරයෙන් කීවේය. "පොඩ්ඩක් හිටපන්. උඹට පේන්නෙ නැද්ද උන් මොකක්ද මේ කරන්නේ කියලා?"

ජොන් වියරුවෙන් ඔහු වෙත කඩාපැන්නේ ය. "මට පේනවා සෙර් ඇලිසර් උගෙ අර කුණු අත මේකට දාලා තියෙන වග. එච්චර තමයි මට පේන්නේ. ඌට ඕන වුනා මට ලැජ්ජා කරන්ට. ඔන්න ඌ ඒක කොහොම හරි කර ගත්තා."

ඩේරියන් ඔහු වෙත නොපහන් බැල්මක් හෙලුවේය. "උඹයි මායි වගේ අයට සහායකයෙක් වෙන එක ඇති සෑම්. ඒත් ස්නොව් උතුමානන්ට එහෙම බෑනේ."

"මම උඹලා කාටත් වඩා හොඳ සටන්කාරයෙක්. හොඳ අශ්වාරෝහකයෙක්." ජොන් ගුගුලේය "මේක අසාධාරණයි!"

"අසාධාරණයි?" ඩේරියන් විරිත්තුවේ ය. "අර කෙල්ල මම එනකල් බලාගෙන හිටියේ, උපන් දා වගේ හෙළුවෙන්. ඒකිමයි මාව ජනේලෙන් ඇතුළට ඇදලාගත්තේ. උඹ එනවා මෙතන මට අසාධාරණේ ගැන කියලා දෙන්ට. නොදකින්." ඔහු එතැනින් ඉවත්ව ගියේය.

"සහායකයෙක් වෙන එකේ ලැජ්ජාවෙන්ට තරම් දෙයක් නෑ." සෑම් කිවේය.

"උඹ හිතන්නේ මගේ ජීවිතේ ඉතුරු කාලෙ නාකියෙක්ගේ යට ඇඳුම් හෝද හෝද ගෙවලා දාන්ට මම කැමැත්තෙන් ඉන්නවයි කියලද?"

"ඒ නාකියා තමා නිශා රකුම් බලකායේ ප්‍රධාන අණදෙන නිළධාරියා. උඹට සිද්ද වෙනවා එයාත් එක්ක දිවා රෑ ඉන්ට. ඇත්ත, උඹට එයාගෙ වයින් වක්කරන්ටයි එයාගෙ ඇඳරෙදි මාරුකරන්ටයි වෙයි තමයි. හැබැයි ඒ එක්කම උඹට එයාගේ ලියුම් කියුම් වල වැඩ කරන්ට වෙයි. එයාත් එක්ක රැස්වීම් වලට සහභාගි වෙන්ට වෙයි. සටනකදී එයාගෙ සහචරයා වගේ ඉන්ට වෙයි. කොටින්ම උඹ එයාගෙ හෙවනැල්ල තරමටම එයාට ලංවෙයි. උඹට හැමදේම දැනගන්ට පුළුවන් වෙයි. හැමදේකම කොටසක් වෙන්ට පුළුවන් වෙයි... අනිත් එක බොවෙන් මාර්ෂ් මොකක්ද කිවුවෙ? අණදෙන නිළධාරිතුමාමයි උඹව ඉල්ලලා තියෙන්නෙ!"

"මම පොඩි කාලේ මගේ තාත්තා හැම වෙලාවේම මට බලකලා එයා මිනිස්සුන් ගේ පැමිණිලි විභාග කරනකොට ඇවිත් එයාත් එක්ක සභාශාලාවෙ ඉඳගන්ටයි කියලා. ව්රල් උතුමානන්ට දණ නවලා පක්ෂපාතිත්වය ඔප්පු කරන්ට හයිගාර්ඩ්න්වලට යනකොටත් මාව ඇදගෙන ගියා. පස්සේ පස්සේ එයා මාව ගෙදර තියලා ඩිකන්ව එක්කරගෙන යන්ට පටන් ගත්තා. ඩිකන් සභාශාලාවෙ ඉන්නවා නම් මම උන්නද මලාද කියලවත් ගානක් නැති වුනා. උඹට පේනවා නේද? එයාට ඕන වුනේ එයාගේ උරුමක්කාරයාව හැමවෙලාවෙම

එයා ළඟ තියාගන්ට. උරුමක්කාරයාව එහෙම ළඟ තියාගන්නේ එයා කරන කියන හැම දෙයක්ම දැකලා, බලලා, අහලා ඒවයින් ඉගෙනගන්ටයි. මම ඕනේ ඔට්ටුවක් අල්ලන්නම්, මෝර්මන්ට් උතුමානන් උඹව ඉල්ලුවෙත් එක හින්දම තමයි. වෙන මොකක්ද ඕකට හේතුව? එයාට ඕන උඹව දැන් ඉඳන්ම නායකත්වයට හැඩ ගස්සන්ට!"

ජොන් විස්මයට පත් විය. ඇත්ත. වින්ටර්ෆෙල්හිදී එඩාර්ඩ් උතුමානන් හැමවිටම රොබ්ව ඔහුගේ මන්ත්‍රණ සභාවලට සහභාගී කරවාගත්තේ ය. සෑම් කියන්නේ ඇත්තක් විය හැකි ද? මිනිසුන් කියන පරිදි නිශා රැකුම තුළදී අවජාතකයකුට වුව ඉහළටම නැගිය හැක. "මම කවදාවත් මෙහෙම දෙයක් ඉල්ලුවෙ නෑ." ඔහු මුරණ්ඩු ස්වරයෙන් කීවේය.

"අපි කවුරුත් මෙතන ඉන්නේ ඉල්ලන් ඇවිල්ලා නෙවෙයි" සෑම් ඔහුට මතක් කලේය.

හදිසියේම ජොන් ස්නොව්ට අතිමහත් ලැජ්ජාවක් දැනෙන්නට විය.

කෙතරම් බියගුල්ලකු වුවද සෑම්වෙල් ටාර්ලි නියම පිරිමියෙකු මෙන් තමන්ට අත්වූ ඉරණමට මුහුණ දීමට දිරි වඩාගෙන තිබිනි. බෙන්ජින් ස්ටාර්ක් අවසන් වරට දුටු වේලේ කියූ පරිදි ප්‍රාකාරයේදී යමෙකුට හිමිවන්නේ ඔහු උපයාගත් දෙයක් පමණි. 'උඹ මුර සංචාරකයෙක් නෙවෙයි ජොන්, තාම කටේ කිරි සුවඳ ගියේ නැති නිකම්ම නිකන් පොඩි කොල්ලෙක් විතරයි.' අවජාතකයන් අනික් දරුවන්ට වඩා වේගයෙන් හැදී වැඩෙන බව ඔහු අසා තිබුනි. ප්‍රාකාරයේදී එක්කෝ ඔහු පරිනත විය යුතුය නැත්නම් මිය යා යුතුය.

ජොන් දිගු සුසුමක් හෙලා ලය සැහැල්ලු කරගත්තේ ය. " උඹ කියන එක හරි . මම දැඟලුවේ නිකන් පොඩි එකෙක් වගේ..."

"ඒ කියන්නේ උඹ මගෙත් එක්ක දිවුරුම් දෙන්ට එනවද?"

"පරණ දෙවිවරු අපි එනකල් බලාගෙන ඇති." ඔහු ආයාසයෙන් සිනහවක් මුවට නගාගත්තේ ය.

* * * * *

ඔවුහු එදින අපරභාගයේදී පිටත්වූහ. ප්‍රාකාරයේ ගේට්ටු නොවීය. කළු බලකොටුවේ හෝ සැතැපුම් තුන්සියයක් පුරා පැතිරුනු ප්‍රාකාරයේ අන් කිසිදු තැනෙක හෝ සාමාන්‍ය ගේට්ටුවක් නොවීය. එමනිසා ප්‍රාකාරයට යටින් අයිස් තුළින් කැපූ පටු උමගයක් හරහා ඔවුන්ට සිය අසුන් මෙහෙයවීමට සිදු වූයේය. මාර්ගය ඇඹරෙමින් වංගු ගැසෙමින් ඇදී යන අතර සීතල බිත්ති ඔවුන් මත තෙරපෙන්නාක් මෙන් හැඟී ගියේය. දැවැන්ත යකඩ ගේට්ටු මගින් තෙවරක්ම ඔවුන්ගේ ගමන් මාර්ගය අවහිර විය. බොවෙන් මාර්ෂ් විසින් යතුරු කැරැල්ලකින් ඒවා වසා තිබනු දැවැන්ත දම්වැල් අගුළු හැරදෙන තුරු බලා හිඳීමට ඔවුනට සිදුවිය. ප්‍රධාන නිවාස බාරකරුවා සිය කර්තව්‍ය නිම කරන තුරු ඔහු පසුපසින් බලා සිටි ජොන්ට තමාට ඉහළින් ඇති අතිමහත් බර දැනෙන්නාක් මෙන් විය. අවට වාතය සොහොන් ගැබකටත් වඩා සීතල හා නිසසල විය. ප්‍රාකාරයෙන් උතුරේ දී නැවත දිවා හිරු එළියේ පහස ලබන විට ජොන්ට පුදුමාකාර සැනසිල්ලක් දැනෙන්නට විය.

ඇතිවුනු හදිසි ආලෝක තත්ත්වය නිසා සෑම් වේගයෙන් ඇසිපිය ගැසුවේය. ඔහු වික්ෂිප්ත අයුරින් අවට බැලුවේය. "වනචාරියො... උං... උං ප්‍රාකාරෙට මෙච්චර කිට්ටුවට එන්ට තරම් බය නැති වෙන එකක් නෑ නේද?"

"කවදාවත් නෑ." ජොන් අසුපිටට නැගගත්තේ ය. බොවෙන් මාර්ෂ් සහ ඔවුන් සමග පැමිණි මුර සංචාරක නඩය අසු පිට නැගුනු පසු ඔහු ඇඟිලි දෙකක් මුවේ රුවා සියුරුහන් බෑවේය. ගෝස්ට් උමගය තුලින් හැල්මේ දිව ආවේය.

ප්‍රධාන නිවාස බාරකරුවා ගේ අශ්වයා හේෂාරව නගමින් සෝරවෘකයා වෙතින් ඈත් විය. "උඹ මේ සතාවත් අරන් යන්ට ද හදන්නේ?"

"ඔවු මගේ උතුමානනි." ජොන් පිළිවදන් දුන්නේය. ගෝස්ට් හිස ඔසොවා අවට පරිසරය රස විඳින්නාක් මෙන් මොහොතක් ඉව කලේය. ඊළඟ මොහොතේ ඌ ඇසිපිය හෙලන පමාවෙන් මීවණයෙන් වැසුනු බිම හරහා දිවගොස් සීතල වනය තුළට වැදී අතුරුදන් විය.

වනය තුළට ඇතුළුවීම වෙනත් ලොවකට ඇතුළුවීම හා සමාන විය. ජොන් නිතරම පාහේ සිය පියා, ජොරී සහ රොබ් සමගින් දඩයම් සවාරි ගොස් තිබින. වින්ටර්ෆෙල් අවට වෘක වනය ඔහු අන් කවර මිනිසකු තරම්ම හොඳින් දැන සිටියේය. මේ හොල්මන් කැලෑවද වෘක වනය හා සමානම එකක් වුවද ඒ තුළදී දැනුනු හැඟීම වෙනස්ම අන්දමේ එකක් විය.

සමහරවිට, ඒ ඔවුන් දන්නා දේ නිසා විය හැක. ඔවුන් ලෝකාන්තයෙන් එපිටට ගොස් ඇත. එය වෙනස්ම තත්ත්වයකි. ඉදින්, ඔවුන් දුටු සෑම සෙවනැල්ලක්ම වඩා අඳුරු විය. ඇසුනු සෑම හඬක්ම වඩා බියකරු විය. ලංලංව වැඩුනු වෘක්ෂයෝ හිරු එළිය ඔවුන්ගෙන් වසන් කලෝය. අලුත වැටුනු සිහින් හිම තට්ටුව අසුන් ගේ කුර පහරට හසුව බිඳී ගියේ ඇටකටු බිඳෙන්නාක් වැනි හඬක් නගමිනි. කොළ සර සර හඬින් සලිත කරවමින් සීතල සුළඟ හමද්දී ජොන්ගේ කොඳුඇට පෙළ හරහා සීතල ඇඟිල්ලක් දිව ගියාක් මෙන් දැනුනි. ප්‍රාකාරය ඔවුන් පසුපසින් වූ අතර ඉදිරියෙන් ඇත්තේ කුමක්දැයි දන්නේ දෙවියන් පමණි.

ඔවුන් සිය ගමනාන්තයට ළඟාවද්දී හිරු ගස් අතරින් නොපෙනී යන්නට පටන්ගෙනතිබුනි. එය වනයේ ගැඹුරේ පිහිටි වයර්වුඩ් ගස් නවයකින් වට වූ කුඩා එළිමහන් තැනක් විය. ජොන් මවිතයෙන් හුස්මක් ඉහළට ඇද ගත්තේය. සෑම් ටාර්ලි දෙනෙත් අයා එදෙස බලා සිටින අන්දම ඔහුට පෙනුනි. වෘක වනය තුළ පවා මේ සුදු පැහැ වයර්වුඩ් ගස් දෙක තුනකට වඩා එක ළඟ දැක ගැනීම අරුමයක් විය. මෙවැනි ගස් නවයකින් යුත් පොකුරක් ගැන කිසිවෙකු අසාවත් තිබේනම් අරුමයකි. බිම වැටුනු පත්‍රයන්ගෙන් කැලයේ මතුපිට පොළොව වැසී ගොස් තිබුනි. ලේ රතුවන් පත්‍ර තට්ටුව මතුපිටින් වූ අතර දිරා යමින් ඇති කළුවන් පත්‍ර ඒවා යට සැඟව ගොස් තිබුනි. පුළුල් සුමුදු ගස් කඳන් ඇටකටු මෙන් සුදුපැහැ විය. ඒ මත කෙටූ මුහුණු නවයක් වටරවුම තුළට යොමු වී තිබින. ඇස්වල රැඳී තිබුනු වියළී ගිය යුෂය රතුකැට මෙන් රත් පැහැ විය, දැඩි විය. සිය අසුන් වටරවුමෙන් පිටත නවතා එන මෙන් බොවෙන් මාර්ෂ් ඔවුන්ට අණ දුන්නේය. "මෙතැන පූජනීය තැනක්. අපි මෙතැන කෙලෙසන්ට නරකයි."

රුක්ගොමුවට ඇතුළු වූ පසු සෑම්වෙල් ටාර්ලි සෙමින් කරකැවෙමින් සෑම මුහුණක්ම හොඳින් නිරීක්ෂණය කලේය. ඒ කිසිදු මුහුණක් කොහෙත්ම එකිනෙකට සමාන නොවීය. "පරණ දෙවිවරු අපි දිහා බලාගෙනයි ඉන්නේ." ඔහු කෙඳිරුවේ ය.

"ඔවු." ජොන් දණ නැමුවේය. සෑම් ද ඔහුට පසෙකින් දණ ගසා ගත්තේය.

දවසේ අවසන් ආලෝකය ගස් අතරින් මැකී ගොස් සැන්දෑව අඳුරු වන්නට ඇරඹෙන මොහොතේ ඔවුන් දෙදෙන එකතුව සිය දිවුරුම දුන්නහ.

"මගේ වචන අසා මගේ දිවුරුමට සාක්ෂි වනු මැනව!" ඔවුන් ගේ වදන් අඳුර සමග මුසුවී රුක්ගොමුව තුල නින්නාද විය.

"අන්ධකාරය එළඹෙයි. මගේ රැකවල මෙතැනින් ඇරඹේ. මගේ මරණය තෙක් එය නිමා නොවනු ඇත. මම බිරිඳක් නොගනිමි. මහ පොළොවට උරුමකම් නොකියමි. දරුවන්ට පියෙකු නොවෙමි. මම කිරුළක් නොපලඳින්නෙමි. කිසිදු යශෝරාවයක් ඇතිකර නොගන්නෙමි. මගේ මුරකාවල මතම ජීවත් වී එහිම මිය යන්නෙමි. අන්ධකාරයේ අසිපත මම වෙමි. ප්‍රාකාරයේ රැකවලා මම වෙමි. ශීතයට එදිරිව දැල්වෙන ගින්න මම වෙමි. හිමිදිරිය රැගෙන එන ආලෝකය මම වෙමි. නිදන්නන් අවදි කරවන හොරණෑ නාදය මම වෙමි. මිනිසුන් ගේ රාජධානි ආරක්ෂා කරන පලිහ මම වෙමි. අද රාත්‍රියත් මතු පැමිණෙන්නා වූ සියලු රාත්‍රීන් සඳහාත් මගේ ජීවිතය සහ ගෞරවය නිශා රැකුම වෙනුවෙන් කැපකරමි."

රුක්ගොමුව නැවත නිසසල විය. "උඹලා දණ නැමුවේ කොල්ලන් විදිහට." බොවෙන් මාර්ෂ් ගාම්භීර ලෙස තෙපලුවේය. "දැන් නිශා රැකුමේ මිනිස්සු විදියට නැගිටපල්ලා."

අතක් දිගුකල ජොන් සැම්ව ඉහළට ඔසවා නැගිට්ටෙවුවේ ය. මුර සංචාරකයන් පිරිස ඔවුන් වටකරගෙන සුබ පතන්නට පටන් ගත්හ. ගැට සහිත ගසක් බඳුවූ මහලු මුරසංචාරකයා, ඩිවන් පමණක් එයට එක් නොවීය. " අපි දැන්ම ආපහු යන්ට පටන්ගත්තනං හොඳයි මයෙ උතුමානනි." ඔහු බොවෙන් මාර්ෂ් වෙත හැරී පැවසීය. "අන්ධකාරේ වැටෙනවා. ඒකත් එක්ක මොකක්දෝ නපුරු ගඳක් එනවා. මම ඒකට කැමැති නෑ."

හදිසියේම වයර්වුඩ් ගස් දෙකක් අතරින් පැන්න ගෝස්ට් ඔවුන් අසලට ළඟා විය. ඌටද වයර්වුඩ් ගසක් මෙන්ම සුදු පැහැ කඳක් හා රතු පැහැ දෑස් ඇති බැව් ජොන්ට හදිසියේම වැටහී ගියේය...

සෝරවෘකයා උගේ හණු අතර කළුවන් යමක් රඳවාගෙන සිටියේය. "මොකද්ද උගේ කටේ තියෙන්නේ?" බොවෙන් මාර්ෂ් බැම අකුළමින් ඇසුවේය.

"මෙහාට වරෙන් ගෝස්ට්." ජොන් දණ ගැසුවේය. "කෝ ඕක මෙහාට ගෙනෙන්."

සෝරවෘකයා ඔහු වෙතට පැන්නේය. සැම්වෙල් ටාර්ලි හදිසියේම බියෙන් මෙන් හුස්මක් ඉහළට ඇද ගනු ජොන්ට ඇසුනි.

"දෙයියන්ටමම ඔප්පු වෙච්චාවෙ!" ඩිවන් මතුලේ ය. "ඒ මිනිහෙක්ගෙ අතක්!"

**Lord Commander Jeor Mormont: “Our wife is duty. Our mistress is honor.”**

එඩාර්ඩ් 14

අරුණෝදයේ මන්දාලෝකය ඔහුගේ කවුළු තුළින් එබෙද්දී අසු කුර ගැටෙන හඬක් විසින් එඩාර්ඩ් ස්ටාර්ක් ගේ කෙටි, විඩාබර නින්ද බිඳ දමන්නට සමත් විය. මේසය මතින් හිස එසවූ ඔහු පහළ අංගනය දෙස එබී බැලීය. පදම් කල සමින්, වානේ සන්නාහයෙන් හා ලේ රතු පැහැ සළුවෙන් ගත වැසූ සෙබළු සිය උදෑසණ සරඹ පුරුදු වෙමින් සිටියෝය. සැන්ඩෝර් ක්ලිගේන් විසින් පිම්මේ අසුපන්නා ගොස් සිය පුහුණු ලන්සයෙන් පඹයකුගේ හිස සිදුරු කරන අයුරු නෙඩ් බලා සිටියේය. කැන්වස් රෙදි ඉරී යද්දී, පිදුරු දසත විහිදෙද්දී ලැනිස්ටර් සෙබළු විහිළු කරමින්, අවලාද නගමින්, සාප කරමින් දිගටම සරඹ පුහුණුවේ යෙදුනෝය.

'මේ මාව බය කරන්ට කරන බොරු සෙල්ලමක්ද?' නෙඩ් මවිතයෙන් කල්පනා කලේය. එසේනම් සෙර්සි ඔහු සිතුවාටත් වඩා මෝඩියකි. 'ඒකි යකාටම ගියාවෙ!' ඔහු සිතුවේය. 'ඇයි මේ ගෑනි තාමත් පැනලා ගියේ නැත්තෙ? මම ඒකිට අවස්ථා පිට අවස්ථා දුන්නා පැනලා යන්ට...'

උදෑසණ වැහි අඳුරින් පිරි පාලු, මූසල ස්වභාවයක් ගත්තේය. නෙඩ් සිය දූවරුන් හා සෙප්ටා මෝර්ඩේන් සමගින් පාතරාසයට වාඩි විය. තවමත් දුකින් පසු වූ සන්සා බුම්මාගත් මුහුණින් යුතුව සිය පිඟාන දෙස බලා සිටියා මිස ආහාරයට අතවත් නොතැබීය. එනමුදු ආර්යා ඇය අබියස තිබුනු සෑම දෙයක්ම මහත් රුචියකින් යුතුව ගිල දැමුවාය. "සිරියෝ කියනවා අද හැන්දෑවෙ නැවු නගින්ට කලින් අපට තව එක පාඩමක් කරන්ට පුළුවන් කියලා. මම යන්ටද තාත්තෙ? මගේ හැම දෙයක්ම අඩුක් කරලයි තියෙන්නෙ."

"බොහොම පොඩි එකක් එහෙනම්. හැබැයි මතක තියාගන්ට නාන්ටයි, ඇඳුම් මාරුකරගන්ටයි තියෙන නිසා ඉක්මනින් ආපහු එන්ට. අද දවල් කාලෙ වෙද්දි ඔයාලා ලෑස්තිවෙලා ඉන්ටයි මට ඕන. තේරුනාද?"

"ඔවු තාත්තෙ." ආර්යා කීය.

සන්සා සිය පිඟානෙන් හිස ඔසවා බැලුවාය. "එයාට එයාගෙ නැටුම් පාඩම් කරන්ට පුළුවන් නම් ඇයි ඔයා මට ඉඩ දෙන්නෙ නැත්තෙ ගිහින් ජොෆ්රි කුමාරයාට ආයුබෝවන් කියලා එන්ට?"

"මමත් බොහොම සන්තෝසෙන් එයත් එක්ක යන්නම් එඩාර්ඩ් උතුමානනි." සෙප්ටා මෝර්ඩේන් ඉදිරිපත් වූවාය. "එයාට නැව මග ඇරගන්ට මම කිසිම අවස්ථාවක් දෙන්නෙ නෑ."

"මේ වෙලාවෙ ජොෆ්රිව මුන ගැහෙන්ට යන එක එච්චර ඥානවන්ත දෙයක් නෙවෙයි සන්සා. මට කණගාටුයි."

සන්සා ගේ දෑස් කඳුලින් පිරී ගියේය. "ඒ වුනත් ඇයි ඒ?"

"සන්සා, ඔයාගෙ තාත්තා දන්නවා මොකක්ද හොඳම දේ කියලා." සෙප්ටා මෝර්ඩේන් පැවසුවා ය. "ඔයා එයාගෙ තීරණ ඔහොම ප්‍රශ්න කරන එක වැරැදියි."

"ඒක සාධාරණ නෑ." සිය පුටුව පසුපසට වැටෙන සේ ක්ෂණිකව මේසයෙන් නැගී සිටි සන්සා හඬමින් කාමරයෙන් පිටතට දිවගියාය.

සෙප්ටා මෝර්ඩේන් ද නැගිට සිටියද නෙඩ් ඇයට නැවත අසුන් ගන්නැයි සන්කලේය. "එයාට යන්ට දෙන්ට සෙප්ටා. අපි හැමෝම ආයෙමත් ආරක්ෂාකාරීව වින්ටර්ෆෙල්වලදි මුනගැහුනම මම එයාට තේරුම් කරලා දෙන්ට උත්සාහ කරන්නම්." හිස නැමූ සෙප්ටා සිය පාතරාසය නිමකිරීම පිණිස අසුන් ගත්තාය.

ඊට පැයකට පමණ පසු ප්‍රධාන මේස්ටර් පයිසෙල් නෙඩ් හමුවීම පිණිස කාමරයට පැමිණියේ ය. ඔහුගේ උරහිස් දෙක කිඳා බැස තිබුනේ හරියටම ප්‍රධාන මේස්ටර්වරයා ගේ දම්වැලේ බර උසුලා සිටීමට ඒ ශරීරයට තවදුරටත් හැකියාවක් නොමැති අයුරිනි. "මගේ උතුමානනි. රොබර්ට් රජතුමා මියගියා. දෙවියො එයාට ශාන්තිය ලබාදුන්නා."

"නෑ." නෙඩ් පිළිතුරු දුනි. "එයා ශාන්තිය පිළිකුල් කලා. දෙවියො එයාට ආදරෙයි හිනාවයි දුන්නා.ඒ වගේම ධාර්මික යුද්ධයක සතුට ලබාදුන්නා." ඔහුට මහත් හිස් බවක් දැනෙන්නට විය. ඔහු මේ පැමිණිම බලාපොරොත්තුවෙන් සිටියද, මේ පණිවුඩය බලාපොරොත්තුවෙන් සිටියද ඒ වදන් සමගින් ඔහු තුළ තිබුනු යම් දෙයක් මියගියාක් වැනි හැඟීමක් දැනෙන්නට විය. නිදහසේ හැඬීම වෙනුවෙන් තමා සතු සියළුම තනතුරු අත් හරින්නට පවා ඔහුට උවමනා විය... එනමුදු ඔහු රොබර්ට් ගේ හස්තය විය. ඔහු ඉමහත් බියෙන් බලාසිටි මොහොත පැමිණ ඇත. "කරුනාකරලා රාජසභාව කැඳවන්ට. එයාලාට මේ කාමරේට එන්ටයි කියන්ට." හස්තයේ කුළුණ ඔහු හා ටොමාර්ඩ් ගේ අණ යටතේ උපරිම ආරක්ෂාවකට යටත් කර තිබුනි. එනමුදු රාජසභා ශාලාව ද එවැනිම ආරක්ෂාවක් සපයතියි බලාපොරොත්තු වීම මෝඩකමක් විය.

"මගේ උතුමානනි." පයිසෙල් ඇසිපිය ගැසුවේය. "රාජ්‍යයේ කටයුතු අපට හෙට වෙනකම් කල්දාන්ට පුළුවන් නේද? එතකොට අපේ කණගාටුව මීට වඩා අඩුවෙලා තියෙයි."

නෙඩ්ගේ ස්වරය මෘදු නමුදු තිර විය. "බොහොම කණගාටුයි. ඒත් අපි මේ වැඩේ දැන්මම කරන්ට ඕන."

පයිසෙල් හිස නැමීය. "ඔබතුමා කියන විදියක්." සිය සේවකයින් කැඳවූ ඔහු පණිවුඩය පිටත් කර හැරියේය. ඉන්පසු නෙඩ්ගේ ආරාධනය පිළිගෙන පුටුවක වාඩි වී මිහිරි බියර් බඳුනක රස බලන්නට වූයේය.

කැඳවීමට මුල්ම ප්‍රතිචාරය ලැබුනේ සෙර් බැරිස්ටාන් සෙල්මිගෙනි. ඔහු පුරුදු පරිදි සුදු සළුවෙන් හා සුදු පැහැ කොරපොතු සන්නාහයකින් සැරසී සිටියේය. "මගේ උතුමනි." ඔහු කීය. "මම මේ වෙලාවෙ ඉන්ට ඕන අපේ අලුත් රජතුමාගෙ පැත්තකින්. කරුනාකරලා අවසර දෙන්ට මට රාජකාරියට යන්ට."

"ඔබේ තැන මෙතැනයි සෙර් බැරිස්ටාන්." නෙඩ් කීවේය.

සුළැඟිල්ලා ඊළඟට පැමිණියේ ය. ඔහු තවමත් පෙරදා රැයේ පැළැඳ සිටි නිල් පැහැ විල්ලූදයෙන් හා රිදී පැහැ කබායෙන් සැරසී සිටියේය. නිරන්තර ගමනාගමනය නිසා

ඔහුගේ බූට්ස් සපත්තු ධූලියෙන් වැසී ගොස් තිබුනි. "මගේ උතුමනි." කිසිදු හේතුවක් නොමැතිව සිනාසුනු ඔහු ඉන්පසු නෙඩ් දෙසට හැරුනේය. "ඔබ අර මට කියාපු පොඩි වැඩේ කරලයි තියෙන්නෙ එඩාර්ඩ් උතුමානනි."

රෝස පැහැති වන තෙක් දිය නා, මුහුණට හොඳින් පූයර දමා, සැහැල්ලු පාවහන් පැළැඳි වාරිස් දසතම ලැවැන්ඩර් සුවඳින් පුරවමින් පැමිණියේ ය. "පුංචි කුරුල්ලො අද බොහොම දුක්මුසු සින්දුවක් ගායනා කරන්නෙ." අසුන් ගන්නා අතරේ ඔහු කීවේය. "මුලු රාජධානියම වැළපෙනවා. අපි පටන් ගමුද?"

"රෙන්ලි උතුමානන් ආපුවහම." නෙඩ් පිළිතුරු දුන්නේය.

වාරිස් ඔහු දෙස දුක්මුසු බැල්මක් හෙළීය. "බොහොම කණගාටුයි, ඒත් රෙන්ලි උතුමානන් නගරෙන් පිටවෙලා ගියා."

"නගරෙන් පිටවෙලා ගියා?" නෙඩ් රෙන්ලි ගේ උපකාරය ගැන මහත් බලාපොරොත්තු තබා තිබුනි.

"එයා එළිය වැටෙන්ට පැයකට කලින් රහස් දොරටුවකින් පිටවෙලා ගියා. එයාත් එක්ක සෙර් ලෝරාස් ටිරලුයි, සෙබළු පනහකුයි ගියා." වාරිස් කීවේය. " අන්තිමට දකිද්දි එයාලා හැකි උපරිම වේගයෙන් දකුණු දිශාවට යමිනුයි හිටියෙ. කිසිම සැකයක් නෑ, එක්කො ස්ටෝර්ම්ස් එන්ඩ්වලට නැත්තම් හයිගාර්ඩන්වලට."

ඒ වනාහි රෙන්ලි හා ඔහුගේ සෙබළුන් සියය විය. මේ සිදුවීම සම්බන්ධයෙන් නෙඩ්ගේ සිතේ කිසිදු කැමැත්තක් නොමැති වුවද ඒ වෙනුවෙන් ඔහුට කල හැකි දෙයක් නොවීය. ඔහු රොබර්ට් ගේ අන්තිම ලිපිය එළියට ගත්තේය. "රජතුමා ඊයෙ රෑ මාව එයාගෙ ඇඳ ළඟට කැඳවලා එයාගෙ අන්තිම කැමැත්ත ලියන්ටයි කියලා අණ කලා. රොබර්ට් මේ ලියුමට මුද්‍රා තියද්දි රෙන්ලි උතුමානනුයි මේස්ටර් පයිසෙලුයි සාක්කිකාරයො විදියට එතැන හිටියා. එයාගෙ මරණෙන් පස්සෙ රාජසභාවෙදි ඒක ඇරලා බලන්ටයි කියලා නියෝග කලා. සෙර් බැරිස්ටාන්, ඔබ සතුටුනම්."

රාජ්‍යාරක්ෂක බලකායේ අණදෙන නිළධාරියා ලිපිය පිරික්සා බැලීය. "රජතුමාගෙ මුද්‍රාව හරි. ඒක කැඩිලත් නෑ." ලිපිය විවෘත කල ඔහු එය කියැවීය. "මේකෙ තියෙන විදියට එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් රාජධානියේ ආරක්ෂකයා විදියට නම් කරලා තියෙනවා. රජතුමාගෙ උරුමක්කාරයා නිසි වයස එනකම්."

'හරි විදියට නම් එයා දැනටමත් නිසි වයසට ඇවිල්ලා.' නෙඩ් කල්පනා කලේය. එනමුදු මේ සිතුවිලි වදනට නොපෙරලන්නට ඔහු පරිස්සම් විය. ඔහු පයිසෙල් හෝ වාරිස් දෙදෙනාවම විශ්වාස නොකලේය. එමෙන්ම සෙර් බැරිස්ටාන් ඔහු විසින් තමාගේ නියම රජු වශයෙන් විශ්වාස කරන කොලුවා රැකීමට දිවි හිමියෙන් බැඳී සිටියේය. මේ මහලු නයිට්වරයා එතරම් පහසුවෙන් ජොෆ්රිව අතහැර දමනු ඇතැයි සිතිය නොහැකි විය. තමන් වංචාවකට හසු වූ බව දැනගැනීම ඔහුට අමිහිරි දෙයක් වනවා ඇත. එනමුදු ඔහුව නම්මා ගැනීම හෙමිහිට, මෘදු අයුරින් කලයුත්තක් බැව් නෙඩ් දැන සිටියේය. ඔහු උපරාජයා වශයෙන් තම තත්ත්වය තහවුරු කරගන්නා තුරු සිය රාජසභාව සමග ප්‍රවේශමෙන් කටයුතු කලයුතු යැයි ඔහු තේරුම් ගෙන සිටියේය. ආර්යා හා සන්සා ආරක්ෂාකාරීව නැවත වින්ටර්ෆෙල් බලා පිටව ගිය පසු, ස්ටැනිස් උතුමානන් සිය හමුදාවත් සමග කින්ග්ස් ලැන්ඩින්ග්වලට පැමිණි පසු මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම වඩා ආරක්ෂාකාරී බැව් ඔහු වටහාගෙන සිටියේය.

"මම කැමැතියි මේ රාජසභාවෙන් ඉල්ලන්ට, රොබර්ට් බලාපොරොත්තු වුන විදියට මාව උපරාජයා විදියට ස්ථිර කරන්ටයි කියලා." නෙඩ් ඔවුන් ගේ මුහුණු දෙස බලමින් කීවේය. පයිසෙල් ගේ අඩක් පියැවුනු දෑස්, සුළැඟිල්ලා ගේ අලස සිනහව හා වාරිස් ගේ ඇඟිලි තුඩු වෙවුලීම පසුපස කුමන සිතුවිලි සැඟවී ඇත්දැයි ඔහු විමතියෙන් කල්පනා කලේය.

දොර ඇරුනි. මහත ටොම් කාමරයට ඇතුළු විය. "සමාවෙන්ට මගේ උතුමනි. ඒ වුනත් රජතුමාගෙ නිවාස බාරකාරයා බලකරනවා..."

රාජකීය නිවාස බාරකරුවා කාමරයට ඇතුළු වී හිස නැමීය. "ගරු කටයුතු උතුමනි, රජතුමා අණ කරනවා එතුමාගෙ රාජසභාවට වහාම සිහසුන් කාමරයට එන්ටයි කියලා."

සෙර්සිගේ මෙවැනි ඉක්මන් ප්‍රහාරයක් නෙඩ් බලාපොරොත්තුවෙන් සිටියේය. මේ කැඳවීම ඔහුට පුදුමයක් නොවීය. "රජතුමා මැරිලා. ඒ වුනත් අපි දැන් ඔබත් එක්ක යා යුතුයි. ටොම් කරුනාකරලා පරිවාර සේනාවක් ලෑස්ති කරන්ට."

පඩිපෙළ බැසීම පිණිස සුළැඟිල්ලා ගේ අත්වාරුව නෙඩ්ට ලැබිනි. වාරිස්, පයිසෙල් හා සෙර් බැරිස්ටාන් ඔවුන් සමීපයෙන් පසුපසින් ආවෝය. මුදු දම්වැල් සන්නාහයෙන් හා වානේ ශිරස්කයෙන් සන්නද්ධ වූ අට දෙනෙකුගෙන් යුතු සෙබළ මුලුවක් කුළුණට පිටතින් ඔවුන් වෙනුවෙන් බලා සිටියහ. අළු පැහැ සළු සුළඟේ ලෙලදෙද්දී සෙබළ මුලුව විසින් ඔවුන්ව අංගනය හරහා කැඳවාගෙන ගියහ. කිසිදු තැනෙක ලැනිස්ටර් ලේ රතු පැහැය දකින්නට නොහැකි විය. එනමුදු පවුරු අටලුවල හා දොරටුවල මුරකාවලෙහි නියැලී සිටි නගරාරක්ෂකයින් නිසා නෙඩ්ගේ සැක බිය දුරුවී ගියේය.

කැටයම් සහිත කළු හා රන් පැහැ එලක සන්නාහයෙන් සැරසී, ශිරස්කයක් කිහිල්ලේ ගන්වාගෙන සිටි ජේනස් ස්ලින්ට් සිහසුන් කාමරයට පිවිසෙන දොරටුව අබියසදී ඔවුන්ට මුනගැසුනේ ය. ඔහු දරදඬු අයුරින් ඔවුන්ට හිස නැමීය. ඔහුගේ සෙබළුන් විසින් අඩි විස්සක් උසැති, ලෝකඩයෙන් සවිමත් කරන ලද දැවැන්ත ඕක් දොරපලු විවෘත කලෝය.

රාජකීය නිවාස බාරකරුවා ඔවුන්ව ඇතුළට කැඳවාගෙන ගියේය. "අන්දාල් වරුන්ගේ ද, රොයිනාර් වරුන්ගේ ද, මුල් මිනිසුන්ගේ ද රජු වන, රාජධානි සප්තකයේ ස්වාමියා හා ආරක්ෂකයා වන, බරතියන් වංශයේ ජොෆ්රි නම් වූ එම නමින් යුත් පළමු රජතුමාගේ නාමයට දිගාසිරි වේවා!" ඔහු නිවේදනය කලේය.

ජොෆ්රි යකඩ සිහසුන මත අසුන්ගෙන සිටි ශාලාවේ එහා කෙලවර වෙත දිගු දුරක් ඇවිද යා යුතු විය. නෙඩ් ස්ටාර්ක් සුළැඟිල්ලා ගේ සහයද ඇතිව ඒ දෙසට සෙමින් සෙමින් නොණ්ඩි ගසමින් ගමන් කරන්නට විය. අනිකුත් පිරිස ඔවුන් පිටුපසින් පියමැන්නහ. මුල්ම වරට මේ ගමන ආ වේලාවේ ඔහු අසිපතක් අතැතිව අසුපිට සිටි බැව් ඔහුට සිහිපත් විය. එදා ඔහු විසින් ජේමි ලැනිස්ටර්ව සිහසුනෙන් බිමට බස්සද්දී ටාර්ගේරියන් මකර හිස්කබල් රැස ඔවුන් එල්ලී සිටි බිත්තිවල සිට ඔහු දෙස බලා සිටියහ. එතරම්ම පහසුවෙන් ජොෆ්රි ද සිහසුනෙන් බසිනු ඇත්දැයි නෙඩ් විමතියෙන් කල්පනා කලේය.

සෙර් ජේමී හා සෙර් බැරිස්ටාන් හැරෙන්නට රාජ්‍යාරක්ෂක බලකායේ අනිත් නයිට්වරු පස්දෙනා සිහසුන පාමුල අඩසඳාකාරයට විසිර සිටියෝය. ඔවුහු හිස සිට දෙපතුළ දක්වාම වානේ සන්නාහයෙන් සැරසී, දිගු සුදු සළු උරහිසට උඩින් පොරවාගෙන, වමතේ ඇඳූ දිදුලන සුදු පැහැ පලිස් දරා සිටියහ. සෙර්සි ලැනිස්ටර් හා ඇගේ බාල දරුවන් දෙදෙනා සෙර් බොරෝස් හා සෙර් මෙරින් පිටුපසින් සිටගෙන සිටියහ. රැජිණ සුදු පැහැ ම'රිෂ් රේන්දවලින් වැඩ දැමූ මුහුදු කොළ පැහැයේ දිගු ගවොමක් හැඳ සිටියාය. ඇගේ අතැඟිල්ලක පරෙවි බිජුවක් තරම් විශාල මරකත මිණක් සවිකල රන් මුදුවක් බැබලුනි. ඇගේ හිසේ එයටම ගැලපෙන අන්දමේ කුඩා ඔටුන්නක් විය.

මේ සැමටම ඉහළින් රන්වන් කමිසයකින් හා ලේ රතු පැහැ සේද කබායකින් සැරසුනු ජොෆ්රි යකඩ සිහසුනේ අසුන්ගෙන සිටියේය. සිහසුනට වහාම පහළින් වූ පටු පඩිය මත මුදු දම්වැල් හා අළු පැහැ එලක සන්නාහයෙන් සැරසී සිය සුනඛ හිසකින් යුත් ශිරස්කය පැළැඳි සැන්ඩෝර් ක්ලිගෙන් ස්ථානගත වී සිටියේය.

සිහසුනට පිටුපසින් දිගු අසිපතින් සන්නද්ධ වූ ලැනිස්ටර් සෙබළුන් විසිදෙනෙක් මුරකාවලෙහි නියැලී සිටියහ. ඔවුන් ගේ උරහිස්වල ලේ රත් පැහැ සළු ගැවසී තිබුනු අතර ඔවුන් ගේ ශිරස්ක යකඩින් කල සිංහයින්ගෙන් සැරසී ගත්තේය. එනමුදු සුළැඟිල්ලා සිය පොරොන්දුව මනාව ඉටු කොට තිබින. කාමරයේ බිත්ති දිගටම පාහේ, රොබර්ට් ගේ අලංකාර දඩයම් සිතුවම් සහිත තිර රෙදිවලට ඉදිරියෙන් රන් සළුවෙන් ගත වැසූ නගරාරක්ෂක සෙබළු සීරුවෙන් සිටගෙන සිටියහ. ඔවුන් සැමෙකකුගේම අත කළු යකඩින් කල තලයකින් හෙබි අඩි අටක් දිගු හෙල්ලයක් විය. ඔවුහු ගණනින් එකට පහක් වශයෙන් ලැනිස්ටර් සෙබළුන් පැරැද්දූහ.

ඇවිදීම නවතන මොහොත වන විට නෙඩ්ගේ පාදය වේදනාවෙන් ඇදුම්කමින් තිබුනි. සිය බර දරාගැනීම හා සමබරතාව රැකගැනීම සඳහා ඔහු සුළැඟිල්ලා ගේ උරහිසට වාරුවිය.

ජොෆ්රි නැගිට සිටියේය. ඔහුගේ රත් පැහැ සේද කබාය රන් නූලෙන් වැඩ දමා තිබින. එහි එක් පසෙක ගොරවමින් නැගී සිටින සිංහයින් පනසක් ද අනිත් පස උඩඟු ලීලාවෙන් හිස ඔසවාගෙන සිටින ගෝනුන් පනසක් ද ගෙත්තම් කොට තිබින. "මම අණ කරනවා උපදේශක සභාවට මගේ අභිෂේකය වෙනුවෙන් අවශය හැම පියවරක්ම ගන්ටයි කියලා." කොලුවා නිවේදනය කර සිටියේය. "සති දෙකක් ඇතුළත ඔටුනු පළඳන්ට මම අදහස්

කරන් ඉන්නවා. අද මම මගේ උපදේශක සභාවෙ සාමාජිකයින්ගෙන් පක්ෂපාතී දිවුරුම් ගන්නම්."

නෙඩ් රොබර්ට් ගේ ලිපිය සුරතට ගත්තේය. "වාරිස් උතුමානනි. කරුනාකරලා මේ ලියුම අපේ ලැනිස්ටර් ආර්යාවට පෙන්නනවද?"

පණ්ඩකයා ලිපිය රැජිණ වෙත රැගෙන ගියේය. රැජිණ එහි ලියා ඇති දෑ උඩින් පල්ලෙන් කියවා බැලුවාය. "රාජධානියේ ආරක්ෂකයා. මේකද උඹෙ ආරක්ෂක පලිහ මගෙ උතුමානනි? නිකංම නිකං කඩදාසි කෑල්ලක්?" කඩදාසිය දෙකට ඉරූ ඇය එය නැවත හතරට ඉරුවාය. කොළ කැබැලි ඇගේ පය පාමුල බිම වැටුනි.

"ඒ තිබුනෙ රජතුමාගෙ වචන. එයාගෙ අණ." සෙර් බැරිස්ටාන් ත්‍රස්ත වූ ස්වරයෙන් කීය.

"අපට දැන් අලුත් රජෙක් ඉන්නවා." සෙර්සි ලැනිස්ටර් පිළිතුරු දුන්නාය. "එඩාර්ඩ් උතුමානනි, මතකද අපි අන්තිමට කතා කරපු වෙලාවෙ උඹ මට පුංචි උපදෙසක් දුන්නා. මටත් ඒ කරුනාවම උඹටත් පෙන්නන්ට ඉඩදෙන්ට. දණ නවාපන් මගේ උතුමානනි. දණ නවලා මගේ පුතාට පක්ෂපාතීයි කියලා දිවුරපන්. එතකොට අපි උඹට අවස්ථාවක් දෙන්නම් ඔය තනතුරෙන් ගෞරවනීය විදියට සමුඅරන් ගිහිල්ලා උඹ අර ගෙදරයි කියලා කියන පාලු සීතල කාන්තාරෙට වෙලා සැපෙන් ඉන්ට."

"එහෙම කරන්ට පුළුවන් නම් කොච්චර හොඳද." නෙඩ් සැරපරුස ස්වරයෙන් කීය. මෙය මෙතැන, මේ පිරිස ඉදිරියේ තව දුරටත් ඇදගෙන යන්නට ඇය අදිටන් කරගෙන ඉන්නේ නම් ඔහුට වෙනත් විකල්පයක් ඉතුරුව නැත්තේය. "ඔබේ පුතාට ඔය සිංහාසනේ වාඩිවෙලා ඉන්ට කිසිම සුදුසුකමක් නෑ. රොබර්ට් රජතුමාගෙ නියම උරුමක්කාරයා ස්ටැනිස් උතුමානනුයි."

"බොරුකාරයා." ජොෆ්රි රතු වී ගිය මුහුණින් යුතුව මොරගෑවේය.

"අම්මා, මොකක්ද ඒකෙන් කියැවෙන්නෙ?" මර්සෙලා කුමරිය දුක්මුසු ස්වරයෙන් රැජිණගෙන් විමසුවා ය. "දැන් එතකොට ජොෆ් නෙවෙයිද රජ්ජුරුවො?"

"උඹ උඹේ කට නිසාම විහින් විනාසවෙනවා ස්ටාර්ක් උතුමානනි." සෙර්සි කීවාය. "සෙර් බැරිස්ටාන්, මේ ද්‍රෝහියාව අත්අඩංගුවට ගනින්."

රාජ්‍යාරක්ෂක බලකායේ ප්‍රධානියා මොහොතක් අතීරණයෙන් පසුවීය. ඇසිපිය හෙලන පමාවෙන් ආයුධ ඇදගත් ස්ටාර්ක් සෙබළුන් විසින් ඔහුව වටකරගන්නා ලදී.

"දැන් ඉතින් ද්‍රෝහිකම වචනවලින් විතරක් නෙවෙයි ක්‍රියාවෙන්ම පෙන්නුවා." සෙර්සි කීවාය. "උඹ හිතන්නෙ සෙර් බැරිස්ටාන් විතරක් තනියම ඉන්නවා කියලද මගෙ උතුමානනි?" දඩබල්ලා අම්හිරි හඬක් නංවමින් සිය දිගු අසිපත කොපුවෙන් පිටතට ඇදගත්තේ ය. රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරුන් ද ලැනිස්ටර් සෙබළුන් විසිදෙනාද ඔහුට සහාය පිණිස ඉදිරියට ඇදුනහ.

"ඌව මරපන්." යකඩ සිහසුනේ අසුන්ගෙන සිටි කොලුවා කෑගැසුවේ ය. "උන් ඔක්කොමල්ලා මරපන්. මම අණ කරනවා."

"ඔබ මට වෙන කිසිම විකල්පයක් දෙන්නෙ නෑ." නෙඩ් සෙර්සි ලැනිස්ටර්ට කීවේය. ඔහු ජේනස් ස්ලින්ට් දෙසට හැරුනේය.

"අණදෙන නිළධාරියා. රැජිණයි එයාගෙ දරුවනුයි අත්අඩංගුවට ගන්ට. එයාලට කිසිම හානියක් කරන්ට එපා. එයාලව ආපහු රාජකීය නවාතැනට එක්කරන් ගිහිල්ලා මුර පිට රඳවලා තියන්ට."

"මුර සෙබළුනි." සිය ශිරස්කය දමා ගනිමින් ජේනස් ස්ලින්ට් හඬගෑවේය. සිය හෙලි පහත් කරගත් නගරාරක්ෂක මුර සෙබළු සියයක් ඔවුන් වටා රැස් වූහ.

"මට මෙතැන කිසිම ලේ හැලීමක් කරන්ට ඕන නෑ." නෙඩ් රජීණට කීවේය. "ඔබේ මිනිස්සුන්ට ආයුධ බිමින් තියන්ටයි කියලා කියන්ට. අනික කිසිම කෙනෙක්-"

නුදුරින්ම සිටි නගරාරක්ෂක සෙබළා එකම එක ක්ෂණික පහරකින් සිය හෙල්ලය ටොමාර්ඩ් ගේ පිටකොණ්දට බැස්සුවේ ය. ලෙයින් පෙඟී රත් පැහැ වූ හෙලි තලය පදම්කල සම් ආවරණ හා මුදු දම්වැල් පසාකරමින් ඔහුගේ ඉළඇට අතරින් පිටතට එද්දී මහත ටොම්ගේ අප්‍රාණික අතැඟිලි වලින් අසිපත ගිලිහී ගියේය. අසිපත බිම වැටෙන්නටත් පෙර ඔහු මියගොස් සිටියේය.

නෙඩ්ගේ කෑගැසීම පමා වැඩි විය. ජේනස් ස්ලින්ට් සියතින්ම වාර්ලි ගේ ගෙල සිඳ දැමීය. සැනෙන් ආපසු හැරුනු කේන් දැඩි අසිපත් පහර කිහිපයකින් තමාට නුදුරින්ම සිටි නගරාරක්ෂක සෙබළා පිටුපසට පලවා හැරියේය. එක් මොහොතකට දිස් වූයේ ඔහුට මේ සංහාරයෙන් මිදී පලායාමට අවස්ථාවක් සැලසෙනු ඇති බවයි. එනමුදු ඊළඟ මොහොතේ දඩබල්ලා ඔහු මතට පිනීය. සැන්ඩෝර් ක්ලිගේන් ගේ පළමු අසිපත් පහරින් කේන්ගේ අසිපත දැරූ සුරත මැණික්කටුව අසලින් වෙන් වී ගියේය. දෙවන පහර ඔහුව දණින් ඉන්දවීමට සමත් වූ අතර ඔහු උරහිසේ සිට පපු ඇටය දක්වාම දෙපළුව ගියේය.

ඔහු වටා ඔහුගේ මිනිසුන් මෙසේ එකිනෙකා මියයද්දී නෙඩ්ගේ ඉණපටියේ රැඳි කිනිස්ස පිටතට ඇදගත් සුළැඟිල්ලා එය ඔහුගේ නිකට යටින් තබා තදකලේය. ඔහුගේ මුවේ සමාව යදිනාකාරයේ සිනහවක් තැවරී තිබුනි. "ඔබට මතකනෙ, මම ඔබට කිවුවා මාව විශ්වාස කරන්ට එපයි කියලා."

**Cersei Lannister: “We have a new king now.”**

ආර්යා 04-1

"උඩින්." සිරියෝ පොරල් කෑගසමින් ඇගේ හිසට පහරක් එල්ල කලේය. ආර්යා පහර වැළැකූ අතර ලී කඩු දෙක හඬ නගමින් එකට ගැටුනි.

"වමෙන්." ඔහු කෑගැසූ අතර අසිපත සියුරුහඬ නංවමින් ඇදී ආයේය. එය සම්මුඛ වීම පිණිස ඇගේ අසිපත ඉදිරියට ගියේය. අසිපත් දෙක එකට ගැටෙද්දී ඔහු ටික් ටික් හඬ නංවමින් දත් එකට ගැටීය.

"දකුණෙන්." ඔහු කීය. "පහතින්." නැවතත් "වමෙන්." තවත් වරක් "වමෙන්." වඩ වඩාත් වේගවත්ව. ඉදිරියටම. ඔහුගේ සෑම පහරක්ම වළකන අතරේ ආර්යා සෙමෙන් පසුබැස්සා ය.

"ඉස්සරහට පැනලා." ඔහු අනතුරු අඟවමින් ඉදිරියට පැන අසිපතෙන් ඇන්නේය. එනමුදු පසෙකට පැන අසිපත් තලය පිසදා හැරිය ඇය ඔහුගේ උරහිසට පහරක් එල්ල කලාය. අන්තිම මොහොතේ ඔහු සිය අසිපත ඔසවා පහර වැළැක්කීය. එය කෙතරම් ආසන්න අවස්ථාවක් වූවාද යත් ඇගේ මුවේ සිනාවක් නැගුනි. දහදියෙන් පෙඟුනු කෙස් රොදක් ඇගේ දෑස් ඉදිරියේ නැටීය. ඇය එය පිටිඅත්ලෙන් පිසදා හැරියාය.

"වමෙන්." සිරියෝ දිගටම කෑගැසුවේ ය. "පහතින්." ඔහුගේ පහරවල් කෙතරම් වේගවත්ද යත් අසිපත බොඳ වූවාක් මෙන් දිස්විය. කුඩා ශාලාව තුළ 'ක්ලැක් ක්ලැක් ක්ලැක්' හඬ රැවු දුන්නේය. "වමෙන්. වමෙන්. උඩින්. වමෙන්. දකුණෙන්. වමෙන්. පහතින්. වමෙන්."

ලී අසිපත ඇගේ ළපැත්තේ ඉහළ සිපගත්තේ ය. එය දැඩි, තියුණු වේදනාවක් ගෙන දුන් අතර ඇයට වඩාත්ම රිදුනේ පහර පැමිණියේ වැරදි පැත්තෙන් බැවිනි. "ආවු!" ඇය කෑගැවාය. අද නින්දට යන වේලාව වන විට ඇගේ සිරුරේ තවත් අලුත් තැල්මක් දැකිය

හැකිවනු ඇත. 'තැල්මක් කියන්නෙ පාඩමක්.' ඇය තමාටම කියාගත්තා ය. 'ඒ වගේම හැම පාඩමක් ගානෙම අපි තව තවත් හොඳ වෙනවා.'

සිරියෝ අඩියක් පසුපසට තැබීය. "දැන් ඔයා මැරිලා."

ආර්යා මුහුණ ඇදකලාය. "ඔයා වංචා කලා." ඇය වාදාත්මක ස්වරයෙන් කීවාය. "ඔයා කිවුවෙ වමෙන් කියලා, ඒත් පාර ආවෙ දකුණෙන්."

"එහෙම වෙන්ට ඇති. ඒ කොහොම හරි ඔයා දැන් මැරිච්ච කෙල්ලක්."

"ඒ වුනත් ඔයා බොරු කිවුවා!"

"මගේ වචන බොරු කිවුවා තමා. ඒ වුනත් මගේ ඇහැ, මගේ අත ඇත්ත කියලා කෑගැහුවා. ඒත් ඔයා ඒක දැක්කෙ නෑ."

"මම දැක්කා." ආර්යා කීවාය. "මම හැම තත්පරයක් ගානෙම ඔයා දිහා බලාගෙනයි හිටියෙ."

"බලනවා කියන්නෙ දකිනවා කියන එක නෙවෙයි මැරිච්ච කෙල්ලෙ. දිය නැට්ටුවො වුනාම හැම දෙයක්ම දකින්ට ඕන. එන්ට. ඔය කඩුව පැත්තකින් දාන්ට. දැන් අහන් ඉන්ට ඕන වෙලාව."

ඇය ඔහු පසුපසින් ගොස් බිත්තිය අද්දර තිබුනු බංකුවක වාඩි වූවාය. "සිරියෝ ෆොරල් බ්‍රාවොස්වල ප්‍රධාන නැවු හිමියාගෙ නායක සෙබළා වෙලා හිටියා. ඔයා දන්නවද කොහොමද ඒක සිද්දවුනේ කියලා?"

"ඔයා තමා නගරයෙ හිටපු හොඳම කඩුහරඹ සූරයා." ආර්යා කීවාය.

"එහෙම වෙන්ට ඇති. ඒත් ඇයි? තවත් මිනිස්සු හිටියා ශක්තිමත්, වේගවත්, තරුණ උදවිය. ඇයි සිරියෝ ෆොරල් හොඳම එක්කෙනා වෙන්නෙ? මම දැන් ඔයාට කියලා දෙන්නම්." ඔහු සුළැඟිලි තුඩින් සිය ඇහිබැම ස්පර්ශ කලේය. "පෙනීම. නියම පෙනීම. ඒක තමා ඒකට ප්‍රධානම හේතුව වුනේ."

"හොඳට අහගන්ට. හුළං හමන්නෙ කොයි පැත්තටද, ඒ හැමතැනටම බ්‍රාවොසි නැවු යනවා. ලෝකෙ කෙලවරටම, කවදාවත් සාමාන්‍ය මිනිස්සු දැකලාවත් නැති අමුතු, පුදුමාකාර රටවල්වලට යනවා. ඉතින් මේ නැවු ආපහු එනකොට ඒවායෙ කපිතාන්ලා නායක නැවු හිමියාගෙ පෞද්ගලික සත්තු වත්තට එක එක ජාතියෙ අමුතු සත්තු ගෙනල්ලා දෙනවා. ඔයා කවදාවත් දැකලා තියා අහලාවත් නැති සත්තු. ඉරි වැටිච්ච අශ්වයො, බොරුකකුල් වගේ දිග බෙලි තියෙන පුල්ලි වැටිච්ච සත්තු, හරකෙක් තරම් විශාල, ලොම් පිරිලා තියෙන ඌරෝ වගේ මීයො, විස මැන්ටිකෝරයො, බඩේ තියෙන මල්ලක තමන්ගෙ පැටවු දාගෙන යන ව්‍යාඝ්‍රයො, උල් පිහි වගේ නිය තියෙන භයානක කටුස්සො. සිරියෝ ෆොරල් මේ හැමජාතියෙම එවුන් දැකලා තියෙනවා."

"මම මේ කියන්ට යන දවසෙ ප්‍රධාන නැවු හිමියා මට එන්ටයි කියලා පණිවුඩයක් එවුවා. එයාගෙ නායක සෙබළා ඊට ටික දවසකට කලින් මැරුනා. ගොඩක් බ්‍රාවොසියො ආවා එයාව හම්බවෙන්ට, ඒ තනතුරට ඉල්ලන්ට. ඒත් එයා ඒ හැමෝම ආපහු හරවලා ඇරියා. කාටවත් හිතාගන්ට බැරිවුනා හේතුව මොකක්ද කියලා. මම එයා ඉස්සරහට යනකොට, එයා පුටුවක වාඩි වෙලා, උකුළ උඩ මහත කහපාට බළලෙක් තියාගෙන හිටියා. එයා මට කිවුවා නැවක කපිතාන් කෙනෙක් තමා ඉර නගින්නෙවත් නැති කොහෙද දූපතකින් එයාට ඒ සතා ගෙනල්ලා දුන්නෙ කියලා. 'ඔබ මේ බැළලි වගේ එකෙක් කවදාවත් දැකලා තියෙනවද?' එයා මගෙන් ඇහුවා."

"ඉතින් එයාට මම කිවුවා, 'හැම රෑකම බ්‍රාවොස්වල පටු මංමාවත්වල මම මේ වගේ එවුන් දාස්ගණන් දකිනවා' කියලා. ප්‍රධාන නැවු හිමියා මහ හයියෙන් හිනාවුනා. එදා ඉඳන් මම තමා එයාගෙ නායක සෙබළා වුනේ."

ආර්යා මුහුණ බෙරි කරගත්තා ය. "මට තේරුනෙ නෑ."

සිරියෝ නැවත වරක් 'ටික් ටික්' හඬින් දත් එකට ගැටීය. "ඒ බළලා සාමාන්‍ය බළලෙක්. විශේෂ එකෙක් නෙවෙයි. අනිත් මිනිස්සු බලාපොරොත්තු වුනේ අසාමාන්‍ය සතෙක්. ඒකයි එයාලා ඌව අසාමාන්‍ය සතෙක් විදියට දැක්කෙ. 'ඌ කොච්චර විශාල ද!' එයාලා කිව්වා. ඒ වුනත් මේ බළලා අනිත් එවුන්ට වඩා විශාල එකෙක් නෙවෙයි. කම්මැලිකම නිසා ටිකක් වැඩිපුර මහත්වෙලා විතරයි. මොකද ප්‍රධාන නැවු හිමියා ඌව තමන්ගෙ කෑම මේසෙ ගාවම තියාගෙන කෑම දුන්න නිසා. 'කොච්චර පුදුමාකාර පුංචි කණ් ද!' එයාලා කිව්වා. එහෙම වුනේ අනිත් බළල්ලු එක්ක කා ගන්නකොට උගෙ කණ් දෙක තුවාල වෙලා කැඩිලා ගිහිල්ලා නිසා. අනික ඌ බළලෙක්. ඒ වුනත් නැවු හිමියා හිතාමතාම 'බැළලි' කියලා කිව්වා. ඉතින් අනිත් අය දැක්කෙ එහෙමයි. ඔයා අහගෙනද ඉන්නෙ?"

ආර්යා මොහොතක් ඒ ගැන කල්පනා කලාය. "ඔයා දැක්කා ඇත්තටම එතැන තිබුනෙ මොකක්ද කියලා."

"අන්න හරි. ඔයාගෙ ඇස් දෙක හොඳින් ඇරලා තියාගන්න එක තමා වැදගත්ම දේ. හදවත අපට බොරු කියන්ට පුළුවන්. මොළය අපට එක එක විකාර කියන්ට පුළුවන්. ඒ වුනත් ඇස් දෙක ඇත්ත දකිනවා. ඔයාගෙ ඇස් දෙකෙන් දකින්ට. ඔයාගෙ කණ් දෙකෙන් අහන්ට. ඔයාගෙ දිවෙන් රහ බලන්ට. ඔයාගෙ නහයෙන් ගඳ-සුවඳ විඳින්ට. ඔයාගෙ හමෙන් හඟින්ට. අන්න එතකොට එනවා සිතීම. ඊටපස්සෙ මේ සිතීම පත්වෙනවා දැනුම බවට. එහෙමයි ඔයා ඇත්ත දැනගන්නෙ."

"එහෙම වෙන්ට ඇති. "ආර්යා විරිත්තමින් කීවාය.

සිරියෝ ෆොරල් මුවට සිනහවක් නගාගත්තේ ය. "මම මේ කල්පනා කරන්නෙ, අපි ඔයාගෙ ඔය වින්ටර්ෆෙල්වලට ගියාට පස්සෙ ඔයාගෙ ඔය කඩුව, ඉදිකට්ටෙන්ම ඔයාට පුහුණුවෙන්ට ඇරියා නම් හොඳයි කියලා."

"ඔවු!" ආර්යා උනන්දුවෙන් කීවාය. "ඉන්ටකො, මම ජොන්ට පෙන්නනකං-"

ඇයට පිටුපසින් කුඩා ශාලාවේ දැවැන්ත දොර පියන් මහ හඬක් නගමින් ඇරුනේය. ආර්යා වහා කරකැවී බැලුවාය.

රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරයෙකු හා ඔහුට පසුපසින් ලැනිස්ටර් සෙබළුන් පස්දෙනෙක් දොර උළුවස්ස අසල සිටගෙන සිටියෝය. ඔහු සම්පූර්ණ සන්නාහයෙන් සැරසී සිටි නමුදු ශිරස්කයේ මුව වැස්ම ඉහළට ඔසවා තිබුනි. රජතුමා සමගින් වින්ටර්ෆෙල්වලට පැමිණි ඔහුගේ මැලවුනු දෑස් හා මළකඩ පැහැ රැවුල ආර්යා විසින් හඳුනාගත්තා ය. සෙර් මෙරින් ට්‍රැන්ට්. ලැනිස්ටර් සෙබළු මුදු දම්වැල් සන්නාහ කමිස හැඳ මුදුනේ සිංහයකු සවි කල වානේ ශිරස්ක පැළැඳ සිටියහ. "ආර්යා ස්ටාර්ක්." නයිට්වරයා කීය. "අපිත් එක්ක එන්ට දරුවො."

ආර්යා දෙගිඩියාවෙන් දෙතොල් විකීය. "ඔයාට මොනවද ඕන?"

"ඔයාගෙ තාත්තාට ඔයාව මුනගැහෙන්ට ඕනලු."

ආර්යා පියවරක් ඉදිරියට තැබුවාය. එනමුදු සිරියෝ ෆොරල් වහා ඇගේ අතකින් අල්ලා ඇයව නැවැත්වීය. "මම කල්පනා කරන්නෙ, ඇයි එඩාර්ඩ් උතුමානන් එයාගෙ මිනිස්සු එවන්නෙ නැතුව ලැනිස්ටර් සෙබළු එවන්නෙ?"

"උඹ උඹේ වැඩක් බලාගනින් නැටුම් ගුරුතුමෝ." සෙර් මෙරින් කීවේය. "මේක උඹට අයිති වැඩක් නෙවෙයි."

"මගේ තාත්තා ඔයාලාව එවන්නෙ නෑ." ආර්යා කීවාය. ඇය සිය ලී අසිපත අහුලා ගත්තා ය. ලැනිස්ටර් සෙබළු සිනහවෙන්නට වූහ.

"ඔය ලී කෑල්ල විසි කරහන් කෙල්ලෙ." සෙර් මෙරින් ඇයට කීය. "මම රාජ්‍යාරක්ෂක බලකායෙ දිවුරුම් දුන්න සහෝදරයෙක්. ධවල අසිපතක්."

"පරණ රජතුමාව මරද්දි රජුන් මරන්නාත් එහෙම දිවුරුම් දීපු සාමාජිකයෙක් වගේ තමා හිටියෙ." ආර්යා කීය. "මට යන්ට උවමනාවක් නැත්තං මම ඔයාලත් එක්ක එන්ට ඕන නෑ."

සෙර් මෙරින් ගේ ඉවසීම සිඳී ගියේය. "ඒකිව අල්ලගනිල්ලා." ඔහු සිය සෙබළුන්ට කීවේ ශිරස්කයේ මුව වැස්ම පහතට දමා ගනිමිනි.

තබන පියවරක් පාසා මුදු දම්වැල් නද දෙවමින් ඔවුන් තිදෙනෙක් ඉදිරියට පිය මැන්නෝය. ආර්යාට හදිසියේම දැඩි බියක් දැනෙන්නට විය. 'බය කඩුවට වඩා ගැඹුරට කැපෙනවා.' ඇය තමාටම කියාගත්තේ සිය හදගැස්මේ වේගය අඩු කරලීමේ අටියෙනි.

අතැති ලී අසිපතෙන් සෙමින් සිය බූට්ස් සපත්තුවට තට්ටු කරමින් සිරියෝ ෆොරල් වහා ඔවුන් මැද්දට පැන්නේය. "උඹලා ඔතැනම නැවතියල්ලා. උඹලා මිනිස්සු ද නැත්තම් බල්ලො ද, මෙහෙම පුංචි දරුවෙකුට තර්ජනය කරන්ට?"

"අහකට වෙයන් නාකියො." එක් සෙබළෙක් කීය.

විදුලියක් මෙන් ඉහළ නැගුනු සිරියෝ ගේ ලී අසිපත සෙබළා ගේ ශිරස්කය මත පතිත විනි. "මම සිරියෝ ෆොරල්. උඹලා දැන්වත් මට ටිකක් ගරුනම්බු දීලා කතා කලොත් හොඳයි."

"තට්ට අවජාතකයො." සෙබළා සිය දිගු අසිපත ඇදගත්තේ ය. ලී අසිපත නැවත වරක් අකුණුසරක වේගයෙන් ඉහළ නැගුනි. ආර්යාට යමක් බිඳෙන හඬක් ඇසුනු අතර දිගු අසිපත රැවුදෙමින් ගල් පොළොව මත පතිත විය. "මගේ අත." සිය බිඳුනු අතැඟිලි මිරිකා ගනිමින් සෙබළා වේදනාවෙන් කෑ ගැසුවේය.

"උඹ බොහොම වේගවත්. නැටුම් ගුරුවරයෙකුට ගැලපෙන තරමටත් වඩා." සෙර් මෙරින් කීවේය.

"උඹ බොහොම මන්දගාමියි. නයිට් කෙනෙකුට ගැලපෙන තරමටත් වඩා." සිරියෝ පිළිතුරු දුන්නේය.

"ඔය බ්‍රාවොසියාව මරලා දාලා මට කෙල්ලව අරන් වරෙල්ලා." නයිට්වරයා විධාන කලේය.

ලැනිස්ටර් සෙබළුන් සිවුදෙනෙක් සිය දිගු අසිපත් ඇදගත්තෝ ය. බිඳුනු අතැඟිලි ඇති පස්වැන්නා සිය වමතින් සිරියක් ඇදගත්තේ ය.

සිරියෝ ෆොරල් සිය සුපුරුදු දිය නැටුම් ඉරියව්වට පැමිණෙමින් 'ටික් ටික්' හඬින් දත් එකට ගැටීය. ඔහු පැති ඉරියව්වකින් සිය සතුරාට මුහුණ දුන්නේය. "ආර්යා දරුවො." ඔහු සතුරු ලැනිස්ටර් සෙබළුන් වෙතින් දෑස් ඉවතට නොගෙන, ඇය දෙස නොබලාම ඇයව ඇමතුවේ ය. "අද දවසට අපේ නැටුම් පාඩම් ඉවරයි. ඔයා දැන් ගියානම් හොඳයි. ඔයාගෙ තාත්තා ගාවට දුවලා යන්ට."

ආර්යාට ඔහුව දමා යෑමට උවමනා නොවීය. එනමුදු තමා කියන්නක් කරන්නැයි ඔහු ඇයට උගන්වා තිබුනි. "මුවෙක් වගේ වේගවත් වෙන්ට." ඇය කොඳුලාය.

"අන්න හරි." ලැනිස්ටර් සෙබළුන් සෙමෙන් සෙමෙන් ඔහු වටා ලංවද්දී සිරියෝ කීවේය.

සිය ලී අසිපත තරයේ අල්ලාගත් ආර්යා සෙමෙන් පසුපසට ඇදුනාය. සිරියෝ ගේ ඉරියවු දුටු ඇයට වැටහී ගියේ තමා සමග ද්වන්ද්ව සටන් කරද්දී ඔහු කලේ විහිළුවක් පමණක් බවයි. සෙබළු ඔහුව තුන් පැත්තකින් වටකලෝය. ඔවුන් ගේ පපු හා බාහු මුදු දම්වැල් සන්නාහයෙන් වැසී තිබුනි. ඔවුන් ගේ කලිසම්වලට තබා මැසූ වානේ පතුරුවලින් කළවා ආරක්ෂා විය. එනමුදු ඔවුන් ගේ පාද ආරක්ෂා කිරීමට තිබුනේ පදම් කල සම් පමණි. එමෙන්ම ඔවුන් ගේ අත් නිරාවරණය වී තිබුනි. ඔවුන් පැළැඳ සිටි ශිරස්කවල නාසය ඉදිරියෙන් වානේ තීරුවක් තිබුනු නමුදු දෑස්වල ආරක්ෂාවට මුව වැස්මක් නොතිබුනි.

ඔවුන් තමා වෙත කඩා පනින තෙක් බලා නොසිටි සිරියෝ වහා තම වම් පසට කරකැවුනේ ය. මිනිසෙකු මෙතරම් වේගයෙන් චලනය වනු ආර්යා මින් පෙර කිසි දිනෙකත් දැක නොතිබින. එක් අසිපත් පහරක් සිය ලී අසිපතින් පිසදා හැරි ඔහු තවත් අසිපත් පහරක් වැළැක්මට පසෙකට පැන්නේය. පහර වැරැදීම නිසා අසමතුලිත වූ දෙවන සෙබළා පළමුවැන්නා ගේ සිරුරේ හැපුනි. සිරියෝ ඔහුගේ පසුපසට පයක් තමා තල්ලු කල අතර

සෙබළුන් දෙදෙනාම බිම පෙරළී ගියහ. ඔවුන් දෙදෙනාට ඉහළින් පිනූ තෙවැන්නා සිරියෝ ගේ හිසට කෙටීය. එනමුදු ඒ අසිපතට යටින් නැමුනු සිරියෝ සිය ලී අසිපතින් ඉදිරියට ඇන්නේය. සෙබළා ගේ වම් ඇස තිබුනු තැනින් රුධිරය විදිද්දී ඔහු වේදනාවෙන් කෑ ගසමින් බිම වැටුනේය.

මේ වනවිට බිම වැටුනු සෙබළුන් දෙදෙන නැවත නැගිටිමින් සිටියෝය. සිරියෝ එකෙකුගේ මුහුණට පා පහරක් එල්ල කර අනිකා ගේ ශිරස්කය ඩැහැගත්තේ ය. සිරිය දැරූ සෙබළා ඔහුට දමා ඇන්නේය. එනමුදු අතැති වානේ ශිරස්කයෙන් එම පහර පහසුවෙන්ම වැළැකූ සිරියෝ ලී අසිපත් පහරකින් සෙබළා ගේ දණහිස බිඳ දැමුවේය. අවලාදයක් නැගූ අවසාන සෙබළා සිය අසිපත දැතින්ම ඔසවා පහරක් එල්ල කලේය. එනමුදු සිරියෝ වහා දකුණට කරකැවුනු අතර අසිපත් පහර මේ වනවිට දණින් නැගී සිටි ශිරස්කය අහිමි සෙබළා ගේ ගෙලත් උරහිසත් අතරින් පතිත විය. වානේ මුදු දම්වැල්, පදම් කල සම් හා මස් කපා දමමින් අසිපත ඇතුළට කිඳා බැස්සේය. දණින් වැටී සිටි සෙබළා වියරුවෙන් කෑ ගැසුවේය. ඔහුගේ මරුවා සිය අසිපත් තලය ආපසු ඇදගන්නට පෙර ඉදිරියට පිනූ සිරියෝ සෙබළා ගේ උගුරු ඇටයට අසිපතින් ඇන්නේය. මැඩුනු කෑ ගැසීමකින් හා කළු වී ගිය මුහුණින් යුතු සෙබළා සිය බෙල්ල දැතින් බදා ගනිමින් පසුපසට වැටුනේය.

කුස්සිය වෙතට ඇරෙන පසුපස දොර වෙතට ආර්යා ළඟාවන මොහොත වනවිටත් මිනිසුන් පස්දෙනෙක් බිම වැටී මිය ගොස් හෝ මියයමින් හෝ සිටියහ. සෙර් මෙරින් ට්‍රැන්ට් ගේ මුවින් නැගුනු අවලාදය ඇයට පැහැදිලිවම ඇසුනි. "පල් බූරුවෝ!" සිය දිගු අසිපත කොපුවෙන් අදිමින් ඔහු සාපකලේය.

නැවත සිය දිය නැටුම් ඉරියවුවට පැමිණි සිරියෝ 'ටික් ටික්' හඬින් දත් එකට ගැටීය. "ආර්යා දරුවෝ." ඇය දෙස බලන්නටවත් වෙහෙස නොවෙමින් ඔහු ඇයව ඇමතීය. "ඔයා දැන් ගියොත් හොඳයි."

'ඔයාගෙ ඇස්වලින් දකින්ට.' ඔහු කියා තිබුනි. ඇය බැලුවාය, ඇය දුටුවාය. නයිට්වරයා හිස සිට දෙපතුළටම යන තෙක් සන්නාහයෙන් සැරසී සිටියේය. ඔහුගේ පාද, ගෙල හා දැත් වානේවලින් ආවරණය වී තිබින. ඔහුගේ දෑස් වානේ ශිරස්කයෙන් හා මුව වැස්මෙන් ආරක්ෂා වී තිබින. ඔහුගේ සුරතේ සුපිරි වානේ අසිපතක් විය. මේ සියල්ලටම එදිරිව

සිරියෝ ෆොරල්, සම් කබායකින් සැරසී ලී අසිපතක් අත දරා සිටියේය. "සිරියෝ දුවන්ට." ඇය කෑ ගැසුවාය.

"බ්‍රාවොස්වල නායක සෙබළා කවදාවත් දුවන්නෙ නෑ." නයිට්වරයා තමා මත කඩා පනිද්දී ඔහු කීවේය. සිරියෝ නර්තන ලීලාවෙන් අසිපත් පහර මගහැරියේ ය. එක් හද ගැස්මක මොහොතකදී ඔහුගේ අසිපත නයිට්වරයා ගේ නළල, වැලිමිට හා ගෙල සිපගත්තේ ය. අසිපත අකුණු සරින් නයිට්වරයා ගේ ශිරස්කය, අත්වැසුම් හා ග්‍රීවාවරණය මත හැපෙද්දී ලී හා වානේ එකිනෙක ගැටෙන හඬ කාමරය පුරා රැවු දුන්නේය. ආර්යා ගල්ගැසී බලා හුන්නාය. සෙර් මෙරින් නැවතත් ඉදිරියට පිනීය. සිරියෝ පසු බැස්සේය. ඔහු නයිට්වරයා ගේ පළමු පහර වළකා, දෙවන පහරින් ඉවතට කරකැවී, තෙවන පහර පිසදා හැරියේය.

එනමුදු සිවුවන පහරින් ඔහුගේ අසිපත දෙකඩ කැඩී ගියේය. ලී පතුරු දසත විහිද ගිය අතර අසිපත් තලය මැද්දේ වූ ඊයම් කැඩී ඇඹරී ගියේය.

ඉකිබිඳිමින් ආපසු හැරුනු ආර්යා දුවන්නට වන්නීය.

**Syrio Forel: “The first sword of Braavos does not run'”**

**ආර්යා 04-2**

තැතිගැන්මෙන් අන්ධ වූ දැස් ඇති ආර්යා කුස්සිය හා බටර් පත්ගාන කාමරය හරහා කෝකියන්, අත් උදවුකාර කොල්ලන් පසු කරමින් හැරෙමින් දිව යන්නට වූවාය. ලී බන්දේසියක් අතින් ගත් බක්කර කෙල්ලක් ඇය ඉදිරියේ ප්‍රාදුර්භූත විය. ආර්යා ඇයව තල්ලු කර දැමූයේ අලුත පිලිස්සූ පාන් දසත විසිර ගියේය. මස් කපන දැවැන්ත පිහියක් අතින් ගෙන ඇය දෙස මුව අයා බලාසිටි, වැලිමිටට යනතෙක්ම රත් පැහැ වූ දෑත් ඇති මස් මරන්නෙක් වටා කරකැවී හැරෙද්දී ඇය පසුපසින් කෑ ගැසීම් ඇසෙන්නට විය.

සිරියෝ ඇයට ඉගැන්වූ සියල්ල අසුරු සැනින් ඇගේ හිසට නැංගේය. 'මුවෙක් වගේ වේගවත් වෙන්ට.' 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' 'සර්පයෙක් වගේ ක්ෂණික වෙන්ට.' 'නිශ්චල ජලය වගේ සන්සුන් වෙන්ට.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' 'වලහෙක් වගේ ශක්තිමත් වෙන්ට.' 'වුල්වරින් එකෙක් වගේ සාහසික වෙන්ට.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' 'පැරදෙන්ට බය මිනිහා දැනටමත් පැරදිලා.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' 'බය කඩුවට වඩා යටට කැපෙනවා.' ඇගේ අතේ තිබුනු ලී අසිපතේ මිට දහදියෙන් පෙඟී තිබුනි. සර්පිලාකාර පඩිපෙළ අසලට ළඟාවද්දී ඇය හති දමමින් උන්නාය. ඇය මොහොතකට ගල් ගැසුනාය. උඩට ද නැත්තම් පහළට ද? උඩට ගියහොත් හස්තයේ කුළුණ හා අර කුඩා අංගනය යා කරන ආවරණය කල පාලම වෙතට යා ගත හැකි වනු ඇත. එනමුදු නිසැකයෙන්ම ඇය ඒ පාරෙන් පැමිණෙනු ඇතැයි ඔවුන් බලාපොරොත්තුවෙන් සිටිනු ඇත. 'කවදාවත් එයාලා බලාපොරොත්තු වෙන දේ කරන්ට එපා,' සිරියෝ වරක් කියා තිබුනි. පඩි දෙක තුන පනිමින්, වටයට වටයට යමින් පඩිපෙළ පහළට දිවගිය ඇය අන්තිමේදී බිංගෙයක් වැනි අඳුරු ගබඩා කාමරයකට පිවිසියා ය. කාමරය පුරා අඩි විස්සක් උසට එකිනෙක මත ගොඩ ගැසූ ඒල් පීප්ප පිරී තිබින. බිත්තියේ ඉහළින් වූ කුඩා ආනති කවුළුවක් තුළින් කාමරයට වැටුනු එකම ආලෝකය පිවිසියේ ය.

ගබඩා කාමරයෙන් පාර කෙලවර විය. ඇය පැමිණි දොර හැර පිටවීමට වෙනත් මඟක් නොවීය. නැවතත් අර පඩිපෙළ දිගේ ආපසු නැඟීමට තරම් ඇය නිර්භීත නොවීය. එනමුදු ඇයට මෙහි නැවතී සිටීමට ද නොහැක. ඇය සිය පියාව සොයාගෙන සිදු වූ සියල්ලක්ම ඔහුට පැවසිය යුතුය. පියා ඇයව ආරක්ෂා කරනු ඇත.

ලී අසිපත ඉණපටියේ රුවා ගත් ආර්යා ඉහළ නැඟීමට පටන්ගත්තා ය. පීප්පයෙන් පීප්පය අල්ලාගෙන ඉහළටම ඇදුනු ඇය අන්තිමේදී කවුළුව වෙත ළඟා වුවාය. ගල් බිත්තිය දැතින්ම අල්ලාගත් ඇය කවුළුව තුළින් උඩට ඇදුනාය. මේ කවුළුව ඇළයට හැරී ඉහළට හා පිටතට ඇරුණු උමගයක් වැනි විය. එහි බිත්තිය අඩි තුනක් ඝනකම විය. ආර්යා සෙමින් බඩගාමින් මෙන් ඉදිරියට ඇදුනේ දිවාකල හිරු එළියට පිවිසියාය. බිම් මට්ටමට ළඟා වූ පසු ඇය පිටතට හිස පොවා බැලුවේ හස්තයේ කුළුණට විවර වන අංගනය දුටුවාය.

හස්තයේ කුළුණේ දැවැන්ත දැවමුවා ඉදිරි දොර පියන් දෙක වැදුනු පොරෝ පහර නිසා පළුදු වී, කැඩී ගොස් එහි සරනේරුවලින් එල්ලෙමින් තිබුනි. මියගිය සෙබළෙක් මුනින් තලා වී පඩිපෙළ පාමුල හතරගාතයෙන් වැටී සිටියේය. ඔහුගේ සළුව සිරුරට යටින් ඇඹරී ගොස් තිබුනු අතර මුදු දම්වැල් වානේ සන්නාහය පිටුපසින් මුලුමනින්ම රත් පැහැයෙන්

ගැවසී ගත්තේය. මේ මළකඳේ සළුව සුදු පැහැ සේදයෙන් පෝරු දැමූ අළු පැහැ ලොම් රෙද්දක් බැව් ආර්යා ත්‍රාසයෙන් යුතුව නිරීක්ෂණය කලාය. එනමුදු ඒ කවරෙක්දැයි ඇයට හරියටම හඳුනාගන්නට නොහැකි විය.

"අයියෝ!" ඇය භීතියෙන් මිමිනුවා ය. මෙහි කුමක් සිදුවී ද? ඇගේ පියා කොහි ද? ලැනිස්ටර් සෙබළුන් ඇය සොයා පැමිණියේ ඇයි? ඇය අර යක්ෂයින් දුටු දිනයේ අර කහ පැහැ දෙබල් රැවුලා පැවසූ දේ ඇයට මෙනෙහිවන්නට විය. 'එක හස්තයකට මැරෙන්ට පුළුවන් නම් ඇයි තව හස්තයකට බැරි?' සිය දෑසට කඳුළු පුරා එනු ඇයට දැනුනි. හුස්ම අල්ලාගත් ඇය වටපිටාවට හොඳින් කණ් දුන්නාය. හස්තයේ කුළුණේ කවුළු තුළින් ගලා ආ මිනිසුන් සටන් කරන හඬ, කෑ ගැසීම් හඬ, වානේ ආයුධ එකිනෙක ගැටෙන හඬ, වේදනාවෙන් මොරගසන හඬ ඇයට ඇසෙන්නට විය.

ඇයට ආපසු යා නොහැක. ඇගේ පියා...

ආර්යා දෑස් පියාගත්තා ය. එක් මොහොතකට ඇයට සෙලවීමටවත් බැරි තරමේ භීතියක් දැනෙන්නට විය. උන් ජොරී, විල් හා හේවර්ඩ්ව මරා දැමූහ. පඩිපෙළේ වැටී සිටින අර නමක් නොදන්නා සෙබළාව මරා දැමූහ. උන් ඇගේ පියාවද මරා දැමූවා වන්නට ඇත. උන්ට ඇයට අසුවුනහොත් ඇයවද මරා දැමෙනු ඇත. "බය කඩුවට වඩා යටට කැපෙනවා." ඇය හයියෙන් තමාටම කියාගත්තා ය. එනමුදු තමා දිය නැට්ටුවෙකියි සිතාගැනීම තවදුරටත් එතරම් ප්‍රතිඵලදායක නොවීය. සිරියෝ දක්ෂ දිය නැට්ටුවෙකු වූ නමුදු අර ධවල නයිට්වරයා අනිවාර්යයෙන්ම ඔහුව මරා දමන්නට ඇත. අනික ඇය ලී කැබැල්ලක් අතේ ඇති කුඩා දැරියක පමණි. තනිවූ, බියෙන් ත්‍රස්ත වී ගිය, අසරණ දැරියක පමණි. ඇය පණුවකු මෙන් බඩගාගෙන අංගනයට ඇදී පරීක්ෂාවෙන් වටපිට බලමින් නැගිට දෙපයින් සිටගත්තා ය. බලකොටුව මුලුමනින්ම පාළු වී ගොස් තිබින. රතු බලකොටුව වනාහි කෙදිනකවත් පාළු වී ගිය ස්ථානයක් නොවීය. සියළුම මිනිසුන් දොරගුළු දමාගෙන ඇතුළට වී සැංගී සිටිනවා වන්නට ඇත. ඇය හිස ඔසවා මහත් ආසාවෙන් සිය නිදන කාමරය පිහිටි තැන දෙස බැලුවාය. ඉන්පසු සෙවනැල්ලකින් තවත් සෙවනැල්ලකට මාරු වෙමින්, සෑමවිටම බිත්තියකට මුවා වන්නට වග බලා ගනිමින් හෙමිහිට හස්තයේ කුළුණෙන් ඈත් වූවාය. තමා බළලුන් ඇල්ලීමෙහි නිරතව සිටින්නී යැයි තමාටම ඒත්තු ගන්වන්නට ඇය යත්න දැරුවාය... එනමුදු මේ වතාවේ බැළලිය ඇය වූ අතර උන්ට අසුවුවහොත් උන් ඇයව මරා දමනු ඇත.

මෙසේ ගොඩනැගිල්ලකින් ගොඩනැගිල්ලකට මාරු වෙමින්, කිසිවෙකුටත් තමා පසුපසින් පැමිණිය නොහැකි වන සේ සැමවිටම තමාට පසුපසින් බිත්තියක් තබා ගනිමින්, ආර්යා කිසිදු අන්තරායයක් නොමැතිව ඉස්තාල පෙළ වෙත ළඟා වූවාය. ඇය හෙමිහිට ඇතුළත අංගනය හරහා ඇදෙද්දී සන්නාහ සන්නද්ධ වූ නගරාරක්ෂකයින් දුසිමක් පමණ ඇයව පසුකොට දිවගියහ. එනමුදු ඔවුන් කාගේ පැත්තේදැයි හරියටම නොදන්නා බැවින් අවදානමක් ගැනීමට නොසිතූ ඇය වහා සෙවනැල්ලක මුවාවේ වකුටු වී ඔවුන් පිටව යනතෙක් බලා සිටියාය.

ආර්යාට මතක ඇති කාලයේ පටන් වින්ටර්ෆෙල්හි අසුන් බාරකරුවා වූ හලන් ඉස්තාල දොර අභිමුව බිම වැටී සිටියේය. ඔහුට කෙතරම් වාරයක් අසිපතින් ඇන තිබුනි ද යත් ඔහුගේ කමිසය රතු පැහැ මලින් වැඩ දැමූවාක් මෙන් දිස් විය. ඔහු මියගොස් ඇති බැව් ආර්යාට සහතික විය. එනමුදු ඇය දොර සමීපයට ළඟාවද්දී ඔහු දෑස් හැරියේය. "ආර්යා..." ඔහු මිමිනුවේ ය. "ඔයා... ඔයා අනතුරු අඟවන්ට... ඔයාගෙ තාත්තාට..." රත් පැහැ පෙන මුසු කෙළ බිඳිති ඔහුගේ මුවින් පිටතට විසිවිය. සිය දෙනෙත් පියාගත් හලන් තවත් කිසිවක් නොදෙඩීය.

ඉස්තාලය ඇතුළත තවත් බොහෝ මළමිනී විය. ඇයත් සමග සෙල්ලම් කරන්නට පුරුදුව සිටි ඉස්තාල කොලුවෙක්. ඇගේ පියාගේ ගෘහාරක්ෂක බලකායේ සෙබළුන් තිදෙනෙක්. ලෑලි පෙට්ටි හා පෙට්ටගම් පිරවූ කරත්තයක් දොර අසල අතැර දමා තිබුනි. මේ මියගියවුන්ට පහර වදිද්දී ඔවුන් නැවට ගෙනයාම පිණිස බඩු පටවමින් සිටියා වන්නට ඇත. ආර්යා සෙමින් සෙමින් තවත් ලංවූවාය. එක් මළමිනියක් ඩෙස්මන්ඩ් විය. සිය දිගු අසිපත කොපුවෙන් ඇද ඇයට පෙන්වා ඇගේ පියා රකින්නෙමියි ඇයට පිළිණ දුන් ඩෙස්මන්ඩ් විය. ඔහු මුනින් තලා බිම වැටී කිසිවක් නොදකින දෑසින් සිවිලිම දෙස බලා සිටිද්දී ඔහුගේ මුහුණ වටා මැස්සන් පියැඹූහ. ඔහු සමීපයේ ලැනිස්ටර් සෙබළෙකු ගේ මළ සිරුරක් විය. එනමුදු ඒ එකම එක මළ සිරුරක් පමණක් විය. උතුරුකරයේ සෑම මිනිසකුම දකුණේ සෙබළුන් දහයකට වඩා වටිනා බැව් ඩෙස්මන්ඩ් ඇයට කියා තිබුනි. "උඹ බොරුකාරයා." ඇය කීවේ හදිසි වියරුවෙන් ඔහුගේ මළකඳට පා පහරක් දෙමිනි.

ලේ ගඳ නිසා අශ්වයින් වියරුවෙන් හේෂාරවය කරමින්, නොසන්සුන්ව දඟලමින් සිටියෝය. අසෙකුට සෑදල පළන්දා මේ බලකොටුවෙන් හා නගරයෙන් ඈතට පලා යාම ඇගේ එකම බලාපොරොත්තුව විය. ඇය මතක තබාගත යුතු එකම දෙය රජමාවතට නුදුරින් ගමන් කිරීම වන අතර එය ඇයව නැවත වින්ටර්ෆෙල් කරා රැගෙන යනු ඇත. ඇය බිත්තියේ එල්ලා තිබුනු කටකලියාවක් හා අසු පිට දමන රෙද්දක් මුදා ගත්තාය.

අශ්ව කරත්තය පිටුපසින් ගමන් කරද්දී බිම වැටී තිබුනු පෙට්ටගමක් ඇගේ ඇසට හසුවිය. එය සටනේදී හෝ පටවන අතරේදී හෝ බිම වැටෙන්නට ඇත. ලීය පළුදු වී පියන ඇරී තිබුනු අතර එහි වූ දෑ බිම දසත විසිර තිබුනි. සේද හා පටරෙදි හා විල්ලුද ඇඳුම් - ඇය කිසිදා අඳින්නට තබා අතවත් තබන්නට නොසිතූ ඇගේ ඇඳුම් - ඇය හඳුනාගත්තා ය. ඇයට රජමාවතේදී උණුසුම් ඇඳුම් උවමනා වනු ඇත... අනික...

ආර්යා වහා බිම විසිර තිබුනු ඇඳුම් කැඩුම් අතර දණ ඇනගත්තා ය. ඇය සනකම ලොම් සළුවක්, විල්ලුද සායක්, සේද කබායක් හා යට ඇඳුම් කිහිපයක් සොයාගත්තා ය. එමෙන්ම මව විසින් ඇය වෙනුවෙන් මැසූ ගෙත්තම් කල ඇඳුමක් ද විකුණා මුදල් කරගත හැකිවෙතැයි ඇය සිතූ කුඩා රිදී වළල්ලක් ද සොයාගත්තා ය. බිඳුනු පියන පසෙකට තල්ලු කර දැමූ ඇය පෙට්ටිය තුළට අත රුවා ඉදිකට්ට සොයන්නට විය. ඇය එය පෙට්ටිය පතුලේම අන් සෑම දෙයකටම යටින් සඟවා තැබූවද පෙට්ටිය බිම වැටෙද්දී ඇඳුම් සියල්ල එකට මිශ්‍ර වී තිබුනි. කාට හෝ එය හමු වී හොරකම් කරන්නට ඇතැයි ඇය මොහොතකට බියපත් වූවාය. එහෙත් ඊළඟ මොහොතේ පටරෙදි ගවොමකට යටින් වානේ වල තද ගතිය ඇගේ අතට දැනුනි.

"අන්න ඉන්නවා ඒකි." ඇයට පිටුපසින් ඇයට නුදුරින් කටහඬක් ඇසුනි.

තිගැස්සුනු ආර්යා වහා කරකැවී ආපසු හැරුනාය. ඉස්තාල කොලුවෙක් මුහුණේ විරිත්තීමක්ද ඇතිව ඇයට පිටුපසින් සිටගෙන සිටියේය. ඔහුගේ කුණු ගෑවී තිබුනු කබායට යටින් පරාජීර්ණ වූ සුදු පැහැ කමිසයක් පෙනෙන්නට තිබුනි. ඔහුගේ බූට්ස් සපත්තුවල ගොම ගෑවී තිබුනු අතර එක් අතෙක මුල්ලුවක් විය. "උඹ කවුද?" ආර්යා ඇසුවාය.

"ඒකි මාව දන්නෙ නෑ." කොලුවා කීය. "ඒ වුනත් මං ඒකිව දන්නවා. ආ ඔවු! වෘක කෙල්ල."

"මට මේ අශ්වයාට සෑදලේ දාන්ට උදවු කරපන්." ආර්යා ආයාචනාත්මක ස්වරයෙන් කීවාය. නැවත පෙට්ටියට අත දැමූ ඇය ඉදිකට්ට වෙත අත යැවුවාය. "මගේ තාත්තා තමා රජතුමාගෙ හස්තය. එයා උඹට ලොකු තෑග්ගක් දෙයි."

"තාත්තා මැරිලා." කොලුවා කීය. ඔහු හෙමිහිට ඈ දෙසට පියවර මනින්නට විය. "රැජිණ තමා මට ලොකු තෑග්ගක් දෙන්ට යන්නෙ. මෙහාට වරෙං කෙල්ලෙ."

"අහකට වෙලා හිටපන්." ඇගේ අත ඉදිකට්ටේ මිට වටා තදින් වෙලී ගියේය.

"මං කිවුවෙ වරෙං කියලා." ඔහු වැරෙන් ඇගේ අතින් අල්ලාගත්තේ ය.

එක් හද ගැස්මක මොහොතකදී සිරියෝ ෆොරල් විසින් ඇයට උගන්වා තිබුනු සියළුම දෑ මතකයෙන් මැකී ගියේය. මේ ත්‍රාසයෙන්පිරි හදිසි මොහොතේදී ඇයට මතක් වුනු එකම පාඩම ජොන් ස්නොව් විසින් ඇයට කියා දුන් මුල්ම පාඩම විය. ඇය වියරු, උන්මාදනීය ශක්තියකින් යුතුව අසිපතේ උල් පැත්තෙන් කොලුවාට දමා ඇන්නාය. සනැති සම් කබායත් සුදු පැහැ උදර මාංශපේශිනුත් පසා කරගෙන ගිය ඉදිකට්ට කොලුවා ගේ පිට පලාගෙන මතුවිය. කොලුවා මුල්ලුව බිම අතහැරිය අතර ඔහුගේ මුවින් මවිතයෙන් මෙන් හුස්මක් ඉහළට ඇදුනි. ඔහුගේ දෑත් තරයේ අසිපත් තලය මිරිකා ගත්තේය. "අනේ දෙයියනේ!" සිය සුදු පැහැ යටි කමිසය කෙමෙන් රත් පැහැ වෙද්දී කොලුවා වේදනාවෙන් කෙඳිරිගෑවේ ය. "ඒක එළියට ගනිං."

ආර්යා අසිපත පිටතට ඇද්ද අතර ඊළඟ මොහොතේ කොලුවා මියගියේ ය.

අසුන් සියල්ලෝම බියෙන් කෑ ගසන්නට වන්හ. තම දෑස් අභියස සිදුවුනු මරණය නිසා බියෙන් මුසපත් වුනු ආර්යා මළකඳ අසල සිටගත්වනම බලා සිටියාය.කොලුවා වැටෙද්දී ඔහුගේ මුවින් රුධිරය වෑහෙන්නට වූ අතර උදරයේ වූ සිදුරෙන් උල්පතකින් මෙන් තවත් රුධිරය ගලා ආයේය. අසිපත් තලය මිරිකා ගැනීම නිසා ඔහුගේ දෙඅත්ල කැපී ගොස් තිබුනි. රත් පැහැ වී ගිය ඉදිකට්ට තරයේ මිරිකා ගනිමින් ඇය සෙමින් පසුපසට ඇදුනාය. ඇය මෙතැනින් පලා යා යුතුය. මෙතැනින් බොහෝ ඈතකට පලා යා යුතුය. මේ ඉස්තාල කොලුවා ගේ දෑසින් මිදී කොහේ හෝ ඈතකට පලා යා යුතුය.

නැවතත් කටකලියාව හා පොරෝණය ඔසවාගත් ඇය අසු වෙත දිව ගියාය. එනමුදු අසු පිටට සෑදලය දමන්නට ඔන්න මෙන්න තිබියදී ඇගේ සිතේ ඉමහත් භීතියට මෙන් ඇයට

සිහිපත් වූයේ මේ වනවිට බලකොටු දොරටු වසා දමා ඇතිය යන කරුනයි. රහස් පැති දොරටුවල පවා මුරකාවල් දමා තිබෙනු ඇත. සමහරවිට මුර සෙබළුන් ඇයව හඳුනා නොගන්නවා ඇත. ඇය කොල්ලෙකු යැයි ඔවුන් සිතුවොත් සමහරවිට ඔවුන් ඇයට යන්නට දෙනවා ඇත... නැත. කිසිවෙකුටත් පිටව යන්නට නොදෙන්නැයි ඔවුන්ට අණ ලැබී ඇතුවා නිසැකය. ඔවුන් ඇයව දන්නවා හෝ නොදන්නවා හෝ එයින් ඵලක් නොවනු ඇත.

එනමුදු බලකොටුවෙන් පිටතට යා හැකි තවත් මාර්ගයක් තිබේ...

ඇගේ අතැඟිලි අතරින් ගිලිහුනු සැදලය තම්ප් හඬක් හා ධූලි වලාවක් නංවමින් බිම වැටුනේය. ඇයට නැවත වතාවක් අර යක්ෂයින් සිටින කාමරය සොයාගත හැකිවේද? ඇය මොහොතක් අතීරණයෙන් පෙලුනාය. එනමුදු ඒ වෙනුවෙන් උත්සාහයක් දැරිය යුතු බැව් ඇය වටහා ගත්තාය.

තමා එකතුකරගත් ඇඳුම් පොදිය සොයාගත් ආර්යා සළුව පොරොවාගෙන එහි රැළි අතරේ ඉදිකට්ට සඟවාගත්තා ය. ඉතුරු දේවල් සියල්ල පොදියක් කොට ඔතාගත්තා ය. මේ පොදිය කිහිල්ලේ ගසාගත් ඇය ඉස්තාලයේ පසුපස කෙලවර වෙත ළඟාවූවාය. හෙමිහිට පසුපස දොර විවර කල ඇය වියවුල් සිතින් අවට පරීක්ෂා කර බැලුවාය. ඈත අසිපත් එකට ගැටෙන හඬත් අංගනයට එහායින් මිනිසෙකු වේදනාවෙන් කෑ ගසන හඬත් ඇයට ඇසුනි. ඇය දැන් සර්පිලාකාර පඩිපෙළ පහළට බැස ගොස් කුඩා කුස්සිය හා ඌරු කොටු පසු කර යා යුතු විය. පසුගිය වතාවේ අර කළු බළලා ලුහුබැඳ ඇය දිවගියේ ඒ මාර්ගයෙනි... එනමුදු ඒ මාර්ගයෙන් ගියහොත් ඇයට නගරාරක්ෂකයින් ගේ බැරැක්ක පසුකර යාමට සිදුවනු ඇත. නැත, එය නුවණට හුරු වැඩක් නොවේ. ආර්යා තවත් මඟක් ගැන සිතන්නට වෑයම් කලාය. ඇය බලකොටුවේ අනිත් පසට පැනගතහොත් ගංගාවට යාබද ප්‍රාකාරය දිගේම ගොස් දෙව්වනය ඔස්සේ යා හැකිවනු ඇත... එහෙත් එසේ කිරීමට නම් ඇය ප්‍රාකාරවල සිටින මුර සෙබළුන්ට පෙනි පෙනී අංගනය හරහා යා යුතු විය.

ප්‍රාකාර හා මුර අට්ටාලවල මෙතරම් සංඛ්‍යාවක් මුර සෙබළුන් සිටිනු ඇය කිසි දිනෙක දැක නොතිබින. ඒ බොහෝ දෙනෙකුන් හෙලිවලින් සන්නද්ධ වූ නගරාරක්ෂක සෙබළු වූහ. ඔවුන්ගෙන් සමහරකු ඇයව දුටු මනතින් හඳුනා ගන්නවා ඇත. ඇය අංගනය හරහා දිව යනු දුටුවහොත් ඔවුන් කුමක් කරනු ඇත්ද? එතරම් ඉහළක සිට බලද්දී ඇයව ඉතා කුඩාවට

පෙනෙනු ඇත. ඇය කවරෙකුදැයි හඳුනාගැනීමට ඔවුන්ට හැකිවනු ඇත්ද? ඔවුන් එය නොතකා හරිනු ඇත්ද?

'කුමක් වුවද දැන් මෙතැනින් පිටව යා යුතුය.' ඇය තමාටම කියාගත්තා ය. එනමුදු ඒ මොහොත පැමිණි විට ඇය කෙතරම් බියෙන් ගල්ගැසුනාදැයි කිවහොත් ඉදිරියට අඩියක්වත් තැබීමට ඇයට නොහැකි විය.

'නිශ්චල ජලය වගේ සන්සුන් වෙන්ට.' සිහින් කටහඬක් ඇගේ කණට කොඳුලේය. ආර්යා කෙතරම් තැතිගත්තාද යත් රෙදි පොදිය ඇගේ අතින් ගිලිහී වැටෙන්නටම ගියේය. ඇය වහ වහා ඉස්තාලය සිසාරා බැල්මක් හෙලූ මුත් ඇයත්, අශ්වයිනුත්, මළ මිනිසුනුත් හැරෙන්නට එහි අන් කිසිවෙකු නොවීය.

'සෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට.' ඇයට නැවත ඇසුනි. ඒ ඇගේම කටහඬ ද නැතිනම් සිරියෝ ද යන්න ඇයට තෝරාබේරා ගත හැකි නොවීය. කෙසේවුවද මේ නිසා ඇගේ බිය තුනී වී ගියේය.

ඇය ඉස්තාලයෙන් පිටට පා තැබුවාය.

මේ ඇය සිය ජීවිත කාලය තුළදී සිදු කල බියජනකම දේ විය. අංගනය හරහා වහා දිවගොස් කොතැනක හෝ සැඟවෙන්නට ඇයට තදින්ම උවමනා විය. එනමුදු බියවීමට කිසිදු හේතුවක් නැතියෙකු මෙන් සෙමින් සෙමින් එක් එක් පියවර තබමින් අංගනය හරහා පිය මනින්නට ඇය දැඩි උත්සාහයකින් පසු සමත් වූවාය. මුර සෙබළුන් ගේ දෑස් තමා වෙත එල්ල වී ඇති අයුරු තමාට දැනෙන්නේ යැයි ඇය සිතුවාය. එය හරියටම ඇඳුම්වලට යටින් සම මත කුරුමිණියන් නලියන්නාක් වැනි හැඟීමක් විය. කිසි විටෙකත් හිස ඔසවා ඉහළ නොබැලීමට ඇය පරිස්සම් වූවාය. ඔවුන් ඇය දෙස බලා සිටින ආකාරය දුටුවහොත් තමා තුළ ගොඩනැංවී ඇති ධෛර්යය සැනෙන් නැති වී යනු ඇති බව ඇය දැන සිටියාය. එසේ වුවහොත් ඇය රෙදි පොදිය බිම දමා කුඩා එකෙකු මෙන් හඬමින් දිව යනු ඇති අතර සෙබළුන් සැනෙන් ඇය මත පැන ඇයව අල්ලාගනු ඇත. එබැවින් ඇය දිගටම බිම බලාගෙන ඉදිරියට පිය මැන්නාය. අංගනයේ එහා කෙලවරේ වූ රාජකීය සප්තක දේවස්ථානයේ සෙවනැල්ල යටට ළඟාවන විට ඇගේ සියොළඟම දහදියෙන් පෙඟී ගොස්

තිබුනි. නමුත් වැදගත්ම දේ වූයේ සෙබළුන් කිසිවෙකුත් අනතුරු ඇඟවීමේ කෑ ගැසීමක් නොකිරීමයි.

සප්තකය මිනිසුන්ගෙන් තොර වූ අතර එහි ඇතුළත ඉටිපන්දම් අඩ සියයක් පමණ සුසන්ධය පතුරවමින් නිසන්සලේ දැල්වෙමින් තිබින. එයින් දෙකතුනක් නැතිවුනද දෙවිවරුන් කෝප නොගනී යැයි ආර්යා බලාපොරොත්තු විය. ඉටිපන්දම් කිහිපය සිය කමිස අතක් අස්සේ ගසාගත් ඇය පසුපස වූ කවුළුවකින් එළියට පැන්නාය. අර කණුක් කොට කළු බළලා කොටු කරගත් පටු මාවත වෙතට හෙමින් සැරේ රිංගා ගැනීම ඇයට අසීරුවක් නොවීය. එනමුදු ඊට පසු ගමන්ගත් මාර්ගය ඇයට නිනවුවක් නොමැති විය. ඇය කවුළුවලින් ඇතුළට හා පිටතට බඩගෑවාය, තාප්ප උඩින් පැන්නාය, අඳුරු ගුහා වැනි ගබඩා කාමර තුළින් අතගාමින් ගියාය. 'හෙවනැල්ලක් වගේ නිහඬ වෙන්ට.' එක් වරක් ඇයට කොහේ හෝ ස්ත්‍රියක හඬන හඬක් ඇසුනි. අන්තිමේදී ඇය අර රාක්ෂයින් සිටින දහගෙට ආනති වී ගිය පටු කවුළුව සොයා ගන්නා විට හෝරාවක් පමණ ගතවී තිබුනි.

සිය පොදිය කවුළුවෙන් එහාට තල්ලු කර දැමූ ඇය ඉටිපන්දමක් දල්වාගැනීම සඳහා නැවත ආපසු දිවගියාය. එය අහඹු වාසනාවක් විය. යන අතරමගදී දැල්වෙමින් තිබුනා යැයි ඇය දුටු ගිනිදළු මේ වනවිට නිවී ගොස් ගිනිඅඟුරු පමණක් ඉතුරු වී තිබින. ගිනිඅඟුරුවලට මුවින් පිඹින අතරේ කාමරය වෙත ළඟාවන කිසිවකු ගේ කටහඬ ඇයට ඇසුනි. ඒ පැමිණි තැනැත්තා කවරෙකු හෝ වේවා ඔවුන් දොරින් ඇතුළුවෙද්දී ඉටිපන්දම් දැල්ල නොනිමෙන සේ අතකින් මුවාකරගෙන වහා කවුළුවකින් පිටතට පැනගන්නට ඇය සමත් වූවාය.

මේ වතාවේ නම් ඇයව බිය වැද්දීමට රාක්ෂයින් පිරිස අසමත් වූහ. ඔවුන් පැරැණි මිතුරන් මෙන් ඇයට හැඟුනි. ඇය ඉටිපන්දම හිසට ඉහළින් සිටින සේ ඔසවා ගත්තාය. තබන තබන පියවරක් පාසා සෙවනැලි බිත්ති මත නැටුයේ ඇය යන දෙස හැරී බැලීමට මෙනි. "මකරු" යි මිමිනූ ඇය සිය සළුව තුළ සඟවාගෙන සිටි ඉදිකට්ට අතට ගත්තාය. මේ අති දැවැන්ත මකරුන් හමුවේ කෙට්ටු අසිපත ඉතා කුඩා එකක් මෙන් පෙනුන ද ආයුධයක් අතැතිව සිටීම නිසා ඇයට වඩා ආරක්ෂාකාරී හැඟීමක් දැනෙන්නට විය.

දොරට එහායින් වූ කිසිදු කවුළුවක් නැති, දිගු, අඳුරු ශාලාව ඇයට මතක ඇති අයුරින්ම විය. ඇය වමතේ - ඇගේ හුරු අතේ - ඉදිකට්ට ද, මිටිකරගත් දකුණතේ ඉටිපන්දම ද රඳවා ගත්තාය. උණු ඉටිකිරි ඇගේ අතැඟිලි දිගේ පෙරෙන්නට විය. ශාලාවේ ආරම්භය වම්පස බැව් මතක තිබුනු ආර්යා දකුණු පසට පිය මැන්නාය. ඇවිද යන්නට වඩා දිවයන්නට ඇගේ

සිත ඇයට බල කල නමුදු එසේ කලහොත් ඉටිපන්දම නිවී යතැයි ඇය බියගත්තා ය. මීයන් ගේ සිහින් නාදය ඇයට ඇසුනු අතර ආලෝක සීමාවේ දිදුලන උන්ගේ කුඩා දෑස් ඇය දුටුවාය. එනමුදු ඇය මීයන්ට බිය නොවූවාය. බියවීමට ඊට වඩා වැඩි දේ තිබුනි. ඇය අර මන්තරකාරයාගෙන් හා දෙබල් රැවුලාගෙන් සැංගී සිටියාක් මෙන් කෙනෙකුට මෙහි සැඟවී සිටීම අතිශයින්ම පහසු කරුනක් විය. සිය අතුල්වල ඇති ගැඹුරු කැපුම්වලින් තවමත් ලේ ගලමින් අර ඉස්තාල කොලුවා උමං බිත්තියකට හේත්තු වී සිටින්නාක් මෙන් ඇයට මැවී පෙනින. ඇය පියමං කර යනවිට අල්ලාගැනීමට ඔහු සමහර විට බලා සිටිනවා වන්නට ඇත. ඇගේ ඉටිපන්දම් දැල්ල බොහෝ දුරක සිට නිරීක්ෂණය කිරීමට ඔහුට හැකිවනු ඇත. සමහරවිට ආලෝකයක් නොමැතිව ගමන් කිරීම වඩා ගුණදායක වන ඇත...

'බය කඩුවට වඩා ගැඹුරට කැපෙනවා.' ඇගේ හිස තුළ වූ අර කටහඬ මතක් කර දුන්නේය. හදිසියේම ආර්යාට වින්ටර්ෆෙල්වලට යටින් වන සොහොන් ගුහා සිහිපත් විය. 'ඒවයෙදි මීට වඩා බය හිතෙනවා' ඇය තමාටම කියා ගත්තාය. එහි ගිය පළමු වතාවේ ඇය කුඩා දැරියක විය. ඇගේ අයියා රොබ් විසින් ඇයත්, සන්සාත්, දැන් රිකන් ගේ වයසේ තරම් වූ බ්‍රැනුත් එහි කැඳවාගෙන ගියේය. ඔවුන් සතුව තිබුනේ එකම එක ඉටිපන්දමක් පමණකි. සිය දෙපා අසල නිදන වෘකයින් හා උකුළ මත ඇති යකඩ අසිපත් සමගින් ඔවුන් දෙස බලා සිටි පුරාණ ශීත රජවරුන් දුටු බ්‍රැන්ගේ දෑස් පිරිසි තරම් විසල් විය.

ඔවුන් වෙනුවෙන් තැනුනු සොහොන් ගැබ් පෙන්වනු වස් රොබ් ඔවුන් කැටුව සොහොන් ගෙයි කෙලවරටම, සීයාත්, බ්‍රැන්ඩනුත්, ලියානාත් පසුකරමින් ඈත කෙලවරටම ගියේය. සන්සා නිතරම වියවුල් සිතින් ඉටිපන්දම් කොටය දෙස බැලුවේ කොයි වෙලාවේ හෝ එය නිවී යතැයි බියෙනි. මෙහි මකුළුවනුත්, බල්ලන් තරම් විසල් මීයනුත් වෙසෙතැයි නාකි ආයම්මා ඇයට කියා තිබින. එනමුදු ඇය එය පැවසූ විට රොබ් ඇයට සිනාසුනේය. "මකුළුවන්ටයි මීයන්ටයි වඩා භයානක දේවල් තියෙනවා නංගී." ඔහු කොඳුළේය. "මේ තමා මැරිච්ච එවුන් ඇවිදින තැන." ඒ මොහොතේ ඔවුන්ට ශබ්දයක් ඇසුනි. ගැඹුරු, ඇඟ වෙවුලවනසුළු පහත් කෙඳිරියක් ඇසුනි. පුංචි බ්‍රැන් ආර්යා ගේ අතක් තරයේ අල්ලාගත්තේ ය.

ඊළඟ මොහොතේ ඔවුන් ගේ රුධිරය ඉල්ලා කෙඳිරි ගෑ සුදුමැලි අවතාරයක් විවෘත සොහොන් ගැබෙන් පිටතට මෑත් විය. සන්සා යටිගිරියෙන් කෑ ගසමින් පඩිපෙළ සොයා දිවගිය අතර පුංචි බ්‍රැන් ඉකිබිඳිමින් රොබ්ගේ කකුලක එල්ලුනේය. එනමුදු නොබියව සිටි පියවර සිටි ආර්යා අවතාරයට මුෂ්ටි ප්‍රහාරයක් එල්ල කලාය. ඒ සියොලඟම පිටි තවරාගත් ජොන් මිස අනිකෙකු නොවීය. "උඹ මෝඩයා. උඹ මේ පුංචි එකාව බයකරනවා." ඇය

ඔහුට බැන වැදුනාය. එනමුදු ජොන් හා රොබ් කොක් හඬලමින් නොනැවතීම සිනාසෙන්නට වූහ. වැඩි වේලාවක් යන්නට මත්තෙන් ආර්යා හා පුංචි බ්‍රැන්ද ඒ සිනාවට හවුල් වූහ.

මේ සොඳුරු මතකය නිසා ආර්යා ගේ මුවට සිනහවක් නැගුනි. එයින් පසු අන්ධකාරය තවදුරටත් ඇයව බියපත් කරන්නට සමත් නොවීය. අර ඉස්තාල කොලුවා මිය ගොසිනි. ඇය ඔහුව මරා දැම්මාය. ඔහු නැවතත් ඇය වෙත කඩා පැන්නොත් ඇය නැවත වරක් ඔහුව මරා දමනු ඇත. ඇය ගෙදර යනු ඇත. ඉන්පසු මේ සියල්ලක්ම නැවත හොඳ අතට පෙරලෙනු ඇත. වින්ටර්ෆෙල්හි අළු පැහැ කළුගල් ප්‍රාකාර ඇතුළට වන්පසු නැවත සියල්ලක්ම හොඳ අතට හැරෙනු ඇත.

ආර්යා තව තවත් අන්ධකාරය තුළට වැදෙද්දී ඇගේ පියවර හඬ මෘදු දෝංකාරයක් නංවමින් ඇයට ඉදිරියෙන් පියාඹා යන්නට විය.

**Syrio Forel: “The heart lies and the head plays tricks with us, but the eyes see true.”**

**සන්සා 04-1**

තෙවන දිනයේ දී ඔවුහු සන්සා සොයා පැමිණියෝ ය.

ඇය කර වටා හා අත්වල ගෙත්තමින් වැඩ දැමූ, තද අළු පැහැ ලොම් ඇඳුමකින් සැරසුනාය. සේවකයින් නොමැතිව තනිවම ඇඳුමේ බොත්තම් පියවීමට දැරූ උත්සාහයේදී සිය අතැඟිලි මොට්ට වී අනම්‍ය වී ඇතැයි ඇයට හැඟෙන්නට විය. ජේන් පූල් ද ඇය සමග සිටිමුත් ඇය කිසිසේත්ම වැඩක් ගතහැකි මට්ටමේ පසු නොවීය.ජේන් නොනවත්වාම සිය පියා වෙනුවෙන් වැලපෙමින් සිටි අතර හැඬීම නිසා ඇගේ මුහුණ ඉදිමී තිබින.

"මට කිසිම සැකයක් නෑ ඔයාගෙ තාත්තා හොඳින් ඉන්නවා." අන්තිමේදී ගවොමේ බොත්තම් සියල්ල නිවැරැදිව පියවා ගැනීමට සමත් වූ පසු ඇය ජේන් අමතා කීවාය. "මම රැජිණගෙන් අහන්නම් ඔයාට එයාව බලන්ට දෙන්ටයි කියලා." මේ කාරුණික වදන් නිසා ජේන්ගේ තත්ත්වය මඳක් හෝ යහපත් වේ යැයි ඇය බලාපොරොත්තු වූවාය. එනමුදු රත් පැහැ ඉදිමුනු දෑසින් ඇය දෙස වරක් බැලූ ජේන් නැවත පෙරටත් වඩා හයියෙන් හඬන්නට වූවාය. ඇය ඇත්තෙන්ම කුඩා දැරියක බඳු විය.

මුල්ම දිනයේ නම් සන්සා ද වැලපී තිබුනි. මේගර් ගේ බලකොටුවේ දැවැන්ත ගල්බිත්ති වලින් ආරක්ෂා වී, ඇගේ කාමරයේ දොර වසා අගුළුලාගෙන සිටිමුත් ඝාතන ඇරඹුනු විට බිය නොවී සිටීම අසීරු කරුනක් විය. අංගනයේ ආයුධ එකට ගැටෙන හඬ ඇය හොඳින් අසා හුරුපුරුදු හඬක් විය. වානේ අසිපත් එකිනෙක ගැටෙන හඬ නොඅසා ගෙවූ දිනක් ඇගේ ජීවිත කාලයේ නොවූ තරම් විය. එනමුදු මේ ආයුධ ගැටීම සරඹ පුහුණුවක් නොව සැබැටම සිදුවන සටනක් බව දැනගැනීම තත්ත්වය වෙනස් කලේය. එය මින් පෙර කිසිදු දිනෙක අසා නැති අමුතුම හඬක් මෙන් ඇයට ඇසෙන්නට විය. එමෙන්ම එහි තවත් හඬවල් විය. වේදනාවෙන් කල කෑගැසීම්, කෝපයෙන් කල අවලාද නැගීම්, උදවු ඉල්ලා නැගූ හඬ, තුවාල ලැබූවන් ගේ හා මියයමින් සිටින්නන් ගේ වේදනාත්මක අඳෝනා ආදි සැමෙකක්ම එහි මුසු වී තිබුනි. වීර කාව්‍යවලදී නම් නයිට්වරුන් කෙදිනකවත් වේදනාවෙන් කෑගැසුවේවත් සමාව ඉල්ලා ආයාචනා කලේවත් නැත.

එබැවින් ඇය වැලපුනාය. සිදුවන්නේ කුමක්දැයි තමාට කියන මෙන් වැසුනු දොර හරහා ඔවුන්ගෙන් අයැදිමින් වැලපුනාය. ඇගේ පියා, සෙප්ටා මෝර්ඩේන්, රජතුමා, ඇගේ නිර්භීත කුමරුවා මේ කවුරුන් හෝ ඇය වෙත ගෙන එන්නැයි අයැදිමින් වැලපුනාය. ඇයව මුරකරමින් සිටි මිනිසුන්ට ඇගේ කෑගැසීම ඇසුනාද නැද්ද යන්න සිතාගත නොහැකි කරුනක් වූ අතර එසේ ඇසුනා වුවද ඔවුහු එය නොතකා හැරියෝය. ඒ දොර ඇරුනු එකම අවස්ථාව වූයේ එදින රැයේ සීරීම් තැලීම් සහිතව බියෙන් වෙවුලමින් සිටි ජේන් පූල්ව කාමරය තුළට තල්ලු කිරීමට පමණි. "උං හැමෝවම මරනවා." නිවාස බාරකරුවා ගේ දියණිය මුරගෑවාය. ඇය දිගින් දිගටම කියවාගෙන ගියාය. දඩබල්ලා පොරොවකින් ගසා සිය කාමරයේ දොර දෙපලු කල බව ඇය කීවාය. හස්තයේ කුළුණේ පියගැට පෙළ මත මළසිරුරු විසිරී තිබුනු අතර පියගැට ලෙයින් පෙඟී ගොස් තිබුනි. සිය කඳුළු නවතාගත් සන්සා ඇගේ මිතුරියව සැනසීමට වෑයම් කලාය. එදින රැයේ ඔවුන් දෙදෙන සොයුරියන් දෙදෙනෙකු මෙන් එකට තුරුළු වී නින්දට ගියෝය.

දෙවන දිනය පෙරදාටත් වඩා නරක් විය. සන්සාව රඳවා තැබූ මේ කාමරය මේගර් ගේ බලකොටුවේ වූ උසම කුළුණේ උඩම පිහිටියේය. එහි කවුළුවකින් එබී බැලූ ඇයට මේගර් ගේ බලකොටුව ඒ වටා පිහිටි විසල් රතු බලකොටුවෙන් වෙන් කරන වියළි අගලට ඉහළින් වූ පාලම ඔසවා තිබෙන අයුරුත්, ප්‍රධාන ද්වාරයේ කටු පැලැල්ල පහත දමා තිබෙන අයුරුත් දිස්විය. දිගු හෙලි හා හරස් දුනුවලින් සන්නද්ධ වූ ලැනිස්ටර් සෙබළු පවුරු මුරකලෝය. සටන් අහවර වී තිබුනු අතර රතු බලකොටුව පුරාම සොහොන් ගැබක මෙන් නිහඬතාවක් පැතිර තිබුනි. ඇසුනු එකම ශබ්දය වූයේ ජේන් පූල්ගේ නොනවතින වැලැපුම් හඬ හා කෙඳිරීම් හඬ පමණි.

උදෑසන ආහාරය වෙනුවෙන් ඔවුන්ට අලුත පිලිස්සූ පාන්, චීස් හා කිරි ද, දිවා ආහාරය වෙනුවෙන් පැළහූ කුකුළු මස් හා එළවළු ද, රාත්‍රී ආහාරය වෙනුවෙන් හරක් මස් හා බාර්ලි ඉස්ටුවක් ද සැපයින. එනමුදු මේ ආහාර රැගෙන ආ සේවකයින් සන්සා ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම මඟ හැරියෝය. එදින සන්ධ්‍යාවේ තවත් සේවිකාවන් කිහිප දෙනෙක් හස්තයේ කුළුණේ වූ ඇගේ ඇඳුම් පැළැඳුම් හා ජේන් පූල්ගේ බඩුබාහිරාදිය ස්වල්පයක් රැගෙන ආහ. එනමුදු ඔවුන් සියල්ලෝ ජේන් පූල් හා සමානවම බියපත් වී සිටි බැව් පෙනෙන්නට තිබුනි. සන්සා ඔවුන්ට කතා කරන්නට තැත් කල නමුදු ඇයට කළු වසංගතය වැළැඳී ඇතිවාක් මෙන් බියෙන් ඇකිළී ඇගෙන් ඈත් වූ ඔවුහු වහා පිටව ගියෝය. දොරට පිටතින් සිටි මුරකරුවෝ ඔවුන්ට කාමරයෙන් පිටව යෑමට අවසර දීම පිළිකෙව් කලහ.

"අනේ කරුනාකරලා, මට රැජිණට කතා කරන්ට ඕන." එදින ඇයට මුනගැසුනු අන් සැම කෙනෙකුටම මෙන්ම මේ මුර සෙබළුන්ට ද ඇය ආයාචනා කලාය. "එයාටත් ඕන වෙයි මට කතා කරන්ට. මම හොඳටම දන්නවා ඒක. අනේ එයාට කියන්ට මට එයාව මුනගැහෙන්ට ඕන කියලා. රැජිණ බැරිනම් ජොෆ්රි කුමාරයා හරි. අනේ කරුනාකරලා. අපි දෙන්නා කසාද බඳින්ටයි යන්නෙ."

දෙවන දිනයේ සන්ධ්‍යා භාගය වද්දී දැවැන්ත ඝණ්ඨාවක් නද දෙන්නට විය. එය ගැඹුරු, ගම්භීර නාදයක් වූ අතර සන්සා ගේ සිත ත්‍රාසයෙන් පුරවාලන්නට එය සමත් විය. ඝණ්ඨා නාදය දිගින් දිගටම නොනැවතීම ඇසෙන්නට විය. මොහොතකට පසු විසෙන්යා ගේ කඳුගැටයේ පිහිටි බේලර් ගේ දැවැන්ත සප්තක දේවස්ථාන දෙසින් තවත් ඝණ්ඨා හඬවල් මුල් හඬට මුසු විය. ඉදිරියට පැමිණීමට නියමිත කුණාටුවක් හඟවන ගිගුරුම් හඬ මෙන් මේ ඝණ්ඨා නද නගරය පුරා රැව් දෙන්නට විය.

"ඒ මොකක්ද?" ජේන් සිය දෙකණ් දෑතින් වසාගෙන ඇසුවාය. "ඇයි එයාලා ඝණ්ඨා නාද කරන්නෙ?"

"රජතුමා මැරිලා." තමා එය දැනගත්තේ කෙසේදැයි ඇයට කිසිදා විස්තර කරදීමට නොහැකි වනු ඇත. එනමුදු ඇය එය දත්තාය. මේ නොනවතින ඝණ්ඨා නාදය ශෝක ගීතිකාවක් මෙන් ඔවුන් ගේ කාමරය පුරවාලීය. කවුරුන් හෝ සතුරකු බලකොටුවට කඩා වැද රොබර්ට් රජතුමා මරා දැමුවා ද? ඔවුන්ට ඇසුනු සටන්වලට හේතුව එය ද?

ඇය බියෙන් හා නොසන්සුන් කමින් කල්පනා කරමින් එදින රෑ නින්දට වන්නීය. ඇගේ ආදරණීය ජොෆ්රි දැන් සිහසුනේ අසුන් ගෙන සිටිනු ඇත් ද? එසේත් නැතහොත් සතුරන් විසින් ඔහුවත් මරා දැමුවා ද? ඇයට ජොෆ්රි ගැනත් සිය පියා ගැනත් බියක් දැනෙන්නට විය. සිදුවන්නේ කුමක්දැයි ඔවුන් ඇයට කීවානම්...

ජොෆ්රි සිහසුනේ අසුන් ගෙන සිටින ආකාරය ඇය එදින රෑ සිහිනයෙන් දුටුවාය. රන්වන් දිගු ගවොමකින් සැරසුනු ඇය ද ඔහු පසෙකින් වාඩි වී සිටියාය. ඇය හිසේ කුඩා කිරුළක් පැළැඳ සිටි අතර ඇය දැන සිටි සැම කෙනෙකුම ඇ වෙත පැමිණ දණ නමා සිය ආචාරය පුද කර සිටියහ.

ඊළඟ උදෑසන, එනම් තෙවන දිනයේ උදෑසන රාජ්‍යාරක්ෂක බලකායේ සෙර් බොරෝස් බ්ලොන්ට් ඇයව රැජිණ වෙතට කැඳවාගෙන යන්නට පැමිණියේය.

සෙර් බොරෝස් වනාහි පුළුල් පපුවකින් හා කෙටි බකල ගැසුනු දෙපාවලින් යුතු විරූපී පුද්ගලයකු විය. ඔහුට මුක්කම් නාසයකුත්, එල්ලා වැටුනු දෙකම්මුල් හා අළු පැහැ හිසකෙසුත් පිහිටා තිබුනි. අද දිනයේ ඔහු සුදු පැහැ විල්ලුදයෙන් සැරසී සිටි අතර ඒ දිගු සුදු සළුව සිංහයෙකු හැඩයට තැනූ හාරිච්චියකින් උරහිස අසලින් එක් කොට තිබුනි. මේ සිංහයා රන් පැහැයෙන් බැබලුනු අතර උගේ දෑස් වෙනුවට මරකත මිණි ඔබ්බා තිබුනි. "අද උදේ ඔබතුමා බොහොම කඩවසම්. බොහොම තේජාන්විතයි සෙර් බොරෝස්." සන්සා කීවාය. කුලීන ආර්යාවක් තම ආචාරශීලීත්වය අමතක නොකල යුතුය. ඒ නිසා කුමක් සිදුවුවද නියම ආර්යාවක් මෙන් හැසිරෙන්නෙමියි සන්සා තමාටම ප්‍රතිඥා දී ගත්තාය.

"ඔබත් එහෙමයි මගේ ආර්යාවනි." සෙර් බොරෝස් නීරස ස්වරයෙන් පිළිතුරු දුන්නේය. "උත්තමාව බලන් ඉන්නවා. එන්ට මගෙත් එක්ක."

රත් පැහැ සළුවෙන් ගත වැසූ, සිංහ ලාංඡන සහිත ශිරස්ක පැළැඳූ ලැනිස්ටර් මුර සෙබළු දොරට පිටතින් වූහ. ඔවුන්ව පසුකොට යද්දී ප්‍රසන්න සිනහවක් පා ඔවුන්ට සුබ උදෑසනක් ප්‍රාර්ථනා කිරීමට ඇය අමතක නොකලාය. දින දෙකකට පෙර උදෑසන සෙර් ඒරිස් ඕක්හාර්ට් විසින් ඇයව මෙම කාමරයට ඇරලූ පසු එයින් පිටව යාමට අවසර ලැබුනු මුල්ම වතාව එය විය. "එහෙම කරන්නෙ ඔයාව පරිස්සමින් තියාගන්ට ඕන නිසයි මගේ වස්තුවෙ." සෙර්සි රැජිණ ඇයට පවසා තිබුනි. "ජොෆ්රි මට කිසිම සමාවක් දෙන එකක් නෑ එයාගෙ ආදරණීය කුමාරිකාවට මොකක් හරි අනතුරක් වුනොත්."

සෙර් බොරෝස් ඇයව රාජකීය නවාතැන් වෙත කැඳවාගෙන යනු ඇතැයි සන්සා බලාපොරොත්තු වූවාය. එනමුදු ඒ වෙනුවට ඔහු ඇයව මේගර් ගේ බලකොටුවෙන් පිටතට කැඳවාගෙන ගියේය. වියළි අගලට ඉහළින් වූ පාලම නැවත පහත දමා තිබුනි. කම්කරුවන් පිරිසක් විසින් කඹයක ගැට ගැසූ තවත් මිනිසකුව පහතින් වූ වියළි අගලට බස්සවමින් සිටියෝය. එබී බැලූ සන්සා පහතින් වූ දැවැන්ත යවුල්වල ඇමිනුනු මළ සිරුරක් දුටුවාය. ඇය වහා දෑස් ඉවත හරවා ගත්තාය. ඒ තමා දන්නා හඳුනන කවුරුන් හෝ විය හැකිය යන බිය නිසා ඒ ගැන විමසීමට හෝ දිගටම ඒ දෙස බලා සිටීමට හෝ ඇය උත්සුක නොවූවාය.

* * *

රාජ සභා ශාලාවේ සිටි සෙර්සි රැජිණ ඔවුන්ට මුනගැසුනි. එහා මෙහා විසිර ගිය ලිපි, කඩදාසි, ඉටිපන්දම් හා මුද්‍රා තබන ඉටි යනාදියෙන් හැඩි වී තිබුනු දිගු සභා මේසය අසල ඇය අසුන්ගෙන සිටියාය. සන්සා මීට පෙර දුටු කවර කාමරයකටත් වඩා මේ කාමරය උත්තුංග විය. තේජාන්විත විය. කැටයම් කල දැවමුවා තිරයත්, දොර දෙපස පිහිටි නරසිංහ රූප දෙකත් දෙස ඇය මුව අයාගෙන බලා සිටියාය.

"මගේ උත්තමාවනි." මලානික මුහුණෙන් යුතු සෙර් මැන්ඩන් විසින් ඔවුන්ව ඇතුළට කැඳවාගෙන ගිය පසු සෙර් බොරෝස් කටහඬ අවදි කලේය. "මම දැරිවිව එක්කරන් ආවා."

රැජිණත් සමගින් සිය ආදරණීය ජොෆ්රි කුමරාද සිටීවි යැයි සන්සා බලාපොරොත්තු වූවාය. එනමුදු ඔහු එහි නොසිටි අතර ඒ වෙනුවට රජතුමා ගේ උපදේශකයින් තිදෙනෙක් එහි වූහ. පෙටයර් බේලිෂ් උතුමානන් රැජිණ ගේ වම්පසින් අසුන් ගෙන සිටි අතර ප්‍රධාන මේස්ටර් පයිසෙල් මේසය කොණේ වාඩි වී සිටියේය. සුවඳ හමන වාරිස් උතුමානන් ඔවුන් අතර ඇවිදිමින් සිටියේය. ඇය භීතියෙන් නිරීක්ෂණය කල පරිදි ඔවුන් සැවොම කළු පැහැ ඇඳුමෙන් සැරසී සිටියෝය. ඒ වනාහි ශෝක සමයට උචිත ඇඳුම් විය...

රැජිණ උස් කොලරයකින් යුතු කළු පැහැ සේද දිගු ගවොමකින් සැරසී සිටියාය. ඇගේ හැට්ටය ගෙල සිට පපුව දක්වාම සිය ගණනක් වූ රතු කැට අල්ලා හැඩ කොට තිබුනි. මේ රතු කැට කඳුළු බිඳුවල හැඩයට කපා තිබුනේ රැජිණ හරියටම කඳුළු වෙනුවට රුධිරය හෙලමින් වැලපෙන්නාක් මෙනි. ඇය දුටු සෙර්සි සිනාසුනු අතර ඒ තමා මෙතුවක් දුටු ලස්සනම එමෙන්ම දුක්මුසුම සිනහව යැයි සන්සා සිතුවාය. "සන්සා මගේ හොඳ දරුවෝ. මම දන්නවා ඔයා මාව ඇහුවා කියලා. මට බොහොම කණගාටුයි මීට කලින් ඔයාව මුනගැහෙන්ට බැරි වුන එක ගැන. අපට ලොකු ප්‍රශ්න ගොඩකට මූන දෙන්ට වෙලයි තිබුනෙ. මට කිසිම ඉස්පාසුවක් තිබුනෙ නෑ. මට විශ්වාසයි මගේ උදවිය ඔයාව හොඳට රැක බලාගන්ට ඇති කියලා."

"හැම කෙනාම බොහොම කරුනාවන්ත වුනා. බොහොම ප්‍රසන්න වුනා උත්තමානි. ඇහුවට බොහොම ස්තූතියි!" සන්සා ආචාරශීලී අයුරින් පැවසුවාය. "ඒ වුනත් එකම එක

වැරැද්දකට තිබුනෙ කිසිම කෙනෙක් අපිට කතා කරපු නැති එකයි, මොනවද සිද්දවෙන්නෙ කියලා අපිට නොකියපු එකයි."

"අපිට?" රැජිණ ප්‍රශ්නාර්ථයක් නඟා ගත්තාය.

"අපි අර නිවාස බාරකාරයාගෙ කෙල්ලත් ඒ කාමරේටම දැම්මා." සෙර් බොරෝස් පිළිතුරු දුනි. "ඒකිට මොකක් කරන්ටද කියලා අපි දැනන් උන්නෙ නෑ."

රැජිණ රවා බැලුවාය. "ඊළඟ පාර අහපන් මොකක්ද කරන්ට ඕන කියලා." ඇය දැඩි ස්වරයෙන් කීවාය. "ඒකි සන්සාගෙ ඔළුවට මොන මොන මනස්ගාත දැම්මාද කියලා දන්නෙ දෙයියොම තමා."

"ජේන් ඉන්නෙ බයවෙලා." සන්සා කීවාය. "එයා අඬන එක නවත්තන්නෙ නෑ. එයාට එයාගෙ තාත්තව දකින්ට පුළුවන්ද කියලා ඔබෙන් අහන්නම් කියලා මම එයාට පොරොන්දු වුනා."

මහලු ප්‍රධාන මේස්ටර් පයිසෙල් සිය දෑස් බිමට නවාගත්තේ ය.

"එයාගෙ තාත්තා හොඳින් නේද?" සන්සා වියවුල් සිතින් ඇසුවාය. සටනක් සිදුවුනු බැව් ඇය දැන සිටියද කිසිවෙකුත් නිවාස බාරකරුවකුට හානියක් කරනු ඇතැයි ඇය නොසිතුවාය. වයොන් පූල් අඩුම ගනනේ අසිපතක් පැළැඳවත් නොසිටියේය.

සෙර්සි රැජිණ සිය උපදේශකයින් ගේ මුහුණු දෙස මාරුවෙන් මාරුවට බැලුවාය. "සන්සා කිසිම තේරුමක් නැතුව නිකම්ම මොට්ට වෙලා යන්ට දෙන්ට බෑ. එයාගෙ මේ පුංචි යාළුවාට අපි මොකක්ද කරන්ට ඕන මගේ උතුමනි?"

පෙටයර් උතුමානන් ඉදිරියට නැමුනේය. "මම එයාට තැනක් ලෑස්ති කරලා දෙන්නම්."

"මේ නගරය ඇතුළෙ නෙවෙයි." රැජිණ කීවාය.

"ඔබ හිතන්නෙ මම මෝඩයෙක් කියලද?"

රැජිණ එය නොතකා හැරියාය. "සෙර් බොරෝස්, ඒ කෙල්ලව පෙටයර් උතුමානන්ගෙ නවාතැනට ඇරලවන්ට. එතුමාගෙ සේවකයින්ට උපදෙස් දෙන්ට එතුමා එනකම් ඒ කෙල්ලව එහෙ තියාගන්ටයි කියලා. එයාට කියන්ට සුළැඟිල්ලා ඇවිත් එයාව එයාගෙ තාත්තා ගාවට එක්කරන් යයි කියලා. ඒකෙන් එයා සන්සුන් වෙයි. සන්සා ආපහු එයාගෙ කාමරේට යන්ට කලින් ඒ කෙල්ලව ඒකෙන් පිටමං කරලා තියෙන්ට ඕන."

"ඔබේ අණ ඒ විදියටම ඉටුවෙයි මගේ උත්තමාවනි." සෙර් බොරෝස් කීවේය. ගැඹුරින් හිස නමා ආචාර කර වහා ආපසු හැරුනු ඔහු පිටුපසින් සුළඟේ ලෙලදෙන සුදු පැහැ සළුවද ඇතිව කාමරයෙන් පිටව ගියේය.

සන්සා කලබල වූවාය. "මට තේරෙන්නෙ නෑ. කෝ ජේන්ගෙ තාත්තා? ඇයි පෙටයර් උතුමානන් නැතුව සෙර් බොරෝස්ටම එයාව තාත්තා ගාවට එක්කරන් යන්ට බැරි?" රැජිණ තරම්ම උදාර අන්දමින්, සිය මව තරම්ම ශක්තිමත් අන්දමින්, නියම ආර්යාවක් පරිද්දෙන් හැසිරෙන්නෙමියි ඇය තමාටම පිළිණ දීගෙන තිබුනාය. එනමුදු හදිසියේම ඇයට නැවතත් දැඩි බියක් දැනෙන්නට විය. තමා නැවතත් හඬන්නට යන්නේ යැයි මොහොතකට ඇයට සිතුනි. "ඔයාලා කොහෙද එයාව යවන්ට යන්නෙ? එයා කිසිම වැරදි දෙයක් කලේ නෑ. එයා හොඳ දරුවෙක්."

"එයා ඔයාගෙ ඔළුවට එක එක විකාර දාලා ඔයාගෙ ඔළුව අවුල් කරලා දායි." රැජිණ මෘදු ස්වරයෙන් කීවාය. "එහෙම දෙයක් වෙන්ට අපට ඉඩදෙන්ට බෑ. ඒ ගැන ආයෙ වචනයක්වත් කතා කරන්ට එපා. බේලිෂ් උතුමානන් වගබලා ගනිවී ජේන්ව පරිස්සමින් බලාගන්න එක ගැන. මම ඔයාට ඒ ගැන පොරොන්දු වෙනවා." ඇය තමා පසෙකින් වූ අසුනට තට්ටු කලාය. "මෙතනට ඇවිල්ලා වාඩිවෙන්ට සන්සා. මට ඔයත් එක්ක කතා කළන්ට ඕන."

සන්සා රැජිණ සමීපයට ගොස් අසුන්ගත්තා ය. සෙර්සි නැවත වරක් ඇය දෙස බලා සිනහ වූ නමුදු එය ඇගේ වියවුල් බව තුරන් කරන්නට සමත් නොවීය. වාරිස් සිය පුයර දැමූ දෑත් එකිනෙක අඹරවන්නට වූ අතර මේස්ටර් පයිසෙල් නිදිබර දෑස් තමාට ඉදිරියෙන් වූ ලිපිගොනු මත රඳවාගෙන සිටියේය. එනමුදු සුළැඟිල්ලා තමා දෙස බලා සිටින ආකාරය ඇයට හැඟෙන්නට විය. මේ මිනිසා තමා දෙස බලා සිටින ආකාරය නිසා ඇගේ සිතට මහත් නොසන්සුන් බවක් දැනෙන්නට විය. එය හරියටම ඇය ඔහුගේ දෑස් ඉදිරියේ නග්නව සිටින්නාක් වැනි විය. ඇගේ සමේ හී ගඩු පිපෙන්නට විය.

"සන්සා වස්තුවෙ," සෙර්සි රැජිණ කීවේ ඇගේ මැණික්කටුව මත මෘදු ලෙසින් අතක් තබමිනි. "කොච්චර ලස්සන දරුවෙක්ද. මම හිතනවා ඔයා දන්නවා ඇති කියලා මායි ජොෆ්රියි ඔයාට කොච්චර ආදරේද කියලා."

"ඔබතුමී?" සන්සා හුස්ම ගැනීමට පවා අමතක වෙමින් ඇසුවාය. සුළැඟිල්ලා සැනෙන් අමතකව ගියේය. ඇගේ කුමරුවා ඇයට ආදරය කරයි. ඉදින් අන් කිසිදු දෙයක් වැදගත් නොවේ.

රැජිණ සුන්දර සිනහවක් පෑවාය. "මම ඔයා ගැන හිතන්නෙ මගෙම දුවක් වගේ. ඒ වගේම ඔයාගෙ හිතේ ජොෆ්රි ගැන තියෙන ආදරේ තරමත් මම දන්නවා." ඇය ඉතා සෙමින් හිස දෙපසට වැනුවාය. "මට බොහොම කණගාටුයි කියන්ට. ඒ වුනත් ඔයාගෙ තාත්තා ගැන බොහොම නපුරු ආරංචියක් තමා කියන්ට තියෙන්නෙ. ඔයා නිර්භීත වෙන්ට ඕන මගේ දරුවො."

ඇගේ මේ සන්සුන් වදන් නිසා සන්සා ගේ ඇඟ සීතල වී ගියේය. "ඒ මොකක්ද?"

"ඔයාගෙ තාත්තා රාජද්‍රෝහියෙක් වස්තුවෙ." වාරිස් උතුමානන් කීය.

මේස්ටර් පයිසෙල් සිය වෘද්ධ හිස එසවීය. "මට මගේ කණ් දෙකෙන්ම අහන්ට ලැබුනා, එඩාර්ඩ් උතුමානන් අපේ ආදරණීය රොබර්ට් රජතුමාට පොරොන්දු වෙනවා එයා මේ තරුණ කුමාරවරු දෙන්නාව එයාගෙම පුතාලා වගේ ආරක්ෂා කරනවා කියලා. ඒ වුනත්

රොබර්ට් රජතුමා මැරුනා විතරයි එයා රාජ සභාව කැඳවලා ජොෆ්රි කුමාරයාට උරුම සිංහාසනේ පැහැරගන්ට කුමන්ත්‍රණ කලා."

"නෑ!" සන්සා දෙඩෙව්වා ය. "එයා එහෙම කරන්නෙ නෑ. එයා කවදාවත් එහෙම කරන්නෙ නෑ!"

## Sansa Stark: "I only want to be Joffrey's loyal and loving wife."

රැජිණ මේසය මත වූ ලිපියක් අතට ගත්තාය. කඩදාසිය පොඩි වී ලේ තැවරී තිබුනු නමුදු එහි වූ මුද්‍රාව සිය පියාගේ සලකුණ වන සෝරවෘකයා ගේ රුව බැව් ඇය දුටුවාය. "අපට මේක ලැබුනේ ඔයාලගෙ ගෘහාරක්ෂක බලකායෙ කපිතාන් ගාව තිබිලයි සන්සා. ඒක මගේ ස්වාමියාගෙ මල්ලි, ස්ටැනිස්ට ලියාපු ලියුමක්. එයා මේ ලියුමෙන් ස්ටැනිස්ට ආරාධනා කරනවා රාජ්‍යය බාරගන්ට එන්ටයි කියලා."

"අනේ, මගේ උත්තමාවනි. මෙතන මොකක් හරි වැරැදීමක් වෙලා තියෙනවා." හදිසි සන්ත්‍රාසය නිසා සන්සාට ක්ලාන්ත ගතියක්, ඇස් බොඳ වී යන බවක් දැනෙන්නට විය. "අනේ! මගේ තාත්තාව එක්කරන් එන්ට. එයා ඔබතුමීට කියයි. එයා කවදාවත් ඔය වගේ ලියුමක් ලියන්නෙ නෑ. රජතුමා එයාගෙ යාළුවෙක්."

"රොබර්ටුත් එහෙම තමා හිතාගෙන හිටියෙ." රැජිණ කීවාය. "මේ පාවාදීම ගැන දැනගන්ට ලැබුනා නම් එයාගෙ පපුව පැලෙයි. දෙවියො කරුනාවන්ත වුනා ඊට කලින් එයාට ඇස් දෙක පියාගන්ට ඉඩ දීලා." ඇය සුසුමක් හෙලුවාය. "සන්සා, මගේ වස්තුවෙ. ඔයාට පේන්ට ඕන මේ වැඩේ නිසා අපි දැන් මොනතරම් අමාරු තත්ත්වයකටද මූන දීලා ඉන්නෙ කියලා. ඇත්ත, ඔයා මේ කිසිම දේකට වැරැදිකාරියක් නෙවෙයි. අපි හැමෝම ඒ බව දන්නවා. ඒ වුනත් ඔයා දැන් රාජද්‍රෝහියෙකුගෙ දුවක්. මම කොහොමද ඔයාට ඉඩදෙන්නෙ මගේ පුතාව කසාද බඳින්ට?"

"ඒ වුනත් මම එයාට ආදරෙයිනෙ." වියවුල් වූ, තැතිගත් සන්සා වැලැපුනාය. ඔවුන් ඇයට කුමක් කරන්නට බලාපොරොත්තු වන්නේද? ඔවුන් සිය පියාට කුමක් කලාද? මෙය මෙලෙසින් සිදුවිය යුතුව තිබුනු දෙයක් නොවේ. ඇය ජොෆ්රිත් සමග විවාහ වීමට නියමිතව තිබුනි. ඔවුන් විවාහ ගිවිසගෙන තිබුනි. ඇය ඒ ගැන අනන්ත සිහින දැක තිබුනි. ඇගේ පියා විසින් සිදුකරන්නට යෙදුනා යැයි සැක කෙරෙන අකටයුත්තක් නිසා සිය ආදරණීය කුමරුවා ඇගෙන් වෙන් කිරීමට තැත්කිරීම කෙතරම් අසාධාරණ ද?

"ඒ ගැන මම කොච්චර හොඳට දන්නවද දරුවො." සෙර්සි කීවාය. ඇගේ ස්වරය අතිශයින්ම කරුනාවන්ත හා ආදරණීය විය. "ආදරේ නිසා නෙවෙයි නම් වෙන මොකටද ඔයා මා ගාවට ඇවිල්ලා ඔයාව අපෙන් වෙන්කරලා ආපහු වින්ටර්ෆෙල්වලට යවන්ට ඔයාගෙ තාත්තා කරපු සැලසුම් ගැන මට කිවුවෙ?"

"ඒ ආදරේ වෙනුවෙන් තමා." සන්සා දඩිබිඩියේ කියාගත්තා ය. "තාත්තා අඩුමගානෙ මට ආයුබෝවන් කියන්ටවත් ඉඩක් දුන්නෙ නෑ." ඇය සැමදාමත් හොඳ ගැහැණු දරුවකු විය. කීකරු ගැහැණු දරුවකු විය. එනමුදු එදා උදැසන ඇයට ආර්යා තරමටම නපුරු සිතුවිලි පහලව තිබුනි. එබැවින් ඇය සෙප්ටා මෝර්ඩේන්ව හෙමින් සීරුවේ මඟහැර සිය පියාගේ අභිමතයට පිටුපාමින් කටයුතු කලාය. ඇය මෙවැනි හිතුවක්කාරකමක් මීන් පෙර කිසි දිනෙකත් සිදු කොට නොතිබුනි. ඇය ජොෆ්රිට මෙතරම් ආදරය නොකලා නම් ඇය අතින් එවැන්නක් කිසිදාකත් නොවන්නට ද ඉඩ තිබුනි. "එයා ලෑස්ති වුනේ මාව ආපහු වින්ටර්ෆෙල්වලට අරන් ගිහිල්ලා ඔය දෙකයි පනහෙ නයිට් කෙනෙකුට බන්දලා දෙන්ටයි. ඒ වුනත් මට ඕන වුනේ ජොෆ්රිවයි. මම එයාට කිවුවා. ඒත් එයා මට ඇහුම්කන් දුන්නෙ නෑ." රජතුමා හමුවීම ඇගේ අන්තිම බලාපොරොත්තුව විය. ඇයට දිගටම කිංග්ස් ලෑන්ඩින්ග්වල නැවතී හිඳ ජොෆ්රි හා විවාහ වන්නට ඉඩ දෙන්නැයි රජතුමා පියාට අණ කරනු ඇත. ඔහුට එසේ කල හැකි වනු ඇති බව සන්සා දැන සිටියාය. එනමුදු රජතුමා සැමවිටම ඇයව බියපත් කරන්නට සමත්ව සිටියේය. ඔහු හැමවිටම අර ගැඹුරු හඬින් කෑගසමින්, නිතරම බීගත්වන සිටියේය. අනෙක, ඔවුන් ඇයට රජතුමාව බැහැ දකින්නට ඉඩ දුන්නද ඔහු කිසිත් නොකර ඇයව නැවත පියා වෙතම එවන්නට ද පුළුවන. එමනිසා ඇය රජතුමා වෙනුවට රැජිණ හමුවීමට ගියාය. ඇය සෙර්සි හමුවී සිය හදවතේ ඇති සියළුම දුක්ඛ දෝමනස්සයන් ඇය ඉදිරියේ වමාරා දැමූ අතර රැජිණ ඇගේ කතාවට ඉවසිල්ලෙන් සවන් දී ඇයට මුව නොසෑහෙන සේ ස්තූති කලාය... එයින් පසු සෙර් ඒරිස් විසින් ඇයව මේගර් ගේ බලකොටුවේ අර කාමරයට කැඳවාගෙන ගොස් ඇයව මුර පිට තැබීය. එයින් පැය කිහිපයකට පසු පිටත සටන් ඇවිලුනි. "අනේ කරුනාකරලා." ඇය සිය කතාව අවසන් කලාය. "මට ජොෆ්රිව කසාද බඳින්ට ඔබතුමී ඉඩදෙන්ට. මම හැමදාමත් එයාට

හොඳ භාර්යාවක් වෙන්නම්. ඔන්න බලන්ටකො. මම ඔබතුමී තරම්ම හොඳ රැජිණක් වෙන්නම්. මම පොරොන්දු වෙනවා."

සෙර්සි අනිකුන් දෙස බැලුවාය. "මගේ උතුමනි. ඔබලා මොකද හිතන්නෙ එයාගෙ ඉල්ලීම ගැන?"

"දූප්පත් අහිංසක දරුවා." වාරිස් මිමිනීය. "කොච්චර අවංක, කොච්චර අහිංසක ආදරයක්ද. මගේ උත්තමාවනි, ඒ වගේ ආදරේකට ඉඩ නොදෙන එක බොහොම නපුරු වැඩක් වේවි... ඒ වුනත්, අපි මොකද කරන්නෙ? එයාගෙ තාත්තා අපරාධකාරයෙක් විදියට හංවඩු ගැහිලයි තියෙන්නෙ." ඔහුගේ මෘදු දෑත් කිසිඳු පිළිසරණක් නොමැති අයුරින් එකට ඇඹරෙන්නට විය.

"රාජද්‍රෝහියෙකුගෙ බීජයෙන් ඉපදුන දරුවෙකුට පාවාදීම් වගේ දේවල් නිකංම ඇඟට එනවා." ප්‍රධාන මෙස්ටර් පයිසෙල් කීය. "එයා දැන් බොහොම ආදරණීය වස්තුවක් තමා. ඒ වුනත් කාටද කියන්ට පුළුවන් තව අවුරුදු දහයකින් එයා මොන මොන විදියෙ කුමන්ත්‍රණ කරන්ට පටන්ගනියිද කියලා?"

"නෑ!" සන්සා බියෙන් ත්‍රස්ත වී කෑගැසුවාය. "මම එහෙම කරන්නෙ නෑ. මම කවදාවත් එහෙම කරන්නෙ නෑ... මම ජොෆ්රිව පාවලා දෙන්ට යන්නෙ නෑ. මම එයාට ආදරෙයි. මම දිවුරනවා."

"ආහ්! කොච්චර ඛේදජනක ද." වාරිස් කීය. "ඒ වුනත් දිවුරුම්, පොරොන්දු වලට වඩා ලේ සනකමයි කියන්නෙ බොරුවක් නෙවෙයි."

"එයාව දැක්කහම මට මතක් වෙන්නෙ එයාගෙ අම්මා, තාත්තා නෙවෙයි." පෙටයර් බේලිෂ් උතුමානන් සන්සුන් ස්වරයෙන් කීවේය. "බලන්ට එයා දිහා. එයාගෙ කොණ්ඩෙ, එයාගෙ ඇස්. එයා හරියටම කැට් ඔය වයසෙදි හිටියා වගේමයි."

රැජිණ ගැටළුවකට මැදි වූ ස්වරයෙන් ඇය දෙස බලා සිටින්නට විය. එනමුදු ඒ කොළ පැහැ දෑස් තුළ වූ කරුනාවන්ත බව සන්සා පැහැදිලිවම දුටුවාය. "දරුවො. ඔයා ඔයාගෙ තාත්තා වගේ නෙවෙයි කියලා මට ඇත්තටම විශ්වාස කරන්ට පුළුවන්නම් ඔයාව මගේ පුතා ජොෆ්රිට කසාද බන්දලා දෙන එක තරම් වෙන සතුටක් මට මේ මුලු ලෝකෙම නෑ. මම දන්නවා එයාත් ඔයාට එයාගෙ මුලු හදවතින්ම ආදරේ කරනවා කියලා." ඇය සුසුමක් හෙලුවාය. "ඒ වුනත්, බොහොම කණගාටුයි මෙහෙම කියනවට. වාරිස් උතුමානනුයි ප්‍රධාන මේස්ටර් තුමායි කියාපු දේ ඇත්ත. ලේ කියන්නෙ බොහොම සනකම දෙයක්. මට හොඳට මතකයි කොහොමද ඔයාගෙ නංගි අර ජරා වෘකයා මගේ පුතාට උසි ගැන්නුවෙ කියලා."

"මම ආර්යා වගේ නෙවෙයි." සන්සා කියෙවුවාය. "එයාට තමා රාජද්‍රෝහියෙකුගෙ ලේ තියෙන්නෙ. මට නෙවෙයි. මම හොඳ දරුවෙක්. අහන්ට සෙප්ටා මෝර්ඩේන්ගෙන්. එයා ඔබතුමීට කියයි. මට ඕන එකම දේ ජොෆ්රිගෙ ආදර බිරිඳ වෙන එක විතරයි."

සෙර්සි බරපතල දෑසින් ඇගේ මුහුණ නිරීක්ෂණය කලාය. "ඔයා ඔය කියන්නෙ ඇත්තම ඇත්ත කියලා මම විශ්වාස කරනවා දරුවො." ඇය අනායයන් දෙසට හැරුනාය. "මගේ උතුමනි. මට පේන විදියට මේ නරක නපුරු වෙලාවෙ එයාගෙ අනිත් නෑයො ටිකත් අපට පක්ෂපාතීව තියාගන්ට පුළුවන් නම් අපේ බය සැක සෑහෙන දුරට අඩුකරගන්ට පුළුවන්."

ප්‍රධාන මේස්ටර් පයිසෙල් සිය දිගු රැවුල සෙමින් පිරිමැද්දේ ය. ඔහුගේ නළල කල්පනාව නිසා රැළි නැංවුනි. "එඩාර්ඩ් උතුමානන්ට පුත්තු තුන්දෙනෙක් ඉන්නවා."

"පොඩි කොල්ලොනෙ." පෙටයර් උතුමානන් දෙවුර අකුළමින් කීවේය. "මම ඊට වඩා වදවෙනවා කැට්ලින් ආර්යාවයි ටලීලායි ගැන."

රැජිණ සන්සා ගේ අත දෝතින්ම අල්ලාගත්තා ය. "දරුවො. ඔයා අකුරු දන්නවා නේද?"

සන්සා බයාදු අයුරින් හිස වැනුවාය. ඇය සිය සොයුරන් සැමටම වඩා හොඳින් ලියන්නටත් කියවන්නටත් දැන සිටියාය. ඇයට අපහසු වූ එකම දෙය ගණිතය පමණි.

"මට බොහොම සන්තෝසයි ඒක අහන්ට ලැබුනට. සමහරවිට ඔයාටයි ජොෆ්රිටයි තාමත් බලාපොරොත්තු තියාගන්ට පුළුවන් වෙයි..."

"මම මොකක්ද කරන්ට ඕන?"

"ඔයා ලියුම් ලියන්ට ඕන ඔයාගෙ අම්මටයි, ඔයාගෙ සහෝදරයටයි. වැඩිමල් එක්කෙනාට... මොකක්ද එයාගෙ නම?"

"රොබ්."

"කිසිම සැකයක් නෑ, ඔයාගෙ තාත්තගෙ රාජද්‍රෝහිකම ගැන විස්තරේ එයාලට ඉක්මනටම දැනගන්ට ලැබෙයි. වඩා හොඳ නැද්ද ඒක ඔයාගෙන්ම එයාලට දැනගන්ට ලැබුනානම්? ඔයා එයාලට කියන්ට ඕන කොහොමද එඩාර්ඩ් උතුමානන් එයාගෙ රජතුමාව පාවාදුන්නෙ කියලා."

සන්සාට ඉතාම දරුණු අයුරින්, බලාපොරොත්තු රහිත අයුරින් ජොෆ්රිව උවමනා විය. එනමුදු රැජිණ පවසන කටයුත්ත සිදුකිරීමට තරම් ධෛර්‍යයක් තමා තුළ තිබේයැයි ඇය විශ්වස නොකලාය. "ඒ වුනත් එයා කවදාවත්... මම දන්නෙ නෑ... මගේ උත්තමාවනි. මම දන්නෙ නෑ මොකක් කියන්ට ද කියලා..."

රැජිණ ඇගේ අතට තට්ටු කලාය. "අපි ඔයාට කියන්නම් මොනවද ලියන්ට ඕන කියලා දරුවො. වැදගත්ම දේ තමා ඔයා කැට්ලින් ආර්යාවටයි ඔයාගෙ අයියටයි කියන්ට ඕන රජතුමාගෙ සාමය ආරක්ෂා කරන් සාමකාමීව ඉන්ට කියලා."

"එයාලා එහෙම නොකලොත් ඒක එයාලට බොහොම දරුණුවට බලපායි." මේස්ටර් පයිසෙල් කීවේය. "ඔයාගෙ හිතේ එයාලා ගැන තියෙන ආදරේ නාමයෙන් එයාලට කියන්ට ඥානවන්ත විදියට වැඩ කරන්ටයි කියලා."

"කිසිම සැකයක් නෑ, ඔයාගෙ අම්මා ඔයා ගැන බයවෙයි." රැජිණ කීවාය. "ඔයා එයාට කියන්ට ඕන අපේ රැකවරණය යටතෙ ඔයා බොහොම හොඳින් ඉන්නවා කියලා. අපි ඔයාට බොහොම කරුනාවෙන් සලකනවා, ඔයාගෙ හැම ඕනෑඑපාකමක් ගැනම හොයා බලනවා කියලා කියන්ට. ජොෆ්රි සිංහාසනේට නැග්ගාට පස්සෙ කින්ග්ස් ලෑන්ඩින්ග්වලට ඇවිල්ලා එයාට පක්ෂපාතියි කියලා දිවුරන්ට කියලා එයාලට කියන්ට. එයාලා එහෙම කලොත්... ඇයි, එතකොට අපට හොඳටම තහවුරු වෙයි ඔයාගෙ ලේ වල කිසිම වැරැද්දක් නැහැයි කියලා. ඉතින් ඔයා වැඩිවිය පත්වුනාට පස්සෙ බේලර්ගෙ සප්තකයට ගිහිල්ලා දෙවිවරුයි මිනිස්සුයි ඉදිරියේ රජතුමාව කසාද බඳින්ට ඔයාට පුළුවන් වෙයි."

'... රජතුමාව කසාද බඳින්ට...' මේ වදන් නිසා ඇගේ හදගැස්මේ සීග්‍රතාව වැඩි විය. එනමුදු තවමත් සන්සා අතීරණයෙන් පෙලුනාය. "සමහරවිට... මට මගේ තාත්තාව මුනගැහෙන්ට පුළුවන් නම්... එයාත් එක්ක මේ ගැන කතාකලොත්..."

"රාජද්‍රෝහිකම?" වාරිස් උතුමානන් කීය.

"ඔයා බොහොම නරක විදියට මගේ බලාපොරොත්තු බිඳලා දැම්මා සන්සා." රැජිණ ගලක් මෙන් දැඩි වූ දෑසින් යුතුව කීවාය. "අපි ඔයාට කිවුවා ඔයාගෙ තාත්තා කරපු අපරාධ ගැන. ඔයා ඔය කියන තරම්ම අපට පක්ෂපාතියි නම් ඇයි ඔයාට එයාව දකින්ට ඕන වෙන්නෙ?"

"මම... මම හිතුවෙ..." සිය දෑස් තෙමෙනු සන්සාට දැනුනාය. "අනේ... එයාට... එයාට මොකුත්... තුවාලයක්... එයාට මොකුත් හානියක්..."

"එඩාර්ඩ් උතුමානන්ට කිසිම හානියක් වෙලා නෑ." රැජිණ කීවාය.

"ඒ වුනත්... එයාට මොකක්ද සිද්දවෙන්ට යන්නෙ?"

"ඒක තීරණය කරන එක රජතුමාට අයිති දෙයක්." ප්‍රධාන මේස්ටර් පයිසෙල් බරපතල ස්වරයෙන් කීය.

රජතුමා! ඇසිපිය ගැසූ සන්සා සිය කඳුළු නවතාගත්තා ය. 'දැන් ජොෆ්රි තමා රජතුමා.' ඇය කල්පනා කලාය. ඇගේ නිර්භීත කුමරුවා කිසිදිනෙකත් ඇගේ පියාට අනතුරක් නොකරනු ඇත. ඔහු කවර වරදක් කර තිබුනත් ඔහුට හානියක් නොකරනු ඇත. ඔහු වෙතට ගොස් පියාට ක්ෂමාව හජනය කරන මෙන් ආයාචනා කර සිටියොත් ඔහු තමාට ඇහුම්කන් දෙනු ඇති බැව් ඇයට නිසැක විය. ඔහු ඇයට ඇහුම්කන් දිය යුතුමය. ඔහු ඇයට ආදරය කරයි. රැජිණ පවා ඒ බැව් පිළිගත්තා ය. කෙසේවුවද සිය පියාට යම් දඬුවමක් දීමට ජොෆ්ට සිදුවනු ඇත. සෙසු වංශාධිපතියන් ඔහුගෙන් එවැන්නක් බලාපොරොත්තු වනු ඇත. සමහරවිට ඔහු පියාව නැවත වින්ටර්ෆෙල් කරා පිටත් කර හරිනු ඇත. එසේත් නැතහොත් පටු මුහුදින් එතෙර නිදහස් වෙළෙඳ නගරයක් වෙත පිටුවහල් කරනු ඇත. එය වසර කිහිපයක් තරම් සුළු කාලයකට පමණි. ඒ වනවිට ඇයත් ජොෆ්රිත් විවාහ වී සිටිනු ඇත. ඊට පසු, ඇය රැජිණ වූවායින් පසු පියා නැවත ගෙන්වාගෙන ඔහුට සමාවක් ප්‍රදානය කිරීමට ජොෆ්රිව පොළොඹවා ගැනීමට ඇයට හැකි වනු ඇත.

එහෙත්... අම්මා හෝ රොබ් හෝ යම් රාජද්‍රෝහී ක්‍රියාවක් සිදු කලහොත්? සිය යටත් ධජ කැඳවා සටනට පැමිණියහොත්, පක්ෂපාතී බවට දිවුරුම් දීම පිළිකෙව් කලහොත් හෝ වෙනත් එවැනි මෝඩ වැඩක් කලහොත්? මේ සැලසුම් සියල්ල වැරදී යනු ඇත. සිය ආදරණීය ජොෆ්රි හොඳ, කරුනාවන්ත පුද්ගලයකු බැව් ඇය මුලු හදින්ම දැන සිටියාය. එනමුදු තමාට එදිරිව කැරළි ගසන්නන්ට විරුද්ධව තදින් සිටීමට රජෙකුට අනිවාර්යයෙන්ම සිදුවනු ඇත. ඔවුන්ට තත්ත්වය අවබෝධ කර දීමට ඇයට සිදුවී ඇත. ඇයට සිදුවී ඇත!

"මම... මම ලියුම් ටික ලියන්නම්." සන්සා කීවාය.

හිරුඋදාව මෙන් ප්‍රබෝධවත් සිනහවක් මුවේ ඇතුව පෙරට නැමුනු සෙර්සි ලැනිස්ටර් ඇගේ කම්මුල් මෘදුව සිම්බාය. "මම දැනගෙන හිටියා ඔයා ඒක කරයි කියලා. ඔයා අද දවසෙ මෙතැන කොච්චර ධෛර්යවන්තව හිටියාද, කොච්චර බුද්ධිමත්ව කටයුතු කලාද කියලා මම ජොෆ්රිට කිවුවහම එයාට හරියට ආඩම්බර හිතෙයි."

* * *

අන්තිමේදී ඇය ලිපි හතරක්ම ලියුවාය. ඇගේ මව කැට්ලින් ටලී ආර්යාවට, වින්ටර්ෆෙල්හි සිටින ඇගේ සොහොයුරන්ට, ඉයරිහි සිටින ඇගේ පුංචි අම්මා ලයිසා ඒරින් ආර්යාවට හා ඇගේ සීයා රිවර්රන්හි හස්ටර් ටලී උතුමානන්ට ඒ ලිපිවලින් ඇමතුනි. මේ සියල්ල හමාර වනවිට ඇගේ අතැඟිලි හිරි වැටී, තීන්ත පැල්ලම්වලින් වැසී ගොස් තිබින. වාරිස් ඇගේ පියාගේ මුද්‍රාව රැගෙන ආයේය. ඉටිපන්දම් දැල්ලකට ඉහළින් අල්ලා සුදු පැහැ මී ඉටි උණු කල සන්සා ඒවා කඩදාසිය මත වත්කර, වාරිස් විසින් ස්ටාර්ක් වංශයේ සෝරවෘකයා ගේ සලකුණ තබා ඒ සෑම ලිපියක්ම මුද්‍රා තබන ආකාරය දෙස බලා සිටියාය.

සෙර් මැන්ඩන් මූර් විසින් ඇයව නැවත මේගර් ගේ බලකොටුවේ ඇගේ කාමරය වෙත කැඳවාගෙන ආ විට ජේන් පූල් හා ඇගේ බඩු බාහිරාදිය සියල්ල අතුරුදන්ව තිබුනි. 'තවත් නම් ඇඬිලි නෑ.' ඇය සැනසුම් සුසුමක් හෙලමින් සිතුවාය. එනමුදු ජේන් නැතිවීම නිසා ඇයට කුටිය තුළ වඩාත් සීතල දැනෙන්නට විය. ඇය ගින්නක් දැල්වුවද ඒ සීතය පහනොවීය. ගිනිඋඳුන අසලට පුටුවක් ඇදගෙන, ඇගේ ප්‍රියතම පොතක් අතට ගත් ඇය, ෆ්ලෝරියන් හා ජොන්ක්විලුත්, ෂෙලා ආර්යාව හා දේදුනු නයිට්වරයාත්, නිර්භීත ඒමන් කුමරා හා සිය සොහොයුරා ගේ බිරිඳ කෙරෙහි ඔහු තුළ ඇතිවූ විනාශකාරී ආලයත් ගැන කියැවෙන රසබර කතා අතරේ කිමිදෙමින් අතරමං වූවාය.

රැයේ බොහෝ වේලා ගෙවීගිය පසු, නිදි දෙව්දුව කෙමෙන් කෙමෙන් ඇය කරා ළඟාවද්දී සන්සාට හදිසියේම මෙන් සිහිපත් වූයේ තමාට සිය සොයුරිය පිළිබඳ විමසන්නට අමතක වූවා නේද යන්නයි.

**Cersei Lannister: “Joffrey would never forgive me if anything happened to his precious.”**

ජොන් **07-1**

"ඒ ඔතෝර්." සෙර් ජැරමි රයිකර් කීවේය. "කිසිම සැකයක් නෑ. එතකොට මේ ඉන්නෙ ජැෆර් ෆ්ලවර්ස්." ඔහු සිය පයින් මළකඳ අනිත් පසට පෙරලුවේය. සුදුමැලි මළ මුහුණ සිය නිල් පැහැ දෑසින් වැහි අන්ධකාරයෙන් පිරි අහස දෙස බලා සිටියේය. "මුන් දෙන්නම බෙන් ස්ටාර්ක්ගෙ මිනිස්සු."

'මගෙ බාප්පගෙ මිනිස්සු.' ජොන්ගේ උගුරට අම්බිරි තිත්ත රසයක් දැනෙන්නට විය. ඔහුත් සමග යාමට ඉඩදෙන්නැයි තමා සිය බාප්පාගෙන් අයැද සිටි අයුරු ජොන්ට සිහිපත් විය. 'දෙයියනේ! මම කොච්චර මෝඩ කොල්ලෙක් වගේද හැසිරුනෙ. එයා එදා මාව එක්කරන් ගියානම් අද මෙතැන මෙහෙම වැටිලා ඉන්නෙ මමයි...'

ගෝස්ට් ගේ හණුවට හසුවීම නිසා ජැෆර් ගේ දකුණු මැණික්කටුව අසලින් අත වෙන්වී තිබුනු අතර එතැන ඉරී ගිය මාංශය හා බිඳී ගිය ඇටකටු පමණක් ඉතුරු වී තිබුනි. වෙන්වී ගිය අත මේ වනවිට මේස්ටර් ඒමන් ගේ කාමරයේ විනාකිරි බඳුනක පාවෙමින් තිබේ. ඔහුගේ වමත ඔහු පැළැඳ සිටි කළු පැහැ සළුව තරම්ම කළු පැහැ ගැන්වී තිබින.

"දෙයියන්ටමඔප්පු වෙච්චාවෙ." නාකි වලහා කටුකුටු ගෑවේය. අසු පිටින් බිමට බට ඔහු තෝන්ලණුව ජොන්ට භාරකලේය. උදෑසන අසාමාන්‍ය අන්දමින් උණුසුම් විය. අණදෙන නිළධාරිතුමාගේ නළලේ නැගි දහදිය බිඳු කොමඩු ගෙඩියක තැවරුනු පිණිබිඳු මෙන් දිදුලන්නට විය. ඔහුගේ අශ්වයා නොසන්සුන් අයුරින් දඟලමින්, දෑස් දෙපසට නෙරවමින්, තෝන්ලණුව ඉඩදෙන උපරිමය දක්වා මළ මිනිසාගෙන් ඈත් වූයේය. ජොන් ඌව පියවර කිහිපයක් ඈතට රැගෙන ගියේ ලණුව කඩාගෙන දිව යෑමට ඌ කරන උත්සාහය මැඩ පැවැත්වීමට යත්න දරමිනි. මෙම ස්ථානයේදී දැනෙන හැඟීමට කිසිම අශ්වයකු කැමති නොවීය. එබැවින්ම ජොන් ද එතැනට කැමැති නොවීය.

මේ හැමටම වඩා බල්ලෝ එතැනට අකැමැති වූහ. කණ්ඩායම මෙතැනට කැඳවාගෙන එනු ලැබූයේ ගෝස්ට් විසිනි. බලු රංචුව සම්පූර්නයෙන්ම පාහේ අසාර්ථක වී තිබින. සුනඛයින් බලාගන්නා වූ බාස් උන්ට වෙන්වී ගිය අත් කැබැල්ල ඉව කිරීමට දුන්විට උන් සම්පූර්ණයෙන්ම පාහේ වියරු වැටුනේ බුරමින් හා උඩුබුරමින් ඉවතට දිවයෑමට උත්සාහ

දැරූහ. මේ දැන් පවා උන් දත් විලිස්සමින්, කෙඳිරිගාමින් තමන්ව බැඳ ඇති රැහැනින් මිදී යාමට යත්න දරමින් සිටින අතර වෙට් උන්ට සාප කරමින් උන්ව වැරෙන් අල්ලාගෙන සිටියේය.

'මේක නිකංම කැලයක්.' ජොන් තමාටම කියාගත්තේ ය. 'මුන් නිකංම මැරිච්ච මිනිස්සු.' ඔහු මීට පෙරද මළ මිනිසුන් ඇතිපදම් දැක තිබේ...

පෙරදා රැයේ ඔහු නැවත වරක් අර වින්ටර්ෆෙල් සිහිනය දුටුවේය. ඔහු හිස් බලකොටුව පුරා ඉබාගාතේ ඇවිදිමින් සිය පියාව සෙවීය. අන්තිමේදී ඔහු සොහොන් ගුහාවලට බැස්සේය. එනමුදු මේ වතාවේ සිහිනය කලින් වතාවට වඩා තරමක් දුර ගොස් තිබුනි. සොහොන් ගුහාවල අන්ධකාරය මැද්දේ ගල් මත ගල් ඇතිල්ලෙන හඬ ඔහුට ඇසුනි. ආපසු හැරී බැලූ ඔහු දුටුවේ සොහොන් ගැබ් එකින් එක විවර වන ආකාරයයි. සිය සීතල, අඳුරු සොහොන් ගුහා තුළ සිට මියගිය ශීත රජවරුන් එකින් එකා පිටතට එද්දී ඔහු සිහිනයෙන් අවදිවිය. අවට දැඩි අන්ධකාරයෙන් වෙලී තිබුනු අතර ඔහුගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබුනි. ගෝස්ට් ඇඳට නැග උගේ හොම්බ ඔහුගේ මුහුණේ ඇතිල්ලූ විට පවා සිය සිතේ නැගී ත්‍රාසය හා භීතිය පලවා හරින්නට ඔහුට හැකි නොවීය. නැවත නින්දට යාමට තරම් ඔහු නිර්භීත නොවීය. ඒ වෙනුවට නැගිට ප්‍රාකාර මුදුනට නැගී ඔහු අරුණෝදය වන තෙක් නොසන්සුන් සිතින් එහි එහා මෙහා ඇවිද්දේය. 'ඒක හීනයක් විතරයි. මම දැන් නිශා රැකුමේ කළු සහෝදරයෙක්. බයවෙච්ච පොඩි කොල්ලෙක් නෙවෙයි.' ඔහු තමාටම කියාගත්තේ ය.

සැම්වෙල් ටාර්ලි අසුන්ට අඩක් මුවා වී තුරුවදුල යට දැත් පොරවා බලා හුන්නේය. ඔහුගේ වටකුරු මුහුණ කිරි මෙන් සුදුමැලි පැහැ ගැන්වී තිබින. වනය තුළට දුවගොස් අප්පිරියාවෙන් වමනය නොකර සිටීමට ඔහු මේ වන තෙක් සමත් වී සිටියේය. එනමුදු ඔහු මළ මිනිසුන් දෙස කිසිදු බැල්මක් නොහෙලා සිටීමට ද පරෙස්සම් වූයේය. "මට ඒ දිහා බලන්ට බෑ." ඔහු අසරණ අයුරින් කොඳුලේය.

"උඹ ඒක බලන්ට ඕනමයි." අනායයන්ට නෑසෙන පරිදි ඔහු සිය කටහඬ පහත් කලේය. "මේස්ටර් ඒමන් උඹව මෙහාට එවුවෙ එයාගෙ ඇස් දෙක වෙන්ට. මෙතැන සිද්ද වෙන හැම දෙයක්ම බලාගෙන යන්ට. ඒ ඇස් දෙක වැහිලා තිබුනොත් මොකක්ද ඒකෙන් ඇති වැඩේ?"

"ඔවු. ඒ වුනත්... මම මහ බයගුල්ලෙක් ජොන්."

ජොන් සෑම්ගේ උරහිසේ අතක් තැබීය. "මෙතැන අපිත් එක්ක මුර සංචාරක සෙබළු දුසිමක් විතර ඉන්නවා. බල්ලො ඉන්නවා. ගෝස්ට්‍රුත් ඉන්නවා. කාටවත් බෑ උඹට හානියක් කරන්ට. සෑම්, ඉස්සරහට ගිහිල්ලා බලපන්. මුල්ම වතාවෙ බලන එක තමා අමාරුම වැඩේ."

සෑම් වේගයෙන් හිස වැනීය. ඔහු සිය ධෛර්යය වඩා ගන්නට වෑයම් කරන්නාක් මෙන් පෙනින. අන්තිමේදී ඔහු විසල් කරගත් දෑසින් යුතුව හෙමින් සැරේ හිස හැරවීය. ඔහුට ආපසු හැරීමට නොහැකි වන සේ ජොන් ඔහුගේ උරහිස මත දිගටම අත තබාගෙන හුන්නේය.

"සෙර් ජැරමි." නාකි වලහා කර්කශ ස්වරයෙන් ඇසීය. "බෙන් ස්ටාර්ක් ප්‍රාකාරෙන් පිටත්වෙලා යද්දි එයාත් එක්ක මිනිස්සු හයදෙනෙක් ගියා. කෝ එතකොට අනිත් එවුන්?"

සෙර් ජැරමි හිස වැනුවේය. "මම දන්නෙ නෑ උතුමානනි."

ලැබුනු පිළිතුරෙන් මෝර්මන්ට් සෑහිමකට පත්නොවූ බැව් පැහැදිලිවම දිස්විය. "අපේ සහෝදරයො දෙන්නෙක් ප්‍රාකාරය පේන මායිමේ මරලා දාලා ඉන්නවා. ඒ වුනත් අපේ මුර සංචාරකයින්ට කිසිම දෙයක් ඇහිලා නෑ. උන් කිසිම දෙයක් දැකලා නෑ. නිශා රැකුම දැන් ඒ ගානට වැටිලා ද? අපි තාමත් මේ කැලේ මුර සංචාර කරනවද?"

"එහෙමයි මගෙ උතුමානනි. ඒත්-"

"අපි තාමත් රෑ මුරේ කරනව ද?"

"කරනවා. ඒත්-"

"මේ මිනිහා ගාව දඩයම් හොරණෑවක් තියෙනවා." මෝර්මන්ට් ඔතෝර් ගේ මළකඳ දෙසට අත දිගුකලේය. "එතකොට මම හිතාගන්ට ඕන ඌ ඒක පිඹින්නෙ නැතුවම මලා කියලද? එහෙමත් නැත්තම් උඹේ මුර සංචාරකයො හැමෝගෙම ඇස් අන්ධ වෙලා කණ් බීරි වෙලා ගිහිල්ලා ද?"

සෙර් ජැරමි වේගයෙන් හුස්මක් පිටකලේය. කේන්තිය නිසා ඔහුගේ මුහුණ රතු වී ගොස් තිබුනි. "කිසිම හොරණෑවක් පිම්බෙ නෑ මගෙ උතුමානනි. එහෙම වුනානම් මගේ මුර සංචාරකයින්ට ඒ සද්දෙ ඇහෙනවා. මට උවමනා තරම් මුර සංචාර දාන්ට ඇති තරම් මිනිස්සු නෑ... අනික, බෙන්ජින් නැතිවුනාට පස්සෙ අපි ඉස්සර තරම්ම කැලෑව ඇතුළට යන්නෙ නැතුව ප්‍රාකාරෙ කිට්ටුවෙන් තමා ඉන්නෙ. ඒ ඔබතුමාගෙම අණ."

නාකි වහලා උගුරෙන් හඬක් නැගීය. "හොඳයි, ඒක එහෙමයි කියමු එහෙනම්." ඔහු නොසැලකිල්ලෙන් මෙන් අතක් වැනීය. "මට කියහන් කොහොමද මුන් මැරිලා තියෙන්නෙ කියලා."

ජැෆර් ෆ්ලවර්ස් ගේ මළකඳ අසලින් උක්කුටියෙන් වාඩිගත් සෙර් ජැරමි ඔහුගේ හිසකෙස්වලින් අල්ලාගත්තේ ය. එනමුදු වියළි පිදුරු මෙන් කැඩෙන බිඳෙන සුළු වූ හිසකෙස් ඔහුගේ ඇඟිලි අතරට ගැලවී ආවේය. අවලාදයක් නැගූ නයිට්වරයා සිය අත්ලේ මිටෙන් මළකඳේ හිස පසෙකට හැරවීය. ගෙලේ පැත්තකින් වූ ගැඹුරු කැපුමක් මුව අයා තිබුනු අතර එහි වියළි රුධිරය මිදී තිබින. හිස ගෙල හා සම්බන්ධ වී තිබුනේ කුඩා කණ්ඩරා හා නහර කිහිපයකින් පමණි. "මේ වැඩේ කරලා තියෙන්නෙ පොරොවකින්."

"ඔවු." මහලු මුර සංචාරකයා, ඩිවන් මතුලේය. "ඒක ඔතෝර් අරන් ගිය පොරොව වගේ මයෙ උතුමානනි."

සිය උදෑසන ආහාරය කුස තුළ දඟලන්නාක් මෙන් ජොන්ට දැනුනි. එනමුදු දෙතොල් වැරෙන් වීකාගත් ඔහු දෙවන මළකඳ දෙස ද නෙත් හෙළීය. ඔතෝර් දැවැන්ත අවලස්සන මිනිසෙකු විය. එහෙයින් දැන් එතැන වූයේ දැවැන්ත අවලස්සක මළකඳකි. ඔහු සතුව පොරොවක් ඇති බවක් පෙනෙන්නට නොවීය. ජොන්ට ඔතෝර්ව මතක තිබුනි. සිය බාප්පා සමගින් මුර සංචාරකයින් පිටව ගිය දිනයේ මහ හඬින් ග්‍රාම්‍ය ගීයක් ගයමින් සිටි

පුද්ගලයා ඔහු විය. එනමුදු ඔහු තවත්නම් ගී නොගයනු ඇත. දැත් හැරෙන්නට ඔහුගේ මුලු සිරුරම සුදුමැලි පැහැයට හැරී තිබුනි. ඒ දැත් ජැෆර් ගේ මෙන්ම කළු පැහැ ගැන්වී තිබින. ඔහුගේ සිරුර පුරා - උදරය, පපුව, ගෙල, පාද සෑමතැනම - විසිර පැවැති මාරාන්තික තුවාල වලින් ගැලූ, දැන් වියළී ගොස් ඇති රුධිරය විසින් රටා මවා තිබින. එනමුදු ඔහුගේ දෑස් තවමත් විවරව තිබුනි. නිල්මිණි මෙන් නිල් පැහැ වූ ඒ දෑස් අහස දෙසට විවරව තිබුනි.

සෙර් ජැරමි නැගිට සිටියේය. "වනවාරින් ගාවත් පොරෝ තියෙනවා."

මෝර්මන්ට් ඔහුව වටකලේය. "ඉතින් උඹ හිතන්නෙ මේක මැන්ස් රේඩර්ගෙ වැඩක් කියලද? ප්‍රාකාරෙට මෙච්චර කිට්ටුවෙන්?"

"වෙන කවුද මගේ උතුමානනි?"

ඊට පිළිතුරු දීමේ හැකියාව ජොන් සතුව පැවතිනි. ඔහු උත්තරය දැන සිටියේය. එතැන සිටි සැවොම උත්තරය දැන සිටියෝය. එනමුදු කිසිවෙකුත් ඒ වචනය නොකියන්නට වග බලාගත්හ. අනික් එවුන් වනාහි කතන්දරයක් පමණි. කුඩා දරුවන් බිය කිරීමට යොදාගන්නා කතන්දරයක් පමණි. උන් කවරදාක හෝ ජීවත්ව සිටියානම් මීට වසර අටදහසකට පෙරාතුව විනාශ වී ගොස් තිබුනි. මේ සිතුවිල්ල පවා මහා මෝඩ එකක් ලෙසින් ජොන්ට හැඟෙන්නට විය. ඔහු දැන් වැඩුනු මිනිසෙකි. නිශා රැකුමේ සේවය කරන කළු සොහොයුරෙකි. බ්‍රෑන්, රොබ් හා ආර්යා සමගින් එක්ව නාකි ආයම්මා ගේ පාමුල වාඩි වී කතන්දර ඇසූ කුඩා කොලුවා නොවේ.

එනමුදු අණදෙන නිළධාරි මෝර්මන්ට් උගුරෙන් නොරිස්සුම් හඬක් පිටකලේය. "කළු බලකොටුවෙන් දවස් බාගෙක දුරින් බෙන් ස්ටාර්ක්ට වනවාරින්ගෙ ප්‍රහාරයකට මූන දෙන්ට වුනානම් එයා අනිවාර්යයෙන්ම ආපිට ඇවිල්ලා තවත් මිනිස්සු අරන් යනවා. ඇවිල්ලා අපා හතම පීරලා හරි මේ මිනීමරුවො හොයාගෙන උන්ගෙ ඔළු ගෙඩි ටික මට අරන් එනවා."

"එයත් මැරුනෙ නැත්තම්." සෙර් ජැරමි තිර ස්වරයෙන් කියා සිටියේය.

ඒ වදන් අතිශයින්ම වේදනා සහගත විය. මේ දැන් පවා ඒවා වේදනාකාරී විය. ඒ කෙතරම් කලක්ද. බෙන් ස්ටාරක් තවමත් ජීවත්ව සිටී යැයි බලාපොරොත්තුවෙන් පසුවීම මෝඩකමක් විය. එනමුඩු මුරණ්ඩු වීම හැරෙන්නට ජොන් ස්නොව්ට වෙනත් විකල්පයක් නොවීය.

"බෙන්ජින් පිටවෙලා ගිහිල්ලා දැන් අවුරුදු බාගෙකට කිට්ටුවෙන්ට ආවා මගේ උතුමානනි." සෙර් ජැරමි දිගටම කතාකලේය. "මේ වනාන්තරේ මහ විශාලයි. වනචාරින් මේ ඕන තැනකදි එයාට පහරදෙන්ට පුළුවන්. මම ඕන ඔට්ටුවක් අල්ලනවා මේ තමා එයාගෙ කණ්ඩායමේ ඉතුරුවුන අන්තිම දෙන්නා. උන් ආපහු ප්‍රාකාරෙට එන ගමන් වෙන්ට ඕන... ඒ වුනත් උන් අන්තිම සීමාව පනින්ට ඉස්සෙල්ලා සතුරො උන්ව හොයාගත්තා. මේ මළකඳන් තාම අලුත්. මුන් මැරිලා තාම දවසකට වඩා වැඩිවෙන්ට බෑ."

"නෑ." සැම්වෙල් ටාර්ලි හෙමින් සීරුවේ කොඳුලේය.

ජොන් තිගැස්සුනි. සැම්ගේ තියුණු, බයාදු කටහඬ වනාහි ඔහු මෙතැන අසන්නට බලාපොරොත්තු නොවුනම දෙය විය. මේ තර කොලුවා නිළධාරින් විෂයෙහි අතිශයින්ම බයපක්ෂපාත විය. එමෙන්ම සෙර් ජැරමි යනු ඉවසිලිවන්ත පුද්ගලයකු හැටියට නමක් දිනා සිටියකු නොවීය.

"මම උඹේ මතය ඇහුවෙ නෑ කොල්ලො." සෙර් ජැරමි කෝපසහගත ස්වරයෙන් කීය.

"එයාටත් කතා කරන්ට ඉඩදෙන්ට සෙර්." ජොන් කීය.

මෝර්මන්ට් ගේ දෑස් සැම්ගේ සිට ජොන් වෙත ද නැවත සැම් වෙත ද යොමුවිය. "මේ කොල්ලාට යමක් කියන්ට තියෙනවා නම් මම කැමැතියි ඒකත් අහන්ට. ළඟට වරෙන් කොලුවො. උඹ ඔය අශ්වයො පිටිපස්සෙ ඉන්නකොට අපට පේන්නෙ නෑ."

සියොලඟම දහදියෙන් පෙඟී ගිය සෑම් හෙමින් සීරුවේ අශ්වයින් හා ජොන්ව පසුකරමින් ඉදිරියට පිය මැන්නේය. "මගේ උතුමානනි, ඒක... ඒක දවසක් දෙකක් වෙන්ට බෑ... බලන්ට... ලේ..."

"ඔවු?" මෝර්මන්ට් නොඉවසිල්ලෙන් ගෙරවීය. "ලේ. මොකක්ද?"

"ලේ දැක්කහම ඌට වූ යනවා." වෙට් මහ හඬින් කීය. මුර සංචාරකයින් සිනාසෙන්නට විය.

සෑම් නළලේ නැගි දහදිය බිඳු පිස දැමීය. "ඔබට... ඔබට පේනවා ගෝස්ට්... ජොන්ගෙ වෘකයා... ඔබට පේනවා ඌ මළකඳේ අත කඩාගත්ත තැන, ඒ වුනත්... අත් කොටෙන් ලේ ගලන්නෙ නෑ, බලන්ට... මගේ තාත්තා... රන්ඩිල් උතුමානන්, එයා සමහර වෙලාවට මට බලකරනවා එයා සත්තු හමගහලා මස් කරන දිහා බලා ඉන්ටයි කියලා." සෑම් වේගයෙන් හිස දෙපසට වැනීය. මේ මළකඳන් දෙස බැලීමට දිරි වඩාගත් පසු දැන් එයින් අහක බැලීමට ඔහුට නොහැකිවාක් මෙන් දිස්විය. "අලුතෙන්ම මැරුවොත්... දිගටම ලේ ගලනවා... ඊට පස්සෙ... ඊට පස්සෙ ලේ කැටි ගැහෙනවා... හරියට ජෙලි වගේ..." ඔහු අසනීප වීමට යන්නාක් මෙන් පෙනුනි. "මේ මිනිහා... බලන්ට එයාගෙ අත දිහා... ඒ ඔක්කොම... වියළියි. හරියට..."

සෑම් මේ කියන්නේ කුමක්දැයි ජොන් වහා වටහාගත්තේ ය. මළ මිනිසා ගේ මැණික්කටුව අසල සුදුමැලි මාංශයෙන් පිටතට ආ කළු පැහැ ගැන්වුනු ලේ නහර ඔහුට දැකිය හැකි විය. ඒ රුධිරය සම්පූර්ණයෙන්ම වියළී ගොස් කළු පැහැ වී තිබුනි. එනමුදු ජැරමි රයිකර් සෑහීමකට පත් වූ බවක් නොපෙනුනි. "උන් මැරිලා දවසකට වඩා වැඩියි නම් දැන් උන් ඉදිමිලා තියෙන්ට ඕන කොල්ලො. අනික මුන්ගෙන් කුණු ගඳක් එන්නෙත් නෑ."

තමාට හිම වැටෙන වැටෙන්නට යන සුවඳ පවා දැනේ යැයි පාරම්බාන මහලු මුර සංචාරකයා ඩිවන් මළකඳන්වලට කිට්ටු වී ළය පුරා හුස්මක් ගත්තේය. "ඔවු, ඒක මල් සුවඳ නෙවෙයි තමා. ඒත්... මයෙ උතුමානන් කිවුවෙ ඇත්ත. කුණුගඳක් දැනෙන්නෙ නෑ තමා."

"උන්... උන් කුණුවෙන්නෙ නෑ." සෑම් පෙන්වා දුන්නේය. ඔහුගේ මහත අතැඟිලි වෙවුලමින් තිබින. "බලන්ට, එතැන... එතැන ඉහඳ පනුවො නෑ... වෙන පනුවොත් නෑ... උන් මෙතැන මේ කැලේ මැද්දෙ වැටිලා ඉන්නවා. ඒ වුනත් උන්... උන්ව කිසිම සතෙක් කාලා නෑ... ගෝස්ට් විතරයි... එහෙම නැත්තං උන්... උන්..."

"උන්ට මොකෙක්වත් අත තියන්නෙ නෑ." ජොන් කීවේය. "ගෝස්ට් කියන්නෙ වෙනස් විදියෙ සතෙක්. ඒ වුනත් සාමාන්‍ය බල්ලොයි අශ්වයොයි එතැනට කිට්ටු වෙන්නෙවත් නෑ."

මුර සංචාරකයෝ එකිනෙකා දෙස බැලුම් හෙලන්නට ගත්හ. එය සත්‍යයක් බැව් ඒ සෑම කෙනෙකුටම පෙනී ගියේය. මෝර්මන්ට් බැම ඇකිළුවේ ය. ඔහු මළකඳන් දෙස ද බල්ලන් දෙස ද බැල්මක් හෙලුවේය. "චෙට්, ඔය බල්ලො ළඟට අරන් වරෙන්."

චෙට් උත්සාහ කලේය. අවලාද නගමින් බල්ලන් බැඳ සිටි පටිවලින් ඇද්දේය. අන්තිමේදී එකෙකුට පා පහරක් පවා දුන්නේය. එනමුදු සෑම බල්ලෙක්ම කෙඳිරිගාමින් සිටිපිය නොසෙල් වී සිටියහ. ඔහු එයින් එකෙකු ඇද ගැනීමට තැත්කලේය. බැල්ල ගොරවමින් ඇඹරෙන්නට වූයේ කර බැඳි පටිය කඩාගන්නට තැත්කලාය. අන්තිමේදී බැල්ල ගොරවමින් චෙට් වෙත කඩාපැන්නා ය. වහා පටිය බිම දැමූ චෙට් ඇකිළෙමින් පසුපසට වූ අතර පා පැකිලී බිම ඇද වැටුනේය. ඔහුට ඉහළින් පිනූ බැල්ල ගස් අතර නොපෙනී ගියාය.

"මේක... මේ හැම දෙයක්ම වැරැදියි." සෑම් දිගටම කියවාගෙන ගියේය. "ලේ... උන්ගෙ ඇඳුම්වල ලේ පැල්ලම් පිරිලා... උන්ගෙ මස් වේලිලා, තදයි... ඒ වුනත් බිම කොහෙවත් ලේ පැල්ලම් නෑ... කොතැනවත් නෑ. අර වගේ... අර වගේ..." අමාරුවෙන් කෙල ගිල්ල සෑම් ගැඹුරු හුස්මක් ඇදගත්තේ ය. "අර වගේ තුවාල... භයානක තුවාල... මේ හැමතැනම ලේ විසිරිලා තියෙන්ට ඕන. එහෙම නේද?"

ඩිවන් දත් අතරින් හුස්මක් ඇද්දේය. "සමහරවිට උං මැරුනෙ මෙතන නෙවෙයි වෙන්ට ඇති. සමහරවිට කවුරුහරි උංව මෙතැනට ගෙනල්ලා දාන්ට ඇති අපට හොයාගන්ට පුළුවන් වෙන්ට. අනතුරු ඇඟවීමක්. හරි ඒ වගේ මොකක් හරි." මහලු මුර සංචාරකයා අවිශ්වාස සහගත අයුරින් මළකඳන් දෙස එබී බැලුවේය. "මම මහ මෝඩයෙක් වගේ

ජේන්ට පුළුවන්. ඒ වුනත් මම දැනගෙන හිටියෙ නෑ ඔතෝර්ට කවදාවත් නිල් පාට ඇස් දෙකක් තිබ්බා කියලා."

සෙර් ජැරමි තිගැස්සුනු බැල්මක් හෙලුවේය. "ෆ්ලවර්ස්ටත් නිල් ඇස් තිබුනෙ නෑ." ඔහු මළකඳන් දෙසට හැරෙමින් කීවේය. වනාන්තරය පුරා නිහඬතාවක් පැතිරුනි. එක් මොහොතකට ඔවුන්ට ඇසුනු එකම හඬ වූයේ සෑම් ගැඹුරු ලෙස හුස්ම ගන්නා හඬ හා ඩිවන් තම දත් අතරින් හුස්ම අදින හඬ පමණි. ජොන් ගෝස්ට් පසෙකින් ඇන බාගත්තේය.

"උංව පුච්චන්ට ඕන." කිසිවෙක් කෙඳිරුවේය. ඒ මුර සංචාරකයෙක් වූ නමුදු හරියටම කවුරුදැයි ජොන්ට සිතා ගත නොහැකි විය. "ඔවු. උංව පුච්චමු." තවත් කටහඬක් ඊට එක්විය.

නාකි වලහා මුරණ්ඩු අයුරින් හිස වැනීය. "දැන්ම නෙවෙයි. මට ඕන මේස්ටර් ඒමන් මේවා පරීක්ෂා කරලා බලන්ට. අපි ඒවා ආපහු ප්‍රාකාරෙට අරන් යන්ට ඕන."

සමහර නියෝග දීම පහසු වුවද ක්‍රියාත්මක කිරීම අසීරුය. ඔවුහු මළකඳන් සළුවලින් එතූහ. එනමුදු හේක් හා ඩිවන් විසින් එක් මළකඳක් අසෙකු පිට තබා ගැට ගැසීමට තැත් කල විට සතා වියරු වැටුනි. ඌ මහ හඬින් හේෂාරවය කරමින්, වියරුවෙන් මෙන් උඩ පනිමින් මළ සිරුරෙන් ඈත් වන්නට තැත් කල අතර උදවුවට දිව ගිය කෙටර්ව සපන්නට පවා පෙළඹුනේය. අනික් අසුන්ගෙන් ද ලැබුනේ සමාන ප්‍රතිචාරයකි. ඉතාම කීකරු, ශාන්තම අශ්වයා පවා මේ නපුරු බඩු පොදිය කර ගැසීමට කැමැති වූයේ නැත. අන්තිමේදී ගස්වල අතු කපා සාදාගත් මැසි මත මළකඳන් හොවා පා ගමනින් ඒවා ඔසවාගෙන යන්නට ඔවුන්ට සිදුවිය. ඔවුන් ආපසු ගමන අරඹද්දී මධ්‍යාහ්නය පසු වී බොහෝ වේලාවක් ගතව තිබුනි.

"මට ඕන මේ අවට කැලේ සෝදිසි කරන්ට." ගමන පිටත්වද්දී මෝර්මන්ට් සෙර් ජැරමිට නියෝග කලේය. "හැම ගහක්ම, හැම ගලක්ම, හැම පඳුරක්ම. මෙතැන ඉඳන් ලීග දහයක් ඇතුළත හැම බිම් අඟලක් ගානෙ සෝදිසි කරන්ට. උඹට ඉන්න ඔක්කොම මිනිස්සු පාවිච්චි කරපන්. උඹට මිනිස්සු මදි නම් දඩයක්කාරයොයි ගස් කපන එවුනුයි ඉල්ලගනින් නිවාස බාරකාරයින්ගෙන්. බෙනුයි, අනිත් එවුනුයි මැරිලා හරි පණපිටින් හරි මේ කොහේ

හරි ඉන්නවානම් මට ඕන උන්ව හොයාගන්ට. ඒ වගේම මේ කැලේ තව මොකෙක් හරි හැංගිලා ඉන්නවා නම් මට ඒකත් දැනගන්ට ඕන. උඹ උන් පස්සෙ ලුහුබැඳගෙන ගිහිල්ලා උන්ව අල්ලගන්ට ඕන. පණපිටින් පුළුවන් නම් වඩා හොඳයි.තේරුනා ද?"

"එහෙමයි මගේ උතුමානනි. ඒක ඒ විදියටම වෙයි."

එයින් පසු මෝර්මන්ට් සිතුවිල්ලේ ගැලෙමින් නිහඬවම ගමන් කලේය. අණදෙන නිළධාරියා ගේ සේවකයා වශයෙන් ජොන් ඔහු පසුපසින්ම වාගේ සිය අසු මෙහෙයවීය. ඒ ඔහුට නියමිත ස්ථානය විය.

* * *

දවස අඳුරු, තෙත්බරිත, වැහි කළුවෙන් අහස වැසී ගිය එකක් විය. එය කෙනෙකු ආසාවෙන් වැස්සක් බලාපොරොත්තු වන අන්දමේ දවසක් විය. වනය තුළ සුළං පොදකුදු නොහැමීය. අවට වාතය උණුසුම් තෙත්බරිත එකක් විය. දහදිය නිසා ජොන්ගේ ඇඳුම් ඇඟටම ඇලී තිබුනි. එය උණුසුම් දවසක් විය. උවමනාවටත් වඩා උණුසුම් දවසක් විය. ප්‍රාකාරය දැඩි ලෙස හඬමින් තිබුනි. එය දැන් දවස් ගනනාවක් තිස්සේම හඬමින් තිබුනි. සමහර අවස්ථාවලදී ජොන්ට පෙනී ගියේ ප්‍රාකාරය ඇකිළී ඇතිවාක් මෙනි.

නාකි මිනිසුන් මෙය හැඳින්වූයේ 'භූත ගිම්හානය' යනුවෙනි. ඔවුන්ට අනුව සෘතුව එය සතු අවසාන ආත්මයන් දියකර හරිමින් පැවතුනි. මෙයින් පසුව ශීතය පැමිණෙන බැව් ඔවුන් අනතුරු අඟවා තිබුනි. එමෙන්ම දිගු ගිම්හානයක් යනු හැමවිටම දිගු ශීත කාලයක් වනවා ඇත. මේ ගිම්හානය වසර දහයක් පුරාවට පැවැතියේ ය. එය ඇරඹෙද්දී ජොන් අත දරුවෙකු විය.

මඳක් තැන් යනතෙක් ඔවුන් සමග දිවගිය ගෝස්ට් ගස් අතරට වැදී අතුරුදන් විය. මේ සෝරවාකයා තමා අසල නැති වූ විට ජොන්ට නග්නව ඉන්නාක් වැනි හැඟීමක් දැනෙන්නට විය. පසුකරන සෑම සෙවනැල්ලක් දෙසම නොසන්සුන් අයුරින් බලන්නට තමා පටන්ගෙන ඇති බැව් ඔහුට තේරුම් ගියේය. කුඩා කොලුවෙකුව වින්ටර්ෆෙල්හි සිටි සමයේ නාකි ආයම්මාගෙන් අසා දැනගත් කතන්දර නිරායාසයෙන්ම ඔහුගේ සිතට ගලා

එන්නට විය. ඇගේ කටහඬත්, කතා කියන අතර ඇය ගොතන ඉදිකටු නොනැවතී එකිනෙක ගැටෙන ක්ලික් ක්ලික් ක්ලික් නාදයත් මේ දැන් ඇසෙන්නාක් මෙන් දැනෙන්නට විය. 'මේ අන්ධකාරෙ තමා අනික් එවුන් ඉස් ඉස්සෙල්ලාම ආවෙ,' ඇය කටහඬ පහත් කර රහස් ස්වරයෙන් කියුවාය. 'උං හරිම සීතල එවුන්. මැරිච්ච එවුන්. උං යකඩවලටයි, ගින්දරටයි, ඉර එළියටයි, උණුසුම් ලේ නහර අස්සෙ දුවන හැම සතෙකුටමයි වෛර කලා. උං බලකොටු, නගර, රාජධානි එකින් එක යටත් කලා. වීරයොයි හමුදායි බුරුතු පිටින් උං අතින් මැරුම් කෑවා. උං ආවෙ තමන්ගෙ මැරිච්ච සුදුමැලි අස්සයො පිටේ නැගලා තමන් අතින් මැරුම් කාපු එවුන්ගෙන් හැදිච්ච හමුදාවකුත් එක්කයි. උං උංගෙ මේ මැරිච්ච සේවකයින්ට මිනිස් දරුවො කන්ට දුන්නා...'

පෞරාණික ඕක් වෘක්ෂයකට ඉහළින් මුලින්ම ප්‍රාකාරයේ මුදුන පෙනෙන්නට පටන්ගත් විට ජොන්ගේ සිතට මහත් සහනයක් දැනෙන්නට වීය. හදිසියේම තෝන්ලණුව ඇද අසු නැවතූ මෝර්මන්ට් සෑදලය මත ආපසු හැරුනේය. "ටාර්ලි." ඔහු කෑගැසුවේය. "මෙහාට වරෙන්."

සිය වෙළඹ පිට නැගී ගාටමින් ඉදිරියට එන අතරේ සෑම්ගේ මුහුණේ ඇඳී තිබුනු භීතිය ජොන් පැහැදිලිවම දුටුයේය. තමා කුමක් හෝ වැරැද්දක් සිදුකර ඇතැයි ඔහු සිතන බැව් නිසැක විය. "උඹ මහතයි තමා, ඒ වුනත් උඹ මෝඩයෙක් නෙවෙයි කොල්ලො." නාකි වලහා කර්කශ ස්වරයෙන් කීය. "උඹ අතනදි බොහොම හොඳට කටයුතු කලා. උඹත් එහෙමයි ස්නොව්."

සෑම්ගේ මුහුණට ලේ පුරා ආ අතර ආචාරශීලී අයුරින් ප්‍රතිඋත්තරයක් දෙන්නට තතනද්දී ඔහුගේ දිව පැටලුනි. ජොන්ට සිය සිනාව සඟවාගන්නට බැරි විය.

තුරු වියනෙන් පිටතට පැමිණි විට හැල්මේ ඉදිරියට යන්නැයි මෝර්මන්ට් සිය අසුට සන් කලේය. දඩයමක් නිසා රත් පැහැ ගත් හොම්බ ලෙවකමින් ගෝස්ට් ගස් අතරේ හිඳ ඔවුන් මුන ගැසෙන්නට පෙරමගට දිව ආවේය. ඉතා ඉහළ ප්‍රාකාරය මුදුනේ සිටි මුර සෙබළු ඔවුන් එන බව දුටුවෝය. සැතැපුම් ගනනාවක් ඈතට විහිද යන, මුරකරුවන් ගේ ගැඹුරු, ඒකතානමය හොරණෑ හඬ ජොන්ට ඇසෙන්නට විය. එක් දිගු, තනි හොරණෑ හඬක් ගස් අතරින් රිංගා ගොස් අයිස් මතින් නින්නාද වී විසිර ගියේය.

ආවූඌඌඌඌඌඌඌඌඌඌඌඌඌඌඌඌඕඕඕඕඕඕඕඕඕඕඕඕඕඕඕඕ

හොරණෑ හඬ කෙමෙන් මැකී ගොස් නිහඬතාව රජයන්නට විය. එක් හොරණෑ නාදයක් යනු මුර සංචාරකයින් ගේ නැවත පැමිණීම දන්වන සලකුණයි. 'මමත් අඩුම ගානෙ එක දවසකට හරි මුර සංචාරකයෙක් වුනා.' ජොන් කල්පනා කලේය. කුමක් කෙසේ සිදුවුවද කිසිවෙකුටත් එය ඔහුගෙන් ඉවත් කල නොහැකි වනු ඇත.

ඔවුන් සිය කුඩා කඳුකර අශ්වයින් සීතල අයිස් උමග දිගේ දක්කාගෙන යද්දී බොවෙන් මාර්ෂ් පළමු ගේට්ටුව අසල පොරොත්තුවෙන් බලා සිටියේය. ප්‍රධාන නිවාස බාරකරුවා ගේ මුහුණ රතු වී කැළැඹිලි ස්වභාවයක් පෙනෙන්නට තිබුනි. "මගේ උතුමානනි." යකඩ දොර අරින අතරේ ඔහු මෝර්මන්ට් ඇමතීය. "කපුටෙක් ආවා. ඔබතුමා ඉක්මනින්ම ආවොත් හොඳයි."

"මොකක්ද මිනිහෝ?" මෝර්මන්ට් කර්කෂ ස්වරයෙන් ඇසීය.

මහත් කුතුහලයට හේතුවන පරිද්දෙන් පිළිතුරක් දීමට පෙර මාර්ෂ් ජොන් දෙස බැල්මක් හෙළීය. "මේස්ටර් ඒමන් ගාවයි ලියුම තියෙන්නෙ. එයා ඔබතුමා එනකම් බලන් ඉන්නවා."

"බොහොම හොඳයි. ජොන් මගේ අශ්වයාව ගනින්. සෙර් ජැරමිට කියාපන් අර මළකඳන් දෙක ගබඩා කාමරේකට දාන්ටයි කියලා මේස්ටර් ඒමන් ඒ දෙක පරීක්ෂා කරලා බලන්ට එනකම්." මෝර්මන්ට් කණ්කෙඳිරි ගාමින් දිගු පියවර තබා ඉවත ගියේය.

* * *

අසුන් දක්කාගෙන ඉස්තාල වෙන අතරතුරේදී ජොන්ගේ ඉමහත් අසන්තෝෂයට හේතුවන පරිද්දෙන් සැමදෙනාම තමා දෙස බලාසිටින බැව් ඔහුට වැටහුනි. සෙර් ඇලිසර් තෝර්න් අංගනයේ සිය කොලු රැණ පුහුණු කරවමින් සිටියේය. එනමුදු එය නවතා දැමූ ඔහු මඳ සිනාවක් දෙතොලේ ඇතිව ජොන් දෙස බලා සිටින්නට විය. එක'තක් ඇති ඩොනල්

නොයේ යුද්ධායුද ගබඩාවේ දොරට පිටතින් බලා සිටියේය. "දෙයියො උඹට පිහිට වෙයි ස්නොව්!" ඔහු හඬගෑවේය.

'මොකක් හරි වැරදිලා.' ජොන් කල්පනා කලේය. 'මොකක් හරි හොඳටෝම වැරදිලා.'

මළකඳන් දෙක ප්‍රාකාරය පාමුල වූ ගබඩා කාමරයකට ගෙන යන ලදී. අයිස් කුට්ටිය තුළට කැපූ අඳුරු සීතල බිංගෙයක් වැනි වූ එය මස්, ධාන්‍ය හා බීර ගබඩා කිරීමට භාවිත කෙරුනු එකක් විය. මෝර්මන්ට් ගේ අසුට කවා පොවා සාත්තු කර නිමාවූ පසු ඔහු සිය අසු ගැන අවධානය යෙදවීය. මේ සැමෙකකින්ම පසු ඔහු සිය මිතුරන් සොයා යන්නට විය. ග්‍රෙන් හා ටොඩ් මුරකාවල පිණිස පිටව ගොස් තිබුනු නමුදු ප්‍රධාන ශාලාව තුළ ඉන්නා පිප් සොයාගැනීම අසීරු නොවීය.

"මොකක්ද වෙලා තියෙන්නෙ?" ඔහු ඇසුවේය.

පිප් සිය කටහඬ පහත්කලේය. "රජ්ජුරුවො මැරිලා."

ජොන් ගල්ගැසී ගියේය. රොබර්ට් බරතියන් වින්ටර්ෆෙල්වලට පැමිණි කාලයේ තරබාරු වයස්ගත මිනිසෙකු මෙන් දිස්වුවද ඔහු හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුතුව සිටියේය. ඔහු අසනීපයෙන් පසු වූ බවට ද කිසිම ආරංචියක් නොවීය. "උඹ කොහොමද දැනගත්තෙ?"

"ක්ලයිඩස් ඒ ලියුම මේස්ටර් ඒමන්ට කියවනවා මුරකාරයෙක් අහන් ඉඳලා තියෙනවා." පිප් ඔහුට ලං විය. "ජොන් මට හරි කණගාටුයි. එයා උඹේ තාත්තාගෙ යාළුවෙක්. එහෙම නේද?"

"එක කාලෙක නම් එයාලා සහෝදරයෝ තරමටම ලංවෙලයි හිටියෙ." ජොෆ්රි සිය පියාව දිගටම හස්තය තනතුරේ තබාගනීවිදැයි ඔහු විමතියෙන් කල්පනා කලේය. එය එතරම්ම විය හැක්කක් නොවේ. එයින් කියැවෙන්නේ එඩාර්ඩ් උතුමානනුත් සිය සොහොයුරියනුත් නැවත වින්ටර්ෆෙල් බලා එන බවයි. මෝර්මන්ට් උතුමානන් ගේ අවසරය ඇතුව ඔහුට එහි ගොස් ඔවුන් දැකබලාගෙන එන්නට හැකි වනු ඇත. ආර්යා ගේ විරිත්තීම නැවත දකින්නට

ලැබීමත් සිය පියා හා කතා කරන්නට ලැබීමත් සිතට සැනසීමක් ගෙන එනු ඇත. 'මම එයාගෙන් මගේ අම්මා ගැන අහනවා.' ඔහු තීරණයකට එළඹියේ ය. 'මම දැන් මිනිහෙක්. එයා මට ඒක කියන්ට ඕන කාලෙ දැන් හොඳටම පහුවෙලා. එයා ගණිකාවක් වුනත් මට කමක් නෑ. මට දැනගන්ට ඕන.'

'මට අහන්ට ලැබුනා හේක් කියනවා අර මැරිච්ච එවුන් දෙන්නා උඹේ බාප්පාගෙ මිනිස්සු කියලා." පිප් ඇසීය.

"ඔවු. එයාත් එක්ක ගිය හයදෙනාගෙන් දෙන්නෙක්. උන් මැරිලා ගොඩාක් කල් වෙනවා. එකම දේ... ඒ මළකඳන් දෙක අසාමාන්‍යයි."

"අසාමාන්‍යයි?" පිප් කුතුහලයෙන් ඇලලී ගියේය. "කොහොමද අසාමාන්‍ය වෙන්නෙ?"

"සැම් උඹට ඒ ගැන කියයි." ජොන්ට ඒ පිළිබඳ කතා කරන්නට උවමනා නොවීය. "මම දැන් ගිහින් බලන්ට ඕන නාකි වලහාට මගෙන් මොකුත් කෙරෙන්ට තියෙනවද කියලා."

**Jeor Mormont: “The things we love destroy us every time.”**

ජොන් තනිවම අණදෙන නිළධාරියා ගේ කුළුණ වෙත පිය මැන්නේය. ඔහුගේ සිත අමුතුම කුතුහලාත්මක සැකයකින් පිරී පැවතින. මුරට සිටි කළු සොයුරන් දෙදෙනා ඔහුගේ පැමිණීම ගරු ගාම්භීර අයුරින් නිරීක්ෂණය කලෝය. "නාකි වලහා එයාගෙ කාමරේ." එයින් එකෙක් නිවේදනය කලේය. "එයා උඹව හෙවුවා."

ජොන් හිස සැලුවේය. ඔහු ඉස්තාලයේ සිට කෙලින්ම මෙහි පැමිණිය යුතුව තිබුනි. ඔහු ඉක්මන් පියවර තබමින් කුළුණේ පියගැට පෙළ නැංගේය. 'එයාට වයින් ටිකක් හරි ගිනි දල්වගන්ට හරි ඕන වෙලා ඇති. එච්චරයි.' ජොන් තමාටම කියාගත්තේ ය.

ඔහු කාමරයට ඇතුළු වූ විට මෝර්මන්ට් ගේ කපුටා ඔහු දෙස බලා කෑගැසුවේ ය. "ඉරිඟු!" ඌ යටි ගිරියෙන් මොර දුන්නේය. "ඉරිඟු! ඉරිඟු! ඉරිඟු!"

"ඔය හොර මගෝඩියා කියන ඒවා විශ්වාස කරන්ට එපා. මම මේ දැන් ඌට කෑම දුන්නා විතරයි." නාකි වලහා ගෙරෙවුවේ ය. ඔහු කවුළුව අසල වාඩි වී ලිපියක් කියවමින් සිටියේය. "මට වයින් කෝප්පයක් ගෙනෙන්. උඹටත් එකක් වක්කරගනින්."

"මටත් එකක් මගේ උතුමානනි?"

ලිපියෙන් හිස එසවූ මෝර්මන්ට් ජොන් දෙස බැලීය. ඒ දෑසේ තැවරී තිබුනු අනුකම්පාව ඔහුට හොඳින්ම වැටහුනි. "උඹට මාව ඇහුනනෙ."

ජොන් කාලය ගනිමින්, සෙමින් වයින් බඳුන් පිරෙවුවේ ය. අර ලිපියේ ඇත්තේ කුමක් වුවත් මේ කුසලාණ පුරවා හමාර වූ විට ඔහු එයට මුහුණ දිය යුතුය. එනමුදු වැඩි වේලාවක් යන්නට පෙර කුසලාණ පිරී හමාර විය. "වාඩිවෙයන් කොල්ලො." මෝර්මන්ට් අණකලේය. "ඕක බීපන්."

ජොන් දිගටම නැගිට සිටියේය. "ඒ මගේ තාත්තා ගැන. එහෙම නේද?"

නාකි වලහා ඇඟිල්ලකින් ලිපියට තට්ටු කලේය. "උඹේ තාත්තායි රජතුමායි දෙන්නාම ගැන. මම උඹට බොරුවක් කියන්නෙ නෑ. ඒක බොහොම කණගාටුදායක ආරංචියක්. මම හිතුවෙ නෑ මගේ මේ නාකි වයසෙදි මට තව අලුත් රජ කෙනෙක් දකින්ට ලැබෙයි කියලා. රොබර්ට් මගෙ වයසෙන් බාගයයි, ගොනෙක් වගේ ශක්තිමත්." ඔහු වයින් උගුරක් බීවේය. "උන් කියනවා රජතුමා දඩයමට ගොඩාක් ආදරේ කලා කියලා. අපි ආදරේ කරන දේවල්ම තමා හැම වෙලාවෙම අපට විනාශය ගේන්නෙත්, කොල්ලො. අන්න ඒක හොඳට මතක තියාගනින්. මගේ පුතා එයාගෙ අර තරුණ බිරිඳට, අර තුච්ඡ ගෑනිට ආදරේ කලා. ඒකි නෙවෙයිනම් එයා කවදාවත් හිතන්නෙ නෑ අර හොර දඩයක්කාරයො ටික වහල් වෙළෙන්දන්ට විකුණන්ට."

ඔහු මේ කියන්නේ කුමක් ගැනදැයි ජොන්ට කිසිසේත් වටහාගැනීමට නොහැකි විය. "මගේ උතුමානනි. මට තේරෙන්නෙ නෑ. මගේ තාත්තාට මොකක්ද වෙලා තියෙන්නෙ?"

"මම උඹට කිවුවෙ වාඩිවෙයන් කියලා." මෝර්මන්ට් ගෙරෙවුවේ ය. "වාඩිවෙයන්!" කපුටා කෑගැසුවේ ය. "වාඩිවෙලා වයින් උගුරක් බීපන්. යකාටම පලයන්. ඒක අණක් ස්නොව්."

අසුනේ වාඩිගත් ජොන් වයින් බිඳක් තොලගෑවේය.

"එඩාර්ඩ් උතුමානන්ව භිරබාරයට අරන්. එයාට රාජද්‍රෝහී චෝදනා එල්ලකරලා. කියන විදියට එයා ජොෆ්රිගෙ රාජ උරුමය අහිමි කරන්ට රොබර්ට්ගෙ සහෝදරයොත් එක්ක කුමන්ත්‍රණය කරලා."

"නෑ." ජොන් සැනෙන් කීවේය. "ඒක වෙන්ට බෑ. මගේ තාත්තා කවමදාවත් රජතුමාව පාවලා දෙන්නෙ නෑ."

"ඒක වෙන්ට පුළුවන්." මෝර්මන්ට් කීය. "ඒ වුනත් ඒක මට කියන්ට අයිතියක් ඇති දෙයත් නෙවෙයි. උඹටත් එහෙමයි..."

"ඒ වුනත් ඒක බොරුවක්." ජොන් තිර හඬින් කීවේය. සිය පියා රාජද්‍රෝහියෙකැයි ඔවුන් පවසන්නේ කෙසේද? ඔවුන් සියල්ලන්ටම පිස්සු හැදිලාද? එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් කෙදිනකවත් සිය ගෞරවයට හානි වන දෙයක් නොකරනු ඇත... එහෙම නේද?

'එයා අවජාතකයෙකුට තාත්තා වුනා.' සිහින් හඬක් ඔහුගේ හිස තුළ සිට කෙඳිරීය. 'ඒකෙ තියෙන ගෞරවනීය බව මොකක්ද? එතකොට උඹේ අම්මා. එයා ගැන කොහොමද? එයා අඩුම ගානෙ අම්මාගෙ නමවත් උඹට කිවුවෙ නෑ.'

"මගේ උතුමානනි. එයාට මොකක් සිද්ද වෙයිද? උන් එයාව මරලා දායිද?"

"ඒ ගැන නම් මට මොකුත් කියන්ට බෑ කොලුවො. මම හිතන් ඉන්නෙ ලියුමක් යවන්ට. රජතුමාගෙ උපදේශක සභාවෙ ඉන්න සමහර උදවිය මම මගේ තරුණ කාලෙ දැනගෙන හිටියා. නාකි පයිසෙල්, ස්ටැනිස් උතුමානන්, සෙර් බැරිස්ටාන්... උඹේ තාත්තා මොකක් කලත්, මොකක් නොකලත් එයා බොහොම උසස් වංශාධිපතියෙක්. එයාට කළු ඇඳලා අපිත් එක්ක එකතු වෙන්ට දෙන්ට ඕන. දෙයියොම දන්නවා එඩාර්ඩ් උතුමානන් වගේ හැකියාවන් තියෙන මිනිස්සු අපට කොච්චර වටිනවද කියලා."

මීට පෙරද මෙවැනි රාජද්‍රෝහී චෝදනාවලට ලක්වූ මිනිසුන්ට නිශා රැකුම් බලකායට බැඳී සිය ඉතුරු ජීවිත කාලය ගෙවිය හැකි අන්දමේ සමාවන් ලැබී ඇති බව ජොන් දැන සිටියේය. එඩාර්ඩ් උතුමානන්ටත් එවැනි සමාවක් ලැබෙනු ඇත්ද? ඔහුගේ පියා සමගින් මෙහි වසන්නට ලැබීම. එය අසාමාන්‍ය සිතුවිල්ලක් මෙන්ම අසාමාන්‍ය අයුරින් අසීරුදායක දෙයක් විය. වින්ටර්ෆෙල්වලට ඔහුගේ ඇති උරුමයන් අහිමි කර නිශා රැකුමට බැඳෙන්නට බල කරනු ලැබීම අතිශයින්ම අසාධාරණ ක්‍රියාවක් වනු ඇත. එනමුදු එයින් ඔහුගේ ජීවිතය බේරේ නම්...

ජොෆ්රි එවැනි දෙයකට ඉඩ දෙනු ඇත්ද? වින්ටර්ෆෙල්වලට පැමිණි ඔහු ගතකල ආකාරය, අංගනයේදී රොබ්ව හා සෙර් රඩ්‍රික්ව අවඥාවට ලක් කල ආකාරය ජොන්ට සිහිපත් විය. ජොන් එහි සිටි බවක්වත් ඔහු නොදත්තේ ය. අවජාතකයින් යනු ඔහුගේ මට්ටමට බොහෝ පහතින් වූ දෙයක් විය. "මගේ උතුමානනි. රජතුමා ඔබට ඇහුම්කන් දෙයිද?"

නාකි වලහා දෙවුර ඇකිළුවේය. "එයා තාම පුංචි කොල්ලෙක්... මම හිතන්නෙ එයා එයාගෙ අම්මට ඇහුම්කන් දෙයි. කුරුමිට්ටා මේ වෙලාවෙ එහෙ නැති එක හරිම කණගාටුවට කාරණයක්. එයා මේ කොල්ලාගෙ මාමා. එයා මෙහෙ ආපු වෙලාවෙ දැක්කා අපේ උවමනාකම් කොච්චරද කියලා. ඒක බොහොම නරක දෙයක් උඹේ අම්මා එයාව අත්අඩංගුවට ගත්තු එක-"

"ස්ටාර්ක් ආර්යාව කියන්නෙ මගේ අම්මා නෙවෙයි." ජොන් තියුණු ස්වරයෙන් ඔහුට සිහිපත් කර දුන්නේය. ටිරියන් ලැනිස්ටර් ඔහුගේ මිතුරෙකු මෙන් ලංව සිටියේය. එඩාර්ඩ් උතුමානන්ව මරාදැමුවහොත් ඊට රැජිණ තරමටම ස්ටාර්ක් ආර්යාව ද වගකිවයුතු වනු ඇත.

"මගේ උතුමානනි. මගේ නංගිලා ගැන මොකද? ආර්යායි සන්සායි. එයාලා මගේ තාත්තාත් එක්කයි හිටියෙ. ඔබ දන්නවාද-"

"පයිසෙල් එයාලා ගැන කිසිම සඳහනක් කරන්නෙ නෑ. ඒ වුනත් කිසිම සැකයක් නෑ එයාලට හොඳින් සලකනවා ඇති. මම එයාලට ලියද්දි උඹේ නංගිලා දෙන්නා ගැනත් අහන්නම්." මෝර්මන්ට් හිස වැනුවේය. "මීටත් වඩා නරක කාලයක් නෑ මෙහෙම දෙයක් සිද්දවෙන්ට. දැන් තමා රාජධානියට ශක්තිමත් රජෙක් උවමනාම කාලෙ... ඉස්සරහට එන්නෙ අන්ධකාර දවස්, සීතල රෑ කාල. මට ඒක දැනෙනවා. මගේ ඇටකටුවලට ඒක දැනෙනවා." ඔහු ජොන් දෙස දිගු විචක්ෂණ බැල්මක් හෙලුවේය. "උඹ මොකුත් මෝඩ වැඩක් කරන්ට කල්පනා කරන්නෙ නැහැයි කියලා මම හිතනවා කොල්ලො."

'එයා මගේ තාත්තා.' ජොන්ට කියන්නට උවමනා විය. එනමුදු මෝර්මන්ට්ට එවැන්නක් අසන්නට උවමනා නැතැයි ඔහු දැන සිටියේය. ඔහුගේ උගුර වියළී ගොස් තිබුනි. ඔහු තවත් වයින් උගුරක් පානය කලේය.

"දැන් උඹේ රාජකාරිය තියෙන්නෙ මෙතැන." මෝර්මන්ට් ඔහුට සිහිපත් කරදුන්නේ ය. "උඹ කළු ඇන්ද දා ඉඳන් උඹේ පරණ ජීවිතේ අහවර වෙනවා." ඔහුගේ කපුටා කර්කශ හඬක් නැංවීය. "කළු!" මෝර්මන්ට් එය නොතකා හැරියේය. "උන් කින්ග්ස් ලැන්ඩින්ග්වල මොනවා කලත් ඒක උඹට අයිති වැඩක් නෙවෙයි." ජොන්ගෙන් කිසිදු පිළිතුරක් නොලද තැන සිය වයින් කුසලාණ බී හමාර කල මහල්ලා ඔහු දෙසට හැරුනේය. "උඹට දැන් යන්ට පුළුවන්. අද දවසේ මට උඹෙන් තවත් මොකුත් වැඩක් ඕන වෙන එකක් නෑ. හෙට උදේ උඹ මට උදවු කරපන් අර ලියුම ලියන්ට."

තමා නැගිට සිටිනු හෝ කාමරයෙන් පිටවෙනු හෝ ජොන් නොදත්තේ ය. ඔහු දත් එකම දෙය වූයේ ඊළඟ මොහොතේ තමා කල්පනාවේ ගැලී පඩිපෙළ පහළට බසිනු පමණි. 'මේ මගේ තාත්තා. මගේ නංගිලා. කොහොමද ඒක මට අයිති නැති වැඩක් වෙන්නෙ?'

පිටතට පැමිණි විට එක් මුර සෙබළෙක් ඔහු දෙසට හැරුනේය. "ශක්තිමත් වෙයන් කොල්ලො. දෙවියො හරිම නපුරුයි."

'උනුත් මේක දන්නවා.' ජොන්ට තේරුම් ගියේය. "මගේ තාත්තා ද්‍රෝහියෙක් නෙවෙයි." ඔහු ගොරෝසු හඬින් තෙපලේය. එනමුදු ඒ වදන් පවා ඔහුගේ උගුරේ හිරවුනු සෙයක් දැනෙන්නට විය. සුළඟ නැගඑමින් තිබුනු අතර ඔහු කාමරය තුලට යන්නට පෙර දැනුනාට වඩා අංගනය තුළ සීතල අධික විය. භූත ගිම්හානය එහි අවසානය වෙත ළඟාවෙමින් තිබුනි.

* * *

දවසේ ඉතුරු කාලය සිහිනයක් මෙන් ගෙවී ගියේය. තමා කොහේ කොහේ ඇවිද්දා ද, කුමක් කලා ද, කාත් සමග කතා කලා ද යන්න ජොන්ට නිනවු නොවීය. ගෝස්ට් තමා අසලම ගැවසුනු බව පමණක් ඔහු දත්තේය. සෝරවෘකයා ගේ මේ නිහඬ සමාගමය ඔහුට මහත් අස්වැසිල්ලක් විය. සිය සොයුරියන්ට එපමණවත් සහනයක් නොමැති බැව් ඔහු කල්පනා කලේය. ඔවුන් ගේ වෘකයින් සිටියානම් ඔවුන්ව ආරක්ෂා කරනු ඇත. එනමුදු ලේඩි මියගොස් ඇති අතර නයිමේරියා අතුරුදන් වී ඇත. සොයුරියන් දෙදෙනා එහි තනි වී ඇත.

හිරු බැස යද්දී උතුරු දෙසින් සීත සුළං හමන්නට පටන්ගත්තේ ය. රාත්‍රි ආහාරය ගනු පිණිස ප්‍රධාන ශාලාව වෙත යද්දී ප්‍රාකාරයට හා හිමෙන් වැසුනු බැරැක්කවලට ඉහළින් හඬ නංවමින් සුළං හමනු ජොන්ට ඇසුනි. හොබ් බාර්ලි, ලූණු හා කැරට් පදමට යෙදූ කදිම මුව මස් ඉස්ටුවක් සාදා තිබුනි. කෝකියා සිය පිඟානට වැඩිපුර හොදි හැන්දක් බෙදූ විට හා තමාට හොඳින් කර වූ පාන් කැබැල්ලක් පිරිනැමූ විට එහි තේරුම කුමක්දැයි ජොන් වහා වටහාගත්තේ ය. 'ඔහුත් සිද්දිය දනී.' ඔහු වහා ශාලාව සිසාරා බැලුවේය. මෙතෙක් ඔහු දෙසට හැරවී තිබුනු මුහුණු වහා ඉවතට හැරෙනුත්, දෑස් ආචාරශීලී අයුරින් වෙනතක ඇදෙනුත් ඔහුට පෙනුනි. 'ඔවුන් සැවොම දනිති!'

ඔහුගේ මිතුරෝ ඔහුව වටකර ගත්හ. "අපි ඇහුවා පූජකයාගෙන් උඹේ තාත්තා වෙනුවෙන් අල්තාරෙ ඉටිපන්දමක් පත්තු කරන්ටයි කියලා." මැතර් කීවේය. "ඒක බොරු චෝදනාවක්. අපි හැමෝම දන්නවා ඒක බොරුවක්. ග්‍රෙන් වුනත් දන්නවා ඒක බොරුවක් කියලා." පිප් කතාවට එක්විය. ග්‍රෙන් හිස වැනීය. සෑම් ජොන්ගේ අතකින් අල්ලාගත්තේ ය. "උඹ දැන් මගේ සහෝදරයෙක්. ඒක නිසා එයා දැන් මගෙත් තාත්තා. උඹට ඕනනම් අර වයර්වුඩ් ගාලට ගිහිල්ලා උඹේ තාත්තා වෙනුවෙන් යාඥා කරන්ට, මමත් එන්නම් උඹත් එක්ක."

වයර්වුඩ් ගාල පිහිටියේ ප්‍රාකාරයට එහායිනි. එනමුදු සෑම් මේ කී දේ අවංකවම කීවක් බව ජොන් වටහාගත්තේ ය. 'එයාලා මගේ සහෝදරයො.' ඔහු ගල්පනා කලේය. 'රොබ්, බ්‍රැන්, රිකන් වගේම මගේ සහෝදරයො.'

ඊළඟ මොහොතේ ඔහුට සිනාහඬ ඇසුනි. කසපහරක් මෙන් දරුණු, සෙර් ඇලිසර් තෝර්න් ගේ කුරිරු සිනාහඬ ඇසුනි. "නිකංම නිකං අවජාතකයෙක් නෙවෙයි. ද්‍රෝහියෙකුගෙ අවජාතකයෙක්." ඔහු තමා වටා වූ මිනිසුන්ට කියමින් සිටියේය.

ඇසිපිය ගසන සැනෙන් සිය සිරිය ඇදගත් ජොන් මේසය මතට කඩා පිනුයේය. පිප් ඔහුව අල්ලාගැනීමට තැත් දැරූ මුත් ජොන් සිය පාදය ගස්සා ඔහුගෙන් මිදුනේය. ඊළඟ මොහොතේ ඔහු මේසය මතින් දිවගොස් සෙර් ඇලිසර් අතේ තිබුනු කෑම පිඟානට පයින් ගැසුවේය. අවට සිටි කළු සොයුරන් තෙමමින් ඉස්ටුව දසත විසර ගියේය. තෝර්න් ඇකිළෙමින් පස්සට විය. ඔහු සෙර් ඇලිසර් ගේ මුහුණ වෙත සිරිය උලුක්කරමින් ඉදිරියට පැන්නේය. එනමුදු ඒ මොහොතේ සෑම් ඔවුන් දෙදෙනා අතරට පිනීය. ජොන් ඔහු වටා යන්නට පෙර පිප් වඳුරකු මෙන් ඔහුගේ පිටේ එල්ලුනු අතර ග්‍රෙන් ඔහුගේ අත අල්ලාගෙන සිටියදී ටොඩ් අතැඟිලි අතරින් සිරිය මුදාගත්තේ ය.

පසුව, ඊට බොහෝ වේලාවකට පසුව, ඔවුන් ඔහුව සිය නිදන කාමරය වෙත ගෙනගොස් ඇරලූ පසුව මෝර්මන්ට් ඔහුව බැලීම පිණිස එහි පැමිණියේය. සුපුරුදු පරිදි ඔහුගේ උරයේ කපුටා වසා සිටියේය. "මම උඹට කිවුවා මොකුත් මෝඩ වැඩක් කරන්ට එපයි කියලා කොල්ලො." නාකි වලහා කීවේය. "කොල්ලො." කපුටා අත්වැල් ඇල්ලීය. මෝර්මන්ට අප්‍රසාදයෙන් යුතුව හිස වැනීය. "ටිකක් හිතපන්, මම උඹ ගැන කොච්චර ඉහළ බලාපොරොත්තු තියාගෙන ද හිටියෙ."

ඔවුහු ඔහුගේ අසිපත ද සිරිය ද ඔහුගෙන් ගත්තෝය. ඔහු කල වරද වෙනුවෙන් කුමක් කල යුතුදැයි ඉහළ නිළධාරීන් රැස්වී තීරණය කරන තුරු ඔහුට සිය කාමරයෙන් පිටවීම තහනම් විය. ඉන්පසු ඔහු අණට කීකරු වනවාදැයි තහවුරු කරගැනීම පිණිස දොරට පිටතින් මුර භටයෙකු ද යෙදවිනි. ඔහුගේ මිතුරන්ට ඔහුව බැහැ දැකීමට පැමිණීම ද තහනම් විය. එනමුදු නාකි වලහා ගෝස්ට්ට ඔහු හා රැඳෙන්නට අවසර දුන්නේය. එබැවින් ඔහු සම්පූර්ණයෙන්ම හුදෙකලා නොවීය.

"මගේ තාත්තා ද්‍රෝහියෙක් නෙවෙයි." පිරිස පිටව ගිය පසු ජොන් ගෝස්ට් අමතා කීවේය. සෝරවෘකයා නිහඬවම ඔහු දෙස බලා සිටින්නට විය. බිත්තියට පිට දී වාඩිගත් ඔහු දෙදණ වටා දෑත් යවා ඇඳ අසල මේසය මත දැල්වෙමින් තිබුනු ඉටිපන්දම් දැල්ල දෙස බලා සිටියේය. දැල්ල විටින් විට දුබල වෙමින් නැවත ඇවිලෙමින් දෙපසට පැද්දුනු අතර ඔහු වටා සෙවනැලි නටන්නට විය. කාමරය වඩවඩාත් අන්ධකාර හා සීතල වන්නාක් මෙන් පෙනින. 'මම අද රෑ නිදාගන්නෙ නෑ' ජොන් කල්පනා කලේය.

එනමුදු ඔහු නිදිකිරා වැටුනා වන්නට ඇත. මක්නිසාද යත් ඔහු නැවත හදිසියේ දෑස් හරින විට ඉටිපන්දම් දැල්ල නිවී බොහෝ වේලාවක් ගෙවී ගොස් තිබුනු අතර ඔහුගේ දෙපා හිරි වැටී තිබුනි. සිය පසුපාදවලින් සිටගත් ගෝස්ට් දොර පහුරු ගාමින් සිටියේය. ඌ කෙතරම් උස ගොස් ඇද්දැයි ජොන් තැති ගනිමින් සිතුවේය. "ගෝස්ට්. මොකද?" ඔහු මෘදු ස්වරයෙන් ඇසුවේය. හිස හැරවූ සෝරවෘකයා ඔහු දෙස බලා නිහඬව දත් විලිස්සුවේ ය. 'ඌට පිස්සු හැදිලාද?' ජොන් විමතියෙන් කල්පනා කලේය. "මේ මම ගෝස්ට්." ඔහු මිමිනුවේ සිතේ නැගුනු බිය වසන් කරමිනි. එනමුදු ඔහුගේ මුලු සිරුරම වෙවුලමින් තිබින. අවට මෙතරම් සීතල වූයේ කොයි වේලාවේද?

ගෝස්ට් දොර වෙතින් පිටුපසට මැත් විය. ඌ පහුරු ගෑ තැන ලීයේ ගැඹුරින් තුවාල වී තිබුනි. නැග එන නොඉවසිලිමත් බවකින් යුතුව ඔහු වෘකයා දෙස බැලුවේය. "එළියෙ මොකෙක් හරි ඉන්නවා. එහෙම නේද?" ඔහු වහා නැගිට උක්කුටියෙන් ඉඳගනිමින් ඇසුවේය. වෘකයා තව තවත් පසුපසට වන්නට වූ අතර උගේ ගෙලේ පිටුපස වූ සුදු පැහැ ලොම් කෙලින් සිටියේය. 'මුරකාරයා' ඔහු සිතුවේය. 'එයාලා මාව මුර කරන්ට දොරට පිටින් එක්කෙනෙක් තිබ්බා. ගෝස්ට්ට දොර හරහා එයාගෙ ඉව දැනෙනවා ඇති. එච්චරයි!'

ජොන් හෙමින් සීරුවේ දෙපයින් නැගී සිටියේය. ඔහු පාලනය කල නොහැකි තරම් තදින් වෙවුලමින් සිටියේය. තවමත් තමා සතුව අසිපත තිබුනා නම් යැයි ඔහු සිතුවේය. දිගු පියවර තුනකින් දොර වෙත ළඟා වූ ඔහු අගුල කරකවා දොර ඇතුළතට ඇරියේය. සරනේරුවල කිරි කිරි හඬ ඔහුව තිගැස්සවීමට සමත් විය.

ඔහුගේ මුර සෙබළා පඩිපෙළ මත හතරගාතයෙන් වැටී ඔහු දෙස බලා සිටියේය. ඔහු උදරය පැත්ත යටවන සේ බිම වැටී සිටි නමුදු හිස ජොන් දෙස බලා සිටියේය. ඔහුගේ ගෙල සම්පූර්ණ වටයක් පසුපසට අඹරවා තිබුනි.

'මේක වෙන්ට බෑ!' ජොන් තමාටම කියාගත්තේ ය. 'මේක අණදෙන නිළධාරිතුමා ගේ කුළුණ. මේක දවල් රෑ තිස්සෙ මුර කරනවා. මේක කොහෙත්ම වෙන්ට බෑ! මේක හීනයක්. මට නපුරු හීන පේනවා.'

ගෝස්ට් ඔහුව පසුකරමින් දොරින් එළියට පැන්නේය. පඩිපෙළ ඉහළට අඩක් දිව ගිය වෘකයා නැවැති ආපසු හැරී ඔහු දෙස බැලීය. ඒ මොහොතේ ඔහුට යම් ශබ්දයක් ඇසුනි. ගල් පොළොව මත බූට්ස් සපත්තු ඇතිල්ලෙන හඬ හා දොරගුලු ඇරෙන හඬ. හඬ ආවේ ඉහළිනි. අණදෙන නිළධාරිතුමා ගේ කාමරයෙනි.

මෙය නපුරු සිහිනයක් විය හැකි නමුදු එය සිහිනයක් නොවීය.

මුර සෙබළා ගේ අසිපත කොපුවේ ලෑ අයුරින්ම තිබුනි. දණ බිම ඇනගත් ජොන් එය පිටතට ඇදගත්තේ ය. අතැති ආයුධය නිසා ඔහුට වඩා සුරක්ෂිත බවක් දැනෙන්නට විය. ගෝස්ට් නිහඬවම ඔහුට ඉදිරියෙන් දිවයද්දී ඔහු වහ වහා පඩිපෙළ නැග්ගේය. පඩිපෙළේ සෑම තැනකින්ම අන්ධකාර ඡායාවන් මතුවන්නට විය. ජොන් පරීක්ෂාවෙන් යුතුව ඉදිරියටම ගියේ සැකසහිත සෑම ඡායාවකටම අසිපතෙන් ඇන්නේය.

හදිසියේම ඔහුට මෝර්මන්ට් ගේ කපුටා ගේ හඬ ඇසුනි. "ඉරිඟු!" කපුටා බෙරිහන් දුන්නේය. "ඉරිඟු! ඉරිඟු! ඉරිඟු! ඉරිඟු! ඉරිඟු! ඉරිඟු!" ගෝස්ට් ඉදිරියට පිනූ අතර ජොන් ඒ පසුපසින්ම දිවගියේය. මෝර්මන්ට් ගේ කාමරයට පිවිසෙන දොර මුලුමනින්ම ඇරදමා තිබුනි. වෘකයා කාමරය තුළට රිංගූ අතර සිය දෑස් අන්ධකාරයට හුරු වන තෙක් ජොන් දොරකඩ මඳක් නතරවූයේ ය. කවුළු වසා ඝනකම් තිරරෙදි දමා තිබුනු බැවින් කාමරය තුළ අන්ධකාරය කළු තීන්ත මෙන් දැඩි විය. "ඔතැන කවුද?" ජොන් හඬගෑවේය.

ඊළඟ මොහොතේ ඔහු එය දුටුවේය. සෙවනැලි රැසක් තුළ වූ එක් සෙවනැල්ලක් මෝර්මන්ට් ගේ නිදන කුටිය වෙත වූ ඇතුළු දොර වෙත ඇදෙමින් තිබුනි. මිනිසකු ගේ

ස්වරූපය ගත්, සළුවක් පැළැඳි, හිස වසාගත් සෙවනැල්ලක්.. එනමුදු ඒ හිස වැසූ සළුවට යටින් වූ නිල් පැහැ දෙනෙතක් අයිස් මෙන් දීප්තියෙන් බැබලුනේ ය.

ගෝස්ට් ඉදිරියට පැන්නේය. මිනිසා ද වෘකයාද එක පොදියට බිම පෙරලී ගිය නමුදු එහි කිසිදු ගෙරවිල්ලක් හෝ කෑගැසීමක් හෝ නොවීය. පෙරලී ගිය ඔවුන් දෙදෙනා පුටුවක හැපී ලිපි ගොනු ගොඩගසා තිබුනු මේසයක් පෙරලා දැමීය. මෝර්මන්ට් ගේ කපුටා බෙරිහන් දෙමින් හිසට උඩින් පියාඹන්නට විය. "ඉරිඟු! ඉරිඟු! ඉරිඟු! ඉරිඟු!" ජොන්ට දැනුනේ තමාද මේස්ටර් ඒමන් මෙන් අන්ධ වී ඇති බවකි. බිත්තිය තමා පිටුපස තබාගනිමින් කවුළුව වෙත ළඟා වූ ඔහු තිර රෙද්ද පසෙකට ඇද දැමීය. සඳ එළිය කාමරය පුරා පැතිර ගියේය. හැරී බැලූ ඔහු දුටුයේ සුදු පැහැ ලොම් අතර එබී ගොස් ඇති කළු පැහැ දැත් යුගලකි. ඉදිමුනු, කළු පැහැ අතැඟිලි සෝරවෘකයා ගේ ගෙල වටා සිරවී ගෙල තව තවත් තද කරමින් තිබුනි. ගෝස්ට් ඇඹරෙමින්, උඩ පනිමින්, මිනිසාව සපා කන්නට තැත් කරමින් සිටියේය. එනමුදු ඌට ඒ ග්‍රහනයෙන් ගැලවී ගත නොහැකි විය.

ජොන්ට තවදුරටත් බිය වෙවී සිටින්නට කාලයක් නොවීය. කෑගසමින් ඉදිරියට පැන්න ඔහු සිය සිරුරේ මුලු වෙර යොදා දිගු අසිපත පහතට ගෙන ආවේය. කමිස අතත්, සමත්, මසුත්, ඇටත් කපා දමමින් අසිපත් තලය යටටම බැස්සේය. එනමුදු ඒ කැපී යන ශබ්දයේ කුමක් හෝ වැරැද්දක් තිබුනි. ඔහුව වසා පැතිරගත් දුර්ගන්ධය කෙතරම් අසාමාන්‍ය හා සීතල වී ද යත් ඔහුට නාසය වසාගන්නට තරම් සිත් දුනි. කැපී වෙන්වී ගිය බාහුවක් හා අතක් සඳ එළිය මැද්දේ බිම වැටී තිබෙනු ඔහු දුටුවේය. එහි අතැඟිලි නලියමින් තිබුනි. ගෝස්ට් වහා අනිත් අතේ ග්‍රහනයෙන් මිදී පිටතට පැනගත්තේ ය. උගේ රත් පැහැ දිව එළියට ඇදී තිබුනි.

හිස වැසූ මිනිසා සිය සුදුමැලි මුහුණ එසෙවුවේ ය. දෙවරක් නොසිතූ ජොන් ඊට පහරක් එල්ල කලේය. මේ පහරින් ආක්‍රමණිකයා ගේ නාසයෙන් කොටසක් කැපී වෙන්වී ගිය අතර එක් කම්මුලක සිට අනිත් කම්මුල දක්වා මුහුණ හරහා නිල් පැහැ දෑසට යටින් ගැඹුරු කැපුමක් ඇතිවිය. ඒ දෑස් නිල් පැහැ තරු මෙන් බබලමින් තිබුනි. ජොන් ඒ මුහුණ හඳුනාගත්තේ ය. 'ඔතෝර්!' ඔහු සිතුවේය. 'දෙයියනේ! ඌ මැරිලා. ඌ මැරිලා. මම දැක්කා ඌ මැරිලා ඉන්නවා.'

සිය වළලුකරේ කුමක් හෝ පැටලෙනු ඔහුට දැනුනි. කළු පැහැ අතැඟිලි ඔහුගේ බත්කෙණ්ඩ බදාගත්තේ ය. කපා දැමූ අත ඔහුගේ පාදය දිගේ ඉහළ නගිමින් වූල් කලිසම

හා සම් මස් පහුරුගාමින් තිබුනි. පිළිකුලෙන් කෑගසමින් සිය අසිපත් තුඩින් අතැඟිලි මැත් කරගත් ජොන් එය ඉවතට විසි කර දැමීය. එය නලියමින් බිම වැටී තිබුනු අතර අතැඟිලි ඇරෙන්නටත් වැහෙන්නටත් විය.

මළකඳ ඉදිරියට පැන්නේය. එහි කිසිදු ලේ සලකුණක් නොවීය. අතක් අහිමිව, මුහුණෙන් අඩක් කැපී ගොස් තිබුනු නමුදු එයට කිසිදු හැඟීමක් දැනීමක් නැත්තා සේ පෙනුනි. ජොන් දිගු අසිපත ඉදිරියට දිගු කලේය. "එහාට වෙලා හිටපන්!" ඔහුගේ ස්වරය කර්කශ විනිවිද යන සුළු එකක් බවට පත්වී තිබුනි. "ඉරිඟු!" කපුටා බෙරිහන් දුන්නේය. "ඉරිඟු! ඉරිඟු!" සිය කමිස අත තුළින් මිදුනු කපා දැමූ අත කළු පැහැ හිස් පහක් ඇති සර්පයෙකු මෙන් දඟලමින් ඉදිරියට ඇදෙන්නට විය. ඉදිරියට පිනූ ගෝස්ට් එය දත්වලින් ඩැහැගත්තේ ය. අතැඟිලි කැඩී බිඳී යන හඬ ඇසුනි. මළසිරුරේ ගෙලට පැති කැපුම් පහරක් එල්ල කල ජොන්ට අසිපත් තලය ගැඹුරුට කිඳා බසිනු දැනින.

මියගිය ඔතෝර් ඔහුගේ ඇඟ මතට කඩා වැටුනේ ඔහුව අසමතුලිත කර බිම පෙරලා දැමීය.

බිම වැටී තිබුනු මේසය ඔහුගේ උරහිස් ඇට දෙක අතරින් වදිද්දී සිය හුස්ම සියල්ල පිටවී යනු ජොන්ට දැනුනි. 'කඩුව! කෝ කඩුව? කඩුව ඔහු අතින් ගිලිහුනා ද?' කෑගැසීම සඳහා මුව විවර කල මොහොතේ මළකඳ සිය කළු පැහැ අතැඟිලි ඔහුගේ මුව තුළ ඔබා තදකලේය. හුස්ම අකුළුවා ගන්නට තැත්කරමින් ඔහු එය පසෙකට තල්ලු කරන්නට උත්සාහ කල නමුදු මළසිරුරේ බර අධික විය. ඒ සීතල අතැඟිලි තවතවත් ඔහුගේ උගුර තුළට කා වැදෙමින් ඔහුගේ හුස්ම හිර කරන්නට විය. ඒ මුහුණ ඔහුගේ මුහුණට තදවෙමින් දර්ශන පථය අවහිර කරන්නට විය. ඒ දෑස් නිල් පැහැ මීදුම් පටලයකින් වැසී තිබුනි. ජොන් සීතල මාංසය නියෙන් පහුරුගාමින් මේ අද්භූත සත්ත්වයා ගේ පාදවලට පයින් ගැසුවේය. ඔහු සපන්නට උත්සාහ කලේය. මුෂ්ටි පහරක් එල්ල කරන්නට උත්සාහ කලේය. හුස්ම ගන්නට උත්සාහ කලේය...

හදිසියේම මළසිරුරේ බර ඉවත්ව ගියේය. අතැඟිලි ඔහුගේ මුවින් පිටතට ඇදීගියේය. ඔක්කාර කරමින්, ගැහෙමින් පසෙකට රෝල්වනවා හැර අන් කල හැක්කක් ජොන්ට නොවීය.

ගෝස්ට් නැවතත් සටනට එළඹ තිබුනි. ඔහු බලා සිටියදී සෝරවෘකයා මළසිරුරේ උදරය සිය දතින් කීතු කීතු කරමින් අතුණුබහන් ඇද දමන්නට විය. ඔහු අසිහියෙන් මෙන් බොහෝ වේලාවක් ඒ දෙස බලා සිටියේ අන්තිමේදී සිය අසිපත මතක් වී වටපිට බැලුවේය. තවමත් නිදිමත පහව නොගිය මෝර්මන්ට් උතුමානන් නිදි ඇඳුමින් සැරසී, දැල්වෙන පහනක් අතින් ගෙන දොරකඩ සිටගෙන සිටියේය. බිම වැටී තිබුනු කපා දැමූ, අතැඟිලි අහිමි වී තිබුනු අත ඔහු දෙසට බඩගාමින් යන්නට විය.

ජොන් කෑගසන්නට තැත් කල නමුදු ඔහුගේ හඬ පිටනොවීය. වහා දෙපයින් නැගී සිටි ඔහු අත ඉවතට විසිවන සේ පයින් ගසා මෝර්මන්ට් ගේ අතේ දැල්වෙමින් තිබුනු පහන උදුරාගත්තේ ය. "පුච්චපන්!" කපුටා කෑගසන්ට විය. "පුච්චපන්! පුච්චපන්! පුච්චපන්!"

අඩ වටයක් කැරකුනු ජොන් තමා මීට පෙර කවුළුවෙන් ඇද දැමූ තිරරෙදි දුටුවේය. පහන දැතින්ම ඔසවාගත් ඔහු එය තිරරෙදි වෙත දමා ගැසීය. ලෝහ තැලී ගියේය. වීදුරු බිඳී ගියේය. තෙල් දසත විසිර ගියේය. තිරරෙදි වුෂ් හඬක් නංවමින් සැනෙන් ගිනි ජාලාවකින් වෙලී ගියේය. එයින් නැගුනු උණුසුම සිය මුහුණ සිප ගනිද්දී මින් පෙර කිසිදු චුම්බනයකින් නොලද තරම් ආහ්ලාදයක් ජොන්ගේ සිරුර පුරා පැතිර ගියේය. "ගෝස්ට්!" ඔහු කෑගැසුවේ ය.

සෝරවෘකයා හනික ඔහු පසෙකට පැන්න අතර මළසිරුර නැගී සිටින්නට වෑයම් කලේය. එහි උදරයේ වූ විසල් තුවාලයෙන් කළු පැහැ සර්පයින් මෙන් අතුණුබහන් පිටතට ඇදී තිබුනි. ගින්නට අත ඔබා ගිනිගන්නා තිරරෙදි කඩක් ඩැහැගත් ජොන් එය මළකඳ වෙත දමාගැසීය. 'ඌව පිච්චියන්!' ගිනිගත් රෙදි කැබළි මළකඳ වටා එතෙද්දී ඔහු යාඥා කලේය. 'දෙවියනේ! කරුනාකරලා, කරුනාකරලා, ඌව පිච්චියන්!'

**Jeor Mormont: “If Ben Stark had come under wildling attack a half day’s ride from Castle Black, he would have returned for more men, chased the killers through all seven hells and brought me back their heads.”**

බ්‍රැන් 06-1

අශ්වාරෝහක සෙබළුන් තුන්සියයක් හා පාබල සෙබළුන් දෙදහසක් පමණ පිරිවැරූ කාර්ස්ටාර්ක්වරුන් එක් සීතල උදෑසනක කාර්හෝල්ඩ්හි පිහිටි සිය බලකොටුවේ සිට පැමිණියෝය. සෙබළ මුලුව සෙමින් සෙමින් ඉදිරියට ඇදී එද්දී ඔවුන් ගේ කුන්තවල වානේමය තුඩු මලානික හිරු එළියේ දිදුලන්නට විය. තමන්ට ද වඩා විශාල බෙරයක් කරේ එල්ලාගත් මිනිසෙක් ඔවුන්ට ඉදිරියෙන් යමින් සරඹ රිද්මයට අනුව බෙරයට තඩිබෑවේය. බුම්! බුම්! බුම්!

හොඩෝර් ගේ උරහිස මත වාඩිවී මේස්ටර් ලුවින් ගේ පිත්තල දුරබලන කන්ණාඩිය දෙනෙතට තද කරගත් බ්‍රැන් ඔවුන් පිටත පවුරේ මුරකුළුණ පසුකරමින් එන සැටි බලා සිටියේය. රිකාර්ඩ් කාර්ස්ටාර්ක් උතුමානන් පිරිසේ ඉදිරියෙන්ම පැමිණියේ ය. ඔහුගේ පුතුන් වන හැරියන්, එඩාර්ඩ් හා ටෝරන් සිය වංශ ලාංඡනය වන කළු පසුබිමේ දිදුලන සුදු පැහැ හිරුගේ සලකුණ සහිත ධජපතාක සෙවනේ ඔහු පසෙකින් අසුන් විහිදූහ. නාකි ආයම්මා කියූ සැටියට නම් ඔවුන් ගේ නහර තුළ ගලාගියේ ද ස්ටාර්ක් රුධිරය විය. වසර සිය ගණනකට පෙරාතුව ඔවුන් ස්ටාර්ක්ලාගෙන් වෙන්වී වෙනමම පෙළපතක් පිහිටුවා තිබුනි. එනමුදු ඔවුන් හා ස්ටාර්ක්වරුන් අතර කිසිදු සමානකමක් බ්‍රැන්ට නම් දැකගත හැකි නොවීය. ඔවුහු බිහිසුනු, මුහුණ පුරා ඝනකම රැවුල් වවාගත්, උරහිසට ද පහතින් වැටෙන සේ දිගු කොණ්ඩා වවාගත්, දැවැන්ත මිනිසුන් වූහ. ඔවුන් ගේ සළු නිමැවී තිබුනේ වලසුන්, වෘකයින් හා සීල් සතුන් ගේ සමිනි.

මේ වනාහි අවසාන පිරිස බව බ්‍රැන් දැන සිටියේය. අනිකුත් වංශාධිපතින් මේ වනවිට ද සිය සෙබළ මුලු හා පැමිණ තිබුනි. ඔවුන් අතර ඇවිද යමින් ශීත පෙළපත්වල ශ්‍රී විභූතිය දැකබලා ගන්නට බ්‍රැන්ට තදින්ම උවමනා විය. සෑම උදෑසනකම මිනිසුන් වෙළෙඳපළ චතුරස්‍රයේ පොර කෑ අතර වීථි කරත්ත රෝදවලට හා සත්ත්ව කුරවලට හසු වී මැඩී ගියේය. එනමුදු ඔහුට මාලිගයෙන් පිටවීම රොබ් විසින් තහනම් කර තිබුනි. "අපට ඔයාව පරිස්සම් කර කර ඉන්ට තරම් අමතර සෙබළු නෑ." ඔහු පැහැදිලි කර තිබුනි.

"මම සමර්ව අරන් යන්නම්." බ්‍රැන් වාද කලේය.

"පොඩි ළමයෙක් වගේ මාත් එක්ක සෙල්ලම් කරන්ට එපා බ්‍රැන්. ඔයා දැන් ඊට වඩා හොඳින් යමක් තේරුම්ගන්ට ඕන. බෝල්ටන් උතුමානන්ගෙ මිනිහෙක් ස්මෝකින් ලොග්වලදී සර්වින් උතුමානන්ගෙ මිනිහෙකුට පිහියෙන් ඇනලා යාන්තං දවස් දෙකයි. ඔයාව එහෙම අවදානමක දැම්මොත් අපේ අම්මා මාව පණපිටින් හම ගහයි." ඔහු මෙය පැවසූයේ රොබ් උතුමානන් සතු විධානාත්මක හඬිනි. එබැවින් එතැනින් එහාට තවත් අයැද සිටීමේ තේරුමක් නැති බව බ්‍රැන් වටහාගත්තේ ය.

මේ සියල්ල එදා අර වෘක වනයේදී සිදුවුනු දේ නිසා බැව් ඔහු දැන සිටියේය. මේ මතකය තවමත් ඔහු වෙත නපුරු සිහින ගෙන එන්නට සමත් වී තිබුනි. ඔහු එදා කිසිදු පිළිසරණක් නැති කුඩා දරුවකු ගේ තත්ත්වයට, අඩුම ගනනේ රිකන් තරමටවත් සිය ආරක්ෂාව සලසාගත නොහැකි තත්ත්වයකට පත්ව සිටියේය. රිකන්ට අඩුම තරමේ ඔවුන්ට පා පහර දීමටවත් හැකියාව තිබුනි. මෙය ඔහුව ලැජ්ජාවට පත්කලේය. ඔහු රොබ්ට වඩා යාන්තම් වසර කිහිපයකින් ලාබාලය. සිය සොයුරා මේ වන විට වැඩුනු මිනිසකු නම් ඔහුද එසේමය. ඔහු තමාව ආරක්ෂා කරගන්නට සමත් විය යුතුව තිබුනි.

මීට වසරකට පෙරාතුව නම්, නගරයට යන්නට උවමනා විනි නම් තනිවම ප්‍රාකාරයට නැගගෙන හෝ එය ඉටු කරගන්නට ඔහුට හැකියාව තිබින. ඒ කාලයේ ඔහුට පියගැටපෙළ දිගේ ඉහළ පහළ දිවයාමට හැකි විය. සිය පෝනියා පිට තනිවම නැගගත හැකි විය. ලී අසිපතක් අත දරා ටමෙන් කුමරා පරදවන්නට හැකි විය. දැන් ඔහුට කල හැකි එකම දෙය මේස්ටර් ලුවින් ගේ දූරේක්ෂයෙන් එබී බැලීම පමණි. මේස්ටර්වරයා ඔහුට සියළුම ධජ ගැන ඉගැන්නුවේ ය. ග්ලවර්වරුන් ගේ ලේ රතු පැහැ පසුබිමේ ඇති රජතමය මිටි මොලවා ගත් අත, මෝර්මන්ට් ආර්යාව ගේ කළු වලසා, ඩ්‍රෙඩ්පෝර්ට්හි රුස් බෝල්ටන් ගේ හමගැසූ මිනිසා, හෝර්න්වුඩ්වරුන් ගේ පිණිමුවා, සර්වින්වරුන් ගේ යුධ පොරොව, ටෝල්හාර්ට්වරුන් ගේ මුරකරු වෘක්ෂ තුන සහ අම්බර් වංශයේ දම්වැල්වලින් බැඳ දැමූ ගොරවන යෝධයා ආදි සියල්ලක්ම ඔහු මනාව දැන සිටියේය.

රිකාර්ඩ් කාර්ස්ටාර්ක්

වැඩි කලක් යන්නට මත්තෙන් ඔහු මේ වංශාධිපතීන් ගේ මුහුණු ද හඳුනාගන්නට සමත් වීය. මේ උතුමන් ද, ඔවුන් ගේ පුතුන් ද, නයිට්වරුන් ද භෝජන සංග්‍රහයන්ට සහභාගී වීම පිණිස වින්ටර්ෆෙල්වලට පැමිණියහ. මේ සියල්ලන්ටම එකවර අසුන් ගන්නට තරම් වින්ටර්ෆෙල්හි ප්‍රධාන ශාලාවද ඉඩ මදි තරම් විය. එබැවින් රොබ් විසින් ප්‍රධාන

වංශාධිපතින් මාරුවෙන් මාරුවට ආගන්තුක සත්කාරය පිණිස කැඳවන ලදී. මේ සෑමවිටම බ්‍රැන්ට සිය සොයුරා ගේ දකුණු පසින් වූ ගරු ආසනයක් හිමිවූයේය. ඔහු එහි අසුන්ගෙන සිටියදී සමහර වංශාධිපතිහු ඔහු දෙස නොපහන් බැලුම් හෙලන්නට ද අමතක නොකලහ. මේ අබ්බගාත, කුඩා කොලුවා තමන්ට වඩා උසස් අසුනක වාඩි වී සිටින්නේ මොන කෙහෙල්මලකට දැයි ඔවුන් කල්පනා කරනවා වන්නට ඇත.

"දැනට කොච්චර කට්ටිය ඇවිල්ලා ඉන්නවද?" බ්‍රැන් මේස්ටර් ලුවින්ගෙන් ඇසුවේය.

"දොලොස්දාහක් හරි ඊට කිට්ටුවෙන් යන ගානක්."

"නයිට්වරු කීදෙනෙක් ද?"

"ටික දෙනෙක්." මේස්ටර්වරයා නොඉවසිලිමත් බව තැවරුනු ස්වරයෙන් පිළිතුරු දුන්නේය. "නයිට් කෙනෙක් වෙන්ට ඔයා සප්තක දේවස්ථානයක දණ නමලා සප්තාලේපනයෙන් අභිෂේක ලබලා දිවුරුම් දෙන්ට ඕන. මේ උතුරෙ ඉන්න වංශවත් පවුල්වලින් බොහොම ටිකයි සත්‍ය ලබ්ධිය අදහන්නෙ. අනිත් හැමෝම තාමත් පුරාණ දෙවිවරුයි අදහන්නෙ. ඒ නිසා එයාලා නයිට්වරු නම් කරන්නෙ නෑ... ඒ වුනත් ඒකෙන් කියැවෙන්නෙ නෑ මේ උතුමානන්ලායි, එයාලාගෙ පුතාලයි, එයාලට දිවුරුම් දීලා ඉන්න සෙබළුයි පක්ෂපාතී බව අතින් හරි ගෞරවනීය බව අතින් හරි නයිට්වරුන්ට වඩා පහතින් ඉන්නවා කියලා. මිනිහෙක්ගෙ වටිනාකම තීරණය වෙන්නෙ එයාගෙ නමට ඉස්සරහින් 'සෙර්' කෑල්ලක් තියෙනවාද නැද්ද කියන එකෙන් නෙවෙයි. මම මීට කලින් සියවාරයක් ඔයාට ඒ ගැන කියලා දීලා ඇති."

"ඒ වුනත්... නයිට්වරු කීදෙනෙක් ද?"

මේස්ටර් ලුවින් සුසුමක් හෙලීය. "තුන්සීයක්, නැත්තං හාරසීයක් විතර... නයිට්වරු නොවෙන සන්නද්ධ ලන්සකාරයො තුන්දාහක් අතරෙ."

"කාර්ස්ටාර්ක් උතුමානන් තමා අන්තිම එක්කෙනා." බ්‍රැන් කල්පනාවෙන් බරව කීවේය. "රොබ් අද රෑ එයාට භෝජන සංග්‍රහයක් පවත්වයි."

"කිසිම සැකයක් නෑ."

"කොච්චර කල් යයිද එයාලා... එයාලා පිටත්වෙලා යන්ට?"

"එයා බොහොම ඉක්මනටම පිටත්වෙලා යන්ට ඕන. එහෙම නැත්තම් නොගිහින් ඉන්ට ඕන. වින්ටර් ටවුන් එක පිරෙන්ටම සෙනඟ ඉන්නවා. මේ හමුදාව තව දිගටම මෙහෙ කඳවුරු බැඳගෙන හිටියොත් එයාලා මේ අවට හැම තැනකම තියෙන කෑම ටික කාලා ඉවර කරයි. තවත් අය එයා එනකම් රජමාවතේ බලාගෙන ඉන්නවා. සොහොන් ගොඩැලිවල නයිට්වරුයි, වගුරු මිනිස්සුයි, මැන්ඩර්ලි උතුමානනුයි, ෆ්ලින්ට් උතුමානනුයි. දැනටමත් ගංගා නිම්නයේ සටන් පටන් අරගෙනයි තියෙන්නෙ. ඔයාගෙ අයියාට ලීග් සියගානක් දුර යන්ට තියෙනවා."

"මම දන්නවා." බ්‍රැන්ගේ ස්වරයේ වූයේ දුක්මුසු බවකි. ඔහු පිත්තල බටය නැවත මේස්ටර්වරයා අතට දුන්නේය. මේස්ටර් ලුවින් ගේ හිස මුදුනේ කෙස් පෑදී ඇති අයුරුත් යාන්තමට තට්ටය මතු වී ඇති අයුරුත් ඔහුගේ නිරීක්ෂණයට හසුවිය. සිය මුලු ජීවිත කාලය පුරාවටම පහළ සිට ඔහු දෙස බලා හිඳ දැන් මෙසේ ඉහළක සිට ඔහු දෙස බැලීම නුහුරු දෙයක් විය. එනමුදු ඔබ හොඩෝර් ගේ පිට මත වාඩිවී සිටින විට ඔබ අන් සියළුදෙනාම දකින්නේ ඔබට පහළිනි. "මට තවත් බලන් ඉන්ට ඕන නෑ. හොඩෝර්, මාව බලකොටුවට අරන් පලයන්."

"හො-ඩෝ-ර්." හොඩෝර් පිළිතුරු දුනි.

මේස්ටර් ලුවින් පිත්තල බටය සිය කමිස අතක් අස්සේ ගසා ගත්තේය. "බ්‍රැන්, ඔයාගෙ අයියට දැන් ඔයා ගැන හොයලා බලන්ට වෙලාවක් ලැබෙන එකක් නෑ. එයා ඉස්සරහට ගිහිල්ලා කාර්ස්ටාර්ක් උතුමානනුයි එයාගෙ පුත්තුයි පිළිගන්ට ඕන."

"මම රොබ්ට බාධා කරන්ට යන්නෙ නෑ. මට දෙව්වනයට යන්ට ඕන." ඔහු හොඩෝර් ගේ උරහිස ස්පර්ශ කලේය. "හොඩෝර්."

කුළුණේ ඇතුළත බිත්තියේ ඉණිමගක් මෙන් භාවිතයට ගත හැකිවන පරිද්දෙන් කළුගල තුළට නියනෙන් කුහර කපා තිබුනි. මේ පඩි අල්ලාගනිමින් සෙමින් සෙමින් පහළ බසින අතරේදී හොඩෝර් තනුවක් නොමැති ගීයක් මුමුනන්නට විය. මෙස්ටර් ලුවින් විසින් ඔහු වෙනුවෙන් පිළියෙල කරදුන් කූඩයේ බැස හොඩෝර් ගේ පිටේ එල්ලී සිටි බ්‍රැන් මේ සෑම බැස්මක් පාසාම ගැස්සෙමින් ඔහුගේ පිටේ වැදුනි. ලුවින්ට මේ අදහස පැමිණ තිබුනේ දර එකතු කරන ගැහැණුන් විසින් පිටේ එල්ලාගෙන යන කූඩා දැකීමෙනි. ඔහුගේ පාද පිටතට දමාගනු පිණිස කුහර දෙකක් හා බර මනාව බෙදී යන පරිදි අමතර පටි කිහිපයක් එක් කිරීම පමණක් අමුතුවෙන් නිර්මාණය කල යුතුව තිබුනි. එය ඩාන්සර් පිටේ යන්නාක් තරම්ම හොඳ නොවුවද ඩාන්සර්ට පවා යා නොහැකි තැන් විය. එමෙන්ම හොඩෝර් විසින් තමාව කුඩා දරුවකු මෙන් දෝතින් වඩාගෙන සිටීමට වඩා මේ ක්‍රමයට බ්‍රැන් කැමැති විය. හොඩෝර් ද මීට කැමැති වූවාක් මෙන් පෙනුනි. එනමුදු හොඩෝර් සිතන්නේ කුමක්දැයි දන්නේ දෙවියන් පමණි. වද විය යුතු එකම කාරණය වූයේ දොරවල් ය. සමහරවිට තමාගේ පිටේ බ්‍රැන් ඉන්නා බව හොඩෝර්ට අමතක වී යයි. එවැනි අවස්ථාවල දොරවල් තුළින් යාම වේදනාකාරී විය.

සති දෙකක් පුරාවට වංශාධිපතීන් ගේ යාම් ඊම් කෙතරම් සිදුවීද යත් අන්තිමේදී දිවා රෑ නොතකා පවුරු දෙකේම කටු පැලැලි ඔසවා තබා දිය අගලට ඉහළින් වූ පාළම පහත්කොට තබන්නැයි අණ දීමට රොබ්ට සිදුවිනි. බ්‍රැන් මෙස්ටර් ගේ කුළුණෙන් පිටතට එද්දී ලන්සකරුවන් කණ්ඩායමක් දිගු පේළියක් සෑදී පවුරු දෙක අතර වූ පාළම තරණය කරමින් සිටියෝය. කාර්ස්ටාක් සෙබළු සිය උතුමන් පසුපසින් බලකොටුවට ඇතුළුවෙමින් සිටියහ. ඔවුහු යකඩින් කල කළු පැහැ අඩ ශිරස්ක හා සුදු පැහැ සූර්ය රටාවන්ගෙන් අලංකාර වූ කළු ලොම් සළු පැළැඳ සිටියහ. හොඩෝර් තමාටම සිනාසෙමින් මේ සෙබළ මුලුව පසෙකින් පාළමින් එතෙර වන්නට විය. අශ්වාරෝහකයින් විසින් ඔවුන් දෙදෙන දෙසට අමුතු බැලුම් හෙලන්නට වූ අතර කිසිවකු කොක්හඬලා සිනාසෙනු වරක් බ්‍රැන්ට අසන්නට ලැබිනි. එය සිය සිතට වදයක් කර නොගැනීමට ඔහු ඉටා ගත්තේය. "මිනිස්සු ඔයා දිහා අමුතු විදියට බලයි." මුල්ම වතාවේ හොඩෝර් ගේ පිටේ කූඩය බඳිද්දී මෙස්ටර් ලුවින් විසින් ඔහුට අනතුරු හඟවා තිබුනි. "එයාලා බලයි. එයාලා කතාවෙයි. සමහර අය ඔයාට සමච්චල් කරයි." 'උන්ට ඕන නම් හිනාවෙච්චාවෙ.' බ්‍රැන් සිතුවේය. කිසිවකු ඔහුගේ නිදන කාමරයේදී ඔහුව සමච්චලයට ලක් නොකලේය. එනමුදු ඔහුට සිය මුලු ජීවිත කාලයම නිදන කාමරයේ ගතකල නොහැක.

ප්‍රධාන ද්වාරයේ කටු පැලැල්ල යටින් යන අතරේ බ්‍රැන් ඇඟිලි දෙකක් මුවේ රුවා සියුරුහන් හඬ නැංවීය. සමර් අංගනය හරහා දිව ආවේය. අශ්වයින් සිය දැස් කරකවමින්, නොසන්සුන් අයුරින් හේෂාරවය කරන්නට පටන්ගත් අතර කාර්ස්ටාර්ක් ලන්සකරුවන්ට සිය අසුන් පාලනය කරගැනීම සඳහා මහත් වෙහෙසක් දරන්නට සිදුවිය. එක් අසෙකු ආපසු හැරී වියරුවෙන් මෙන් දිවයන්නට වූ අතර අසරුවා අවලාද නගමින්, බලාපොරොත්තු විරහිත අයුරින් සෑදලයේ එල්ලී හුන්නේය. සෝරවෘකයා ගේ ඉව අසුන් මෙතරම් නොසන්සුන් කරන්නට හේතු වූයේ උන් මීට පෙර ඊට හුරුපුරුදුව නොසිටි බැවිනි. එනමුදු සමර් දොරටුවෙන් එපිට නොපෙනී ගිය පසු උන් නැවතත් සාමාන්‍ය තත්ත්වයට පත්වන්නට වූහ. "දෙව්වනයට." බ්‍රැන් හොඩෝර්ට මතක් කර දුන්නේය.

වින්ටර්ෆෙල් පවා මුලුමනින්ම මිනිසුන්ගෙන් පිරී තිබුනි. අංගනය පුරාවටම අසිපත් හා පොරෝ හඬත්, කරත්ත රෝදවල කිරි කිරි හඬත්, බල්ලන් බුරන හඬත් නැගෙන්නට විය. යුද්ධායුධ ගබඩාවේ දොර ඇර තිබුනි. මික්කෙන් දහදිය පෙරාගෙන සිය කිණිහිර වෙත නැවී මිටියෙන් තලමින් සිටිනු බ්‍රැන්ගේ දර්ශන පථයට හසුවින. බ්‍රැන් සිය මුලු ජීවිත කාලය පුරාවටම මෙතරම් අමුත්තන් පිරිසක් එක්රැස් වී සිටිනු දැක නොතිබින. අඩුම තරමේ රජතුමා වින්ටර්ෆෙල්වලට පැමිණි විටදීවත් මෙවැන්නක් සිදුවී නොතිබින.

මේස්ටර් ලුවින්

හොඩෝර් පටු දොරකින් ඇතුළුවද්දී කූඩය තුළ නොඇකිළී සිටින්නට බ්‍රැන් උත්සාහ දැරුවේය. සමර් සන්සුන් ගමනින් ඔවුන් පසෙකින් ඇවිද එද්දී ඔවුහු දිගු මන්දාලෝක ශාලාවක් හරහා ඇවිද යන්නට වූහ. වෘකයා වරින් වර හිස ඔසවා සිය රන්වන් දියර බඳු දෑස්වලින් ඔහු දෙස බැලීය. ඌව අල්ලන්නට බ්‍රැන්ට උවමනා වූ නමුදු ඔහු අතේ දුරට වඩා ඉහළින් සිටියේය.

දෙව්වනය වනාහි වින්ටර්ෆෙල්වල කලිකලහයෙන් විනිර්මුක්ත වූ සාමකාමී දිවයිනක් බඳු විය. හොඩෝර් ඕක්, අයන්වුඩ් හා මුරකරු වෘක්ෂ වදුලු අතරින් හෙමිහිට පිය මනිමින් දෙව්වනය මධ්‍යයේ වූ හදවෘක්ෂය සමීපයේ පිහිටි නිසල පොකුණ වෙත ළඟා වන්නට විය. අන්තිමේදී ඔහු සිහින් හඬින් මුමුනමින් වයර්වුඩ් වෘක්ෂයේ ගැට සහිත අතුපතර යට නතර වූයේය. ඔහුගේ හිසට ඉහළින් අත දිගුකල බ්‍රැන් ගසේ අත්තක් අල්වාගෙන ඉහළට එසැවී සිය අජීවී දෙපා කූඩයේ කුහර තුළින් ඇදගත්තේ ය. තද රත් පැහැ වයර්වුඩ් පත්‍ර මුහුණේ ඇතිල්ලෙද්දී ඔහු මෙසේ මොහොතක් අත්තේ එල්ලී සිටි අතර හොඩෝර් ඔහුව ඔසවා

පොකුණ පසෙකින් වූ සුමට ගල මතින් තැබීය. "මට ටික වෙලාවක් තනියෙන් ඉන්ට ඕන." බ්‍රැන් කීවේය. "උඹ ගිහින් නාපන්. පොකුණුවලට පලයන්."

"හො-ඩෝ-ර්." ගස් අතරින් උඩ පනිමින් නටමින් ගිය හොඩෝර් සැනෙන් අතුරුදන් විය. දෙව්වනයේ අනෙක් පස, අමුත්තන් ගේ ශාලාවේ කවුළුවලට පහතින් පොළොව යටින් ගැලූ උණුදිය උල්පතක් විසින් කුඩා පොකුණු තුනක් නිමවා තිබුනි. මේ පොකුණු මතින් දිවා රෑ නොතකා ජලවාෂ්ප ඉහළ නැගී අතර ඒ අබියස වූ පවුරු බිත්ති දිය සෙවෙලින් ගැවසී ගත්තේය. හොඩෝර් සීතල ජලයට වෛර කලේය. කිසිවකු ඔහුව නාවන්නට තැත් කලහොත් වල් බළලෙකු මෙන් ඊට එරෙහිව සටන් කලේය. එනමුදු මේ උණුදිය පොකුණු තුනෙන් උණුසුම්ම පොකුණේ ගිලී හෝරා ගනනක් වුව ගෙවාලන්නට ඔහු ප්‍රිය කලේය.

පොකුණෙන් දිය උරා බිවු සමර් බ්‍රැන් පසෙකින් වැතිරුනේය. ඔහු වෘකයා ගේ හොම්බ යට හෙමිහිට පිරිමදින්නට විය. මඳ වේලාවක් ගතවන තෙක් කොලුවාට ද සත්ත්වයාට ද සොඳුරු සාමකාමී බවක් දැනෙන්නට විය. බ්‍රැන් හැමදාමත් දෙව්වනය ප්‍රියකලේය. ඔහු අබ්බගාතයකු වීමට පෙර පවා එය ප්‍රියකලේය. එනමුදු මෑතක සිට තමා වඩ වඩාත් දෙව්වනය දෙසට ඇදෙන බවක් ඔහුට දැනී තිබුනි. හදවෘක්ෂය පවා තවදුරටත් පෙරපරිදි ඔහුව බියපත් කරන්නට සමත් නොවීය. සුදු පැහැ ගස් කඳේ කෙටූ ගැඹුරු රත් පැහැ දෑස් තවමත් ඔහු දෙස බලා සිටි නමුදු දැන් එයින් ඔහුට දැනෙන්නට වූයේ සුවදායක බවකි. දෙව්වරුන් - පුරාණ දෙව්වරුන්, ස්ටාර්ක්වරුන් ගේ මුල් මිනිසුන් ගේ හා වනාන්තරයේ දරුවන් ගේ දෙව්වරුන්, සිය පියාගේ දෙව්වරුන් - තමා දෙස බලාසිටින බව ඔහු තමාටම කියාගත්තේ ය. මේ දෙව්වරුන් ගේ ආමුඛය අබියස ඔහුට වඩා ආරක්ෂාකාරී බවක් දැනෙන්නට විය. එමෙන්ම මේ ගස්වැල්වල ගැඹුරු නිහඬතාව විසින් ඔහුට දිගින් දිගටම කල්පනා කරන්නට අවශ්‍ය ඉඩප්‍රස්ථාව ලබාදුන්නේ ය. සිය වැටීමෙන් පසු බ්‍රැන් වඩ වඩාත් කල්පනා කරන්නට පටන්ගෙන තිබුනි. කල්පනා කරන්නට, සිහින දකින්නට හා දෙව්වරුන් හා කතා කරන්නට පටන්ගෙන තිබුනි.

"කරුනාකරලා රොබ්ට මෙහෙන් යන්ට වෙන්නෙ නැති විදියට වැඩ සිද්ද කරන්ට." ඔහු මෘදු ස්වරයෙන් දෙවියන්ට යාඥා කරන්නට විය. සීතල ජලය තුළ අතක් බහා සෙලවූ ඔහු පොකුණු තලය මත දිය රැළිති නංවන්නට විය. "කරුනාකරලා එයාව ගෙදර නවත්තන්ට. එයාට යන්ටම වුනොත් එයාව ආපහු පරිස්සමින් ගෙදර එවන්ට. අම්මයි, තාත්තයි, අක්කලා දෙන්නයි එක්ක. ඒ වගේම... ඒ වගේම රිකන්ට මේ හැම දෙයක්ම තේරුම් කරලා දෙන්ට."

රොබ් යුධ පිණිස පිටවී යන බැව් දැනගත් දා ඔහුගේ ළදරු සොහොයුරා අඬමින් හා කේන්තියෙන් පුපුරා හැලෙමින් ශීත ඍතුවේ කුණාටුවක් මෙන් දරුණු අන්දමින් පෙරළි කරන්නට වන්නේය. ඔහු ආහාර ගැනීම ප්‍රතික්ෂේප කල අතර රාත්‍රී කාලයේ වැඩි හරියක් අඬමින් හා කෑගසමින් ගතකලේය. නාකි ආයම්මා ඔහුව නින්දට යවනු පිණිස නිද්‍රා ගීයක් ගයන්නට තැත් දැරූ මොහොතේ ඔහු ඇයට පවා මුෂ්ටි ප්‍රහාරයක් එල්ලකලේ ය. ඊළඟ දවසේ ඔහු අතුරුදන් විය. ඔහුව සොයනු පිණිස රොබ්ට බලකොටුවේ වූ පිරිසෙන් අඩක්ම යෙදවීමට සිදුවිය. අන්තිමේදී පහළ සොහොන් ගුහාවල සැඟවී සිටි ඔහුව සොයාගත් මොහොතේ මළගිය ශීත රජකෙනෙකුගෙන් උදුරාගත් මළ කෑ යකඩ අසිපතක් අතින් ගත් රිකන් ඔවුන්ට පහරදුන්නේ ය. ඔහුගේ වෘකයා ෂැගීඩෝග් කොළ පැහැ දිලිසෙන දෙනෙතින් යුතු රාක්ෂයකු මෙන් අන්ධකාරයේ සිට ඔවුන් වෙත කඩාපැන්නේ ය. මේ වෘකයාද රිකන් තරමටම වියරු වැටී සිටියේය. ඌ ගේජ්ගේ අත සපා මික්කෙන් ගේ කලවයෙන් මස් කුට්ටියක් කඩා ගත්තේය. ඌව සන්සුන් කර යටපත් කරන්නට රොබ් හා ඔහුගේ වෘකයා ග්‍රේ වින්ඩ් යන දෙදෙනාම උවමනා විය. ඌ දැන් ෆාර්ලන් ගේ අධීක්ෂණය යටතේ බලු කූඩුවක දම්වැලින් බැඳ දමා සිටින අතර සිය සුරතලා නැති සොවින් රිකන් ගේ හැඬුම් තවත් අලුත් වූයේය.

රොබ්ට වින්ටර්ෆෙල්වලම නැවතී සිටින්නැයි මේස්ටර් ලූවින් අනුශාසනා කලේය. එමෙන්ම බ්‍රැන් ඔහුගෙන් එසේ අයැද සිටියේය. ඒ ඔහු වෙනුවෙන් පමණක් නොව පුංචි රිකන් වෙනුවෙන් ද විය. එනමුදු ඔහුගේ සොහොයුරා මුරණ්ඩු අයුරින් හිස වැනීය. "මට යන්ට ඕන නෑ. ඒ වුනත් මම යා යුතුයි."

එය ඇත්තෙන්ම අර්ධ සත්‍යයක් විය. 'බෙල්ල' සුරක්ෂිතව ආරක්ෂාකරගනිමින් ලැනිස්ටර්වරුන්ට විරුදුව සටන් වදින්නට ටලීවරුන්ට සහායවීම පිණිස කවුරුන් හෝ යා යුතුව තිබුනි. එය බ්‍රැන්ට ද තේරුම් ගත හැකි දෙයක් විය. එනමුදු ඒ වෙනුවෙන් රොබ්ම යාම අවශ්‍ය නොවීය. හමුදාවේ නායකත්වය පහසුවෙන්ම හැලිස් මොලන්ට හෝ තියන් ග්‍රේජෝයිට හෝ ඔහුගේ ධජ දරන යටත් වංශාධිපතියකුට හෝ දිය හැකිව තිබුනි. එය එසේ කරන්නැයි මේස්ටර් ඒමන් දැඩිව ඉල්ලා සිටිමුත් රොබ් ඒ ගැන අසන්නටවත් කැමැති නොවීය. "මගේ තාත්තා කවදාවත් වින්ටර්ෆෙල් බලකොටුව අස්සෙ සුරක්ෂිතව හැංගිලා එයා වෙනුවෙන් සටන් කරන්ටයි මැරෙන්ටයි මිනිස්සු යවන්නෙ නෑ." ඔහු රොබ් උතුමානන් ගේ හඬින් කීවේය.

ඇත්තෙන්ම, දැන් බ්‍රෑන්ට රොබ් යනු අඩක් ආගන්තුක පුද්ගලයකු විය. ඔහු තවමත් සිය දහසය වන විය සපුරා නොතිබුනු නමුදු දැනටමත් උතුමානන් කෙනෙකු බවට පරිවර්තනය වී තිබුනි. ඔවුන් ගේ පියාගේ ධජ දරන යටත් වංශාධිපන්ට පවා ඒ බව හැඟුනු බවක් පෙනෙන්නට තිබුනි. මේ බොහොමයක් වංශාධිපතීන් නොයෙක් නොයෙක් ක්‍රම භාවිත කරමින් ඔහුව පිරික්සුමට ලක්කලෝය. රූස් බෝල්ටන් හා රොබර්ට් ග්ලවර් යන දෙදෙනාම හමුදාවේ නායකත්වය තමන්ට පවරන්නැයි ඉල්ලා සිටියෝය. පළමුවැන්නා රළු පරළු ගොරෝසු ස්වරයෙනුත් දෙවැන්නා මුවේ සිනහවක් ඇතුව විහිළු ස්වරයෙනුත් මේ ඉල්ලීම කර තිබුනි. පිරිමියකු මෙන් වානේ මුදු සන්නාහයෙන් සැරසුනු තරබාරු, පැසුනු හිසකෙස් ඇති මේජ් මෝර්මන්ට් රොබ්ට කියා සිටියේ ඔහු ඇයගේ මුණුබුරා වන්නට තරම් ලාබාල බවයි. ඇයට අණ දෙන්නට තරම් ඔහුට හැකියාවක් නොමැති අතර... අවශ්‍ය නම් සිය මිණිබිරිය ඔහුට විවාහ කරදෙන්නට තමා සූදානම් බව ද ඇය කියා සිටියාය. මෘදු හඬින් කතා කරන සර්වින් උතුමානන් ඇත්තෙන්ම ඔහුගේ දියණිය ඔහුත් සමග කැඳවාගෙන විත් තිබුනි. තරබාරු, චාම්, වයස තිහක දැරියක වූ මේ දියණිය සැමවිටම කෑම මේසයේ සිය පියාණන් ගේ වම්පසින් අසුන්ගත් අතර කිසිවිටෙකත් කෑම පිඟානෙන් දෑස් ඉවතට නොගත්තා ය. සෙල්ලක්කාර හෝර්න්වුඩ් උතුමානන්ට දියණියක් නොසිටියා ය. එනමුදු ඔහු සෑම දිනෙකම විවිධ තෑගි රැගෙන එන්නට පටන්ගත්තේ ය. එක් දිනෙක අශ්වයෙක්, ඊළඟ දවසේ මුව ගාතයක්, ඊටත් පසු දවසේ රිදී ආලේපිත දඩයම් හොරණෑවක් ආදි තෑගි ඒ අතර විය. ඔහු මේ තෑගි වෙනුවෙන් කිසිදු ප්‍රත්‍යුපකාරයක් බලාපොරොත්තු නොවීය... ඔහුගේ සීයාගෙන් උදුරාගත් කුඩා බලකොටුවක් ආපසු ලබාගැනීම, කුමක්දෝ කළුගැටයකින් මෙහා දඩයම් අයිතිය ලබාගැනීම, සුදු ගංගාවේ වේලි බඳින්නට අයිතිය ලබාගැනීම වැනි සුළු සුළු කාරනා කිහිපයක් හැරෙන්නට කිසිදු ප්‍රත්‍යුපකාරයක් බලාපොරොත්තු නොවීය.

රොබ් මේ සැමදෙයකටම සන්සුන් ආචාරශීලී ස්වරයෙන් පිළිතුරු ලබා දුන්නේය. ඔවුන් ගේ පියා සිදුකරතැයි බලාපොරොත්තු වන අයුරින්ම ඒවාට මුහුණ දුන්නේය. කෙසේ හෝ අන්තිමේදී ඔහු මේ සැවොම ඔහුගේ අණසකට යටත් කරගත්තේ ය.

**Robb Stark: “You are the lord in Winterfell now. You must take my place, as I took Father’s, until we come home.”**

හමුදා පෙළපාලියේදී තමාව හෝර්න්වුඩ්වරුන්ට හෝ සර්වින්වරුන්ට පසුපසින් තැබුවහොත් තම මිනිසුන්ද රැගෙන පිටව යන බවට අම්බර් උතුමානන් - ඔහුගේ මිනිසුන් විසින් 'ග්‍රේට්ජොන්' යනුවෙන් හැඳින්වූ, හොඩෝර් තරම්ම උස එමෙන් දෙගුණයක් පමණ තරබාරු වූ අම්බර් උතුමානන් - විසින් තර්ජනය කල අවස්ථාවේ කැමැති දෙයක් කරගන්නැයි රොබ් ඔහුට කීවේය. "ඒ වගේම, අපි ලැනිස්ටර්ලාත් එක්ක යුද්ධ කරලා ඉවර වුනාට පස්සෙ," ග්‍රේ වින්ඩ් ගේ කණ පිටුපස කසමින් ඔහු පොරොන්දු වූයේය. "අපි උතුරට හමුදා මෙහෙයවලා, ඔබව ඔබේ බලකොටුවෙන් එලවලා, ඔබව එල්ලලා මරනවා පොරොන්දු කඩකිරීම නිසා." කේන්තියෙන් අවලාදයක් නැගූ ග්‍රේට්ජොන්, අත තිබුනු ඒල් ගුරුලේත්තුව ගිනි උඳුනට විසි කර රොබ් වනාහි මොකුත් නොදන්නා, මෝඩ, කුඩා කොල්ලෙක් පමණක් යැයි ගුගුලේය. ඔහුව සන්සුන් කිරීම පිණිස හැලිස් මොලන් ඒ වෙත ළඟා වූ විට ඔහුට බිම වැටෙන්නට පහරක් දුන් ග්‍රේට්ජොන්, මේසයක් පෙරලෙන්නට පයින් පහරක් ගසා බ්‍රැන් විසින් මෙතෙක් කලකට දැක තිබුනු දැවැන්තම හා අවලක්ෂණම මහා අසිපත එළියට ඇදගත්තේ ය. දිගු බංකුවල අසුන්ගෙන ආහාර ගනිමින් සිටි ඔහුගේ පුතුන්, සොයුරන් හා සෙබළුන් සැනෙන් නැගිට සිටියේ තම අසිපත්වලට අත යැවූහ.

එනමුදු රොබ් සිහින් හඬින් යමක් කීවා පමණි. ඇසිපිය ගසන මොහොතක හා ගෙරවීමක පමාවෙන් අම්බර් උතුමානන් උඩුබැල්ලෙන් බිම වැටී සිටියේය. ඔහුගේ අසිපත අඩි කිහිපයක් දුරට විසි වී තිබුනු අතර ග්‍රේ වින්ඩ් විසින් සපා කෑ අතේ අතැඟිලි දෙකක් අහිමිව එතැනින් ලේ පෙරෙමින් තිබුනි. "මගේ තාත්තා මට උගන්නලා තියෙන හැටියට නම් තමන්ගෙ උසස් වංශාධිපතියා ඉදිරියේදී ආයුධයක් ඇදගන්න එකාට හිමිවෙන්නෙ මරණය." රොබ් කීවේය. "ඒ වුනත් මම හිතන්නෙ ඔබ ඔය කඩුව ඇදගන්ට ඇත්තෙ මගේ මස් කෑල්ල කපලා දෙන්ට වෙන්ට ඕන." සිය ඇඟිලි කොට දෙක මුවේ රුවා උරමින්, ග්‍රේට්ජොන් තතනමින් නැගිටිද්දී බ්‍රැන්ගේ සිරුරේ ලේ වතුර විය... එනමුදු, ඊළඟ මොහොතේ මහත් පුදුමයකට මෙන් මේ දැවැන්ත මිනිසා කොක් හඬලමින් සිනාසෙන්නට පටන්ගත්තේ ය. "ඔබේ මස් කෑල්ල බොහොම හයියයි නෙ." ඔහු ගුගුලේය.

කෙසේ වුවද මේ සිදුවීමෙන් පසු ග්‍රේට්ජොන් රොබ්ගේ දකුණු අත බවට පත් විය. මේ ළමා උතුමානන් ඇත්තෙන්ම නියමම ස්ටාර්ක් කෙනෙකු බවත්, තම ජීවිතයට ආසාවක් ඇත්නම් ඔහුට දණ නමා පක්ෂපාතීත්වය දැක්වීම වඩාත්ම සුදුසු දෙය බවත් ඔහු හමුවන සෑම කෙනෙකුටම කීවේය.

එනමුදු එදා රෑ, මහා ශාලාවේ දැල්වුනු පන්දම් එකින් එක නිවී යද්දී, ඔහුගේ සොහොයුරා සුදුමැලි වී ගිය වතින් හා වෙවුලන සිරුරින් යුතුව බ්‍රැන්ගේ නිදන කාමරයට පැමිණියේ ය.

"මම හිතුවෙ එයා මාව මරන්ට තමා යන්නෙ කියලා." රොබ් ඔහුට පාපොච්චාරණය කලේය. "ඔයා දැක්කද එයා හැල්ව බිම දාපු හැටි? හරියට හැල් නිකං රිකන් තරම් පුංචි එකෙක් වගෙයි තල්ලු කලේ. දෙයියම්පා! මම හොඳටම බයවුනා. අනික ශ්‍රේට්ජොන් නෙවෙයි ඕතැන ඉන්න හයානකම එකා. එයා හයියෙන් කෑගහනවා විතරයි. රූස් උතුමානන් කවදාවත් වචනයක්වත් කතා කරන්නෙ නෑ. නිකංම මා දිහා බලනවා විතරයි. ඒ වුනත් ඒ වෙලාවට මට මතක් වෙන්නෙ එයාලගෙ අර ඩ්‍රෙඩ්ෆෝර්ට්වල තියෙනවයි කියන කාමරේ. බෝල්ටන්ලා තමන්ගෙ හතුරෝ මරලා හමගහලා ඒ හම් එල්ලලා තියෙනවයි කියන කාමරේ."

"ඒක නාකි ආයම්මගෙ කතාවක් විතරයි නෙ." බ්‍රෑන් කීවේය. ඔහුගේ ස්වරයේ සැකයක සේයාවක් තැවරී තිබුනි. "එහෙම නේද?"

"මම දන්නෙ නෑ." රොබ් දුබල අයුරින් හිස සෙලවීය. "සර්වින් උතුමානන් හිතාගෙන ඉන්නෙ එයාගෙ දුවව අපිත් එක්ක දකුණට එක්කරන් යන්ටයි. එයා කියන්නෙ නම් ඒ එයාට කෑම උයන්ට කියලයි. ඒ වුනාට තියන් නම් කියන්නෙ එක රෑක ඒ කෙල්ල මගේ ඇඳට නැගලා ඉන්නවා මට හම්බවෙයි කියලයි... තාත්තා මෙහෙ හිටියානම්..."

ඒ වනාහි ඔවුන් සැමටම එකඟ විය හැකි කරුනක් විය. බ්‍රෑන්ට ද, රිකන්ට ද, රොබ් උතුමානන්ට ද යන මේ සියල්ලන්ටම සිය පියාණන් එහි නැති අඩුපාඩුව තදින්ම දැනුනි. එනමුදු එඩාර්ඩ් උතුමානන් සිටියේ ලීග දහස් ගණනක් දුරිනි. ඔහු දඟගෙයක දැමූ සිරකරුවෙකු, තම දිවි බේරාගැනීම සඳහා සැඟවී පලායන්නෙකු, නැතිනම් දැනටමත් මියගිය අයෙකු විය. ඔහුට අත් වූ ඉරණම ගැන කිසිවෙකුත් හරියටම නොදත්හ. සෑම සංචාරයකයකුම එකිනෙකට වෙනස් කතාවක් කියන්නට වූහ. ඒ සෑම කතාවක්ම පෙර එකට වඩා බිහිසුණු පුවතක් විය. හෙලි වල ඇමිනූ පියාගේ සෙබළුන් ගේ හිස් රතු බලකොටුවේ පවුරේ ගසා තිබුනි. පියාගේ අතින් රොබර්ට් රජතුමා මියගොස් තිබුනි. බරතියන්වරු කින්ග්ස් ලෑන්ඩින්ග් වටලෑම පිණිස පැමිණෙමින් තිබුනි. එඩාර්ඩ් උතුමානන් රජතුමා ගේ නපුරු සොහොයුරා වන රෙන්ලි උතුමානන් සමගින් දකුණට පලාගොස් තිබුනි. ආර්යා හා සන්සා දඩබල්ලා අතින් මියගොස් තිබුනි. අම්මා විසින් පුංචි යකා ටිරියන්ව මරා ඒ සිරුර රිවර්රන්හි පවුරේ එල්ලා තිබුනි. ටයිවින් ලැනිස්ටර් උතුමානන් ඉයරී වෙත යමින් මගදිගට හමුවන සියළු දේ ගිනිබත් කරමින්, මිනිසුන් මරාදමනු ලැබීය. එක් බේබදු සංචාරකයකු මේ සැමටම එහා යමින් කියා සිටියේ මළවුන්ගෙන් නැගිට පැමිණි රේගාර් ටාර්ගේරියන් සිය පියාගේ සිහසුන නැවත ලබාගනු වස් පුරාණ වීරයන්ගෙන් සමන්විත සේනාවක් ඩ්‍රැගන්ස්ටෝන්හි එක්රැස් කරමින් සිටින බවයි.

ග්‍රේට්ජොන් අම්බර්

අන්තිමේදී, කපුටකු අත සන්සා ගේ අත් අකුරින් ලියූ, පියාගේ මුද්‍රාව තැබූ ලිපිය ලැබුනු විට ඒ කුරිරු සත්‍යය ප්‍රබන්ධය තරම්ම විස්මයජනක විය. සිය සොයුරිය ගේ අත් අකුරින් ලියැවුනු ලිපිය කියවද්දී රොබ්ගේ මුහුණේ ඇඳුනු හැඟීම් බ්‍රැන්ට කිසි දිනෙකත් අමතක නොවනු ඇත. "එයා කියනවා තාත්තා රජතුමාගෙ සහෝදරයිනුත් එක්ක එක්කහු වෙලා රාජද්‍රෝහි වැඩක් කරලා තියෙනවයි කියලා. රොබර්ට් රජතුමා මැරිලා. අම්මවයි මාවයි කින්ග්ස් ලැන්ඩින්ග්වලට කැඳවලා තියෙනවා ජොෆ්රිට පක්ෂපාතියි කියලා දිවුරුම් ගන්ට. එයා කියනවා අපට ලැනිස්ටර්ලාට පක්ෂපාතී වෙලා ඉන්ටලු. එයා ජොෆ්රිව කසාද බැන්දහම එයා අපේ තාත්තගෙ ජීවිතේ වෙනුවෙන් ජොෆ්රිට බැගෑපත් වෙන්නම්ලු." ඔහුගේ දැත් මිට මෙලැවී ගිය අතර ඊට මැදි වූ සන්සා ගේ ලිපිය පොඩි වී ගියේය. "අනික එයා ආර්යා ගැන මොකුත් කියන්නෙ නෑ. මොකුත්ම නෑ. අඩුමගානෙ වචනයක් වත් නෑ. මෙකි යකාටම ගියාවෙ! මේ කෙල්ලට මොකක්ද වෙලා තියෙන්නෙ?"

බ්‍රැන්ගේ සියොලඟම වෙලාගෙන සීතලක් පැතිරෙන්නට විය. "එයාට එයාගෙ වෘකයා නැතිවුනා." ඔහු දුබල අන්දමින් කියාගත්තේ ය. ලේඩිගේ ඇටකටුත් රැගෙන පියාගේ සෙබළුන් සිවුදෙනෙකු දකුණුකරයේ සිට පැමිණි දවස බ්‍රැන්ට සිහිපත් විය. ඔවුන් දිය අගල තරණය කරන්නටත් පෙරාතුවම සමර්, ග්‍රේ වින්ඩ් හා ෂැගී ඩෝග් දුක්මුසු අසරණ ස්වරයකින් උඩුබුරලන්නට පටන් ගත්හ. මුල් බලකොටුවේ සෙවනැල්ල යට පුරාණ සුසාන භූමියක් පිහිටා තිබුනි. එහි වූ සොහොන් කොත් මේ වනවිට ලයිකනයෙන් වැසී ගොස් තිබුනි. පුරාණ ශීත රජවරුන් විසින් සිය විශ්වාසවන්ත සේවකයින් වල දැමීමට තෝරාගෙන තිබුනේ මේ ස්ථානය විය. ඇගේ සොහොයුරන් නොසන්සුන් සෙවනැලි මෙන් සොහොන් කොත් අතර එහා මෙහා සැරිසරද්දී ඔවුහු ලේඩිගේ ඇටකටු එහි භූමිදාන කලෝය. ඇය දකුණුකරයට ගිය අතර නැවත පැමිණියේ ඇගේ ඇටකටු පමණි.

ඔවුන් ගේ සීයා, පුරාණ රිකාර්ඩ් උතුමානන් ද මෙලෙසම දකුණුකරයට ගියේය. සිය පියාගේ වැඩිමහල් සොයුරා වූ ඔහු පුත් බ්‍රැන්ඩන් හා හොඳම සෙබළුන් දෙසිය දෙනෙකු ද ඒ සමගින් දකුණ බලා ගියහ. මේ කිසිවෙකුත් නැවත පැමිණියේ නැත. ඔවුන් ගේ පියා සන්සා හා ආර්යා ද කැටුව දකුණ බලා ගියේය. ඒ සමගින් ජොරී, හලන්, මහත ටොම් හා අනිකුන් ද කැටුව ගියේය. ඊට පසු අම්මා හා සෙර් රඩ්‍රික් දකුණ බලා ගියහ. මේ කිසිවෙකුත් තවමත් නැවත පැමිණියේ නැත. ඉතින් දැන් රොබ් ද දකුණ බලා යන්නට

සැරසේ. ඒ කින්ග්ස් ලැන්ඩින්ග් කරා ගොස් රජතුමාට පක්ෂපාතීත්වය දක්වන්නට නොවේ. ඔහු යන්නේ අසිපතක් සුරතින් ගෙන රිවර්රන් වෙතටය. එමෙන්ම ඔවුන් ගේ පියා ඇත්තෙන්ම දැන් සිරකරුවෙකු නම් එහි තේරුම නිසැකයෙන්ම ඔහුගේ මරණයයි. මේ සිතුවිල්ල විසින් බ්‍රැන්ව කියාගත නුහුනු තරමට බිය වැද්දූවේ ය.

* * *

"ඉතින්, රොබ්ට යන්ටම වෙනවානම් එයාව පරිස්සමින් බලාගන්ට." බ්‍රැන් පුරාණ දෙවිවරුන්ගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියේය. ඔවුහු හදවෘක්ෂයේ වූ රත් පැහැ දෑස් තුළින් ඔහු දෙස බලා සිටින්නට විය. "ඒ වගේම, එයාගෙ මිනිස්සුන්වත් බලාගන්ට. හැල්, ක්වෙන්ට්, අනිත් අය, අම්බර් උතුමානන්, මෝර්මන්ට් ආර්යාව, අනිත් උතුමන් හැමෝමත් බලාගන්ට. ඒ වගේම තියන්වත්. එයාලව පරිස්සමින් බලාගන්ට. එයාලව ආරක්ෂා කරන්ට. ඔබතුමන්ලාගෙ අමනාපයක් නැත්තම් දෙවිවරුනි, එයාලට උදවු කරන්ට ලැනිස්ටර්ලාව පරද්දලා තාත්තාව බේරගෙන ගෙදර එක්කරන් එන්ට."

දෙවිවනය පුරා මුදු පවනක් හමා ගිය අතර රතු පැහැ කොළ සිලි සිලි සරින් සැලෙමින් කොඳුරන්නට වන්හ. සමර් දත් විලිස්සුවේය. "ඔයාට එයාලව ඇහෙනවද දරුවො?" කටහඬක් විමසීය.

බ්‍රැන් වහා හිස එසවීය. පොකුණ එහා ඉවුරේ වූ පුරාණ ඕක් ගසක් යට ඕෂා සිටගෙන සිටියාය. ගසේ කොළ වල සෙවනැල්ලෙන් ඇගේ මුහුණ වැසී ගොස් තිබුනි. යකඩ දම්වැල් ලූ විට පවා මේ වනචාරියා බැළලියක මෙන් නිසලව ඇවිදීමට දත්තාය. පොකුණ වටා ගිය සමර් ඇය දෙසට ඉව ඇල්ලුවාය. උස් ගැහැණිය බියෙන් ඇකිළී ගියාය.

"සමර්, මා ගාවට වරෙන්." බ්‍රැන් කීවේය. අන්තිම වරටත් ඉව කර බැලූ වෘකයා ආපසු හැරී බ්‍රැන් වෙතට පැමිණියේය. බ්‍රැන් ඌ වටා දෑත් යවා ඌව තුරුළු කරගත්තේ ය. "උඹ මොනාද මෙතන කරන්නෙ?" වෘකවනයේදී ඇයව පණපිටින් අල්ලාගත් දාට පසු මේ වන තෙක් ඔහු ඇයව දැක නොතිබිනි. ඇයව කුස්සියේ රාජකාරි පිණිස යෙදවූ බව පමණක් ඔහු දැන සිටියේය.

"මෙයාලා මගෙත් දෙවියො." ඕෂා කීවාය. "ප්‍රාකාරෙට එහා පැත්තට ගියාම මෙයාලා තමා ඉන්න එකම දෙවිවරු." ඇගේ දුඹුරු පැහැ කෙස් කළඹ මේ වනවිට නැවත වැඩෙමින් තිබූ අතර ඒ නිසා ඇයට වඩා වැඩි ගැහැණු පෙනුමක් ලැබී තිබුනි. එමෙන්ම ඇගේ පදම් කල සම් හා මුදු දම්වැල් සන්නාහය ඇගෙන් ඉවත් කල ඔවුහු ඇයට සරල, වාම්, දුඹුරු පැහැ හණ රෙද්දෙන් නිමැවූ ඇඳුමක් ලබා දී තිබුනි. එයද ඇගේ ගැහැණු ගතිය මනාව ඉස්මතු කලේය. "ගේජ් මට ඉඩදෙනවා සැරින් සැරේ මෙහාට ඇවිල්ලා යාඥා කරන්ට. මට එහෙම ඕනකමක් ඇතිවුනාම. ඉතින් මම එයාට ඉඩදෙනවා මගේ සාය අස්සට රිංගලා කැමැති දෙයක් කරගන්ට. එයාට එහෙම ඕනකමක් ඇතිවුනාම. ඒක මට අලුත් දෙයක් නෙවෙයි. එයාගෙ අත්වලින් එන පිටි පුසුඹට මම කැමැතියි. අනික එයා ස්ටිව්ට වඩා කරුනාවන්තයි." ඇය දරදඬු අයුරින් හිස නැමුවාය. "මම දැන් පිටවෙලා යන්නම්. හට්ටි මුට්ටි සුද්ද කරන්ට තියෙනවා."

"එපා. ඉදපන්." බ්‍රැන් ඇයට විධාන කලේය. "උඹ මොකක්ද අර දෙවියන්ව ඇහෙනවද කියලා කිවුවෙ? මට ඒක තේරුම් කරලා දීපන්."

ඕෂා ඔහුව නිරීක්ෂණය කලාය. "ඔබ එයාලගෙන් ඉල්ලුවා. එයාලා උත්තර දුන්නා. ඔබේ කණ් දෙක හොඳට ඇරගෙන ඇහුම්කන් දෙන්ට. එතකොට ඔබට ඇහෙයි."

බ්‍රැන් නිසලව හිඳ සවන් දුන්නේය. "ඒ හුළඟ විතරනෙ." මඳ වේලාවකට පසු ඔහු අතීරණයෙන් මෙන් කීවේය. "හුළඟට කොළ හෙලවෙනවා."

"දෙවියන් නෙවෙයි නම් ඔය හුළඟ එවන්නෙ වෙන කවුරු කියලාද ඔබ හිතන්නෙ?" ඇය ඔහුට මුහුණ ලා පොකුණ අනිත් පස බිම හිඳගත්තේ ය. ඇය සෙලවෙන විට සිහින් ක්ලින්ක් හඬක් නැංවින. මික්කෙන් විසින් ඇගේ දෙපාවල වලළුකරට යකඩින් කල මාංචු ලා ඒ දෙක බරැති යකඩ දම්වැලක් මගින් එකතුකර තිබුනි. ඇයට කෙටි පියවර තබමින් අපහසුවකින් තොරව ඇවිදිය හැකිවිය. එනමුදු ඇයට දුවන්නට හෝ ගසකට නගින්නට හෝ අසෙකු පිට නගින්නට හෝ හැකියාවක් නොවීය. "එයාලට ඔබව පේනවා දරුවො. එයාලට ඔබ කතාකරන දේ ඇහෙනවා. අර කොළ හෙලවෙන සද්දෙ, ඒ එයාලා ඔබට ආපිට උත්තර දෙන සද්දෙ."

"එයාලා මොනවද කියන්නෙ?"

"එයාලා දුකින් ඉන්නෙ. ඔබේ සහෝදරයාට එයාලගෙන් උදවු ගන්ට බෑ. එයා යන පැත්තෙ හැටියට ඒක කරන්ට බෑ. පුරාණ දෙවිවරුන්ට දකුණුකරේදි කිසිම බලයක් නෑ. එහෙ තිබ්බ වයර්වුඩ් ගස් හැම එකක්ම අවුරුදු දාස් ගානකට කලින්ම කපලා දාලා ඉවරයි. එයාලගෙ ඇස් නැතුව කොහොමද එයාලා ඔබේ සහෝදරයා ගැන හොයලා බලන්නෙ?"

රුස් බෝල්ටන්

බ්‍රැන් මේ ගැන කිසිම විටෙක සිතා බලා නොතිබුනි. එය ඔහුව බියපත් කලේය. දෙවියන්ට පවා ඔහුගේ සොහොයුරාට උදවු කල නොහැකි කල, තවත් එහි ඇති බලාපොරොත්තුව කුමක්ද? සමහරවිට ඕෂාට ඔවුන්ව වැරැදියට ඇසුනා වන්නට ඇත. හිස පසෙකට ඇල කල ඔහු නැවත වරක් වඩා හොඳින් සවන් දෙන්නට උත්සාහ කලේය. සුළඟේ තැවරී තිබුනු දුක්මුසු ස්වරය මෙවර තමාට හඳුනාගන්නට හැකිවිනැයි ඔහු කල්පනා කලේය. එනමුදු එයින් ඊට වඩා වැඩි යමක් උකහා ගන්නට නොහැකි විය.

කොළ සෙලවෙන හඬ හදිසියේම වැඩි වන්නට විය. බිම වැටුනු කොළ නිසා මැඩුනු පියවර හඬක් හා පහත් මිමිනුම් හඬක් ඔහුට ඇසෙන්නට විය. ඊළඟ මොහොතේ ගස් අතරින් හොඩෝර් මතුවිය. ඔහු නිරුවතින් සිටි අතර මුවේ සිනාවක් රැඳී තිබුනි. "හො-ඩෝ-ර්!"

"එයාට අපේ කටහඬවල් ඇහෙන්ට ඇති." බ්‍රැන් කීය. "හොඩෝර්. උඹට ඇඳුම් අමතක වෙලා."

"හො-ඩෝ-ර්." හොඩෝර් එකඟ විය. ඔහුගේ ගෙලින් පහළ සිරුර පුරා දියබිඳු බේරෙමින් තිබුනු අතර සීතල වාතය නිසා එයින් වාෂ්පයක් මතුවන්නට විය. ඔහුගේ සිරුර පුරාම සත්ත්ව සමක මෙන් ඝනකම් දුඹුරු පැහැ ලොමින් වැසී තිබුනි.

ඕෂා නොරිස්සුම් සිනහවකින් යුතුව ඔහු දෙස බැලුවාය. "මෙන්න ඉන්නවා ලොකු මිනිහෙක්. එයාට අනිවාර්යයෙන්ම යෝධයින්ගෙ ලේ තියෙන්ට ඕන. මම ඕන ඔට්ටුවක් දානවා."

"මේස්ටර් ලුවින් කියන්නෙ යෝධයො තවදුරටත් නෑ කියලයි. එයා කියන්නෙ යෝධයොත් වනාන්තරයේ දරුවන් වගේම වඳ වෙලා ගිහිල්ලා කියලා. ඉතුරුවෙලා තියෙන එකම දේ පොළොව යට තියෙන එයාලගෙ ඇටකටු විතරයි."

"මේස්ටර් ලුවින්ට ප්‍රාකාරෙන් එහා පැත්තට යන්ට කියන්ටකො. එතකොට එයාට යෝධයො හම්බවෙයි. එහෙමත් නැත්තං යෝධයින්ට එයාව හම්බවෙයි. මගේ අයියා එකපාරක් එකෙක්ව මැරුවා. ඒකි අඩි දහයක් උසයි. ඒ වුනත් ඒකි කුරුමිට්ටි යෝධයෙක්. උං අඩි දොළහක් නැත්තං දහතුනක් විතර උස යනවා කියලයි කියන්නෙ. උං හරිම බිහිසුනු සත්තු. දිග ලෝමයි, දිග දතුයි. ගෑණුන්ටත් පිරිමින්ට වගේම රැවුල් තියෙනවා. ඒ නිසා උංව වෙන්කරලා අඳුරගන්ට බෑ. උංගෙ ගෑනු මිනිස් පිරිමින්ව තියාගන්නවා ආදරවන්තයො විදියට. ඒකෙන් තමා ඔය බාග යෝධයො බිහිවෙන්නෙ. උං අල්ලගන්න මිනිස් ගෑනුන්ටනං අත්වෙන්නෙ ඊට වඩා දරුණු ඉරණමක්. උං කොච්චර ලොකුද කියනවානං දරුවෙක් ලැබෙන්ට තියා ඒ ගැන හිතන්ටත් කලින්ම ගෑනු මැරෙනවා." ඇය විරිත්තුවා ය. "ඒ වුනත් මම මේ කියන්නෙ මොකක් ගැනද කියලා ඔබට තේරෙන්නෙ නෑ නේද දරුවො?"

"මට තේරෙනවා." බ්‍රැන් තිර කොට කීවේය. සහවාසය යනු කුමක්දැයි ඔහු දැන සිටියේය. අංගනයේ සුනඛයින් හා ඉස්තාලවල අසුන් එය සිදුකරනු ඔහු දැක තිබුනි. එනමුදු ඒ ගැන මෙලෙස කතාකිරීම නිසා ඔහුට අපහසුතාවක් දැනෙන්නට විය. ඔහු හොඩෝර් දෙස බැලුවේය. "ගිහින් උඹේ ඇඳුම් ටික අරන් වරෙන් හොඩෝර්. පලයන්, ගිහින් ඇඳගනින්."

"හො-ඩෝ-ර්." ගසක පහත් අත්තක් යටින් දෙකට නැමුනු හොඩෝර් ආ මගින්ම නැවත යන්නට ගියේය.

ඔහු ඇත්තෙන්ම බිය සිතෙන තරම් දැවැන්ත මිනිසෙකියි ඔහු යන දෙස බලමින් බ්‍රැන් කල්පනා කලේය. "ඇත්තටම ප්‍රාකාරෙන් එහා පැත්තෙ යෝධයො ඉන්නවද?" ඔහු දෙගිඩියාවකින් මෙන් ඕෂාගෙන් විමසීය.

"යෝධයොයි, යෝධයින්ටත් වඩා භයානක දේයි පුංචි උතුමානනි. ඔබේ සහෝදරයා මගෙන් ප්‍රශ්න කරද්දී මම මේ ගැන කියන්ට උත්සාහ කලා. එයයි, ඔබේ මේස්ටරුයි, අර නිතරම හිනාවෙන ග්‍රේජෝයි කොල්ලයි. සීතල හුළං එන්ට එන්ටම වැඩිවෙනවා. මිනිස්සු තමන්ගෙ ගිනිමැල ගාවින් නැගිටලා ගියොත් ආයෙමත් එන්නෙ නෑ... එහෙම නැත්තං උං ආපහු ආවොත් උං තවදුරටත් මිනිස්සු නෙවෙයි. නිල් පාට ඇසුයි, කළු පාට සීතල අතුයි තියෙන මළ මිනිස්සුන්ට පරිවර්තනය වෙලා. ස්ටිවුයි, හාර්ලියි, අර අනිත් මෝඩයො රළයි එක්ක මම දකුණට දුවගෙන ආවෙ ඇයි කියලාද ඔබ හිතන්නෙ? මැන්ස් හිතනවා උනුත් එක්ක හටන් කරන්ට. නිර්භීත, මුරණ්ඩු, මෝඩ මිනිහා. ඌ හිතනවා ඇති ධවල යාත්‍රිකයො කියන්නෙ නිශා රැකුමේ මුර සංචාරකයො වගේ ජාතියක් කියලා. ඒ වුනත් ඌ මොනාද දන්නෙ? ඌ කැමැතිනං ඌට පුළුවන් ප්‍රාකාරෙන් එහා රජ්ජුරුවො කියලා තමන්ටම කියාගන්ට. ඒ වුනත් ඌ හෙවනැලි කුළුණෙන් පැනලා ගිය නාකි කළු කපුටෙක් විතරයි. ඌ කවදාවත් හරිහමන් සීත කාලයක් විඳලා නෑ. මම එහෙ ඉපදිච්ච එකියක් දරුවො. මගේ අම්මා, අම්මගෙ අම්මා, එයාගෙත් අම්මා වගේ, අපි හැමෝම නිදහස් මිනිස්සු විදියට එහෙ ඉපදිච්ච අය. අපට හැමදේම මතක තියෙනවා." ඕෂා නැගිට සිටියෙන් ඇගේ දම්වැල් නැවත නද දුනි. "මම උත්සාහ කලා ඔබේ සහෝදරයාට මේ ගැන කියන්ට. මේ ඊයෙ පවා, මම දැක්කා එයා අංගනයේ ඉන්නවා. 'මයෙ ස්ටාර්ක් උතුමානනි' මම එයාට කතා කලා. බොහොම ගරුසරු ඇතිව. ඒ වුනත් එයා මාව දැක්කෙ නෑ වගේ මා දිහා බලන් හිටියා. ඊටපස්සෙ අර මහ දැවැන්තයා, ග්‍රේට්ජොන් අම්බර් මාව එයාගෙ පාරෙන් අහකට තල්ලු කරලා දැම්මා. ඉතිං එච්චරයි. ඉතිං මම මගේ දම්වැල් ටික දාගෙන මගේ කට වහගෙන ඉන්නං. ඇහුම්කන් දෙන්නෙ නැති මිනිහෙකුට බෑ කිසිම දෙයක් අහන්ට."

"මට කියන්ට. මම රොබ්ට කියන්නම්. මම දන්නවා එයා මට ඇහුම්කන් දෙනවා කියලා."

"එයා එහෙම කරයිද? අපි බලමු. ඔබ එයාට මෙන්න මේක කියන්ට මයෙ උතුමානනි. එයාට කියන්ට එයා ඔය හමුදාවත් අරන් යන්නෙ වැරදි පැත්තටයි කියලා. එයා හරිනම් යන්ට ඕන උතුරු පැත්තට. උතුරට. දකුණට නෙවෙයි. ඔබට මං කියන දේ ඇහෙනවද?"

බ්‍රැන් හිස වැනුවේය. "මම එයාට කියන්නම්."

* * *

එනමුදු, එදා රාත්‍රියේ ඔවුන් මහා ශාලාවේ ආහාර ගනිද්දී රොබ් ඔවුන්ට එක් නොවීය. ඔහු ඇතුළු කාමරයක රිකාර්ඩ් උතුමානන්, ග්‍රේට්ජොන් උතුමානන් හා අනිකුත් ප්‍රධාන වංශවතුන් සමගින් අහර ගත්තේය. ඉදිරියට නියමිත දිගු ගමන වෙනුවෙන් අවසන් පිඹුරුපත් සකසන්නට ඔවුන්ට සිදුව තිබුනි. ඔහුගේ අඩුව පුරවාලමින් කෑම මේසයේ මුලසුන ගන්නටත්, කාර්ස්ටාර්ක් උතුමානන් ගේ පුතුන් හා හිතමිතුරන් වෙනුවෙන් ප්‍රධාන සංග්‍රාහකයා වශයෙන් කටයුතු කරන්නටත් බ්‍රැන්ට සිදුවිය. හොඩෝර් විසින් ඔහුව ශාලාවට ඔසවාගෙන විත් මුලසුන අසල දණ නමන විටත් ඔවුන් සැවොම තම තමන්ට නියමිත අසුන්වල වාඩිගෙන සිටියෝය. සේවකයින් දෙදෙනෙකු විසින් ඔහුට කූඩයෙන් පිටතට පැමිණීමට උදවු කරන ලදී. ශාලාව තුළ සිටි සෑම ආගන්තුකයෙකු ගේ ම දෑස් තමා වෙත එල්ල වී ඇති අයුරු බ්‍රැන්ට දැනෙන්නට විය. අවට මුළුමනින්ම නිහඬතාවයෙන් පිරී ගොස් තිබුනි. "මගේ උතුමනි." හැලිස් මොලන් නිවේදනය කලේය. "වින්ටර්ෆෙල් වල බ්‍රැන්ඩන් ස්ටාර්ක්."

"ඔබ හැමදෙනාම අපේ ගිනිමැල වලට සාදරයෙන් පිළිගන්නවා." බ්‍රැන් දරදඬු ස්වරයෙන් කියාගත්තේ ය. "අපේ මිත්‍රත්වයට කරන ගරුකිරීමක් විදියට ඔබලාට කෑමෙනුත් බීමෙනුත් සංග්‍රහ කරනවා."

රිකාර්ඩ් උතුමානන් ගේ පුතුන් අතරින් වැඩිමලා වූ හැරියන් කාර්ස්ටාර්ක් ඇරයුම පිළිගනිමින් හිස නමා ආචාර කලේය. ඊට පසු ඔහුගේ සොහොයුරන්ද ආචාර කලෝය. එනමුදු ඔවුන් නැවතත් අසුන් ගනිද්දී වයින් කුසලාණවල හඬ මධ්‍යයේ ලාබාල පුතුන් දෙදෙනා පහත් මිමිනුම් ස්වරයෙන් එකිනෙකා හා දොඩනු බ්‍රැන්ට ඇසුනි. "... ඒ විදියට ජීවත් වෙනවාට වඩා හොඳයි මැරෙනවා." එඩාර්ඩ් කාර්ස්ටාර්ක් කෙඳිරුවේය. ඔහුගේ සොහොයුරා ටෝරන් කියා සිටියේ මේ කොලුවා පිටතින් මෙන්ම ඇතුළතින් ද බිඳී ගොස් ඇති බවත්, සිය දිවි තොර කරගැනීමට පවා නොහැකි තරම් බියසුල්ලකු බවට ඔහු පත්වී ඇති බවත් ය.

'බිඳිලා ගිහිල්ලා!' සිය පිහියා මිට තදින් මිරිකා ගනිමින් බ්‍රැන් කල්පනා කලේය. ඔහු දැන් පත්වී ඇත්තේ එවැනි තත්ත්වයකට ද? 'බිඳී ගිය බ්‍රැන්?' "මට බිඳිලා යන්ට බෑ." ඔහු සිය දකුණු පසින් අසුන්ගෙන සිටි මේස්ටර් ලුවින්ට කොඳුලේය. "මට නයිට් කෙනෙක් වෙන්ට ඕන."

"සමහර උදවිය මගේ නිකායට කියනවා 'මනසේ නයිට්වරු' කියලා." ලූවින් පිළිතුරු දුන්නේය. "ඔයා බොහොම දක්ෂ දරුවෙක් බ්‍රැන්. විශේෂයෙන්ම ඔයා යමක් ගැන හිත යොමුකරන වෙලාවට. ඔයා කවදාවත් හිතලා තියෙනවද මේස්ටර් කෙනෙක්ගෙ දම්වැලක් පළඳින්ට එහෙම? ඔයාට ඉගෙනගන්ට පුළුවන් දේ සීමාවක් නැති වේවි."

"මට ඕන ඉන්ද්‍රජාලික වැඩ ඉගෙනගන්ට. අර කපුටා මට පොරොන්දු වුනා මට පියාඹන්ට පුළුවන් වෙනවා කියලා."

මේස්ටර් ලූවින් සුසුමක් හෙළීය. "මට පුළුවන් ඔයාට උගන්නන්ට ඉතිහාසය, සුවකිරීම් ගැන, බෙහෙත් පැළෑටි ගැන. මට පුළුවන් ඔයාට උගන්නන්ට කපුටන්ගෙ භාෂාව. කොහොමද බලකොටුවක් ගොඩනංවන්නෙ කියලා. සේලරුවෙක් කොහොමද තරු දිහා බලලා පාර හොයාගන්නෙ කියලා. මට පුළුවන් ඔයාට උගන්නන්ට කොහොමද දවස් මනින්නෙ, කොහොමද සෘතු වෙන් කරන්නෙ කියලා. ඕල්ඩ්ටවුන් වල තියෙන සිටඩෙල් එකට ගියොත් එයාලා ඔයාට තව දාහක් දේ උගන්නාවි. ඒ වුනත් බ්‍රැන්, කිසිම මිනිහෙකුට බෑ ඔයාට ඉන්ද්‍රජාලික උගන්නන්ට."

"දරුවන්ට පුළුවන්. වනාන්තරේ දරුවන්ට පුළුවන්." මේ කතාවත් සමගින් අද දින දහවල් දෙව්වනයේදී තමා ඕෂාට දුන් පොරොන්දුව ඔහුට සිහිපත් විය. ඉදින් ඔහු ඕෂා විසින් තමාට කී සියල්ලක්ම මේස්ටර් ලූවින් හට පැවසුවේය.

මේස්ටර් ඉවසිලිවන්තව මේ සියල්ලටම ඇහුම්කන් දුන්නේය. "මම හිතන්නෙ, මේ වනචාරී ගැනිට පුළුවන් කතන්දර කියන්නෙ කොහොමද කියලා නාකි ආයම්මාට උගන්නන්ට." අන්තිමේදී, බ්‍රැන් කතාව නිමා කල පසු ඔහු කීය. "ඔයා කැමැති නම් මම ඒ ගැනිත් එක්ක ආයෙමත් පාරක් කතා කරන්නම්. ඒ වුනත් ඔයා මේ එක එක විතාර කියලා ඔයාගෙ අයියාට කරදර කරන්නෙ නැතුව ඉන්නවා නම් හොඳයි. යෝධයොයි, කැලේ ඉන්න මැරිච්ච මිනිස්සුයි එක්ක පොර බදනවාට වඩා එයාට වදවෙන්ට ගොඩක් දේවල් තියෙනවා. ඔයාගෙ තාත්තාව අල්ලලා හිරකරන් ඉන්නෙ ලැනිස්ටර්ලා බ්‍රැන්. වනාන්තරයේ දරුවො නෙවෙයි." ඔහු මෘදු අයුරින් බ්‍රැන්ගේ අත මතින් සිය අත තැබීය. "මම කියාපු දේ ගැන පොඩ්ඩක් හිතලා බලන්ට දරුවො."

* * *

දවස් දෙකකට පසු හිම්දිරි පාන්දර පෙරදිග අහස රත් පැහැ ගන්වමින් අරුණෝදය උදාවද්දී බ්‍රැන් සිය අසු වන ඩාන්සර් පිට නැගී වාහල්කඩ අසබඩ අංගනයට ළඟා වූයේය. ඔහු සිය සොහොයුරාට ආයුබෝවන් කියන්නට පැමිණ සිටියේය.

"දැන් ඔයා තමා වින්ටර්ෆෙල්වල උතුමානන්." රොබ් ඔහුට කීවේය. ඔහු අළු පැහැ යුධ සෛන්ධවයකු පිට නැගී සිටියේය. දැවයෙන් තනා යකඩින් ආවරණය කල, සුදු හා අළු පැහැයෙන් යුත් ඔහුගේ පලිස අසුගේ පසෙකින් එල්ලා තිබුනි. පලිස මතුපිට ඔවුන් ගේ වංශ සලකුණ වන දත් විලිස්සාගත් සෝරවෘකයා සිතුවම් කොට තිබුනි. රොබ් පදම්කල සම් ආවරණ හා ඊට උඩින් අළු පැහැ මුදු දම්වැල් සන්නාහයක් පැළැඳ සිටියේය. ඔහුගේ ඉණේ දිගු අසිපතක් හා කිනිස්සක් විය. ලොම්වලින් පෝරු දැමූ දිගු සළුවක් ඔහුගේ උරහිසෙන් එල්ලුනි. "මම තාත්තගෙ තැන ගත්තා වගේ දැන් ඔයා මගේ තැන ගන්ට ඕන. අපි ආපහු එනකම්."

"මම දන්නවා." බ්‍රැන් දුක්මුසු ස්වරයෙන් පිළිතුරු දුන්නේය. මීට පෙර කිසිදිනෙකත් මෙතරම් තනිකමක්, මෙතරම් බියක්, තමා කෙතරම් ක්ෂුද්‍ර ජීවියෙක්දැයි යන හැඟීමක් ඔහු තුළ පහළ වී නොතිබුනි. උතුමානන් කෙනෙකු වන්නේ කෙසේදැයි හාංකවිංසියකවත් දැනුමක් ඔහු තුළ නොවීය.

"මෙස්ටර් ලුවින්ගෙ උපදේශනයට ඇහුම්කන් දෙන්ට. රිකන්ව බලාගන්ට. එයාට කියන්ට යුද්ධෙ ඉවර වුන ගමන්ම මම ආපහු එනවා කියලා."

රිකන් සිය සොයුරාට සමු දීම සඳහා පැමිණීම ප්‍රතික්ෂේප කොට තිබුනි. ඔහු සිය නිදන කාමරයට වී රතු වූ දෑස්වලින් යුතුව විරෝධය දක්වමින් සිටියේය. "නෑ!" රොබ්ට සමුදීම සඳහා ඔහු පැමිණෙන්නේදැයි බ්‍රැන් ඇසූ විට ඔහු කේන්තියෙන් බෙරිහන් දුනි. "කිසිම සමුදීමක් නෑ!"

"මම එයාට කියන්නම්." බ්‍රැන් පොරොන්දු විය. "එයා කියනවා යන කිසිම කෙනෙක් ආපහු එන්නෙ නෑ කියලා."

"එයාට හැමදාමත් පුංචි බබෙක් වෙලා ඉන්ට බෑ. එයා ස්ටාර්ක් කෙනෙක්. දැන් අවුරුදු හතරකටත් කිට්ටුයි." රොබ් සුසුමක් හෙලුවේය. "හොඳයි. අම්මා ඉක්මනටම ගෙදර එයි. මම තාත්තාව ආපහු අරන් එන්නම්. මම පොරොන්දු වෙනවා."

සිය අසු හරවා ගත් රොබ් හැල්මේ අසු පැන්නවීය. කෙට්ටු, වේගවත් ග්‍රේ වින්ඩ් අසු පසෙකින් දුවන්නට විය. සුළඟේ ලෙලදෙන සුදු පැහැ ස්ටාර්ක් ධජය ඔසවාගත් හැලිස් මොලන් ඔවුන්ට ඉදිරියෙන් ගේට්ටුව පසුකලේය. තියන් ග්‍රේජෝයි හා ග්‍රේට්ජොන් අම්බර් රොබ්ගේ දෙපසින් අසුන් විහිදූහ. පේළි දෙකකට සැදුනු ඔවුන් ගේ නයිට්වරු ඒ පසුපස්සේ වැටුනහ. ඔවුන් ගේ ලන්සවල වානේ තුඩු හිරු එළිය වැටී දිදුලන්නට විය.

හදිසියේම බ්‍රැන්ට ඕෂාගේ වදන් මතක් විය. 'එයා ගමන් කරන්නේ වැරැදි දිශාවටයි.' ඔහු කල්පනා කලේය. ඔහු පසුපසින් පිම්මේ අසු විහිදා ගොස් අනතුරු ඇඟවීමක් කරන්නට බ්‍රැන්ට මොහොතකට සිතුනේය. එනමුදු ඊළඟ මොහොතේ රොබ් කටු පැලැල්ල යටින් නොපෙනී ගිය අතර ඒ අවස්ථාව ගිලිහී ගියේය.

බලකොටුවේ පවුරුවලට එහායින් මහත් කලිකලහයක් නැගෙන්නට විය. ඒ පාබල හේවායින් හා නගරවාසීන් විසින් රොබ් වෙනුවෙන් ජයඝෝෂා නගන හඬ බව බ්‍රැන් දත්තේය. ඔවුන් මේ ජයඝෝෂා නංවන්නේ ස්ටාර්ක් උතුමානන් වෙනුවෙනි. සුළඟේ ලෙලදෙන සළුවකින් හා පසෙකින් දුවන ග්‍රේවින්ඩ් ඇතුව දැවැන්ත යුධ අසෙකු පිට නැගී පෙරට යන වින්ටර්ෆෙල්හි උතුමානන් වෙනුවෙනි. ඔවුන් කිසිදිනෙකත් තමා වෙනුවෙන් මෙසේ ජයඝෝෂා නංවන්නේ නොමැති බැව් හදෙහි සියුම් වේදනාවක් ද සමගින් ඔහුට අවබෝධ විය. සිය පියා හා වැඩිමහල් සොහොයුරා බැහැර ගිය විට ඔහු වින්ටර්ෆෙල්හි උතුමානන් වන බැව් සැබෑවි. එනමුදු ඔහු තවමත් 'බිඳී ගිය බ්‍රැන්' මය. සදහටම එය එසේමය. බිම නොවැටී සිය අසු පිටින් බැසීම පවා ඔහුට කල නොහැක්කකි.

අන්තිමේදී ඈතින් ඇසුනු ජයඝෝෂා හඬ කෙමෙන් මැකී ගොස් අංගනය පුරා නිහඬතාව රජයන්නට විය. වින්ටර්ෆෙල් මිනිසුන්ගෙන් තොර, පාළු, අමු සොහොනක් මෙන් දිස්විය. බ්‍රැන් මොහොතක් වටපිට බැලූයේ තමා සමගින් ඉතුරු වී සිටින පිරිසේ මුහුණු පිරික්සා බැලීය. ගැහැණුන්, දරුවන් හා මහල්ලන්... හා හොඩෝර් පමණක් එහි වූහ. මේ දැවැන්ත ඉස්තාල කොලුවා ගේ මුහුණේ කුමක් දෝ අතරමං වූ පෙනුමක් හා බියපත් පෙනුමක් දක්නට ලැබුනි. "හො-ඩෝ-ර්!" ඔහු දුක්මුසු ස්වරයෙන් කීවේය.

**"හො-ඩෝ-ර්." බ්‍රැන් එකඟවිය. ඒ පැවසුමේ කුමක් වන්නට ඇත්දැයි ඔහු විමතියෙන් කල්පනා කරන්නට විය.**

**Maester Luwin: “A man’s worth is not marked by a ser before his name.”**

ඩනේරිස් 06-1

සිය තෘප්තිය විඳ හමාර වූ පසු බාල් ඩ්‍රෝගෝ නිදි පැදුරෙන් නැගිට සිටියේය. ඇය අබියස නැගී සිටි ඔහු කුළුණක් මෙන් උස්ව පෙනුනි. ගිනි කබලෙන් නැගුනු රත් පැහැ ආලෝකය නිසා ඔහුගේ සම ලෝකඩ පැහැයෙන් දිදුලන්නට විය. ඒ පුළුල් පපුවෙහි වූ පැරණි තුවාල කැළැල් සිහින් ඉරි මෙන් දිස් විය. ඔහුගේ උරහිස මත හා පිට දිගේ ලිහිල්ව වැක්කෙරුනු තීන්ත මෙන් කළු පැහැ වූ නොගෙතූ කෙස් වැටිය ඉණෙනුත් පහළට වැටී තිබූ අතර පුරුෂ ලිංගය තෙත්ව දිලිසුනේය. ඒ දිගු උඩු රැවුලට යටින් බාල්ගේ මුව ඇදවී රවමින් තිබින. "ලෝකය පාලනය කරන සෙන්ධවයාට ඔය යකඩ පුටුවලින් ඇති වැඩක් නෑ."

සිය වැලමිටට බර දී එසවුනු ඩැනී ඔහු දෙස බැලුවාය. 'ඔහු කෙතරම් උස් ද. කෙතරම් තේජාන්විත ද.' ඇය වෙසෙසින්ම ඔහුගේ දිගු කේශ කලාපයට ආදරය කලාය. එය කිසිදාක නොකැපූ කෙස් කළඹක් විය. ඔහු කිසිදාකත් පරාජය යනු කුමක්දැයි හඳුනාගත්තකු නොවීය. "අනාවැකියෙ කියැවෙන විදියට මේ සෙන්ධවයා ලෝකෙ කෙලවරටම යනකම් යනවා." ඇය ඔහුට සිහිපත් කර දුන්නාය.

"කළු පාට ලුණු මුහුද ගාවින් ලෝකෙ ඉවර වෙනවා." ඩ්‍රෝගෝ සැනෙන් පිළිතුරු දුන්නේය. සිය ගතේ රැඳි දහදිය හා තෙල් ගතිය පිසදා හරිනු පිණිස ඔහු උණුසුම් දිය පිරි බේසමක රෙදි කැබැල්ලක් බහා තෙමාගත්තේ ය. "කිසිම අශ්වයෙකුට බෑ ඔය වස වතුර හරහා යන්ට."

"නිදහස් නගරවල නැවු දාස් ගානක් තියෙනවා." මීට පෙර අනන්ත වතාවක් කියා ඇති පරිද්දෙන් ඩැනී නැවතත් කීවාය. "ඒවා හරියට කකුල් සිය ගානක් තියෙන ලී අශ්වයො වගේ. උන්ට පුළුවන් පියාපත් විදහලා මුහුද උඩින් පියාඹලා යන්ට."

බාල් ඩ්‍රෝගෝට මේ කිසිවක් අසන්නට උවමනා නොවීය. "මේ ලී අශ්වයොයි යකඩ පුටුයි ගැන අපි ආයෙමත් කතා නොකර ඉම්මු." තෙත් රෙදි කැබැල්ල බිම අතහල ඔහු ඇඳුම් ඇඟලාගන්නට පටන්ගත්තේ ය. "අද දවසේ මම තණ පිටියට යනවා දඩයම් කරන්ට, මගේ බිරිඳ." වර්ණවත් සම් බැනියමක් හැඳ රන්, රිදී හා ලෝකඩින් නිමවූ පදක්කම්වලින් කල පුළුල් ඉණ පටියක් පළඳිමින් ඔහු කීවේය.

"හොඳයි මගේ ඉරයි තරුයි." ඩැනී කීවාය. ඩ්‍රෝගෝ සිය රුධිරාරක්ෂකයින් පිරිවරා හ්‍රක්කාර් හෙවත් තණබිමේ වසන දැවැන්ත සුදු සිංහයා දඩයම් කරනු පිණිස යාමට අදහස් කරගෙන සිටියේය. ඔවුන් දඩයම සාර්ථක කරගෙන ජයග්‍රාහක ලීලාවෙන් නැවත පැමිණියහොත් ඇගේ සැමියා ගේ ප්‍රීතිය අතිමහත් එකක් වනු ඇත. සමහරවිට එවිට ඔහු ඇයට ඇහුම්කන් දෙනු ඇත.

ඔහු කිසිදු වන සතෙකුට බිය නොවීය. කිසිදු මිනිසකුට ද බිය නොවීය. එනමුදු මුහුද යනු වෙනස්ම දෙයක් විය. ඩොත්රැකියන්ට අනුව තම අසුන්ට පානය තල නොහැකි ජලය වනාහි උපද්‍රව සහගත දෙයක් විය. අළු-කොළ පැහැ තැනිතලාවක් මෙන් වූ දැවැන්ත මුහුද ඔවුන් තුළ මිත්‍යා විශ්වාසයන්ගෙන් පිරි පිළිකුලක් ජනිත කලේය. ඩොත්රැකි තැනිතලාවේ වසන අනෙකුත් අස් හිමියන්ට වඩා ඩ්‍රෝගෝ පනස් ගුණයක් නිර්භීත බැව් ඇය මේ වනවිට වටහාගෙන සිටියාය... එනමුදු මේ එයින් එකක් නොවීය. නැවකට නැගීමට ඔහු කෙසේ හෝ නම්මා ගැනීමට ඇයට හැකි වී නම්...

බාල් හා ඔහුගේ රුධිරාරක්ෂකයින් සිය දුනුත් රැගෙන පිටව ගිය පසු ඩැනී සිය සේවිකාවන් කැඳෙවුවාය. තම සිරුර දැන් කෙතරම් තර හා අශෝභන ලෙස ඇයට හැඟුනේද යත් සේවිකාවන් ගේ ශක්තිමත්, බුහුටි දෑත් ඇය සාදරයෙන් පිළිගත්තාය. ටික කලෙකට පෙරදී නම් ඔවුන් ගේ මේ සාත්තු සත්කාර ඇයට මහත් හිසරදයක් වී තිබුනි. ඔවුහු ඇගේ ඇඟ අතුල්ලා, නහවා, ලිහිල් සැහැල්ලු සේද රෙදි ඇගේ ගත දැවටූහ. ඩෝරියා ඇගේ හිස පීරන අතරේ සෙර් ජෝරා මෝර්මන්ට් කැඳවාගෙන එනු පිණිස ඇය ජික්වීව පිටත්කොට හැරියාය.

නයිට්වරයා සැනින් පැමිණියේය. ඔහු අසරුවකුට ගැලපෙන පරිද්දෙන් අශ්ව කෙඳිවලින් වියන ලද කලිසමක් හා වර්ණවත් බැනියමක් හැඳ සිටියේය. ඔහුගේ පුළුල් පපුව හා දෑත් කළු පැහැ දළ රෝමයෙන් ගැවසීගත්තේ ය. "මගේ කුමරියනි. මම මොකක්ද ඔබ වෙනුවෙන් කරන්ට ඕන?"

"ඔබ මගේ සැමියාත් එක්ක කතා කරන්ටම ඕන. ඩ්‍රෝගෝ කියනවා ලෝකය පාලනය කරන සෙන්ධවයාට මේ මුලු ලෝකෙම තියෙන භූමිය ලැබෙනවාලු පාලනය කරන්ට. ඒ වුනත් එයා විස වතුරෙන් එහාට යන්ට කැමැති නැහැ. එයා හිතාගෙන ඉන්නෙ රේගෝ

ඉපදුනාට පස්සෙ බලසාරයත් අරන් නැගෙනහිර පැත්තට යන්ටයි. එයාට ඕන ජේඩ් මුහුද අවට තියෙන බිම් කොල්ලකන්ට."

නයිට්වරයා මොහොතක් වේලා කල්පනා කර බැලීය. "බාල් කවදාවත් රාජධානි සප්තකය දැකලා නෑ. එයාට ඒ නම ඇහුනා කියලා මොකුත් අමුත්තක් දැනෙන්නෙ නෑ. එයා බැරිවෙලාවත් ඒ ගැන හිතුවත් එයාගෙ හිතේ මැවෙන්නෙ පොඩි දූපත් කීපයක් විතරයි. ලෝරාත් හරි ලයිස් හරි වගේ කුණාටු මුහුදෙන් වටවෙලා ගල් කන්දක් උඩ හදලා තියෙන පුංචි නගර කීපයක් කියලා තමා එයාට හිතෙන්නෙ. නැගෙනහිර පැත්තෙ තියෙන වස්තු සම්භාරය ඊට වඩා ආකර්ෂණීයයි."

"ඒ වුනත් එයා බටහිර පැත්තට යන්ටම ඕන." ඩැනී නෂ්ටාපේක්ෂාවකින් යුතුව කීවාය. "අනේ! කරුනාකරලා. එයාට මේක තේරුම් කරලා දෙන්ට මට උදවු කරන්ට." ඩ්‍රෝගෝ පමණක් නොව ඇය පවා රාජධානි සප්තකය යනු කවරාකාරයේ එකක්දැයි කිසිදා දැක නොතිබුනාය. එනමුදු සිය සොහොයුරා ඇයට කියා දුන් කතන්දර අනුව ඒ සෑම තැනක්ම ඇගේ සිතේ මැවී තිබින. ඔහු විසින් මතු යම් කවරදාක හෝ ඇයව නැවතත් එහි කැඳවාගෙන යන බවට විසේරිස් ඇයට පොරොන්දු වී තිබින. එනමුදු ඔහු දැන් මියගිය පුද්ගලයකු වන අතර ඔහුගේ පොරොන්දු ද ඔහුත් සමගම මියගොස් තිබින.

"ඩොත්රැකියො මොකක් හරි දෙයක් කරන්නෙ උන්ට ඕන වෙලාවට. උන්ටම හිතෙන හේතු උඩ. ඉවසලා ඉන්ට කුමාරි. ඔබේ සහෝදරයා කරපු වැරැද්දම කරන්ට යන්ට එපා. අපි දවසක ගෙදර යනවා. මම ඔබට පොරොන්දු වෙනවා."

ගෙදර? මේ වදන ඇගේ සිතේ ශෝකයක් ජනිත කරවන්නට සමත් විය. සෙර් ජෝරාට නම් ඔහුගේ වලස් දූපත ඇත. එනමුදු ඇයට ගෙදර කියන්නට ඇත්තේ කුමක්ද? කතන්දර කිහිපයක්, දිවමතුරක් සේ නැවත නැවතත් ගයන්නට යෙදුනු නම් කිහිපයක්, මතකයෙන් වියැකී යමින් තිබෙන රතු පැහැ දොරක සේයාවක්... එපමණකි. වයෙස් ඩොත්රැක් සදහටම ඇගේ නිවස වන්නට යන්නේද? ඩොෂ් ඛලීන් මැහැල්ලන් දෙස බැලූවිට ඇයට පෙනුනේ ඇගේම අනාගතය ද?

සෙර් ජෝරාට ඇගේ මුහුණේ වූ දුක්මුසු බව පෙනුනා වන්නට ඇත. "ඊයෙ රෑ මහ දැවැන්ත තවලමක් ආවා ඛලීසි. අශ්වයො හාරසීයක්. උන් පෙන්ටොස්වල ඉඳන් නෝර්වොසුයි

කොහෝරුයි හරහා ඇවිල්ලා තියෙන්නෙ. වෙළෙඳ කපිතාන් කෙනෙක් වෙන බයන් වොටිරිස් කියලා එකෙක් තමා මේ තවලමේ නායකයා. සමහරවිට ඉල්ලීරියෝ උන් අතේ මොකක් හරි ලියුමක් එවලා තියෙනටත් පුළුවන්. මොකද කියන්නෙ, අපි බටහිර වෙළෙඳපල පැත්තෙ යමුද?"

ඩැනී කැළැඹුනාය. "ඔවු. මම ඒකට කැමැතියි." තවලමක් පැමිණි සැම විටෙකම වෙළෙඳපල ජීවයෙන් ඇලලී යයි. මේ වෙළෙන්ඳන් කවරාකාරයේ වස්තු සම්භාරයක් මෙවර රැගෙන එන්නට ඇත්දැයි කිසිවෙකුටත් කිව නොහැකි විය. එමෙන්ම මිනිසුන් වැලීරියන් බසින් කතා කරනු අසන්නට ලැබීමත් සිතට සහනයක් විය. එය ඇයට නැවතත් නිදහස් වෙළෙඳ මතක් කර දුනි. "ඉරී. දෝලාවක් ලෑස්ති කරන්ටයි කියලා කියපන්..."

"මම ඔබේ ඛාස් එකේ සෙබළුන්ට කියන්නම්." සෙර් ජෝරා පිටව ගියේය.

ඛාල් ඩ්‍රෝගෝ ඇයත් සමග සිටියේ නම් ඇය සිය වෙළඹ, රිදී පිට නැගී යන්නට තිබින. ගැබිණි මවුවරුන් සිය දරු ප්‍රසූති මොහොත ලංවන තෙක්ම අසුපිට නැගී ගමන් යාම ඩොත්රැකියන් අතර සාමාන්‍ය දෙයක් විය. සිය සැමියාගේ දෑස් හමුවේ තමා දුර්වලයෙකියි පෙන්වන්නට ද ඇයට උවමනා නොවීය. එනමුදු ඛාල් දඩයම් පිණිස පිටව ගොස් ඇති මේ වේලාවේ, සුමුදු කොට්ටවලට හේත්තු වී වයෙස් ඩොත්රැක් හරහා ඔසවාගෙන යනු ලැබීම සුවදායක දෙයක් වනු ඇත. එමෙන්ම රතු පැහැ සේද තිර රෙදි විසින් ඇයව උණුසුම් හිරු එළියෙන් ආවරණය කරනු ඇත. අසු පිට නැගුනු සෙර් ජෝරා ඇය පසෙකින් වැටුනු අතර ඇගේ ඛාස් එකේ තරුණ සෙබළුන් සිවුදෙනා හා ඇගේ සේවිකාවෝ ඒ පසුපසින් පෙළ ගැසුනෝය.

දවස උණුසුම හා වළාකුළු රහිත විය. අහස තද නිල් පැහැයෙන් දීප්තිමත්ව බැබලුනේය. සුළං හමද්දී තණකොළවල හා පසේ ප්‍රණීත සුවඳ ඇගේ නැහැ පුඩුවලට දැනෙන්නට විය. ඩොත්රැකියන් විසින් මංකොල්ලකනු ලැබූ ස්මාරක අබියසින් ඇගේ දෝලාව ඔසවාගෙන යද්දී ඇය මාරුවෙන් මාරුවට හිරු එළියටත් සෙවනැලිවලටත් නිරාවරණය වූවාය. ඩැනී දෝලාවේ පසෙකට හැරී මේ මියගිය විරුවන් ගේ හා නම් අමතකව ගිය රජවරුන් ගේ මුහුණු උනන්දුවෙන් පිරික්සා බැලුවාය. ගිනිගෙන බිමට සමතලා වූ නගරවලින් පැමිණි මේ දෙවිවරුන්ට තවමත් යාඥාවලට පිළිතුරු දීමේ හැකියාවක් ඇත්දැයි ඇය විමතියෙන් කල්පනා කලාය.

'මම මකරාගෙ රුධිරය නොවුනා නම් මේක මගේ ගෙදර වෙන්ට තිබුනා.' ඩැනී උකටලී සිතින් කල්පනා කලාය. ඇය බලසාරයක බලීසි වූවාය. ඇයට ශක්තිමත්, උදාර සැමියකු හා වේගවත් අසෙකු සිටිති. ඇයට සේවය කරන්නට උවමනා තරම් සේවිකාවෝ සිටිති. ඇයව රකින්නට ඕනෑවටත් වඩා රණකාමීහු සිටිති. ඇය මහලු වූ පසු ඩොෂ් ඛලීන්හි ගෞරවාන්විත ස්ථානයක් ඇය වෙනුවෙන් වෙන්වී ඇත... එමෙන්ම මතු යම් දිනෙක මේ මුලුමහත් ලෝකයම පාලනය කරන පුතෙකු ඇගේ ගැබේ සෙමින් වැඩෙමින් සිටියි. සාමාන්‍ය ගැහැණියකට නම් මේ දේවල් ඉහටත් උඩින් වනු ඇත... එනමුදු මකරෙකුට එසේ නොවේ. විසේරිස් මියගොස් ඇති නිසා දැන් මෙලොව වසන අවසාන මකරා - අවසානම මකරා - වන්නේ ඇයයි. ඇය රජවරුන් ගේ හා ආක්‍රමණික ජයග්‍රාහකයින් ගේ බීජයෙන් උපන්නියකි. ඇගේ කුස තුළ සිටින බිළිඳා ද එවැන්නෙකි. ඇය මේවා අමතක කර දැමිය යුතු නොවේ.

බටහිර වෙළෙඳපල වනාහි එහා මෙහා විසිර ගිය අමු ගඩොලින් තැනූ සත්ත්ව කොටු හා සුදු පිරියම් කල තැබෑරුම්වලින් වටවූ විසල්, චතුරස්‍රාකාර භූමි භාගයක් විය. පොළොව යට සිට මතුපිටට ඒමට දඟලන දැවැන්ත සතුන් ගේ පිටවල් බඳු වූ පස් ගොඩැලි එහි සැම තැනකම දැකිය හැකි විය. මේ සතුන්ගේ අයාගෙන සිටි කළු පැහැ මුවවල් ඔස්සේ පොළොව යටට හාරා තිබුනු සිසිල්, උමං වැනි ගබඩා කාමර කරා පිවිසිය හැකි විය. චතුරස්‍රයේ ඇතුළත, වියූ තණකොළයෙන් සෙවන වූ වෙළෙඳ සල්පිල් හා එකිනෙක වෙළුනු වීථිවලින් පිරුනු අවුල්ජාලයක් විය.

ඔවුන් ඇතුළුවන විටත් සිය ගණනක් වූ වෙළෙන්දෝ හා කඩකාරයෝ සිය බඩු බාහිරාදිය බිමට බාමින්, වෙළෙඳ සල්පිල් ඉදිකරමින් හුන්හ. එනමුදු ඩැනී පෙන්ටොස් හා අනෙකුත් නිදහස් වෙළෙඳ නගරවල දැක තිබුනු වෙළෙඳපල හා සසඳන විට මෙය නිහඬ, අතහැර දැමුනු තැනක් මෙන් පෙනුනි. සෙර් ජෝරා පැවසූ පරිදි මේ වෙළෙඳ තවලම් නැගෙනහිර දිගින් හා බටහිර දිගින් පැමිණ මෙසේ වයෙස් ඩොත්රැකිවලදී එකිනෙක මුනගැසුනේ ඩොත්රැකියන්ට බඩු විකිණීමටත් වඩා තම තමන් අතර බඩු හුවමාරු කරගැනීම පිණිස විය. මේ ශුද්ධ වූ නගරයේ සාමය කඩ නොකරන තාක් කල්, සියළු කඳුවල මවුතුමිය හෝ ලෝකයේ ගැබ නොකෙලෙසන තාක් කල්, ඩොෂ් ඛලීන්හි මැහැල්ලන්ට ගෞරවයෙන් සලකා සම්ප්‍රදායික තෑගි වන ලුණු, රිදී හා ධාන්‍යවලින් ඔවුන් පුදන තාක් කල් මේ වෙළෙන්දන්ට කිසිදු බාධාවකින් තොරව නිදහසේ තම කටයුතු කරගෙන යෑමේ අවසරය ඩොත්රැකියන් වෙතින් ලැබී තිබුනි. බඩු විකිණීම් හා මිලට ගැනීම් වනාහි ඩොත්රැකියන්ට නුහුරු නුපුරුදු දෙයක් විය.

අසාමාන්‍ය දර්ශනයන්ගෙන්, ශබ්දවලින් හා සුවඳින් පිරුනු නැගෙනහිර වෙළෙඳපලට ද ඩැනී ප්‍රියකලාය. ඇය බොහෝවිට සිය උදය කාලයන් එහි ගෙවා දමන්නට පුරුදුව සිටියාය. පළඟැටි පයි එකක් හෝ කොළ නූඩ්ල්ස් එකක් හෝ කමින්, මහ හඬින් බෙරිහන් දෙන මායාගායකයින් ගේ හඬට කණ් දෙමින්, රිදී කූඩුවල සිර කර සිටින මැන්ටිකෝරයින්, දැවැන්ත අළු පැහැ හස්තීන් හා ජොගෝස් නායි සිට ගෙන ආ කළු-සුදු ඉරි වැටුනු අශ්වයින් දෙස මුව අයාගෙන බලමින් කාලය ගෙවාලන්නට ඇය පුරුදුව සිටියාය. එමෙන්ම එහි සිටි අමුතු මිනිසුන්ද ඇයට විනෝදයක් විය. අඳුරු, ගම්භීර අෂයීයන් හා උසැති සුදුමැලි පැහැ කාර්තීනුවන්, වඳුරු වලිගා තොප්පි පැළැඳි, දීප්තිමත් දෑසින් යුතු යි-ටී වැසියන්, බයාසාබාද්, ෂම්රියානා හා කයකයනායාවලින් පැමිණි, තණපුඩුවල යකඩ මුදු සහ දෙකම්මුල්වල රතුකැට පැළැඳි රණකාමී තරුණියන්, සිය දෑත් දෙපා පපු පුරා පච්චා කොටාගත්, වෙස්මුහුණු පැළැඳ මුහුණු වසාගත් පරුෂ බියකරු සෙවනැලි මිනිසුන් ආදින් දෙස බලමින් ඇයට මුළු දවසම වුව එහි ගෙවා දැමිය හැකි විය. නැගෙනහිර වෙළෙඳපල ඩැනීට සැමවිටම මායාකාරී ආශ්චර්යවත් ස්ථානයක් විය.

එනමුදු බටහිර වෙළෙඳපලින් සැමවිටම හැමුවේ ඇයට හුරුපුරුදු ගෙදර සුවඳ විය.

ඉරී හා ජික්වි ඇයට දෝලාවෙන් බසින්නට උපකාර කරද්දී අවට වාතය ඉව ඇල්ලූ ඇය සුදුළූණු හා ගම්මිරිස් සුවඳ හඳුනාගත්තා ය. මේ සුවඳ විසින් මීට බොහෝ කලෙකට පෙර ටයිරොෂ් හා ම(ර්)හි මාවත්වල ගතකල දවස් ඇයට සිහිපත් කරදුන් අතර එය ඇගේ මුවට සිනහවක් නංවන්නට සමත්විය. මේ කුළුබඩු සුවඳට යටින් ඇයට ලයිස්වලින් ගෙනා හිස බර කරවන අන්දමේ මිහිරි සුවඳ විලවුන් සුවඳ ද දැනෙන්නට විය. වහලුන් විසින් ඔසවාගෙන යනු ලබන විවිධ සංකීර්ණ රටාවන්ගෙන් වියුනු මරිෂ් රේන්ද කච්චි ද, වර්ණ දුසිම් ගනනාවකින් පාට කැවුනු අගනා ලොම් රෙදි කච්චි ද ඇය දුටුවාය. කහ පැහැ කපු රෙද්දෙන් කල, දණ තෙක් දිගු කබා හැඳ, තඹ ශිරස්ක පැළැඳි තවලම් මුරභටයෝ වීථී අතර එහා මෙහා ඇවිද්දෝය. වියන ලද සමින් නිමැවූ ඔවුන් ගේ ඉණපටිවලින් පහළට එල්ලුනු හිස් අසිපත් කොපු එහා මෙහා පැද්දුනි. ආයුධ වෙළෙන්දෙකුට අයත් වූ එක් සල්පිලෙක රිදියෙන් හා රනින් කැටයම් වැඩ දැමූ වානේ සන්නාහ පපු තහඩු ද, අනේක විධ සතුන් ගේ හැඩයට තැනූ වානේ ශිරස්ක ද විකුණනන්ට දමා තිබුනි. ඔහුගේ අසල්වාසියා වූයේ ලැනිස්පෝර්ට්වලින් ගෙනා රන් බඩු - මුදු, හාරිච්චි, ගෙල පළඳනා හා ඉණපටි සාදන්නටම ගැලපෙන අගනා පදක්කම් - විකිනූ රූමත් තරුණියකි. ගොළු, හිසේ එකදු කෙස් ගසකුදු නැති, දහදියෙන් පෙඟුනු විල්ලුදයෙන් සැරසුනු දැවැන්ත පණ්ඩකයෙක් ඇගේ සල්පිලේ මුරටා සිටුවා සිටියේ ඊට සමීපවන කවරෙකු හෝ දෙස තරහයෙන් රවා බැලුවේය. වීථියේ අනිත් පස සිටි යි-ටී වලින් පැමිණි මහත රෙදි වෙළෙන්දා කුමක් දෝ කොළ පැහැ සායමක මිල සම්බන්ධයෙන් පෙන්ටෝෂියෙකු හා වාද කරමින් හුන්නේය. ඔහු හිස සොලවන

වාරයක් වාරයක් පාසා හිසේ වූ තොප්පියෙන් එල්ලුනු වඳුරු වාලධිය එහා මෙහා පැද්දෙන්නට විය.

"මම පුංචි කෙල්ලක් කාලෙ මම හරිම ආසා කරපු දෙයක් තමා වෙළෙඳපලේ සෙල්ලම් කරන එක." සල්පිල් අතරින් වීථි දිගේ ඇවිද යන අතරේ ඩැනී සෙර් ජෝරාට කීවාය. "ඒක හරිම ජීවයෙන් පිරිච්ච තැනක්. මිනිස්සු කෑගහනවා, හිනාවෙනවා. බලන්ට ගොඩාක් දේවල් තියෙනවා... ඒ වුනත් උවමනා දේවල් මිලට ගන්ට අපට ඇති තරම් සල්ලි තිබුනෙ නෑ කවදාවත්... ඉඳලා හිටලා ඔය සොසේජ් එකක්, පැණි ඇඹිල්ලක් වගේ දෙයක් ඇරෙන්ට... ඒ ටයිරෝෂ්වල හදන ජාතියෙ පැණි ඇඹිලි රාජධානි සප්තකයෙක් තියෙනව ද?"

"ඒවා කේක් වගේ ජාතියක් ද? මම කියන්ට දන්නෙ නෑ කුමාරි." නයිට්වරයා හිස නැමීය. "මට පොඩ්ඩකට සමාවෙන්ට. මම කපිතාන් හම්බවෙලා බලන්නම් අපට මොකුත් ලියුම් එහෙම ඇවිල්ලා තියෙනවද කියලා එයාගෙ බාරෙ."

"හරි හොඳයි. මම ඔබට උදවු කරන්නම් එයාව හොයාගන්ට."

"ඔබ කරදර වෙන්ට ඕන නෑ." සෙර් ජෝරා නොඉවසිල්ලෙන් මෙන් ඉවත බැලීය. "වෙළෙඳපල වටේ ඇවිදලා විනෝද වෙන්ට. මේ වැඩේ ඉවරවුනාට පස්සෙ මම ආයෙමත් කට්ටියට එකතු වෙන්නම්."

'ඒක හරි පුදුමයි!' දිගු පියවර තබමින් සෙර් ජෝරා ඉවත යන දෙස බලමින් ඩැනී සිතුවාය. ඔහුත් සමග තමාද නොයාමට හේතුවක් ඇයට නොපෙනින. සමහරවිට වෙළෙඳ කපිතාන් මුනගැසීමෙන් අනතුරුව ගණිකාවක හෝ එබඳු ගැහැණියක සොයායාමට ජෝරා අදහස් කරනවා විය හැක. ගණිකාවන් මෙවැනි වෙළෙඳ තවලම් සමගින් නිතරම ගමන්ගන්නා බැව් ඇය දැන සිටියාය. එමෙන්ම සමහර මිනිසුන් තම ලිංගික චර්යාවන් සම්බන්ධයෙන් ලැජ්ජාශීලීය. ඇය දෙවුර ඇකිළුවාය. "එන්ට යමු." ඇය සිය පිරිස බැනවීය.

ඩැනී වෙළෙඳපල සංචාරය නැවත ආරම්භ කල අතර ඇගේ සේවිකාවෝ ඇය පසුපසින් වැටුනහ. "අනේ අර බලන්ට." ඇය ඩෝරියාට අත දිගුකොට පෙන්වූවාය. "අන්න ඒ

වගේ සොසේජස් ගැන තමා මම කිවුවෙ." කුඩා සල්පිලෙක වූ ජරාවට ගිය කුඩා ගැහැණියක් ගිනි උඳුනක් මත තබා මස් හා ළෑණු පුළුස්සමින් උන්නාය. "එයාලා ඒකට ගොඩක් සුදුළෑණුයි ගම්මිරිසුයි දානවා." සිය සොයාගැනීම නිසා උද්දාමයට පත් වූ ඩැනි සොසේජ්වල රස බැලීමට තමා හා එක්වන්නැයි ඇගේ පිරිසේ වූවන්ගෙන් ඉල්ලා සිටියාය. ඇගේ සේවිකාවෝ කිචි කිචි ගාමින්, විරිත්තමින් සිය සොසේජ් උගුරට දෙකට ගිලදැමූහ. එනමුදු ඇගේ බාස් එකේ සෙබළු මේ පිළිස්සූ මස් දෙස ඉවකරමින් සැකසහිත බැලුම් හෙලන්නට වූහ. "මට මතක තිබුනාට වඩා මේකෙ රසය වෙනස්නෙ." කටවල් දෙකතුනක් කෑමෙන් පසු ඩැනී කීවාය.

"පෙන්ටොස්වලදී මම මේවා හදන්නෙ ඌරුමස්වලින්." මහලු ගැහැණිය කීවාය. "ඒ වුනත් මගේ ඌරෝ ඔක්කොම ඩොත්රැකි මුහුදෙදි මැරුනා. මේවා හදලා තියෙන්නෙ අශ්ව මස්වලින් බලීසි. ඒ වුනත් මම ඒවට නියම ගානටම කුළුබඩු දැම්මා."

"ආහ්!" ඩැනීට සිය බලාපොරොත්තු බිඳවැටුනු බවක් දැනෙන්නට විය. එනමුදු ක්වොරෝ සිය සොසේජ් එකේ රසයට කෙතරම් ගිජු වූවාද යත් ඔහුට තවත් එකක් කෑමට උවමනා විය. ඔහුට නොපරදින්නට සිතූ රබාරෝ මහ හඬින් රාමතෙල් අරිමින් තවත් සොසේජස් තුනක්ම කා නිම කලේය. ඩැනී කැකිරි පලන්නට වූවාය.

"ඔබේ සහෝදරයා, කරත්ත රජාට ඩ්‍රෝගෝ ඔටුනු පලන්දපු දවස ඉඳලම ඔබ හිනාවුනේ නෑ." ඉරී කීවාය. "ඔබ හිනාවෙනවා දකින්ට ලැබීමත් ලොකු සතුටක් බලීසි."

ඩැනී ලැජ්ජාශීලී සිනහවක් පෑවාය. සිනාසීම ඇගේ සිතේ තිබූ බර ඉවත් කලාක් වැන්න. තමා නැවතත් දැරියක බවට පත්ව ඇතැයි ඇයට සිතෙන්නට විය.

ඔවුහු මුලු උදේ වරුවෙන් අඩක්ම මෙලෙස ඇවිද්දෝය. ගිම්හාන දූපත්වලින් ගෙනා පිහාටුවලින් කල අලංකාර සළුවක් දුටු ඇය එය කාට හෝ තෑගි දෙනු පිණිස මිලදී ගත්තාය. ඩොත්රැකියන් ගනුදෙනු කරන ආකාරයට සිය ඉණපටියෙන් ගලවාගත් රිදී පදක්කමකින් ඇය එහි මිල ගෙවුවාය. කුරුල්ලන් වෙළෙන්දෙක් කොළ හා රතු පැහැ ගිරවෙකුට ඇගේ නම කියන්නට ඉගැන්වීය. ඩැනී නැවතත් සතුටින් සිනාසුනු නමුදු මේ පක්ෂියා මිලදී ගැනීම ප්‍රතික්ෂේප කලාය. බලසාරය තුළ ඇය රතු-කොළ පැහැති ගිරවකු හා කුමක් කරන්නද? මීට අමතරව සිය ළමා කාලයේදී ඇඟ ගල්වන්නට පුරුදුව සිටි සුවඳ

කැවූ තෙල් බහාලූ බෝතල් දුසිමක් පමණ ද ඇය මිලයට ගත්තාය. දෑස පියාගෙන මේ තෙල්වල සුවඳ බැලූ පමණින් රතු දොරක් සහිත අර සුවිසල් නිවසේ රුව ඈ ඉදිරිපිට මැවෙන්නාක් බඳු විය. විජ්ජාකරුවකු ගේ සල්පිලේ තමා තිබුනු සරුබව ලබාදෙන යම් වශීකරණයක් දෙස ඩෝරියා මහත් ආසාවෙන් බලාසිටිනු දුටු ඩැනී එය මිලයට ගෙන ඇයට තෑගි කලාය. දැන් තමා ඉරී හා ජීක්වී වෙනුවෙන් ද යමක් මිලයට ගතයුතු බව ඇගේ සිත ඇයට කීවේය.

## Daenerys Targaryen: “The Usurper owes Drogo a lordship.”

වංගුවකින් හැරුනු ඔවුහු කුඩා දිදාල ප්‍රමාණයේ කෝප්පවල බහාලූ වයින් මග යන එන්නවුන්ට රස බලන්නට දෙමින් සිටි වයින් වෙළෙන්දෙකු අභිමුවට පැමිණියෝය. "රස රතු වයින්." ඔහු ව්‍යක්ත ඩොත්රැකිවලින් කෑගැසීය. "මගේ ගාව තියෙනවා රස රතු වයින්. ලයිස්වලින් ගෙනාපුවා. වොලැන්ටිස්වලින් ගෙනාපුවා. ආර්බර්වලින් ගෙනාපුවා. ලයිස්වල සුදු වයින්. ටයිරෝෂ්වල පෙයාර් බ්‍රැන්ඩි. ෆයර්වයින්. පෙපර්වයින්. ම(ර්)වල ලා කොළ පාට පැණිරස එවුවා. ස්මොක්බෙරි දුඹුරුපාට එවුවා. අන්දලීෂ් ඇඹුල් වයින්. මගේ ගාව තියෙනවා. මගේ ගාව තියෙනවා." ඔහු කෙට්ටු, කඩවසම්, කුඩා මිනිසකු විය. ඔහුගේ හණ වැනි කෙහෙරැළි ලයිස්වල විලාසිතාව අනුව කැරැළි ගස්වා සුවඳ ගල්වා තිබුනි. ඩැනී ඔහුගේ සල්පිල ඉදිරියේ නැවතුනු යිට ඔහු හිස පහත් කලේය. "බලීසිට රස බලන්ට චුට්ටක් දෙන්ටද? මගේ ගාව තියෙනවා ඩෝර්න්වලින් ගෙනාපු හොඳ රස රතු වයින් එකක් මගේ ආර්යාවනි. ඒකෙ තියෙනවා හොඳ මිදියි වෙරියි රහකුයි එක්ක එකතුවෙච්ච තද ඕක් කහට රහක්. පීප්පයක් බොමුද, කෝප්පයක් බොමුද, උගුරක් බොමුද? එක උගුරක් බීලා බැලුවොත් ඔබේ ඔය කුසේ ඉන්න දරුවා මගේ නමින් නම් කරනවා සහතිකයි."

ඩැනී සිනාසුනාය. "මගේ පුතාට දැනටමත් නමක් තියෙනවා. ඒ වුනත් මම ඔබේ සමර්වයින් චුට්ටක් බීලා බලන්නම්." ඇය වැලීරියන් බසින් - නිදහස් වෙළෙඳ නගරවල භාවිත වන වැලීරියන් බසින් - වෙළෙන්දාට කීවාය. මෙතරම් කලකට පසු මේ වදන් තෙපලීමේ නුහුරු බවක් ඇගේ මුවට දැනුනි. "පුංචි උගුරක් දෙන්ටකො රස බලන්ට."

වෙළෙන්දා ඇය ඩොත්රැකියකු කොට සිතූ බවකි. ඇය හැඳ සිටි ඇඳුම් ද, තෙල් ගැල්වූ කෙහෙරැළි ද, අවුවට පිච්චී ගිය සම ද නිසා එය මහ අරුමයක් නොවීය. ඇගේ කතාව ඇසූ

ඔහු විමතියෙන් මුව අයාගත්තේ ය. "මගේ ආර්යාවනි, ඔබතුමී... ටයිරෝෂි ද? ඒක වෙන්ට පුළුවන් ද?"

"මගේ කතාව ටයිරෝෂි වෙන්ට ඇති. මගේ ඇඳුම් ඩොත්රකි වෙන්ට ඇති. ඒ වුනත් මම වෙස්ටෙරොස්වල රාජධානි සප්තකයේ." ඩැනී ඔහුට කීවාය.

ඩෝරියා ඉදිරියට පැමිණ ඇය පසෙකින් සිටගත්තා ය. "උඹ මේ කතා කරන්නෙ ටාර්ගේරියන් වංශයේ ඩනේරිස්ට. ඩනේරිස් ස්ටෝර්ම්බෝර්න්ට. අශ්වාරෝහකයින්ගෙ බලීසිට. රාජධානි සප්තකයේ කුමාරිට. උඹට මේක ලොකු ගෞරවයක්."

වයින් වෙළෙන්දා දණින් වැටුනේය. "කුමරියනි." ඔහු හිස නැමීය.

"නැගිටින්ට." ඩැනී ඔහුට අණකලාය. "මම තාමත් කැමැතියි ඔබ අර කියාපු සමර්වයින් චුට්ටක් රස බලන්ට."

මිනිසා දඩිබිඩියේ නැගිටගත්තේ ය. "ඒක? අර ඩෝර්නිෂ් ජරාව? ඒක කුමාරියකට තරම් නෑ. මගේ ගාව තියෙනවා බොහොම හොඳ වියළි රතු ආර්බර් වයින් එකක්. බොහොම ප්‍රසන්නයි. බොහොම මනෝහරයි. කරුනාකරලා, මට ඉඩදෙන්ට ඔබතුමීට ඒකෙන් පීප්පයක් දෙන්ට."

නිදහස් නගර වෙත නිරන්තරයෙන් කෙරුනු බාල් ඩ්‍රෝගෝගේ සංචාර විසින් ඔහු තුළ හොඳ වයින් කෙරෙහි මහත් ඇල්මක් ඇති කොට තිබින. මෙවැනි අගනා පැරණි වයින් වර්ගයක් ලැබුනහොත් ඔහු අමන්දානන්දයට පත්වනු ඇති බැව් ඩැනී දැන සිටියාය. "ඔබ මට ගෞරව කරනවා සෙර්." ඇය මධුර ස්වරයෙන් මිමිනුවාය.

"ගෞරවය අයිති මටයි." සිය සල්පිලේ පසුපසට ගිය වෙළෙන්දා ඕක් ලීයෙන් කල කුඩා පීප්පයක් රැගෙන ආයේය. මේ පීප්පයේ ලීය මතුපිට මිදි පොකුරක සලකුණක් හංවඩු ගසා තිබුනි. "රෙඩ්වින් සලකුණ." ඔහු එයට ඇඟිල්ල දිගු කරමින් කියා සිටියේය. "ආර්බර්වල සලකුණ. මේකට ගහන්ට පුළුවන් බීමක් වෙන කොහෙවත් නෑ."

"බාල් ඩ්‍රෝගෝයි මමයි ඒක ඉවර කරන්නම්. අග්ගෝ. කරුනාකරලා මේක මගේ දෝලාවට අරන් යන්ට." ඩොත්රැකියා වයින් පීප්පය ඔසවා ගනිද්දී වයින් වෙළෙන්දා සතුටින් පිනා ගියේය.

සෙර් ජෝරාගේ කටහඬ ඇසෙන තෙක් නයිට්වරයා තම පිරිසට යළි එකතු වී ඇති බවක් ඇය නොදත්තාය. "එපා!" ඔහුගේ ස්වරයට අමුතු පරුෂ බවක් එක් වී තිබුනි. "අග්ගෝ. ඔය පීප්පෙ බිමින් තියාපන්."

අග්ගෝ ඩැනී දෙස බැලීය. ඇය දෙගිඩියාවකින් මෙන් ඔවු කියන්නට හිස සැලුවාය. "සෙර් ජෝරා. මොකක් හරි ප්‍රශ්නයක් ද?"

"මට පොඩි තිබහක් ආවා. වයින් වෙළෙන්දා, මේ පීප්පෙ ඇරපන්."

වෙළෙන්දා රවා බැලීය. "මේ වයින් එක ඛලීසිට. උඹලා වගේ එවුන්ට නෙවෙයි සෙර්."

සෙර් ජෝරා සල්පිල වෙත තවත් ලංවිය. "උඹ ඒක ඇරියෙ නැත්තම්, මම උඹේ ඔළුවෙ ගහලා ඒක අරිනවා." මේ පූජනීය නගරය තුළ ඔහු කිසිදු ආයුධයක් අත නොදැරීය. සිය දැත් හැරෙන්නට වෙනත් කිසිදු ආයුධයක් ඔහු අත නොවීය. එනමුදු ඒ විසල්, හැඩිදැඩි, දළ ලොමින් ගැවසීගත් දෑත් උවමනාවටත් වඩා වැඩි ආයුධයක් විය. වයින් වෙළෙන්දා මොහොතක් අතීරණයෙන් පෙලෙන්නාක් මෙන් පෙනින. එනමුදු ඊළඟ මොහොතේ ඔහු සිය මිටිය අතට ගෙන පීප්පයේ ඇබයට ගසා එය විවර කලේය.

"වක්කරපන්." සෙර් ජෝරා නියෝග කලේය. ඩැනීගේ බාස් එකේ තරුණ සෙබළුන් සිවුදෙනා ඔහු පිටුපසින් පෙළ සැදුනහ. ඔවුන් ගේ රවුම් ආමන්ඩ් හැඩැති දෑස් රවන්නට පටන් ගත්හ.

"මේ වගේ හොඳ වයින් එකකට නියම විදියට හුළං වදින්ට දෙන්නෙ නැතුව එකපාරටම බොන එක මහ අපරාධයක්." වයින් වෙළෙන්දා තවමත් සිය මිටිය පහත හෙලා නොතිබින.

ජෝගෝ සිය ඉණපටියේ රුවා තිබුනු කසය වෙත අත යැවීය. එනමුදු මුදු ලෙස ඔහුගේ අත ස්පර්ශ කල ඩැනී ඔහුව නැවැත්වීය. "සෙර් ජෝරා කියාපු විදියට කරපන්." ඇය වෙළෙන්දාට අණදුනි. මග යන එන්නෝද සිදුවන්නේ කුමක්දැයි බලනු පිණිස රැස් කන්නට වූහ.

මිනිසා ඇය වෙත කෙටි බුම්මාගත් බැල්මක් හෙලීය. "කුමරියගෙ කැමැත්තක්." මිටිය පසෙකින් තැබූ ඔහු පීප්පය ඔසවාගත්තේ ය. ඉන්පසු බිඳකුදු අපතේ නොයන සේ පරෙස්සමින් දිදාලයක ප්‍රමාණයේ රස බලන කෝප්ප දෙකකට වයින් වත්කලේය.

කෝප්පය එසවූ සෙර් ජෝරා රවාගත් මුහුණින් යුතුව එය ඉවකර සුවඳ බැලීය.

"ප්‍රසන්නයි නේද?" වයින් වෙළෙන්දා සිනාසෙමින් කීවේය. "ඔබට පළතුරු සුවඳ දැනෙනවද සෙර්? ඒ තමා ආර්බර්වල සුවඳ විලවුන් සුවඳ. රහ බලන්ට මගේ උතුමානනි. රහ බලලා මට කියන්ට මෙච්චර කාලෙකට ඔබේ දිවේ ගැවුන හොඳම ප්‍රණීතම වයින් එක මේක නෙවෙයිද කියලා."

සෙර් ජෝරා කෝප්පය ඔහු දෙසට දිගුකලේය. "උඹ ඉස්සෙල්ලා රහ බලපන්."

"මම?" මිනිසා සිනාසුනේය. "මේ හොඳ වයින් එක බොන්ට තරම් මම සුදුස්සෙක් නෙවෙයි මගේ උතුමානනි. අනික තමන්ගෙ වෙළෙඳ බඩුවලින් වයින් බොන වෙළෙන්දා හොඳ වෙළෙන්දෙක් නෙවෙයි." ඔහුගේ මුවේ නැගුනු සිනහව ආදරණීය මිත්‍රශීලී එකක් වුවද ඔහුගේ නළලේ නැගී දහදිය බිඳු ඩැනී මනාව දුටුවාය.

"උඹ මේක බොන්ටමම ඕන." ඩැනී සීතල ස්වරයෙන් කීවාය. "ඔය කෝප්පෙ බීලා ඉවරකරපන්. එහෙම නොකලොත් මම කියනවා මගේ මිනිස්සුන්ට උඹව අල්ලගෙන

ඉන්න අතරෙ සෙර් ජෝරාට ඔය වයින් පීප්පෙම උඹේ උගුරෙන් පහළට යවන්ටයි කියලා."

දෙවුර ඇකිළූ වෙළෙන්දා කෝප්පය වෙත නැඹුරු විය... එහෙත් සැනින් වයින් පීප්පය දෑතින් ගත් ඔහු එය ඩැනී වෙත දමා ගැසීය. සෙර් ජෝරා ගොනෙකු මෙන් ඇය දෙසට කඩා පිනුයේ ඇයව ඉවතට තල්ලු කර හැරියේය. ඔහුගේ උරහිසේ වැදුනු පීප්පය බිම වැටී වයින් දසත විසිර ගියේය. පා පැකිළුනු ඩැනී වැටෙන්නට ගියාය. "අයියෝ!" වැටීම වලක්වනු වස් අත් දිගු කරමින් ඇය කෑගැසුවාය... ඇගේ අතකින් අල්ලාගත් ඩෝරියා ඇයව පසුපසට ඇද්දාය. එනයින් ඩැනී සිය උදරය මත නොව ඩෝරියා ගේ පාද මත ඇද වැටුනාය.

සල්පිල හරහා පිනූ වෙළෙන්දා අග්ගෝ හා රඛාරෝ අතරින් ඊයක් මෙන් විද්දේය. තමා අත නොමැති අරඛ් එකක් වෙනුවෙන් ක්වාරෝ සුරත යොමද්දී මිනිසා ඔහුව පසෙකට තල්ලු කර දැම්මේය. ඔහු වීථිය දිගේ දුවන්නට වන්නේය. ඊළඟ මොහොතේ ඩැනීට ජෝගෝගේ කසයේ හඬ ඇසුනි. සර්පයකු මෙන් ඉදිරියට පිනූ සම් කසය වෙළෙන්දා ගේ වළළුකර වටා එතී ගියේය. මිනිසා මුහුණ ඉදිරියට සිටින සේ වීථිය මැද හතරගාතයෙන් වැටුණේය.

තවලම් මුරභටයින් දුසිමක් පමණ එදෙසට දිව එන්නට වූහ. තවලමේ නායකයා වූ කපිතාන් බයන් වොටිරිස් ද ඒ අතර විය. මේ කුඩා නොර්වොෂියා පදම්කල සමක් මෙන් වියළී ගිය දෙකණ් දක්වා විහිද ගිය දැවැන්ත නිල් පැහැ උඩු රැවුලක් ඇත්තෙකු විය. වදනකුදු කතා නොකරම සිදුව ඇත්තේ කුමක්දැයි වහා වටහාගන්නට ඔහු සමත් විය. "මේකාව අරන් ගිහින් බාල්ට බාර දීපන් කැමැත්තක් කරගන්ටයි කියලා." බිම හොත් මිනිසා දෙස අතක් දිගු කරමින් ඔහු අණකලේය. මුරභටයින් දෙදෙනෙක් වයින් වෙළෙන්දා දෙපයින් සිටවූහ. "උගේ බඩු ඔක්කොම මම තෑග්ගක් විදියට ඔබතුමීට දෙනවා කුමරියනි." කපිතාන් දිගටම කතාකලේය. "මගේම මිනිහෙක් මෙහෙම දෙයක් කලැයි කියලා හිතනකොට මට ඇතිවෙන පසුතැවීම කණගාටුව වෙනුවෙන් පුංචි සංකේතයක්."

ඩෝරියා හා ජික්වි එක්ව ඩැනිව අල්ලා පරෙස්සමින් ඇයව නැවත නැගිට්ටෙවුවෝ ය. බිම වැටී පලුදු වූ වයින් පීප්පයේ වූ විසමුසු වයින් පොළොවට කාන්දු වන්නට විය. "ඔබ කොහොමද දැනගත්තෙ?" ඇය වෙවුලමින් සෙර් ජෝරාගෙන් විමසුවාය. "කොහොමද?"

"මම දැනගෙන හිටියෙ නෑ බලීසි. මේ මිනිහා වයින් බොන එක ප්‍රතික්ෂේප කරනකම්ම මම දැනගෙන හිටියෙ නෑ. ඒ වුනත් මැජිස්ටර් ඉල්ලීරියෝගෙ ලියුම කියෙවුවට පස්සෙ මට පොඩි බයක් ඇතිවුනා." ඔහුගේ අඳුරු දෑස් වෙළෙඳපලෙහි වූ නාඳුනන මුහුණු පිරික්සා බැලීය. "එන්ට අපි යමු. මෙතැන ඉඳන් ඒ ගැන කතාකරන එක එච්චර හොඳ වැඩක් නෙවෙයි."

ඔවුන් ඇයව නැවත ඔසවාගෙන යද්දී ඩැනී හැඩුම් එන්නට ආසන්නව සිටියාය. ඇගේ මුවේ වූ ඒ අම්හිරි රසය ඇය මින් පෙරද දැන සිටි දෙයක් විය. බිය! වසර ගනනාවක් තිස්සේ ඇය විසේරිස් කෙරෙහි ඇති භීතියෙන් යුතුව කල් ගෙවූවාය. මකරාව අවදි වේයැයි බියෙන් කල් ගෙවූවාය. මෙය ඊටත් වඩා නරක දෙයක් විය. ඇය දැන් බියපත් වූයේ තමා වෙනුවෙන් පමණක් නොවේ. සිය කුස තුළ වැඩෙන බිළිඳා ගැනද බියපත් වූවාය. ඔහුටද ඇගේ බිය දැනුනා වන්නට ඇත. මක්නිසාද යත් ඔහු නොසන්සුන් අයුරින් ගැබ තුළ පෙරලෙන අයුරු ඇයට දැනුනු බැවිනි. ඩැනී හෙමින් සීරුවේ සිය පිරුනු උදරය පිරිමැද්දා ය. තමාට ඔහු වෙත ළඟා විය හැකිනම්, ඔහුව ස්පර්ෂ කල හැකිනම්, ඔහුව සැනසිය හැකිනම් යැයි ඇය දුකින් කල්පනා කලාය. "ඔයා මකරාගෙ රුධිරය පුංචි පැටියෝ." තිරරෙදි තදින් පහතට ඇදදමා තිබුනු සිය දෝලාව සෙමින් පැද්දෙද්දී ඇය මිමිනුවාය. "ඔයා මකරාගෙ රුධිරය. මකරු බයවෙන්නෙ නෑ."

වයෙස් ඩොත්රැක්වල ඇගේ නිවහන වූ උමගක් සහිත පස් ගොඩැල්ල තුළට පිවිසි පසු ඩැනී සෙර් ජෝරා හැරෙන්නට අන් සැවොම ඉවත යැවූවාය. "මට කියන්ට." සිය කොට්ට මත හාන්සි වෙන අතරේ ඇය අණකලාය. "ඒ රජකම පැහැරගත්තු එකාගෙ වැඩක්ද?"

"ඔවු." නයිට්වරයා නැමූ කඩදාසියක් පිටතට ඇදගත්තේ ය. "මැජිස්ටර් ඉල්ලීරියෝගෙන් විසේරිස්ට ලියුමක්. ඔබේ හරි ඔබේ සහෝදරයාගෙ හරි මරණය වෙනුවෙන් රොබර්ට් බරතියන් වංශාධිපති තනතුරක් ප්‍රදානය කරනවා."

"මගේ සහෝදරයා?" ඇගේ ඉකිබිඳුම අඩ සිනහවක් බවට පෙරලින. "එයා තාම ඒ ගැන දන්නෙ නෑ. එහෙම නේද? රජකම පැහැරගත්තු එකා ඩ්‍රෝගෝට වංශාධිපති තනතුරක් දෙන්ට ඕන." මෙවර ඇගේ සිනහව අඩ ඉකිබිඳුමක් විය. ඇය තමාව ආරක්ෂා කරගන්නට මෙන් තමාවම වැළැඳගත්තා ය. "ඒ වගේම මාත් කියලා ඔබ කිවුවා. මම විතරද?"

"ඔබයි දරුවයි දෙන්නම." සෙර් ජෝරා දරුණු ස්වරයෙන් කීය.

"නෑ. ඌට බෑ මගේ පුතාව ගන්ට." තවදුරටත් වැලපිය යුතු නැතැයි ඇය තීරණය කලාය. තවදුරටත් බියෙන් වෙවුලිය යුතු නැත. 'රජකම පැහැරගත්තු එකා දැන් මකරාව නැගිට්ටෙවුවා.' ඇය තමාටම කියාගත්තා ය... අඳුරු පැහැ විල්ලුද මත තැන්පත්ව ඇති මකර බිත්තර දෙස ඇගේ දෑස් ඇදීගියේය. එහා මෙහා දඟලන පහන් දැල්ල මේ බිත්තරවල ශෛලමය කොරපොතු මත නැටීය. දිදුලන ජේඩ් කොළ පැහැ, ලේ රතු පැහැ හා රන් පැහැ ධූලි අංශු මේ බිත්තර වටා වූ වාතය තුළ පිහිනුවේය. එය හරියටම රජෙකු වටා ඉච්ඡාකාරයින් රැනක් දඟලන්නාක් මෙන් විය.

ඊළඟ මොහොතේ තමා තුළ මතුව ආයේ බිය නිසා උපන් එක්තරා අන්දමක පිස්සුවක් ද? එසේත් නැතිනම් ඇගේ මකර රුධිරය තුළ සැඟවී තිබුනු කිසියම් අන්දමක ප්‍රඥාවක් ද? ඩැනීට ඒ කුමක් නිසාදැයි කිව නොහැකි විය. එනමුදු සිය මුවින් මෙවදන් පිටවනු ඇයට ඇසුනි. "සෙර් ජෝරා. ගිනිකබල පත්තු කරන්ට."

"බලීසි?" නයිට්වරයා ඇය දෙස විස්මයෙන් බැලීය. "මෙතැන හරිම රස්නෙයි. ඔබට හොඳටම විශ්වාස ද?"

ඇයට මින් පෙර කෙදිනකවත් මෙවැනි විශ්වාසවන්ත බවක් දැනී නොතිබුනි. "ඔවු. මට... මට පොඩි සීතලක් දැනුනා. ගිනිකබල පත්තු කරන්ට."

ඔහු හිස නැමීය. "ඔබේ කැමැත්තක්."

ගල්අඟුරු ගිනිගෙන දැල්වෙන්නට වූ විට ඇය සෙර් ජෝරාව ඉවත යැවුවාය. දැන් මේ සිදුකරන්නට යන දෙය ඇය විසින් තනිවම කල යුත්තක් විය. 'මේක මහ පිස්සුවක්!' කළු හා ලේ රතු පැහැ මකර බිත්තරය විල්ලුද මතින් ඔසවද්දී ඇය තමාටම කියාගත්තා ය. 'ඒක නිකම්ම පිපිරිලා පිච්චිලා යයි. අනික ඒක කොච්චර ලස්සන ද. මම ඒක විනාස කරලා දැම්මොත් සෙර් ජෝරා මට මෝඩියෙක් කියලා කියයි. ඒ වුනත්, ඒ වුනත්...'

දැතින්ම බිත්තරය ඔසවාගත් ඇය ගිනිකබල වෙතට පිය මැන්නී එය ගිනිගන්නා ගල්අඟුරු මත තැන්පත් කලාය. කළු පැහැ කොරපොතු තාපය උරාගනිද්දී දිදුලන්නට විය. රතු පැහැ දිවවල් මෙන් වූ ගිනිදළු බිත්තරය වැළඳගන්නට විය. ඩැනී ඉතුරු බිත්තර දෙකද කළු බිත්තරය පසෙකින් ගිනිකබලේ අඟුරු මත තැන්පත් කලාය. ගිනිකබල වෙතින් මෑත්වද්දී සිය හුස්ම උගුරේ හිරවන්නාක් මෙන් ඇයට දැනුනි.

ගල්අඟුරු දැවී අළු බවට පත්වන තෙක්ම ඇය එදෙස බලා හුන්නාය. ඉහළට නැගුනු ගිනිපුපුරු දුම් පිටකරන සිදුරෙන් එළියට ඇදී ගියේය. තාප ධාරා බිත්තර වටා නැටීය. එපමණකි.

'ඔබේ සහෝදරයා රේගාර් තමා අන්තිම මකරා.' සෙර් ජෝරා ඇයට වරක් කියා තිබුනි. ඩැනී දුක්මුසු බැල්මක් දෙනෙතේ රඳවාගෙන සිය බිත්තර දෙස බලා හුන්නාය. ඇය වෙන කුමක් බලාපොරොත්තු වන්නට ද? මීට වසර දහස් ගණනකට එහානම් මේ බිත්තර සජීවී ඒවා වන්නට ඇත. එනමුදු දැන්... ඒවා නිකංම නිකං ලස්සන ගල් තුනක් පමණි.

'ඒවාට බෑ මකරෙක් උපද්දන්ට. මකරෙක් කියන්නෙ ගින්දරයි වාතයයි. මකරෙක් කියන්නෙ ජීවත්වෙන මාංශයක්. මැරිච්ච ගලක් නෙවෙයි.'

* * *

ඛාල් ඩ්‍රෝගෝ නැවත පැමිණෙන මොහොත වනවිට ගිනිකබල ද සීතල වී ගොස් තිබුනි. කොහොල්ලෝ තමාට පසුපසින් බර අදින අසෙකු දක්කාගෙන ආවේය. මේ අසු පිට සුදු පැහැ දැවැන්ත සිංහයකු ගේ මළ සිරුරක් හොවා තිබුනි. ඉහළ අහසේ තරු පායා එමින් තිබුනි. සිනාසෙමින් අසුපිටින් බට ඛාල් ඒරක්කාර් විසින් සිය කලිසම හරහා පහුරු ගා පාදයේ ඇති කල තුවාල ඇයට පෙන්වීය. "මම උගේ හමෙන් ඔබට ලස්සන සළුවක් මස්සලා දෙන්නම්, මගේ ජීවිතේ හඳ." ඔහු දිවුලේය.

අද දිනයේ වෙළෙඳපලේදී සිදුවූ සිද්දීන් ඩැනී ඔහුට පැවසූ විට මේ සියළු සිනා නැවතුනි. ඛාල් ඩ්‍රෝගෝ ගැඹුරු නිහඬතාවක වෙළී ගියේය.

"මේ තමා පළවෙනියා." සෙර් ජෝරා ඔහුට අනතුරු ඇඟවීය. "ඒ වුනත් ඌ අන්තිමයා වෙන එකක් නෑ. වංශාධිපති තනතුරක් වෙනුවෙන් මිනිස්සු ඕනම දෙයක් කරයි."

ඩ්‍රෝගෝ බොහෝ වේලාවක් නිහඬව සිටියේය. අන්තිමේදී ඔහු කටහඬ අවදි කලේය. "මේ වස විකුනපු එකා මගේ ජීවිතේ හඳෙන් ඈතට දුවලා ගියා. වඩා හොඳයි ඌ එයා පස්සෙන් දිවුවොත්. ඒක එහෙමම වෙයි. ජෝගෝ, අන්දාල් ජෝරා. මම මේ උඹලා දෙන්නටමයි කියන්නෙ. මගේ අශ්වයො රංචුවෙන් උඹලා කැමැති ඕනෑම අශ්වයෙක් ගානෙ තෝරගනිල්ලා. උං උඹලාට අයිතිවෙයි. මගේ රතු අශ්වයයි, මගේ ජීවිතේ හඳට මම මනාලි තෑග්ගක් විදියට දීපු රිදීයි ඇරෙන්ට වෙන ඕනෑම අශ්වයො දෙන්නෙක් තෝරගනිල්ලා. උඹලා දෙන්නා අද දවසේ කරපු උපකාරෙ වෙනුවෙනුයි මේ තෑගි දෙන්නෙ."

"ඩ්‍රෝගෝගෙ පුතා රේගෝට, මේ ලෝකය පාලනය කරන්ට යන සෙන්ධවයාට, එයාටත් මම තෑග්ගක් දෙනවා. එයාට මම තෑගි දෙනවා එයාගෙ අම්මාගෙ තාත්තා වාඩිවෙලා හිටපු යකඩ පුටුව. එයාට මම දෙනවා රාජධානි සප්තකය. මම, ඩ්‍රෝගෝ, ඛාල් මේක කරනවාමයි." ඔහුගේ හඬ උස් වන්නට වූ අතර මිටිකරගත් සිය අත ඔහු ආකාශය දෙසට එසෙවුවේය. "මගේ බලසාර් එක අරන් මම යනවා බටහිරට. මම යනවා ලෝකාන්තයට. මීට කලින් කිසිම ඛාල් කෙනෙක් කරපු නැති විදියට මම ලී අශ්වයො පිටේ නැගලා කළුපාට ලුණු වතුරෙන් එහා පැත්තට යනවා. මම යකඩ ඇඳුම් ඇඳලා ඉන්න මිනිස්සු මරලා උංගෙ ගල් කූඩාරම් විනාශකරලා දානවා. මම උංගෙ ගෑනු දූෂණය කරනවා. උංගෙ දරුවො වහල්කමට ගන්නවා. උංගෙ බිඳිච්චි දෙයියො ඇදගෙන එනවා වයෙස් ඩොත්රැක් වලට. ගෙනල්ලා කඳු මාතාවට උං ලව්වා නමස්කාර කරවනවා. මේක මම දිවුරනවා. මම, බාර්බෝගෙ පුතා ඩ්‍රෝගෝ. මම මේක දිවුරනවා කඳු මාතාව ඉදිරියේ. අහසෙ තරු මට සාක්කි දෙයි."

දවස් දෙකකට පසු ඔහුගේ බලසාරය වයෙස් ඩොත්රැක් වෙතින් පිටවූයේය. ඔවුහු තැනිතලාව හරහා බටහිරට බරව දකුණු දෙසට ගමන් කරන්නට වූහ. සිය රතු පැහැති දැවැන්ත සෙන්ධවයා පිට නැගුනු ඛාල් ඩ්‍රෝගෝ ඔවුන්ව මෙහෙයවීය. රිදී පිට නැගුනු ඩැනී ඔහු පසෙකින් විය. ගෙලට හා මැණික්කටුවලට යදම් ඇමූ, නිරුවත් වයින් වෙළෙන්දා ඔවුන් පසුපසින් දිව ආයේය. ඔහුව බැඳ තිබූ දම්වැල් ඩැනීගේ වෙළඹ, රිදීගේ ඉස්පටියට ඈඳා තිබුනි. ඇය අසු ධාවනය කරන අතරේ ඔහු ඇ පසුපසින් දිව ආවේය. නිරුවත් දෙපයින් යුතුව, පා පැකිලෙමින් දිව ආවේය. ඔහුට කිසිදු අනතුරක් සිදු නොවනු ඇත... සිය වේගය පවත්වා ගන්නා තෙක් කිසිවක්ම සිදු නොවනු ඇත.

**Jorah Mormont: “The Dothraki do things in their own time, for their own reasons.”**

කැට්ලින් **08-1**

මෝට් කේය්ලින්

ධජපතාක පැහැදිලිව හඳුනාගැනීමට තරම් දුර වැඩි වූ නමුදු ඒවා සුදු පැහැ බවත්, ඒ මැද්දේ අඳුරු පැහැ ලපයක් ඇති බවත් තුනී වී යන මීදුම මැද්දෙන් ඇය හඳුනාගත්තා ය. ඒ අනිවාර්යයෙන්ම හිම පසුබිමේ දත් විලිස්සා සිටිනා ස්ටාර්ක් සෝරවෘකයා විය යුතුය. මේ ධජපතාක සිය දෑසින්ම දුටු මුල්ම මොහොතේ අසු නැවතූ ඇය ස්තූති පූර්වකව හිස නැමුවාය. දෙවියන් එතරමම අකාරුණික නැත. ඇය එතරමම ප්‍රමාද වී නැත.

"එයාලා අපි එනකම් බලන් ඉන්නවා මගේ ආර්යාවනි." සෙර් විලිස් මැන්ඩර්ලි කීවේය. "මගේ තාත්තා දිවුරලා කිවුවා එයාලා ඉඳියි කියලා."

"එහෙමනම් අපි එයාලව තවත් පරක්කු කරන්ට හොඳ නෑ සෙර්." සිය අසුට සන් කල සෙර් බ්‍රින්ඩන් ටලී හැල්මේ ඉදිරියට ගියේය. කැට්ලින්ද ඔහු පසෙකින් සිය අසු මෙහෙයවීය.

එක්දහස් පන්සියයක් පමණ වූ සිය පිරිස පිරිවැරූ සෙර් විලිස් හා ඔහුගේ සොහොයුරා සෙර් වෙන්ඩල් ඔවුන් පසුපසින් අසුන් මෙහෙයවූහ. විස්සක් පමණ වූ නයිට්වරුන් ද, ඔවුන් ගේ සහචරයින් ද, ලන්සධරයින්, කඩුහරඹකරුවන් හා නිදහස් අසරුවන්ගෙන් සැදි දෙසියයක් පමණ වූ අසරු බලඇණියක් ද, හෙල්ලෙන් හා කුන්තයෙන් සන්නද්ධ වූ පාබල බලඇණියක් ද මේ පිරිසට අයත් වූහ. ධවල වරායේ ආරක්ෂාව බලාගැනීම පිණිස නැවතුනු වයිමන් මැන්ඩර්ලි උතුමානන් පමණක් මේ පිරිසට ඇතුළත් නොවීය. අවුරුදු හැටක් වයස් වූ මැන්ඩර්ලි උතුමානන් මේ වනවිට අසකු පිට නැගිය නොහැකි තරම් තරබාරු වී සිටියේය. "මගේ ජීවිත කාලෙ ඇතුළතදී ආයෙමත් යුද්ධයක් දකින්ට ලැබෙයි කියලා හිතුවානම් මම මෙච්චර ආදො නොකා ඉන්ට තිබුනා." කැට්ලින් පැමිණි නැව පිළිගැනීම පිණිස පැමිණි මොහොතේ ඔහු සොසේජස් තරම් මහත අතැඟිලි වලින් සිය දැවැන්ත උදරයට තට්ටුකරමින් පැවසීය. "ඒ වුනත් හිත කරදර කරගන්ට එපා ආර්යාවනි. මගේ කොල්ලො දෙන්නා බොහොම පරිස්සමෙන් ඔබව ඔබේ පුතා ළඟට එක්කරන් යයි."

ඔහුගේ මේ 'කොල්ලන්' දෙදෙනාම කැට්ලින්ට වඩා වැඩිමහලු වූවන් වූහ. එමෙන්ම ඔවුන් දෙදෙනා ඔවුන් ගේ පියාගේ ස්වරූපයට මෙතරම් සමීප නොවූවා නම් කැට්ලින් වඩාත් කැමැති විය. සෙර් විලිස් අසෙකු පිට නැගිය නොහැකි තරම් තරබාරු නොවී සිටියේ ආඳන් ඉතා ස්වල්ප දෙනෙකු ගේ මදකමිනි. ඒ අසරණ අශ්වයා ගැන කැට්ලින්ට ඇත්තෙන්ම දුකක් දැනුනි. අනිත් අතට දෙදෙනාගෙන් ලාබාලයා වූ සෙර් වෙන්ඩල් වනාහි ඔහුගේ පියා හා වැඩිමහල් සොහොයුරා නොතකා හැරියහොත් කැට්ලින් විසින් මෙතුවක් කලෙකට දැක තිබුනු තරබාරුම පුද්ගලයා විය. විලිස් නිහඬ, උපචාර සහිත පුද්ගලයකු වූ අතර වෙන්ඩල් මහහඬින් දොඩන ඝෝෂාකාරී පුද්ගලයකු විය. මේ දෙදෙනාටම වොල්රස් සතුන්ට මෙන් දැවැන්ත, අලංකාර උඩුරැවුල් පිහිටා තිබුනු අතර හිසේ එකදු කෙස්ගසක් වත් නොවීය. එමෙන්ම ඔවුන් දෙදෙනා සතුවම ඉදුල් පැල්ලමින් නොවැසුනු එකදු ඇඳුමක් වත් ඇතිබවක් ද නොපෙනුනි. එනමුදු කැට්ලින් මේ දෙදෙනාවම ප්‍රියකලාය. ඔවුන් ගේ පියා පොරොන්දු වූ පරිදිම ඔවුන් දෙදෙන විසින් ඇයව ආරක්ෂාකාරීව සිය පුත්‍රයා වෙත ගෙනැවිත් තිබින. එතැනින් එහාට තවත් වද විය යුතු දෙයක් නොවීය.

ඇගේ පුත්‍රයා සිවුදිගටම – නැගෙනහිර දෙසට පවා – නිරීක්ෂකයින් යවා තිබීම ඇගේ සතුටට හේතුවිය. ලැනිස්ටර්වරුන් පහර දෙන්නට එන්නේ නම් ඔවුන් පැමිණිය යුත්තේ දකුණු දෙසින් වුවද රොබ් විසින් මෙසේ අවශ්‍යා ආරක්ෂක පියවර ගෙන තිබීම යහපත් දෙයක් විය. 'මගේ පුතා හමුදාවක් අරන් යුද්ධෙට යනවා!' ඇය මවිතයෙන් යුතුව සිතුවාය. ඇයට එය තවමත් අදහාගැනීමට අසීරු කරුනක් විය. ඇය බලාපොරොත්තු විරහිත අන්දමින් ඔහු ගැනත් වින්ටර්ෆෙල් ගැනත් බියපත්ව සිටියාය. එනමුදු ඔහු ගැන ඇගේ සිතේ අමුතුම ආඩම්බරයක් ද ඇති වී ඇති බැව් නොපිළිගෙන සිටි හැකි කරුනක් නොවීය. යාන්තම් වසරකට පෙරාතුව ඔහු කුඩා කොලුවකුව සිටියේය. දැන්? දැන් ඔහු කවරෙකුදැයි ඇයවත් නොදන්නීය.

නිල් කොළ පැහැ මුහුදු දියෙන් නැගුනු ත්‍රිශූලයක් අතින් ගත් දියකිඳුරා ගේ රුව සහිත මැන්ඩර්ලි ධජපතාක නිරීක්ෂක මුර සෙබළුන් විසින් දුරතියාම හඳුනාගෙන තිබින. ඉදින් ඔවුන් ගේ පැමිණීම සාදරයෙන් පිළිගෙන කඳවුරක් ඇටවීමට තරම් සුදුසු වියළි, උස් බිමක් වෙත ඔවුන්ව කැඳවාගෙන යනු ලැබින. අසුන්ට සාත්තු කිරීමත් කඳවුරු ඇටවීමත් පිණිස සෙර් විලිස් සිය මිනිසුන් සමගින් එහි නැවතුනු අතර වෙන්ඩල් කැට්ලින් හා සෙර් බ්‍රින්ඩන් සමගින් ඉදිරියටම ගියේය. තම පියාගේ සුභාශිංසන හා පක්ෂපාතිත්වය සිය ඉහළ වංශාධිපතියා වෙත දැක්වීම අවශ්‍යා දෙයක් විය.

අසු කුර යටින් වූ පොළොව මෘදු හා තෙත් එකක් විය. ගිනිමැල, අසුන් පේළි හා ආහාරපානාදියෙන් පිරවූ කරත්ත පසුකරමින් ඔවුහු ඉදිරියටම ගියෝය. යාබද භූමියට වඩා උස් වූ, ගල්සහිත බිමක තනා තිබුනු, සනකම් රුවල් රෙද්දෙන් නිම වූ වංශාධිපතියකු ගේ මණ්ඩපයක් ද ඔවුහු පසුකලෝය. තැඹිලි පැහැ පසුබිමේ සිටින දුඹුරු පැහැ පිණිමුවා හෙවත් හෝර්න්වුඩ්වරුන් ගේ ලාංඡනය කැට්ලින් විසින් හඳුනාගත්තා ය.

ඊට මඳක් එහායින් මීදුම අතරින් මෝට් කේය්ලින් බලකොටුවේ පවුරු හා කුළුණු... ඇත්තෙන්ම කිවහොත් ඒවායේ නටඹුන් කැට්ලින්ට යාන්තමට මෙන් දැකිය හැකි විය. කුඩා පැල්පතක් තරම් විසල්, කළු පැහැ දැවැන්ත බැසෝල්ට් ගල්කුට්ටි මෘදු පසේ අඩක් එරී තැන තැන විසිර තිබුනේ කුඩා දරුවකු සෙල්ලම් කිරීමට ගන්නා ලී කැබලි මෙනි. එක් කලෙකදී වින්ටර්ෆෙල්හි ප්‍රාකාර තරමම උස් වූ බලකොටු පවුරේ මේ වනවිට ඉතිරි වී තිබුනේ එපමණකි. දැවයෙන් තැනුනු බලකොටුව ද මීට වසර දහස් ගණනකට පෙරාතුවම දිරාගොස් සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් තිබුනි. එය පිහිටි තැන හඳුනාගැනීම පිණිසවත් අඩුම තරමේ ලී කැබැල්ලක්වත් ඉතිරි වී නොතිබුනි. මුල් මිනිසුන් විසින් වසර දහස් ගණනකට පෙරාතුව ගොඩනැගූ මේ සුප්‍රසිද්ධ බලකොටුවේ දැන් ඉතිරිව තිබුනේ කුළුණු තුනක් පමණි. ප්‍රවාදවලට අනුව නම් මෙහි එක් කලෙක කුළුණු විස්සක් තිබින.

'වාහල්කඩ කුළුණ' තවමත් යම් සවිශක්තියක් ඇතුව තිබෙන බැව් පෙනුනු අතර එහි දෙපස වූ පවුරු බිත්ති දෙපැත්තෙන්ම අඩි කිහිපයක් දක්වා උස්ව නැගී තිබුනි. පෙර කල බටහිර හා දකුණු පවුරු දෙක මුනගැසුනු තැන වගුරට නුදුරින් පිහිටා තිබුනු 'බේබද්දා ගේ කුළුණ' වගුර දෙසට ඇලවී තිබුනේ බේබද්දකු වමනය කිරීමට කාණුවට ඇලවෙන්නාක් මෙනි. එක්තරා කාලයකදී වනාන්තරයේ දරුවන් විසින් සතුරන්ට එදිරිව මහා දියකඳකින් පහරදෙන්නට සිය වනාන්තරයේ නම නොදන්නා දෙවිවරුන් කැඳවූයේයැයි කියැවෙන උස් කෙට්ටු 'දරුවන් ගේ කුළුණට' එහි මුදුනෙන් බාගයක්ම අහිමිව තිබුනි. එය දිස්වූයේ හරියටම දැවැන්ත සත්ත්වයකු විසින් එයින් අඩක් සපා කා වගුර පුරා එහි කැබැලිති විසිරුවා දමා තිබුනාක් මෙනි. මේ කුළුණු තුනම කොළ පැහැ පෙඳ පාසියෙන් වැසී ගියේය. වාහල්කඩ කුළුණේ උතුරු බිත්තියේ ගල් අතරින් ගසක් පවා වැවී තිබුනි.

"දෙයියන්ටමම ඔප්පු වෙච්චාවෙ!" මේ නටඹුන් දුටු සෙර් බ්‍රින්ඩන් ගේ මුවින් විමතිය පලවිය. "මේකද මෝට් කේය්ලින් කියන්නෙ? ඒක නිකංම නිකං-"

සෙර් වෙන්ඩල් මැන්ඩර්ලි

"-මර උගුලක්." කැට්ලින් ඔහු වෙනුවෙන් වාක්‍යය සම්පූර්ණ කලාය. "මම දන්නවා, ඒක පේන්නෙ බොහොම නරක විදියට බාප්පෙ. ඒක දැකපු මුල්ම වතාවෙ මම හිතුවෙත් ඔහොමමයි. ඒ වුනත් නෙඩ් මට පෙන්නලා දුන්නා ඒක පේනවාට වඩා බොහොම බලසම්පන්නයි කියලා. මේ ඉතුරුවෙලා තියෙන කුළුණු තුනෙන් පුළුවන් මේ අවට පාර සම්පූර්ණයෙන්ම හැම පැත්තෙන්ම පාලනය කරන්ට. මේ පාරෙන් යන ඕනම හතුරෙක් අනිවාර්යයෙන්ම කුළුණු පහුකරගෙන ඒ මැදිනුයි යන්ට ඕන. මේ අවට තියෙන වගුරට බැහැලා එතෙර වෙන්ට කොහෙත්ම බෑ. බොරුවැල්ලයි, මඩ වලවලුයි. හැම තැනම සර්පයො පිරිලා. මේ එක කුළුණකට හරි පහරදෙන්ට ඕන නම් හතුරො ඉණක් ගැඹුරු කළු මඩේ බැහැලා සිංහ කටුස්සන්ගෙන් පිරිච්ච දියඅගලක් තරණය කරන්ට ඕන. ඊටපස්සෙ අර පෙදපාසියෙන් වැහිච්ච බිත්ති දිගේ නගින්ට ඕන. ඒ හැමදෙයක්ම අතරෙදි උන් අනිත් කුළුණු දෙකේ ඉන්න දුනුවායන්ගෙ ඊතල පාරට ගොදුරු වෙනවා." ඇය සිය බාප්පාට දරුණු සිනහවකින් සංග්‍රහ කලාය. "ඒත් එක්කම මේකෙ රෑට භූතයො ඉන්නවයි කියලා කියනවා. දකුණුකරේ එවුන්ගෙ ලේ බොන්ට පිපාසෙන් බලන් ඉන්න උතුරුකරේ සීතල, පලිගන්නාසුළු භූතයො."

සෙර් බ්‍රින්ඩන් කෙකර සිනහවක් පෑවේය. "මට මතක් කරන්ට මෙතැන වැඩිය තැවරි තැවරි ඉන්නෙ නැතුව ඉක්මනින්ම යන්ට. අන්තිමට බලද්දි මමත් දකුණුකරේ මිනිහෙක්."

මේ කුළුණු තුනේම මුදුනේ ධජපතාක ඔසවා තිබුනි. බේබද්දා ගේ කුළුණේ ස්ටාර්ක් ධජයට යටින් කාර්ස්ටාර්ක්වරුන් ගේ සුදු පැහැ සූර්යයා ලෙල දුන්නේය. දරුවන් ගේ කුළුණේ ඒ හා සමානව ග්‍රේට්ජෝන්වරුන් ගේ දම්වැලින් බැඳි යෝධයා දක්නට හැකිවිය. එනමුදු වාහල්කඩ කුළුණේ ස්ටාර්ක් සෝරවෘකයා පමණක් තනිව ලෙල දුන්නේය. රොබ් එහි කඳවුරු බැඳ සිටි අතර කැට්ලින් එදෙසට සිය අසු මෙහෙයවූවා ය. ඇයට පිටුපසින් සෙර් බ්‍රින්ඩන් හා සෙර් වෙන්ඩල් කොළ-කළු පැහැ මඩ බිම මත ලී කොට හා ලෑලි පුවරුවලින් තනා තිබුනු මාවත ඔස්සේ හෙමිහිට සිය අසුන් මෙහෙයවූහ.

* * *

විසල් ශාලාවක් තුළ සිය පියාගේ ප්‍රධාන ධජ දරන්නන් පිරිවරා සිටින සිය පුත්‍රයා සොයාගැනීමට කැට්ලින්ට හැකිවිය. ශාලාවේ කොණක වූ කළු ගැසුනු උඳුනක වූ ගිනිමැලයෙන් උණුසුමට වඩා දුම් නැගළුමින් තිබුනි. දැවැන්ත ශෛලමය මේසයක් අබියස

අසුන්ගෙන සිටි රොබ් ඉදිරියේ සිතියම් හා නොයෙකුත් ලිපිගොනු රසක් අතුරා තිබුනි. ඔහු මහත් උනන්දුවකින් යුතුව රූස් බෝල්ටන් හා ග්‍රේට්ජොන් අම්බර් සමගින් කතාකරමින් හුන්නේය. ඔහු ඇයව එක්වරම නොදුටු නමුදු ඔහුගේ වෘකයා සැනින් ඇයව හඳුනාගත්තේය. මේ දැවැන්ත අළු පැහැ සත්ත්වයා ගිනිඋඳුන අබියස බිම වැතිර සිටි නමුදු කැට්ලින් කාමරයට ඇතුළු වූ වහා හිස ඔසවා ඈ දෙස බැලීය. උගේ රන්වන් දෑස් ඇගේ දෑස් හා සම්මුඛ විය. වංශාධිපතීන් එකිනෙකා සිය මිමිනීම් නවතා නිහඬවන්නට වූ අතර නැගුනු හදිසි නිශ්ශබ්දතාව නිසා හිස ඔසවා අවට බැලූ රොබ් ඇයව දුටුවේය. "අම්මා!" ඔහුගේ කටහඬ හැඟුම්බර විය.

කැට්ලින්ට ඔහු වෙත දිවයාමට උවමනා විය. දිවගොස් ඔහුගේ නළල සිපගැනීමට උවමනා විය. ඔහු වටා සිය දෑත් යවා ඔහුව කිටිකිටියේ තුරුළුකොට මෙලොව ඇති සියළු උපද්‍රවවලින් ඔහුව රැකගැනීමට උවමනා විය... එනමුදු මෙහි, ඔහුගේ යටත්වැසි වංශාධිපතීන් ඉදිරියේ එසේ කිරීමට තරම් ඇය නිර්භීත නොවීය. ඔහු දැන් වැඩුනු මිනිසකු මෙන් සිය රාජකාරි ඉටුකරමින් සිටින්නේය. ඔහුගෙන් එය උදුරාගැනීමට ඇයට උවමනා නොවීය. එමනිසා ඔවුන් මේසයක් වශයෙන් භාවිත කරමින් සිටි බැසෝල්ට් ලෑල්ල අසල නැවතුනු ඇය ඔවුන් දෙස බලා හුන්නාය. හනික නැගිට සිටි සෝරවෘකයා කාමරය හරහා ඇය සිටි තැන වෙත පියවර මැන්නේය. ඌ සාමාන්‍ය වෘකයෙකුට වඩා අතිශයින් දැවැන්තව නැගී සිටියේය. "ඔයා රැවුලක් වවලා තියෙන්නෙ." ග්‍රේ වින්ඩ් ඇගේ අත ඉව කරද්දී ඇය රොබ් ඇමතුවාය.

හදිසියේම යම් අමනෝඥ දෙයකට මුහුණපෑමට සිදුවූවාක් මෙන් රොබ් රැවුල් කොටයෙන් වැසුනු නිකට අතගෑවේය. "ඔවු." ඔහුගේ රැවුල හිසකෙස්වලටත් වඩා රත් පැහැයෙන් බැබලින.

"මම කැමැතියි ඒකට." කැට්ලින් වෘකයා ගේ හිසට සෙමින් තට්ටු කලාය. "ඔයා දැන් හරියට මගේ මල්ලි එඩ්මුයර් වගේ." සෙල්ලමට මෙන් ඇගේ අතැඟිලි සැපූ ග්‍රේ වින්ඩ් ගිනිඋඳුන අසල සිය සයනය වෙත නැවත පියමැන්නේය.

සෝරවෘකයා අනුව යමින් ඇයට ගෞරවාදර දැක්වීම උදෙසා කාමරය හරහා පිය නැගි පළමුවැනියා වූ සෙර් හෙල්මන් ටෝල්හාර්ට් ඇය ඉදිරිපිට දණ නමා ඇගේ සුරතේ නළල එබීය. "කැට්ලින් ආර්යාවනි. ඔබතුමී හැමදාමත් වගේ ලස්සනයි. මේ අමාරු වෙලාවෙ ඔබතුමීව මෙහෙම දකින්ට ලැබුන එක අපට ලොකු සැනසීමක්." ගැල්බට් හා රොබර්ට්

ග්ලවර් ඊළඟට පැමිණියෝය. ග්‍රේට්ජොන් අම්බර් හා අනෙකුත් වංශාධිපතීන් එකිනෙකා ඉන්පසු පැමිණෙන්නට වන්හ. අවසාන වශයෙන් තියන් ග්‍රේජෝයි පැමිණියේය. "ඔබතුමීව මෙතැන මෙහෙම මුනගැහෙන්ට මම බලාපොරොත්තු වුනේ නෑ මගේ ආර්යාවනි." දණ නමන අතරේ ඔහු මිමිනීය.

"මෙතැනට එන්ට මගේ කිසිම අදහසක් තිබුනෙ නෑ." කැට්ලින් කීවාය. "මම ධවල වරායෙන් ගොඩබහිනකම් මට එහෙම අදහසක් තිබුනෙ නෑ. එහෙදි වයිමන් උතුමානන් මට කිවුවා රොබ් එයාගෙ වංශාධිපතියො රැස් කරනවයි කියලා. ඔබලා දන්නවනෙ එයාගෙ පුතා, සෙර් වෙන්ඩල්." ඉදිරියට පැමිණි වෙන්ඩල් මැන්ඩර්ලි සිය දැවැන්ත වට ප්‍රමාණය විසින් අවකාශ දුන් තරමට හිස නැමීය. "ඒ වගේම මගේ බාප්පා, සෙර් බ්‍රින්ඩන් ටලී. එයා මගේ නංගිගෙ සේවයෙන් අයින්වෙලා මගේ සේවයට බැඳුනා."

"කළු මාළුවා." රොබ් කීවේය. "අපිත් එක්ක එකතුවුනාට බොහොමත්ම ස්තූතියි සෙර්. ඔබ වගේ ධෛර්‍යසම්පන්න උදවිය අපට මේ වෙලාවෙ තදින්ම උවමනායි. ඒ වගේම ඔබත් සෙර් වෙන්ඩල්. ඔබලා මෙහෙ ආපු එක ගැන මට බොහොම සන්තෝසයි. සෙර් රඩ්‍රිකුත් ඔයාත් එක්ක ආවද අම්මා? එයා නැතුව මගේ අත නෑ වගෙයි."

"සෙර් රඩ්‍රික් ධවල වරායෙ ඉඳන් උතුරට ගියා. මම එයාව වින්ටර්ෆෙල්වල මුරකාරයා විදියට නම්කරලා අපි ආපහු එනකම් එහෙ රැකගන්ටයි කියලා අණ කලා. මේස්ටර් ලූවින් කියන්නෙ හොඳ උපදේශකයෙක් තමා. ඒ වුනත් එයාට යුද්ධ උපක්‍රම ගැන ඒ හැටි දැනුමක් නෑ."

"ඒ ගැන බයක් ඇතිකරගන්ට එපා ස්ටාර්ක් ආර්යාවනි." ග්‍රේට්ජොන් සිය ගොරහැඩි රැවුදෙන ස්වරයෙන් පැවසීය. "වින්ටර්ෆෙල් බොහොම ආරක්ෂාකාරීයි. අපි බොහොම ඉක්මනට ටයිවින් ලැනිස්ටර්ගෙ පස්සා පැත්තෙ අපේ කඩු ඔබන්ටයි යන්නෙ. සමාවෙන්ට එහෙම කිවුවට. ඊටපස්සෙ අපි යමු රතු බලකොටුවට නෙඩ්ව නිදහස් කරගන්ට."

"මගේ ආර්යාවනි, ඔබ අමනාප නැත්තං මම පොඩි ප්‍රශ්නයක් අහන්නම්." ඩ්‍රෙඩ්ෆෝර්ට්හි අධිපතියා වූ රූස් බෝල්ටන් සතුව මෘදු කටහඬක් තිබුනි. එනමුදු ඔහු කතාකරන විට ඇහුම්කන් දීම පිණිස ඔහුට වඩා දැවැන්ත මිනිස්සු පවා සිය කතා නවත්වති. ඔහුගේ දෑස් පුදුමාකාර අන්දමින් සුදුමැලි පැහැති විය. එමෙන්ම ඔහුගේ බැල්ම සෑමවිටම කෙනෙකුව

නොසන්සුන් කරවන්නක් විය. "අපට අහන්ට ලැබුනා ඔබ ටයිවින් උතුමානන්ගෙ කුරුම්ට් පුතාව අත්අඩංගුවට ගත්තයි කියලා. ඔබ එයාව මෙහාට ගෙනාවද? මම කැට තියලා කියන්නම්. ඒ වගේ ප්‍රාණ ඇපකාරයෙක් ඉන්නවානම් අපට සෑහෙන ප්‍රයෝජන ගන්ට පුළුවන්."

ගැල්බට් ග්ලවර්

"මම ටිරියන් ලැනිස්ටර්ව අත්අඩංගුවට ගත්තා තමා. ඒ වුනත් එයා තවදුරටත් මගේ ගාව නෑ." කැට්ලින්ට පිළිගන්නට සිදුවිය. සන්ත්‍රාසයෙන් හා චිත්තවික්ෂේපයෙන් කල මිමිනීම් රැසක් විසින් මේ ආරංචිය පිළිගනු ලැබින. "මමත් ඔබලා තරමටම කණගාටු වෙනවා ඒ වෙච්ච දේ ගැන මගේ උතුමනි. දෙවිවරුන් තීරණය කලා එයා වැරැදිකාරයෙක් නෙවෙයි, එයාව නිදහස් කල යුතුයි කියලා. ඒ වැඩේට මගේ මෝඩ නංගිගෙනුත් සෑහෙන උදවුවක් හම්බවුනා." තමාට සිදු වූ මදිපුංචිකම ගැන මෙසේ විවෘතව කතාකිරීම නොමනා යැයි ඇය දැන සිටියාය. එනමුදු ඉයරි වෙතින් සිදු වූ ඇගේ පිටවීම ප්‍රසන්න එකක් නොවීය. වින්ටර්ෆෙල්හි හදාවඩා ගැනීම සඳහා ඇයත් සමග කුඩා රොබර්ට් කැටුව යාමට ඉඩ දෙන්නැයි ඇය සිය සොයුරියගෙන් ඉල්ලා තිබුනි. අනිකුත් පිරිමි දරුවන් සමගින් හැදී වැඩෙන්නට ඇත්නම් එය ඔහුට ලොකු යහපතක් වනු ඇතැයි ඇය කියා සිටියාය. ලයිසා ගේ කේන්තිය හා වියරුව බලාසිටිය නොහැකි තරම් අතිමහත් විය. "උඹ මගේ අක්කා වුනත් නැතත්," ලයිසා පිළිතුරු දී තිබින. "උඹ මගේ දරුවාව මගෙන් උදුරගන්ට හැදුවොත්, උඹටත් යන්ට වෙන්නෙ අර චන්ද්‍ර දොරටුවෙන් තමා." එතැනින් පසු ඒ ගැන තවත් කතා කල හැක්කක් නොවීය.

වංශාධිපතිවරුන් ඇගෙන් තවතවත් තොරතුරු දැනගැනීමේ උනන්දුවකින් පසුවූහ. එනමුදු කැට්ලින් අතක් එසෙවුවා ය. "කිසිම සැකයක් නෑ අපට මේකට තව පස්සෙ වෙලාව තියෙයි. අනික මේ ගමන නිසා මට හරිම මහන්සියි. මට ඕන මගේ පුතාත් එක්ක තනියම ටිකක් කතාකරන්ට මගේ උතුමනි. මම දන්නවා ඔබලා මට සමාව දෙනවා කියලා." ඇය ඔවුන්ට කිසිදු අවස්ථාවක් නොදුන්නා ය. සැමදාමත් කීකරු උතුමකු වූ හෝර්න්වුඩ් උතුමානන් පෙරටුකොට ගත් වංශාධිපතීහු එකිනෙකා ඇයට හිස නමමින් කාමරයෙන් පිටවන්නට වූහ. "ඔබත් යන්ට ඕන තියන්." තියන් ග්‍රේජෝයි තාවර වන්නට වූ විට ඇය ඔහුට පැවසුවාය. සිනාසුනු ඔහු පිටව ගියේය.

මේසය මත ඒල් හා චීස් විය. අභක් පිරෙන්නට මධ්‍යසාරය වත්කරගත් කැට්ලින්, අසුනක වාඩි වී, බීම තොලගාමින් සිය පුත්‍රයාව අධ්‍යයනය කරන්නට වූවාය. තමා වින්ටර්ෆෙල්වලින් පිටත්වද්දීට වඩා ඔහු උස ගොස් ඇතැයි ඇයට සිතින. එමෙන්ම රැවුල් කොට නිසා ඔහුට වඩා වැඩිමහලු පෙනුමක් ලැබී තිබුනි. "එඩ්මුයර් රැවුල වවන්ට පටන්ගනිද්දී එයාට දාසයයි."

"මටත් ඉක්මනටම දාසය ලබනවා."

"ඒ වුනාට ඔයාට තාමත් පහළොවයි. පහළොවයි. හමුදාවක් අරන් යුද්ධෙට යනවා. ඔයාට තේරෙනවද ඇයි මම මෙච්චර බයවෙලා ඉන්නෙ කියලා රොබ්?"

ඔහුගේ පෙනුම වඩාත් මුරණ්ඩු විය. "ඒකට ගැලපෙන වෙන කෙනෙක් හිටියෙ නෑ."

"වෙන කෙනෙක් හිටියෙ නෑ? දෙයියම්පා! එතකොට දැන් ටිකකට කලින් මෙතන හිටපු මිනිස්සු මොක්කුද? රූස් බෝල්ටන්, රිකාර්ඩ් කාර්ස්ටාර්ක්, ගැල්බට් ග්ලවර්, රොබර්ට් ග්ලවර්, ග්‍රේට්ජොන්, හෙල්මන් ටෝල්හාර්ට්... ඔයාට මේ ඕනෑම කෙනෙකුට අණදෙන නිළධාරි තනතුර දෙන්ට තිබුනා. ඔයාට ඕනම නම් තියන්ට වුනත් ඒක දෙන්ට තිබුනා. ඒ වුනත් මගේ තේරීම නම් එයා නෙවෙයි."

"එයාලා ස්ටාර්ක්ලා නෙවෙයි."

"එයාලා මිනිස්සු රොබ්. යුද්ධෙන් පදම්වෙච්ච මිනිස්සු. ඔයා මීට අවුරුද්දකට උඩදි ලී කඩුවකින් සෙල්ලම් කර කර හිටපු ළමයෙක්."

ඔහුගේ දෑසේ කේන්තිය නැග එනු ඇයට පෙනුනි. එනමුදු එය පැමිණි වේගයෙන්ම බැහැරව ගියේය. ඊළඟ මොහොතේ ඔහු නැවතත් අර කුඩා කොලුවා විය. "මම දන්නවා." ඔහු ලැජ්ජාවෙන් මෙන් කීවේය. "ඔයා... ඔයා මාව ආපහු වින්ටර්ෆෙල්වලට යවනවද?"

කැට්ලින් සුසුමක් හෙලුවාය. "එහෙම තමා කරන්ට වටින්නෙ. ඔයා කොහෙත්ම එහෙන් පිටවෙලා නොඑන්ටයි තිබුනෙ. ඒ වුනත් මට දැන් ඒ වැඩේ කරන්ට බෑ. ඔයා සෑහෙන්න දුර ඇවිල්ලා ඉවරයි. කවදාහරි දවසක මේ වංශාධිපතියො ඔයා දිහා බලයි එයාලගෙ උසස් උතුමානන් විදියට. මම දැන් ඔයාව හරියට රෑ කෑම දෙන්නෙ නැතුව ඇඳට යවන පුංචි එකෙක් වගේ ආපහු යැවුවොත් එයාලා ඒක මතක තියාගනීවි. ඊට පස්සෙ එයාලා ඒ ගැන හිනාවේවි. එක දවසක් එනවා, එදාට එයාලා ඔයාට ගරු බුහුමන් දක්වන්ට ඕන. ඔයාට චුට්ටක් විතර බයවෙන්ටත් ඕන. එයාලා දැන් ඔයාට හිනාවුනොත් ඒක අනාගතේට හොඳ නෑ. ඔයාට එහෙම දෙයක් වෙනවා දකින්ට මට ඕන නෑ. ඔයාව පරිස්සම් කරගන්ට ඕන වගේම ඒකත් මට ඕන."

"ඔයාට ගොඩක් ස්තූතියි අම්මා!" රොබ්ගේ මුහුණේ වූ සහනය පැහැදිළිවම දිස්විය.

**Catelyn Stark: "Make no mistake, these are your bannermen, not your friends."**

මේසය හරහා නැඹුරු වූ කැට්ලින් රොබ්ගේ හිසකෙස් පිරිමැද්දා ය. "ඔයා තමා මගේ පළවෙනි දරුවා රොබ්. ඔයා දිහා බලන එක බැල්මක් ඇති මට ඔයා මේ ලෝකෙට ආපු දවස මතක් කරගන්ට. මූන රතුකරගෙන, මහ හයියෙන් අඬ අඬා."

ඔහු නැගී සිටියේය. ඇගේ ස්පර්ශය නිසා ඔහු අසීරුවට පත් වූ බැව් පැහැදිළිව පෙනෙන්නට විය. නැගිට සිටි ඔහු ගිනිඋඳුන වෙත ඇවිද ගියේය. ග්‍රේ වින්ඩ් ඔහුගේ පාදයේ සිය හිස අතුල්ලන්නට විය. "ඔයා දන්නවනෙ... තාත්තා ගැන නේද?"

"ඔවු." රොබර්ට් ගේ හදිසි අභාවයත් නෙඩ්ගේ බිඳ වැටීමත් ඇයව කිවනොහැකි තරම් තදින් බියපත් කරන්නට සමත් වී තිබිනා. එනමුදු සිය පුත්‍රයාට සිත තුළ ඇති බිය පෙන්වීමට ඇයට උවමනා නොවීය. "මම ධවල වරායෙන් ගොඩ බැස්සාම මැන්ඩර්ලි උතුමානන් මට ඒ ගැන කිවුවා. ඔයාට නංගිලා ගැන මොකුත් ආරංචියක් ලැබුනද?"

"ලියුමක් ආවා." සෝරවෘකයා ගේ නිකට යට කසමින් රොබ් කීය. "ඔයාටත් එකක් ආවා. ඒ වුනත් ඒක ආවෙ වින්ටර්ෆෙල්වලට. මගේ එකත් එක්කම." මේසය වෙත ළඟා වූ ඔහු

සිතියම් හා ලිපි ගොනු අවුස්සා පොඩි වී ගිය කඩදාසියක් සොයාගත්තේ ය. "මේ තියෙන්නෙ එයා මට එවපු එක. ඔයාට ආපු එක අරන් එන්ට මට කල්පනා වුනේ නැහැ."

රොබ්ගේ ස්වරයේ තැවරී තිබුනු කුමක් හෝ දෙයක් නිසා ඇගේ සිත නොසන්සුන් විය. කඩදාසිය දිගහැරගත් ඇය එය කියවන්නට වූවාය. ඇගේ සිතේ වූ අවධානය ක්‍රමයෙන් අවිශ්වාසයටත්, එතැනින් කේන්තියටත්, අන්තිමේදී බියකටත් පෙරලුනි. "මේකෙ තියෙන්නෙ සෙර්සිගෙ වචන. ඔයාගෙ නංගිගෙ නෙවෙයි." ලිපිය කියවා හමාර වූ පසු ඇය කීවාය. "ඇත්තම පණිවුඩේ තියෙන්නෙ සන්සාට කියාගන්ට බැරි ටිකේ. ලැනිස්ටර්ලා එයාට බොහොම කරුනාවෙන් ආදරෙන් සලකනවයි කියලා තියෙන ටිකේ... මම දන්නවා තර්ජනයක් කරන්නෙ කොහොමද කියලා. මට තේරෙනවා මෙතැන තියෙන්නෙ තර්ජනයක් කියලා. උන් සන්සාව ප්‍රාණ ඇපකාරියක් වගේ තියාගෙනයි ඉන්නෙ. උන් එයාව දිගටම එහෙම තියාගන්ටයි හිතාගෙන ඉන්නෙ."

"ඒකෙ ආර්යා ගැන කිසිම සඳහනක් නෑ." රොබ් දුක්බිත අයුරින් පෙන්වා දුන්නේය.

"නෑ." එයින් අදහස් වන්නේ කුමක්දැයි සිතන්නට පවා කැට්ලින්ට උවමනා නොවීය. දැන්, මේ මොහොතේ, මෙතැනදී ඒ ගැන සිතන්නටවත් ඇයට අවශ්‍ය නොවීය.

"මම හිතාගෙන හිටියෙ... ඔයා ගාව පුංචි යකා ඉන්නවා නම්, ප්‍රාණ ඇපකාරයො හුවමාරු කරගන්ට." සන්සා ගේ ලිපිය නැවත අතට ගත් ඔහු එය මිටිකරගත් අතින් පොඩිකලේය. ඔහු එය කල විලාසයෙන්ම මේ පළමු වතාව නොවන බැව් කැට්ලින්ට වැටහුනි. "ඉයරිවලින් මොකුත් පණිවුඩයක් නැද්ද? මම උදවු ඉල්ලලා ලයිසා පුංචි අම්මාට ලියුමක් යැවුවා. එයා ඒරින් උතුමානන්ගෙ ධජ දරන්නො එකතු කරනවද? ඔයා දන්නවද ඒ ගැන? මිටියාවතේ නයිට්වරු අපට එකතුවෙන්ට එයිද?"

"එකම එක්කෙනයි. එයා තමා හොඳම එක්කෙනා. මගේ බාප්පා... ඒ වුනත් බ්‍රින්ඩන් කියන්නෙ මුලින් ටලී කෙනෙක්. මගේ නංගි එයාගෙ අර මලඉලවු ලේ වාහල්කඩින් මෙහාට අඩියක් තියන්නෙ නෑ."

මෙය රොබ්ට තදින්ම වැදුනි. "අම්මා. අපි මොකක්ද දැන් කරන්ට යන්නෙ? මම මේ මහ විසාල හමුදාව එකතු කරන් මෙහාට ආවා. දහඅටදාහක් මිනිස්සු... ඒ වුනත් මම... මට හිතාගන්ට බෑ..." ඔහු ඇය දෙස බැලුවේය. ඒ දැස් දිලිසෙමින් තිබුනි. අර උදාර, තරුණ වංශාධිපතියා සැනින් අතුරුදන්ව ගොස් නැවතත් අර කුඩා දරුවා එතැනට පැමිණ තිබුනි. සිය මවගෙන් පිළිතුරු බලාපොරොත්තු වන වසර පහළොවක කුඩා කොලුවා බවට පත්ව තිබුනි.

නැත. එවැන්නක් සිදුවීමට දිය නොහැක.

"ඔයා මොකක් ගැනද ඔය බයවෙන්නෙ රොබ්?" ඇය මෘදු ස්වරයෙන් ඇසුවාය.

"මම..." කඳුළු බිඳු සඟවනු පිණිස ඔහු ඉවත බැලුවේය. "අපි දිගටම පහළට ගියත්... අපි යුද්ධය දිනුවත්... ලැනිස්ටර්ලා තාත්තාවයි සන්සාවයි අල්ලගෙනයි ඉන්නෙ. උන් එයාලව මරලා දායි. එහෙම නෙවෙයිද?"

"උන්ට ඕන අපි ලවුවා එහෙම හිතන්ටයි."

"ඔයා කියන්නෙ උන් බොරු කියනවා කියලද?"

"මම දන්නෙ නෑ රොබ්. මම දන්න එකම දේ ඔයාට වෙන විකල්පයක් නෑ කියන එක විතරයි. ඔයා කින්ග්ස් ලැන්ඩින්ග්වලට ගිහිල්ලා උන්ට පක්ෂපාතියි කියලා දිවුරුම් දුන්නොත් ඔයාට ආයෙ කවමදාවත් එහෙන් ගැලවිලා එන්ට ලැබෙන්නෙ නෑ. ඔයා නැට්ට කකුල් දෙක අස්සෙ ගහගෙන ආයෙම වින්ටර්ෆෙල්වලට ගියොත් ඔයාගෙ යටත් වංශාධිපතීන්ගෙ හිතේ ඔයා ගැන තියෙන ගෞරවය එහෙම පිටින්ම නැතිවෙලා යයි. සමහර අය ලැනිස්ටර්ලාගෙ පැත්තට යන්ටත් පුළුවන්. එහෙම වුනොත් රැජිණ දැනගන්නවා එයාට බයවෙන්ට ඒ හැටි හේතුවක් නෑ කියලා. ඒක නිසා එයා හිරකාරයින්ට එයා කැමැති දෙයක් කරයි. අපට තියෙන හොඳම බලාපොරොත්තුව, ඇත්තටම බැලුවොත් අපට තියෙන එකම බලාපොරොත්තුව ඔයා සතුරාව යුද්ධ භූමියෙදි පරද්දන එකයි. ඔයාට පුළුවන් වුනොත් ටයිවින් උතුමානන් නැත්තම් රජුන් මරන්නාව පණපිටින් අල්ලගන්ට... ආන්න එහෙම වුනොත් නම් අපට පුළුවන් වෙයි ප්‍රාණ ඇපකාරයො හුවමාරුවක් ගැන

සලකලා බලන්ට. ඒ වුනත් ඒක නෙවෙයි ඒකෙ තියෙන වැදගත්ම දේ. ඔයා බලවත්ව ඉන්න තාක් කල් උන් ඔයාට බය වෙනවා. ඒ කියන්නෙ නෙඩුයි ඔයාගෙ නංගියි ආරක්ෂාකාරීයි. සෙර්සි කපටි අම්මන්ඩි. එයාට මොළේ තියෙනවා. බැරි වෙලාවත් යුද්ධෙන් එයාගෙ පැත්තට අවාසි වුනොත් තමන්ගෙ ආරක්ෂාව වෙනුවෙන් අර දෙන්නා ඕන වෙනවා කියලා එයා දන්නවා."

"යුද්ධෙ එයාට අවාසි වෙන පැත්තකට හැරුනෙ නැත්තම් මොකද වෙන්නෙ? ඒක අපට අවාසි වෙන පැත්තකට හැරුනොත් මොකද කරන්නෙ?"

කැට්ලින් ඔහුගේ දෑතින් අල්ලාගත්තා ය. "රොබ්. මම ඔයාගෙන් ඇත්ත හංගන්නෙ නෑ. ඔයා යුද්ධෙන් පැරදුනොත් අපි කිසිම කෙනෙකුට තවත් බලාපොරොත්තුවක් ඉතුරුවෙන්නෙ නෑ. කාර්ස්ටලී රොක්වල මැද්දෙ ගල් ඇරෙන්ට වෙන මොකුත් නැහැයි කියලයි මිනිස්සු කියන්නෙ. මතකනෙ රේගාර්ගෙ දරුවන්ට මොකක්ද වුනේ කියලා?"

ඔහුගේ තරුණ දෑසේ විද්‍යාමාන වූ බිය ඇය පැහැදිළිවම දුටුවාය. එනමුදු එහි එක්තරා අන්දමක අධිෂ්ඨානයක් හා ශක්තිමත් බවක් ද පෙනෙන්නට විය. "එහෙම නම් ඉතින් මම පරදින්නෙ නෑ." ඔහු දිවුලේය.

"මට කියන්ට. ගංගා නිම්නයේ සටන් ගැන ඔයා මොනවද දන්නෙ?" ඔහු ඇත්තෙන්ම මීට සූදානම්දැයි දැනගැනීමට ඇයට අවශ්‍ය විය.

"එයාලා ගෝල්ඩන් ටූත්වලට පහළින් තියෙන කඳුගැටවලදි සටනක් කරලා තාම සති දෙකක්වත් ගියේ නෑ. එඩ්මුයර් මාමා වාන්ස් උතුමානන්වයි පයිපර් උතුමානන්වයි යැවුවා කපොල්ල ආරක්ෂා කරගන්ටයි කියලා. ඒ වුනත් රජුන් මරන්නා එයාලා උඩට කඩන් වැදිලා සටන් කලා. වාන්ස් උතුමානන් මැරුනා. අපට අන්තිමට අහන්ට ලැබුන ආරංචියේ හැටියට පයිපර් උතුමානන් පහුබහිනවා. රිවර්රන් වල ඉන්න එඩ්මුයර් මාමායි අනිත් වංශාධිපතියොයි එක්ක එකතුවෙන්ට. ජේමි ලැනිස්ටර් එයාගෙ පස්සෙන්ම පන්නනවා. ඒ වුනත් ඒක නෙවෙයි නරකම දේ. එයාලා කපොල්ලෙ සටන් කරන අතරතුරේදී ටයිවින් උතුමානන් තවත් ලැනිස්ටර් හමුදාවක් අරන් වටෙන් ගිහින් දකුණු පැත්තෙන් උඩට එනවා. කියන හැටියට නම් ඒක ජේමිගෙ හමුදාවටත් වඩා ලොකුයි."

එඩ්මුයර් ටලී

"තාත්තා ඒ ගැන දැනගෙන හිටියා වෙන්ට ඕන. මොකද එයා ඒ හමුදාවට විරුද්ධව එයාගෙ හමුදාවක් යවලා තියෙනවා. රජතුමාගෙම ධජය යටතේ. එයා දකුණුකරේ ඔන්න ඔය එරික් ද ඩෙරික් ද කවුද මන්දා උතුමානන් කෙනෙකුට තමා ඒ හමුදාවෙ අණදෙන නිළධාරි තනතුර දීලා තියෙන්නෙ. සෙර් රේමන් ඩැරීත් එයාලත් එක්ක ගිහින් තියෙනවා. ලියුමෙ තියෙන විදියටනම් ඒ හමුදාවෙ තවත් නයිට්වරුත් ඉඳලා තියෙනවා. තාත්තගෙම වින්ටර්ෆෙල් සෙබළුත් ඉඳලා තියෙනවා. ඒ වුනත් ඒක උගුලක්. මේ ඩෙරික් උතුමානන් රතු ගංගාව තරණය කරපු ගමන් ලැනිස්ටර් හමුදාව එයාලට පහරදීලා තියෙනවා. එයාලා රජතුමාගෙ ධජය යටතෙ ඉන්නෙ කියලා පොඩ්ඩක්වත් ගනන් අරන් නෑ. එයාලා මමර්ස් ෆෝර්ඩ් පැත්තෙන් පහුබහින්ට ගියාම ග්‍රෙගර් ක්ලිගේන් එයාලට පිටිපස්සෙන් පහරදීලා තියෙනවා. මේ ඩෙරික් උතුමානනුයි තවත් ටික දෙනෙකුයි බේරෙන්ට ඇති කියලා තමා කියන්නෙ. කවුරුවත් ඒක හරියටම දන්නෙ නෑ. ඒ වුනත් සෙර් රේමන් මැරිලා. වින්ටර්ෆෙල්වල අපේ සෙබළුත් ඔක්කොම වගේ මැරිලා. ටයිවින් උතුමානන් රජමාවත වහලා දාලා කියලයි කියන්නෙ. දැන් එයා උතුරේ හැරෙන්හෝල්වලට හමුදාව මෙහෙයවනවා. මග දිගට හම්බවෙන හැම දෙයක්ම ගිනිතියලා විනාශකරලා දානවා."

'භයානකයි! හොඳටම භයානකයි!' කැට්ලින් කල්පනා කලාය. තත්ත්වය ඇය සිතුවාටත් වඩා බරපතල විය. "ඉතින් ඔයා හිතාගෙන ඉන්නෙ එයාව මෙතැනදි මුනගැහෙන්ට ද?"

"එයා මෙච්චර උතුරට ආවොත්. ඒ වුනත් කිසිම කෙනෙක් හිතන්නෙ නෑ එයා එහෙම කරයි කියලා. මම පණිවුඩයක් යැව්වා හොව්ලන්ඩ් රීඩ්ට. මතකනෙ ග්‍රේවෝටර් වොච්වල ඉන්න තාත්තගෙ පරණ යාළුවා. ලැනිස්ටර්ලා බෙල්ල දිගේ උතුරට ආවොත් තියන තියන අඩියක් ගානෙ වගුරු මිනිස්සු උන්ගෙ ලේ හලාවි. ඒ වුනත් ගැල්බට් ග්ලවර් කියන්නෙ ටයිවින් ලැනිස්ටර් ඒ වගේ දෙයක් කරන්ට තරම් මෝඩයෙක් නෙවෙයි කියලයි. රූස් බෝල්ටනුත් ඒ කතාවට එකඟවෙනවා. එයාලා හිතන්නෙ ටයිවින් උතුමානන් දිගටම ගංගා නිම්නය පැත්තෙම කැරකෙයි කියලයි. එතකොට එයාට පුළුවන් ගංගා නිම්නයේ ඉන්න වංශාධිපතියන්ගෙ බලකොටු එකින් එක අල්ලගන්ට. එතකොට අන්තිමේදි ඉතුරු වෙන්නෙ රිවර්රන් විතරයි. ඒ නිසා හොඳම වැඩේ අපි දකුණට ගිහිල්ලා එයාට මුහුණ දෙන එකයි."

මේ අදහස නිසා කැට්ලින් ඇටමිදුළුවලට යනතෙක්ම සීතල වී ගියාය. යුද්ධයෙන් පදම් වූ තෙම්පරාදු වූ අණදෙන නිළධාරින් වන ජේමී හා ටයිවින් ලැනිස්ටර් හමුවේ පහළොස් වියැති කොලුවෙකුට ඇති අවස්ථාවන් කවරේද? "ඒක මොළේ ඇති වැඩක් ද? ඔයා මෙතැන බොහොම ආරක්ෂාකාරීව ඉන්නවා. එයාලා කියන්නෙ උතුරේ පුරාණ රජවරු මෝට් කේය්ලින්වල ඉඳන් එයාලා වගේ දහගුණයක් විශාල හමුදාවල් හිටන් පරද්දලා පන්නලා දැම්මයි කියලා."

"ඔවු. ඒක ඇත්ත. ඒ වුනත් අපේ කැමබීමයි අනිත් කලමනායි හැමදේම අඩුවේගෙන යනවා. මේක අපට ලේසියෙන් කෑම හොයාගන්ට පුළුවන් භූමියක් නෙවෙයි. අපි මෙච්චර කල් බලන් හිටියෙත් මැන්ඩර්ලි උතුමානන් එනකනුයි. ඉතින් දැන් එයාගෙ පුත්තු දෙන්නා අපට එකතුවෙලා තියෙන නිසා අපි ඉක්මනින්ම මෙතැනින් පිටවෙලා ඉස්සරහට යන්ට ඕන."

මේ කතාකරන්නේ සිය පුත්‍රයා නොව ඔහුගේ යටත් වංශාධිපතීන් ගේ වදන් බැව් කැට්ලින් වහා වටහාගත්තා ය. පසුගිය වසර ගනනාවක් තිස්සේ ඇය මොවුන්ගෙන් බොහෝ දෙනෙකුට වින්ටර්ෆෙල්හිදී සංග්‍රහ කර තිබුනාය. එමෙන්ම නෙඩ් සමගින් මොවුන් ගේ බලකොටුවලට ගොස් ආගන්තුක සත්කාර ද විඳ තිබුනාය. ඔවුන් සෑම කෙනෙකුම කවරාකාරයේ කෙනෙකුදැයි කීමට ඇය දැන සිටියාය. රොබුත් ඒ බව දනීදැයි ඇය විමතියෙන් කල්පනා කරන්නට විය.

එනමුදු ඔහු පැවසූ දෙය ද සත්‍යයක් විය. ඇගේ පුත්‍රයා විසින් එකතුකරගත් මේ හමුදාව නිදහස් නගරවල මෙන් ස්ථිරව පවත්වාගෙන යන හමුදාවක් නොවීය. එමෙන්ම මුදල් ගෙවා නඩත්තු කරන පෞද්ගලික හමුදාවක් ද නොවීය. මෙහි වූ බහුතරය සාමාන්‍ය ජනතාව වූහ. ඔවුහු සුළු ගොවීන්, ගොවිපළ අත්උදවු කරුවන්, මසුන් මරන්නන්, එඬේරුන්, තැබෑරුම් හිමියන් ගේ පුතුන්, වෙළෙන්දන් හා පෙහෙරන්ගෙන් සැදි පිරිසක් වූහ. ඒ අතරට කොල්ලකෑමෙන් මුදල් ඉපයීමේ ආසාවෙන් ඊට එක් වූ කුලී හේවායින් හා නිදහස් අසරුවන් සුළු පිරිසක්ද එක්වී සිටියහ. ඔවුන් ගේ වංශාධිපතීන් විසින් කැඳවූ විට ඔවුන් පැමිණිය යුතු විය... එනමුදු ඒ සදාකල් වෙනුවෙන් නොවීය. "ඉස්සරහට යන එක හොඳයි තමා. ඒත් කොහාටද යන්නෙ? මොන අරමුනක් වෙනුවෙන් ද යන්නෙ? ඔයා මොකක්ද කරන්ට බලාපොරොත්තු වෙන්නෙ?"

රොබ් තැතනුවේය. "ග්‍රේට්ජොන් හිතන්නෙ අපි ටයිවින් උතුමානන්ට හදිසි පහරදීමක් කරලා, එයාව පුදුම කරවන්ට ඕන කියලයි. ඒ වුනත් ග්ලවර්ලායි කාර්ස්ටාර්ක්ලායි හිතන්නෙ අපි ටයිවින්ගෙ හමුදාව වටෙන් ගිහිල්ලා එඩ්මුයර් මාමාත් එක්ක එකතුවෙලා ජේමි ලැනිස්ටර්ගෙ හමුදාවට පහරදෙන එක ඊට වඩා නුවණක්කාරයි කියලයි." ඔහු අසතුටට පත් වූ අයුරින් සිය රතු-දුඹුරු හිසකෙස් අතරින් අතැඟිලි විහිදෙවුවේය. "ඒ වුනත් අපි රිවර්රන්වලට කිට්ටු කරන වෙලාව වෙනකොට... මට හරියටම ස්ථිර නෑ..."

"ස්ථිර වෙන්ට. එහෙම නැත්තම් ආයෙමත් ගෙදර ගිහිල්ලා අර ලී කඩුව අතට ගන්ට. රූස් බෝල්ටන් නැත්තම් රිකාර්ඩ් කාර්ස්ටාර්ක් වගේ මිනිස්සු ඉස්සරහදි ඔයාට දෙගිඩියාවෙන් ඉන්නවා කියලා පෙන්නන්ට බෑ. වරද්දගන්ට එපා රොබ්, මේ ඉන්නෙ ඔයාගෙ යටත් වංශාධිපතියො. ඔයාගෙ යාළුවො නෙවෙයි. ඔයාමයි ඔයාට මේ හමුදාවෙ අණදෙන නිළධාරි තනතුර දීගත්තෙ. එහෙමනම් ඔයාම අණදෙන්ට."

ඇගේ පුත්‍රයා ඈ දෙස බැලුවේය. මේ අසන්නට ලැබුනු දෙයින් ඔහු තිගැස්සුනු බවක් පෙනෙන්නට තිබුනි. "ඔයා කියන විදියක් අම්මෙ."

"මම ආයෙමත් අහන්නම්. ඔයා මොකක්ද කරන්ට බලාපොරොත්තු වෙන්නෙ?"

රොබ් මේසය මත වූ පැරණි, පාට වියැකී ගිය, සමින් කල සිතියමක් ඇදගත්තේ ය. නිරන්තර ඇකිළීම නිසා එහි එක් කෙලවරක් රෝල් වී තිබුනු අතර රොබ් ඒ මතින් සිය සිරිය තැබීය. "ඒ සැලසුම් දෙකේම හොඳ-නරක දෙකම තියෙනවා... මම ටයිවින් උතුමානන්ගෙ වටේ යන්ට උත්සාහ කලොත් එයයි ජේමි ලැනිස්ටර්ගෙ හමුදාවයි දෙක අතරේ අපි හිරවීමෙ අවදානමක් තියෙනවා. අපි එයාට පහර දුන්නොත්... අපට ලැබුන හැම වාර්තාවක්ම අනුව එයාට මට වඩා හමුදාව ඉන්නවා. මට වඩා ගොඩක් අශ්වාරෝහක සෙබළු ඉන්නවා. ග්‍රේට්ජොන් කියන්නෙ අපි එයාව පුදුමයට පත්කරලා හදිසි පහරදීමක් කලොත් ඒකෙ එච්චරම ප්‍රශ්නයක් වෙන්නෙ නැහැයි කියලයි. ඒ වුනත් මට හිතෙන්නෙ ටයිවින් ලැනිස්ටර් වගේ යුද්ධ අත්දැකීම් තියෙන මනුස්සයෙක්ව එහෙම පුදුම කරන්ට ලේසියෙන් බැහැයි කියලයි."

"බොහොම හොඳයි!" සිය පුත්‍රයා ගේ කතාව තුළින් ඇය සිය ස්වාමියාව දුටුවාය. "මට තව කියන්ට."

"මම මෙතැන මෝට් කේය්ලින්වල පුංචි හමුදාවක් ඉතුරුකරලා යනවා. වැඩිපුරම දුනුවායො. අනිත් කට්ටිය රජමාවතේ පහළට අරන් යනවා. ඒ වුනත් බෙල්ල පහුකරපු ගමන් මම අපේ හමුදාව දෙකට බෙදනවා. ප්‍රධාන පාබල හමුදාව දිගටම රජමාවතේ පහළට යනවා. ඒ අතරෙ අපේ අශ්වාරෝහක සෙබළු නිවුන් බලකොටුව ගාවින් කොළ ගංගාව අනිත් පැත්තට පනිනවා." ඔහු සිතියම මත ඇඟිල්ල තබා පෙන්වීය. "අපි දකුණට ආවා කියන ආරංචිය ටයිවින් උතුමානන්ට ලැබුනහම එයා අපට පහරදෙන්ට උතුරට එයි. ඒකෙන් අපේ අශ්වාරෝහකයින්ට ඉඩ ලැබෙනවා කිසි කරදරයක් නැතුව බටහිර ඉවුර දිගේ ඉක්මනින්ම රිවර්රන්වලට යන්ට." රොබ් මැඩගත් සිනහවකින් යුතුව නැවත අසුන් ගත්තේය. ඔහු තමා ගැනම සතුටට පත් වී සිටි අතර පැසසුමක් බලාපොරොත්තු වන කුඩා දරුවකු මෙන් පෙනුනි.

කැට්ලින් සිතියම දෙස රවා බැලුවාය. "එතකොට ඔයා ඔයාගෙ හමුදාවෙ කොටස් දෙක අතරේ ගංගාවක් තියාගන්නවනෙ."

"ඒ වගේම ජේමිගෙයි ටයිවින්ගෙයි හමුදා දෙක අතරෙත් ගංගාවක් තියෙනවා." ඔහු උනන්දුවෙන් කීවේය. මැඩගත් සිනහව මෙවර එළියට පැන්නේය. "රොබර්ට් රේගාර්ව මරලා සිංහාසනේ දිනපු රතුකැට තොටුපළෙන් පස්සෙ උතුරට යනකම් කොළ ගංගාවෙ කිසිම තොටුපළක් නෑ. මෙතැන උඩ නිවුන් බලකොටුවට එනකම් කිසිම කෙනෙකුට ගඟෙන් එතෙර වෙන්ට බෑ. එතැන පාලම පාලනය කරන්නෙ ෆ්‍රේ උතුමානන්. එයා ඔයාගෙ තාත්තගෙ යටත් වංශාධිපතියෙක් නේද?"

'හැමදාම ප්‍රමාද වෙන ෆ්‍රේ උතුමානන්.' කැට්ලින් කල්පනා කලාය. "එහෙමනම් තමා. ඒ වුනත් මගේ තාත්තා එයාව කවදාවත් විශ්වාස කලේ නෑ. ඔයත් එයාව විශ්වාසකරන්ට එපා."

"මම එහෙම කරන්නෙ නෑ." රොබ් පොරොන්දු විය. "ඔයා මොකද හිතන්නෙ?"

මේ සැලසුම සැබැවින්ම ඇයව විමතියට පත්කරන්නට සමත්ව තිබුනි. 'එයා ටලී කෙනෙක් වගේ තමා පේන්නෙ.' ඇය සිතුවාය. 'ඒ වුනත් එයා තාත්තගෙම පුතා. නෙඩ් එයාට හොඳට උගන්නලා තියෙනවා!' "ඔයා අණදෙන්නෙ මෙතැනින් කොයි හමුදාවට ද?"

"අශ්වාරෝහකයින්ට." ඔහු සැනෙන් පිළිතුරු දුන්නේය. 'ආයෙමත් තාත්තා වගේ!' නෙඩ් හැමදාමත් වඩා අවදානම් රාජකාරිය තමා පිට පවරාගන්නේය.

"එතකොට අනිත් හමුදාව?"

"ග්‍රේට්ජොන් හැමදාම කියනවා අපි ටයිවින්ව පොඩිකරලා දාන්ට ඕන කියලා. ඉතින් මම හිතුවා එයාට ඒ ගෞරවය දෙන්ට."

ඒ වනාහි ඔහුගේ පළමු වැරැදීම විය. එනමුදු ඔහුගේ නිසලබව හා ආත්ම විශ්වාසය නොබිඳෙන සේ ඔහුට ඒ බව ඒත්තු ගන්වන්නේ කෙසේදැයි කැට්ලින් මොහොතක් කල්පනා කලාය. "ඔයාගෙ තාත්තා මට එකපාරක් කිවුවා ග්‍රේට්ජොන් එයා දන්න වෙන ඕනම මිනිහෙකුට වඩා බිහිසුනුයි කියලා."

රොබ් විරිත්තුවේය. "ග්‍රේ වින්ඩ් එයාගෙ අතේ ඇඟිලි දෙකක් හපලා කඩාගත්තා. එයා ඒ ගැන හිනාවුනා විතරයි. ඉතින්, ඒ කියන්නෙ ඔයා ඒකට එකඟවෙනවා නේද?"

"ඔයාගෙ තාත්තා බිහිසුනු නෑ." ඇය පෙන්වා දුන්නාය. "එයා නිර්භීතයි. ඒත් ඒ දෙක සම්පූර්ණයෙන්ම වෙනස් දෙකක්."

ඇගේ පුත්‍රයා ඒ ගැන මොහොතක් කල්පනා කර බැලුවේය. "නැගෙනහිර ඉවුරෙ හමුදාව කියන්නෙ ටයිවින් උතුමානනුයි වින්ටර්ෆෙලුයි අතර තියෙන එකම බාධකේ." ඔහු කල්පනාකාරීව පැවසීය. "එයාලයි, මෙතැන මෝට් කේය්ලින්වල මම ඉතුරුකරලා යන දුනුවායො ටිකයි විතරයි. ඒ කියන්නෙ, මට මේ වැඩේට බිහිසුනු කෙනෙක් දාලා හරියන්නෙ නෑ. එහෙම නේද?"

"නෑ. මම හිතන්නෙ ඔයාට ඕන වෙන්නෙ දරුණු කපටියෙක්. ධෛර්යවන්ත කෙනෙක් නෙවෙයි."

"රූස් බෝල්ටන්." රොබ් සැනෙන් කීය. "මේ මනුස්සයා හැමවෙලාවෙම මාව බයකරනවා."

"එහෙමනම් අපි යාඥා කරමු එයා ටයිවින් උතුමානන්වත් බයකරයි කියලා."

හිස වැනූ රොබ් සිතියම ඇකිළුවේය. "මම අවශ්‍ය නියෝග දෙන්නම්. ඒ වගේ ම ඔයාව පරිස්සමෙන් ගෙදර එක්කරන් යන්ට හට කණ්ඩායමක් ලෑස්ති කරන්නම්."

තමාව ශක්තිමත් කරගැනීමට කැට්ලින් හැකි සෑම උත්සාහයක්ම දරා තිබුනි. නෙඩ් වෙනුවෙන් හා ඔවුන් දෙදෙනා ගේ මේ නිර්භීත මුරණ්ඩු පුතණුවන් වෙනුවෙන් ශක්තිමත්ව නැගී සිටීමට ඇය හැකි උපරිමයෙන් සටන් වැද තිබුනි. අදින්නට පිළිකුල් කරන ඇඳුම් දෙකක් මෙන් නෂ්ටාපේක්ෂාව හා බිය යන හැඟීම් ඇය විසින් සිය සිතෙන් ඈත් කොට තිබුනි... එනමුදු, කෙතරම් සිය සිත රවටාගෙන සිටියද තමා මෙතෙක් කලක් තිස්සේ එම ඇඳුම් හැඳගෙන සිටි බැව් ඇයට ඒ මොහොතේ තේරුම් ගියේය.

"මම වින්ටර්ෆෙල්වලට යන්නෙ නැහැ." තම මුවින් පිටවෙනු ඇයට ඇසුනි. හදිසියේම දෑසට නැඟුනු කඳුළු බිඳු විසින් ඇගේ දර්ශන පථය බොඳ කොට දැමීය. "මගේ තාත්තා රිවර්රන්වල ප්‍රාකාර පිටිපස්සෙ මැරෙන්ට වැටිලා ඉන්නවා. මගේ මල්ලිව සතුරො වටකරලා. මම දැන් එයාලා ගාවටයි යන්ට ඕන."

**Theon Greyjoy: “I had not looked to see you here, my lady.”**

**Catelyn Stark: “I had not thought to be here.”**



GREYTOWER WATCH
KINGSROAD
LINTSFINGER
THE NECK
THE BITE
SEAGARD
THE TWINS
IRONMAN BAY
BLUE FORK
GREEN FORK
RIVERRUN
RED FORK
RIVER ROAD
BANEFORT

ටිරියන් 07-1

කළු කණ් ඇත්තන් ගේ ගෝත්‍රයේ චීක් ගේ දුව වූ චෙලා ප්‍රධාන කණ්ඩායමට ඉදිරියෙන් ගියේ අවට පිරික්සා බැලීම පිණිස විය. ඉදිරියෙන් ඇති මංසන්ධියේ හමුදාවක් වාඩි ලා සිටින ආරංචිය රැගෙන ආවේ ඇය විසිනි. "උංගෙ ගිනිමැලවලින් මට කියන්ට පුළුවන් එතැන අඩුම ගානෙ විසිදාහක්වත් ඉන්නවා කියලා. උංගෙ කොඩි රතු පාටයි. ඒ මැද්දෙ රත්තරන් පාට සිංහයෙක් ඉන්නවා."

"උඹේ තාත්ත ද?" බ්‍රොන් ඇසුවේය.

"මගේ අයියා ජේමි වෙන්ටත් පුළුවන්." ටිරියන් පිළිතුරු දුන්නේය. "අපට ඉක්මනටම දැනගන්ට ලැබෙයි." ඔහු සිය කුඩා මංකොල්ලකාරී කන්ඩායම පිරික්සා බැලීය. තුන්සියයක් පමණ වූ ගල්කපුටන්, චන්ද්‍ර සොහොයුරන්, කළු කණ් ඇත්තන් හා පිළිස්සුනු මිනිසුන්ගෙන් සැදි මේ කණ්ඩායම වනාහි ඔහු සැදීමට බලාපොරොත්තුවෙන් සිටින හමුදාවේ ආරම්භක පියවර විය. මේ වනවිටත් ගර්න් ගේ පුතා ගන්තර් විසින් අනිකුත් ගෝත්‍ර එකතු කරමින් සිටිනවා ඇත. මේ සත්ත්ව සම් පොරොවාගත්, එහෙන් මෙහෙන් සොරකම් කරනලද ආයුධවලින් සැරසීගත් කණ්ඩායමෙන් සිය පියා කුමක් කරනු ඇත්දැයි ඔහු විමතියෙන් කල්පනා කලේය. ඇත්තෙන්ම කිවහොත් මොවුන්ගෙන් කුමක් කලයුතු දැයි ඔහු පවා නොදැන සිටියේය. ඔහු ඔවුන් ගේ අණදෙන නිළධාරියා ද නැතිනම් ඔවුන් ගේ සිරකරුවා ද? ඔහු ඒ බවවත් නොදැන සිටියේය. බොහෝවිට එය මේ දෙකෙහිම සම්මිශ්‍රනයක් විය. "මම විතරක් මුලින් ඉස්සරහට ගියානම් වඩා හොඳ වෙයි." ඔහු යෝජනා කලේය.

"ටයිවින්ගෙ පුතා ටිරියන්ට නං ඒක හොඳ වෙයි තමා." චන්ද්‍ර සොහොයුරන් වෙනුවෙන් කතා කල උල්ෆ් කීවේය. ෂග්ගා රවා බැලූ අතර එය දැකීමට බිහිසුනු දසුනක් විය. "ඩොල්ෆ්ගෙ පුතා ෂග්ගා ඒකට කැමැති නෑ. ෂග්ගාත් එනවා කොලුමිනිහාත් එක්ක යන්ට. කොලුමිනිහා බොරුවක් කියලා තිබ්බොත් ෂග්ගා උගෙ පිරිමි ඇඟ කපලා-"

"-එළුවන්ට කන්ට දානවා. ඔවු මම දන්නවා." ටිරියන් උදාසීන අයුරින් පැවසීය. "ෂග්ගා. මම උඹට ලැනිස්ටර් කෙනෙකුගෙ වචනෙ දෙනවා. මම ආපහු එනවා."

"අපි මොකටද උඹේ වචනෙ විශ්වාස කරන්නෙ?" චෙලා වනාහි පිරිමියෙකු ගේ මෙන් පැතැළි පපුවක් ඇති, කුඩා, දැඩි ගැහැණියක වූවාය. එමෙන්ම ඇය මෝඩියක ද නොවූවා ය. "මේ පාත රටේ උත්තමයො මීට කලිනුත් අපේ ගෝත්‍රවලට බොරු කියලා තියෙනවා."

"උඹ මගේ හිත රිද්දනවා චෙලා." ටිරියන් කීවේය. "මම හිතාගෙන හිටියෙ අපි හැමෝම දැන් හොඳ යාළුවො වෙලා කියලයි. ඒ වුනත් උඹට ඕනෙම නම් උඹට පුළුවන් මගෙත් එක්ක යන්ට එන්ට. ඒ එක්කම ගල්කපුටො වෙනුවෙන් ෂග්ගායි කොනුයි, චන්ද්‍ර සහෝදරයො වෙනුවෙන් උල්ෆුයි, පිච්චුන මිනිස්සු වෙනුවෙන් ටිමට්ගෙ පුතා ටිමටුයි මාත් එක්ක එකතු වෙයල්ලා." මේ නම් කියද්දී ගෝත්‍රිකයන් එකිනෙකා අතර පරීක්ෂාකාරී බැලුම් හුවමාරු කරගන්නට වූහ. "මම උඹලාට එන්ටයි කියනකං අනිත් එවුන් ටික මෙතැනම නැවතිලා ඉඳපල්ලා. මම නැති අතරේ නිරපරාදෙ මිනිස්සු මරන්ට යන්නෙ නැතුව, උඹලා අතරේ ගැටුම් ඇතිකරගන්නෙ නැතුව හිටපල්ලා."

චෙලා

අසුට සන්කල ඔහු අසු ඉදිරියට මෙහෙයවීය. ඔහු විසින් නම් කලවුන්ට ඔහුත් සමගින් යාම හෝ නැවතී බලාසිටීම හැර වෙනත් විකල්පයක් නොවීය. ඒ දෙකෙන් කුමක් සිදුවූවද ටිරියන්ට ගැටළුවක් නොවීය. ඒ ගැන කතාකරන්නට බිම වාඩි වී සම්පූර්ණ රයක් හා දහවලක් නාස්ති නොකරන තාක් කල් ඔහුට කිසිදු ගැටළුවක් නොවීය. මේ ගෝත්‍රිකයින් සම්බන්ධයෙන් වූ එකම ප්‍රශ්නය එය විය. ඔවුන් ගේ අමුතුම සමාචාර විදිවලට අනුව සෑම දෙයකදීම සෑම මිනිසකුගේම මතය විමසා බැලීම අනිවාර්ය දෙයක් විය. එමනිසා ඔවුහු සෑමවිටම යම්දෙයක් සම්බන්ධයෙන් නොනැවතීම වාද විවාද කරමින් කල් ගෙවූහ. ඔවුන් ගේ ගැහැණුන්ට පවා මේ වාද විවාදවලට සම්බන්ධ වීමේ හැකියාව තිබිනි. විටින් විට සිදුවන සාමාන්‍ය මංකොල්ල කෑමකට එහා ගිය දරුණු උපද්‍රවයකින් ඒරින් මිටියාවතට හානි පැමිණවීමට ඔවුන්ට වසර සිය ගණනකින් වත් හැකි නොවීම මහ පුදුමයක් නොවේ. ටිරියන් මේ තත්ත්වය වෙනස් කරවීමට සැලසුම් කරගෙන සිටියේය.

බ්‍රොන්ද ඔහු හා එකපෙළට අසු මෙහෙයවීය. තම කුඩා කඳුකර අසුන් පිට නැගුනු ගෝත්‍රිකයෝ ඔවුන් පසුපසින් වැටුනහ. මේ කුඩා කෙට්ටු අසුන් පෝනියන් මෙන් දිස් වූ අතර උන් එළුවන් මෙන් කඳු නැගීමේ ශූරයින් වූහ.

ගල්කපුටන් දෙදෙන එකට ගමන් කලෝය. එමෙන්ම වෙලා හා උල්ෆ් ද එක්ව අසුන් මෙහෙයවූහ. චන්ද්‍ර සොහොයුරන් හා කළු කණ් ඇත්තවුන් අතර සැමවිටම සමීප මිත්‍රත්වයක් තිබුනි. ටිමට් ගේ පුතා ටිමට් පමණක් තනිවම සිය අසු මෙහෙයවීය. කඳුකරයේ විසූ අන් සැම ගෝත්‍රයක්ම පිළිස්සුනු මිනිසුන් කෙරෙහි බියක් දැක්වූහ. ඔවුහු සිය නිර්භීත භාවය ඔප්පුකිරීම පිණිස සිරුරු ගින්නෙන් පුළුස්සා ගැනීම චාරිත්‍රයක් ලෙසින් සිදුකලෝය. එමෙන්ම අන්‍යයන් විසින් කියූ පරිදි සිය භෝජන සංග්‍රහ වලදී කුඩා දරුවන් රෝස් කිරීමද සිදුකලහ. මේ පිළිස්සුනු මිනිසුන් සැවොම ටිමට්ට දැඩි බියක් දැක්වූහ. කොලුවකු වැඩුනු මිනිසකු බවට පත්කෙරෙන උත්සවයේදී සිය නිර්භීත භාවය ඔප්පු කරනුවස් ඔහු ගිනියම් වූ පිහියකින් තමාගේම වම් ඇස පුළුස්සාගෙන තිබුනි. සාමාන්‍යයෙන් නම් මෙවැනි උත්සවයකදී කොලුවකු විසින් සිය අතැඟිල්ලක් හෝ තණ පුඩුවක් හෝ පුළුස්සාගැනීම සම්ප්‍රදාය විය. වඩාත් නිර්භීත - හෝ වඩාත් මෝඩ - කොලුවකු නම් ඔහු සිය කණක් පුළුස්සා ගනු ඇත. ටිමට් ගේ මේ ඇස් පුළුස්සා ගැනීම නිසා ඔහුගේ ගෝත්‍රයේ මිනිසුන් කෙතරම් විමතියකට පැමිණියාද යත් ඔවුහු වහාම ටිමට්ව 'රතු හස්තයක්' බවට නම් කලෝය. මේ රතු හස්තය යනු යම් ආකාරයක හමුදා නිළයක් බව ටිරියන් පසුව දැනගත්තේ ය.

"මම මේ කල්පනා කරන්නෙ උන්ගෙ රජතුමා වුන එකා මොකක් පුච්චගන්ට ඇත්ද කියලයි." මේ කතාව ඇසූ දවසේ ටිරියන් බ්‍රොන් අමතා කීවේය. කුලීහේවායා විරිත්තමින් සිය රහසඟ දෙසට ඇඟිල්ලක් දිගුකලේය... එනමුදු ටිමට් සමීපයේ සිටින විටදී බ්‍රොන් පවා සිය කට පරෙස්සම් කරගන්නට වග බලාගත්තේ ය. යම් මිනිසකු සියතින්ම ඇසක් පුළුස්සා ගැනීමට තරම් උන්මත්තකයකු නම් ඔහුගේ සතුරන් කෙරෙහි කරුනාවක් බලාපොරොත්තු වීම විහිළුවකි.

* * *

ඔවුන් ගේ කණ්ඩායම කඳුගැටයෙන් පහළට අසුන් විහිදුවද්දී දුරින් පිහිටි රළු ගල් බැම්මෙන් බැඳි නිරීක්ෂක කුළුණු වල සිටි විමසිලිමත් ඇස් ඔවුන් දෙස බලා සිටියහ. පණිවුඩයක් රැගත් කපුටකු අහසට නගිනු ටිරියන් නිරීක්ෂණය කලේය. කඳුකර මාර්ගය

දැවැන්ත ගල් පර්වත දෙකක් මැදින් ඇදී යන ස්ථානයකදී ඔවුන්ට පළමු මුර කපොල්ල දකින්නට ලැබුනි. මාර්ගය වසා අඩි හතරක් පමණ උස් පස් බැම්මක් බැඳ තිබුනු අතර දෙපස උස් බිම් හරස් දුනු දැරූ සෙබළුන් දුසිමකගෙන් ආරක්ෂා විය.

දඩුබස්නාමානයෙන් එපිට සිය සගයින් නැවැත්වූ ටිරියන් තනිවම ඉදිරියේ ඇති පස් බැම්ම වෙත ගියේය. "කවුද මෙතන අණ දෙන්නෙ?" ඔහු කෑගසා විමසීය.

ටිමට්

කපිතාන් විගස පැමිණියේ ය. එමෙන්ම සිය උතුමානන් ගේ පුත්‍රයා හඳුනාගත් ඔහු විගස ඔවුන් සමග යාමට පිරිවර සේනාවක් සූදානම් කලේය. ඔවුහු කළු පැහැගත් බිම් හා ගිනිගත් බලකොටු පසුකරමින් පහතින් වූ ගංගා නිම්නයේ කොළ ගංගාව වෙත සිය අසුන් මෙහෙයවූහ. ටිරියන් කිසිදු මළ සිරුරක් නොදුටු නමුදු අවට ආකාශය කපුටන්ගෙන් පිරී පැවතුනි. මෙහි ඉතා මෑතකදී සටන් ඇවිලී තිබුනු බවට සාක්ෂි සෑමතැනම දැකිය හැකිවිය.

මංසන්ධියට අඩ ලීගයක දුරක් තිබියදී මාර්ගය වසා, උල්කල ලී වලින් තැනූ පැලලි යොදා මාර්ග බාධක යොදා තිබුනි. එහි මුරට දුනුවායන් ද කුන්තධරයින් ද වූහ. මේ බාධකයට එපිටින් ඇසට හසුවන මානය තෙක් යුධ කඳවුර පැතිර විසිර සිටියේය. සිය ගණනක් වූ කඳවුරු ගිනිමැලවලින් නැගී සිහින් දුම්රොටු අහසට නැග්ගේය. මුදු දම්වැල් සන්නාහයෙන් සැරසුනු මිනිස්සු ගස් යට වාඩිගෙන සිය අසිපත් මුවහත් කරමින් හුන්හ. මඩ සහිත බිමෙහි සිටවූ කණුවල හුරුපුරුදු ධජපතාක එල්ලී තිබුනි.

ඔවුන් මාර්ග බාධකයට ලංවද්දී අසරු සෙබළුන් පිරිසක් ඔවුන්ට අභියෝග කරනු වස් ඉදිරියට ආවෝය. ඔවුන්ව මෙහෙය වූ නයිට්වරයා අමතේස්ත එබ්බවූ රජතමය සන්නාහයෙන් සැරසී දම් හා රිදී පැහැ ඉරි වැටුනු සළුවක් පැළැඳ සිටියේය. ඔහුගේ පලිසේ සිය වංශ සලකුණ වන කඟවේනකු සිතුවම් කර තිබුනු අතර ඔහු පැළැඳ සිට අශ්ව හිසක හැඩය ගත් ශිරස්කයේ නළල මත අඩි දෙකක් පමණ දිගු සර්පිලාකාර අඟක් සවි වී තිබුනි. අසු නැවතූ ටිරියන් ඔහුට ආචාර කලේය. "සෙර් ෆ්ලෙමන්ට්."

සෙර් ෆ්ලෙමන්ට් බ්‍රැක්ස් සිය ශිරස්කයේ මුවවැස්ම ඉහළට එසවීය. "ටිරියන්!" ඔහු විස්මය රැඳි ස්වරයෙන් කීය. "මගේ උතුමානනි. අපි හැමෝම බයවෙලයි හිටියෙ ඔබ මැරිලයි කියලා. නැත්තම්..." ඔහු ගෝත්‍රිකයින් දෙස අතීරණාත්මක ස්වරයකින් නෙත් හෙළීය. "මේ... ඔබේ ගමන් සගයො..."

"බොහොම හොඳ යාළුවො. පක්ෂපාතී සෙබළු. මට කොහෙන්ද මගේ තාත්තව හොයාගන්ට පුළුවන්?"

"එතුමා මංසන්ධි තානායම එයාගෙ නවාතැන විදියට පාවිච්චි කරනවා."

ටිරියන් සිනාසුනේය. 'මංසන්ධි තානායම!' සමහරවිට දෙවිවරුන් සිතන තරම්ම නරක නැතුවා වන්නට ඇත. "මම හැකි ඉක්මනින්ම එයාව මුනගැහෙන්ට ඕන."

"ඔබේ කැමැත්තක් මගේ උතුමානනි." සිය අසු හරවාගත් සෙර් ෆ්ලෙමන්ට් කැගසා විධානයක් දුන්නේය. බාධක පැලලි තුනක් දෙපසට ඇදුනු අතර මාර්ගයේ විවරයක් සැදුනි. ටිරියන් සිය පිරිස් ඒ තුළින් කඳවුරට ඇතුළුකලේය.

ලැනිස්ටර් යුධ කඳවුර ලීග ගනනාවක් දුරට යනතෙක් පැතිර තිබුනි. වෙලාගේ තක්සේරුව වූ සෙබළුන් විසිදහස එතරම්ම වැරැදි ගණනයක් නොවීය. සාමාන්‍ය සෙබළුන් එළිමහනේ කඳවුරු බැඳ සිටි අතර නයිට්වරුන් වෙනුවෙන් කූඩාරම් ඉදිවී තිබුනි. සමහර උසස්ම මට්ටමේ වංශාධිපතීන් වෙනුවෙන් සාමාන්‍ය නිවාසයක් තරම්ම විශාල වූ මණ්ඩප ඉදිවී තිබුනි. ප්‍රෙස්ටර්වරුන් ගේ රතු ගොනා ද, ක්‍රේක්හෝල් උතුමානන් ගේ වල්ඌරා ද, මාර්බ්‍රෑන්ඩ්වරුන් ගේ ගිනිගන්නා ගස ද, ලිඩ්න්වරුන් ගේ බැජර් මුගටියා ද ටිරියන් ගේ නිරීක්ෂණයට හසුවිය. ඔහු සිය පිරිස සමගින් හෙමින් සීරුවේ අසු ඉදිරියට මෙහෙයවන අතරේ දෙපස සිටි නයිට්වරුන් ඔහුට සිය ආචාරය පුදකලහ. සාමාන්‍ය සෙබළු විමතියෙන් මුව අයාගෙන ඔහුත් සමග ගමන්ගන්නා ගෝත්‍රිකයින් දෙස බලාසිටින්නට වූහ.

කිසිදු සැකයකින් තොරව ෂග්ගා ද අසීමාන්තිකවම මවිතයට පත්ව සිටියේය. ඔහු සිය ජීවිත කාලය තුළ කිසිදු දිනෙක මෙතරම් මිනිසුන්, අසුන් හෝ ආයුධ ප්‍රමාණයක් දැක නොතිබුනු අතර මුව අයාගෙන අවට බලමින් සිටියේය. සෙසු ගෝත්‍රිකයින් පිරිස එලෙස තම හැඟීම්

මුහුණින් නොපෙන්වා සිටීමට තරම් ප්‍රවේශම් සහගත වුවද ඔවුන් ද ඒ හා සමානවම මවිතයට පත්ව ඇති බව ටිරියන්ට රහසක් නොවීය. 'හොඳයි! හොඳටම හොඳයි!' ලැනිස්ටර්වරුන් සතු බලය ගැන ඔවුන් මවිත වන තරමට ඔවුන්ව පාලනය කිරීම හා ඔවුන්ට අණදීම වඩා පහසු වනු ඇත.

තානායම හා එහි ඉස්තාල ටිරියන්ට මතක ඇති පරිද්දෙන්ම විය. එනමුදු ඒ අවට ගම්මානයේ වූ ගොඩනැගිලිවලින් ඉතිරිව තිබුනේ ගල් ගොඩවල් හා කළු ගැහුනු අත්තිවාරම් පමණි. තානායම් අංගනයේ එල්ලුම් ගහක් ඉදිවී තිබුනු අතර එහි මේ වනවිටත් පැද්දෙමින් තිබුනු මළකඳ කපුටන්ගෙන් වැසී පැවතින. ටිරියන් ලංවද්දී උන් කරවූ හඬ නංවමින් කළු පියාපත් ගසමින් ඉගිල යන්නට වූහ. අසු බිටින් බිමට බට ඔහු මළසිරුරේ මේ වනවිට ඉතිරිව ඇති නශ්ටාවශේෂ දෙස බැලුවේය. කපුටන් විසින් ඒ දෙතොල්, දෙකම්මුල් හා දෑස් කා දමා තිබුනද භයංකාර සිනහවක් නගා සිටි ඒ රත් පැහැ වූ දත් දෙපෙළ හඳුනාගැනීමට ඔහු සමත් විය. "මම ඉල්ලුවෙ කාමරයකුයි, කෑමයි, වයින් ගුරුලේත්තුවකුයි විතරයි." ඔහු අවලාදයක ස්වරූපයෙන් ඇයට පැවසීය.

ෂග්ගා

ඉස්තාල කොලුවෝ හනික ඉදිරියට පැමිණියේ ඔවුන් ගේ අසුන් පිළිගැනීමට විය. සිය අශ්වයා ඔවුන්ට බාරදීමට ෂග්ගා කොහෙත්ම කැමැති නොවීය. "ඒ කොල්ලා උඹේ වෙළඹ හොරකම් කරන්නෙ නෑ බං." ටිරියන් ඔහුව අස්වැසුවේ ය. "ඌට ඕන කරන්නෙ ඒකිට ඕට්ස් ටිකකුයි වතුරයි දීලා ඒකිගෙ බූල් ටික පීරලා පොඩි සාත්තුවක් කරන්ට විතරයි." ෂග්ගාගේ බූල් කබායටද එවැනිම සාත්තුවක් අවශ්‍ය බව පෙනීගියද එවැන්නක් සඳහන් කිරීම නුවණක්කාර වැඩක් නොවනු ඇත. "උඹට මම පොරොන්දු වෙනවා. උඹේ අශ්වයාට හානියක් කරන්නෙ නෑ."

ෂග්ගා රවමින් තෝන්ලණුව අත හැරියේය. "මේ ඉන්නෙ ඩොල්ෆ්ගෙ පුතා ෂග්ගාගෙ අස්සයා." ඔහු ඉස්තාල කොලුවාට ගෙරවීය.

"ඌ ඒකිව ආපහු දුන්නෙ නැත්තම් උගෙ පිරිමි ඇඟ කපලා එළුවෙකුට කන්ට දාපන්... උඹට එළුවෙක් හොයාගන්ට පුළුවන් වුනොත්." ටිරියන් පොරොන්දු විය.

ලේ රත් පැහැ සළුවෙන් සැරසී සිංහ රූප සහිත ශිරස්ක පැළැඳි ලැනිස්ටර් සෙබළුන් දෙදෙනෙක් තානායමේ නාම පුවරුව යට දොරටුව දෙපස මුරකාවලෙහි යෙදී සිටියෝය. ටිරියන් ඔවුන්ගේ නායකයා හඳුනාගත්තේ ය. "මගේ තාත්තා?"

"ප්‍රධාන ශාලාවෙ මයෙ උතුමානනි."

"මගේ මිනිස්සුන්ට කෑමයි බීමයි ඕන." ටිරියන් ඔහුට පැවසීය. "උන්ට ඒවා ලැබෙන්ට සලස්සපන්." ඔහු තානායමට ඇතුළු වූ අතර එහි ඔහුගේ පියා විය.

කාර්ස්ටලී රොක්හි උතුමානන් හා බටහිර දිග ආරක්ෂකයා වන ටයිවින් ලැනිස්ටර් පනස්වන දශකයේ මැදභාගයේ පසුවූවකු විය. එනමුදු ඔහු තවමත් විසිවියෙහි වූවකු මෙන් හැඩිදැඩි ශක්ති සම්පන්නයකු විය. හිඳගෙන සිටියදී පවා ඔහු උස් සිරුරැති, දිගැති පාද හා පුළුල් උරහිස් ඇති, පැතලි උදරයකින් හෙබියකු විය. ඔහුගේ කෙට්ටු දෑත් මාංශ පේෂියෙන් ගැවසී ගත්තේය. එක් කලෙක රන්වන් පොදියක් මෙන් දිදුලූ ඔහුගේ හිසකෙස් හැලී යන්නට පටන්ගත් විට සිය කරණැවැමියා කැඳවූ ඔහු මුළුමනින්ම තට්ටය බාන්නැයි අණකර සිටියේය. ටයිවින් උතුමානන් වනාහි කිසිදු වැඩක් බාගෙට සිදුකරන පුද්ගලයකු නොවීය. එබැවින් ඔහු මුව වටා හා නිකටේ වූ රැවුල පවා කපා දැමූ අතර දෙපස රැවුල පමණක් ඉතිරි කරගත්තේ ය. එකට ගෙතුනු, දැවැන්ත රන්වන් රැවුලක් ඔහුගේ දෙකණ්වල සිට හණුව දක්වා දෙකම්මුල් වසා ගත්තේය. ඔහුගේ දෙනෙත් රන් පැහැ පුල්ලි වැටුනු ලා කොළ පැහැයක් විය. එක් මෝඩ මිනිසකු වරක් ප්‍රකාශ කර සිටියේ ටයිවින් උතුමානන්ගේ මළපහ පවා රන් පැහැයෙන් දිදුලන බවකි. සමහරුන් කියන්නේ ඒ මිනිසා තවමත් ජීවත්වන බවකි. කාර්ස්ටලී රොක්හි ගැඹුරේ වන අන්ධකාර දඟගෙයක ජීවත්වන බවකි.

ටිරියන් ප්‍රධාන ශාලාවට ඇතුළුවන විට ඔහුගේ පියාගේ ජීවත්ව සිටින එකම සොහොයුරා වන සෙර් කෙවන් ලැනිස්ටර් ටයිවින් උතුමානන් සමගින් ඒල් බඳුනක් තොලගාමින් හුන්නේය. ඔහුගේ බාප්පා තරබාරු, තට්ට හිසැතියෙකු විය. කොට කර කපනලද කහවන් රැවුලකින් ඒ දැවැන්ත හණු වැසී ගියේය. ටිරියන්ව මුලින්ම දුටුයේ සෙර් කෙවන් විසිනි. "ටිරියන්!" ඔහු විමතියෙන් පැවසීය.

"බාප්පෙ." ටිරියන් හිස නමමින් කීවේය. "මගේ තාත්තෙ. ඔබලාව මෙහෙදි මුනගැහෙන්ට ලැබුන එක කොච්චර ලොකු සන්තෝසයක් ද?"

**Tywin Lannister: “No sword is strong until it’s been tempered.”**

ටයිවින් උතුමානන් පුටුවෙන් නොනැගිටි නමුදු සිය කුරුමිට්ටි පුත්‍රයා දෙස දිගු වේලාවක් පරීක්ෂණාත්මක බැලමෙන් බලා සිටියේය. "උඹේ මරණය ගැන අපට අහන්ට ලැබුන කටකතා බොරු එහෙනම්."

"ඔබේ බලාපොරොත්තු කඩකරන්ට සිද්දවුන එක ගැන බොහොම කණගාටුයි තාත්තෙ. නෑ නෑ නෑ. පුටුවෙන් නැගිටලා දුවලා ඇවිල්ලා මාව බදාගන්ට උවමනා නෑ. ඔබට අනවශ්‍ය කරදරයක් කරන්ට මට කොහෙත්ම ඕනකමක් නෑ." ටිරියන් කාමරය හරහා මේසය වෙත ඇවිද ගියේය. සිය බකල දෙපා විසින් තබන සෑම පියවරන් පාසාම ඔහුව තාරාවෙක් මෙන් ගාටවන අයුරු ඔහුට හොඳින්ම වැටහුනි. සිය පියාගේ දෑස් ඔහු වෙත යොමුවී තිබෙන සෑම විටෙකම මෙලෙස ඔහුට සිය දුබලතා ගැනත් අංගවිකෘතීන් ගැනත් සිහිපත්වී නොසන්සුන් බවක් දැනීම සුපුරුදු දෙයක් විය. "මං වෙනුවෙන් යුද්ධෙට ගිය එක හරිම කරුනාවන්ත කමක්." මේසය අසල වූ පුටුවකට නැග ඒල් කෝප්පයක් පුරවාගන්නා අතරේ ඔහු පැවසීය.

"මම දන්න දේ අනුවනම් උඹයි මේ යුද්ධෙ පටන්ගත්තෙ." ටයිවින් උතුමානන් පිළිතුරු දුන්නේය. "උඹේ අයියා ජේමිනම් ඔහොම මීක් සද්දයක්වත් නැතුව ගෑනියෙකුට ඌව අල්ලගන්ට දෙන එකක් නෑ."

"ඒ තමා ජේමියි මායි වෙනස් වෙන එක විදියක් තාත්තෙ. අනික එයා මට වඩා උසයි. ඔබ ඒක දකින්ට ඇති."

ඔහුගේ පියා මේ නර්මාලාපය නොතකා හැරියේය. "අපේ පෙළපතේ ගෞරවය පරදුවට තියලයි තිබුනෙ. හමුදාවත් අරන් ඉස්සරහට යනවා ඇරෙන්ට මට වෙන විකල්පයක් තිබුනෙ නැහැ. කිසිම මිනිහෙකුට බෑ ලැනිස්ටර් ලේ හොල්ලලා විපාක නොවිඳ ඉන්ට..."

"අසන්න මා ගොරවන හඬ!" ටිරියන් විරිත්තමින් සිය පෙළපතේ ආදර්ශ පාඨය කීවේය. "ඇත්තම කියනවා නම් මගේ ලේ පොඩ්ඩක්වත් හෙල්ලුනෙ නෑ. එකපාරක් දෙපාරක් විතර ඒ ළඟටම ආවා. මොරෙකුයි ජයිකුයි දෙන්නා නම් මලා."

"මම හිතන්නෙ උඹට අලුත් මිනිස්සු කීපදෙනෙක් ඕන වෙලා ඇති."

"අපොයි! ඒ ගැන පොඩ්ඩක්වත් වදවෙන්ට එපා තාත්තෙ. මමම මිනිස්සු කීපදෙනෙක් හොයාගත්තා." ඔහු ඒල් උගුරක් ගිල දැමීමට උත්සාහ කලේය. එය මනාව දුඹුරු පැහැගත්, හොඳින් පැසුනු, මධ්‍යසාරයක් විය. ඇත්තෙන්ම කිවහොත් ඉතා හොඳ මධ්‍යසාරයක් විය. ඔහුගේ පියා විසින් තානායම්පතිනිය එල්ලා දැමීම කණගාටුවට කරුනක් විය. "කොහොමද දැන් යුද්ධෙ තත්ත්වෙ?"

ඔහුගේ බාප්පා පිළිතුරු දුන්නේය. "මේ වෙනකම් බොහොම හොඳයි. සෙර් එඩ්මුයර් එයාගෙ සීමාවෙ මායිම දිගටම පොඩි පොඩි හමුදා කණ්ඩායම් රඳවලා තියෙනවා අපේ කඩාපනින හමුදා නවත්තන්ට. ඔයාගෙ තාත්තටයි මටයි පුළුවන් වුනා ඒ හමුදාවලින් බොහොමයක්ම විනාශ කරලා දාන්ට උන් එකතුවෙන්ට කලින්."

"උඹේ අයියා දවසින් දවස එයාගෙ පාරට්ටුව තවතවත් වැඩි කරගන්නවා." ඔහුගේ පියා කීවේය. "එයා ගෝල්ඩන් ටූත්වලදී වාන්ස් උතුමානන්වයි පයිපර් උතුමානන්වයි සම්පූර්ණයෙන්ම නැතිකරලා දැම්මා. ඊටපස්සෙ රිවර්රන් බලකොටුවෙ ප්‍රාකාර යටදී ඒකාබද්ධ ටලී හමුදාවට පහර දුන්නා. ගංගා ත්‍රිශූලයේ වංශාධිපතියො පැරදිලා පැනලා දිවුවා. සෙර් එඩ්මුයර් ටලීව අපි පණපිටින් අල්ලගත්තා. එයාගෙ යටත් වංශාධිපතියොයි නයිට්වරුයි හුඟදෙනෙක්වත් අල්ලගත්තා. බ්ලැක්වුඩ් උතුමානන් ඉතුරුවෙච්ච ටිකදෙනෙක් අරන් රිවර්රන්වලට පැනලා ගියා. දැන් ජේමි උන්ව වටලලායි තියෙන්නෙ. අනිත් එවුන් තමතමන්ගෙ බලකොටුවලට පැනලා ගිහිල්ලා."

"ඔයාගෙ තාත්තයි මායි මේ බලකොටු එකින් එකට පහරදුන්නා." සෙර් කෙවන් කීවේය. "බ්ලැක්වුඩ් උතුමානන් නැති හන්දා රේවන්ට්‍රී එකපාරින්ම වැටුනා. හැරෙන්හෝල් ආරක්ෂාකරගන්ට මිනිස්සු නැති හන්දා වෙන්ට් ආර්යාව අපට යටත් වෙලා බලකොටුව බාරදුන්නා. සෙර් ග්‍රෙගර්, පයිපර්ලාගෙයි බ්‍රැකන්ලාගෙයි බලකොටු ගිනි තියලා දැම්මා..."

"ඒ කියන්නෙ දැන් කිසිම ප්‍රතිරෝධයක් නෑ?"

"එහෙමමත් නෙවෙයි." සෙර් කෙවන් පිළිතුරු දුන්නේය. "මැලිස්ටර්ලා තාමත් සීගාර්ඩ් අල්ලගෙන ඉන්නවා. ඒ වගේම වෝල්ඩර් ෆ්‍රේ තාමත් නිවුන් බලකොටුව පුරුදු විදියටම පාලනය කරනවා. බදු එකතු කරනවා."

"ඒකෙ එච්චර ප්‍රශ්නයක් නෑ." ටයිවින් උතුමානන් කතාවට මැදිහත් වූයේය. "දිනුම ජේනතෙක් මානෙක නැත්තං ෆ්‍රේ එයාගෙ හමුදාව එළියට දාන්නෙ නෑ. එයාට දැන් දැනෙන එකම සුවඳ නටඹුන්වල සුවඳ විතරයි. අනික ජේසන් මැලිස්ටර්ට තනියෙන්ම සටන් කරන්ට තරම් ශක්තියක් නෑ. ජේමි රිවර්රන් අල්ලගත්ත ගමන් අනිත් එවුන් හැමෝම හැරෙන පමාවෙන් දණ ගහවි. ස්ටාර්ක්ලායි ඒරින්ලායි අපට විරුද්ධව ආවෙ නැත්තම් මේ යුද්ධෙ දැනටමත් දිනුවා හා සමානයි."

"මම ඔබනම් ඒරින්ලා ගැන ඔච්චර වදවෙන්නෙ නෑ." ටිරියන් කීවේය. "ඒ වුනත්, ස්ටාර්ක්ලා කියන්නෙ වෙනමම ප්‍රශ්නයක්. එඩාර්ඩ් උතුමානන්-"

"-දැන් අපේ ප්‍රාණ ඇපකාරයෙක්." ඔහුගේ පියා පැවසීය. "එයා රතු බලකොටුවෙ යට තියෙන දඟගේක දිර දිරා යනකං අපට විරුද්ධව හමුදා මෙහෙයවන එකක් නෑ."

"නෑ." සෙර් කෙවන් එකඟවිය. "ඒ වුනත් එයාගෙ පුතා යටත් වංශාධිපතියො කැඳෙවුවා. දැන් එයා ලොකු හමුදාවකුත් එක්ක මෝට් කේය්ලින් වල වාඩිලාගෙන ඉන්නවා."

"කිසිම කඩුවක් ශක්තිමක් නෑ ඒකට පන්නරේ තියනකම්." ටයිවින් උතුමානන් ප්‍රකාශ කලේය. "ස්ටාර්ක් කොල්ලා පොඩි එකෙක්. කිසිම සැකයක් නෑ ඌ යුද්ධ හොරණෑ හඬ අහන්ට එහෙම ආස ඇති. ඒ වගේම උන්ගෙ කොඩි හුළඟෙ ලෙලදෙනවා බලන් ඉන්ටත් ආස ඇති. ඒ වුනත් අන්තිමේදී යුද්ධෙ පටන් ගත්තහම, මිනිස්සු මරන්ට පටන් ගත්තහම අපි බලමු ඌට කොච්චර ධෛර්යයක් තියෙනවාද කියලා ඒකට මූන දෙන්ට."

තමා නොමැති අතර සෑම දෙයක්ම බොහොම සිත් ඇදගන්නාසුළු තත්ත්වයකට පත් වී ඇතැයි ටිරියන් විමතියෙන් කල්පනා කලේය. "ඉතින් මේ මිනිස්සු මරන වැඩේ කරන අතරේ අපේ උතුම් මහරජතුමා මොකක්ද කරන්නෙ?" ටිරියන් පුදුමයෙන් ඇසීය. "කොහොමද අපේ ලස්සන අක්කා රොබර්ට්ව එකඟ කරගත්තෙ එයාගෙ ආදරණීය මිත්‍රයාව හිරබාරෙට ගන්න එකට?"

"රොබර්ට් බරතියන් මලා." ටයිවින් උතුමානන් කීය. "දැන් උඹේ බෑණා තමා කින්ග්ස් ලෑන්ඩින්ග්වල ඉඳන් පාලනේ ගෙනියන්නෙ."

මෙය ටිරියන්ව තවත් මවිත කරන්නට හේතු විය. "ඔබ කිවුවෙ මගේ අක්කා පාලනේ ගෙනියනවා කියලා වෙන්ටැති." ඔහු තවත් ඒල් උගුරක් ගිල්ලේය. සිය සැමියා වෙනුවට සෙර්සි මේ රාජධානිය පාලනය කරන්නට පටන් ගතහොත් එය ඉඳුරාම වෙනස් තැනක් වෙනු ඇත.

"උඹටත් මේ වෙලාවෙ වැඩක් ඇති වැඩක් කරන්ට තරම් හිතක් පහලවුනා නම් මම උඹට සේනාංකයක් බාර දෙන්නම්." ඔහුගේ පියා කීවේය. "මාර්ක් පයිපරුයි කේරිල් වාන්සුයි තාමත් අපේ පස්සෙන් ඉන්නවා. නිදහසේ. උන් රතු ගංගාවෙන් එහා අපේ ඉඩම් මංකොල්ල කනවා."

ටිරියන් සිය දත් අතරින් 'ට්ස්ස්' හඬක් නැංවීය. "කාලකන්නි බල්ලො. පෙරලා සටන් කරන්ට! සාමාන්‍යයෙන් නම් මම බොහොම කැමැතියි ඔය වගේ අශිෂ්ටයින්ට පාඩමක් උගන්නන්ට තාත්තෙ. ඒ වුනත් මේ වෙලාවෙ මට වෙන තැනක බොහොම ලොකු වැඩක් කරන්ට තියෙනවා."

"එහෙමද?" ටයිවින් උතුමානන් එයින් එතරම් සැලුනු බවක් නොපෙනුනි. "අපට නෙඩ් ස්ටාර්ක්ගෙ තවත් හිසරද දෙකක් ඉන්නවා. උන් දෙන්නා මගේ සැපයුම් කණ්ඩායම්වලට පහර දීලා හරි කන්දොස්කිරියාවක් කරනවා. බෙරික් ඩොන්ඩරියන් කියලා ඕන්න ඔය තරුණ උතුමානන් කෙනෙක්. තමන්ගෙ පෞද්ගලික කීර්තිය ගැන හීන මවන මෝඩයෙක්. ඌත් එක්ක ඉන්නවා අර මහත, පිස්සු රතු පූජකයා. අර උගෙ කඩුවට ගිනි තියාගන්නෙ, අන්න ඌ. උඹ හිතනවද මෙතැනින් පිටවෙලා බයෙන් දුවලා යන අතරේ

උඹට පුළුවන් වෙයි කියලා උන්ට මොකක් හරි වැඩක් දෙන්ට? නිකං බොරුවට වැඬේ වල් කරගන්නෙ නැතුව යමක් කරන්ට පුළුවන් නම් විතරයි."

කෙවන් ලැනිස්ටර්

සිය පිටි අත්ලෙන් මුව පිස දා හැරි ටිරියන් සිනාසුනේය. "තාත්තෙ, මගේ හදවත ආදරෙන් පිරිලා යනවා ඔබ මෙහෙම මා ගැන විශ්වාසෙ තියලා... කොච්චර ද? මිනිස්සු විස්සක්? පනහක්? විතර දෙනකොට. ඔබට හොඳටම විශ්වාසද ඔබට පුළුවන් කියලා එච්චර මිනිස්සු ගොඩක් මට දෙන්ට? හරි, ප්‍රශ්නයක් නෑ. මම යන අතරමගදි තොරෝසුයි, බෙරික් උතුමානනුයි මුනගැහුනොත් මම උන් දෙන්නව අතුගාලා දාන්නම්." පුටුවෙන් බිමට පිනූ ඔහු බකල ගසමින් පසෙකින් වූ අල්මාරි මේසය වෙත ගියේය. ඒ මත පළතුරු රැසක් මැද්දේ සුදු පැහැ කේජු රෝදයක් විය. "කොහොමවුනත්, මුලින්ම මට තියෙනවා මම දූන්න පොරොන්දු කීපයක් ඉෂ්ටකරලා ඉන්ට." කේජු කැබැල්ලක් කපාගන්නා අතරේ ඔහු කීවේය. "මට ඕනකරලා තියෙනවා යකඩ ශිරස්ක තුන්දාහක් විතරයි ඒ තරමම මුදු දම්වැල් කමිසයි. තව කඩු, කුන්ත, වානේ හෙලි තල, යමුගුරු, යුද්ධ පොරෝ, යකඩ අත්වැසුම්, බෙලි ආවරණ, කකුල් ආවරණ, පපු තහඩු, මේවා අරන් යන්ට කරත්ත-"

ඔහුට පිටුපසින් වූ දොර මහහඬක් නගමින් ඇරුනි. එය කෙතරම් චණ්ඩ වී ද යත් ඔහු අතේ වූ කේජු කැබැල්ල බිම නොවැටුනා පමණි. ආරක්ෂක බලඇණියේ කපිතාන්වරයා කාමරය හරහා පියඹා ගොස් ගිනිඋදුනේ හැපුනු අතර සෙර් කෙවන් අවලාදයක් නගමින් උඩපැන නැගිට සිටියේය. කපිතාන්වරයා නිවීගිය ගිනි අළු අතර හතරගාතයෙන් ඇද වැටෙද්දී ෂග්ගා ඔහුගේ අසිපත ගස් කදක් තරම් විසල් වූ සිය දණහිසේ ගසා දෙකට කඩා දැම්මේය. කැබලි දෙක විසිකර දැමූ ඔහු ප්‍රධාන ශාලාවට ඇතුළු විය. ඔහුටත් පෙර ඔහුගේ සිරුරේ ගඳ කාමරය තුළට පිවිසි අතර එය කේජුවල ගඳටත් වඩා සැරෙන් කාමරයේ කුඩා අවකාශය තුළ පැතිරෙන්නට විය. "පුංචි රතු කාප්පයො." ඔහු ගෙරවීය. "ඊළඟ පාර උඹ ඩොල්ෆ්ගෙ පුතා ෂග්ගාට ආයුධ දික්කරන්ට ආවොත් මම උඹේ පිරිමි ඇඟ කපලා ගින්නට දානවා පිච්චෙන්ට."

"මොකක්! ඒ පාර එළවො නැද්ද?" ටිරියන් කීවේ කේජු කැබැල්ලක් දතින් කොනහමිනි.

අනිත් ගෝත්‍රිකයෝ ද ෂග්ගා පසුපසින් කාමරයට පිරෙන්නට වූහ. බ්‍රොන් ද ඒ අතර වූහ. ටිරියන් දෙස බැලූ කුලී භේවායා දුක්ඛිත ස්වරයෙන් දෙවුර ඇකිළීය.

"උඹලා මොක්කුද බොලව්?" ටයිවින් උතුමානන් විමසූයේ හිම කන්දක් මෙන් ශාන්ත ස්වරයෙනි.

"එයාලා මගෙත් එක්ක ගෙදර ආපු අය තාත්තෙ." ටිරියන් පැහැදිලි කළේය. "මම එයාලව තියාගන්ට ද? එයාලා වැඩිය කෑම කන්නෙ නෑ."

කිසිවෙකුත් මෙයට සිනානොවුනි. "මොන බලයක් පිටද උඹලා ම්ලේච්ඡයො අපේ සාකච්ඡාවට බාධා කළේ?" සෙර් කෙවන් විමසීය.

"ම්ලේච්ඡයො, පාත්තයො?" කොන්ව නහවා ගතහොත් ඔහු හොඳ කඩවසම් මිනිසකු වනු ඇත. "අපි නිදහස් මිනිස්සු. නිදහස් මිනිස්සුන්ට බලයක් තියෙනවා ඕනම යුද්ධ සාකච්ඡාවකට සහභාගි වෙන්ට."

"කොයි එකාද සිංහ උතුමා?" චෙලා විමසුවාය.

"උං දෙන්නම නාකි මිනිස්සු." ටිමට් ගේ පුත් ටිමට් නිවේදනය කළේය. ඔහුට තවම වයස අවුරුදු විස්සක්වත් නොවීය.

සෙර් කෙවන් ගේ අත සැනෙන් සිය අසිපත් මිට වෙත ඇදී ගියේය. එනමුදු ඔහුගේ සොහොයුරා මැණික්කටුව මත ඇඟිලි දෙකක් තැබීමෙන් ඔහුව නැවැත්වීය. ටයිවින් උතුමානන් මෙම සිදුවීමෙන් වික්ෂිප්තභාවයකට පැමිණි බවක් කොහෙත්ම පෙනෙන්නට නොවීය. "ටිරියන්, උඹට උඹේ ආචාරශීලීත්වය අමතක වුනාද? කරුනාකරලා අපට අඳුන්නලා දීපන් අපේ මේ... ගෞරවනීය අමුත්තො ටික."

ටිරියන් සිය ඇඟිලි ලෙවකෑවේය. "බොහොම සන්තෝසෙන්. මේ ලස්සන තරුණී තමා කළු කණ් ඇත්තන්ගෙ ගෝත්‍රයේ වීක්ගෙ දුව වෙලා."

"මම තරුණියක් නෙවෙයි." වෙලා වහා විරෝධය පෑවාය. "මගේ පුතාලත් දැනටමත් කණ් පනහකටත් වඩා එකතු කරලා තියෙනවා."

"උන් තව පනහක් එකතු කරගත්තාවෙ." ටිරියන් බකල ගසමින් ඇගෙන් මෑත් වූයේය. "මේ ඉන්නෙ කොරාට්ගෙ පුතා කොන්. අර ලොම්වලින් වැහිච්ච කාර්ස්ටලී රොක් වගේ හිටගෙන ඉන්නෙ ඩොල්ෆ්ගෙ පුතා ෂග්ගා. උන් දෙන්නම ගල් කපුටො. මේ ඉන්නෙ චන්ද්‍ර සහෝදරයින්ගෙ ගෝත්‍රයේ උමර්ගෙ පුතා උල්ෆ්. එතකොට මේ ඉන්නෙ ටිමට්ගෙ පුතා ටිමට්. පිච්චුන මිනිස්සුන්ගෙ ගෝත්‍රයේ රතු හස්තයක්. එතකොට මෙයා තමා බ්‍රොන් කියන්නෙ. කිසිම කෙනෙකුට පක්ෂපාතීත්වයක් නැති කුලී හේවායෙක්. මම මිනිහව දැන අඳුනගත්ත කෙටි කාලෙ ඇතුළත මිනිහා දෙපාරක් පැත්ත මාරු කලා. ඔබයි එයයි බොහොම හොඳට තකට තක පෑහෙයි තාත්තෙ." ඊට පසු බ්‍රොන් හා ගෝත්‍රිකයින් දෙසට හැරුනු ඔහු මෙසේ නිවේදනය කලේය. "මම උඹලාට අඳුන්නලා දෙන්නම් මගේ තාත්තා. ලැනිස්ටර් වංශයේ ටයිටස්ගෙ පුතා ටයිවින්. කාර්ස්ටලී රොක්වල උතුමානන්. බටහිර දිග ආරක්ෂකයා. ලැනිස්පෝර්ට්වල පලිහ. ඒ වගේම අතීතයේ හා අනාගතයේ රජතුමාගෙ හස්තය."

ටයිවින් උතුමානන් ආනුභාව සම්පන්න අයුරින් නැගිට සිටියේය. "මෙච්චර ඈත බටහිර දිසාවෙ ඉන්න අපි පවා අහලා තියෙනවා චන්ද්‍ර කඳුකරයේ ඉන්න නිර්භීත රණකාමී ගෝත්‍රිකයන්ගෙ බලපරාක්‍රමය ගැන. ඔබලා තමන්ගෙ බලවසමෙන් පහළට බැහැලා මෙහාට ආවෙ මොන හේතුවක් නිසාද මගේ උතුමනි?"

"අස්සයො." ෂග්ගා කීය.

"සේද ඇඳුමුයි වානේ ආයුධයි ගැන වෙච්ච පොරොන්දුවක්." ටිමට් ගේ පුත් ටිමට් කීය.

ඒරින් මිටියාවත දුම් දමන මුඩුබිමක් කරන්නට තමා ඔවුන්ට වුනු පොරොන්දුව ගැන සිය පියාට කියන්නට ටිරියන් සැරසුනි. එනමුදු ඔහුට ඊට අවස්ථාවක් නොලැබුනි. මහහඩක්

නංවමින් නැවතත් දොර ඇරුනි. පණිවුඩකරුවා ටයිවින් උතුමානන් ඉදිරියේ දණ නමන අතරේ ටිරියන් ගේ මේ අරුම පුදුම ආගන්තුකයින් දෙස අමුතු බැල්මක් හෙළුවේය. "මගේ උතුමානනි. සෙර් ඇඩම් මට කිවුවා ඔබතුමාට දැනුම් දෙන්ටයි කියලා ස්ටාර්ක් හමුදාව රජමාවතේ පහළට එනවයි කියලා."

මේ පුවත නිසා ටයිවින් ලැනිස්ටර් උතුමානන් සිනාසුනේ නැත. ටයිවින් උතුමානන් කෙදිනකවත් සිනාසුනේ නැත. එනමුදු සිය පියාගේ මුහුණේ ඇඳෙන හා නැඳෙන හැඟීම් නිවැරැදිව කියවන්නට ටිරියන් මනාව දැන සිටියේය. ඔහුගේ මුහුණේ වූ ප්‍රීතිය ඔහු මනාව හඳුනා ගත්තේ ය. "ඉතින් ඒ කියන්නෙ වෘක පැටියා උගෙ ගුහාවෙන් එළියට ඇවිල්ලා සිංහයොත් එක්ක සෙල්ලම් කරන්ට එනවා." ඔහු තෘප්තිමත් ස්වරයෙන් කීය. "නියමයි! උත්කෘෂ්ටයි! වහාම ආපහු පලයන් සෙර් ඇඩම් ගාවට. එයාට කියාපන් පහුබහින්ටයි කියලා. අපි එනකම් උතුරු හමුදාවට මූනදෙන්ට යන්ට එපයි කියලා එයාට කියපන්. ඒ වුනත් මට ඕන එයා උන්ගෙ හමුදාවෙ දෙපැත්තෙන් පොඩි පොඩි ප්‍රහාර එල්ල කරලා උන්ව අවුස්සන්ට. එහෙම කරලා උන්ගෙ හමුදාව තවතවත් දකුණට අද්දගන්ට."

"ඔබතුමා නියෝග කරන විදියටම කියන්නම්." පණිවුඩකරුවා පිටව ගියේය.

"අපි මෙතැන බොහොම හොඳට පැලපදියම් වෙලා ඉන්නවා." සෙර් කෙවන් පෙන්වා දුන්නේය. "ගඟේ තොටුපළට කිට්ටුයි. අගල් හාරලා, බාධක දාලා බොහොම හොඳට ආරක්ෂා වෙලයි ඉන්නෙ. උන් දකුණට එනවා නම් මම කියන්නෙ උන්ට එන්ට දෙන්ට. ඊටපස්සෙ උන්ට මෙතැනදි අපිත් එක්ක හැප්පෙන්ට කියමු."

"මේ කොල්ලා අපේ මුලු හමුදාවම දැක්කොත් ආපහු හැරෙන්ට පුළුවන්. එහෙමත් නැත්තන් උගෙ ධෛර්යය හීනවෙලා යයි." ටයිවින් උතුමානන් පැහැදිළි කලේය. "ඉක්මනටම ස්ටාර්ක්ලා පරද්දපු තරමට මට පුළුවන්වෙනවා නිදහසේ ස්ටැනිස් බරතියන් ගැන වග බලාගන්ට. බෙරකාරයින්ට කියන්ට සෙබළුන්ට එකතුවෙන්ට සංඥාව හඬවන්ටයි කියලා. ජේමිට පණිවුඩයක් යවන්ට මම රොබ් ස්ටාර්ක්ට විරුද්ධව උතුරට හමුදා මෙහෙයවනවයි කියලා."

"ඔබේ කැමැත්තක්." සෙර් කෙවන් කීය.

සිය පියා ඉන්පසු අර්ධ වනචාරි කඳුකර ගෝත්‍රිකයින් දෙසට හැරෙන අයුරු ටිරියන් දරුණු වශීකරණයකට හසුවූවකු මෙන් බලා සිටියේය. "මිනිස්සු කියන්නෙ කඳුකරයේ ගෝත්‍රිකයො කියන්නෙ බය නාඳුනන රණකාමියො කියලයි."

"ඒක ඇත්ත කතාවක්." ගල් කපුටන් ගේ කොන් පිළිතුරු දුන්නේය.

"ගැනුත් එහෙම තමා." චෙලා එකතු කලාය.

"මාත් එක්ක මගේ සතුරන්ට විරුද්ධව යන්ට එන්ට. ඔබලාට ලැබෙයි මගේ පුතා ඔබලාට පොරොන්දු වුන හැමදේම. තවත් දේවලුත් ලැබෙයි." ටයිවින් උතුමානන් ඔවුන්ට පොරොන්දු විය.

"උඹ අපේ සල්ලිවලින්ම අපට ගෙවන්ට යනවද?" උමර් ගේ පුත් උල්ෆ් ඇසීය. "ඇයි අපට තාත්තගෙ පොරොන්දු ඕන වෙන්නෙ? අපට දැනටමත් පුතාගෙ පොරොන්දුව තියෙනවනෙ."

"මම ඕනකමක් ගැන කතාකලේ නෑ." ටයිවින් උතුමානන් පිළිතුරු දුන්නේය. "මම ආරාධනයක් කලා විතරයි. ඊට වඩා දෙයක් එතැන නෑ. ඔබලා අපට එකතුවෙන්ට ඕන නෑ. ශීත රටේ මිනිස්සු හැදිලා තියෙන්නෙ යකඩෙනුයි අයිස්වලිනුයි. මගේ නිර්භීතම නයිට්වරු වුනත් බයයි උන්ට මූනදෙන්ට."

'ආහ්! බොහොම දක්ෂ විදියට කලා.' ටිරියන් සිය වංචාකාරී සිනහව පාමින් සිතුවේය.

"පිච්චුන මිනිස්සු මොකාටවත් බය නෑ. ටිමට්ගෙ පුතා ටිමට් සිංහයොත් එක්ක යන්ට එයි."

"පිච්චුන මිනිස්සු කොහාටද යන්නෙ, එතැනට ඊට කලින් ගල් කපුටො ගිහිල්ලා තියෙනවා." කොන් උද්වේගයෙන් යුතුව කීය. "අපිත් එනවා යන්ට."

"ඩොල්ෆ්ගෙ පුතා ෂග්ගා උංගෙ පිරිමි ඇඟවල් කපලා කපුටන්ට කන්ට දාන්නං."

"අපි එන්නං උඹත් එක්ක යන්ට සිංහ උතුමෝ." චීක් ගේ දුව වෙලා එකඟ වූවාය. "හැබැයි උඹේ පුතා, කොලුමිනිහා අපිත් එක්ක යනවානං විතරයි. ඌ උගේ ජීවිතේ බේරගත්තෙ අපට පොරොන්දු දීලා. ඌ අපට පොරොන්දු වෙච්ච ආයුධ අපේ අත්වලට ලැබෙනකං උගේ ජීවිතේ අපට බාරයි."

ටයිවින් උතුමානන් සිය රන්වන් පුල්ලි වැටුනු දෑස් පුතු දෙසට හැරවීය.

"ලොකු සතුටක්!" ටිරියන් යටහත් පහත් සිනහවකින් යුතුව කීවේය.

**Chella: "Why should we trust your word? Lowland lords have lied to the clans before."**



සන්සා 05

සිහසුන් ශාලාවේ බිත්ති සියල්ලම නිරුවත් කර දමා තිබුනි. රොබර්ට් රජතුමා මහත් ආදරයෙන් රැක බලාගත් දඩයම් සිතුවම් සහිත තිරරෙදි සියල්ලම ගලවා දමා ශාලාවේ කොණක කුණුගොඩක් මෙන් ගොඩගසා තිබුනි.

සෙර් මැන්ඩන් මූර් තමාට නියමිත ස්ථානය වූ සිංහාසනයට පහළින් තම ධවල සොහොයුරන් දෙදෙනෙකු මුරකාවලෙහි යෙදී සිටි තැනට ගොස් ඔවුන් හා එක්විය. පළමුවරට කිසිදු මුරකරුවකු හෝ ආරක්ෂකයකු නොමැතිව තනි වූ සන්සා දොර අසල තාවර වූවාය. ඇගේ යහපත් හැසිරීම වෙනුවෙන් පිරිනැමුනු ත්‍යාගයක් වශයෙන් රැජිණ විසින් ඇයට බලකොටුව තුළ නිදහසේ ඇවිදීමේ අවසරය ඇයට ලබා දී තිබුනි. එනමුදු ඇය යන යන සෑම තැනකටම ඇයත් සමග යාමට පරිවාර සෙබළකු යෙදවිනි. 'මගේ අනාගත දූව වෙනුවෙන් ආරක්ෂක බහුමානයක්!' රැජිණ මේ සෙබළුන් හැඳින්වූයේ එනමිනි. එනමුදු ඔවුන් සමීපයේදී සන්සාට කිසිදු බුහුමනක් නොදැනුනි.

'බලකොටුව තුළ නිදහසේ ඇවිදීමේ අවසරය' යනු සන්සා පවුරු සීමාවෙන් එපිටට නොයන පොරොන්දුව පිට රතු බලකොටුව තුළ ඇයට කැමැති කැමැති තැනකට යෑමේ නිදහස විය. සන්සා මේ පොරොන්දුව බිඳහෙළීමට තබා ඒ ගැන සිතන්නටවත් උත්සුක නොවූවාය. ඇය උත්සාහ කලද ගේට්ටුවෙන් පිටවීමට නොහැකි වනු ඇත. මේ ගේට්ටුව සෑමවිටම ජේනස් ස්ලින්ට් ගේ නගරාරක්ෂක සෙබළුන් විසින් රකිනු ලැබින. එමෙන්ම ලැනිස්ටර් ගෘහාරක්ෂක සෙබළුන්ද සෑමවිටම අතේ දුරින් වූහ. අනිත් අතට, ඇය බලකොටුවෙන් පිටවී කොහේ කියා යන්ටද? අංගනයේ ඇවිදින්නට ලැබීමත්, මර්සෙලා ගේ උද්‍යානයේ මල් නෙලන්නට අවස්ථාව ලැබීමත්, ඇගේ පියා වෙනුවෙන් යාඥා කරන්නට සප්තක දේවස්ථානයට යන්නට ලැබීමත් ඇයට ඉහටත් උඩින් විය. ස්ටාර්ක්වරුන් විසින් තවමත් පුරාණ දෙවිවරුන් අදහනු ලැබීම නිසා ඇය යම් යම් අවස්ථාවල යාඥාව පිණිස දෙව්වනයට යාමටද පුරුදුව සිටියාය.

මේ වනාහි ජොෆ්රි ගේ රාජ්‍ය සමයේ පළමු රාජසභා රැස්වීම විය. එනිසා සන්සා වියවුල් සිතින් වටපිට බලමින් හුන්නාය. ශාලාවේ බටහිර දිග බිත්තියේ වූ කවුළුවලට යටින් ලැනිස්ටර් ගෘහාරක්ෂක සෙබළුන් පිරිසක් ද, නැගෙනහිර දිග බිත්තියේ කවුළුවලට යටින්

නගරාරක්ෂක බලඇණියේ සෙබළුන් පිරිසක් ද මුරකාවලෙහි යෙදී සිටියහ. එහි එකදු සාමාන්‍ය වැසියකු නොවීය. එනමුදු සක්මනට පහළින් උස් හා පහත් වංශාධිපතීන් පිරිසක් නොසන්සුන් අයුරින් ඇඹරෙමින් උන්නෝය. රොබර්ට් රජතුමා හමුවීම පිණිස දිනෙකට වංශාධිපතීන් සියයක් පමණ පැමිණීම සාමාන්‍ය දෙයක් වුවද අද දිනයේ එහි වූයේ විස්සක් තරම් සුළු පිරිසකි.

සන්සා හෙමින් සීරුවේ ඔවුන් අතරට ඇදුනාය. එකිනෙකා පසුකරමින් සෙමින් ශාලාවේ ඉදිරියට ඇදෙන අතරේ ඇය ඇසගැටෙන උතුමන්ට මුමුනමින් මෙන් ආචාර සමාචාර දැක්වූවාය. මේ වංශාධිපති කණ්ඩායමේ හුන් කළු පැහැ සමෙන් යුතු ජලබාර් ක්ෂෝ, අඳුරු කරගත් මුහුණින් යුතු සෙර් ආරොන් සැන්ටගාර්, රෙඩ්වින් නිවුන්නු දෙදෙනා ආදීන් හඳුනාගැනීමට ඇය සමත්වූවාය... එනමුදු ඒ කිසිවෙකුත් ඇයව හඳුනාගත් බවක් නොපෙනුනි. නොඑසේව, ඔවුන් ඇයව හඳුනාගත්තේ වී නම් ඇයට කළු වසංගතය බෝවී ඇතිවාක් මෙන් ඔවුහු පිළිකුලෙන් යුතුව ඇගෙන් ඈත් වූහ. අසනීපකාර ජයිල්ස් උතුමානන් ඇය ලංවන විට සිය මුහුණ වසාගෙන බොරුවට කහින්නට විය. නිතරම සිනහවෙන් සිටින, බේබදු සෙර් ඩොන්ටොස් ඇයට ප්‍රත්‍යාචාර දක්වන්නට සැරසුනු විට සෙර් බේලන් ස්වෝන් ඔහුගේ කණට කර රහසින් යමක් කෙඳිරූ අතර ඔහු වහා අනික් පස හැරුනේය.

තවත් බොහෝ වංශාධිපතීන් එහි නොවීය. 'ඒ සියල්ලන්ම කොයිබක ගොස්ද?' සන්සා මවිතයෙන් කල්පනා කලාය. මිත්‍රශීලී මුහුණක් දකිනු රිසියෙන් ඇය නිශ්ඵල ලෙස එහා මෙහා බැලුවාය. එනමුදු ඒ කිසිවෙකුත් ඇගේ දෑස්වලට මුනනොගැසෙන්නට වග බලාගත්හ. එය හරියටම ඇය මියගොස් භූතයකු වී ඇත්තාක් මෙන් විය.

රාජසභික මේසයේ ප්‍රධාන මේස්ටර් පයිසෙල් පමණක් තනිව හිඳගෙන සිටියේය. ඔහුගේ දෑත් දැවැන්ත සුදු රැවුළ මතින් එකට බැඳී තිබුනු අතර ඔහු නින්දේ පසුවන්නාක් මෙන් දිස්විය. වාරිස් උතුමානන් හනිහනික ශාලාවට ප්‍රවිශ්ට වූ අතර ඔහුගේ පියවර ගැටෙන හඬ නෑසෙන තරම් විය. සුළු මොහොතකට පසුව පිටුපස වූ දැවැන්ත දොරටු තුළින් සිනාමුසු මුහුණින් යුතු බේලිෂ් උතුමානන් ඇතුළුවිය. ඉදිරියට යන අතරේ ඔහු සෙර් බේලන් හා සෙර් ඩොන්ටොස් සමගින් මිත්‍රශීලී අයුරින් දෙඩීය. තම උදරයේ සමනළුන් පියාඹන්නාක් මෙන් සන්සාට දැනුනි. 'මම බයවෙන්ට හොඳ නෑ.' ඇය තමාටම කියාගත්තා ය. 'මට බයවෙන්ට කිසිම හේතුවක් නෑ. හැමදේම හොඳින් සිද්ද වෙයි. ජොෆ්රි මට ආදරෙයි. රැජිණත් මට ආදරෙයි.' ඇය තවදුරටත් කියාගත්තා ය.

රාජදූතයකු ගේ ප්‍රශස්ති ගායනාවකින් අභිනව රජතුමා ගේ පැමිණීම දැන්විනි. "අන්දාල්වරුන් ගේ ද රොයිනාර්වරුන් ගේ ද මුල් මිනිසුන් ගේ ද රජු වන, රාජධානි සප්තකයේ ස්වාමීන් වන, බරතියන් වංශයේ හා ලැනිස්ටර් වංශයේ ජොෆ්රි වන, එම නමින් යුත් පළමු රජතුමා ගේ ශ්‍රී නාමය සැරදේවා! එතුමන් ගේ උදාර මවුතුමිය වන, භාරකාර රැජිණ වන, බස්නාහිර දිශාවේ ආලෝකය වන, රාජධානියේ ආරක්ෂකයා වන, ලැනිස්ටර් වංශයේ සෙර්සි උත්තමාවගේ ශ්‍රී නාමය සැරදේවා!"

සුදු පැහැ එලක සන්නාහයෙන් ඒකාලෝක වූ සෙර් බැරිස්ටාන් සෙල්මි ඔවුන්ව කැඳවාගෙන ආයේය. සෙර් ඒරිස් ඕක්හාර්ට් රැජිණගේ පරිවාරකයා වශයෙන් කටයුතු කල අතර සෙර් බොරෝස් බ්ලොන්ට් ජොෆ්රි පසෙකින් ඇවිද ආවේය. මේ අනුව මේ ශාලාව තුළ අද දින රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරු සයදෙනෙකු - ජේමි ලැනිස්ටර් හැරෙන්නට අන් සියළුම අය - එක්රැස්වී සිටියහ. ඇගේ කුමරා - නැත නැත, දැන් ඇගේ රජතුමා! - පියගැට පෙළේ පඩි දෙක බැගින් නගිමින් සිහසුන වෙත ළඟා වූ අතර ඔහුගේ මව පහළින් වූ රාජසභා මේසයේ අසුන්ගත්තා ය. ජොෆ් ලේ රතු පැහැ වයිරම් වැටුනු කළු පැහැ විල්ලුදයෙන් සැරසී දිදුලන රන් නූලෙන් කල උස් කොලරයක් සහිත කබායක් හැඳ සිටියේය. ඔහුගේ හිස මත කළු දියමන්ති හා රතු කැට එබ්බවූ රන්වන් කිරුළක් විය.

ජොෆ්රි ආපසු හැරී ශාලාවේ හුන් පිරිස දෙස බලද්දී ඔහුගේ දෑස් සන්සා ගේ දෑස් හා ගැටින. ඔහු සිනාසෙමින් අසුන්ගත්තේ කතාව ඇරඹීය. "පක්ෂපාතී නොවූවන්ට දඬුවම් දීම හා අපට සත්‍ය වශයෙන්ම ලැදි අයට ත්‍යාග ලබාදීම රජතුමාගේ වගකීමයි. ප්‍රධාන මේස්ටර් පයිසෙල්, මගේ නියෝග ටික කියවන්ට."

පුටුව පසුපසට තල්ලු කල පයිසෙල් නැගී සිටියේය. ඔහු අද දිනයේ මහානුභාව සම්පන්න අයුරින් සුදු පැහැ මුගටි ලොම් කොලරයකින් හා දිදුලන රන්වන් ගාංචු ඇති සනකම් රත් පැහැ විල්ලුද ලෝගුවකින් සැරසී හුන්නේය. අලංකාර, ගෙත්තම් කල කබා අතක් තුළින් කඩදාසියක් පිටතට ගෙන දිගහැරගත් ඔහු දිගු නම් ලැයිස්තුවක් කියවන්නට විය. මේ නම් කියැවෙන සෑම කෙනෙකුම රජතුමා ගේ හා රාජසභාවේ නාමයෙන් මෙහි පැමිණ ජොෆ්රිට පක්ෂපාතී බවට දිවුරිය යුතු විය. එසේ නොකලහොත් ඔවුන් රාජද්‍රෝහීන් හැටියට හංවඩු ගැසෙන අතර ඔවුන් ගේ තනතුරු, වතුපිටි, ඉඩකඩම් රාජසන්තක කෙරෙනු ඇත.

මේ ඇසුනු නම් ලැයිස්තුව නිසා සන්සා ගේ හුස්ම පවා හිරවී ගියේය. ස්ටැනිස් බරතියන් උතුමානන්, ඔහුගේ ආර්යාව හා ඔහුගේ දියණිය. රෙන්ලි බරතියන් උතුමානන්. රොයිස් උතුමන් දෙදෙන හා ඔවුන් ගේ පුතුන්. සෙර් ලෝරාස් ටිරල්. මේස් ටිරල් උතුමානන්, ඔහුගේ සොහොයුරන්, මාමාවරුන් හා පුතුන්. රතු පූජකයා, ම(ර්) හි තොරෝස්, බෙරික් ඩොන්ඩරියන් උතුමානන්. ලයිසා ඒරින් ආර්යාව හා ඇගේ පුතණුවන්, පුංචි රොබර්ට් උතුමානන්. හස්ටර් ටලී උතුමානන්, ඔහුගේ සොහොයුරා සෙර් බ්‍රින්ඩන් ටලී, ඔහුගේ පුතා සෙර් එඩ්මුයර්. ජේසන් මැලිස්ටර් උතුමානන්. වගුරුබිම්වල බ්‍රයිස් කැරන් උතුමානන්. ටයිටස් බ්ලැක්වුඩ් උතුමානන්. වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් හා ඔහුගේ උරුමකරු සෙර් ස්ටිව්රන්. කේරිල් වාන්ස් උතුමානන්. ජොනෝස් බ්‍රැකන් උතුමානන්. ශීලා වෙන්ට් ආර්යාව. ඩෝර්න් හි කුමරුවා ඩෝරාන් මාර්ටෙල් හා ඔහුගේ පුතුන්. 'මහ ගොඩක්!' පයිසෙල් විසින් නම් ලැයිස්තුව නොනවත්වාම කියවාගෙන යද්දී සන්සා මව්තයෙන් කල්පනා කලාය. මේ නියෝග රාජධානියේ සතර අතටම යැවීමට කපුටන් රංචුවක් අවශ්‍ය වනු ඇත.

අන්තිමේදී, ලැයිස්තුව ඉවරවෙන්නට ආසන්නයේදී සන්සා මෙතෙක් වේලා භීතියෙන් යුතුව අසන්නට බලා සිටි නම් කියැවෙන්නට විය. කැට්ලින් ස්ටාර්ක් ආර්යාව, රොබ් ස්ටාර්ක්, බ්‍රැන්ඩන් ස්ටාර්ක්, රිකන් ස්ටාර්ක්, ආර්යා ස්ටාර්ක්. සන්සා මව්තයෙන් හුස්මක් ඉහළට ඇදගත්තා ය. ආර්යා! ආර්යා මෙහි චිත් පක්ෂපාතී දිවුරුමක් ලබාදෙනු දකින්නට ඔවුන්ට උවමනාය... එහි තේරුම ඇගේ සොයුරිය කෙසේ හෝ අර නැවේ නැගී පැනගන්නට සමත් වී ඇති බවයි. මේ වනවිට ඇය වින්ටර්ෆෙල්හි පවුරු තුළ සුරක්ෂිතව පසුවනවා ඇත...

කඩදාසිය රෝල්කල පයිසෙල් එය සිය වම් කබා සාක්කුවේ රුවා ගත්තේය. ඉන්පසු දකුණු කබා සාක්කුවෙන් තවත් කඩදාසියක් ඇදගත්තේ ය. උගුර පාදාගත් ඔහු නැවතත් කාර්යය ආරම්භ කලේය. "රාජද්‍රෝහියකු වන එඩාර්ඩ් ස්ටාර්ක්ගෙන් හිස්වන රජතුමාගේ හස්තය තනතුරට අපේ ස්වාමීන් වහන්සේ ගේ අභිමතය අනුව කාර්ස්ටලී රොක්හි උතුමානන් හා බටහිර දිග ආරක්ෂකයා වන ටයිවින් ලැනිස්ටර් උතුමානන් පත්වනු ඇත. එතුමා රජතුමා ගේ නාමයෙන් කතා කරනු ඇත, එතුමා ගේ සතුරන්ට එදිරිව එතුමා ගේ හමුදා මෙහෙයවනු ඇත, එතුමා ගේ රාජකීය අභිප්‍රායන් ඉටුකරනු වස් කටයුතු කරනු ඇත. රජතුමා මෙලෙස තීන්දු ප්‍රකාශ කරන අතර රාජසභාව එයට එකඟ වෙයි."

"රාජද්‍රෝහියකු වන ස්ටැනිස් බරතියන්ගෙන් හිස්වන රාජසභික තනතුරට අපේ ස්වාමීන් වහන්සේ ගේ අභිමතය අනුව සැමදා එතුමන්ට ශක්තිමත් බලකණුවක් වෙමින් සහයෝගය

දුන් රාජමාතාව හා භාරකාර රැජිණිය වන සෙර්සි ලැනිස්ටර් පත්වනු ඇත. ඇය රාජසභාවේ අසුන්ගෙන නැණවත් හා යුක්තිගරුක අයුරින් රාජ්‍යය විචාරීමට එතුමන්ට සහාය වනු ඇත. රජතුමා මෙලෙස තීන්දු ප්‍රකාශ කරන අතර රාජසභාව එයට එකඟ වෙයි."

තමා වටා සිටි වංශාධිපතීන් අතරින් සිහින් මුනුමුනුවක් නැග එනු සන්සාට ඇසුනි. එනමුදු එය නැගුනු සැනින් නිහඬ වී ගියේය. පයිසෙල් දිගටම කතා කරන්නට විය.

"අප ස්වාමීන් ගේ තවත් අභිප්‍රායක් අනුව එතුමන් ගේ පක්ෂපාතී යටත් සේවක, කිංග්ස් ලැන්ඩින්ග්හි නගරාරක්ෂක බලකායේ අණදෙන නිළධාරී, ජේනස් ස්ලින්ට් වහාම ක්‍රියාත්මක වන පරිදි වංශාධිපති තනතුරට උසස් කෙරෙනු ඇත. එතුමන්ට පුරාණ හැරෙන්හෝල් බලකොටුව හා එහි ඉඩකඩම් ආදායම්ද හිමිවනු ඇත. ඔහුගේ පුතුන්ට ද පුතුන් ගේ පුතුන්ට ද යනාදී වශයෙන් කාලාවසානය දක්වා මේ ඉඩකඩම් හා තනතුරු භුක්ති විඳීමේ හැකියාව හිමිවනු ඇත. එමෙන්ම, අප ස්වාමින් වහන්සේ ගේ අභිප්‍රාය පරිදි ස්ලින්ට් උතුමානන්ව වහාම ක්‍රියාත්මක වන පරිදි රාජසභික තනතුරකට පත්කෙරෙනු ඇත. එතුමන් රාජසභාවේ අසුන්ගෙන රාජ්‍ය විචාරීම සඳහා අප ස්වාමීන්ට උපකාර කරනු ඇත. රජතුමා මෙලෙස තීන්දු ප්‍රකාශ කරන අතර රාජසභාව එයට එකඟ වෙයි."

සන්සා දැස් කොණින් යම් චලනයක් දුටුවාය. ජේනස් ස්ලින්ට් ශාලාවට ඇතුළුවිය. මෙවර අනිකුත් වංශාධිපතීන් ගේ කටුකුටුගෑම් පෙරටත් වඩා වැඩි වූ අතර ඒ ස්වරයේ කේන්තියක්ද ගැබ් වී තිබුනි. ගෙඹි මුහුණකින් හා තට්ට හිසකින් යුතු, සාමාන්‍ය පෙළපතකින් පැමිණෙන මේ නව වංශාධිපතියා සෙමින් ඉදිරියට ඇදෙද්දී වසර දහස් ගනනාවක අතීතයකට උරුමකම් කියන පෙළපත්වලින් පැවැතෙන මාන්නක්කාර රදළයෝ අකැමැත්තෙන් මෙන් දෙපසට වී ඔහුට මඟ ඉඩදුන්නෝය. ඔහු හැඳ සිටි කළු පැහැ විල්ලුද කබායට අල්ලා මසා තිබුනු රන් කොරපොතු තබන තබන පියවරක් පාසා සිහින් හඬින් නද දුන්නේය. ඔහුගේ සළුව කළු හා රන් පැහැයෙන් කොටු වැටුනු පට රෙද්දක් විය. ඔහුගේ පුතුන් විය හැකි අවලක්ෂණ කොලුවන් දෙදෙනෙක් ඔහුට ඉදිරියෙන් ගියේ ඔවුන් තරම්ම උස, බර යකඩ පලිසක් ඔසවාගෙන ගියහ. මේ කොලුවන් දෙදෙනා පලිහේ බරින් මිරිකී සිටි බැව් පැහැදිලිව පෙනෙන්නට තිබුනි. සිය වංශ සලකුණ වෙනුවෙන් ජේනස් ස්ලින්ට් උතුමානන් රාත්‍රී අන්ධකාරය මෙන් කළු පැහැ පසුබිමක ඇති රන්වන් හෙල්ලයක් තෝරාගෙන තිබුනි. මේ හෙලි තලය රුධිරයෙන් පෙඟී ඇති බැව් හැඟවෙන්නට රතු පැහැයෙන් පාටකර තිබුනි. මේ දුටු විගස සිය බාහුවල හී ගඩු පිපී එන්නාක් මෙන් සන්සාට දැනුනි.

ස්ලින්ට් උතුමානන් තමාට නියමිත ස්ථානයේ අසුන් ගනිද්දී ප්‍රධාන මේස්ටර් පයිසෙල් නැවතත් කතාව ඇරඹීය. "අවසාන වශයෙන්, මේ ද්‍රෝහිකම් හා ආරවුල්වලින් පිරුන කාලයේ, අපේ ආදරණීය රොබර්ට් රජතුමා මියගිහිල්ලා තියෙන වෙලාවෙ, අපගේ අභිනව රජතුමා වන ජොෆ්රි උතුමානන් ගේ ජීවිතාරක්ෂාව ගැන සැලකිලිමත් වීම අපේ ප්‍රමුඛතම කාර්යභාරයක් බවට රාජසභාව තීරණය කර තිබේ..." ඔහු රැජිණ දෙස බැලීය.

සෙර්සි නැගිට සිටියාය. "සෙර් බැරිස්ටාන් සෙල්මි. එදිරියට එනු."

සෙර් බැරිස්ටාන් යකඩ සිහසුනට නගින පියගැටපෙළ පාමුල ප්‍රතිමාවක් මෙන් සිටගෙන සිටියේය. ඔහු වහා එක් දණක් නවා හිස බිමට නැඹුරු කරගත්තේ ය. "මගේ උත්තමාවනි. ඔබේ අණ මගෙයි."

"නැගිටින්ට සෙර් බැරිස්ටාන්." සෙර්සි ලැනිස්ටර් කීවාය. "නැගිටලා ඔය ශිරස්කය අයින් කරන්ට."

"මගේ උත්තමාවනි?" නැගිට සිටි මහලු නයිට්වරයා සිය උස්, සුදු පැහැ ශිරස්කය ගැලවීය. එනමුදු ඒ කුමක් සඳහාදැයි ඔහුට කිසිදු නිනවුවක් නොවීය.

"ඔබ බොහොම දීර්ඝ කාලයක් තිස්සේ මේ රාජධානියට බොහොම ලැදිකමෙන් සේවය කලා මගේ හොඳ නයිට්වරයානනි. මේ රාජධානි සප්තකයේ ඉන්න හැම පිරිමියෙක්ම, හැම ගැනියෙක්ම ඔබට ඒ වෙනුවෙන් ස්තූතිපූර්වක වෙනවා. ඒ වුනත් මට බොහොම කනගාටුවෙන් වුනත් කියන්ට වෙනවා ඔබේ සේවය අවසානයි කියලා. ඔබේ හිසේ තියෙන ඔය ලොකු බර අහක් කරන්ට කාලෙ හරි කියලා රජතුමාත් රාජසභාවත් තීරණය කරලා තියෙනවා."

"මගේ... හිසේ... බර? සමාවෙන්ට... මට... මට තේරෙන්නෙ නෑ..."

අලුත පත්කෙරුනු ස්ලින්ට් උතුමානන් සිය ගැඹුරු, මොට්ට හඬින් කතාකලේය. "අපේ උත්තමාවිය කියන්ට හදන්නෙ, ඔබ රාජ්‍යාරක්ෂක බලකායෙ අණදෙන නිළධාරි තනතුරෙන් අයින් කලා කියලයි."

උසැති, සුදු පැහැ හිසකෙසින් යුතු නයිට්වරයා සිටිතැනම කිඳා බැස්සාක් මෙන් දිස්විය. ඔහුට හුස්ම ගැනීම පවා අසීරු වූවාක් මෙන් පෙනුනි. "මගේ උත්තමාවනි." ඔහු අන්තිමේදී කියාගත්තේ ය. "රාජ්‍යාරක්ෂක බලකාය කියන්නෙ දිවුරුම් දුන්න සහෝදරත්වයක්. අපේ දිවුරුම මුලු ජීවිත කාලෙටම වලංගු වෙනවා. රාජ්‍යාරක්ෂක බලකායෙ අණදෙන නිළධාරිතුමාව තමන්ගෙ රාජකාරියෙන් අයින් කරන්ට පුළුවන් මරණයට විතරයි."

"කාගෙ මරණයට ද සෙර් බැරිස්ටාන්?" රැජිණ ගේ හඬ සේද මෙන් මෘදු විය. එනමුදු ඒ හඬ මුලු ශාලාව පුරාම විහිද ගියේය. "ඔබේ ද? නැත්තම් ඔබේ රජතුමාගෙ ද?"

"උඹ මගේ තාත්තව මැරෙන්ට ඇරියා." ඉහළ යකඩ සිහසුනේ අසුන්ගෙන සිටි ජොෆ්රි චෝදනාත්මක ස්වරෙයෙන් කතා කලේය. "කාවවත් ආරක්ෂා කරන්ට බැරි තරම් උඹ දැන් නාකි වැඩියි."

නයිට්වරයා සිය අභිනව රජතුමා දෙස හිස ඔසවා බලන'යුරු සන්සා දුටුවාය. ඔහු වෙතින් මෙවැනි මහලු බවක් දිස්වනු ඇය කිසිදා නොදුටු දෙයක් විය. එනමුදු මේ මොහොතේනම් ඔහු දුබල මහල්ලෙකු හැර අන් කිසිවකු නොවීය. "මගේ ස්වාමිනී. මම රාජ්‍යාරක්ෂක බලකායට තේරුනෙ මගේ විසිතුන්වෙනි අවුරුද්දෙදි. ඒ තමා මම හැමදාමත් හීන දැකපු දේ. මම කඩුවක් අතින් අල්ලපු මුල්ම දවසේ ඉඳන් මගේ හීනය වුනේ. පරම්පරාවෙන් මට උරුම වෙන්ට තිබුන බලකොටුවට ඇයි අයිතිය මම අතඇරලා දැම්මා. මම කසාද බඳින්ට බලාපොරොත්තුවෙන් හිටිය කෙල්ල මා වෙනුවට මගේ ඥාති සහෝදරයෙක් එක්ක විවාහ වුනා. මට ඉඩකඩම් වලින්වත්, පුත්තුන්ගෙවත් වැඩක් නෑ. මම මගේ ජීවිතේ ජීවත්වෙන්ට නියමවුනේ මේ රාජධානිය වෙනුවෙන්. සෙර් ජෙරල්ඩ් හයිටවර්, එයාමයි මගේ දිවුරුම ගත්තෙ... මට හැකි උපරිම ශක්තියෙන් රජතුමාව රැකබලා ගැනීම... ඒ වෙනුවෙන් මගේ රුධිරයෙන් වුනත් මිල ගෙවීම... මම සුදු ගොනා, එතකොට ඩෝර්න්වල ලෙවින් කුමාරයා වගේ අය එක්ක එක්කහුවෙලා සටන්කරලා තියෙනවා... උදෑසනේ අසිපත සෙර් ආතර් ඩේන් එක්ක එක්කහු වෙලා සටන්කරලා තියෙනවා. ඔබේ පිය රජතුමාට සේවය කරන්ට

කලින් මම ඒරිස් රජතුමාව ආරක්ෂා කලා. එයාට කලින් එයාගෙ තාත්තා ජහරිස් ආරක්ෂා කලා... රජවරු තුන්දෙනෙක්..."

"ඒ තුන්දෙනාම දැන් මැරිලා." සුළැඟිල්ලා පෙන්වා දුන්නේය.

"ඔබේ කාලය ඉවරයි." සෙර්සි ලැනිස්ටර් නිවේදනය කලාය. "ජොෆ්රිට උවමනායි එයා වටේ තරුණ, ශක්තිමත් ආරක්ෂකයො ඉන්නවා දකින්ට. රාජසභාව තීරණය කරලා තියෙනවා ඔබෙන් හිස්වෙන රාජ්‍යාරක්ෂක බලකායෙ අණදෙන නිළධාරි තනතුරට සෙර් ජේමි ලැනිස්ටර්ව පත්කරන්ට."

"රජුන් මරන්නා!" මේ සිදුවුනු අවමානය නිසා සෙර් බැරිස්ටාන් ගේ ස්වරය දැඩි වී තිබුනි. "තමන් දිවිහිමියෙන් ආරක්ෂා කරනවයි කියලා දිවුරුම් දුන්න රජතුමාව තමන්ගෙම කඩුවෙන් බෙල්ල කපලා මරලා දාපු පොරොන්දු කඩකරපු එකා!"

"උඹ ඔය කතාකරන වචන ගැන පරිස්සම් වෙයන් සෙර්." සෙර්සි අනතුරු ඇඟෙවුවාය. "උඹ ඔහොම කතාකරන්නෙ මගේ සහෝදරයට. අපේ රජතුමාගෙ ලේ වලට."

වාරිස් උතුමානන් අන් අයට වඩා මෘදු ස්වරයෙන් කතාකලේය. "ඔබතුමාගෙ සේවය අපි අමතක කරලා දැම්මෙ නෑ අපේ හොඳ නයිට්තුමනි. ටයිවින් ලැනිස්ටර් උතුමානන් බොහොම කරුනාවන්තව ඉදිරිපත් වෙලා ඔබ වෙනුවෙන් ලැනිස්පෝර්ට්වලට උතුරින් ඉඩම් කැල්ලක් වෙන්කරලා දුන්නා. මුහුද අද්දරම. ඔබතුමාට ඇති තරම් රත්තරන් හම්බවෙනවා. ඇති තරම් මිනිස්සු ලැබෙනවා හොඳ ශක්තිමත් බලකොටුවක් ගොඩනංවන්ට. ඔබතුමාගෙ හැම වැඩක්ම කරලා දෙන්ට ඇති තරම් සේවකයො හම්බවෙනවා."

සෙර් බැරිස්ටාන් සැනෙන් ඔහු දෙස බැලීය. "මැරෙනකම් ඉන්ට පැල්පතකුයි. මැරුනම වළලන්ට මිනිස්සුයි. බොහොම ස්තුතියි මගේ උතුමනි... ඒ වුනත් ඔබලාගෙ මේ දයාවට

මම කෙලගහනවා." අත එසවූ ඔහු සිය සළුව රඳවා තිබුනු හාරිච්චිය ගැලෙව්වේය. සනකම, ධවල සළුව උරහිසෙන් රූටා ගොස් බිම වැටුනි. මෙතෙක් වේලාවක් අත තිබුනු ශිරස්කය නදදෙමින් බිමට අතහැරුනි. "මම නයිට්වරයෙක්." සිය පපු තහඩුව රඳවා තිබුනු රජතමය ගාංචු ගලවා එයද බිම දමන අතරේ ඔහු කීවේය. "මම මැරෙන්නෙත් නයිට්වරයෙක් විදියට."

"ජේන විදියට නම් හෙලුවැල්ලෙන් ඉන්න නයිට්වරයෙක් විදියට." සුළැඟිල්ලා නර්මාලාපයක් කීවේය.

ඔවුහු සියලුදෙනාම මීට සිනාසුනෝය. සිහසුනේ සිටි ජොෆ්රි, රැස්ව සිටි වංශාධිපතිවරු, ජේනස් ස්ලින්ට් හා රැජිණ හා සැන්ඩෝර් ක්ලිගේන්, රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරු පවා සිනාසුනෝය. මීට සුළු මොහොතකට පෙරාතුව ඔහුගේ සොහොයුරන්ව සිටි ධවල නයිට්වරුන් පවා සිනාසුනෝය. එය අන් සෑම දෙයකටම වඩා රිදුම් දෙන්නට ඇතැයි සන්සා කල්පනා කලාය. ලැජ්ජාවෙන් මිරිකී රතුවුනු මුහුණින් යුතුව, කතා කරන්නට පවා නොහැකි තරම් කේන්තියකින් පිපිරෙමින් සිටගෙන සිටි මේ නිර්භීත මහලු මිනිසා කෙරෙහි ඇති වූ දයානුකම්පාවකින් ඇගේ හදවත පිරී ඉතිරී යන්නට විය. අන්තිමේදී ඔහු සිය අසිපත කොපුවෙන් පිටතට ඇද්දේය.

කිසිවකු තැතිගැන්මෙන් මෙන් හුස්මක් ඇදගනු සන්සාට ඇසුනි. ඔහුට අභිමුඛ වනු පිණිස සෙර් බොරෝස් හා සෙර් මෙරින් ඉදිරියට පා තැබූහ. එනමුදු ඔවුන් දෙස හෙලූ එක් අවඥාසහගත බැල්මකින් ඔවුන්ව එතැනම ගල්කරන්නට සෙර් බැරිස්ටාන් සමත් විය. "බයවෙන්ට එපා මහත්වරුනි. ඔබලාගෙ රජතුමා ආරක්ෂිතයි... හැබැයි ඔබලාට ස්තූතිවෙන්ට නෙවෙයි. මේ දැන් වුනත් මට පුළුවන් ඔබලා පස්දෙනාවම කපලා දාන්ට, පිහියකින් බටර් කපනවාටත් වඩා ලේසියෙන්. ඔබලා රජුන් මරන්නා යටතේ සේවය කරන්ට යනවානම් ඔබලා එක්කෙනෙක්වත් ඔය පැළැඳගෙන ඉන්න සුදු සළු අඳින්ට සුදුසු නෑ." ඔහු සිය අසිපත යකඩ සිහසුන පාමුලට විසිකර දැම්මේය. "මෙන්න කොල්ලො. උඹ කැමැතිනම් මේකත් උණුකරලා අනිත් කඩු ගොඩටම එකතු කරහන්. මේ අනිත් පස්දෙනා අතේ තියෙන කඩුවලට වඩා සේවයක් කරන්ට ඒකට පුළුවන් වෙයි. ස්ටැනිස් උතුමානන් උඹේ සිහසුන පැහැරගත්තම සමහරවිට එයා ඒක උඩ වාඩිවෙන්ට පුළුවන්."

ආපසු හැරුනු ඔහු ශාලාවේ අනිත් අන්තයෙහි වූ දොර දෙසට පිය මනින්නට විය. ඔහුගේ පියවර හඬ ශාලාවේ නිරුවත් බිත්තිවල හැපී දෝංකාර දෙන්නට වූයේය. වංශාධිපතියෝ

හා වංශාධිපතිනියෝ දෙපසට වී ඔහුට යන්නට ඉඩ හැරියෝය. දොරටු පල්ලන් විසින් ඔහුට පිටුපසින් දැවැන්ත ඕක් හා ලෝකඩ දොරපලු වසාදමන තෙක් තුශ්නීම්භූතව බලාසිටි ශාලාව තුළ නැවතත් හඬ ඇසෙන්නට විය. මෘදු මිමිනීම්, නොසන්සුන් එහා මෙහා වීම් හා රාජසභික මේසය මත වූ කඩදාසි සැලෙන හඬ ඇසෙන්නට විය. "ඌ මට කොල්ලා කිවුවා." ජොෆ්රි නුරුස්සනු සුළු ස්වරයෙන් කීය. ඔහුගේ කටහඬ චෝදනා කරන ලාබාල දරුවෙකු ගේ මෙන් විය. "ඌ මගේ බාප්පා ස්ටැනිස් ගැනත් කිවුවා."

"හිතලු කතා." වාරිස් කීවේය. "ඔහේ කටට ආපු පලියට කියාපුවා."

"ඌ දැන් ගිහිල්ලා මගේ බාප්පලා එක්ක එකතුවෙලා මට විරුද්ධව කුමන්ත්‍රණය කරන්ට පුළුවන්. මට ඌව අත්අඩංගුවට අරන් ප්‍රශ්න කරන්ට ඕන." කිසි කෙනෙකුත් නොසෙල්වින. ජොෆ්රි හඬ උස්කලේය. "මම කිවුවෙ, මට ඕන ඌව අත්අඩංගුවට ගන්ට."

ජේනස් ස්ලින්ට් රාජසභික මේසයෙන් නැගිට සිටියේය. "මගේ නගරාරක්ෂකයො ඒ ගැන වගබලාගනියි ස්වාමිනී."

"බොහොම හොඳයි." ජොෆ්රි රජතුමා කීවේය. ජේනස් උතුමානන් දිගු පියවර තබමින් ශාලාවෙන් පිටව ගියේය. ඔහුගේ අවලක්ෂණ පුතුන් දෙදෙනා ස්ලින්ට් වංශයේ සලකුණ සහිත යකඩ පලිස ඔසවාගෙන ඔහු පසුපසින් දුවමින් මෙන් ගියහ.

"මගේ ස්වාමිනී." සුළැඟිල්ලා රජු ඇමතීය. "අපි නවත්තපු වැඩේ ගැන ආයෙමත් කතාකලොත්, දැන් අපට ඉන්නෙ නයිට්වරු හයදෙනයි. හත්දෙනෙක් ඉන්ට ඕන. රාජ්‍යාරක්ෂක බලකායට තව නයිට්වරයෙක් හොයාගන්ට අපට සිද්දවෙලා තියෙනවා."

ජොෆ්රි සිනාසුනේය. "එයාලට කියන්ට අම්මා."

"රජතුමයි රාජසභාවයි දැඩිවම තීරණය කරලා තියෙනවා, මේ මුලු රාජධානි සප්තකයේම ඉන්න මිනිස්සු අතරින් රජතුමාව ආරක්ෂා කරන්ට හොඳින්ම ගැලපෙන කෙනා එයාගෙම අංගාරන්ෂකයා සැන්ඩෝර් ක්ලිගේනුයි කියලා."

"උඹ මොකක්ද ඒ ගැන හිතන්නෙ බල්ලො?" ජොෆ්රි රජතුමා ඇසීය.

දඩබල්ලා ගේ කැළැල්වලින් වැසුනු මුහුණේ වූ හැඟීම් කියැවීම අසීරු විය. ඔහු සිය තීරණය ලබා දීම පිණිස බොහෝ වේලාවක් කල්පනා කලේය. "මොකද නැත්තෙ? මට ඉඩකඩම් නෑ. මේ වෙනුවෙන් අතඇරලා දාන්ට මට ගෑනියෙක් නෑ. මම එහෙම අතෑරලා දැම්මත් කවුද ඒ ගැන වදවෙන්නෙ?" ඔහුගේ මුහුණේ පිළිස්සුනු අඩ නැටුවේය. "ඒ වුනත් මම අනතුරු අඟවන්ට කැමැතියි. මම ඔය මලඉලවු නයිට් දිවුරුම නම් දෙන්නෙ නෑ."

"රාජ්‍යාරක්ෂක බලකායෙ දිවුරුම් දුන්න සහෝදරයො හැම වෙලාවෙම නයිට් කෙනෙක් වෙන්ට ඕන." සෙර් බොරෝස් තිර හඬින් කියා සිටියේය.

"මේ වෙනකං." දඩබල්ලා සිය ගොරෝසු ස්වරයෙන් කීවේය. සෙර් බොරෝස් කට වසාගත්තේ ය.

* * *

රාජදූතයා ඉදිරියට පැමිණිවිට සිය මොහොත උදා වී ඇතැයි සන්සා තේරුම් ගත්තාය. ඇය නොසන්සුන් අයුරින් සිය සාය හරි ගැස්සුවාය. මියගිය රජතුමාට කරන ගෞරවයක් වශයෙන් ඇය ශෝකය පළකරන ඇඳුමින් සැරසී හුන්නාය. එනමුදු ඒ අතරම සිය සුන්දරත්වය මනාව ඉස්මතු වී පෙනෙන'යුරින් සැරසීමට ද ඇය අමතක නොකලාය. ඇය හැඳ සිටි ගවොම රැජිණ විසින් ඇයට තෑගි වශයෙන් ලබා දුන්, ආර්යා දොඩම් ඉස්ම ඉස විනාශකර දමන ලද ඒ ඇත්දළ පැහැති සේද ඇඳුම විය. එනමුදු ඇය සායම් උලා ඒ පැල්ලම මකා දමන්නට සමත් වී තිබුනි. සුදුසු ආභරණ තෝරාගත නොහැකිව සිය ආභරණ මංජුසාව අබියස පැය ගණනක් කල්පනා කල ඇය අන්තිමේදී සරල එනමුදු කදිම, මනහර රිදී දම්වැලක් පමණක් තෝරාගෙන තිබුනාය.

රාජදූතයා ගේ ස්වරය ශාලාව තුළ ගිගුම් දුන්නේය. "මෙතන ඉන්නා කිසියම් මිනිසෙකුට අපේ ස්වාමින් ඉදිරියේ තමන් ගේ යම් ගැටළුවක් ඉදිරිපත් කරන්නට උවමනා නම් දැන් එයට සුදුසු කාලයයි. දැන් කතා කරන්ට. නැත්තම් නිහඬවම ඉන්ට."

සන්සා තැතිගත්තා ය. 'දැන්!' ඇය තමාටම කියාගත්තා ය. 'මම දැන් ඒක කරන්ටම ඕන. දෙවියො මට අවශ්‍ය ධෛර්යය දෙන්ට.' ඇය සෙමින් එක් පියවරක් ඉදිරියට තැබුවාය. ඉන්පසු තවෙකක්. වංශාධිපතියෝ හා නයිට්වරු ඇයට යාමට ඉඩදෙනු පිණිස නිහඬවම දෙපසට වූහ. ඔවුන් ගේ දෑස් තමා මත පතිත වී ඇති ආකාරය ඇයට දැනෙන්නට විය. 'මම මගේ අම්මා වගේ ශක්තිමත් වෙන්ට ඕන.' "මගේ ස්වාමිනී." ඇය මෘදු, සැලෙන හඬින් කීවාය.

පියගැටපෙළ ඉහළ සිහසුනේ හුන් ජොෆ්රිට අන් කවරෙකුටත් වඩා හොඳින් ඇයව දැකගත හැකි විය. ඇයව දුටු මුල්ම තැනැත්තා ඔහු විය. "ඉස්සරහට එන්ට මගේ ආර්යාවනි." ඔහු සිනාමුසු මුහුණින් යුතුව කීවේය.

ඔහුගේ සිනහව ඇයට ධෛර්යය ලබා දුන්නේය. තමා ලස්සන හා ශක්තිමත් යැයි හැඟීමක් ඇය තුළ ඇතිකලේය. 'එයා මට ආදරෙයි! එයා ඇත්තටම මට ආදරෙයි!' හිස එසවූ සන්සා ඔහු දෙසට පිය මැන්නාය. 'වැඩිය හෙමින් යන්ට එපා. වැඩියම හයියෙන් යන්ටත් එපා.' තමා කෙතරම් නොසන්සුන් වී ඇත්දැයි අන්‍යයන්ට පෙන්වීමට ඇයට අවැසි නොවීය.

"ස්ටාර්ක් වංශයේ සන්සා ආර්යාව." රාජදූතයා නිවේදනය කලේය.

සිහසුන පාමුල බිම වැටී තිබුනු සෙර් බැරිස්ටාන් ගේ ශිරස්කය, පපු එලකය හා ධවල සළුව අසල ඇය නැවතුනාය. "ඔයාට රජතුමාගෙනුයි රාජසභාවෙනුයි මොකක් හරි ඉල්ලන්ට තියෙනවද සන්සා?" රැජිණ රාජසභික මේසයේ හිඳ ඇසුවාය.

"එහෙමයි." සන්සා බිම වැටී තිබුනු සළුව මත දණගැසුවේ සිය ගවොමේ කුණු නොගැවෙනු පිණිසය. ඇය ඉන්පසු හිස ඔසවා බිහිසුණු, කළු පැහැ යකඩ සිහසුන මත හිඳි සිය කුමරුවා දෙස බැලීය. "ඔබතුමාගෙ කරුනාවෙන්, මම කැමැතියි මගේ තාත්තා,

රජතුමාගෙ හිටපු හස්තය එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන්ට සමාව භජනය කරන්ට කියලා ඉල්ලන්ට." ඇය මේ වදන් පෙළ සිය වරක් ප්‍රගුන කර තිබුනාය.

රැජිණ සුසුමක් හෙලුවාය. "සන්සා ඔයා මගේ බලාපොරොත්තු නැතිකරලා දානවා. මම මොකක්ද ඔයාට කිවුවෙ ද්‍රෝහියෙකුගෙ ලේ ගැන?"

"ඔබේ තාත්තා බොහොම භයානක රාජද්‍රෝහී අපරාධයක් කරලා තියෙන්නෙ මගේ ආර්යාවනි." ප්‍රධාන මේස්ටර් පයිසෙල් තිර හඬින් කියා සිටියේය.

"අනේ පුංචි අසරණ දරුවා." වාරිස් සුසුමක් හෙලුවේය. "එයා නිකංම පුංචි දරුවෙක් විතරයි මගේ උතුමනි. එයාට තේරුමක් නෑ එයා මේ මොකක් ගැනද අහන්නෙ කියලා."

සන්සා සිය දෙනෙත් ජොෆ්රි වෙතින් මුදා නොගත්තා ය. 'එයා මට ඇහුම්කන් දෙන්ට ඕනමයි. ඕනමයි.' සන්සා සිතුවාය. රජතුමා සිය ආසනයේ හරිබරි ගැසුනේය. "එයාට කතා කරන්ට ඉඩදෙන්ට. එයාට මොනවද කියන්ට තියෙන්නෙ කියලා මට අහන්ට ඕන." ඔහු අණකලේය.

"බොහොම ස්තූතියි මගේ ස්වාමිනී!" සන්සා සිනාසුනාය. ඔහු වෙනුවෙන්ම වූ ලැජ්ජාකාරී රහස් සිනහවක් පෑවාය. ඔහු ඇයට ඇහුම්කන් දෙමින් සිටියි. ඇය එය දත්තාය.

"රාජද්‍රෝහිකම කියන්නෙ බොහොම හානිකර වල් පැලෑටියක්." පයිසෙල් ගාම්භීර හඬින් නිවේදනය කර සිටියේය. "ඒක උදුරලා විනාශකරලා දාන්ට ඕන. මුලයි, කඳයි, ඇටයි ඔක්කොම. එහෙම කලේ නැත්තම් පාර දිගේ හැම ගහක් ගලක් ගානෙම අලුත් ද්‍රෝහියො මෝදුවෙයි."

"ඔබ ඔබේ තාත්තගෙ අපරාධය ප්‍රතික්ෂේප කරනවද?" බේලිෂ් උතුමානන් ඇසුවේය.

"නැහැ මගේ උතුමනි." සන්සා ඊට වඩා දැනුම් තේරුම් ඇතිව සිටියාය. "මම දන්නවා එයාට දඬුවම් ලබාදෙන්ට ඕනයි කියලා. මම ඉල්ලන්නෙ අභයදානය විතරයි. මම දන්නවා මගේ තාත්තා එයා කරපු දේ ගැන පසුතැවිලි වෙන්ට ඕනයි කියලා. එයා රොබර්ට් රජතුමාගෙ යාළුවා. එයා එතුමාට ආදරේ කලා. ඔබලා හැමෝම දන්නවා එයා එතුමාට ආදරේ කලා කියලා. රජතුමා එයාගෙන් අහනකම් එයාට රජතුමාගෙ හස්තය වෙන්ට කිසිම උවමනාවක් තිබුනෙ නැහැ. එයාලා තාත්තට බොරු කිවුවා වෙන්ට ඕන. රෙන්ලි උතුමානන් හරි ස්ටැනිස් උතුමානන් හරි... එහෙමත් නැත්තම් වෙන කවුරු හරි. එයාලා තාත්තට බොරු කිවුවා වෙන්ටම ඕන. එහෙම නෙවෙයි නම්..."

ජොෆ්රි රජතුමා සිහසුනේ ඉදිරියට බරවූයේය. ඔහු දෑතින් අසුනේ ඇඳි අල්ලාගෙන සිටි අතර ඇඟිලි අතරින් කැඩුනු අසිපත් තුඩු ඉදිරියට නෙරා විත් තිබින. "ඌ කිවුවා මම රජතුමා නෙවෙයි කියලා. ඇයි ඌ එහෙම දෙයක් කිවුවෙ?"

"එයාගෙ කකුල කැඩිලයි තිබුනෙ." සන්සා සැනෙන් පිළිතුරු දුන්නාය. "ඒක දිගටම බොහොම වේදනා දිදියි තිබුනෙ. මේස්ටර් පයිසෙල් එයාට හැමදාම වගේ පොපි යුෂ දුන්නා. මිනිස්සු කියන්නෙ පොපි යුෂ හන්දා කෙනෙකුගෙ ඔළුව බරවෙනවයි කියලා. ඒ නිසා කෙනෙකුට හරියට හිතන්ට බැරිවෙනවයි කියලා. එහෙම නැත්තම් එයා කවදාවත් ඒ වගේ දෙයක් කියන්ට හිතන්නෙවත් නෑ."

"දරුවෙක්ගෙ බලාපොරොත්තු... කොච්චර අහිංසක කමක්ද... ඒ වුනත්, මිනිස්සු කියනවා දරුවන්ගෙ කටෙන් තමා බොහොම වෙලාවට ඥානවන්ත කතා එළියට එන්නෙ කියලා." වාරිස් කීවේය.

"රාජද්‍රෝහිකම රාජද්‍රෝහිකමමයි." පයිසෙල් පෙරලා පිළිතුරු දුන්නේය.

ජොෆ්රි නොසන්සුන් අයුරින් සිහසුන මත ඇඹරුනේය. "අම්මා?"

සෙර්සි ලැනිස්ටර් මොහොතක් සන්සා කී දේ ගැන සිතා බැලුවාය. "එඩාර්ඩ් උතුමානන්ට පුළුවන් නම් එයා කරපු අපරාධය ගැන පාපොච්චාරණයක් කරන්ට..." ඇය අන්තිමේදී කීවාය. "එතකොට අපි දන්නවා එයා කරපු අපරාධය ගැන පසුතැවෙනවා කියලා."

ජොෆ්රි සිහසුනෙන් නැගිට්ටේය. 'අනේ කරුනාකරලා!' සන්සා සිතුවාය. 'අනේ! අනේ! හොඳ කරුනාවන්ත උදාර රජකෙනෙක් විදියට මගේ හිතේ ඔයා ගැන තියෙන හැඟීම බිඳලා දාන්ට එපා. අනේ!' "ඔබට තව මොකුත් කියන්ට තියෙනවද?" ඔහු ඇගෙන් ඇසුවේය.

"ඔබතුමා මට දක්වන ආදරේ වෙනුවෙන්, මට මේ කරුනාව දක්වයි කියලා මම බලාපොරොත්තු වෙනවා මගේ කුමරුනි."

ජොෆ්රි රජතුමා ඇගේ උඩ සිට පහළට යනතෙක් නෙත් හෙළීය. "ඔබේ මේ සුන්දර වචන නිසා මට එහෙම කරන්ට හිතෙනවා." සෑම දෙයක්ම හොඳින් සිදුවන්නට යන්නේ යැයි ඇයට ඒත්තු ගන්වන්නට මෙන් ඔහු උදාර ලෙස හිස වැනුවේය. "ඔබ අහන විදියට මම කරන්නම්... ඒ වුනත් මුලින්ම ඔබේ තාත්තා පාපොච්චාරණයක් කරන්ට ඕන. එයා පාපොච්චාරණය කරන්ට ඕන. ඒ වගේම කියන්ට ඕන මම තමා නියම රජතුමා කියලා. එහෙම නැත්තම්, එයාට කිසිම අභයදානයක් ලැබෙන්නෙ නැහැ."

"එයා එහෙම කරාවි." හද උතුරා යන සතුටින් යුතුව සන්සා කීවාය. "අනේ! මම දන්නවා එයා එහෙම කරාවි."

**Ser Barristan Selmy: “The Kingsguard is a Sworn Brotherhood. Our vows are taken for life. Only death may relieve the Lord Commander of his sacred trust.”**

එඩාර්ඩ් 15

සිරකුටියෙහි බිම අතුල පිදුරුවලින් මුත්‍රා ගඳ වහනය විය. එහි කිසිදු කවුළුවක්, නිදා ගැනීමට ඇඳක් හෝ මුත්‍රා කිරීමට භාජනයක් වත් නොවීය. මුත්‍රා පැල්ලම්වලින් රටා ඇඳුණු ලා රත් පැහැ ගල් බිත්ති ද, අඟල් හතරක පමණ ඝනකමින් යුතු, යකඩ පතුරින් සවිමත් කල අඳුරු ලී දොරක් ද ඔහුට සිහිපත් විය. ඔවුන් ඔහුව මේ කුටිය තල්ලු කරද්දී එක් නිමේෂයකට මේ දේවල් දැකගන්නට ඔහුට හැකිව තිබින. එනමුදු ඒ එකම එක නිමේෂයකට පමණි. ඔහුට පසුපසින් මහහඬක් නගමින් දොර වැසී ගිය අතර තවදුරටත් යමක් දැකීමේ හැකියාවක් නොවීය. කුටිය සම්පූර්ණයෙන්ම අඳුරින් වැසී ගියේය. එය හරියටම ඔහු අන්ධයකු වූවාක් වැන්න.

එසේ නැතිනම් ඔහු මියගියා විය හැක. මියගොස් සිය රජතුමාත් සමගම වළලා දැමූවා විය හැක. "ආහ් රොබර්ට්!" අවට අතපත ගෑ ඔහුට සීතල ගල්බිත්තියක් හැර වෙනත් යමක් හසුනොවින. සිදුකරන සෑම චලනයක් පාසාම පාදය වේදනාවෙන් ඇදුම් කන්නට විය. උතුරේ ශීත රජවරුන් නොපහන් දෑසින් ඔවුන් දෙස බලා සිටිද්දී වින්ටර්ෆෙල්වල සොහොන් ගැබ් තුළදී රොබර්ට් ඔහුත් සමග කල විහිළුව නෙඩ්ට මතක්විය. 'රජතුමා කනවා. රජතුමාගෙ හස්තය පස්ස හෝදනවා!' රොබර්ට් එදා කෙතරම් සිනාසුනාද. එනමුදු ඔහු ඒ කී දේ සම්පූර්ණයෙන්ම වැරැදිය. හරි විදියට නම් එය 'රජතුමා මැරුනම රජතුමාගෙ හස්තය වළලනවා!' ලෙසින් වෙනස් විය යුතුය.

මේ සිරකුටිය රතු බලකොටුවේ ගැඹුරේම, ඔහුට සිතාගන්නටවත් නොහැකි තරම් ගැඹුරේ පිහිටි එකක් විය. කෲර මේගර් ටාර්ගේරියන් රජතුමා ගැන වූ කටකතා ඔහුට මතක් විය. මේ බලකොටුව නිමවා හමාර වූ පසු ඔහු ඊට සහභාගි වූ පෙදරේරුවන් හා වඩුවන් සියල්ල මරවා දැමූයේ බලකොටුවේ රහස් පිටට නොයනු පිණිස විය.

ඔවුන් සැවොම යකාට ගියාවේ. සුළැඟිල්ලා, ජේනස් ස්ලින්ට් හා ඔහුගේ නගරාරක්ෂකයින්, රැජිණ, රජුන් මරන්නා, පයිසෙල් හා වාරිස් හා සෙර් බැරිස්ටාන්. රජතුමා ගේ සොහොයුරු රෙන්ලි උතුමානන් පවා යකාට ගියාවේ. තමාට ඔහුව උවමනාම වූ වේලාවේ ඔහු පලාගියේය. එනමුදු අන්තිමේදී ඔහු සිදුවූ සියල්ලක්ම සම්බන්ධයෙන්

තමාටම චෝදනා කරගත්තේ ය. "මෝඩයා!" අන්ධකාරය තුළ මහ හඬින් කෑගසමින් ඔහු තමාටම සාප කරගත්තේ ය. "තුන් පාරක් යකාට ගිය බූරු පොට්ටයා."

අන්ධකාරය තුළ සෙර්සි ලැනිස්ටර් ගේ මුහුණ ඔහු ඉදිරියේ පාවෙන්නාක් මෙන් දැනුනි. ඇගේ කෙහෙරැළි හිරු රැස් වැටී බැබලෙමින් තිබුනු අතර ඒ සිනාවේ අවඥාවක් තැවරී තිබින. "උඹ සිහසුන් ක්‍රීඩාව කරද්දි එක්කෝ උඹ දිනනවා. නැත්තම් උඹ මැරෙනවා." ඇය මිමිනුවාය. නෙඩ් ක්‍රීඩා කල අතර ඔහු පැරදුනේය. ඔහුගේ අමන මෝඩකම් වෙනුවෙන් ඔහුගේ මිනිස්සු සිය රුධිරයෙන් වන්දි ගෙවූහ.

සිය දියණියන් දෙදෙනා ගැන සිතන්නට සිතන්නට ඔහුට මහහඬින් වැලපෙන්නට සිත්විය. එනමුදු දෑස්වලින් කිසිදු කඳුළක් පිටාර නොගැලුවේය. ඔහු තවමත් වින්ටර්ෆෙල්හි ස්ටාර්ක්වරයෙකි. ඔහුගේ ශෝකයත්, ඔහුගේ ක්‍රෝධයත් ඔහු තුළම මිදී ගල්වී ගිය සේය.

ඔහු එහා මෙහා නොවී නොසෙල්වී සිටින තාක් කල් පාදයේ ඇදුම් කෑම අඩු මට්ටමක තබාගත හැකි විය. එමනිසා ඔහු හැකිතාක් නොසෙල්වී සිටීමටම වගබලා ගත්තේය. එනමුදු ඔහු මෙසේ කෙතෙක් කල් සිටියාද යන්න නම් ඔහුට කිව නොහැකි විය. එහි හිරු එළියක් හෝ සඳ එළියක් හෝ නොවීය. බිත්තියේ සලකුණක් තැබීමට පවා කිසිදු ආලෝකයක් නොවීය. නෙඩ් සිය දෑස් පියාගෙන නැවත ඒවා විවර කල නමුදු එහි කිසිදු වෙනසක් නොවීය. ඔහු නිදාගත්තේ ය. නැගිට්ටේ ය. නැවත නිදාගත්තේ ය. මෙයින් කවරක් වඩා වේදනාකාරීද යන්න ඔහු නොදත්තේ ය. නිදාගැනීම හෝ අවදියෙන් සිටීම යන දෙකම එක සේ වේදනාකාරී විය. නිදාගත් විට ඔහු සිහින දිටීය. ඒවා ඔහුව නොසන්සුන් කල, රුධිරය හා බිඳුනු පොරොන්දු ගැන කියැවෙන නපුරු සිහින විය. අවදියෙන් සිටිද්දී සිතීම හැර අන් කල හැකි යමක් නොවීය. එනමුදු ඔහුගේ මේ සිතුවිලි නපුරු සිහිනවලටත් වඩා භයානක විය. කැට් ගැන සිතීම කටු අතුළ යහනකටත් වඩා වේදනාකාරී විය. ඇය මේ වනවිට කොහේ කුමක් කරමින් සිටිනු ඇත්දැයි ඔහු කල්පනා කලේය. ඔහුට නැවත කෙදිනකවත් ඇයව දකින්නට නොලැබේදෝ යි ඔහු කල්පනා කලේය.

පැයෙන් පැය ගෙවී ඒවා දවස් බවට පෙරලුනි. එසේ නැතහොත් ඔහුට එසේ හැඟුනි. සිය බිඳුනු පාදයේ අමුතු වේදනාවක් ඔහුට දැනෙන්නට විය. වෙළුම්පටිවලට යටින් කසන්නට පටන්ගත්තේ ය. ඔහු සිය කලව ස්පර්ශ කල විට සම ගිනිගෙන දැවෙන්නාක් මෙන් ඇඟිලි තුඩුවලට දැනුනි. ඔහුට ඇසුනු එකම ශබ්දය සිය හුස්ම වැටීමේ හඬ පමණි. ටික කලකට

පසු කුමක් හෝ හඬක් ඇසීමේ අටියෙන් ඔහු තමාටම ශබ්ද නගා කතාකරන්නට පටන්ගත්තේ ය. මනස අවුල් නොවී තබාගැනීම පිණිස ඔහු විවිධ සැලසුම් ඇන්දේය. අන්ධකාරය තුළ බලාපොරොත්තුවේ බලකොටු ගොඩනංවන්නට විය. රොබර්ට් ගේ සොහොයුරන් තවම සිටිති. නිසැකවම ඔවුහු ඩ්‍රැගන්ස්ටෝන් හා ස්ටෝර්ම්ස් එන්ඩ්හි සිට හමුදා රැස් කරනවා විය යුතුය. සෙර් ග්‍රෙගර්ට පාඩමක් ඉගැන්වූ පසු ඇලන් හා හාර්වින් ඔහුගේ සෙසු ගෘහාරක්ෂක සෙබළ මුලුවත් සමගින් නැවත කින්ග්ස් ලෑන්ඩින්ග්වලට පැමිණෙනවා ඇත. කැට්ලින්ට ආරංචිය ලැබුනු පසු ඇය උතුර නැගිට්ටවනවා ඇත. ගංගා නිම්නයේ හා ඊරින් මිටියාවතේ වංශාධිපතීන් ඇයට එක්වනවා ඇත.

තමා වඩ වඩාත් රොබර්ට් ගැන සිතමින් සිටින බැව් ඔහුට පසක් වන්නට විය. සිය දිවියේ තරුණ කාලයේදී සිටියාක් මෙන්, උස්ව, කඩවසම් පෙනුමකින් යුතුව, ගෝන අං තට්ටුවක් සවිකල සිය ශිරස්කය පැළැඳ, සිය දැවැන්ත යගදාව අතකින් ගෙන, දෙවියකු මෙන් මහානුභාවසම්පන්නව සිය අසු පිට නැග සිටි රජතුමා ගේ රුව ඔහු ඉදිරියේ මැවී ගියේය. අන්ධකාරය මධ්‍යයේ රජුගේ සිනා හඬ ඔහුට ඇසුනි. කඳුකරයේ විලක් මෙන් පැහැදිළි නිල් පැහැ ඒ දෑස් ඔහුට පෙනුනි. "බලහං අපි දෙන්නා දිහා නෙඩ්." රොබර්ට් කීවේය. "උඹ මෙතන හිරකූඩුවක. මම ඌරෙක්ගෙන් මැරුම් කෑවා. අම්මපා! අපි දෙන්නා එකතුවෙලා සිංහාසනේකුත් දින්නනෙ..."

'මම උඹව අසමත් කලා රොබර්ට්.' නෙඩ් සිතුවේය. ඔහුට ඒ වදන් මුවින් පිටකර ගත නොහැකි විය. 'මම උඹට බොරු කිවුවා. උඹෙන් ඇත්ත වසන් කලා. මම උන්ට ඉඩදුන්නා උඹව මරලා දාන්ට.'

රජතුමාට ඔහුව ඇසුනු සෙයකි. "උඹ මුරණ්ඩු මෝඩයා!" ඔහු කටුකුටු ගෑවේය. "උඹ කවදාවත් මම කියන දේකට ඇහුම්කන් දුන්නෙ නෑ. උඹට පුළුවන්ද උඹේ ඔය ආඩම්බරේ කන්ට ස්ටාර්ක්? උඹේ ඔය ගෞරවයට පුළුවන් වෙයිද උඹේ දරුවො ආරක්ෂා කරන්ට?" රජතුමා ගේ මුහුණ ඉරිතලා ගියේය. සම පුපුරා ගියේය. ඉහළට එසැවී අත දිගුකල නෙඩ් ඒ වෙස් මුහුණ ඉරා දැම්මේය. එතන තවදුරටත් රොබර්ට් නොවීය. ඒ වෙනුවට ඔහුට සමච්චලයට මෙන් විරිත්තමින් සිටි සුළැඟිල්ලා එතැන විය. ඔහු කතා කරන්නට මුව විවර කල විට එයින් පිටවූ බොරු කන්දරාව සලබයින් බවට පත් වී ඔහු වටා පියාසලන්නට විය.

* * *

ශාලාව දිගේ අඩි ශබ්ද ඇසෙද්දී නෙඩ් නින්දත් නොනින්දත් අතර පසුවිය. තමා සිහිනයක් දකිමින් සිටින්නේ යැයි ඔහු මුලින් සිතුවේය. සිය කටහඬ හැර වෙනත් ශබ්දයක් නොඇසී බොහෝ කාලයක් ගතවී තිබුනි. ඔහුට උණ ගැනී තිබුනු අතර පාදය එකම කටුක වේදනාවක් විය. ඔහුගේ දෙතොල් වියළී ඉරිතලා ගොස් තිබුනි. බරැති දැවමුවා දොර ක්‍රීක් හඬක් නංවමින් විවර වූ අතර ඇති වූ හදිසි ආලෝකය ඔහුගේ දෑසට පීඩාකාරී විය.

මුර හටයෙක් ඔහු වෙතට කොතලයක් දිගුකලේය. මැටි බඳුන සිසිල් වූ අතර එහි පිටත ජලවාෂ්ප බැඳී තිබුනි. දෝතින්ම එය ඩැහැගත් නෙඩ් මහත් ආසාවෙන් දිය බොන්නට විය. ඔහුගේ මුවින් පිටතට රුරා ගිය දිය රැවුළ අතරින් පහළට ගලා බසින්නට විය. ඔහු එකදිගටම කෙතරම් දිය පානය කලාද යත් තමා අසනීප වෙන්නට එන්නාක් මෙන් ඔහුට හැඟුනි. "කොච්චර කාලයක් ද...?" තවත් දිය බී ගත නුහුනු තැන ඔහු දුබල හඬින් ඇසුවේය.

මේ මුරහටයා මීයකු ගේ වැනි මුහුණකින් ද, අවුල් වූ රැවුලකින් ද යුතු ඉතා කෙට්ටු මිනිසකු විය. ඔහු මුදු දම්වැල් සන්නාහ කමිසයක් හා සමින් නිමවූ අඩ කබායක් පැළැඳ සිටියේය. "කතා බෑ." ඔහු කීවේ නෙඩ්ගේ අතින් කොතලය උදුරාගනිමිනි.

"අනේ, කරුනාකරලා..." නෙඩ් කීවේය. "මගේ දුවලා දෙන්නා..." මහහඬක් නංවමින් දොර වැසී ගියේය. හදිසියේම නැතිව ආලෝකය නිසා නෙඩ් වේගයෙන් ඇසිපිය ගැසුවේය. ඔහුගේ හිස සෙමෙන් පහත් වී පපුව මතට කඩා හැලුනු අතර පසෙකට හැරුනු ඔහු පිදුරු මත වකුටු වූයේය. තවදුරටත් ඒවායින් මුත්‍රා ගඳක් වහනය නොවීය. එයින් තවදුරටත් කිසිඳු ගඳක් වහනය නොවීය.

* * *

නිදාගැනීම හා අවදිවීම අතර වෙනස ඔහුට තවදුරටත් හඳුනා ගත නොහැකි විය. අන්ධකාරය තුළදී පැරණි මතක ඔහු වෙත ඇදී ආයේය. ඒවා නින්දේදී දකින සිහින තරමටම විචිත්‍ර විය, පැහැදිලි විය. ඒ බොරු වසන්තයේ වසර විය. ඔහු නැවතත් අවුරුදු දහඅටක ගැටවරයකු විය. හැරෙන්හෝල්හි පැවැති තරගාවලියට සහභාගි වනු පිණිස ඔහු ඉයරිහි සිට පැමිණ සිටියේය. තණකොළවල තද කොළ පැහැය ඔහුට පෙනෙන්නාක්

මෙන් විය. සුළඟේ පාවෙන මල් රේණුවල සුවඳ දැනෙන්නාක් මෙන් විය. උණුසුම් දිවා කාලයන්, සිසිල් රෑ කාලයන් හා වයින්වල මිහිරි රස. බ්‍රැන්ඩන් ගේ සිනහව ඔහුට සිහිපත් විය. තරගාවලියේදී රොබර්ට් පෙන්වූ සුරුවිරුකම්, සතර අතේම ප්‍රතිවාදීන් බිම හෙලද්දී ඔහු මහහඬින් සිනාසුන'යුරු ඔහුට සිහිපත් විය. සුදු පැහැ කොරපොතු සන්නාහයකින් සැරසුනු, රන්වන් කෙස් කලඹින් යුතු ජේමි ලැනිස්ටර් නම් කොලුවා රජතුමා ගේ මණ්ඩපය අබියස තණබිස්සේ දණ නමා ඒරිස් රජතුමාව සදා රකිමියි පිළිණ දුන් සැටි ඔහුට සිහිපත් විය. එයින් පසුව සෙර් ඔස්වල්ඩ් වෙන්ට් ජේමිට නැගිට සිටිනු පිණිස අත දුන්නේය. සුදු ගොනා, රාජ්‍යාරක්ෂක බලකායේ අණදෙන නිළධාරි සෙර් ජෙරල්ඩ් හයිටවර් විසින් බලකායට හිමි සුදු සළුව සියතින්ම ජේමිගේ උරහිසට තබා ගැටගැසුවේය. සිය නවක සහෝදරයා පිළිගනු පිණිස බලකායේ නයිට්වරුන් සයදෙනාම එදින පැමිණ සිටියෝය.

එනමුදු තරග ආරම්භ වූ පසු දිනය අයත් වූයේ රේගාර් ටාර්ගේරියන්ට විය. ඔටුන්න හිමි කුමරා එදින සැරසී සිටියේ ඔහු මියගිය දා පැළැඳ සිටි අන්දමින්ම විය. දිදුලන කළු පැහැ එලක සන්නාහයේ පපු තහඩුව මත සිය වංශ සලකුණ වන හිස් තුනේ මකරා රතු කැටවලින් නිමවා තිබින. ඔහු අසු විහිදද්දී ඔහුට පිටුපසින් ලේ රතු පැහැ සේද සළුව සුළඟේ නැටීය. අන් කිසිදු ලන්සයකට ඔහුට කිට්වු කිරීමටවත් නොහැකි බවක් පෙනුනි. බ්‍රැන්ඩන් ඔහුට පරාද විය. ලෝකඩ යොන් රොයිස් ඔහුට පරාද විය. උදැසනේ අසිපත හෙවත් තේජස්වී සෙර් ආතර් ඩේන් පවා ඔහුට පරාද විය.

අවසාන වටයේදී සෙර් බැරිස්ටාන් සෙල්මිව පැරදවූ කුමරා තරගාවලියේ ශූරතාව තමා සතු කරගත්තේ ය. ඔහු පිටිය වටා යමින් නරඹන්නන්ට ආචාර කරමින් සිටින අතරේ රොබර්ට් ජොන් ඒරින් හා මහලු හන්ටර් උතුමානන් සමගින් කවට බස් දොඩමින් හුන්නේය. මේ සියලු සිනාවන් හා කතාවන් සැනෙන් මියගිය ඒ එක් නිමේෂය නෙඩ්ට සිහිපත් විය. රේගාර් ටාර්ගේරියන් සිය බිරිඳ වන ඩෝර්න්හි ඊලියා මාර්ටෙල් කුමරිය පසුකරමින් ගොස් 'ආලයේ හා සුන්දරත්වයේ රැජිණ' වෙනුවෙන් පිදිය යුතු කිරුළ ලියානා ගේ උකුළ මත හෙලූ ඒ නිමේෂය ඔහුට සිහිපත් විය. හිම මෙන් නිල් පැහැයෙන් දිදුල, නිල් රෝස මලින් සැදි ඒ කිරුළ නෙඩ්ට අද ඊයේ මෙන් මතකය.

සිය අත දිගුකල නෙඩ් ස්ටාර්ක් මේ මල් කිරුළ ඩැහැගැනීමට උත්සාහ කලේය. එනමුදු මේ ලා නිල් පැහැ රෝස මල් පෙති යටින් රෝස කටු සැඟවී තිබුනි. ඒවා කුරිරු අන්දමින්, තියුණු අන්දමින් සිය සම සූරනු ඔහුට දැනුනි. සිය අතැඟිලි දිගේ සෙමින් රුධිරය රූරා හැලෙනු ඔහුට පෙනුනි. ඔහු වෙවුලමින් අන්ධකාරය මධ්‍යයේ අවදිවිය.

'මට පොරොන්දු වෙන්ට නෙඩ්!' ඔහුගේ සොයුරිය සිය ලෙයින් පෙඟුනු මරණ මංචකයේ සිට අයැද සිටියාය. ඇය සැමදාමත් නිල් රෝස මල් සුවඳට ආලය කලාය.

"දෙයියො මට පිහිට වෙන්ට!" නෙඩ් වැළපුනේය. "මට පිස්සු හැදීගෙන එනවා."

ඔහුට පිළිතුරු දීමට තරම් දෙවිවරුන්ට වේලාවක් නොවීය.

* * *

මුරභටයා ඔහු වෙත දිය ගෙන ආ සෑම මොහොතකම තවත් දවසක් පසු වී ඇතැයි ඔහු සනිටුහන් කරගත්තේ ය. මුලදී නම් සිය දියණියන් ගැනත් සිරකුටියෙන් පිටත ලෝකය ගැනත් යමක් පවසන්නැයි ඔහු මුරභටයාගෙන් අයැද සිටියේය. එනමුදු ඔහුට පිළිතුරු වශයෙන් ලැබුනේ නොරිස්සුම් හඬක් හා පා පහරවල් පමණි. ඉන්පසු, සිය උදරය ගැටගැසී එන්නාක් මෙන් දැනෙන්නට පටන්ගත් විට ඔහු ඒ වෙනුවට ආහාර ඉල්ලා අයැදුවේය. ප්‍රතිඵලය එකම විය. ඔහුට අහර කිසිත් නොසැපයින. සමහරවිට ඔහුව නිරාහාර කොට මරා දැමීමට ලැනිස්ටර්වරුන් කල්පනා කරනවා විය හැක. "නෑ!" ඔහු තමාටම කියාගත්තේ ය. සෙර්සිට ඔහුව මරා දැමීමට උවමනා නම් ඔහුව කපා බිම හෙලනු ඇත්තේ එදා අර සිහසුන් කාමරය තුළදීමය. ඇයට ඔහුව පණපිටින් උවමනාය. දුබල, බලාපොරොත්තු විරහිත තත්ත්වයෙන් වුව පණපිටින් උවමනාය. කැට්ලින් තවමත් ඇයගේ සොහොයුරා අත්අඩංගුවේ තබාගෙන සිටියි. ඔහුව මරා දැමීමට තරම් සෙර්සි නිර්භීත නොවන අතර එසේ කලහොත් පුංචි යකාගේ ජීවිතයද කෙලවර වනු ඇත.

ඔහුගේ කුටියට පිටතින් යකඩ දම්වැල් එකට ගැටෙන හඬක් ඇසුනි. ක්‍රීක් හඬක් නංවමින් දොර විවර වෙද්දී නෙඩ් තෙත් බිත්තියට අත තබා ආලෝකය දෙසට නැඹුරු විය. පන්දම් එළියක් නිසා ඔහුගේ දෑස් ගිනිකණ වැටුනි. "කෑම." ඔහු ගොරෝසු හඬින් කෙඳිරුවේය.

"වයින්." කටහඬක් පිළිතුරු දුන්නේය. ඒ මීට පෙර පැමිණි අර මී මුහුණක් ඇති මුරභටයා නොවීය. මොහු ඒ හා සමානවම මුදු දම්වැල් සන්නාහ කමිසයක් හා අඩ කබායක් හැඳ සිටි

නමුදු මිටි, තරබාරු පුද්ගලයකු විය. "බොන්ට එඩාර්ඩ් උතුමානනි." ඔහු නෙඩ්ගේ දෑතට වයින් සම් මල්ලක් දිගුකලේය.

මේ කටහඬ පුදුමාකාර ලෙස හුරුපුරුදු එකක් විය. එනමුදු සැබැවින්ම ඒ කවුදැයි හඳුනාගැනීමට නෙඩ්ට මඳ වේලාවක් ගතවිය. "වාරිස්?" ඔහු පැටලිලි ස්වරයෙන් ඇසුවේය. අත දිගුකල ඔහු මුරභටයා ගේ මුහුණ ස්පර්ශ කලේය. "මම මේ... හීනයක් දකිනවා නෙවෙයි නේද? උඹ මෙතැන." පණ්ඩකයා ගේ සුමුදු වටකුරු කම්මුල් ගොරෝසු අඳුරු රැවුල් කොටයෙන් වැසීගත්තේ ය. වාරිස් දහදිය හා වයින් ගඳ හමන, අඳුරු පැහැ මුරභටයකු බවට පරිවර්තනය වී හුන්නේය. "කොහොමද උඹ... උඹ ඇත්තටම මොන වගේ මන්තරකාරයෙක් ද?"

"පිපාසෙ හැදිච්ච එකෙක්." වාරිස් පිළිතුරු දුන්නේය. "බොන්ට මගේ උතුමානනි."

නෙඩ්ගේ අතැඟිලි වෙවුලුවේය. "මේ උන් රොබර්ට්ට දුන්න වස ජාතියම ද?"

"ඔබ මාව වැරැදියට වටහාගෙන." වාරිස් දුක්මුසු ස්වරයෙන් කීවේය. "ඇත්තටම. කිසිම කෙනෙක් නපුංසකයින්ට ආදරේ නෑ. මෙහාට දෙන්ට ඔය මල්ල." ඔහු ලොකු වයින් උගුරක් බීවේය. මුව අගින් ගිලිහුනු වයින් දහරාවක් පහතට රූරා ආයේය. "මේක අර එදා තරගාවලිය දවසෙ රෑ ඔබතුමා මට දුන්න වයින් ජාතිය තරම් උත්කෘෂ්ට එකක් නෙවෙයි. ඒ වුනත් මේකෙ වෙන කිසිම වයින් ජාතියකට වඩා වසක් නෑ." ඔහු සිය දෙතොල් පිසදැමීය. "මෙන්න."

නෙඩ් වයින් උගුරක් බීමට තැත් කලේය. "මණ්ඩි." පානය කල වයින් නැවත උගුරට එන්නාක් මෙන් ඔහුට හැඟින.

"හැම මිනිහෙක්ම මිහිරි වයින් වගේම ඇඹුල් වයිනුත් බොන්ට ඕන. උසස් වංශාධිපතියෙක් වුනත් නපුංසකයෙක් වුනත් ඒකෙ වෙනසක් නෑ. ඔබේ වෙලාව දැන් ඇවිල්ලා මගේ උතුමානනි."

"මගේ කෙල්ලො දෙන්නා..."

"පොඩි කෙල්ල සෙර් මෙරින්ගෙන් බේරිලා පැනලා ගියා. මට එයාව හොයාගන්ට බැරිවුනා. ලැනිස්ටර්ලාටත් බැරිවුනා. ඒක බොහොම කරුනාවන්ත දෙයක්. අපේ අලුත් රජතුමා එයාට කොහෙත්ම කැමැති නෑ කියලා දන්නවනෙ. වැඩිමහලු කෙල්ල තාමත් ජොෆ්රිට විවාහ ගිවිසගෙනයි ඉන්නෙ. සෙර්සි එයාව බොහොම ළඟින් තියාගෙන ඉන්නෙ. එයා දැන් දවස් කීපෙකට කලින් රාජසභාවට ආවා ඔබට අභයදානය දෙන්ටයි කියලා ආයාචනා කරන්ට. ඔබ එතැන හිටියෙ නැති එක ලොකු කණගාටුවක්. ඔබට එච්චරටම දුක හිතෙන්ට තිබුනා ඒක දැක්කනම්." ඔහු චේතනාන්විතව මෙන් ඉදිරියට නැඹුරු වූයේය. "මම හිතන්නෙ ඔබ දන්නවා ඔබ දැන් මැරිච්ච මිනිහෙක් කියලා එඩාර්ඩ් උතුමානනි?"

"රැජිණ මාව මරලා දාන එකක් නෑ." නෙඩ්ගේ හිස බමන්නාක් මෙන් විය. වයින් වර්ගය සැර එකක් විය. එමෙන්ම ඔහු දිග කලෙකින් කුසට අහරක්ද ගෙන නොතිබුනි. "කැට්... කැට් එයාගෙ සහෝදරයව අල්ලන් ඉන්නවා..."

"වැරදි සහෝදරයා." වාරිස් සුසුමක් හෙලීය. "අනිත් එක, දැන් කොහොමවුනත් කැට්ලින් ආර්යාව ළඟ එයා නෑ. එයා පුංචි යකාට ඉඩදුන්නා එයාගෙ ඇඟිලි අතරින් ගැලවිලා පැනගන්ට. මම හිතන්නෙ මිනිහා දැන් මැරිලා. චන්ද්‍ර කඳුකරයේ කොහේහරි තැනක මැරිලා ගිහිල්ලා."

"ඒක ඇත්තක් නම් ඉතින් මගේ බෙල්ල කපලා දාලා වැඩේ අහවරයක් කරලා දාන්ට." ඔහුට වයින් මත නිසා හිස කරකැවෙන්නාක් මෙන් දැනින. එමෙන්ම ඔහු දැඩි වේදනාවකින් පෙලෙමින් සිටි අතර ඔහුගේ හදවත බිඳී ගොස් තිබින.

"මට උවමනා කරන්නෙ නැතිම දේ තමා ඔබේ ලේ."

නෙඩ් රවා බැලුවේය. "උන් මගේ මිනිස්සු බල්ලො ගානට මරලා දාද්දි උඹ රැජිණ ගාවට වෙලා හිටගෙන වචනයක්වත් කතා නොකර බලාගෙන හිටියා."

"ඇත්ත. ආයෙමත් එහෙම දෙයක් වුනොත් මම ආයෙමත් එහෙමම කරයි. මට මතක හැටියට ඒ වෙලාවෙ මම නිරායුධයි. මම සන්නාහයක් ඇඳලා හිටියෙත් නෑ. ලැනිස්ටර් සෙබළු මාව වටකරගෙන හිටියෙ." පණ්ඩකයා හිස ඇළ කොට ඔහු දෙස කුතුහලාත්මක බැල්මක් හෙලුවේය. "මම පොඩි කොල්ලෙක් කාලෙ, ඒ කියන්නෙ මාව නපුංසකයෙක් කරන්ට කලින්, මම නාට්‍යකාරයො රංචුවක් එක්ක එකතුවෙලා නිදහස් නගර පුරාවටම ඇවිද්දා. උන්ගෙන් මම ඉගෙනගත්තු දෙයක් තමා නාට්‍ය ලෝකෙදි වගේම ඇත්ත ජීවිතේදීත් අපි හැමෝටම රඟපාන්ට නියමිත චරිතයක් තියෙනවා කියන එක. රාජසභාවෙදිත් ඒක එහෙම්මමයි. රජතුමාගෙ අළුගෝසුවා බිහිසුණු වෙන්ට ඕන. භාණ්ඩාගාරයේ ප්‍රධානියා සකසුරුවම් සහගත වෙන්ට ඕන. රාජ්‍යාරක්ෂක බලකායෙ අණදෙන නිළධාරිතුමා වික්‍රමාන්විත වෙන්ට ඕන... ඒ වගේම රහස් ඔත්තුකාරයින්ගෙ නායකයා කපටි වෙන්ට ඕන. නියාලු වෙන්ට ඕන. කාටවත් එයාව සැකකරන්ට අවස්ථාවක් දෙන්ට හොඳ නෑ. ධෛර්‍යසම්පන්න ඔත්තුකාරයෙක් කියන්නෙ බයගුලු නයිට්වරයෙක් තරම්ම වැඩකට නැති දෙයක්." වයින් සම් මල්ල අතට ගත් ඔහු නැවත ඉන් උගුරක් බීවේය.

නෙඩ් පණ්ඩකයා ගේ මුහුණ පිරික්සා බලන්නට විය. බොරු තුවාල කැළැල් හා බොරු රැවුලට යටින් ඇති සත්‍යය හඳුනාගැනීමට තැත්දැරීය. ඔහු තවත් වයින් උගුරක් පානය කල අතර මෙවර එය පෙරට වඩා පහසුවෙන් උගුරෙන් පහළට ගියේය. "උඹට පුළුවන්ද මාව මේ ආගාධයෙන් නිදහස් කරගන්ට?"

"මට පුළුවන්... ඒ වුනත් මම එහෙම කරයිද? නෑ. කොහොමද එහෙම වුනේ කියලා ප්‍රශ්න අහයි. එතකොට ඒකට ලැබෙන උත්තර කොහාටද එල්ලවෙන්නෙ? මා දිහාට." නෙඩ් මීට වඩා දෙයක් බලාපොරොත්තු නොවීය. "උඹ හරිම අවංකයි."

"නපුංසකයෙකුට ගෞරවය කියලා දෙයක් නෑ. ඒ වගේම රහස් ඔත්තුකාරයෙකුට තමන් දිහාට සැක එල්ලවෙන්ට ඉඩතියන්ට බෑ මගේ උතුමානනි."

"උඹ අඩුම ගානෙ මගේ පණිවුඩයක් අරන් යන්ට එකඟ වෙනවද?"

"ඒක තීරණය වෙන්නෙ යවන පණිවුඩය අනුවයි. මම බොහොම සන්තෝසෙන් ඔබට තීන්තයි කොලයි ගෙනල්ලා දෙන්නම්. ඔබ කැමැති නම්. ඔබ ඔබට උවමනා දේ ලියලා

ඉවරවුනාට පස්සෙ මම ඒ ලියුම අරන් කියවලා බලනවා. ඒක අදාල කෙනාට ගිහින් බාර දෙනවද නැද්ද කියන එක තීරණය වෙන්නෙ ඒක මගේ වැඩේට කොච්චර උදවුවෙනවද කියන එක මතයි."

"උඹේ වැඩේට? මොකක්ද ඒ උඹේ වැඩේ වාරිස් උතුමානනි?"

"සාමය." වාරිස් සැනින් පිළිතුරු දුන්නේය. "රොබර්ට් බරතියන්ව පණපිටින් තියාගන්ට උත්සාහ දරපු එක මිනිහෙක් හරි කින්ග්ස් ලෑන්ඩින්ග්වල හිටියා නම් ඒ මමයි." ඔහු සුසුමක් හෙළීය. "අවුරුදු පහළොවක් පුරාවටම මම එයාව එයාගෙ සතුරන්ගෙන් ආරක්ෂා කලා. ඒ වුනත් මට බැරිවුනා එයාව එයාගෙ මිතුරන්ගෙන් ආරක්ෂා කරගන්ට. ඔබ ජොෆ්රි කුමාරයෙ උපත ගැන ඇත්ත දැනගත්තා කියලා සෙර්සිට ගිහින් කිවුවෙ ඔබේ ඔළුවට මොන අමන මෝඩ පිස්සුවක් ගහලාද?"

"අභයදානය කියන පිස්සුව නිසා." නෙඩ් පිළිගත්තේ ය.

"ආහ්! ඇත්තෙන්ම. ඔබතුමා බොහොම උදාර, අවංක මනුස්සයෙක් එඩාර්ඩ් උතුමානනි. සමහර වෙලාවට මට ඒක අමතක වෙනවා. මගේ මුලු ජීවිත කාලෙදිම ඒ වගේ අය බොහොම ටිකදෙනයි මුනගැහිලා තියෙන්නෙ." ඔහු සිරකුටිය වටා වූ ගල් බිත්ති දෙස බැල්මක් හෙළීය. "අවංකකමයි ගෞරවයයි නිසා ඔබට හම්බවෙලා තියෙන තෑගි දැක්කහම මට හිතාගන්ට පුළුවන් ඇයි ඒ කියලා."

තමාට පිටුපසින් වූ තෙත් ගල් බිත්තියට හිස හේත්තු කරගත් නෙඩ් දෑස පියාගත්තේ ය. ඔහුගේ පාදය වේදනාවෙන් ඇදුම් කමින් තිබින. "රජතුමාගෙ වයින්... උඹ ඒ ගැන ලැන්සල්ගෙන් ප්‍රශ්න කලාද?"

"අපොයි ඔවු. අනිවාර්යයෙන්ම. සෙර්සි තමා එයාට ඒ වයින් මලු දීලා තියෙන්නෙ. දීලා කිවුවලු ඒ තමා රොබර්ට්ගෙ කැමතිම වයින් ජාතිය කියලා." පණ්ඩකයා දෙවුර ඇකිළීය. "දඩයක්කාරයෙක් ගෙවන්නෙ බොහොම උපද්‍රව සහිත ජීවිතයක්. අර වල්ඌරා රොබර්ට්ට වැඩේ දුන්නෙ නැත්තම් ඒක අශ්වයා පිටෙන් වැටීමක් වෙන්ට පුළුවන්. විසකුරු සර්ප දෂ්ටනයක් වෙන්ට පුළුවන්. අහක ගිය ඊයක් වෙන්ට පුළුවන්... වනාන්තරය කියන්නෙ

දෙවිවරුන්ගෙ වධකාගාරය. රොබර්ට්ව මැරුවෙ ඒ වයින් නෙවෙයි. ඔබේ අභයදානය තමා එයාව මරලා දැම්මෙ."

නෙඩ්ද ඒ බව මේ වනවිට වටහාගෙන තිබුනි. "දෙයියො මට සමාව දෙන්ට!"

"දෙවිවරු ඉන්නවා නම්. මම හිතනවා එයාලා ඉන්නවා කියලා. කොහොම වුනත් රැජිණ තව ගොඩක් කල් බලන් ඉන්ට ඉඩක් තිබුනෙ නෑ. රොබර්ට්ව පාලනය කරන එක එන්ට එන්ටම අමාරු වීගෙන ආවා. එයාට ඕන වුනා ඉක්මනටම රොබර්ට්ගෙන් නිදහස් වෙන්ට, මොකද එතකොට එයාට කාලය හම්බවෙනවා රොබර්ට්ගෙ සහෝදරයින්ට වැඩේ දෙන්ට. ඒ දෙන්නා නියමම ජෝඩුවක් තමා. ස්ටැනිසුයි රෙන්ලියි. හරියට යකඩ අත් ආවරණයකුයි සේද අත්වැසුමකුයි වගේ." වාරිස් පිටි අත්ලෙන් සිය මුව පිසදැමීය. "ඔබ මහ මෝඩ විදියට හැසිරුනේ මගේ උතුමානනි. ජොෆ්රිව රජකමට පත්කරමුයි කියලා සුළැඟිල්ලා ඔබට බලකරපු වෙලාවෙ ඔබට තිබුනෙ ඒකට එකඟ වෙන්ට."

"කොහොමද... කොහොමද උඹ ඒ ගැන දන්නෙ?"

වාරිස් සිනාසුනේය. "මම දන්නවා. ඔබට දැනගන්ට අවශ්‍ය එච්චරයි. ඒ වගේම මම දන්නවා හෙට රැජිණ එනවා ඔබව මුනගැහෙන්ට."

නෙඩ් හෙමිහිට සිය දෑස් එසෙවුවේය. "ඇයි?"

"සෙර්සි ඔබ ගැන බයවෙලයි ඉන්නෙ මගේ උතුමානනි... ඒ වුනත් එයාට ඉන්නවා තව හතුරො. එයා උන්ට ඔබට වඩා බයයි. එයාගෙ ආදරණීය ජේමි මේ වෙනකොටත් ගංගා නිම්නයේ වංශාධිපතියොත් එක්ක යුද්ධ කරමිනුයි ඉන්නෙ. ලයිසා ඒරින් සෙබළු වටකරගෙන ඉයරිවලට වෙලා ඉන්නවා. එයායි රැජිණයි අතරෙ තියෙන්නෙ ආදරයක් නෙවෙයි. ඩෝර්න්වල මාර්ටෙල්ලා තාමත් අමතක කරලා නෑ ඊලියා කුමාරියි එයාගෙ දරුවො දෙන්නවයි මරලා දාපු එක ගැන. ඒත් එක්කම, දැන් ඔබේ පුතා බෙල්ලෙන් පහළට ඇවිල්ලා තියෙනවා උතුරු හමුදාවකුත් එක්ක."

"රොබ් තාමත් පොඩි කොල්ලෙක්." නෙඩ් ත්‍රස්ත වෙමින් පැවසීය.

"හමුදාවක් එක්ක ආපු කොල්ලෙක්. ඒ වුනත් ඔබ කියනවා වගේ කොල්ලෙක් තමා. මේ ඔක්කොටම වඩා සෙර්සිට රට නින්ද යන්නෙ නැත්තෙ රොබර්ට්ගෙ සහෝදරයො ගැන කල්පනා වෙද්දියි... විශේෂයෙන්ම ස්ටැනිස් උතුමානන්. රාජධානියට එයාගෙ තියෙන උරුමකම ඇත්තම ඇත්ත එකක්. එයා බලසම්පන්න යුද්ධ අණදෙන නිළධාරියෙක් විදියට නමක් දිනාගෙන ඉන්නෙ. ඒ වගේම එයා කොහෙත්ම සමාවක් දෙන මනුස්සයෙක් නෙවෙයි. සීයට සීයක් සාධාරණ මිනිහෙක් තරම් මේ ලෝකෙ වෙන කිසිම දෙයක් භයානක නෑ. අනික කිසිම කෙනෙක් දන්නෙ නෑ ස්ටැනිස් ඩ්‍රැගන්ස්ටෝන්වලට වෙලා මොකක්ද කරේ කියලා. ඒ වුනත් මම ඔබට කැට තියලා කියන්නම් එයා සිප්පි කටු එකතු කර කර නෙවෙයි හිටියෙ. එයා හොඳ හමුදාවක් එකතු කරලා ඇති. ඉතින්, ඔන්න තියෙනවා සෙර්සිගෙ නපුරු හීනෙ. එයාගෙ තාත්තයි සහෝදරයයි තමන්ගෙ බලය ස්ටාර්ක්ලයි ටලීලයි එක්ක යුද්ධ කරන්ට පාවිච්චි කරද්දි ස්ටැනිස් උතුමානන් මෙහාට ගොඩවදියි. තමන් තමා රජතුමා කියලා නිවේදනය කරයි. එයාගෙ පුතාගෙ ඔළුව රිටක අමුනයි අර ලස්සන රත්තරන් පාට බොකුටු කොණ්ඩෙත් එක්කම. එයාගෙ ඔළුවත් අමුනයි කිසිම සැකයක් නෑ. ඒ වුනත් මම ඇත්තෙන්ම විශ්වාස කරනවා සෙර්සි තමන්ගෙ පුතා ගැන තමා වැඩියෙම්ම වදවෙන්නෙ කියලා."

"ස්ටැනිස් බරතියන් තමා රොබර්ට්ගෙ නියම උරුමක්කාරයා. නීතිය අනුව සිංහාසනේ එයාටයි අයිති වෙන්ට ඕන. මම බොහොම ආසාවෙන් පිළිගන්නවා එයාගෙ නැගීම."

වාරිස් දත් අතරින් ටස්ස් හඬක් නැංවීය. "සෙර්සි කොහෙත්ම කැමැති වෙන එකක් නෑ ඔය වගේ කතා අහන්ට. මම මේ පෙරනිමිත්තක් කියන්නෙ. සමහරවිට ස්ටැනිස් සිංහාසනේ දිනයි. ඒත් ඔබේ ඔය දිව පරෙස්සම් කරගත්තෙ නැත්තම් එයා සිංහාසනේට නගිද්දී ප්‍රීතිඝෝෂා කරන්ට ඉතුරුවෙන්නෙ ඔබේ කුණුවෙන ඔළුගෙඩිය විතරක් වෙන්ට පුළුවන්. සන්සා බොහොම ආදරණීය විදියට ආයාචනා කලා ඔබේ අභයදානය ගැන. ඔබ ඒක පැත්තකට වීසිකරලා දැම්මොත් ඒක බොහොම ලොකු කණගාටුවක් වේවි. ඔබට ඔබේ ජීවිතය ආපහු හම්බවෙයි. හැබැයි ඔබ ඒක ගන්නවානම් විතරයි. සෙර්සි මෝඩයෙක් නෙවෙයි. එයා දන්නවා හීලෑ කරපු වෘකයෙක් කියන්නෙ මැරිච්ච වෘකයෙකුට වඩා බොහොම ප්‍රයෝජනවත් දෙයක් කියලා."

"උඹ කියන්නෙ මගේ රජතුමා මරවපු, මගේ මිනිස්සු මරවපු, මගේ පුතා අබ්බගාතයෙක් කරපු ගැනිට සේවය කරන්ටයි කියලද?" නෙඩ්ගේ ස්වරය අවිශ්වාසයෙන් පිරී තිබින.

"මට ඕන ඔබ මේ රාජධානියට සේවය කරන්ටයි. රැජිණට කියන්ට ඔබ සූදානම් කියලා ඔබේ කුමන්ත්‍රණය ගැන පාපොච්චාරණයක් කරන්ට. ඔබේ පුතාට අණ කරන්ට ආයුධ බිමින් තියන්ටයි කියලා. බිම තියලා ජොෆ්රි තමා නියම උරුමක්කාරයා කියලා පිළිගන්ටයි කියන්ට. ස්ටැනිසුයි රෙන්ලියි කියන්නෙ රාජ්‍යය පැහැරගන්ට එන බොරුකාරයො දෙන්නෙක් කියලා නිවේදනයක් කරන්ට සූදානම් කියලා කියන්ට. අපේ මේ කොළ ඇස් තියෙන සිංහධේනුව දන්නවා ඔබ උදාර මිනිහෙක් කියලා. එයාට ඕන සාමය ඔබ එයාට දෙනවනම්, එයාට ස්ටැනිස් එක්ක හැප්පෙන්ට අවශ්‍ය තරම් කාලයක් ඔබ එයාට දෙනවනම්, එයාගෙ අර රහස ඔබේ මිනීවලට යනකම්ම අරන් යනවා කියලා දිවුරනවානම්, එයා ඔබට සමාවක් දෙයි. මම විශ්වාස කරනවා එයා ඔබට අවස්ථාවක් දෙයි නිශාරැකුමට බැඳිලා ඔබේ ජීවිතේ ඉතුරු කාලෙ ඔබේ සහෝදරයයි අවජාතක පුතායි එක්ක ප්‍රාකාරට වෙලා ගෙවලා දාන්ට."

ජොන් ගැන සිතත්ම නෙඩ්ගේ සිතෙහි ලැජ්ජාවක් ඇති වන්නට විය. එමෙන්ම වදනට නොපෙරලිය හැකි තරමේ කනගාටුවක් ද ඇති වන්නට විය. ඔහුට තව එක් වරක් මේ දරුවා මුනගැසිය හැකි නම්, ඔහුත් සමග වාඩි වී කතා කරන්නට අවස්ථාවක් ලැබේ නම්... ඔහුගේ බිඳුනු පාදය පුරා වේදනාවක් පැතිර යන්නට විය. ඔහු වේදනාවෙන් ඇකිළුනේය, පිළිසරණක් නොමැති අයුරින් අතැඟිලි නමන්නටත් දිග හරින්නටත් වූයේය. "මේ උඹේම සැලැස්මක් ද? එහෙමත් නැත්තම් උඹයි සුළැඟිල්ලයි දෙන්නම එකම පැත්තෙ ද?"

මේ පැනය පණ්ඩකයාව විමතියට පත් කල බවක් පෙනුනි. "ඊට වඩා හොඳයි මම කොහෝර්වල කළු එළුවව කසාද බැඳගන්නවා. සුළැඟිල්ලා තමා මේ රාජධානි සප්තකයේ ඉන්න දෙවැනියට වැඩියෙම්ම වටේ යන මනුස්සයා. මිනිහා කරන්නෙ එකක්, පෙන්නන්නෙ තව දෙයක්. ඇත්ත, මම මිනිහට තෝරගත්ත රහස් කොඳුරනවා තමා. ඒකෙන් මිනිහා හිතනවා මම එයාගෙ පැත්තෙ කියලා... ඒ වගේම මම සෙර්සිට ඉඩ දීලා තියෙනවා මම ඉන්නෙ එයාගෙ පැත්තෙ කියලා විශ්වාස කරන්ට."

"හරියට උඹ මට ඉඩදුන්නා වගේ විශ්වාස කරන්ට උඹ ඉන්නෙ මගේ පැත්තෙ කියලා. මට ඇත්ත කියපන් වාරිස් උතුමානනි. උඹ ඇත්තටම කාටද සේවය කරන්නෙ?"

වාරිස් සිහින් සිනාවක් පෑවේය. "ඇයි. මම සේවය කරන්නෙ රාජධානියට. මගේ හොඳ උතුමානනි, ඔබ කොහොමද කවමදාවත් ඒ ගැන සැකයක් ඇති කරගන්නෙ? මගේ නැතිවෙච්ච පුරුෂ ශක්තියපල්ලා මම දිවුරනවා. මම සේවය කරන්නෙ රාජධානියටයි. ඉතින් මේ රාජධාවනියට දැන් අවශ්‍ය සාමය." අවසාන වයින් උගුර පානය කල ඔහු හිස් සම් මල්ල පසෙකට විසිකලේය. "ඉතින් මොකක්ද ඔබේ උත්තරේ එඩාර්ඩ් උතුමානනි? මට ඔබේ වචනෙ දෙන්ට, හෙට රැජිණ ඔබව මුනගැහෙන්ට ආපුවහම ඔබ කියන්නෙ එයාට අහන්ට උවමනා කරන දේ විතරයි කියලා."

"මම එහෙම කලොත්, ඊටපස්සෙ මගේ වචන නිකංම නිකං හිස් සන්නාහයක් වගේ බොල් දෙයක් වෙනවා. මගේ ජීවිතේ මට එච්චර වටින්නෙ නැහැ."

"කොච්චර කනගාටුවට කාරනයක් ද?" පණ්ඩකයා නැගී සිටියේය. "එතකොට ඔබේ දුවගෙ ජීවිතේ මගේ උතුමානනි? ඒක කොච්චර වටිනවද?"

නෙඩ්ගේ හදවත පුරා සීතලක් දිවයන්නට විය. "මගේ දුව..."

"ඇත්තෙන්ම, ඔබ හිතුවෙ නෑ නේද මට ඔබේ අර ලස්සන, අහිංසක දුව ගැන අමතක වුනයි කියලා? රැජිණට නම් එයාව කොහෙත්ම අමතක වෙලා නෑ."

"නෑ." නෙඩ් බිඳවැටෙන ස්වරයෙන් ආයාචනා කලේය. "වාරිස්. දෙයියො අනුකම්පා කරන්ට. උඹට ඕනම දෙයක් මට කරපන්. ඒ වුනත් උඹේ සැලසුම්වලින් මගේ දුවව අහක් කරපන්. සන්සා තාම පුංචි දරුවෙක්."

"රේනිසුත් පුංචි දරුවෙක්. රේගාර් කුමාරයාගෙ දුව. හරිම අහිංසක, ලස්සන පුංචි කෙල්ලෙක්. ඔබේ දුවලා දෙන්නටම වඩා ලාබාලයි. ඔබ දන්නවද, එයාට හිටියා චූටි කළු පාට පූස් පැටියෙක්. එයා ඌට නම දාලා තිබුනෙ බැලේරියන් කියලා. මම හැමදාමත් කල්පනා කලා මේ පූස් පැටියාට මොකද වුනේ කියලා. රේනිස් හරියට ආසා කලා ඌ තමා අර අතීතෙ හිටිය ඇත්ත බැලේරියන් මකරා කියලා හිතාගෙන සෙල්ලම් කරන්ට. ඒ වුනත්

මම හිතන්නෙ ලැනිස්ටර්ලා එයාට ඉගැන්නුවා මකරෙකුයි පූස් පැටියෙකුයි අතර තියෙන වෙනස මොකක්ද කියලා, උන් එයාගෙ කාමරේ දොර කඩපු දවසෙ." වාරිස් දිගු වෙහෙසකර සුසුමක් හෙලුවේය. එය හරියටම ලෝකයේ ඇති තාක් දුක් වේදනාවන් සියල්ල ගෝනියක බහා තම උර මත පටවාගත්තෙකුගේ දුක් සුසුමක් බඳු විය. "ප්‍රධාන පූජකයා මට එකපාරක් කිවුවා, අපි පවු කරන ගානෙ අපි දුක් විඳිනවා කියලා. ඒක ඇත්තක් නම් එඩාර්ඩ් උතුමානනි, මට කියන්ට... ඇයි හැමවෙලාවෙම අහිංසකයො වැඩිපුරම දුක් විඳින්නෙ? ඔබලා වගේ උසස් උත්තමයො තමන්ගෙ සිහසුන් ක්‍රීඩා කරද්දි ඇයි අහිංසකයොම දුක් විඳින්නෙ? රැජිණ එනකම් බලන් ඉන්න වෙලාවෙ ඔබට පුළුවන් කමක් තියෙනවා නම් පොඩ්ඩක් ඒ ගැනත් හිතලා බලන්ට. පොඩ්ඩක් නෙවෙයි, බොහොම ඕනෑකමින් හිතලා බලන්ට. ඒ වගේම මෙන්න මේ දේ ගැනත් හිතලා බලන්ට. ඊළඟට ඔබව බලන්ට එන අමුත්තා ඔබට කන්ට කියලා පානුයි වීසුයි, ඔබේ වේදනාව අඩුවෙන්ට කියලා පොපි යුෂයි අරන් එයි... එහෙමත් නැත්තම් එයා ඔබට සන්සාගෙ ඔළුව අරන් එයි."

"තීරණය, මගේ ආදරණීය හස්තයේ උතුමානනි, සම්පූර්ණයෙන්ම ඔබේ අතේ තමා තියෙන්නෙ."

**Varys: “Why is it always the innocents who suffer most, when you high lords play your game of thrones?”**

කැට්ලින් **09-1**

ද්විත්ව බලකොටුව

රොබ්ගේ හමුදාව බෙල්ල හා එහි වූ අනන්ත කළු මඩවගුරු පසුකරමින් ඊට එපිටින් වූ ගංගා නිම්නයට කෙමෙන් ඇතුළුවද්දී කැට්ලින්ගේ සිතෙහි වූ බිය එන්ට එන්ටම වැඩි විය. මතුපිටින් නිසල, පරුෂ මුහුණක් මවා පෙන්වමින් සිත තුළ ඇති බිය අන්‍යයන්ගෙන් වසන් කරන්නට ඇයට හැකි වුවද ඒ බිය කිසිවිටෙකත් තුරන් වී නොගියේය. ගෙවන සෑම ලීගයක් පාසාම, පසුකරන සෑම බිම් අඟලක් පාසාම ඒ බිය වැඩි වූවා මිස අඩු නොවීය. ඇගේ දිවා කාලයන් තැවිලි සහගත වූ අතර රාත්‍රී කාලයන් චංචල, නිදි නොමැති ඒවා විය. ඔවුන්ට ඉහළින් පියාඹන කපුටකු දකින වාරයක් පාසා ඇයට දත්මිටි කැවුනේය.

ඇය සිය පියා ගැන බියවූවාය. ඔහුගේ මේ අසුබ නිහඬතාව පිළිබඳව වදවූවාය. ඇය සිය සොයුරා එඩ්මුයර් ගැන බියවූවාය. රජුන් මරන්නා හා යුධ වැදීමට සිදු වුවහොත් ඔහුට දෙවිවරුන් ගේ පිහිටාධාරය ලැබේවායි යාඥා කලාය. ඇය නෙඩ් හා සිය දියණියන් දෙදෙනා ගැන බියවූවාය. එමෙන්ම වින්ටර්ෆෙල්හි හැර දමා ආ ඇගේ ආදරණීය පුතුන් දෙදෙනා ගැන බියවූවාය. එනමුදු මේ කිසිවෙකුත් වෙනුවෙන් ඇයට කල හැක්කක් නොවීය. එබැවින් ඔවුන් ගැන වූ සියළු සිතුවිලි සිය සිතෙන් ඉවත් කර දැමීමට ඇය උත්සාහ කලාය. 'මම මගෙ මුලු ශක්තියම දැන් රොබ් වෙනුවෙන් යොදවන්ට ඕන.' ඇය තමන්ටම කියාගත්තා ය. 'මට උදවු කරන්ට පුළුවන් එකම එක්කෙනා එයයි. ඔබ දැන් උතුර වගේම බිහිසුනු වෙන්ට ඕන, දැඩි වෙන්ට ඕන, කැට්ලින් ටලී. ඔබත් දැන් ඔබේ පුතා වගේ නියම ස්ටාර්ක් කෙනෙක් වෙන්ට ඕන.' ඇගේ සිත ඇයට මොරගැවේය.

මේ හමුදාවේ ඉදිරියෙන්ම, සුළඟේ ලෙලදෙන වින්ටර්ෆෙල්හි ධවල ධජය යට රොබ් ගමන් කලේය. සෑම දිනෙකම තමා හා එක්වන්නැයි ඔහු සිය වංශාධිපතීන් අතරින් කවුරුන් හෝ එක් අයෙකුට ආරාධනා කලේ ගමන අතරතුර සිය සැලසුම් ගැන කතාකරනු පිණිස විය. ඔහු පෙරලා මේ සෑම උතුමෙකුටම ගෞරවාදර දැක්වූ අතර කිසිවෙකුටත් කිසිදු විශේෂත්වයක් නොපෙන්වීය. සිය පියා මේ උතුමන්ට සවන් දුන්නේ යම්සේද ඒ හා සමානවම ඔහු ද ඔවුන්ට සවන් දුන්නේය. මේ සැමෙකෙකුම පැවසූ වදන් පරෙස්සමින් කිරා මැන බලා තමන්ට අවශ්‍ය දේ උකහා ගැනීමට ඔහු නොපසුබට විය. 'එයා නෙඩ්ගෙන් ගොඩාක් දේවල් ඉගෙනගෙන තියෙනවා.' මේ දේවල් දෙස බලමින් කැට්ලින් සිතුවාය. 'ඒ වුනත් එයා ඇති තරමට ඉගෙනගෙන තියෙනවද?'

* * *

තෝරාගත් සෙබළුන් සියයක් හා වේගවත් අසුන් සියයක් සමගින් කළු මාළුවා ප්‍රධාන හමුදාවට පෙරටුව වේගයෙන් ගොස් තිබුනේ ය. ඉදිරියේ ඇති වටපිටාව පිළිබඳ ඔත්තු බැලීම මෙන්ම සතුරු ඔත්තුකරුවන්ගෙන් සිය හමුදාවේ ඉදිරිගමන ආවරණය කිරීම ද ඔවුන් ගේ අරමුණ විය. සෙර් බ්‍රින්ඩන් ගේ මේ මිනිසුන් විසින් රැගෙන එනු ලැබූ ආරංචි ඇගේ සිත අස්වසන්නට කිසිසේත්ම සමත් නොවීය. ටයිවින් උතුමානන් ගේ හමුදාව තවමත් ඔවුන්ට වඩා දින ගනනාවක දුරකින් දකුණුකරයේ විය... එනමුදු පාලමේ උතුමානන් වූ වෝල්ඩර් ෆ්‍රේ විසින් කොළ ගංගාව දෙපස වූ සිය ද්විත්ව බලකොටුවේ සෙබළුන් හාරදහසක හමුදාවක් රැස් කොට තිබින.

"එයා ආයෙමත් ප්‍රමාදයි." මේ පුවත කණ වැකුනු විගස කැට්ලින් මිමිනුවාය. එය හරියටම ගංගා ත්‍රිශූලයේ සටනේදී වූ දේ නැවත වතාවක් සිදුවූවාක් වැන්න. 'මේ මිනිහා යකාටම ගියාවේ!' ඇගේ බාල සොහොයුරා එඩ්මුයර් සිය යටත් වංශාධිපතීන් කැඳවා තිබුනි. නියමය අනුව නම් ෆ්‍රේ උතුමානන් මේ වනවිටත් රිවර්රන්හි රැස්වී සිටින ටලී හමුදාවන්ට එක්වීම පිණිස පිටත්ව ගොස් සිටිය යුතු විය. එනමුදු මේ මිනිසා තවමත් සිය නිවසට වී සිටියි.

"සෙබළු හාරදාහක්!" රොබ් පුනරුච්චාරණය කලේය. ඒ ස්වරයේ තැවරී තිබුනේ කේන්තියකටත් වඩා සැකයක් විය. "ෆ්‍රේ උතුමානන් තනියම ලැනිස්ටර් හමුදාවත් එක්ක සටන් කරන්ට හිතාගෙන ඉන්නවා වෙන්ට බෑ. කිසි සැකයක් නෑ, එයා බලන් ඉන්නවා ඇත්තෙ අපේ හමුදාවත් එක්ක එකතු වෙන්ට වෙන්ට ඇති."

"එහෙමද?" කැට්ලින් ඇසුවාය. ඇය මේ වනවිට සිය අසු ඉදිරියට විහිදා පෙරමුණේ ගමන් ගත් රොබ් සහ අද දින ඔහුගේ ගමන් සගයා වූ රොබර්ට් ග්ලවර් හා එක්ව සිටියාය. හමුදාවේ පෙරටු බලඇණිය ඔවුන්ට පසුපසින් විහිද තිබුනි. එය හරියටම ලන්සධරයින්, ධජධරයින් හා හෙලිධරයින්ගෙන් සැදි වනාන්තරයක් සෙමින් ඉදිරියට ඇදෙන්නාක් මෙන් විය. "මම නම් එකපාරටම එහෙම හිතන්නෙ නෑ. වෝල්ඩර් ෆ්‍රේගෙන් මොකුත් බලාපොරොත්තු වෙන්ට එපා. එතකොට ඔයා කවදාවත් එයාගෙ වැඩ නිසා පුදුම වෙන එකක් නෑ."

"එයා ඔයාගෙ තාත්තාගෙ ධජ දරන්නෙක්!"

සමහර මිනිස්සු තමන්ගෙ දිවුරුම් ගැන අනිත් අයට වඩා බොහොම බැරෑරුම් විදියට හිතනවා රොබ්. වෝල්ඩර් උතුමානන් හැමදාමත් කාර්ස්ටලී රොක් එකත් එක්ක යාළුකමෙන් හිටියා. මගේ තාත්තා කැමැති වුනාටත් වැඩියෙන් යාළුකමක් තිබුනා. එයාගෙ එක පුතෙක් කසාද බැන්දෙ ටයිවින් ලැනිස්ටර්ගෙ සහෝදරියක්ව. ඇත්ත, ඒක මහ ලොකු දෙයක් නෙවෙයි තමා. වෝල්ඩර් උතුමානන් එයාගෙ ජීවිත කාලෙ පුරාවට පුත්තු ගොඩක් හදලා තියෙනවා. ඒ පුත්තු කොහෙන් හරි කසාද බඳින්ට ඕන තමා. ඒ වුනත්..."

"ඔබ හිතන්නෙ එයා අපිව ලැනිස්ටර්ලාට පාවාදෙන්ට හිතාගෙන ඉන්නවයි කියලාද මගේ ආර්යාවනි?" රොබර්ට් ග්ලවර් බැරෑරුම් ස්වරයෙන් ඇසීය. කැට්ලින් සුසුමක් හෙලුවාය. "ඇත්තම කියනවා නම්, මම හිතන්නෙ නෑ ෆ්‍රේ උතුමානන්වත් දන්නවා ඇති කියලා ෆ්‍රේ උතුමානන් මොකක් කරන්ට හිතාගෙන ඉන්නවද කියලා. එයාට තියෙන්නෙ තරුණයෙකුට තියෙන විදියෙ ඉහළ නැගීමේ ආසාවක්. ඒ වගේම නාකි මිනිහෙකුට තියෙන විදියෙ පරෙස්සමක්. ඒ වගේම එයාට කවදාවත් කපටිකමෙන් අඩුවක් වුනේ නෑ."

"අපි ද්විත්ව බලකොටුව කොහොමහරි අපේ යටතට ගන්ට ඕනමයි අම්මා." රොබ් උණුසුම් ස්වරයෙන් කීවේය. "මේ ගඟෙන් එතෙර වෙන්ට වෙන ක්‍රමයක් නෑ. ඔයා දන්නවනෙ ඒක."

"ඔවු, මම දන්නවා. වෝල්ඩර් ෆ්‍රේත් ඒ බව දන්නවා. ඔයාට ඒක නම් විශ්වාසයෙන් කියන්ට පුළුවන්."

* * *

එදින රැයෙහි ඔවුහු වගුරුබිම්වල දකුණු මායිමේ, රජමාවතත් කොළ ගංගාවත් අතර වූ බිමක කඳවුරු බැඳගත්හ. ඇගේ බාප්පාගෙන් නවතම තොරතුරු රැගත් තියන් ග්‍රේජෝයි එහි පැමිණියේය. "සෙර් බ්‍රින්ඩන් ඔබට කියන්ටයි කිවුවා එයාට ලැනිස්ටර්ලාත් එක්ක පොඩි සටනක් කරන්ට වුනයි කියලා. ඔත්තුකාරයො දුසිමක් විතර ආයෙමත් ටයිවින් ලැනිස්ටර් උතුමානන්ට ගතු කියන්ට යන එකක් නෑ." ඔහු විරිත්තුවේය. "උන්ගෙ

ඔත්තුකාරයො මෙහෙයවන්නෙ සෙර් ඇඩම් මාර්බ්‍රෑන්ඩ්. එයා සෙබළුත් එක්ක ආයෙමත් දකුණට පහුබහිනවා. පහුකරන බිම් ගිනි තියනවා. එයා අඩු වැඩි වශයෙන් දන්නවා කොහෙද අපි ඉන්නෙ කියලා. ඒ වුනත් කළු මාළුවා දිවුරනවා අපේ හමුදාව දෙකට බෙදන්නෙ කොයි වෙලාවටද කියන එක එයාට දැනගන්ට ඉඩ තියන්නෙ නැයි කියලා."

"ග්‍රේ උතුමානන් එයාට කිවුවෙ නැත්තම් විතරක්." කැට්ලින් තියුණු ස්වරයෙන් කීවාය. "තියන්, ඔබ ආයෙමත් මගේ බාප්පා මුනගැහෙන්ට ගියාම එයාට මෙන්න මේක කියන්ට. එයාගෙ හොඳම දුනුවායො ටිකක් ද්විත්ව බලකොටුව වටේ දවල් රෑ නැතුව නවත්තලා තියන්ට. මේ බලකොටුවලින් පිටවෙන හැම කපුටෙක්ම විදලා බිම දාන්ටයි කියන්ට. මගේ පුතාගෙ මෙහෙයුම් ගැන කිසිම වචනයක් ටයිවින් උතුමානන්ට නොලැබෙන තැනට වැඩකරන්ටයි මට ඕන."

"සෙර් බ්‍රින්ඩන් දැනටමත් ඒ වැඩේ කරලයි තියෙන්නෙ මගේ ආර්යාවනි." තියන් උඩඟු සිනහවකින් යුතුව පිළිතුරු දුන්නේය. "තව කපුටො දෙතුන් දෙනෙක් බිම දැම්මනම් අපට බ්ලැක්බර්ඩ් පයි එකක් වුනත් හදන්ට පුළුවන් වෙයි. මම උන්ගෙ පිහාටු එකතු කරවලා තියන්නම් ඔබට තොප්පියක් හදාගන්ට."

බ්‍රින්ඩන් කළු මාළුවා හැමවිටම ඇයට වඩා ඉදිරියෙන් සිටින බැව් ඇය දැන සිටිය යුතුව තිබින. "ලැනිස්ටර්ලා තමන්ගෙ ඉඩකඩම් ගිනිතියලා බලකොටු මංකොල්ලා කනකම් ෆ්‍රේලා මොකක්ද කරන්නෙ?"

"සෙර් ඇඩම්ගෙ සෙබළුයි වෝල්ඩර් උතුමානන්ගෙ සෙබළුයි අතරෙ පොඩි පොඩි සටන් කීපයක් ඇතිවුනා. මෙතැන ඉඳන් දවසක්වත් නැති දුරින් අපට හම්බවුනා මැරිච්ච ලැනිස්ටර් ඔත්තුකාරයො දෙන්නෙක්. ෆ්‍රේ සෙබළු උන්ට විදලා මරලා. දැනටමත් කපුටො උන්ගෙ බාගයක් විතර කාලා දාලා. ඒ වුනත් වෝල්ඩර් උතුමානන්ගෙ හමුදාවෙ වැඩිහරිය ද්විත්ව බලකොටුවෙ වාඩිලාගෙනයි ඉන්නෙ."

කිසිදු සැකයකින් තොරව ඒ වෝල්ඩර් ෆ්‍රේ ගේ සලකුණ විය. කැට්ලින්ගේ මුවට අම්හිරි රසයක් දැනෙන්නට විය. හමුදාව රැස්කර පසුපසට වී බලා සිටීම. සිදුවන්නේ කුමක්දැයි නිරීක්ෂණය කිරීම. තමන්ව සටනකට නොපොලොඹවන තාක් කල් කිසිදු අවදානමක් නොගෙන බලා සිටීම. මේ හැමදාමත් වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් ගේ පටිපාටිය විය.

"එයා ලැනිස්ටර්ලාත් එක්ක සටන් කරනවයි කියන්නෙ, සමහරවිට එයා හිතනවා ඇති එයාගෙ දිවුරුම් අනුව වැඩ කරන්ට." රොබ් කීවේය.

කැට්ලින්ට මේ අදහසින් එතරම් රුකුලක් නොලැබුනි. "තමන්ගෙ ඉඩකඩම් ආරක්ෂා කරගන්නවා කියන්නෙ එකක්. ටයිවින් උතුමානන්ට විරුද්ධව ප්‍රසිද්ධියේ යුද්ධෙට යනවා කියන්නෙ තව එකක්."

රොබ් නැවතත් තියන් ග්‍රේජෝයි දෙසට හැරුනි. "කළු මාළුවා හොයාගත්තද කොළ ගංගාවෙන් එතෙර වෙන්ට පුළුවන් වෙන තැනක්?"

තියන් හිස සැලීය. "ගඟ බොහොම ගැඹුරුයි. බොහොම වේගවත්. සෙර් බ්‍රින්ඩන් කියන්නෙ මෙච්චර උතුරෙදි ගඟට බැහැලා එතෙර වෙන්ට කොහොමවත්ම බැහැයි කියලයි."

"මම කොහොමහරි පාලම අල්ලගන්ට ඕන." රොබ් කේන්තියෙන් දුම් දමමින් කීවේය. "මම හිතන්නෙ අපේ අශ්වයින්ට පුළුවන් වෙයි ගඟට බැහැලා පීනලා එතෙර වෙන්ට. ඒ වුනත් සන්නාහ සන්නද්ධ මිනිස්සු උන්ගෙ පිටේ නැගලා ඉන්නකොට ඒ වැඩේ කරන්ට බෑ. අපේ ආයුධ, ශිරස්ක, සන්නාහ, කඩු, හෙලි, ලන්ස අනිත් පැත්තට අරන් යන්ට අපට පහුරු හදාගන්ට වෙයි. ඒ වැඩේ කරන්ට අපට ඇතිතරම් ගස් නෑ. කාලයත් නෑ. ටයිවින් උතුමානන් උතුරට එනවා." ඔහුගේ අත මිට මෙලවුනි.

"අපේ ගමනට එරෙහි වෙන්ට හිතනවා නම් ෆ්‍රේ උතුමානන් මෝඩයෙක් වෙන්ට ඕන." තමාට හුරුපුරුදු ආත්ම විශ්වාසයෙන් යුතුව තියන් ග්‍රේජෝයි කීවේය. "අපට එයාට වඩා පස් ගුණයක් සෙබළු ඉන්නවා. ඔයාට ඕන වුනොත් ඔයාට පුළුවන් ද්විත්ව බලකොටුව යටත් කරගන්ට රොබ්."

"එච්චර ලේසියෙන් ඒක කරන්ට බෑ." කැට්ලින් ඔවුන්ට අනතුරු ඇඟෙවුවාය. "අනික එච්චර ඉක්මනින් කරන්ටත් බෑ. ඔයා බලකොටුව වටලාගෙන ඉන්ට ලෑස්ති වෙන අතරේ ටයිවින් ලැනිස්ටර් එයාගෙ හමුදාව අරන් ඇවිල්ලා ඔයාට පිටිපස්සෙන් පහර දෙයි."

රොබ් මාරුවෙන් මාරුවට ඇගේ හා තියන් ගේ මුහුණු දෙස බැලූයේ පිළිතුරක් බලාපොරොත්තුවෙන් මෙනි. එනමුදු එහි ඔහු බලාපොරොත්තු වූ අන්දමේ පිළිතුරක් නොවීය. එක් මොහොතකට ඔහුගෙන් දිස්වූයේ වසර පහළොවක යෞවනයකුට ද වඩා ලාබාල බවකි. ඔහු පැළැඳි සන්නාහයට හෝ අසිපතට හෝ කම්මුල් වසාගත් රත් පැහැ රැවුල් කොටවලට හෝ ඒ බැව් වසන් කිරීමට නොහැකි විය. "මගේ තාත්තා මොකක් කරාවිද?" ඔහු ඇගෙන් විමසීය.

"එතෙර වෙන්ට ක්‍රමයක් හොයාගන්ට." ඇය පිළිතුරු දුනි. "ඒක මොකක් වුනත් කමක් නෑ."

ඊළඟ උදෑසන සෙර් බ්‍රින්ඩන් ටලී තමා විසින්ම ඔවුන්ව මුනගැසීම පිණිස පැමිණියේය. ඉයරිහිදී වාහල්කඩ නයිට්වරයා වශයෙන් පැළැඳ සිටි බරැති සන්නාහ එලක හා ශිරස්කය ඉවත හල ඔහු ඔත්තුකරුවකුට ගැලපෙන අන්දමේ පදම් කල සම් ආවරණ හා සැහැල්ලු මුදු දම්වැල් සන්නාහ පැළැඳ සිටියේය. එනමුදු ඔහුගේ සළුව උරයට තබා ගැටගැසූ ඔබ්සිඩියන් කළු මාළුවා තවමත් එහි විය.

සිය අසුපිටින් බිමට බසින අතරේ ඔහුගේ මුහුණට බැරෑරුම් බවක් එක්වී තිබින. "රිවර්රන්වල තාප්පවලට එපිටින් යුද්ධයක් වෙලා තියෙනවා. අපි ඒ ගැන දැනගත්තෙ අල්ලාගත්තු ලැනිස්ටර් ඔත්තුකාරයෙක්ගෙනුයි. රජුන් මරන්නා එඩ්මුයර්ගෙ හමුදාව පරද්දලා. ගංගා ත්‍රිශූලයෙ වංශාධිපතියො සී සී කඩ දුවලා."

සීතල දෑතක් විසින් කැට්ලින් ගේ හදවත මිරිකා දැම්මේය. "මගේ මල්ලි?"

"එයාට තුවාල වෙලා. එයාව හිරබාරයට අරන්. බ්ලැක්වුඩ් උතුමානනුයි අනිත් බේරුන අයයි දැන් රිවර්රන් ඇතුළෙ කොටුවෙලා. ජේමිගෙ හමුදාව එයාලාව වටලලයි තියෙන්නෙ."

රොබ්ගේ කේන්තිය ඇවිස්සී ගිය සෙයක් පෙනුනි. "එයාලව කල්වේලා ඇතිව බේරගන්ට නම් අපි කොහොමහරි මේ මලඉලවු ගංගාවෙන් එතෙර වෙන්ට ඕන."

"ඒක එච්චර ලේසි වෙන එකක් නෑ." ඇගේ බාප්පා අනතුරු ඇඟෙවුවේය. "ෆ්‍රේ උතුමානන් එයාගෙ සම්පූර්ණ ශක්තියම බලකොටුව ඇතුළට කැඳවලයි තියෙන්නෙ. එයාගෙ ගේට්ටුත් ඔක්කොම වහලා, අගුළු දාලා."

"මූව යකාටම ගියාදෙන්!" රොබ් දිවුලේය. "මේ නාකි මෝඩයා ඔය තද ගති අඩුකරන් මට ගඟෙන් එතෙරවෙන්ට ඉඩදෙන්නෙ නැත්තම් මට වෙන කරන්ට දෙයක් නෑ එයාගෙ ප්‍රාකාරවලට පහර දෙනවා ඇරෙන්ට. ඕනවුනොත් මම මිනිහගෙ ඇස් දෙක ඉස්සරහාම එයාගෙ ද්විත්ව බලකොටුව බිම දානවා. අපි බලමු මිනිහා කොච්චර ඒකට කැමැති වෙයිද කියලා."

"ඔයා කතාකරන්නෙ හරියට බුම්මන් ඉන්න පොඩි කොල්ලෙක් වගේ රොබ්." කැට්ලින් තියුණු හඬින් කීවාය. "පුංචි ළමයෙක් මොකක් හරි බාධකයක් දැක්කහම එයාගෙ හිතට එන මුල්ම සිතුවිල්ල වෙන්නෙ ඒක වටේ යන එක. නැත්තම් ඒක පෙරලලා දාන එක.වංශාධිපතියෙක් වුනාම ඉගෙනගන්ට ඕන සමහර වෙලාවට කඩුවලට කරන්ට බැරි දේවල් වචනවලට කරන්ට පුළුවන් කියලා."

මේ තරවටුව නිසා රොබ්ගේ මුහුණ රත් පැහැ ගැන්වී ගියේය. "ඔයා මොකක්ද අදහස් කරන්නෙ කියලා මට කියන්ට අම්මා." ඔහු යටත් ස්වරයෙන් ඇසුවේය.

"ෆ්‍රේලා මේ පාලම පාලනය කරනවා දැන් අවුරුදු හයසීයක් තිස්සෙ. මේ අවුරුදු හයසීය තිස්සෙම තමන්ට අයවෙන්ට ඕන රේන්ද බද්ද අය කරගන්ට එයාලා අසමත් වෙලා නෑ."

"මොන රේන්ද බද්දක් ද? එයාට මොනවද ඕන?"

ඇය සිනාසුනාය. "ඒක තමා අපි හොයාගන්ට ඕන."

"ඉතින්, එයාගෙ මේ රේන්ද බද්ද ගෙවන්ට මම කැමැති වුනේ නැත්තම් මොකද කරන්නෙ?"

"එහෙමනම් ඔයා ආපහු මෝට් කේය්ලින්වලටම පහුබහින එක හොඳයි. පහුබැහැලා ටයිවින් උතුමානන් එක්ක සටන් කරන්ට ලැස්තිවෙන්ට... එහෙමත් නැත්තම් පියාපත් දෙකක් වවාගන්ට. මටනම් වෙන විකල්පයක් පේන්නෙ නෑ." තමා පැවසූ වදන් ගැන සිත යොමන්නට සිය පුත්‍රයාට අවස්ථාව ලබා දෙනු වස් අසුට සන් කල කැට්ලින් ඉවත ගියාය. සිය මව විසින් තමන්ට හිමි ස්ථානය පැහැරගත්තාය යන හැඟීම ඔහුගේ සිතේ ඇතිවනු වැළැක්වීමට එය සමත් නොවීය. 'ඔයා එයාට ශූරවීරකම වගේම ප්‍රඥාවත් ඉගැන්නුවා ද නෙඩ්?' ඇය මවිතයෙන් කල්පනා කලාය. 'ඔයා එයාට ඉගැන්නුවා ද කොහොමද දණ නමන්නෙ කියලා?' මේ පාඩම කිසිදා නූගත් නිර්භීත මිනිසුන්ගෙන් රාජධානි සප්තකයේ සොහොන් බිම් පිරී පවතී.

* * *

පාලමේ උතුමන් විසින් සිය බලවසම කොටගත් ද්විත්ව බලකොටුව පෙනෙන මානයට ඔවුන්ගේ පෙරටු බලඇණිය පැමිණෙන විට එදින මධ්‍යාහ්නය ළඟා වී තිබුනි.

මේ අඩවියේදී කොළ ගංගාව ගැඹුරු එමෙන්ම වේගවත් දිය පහරක් විය. එනමුදු සියවස් ගනනාවකට පෙරාතුව මේ ගංගාවේ ඉවුරු දෙක හා කල ෆ්‍රේවරු ගංගාවෙන් එතෙරවීම පිණිස මිනිසුන් විසින් ගෙවූ තොටුපළ රේන්ද බද්ද අයකරගනිමින් කෙමෙන් ධනවත් වන්නට වූහ. ඔවුන් විසින් ගොඩනැගූ පාලම සිනිඳු අළු පැහැ ගලින් නිමවූ දැවැන්ත ආරුක්කුවක් විය. එය කරත්ත දෙකකට එකවර මාරුවිය හැකි තරම් පුළුල් විය. පාලම මැද්දේ උස්ව නැගුනු දිය කුළුණ විසින් එහි වූ කටුපැලැලි, ඊ විදින සිදුරු හා මුර අට්ටාල මගින් පාලමත් ගංගාවත් දෙකම පාලනය කෙරුනි. මේ පාලම ගොඩනංවා නිමකරන්නට ෆ්‍රේවරුන්ට පරම්පරා තුනක් ගතවී තිබින. එය නිමවනවාත් සමගින්ම ඔවුහු ඉවුරු දෙකෙහිම ශක්තිමත් ලී බලකොටු දෙකක් ඉදිකලේ ඔවුන් ගේ අවසරයකින් තොරව කිසිවෙකුටත් පාලමෙන් එතෙර විය නොහැකි වනු පිණිසය.

වැඩි කල් යන්නට මත්තෙන් මේ ලී බලකොටු ඉවත්ව ඒ වෙනුවට ගලින් කල බලකොටු දෙකක් එතැනට පැමිණියේය. ද්විත්ව බලකොටුව නම් වූ මේවා මිටි, මහත, අවලක්ෂණ එනමුදු ශක්තිමත්, සෑම අතින්ම එක හා සමාන බලකොටු යුගලයක් විය. මේ බලකොටු යුගලත් ඒ අතරමැදින් වැටුනු පාලමත් විසින් අවට ප්‍රදේශය සියවස් ගනනාවක් තිස්සේ

පාලනය කරන්නට යෙදුනි. උසැති ශෛලමය ප්‍රාකාරත්, ගැඹුරු දිය අගලුත්, යකඩින් සවිමත් කල දැවැන්ත ඕක් දොරවලුත් විසින් පාලමේ පිවිසුම ආරක්ෂා කරන ලදී. මේ බලකොටු තුළ පිහිටි සවිමත් ඇතුළු බලකොටුවක සිට පාලමේ පාදම් ඇරඹුනු අතර ඒවා මුරකපොලු හා කටු පැලැලි මගින් සවිමත් කෙරුනි. මේ සැමටම අමතරව පාලමේ මැද පිහිටි දිය කුළුණ මගින් අවට සම්පූර්ණ ගමනාගමනයම පාලනය කෙරුනි.

මේ බලකොටුවට එල්ල කරන ප්‍රහාරයකින් එය යටපත් කරගත නොහැකි බව ඒ දෙස හෙලූ එක් බැල්මකින්ම කැට්ලින් වටහාගත්තා ය. මුරකපොලු හෙලිධරයින්, අසිපත්ධරයින් හා ඊ විදින ගෝනුසු යන්ත්‍ර විසින් ගැවසීගත්තේ ය. සැම කපොල්ලක්ම, සැම විවරයක්ම දුනුවායින්ගෙන් සෙවුනේ විය. දියඅගලට ඉහළින් වූ පාලම උඩට ඔසවා තිබුනු අතර කටු පැලැලි පහත දමා තිබුනි. ගේට්ටු වසා අගුළු දමා තිබුනි.

තමන් අබියස ඇත්තේ කවර අන්දමේ බාධකයක්දැයි දුටු මොහොතේ පටන් ග්‍රේට්ජොන් දිවුරන්නටත් සාපකරන්නටත් පටන්ගත්තේ ය. රිකාර්ඩ් කාර්ස්ටාර්ක් උතුමානන් නිහඬව එනමුදු තරහෙන් පිපිරෙමින් බලා සිටින්නට විය. "මගේ උතුමනි, මේකට නම් පහර දෙන්ට බෑ." රූස් බෝල්ටන් නිවේදනය කලේය.

"අපට ඒක වටලන්ට පුළුවන් කමක් ඇත්තෙත් නෑ. එහා ඉවුරෙ බලකොටුව වටලන්ට හමුදාවක් නැතුව එහෙම කරන එකෙන් පලක් නෑ." හෙල්මන් ටෝල්හාර්ට් දොම්නස් ස්වරයෙන් කීවේය. වේගයෙන් ගලන කොළ පැහැ ගැඹුරු දියට එපිටින් බටහිර ඉවුරේ බලකොටුව සිය නැගෙනහිර ඉවුරේ සොහොයුරා මෙන්ම උත්තුංගව නැගී සිටියේය. "ඒ අපට ඇතිතරම් කාලය තිබුනත්. කොහොමත් අපට ඇතිතරම් කාලයක් නෑ."

උතුරුදිග වංශාධිපතීන් මෙලෙස බලකොටුව අධ්‍යයනය කරමින් සිටින අතරතුරේදී බලකොටුවෙහි වූ කුරුබිලියක් විවර වුනි. දියඅගලට ඉහළින් කුඩා ලෑලි පාලමක් පහත්කෙරුනු අතර නයිට්වරුන් දුසිමක් මේ අමුත්තන් හමුවීම පිණිස පෙරට ආවෝය. වෝල්ඩර් උතුමානන් ගේ අප්‍රමාණ පුතුන් අතරින් සිවුදෙනෙක් මේ පිරිසේ පෙරමුණ ගත්හ. ඔවුන්ගේ සලකුන වන ලා රිදී-අළු පැහැ පසුබිමේ වූ තද නිල් පැහැ ද්විත්ව බලකොටුව සහිත ධජය මඳ සුළඟේ ලෙලදෙන්නට විය. වෝල්ඩර් උතුමානන් ගේ උරුමක්කරු වන සෙර් ස්ටෙව්රන් ෆ්‍රේ ඔවුන් වෙනුවෙන් කතාකරන්නට පටන්ගත්තේ ය. ෆ්‍රේවරුන් සැමදෙනාම වාගේ මුගටි පෙනුමක් ඇත්තවුන් වූහ. වසර හැටකටත් වඩා වයස් වූ, තමන්ගේම මුනුබුරන් පවා ඇති සෙර් ස්ටෙව්රන් වෙසෙසින්ම මහලු, වෙහෙසට පත්වූ

මුගටියකු ගේ පෙනුම පෑවේය. එනමුදු ඔහු ආචාරශීලී විය. "මගේ වංශාධිපති තාත්තා මාව මෙතැනට එවුවෙ ඔබලාට ආයුබෝවන් කියන්ටයි. ඒත් එක්කම අපට දැනගන්ට ඕන කවුද මේ හමුදාවට අණදෙන්නෙ කියලා."

"මමයි." සිය අසුට සන් කල රොබ් පෙරට ආයේය. ඔහු සිය සන්නාහයෙන් සැරසී සිටි අතර අසුගේ සෑදලය පසෙකින් වින්ටර්ෆෙල්හි සෝරවෘක සලකුණ සහිත පලිහ එල්ලා තිබින. ග්‍රේවින්ඩ් අසුට සමගාමීව ඉදිරියට පිය මැන්නේය.

මහලු නයිට්වරයා සිය දියාරු අළුරු දෑසින් ඇගේ පුත්‍රයා දෙස බැලූ අතර ඒ දෑසේ යම් විමතියක් සටහන්ව තිබුනි. ඔහුගේ අශ්වයා නොසන්සුන් අයුරින් හේෂාරවය කරමින් සෝරවෘකයාගෙන් මෑත්වන්නට විය. "ඔබතුමා අපේ බලකොටුවට ඇවිල්ලා මගේ තාත්තත් එක්ක කෑමබීම අරන් ඔබතුමා මේ හමුදාවත් එක්ක මෙහෙ මොකද කරන්නෙ කියලා පැහැදිලි කරනවා නම් ඒක අපට ලොකු ගෞරවයක්."

ඔහුගේ මේ වදන් කැටපෝලයකින් විදුනු දැවැන්ත ගලක් මෙන් රොබ්ගේ වංශාධිපතීන් අතරට තදින් කඩා වැදුනේය. කිසිවෙකුත් මේ අදහසට එකඟ වූ බවක් නොපෙනින. ඔවුහු අවලාද නගන්නටත්, වාද කරන්නටත්, එකිනෙකා නොපරයන තරම් මහ හඬින් එකවර කතාකරන්නටත් වූහ.

"ඔබ මේක කරන්ට සුදුසු නෑ මගේ උතුමානනි." ගැල්බට් ග්ලවර් රොබ්ට ආයාචනා කලේය. "වෝල්ඩර් උතුමානන් කියන්නෙ විශ්වාස කරන්ට පුළුවන් මිනිහෙක් නෙවෙයි."

රූස් බෝල්ටන් අනුකූලතාව හඟවන අන්දමින් හිස වැනීය. "ඔබ ඒක ඇතුළට තනියම ගියා කියන්නෙ ඔබ එයාගෙයි. එයාට පුළුවන් එයා කැමැති හැටියකට ඔබව ලැනිස්ටර්ලාට විකුණන්ට, ඔබව හිරකුටියකට දාන්ට, එහෙමත් නැත්තම් ඔබේ බෙල්ල කපලා දාන්ට."

"එයාට ඕන නම් අපට කතා කරන්ට එයාට කියන්ට ගේට්ටු අරින්ට කියලා. එතකොට අපි ඔක්කොටම පුළුවන් එයාත් එක්ක කෑමබීම ගන්ට." සෙර් වෙන්ඩල් මැන්ඩර්ලි නිවේදනය කලේය.

"එහෙමත් නැත්තම් එයාට එළියට ඇවිල්ලා මෙතන රොබ් එක්ක සංග්‍රහ විඳින්ට කියන්ට. එතකොට එයාගෙ මිනිස්සුයි අපේ මිනිස්සුයි දෙගොල්ලන්ටම පේනවා." ඔහුගේ සොහොයුරා සෙර් විලිස් කීවේය.

මේ වංශාධිපතීන් ගේ සෑම සැකයක්ම, සෑම දෙගිඩියාවක්ම එලෙසින්ම කැට්ලින් ගේ සිතේද ඇතිවී තිබුනි. එනමුදු සෙර් ස්ටෙව්රන් දෙස හෙලූ එක් බැල්මකින්ම තමාට මේ අසන්නට ලැබෙන දේ කෙරෙහි ඔහුගේ කිසිදු පැහැදීමක් නොමැති බැව් පෙනී ගියේය. තව දුරටත් අනවශ්‍ය වදන් හුවමාරුවකට ඉඩදුනහොත් අත පත් අවස්ථාව මඟ හැරී යනු නිසැකය. ඇය සැනින් ක්‍රියාශීලී වීම අත්‍යවශ්‍යය. "මම යන්නම්." ඇය මහ හඬින් කීවාය.

"ඔබ, මගේ ආර්යාවනි?" ග්‍රේට්ජොන් බැම ඇකිළීය.

"අම්මා! ඔයාට හොඳටම විශ්වාස ද?" රොබ්ගේ වදන්වල කිසිදු විශ්වාසයක් නොවීය.

"හොඳටම විශ්වාසයි." කැට්ලින් මුබරි අන්දමින් බොරුවක් කීවාය. "වෝල්ඩර් උතුමානන් කියන්නෙ මගේ තාත්තගෙ ධජ දරන යටත් වංශාධිපතියෙක්. මම පුංචි කෙල්ලක් කාලෙ ඉඳන්ම එයාව දන්නවා. එයා කවදාවත් මට හානියක් කරන එකක් නැහැ." 'ඒකෙන් එයාට ලාබයක් වෙන්නෙ නැත්තම්.' ඇය නිහඬවම එයට එකතු කලාය. එනමුදු සමහර සත්‍යයන් නොපවසා සිටීම වඩා හොඳ වන අතර සමහරවිට බොරු කීමද උවමනා වනු ඇත.

"මට හොඳටම විශ්වාසයි මගේ තාත්තා බොහොම සතුටු වෙයි කැට්ලින් ආර්යාවට කතා කරන්ට ලැබෙන එක ගැන." සෙර් ස්ටෙව්රන් කීවේය. "අපේ මොකුත් පහත් යටි අරමුණු නෑ කියන එක ඔප්පු කරන්ට මගේ මල්ලි සෙර් පර්වින් මෙතන නවත්තලා යන්නම් ඇය ආරක්ෂිතව ආපහු ඔබලා අතරට එනකම්..."

"එයා අපේ ගෞරවනීය ආගන්තුකයෙක් වෙයි." රොබ් කීවේය. එතැන සිටි ෆ්‍රේවරුන් අතරින් ලාබාලතමයා වූ සෙර් පර්වින් අසුපිටින් බැස තෝන්ලණුව සිය සොයුරෙකුට භාරදුන්නේය. "අද හැන්දෑවෙනකොට මගේ අම්මා ආපහු මෙහාට එන්ට අවශ්‍යයි සෙර් ස්ටෙව්රන්." රොබ් නිවේදනය කලේය. "මෙතැන තාවර වෙවී ඉන්ට මගේ කිසිම අදහසක් නෑ."

සෙර් ස්ටෙව්රන් ෆ්‍රේ ආචාරශීලී අයුරින් හිස වැනීය. "ඔබතුමා කියන විදියක් මගේ උතුමානනි." අසුට සන්කල කැට්ලින් පසුපස නොබලාම ඉදිරියට ගියාය. වෝල්ඩර් උතුමානන් ගේ පුතුන් හා අනිකුත් පරිවාර සෙබළු ඈ පසුපසින් වැටුනෝය.

**Walder Frey: “All those who did go south are running north again.”**

කැට්ලින් ගේ පියා වරක් වෝල්ඩර් ෆ්‍රේ ගැන කියා තිබුනු අන්දමට නම් මේ රාජධානි සප්තකය පුරාවටම නිසැක වශයෙන්ම තමාගේම යැයි කිවහැකි හමුදාවක් සන්තකව තිබුනු එකම පුද්ගලයා ඔහු විය. සිය නැගෙනහිර කුළුණේ වූ ප්‍රධාන ශාලාවේදී පාලමේ අධිපතියා විසින් ඇයව පිළිගන්නට යෙදුනු විට පියා පැවසූයේ කුමක්දැයි ඇයට මනාව වැටහී ගියේය. පුතුන් විසිදෙනෙක් (මියගිය පුතුන් හා විසිඑක්වැන්නා වන සෙර් පර්වින් හැරුනු විට), මුනුබුරන් තිස්හයදෙනෙක්, මී-මුනුබුරන් දහනවදෙනෙක් හා අනන්ත ප්‍රමාණයක් වූ දියණියන්, මිනිබිරියන්, අවජාතකයින් හා අවජාතක මුනුබුරන් විසින් කැට්ලින්ව පිළිගන්නට යෙදුනි.

වෝල්ඩර් උතුමානන් වනාහී අනූවන වියෙහි වූ, ලප වැටුනු තට්ට හිසකින් යුතු, මහලුව ජරාවට ගිය, රෝස පැහැ මුගටියකු විය. මේ සැමටම අමතරව ඔහු නැගිට සිටින්නට නොහැකි තරම් වාතරක්තියෙන් පෙලෙන්නෙකු ද විය. සේවකයින් විසින් ඔහුගේ දෝලාව ඔසවාගෙන පැමිණෙද්දී ඔහුගේ නවතම බිරිය වන දහසයවන වියෙහි වූ, සුදුමැලි, කෙට්ටු තරුණිය ඒ පසෙකින් ඇවිද ආවාය. ඇය වනාහී අටවන ෆ්‍රේ ආර්යාව වූවාය.

"මෙච්චර කාලෙකට පස්සෙ ඔබව ආයෙමත් දකින්ට ලැබුන එක බොහොම ලොකු සතුටක් මගේ උතුමානනි." කැට්ලින් කීවාය.

මහලු මිනිසා සිය වපරැසින් ඇය දෙස සැකමුසු බැල්මක් හෙලුවේය. "එහෙමද? මට ඒක සැකයි. ඔය ලස්සන වචන ඔබ ගාවම තියාගන්ට කැට්ලින් ආර්යාවනි. ඒවට මම නාකි

වැඩියි. ඔබ මොනාද මෙහෙ කරන්නෙ? ඇයි ඔබේ කොල්ලා මෙහාට එන්ට බැරි තරම් ආඩම්බර වැඩිද? ඔබත් එක්ක මම මොකක් කරන්ට ද?"

අවසන් වරට ද්විත්ව බලකොටුවට පැමිණෙද්දී කැට්ලින් කුඩා දැරියක වූවාය. එනමුදු ඒ කාලයේ පවා වෝල්ඩර් උතුමානන් වනාහි ඉක්මනින් කිපෙන, කටට එන දේ කියන, කිසිදු චාරිත්‍රයක් නොහඳුනන්නකු විය. පෙනෙන අන්දමට නම් මහලු වයස විසින් මේ ගතිපැවතුම් පෙරටත් වඩා නරක අතට හරවා තිබුනි. ඇය ප්‍රවේශමෙන් සිය වදන් තෝරාගත යුතුවිය. එමෙන්ම ඔහුව තරහ නොගැස්සවීමට ද වගබලාගත යුතු විය.

"තාත්තා." සෙර් ස්ටෙව්රන් අවලාදාත්මක ස්වරයෙන් කතාකලේය. "ඔබට අමතක වෙලා හැඩයි. ස්ටාර්ක් ආර්යාව මෙහාට ඇවිල්ලා ඉන්නෙ ඔබේම ආරාධනාවක් උඩයි."

"මම උඹෙන් ඇහුවද? උඹ තාමත් ෆ්‍රේ උතුමානන් නෙවෙයි. මම මැරෙනකම් ඒක එහෙම නෙවෙයි. උඹට පේන්නෙ මම මැරිලා වගේද? මට උඹෙන් කිසිම උපදෙසක් ඕන නෑ."

"අපේ මේ ගෞරවනීය ආගන්තුකයා ඉස්සරහා ඔහොම කතාකරන එක හොඳ නෑ තාත්තා." ඔහුගේ තරුණ පුතෙක් මෙවිට කතා කලේය.

"ඒ ගමන මගේ අවජාතකයොත් මට උපදෙස් දෙන්ට එනවා ආචාරශීලීත්වය ගැන." මහල්ලා පැමිණිලි ස්වරයෙන් කීය. "මට කැමැති විදියකට මම කතා කරනවා. උඹලා යකාටම ගියාවෙ! මගේ ජීවිත කාලෙ ඇතුළෙ මම මේ වහල යට රජවරු තුන්දෙනෙකුට ආගන්තුක සත්කාර කරලා තියෙනවා. උඹ හිතනවද මට උඹලා වගේ එවුන්ගෙන් ඒ ගැන උපදෙස් ගන්ට ඕනයි කියලා රිගර්? උඹේ අම්මව මම ඇඳට ගන්නකොට ඒකි එළුවන්ගෙන් කිරි දොවන කෙල්ලක්." අසුරු ගැසීමකින් මේ රත් පැහැ ගත් මුහුණින් යුතු තරුණයා ඉවත හල ඔහු වෙනත් පුතුන් දෙදෙනෙකුට සන් කලේය. "ඩැන්වෙල්, වේලන්, මට මේ පුටුවට නගින්ට උදවු වෙයල්ලා."

වෝල්ඩර් උතුමානන්ව සිය දෝලාවෙන් පිටතට ගත් ඔවුහු ඔහුව ෆ්‍රේවරුන් ගේ උස් ආසනය වෙත කැඳවාගෙන ගියහ. එය කළු පැහැ ඕක් ලීයෙන් නිමකල උස් අසුනක් වූ අතර එහි පිටුපස ඇන්ද පාලමකින් එකට සම්බන්ධ වූ ද්විත්ව බලකොටුවක හැඩයට

කැටයම් කර තිබුනි. ඔහුගේ තරුණ බිරිය බයාදු ලෙස ඉදිරියට ගොස් ඔහුගේ දෙපා පොරෝණයකින් වසා දැමුවාය. අසුනේ හරිබරි ගැසුනු පසු කැට්ලින්ට ඉදිරියට එන්නැයි අතින් සන් කල මහල්ලා ඇගේ සුරත මත වියළි හාදුවක් තබමින් ඇයව පිළිගත්තේ ය. "ඔන්න හරි. දැන් මම ඔබව නියම චාරිත්‍රානුකූලව පිළිගත්තාට පස්සෙවත් මගේ ආර්යාවනි, මගේ පුත්තු උන්ගෙ ඔලමොල කටවල් වහගෙන ඉදියි කියලා මම හිතනවා. ඇයි ඔබ මෙහෙ ආවෙ?"

"ඔබේ ගේට්ටු විවෘත කරන්ටයි කියලා අහන්ටයි මගේ උතුමානනි.." කැට්ලින් ආචාරශීලී අයුරින් පිළිතුරු දුන්නාය. "මගේ පුතයි, එයාගෙ යටත් වංශාධිපතියොයි බොහොම උනන්දුවෙන් බලන් ඉන්නවා පාලමෙන් එගොඩවෙලා එයාලගෙ ගමන යන්ට."

"රිවර්රන්වලට වෙන්ටැති." ඔහු අවඥාවෙන් මෙන් හිකි හිකි ගා සිනාසුනේය. "ආහ්! මට කියන්ට ඕන නෑ. කියන්ට ඕන නෑ. මම තාම අන්ධ වෙලා නෑ. මේ නාකියාට තාමත් පුළුවන් සිතියමක් කියවන්ට."

"රිවර්රන්වලට තමා." කැට්ලින් තහවුරු කලාය. එය ප්‍රතික්ෂේප කිරීමේ කිසිදු අවැසිතාවක් ඇයට නොපෙනුනි. "ඔබත් එහෙ ඇතියි කියලයි මම බලාපොරොත්තු වුනේ මගේ උතුමානනි. ඔබ තාමත් මගේ තාත්තගෙ යටත් වංශාධිපතියෙක්. එහෙම නේද?"

"හෙහ්!" වෝල්ඩර් උතුමානන් ගේ මුවින් පිටවින. එය සිනහවක් හා නොරිස්සුමින් කල ගෙරවීමක් අතරමැදි දෙයක් විය. "මම මගේ සෙබළු රැස් කලා. ඔවු මම එහෙම කලා. උන් මෙහෙ ඉන්නවා. ඔබ දැක්කා උන් පවුර දිගටම ඉන්නවා. මගේ මුලු ශක්තියම එක්කහු වුනාට පස්සෙ එහාට යන්ටයි මම සූදානම් වෙලා හිටියෙ. ඇත්තම කියනවා නම්, මගේ පුතාලා යවන්ට. මම අශ්වයො පිටේ ගිය කාලෙ ඉවරයි කැට්ලින් ආර්යාවනි." තම මතය තහවුරු කරන්නට මෙන් වටපිට බැලූ ඔහු උසැති, කුදු ගැසුනු, පනස් වියැති මිනිසකු ඇමතීය. "එයාට කියහන් ජැරඩ්. එයාට කියහන් ඒක තමා මම කරන්ට බලාපොරොත්තු වෙලා හිටියෙ කියලා."

"ඒක ඇත්ත මගේ ආර්යාවනි." ඔහුගේ දෙවන බිරිඳගෙන් ලද පුතෙකු වූ සෙර් ජැරඩ් ෆ්‍රේ කීවේය. "මම මගේ ගෞරවයේ නාමයෙන් දිවුරන්නම්."

"අපි හමුදාවත් අරන් එහාට යන්ට කලින් ඔබේ මෝඩ මල්ලි යුද්ධෙන් පැරදුන එක මගේ වැරැද්දක් ද?" සිය අසුනේ පිටුපසට ඇලවුනු ඔහු ඇය දෙස තරහින් රවා බැලීය. එය හරියටම සිදුවූයේ මේ යැයි ඔහු පවසන දේ ගැන වාදයට එන්නැයි ඇයට අභියෝග කරන්නාක් බඳු විය. "මට අහන්ට ලැබුනා රජුන් මරන්නා එයාගෙ හමුදාව හරහා ගියේ හරියට පොරවක් චීස් කපාගෙන යනවා වගේ කියලා. මොකටද මගේ කොල්ලො ඉක්මනින් දකුණට යන්නෙ, නිකන් මැරෙන්ට ද? දකුණට ගිය එවුවො හැමෝම දැන් ආපහු උතුරට දුවගෙන එනවා."

මේ නාකි පොරකුකුළා හමගසා ගිනි උඳුනක ලා පලහන්නට ලැබුනි නම් කැට්ලින් එය සතුටින් භාරගන්නවා නිසැක විය. එනමුදු මේ පාලම විවර කරගන්නට ඇයට කාලය ඇත්තේ අද සන්ධ්‍යාව වනතෙක් පමණි. එබැවින් ඇය සන්සුන් ස්වරයෙන් මෙසේ කීවාය. "ඒ නිසාම තමා අපි ඉක්මනින්ම රිවර්රන්වලට යන්ට ඕන. අපට කතා කරන්ට කොහාටද යන්ට පුළුවන් මගේ උතුමානනි?"

"අපි දැනුත් කතා කරනවානේ." ෆ්‍රේ උතුමානන් චෝදනාත්මක ස්වරයෙන් කීය. ලප වැටුනු රෝස පැහැ තට්ට ගෙඩිය දසත හැරවුනි. "බොලා මොනා දිහාද කට ඇරන් බලන් ඉන්නෙ?" ඔහු සිය පවුලේ අයට සැර කලේය. "මෙතැනින් අහකට පලයල්ලා. ස්ටාර්ක් ආර්යාවට මගෙත් එක්ක පුද්ගලිකව කතා කරන්ට ඕනලු. සමහරවිට එයාට මගෙ විශ්වාසය ගැන ප්‍රශ්න කරන්ට ඕන වෙලා ඇති. හෙහ්. පලයල්ලා. උඹලා හැමෝම. ගිහිල්ලා කරන්ට වැඩක් ඇති වැඩක් හොයාගනිල්ලා. ඔවු ඔවු, උඹලාත්. ගෑනු ඔක්කෝමලත්. පලයල්ලා. දුවපල්ලා. දුවපල්ලා." ඔහුගේ පුතුන් ද, මුනුබුරන් ද, දියණිවරුන් ද, අවජාතකයින් ද, ලේලිවරුන් හා බෑණාවරුන් ද එක පොදියට ශාලාවෙන් පිටවෙද්දී ඔහු කැට්ලින් දෙසට නැඹුරු විය. "උන් හැමෝම බලන් ඉන්නෙ මම මැරෙනකම්. ස්ටෙව්රන් දැන් අවුරුදු හතලිහක් තිස්සෙ බලන් ඉන්නවා. ඒ වුනත් මට තාමත් පුළුවන් වෙලා තියෙනවා මිනිහගෙ බලාපොරොත්තු බිඳලා දාන්ට. හෙහ්! මම මොකටද මැරෙන්නෙ ඌට නිකංම උතුමානන් කෙනෙක් වෙන්ට ඉඩ ඇරලා? මම ඔබෙන් අහන්නෙ. මම ඒ වැඩේ කරන්නෙ නෑ."

"මම හොඳටම විශ්වාසයි ඔබ අවුරුදු සීයක් ජීවත් වෙයි කියලා."

"උන්ගෙ ඇඟේ මාළු නටයි නේද? ඒක නම් හොඳටම විශ්වාසයි. හොඳයි. දැන් ඔබට මොනාද කියන්ට තියෙන්නෙ?"

"අපට පාලමෙන් එගොඩ වෙන්ට ඕන."

"ආහ්! ඇත්තට? ඒක හරි මොට්ට කතාවක්නෙ. මම මොකටද ඔබලාට එගොඩ වෙන්ට දෙන්නෙ?"

එක් මොහොතකට ඇගේ වියරුව උතුරා ගියේය. "ඔබේ මුරකපොලුවලට ගිහින් හිටගෙන බලන්ට තරම් ඔබ ශක්තිමත් නම් ෆ්‍රේ උතුමානනි, ඔබට දකින්ට පුළුවන් වෙයි මගේ පුතා ඔබේ ප්‍රාකාරවලට එපිටින් විසිදාහක හමුදාවක් රඳවලා තියෙනවා."

"ටයිවින් උතුමානන් මෙහාට ආවහම උන් අලුත් මළකඳන් විසිදාහක් වේවි." මහල්ලා පෙරලා පිළිතුරු දුනි. "මාව බය කරන්ට හිතන්ට එපා මගේ ආර්යාවනි. ඔබේ සැමියා රාජද්‍රෝහියෙක් විදියට හංවඩු ගැහිලා රතු බලකොටුව යට දඟගේක හිරකරලා. ඔබේ තාත්තා ලෙඩ ගානෙ. සමහරවිට මැරෙන්ට වැටිලාද දන්නෙත් නෑ. ජේමී ලැනිස්ටර් ඔබේ මල්ලිව අල්ලගෙන දම්වැල් දාලා. ඔබ හිතන්නෙ මම මොකක් නිසාද බයවෙන්ට ඕන? ඔබේ පුතාට ද? ඔබේ පුතෙකුට මගේ පුතෙක් ගානෙ දැම්මත් ඔබේ පුතාලා ඔක්කොම මැරුනට පස්සෙත් මගේ එවුන් දහඅට දෙනෙක් ඉතුරුවෙලා ඉඳියි."

"ඔබ මගේ තාත්තට දිවුරුමක් දීලයි තියෙන්නෙ." ඇය සිහිපත් කර දුන්නාය.

ඔහු සිනාසෙමින් හිස දෙපසට පැද්දුවේය. "ආහ්! ඔවු. මම මොනවදෝ වචන වගයක් කිවුවා තමා. ඒ වුනත් මට මතක හැටියට නම් මම රජතුමාටත් දිවුරුමක් දීලයි තියෙන්නෙ. ජොෆ්රි තමා දැන් රජතුමා. ඒ කියන්නෙ ඔබේ කොල්ලයි අර එළියෙ වාඩිලාගෙන ඉන්න අනිත් පල් බූරුවො ටිකයි කැරැළිකාරයො හැටියටයි ගණන් ගැනෙන්නෙ. දෙයියො මාළුවෙකුට දීලා තියෙන තරම්වත් මොළයක් මට තියෙනවා නම් මම කරන්ට ඕන උඹලා හැමෝම විනාශකරලා දාන්ට ලැනිස්ටර්ලාට උදවු කරන එකයි."

"ඇයි ඔබ එහෙම නොකරන්නෙ?" ඇයි විවාදාත්මකව ඇසුවාය.

වෝල්ඩර් උතුමානන් අවඥාවෙන් මෙන් උගුරෙන් හඬක් පිටකලේය. "මාන්නක්කාර තේජාන්විත ටයිවින් උතුමානන්. බටහිර ආරක්ෂකයා. රජතුමාගෙ හස්තය. ආහ්! කොච්චර උදාර මනුස්සයෙක් ද. එයයි, එයාගෙ රත්තරන් අරකයි රත්තරන් මේකයි, අතන සිංහයයි මෙතන සිංහයයි. මම ඕන ඔට්ටුවක් දාන්නම්, මිනිහා මහ ගොඩක් බෝංචි කනවා. මොකද මිනිහත් මම වාගෙම අධෝවාතෙ අරිනවා. ඒ වුනත් ඔබට කවදාවත් අහන්ට ලැබෙන එකක් නෑ මිනිහා ඒක පිළිගන්නවා. අනික ඔච්චර පිම්බෙන්ට, මොනාද මිනිහට තියෙන්නෙ? පුත්තු දෙන්නෙක් විතරයි. ඒකෙනුත් එකෙක් ඇඹරිච්ච, බකල ගහන පුංචි යක් පැටියෙක්. එයාගෙ පුතෙකුට මගේ පුතෙක් ගානෙ දැම්මත් එයාගෙ පුත්තු ඔක්කොම මැරුනට පස්සෙත් මගේ එවුන් දහනවයකුත් තව බාගයක් ඉතුරුවෙලා ඉඳියි." ඔහු කෙකර ගෑවේය. "ටයිවින් උතුමානන්ට මගේ උදවු ඕන නම් මිනිහා ඉස්සෙල්ලා මගෙන් ඉල්ලන්ට ඕන."

මේ වනාහි කැට්ලින් එල්ලෙන්නට බලා සිටි පිදුරු ගස විය. "මම ඔබේ උදවු ඉල්ලා හිටිනවා මගේ උතුමානනි." ඇය යටහත් පහත් අයුරින් කීවාය. "මගේ තාත්තත්, මගේ මල්ලිත්, මගේ සැමියත්, මගේ පුත්තුත් වෙනුවෙන් මම ඉල්ලා හිටිනවා."

වෝල්ඩර් උතුමානන් කෙට්ටු ඇඟිල්ලක් ඇය වෙතට දිගු කලේය. "ඔබේ ඔය ලස්සන වචන ඔබ ගාවම තියාගන්ට මගේ ආර්යාවනි. ලස්සන වචන මට මගේ බිරිඳගෙන් අහන්ට පුළුවන්. ඔබ දැක්කද එයාව? අවුරුදු දාසයයි. පුංචි මලක් වගේ. ඒ මල් පැණි මට විතරමයි. මම ඕන ඔට්ටුවක් දාන්නම් ලබන අවුරුද්දෙ මේ කාලෙ වෙනකොට එයා මට පුතෙක් දෙනවා. සමහරවිට මම එයාව මගේ උරුමක්කාරයා කරන්ටත් පුළුවන්. කොහොමද එතකොට. අනිත් එවුන් ටික රත් වෙලා යයි නේද?"

"මට හොඳටම විශ්වාසයි එයා ඔබට පුත්තු ගොඩක් දේවි."

ඔහුගේ හිස ඉහළ පහළ වැනෙන්නට විය. "ඔබේ තාත්තා මේ මඟුලට ආවෙ නෑ. මට පේන හැටියට නම් ඒක මට අපහාසයක්. එයා මැරෙන්ට වැටිලා හිටියත්. අනික එයා මගේ කලින් මඟුලට ආවෙත් නෑ. ඔබ දන්නවද එයා මට කියන්නෙ 'ප්‍රමාද වෙන ෆ්‍රේ උතුමානන්' කියලයි. එයා හිතන්නෙ මම මැරිලයි කියලද? මම තාම මැරිලා නෑ. මම පොරොන්දු

වෙනවා එයාගෙ තාත්තට වඩා කල් ජීවත් වුනා වගේ මම එයාටත් වඩා කල් ජීවත්වෙනවා. ඔබේ පවුල හැමදාමත් මට පහත් කරලා සැලකුවා. නෑ කියන්ට එපා. බොරු කියන්ටත් එපා. ඔබ දන්නවා ඒක ඇත්ත කියලා. අවුරුදු ගානකට කලින් මම ඔබේ තාත්තාව මුනගැහෙන්ට ගිහින් ඉල්ලුවා එයාගෙ පුතාට මගේ දූවෙක්ව කසාද බන්දලා දෙන්ටයි කියලා. මොකද ඒක හොඳ නැත්තෙ? මගේ හිතේ තිබුනෙ මගේ එක දූවෙක් ගැන. හරිම ශෝක් කෙල්ල. එඩ්මුයර්ට වඩා ඕන නම් අවුරුදු කීපයක් වැඩිමල් ඇති. ඒ වුනත් ඔබේ සහෝදරයාට එයා ගැන ඇල්මක් ඇතිවුනේ නැත්තම් මගේ ගාව තව දූවරු ඉන්නවා. ලාබාල අය. වැඩිහිටි අය. කන්‍යාවෝ. වැන්දඹුවෝ. එයාට ඕන කෙනෙක්. නෑ. හස්ටර් උතුමානන් ඒ ගැන අහන්ටවත් සතුටු වුනේ නෑ. එයා මට බොහොම ලස්සන වචන ටිකක් නම් කිවුවා. සමාවට කාරනා. ඒ වුනත් මට ඕන වුන එකම දේ වුනේ කොහොමහරි කරලා එක දූවෙක් පිටමන් කරගන්ටයි."

"ඒත් එක්කම ඔබේ නංගි. එයා අනිත් එක්කෙනා. එයා ඔක්කොටම වඩා නරකයි. මේක වෙලා... ආහ්.. යාන්තං අවුරුද්දක් ඇති. ඊට වඩානම් වැඩිවෙන්ට බෑ. ජොන් ඒරින් එතකොටත් රජතුමාගෙ හස්තය. මම නගරෙට ගියේ මගේ පුත්තු තරගාවලියට සහභාගී වෙනවා බලන්ටයි. ස්ටෙව්රනුයි ජැරඩුයි නම් දැන් ඒ වගේ ඒවට සහභාගී වෙන්ට තරම් නාකි වැඩියි. ඒ වුනත් ඩැන්වෙලුයි හොස්ටීනුයි ගියා. පර්වින්නුත් සහභාගී වුනා. ඒ වගේම මගේ අවජාතක පුත්තු දෙන්නෙක් මිශ්‍ර සටනට එකතුවුනා. උන් මාව ඔච්චර ලැජ්ජාවට පත්කරයි කියලා දන්නවානම් මම ඔය ගමන යන්ට හිතන්නෙවත් නෑ. මම මොකටද ඔච්චර දුර යන්නෙ අර ටිරල් කොල්ලා මගේ හොස්ටීන්ව අශ්වයා පිටින් බිම දානවා බලන්ට? මම මේ ඔබෙන් අහන්නෙ. ඒ කොල්ලා මුගෙන් බාගයක්වත් වයස නෑ. උන් එයාට කියන්නෙ සෙර් ඩේසි කියලා. මොකක් හරි ඒ වගේ නමක් තමා. එතකොට, ඩැන්වෙල්ව අශ්වයා පිටින් වැට්ටුවෙ මේ නිකං දෙකයි පනහෙ නයිට් කෙනෙක්! සමහරදාට මම කල්පනා කරනවා මුන් දෙන්නා ඇත්තටම මගේ පුත්තු ද කියලත්. මගේ තුන්වෙනි බිරිඳ ක්‍රැකර්හෝල් කෙනෙක්. ක්‍රැකර්හෝල් ගෑනු ඔක්කොම වේසියො. හරි. ඒ ගැන අමතක කරලා දාන්ට. ඒකි මැරුනෙ ඔබ ඉපදෙන්ටත් කලින්. ඔබ මොකටද ඒ ගැන වදවෙන්නෙ."

"මම කතා කරකර හිටියෙ ඔබේ නංගි ගැන. මම යෝජනා කලා ඒරින් උතුමානන්ටයි ආර්යාවටයි මගේ මුනුබුරෝ දෙන්නෙක් එයාලා ගාව හදාවඩා ගන්ට අරගන්ටයි කියලා. ඒ එක්කම යෝජනා කලා එයාලගෙ පුතා මෙහෙ මේ නිවුන් බලකොටුවෙ හදාගන්ට දෙන්ටයි කියලා. මගේ මුනුබුරෝ රාජසභාවක හදාගන්ට බැරි තරම් වැදගැම්මකට නැද්ද? උන් දෙන්නම හරි ශෝක් කොල්ලො. නිශ්ශබ්දයි. හොඳ පුරුදු දන්නවා. වෝල්ඩර් කියන්නෙ මැරට්ගෙ පුතා. එතකොට අනිත් එකා... හෙහ්, මට මතක් වෙන්නෙම නෑ

නෙව... ඌත් වෝල්ඩර් කෙනෙක් වෙන්ට ඕන. උන් තමන්ගෙ පුතාලට හැමවෙලාවෙම නම් දාන්නෙ වෝල්ඩර් කියලා, මොකද මම උන්ට වැඩියෙන් සලකයි කියලා. ඒ වුනත් උගෙ තාත්තා... හොඳයි, දැන් කවුද එතකොට උගෙ තාත්තා?" ඔහුගේ මුහුණ රැළි ගැසී ගියේය. "හරි, මොකෙක් හරි කමක් නෑ. ඒරින් උතුමානන් ඌව ගන්ට බෑ කිවුවා. ඌවයි අනිත් එකාවයි දෙන්නවම. මම ඒකට වැරැද්ද පටවන්නෙ ඔබේ නංගිට. එයා කතා කලේ හරියට මම එයාගෙ කොල්ලා නාට්‍ය කණ්ඩායමකට විකුණන්ට කතා කලා වගේ. එහෙමත් නැත්තම් එයාව නපුංසකයෙක් කරන්ට කතා කලා වගේ. ඊටපස්සෙ ඒරින් උතුමානන් කිවුවා එයාගෙ ළමයා ඩ්‍රැගන්ස්ටෝන්වල ස්ටැනිස් උතුමානන් ගාව හදාවඩා ගන්ට යවන්ට තීරණය වෙලයි තියෙන්නෙ කියලා. මෙන්න ඔබේ නංගි නැගිටලා ගස්සගෙන එළියට ගියා කිසිම වචනයක්වත් නැතුව. අඩුමගානෙ කණගාටුයි කියන්නෙවත් නැතුව. හස්තයේ උතුමානන් මගෙන් සමාව ඉල්ලුවා. ඒ වුනත් සමාව ඉල්ලීමෙන් මට ඇති වැඩෙ මොකක්ද? මම ඔබෙන් අහන්නෙ."

කැට්ලින් නොඉවසිලිමත් විලසින් රවා බැලුවාය. "මට දැනගන්ට ලැබුන විදියට ලයිසාගෙ පුතාව කාර්ස්ටලී රොක්වල ටයිවින් උතුමානන් ගාව හදාවඩා ගන්ට යවන්ටයි තීරණය වෙලා තිබුනෙ."

"නෑ නෑ. ඒ ස්ටැනිස් උතුමානන්." වෝල්ඩර් ෆ්‍රේ නුරුස්සන සුළු ස්වරයෙන් කීය. "ඔබ හිතන්නෙ මට ස්ටැනිස් උතුමානන්වයි ටයිවින් උතුමානන්වයි වෙන්කරලා අඳුනගන්ට බැහැයි කියලද? ඇත්ත උන් දෙන්නම තමන් මහ උදාරයි කියලා හිතාගෙන ඉන්න බලුබෙටි දෙකක් තමා. ඒ වුනත් මම දන්නවා දෙන්නගෙ වෙනස. එහෙමත් නැත්තම් ඔබ හිතනවද මම නාකි වෙලා නිසා මට ඕවා මතක නැහැයි කියලා? මට අනූවක් වුනාට මට හොඳට මතකයි. මට හොඳට මතකයි ගෑනියෙක් එක්ක මොකක්ද කරන්ට ඕන කියලා. මම ඕන ඔට්ටුවක් දානවා ලබන අවුරුද්දෙ මේ කාලෙ වෙනකොට මගේ අර බිරිඳ මට පුතෙක් දෙනවා. එහෙමත් නැත්තම් දුවෙක්. ඒකට ඉතින් කරන්ට දෙයක් නෑ. කොල්ලෙක් හරි කෙල්ලෙක් හරි. අනික ඒකිට ඕනවෙයි එයාට නම දාන්ට වෝල්ඩර් නැත්තම් වෝල්ඩා කියලා."

ෆ්‍රේ ආර්යාව සිය දරුවාට කුමන නමක් දමාවිද යන්න කැට්ලින්ට කිසිසේත්ම වැදගත් වූ කරුනක් නොවීය. "ජොන් ඒරින් එයාගෙ පුතාව ස්ටැනිස් උතුමානන් ගාව හදාවඩා ගන්ට යවන්ට ලෑස්තිවෙලයි හිටියෙ. ඔබට ඒක හොඳටම විශ්වාස ද?"

"ඔවු. ඔවු. ඔවු." මහල්ලා කීවේය. "ඒ වුනත් එයා මැරුනනෙ. ඉතින් ඒකෙන් දැන් ඇති වැඩේ මොකක්ද? ඔබ කිවුවා ඔබලාට පාලමෙන් එතෙර වෙන්ට ඕනයි කියලා."

"ඔවු. අපට ඕන..."

"හොඳයි ඔබලාට එහෙම කරන්ට බෑ." වෝල්ඩර් උතුමානන් ප්‍රසන්න අයුරින් නිවේදනය කලේය. "මම ඉඩදෙනකම් යන්ට බෑ. මොකටද මම යන්ට ඉඩදෙන්නෙ? ටලීලායි ස්ටාර්ක්ලායි කවදාවත් මගේ යාළුවො වුනේ නෑ." සිය පුටුවේ පසුපසට හේත්තු වූ ඔහු පපුව හරහා දෑත් බැඳගෙන, නියවමින් ඇගේ පිළිතුර ලැබෙන තෙක් බලා සිටින්නට විය.

එයින් පසු කේවල් කිරීම් හැර වෙනෙකක් නොවීය.

* * *

බලකොටුවේ දොරටු නැවත හැරෙන මොහොත වනවිට රත් පැහැ හිරු බටහිර දිග කඳු පන්තිවලට මඳක් ඉහළින් ආකාශයේ එල්ලෙමින් තිබින. දියඅගලට උඩින් වූ පාලම ක්‍රීක් හඬින් පහත් වූ අතර කටු පැලැල්ල හෙමිහිට ඉහළට නැගුනි. සිය පුතු හා ඔහුගේ යටත් වංශාධිපතීන් මුනගැසෙනු පිණිස කැට්ලින් අසු ඉදිරියට විහිදෙවුවා ය. ඇයට පිටුපසින් සෙර් ජැරඩ් ෆ්‍රේ, සෙර් හොස්ටීන් ෆ්‍රේ, සෙර් ඩැන්වෙල් ෆ්‍රේ සහ වෝල්ඩර් උතුමානන් ගේ අවජාතක පුතකු වන රොනල් රිවර්ස් සිය අසුන් විහිදවූහ. ඊට පිටුපසින් නිල් පැහැ වානේ මුදු දම්වැල් සන්නාහයෙන් සැරසී රිදී-අළු පැහැ සළු පැළැඳි කුන්තධරයෝ පේලි ගැසී පිටතට පැමිණෙන්නට වූහ.

ඇයව මුනගැසෙනු පිණිස රොබ් හැල්මේ අසු ඉදිරියට මෙහෙයවීය. ඔහුගේ අසුට සමගාමීව ග්‍රේවින්ඩ් ද දිවආවේය. "ඒක හරි." ඇය ඔහුට කීවාය. "වෝල්ඩර් උතුමානන් ඔයාට ගඟ තරණය කරන්ට අවසර දුන්නා. එයාගෙ සෙබළුත් ඔයාගෙ හමුදාවටම එකතු වෙයි. ද්විත්ව බලකොටුව ආරක්ෂා කරගන්ටයි කියලා එයා සෙබළ හාරසීයක් තියාගන්නවයි කිවුවා. මම නම් කියන්නෙ ඔයත් ඔයාගෙ සෙබළ හාරසීයක් මෙහෙ තියලා යන එක හොඳයි. දුනුවායොයි සාමාන්‍ය සෙබළුයි දෙගොල්ලම තියන්ට. එයාගෙ බලමුලුව තර කරන්ට අපි කරන යෝජනාවකට එයා අකැමැති වෙන එකක් නෑ... ඒ වුනත් ඔයාට

විශ්වාස කරන්ට පුළුවන් කෙනෙකුට මේ බලමුලුවෙ අණදෙන නිළධාරිකම දෙන්ට මතක තියාගන්ට. මොකද වෝල්ඩර් උතුමානන්ගෙ විශ්වාසය දිගටම තියාගන්ට උදවු ඕනවෙන්ට පුළුවන්."

"ඔයා කියන විදියක් අම්මා." රොබ් පිළිතුරු දුන්නේ කුන්තධරයින් දෙස බැල්මක් හෙලමිනි. "කොහොමද... සෙර් හෙල්මන් ටෝල්හාර්ට්? ඔයා මොකද හිතන්නෙ?"

"හොඳ තෝරගැනීමක්."

"මොනවද... මොනවද එයාට අපෙන් ඕන?"

"ඔයාගෙ සෙබළු ටිකදෙනෙක් නිදහස් කරන්ට පුළුවන් නම් මට ඕන පරිවාර සෙබළ මුලුවක් ෆ්‍රේ උතුමානන්ගෙ මුනුබුරෝ දෙන්නෙක් වින්ටර්ෆෙල්වලට යවන්ට. මම පොරොන්දු වුනා එයාලාව එහෙ හදාවඩා ගන්ට. දෙන්නම පොඩි කොල්ලො. එක්කෙනෙකුට අටක්. අනිකට හතක්. දෙන්නගෙම නම වෝල්ඩර්. බ්‍රැන්ට එයාගෙ වයසෙ කොල්ලන්ගෙ සමාගමක් තියෙන එක හොඳයි කියලයි මට හිතෙන්නෙ."

"එච්චරද? හදාවඩා ගන්ට දෙන්නෙක්? ඒක බොහොම පොඩි මිලක්-"

"ෆ්‍රේ උතුමානන්ගෙ පුතා ඔලිවර් අපිත් එක්ක එනවා. එයා ඔයාගෙ පුද්ගලික සහචරයා විදියට සේවය කරන්ට ඕන. එයාගෙ තාත්තට ඕන නිසි වයස ආවහම එයාව නයිට්වරයට උසස් වෙනවා දකින්ට."

"සහචරයෙක්." ඔහු දෙවුර ඇකිළීය. "හරි. ඒක හරි. එයා-"

"ඒ වගේම, ආර්යා පරෙස්සමින් ආපහු අපි ගාවට ආවොත්, එයා වෝල්ඩර් උතුමානන්ගෙ බාලම පුතා එල්මර්ට කසාද බන්දලා දෙන්ට පොරොන්දු වුනා. දෙන්නම නිසි වයස ආපුවහම."

රොබ් අන්දුන් කුන්දුන් වූ සෙයක් පෙනුනි. "ආර්යා නම් ඒකට පොඩ්ඩක්වත් කැමැති වෙන එකක් නෑ."

"ඒ වගේම ඔයා එයාගෙ දුවෙක් කසාද බඳින්ට ඕන. මේ සටන් ඉවරවුනාම. ඔයා කැමැති ගෑනු ළමයෙක් තෝරගන්ට ඔයාට නිදහස දෙන්ට අපේ උදාර උතුමානන් කැමැති වුනා. ඔයාට ගැලපෙන කීපදෙනෙක්ම ඉන්නවා කියලා එයාට විශ්වාසයි."

ඇගේ පුදුමයට මෙන් මේ අවසන් කොන්දේසිය නිසා රොබ් ඇකිළී නොගියේය. "ආ හා."

"ඔයා කැමැත්ත දෙනවද?"

"මට ප්‍රතික්ෂේප කරන්ට පුළුවන් ද?"

"ඔයාට පාලමෙන් එගොඩවෙන්ට ඕන නම් ප්‍රතික්ෂේප කරන්ට බෑ."

"මම කැමැතියි." රොබ් සන්සුන් ස්වරයෙන් කීවේය. මේ මොහොතේදී තරම් අන් කවරදාවත් ඔහුගෙන් මෙතරම් පිරිමිකමක් ඈ දැක නොතිබින. කොල්ලන් අසිපත්වලින් සෙල්ලම් කරන්නට කැමැති වෙති. එනමුදු විවාහ ගිවිසුමක් යනු කවරාකාරයේ දෙයක්දැයි තේරුම්ගෙන ඊට කැමැත්ත දෙන්නට නම් කෙනෙකු නියම වංශාධිපති උතුමකුම විය යුතුය.

ගංදිය මත අඩසඳක් පාවෙමින් තිබියදී, සන්ධ්‍යාභාගයේ මඳ අන්ධකාරය මධ්‍යයේ ඔවුහු පාලමෙන් එතෙර වූහ. දැවැන්ත වානේ සර්පයකු මෙන් නැගෙනහිර බලකොටුවෙන් ඇතුළු වූ හමුදාව අංගනය හරහා දඟර ගැසී ඇතුළු බලකොටුව හරහා පාලමට පිලිපන්නේ ඉදිරියට ඇදී ගොස් බටහිර ඉවුරේ දෙවන බලකොටුවෙන් පිටතට පැමිනියහ.

මේ සර්පයාගේ හිසේ කැට්ලින් ගමන්ගත්තා ය. ඇත් සමග ඇගේ පුත්‍රයා ද, ඇගේ බාප්පා සෙර් බ්‍රින්ඩන් සහ සෙර් ස්ටෙව්රන් ෆ්‍රේ ද වූහ. ඔවුන්ට පිටුපසින් ඔවුන්ගේ අසරු හමුදාවෙන් දහයෙන් නවයක් - නයිට්වරුන්, ලන්සධරයින්, නිදහස් අසරුවන් හා අසරු දුනුවායින් - පේළි සැදී ගමන් ගත්හ. මේ සියල්ලන්ටම පාලමෙන් එතෙර වීමට පැය ගනනාවක් ගතවිය. පාලම මත ගැටෙන අනන්ත අසුකුර හඬත්, සිය දෝලාවට වී ඔවුන් තමා පසුකර යන දෙස වෝල්ඩර් ෆ්‍රේ බලාසිටි අයුරුත්, දිය කුළුණු පසුකර යද්දී එහි සිවිලිමේ වූ විවර තුළින් ඔවුන් දෙස බලාසිටි දිදුලන දෑස් සමූහයත් බොහෝ කලක් යනතෙක් කැට්ලින් ගේ මතකයේ රැඳී තිබුනි.

උතුරු හමුදාවේ බහුතරය - කුන්තධරයින්, දුනුවායන් හා පාබල සෙබළුන් - රූස් බෝල්ටන් ගේ විධානය යටතේ නැගෙනහිර ඉවුරේ රැඳී සිටියහ. ඔහුට සිය ගමන දිගටම දකුණුකරය වෙත ගෙන යන්නැයි රොබ්ගෙන් අණ ලැබී තිබුනි. ටයිවින් උතුමානන්ගේ අණ යටතේ උතුර බලා එමින් සිටි විසල් ලැනිස්ටර් හමුදාව මුනගැසීම මේ පිරිසේ අභිමතාර්ථය විය.

හොඳට හෝ නරකට හෝ ඇගේ පුත්‍රයා විසින් දාදු කැටය උඩ දමා තිබින.

**Catelyn Stark: “I doubt even Lord Frey knows what Lord Frey intends to do.”**

ජොන් 08-1

"උඹට දැන් හොඳයි ද ස්නෝව්?" මෝර්මන්ට් උතුමානන් පැඟිරි කරගත් මුහුණෙන් යුතුව විමසුවේය. "හොඳයි!" ඔහුගේ කපුටා කෑගැසීය. "හොඳයි!"

"එහෙමයි මගේ උතුමානනි." ජොන් බොරුවක් කීවේ එයින් තත්ත්වය යහපත් අතට හැරේයැයි සිතුවාක් මෙනි. "ඔබට කොහොමද?"

මෝර්මන්ට් බැම ඇකිළීය. "මැරිච්ච මිනිහෙක් මාව මරන්ට හැදුවා. ඉතිං කොහොමද බං මම හොඳින් වෙන්නෙ?" ඔහු සිය නිකට යට කැසුවේය. ඔහුගේ පෙර පැවැති පුළුල් අළු පැහැ රැවුල ගින්නට හසුව පිළිස්සී ගිය බැවින් ඔහුට එය බූ ගා දැමීමට සිදුවිය. අලුත වැවුනු රැවුල් කොට විසින් ඔහුට වඩාත් මහලු, ගර්හිත හා නොඉවසිලිවන්ත පෙනුමක් ලබා දී තිබුනි. "උඹ හොඳින් කියලා පේන්නෙ නම් නැහැ. කොහොමද උඹේ අත?"

"තුවාල ටික ටික හොඳ වෙනවා." වෙළුම් පටි යෙදූ සිය අතැඟිලි ඔහුට පෙනෙන සේ ජොන් අත එසැවීය. එදා අර ගිනිගත් තිර රෙදි ඔසවා විසිකරද්දී සිතුවාටත් වඩා තදින් ඔහුව පිළිස්සී තිබූ අතර දකුණත වැලමිට අසලට යනතෙක්ම වාගේ සේද රෙද්දෙන් කල වෙළුම්පටිවලින් ඔතා තිබුනි. ඒ මොහොතේදී ඔහුට කිසිවක් නොදැනුනු නමුදු පසුව පැමිණි වේදනාව දරාගත නොහැකි තරම් අතිමහත් විය. ඔහුගේ සම පිපිරී ඉස්ම ගලා එන්නට වූ අතර ඇඟිලිවල කැරපොත්තන් තරම් විසල් ලේ බිබිළි නැග එන්නට විය. "මේස්ටර් කිවුවා තුවාල කැළැල් දිගටම තියෙයි කියලා. ඒ වුනත් අත නම් කලින් තිබුන ගානටම හොඳවෙයි කියලා කිවුවා."

"තුවාල කැළැල් කියන්නෙ මහ ලොකු දෙයක් නෙවෙයි. අනික උඹ ප්‍රාකාරෙදි කොහොමත් අත්වැසුම් දාගෙනනෙ ඉන්නෙ."

"එහෙමයි මගේ උතුමානනි." ජොන් වදවූයේ මේ තුවාල කැළැල් නිසා නොවේ. වෙනත් දේ නිසාය. මේස්ටර් ඒමන් විසින් ඔහුට පොපි යුෂ ලබා දුන්නේය. එනමුදු වේදනාව

ඉසිලිය නොහැකි තරම් විය. මුලදී ඔහුගේ අත දිවා රෑ නොතකා ඇදුම් දුන්නේ හරියටම එය තවමත් ගිනිදැල් වලින් වෙලී පවතින්නාක් මෙනි. හිම සහ සූරාගත් අයිස් කැබැලි පිරවූ බේසමකට අත ඔබාගෙන සිටීමෙන් පමණක් මඳ අස්වැසිල්ලක් ලබන්නට ඔහුට හැකිවිය. මේ වේදනාව නිසා තමා ඉකිබිඳිමින්, නිදි ඇඳේ එහාමෙහා පෙරලෙමින් සිටි අයුරු දකින්නට තමා අසල සිටියේ ගෝස්ට් පමණක් වීම ගැන ඔහු දෙවිවරුන්ට ස්තූතිවන්ත වූයේය. අන්තිමේදී නින්ද ඔහු වෙත පැමිණි විට ඔහු සිහින දකින්නට පටන්ගත් අතර එය සෑම දෙයකටම වඩා දරුණු විය. මේ සිහින තුළදී ඔහු හා පොරබැදි මළකඳට නිල් දෑසක්, කළු පැහැ දෑතක් හා සිය පියාගේ මුහුණ පිහිටා තිබුනි. එනමුදු මේ දේවල් මෝර්මන්ට් හා පවසන්නට තරම් ඔහු නිර්භය නොවීය.

"ඩිවනුයි හේකුයි ඊයෙ රෑ ආපහු ආවා. උන් දෙන්නට උඹේ බාප්පා ගැන කිසිම සලකුණක් හොයාගන්ට බැරිවෙලා. අනිත් එවුන් හොයාගත්තට වඩා වැඩියමක් නෑ."

"මම දන්නවා." සිය මිතුරන් හා එක්ව රාත්‍රී ආහාරය ගනු පිණිස ජොන් ප්‍රධාන ශාලාව වෙත ගොස් තිබුනි. මුරසංචාරකයින් ගේ අසාර්ථක මුරසංචාරය පිළිබඳ පුවත සෑම දෙනාගේම කතාබහට ලක් වූ කාරණය විය.

"උඹ දන්නවා." මෝර්මන්ට් මැසිවිලි කීවේය. "කොහොමද මෙතැන ඉන්න හැමඑකාම හැම දෙයක්ම දන්නෙ?" ඔහු මීට පිළිතුරක් බලාපොරොත්තු වූ බවක් නොපෙනුනි. "ජේන විදියට නම් අර... අර සත්තු, උන් මොක්කුන් වුනත් කමක් නෑ අර සත්තු දෙන්නයි ඉඳලා තියෙන්නෙ. මම උන්ට මිනිස්සු කියලා නම් කියන්නෙ නෑ කොහොමත්ම. අපි දෙවිවරුන්ට ස්තූතිවෙන්ට ඕන උන් දෙන්නෙක් විතරක් හිටපු එක ගැන. තවත් හිටියානම්... හරි, කොහොමවුනත් උන් තව එන්ට පුළුවන්. මගේ මේ නාකි ඇටකටුවලට ඒක තේරෙනවා. මේස්ටර් ඒමනුත් ඒකට එකඟයි. සීතල හුළං වැඩිවෙනවා. ගිම්හානය ඉවරවෙලා. මේ ලෝකෙ මීට කලින් කිසිමදාක දැකලා නැති විදියෙ සීතකාලයක් එන්ටයි යන්නෙ."

'සීත කාලය එනවා.' මේ ස්ටාර්ක්වරුන් ගේ ආදර්ශ පාඨය මීට පෙර කිසිදිනෙකත් මෙතරම් ක්‍රෑර ලෙස හෝ අසුබ ලෙස හෝ ජොන්ට දැනී නොතිබුනි. "මගේ උතුමානනි." ඔහු දෙගිඩියාවකින් මෙන් ඇසීය. "උන් කියනවා ඊයෙ රෑ කපුටෙක් ආවයි කියලා."

"ආවා. ඉතින් මොකද?"

"මම හිතුවෙ මගේ තාත්තා ගැන මොකුත් ආරංචියක් ඇති කියලයි."

"තාත්තා!" මහලු කපුටා මෝර්මන්ට් ගේ දසරුවේ එහාමෙහා යමින්, හිස දෙපසට හරවමින් කෑගැසුවේය. "තාත්තා! තාත්තා!"

මෝර්මන්ට් අත ඔසවා කපුටා ගේ හොටය වසා දැමීමට තැත් දැරූ මුත් ඌ ඔහුගේ හිස මතට පැන, පියාපත් විදහා, කාමරය හරහා පියඹා ගොස්, කවුළුවක් මතට නැංගේය. "දුකයි සද්දෙයි විතරයි." මෝර්මන්ට් ගෙරෙවුවේය. "එච්චරම තමා මේ කපුටො ගේන්නෙ. මම මොකට මේ දුෂ්ට කපුටා හදාගන්ට ගත්තද මන්දා... එඩාර්ඩ් උතුමානන් ගැන මොකක් හරි පණිවුඩයක් ආවානම් උඹ හිතන්නෙ නැද්ද මම උඹට එන්ට කියලා යවන්නෙ නෑ කියලා? අවජාතකයෙක් හරි මොකෙක් හරි උඹ එයාගෙ ලේ. ඒ පණිවුඩේ තිබුනෙ සෙර් බැරිස්ටාන් සෙල්මි ගැනයි. ජේන හැටියට උන් එයාව රාජ්‍යාරක්ෂක බලකායෙන් අයින් කරලා. එයාගෙ තැන අර කළු බල්ලා ක්ලිගේන්ට දීලා. ඉතින් දැන් සෙල්මිව හොයනවලු රාජද්‍රෝහී අපරාධ වෙනුවෙන්. ඒ මෝඩයො එයාව අල්ලගන්ටයි කියලා නගරාරක්ෂක මුර සෙබළු ටිකක් යවලා. ඒ වුනත් එයා උන් දෙන්නෙකුත් මරලා දාලා බේරිලා පැනලා ගිහිල්ලා." මෝර්මන්ට් නහයෙන් නොරිස්සුම් හඬක් පිටකලේය. නිර්භීත බැරිස්ටාන් වැනි නම් දැරූ නයිට්වරයකු අත්අඩංගුවට ගැනීම සඳහා නගරාරක්ෂක බලකායේ සෙබළුන් යැවූ මෝඩයින් රළ පිළිබඳ ඔහුගේ සිතේ ඇති හැඟීම එයින් මොනවට පැහැදිලි විය. "අපේ කැලෑවල සුදුපාට හෙවනැලි ඇවිදිනවා. අපේ කාමරවල මැරිච්ච මිනිස්සු ඇවිදිනවා. ඒ අස්සෙ යකඩ සිංහාසනේ පුංචි කොල්ලෙක් ඉඳගෙන ඉන්නවා." ඔහු පිළිකුලෙන් යුතුව කීවේය.

කපුටා කණ් බිහිරි කරවන හඬින් කෑගැසීය. "කොල්ලෙක්! කොල්ලෙක්! කොල්ලෙක්! කොල්ලෙක්!"

සෙර් බැරිස්ටාන් වනාහි නාකි වලහාගේ හොඳම බලාපොරොත්තුව වූ බැව් ජොන්ට සිහිපත් විය. ඔහුත් සිය තනතුරුවලින් පහත වැටුනි නම් මෝර්මන්ට් ගේ ලියුම්වලට වෙනත් කෙනෙකු අවධානය යොමු කරාවි යැයි කෙලෙස බලාපොරොත්තු තබාගන්න ද?

ඔහු සිය අතැඟිලි මිට මොලොවා ගත් අතර පිළිස්සුනු අතැඟිලි වේදනාවෙන් මිරිකෙන්නට විය. "මගේ නංගිලා ගැන මොකද?"

"මේ පණිවුඩේ එඩාර්ඩ් උතුමානන් ගැනවත් එයාගෙ දුවලා ගැනවත් කිසිම ආරංචියක් සඳහන් කරලා නැහැ." ඔහු පීඩාවට ලක් වූ ස්වරයකින් දෙවුර ඇකිළීය. "සමහරවිට එයාලට මගේ ලියුම ලැබුනෙ නැතුවමම වෙන්ට ඇති. ඒමන් ලියුම් දෙකක්ම යැවුවා, එයාගෙ හොඳම කපුටො දෙන්නෙක් අතේ. ඒ වුනත් කාටද කියන්ට පුළුවන්? ඊටත් වඩා මම හිතන්නෙ පයිසෙල් පිළිතුරක් එවන්ට උනන්දු වෙන්නෙ නැහැ. මේ පළවෙනි වතාව නෙවෙයි. අන්තිම වතාවත් නෙවෙයි. කින්ග්ස් ලැන්ඩින්ග්වල ඉන්න උදවිය අපිව ගනන් නොගන්නාම ගානයි. උන් අපට කියන්නෙ අපි දැනගන්ට ඕනැයි කියලා උන් හිතන දේවල් විතරයි. ඒක බොහොම සොච්චමක්."

'ඒ වගේම ඔබ මට කියන්නෙ මම දැනගන්ට ඕනැයි කියලා ඔබ හිතන දේවල් විතරයි. ඒකත් බොහොම සොච්චමයි.' ජොන් නුරුස්නා ස්වරයෙන් කල්පනා කලේය. ඔහුගේ සොහොයුරා රොබ්, සිය යටත් වංශාධිපතීන් කැඳවාගෙන යුධ පිණිස දකුණුකරය බලා ගොස් තිබින. එනමුදු ඒ ගැන අංශුමාත්‍රයකවත් වදනක් ඔහුගේ සවනේ නොවැටෙන්නට ඔවුන් වගබලාගෙන තිබුනි... සැම්වෙල් ටාර්ලි හැරෙන්නට. සැම් එම ලිපිය මේස්ටර් ඒමන් වෙනුවෙන් කියවා තිබුනු අතර එදා රැයේ ඔහු හොර රහසේම ජොන්ට එහි වූ විස්තර අකුරක් නැර පවසා සිටියේය. එනමුදු මේ රහස් කෙදිරීම් අතරතුර ඔහු නොනවත්වාම කියා සිටියේ තමා විසින් මේ දේවල් ජොන්ට නොපැවසිය යුතුව තිබුනු බවයි. සිය සොයුරා ගේ යුද්ධය ඔහුට කිසිදු අදාලත්වයක් නැතැයි ඔවුන් නිසැකවම උපකල්පනය කරන්නට ඇත. එය විස්තර කරන්නටවත් නොහැකි තරම් තදින් ඔහුට වද දුන්නේය. රොබ් යුධ පිණිස යන අතර ඔහු මෙතැනට වී සිටියි. තමාට නියමිත ස්ථානය මෙතැන, සිය කළු සොයුරන් සමගින් ප්‍රාකාරයේ බව ඔහු අනන්ත වාරයක් තම සිතට පවසාගත් නමුදු තමා මහත් බියගුල්ලෙකිය යන හැඟුම සිතෙන් පලවා හරින්නට ඊට නොහැකි විය.

"ඉරිඟු!" කපුටා කෑගැසීය. "ඉරිඟු! ඉරිඟු!"

"ආහ්! කට වහගෙන හිටහන්." නාකි වලහා ඌට ගෙරෙවුවේය. "ස්නෝව්. ඔය පිච්චුන අතෙන් වැඩගන්ට තව කොච්චර කල් යයි කියලද මේස්ටර් ඒමන් කිවුවෙ?"

"බොහොම ඉක්මනටම."

"හොඳයි." කළු පැහැ ලෝහය මත රිදියෙන් කැටයම් වැඩ දැමූ අලංකාර කොපුවක බහා ලූ විශාල අසිපතක් මෝර්මන්ට් විසින් ඔවුන් දෙදෙනා අතරින් වූ මේසය මතුයෙහි තබනු ලැබීය. "මෙන්න. ඒ කියන්නෙ එහෙනම් උඹ දැන් මේකට ලෑස්තියි."

පියාපත් විදහූ කපුටා මේසය මතට ගොඩ බැස්සේය. ඌ කුතුහලයෙන් හිස කරකවා බලමින් අසිපත දෙසට පැනපැන යන්නට විය. ජොන් දෙගිඩියාවෙන් මෙන් මොහොතක් බලා සිටියේය. මෙයින් අදහස් වන්නේ කුමක්දැයි ඔහුට කිසිදු අරමුණක් නොවීය. "මගේ උතුමානනි?"

"ගින්න නිසා මිටේ තිබුන රිදී බෝලෙ උණුවුනා. හරස් ආවරණයයි අල්ලුවයි පිච්චුනා. කොහොමත් ඒ පරණ ලීයි වියළි හමකුයි. වෙන මොනවද අපට බලාපොරොත්තු වෙන්ට පුළුවන්? ඒ වුනත් තලය... ඒ කඩු තලේට හානි කරන්ට ඊට වඩා දාස් ගුණයක් බලසම්පන්න ගින්දරක් ඕන." මෝර්මන්ට් මේසය මත වූ අසිපත ඉදිරියට තල්ලු කලේය. "මම අනිත් ටික අලුතෙන්ම හැදෙව්වා. ඒක ගනින්."

"ඒක ගනිං!" කපුටා පුනරුච්චාරණය කලේය. "ඒක ගනිං! ඒක ගනිං!"

ජොන් නුහුරු අන්දමින් වමතින් අසිපත ඔසවාගත්තේ ය. වෙළුම්පටි ලූ ඔහුගේ දකුණත තවමත් අනම්‍ය විය. ප්‍රවේශමෙන් අසිපත කොපුවෙන් පිටතට ගත් ඔහු එය දෑස් මට්ටමින් අල්ලාගත්තේ ය.

අසිපත් මිටෙහි කෙලවර වූ ගෝලය දිගු අසිපත් තලය සමබර කිරීම පිණිස ඊයම් යොදා බර කල ලා පැහැති ගලක් විය. එය දත් විලිස්සාගෙන සිටින වෘකයෙකු ගේ හිසේ හැඩයට කැටයම් කර තිබුනු අතර උගේ දෑස් වෙනුවට රතු රබහ මැණික් දෙකක් අල්ලා තිබුනි. අල්ලුව අලුත්ම අලුත් සුමුදු, කළු පැහැ සමින් නිමියේය. එය තවමත් දහදියෙන් හෝ රුධිරයෙන් හෝ දූෂිත වී නොතිබුනි. අසිපත් තලය ජොන් පුරුදුව සිටියාට වඩා අඩි බාගයක් පමණ දිගු එකක් විය. එය කපන්නට කොටන්නට මෙන්ම අනින්නට ද සැදූ අසිපතකි. අසිපත් තලය මත ගැඹුරු ඇළි තුනක් කොටා තිබින. ඔහු දැන සිටි අයිස් අසිපත

වනාහි දැතින්ම එසවිය යුතු මහ අසිපතක් වූ නමුදු මෙය අත් එකහමාරක අසිපතක් විය. සමහරුන් මීට 'අවජාතක අසිපත' කියාද කියති. කෙසේ වුවද මේ වෘක අසිපත ඔහු මීට පෙර භාවිත කල සෑම අසිපතකටම වඩා සැහැල්ලු බව ඔහුට දැනින. ඔහු අසිපත පැත්තට හැරවූ අතර අඳුරු අසිපත් තලය මැද්දේ නැවත නැවතත් තලමින් පන්නරය තැබූ කුඩා රැළිති ඔහුට පහසුවෙන්ම නිරීක්ෂණය කල හැකි විය. "මේක වැලීරියන් වානේනෙ මගේ උතුමානනි." ඔහු විස්මයෙන් කීවේය. ඔහුගේ පියා සිය පවුලේ අසිපත වූ අයිස් ඔහුට නිතරම අතපත ගාන්නට දී තිබුනෙන් එහි පෙනුමත්, ස්පර්ශයත් ඔහු හොඳින්ම හඳුනන දෙයක් විය.

"ඔවු." නාකි වලහා කීවේය. "ඒක මගේ තාත්තගෙ කඩුව. එයාට කලින් එයාගෙ තාත්තගෙ. මේ කඩුව සියවස් පහක් තිස්සෙ මෝර්මන්ට්වරුන්ට අයිතිවෙලා තිබුනා. මගේ කාලෙදි මම ඒක පාවිච්චි කලා. ඊට පස්සෙ මම නිශාරකුමට බැදෙද්දි ඒක මගේ පුතාට පවරලා දුන්නා."

'එයා මට එයාගෙ පුතාගෙ කඩුව දෙනවා!' ජොන්ට මෙය විශ්වාස කිරීමත් අසීරු සෙයක් දැනුනි. අසිපත් තලය උත්කෘෂ්ට අයුරින් සමබර විය. ආලෝකය වැටෙද්දී එහි දාර යාන්තමින් දිදුලන්නට විය. "ඔබේ පුතා-"

"මගේ පුතා මුලු මෝර්මන්ට් පරම්පරාවටම අවනම්බු කලා. ඒ වුනත් අඩුම ගානෙ එයාට ලැජ්ජාවක් කියලා එකක් තිබුනා පැනලා යද්දි මේ කඩුව දාලා යන්ට තරම්. මගේ නංගි මට ආයෙමත් ඒක ගෙනල්ලා දුන්නා. ඒ වුනත් ඒක දකින වාරයක් වාරයක් ගානෙ මට මතක්වෙනවා ජෝරා කරපු අවනම්බුව. ඒ නිසා මම ඒක පැත්තකට දාලා ඒක අමතක කරලා දාලායි තිබුනෙ. ආයෙමත් මට ඒක හම්බවුනේ මගේ නිදන කාමරේ අළු ගොඩ අවුස්සද්දියි. ඒකෙ මුලින් තිබුන මීට රිදියෙන් කරපු වලස් ඔළුවක්. ඒ වුනත් ඒක කොච්චර ගෙවිලා තිබුනද කිවුවොත් ඒ වලහෙක් කියලා අඳුරගන්ටත් බැරි මට්ටමෙනුයි තිබුනෙ. ඒ වුනත් උඹට වඩාත්ම ගැලපෙන්නෙ සුදුපාට වෘකයෙක් කියලා මම කල්පනා කලා. අපේ එක ගොඩනංවන්නෙක් ඉන්නවා, මිනිහා බොහොම දක්ෂ ගල් වඩුවෙක්."

ජොන් කුඩා කල, බ්‍රැන්ගේ වයසේ වූ අවධියේදී, අන් ඕනෑම කුඩා කොලුවකු මෙන් උදාර කර්තව්‍යයන් කිරීමේ සිහින දුටුයේය. මේ සෑම සිහිනයක් පාසාම මේ උදාර කාර්යයන් එකිනෙකට වෙනස් විය. එනමුදු ඔහු නිතරම පාහේ දුටු එක් සිහිනයක් වූයේ තමා විසින් සිය පියාණන් ගේ දිවි ගලවාගන්නා අන්දමයි. එයින් පසු එඩාර්ඩ් උතුමානන් විසින් ජොන්

නියම ස්ටාර්ක් කෙනෙකු බව ක්‍රියාවෙන්ම ඔප්පුකල බැව් නිවේදනය කර අයිස් ඔහුගේ සුරතට බාරදෙන්නේය. එනමුදු ඒ කාලයේ පවා මෙය කුඩා දරුවකු ගේ මනස්ගාතයක් බැව් ඔහු යටි සිතින් දැන සිටියේය. කිසිදු අවජාතකයකු කිසිදා සිය පියාගේ අසිපත දරන්නට සිහිනෙන් හෝ බලාපොරොත්තු නොවේ. මේ මතකය පවා ඔහුව ලැජ්ජාවට පත්කරන්නට සමත් විය. සිය සොයුරාගේ උපන් උරුමකම් උදුරාගන්ට සිතන්නේ කවර නම් අශිෂ්ටයෙක් ද? 'මට මේකට කිසිම අයිතිවාසිකමක් නෑ.' ඔහු සිතුවේය. 'අයිස්වලට උරුමකමක් නෑ වාගෙම මේකටත් උරුමකමක් නෑ.' ඔහු සිය පිළිස්සුනු අතැඟිලි නමන්නටත් දිගහරින්නටත් වූයේ සමට යටින් කුමක්දෝ අමුතුම අන්දමේ වේදනාවක් දැනෙන්නට වූ බැවිනි. "මගේ උතුමානනි. මේක මට ලොකු ගෞරවයක්. නමුත්-"

"උඹේ නමුත් කෑලි උඹ ගාවම තියාගනින් කොල්ලො." මෝර්මන්ට් මැද්දට පැන්නේය. "උඹයි උඹේ අර සතායි නැතිවෙන්ට මම මෙතැන මෙහෙම ඉඳගෙන ඉන්නෙ නැහැ. උඹ බොහොම නිර්භීතව සටන් කලා... ඊටත් වඩා උඹ බොහොම ඉක්මනට කල්පනා කලා. ගින්දර! ඔවු. යකාටම ගියාවෙ. අපි ඒක දැනගෙන ඉන්ට තිබුනා. අපි ඒක මතකෙ තියාගෙන ඉන්ට තිබුනා. මීට කලිනුත් මේ දීර්ඝ රාත්‍රිය ඇවිල්ලා තියෙනවා. ඇත්ත, අවුරුදු අටදාහක් කියන්නෙ දිග කාලයක් තමා... ඒ වුනත්, නිශාරකුමත් ඒක අමතක කරලා දැම්මොත් කවුද ඒක මතක තියාගන්නෙ?"

"කවුද!" කපුටා කෑගැසීය. "කවුද!"

සැබැවින්ම දෙව්වරුන් විසින් එදා රයේ ජොන්ගේ යාඥාවට ඇහුම්කණ් දී තිබුනි. ගින්න ඒ මළ මිනිසා වෙලාගත්තේ හරියටම ඔහුගේ සම ඉටිකිරි වූවාක් මෙනි. ඔහුගේ ඇටකටු වියළි දැව වූවාක් මෙනි. ඒ අප්‍රියජනක දේ ගිනිදැල්වලින් වෙලී ගෘහභාණ්ඩවල හැපෙමින් මෝර්මන්ට්ගේ කාමරය තුළ නලියන අන්දම මවාගැනීමට ජොන්ට දෑස් පියාගැනීම පමණක් ප්‍රමාණවත් විය. සැමටම වඩා ඔහුගේ සිතේ හොල්මන් කලේ ඒ මුහුණයි. ගිනිරැස් වළල්ලකින් වෙලී, පිදුරු මෙන් ගිනිගන්නා හිසකෙස් සහිතව, මාංසය දියවී ඊට යටින් වූ හිස්කබල මතුවී පෙනුනු ඒ අප්‍රියජනක මුහුණයි.

ඔතෝර්ව මෙහෙයවූ අමනුෂ්‍ය බලවේගය කුමක් වුවත් එය ගිනිදළු හමුවේ පැරද පලාගොස් තිබින. අළු ගොඩ අතරින් ඔවුන්ට සොයාගැනීමට හැකිවූයේ පිළිස්සුනු මාංසයත්, අඟුරු වූ ඇටකටුත් පමණි. එනමුදු සිය සිහින තුළදී ඔහු නැවත නැවතත් ඊට මුහුණ දුන්නේය... මේ වතාවේ ඒ ගිනිගෙන දැවෙන මළමිනිය ඔහුගේ පියාගේ හැඩරුව ගෙන තිබින. ගින්නට

හසුව දැවෙමින් පුපුරා ඉරිතලා ගියේ සිය පියාගේ සිරුර විය. ගින්නට හසුව උණු වී කැටිගැසුනු කඳුළු මෙන් දෙකම්මුල් දිගේ ගලා ගියේ සිය පියාගේ දෑස් විය. තමාට මෙලෙස පෙනෙන්නේ ඇයිද යන්න හෝ එයින් කියැවෙන්නේ කුමක්ද යන්න හෝ ගැන ජොන්ට කිසිඳු අවබෝධයක් නොවීය. එනමුදු එය වදනින් විස්තර කල නොහැකි තරමට ඔහුව බිය වැද්දුවේය.

"මේ කඩුව කියන්නෙ මගේ ජීවිතේ වෙනුවෙන් උඹට දෙන පුංචි තෑග්ගක්. උඹට ගෙවන බොහොම පුංචි මිලක්." මෝර්මන්ට් කතාව හමාර කලේය. "ඒක නිසා ඒක ගනින්. මට තවත් ඒ ගැන මොකුත් අහන්ට ඕන නැහැ. තේරුනාද උඹට?"

"එහෙමයි මගේ උතුමානනි." අසිපත් මිටෙහි සුමුදු සම ඔහුගේ අතැඟිලිවලට යටින් කදිමට එබී ගියේ අසිපත දැනටම ඔහුගේ ග්‍රහණය හා ඒකාත්මික වූවාක් මෙනි. තමාව ගෞරවයට පාත්‍ර වූවාය යන හැඟීමක් සිත තුළ ඇති විය යුතු බැව් ඔහු දැන සිටියේය. එනමුදු...

'එයා මගේ තාත්තා නෙවෙයි!' මේ සිතුවිල්ල අනායාසයෙන්ම ජොන්ගේ සිත තුළට පිවිසියේය. 'එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන් තමා මගේ තාත්තා. මම එයාව අමතක කරන්නෙ නෑ. උන් මට කඩු එකක් නෙවෙයි සීයක් දුන්නත් මම එයාව අමතක කරන්නෙ නෑ.' එනමුදු තමා සිහින දුටුයේ වෙනත් මිනිසකුගේ අසිපතක් හිමිකරගැනීම පිළිබඳව යැයි මෝර්මන්ට් උතුමානන්ට කියාගැනීම ඔහුට උගහට විය...

"මට කිසිම ආචාර සමාචාරයකුත් ඕන නැහැ." මෝර්මන්ට් දිගටම කතාකලේය. "ඒ නිසා මට ස්තූති කරන්ට හදන්ටත් එපා. උඹේ රාජකාරිය හරියට ඉටුකරලා මේ කඩුවට ගෞරවය දක්වපන්. වචනවලින් නෙවෙයි."

ජොන් හිස සැලීය. "මේකට නමක් තියෙනවද මගේ උතුමානනි?"

"එක කාලෙකනම් ඒකට නමක් තිබුනා. 'දිගුනියපහුර' එහෙමයි ඒකට කිවුවෙ."

"නියපහුර!" කපුටා කෑගැසීය. "නියපහුර!"

"දිගුනියපහුර කියන්නෙ බොහොම හොඳට ගැලපෙන නමක්." ජොන් පෙරහුරු පහරක් එල්ලකිරීමට වෑයම් කලේය. වමතින් සරඹ දැක්වීම නුහුරු මෙන්ම අපහසු කාර්යයක් බැව් ඔහුට හැඟුනි. එනමුදු මේ වානේ අසිපත් තලය වාතය හරහා සුමට අන්දමින් එහාමෙහා ගියේ හරියටම එයට තමාගේම අභිප්‍රායක් ඇත්තාක් මෙනි. "වෘකයින්ටත් නිය තියෙනවා. වලස්සුන්ට වගේම."

නාකි වලහා මේ කතාවෙන් සතුටට පත් වූ බවක් පෙනුනි. "මාත් හිතන්නෙ එහෙමයි කියලා. මම හිතන්නෙ උඹට ඒක උරහිසට උඩින් පළඳින්ට වෙයි. ඒක ඉණේ පළඳින්ට තරම් දිග වැඩියි. අඩුමගානෙ උඹ තව අඟල් කීපයක් උස යනකම් වත් එහෙම වෙයි. ඒ වගේම උඹට සරඹ පුරුදුවෙන්ට වෙයි, කොහොමද දැතින්ම කඩුව අල්ලලා පහර එල්ල කරන්නෙ කියලා. උඹේ ඔය තුවාල සනීප වුනාට පස්සෙ සෙර් එන්ඩෲට පුළුවන් වෙයි උඹට පොඩි ගුරුහරුකම් ටිකක් කියලා දෙන්ට."

"සෙර් එන්ඩෲ?" ජොන් මේ නම මීට පෙර අසා නොතිබින.

"සෙර් එන්ඩෲ ටාර්ත්. හොඳ මිනිහෙක්. එයා හෙවනැලි කුළුණේ ඉඳන් මෙහාට එනවා ප්‍රධාන සටන් පුහුණුකාරයා හැටියට වැඩ බාරගන්ට. සෙර් ඇලිසර් ඊයෙ උදේ පිටත්වෙලා ගියා නැගෙනහිර කුළුණට යන්ට."

ජොන් අසිපත පහත්කලේය. "ඒ මොකද?" ඔහු මුග්ධ ස්වරයකින් ඇසුවේය.

මෝර්මන්ට් උගුරෙන් හඬක් පිටකලේය. "මොකද. මම මිනිහාව යවපු හන්දා. මොකක් නිසා කියලද උඹ හිතන්නෙ? එයා අරන් යනවා උඹේ අර ගෝස්ට් ජෑෆර් ෆ්ලවර්ස්ගෙ මැණික්කටුවෙන් වෙන්කරපු අත් කෑල්ල. මම එයාට අණ කලා එයාට නැවු නැගලා කින්ග්ස් ලැන්ඩින්ග්වලට ගිහිල්ලා අර කොලු රජා ඉස්සරහා මේ අත්කෑල්ල පෙන්නන්ටයි කියලා. මම හිතන්නෙ එතකොටවත් මේ ජොෆ්රිගෙ අවධානය මෙහාට හරවගන්ට පුළුවන් වෙයි කියලයි... අනික සෙර් ඇලිසර් කියන්නෙ නයිට්වරයෙක්. උසස් පවුලක ඉපදුන, සප්තාලේපනයෙන් අභිෂේක ලබාපු, රාජසභාවෙ පරණ යාළුවො ඉන්න මිනිහෙක්.

මේ හැමදෙයක්ම නිසා මිනිහාව සාමාන්‍ය කළ කපුටෙක් කියලා නොතකා හරින එක ටිකක් අමාරුයි."

"කපුටෙක්!" කපුටාගේ ස්වරයේ යම් කුපිත වූ බවක් ජොන්ට දැනුනි.

"ඒ වගේම." කපුටා ගේ බාධාකිරීම් නොතකා හරිමින් මෝර්මන්ට් දිගටම කතාකලේය. "මේ වැඩේ නිසා කිසිම කලබලයක් නැතුවම, කිසිම තරවටුවක් නැතුවම එයයි උඹයි අතරේ ලීග් දාස් ගානක දුරක් ඇතිවෙනවා." ඔහු ජොන්ගේ මුහුණට ඇඟිල්ල දිගුකලේය. "ඒ වුනත් ඒකෙන් හිතන්ට එපා ප්‍රධාන ශාලාවෙ උඹ එදා අර නටපු ජෝගිය මම අනුමත කරනවයි කියලා. සූරවීරකම කියන්නෙ ටිකක් විතර මෝඩකමත් එක්කම යන දෙයක් තමා. ඒ වුනත් උඹ තවදුරටත් පොඩි කොල්ලෙක් නෙවෙයි. උඹේ අතේ ඔය තියෙන්නෙ මිනිහෙක්ගෙ කඩුවක්. ඒක දරන්ටත් පුළුවන් මිනිහෙකුට විතරයි. මම බලාපොරොත්තු වෙනවා මෙතැන ඉඳන්වත් උඹ ඒ හැටියට වැඩ කරයි කියලා."

"එහෙමයි මගේ උතුමානනි." ජොන් අසිපත නැවතත් කොපුවේ ලැවේය. මේ ත්‍යාගය වෙනුවෙන් මෝර්මන්ට් විසින් තෝරාගත් අසිපත ඔහුගේ පරම්පරාගත අසිපත නොවූවද එය උදාරතර ත්‍යාගයක් වනු ඇත. ඔහුව ඇලිසර් තෝර්න්ගේ මාත්සර්යයෙන් මුදවාගැනීම ඊටත් වඩා උදාර කර්තව්‍යයක් විය.

නාකි වලහා සිය නිකට යට කැසුවේය. "මට අමතකම වෙලයි තිබුනෙ අලුත් රැවුලක් කොච්චර කසනවද කියලා. හරි ඒකට කරන්ට දෙයක් නැහැ. උඹේ රාජකාරි ආපහු බාරගන්ට ගරමට ඔය අත හොඳවෙලාද තියෙන්නෙ?"

"ඔවු මගේ උතුමානනි."

"නියමයි. අද රෑ සීතල වෙයි. මට ඕන හොඳට කුළුබඩු දාපු උණුසුම් වයින් කෝප්පයක්. මට හොඳ රතු වයින් මල්ලක් හොයාගනින්. ගොඩාක්ම තිත්ත එකකුත් එපා. අනිත් එක ලෝබකම් කරන්නෙ නැතුව කුළුබඩු දාපන්. ඒත් එක්කම හොබ්ට කියාපන් ඌ ආයෙමත් මට තම්බපු බැටළු මස් එවලා තිබුනොත් මම ඌව තම්බනවයි කියලා. අර අන්තිමට එවාපු මස් ගාතෙ හොඳටම පරණවෙලා. අඩුගානෙ කපුටාවත් ඒකට හොට ගැහැවුවෙ නැහැ."

ඔහු මහපටැඟිල්ලෙන් පක්ෂියාගේ හිස පිරිමැදි අතර ඌ අම්හිරි හඬකින් නොනවත්වාම කරවු කරන්නට විය. "හරි. දැන් පලයන්. මට වැඩ තියෙනවා කරන්ට."

**Maester Aemon: “Love is the bane of honor, the death of duty.”**

තෑගි ලද අසිපත අතකින් ගෙන පඩිපෙළ පහළට බසින අතරේ මුර සෙබළු ඔහු දෙස බලා සිනාසුනෝය. "නියම කඩුවක්." එකෙක් කීය. "උඹ නියම විදියට ඒක දිනාගත්තා ස්නෝව්." තවෙකෙක් කීවේය. ජොන්ද පෙරලා ඔවුන් වෙත සිනහවක් පහල කරන්නට සමත් වූ නමුදු ඔහුගේ හදවතේ කිසිදු සන්තෝෂයක් නොවීය. තමා මේ ත්‍යාගය ගැන සතුටු විය යුතු බැව් ඔහු යටිසිතින් දැන සිටියද ඔහුට එවැන්නක් නොදැනින. ඔහුගේ තුවාල වූ අත ඇදුම්කමින් තිබුනු අතර මුවට කෝපයක තිත්ත රසය දැනෙමින් තිබුනි. එනමුදු මේ කේන්තිය කා සමගින් කුමක් අරභයා ඇතිවූවක්දැයි කියන්නට ඔහුට හැකියාවක් නොවීය.

ප්‍රධාන අණදෙන නිළධාරිතුමා දැන් සිය නිවහන වෙනුවෙන් තෝරාගෙන තිබුනු රජතුමාගේ කුළුණින් පිටතට එද්දී පිටත සිය මිතුරන් අඩ දුසිමක් පමණ අයාලේ ඇවිදිමින් සිටිනු ජොන් දුටුවේය. ධාන්‍යාගාරයේ දැවැන්ත දොරෙහි ඉලක්කයක් සලකුණු කොට දුනු විදීම පුරුදුවෙමින් සිටි බවක් පෙන්නුම් කලද ඔවුන් සැබැවින්ම වෙනත් කරුනක් වෙනුවෙන් මෙසේ රැස්වී සිටින බැව් ඔවුන් දුටු විගසම ජොන් තේරුම් ගත්තේය. ඔහු දොරින් මෑත් වූ වහාම පිප් හඬගෑවේය. "ආ මෙහෙ වරෙන් මෙහෙ වරෙන්. කෝ අපිටත් බලන්ට."

"බලන්ට? මොකක් බලන්ට ද?"

ටොඩ් ඉදිරියට පැමිණියේය. "උඹේ රෝස පාට තට්ටම් දෙක. වෙන මොකක්ද?"

"කඩුව යකෝ." ග්‍රෙන්ද කතාවට එක්විය. "අපට ඕන කඩුව බලන්ට."

ජොන් ඔවුන් දෙස සැකමුසු බැල්මක් හෙළීය. "ඒ කියන්නෙ උඹලා දැනගෙන හිටියද?"

පිප් විරිත්තුවේය. "උඹ හිතුවද අපි හැමෝම ග්‍රෙන් වගේ මෝඩයො කියලා?"

"උඹ මෝඩයි තමා." ග්‍රෙන් කඩා පැන්නේය. "උඹ මටත් වඩා මෝඩයි."

හෝල්ඩර් සමාව යදින ආකාරයෙන් දෙවුර ඇකිළීය. "ජේට්ට ඔය කඩු මිට හදන්ට මම තමා උදවු කලේ. උඹේ යාළුවා සෑම් තමා අර රබහ මැණික් ගෙනාවෙ මෝල්ස් ටවුන් වලින්."

"ඒ වුනත්, අපි ඊටත් කලින් ඉඳලාම දැනගෙන හිටියා." ග්‍රෙන් කීවේය. "රජ් දැන් ඩොනල් නොයේට කම්මලේ වැඩවලට උදවු කරනවනෙ. නාකි වලහා පිච්චුන කඩුව නොයේට ගෙනත් දෙද්දි ඌ එතන ඉඳලා තියෙනවා."

"කඩුව." මැට් බලකර සිටියේය. අනිකුන්ද ඊට එක්වූහ. "කඩුව. කඩුව. කඩුව."

දිගුනියපහුර කොපුවෙන් මැත්කරගත් ජොන් එය ඔවුන්ට පෙන්වීය. ඔවුන් වඩා හොඳින් එය අගය කරනු වස් එය ඒ මේ අත පෙරලමින් එහි වරුන පෙන්වීය. මලානික හිරුළිරියේ අසිපත් තලය අඳුරු මාරාන්තික දීප්තියකින් බැබලුනේය. "වැලීරියන් වානේ." ඔහු ගාම්භීර ස්වරයෙන් නිවේදනය කලේය. තමාගෙන් පලවිය යුතු ආඩම්බර ස්වරය ඊට මුසු කරන්නට ඔහු වග බලාගත්තේ ය.

"මම අහලා තියෙනවා වැලීරියන් වානේවලින් දැලිපිහියක් හදාපු මනුස්සයෙක් ගැන." ටොඩ් කීවේය. "ඌ රැවුල බාන්ට හදද්දි බෙල්ල කැපිලා මලා."

පිප් විරිත්තුවේය. "නිශාරකුම අවුරුදු දාස්ගානක් පැරණියි. ඒ වුනත් මම කැට තියලා කියන්නම්, ස්නෝව් උතුමානන් තමා අණදෙන නිළධාරිතුමාගෙ කුළුණ ගිනිතියලා ඒකට තෑගි දිනාගත්තු පළවෙනි කළු සහෝදරයා."

කොලු රැළ සිනාසුනෝය. ජොන්ටද සිනා නොවී බැරි විය. ඇත්තෙන්ම කිවහොත් ජොන් ඇතිකල ගින්න විසින් ඒ ශක්තිසම්පන්න ශෛලමය කුළුණ සම්පූර්ණයෙන්ම විනාශ කර නොදැමීය. එනමුදු නාකි වලහා සිය නිදන කාමර වශයෙන් භාවිත කල එහි ඉහළ මාල දෙකෙහි අභ්‍යන්තරය සැහෙන තරම් දුරට දවාලන්නට එයට හැකි වී තිබුනි. කෙසේවුවද මේ ගින්න විසින් ඔතෝර්ගේ බිහිසුණු මළකඳ දවාලන්නට සමත් වූ බැවින් කිසිවෙකුත් ඒ හානිය ගැන වද වූයේ නැත.

අර අනිත් මළකඳ ද, අතක් අහිමි මියගිය මුර සංචාරකයා ජැෆර් ෆ්ලවර්ස් ද අසිපත් දූසිමක බලය හමුවේ කීතු කීතු කර කපා විනාශ කර දැමින... එනමුදු ඊට පෙර සෙර් ජැරමි රයිකරුත්, තවත් සෙබළුන් සිවුදෙනෙකුත් මරාදමන්නට ඊට හැකිව තිබින. මළ මිනිසාගේ හිස වෙන්කරලමින් අසිපත් පහරක් එල්ල කර කාර්යය අවසන් කරන්නට සෙර් ජැරමි සමත්ව තිබූ නමුදු ඒ කවන්ධය ඔහුගේම කොපුවෙන් ඇදගත් සිරිය සෙර් ජැරමිගේ සිරුරට බස්සවා ඔහුව මරාදමන්නට සමත් විය. දැනටමත් මියගොස් තිබුනු මේ අමනුශ්‍ය සතුරන් හමුවේ ශරීර ශක්තිය හෝ ධෛර්යය යනු එතරම්ම වැදගත් දෙයක් නොවීය. ආයුධ හා සන්නාහ පවා එතරම් වැදගැම්මකට ඇති දෙයක් නොවීය.

මේ අඳුරු සිතුවිලි විසින් ජොන්ගේ දැනටමත් නරක මනෝභාවය තවත් අයහපත් කරන්නට සමත් වී තිබුනි. "මට හොඳ්ව මුනගැහෙන්ට ඕන නාකි වලහාගෙ රෑ කෑම ගැන කතා කරන්ට." ඔහු දිගුනියපහුර නැවත කොපුවේ ලමින් ඉක්මන් ස්වරයකින් කීවේය. ඔහුගේ මිතුරන් ඔහුට හොඳක් කරන්නට සිතූවද ඔවුන් ඔහුගේ මනෝභාව තේරුම්ගත්තේ නැත. ඔවුන්ට ඔහුව තේරුම්ගන්නට ද නොහැක. ඇත්තෙන්ම කිවහොත්, එය ඔවුන්ගේ වරදක් ද නොවේ. ඔවුන් ඔතෝර්ට මුහුණ දුන්නේ නැත. අර අසාමාන්‍ය නිල් පැහැ දෑසේ වූ දීප්තිය ඔවුන් දුටුවේ නැත. ඒ සීතල ඇඟිලිවල ස්පර්ෂය ලැබුයේ නැත. ගංගා නිම්නයේ මේ වනවිට ඇවිල ඇති සටන් ගැනද ඔවුන් දන්නේ නැත. ඔවුන් කෙසේ තේරුම්ගන්ට ද? හනිකට ආපසු හැරුනු ඔහු බුම්මාගත් මුහුණින් යුතුව දිගු පියවර තබමින් ඉවතට පිය මැන්නේය. පිප් ඔහුට කතා කල නමුදු ජොන් ඒ නොතකා හැරියේය.

ගින්නෙන් පසු ඔවුන් නැවතත් ඔහු පෙර පදිංචිව සිටි කඩාහැලෙන හාර්ඩින් ගේ කුළුණේ වූ කුටිය ඔහුට වාසය පිණිස ලබා දී තිබින. ගෝස්ට් දොර අබියස වකුටුව නිදා සිටි නමුදු ජොන්ගේ බූට්ස් සපත්තුවල හඬ ඇසුනු සැනින් හිස ඔසවා බැලීය. සෝරවාකයා ගේ රත් පැහැ දෑස් රබහ මැණික්වලටත් වඩා අඳුරු වූ අතර මිනිසුන්ට වඩා ඥානවන්ත විය. ජොන්

බිම දණ නමා, වෘකයා ගේ කණ පිටුපස කසා, සිය අසිපතේ මිට උඩට පෙන්වීය. "මේ. මේ බලපන්. මේ ඉන්නෙ උඹ."

සිය අනුරුව අනුව කැටයම් කල ශිලා මිට දෙස ඉවකර බැලූ ගෝස්ට් එය ලෙවකන්නට උත්සාහ දැරීය. ජොන් සිනාසුනේය. "උඹ තමා ගෞරවයක් ලබන්ට සුදුස්සා." ඔහු වෘකයාට කීවේය... ගිම්හානයේ එක්තරා දවසක, හිම අතරින් තමා ඌව සොයාගත් අන්දම හදිසියේම ඔහුට සිහිපත් වන්නට විය. ඔවුන් අනිත් වෘක පැටවුන් රැගෙන පිටව යන්නට සැරසුනු අතර ජොන් නැවත අසු හැරවූයේ ඇසුනු සියුම් හඬක් නිසා විය. අවට සැමතැනම වූ මිදුනු හිම අතර මේ පැටවා මුළුමනින්ම පාහේ අදෘශ්‍යමාන විය. 'එයා තනියම.' ජොන් සිතුවේය. 'රංචුවෙ අනිත් පැටවුන්ගෙන් වෙන්වෙලා. එයා වෙනස්. ඒ නිසා උන් එයාව රංචුවෙන් එලවලා.'

"ජොන්." ඔහු හිස ඔසවා බැලුවේය. සැම්වෙල් ටාර්ලි ඔහු අසල සිටගෙන නොසන්සුන් අයුරකින් ඔහු දෙස බලා සිටියේය. සීතය නිසා ඔහුගේ දෙකොපුල් රත් පැහැ ගැන්වී තිබුනු අතර පැළැඳ සිටි සනකම් ලොම් හිමකබාය නිසා ඔහුව දිස්වූයේ ශීතකාලය වෙනුවෙන් නිදන්නට සූදානම් වන වලසකු මෙනි.

"සැම්." ජොන් නැගිට සිටියේය. "මොකක්ද? උඹටත් කඩුව බලන්ට ඕනද?" අනිත් කොලුවන් ද මේ බැව් දැනසිටියා නම් සැම් ඒ බව නොදැන සිටීමට හේතුවක් නැත.

මහත කොලුවා හිස සැලීය. "එක කාලෙක මමත් මගේ තාත්තගෙ කඩුවට උරුමක්කාරයෙක් වෙලා හිටියා. හදවතේ විනාශය. තාත්තා කීපවතාවක්ම මට ඒක අල්ලලා බලන්ට දුන්නා. ඒ වුනත් ඒ හැම වෙලාවෙම ඒක මාව බයකලා. ඒකත් වැලීරියන් වානේ. ඒක හරිම ලස්සනයි. ඒ වුනත් ඒක හරිම මුවහත්, මම බයවුනා මගේ අතින් නංගිලාට මොකුත් අනතුරක් වෙයි කියලා. දැන් ඉතින් ඒක ඩිකන්ට තමා අයිති." ඔහු දඟදිය දැමූ දෑත් සළුවේ පිසදැමීය. "මම. ආහ්!.. මේස්ටර් ඒමන්ට උඹව මුනගැහෙන්ට ඕනලු."

ඒ ඔහුගේ වෙළුම්පටි අලුත් කරන්නට අවැසි වේලාවක් නොවීය. ජොන් සැකමුසු අයුරින් රවා බැලීය. "ඇයි?" සැම්ගෙන් දිස්වූ බැගෑපත් දුක්ඛිත පෙනුමෙන්ම ඔහු පිළිතුර

වටහාගත්තේ ය. "උම එයාට කිවුවා. එහෙම නේද?" ජොන් කේන්තියෙන් ඇසීය. "උඹ මට විස්තරේ කිවුවා කියලා උඹ එයාට කිවුවා නේද?"

"මම... එයා... ජොන්, මට කියන්ට ඕන වුනේ නෑ... එයාමයි ඇහුවෙ... මම හිතන්නෙ එයා දන්නවා. අපි කාටවත් පේන්නෙ නැති දේවල් එයා දකිනවා..."

"එයා අන්ධයෙක්." ජොන් සිතේ නැගී පිළිකුලින් යුතුව සැරෙන් කීවේය. "මට පුළුවන් යන පාර හොයාගන්ට. "ඇරගත් මුවින් යුතුව නලියමින් සිටි සැම් එතැන හැර දමා ඔහු පිටව ගියේය.

* * *

කපුටු කූඩු අසල කපුටන්ට කෑම දමමින් සිටි මෙස්ටර් ඒමන් සොයාගැනීමට ජොන්ට හැකිවිය. මස් කැලි පිරවූ බාල්දියක් අතින් ගත් ක්ලයිඩස් ද ඔහුත් සමග වූ අතර ඔවුන් දෙදෙනා කූඩුවෙන් කූඩුවට යමින් සතුන්ට අහර බෙදා දෙමින් සිටියහ. "සැම් කිවුවා ඔබට මාව මුනගැහෙන්ට ඕනයි කියලා."

මෙස්ටර්වරයා හිස වැනීය. "ඔවු. ක්ලයිඩස්, ඔය බාල්දිය ජොන්ට දීපන්. එයා මට උදවු කරයි." කුදුගැසුනු කළු සොහොයුරා බාල්දිය ජොන් අතට බාර දී දඬිබිඩියේ ඉණිමගෙන් පහළට බැස්සේය. "ඔය මස් කැලි කූඩුවලට වීසි කරපන්." ඒමන් ඔහුට උපදෙස් දුන්නේය. "කපුටො ඉතුරු ටික බලාගනියි."

බාල්දිය දකුණතට මාරු කල ජොන් රත් පැහැ මස් කැබැලි අතරට වමත එබීය. මහහඬින් කෑගසන්නට පටන්ගත් කපුටෝ කූඩුව තුළ එහාමෙහා පියාඹමින් ලෝස දැල්වල හැපෙමින් මහත් ගාලගෝට්ටියක් කරන්නට වන්හ. මේ මස් කැබැලි ඇඟිලි පුරුකක් තරම් කුඩාවට කපා තිබුනි. එයින් මිටක් පුරවාගත් ජොන් එය කූඩුව තුළට විසිකලේය. කපුටන්ගේ ගාලගෝට්ටිය තවත් වැඩිවන්නට විය. වඩා විශාල වූ කපුටන් දෙදෙනෙකු මස් කැබැල්ලකට පොරකද්දී උන්ගේ පිහාටු දසත විසිර ගියේය. විගස දෙවන මිටක් පුරවාගත් ජොන් එය කූඩුවට විසිකලේය. "මෝර්මන්ට් උතුමානන්ගෙ කපුටා කැමැතියි පළතුරුයි ඉරිඟු ඇටයි කන්ට."

"ඌ බොහොම දුර්ලභ කුරුල්ලෙක්. ගොඩක් කපුටො ධාන්‍ය කනවා. ඒ වුනත් උන් වැඩියම කැමැති මස් කන්ට. ඒකෙන් උන් ශක්තිමත් වෙනවා. ඒ වගේම උන් ලේ රසයට කැමැතියි. එහෙම බැලුවොත් උනුත් හරියට මිනිස්සු වගේ... මිනිස්සු වගේම හැම කපුටාම එක වගේ නැහැ."

මෙයට සුදුසු පිළිතුරක් ජොන්ට සොයාගත නොහැකි විය. එබැවින් ඒමන් තමාව කැඳවූයේ මන්දැයි සිතමින් ඔහු නිහඬවම මස් කැබැලි විසිකරන්නට විය. කිසිදු සැකයකින් තොරව මහල්ලා තමාට උවමනා තරම් වේලාව ගනිමින් අවැසි වේලාවට එය ඔහුට පවසනු ඇත. මේස්ටර් ඒමන් වනාහි ඔබට හදිසි කල හැකි මිනිසකු නොවේ. "පරෙවියොත් පුරුදු කරන්ට පුළුවන් පණිවුඩ අරන් යන්ට." ඔහු දිගටම කතා කරන්නට වන්නේය. "ඒ වුනත් කපුටා වඩා ලොකුයි. ශක්තිමත් පියාඹන්නෙක්. නිර්භීතයි. හරිම දක්ෂයි. උකුස්සන්ගෙන් බේරෙන්ට වැඩි හැකියාවක් තියෙනවා... ඒ වුනත් කපුටො කළුයි. උන් ජරාව කනවා. මළකුණු කනවා. ඒක නිසා සමහර භක්තිමත් මිනිස්සු උන්ව පිළිකුල් කරනවා. උඹ දන්නවද? ආශීර්වාද ලත් බේලර් උත්සාහ කලා ඔක්කොම කපුටො අයින්කරලා එතැනට පරෙවියො දාන්ට." මහල්ලා සිනාසෙමින් සිය අන්ධ දෑස් ජොන් දෙසට හැරවීය. "නිශාරකුම කැමැතියි කපුටන්ට."

ජොන්ගේ අතැඟිලි බාල්දියේ ගිලී ගියේ මැණික්කටුව දක්වාම රත් පැහැ ගන්වමිනි. "ඩිවන් කියනවා වනචාරින් අපට කපුටො කියලා කියනවලු."

"ඒ කියන්නෙ අර මුන්ට වඩා පොඩි කපුටො ජාතිය ගැන. උන් දෙන්නම ඥාති සහෝදරයො. උන් දෙන්නම කළුයි, පිළිකුල් කරනවා, වරදවා වටහගෙන තියෙන්නෙ."

ඔවුන් මේ කතා කරමින් සිටින්නේ කුමක් සම්බන්ධව ද, ඒ ඇයි ද යන්න දැනගන්නට ඇත්තේ නම් යැයි ජොන් කල්පනා කලේය. කපුටන් හා පරෙවියන්ගෙන් ඔහුට ඇති වැඩය කිම? මේ නාකියාට ඔහුට යමක් කියන්නට ඇත්නම් ඔහු එය කෙලින්ම නොකියන්නේ මන්ද?

"ජොන්, උඹ කවදාවත් හිතුවද ඇයි නිශාරකුමෙ මිනිස්සු කසාද බැඳලා ළමයි හදන්නෙ නැත්තෙ කියලා?"

ජොන් දෙවුර ඇකිළීය. "නෑ." ඔහු තවත් මස් විසුරුවා හැරියේය. ඔහුගේ වමතේ අතැඟිලි රුධිරය නිසා සෙවෙල සහිත විය. ඔහුගේ දකුණත බාල්දියේ බරින් මිරිකෙන්නට විය.

"එහෙම කරන්නෙ උන්ට ආදරේ කරන්ට බැරි වෙන්ටයි. මොකද ආදරේ කියන්නෙ ගෞරවයේ විනාශය. රාජකාරියේ මරණය."

මෙය එතරම්ම ජොන්ගේ සිතට කා වැදී නොගියේය. එනමුදු ඔහු කිසිවක් නොකියා නිහඬ විය. මේස්ටර්වරයා සියක් වසරක් වයස් ගතවූවකු වන අතර නිශාරකුමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි. ඔහු කියන්නකට එදිරි වීම තමන්ට ගැලපෙන්නක් නොවේ.

මහල්ලාට ඔහුගේ දෙගිඩියාව තේරුනාක් මෙනි. "මට කියහන් ජොන්. අවාසනාවකට වගේ එක දවසක් ආවොත් උඹේ තාත්තට තෝරගන්ට තමන්ගෙ ගෞරවයයි එයා ආදරේ කරන අයයි අතරින් එකක්, එයා මොකක් කරයිද?"

ජොන් මොහොතක් අතීරණයෙන් පෙලුනේය. එඩාර්ඩ් උතුමානන් කෙදිනකවත් තමන්ගේ ගෞරවය නැති කරනොගන්නා බවත්, ආදරය වෙනුවෙන් හෝ එවැනි දෙයක් කරන්නට නොසිතන බවත් කියන්නට ඔහුට උවමනා විය. එනමුදු ඔහු තුළ වූ යම් සිහින් කටහඬක් ඔහුට කෙඳිරීය. 'එයා අවජාතකයෙකුට තාත්තා වුනා. ඒකෙ තියෙන ගෞරවය මොකක්ද? එතකොට උඹේ අම්මා? අම්මා වෙනුවෙන් එයාගෙ යුතුකම් කෝ? එයා අඩුමගානෙ අම්මගෙ නමවත් කියන්නෙ නෑ.' "එයා හරියි කියලා හිතෙන දේ කරයි. මොන දේ වුනත්."

"එහෙමනම් ඉතින් එඩාර්ඩ් උතුමානන් කියන්නෙ මිනිස්සු දහදාහකින් එක්කෙනෙක්. අපි ගොඩක් දෙනෙක් එච්චර ශක්තිමත් උදවිය නෙවෙයි. ගෑනියෙකුගෙ ආදරේ එක්ක සංසන්දනය කරලා බලද්දි ගෞරවය කියන්නේ මොන කෙහෙල්මලක් ද? උඹේ අත්දෙකට මැදිවෙලා ඉන්න අලුත ඉපදුන පුංචි එකෙක් එක්ක බලද්දි රාජකාරිය කියන්නෙ මොන මගුලක් ද? එහෙමත් නැත්තම් සහෝදරයෙක්ගෙ හිනාවත් එක්ක බැලුවොත්?

එතකොට ඒවා නිකංම නිකං වචන ටිකක් විතරයි. නිකං හුළං පාරක ගහගෙන යන වචන ටිකක් විතරයි. අපි නිකංම නිකං මිනිස්සු. දෙවිවරු අපිව මවලා තියෙන්නෙ ආදරේ කරන්ට. ඒක තමා අපේ ලොකුම ජයග්‍රහණය. ඒ වගේම අපේ ලොකුම ශෝකාන්තය."

"මේ නිශාරකුම ගොඩ නංවපු මිනිස්සු දැනගෙන හිටියා උතුරෙන් එන නපුරු අන්ධකාරයෙන් මේ රාජධානිය ආරක්ෂා කරන්ට තියෙන එකම පලිහ උන්ගෙ ධෛර්යය විතරයි කියලා. උන් දැනගෙන හිටියා උන්ගෙ අධිෂ්ටානය වෙනස් නොවී තියාගන්ට ඕන නම් උන්ගෙ පක්ෂපාතිත්වය, උන්ගෙ ලැදිකම හතර අතේ බෙදලා දාන්නෙ නැතුව එක තැනකට යොමුකරලා තියාගන්ට ඕනමයි කියලා. එහෙම වුනොත් උන්ගෙ අධිෂ්ටානය දුර්වල වෙනවා. ඉතින් ඒක නිසා උන් දිවුරුමක් දුන්නා කවදාවත් කසාද බඳින්නෙ නෑ, කවදාවත් ළමයි හදන්නෙ නෑ කියලා."

"ඒ වුනත් උන්ට සහෝදරයො හිටියා. සහෝදරියො හිටියා. උන්ට උපත දුන්න අම්මලා හිටියා. උන්ට නම් දුන්න තාත්තලා හිටියා. උන් ආවෙ හැම වෙලාවෙම එකාට එකා සටන් කරමින් හිටිය රාජධානි සිය ගානකින්. ඒ වගේම උන් දැනගෙන හිටියා කාලයත් එක්ක දේවල් වෙනස් වෙන්ට පුළුවන්, නමුත් මිනිස්සු වෙනස් වෙන්නෙ නෑ කියලා. ඒක නිසා උන් තවත් දිවුරුමක් දුන්නා, තමන් රකින්ට ප්‍රතිඥා දීලා තියෙන මේ රාජධානිවල අභ්‍යන්තර අරගලවලට මැදිහත් වෙන්නෙ නෑ කියලා."

"උන් මේ දිවුරුම රැක්කා. ජයග්‍රාහක ඒගන් කළු හැරෙන්ව මරලා දාලා රාජධානිය උදුරගත්තු වෙලාවෙ නිශාරකුමෙ අණදෙන නිළධාරියා වෙලා හිටියෙ කළු හැරෙන්ගෙ සහෝදරයා. එයා යටතෙ දහදාහක් සෙබළු හිටියා. ඒ වුනත් එයා යුද්ධෙට ගියේ නැහැ. මේ රාජධානි සප්තකය ඇත්තටම වෙන් වෙන් රාජධානි හතක් වෙලා තිබුන කාලෙ උන් තුන් හතරදෙනෙක් යුද්ධ නොකර හිටපු පරම්පරාවක් තිබුනෙ නැති ගානයි. ඒ වුනත් නිශාරකුම කාගෙවත් පැත්තක් ගත්තෙ නැහැ. අන්දාල්වරු පටු මුහුද තරණය කරලා ඇවිල්ලා මුල් මිනිස්සුන්ගෙ රාජධානි විනාශ කර කර යනකොට මේ වැටිච්ච රජවරුන්ගෙ පුත්තු තමන්ගෙ දිවුරුමට පක්ෂපාතීව තමන්ගෙ නියමිත තැන වෙච්ච ප්‍රාකාරෙටම වෙලා හිටියා. එහෙමයි ඒක හැමදාමත් වුනේ. උඹට ගණන් කරන්ටත් බැරි තරම් කාලාන්තරයක් තිස්සෙ එහෙමයි වුනේ. ඒ තමා ගෞරවය වෙනුවෙන් ගෙවන්ට වෙච්ච මිල."

"බයගුල්ලෙකුටත් පුළුවන් අනිත් ඕනම මිනිහෙක් තරමටම නිර්භීත වෙන්ට. බයවෙන්ට වෙන කිසිම කාරණයක් නැත්තම්. අපි හැමෝම අපේ රාජකාරිය අකුරටම ඉටුකරනවා ඒ

වෙනුවෙන් මිලක් ගෙවන්ට සිද්ද වුනේ නැති වෙලාවට. එතකොට නම් හිතෙන්නෙ මේ ගෞරවය වෙනුවෙන් වැඩ කරන එක කොච්චර ලේසිද කියලයි. ඒ වුනත් ඉක්මනටම හරි පස්සෙ හරි හැම මිනිහෙකුටම එනවා දවසක්, ඒක තවදුරටත් ලේසි වැඩක් වෙන්නෙ නැති. දවසත් එනවා එයාට තෝරාගැනීමක් කරන්ට සිද්දවෙන."

සමහර කපුටෝ තවමත් අහර බුදිමින් සිටියහ. ඔවුන්ගේ හොටවලින් දිගැති මස් කැබැලි එල්ලෙමින් තිබුනි. එනමුදු අනික් කපුටන් සියල්ලක්ම තමා දෙස බලා සිටින්නාක් මෙන් ජොන්ට හැඟුනි. මේ පුංචි කළු පැහැ දෑස් සියල්ලම එකතු වී තමා මත මහත් බරක් පටවන්නාක් මෙන් ඔහුට දැනුනි. "ඉතින් අද තමා මගේ දවස... ඒකද ඔබ ඔය කියන්ට හදන්නෙ?"

මේස්ටර් ඒමන් හිස හරවා ඒ අන්ධ කිරි සුදු පැහැ දෑසින් ඔහු දෙස බැලුවේය. එය හරියටම ඔහු සිය සම විනිවිද ගොස් හදවත පතුළ අත ගා බලන්නාක් මෙන් විය. තමා නිරුවතින් ඔහු ඉදිරියේ සිටගෙන ඉන්නාක් වැනි හැඟීමක් ජොන්ට දැනෙන්නට විය. දැතින්ම මස් බාල්දිය ඔසවාගත් ඔහු ඉතුරු වී තිබුනු මස් සියල්ලම කූඩුව තුළට විසිකර දැම්මේය. මස් කැබැලිත් රුධිරයත් දසත විසිර ගියේය. කපුටෝ වහා විසිර ගියේ මහහඬින් කරවු කරමින් සීසීකඩ පියාඹන්නට වන්හ. ජොන් හිස් බාල්දිය බිම අත් හැරියේය.

මහල්ලා වියළි, පුල්ලි වැටුනු අතක් ඔහුගේ දසරුව මත තැබුවේය. "ඒක වේදනාවයි කොල්ලො." ඔහු මෘදු ස්වරයෙන් කීය. "ආහ්! ඔවු. තෝරාගැනීම කියන්නෙ හැම වෙලාවෙම වේදනාවක්. මම දන්නවා ඒක හැමදාමත් එහෙම වුනා. හැමදාමත් එහෙම වේවි."

"ඔබ දන්නෙ නෑ." ජොන් කටුක ස්වරයෙන් කීය. "කිසිම කෙනෙක් දන්නෙ නෑ. මම එයාගෙ අවජාතකයා වුනත් එයා තාමත් මගේ තාත්තා..."

මේස්ටර් ඒමන් සුසුමක් හෙලීය. "මම උඹට කියාපු කිසිම දෙයක් උඹ අහගෙන නෙවෙයිද හිටියෙ ජොන්? උඹ හිතන්නෙ ඕකට මූනදුන්න පළවෙනියා උඹයි කියලද?" ඔහු සිය මහලු හිස දෙපසට වැනුවේ හරියටම වදනින් කියාගත නුහුන යමක් කියන්නට තැත් කරන්නාක් මෙනි. "දෙවිවරු මගේ දිවුරුම තුන් පාරක් පරීක්ෂා කරලා බැලුවා. එකපාරක් මම පොඩි කොල්ලෙක් කාලෙ. තව පාරක් මම හොඳට වැඩුන මිනිහෙක් වෙලා ඉන්දැද්දි. අනිත් පාර

මම නාකි වෙලා ඉන්දැද්දි. ඒ වෙනකොට මගේ ශක්තිය නැතිවෙලා ගිහිල්ලයි තිබුනෙ. මගේ ඇස් දෙක දුර්වල වෙලයි තිබුනෙ. ඒ වුනත් ඒ අන්තිම පරීක්ෂාව අර මුල්ම පරීක්ෂාව තරම්ම වේදනාවක් ගෙනාවා. ඒ අන්තිම තෝරාගැනීම අර මුල්ම තෝරාගැනීම තරම්ම කෲර වුනා. මගේ කපුටො දකුණෙ ඉඳන් පණිවුඩ අරන් ආවා. උන්ගෙ පියාපත්වලටත් වඩා අඳුරු ආරංචි. මගේ වංශයේ විනාශය. මගේ නෑයින්ගෙ මරණ. අපකීර්තිය. වියෝගය. මට මොකක්ද කරන්ට පුළුවන්? නාකියි, අන්ධයි, දුර්වලයි. මම හරියට කිරිබොන දරුවෙක් ගානට අසරණ වුනා. අනාථ වුනා. ඒ වුනත් ඒ දේවල් වෙන අතරෙදි මෙහෙම මුල්ලකට වෙලා කාටත් අමතක වෙලා ඉන්ට සිද්දවෙච්ච එක ගැන මට මහ කණගාටුවක් ඇතිවුනා. උන් මගේ මල්ලිගෙ අර අසරණ මුනුබුරාගෙ බෙල්ල කපලා මරද්දි, එයාගෙ පුතාවත් මරද්දි, ඒ පුතාගෙත් පුංචි දරුවො පවා මරද්දි..."

මහල්ලාගේ දෑසේ දිදුලන කඳුළු බිඳු දැකීමෙන් ජොන් තිගැස්සුනේය. "ඔබ කවුද?" ඔහු මෘදු ස්වරයෙන්, තැතිගැන්මෙන් යුතුව ඇසීය.

වියළි දෙතොල් මත දත් නැති සිනාවක් මතුවිය. "මම සිටඩෙල් එකේ නිකංම නිකං මේස්ටර් කෙනෙක් විතරයි. කළු බලකොටුවටත් නිශාරක්‍ෂකුමටත් සේවය කරන්ට බැඳුන සේවකයෙක් විතරයි. අපේ නිකායෙ සම්ප්‍රදාය අනුව දිවුරුම් දීලා මේ දම්වැල කරේ දාගන්න දා ඉඳන් අපි අපේ පෙළපත් නම් අත ඇරලා දානවා." මහල්ලා සිය කෙසඟ ගෙල වටා ලිහිල්ව එල්ලා වැටුනු දම්වැල අතපත ගෑවේය. "මගේ තාත්තගෙ නම මේකර්. ඒ නමින් හිටිය පළමුවෙනියා. එයාගෙන් පස්සෙ මගේ මල්ලි ඒගන් රජවුනා මම වෙනුවට. මගේ සීයා මට නම දැම්මෙ මකර නයිට්වර ඒමන් කුමාරයා මතක් වෙන්ට කියලයි. ඒ එයාගෙ මාමා. එහෙමත් නැත්තම් එයාගෙ තාත්තා. ඒක තීරණය වෙන්නෙ උඹ මොන කතාව විශ්වාස කරනවද කියන එක උඩ. ඒමන්. එහෙමයි එයා මට නම දැම්මෙ..."

"ඒමන්... ටාර්ගේරියන්?" ජොන්ට තම දෙසවන් අදහාගැනීමට නොහැකි විය.

"එකමත් එක කාලෙක." මහල්ලා කීවේය. "එකමත් එක කාලෙක. ඉතින් දැන් උඹට පේනවනෙ. මමත් ඔය දේවල් ගැන දන්නවා... මම උඹට කියන්නෙ නෑ ඉන්ටයි කියලා. මම උඹට කියන්නෙ නෑ යන්ටයි කියලත්. ඒ තීරණය උඹ විසින්මයි ගන්ට ඕන. ඊටපස්සෙ ඒ ගත්තු තීරණයත් එක්ක උඹේ ඉතුරු ජීවිතකාලෙම ගෙවලා දාන්ට ඕන. හරියට මම කලා වගේ." ඔහුගේ කටහඬ සිහින් වී ගොස් මිමිනුමක් බවට පත්වූයේය. "හරියට මම කලා වගේ...

**Jeor Mormont: “Eight thousand years is a good while, to be sure... yet if the Night’s Watch does not remember, who will?”**

ඩෙනේරිස් 07-1

සටන නිමවූ පසු ඩැනී මළකඳන් පිරුනු භූමිය අතරින් සිය රිදී වෙළඹ මෙහෙයෙවූවා ය. ඇගේ සේවිකාවෝ හා බාස් එකේ සෙබළු සිනාසෙමින්, එකිනෙකාට විහිළු කරමින් ඈ පසුපසින් ඇදී ආවෝය.

ඩොත්රකියන් ගේ අසු කුර මගින් පොළොව මැඩී, රයි හා පරිප්පු වගාවන් බිමටම සමතලා වී තිබුනි. මේ අතර අරඛ් හා ඊතල මගින් නවතම වගාවක් සිටුවා එයට රුධිරයෙන් පොහොර දමා තිබුනි. මියයමින් සිටි අස්හු පසුකර යන ඇය දෙස හිස ඔසොවා බලා දුක්ඛිත අයුරින් හේෂාරවය කලෝය. තුවාල ලැබූ මිනිස්සු වේදනාවෙන් කෙඳිරිගාන්නටත් යාඥා කරන්නටත් වන්හ. බරුති පොරෝ අතින් ගත් ජබ්බා ර්හාන් හෙවත් ක්ෂමාවේ දූතයෝ මේ මිනිසුන් අතර ඇවිදිමින් ඔවුන්ට සාමය ලබාදෙමින් හුන්හ. ඔවුන්ට අයත් රාජකාරිය වූයේ මියගිය හා මියයමින් සිටින්නන් ගේ හිස්ගෙඩි එකතු කරගැනීමයි. මේ ක්ෂමාවේ දූතයින්ට පසුපසින් පැමිණි කුඩා ගැහැණු ළමයින් රංචුවක් මළකඳන්වල ඇමිනී තිබුනු ඊතල ගලවාගෙන සිය කූඩා පුරවාගන්නට වූහ. මේ සැමටම පසුව කෙසඟ, සැමවිටම කුසගින්නෙන් පෙලෙන බලු රංචුව ඉව කරමින් පැමිණියහ. මේ ප්‍රචණ්ඩ බලු රංචුව සැමවිටම ඩොත්රකි සේනාවට සමීපයෙන් සිටීමට පුරුදු වී සිටියෝය.

බැටළු රංචු සැමටම පෙර මියගොස් සිටියෝය. ඔවුන් දහස් ගණනක් බිම විසිරී සිටි අතර ඒ වටා මැස්සෝ පොදි කමින් සිටියහ. මේ සැම මළකඳකම ඇමිනුනු ඊතලයක් බැගින් විය. බාල් ඕගෝගේ සෙබළුන් විසින් මේ ඝාතන කරන්නට ඇති බැව් ඩැනී දැන සිටියාය. මරා දමන්නට ඇතිතරම් එඬේරුන් සිටියදී බැටළුවන්ට විද ඊතල නාස්ති කර දමන්නට තරම් මෝඩයෝ ඩ්‍රෝගෝගේ බලසාරයේ නොවූහ.

නගරය ගිනිගෙන දැවෙමින් තිබුනි. කළු පැහැ විසල් දුම් රොටු නිල් අහසට නගිමින් තිබුනි. වියළි මැටියෙන් තැනුනු බිඳීගිය නගර ප්‍රාකාර යට අසරුවෝ එහාටත් මෙහාටත් යමින් සිටියහ. ඔවුහු සිය දිගු කස වනමින් සටනින් නොමැරී ඉතුරු වූ මිනිසුන්ව දුම් දමන නටඹුන් අතරින් ගාල් කරමින් සිටියහ. ඕගෝගේ බලසාරයේ ගැහැණුන් හා දරුවන් පරාජිතව, බැම්මෙන් බැඳී නමුදු බුම්මාගත් මාන්නයකින් යුතුව ඇවිදින්නට වූහ. ඔවුන් දැන් වහලුන් වූ නමුදු ඔවුන් ඒ ගැන බිය වූ බවක් පෙනෙන්නට නොතිබුනි. එනමුදු නගරවැසියන් කෙරෙහි එය වෙනස් ආකාරයේ අත්දැකීමක් විය. ඩැනීට ඔවුන් ගැන මහත්

අනුකම්පාවක් දැනෙන්නට විය. මරබිය යනු කවරාකාරයේ දෙයක් දැයි ඇය හොඳින් දැන සිටියාය. හිස්, කිසිඳු ප්‍රාණවත් බවක් නොමැති මුහුණින් යුතු මවුවරු සිය ඉකිබිඳින දරුවන් අතින් ඇදගෙන පැකිලෙමින් ඇවිදින්නට වන්හ. මේ අතර පිරිමින් වූයේ ඉතාම සොච්චමකි. අබ්බගාතයින්, බියගුල්ලන් හා මහල්ලන් පමණි.

මේ රාජ්‍යයේ මිනිසුන් තමන්ව ලසාරීයයන් නමින් හඳුන්වාගන්නා බැව් සෙර් ජෝරා ඇයට කියාදුන්නේය. එනමුදු ඩොත්රකියන් ඔවුන්ව හැඳින්වූයේ හයෙශ් රාබ් හෙවත් බැටළු මිනිසුන් වශයෙනි. එක් කලෙකදී නම් ඩැනි ඔවුනුත් ඩොත්රකියන් යැයි වරදවා වටහාගන්නවා ඇත. මන්ද ඔවුන්ට ද ඒ හා සමාන තඹ පැහැ සමක් හා ආමන්ඩ් හැඩැති දෑස් තිබුනු බැවිනි. එනමුදු දැන් ඇයට ඔවුන් ගේ වෙනස්කම් විද්‍යමාන වන්නට විය. මිටි, තරබාරු සිරුරු හා පැතැළි මුහුණු හිමිව තිබුනු ඔවුන්ගේ කළු පැහැ හිසකෙස් අසාමාන්‍ය ලෙස කෙටි කර කපන ලද්දේය. ඔවුහු බැටළුවන් බලාගන්නා එඬේරුන් හා එළවළු අනුභව කරන්නන් වූහ. ඛාල් ඩ්‍රෝගෝ පැවසූයේ ඔවුන් ගංගාවේ නැම්මෙන් දකුණේ මිනිසුන් බවයි. ඩොත්රකි තැනිතලාවේ වූ තෘණ වර්ග බැටළුවන්ට හිතකර ඒවා නොවීය.

පිරිසෙන් මිදුනු එක් කොලුවෙක් ගංගාව දෙසට දිවයන ආකාරය ඩැනී දුටුවාය. ඔහුට අවහිර කල අසරුවෙක් ඔහුව ආපසු හැරවූ අතර තවත් සෙබළු ඔහුව වටකලෝය. ඔවුහු ඔහුගේ මුහුණට කසපහර දෙමින් ඔහුව ඒ මේ අත දුවවන්නට වූහ. එකෙක් ඔහු පසුපස අසු පන්නමින් කොලුවාගේ තට්ටම් ලෙයින් රත් පැහැ ගැන්වෙන තෙක් ඔහුට කසයෙන් තැලුවේය. තවෙකෙක් ඔහුගේ වලළුකර වටා කසය පටලවා ඇද්දෙන් කොලුවා හතරගාතයෙන් බිම ඇදවැටුනි. අන්තිමේදී, මේ කොලුවාට තවත් දුවන්නට හෝ නැගී සිටින්නට නොහැකි වූ විට, ඔහු බිම බඩගාන්නට පටන්ගත් විට මේ සෙල්ලම එපා වූ අසරුවෝ කොලුවාගේ පිට හරහා ඊයක් විද ඔහුට ශාන්තිය අත්කර දුන්නෝය.

* * *

බිඳවැටුනු නගර ද්වාරය අභිමුවදී ඇයට සෙර් ජෝරා මුනගැසුනි. ඔහු සිය මුදු දම්වැල් සන්නාහයට උඩින් තද කොළ පැහැ පිට කබායක් හැඳ සිටියේය. ඔහුගේ අත්වැසුම්, කළවා ආවරණ හා ශිරස්කය තද අඳුරු පැහැ වානේවලින් නිමියේය. මේ සන්නාහය ලාගත් විට ඩොත්රකියන් විසින් ඔහුට බියගුල්ලෙකියි සමච්චල් කර තිබුනු නමුදු නයිට්වරයා මේ සමච්චල් පෙරලා ඩොත්රකියන් වෙතටම එල්ලකරන්නට සමත් වී තිබුනි. වහසිබස්

දෙඩවී, දිගු අසිපත හා අරබ් එකට ගැටී තිබුනු අතර අන්තිමේදී වඩාත්ම හයියෙන් වහසිබස් දෙඩූ, සමච්චල් කල අසරුවා සිය තුවාලවලින් මියයන්නට හැරදමා තිබුනි.

ඉදිරියට පැමිණි සෙර් ජෝරා සිය ශිරස්කයේ මුව වැස්ම ඉහළට එසවීය. "ඔබේ සැමියා නගරෙ ඇතුළෙ ඔබ එනකම් බලන් ඉන්නවා."

"ඩ්‍රෝගෝට මොකුත් අනතුරක් නැහැ නේද?"

"පොඩි පොඩි කැපුම් දෙකතුනක් විතරයි. ඒවා ඒ හැටි ගණන් ගන්ට ඕන ඒවා නෙවෙයි. එයා අද දවසේ බාල්ලා දෙන්නෙක් මරලා දැම්මා. මුලින්ම බාල් ඕගෝව. ඊටපස්සෙ ඕගෝ මැරුනට පස්සෙ ඒ බලසාර් එකේ බාල් වුන එයාගෙ පුතා ෆෝගෝව. එයාගෙ රුධිරාරක්ෂකයො උන්ගෙ කොණ්ඩාවල ගහලා තිබුන සීනු ඔක්කොම ගලවලා දැම්මා. දැන් බාල් ඩ්‍රෝගෝ තියන තියන පියවරක් ගානෙ ඉස්සරටත් වඩා හයියෙන් සීනු සද්ද ඇහෙයි."

විසේරිස්ට ඔටුනු පැළැන්දූ දා පැවැති නම් තැබීමේ උත්සවයේදී බාල් ඕගෝත් ඔහුගේ පුතාත් දෙදෙනාම ඇගේ සැමියා හා එක්ව ගෞරවනීය උස් ආසනයේ වාඩි වී භෝජන සංග්‍රහය භුක්ති වින්දෝය. එනමුදු ඒ වයෙස් ඩොත්රැක්වල සියළු කඳුවල මාතාවගේ පාමුලදී විය. ඒ ශුද්ධ වූ නගරය තුළදී සියළුම ඩොත්රැකියන් සහෝදරයින් වූ අතර සියළුම අමනාපකම්, සටන්, ගැටුම් අමතක කර දමන ලදී. එනමුදු එයින් පිටත මේ තණපිටියේදී තත්ත්වය ඉඳුරාම වෙනස් විය. බාල් ඩ්‍රෝගෝ ඔවුන්ට පහර දෙද්දී ඕගෝගේ බලසාරය නගරයට පහර එල්ලකරමින් සිටියේය. බැටළු මිනිසුන් මේ සිදුවීම ගැන කුමක් සිතන්නට ඇත්දැයි ඩැනී විමතියෙන් කල්පනා කලාය. මැටි ප්‍රාකාරය උඩ සිට ඩ්‍රෝගෝගේ අසරු හමුදාව විසින් ඇතිකරන ලද ධූලි වලාව දෙස බලද්දී සමහරවිට තමන් විසින් දෙවියන්ට කල යාඥා සඵල වී යැයි, දෙවියන් විසින් ඔවුන්ව මුදවා ගත්තේයැයි ඔවුන් සිතන්නට ඇත.

පාරෙන් එහා පස එක් ඩොත්රැකි අසරුවෙක් ඩැනීගේ වයසේ වූ දැරියක් මළකඳන් අතර මුනින්තලා බිම හොවා ඇයව දූෂණය කරමින් සිටියේය. මේ දැරිය නොනවත්වාම තියුණු සරින් ඉකිබිඳ හඬමින් සිටියාය. තවත් අසරුවෝ එතැන අසු නවත්වා බිමට බැස්සේ සිය වාරය එනතෙක් කල් මරන්නට වූහ. මේ වනාහි ඩොත්රැකියන් වෙතින් බැටළු මිනිසුන්ට පිදුනු ගලවාගැනීම විය.

'මම තමා මකරාගේ රුධිරය!' ඩැනී තමාටම පවසාගත්තේ මේ දසුනෙන් ඉවතට දෑස් හරවමිනි. දෙතොල් තද කරගත් ඇය, හදවත දැඩි කරගෙන නගර ද්වාරය දෙසට අසු මෙහෙයවීය.

"ඕගෝගෙ සෙබළු වැඩිහරිය පැනලා දිවුවා." සෙර් ජෝරා කීවේය. "ඒ වුනත්, අපට දහදාහක් විතර අල්ලගන්ට පුළුවන් වුනා."

'වහල්ලු!' ඩැනී සිතුවාය. බාල් ඩ්‍රෝගෝ විසින් ඔවුන්ව ගංගාව පහළ වූ වහල් හිමියන්ගේ මුහුදු බොක්ක අසල නගරයකට දක්කනවා ඇත. ඇයට හඬන්නට උවමනා විය. එනමුදු තමා ශක්තිමත් විය යුතු බැව් ඇය තමාටම පවසාගත්තා ය. 'මේ තමා යුද්ධය. මේ තමා ඒකෙ හැටි. මේ තමා යකඩ සිංහාසනය වෙනුවෙන් ගෙවන්ට ඕන මිල.'

"මම බාල්ට කිවුවා එයා මීරීන්වලට ගියානම් වඩා හොඳයි කියලා." සෙර් ජෝරා දිගටම කතාකලේය. "වහල් තවලමකින් ගෙවනවාට වඩා හොඳ ගානක් උන්ගෙන් ගන්ට පුළුවන් වෙයි. ඉල්ලීරියෝ ලියලා තිබුනා උන්ට ගිය අවුරුද්දෙ වසංගතයක් ආවයි කියලා. එහෙ ගණිකා මඩම්වලින් හොඳ නිරෝගී කෙල්ලන්ට දෙගුණයක් මිල ගෙවනවලු. අවුරුදු දහයෙන් පහළ කොල්ලන්ට තුන්ගුණයක් ගෙවනවලු. ඇති තරමක් ළමයි මේ ගමන නිසා නොමැරී ඉතුරුවුනොත් අපට හොඳ සල්ලියක් හොයාගන්ට පුළුවන් වෙයි. එතකොට අපට පුළුවන් ඕනකරන නැවු ඔක්කෝමයි ඒවායෙ සේවය කරන්ට ඕන නාවිකයොයි ඔක්කොම හොයාගන්ට."

ඔවුන්ට පිටුපසින් දූෂණයට ලක්වෙමින් සිටි තරුණිය හදවත රිදවන අන්දමේ ස්වරයකින් හඬන්නට වන්නීය. ඇගේ උස්, තියුණු වැළපීම නොනවත්වාම ඇසෙන්නට විය. ඩැනීගේ දැත් තෝන්ලණුව තදින් මිරිකා ගති. ඇය සිය රිදී වෙළඹ ආපසු හැරෙවුවාය. "උන්ට ඒක නවත්තන්ටයි කියන්ට." ඇය සෙර් ජෝරාට අණ දුන්නාය.

"බලීසි?" නයිට්වරයා වික්ෂිප්ත වූවාක් මෙන් පෙනුනි.

"ඔබට ඇහුනානෙ මම කියපු දේ. උන්ව නවත්තන්ට." ඇය සිය බාස් එකේ සෙබළුන්ට ඩොත්රැකි බසින් ඇමතුවාය. "ජෝගෝ, ක්වාරෝ. උඹලා සෙර් ජෝරාට උදවු කරන්ට ඕන. මට ඕන මේ දූෂණ නවත්තන්ට."

සෙබළු පැටලිලි සහගත ස්වරයෙන් එකිනෙකා ගේ මුහුණු බලන්නට වන්හ.

සිය අසුට සන් කල ජෝරා ඇයට සමීප විය. "කුමාරි. ඔබට බොහොම කරුනාවන්ත හදවතක් තියෙනවා. ඒ වුනත් ඔබ මේක තේරුම් ගන්නෙ නැහැ. මෙහෙම තමා හැමදාම වැඩ සිද්ද වුනේ. මේ මිනිස්සු ඩ්‍රෝගෝ වෙනුවෙන් තමන්ගෙ ලේ හැලුවා. දැන් උන් ඒකෙ හිලවුවට තෑගි ලබාගන්නවා."

පාරෙන් එහා පස වූ තරුණිය තවමත් වැලපෙමින් සිටියාය. මුල් අසරුවා මේ වනවිට සිය කාර්‍ය්‍ය නිමා කොට තිබුනු අතර තවෙකෙකු ඔහුගේ ස්ථානය ගෙන තිබුනේය.

"ඒකි බැටළු කෙල්ලෙක්." ක්වාරෝ කීවේය. "ඒකි කොහෙත්ම වැදගැම්මකට ඇති එකියක් නෙවෙයි ඛලීසි. මේ සෙබළු ඒකිට ගෞරවයක් ඔය කරන්නෙ. බැටළු මිනිස්සු කියන්නෙ බැටළුවො එක්කත් නිදිවදින ජාතියෙ මිනිස්සු. ඒක දන්න දෙයක්."

"ඒක දන්න දෙයක්." ඇගේ සේවිකාව ඉරී ද ප්‍රතිරාව නැගුවාය.

"ඒක දන්න දෙයක්." ඩ්‍රෝගෝ විසින් ඔහුට ලබාදුන් අළු පැහැ උස් සෛන්ධවයා පිට නැගුනු ජෝගෝද එකඟ විය. "ඒකිගෙ කෑගැහිල්ල ඔබේ කණ් දෙකට හිරිහැරයක් නං ඛලීසි, ජෝගෝ ගිහින් ඒකිගෙ දිව කපලා ඔබට අරන් එන්නං." ඔහු සිය අරඛ් එක පිටතට ඇදගත්තේ ය.

"ඒකිට අනතුරක් කරන්ට මට ඕන නැහැ." ඩැනී කීවාය. "මම ඒකිට අයිතිවාසිකම් කියනවා. මම අණ කරන විදියට කරපන්. එහෙම නොකලොත් ඛාල් ඩ්‍රෝගෝට දැනගන්ට ඕන වෙයි ඒ ඇයි කියලා."

"එහෙමයි බලීසි." ජෝගෝ පිළිතුරු දුන්නේය. ඔහු අසු හරවා ගත් අතර ක්වාරෝ හා අනිකුන් ඒ පසුපසු අසුන් පැන්නවූහ. ඔවුන්ගේ කෙහෙරළිවල බැඳි සීනු නද දෙන්නට විය.

"එයාලත් එක්ක යන්ට." ඇය සෙර් ජෝරාට අණකලාය.

"ඔබේ අණ මගෙයි කුමාරි." නයිට්වරයා ඇ දෙස කුතුහලාත්මක බැල්මක් හෙලුවේය. "ඇත්තම කියනවා නම් ඔබ ඔබේ අයියාගෙම නංගි."

"විසේරිස්?" ඇයට ඔහු කියන්නක් වටහා ගත නොහැකි විය.

"නෑ. රේගාර්." ඔහු සිය අසු පිම්මේ ඉවත පැන්නවීය.

* * *

ජෝගෝ කෑගසන හඬ ඩැනීට ඇසුනි. දූෂකයෝ ඔහුට සිනාසුනෝය. එක් මිනිසෙක් පෙරලා කේන්තියෙන් කෑගැසීය. ජෝගෝගේ අරඛ් එක විදුලියක් මෙන් ඉදිරියට පිනූ අතර කෑගැසූ මිනිසාගේ හිස කඳින් වෙන්ව පෙරළී ගියේය. අනිකුත් දූෂකයින් ගේ මුවේ වූ සිනා මැකීගොස් අවලාද මතුවන්නට වූ අතර ඔවුන්ද සිය ආයුධ වෙතට අත් යැවූහ. එනමුදු ඒ වනවිට ක්වාරෝ, අග්ගෝ හා රඛාරෝ ද ඒ දෙසට ළඟා වී සිටියහ. ඇය සිය රිදී පිට වාඩිවී බලා සිටින දෙසට අතක් දිගුකරමින් අග්ගෝ කුමක්දෝ පවසනු ඇය දුටුවාය. දූෂකයෝ ද්වේශය පිරුනු දෑසින් ඇය දෙස බලාසිටින්නට වූහ. එකෙක් බිමට කෙලගැසීය. අනිකුන් කටුකුටු ගාමින් සිය අසුන් පිටට නැගී විසිර යන්නට වූහ.

මේ සියල්ල සිදුවද්දී බැටළු කෙල්ල මත නැගී සිටි දූෂකයා කිසිදු වගක්වත් නොමැතිව දිගටම සිය කාර්යයේ යෙදී සිටියේය. ඔහු සිය තෘප්තිය කෙරෙහි කෙතරම් සිත් අලවා සිටියේද යත් අවට සිදුවන කිසිදු දෙයක් ඔහුගේ අවධානයට හසු වී නොතිබින. අසු පිටින් බිමට බට සෙර් ජෝරා ඔහුව ගලග්‍රහයෙන් ගෙන විසිකර දැමුවේය. බිම මඩෙහි හතරගාතයෙන් ඇදවැටුනු ඩොත්රැකියා ඊළඟ මොහොතේ පිහියක් අතැතිව නැගිට සිටියේය. එනමුදු අග්ගෝගේ දුන්නෙන් මිදුනු ඊයක් විසින් ඔහුව නිහඬ කෙරින. මළකඳන්

අතර බිම බැවී සිටි තරුණිය අතින් අල්ලා නැගිට්ටවූ මෝර්මන්ට් සිය ලේ වැකි සළුවෙන් ඇයව ආවරණය කර ඇයව ඩැනී වෙත කැඳවාගෙන ආවේය. "එයාට මොකක් කරන්ටද ඔබට ඕන?"

තරුණිය විසල් කරගත් දෑසින් යුතුව වෙවුලමින් සිටියාය. ඇගේ හිසකෙස් රුධිරයෙන් පෙඟී එකට ඇලී තිබින. "ඩෝරියා. ඒකිගෙ තුවාලවලට බෙහෙත් දාන්ට. උඹට ඩොත්රකියෙකුගෙ පෙනුම නැහැනෙ. ඒ නිසා සමහරවිට ඒකි උඹට බයවෙන එකක් නැහැ. අනිත් අය මගෙත් එක්ක එන්ට." ඩැනී සිය රිදී වෙළඹ බිඳ වැටුනු නගර ද්වාරය තුළින් මෙහෙයෙවුවා ය.

නගරය තුළ තත්ත්වය ඊටත් වඩා නරක් විය. නිවාස බොහොමයක් ගිනිගනිමින් තිබුනු අතර ජක්කා ඊහාන්වරුන් විසින් සිය කාර්යය නිමාකොට තිබුනි. එකිනෙක වෙලී ගිය පටු මාවත් හිස් නොමැති මළකඳන්වලින් පිරීගියේය. තැනින් තැන ගැහැණුන් දූෂණයට ලක්වෙමින් සිටිනු දක්නට ලැබුනි. මේ සෑම විටෙකදීම අසු නැවතූ ඩැනී සිය ඛාස් සෙබළුන් යවා දූෂණයන් නතර කරවා ඒ ගැහැණුන් සිය වහලියන් වශයෙන් බඳවාගත්තා ය. මේ අතරින් එකියක් වූ මුක්කම් නාසයකින් යුත් සතලිස් වියේ පමණ වූ තර ගැහැණිය නිදහස් නගරවල පොදු බසින් ඩැනීව අමතමින් ඇයට ආශීර්වාද කර සිටියාය. එනමුදු අනිකුන් වෙතින් ඩැනීට ලැබුනේ නිහඬ බැලුම් පමණි. ඔවුන් ඇයව අවිශ්වාස කරන බව ඩැනී දුක්මුසු අයුරින් වටහාගත්තා ය. ඇය ඔවුන්ව මුදාගත්තේ මීට වඩා දරුණු ඉරණමකට ඇද දමනු පිණිස යැයි ඔවුන් සිතූ බවක් පෙනෙන්නට තිබුනි.

"ඔබට මේ හැමෝවම අයිති කරගන්ට බෑ දරුවො." සිවුවන වර අසු නවත්වද්දී සෙර් ජෝරා ඇයට කියා සිටියේය. ඇගේ ඛාස් සෙබළු අලුත බඳවාගත් වහලියන් ඇය පසුපසින් දක්කාගෙන එමින් සිටියහ.

"මමයි ඛලීසි. මමයි රාජධානි සප්තකයේ උරුමක්කාරයා. මමයි මකරාගෙ රුධිරය." ඩැනී ඔහුට සිහිපත් කර දුන්නාය. "මට කරන්ට පුළුවන් මොකක්ද බැරි මොකක්ද කියලා කියන එක ඔබට අයිති වැඩක් නෙවෙයි." නගරයේ ගොඩනැගිල්ලක් අග්නිජාලා හා දුම් රොටු විහිදුවමින් මහ හඬ නංවමින් කඩා වැටුනි. බියට පත් කුඩා දරුවන්ගේ හැඬුම් හා කෑගැසීම් ඇයට දුරින් ඇසුනි. ඇය සිය අසු ඉදිරියටම මෙහෙයවූවා ය.

**Khal Drogo: “Moon of my life, you do not ask a slave, you tell her. She will do as you command.”**

****

සනකම මැටි බිත්තියෙන් බැඳි, කිසිදු කවුළුවක් නොමැති, මුදුනත දැවැන්ත දුඹුරු පැහැ ඇණූ ගෙඩියක් වැනි ශිඛර ගෝලාර්ධයක් පිහිටි දෙවොලක් අබියස ඛාල් ඩ්‍රෝගෝ හිඳ සිටිනු ඔවුන්ට හමුවිය. ඔහු පසෙකින් ඔහුටත් වඩා උස් වූ හිස් ගොඩක් ගොඩගසා තිබුනි. බැටළු මිනිසුන් ගේ කෙටි ඊයක් ඔහුගේ උඩු බාහුව පසා කරගෙන ගොස් තිබුනි. ඔහුගේ නිරාවරණ පපුවේ වම්පස රත් පැහැයෙන් පින්තාරු කලාක් මෙන් රුධිරයෙන් පෙඟී තිබුනි. ඔහුගේ රුධිරාරක්ෂකයින් තිදෙනාද ඔහු පසෙකින් වූහ.

ඩැනීට අසුපිටින් බිමට බැසීමට ජික්වී උපකාර කලාය. සිය උදරය කෙමෙන් විශාල වද්දී, එහි බර වැඩි වද්දී ඇය අශෝභන අනම්‍ය තත්ත්වයකට පත්ව තිබුනි. ඇය ඛාල් පසෙකින් දණ නමා ගත්තාය. "මගේ ඉරයි තරුයි තුවාල වෙලා." අරඛ් තුවාලය පුළුල් නමුදු නොගැඹුරු එකක් විය. ඔහුගේ වම් කණපුඩුව සම්පූර්ණයෙන්ම කැපී වෙන්ව ගොස් තිබුනු අතර ලෙයින් පෙඟී ගිය මස් හා සම් පෙත්තක් තෙත් රෙදි කැබැල්ලක් මෙන් පපුවෙන් එල්ලා වැටුනේය.

"ඒක නිකං හීරීමක් විතරයි මගේ ජීවිතේ හඳ. ඒක ඛාල් ඕගොගෙ එක් රුධිරාරක්ෂයෙක්ගෙ අරඛ් එකෙන් වුනේ." ඩ්‍රෝගෝ පොදු බසින් ඇයට පිළිතුරු දුන්නේය. "මම ඒ වෙනුවෙන් ඌව මැරුවා. ඕගෝවත් මැරුවා."ඔහු හිස හැරවූ අතර කෙහෙරැල්ලේ බැඳි සීනු මුදු හඬින් නදදෙන්නට විය. "ඇහෙනවද? ඒ ඇහෙන්නෙ ඕගෝගෙ හඬ. ඒ වගේම එයාගෙ බලබා ෆෝගෝගෙ හඬ. ඕගෝ මලාට පස්සෙ එයා ඛාල් වුනා."

"මගේ ජීවිතේ ඉරත් එක්ක හැරෙන්ටවත් කිසිම මිනිහෙකුට බැහැ. එයා තමා ලෝකය පාලනය කරන සෙන්ධවයාගෙ තාත්තා."

අසෙකු පිටින් පැමිණි ඩොත්රැකි රණකාමියෙක් මහා හදිසියකින් මෙන් අසුපිටින් බිමට පැන්නේය. ඔහු හග්ගෝට යමක් කීවද කෝපයෙන් හා වේගයෙන් බිනු ඩොත්රැකි වදන් අල්ලාගැනීම ඩැනීට උගහට විය. දැවැන්ත රුධිරාරක්ෂකයා සිය ඛාල් දෙසට හැරෙන්නට

පෙර ඩැනී වෙතට නොපහන් බැල්මක් හෙලුවේය. "මේ ඉන්නෙ මාගෝ. කෝ ජබෝගෙ ඛාස් එකේ සෙබළෙක්. එයා කියනවා බලීසි එයාගෙ තැග්ග එයාගෙන් උදුරගත්තලු. එයා නගින්ට ලැස්තිවුන බැටළු කෙල්ල එයාගෙන් උදුරගත්තලු."

ඛාල් ඩ්‍රෝගෝගේ මුහුණ දැඩි හා නිසල වුවද ඒ කළු පැහැ දෑස් ඩැනී දෙසට යොමුවද්දී ඒවා කුතුහලයෙන් පිරී තිබුනි. "මේ කතාවෙ ඇත්ත මොකක්ද කියලා මට කියන්ට මගේ ජීවිතේ හඳ." ඔහු ඩොත්රැකි බසින් අණ දුන්නේය.

ඛාල්ට වඩා හොඳින් වටහාගත හැකි වන පරිදි ඇය තමා කල දේ ඩොත්රැකි බසින් ඔහුට විස්තර කර දුන්නාය. ඇගේ වදන් කෙටි එමෙන්ම සරල ඒවා විය.

ඇගේ කතාව නිමාවන විට ඩ්‍රෝගෝගේ මුහුණට රැවුමක් එක් වී තිබුනි. "මේ තමා යුද්ධෙ හැටි. මේ ගෑනු දැන් අපේ වහල්ලු. අපට කැමැති දෙයක් උන්ට කරන්ට අපට පුළුවන්."

"උන්ව ආරක්ෂා කරගත්තහම මට සතුටුයි." ඩැනී කීවේ තමා උවමනාවටත් වඩා නිර්භීත වුවාදැයි සැකසහිත වෙමිනි. "ඔබේ සෙබළුන්ට මේ ගෑනු ගන්ට ඕන නම් උන්ට මීට වඩා ශිෂ්ට විදියට ගන්ටයි කියන්ට. උන්ව තමන්ගෙ බිරින්දෑත් විදියට ගන්ටයි කියන්ට. උන්ටත් ඛලසාර් එකේ තැනක් දීලා උන්ට ඔබේ පුත්තු දෙන්ට."

ඛාල්ගේ රුධිරාරක්ෂකයින් අතරින් කුරිරුතම පුද්ගලයා වූ ක්වෝතෝ මහහඬින් සිනාසුනේය. "අශ්වයො කවදද බැටළුවොත් එක්ක එක්කහු වෙලා පැටවු ගැහුවෙ?"

ඔහුගේ ස්වරයේ වූ යමක් විසින් ඇයට විසේරිස්ව සිහිපත් කලේය. ඩැනී කෝන්තියෙන් යුතුව ඔහු දෙසට හැරුනාය. "මකරු අශ්වයොයි බැටළුවොයි දෙගොල්ලන්ම කෑමට ගන්නවා."

ඛාල් ඩ්‍රෝගෝ සිනාසුනේය. "පේනවනෙ එයා කොච්චර බිහිසුණු විදියට වැඩිලාද කියලා. ඒ එයාගෙ ඇතුළෙ ඉන්න මගේ පුතා නිසයි. ලෝකය පාලනය කරන සෙන්ධවයා නිසයි. එයා තමා තමන්ගෙ ගින්නෙන් එයාව පුරවන්නෙ. පරෙස්සමින් කතා කරපන්

ක්වෝතෝ... අම්මා උඹ ඔය ඉන්න තැනම උඹව පුච්චලා දැම්මෙ නැත්තන් එයාගෙ පුතා උඹව මඩේ දාලා පාගයි. ඒත් එක්කම උඹ මාගෝ.. උඹේ කට වහගෙන ගිහින් නගින්ට වෙන බැටළුවෙක් හොයාගනින්. මුන් දැන් අයිති මගේ බලීසිටයි." ඔහු ඩැනී දෙසට අතක් දිගු කිරීමට වෑයම් කලද අත එසවූ පමණින් නැගුනු හදිසි වේදනාවෙන් මැඩුනු ඩ්‍රෝගෝ වහා ඉවත බැලීය.

ඩැනීට ඔහුගේ වේදනාව දැනෙන්නාක් මෙන් විය. සෙර් ජෝරා ඇයට විශ්වාස කරන්නට සැලැස්වූවාට වඩා ඒ තුවාල දරුණු විය. "කෝ වෙද්දු?" ඇය විමසා සිටියාය. බලසාරය තුළ වඳ ගැහැණුන් හා නපුංසක වහලුන් වශයෙන් සුවකරන්නන් දෙකොටසක් සිටියහ. වඳ ගැහැණුන් හෙවත් ඔසු ගැහැණුන් විවිධාකාරයේ තරලසාර හා හදි හූණියම් මගින් සුව කිරීම් සිදුකලහ. අනත් අතට නපුංසකයෝ පිහියෙන්, ඉඳිකටුවෙන් හා ගින්නෙන් වැඩගත්තන් වූහ. "ඇයි උන් බාල් ගැන හොයා බලන්නෙ නැත්තෙ?"

"බාල් ඒ මිනිස්සු අහක යැවුවා බලීසි." මහලු කොහොල්ලෝ ඇයව අස්වැසීය. මේ රුධිරාරක්ෂයා ද තුවාල ලබා සිටිනු ඩැනී දුටුවාය. ඔහුගේ වම් උරහිසේ දරුණු ගැඹුරු කැපුමක් විය.

"ගොඩක් සෙබළුන්ට තුවාල වෙලා." ඩ්‍රෝගෝ මුරණ්ඩු ස්වරයෙන් කියා සිටියේය. "ඉස්සෙල්ලා උන්ට සාත්තු කරලා හිටපුවාවෙ. මේ ඊතලේ මැස්සෙක් කාපු තරම්වත් ගානක් නෑ. මේ පුංචි කැපුම මගේ පුතාට පාරට්ටු කරන්ට පුළුවන් තවත් එක තුවාල කැළැලක් විතරයි."

ඔහුගේ පපුවේ සම තුවාල වූ තැන යටින් වූ මාංශය පවා ඩැනීට පැහැදිලිව දැකිය හැකි විය. ඔහුගේ බාහුව සිදුරු කල ඊතලය දිගේ සිහින් රුධිර ධාරාවක් ගලායමින් තිබුනි. "බාල් ඩ්‍රෝගෝව මෙහෙම පරක්කු කරන්ට හොඳ නැහැ." ඇය නිවේදනය කලාය. "ජෝගෝ. අර නපුංසකයො ටික හොයාගෙන ඉක්මනටම මෙහාට එක්කරන් එන්ට."

"රිදී ආර්යාවනි." ඇයට පසුපසින් ගැහැණු කටහඬක් කතා කලේය. "මට පුළුවන් වෙයි මේ උදාර අසරු උත්තමයගෙ තුවාලවලට බෙහෙත් කරන්ට."

ඩැනී හිස හැරෙවුවාය. ඒ වනාහි ඇය විසින් දූෂකයින්ගෙන් බේරාගත් අර තර, මුක්කම් නාසයකින් හෙබි ගැහැණිය විය.

"බැටළුවොත් එක්ක නිදිවදින ගෑනුන්ගෙන් බාල්ට කිසිම උදවුවක් ඕන නෑ." ක්වෝතෝ ගුගුලේය. "අග්ගෝ. ඒකිගෙ දිව කපලා දාපං."

ඇගේ කෙහෙරැල්ලෙන් අල්ලාගත් අග්ගෝ උගුර මුලට පිහියක් තදකලේය.

ඩැනී අතක් එසෙවුවාය. "එපා. ඒකි අයිති මටයි. ඒකිට කතා කරන්ට ඉඩදෙන්ට."

අග්ගෝ ඇගේ මුහුණත් ක්වෝතෝගේ මුහුණත් දෙස මාරුවෙන් මාරුවට බැලුවේය. ඔහු සිය පිහිය පහත් කරගත්තේ ය.

"මම වැරැද්දක් කරන්ට හිතුවෙ නෑ නිර්භීත රණකාමියනෙ." මේ ගැහැණිය ඩොත්රැකි බස හොඳින් වහරන්නට දත්තාය. ඇය හැඳ සිටි සළුපිළි එක් කලෙකදී නම් මනාව ගෙත්තම් කර වැඩ දැමූ උසස්ම තත්ත්වයේ ලොම් ඇඳුම් විය. එනමුදු දැන් නම් ඒවා මඩ හා ලේ වැකී ඉරී වැරහැලි වී තිබුනි. ඇය සිය හැට්ටයේ ඉරීගිය රෙදි දෙපට අතින් එක්කර එයින් සිය විසල් පියයුරු ආවරණය කරගෙන හුන්නාය. "මටත් සුවකිරීම් ගැන පොඩි දැනුමක් තියෙනවා."

"උඹ කවුද?" ඩැනී ඇයගෙන් විමසුවාය.

"මගේ නම මිරී මාස් ඩූර්. මම මේ දේවාලයේ දේවදාසියක්."

"යක්දෙස්සියක්." හග්ගෝ සිය අරබ් එක අතගාමින් උගුරෙන් පිළිකුල මුසු හඬක් නැංවීය. ඔහුගේ බැල්ම භයානක විය. එක්තරා රැයක ආහාර පිසින අතරේ ජික්වි විසින් ඇයට පවසා තිබුනු භයානක කතන්දරයකදී ඇය මේ නම අසා තිබුනි. යක්දෙස්සියන් යනු යක්ෂයින් සමග නිදිවදින, ඉතාම දරුණු ගනයේ හදිහූණියම් සිදුකරන, සිය ආත්මය යක්ෂයින්ට කැප

කල නපුරු අයවලුන් විය. ඔවුන් රාත්‍රී අන්ධකාරයට මුවා වී පිරිමින් කරා පැමිණ ඔවුන්ගේ ජීවිතයත් ශක්තියත් උරාගනිති.

"මම වෙදෙක්." මිරි මාස් ඩූර් කීවාය.

"බැටළුවන්ට වෙදකම් කරපු වෙදෙක්." ක්වෝතෝ නියැවීය. "මගේ රුධිරයෙන් උපන් රුධිරය, මම කියන්නෙ අපි මේ යක්දෙස්සිව මරාදාලා නපුංසකයො එනකම් ඉම්මු කියලයි."

ඩැනී මේ රුධිරාරක්ෂකයා ගේ ප්‍රකාශය නොතකා හැරියාය. මේ මහලු, වාම්, තර ගැහැණිය යක්දෙස්සියක් මෙන් ඇයට නොපෙනුනි. "උඹ කොහෙන්ද මේ වෙදකම් ඉගෙනගත්තෙ මිරි මාස් ඩූර්?"

"මගේ අම්මත් දේවදාසියක්. එයා මට ඉගැන්නුවා ඔක්කොම ගීතිකා, උපචාර විදි කොහොමද අපේ මහා එඬේරාව සන්තෝස කරන්නෙ කියලා. කොහොමද ගස්වල පොතු, කොළ, ගෙඩි, මුල් අරන් පූජනීය සුවඳ දුම්, සුවඳ තෙල් හදන්නෙ කියලා. මම තරුණ කාලෙ වෙළෙඳාම් තවලමක් එක්ක සෙවනැලි දේශයේ අශයීවලට ගියා එයාලගෙ විජ්ජාකාරයින්ගෙන් තව දුරටත් ඉගෙනගන්ට. ලෝකෙ හැම රටකින්ම වාගේ නැවු එනවා අශයීවලට. ඉතින් ඒක නිසා මම ගොඩක් කල් එහෙ නැවතිලා ඉඳලා එක එක මිනිස්සුන්ගෙ බෙත්-හේත් ක්‍රම ගැන ඉගෙනගත්තා. ජොගෝස් නායිවලින් ආපු සඳගායිකාවක් මට කියලා දුන්නා එයාලගෙ දරුඋපත් ගීතිකා ගැන. ඔබේ මේ ඩොත්රැකි ගැනියක් මට කියලා දුන්නා තණකොළවලයි, ඉරිඟුවලයි, අශ්වයොන්ගෙයි රහස් ගැන. ඉරබහින දේශයෙන් ආපු මේස්ටර් කෙනෙක් මළකඳක් කපලා මට පෙන්නුවා අපේ හමට යටින් මොනාද හැංගිලා තියෙන්නෙ කියලා."

සෙර් ජෝරා මෝර්මන්ට් කතාකලේය. "මේස්ටර් කෙනෙක්?"

"මාර්වින්. එයා එහෙමයි තමන්ට කියාගත්තෙ." ගැහැණිය පොදු බසින් පිළිතුරු දුන්නාය. "මුහුදෙන්. මුහුදෙන් එතෙර. රටවල් හතෙන්. ඉරබහින රටෙන්. මිනිස්සු යකඩින් හැදිලා තියෙන රටෙන්. මකරු පාලනය කරන රටෙන්. එයා තමා මට මේ බාසාව ඉගැන්නුවෙ."

"අශයීවල මේස්ටර් කෙනෙක්." සෙර් ජෝරා විස්මය පලකලේය. "මට කියපන් දේවදාසි, උඹේ මේ මාර්වින් මොකක්ද එයාගෙ බෙල්ල වටේ පැළඳගෙන හිටියෙ?"

"දම්වැලක්. ඒක කොච්චර තදද කිවුවොත් එයාගෙ හුස්ම හිරවෙලා මැරෙයි කියලා මට හිතුනා යකඩ උතුමානනි. ඒ දම්වැල හැදිලා තිබුනෙ එක එක ජාතියෙ ලෝහවලින්."

නයිට්වරයා ඩැනී දෙස බැලුවේය. "ඕල්ඩ්ටවුන්වල සිටඩෙල් එකේ පුහුණු වෙච්ච මිනිහෙකුට විතරයි එහෙම දම්වැලක් පළඳින්ට පුළුවන්. එයාලා සුවකිරීම් ගැන ගොඩක් දේවල් දන්නවා."

"ඇයි උඹට ඕන වුනේ මගේ ඛාල්ට උදවු කරන්ට?"

"මිනිස්සු හැමෝම එක රංචුවකට අයිති අයයි. අපි එහෙමයි ඉගෙනගෙන තියෙන්නෙ." මිරී මාස් ඩූර් පිළිතුරු දුන්නාය. "මහා එඬේරා මාව මේ ලෝකෙට එවලා තියෙන්නෙ බැටළුවන්ව සුවකරන්ටයි. මට එයාලා කොහෙන් හම්බවුනත් එකයි."

ක්වෝතෝ ඇයට දරුණු අතුල් පහරක් දුන්නේය. "අපි බැටළුවො නෙවෙයි යක්දෙස්සියෙ."

"ඕක නවත්තපන්." ඩැනී කේන්තියෙන් කීවාය. "ඒකි අයිති මටයි. ඒකිට හිංසා කරන්ට මට ඕන නැහැ."

ඛාල් ඩ්‍රෝගෝ උගුරින් නොරිස්සුම් හඬක් නැගීය. "මේ ඊතලේ පිටට ගන්ට ඕන ක්වෝතෝ."

"එහෙමයි මහා අසරුවානනි." අතුල් පහරින් රතු වූ සිය මුහුණ අතගාමින් මිරී මාස් ඩූර් පිළිතුරු දුන්නාය. "ඒ වගේම ඔබතුමාගෙ පපුවෙ තුවාලෙත් හෝදලා මහන්ට ඕන. එහෙම කලේ නැත්තං ඒක පැසවන්ට පුළුවනි."

"එහෙමනම් ඒක කරපං." ඩ්‍රෝගෝ අණකලේය.

"මහා අසරුවානනි. මගේ ආයුධ, උපකරණයි, බෙත්-හේතුයි ඔක්කොම තියෙන්නෙ දේවාලෙ ඇතුළෙ. ඒක ඇතුළෙ තමා සුවකිරීමේ ශක්තිය වැඩිම."

"මම ඔබව උස්සගෙන යන්නං, රුධිරයෙන් උපන් මගේ රුධිරය." හග්ගෝ ඉදිරියට පැමිණියේය.

ඛාල් ඩ්‍රෝගෝ ඔහුව ප්‍රතික්ෂේප කලේය. "මට කිසිම මිනිහෙක්ගෙ උදවු ඕන නෑ." ඔහු දැඩි, උදාරම් හඬින් කීවේය. ඔහු කිසිවෙකුගේ උදවුවක් නොමැතිව නැගිට සිටි අතර පිරිස අතරේ උස් කුළුණක් මෙන් උසට උසේ නැගී සිටියේය. පපුවේ වූ තුවාලයෙන් අලුත් රුධිර දහරාවක් ගලා යන්නට විය. ඩැනී වහා ඔහු පසෙකට ඇවිද ගියාය. "මම මිනිහෙක් නෙවෙයි." ඇය මිමිනුවාය. "ඒක නිසා ඔබට පුළුවන් මට වාරුවෙන්ට." ඩ්‍රෝගෝ ඔහුගේ දැවැන්ත අතක් ඇගේ දසරුව මතින් තැබීය. ඇය ඔහුගේ බරින් කොටසක් දරා සිටියදී ඔවුන් දෙදෙන එකතුව මැටියෙන් කල දෙවොල වෙත ඇවිද ගියහ. ඔහුගේ රුධිරාරක්ෂකයින් තිදෙනාද ඒ පසුපසින් ඇවිද එන්නට වූහ. දෙවොලේ ද්වාරය මුරකරමින් එතැන හිඳ, ඔවුන් දෙවොල තුළ සිටින අතරේදී කිසිවෙකුටත් එය ගිනි තබන්නට ඉඩ නොදෙන්නැයි ඩැනී සෙර් ජෝරාටත් ඇගේ ඛාස් එකේ සෙබළුන්ටත් අණකලාය.

* * *

දෙවොල ඇතුළත වූ කාමර රැසක් පසුකරමින් ගිය ඔවුහු අන්තිමේදී ගෝලාර්ධ ශිඛරයට යටින් වූ මධ්‍යම කුටියට ඇතුළු වූහ. ඉහළින් වූ සැඟවුනු කවුළුවලින් කුටියට මෘදු ආලෝකයක් පතිත වුනි. බිත්තියේ සවිකර තිබුනු ආධාරකවල වූ පන්දම් කිහිපයක් දුම් දමමින් ඇවිලෙන්නට විය. බිම මැටි පොළොව මත බැටළු සම් අතුරා තිබුනි. "අතෙන්ට." අල්තාරය ලෙසින් භාවිත වුනු, එඬේරුන් හා ඔවුන්ගේ බැටළු රංචු කැටයම් කර තිබුනු

දැවැන්ත ගල් කුට්ටියට අත දිගු කරමින් මිරී මාස් ඩූර් කියා සිටියාය. බාල් ඩ්‍රෝගෝ ඒ මත වැතිර ගත්තේය. ගැහැණිය ගිනිකබලකට වියළි කොළ අහුරක් එක් කලෙන් කාමරය පුරවාලමින් සුවඳ ධූමයක් නැග එන්නට විය. "ඔබලා එළියෙන් නැවතිලා හිටියොත් හොඳයි." ඇය පිරිසට කීවාය.

"අපි එයාගෙ රුධිරයෙන් උපන් රුධිරය." කොහොල්ලෝ කීවේය. "අපි මෙතැනයි ඉන්නෙ."

ක්වෝතෝ මිරී මාස් ඩූර් සමීපයට පිය මැන්නේය. "මේක හොඳට මතක තියාගනිං බැටළු දෙයියන්නෙ ගැනියෙ. උඹ බාල්ට මොකුත් අනතුරක් කලොත් උඹටත් ඒක ඒ විදියටම විඳින්ට වෙනවා." සතුන් හමගැසීමට භාවිත කරන පිහිය කොපුවෙන් පිටතට ඇදගත් ඔහු එය ගැහැණියට පෙන්වීය.

"එයා එහෙම මොකුත් අනතුරක් කරන එකක් නැහැ." මේ ගැහැණිය විශ්වාස කටයුතු අයෙකු යැයි ඩැනීට සිතෙන්නට පටන්ගෙන තිබුනි. කෙසේවුවද ඩැනී විසින් ඇයව ඇයගේ දූෂකයින්ගෙන් ගලවාගෙන තිබුනි.

"ඔබලාට ඉන්ටම ඕනනං, එහෙනං මට උදවු කරන්ට." මිරී රුධිරාරක්ෂකයින්ට කීවාය. "මේ මහා අසරුවා මට ආම්බාන් කරන්ට බැරිතරං ශක්තිමත්. මම ඊතලේ ඇදලා ගන්නකං එයාව අල්ලගෙන ඉන්ට." සිය වැරහැලි වී ගිය ගවොම අත හැරිය අතර එය ඇගේ ඉණ තෙක් පහළට වැටුනි. කැටයම් කල පෙට්ටගමක් විවර කල ඇය එතුළින් විවිධාකාරයේ බෝතල්, පෙට්ටි, පිහියා හා ඉඳිකටු පිටතට ගත්තාය. මේ සියල්ලම සූදානම් වූ පසු කටුසහිත ඊමුණ කඩා දැමූ ඇය ඊදණ්ඩ පිටතට ඇදගත්තා ය. මේ වෙදකම් අතරතුරේදී ඇය ලසාරීන්ගේ ඒකස්වර ගායන බසින් ගීතිකා මතුරන්නට වූවාය. ගිනිකබලෙහි බහා වයින් ගුරුලේත්තුවක් නටන තුරු රත්කල ඇය ඒ වයින් ඩ්‍රෝගෝගේ තුවාල මත වත්කලාය. බාල් ඩ්‍රෝගෝ වේදනාවෙන් ඇයට සාප කල නමුදු ඔහු වේදනාවෙන් ඇඹරුනේ තබා සෙලවුනේවත් නැත. තෙත් කොළවලින් සැදි වෙළුම් පටියකින් ඊතල තුවාලය වෙලූ ඇය ඉන්පසු පපුවේ තුවාලය වෙත සිය අවධානය යොමුකලාය. තුවාලය මත ලා-කොළ පැහැ ආලේපයක් තැවරූ ඇය නැවත සම හා මස් පෙත්ත ඇද නියමිත ස්ථානයේ තැබුවාය. බාල් දත්මිටි කමින් වේදනාත්මක කෑගැසිල්ලක් මැඩගත්තේ ය. රිදී ඉඳිකටුවක් හා සේද නූල් පන්දුවක් ගත් දේවදාසිය තුවාලය මැසීමට පටන්ගත්තා ය. මේ කාර්‍යය හමාර වූ පසු ඒ මතින් නැවත වරක් රත් පැහැ ආලේපයක්

තැවරූ ඇය ඊට උඩින් තවත් කොළ වර්ග තබා අන්තිමේදී බැටළු සමින් කල වෙළුම්පටියකින් තුවාලය වසා ඇමුවාය. "මේ වෙළුම්පටිය දවල් දහයකුයි රෑ දහයකුයි තියෙන්ට ඕන. ඒ වගේම මම කියලා දීපු යාඥා ගීතිකා දිගටම කියන්ට ඕන." ඇය ඩ්‍රෝගෝට පැවසුවාය. "උණක් හැදෙයි. තුවාලෙ කසයි. ඒ වගේම තුවාලෙ හොඳවුනාට පස්සෙ එතැන ලොකු කැළැලක් ඉතුරුවෙයි."

බාල් ඩ්‍රෝගෝ නැගිට සිටි අතර හිසේ වූ සීනු නද දුන්නේය. "මගේ තුවාල කැළැලි ගැන මම සින්දු කියනවා බැටළු ගැනියෙ." ඔහු සිය අත නවමින් දිගහරිමින් අවලාදාත්මක ස්වරයෙන් කීවේය.

"වයින් බොන්ටත් එපා පොපි යුෂ බොන්ටත් එපා." ඇය ඔහුට අනතුරු ඇඟෙවුවාය. "ඔබට වේදනාව දැනෙයි. ඒ වුනත් නපුරු ආත්මත් එක්ක සටන් කරන්ට ඔබ ඔබේ ඇඟ ශක්තිමත්ව තියාගන්ට ඕන."

"මම බාල්." ඩ්‍රෝගෝ කීවේය. "මම වේදනාවට කෙල ගහනවා . ඒ වගේම මම කැමැති දෙයක් බොනවා. කොහොල්ලෝ, මගේ කබාය ගෙනෙන්." මහලු මිනිසා සැනෙන් පිටව ගියේය.

ඩැනී මේ ලසාරීන් ගැහැණිය දෙසට හැරුනාය. "කලින් මම අහගෙන උඹ කිවුවා දරුඋපත් ගීතිකා ගැන..."

"මම වින්නඹු කාමරේ හැම රහසක්ම දන්නවා රිදී ආර්යාවනි. මගේ අතින් මෙච්චර කාලෙකට කිසිම දරුවෙක් නැතිවෙලා නෑ."

"මගේ වෙලාවත් ලංවෙනවා. දරුවා ඉපදෙනකොට උඹ එතැන ඉන්නවානම් මම සතුටුයි. උඹ කැමැති නම්."

බාල් ඩ්‍රෝගෝ මහහඬින් සිනාසුනේය. "මගේ ජීවිතේ හඳ, ඔබ වහල්ලුන්ගෙන් අහන්නෙ නෑ. ඔබ උන්ට කියනවා. අණදෙනවා. ඔබ අණ කරන දෙයක් ඒකි කරයි." ඔහු

අල්තාරයෙන් බිමට පැන්නේය. "එන්ට මගේ රුධිරය. අශ්වයො කතා කරනවා. මෙතැන දැන් ඉතුරුවෙලා තියෙන්නෙ අළු විතරයි. අපට පිටවෙලා යන්ට කාලෙ හරි."

හග්ගෝද බාල් අනුව දෙවොලින් පිටවිය. එනමුදු ක්වෝතෝ මොහොතක් පමා වූයේ මිරී මාස් ඩූර්ට දරුණු බැල්මකින් සංග්‍රහ කලේය. "මතක තියාගනිං යක්දෙස්සි. බාල්ට මොකක් හරි සිද්දවුනොත් උඹටත් ඒ දේම වෙයි."

"ඔබ කැමැති විදියක් අසරුවෝ." ගැහැණිය සිය බෙහෙත් බෝතල් හා ආම්පන්න එකතු කරගනිමින් පිළිතුරු දුන්නාය. "මහා එඬේරා එතුමන්ගෙ රංචුව ආරක්ෂා කරනවා."

**Jorah Mormont: “You are your brother’s sister, in truth.”**

**Daenerys: “Viserys?”**

**Jorah Mormont: “No, Rhaegar.”**

ටිරියන් **08-1**

රජමාවත පෙනෙන මානයේ වූ කුඩා කඳුගැටයක් මුදුනේ, එල්ම් ගසක සෙවනැල්ල යට, අලුත කපාහෙලන ලද පයින් දැවයෙන් නිමවූ මැස්සක් වැනි දිගු මේසයක් මත රන්වන් මේස රෙද්දක් එලා තිබුනි. සිය මන්ඩපයට මඳක් ඔබ්බෙන් වූ මේ මේසයේ අසුන්ගත් ටයිවින් උතුමානන්, ඔහුගේ ප්‍රධාන නයිට්වරුන් හා ධජ දරන යටත් වංශාධිපතියන් හා එක්ව රාත්‍රී භෝජනය සප්පායම් වන්නට විය. උසැති කුන්තයක අමුනා තිබුනු ඔහුගේ රන් හා ලේ රත් පැහැ වංශ සලකුන උඩඟු ලෙසින් මඳ පවනේ වැනෙමින් තිබින.

ටිරියන් මේසයට වාඩි වන්නට පමා වී තිබුනි. දවස පුරාම සෑදලය මතට වී සිටීම නිසා ඔහු බෙහෙවින් විඩා වැටී නොරිස්සුම් බවකින් පෙලෙමින් සිටියේය. බකල ගසමින් කුඩා කඳු ගැටය නගිද්දී තමා කෙතරම් විකාරරූපිව අන්‍යයන්ට පෙනේද යන්න ඔහු හොඳාකාරවම දැන හුන්නේය. දවසේ හමුදා පෙලපාලිය අතිශයින්ම දිගු හා වෙහෙසකර එකක් විය. අද රෑ තමා නොසෑහෙන්නට මත්පැන් පානය කරනු ඇතැයි ඔහු කල්පනා කලේය. සන්ධ්‍යාව එළඹ තිබුනු අතර අවට පරිසරය දීප්තිමත් එළි විහිදුවන කනාමැදිරියන්ගෙන් පිරී පැවතින.

සේවකයෝ මේ වනවිට මස් පලංගාන් මේසයට ගෙනඑමින් සිටියහ. සම පුපුරා රන්වන් පැහැ වනතෙක් පැළහු ඌරු පැටවුන් පස්දෙනෙක් ඔවුන් අතින් මේසයට වැඩියහ. මේ සැම ඌරු පැටවකුගේම මුවේ එකිනෙකට වෙනස් පළතුරක් ඔබා තිබුනි. සුවඳ කෙතරම් ප්‍රනීත වී ද යත් ටිරියන්ගේ මුවට කෙල ඉනුවේය. "මට සමාවෙන්ට." සිය මාමා පසෙකින් බංකුව මත අසුන්ගන්නා අතරේ ඔහු කීවේය.

"මම හිතන්නෙ, සමහරවිට අපේ මැරිච්ච එවුන් වලලන එක උඹට බාරදුන්නා නම් හොඳයි කියලයි ටිරියන්." ටයිවින් උතුමානන් කීවේය. "උඹ කෑම මේසෙට එන තරමටම යුද්ධෙට එන්ටත් පරක්කු වුනොත් උඹ එන වෙලාව වෙනකොට යුද්ධෙ හමාර වෙලා තියෙයි."

"ආහ්! කිසිම සැකයක් නැහැ, ඔබ මට ඔය ගම්මු කීපදෙනෙක් හරි ඉතුරු කරයි තාත්තෙ. මහ ගොඩක් ඕන නැහැ. මම එච්චරම කෑදර නැහැ." සිය වයින් කුසලාණ පුරවාගත් ඔහු සේවකයෙකු විසින් ඌරාව කපන ආකාරය දෙස බලා සිටියේය. පිහියට යටින් රන්වන්

පැහැ වූ සම පුපුරා ගිය අතර උණුසුම් ඉස්ම හෙමිහිට පහළට රූටා ගියේය. ඒ වනාහි ටිරියන් කාලයකට පසු දුටු අලංකාරතම දර්ශනය විය.

"සෙර් ඇඩම්ගෙ ඔත්තුකාරයො කියනවා ස්ටාර්ක් හමුදාව ද්විත්ව බලකොටුවෙන් පහළට ඇවිල්ලලු." සේවකයකු විසින් සිය පිඟානට ඌරු මස් පෙත්තක් බෙදන අතරේ ඔහුගේ පියා නිවේදනය කලේය. "ෆ්‍රේ උතුමානන්ගෙ හමුදාවත් උන්ට එක්කහු වෙලා. උන් අපට වඩා දවසක දුරින් උතුරේ ඉන්නවා වෙන්ට ඕන."

"අයියෝ තාත්තෙ. මම මේ කෑම කන්ටයි හදන්නෙ."

"ස්ටාර්ක් කොල්ලාට මූන දෙන්ට යනවා කියලා හිතනකොට උඹේ පිරිමි ගතිය නැතිවෙලා යනවද ටිරියන්? උඹේ අයියා ජේමි නම් ඌත් එක්ක පොර අල්ලන එක ගැන හිතනකොටත් ආසාවෙන් උඩ පනියි."

"ඊට වඩා මම කැමැතියි අර ඌරු පැටියාත් එක්ක පොර අල්ලන්ට. රොබ් ස්ටාර්ක් ඒකෙන් බාගයක්වත් මොළකැටි නැහැ. අනික එයා කවදාවත් මෙච්චර සුවඳ ගැහැවුවෙත් නැහැ."

සැමවිටම පැඟිරි කරගත් මුහුණින් සිටින පක්ෂියකු වන ඔවුන්ගේ ගබඩා හා සැපයුම් භාර නිළධාරී ලෙෆර්ඩ් උතුමානන් ඉදිරියට නැඹුරු වීය. "මම හිතනවා ඔබේ ඔය අමනාපය ඔබේ අර ම්ලේච්ඡයන්ටත් බෝවෙලා නැහැයි කියලා. එහෙම වුනොත් අපේ ආයුධ ටික අපතේ ගියා වෙනවා."

"මගේ ම්ලේච්ඡයො ටික ඔබේ ආයුධ බොහොම හොඳට පාවිච්චි කරයි මගේ උතුමානනි." ටිරියන් පිළිතුරු දුන්නේය. උල්ෆ් විසින් කඳුකර මාර්ගයේ සිට කැඳවාගෙන ආ ඔහුගේ කඳුකර ගෝත්‍රිකයින් තුන්සිය දෙනාට ආයුධ හා සන්නාහ අවශ්‍යයැයි ටිරියන් විසින් කියා සිටි අවස්ථාවේ ලෙෆර්ඩ්ගේ මුහුණින් පලවූයේ හරියටම ඔහුගේ දියණියන් ගේ කන්‍යාභාවය මේ ගෝත්‍රිකයින් ගේ සතුට වෙනුවෙන් පුද දෙන්නට ඇසුවාක් මෙනි.

ලෙෆර්ඩ් උතුමානන් රැවුවේය. "මම අද දැක්කා අර ලොමින් වැහිච්ච යෝධයාව. අර කළු වානේවලින් හදාපු දෙපැත්ත කැපෙන යුද්ධ පොරෝ දෙකක්ම ඕනෙයි කියලා කියපු එකා."

"ෂග්ගා කැමැතියි අත් දෙකෙන්ම මරන්ට තියෙනවා නම්." ටිරියන් කීවේ ඔහු ඉදිරියෙන් සේවකයකු විසින් තැබූ දුම් දමන ඌරු මස් පලංගාන දෙස බලමිනි.

"ඌ තාමත් අර ලී පොරොවත් පිටේ එල්ලන් ඉන්නවා."

"ෂග්ගා කියන්නෙ පොරෝ දෙකකට වඩා පොරෝ තුනක් හොඳයි කියලයි." ලුණු කුඩු දීසියට මහපටැඟිල්ලත් දබරැඟිල්ලත් එබූ ටිරියන් සිය මස් පෙත්ත මත ලුණු අහුරක් ඉස්සේය.

සෙර් කෙවන් ඉදිරියට නැමුනේය. "අපට පොඩි අදහසක් ආවා ඔබයි ඔබේ ඔය ම්ලේච්ඡයො ටිකයි පෙරමුණු බල ඇණියට දාන්ට."

සෙර් කෙවන්ගේ මේ 'අදහස්' වනාහි සෑමවිටම ටයිවින් උතුමානන්ගේ සිතේ පිළිසිඳ ඉන්පසු සිය සොහොයුරා වෙත සපැමිණි ඒවා විය. පිහියෙන් කුඩා මස් කැබැල්ලක් කපාගත් ටිරියන් එය සිය මුව වෙත ගෙන ආවා පමණි. ඔහු වහා එය පහත් කලේය. "පෙරමුණු බලඇණිය?" ඔහු අවිශ්වාසයෙන් යුතුව ප්‍රතිරාව නැංවීය. එක්කෝ ඔහුගේ පියාණන් සිය කුරුමිට්ටි පුත්‍රයාගේ හැකියාවන් කෙරෙහි අලුත් අන්දමේ ගෞරවයක් ඇති කරගත්තා විය යුතුය. එසේත් නැතහොත් සදහටම සිය කුරුමිට්ටි පුත්‍රයාගෙන් වෙන්වන්නට අදහස් කරගෙන සිටිනවා විය යුතුය. පිළිතුර මේ දෙකෙන් කොයිකදැයි තමා දන්නා බව ටිරියන්ට වැටහී ගියේය.

"උන් බොහොම බිහිසුණුයි නෙ." සෙර් කෙවන් කීය.

"බිහිසුණුයි?" තමා ගිරවෙකු මෙන් තම මාමා කියන දේම නැවත කියන බව ටිරියන් තේරුම් ගත්තේ ය. ඔහුගේ පියා පරීක්ෂාවෙන් ඔහු දෙස බලමින්, ඔහු පවසන සෑම

වදනක්ම කිරා බලන බව ඔහුට වැටහුනි. "මම ඔබට කියන්නම් උන් කොච්චර බිහිසුණුද කියලා. ඊයෙ රෑ, මේ සොසේජ් එකක ප්‍රශ්නයක් නිසා චන්ද්‍ර සහෝදරයෙක් ගල් කපුටෙකුට පිහියෙන් ඇන්නා. ඉතින් අද අපි කඳවුර අටවද්දි ගල්කපුටො තුන්දෙනෙක් අර මිනිහාව අල්ලගෙන උගෙ උගුරු දණ්ඩ කපලා දැම්මා. සමහරවිට උන් හිතුවද දන්නෙ නැහැ අර සොසේජ් එක ආපහු එළියට ගන්ට. මට ඒක හරියටම කියන්ට බැහැ. බ්‍රොන් බොහොම අමාරුවෙන් නවත්තගත්තෙ ෂග්ගාට ඒ මැරිච්ච මිනිහගෙ පිරිමි ඇඟ කපන්ට නොදී. ඒක ලොකු වාසනාවක්. ඒ වුනත් උල්ෆ් ලේ මිල ඉල්ලනවා. කොනුයි ෂග්ගායි ඒක ප්‍රතික්ෂේප කරනවා."

"සොල්දාදුවන්ගෙ විනය හොඳ නැත්තම් ඒකෙ වැරැද්ද පැටවෙන්නෙ උන්ගෙ අණදෙන නිළධාරියාටයි." ටයිවින් උතුමානන් කීවේය.

ඔහුගේ සොහොයුරා ජේමි නම් සැමවිටෙකම මිනිසුන් ඔහු පසුපස ගෙන්වා ගැනීමේ ආකර්ශනයකින් යුක්ත වූවකු විය. මිනිස්සු ඔහු වෙනුවෙන් දිවි පිදීමට වුව සූදානම් වූහ. එනමුදු ටිරියන්ට එවැනි කුසලතාවක් නොවීය. ඔහු මිල මුදල් ගෙවීමෙන් පක්ෂපාතිත්වය මිලදී ගත් අතර ඒ මිලදී ගත්තවුන් ගේ කීකරු බව වෙනුවෙන් බලකර සිටින්නට ඔහුට සිදුවිය. "මට වඩා ලොකු මිනිහෙකුට පුළුවන් වෙයි උන්ගෙ හිත්වලට බය කාවද්දන්ට. ඒකද ඔබ ඔය කියන්ට හදන්නෙ මගේ උතුමානනි?"

ටයිවින් ලැනිස්ටර් උතුමානන් සිය සොහොයුරා දෙසට හැරුනේය. "මගේ පුතාගෙ මිනිස්සු එයාගෙ අණට කීකරු වෙන්නෙ නැත්තම්, පෙරමුණු බලඇණිය කියන්නෙ එයාට ගැලපෙන තැනක් නෙවෙයි. එයාව පස්සට දැම්මොත් වඩා හොඳවෙයි මම හිතන්නෙ. එයාට බැරිය අපේ සැපයුම් තවලම් ආරක්ෂා කරන්ට."

"මට බොරුවට කරුනාව පෙන්නන්ට ඕන නැහැ තාත්තෙ." ඔහු කේන්තියෙන් කීවේය. "ඔබට බැරිනම් මට වෙන තැනක් දෙන්ට, මම ඔබේ පෙරමුණු බලඇණියට අණ දෙන්නම්."

ටයිවින් උතුමානන් සිය කුරුමිට්ටි පුත්‍රයා දෙස නිරීක්ෂණාත්මක බැල්මක් හෙලුවේය. "මම කිවුවද අණදීමක් ගැන? උඹ සටන් කරන්නෙ සෙර් ග්‍රෙගර්ගෙ අණ යටතේ."

ඌරු මස් කැබැල්ලක් මුවට ලා ගත් ටිරියන් මොහොතක් එය සෙමින් සැපීය. එනමුදු ඊළඟ මොහොතේ කේන්තියෙන් කෙල ගසා එය බිමට විසිකර දැමීය. "මම හිතන්නෙ මට කොහෙත්ම බඩගිනි නැහැ." අදක්ෂ අයුරින් බංකුවෙන් බිමට බසිමින් ඔහු කීවේය. "මට සමාවෙන්ට මගේ උතුමනි."

හිස මඳක් ඇල කල ටයිවින් උතුමානන් ඔහුට යාමට අවසර ලබා දුන්නේය. ආපසු හැරුනු ටිරියන් ඉවතට ඇවිද යන්නට විය. කඳුගැටය පහළට බසිද්දී ඔහු පිටුපසින් එල්ල වී ඇති ඔවුන්ගේ දෑස් ඔහුට හැඟෙන්නට විය. ඔහු පසුපසින් කෑම මේසයෙන් මහත් සිනා හඬක් නැග එන්නට වූ නමුදු ටිරියන් ආපසු හැරී නොබැලුවේය. ඔවුන් සියල්ලෝම සිය ඌරු මස් කැබලි උගුරේ සිරවී මියයන්නේ නම් මැනවැයි ටිරියන් ප්‍රාර්ථනා කලේය.

* * *

සැඳෑඅඳුර දසත වෙලාගත්තේ ධජ සියල්ල අඳුරු කළු පැහැයකට හැරුනි. ලැනිස්ටර් යුධ කඳවුර ගංගාවත් රජමාවතත් අතර සැතැපුම් ගනනාවක් දුරට යනතෙක් විහිද පැවතින. දහස් ගණනක් වූ මිනිසුන්, අශ්වයින් හා ගස් අතරේ මිනිසකු අතරමං වීම පහසු දෙයක් විය. මේ මොහොතේ ටිරියන්ට ද ඒ දේම සිදු විය. ඔහු දැවැන්ත මන්ඩප දුසිමක් පමණද කඳවුරු ගිනිමැල සිය ගණනක් ද පසුකලේය. කූඩාරම් අතරේ පියැඹූ කනාමැදිරින් දිස්වූයේ ඔහු මෙන්ම වල්මත්ව ඉබාගාතේ යන තාරකාවන් මෙනි. හොඳ පදමට සුදුළූණු හා කුළුබඩු මුසු කල සොසේජ් බැදෙන සුවඳ ඔහුට දැනෙන්නට වූ අතර එයින් වූයේ ඔහුගේ හිස් උදරය තවතවත් ඇවිස්සීම පමණි. ඈත කොහේදෝ තැනක මිනිසුන් ගොරහැඩි හඬින් ග්‍රාම්‍ය ගීයක් ගයන'යුරු ඔහුට ඇසුනි. අඳුරු පැහැ සළුවකට යටින් මුළුමනින්ම නිරුවත්ව සිටි ගැහැණියක් කැකිරි පලමින් ඔහු පසුකොට දිවගියාය. ඈ පසුපසින් පන්නාගෙන පැමිණි බේබද්දා ගස්මුල්වල පය පැකිලී ඇද වැටිනි. මඳක් ඈතින් වූ කුඩා දිහපහරක් අසබඩ හෙලිධරයින් දෙදෙනෙක් එකිනෙකාට මුහුණ ලා කෙමෙන් තුනී වී යන ආලෝකය අතරේ සිය පහරවල් හා පහර වැළැකීම් පුහුණුවෙමින් සිටියෝය. ඔවුන්ගේ නිරුවත් පපු දහදියෙන් පෙඟී දිලිසුනි.

කිසිවෙක් ඔහු දෙස නොබැලීය. කිසිවෙක් ඔහු හා කතා නොකලේය. කිසිවෙක් ඔහු කෙරෙහි කිසිදු අවධානයක් නොයෙදවීය. විසිදහසක් වූ ලැනිස්ටර් පාක්ෂිකයින්ගෙන් සැදි දැවැන්ත හමුදාවක මධ්‍යයේ සිටියේ වුව ඔහු තනිවී සිටියේය.

* * *

අන්ධකාරය විනිවිද ෂග්ගාගේ සිනාහඬ ගිගුම් දෙනු ඇසුනු ඔහු ඒ හඬ පැමිණි දිශාව ඔස්සේ පියමැන්නේ ගල් කපුටන් ගේ කඳවුර වෙත පැමිණියේය. ඔහු දුටු කොරාට්ගේ පුතා කොන් ඒල් පිරි ගුරුලේත්තුවක් ඔසවා ඔහුට ආචාර කලේය. "ටිරියන් කොලුමිනිහා! වරෙන් වරෙන්. අපේ ගිනිමැලේ ගාවින් වාඩිවෙලා අපිත් එක්ක මස් කෑල්ලක් කාපන්. අපි ගොනෙක්ව පුච්චනවා."

"මට ඒ වග පේනවා කොරාට්ගෙ පුතා කොන්." කුඩා ගස්කඳක් තරම් වූ හරස් පොල්ලක ගැසූ දැවැන්ත රතු පැහැ මළසිරුර බුර බුරා නගින ගිනිජාලාවට ඉහළින් කරකැවෙමින් තිබිනි. ගල් කපුටන් දෙදෙනෙකු දෙපසින් හිඳ මේ මස් කුට්ටිය කරකවමින් පලහන අතරේ එයින් වැගිරුනු මේදය හා රුධිරය පහතින් වූ ගිනිදළු හා මුසුව ගියේය. "උඹලාට බොහොම ස්තූතියි! ගොනා පිච්චුනාම මට පණිවුඩයක් එවපන්කො. පෙනුන අයුරින් නම් යුද්ධාරම්භය වෙනතුරු වත් ඔහුට බලා සිටින්නට සිදුවන සැටියකි. ඔහු නොනැවතීම ඉදිරියට ගමන් කලේය.

මේ සැම ගෝත්‍රයකටම ඊට වෙන්වූ ගිනිමැලයක් විය. කළු කණ් ඇත්තන් ගල් කපුටන් හා එක්ව අහර නොගත්තෝය. ගල් කපුටන් චන්ද්‍ර සොහොයුරන් හා එක්ව අහර නොගත්තෝය. කිසිදු ගෝත්‍රයක් පිළිස්සුනු මිනිසුන් හා එක්ව අහර නොගත්තෝය. ලෙෆර්ඩ් උතුමානන් වෙතින් ඔහු ඉල්ලාගත් වාම් කූඩාරම මේ ගිනිමැල හතර මැද්දේ එසැවී තිබුනි. බ්‍රොන් ඔහුගේ නව සේවකයින් හා එක්ව වයින් මල්ලක් හිස් කරමින් හුන්නේය. ටයිවින් උතුමානන් විසින් ඔහුගේ අවශ්‍යතා වෙනුවෙන් අස් ගොවුවකු හා සේවකයකු එවා තිබුනි. එමෙන්ම ඔහු වෙනුවෙන් සහවරයෙකු ලබාගන්නා මෙන් බලකර තිබුනි. මේ සියළුදෙන කුඩා ගිනිමැලයක නිවී යමින් තිබෙන ගිනිදළු අසබඩ අසුන්ගෙන සිටියහ. කෙසඟ, කළු පැහැ හිසකෙසැති තරුණියක් ද ඔවුන් සමග සිටියාය. ඇගේ වයස යාන්තමින් දහඅටක් පමණ වූවායැයි බැලූ බැල්මටම පෙනුනි. ටිරියන් මොහොතක් ඇගේ මුහුණ නිරීක්ෂණය කලේය. ඊළඟ මොහොතේ ඔහුගේ දෑසට ගිනිමැලයේ අළු අතර වූ මාළු ඇටකටු හසුවිනි. "උඹලා මොනවද කෑවෙ?"

"ට්‍රවුට් මයෙ උතුමානනි." ඔහුගේ නව අස් ගොවුවා පිළිතුරු දුනි. "බ්‍රොන් ඌව ඇල්ලුවා."

'ට්‍රවුට්.' ඔහු සිතුවේය. 'ඌරු පැටවු. මගේ තාත්තව යකාටම ගියාදෙන්.' ඔහු දුක්මුසු අයුරින් මේ මාළු ඇටකටු දෙස බලා සිටින්නට විය. කුසගින්න නිසා ඔහුගේ උදරය පෙරලී එන්නාක් මෙන් දැනෙන්නට විය.

ඔහුගේ නව සහචරයා වූ, පොඩ්රික් පේයින් නම් අමුතුම නමක් හිමි කොලු ගැටයා කියන්නට ආ කුමක් හෝ දෙයක් ගිලගත්තේ ය. මේ කොලුවා රජතුමාගේ අළුගෝසුවා වන සෙර් ඉලියන් පේයින්ගේ දුරස්ථ ඥාතියකු විය... එමෙන්ම ඔහුද සෙර් ඉලියන් තරම්ම නිහඬ පුද්ගලයකු විය. එනමුදු මේ නිහඬ බව සෙර් ඉලියන්ට මෙන් දිවක් නොමැති නිසා සිදු වූවක් නොවීය. ඒ බව තහවුරු කරගන්නට ටිරියන් වරක් ඔහුට දිව දිගුකර පෙන්වන්නට යැයි කීවේය. "ආ ඇත්තටම ඒක දිවක් තමා." ඔහු එදා කීවේය. "උඹ දවසක ඉගෙනගනියි කොහොමද ඒක පාවිච්චි කරන්නෙ කියලා."

මේ මොහොතේදී කොලුවාගේ සිතේ ඇති දේ පිටතට ඇදගැනීම වෙනුවෙන් වෙහෙසෙන්නට තරම් ඉවසිල්ලක් ටිරියන් වෙත නොවීය. එමෙන්ම ඔහුගේ පියා විසින් සිය නොකැමැත්තෙන්ම මේ කොලුවා ඔහු වෙතට පැමිනවූයේ යම් කුරිරු විහිළුවක් වශයෙනැයි ඔහු සැකකලේය. එබැවින් ඔහු නැවත සිය අවධානය තරුණිය දෙසට යොමුකලේය. "මේ ඒකිද?" ඔහු බ්‍රොන්ගෙන් ඇසුවේය.

ඇය සුනමාය අයුරින් නැගී සිට අඩි පහක් පමණ උස් වූ තමාට පහතින් සිටි ටිරියන් දෙස බැලුවාය. "එහෙමයි මයෙ උතුමානනි. ඔබතුමා සතුටුනං ඒකිටම පුළුවන් ඒකි ගැන කතා කරන්ට."

ඔහු හිස පසෙකට ඇලකලේය. "මම ටිරියන්. ලැනිස්ටර් වංශයේ. මිනිස්සු මට කතා කරන්නෙ පුංචි යකා කියලා."

"මගේ අම්මා මට නම තිබ්බෙ ෂේ කියලා. මිනිස්සු මට කතා කරන්නෙ... නිතරම වගේ."

බ්‍රොන් සිනාසුනේය. ටිරියන්ට ද සිනාගියේය. "උඹ අකැමැත්තක් නැත්තම් කූඩාරම ඇතුළට යමන් ෂේ." ඇයට ඇතුළුවීම පිණිස ඔහු කූඩාරමේ දොර පියල්ල එසැවීය. ඇතුළට වන් ඔහු ඉටිපන්දමක් දල්වනු වස් බිම දණ නමාගත්තේ ය.

සොල්දාදුවකු ගේ ජීවිතය වනාහි යම් යම් ප්‍රතිලාභ රහිත වූවක්ම නොවේ. ඔබ කොහේ කොතැන කඳවුරක් අටවාගත්ත ද ඒ සමගින් කඳවුරු පසුපස යන ගණිකාවෝ එතැනට ඇදී එන්නෝය. අද දවසේ ගමන නිමා වූ වහා ඔහු බ්‍රොන්ව පිටත්කර හැරියේ එවැනි ගණිකාවක් සොයාගෙන එනු පිණිස විය. "මම වඩා කැමැතියි ඒකි හොඳ තරුණ එකියක් නම්. හොඳ ලස්සන මූනක් තියෙනවා නම් තවත් හොඳයි. ඒකි මේ අවුරුද්ද ඇතුළෙ දවසක් හරි නාලා තියෙනවා නම් ගොඩක් හොඳයි. ඒකි නාලා නැත්තම් නාවලා ගනින්. ඒ වගේම මතක ඇතුව ඒකිට කියාපන් මම කවුද කියන එකත්, මම කොයි වගේ කෙනෙක්ද කියන එකත්." ඔහුගේ පෙර සේවකයා වූ පයික් මේ පිළිබඳව සැමවිටම එතරම් අවධානයක් නොදැක්වූවෙකු විය. ඔවුන් විසින් සතුට සපයන්නට නියමිත උතුමානන් වහන්සේ කවරාකාරයේ කෙනෙකුදැයි මුලින්ම දුටු වේලේ මේ සමහර කෙල්ලන්ගේ දෑසේ අමුතුම ආකාරයේ බැල්මක් හටගැනෙනු ටිරියන් නිරීක්ෂණය කොට තිබින... එමෙන්ම ඒ බැල්ම නැවත දකින්නට ටිරියන් ලැනිස්ටර් කොහෙත්ම සතුටු නොවීය.

දැල්වූ ඉටිපන්දම ඉහළට එසැවූ ඔහු තරුණිය නිරීක්ෂණය කරන්නට විය. බ්‍රොන් සෑහෙන සතුටුදායක රාජකාරියක් ඉටුකොට තිබුනි. ඇය කෙසඟ, මුව ඇසින් හා කුඩා සව්මත් පයෝධරයින්ගෙන් යුතු කෙල්ලක වූවාය. ඇගේ සිනහව තුළ ලැජ්ජාවක්, අහංකාර කමක් මෙන්ම නපුරු කමක් ද සැඟව තිබුනි. ටිරියන් මීට බෙහෙවින් කැමැති විය. "මම ගවුම ගලවන්ට ද මයෙ උතුමානනි?"

"ඒක ඒ වෙලාවට පුළුවන්. උඹ අවිවාහකයිද ෂේ?"

"ඔබතුමා සතුටුනම් මයෙ උතුමානනි." ඇය බොරු ලැජ්ජාවකින් මෙන් පිළිතුරු දුන්නාය.

"මම සතුටු වෙන්නෙ උඹෙන් ඇත්ත කියැවුනොත් තමා කෙල්ලෙ."

"එහෙමයි. ඒ වුනත් එතකොට ඔබට ගාස්තුව දෙගුණයක් ගෙවන්ට වෙයි."

ඔවුන් දෙදෙන නියමෙටම පෑහෙතැයි ටිරියන්ට සිතුනි. "මම ලැනිස්ටර් කෙනෙක්. මගේ ගාව ඇති පදම් රත්තරන් තියෙනවා. ඒ වගේම උඹ තේරුම් ගනියි මම කරුනාවන්තයි,

තැගිවන්තයි කියලා... ඒ වුනත් උඹෙ ඔය කකුල් දෙක මැද්දෙ තියෙන එකට වඩා දේවල් මම උඹෙන් බලාපොරොත්තු වෙනවා. ඇත්ත මට ඒකත් ඕන තමා. උඹ මගෙත් එක්ක මගේ කූඩාරමේම ජීවත් වෙයි. මගේ කුසලාණට වයින් පුරවයි. මම විහිළු කරනකොට හිනාවෙයි. දවස අහවර වුනාම මගේ කකුල් කෙඩෙත්තුව යනකම් මගේ කකුල් දෙක අතගායි... ඒ වගේම, මම උඹව දවසක් තියාගත්තත්, අවුරුද්දක් තියාගත්තත්, ඒක කොච්චර කාලයක් වුනත් අපි දෙන්නා එකට ඉන්න ඒ කාලෙ ඇතුළත උඹ වෙන මිනිහෙක් ඇඳට ගන්ට බෑ."

"හරි. සාධාරණයි." පහතට නැමුනු ඇය දළ හණ රෙද්දෙන් කල සිය ගවොමේ වාටිය දැතින් අල්ලා එක් සුනම්‍ය සෙලැවීමකින් එය ඉහළට ඇද හිසෙන් පන්නා ගලවා දැමුවාය. මේ ගවොමට යටින් නිරුවත් ෂේ හැර අන් යමක් නොවීය. "මයෙ උතුමානන් ඔය ඉටිපන්දම පැත්තකින් තිබ්බෙ නැත්තං එතුමා එතුමාගෙ ඇඟිලි ටික පුච්චගනියි."

ඉටිපන්දම පසෙකින් තැබූ ටිරියන් ඇගේ අතින් අල්ලා මුදු අන්දමින් ඇයව තමා වෙත ඇදගත්තේ ය. පහතට නැමුනු ඇය ඔහුගේ දෙතොල් සිපගත්තා ය. ඇගේ මුවින් මීපැණි හා කරාබුනැටි රසක් වහනය විය. ඇගේ දක්ෂ, සුනම්‍ය, පලපුරුදු අතැඟිලි විසින් ඔහුගේ ඇඳුමේ ගාංචු ගලවා දැමින.

ඔහු ඈ තුළට ප්‍රවිශ්ට වද්දී ඇය ආදරණීය කෙඳිරුමකින් හා සිහින් සතුටුදායක වෙවුලීමකින් ඔහුව පිළිගත්තා ය. ඇගේ මේ සතුට බොරු මවා පෙන්වීමක් බවට ටිරියන් සැකකලේය. එනමුදු ඇය එය කෙතරම් හොඳින් සිදුකලේද යත් ඒ ගැන සිතා වදවීම අවශය නොවීය. ටිරියන්ට එතරමම ගැඹුරට සත්‍යය සොයා කිමිදෙන්නට කොහෙත්ම අවශ්‍යතාවක් නොවීය.

* * *

සතුට ලැබීමෙන් පසුව ඇය ඔහුගේ දෝතට මැදිව නිදා සිටියදී තමාට ඇයව උවමනා කර තිබුනු බව ඔහුට තේරුම් ගියේය. ඔහුට ඇය හෝ ඈ වැනි කෙනෙකු තදින්ම උවමනා වී තිබුනි. ඔහු අවසන් වරට මෙලෙස ගැහැණියක හා රයක් පහන් කොට මේ වනවිට වසරකට ආසන්න කාලයක් ගෙවී ගොස් තිබුනි. ඒ ඔහු රොබර්ට් රජතුමා හා සිය සොහොයුරාත් සමග වින්ටර්ෆෙල් බලා පිටව ගිය කාලයේ විය. සමහරවිට ඔහු හෙට හෝ

අනිද්දා හෝ යුද්ධයෙන් මිය යනු ඇත. එසේ වුවහොත් ඔහු මිනීවලට ගෙන යන්නේ සිය පියා ගැන මතකය හෝ ලයිසා ඒරින් ගැන මතකය හෝ කැට්ලින් ස්ටාර්ක් ගැන මතකය හෝ නොව ෂේ ගැන මතකය වනු ඇත.

සිය බාහුවට තද වී තිබුනු ඇගේ පයෝධරවල මෘදු බව ඔහුට දැනුනි. එය සතුටුදායක හැඟීමක් හා දැනීමක් විය. ඔහුගේ සිතට ගීයක මතකය ගලා එන්නට විය. ඔහු සිහින්, මෘදු හඬින් සියුරුහඬ ලන්නට වූයේය.

"ඒ මොකක්ද මයෙ උතුමානනි?" ෂේ මිමිනුවාය.

"මොකුත් නෑ කෙල්ලෙ. මම පුංචි කාලෙ ඉගෙනගත්තු සින්දුවක්. එච්චරයි. උඹ නිදාගනින් වස්තුවෙ."

ඇගේ දෑස් පියැවී ගොස් ඇගේ හුස්ම ගැඹුරු හා ඒකාකාරී වූ පසු ඔහු හෙමිහිට ඇයට නොදැනෙන සේ, ඇගේ නින්දට බාධා නොවන සේ ඇගේ ග්‍රහණයෙන් මිදුනේය. ඉන්පසු දණගාමින් මෙන් කූඩාරමෙන් පිටතට ඇදුනු ඔහු සිය සහචරයා ගේ සිරුරට උඩින් පැන මුත්‍රා කරනු වස් කූඩාරම වටා එහි පිටුපස වූ ගස් අතරට පිය මැන්නේය.

ඔවුන් විසින් සිය අසුන් ගැටගැසූ ස්ථානයට යාබද චෙස්නට් ගසක් යට බ්‍රොන් දෙපා හරස් කර වාඩි වී සිටියේය. ඔහු මුළුමනින්ම අවදිව තෙල් ගලකින් සිය අසිපත මුවහත් කරමින් සිටියේය. මේ කුලී හේවායා අනිකුත් මිනිසුන් මෙන් නිදාගැනීම පිළිබඳ එතරම් සිත යොමන කෙනෙකු නොවීය.

"උඹ කොහෙන්ද ඒකිව හොයාගත්තෙ?" මුත්‍රා කරන අතරතුර ටිරියන් ඔහුගෙන් විමසීය.

"මම ඒකිව නයිට් කෙනෙක්ගෙන් උදුරගත්තා. ඒ යකා මේකිව දෙන්ට කොහෙත්ම කැමැති වුනේ නෑ. ඒ වුනත් උඹේ නම කිවුවහම ඌ හිත වෙනස් කරගත්තා... ඒකයි ඒ එක්කම උගේ බෙල්ලට තදවෙලා තිබ්බ මගේ කිනිස්සයි නිසා."

"නියමයි." ටිරියන් වියළි ස්වරයෙන් කීවේය. "මතක විදියට මම උඹට කිවුවේ මට කෙල්ලෙක් හොයන් වරෙන් කියලා විතරයි. මට අලුතෙන් හතුරො හදන්ටයි කියලා නෙවෙයි."

"ලස්සන එවුන් ඔක්කොම අරන් නෙ. උඹට දත් හැලිච්ච නාකිච්චියෙක් ඕන නම් මම මේකිව ආපහු අරන් යන්නම්."

ඔහු අසුන්ගෙන සිටි ස්ථානයට ටිරියන් බකල ගසමින් පියමැන්නේය. "මගේ තාත්තානම් ඕකට කියයි අහංකාරකම කියලා. උඹේ නොහික්මුන කමට දඬුවමක් විදියට උඹව පතල්වල වැඩට යවයි."

"උඹ උඹේ තාත්තා නොවිච්ච එක හොඳට ගියා. මම දැක්කා නාහෙ පුරාම බිබිළි නැගිච්ච එකියක්. උඹ ඒකිට කැමැතිද?"

"මොකක්? එහෙම කරලා මම උඹේ හදවත බිඳලා දාන්ටද?" ටිරියන් පෙරලා සමච්චල් කලේය. "මම ෂේව තියාගන්නම්. උඹ ඒකිව උදුරගත්තු නයිට්ගෙ නම මතක තියාගත්ත ද? යුද්ධෙ වෙලාවෙදි ඌව මගේ පැත්තකින් තියානොගෙන ඉන්ට මම කැමැතියි."

බ්‍රොන් බළලෙකු මෙන් සුනම්‍යව බළලෙකු මෙන් ක්ෂණිකව නැගිට සිටියේය. ඔහු මිටින් ගත් අසිපත එහා මෙහා පෙරලුවේය. "යුද්ධෙ වෙලාවෙදි මම උඹේ පැත්තකින් ඉඳියි කුරුමිට්ටො."

ටිරියන් හිස වැනීය. රාත්‍රී සුළඟ ඔහුගේ නිරුවත් සම මත උණුසුම්ව දැවටුනේය. "මාව මේ යුද්ධෙදි පරිස්සමින් බලාගනින්. එතකොට උඹට කැමැති තෑග්ගක් මගෙන් ඉල්ලගන්ට පුළුවන් වෙයි."

දිගු අසිපත දකුණතින් වමතට මාරු කල බ්‍රොන් හරස් කැපුමක් අත්හදා බැලීය. "උඹ වගේ එකෙක්ව මරලා දාන්ට කාටද ඕනවෙන්නෙ?"

"මගේ තාත්තා. එයින් එක්කෙනෙක්. එයා මාව පෙරමුණු බලඇණියට දැම්මා."

"මම එයානං මමත් ඒ දේමයි කරන්නෙ. ලොකු පලිහක් ගත්තු පුංචි මිනිහෙක්. උඹ නිසා දුනුවායින්ට ඔළුව කැක්කුම හැදෙයි."

"මට හිතෙන්නෙ හරියට උඹ මට ප්‍රශංසා කරනවා, මට ඔල්වරසන් දෙනවා වගේ. මට පිස්සුද මන්දා."

බ්‍රොන් අසිපත කොපුවේ ලෑවේය. "ඒ ගැන කිසිම සැකයක් නෑ"

ටිරියන් නැවත සිය කූඩාරමට ඇතුළු වූ විට ෂේ සිය වැලමිට මතින් එසැවී නිදිමතයේම මිමිනුවාය. "මම නැගිටලා බලද්දි මයෙ උතුමානන් යන්ට ගිහිං."

"මයෙ උතුමානන් ඔන්න ආපහු ආවා." ඔහු ඇය පසෙකින් වැතිරුනේය.

ඔහුගේ බකල කකුල් අතරින් ගිය ඇගේ දෑත් ඔහුගේ රහසඟ පිරිමැද්දේය. "ඔවු මෙන්න එතුමා ඇවිල්ලා." ඇය ඔහුව පිරිමදිමින් කෙඳිරුවාය.

බ්‍රොන් විසින් ඇයව උදුරාගත් ඒ නයිට්වරයා පිළිබඳ ඔහු ඇගෙන් විමසීය. යම්කිසි පහත් මට්ටමේ වංශාධිපතියකු ගේ නයිට්වරයකු ගේ නමක් පිළිතුරු වශයෙන් ලැබුනි. "ඔබතුමා එයාට බය වෙන්ට ඕන නෑ මයෙ උතුමානනි." තරුණියගේ අතැඟිලි ඔහුගේ දෙපා අතර කඩිසරව වැඩකරමින් තිබින. "එයා බොහොම පුංචි මිනිහෙක්."

"එතකොට මම කවුද බොලේ? යෝධයෙක් ද?"

"අපොයි ඔවු." ඇය පුරුපුරු ගෑවාය. "මගේ ලැනිස්ටර් යෝධයා." ඊළඟ මොහොතේ ඇය ඔහුගේ සිරුර මත නැගගත් අතර ටික මොහොතක් යන තෙක් තමා සැබෑවටම

යෝධයෙකු යැයි ඔහුට විශ්වාස කරන්නට සැලැස්වූවාය. ටිරියන් සිනාසෙමින් නින්දට වන්නේය...

**Bronn: “Always follow a big man into battle.”**

**Tyrion: “And why is that?”**

**Bronn: “They make such splendid targets. they’ll draw the eyes of every bowman on the field.”**

එනමුදු අන්ධකාරය විනිවිද නැගෙන්නට වූ කාහල නාදය මැද්දේ ටිරියන් අවදි වූයේය. ෂේ ඔහුගේ දෙවුරින් අල්ලා සොලවමින් සිටියාය. "මයෙ උතුමානනි." ඇය කෙඳිරුවාය. "නැගිටින්ට මයෙ උතුමානනි. මට බයයි."

නිදිමතයේම නැගිට සිටි ඔහු සිය පොරෝනාව පසෙකට වීසිකර දැමුවේය. රාත්‍රී අන්ධකාරය මධ්‍යයේ මේ හොරණෑ හඬ වියරු බවකින් හා මහා හදිසියකින් මෙන් ඇසෙන්නට විය. එය හරියටම 'ඉක්මනට! ඉක්මනට! ඉක්මනට!' යැයි මුරගාමින් ඔබව කැඳවන්නාක් මෙනි. මිනිසුන් කෑගසන හඬත්, හෙලි එකට ගැටෙන හඬත්, අසුන් ගේ හේෂාරවයත් ඔහුට ඇසෙන්නට විය. එනමුදු තවමත් කිසිදු ගැටුමක හඬක් ඔහුගේ සවනත නොවැකින. "මගේ තාත්තගෙ හොරණෑ හඬ. යුද්ධෙට කැඳවන සංඥාව. මම හිතුවෙ ස්ටාර්ක් හමුදාව තාමත් අපට දවසක දුරින් ඉන්නෙ කියලයි."

කිසිවක් තේරුම්ගත නුහුනු ෂේ හිස වැනුවාය. ඇගේ දෑස් විසල් වී සුදුමැලි පැහැගැන්වී තිබුනි.

උගුරෙන් වේදනාත්මක මොරගෑමක් කල ටිරියන් සැනෙන් දෙපයින් නැගිට සිටියේ කූඩාරමින් පිටතට විත් සිය සහචරයාට හඬගෑවේය. ගංදියෙන් නැගුනු සුදු පැහැ මීදුම දිගු සුදු අතැඟිලි මෙන් අන්ධකාරය මධ්‍යයේ පාව යමින් තිබුනි. අරුණට පෙර වූ ශීතය මැද්දේ මිනිසුන් මෙන්ම අසුන් ද පමාවන්නට වූහ, සිය කායීය වරද්දාගන්නට වූහ. සැදල තදකොට

බැඳුනු අතර කරත්තවලට බඩු පැටවෙන්නට විය. ගිනිමැල නිවී යන්නට විය. කාහල නාදය නැවත ඇසෙන්නට විය. 'ඉක්මනට! ඉක්මනට! ඉක්මනට!' නොසන්සුන් අයුරින් නහයෙන් පිඹිමින් සිටි යුධ සෛන්ධවයින් මතට නයිට්වරුන් පිනූ අතර සෙබළු දිවයන අතරේම සිය අසිපත් ඉණපටි පැළැඳගන්නට වූහ. ටිරියන් විසින් පොඩ්ව සොයාගන්නා විට කොලුවා සිහින් සරින් ගොරවමින් නිදාහුන්නේය. ටිරියන් ඔහුගේ ඉළඇටවලට පා ඇඟිලිවලින් ඇන්නේය. "මගේ සන්නාහය ගෙනෙන්. ඉක්මන් කරපන්." දැනටමත් සන්නාහයෙන් සැරසී සිය ශිරස්කය පැළැඳ සිටි බ්‍රොන් මීදුම මැද්දෙන් අසු අරා හැල්මේ ආවේය. "උඹ දන්නවද මොකක්ද සිද්ද වෙලා තියෙන්නෙ කියලා." ටිරියන් විමසීය.

"ස්ටාර්ක් කොල්ලා හොරෙන්ම කඩන් පැනලා." බ්‍රොන් පිළිතුරු දුන්නේය. "ඌ මහ රෑම රජමාවතේ පහළට ඇවිල්ලා. දැන් උන්ගෙ හමුදාව අපට හැතැප්මක්වත් නැති දුරින් උතුරෙ යුද්ධෙට ලෑස්තිවෙලා ඉන්නවා."

'ඉක්මනට!' නැවතත් හොරණෑ හඬ නද දෙන්නට විය. 'ඉක්මනට! ඉක්මනට! ඉක්මනට!'

"අර ගෝත්‍රිකයො ටික සටනට යන්ට ලෑස්තිවෙලාද කියලා බලපන්." ටිරියන් දෙකට නැවී නැවතත් සිය කූඩාරම තුළට රිංගුවේය. "කෝ යකෝ මගේ ඇඳුම්?" ඔහු ෂේට කෑගැසීය. "අර තියෙන්නෙ. නෑ ඕවා නෙවෙයි. හම් ඇඳුම් බොල. උඹ යකාටම පලයන්! අන්න හරි. මගෙ බූට්ස් දෙකත් අරන් වරෙන්."

ටිරියන් හැඳපැළැඳගෙන හමාර වනවිට ඔහුගේ සහචරයා විසින් සන්නාහය ඔහු වෙනුවෙන් පිළියෙල කොට තිබුනි. ටිරියන් සතුව සිය අසාමාන්‍ය ශරීරය වෙනුවෙන්ම වෙසෙසින් සැකසුනු කදිම, ශක්තිමත් ඵලක සන්නාහයක් වූයේය. එනමුදු අවාසනාවකට මෙන් එය මේ මොහොතේ කාර්ස්ටලී රොක්හි සුරක්ෂිතව තැන්පත්ව ඇති අතර ඔහු මෙහි සිටියි. එබැවින් ඔහුට ලෙෆර්ඩ් උතුමානන් ගේ සැපයුම් කරත්තවලින් එහෙන් මෙහෙන් අහුලාගත් එකිනෙකට නොගැලපෙන සන්නාහ කට්ටලයකින් සැරසීමට සිදුව තිබිනි. මුදු යකඩ දම්වැලින් තැනුනු සන්නාහ කමිසයක් හා හිස් ආවරණයත්, මියගිය නයිට්වෙකුගේ ග්‍රීවාවරණයක්, පොකිරිස්සකු මෙන් වූ කලවා ආවරණ හා අත්වැසුම්, උල් වානේ බූට්ස් යුගලක් ඒ අතර විය. මේ සමහරක් කැටයම් කර තිබුනු අතර සමහරක් චාම් ඒවා විය. ඒ කිසිවක් එකිනෙක හා නොපෑහින. එමෙන්ම ඒ කිසිවක් ඔහුගේ ශරීරය සමගින්ද නොපෑහින. ඔහුගේ පපු ඵලකය ඔහුට වඩා විශාල මිනිසෙකුට සුදුසු එකක් විය. ඔහුගේ

පමණට වඩා විසල් හිසට ගැලපෙන අන්දමින් ඔවුන් විසින් මුදුනේ අඩියක් පමණ දිගු ත්‍රිකෝණාකාර කුන්තයක් සවි වූ විශාල බාල්දියක් වැනි ශිරස්කයක් සොයාගෙන තිබුනි.

සන්නාහයේ ගාංචු හා පූට්ටු සවිකරනු පිණිස ෂේ පොඩ්ට සහාය වූවාය. "මම මැරුනොත් මා වෙනුවෙන් අඩපන්." ටිරියන් ඇයට පැවසීය.

"ඔබ කොහොමද දන්නෙ? ඔබ මැරිලානෙ."

"මම දන්නවා."

"මම විශ්වාස කරනවා ඒක." ෂේ ශිරස්කය ඔහුගේ හිසට උඩින් පාත් කල අතර පොඩ් එය ග්‍රීවාවරණයට තබා සවිකලේය. අසිපත හා සිරිය බරට බරේ එල්ලී තිබුනු සිය ඉණපටිය ටිරියන් පැළැඳගත්තේය. මේ වනවිට ඔහුගේ අස්ගොවුවා විසින් ඔහු තරම්ම සන්නාහයෙන් සැරසුනු ඔහුගේ දුඹුරු පැහැ යුධ සෙන්ධවයා කැඳවාගෙන විත් තිබුනි. අසු පිට නැගීම පිණිස ඔහුට උදවු අවශ්‍ය විය. තමා ස්ටෝන් දහසක්වත් බර යැයි ඔහුට හැඟෙන්නට පටන්ගෙන තිබුනි. පොඩ් විසින් ඔහුට යකඩින් සවිමත් කල බරැති අයන්වුඩ් ලීයෙන් තැනූ විසල් පලිහක් ලබාදුන්නේය. අවසනදී ඔහුගේ යුධ පොරොව ඔහු අතට ලැබින. අඩියක් පසුපසට තැබූ ෂේ ඔහුගේ හිස සිට දෙපතුල දක්වාම බැල්මක් හෙලීය. "මයෙ උතුමානන් හරිම බිහිසුණු පෙනුමයි."

"මයෙ උතුමානන් නොගැලපෙන සන්නාහයක් ඇන්ද කුරුමිට්ටෙක් වගේ." ටිරියන් ඇඹුල් ස්වරයෙන් පිළිතුරු දුන්නේය. "ඒ වුනත් උඹට ස්තූතියි එහෙම කිවුවට. පොඩ්රික්, යුද්ධෙ අපට අවාසි පැත්තට හැරුනොත් ආර්යාව පරිස්සමින් ගෙදර ඇරලවපන්." පොරොව ඔසවා ඇයට ආචාර කල ටිරියන් අසු ආපිට හරවාගත්තේ ඔවුන්ගෙන් වෙන්ව පිටව ගියේය. ඔහුගේ උදරය ඇඹරී එකම ගුලියක් මෙන් වේදනා ගෙනදුන්නේය. ඔහුට පසුපසින් ඔහුගේ සේවකයින් විසින් ලහිලහියේ කූඩාරම් ගලවන්නට වූහ. ක්ෂිතිජයට ඉහළින් හිරු අහසට නැගෙන්නට තැත්කරද්දී නැගෙනහිර ආකාශයේ ලා රත් පැහැ රේඛාවන් ඇඳෙන්නට විය. බටහිර දිග අහස තද දම් පැහැයකින් යුක්ත වූ අතර එහි අතරින් පතර තරු බැබලිනි. තමා විසින් දකින්නට යෙදෙන අවසන් සූර්යෝදය මෙය දැයි ටිරියන් විමතියෙන් කල්පනා කරන්නට විය... එමෙන්ම මෙසේ කල්පනා කිරීම බියගුලුකමක් දැයි

සිතන්නට විය. ඔහුගේ සොහොයුරා ජේමී කවදාක හෝ සටනකට පෙර මරණය මෙනෙහි කරන්නට ඇත්ද?

ඉතා ඈතින් යුධ හොරණෑ හඬක් නැගෙන්නට විය. එය කෙතරම් ගැඹුරු, කෙතරම් දුක්මුසු හඬක් වී ද යත් ඔහුගේ සියොලඟම සීතල වී ගියේය. ගෝත්‍රිකයෝ සිය කැහැටු කඳුකර අසුන් පිට නැගී එකිනෙකාට කවට බස් දොඩමින්, සාප කරමින්, අවලාද නගමින් හුන්නෝය. ඔවුන්ගෙන් කිහිප දෙනෙකු බීමතින් පසුවන්නාක් මෙන් පෙනින. ටිරියන් විසින් ඔවුන්ව කැඳවාගෙන සටනට පිටවෙද්දී නැගෙන හිරුත් සමගින් මෙතෙක් වේලා ඔවුන් වසා පැවති මීදුම් පටලය කෙමෙන් බොඳ වී යන්නට විය. අසුන් විසින් නොකා ඉතුරු කරන ලද තණපත් මත පිණිබිඳු නැගී තිබුනි. එය හරියටම යම් කිසි දෙවිකෙනෙකුන් විසින් පොළොව මත දියමන්ති මල්ලක් හලාගෙන ගියාක් බඳු විය. ඔහුට පිටුපසින් ඔහුගේ කඳුකර ගෝත්‍රිකයෝ සිය නායකයින් ගේ අණ යටතේ පේළි සැදී ගමනාරම්භ කරන්නට වූහ.

ටයිවින් ලැනිස්ටර් උතුමානන් ගේ හමුදාව අරුණාළෝකයේ පිබිදෙන යකඩ රෝස මලක් මෙන් කෙමෙන් කෙමෙන් පිබිදෙන්නට වූ අතර එහි වානේ කටු තුඩු හිරු එළියේ දිලිසෙන්නට විය.

* * *

සුපුරුදු පරිදි ටිරියන්ගේ බාප්පා විසින් හමුදාවේ මධ්‍ය බලඇණිය මෙහෙයවනු ලැබීය. සෙර් කෙවන් රජමාවතට ඉහළින් සිය සේනාංක පෙළගන්වා තිබුනි. දසරුවෙන් එල්බෙන හියොවුරු සහිත පාබල දුනුවායින්ගේ බලඇණිය මාර්ගයේ බටහිරට හා නැගෙනහිරට වන්නට දිගු පේළි තුනක් සැදී සිය දුනුවලට දුනුදිය යොදමින් සිටියෝය. ඔවුන් අතරට මැදි වූ කුන්තධරයෝ චතුරස්‍රාකාර ප්‍රහාරක කණ්ඩායම් සාදමින් පෙළගැසී උන්හ. ඔවුන්ට පිටුපසින් අසිපතින්, හෙල්ලයෙන් හා යුධ පොරොවෙන් සන්නද්ධ වූ සාමාන්‍ය සෙබළ පෙළක් පසුපස පෙළක් වන සේ දිගහැරී සිටියෝය. තුන්සියයක් වූ බැර අශ්වාරෝහක බලඇණියක් සෙර් කෙවන් හා අනිකුත් ධජධරයින් වූ ලෙෆර්ඩ්, ලිඩ්න් හා සෙරට් යන උතුමන් ද ඔවුන්ගේ නයිට්වරුන් ද වටකරමින් නැගී සිටියෝය.

දකුණු බලඇණිය මුළුමනින්ම පාහේ අශ්වාරෝහක සෙබළුන්ගෙන් සැදුනි. ඒ වනාහි බරැති සන්නාහයෙන් සැරසුනු භාරදහසක සෙබළ මුලුවක් විය. මුලු හමුදාවේම සිටි නයිට්වරුන්ගෙන් හතරෙන් තුනක් පමණ මීට අයත් වූ අතර එය හරියටම මිටි කරගත් යෝධ වානේ අතක් මෙන් විය.එහි නායකත්වය සෙර් ඇඩම් මාර්බ්‍රෑන්ඩ් විසින් උසුලනු ලැබීය. ඔහුගේ වංශ සලකුණ වන තැඹිලි හා අළු පැහැයෙන් යුත් ගිනිගන්නා ගසක රුව සහිත ධජය සුළඟේ ලෙලදෙනු ටිරියන් දිටීය. ඔහුට පිටුපසින් සෙර් ෆ්ලෙමන්ට් ගේ දම්පැහැ කඟවේනා ද, ක්‍රේක්හෝල්වරුන් ගේ වල්ඌරා ද, ස්විෆ්ට්වරුන් ගේ කුරු කුකුළා ද තවත් බොහෝ වංශ ලාංඡනද සුළඟේ ලෙලදෙන්නට විය.

ඔහුගේ පියා තමා පෙරදා රැයේ නවාතැන් ගත් කුඩා කඳුගැටය මුදුනේ තම බලඇණිය රඳවා සිටිනු දක්නට ලැබින. ඔහු වටා අඩක් අසරු හා අඩක් පාබල සෙබළුන්ගෙන් සැදි පන්දහසක් වූ අතිරේක බලඇණිය නැගී සිටියෝය. ටයිවින් උතුමානන් සෑමදාම පාහේ අතිරේක බලඇණියට අණදෙන්නට කැමැත්තක් දැක්වීය. ඔහු උස් බිමකට වී තමන් ඉදිරියේ සටන දිගහැරෙන ආකාරය දෙස පරීක්ෂාවෙන් බලා සිට අවැසි මොහොතේදී අවැසි තැනට සිය බලඇණිය මෙහෙයවීමේ ශූරයෙකු විය.

මෙතරම් දුරක සිට පවා ඔහුගේ පියා ඉතා දීප්තිමත්ව හා උත්තුංගව නැගී සිටිනු නිරීක්ෂණය කල හැකි විය. ටයිවින් ලැනිස්ටර් උතුමානන්ගේ යුධ සන්නාහය වනාහි එහි මහේශාඛ්‍ය භාවය විසින් ඔහුගේ පුත් ජේමි ලැනිස්ටර් ගේ රන්වන් සන්නාහය ලජ්ජාවෙන් සඟවන්නට සමත් එකක් විය. ඔහු උර පැළැඳි සළුව අනන්ත රන්කෙඳි ස්ථරයන්ගෙන් වියුනක් වූ අතර එහි බර කෙතරම් වී ද යත් ඔහු වේගයෙන් අසු විහිදුවන විට පවා එය සුළඟේ ලෙල දුන්නේ මඳ වශයෙනි. එය කෙතරම් විසල් වී ද යත් ඔහු යුධ සෛන්ධවයා පිට නැගුනු විට එයින් සත්ත්වයා ගේ පසුපස සැහෙන ප්‍රමාණයක් ආවරණය වී ගියේය. කිසිඳු සාමාන්‍ය හාරිච්චියකට මෙවැනි බරක් රඳවාගෙන සිටීම උගහට විය. එබැවින් මේ බරැති සළුව ඔහුගේ උරයේ රඳවනු වස් වෙසෙස් හාරිච්චි යුගලයක් භාවිත විය. මේ හාරිච්චි ඉදිරියට පනින්නට සූදාණමින් සිටින සිංහ ධේනුවකගේ රුවින් සැකසී තිබුනි. මේ සිංහ ධේනුන් දෙදෙනා ගේ වල්ලභයා වූ විසල් කේශර කළඹකින් හෙබි සිංහයා ටයිවින් උතුමානන් ගේ ශිරස්කය මතට වී එක් අතක් ඔසවාගෙන ගර්ජනා කරමින් හුන්නේය. මේ සිංහයින් තිදෙනාම රනින් නිමවා දෑස් වෙනුවට රතු කැට එබ්බවූ අලංකාර නිර්මාණ විය. ඔහුගේ සන්නාහය තද ලේ රත් පැහැයෙන් වර්ණ ගැන්වූ වානේ ඵලකයෙන් සැදුනේවිය. ඔහුගේ වානේ අත්වැසුම් හා ජංඝාවරණ රනින් කැටයම් කොට වැඩ දමා තිබුනි. සන්නාහයේ වූ සියළු වෘත්තාකාර ආරක්ෂාවරණයන් රනින් නිමවූ සූර්යයන් විය. ගාංචු හා පූට්ටු සියල්ලම රත් පැහැ වානේවලින් නිමවී තිබුනි. මේ රක්තවර්ණ වානේ කෙතරම්

තදින් ඔපදමා තිබුනිද යත් නැග එන සූර්‍යාලෝකය හමුවේ ඒවා ගින්දර මෙන් දිස්නය දෙන්නට විය.

ටිරියන්ට දැන් දැන් සතුරන්ගේ බෙර හඬ ඇසෙන්නට විය. අවසන් වරට තමා රොබ් ස්ටාර්ක් දුටු දා ටිරියන්ට සිහිපත් විය. ඒ වින්ටර්ෆෙල්හි ප්‍රධාන ශාලාවේ ඔහුගේ පියාගේ උස් අසුනේ වාඩි වී දිදුලන අසිපතක් සුරතින් රැගෙන සිටි රොබ්ගේ රුව විය. සෙවනැලි මුවාවේ හිඳ සෝරවෘකයින් ඔහු වෙත කඩා පිනූ අයුරු ඔහුට සිහිපත් විය. දත් විලිස්සාගෙන ගොරවමින් උන් තමා වෙත කඩා පිනූ අයුරු ඔහුට මැවී පෙනෙන්නට විය. මේ කොලුවා සිය වෘකයිනුත් යුද්ධය වෙනුවෙන් දකුණුකරයට කැඳවාගෙන ආවේද? මේ සිතුවිල්ල විසින් ටිරියන්ව නොසන්සුන් කරන්නට සමත් විය.

සිය දිගු, නිදිනොමැති රාත්‍රී ගමනින් පසු උතුරුකරයේ සෙබළුන් අතිශයින්ම වෙහෙසට පත්ව සිටිනු නොඅනුමානය. මේ කොලුවා කුමක් බලාපොරොත්තු වන්නේදැයි ටිරියන් විමතියෙන් කල්පනා කලේය. ඔවුන් නිදි අතර හදිසියේ කඩා පැන පහර දෙන්නට ඔවුන් අදහස් කලේද? ඊට ඇත්තේ ඉතාම අඩු ප්‍රස්ථාවයකි. මිනිසුන් ඔහු ගැන කෙසේ කුමක් කීවද ටයිවින් ලැනිස්ටර් යනු මෝඩයෙකු නොවේ.

පෙරටු බලඇණිය වම්පස එකතු වෙමින් සිටියේය. කහ පැහැ පසුබිමක සිටින කළු බල්ලන් තිදෙනාගේ රුව සහිත බලඇණි ධජය ඔහු නිරීක්ෂණය කලේය. ටිරියන් විසින් සිය දිවිය තුළ දුටු දැවැන්තම යුධ අශ්වයා පිට නැගුනු සෙර් ග්‍රෙගර් ක්ලිගේන් මේ ධජය සෙවණේ හුන්නේය. ඔහු දෙස එක් බැල්මක් හෙලූ බ්‍රොන් සතුටින් විරිත්තුවේය. "හැමවෙලාවෙම ලොකු මිනිහෙක් එක්ක යුද්ධෙට යන්ට ඕන."

ටිරියන් ඔහු දෙසට නොපහන් බැල්මක් හෙලුවේය. "ඒ මොකද?"

"උන් බොහොම හොඳ ඉලක්ක. අර යකා පේනවනෙ. මෙතැන ඉන්න හැම දුනුවායාගෙම ඇස් දෙක ඇදිලා යන්නෙ ඌ දිහාටයි." ටිරියන් සිනාසෙමින් 'කන්ද' දෙස නැවත වරක් බැලුවේය. "මම අවංකවමයි කියන්නෙ. මම මීට කලින් කවදාවත් ඒ පැත්තෙන් ඒ දිහා බලලා නැහැ."

ක්ලිගේන් සතුව කිසිදු උත්කර්ශයක් හෝ ආනුභාවයක් හෝ නොවීය. ඔහුගේ සන්නාහය අඳුරු අළු පැහැ වානේ එලක විය. ඒවා භාවිතය නිසාම කැළැල් ඇති වූ කිසිදු අලංකරණයක් හෝ වංශ සලකුණක් හෝ නොමැති වාම් පැළැඳුම් විය. ඔහු අසිපතක් වනමින් සිය මිනිසුන් ස්ථානගත කරවමින් හුන්නේය. දෑතින්ම එසවිය යුතු මහ අසිපතක් වූ මෙය සෙර් ග්‍රෙගර් විසින් එක් අතකින් වනමින් හුන්නේ සාමාන්‍ය මිනිසකු සිරියක් වනන්නාක් වැනි සැහැල්ලුවකිනි. "එකෙක් හරි ආපිට දිවුවොත් මමම ඇවිල්ලා ඌව කපලා දානවා." ටිරියන්ව ඇස ගැටෙද්දී ඔහු ගිගුම් දෙමින් සිටියේය. "පුංචි යකා. වම් පැත්ත ගනින්. ගඟ අල්ලන් හිටපන්, උඹට පුළුවන් නම්."

වම්පස බලඇණියේ වම්පැත්ත. ඔවුන්ගේ අංශයට පහරදෙන්නට නම් ස්ටාර්ක් සෙබළුන්ට දිය මත පියාඹන අශ්වයින් උවමනා වනවා ඇත. ටිරියන් සිය සෙබළුන්ව ගංතෙර දෙසට මෙහෙයවීය. "අර බලපල්ලා." ඔහු සිය පොරොව දිගුකරමින් කෑගැසුවේය. "ගඟ." ලා පැහැ මීදුමක් තවමත් ගංදිය මත පැතිර පැවතින. අඳුරු කොළ පැහැ දියදහරා වේගයෙන් පහතට ගලාගියේය. ගංතෙර මඩ සහිත වූ අතර පන් ගසින් සෙවුනේය. "මේ ගඟ අපෙයි. මොන දේ සිද්දවුනත් ඒකට කිට්ටුවෙන් හිටපල්ලා. කොයිවෙලාවකවත් ඒක නොපෙනෙන තරම් දුරකට යන්ට එපා. කිසිම සතුරෙකුට අපියි ගඟයි අතරට එන්ට දෙන්ටත් එපා. උන් අපේ ගඟ අපවිත්‍ර කරන්ට ආවොත් උන්ගෙ පිරිමි ඇඟවල් කපලා මාළුන්ට කන්ට දාපල්ලා."

ෂග්ගා දෑතින්ම පොරොවක් බැගින් දරා සිටියේය. ඒවා එකට ගැටූ ඔහු මහත් හඬක් නැංවීය. "කොලුමිනිහා!" ඔහු කෑගැසුවේය. අනිකුත් ගල් කපුටන් ද, කළු කණ් ඇත්තන් හා චන්ද්‍ර සොහොයුරන් ද මේ වදන අල්ලාගත් බවක් පෙනුනි. පිළිස්සුනු මිනිස්සු කෑ නොගැසුව ද සිය අසිපත් හා හෙලි එකට ගටමින් කලිකලහයට සහය දැක්වූවෝය. "කොලුමිනිහා! කොලුමිනිහා! කොලුමිනිහා!"

සිය අසු සම්පූර්ණ වටයක් කරකැවූ ටිරියන් භූමිය නිරීක්ෂණය කලේය. මෙහි බිම වලගොඩැලි සහිත අසමාන එකක් විය. ගංගාවට ආසන්නයේ එය මෘදු හා මඩ ගතියෙන් යුක්ත විය. මඳ බෑවුමකින් යුක්තව රජමාවත දෙසට කෙමෙන් එසැවී ගිය එය ගලින් වැසුනේය. අතරින් පතර වූ ගස් කිහිපයක් හැරෙන්නට මුළු භූමියම පාහේ විවෘත එළිමහනක් හා ගොවිබිමක් විය. බෙර හඬේ තානය අනුව ඔහුගේ හදවත සැලෙන්නට විය. වානේ හා සම් ආවරණවලට යටින් ඔහුගේ නළල දහදියෙන් පෙඟී ගොස් තිබින. සෙර් ග්‍රෙගර් මිනිසුන් අතරේ එහා මෙහා යමින් කෑගසමින් හා නොයෙකුත් අභිනයන් දක්වමින් සිටින'යුරු ඔහු දිටීය. මේ බලඇණියද මුලුමනින්ම පාහේ අසරු සෙබළුන්ගෙන් සැදුනේ

විය. එනමුදු නයිට්වරුන්ගෙන් හා බර ලන්සධරයින්ගෙන් සැදි වානේ මිටක් බඳු වූ දකුණු බලඇණිය මෙන් නොව පෙරටු බලඇණිය වනාහි හුදෙක් බටහිර දිග අතුගා එකතුකර සාදාගත් හමුදාවක් විය. සම් කබා හැඳි අසරු දුනුවායන්, කිසිදු විනයකින් තොර නිදහස් අසරුවන් හා කුලී හේවායින්, ගොවිපල අසුන් පිට නැගී සිය පියවරුන් ගේ මළ කෑ අසිපත් හා මහ දැකැතිවලින් සන්නද්ධ වූ ගොවිපල සේවකයන්, ලැනිස්පෝර්ට්වල ගබඩා හා කුස්සිවලින් සොයාගත් බාගෙට පුහුණු වූ කොල්ලන් සහ ටිරියන් හා ඔහුගේ කඳුකර ගෝත්‍රිකයින්ගෙන් මේ පෙරටු බලඇණිය සමන්විත විය.

"කපුටන්ට කෑම." බ්‍රොන් කටුකුටු ගෑවේය. ඒ වනාහි ටිරියන් නොපවසා සිටි දෙයම විය. එකඟවෙමින් හිස වැනීම හැර ඔහුට අන් කල හැකි දෙයක් නොවීය. ඔහුගේ පියාට උමතුවක් වැළඳී ද? කුන්තධරයින් නැති, දුනුවායින් ස්වල්පයක් පමණක් ඇති. නයිට්වරුන් කිහිපදෙනෙකුන් හා පැරණි ආයුධයෙන් සැරසුනු සන්නාහ නොලූ සෙබළුන්ගෙන් පිරි, සිය ඥානයට වඩා කේන්තිය විසින් මෙහෙයවන මෘගයකු විසින් අණදෙනු ලැබූ පෙරටු බලඇණිය... මේ විකාරකාරයින් රැළ විසින් වම්පස පෙරමුණ රැකගනිවී යැයි ඔහුගේ පියා කෙලෙසක නම් බලාපොරොත්තු වන්නේද?

එනමුදු මේ ගැන සිතා තවදුරටත් වදවන්නට ඔහුට අවකාශයක් නොවීය. සතුරු බෙර හඬ අත ළඟම ඇසෙන්නට විය. ඔහුගේ දැත් නලියන්නට විය. බ්‍රොන් සිය දිගු අසිපත ඇදගත්තේ ය. ඊළඟ මොහොතේ සතුරු හමුදාව ඔවුන් අබියස විය. පලිස්වලින් හා කුන්තවලින් සැදි පවුරක් පසුපසට වී සිටි සතුරු සෙබළු ප්‍රවේශම් සහගත ඉදිරි ගමනකින් කඳු ගැට මුදුනින් මතුවන්නට වූහ.

* * *

'දෙයියො යකාටම ගියාටම ගියාදෙන්! බලපන් උන් කොච්චර ඉන්නවද කියලා.' ටිරියන් තොල මතුලේය. එනමුදු සිය පියා සතුව ඊට වඩා සෙබළුන් සතුව ඇති බව ඔහු දැන සිටියේය. සන්නාහයෙන් සැරසුනු යුධ අසුන් පිට නැගුනු කපිතාන්වරුන් විසින් මේ සෙබල මුලුවට අණදෙනු ලැබින. ඔවුන් එකිනෙකාගේ වංශ සලකුණු සහිත ධජ ඔසවාගත් අසරුවෝ ඒ හා සමපාතව ඉදිරියට එන්නට වූහ. හෝර්න්වුඩ්වරුන් ගේ පිණිමුවා ද, කාර්ස්ටාර්ක්වරුන් ගේ සූර්යයා ද, සර්වින් උතුමානන් ගේ යුධ පොරොව ද, ග්ලවර්වරුන් ගේ මිටි මොලොවාගත් හස්තය ද... ෆ්‍රේවරුන් ගේ ද්විත්ව බලකොටුව ද ටිරියන්ට හඳුනාගත හැකි විය. වෝල්ඩර් උතුමානන් සිය සෙබළුන් සටන වෙනුවෙන්

මෙහෙයවන්නේ නොමැති බවට ටයිවින් උතුමානන් ගේ වූ නිසැක නිගමනය වැරදී තිබුනි. ස්ටාර්ක් වංශයේ සුදු පැහැ ධජ සැම දෙසින්ම දක්නට හැකි විය. උසැති රිටි මුදුනේ වූ මේ ධජ සුළඟේ ලෙලදෙද්දී එහි වූ අළු පැහැ සෝරවෘකයින් ඉදිරියට පිම් පනින්නාක් මෙන් දිස්විය. "කෝ එතකොට කොල්ලා?" ටිරියන් විමතියෙන් එහා මෙහා බැලුවේය.

යුධ හොරණෑවක් නද දෙන්නට විය. හරුඌඌඌඌඌඌඌඌඌඌඌඌ... මේ ශබ්දය උතුරුකරයෙන් හමාඑන ශීතල සුළඟක් මෙන්ම දිගු පහත් හඬක් වූ අතර එය අසන්නන්ගේ සියොලඟම සීතල කර දැමීමට සමත් විය. ලැනිස්ටර්වරුන් ගේ නලා මීට පිළිතුරු වශයෙන් විරෝධාත්මක ලෝහමය හඬක් නැංවූයේය. ඩා-ඩා ඩා-ඩා ඩා-ඩාආආආආආආආආආආආආ... එනමුදු ටිරියන්ට හැඟුනේ තම නලා හඬ වඩා පහත්, කාන්සා සහගත හඬක් එකක් ලෙසිනි. තම උදරය තුළ සලබයින් පියාඹන්නාක් මෙන් ඔහුට දැනෙන්නට විය. තමා මේ මොහොතේ අසනීප වී මියනොයන්නැයි ඔහු ප්‍රාර්ථනා කලේය.

හොරණෑ හඬ හා නලා හඬ කෙමෙන් මැකී යද්දී වාතය පුරා 'හිස්ස්ස්ස්ස්...' ශබ්දයක් ඇසෙන්නට විය. ඊළඟ මොහොතේ ඔහුගේ දකුණු පසින් ඊතල වර්ෂාවක් අහසට නගිනු පෙනිනි. උතුරු සෙබළුන් මේ වනවිට කෑගසමින් ඉදිරියට දිව එන්නට පටන්ගෙන තිබුනි. එනමුදු සිය ගණනක් වූ - නැත, දහස් ගණනක් වූ ලැනිස්ටර් ඊතල ගල් කැට වර්ෂාවක් මෙන් ඔවුන් මත පතිත වන්නට වූ විට මේ කෑගැසීම් වේදනාත්මක මුරගෑම් බවට පරිවර්තනය විය. මිනිසුන් එකාපිට එකා ඇද වැටෙන්නට පටන්ගත්තේ ය. මේ වනවිට දෙවන ඊතල වර්ෂාවද අහස අරා සිටි අතර දුනුවායන් පිරිස සිය තෙවැනි ඊතලය දුනුදියේ අමුනා බලා සිටියෝය.

නැවතත් නලා හඬ නැගෙන්නට විය. ඩා-ඩාආආආ ඩා-ඩාආආආ ඩා-ඩා ඩා-ඩා ඩා-ඩාආආආආආආ... සිය දැවැන්ත අසිපත වැනූ සෙර් ග්‍රෙගර් යම් අණක් දෙමින් කෑගැසුවේය. ඔහුගේ හඬට පිළිතුරු ලෙසින් තවත් දහසකුත් එකක් කෑගැසීම් නැගී ආයේය. සිය අසුට පයින් සන්කල ටිරියන්ද මේ කෑගැසීමට සිය දායකත්වය ලබා දුන්නේය. ඊළඟ මොහොතේ පෙරටු බලඇණිය ඉදිරියට ඇදෙන්නට විය. "ගඟ." ඉදිරියට ඇදෙන අතරේ ඔහු සිය ගෝත්‍රික සෙබළුන් අමතා බෙරිහන් දුන්නේය. "මතක තියාගනිල්ලා. ගඟට කිට්ටුවෙන් හිටපල්ලා." අසුන් හැල්මේ යාමට සන්කරද්දීත් ඔහු පිරිසේ ඉදිරියෙන්ම විය. එනමුදු එක් නිමේෂයක් තුළ ලේ සීතල කරවන අන්දමේ කෑගැසීමක් සමගින් චෙලා සිය අසු පිම්මේ ඉදිරියට පැන්නූ අතර ෂග්ගා ද ගිගුම් දෙමින් ඈ

ලුහුබැඳ අසු පැන්නවීය. ඔවුන් පසුපසින් අනිකුත් ගෝත්‍රිකයින්ද ඉදිරියට ඇදෙන්නට වූ අතර ටිරියන් ධූලි වලාවක් තුළ තනිවිය.

**Tywin Lannister: “Robb Stark is a green boy, more like to be brave than wise.”**

සතුරු හෙලිධරයින් අඩසඳක හැඩයේ ඉරියවුවකින් පෙළ සැදූහෝය. ඒ වනාහි කාර්ස්ටාර්ක් සූර්යා සලකුණ කල උසැති ඕක් පලිහවලින් කෙරුනු පවුරක් පිටුපස වූ වානේමය ඉත්තෑවකු බඳු විය. ග්‍රෙගර් ක්ලිගේන් මුලින්ම එහි ළඟාවුයේ ඔහු පසුපසින් වූ තවත් සන්නාහ සන්නද්ධ අසරු සෙබළ මුලුවකුත් සමගිනි. ප්‍රහාරයේ අන්තිම තත්පරයේදී සතුරු හෙලි ඉදිරියට දිගු වූ අතර අසුන් ඊට බියෙන් ඉද්දගැසුවාක් මෙන් නවතින්නටත් පසුබසින්නටත් වූහ. සමහර අසුන් පැකිළෙද්දී තවත් සමහරුන් ගේ පපු පසා කරමින් සතුරු හෙලි ගිලා බැස්සේය. ඇතිවූ ක්ෂණික නැවතීම නිසා සෙබළුන් දූසිමක් පමණ අසුන් පිටින් විසි වී යනු ටිරියන් නිරීක්ෂණය කලේය. සෙර් ග්‍රෙගර් ගේ දැවැන්ත යුධ සෙන්ධවයා බියෙන් මෙන් පසුබැවේ තියුණු කටු සහිත හෙලි තලයක් උගේ ගෙල සූරා දැමූ බැවිනි. බියෙන් වියරු වැටුනු සත්ත්වයා කෙලින්ම ඉදිරියට පිනීය. හෙලි දූසිමක් පමණ සතර අතින්ම ඌට අනින්නට වූ නමුදු සතාගේ දැවැන්ත භාවයත් අධික බරත් නිසා හෙලි පවුර බිඳී ගියේය. මරණ වේදනාවෙන් කල උගේ දැඟලීමෙන් බේරෙනු පිණිස උතුරු සෙබළු ඉවතට පැන්නෝය. සිය සෙන්ධවයා මුවින් ලේ බිඳිති විසි කරමින් අවසාන හුස්ම හෙලද්දී උගේ ස්වාමියා, අසු පිට යන කන්ද. කිසිදු අනතුරකින් තොරව සිය දැවැන්ත අසිපතත් අතකින් ගෙන කන්දක් මෙන් නැගී සිටියේය.

පලිස් පවුර නැවත වැසෙන්නට පෙර ෂග්ගා විදුලි වේගයෙන් විවරය තුළින් ඇතුළට රිංගුවේය. ඔහු පසුපසින් තවත් ගල් කපුටෝද ඒ විවරයෙන් රිංගාගන්නට සමත් වූහ. "පිච්චුන මිනිස්සුනේ. චන්ද්‍ර සහෝදරයිනේ. මගෙත් එක්ක වරෙල්ලා." ටිරියන් කෑගැසුවේය. එනමුදු ඒ වනවිටත් ඔවුන් බොහෝදෙනෙක් ඔහුට වඩා ඉදිරියෙන් වූහ. ටිමට්ගේ පුතා ටිමට් නැගි අසු ඉදිරි පිම්මෙන්ම මියයද්දී ඔහු අසු පිටින් ඉවතට පැන්නේය. චන්ද්‍ර සොහොයුරකු කාර්ස්ටාර්ක් හෙල්ලයක ඇමිනුනේය. කොන්ගේ අසු සිය කුර පහරින් මිනිසෙකුගේ ඉළඇට බිඳ දැමීය. ඔවුන් මත ඊතල වර්ෂාවක් වැටෙන්නට වූ නමුදු ඒවා කොයිබින් පැමිණියේදැයි ඔහුට සිතා ගත නොහැකි විය. මේ ඊතල වර්ෂාව ලැනිස්ටර් හෝ ස්ටාර්ක් කියා වෙනසක් නොමැතිව මිනිසුන් මත පතිත වන්නට විය. සමහර ඊතල සන්නාහයේ ගැටී ඉවත විසි වූ අතර තවත් සමහර ඒවා සම් මස් පසාකරමින් ගිලා බැස්සෝය. තම පලිහ එසවූ ටිරියන් මේ වර්ෂාවෙන් නොතේමී බේරිමට තැත් දැරුවේය.

වානේ ඉත්තෑවා බිඳී යන්නට පටන්ගෙන තිබුනි. අශ්වාරෝහක බලඇණියේ ප්‍රහාරය හමුවේ උතුරු සෙබළුන් පසුබසින්නට පටන්ගෙන තිබුනි. ෂග්ගා හෙලිධරයකුට පහර දෙනු ටිරියන් දුටුවේය. බරැති යුධ පොරොව මුදු දම්වැල් සන්නාහය ද, සම් ආවරණය ද, මාංශ ඇටකටු හා සතුරාගේ පෙනහල්ලක් ද කපාගෙන පපුව තුළට කිඳා බැස්සේය. මිනිසා සිටි පිය මියගිය අතර පොරෝ හිස ඔහුගේ පපුව තුළ ගිලාබැස තිබුනි. එනමුදු සිය පොරොව මුදා ගන්නට වෑයම් නොකල ෂග්ගා දකුණතේ එල්ලෙන මළකඳත් සමගින්ම පෙරට ගියේ වමතේ වූ පොරොවෙන් තවත් පලිහක් දෙපළු කලේය. අන්තිමේදී මළකඳ ගැලවී වැටුනු අතර ෂග්ගා පොරෝ දෙක එකට ගටා ගිගුම් දුන්නේය.

මේ වනවිට සතුරු සෙබළුන් ඔහු කරා ළඟා වී සිටියේය. සෙබළෙකු ඔහුගේ පපුවට සිය හෙල්ලයෙන් ඇන්න නමුදු පොරොව වැනූ ටිරියන් පහර වළකා හැරියේය. මිනිසා දෙවන ප්‍රහාරයකට සැරසුනු අතරේ සිය අසුට සන් කර ඉදිරියට පැන්නවූ ටිරියන් සතුරාව යට කර දැම්මේය. බ්‍රොන් සතුරන් තිදෙනෙකුට මැදිව සිටියේය. තමා වෙත එල්ල වූ පළමු හෙලි පහර අසිපතෙන් පිසදා හැරි ඔහු පසුකැපුම් පහරක් මගින් තවත් සෙබළෙකුගේ මුහුණ විනාශ කර දැම්මේය.

වම්පසින් ටිරියන් වෙත දමාගැසුනු හෙල්ලයක් තඬ හඬින් ඔහුගේ පලිහේ ඇමිනී ගියේය. වහා අසු හරවාගත් ටිරියන් පහර දුන්නා හඹා යන්නට විය. එනමුදු උපායශීලී වූ සතුරා සිය පලිහ හිසට ඉහළින් එසවූ අතර ටිරියන් ඔහු වටා කරකැවෙමින් පලිහට පහර පිට පහර එල්ල කරන්නට විය. ඕක් ලී කැබැලි දසත විසිර යන්නට විය. අන්තිමේදී පා පැකිලී ගිය සතුරා උඩුබැල්ලෙන් බිම වැටුනු අතර පලිහ ඔහු මත වැටුනේය. ඔහු ටිරියන්ගේ පොරොවට හසුවන මානයෙන් ඔබ්බේ වූ අතර එවැනි සුළු දෙයක් වෙනුවෙන් අසු පිටින් බිමට බසින්නට ටිරියන්ට උවමනාවක් ද නොවීය. එබැවින් අසු හරවා ගත් ඔහු වෙනත් සතුරකු සොයා යන්නට විය. සතුරාගේ පසුපසින් භයානක යටි කැපුමක් එල්ල වූ අතර සට්ටනය නිසා ඇති වූ කම්පනය ටිරියන්ගේ සුරත පුරා දිවයන්නට විය. මෙය ඔහුට මොහොතක නිස්කලංක අවකාශයක් ලබා දුන්නේය. අසු නැවතූ ටිරියන් ගංගාව කොහේදැයි විමසා බැලූ අතර එය මෙවර ඔහුගේ දකුණු පසින් විය. ඔහු කෙලෙසක හෝ සිය අසු ආපසු හරවාගෙන තිබුනි.

සිය අසු මත කිඳා බැසි පිළිස්සුනු මිනිසෙක් ඔහුව පසුකොට ගියේය. මිනිසාගේ උදරයෙන් ඇතුළු වූ හෙල්ලයක් පිට පලාගෙන මතුව තිබුනි. ඔහුට තවත් කිසිදු පිහිටකින් පලක්

නොවිනි. එනමුදු උතුරු සෙබළෙක් දිවගොස් මේ අසුගේ තෝන්ලණුව අල්ලාගැනීමට තැත්දරනු දුටු ටිරියන් එදෙසට අසු පැන්නුවේය.

ප්‍රතිමල්ලවයා අසිපත අතැතිව ඔහුට මුහුණ දුනි. උස් කෙට්ටු මේ මිනිසා මුදු යකඩ දම්වැලින් කල සන්නාහයකින් සැරසී සිටි නමුදු ඔහුට ඔහුගේ ශිරස්කය අහිමිව ගොස් තිබින. ඔහුගේ නළල හරහා වූ කැපුමකින් දෑස් මතට රුධිරය වැස්සෙමින් තිබින. ටිරියන් ඔහුගේ මුහුණට පහරක් එල්ල කල නමුදු මිනිසා පහසුවෙන්ම පහර පිසදා හැරියේය. "කුරුමිට්ටො!" සෙබළා කෑගැසුවේය. "තෝ මැරියං!" සතුරාගේ හිසට හා උරහිසට පහර එල්ල කරමින් ටිරියන් ඔහු වටා අසු පන්නවද්දී මිනිසා වටයට කරකැවුනේය. වානේ මත වානේ ගැටී නද දුන් අතර ප්‍රතිවාදියා තමාට වඩා ශක්තිමත් හා වේගවත් බව ටිරියන් වැඩි වේලාවක් යන්නට මත්තෙන් වටහා ගත්තේය. 'මේ බ්‍රොන් බූරුවා කොහේ ගියාද?' "මැරියං!" මිනිසා නැවතත් කෑගැසුවේ ඔහුට දරුණු පහරක් එල්ල කරමිනි. ටිරියන් යාන්තමින් සිය පලිහ ඔසවා ගැනීමට සමත් වූ අතර පහරේ දැඩි බව නිසා පලිහ දෙදරුම් කෑවේය. පලිහේ කැඩුනු කැබලි දසත විසිර ගියේය. "මැරියං!" මිනිසා නැවතත් ගිගුම් දෙමින් ඉදිරියට පැන ඔහුගේ නළල හරහා පහරක් එල්ල කලේය. සිය හිස පුපුරා යන්නාක් මෙන් ටිරියන්ට දැනුනි. උස මිනිසා සිනාසුනේය... එනමුදු ඊළඟ මොහොතේ සර්පයකු මෙන් ඉදිරියට පිනූ ටිරියන්ගේ අශ්වයා මිනිසාගේ කම්මුල ඇටයට යනතෙක්ම සපා කෑවේය. මිනිසා වේදනාවෙන් කෑ ගසන්නට වූ අතර ටිරියන් සිය පොරොව ඔහුගේ හිස මතට කිඳා බැස්සුවේය. "තෝ මැරියං!" ඔහු කීවේය. මිනිසා මියගියේය.

සිය පොරෝතලය මළකඳේ හිසෙන් ඇදගන්නා හාම ඔහුට කෑගැසීමක් ඇසුනි. "එඩාර්ඩ්!" කිසිවෙක් බෙරිහන් දුන්නේය. "එඩාර්ඩ්‍ුයි වින්ටර්ෆෙලුයි වෙනුවෙන්!" නයිට්වරයා දම්වැලක බැඳි කටු යගදාවක් හිස වටා කරකවමින් විදුලියක් මෙන් ඔහු වෙත පිනීය. යුධ අශ්වයින් දෙදෙනා එකිනෙක හැපෙන මොහොතේදී ටිරියන් බ්‍රොන්ට කෑගසන්නට මුව විවර කලේය. දකුණු වැලමිට ආවරණය කල තුනී ලෝහ ආවරණය මත කටු යගදාව වදිද්දී සිය වැලමිට පුපුරා යනු ඔහුට වේදනාත්මත අන්දමින් අවබෝධ විය. ඒ හා සමගින්ම ඔහුගේ පොරොවද ඉවතට විසිව ගියේය. ඔහු සිය අසිපත ඇදගනු වස් සුරත යැවූ නමුදු නැවත වරක් කැරකෙමින් ආ කටු යගදාව මුහුණ පුරා තදින් වැදී ගියේය. තමාව තැලී පෙලී සිඳී යනු දැනෙද්දී ඔහු අසු පිටින් විසි වී ගියේය. තමා බිම හැපෙනු ඔහුට නොදැනුනු නමුදු හිස හරවා ඉහළ බලද්දී ඔහුට ඉහළින් ආකාශය මිස අන් කිසිවක් නොවීය. පසෙකට රෝල් වී ගිය ඔහු දෙපා මතින් නැගී සිටීමට තැත් දැරූ නමුදු සිරුර පුරා වේදනාව පිරී'තිරී යන්නට වූ අතර මුලු ලෝකයම කැරකෙන්නට විය. ඔහුව බිම දැමූ නයිට්වරයා අසු සමීපයට ගෙන ආවේය. "ටිරියන් පුංචි යකා." ඔහු බිම බලා ගර්ජනය කලේය. "උඹ දැන් මගෙයි. උඹ යටත්වෙනවද ලැනිස්ටර්?"

'ඔවු' ටිරියන් සිතුවේය. එනමුදු වදන් උගුරේ සිරවනු මිස පිටතට නොපැමිණියේය. උගුරෙන් ගොර ගොර හඬක් නිකුත් කල ඔහු දණින් නැගී සිටීමට තැත් දැරුවේය. කුමක් හෝ ආයුධයක් ඇදගනු පිණිස ඔහු අතපත ගෑවේය. සිය අසිපත, සිය සිරිය හෝ අන් කුමක් වුවත් කම් නැත...

"උඹ යටත් වෙනවද?" සන්නාහ ලූ අසු මත සිට නයිට්වරයා ගිගිරුවේය. මිනිසා හා අශ්වයා යන දෙදෙනාම දැවැන්තව නැගී සිටියෝය. කටු යගදාව හෙමිහිට වටයට කරකැවෙමින් තිබුනි. ටිරියන්ගේ දැත් හිරි වැටී තිබුනි. දසුන අපැහැදිලි විය. අසිපත් කොපුව හිස් විය. "යටත් වෙයන් නැත්තම් මැරියන්." නයිට්වරයා නිවේදනය කලේය. ඔහුගේ කටු යගදාව වඩ වඩා වේගයෙන් කරකැවෙන්නට පටන්ගත්තේය.

දෙපයින් නැගී සිටි ටිරියන් සිය හිසෙන් අසුගේ උදරයට ඇන්නේය. වේදනාත්මක කෑගැසීමක් කල සත්ත්වයා පසුපසට පිනීය. ඌ වේදනාවෙන් ඇඹරුනු අතර රුධිරය හා අතුණුබහන් වර්ෂාවක් මෙන් ටිරියන්ගේ මුහුණ තෙමීය. අශ්වයා ගිරිහිම නිපාතයක් මෙන් බිම ඇදවැටින. ඊළඟ මොහොතේ ඔහුගේ මුවවැස්ම මඩදියෙන් පිරී ගිය අතර ඔහුගේ පාදය යම් කිසිවකට සිරවුනි. ඔහු ආයාසයෙන් පාදය පිටතට ඇදගත්තේ ය.

"යටත් වෙනවා..." ඔහු අන්තිමේදී යාන්තමින් කෙදිරිගෑවේය.

"ඔවු." වේදනාවෙන් පිරි කටහඬක් පිළිතුරු දුන්නේය.

ටිරියන් සිය මුවවැස්මේ පිරි මඩ අතින් පිසදා හැරියේ හොඳින් අවට බලනු පිණිසය. අශ්වයා සිය අසරුවාව යටකරමින් බිම වැටී සිටියේය. නයිට්වරයා ගේ පාදය අසුට යටවී සිරවී තිබුනු අතර වැටීම වැළකීම වස් බිමට තද කල අතර ඇඹරී කැඩී ගොස් තිබුනි. "යටත්වෙනවා." ඔහු නැවතත් කීවේය. සිය හොඳ අතින් ඉණපටිය අතපත ගෑ ඔහු අසිපත කොපුවෙන් පිටතට ඇද ටිරියන්ගේ දෙපා මුලට විසිකර දැමුවේය. "මම යටත් වෙනවා මගේ උතුමානනි."

තෝන්තු වී ගිය කුරුමිට්ටා බිම දණ නමා අසිපත අහුලාගත්තේ ය. සිය අත එහා මෙහා කරද්දී ඔහුගේ වැලමිට තුළින් නැග ආ වේදනාව ඉසිලිය නොහැකි තරම් විය. පෙනුන සැටියට නම් මේ වනවිට සටන ඔවුන් පසුකර ගොස් තිබුනි. බිම වැටුනු මළකඳන් සමූහයක් හැරෙන්නට අන් කිසිවෙක් අවට නොවීය. කපුටන් දැනටමත් අහස සිසාරා පියාඹමින් සිය බොජුන් මේස මත වසන්නට පටන්ගෙන තිබින. සෙර් කෙවන් විසින් පෙරටු බලඇණියේ සහාය පිණිස සිය මධ්‍ය බලඇණිය රැගෙන විත් ඇති බැව් ඔහු දුටුවේය. ඔහුගේ කුන්තධරයින් විසින් උතුරු සෙබළුන් නැවතත් ඔවුන්ගේ කඳු ගැට වෙතටම තල්ලු කර හරින්නට සමත්ව තිබින. කඳු බෑවුමේදී ඔවුන්ට තවත් පලිස් පවුරකට මුහුණ දෙන්නට සිදුවිය. ඕවලාකාර, යකඩින් සවිමත් කල මේ පලිස් පවුර අබියස ඔවුන්ගේ උත්සාහය යම් තරමකින් මැඩ පැවැත්වෙන්නට වූ නමුදු ඊළඟ මොහොතේ තවත් ඊතල වර්ෂාවක් අහසට නගින්නට විය. මේ මාරාන්තික ප්‍රහාරය හමුවේ පලිස් පවුර හා එහි පදනම් බිඳ වැටෙන්නට පටන්ගත්තේ ය. "මම හිතන්නෙ උඹලා සටන පරදින්ටයි යන්නෙ සෙර්." ඔහු අසුට යටවී සිටි නයිට්වරයා අමතා කීවේය. එනමුදු ප්‍රතිවාදියා කිසිදු පිළිතුරක් නොදුන්නේය.

පසුපසින් ඇසුනු කුරහඬක් නිසා ටිරියන් වහා ආපසු හැරුනේය. සිය වැලමිට අධික ලෙස වේදනා ගෙන දුන්නද ඔහු අසිපත පහත නොදමා සිටීමට තරම් සමත්විය. තෝන්ලණුව ඇද අසු නැවතූ බ්‍රොන් ඔහු දෙස පහළ බැලීය.

"උඹෙන් කිසිම වැඩක් වුනේ නැහැ." ටිරියන් ඔහුට කීවේය.

"පේන හැටියට නං උඹ තනියෙම්ම හොඳ වැඩ කොටසක් කරලා තියෙනවා වගේ." බ්‍රොන් පිළිතුරු දුන්නේය. "උඹේ ශිරස්කයේ ගහලා තිබ්බ උල නැතිවෙලා හැබැයි."

ටිරියන් සිය ශිරස්කයේ මුදුන අතගා බැලුවේය. තුන්හුලස් උල සම්පූර්ණයෙන්ම ගැලවී වෙන්වී තිබුනි. "මම ඒක නැතිකරගත්තෙ නැහැ. මම දන්නවා හරියටම ඒක කොහෙද තියෙන්නෙ කියලා කියන්ට. උඹ මගේ අශ්වයාව දැක්කද?"

* * *

ඔවුන් ඌව සොයාගන්නා මොහොත වන විට නැවතත් නලා හඬක් ඇසෙන්නට විය. ටයිවින් උතුමානන්ගේ අතිරේක බලඇණිය ගංඉවුර දිගේ ධූලි වලා නංවමින් ඇදී ආයේය. ලේ රතු හා රන් පැහැ ලැනිස්ටර් ධජය සෙවනේ සිය පියා පියාඹා යනු ටිරියන් දුටුවේය. ඔහු වටා නයිට්වරුන් පන්සියයක් වූහ. ඔවුන්ගේ ලන්ස තුඩු හිරුඑළිය වැටී දිදුලමින් තිබින. ඔවුන්ගේ මේ අවසාන ප්‍රහාරය හමුවේ ස්ටාර්ක් හමුදාවෝ මිටියකින් පහර ලැබූ වීදුරුවක් මෙන් සිඳී බිඳී යන්නට වූහ.

සිය සන්නාහයට යටින් වැලමිට ඉදිමී වේදනා ගෙන දෙන්නට වූ බැවින් ටිරියන් මේ අවසන් සමූල ඝාතනයට සහභාගි වන්නට නොසිතුවේය. ඒ වෙනුවට ඔහු බ්‍රොන් හා එක්ව සිය මිනිසුන් සොයන්නට පිටත්ව ගියේය. ඔහුට හමුවූ බොහෝ දෙනෙක් මළවුන් අතරට ගොස් සිටියෝය. උල්ෆ්ගේ පුත් උමර් ලේ විලක් මැද වැටී සිටි අතර ඔහුගේ අත වැලමිට අසලින් වෙන්ව ගොස් තිබුනි. ඔහුගේ චන්ද්‍ර සොහොයුරන් දුසිමක් පමණ ඔහු වටා බිම වැටී සිටියෝය. ඊතලවලින් වැසීගිය ෂග්ගා ගස් කඳකට හේත්තු වී සිටියේය. ඔහුගේ උකුළ මත කොන්ගේ හිස විය. ඔවුන් දෙදෙනම මියගොස් වනැයි ටිරියන් සිතුවේය. එනමුදු ඔහු අසු පිටින් බසිද්දී ෂග්ගා දෙනෙත් හැරියේය. "උං කොරාට්ගෙ පුතා කොන්ව මැරුවා." හෙල්ල පහරකින් පපුව පසා වූ රත් පැහැ පැල්ලම හැරෙන්නට කඩවසම් කොන්ගේ සිරුරේ අන් කිසිදු තුවාලයක් නොවීය. බ්‍රොන් ෂග්ගාව අතින් ඇද නැගිට්ටවූ විට මේ දැවැන්ත මිනිසා පළමුවරට සිය සිරුරේ ඇමිනී තිබුනු ඊතල රැස දුටුවේය. සිය සන්නාහයට හා සම් ආවරණවලට සිදුව ඇති හානිය ගැන අවලාද නගමින් ඔහු මේ ඊතල එක එකක් පිටතට ඇද දමන්නට වූයේය. එමෙන්ම සන්නාහය විනිවිද ගොස් මසට කා වැදී තිබුනු ඊතල ඇද දමද්දී කුඩා දරුවෙකු මෙන් බෙරිහන් දුන්නේය. ඔවුන් මෙලෙස ෂග්ගාගේ සිරුරින් ඊතල ඉවතට ඇද දමමින් සිටින අතරේ සිය අසු පිට නැගී එතැනට පැමිණි චීක්ගේ දුව චෙලා ඇය විසින් කපාගත් කණ් සතරක් ඔවුන්ට පෙන්වීය. ටිමෙට් සිය පිළිස්සුණු මිනිසුන් හා එක්ව මළකඳන් වලින් කොල්ලාකමින් සිටියදී ඔවුන්ට මුනගැසුනි. ටිරියන් ලැනිස්ටර් සමගින් එක්ව යුධට පැමිණි තුන්සියයක් වූ ගෝත්‍රික පිරිසෙන් අඩක් පමණක් ඉතුරු වී තිබිනි.

පණ පිටින් සිටිනවුන්ට මළවුන් ගැන බලාගන්නට යැයි පවසා, තමාට යටත් වූ නයිට්වරයා ගැන සොයා බලන්නට බ්‍රොන්ව පිටත් කර හැරි ටිරියන් සිය පියා සොයනු පිණිස තනිවම පිටත්ව ගියේය. ටයිවින් උතුමානන් ගංඉවුරේ අසුන් ගෙන මැණික් ගල් ඇල්లූ කුසලාණකින් වයින් බොමින් සිටින අතරේ ඔහුගේ සහචරයා සන්නාහයේ පපු තහඩුවේ ගාංචු බුරුල් කරමින් සිටියේය. "නියම දිනුමක්." ටිරියන්ව දුටු සෙර් කෙවන් පවසා සිටියේය. "ඔබේ වනචාරියො බොහොම හොඳට සටන් කලා."

ඔහුගේ පියාගේ රන්වන් පුල්ලි වැටුනු කොළ පැහැ දැස් ඔහු වෙතට එල්ල විය. එය කෙතරම් සීතල බැල්මක් වී ද යත් ටිරියන්ගේ සියොළඟම සීතල වී ගියේය. "ඒක ඔබව පුදුම කලාද තාත්තෙ?" ඔහු ඇසුවේය. "ඒක ඔබේ සැලසුම් අවුල් කලාද? අපි ඔක්කොම මස් කඬේ හරක් වගේ මැරෙන්ටයි නියම වෙලා තිබුනෙ. එහෙම නේද?"

ටයිවින් උතුමානන් කිසිදු හැඟීමක් නොමැති මුහුණින් යුතුව සිය වයින් කුසලාණ බී හමාර කලේය. "ඔව්. ඇත්ත. මම අඩුවෙන්ම විනයගරුක සෙබළු වම් පැත්තෙ තිබ්බා තමා. මම බලාපොරොත්තු වෙලා හිටියෙ උන් ඉක්මනින්ම බිඳිලා විසිරිලා යයි කියලයි. රොබ් ස්ටාර්ක් කියන්නෙ නවක කොල්ලෙක්. ඌට ඥානවන්තකමට වඩා තියෙන්නෙ නිර්භීත කම. මම බලාපොරොත්තු වුනේ ඌ අපේ වම් පැත්ත බිඳ වැටුනා කියලා දැක්කහම ඒ පැත්තට කඩා වදියි කියලයි. ඌට එතැන බොහොම ලේසි ජයක් පේන්ට තියෙන නිසා. ඌ සම්පූර්ණයෙන්ම එතැනට පැන්නට පස්සෙ කෙවන්ගෙ කුන්තධරයින්ට පුළුවන් ආපහු හැරිලා උන්ගෙ පැත්තට පහර දෙන්ට. උන් එකතු වෙලා රොබ්ගෙ හමුදාව ගඟ පැත්තට තල්ලු කරද්දි මට පුළුවන් මගේ අතිරේක බලඇණිය අරන් ඇවිත් පහරදෙන්ට."

"ඉතින් ඔබ හිතුවා මේ මනුස්ස සංහාරය මැද්දෙ තමා මම ඉන්න ඕන හොඳම තැන කියලා නේද? ඒ වගේම ඔබේ අදහස් සැලසුම් මට කියන්ට උනන්දු වුනෙත් නැහැ නේද?"

"බොරු බිඳවැටීමක් මවලා පෙන්නවට වඩා ඇත්තම බිඳවැටීමක් වඩා හොඳයිනෙ. අනිත් එක මට කිසිම උවමනාවක් නැහැ කුලී හේවායොයි, වනචාරියොයි එක්ක හවුල් තියාගන්න එකෙකුට මගේ සැලසුම් එළි කරන්ට."

"මගේ වනචාරියො ඔබේ නැටුම අවලස්සන කරපු එකට බොහොම කණගාටුයි." සිය වානේ අත්වැස්ම ගැලවූ ටිරියන් එය බිම අත හැරියේය. අත පුරා විහිද ගිය වේදනාව නිසා ඔහුගේ මුහුණ ඇකිළී ගියේය.

"ස්ටාර්ක් කොල්ලා උගේ වයසෙ එකෙකුගෙන් බලාපොරොත්තු වෙන්ට බැරිතරම් පරීක්ෂාකාරියි." ටයිවින් උතුමානන් පිළිගත්තේ ය. "කොහොම වුනත් දිනුමක් කියන්නෙ දිනුමක්. උඹට තුවාල වෙලා වගේ."

ටිරියන්ගේ දකුණත රුධිරයෙන් පෙඟී ගොස් තිබුනි. "ඔබ ඒක දැකපු එක ලොකු දෙයක් තාත්තෙ." ඔහු දත්මිටි කමින් පිළිතුරු දුන්නේය. "ඔබේ මේස්ටර්වරයෙක් ගෙන්නන්ටයි කියලා මම ටිකක් කරදර කලාට කමක් නැද්ද? ඔබට අතක් නැති කුරුමිටි පුතෙක් ඉන්න එක ගැන ඔබ එච්චරම වදවෙන්නෙ නැත්තම්..."

"ටයිවින් උතුමානනි." යැයි අනපේක්ෂිතව නැගුනු හඬක් නිසා පිළිතුරක් දෙන්නට පෙර ඔහුගේ පියාගේ හිස එදෙසට හැරවුනි. සෙර් ඇඩම් මාර්බ්‍රැන්ඩ් සිය අසු පිටින් බිමට පනිද්දී ටයිවින් ලැනිස්ටර් උතුමානන් සෙමින් නැගිට සිටියේය. අශ්වයා දහදියෙන් පෙඟී ගොස් සිටි අතර උගේ මුවින් රුධිරය ගලා ආයේය. සෙර් ඇඩම් දණක් නැමීය. ඔහු උරහිස තෙක් වැටුනු තද තඹ පැහැ හිසකෙසින් යුතු උස් කෙට්ටු මිනිසකු විය. ඔහුගේ සන්නාහය ද තඹ පැහැ වූ අතර එහි පපු තහඩුවේ සිය වංශ සලකුණ වන ගිනිගන්නා ගස කළු පැහැයෙන් කොටා තිබුනි. "මගේ උතුමානනි. අපි උන්ගෙ අණදෙන නිළධාරීන් කීපදෙනෙක් හිරබාරෙට ගත්තා. සර්වින් උතුමානන්, සෙර් විලිස් මැන්ඩර්ලි, හැරියන් කාර්ස්ටාර්ක්, ෆ්‍රේලා හතරදෙනෙක්. හෝර්න්වුඩ් උතුමානන් මැරුනා. ඒ වුනත් කියන්ට කනගාටුයි රූස් බෝල්ටන් අපෙන් ගැලවිලා පැනගත්තා."

"එතකොට කොල්ලා?" ටයිවින් උතුමානන් විමසීය.

සෙර් ඇඩම් මදක් තැතනුවේය. "ස්ටාර්ක් කොල්ලා උනුත් එක්ක හිටියෙ නැහැ මගේ උතුමානනි. උන් කියනවා එයා ද්විත්ව බලකොටුවෙදි දෙකට බෙදිලා, එයාගෙ අසරු හමුදාවෙන් වැඩි කොටසකුත් අරන් දැන් රිවර්රන්වලට පිම්මේ යනවයි කියලා."

'රොබ් ස්ටාර්ක් කියන්නෙ නවක කොල්ලෙක්. ඌට ඥානවන්තකමට වඩා තියෙන්නෙ නිර්භීත කම.' සිය පියාගේ වදන් ටිරියන්ට සිහිපත් විය. ඔහුගේ දකුණත මෙතරම් වේදනා ගෙන නොදුන්නේ නම් ටිරියන් කොක්හඬලා සිනාසෙනු නොඅනුමානය.

**Tywin Lannister: “When soldiers lack discipline, the fault lies with their lord commander.”**

කැට්ලින් 10

වනාන්තරය මුලුමනින්ම පාහේ කෙඳිරීම්වලින් පිරී පැවතින.

මිටියාවත පතුලේ වූ කුඩා දියපහර දහර ගැසී ගල් මතින් කිංකිනි නදින් ගලා බසිද්දී ජලතලය මත සඳඑළිය නැටීය. ගස්වල අතුපතරට යටින් යුධ අශ්වයෝ නොසන්සුන් ස්වරයෙන් සුසුම් හෙලමින් කොළ රොඩු ඇතිරුනු, තෙත් වන බිම මත දෙපා ගැසූහ. මිනිස්සු සිය වියවුල් බව පහකරගනු පිණිස මැඩගත් හඬින් කෙලිකවට බස් දෙඩූහ. අතරින් පතර ඇයට හෙල්ලයක ක්ලින්ක් හඬක් හෝ මුදු දම්වැල් සන්නාහ එහා මෙහා වනවිට ඇසෙන ලෝහ ඇතිල්ලෙන මෘදු හඬක් හෝ ඇසුනු නමුදු මේ හඬවල් පවා බෙහෙවින් යටපත් වූ ඒවා විය.

"තව වැඩි වෙලාවක් ගතවෙන එකක් නෑ මගේ ආර්යාවනි." හැලිස් මොලන් කීවේය. ඉදිරියේදී සිදුවන්නට යන සටන අතරතුරේදී ඇයව ආරක්ෂා කිරීම තමාට පවරන්නැයි ඔහු උදෙක්ම ඉල්ලා සිටියේය. වින්ටර්ෆෙල්හි මුර සෙබළුන්ගේ නායකයා වශයෙන් එය ඔහුගේ අයිතිය හා රාජකාරිය වූ අතර රොබ් එය ඔහුගෙන් උදුරා ගන්නට නොසිතුවේය. ඇය වටා මිනිසුන් තිස් දෙනෙකු සිටි අතර සටන ඔවුනේග් පසට අවාසිදායක තත්ත්වයකට පෙරලුනහොත් ඇයව ආරක්ෂාකාරීව නැවත වින්ටර්ෆෙල් බලා කැඳවාගෙන යාම ඔවුන්ට පැවරුනු රාජකාරිය විය. රොබ්ට ඒ වෙනුවෙන් මිනිසුන් පනස්දෙනෙකු යොදවන්නට උවමනා වූ අතර දසදෙනෙකු පමණටත් වඩා ඇතියැයි ඇය බලකර සිටියාය. ඔහුට සටන වෙනුවෙන් සෙබළුන් අවශ්‍ය බව ඇය දැන සිටියාය. අන්තිමේදී ඔවුන් දෙදෙනා මිනිසුන් තිස්දෙනෙකුගෙන් වාදය හමාර කල අතර ඒ ගණන සම්බන්ධයෙන් දෙදෙනාම සතුටු නොවූහ.

"ඒක එන වෙලාවට ඒක එයි." කැට්ලින් ඔහුට පිළිතුරු දුන්නාය. එය පැමිණිවිට මරණය පමණක් ප්‍රත්‍යක්ෂ බැව් ඇය දැන හුන්නාය. ඒ සමහරවිට හැල්ගේ මරණය විය හැක.. එසේත් නැතිනම් ඇයගේ.. හෝ රොබ්ගේ.. කිසිවෙකුත් මෙහි ආරක්ෂාකාරී නොමැත. කිසිදු ජීවිතයක් තිර නැත. මෙලෙස දිගටම නැවතී බලා සිටින්නට, වනාන්තරයේ කෙඳිරීම්වලට සහ දියපහරේ කිංකිනි සංගීතයට සවන් දෙන්නට, ඇගේ කෙහෙරැළිවල දැවටෙන උණුසුම් සුළඟේ පහස විඳින්නට ඇය වඩා සතුටු වූවාය.

අනිත් අතට ඇය මෙවැනි බලාපොරොත්තුවෙන් බලාසිටීම්වලට කොහෙත්ම අමුත්තියක නොවූවාය. ඇගේ ජීවිතයේ සිටි පිරිමින් හැමෙකෙක්ම පාහේ ඇයට මෙලෙස බලා සිටින්නට සලස්වා තිබින. "මං එනකම් බලන් ඉන්ට පුංචි කැට්." ඇගේ පියා රාජසභාවට හෝ වෙළෙඳපලට හෝ යුධට හෝ යන සෑමවිටෙකම පවසන්නට පුරුදුව සිටියේය. ඉදින් ඇය එසේ කලාය. රිවර්රන්හි මුරකපොලු මතට වී පහතින් ගලා යන රතු ගංගාවේ හා ටම්බ්ල්ස්ටෝන්හි දියපහර දෙස බලමින් ඉවසිලිවන්තව බලා සිටියාය. ඔහු සමහර විට එනවායැයි ඇයට පොරොන්දු වූ දවසේ නොපැමිණියේ ය. සමහරවිට කැට්ලින්ට දවස් ගණන් බලාසිටින්නට සිදුවිය. අන්තිමේදී හස්ටර් ටලී උතුමානන් සිය දුඹුරු පැහැ මහළු අසු පිට නැගී ගංඉවුර වෙත පැමිණෙන දර්ශනය දකින තෙක්ම මුර කපොලුවල විවර තුළින් හා ඊ විවර තුළින් එබී බලමින් බලාපොරොත්තුව සිටියාය. "ඔයා මම එනකම් බලන් හිටියද?" ඇයව වැළැඳගන්නට නැඹුරු වද්දී ඔහු සැමවිටම ඇගෙන් අසන්නට පුරුදුව සිටියේය. "ඔයා එහෙම කලාද පුංචි කැට්?"

බ්‍රැන්ඩන් ස්ටාර්ක් ද ඇයට බලාපොරොත්තුවෙන් බලා සිටින්නට සැලැස්වීය. "මම මහ කාලයක් ගිහින් ඉන්නෙ නැහැ මගේ ආර්යාවනි." ඔහු පිළිණ දුන්නේය. "මම ආපහු ආවහම අපි කසාද බඳිමු." එනමුදු ඇගේ විවාහ දිනය පැමිණි විට ඇය පසෙකින් සප්තක දේවස්ථානයේ හුන්නේ බ්‍රැන්ඩන් නොව ඔහුගේ සොහොයුරා එඩාර්ඩ් විය.

සිය නව මනාලිය සමගින් යාන්තමින් සති දෙකක් කාලය ගෙවූ නෙඩ් ද සිය මුවේ වූ දහසකුත් එකක් පොරොන්දු සමගින් යුධ පිණිස පිටත්ව ගියේය. අඩුම තරමේ ඔහු ඇයට පොරොන්දුවලට වඩා දෙයක් ඉතුරු කර ගොස් තිබින. ඔහු ඇයට පුතෙකු ලබා දී තිබින. සඳවල් නවයක් පිරී වියැකී ගොස් අන්තිමේදී රොබ් රිවර්රන්හි දී මෙලොව එළිය දකිද්දී ඔහුගේ පියා තවමත් ඈත දකුණුකරයේ යුධ වැදී සිටියේය. ඇය රුධිරය හා වේදනාව මතින් ඔහුව මෙලොවට ගෙන ආවාය. නෙඩ්ට කවදා තම බිළිඳු පුත්‍රයාව දකින්නට ලැබේදැයි ඇය නොදැන සිටියාය. ඔහුට කෙදිනකවත් සිය පුත්‍රයා දකින්නට ලැබේදැයි කියා හෝ ඇය දැන නොසිටියාය. ඇගේ පුතා. ඔහු එකල ක්ෂුද්‍ර පුංජයක් පමණක් විය...

ඉදින් දැන්, ඇය රොබ් වෙනුවෙන් බලා සිටියාය... රොබ් සහ ජේමි ලැනිස්ටර් වෙනුවෙන් බලා සිටියාය. මිනිසුන්ගේ කටකතා අනුව නම් මේ නයිට්වරයා බලාසිටීම යනු කවරාකාරයේ දෙයක්දැයි නොදත්තෙකු, නුගත්තෙකු විය. "රජුන් මරන්නා කියන්නෙ බොහොම නොඉවසිලිවන්ත, ඉක්මනින් කේන්ති යන කෙනෙක්." ඇගේ බාප්පා බ්‍රින්ඩන්

ටලී රොබ්ට පවසා සිටියේය. ඇගේ පුතා ජයග්‍රහණය පිළිබඳ ඔවුන්ගේ සියලු බලාපොරොත්තුත්, ඔවුන්ගේ ජීවිතත් මේ එකම එක කරුණ මත පරදු තබා තිබින.

රොබ් බියපත්ව සිටියේ නම් ඔහු කිසිසේත්ම ඒ බවක් නොපෙන්වීය. ඔහු සිය සෙබළුන් අතර ඇවිදිමින්, එකෙකුගේ උරහිස මත අතක් තබමින්, තවකෙකු හා කවට බසක් දොඩමින්, තවකෙකුට සිය නොසන්සුන් වූ අසු පාලනය කරගැනීමට සහාය වෙමින් සිටින ආකාරය ඇය නිරීක්ෂණය කලාය. ඔහු එහා මෙහා යනවිට ඔහුගේ සන්නාහය මුදු හඬින් ක්ලින්ක් නද දුන්නේය. ඔහුගේ හිස පමණක් නිරාවරණය වී තිබින. සුළඟට හසු වූ ඔහුගේ රතු-දුඹුරු පැහැ කෙස් රොදක් - තමාගේම මෙන් වූ කෙස් රොදක් - නටන අයුරු ඇය බලා හුන්නාය. ඇගේ පුතා මෙතරම් වැඩුනේ කවරදා ද? අවුරුදු පහළොවක්! ඔහු දැන් ඇය තරම්ම උසය.

'එයාට තවත් උස යන්ට ඉඩදෙන්ට!' ඇය දෙවිවරුන්ගෙන් අයැද සිටියාය. 'එයාට දාසය වෙන්ට ඉඩදෙන්ට. විස්ස වෙන්ට ඉඩදෙන්ට. පනහ වෙන්ට ඉඩදෙන්ට. එයා එයාගෙ තාත්තා තරම්ම ලොකුවට වැඩෙන්ට ඉඩදෙන්ට. එයාට එයාගෙම පුතෙක් දෝතින් වඩාගන්ට ඉඩදෙන්ට. අනේ! අනේ! අනේ කරුනාකරලා!' ඇය ඔහු දෙස - අලුත වැඩුනු රතු පැහැ රැවුලක් සහිත, සිය දෙපා අසලින් ඇවිදින සෝරවෘකයෙකු සහිත, මේ උසැති තරුණයා දෙස - බලද්දී ඇයට සිහිපත් වූ එකම දෙය නම් මීට වසර බොහෝ ගණනකට පෙරාතුව රිවර්රන්හි දී ඔවුන් ඇගේ ළමැද මත තැබූ ඒ පුංචි බිළිඳා පමණි.

රැය උණුසුම් විය. එනමුදු රිවර්රන් ගැන ඇති වූ සිතුවිල්ල ඇයව වෙවුලවාලන්නට සමත් වී තිබින. 'එයාලා කොහෙද?' ඇය විමතියෙන් කල්පනා කලාය. ඇගේ බාප්පා වැරැදි ද? ඔහු ඔවුන්ට පැවසූ ඒ එකම එක කරුණ මත බොහෝ දේ රඳා පැවතින. රොබ් කළුමාළුවාට තෝරාගත් මිනිසුන් තුන්සියයක් ලබා දී මූලික හමුදාවට පෙරාතුව ඉදිරියට යැවුවේ ඔහුගේ ඉදිරි ගමන මුවා කරනු පිණිස විය. "ජේමි කිසිම දෙයක් දන්නෙ නැහැ." ආපසු පැමිණි විට සෙර් බ්‍රින්ඩන් කියා සිටියේය. "මම මගේ ජීවිතේ පරදු තියනවා ඒ සම්බන්ධයෙන්. කිසිම කපුටෙකුට බැරිවුනා එයා ගාවට කිට්ටුවෙන්ට. මගේ දුනුවායො ඒ ගැන වගබලාගත්තා. අපි දැක්කා එයාගෙ ඔත්තුකාරයො කීපදෙනෙක්. ඒ වුනත් අපව දැකපු එයාගෙ ඔත්තුකාරයො එකෙක්වත් එයාට ඒ ආරංචිය කියන්ට ජීවත්වුනෙ නැහැ. එයා ඒක දැනගත්තනම්, හරිනම් එයා තවත් කට්ටිය එවන්ටයි තිබුනෙ. එයා දන්නෙ නැහැ."

"එයාගෙ හමුදාව කොච්චර විශාලද?" ඇගේ පුතා විමසීය.

"දොළොස්දාහක් පාබල සෙබළු. බලකොටුව වටේ වෙන වෙනම කඳවුරු තුනක විසිරිලයි ඉන්නෙ. මේ කඳවුරු මැදින් ගංගාවල් තියෙනවා." ඇයට හොඳින් හුරුපුරුදු අර විෂම සිනහවත් මුවේ ඇතිව ඇගේ බාප්පා කීවේය. "රිවර්රන් වටලන්ට වෙන කිසිම ක්‍රමයක් නැහැ. ඒ කොහොම වුනත්, ඒකම තමා උන්ට හෙනේට හිටින්නෙ. අසරු සෙබළු ඕනනම් දෙදාහක් නැත්තම් තුන්දාහක් ඇති."

"රජුන් මරන්නා අපට තුනට එකේ අනුපාතයට ඉස්සරහින් ඉන්නවා." ගැල්බට් ග්ලවර් කීවේය.

"ඇත්ත. ඒක හරි." සෙර් බ්‍රින්ඩන් පිළිවදන් දුන්නේය. "ඒ වුනත් ජේමිට නැති එක දෙයක් තියෙනවා."

"ඒ මොකක්ද?" රොබ් ඇසීය.

"ඉවසීම."

ඔවුන්ගේ හමුදාව මේ වනවිට ද්විත්ව බලකොටුවෙන් පිටවෙද්දීට වඩා වැඩී සිටියේය. ඔවුන් නිල් ගංගාව වටා කරකැවී දකුණුකරය බලා එන ගමනේදී ජේසන් මැලිස්ටර් උතුමානන් සිය හමුදාවත් සමග සීගාර්ඩ්හි සිට ඔවුන්ට එකතු විය. එමෙන්ම ඔවුන්ට තවත් අය එකතු වී සිටියෝය. දෙවන පන්තියේ නයිට්වරුන්, පහත් පෙළේ වංශාධිපතීන් සහ එඩ්මුයර් ගේ හමුදාව රිවර්රන්හිදී පරාද වූ පසු උතුරුකරය බලා පලායමින් සිටි ස්වාමියන් නොමැති සෙබළුන් ආදී විශාල පිරිසක් ඔවුන්ට එක්වූහ. ඔවුන්ගේ පැමිණීම ජේමි ලැනිස්ටර්ට දැනගන්නට ලැබෙන්නට පෙරාතුව මෙහි පැමිණීමේ අටියෙන් ඔවුහු සිය අසුන් වැරෙන් මෙහෙයවා තිබින. ඉදින් දැන් ඒ හෝරාව එළඹ තිබින.

සිය පුත්‍රයාඅසු පිට නගිනු කැට්ලින් බලාසිටියාය. වෝල්ඩර් උතුමානන් ගේ පුතු වූ ඔලිවර් ෆ්‍රේ ඔහු වෙනුවෙන් අසු අල්ලාගෙන සිටියේය. ඔහු රොබ්ට වඩා වසර දෙකක් වැඩිමහලු වූ නමුදු අත්දැකීම් විසින් ඔහුට වඩා දසවසක් ලාබාල හා ව්‍යාකූල විය. ඔහු රොබ්ගේ පලිහ නිසි ස්ථානයේ රඳවා ඔහුගේ ශිරස්කය පිරිනැමුවේය. ඇය විසින් මහත් සේ ආදරය කල ඒ

මුහුණ වසමින් ඔහු ශිරස්කය පහත් කල විට එතැන ඇගේ පුතා වෙනුවට උසැති තරුණ නයිට්වරයෙකු බිහිව සිටියේය. ගස් අතර සඳඑළිය පතිත නොවූ බැවින් වටපිටාව අඳුරු විය. ඇය දෙස බැලීම පිණිස රොබ් හිස හැරවූ විට ඒ මුවවැස්ම යට අන්ධකාරය හැර අන් කිසිවක් දක්නට නොහැකි විය. "මම සෙබළු ඉස්සරහට යන්ට ඕන අම්මා." ඔහු ඇයට කීවේය. "තාත්තා කිවුවෙ, යුද්ධෙකට කලින් ඔයාගෙ සෙබළුන්ට ඔයාව දකින්ට ඉඩදෙන්ට ඕනයි කියලා."

"එහෙනම් ඔයා යන්ට." ඇය කීවාය. "එයාලට ඔයාව දකින්ට දෙන්ට."

"ඒකෙන් එයාලගෙ ධෛර්යය වැඩිවෙනවා."

'එතකොට මට ධෛර්යය දෙන්නෙ කවුද?' ඇය විමතියෙන් කල්පනා කලාය. එනමුදු ඇය ඒ තැවුල සිත යට සඟවාගෙන නිහඬවම ඔහු වෙනුවෙන් සිනාසුනාය. සිය දැවැන්ත අළු පැහැ යුධ සෛන්ධවයා හරවා ගත් රොබ් සෙමින් සෙමින් ඇගෙන් ඈත් වන්නට විය. ග්‍රේවින්ඩ් අසුගේ පියවර පසුපසින් වැටුනි. මීට පිටුපසින් ඔහුගේ යුධ ආරක්ෂක බලකාය ගමන් ගත්තේය. කැට්ලින්ට ඇගේ ආරක්ෂකයින් ගන්නයැයි ඔහු බලකර සිටි අවස්ථාවේ ඔහුද තමා වෙනුවෙන් ආරක්ෂක බල මුලුවක් තබා ගත යුතුයැයි ඇය බලකර සිටියාය. ඔහුගේ යටත් වංශාධිපතීහු මීට එකහෙලාම කැමැත්ත පලකලහ. ඔවුන්ගේ පුතුන් බොහෝදෙනෙක් මේ තරුණ වෘකයා - මේ වනාහි රොබ්ගේ වංශාධිපතීන් විසින් ඔහුට පටබැඳි නාමය විය - සමගින් ගමන් කිරීමේ ගෞරවය දිනාගැනීමට තරග කලෝය. මේ ආරක්ෂක බලකායේ සෙබළුන් තිස්දෙනා අතර ටෝරන් කාර්ස්ටාර්ක් හා ඔහුගේ සොහොයුරු එඩාර්ඩ්, පැට්‍රෙක් මැලිස්ටර්, ස්මොල්ජොන් අම්බර්, ඩේරින් හෝර්න්වුඩ්, තියන් ග්‍රේජෝයි හා වෝල්ඩර් ෆ්‍රේ ගේ පුතුන් පස්දෙනෙකු වැනි තරුණයින් මෙන්ම සෙර් වෙන්ඩල් මැන්ඩර්ලි හා රොබින් ෆ්ලින්ට් වැනි වැඩිමහලු මිනිසුන්ද වූහ. මේ සැමටම අමතරව එහි ගැහැණියක ද වූවාය. ඒ වනාහි මේජ් ආර්යාවගේ වැඩිමහලු දියණිය හා වලස් දූපතේ උරුමක්කාරිය වන ඩේසි මෝර්මන්ට් වූවාය. ඇය කෙසඟ, අඩි හයක් උස් තරුණියක වූ අතර අන් කුඩා දැරියන් බෝනික්කන් අතට ගන්නා කාලයේ ඇය කටු යගදාවක් සුරතට ගෙන තිබුනි. මේ සම්බන්ධයෙන් සමහර වංශාධිපතීන් කටුකුටු ගාන්නට පටන්ගෙන තිබුනු නමුදු කැට්ලින් ඔවුන්ගේ පැමිණිලිවලට සවන් නොදුන්නාය. "මේක ඔබලාගෙ වංශයේ ගෞරවය ගැන වදවෙන්ට ඕන අවස්ථාවක් නෙවෙයි මහත්වරුනි. මේක ඇවිල්ලා මගේ පුතාව ආරක්ෂා කරන එක ගැන හිතන්ට ඕන වෙලාවක්." ඇය ඔවුන්ට කීවාය.

'ඉතින් අපි එතැනට ආවොත්..' ඇය කල්පනා කලාය. 'තිස්දෙනෙක් ඇතිවෙයිද? හයදාහක් ඇතිවෙයිද?'

ඈතින් කුරුලු නාදයක් යාන්තමින් ඇසෙන්නට විය. එය කෙතරම් තියුණු, උච්චස්වරයක් ද යත් සිය ගෙල සීතල අතකින් පිරිමදින්නාක් මෙන් කැට්ලින්ට දැනුනි. තවත් කුරුල්ලෙක් ඌට පිළිතුරු දුන් අතර තෙවැන්නෙක් හා සිවුවැන්නෙක්ද ඊට එක් වූහ. වින්ටර්ෆෙල්හි ගෙවූ කාලය ඇතුළත ඇය ඔවුන්ගේ නාදය මනාව දැන සිටියාය. මේ වනාහි හිම ෂ්රයිකයකු විය. ශීත කාලය මැද්දේ දෙව්වනය හිමෙන් වැසී ගොස් මුලුමනින්ම සුදු පැහැ ගැන්වුනු විට සමහරවිට ඔබට මොවුන්ව දැකිය හැකිවනු ඇත. ෂ්රයිකයන් වනාහි උතුරුකරයේ වසන කුරුල්ලන් වර්ගයක් විය.

'එයාලා එනවා.' කැට්ලින් සිතුවාය.

"උන් එනවා මගේ ආර්යාවනි.' හැල් මොලන් මිමිනුවේය. ඔහු සැමවිටම පෙනෙන්නට තිබෙන දෙය හුවා දක්වන පුද්ගලයකු විය. "දෙවියො අපට පිහිට වෙන්ට."

ඔවුන් වටා වනය නිසල වද්දී ඇය නිහඬවම හිස සැලුවාය. මේ නිහඬතාව මැද්දේ ඇයට ඔවුන්ව ඇසුනි. ඔවුහු තවමත් ඉතා ඈතින් නමුදු කෙමෙන් කෙමෙන් ලංවෙමින් සිටියෝය. අසුන් බොහෝ ගණනකගේ කුර ගැටෙන හඬ, අසිපත්, හෙලි හා පලිහ සෙලවෙන හඬ, මිනිසුන් පහත් හඬින් කතාකරන හඬ, එහෙන් මෙහෙන් ඇසෙන සිනා හඬක් හා අවලාද හඬක්.

වසර දහස් ගණනක් පැමිණ ගෙවී ගියාක් මෙන් දැනින. හඬවල් මදින් මඳ වැඩි වන්නට පටන් ගත්තේය. තවත් සිනා හඬ, අණක්, කුඩා දිය පහරක් තරණය කරද්දී ජලය කැලැත්තෙන හඬ ඇයට ඇසුනි. අශ්වයෙක් උගුරෙන් හඬක් කලේය. මිනිසෙක් දිවුලේය. අන්තිමේදී ඇය ඔහුව දුටුවාය... එක් නිමේෂයකට ඔහුව දුටුවාය. පහළ මිටියාවත දෙස බලා සිටියදී ගස්වල අතුපතර පසුබිමේ ඇය ඔහුව දුටුවාය. ඡායාව අඳුරු වුවද ඒ ඔහු බව ඇය දැන සිටියාය. ජේමි ලැනිස්ටර් යනු මෙතරම් දුරක සිට පවා පහසුවෙන් හඳුනාගත හැකි පුද්ගලයකු විය. සඳඑළිය විසින් ඔහුගේ සන්නාහය හා රන්වන් හිසකෙස් රිදී

පැහැයෙන් බැබළිනි. එමෙන්ම ඔහුගේ ලේ රත් පැහැ සළුව කළු පැහැයට හරවා තිබුනි. ඔහු ශිරස්කයක් පැළැඳ නොසිටියේය.

එක් මොහොතක ඔහු දිස්වූ අතර ඊළඟ මොහොතේ ඔහු නොපෙනී ගියේය. ඔහුගේ රිදී පැහැ සන්නාහය නැවත වරක් ගස් අතර සැඟව ගියේය. ඔහුට පිටුපසින් තවත් අය පැමිණෙමින් සිටියහ. නයිට්වරු, පක්ෂපාති සෙබළු හා නිදහස් අසරුවන්ගෙන් සැදි ලැනිස්ටර් අසරු සෙබළුන්ගෙන් හතරෙන් තුන් පංගුවක් ඔහු පසුපසින් පෙළ සැදී ගමන්ගත්හ.

"තමන්ගෙ වඩුවෝ වැටලීම් කුළුණු හදනකම් තමන්ගෙ කූඩාරමට වෙලා බලන් ඉන්න ජාතියෙ මිනිහෙක් නෙවෙයි එයා." සෙර් බ්‍රින්ඩන් පොරොන්දු වී තිබිනි. "එයා දැනටමත් තුන්පාරක් එයාගෙ නයිට්වරුත් එක්ක එළියට ගිහිල්ලා තියෙනවා. හොරෙන් කඩාපැනලා පහර දෙන එවුන් එලවලා දාන්ට හරි, මුරණ්ඩු විදියට අල්ලන් ඉන්න පොඩි බලකොටුවකට පහරදෙන්ට හරි."

රොබ් හිස වනමින් ඇගේ බාප්පා විසින් මේසය මත අතුල සිතියම නිරීක්ෂණය කරන්නට විය. නෙඩ් ඔහුට සිතියම් කියවන්නට උගන්වා තිබුනි. "එයාට මෙතැනදි පහර දෙන්ට." ඔහු ඇඟිල්ල තබා පෙන්වමින් කීය. "මිනිස්සු දෙතුන් සීයක් විතර ඇති. ඊට වඩා ඕන නැහැ. ටලී කොඩි අරන් යන්ට. උන් ඔයාලා පස්සෙ පන්නන්ට පටන් ගත්තහම අපි බලන් ඉන්නවා..." ඔහුගේ ඇඟිල්ල සිතියම මත අඟලක් වම්පසට ගියේය. "මෙන්න මෙතැන."

මෙහි රැයේ නිහඬතාව විය. සඳඑළිය හා සෙවනැලි විය. ගස්වල අතුපතරින් බිමට වට මළගිය පත්‍රවලින් සැදි පාවාඩයක් පයට යටින් විය. මිටියාවතේ පතුළ දක්වා සෙමින් බෑවුම් වෙමින් යන ගස්වලින් වැසුනු කුඩා කඳු වැටි විය. භූමිය පහතට යන්නට යන්නට යටිවගාව තුනී විය.

මෙහි සිය යුධ අසු පිට නැගී ඇගේ පුත්‍රයා විය. ඇය දෙස අවසන් වරට හිස හරවා බලා ඇයට ආචාර කරනු පිණිස සිය අසිපත එසවූ ඇගේ පුත්‍රයා විය.

මෙහි මේජ් මෝර්මන්ට් ගේ යුධ හොරණෑවේ හඬ විය. එය නැගෙනහිර දෙසින් ඇරඹී නිම්නයේ පතුළ ඔස්සේ විහිදුනු දිගු, පහත් හඬක් විය. ඒ වනාහි ජේමිගේ අවසාන සෙබළාත් ඔවුන්ගේ උගුලට ඇතුළු වූ බව දන්වන සංඥාවයි.

ඊළඟ මොහොතේ හිස එසවූ ග්‍රේවින්ඩ් උඩු බුරන්නට විය.

මේ ශබ්දය කැට්ලින්ගේ සිරුර විනිවිද ගියාක් බඳු විය. ඇය වෙවුලන්නට පටන්ගත්තා ය. එය බිහිසුණු හඬක් විය. බියකරු හඬක් විය. එනමුදු එහි ගීතවත් බවක් ද විය. එක් තත්පරයකට ඇයට පහතින් වූ ලැනිස්ටර් මිනිසුන් ගැන අනුකම්පාවක් දැනෙන්නට විය. 'ඉතින් එහෙනම්, මේක තමයි මරණයේ හඬ!' ඇය කල්පනා කලාය.

හරූඌඌඌඌඌඌඌඌඌඌ... එහා අන්තයේ කඳුවැටිය මුදුනේ සිටි ග්‍රේට්ජොන්ගේ පිළිතුරු හොරණෑ නාදය ඇසෙන්නට විය. නැගෙනහිරටත් බටහිරටත් මැලිස්ටර්වරුන් ගේ හා ෆ්‍රේවරුන් ගේ නලා විසින් පලිගැනීමේ නාදය පතුරවන්නට විය. උතුරින්, නිම්නය පටු වී වැලමිටක් මෙන් නැමුනු ස්ථානයේ වූ කාර්ස්ටාර්ක් උතුමානන්ගේ යුධ හොරණෑ ද ඔවුන්ගේ ගැඹුරු, දුක්මුසු නාදය මේ සංගීතයට මුසු කරන්නට විය. පහළින් වූ ගංගාව අසබඩ මිනිසුන් කෑගසන්නටත්, අසුන් එහා මෙහා හැරවෙන්නටත් විය.

කොඳුරන වනය එක් මොහොතකදී සිය හුස්ම සියල්ල මුදා හැරියේය. රොබ් විසින් ගස්වල අතුපතර මත සඟවන ලද දුනුවායින් සිය දුනුදිය මුදාහැරි අතර වාතය මිනිසුන්ගේ හා අසුන්ගේ කෑගැසීම්වලින් පිරී ගියේය. ඇය වටා සෑම තැනකම වූ අසරුවෝ සිය ලන්සයන් ඔසවන්නට වූහ. මෙතෙක් වේලා පසින් හා මළ කොළවලින් වැසී තිබුනු ලන්ස තුඩු පිටතට පැමිණියේ සඳඑළියේ දිදුලන්නට විය. "වින්ටර්ෆෙල්!" නැවත වරක් ඊතල අහස ගනිද්දී රොබ් කෑගසනු ඇයට ඇසුනි. ඔහු ඇගෙන් ඈත්වී සිය සෙබළුන්ට නායකත්වය දෙමින් කඳුපාමුල බලා හැල්මේ යන්නට විය.

කැට්ලින් සිය අසු මතට වී නොසැලී බලා සිටියාය. හැල් මොලන් හා ඔහුගේ ආරක්ෂක බලමුලුව ඇය වටා විය. ඉදින් ඇය පෙර පුරුදු පරිදි ඇගේ පියා, බ්‍රැන්ඩන් හා නෙඩ් වෙනුවෙන් කලාක් මෙන් බලා සිටින්නට විය. ඇය කඳුවැටියක් මුදුනේ වූ අතර ඇයට පහළින් සිදුවන බොහෝ දෑ ගස්වල අතුපතර නිසා නොපෙනී ගියේය. හදවත ගැහෙන වාරයක්, දෙකක්, තුනක්, හතරක්... ඊළඟ මොහොතේ වනය තුළ ඇයත් ඇගේ ආරක්ෂක

බලමුලුවත් හැරෙන්නට අන් කිසිවක් නැත්තාක් මෙන් පෙනී ගියේය. අනිත් සියල්ලෝම වනයේ අඳුරු කොළ පැහැය තුළට මුසු වී ගොසිනි.

එනමුදු ඇය නිම්නය හරහා අනිත් පස කඳුවැටිය දෙස බැලූවිට ග්‍රේට්ජොන්ගේ අසරු සෙබළුන් ගස් වියන යටින් පිටතට පැමිණෙනු ඇය දුටුවාය. ඔවුහු දිගු අනන්ත පේළියක් සැදී වනයෙන් පිටතට එන්නට වූහ. එක් නිමේෂයකට, හද ගැස්මකින් එක් සුළු මොහොතකට සඳඑළිය ඔවුන්ගේ ලන්ස තුඩු මත වැටී දිදුලනු පමණක් ඇය දුටු අතර එය හරියටම රිදී දියෙන් නැහැවුනු දහස් ගණනක් වූ අද්භූත මායා ආලෝක කිරණ කඳු වැටියෙන් පහත බසින්නාක් මෙන් විය.

ඊළඟ මොහොතේ ඇය ඇසිපිය ගැසූ අතර ඒ අනිකක් නොව මරන්නට හෝ මියයන්නට නියමිතව සිටි මිනිසුන් පමණක් විය.

තමා සැබැවින්ම මේ යුද්ධය දුටුවාදැයි ඇයට පසුකලෙක තිර කොට කියන්නට නොහැකි විය. එනමුදු ඇයට යුද්ධය ඇසුනු බව නම් ස්ථිර විය. නිම්නය පුරා හඬවල් දෝංකාර දෙමින් තිබුනි. බිඳෙන ලන්සයක ක්‍රැක් හඬ, අසිපත් එකට ගැටෙන හඬ, මිනිසුන් කෑගසන හඬ, "ලැනිස්ටර්!", "වින්ටර්ෆෙල්!", "ටලී!" හා "රිවර්රන්!" තව දුරටත් කිසිවක් දකින්නට නොහැකි බව වටහාගත් පසු ඇය දෑස් පියාගෙන යුද්ධයට කණ් දෙන්නට පටන්ගත්තා ය. ඒ සැනින් ඇය වටා යුද්ධය ඇවිලී යන්නට විය. අසුකුර ගැටෙන හඬ, නොගැඹුරු දියකඳ මත යකඩ බූට්ස් සපත්තු වලින් දිය කැලැත්තෙන හඬ, අසිපත් ලී පලිහ මත ගැටෙද්දී ඇසෙන දැවමුවා හඬ, අසිපත් හා අසිපත් එකට ගැටෙන තානමය හඬ, ඊතල පියාඹා යන හඬ, බෙරහඬ, බියපත් අසුන් දහස් ගණනකගේ හේෂාරවය යන මේ සියල්ල ඇයට පැහැදිලව ඇසෙන්නට විය. මිනිස්සු අවලාද නගමින් සාප කල අතර ක්ෂමා අයැදිමින් යදින්නට විය. ඔවුන්ට ක්ෂමා ලැබුනි (හෝ නොලැබුනි). ඔවුන්ට ජීවිතය ලැබුනි (හෝ මරණය ලැබුනි). මේ කඳුවැටි මගින් හඬ විපරීත කරන්නට යෙදුනු බවක් සමහරවිට පෙනුනි. එක්වරක් ඇයට රොබ්ගේ කටහඬ පවා ඇසුනි. එය කෙතරම් පැහැදිලි වී ද යත් ඔහු ඇය පසෙකින් සිටගෙන සිටින්නාක් වැනි විය. "මගේ ළඟට වරෙල්ලා! මගේ ළඟට වරෙල්ලා!" එමෙන්ම ඔහුගේ සෝරවෘකයා දත් විලිස්සමින් ගොරවන හඬ පවා ඇයට ඇසෙන්නට විය. ඒ දිගු දත් එකිනෙක ගැටෙන හඬ, මස් ඉරෙන හඬ, මිනිසුන් හා අසුන් දෙකොටසම බියෙන් හා වේදනාවෙන් කල මුරගෑම් යන මේ සියල්ල එකට කැලැත්තී ගියේය. ඒ එක් තනි වෘකයෙකු නොව වෘකයින් රංචුවක් වැන්න.

අන්තිමේදී කෙමෙන් කෙමෙන් මේ ශබ්ද නැසී ගියේය. අන්තිමේදී වෘකයාගේ හඬ හැරෙන්නට අන් සෑම හඬක්ම නැසී ගියේය. නැගෙනහිර දෙසින් රත් පැහැ අරුණාලෝකය උදාවද්දී ග්‍රේවින්ඞ් නැවත වතාවක් හිස ඔසවා උඹු බුරන්නට පටන්ගත්තේ ය.

රොබ් වෙනත් අසෙකු පිට නැගී ඇය මුනගැසීමට පැමිණියේය. ඒ ඔහු නිම්නය පහළට ගමන්ගත් අළු පැහැ යුධ සෛන්ධවයා නොව පුල්ලි වැටුනු සතකු විය. ඔහුගේ පලිහේ වූ වෘක හිස කැබලිවලට කැඩී ගොස් තිබුනි. ඕක් ලීය මත ගැඹුරු කැපුම් ඇති වූ තැන්වල ලීය පවා පැහැදිලිව දිස්විය. එනමුදු රොබ්ට කිසිදු තුවාලයක් සිදුවූ බවක් නොපෙනින. එනමුදු ඔහු තමා සමීපයට එද්දී ඔහුගේ අත්වැසුම් හා පිටකබායේ අත් රුධිරයෙන් පෙඟී කළු පැහැ වී ඇති බැව් ඇය දුටුවාය. "ඔයාට තුවාල වෙලා." ඇය කීවාය.

අත එසවූ රොබ් ඇඟිලි නමන්නටත් දිග හරින්නටත් විය. "නැහැ. මේ... ටෝරන්ගෙ ලේ වෙන්ටැති සමහරවිට. එහෙමත් නැත්තම්..." ඔහු හිස වැනීය. "මම දන්නෙ නැහැ."

කුණු වැකුනු, ඇඳුමු පැළැඳුම් ඉරීගිය, සන්නාහ තැලී ගිය, එනමුදු විරිත්තමින් පැමිණි පිරිසක් රොබ් පසුපසින් කන්ද නැග ආහ. ඔවුන්ගේ ඉදිරියෙන්ම පැමිණියේ තියන් හා ග්‍රේට්ජොන් විය. ඔවුන් දෙදෙනා එකතුව දෙදෙනාට මැදින් ජේමි ලැනිස්ටර්ව ඇදගෙන ආවෝය. ඔවුන් ඔහුව ඇගේ අසුගේ පාද මුල අතහැරියේය. "රජුන් මරන්නා." හැල් පුරුදු පරිදි නිවේදනය කලේය.

ලැනිස්ටර් සිය හිස එසවීය. "ස්ටාර්ක් ආර්යාවනි." ඔහු දණින් වැටී හිඳිමින්ම කතා කලේය. ඔහුගේ කම්මුලෙහි වූ කැපුමකින් රුධිරය වැස්සින. එනමුදු අරුණෝදයේ ලා එළිය විසින් ඔහුගේ හිසකෙස්වල නියම රන්වන් පැහැය නැවත උරුම කර දී තිබුනි. "මම ඔබට මගේ කඩුව පුදන්ට කැමැතියි. ඒ වුනත් පේන හැටියට නම් ඒක මගෙ අතින් නැතිවෙලා."

"මට ඔබේ කඩුවෙන් ඇති වැඩක් නැහැ සෙර්. මට මගේ තාත්තව දෙන්ට. මගේ මල්ලි එඩ්මුයර්ව දෙන්ට. මට මගේ දුවලව දෙන්ට. මට මගේ සැමියව දෙන්ට."

"මට බොහොම කණගාටුයි. මම හිතන්නෙ ඒ හැමෝම මගෙ අතින් නැතිවෙලා."

"බොහොම කණගාටුවට කාරණයක්." ඇය සීතල ස්වරයෙන් කීවාය.

"ඌව මරන්ට රොබ්." තියන් ග්‍රේජෝයි උනන්දු සහගත ස්වරයෙන් කීය. "උගෙ ඔළුව කඳින් වෙන් කරන්ට."

"නැහැ." ඇගේ පුත්‍රයා පිළිතුරු දුන්නේය. "එයා මැරුනාට වඩා පණපිටින් ඉන්න එක ප්‍රයෝජනවත්. අනික මගේ තාත්තා සටනකින් පස්සෙ යුධ හිරකාරයින්ව මරන එකට කවදාවත් කැමැති වුනේ නැහැ."

"බොහොම නුවණක්කාර මනුස්සයෙක්." ජේමි ලැනිස්ටර් කීවේය. "ඒ වගේම උදාර මනුස්සයෙක්."

"මෙයාව අරන් ගිහින් දම්වැල් දාලා බැඳලා දාන්ට." කැට්ලින් කීවාය.

"මගේ අම්මා කියපු විදියට කරන්ට." රොබ් අණ දුන්නේය. "ඒ වගේම එයා වටේ හොඳට මුරකාවල් දාන්ට. කාර්ස්ටාර්ක් උතුමානන්ට එයාගෙ ඔළුව කුන්තයක අමුනන්ට ඕන වෙයි."

"අනිවාර්යයෙන්ම ඕන වෙයි." ග්‍රේට්ජොන් අතින් සන් කරමින් එයට එකඟ විය. තුවාලවලට සාත්තු කිරීමටත්, දම්වැලින් බැඳ දැමීමටත් පිණිස ජේමි ලැනිස්ටර් ඉවත කැඳවාගෙන යනු ලැබීය.

"ඇයි කාර්ස්ටාර්ක් උතුමානන්ට එයාගෙ ඔළුව ඕන වෙන්නෙ?" කැට්ලින් විමසුවාය.

රොබ් හිස හරවා වනය දෙස බැලීය. ඒ වනාහි නෙඩ් වෙතින් බොහෝවිට දකින්නට ලැබුනු කල්පනාවෙහි ගැලුනු පෙනුමක් විය. "එයා.. එයා අරගොල්ලන්ව මැරුවා."

"කාර්ස්ටාර්ක් උතුමානන්ගෙ පුත්තු." ගැල්බට් ග්ලවර් පැහැදිලි කලේය.

"ඒ දෙන්නවම." රොබ් කීවේය. "ටෝරනුයි එඩාර්ඩුයි. ඩේරින් හෝර්න්වුඩ්වත් මැරුවා."

"කිසිම කෙනෙකුට බැහැ ලැනිස්ටර්ගෙ ධෛර්යය ගැන එයාට චෝදනා කරන්ට." ග්ලවර් කීවේය. "තමන්ගෙ හමුදාව පැරදුනයි කියලා දැක්කහම එයා ඉතුරුවෙලා හිටපු ටික දෙනාවත් එකතු කරන් නිම්නයේ උඩහට ආවා සටන් කර කර. එයා බලාපොරොත්තු වුනේ රොබ් උතුමානන්ව කපලා දාන්ටයි. එයා එතැනටම ආවා.."

"එයාගෙ කඩුපාර වැරදිලා වැදුනෙ එඩාර්ඩ් කාර්ස්ටාර්ක්ගෙ බෙල්ලටයි. ඊටපස්සෙ එයා ටෝරන්ගෙ අත සම්පූර්ණයෙන්ම කපලා වෙන්කරලා ඩේරින් හෝර්න්වුඩ්ගෙ හිස්කබල දෙකට පැලුවා." රොබ් කීවේය. "ඒ වුනත් හැම වෙලාවෙම එයා මගේ නම කිය කියා කෑ ගහගහයි හිටියෙ. අරගොල්ලො එයාව නවත්තන්ට හැදුවෙ නැත්තම්-"

"-කාර්ස්ටාර්ක් උතුමානන් වෙනුවට මමයි එහෙනම් මෙතැන වැලපෙන්නෙ." කැට්ලින් කීවාය. "ඔයාගෙ මිනිස්සු කලේ එයාලා කරන්නම් කියලා දිවුරුම් දුන්න දේයි රොබ්. එයාලා මැරුනෙ එයාලගෙ උතුමානන්ව ආරක්ෂා කරන්ට ගිහිල්ලයි. එයාලා වෙනුවෙන් දුක්වෙන්ට. එයාලගෙ ධෛර්යය, ශූරවීරකම වෙනුවෙන් එයාලට ගෞරව කරන්ට. ඒ වුනත් දැන් නෙවෙයි. ඔයාට දැන් දුක් වෙවී ඉන්ට තරම් කාලයක් නැහැ. ඔයා සර්පයාගෙ ඔළුව කපලා දැම්මා වෙන්ට පුළුවන්. ඒ වුනාට උගේ ඇඟේ හතරෙන් තුනක්ම තාමත් මගේ තාත්තගෙ බලකොටුව වටලන් ඉන්නවා. අපි දිනුවෙ එක සටනයි. යුද්ධයක් නෙවෙයි."

"ඒ වුනත් ඒක කොච්චර නියම සටනක්ද!" තියන් ග්‍රේජෝයි උනන්දු ස්වරයෙන් කීවේය. "මගේ ආර්යාවනි. මේ රාජධානිය මේ වගේ ජයග්‍රහණයක් දැක්කෙ නැහැ 'ගිනිගත් කෙතේ' සටනින් පස්සෙ. මම දිවුරනවා. අපෙන් වැටුන එක මිනිහෙකුට ලැනිස්ටර්ලා දහදෙනෙක් වැටුනා. අපි නයිට්වරු සීයකට කිට්ටු ගානක් අත්අඩංගුවට ගත්තා. ඒ වගේම වංශාධිපතියො දුසිමක් විතරත්. වෙස්ටර්ලින්ග් උතුමානන්, බෙන්ෆර්ට් උතුමානන්, සෙර් ගාර්ත් ග්‍රීන්ෆීල්ඩ්, එස්ට්‍රෙන් උතුමානන්, සෙර් ටයිටස් බ්‍රැක්ස්, ඩෝර්නිෂ්කාරයා මැලර්... ජේමිට අමතරව තවත් ලැනිස්ටර්ලා තුන්දෙනෙක්. ටයිවින් උතුමානන්ගෙ බෑණාවරු. එයාගෙ සහෝදරීගෙ පුත්තු දෙන්නෙකුයි එයාගෙ මැරිච්ච සහෝදරයගෙ පුතෙකුයි..."

"එතකොට ටයිවින් උතුමානන්?" කැට්ලින් බාධා කලාය. "ඔබලා ටයිවින් උතුමානනුත් අල්ලගත්තද තියන්?"

"නෑ." ග්‍රේජෝයි නැවත පියවි සිහියට ආවාක් මෙන් පෙනින.

"ඔබලා එයාව අල්ලගන්නකම් මේ යුද්ධෙ ඉවර වෙලා නැහැ."

හිස එසවූ රොබ් සිය දෑසට වැටී තිබුනු කෙස් රොදක් පිසදා හැරියේය. "මගේ අම්මා කියන කතාව ඇත්ත. අපට තාමත් රිවර්රන් බේරගන්ට තියෙනවා."

**Ser Brynden Tully: “There is one thing Ser Jaime lacks.”**

**Robb Stark: “Yes?”**

**Ser Brynden Tully:  “Patience.”**

ඩනේරිස් 08-1

මැසි රංචුවක් සෙමින් සෙමින් බාල් ඩ්‍රෝගෝ වටා කරකැවෙන්නට වූ අතර උන්ගේ පියාපත් ගැටීමෙන් නැගුනු, කණට ඇසෙන නෑසෙන තරම් වූ පහත් ගුමුගුමු හඬ ඩැනීගේ සිත භීතියෙන් පුරවාලන්නට සමත් විය.

හිරු අහසේ ඉහළ නැග තිබුනු අතර කිසිදු ක්ෂමාවකින් තොරව ඔවුන් සෑම සිය තාපයෙන් පෙළමින් හුන්නේය. අවට වූ මිටි කඳුගැට පුරා විසිර පැවති ගල් පර්වත වලින් පරාවර්තනය වෙමින් ආ තාප තරංග ඉසිලිය නොහැකි තරම් විය. ඩැනීගේ ඉදිමුනු පයෝධර යුග්මය අතරින් සිහින් දිහදහරාවක් මෙන් දහදිය ගලන්නට වූයේය. ඇසුනු එකම ශබ්දය වූයේ ඔවුන්ගේ අසුන්ගේ කුරගැටෙන ඒකාකාරී හඬත්, ඩ්‍රෝගෝගේ කෙහෙරැල්ලේ ගවසා තිබුනු සීනු නද දෙන හඬත්, ඔවුන්ට පිටුපසින් ඈතින් ඇසෙන මිනිසුන් කතාකරන හඬත් පමණි.

ඩැනී නැවත වරක් මැස්සන් දෙස බැලුවාය.

ඔවුන් මීමැස්සන් තරම් විසල් වූ අතර දම් පැහැයෙන් දිදුලන්නට විය. ඩොත්රැකියන් මොවුන්ව හැඳින්වූයේ 'ලේමැස්සන්' යනුවෙනි. මොවුන් මඩවගුරුවල හා ගඳගසන පල්දියෙන් පිරි දියකඩිතිවල දිවිගෙවූ අතර මිනිසුන්ගෙන් මෙන්ම අසුන්ගෙන් ද එකසේ රුධිරය උරා බීහ. එමෙන්ම මළකඳන්වල හා මියයන්නට ආසන්න වූවන්ගේ සිරුරවල සිය බිත්තර දැමූහ. ඩ්‍රෝගෝ සෑමවිටම මේ මැස්සන්ට වෛර කලේය. මැස්සකු ඔහු වෙත ළඟා වූ සෑම විටෙකම පහරදෙන සර්පයෙකු මෙන් සැනින් ඉදිරියට විහිදෙන ඔහුගේ හස්තය මැස්සාව ග්‍රහණය කොට ගන්නේය. ඔහුට කිසිදා මේ පහර වරදිනු ඇය දැක නොතිබුනි. සිය අත මිටි කරගෙන මොහොතක් වේලා මැස්සාගේ වියරු ගුමුගුමු හඬ අසමින් සිටින ඔහු ඊළඟ මොහොතේ කෙමෙන් ඇඟිලි තද කරන්නේය. ඔහු නැවත සිය අත්ල විදහූ විට මැස්සා ඔහුගේ අත්ලේ ඇලවුනු රත් පැහැ තලපයක් පමණි.

දැන් මේ මොහොතේ එක් මැස්සෙක් ඔහුගේ අසුගේ තට්ටම් මත වසන්නට තැත් කරමින් වටයට කරකැවෙන්නට වූ අතර අශ්වයා කේන්තියෙන් මෙන් වල්ගය වනමින් ඌ පලවා හරින්නට තැත්කලේය. අනිත් මැස්සන් සියල්ලෝම ඩ්‍රෝගෝ වටා කරකැවෙමින්

කෙමෙන් කෙමෙන් ඔහුට ලංවන්නට වූහ. එනමුදු බාල්ගෙන් කිසිදු ප්‍රතික්‍රියාවක් නොදැක්වීන. ඔහුගේ දැස් ඇතින් වූ දුඹුරු පැහැ කඳුවැටිය දෙසට එල්ල වී තිබුනු අතර දැත් මත තෝන්ලණුව ලිහිල් ලෙස රැඳී තිබුනි. ඔහු හැඳ සිටි වර්ණවත් කමිසයට යටින් ෆිග් පත්‍ර හා වියළි නිල් මඩවලින් කල තලපයකින් සෑදූ වෙළුම්පටියකින් පපුවේ වූ තුවාලය ආවරණය කොට තිබුනි. ඩොත්රැකි ඔසු ගැහැණුන් විසින් ඔහු වෙනුවෙන් මේ තලපය තනා දී තිබුනි. මිරි මාස් ඩූර්ගේ ඔසු තලපය ඔහුගේ සම දවන්නටත්, කැසිල්ල ඇති කරවන්නටත් සමත් වී තිබුනු අතර ඇයට යක්දෙස්සියකැයි පරිභව කරමින් ඔහු විසින් මීට දින සයකට පෙර ඒ වෙළුම්පටි ගලවා විසිකර දමා තිබුනි. මඩ තලපය වඩා සුවදායක වූ අතර ඔසු ගැහැණුන් විසින් ඔහු වෙනුවෙන් පොපි වයින්ද පිළියෙල කොට තිබුනි. පසුගිය දින තුන පුරාවටම ඔහු දැඩි ලෙස මෙම පොපි වයින් පානය කරන්නට පුරුදුව සිටියේය. මේ පොපි වයින් පානය නොකරන වේලාවට ඔහු වෙළඹ කිරෙන් සෑදූ මධ්‍යසාරය හෝ පෙපර්බියර් හෝ පානය කරමින් හුන්නේය.

එනමුදු ඔහු සිය කෑමවලට යාන්තමින් අත ගැසුවා පමණි. එමෙන්ම ඔහු මුලු රාත්‍රිය පුරාවටම වේදනාවෙන් කෙඳිරිගාමින් ඇඹරෙන්නට විය. ඔහුගේ මුහුණ කෙතරම් ඇදී ගොස් ඇත්දැයි ඩැනීට හොඳින් නිරීක්ෂණය කලහැකි විය. ඇගේ කුසේ වූ රේගෝ පවා අතිශයින්ම නොසන්සුන් වී සිටියේය. ඔහු අශ්වයෙකු මෙන් දැඩිව පයින් ගසමින් සිටි නමුදු පෙරදී මෙන් ඩ්‍රෝගෝගේ අවධානය ඇදගන්නට එය සමත් නොවීය. සෑම උදෑසනකම ඔහු සිය නින්දෙන් - සැබෑවටම නම් නොනින්දෙන් - නැගිට සිටි විට ඒ මුහුණේ ඇඳුනු නව වේදනා සටහන් ඇයට දැකගන්නට හැකි විය. එමෙන්ම දැන් ඔහුගේ මේ හදිසි නිශ්චලත්වය ඇයව අන් කිසිවකටත් වඩා බියපත් කරවන්නට සමත් වී තිබුනි. ඔවුන් අද උදෑසන අසුපිට නැගුනු තැන් පටන් ඔහු වදනක්වත් නොදෙඩීය. ඇය ඔහුට කතා කල විට උගුරෙන් කල නොරිස්සුම් හඬක් මිස අන් පිළිතුරක් නොලැබින. අද දිවාකාලයේ සිට මේ ප්‍රතිචාරය පවා නැතිව ගොස් තිබුනි.

එක් ලේමැස්සෙක් බාල්ගේ නිරුවත් දසරුව මත වැසුවේය. තවත් එකෙක් කරකැවෙමින් විත් ඔහුගේ ගෙලේ වැසුවේ මුව වෙත ඇවිද යන්නට විය. එනමුදු සිය අසු ඒකාකාරී ගමනින් ඉදිරියට ඇදෙද්දී බාල් ඩ්‍රෝගෝ කිසිදු ප්‍රතිචාරයක් නොදක්වමින්, සීනු හඬ නංවමින් අසු මත වැනෙමින් හුන්නේය.

සිය අසුට සන් කල ඩැනී ඔහුට සමීප වූවාය. "මගේ උතුමානනි." ඇය මෘදු ස්වරයෙන් කීවාය. "ඩ්‍රෝගෝ. මගේ ඉරයි තරුයි."

ඔහුට ඇයව ඇසුනු බවක් නොපෙනින. ඔහුගේ දැවැන්ත උඩුරැවුලට යටින් ඇවිද ගිය ලේමැස්සා කම්මුල මත නතර විය. ඩැනී අසීරුවෙන් හුස්මක් ඉහළට ඇදගත්තාය. "ඩ්‍රෝගෝ." ඇය අලස අයුරින් ඔහු දෙසට නැඹුරු වී බාහුව ස්පර්ශ කලාය.

සෑදලය මත වැනුනු ඛාල් ඩ්‍රෝගෝ, යාන්තමින් ඇලවී ගොස් තඩ් හඬ නංවමින් අසුපිටින් බිම ඇද වැටුනේය. මැසි රංචුව මොහොතක් ඉවතට ඉගිල ගියද ඊළඟ මොහොතේ නැවතත් බිම වැටී සිටි ඔහු මත කරකැවෙන්නට වූහ.

"නෑ!" ඩැනී අසු නවතන්නට තෝන්ලණුව අදිමින් කීවාය. එක් මොහොතකට සිය පිරිපුන් උදරය ගැන කිසිදු තැකීමක් නොමැතිව අසු පිටින් රූටා බිමට බට ඇය ඔහු වෙත දිව ගියාය.

ඔහුට යටින් වූ තණකොළ වියළී දුඹුරු පැහැයට හැරී තිබුනි. ඩැනී ඔහු පසෙකින් බිම දණ නමද්දී ඩ්‍රෝගෝ වේදනාවෙන් කැගැසීය. ඔහුගේ හුස්ම ගොරගොර හඬ නංවමින් උගුරේ පටලැවුනු අතර ඈ දෙස බලා සිටි ඒ දෑස් කිසිදු හඳුනාගැනීමේ ලකුණක් නොපෙන්වීය. "මගේ අශ්වයා." ඔහු අමාරුවෙන් කතා කලේය. ඩැනී ඔහුගේ පපුවේ වසා සිටි මැස්සන් පලවා හරිමින් ඔහු කරන්නාක් මෙන් එක් මැස්සකු පොඩි කරදැමීය. ඇගේ අතැඟිලිවලට යටින් ඔහුගේ සම ගිනිගෙන දැවෙන්නාක් මෙන් ඇයට හැඟින.

ඛාල්ගේ රුධිරාරක්ෂකයින් ඔවුන්ට වහාම පසුපසින් සිය අසුන් මෙහෙයවමින් සිටියෝය. ඔවුන් සිය අසුන් මෙදෙසට පන්නන අතරේ හග්ගෝ කෑගසනු ඇයට ඇසුනි. කොහොල්ලෝ අසුපිටින් බිමට පැන්නේය. "මගේ ලෙයින් උපන් ලෙය." ඩ්‍රෝගෝ පසෙකින් දණ නමන අතරේ ඔහු කීවේය. එනමුදු අනෙක් දෙදෙනා සිය අසුන් මතටම වී උන්හ.

"නෑ." ඛාල් ඩ්‍රෝගෝ වේදනාවෙන් කෙඳිරිගෑවේය. "අපි යන්ට ඕන. යන්ට. නෑ."

"එයා අශ්වයා පිටින් බිම වැටුනා." හග්ගෝ කීවේ අසු පිට සිට බිම බලමිනි. ඔහුගේ පුළුල් මුහුණේ ශාන්ත බවක් දක්නට ලැබුනද ඒ ස්වරය දැඩි විය.

"ඔබ එහෙම කියන එක හොඳ නැහැ." ඩැනී ඔහුට කීවාය. "අද දවසට අපි බොහොම දුර ගියා. අපි මෙතැන කඳවුරු බඳිමු."

"මෙතැන?" හග්ගෝ අවට පිරික්සා බැලීය. භූමිය ශුෂ්ක, දුඹුරු පැහැ, නවාතැන් ගැනීමට කොහෙත්ම නුසුදුසු ස්ථානයක් විය. "මේක කඳවුරු බඳින්ට හොඳ තැනක් නෙවෙයි."

"අපේ ගමන නවත්තන්ට ගැණියෙකුට බැහැ." ක්වෝතෝ කීවේය. "බලීසි කෙනෙකුටවත් බැහැ."

"අපි මෙතැන කඳවුරු බඳිනවා." ඇය නැවත කීවාය. "හග්ගෝ, එයාලට කියන්ට බාල් ඩ්‍රෝගෝ නවතින්ට අණ දුන්නයි කියලා. කවුරුහරි ඇහුවොත් ඒ ඇයි කියලා එයාලට කියන්ට මට දරුවා ලැබෙන්ට වෙලාව ලංවෙලා නිසා මට තවත් දුර යන්ට බැහැයි කියලා. කොහොල්ලෝ, වහල්ලු එක්කරන් එන්ට. එයාලා හැකි ඉක්මනින් බාල්ගෙ කූඩාරම අටවන්ට ඕන. ක්වෝතෝ-"

"ඔබට බැහැ මට අණකරන්ට බලීසි." ක්වෝතෝ කීවේය.

"ගිහින් මිරී මාස් ඩූර්ව හොයාගෙන එන්ට." ඇය ඔහුට කීවාය. මේ දේවදාසිය අනිත් වහලුන් සමගින් ඇවිදිනවා වන්නට ඇත. "එයාව මගේ ගාවට අරන් එන්ට. එයාගෙ බෙහෙත් පෙට්ටියත් එක්කම."

ක්වෝතෝ කළුගල් මෙන් දැඩි දෑසින් ඇය දෙස රවා බැලුවාය. "අර යක්දෙස්සි?" ඔහු බිමට කෙල ගැසීය. "ඒක මම කොහෙත්ම කරන්නෙ නැහැ."

"ඔබ ඒක කරන්ටම ඕන. එහෙම නැත්තම්, ඩ්‍රෝගෝ නැගිට්ටහම එයාට දැනගන්ට ඕන වෙයි ඇයි ඔබ මට කීකරු වුනේ නැත්තෙ කියලා."

කෝපාවිෂ්ට ස්වරයෙන් සිය අසු හරවාගත් ක්වෝතෝ කේන්තියෙන් යුතුව පිම්මේ අසු පන්නාගෙන ගියේය. එනමුදු, ඔහු එයට කෙතරම් අකැමැති වුවද ඔහු විසින් මිරී මාස් ඩූර්ව කැඳවාගෙන පැමිණෙනු ඇති බැව් ඩැනී දැන සිටියාය. මද්දහනේ දැඩි සූර්යතාපයෙන් මඳ හෝ අස්වැසිල්ලක් ලබනු වස් වහලුන් විසින් විසල් කළුගල් පර්වතයක සෙවනේ ඩ්‍රෝගෝගේ කූඩාරම අටවනු ලැබිනි. එනමුදු කූඩාරමේ සේද රෙදි යට හුස්ම ගැනීම පවා අසීරු විය. ඉරීගේ හා ඩෝරියාගේ උදවු ඇතිව ඩැනී ඩ්‍රෝගෝව වත්තම් කරගෙන කූඩාරම තුළට පිවිසියාය. වර්ණවත් රටාවන් ඇඳුනු බුමුතුරුණු බිමට එලා තිබුනු අතර කොට්ට අහුමුළුවල විසි කර දමා තිබුනි. ඉරෝආ, ඩැනී විසින් මැටි පවුරුවලට එපිටදී දූෂකයින්ගෙන් බේරාගත් බයාදු දැරිය ගිනි කබලක් දැල්වූවාය. ඔවුහු එකතුව තෘණවලින් වියූ මෙට්ටයක් මත ඩ්‍රෝගෝව දිගා කෙරුවෝය. "නෑ." ඔහු පොදු බසින් කෙඳිරිගෑවේය. "නෑ. නෑ." ඔහු පැවසූ එකම දෙය එය විය. ඔහුට පවසන්නට හැකි වූ එකම දයෙ එය විය යුතුය.

ඩ්‍රෝගෝගේ පදක්කම් සහිත බඳපටිය ගැලවූ ඩෝරියා ඔහුගේ කමිසය හා කලිසම ගලවා ඉවත් කලාය. ඔහුගේ දෙපා අසල ඇනබාගත් ජික්වී ඔහු අසු පිට යන විට පළඳින පාවහන් සඟල ගලවා දැමුවාය. කූඩාරම තුළට සුළඟ එනු පිණිස දොර පැළැල්ල ඔසවා තැබීමට ඉරීට උවමනා වූ නමුදු ඩැනී එය තහනම් කලාය. ඩ්‍රෝගෝ මෙලෙස සිහිමුලාව, දුබල අයුරින් වැතිර සිටිනු කිසිවෙකුගේ ඇස ගැටෙනු ඇයට උවමනා නොවීය. ඇගේ ඛාස් එකේ සෙබළුන් පැමිණි විට ඇය ඔවුන්ව දොරකඩ මුරට සිටුවා තැබුවාය. "මගේ අවසරය නැතුව කිසිම කෙනෙකුට ඇතුළුවෙන්ට දෙන්ට එපා." ඇය ජෝගෝට කීවාය. "කිසිම කෙනෙකුට."

ඉරෝආ ඩ්‍රෝගෝ වැතිර සිටින දෙස බියමුසු බැල්මක් හෙලුවාය. "එයා මැරෙන්ටයි යන්නෙ." ඇය මිමිනුවාය.

ඩැනී ඇයට අතුල් පහරක් දුන්නාය. "ඛාල්ට මැරෙන්ට බැහැ. එයා තමා මේ ලෝකය පාලනය කරන්ට යන සෙන්ධවයාගෙ තාත්තා. එයාගෙ කොණ්ඩෙ කවදාවත් කපලා නැහැ. එයාගෙ තාත්තා එයාට දුන්න සීනු එයා තාමත් එල්ලගෙන ඉන්නවා."

"ඛලීසි." ජික්වි කීවාය. "එයා එයාගෙ අස්සයා පිටින් බිම වැටුනා."

හදිසියේම දෑසේ පිරුනු කඳුළු නවතන්නට වෑයම් කරමින්, වෙවුලමින් ඩැනී ඔවුන්ගෙන් අහකට හැරුනාය. 'එයා එයාගෙ අශ්වයා පිටින් බිම වැටුනා!' ඒක ඇත්ත. ඇය එය දුටුවාය. ඔහුගේ රුධිරාරක්ෂකයෝ එය දුටුවෝය. කිසිදු සැකයකින් තොරව ඇගේ සේවිකාවන් ද ඇගේ ඛාස් එකේ සෙබළුන් ද එය දකින්නට ඇත. තවත් කීදෙනෙකු එය දකින්නට ඇත්ද? ඔවුන් එය රහසක් වශයෙන් තබා නොගනු ඇත. එයින් කියැවෙන්නේ කුමක්දැයි ඩැනී දැන සිටියාය. අසු පිට යා නොහැකි ඛාල් කෙනෙකුට බලසාරයක් පාලනය කරන්නට නොහැක. ඩ්‍රෝගෝ අසුපිටින් බිම වැටුනේය.

"අපි එයාව නාවන්ට ඕන." ඩැනී මුරණ්ඩු ස්වරයෙන් කීවාය. තමාව බලාපොරොත්තු විරහිත තත්ත්වයකට පත්කරගන්නට ඇයට නොහැක. "ඉරී, දැන්ම ගිහිල්ලා නාන බාල්දිය අරන් එන්ට. ඩෝරියා, ඉරෝආ, වතුර හොයාගෙන එන්ට. සීතල වතුර. එයා හොඳටම රස්ණෙයි." ඔහු මිනිස් සමකින් වැසූ ගිනිමැලයක් වැනි විය.

වහලුන් විසින් කූඩාරමේ කොනක බරැති තඹ නාන බාල්දිය අටවන ලදී. ඩෝරියා පළමු වතුර බුජම ගෙන ආ විට සේද රෙදි කැබැල්ලක් දියෙන් පෙඟවූ ඩැනී එය ඩ්‍රෝගෝගේ ගිනිගෙන දැවෙන නළල මත ඇතිරුවාය. ඔහුගේ දෑස් ඇය දෙස බලා සිටි නමුදු ඔහු ඇය දුටු බවක් නොපෙනින. ඔහුගේ දෙතොල් විවර වූ නමුදු කෙඳිරියක් මිස කිසිදු වදනක් එයින් පිටනොවීය. "කෝ මිරී මාස් ඩූර්?" ඇය කෑගැසුවාය. බිය විසින් ඇගේ ඉවසීමේ සීමාවන් ඉක්මවා තිබුනි.

"ක්වෝතෝ එයාව හොයාගනියි." ඉරී පිළිතුරු දුන්නාය.

ගෙන්දගම් ගඳ හමන ඇල්මැරුනු දියෙන් නාන බාල්දිය පිරවූ ඇගේ සේවිකාවෝ ඊට බුජම්වලින් ගත් විවිධ තෙල් වර්ග හා පොඩි කරගත් සුවඳතලා කොළ අහුරු කිහිපයක් එක්කලෝය. නාන බාල්දිය සැකසෙන අතරේ ඩැනී සිය සැමියා අබියස නුහුරු ලෙස දණ නමා හුන්නාය. ඔවුන්ගේ දරුවා නිසා පිරීගිය ඇගේ උදරය ඇයට අපහසුවක් ඇති කර තිබුනි. ඇය අදක්ෂ, අනම්‍ය ඇඟිලිවලින් ඔහුගේ වරලස ලිහා දැමුවාය. එය හරියටම ඔවුන්ගේ විවාහ මංගලෝත්සවය දා තරු පිරි අහස යට ඔහු හා මුල්ම වරට එක්වන්නට පෙර ඇය විසින් එය ලිහා දැමුවාක් වැනි විය. ඔහු හිසේ ගවසා තිබූ සීනු එකින් එක ඇය ප්‍රවේශමෙන් ඉවත තැබුවාය. 'එයා සනීප වුනාම එයාට ආයෙමත් මේවා ඕන වෙයි.' ඇය තමාටම කියාගත්තාය.

අග්ගෝ දොර පැළැල්ල ඔසවා හිස ඇතුළට ඔබන අතරේ සීතල සුළං රැල්ලක් කූඩාරම තුළ පිරෙන්නට විය. "බලීසි. අන්දාලයා ඇවිල්ලා ඉන්නවා. එයා කියනවා ඇතුළට එන්ට දෙන්ටයි කියලා."

'අන්දාලයා' යනු ඩොත්රැකියන් විසින් සෙර් ජෝරා වෙනුවෙන් භාවිත කල නම විය. "ඔවු." අදක්ෂ අයුරින් නැගිටිමින් ඇය කීවාය. "එයාව ඇතුළට එවන්ට." ඇය මේ නයිට්වරයාව විශ්වාස කලාය. මේ මොහොතේ කලයුතු කුමක්දැයි දන්නා කෙනෙකු වෙත්නම් ඒ ඔහු පමණි.

දොර පැළැල්ල තුළින් දෙකට නැමී කූඩාරමට ඇතුළු වූ සෙර් ජෝරා මෝර්මන්ට් මඳ ආලෝකයට දෑස් හුරුවන තෙක් මොහොතක් නොසැලී බලා සිටියේය. දකුණුකරයේ දැඩි සූර්යතාපයට ගැලපෙන පරිදි ඔහු සේද රෙද්දෙන් කල සැහැල්ලු කලිසමක් හා ඉදිරියෙන් විවර වූ, අසුපිට යන විට පළඳින වර්ගයේ දණහිස තෙක් ලේස්වලින් ගැටගැසූ පාවහන් පැළැඳ සිටියේය. ඔහුගේ අසිපත් කොපුව එකට ඇඹරූ අශ්ව ලොම් කෙඳිවලින් නිමවූ පටියක එල්ලෙමින් තිබුනි. සුදු පැහැ හණ කමිසයකට යටින් වූ නිරුවත් පපුව හිරු රශ්මිය නිසා රත් පැහැ ගැන්වී තිබුනි. "බලසාර් එක පුරාම කටකතාවක් පැතිරෙනවා." ඔහු පැවසීය. "උන් කියනවා බාල් ඩ්‍රෝගෝ අශ්වයා පිටින් වැටුනයි කියලා."

"එයාට උදවු කරන්ට." ඩැනී අයැද සිටියාය. "ඔබේ හිතේ මා ගැන තියෙන ආදරේ ඇත්ත නම් එයාට දැන් උදවු කරන්ට."

නයිට්වරයා ඇය පසෙකින් බිම දණ නමා ගත්තේය. ඔහු ඩ්‍රෝගෝගේ ස්වරූපය බොහෝ වේලාවක් හොඳින් නිරීක්ෂණය කලේය. ඊළඟ මොහොතේ ඔහු ඩැනී දෙසට හැරුණේය. "ඔබේ සේවිකාවො ටික පිටතට යවන්ට."

උගුර පුරා පිරීගිය භීතිය නිසා වදනකුදු කියාගත නුහුනු ඩැනී අතක් වනා සන් කලාය. ඉරී අනිත් තරුණියන් ද කැඳවාගෙන කූඩාරමෙන් පිටතට ගියාය.

ඔවුන් දෙදෙනා තනි වූ විට සෙර් ජෝරා සිය සිරිය පිටතට ඇදගත්තේය. මෙවැනි දැවැන්ත මිනිසකුට නොවන තරම් පුදුමාකාර පලපුරුදු දක්ෂ අතකින් ඔහු ඩ්‍රෝගෝගේ පපුව මත වූ කළු පැහැ ගැන්වුනු ෆිග් පත්‍ර හා වියළි නිල් මඩවලින් සැදුනු පල්පය සූරා දමන්නට වූයේය. මේ වෙළුම්පටි බැටළු මිනිසුන්ගේ මැටි පවුරු මෙන් වියළී සවි වී තිබුනි. එමෙන්ම ඒ පවුරු මෙන් මේ පල්පය ද පහසුවෙන්ම බිඳවැටුනි. වියළී ගිය මැටි සිය සිරියෙන් කඩා දැමූ සෙර් ජෝරා සමේ ඇලී තිබුනු මැටි කැබැලි ගලවා දමා ෆිග් පත්‍ර එකින් එක ඉවත් කරන්නට වූයේය. තුවාලයෙන් සැර දුගඳක් හමා එන්නට විය. එය කෙතරම් සැර දුගඳක් වී ද යත් ඇගේ හුස්ම සිරවන්නට එන්නාක් මෙන් ඇයට දැනුනි. මේ ෆිග් පත්‍ර වියළි රුධිරයෙන් හා සැරවයෙන් වැසී පැවතුනි. ඩ්‍රෝගෝගේ පපුවෙහි වූ තුවාලය කුණු වී කළු පැහැයෙන් දිදුලමින් තිබුනි.

"අයියෝ!" දෙකොපුල් තෙමමින් කඳුළු දහරා ගලා හැලෙද්දී ඩැනි කෙඳිරුවාය. "අනේ! දෙයියනේ, මට ඇහුම්කන් දෙන්ට. මේකනම් වෙන්ට ඉඩදෙන්ට එපා."

ඛාල් ඩ්‍රෝගෝ අදිසි සතුරකු හා පොරබදින්නාක් මෙන් දැත් ඔසවා හිස් අවකාශයට පහර දුන්නේය. විවර වූ තුවාලයෙන් කළු පැහැ කුණු ලේ සෙමින් ගලායන්නට විය.

"ඔබේ ඛාල් මැරුනා වගේ තමා කුමාරි."

"අනේ! එයාට එහෙම මැරෙන්ට බැහැ. එයාට එහෙම මැරෙන්ට අයිතියක් නැහැ. ඒක නිකංම පොඩි කැපුමක් විතරයි." ඔහුගේ කරගැටයෙන් වැසුනු ගොරහැඩි අත අල්ලාගත් ඩැනී එය සිය දෝතට මැදි කරගත්තා ය. "මම එයාට මැරෙන්ට ඉඩදෙන්නෙ නැහැ..."

සෙර් ජෝරා කටුක සිනහවක් පෑවේය. "බලීසි හරි රැජිනක් හරි ඒ අණ ඔබේ බලයෙන් පිටයි කුමාරි. ඔය කඳුළු නවත්තගන්ට දරුවා. එයා වෙනුවෙන් හෙට අඬන්ට. එහෙමත් නැත්තම් තව අවුරුද්දකින්. ඒ වුනත් දැන් අපට සෝක වෙවී ඉන්ට තරම් කාලයක් නැහැ. අපි දැන් යන්ට ඕන. ඉක්මනටම. එයා මැරෙන්ට කලින්."

ඩැනීට මේ කිසිවක් තේරුම් ගත නොහැකි විය. "යන්ට? අපි කොහෙ යන්ටද?"

"අශයිවලට යමු කියලයි මමනම් කියන්නෙ. ඒක තියෙන්නෙ බොහොම දුර ඈත දකුණෙ. මිනිස්සු දන්න කියන මානේ අන්තිම කෙලවරේ. ලෝකාන්තයේ. ඒ වුනත් මිනිස්සු කියන්නෙ ඒක මහා විශාල නාවුක තොටුපලක් කියලයි. අපි එතැනින් නැවක් හොයාගමු ආපහු පෙන්ටොස්වලට යන්ට. හැබැයි වරද්දගන්ට එපා, ඒක මහ අමාරු ගමනක් වේවි. ඔබේ බාස් එකේ සෙබළු ඔබට විශ්වාසද? උන් අපිත් එක්ක යන්ට එයිද?"

"බාල් ඩ්‍රෝගෝ එයාලට අණකරලා තියෙන්නෙ මාව ආරක්ෂා කරන්ටයි කියලයි." ඩැනී අතීරණාත්මකව පිළිතුරු දුන්නාය. "ඒ වුනත් එයා මැරුනොත්..." ඇය සිය පිරිපුන් උදරය පිරිමැද්දාය. "මට තේරෙන්නෙ නැහැ. ඇයි අපි පැනලා යන්ට ඕන? මමයි බලීසි. මගේ කුසේ ඩ්‍රෝගෝගෙ උරුමක්කාරයා ඉන්නවා. එයා ඩ්‍රෝගෝගෙන් පස්සෙ බාල් වෙයි..."

සෙර් ජෝරා රවා බැලුවේය. "කුමාරි, මම කියන දේ අහන්ට. මේ ඩොත්රැකියො කිරිබොන අතදරුවෙක් පස්සෙන් යන්නෙ නැහැ. උන් දැන් ඔය හිස නමන්නෙ ඩ්‍රෝගෝගෙ ශක්තියටයි. වෙන මොකටවත් නෙවෙයි. එයා මලොත් එයාගෙ තැන ගන්ට ජබෝයි, පොනෝයි, අනිත් බොස්ලයි සටන් වදියි. එතකොට මේ ඛලසාර් එක ඒක විසින්ම වැනසෙයි. මේ සටනින් දිනන කෙනා කවුරු වුනත් එයාට තවත් එදිරිවාදියෙක් ඉන්න එක දරන්ට බැහැ. ඔය දරුවා ඉපදුන ගමන්ම ඔබේ තුරුලෙන් උදුරගනියි. උන් එයාව බල්ලන්ට කන්ට දායි..."

ඩැනී සිය දෙවුර වැළැඳගත්තා ය. "ඒ වුනත් ඇයි ඒ?" ඇය දුක්මුසු අයුරින් හැඬුවාය. "ඇයි උන්ට පුංචි අතදරුවෙක් මරන්ට ඕන වෙන්නෙ?"

"එයා ඩ්‍රෝගෝගෙ පුතා නිසා. අර නාකිච්චියො කිවුවා එයා තමා මේ ලෝකය පාලනය කරන සෙන්ධවයා කියලා. ඒක අනාවැකියක්. මේ දරුවා වැඩිවිය පැමිණුනාට පස්සෙ එයාගෙ වියරුවට මූනදෙනවට වඩා ලේසියි පුංචි කාලෙම මරලා දාන එක."

ඇගේ කුසයේ වූ බිළිඳා පයින් ගැසුවේ හරියටම මේ පැවසූ දේ ඔහුට ඇසුනාක් මෙනි. විසේරිස් විසින් ඇයට පැවසූ කතා, රාජ්‍යය පැහැරගත්තාගේ බල්ලන් විසින් රේගාර්ගේ දරුවන්ට සිදුකල දේ ඇයට සිහිපත් වන්නට විය. ඔහුගේ පුතාද කුඩා අතදරුවකු විය. එනමුදු ඔහුව සිය මවගේ තුරුලෙන් උදුරාගත් උන් බිත්තියක ගසා ඔහුගේ හිස පොඩිකර දැමූහ. මේ වනාහි පිරිමින්ගේ ස්වභාවයයි. "උන්ට මගේ දරුවට අනතුරක් කරන්ට දෙන්ට

බෑ!" ඇය හැඬුවාය. "මම මගේ ඛාස් එකට අණ දෙන්නම් මාව ආරක්ෂා කරන්ටයි කියලා. ඒ වගේම ඩ්‍රෝගෝගෙ රුධිරාරක්ෂකයො-"

සෙර් ජෝරා ඇගේ දෙවුරෙන් අල්වාගත්තේ ය. "රුධිරාරක්ෂකයෙක් එයාගෙ ඛාලුත් එක්කම මැරෙන්ට ඕන. ඔබ දන්නවා ඒක දරුවො. උන් ඔබට ආපහු වයෙස් ඩොත්රක්වලට අරන් යයි. අර නාකිච්චියො ගාවට. ඒ තමා උන් එයා වෙනුවෙන් ජීවිතේ අවසානෙටම කරන්ට බැඳිලා ඉන්න අණ... ඒක සිද්ද කලාට පස්සෙ උනුත් ඩ්‍රෝගෝත් එක්ක එකතුවෙන්ට නිශා ලෝකෙට යයි."

නැවත වයෙස් ඩොත්රක් වෙත ගොස් අර මැහැලියන් සමගින් සිය දිවියේ ඉතුරු කාලය ගෙවා දමන්නට ඩැනීට කොහෙත්ම අවශය නොවීය. එනමුදු නයිට්වරයා මේ පවසන්නේ සැබෑවක් බව ඇයට වැටහින. ඩ්‍රෝගෝ ඇගේ දිවියේ ඉර හා තරුවලටත් වඩා වැඩි මෙහෙයක් ඉටුකොට තිබින. ඔහු වනාහි ඇයව ආරක්ෂාකාරීව තබාගත් පලිහ විය. "මම එයාව දාලා යන්නෙ නැහැ." ඇය මුරණ්ඩු හා දුක්ඛිත ස්වරයෙන් කීවාය. ඇය නැවතත් ඔහුගේ අතින් අල්ලාගත්තා ය. "මම එහෙම කරන්නෙ නැහැ."

කූඩාරමේ දොර පැලැල්ල සෙලවෙන හඬක් නිසා ඩැනී හිස හරවා බැලුවාය. මිරී මාස් ඩූර් දෙකට නැමී දොරින් ඇතුළුවෙමින් සිටියාය. දින ගණනාවක් පුරා ඛලසාරය පසුපසින් ඇවිදීම නිසා ඇය වැහැරී ගොස් තිබුනු අතර කොර ගසන්නට ද වූවාය. එමෙන්ම ඇගේ දෙපතුල්වල තුවාල ඇති වී ලේ ගලමින් තිබුනු අතර දෑස් යට කළු පැල්ලම් ද විය. ඇයට පසුපසින් ක්වෝතෝ හා හග්ගෝ එකතුව දේවදාසියගේ බෙහෙත් බඩු පෙට්ටිය ඔසවාගෙන පැමිණියෝය. එනමුදු ඩ්‍රෝගෝගේ තුවාලය දුටු මනතින් හග්ගෝගේ අතැඟිලි අතරින් රූටා ගිය පෙට්ටිය මහ හඬක් නගමින් කූඩාරම් පොළොව මත ඇද වැටුනි. ක්වෝතෝගේ මුවින් පිටවූ අවලාදවලින් අවට වාතය දූෂිත වන්නට විය.

මිරී මාස් ඩූර් නිසල, කිසිදු හැඟීමක් නොමැති මුහුණින් ඩ්‍රෝගෝව අධ්‍යයනය කලාය. "තුවාලෙ පැසවලා."

"මේක උඹේ වැඩක් යක්දෙස්සි." ක්වෝතෝ කීවේය. හග්ගෝ මිරීගේ මුහුණ හරහා දුන් මුෂ්ටි පහරින් ඇය විසිවී ගොස් බිම පතිත වූවාය. ඔහු නැවත බිම වැටුනු ඇයට පයින් ගැසුවේය.

"ඕක නවත්තපන්!" ඩැනී මුරගෑවාය.

ක්වෝතෝ හග්ගෝව පසෙකට ඇද දැමීය. "මේ යක්දෙස්සිට පයින් පාරවල් හොඳ වැඩියි. ඒකිව එළියට අරන් යමු. අපි ඒකිව බිමට තියලා උල ඉන්දමු. එතැනින් යන එන හැම එකාටම ඒකිගෙ ඇඟ උඩ නගින්ට පුළුවන් වෙයි. උන් වැඩේ කරගෙන අහවර වුනාට පස්සෙ බල්ලොත් ඒකිව පාවිච්චි කරයි. මුගටියො ඒකිගෙ බඩවැල් උගුල්ලපුවාවෙ. කපුටො ඒකිගෙ ඇස් දෙක කාපුවාවෙ. ගඟේ ඉන්න මැස්සො ඒකිගෙ ගර්භාෂෙ බිත්තර දාපුවාවෙ. උන් ඒකිගෙ තන් දෙකේ තුවාලවලින් හැරව උරා බීපුවාවෙ..." ඔහු සිය යකඩ බඳු අතැඟිලි දේවදාසියගේ මුදු මොළොක් බාහුවට ඔබා ඇයව නැගිට්ටෙවුවේය.

"එපා." ඩැනී කෑගැසුවාය. "එයාට අනතුරක් කරන්ට මම ඉඩදෙන්නෙ නැහැ."

ක්වෝතෝගේ දුඹුරු පැහැ බිඳුනු දත් දෙපෙළ පෙන්වමින් දෙතොල් ඇදී ගියේය. ඒ මුවේ කුරිරු සිනහවක් ඇඳී ගියේය. "එපා? උඹද මට එපා කියන්නෙ? උඹ දෙයියන්ට යාඥා කරපන් උඹේ යක්දෙස්සිත් එක්ක අපි උඹවත් පොළොවෙ උල තියන්නෙ නැති වෙන්ටයි කියලා. ඒකි වගේම උඹත් මේකට වගකියන්ට ඕන."

සෙර් ජෝරා සිය අසිපත කොපුවෙන් බුරුල් කරමින් ඔවුන් දෙදෙනා මැද්දට පා තැබුවේය. "උඹේ කට පරෙස්සම් කරගනින්. කුමාරි තාමත් උඹේ ඛලීසි."

"මගේ ලෙයින් උපන් ලෙය ජීවත්වෙලා ඉන්නකම් විතරයි." ක්වෝතෝ නයිට්වරයාට කීවේය. "එයා මැරුනට පස්සෙ ඒකි නිකම්ම නිකමෙක්."

සිය සිරුර ඇතුළතින් දරදඬු වී යන්නාක් මෙන් ඩැනීට දැනුනි. "ඛලීසි වෙන්ට කලින් මම මකරාගෙ රුධිරය. සෙර් ජෝරා, මගේ ඛාස් එකට එන්ටයි කියන්ට."

"නෑ ඕන නෑ." ක්වෝතෝ කීවේය. "අපි යනවා.. දැනට... ඛලීසි." හග්ගෝ තරහින් රවා බලමින් ඔහු පසුපසින් කූඩාරමෙන් පිටතට පිළිපන්නේය.

"අරුගෙන් නම් ඔබට කිසිම හොඳක් බලාපොරොත්තු වෙන්ට බැහැ කුමාරි." මෝර්මන්ට් කීවේය. "ඩොත්රකියො කියන්නෙ මිනිහෙකුයි එයාගෙ රුධිරාරක්ෂකයිනුයි එකම ජීවිතයක් හවුලේ භුක්ති විඳිනවා කියලයි. ක්වෝතෝට දැන් පේනවා ඒ ජීවිතේ අවසාන වෙන්ටයි යන්නෙ කියලා. මැරිච්ච මිනිහෙක් කියන්නෙ කිසිම බයක් සැකක් නැති මිනිහෙක්."

"කිසිම කෙනෙක් තාම මැරුනෙ නැහැ. සෙර් ජෝරා, මට අද දවසේ ඔබේ කඩුවෙ සහාය උවමනා වෙයි. ඔබ ගිහින් ඔබේ සන්නාහය ඇඳගත්තනම් හොඳයි." තමාටම පවා පිළිගන්නට නොහැකි තරම් භයානක අන්දමින් ඇය බියපත්ව සිටියාය.

නයිට්වරයා හිස නැමීය. "ඔබේ කැමැත්තක්." ඔහු දිගු පියවර තබමින් කූඩාරමෙන් පිටවිය.

**Daenerys Targaryen: “Am I truly your princess?”**

**Ser Jorah Mormont: “You know you are, gods save us both.”**

ඩැනී නැවත මිරී මාස් ඩූර් වෙත හැරුනාය. ගැහැණියගේ දෑස් පරීක්ෂාකාරී විය. "ඉතින් එහෙනම් ඔබ ආයෙත් වතාවක් මාව බේරගත්තා."

"ඉතින් දැන් ඔබ එයාව බේරගන්ට ඕන. අනේ කරුනාකරලා."

"ඔබ වහලෙකුගෙන් අහන්නෙ නෑ." මිරී තියුණු ස්වරයෙන් පිළිතුරු දුන්නාය. "ඔබ අණ කරනවා." පැදුර මත බැව් උණෙන් පෙලෙමින් සිටි ඩ්‍රෝගෝ වෙතට ගිය ඇය ඔහුගේ තුවාලය බොහෝ වේලාවක් පිරික්සා බැලුවාය. "ඇහුවත් කිවුවත් දැන් ඒකෙන් වැඩක් වෙන්නෙ නැති ගානයි. එයා දැන් සුවකරන්නන්ගෙ හැකියාවෙන් එහා ගිහිල්ලා." ඇය

වැසී තිබුනු බාල්ගේ ඇසක් අතැඟිලිවලින් විවර කලාය. "එයා පොපි යුෂ බීලා වේදනාව මැඩ පවත්වගෙන ඉඳලා තියෙනවා."

"ඔවු." ඩැනී පිළිගත්තාය.

මම ගිනි කරලුයි, බූව කොළයි අඹරලා ආලේපයක් හදලා බැටළු හමකින් තුවාලෙට තියලා බැන්දා."

"එයා කිවුවා ඒක දැවිල්ලයි කියලා. එයා ඒක ඉරලා විසි කලා. ඔසු ගැනු එයාට අලුත් ආලේපයක් හදලා දුන්නා. හොඳ තෙත් සනීප එකක්."

"ඒක දැවිල්ලයි. ඔවු. ගින්දරේ ලොකු මායා බලයක් තියෙනවා තුවාල හොඳ කරන්ට පුළුවන්. ඔබලාගෙ නපුංසකයො පවා ඒක දන්නවා."

"එයාට තවත් ආලේපයක් හදලා දෙන්ට." ඩැනී ආයාචනා කලාය. "මේ ගමන එයා ඒක දිගටම පැළැඳගෙන ඉන්නවයි කියලා මම සහතික වෙන්නම්."

"ඒකට දැන් කල් ගිහින් වැඩියි මගේ ආර්යාවනි. දැන් මට කරන්ට පුළුවන් එකම දේ එයාට යන්ට තියෙන අන්ධකාර පාර සුවපහසු කරලා දෙන එක විතරයි. එයා එතකොට වේදනාවක් නැතුව නිශා ලෝකෙට යන්ට යයි. උදේ වෙද්දි එයා ගිහින් තියෙයි."

ඇගේ වදන් පිහි පහරවල් මෙන් ඩැනීගේ හදවත පසා කලේය. දෙවියන් මෙතරම් නපුරු වන්නට, මෙතරම් කුරිරු වන්නට ඇය සිදු කල වරද කුමක්ද? ඇය මෙතෙක් ගෙවූ දුක්ඛිත දිවිය නිමා කර අන්තිමේදී වාසය පිණිස ආරක්ෂාකාරී ස්ථානයක් සොයාගත්තා පමණි. අන්තිමේදී ආදරය හා බලාපොරොත්තුව ළඟාකරගත්තා පමණි. අන්තිමේදී නැවත ගෙදර යන්නට පටන්ගත්තා පමණි. ඉදින් දැන් මේ සියල්ලක්ම නැති කරගන්නට... "නෑ." ඇය ආයාචනා කලාය. "එයාව බේරගන්ට. එතකොට මම ඔබව නිදහස් කරන්නම්. මම දිවුරනවා. ඔබ මොකක් හරි ක්‍රමයක් දන්නවා වෙන්ට ඕන... මොකක් හරි මායා බලයක්... මොකක් හරි..."

බිම වාඩිගත් මිරී මාස් ඩූර් රාත්‍රිය මෙන් කළු පැහැ දෑසින් ඩැනීව නිරීක්ෂණය කලාය. "එක හූනියමක් තියෙනවා." ඇගේ ස්වරය කෙඳිරීමක් තරම් පහත් විය. "ඒ වුනත් ඒක හරිම අමාරු දෙයක් ආර්යාවනි. ඒ වගේම ඒක මහ නපුරු දෙයක්. සමහරු කියනවා මරණය ඊට වඩා පිරිසුදු දෙයක්ය කියලා. මම මේක ඉගෙනගත්තෙ අෂයිවල ඉන්න කාලෙ. ඒ වගේම ඒ පාඩම වෙනුවෙන් මම කියලා නිම කරන්ට බැරි තරමේ මිලක් ගෙවුවා. මගේ ගුරුවරයා වුනේ හෙවනැලි දේශයෙන් ආපු ලේ යකැදුරෙක්."

ඩැනීගේ සියොලඟම සීතල වී ගියේය. "ඒ කියන්නෙ ඇත්තටම ඔබ යක්දෙස්සියක්."

"එහෙමද?" මිරී මාස් ඩූර් සිනාසුනාය. "ඔබේ මේ අසරුවාව බේරගන්ට පුළුවන් දැන් ඉතින් යක්දෙස්සියකටම විතරයි රිදී ආර්යාවනි."

"වෙන කිසි ක්‍රමයක් නැද්ද?"

"කිසිම ක්‍රමයක් නෑ."

ඛාල් ඩ්‍රෝගෝ අසීරුවෙන් හුස්මක් ඇද්දේය.

"ඒක කරන්ට." ඩැනීගේ දෙතොල් අතරින් පිටවිය. ඇය බිය විය යුතු නොවේ. ඇය මකරාගේ රුධිරයයි. "එයාව බේරගන්ට."

"ඒ වෙනුවෙන් මිලක් ගෙවන්ට ඕන." යක්දෙස්සිය අනතුරු ඇඟෙවුවාය.

"ඔබට ඕන දෙයක්. රත්තරන්. අශ්වයො."

"රත්තරන්වලින්වත් අශ්වයොන්ගෙන්වත් වැඩක් නෑ. මේ ඇවිල්ලා ලෙයින් කරන හූනියමක් ආර්යාවනි. ජීවිතය වෙනුවෙන් මිලක් ගෙවන්ට පුළුවන් මරණයෙන් විතරයි."

"මරණයෙන්?" සිය දෑත් සිරුරු වටා යවා තමාවම වැළැඳගත් ඩැනී දෙපා මත පැද්දුනාය. "මගේ මරණයෙන් ද?" ඔහු වෙනුවෙන් මිය යා යුතු නම් තමා ඊටද සූදානම් බැව් ඇය තමාටම කියාගත්තා ය. ඇය මකරාගේ රුධිරයයි. ඇය බිය විය යුතු නොවේ. ඇගේ සොහොයුරා රේගාර් තමා ආදරය කල කාන්තාව වෙනුවෙන් දිවි පිදුවාය.

"නෑ." මිරී මාස් ඩූර් පිළිණ දුන්නාය. "ඔබේ මරණය නෙවෙයි බලීසි."

ලද සහනය නිසා ඩැනී වෙවුලුවාය. "ඒක කරන්ට."

යක්දෙස්සිය සන්සුන් අයුරින් හිස වැනුවාය. "ඔබ කියන විදියක්. එහෙමනං ඒක එහෙම වෙච්චාවෙ. ඔබේ සේවකයින්ට කතා කරන්ට."

රඛාරෝ සහ ක්වාරෝ එක්ව ඛාල් ඩ්‍රෝගෝව නාන බාල්දියට බහාලද්දී ඔහු දුබල ලෙස වේදනාවෙන් ඇඹරුනේය. "නෑ." ඔහු කටුකුටු ගෑවේය. "නෑ. යන්ට ඕන." එනමුදු දියට බහා ලූ සැනින් ඔහු සතු සියලු ශක්තිය සිඳී ගියාක් වැනි විය.

"එයාගෙ අශ්වයාව ගේන්ට." මිරී මාස් ඩූර් අණකලාය. ඒ අණ එලෙසින්ම ඉටුවිනි. ජෝගෝ දැවැන්ත රතු පැහැ සෛන්ධවයා කූඩාරම තුළට දක්කාගෙන ආවේය. මරණයේ ඉව දැනුනු සත්ත්වයා දැස් කරකවමින්, කෑගසමින් පසුබසින්නට තැත්කලේය. ඌව යටපත් කරගන්නට මිනිසුන් තිදෙනෙකුගේ සහය අවශ්‍ය විය.

"ඔබ මොකක්ද දැන් කරන්ට බලාපොරොත්තු වෙන්නෙ?" ඩැනී ඇගෙන් විමසුවාය.

"අපට උගේ ලේ ඕන." මිරී පිළිතුරු දුන්නාය. "ඒක තමා ක්‍රමේ."

සිය අරඹ එකට අත යවමින් ජෝගෝ වහා පසුපසට ඇදුනි. ඔහු දහසය වැනි වියේ වූ, කසයක් මෙන් සිහින්, නිර්භය, නිතරම සිනාසෙන ගැටවරයෙකු විය. ඔහුගේ පළමු උඩුරැවුල සිහින් රේඛාවක් මෙන් උඩුතොලට ඉහළින් යාන්තමට මතුවන්නට ගත්තා පමණි. ඔහු ඇය පසෙකින් දණින් වැටුනි. "බලීසි. ඔබ මේක කරන්ට හොඳ නෑ. මට මේ යක්දෙස්සිව මරලා දාන්ට ඉඩදෙන්ට." ඔහු අයැද සිටියේය.

"එයාව මැරුවා කියන්නෙ උඹේ බාලුත් මරලා දැම්මා වගේ තමා."

"මේ ලේ යකැදුරුකම්. මේවා කරන්ට තහනම්."

"මමයි බලීසි. මම කියනවා ඒක තහනම් නැහැයි කියලා. වයෙස් ඩොත්රැක්වලදී බාල් ඩ්‍රෝගෝ අශ්වයෙක්ව මරලා මට උගේ හදවත කන්ට දුන්නා. අපේ පුතාට ශක්තියයි ධෛර්‍යයයි ලැබෙන්ටයි කියලා. මේකත් ඒ වගේ දෙයක් තමා."

රඛාරෝ, ක්වාරෝ හා අග්ගෝ එකතුව අශ්වයාව බාල්ව බහා ලූ නාන බාල්දිය අසලට රැගෙන එද්දී ඌ පයින් ගසමින් ඔවුන්ගෙන් මිදෙන්නට තැත්කලේය. බාල් දැනටමත් මියගිය එකෙකු මෙන් දිය මත පාවෙමින් හුන් අතර ඔහුගේ තුවාලයෙන් වැගිරුනු කුණු ලෙයින් හා සැරවයෙන් දිය අපවිත්‍ර විය. මිරි මාස් ඩූර් ඩැනීට වටහාගත නුහුන කුමක්දෝ භාෂාවකින් මතුරන්ට පටන්ගෙන තිබින. ඊළඟ මොහොතේ ඇගේ සුරතට පිහියක් පැමිණියේය. එය කොහෙන් කෙසේ ආවාදැයි ඩැනීට නිනවුවක් නොවීය. ගසක කොළයක හැඩය ගත්, රත් පැහැ ලෝකඩයෙන් නිමවූ පැරණි ආයුධයක් වූ එහි තලයේ පුරාණ රූපාක්ෂර කොටා තිබින. යක්දෙස්සිය අසුගේ ගෙල වටා පිහිය ඇද්දාය. රත් පැහැ දිය දහරාවක් මෙන් රුධිරය පිටතට විදිද්දී අසු කෑගසමින් වෙවුලන්නට විය. ඇගේ බාස් එකේ සෙබළුන් විසින් ඔසවාගෙන නොසිටින්නට ඌ බිම ඇද වැටෙනු නිසැක විය. "අශ්වයාගේ ශක්තිය අසරුවාට ගලන්ට." අශ්ව රුධිරය නාන බාල්දියේ වූ දිය හා මුසුවද්දී මිරි ගායනා කලාය. "අශ්වයාගේ ශක්තිය අසරුවාට ගලන්ට."

අශ්වයාගේ බරින් මිරිකී සිටි ජෝගෝ බියෙන් ත්‍රස්ත වී ගිය බවක් පෙනෙන්නට තිබුනි. මළකඳකට කර ගසන්නට වීම ගැන මෙන්ම එය අතහරින්නට ද ඔහු එක සේ බිය වූ බවක් පෙනුනි. 'ඒ නිකම්ම අශ්වයෙක් විතරයි.' ඩැනී සිතුවාය. අශ්වයකුගේ මරණය විසින්

ඩ්‍රෝගෝට නැවත පණ උපද්දවන්නට සමත් වන්නේනම් ඇය එමෙන් දහස් ගුණයක් වුව මිල ගෙවනු ඇත.

* * *

අන්තිමේදී ඔවුන් අසු බිම අතහරින විට නාන බාල්දිය රුධිරයෙන් පිරී තද රත් පැහැ වී තිබුනු අතර ඩ්‍රෝගෝගේ මුහුණ හැර අන් යමක් දැකිය නොහැකි විය. මිරී මාස් ඩූර්ට මළකඳෙන් එලක් නොමැති විය. "ඌව පුච්චන්ට." ඩැනී ඔවුන්ට කීවාය. සම්ප්‍රදාය අනුව සිදුවිය යුත්තේ එය බව ඩැනී දැන සිටියාය. මිනිසකු මියගිය විට ඔහුගේ අශ්වයාද මරා ආදාහන සෑය යටින් තබනුයේ ඔහුව නිශා ලෝකයට කැඳවාගෙන යනු පිණිස විය. ඇගේ ඛාස් එකේ සෙබළුන් විසින් අශ්ව මළකඳ කූඩාරමෙන් පිටතට ඇදගෙන යනු ලැබිනි. රුධිරය දසත තැවරුනි. සේද රෙද්දෙන් කල කූඩාරම් බිත්ති පවා රත් පැහැයෙන් පින්තාරු වී තිබුනු අතර පයට යටින් වූ බුමුතුරුණු කළු පැහැ වී ඇලෙමින් තිබුනි.

ගිනිකබල් දැල්විනි. මිරී මාස් ඩූර් ගල්අඟුරු මතට යම් රතු කුඩක් විසිකල අතර එයින් නැගෙන දුමට ප්‍රසන්න කුළුබඩු සුවඳක් එක් විය. එනමුදු ඉරෝආ කඳුළු සලමින් කූඩාරමෙන් පිටතට දිවගිය අතර ඩැනීගේ සිතට බියක් දැනෙන්නට විය. කෙසේ වුවද දැන් ආපසු හැරෙන්නට නොහැකි තරම් දුරක් ඇය පියමැන අවසානය. ඇය සිය සේවිකාවන් ඉවත යැවුවාය. "එයාලත් එක්ක ඔබත් යන්ට රිදී ආර්යාවනි." මිරී මාස් ඩූර් පැවසුවාය.

"මම ඉන්නවා. මේ මිනිහා අහසේ තරු යටදී මාව එයාගෙ බිරිඳ කරගත්තා. මට එයාගෙ දරුවෙක් දුන්නා. මම එයාව දාලා යන්නෙ නැහැ."

"ඔබ යන්ට ඕනමයි. මම ගීතිකා ගායනා කරන්ට පටන්ගත්තට පස්සෙ කිසිම කෙනෙකුට මේ කූඩාරමට ඇතුළුවෙන්ට බෑ. මගේ ගීතිකා නිසා බොහොම පුරාණ, බොහොම භයානක බලවේගවලට පණ එනවා. අද රෑ මේ කූඩාරම ඇතුළෙ මළවුන් නටයි. කිසිම පණ ඇති මිනිහෙක් එයාලා දිහා බලන එක සුදුසු නෑ."

කිසිදු පිළිසරණක් නොමැති වූ ඩැනී හිස නැමුවාය. "කිසිම කෙනෙක් ඇතුළුවෙන එකක් නැහැ." නාන බාල්දියට උඩින් පාත් වූ ඇය ඩ්‍රෝගෝගේ නළල සැහැල්ලු ලෙස සිපගත්තා

ය. "එයාව ආපහු මට ලබාදෙන්ට." කූඩාරමෙන් පිටවීමට පෙර ඇය මිරී මාස් ධූර්ට කොඳුලාය.

* * *

පිටත හිරු ක්ෂිතිජය අබිසයටම පාහේ බැසගොස් තිබුනු අතර අහස රත් පැහැ විය. බලසාරය කඳවුරු බැඳ තිබින. ඇසට හසුවන මානය තෙක් කූඩාරම් ද නිදන පැදුරු ද විසිර පැවතින. උණුසුම් සුළඟක් හමන්නට විය. ජෝගෝ සහ අග්ගෝ නොගැඹුරු වලක් සාරමින් සිටියේ මළ අසු දවනු පිණිස විය. ඩැනී වටා රැස් වූ පිරිසක් ඔවුන්ගේ දැඩි, කළු පැහැ දෑස්වලින් ඇය දෙස බලා සිටින්නට වූහ. ඔවුන්ගේ මුහුණු තඹයෙන් කල වෙස්මුහුණු මෙන් කිසිදු හැඟීමකින් තොර විය. සිය සම් ආවරණයන්ගෙන් හා සන්නාහයෙන් සැරසුනු, නළල පුරා දහදිය නැගි සෙර් ජෝරා මෝර්මන්ට්ව ඇය දුටුවාය. ඩොත්රැකියන් පීරමින් ඉදිරියට පැමිණි ඔහු ඇගේ පසෙකින් නතර විය. ඇගේ බූට්ස් සපත්තුවල අඩිය විසින් බිම මත ඇතිකර තිබුනු රත් පැහැ පා සලකුණු දුටු විට ඔහුගේ මුහුණ සුදුමැලි වී ගියේය. "උඹ මොකක්ද මේ කලේ? උඹ පුංචි මෝඩී." ඔහු රළු ස්වරයෙන් ඇසුවේය.

"මට එයාව බේරගන්ට ඕන වුනා."

"අපට ලේසියෙන්ම පැනලා යන්ට තිබුනා. මට ඔබව පරෙස්සමින් අෂයීවලට එක්කරන් යන්ට තිබුනා කුමාරි. මෙහෙම දෙයක් කරන්ට කිසිම උවමනාවක් තිබුනෙ නැහැ..."

"මම ඇත්තටම ඔබේ කුමාරිද?"

"ඔබ දන්නවනෙ ඒක. දෙයියො අපි දෙන්නවම බේරන්ට."

"එහෙමනම් දැන් මට උදවු කරන්ට."

සෙර් ජෝරා මුහුණ පුලුටු කරගත්තේය. "මම දන්නෙ නෑ කොහොමද උදවු කරන්ට ඕන කියලා."

මිරී මාස් ඩූර්ගේ ස්වරය උස්, බෙරිහන්දෙන විලාපයක් බවට පත්වූ අතර ඩැනීගේ කොඳුඇටපෙළ දිගේ සීතල වෙවුලුමක් දිවගියේය. එකිනෙකාට කටුකුටු ගාන්නට පටන්ගත් සමහර ඩොත්රකියෝ පසුබා ඉවත යන්නට වූහ. ඇතුළත වූ ගිනිකබල්වල ආලෝකයෙන් කූඩාරම උජ්වලිත වී තිබින. ලේ පැල්ලම් වැකුනු සුදුපැහැ සේද රෙදි අතරින් සෙවනැලි එහාමෙහා යනු ඇයට දැකිය හැකි විය.

මිරී මාස් ඩූර් නටමින් සිටියාය. එනමුදු ඒ තනිවම නොවේ.

ඩොත්රකියන් ගේ මුහුණු මත ඇඳුනු බිය ඩැනී පැහැදිලිවම දුටුවාය. "මේක වෙන්ට දෙන්ට බෑ." ක්වෝතෝ ගිගිරුවේය. රුධිරාරක්ෂකයා ගේ මේ පුනරාගමනය ඇය නොදුටුවක් විය. හග්ගෝ සහ කොහොල්ලෝ ද ඔහු සමග වූහ. ඔවුහු ගින්නෙන්, පිහියෙන් හා ඉඳිකටුවෙන් වැඩගන්නා නපුංසක සුවකරන්නන් කැඳවාගෙන විත් තිබින.

"මේක වෙයි." ඩැනී පිළිතුරු දුන්නාය.

"යක්දෙස්සි." හග්ගෝ ගුගුලේය. මහලු කොහොල්ලෝ - ඩ්‍රෝගෝ උපන් දා පටන් ඔහුගේ දිවිය හා සිය දිවිය ඈඳූ කොහොල්ලෝ, ඇයට හැමදාමත් කාරුනිකව සැලකූ කොහොල්ලෝ - ඇගේ මුහුණ පුරා කෙළ පහරක් ගැසුවේය.

"මේකට නං උඹ මැරෙනවා යක්දෙස්සි." ක්වෝතෝ දිවුලේය. "ඒ වුනාට උමට ඉස්සෙල්ලා අනිකි මැරෙන්ට ඕන." සිය අරඛ් එක ඇදගත් ඔහු කූඩාරම දෙසට පිය මනින්නට වූයේය.

"එපා." ඇය කෑගැසුවාය. "උඹට එහෙම කරන්ට බෑ." ඇය ඔහුගේ දසරුවෙන් අල්ලාගත් නමුදු ක්වෝතෝ ඇයව තල්ලුකර දැමුවේය. දණින් වැටුනු ඩැනී සිය දරුවා රැකගනු වස්

උදරය හරහා දැත් යවා බදාගත්තා ය. "ඌව නවත්තන්ට." ඇය සිය බාස් සෙබළුන්ට අණකලාය. "ඌව මරන්ට."

කූඩාරමේ දොර පැලැල්ල දෙපස රබාරෝ හා ක්වාරෝ මුරට තබා තිබුනි. ක්වාරෝ ඉදිරියට පියවරක් තැබූයේ සිය කසයේ මිට වෙත අත යැවීය. එනමුදු ක්වෝතෝ නැට්ටුවෙකු මෙන් සුනම්‍ය අයුරින් ඉදිරියට පිනූයේ සිය කවාකාර අරක් එක ඉහළට ඔසවා කැපීය. පහර ක්වාරෝගේ බාහුවට පහළින් ළපැත්ත කපාගෙන සම් ඇඳුම්, සම් මස් හා ඉළඇට පසා කරමින් කිඳා බැස්සේය. තරුණ අසරුවා හුස්මක් අදිමින් පසුපසට විසිවද්දී උල්පතකින් මෙන් රුධිරය ගලා ආයේය.

ක්වෝතෝ වැරෙන් අත ගස්සා ඇද සිය අරක් එක නිදහස් කරගත්තේ ය. "අස්හිමියො." සෙර් ජෝරා කෑගැසුවේය. "මාත් එක්ක හැප්පිලා බලපන්." ඔහුගේ දිගු අසිපත කොපුවෙන් පිටතට ඇදී ආයේය.

ක්වෝතෝ අවලාදයක් නගමින් ආපසු හැරුනේය. ඔහුගේ අරක් එක කෙතරම් වේගයෙන් ඉදිරියට පිනූයේ ද යත් එහි තැවරී තිබුනු ක්වාරෝ ගේ රුධිරය උණුසුම් වර්ෂාවක් මෙන් දසත විසිර ගියේය. සෙර් ජෝරාගේ මුහුණට අඩියක් ඉදිරියෙන් එසැවුනු දිගු අසිපත විසින් මේ පහර වැළැක්වූ අතර මේ ග්‍රහනය එක් මොහොතක් එලෙසම පැවතුනේ ක්වෝතෝ වියරුවෙන් මොරගෑවේය. නයිට්වරයා සිය මුදු දම්වැල් සන්නාහයෙන් සැරසී, යකඩ අත්වැසුම්, ජංඝාවරණ හා ග්‍රීවාවරණ පැළැඳ සිටි නමුදු සිය ශිරස්කය පැළැඳීමට අමතක කර තිබුනි.

ක්වෝතෝ නටමින් මෙන් පසුපසට පිනීය. ඔහුගේ අරක් එක විදුලියක් මෙන් හිස වටා කරකැවෙන්නට විය. විදුලි කොටන්නාක් මෙන් එක පිට එක පහර වදින්නට වූ අතර නයිට්වරයා තමාට හැකි උපරිමයෙන් පහර වලකන්නට වූයේය. එනමුදු මේ පහරවල් එකකට එකක් නොපරදින්නට මෙන් වේගයෙන් පැමිණියේ ක්වෝතෝට අත් සතරක් හා අරක් සතරක් ඇත්තාක් මෙන් ඩැනීට පෙනුනි. අරක් එක මුදු දම්වැල් සන්නාහයේ ගැටෙන හඬ ඇයට ඇසුනි. යකඩ අත්වැසුම්වල එය ගැටීමෙන් නගින ගිනි පුළිඟු ඇය දුටුවාය. ඊළඟ මොහොතේ මෝර්මන්ට් පසුබසින්නට වූ අතර ක්වෝතෝ පහර පිට පහර දෙමින් ඉදිරියට පැන්නේය. නයිට්වරයා ගේ මුහුණේ වම්පස රුධිරයෙන් තෙමී ගොස් තිබුනි. උකුළට වැදුනු පහරක් විසින් මුදු දම්වැල් සන්නාහය කැපී ගොස් තිබුනු අතර ඔහු කොර ගසන්නට විය. ක්වෝතෝ ඔහුට ගර්හා කරමින් ඇනුම්පද කියන්නට වූයේය. ඔහු බියගුල්ලකු,

කොන්ද පණ නැතියකු, යකඩ ඇඳුමක සැඟවුනු නපුංසකයකු යැයි කියමින් පරිභව කරන්නට වූයේය. "උඹ දැන් මැරෙනවා!" ඔහු දිවුලේය. රත්පැහැ සැඳෑ හිරුඑළියේ අරඛ් එක විදුලියක් මෙන් දිදුලන්නට විය. ඩැනීගේ ගැබෙහි වූ ඇගේ පුත්‍රයා වියරුවෙන් මෙන් පයින් ගසමින් සිටියේය. තනි කෙලින් වූ දිගු අසිපත මතින් ලිස්සා ගිය කවාකාර අරඛ් එක නයිට්වරයාගේ මුදු දම්වැල් සන්නාහයේ පෙර වූ කැපුම තුළින් රිංගා ගොස් ඔහුගේ උකුළ මතට කිඳා බැස්සේය.

මෝර්මන්ට් උගුරෙන් වේදනාත්මක හඬක් පිට කල අතර ඔහුගේ පා පැකිළුනේය. සිය උදරයේ තියුණු වේදනාවක් සමගින් කළවා තෙත්ව යනු ද ඩැනිට දැනෙන්නට විය. ක්වෝතෝ ජයග්‍රාහී හඬක් නැගුවේය. එනමුදු ඔහුගේ අසිපත ඇටකටුවක් කපාගෙන කිඳා බැස තිබුනු අතර එය සුළු මොහොතක් එලෙසින්ම සිරව තිබුනේය.

ඒ සුළු මොහොත නයිට්වරයාට ප්‍රමාණවත් විය. සෙර් ජෝරා තමා තුළ ඉතිරිව ඇති මුලු වෙර යොදා සිය දිගු අසිපත පහළට ගෙන ආයේය. එය සම් මස් ඇට කපා දමමින් ඇතුළට කිඳා බැස්සේ ක්වෝතෝ ගේ අත සහමුලින්ම පාහේ කැපී ගොස් කුඩා සම් හා නහරවැලකින් එල්ලා වැටෙන්නට විය. ඩොත්රැකියා ගේ කණ අසලින් වැදුනු නයිට්වරයා ගේ දෙවන පහර කෙතරම් බිහිසුණු එකක් වී ද යත් ක්වෝතෝ ගේ මුහුණ සුනුවිසුනුව ගියේය.

ඩොත්රැකියෝ කෑගසන්නට වන්හ. මිරී මාස් ඩූර් කූඩාරම තුළ සිට අමානුෂික ස්වරයකින් බෙරිහන් දෙමින් සිටියාය. මියයමින් සිටි ක්වාරෝ දියපොදක් ඉල්ලා අයැදින්නට විය. ඩැනී උදවු ඉල්ලා කෑ ගැසූ නමුදු කිසිවෙකුටත් ඇයව ඇසුනු බවක් නොපෙනින. රඛාරෝ හග්ගෝ සමගින් පොර වැටී සිටියේය. අරඛ් දෙක නටමින්, උඩ පනිමින් එකිනෙක හා ගැටුනු අතර අකුණක් පුපුරන්නාක් මෙන් ඉදිරියට ඇදුනු ජෝගෝගේ කසය හග්ගෝ ගේ ගෙල වටා සිරව ගියේය. ඔහු කසය ගස්සා ඇද්ද අතර සිය අරඛ් එක හා සමබරතාව අහිමිව ගිය රුධිරාරක්ෂකයා පා පැකිළ පසුපසට ඇද වැටුනේය. වියරුවෙන් කෑගසමින් ඉදිරියට පිනූ රඛාරෝ සිය අරඛ් එක දෑතින්ම අල්ලා හග්ගෝ ගේ හිස මතට ගෙන ආයේය. අසිපත් තුඩ රත් පැහැයෙන් දිදුලමින් ඔහුගේ දෙනෙත් මැදින් නළල තුළට කිඳා බැස්සේය. කිසිවෙකු ගල් පහරක් එල්ල කල අතර ආපසු හැරී බැලූ ඩැනී සිය දසරුව තුවාල වී ලේ ගලමින් තිබෙනු දුටුවාය. "එපා." ඇය වැලපුනාය. "එපා. අනේ එපා. නවත්තන්ට. ඒක හොඳටම වැඩියි. මේ මිල හොඳටම වැඩියි." තව තවත් ගල් පියාඹා එමින් තිබුනි. දණගාමින් කූඩාරම දෙසට යන්නට උත්සාහ කල නමුදු ඊළඟ මොහොතේ කොහොල්ලෝ ඇයව අල්ලාගත්තේ ය. ඇගේ කෙහෙවල්ලෙන් අල්ලාගත් ඔහු හිස පසුපසට නැමූ අතර

සිය උගුර මුල ඔහුගේ සීතල පිහිය ස්පර්ෂ වනු ඇයට දැනින. "මගේ දරුවා." ඇය කෑගැසුවාය. සමහරවිට දෙවිවරුන්ට ඇයව ඇසුනා වන්නට ඇත. මක්නිසාද යත් ඊළඟ මොහොතේ කොහොල්ලෝ මියගිය බැවිනි. අග්ගෝ ගේ දුන්නෙන් මිදුනු ඊයක් ඔහුගේ බාහුවට යටින් ඇතුළුව හදවත හා පෙනහල්ලක් පසා කරගෙන ගොස් තිබින.

* * *

අන්තිමේදී සිය හිස ඔසවාගන්නට තරම් ශක්තියක් ඇයට ලැබුනු විට පිරිස කෙමෙන් විසිර යන්නට පටන්ගෙන තිබුනු බැව් ඇය දුටුවාය. ඩොත්රකියෝ සෙමින් සෙමින් සිය කූඩාරම් හා නිදන පැදුරු වෙතට යමින් සිටියෝය. තවත් සමහරු සිය අසුන්ට සෑදල පළඳා පිටව යමින් සිටියෝය. හිරු බැස ගොස් තිබිනි. බලසාරය පුරා ගිනිමැල දැල්වී තිබිනි. ඒවායේ තැඹිලි පැහැ ගිනිදළු වියරුවෙන් මෙන් පට පට හඬින් පුපුරමින් ඉහළින් වූ ආකාශයට ගිනි පුලිඟු මුදාහලේය. ඇය නැගී සිටින්නට තැත් කලාය. එනමුදු ඇගේ සර්වාංගයම වෙලා ගත් අති මහත් වේදනාවක් යෝධයකු ගේ අත්මිටක් මෙන් ඇයව මිරිකන්නට විය. ඇගේ හුස්ම හිර වී ගිය අතර ආයාසයෙන් හුස්මක් ඇදගැනීම හැර කල හැකි අන් යමක් නොවීය. මිරී මාස් ඩූර්ගේ කෑගැසීම මේ වනවිට මළගෙයක ලතෝනියක් මෙන් ඇසෙන්නට විය. කූඩාරම තුළ සෙවනැලි වේගයෙන් එහාමෙහා නැටුවෝය.

ඇගේ ඉණ වටා අතක් ඇදී ගිය අතර ඊළඟ මොහොතේ සෙර් ජෝරා ඇයව දෙපයින් නැගිට්ටෙවුවේය. ඔහුගේ මුහුණ ලෙයින් පෙඟී ඇලෙමින් තිබුනු අතර ඔහුට එක් කණකින් අඩක් අහිමිව තිබෙනු ඇය දුටුවාය. නැවත වතාවක් සියොළඟම පෙලමින් වේදනාව පැතිර යද්දී ඇය ඔහුගේ දෑත් අතරට මැදිව ගැහෙන්නට වූවාය. නයිට්වරයා උදවු ඉල්ලා ඇගේ සේවිකාවන්ට කෑගසන හඬ ඇයට සිහිනයෙන් මෙන් ඇසුනි. 'උන් හැමෝම බයවෙලාද?' ඇය පිළිතුර දැන සිටියාය. වේදනාවේ තවත් වටයක් ඇරඹුනි. ඩැනීගේ මුවින් වේදනාත්මක කෑගැසීමක් පිටවිය. එය හරියටම ඇගේ පුත්‍රයා දැතින් පිහි දෙකක් රැගෙන පිටතට පැමිණීමට පාරක් කපනවාක් වැනි විය. "ඩෝරියා. උඹ යකාටම පලයං!" සෙර් ජෝරා ගුගුලේය. "මෙහාට වරෙන්. ගිහිල්ලා වින්නඹු ගෑනු එක්කරන් වරෙන්."

"උන් එන්නෙ නෑ. උන් කියන්නෙ එයාට ශාපයක් වැදිලා කියලා."

"උන් ආවෙ නැත්තං මම උන්ගෙ ඔළුගෙඩි ටික කපලා දානවා."

ඩෝරියා වැලපනාය. "උං ඔක්කොම යන්ට ගිහින් මගේ උතුමානනි."

"යක්දෙස්සි." කවුදෝ කීවේය. 'ඒ කවුද? අග්ගෝ ද?' "එයාව යක්දෙස්සි ගාවට අරන් යන්ට."

'එපා!' ඩැනීට පැවසීමට උවමනා විය. 'එපා එපා. ඒකනම් කරන්ට එපා. ඔබට ඒක කරන්ට බැහැ.' එනමුදු ඇය සිය මුව විවර කල විට වචන වෙනුවට දිගු වේදනාත්මක වැලපීමක් පමණක් එයින් පිටවිය. ඇගේ ගතේ දහදිය නැගෙන්නට විය. 'ඔවුන්ට මේ කුමක් වෙලාද? ඔවුන්ට එය නොපෙනේද?' කූඩාරම තුළ සෙවනැලි නටමින් සිටියෝය. ඒවා ගිනිකබල් හා නාන බාල්දිය වටා කරකැවෙමින් සුදු පැහැ සේද රෙද්දේ කළු පැහැ රටා මවමින් නටන්නට වූවෝය. මේ සමහරක් සෙවනැලි කිසිසේත්ම මිනිස් අනු රූ හා සමාන නොවීය. දැවැන්ත වෘකයකු ගේ ඡායාවක් ද, ගින්නෙන් වෙලී ගිය මිනිසකු ගේ රුවක් මෙන් වූ තවත් ඡායාවක් ද ඇය යාන්තමින් දුටුවාය.

"මේ බැටළු ගෑනි දන්නවා වින්නඹු කම් ගැන." ඉරී කීවාය. "ඒකිමයි කිවුවෙ. මම අහගෙනයි."

"ඔවු." ඩෝරියා එකඟවූවාය. "මමත් අහගෙනයි."

'එපා!' ඇය කෑගැසුවාය. එසේත් නැතිනම් එසේ කෑගැසුවායැයි සිතුවාය. මක්නිසාද යත් ඇගේ දෙතොලින් කිසිදු හඬක් පිටනොවූ බැවිනි. ඇයව ඔසවා ගැනුනි. ඇගේ දෙනෙත් ඉහළින් වූ කළු පැහැ, මුඩු, තරු රහිත ආකාශය දෙසට යොමුවූයේය. 'එපා. අනේ එපා.' මිරී මාස් ඩූර්ගේ හඬ වඩ වඩාත් උස්ව නැගෙන්නට විය. අන්තිමේදී එයින් ඇගේ මුලුමහත් ලෝකයම පිරී යන්නාක් මෙන් දැනුනි. 'හෙවනැලි!' ඇය කෑගැසුවාය. 'නැට්ටුවො!'

සෙර් ජෝරා ඇයව ඔසවාගෙන කූඩාරම තුළට පිවිසියේය.

**Daenerys Targaryen: “I will not let him die...”**

**Ser Jorah Mormont: “Khaleesi or queen, that command is beyond your power.”**

ආර්යා 05-1

බේකරි වීථියේ වූ වෙළෙඳසල් වලින් හමා ආ උණු පාන් වලින් නැගුනු සුගන්ධය ආර්යා මෙතෙක් කලක් විඳ ඇති සියලු සුවඳ විලවුන් සුගන්ධයන් පැරදීය . ඇය ගැඹුරු හුස්මක් ගෙන පරෙවියා දෙසට ලංවූවාය. ඌ දුඹුරු තිත් වැටුණු මහත එකෙක් විය. පාරේ වටකුරු ගල් දෙකක් අතර වැටී තිබූ පාන් වාටියකට කොටමින් සිටි පරෙවියා ආර්යාගේ සෙවනැල්ල ඌ මත වැටුනු විගස අහසට නැගී ගියේය.

ඇගේ ලී අසිපත වාතලය කපා ගෙන ගොස් පොළොවට අඩි දෙකක් ඉහළින් පියාඹමින් සිටි පරෙවියා මත පතිත වූ අතර දුඹුරු පිහාටු වැස්සක් මෙන් ඌ පොළොව සිප ගත්තේය. ඇසිපිය ගසන පමාවෙන් ඌ මතට පිනූ ආර්යා ඇඹරෙමින් දඟලන පරෙවියා අල්ලා ගත්තාය. ඌ ඇගේ අතට කෙටුවේය. එනමුදු උගේ ගෙලින් අල්ලාගත් ඇය ඇටකටු බිඳෙන හඬ ඇසෙන තුරු එය අඹරවා දැමුවාය. බළලුන් හා සසඳන විට පරෙවියන් අල්ලා ගැනීම ඉතා පහසු කටයුත්තක් විය.

ඇයව පසුකර යමින් සිටි සප්තක පූජකවරයෙක් මේ ක්‍රියාව දෙස නොරිස්සුමෙන් මෙන් බලා සිටියේය. "මෙතැන තමා පරෙවියෝ අල්ලන්ට හොඳම තැන." දූහුවිලි පිසදාගෙන සිය ලී අසිපත ඇහිඳගන්නා අතර ඇය ඔහුට කීවාය. "උන් මේ පාන් වාටි කන්ට එන්නේ." ඔහු වහා එතැනින් ඉවත්ව ගියේය.

පරෙවියාව බඳපටියේ අමුනාගත් ඇය මාවත පහළට ගමන් කලාය . මිනිසෙකු රසකැවිලි පිරවූ අත් කරත්තයක් තල්ලු කරමින් ඇය ඉදිරියට ආ අතර ඉන් ප්‍රණීත බ්ලුබෙරි, ලෙමන් සහ ඇප්‍රිකොට් සුවඳ හමා එන්නට විය. ඇගේ උදරය ගෙරවිලි හඬක් නැංවීය. "අනේ මටත් එකක් දෙනවද?" සිය මුවින් පිටවෙනු ඇයටම ඇසුනි. "ලෙමන් එකක් හරි... මොනවා හරි එකක්."

කරත්තකරු ඇගේ කේශාන්තයේ සිට පාදාන්තයට බැල්මක් හෙලුවේය. පැහැදිලිවම ඔහු ඇගේ දර්ශනයට කැමති වූයේ නැත."තඹ කාසි තුනයි."

ආර්යා ඇගේ ලී කඩුවෙන් සිය බූට්ස් සපත්තුවලට තට්ටු කලාය . "මම මේ තඩි පරෙවියා ඔබට දෙන්නම්."

"උඹේ පරෙවියා ගිහින් දීපන් අනික් එවුන්ට." කරත්තකරු පැවසීය.

රසකැවිලි මේ දැන් උඳුනෙන් බෑවාක් මෙන් උණුසුම් විය. ඒවායේ සුවඳ කටට කෙල උනවනසුළු විය. නමුත් ඈ සතුව තඹ කාසි තුනක් තබා එකක් වත් නොමැත. ඇය කරත්තකරු දෙස බැල්මක් හෙලුවාය. 'දැකීම' ගැන සිරියෝ කියාදුන් පාඩම් ඇගේ සිතට නැගුනි. කරත්තකරු මිටි අයෙකු විය. ඔහුට කූඩා, රවුම් බඩ ගෙඩියක් තිබූ අතර වම් කකුලට බරදී ඇවිද්දේය. රසකැවිල්ලක් රැගෙන දිවුවොත් ඔහුට කිසිදිනෙක ඇයව අල්ලනු බැරි වනු ඇතැයි ඇය සිතුවාය. "උඹේ ඔය ජරා අත් අහකට ගනිං. රන්කබාකාරයෝ දන්නවා කොහොමද උඹ වගේ හොර හිඟන්නියන් එක්ක ගනුදෙනු කරන්නෙ කියලා." එවිටම ඔහු පැවසීය.

ඔහුගේ වචන ඇසුනු ඇයට ඉබේම පසුපස බැලුනි . නගරාරක්ෂකයින් දෙදෙනෙක් පටුමගක මුවවිටෙහි සිටගෙන සිටියහ. පොළොවේ ගෑවෙන තරම් දිගු වූ ඔවුන් පැළැඳ සිටි ඝන ලොම් සළු තද රන් පැහැයෙන් වර්ණ ගන්වා තිබුනි. ඔවුන්ගේ මුදු දම්වැල් සන්නාහ, බූට්ස් සපත්තු හා අත්වැසුම් සියල්ලම කාලවර්ණ විය. එකෙකු ගේ ඉණෙහි දිගු අසිපතක් ද අනෙකා සතුව යකඩ මුගුරක් ද විය. රසකැවිලි දෙස අවසන්වරට දුක්බර බැල්මක් හෙලූ ආර්යා කරත්තයෙන් හෙමිහිට ඈත්වූවාය. රන්කබාකරුවන් ඇය වෙත කිසිදු සැලකිල්ලක් දැක්වූයේ නොමැති නමුදු ඔවුන් දකින හැමවිටම ඇයට දැනුනේ බඩ කොරවෙන්නාක් මෙනි. බලකොටුවෙන් හැකි තරම් ඈත්ව සිටීමට ආර්යා සැමවිටම උත්සාහ කලද උස්, රතු ප්‍රාකාරය මත කුණුවෙමින් තිබුණු හිස් ඉතා ඈතට පවා පැහැදිලිව දර්ශනය විය. මේ සෑම හිසක් වටාම කපුටන් ඇහිරුනේ මැසි රංචුවක් මෙනි. රන්කබාකරුවන් ලැනිස්ටර් පිලට එක්ව ඇති බවත්, ඔවුන්ගේ අණදෙන්නාට ගංගා ත්‍රිශූලයේ නින්දගම් සහ රජුගේ මන්ත්‍රණ සභාවේ අසුනක් ද සමගින් වංශාධිපතිකමක් ලැබී ඇති බව ෆ්ලී බොටම් මුඩුක්කුවේ පැතිර ගිය කට කතා වලින් කියැවුනි.

ඇයට වෙනත් බියකරු දේවල්ද ඇසිනි. එනමුදු මේ බොහෝ දේ ඇයට තේරුම්ගත නොහැකි විය. සමහරකින් කියැවුනේ ඇගේ පියා විසින් රොබට් රජුව මරා දමන ලද බවය. ඉන් කෝප වූ රෙන්ලිගේ පහරකින් ඔහුද මියගොස් ඇත. අනෙකෙකු තරයේ පැවසුවේ බීමත් සොයුරන් අතර සිදුවූ කලහයකදී රෙන්ලි විසින් රොබට්ව මරා දැමූ බවයි. නිකන්ම

නිකන් හොරෙකු ලෙස නගරයෙන් පලා යාමට රෙන්ලි හට වෙනත් හේතුවක් තිබුනේදැයි ඔවුහු ප්‍රශ්න කලහ. තවත් කතාවකින් කියැවුනේ රජු වල්ඌරු දඩයමේ ගොස් සිටින විට ඌරකු ඇනීමෙන් මියගිය බවකි. තවත් එකකින් කියවුනේ ඔහු වල්ඌරෙකු අනුභව කරමින් සිටියදී බඩ පිපිරෙන තුරුම ඌරු මස් ගිලදැමීම නිසා ඔහු මියගොස් ඇති බවකි. නැත. වාරිස් මකුළුවා ඔහුට වස දී ඇත. නැත, වස දුන්නේ රැජිනයි. නැත, ඔහු මැරුනේ වසංගත ලෙඩක් නිසාය. නැත නැත, මාළු කටුවක් හිරකරගෙනය.

එනමුදු මේ සැම ඕපාදූපයකින්ම කියැවුනු එක් දෙයක් විය. රොබර්ට් රජතුමා මියගොස් ඇත. එක් දිනක් සහ එක් රැයක් පුරාවට හැඬවුනු, ආශිර්වාද ලත් බේලර් ගේ සප්තකයේ කුළුණු හතේ වූ සන්ටාවන් විසින් සිය ලෝකඩමය හෙණහඬ මගින් නගරය පුරා මේ ශෝකාතුර පණිවුඩය ගෙන ගියේය. එවැන්නක් හඬවන්නේ රජෙකුගේ මරණයකදී පමණක් බව සම් පදම් කරන්නකුගේ කොලුවකු ආර්යාට කියා දුන්නේය.

* * *

ඇයට උවමනා වූ එකම දෙයනම් ගෙදර යෑම පමණි. නමුත් කිංග්ස් ලැන්ඩින්ග්වලින් පිටතට පැන ගැනීම ඇය බලාපොරොත්තුවූ තරම් පහසු නොවීය. සියල්ලන්ම කතා කලේ යුද්ධය ගැන විය. නගර ප්‍රාකාරවල රන් කබාකරුවන් පිරී සිටියේ ඇගේ සිරුරේ මැක්කන් පිරී සිටින්නාක් මෙනි. ෆ්ලී බොටම්හි වැතිර නිදාගැනීමට හැකියාවක් ඇති කවර හෝ තැනක - වහලයන් මත සහ ඉස්තාලවල - නිදන්නට ඇය පුරුදුව සිටියාය. 'ෆ්ලී බොටම්' යන නම නිකමට වැටුනු එකක් නොවන බවත්, එම දිස්ත්‍රික්කයට ගැලපෙනම නම තබා ඇති බවත් ඇයට වැඩිකල් නොගොස්ම තේරුම් ගියේය.

රතු බලකොටුවෙන් පැනගත් දින පටන් වූ සැම දිනෙකම ආර්යා නගරයේ දොරටු හත වෙතම මාරුවෙන් මාරුවට ගියාය. පැරණි දොරටුව, සිංහ දොරටුව සහ මකර දොරටුව වසා යතුරු ලා අවහිර කර තිබුනි. මඩ දොරටුව සහ දෙවියන්ගේ දොරටුව විවරව තිබුනද ඇතුළුවන්නන්ට පමණක් විවරව තිබූ ඒවායින් නගරයෙන් පිට විය නොහැකි විය. නගරයෙන් පිටවීමට අවසර ලද්දන් පිට වූයේ යකඩ දොරටුවෙන් හෝ රජ දොරටුවෙනි. එනමුදු සිංහ හිස් ශිරස්ක සහ ලේ රතුවන් ලෝගු පළඳි ලැනිස්ටර් සෙබළු එම දොරටු මුර කරමින් සිටියහ. රජ දොරටුව අසල පිහිටි තානායමක වහලය මත සැඟවීගෙන දොරටුව දෙස විමසිල්ලෙන් බලා සිටි ආර්යා දුටුවේ ඔවුන් සියලු පදිකයින්ගෙන් තරයේ ප්‍රශ්න

කරන බවය. සියලු කරත්ත පරීක්ෂා කල ඔවුහු අසරුවන් ගේ සෑදල මලු විවර පවා කර පෙන්වන්නයි බල කලහ.

නදියේ පිහිනා එගොඩ වීම ගැන වරෙක ඇය කල්පනා කලද කළුදියදහර වනාහි දරුණු දියසුළි සහිත පුළුල්, ගැඹුරු එකක් බව කවුරුත් කීවෝය. ඔරුකරුවකුට දීමට හෝ නැව් ගාස්තු ගෙවීමට හෝ ඇය ලඟ මුදල් නොතිබුනි.

කිසිදා සොරකම් නොකරන්නැයි ඇගේ පියා ඇයට කියා දී ඇති නමුදු ඒ මන්දැයි ඇයට අමතක වෙමින් පැවතුනි. ඉක්මනින්ම මෙයින් පැන ගැනීමට නොහැකි වුවහොත් රන්කබාකරුවන්ට මුහුණ දීමට  ඇයට සිදුවනු ඇත. ලී කඩුවෙන් පරෙවියන් දඩයම් කිරීම උගත් දා සිට ඇය එතරම් සාගින්නෙන් නොපෙළුනද සෑම දිනෙකම පරෙවියන් බුදීමෙන් ලෙඩවේදෝයි ඇයට බියක් සිතුනි. ෆ්ලී බොටම් වෙත එන්නට පෙර ඇය පරෙවියන් කීපදෙනෙකු අමුවෙන්ම කා දමා තිබුනි.

ෆ්ලී බොටම් හි වසර ගණනක් එකදිගට ඉදෙන ඉස්ටු කල්දේරම් සහිත එළිමහන් මුළුතැන්ගෙවල් තිබුණු අතර ඇගේ පරෙවියා ගේ බාගයකට ඊයේ දිනයේ පාන් කාලක් සමගින් දුඹුරුවන් හොදි බඳුනක් ලබාගත හැකි විය. පිහාටු ගලවා දෙන්නේ නම් පරෙවියා ගේ ඉතුරු අඩ ගින්නට දමා පුළුස්සා දීමට වුවද ඔවුහු එකඟ වූහ. කිරි කෝප්පයක් සහ ලෙමන් කේක් කැබැල්ලක් වෙනුවෙන් ආර්යා ඕනෑම දෙයක් කිරීමට පෙළඹෙනු ඇති නමුදු දුඹුරු ඉස්ටුව එතරම්ම නරක නොවීය. මතුපිට පාවෙන තෙල් තට්ටුවකින් යුතු වුවද එහි සෑමවිටම බාර්ලි තිබුනි. කැරට් කැබැල්ලක් හෝ ළූණු හෝ ටර්නිප් ද සමහර විටෙක ඇපල් කැබැල්ලක් පවා එහි තිබී හමුවේ. මස් ගැන නොසිතා සිටීමට ඇය යත්න දැරූ අතර වරෙක එහි තිබී ඇයට මාළු කැබැල්ලක් හමු විය.

එකම ප්‍රශ්නය වූයේ මෙම මුළුතැන් ගෙවල් කිසිවිටෙකත් හිස් නොවීමයි. හැකි උපරිම වේගයෙන් ආහාර ගිල දමමින් සිටියදී පවා ඔවුන් තමා දෙස බලා සිටිනු ඇයට දනුනි. සමහරු ඇගේ බූට්ස් සපත්තු දෙස හෝ කබාය දෙස හෝ බලා සිටි අතර ඔවුන් සිතන්නේ කුමක්දැයි ඇය දැන සිටියාය. එනමුදු තවත් සමහරුන්ගේ දෑස් ඇයගේ සමින් කල ඇඳුම් යට දුවනු ඇයට දැනුනි. ඔවුන් සිතන්නේ කුමක්දැයි ඇයට නොවැටහුනු අතර එය ඇයව වඩාත්ම බියපත් කලේය. කිහිප වරක්ම මුඩුක්කු මංමාවත් වලදී ඇයව ලුහුබඳීමට ලක්විය. එහෙත් තවම කිසිවෙකුට ඇයව අල්ලා ගැනීමට නොහැකි විය.

බලකොටුවෙන් පිටත ගත කල පළමු රාත්‍රියේ, ඌරු පටුමගේ වූ දැවී ගිය නිවෙසක නිදා සිටින අතරේ, ඇය විකිණීමට බලාපොරොත්තුවෙන් සිටි රිදී පළඳනාව සහ ඇගේ හොඳ ඇඳුම් පොට්ටනිය සොරකම් කර තිබුනි. ඔවුන් ඇයට ඉතුරුකර ගිය එකම දෙය වූයේ ඈ පොරවාගෙන සිටි සළුවත්, හැඳ සිටි ඇඳුමුත්, ලී අසිපත සහ... ඉඳිකට්ටත් පමණි. අන් සියල්ලටම වඩා වටිනාකමින් වැඩි එය මත ඇය නිදා නොසිටියා නම් එයද ඇයට අහිමි වන්නට ඉඩ තිබුනි. ඉණ පැළැඳි අසිපත වසන්වනු පිණිස දකුණත වැසෙන්නට සළුව දමාගෙන යාමට ඇය පුරුදුව සිටියාය. සොරුන් බිය කරනු පිණිස සියල්ලන්ටම පෙනෙන පරිදි වමතින් ලී අසිපත රැගෙන යාමට ඇය පුරුදුව සිටියද, මුළුතැන්ගෙවල සිටි සමහර මිනිසුන් ගෙන් ගැලවීමට නම් ඇයට යුධ පොරොවක් තිබුනද මදි වනු නොඅනුමානය. ඔවුන්ගේ කරදරය නිසාම පරණ පාන් සහ පරෙවි මස් අනුභව කිරීම මේ වනවිට ඇයට එපා වෙමින් තිබුනි. බොහෝවිට, මිනිසුන්ගේ බැල්මෙන් ගැලවෙනු උදෙසා කෑම අමතක කර කුසගින්නේම නිදා ගැනීමට ඇය පුරුදුව සිටියාය.

නගරයෙන් පැනගත් පසුව වනවදුලු වල ඇති බෙරි කඩන්නට හෝ පළතුරු වතුවලට පැන චෙරි හා ඇපල් සොරකම් කිරීමට ඇයට හැකිවනු ඇත. රජ මාවතේ දකුණට පැමිණි ගමනේදී එවැනි පළතුරු වතු දුටු බව ඇයට මතක තිබුනි. වනයේ අල සහ මුල් සොයා ගැනීමටත් සමහර විට සාවෙකු අල්ලාගැනීමටත් හැකි වනු ඇත. මීයන්, බළලුන් සහ නකුටු බල්ලන් හැර වෙන කිසිදු හැකි සතෙකු මේ ජරා නගරයේ නොවීය. බලු පැටවුන් රංචුවක් වෙනුවෙන් මුළුතැන්ගෙවලින් තඹ කාසි අහුරක්ම ලබා ගැනීමට හැකියැයි අසා තිබුනද ඒ පිළිබඳව සිතන්නට පවා ඇය නොකැමති වූවාය.

* * *

බේකරි වීථිය පසු කර යනවිට හරස් මං සහ පටු මං වලින් සුසැදී වංකගිරියක් බඳු කොටසක් හමු වේ. රන්කබාකරුවන්ගෙන් හැකිතරම් ඈතින් සිටීමට ඉටාගත් ආර්යා මෙම කොටසේ මිනිසුන් අතරින් තෙරපෙමින් ඇඹරෙමින් ඉදිරියට ඇදුනාය. මාවත මැද ගමන් කිරීමට මේ වන විට ඇය ඉගෙනගෙන උන්නාය. කරත්ත සහ අසුන් මග හැරීමට සිදුවීම කරදරයක් වුවද ඒවා දුර ඈත තියා හඳුනා ගතහැක. ගොඩනැගිලි ආසන්නයෙන් ගමන් කළහොත් මිනිසුන් ඔබව අල්වාගන්නේ ය. එනමුදු සමහර පටු මං කෙතරම් පටු වීද යත් එක ළඟින් තනා තිබු ගොඩනැගිලි පසුකර යන විට ඒවායේ ගෑවී යෑමට සිදුවන්නේය.

පෙරලෙන රෝද පට්ටමක් පසුපස හඬ දෙමින් දුව පනින ළමුන් පිරිසක් ඇයව පසු කලෝය. මේ දසුනින් බ්‍රැන්, ජොන් සහ කුඩා රිකන් සමගින් සෙල්ලම් කල කාලය මතක් වූ බැවින් ඇය ඔවුන් දෙස නොරිස්සුම් බැල්මක් හෙලුවාය. රිකන් කෙතරම් ලොකු මහත් වී ඇතිද. බ්‍රැන් තවමත් දුකින් සිටිනු ඇතිද. "පුංචි නංගි." කියා ඇගේ හිසකෙස් අවුල් කරන්නට ජොන් මෙහි ඇත්නම් කෙතරම් අගනේද. ලඟකදී දිය කඩිත්තක දුටු ඇගේ ප්‍රතිබිම්බය අනුව නම් ඇගේ හිසකෙස්වල තවදුරටත් අමුතුවෙන් අවුල් කරන්නට දෙයක් නොවීය.

පාරේදී දුටු ළමුන් හා කතා කිරීමට ඈ උත්සාහ දරා තිබුනි. නිදාගැනීමට තැනක් සොයාදෙන යහළුවෙකු සාදාගැනීම ඇගේ බලාපොරොත්තුව විය. එහෙත් ඇය වැරැදියට කතා කලා වන්නට ඇත. කුඩා උන් ඉක්මන්, බියපත් දෑසින් ඈ දෙස බලා, ඇය ලංවෙනවිට ඉවතට දිව ගියෝය. ඔවුන්ගේ වැඩිමල් සොයුරු සොයුරියෝ ආර්යාට පිළිතුරු දිය නොහැකි අන්දමේ ප්‍රශ්න ඇසූහ; ඇයට නොයෙක් නම් කීහ; ඇගෙන් සොරකම් කිරීමට උත්සාහ කලහ. ඊයේ දිනයේ ඇය මෙන් දෙගුණයක් වයසැති, නිරුවත් දෙපයින් යුතු කෙල්ලක් ඇයට පහර දී බිම දමා, ඇගේ බූට්ස් දෙක උදුරා ගැනීමට උත්සාහ කලාය. ආර්යා ගේ ලී අසිපතින් කණ හරහා වැදුනු තද පහරින් පසු ඇය හඬමින්, ලේ පෙරමින් ඉවත දිව ගියාය.

කන්ද බැසගෙන ෆ්ලී බොටම් කරා යන ඇගේ හිසට උඩින් මුහුදු ලිහිණියෙක් නිදහසේ පියාසර කලේය. ආර්යා ඒ දෙස විමසිලිමත්ව බැලූ නමුදු ඌ ලී අසිපතේ පහරවදින මායිමෙන් දුරස්ව සිටියේය. ලිහිණියා ඇයට මුහුද සිහි ගැන්වීය. සමහරවිට ඇයට පැනගැනීමට ඇති මාර්ගය එය විය හැක. වෙළෙඳ නැවුවලට හොරෙන් රිංගා ගොස්, විවිධ ත්‍රාසජනක අත්දැකීම් ලබන කුඩා කොල්ලන් ගැන කතන්දර කියන්නට නෑකි ආයම්මා පුරුදුව සිටියාය. සමහරවිට ආර්යාට ද එසේ කල හැකිවනු ඇත. ගංඉවුර බලා යාමට ඇය තීරණය කලාය. එය මඩ ගේට්ටුවට යන අතරමග එය පිහිටා තිබුනු අතර අද දිනයේ තවමත් ඇය එහි ගොස් නොතිබින.

වාප්පු අද අසාමාන්‍ය ලෙස නිහඬ විය. මාළු වෙළෙඳපල තුළින් යන විට තවත් රන්කබාකරුවන් දෙදෙනෙකු ඇය සිටි දෙසට ඇවිද ආ නමුදු ඔවුහු ආර්යා දෙස බැල්මක් හෝ නොහෙලූහ. වෙළෙඳසල් බාගෙට බාගයක්ම වසා දමා තිබුනි. වෙනදාට වඩා වරායේ නැවු ද අඩුබව ඇයට හැඟුනි. ගංදිය විනිවිද යන, රන්වන් බඳින් සහ ලෙලදෙන හබලින් යුතු, රජුගේ යුධ නෞකා තුනක් කළුදියදහර දිගේ තේජස්වී ලෙස යාත්‍රා කරමින් සිටියෝය. ඒ දෙස මොහොතක් බලාසිටි ආර්යා ගං ඉවුර ඔස්සේ ඇවිදීමට පටන් ගත්තාය.

සුදු පට රෙද්දෙන් පෝරු ඇල්ලූ අළුවන් ලොම් සළු පැළැඳ, තෙවැනි ජැටිය මත සිටි ආරක්ෂකයන් දුටු විට ඇගේ හද ප්‍රීතියෙන් පිනා ගියේය. වින්ටෙර්ෆෙල්හි වර්ණයන් ඇගේ දෙනෙතට කඳුළු නැංවීය. කදිම මටසිලුටු පෙනුමක් සහිත හබල් පේළි තුනක් සහිත නැවක් ඔවුන්ට පිටුපසින් දිය මත පැද්දෙමින් තිබුනි. ම(ර්)රිෂ් හෝ බ්‍රාවොසි හෝ ශුද්ධ වැලීරියන් වලින් නැවූ බඳ මත ලියා තිබුනු නම ආර්යාට කියවා ගත නොහැකි විය. ඇය තමා පසුකර යමින් සිටි හබල්කරුවෙකුගේ කබා අතින් ඇද්දේය. "අනේ, මේ නැව මොකක්ද?" ඇය ඔහුගෙන් විමසුවාය.

"ම(ර්) වල ඉඳන් ආපු වින්ඩ් විච්."

"ඒක තාමත් මෙතන!" ආර්යාට කියැවුනි. ඇය දෙස අමුතු බැල්මක් හෙලූ හබල්කරු දෙවුර ගස්සා ඉවත ගියේය. ආර්යා ජැටිය දෙසට දිව ගියාය. ඔවුන්ව ගෙදර රැගෙන යනු පිණිස පියා විසින් කුලියට ගත් නෞකාව වින්ඩ් විච් විය... එය තවමත් ඔවුන් වෙනුවෙන් බලා සිටියි. එය මීට බොහෝ කලෙකට පෙරම පිටව ගොස් ඇති බව ඇය සිතාගෙන සිටියාය.

ආරක්ෂකයන් දෙදෙනෙක් දූ කෙලින අතර තෙවැන්නා සිය අසිපතේ මිටට අත තබාගෙන විමසිල්ලෙන් මුර සංචාරය කරමින් සිටියේය. කුඩා දරුවකු මෙන් ඔවුන් ඉදිරියේ ඇඬීමට ලැජ්ජා වූ ඇය සිය දෑස් පිසදා ගැනීමට නතර වූවාය. ඇගේ දෑස්, ඇගේ දෑස්, ඇගේ දෑස්. ඇයි...

'ඔබේ දෑසින් බලන්ට.' සිරියෝගේ කෙඳිරුම් හඬ ඇයට ඇසුනි.

ආර්යා බැලුවාය. ඇය සිය පියාගේ සෙබළුන් සියල්ලන්ම හොඳින් දැන සිටියාය. එනමුදු අළුවන් සළුවෙන් සැරසුනු මේ තිදෙනා ආගන්තුකයන් වූහ. "ඒයි උඹ. උඹ මොකද ඔතන කැරකෙන්නෙ කොල්ලෝ?" ඇවිදිමින් සිටි මිනිසා ප්‍රශ්න කලේය. අනිත් දෙදෙනා දාදු කැට වෙත වූ අවධානය ඇය වෙත යොමු කලහ.

මෙතැනින් පැන දිවීමට සිතුනද ආර්යා ඉන් වැලකුනේ එසේ කලහොත් ඔවුන් තමා ලුහුබැඳ එන බව හොඳින් දැන සිටි බැවිනි. එබැවින් සිතට දිරි වඩාගත් ඇය ඔවුන් වෙතට තවත් ලංවූවාය. ඔවුන් සොයමින් සිටියේ කෙල්ලකි. එහෙත් ඔවුන් සිතන්නේ තමා කොල්ලෙකු යැයි කියාය. එසේ නම් තමා කොල්ලෙකු උනාවේ. ඈ ඔවුන් වෙත මළ කුරුල්ලා පෙන්වූවාය. "පරෙයියෙක් ගන්නවද?" ඇය විමසුවාය.

"පල යන්ට මෙතනින්!" ආරක්ෂකයා සැර විය.

ආර්යා කී දේ කලාය. බිය වූ බවක් රහපා පෙන්වීමට අවශ්‍ය නොවීය. ඇය සැබැවින්ම බියපත් වී සිටියාය. ඇයට පසුපසින් දූ කෙලිය නැවතත් ඇරඹින.

තමා නැවත ෆ්ලී බොටම් වෙත පැමිණියේ කෙසේදැයි ඇය නොදත්තාය. එනමුදු කඳුගැට දෙක අතර වූ, අපිළිවෙල පටු මගින් පිරුනු එහි ලඟාවන විට ඇය හතිලමින් සිටියාය. එහි වූයේ එයටම ආවේනිකවූ දුර්ගන්ධයකි. ඌරු කොටු, ඉස්තාල සහ හම් මඩුවලින් නැගුනු දුර්ගන්ධය, ලාබ ගණිකා මඩම් සහ තැබෑරුම් වලින් නැගුනු ඇඹුල් ගඳ සමගින් මුසු වූයේය. ආර්යා අරමුණක් රහිතව මාවත් ඔස්සේ ඔහේ ඇවිද්දාය. මුළුතැන්ගෙයක දොරින් එළියට එන දුඹුරු හොද්දෙහි සුවඳ දැනෙන්දී සිය පරෙවියා තමා වෙත නොමැති බව ඇයට වැටහුනි. ඇය දුවද්දී එය ඉණ පටියෙන් ලිස්සා වැටෙන්නට ඇත. නැතිනම් යම් කිසිවෙකු ඇයට නොදැනෙන්නට එය සොරා ගන්නට ඇත. මොහොතකට ඇයට හැඬුම් යන්නට ආවේය. එවැනි තර පක්ෂියෙකු සොයා ගැනීමට නම්, නැවත බේකරි වීථියට යාමට සිදු වනු ඇත.

ඊළඟ මොහොතේ නගරයේ ඈත කොහේ හෝ තැනකින් ඝන්ටා නාදවන හඬ ඇසෙන්නට පටන් ගත්තේය.

**Joffrey Baratheon: “So long as I am your king, treason shall never go unpunished.”**

මෙවර මේ සන්ටානාදයෙන් කියැවෙන්නේ කුමක්දැයි විමසිලිමත්වෙමින්, ආර්යා හිස ඔසවා ඇහුම්කන් දුන්නාය.

"ඒ ගමන මොකක්ද?" මුලුතැන්ගෙයක සිටි සිටි මහත මිනිසෙක් කෑ ගැසුවේය.

"දෙයියො අනුකම්පා කරන්ට. ආයෙමත් ගාන්ටාර ගහනවා." මැහැල්ලක් අඳෝනා නැගුවාය.

වර්ණවත් සේද රෙදි කඩක් හැඳ සිටි, රතු කෙසින් යුතු ගණිකාවක් දෙවන තට්ටුවේ වූ ජනේලයක් විවර කරමින් පෙනී සිටියාය. "ඒ ගමන පොඩි රජා මැරිලද?" වීථිය දෙසට නැඹුරුවෙමින් ඇය විමසුවාය. "ඔහොම තමා පොඩි කොල්ලෝ. වැඩිය අල්ලා හිටින්නේ නෑ." ඇය සිනාසෙන අතර නිරුවතින් සිටි මිනිසෙක් ඇයට පිටුපසින් දෑත් යවා, ඇයව බදා, ඇගේ ගෙල සපන්නටත්, ඇඳුමට යටින් එල්ලෙමින් තිබූ ඇගේ මහත, සුදු, පියයුරු මිරිකන්නටත් පටන් ගත්තේය.

"මෝඩ වේසි!" මහත මිනිසා ඉහළ බලා පිළිතුරු දුන්නේය. "රජ්ජුරුවෝ මැරිලා නෑ. ඕක කැඳවීම් ගන්ටාවක් විතරයි. ඇහෙන්නේ නැද්ද එක කුළුණයි සද්ද කරන්නේ. රජ්ජුරුවෝ මැරුනා නං නගරයේ තියන හැම ගන්ටාවම ගහනවා නෙව."

"ඒයි, ඔය හපන එක නවත්තපන්. නැත්තං මම උඹේ ගන්ටාරේ ගහනවා." ඇය තමා පිටුපසින් සිටි මිනිසාට වැලමිටෙන් වැලමිටෙන් ඇන්නාය. "රජා නැත්තම් කවුද මැරුනෙ?"

"ඒක කැඳවීමක් විතරයි." මහත මිනිසා නැවත කීවේය.

ආර්යා ගේ වයසෙහිම වූ කොලුවන් දෙදෙනෙක් මඩ කඩිත්තක් කලතමින් ඇය පසුකර දිව ගියහ. මැහැල්ල ඔවුනට ශාප කලද ඉන් ඔවුන්ගේ වේගය අඩු වුයේ නැත. අනෙකුන්ද ශබ්දය ආ දෙසට ගමන් කරමින් සිටියේ මේ කුමක්දැයි දැනගනු පිණිස විය. අඩු

වේගයකින් දිවූ කොලුවා පසුපස ආර්යා දිවගියාය. "කොහෙද මේ දුවන්නේ?" ඔහුට ලංවූ ඇය කෑගසා ඇසුවාය. "මොකක්ද වෙන්ට යන්නේ?"

වේගය අඩු නොකරම ඔහු ඇය වෙත හැරුනි. "රන්කබාකාරයෝ එයාව සප්තකයට අරන් යනවා."

"කාවද?" වේගයෙන් දුවමින් ඇය කෑගැවාය.

"හස්තය! බූ කියනවා උන් එයාගේ හිස ගසා දාන්ටලු යන්නේ."

කලින් ගමන් කල කරත්තයක් විසින් වීථියෙහි ගැඹුරු ඇගිලියක් සාදා තිබුනි. කොලුවා එයට උඩින් පිනු නමුදු ආර්යා එය නොදුටුවාය. ඇය පය පැකිලී මුනින් අතට බිම ඇදවැටුනේ ගලක වැදුනු දණහිස සීරී ගියේය; පොළොවේ හැපුනු ඇඟිලි තැලී ගියේය. ඉදිකටුව දෙපා අතර පැටලුනි. ඇය ඉකි ගසමින් දණින් නැගිටගත්තාය. ඇගේ වමතේ මහපටැඟිල්ල ලෙයින් වැකී තිබුනි. එය කටේ දමා උරන අතර එහි නියපොත්ත දෙකඩ වී කොටසක් හැලී ගොස් ඇති බව පෙනුනි. ඇගේ දෑත් පුපුරු ගැසූ අතර දණහිස ලෙයින් පෙඟී ගොස් තිබුනි.

"ඉඩ දීපල්ලා!" යමෙකු හරස් පාරේ සිට මුර ගෑවේය. "මගේ රෙඩ්වින් උතුමන්ට ඉඩ දීපල්ලා!" සෙබළුන් සිවුදෙනෙකු දරා පිම්මේ ආ දැවැන්ත අසුන් සිවුදෙනෙකුට යටනොවී යන්තම් පාරෙන් ඉවතට පැන ගැනීමට ආර්යාට හැකි විය. ඔවුහු නිල් සහ රතු පැහැ කොටු වැටුනු සළු පැළැඳ සිටියහ. සර්වප්‍රකාරයෙන්ම එකිනෙකාට සමාන වූ තරුණ වංශාධිපතීන් යුගලක් එක සමාන වූ චෙස්නට් පැහැ වෙළඹුන් දෙදෙනෙකු පිට නැගී ඔවුන් පසුපස ගමන් කලහ. ආර්යා ඔවුන් දෙදෙනාව සියවරක් පමණවත් අංගනයේදී දැක තිබුනි. රෙඩ්වින් නිවුන්නු හෙවත් සෙර් හොරාස් සහ සෙර් හොබර් වනාහි තැඹිලි පැහැ හිසකෙසින් හා දුඹුරු ලප සහිත සතරැස් මුහුණින් යුතු චාම් තරුණයන් දෙදෙනෙකු වූහ. සන්සා සහ ජේන් පූල් ඔවුන් දුටු හැමවිටම කෙකර ගෑවෝය. ඔවුන්ට සමච්චලයට කීවේ සෙර් හොරර් හෙවත් 'සන්ත්‍රාසය' සහ සෙර් ස්ලොබර් හෙවත් 'කෙල හලන හොබර්' යනුවෙනි. දැන්නම් ඔවුන් දෙපල විහිළුවක් ලෙසින් පෙනුනේ නැත.

* * *

සිදුවන දෙය දැන ගැනීමට උත්සුක වූ ඔවුන් සියලුදෙනාම එකම දිසාවකට ගමන් කරමින් සිටියහ. සණ්ටාවල ශබ්දය දැන් වඩාත් උස්ව ඇසුනි. ආර්යාගේ නියපොත්ත කැඩුනු මහපටැඟිල්ල මහත් ලෙස රිදුම් දුන්නේය. රිදුම් දෙන ඇඟිල්ලේ වේදනාව නිසා නැගෙන හැඬුම් ආයාසයෙන් සිර කර ගනිමින් ඇය ජන ගංගාව සමග එක්වූවාය. වේදනාව මැඩගෙන දෙතොල් විකාගත් ඇය කොර ගසමින්, අවට මිනිසුන් ගේ උනන්දුකර කතාබහට ඇහුම්කන් දුන්නාය.

"-රජතුමාගෙ හස්තය. ස්ටාර්ක් උතුමානන්. උන් එයාව බේලර්ගෙ සප්තකයට උස්සගන යනවා."

"මට ආරංචිවුනේ එයා මැරුනා කියලයි."

"ඉක්මනටම වෙයි. ඔවු ඉක්මනටම. රිදී කාසියක් ඔට්ටුයි අද මුංගේ ඔලුව ගහල යනවා."

"ඔහොම උන එකම හොඳයි. ද්‍රෝහියා!" මිනිසා කෙළ ගැසීය.

ආර්යාගේ ගොළු වූ මුව විවර විය. "එයා එහෙම නෑ-" ඇය පටන්ගත් නමුදු පුංචි කෙල්ලක වූ ඇය කී දේ නැසුනාක් මෙන් ඔවුහු තම කතාව කරගෙන ගියහ.

"එහෙම ඔළුව කපන්නෙ නෑ බූරුවො! සප්තක දෙවස්තානේ පඩිපෙළ උඩ ද්‍රෝහියන්ගෙ හිස් ගසා දමන්ට පටන් ගත්තේ කවදා ඉඳලද?"

"මිනිහව මෙතනට ගෙනාවේ නයිට් දිවුරුමක් ගන්ට නෙවෙයි නේ බොල. මට අහන්ට ලැබුන විදියට ස්ටාර්ක් තමා පරණ රොබර්ට් රජ්ජුරුවො මරල තියෙන්නෙ. ඌ කැලෑවෙදි රජ්ජුරුවන්ව බෙල්ල කපල මරල දැම්මලු. ඊට පස්සේ කිසි දෙයක් උනේ නෑ වගේ ඉඳගෙන කිව්වලු, ඒක කලේ වල්ඌරෙක් කියල."

"ඕක අමූලික බොරුවක්. අර රත්තරන් අං තට්ටුවක් හයි කරගෙන ඉන්න රෙන්ලි තමා රජ්ජුරුවන්ට වැඩේ දුන්නේ."

"බොරු නොකියා කටවහගෙන හිටපං ගෑනියේ. උඹ එළදෙනක් වගේ දොඩවන්නේ. රෙන්ලි උතුමානන් කියන්නෙ බොහොම ගුණයහපත්, කෙලින් මිනිහෙක්."

සොයුරියන්ගේ වීථිය වෙත ළඟාවන විට සෙනග උරිනුර ගැටෙන තරමට තදබද වී සිටියහ. ජනගංගාවට තමාව නිරායාසයෙන්ම විසෙන්යා ගේ කඳු මුදුනට රැගෙන යන්නට ආර්යා ඉඩ දුන්නාය. සුදු කිරිගරුඬෙන් කල චතුරස්‍රය බේලර් සප්තකයට වඩා ලංවන්නට පොදිකන මහජනයාගෙන් පිරී පැවතුනි. සන්ටා නාදය ඉතා උස් හඬින් ඇසෙන්නට විය.

ලී අසිපත තදින් මිරිකා අල්ලාගත් ආර්යා සෙනඟ අතරින් පණුවකු මෙන් ලිස්සා යමින්, අසුන්ගේ කුර අතරින් රිංගමින් ඉදිරියටම ඇදුනාය. ජනකාය මැද තදබදව සිටි ඇයට සප්තකයේ උස්, සිහින් කුළුණු හැර දැකගත හැකි වූ එකම දෙය මිනිසුන්ගේ දැත්, දෙපා සහ බඩවල් පමණි. අසල වූ ලී කරත්තයක් දුටුවිට ඒ මතට නැග ගතහොත් සියල්ල පැහැදිලිව දිස්වනු ඇති බව ඇයට වැටහුනු නමුදු අවාසනාවකට මෙන් තවත් බොහෝ දෙනෙකුට ද එම නුවණ පහල වී තිබුනි. කරත්තකරු ඔවුන්ට සාප කරමින්, කසපහර දෙමින් ඔවුන්ව ඉන් පන්නා දැමුවේය.

ආර්යා කලබල වූවාය. ඉදිරි පෙළටම තල්ලු වීමට දරන උත්සාහයේදී ඇයව යම් ප්‍රතිමාවක පාදස්ථය මතට තෙරපනු ලැබුනි. ඉහල බැලූ ඇයට දක්නට ලැබුනේ පූජක රජු හෙවත් ආශිර්වාද ලත් බේලර් ගේ දැවැන්ත මුහුණ විය. ලී අසිපත ඉණතුරෙහි ගසා ගත් ඇය ඉහළ නගින්නට පටන් ගත්තාය. බිඳී ගිය නියපොත්ත කිරිගරුඬ මත ලේ පල්ලම් ඇති කලේය. එහෙත් ඇය අවසානයේ එහි ලඟා වී රජුගේ දෙපා අතර හරිබරි ගැසී හිඳ ගැනීමට සමත් වූවාය.

ඊළඟ මොහොතේ ඇය සිය පියාව දුටුවාය.

* * *

එඩාර්ඩ් ස්ටාර්ක් උතුමානන්, රන්කබාකරුවන් දෙදෙනෙකුට වත්තම් වෙමින්, සප්තකයේ දොරටුව අබියස දේශනා මණ්ඩපයේ සිටගෙන සිටියේය. ඔහු සුදු පබළුවලින් සෝරවෘකයෙකු ගෙත්තම් කල අළු පැහැ විල්ලුද උඩු කබායකින් හා ලොමින් නිමකර ලොමින් පෝරු දැමූ අළුවන් සළුවකින් සැරසී හුන්නේය. එනමුදු ආර්යා මින් පෙර කිසිදු දිනක දැක නොමැති තරම් ඔහු කෘෂව ගොස් සිටියේය. ඒ මුහුණ වේදනාවෙන් ඇදී ගොස් තිබුනි. ඔහු සිටගෙන සිටිනවාට වඩා ඔසොවාගෙන සිටින්නාක් බඳ විය. ඔහුගේ බිඳුණු පයට දැමූ වෙළුම්පටි කළුපැහැ ගැන්වී ජරාජීර්ණ වී තිබුනි.

ඔහුට පිටුපසින් ප්‍රධාන සප්තක පූජකවරයා සිටගෙන සිටියේය. ඒ වනාහි හසුරවා ගත නොහෙන තරම් තරබාරු සිරුරෙන් යුතු මිටි මහල්ලෙක් විය. සුදෝ සුදු දිගු ලෝගුවකින් සැරසුනු හේ සතර දෙසටම දේදුනු වර්ණ විහිදූ රනින් හා පළිඟුවෙන් කල දැවැන්ත ඔටුන්නක් පැළැඳ සිටියේය.

සප්තකයේ දොරටු අබියස දේශනා මණ්ඩපය ඉදිරිපිට නයිට්වරුන් සහ උසස් වංශාධිපතීන් පිරිසක් රැස්කමින් සිටියහ. ලේ රතු පැහැ සේද සහ පට රෙද්දෙන් කල, සිංහයන් සහ ගෝනුන්ගෙන් යුතු අලංකාර ඇඳුමකින් සැරසී, රන් කිරුළක් පැළැඳ සිටි ජොෆ්රි ඔවුන් අතර ප්‍රමුඛස්තානය ගත්තේය. ඔහුගේ මව් රැජින රතු මිශ්‍ර කළුවන් අවමංගල ඇඳුමකින් සැරසී, කළු දියමන්තියෙන් කල වේලයක් හිස පැළැඳ සිටියාය. සිය අඳුරු අළුවන් සන්නාහයට පිටතින් හිම මෙන් සුදු පැහැ පැළැඳ, රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරුන් සිවුදෙනෙකු පිරිවරා සිටි දඩබල්ලා ද ආර්යාට හැඳිනිය හැකි විය. මෝස්තර සහිත දමස්ක ලෝගුවකින් සැරසී සිටි වාරිස් නම් පණ්ඩකයා සුමුදු පාවහන් ලු දෙපයින් වංශාධිපතීන් අතර එහා මෙහා යමින් සිටියේය. ඒ අතර සිටි උල් යටිරැවුලක් ඇති, රිදීවන් කෙටි ලෝගුවකින් සැරසුනු කුඩා මිනිසා වරෙක ඇගේ මව වෙනුවෙන් ද්වන්ද්ව සටනක් කල තැනැත්තා විය හැකි බව ආර්යාට සිතුනි.

මේ සියල්ලටම අමතරව ඒ මධ්‍යයයේ සන්සා ද විය. අහස් නිල් පැහැති සේද ගවුමක් හැඳ සිටි ඇගේ රතු-දුඹුරු හිසකෙස් මනාව සෝදා කැරලි කර තිබුනි. දැත් වල රිදී වළලු පැළැඳ සිටි ඇගේ පෙනුම ආර්යාට රිස්සුවේ නැත. ඇගේ සොයුරිය මෙතන කුමක් කරන්නේ ද? ඇය මෙතරම් සතුටු පෙනුමකින් සිටින්නේ ඇයි?

හෙලි රැගත් රන්කබාකාරයින් පෙළක් ජන සන්නිපාතය පාලනය කරමින් සිටියහ. ඔවුනට අණ දුන් මහත අණදෙන නිළධාරියා කලු ලැකර් සහ රනින් වැඩ දැමූ අගනා විචිත්‍ර සන්නාහයක් පැළැඳ සිටියේය. ඔහුගේ සළුව සත්‍ය රන් හුයෙන් කල රෙදි වල දක්නට ලැබෙන ලෝහමය දිලිසීම පෙන්නුම් කලේය.

ඝණ්ටා නාදය කෙමෙන් මැකී යද්දී චත්‍රරස්‍රය පුරා කෙමෙන් කෙමෙන් නිහඬතාවක් පැතිර යන්නට විය. ඇගේ පියා හිස ඔසොවා ඉතා දුර්වල හඬකින් කතා කරන්නට පටන්ගත්තේ ය. ඔහුගේ හඬ කෙතරම් දුබල හා සිහින් වී ද යත් ඒ කියන කිසිවක් ඇයට නොවැටහුනි. ඇයට පිටුපසින් සිටි මිනිස්සු කෑගසන්නට පටන් ගත්හ. "මොකද්ද කිව්වෙ?" "හයියෙන් කියපං!" කළු හා රන් සන්නාහයෙන් සැරසුනු මිනිසා ඇගේ පියා වෙත පසුපසින් ලංවී ඔහුට තද හෙලි පහරක් දුන්නේය. 'එයාට ඉන්ට දීපන්!' ආර්යාට කෑගසන්නට සිත්විය. එනමුදු කිසිවෙකු ඇයට සවන් නොදෙන බව ඇය දත් ඇය දෙතොල් විකා ගත්තාය.

පියා සිය ස්වරය උස්කර නැවත කතාව ඇරඹුවේය. "මම එඩාර්ඩ් ස්ටාර්ක්. වින්ටෙර්ෆෙල්වල උතුමානන් සහ රජතුමාගේ හස්තය." ඔහුගේ හඬ පෙරට වඩා උස්ව නැගුනු අතර එය චතුරස්‍රය පුරා විහිදී යන්නට විය. "මම දැන් ඔබලා ඉදිරියට ඇවිල්ලා ඉන්නෙ මගේ රාජද්‍රෝහී ක්‍රියාව ගැන මිනිසුන් සහ දෙවියන් ඉදිරියේ පාපොච්චාරණය කරන්ටයි."

"එපා!" ආර්යා කෙඳිරි ගෑවාය. ඇයට පහළින් සිටි ජනතාව කෑගසන්නටත් දෙස් දෙවොල් තබන්නටත් අරඹා තිබුනි. සන්සා සිය මුහුණ දැත් අතර සඟවා ගත්තාය.

කලිකලහය මැද්දේ පැහැදිලිව ඇසෙනු පිණිස ඇගේ පියා කටහඬ තවත් උස් කලේය. "මම මගේ රජතුමාගෙ විශ්වාසය පාවාදුන්නා. මගේ යාළුවා රොබර්ට්ට ද්‍රෝහි වුනා." ඔහු මොරගෑවේය. "මම දිවුරලා පොරොන්දු වුනා එයාගෙ දරුවන් ආරක්ෂා කරනවයි කියලා. ඒ වුනත් එයාගෙ ලේ සීතල වෙන්ටත් කලින් එයාගෙ දරුවා මරා දාලා රාජ්‍යය උදුරගන්ට කුමන්ත්‍රණය කලා. මම මේ ප්‍රකාශ කරන්ට යන සත්‍යය වෙනුවෙන් ප්‍රධාන පූජකතුමාත්, ආශ්ර්වාද ලත් බේලරුත්, සප්තකයේ දෙවිවරුනුත් සාක්ෂි දෙනු ඇති. යකඩ සිංහාසනයේ නියම උරුමක්කරු ජොෆ්රි බරතියන් මිස අනිකෙක් නොවේ. සියළු දෙවිවරුන් ගේ කරුනාව ඇතුව එතුමා රාජධානි සප්තකයේ උතුමානන් හා රාජධානියේ නියම ආරක්ෂකයා වනු ඇත."

පිරිස අතරින් ගලක් පියඹා ආවේය. එය පියාගේ සිරුරේ වදිනවා දුටු ආර්යා හට හැඟුනි . රන්කබාකරුවෝ ඔහුව වැටෙන්නට නොදී අල්වා ගත්තෝය. ඔහුගේ නළලේ ගල වැදී ඇති වූ තුවාලයෙන් රුධිරය ගලා යමින් තිබුනි. තව තවත් ගල් පහර එල්ල වන්නට විය. එකක් පියාගේ වම් පැත්තේ සිටි සෙබලා ගේ වැදුනු අතර තවෙකක් රන්-කළු සන්නාහය පැළැඳ සිටි නයිට්වරයාගේ පපු ආවරණයේ වැදුනි. ජොෆ්රි සහ රැජින වෙත ගිය රාජාරක්ෂක නයිට්වරුන් දෙදෙනෙක් ඔවුන්ගේ පලිස් වලින් රාජකීයයන්ට ආරක්ෂාව සැලසුහ.

හැඳ සිටි සළුවට යටින් ඇදී ගිය ආර්යාගේ හස්තය කොපුවෙහි ලූ ඉදිකට්ට හා ගැටින. එහි මිට වටා තදින් වෙලී ගිය ඇගේ අතැඟිලි මින් පෙර කිසිදා කිසිවක් මිරිකා නොගත් තරම් තදින් එය මිරිකාගත්තේය. 'අනේ කරුනාකරලා දෙවියනි. එයාව ආරක්ෂා කරන්ට!' ඇය යාඥා කලාය. 'උන්ට මගේ තාත්තට හානියක් කරන්ට ඉඩදෙන්ට එපා!'

ප්‍රධාන දේවගැති තුමා ජොෆ්රි සහ ඔහුගේ මව අසල දණ නැමුවේය. "අපේ පවුවලට අපි වන්දි ගෙවන්ට ඕනැ." පියාගේ ස්වරයට ද වඩා උස් වූ, පැතිර යන සුළු, ගීතවත් හඬකින් ඔහු කියා සිටියේය. "මේ මිනිසා මේ ශුද්ධ වූ ස්ථානයට ඇවිල්ලා තමන් කල පවු මිනිසුන් සහ දෙවියන් ඉදිරියේ පාපොච්චාරණය කලා." කන්නලව් කරනු පිණිස ඔහු දෑත් ඔසවද්දී සප්තාලෝකය ඔහු වටා දේදුන්නක් මෙන් පැතිරී ගියේය. "දෙවියන් සාධාරණයි. ඒ වුනත් ආශීර්වාද ලත් බේලර් අපිට කියා දුන්නේ දෙවියන් අනුකම්පා සහගතයි කියලයි. මේ ද්‍රෝහියාට කුමක් කල යුතුද මගේ ස්වාමිනී?"

හඬවල් දහසක් ඇයට පිටුපසින් මුරගාමින් සිටියද ආර්යා හට ඒ කිසිවක් නොඇසුනි. ජොෆ්රි කුමරා... නැහැ ජොෆ්රි රජතුමා... සිය රාජ්‍යාරක්ෂකයන්ගේ පලිස් අතරින් පිටතට ආවේය. "මගේ මව් රැජින මට උපදෙස් දුන්නේ එඩාර්ඩ් උතුමානන් නිශා රැකුමට එක්වෙන්ට ඕන කියලයි. සන්සා ආර්යාව එයාගෙ තාත්තා වෙනුවෙන් අනුකම්පාව අයැදිනවා." ඔහු ඉන්පසු සන්සා දෙස කෙලින් බලා සිනාසුනේය. දෙවියන් තම යාඥාවන්ට සවන් දුන් බවක් එක් මොහොතකට ආර්යාට සිතුනි. එනමුදු ඒ ජොෆ්රි ජනකාය දෙස බලා මෙසේ පවසන තෙක් පමණි. "ඒ වුනත් එයාලා ගෑනු. එයාලගේ හදවත් මෘදු වැඩි. මම උඹලගේ රජතුමා වෙලා ඉන්නකල් ද්‍රෝහීන්ට සමාවක් නැහැ. සෙර් ඉලියන්, මට උගේ ඔළුව ගෙනත් දීපන්!"

* * *

ජනසන්නිපාතය යටිගිරියෙන් හඬ තැලූහ. ඔවුන් නගින බසින රළක් මෙන් ප්‍රතිමාවේ හැප්පෙද්දී බේලර් ගේ ප්‍රතිමාව පැද්දෙනු ඇයට දැනුනි. ප්‍රධාන පූජකතුමා රජතුමාගේ කෙටි කබායෙන් අදිමින් සිටියේය, වාරිස් යමක් කියමින්, දැත් වනමින් පියඹා ආවේය, රැජින පවා ජොෆ්රිට යමක් කියමින් සිටියාය. නමුත් ඔහු හිස සැලීය. උස්, මුදු දම්වැල් සන්නාහයෙන් වැසුනු මසින් තොර ඇටසැකිල්ලක් බඳු වූ රජුගේ යුක්තිය පසිඳලන්නා ඉදිරියට එද්දී ඔහුට ඉඩ දෙමින් වංශාධිපතිවරුන් හා නයිට්වරුන් සියල්ල පසෙකට වූහ. සිය සොහොයුරිය කෑගසන අයුරු ආර්යාට ඉතා දුරකින් එන හඬක් මෙන් ඇසුනි. සන්සා ඉකිබිඳිමින් දණින් වැටුනාය. සෙර් ඉලියන් පේන් දේශනා මණ්ඩපයේ පියගැට නැගගෙන ගියේය.

ඉඳිකට්ට ඇදගත් ආර්යා බේලර් ගේ දෙපා අතරින් මිදී ජනතාව අතරට පැන්නාය. මස් වෙළෙන්දෙකු ගේ සිරුරේ වැදුනු ඇය ඔහුව බිම පෙරලා දැමුවේය.  ඒ මොහොතේම යමෙකු ඇගේ පසුපසින් සිරුරේ ගැටුනු අතර ඇය බිම වැටෙන්නටම වාගේ ගියේය. මිනිස්සු ඇය වටා තෙරපෙමින්, දහලමින්, අදිමින්, තල්ලු කරමින් අසරණ මස් වෙළෙන්දා පාගා දැමූහ. ආර්යා ඔවුන් වෙත ඉඳිකට්ටෙන් පහර දුන්නාය.

ඉහළ දේශනා මණ්ඩපය මත හුන් සෙර් ඉලියන් පේන් යම් සංඥාවක් කල අතර රන්-කළු සන්නාහය හැඳි නයිට්වරයා විධානයක් දුන්නේය. රන්කබාකරුවෝ එඩාර්ඩ් උතුමානන්ව අල්ලා හිස හා පපුව පිටතට විහිද තිබෙන ලෙස කිරිගරුඬ පුවරුව මත බිම බෑවූහ.

"ඒයි උඹ!" යමෙකු කේන්තියෙන් මෙන් ඇයට මොරගෑවේය. එනමුදු ඇය වේගයෙන් දිවයමින්, මිනිසුන් දෙපසට තල්ලු කරමින්, ඇයට බාධාවක් වන කවරෙකු හෝ වේ නම් කඩු පහර දෙමින් ඉදිරියටම ගියාය. කොහෙන්දෝ පැමිණි අතක් ඇගේ කකුලක් අල්ලා ගන්නට උත්සාහ කල අතර ඇය එයට පහර දුන්නාය. දෙපාවලට පා පහර දුන්නාය. ගැහැණියක පා පැකිලී බිම ඇදවැටුනු අතර ආර්යා ඇගේ පිට දිගේ දිව ගියාය. දෙපස සිටි සියල්ලන් හට කඩු පහර එල්ලකරමින් ඉදිරියට ගියාය. එනමුදු මේ කිසිවකින් පලක් නොවීය. මිනිසුන් බොහෝ ප්‍රමාණයක් සිටි අතර ඉඩක් පෑදුනු වහා එය වැසී ගියේය. ඇයට තවමත් සන්සාගේ කෑගැසුම ඇසෙන්නට විය.

සෙර් ඉලියන් සිය පිටේ බැඳගෙන සිටි කොපුවෙන් දැතින්ම එසවිය යුතු දැවැන්ත මහකඩුවක් පිටතට ඇදගත්තේ ය. ඔහු අසිපත හිසට ඉහලින් ඔසවද්දී අඳුරු ලෝහමය අසිපත් තලය මත හිරු රැස් නටන්නාක් මෙන් පෙනුනි. දැලිපිහියකටද වඩා තියුණු වූ

අසිපත් දාරය දිලිසුනි. 'අයිස්!' ඇය සිතුවාය. 'එයා ගාව අයිස් තියෙනවා!' කම්මුල් දිගේ කඳුළු ගලා යද්දී දෑසට නැගුනු කඳුළු විසින් ඇගේ දර්ශන පථය අවහිර කලේය.

ඊළඟ මොහොතේ පිරිස අතරින් ක්ෂණයෙන් ඇදී ආ සවිමත් අතක් ඇගේ අත දඬුඅඬුවකින් මෙන් දැඩිව අල්ලාගත්තේය. එය කෙතරම් සවිමත් වී ද යත් ඉදිකටුව ඇගේ අතින් ගිලිහී විසිවුනි. දෙපයින් ඔසොවා ගනු ලැබූ ආර්යා බෝනික්කෙකු මෙන් ඔහුගේ දෑතට සිරවී සිටියාය. දිගු කළු කෙස්, හැඩපලු ගෙතුනු රැවුලක් හා දිරාගිය දතින් යුතු මුහුණක් ඇගේ මුහුණ අසලට තෙරපින. "බලන්ට එපා!" ගැඹුරු හඬක් ගෙරවීය.

"මම... මම... මම..." ආර්යා ඉකි ගැසුවාය.

වියපත් මිනිසා ඇයව කෙතරම් තදින් සෙලවීද යත් ඇගේ දත් එකට වැදී කට කට ගෑවේය. "උඹේ කට වහගෙන ඇස් පියාගනින් කොල්ලෝ." සිහිනයකින් ඇසෙන්නාක් මෙන්, ඉතා ඈත දුරකින් ඇසෙන්නාක් මෙන් දුබලව නැගුනු යම් හඬක්... මෘදු හඬක්... ඇගේ කණ වැකුනි. එය හරියට මිනිසුන් දහස් ගණනක් එකවරම හුස්ම පහල හෙලුවාක් වැනි හඬකි. මහලු මිනිසාගේ යකඩ මෙන් සවිමත් වූ අතැඟිලි ඇගේ බාහුවට තදින් කා වැදුනි. "මං දිහා බලපං. ඔවු. අන්න එහෙම, මං දිහාම බලපං." ඔහුගේ ප්‍රශ්වාසය නරක්වූ වයින් ගඳින් පිරී තිබුනි. "උඹට මතකද කොල්ලෝ?"

ඇගේ මතකය අවදිකරන්නට සමත් වූයේ අන් කිසිවක් නොව ඒ වයින් සන්ධය විය. හැඩපලු ගෙතුණු ජරා හිසකෙස්, ඇඹරුණු උරහිස් වසා ගෙන තිබූ, අණ්ඩ දැමූ දුහුවිලි වැකුනු කළු සළුව, ඇය දෙස බලා සිටි කළු දෑස්. සිය පියා හමුවීම පිණිස පැමිණි මේ කළු සොහොයුරා ඇයට මතක් විය.

"උඹට මතකයි නේද? බොහොම බුද්ධිමත් කොල්ලෙක්." ඔහු කෙල පහරක් ගැසීය. "උං මෙතැන වැඩේ කරලා අහවරයි. උඹ දැන් මගෙත් එක්ක එන්ට ඕනේ. ඒත් එක්කම උඹේ කට වහගන ඉන්ට වගබලාගනින්." ඇය එයට පිළිතුරක් දෙන්නට සූදානම් වද්දී ඔහු පෙරටත් වඩා තදින් ඇයව සෙලෙවුවේ ය. "කට වහගෙන ඉන්ට කියලා නේද මං කිව්වෙ?"

චතුරස්‍රය මිනිසුන්ගෙන් හිස් වන්නට පටන් ගෙන තිබුනි. මිනිසුන් සිය එදිනෙදා සාමාන්‍ය දිවිය වෙත නැවත යන අතරේ ඔවුන් වටා වූ තදබදය තුනී වී ගියේය. එනමුදු සිය ජීවිතය අවසන් බව ඇයට හැඟුනි. මුලු සිරුරම හිරිවැටුනාක් මෙන් ඇය යොරේන් පසුපස... ඔවු ඔහුගේ නම යොරේන් විය... ඇදෙන්නට වූවාය. අසිපත නැවත සියතට ලැබෙන තෙක්ම ඔහු ඉදිකට්ට ඇහිඳගන්නා ආකාරය ඇය දුටුවේ නැත. "මං හිතන්නෙ උඹ ඕක පාවිච්චි කරන්ට දන්නවා ඇති කොල්ලො."

"මම කොල්ලෙක් නෙ-" ඇය පටන්ගත්තා ය.

ඔහු ඇයව වසා දැමුනු දොරටුවක් තුළට තල්ලු කලේය. සිය අපවිත්‍ර ඇඟිලි ඇගේ හිසකෙස් අතරින් යවා, අඹරා, ඇගේ හිස පසුපසට තල්ලු කලේය. "-මොළේ තියෙන කොල්ලෙක් නෙවෙයි. ඒකද උඹ කියන්ට ලෑස්ති උනේ?"

ඔහුගේ අනෙක් අතේ පිහියක් දිදුලුවේය.

පිහිය ඉර එළියේ දිලිසෙමින් ඇගේ මුහුණ දෙසට එද්දී ආර්යා වියරුවෙන් මෙන් පයින් ගසමින් සිය හිස පසුපසට ඇදගන්නට වෑයම් කලාය. ඇය වැරෙන් හිස දෙපසට වනමින් ඔහුගෙන් මිදෙන්නට තැත් කල නමුදු ඒ ග්‍රහණය දැඩි විය. ශක්තිමත් විය. සිය හිස්කබලේසම ඉරී යන'යුරු ඇයට දැනෙන්නට විය. එමෙන්ම සිය දෙතොලේ තැවරුනු කඳුළුවල වූ ලුණු රසය ඇයට දැනෙන්නට විය.

**All she wanted was to go home, but leaving King’s Landing was not so easy as she had hoped.**

බ්‍රැන් 07-1

පිරිසේ වූ වැඩිමහලුම අයවලුන් වයස දහඅටක් හෝ දහනවයක් හෝ වූ වැඩුනු මිනිස්සු වූහ. එක් අයෙකු පමණක් වයස විස්ස පසුකර සිටි අතර ඉතුරු බහුතරය දහසයක් හෝ ඊටත් වඩා වයසින් අඩු යෞවනයින් වූහ.

බ්‍රැන් මේස්ටර් ලුවින්ගේ කුළුණේ සඳළුතලයට වී ඔවුන් සිය ලී අසිපත් හා පලිස් වෙනුවට භාවිත කල ලී පුවරු එහා මෙහා වනමින්, වේදනාවෙන් කෙඳිරිගාමින්, එකිනෙකාට සාප කරමින් පුහුණුවීම්වල යෙදී සිටින'යුරු නැරඹීය. සෙන්ඩුවාලුව පුරාවටම ලී මත ලී වදින ක්ලැක් ක්ලැක් හඬ නොනවත්වාම ඇසෙන්නට විය. එසේම මේ හඬට අමතරව ලී අසිපතක් පදම් කල සම් ආවරණවල හෝ විවෘත මාංශයේ ගැටුනු විට නගින ත්වැක් හඬත් පහර ලද්දා වේදනාවෙන් කෑගසන හඬත් නිතරම පාහේ අසන්නට හැකිවිය. රතු වූ මුහුණින් යුතු සෙර් රඩ්‍රික් මේ පුහුණුවන්නක් අතරින් එහා මෙහා ඇවිද්දේ ඔවුන්ට කටුකුටු ගාමින් බැන වදිමින් සිටියේය. මේ මහලු නයිට්වරයා මේ තරම් සැඩපරුෂ ස්වරයෙන් සිටිනු බ්‍රැන් මින් පෙර කිසිදා දැක නොතිබිනි. "නෑ." ඔහු නැවත නැවතත් කීයේය. "නෑ! නෑ! නෑ!"

"එයාලා එච්චරම හොඳට සටන් කරන්නෙ නැහැ." බ්‍රැන් දෙගිඩියාවකින් මෙන් කීවේය. ඔහු තමා පසෙකින් මස් කැබැල්ලක රස විඳිමින් හුන් සමර්ගේ කණ පිටුපස කැසුවේය.

"සහතිකෙන්ම." මේස්ටර් ලුවින් ගැඹුරු සුසුමක් හෙලමින් එකඟවිය. මහලු මේස්ටර්වරයා සිය දුර බලන ම(ර්)රිෂ් කාචය තුළින් එබී බලමින්, උදෑසන ආකාශයේ ක්ෂිතිජය කිට්ටුව වන්නට එල්ලී තිබුනු වල්ගාතරුවක පිහිටීම අධ්‍යයනය කරමින් හුන්නේය. "ඒ වුනත් අපි එයාලට කල් දීලා බලමු. සෙර් රඩ්‍රික් කියන්නෙ ඇත්ත. අපට ප්‍රාකාරෙ රකින්ට මිනිස්සු ඕන. ඔයාගෙ තාත්තා එයාගෙ හොඳම සෙබළු ටික එයත් එක්ක කින්ග්ස් ලැන්ඩින්ග්වලට එක්කරන් ගියා. ඉතුරුවෙලා හිටපු අය ඔයාගෙ අයියා එක්කරන් ගියා. ඒ අයත් එක්ක මේ අවට හිටපු සටන් කරන්ට පුළුවන්කමක් තිබුන හැම තරුණයෙක්ම යන්ට ඇති. මේ ගොඩ දෙනෙක් ආපහු අපි ගාවට එන එකක් නැහැ. ඉතින් එයාලගෙ තැන ගන්ට අපි කොහෙන් හරි කට්ටිය හොයාගන්ට ඕන."

පහතින් සිටි මේ නවක සෙබළුන් දෙස බ්‍රැන් නුරුස්නා බැල්මකින් බලා සිටින්නට විය. "මගේ කකුල් දෙක තාමත් හොඳට තිබුනා නම්... මට එයාලා හැමෝම පරද්දන්ට තිබුනා." තමා අවසාන වරට අසිපතක් සුරතින් ගෙන සිටි දවස් සිහියට නගාගන්නට බ්‍රැන් වෑයම් කලේය. ඒ රොබර්ට් රජතුමා වින්ටර්ෆෙල්වලට පැමිණි වකවානුවේ විය. ඒ නිකම්ම නිකම් ලී අසිපතක් වුව ඔහු එයින් තලා ටමෙන් කුමරා අඩුම තරමේ පනස් වතාවක්වත් බිම දමන්නට ඇත. "සෙර් රඩ්‍රික්ට කියන්ට ඕන මට දඬු පොරොවක් පාවිච්චි කරන්ට උගන්නන්ටයි කියලා. මට දිග මිටක් තියෙන දඬු පොරොවක් තියෙනවානම් හොඩෝර්ට පුළුවන් මගේ කකුල් දෙක වෙන්ට. එතකොට අපි දෙන්නට එකතු වෙලා නයිට් කෙනෙක් වෙන්ට පුළුවන්."

"මම හිතන්නෙ ඒක... හරියන වැඩක් නෙවෙයි. බ්‍රැන්, මිනිහෙක් සටන් කරනකොට එයාගෙ අතුයි, කකුලුයි, හිතයි මේ හැමදේම එකක් වෙන්ට ඕන."

පහතින් වූ අංගනයේ සෙර් රඩ්‍රික් බෙරිහන් දෙමින් සිටියේය. "උඹ සටන් කරන්නෙ හරියට පාත්තයෙක් වගේ. ඌ උඹට කොටනවා, උඹ ඊට වඩා හයියෙන් ඌට කොටනවා. පැනී! පාර වලකපන්. පාත්ත සටන් හරියන්නෙ නැහැ. මේවා ඇත්ත කඩුනම් පලවෙනි කෙටිල්ලෙන්ම උඹේ අතක් කැපිලා වෙන්වෙයි." තවත් කොලුවෙක් මේ කතාවට සිනාසුනු අතර මහලු නයිට්වරයා වහා ඔහු දෙසට හැරුනි. "උඹ හිනාවෙනවා. උඹ! නියමයි. උඹ සටන් කරන්නෙ හරියට ඉත්තෑවෙක් වගේ..."

"එක නයිට් කෙනෙක් හිටියා ඇස් පේන්නෙ නැති." බ්‍රැන් මුරණ්ඩු ස්වරයෙන් කීවේය. "නාකි ආයම්මා මට එයා ගැන කියලා දුන්නා. එයාට තිබුනා දිග රිටක් දෙපැත්තෙම කඩු තල දෙකක් හයිකරපු. එයාට පුළුවන් ඒ රිට හයියෙන් කරකවලා එකපාර මිනිස්සු දෙන්නෙක් කපලා දාන්ට."

"තරු ඇස් තියෙන සිමියොන්." පොතක යම් නොම්මර කිහිපයක් සටහන් කරමින් මේස්ටර් ලූවින් පිළිතුරු දුන්නේය. එයාගෙ ඇස් දෙක නැතිවුනාම එයා හිස් කුහර දෙකේ ඉඳුනිල් මැණික් දෙකක් ඔබාගත්තා. ඒ වගේ මොකක්හරි කතාවක් තමා ගායකයො කියන්නෙ. බ්‍රැන්, ඒක කතාවක් විතරයි. මෝඩ ෆ්ලෝරියන් ගැන කියැවෙන කතාව වගේ, වීරයින්ගෙ යුගයේ ඉඳන් එන සුරංගනා කතාවක් විතරයි. ඔයා ඔය හීන පැත්තකට දැම්මානම් හොඳයි. ඒවයින් වෙන්නෙ ඔයාගෙ හදවත රිද්දෝගන්න එක විතරයි."

මේ සිහින පිළිබඳ කතාව විසින් ඔහුට යම් දෙයක් සිහිපත් කර දුනි. "මම ඊයෙ රෑ ආයෙමත් අර කපුටාව හීනෙන් දැක්කා. අර ඇස් තුනක් තියෙන එකා. එයා මගේ නිදන කාමරේට ඇවිත් මට අඬගැහුවා එයත් එක්ක යන්ට එන්ටයි කියලා. ඉතින් මම ගියා. අපි දෙන්නා පහළ සොහොන් ගුහාවලට ගියා. තාත්තා එහෙ හිටියා. ඉතින් අපි කතා කලා. එයා හරි දුකෙන් හිටියෙ."

"ඇයි ඒ?" ලුවින් නැවත වරක් සිය දුරේක්ෂයෙන් එබී බැලුවේය.

"මම හිතන්නෙ ඒ ජොන් ගැන මොකක් හරි නිසා කියලයි." මේ සිහිනය අනිකුත් සියළුම කපුටු සිහිනවලට වඩා බ්‍රැන්ගේ සිතට පීඩාවක් ඇති කරන්නට සමත්ව තිබුනි. "හොඩෝර් ඒ සොහොන් ගුහාවලට යන්නෙ නැහැ."

මේස්ටර්වරයා ඔහුට මනාව ඇහුම්කණ් නුදුන් බව බ්‍රැන් එකවිටම වටහාගත්තේ ය. ඔහු දුරේක්ෂයෙන් දෑස් මෑත් කරගත්තේ වේගයෙන් ඇසිපිය ගසන්නට විය. "හොඩොර් මොකක්ද..."

"සොහොන් ගුහාවලට යන්නෙ නැහැ. මම නැගිට්ටට පස්සෙ මම එයාට කිවුවා මාව පල්ලෙහාට එක්කරන් යන්ටයි කියලා. තාත්තා ඇත්තටම එහෙ ඉන්නවද බලන්ට. මුලදී එයාට කොහෙත්ම තේරුනෙ නැහැ මම මොකක්ද කියන්නෙ කියලා. ඒ වුනත් මම එයාට අතින් පයින් පාර පෙන්නලා කොහොමහරි පඩිපෙළ ගාවට එක්කරන් ගියා. ඒ වුනත් එයා උඩම පඩියට වෙලා 'හොඩොර්' කිය කියා බලා හිටියා විතරයි. හරියට එයා කළුවරට බයවෙලා වගේ. ඒ වුනත් මගේ අතේ පන්දමකුත් තිබුනා. මට කොච්චර තරහා ආවද කිවුවොත් මට හිතුනා අර නාකි ආයම්මා නිතරෝම එයාට ගහනවා වගේ හොඳ පාරක් ඔළුවට දෙන්ට." මේස්ටර්වරයා මුහුණ ඇඹුල් කරගන්නා ආකාරය දුටු ඔහු වහා මේ ටිකද එකතු කලේය. "මම එහෙම කලේ නැහැ ඒ වුනත්."

"ඒක හොඳයි. හොඩෝර් කියන්නෙ මිනිහෙක්. කොටළුවෙක් නෙවෙයි තලන්ට."

"ඒ හීනෙදි නම් මම කපුටාත් එක්ක පියාඹලා පල්ලෙහාට ගියා. ඒ වුනත් මම නැගිට්ටහම මට ඒක කරන්ට බැහැ."

"ඇයි ඔයාට ඕන වුනේ සොහොන් ගුහාවලට යන්ට?"

"මම ඔයාට කිවුවෙ. තාත්තා ඉන්නවද බලන්ට."

අපහසුතාවට පත් වූ අවස්ථාවන්හිදී නිතරම කරන්නාක් මෙන් මේස්ටර්වරයා සිය ගෙල වටා වූ දම්වැල ඇද්දේය. "බ්‍රැන්, මගේ හොඳ දරුවෝ. එක දවසක් එයි එඩාර්ඩ් උතුමානනුත් එයාගෙ තාත්තයි, තාත්තගෙ තාත්තයි, උතුරේ රජකරපු පුරාණ ස්ටාර්වරු ඔක්කොමයි වගේ ගල් පිළිමයක් වෙලා පහළ සොහොන් ගෙට වෙලා නිදාගෙන ඉන්න... ඒ වුනත් ඒකට තව අවුරුදු ගනනාවක් යාවි. ඔයාගෙ තාත්තා දැන් කින්ග්ස් ලැන්ඩින්ග්වල රැජිනගෙ හිරකාරයෙක්. ඔයාට එයාව පහළ සොහොන් ගෙවල්වල හොයාගන්ට හම්බවෙන්නෙ නැහැ."

"එයා ඊයෙ රෑ එහෙ හිටියා. මම එයාට කතා කලා."

"මුරණ්ඩු කොලුවා." සුසුමක් හෙලූ මේස්ටර්වරයා සිය පොත පසෙකින් තැබීය. "ඔයා කැමැතිද ගිහින් බලන්ට?"

"මට බැහැ නෙ. හොඩෝර් යන්ට කැමැති නැහැ. ඩාන්සර්ගෙ පිටේ යන්ට තරම් පඩිපෙළ පටු වැඩියි, වංගු වැඩියි."

හොඩෝර් වෙනුවට වනචාරී ගැහැණිය ඕෂා කැඳවනු ලැබිනි. ඇය උස්, දැඩි, මැසිවිලි නොනගන වර්ගයේ අයකු විය. ඇයට අණකෙරුනු වහා කොහේ වුවද යාමට කැමැති වූවාය. "මම මගේ ජීවිතේ ගෙවුවෙ ප්‍රාකාරෙන් එහා. ඉතින් මේ පොළොවෙ හාරලා තියෙන වලකට මම මොකට බයවෙන්ටද මගේ උතුමනි." ඇය කීවාය.

"සමර්, එන්ට." ඇය සිය කෙහඟ, ශක්තිමත් දෑතින් ඔහුව ඔසවාගද්දී බ්‍රැන් කීවේය. ලැටිගාමින් සිටි ඇටකටුව අතහැරි සෝරවෘකයා ඕෂා විසින් බ්‍රැන්ව ඔසවාගෙන අංගනය හරහාත් සර්පිලාකාර පඩිපෙළ දිගේ පහළින් වූ අන්ධකාර සීතල බිංගෙයටත් ගෙනයද්දී

ඇය පසුපසින් ඇදුනේය. පන්දමක් අතින් ගත් මේස්ටර් ලූවින් ඔවුන්ට පළමුව පඩිපෙළ බැස්සේය. ඇය හොඩෝර් මෙන් ඔහුව පිටේ බැඳගෙන නොගොස් කුඩා දරුවකු මෙන් වඩාගෙන යෑම ගැන බ්‍රැන් එතරම්ම අභිතක් නොසිතුවේය. මේ වනචාරී ගැහැණිය වින්ටර්ෆෙල්වලට පැමිණියායින් පසුව හොඳින් හැසිරීමත් ඔවුන්ට ලැදිව සේවය කිරීමත් නිසා ඇගේ දෙපාවලට යොදා තිබුනු දම්වැල ඉවත් කරන්නැයි සෙර් රඩ්‍රික් විසින් අණ දී තිබුනි. දම්වැලින් ඇදා තිබුනු බරැති යකඩ විලංගු යුගළ තවමත් ඇගේ වළළුකර වටා තිබුනු නමුදු - ඔවුන් තවමත් ඇයව සියයට සියයක්ම විශ්වාස නොකරන බැව් සිහිපත් කරදෙන්නට දෝ - පටු පඩිපෙළ බැස යාමට ඒ බාධාවක් නොවීය.

* * *

තමා අවසන් වරට මේ සොහොන් ගෙවලට පැමිණි අවස්ථාව සිහිපත් කරගැනීමට බ්‍රැන් අසාර්ථක උත්සාහයක් දැරීය. නියත වශයෙන්ම ඒ ඔහු කුඩා දරුවකුව සිටියදී විය යුතුය. රොබ්, ජොන් හා සිය සොයුරියන් සමගින් මෙහි සෙල්ලම් කිරීමට ඔහු පුරුදුව සිටියේය.

ඔවුන් නැවතත් දැන් මෙහි සිටියානම් යැයි ඔහු හුල්ලන්නට විය. එසේනම් මේ බිංගෙය මෙතරම් අන්ධකාරවට හෝ මෙතරම් බියකරු විලසට නොපෙනෙනවා ඇත. වැඩිවන අන්ධකාරය මැද්දේ හදිසියේම නැවතුනු සමර් හිස ඔසවා බලා සීතල නිසල වාතය ඉව කර බැලීය. දත් විලිස්සාගත් ඌ හෙමිහිට පස්සට ඇදුනේ මේස්ටර්වරයා ගේ පන්දමේ එළියෙන් ඒ දැස් රන් පැහැයෙන් දිදුලන්නට විය. පැරණි යකඩ ගොඩක් මෙන් දැඩි වූ ඕෂා පවා මොහොතකට සසල වූ බැව් පෙනුනි. "ජේන හැටියට නං බොහොම භයානක සැරපරුස මිනිස්සු." සිය ශෛලමය අසුන්වලට වී සිටි ශෛලමය ස්ටාර්ක්වරුන් පේළිය දෙස බලමින් ඇය කීවාය.

"එයාලා තමා ශීත ඍතුවේ රජවරු." බ්‍රැන් මිමිනුවේය. මෙම ස්ථානයේ දී හඬනගා කතාකිරීම බලවත් වරදක් මෙන් කෙනෙකුට හැඟෙයි.

ඕෂා සිනාසුනාය. "ශීත ඍතුවට රජවරු නෑ. ඔබ ඒක දැක්කනං ඔබ ඒක තේරුම්ගනියි ගිම්හානයේ දරුවො."

"එයාලා තමා අවුරුදු දාස් ගානක් තිස්සෙ උතුරුකරයේ රජවරු." මේස්ටර් ලූවින් පැහැදිලි කලේය. ඔහු සිය පන්දම ඉහළට කර එසවූ අතර ශෛලමය මුහුණු මත ගිනිදළු නටන්නට විය. මෙයින් සමහරු දිගු කොණ්ඩා හා රැවුල් වවාගත්, සිය දෙපා අසල වැතිර නිදන වෘකයින් මෙන්ම දළ ලොමින් ගැවසීගත් බිහිසුණු මිනිසුන් වූහ. තවත් සමහරු හොඳින් රැවුල බෑ, සිය උකුළු මත ඇති දිගු යකඩ අසිපත් මෙන්ම වැරුනු, තියුණු මිනිසුන් වූහ. "අමාරු කාලවලට එන්නෙ දැඩි මිනිස්සු. එන්ට." ඔහු දිගු පියවර තබමින් උමගට වැදුනේ ශෛලමය කුළුණුත්, නිමක් නැති ප්‍රතිමාත් පසුකරමින් ඉදිරියට යන්නට විය. ඉහළට කර ඔසවාගත් පන්දමෙන් විහිදුනු ආලෝක ධාරාවක් පසුපසට විහිදුනේය.

මේ උමගය විශාල එමෙන්ම ගැඹුරු එකක් විය. එය වින්ටර්ෆෙල්වලටත් වඩා දිගු එකක් විය. වරක් ජොන් ඔහුට පවසා තිබුනේ මෙහි මීටත් පහළින් තවත් මට්ටම් ඇති බවකි. ඒ වනාහි පුරාතණ රජවරුන් නිදනා මීටත් වඩා අන්ධකාර, මීටත් වඩා ගැඹුරු උමං විය. මේස්ටර්වරයා ගේ ආලෝකය මඟහැරීම සුදුසු නොවේ. බ්‍රැන්ව වඩාගත් ඕෂා මේස්ටර්වරයා පසුපස පියමැන්න නමුදු සමර් පඩිපෙළින් බිමට බැසීම ප්‍රතික්ෂේප කරමින් එහිම රැඳී හුන්නේය.

"ඔයාට ඔයාගෙ ඉතිහාස පාඩම් මතකද බ්‍රැන්?" ඇවිදින අතරේ මේස්ටර්වරයා විමසීය. "ඔයාට පුළුවන්නම් ඕෂාට කියන්ට එයාලා කවුද, එයාලා මොනවද කලේ කියලා."

* * *

පසු කරමින් යන මුහුණ දෙස බලන අතරේ පැරණි කතන්දර නැවත ඔහුගේ මතකයට පිවිසියේය. මේස්ටර්වරයා ඔහුට මේ කතා කියා දී තිබුනු අතර නාකි ආයම්මා ඒවා වඩා සජීවී අයුරින් ඔහු ඉදිරියේ මවා පෙන්වා තිබුනි. "අර ඉන්නෙ ජොන් ස්ටාර්ක්. නැගෙනහිරින් මුහුදු කොල්ලකාරයො ගොඩබැස්සට පස්සෙ එයා උන්ව එලවලා දාලා ධවල වරායෙ තියෙන බලකොටුව ගොඩනැගුවා. එයාගෙ පුතා රිකාර්ඩ් ස්ටාර්ක්. මගේ තාත්තගෙ තාත්තා නෙවෙයි, වෙන රිකාර්ඩ් කෙනෙක්. එයා වගුරු රජාගෙන් බෙල්ල අල්ලගෙන එයාගෙ දුවව කසාද බැඳගත්තා. තියන් ස්ටාර්ක් කියන්නෙ අර ඉන්න දිග කොණ්ඩෙකුයි රැවුලකුයි තියෙන කෙට්ටු එක්කෙනා. මිනිස්සු එයාට කිවුවෙ 'බඩගිනිකාර වෘකයා' කියලයි. මොකද එයා හැම තිස්සෙම යුද්ධ කර කර හිටපු නිසා. අර ඉන්නෙ, අර උස, නිදිමත මූනෙන් ඉන්නෙ බ්‍රැන්ඩන්. එයාට කිවුවෙ 'නාවුක බ්‍රැන්ඩන්' කියලා මොකද එයා මුහුදට ආදරේ කරපු නිසා. එයාගෙ සොහොන් ගැබ හිස්. එයා ඉරබහින මුහුදෙ බටහිර

පැත්තට යාත්‍රා කලා. ඊටපස්සෙ එයා ගැන අහන්ට කිසිම ආරංචියක් නැහැ. එයාගෙ පුතා තමා 'ගිනි තියන බ්‍රැන්ඩන්' මොකද එයා තාත්තා නැති වුන දූක නිසා තාත්තගෙ නැවු සේරටම ගිනි තියලා දැම්මා. එතකොට අර ඉන්නෙ රඩ්‍රික් ස්ටාර්ක්. එයා තමා මල්ලව පොරයකින් වලස් දූපත දිනලා ඒක මෝර්මන්ට්ලාට පවරලා දුන්නෙ. අරයා තමා 'දණ නමපු රජා' ටෝරන් ස්ටාර්ක්. එයා තමා උතුරේ අන්තිම රජතුමා. වින්ටර්ෆෙල්වල පළවෙනි අධිපතියා. එයා ජයග්‍රාහක ඒගන්ට යටත් වෙලා දණ නැමුවා. ආහ්! අර ඉන්නෙ අර ඉන්නෙ. එයා තමා ක්‍රෙගන් ස්ටාර්ක්. එයා එකපාරක් ඒමන් කුමාරයා එක්කත් සටන් කලා. මකර නයිට්වරයා ඊට පස්සෙ කිවුවා මේ තරම් දක්ශ කඩුහරඹ සූරයෙකුට එයා කවදාවත් මුහුණ දීලා නැහැයි කියලා." ඔවුන් මේ වනවිට පේළියේ අවසානයට ළඟා වී තිබුනි. සිය සිරුර පුරාම පුදුමාකාර අන්දමේ ශෝකාකූල බවක් පැතිර යනු බ්‍රැන්ට දැනුනි. "ඉතින් අර ඉන්නෙ මගේ සීයා. රිකාර්ඩ් උතුමානන්. පිස්සු රජා ඒරිස් එයාගෙ බෙල්ල කපලා මරලා දැම්මා. එයාගෙ පැත්තකින් තියෙන සොහොන් ගැබ් දෙකේ ඉන්නෙ එයාගෙ දුව ලියානායි එයාගෙ පුතා බ්‍රැන්ඩනුයි. මම නෙවෙයි. වෙන කෙනෙක්. ඒ මගේ තාත්තගෙ අයියා. හරිනම් එයාල වෙනුවෙන් ඔහොම පිළිම දෙකක් හදන්ට බැහැ. ඒ අයිතිය තියෙන්නෙ රජවරුන්ටයි අධිපතියන්ටයි විතරයි. ඒ වුනත් මගේ තාත්තා එයාලට කොච්චර ආදරේ කලාද කිවුවොත් එයා ඒ ගොල්ලො වෙනුවෙන් ඒවා හැදෙවුවා."

"ඒ තරුණි හරිම ලස්සනයි." ඕෂා පැවසීය.

"එයා විවාහ ගිවිසගෙන හිටියෙ රොබර්ට් රජතුමාත් එක්කයි. ඒ වුනත් රේගාර් කුමාරයා එයාව පැහැරගෙන ගිහින් දූෂණය කලා." බ්‍රැන් විස්තර කලේය. "එයාව ආපහු දිනාගන්ට රොබර්ට් රජතුමා යුද්ධයක් කලා. එයා ගංගා ත්‍රිශූලෙදි එයාගෙ අර මහ යගදාවෙන් ගහලා රේගාර්ව මරලා දැම්මා. ඒ වුනත් ලියානා මැරුනා. එයාට ලියානාව ආපහු කවදාවත් හම්බවුනේ නැහැ."

"හරිම දූක හිතෙන කතාවක්." ඕෂා කීවාය. "ඒ වුනත් අර හිස් වලවල් ඔක්කොටම වඩා දුක්මුසුයි."

"එඩාර්ඩ් උතුමානන්ගෙ බිංගෙය. එයාගෙ කාලෙ ආවහම." මේස්ටර් ලුවින් පැහැදිලි කලේය. "ඔයාගෙ හීනෙදි තාත්තා මෙතැන ඉන්නවද ඔයා දැක්කෙ බ්‍රැන්?"

"ඔවු." මේ මතකය විසින් ඔහුව වෙවුලුවාලීය. ඔහු අපහසුතාවට පත් වූ අන්දමින් උමගේ හාත්පස පිරික්සා බැලීය. සිය ගෙලෙහි පිටුපස වූ කෙස් කෙලින් වනු ඔහුට දැනුනි. ඔහුට යම් ශබ්දයක් ඇසුනිද නැතිනම් ඒ සිතේ සැකයද? තවත් කෙනෙකු මෙහි ආවාද?

පන්දම අතින් ගත් මේස්ටර් ලුවින් විවෘත සොහොන් වල දෙසට ලංවුනි. "ඉතින් ඔයාට දැන් පේනවනෙ. එයා මෙහෙ නැහැ. තව අවුරුදු ගානකට මෙහාට එන්නෙත් නැහැ. හීන කියන්නෙ හීන විතරයි දරුවො." දැවැන්ත මෘගයෙකු ගේ මුවට අත ඔබන්නාක් මෙන් ඔහු අන්ධකාර සොහොන් වල තුළට සිය අත එබීය. "ඔයාට පේනවනෙ? ඒක නිකංම හි-"

ඊළඟ මොහොතේ අන්ධකාරය දත් විලිස්සා ඔහු දෙසට කඩා පැන්නේය.

**Maester Luwin: “The man who trusts in spells is dueling with a glass sword.”**

කොළ පැහැ ගින්දර මෙන් දිදුලන දෑසක් ද, විලිස්සුනු දත් දෙපෙළක දිලිසීම ද, ඔවුන් වටා වූ අන්ධකාරය තරමටම කළු පැහැ වූ ලොම් ගුලියක් ද බ්‍රැන් දුටුවේය. කෑගැසූ මේස්ටර් ලුවින් දැත් වැනුවේය. අතැඟිලි අතරින් ගිලිහී පියාඹා ගිය ගිනි පන්දම බ්‍රැන්ඩන් ස්ටාර්ක් ගේ මුහුණේ වැදී ඔහුගේ ප්‍රතිමාවේ පාමුල වැටුනු අතර එහි දෙපා ගිනිදළුවලින් වැසී ගියේය. නිවෙන්නට තතනමින් දඟලන ගිනිදළුවල ආලෝකය මැද්දේ මේස්ටර් ලුවින් සෝරවෘකයා හා සටන් වදිනුත්, ඔහුගේ එක් අතක් සතාගේ හණුවට සිරවී තිබියදී ඔහු අනිත් අතින් උගේ හොම්බට තඩිබානුත් ඔවුහු දුටුවෝය.

"සමර්!" බ්‍රැන් මොරගැසුවේය.

ඔවුන්ට පිටුපසින් වූ අන්ධකාරය විනිවිද සෙවනැල්ලක් මෙන් සමර් දිව ආයේය. ඌ ෂැගීඩෝග් වෙතට කඩාපැන ඌව බිම පෙරලා දැමූ අතර ඊළඟ මොහොතේ සෝරවෘකයින් දෙදෙනා එකිනෙකා සපාකමින්, එකිනෙකාට කඩා පනිමින්, අළු පැහැ සහ කළු පැහැ ලොම් ගුලි දෙකක් මෙන් නැවත නැවතත් එකිනෙකා හා සටන් වැදුනෝය. සිය තුවාල වූ රුධිරය වැගිරෙන අතත් සමගින් මේස්ටර් ලුවින් දණින් නැගී සිටියේය. බ්‍රැන්ව රිකාර්ඩ් උතුමානන්ගේ ශෛලමය වෘකයාට හේත්තු කොට තැබූ ඕෂා මේස්ටර්වරයාට

උදවු වනු පිණිස දිවගියාය. බිම වැටී තිබුනු පන්දමේ දඟලන එළියෙන් අඩි විස්සක් උසැති සෙවනැලි වෘකයින් දෙදෙනෙක් උමගයේ බිත්ති මත හා වහලය මත එකිනෙකා කා කොටාගන්නා අයුරු පෙනුනි.

"ෂැගී." කුඩා කටහඬක් කතාකලේය. බ්‍රැන් හිස ඔසවා බැලූ විට ඔහු බාල සොහොයුරා සිය පියා වෙනුවෙන් තැනුනු සොහොන් ගැබේ මුවවිට සිටගෙන සිටිනු දිස්විය. අවසාන වරට සමර්ගේ මුහුණට කඩා පිනූ ෂැගීඩෝග් සටනින් මිදී රිකන්ගේ පසෙකට පිනීය. "ඔයා මගේ තාත්තට ඉන්ට දෙන්ට." රිකන් මේස්ටර්වරයාට අනතුරු ඇඟවීය. "ඔයා එයාට ඉන්ට දෙන්ට."

"රිකන්." බ්‍රැන් මෘදු ස්වරයෙන් ඇමතීය. "තාත්තා මෙහෙ නැහැ."

"නෑ එයා ඉන්නවා. මම එයාව දැක්කා." රිකන්ගේ මුහුණේ කඳුළු බිඳු දිදුලනු පෙනින. "මම එයාව ඊයෙ රෑ දැක්කා."

"ඔයාගෙ හීනෙදි...?"

රිකන් හිස වැනීය. "ඔයා එයාට ඉන්ට දෙන්ට. ඔයා එයාට ඉන්ට දෙන්ට. එයා දැන් ගෙදර එනවා. පොරොන්දු වුනා වගේම එයා ගෙදර එනවා."

මේස්ටර් ලුවින් මෙතරම් අභිරණාත්මක ස්වරයෙන් බලා සිටිනු බ්‍රැන් මින් පෙර කිසිදා දැක නොතිබුනි. ෂැගීඩෝග් විසින් ඔහුගේ කබා අතේ ලොම් හා ඊට යටින් වූ මාංසය ඉරා දැමූ තැනින් රුධිර බිංදු වෑස්සෙන්නට විය. "ඕෂා. පන්දම ගනින්." ඔහු වේදනාවෙන් දත්මිටි කමින් කීවේය. ඇය වහා පැන එය නිවී යන්නට පෙර ඔසවා ගත්තාය. බ්‍රැන්ගේ මහප්පාගේ දෙකකුල් දැළිඅඟුරු විසින් කළු පැහැයට හරවා තිබුනි. "මේ... මේ සතා... බලු කූඩුවෙ දම්වැලින් බැඳලා දාලයි ඉන්ට ඕන." ලුවින් කීවේය.

රිකන් ෂැගීඩෝග් ගේ ලෙයින් පෙඟී තිබුනු හොම්බට තට්ටු කලේය. "මම එයාව නිදහස් කලා. එයා දම්වැල්වලට කැමැති නැහැ." ඌ ඔහුගේ අතැඟිලි ලෙවකෑවේය.

"රිකන්. ඔයා මගෙත් එක්ක එන්ට කැමැතිද?" බ්‍රැන් ඇසුවේය.

"නෑ. මම කැමැතියි මෙතනට වෙලා ඉන්ට."

"මෙතන හරිම කළුවරයිනෙ. ඒ වගේම සීතලයි."

"මම බය නැහැ. මට තාත්තා එනකම් බලන් ඉන්ට ඕන."

"ඔයාට මාත් එක්ක බලන් ඉන්ට පුළුවන්. අපි දෙන්නම බලන් ඉමු. අපි දෙන්නයි අපේ වෘකයා දෙන්නයි." සෝරවෘකයින් දෙදෙනාම දැන් සිය තුවාල ලෙවකමින් සිටියෝය.

"බ්‍රැන්." මේස්ටර්වරයා තිරහඬින් කීවේය. "මම දන්නවා ඔයා ඔය හොඳක් කරන්ටයි හදන්නෙ කියලා. ඒ වුනත් ෂැගීඩෝග් මෙහෙම නිදැල්ලෙ යන්ට අරින්ට තරම් කැලෑ ගතිය වැඩියි. ඌ හපාකාපු තුන්වෙනියා මම. ඌට මෙහෙම නිදහසේ බලකොටුවෙ ඇවිදින්ට දුන්නොත් වැඩිකල්යන්ට කලින්ම ඌ මිනිහෙක්ව මරලා දායි. ඇත්ත පිළිගන්ට අමාරුයි තමා. ඒ වුනත් මේ වෘකයා එක්කො දම්වැල් දාලා බඳින්ට ඕන. එහෙම නැත්තම්..." ඔහු නැතනුවේය.

'...එහෙම නැත්තම් මරලා දාන්ට ඕන.' බ්‍රැන් සිතුවේය. එනමුදු ඔහු කීවේ අනිකකි. "එයා හැදිලා ඉන්නෙ දම්වැලින් බැඳලා දාන්ට නෙවෙයි. අපි ඔයාගෙ කුළුණට වෙලා බලා ඉන්නම්. අපි ඔක්කොම."

"ඒක කරන්ට බැරි දෙයක්." මේස්ටර් ලුවින් කීවේය.

ඕෂා විරිත්තුවාය. "මම දන්න තරමින් නම් මේ දරුවා තමා දැන් මේ බලකොටුවෙ උතුමානන්." පන්දම නැවත මේස්ටර්වරයාට බාරදුන් ඇය බ්‍රැන්ව දෝතින් ඔසවා ගත්තාය. "මේස්ටර්ගෙ කුළුණට යමු."

"ඔයත් එනවද රිකන්?"

ඔහුගේ සොහොයුරා හිස වැනීය. "ෂැගීත් එනවනම් විතරයි." ඕෂා හා බ්‍රැන් පසුපස දුවමින් ඔහු කීවේය. වෘකයින් දෙස පරීක්ෂාකාරීව බලමින් ඔවුන් පසුපසින් වැටෙනවා හැර මේස්ටර් ලුවින් වෙත වෙනත් විකල්පයක් නොවීය.

* * *

මේස්ටර් ලුවින් ගේ කුළුණ කෙතරම් අපිළිවෙල තැනක් වී ද යත් යම් කිසිවක් උවමනා වූ විට ඔහු එය සොයාගන්නේ කෙසේදැයි බ්‍රැන් මවිතයෙන් යුතුව කල්පනා කලේය. මේස සහ පුටු මත පොත් තට්ටු පිට තට්ටු ගොඩගසා තිබින. රාක්ක පුරවා නොයෙකුත් දෑ පිරවූ වීදුරු බෝතල්, බරණී පේළියක් පසුපස පේළියක් බැගින් වූ අතර ගෘහභාණ්ඩ සැමෙකක්ම පාහේ ඉටිපන්දම් කොටවලින් හා වියළී ගිය ඉටිවලින් අපවිත්‍ර විය. ත්‍රිපාදයක් මත සවිකර තිබුනු ලෝකඩින් කල ම(ර්)රිෂ් කාච බටය සඳළුතලයට පිවිසෙන දොර පසෙක විය. බිත්තිවල නොයෙක් තරු රටා, වගු හා චක්‍ර එල්ලා තිබින. අනේකවිධ සිතියම් ද, කඩදාසි ද, පිහාටු පෑන් හා තීන්ත බහාලන බඳුන් ද දසත විසිර තිබින. මේ සෑම භාණ්ඩයක්ම හා උපකරණයක්ම කපුටු කූඩුවල සිටින කපුටන් විසින් හෙලූ වසුරුවලින් අපවිත්‍ර වී තිබින. මේස්ටර් ලුවින් ගේ උපදෙස් මැද්දේ ඕෂා විසින් ඔහුගේ තුවාල පිරිසුදු කර බෙහෙත් දමන අතරේ ඉහළින් වූ මේ කපුටු කූඩුවල සිටි කපුටෝ කරව් කරමින් ඔවුන් දෙස බලා සිටින්නට වූහ. "මේක මහ මෝඩ පිස්සු වැඩක්." ඈය ඔහුගේ තුවාලය මත දැවෙනසුළු ආලේපයක් අතුල්ලන අතරේ ඔහු කීවේය. "මම පිළිගන්නවා ඔයාලා දෙන්නම එකම හීනෙ දැකපු එක ටිකක් අමුතුයි තමා කියලා. ඒ වුනත් ඔයාලා පොඩ්ඩක් නැවතිලා ඒ ගැන හිතලා බැලුවොත් තේරෙයි ඒක සාමාන්‍යයි කියලා. ඔයාලට ඔයාලගෙ තාත්තා නැතුව පාළුයි. ඒ වගේම ඔයාලා දන්නවා එයා හිරකාරයෙක් කියලා. බය නිසා මිනිස්සුන්ගෙ හිත්වලට එක එක විකාර අදහස් පහළවෙන්ට පුළුවන්. රිකන් තාම පුංචි වැඩියි තේරුම්ගන්ට-"

"මට දැන් හතරයි." රිකන් පිළිතුරු දුන්නේය. ඔහු දුරේක්ෂය තුළින් පළමු බලකොටුවේ මුරකපොලු නිරීක්ෂණය කරමින් හුන්නේය. සෝරවෘකයින් දෙදෙනා කාමරයේ දෙපස වාඩිගෙන සිය තුවාල ලෙවකමින්, ඇටකටුවක් ලැටිගාමින් සිටියහ.

"-බොහොම ලාබාලයි. ආහ්! අපා හතටම පලයන්! ඒක දනවා... නෑ.. නෑ.. නවත්තන්ට එපා. තව දාන්ට. මම කියන්නෙ බොහොම ලාබාලයි. ඒ වුනත් ඔයා බ්‍රෑන්.. ඔයා දැන් ලොකු ළමයෙක්. ඔයා දැනගන්ට ඕන හීන කියන්නෙ හීන විතරයි කියලා."

"සමහර ඒවා එහෙමයි. සමහර ඒවා එහෙම නෙවෙයි." ඕෂා ගැඹුරු කැපුමක් මතට ලා රත් පැහැ ගිනිවතුර වත්කල අතර මේස්ටර්වරයා හුස්මක් ඇදගත්තේ ය. "වනාන්තරයේ දරුවන්ට පුළුවන් වෙයි ඔබට හීන ගැන කාරනයක් දෙකක් කියලා දෙන්ට."

බෙහෙත්වල සැර නිසා මේස්ටර්වරයාගේ දෑසින් කඳුළු කඩා හැලෙන්නට විය. එනමුදු ඔහු මුරණ්ඩු අයුරින් හිස වැනීය. "දරුවො... ඉන්නෙ හීනවල විතරයි. දැන් එයාලා සහමුලින්ම වඳවෙලා ගිහිල්ලා. ඇති. ඔය ඇති. දැන් වෙළුම්පටි ඔතන්ට. හොඳට ඔතලා තදට ගැටගහන්ට. නැත්තම් ආයෙමත් ලේ ගලයි."

"නාකි ආයම්මා කිවුවෙ දරුවො දැනගෙන හිටියා කියලා ගස්වල කතා බහ තේරුම්ගන්ට. එයාලට කුරුල්ලො වගේ පියාඹන්ට, මාළු වගේ පීනන්ට, සත්තුත් එක්ක කතා කරන්ට පුළුවන් කියලා." බ්‍රෑන් කීවේය. "එයා කිවුවා දරුවො කොච්චර ලස්සනට සංගීතය වාදනය කරනවද කිවුවොත් ඔයාගෙ ඇස් දෙකට කඳුළු පිරෙනවලු ඒවා අහනකොට."

"මේ හැමදෙයක්ම එයාලා කලේ මායා බලවල පිහිටෙන්." මේස්ටර් ලුවින් කීය. "එයාලා දැනුත් හිටියානම්... එහෙමනම් මගේ අත ඉක්මනට සනීප කරගන්ට තිබුනා මායා බලයක් පාවිච්චි කරලා. ඒ වගේම එයාලට පුළුවන් වෙයි ෂැගීඩෝග්ට කතා කරලා කියන්ට කාටවත් හපන්ට එපයි කියලා." ඔහු දැස් කොනින් දැවැන්ත කළු පැහැ සෝරවෘකයා දෙස නොපහන් බැල්මක් හෙලුවේය. "මෙන්න මේක තේරුම්ගන්ට බ්‍රෑන්. මායා බන්ධන වැඩ ගැන විශ්වාසය තියන මිනිහා කරන්නෙ හරියට වීදුරු කඩුවකින් ද්වන්ද්ව සටනක් කරනවා වගේ වැඩක්. හරියට වනාන්තරයේ දරුවො කලා වගේමයි. එන්ට. මම ඔයාට යමක් පෙන්නනන්නම්." නැගිට සිටි ඔහු කාමරය හරහා ගොස් කොළ පැහැ වීදුරු බරණියක් රැගෙන නැවත පැමිණියේය. "මේවා දිහා පොඩ්ඩක් බලන්ට." බරණියේ කට විවර කර දිදුලන, කළු පැහැ ඊමුනු අහුරක් අතට ගනිමින් ඔහු කීවේය.

බ්‍රැන් එයින් එකක් අතට ගත්තේය. "ඒක හැදිලා තියෙන්නෙ වීදුරුවලින්." කුතුහලයට පත් රිකන් ද මේසය අසලට ළඟා වූයේ වඩා හොඳින් දැකගනු පිණිස විය.

"මකරවීදුරු." ඕෂා කීවේ වෙළුම්පටි රැගෙන මේස්ටර් ලූවින් අසලින් අසුන් ගනිමිනි.

"ඔබ්සිඩියන්." මේස්ටර්වරයා තිරහඬින් කීවේය. ඇයට වෙළුම්පටි යොදනු පිණිස ඔහු සිය තුවාල අත ඔසවා අල්ලාගත්තේ ය. "පොළොවෙ බොහොම යට තියෙන දෙවියන්ගෙ ගින්නෙන් පදම් කරලා හදාපුවා. අවුරුදු දාස් ගානකට කලින් වනාන්තරයේ දරුවො දඩයම් කලේ මේවයින් තමා. දරුවො ලෝහ පාවිච්චි කලේ නැහැ. ඇඳුම් පැළැඳුම් වෙනුවට එයාලා ගස්වල කොළවලින් වියාපු දිග ගවුම් වගේ ඇඳුමක් ඇන්දා. කකුල්වලට ගස්වල පොතු තියලා බැන්දා. එතකොට එයාලට ලේසියෙන්ම කැලේ ගස් අතරේ හැංගිලා ඉන්ට පුළුවන්. කඩු වෙනුවට එයාලා පාවිච්චි කලේ ඔබ්සිඩියන් වලින් හදාපු තල."

"තාමත් පාවිච්චි කරනවා." මේස්ටර්වරයා ගේ තුවාල මතින් සුමුදු රෙදි කැබැලි තැබූ ඇය දිග හණ රෙදි පටිවලින් ඒවා තදකොට බැන්දාය.

බ්‍රැන් ඊමුණ දැසට ලංකොට නිරීක්ෂණය කලේය. කළු පැහැ වීදුරුව සිනිඳු දිදුලන එකක් විය. එය අලංකාර යැයි ඔහු සිතුවේය. "මට එකක් තියාගන්ට පුළුවන් ද?"

"ඔයාගෙ කැමැත්තක්." මේස්ටර් ලූවින් කීවේය.

"මටත් එකක් ඕන." රිකන් කීය. "මට හතරක් ඕන. මොකද මට හතරයි නෙ."

ලූවින් ඔහුට ඒවා ගණන් කර ගන්නැයි කීවේය. "පරෙස්සමින්. ඒවා තාමත් හරි තියුණුයි. කපාගන්ට එහෙම එපා."

"මට දරුවො ගැන කියන්ට." බ්‍රැන් කීය. එය වැදගත් දෙයක් බැව් ඔහුට හැඟුනි.

"ඔයාට මොනවද දැනගන්ට ඕන?"

"හැම දෙයක්ම."

* * *

මේස්ටර් ලුවින් සිය ගෙල වටා සිරව තිබූ දම්වැල අතින් ඇද්දේය. "එයාලා 'උදා යුගයේ' හිටපු ජන කොට්ටාසයක්. මුල්ම ජනතාව. රාජධානියි රජවරුයි එන්ටත් ගොඩක් ඉස්සර. ඒ කාලෙ මේ වගේ බලකොටු, මාලිගා තිබුනෙ නැහැ. නගර මොකුත් තිබුනෙත් නැහැ. මෙතැන ඉඳන් ඩෝර්න් මුහුද ගාවට යනකම්ම කිසිම නගරයක්, අඩුම ගානෙ පුංචි වෙළෙඳපලක්වත් තිබුනෙ නැහැ. කිසිම මිනිහෙක් හිටියෙත් නැහැ. අපි දැන් මේ රාජධානි සප්තකය කියලා කියන මුළු බිමේම හිටියෙ වනාන්තරයේ දරුවො විතරයි."

"එයාලා අඳුරු පාට හමක් තිබුන, බොහොම ලස්සන ජනතාවක්. එයාලගෙ ඇඟවල් පොඩියි. වැඩුන කෙනෙක් වුනත් දැන් කාලෙ දරුවෙකුට වඩා උස ගියේ නැහැ. එයාලා ජීවත්වුනේ කැලේ මැද්දෙ, බොහොම ගැඹුරෙ ගල් ගුහාවල, පොළොවෙ පැළුම්වල, රහසිගත ගස් නගරවල එහෙම. ශරීර ප්‍රමාණෙන් පුංචි වුනා වගේම එයාලා බොහොම වේගවත්. ක්ෂණිකයි. පිරිමි ගෑනු දෙගොල්ලම හරි හරියට දඩයමේ ගියා. ඒකට එයාලා පාවිච්චි කලා වයර්වුඩ් ලීයෙන් හදාපු දුනුයි, උගුලුයි. එයාලගෙ දෙවිවරුන්ට කිවුවෙ වනාන්තරයේ දෙවිවරු කියලයි. ගස්, ගල්, දියපාරවල්. මේ දෙවිවරුන්ට නමක් තිබුනෙ නැහැ. මෙයාලගෙ හිටියා බොහොම ඥානවන්ත වක්තෘන්ලා, එයාලට කිවුවෙ 'සිහිනදකින්නෝ' කියලා. එයාලා වයර්වුඩ් ගස්වල මූනු කෙටුවා වනාන්තරේ ඇතුළෙ සිද්දවෙන දේවල් ඒ මූනු හරහා දකින්ට පුළුවන් වෙන්ට. මේ වනාන්තරයේ දරුවො කොහෙන් මෙහාට ආවද එයාලා කොච්චර කාලයක් මෙහෙ හිටියද කියන එක කිසිම කෙනෙක් දන්නෙ නැහැ."

"ඒ වුනත් මීට අවුරුදු දොළොස්දාහකට කලින් නැගෙනහිර දිසාවෙ ඉඳන් මුල් මිනිස්සු ආවා. ඩෝර්න්වල කැඩුන අත ඒ කාලෙ කැඩිලා නෙවෙයි තිබුනෙ. ඉතින් එයාලා ඒක දිගේ ඇවිදගෙන ආවා. එයාලා ආවෙ ලෝකඩ කඩු අරන්, දැවැන්ත හම් පලිස් අරන්. අශ්වයො පිටේ නැගලා. ඒ වෙනකම් පටු මුහුදෙන් මෙහා පැත්තෙ අශ්වයෙක් දැකලා තිබුනෙ නැහැ. කිසිම සැකයක් නැහැ දරුවො මේ අශ්වයො දැකලා බයවුනා. ඒ තරමටම

මුල් මිනිස්සුත් බයවුනා වයර්වුඩ් ගස්වල කොටලා තිබුන මූනු දැකලා. ඉතින් මේ මුල් මිනිස්සු වනාන්තරේ එළිකරලා ගොවිපල, බලකොටු හදන්ට පටන් ගත්තහම එයාලා මේ වයර්වුඩ් ගස් කපලා ඒවා ගින්නට දැම්මා. වනාන්තරේ දරුවො මේ වැඩෙන් ත්‍රස්ත වුනා. ඉතින් එයාලා යුද්ධෙට ආවා. පරණ සැහැලිවල තියෙන විදියට නම් සිහිනදකින්නො බොහොම බලසම්පන්න මායා බල පාවිච්චි කරලා, මුහුද ගොඩ ගලන්ට සලස්වලා, ඩෝර්න්වල අත යටකරලා දැම්මා. එහෙම තමා ඩෝර්න්වල අත අද ඔය තියෙන තත්ත්වයට පත්වුනේ. ඒ වුනත් එයාලා දොර වහන්ට පරක්කු වුනා වැඩියි. යුද්ධෙ දිගටම ඇදි ඇදී ගියා. මුල් මිනිස්සුන්ගෙ වගේම දරුවොන්ගෙ ලෙයින් මේ බිම රතු පාට වුනා. ඒත් වැඩිපුරම මැරුනෙ දරුවො. මොකද මිනිස්සු ශරීරයෙන් විශාලයි, ශක්තිමත්. අනික ලී, ගල්, ඔබ්සිඩියන් වලින් හදාපු ආයුධවලට ලෝකඩ ආයුධත් එක්ක හැප්පෙන්ටවත් බැරිවුනා. අන්තිමේදි දෙපැත්තෙම ඥානවන්ත උදවිය තේරුම්ගත්තා මේ යුද්ධෙ තේරුමක් නැති දෙයක් කියලා. ඉතින් මුල් මිනිස්සුන්ගෙ නායකයොයි වීරයොයි ගියා වනාන්තරේ දරුවන්ගෙ සිහිනදකින්නොයි වනනැට්ටුවොයි මුන ගැහෙන්ට. එයාලා 'දෙවියන්ගෙ ඇස' කියන මහ විශාල විල මැද්දෙ තියෙන පුංචි දූපතේ වයර්වුඩ් වදුලු මැද්දෙදි මුනගැහුනා."

"එතැනදි මෙයාලා සාම ගිවිසුමක් ඇතිකරගත්තා. මේ ගිවිසුමෙන් මුල් මිනිස්සුන්ට බෙදලා වෙන් කලා මුහුදු වෙරළයි, උස් තැනිතලා බිමුයි, මිටියාවත් ටිකයි, කඳුයි වගුරු බිමුයි. ඒ වුනත් වනාන්තර දිගටම දරුවන්ට අයිති වුනා. ඒ වගේම ආයෙමත් කිසිම වයර්වුඩ් ගහක් කපන්නෙ නැහැයි කියලත් පොරොන්දුවක් ලැබුනා. මේ සාම ගිවිසුමට දෙවියන්ට සාක්කි කරන්ට දූපතේ හැම ගහකම මූනක් කෙටුවා. ඊටපස්සෙ මේ 'මුහුණු දූපතේ' පිහිටෙවුවා 'සිහිනදකින්නන් ගේ ශුද්ධ වූ නිකාය' කියලා එකක් සාම ගිවිසුමේ ඵලවිපාක ගැන ඇහැගහගෙන ඉන්ටයි කියලා."

"මේ සාම ගිවිසුම නිසා මුල් මිනිස්සුයි වනාන්තරේ දරුවොයි අතරේ අවුරුදු හාරදාහක සාමයක් ඇතිවුනා. ඒ වගේම මේ දෙගොල්ල ටික ටික මිත්‍ර වුනා. කාලෙකට පස්සෙ මුල් මිනිස්සු එයාල මෙහාට අරන් ආපු එයාලගෙ පැරණි දෙවිවරු අතඇරලා දාලා වනාන්තරේ දරුවන්ගෙ නමක් නැති දෙවිවරුන්වම අදහන්ට පටන්ගත්තා. මේ සාම ගිවිසුම අත්සන් කරායින් තමා 'උදායුගය' ඉවර වෙන්නෙ. ඊට පස්සෙ පටන්ගත්තා 'වීරයින්ගෙ යුගය.'

බ්‍රැන්ගේ සුරත අත්ල මත වූ සිනිඳු කළු පැහැ ඊමුණ වටකරමින් ගුලි වී ගියේය. "ඔයා කිවුවා ඒ වුනත් දැන් වනාන්තරේ දරුවො ඔක්කොම වඳවෙලා ගිහිල්ලයි කියලා."

"මෙහෙ වඳවෙලා ගිහිල්ලා." ඕෂා පිළිතුරු දුන්නාය. අවසාන වෙළුම්පටිය ගැට ගැසූ ඇය ගැටය තදවනු පිණිස දතින් ඇද්දාය. "ඒ වුනත් ප්‍රාකාරෙන් උතුරෙ තත්ත්වය වෙනස්. වනාන්තරේ දරුවො එහාට තමා ගියේ. එයාලයි, යෝධයොයි, අනිත් පැරණි ජන කොටස් හැමෝමයි."

මේස්ටර් ලුවින් සුසුමක් හෙළීය. "ගෑනියෙ. හරිනම් උඹව මරලා දාන්ටයි තිබුනෙ. නැත්තම් දම්වැල්වලින් බැඳලා දාන්ට. ස්ටාර්ක්ලා උඹට ඕනවටත් වඩා හොඳට සලකනවා. එයාලගෙ කරුනාවන්ත කමට කරන නිග්‍රහයක් ඔහොම එක එක වල්පල් කියලා මේ දරුවන්ගෙ ඔළුවලට ඔය මෝඩ අදහස් දාන එක."

"මට කියන්ට එයාලා කොහෙද ගියේ කියලා." බ්‍රැන් කීවේය." මට දැනගන්ට ඕන."

"මටත් මටත්." රිකන් ද එකතුවිය.

"හරි බොහොම හොඳයි." ලුවින් කටුකුටු ගෑවේය. "හරි ඉතින්, මේ මුල් මිනිස්සුන්ගෙ රාජධානි තියෙන තාක් කල් මේ සාම ගිවිසුම හොඳින් පවත්වගෙන ගියා. වීරයින්ගෙ යුගය පුරාවටමත්, අන්ධකාර රාත්‍රියෙත්, රාජධානි සප්තකය පටන්ගන්නකනුත්. ඒ වුනත් මීට අවුරුදු සිය ගානකට පස්සෙ කාලයක් ආවා, තවත් මිනිස්සු කොට්ටාසයක් පටු මුහුද තරණය කරලා මෙහාට ආවා."

"ඒ ආපු මුල්ම අය තමා අන්දාල්වරු. එයාලා බොහොම උස, ලා පාට හිසකෙස් තියෙන රණකාමී ජනතාවක්. එයාලා ආවෙ වානේවලින් හදාපු ආයුධ අරගෙන, ගින්දරත් අරගෙන, එයාලගෙ අලුත් දෙවියා වුන සප්තකය නිරූපනය කරන්ට එයාලගෙ පපුවල සප්තාග්‍ර තරු ඇඳගෙනයි. මේ යුද්ධ තවත් අවුරුදු සියගානක් තිස්සෙ ඇදිලා ගියා. ඒ වුනත් අන්තිමේදී දකුණුකරේ රාජධානි හයම එයාලා ඉදිරියෙ බිඳ වැටුනා. මේ උතුරුකරේ විතරයි මුල් මිනිස්සුන්ගෙ රාජධානියක් ඉතුරු වුනේ. බෙල්ල පහුකරලා උතුර ආක්‍රමණය කරන්ට ආපු හැම අන්දාල් හමුදාවක්ම උතුරෙ රජතුමාගෙ හමුදාවලට පරාද වුනා. මේ අන්දාල්වරු වයර්වුඩ් වදුලු ගිනි තිබ්බා. මූණු කපලා කොටලා විනාශ කරලා දැම්මා. අතට අහුවුන හැම වනාන්තරේ දරුවෙක්ම මරලා දැම්මා. හැම තැනකම පුරාණ දෙවිවරු නැතිකරලා එයාලගෙ අලුත් සප්තක දෙවියන්ව පිහිටෙවුවා. ඉතින් වනාන්තරේ දරුවො උතුර-"

සමර් උඩුබුරන්නට පටන්ගත්තේ ය.

* * *

තැතිගත් මේස්ටර් ලුවින් හිටි අඩියේ නැවතුනි. දෙපයින් නැගිටගත් ෂැගීඩෝග්ද සිය සොහොයුරාගේ හඬට තමාගේ හඬද මුසු කරන්නට වන් කල බ්‍රැන්ගේ හදවත භීතියෙන් පිරී යන්නට විය. "ඒක එනවා." ඔහු මිමිනුවේය. එය සහතික වශයෙන්ම බලාපොරොත්තු විරහිත ස්වරයක් විය. තමා පෙරදා රැයේ පටන්ම එය දැන සිටි බැව් ඔහු තේරුම් ගත්තේය. අර කපුටා පැමිණ පියාට ආයුබෝවන් කියන්නට තමාව සොහොන් ගුහාවලට කැඳවාගෙන ගිය මොහොතේ සිටම ඔහු ඒ බැව් දැන සිටියේය. එනමුදු ඔහු එය විශ්වාස කිරීමට මැලි විය. මේස්ටර් ලුවින් පැවසූ දේ හරියනු දැකීමට ඔහුට උවමනා විය. 'කපුටා!' ඔහු කල්පනා කලේය. "ඇස් තුනේ කපුටා...'

ඇරඹුනු තරමම අනපේක්ෂිතව උඩුබිරීම හදිසියේම නැවතින. කාමරය හරහා ෂැගීඩෝග් වෙත ඇවිද ගිය සමර් සිය සොහොයුරාගේ ගෙලේ පිටුපස තැවරී තිබුනු ලේ පැල්ලමක් දිවෙන් පිසදාලන්නට විය. කවුළුව දෙසින් පියාපත් ගසන හඬක් ඇසුනි.

කපුටෙක් අඳුරු අළු පැහැ ශෛලමය කවුළු පඩිය මතට ගොඩ බැස්සේය. සිය හොටය විවර කල ඌ නොරිස්සුම් හඬකින් කරව් කරන්නට විය.

රිකන් හඬන්නට වන්නේය. ඔහුගේ සුරතින් මිදුනු ඊමුණු එකින් එක බිම පතිත විය. ඔහුව තමා ළඟට ඇදගත් බ්‍රැන් සිය සොයුරාව වැළැඳගත්තේ ය.

මේස්ටර් ලුවින් කපුටා දෙස බලා සිටියේ හරියටම පියාපත් සහිත ගෝනුස්සකු දෙස බලන්නාක් මෙනි. නින්දෙන් ඇවිදින්නාක් මෙන් හෙමිහිට නැගිට සිටි ඔහු කවුළුව වෙතට ළඟාවූයේය. ඔහු සියුරුහඬලැ අතර කපුටා ඔහුගේ වෙළුම්පටිවලින් ඔතා තිබුනු අත මතට නැංගේය. උගේ පියාපත් අතර වියළි රුධිරය තැවරී තිබුනි. "උකුස්සෙක්." ලුවින් මිමිනුවේය. "එහෙමත් නැත්තම් බස්සෙක් වෙන්ට ඇති. අසරණ සතා. ඌ මෙහෙමවත්

ආපු එක මහ පුදුමයක්." ඔහු කපුටා ගේ පාදයේ ගැටගසා තිබුනු පණිවුඩය ගලවාගත්තේ ය.

මේස්ටර්වරයා කඩදාසිය දිගහරිද්දී තම සිරුර වෙවුලමින් තිබෙනු බ්‍රැන්ට දැනුනි. "ඒ මොකක්ද?" සිය සොයුරා තවත් තදින් වැළැඳගනිමින් ඔහු විමසීය.

"ඔයා දන්නවා ඒ මොකක්ද කියලා දරුවො." ඕෂා කීවාය. එය අකාරුණික ස්වරයක් නොව ඔහුව තේරුමගත්, ඔහුව හඳුනාගත් ස්වරයක් විය. ඇය සිය අත ඔහුගේ හිස මත තැබුවාය.

මේස්ටර් ලුවින් කිසිදු හැඟීමක් නොමැති ස්වරූපයෙන් ඔවුන් දෙස බැලුවේය. සිය අළු පැහැ ලොම් කබා අතේ රුධිරය තැවරුනු, වෙළුම්පටිවලින් සුරත වෙලූ මේ කුඩා මහලු මිනිසාගේ දීප්තිමත් අළු පැහැ දෑසේ කඳුළු බිඳු මතුව තිබුනි. "මගේ උතුමනි," ඔහු බැරෑඩි, වෙවුලුම්කන ස්වරයකින් දෙසොහොයුරන්ව ඇමතීය. "අපි... අපි හොයාගන්ට ඕන එතුමන්ගෙ රූපකාය හොඳට දන්න ගල්වඩුවෙක්ව......"

**Osha: “Winter’s got no king. If you’d seen it, you’d know that.”**

සන්සා 06

මේගර්ගේ බලකොටුවේ පිහිටි කුළුණක වූ සිය නිදන කාමරය තුළ සන්සා අන්ධකාරයේ ගිලී ගියාය. ඇඳ වටා වූ සියළුම තිර රෙදි පහළට ඇද දැමූ ඇය නින්දට යමින්, වැළපෙමින් අවදිවෙමින්, නැවත නින්දට යමින් කාලය ගෙවුවාය. තව දුරටත් නිදන්නට නොහැකි තරම් වූ විට ඇය සිය ඇතිරිලි යටට වී ශෝකය නිසා වෙවුලමින් වැතිර සිටියාය. අහර බඳුන් රැගත් සේවකයින් සෑම කෑම වේලක් පාසාම පැමිණියද ඇයට ඒ දෙස බැලීමට පවා තරම් පිරියක් නොවුනි. අතවත් නොගෑසූ අහර බඳුන් ඇගේ කාමරයේ කවුළුව සමීපයෙහි වූ මේසය මත ගොඩගැසෙන්නට වූ අතර අන්තිමේදී සේවකයින් විසින්ම ඒවා ඉවත රැගෙන යනු ලැබීය.

සමහරවිට ඇගේ නින්ද කිසිදු සිහිනයක් නොදකින බර නින්දක් විය. එවැනි විටෙක ඇය නැවත දෑස් හැරියේ දෑස් පියාගන්නට පෙර සිටියාටද වඩා වෙහෙසකින් වූ නමුදු ඇය එයට වඩා කැමැති වූවාය. මක්නිසාද යත් ඇය නින්දේදී සිහින දුටහොත් ඒ සෑම සිහිනයක්ම ඇගේ පියා පිළිබඳ වූ බැවිනි. නිදා සිටියදී හෝ අවදි වී සිටියදී කියා වෙනසක් නැතිව ඇගේ දෑස් ඉදිරියේ ඔහුගේ රුව මැවී ගියේය. රන්කබාකාරයින් විසින් ඔහුව ඇදගෙන එනු ලැබූ අන්දම, සෙර් ඉලියන් දිගු පියවර තබමින් ඉදිරියට එන අන්දම, සිය පිටට අත යවා අයිස් අසිපත කොපුවෙන් පිටතට ඇදගත් අන්දම, ඒ මොහොත... ඒ මොහොත... ඒ මොහොතේ ඒ දෙස නොබලා ඉවත බලන්නට ඇයට ඕනෑ විය. ඇයට තදින්ම ඕනෑ විය. ඇගේ දෙපා පණ නැතිව ගොස් ඇයව දණින් ඉන්දවුනු නමුදු ඇයට කිසිසේත්ම සිය හිස හරවාගැනීමට නොහැකි විය. සියළුම මිනිසුන් කෑගසමින්, හඬ තලමින් සිටි අතර ඇගේ කුමරා ඇය දෙස බලා සිනාසුනේය. ඔහු එසේ ඈ දෙස බලා සිනාසෙද්දී ඇයට මහත් ආරක්ෂාකාරී බවක් දැනුනි. එනමුදු ඒ එක් මොහොතකට පමණි. ඔහු අර බියකරු වදන් මුවින් පිටකරන තෙක් පමණි. ඇගේ පියාගේ දෙපා... ඇයට වඩාත්ම හොඳින් මතක තිබුනු දේ එය විය... ඔහුගේ දෙපා... සෙර් ඉලියන්... අර කඩුවෙන්... ඔහුගේ දෙපා ගැහුනු අයුරු...

'සමහරවිට මාත් මැරෙයි.' ඇය තමාටම කියාගත්තා ය. මේ සිතුවිල්ල ඇය පෙර සිතා සිටි තරම් බිහිසුණු එකක් නොවීය. ඇය සිය කවුළුවෙන් පිටතට පැන්නොත් මේ වදවේදනා කෙලවර වනු ඇත. මතු යම් දවසක කවීන් ඇගේ සන්තාපය හා දිවි පිදීම ගැන කවි ලියනු ඇත. සිඳී බිඳී ගිය ඇගේ අහිංසක සිරුර පහළින් ඇති ගල් ගොඩවල් මත වැතිර තිබෙනු

ඇත. ඇයව පාවාදුන්, ඇගේ විශ්වාසය පාවාදුන් ඒ සියල්ලෝම එය දැකීමෙන් ලැජ්ජාවට පත්වනු ඇත. සන්සා ඇත්තෙන්ම ඇඳෙන් බැස සිය කාමරයේ කවුළුව වෙතට ගොස් එහි තිර රෙදි ඇද දැමීමට තරම් දුර ගොස් තිබුනාය... එනමුදු ඊළඟ මොහොතේ ඇගේ සිත තුළ වූ ධෛර්‍යය සහමුලින්ම නැතිවී ගිය අතර ඇය ඉකිබිඳිමින් නැවත ඇඳ වෙත දිවගියාය.

කුළුණු පඩිපෙළේ පියගැටෙන හඬ ඇය සිහිනෙන් ඇසුවාය. මිනිසකු ඇගේ නිදන කාමරය වෙත හෙමින් හෙමින් ළඟාවන ඒ හඬ ඇයට ඇසුනාය. ඇයට කල හැකි වූ එකම දෙය දොර පිටුපසට වී ගුලි ගැසී වෙවුලමින් ඒ පියවර හඬට කන්දීම පමණක් විය. මේ මිනිසා තව තවත් කාමරයට ලං වූයේය. ඒ අන් කිසිවෙකුත් නොව සෙර් ඉලියන් ජේය්න් බැව් ඇය දැන සිටියාය. අයිස් අසිපත සුරතින් දරා ඇගේ හිස සිඳලීම පිණිස පැමිණෙමින් සිටින සෙර් ඉලියන් ජේය්න් විය. ඇයට දිව යන්නට තැනක් හෝ සැඟවෙන්නට තැනක් හෝ කාමරයේ දොරට අගුලු දැමීමට ක්‍රමයක් හෝ නොවීය. අන්තිමේදී ඒ පියවර හඬ නැවතුනු අතර ඔහු දැන් දොරට පිටතින් සිටගෙන සිටින බැව් ඇයට වැටහුනි. නිහඬවම, ඒ සීතල දෑසින් බලමින් සිටගෙන සිටිනු ඇයට දැනුනි. ඒ මොහොතේ ඇයට වැටහී ගියේ තමා මුලුමනින්ම නිරුවතින් සිටින බවකි. වහා උක්කුටියෙන් වාඩිවුනු ඇය දෝතින් සිය නිරුවත වසා ගැනීමට තැත්කලාය. ඊළඟ මොහොතේ ඇගේ කාමරයේ දොර ක්‍රීක් හඬ නංවමින් ඇරෙන්නට වූ අතර දැවැන්ත අසිපතක තුඩ එතුළින් එබී බලන්නට විය...

ඇය වෙවුලමින් කෙඳිරිගාමින් අවදිවූවාය. "අනේ එපා. අනේ එපා. මම හොඳ ළමයෙක් වගේ ඉන්නම්. අනේ එපා!" එනමුදු ඒ වදන් අසන්නට එහි කිසිවෙකුත් නොවීය.

* * *

අන්තිමේදී ඔවුන් සත්‍ය වශයෙන්ම ඇය වෙනුවෙන් පැමිණි විට සන්සාට ඔවුන්ගේ පියවර හඬ කොහෙත්ම නොඇසින. එමෙන්ම ඇගේ කාමරයේ දොර ඇරියේ සෙර් ඉලියන් නොව ඇගේ කුමරුවා වූ ජොෆ්රි විය. ඇය සිය ඇඳ මතට වී, තිර රෙදි පහත හෙලාගෙන, බෝලයක් මෙන් වකුටුව බලා සිටි අතර ඒ දහවලද නැතිනම් මධ්‍යම රාත්‍රියද කියා කියන්නටවත් නොදත්තාය. ඇයට ඇසුනු මුල්ම දෙය නම් සිය දොර මහ හඬින් වැසෙන ශබ්දයයි. ඊළඟ මොහොතේ ඇගේ ඇඳ වටා වූ තිරරෙදි වැරෙන් දෙපසට ඇදී ගිය අතර ඇතිවුනු හදිසි ආලෝක තත්ත්වයෙන් සිය දෑස් මුදාගන්නට ඇය දෑත් එසෙවුවාය.

"ඔබ අද දවාලෙ මගෙත් එක්ක රාජසභාවෙ පෙනී ඉන්ට ඕන." ජොෆ්රි කීයේය. "නාලා, හොඳට ඇඳපැළැඳගෙන මගේ කුමාරිකාවට ගැලපෙන විදියට ඉන්ට ඕන." ජොෆ්රි පසුපසින් දුඹුරු පැහැ පිටකබායකින් හා කොළ පැහැ සළුවකින් සැරසුනු දඩබල්ලා බලා සිටියේය. උදෑසන හිරුඑළිය නිසා ඔහුගේ පිළිස්සුනු මුහුණ තවත් අප්‍රිය පෙනුමක් ගත්තේය. ඔවුන්ට පිටුපසින් දිගැති සුදු පැහැ සළුවෙන් සැරසුනු රාජ්‍යාරක්ෂක බලකායේ නයිට්වරුන් දෙදෙනෙක් සිටගෙන සිටියහ.

නිකට තෙක් සිය පොරෝණය ඇදගත් සන්සා ගත වසා ගත්තාය. "නෑ." ඇය ඉකිබින්දාය. "අනේ.. අනේ කරුනාකරලා.. මට තනියෙන් ඉන්ට දෙන්ට."

"ඔබ නැගිටලා තනියෙන් ඇඳුම් ඇඳගත්තෙ නැත්තම් මගේ දඩබල්ලා ඔබ වෙනුවෙන් ඒක කරාවි." ජොෆ්රි පිළිවදන් දුනි.

"මම බොහොම බැගෑපත්ව ඔබෙන් ඉල්ලා ඉන්නවා මගේ කුමරුනි."

"මම දැන් කුමාරයෙක් නෙවෙයි රජෙක්. බල්ලො, එයාව ඇඳෙන් එළියට ඇදලා දාපන්."

ඇය කිසිදු එලක් නොමැතිව දුබල අයුරින් දඟලද්දී ඉහටියෙන් අල්ලාගත් සැන්ඩෝර් ක්ලිගේන් ඇයව ඇඳෙන් නැගිට්ටෙවුවේ ය. සිරුර වසා තිබුනු පොරෝණය බිම වැටුනු අතර ඇගේ නිරුවත් සිරුර ආවරණය පිණිස හැඳ සිටි තුනී නිදන ගවොම හැර අන් කිසිවක් එහි නොවීය. "ඔබට කියාපු විදියට කරන්ට දරුවො." ක්ලිගේන් කීවේය. "ඇඳුම් ඇඳගන්ට." ඔහු මෘදු අන්දමින් ඇයව ඇඳුම් අල්මාරිය දෙසට තල්ලු කලේය.

සන්සා ඔවුන්ගෙන් පසෙකට ඇදුනාය. "මම රැජින කියපු හැම දෙයක්ම කලා. මම අර ලියුම් ලිවුවා. එයා ලියන්ට කියපු හැම දෙයක්ම මම ලිවුවා. ඔබ මට පොරොන්දු වුනා අභයදානය දෙනවයි කියලා. අනේ මට ගෙදර යන්ට දෙන්ට. මම හොඳට ඉන්නම්. කිසිම රාජද්‍රෝහි වැඩක් නොකර ඉන්නම්. මම දිවුරලා පොරොන්දු වෙනවා. මගේ ඇඟේ ද්‍රෝහියෙකුගෙ ලේ නැහැ. මට ඕන එකම දේ ගෙදර යන එක විතරයි."තමා උගත් ආචාරශීලීත්වයන් සිහිපත් වූ ඇය වහා හිස නැමුවාය. "ඔබතුමා සතුටු නම්". ඇය බැගෑපත් ස්වරයෙන් එක්කලාය.

"මම ඒකෙන් සතුටුවෙන්නෙ නැහැ." ජොෆ්රි පිළිතුරු දුන්නේය. "අම්මා කියන්නෙ මම ඔබත් එක්ක විවාහ වෙන්ට යනවා කියලයි. ඒක නිසා ඔබ මෙහෙ ඉන්ට ඕන. ඒ වගේම මට කීකරු වෙන්ට ඕන."

"මට ඔබත් එක්ක විවාහවෙන්ට කිසිම උවමනාවක් නැහැ. ඔබ මගේ තාත්තගෙ හිස ගසා දැම්මා."

"ඌ රාජද්‍රෝහියෙක්. මම කවදාවත් පොරොන්දු වුනේ නැහැ ඌව බේරනවා කියලා. මම කිවුවෙ මම අනුකම්පාසහගත වෙන්නම් කියලා විතරයි. මම එහෙම කලා. ඒ ඔබේ තාත්තා නැතුව වෙන මිනිහෙක් වුනානම් මම ඌව කැලි කැලි ඉරනවා. නැත්තම් පණපිටින් හම ගහනවා. ඒ වුනත් මම එහෙම නොකර ඌට ඉක්මන් මරණයක් ලබාදුන්නා."

සන්සා ඔහු දෙස බැලූයේ සිය දිවියේ පළමුවරට ඔහුව නියමාකාරයෙන් දුටුවාය. ඔහු සිංහ රූ වලින් අලංකාර කෙරුනු ලේ රතු පැහැ පිට කබායකින් සැරසී රන් හුයෙන් කල උස් කොලරයක් සහිත කෙටි කබායක් හැඳ සිටියේය. ඔහු කඩවසම් යැයි තමා සිතූයේ කෙසේදැයි සන්සා මවිතයෙන් කල්පනා කලාය. ඔහුගේ දෙතොල් වර්ෂාවකින් පසු මතුවන පනුවන් මෙන් සුමුදු රත් පැහැයකින් දිදුලුවේය. එමෙන්ම ඒ දැස් අහංකාර කුරිරු ඒවා විය. "මම ඔබට වෛර කරනවා." ඇය කොඳුලාය.

ජොෆ්රි රජුගේ මුහුණ ඇඩිවිය. "මගේ අම්මා මට කියපු දෙයක් තමා රජ කෙනෙක් තමන්ගෙ බිරිඳට තඩිබාන එක මහ නොහොබිනා කමක් කියලා. සෙර් මෙරින්."

ඇයට කිසිවක් සිතාගන්නට ලැබෙන්නටත් පෙර නයිට්වරයා ඇය අසල විය. සිය මුහුණ ආවරණය කරගනු පිණිස එසවූ සන්සාගේ දෑත් වැරෙන් පසෙකට ඇද දැමූ ඔහු අත්වැසුම් ලූ මිටින් ඇගේ කණ හරහා අතුල් පහරක් එල්ල කලේය. තමා ඇද වැටෙනු සන්සා නොදත් මුත් ඊළඟ මොහොතේ තමා තිරරෙදි අතර දණින් වැටී සිටිනු ඇයට තේරුම්ගියේය. ඇගේ කණ කිං ගාමින් තිබූ අතර සෙර් මෙරින් ට්‍රෙන්ට් ඇය අබියස සිටගෙන සිටියේය. ඔහුගේ සුදු පැහැ අත්වැස්මේ රුධිරය තැවරී තිබින.

"උඹ දැන්වත් කීකරු වෙනවද නැත්තම් මම එයාට කියන්ටද ආයෙමත් වතාවත් උඹව මට්ටු කරන්ටයි කියලා?"

සිය කණ අගුළු වැටී ඇත්තාක් මෙන් සන්සාට හැඟුනි. ඇය එය අත ගා බැලූ අතර ඇඟිලි තුඩුවල රුධිරය තැවරී තිබුනි. "මම.. ඒ.. ඒ.. විදියට කරන්නම් මගේ උතුමානනි."

"උඹේ ස්වාමින්. උතුමානන් නෙවෙයි." ජොෆ්රි ඇයව නිවැරදි කලේය. "උඹ රාජසභාවට එයි කියලා මම බලන් ඉන්නවා." ආපසු හැරුනු ඔහු පිටව ගියේය.

සෙර් මෙරින් හා සෙර් ඒරිස් ද ඔහු අනුව පිටව ගියමුත් මඳක් සුනංගු වූ සැන්ඩෝර් ක්ලිගේන් ඇයව අතින් අල්ලා ඇද නැගිට්ටෙවුවේ ය. "නිකං බොරුවට වේදනා විඳින්ට එපා දරුවො. එයාට ඕන දේ කරන්ට."

"මොකක්ද... මොකක්ද එයාට ඕන කරලා තියෙන්නෙ? අනේ මට කියන්ට."

"එයාට ඕන ඔබ හොඳ ලස්සනට හිනාවෙලා, සුවඳ ගගහ එයාගෙ ආදරණීය කුමාරිකාව වගේ ඉන්න එකයි. එයාට ඕන ඔබේ අර සෙප්ටා ඔබට උගන්නලා තියෙන විදියට ලස්සන චාටු කතා, මෝඩ කතා එයාට කියන එකයි. එයාට ඕන ඔබ එයාට ආදරේ කරන්ටයි... එයාට බයවෙන්ටයි."

ඔහු පිටව ගිය පසු නැවත තිරරෙදි අතර බිම ඇණබාගත් සන්සා බිත්තිය දෙස බලාගත්වනම කල්පනාවේ ගැලුනාය. ඇගේ සේවිකාවන් දෙදෙනෙක් බයාදු අයුරින් කාමරය තුළට රිංගාගත්තෝ ය. "මට නාන්ට උණුවතුර ඕන." ඇය ඔවුන්ට පැවසුවාය. "ඒ වගේම සුවඳ විලවුන්. ඒත් එක්කම මේ තැල්ම මකලා දානට පුයර ටිකකුත්." ඇගේ මුහුණේ දකුණු පස දැන් ඉදිමී තිබුනු අතර දැඩිව වේදනා ගෙන දුන්නේය. එනමුදු ජොෆ්රිට ඇයව අලංකාරවත් අයුරින් දකින්නට උවමනා බව ඇය දැන සිටියාය.

උණුදිය විසින් ඇයට නැවත වින්ටර්ෆෙල් සිහිගැන්වූ අතර එයින් ඇගේ සිරුරට අමුතු ශක්තියක් ලැබුනාක් මෙන් පෙනින. සිය පියා මියගිය දිනයේ සිට ඇය මුහුණ සේදීම පවා

නොකල අතර සිරුරේ වූ කුණුධූලි විසින් උණුදිය අවපැහැ ගැන්වූ ආකාරය දෙස ඇය මවිතයෙන් යුතුව බලා සිටියාය. සේවිකාවෝ ඇගේ මුහුණේ වූ රුධිරය සෝදා පිසදා හැර, සිරුරේ කුණු අතුල්ලා, හිසකෙස් සෝදා ඒවා නැවත පෙර මෙන් රතු දුඹුරු කැරැළි ගැසෙන තෙක් හොඳින් පීරුවෝය. ඔවුන්ට යම් යම් අණ දීමට හැරෙන්නට ඇය ඔවුන් හා වදනකුදු නොදෙඩුවාය. ඔවුන් ඇගේ සේවිකාවන් නොව ලැනිස්ටර් සේවිකාවන් විය. ඇය ඔවුන් කිසිවෙකුත් බිඳකුදු විශ්වාස නොකලාය. නා හමාර වූ පසු ඇය එදා තරගාවලිය වෙනුවෙන් සැරසුනු කොළ පැහැ සේද ගවොමෙන් සැරසුනාය. එදා රෑ පැවැති භෝජන සංග්‍රහයේදී ඇගේ කුමරුවා කෙතරම් නිර්භීත අන්දමින් හැසිරුනාදැයි ඇයට සිහිපත් වන්නට විය. සමහරවිට මේ ගවොම දැකීමෙන් ඔහුටද එය සිහිපත් වනු ඇත. එවිට ඔහු ඇයට වඩා කරුනාවෙන් සලකන ඇත.

තමාව කැටුව යාමට කෙනෙකු පැමිණෙන තෙක් බලාසිටින අතරේ කුසගින්න නිවාගනු පිණිස ඇය බටර්කිරි වීදුරුවක් පානය කර විස්කෝතු කිහිපයක් අනුභව කලාය. සෙර් මෙරින් නැවත පැමිණෙද්දී මධ්‍යාහ්නය වී තිබුනි. මේ වනවිට ඔහු සිය ධවල සන්නාහයෙන් සැරසී හුන්නේය. සුදු කොරපොතු සන්නාහයේ රන් පැහැයෙන් වැඩ දමා තිබුනු අතර උස් ශිරස්කය මුදුනේ රන්වන් සූර්යයෙක් විය. ඔහුගේ ග්‍රීවාවරණ, අත්වැසුම්, ජංඝාවරණ හා බූට්ස් සපත්තු යන සියල්ලක්ම ඔප දැමූ වානේවලින් නිමාවී තිබුනු අතර බරැති ලොම් සළුවක් රන්වන් සිංහ රුවක හැඩගත් හාරිච්චියකින් උරහිස මත රැඳවී තිබුනි. ශිරස්කයේ මුවවැස්ම ඉවත් කොට තිබුනෙන් ඔහුගේ රළු මුහුණ ද, දැස් යට වූ අඳුරු පැහැ පැල්ලම් ද, නොරිස්සුම් සහගත මුව ද, අවර්ණ වී යාමට පටන්ගෙන තිබුනු මලකඩ පැහැ හිසකෙස්ද පැහැදිලිව දැකගත හැකි විය. "මගේ ආර්යාවනි." ඔහු ඇයට හිස නැමුයේ හරියට මීට පැය තුනකට පෙරාතුව ඇයට ලේ එනතෙක් තැලූ තැනැත්තා ඔහු නොවන්නාක් මෙනි. "ස්වාමින් අණකලා ඔබතුමීව රාජසභා ශාලාවට එක්කරන් එන්ටයි කියලා."

"මම එන්ට බැහැයි කිවුවොත් මට තලන්ටයි කියලත් එයා කිවුවද?"

"ඔබතුමී එන එක ප්‍රතික්ෂේප කරනවද මගේ ආර්යාවනි?" ඔහු ඇය දෙස හෙලූ බැල්ම කිසිඳු හැඟීමක් නොමැති එකක් විය. අඩුම තරමේ ඔහු ඇගේ මුහුණේ ඉතුරුකර තබාගිය තැල්ම දෙසවත් දැස් යොමු නොකලේය. ඔහු තමාට වෛර නොකරන බැව් සන්සා වටහාගත්තා ය. එමෙන්ම ඔහු තුළ ඇය කෙරෙහි ඇල්මක් ද නැත්තේය. ඔහු තුළ ඇය ගැන කිසිඳු ආකාරයක හැඟීමක් නොවීය. ඔහුට ඇය නිකංම නිකම් ගෘහභාණ්ඩයක් වැනි දෙයක් පමණි. "නැහැ." ඇය අසුනින් නැගිටිමින් පැවසුවාය. ඇයට කේන්තියෙන් පුපුරන්නට උවමනා විය. ඔහු ඇයට රිදවූවාක් මෙන් පෙරලා ඔහුට ද රිදවන්නට උවමනා

විය. නැවත වරක් තමාට රිදවුවහොත් තමා රැජින වූ පසු ඔහුව මේ රාජධානියෙන් එලවා දමන්නෙමියි ඔහුට අනතුරු අඟවන්නට උවමනා විය. එනමුදු දඩබල්ලා තමාට පැවසූ දේ ඇයට සිහිපත් විය. එබැවින් ඇගේ මුවින් පිටවූයේ මෙවැන්නකි. "මගේ ස්වාමීන් මට අණකරන ඕන දෙයක් මම කරන්නම්."

"හරියට මම කරනවා වගේ."

"ඔවු... ඒ වුනත් ඔබ නියම නයිට්වරයෙක් නෙවෙයි සෙර් මෙරින්."

සැන්ඩෝර් ක්ලිගේන් ඇගේ මේ කතාවට සිනාසෙන්නට ඉඩතිබුනි. තවත් සමහර මිනිසුන් ඇයට සාපකරනු ඇත. ඇයට කට පියාගෙන සිටින්නැයි අනතුරු අඟවනු ඇත. නැතිනම් ඇගෙන් සමාව ඉල්ලා සිටිනු ඇත. එනමුදු සෙර් මෙරින් ට්‍රැන්ට් මේ කිසිවක් නොකළේය. සෙර් මෙරින් ට්‍රැන්ට් මේ කිසිවක් ගැන තැකීමක් නොකළේය.

* * *

සභාශාලාවේ සඳළුතලයේ ඇය හැරෙන්නට අන් කිසිවෙකුත් නොවීය. ඇය දෑසට නැගෙන කඳුළු බිඳු වළකාලන්නට තැත්කරමින් බිමට හරවාගත් මුහුණින් යුතුව කාලය ගෙවා දැමුවාය. පහළින් වූ යකඩ සිංහාසනයේ අසුන්ගෙන සිටි ජොෆ්රි ඔහු විසින් යුක්තිය යැයි කියාගත් දේ පසිඳලමින් සිටියේය. කෙසේවුවද තමා ඉදිරියට ගෙනා නඩුහබවලින් දහයෙන් නවයක් කෙරෙහිම ඔහු තුළ කිසිදු උනන්දුවක් නොවූ අතර ඒ සැමෙකක්ම රාජසභාව වෙත යොමු කෙරින. බේලිෂ් උතුමානන්, ප්‍රධාන පූජක පයිසෙල් හා සෙර්සි රැජින විසින් මේ නඩුහබ විසඳන තෙක් ඔහු අසුන මත නොසන්සුන් ලෙස ඇඹරෙමින් බලා සිටියේය. එනමුදු යම් නඩුවක තීන්දුව තමා විසින්ම ලබාදීමට ඔහුට උවමනා විනි නම් එතැනින් එහාට ඔහුගේ මවට පවා ඊට මැදිහත් විය නොහැකි විය.

තමා ඉදිරිපිටට ගෙනා සොරෙකුගේ දෑත් ඒ මොහොතේම, සභාශාලාව තුළදීම සිඳලන්නට ඔහු විසින් සෙර් ඉලියන්ට අණ කෙරින. ඉඩම් හබයක් රැගෙන ආ නයිට්වරුන් දෙදෙනෙකුට හෙට දිනයේ ඒ වෙනුවෙන් ද්වන්ද්ව සටනක් කරන්නැයි ඔහුගෙන් උපදෙස් ලැබුනි. "එකෙක් මැරෙනකම්ම." ඒ ඔහුගේ තීන්දුව විය. ඔහු ඉදිරියේ දණ නැමූ

ගැහැණියක් රාජද්‍රෝහියකු යැයි චෝදනා ලැබ හිස ගසා දමනු ලැබූවකුගේ හිස ලබා දෙන්නැයි අයැද සිටියාය. තමා ඔහුට ආදරය කල බවත්, ඔහුව නිසිපරිදි වල දමා බුහුමන් දක්වන්නට උවමනා බවත් ඇය කීවාය. "උඹ ද්‍රෝහියෙකුට ආදරේ කලානම් උඹත් ද්‍රෝහියෙක් වෙන්ට ඕන." ජොෆ්රි කීවේය. රන්කබාකරුවන් දෙදෙනෙකු විසින් ඇයව දඟගෙය වෙත ඇදගෙන යනු ලැබින.

කළු විල්ලුදයෙන් කල උඩු කබායක් හා රන් හුයෙන් කල කෙටි කබායකින් සැරසුනු, ගෙඹි මුහුණකින් යුත් ස්ලින්ට් උතුමානන් රාජසභා මේසයේ කෙලවරක අසුන් ගෙන සිටියේ රජතුමා නිවේදනය කරනු ලබන සෑම තීන්දුවක්ම අවසානයේ ඒ අනුමත කරන අයුරින් හිස වැනීය. සන්සා නොපහන් ස්වරයෙන් ඒ අප්‍රුව මුහුණ දෙස බලා සිටියේ සෙර් ඉලියන්ට සිය පියාගේ ගෙල සිඳලනු පිණිස ඔහු විසින් පියාව අල්ලා බිම බාවා අල්ලාගත් ආකාරය මෙනෙහි කරමිනි. තමාට ඔහුට රිදවන්නට ඇත්නම්, කිසියම් වීරයෙකු මෙතැන පහල වී ඔහුව බිම බාවා හිස සිඳ දමන්නේ නම් යැයි ඇය ප්‍රාර්ථනා කලාය. එනමුදු ඇගේ හිස තුළ වූ කටහඬක් මුමුනන්නට විය. 'වීරයො කියලා ජාතියක් නැහැ.' එමෙන්ම පෙටයර් උතුමානන් විසින් වරක් මේ සභාශාලාව තුළදීම තමාට පවසන්නට යෙදුනක් ඇයට සිහිපත් විය. "ජීවිතේ කියන්නෙ සින්දුවක් නෙවෙයි වස්තුවෙ. ඔයාගෙ තණගාටුවට හේතුවෙන්ට ඔයාම දවසක ඒක තේරුම් ගනියි." ඔහු එදා එලෙස පැවසීය. 'ඇත්ත ජීවිතේදි දිනන්නෙ වීරයො නෙවෙයි, යක්කු, අමනුස්සයො.' ඇය තමාටම පවසා ගත්තාය. ඊළඟ මොහොතේ ඇගේ සිත තුළ දඬබල්ලා ගේ ගොරෝසු, බෙලෙක් කටහඬ ඇසෙන්නට විය. "නිකං බොරුවට වේදනා විඳින්ට එපා දරුවො. එයාට ඕන දේ කරන්ට."

දිනයේ අවසාන නඩු තීන්දුව වූයේ තරබාරු තැබැරුම් ගායකයෙකුට එරෙහිව විය. මියගිය රොබර්ට් රජතුමාට නිගාදෙන අන්දමේ විකට ගීයක් තනා ගායනා කිරීම ඔහුට නැගුනු චෝදනාව විය. ඔහුට සිය වීණාව ලබදෙන්නැයි අණකල ජොෆ්රි මේ සභාශාලාවට ඇසෙන්නට එය දැන් ගයන්නැයි ගායකයාට අණ කලේය. බියෙන් වැලපෙන්නට වූ ගායකයා තමා නැවත කිසිදාක එය නොගයන්නෙමැයි දිවුරන්නට වූ නමුදු රජතුමා බලකර සිටියේය. එය ඇත්තෙන්ම යම් ආකාරයක විතට ගීයක් විය. රොබර්ට් රජතුමා ඌරෙකු හා සටන් වැද මියගිය අයුරු එයින් විස්තර කෙරිනි. මේ ඌරා වනාහි රොබර්ට්ව මරා දැමූ අර වල්ඌරා බැව් සන්සා දැන සිටියාය. එනමුදු ගීයේ වූ යම් යම් ව්‍යංගාර්ථයන්ගෙන් කියැවුනේ ඇත්තටම මේ කියැවෙන්නේ රැජින ගැන බැව් ඇය වටහාගත්තා ය. ගීය නිමාවූ පසු ජොෆ්රි නිවේදනය කර සිටියේ තමා අනුකම්පා සහගත වන්නට සිතූ බවයි. ගායකයාට සිය අතැඟිලි හෝ දිව යන දෙකෙන් එකක් පමණක් තබාගන්නට අවසර ලැබුනු අතර ඒ කුමක්දැයි තීරණය කරන්නට දවසක කාලයක් ද ලැබුනි. සුපුරුදු පරිදි ජේනස් ස්ලින්ට් උතුමානන් හිස වැනුවේය.

මේ වනාහි දිනයේ අවසාන නඩුව බැව් සන්සා සිතේ නැගුනු සහනයකින් යුතුව සිතුවාය. එනමුදු ඇගේ වදවිභාගය තවම හමාර නොවීය. රාජදූතයා විසින් රාජසභාව අවසන් වූ බැව් නිවේදනය කල වහා ඇය සඳළුතලයෙන් පිටවූ නමුදු සර්පිලාකාර පියගැටපෙළ පාමුල ජොෆ්රි ඇය එනතෙක් බලා සිටියේය. ඔහුත් සමග දඩබල්ලා ද සෙර් මෙරින් ට්‍රැන්ට් ද වූහ. යෞවන රජතුමා ඇය දෙස විවේචනාත්මක බැල්මක් හෙලුවේය. "කලින් හිටියට වඩා දැන් ඔබ ගොඩක් ලස්සනයි."

"ස්තූතියි මගේ ස්වාමිනී!" සන්සා කීවාය. ඒ නිකංම් නිකම් හිස් වචන ටිකක් පමණක් වුවද ඔහු එයින් සතුටු වූ බව ඇය දුටුවාය.

"මගෙත් එක්ක ඇවිදින්ට." ජොෆ්රි ඇයට සිය අත දෙමින් අණ කලේය. ඒ අත ගැනීම හැර ඇයට අන් විකල්පයක් නොවීය. එක් කලෙකදී නම් මේ ස්පර්ෂය ඇගේ රෝමෝද්ගමනය කර ඇයව සතුටින් පිනවන්නට සමත් වුවද දැන් ඇයට දැනුනේ අතිමහත් පිළිකුලක් පමණි. "මගේ උපන්දිනේ ඉක්මනටම එනවා." සභාශාලාව පසුපස වූ දොරින් පිටතට පියමනින අතරේ ජොෆ්රි පැවසුවේය. "ලොකු භෝජන සංග්‍රහයක් පැවැත්වෙයි. තෑගිත් ගොඩක් ලැබෙයි. ඔබ මොනවද මට දෙන්ට යන්නෙ?"

"මම... මම ඒ ගැන හිතුවෙ නැහැ මගේ උතුමානනි."

"ඔබේ ස්වාමිනී." ඔහු තියුණු ස්වරයෙන් කීවේය. "ඔබ ඇත්තෙන්ම මහ මෝඩ කෙල්ලෙක් නේද? මගේ අම්මා එහෙම කියනවා."

"එයා එහෙම කියනවද?" හරිනම් මේ සිදුවූ සියලු දේවලින් පසු ඔහුගේ වදන්වලට තවදුරටත් ඇයව රිදවන්නට නොහැකි විය යුතුව තිබින. එනමුදු එය එසේ නොවීය. රැජින හැමදාමත් ඇයට කරුනාවෙන් සැලකුවාය.

"අපොයි ඔවු. එයා අපි දෙන්නට ලැබෙන්ට යන දරුවො ගැන වදවෙනවා. එයාලත් ඔබ වාගෙම මෝඩයො වෙයි කියලයි එයා බය. ඒ වුනත් මම එයාට කිව්වා ඒ ගැන වදවෙන්ට

එපයි කියලා." රජතුමා සන් කල අතර සෙර් මෙරින් ඔවුන් වෙනුවෙන් දොර විවර කර දුන්නේය.

"බොහොම ස්තූතියි මගේ ස්වාමිනී!" ඇය කොඳුලාය. 'දඩබල්ලා හරි.' ඇය සිතුවාය. 'මම නිකංම නිකම් පුංචි කිරිල්ලියෙක් විතරයි. එයාලා මට උගන්නපුවා මම දොඩවනවා.' බටහිර දෙසින් වූ ප්‍රාකාරවලට එපිටින් හිරු බැසගොස් තිබුනු අතර රතු බලකොටුවේ ගල් බිත්ති ලේ රතු පැහැයෙන් බැබලින.

"ඔබ නියම කාලෙට ආපු ගමන්ම මම ඔබට දරුවෙක් දෙන්නම්." සරඹ පුහුණු අංගනය හරහා ඇයව කැඳවාගෙන යන අතරේ ජොෆ්රි පැවසීය. "පලවෙනි දරුවා මෝඩයෙක් වුනොත් මම ඔබේ හිස ගසා දාලා වෙන බුද්ධිමත් බිරිඳක් හොයාගන්නම්. කොයි කාලෙ විතර වෙයිද ඔබට දරුවෙක් ලැබෙන්ට සුදුසු තත්ත්වයට පත්වෙනකොට?"

සන්සාට හිස ඔසවා ඔහු දෙස බැලිය නොහැකි විය. ඔහු ඇයව එතරම්ම ලැජ්ජාවට පත් කර තිබුනි. "සෙප්ටා මෝර්ඩේන් කියපු විදියට නම්.. ගොඩක්.. ගොඩක් උසස් පවුල්වල ගෑනු ළමයි අවුරුදු දොළහ දහතුන වෙනකොට වැඩිවිය පැමිණෙනවා."

ජොෆ්රි හිස වැනුවේය. "මේ පැත්තෙන්." ඔහු ඇයව බලකොටු ද්වාරය පාමුල වූ ඉහළ මුරකපොලුවලට නගින පඩිපෙළ පාමුලට කැඳවාගෙන ගියේය.

සන්සා වෙවුලමින් ඔහුගෙන් මෑත්වුවාය. ඔවුන් මේ යන්නේ කොහේදැයි ඇයට හදිසියේම වැටහී ගියේය. "නෑ." බිය නිසා ඇගේ ස්වරය අමාරුවෙන් හුස්ම අල්ලන්නාක් බඳු විය. "අනේ එපා. එහෙම කරන්ට එපා. මම වඳින්නම්..."

ජොෆ්රි සිය දෙතොල් තද කරගත්තේය. "මට ඕන ඔබට පෙන්නන්ට මොකක්ද ද්‍රෝහින්ට වෙන්නෙ කියලා."

සන්සා වියරුවෙන් හිස සැලීය. "මට බැහැ.. මට බැහැ.."

"මට පුළුවන් සෙර් මෙරින්ට කියන්ට ඔබව උඩට ඇදගෙන යන්ටයි කියලා. ඔබ ඒකට කැමැති වෙන එකක් නැහැ. ඊට වඩා හොඳ නැද්ද මම කියන හැටියට වැඩ කරන එක." ජොෆ්රි ඇ දෙසට නැඹුරු වූ අතර ඇය බියෙන් ඇකිළෙමින් ඔහු වෙතින් මෑත් වූයේ දඩබල්ලා දෙසට පසුබැස්සාය.

"ඒක කරන්ට කෙල්ලෙ." දඩබල්ලා ඇයව නැවත රජතුමා දෙසට තල්ලු කරමින් සෙමින් කීවේය. ඔහුගේ මුහුණේ පිළිස්සුනු පැත්තේ මුව ඇදවී තිබුනු අතර ඔහු ඊළඟට පවසන්නට යන දේ ඇයට ඇසෙන්නාක් බඳු විය. 'ඔබ මොනවා කලත් එයා කොහොමහරි ඔබව ඒක උඩට ගෙනියනවා. ඒක නිසා එයාට උවමනා දේ කරන්ට.'

ඇය ආයාසයකින් යුතුව ජොෆ්රිගේ අතකින් අල්ලාගත්තා ය. ඉහළ නැගීම නපුරු සිහිනයක් බඳු විය. තබන සෑම පියවරක්ම වෙනවෙන් කෙතරම් දැඩි ආයාසයක් දැරිය යුතු වී ද යත් එය හරියටම මඬේ බැස ඇවිදින්නාක් මෙන් විය. එමෙන්ම එහි ඇය සිහිනෙන් වත් නොසිතූ තරම් පියගැට විය. පියගැට දහස් ගණනක්, දසදහස් ගණනක්! එමෙන්ම ඉහළින් වූ මුර අට්ටාලවල ඇය වෙනුවෙන් මහත් බියකරු දෙයක් බලා සිටියේය.

මුර අට්ටාලවලට නැගගත් පසු ඔවුන්ට පහළින් මුලුමහත් ලෝකයම විවර විය. ඇගේ පියා මියගිය බේලර්ගේ සප්තකය, විසෙන්යාගේ කඳුගැටයේ පිහිටා තිබුනු ප්‍රධාන සප්තක දේවස්ථානය සන්සාට දැකගත හැකිවිය. නගරයේ අනිත් පස සොහොයුරියන් ගේ වීථියේ වූ ගින්නෙන් කළුගැසුනු, මකරාවාටයේ නටඹුන් දිස්විය. බටහිර දෙසට වන්නට රත් පැහැ ගුලියක් මෙන් වූ සූර්යයා දෙවිවරුන් ගේ ද්වාරයට එපිටින් අඩක් සැඟව ගොස් තිබුනි. ඇයට පසුපසින් ලුණු මුහුද වූ අතර දකුණු පසින් මාළු වෙළෙඳපලත්, නාවුක තටාකාංගනයත්, වරායත්, වේගයෙන් ගලාබස්නා කළුදියදහරත් විය. උතුරෙන්...

ඇය උතුරු දෙසට හැරුනාය. ඇයට දැකගත හැකි වූ එකම දෙය නගරය පමණි. වීථී, පටුමං, කඳුගැට, මුඩුක්කු, තවත් වීථී, තවත් පටුමං හා අන්තිමේදී ගඩොලින් බැඳි නගර ප්‍රාකාර. එනමුදු මේ සැමට එපිටින් විවෘත භූමිභාගයක් ඇති බැව් ඇය දැන සිටියාය. ගොවිපල, තණබිම්, වනාන්තර සහ තවත් උතුරට යනවිට... උතුරට උතුරට උතුරටම යනවිට වින්ටර්ෆෙල්!

"ඔය මොකක් දිහාද ඔය බලන්නෙ?" ජොෆ්රි ඇසුවේය. "මට මෙන්න මේකයි ඔබට පෙන්නන්ට ඕන වුනේ. මෙන්න මෙතැන."

සන්සාගේ නිකට තෙක් උස්වූ තාප්පයකින් මුර අටල්ලේ පිටත සීමාව ආවරණය කෙරින. එහි අඩි පහෙන් පහට මෙන් විවර කපා තිබුනේ දුනුවායින්ට ඊ විදීම පහසු වනු පිණිස විය. ප්‍රාකාරය දිගටම මේ කපොලු දෙකක් අතර යකඩ හෙල්ලයක ඇමිනූ මිනිස් හිසක් බැගින් සිටවා තිබුනේ නගර වැසියන්ට දිස්වනු පිණිසය. ඇය මුර අට්ටාලවලට නැගුනු වහාම පාහේ සන්සා මේවා දැක තිබුනද නදියේ වේගවත් දියපහර දෙස ද, ජනයා පොදිකන වීථි දෙස ද, බැසයන හිරු දෙස ද බලා සිටීම එදෙස බැලීමට වඩා ප්‍රියජනක විය. 'එයාට පුළුවන් මට ඒවා දිහා බලන් ඉන්ට කියලා බල කරන්ට.' ඇය තමාටම කියාගත්තා ය. 'ඒ වුනත් එයාට බැහැ මට ඒවා පෙන්නන්ට.'

"මේ ඉන්නෙ ඔබේ තාත්තා. මෙන්න මේක. බල්ලො, ඒක මෙහාට හරවපන් එයාට ඒක දිහා හොඳට බලන්ට."

හිසේ කෙහෙරැල්ලෙන් අල්ලාගත් සැන්ඩෝර් ක්ලිගේන් එය ඔවුන් දෙසට හැරෙවුවේය. කපා වෙන් කරන ලද හිස කල්තබා ගැනීම උදෙසා තාරවල ගිල්වා තිබුනි. සන්සා සන්සුන් ස්වරයෙන් එදෙස බලා සිටියද සැබැවින්ම එය නොදැක්කාය. 'ඒක ඇත්තෙන්ම එඩාර්ඩ් උතුමානන් වගේ නෙවෙයි.' ඇය සිතුවාය. 'ඒක ඇත්තම මිනිස් ඔළුවක් වගෙත් නෙවෙයි.' "මම කොච්චර වෙලා බලන් ඉන්ට ඕනද?"

ජොෆ්රිගේ බලාපොරොත්තු කඩවූවාක් මෙන් පෙනින. "ඔබට අනිත් ඒවාත් බලන්ට ඕනද?" එහි මිනිස් හිස්ගෙඩි දිගු පේළියක් විය.

"ඔබතුමා සතුටුනම් මගේ ස්වාමිනී."

ජොෆ්රි ඇයව කැඳවාගෙන මිනිස් හිස් දුසිමකට වැඩි ප්‍රමාණයක් ද හිස් යකඩ හෙලි දෙකක් ද පසු කරමින් ඇවිද ගියේය. "මම ඔය දෙක තියාගෙන ඉන්නෙ මගේ බාප්පලා දෙන්නා ස්ටැන්ලිටයි රෙන්ලිටයි." ඔහු පැහැදිලි කලේය. මේ අනිකුත් හිස් ඇගේ පියාගේ එකට වඩා පැරණි ඒවා විය. තාරවල ගිල්වූ නමුදු ඒවා දැන් බොහෝ කොටම කුණු වී ගොස්

හඳුනාගත නොහැකි තරමට විරූපව ගොස් තිබුනි. රජතුමා එයින් එකකට ඇඟිල්ල දිගුකලේය. "අර ඉන්නෙ ඔබේ සෙප්ටා." එනමුදු සන්සාට අඩුම තරමේ ඒ ගැහැණියකගේ හිසක් ද යන්නවත් හඳුනාගත නොහැකි විය. එහි හණුව ගැලවී වෙන්ව ගොස් තිබුනු අතර කපුටන් විසින් එක් කණකුත් කම්මුල්වල බොහොමයකුත් කා දමා තිබුනි.

සෙප්ටා මෝර්ඩේන්ට කුමක් සිදු වී දැයි සන්සා නොයෙක් වර කල්පනා කර තිබුනි. එනමුදු ඇයට ඇත්තටම කුමක් වන්නට ඇත්දැයි තමා නොදැනුවත්වම හෝ දැනසිටි බැව් ඇයට වැටහින. "ඇයි ඔබ එයාව මරලා දැම්මෙ? එයා දෙවියන්ට කැපවුන-"

"ඒකි ද්‍රෝහියෙක්." ජොෆ්රි අමනාපයෙන් හොටබලියා ගත්තේය. ඇය ඔහුව නොමනාපයට පත් කර ඇති සේය. "මගේ උපන්දිනේට ඔබ මට මොනවද දෙන්ට යන්නෙ කියලා ඔබ කිවුවෙ නැහැ. මම හිතන්නෙ ඒ වෙනුවට මම ඔබට මොනවහරි දෙයක් දෙන්ට ඕනයි කියලයි. ඔබ ඒකට කැමැතිද?"

"ඔබතුමා සතුටුනම් මගේ ස්වාමිනී."

ඔහුගේ සිනහව දුටුවිට ඔහු ඇයට සමච්චල් කරමින් සිටින වග ඇය තේරුම් ගත්තාය. "ඔබ දන්නවද? ඔබේ අයියත් ද්‍රෝහියෙක්." ඔහු සෙප්ටා මෝර්ඩේන් ගේ හිස ආපසු හැරවීය. "මට මතක් වෙනවා ඔබේ අයියා වින්ටර්ෆෙල්වල හිටපු හැටි. මගේ බල්ලා ඌට කිවුවෙ ලී අසිපතේ උතුමානන් කියලයි. එහෙම නේද බල්ලො?"

"මම එහෙම කිවුවද?" දඩබල්ලා පිළිතුරු දුනි. "මට මතක නෑ."

ජොෆ්රි නොරිස්සුමෙන් මෙන් දෙවුර ඇකිළීය. "ඔබේ අයියා මගේ මාමා ජේමිව පරද්දලා. මගේ අම්මානම් කියන්නෙ ඒක වංචාවක් කියලයි. රාජද්‍රෝහිකමක් කියලයි. ඒ ආරංචිය ආවාහම එයා ඇඬුවා. ගෑනු ඔක්කොම හරි මෝඩයි. හරිම දුර්වලයි. එයා වුනත්. ඒ වුනත් එයා පෙන්නන්ට හදන්නෙ එයා එහෙම නැහැ කියලා. එයා කියනවා අපි කින්ග්ස් ලැන්ඩින්ග් ඇතුළට වෙලා ඉන්ට ඕනයි කියලා. මොකද මගේ බාප්පලා දෙන්නා පහර දෙන්ට පුළුවන් නිසා. ඒ වුනත් මම එයා කියන එක අහන්නෙ නැහැ. මගේ උපන්දින

උත්සවෙන් පස්සෙ මම හමුදාවකුත් අරන් යනවා මගේ අතින්ම ඔබේ අයියාව මරලා දාන්ට. ඒක තමා මම ඔබට දෙන්ට යන්නෙ සන්සා ආර්යාවනි. ඔබේ අයියාගෙ ඔළුව."

ඒ මොහොතේ ඇය තුළ මහත් වියරුවක් නැග ආවේය. සිය මුවින් මෙලෙස පිටවෙනු ඇයට ඇසුනි. "සමහර විට මගේ අයියා මට ඔබේ ඔළුව දෙයි."

ජොෆ්රි තරහින් රවා බැලුවේය. "ඔබ කවදාවත් මට ඒ වගේ විහිළු කරන්ට එපා. නියම බිරිඳක් කවදාවත් තමන්ගෙ සැමියාට ඔය වගේ විහිළු කරන්නෙ නැහැ. සෙර් මෙරින්, එයාට උගන්නන්ට."

මේ වතාවේ නයිට්වරයා ඇගේ මුහුණට පහර දෙද්දී ඇගේ හණුවෙන් අල්ලා මුහුණ තිරකොට සිර කරගත්තේ ය. ඔහු මෙවර ඇයට දෙවරක් තැලීය. වමේ සිට දකුණටත් නැවත පෙරටත් වඩා හයියෙන් දකුණේ සිට වමටත්. ඇගේ තොල පුපුරා නිකට දිගේ රුධිරය ගලා යන්නට විය. ඒවා ඇගේ දෙනෙතින් ගැලූ කඳුළු හා මුසුවිය.

"ඔබ ඔහොම හැමවෙලාවෙම අඬාගත්තු ගමන් ඉන්ට ඕන නැහැ." ජොෆ්රි කීවේය. "ඔබ හිනාවෙනකොට ඔයිට වඩා ලස්සනයි."

ඇය ආයාසයෙන් මුවට සිනාවක් නංවාගත්තා ය. එසේ නොකලහොත් ඔහු සෙර් මෙරින් ලවා නැවත වරක් ඇයට තලවනු ඇතැයි ඇය බියපත් වූවාය. එනමුදු එයින් පලක් නොවීය. රජතුමා නොරිස්සුමින් හිස සැලීය. "ඔය ලේ පිහදාගන්නවා. ඔබ බොහොම අපිරිසුදුවට පේන්නෙ."

පිටත බිත්තිය ඇගේ නිකට තරම් උස් වුවද ඇතුළත කිසිදු බිත්තියක් නොවීය. අඩි හැත්තෑවක් අසූවක් තරම් පහළින් වූ අංගනය හා ඔවුන් අතර කිසිදු බාධකයක් නොවීය. 'පුංචි තල්ලුවක් විතරයි ඕන කරන්නෙ.' ඇය තමාටම කියාගත්තා ය. ඔහු ඒ අයිනේ සිටගෙන අර පනුවන් වැනි දෙතොලින් ඇය දෙස සිනාසෙමින් බලා සිටියේය. 'ඔයාට ඒක කරන්ට පුළුවන්.' ඇය තමාටම කියාගත්තා ය. 'ඔයාට පුළුවන්! දැන්ම ඒක කරන්ට.' ඔහුත් සමග ඇයත් පහළට වැටුනද කම් නැත. එහි කිසිදු ප්‍රශ්නයක් නොමැත.

"මෙන්න කෙල්ලෙ." සැන්ඩෝර් ක්ලිගේන් ඇය ඉදිරියෙන්, ඇයත් ජොෆ්රිත් අතර වූ ඉඩේ දණ නමාගත්තේ ය. ඒ මුදුමොළොක් බව ඔහු වැනි දැවැන්ත මිනිසකුට නොගැලපෙන තරම් පුදුමාකාර එකක් විය. ඇගේ දෙතොලින් ගලන රුධිරය ඔහු පිසදා හැරියේය.

අත පත් මොහොත ඉවත ගියේය. සන්සා සිය දෑස් පහත් කරගත්තා ය. "ඔබට ස්තූතියි!" රුධිරය පිසදා හමාර වූ පසු ඇය ඔහුට කීවාය. ඇය හැමදාමත් හොඳ දරුවකු විය. ඇය සැමදාමත් සිය ආචාරශීලීත්වයන් මතක තබාගත්තා ය. රැකගත්තා ය.

**Sandor Clegane: “Save yourself some pain, and give him what he wants.”**

ඩනේරිස් 09-1

උණ විකාරයෙන් ඈ දුටු සිහින සැමෙකක්ම පාහේ මකරාගේ පියාපතින් සෙවන වී තිබින.
"උඹට මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද? ඕනද?"

ඇය උස්, ශෛලමය ආරුක්කු සහිත වහලයකින් යුතු දිගු ශාලාවක් ඔස්සේ ඇවිදිමින් සිටියාය. ඇයට පසුපස හැරී බැලීම කල නොහැක්කක් විය. ඇය එසේ කල යුතු ද නොවීය. ඇයට ඉදිරියෙන් ඈත දොරක් තිබේ. මෙතරම් දුරක සිට බලද්දී ඒ දොර ඉතා කුඩා පුංජයක් මෙන් දිස්වුවද එය රතු පාටින් පින්තාරු කර ඇති බැව් ඇයට පැහැදිලිවම පෙනින. ඇය වඩ වඩාත් වේගයෙන් ඇවිදින්නට පටන් ගත්තාය. ගලින් කල ශාලාවේ බිම ඇගේ නිරුවත් දෙපා විසින් රත් පැහැ ලේ පැල්ලම් මතුකලේය.

"උඹට මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද? ඕනද?"

ඇය හිරුඑළියෙන් නැහැවී තිබුනු ඩොත්රැකි තැනිතලාව දුටුවාය. එය ජීවයෙන් පිරී පැවතුනි. නැවුම් පස් සුවඳින් හා මරණයේ සුවඳින් පිරී පැවතුනි. සුළඟේ ලෙලදුන් තණපඳුරු මුහුදු රළ මෙන් උස්පහත් විය. ඩ්‍රෝගෝ සිය ශක්තිමත් දෑතින් ඇයව වැළඳගෙන සිටියේය. ඔහුගේ හස්තය මෘදුව ඇගේ යටිකය පිරිමදිමින්, ඇයව පුබුදුවමින්, ඔහුට උරුම වූ - ඔහුට පමණක්ම උරුම වූ - ඒ මිහිරි තෙත්බව මතුකරලමින් තිබුනේය. නීලවර්ණ දිවා ආකාශයේ පායා තිබුනු තාරකාවෝ පහළින් සිටි ඔවුන් දෙස බලා සිනහ සැලූහ. "ගෙදර." ඔහු ඈ තුළට ප්‍රවිෂ්ට වෙමින් සිය බීජයෙන් ඇයව පුරවාලද්දී ඇය සෙමින් මිමිනුවාය. එනමුදු ඊළඟ මොහොතේ මේ තාරකා අතුරුදන් වී ගියේය. නීල ආකාශය පුරවාලමින් දැවැන්ත පියාපත් විදහෙන්නට විය. මුලු ලෝකයම අග්නි ජාලාවෙන් වැසී ගියේය.

"...මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද? ඕනද?"

සෙර් ජෝරාගේ මුහුණ ඇදී මැලවී ගොස් දුකින් බරව තිබින. "රේගාර් තමා අන්තිම මකරා." ඔහු ඇයට කීවේය. ඔහු දිදුලන ගිනිකබලකට අල්ලා සිය විනිවිද පෙනෙන දෑත්

උණුසුම් කරමින් සිටියේය. මේ ගිනිකබලෙහි වූ ගල් බිත්තර ගිනිගත් ගල්අඟුරු මෙන් රත් පැහැයෙන් දැල්වෙන්නට විය. එක් මොහොතක ඔහු එතැන වූ අතර ඊළඟ මොහොතේ කෙමෙන් වියැකී යන්නට වූයේය. වාතය මෙන් තුනී වී ගොස් පැහැය වියැකී යන්නට වූයේය. "අන්තිම මකරා." සුළං රොදක මුදු ස්වරයෙන් අවසන් වරටත් මිමිනූ ඔහු සම්පූර්ණයෙන්ම නොපෙනී ගියේය. ඇයට පසුපසින් වූ අන්ධකාරය ඇයට දැනෙන්නට විය. රතු පැහැ දොර දැන් පෙරටත් දුරස්ථ බැව් ඇයට හැඟුනි.

"...මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද? ඕනද?"

ඇය ඉදිරියෙන් සිටගෙන සිටි විසේරිස් ඇයට මුරගාමින් සිටියේය. "මකරු කිසිදෙයක් ඉල්ලලා බැගෑපත් වෙන්නෙ නැහැ වේසියෙ. උඹට බැහැ මකරාට අණදෙන්ට. මමයි මකරා. මමයි රජවෙන්නෙ." උණු වී වැගිරෙන රත්රන්, උණු ඉටි මෙන් ඔහුගේ මුහුණ පුරා පහළට රූරා වැටුනේ මුහුණ පිළිස්සී ගැඹුරු අගල් මෙන් වූ තුවාල ඇතිකලේය. "මමයි මකරා. මමයි රජවෙන්නෙ." ඔහු වියරුවෙන් මුරගෑවේය. සර්පයකු මෙන් ඉදිරියට පිනූ ඔහුගේ අතැඟිලි ඇගේ පයෝධර තුඩු කොනිත්තමින්, මිරිකමින්, අඹරවමින් ඇයට පීඩා කලේය. ඔහුගේ දෑස් පුපුරා ගොස් කළු පැහැ ගැන්වුනු දෙකම්මුල් දිගේ සාරු මෙන් වැගිරුනේය.

"...මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද..."

රතු පැහැ දොර ඇයට ඉදිරියෙන් එනමුදු ඇයට බොහෝ ඈතින් විය. ඇයව වසාලන්නට තැත්කරමින්, පසුපසින් ඈ දෙසට ඇදෙන සීතල හුස්ම ඇයට හැඟෙන්නට විය. එයට ඇයව අල්ලාගන්නට හැකි වුවහොත් මරණයටත් වඩා බියකරු මරණයක් ඇයට උරුම වනු ඇත. ඇයට සදාකල්ම අන්ධකාරයේ අතපත ගාමින්, වැලපෙමින් ඉන්නට සිදුවනු ඇත. ඇය දුවන්නට පටන් ගත්තාය.

"...මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද..."

තම සිරුර තුළ නැග එන දැඩි උණුසුම ඇයට දැනෙන්නට විය. ඒ වනාහි ඇගේ ගැබෙහි ඇවිලෙමින් තිබුනු දැවැන්ත බියකරු අග්නිජාලාවක් විය. ඒ වනාහි ඇගේ පුත්‍රයා - උස්,

මාන්නක්කාර, ඩ්‍රෝගෝගේ මෙන් තඹ පැහැති සමකින් හා ඇගේ මෙන් රිදී-රන් පැහැ හිසකෙසින් යුතු, ආමන්ඩ් හැඩැති දම් පැහැ දෑසින් යුතු ඇගේ පුත්‍රයා - විය. ඈ දෙස බලා සිනාසුනු ඔහු ඇය දෙසට දෑත් දිගුකලේය. එනමුදු ඔහු ඇයට කතා කරන්නට මුව විවර කරනවාත් සමගින් අග්නිජාලා ඔහු වටකරමින් පැතිර ගියේය. ඔහුගේ හදවත පිළිස්සූ උණුවන අයුරු ඇය දුටුවාය. ඊළඟ මොහොතේ ඔහු ගින්න තුළ දියව ගියේ ඉටිපන්දම් දැල්ලකට හසුවූ සලබයකු වැනසී, අළු වී යන්නාක් මෙනි. ඇය සිය පුත්‍රයා වෙනුවෙන් හැඬුවාය. ඇගේ තණපුඩුවේ තැවරෙන්නට බලා සිටි ඒ මිහිරි දෙතොල වෙනුවෙන් වැලපුනාය. එනමුදු ඇගේ කඳුළු දෙකොපුලේ ස්පර්ශ වූ වහාම වාෂ්ප වී විසිර ගියේය.

"...මකරාව නැගිට්ටවන්ට ඕන නැහැ නේද..."

ශාලාව දිගටම වියැකී ගිය රජ ඇඳුමෙන් සැරසුනු භූතයෝ පේළි ගැසී බලා සිටියෝය. ඔවුන්ගේ අත්වල ගින්නෙන් තැනුනු අසිපත් විය. ඔවුන්ට රිදී පැහැ හිසකෙස්, රන් පැහැ හිසකෙස් හා ප්ලැටිනම් සුදු පැහැ හිසකෙස් ද උපල, අමතේස්ත, තෝරමල්ලි හා ජේඩ් පැහැති දෑස් ද විය. "හයියෙන්!" ඔවුන් සැවොම කෑගැසූහ. "හයියෙන්! හයියෙන්!" ඇය වේගයෙන් දිවගියාය. ඇගේ දෙපා ගැටුනු ශෛලමය බිම උණු වී ගියේය. "හයියෙන්!" භූතයින් සියල්ලෝම එකාවන්ව කෑගසන්නට වන්හ. වියරුවෙන් කෑගැසූ ඇය තවත් වේගයෙන් දුවන්නට පටන් ගත්තාය. ඇගේ පිටකොන්ද දිගේ පිහියකින් අනින්නාක් මෙන් තියුණු වේදනාවක් මතුවන්නට විය. ඇගේ පිට පුපුරා, සම ඉරිතලා යනු ඇයට ඇසින. උණු වී කැකෑරෙන රුධිරයේ පුසුඹ ඇයට දැනින. දැවැන්ත පියාපත් දෙකක සෙවනැලි ඇයට පෙනින. ඊළඟ මොහොතේ ඩනේරිස් ටාර්ගේරියන් පියාඹන්නට පටන් ගත්තාය.

"...මකරාව නැගිට්ටවන්ට..."

ඉදිරියෙන් වූ රතු පැහැ දොර මේ වනවිට ඇයට ආසන්න වී තිබුනි. තව ටිකයි, තව ටිකයි... ඇය වටා වූ ශාලාව අපැහැදිලි සේයාවක් පමණක් විය. ඇයට පසුපසින් වූ සීතල ඇයව අල්ලාගන්නට ඉදිරියට පැතිර ආවේය. ඊළඟ මොහොතේ ඇයට යටින් වූ ශෛලමය භූමිය නැතිව ගොස් ඇය ඩොත්රකි තැනිතලාවට ඉහළින් පියාඹමින් සිටියාය. ඉහළටම, තවත් ඉහළටම... ඇයට පහළින් තණපඳුරු මුහුදු රළ මෙන් සුළඟේ ලෙලදුන්නේය. පණැති, හුස්ම ගන්නා සෑම කෙනෙකුම, සෑම දෙයක්ම ඇගේ දසුනට බියෙන් සැඟව පලාගියෝය. ඇයට ගෙදර සුවඳ දැනෙන්නට විය. ඇයට දැන් එය දැකිය හැකි විය. අර තියෙන්නෙ.. රතු දොරට එහායින්... කොළ පැහැ වනාන්තර ද, ගොවිබිම් ද, මිටියාවත් ද, දැවැන්ත

ශෛලමය බලකොටු ද, ඇයව වැළඳගෙන උණුසුම් කරන්නට සූදානමින් බලාසිටින දෑත් ද එහි විය. ඇය දොර හැරියාය.

"...මකරාව..."

ඊළඟ මොහොතේ ඇය සිය සොයුරු රේගාර්ව දුටුවාය. ඔහු සිය සන්නාහය තරම්ම කළු පැහැති වූ දැවැන්ත සෛන්ධවයකු පිට නැගී සිටියේය. ඔහුගේ ශිරස්කයෙහි වූ පටු දැස් විවර තුළින් ගින්දර රත් පැහැයෙන් බැබලුනේය. "අන්තිම මකරා." සෙර් ජෝරාගේ මිමිනුම කොහේදෝ ඈතකින් ඇසෙන්නට විය. "අන්තිම.. අන්තිම.." ඩැනී ඔප දමා තිබුනු ඒ කළු පැහැ ශිරස්කයේ මුව වැස්ම ඔසවා විවර කලාය. ඒ තුළ වූ මුහුණ වෙනෙකක් නොව ඇගේම මුහුණ විය.

එයින් පසු බොහෝ වේලාවක් යනතෙක් වේදනාවත්, ඇගේ සිරුර තුළ ඇවිලෙමින් තිබුනු ගින්නත්, තාරකාවන් ගේ මිමිනීමත් හැරෙන්නට අන් යමක් නොවීය.

* * *

ඇය සෙමින් දෑස් විවර කලාය. අවට පරිසරය ගින්නකින් පසු දැනෙන දුම් හා අළු පුසුඹින් සහ රසයෙන් යුතු විය.

"එපා." ඇය වේදනාවෙන් කෙඳිරිගෑවාය. "එපා. අනේ එපා."

"ඛලීසි." ජික්වි බියපත් මුවදෙනක මෙන් ඇයට ඉහළින් එබුනාය.

කූඩාරම සෙවනැල්ලේ ගැලී තිබුනි. අවට සෑමතැනම නිහඬතාව පමණක්ම විය. ගිනිකබලක ඇවිලෙන ගින්නෙන් නගින දුම් හා අළු ඉහළ නගිමින් තිබුනි. ඩැනී ඒ ඔස්සේ දෑස් ගෙනයමින් ඉහළ බැලූයේ ඉහළින් වූ දුම් කවුළුව දුටුවාය. 'පියාඹනවා.' ඇය කල්පනා කලාය. 'මට පියාපත් තිබුනා. මම පියෑඹුවා.' එනමුදු එය සිහිනයක් පමණි. "මට උදවු

කරන්ට." නැගිට සිටින්නට යත්න දරමින් ඇය කෙඳිරිගෑවාය. "මට ගේන්ට..." ඇගේ ස්වරය බැරෑඬි වී ගොසිනි; වේදනාවෙන් පිරී ගොසිනි. තමාට උවමනා වූ දේ කුමක්දැයි ඇයට වටහාගත නොහැකි විය. ඇගේ සිරුර මෙතරම් වේදනා ගෙන දෙන්නේ මන්ද? එය හරියටම ඇගේ සිරුර කැලි කැලිවලට කඩා නැවත එකතුකර පැස්සුවාක් වැන්න. "මට ඕන..."

"එහෙමයි බලීසි." ඊළඟ මොහොතේ ජීක්වී විදුලියක් මෙන් කූඩාරමින් පිටවී කැගසමින් දිවයන්නට වූවාය. ඩැනීට උවමනා වූයේ යමක්... යමෙක්... කුමක්ද? එය අතිශයින්ම වැදගත් දෙයක් බව පමණක් ඇය දැන සිටියාය. ඒ වනාහි මෙලොව ඇති වැදගත්ම දෙය, වැදගැම්මකට ඇති එකම දෙය බැව් ඇය දැන සිටියාය. පසෙකට හැරුනු ඇය වැලමිටට බරදී එසවුනාය. පොරෝණය ඇගේ දෙපා වටා පැටලෙමින් ඇයට බාධා කරන්නට විය. සෙලවීම අතිශයින්ම අසීරු කටයුත්තක් විය. මුලු ලොවම මීදුමක් මෙන් ඇය වටා බොඳව යන්නට විය. 'මට...'

ඔවුන් ඇය වෙත පැමිණෙන විට ඇය බිම බුමුතුරුණු දිගේ මකර බිත්තර දෙසට බඩගාමින් හුන්නාය. ඇයව දෝතින් ඔසවාගත් සෙර් ජෝරා නැවත නිදන මෙට්ටය වෙත ඇයව රැගෙන ගියේය. ඇය දුබල අයුරින් ඔහුගෙන් නිදහස් වීමට දැඟලූ නමුදු එය සාර්ථක ප්‍රයත්නයක් නොවීය. ඔහුගේ උරහිසට පිටුපසින් ඇගේ සේවිකාවන් තිදෙනා ද, තුනී උඩු රැවුලකින් යුතු ජෝගෝ ද, පැතැලි පුළුල් මුහුණකින් හෙබි මිරී මාස් ඩූර් ද සිටගෙන සිටිනු ඇය දුටුවාය. "මම..." ඇය ඔවුන්ට වටහා දෙන්නට උත්සාහ කලාය. "මට..."

"...නිදාගන්ට කුමාරි." සෙර් ජෝරා පැවසීය.

"බෑ. අනේ.. අනේ එපා.."

"ඔවු." ඇගේ සිරුර ගිනිගෙන දැවෙමින් තිබුනු නමුදු ඔහු ඇයව සේද රෙද්දකින් වැසුවේය. "නිදාගන්ට. නිදාගෙන ශක්තිමත් වෙලා ආයෙමත් නැගිටින්ට. අපේ පරණ බලීසි වෙලා ආයෙමත් අපි අතරට එන්ට." ඊළඟ මොහොතේ ඇය අසලට පැමිණි යක්දෙස්සි, මිරී මාස් ඩූර් ඇගේ මුවට කෝප්පයක් ලංකලේය. ඇයට ඇඹුල් කිරි රසද තවත් කුමක්දෝ අමුතු රසයක් ද දැනෙන්නට විය. කුමක් හෝ තිත්ත, උකු දියරයක්! ඇගේ නිකට දිගේ උණුසුම් දියර ගලා යන්නට වූ නමුදු ඇය ආයාසයෙන් ඒ දියරය ගිල දැමුවාය. කූඩාරම කෙමෙන්

අඳුරු වී යන්නට විය. නින්ද නැවත ඇය වෙත පැමිණියේය. එනමුදු මේ වතාවේ ඇය කිසිඳු සිහිනයක් නොදුටුවාය. ඒ වෙනුවට කිසිඳු වෙරළක් නොමැති, කළු පැහැ මුහුදක සතුටින්, සාමයෙන් හා ශාන්තභාවයෙන් යුතුව පාවුනාය.

* * *

බොහෝ වේලාවකට පසුව - ඒ එක් රැයක් ද එක් දවසක් ද නැතිනම් එක් වසරක් ද කීමට ඇය නොදත්තා ය - ඩැනී නැවත අවදිවූවාය. කූඩාරම අන්ධකාරයේ ගැලී තිබින. පිටත හමන සුළඟ නිසා එහි පැළැලි පියාපත් මෙන් සැලෙමින් තිබින. මෙවර ඇය නැගීසිටීමට කිසිඳු උත්සාහයක් නොදැරුවාය. "ඉරී." ඇය හඬගෑවාය. "ජික්වී. ඩෝරියා." ඔවුහු විගස එහි පැමිණියහ. "මගේ උගුර වේලිලා. හොඳටම වේලිලා ගිහිල්ලා." ඔවුන් ඇයට පානය පිණිස දිය ගෙන ආවෝය. ඒ ඇල්මැරුනු, නීරස ජලය වුවද ඇය මහත් ආසාවෙන් දිය බීවාය. ඉන්පසු තවත් දියපොදක් වෙනුවෙන් ජික්වීව පිටත් කර හැරියාය. රෙදි කැබැල්ලක් දියෙන් පෙඟවූ ඉරී එයින් ඇගේ නළල පිරිමැද්දාය. "මම අසනීප වෙලා හිටියා." ඩැනී කීවාය. ඩොත්රැකි දැරිය එකඟවෙමින් හිස වැනුවාය. "කොච්චර කාලයක්ද?" රෙදි කැබැල්ල සුවදායක විය. එනමුදු ඉරී වෙතින් ඇඩි දුක්බර බවක් පෙන්නුම් කෙරුනු අතර ඩැනී එයින් බියපත් වූවාය. "ගොඩක් කල්." ඇය මිමිනුවාය. ජික්වී නැවත දිය රැගෙන පැමිණි විට ඇයත් සමග මිරී මාස් ඩූර් ද විය. ඇගේ දෑස් නිදිමතින් බර වී තිබින. "බොන්ට." ඇය කීවේ නැවත වරක් ඩැනීගේ මුවට කෝප්පයක් ලංකරමිනි. එනමුදු මේ වතාවේ එහි වූයේ වයින් විය. මිහිරි වයින් විය. වයින් සියල්ල බී හමාර කල ඩැනී නැවත පසුපසට බර වී සිය රිද්මයානුකූල හුස්ම වැටීමට කණ් දුන්නාය. නැවතත් නින්ද ඇය කරා පැමිණෙද්දී සිය අත් පා වල බර ගතිය ඇයට දැනෙන්නට විය. "මට ගේන්ට..." ඇය මිමිනුවාය. ඇගේ කටහඬ නිදිබර හා අපැහැදිලි විය. "ගේන්ට... මට තියාගන්ට ඕන..."

"ඔවු?" යක්දෙස්සිය ඇසුවාය. "ඔබට මොකක්ද ඕන බලීසි?"

"මට ගේන්ට... බිත්තරයක්... මකර බිත්තරයක්... අනේ..." ඇගේ ඇසිපිය ඊයම් බරු මෙන් බරවන්නට විය. ඒවා නැවත ඔසවාගන්නට තරම් ඇය දුර්වල වැඩි විය.

ඇය තෙවන වර නැවත අවදි වන විට රන්වන් හිරුකිරණ තීරුවක් ඉහළින් වූ දුම් කවුළුව තුළින් කූඩාරම තුළට වැටී තිබින. ඇගේ දෑත් මකර බිත්තරයක් වටා වෙලී එය

වැළැඳගෙන සිටියේය. ඒ වනාහි ලා පැහැ, බටර් ක්‍රීම් පැහැති කොරපොතු හා රන් පැහැයෙන් හා ලෝකඩ පැහැයෙන් සුළි වැටුනු බිත්තරය විය. ඩැනීට එයින් නගින උණුසුම දැනෙන්නට විය. ඇය සිරුර වසා සිටි සේද පොරෝණයට යටින් ඇගේ නිරුවත් සම මත යාන්තමින් දහදිය දමා තිබුනි. 'මකරපින්න.' ඇය කල්පනා කලාය. ඇගේ අතැඟිලි බිත්තර කටුව මත මෘදුව එහා මෙහා යමින් එහි වූ රන්වන් සුළි පිරිමදින්නට විය. ඇගේ මේ පිරිමැදීමට ප්‍රතිචාරයක් වශයෙන් බිත්තරය තුළ ගැඹුරේ වූ යම්දෙයක් ඇඹරෙනු දිගහැරෙනු ඇයට දැනුනි. එනමුදු ඇයව බියපත් කරන්නට එය සමත් නොවීය. ඇගේ සිතේ වූ සියලු බිය තුරන්ව ගොසිනි. ගින්නෙන් පිළිස්සී ගොසිනි.

ඩැනී සිය නළල පිරිමැද්දාය. තුනී දහදිය ස්ථරයට යටින් ඇගේ සම ස්පර්ශයට සීතල විය. ඇගේ උණ බැස ගොස් තිබිනි. ඇය නැගිට හිඳගත්තා ය. එක් මොහොතකට ඇයට සුළු ක්ලාන්ත ගතියක් දැනුනු අතර ඇගේ දෙකළවා අතර දැඩි වේදනාවක් ද විය. එනමුදු ඇයට මීට පෙර නොවූ විරූ ශක්තිමක් බවක් දැනෙන්නට විය. ඇගේ කටහඬ ඇසුනු විගස සේවිකාවෝ දිව ආවෝය. "වතුර. වතුර ගුරුලේත්තුවක් ගේන්ට. හොයාගන්ට පුළුවන් සීතලම වතුර නම් තවත් හොඳයි. ඒ වගේම පළතුරු ටිකකුත්. මම හිතන්නෙ ඉඳි හොඳයි."

"එහෙමයි ඛලීසි."

"මට ඕන සෙර් ජෝරා." ඇය නැගී සිටිමින් පැවසුවාය. සේද ලෝගුවක් රැගෙන ආ ජික්වී එය ඇගේ දෙවුර මතින් පෙරෙවුවාය. "නාන්ට උණු වතුරත් ඕන. මිරි මාස් ඩූර්ටත් එන්ට කියන්ට. ඒත් එක්කම..." අසුරු සැනකදී පෙර මතකය සියල්ල පෙරලා පැමිණි අතර ඇගේ කතාව ඇණ සිටියේය. "ඛාල් ඩ්‍රෝගෝ." ඇය අමාරුවෙන් කියා ගත්තාය. ඇය භීතියෙන් යුතුව ඔවුන්ගේ මුහුණු පිරික්සා බැලුවාය. "එයා..?"

"ඛාල් ජීවත් වෙනවා." ඉරී ඕනෑවටත් වඩා ඉක්මනින් පිළිතුරු දුන්නාය. එනමුදු මේ වදන් පවසද්දී ඇගේ දෑසෙහි වූ අන්ධකාරයක සේයාවක් ඩැනී දුටුවාය. මේ වදන් තෙපලූ සැනින් හනික ආපසු හැරුනු ඇය දිය ගෙන ඒම පිණිස පිටව ගියාය.

ඇය ඩෝරියා දෙසට හැරුනාය. "මට කියන්ට."

"අ... මම ගිහින් සෙර් ජෝරාව එක්කරන් එන්නම්." ඇයට හිස නැමූ ලයිසෙනී තරුණිය කඩිමුඩියේම කූඩාරමෙන් පිටතට පැනගත්තා ය.

ජික්වී ද පැන දුවන්නට ඉඩ තිබූ නමුදු ඇගේ මැණික්කටුව අසලින් අල්ලාගත් ඩැනී ඇයව සිය ග්‍රහණයට ගත්තාය. "මොකක්ද මේ? මට දැනගන්ට ඕන. ඩ්‍රෝගෝ... මගේ දරුවා." ඇයට මේ වනතෙක් ඇගේ දරුවා ගැන සිහියට නොනැගුනේ මන්ද? "මගේ පුතා... රේගෝ... කෝ එයා? මට එයාව ඕන."

සේවිකාව දෑස් බිමට නැඹුරු කරගත්තා ය. "දරුවා... එයා ජීවත් වුනේ නෑ ඛලීසි." ඇගේ ස්වරය බියෙන් තැතිගත් කෙඳිරුමක් බඳු විය.

ඩැනී ඇගේ මැණික්කටුව මත වූ ග්‍රහණය මුදා හැරියාය. 'මගේ පුතා මැරිලා!' ජික්වී කූඩාරමෙන් පිටතට පැනගද්දී ඇය විමතියෙන් කල්පනා කලාය. කෙසේ හෝ ඇය මේ බැව් කලින්ම දැන සිටියාය. පළමු වර නින්දෙන් අවදිවද්දීම ඇය මේ බැව් දැන සිටියාය. නැත නැත.. ඒ නින්දෙන් අවදිවීමට පෙරාතුවම ඇය ඒ බැව් දැන සිටියාය. තමා දුටු සිහිනය විචිත්‍රවත් පැහැදිළිවත් හදිසියේම යළි ඇගේ සිහියට ආයේය. තඹ පැහැ සමින් හා රිදී-රන් පැහැ කෙස් කළඹින් යුතු උස් මිනිසා ගිනිගෙන දැවුනු සැටි ඇයට සිහිපත් විය.

තමා වැලපිය යුතු බැව් ඩැනී දැන සිටියද ඇගේ දෑස් අළු මෙන් වියළි විය. ඇය සිය සිහිනය තුළදී හඬා වැලපී තිබුනු අතර ඇගේ දෑසින් ගැලූ කඳුළු කම්මුල් මත ස්පර්ශ වූ වහාම වාෂ්ප වී ගියේය. 'ඔක්කොම දුක සංකා පිච්චිලා මගෙන් අයින් වෙලා ගිහිල්ලා!' ඇය තමාටම කියාගත්තා ය. ඇයට දුකක් දැනුනු බව සැබැවකි. එනමුදු... රේගෝ ඇගේ දිවියෙන් ඉවතට නැඹුරු වන ආකාරය ඇයට හැඟුනි. එය හරියටම ඔහු කිසිදා ඇගේ දිවියේ කොටසක් නොවූවාක් මෙනි.

**Mirri Maz Duur: “Look and see what life is worth, when all the rest is gone.”**

මඳ වේලාවකට පසු කූඩාරමට ඇතුළු වූ සෙර් ජෝරා සහ මිරී මාස් ඩූර් විසින් තවමත් ඒවා තැන්පත් කර තිබුනු පෙට්ටිය තුළ වූ අනෙක් මකර බිත්තර දෙක දෙස බලමින් හුන් ඩැනී දුටුවෝය. ඩැනීට වැටහී ගියේ මේ බිත්තර දෙක ද ඇය තුරුළු කර නිදා සිටි මකර බිත්තරය තරම්ම උණුසුම් වී ඇති බවකි. එය අදහන්නට නොහැකි තරමේ පුදුමාකාර දෙයක් විය. "සෙර් ජෝරා, මෙහාට එන්ට." ඔහුගේ අතින් අල්ලාගත් ඇය එය ලේ රතු පැහැ සුළි වැටුනු කළු බිත්තරය මතින් තැබුවාය. "ඔබට මොනවද දැනෙන්නෙ?"

"බිත්තර කටුව. ගලක් වගේ හයියයි." නයිට්වරයා පරීක්ෂාකාරී ස්වරෙයෙන් පිළිතුරු දුනි. "කොරපොතු."

"රස්නෙ ද?"

"නැහැ. සීතල ගලක් විතරයි." ඔහු සිය අත ඉවතට ඇදගත්තේ ය. "කුමාරි, ඔබ හොඳින් ද? ඔබ මෙහෙම නැගිටලා ඉන්න එක හොඳ ද? තාම ඇඟ දුර්වලයි නේද?"

"දුර්වලයි! මම දැන් හොඳටම ශක්තිමත් සෙර් ජෝරා." එනමුදු ඔහුව සතුටු කිරීම පිණිස ඇය බිම වූ කොට්ට ගොඩක් මත වාඩිවුනාය. "මට කියන්ට කොහොමද මගේ දරුවා මැරුනෙ කියලා."

"එයා කොහෙත්ම ජීවත් වුනේ නැහැ මගේ කුමාරි. ගෑනු කියන්නෙ..." ඔහුගේ කතාව හදිසියේම ඇන සිටියේය. ඔහුගේ සිරුර බුරුල්ව එල්ලා වැටෙන ආකාරයත්, ඔහු ඇවිදින විට කොරගසන ආකාරයත් ඩැනී නිරීක්ෂණය කලාය.

"මට කියන්ට... මට කියන්ට මොනවද ගෑනු කියන්නෙ."

ඔහු සිය මුහුණ ඇගෙන් ඉවතට හරවා ගත්තේය. ඒ දෑස්වල අමුතුම ආකාරයේ බැල්මක් විය. "එයාලා කියනවා දරුවා..."

ඇය නැවතී බලා සිටි නමුදු සෙර් ජෝරාට එය කියා ගත නොහැකි විය. ලැජ්ජාව නිසා ඔහුගේ මුහුණ කළු වී ගියේය. ඔහුගෙන් දිස් වූයේ බාගෙට මැරුනු මිනිසකු ගේ වැනි පෙනුමකි.

"යක්ෂ පැටියෙක්." මිරී මාස් ඩූර් ඔහු වෙනුවෙන් වාක්‍යය සම්පූර්ණ කලාය. නයිට්වරයා බෙහෙවින් ශක්තිමත්, ප්‍රබල පුද්ගලයකු විය. ඒ මොහොතේ ඩැනීට තේරුම් ගියේ මේ යක්දෙස්සිය ඔහුටද වඩා ශක්තිමත්, කුරිරු එමෙන්ම අපරිමානවම භයානක පුද්ගලයකු බවයි. "ඇඟ ඇඹරිලා තිබ්බෙ. මමමයි එයාව එළියට ගත්තෙ. එයාව කටුස්සෙක් වගේ කොරපොතුවලින් වැහිලා තිබුනා. ඇස් පේන්නෙ නෑ. පුංචි වල්ගා කොටේකුයි, වවුලෙකුගෙ වගේ පුංචි හම් පියාපත් දෙකකුයි තිබුනා. මම එයාව ඇල්ලුවම මස් කෑලි කෑලි ගැලවිලා ආවා. ඇඟ ඇතුළෙ තනිකරම ඉහඳ පණුවොයි, කුණු ගඳයි විතරයි. එයා අවුරුදු ගානකට කලින්ම මැරිලා."

'අන්ධකාරය!' ඩැනී කල්පනා කලාය. ඇයව ගිල දැමීමට මාන බලමින් ඇය පසුපස හඹා ආ ඒ බිහිසුණු අන්ධකාරය. දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. "සෙර් ජෝරා මාව කූඩාරම ඇතුළට උස්සගෙන එද්දී එයා බොහොම ශක්තිමත්ව, පණපිටින් හිටියා. මට දැනුනා එයා පයින් ගහපු හැටි. මට දැනුනා එයා එළියට එන්ට හදපු හැටි."

"ඒක එහෙම වෙන්ට පුළුවන්." මිරී මාස් ඩූර් පිළිතුරු දුන්නාය. "ඒ වුනත් ඔබේ ගැබෙන් එළියට ආවෙ අර වගේ සතෙක්. ඒ වෙලාවෙ මේ කූඩාරම ඇතුළෙ තිබ්බෙ මරණයයි බලීයි."

"ඒවා නිකං හෙවනැලි විතරයි." සෙර් ජෝරා කී නමුදු ඒ වදන්වල තැවරී තිබුනු සැකය හා දෙගිඩියාව ඇයට තේරුම් ගියේය. "මම දැක්කා, යක්දෙස්සී. මම උඹව දැක්කා. තනියම. හෙවනැලිත් එක්ක නටනටා හිටියා."

"මළවුන් බොහොම දිග හෙවනැලි මවනවා යකඩ උතුමානනි." මිරී කීවාය. "බොහොම දිග බොහොම අන්ධකාර හෙවනැලි. අන්තිමේදී කිසිම එළියකට බෑ ඒවා නවත්තන්ට."

සෙර් ජෝරා විසින් නොදැනුවත්වම හෝ සිය පුත්‍රයා මරා දැමුනු බැව් ඩැනී වටහාගත්තා ය. ඔහු ඒ දේ කලේ ලැදි බව හා ආදරය නිසා බව සැබැවි. එනමුදු කිසිදු පණ ඇති මිනිසකු පය නොතැබිය යුතු තැනකට ඔහු විසින් ඈ ඔසවාගෙන ගොස් ඇගේ පුත්‍රයාව අන්ධකාරයට බිලි දුන්නේය. ඔහු පවා ඒ බැව් දැන සිටියේය. අඳුරු වී ගිය මුහුණ, ගිලී ගිය දෑස්, නොන්ඩිය. "ඒ හෙවනැලිවල බලපෑමට ඔබවත් අහුවෙලා සෙර් ජෝරා." ඩැනී කීවාය. නයිට්වරයා කිසිදු පිළිතුරක් නොදුන් අතර ඩැනී නැවත දේවදාසිය වෙතට හැරුනි. "ඔබ මට අනතුරු ඇඟෙවුවා ජීවිතය වෙනුවෙන් වන්දි ගෙවන්ට පුළුවන් මරණයෙන් විතරයි කියලා. මම හිතුවෙ ඔබ ඒ කිවුවෙ අශ්වයා ගැනයි කියලා."

"නෑ. ඒ ඔබ තමන්ව සනසගන්ට ඔබටම කියාගත්තු බොරුවක්. ඔබ මුල ඉඳන්ම දැනගෙන හිටියා මොකක්ද නියම මිල කියලා."

ඇය දැන සිටියා ද? ඇය එය දැන සිටියා ද? දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. "හරි ඒ ඉල්ලපු මිල ගෙවුවා. අශ්වයා, මගේ දරුවා, ක්වාරෝ, ක්වෝතෝ, හග්ගෝ, කොහොල්ලෝ. මේ මිල ගෙවුවා, ගෙවුවා, ගෙවුවා." ඇය වාඩි වී සිටි කොට්ටා ගොඩ උඩින් නැගිට්ටාය. "කෝ දැන් ඛාල් ඩ්‍රෝගෝ? එයාව මට පෙන්නන්ට. දේවදාසි, යක්දෙස්සි, ලේ යකැදුරී හරි මොකෙක් හරි. මට ඛාල් ඩ්‍රෝගෝව පෙන්නන්ට. මගේ පුතාගෙ ජීවිතයෙන් වන්දි ගෙවලා මම මොකක්ද මිලේට ගත්තෙ කියලා මට බලන්ට ඕන."

"ඔබේ කැමැත්තක් ඛලීසි." ගැහැණිය කීවාය. "එන්ට. මම ඔබව එයා ගාවට එක්කරන් යන්නං."

ඩැනී සිතා සිටියාට වඩා ඇය දුර්වල විය. ඇගේ බඳ වටා අතක් යැවූ සෙර් ජෝරා ඇයට කෙලින් සිටගැනීමට උදවු කලේය. "අපි මේ වැඩේ පස්සට කල් දාමු මගේ කුමාරි." ඔහු පහත් හඬින් ඇයට කීවේය.

"මට දැන් එයාව බලන්ට ඕන සෙර් ජෝරා."

කූඩාරම තුළ වූ මන්දාලෝකයෙන් පසු පිටත දැස් නිලංකාර කරවන අන්දමින් දීප්තිමත් විය. සූර්යයා ආකාශයේ රන් පැහැයෙන් බබලමින් සිටියේය. අවට පරිසරය මුලුමනින්ම කර්කශ වී ගොස් තිබුනි. ඇගේ සේවිකාවෝ පළතුරුත්, වයින් හා ජලයත් රැගෙන ඇය එනතෙක් බලා සිටියෝය. ජෝගෝ ඇය වෙතට ළඟා වූයේ සෙර් ජෝරාට උදවු වනු පිණිස විය. ඔහුට පසුපසින් අග්ගෝ හා රඛාරෝ සිටගෙන සිටියහ. හිරුඑළිය වැල්ල මත පතිත වීම නිසා ඇති වූ දීප්තිය කෙතරම් ද යත් ඩැනී සිය දෑත් ඔසවා ආලෝකය මුවා කරන තුරු වෙනත් කිසිවක් දැකිය නොහැකි විය. විශාල ගිනිමැලයක අළු ද, එහා මෙහා ඉබාගාතේ ඇවිදිමින් තණකොළ බිඳක් සොයන අසුන් කිහිපදෙනෙකු ද, තැනින් තැන විසිරුනු කූඩාරම් කිහිපයක් හා නිදි පැදුරු ද ඇයට දැකගත හැකි විය. කුඩා දරුවන් පිරිසක් ඇය දෙස බැලීම පිණිස එක්ව සිටි අතර ඊට ඔබ්බෙන් ගැහැණුන් සිය එදිනෙදා කටයුතුවල නිරත වන ආකාරයත්, මහලු මිනිසුන් බිම වාඩි වී, දුබල දෑත්වලින් ලේ මැස්සන් තලමින්, වෙහෙසකර දෑසින් නිල් අහස දෙස බලා සිටින ආකාරයත් දිස්විය. මේ සියලු පිරිස සියයක් නොඉක්මවීය. සතලිස් දහසක් මිනිසුන් විසූ ස්ථානයේ දැන් වූයේ වියළි සුළඟත්, දූහුවිල්ලත් පමණි.

"ඩ්‍රෝගෝ ගේ බලසාර් එක ගිහිල්ලා."

"අශ්වයෙක් පිටේ යන්ට බැරි ඛාල් කෙනෙක් කියන්නෙ ඛාල් කෙනෙක් නෙවෙයි." ජෝගෝ පිළිතුරු දුන්නේය.

"ඩොත්රැකියො යන්නෙ ශක්තිවන්තයා පස්සෙයි." සෙර් ජෝරා කීය. "මට සමාවෙන්ට කුමාරි. උන්ව නවත්තගන්ට ක්‍රමයක් තිබුනෙ නැහැ. කෝ පොනෝ තමා මුලින්ම ගියේ. එයා තමන්ට කියාගත්තා ඛාල් පොනෝ කියලා. එයාත් එක්ක ගොඩක් දෙනෙක් ගියා. වැඩි වෙලාවක් යන්ට කලින් ජඛෝත් ඒකම කලා. අනිත් එවුන් ටිකෙන් ටික, රැයින් රැය හෙමින් සීරුවේ පිටවෙලා යන්ට ගියා. ලොකු කණ්ඩායම්, පුංචි කණ්ඩායම් විදියට. මීට කලින් ඩ්‍රෝගෝගෙ බලසාර් එක තිබුන තැන දැන් අලුත් බලසාර් දූසිමක් විතර තියෙනවා."

"නාකි එවුන් ටික විතරක් ඉතුරු වුනා." අග්ගෝ කීවේය. "උනුයි, බලගුල්ලොයි, දුබලයොයි, ලෙඩ්ඩුයි. ඒ වගේම ඔබට පක්ෂපාතියි කියලා දිවුරුම් දුන්නු අපි හැමෝමත් නැවතුනා."

"උන් බාල් ඩ්‍රෝගෝගෙ අශ්වයො ඔක්කොම අරන් ගියා ඛලීසි." රඛාරෝ ද කතාවට එක්විය. "අපට උන්ව නවත්තන්ට හැකියාවක් තිබුනෙ නෑ. අපි ටිකයි, උන් මහ ගොඩක්. බලවතා දුබලයාගෙ දේ පැහැරගන්න එක තමා අපේ ක්‍රමේ. උන් වහල්ලුත් ඔක්කොම වගේ අරන් ගියා. බාල්ගෙයි ඔබෙයි දෙන්නගෙම. ඒ වුනත් උන් බොහොම සොච්චමක් ඉතුරු කරලා ගියා."

"එතකොට ඉරෝආ?" තමා විසින් බැටළු මිනිසුන්ගේ නගරයේ ද්වාරය අසලදී ගලවාගත් දැරිය සිහිපත් වූ ඩැනී ඇසුවාය.

"මාගෝ ඒකිව පැහැරගත්තා. මාගෝ දැන් බාල් ජබෝගෙ රුධිරාරක්ෂකයෙක්." ජෝගෝ පිළිතුරු දුන්නේය. "ඌ ඒකිව කැමැති කැමැති විදියට පාවිච්චි කරලා උගෙ බාල්ට බාරදුන්නා. ජබෝ ඒකිව උගෙ අනිත් රුධිරාරක්ෂකයින්ගෙ පාවිච්චියට දුන්නා. උන් හයදෙනෙක්. උන් ඇති වෙනකං ඒකිව පාවිච්චි කරලා අන්තිමේදි ඒකිගෙ බෙල්ල කපලා දැම්මා."

"ඒ තමා ඒකිගෙ ඉරණම ඛලීසි." අග්ගෝ පැවසීය.

දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. "ඒක හරිම කුරිරු ඉරණමක්. ඒ වුනත් ඒක මාගෝට අත්වෙන්ට යන ඉරණම තරම් කුරිරු එකක් නෙවෙයි. මම ඒක පොරොන්දු වෙනවා. පැරණි දෙවියන්ගෙත්, අලුත් දෙවියන්ගෙත්, අශ්ව දෙවියන්ගෙත්, බැටළු දෙවියන්ගෙත්, මේ ලෝකෙ ඉන්න හැම දෙවි කෙනෙක්ගෙම නාමෙන් මම ඒක පොරොන්දු වෙනවා. පොළෝ ගැබේ සහ කඳු මාතාවගෙ නාමයෙන් මම ඒක දිවුරනවා. මම උන්ට වධ දීලා ඉවර වෙනකොට මාගෝයි කෝ ජබෝයි දෙන්නා උන් ඉරෝආට පෙන්නුව විදියෙ ක්ෂාන්තියක් ඉල්ලලා මගෙන් බැගෑපත් වෙනවා."

ඩොත්රකියෝ අතීරණයෙන් මෙන් බැලුම් හුවමාරු කරගත්හ. "ඛලීසි." ඇගේ සේවිකාව ඉරී කතාකලාය." "ජබෝ කියන්නෙ දැන් විසිදාහක් සෙබළු ඉන්න බලසාර් එකක් බාල් කෙනෙක්."

ඩැනී ගර්වයෙන් හිස එසෙවුවාය. "මම ඩනේරිස් ස්ටෝම්බෝර්න්. ටාර්ගේරියන් වංශයෙ ඩනේරිස්. මගේ ඇඟේ දුවන්නෙ ජයග්‍රාහී ඒගන්ගෙ ලේ. කුරිරු මේගර්ගෙ ලේ. ඒ ඔක්කොටමත් වඩා පුරාණ වැලීරියාවෙ ලේ. මම මකරාගෙ දුව. මම ඔබලාට දිවුරලා පොරොන්දු වෙනවා. මේ මිනිස්සු බයෙන් වේදනාවෙන් කෑ ගහ ගහ තමා මැරෙන්නෙ. දැන් මාව එක්කරන් යන්ට බාල් ඩ්‍රෝගෝ ගාවට."

* * *

ඔහු නිරුවත් රතු පස් මත වැතිර ඉහළින් වූ සූර්යයා දෙස බලා සිටියේය.

සිරුර පුරා ලේමැස්සන් දුසිමක් පමණ වසා සිටි නමුදු ඔහුට ඒ ගැන වගක්වත් ඇති බවක් නොපෙනුනි. ඔවුන් පිසදා ඉවත හැරි ඩැනී ඔහු පසෙකින් දණ බිම ඇන ගත්තාය. ඒ ඇස් විවරව තිබුනු නමුදු ඔහු එයින් දුටු බවක් නොපෙනුනි. ඒවා අන්ධ වී ගොස් ඇති බැව් ඩැනී එක්වරම වටහා ගත්තාය. ඇය ඔහුගේ නම මිමිනූ මුත් ඔහුට ඒ ඇසුනු බවක් නොපෙනුනි. පපුවේ වූ තුවාලය සුව වී ගොස් රතු අළු පැහැ තුවාල කැළැලක් පමණක් ඉතුරු වී තිබුනි.

"ඇයි එයා මෙහෙම අවුවට වෙලා තනියම ඉන්නෙ?"

"එයා උණුසුමට කැමැතියි වගේ කුමාරි." සෙර් ජෝරා පිළිතුරු දුන්නේය. "එයාගෙ ඇස් ඉරඑළිය එන පැත්තට හැරෙනවා. කොහොමවුනත් එයාට ඒක පේන්නෙ නැහැ. ඔබ එයාව එක්කරන් යන්නෙ කොහෙද එයා එතැනට යයි. ඊට වඩා බැහැ. ඔබ එයාගෙ කටේ කෑම එබුවොත් එයා කයි. එයාගෙ තොල්වල තැවරුවොත් වතුර බොයි."

ඩැනී ඔහුගේ නළල මෘදුව සිපගත්තා ය. ඉන්පසු නැගිට සිට මිරී මාස් ඩූර් දෙස බැලුවාය. "උඹේ යකැදුරුකම් බොහොම මිලයි යක්දෙස්සි."

"එයා ජීවත්වෙනවා." මිරී මාස් ඩූර් පිළිතුරු දුන්නාය. "ඔබ ඇහුවේ ජීවිතේ ගැන. ඔබ ගෙවුවෙ ජීවිතේ වෙනුවෙන්."

"මේක ජීවිතයක් නෙවෙයි. ඩ්‍රෝගෝ වගේ කෙනෙකුට කොහෙත්ම ජීවිතයක් නෙවෙයි. එයාගෙ ජීවිතේ වුනේ හිනාව, ගිනිමැලයකට අල්ලලා මස් පුච්චලා කන එක, අශ්වයෙකුගෙ පිටේ යන එක. එයාගෙ ජීවිතේ වුනෙ අරඛ් එකක් අතින් අරන්, කොණ්ඩෙ ගහලා තියෙන සීනු නාදවෙද්දි සතුරාව මුලිච්චි වෙන්ට ඉස්සරහට යන එක. එයාගෙ ජීවිතේ වුනේ එයාගෙ රුධිරාරක්ෂකයො, මම, එයා වෙනුවෙන් මම උපද්දන්ට ලෑස්තිවෙලා හිටපු පුතා."

මිරි මාස් ඩූර් කිසිදු පිළිතුරක් නොදුන්නාය.

"එයා ආයෙමත් පරණ පුරුදු තත්ත්වයට එන්නෙ කවදද?"

"ඉර බටහිරෙන් පායලා නැගෙනහිරෙන් බැහැලා ගියදාට." යක්දෙස්සිය පිළිතුරු දුන්නාය. "මුහුදෙ වතුර හිඳිලා ගියදාට. ගස්වල කොළ හුළඟෙ ගහගෙන යනවා වගේ කඳු හුළඟෙ ගියදාට. ඔබේ ගැබ ආයෙමත් ශක්තිමත් වෙලා ඔබේ කුසට ආයෙමත් පුතෙක් ආපු දාට. එදාට එයා ආපහු එයි. ඊට කලින් නෙවෙයි."

ඩැනී සෙර් ජෝරා හා අනිකුන්ට පිටව යන්නැයි සන් කලාය. "පිටවෙන්ට. මට මේ යක්දෙස්සිත් එක්ක තනියම කතා කරන්ට ඕන."

මෝර්මන්ට් හා ඩොත්රැකියන් පිරිස විසිර ගියෝය. "උඹ දැනගෙන හිටියා." ඔවුන් දෙදෙන තනිවූ පසු ඩැනී කීවාය. ඇගේ සිරුර ඇතුළතින් මෙන්ම පිටතින්ද වේදනාවෙන් ඇදුම් කමින් තිබින. එනමුදු කේන්තිය හා වියරුව විසින් ඇයට අමුතු ශක්තියක් ලබා දී තිබින. "උඹ දැනගෙන හිටියා මම මොකක්ද මිලට ගන්නෙ කියලා. ඒ වගේම උඹ දැනගෙන හිටියා මොකක්ද ඒ වෙනුවෙන් මම ගෙවන්ට නියමිත මිල කියලා. ඒ වුනත් උඹ ඒ ගැන මට නොකියා ඒ මිල ගෙවන්ට මට ඉඩ ඇරියා."

"උන් මගේ දේවාලෙ පිච්චුව එක වැරැදියි." තරබාරු, මුක්කම් නාසයකින් හෙබි ගැහැණිය පිළිතුරු දුන්නාය. "ඒකෙන් වුනේ මහා එඬේරා කෝප වුන එකයි."

"මේක දෙවියන්ගෙ වැඩක් නෙවෙයි." ඩැනී කෝපාන්විත ස්වරයෙන් කීවාය. දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. "උඹ මට වංචා කලා. උඹ මගේ දරුවාව මරලා දැම්මා."

"ලෝකය පාලනය කරන සෙන්ධවයා තවත් නම් කිසිම නගරයක් ගිනිතියන එකක් නෑ. එයාගෙ බලසාරය තවත් නම් කිසිම ජාතියක් පාගලා පොඩිකරලා දාන එකක් නෑ."

"මම උඹ වෙනුවෙන් කතා කලා." ඇය දැඩි සන්තාපයෙන් යුතුව කීවාය. "මම උඹව බේරගත්තා."

"මාව බේරගත්තා?" ලසාරීන් ගැහැණිය බිමට කෙල ගැසුවාය. "ඩොත්රැකි අසරුවො තුන්දෙනෙක් මාව පාවිච්චි කලා. මිනිහෙක් ගෑනියෙක්ව ගන්න විදියට නෙවෙයි. පිටිපස්සෙන්. හරියට බල්ලෙක් බැල්ලියෙක්ව ගන්නවා වගේ. ඔබ මාව පහුකරන් යද්දි මගේ ඇඟ උඩ නැගලා හිටියෙ හතරවෙනියා. ඉතින් කොහොමද ඔබ කියන්නෙ මාව බේරගත්තා කියලා? මම දැක්කා මගේ දෙවියන්ගෙ දේවාලය ගිනිඅරන් කඩන් වැටෙනවා. මම ඒ දේවාලෙ ඇතුළෙදි කොච්චර නම් හොඳ මිනිස්සු සනීප කරලා ඇද්ද? උන් මගේ ගෙදරත් පිච්චුවා. පාරවල් පුරා ඔළුගෙඩි ගොඩගහලා තිබ්බා මම දැක්කා. මට පාන් පිච්චුව බක්කරේගෙ ඔළුගෙඩිය මම දැක්කා. යාන්තං මාස තුනකට විතර කලින් උණ හැදිලා වැටිලා ඉන්දැද්දි මම බේරගත්තු ඒ පුංචි කොලුවගෙ ඔළුගෙඩිය මම දැක්කා. අසරුවො උන්ගෙ කසවලින් ගගහා එලවන් යද්දි පුංචි එවුන් අඬන සද්දෙ මට ඇහුනා. මට කියන්ට ඔබ මොනවද බේරගත්තෙ කියලා."

"උඹේ ජීවිතේ."

මිරී මාස් ඩූර් කුරිරු සිනහවක් පෑවාය. "ඔබේ ඛාල් දිහා බලලා මට කියන්ට මොකක්ද ජීවිතෙන් ඇති පලේ කියලා. අනිත් හැම දෙයක්ම නැතිවුනාට පස්සෙ මොකක්ද ජීවිතෙන් විතරක් ඇති පලේ කියලා."

සිය ඛාස් එකේ සෙබළුන්ට කතා කල ඩැනී මිරී මාස් ඩූර්ව රැගෙන ගොස් ඇගේ අතපය බැඳ දමන්නැයි අණ කලාය. එනමුදු ඔවුන් විසින් ඇදගෙන යන අතරේ යක්දෙස්සිය ඇයට

සිනාසුනේ හරියටම ඔවුන් දෙදෙනා පමණක් දන්නා රහසක් ගැන උදම් වන්නාක් මෙනි. සිය මුවින් පිටකරන එක් වදනකින් ඩැනීට ඇගේ හිස ගසා දැමිය හැකිව තිබුනු නමුදු ඇය කිසිත් නොකීවාය. එසේ කිරීමෙන් ඇයට අත්වන ප්‍රතිලාභය කුමක්ද? ඔළුගෙඩියක්? ජීවිතයෙන් කිසිදු ඵලක් නැතිනම් මරණයෙන් ඇති ඵලය කිම?

ඔවුහු බාල් ඩ්‍රෝගෝව නැවත ඇගේ කූඩාරමට කැඳවාගෙන ආවෝය. නාන බාල්දිය දියෙන් පුරවන්නැයි ඩැනී ඔවුන්ට අණ කලාය. මෙවර ඒ දියේ රුධිරය නොවීය. සියතින්ම ඔහුව නැවූ ඩැනී ඔහුගේ අත්පාවල, පපුවේ තැවරී තිබුනු කුණු දූවිලි සෝදා හැරියාය. මුදු රෙදි කඩක් ගෙන ඔහුගේ මුහුණ පිස දැම්මාය. ඔහුගේ දිගු කළු පැහැ වරලස හොඳින් සෝදා, එහි වූ ගැට හා අවුල් කඩා ඇයට මතක තිබුනු පරිද්දෙන්ම දිස්නය දෙන තෙක් හොඳින් පීරුවාය. මේ සියලු කාර්යයන් නිමාවන විට අඳුරු වැටී බොහෝ වේලාවක් ගෙවී තිබුනු අතර ඇය බෙහෙවින් විඩා වැටී සිටියාය. කෑම කටක් කා කුමක් හෝ පානය කරනු පිණිස ඇය මඳ විවේකයක් ගත්ත ද ෆිග් ගෙඩියක් ලැටි ගා පැන් උගුරු කිහිපයක් බීම හැර හැර අන් කිසිවක් කෙරෙහි ඇය තුළ රුචියක් නොවීය. නින්ද ඇයට හොඳ විවේකයක් වන්නට ඉඩ තිබුනු නමුදු ඇය හොඳින් නිදාගෙන තිබුනාය... උවමනාවටත් වඩා වැඩියෙන් නිදාගෙන තිබුනාය. අද රාත්‍රිය ඩ්‍රෝගෝ වෙනුවෙන් පුද කල යුතු විය. ඔවුන් දෙදෙන එක්ව ගෙවූ සියලු රාත්‍රීන් වෙනුවෙන් හා මතු එළඹෙන්නා වූ සියලුම රාත්‍රීන් වෙනුවෙන් අද ඔහු වෙනුවෙන් කැප කල යුතු විය.

ඔවුන් දෙදෙන එකතුව මුලින්ම අසු විහිදූ ඒ රාත්‍රිය ඇගේ සිතේ වෛවර්ණයෙන් ඇඳෙද්දී ඇය ඔහුව කැඳවාගෙන පිටත අන්ධකාරය තුළට පිවිසුනාය. මන්ද මිනිසකු ගේ දිවියේ සියලුම වැදගත් දේ විවෘත ආකාශය යට සිදුවිය යුතු යැයි ඩොත්රැකියන් තරයේ ඇදහූ බැවිනි. වෛරයට වඩා බලගතු තවත් බලයන් ඇතැයි ඇය තමාටම කියා ගත්තාය. යක්දෙස්සිය විසින් අශයීහිදී ඉගෙනගත් යකැදුරුකම්වලට වඩා පුරාණ, සත්‍ය මායා බන්ධන ඇතැයි ඇය තම සිතට ඒත්තු ගැන්නුවාය. රාත්‍රිය අන්ධකාර වූ අතර අහසේ සඳ පායා නොතිබින. එනමුදු ඔවුන්ට ඉහළින් මිලියන ගණනක් තාරකාවෝ බබලමින් තිබුනු අතර එය සුබ ලකුණක් යැයි ඇය විශ්වාස කලාය.

ඔවුන් වෙනුවෙන් බලා සිටි මෘදු තණ ඇතිරිල්ලක් එහි නොවීය. ඒ වෙනුවට එහි වූයේ කර්කශ, ගල්මුල් පිරුනු, දූඹුරුවන් වියළි පොළොව පමණක් විය. සුළඟේ ලෙලදෙමින් සිලිසිලි හඬ නංවන්නට එහි කිසිදු ගසක් නොවීය. සිය ජලදහරේ කිංකිණි සංගීතයෙන් ඇගේ සිත තුළ වූ බිය තුරන් කරන්නට කිසිදු දියපහරක් ද එහි නොවීය. එනමුදු තාරකාවන් ගේ ආමුඛය ඕනෑවටත් වඩා ඇති යැයි ඩැනී තමාටම කියා ගත්තාය. "මතක් කරන්ට

ඩ්‍රෝගෝ." ඇය ඔහුගේ කණට කෙඳිරුවාය. "මතක් කරන්ට අපි දෙන්නා මුලින්ම අශ්වයො පැදගෙන ගිය දවස. අපි දෙන්නා කසාද බැන්ද දවස. අපි දෙන්නා එකතුවෙලා රේගෝව හදපු දවස මතක් කරන්ට. මුලු බලසාර් එකම අපි අවට ඉන්දැද්දි ඔබ මගේ මූන දිහාම බලාගෙන හිටපු හැටි මතක් කරන්ට. ලෝකයේ ගැබේ වතුර කොච්චර පිරිසුදු ද, කොච්චර සීතල ද කියලා මතක් කරන්ට. මගේ ඉරයි තරුයි, මේ හැම දෙයක්ම මතක් කරන්ට. මතක් කරලා ආයෙමත් මගේ ළඟට එන්ට."

දරු උපත විසින් ඇයව වියළා දමා ඉරා දමා තිබුනු බැවින් ඇයට උවමනා වූ අන්දමින් ඔහුව තමා තුළට ප්‍රවිශ්ට කරවා ගැනීම උගහට විය. එනමුදු ඩෝරියා ඇයට තවත් නොයෙකුත් ක්‍රම උගන්වා තිබුනාය. ඩැනී සිය දැත් ද, සිය මුව ද, සිය පයෝධර යුවල ද යොදවා ගත්තාය. ඔහුව නියපොතුවලින් සූරා දමා, හාදු වලින් තෙමා, ඔහුගේ කණට කර නොයෙකුත් ආදර කතා මිමිනුවාය. අන්තිමේදී මේ කිසිදු දෙයකින් එලක් නොවූ තැන සිය කඳුළුවලින් ඔහුව තෙමුවාය. එනමුදු ඩ්‍රෝගෝට මේ කිසිදු දෙයක් නැසුනි. කිසිවක් නොදැනුනි. ඔහුව යලි පුබුදන්නට සමත් තවත් කිසිවක් ඉතිරි වී නොතිබුනි.

හිස් ක්ෂිතිජයට ඉහළින් මූසල අරුණෝදය එබී බලද්දී තමාගේ සියලු උත්සාහයන් ව්‍යර්ථ වී ඇති බැව් ඩැනී වටහා ගත්තාය. ඇයට ඔහුව අහිමිව ගොස්, සදහටම අහිමිව ගොස් ඇති බැව් ඇය තේරුම් ගත්තාය. "ඉර බටහිරෙන් පායලා නැගෙනහිරෙන් බැහැලා ගියදාට." ඇය බලවත් සන්තාපයෙන් යුතුව කීවාය. "මුහුදෙ වතුර හිඳිලා ගියදාට. ගස්වල කොළ හුළඟෙ ගහගෙන යනවා වගේ කඳු හුළඟෙ ගියදාට. මගේ ගැබ ආයෙමත් ශක්තිමත් වෙලා මගේ කුසට ආයෙමත් පුතෙක් ආපු දාට. එදාට ඔබ ආපහු එයි මගේ ඉරයි තරුයි. ඊට කලින් නෙවෙයි."

'කවදාවත් ආපහු එන්නෙ නෑ!'අන්ධකාරය මුරගෑවේය. 'කවදාවත් නෑ! කවදාවත් නෑ! කවදාවත් නෑ!'

කූඩාරම තුළට වැදුනු ඩැනී පිහාටු පුරවා සිනිඳු සේද රෙද්දෙන් මැසූ කොට්ටයක් සොයා ගත්තාය. එය සිය ළයට තදකරගත් ඇය නැවත ඩ්‍රෝගෝ වෙතට පිය මැන්නාය. සිය දිවියේ සූර්යයා සහ තාරකාවන් වෙතට පිය මැන්නාය. දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. ඇවිදීම පවා දැන් ඇයට වේදනා ගෙන දුන්නේය. ඇයට නිදන්නට අවශ්‍ය විය. කිසිදු සිහිනයක් නොදැක සුවසේ නිදන්නට අවශ්‍ය විය.

**දණ බිම ඇනගත් ඩැනී අවසන් වරට ඩ්‍රෝගෝගේ දෙතොල් සිපගත්තී පිහාටු කොට්ටය ඔහුගේ මුහුණ මත තබා තදකලාය.**

**If she looked back she was lost.**

ටිරියන් 09

"උන් මගෙ පුතාව අල්ලගෙන?" ටයිවින් ලැනිස්ටර් ඇසුවේය.

"එහෙමයි මගෙ උතුමානනි." අධික වෙහෙස නිසා පණිවුඩකරුවාගේ කටහඬ අපැහැදිලි විය. ඔහුගේ ඉරී ගිය උඩු කබායේ පපුවෙහි ගෙත්තම් කර තිබුනු ක්‍රේක්හෝල්හි වල්ඌරා අඩක් ලෙයින් පෙඟී තිබුනි.

'ඔබේ එක පුතෙක්.' ටිරියන් කල්පනා කලේය. එනමුදු ඔහු ජේමී ගැන කල්පනා කරමින් වයින් උගුරක් තොල ගෑවා මිස වදනකුදු නොදෙඩීය. ඔහු අත එසවූ විට දරුනු වේදනාවක් වැලිමිටි සිසාරා පැතිර ගියේ යුද්ධය සම්බන්ධයෙන් ඔහුට ඇති කෙටි මතකයන් යළි සිහිපත් කරදෙමිනි. ඔහු ඇත්තෙන්ම සිය සොහොයුරාට ආදරය කලේය. එනමුදු කාර්ස්ටලී රොක්හි ඇති සියලු රත්රන් දෙන්නෙමැයි පොරොන්දු වුවද ඔහුත් සමග මේ මොහොතේ කොඳුරන වනාන්තරයේ සිටින්නට ටිරියන් කොහෙත්ම කැමැති නොවනු ඇත.

පණිවුඩකරුවා මෙවදන් පවසද්දී සිය පියා විසින් රැස්වීම වෙනුවෙන් කැඳවා තිබුනු කපිතාන්වරුත්, අනෙකුත් වංශාධිපතීනුත් සියල්ලෝම මුලුමනින්ම නිහඬ වූහ. ඇසුනු එකම ශබ්දය වූයේ ප්‍රධාන ශාලාවේ ගිනි උඳුනෙහි වූ දරකොට පට පට හඬින් පුපුරන හඬත්, ගිනිදලුවල ස්ස්ස් හඬත් පමණි.

දකුණුකරය බලා වූ දිගු, වෙහෙසකර ගමනක නිමාවේ එක් රැයක් හෝ මෙලෙස තානායමක ගත කරන්නට ලැබීම ගැන ටිරියන් අතිශයින්ම කෘතඥ විය. එනමුදු... ඒ නැවතත් මේ තානායම වීම ගැන ඔහු කොහෙත්ම සතුටට පැමිණ සිටියේ නැත. එහි එතරම්ම අඳුරු මතකයන් රැසක් විය. ඔහුගේ පියා සිය හමුදාවේ ගමන් වේගය කෙරෙහි දැඩිව සැලකිලිමත් වූ අතර ඔවුන්ට එහි එලවිපාක යහමින් අත්විඳින්නට සිදුවී තිබුනි. යුද්ධයේදී තුවාල වූ සෙබළුන් හැකි උපරිමයෙන් සිය ගමන් වේගය පවත්වාගැනීමට යත්න දැරූ අතර එසේ නොහැකි වූවන් ඔවුන්ටම යමක් කරගන්නට ඉඩ දී අතරමග හැරදා පියා තිබුනි. සෑම උදෑසනකම ඔවුන්ට මිනිසුන් කිහිප දෙනෙකු - සිය අවසන් නින්ද නිදා නැවත දෑස් නොහැරිය මිනිසුන් - පාර දෙපස අත හැර දා එන්නට සිදුවිය. සෑම දහවලකම තවත් ඉවසා සිටිය නොහැකි වූ මිනිසුන් කිහිපදෙනෙක් ගමන අතරමගදීම බිම ඇද වැටුනෝය.

එමෙන්ම සෑම සන්ධ්‍යාවකම තවත් මිනිස්සු වැඩිවන අන්ධකාරයට මුවා වී හමුදාව අතහැර පලා ගියෝය. ඔවුන් සමග එක්ව මෙයින් මිදී පලායන්නට ටිරියන්ට සිතුනු වාර බොහෝය.

තානායමේ උඩු මහලට වී පිහාටු මෙට්ටයක් දැමූ ඇඳක සුවපහසුවෙන් වැතිර, තමා පසෙකින් වැතිර නිදන ෂේ ගේ උණුසුම විඳිමින් සිටියදී ඔහුගේ සහචරයා විසින් ඔහුව අවදි කරනු ලැබීය. නපුරු ආරංචියක් රැගෙන රිවර්රන්හි සිට පණිවුඩකරුවකු පැමිණ තිබුනි. එසේනම් අන්තිමේදී මේ සියල්ල කිසිදු ඵලක් නොමැති දෙයක් විය. දකුණුකරය කරා පැමිණි ඉක්මන් ගමන, නිමක් නැති වෙහෙසකර පා ගමන, පාර දෙපස අතහැර පැමිණි සෙබළුන්... මේ සියල්ල අපතේ ගිය උත්සාහයක් විය. රොබ් ස්ටාර්ක් ඔවුන්ට දවස් ගනනාවකට පෙරාතුව රිවර්රන්වලට ළඟා වී තිබුනි.

"කොහොමද මෙහෙම දෙයක් වෙන්නෙ?" සෙර් හැරිස් ස්විෆ්ට් කෙඳිරිගෑවේය. "කොහොමද? විස්පරින්ග් වුඩ්වල පරාජයෙන් පස්සෙ වුනත් අපට රිවර්රන්වල ලොකු හමුදාවක් ඉතුරුවෙලා තිබුනා. අපි රිවර්රන් වට කරලයි තිබුනෙ... මොන පිස්සුවක් වැහිලද සෙර් ජේමි එයාගෙ හමුදාව කොටස් තුනකට බෙදුවෙ? එයා අනිවාර්යයෙන්ම දැනගන්ට ඕන ඒකෙන් එයාගෙ මුලු හමුදාවම කොච්චර ලොකු අන්තරායකට මූන පානවද කියලා."

'උඹට වඩා හොඳට එයා ඒක දන්නවා. උඹ ඔය නිකටක් නැති, මහත, බූරු, බයගුල්ලො.' ටිරියන් කල්පනා කලේය. සිය සොහොයුරා රිවර්රන්හිදී පරාජයට පත් වූ බැව් සැබැවි. එනමුදු ස්විෆ්ට් වැනි අමනයෙකුගෙන් ඔහු පිළිබඳ මෙවැනි නින්දා බස් පිටවනු ඇසීම ඔහුට ඉහිලුම් නොදුන්නේය. කිසිදු ලැජ්ජාවක් නොමැති, බියගුලු මේ ඉච්ඡාකාරයා සිය දිවිය තුළ සිදුකර තිබුනු වැදගත්ම දෙය වූයේ තමා මෙන්ම තරබාරු වූ සිය දියණිය සෙර් කෙවන්ට විවාහකර දී එමගින් ලැනිස්ටර්වරුන් සමග ඥාතිත්වයක් ගොඩනංවා ගැනීම පමණි.

"මම වුනත් ඒ දේම කරයි." ටිරියන් බලාපොරොත්තු වූවාටත් වඩා වැඩි ශාන්ත භාවයකින් යුතුව ඔහුගේ බාප්පා පිළිතුරු දුන්නේය. "ඔබ කවදාවත් රිවර්රන් දැකලා නැහැ සෙර් හැරිස්. එහෙම දැකලා තිබුනා නම් ඔබ තේරුම් ගනියි ජේමිට වෙන විකල්පයක් තිබුනෙ නැහැයි කියන එක. මේ බලකොටුව පිහිටලා තියෙන්නෙ ටම්බල්ස්ටෝන් ගංගාව රතු ගංගාවට වැටෙන තැන ගොඩබිම අද්දරමයි. මේ ගංගා දෙක නිසා ත්‍රිකෝණයෙ දෙපැත්තක් ආවරණය වෙනවා. අනතුරුදායක කාලයක් ආපු ගමන් ටලීලා ගඟේ ඉහළින්

තියෙන සොරොවුවක් අරිනවා. එතකොට තුන්වෙනි පැත්තෙ තියෙන දියඅගල වතුරෙන් පිරිලා යනවා. රිවර්රන් තනිකරම දූපතක් වෙනවා. බලකොටුවෙ ප්‍රාකාර කෙලින්ම වතුරෙ ඉඳන්මයි ඉහළ නගින්නෙ. උන්ගෙ බලකොටු කුළුණුවල ඉන්න ආරක්ෂකයින්ට පුළුවන් තුන්පැත්තෙම ලීග ගානක් දුර යනකම් බලන්ට. කෙනෙකුට මේ බලකොටුව වටලන්ට ඕන නම් එයා තුන් පැත්තකින් හමුදාව යොදවන්ට ඕන. ටම්බ්ල්ස්ටෝන්වලට උතුරෙන් එක කඳවුරකුත්, රතු ගංගාවෙන් දකුණෙ එක කඳවුරකුත්, මේ ගංගා දෙක මැද්දෙ, දියඅගලෙන් බටහිරට වෙන්ට තව කඳවුරකුත් දාන්ට ඕන. වෙන ක්‍රමයක් නැහැ. කිසිම ක්‍රමයක් නැහැ."

"සෙර් කෙවන් කියන්නෙ ඇත්තයි මගේ උතුමනි." පණිවුඩකරුවා පැවසීය. "අපි කඳවුරු හැම එකක්ම වටේට උල් කරපු රිටි ගහලා දඬුවැටවල් බැඳලයි තිබ්බෙ. ඒ වුනත් ඒ දේ ඇති වුනේ නෑ. පහරදීම ආවෙ හදිස්සියෙමයි. අනික ගඟ නිසා අපි තුන්ගොල්ලම එකාට එකා වෙන්වෙලයි හිටියෙ. උං මුලින්ම උතුරු කඳවුරට කඩන් පැන්නා. කිසිම කෙනෙක් මෙහෙම පහරදීමක් බලාපොරොත්තුවෙන් හිටියෙ නෑ. මාර්ක් පයිපර් අපේ සැපයුම් කණ්ඩායම්වලට පහර දුන්නා තමා. ඒත් මිනිහා ගාව පනහකට වඩා වැඩි සෙබළ පිරිසක් හිටියෙ නෑ. සෙර් ජේමි කලින් දා රෑ පිටත්වෙලා ගියා උන්ට පහරදෙන්ට... ඇත්තම කියනවා නම් උනුයි කියලා අපි හිතාගෙන හිටපු හමුදාවකට පහරදෙන්ට. අපට ලැබුන ආරංචිවල හැටියට ස්ටාර්ක් හමුදාව කොළ ගංගාවෙන් නැගෙනහිර පැත්තෙ දකුණට යමිනුයි හිටියෙ."

"එතකොට උඹලාගෙ ඔත්තුකාරයො?" සෙර් ග්‍රෙගර් ගේ මුහුණ ගලින් නෙලුවාක් වැනි විය. උඳුනෙහි වූ ගිනිදළු විසින් ඔහුගේ සමට තැඹිලි පැහැයක් එක් කර තිබුනු අතර ඒ ගිලී ගිය දැස් තුළ ගැඹුරු සෙවනැලි ඇතිකර තිබුනි. "උන් මොකුත් දැක්කෙ නැද්ද? උන් මොකුත් අනතුරු ඇඟවීමක් කලේ නැද්ද?"

පණිවුඩකරුවා හිස සැලීය. "අපේ සමහර ඔත්තුකාරයො අතුරුදහන් වුනා. අපි හිතුවෙ මාර්ක් පයිපර්ගෙ වැඩක් වෙන්ටැතියි කියලා. ආපහු ආපු එක ඔත්තුකාරයෙක්වත් කිසිම දෙයක් දැකලා තිබ්බෙ නෑ."

"කිසිම දෙයක් දකින්නෙ නැති එකෙකුට උගෙ ඇස් දෙකෙන් ඇති වැඩක් නැහැ." කන්ද නිවේදනය කලේය. "උගෙ ඇස් දෙක කපලා දීපන් ඊළඟ ඔත්තුකාරයාට. ඌට කියපන්

ඇස් දෙකක් වෙනුවට ඇස් හතරකට හොඳට බලන්ට පුළුවන් කියලා... ඒකත් හරි ගියෙ නැත්තම් ඊළඟට යන එකාට ඇස් හයක් හම්බවෙයි."

සෙර් ග්‍රෙගර් දෙසට හැරුනු ටයිවින් ලැනිස්ටර් උතුමානන් ඔහු වෙත නිරීක්ෂණාත්මක බැල්මක් හෙලුවේය. ගිනිදළු රන්වන් පැහැයෙන් ඒ දෑස්වල කණිනිකා මත නටන ආකාරය ටිරියන් දුටුවේය. එනමුදු ඒ බැල්ම ග්‍රෙගර් පැවසූ දේ හා එකඟවන බැල්මක් ද නොඑසේ නම් පිළිකුල හඟවන බැල්මක් ද යන්න ඔහුට වටහාගත නොහැකි විය. ටයිවින් උතුමානන් මෙවැනි රැස්වීම්වලදී බොහෝ විට නිහඬතාව රැක්කේ අන් සැමටම පසුව සිය අදහස් කියාපෑමට පුරුදුව සිටියේය. ටිරියන් ද මේ පුරුද්ද ඇති කරගැනීමට අසාර්ථක උත්සාහ කිහිපයක්ම දරා තිබුනි. එනමුදු මේ මොහොතේ ටයිවින් උතුමානන් වෙතින් පලවන නිහැඬියාව අසාමාන්‍ය එකක් විය. ඔහු සිය වයින් බඳුනට අතවත් තබා නොතිබුනි.

"උඹ කිවුවා උන් ආවෙ රෑ ජාමෙ කියලා." සෙර් කෙවන් විමසීය.

මිනිසා විඩාබර අයුරින් හිස වැනීය. "කළුමාළුවා තමා පෙරටු බලඇණිය මෙහෙයුවෙ. ඌ අපේ මුරසෙබළු කපලා දාලා දඬුවැටවල් ගලවලා අයින් කලා උන්ගෙ ප්‍රධාන බලඇණියට එන්ට ලේසිවෙන්ට. සිද්දවෙන්නෙ මොකක්ද කියලා අපේ මිනිස්සු තේරුම්ගන්නකොටත් අසරු හමුදාව කඩුයි පන්දමුයි අරන් අපේ කඳවුරට ඇතුල්වෙලා ඉවරයි. මම නිදාගෙන හිටියෙ ගංගා දෙක මැද්දෙ තිබ්බ බටහිර කඳවුරේ. අපට සටනෙ සද්දෙ ඇහුනම, කූඩාරම් ගිනිගන්නවා දැක්කම බ්‍රැක්ස් උතුමානන් අපිව මෙහෙයුවා අපේ පහුරුවලට. ඒ වුනත් ගඟේ සැඩපාර සැර වැඩි හන්දා අපිව පහළට ගහගෙන ගියා. ඒත් එක්කම ටලීලා පටන්ගත්තා උන්ගෙ ප්‍රාකාරෙ උඩ ඉඳන් කැටපෝල්වලින් අපට ගල් විදින්ට. මම දැක්කා එක පහුරක් සම්පූර්ණයෙන්ම කැලි කැලිවලට කැඩිලා යන හැටි. තවත් පහුරු තුනක් අනිත් පැත්ත ගැහුවා. මිනිස්සු ගඟට විසිවෙලා ගිහින් වතුරෙ ගිලුනා... කොහොමහරි පීනලා ගඟෙන් එතෙර වෙන්ට පුළුවන් වුන එවුන් එහා පැත්තෙ ගංඉවුරෙ රැකගෙන හිටපු ස්ටාර්ක් සෙබළුන්ට ගොදුරු වුනා."

රජත හා දම් පැහැ සන්නාහයකින් සැරසී සිටි සෙර් ෆ්ලෙමන්ට් බ්‍රැක්ස් තමාට මේ අසන්නට ලැබුනු දේ අදහාගත නොහැකි සේ හිස ඔසවා බැලුවේය. "මගේ තාත්තා-"

"කණගාටුයි මගේ උතුමානනි." පණිවුඩකරු කීවේය. "බ්‍රැක්ස් උතුමානන් එතුමන්ගෙ වානේ සන්නාහයෙන් සැරසිලායි හිටියෙ. එතුමන්ගෙ පහුර අනිත් පැත්ත ගැහුවා. එතුමන් බොහොම නිර්භීතයි."

'ඌ මහ මෝඩයෙක්.' සිය වයින් කුසලාණ සෙමින් කරකවමින් ටිරියන් කල්පනා කලේය. රාත්‍රි අන්ධකාරය මධ්‍යයේ, සම්පූර්ණ සන්නාහයෙන් සැරසී, සතුරා අනිත් ඉවුරේ තමා එනතෙක් බලා සිටියදී, පහුරක නැගී ගංගාවක් තරණය කරන්නට යෑම නිර්භීත කමක් වශයෙන් සැලකෙන්නේ නම් හැමවිටම බියගුල්ලකු මෙන් සිටීම වඩා යහපත් වනු ඇත. සිය සන්නාහයේ අධික බර විසින් ඔහුව කළු පැහැ ගංදිය යටට ඇදගෙන යද්දී බ්‍රැක්ස් උතුමානන්ගේ සිතට කෙබඳු අන්දමේ නිර්භීත කමක් දැනෙන්නට ඇත්දැයි ඔහු විමතියෙන් කල්පනා කලේය.

"ගංගාවල් දෙක අතරෙ තිබ්බ කඳවුරටත් පහරදුන්නා." පණිවුඩකරුවා දිගටම කියාගෙන ගියේය. "අපි ගඟ තරණය කරන්ට ලෑස්තිවෙන අතරේ තවත් ස්ටාර්ක් හමුදාවක් ආවා බටහිර පැත්තෙන්. සන්නාහ සන්නද්ධ අසරු බලකායක්. පේළි දෙකක්ම. මම දැක්කා අම්බර් උතුමානන්ගෙ දම්වැල් දාපු යෝධයයි, මැලිස්ටර්ලාගෙ රාජාලියායි. ඒ වුනත් ඒ හමුදාවට අණදුන්නෙ ස්ටාර්ක් කොල්ලාමයි. උගෙ පැත්තකින් දිවුවා මහ දැවැන්ත වෘකයෙක්. මම එතන හිටියෙ නෑ ඒක දකින්ට. ඒ වුනත් දැකපු මිනිස්සු කිවුවෙ ඌ මිනිස්සු හතරදෙනෙක් මරලා දාලා තවත් අශ්වයො දුසිමක් විතර කෑලි කෑලිවලට ඉරලා දැම්මයි කියලා. අපේ හෙලිධරයො ඉක්මනට එකතුවෙලා උන්ගෙ පළවෙනි ප්‍රහාරයට විරුද්ධව පලිස් පවුරක් හැදුවා. ඒ වුනත් ඒක දැක්ක ගමන් ටලීලා උන්ගෙ බලකොටු දොර ඇරියා. ටයිටස් බ්ලැක්වුඩ් දියඅගලට උඩින් තිබ්බ පාලමෙන් හමුදාවක් අරන් ඇවිත් උන්ට පස්සෙන් පහර දුන්නා."

"දෙයියො අපට පිහිටවෙන්ට." ලෙෆර්ඩ් උතුමානන් දිවුලේය.

"ග්‍රේට්ජොන් අම්බර් අපි හද හදා හිටපු වැටලීම් කුළුණු සේරටම ගිනිතිබ්බා. බ්ලැක්වුඩ් උතුමානන් ඇවිල්ලා දම්වැල් දාලා බැඳලා හිටපු සෙර් එඩ්මුයර් ටලීවයි අනිත් හිරකාරයො ඔක්කොමයි නිදහස් කරන් අරන් ගියා. අපේ දකුණු කඳවුරට අණදුන්නෙ සෙර් ෆෝර්ලි ප්‍රෙස්ටර්. අනිත් කඳවුරු දෙක බිඳවැටුනා කියලා දැක්කහම එයා මොළේ පාවිච්චි කරලා එයාගෙ හමුදාවත් අරන් පසුබැස්සා. දෙදාහක් විතර හෙලිධරයොයි, ඒ තරම්ම ඇති

දුනුවායොයි. ඒ වුනත් නිදහස් අසරුවන්ට අණදුන්නු ටයිරෝෂි කුලී භේවායා එයාගෙ ධජ විසිකරලා දාලා සතුරු හමුදාවට එකතුවුනා."

"ඌ යකාටම ගියාදෙන්." කෙවන් ලැනිස්ටර් පුදුමයට වඩා කේන්තියට පත් වී සිටින බවක් දිස්විය. "මම ජේමිට අනතුරු ඇඟෙවුවා ඌව විශ්වාස කරන්ට එපැයි කියලා. සල්ලිවලට සටන්කරන මිනිහෙක් පක්ෂපාති වෙන්නෙ එයාගෙ සල්ලි පසුම්බියට විතරයි."

දෑතේ ඇඟිලි එකට බැඳගත් ටයිවින් උතුමානන් එය නිකටට යටින් තබාගත්තේ ය. සැමටම ඇහුම්කණ් දෙන අතරේ ඔහුගේ දෑස් පමණක් ඔබමොබ දිවුවේය. රන්වන් පැහැ දෙපස රැවුලෙන් ආවරණය වූ ඒ මුහුණ කෙතරම් නිසල වී ද යත් එය වෙස් මුහුණක් යැයි දකින්නෙකුට සිතෙනු ඇත. එනමුදු සිය පියාගේ තට්ට හිස මත සිහින් දහදිය බිඳු නැංවී තිබෙනු ටිරියන් නිරීක්ෂණය කලේය.

"කොහොමද මෙහෙම දෙයක් වෙන්නෙ?" සෙර් හැරිස් ස්විෆ්ට් නැවතත් කෙඳිරිගෑවේය. "සෙර් ජේමිව අල්ලගත්තා. වැටලීම බිඳලා දැම්මා... මේක මහ විපත්තියක්."

සෙර් ඇඩම් මාර්බ්‍රෑන්ඩ් කට හැරියේය. "මේ පැහැදිලිවම ජේන්ට තියෙන දේ අපිට පෙන්නලා දුන්නට බොහොම ස්තූතියි සෙර් හැරිස්. ප්‍රශ්නෙ තියෙන්නෙ, අපි දැන් මොකක්ද මේකට කරන්නෙ?"

"මොකක්ද අපට කරන්ට පුළුවන්? ජේමිගෙ හමුදාව ඔක්කොම වගේ එක්කො මරලා දාලා, එක්කො අල්ලගෙන, නැත්තම් පැනලා ගිහිල්ලා. ස්ටාර්ක්ලායි ටලීලායි අපේ සැපයුම් මාර්ග අවහිර කරගෙන ඉන්නවා. අපිව බටහිර පැත්තෙන් කපලා දාලා. උන්ට ඕනනම් දැන් කෙලින්ම කාර්ස්ටලී රොක්වලටම යන්ට පුළුවන්. කවුද උන්ව නවත්තන්ට ඉන්නෙ? මගේ උතුමනි, අපි පැරදිලා ඉවරයි. දැන් අපි සාමයක් වෙනුවෙන් ලැස්ති වෙන්ට ඕන."

"සාමය?" කල්පනාකාරීව සිය වයින් කුසලාන කරකවමින් මොහොතක් සිටි ටිරියන් එහි වූ වයින් සියල්ලම උගුරට හලාගෙන හිස් කුසලාණ බිමට දමා ගැසීය. එය දහසක් කැබැලිවලට සිදී බිඳී ගියේය. "ඔන්න තියෙනවා ඔබේ සාමය සෙර් හැරිස්. මගේ ආදරණීය බෑණා ඔය බඩකඩුත්තු සාමය සම්පූර්ණයෙන්ම කඩලා දැම්මා අර එඩාර්ඩ් උතුමානන්ගෙ

ඔළුගෙඩිය ගහලා රතු බලකොටුවෙ බිත්ති ලස්සන කරන්ට ඕන වුන දවසෙ ඉඳලා. රොබ් ස්ටාර්ක්ව සාම ගිවිසුමකට පොළඹවනවට වඩා ලේසියි අර බිදිච්ච කුසලාණෙන් වයින් බොන්ට හදන එක. ඌ දැන් දිනනවා... සමහර විට ඔබට ඒක පේන්නෙ නැතුව ඇති."

"සටන් දෙකකින් යුද්ධයක් තීරණය වෙන්නෙ නැහැ." සෙර් ඇඩම් තිර කොට සිටියේය. "අපි තාමත් පරාජයෙන් හුඟාක් ඈත. මේ ස්ටාර්ක් කොල්ලාත් එක්ක මගේ හමුදාව දාලා හැප්පෙන්ට මම බොහොම කැමැතියි."

"සමහරවිට උන් සාම ගිවිසුමකට එකඟ වෙයි. උන්ගෙ හිරකාරයොයි අපේ හිරකාරයොයි හුවමාරු කරගන්ට." ලෙෆර්ඩ් උතුමානන් කියා සිටියේය.

"උන් තුනට එකේ අනුපාතෙට වගේ හිරකාරයො හුවමාරු කරගන්ට කැමැති වුනොත් ඇරෙන්ට ඒකෙන් අපට ලොකු වාසියක් වෙන්නෙ නැහැ." ටිරියන් තිත්ත ස්වරයෙන් කීවේය. "අනිත් එක අපි මොනවද දෙන්නෙ මගේ අයියා වෙනුවෙන්? එඩාර්ඩ් උතුමානන්ගෙ කුණුවෙච්චි ඔළුගෙඩිය ද?"

"මට අහන්ට ලැබුනා සෙර්සි රැජිණ ගාව හස්තයේ උතුමානන්ගෙ දුවලා දෙන්නා ඉන්නවයි කියලා." ලෙෆර්ඩ් බලාපොරොත්තු සහගත ස්වරයෙන් කීවේය. "අපි මේ කොල්ලට එයාගෙ නංගිලා දෙන්නා ආපහු දුන්නොත්..."

සෙර් ඇඩම් උගුරෙන් යම් අවඥාසහගත හඬක් නැංවීය. "ජේමි ලැනිස්ටර්ගෙ ජීවිතේ කෙල්ලො දෙන්නෙක්ගෙ ජීවිතේ වෙනුවෙන් හුවමාරු කරගන්ට ඌ නොමමර එකේ මෝඩයෙක් වෙන්ට ඕන."

"එහෙමනම් අපි සෙර් ජේමි වෙනුවෙන් වන්දියක් ගෙවමු. ගාන කීය වුනත් කමක් නැහැ." ලෙෆර්ඩ් උතුමානන් නැවත කීවේය.

ටිරියන් දෑස් කරකැවීය. "ස්ටාර්ක්ලාට රත්තරන් ඕන නම් උන්ට පුළුවන් ජේමිගෙ සන්නාහය උණු කරන්ට."

"අපි සාම ගිවිසුමකට කතාකලොත් උන් හිතයි අපි දැන් දුර්වල වෙලයි කියලා." සෙර් ඇඩම් විවාදාත්මක ස්වරයෙන් කීවේය. "ඊට වඩා හොඳයි අපි දැන්මම ගිහිල්ලා උන් එක්ක සටන් කරන එක."

"කිසිම සැකයක් නැහැ රාසභාවෙ ඉන්න අපේ යාළුවන්ට ඒත්තු ගන්නන්ට ඕන අලුත් හමුදාවකුත් අරන් අපිට එකතු වෙන්ට එන්ටයි කියලා." සෙර් හැරිස් කීය. "ඒත් එක්කම තවත් කවුරුහරි කාර්ස්ටලී රොක්වලට යන්ට ඕන තව හමුදාවක් රැස් කරගන්ට."

ටයිවින් ලැනිස්ටර් උතුමානන් සිය දෙපා මතින් නැගී සිටියේය. "උන් මගේ පුතා අල්ලගෙන." ඔහුගේ වදන් මේදය කුට්ටියක් කපාගෙන බසින අසිපතක් මෙන් මේ උතුමන්ගේ නන් දෙඩවීම් අභිබවමින් පැතිර ගියේය. "පලයල්ලා මෙතැනින්. උඹලා හැමෝම පලයල්ලා."

සැමදාමත් සිය පියාගේ කීකරු බලු කුක්කකු වූ ටිරියන් අනිකුත් උතුමන් සමගින් පිටව යෑම පිණිස සිය බංකුවෙන් බිමට පැන්නේය. එනමුදු පියාගේ බැල්ම ඔහු වෙතට එල්ල විය. "නෑ. උඹ යන්ට එපා ටිරියන්. නැවතියන්. උඹත් නැවතියන් කෙවන්. අනිත් එවුන් හැමෝම පිටවෙලා පලයල්ලා."

* * *

ටිරියන් නිහඬවම නැවත බංකුව මත වාඩිවිය. සෙර් කෙවන් කාමරය හරහා ගොස් වයින් මලු වෙත ළඟාවිය. "බාප්පෙ, කරුනාකරලා මටත් එකක්-"

"මෙන්න මේක ගනින්." ඔහුගේ පියා අතවත් නොගැසූ සිය වයින් කුසලාණ ඔහු දෙසට තල්ලු කලේය.

එවිගස නම් ටිරියන් සම්පූර්ණයෙන්ම අන්දුන් කුන්දුන් වී ගියේය. එනමුදු කුසලාණ අතට ගත් ඔහු වයින් උගුරක් බීවේය.

ටයිවින් උතුමානන් ද නැවත සිය අසුනේ වාඩි ගත්තේය. "උඹ ස්ටාර්ක් ගැන කියාපු කතාව ඇත්ත. එඩාර්ඩ් උතුමානන් පණ පිටින් හිටියානම් අපට එයාව පාවිච්චි කරලා වින්ටර්ෆෙලුයි රිවර්රනුයි එක්ක බොරු සාම ගිවිසුමක් ගහන්ට තිබුනා. ඒකෙන් අපට කාලයක් ලැබෙනවා රොබර්ට්ගෙ සහෝදරයො එක්ක හැප්පෙන්ට. ඒත් දැන් එයා මැරිලා..." ඔහුගේ දැත් කිටිකිටියේ මිට මෙලැවී ගියේය. "මහ ගොන්කමක්. මහ බූරු ගොන්කමක්."

"ජොෆ් තාම පොඩි කොල්ලෙක්නෙ." ටිරියන් පෙන්වා දුන්නේය. "එයාගෙ වයසෙදි මමත් ඔය වගේ ගොන්කම් කීපයක්ම කලා නෙව."

පියා ඔහු දෙස තියුණු බැල්මක් හෙලුවේය. "මම හිතන්නෙ අපි සන්තෝස වෙන්ට ඕන එයා තාම වේස ගෑනියෙක් කසාද බැඳගත්තෙ නැති එක ගැන."

ටිරියන් නිහඬවම වයින් බඳුන තොලගෑවේය. සිය වයින් බඳුන පියාගේ මුහුණට දමා ගැසුවහොත් ඔහුව කෙසේ පෙනෙනු ඇත්දැයි ඔහු කල්පනා කලේය.

"අපේ තත්ත්වය උඹලා හිතනවටත් වඩා නරක අඩියකයි තියෙන්නෙ. ජේන හැටියට නම් අපට දැන් අලුත් රජ කෙනෙක් ඉන්නවා."

සෙර් කෙවන් තුෂ්නීම්භූත වී ගියාක් මෙන් පෙනින. "අලුත් මොකෙක්? උන් ඒ ගමන ජොෆ්රිට මොකක්ද කරලා තියෙන්නෙ?"

ටයිවින් උතුමානන් ගේ දෙතොල් මත යාන්තමින් මෙන් අප්‍රසාදාත්මක රැවුමක් නැඟී ආයේය. "මොකුත් වෙලා නැහැ... තාමත්. මගේ මුණුබුරා තමා තාමත් යකඩ සිංහාසනේ වාඩිවෙලා ඉන්නෙ. ඒ වුනත් වාරිස් නපුංසකයාට දකුණෙන් රහස් ආරංචි වගයක් ලැබිලා තියෙනවා. දැනට සති දෙකකට උඩදි රෙන්ලි බරතියන් හයිගාර්ඩන්වලදි මාර්ජරී ටිරල්ව කසාද බැඳලා. දැන් එයා කිරුළට උරුමකම් කියනවලු. මනමාලිගෙ තාත්තයි, මාමලයි හැමෝම තමන්ගෙ දණ නමලා එයාට පක්ෂපාතීත්වය ඔප්පු කරලා තියෙනවා."

"ඒක බොහොම නරක ආරංචියක්." සෙර් කෙවන් බැම ඇකිළුං විට ඔහුගේ නළලේ දැනටමත් ඇති රැළි ගැඹුරු ආගාධ මෙන් දිගු වී යයි.

"මගේ දුව අණකරනවා හමුදාවත් එක්ක වහාම කින්ග්ස් ලැන්ඩින්ග්වලට එන්ටයි කියලා. රෙන්ලි රජතුමාගෙනුයි කුසුම් නයිට්වරයාගෙනුයි රතු බලකොටුව බේරගන්ට." ඔහුගේ මුව තද වී ගියේය. "අණ කරනවා ඈ. ඔන්න බලපන්. රජතුමාගෙයි රජසභාවෙයි නාමයෙන් අණකරනවා."

"ජොෆ්රි රජතුමා කොහොමද මේ ආරංචිය ගැන හිතන්නෙ?" ව්‍යාජ විමතියකින් මුව සරසාගෙන ටිරියන් ඇසුයේය.

"සෙර්සි තාම එයාට ඒ ගැන කියන්ට හිතලා නැහැ. එයා බයයි කොල්ලා රෙන්ලිට විරුද්ධව එයාම හමුදාවක් අරන් යයි කියලා."

"මොන හමුදාවක් එක්කද? ඔබ එයාට මේ හමුදාව දෙන්ට කල්පනා කරන එකක් නැහැ මම හිතන්නෙ."

"එයා හිතනවලු නගරාරක්ෂක බලකාය අරන් යන්ට."

"එයා නගරාරක්ෂක බලකාය අරන් ගියොත් නගරෙ අනාරක්ෂිත වෙනවනෙ." සෙර් කෙවන් කීය. "ස්ටැනිස් උතුමානන් ඩ්‍රැගන්ස්ටෝන්වල..."

"ඔවු." ටයිවින් උතුමානන් සිය පුතු දෙස බැලීය. "මම හිතාගෙන උඹ තමා බම්මන්නා කියලා ටිරියන්. ඒ වුනත් පේන හැටියට නම් මම වැරදියි වගේ."

"ඇයි තාත්තෙ. ඒක නිකම් මට කරපු ප්‍රශංසාවක් වගේනෙ." ඔහු ඕනෑකමින්ම ඉදිරියට නැඹුරු වූයේය. "ස්ටැනිස් ගැන මොකද? එයා තමා වැඩිමලා. රෙන්ලි නෙවෙයි. එයා මොකක්ද හිතන්නෙ මල්ලිගෙ මේ රජකමට උරුමකම් කියන එක ගැන?"

ඔහුගේ පියා බැම ඇකිළීය. "මට මුල ඉඳන්ම තේරුම් ගිය දෙයක් තමා මේ අනිත් එවුන් ඔක්කොම එක්කහු කරලා ගත්තටත් වඩා තනි ස්ටැනිස් භයානකයි කියන එක. ඒ වුනත් ඌ කිසිම දෙයක් කරන්නෙ නැහැ. ඇත්ත, වාරිස්ට එක එක ආරංචි ලැබෙනවා තමා. ස්ටැනිස් නැවු හදනවලු. ස්ටැනිස් කුලී හේවායො එකතු කරනවලු. ස්ටැනිස් අෂයිවල ඉඳන් මායා බන්ධකයෙක් ගෙනාවලු. මොකක්ද ඒකෙන් කියැවෙන්නෙ? මේ කියන එක දෙයක් හරි ඇත්තද?" ඔහු පීඩාවට පත් වූ ස්වරයෙන් දෙවුර ඇකිළීය. "කෙවන්. ඔය සිතියම මෙහාට අරන් වරෙන්."

සෙර් කෙවන් අණට කීකරු වූ අතර ටයිවින් උතුමානන් සම් රෝල මේසය මත දිගහැර ඇතිරුවේය. "ජේමි අපිව බොහොම නරක තැනකටයි අතඇරලා තියෙන්නෙ. රූස් බෝල්ටනුයි උගෙ හමුදාවෙ ඉතුරු වෙච්ච එවුනුයි අපට උතුරෙන්. අපේ හතුරො ද්විත්ව බලකොටුවයි මෝට් කේය්ලින් බලකොටුවයි දෙකම පාලනය කරනවා. රොබ් ස්ටාර්ක් බටහිර පැත්තෙ. සටනක් කරන්නෙ නැතුව අපට ලැනිස්පෝර්ට්වලට හරි කාර්ස්ටලී රොක්වලට හරි පහුබහින්ට බැහැ. ජේමි අත්අඩංගුවට අරන්. එයාගෙ හමුදාව දැන් ඇත්තෙම නැති ගානයි. ම(ර්) වල තොරෝස්සුයි බෙරික් ඩොන්ඩරියනුයි තාමත් අපේ සැපයුම් තවලම්වලට පහර දෙනවා. නැගෙනහිර පැත්තෙන් අපට ඉන්නවා ඒරින්ලා. ස්ටැනිස් බරතියන් ඩ්‍රැගන්ස්ටෝන්වල. දකුණුකරේ හයිගාර්ඩනුයි ස්ටෝර්ම්ස් එන්ඩුයි උන්ගෙ යටත් ධජ දරන්නො එකතු කරනවා."

ටිරියන් වංචාකාරී සිනහවක් පෑවේය. "දහිරිය ගන්ට තාත්තෙ. අඩුම ගානෙ රේගාර් ටාර්ගේරියන් මැරිලනෙ."

"අපට දෙන්ට ඔය විකාර විහිළුවලට වඩා වැදගත් දෙයක් උඹ ගාව ඇතිය කියලයි මම හිතුවෙ ටිරියන්."

සෙර් කෙවන් අකුළාගත් බැමින් යුතුව සිතියම දෙස රවා බැලුවේය. "දැන් එඩ්මුයර් ටලීයි ගංගා නිම්නයේ අනිත් වංශාධිපතියො ඔක්කොමයි රොබ් ස්ටාර්ක් එක්ක එක්කහු වෙලයි

ඉන්නෙ. උන්ගෙ හමුදා ඔක්කොම එකතු කරලා ගත්තොත් අපට වඩා වැඩිවෙන්ට පුළුවන්. ඒත් එක්කම රූස් බෝල්ටන් අපේ පිටිපස්සෙ... ටයිවින්, අපි මෙතැනට වෙලා නැවතිලා හිටියොත්, අපි හමුදා තුනකට කොටුවෙනවා."

"මෙතැනට වෙලා බලන් ඉන්ට මගේ කිසිම අදහසක් නැහැ. රෙන්ලි බරතියන් හයිගාර්ඩ්න්වල ඉඳන් හමුදාවත් අරන් උතුරට එන්ට පිටත්වෙන්ට කලින් අපි මේ තරුණ ස්ටාර්ක් උතුමානනුත් එක්ක තියෙන ගනුදෙනු අහවරක් කරලා දාන්ට ඕන. බෝල්ටන් ගැන මගේ එච්චර බයක් නැහැ. ඌ බොහොම පරීක්ෂාකාරී මිනිහෙක්. කොළ ගංගාවෙ සටනින් පස්සෙ මිනිහා කලින්ටත් වඩා පරීක්ෂාකාරී වෙයි. මිනිහා අපිව ලුහුබැඳන් එන්ට තව පරක්කු වෙයි. ඒ නිසා... අපි හෙට උදේම හැරෙන්හෝල්වලට පිටත්වෙලා යනවා. කෙවන්, මට ඕන සෙර් ඇඩම්ගෙ ඔත්තුකාරයො අපේ ගමන සම්පූර්ණයෙන්ම ආවරණය කරන්ට. එයාට ඕන තරමක් මිනිස්සු ගන්ටයි කියහන්. ඒ වගේම උන් හතරදෙනාගෙ කණ්ඩායම් යවන්ටයි කියහන්. ආයෙමත් ඔත්තුකාරයො අතුරුදහන් වෙනවා දකින්ට මට ඕන නැහැ."

"ඔබ කියන විදියක් මගේ උතුමානනි. ඒත්... ඇයි හැරෙන්හෝල්? ඒක මහ අඳුරු, අවාසනාවන්ත තැනක් නෙව. සමහරු කියනවා ඒක සාපලත් තැනක් කියලා."

"උන්ට ඕන දෙයක් කියපුවාවෙ. සෙර් ග්‍රෙගර්ට කියපන් උගෙ මංකොල්ලාකාරයො ඔක්කොමත් අරන් අපට ඉස්සරහින් යන්ටයි කියලා. වාර්ගෝ හෝර්ට්‍ටයි උගෙ කුලී හේවායනුයිත් යවන්ට ඕන. ඒත් එක්කම සෙර් අමෝරි ලෝර්ක්වත්. මේ තුන්දෙනාටම කියපන් අසරු සෙබළු තුන්සීය ගානෙ ගන්ටයි කියලා. උන්ට කියපන් මට ඕන කියලා රතු ගංගාවෙ ඉඳන් දෙවියන්ගෙ ඇහැ වෙනකම් මුලු ගංගා නිම්නයම ගිනි තියලා, විනාශ කරලා දාන්ට."

"උන් බොහොම කැමැත්තෙන් ගිනි තියයි මගේ උතුමානනි." සෙර් කෙවන් අසුනෙන් නැගිටිමින් කීවේය. "මම අණ නිකුත් කරන්නම්." හිස නැමූ ඔහු දොර දෙසට පිටව ගියේය.

* * *

ඔවුන් දෙදෙන තනි වූ විට ටයිවින් උතුමානන් සිය පුතු දෙස දැස් කොණින් බැල්මක් හෙළීය. "උඹේ වනචාරියොත් කැමැති වෙයි පොඩි මංකොල්ලාකෑමක් කරන්ට. උන්ට කියාපන් කැමැතිනම් වාර්ගෝ හෝර්ට් එක්ක පිටත් වෙලා ගිහිල්ලා කැමැති විදියට මංකොල්ලා කන්ටයි කියලා. කෑම, බඩුභාණ්ඩ, ගෑනු, ඕන දෙයක්. උන්ට ඕන තරමක් අරන් අනිත් හැම දෙයක්ම ගිනි තියන්ට කියපන්."

"ෂග්ගාටයි ටිමට්ටයි මංකොල්ලා කන්නෙ කොහොමද කියලා උගන්නන එක හරියට කුකුළෙකුට කොක් කොක් ගාන්ට උගන්නනවා වගේ වැඩක්. ඒ වුනත් මම කැමැතියි උන්ව මගේ ළඟ තියාගන්ට." ඔවුන් අශිෂ්ට හා දඩබ්බර නොහික්මුනු එවුන් වුවද මේ වනචාරීන් වනාහි ඔහුගේ මිනිස්සු වූහ. එමෙන්ම සිය පියාගේ ඕනෑම සෙබළෙකුට වඩා ටිරියන් ඔවුන්ව විශ්වාස කලේය. ඔවුන් වෙනෙකෙකු ගේ පාලනය යටතට පංගාර්තු කිරීම ඔහුට කිසිසේත් අවශ්‍ය නොවීය.

"එහෙම නම් උඹ ඉගෙනගනින් කොහොමද උන්ව පාලනය කරන්නෙ කියලා. මට ඕන නැහැ උන් නගරය මංකොල්ලා කනවා දකින්ට."

"නගරය?" තමා අතරමං වූ සෙයක් ටිරියන්ට දැනින. "මොන නගරයක් ගැනද ඔය කියන්නෙ?"

"කින්ග්ස් ලැන්ඩින්ග්. වෙන මොකක්ද? මම උඹව යවනවා රාජ සභාවට."

මේ වනාහි ටිරියන් ලැනිස්ටර් කිසිසේත්ම බලාපොරොත්තු නොවුනු දෙයක් විය. සිය වයින් බඳුන වෙත අත යැවූ ඔහු කල්පනාකාරීව වයින් උගුරක් පානය කලේය. "ඉතින් මම මොකක්ද එහෙ ගිහින් කරන්ට ඕන?"

"පාලනය කරපන්."

ටිරියන් කොක් හඩලා සිනාසුනේය. "මගේ ලස්සන අක්කාට ගොඩක් දේවල් තියෙයි ඒ ගැන කියන්ට."

"එයාට ඕන දෙයක් කියාපුදෙන්. එයාගෙ පුතා අපි හැමෝවම නැති බංගස්ථාන කරලා දාන්ට කලින් අපි එයාව පාලනය කරගන්ට ඕන. මම ඒකට වැරැද්ද පටවන්නෙ වෙන කාටවත් නෙවෙයි. රාජසභාවෙ ඉන්න අර ජේත්තුකාරයො ටිකට. අපේ යාළුවා පෙටයර්, ගරු කටයුතු ප්‍රධාන මේස්ටර්, එතකොට අර නපුංසකයා වාරිස් උතුමානන්. ජොෆ්රි එක මෝඩ වැඩකින් තව මෝඩ වැඩකට පනිනකම් උන් මොනවද එයාට අනුශාසනා කරන්නෙ? මේ ජේනස් ස්ලින්ට් කියන බූරුවාව වංශාධිපතියෙක් කරන්ටයි කියපු එක කාගෙ අදහසක් ද? මේ මිනිහගෙ තාත්තා මස් කඩ කාරයෙක්. අනිත් එක එයාලා ඌට දෙනවා හැරෙන්හෝල්. හැරෙන්හෝල්! හැරෙන්හෝල් කියන්නෙ රජෙකුට සුදුසු තැනක්. මට පුළුවන් නම් මම ඌට ඒකට අඩිය තියන්ටවත් දෙන්නෙ නැහැ. මට ලැබුන ආරංචිවල හැටියට ඌ තමන්ගෙ වංශ ලාංඡනය හැටියට තෝරගෙන තියෙන්නෙ ලේ ගෑවිච්ච හෙල්ලක්. ලේ ගෑවිච්ච මන්නයක් ගත්තනම් හොඳයි ඊට වැඩිය." සිය පියා කටහඬ උස් කලේ නැති නමුදු ඒ රන්වන් දෑසේ දිදුලන කේන්තිය ටිරියන් පැහැදිලිවම දුටුවේය. "එතකොට සෙල්මිව තනතුරෙන් පහ කරපු එක. ඒක මොන අමන මරි මෝඩ වැඩක් ද? ඇත්ත, මේ මනුස්සයා වයසයි තමා. ඒ වුනත්, 'නිර්භීත බැරිස්ටාන්' කිවුවහම තාමත් මේ රජධානි සප්තකයේ මිනිස්සු ගරු බුහුමන් දක්වනවා. එයා සේවය කරන්නෙ කාට වුනත් ඒකෙන් එයාගෙ ස්වාමියාට අත්වෙන්නෙ ගෞරවයක්. කාටවත් පුළුවන් ද මේ කතාවම දඩබල්ලා ගැන කියන්ට? උඹ උඹේ බල්ලන්ට කන්ට දෙන්නෙ මේසෙ යට. උඹ උන්ව නග්ගගන්නෙ නැහැ උඹ වාඩිවෙලා ඉන්න බංකුවෙ පැත්තකින්." ඔහු ටිරියන් ගේ මුහුණට ඇඟිල්ලක් දිගුකලේය. "සෙර්සිට මේ කොල්ලව හදාගන්ට බැරි නම් උඹ හදපන්. ඒත් එක්කම, මේ රාජසභිකයො අපට වංචා කරනවයි කියලා අහුවුනොත්..."

කලයුත්තේ කුමක්දැයි ටිරියන් මනාව දත්තේය. "යකඩ රිටි." ඔහු සුසුමක් හෙලීය. "ඔළු ගෙඩි. ප්‍රාකාර."

"මට පේනවා උඹ මගෙන් පාඩම් ටිකක් ඉගෙනගෙන තියෙනවා කියලා."

"ඔබ දන්නවාටත් වැඩියෙන් තාත්තෙ." ටිරියන් කටුකුටු ගෑවේය. සිය වයින් බඳුන බී හමාර කල ඔහු සිතුවිල්ලේ ගැලෙමින් හිස් කුසලාණය පසෙකින් තැබීය. ඔහුගෙන් අඩක් සිතනවාටත් වඩා සතුටින් ප්‍රමුදිතව සිටියේය. එනමුදු ඉතුරු අඩ ගඟ අද්දර සිදු වූ සටන

මෙනෙහි කරමින් හුන්නේය. මෙහි අරමුණ නැවත වරක් ඔහුව වම් අංශය රැකගැනීමට යැවීම ද? "ඇයි මම?" හිස පසෙකට ඇල කරමින් ඔහු විමසා සිටියේය. "ඇයි බාජ්පාව යවන්නෙ නැත්තෙ? එහෙමත් නැත්තම් සෙර් ඇඩම් හරි සෙර් ෆ්ලෙමන්ට් හරි සෙරට් උතුමානන් හරි යවන්නෙ නැත්තෙ? ඇයි... ලොකු මිනිහෙක් යවන්නෙ නැත්තෙ?"

ටයිවින් උතුමානන් හිටි අඩියේම සිය අසුනින් නැගී සිටියේය. "මොකද උඹ මගේ පුතා නිසා."

සත්‍යය කුමක්දැයි ඔහු ඒ මොහොතේ වටහා ගත්තේය. 'උඹ එයාව අත ඇරලා දාලා ඉවරයි.' ඔහු කල්පනා කලේය. 'උඹ අවජාතක බල්ලා. උඹ හිතන්නෙ දැන් ජේමි මලා හා සමානයි කියලා. දැන් උඹට ඉතුරුවෙලා ඉන්න එකම එකා මම විතරයි.' සිය පියාට කම්මුල් පහරක් දීමට ටිරියන්ට සිත් විය. ඔහුගේ මුහුණට කෙල ගැසීමට උවමනා විය. සිය සිරිය ඇදගෙන, ඔහුගේ පපුව පලා, හදවත එළියට ගෙන, සාමාන්‍ය මිනිසුන් කියන්නාක් මෙන් ඇත්තටම ඔහුගේ හදවත රනින් නිම වී ඇත්දැයි බලන්නට උවමනා විය. එනමුදු මේ කිසිවක් නොකල ඔහු සිය අසුනට වී නිසලව, නිහඬව බලා සිටියේය.

ටයිවින් උතුමානන් කාමරය හරහා පිය මනිද්දී ඔහුගේ පයට පෑගුනු බිඳුනු වීදුරු කුසලාණයේ කටුකැබැලි කරකරස් හඬින් කුඩු වී ගියේය. "තව එක දෙයක්." දොර අසලදී ආපසු හැරුනු ඔහු කීවේය. "උඹේ අර වේස ගෑනිව රාජසභාවට එක්කරන් යන්ට බැහැ."

සිය පියා පිටව ගිය පසු ටිරියන් ප්‍රධාන ශාලාවට වී බොහෝ වේලාවක් තනිවම ගතකලේය. අන්තිමේදී කාමරයෙන් පිට වූ ඔහු සණ්ඨා කුළුණ යට පිහිටි සිය සුවපහසු අට්ටාල කාමරයට යනු පිණිස පිටගැට පෙළ නැංගේය. එහි සිවිලිම පහත් එකක් වුවද ඔහු වැනි අඟුටුමිට්ටකුට එය සැලකිය යුතු දෙයක් නොවීය. කාමරයේ වූ කවුළුව තුළින් ඔහුට සිය පියා විසින් තානායම් මිදුලේ ඇටවූ එල්ලුම් ගස නිරීක්ෂණය කල හැකි විය. රාත්‍රී සුළං හමන වාරයක් පාසා එහි එල්ලී තිබුනු තානායම්පතිනිය ගේ මළසිරුර සෙමින් පැද්දෙන්නට විය. දැන් එහි වූ සම්, මස්, නහර වියළී ගොස් මළසිරුර ලැනිස්ටර් බලාපොරොත්තු තරමටම සිහින් වී, තුනී වී ගොස් තිබින.

ඔහු පිහාටු මෙට්ටය මත වාඩි වෙද්දී නිදිමතයේම මොනවාදෝ මිමිනූ ෂේ ඔහු දෙසට රෝල් විය. පොරෝණයට යටින් රිංගූ ඔහුගේ අත ඇගේ සුමුදු පයෝධරයක් මත නතර වූ අතර ඇගේ දෑස් විවර විය. "මයෙ උතුමානනි." ඇය නිදිමත සිනහවක් පාමින් කීවාය.

ඇගේ තණපුඩුව දැඩිවනු ඔහුගේ අතට දැනෙද්දී ඔහු පහත් වී ඇගේ දෙතොල් සිප ගත්තේය. "මට අදහසක් ආවා උඹව කින්ග්ස් ලෑන්ඩින්ග්වලට එක්කරන් යන්ට වස්තුවෙ." ඔහු කෙඳිරීය.

**Kevan Lannister: “A man who fights for coin is loyal only to his purse.”**

ජොන් 09-1

ජොන් සෑදල පටි තද කරද්දී වෙළඹ මෘදු හඬින් හේෂාරවය කලාය. "හරි හරි. හෙමින් කෙල්ලේ, හෙමින්." මුදු හඬින් මුමුනමින්, වෙළඹව ස්පර්ශ කරමින් ඔහු ඇයව සන්සුන් කරන්නට තැත් කලේය. ඉස්තාලය පුරා හමා ගිය සීතල සුළං සිය මුහුණේ දැවටෙන්නට වූ නමුදු ඔහු ඒ නොතකා හැරියේ සිය දරදඬු වූ, අනම්‍ය ඇඟිලිවලින් සෑදල බැගය සෑදලයට තබා ගැට ගැසුවේය. "ගෝස්ට්. මගේ ළඟට වරෙන්." ඔහු සිහින් හඬින් මිමිනූ අතර ඊළඟ මොහොතේ රත් පැහැයෙන් දිදුලන දෑසින් යුතු වෘකයා එතැන විය.

"ජොන් කරුනාකරලා. උඹට මේ වැඩේ කරන්ට බැහැ."

වෙළඹ පිට නැගුනු ජොන් තෝන්ලණුව අල්ලාගත්තේ රාත්‍රී අන්ධකාරය දෙසට ඇයව හරවා ගත්තේය. සැම්වෙල් ටාර්ලි ඉස්තාල දොරකඩ සිටගෙන සිටි අතර ඔහුගේ උරහිසට උඩින් පුරා හඳක් එබිකම් කරමින් තිබුනි. එනයින් ඔහුගේ සෙවනැල්ල දැවැන්ත කළු පැහැ යෝධයකු මෙන් ඉස්තාල බිම වසා පැතිරුනේය. "මගේ පාරෙන් අයින් වෙයන් සැම්."

"ජොන් උඹට මෙහෙම කරන්ට බැහැ. මම උඹට ඉඩදෙන්නෙ නැහැ මේක කරන්ට."

"මම කැමැති නැහැ උඹට තුවාලයක් කරන්ට. අහකට වෙයන් සැම්. නැත්තම් මම උඹව යටකරලා දානවා."

"මම දන්නවා උඹ එහෙම කරන්නෙ නැහැයි කියලා. අනේ, උඹ මම කියන දේට ඇහුම්කණ් දීපන්."

ජොන් සිය සන්කටු තද කල අතර වෙළඹ දොර දෙසට පිම්මේ පැන්නාය. එක් මොහොතකට සැම් සුදුමැලි මුහුණින් හා ඇරගත් මුවින් යුතුව ඔහු එන දෙස බලා සිටි නමුදු අවසාන නිමේෂයේ ඉවතට පැන ගන්නට සමත් විය. ඔහු එසේ කරනු ඇතැයි ජොන් බලාපොරොත්තු වූ අයුරින්ම අශ්වයා තමා හා ගැටෙන්නට මොහොතකට පෙර ඉවතට

පැන ගත්තේය. එනමුදු ඔහු පා පැකිළී බිම ඇද වැටුනු අතර ඔහුට ඉහළින් වෙළඹ පැන්නවූ ජොන් රාත්‍රී අන්ධකාරය තුළට එළඹියේය.

සිය සනකම් සළුවෙහි වූ ශීර්ෂාවරණය හිස වැසෙන සේ ඇදගත් ඔහු ඉදිරියට යන්නැයි වෙළඹට සන්කලේය.

තමා පසෙකින් දුවන ගෝස්ට් ද ඇතිව ඔහු පිටත්වද්දී කළු බලකොටුව නිහඬවම නිසොල්මනේ බලා සිටියේය. ප්‍රාකාරය උඩ මුර සෙබළුන් බලා සිටිනු ඇති බව ඔහු දත්තද නිසැකවද ඔවුන්ගේ දෑස් යොමුව තිබෙනුයේ දකුණු දෙසට නොව උතුරු දෙසට විය. ඔහු පිටව යන අයුරු කිසි කෙනෙකු නොදිටීය. මේ වනවිට දනිපනි ගා නැගිට සිය සිරුරේ දූවිලි පිස දමමින් ඉන්නා සැම්වෙල් ටාර්ලි හැර අන් කිසිවකු නොදිටීය. මෙලෙස පැනීමෙන් සැම්ට අනතුරක් නොවන්නට ඇතැයි ජොන් කල්පනා කලේය. ඔහුගේ සිරුර දැවැන්ත බරැති පංචස්කන්ධයක් වූ අතර මෙවැනි වැටීමක් නිසා මැණික්කටුවක් බිඳීයාම හෝ වළලුකරක් ඇඹරී යාම පහසුවෙන්ම සිදු විය හැක. "මම ඌට අනතුරු ඇඟෙවුවා." ජොන් මහ හඬින් තමාටම කියා ගත්තේය. "ඒ කොහොම වුනත් ඒක ඌට අයිති දෙයක් නෙවෙයි." අසු ධාවනය කරන අතරේ ඔහු සිය පිළිස්සුනු අතේ ඇඟිලි නවමින් දිග හරිමින් ඒවා සුනම්‍ය කරන්නට තැත් දැරුවේය. අතැඟිලි තවමත් වේදනා ගෙන දුන්නද වෙළුම්පටි ඉවත් කර තිබීම මහත් සහනයක් විය.

පීත්ත පටියක් මෙන් දිගහැරුනු රජමාවත දිගේ අසු ඉදිරියටම යද්දී සඳළුළිය විසින් කඳු මුදුන් රජතමය පැහැයෙන් බබලවන්නට විය. ඔහුගේ පලායාම ගැන ඔවුන් දැන ගන්නට පෙර හැකි තරම් දුරක් ප්‍රාකාරයෙන් ඈතට ගමන් කිරීම ජොන්ගේ අභිලාෂය විය. හෙට උදැසන ඔහුට ප්‍රධාන මාවතෙන් ඉවත් වී වනාන්තර, ලඳු බිම්, දිහපහර හා කඳු ඔස්සේ යමින් තමා පසුපස පන්නන්ගෙන් මඟහැරිය හැකි වනු ඇත. එනමුදු මේ මොහොතේ වඩා වැදගත් වනුයේ මඟහැරීම නොව වේගයෙන් ගොස් හැකිතරම් ඈතට යාමයි. කෙසේ වුවද ඔහු මේ පලායන්නේ කොහේටදැයි අනුමාන කිරීම ඔවුන්ට අපහසු දෙයක් නොවනු ඇත.

නාකි වලහා බිමට එළිය වැටෙන්නා හාම නැගිටින්නට පුරුදුව සිටියේය. එබැවින් තමා හා ප්‍රාකාරය අතර ලීග ගනනාවක දුරක් තබාගැනීම පිණිස ජොන්ට අරුණෝදය තෙක් අවකාශ ඇත... ඒ සැම් ටාර්ලි ඔහුව පාවා නොදුනහොත් පමණි. මේ මහත කොලුවා රාජකාරිය අකුරටම ඉටුකරන, බියගුල්ලෙකු වුවද ඔහු ජොන්ට සොහොයුරකුට මෙන් ආදරය කලේය. ප්‍රශ්න කිරීමකට ලක් වුවහොත් ඔහු නිසැකයෙන්ම ඔවුන්ට ඇත්ත පවසනු

ඇත. එනමුදු මේ වෙලාවේ රජතුමාගේ කුළුණ වෙතට ගොස්, මුර කරුවන්ට කරදර කර, නාකි මෝර්මන්ට්ව නින්දෙන් අවදි කරවීමට තරම් ඔහු නිර්භය නොවනු ඇතැයි ජොන් දැන සිටියේය.

නාකි වලහාගේ පාතරාසය ගෙන යනු පිණිස ඔහු උදෑසන කුස්සියට නොගිය විට ඔවුන් ඔහුගේ කුටිය පිරික්සා බලනු ඇත. එවිට ඔහු එහි දමා ආ දික්නියපහුර ඔවුන්ට හමුවනු ඇත. එය අත්හැර දමා පැමිණීම අසීරු කරුණක් වුවද ජොන් තවමත් සිය ගෞරවය අමතක කර දමා නොමැත. අඩුම ගනනේ අවඥාවට බඳුන් වී පලායද්දී සෙර් ජෝරා මෝර්මන්ට් පවා එය රැගෙන ගියේ නැත. කිසිදු සැකයකින් තොරව මේ අසිපත බාර දෙනු පිණිස ඔහුට වඩා සුදුසුකම් ඇත්තෙකු නාකි වලහා විසින් සොයා ගන්නවා ඇත. මේ මහලු මිනිසා ගැන කල්පනා කරද්දී ජොන්ගේ සිතේ තමා කල දේ ගැන නොපහන් හැඟීමක් ඇතිවන්නට විය. ඔහුගේ පුතාගේ පලායාම නිසා තවමත් රිදුම් දෙමින් තිබෙන ඒ සිතට තමාගේ මේ පලායාම තවත් දුකක් එක්කරනු ඇති බැව් ඔහු දැන සිටියේය. නාකි වලහා තමා කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් මේ කරන්නා වූ දේ නපුරු කලගුන සැලකීමක් වනු ඇති නමුදු ඔහුට අන් කිසිදු විකල්පක් නොවීය. ඔහු කුමක් කලත් ඔහු අතින් කිසිවෙකු හෝ පාවාදෙවනු ඇත.

මේ දැන් පවා තමා මේ කරමින් සිටින්නේ ගෞරවනීය දෙයක් දැයි ඔහුගේ සිත විමසමින් තිබුනි. දකුණුකරයේ උදවියට නම් එය පහසු කටයුත්තක් වනු ඇත. ඔවුන්ට කතා කරන්නට, උපදෙස් ගන්නට, දෙවියන්ගේ වචනය ඔවුන්ට කියා දී හොඳ නරක තෝරාබේරා ගන්නට උදවු වනු පිණිස සප්තක පූජකවරුන් සිටියි. එනමුදු ස්ටාර්ක්වරුන් වන්දනාමාන කලේ පුරාණ දෙවිවරුන්ටය. වනාන්තරයේ නිර්නාමික දෙවිවරුන්ටය. හදවෘක්ෂය ඔහු කියන දේ අසා සිටියද පෙරලා ඔහුට කතා නොකරයි, උපදෙස් නොදෙයි.

* * *

කළු බලකොටුවේ අවසාන එළියත් තමා පසුපසින් වැසී යද්දී ජොන් සිය වෙළඹගේ වේගය අඩු කොට ඇයට සැහැල්ලුවෙන් ඇවිද යන්නට සැලැස්වූවේය. ඔහුට බොහෝ දුර ගමනක් යන්නට ඇති අතර ඒ මුලු දුරම ඔහුව ගෙනයන්නට සිටින එකම අසු මෙපමණකි. රජමාවතේ දකුණට යන විට ඔහුට ගොවිබිම් හා කුඩා බලකොටු මුනගැසෙනු ඇති අතර අවශ්‍ය වී නම් ඔහුට එයින් එකකට ගොඩ වැදී සිය වෙළඹ වෙනුවෙන් නව අසෙකු

හුවමාරු කරගත හැකි වනු ඇත. එහෙත් ඒ වෙළඹ කිසිදු අනතුරකින් තොරව අතක් පයක් නොබිඳී සිටියහොත් පමණි.

ඔහුට ඉක්මනින්ම අලුත් ඇඳුම් ද සොයාගත යුතු වනු ඇත. ඇත්තෙන්ම කියන්නේ නම් සොරාගත යුතු වනු ඇත. ඔහු හිසේ සිට දෙපතුලට යන තෙක්ම කළු ඇඳුමින් සැරසී සිටියේය. අසු පිට යන විට පළඳින උස් හම් බූට්ස් සපත්තු, ඔහුගේ කලිසම හා උඩු කබාය, සමින් කල අත් රහිත කොට කබාය, සනකම් ලොම් සළුව, මේ සියල්ලම කළු පැහැතිය. ඔහුගේ දිගු අසිපත හා සිරිය බහා තිබෙන්නේ කළු පැහැ කොපුවලය. සැදල මල්ලේ ඇති මුදු දම්වැල් හිස් ආවරණය හා කමිසය පවා කළු පැහැතිය. මේ සියල්ලේ තේරුම නම් ඔහුව අල්ලාගනු ලැබුවහොත් නියත මරණයකි. බෙල්ලෙන් උඩ ඇති සෑම ලොකු කුඩා බලකොටුවක්ම, ගොවිපලක්ම, ගම්මානයක්ම කළු පැහැයෙන් සැරසුනු ආගන්තුකයෙකු දෙස හෙලන්නේ සැකමුසු බැල්මකි. එමෙන්ම වැඩි කාලයක් යන්නට පෙරම මිනිසුන් ඔහුව සොයා එනු ඇත. ඔහුගේ පලායාම සඳහන් කරමින් මේස්ටර් ඒමන්ගේ කපුටන් විසින් දසඅත පණිවුඩ රැගෙන ගිය පසු ඔහුට සැඟව ගන්නට අභය ස්ථානයක් සෙවීම උගහට වනු ඇත. වින්ටර්ෆෙල් පවා ආරක්ෂාකාරී නොවනු ඇත. නිසැක වශයෙන්ම බ්‍රැන් ඔහුට බලකොටුවට ඇතුළුවීමට අවසර දෙනු ඇති මුත් මේස්ටර් ලූවින් ඊට වඩා දුරදිග බලා වැඩකරනු ඇත. කලයුතු පරිද්දෙන්ම ඔහු බලකොටු ද්වාරයට අගුළු දමා ජොන්ව පලවා හරිනු ඇත. එහි කොහෙත්ම නොයාම වඩාත් මනෝඥ පියවරයි.

එනමුදු ඔහුගේ මනසේ වින්ටර්ටෆෙල්හි රූපකාය සිතුවම් පටක් මෙන් ඇඳී ගියේය. හරියටම ඔහු එය හැරදා මෙහි පැමිණියේ අද ඊයේ මෙනි. දැවැන්ත කළුගල් ප්‍රාකාර, බල්ලන්ගේ හා පිළිස්සෙන මස්වල සුවඳින් පිරුනු ප්‍රධාන ශාලාව, පියාගේ පුස්තකාල කාමරය, ඔහු නිදාගත් අට්ටාල කාමරය. යලිත් බ්‍රැන් සිනාසෙන හඬ අසන්නටත්, ගේජ් කෝකියා ගේ හරක් මස් හා බේකන් පයි එකක රස විඳින්නටත්, වනාන්තරයේ දරුවන් හා මෝඩ ෆ්ලෝරියන් ගැන නාකි ආයම්මා කියාදෙන කතන්දර අසන්නටත් ඔහුගේ එක් අර්ධයකට දැඩිව උවමනා විය.

එනමුදු ඔහු ප්‍රාකාරයෙන් පලා ආයේ මේ දේවල් වෙනුවෙන් නොවේ. ඔහු එයින් පලා ආයේ ඔහු ඇත්තටම සිය පියාගේ පුතනුවන් කෙනෙකු හා රොබ්ගේ සොහොයුරකු බැවිනි. දික්නියපහුර වැනි උත්තම ගනයේ අසිපතක් ත්‍යාග වශයෙන් ලැබුනද ඔහු මෝර්මන්ට් කෙනෙකු නොවනු ඇත. එමෙන්ම ඔහු ඒමන් ටාර්ගේරියන් ද නොවේ. දෛවය විසින් මේ මහලු මිනිසාව තෙවරක්ම පිරික්සා බැලුවද ඔහු සැමවිටම සිය ගෞරවය තෝරා ගත්තේය. එනමුදු ඒ ඔහුය. මේස්ටර්වරයා දිගටම කළු බලකොටුවේ නතර වූයේ ඔහු දුබලයකු හා

බියගුල්ලකු වන නිසා ද නැතිනම් ශක්තිමත්, සිය දිවුරුමට පක්ෂපාතී වූ කෙනෙකු නිසා ද යන්න මේ දැන් පවා ජොන්ට සිතා ගත හැකි කරුනක් නොවේ. එනමුදු මේ මහලු මිනිසා තෝරාගැනීම හා වේදනාව ගැන එදා කී දේ ජොන්ට හොඳින්ම අවබෝධ වී තිබුනි. ඔහු ඒ සියල්ල ඕනෑවටත් වඩා හොඳින් ඔහුට අවබෝධ වී තිබුනි.

ටිරියන් ලැනිස්ටර් පැවසූයේ බහුතරයක් මිනිසුන් තිත්ත ඇත්තට මුහුණ දීමට වඩා එයින් සැඟවයාමට, මඟ හැරීමට කැමැති බවයි. එනමුදු ජොන් මේ සැඟවයාම් වලින් හා මඟහැරීම්වලින් වෙහෙසට පත්ව සිටියේය. ඔහු ඔහුමය. ඔහු ජොන් ස්නොව්ය. අවජාතකයකු හා දිවුරුම් කඩකරන්නෙකි. මවක නැති, යහළුවකු නැති, සැමදෙනාම වෙතින් ගර්හාවට පත්වූවෙකි. ඔහුගේ ඉතිරි ජීවිත කාලය කෙතරම් දිගු එකක් වුවද ඒ මුලු කාලය පුරාවටම ඔහුට පිටවහලෙකුට මෙන් රහස් දිවියක් ගත කරන්නට සිදුවනු ඇත. සිය සැබෑ නම සඟවාගත්, අන්ධකාර සෙවනැලි තුළ සැඟව ගත් නිහඬ මිනිසකු වීමට සිදුවනු ඇත. ඔහු මේ රාජධානි සප්තකය තුළ කොයිබ සංචාරය කල ද ඒ සෑමවිටම ඔහුට බොරුව තුළ සැඟව දිවි ගෙවන්නට සිදුවනු ඇත. එසේ නොවුනහොත් ඔහුට එරෙහිව සෑම මිනිසකුගේම දෑත් එසවෙනු ඇත. කෙසේ වුවද කම් නැත. සිය සොහොයුරාගේ පසෙකින් හිඳ ඔහුත් සමග එකතුව පියාගේ මරණය වෙනුවෙන් පලිය ගන්නට හැකියාවක් ලබන තෙක් ජීවත් වන්නට ලැබුනහොත් එයින් පසු කුමක් සිදුවූවද කම් නැත.

අවසන් වරට රොබ්ව දුටු දිනය ඔහුගේ සිහියට ආයේය. ඔහු අංගනයේ හිම වරුසාව මධ්‍යයේ සිටගෙන සිටිද්දී ඒ රතු දුඹුරු පැහැ හිසකෙස් මත හිම දියවූ අයුරු. ජොන්ට ඔහු වෙතට ළඟා විය හැකි වනු ඇත්තේ වෙස් වලාගෙන රහසේ ගියහොත් පමණි. තමාව ඔහුට නිරාවරණය කල පසු රොබ්ගේ මුහුණේ ඇඳෙනු ඇති විමතිය සිතේ මවා ගන්නට ජොන් උත්සාහ දැරුවේය. සිය සොහොයුරා හිස සලා සිනහවෙනු ඇත. ඉන්පසු ඔහු... ඉන්පසු ඔහු...

ඔහුට රොබ්ගේ සිනහව සිතේ ඇඳගත නොහැකි විය. කෙතරම් උත්සාහ කලද එය මවාගත නොහැකි විය. ඔවුන් එදා අර සෝරවෘක පැටවුන් සොයාගත් දවසේ ඔවුන්ගේ පියා විසින් හිස සිඳ මරා දැමූ මිනිසා ගැන ඔහු කල්පනා කරන්නට වන්නේය. "උඹ ඒ වචන කිවුවා." එඩාර්ඩ් උතුමානන් ඒ මිනිසාට කීවේය. "උඹ දිවුරුමක් දුන්නා. උඹේ සහෝදරයෝ ඉදිරිපිට. පුරාණ දෙවිවරුයි අලුත් දෙවිවරුයි ඉදිරිපිට." ඩෙස්මන්ඩ් හා මහත ටොම් එකතුව ඒ මිනිසාව දංගෙඩිය වෙත ඇදගෙන ආවෝය. බ්‍රැන්ගේ දෑස් පීරිසි තරම් විසල් වී ගිය අතර සිය පෝනියාව තරයේ අල්ලා ගන්නැයි ඔහුට මතක් කර දෙන්නට ජොන්ට සිදුවිය. තියන් ග්‍රේජෝයි විසින් අයිස් අසිපත ගෙනෙන විට පියාගේ මුහුණේ වූ පෙනුම ජොන්ට සිහිපත්

වන්නට විය. හිම මත විසිරුනු රත් පැහැ ලේ, සිය දෙපා අසලට රෝල් වී පැමිණි හිස් ගෙඩියට තියන් පයින් ගැසූ අයුරු.

ඒ පලායන්නා වැරහැලි හැඳි ආගන්තුකයකු නොව සිය සොහොයුරා බෙන්ජින් ස්ටාර්ක් වූවානම් එඩාර්ඩ් උතුමානන් කුමක් කරනු ඇත්දැයි ජොන් කල්පනා කලේය. එයින් තීරණයේ වෙනසක් වනු ඇත්ද? නිසැකවම, නිසැකවම, එසේ විය යුතුය... රොබ් ඔහුව සාදරයෙන් පිළිගනු ලැබෙනු ඇත. නිසැකවම. ඔහු එසේ කල යුතුව ඇත. නොඑසේ නම්...

ඒ ගැන සිතීම අසීරු කටයුත්තක් විය. ඔහු දැඩිව තෝන්ලණුව අල්ලාගත් අතර අතැඟිලි පුරා ගැඹුරු වේදනාවක් පැතිර යන්නට විය. වෙළඹට විළුඹෙන් සන් කල ඔහු රජමාවත ඔස්සේ ඇයව පිම්මේ පන්නවන්නට වූයේ හරියට සිය සිත තුළ නැග එන සැකයන්ගෙන් මිදෙනු පිණිස දුවන්නාක් මෙනි. ජොන් මියයාමට බිය නොවීය. එනමුදු ඒ අයුරින් මියයාමට ඔහු තුළ කිසිදු කැමැත්තක් නොවීය. සාමාන්‍ය පල්හොරකු නැතහොත් මංකොල්ලාකාරයකු මෙන් බැම්මෙන් බැඳී, හිස්ගැසුම් කන්නට ලැබීම. මිය යා යුතු නම් ඔහු මියයන්නේ අතකින් ගත් අසිපතක් ඇතිව, සිය පියාගේ මිනීමරුවන් හා සටන් වදිමිනි. ඔහු සැබෑ ස්ටාර්ක් කෙනෙකු නොවේ. ඔහු කිසිදා ස්ටාර්ක් කෙනෙකු නොවීය... එනමුදු ඔහුට ස්ටාර්ක් කෙනෙකු මෙන් මිය යන්නට කිසිදු බාධාවක් නොමැත. එඩාර්ඩ් ස්ටාර්ක් පුතුන් තිදෙනෙකුට නොව පුතුන් සිවු දෙනෙකුට පියා වූහයි මිනිසුන් විසින් පවසනු ඇත.

* * *

අඩ මයිලයක් පමණ දුරක් යනතෙක් ඔවුන් හා සමගාමීව සිය වේගය පවත්වා ගැනීමට ගෝස්ට් සමත් විය. මුවෙන් එල්ලෙන රත් පැහැ දිවෙන් හති දමමින් ඌ ඔවුන් සමග දිව ආයේය. මිනිසා ද අශ්වයාද සිය හිස් තවත් පහත් කරගත්තේ ජොන් විසින් තවත් වේගයෙන් යන්නට අසුට සන් කල බැවිනි. වෘකයා සිය වේගය අඩු කලේ අන්තිමේදී සම්පූර්ණයෙන්ම නැවතී සඳ එළියේ රත් පැහැයෙන් බබලන දෙනෙතින් ඔවුන් දෙස බලා සිටියේය. ඌ ඔවුන්ට පසුපසින් නොපෙනී ගිය නමුදු සිය සාමාන්‍ය වේගයෙන් යුතුව දිගටම ඌ ඔවුන් හඹා එනු ඇති බව ජොන් දත්තේය.

ඔහුට ඉදිරියෙන් පාර දෙපසම ගස් අතරින් ආලෝක පුංජ දිදුලනු දක්නට ලැබින. මෝල්ස් ටවුන්! බල්ලකු බුරන හඬ ද, ඉස්තාලයක සිටි කොටලුවකු බැරෑඩි හඬින් තප්පුලනු ද ඔහුට

ඇසුනි. එනමුදු ඒ ඇරෙන්නට මුලු නගරයම පාහේ නිහඬතාවයේ ගැලී තිබින. අතරින් පතර වසා දැමුනු කවුළු පියන්පත් අතරින් ගිනි උඳුණක ආලෝකය දිස් වුවද ඒ ද යාන්තමින් මෙනි.

මෝල්ස් ටවුන් වනාහි පෙනෙනවාට වඩා විශාල නගරයක් විය. එහි හතරෙන් තුනක්ම පාහේ පොළොව යට වූ උණුසුම් බිංගෙවල් තුළ සැඟවී තිබුනු අතර වංකගිරියක් මෙන් වූ උමං සමූහයක් මගින් එකිනෙක හා සම්බන්ධ විය. ගනිකා නිවාසය පවා පොළොව යට සැඟවී තිබුනි. මතුපිට වූ එකම දෙය නම් දොරට ඉහළින් එල්ලුනු රතු ලන්තැරුමක් සහිත කුඩා දැවමය මඩුවක් පමණි. ප්‍රාකාරයේ වූ මිනිසුන් මෙහි සිටි ගණිකාවන්ව හැඳින්වූයේ 'වැලලුන නිධාන' යන අන්වර්ථ නාමයෙනි. සිය කළු සොහොයුරන් කිසිවෙක් අද රාත්‍රියේ මෙහි වැලලුනු නිධන් හාරමින් සිටිනු ඇතිදැයි ඔහු කල්පනා කලේය. එයද සාමාන්‍යයෙන් දිවුරුම් කඩ කිරීමක් වන නමුදු කිසිවෙකුත් ඒ ගැන තැකීමක් නොකලහ.

නගරය පසු කර සැඟෙන දුරක් යන තෙක් ජොන් සිය වේගය අඩු නොකලේය. ඒ වනවිට ඔහු මෙන්ම වෙළඹ ද දහදියෙන් පෙඟී සිටියාය. ඔහු වෙවුලමින් අසු පිටින් බිමට පැන්න අතර තුවාල වූ අත වේදනා ගෙනදෙමින් තිබින. දියවෙමින් පැවති හිම ගොඩක් පාර අසබඩ ගස් යට, සඳ එළියේ දිදුලමින් විසිර පැවතියේය. දියවෙමින් පැවති හිම විසින් කුඩා දිය කඩිති සාදා තිබින. උක්කුටියෙන් බිම ඇන බා ගත් ජොන්, දැත් එක් කර මේ දිය දෝතක් පුරවා ගත්තේය. දිය හිම මෙන්ම සීතල විය. උගුරු කිහිපයක් පානය කල ඔහු දෙකම්මුල් පුපුරු ගසන තෙක් මේ සීතල දිය මුහුණට විසි කර ගත්තේය. පසුගිය දින කිහිපයටම වඩා දැන් ඔහුගේ පිළිස්සුනු අතැඟිලි වේදනා ගෙනදෙමින් තිබූ අතර හිසද කැක්කුම් ගෙන දෙන්නට පටන්ගෙන තිබුනි. 'මම මේ කරන්නෙ හරි දේ.' ඔහු තමාටම කියා ගත්තේය. 'එහෙමනම් ඇයි මට මේ මහා නරක හැඟීමක් දැනෙන්නෙ?'

අධික විඩාව නිසා වෙළඹ මුවින් පෙණ දමමින් සිටියාය. එබැවින් උගේ කටකලියාවෙන් අල්ලාගත් ජොන් ඇයත් සමග ඉදිරියට ඇවිද ගියේය. මාවත අසරුවන් දෙදෙනෙකුට යාන්තමින් මාරු විය හැකි තරම් පටු විය. මතුපිට සෑම තැනම කුඩා දිය පහරවල් ද, උඩට නෙරා ආ ගල්මුල් ද විය. ඔහු පිම්මේ ආ ගමන අතිමහත් මෝඩ කමක් විය. ඔහුගේත් අසුගේත් බෙල්ල නොකැඩී බේරුනේ වාසනාවක් නිසා විය යුතුය. තමාට මේ කුමක් සිදු වී දැයි ජොන් විමතියෙන් කල්පනා කරන්නට විය. ඔහුට මෙතරම් ඉක්මනින් මියැදෙන්නට සිත් වී ද?

ගස් අතරින් ඇදී ආ, ඇතින් ඇසුනු කිසියම් සතෙකු බියෙන් කල කෑ ගැසීමක් නිසා ඔහු හිස ඔසවා බැලුවේය. ඔහුගේ වෙළඹ නොසන්සුන් ස්වරයෙන් හේෂාරවය කරන්නට වන්නීය. ඔහුගේ වෘකයා කිසියම් සතකුව දඩයම් කර ඇත්ද? "ගෝස්ට්!" මුව වටා දෑත් යැවූ ඔහු කෑ ගැසුවේය. "ගෝස්ට්. මෙහාට වරෙන්." ඇසුනු එකම පිළිතුර වූයේ ඔහුට පිටුපසින් තැති ගත් බස්සකු අහසට නගින හඩ පමණි.

රවා ගත් මුහුණින් යුතුව ජොන් ඉදිරියටම ගියේය. සිය වෙළඹගේ සිරුරේ නැගී දහදිය වියළෙන තෙක් ඔහු ඇය සමග පැය බාගයක් පමණ ඉදිරියට ඇවිද ගියේය. එනමුදු ගෝස්ට් ගේ ආගමනයක් නොවීය. නැවත අසු පිට නැගී යන්නට ජොන්ට උවමනා වූ නමුදු සිය වෘකයාගේ අතුරුදන් වීම ඔහුගේ සිතේ යම් බියක් ඇති කර තිබිනි. "ගෝස්ට්!" ඔහු නැවත කෑ ගැසුවේය. "උඹ කොහෙද? මෙහාට වරෙන් ගෝස්ට්!" මේ වනාන්තර තුළ සෝරවෘකයෙකුට අනතුරක් විය හැකි කිසිවක් නොවීය. ගෝස්ට් වැනි අඩක් වැඩුනු සෝරවෘකයකුට පවා අනතුරක් විය හැකි ක්‍රමයක් නොවීය. එහෙත්... නැත. වලසෙකුට පහර දෙන්නට යාමට තරම් ගෝස්ට් මෝඩයකු විය නොහැක. තවත් වෘක රංචුවක් මේ අසලක වේ නම් ජොන්ට නිසැකවම උන්ගේ උඩුබිරිම් ඇසෙනු ඇත.

තමා දැන් කෑම කටක් කෑ යුතු බැව් ඔහු තීරණය කලේය. අහර විසින් ඔහුගේ උදරය සන්සුන් කරනු ඇති අතර ගෝස්ට්ට ඔවුන්ව අල්ලාගැනීමට ඉඩ ප්‍රස්ථාවද ලැබෙනු ඇත. කළු බලකොටුව තවමත් නින්දේ පසුවන අතර ඔහුව හඹා ඒමක් සිදු විය නොහැක. සෑදල මල්ල ඇවිස්සූ ඔහු විස්කෝතුවකුත්, කේජු කැබැල්ලකුත්, වියළී ගිය කුඩා ඇපල් ගෙඩියකුත් සොයා ගත්තේය. ඔහු සතුව ලුණු දැමූ හරක් මස් කැබැල්ලක් හා කුස්සියෙන් පන්නා ගත් බේකන් කැබැල්ලක් ඇති නමුදු ඒවා හෙට වෙනුවෙන් පරෙස්සම් කර ගන්නට ඔහු තීරණය කලේය. මේ සියල්ල අවසන් වූ පසු ඔහුට දඩයම් කරන්නට සිදුවනු ඇති අතර එයින් ඔහුගේ ගමන් වේගය අඩාල වනු ඇත.

සිය වෙළඹ රජමාවත පසෙක උලා කන අතරේ ගසක් යට වාඩි වූ ජොන් විස්කෝතුව හා කේජු කැබැල්ල කා හමාර කලේය. ඔහු ඇපල් ගෙඩිය අවසානයට ඉතුරු කර ගත්තේ එය හොඳින් රස විඳිනු පිණිස විය. එය යාන්තමින් මෙන් බෙරි වන්නට පටන්ගෙන තිබුනු නමුදු මදය තවමත් කසට ගතියෙන් හා යුෂයෙන් පිරී තිබිනි. එය කා හමාරවන්නට ඔන්න මෙන්න තිබියදී ඔහුට ශබ්දයක් ඇසුනි. අශ්වයින්! උතුරු දෙසින්! වසා නැගී සිටි ජොන් දුවමින් මෙන් සිය වෙළඹ වෙත ළඟාවූයේය. ඔහුට ඔවුන්ව පරදා අසු පැන්නවිය හැකි වනු ඇතිද? නැත, ඔවුන් ආසන්නයටම පැමිණ ඇත. ඔවුන්ට ඔහුව නිසැකයෙන්ම ඇසෙනු ඇත. මේ පිරිස කළු බලකොටුවේ සිට ඔහු සොයා පැමිණියවුන් නම්...

**Jeor Mormont: "I think you were meant to be here."**

වහා සිය වෙළඹ පාරෙන් එපිටට පැන්නවූ ජොන් අළු-කොළ පැහැ මුරකරු වෘක්ෂ ගොන්නක් පසුපස සැඟවුනේය. "සද්ද කරන්නෙ නැතුව හිටපන්." ඔහු මෘදු ස්වරයෙන් ඇයට කෙඳිරුවේය. උක්කුටියෙන් ඇණ බා ගත් ඔහු අතුපතර අතරින් එබී බලන්නට විය. දෙවියන් කරුනාවක් දැක් වී නම් මේ අසරුවන් ඔහුව නොදැක ඔහුව පසු කර යනු ඇත. සමහරවිට ඒ සිය ගොවිපල රාජකාරි වෙනුවෙන් යන මෝල්ස් ටවුන්හි ගම්මුන් පිරිසක් විය හැක. එනමුදු මේ මහ රෑ ජාමයේ ඔවුන් කුමක් පිණිස...

රජමාවත ඔස්සේ අසරු පිරිස කෙමෙන් ලංවද්දී අසු කුර මාවත මත ගැටීමෙන් නැංවෙන දෝංකාර හඬ කෙමෙන් වැඩිවනු ඔහු අසා සිටියේය. ශබ්දය අනුව නම් එහි අඩුම තරමේ පස් හය දෙනෙකුවත් සිටිය යුතුය. ගස්වල අතුපතර අතරින් ඔවුන්ගේ කටහඬ ඇසෙන්නට විය.

"...විශ්වාස ද මිනිහා මේ පැත්තෙන් තමා ගිහිල්ලා තියෙන්නෙ කියලා?"

"අපිට හරියටම විශ්වාසෙන් කියන්ට බෑ."

"උඹලා දන්නවද, එයා නැගෙනහිර පැත්තට ගියා වෙන්ට පුළුවන්. එහෙම නැත්තං පාරෙන් අයින්වෙලා කැලේ මැද්දෙන් ගියා වෙන්ටත් පුළුවන්. මම නං ඒක තමා කරන්නෙ."

"මේ අන්ධකාරෙ? මෝඩයා. එක්කො උඹ අස්සයා පිටෙන් වැටිලා බෙල්ල කඩාගනියි. එහෙමත් නැත්තං පාර වැරදිලා අතරමං වෙලා වටයක් ගහලා ආයෙමත් උදේ ඉර පායද්දි ආපහු ප්‍රාකාරෙටම එයි."

"මම එහෙම කරන්නෙ නෑ." ග්‍රෙන්ගේ ස්වරය කෝප වුනු බවක් හැඟවීය. "මම දකුණට යනවා. උඹට තරු දිහා බලලා දකුණ හොයාගන්ට පුළුවන්."

"ආකාසෙ වළාකුළුවලින් වැහිලා තිබුනොත් උඹ මොකද කරන්නෙ?" පිජ් ඇසීය.

"එහෙමනං මම නොයා ඉන්නවා."

තවත් කටහඬක් කතාවට එක් විය. "උඹලා දන්නවද මමනං මොකද කරන්නෙ කියලා? මෝල්ස් ටවුන්වලට රිංගලා වැලලිච්ච නිධානයක් ගොඩදානවා." ටෝඩ්ගේ උස් සිනා හඬ තුරුපතර සිසාරා රැවුදෙන්නට විය. ජොන්ගේ වෙළඹ උගුරෙන් හඬක් නැංවූවාය.

"සද්දෙ වහගනිල්ලා. උඹලා හැමෝම." හෝල්ඩර් කීවේය. "මං හිතන්නෙ මට මොකක් හරි සද්දයක් ඇහුනා."

"කොහෙද? මට මොකුත් ඇහුනෙ නෑ." අසුන් සියල්ලෝම නතර වූහ.

"උඹ පඩයක් ඇරියත් උඹට ඇහෙන එකක් නෑ."

"මට ඇහෙනවා." ග්‍රෙන් තිර හඬින් කීවේය.

"කට වහගනිල්ලා!"

සියල්ලෝම නිහඬ වූයේ වටපිටාවට ඇහුම්කන් දෙන්නට වූහ. තමා හුස්ම අල්ලාගෙන සිටින ආකාරය ජොන්ට දැනෙන්නට විය. 'සෑම්!' ඔහු කල්පනා කලේය. ඔහු නාකි වලහා වෙත ගොස් නොමැත. එනමුදු ඔහු නැවත නින්දට ගොස් ද නැත. ඒ වෙනුවට ඔහු අනිත් කොල්ලන් ද අවදි කර ඇත. 'උන් හැමෝම යකාටම ගියාවේ!' හෙට උදෑසන ඉර පායන මොහොත වද්දී ඔවුන් තම නිදි ඇඳන්වල නොමැති වුවහොත් ඔවුන් සියල්ලන්ම ද

පලායන්නන් වශයෙන් හංවඩු ගැසෙනු ඇත. ඔවුන් මේ කුමක් කරනවා යැයි ඔවුන් සිතාගෙන ඇත්ද?

මැඩගත් නිහඬතාව දිගින් දිගටම ඇදී ගියේය. තමා ඇණ බා ගත් තැන සිට ජොන්ට ගස්වල අතුපතර අතරින් ඔවුන්ගේ අසුන්ගේ පාද දැකිය හැකි විය. අන්තිමේදී පිප් කටහඬ අවදි කලේය. "උඹට මොකක්ද ඇහුනෙ?"

"මං හරියටම දන්නෙ නෑ." හෝල්ඩර් පිළිගත්තේය. "මොකක්දෝ සද්දයක්. මං හිතුවෙ ඒ අශ්වයෙක් කියලයි. ඒ වුනත්..."

"මෙතන මොකෙක් වත් නෑ."

ගස් අතර එහා මෙහා වන ලා පැහැ ඡායාවක් ජොන් සිය දෑස් කොණින් දුටුවේය. කොළ සරබර ගෑ අතර ගෝස්ට් සෙවනැලිවලින් මෑත් වී ඔහු කරා දිව ආයේය. හදිසියේම සිදු වූ මේ අනපේක්ෂිත සිදුවීම නිසා බියපත් ජොන්ගේ වෙළඹ හේෂාරවය කලාය. "අන්න." හෝල්ඩර් කෑගැසීය.

"උඹ ද්‍රෝහියා." සෑදලය මතට පනින අතරේ ජොන් සෝරවෘකයාට බැන වැදුනේය. ඔහු වෙළඹ හරවා ගත්තේ ගස් අතරින් පලා යාම පිණිස මුත් අඩි දහයක් යන්නට මත්තෙන් පිරිස ඔහුව වටකලෝය.

"ජොන්." පිප් කෑ ගැසුවේය.

"නවත්තපන්." ග්‍රෙන් කීවේය. "උඹට අපිව පරද්දලා දුවන්ට බෑ."

ජොන් ඔවුන්ට මුහුණ දෙනු පිණිස අසු හරවාගත්තේ සිය අසිපත කොපුවෙන් මෑත් කරගත්තේය. "ආපහු පලයල්ලා. මට ඕන නැහැ උඹලට අනතුරක් කරන්ට. ඒ වුනත් මට එහෙම කරන්ට වුනොත් නොකර ඉන්නෙත් නැහැ."

"හතකට විරුද්ධව එකෙක්?" හෝල්ඩර් සංඥාවක් දුන් අතර විසිර ගිය කොලු රැළ ඔහුව වට කරන්නට වන්හ.

"උඹලට මොකක්ද මගෙත් එක්ක ඇති වැඩේ?"

"අපිට ඕන උඹව ආපහු එක්කරන් යන්ට උඹ අයිති තැනට." පීප් කීවේය.

"මම ඉන්ට ඕන මගේ සහෝදරයත් එක්ක."

"දැන් අපියි උඹෙ සහෝදරයො." ග්‍රෙන් පිළිතුරු දුන්නේය.

"උඹ දන්නවද. උන් උඹව අල්ලගත්තොත් උඹේ බෙල්ල ගහලා දායි." ටෝඩ් නොසන්සුන් සිනහවක් සහිතව කීවේය. "මේක මහ මෝඩ වැඩක්. ඒක ගැලපෙන්නෙ උඹ වගේ එකෙකුට වඩා ඔරොක්ස්ගෙ ජාතියෙ එකෙකුට."

"මං එහෙම කරන්නෙ නෑ." ග්‍රෙන් කීවේය. "මං දිවුරුම් කඩකරන එකෙක් නෙවෙයි. මම වචනෙ දුන්නා. ඒක එහෙමම තමා."

"මමත් එහෙම තමා." ජොන් ඔවුන්ට කීවේය. "උඹලට තේරෙන්නෙ නැද්ද? උන් මගේ තාත්තාව මරලා දැම්මා. දැන් යුද්ධෙ ඇවිලිලා තියෙන්නෙ. මගේ සහෝදරයා රොබ් දැන් ගංගා නිම්නයෙ යුද්ධ කරනවා–"

"අපි දන්නවා." පිප් සන්සුන් ස්වරයෙන් කීය. "සෑම් අපට හැම දෙයක්ම කිවුවා."

"අපිට හරිම කණගාටුයි උඹේ තාත්තා ගැන. අපිට ඇත්තටම කණගාටුයි." ග්‍රෙන් කතාකලේය. "ඒ වුනත් ඒකෙන් වැඩක් නෑ. උඹ එකපාරක් දිවුරුම දුන්නට පස්සෙ මොන දෙයක් සිද්දවුනත් උඹට ආයෙ පිටවෙලා යන්ට බෑ."

"මම යන්ට ඕනමයි." ජොන් දැඩි ස්වරයෙන් කියා සිටියේය.

"උඹ ඒ වචන කිවුවා." පිප් ඔහුට සිහිපත් කර දුන්නේය. "මගේ රැකවල මෙතැනින් ඇරඹේ. උඹ එහෙම කිවුවා. මගේ මරණය තෙක් එය නිමා නොවනු ඇත."

"මගේ මුරකාවල මතම ජීවත් වී එහිම මිය යන්නෙමි." ග්‍රෙන් එක් කලේය.

"උඹලාට ඔය වචන ආයෙමත් මට කියලා දෙන්ට ඕනවෙන්නෙ නැහැ. උඹලා තරම්ම මමත් ඒවා දන්නවා." ඔහුට කේන්ති එමින් තිබින. ඔවුන් ඔහුට සාමයෙන් පිටවී යන්නට නොදෙන්නේ කිම? ඔවුහු තත්ත්වය තවත් බැරෑරුම් කරමින් සිටිති.

"අන්ධකාරයේ අසිපත මම වෙමි." හෝල්ඩර් ගීතිකාවක් මෙන් කීවේය.

"ප්‍රාකාරයේ රැකවලා මම වෙමි." ටෝඩ් ද ඊට එක්විය.

ජොන් ඔවුන් සියල්ලන්ගේම මුහුණට අවලාද නැගුවේය. ඔවුන් එය ගනන් ගන්නා බවක් නොපෙනුනි. පිප් සිය අසුට සන් කරමින් ඔහුට ලංවිය. "ශීතයට එදිරිව දැල්වෙන ගින්න මම වෙමි. හිමිදිරිය රැගෙන එන ආලෝකය මම වෙමි. නිදන්නන් අවදි කරවන හොරණෑ නාදය මම වෙමි. මිනිසුන් ගේ රාජධානි ආරක්ෂා කරන පලිහ මම වෙමි."

"පස්සට වෙලා හිටපන්." ජොන් අසිපත ලෙලවමින් ඔහුට අනතුරු ඇඟවීය. "මම ඇත්තටමයි මේ කියන්නෙ පිප්." ඔවුන් අඩුම ගනනේ සන්නාහවත් පැළැඳ නොතිබින. අවශ්‍ය වී නම් ඔහුට ඔවුන්ව කෑලි කෑලිවලට කපා දැමිය හැක.

මැතර් ඔහුට පිටුපසින් කරකැවුනේ ගායනාවට එකතු විය. "මගේ ජීවිතය සහ ගෞරවය නිශා රැකුම වෙනුවෙන් කැපකරමි."

ජොන් වෙළඹට පයින් ඇන සන් කලේ ඇයව වටයක් කරකැවීය. කොලුවන් සියල්ලෝම දැන් ඔහුව වටකරමින් ඔහු වෙත සෙමින් සෙමින් ලංවෙමින් සිටිති.

"අද රාත්‍රියත්..." හෝල්ඩර් වම් පසින් ලංවිය.

"...මතු පැමිණෙන්නා වූ සියලු රාත්‍රීන් සඳහාත්." පිප් වාක්‍යය අවසන් කලේය. අත දිගුකල ඔහු ජොන්ගේ තෝන්ලණුව අල්ලාගැනීම සඳහා නැඹුරු විය. "ඉතින් ඔන්න තියෙනවා උඹේ තෝරාගැනීම. එක්කො මාව මරපන්. නැත්තං මාත් එක්ක ආපහු යන්ට වරෙන්."

ජොන් අසිපත එසවීය... එනමුදු කිසිදු පිළිසරණක් නොමැති අයුරින් එය නැවත පහත හෙළීය. "උඹ යකාටම පලයං! උඹලා ඔක්කොම යකාටම පලයල්ලා!"

"අපට උඹේ අත්දෙක බඳින්ට වෙයිද? නැත්තං උඹ අපට වචනෙ දෙනවද මොකුත් කලබැගෑනියක් කරන්නෙ නැතුව ආපහු යන්ට එනවා කියලා?" හෝල්ඩර් විමසීය.

"මම දුවන්නෙ නැහැ. උඹ අදහස් කරන්නෙ ඒක නම්." ගෝස්ට් තුරුවදුල යට සිට ඔහු වෙතට ළඟා වූයේය. ජොන් ඌ දෙස රවා බැලුවේය. "උඹෙන් හරි උදව්වක් තමා ලැබුනෙ." ඒ දීප්තිමත් රතු පැහැ දෑස අවබෝධාත්මක බැල්මකින් ඔහු දෙස බලා සිටියේය.

"අපි ඉක්මන් කලා නං හොඳයි." පිප් කීවේය. "එළිය වැටෙන්ට කලින් අපි ආපහු ගිහින් හිටියෙ නැත්තං නාකි වලහා අපි හැමෝගෙම ඔළුගෙඩි ටික කපලා දායි."

* * *

ආපසු ගමන ගැන ජොන් ස්නොව් තුළ කිසිදු මතකයක් නොවීය. එනමුදු එය දකුණුකරය බලා වූ පලායාමට වඩා කෙටි ගමනක් බැව් පමණක් ඔහුට හැඟුනි. සමහරවිට ඒ ඔහුගේ සිතුවිලි වෙනතක තිබූ නිසා වන්නට ඇත. පිප් ගමනට නායකත්වය ලබා දුන්නේය. අසු පිම්මේ පන්නමින්, හැල්මේ දුවවමින්, ඇවිදවමින්, නැවත පිම්මේ පන්නමින් නියත ගමන් වේගයක් පවත්වා ගත්තේය. මෝල්ස් ටවුන් පැමිණ නොපෙනී ගියේය. ගණිකා මඩමට ඉහළින් වූ රතු ලන්තෑරුම බොහෝ වේලාවකට පෙරාතුවම නිවා දමා තිබුනි. ඔවුන් හොඳ ගමන් වේගයක් පවත්වා ගන්නට සමත් වූ අතර ජොන් අන්තිමේදී ඔවුන්ට ඉදිරියෙන් ඉහළින් වූ කළු බලකොටුවේ කුළුණුවල ඡායා දකිද්දී අරුණට තවත් පැයක් ඉතිරිව තිබුනි. පසුපසින් වූ ප්‍රාකාරයේ සෙවනැල්ලට යටින් ඒවා කළු පැහැයෙන් දිදුලුවේය. එනමුදු මේ වතාවේ නම් ඔහු එය නිවෙසක් මෙන් දුටුවේ නැත.

ඔවුන්ට මේ වතාවේ ඔහුව නැවත රැගෙන ඒමට හැකිවිය. එනමුදු ඔහුව සදහටම මෙහි නවත්වා ගැනීමට ඔවුන්ට නුපුළුවන් වනු ඇත. යුද්ධය හෙට හෝ අනිද්දා හෝ හමාර නොවේ. ඔහුගේ මිතුරන්ට දිවා රෑ ඔහු ගැන සොයා බැලිය නොහැක. ඔහු කල් මරමින් සිටිනු ඇත. ඔහු දිගටම මෙහි රැඳෙන්නට යන්නේ යැයි ඔවුන්ට සිතා ගන්නට අවකාශ සලසා දෙනු ඇත... ඉන්පසු, ඔවුන් සිය පරීක්ෂාව අඩු කල පසු ඔහු නැවතත් මෙයින් මිදී පලා යනු ඇත. ඊළඟ වතාවේ ඔහු රජමාවත සම්පූර්ණයෙන්ම මඟහරිනු ඇත. ඒ වෙනුවට ඔහු ප්‍රාකාරය දිගේ නැගෙනහිර දෙසට යනු ඇත. සමහරවිට මුහුද දක්වාම. එය දිගු ගමනක් වනු ඇති නමුදු ආරක්ෂාකාරී ගමනක් වනු ඇත. එසේ නැතහොත් බටහිරට? කඳු පන්ති වෙත? ඉන්පසු කඳුකර කපොලු ඔස්සේ දකුණට. ඒ වනාහි වනචාරින් විසින් භාවිත කරන ගමන් මාර්ගයයි. දුෂ්කර වෙහෙසකර ගමනක්! එනමුදු අඩුම තරමේ කිසිවෙකුත් තමා පසුපස ලුහුබැඳ නොඑන බව ඔහුට සහතික විය හැක. රජමාවතට හෝ වින්ටර්ෆෙල්වලට ලීග සිය ගනනක් මෑතින්වත් ඔහු ගමන් නොකරනු ඇත.

* * *

සැම්වෙල් ටාර්ලි පැරණි ඉස්තාලයට වී ඔවුන් එනතෙක් බලා සිටියේය. පිදුරු මිටියකට හේත්තු වී බිම වැතිර සිටි නමුදු නිදා ගැනීමට නොහැකි තරම් ඔහු වියවුල් වී සිටියේය. වහා නැගිට සිටි ඔහු ඇඳුම්වල ධූලි පිසදැමීය. "මට... මට බොහොම සන්තෝසයි උන් උඹව හොයාගත්තු එක ගැන ජොන්."

"මටනම් එහෙම දැනෙන්නෙ නැහැ." ජොන් අසුපිටින් බසිමින් කීවේය.

අසුපිටින් බිමට පැන්න පිප් අරුණළු පැතිරෙමින් තිබුනු ආකාශය දෙස නොරිස්සුමින් බැලීය. "අශ්වයො ටික නිදහස් කරන්ට උදවුවක් දියන් සෑම්. අපට දිග දවසක් තියෙනවා ඉස්සරහට. රෑ කිසිම නින්දක් නැතුව ඒකට මූන දෙන්ට වෙන්නෙ. ස්නොව් උතුමානන්ට පින්සිද්ද වෙන්ට."

දවස උදා වූ විට ජොන් පුරුදු පරිදි කුස්සිය වෙත පිය මැන්නේය. නාකි වලහාගේ පාතරාසය ඔහු අතට ලබා දෙද්දී ඇඟිලි තුනේ හොබ් කිසිත් නොකීවේය. අද උදෑසන ආහාරය හොඳින් තැම්බූ දුඹුරු බිත්තර තුනක් ද, කර කරන ලද පාන් ද, හැම් ගාතයක් ද, වියළි මිදි පලංගානක් ද විය. අහර බන්දේසිය ඔසවාගත් ඔහු රජතුමාගේ කුළුණ වෙතට පියනැගීය. මෝර්මන්ට් මේසය අසල වාඩි වී යමක් ලියමින් සිටියේය. ඔහුගේ කපුටා දසරුවෙහි වසා එහාට මෙහාට ඇවිදිමින් සිටියේය. "ඉරිඟු! ඉරිඟු! ඉරිඟු!" ජොන් කාමරයට ඇතුළුවන්නා හාම ඌ මහහඬින් කෑ ගසන්නට විය. "කෑම ටික මේසෙ උඩින් තියපන්." නාකි වලහා හිස ඔසවමින් කීවේය. "මම බියර් ටිකක් බොන්නම්."

කවුළු වීදුරුව එසවූ ජොන් සීතල වනු පිණිස පිටත එල්ලා තිබුනු බීර මල්ල අතට ගත්තේ අඟක් පුරා බීර පිරෙවුවේය. හොබ් ඔහුට ප්‍රාකාරය තුළින් පිටතට ගත් සීතල ලෙමන් ගෙඩියක් දී තිබුනි. ජොන් එය බීර අඟට ඉහළින් අල්ලා මිරිකූ අතර අතැඟිලි දිගේ ලෙමන් යුෂ රූරා වැටෙන්නට විය. මෝර්මන්ට් සෑම දිනකම ලෙමන් මුසු කොටගත් බීර බීම පුරුද්දක් කොටගෙන සිටියේය. තමා තවමත් සිය දත් දෙපෙළ රැකගෙන සිටින්නේ එබැවිනැයි ඔහු පාරම් බෑවේය.

"කිසිම සැකයක් නැහැ උඹ උඹේ තාත්තට ගොඩක් ආදරෙයි." බීර අඟ අතින් ගත් ජොන් ඔහු වෙත ලං වූ විට මෝර්මන්ට් කීවේය. "අපි ආදරේ කරන දේ තමා හැමදාමත් අපිව විනාශ කරන්නෙ. මම එහෙම කිවුවය කියලා මතකද?"

"මට මතකයි." ජොන් බුම්මාගත් මුහුණින් යුතුව කීවේය. සිය පියාගේ මරණය ගැන මෝර්මන්ට් සමග වුව කතා කිරීම ඔහුට රිසි නොවීය.

"උඹට ඒක කවදාවත් අමතක වෙන්නෙ නැහැයි කියන එක ගැන වග බලාගනින්. තිත්ත ඇත්ත තමා අපි අපේ හදවත්වලට වඩා ළඟින් තියාගන්ට ඕන. මගේ පිඟාන මෙහාට

ගනින්. ආයෙමත් හැම් ද? මොනව කරන්ට ද? උඹට බොහොම මහන්සි පාටයි. මොකද ඊයෙ රෑ හඳඑළියෙ කරපු සංචාරය නිසා ඇඟට අමාරුද?"

ජොන්ගේ උගුර වියළී ගියේය. "ඔබ දන්නවද?"

"දන්නවා!" මෝර්මන්ට් ගේ දසරුව මත සිටි කපුටා හඬ නැගීය. "දන්නවා!"

නාකි වලහා උගුරෙන් නොරිස්සුම් හඬක් නැගීය. "උඹ හිතනවද ස්නොව්, උන් මාව නිශා රැකුමෙ ප්‍රධාන අණදෙන නිළධාරියා විදියට පත් කරගත්තෙ මම මෝඩ, බූරු, නාකි හමෙක් නිසයි කියලා? ඒමන් මට කිවුවා උඹ පැනලා යයි කියලා. මම එයාට කිවුවා උඹ ආපහු එයි කියලා. මම දන්නවා මගේ මිනිස්සු ගැන... මගේ කොල්ලො ගැනත් මම දන්නවා. උඹ රජමාවතට වැටුනෙ ගෞරවය නිසා... උඹ ආපහු ආවෙත් ගෞරවය නිසා."

"මාව ආපහු ගෙනාවෙ මගේ යාළුවො."

"මම උඹට කිවුවද ඒ උඹේ ගෞරවය නිසයි කියලා?" මෝර්මන්ට් සිය පිඟාන පිරික්සා බැලීය.

"උන් මගේ තාත්තව නිරපරාදෙ මරලා දැම්මා. ඔබ බලාපොරොත්තු වෙනවද මම මොකුත් නොකර නිකං ඉඳියි කියලා?"

"ඇත්තම කියනවා නම් අපි බලාපොරොත්තුවෙන් හිටියා උඹ ඔය කරපු දේ කරයි කියලා." මෝර්මන්ට් මිදි ගෙඩියක් මුවේ බහාලුවේය. "මම අණ කලා උඹ ගැන ඇහැ ගහගෙන ඉන්ටයි කියලා... උඹ පිටවෙලා යනවා මුරහටයො දැක්කා. උඹේ සහෝදරයින්ට බැරි වුනා නම් උඹව ආපහු ගේන්ට, උඹව රජමාවත පහළදි අල්ලගන්ට සූදානම් කරලයි තිබුනෙ. හැබැයි ඒ අල්ලගන්නෙ උඹේ යාළුවො නෙවෙයි. ඒ කියන්නෙ, උඹට කපුටෙකුට වගේ පියාපත් තියෙන අශ්වයෙක් නැත්තම් විතරයි. උඹට එහෙම එකෙක් ඉන්නවද?"

"නැහැ." තමා මහත් මෝඩයකු යැයි ජොන්ට හැඟෙන්නට විය.

"අපරාදෙ! එහෙම එකෙක් හිටියනම් අපට ලොකු ප්‍රයෝජනයක් ගන්ට තිබුනා."

ජොන් සීරුවෙන් සිට ගත්තේය. නියම මිනිසෙකු මෙන් මියයන්නෙමැයි ඔහු තමාටම කියා ගත්තේය. ඔහුට අඩුම තරමින් ඒ දේ වත් කල හැක. "මම දන්නවා පලායාමට දඬුවම මොකක්ද කියලා මගේ උතුමානනි. මම මැරෙන්ට බය නැහැ."

"මැරෙන්ට!" කපුටා කෑ ගැසීය.

"මම හිතනවා උඹ ජීවත්වෙන්ට බයත් නැහැයි කියලා." සිය සිරියෙන් හැම් කැබැල්ලක් කපාගත් මෝර්මන්ට් කපුටාට එයින් කටක් කැවීය. "උඹ පලා ගියේ නැහැ - තාමත්. උඹ දැන් මෙතන හිටගෙන ඉන්නවනෙ. රෑට හොරෙන් මෝල්ස් ටවුන්වලට රිංගන හැම කොල්ලගෙම බෙල්ල කපලා දාන්ට හැදුවොත් අපට ප්‍රාකාරෙ රකින්ට ඉතුරු වෙන්නෙ හොල්මන් විතරයි. ඒ වුනත්... උඹ හිතාගෙන ඉන්නෙ හෙට ආයෙමත් පැනලා යන්ට. හෙට නැත්තම් තවත් සති දෙකකින්. එහෙම නේද? උඹ එහෙම නේද හිතාගෙන ඉන්නෙ කොල්ලො?"

ජොන් නිහඬවම සිටියේය.

"මම හිතුවා." මෝර්මන්ට් තැම්බූ බිත්තරයක කටුව ඉවත් කලේය. "උඹේ තාත්තා මැරිලා කොල්ලො. උඹ හිතනවද එයාව ආපහු මේ ලෝකෙට ගේන්ට හැකියාවක් උඹට තියෙනවයි කියලා?"

"නැහැ." ඔහු බුම්මාගත් මුහුණින් යුතුව පිළිතුරු දුන්නේය.

"හොඳයි. මොකද අපි දැක්කා මලවුන් ආපහු නැගිටලා එනවා. උඹයි මායි දෙන්නම. මම ආයෙමත් එහෙම දෙයක් දකින්ට කිසිම කැමැත්තක් නැහැ." බිත්තරය කටවල් දෙකට ගිල

දැමූ ඔහු දත් අතර සිරවූ බිත්තර කටු කැබැල්ලක් නියෙන් ගෙන විසිකර දැමීය. "උඹේ සහෝදරයා යුද්ධෙට ගිහින් තියෙන්නෙ මුලු උතුරුකරේම තියෙන සම්පූර්ණ ශක්තියම එයා යටතට අරගෙනයි. එයාගෙ ධජ දරන හැම යටත් වංශාධිපතියෙක්ම, උඹට මේ නිශා රැකුම ඇතුළෙ හොයාගන්ටවත් බැරි තරම් විශාල හමුදාවකට අණ දෙනවා. එයාලට උඹේ උදවු ඕනයි කියලා ඇයි උඹ හිතන්නෙ? උඹ මහ ලොකු බලසම්පන්න රණශූරයෙක් ද? එහෙමත් නැත්තම් උඹේ කඩුවට මොකක් හරි අමුතු මායා බලයක් කවන්ට පුළුවන් විදියෙ භූතයෙක් උඹ සාක්කුවෙ හංගන් ඉන්නවද?"

ජොන්ට මේ වෙනුවෙන් කිසිදු පිළිතුරක් නොවීය. කපුටා බිත්තරයකට කොටා කටුව සිදුරු කළේය. හොටය ඇතුළට එබූ ඌ බිත්තර කැබලි හොටින් ගෙන කන්නට විය.

නාකි වලහා සුසුමක් හෙළීය. "මේ යුද්ධය නිසා පීඩාවට පත්වෙච්චි එකම එකා උඹ විතරක් නෙවෙයි. මගේ නංගිත් උඹේ සහෝදරයගෙ පැත්තකින් යුද්ධෙට යනවා. එයයි, එයාගෙ දුවලයි හැමෝම. පිරිමි වගේ දම්වැල් සන්නාහ ඇඳගෙන. මේජ් කියන්නෙ කෙස් පැහිච්ච නාකි අම්මන්ඩියෙක්. හරිම මුරණ්ඩුයි. ඉක්මනට කේන්ති යනවා. හිතුවක්කාරයි. ඇත්තම කියනවනම් මේ ගැනි ඉන්න අහලකින්වත් මට යන්ට හිතෙන්නෙ නැහැ. ඒ වුනත් ඒකෙන් අදහස් වෙන්නෙ නැහැ ඒකි ගැන මගේ හිතේ තියෙන ආදරේ, උඹේ හිතේ උඹේ අර්ධ-සහෝදරියො ගැන තියෙන ආදරේට වඩා අඩුයි කියලා." මෝර්මන්ට් රවා ගත් මුහුණින් යුතුව සිය අවසන් බිත්තරය අතට ගෙන කටුව පොඩි වී යන තෙක් එය අත්ල මත පොඩි කළේය. "සමහරවිට ඒක එහෙම වෙන්ටත් ඇති. අපි එහෙම හිතමුකො. ඒකි මේ යුද්ධෙන් මැරුනොත් මට දුක හිතෙයි. ඒ වුනත් උඹට පේන එකක් නැහැ මම මෙතන දාලා දුවනවා. උඹ වගේම මමත් දිවුරුමක් දීලා තියෙනවා. මෙතැන තමා මට හිමි තැන... උඹට හිමි තැන මොකක්ද කොල්ලො?"

'මට හිමි කිසිම තැනක් නැහැ.' ජොන්ට පැවසීමට උවමනා විය. 'මම අවජාතකයෙක්. මට කිසිම දෙයක් උරුම නැහැ. නමක් නැහැ. අම්මෙක් නැහැ. දැන් මට තාත්තෙකුත් නැහැ.' එනමුදු මේ වදන් මුවින් පිටනොවීය. "මම දන්නෙ නැහැ."

"මම දන්නවා. සීතල හුළං වැඩිවෙනවා ස්නොව්. ප්‍රාකාරෙන් එහා පැත්තෙ හෙවනැලි දික්වෙනවා. කොටර් පයික් මට ලියලා එවනවා උන් දකිනවා කියලා මහ විශාල එල්ක් රංචු දකුණටයි නැගෙනහිර පැත්තටයි පැනලා යනවා කියලා. මැමත්ලා හිටං. උගෙ එක මිනිහෙක් දැක්කලු නැගෙනහිර කුළුණෙ ඉඳන් ලීග තුනක් වත් නැති දුරින් මහ දැවැන්ත

පිය සටහන් වගයක්. හෙවනැලි කුළුණේ මුර සංචාරකයෝ හොයාගෙන තියෙනවා ගම්මාන පිටින් අත්ඇරලා දාලා තියෙනවා. සෙර් ඩෙනිස් කියනවා මහ රැට උන්ට පේනවා කියලා අර කඳුවැටි මැද්දෙ ගිනිමැල. හැන්දෑවෙ කරුවල වැටුන වෙලාවෙ ඉඳන් උදේ ඉර පායනකම් එක දිගට පත්තුවෙන මහ විශාල ගිනිමැල. අත කොට ක්වෝරින් අල්ලගෙන තියෙනවා එක මිනිහෙක්ව, දොරුව ගැඹුරෙ හැංගිලා හිටපු. මේ මිනිහා දිවුරලා කියනවා මැන්ස් රේඩර්, ඌ අලුතින් හොයාගත්තු ඔය කොහේද මන්දා රහස් තැනක වනචාරී හමුදාව රැස් කරනවයි කියලා. ඒ මොන මගුලකට ද කියලා දෙයියො තමා දන්නෙ. උඹ හිතනවද පහුගිය අවුරුද්දෙ අපට නැතිවුන එකම මුර සංචාරකයා උඹේ බාප්පා බෙන්ජින් විතරයි කියලා?"

"බෙන්ජින්!" කපුටා හිස පද්දමින් කෑ ගැසීය. උගේ හොටයෙන් බිත්තර කැබැලි විසි විය. "බෙන්ජින්! "බෙන්ජින්!"

"නැහැ." තවත් අය අතුරුදන්ව තිබින. බොහෝ අය අතුරුදන්ව තිබින.

"උඹ හිතනවද උඹේ සහෝදරයගෙ යුද්ධෙ, අපේ යුද්ධෙට වඩා වැදගත් කියලා?"

ජොන් දෙතොල සපා ගත්තේය. කපුටා පියාපත් ගැසුවේය. "යුද්ධෙ! යුද්ධෙ! යුද්ධෙ! යුද්ධෙ!" ඌ බෙරිහන් දුන්නේය.

"එහෙම නෙවෙයි. දෙයියො අපිව ආරක්ෂා කරන්ට. කොල්ලො, උඹ අන්ධයෙකුත් නෙවෙයි, මෝඩයෙකුත් නෙවෙයි. මැරිච්ච මිනිස්සු මහ රෑ ජාමෙ අපිව දඩයම් කරන්ට එද්දි, උඹ හිතනවද යකඩ සිංහාසනේ වාඩිවෙලා ඉන්නෙ කවුද කියන එක එච්චර වැදගත් වෙයි කියලා?"

"නැහැ." ජොන් ඒ පිළිබඳ කලින් සිතා නොතිබුනි.

"උඹේ තාත්තයි උඹව අපි අතරට එවුවෙ ජොන්. ඇයි ඒ? කාටද කියන්ට පුළුවන්?"

"ඇයි? ඇයි? ඇයි?" කපුටා කෑ ගැසුවේය.

"මම දන්න එකම දේ තමා ස්ටාර්ක්වරුන්ගෙ නහරවල මුල් මිනිස්සුන්ගෙ ලේ දුවනවයි කියන එක. මුල් මිනිස්සු තමා මේ ප්‍රාකාරෙ හැදුවෙ. කතාවට කියන්නෙ හැමෝටම අමතක වෙලා ගිය දෙයක් වුනත් එයාලට මතක තියෙනවා කියලයි. එතකොට උඹේ අර සතා... ඌ තමා අපිව අර මැරිච්ච එවුන් දෙන්නා ගාවට අරන් ගියේ. මැරිච්ච මිනිහා පඩිපෙළ නගිනවයි කියලා උඹට අනතුරු ඇඟෙවුවෙ. කිසිම සැකයක් නැහැ, සෙර් ජැරමි නම් කියයි ඒක මහ අහම්බයක් කියලා. ඒ වුනත් ජැරමි මලා, මම තාම පණපිටින් ඉන්නවා." මෝර්මන්ට් කිනිසි තුඩින් හැම් කැබැල්ලකට ඇන්නේය. "මම හිතන්නෙ උඹ මෙහාට එන එක ඉරණමෙන්ම නියම වෙලා තිබුන දෙයක් කියලයි. මොකද උඹ මෙතන ඉන්ට ඕන කෙනෙක් නිසා. ඒක නිසා මට ඕන උඹයි, උඹේ අර වෘකයයි අපිත් එක්ක ඉන්ට අපි ප්‍රාකාරෙන් එහාට යනකොට."

මේ වදන් විසින් ජොන්ගේ පිට දිගේ සීතල, උනන්දුකර වෙවුලීමක් පැතිරෙවුවේය. "ප්‍රාකාරෙන් එහාට?"

"උඹට මාව ඇහුනනෙ. මම හිතාගෙන ඉන්නෙ බෙන් ස්ටාර්ක්ව හොයන්ට යන්ට. පණපිටින් හරි මැරිලා හරි හොයාගන්ට." ඔහු හැම් කැබැල්ලක් සපා ගිලදැමීය. "මට ඕන නැහැ මෙතන බයගුල්ලෙක් වගේ වාඩිවෙලා හිමයි, සීතල හුළඟයි මාව හොයන් එනකම් බලන් ඉන්ට. අපි කොහොමහරි හොයාගන්ට ඕන මොකක්ද සිද්දවෙන්නෙ කියලා. මේ වතාවෙ නිශා රැකුම ලොකු හමුදාවක් එක්ක ගමන් කරයි. ප්‍රාකාරෙන් එහා රජතුමාට විරුද්ධවයි, අනික් එවුන්ට විරුද්ධවයි, එහෙ ඉන්න වෙන ඕන මල යකෙකුට විරුද්ධවයි. මම හිතාගෙන ඉන්නවා මේ හමුදාවට මමම අණදෙන්ට." ඔහු සිය සිරිය ජොන්ගේ පපුව දෙසට එල්ල කලේය. "සම්ප්‍රදාය අනුව නම්... ප්‍රධාන අණදෙන නිළධාරිතුමාගෙ නවාතැන් බාරකාරයා තමා එයාගෙ සහචරයා විදියටත් කටයුතු කරන්නෙ... ඒ වුනත් මට කිසිම උවමනාවක් නැහැ උඹ පැනලා ගිහිල්ලදෝ කිය කියා කල්පනා කර කර හැම උදේකම නැගිටින්ට. ඒ නිසා මට දැන් උඹෙන් උත්තරයක් ඕන. මට මේ දැන්ම උඹෙන් උත්තරයක් ඕන ස්නොව් උතුමානනි. උඹ නිශා රැකුමේ ඇත්ත සහෝදරයෙක් ද... එහෙමත් නැත්තම් යුද්ධෙට ගිහින් සෙල්ලම් කරන්ට ආසාවක් ඇතිවුන අවජාතක කොල්ලෙක් ද?"

සීරුවෙන් සිටගත් ජොන් ස්නොව් දිගු, ගැඹුරු සුසුමක් හෙලීය. 'මට සමාවෙන්ට තාත්තෙ... රොබ්, ආර්යා, බ්‍රැන්... මට සමාවෙන්ට. මට බැහැ ඔයාලට උදවු කරන්ට.'

**ඔහුට දැන් සත්‍යය අවබෝධ වෙමින් තිබින. 'මේ තමා මට හිමි තැන.' ඔහු කටහඬ අවදි කලේය. "මම... මම ඔබෙයි මගේ උතුමානනි. මම ඔබේ මිනිහෙක්. මම දිවුරලා පොරොන්දු වෙනවා ආයෙමත් මෙහෙන් පැනලා යන්නෙ නැහැ කියලා."**

**නාකි වලහා ගෙරෙවුවේය. "හොඳයි! නියමයි! එහෙමනම් දැන් ගිහින් අර කඩුව පැළැඳගනින්."**

**“You said the words, You took a vow, before your brothers, before the old gods and the new.”**

කැට්ලින් 11-1

රිවර්රන්

සිය බිළිඳු පුතුද රැගෙන උතුරුකරයේ වින්ටර්ෆෙල් බලා යන දිගු ගමන අරඹනු පිණිස, රිවර්රන්වලින් පිටත් වී, කුඩා බෝට්ටුවක නැග, ටම්බල්ස්ටෝන් ගංගාව තරණය කර දැන් වසර දහසක්වත් ගෙවී ගොස් ඇතැයි කැට්ලින් ස්ටාර්ක්ට සිතෙමින් තිබුනි. ඔවුහු දැන් නැවතත් ටම්බල්ස්ටෝන් ගංගාව තරණය කරමින් නිවෙස බලා පැමිණෙමින් සිටියහ. එනමුදු එදා ඒ රෙදිවලින් ඔතා රැගෙන ගිය ළදරුවා මහ මිනිසකු වී සන්නාහයෙන් හා කංචුකයෙන් සැරසී සිටියි.

රොබ් බෝට්ටුවේ ඉදිරිපසට වන්නට ග්‍රේ වින්ඩ් සමගින් අසුන් ගෙන සිටියේය. හබල්කරුවන් සිය හබල් සමගින් ඔරොට්ටු වන අතරේ ඔහු සිය හස්තය සෝරවෘකයා ගේ හිස මත රඳවාගෙන ඉදිරිය බලා හුන්නේය. තියන් ග්‍රේජෝයි ද ඔහු පසෙකින් අසුන් ගෙන සිටියේය. ඇගේ බාප්පා පසුපසින් වූ දෙවන බෝට්ටුවේ ග්‍රේට්ජොන් හා කාර්ස්ටාර්ක් උතුමන් සමගින් පැමිණෙමින් සිටියේය.

කැට්ලින් බෝට්ටුවේ අවරයට වන්නට අසුන්ගෙන සිටියාය. ඔවුහු ගංදියේ වේගවත් සැඩපහරට ඔවුන්ව පහළට රැගෙන යාමට ඉඩ හරිමින් දැවැන්ත ජල රෝද කුළුණ පසුකරමින් ඉදිරියට ඇදුනෝය. මේ කුළුණ තුළ වූ ජලරෝදය වෙතින් නැගුනු ගර්ජනා හඬත් දියපහර වැගිරෙන හඬත් විසින් ඇගේ ළමා කාලය සිහිපත් කොට දී කැට්ලින් ගේ මුවට දුක්මුසු සිනහවක් නගන්නට සමත් වී තිබුනි. බලකොටුවේ වැලිගල් ප්‍රාකාර මත රැස් වී සිටි සෙබළුන් ද සේවකයින් ද ඇගේත් රොබ්ගේත් නම් කියමින්, 'වින්ටර්ෆෙල්!' යැයි මොරගසමින් ඔවුන්ව පිළිගන්නට වූහ. සියලුම බලකොටු මුර අටලු වෙතින් ටලී වංශයේ සලකුණ වන රතු හා නිල් පසුබිමක ඉහළට ඉපිලෙන රජතමය ට්‍රවුට් මාලුවා දැක්වෙන ධජපතාක එල්ලෙමින් තිබුනි. එය සැබැවින්ම හද අලළවන දසුනක් වූ නමුදු ඇගේ හද ඉපිලවන්නට එය සමත් නොවීය. සිය හදවත නැවත කවදාවත් සතුටින් නොඉල්පෙනු ඇත්දැයි ඇය විමතියෙන් කල්පනා කලාය. අනේ, නෙඩ්...

ජල රෝද කුළුණට පහළින් ලොකු වංගුවක් ගත් ඔවුහු දියපහර කපාගෙන ඉදිරියට ඇදුනෝය. මිනිසුන් සිය උපරිම ජවය හබල් වෙත යොමු කොට තිබිනි. දිය ද්වාරයේ විසල්

ආරුක්කුව ඔවුන් ඉදිරියෙන් පෙනෙන්නට වූ අතර දැවැන්ත යකඩ කටු පැළැල්ල සෙමින් සෙමින් ඉහළට ඔසවන දම්වැල්වල කිරි කිරි නාදය ඇසෙන්නට විය. ඔවුන් කෙමෙන් එයට ළඟාවද්දී පැළැල්ල සෙමින් ඉහළට එසවුනෙන් එහි යට බාගය මල කා රත් පැහැයෙන් දිදුලමින් තිබෙනු කැට්ලින්ට දැකිය හැකි විය. උල්කටු සහිත පැළැල්ලට යාන්තමින් අහල් කිහිපයක් යටින් එය පසු කර යන අතරේ එහි අඩියේ වූ දුඹුරු පැහැ මඩ ඔවුන්ගේ සිරුරු මත පතිත විය. කැට්ලින් ඉහළ බැලූ අතර පැළැල්ල කෙතරම් නම් මල කා ඇත් ද, හදිසි පහරදීමකට එය ඔරොත්තු දේ ද, එය ඉවත් කර නව පැළැල්ලක් සවි කල යුතු ද වැනි නා නා ප්‍රකාර සිතුවිලි ඇගේ සිතේ පහළ වන්නට විය. මේ දිනවල ඇගේ නිතරම රැඳෙන සිතුවිලි එවැනි දෑ විය.

ආරුක්කුව පසුකර ගිය ඔවුහු ප්‍රාකාරය යටින් දිගටම ඉදිරියට ඇදුනෝය. ඔවුන් වටා ලොකු පොඩි බෝට්ටු රැසක් යකඩ රාමුවලට බැඳී පාවෙමින් තිබුනි. ඇගේ සොහොයුරා සිය සෙබළුන් ද සමගින් ඔවුන් එනතෙක් දිය සෝපානය මත රැඳී සිටියේය. සෙර් එඩ්මුයර් ටලී වනාහි තද රත් පැහැ රැවුලකින් හා අවුල් වී ගිය රතු-දුඹුරු පැහැ හිසකෙසින් යුතු තරබාරු තරුණයකු විය. ඔහුගේ සන්නාහයේ පපු තහඩු තැලී ඇදවී තිබුනේ යුද්ධයේ අතුරුඵලයක් ලෙසින් විය හැක. ඔහු පැළැඳ සිටි රතු-නිල් සළුව දුම් වැකී රුධිර පැල්ලමින් කිලිටි වී තිබින. ගිරා හොටක් වැනි නාසයකින් හා කෙටි කර කපන ලද සුදු-අළු පැහැ දෙපස රැවුලකින් යුතු, හෙල්ලයක් මෙන් උස ටයිටස් බ්ලැක්වුඩ් උතුමානන් ඔහු පසෙකින් සිටගෙන උන්නේය. ඔහුගේ දීප්තිමත් කහ පැහැ සන්නාහය කළු පැහැ විචිත්‍ර ලියවැල් කැටයමින් අලංකාර කෙරුනි. කපුටු පිහාටුවලින් මැසූ සළුවක් ඔහුගේ කෙට්ටු දසරුවෙන් එල්ලෙමින් තිබුනි. ඇගේ සොහොයුරා ලැනිස්ටර් කඳවුරෙන් බේරාගනු පිණිස බලකොටුවෙන් පිටතට ගොස් පහර දුන් සේනාංකය මෙහෙයවා තිබුනේ ටයිටස් විසිනි.

"එයාලව ගොඩට ගන්ට." සෙර් එඩ්මුයර් අණකලේය. පියගැට පෙළේ දණතෙක් වූ වතුරේ බැසි සෙබළුන් තිදෙනෙක් කොකු ඇමිනූ දිගැති රිටි යොදාගෙන බෝට්ටුව ඔවුන් දෙසට අදින්නට විය. ග්‍රේ වින්ඩ් හදිසියේම නැගිට සිටගත්තෙන් බිය වූ එක් සොල්දාදුවෙක් සිය රිට අතහැර පසුපසට පැන්නේ, පා පැකිළි දියකඳ මත හතරගාතයෙන් ඉන්දවුනේය. අනික් එවුන් සිනාසෙද්දී මිනිසාගේ මුහුණේ බියමුසු ලැජ්ජාවක් පැතිරී ගියේය. බෝට්ටුවේ පසෙකින් පඩිපෙළ මතට පිනූ තියන් ග්‍රේජෝයි කැට්ලින් ගේ ඉහටියෙන් අල්ලා ඇයව ඔසවා ඉහළින් වී වියළි පඩිය මත තැබීය.

එඩ්මුයර් පඩි බැස පහළට පැමිණියේ ඇයව වැළැඳ ගත්තේය. "අක්කේ!" ඔහු බැරෑඩි හඬින් කෙඳිරුවේය. ඔහුට තද නිල් පැහැ දෑසක් හා සිනාසීම වෙනුවෙන්ම සැදුනු මුවක්

තිබුනද ඒ මුවේ මේ මොහොතේ නම් සිනහවක් දක්නට නොවීය. ඒ වෙනුවට බෙහෙවින් ක්ෂය වී ගිය, වෙහෙසට පත්වුනු පෙනුමක් දැකිය හැකි වූයේ ඔහු යුද්ධයෙන් බැට කා ආතතියෙන් මිරිකී ගිය හෙයින් විය හැක. ගෙලෙහි තුවාල වූ තැනක් වෙළුම්පටි යොදා ආවරණය කර තිබුනි. කැට්ලින් දැඩිව ඔහුව වැළැඳ ගත්තාය.

"ඔයාගෙ දුක මගෙත් දුක කැට්." දෙදෙනා සිය ග්‍රහණයෙන් මිදුනු පසු ඔහු ඇය අමතා කීවේය. "අපට එඩාර්ඩ් ගැන අහන්ට ලැබුන වෙලාවෙ... ලැනිස්ටර්ලා මේකට වන්දි ගෙවයි. මම දිවුරනවා. ඔයාට ඔයාගෙ පලිය ගන්ට ලැබෙයි."

"ඒකෙන් මට නෙඩ්ව ආපහු ලැබෙයිද?" ඇය තියුණු හඬින් විමසුවාය. මෙවැනි මුදු වදන් තවරන්නට තරම් තුවාලය තවමත් අලුත් වැඩිය. ඇය දැන් නෙඩ් ගැන සිතමින් කාලය නාස්ති කල යුතු නොවේ. ඇයට එසේ කල නොහැක. එය පසුවට කල් දැමිය යුතුය. ඇය මේ මොහොතේ ශක්තිමත් විය යුතුය. "ඒ දේවල් පස්සෙ කතා කරමු. මට දැන් තාත්තව දකින්ට ඕන."

"එයා ඔයා එනකම් කාමරේ බලන් ඉන්නවා."

"හස්ටර් උතුමානන් ඇඳට වැටිලා මගේ ආර්යාවනි." ඇගේ පියාගේ නවාතැන් බාරකරුවා ප්‍රකාශ කර සිටියේය. මේ මිනිසා මෙතරම් දුබලව මෙතරම් මහලුව ගියේ කවදාද? "එතුමා මට උපදෙස් දුන්නා ඔබතුමියව දැන්නම එහාට එක්කරන් එන්ටයි කියලා."

"මම එයාව එක්කරන් යන්නම්." එඩ්මුයර් ඇයව දිය සෝපානය දිගේ ඉහළටත් පහළ අංගනය ඔස්සේත් කැඳවාගෙන ගියේය. ඒ වනාහි වරක් පෙටයර් බේලිෂ් හා බ්‍රැන්ඩන් ස්ටාර්ක් ඇගේ අත පතා සටන් වැදුනු ස්ථානය විය. ඇතුළු බලකොටුවේ දැවැන්ත වැලිගල් ප්‍රාකාර ඔවුන්ට ඉහළින් විභූතිමත්ව නැගී සිටියේය. "එයාගෙ තත්ත්වය කොහොමද?" මුර සෙබළුන් දෙදෙනෙකු විසින් රැකවල් කෙරුනු දොරක් පසු කර යන අතරේ ඇය විමසුවාය. මේ වදන් මුවින් පිටවෙද්දී ලැබිය හැකි පිළිතුර ගැන ඇගේ සිත බියෙන් ත්‍රස්ත වී ගියේය.

එඩ්මුයර් ගේ ස්වරය සන්සුන් විය. "එයා අපි අතරෙ වැඩිකල් ඉන්න එකක් නැහැ. එහෙමයි මේස්ටර්ලා කියන්නෙ. වේදනාව... දිගටම අල්ලලා හිටිනවා. උහුලන් ඉන්ට අමාරුයි."

වටහාගත නොහැකි අන්දමේ වියරුවකින් ඇගේ සිත පිරී ගියේය. ඒ වනාහි මුලු මහත් ලෝකයටම එදිරිව නැගුනු වියරුවක්, ඇගේ සොහොයුරා එඩ්මුයර්ට, ඇගේ සොහොයුරිය ලයිසාට, ලැනිස්ටර්වරුන්ට, සියලුම මේස්ටර්වරුන්ට, නෙඩ්ට හා ඇගේ පියාට, ඔවුන් දෙදෙනාවම ඇය වෙතින් උදුරාගන්නට කුමන්ත්‍රණය කරන නරක නපුරු දෙවිවරුන්ට එදිරිව නැගුනු වියරුවක් විය. "ඔයාට තිබුනා මට දන්නලා එවන්ට. ඔයා දැනගත්ත ගමන්ම මට පණිවුඩයක් එවන්ට තිබුනා."

"එයා ඒක තහනම් කලා. එයාට ඕන වුනේ නැහැ හතුරො එයා මැරෙන්ට වැටිලා ඉන්නවා කියන එක දැනගන්නවට. රාජධානියෙ තත්ත්වෙ නරක අතට හැරිලා තියෙන වෙලාවෙ. එයා බයවුනා එයා කොච්චර දුර්වලද කියලා ලැනිස්ටර්ලා දැන ගත්තොත්..."

"...එයාලා පහර දෙයි කියලා." කැට්ලින් ඔහු වෙනුවෙන් වාක්‍යය අවසන් කලාය. 'ඒක උඹේ වැරැද්ද. උඹේ.' ඇගේ සිත තුළ වූ යම් කිසිවෙක් මුරගාමින් සිටියේය. 'අර කුරුමිට්ටාව අල්ලගන්න එක උඹේ කරපිටට දාගත්තෙ නැත්තම්...'

ඔවුහු නිහඬවම සර්පිලාකාර පියගැටපෙළ නැංගෝය.

ඇතුළු බලකොටුවද රිවර්රන් මෙන්ම ත්‍රිකෝණාකාර ගොඩනැගිල්ලක් විය. එමෙන්ම හස්ටර් උතුමානන්ගේ නිදන කාමරය ද ත්‍රිකෝණාකාර එකක් විය. එහි නැගෙනහිර පසට වන්නට ගලින් කල නැවක් මෙන් පිටට නෙරා ගිය සඳළුතලයක් විය. බලකොටුවේ උතුමානන්ට එහි සිට තමාට පහළින් වූ ප්‍රාකාර, අංගන හා එයින් ඔබ්බෙහි වූ ගංගාව තෙක්ම දැකිය හැකි විය. සේවකයින් විසින් ඇගේ පියාගේ නිදියහන මේ සඳළුතලයට ඔසවාගෙන ගොස් තිබින. "එයා ආසයි ඉරඑළියෙ වාඩිවෙලා ගඟ දිහා බලන් ඉන්ට." එඩ්මුයර් පැහැදිලි කලේය. "තාත්තෙ, මේ බලන්ට මම කාවද එක්කරන් ආවෙ කියලා. කැට් ඇවිල්ලා ඔයාව බලන්ට..."

හස්ටර් ටලී යනු දැවැන්ත මිනිසකු විය. තරුණ වියේදී උස් සිරුරකින් හා පුළුල් පපුවකින් හෙබි වූ ඔහු වයසට යත්ම කෙමෙන් තර වන්නට පටන්ගෙන තිබුනි. එනමුදු දැන් ඔහු ඇකිළී ගොස් ඇතිවාක් මෙන් පෙනුනි. ඇටකටු පමණක් ඉතුරු වී සියලු මාංශය දිය වී ගොස් ඇතිවාක් මෙන් පෙනුනි. ඒ මුහුණ පවා එල්ලා වැටෙමින් තිබුනි. අවසන් වරට කැට්ලින් ඔහුව දකිද්දී ඒ හිසකෙස් හා රැවුල දුඹුරු පැහැයෙන් අව පැහැයට හැරෙමින් තිබූ අතර දැන් ඒ සියල්ල හිම මෙන් සුදු පැහැ ගැන්වී තිබුනි.

එඩ්මුයර්ගේ කටහඬ ඇසෙද්දී වැසී තිබුනු ඒ දෑස් විවර විය. "පුංචි කැට්." වේදනාව නිසා බැරෑඩි වී ගිය, අපැහැදිලි ස්වරයකින් ඔහු කෙඳිරුවේය. "මගේ පුංචි කැට්." සැලෙන සිනහවක් මුහුණේ නැගෙද්දී ඒ අත ඇයව සොයා ඉදිරියට ඇදී ආයේය. "මම ඔයා එනකම් බලන් හිටියා..."

"මම ඔයාලා දෙන්නට කතා කරන්ට ඉඩ දීලා යන්නම්." පියාගේ නළල මුදුව සිප ගත් ඇගේ සොහොයුරා පිටව ගියේය.

බිම දණ නමා ගත් කැට්ලින් පියාගේ අත සිය දෑත් අතරට සිරකර ගත්තාය. පෙරදී විසල් අතක් වූ නමුදු දැන් එය නිකංම නිකං ඇටකටු ගොඩක් පමණි. එහි පෙර පැවැති ශක්තිය මුලුමනින්ම පාහේ නැතිව ගොසිනි. "ඔයාට මට දන්නලා එවන්ට තිබුනා. පණිවුඩකාරයෙක්, කපුටෙක්..."

"පණිවුඩකාරයො මගදි අල්ලගන්ට පුළුවන්. ප්‍රශ්න කරන්ට පුළුවන්. කපුටන්ට විදලා බිම දාන්ට පුළුවන්..." ඔහු පිළිතුරු දුන්නේය. හදිසි වේදනාවක් මතුව ආයෙන් ඒ අතැඟිලි දැඩිව ඇගේ අතැඟිලි බදා ගත්තේය. "මගේ බඩේ කකුළුවො එහාට මෙහාට දුවනවා... උන් අඬුවලින් කොනිති ගහනවා. හැම වෙලාවෙම.. දවල් රෑ කියලා වෙනසක් නැතුව. උන්ට මහ භයානක අඬු තියෙන්නෙ... මේස්ටර් වයිමන් මට ඩ්‍රීම් වයිනුයි, පොපි යුෂයි හදලා දෙනවා... මම ගොඩක් නිදාගන්නවා... ඒ වුනත් මට ඕන වුනා ඔයාව දකින්ට නැගිටලා ඉන්ට. මට බය හිතුනා... ලැනිස්ටර්ලා ඔයාගෙ මල්ලිව අල්ලගත්තහම, අපිව වටකරලා හතුරා කඳවුරු බැඳගෙන හිටියා... මට බය හිතුනා මම මැරෙයි කියලා... ඔයාව ආයෙමත් දකින්නෙ නැතුවම මට මැරෙන්ට වෙයි කියලා... මට බය හිතුනා..."

"ඉතින් දැන් මම ඇවිල්ලා ඉන්නවනෙ තාත්තෙ. රොබ්, මගේ පුතාත් ඇවිල්ලා ඉන්නවා. එයාටත් ඔයාව දකින්ට ඕන වෙයි."

"ඔයාගෙ පුතා. එයාටත් මගේ ඇස්මයි තියෙන්නෙ. මට මතකයි."

"ඔවු.  ඒ වගේම අපි ඔයාට ජේමී ලැනිස්ටර්ව අල්ලන් ආවා. දම්වැල් දාලා අතපය බැඳලා දාලා. රිවර්රන් දැන් ආයෙමත් නිදහස් තාත්තෙ."

හස්ටර් උතුමානන් සිනාසුනේය. "මම දැක්කා. ඊයෙ රෑ. ඒක පටන් ගත්තහම, මම එයාලට කිවුවා... මට ඒක බලන්ට ඕනැයි කියලා. එයාලා මාව උස්සගෙන ගියා ප්‍රධාන දොරටුව උඩින් තියෙන මුර අටල්ලට... මම එතන ඉඳන් බලන් හිටියෙ. ආහ්! ඒකනම් හරිම ලස්සන දර්ශනයක්... පන්දම් ආවෙ හරියට මුහුදු රැල්ළ එනවා වගෙයි. මට ගඟට උඩින් ඇහුනා මිනිස්සු කෑගහන සද්දෙ... හරිම මිහිරි සද්ද... අර වැටලීම් කුළුණ කඩන් වැටිච්ච වෙලාවෙ, දෙයියම්පා... ඒ වෙලාවෙ මැරුනත් සැපයි. මම ඔයාගෙ දරුවො කලින්ම දැකලා තිබුනානම් ඒ වෙලාවෙ මම සතුටින් මැරෙනවා... ඔයාගෙ පුතාද ඒ වැඩේ කලේ? ඒ ඔයාගෙ රොබ් ද?"

"ඔවු." සිත පැලෙන්නට තරම් වූ ආඩම්බරයකින් යුතුව කැට්ලින් කීවාය. "ඒ රොබ් තමා... බ්‍රින්ඩනුත් හිටියා. ඔයාගෙ මල්ලිත් මෙහෙ ඇවිල්ලා ඉන්නවා මගේ උතුමානනි."

"එයා." ඇගේ පියාගේ කටහඬ සවනට නෑසෙන තරමට සිහින් වී ගොස් තිබින.
"කළුමාලුවා... ආයෙමත් ආවා? මිටියාවතේ ඉඳන්?"

"ඔවු..."

"ලයිසාත්?" ඔහුගේ තුනී වී ගිය සුදු පැහැ කෙහෙරැළි අතරින් සිසිල් සුළං පොදක් හමන්නට විය. "දෙයියන්ට ස්තූති වෙන්ට! ඔයාගෙ නංගි... එයාත් ආවද?"

ඔහුගේ මුහුණ කෙතරම් බලාපොරොත්තු සහගත අයුරින් දැල්වුනේ ද යත්, ඔහු කෙතරම් තද උවමනාවකින් ඒ වෙනුවෙන් බලා සිටියේද යන්න පැහැදිලි වූ විට ඇයට සත්‍යය පැවසීම අතිශයින්ම දුෂ්කර විය. "එයා ආවෙ නැහැ. මට කණගාටුයි..."

"ආහ්!" ඔහුගේ මුහුණ එල්ලා වැටුනු අතර ඒ දෑසේ වූ දීප්තිය අඩු වී ගියේය. "මම ආසාවෙන් හිටියෙ යන්ට කලින් එයාවත් ආපහු සැරයක් දැක බලාගන්ට."

"එයා ඉයරිවල, එයාගෙ පුතත් එක්ක."

හස්ටර් උතුමානන් දුබල අයුරින් හිස වැනීය. "දැන් එයා රොබර්ට් උතුමානන්. අසරණ ඒරින් මලා නෙව... මට මතකයි... ඇයි එයා ඔයාත් එක්ක නාවෙ?"

"එයා හොඳටම බයවෙලා ඉන්නෙ මගේ උතුමානනි. එයාට ඉයරිවල ඉන්නකොට ආරක්ෂාවක් දැනෙනවලු." ඇය ඔහුගේ රැළි වැටී ගිය නළල සිප ගත්තාය. "රොබ් තාමත් බලන් ඉන්නවා ඇති. ඔයාට එයාව දකින්ට ඕනද? බ්‍රින්ඩන්වත්?"

"ඔයාගෙ පුතා. ඔවු. කැට්ගෙ පුතා... එයාට තියෙන්නෙ මගේ ඇස්මයි. මට මතකයි. එයා ඉපදුනාම, එයාව ගේන්ට... ඔවු."

"එතකොට ඔයාගෙ මල්ලි?"

ඇගේ පියා ගංගාව දෙසට බැල්මක් හෙලුවේය. "කළු මාලුවා. එයා දැන්වත් කසාද බැඳලද? කවුරුහරි... කෙල්ලෙක්ව බිරිඳ විදියට සරණපාවගෙන ද?"

'එයා මැරෙන්ට වැටිලා ඉන්දැද්දිත්!' කැට්ලින් විමතියෙන් යුතුව කල්පනා කලාය. "එයා බැන්දෙ නැහැ. ඔයා ඒක දන්නවනෙ තාත්තෙ. එයා කවදාවත් බඳින එකක් නැහැ."

"මම එයාට කිවුවා... එයාට අණ කලා. බැඳපන්! මම එයාගෙ උතුමානන්. එයා ඒක දන්නවා. ඒක මගෙ අයිතිය එයාට ගැලපෙන කෙනෙක් හොයලා දෙන එක. මම හොඳ කෙනෙක් හොයලත් දුන්නා. රෙඩ්වින්. පැරණි වංශයක්. හරිම ලස්සන, අහිංසක කෙල්ලක්... බෙතනි... ඔවු, ඒක තමා එයාගෙ නම.. අහිංසක දරුවා... එයා තාමත් බලන් ඉන්නවා. ඔවු, තාමත්."

"බෙතනි රෙඩ්වින් මීට අවුරුදු ගානකට කලින් රොවන් උතුමානන්ව කසාද බැන්දා." කැට්ලින් ඔහුට සිහිපත් කර දුන්නාය. "එයාට දැන් දරුවො තුන්දෙනෙක් ඉන්නවා."

"ඒ වුනත්." ඔහු කටුකුටු ගෑවේය. "ඒ වුනත්. එයා ඒ කෙල්ලට කෙල ගැහුවා. රෙඩ්වින්ලාට කෙල ගැහුවා. මට කෙල ගැහුවා... මම එයාගෙ උතුමානන්, එයාගෙ අයියා... කළු මාලුවා... මම තවත් යෝජනා ගෙනාවා. බ්‍රැකන් උතුමානන්ගෙ කෙල්ල. වෝල්ඩර් ෆ්‍රේ... කෙල්ලො තුන්දෙනාගෙන් කැමැති කෙනෙක් තෝරගන්ට. එයා එහෙමයි කිවුවෙ... එයා බැන්දද? කාවහරි... කාවහරි..."

"කාවවත් බැන්දෙ නැහැ. ඒ වුනත් එයා ලීග සියගානක් දුර ගෙවාගෙන ඇවිත් තියෙන්නෙ ඔයාව බලන්ට. රිවර්රන්වලට එනකම්ම යුද්ධ කර කර. සෙර් බ්‍රින්ඩන් අපට උදවු කලේ නැත්තම් මම අද මෙතන නැහැ."

"එයා හැමදාමත් රණශූරයා. එයා ඒ වැඬේනම් කරයි. වාහල්කඩ නයිට්වරයා. ඔවු." පසුපසට දිගෑදුනු ඔහු දෑස් පියා ගත්තේය. ඒ සිරුර දැඩි වෙහෙසින් පෙලෙමින් තිබෙන බැව් පැහැදිලි විය. "එයාව එවන්ට, පස්සෙ. මම දැන් ටිකක් නිදා ගන්නම්. මට දැන් එයත් එක්ක හටන් කරන්ට තරම් සනීපයක් නැහැ. එයාව පස්සෙ එවන්ට. කළු මාලුවා..."

ඔහුගේ නළල සිපගත් කැට්ලින්, හිසකෙස් අතගා, ඔහුට සිය බලකොටුවේ සෙවනැල්ල යට, පහළින් ගලා යන සිය ගංගාවන්හි හඬ අසමින් නිදන්නට ඉඩ හැර සඳළුතලයෙන් පිටවූවාය. ඇය නිදන කාමරයෙන් පිටතට එන්නටත් පෙර ඔහු නින්දට වැටී තිබුනි.

ඇය නැවතත් පහළ අංගනයට පිවිසෙද්දී සෙර් බ්‍රින්ඩන් ටලී දිය සෝපානය අසල රිවර්රන්හි මාලිගාරක්ෂක බලකායේ කපිතාන් සමගින් සාමිචියේ යෙදී සිටියේය. ඔහු වහා ඇය වෙත පැමිණියේය. "එයා?"

"මැරෙන්ට වැටිලා. අපි බයවුන විදියටම."

ඇගේ බාප්පාගේ මුහුණින් දැඩි වේදනාවක සලකුණු විද්‍යමාන විය. ඔහු සිය අළු පැහැ හිසකෙස් අතරින් ඇඟිලි යවා පිරිමැද්දේය. "එයා මාව මුනගැහෙයි ද?"

ඇය හිස වැනුවාය. "එයා කියනවා ඔයත් එක්ක සටන් කරන්ට තරම් දැන් එයාට සනීපයක් නැහැල්ලු."

බ්‍රින්ඩන් කෙකර සිනහවක් පෑවේය. "මම ගොඩක් කල් සොල්දාදුවෙක් වෙලා හිටපු නිසා මම දන්නවා එයා ඒ කියන්නෙ බොරුවක් කියලා. අපි එයාගෙ දරසෑයට ගින්දර දාන්ට ඔන්න මෙන්න තියෙද්දිත් හස්ටර් මට කඩන් පනියි අර රෙඩ්වින් කෙල්ල ගැන කියලා. මුගෙ නාකි ඇටකටු ටික යකාටම ගියාවෙ!"

එය සැබෑවක් බව දත් කැට්ලින් සිනාසුනාය. "රොබ් ජේන්ට නැහැ."

"එයා ග්‍රේජෝයි එක්ක ප්‍රධාන ශාලාව පැත්තට ගියා මම හිතන්නෙ."

තියන් ග්‍රේජෝයි රිවර්රන්හි ප්‍රධාන ශාලාවේ බංකුවක් මතට වී ඒල් අහක් තොලගාමින්, ඇගේ පියාගේ සෙබළ මුලුවට විස්පරින්ග් වූඩ්හි සිදුවූ සටන ගැන විස්තරයක් කරමින් හුන්නේය. "...සමහරු හැදුවා පැනලා යන්ට. ඒ වුනත් අපි මිටියාවත දෙපැත්තෙන්ම වහලා දාලයි තිබුනෙ. ඉතින් අපි අන්ධකාරෙ මැද්දෙම කඩුයි ලන්සයි අරන් ඉස්සරහට ගියා. රොබ්ගෙ වෘකයා ලැනිස්ටර්ලා උඩට කඩන් පැන්නහම උන් හිතන්ට ඇති අනික් එවුන් ඇවිත් උන්ට පහර දෙනවා කියලා. මම දැක්කා ඌ එක මිනිහෙක්ගෙ අත උරහිස ගාවින් ඉරලා කඩා ගන්නවා. උගෙ ඉව දැනුනහම ලැනිස්ටර් අශ්වයො නිකං පිස්සු වැටුනා වගේ වුනා. මම දන්නෙ නැහැ මිනිස්සු කී දෙනෙක් අශ්වයො පිටින් විසිවෙලා-"

"තියන්." ඇය කතාවට බාධාකලාය. "කොහෙන්ද මගේ පුතාව හොයාගන්ට පුළුවන්?"

"රොබ් උතුමානන් දෙව්වනයට ගියා මගේ ආර්යාවනි..."

ඒ වනාහි නෙඩ් විසින් සිදු කරතැයි බලාපොරොත්තු විය හැකි දේම විය. ඔහු ඇගේ පුතා මෙන්ම ඔහුගේ පියාගේ පුතා ද විය. ඇය එය සිහියේ තබා ගත යුතු විය. 'අනේ දෙවියනේ නෙඩ්...'

කොළ පැහැ දැවැන්ත තුරු වියන යට, උසැති රෙඩ්වුඩ් ගසින් හා පැරැණි එල්ම් ගසින් වට වී, හදවෘක්ෂය වශයෙන් භාවිත වුනු කෙසඟ වයර්වුඩ් ගසක් ඉදිරියේ දණ නමා සිටින රොබ් ඇයට හමුවිය. ඔහුගේ දිගු අසිපත ඉදිරියෙන් පොළොවේ ඇන තිබූ අතර අත්වැසුම් ලූ ඔහුගේ දෑත් එහි මිට වටා වෙලී ගොස් තිබිනි. ඔහු වටා තවත් අය ඇණ බා ගෙන උන්හ. ග්‍රේට්ජොන් අම්බර්, රිකාර්ඩ් කාර්ස්ටාර්ක්, මේජ් මෝර්මන්ට්, ගැල්බට් ග්ලවර්, සහ තවත් අය එහි වූහ. ටයිටස් බ්ලැක්වුඩ් පවා එහි විය. මේ වනාහි තවමත් පැරැණි දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන අය බැව් කැට්ලින් වටහා ගත්තාය. තමා මේ දවස්වල වැඳුම් පිදුම් කරන්නේ කවර දෙවිවරුන්ටදැයි ඇය තමාගෙන්ම විමසා සිටියාය. එනමුදු ඊට කිසිදු පිළිතුරක් ඇය සතුව නොවීය.

**Brynden Tully: “It is no good hammering your sword into a plowshare if you must forge it again on the morrow.”**

මිනිසුන්ගේ යාඥාවට බාධා කිරීම නොමැනවි. දෙවිවරුන්ට ද ඔවුන්ට හිමි දේ ලබා දිය යුතු විය... ඇගේ පියා සහ ඇගේ නෙඩ්ව ඇගෙන් උදුරාගන්නට තරම් සැහැසි වූ කුරිරු වූ දෙවිවරුන්ට පවා ඔවුන්ගේ හිමිකම් ඇත. එබැවින් කැට්ලින් නැවතී බලා සිටියාය. ගඟ දෙසින් හමා ආ සීත සුළං උසැති තුරුපතර අතරින් හමා ගියේය. දැවැන්ත ජල රෝද කුළුණ ඇගේ දකුණු පසින් විය. ඇය මෙසේ බලා සිටිද්දී පැරැණි මතක සියල්ලක්ම නැවත ඇගේ සිත තුළට ගලා ආයේය. පියා විසින් ඇයට අසුන් පිට යන්නට පුහුණු කරන ලද්දේ මේ ගස් අතර විය. අර තිබෙන්නේ එඩ්මුයර් වරක් වැටී අත කඩාගත් එල්ම් ගසයි. එතකොට අර

අතන, ලතා මණ්ඩපයට යටින් තිබෙන්නේ ඇයත් ලයිසාත් එක්ව පෙටයර් සමගින් සිපගැනීමේ සෙල්ලම කල ස්ථානයයි.

ඇයට මේ දේවල් වසර ගනනාවක් තිස්සේම අමතක වී තිබුනි. ඔවුන් එකල කෙතරම් කුඩා දරුවන් වීද. ඇය සන්සා ගේ වයස් තරම් විය. ලයිසා ආර්යාට ද වඩා බාල විය. පෙටයර් ඔවුන් දෙදෙනාටම වඩා බාල වුවද ඒ දෙදෙනාටම වඩා උත්සුක විය. දැරියන් දෙදෙන කැකිරි සිනහ පාමින් මේ කොලුවාව ඔවුන් දෙදෙනා අතර හුවමාරු කරගත්හ. මේ මතකයන් කෙතරම් ප්‍රබලව, කෙතරම් විචිත්‍රව නැවත ඇගේ සිතට පැමිණියා ද යත් ඇයට ඔහුගේ මොළකැටි ඇඟිලි සිය දසරුව ස්පර්ශ කරමින් තිබෙන්නාක් මෙන් හැඟින. ඔහුගේ හුස්මේ තැවරී තිබුනු සුවඳතලා සුවඳ දැනෙන්නාක් මෙන් විය. දෙව්වනය පුරා නිතරම පාහේ සුවඳතලා පඳුරු වැවී තිබුනු අතර පෙටයර් ඒවා සැපීමට රුචියක් දැක්වූයේය. ඔහු නිර්භීත කුඩා කොලුවකු විය. සැමවිටම කුමක් හෝ දෙයකට පැටලී හුන්නේය. "එයා මගේ කට ඇතුළට එයාගෙ දිව දාන්ට හැදුවා." පසු වේලාවක ඔවුන් දෙදෙන පමණක් සිටින මොහොතක කැට්ලින් සිය සොයුරියට පාපොච්චාරණය කලාය. "එයා මටත් එහෙම කලා." ලයිසා සෙමින් කෙඳිරුවාය. "මම ඒකට කැමැතියි."

* * *

සෙමින් නැගිට සිටි රොබ් සිය අසිපත කොපුවේ ලෑවේය. කැට්ලින් විමතියෙන් කල්පනා කරන්නට වන්නීය. ඇගේ පුතා කෙදිනකවත් දෙව්වනය තුළදී ගැහැණු දරුවකු සිපගෙන නැතිද? අනිවාර්යයෙන්ම ඔහු එසේ කරන්නට ඇත. ජේන් පූල් ඔහුට නෙත් කොණින් හී සැර විදිනයුරු ඇය අනන්ත වාරයක් දැක තිබුනාය. වැඩකාර කෙල්ලන් පවා. අවුරුදු දහඅටක් තරම් වයස්ගතවූ වැඩකාර කෙල්ලන් පවා... ඔහු දැනටමත් යුධ පිණිස ගොස් සිය අසිපතෙන් මිනිසුන් මරා දමා තිබුනි. නිසැකයෙන්ම ඔහු සිපගැනුම්වලට ලක්වන්නට ඇත. ඇගේ දෑසට කඳුළු බිඳු නැගී තිබුනු අතර ඇය කේන්තියෙන් මෙන් ඒවා පිසදා හැරියාය.

"අම්මා." ඇය එතැන සිටගෙන සිටිනු දුටු ඔහු කතාකලේය. "අපි මන්ත්‍රණ සභාවක් කැඳවන්ට ඕන. සාකච්ඡා කරන්ට ගොඩක් දේවල් තියෙනවා."

"ඔයාගෙ සීයා කැමැතියි ඔයාව දැකලා කතා කරන්ට. රොබ්, එයාට හොඳටම අසනීපයි."

"සෙර් එඩ්මුයර් මට කිවුවා. මට කණගාටුයි අම්මා! හස්ටර් උතුමානන් ගැනත්, ඔයා ගැනත් දෙන්නා ගැනම කණගාටුයි! ඒ වුනත් අපි මුලින්ම මේ සාකච්ඡාව තියලා ඉන්ට ඕන. අපට දකුණෙන් පණිවුඩයක් ආවා. රෙන්ලි බරතියන් එයාගෙ සහෝදරයගෙ සිංහාසනේට උරුමකම් කියලා."

"රෙන්ලි?" ඇය විමතියෙන් හා තිගැස්මෙන් යුතුව කීවාය. "මම හිතුවෙ... ඇත්තටම ඒක යන්ට ඕන ස්ටැනිස් උතුමානන්ට..."

"අපි හැමෝම හිතුවෙ එහෙමයි මගේ ආර්යාවනි." ගැල්බට් ග්ලවර් කීවේය.

යුධ මන්ත්‍රණ සභාව ප්‍රධාන ශාලාවේ රැස්විය. දිග අකුලන මේස හතරක් චතුරස්‍රාකාර හැඩයට පෙළගස්වා තිබුනි. හස්ටර් උතුමානන් මේ සභාවට එක්වීමට තරම් සුදුසු සනීපයක නොවූ බැවින් සිය සඳළුතලයට වී ගෙවී ගිය තරුණ කාලය ගැනත්, සිය ගංගාවන් ගැනත් සිහින දකිමින් නිදා සිටියේය. එඩ්මුයර්, ටලීවරුන්ගේ උස් ආසනය අරා වාඩි වී සිටි අතර ඔහු පසෙකින් බ්‍රින්ඩන් කළු මාලුවා අසුන්ගෙන සිටියේය. ඔහුගේ පියාගේ යටත් වංශාධිපතීහු ඔහුගේ දකුණටත් වමටත් වන්නට මේස අරා හුන්නෝය. රිවර්රන්හි යුධ ජයග්‍රහණය පිළිබඳ ආරංචිය පැරද පලා ගොස් සිටි ගංගා නිම්නයේ වංශාධිපතීන් වෙත ලැබී තිබුනු අතර ඔවුහු නැවතත් ඒකරාශී වී සිටියහ. කේරිල් වාන්ස් -සිය පියා ගෝල්ඩන් ටූත්හිදී මියගොස් සිටි බැවින් ඔහු දැන් වාන්ස් උතුමානන් විය- සහ සෙර් මාර්ක් පයිපර් එහි වූහ. ඔවුන් විසින් ඩැරීවරුන් නියෝජනය පිණිස සෙර් රේමන්ගේ කුඩා පුතණුවන් -බ්‍රැන්ගේ වයසේ පමණ වූ කුඩා පුතණුවන්- එහි කැඳවාගෙන විත් තිබින. ස්ටෝන් හෙජ්හි නටඹුන් අතරින් මතුවූ ජොනෝස් බ්‍රැකන් උතුමානන් ද රවමින්, ගර්ජනා කරමින් එහි පැමිණ හුන්නේය. මේස විසින් අවකාශ සලසා දුන් උපරිමයෙන් ඔහු ටයිටස් බ්ලැක්වූඩ්ගෙන් ඈත්ව අසුන් ගත්තේය.

විරුද්ධ පැත්තෙන් උතුරුකරයේ උතුමන් - කැට්ලින් හා රොබ් එඩ්මුයර්ට මුහුණ ලා වාඩි වී සිටි අතර ඔවුන්ගේ පිරිස ප්‍රමාණාත්මකව ස්වල්පයක් විය. ග්‍රේට්ජොන් රොබ්ගේ වම්පසින් අසුන්ගත් අතර කැට්ලින්ගේ දකුණු පසින් තියන්, ගැල්බට් ග්ලවර් හා මෝර්මන්ට් ආර්යාව වාඩි වී සිටියෝය. ගිලී ගිය දෑසින් හා එල්ලා වැටුනු මුහුණින් යුතු රිකාර්ඩ් කාර්ස්ටාර්ක් උතුමානන් සිහිනයෙන් ඇවිදින්නාක් මෙන් පැමිණ ඔහුට හිමි අසුනේ වාඩිවූයේය. ඔහුගේ දිගු රැවුල හා කේශ කලාපය සෝදා හෝ පීරා හෝ නොතිබුනු අතර මුහුණ සන්තාපයෙන් මැලවී තිබින. විස්පරින්ග් වුඩ් සටනේදී ඔහුගේ පුතුන් දෙදෙනෙකු මියගොස් සිටි අතර

තෙවැන්නා - ඔහුගේ වැඩිමහල් පුතා - රූස් බෝල්ටන් සමග එක්ව කොළ ගංගාව අද්දරදී ටයිවින් ලැනිස්ටර්ට පහර දෙනු පිණිස පිටව ගොස් තිබින. ඔහු කාර්ස්ටාර්ක් හෙලිධරයින්ට අණදෙමින් සටනට එක් වූ නමුදු සටනින් පසු ඔහු පිළිබඳ කිසිදු ආරංචියක් නොවීය.

* * *

වාද විවාද රෑ මැදියමක් වන තුරුම ඇදී ගියේය. සම්ප්‍රදාය අනුව මේ සෑම වංශාධිපතියකුටම තම අදහස් කියා පෑමේ අවසරය ලැබී තිබුනු අතර ඒ සැමෙකෙක්ම කතාවට සහභාගි වූහ. ඔවුහු කතා කරමින්, කෑ ගසමින්, සාප කරමින්, බැන වදිමින්, බොරුවෙන් රවටමින් හා විහිළු කරමින්, හෙට්ටු කරමින්, තර්ජනය කරමින්, මේසයෙන් නැගිට ඉවත යමින්, සිනාසෙමින් හෝ බුම්මාගත් මුහුණින් යුතුව නැවත පැමිණෙමින් කාලය ගෙවා දමන්නට වූහ. කැට්ලින් මේ සියලු කතාවලට ඇහුම්කන් දෙමින් නිසලව වාඩි වී සිටියාය.

රූස් බෝල්ටන් ඔහුගේ බිඳුනු හමුදාව නැවත එක්තැන් කොට, ඒකරාශී කොට, පණගන්වා රජමාවතේ රැස් කරවා තිබින. සෙර් හෙල්මන් ටෝල්හාර්ට් හා වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් තවමත් ද්විත්ව බලකොටුව පාලනය කරමින් සිටිති. ටයිවින් උතුමානන්ගේ හමුදාව ගංගා ත්‍රිශූලයෙන් මෙතෙර වී හැරෙන්හෝල් බලා පැමිණෙමින් සිටිති. මේ සියල්ලටම අමතරව දැන් රාජධානියේ රජවරුන් දෙදෙනෙක් සිටිති. රජවරුන් දෙදෙනෙකු සිටින අතර කිසිදු සම්මුතියක් නොමැත.

බහුතරයක් වංශාධිපතීන්ගේ අභිප්‍රාය වූයේ එකහෙලා හැරෙන්හොල් බලා හමුදා විහිදුවා ටයිවින් උතුමානන්ගේ හා ලැනිස්ටර්වරුන්ගේ බලය සදහටම විනාශ කර දැමීම විය. එනමුදු තරුණ, ආවේගශීලී මාර්ක් පයිපර් කියා සිටියේ ඒ වෙනුවට බටහිර දෙසට, කාර්ස්ටලී රොක්වලට පහර දීම වඩා සුදුසු වනු ඇත යනුවෙනි. තවත් සමහරු ඉවසා බලා සිටීම ගැන කතාකලෝය. රිවර්රන් පිහිටා තිබෙනුයේ ලැනිස්ටර් සැපයුම් මාර්ගය අතරමැද්දේ බැව් ජේසන් මැලිස්ටර් පෙන්වා දුන්නේය. ටයිවින් උතුමානන්ගේ සැපයුම් අවහිර කරන අතරේ සිය හමුදා ශක්තිමත් කරමින්, ඔවුන්ට විවේකයක් ලබා දෙමින් නිවිසැනසිල්ලේ මඳක් බලා සිටීම යෝග්‍ය නොවන්නේ ද? බ්ලැක්වුඩ් උතුමානන් ඒ ගැන අසන්නටවත් කැමැති නොවීය. විස්පරින්ග් වුඩ්වලින් පටන්ගත් කාර්යය නිමාවක් දැකීම වඩා යහපත් වනු ඇත. මෙහි සිට හැරෙන්හෝල්වලට හමුදා මෙහෙයවන අතරේ රූස් බෝල්ටන්ගේ හමුදාවද පහළට ගෙන ආවොත් කෙලෙසද? සුපුරුදු පරිදි බ්ලැක්වුඩ් යෝජනා කරන දෙයට බ්‍රැකන් එක හෙලා විරුද්ධ විය. නැගිට සිටි ජොනෝස් බ්‍රැකන්

උතුමානන් කියා සිටියේ රෙන්ලි රජතුමාට පක්ෂපාතීත්වය ප්‍රකාශ කර දකුණුකරය බලා හමුදා මෙහෙයවීම වඩා සුදුසු බවකි.

"රෙන්ලි කියන්නෙ රජෙක් නෙවෙයි." රොබ් කීවේය. ඒ වනාහි ඔහු මුව විවර කල පළමු වතාව විය. ඔහුගේ පියා මෙන්ම සිය යටත් වංශාධිපතීන්ට ඇහුම්කන් දෙන්නේ කෙසේදැයි ඔහු මනාව දැන හුන්නේය.

"ඔබ ජොෆ්රිට පක්ෂපාතී වෙන්ට අදහස් කරගෙන නැහැ නේද මගේ උතුමානනි?" ගැල්බට් ග්ලවර් ඇසුවේය. "එයා ඔබේ තාත්තා මරලා දැම්මා."

"ඒක හරි. ඒ වුනත් ඒකෙන් කියැවෙන්නෙ එයා නරකයි නපුරුයි කියලා විතරයි." රොබ් පිළිතුරු දුන්නේය. "මම දන්නෙ නැහැ ඒකෙන් කියැවෙනවා කියලා රෙන්ලි තමා දැන් රජතුමා කියලා. ජොෆ්රි තමා රොබර්ට්ගෙ ඇත්ත වැඩිමහල් පුතා. ඒ කියන්නෙ මේ රාජධානියෙ නීතිරීති අනුව එයාට තමා සිංහාසනේ නියම විදියට උරුම වෙන්ට ඕන. එයා මලොත් - මම හිතාගෙන ඉන්නෙ එයාව පරලෝකෙට යවන්ට තමා - එයාට ඉන්නවා බාල සහෝදරයෙක්. ජොෆ්රිගෙන් පස්සෙ ටමෙන්ටයි රජකම යන්ට ඕන."

"ටමෙන් කියන්නෙත් ලැනිස්ටර් කෙනෙක්." සෙර් මාර්ක් පයිපර් කඩා පැන්නේය.

"ඒක හරි." රොබ් ප්‍රශ්නයකට මැදි වූ බවක් පෙනුනි. "ඒ වුනත් අපි හිතමු ඒ දෙන්නම රජවෙලා නැහැයි කියලා. ඒත් කොහොමද රෙන්ලි උතුමානන් රජවෙන්නෙ? එයා රොබර්ට්ගෙ බාල සහෝදරයා. බ්‍රැන්ට බැහැ මට කලින් වින්ටර්ෆෙල්වල අධිපතියා වෙන්ට. ඒ වගේම රෙන්ලිට බැහැ ස්ටැනිස් උතුමානන්ට කලින් රජවෙන්ට."

මෝර්මන්ට් ආර්යාවද ඒ කතාවට එකඟ විය. "නියම උරුමක්කාරකම තියෙන්නෙ ස්ටැනිස් උතුමානන්ට තමා."

"රෙන්ලි දැන් රජවෙලා ඉවරයි." මාර්ක් පයිපර් කියා සිටියේය. "හයිගාර්ඩ්නුයි ස්ටෝර්ම්ස් එන්ඩ්ුයි එයාට පක්ෂපාතීත්වය දක්වලා තියෙනවා. ඩෝර්නිෂ් කාරයොත් නිකං බලන්

ඉන්න එකක් නැහැ. වින්ටර්ෆෙල්වලටයි රිවර්රන්වලටයි පුළුවන් වුනොත් තමන්ගෙ ශක්තිය එයත් එක්ක එක්කහු කරන්ට, මේ රාජධානියෙ තියෙන උසස්ම වංශාධිපති පවුල් හතෙන් පහක් එයත් එක්ක එකතු වුනා වෙනවා. ඒරින්ලා නින්දෙන් නැගිටලා ආවොත් ඒක හතෙන් හයක් වෙනවා. කාර්ස්ටලී රොක්වලට විරුද්ධව අනිත් පවුල් හයම! මගේ උතුමනි, මේ අවුරුද්ද ඉවරවෙන්ට ඉස්සෙල්ලා අපට උන් හැමෝගෙම ඔළුගෙඩි රිටිවල අමුනන්ට පුළුවන් වෙයි. රැජිනයි, කොලු රජයි, ටයිවිනුයි, පුංචි යකායි, රජුන් මරන්නායි, සෙර් කෙවනුයි, මේ හැමඑකාම. අපි රෙන්ලි රජතුමාත් එක්ක එක්කහු වුනොත් ඒක තමා අපට ලැබෙන දිනුම. අපි මේ හැමදෙයක්ම අහකට කරලා දාන්ට ඕන ස්ටැනිස් උතුමානන්ට මොකක් තියෙන නිසාද?

"නියම උරුමකම." රොබ් මුරණ්ඩු ස්වරයෙන් කීවේය. ඔහු හරියටම සිය පියා මෙන්ම මේ වදන් පැවසීයැයි කැට්ලින් සිතුවාය.

"ඉතින් ඒ කියන්නෙ ඔබ අදහස් කරනවද අපි ස්ටැනිස්ට පක්ෂපාතියි කියලා ප්‍රකාශ කරන්ට ඕනැයි කියලා?" එඩ්මුයර් ඇසුවේය.

"මම දන්නෙ නැහැ. නියම උත්තරේ පෙන්නලා දෙන්ටයි කියලා මම යාඥා කලා. ඒ වුනත් දෙවිවරු මට උත්තරයක් දුන්නෙ නැහැ. ලැනිස්ටර්ලා මගේ තාත්තව මරලා දැම්මා රාජද්‍රෝහි චෝදනා එල්ල කරලා. අපි හැමෝම දන්නවා ඒක බොරුවක් කියලා. ඒ වුනත් ජොෆ්රි රජකමට නියම උරුමක්කාරයා නම්, අපි එයාට විරුද්ධව සටන් කලොත් අපිත් රාජද්‍රෝහියො වෙනවා."

"මගේ තාත්තනම් කියයි පරෙස්සමින් බලන් ඉන්ට කියලා." ෆ්‍රේ වරුන්ට උරුම මුගටි සිනහව රැඳි මුවින් යුතුව නාකි සෙර් ස්ටෙව්රන් කියා සිටියේය. "නැවතිලා බලන් ඉන්ට. මේ රජවරු දෙන්නට තමන්ගෙ සිහසුන් සෙල්ලම කරගෙන යන්ට දෙන්ට. එයාලා සටන් කරලා ඉවරවුනාට පස්සෙ අපට පුළුවන් ඒ සටනින් දිනපු කෙනාට දණ නමන්ට. එහෙමත් නැත්තම් අපි කැමැති නම් එයත් එක්ක සටන්කරන්ට. රෙන්ලි දැන් හමුදාව රැස්කරන වෙලාවෙ ටයිවින් උතුමානන් බොහොම කැමැති වෙයි සාම ගිවිසුමක් ගහන්ට... ඒ වගේම එයාගෙ පුතාව පරෙස්සමින් ආපහු බාරගන්ට. උදාර උතුමනි, මට ඉඩදෙන්ට හැරෙන්හෝල්වලට ගිහිල්ලා එයත් එක්ක ගිවිසුම් කොන්දේසි ගැනයි වන්දි ගැනයි කතා කරගන්ට..."

සැහැසි ගර්ජනා රැසක් විසින් ඔහුගේ කතාව යටපත් කරදමන ලදී. "බයගුල්ලා!" ග්‍රේට්ජොන් ගිගිරුවේය. "සාම ගිවිසුමක් ඉල්ලලා යැවුවොත් හිතයි අපි දුර්වල වෙලා කියලා." මෝර්මන්ට් ආර්යාව නිවේදනය කර සිටියාය. "වන්දිය යකාට ගියාවෙ! අපි රජුන් මරන්නාව ආපහු දෙන්ට හොඳ නෑ." රිකාර්ඩ් කාර්ස්ටාර්ක් කීවේය.

"ඇයි සාමයකට යන්නෙ නැත්තෙ?" කැට්ලින් විමසුවාය.

වංශාධිපතීන් සියල්ල ඈ දෙස බැලූහ. එනමුදු ඒ අතරින් ඇයට වඩාත්ම බරට දැනුනේ රොබ්ගේ දෑසේ වූ බැල්ම විය. "මගේ ආර්යාවනි. උන් මගේ තාත්තාව, ඔබේ සැමියාව නිරපරාදෙ මරලා දැම්මා." ඔහු දරුණු ස්වරයෙන් කීවේය. සිය දිගු අසිපත කොපුවෙන් මෑත් කරගත් ඔහු එය ඉදිරිපස මේසය මත තැබුවේය. "මේ තමා ලැනිස්ටර්ලාත් එක්ක මගෙ තියෙන එකම සාමය."

ග්‍රේට්ජොන් ගුගුරමින් සිය එකඟතාව පලකලේය. අන්‍යයන්ද කෑ ගසමින්, සිය අසිපත් ඇද ගනිමින්, මේසයට මිටින් තඩිබාමින් ඊට සිය හඬ මුසු කලෝය. ඔවුන් නිහඬ වනතෙක් කැට්ලින් මඳක් බලා සිටියාය. "මගේ උතුමනි. එඩාර්ඩ් උතුමානන් කියන්නෙ ඔබලා හැමෝගෙම වංශාධිපතියා. ඒ වුනත් මම ඒ මනුස්සයත් එක්ක ඇඳ බෙදාහදා ගත්තා. එයා වෙනුවෙන් දරුවො වැදුවා. ඔබලා හිතනවද මගේ හිතේ එයා ගැන තියෙන ආදරේ ඔබලගෙ හිතේ තියෙන ආදරේට වඩා අඩුයි කියලා?" දුක නිසා ඇගේ කටහඬ බිඳී යන්නට විය. එනමුදු දිගු හුස්මක් ඉහළට ඇදගත් කැට්ලින් තමාව සන්සුන් කරගත්තාය. "රොබ්, ඔය කඩුවට පුළුවන් නම් එයාව ආපහු ගේන්ට, එයා ආයෙමත් මගේ පැත්තකින් හිටගෙන ඉන්න වෙලාව එනකම් ඔය කඩුව කොපුවෙ දාන්ට මම ඉඩ තියන්නෙ නැහැ... ඒ වුනත් දැන් එයා මැරිලා. විස්පරින්ග් වුඩ් සීයක් ගෙනාවත් එයා ආපහු එන්නෙ නැහැ. නෙඩ් යන්ට ගිහිල්ලා, ඩේරින් හෝර්න්වුඩ්, එතකොට කාර්ස්ටාර්ක් උතුමානන්ගෙ නිර්භීත පුත්තු දෙන්නා, තවත් හොඳ මිනිස්සු මහ ගොඩක් යන්ටම යන්ට ගිහිල්ලා. ඒ කිසිකෙනෙක් ආපහු එන්නෙ නැහැ. ඉතින්, අපට තවත් මිනිස්සු මැරෙන්ට ඕනද?"

"ඔබ ගැහැණියක්, මගේ ආර්යාවනි." ග්‍රේට්ජොන් සිය ගැඹුරු ස්වරයෙන් කීවේය. "ගෑනුන්ට මේ දේවල් තේරෙන්නෙ නැහැ."

"ඔබලා මෘදු වැඩියි." කාර්ස්ටාර්ක් උතුමානන් ද දුක්මුසු මුහුණින් යුතුව කතාවට එක්විය. "පිරිමියෙක් වුනාම පලිය ගන්ට තියෙන්ට ඕන."

"ඔබ සෙර්සි ලැනිස්ටර් දිහා බැලුවොත් කාර්ස්ටාර්ක් උතුමානනි, ඔබට පෙනෙයි ගෑනියෙකුට කොච්චර මෘදු වෙන්ට පුළුවන්ද කියලා. ඇත්ත, සමහරවිට මට තේරෙන්නෙ නැතුව ඇති ඔබලාගෙ ඔය යුද්ධ උපක්‍රමයි, උපායනුයි ගැන... ඒ වුනත් මම දන්නවා නිශ්ඵලභාවය කියන්නෙ මොකක්ද කියලා. අපි මේ යුද්ධෙ පටන් ගත්තෙ ලැනිස්ටර් හමුදා අපේ ගංගා නිම්නය මංකොල්ලා කද්දි, නෙඩ් බොරුවට රාජද්‍රෝහී චෝදනාවලට ලක්වෙලා හිරකාරයෙක් වෙලා ඉන්දැද්දි. අපි සටන් කලේ අපේ භූමිය බේරගන්ට. නෙඩ්ගෙ නිදහස දිනාගන්ට."

"හරි අපි එක දෙයක් දිනාගත්තා. අනිත් කාරනාව අපට ආයෙ කවදාවත් දිනාගන්ට බැහැ. මම මැරෙන දවස වෙනතුරුම නෙඩ් ගැන දුක්වෙයි. අඬයි. වැළැපෙයි. ඒ වුනත් මම ජීවත්වෙලා ඉන්න අය ගැනත් හිතන්ට ඕන. මට ඕන මගේ දූවලා දෙන්නා ආපුහ මගේ ගාවට ගන්ට. රැජින තාමත් ඒ දෙන්නව අල්ලගෙනයි ඉන්නෙ. උන් අල්ලන් ඉන්න ස්ටාර්ක්ලා දෙන්නා වෙනුවෙන් අපි අල්ලන් ඉන්න ලැනිස්ටර්ලා හතරදෙනාම දෙන්ට සිද්දවුනත් මම ඒක සාධාරණ ගනුදෙනුවක් හැටියට සතුටින් බාරගන්නවා. මට ඕන ඔයා ආරක්ෂා ඇතුව ඉන්නවා දකින්ට රොබ්. වින්ටර්ෆෙල්වලට වෙලා ඔයාගෙ තාත්තගෙ ආසනේ වාඩිවෙලා උතුර පාලනය කරනවා දකින්ට. මට ඕන ඔයා ඔයාගෙ ජීවිතේ විඳිනවා දකින්ට. ඔයා කෙල්ලෙකුට හාදුවක් දීලා, ගෑනියෙක් කසාද බැඳලා පුතෙකුට තාත්තා වෙනවා දකින්ට. මට ඕන මේ හැමදේකම කෙලවරක් දකින්ට. මට ඕන ගෙදර යන්ට මගේ උතුමනි. ගෙදර ගිහිල්ලා මගේ සැමියා වෙනුවෙන් ඇතිපදම් අඬන්ට."

කැට්ලින් සිය කතාව නිමකරන විට මුලු ශාලාවම නිහඬතාවයේ ගැලී තිබුනි.

"සාමය..." ඇගේ බාප්පා බ්‍රින්ඩන් කතාව ඇරඹීය. "සාමය කියන්නෙ බොහොම සුන්දර දෙයක් මගේ ආර්යාවනි... ඒ වුනත් ඒ මොන කොන්දේසි යටතෙද? අද දවසෙ ඔබේ කඩුව උණුකරලා ඒකෙන් නඟුල් දතක් හැදුවට වැඩක්වෙන්නෙ නැහැ හෙට ආයෙමත් ඒක උණුකරලා කඩුවක් හදන්ට වෙනවානම්."

"එතකොට ටෝරනුයි මගේ පුතා එඩාර්ඩුයි මැරුනෙ මොන කෙහෙල්මලකට ද? මට උන්ගෙ ඇටකටු විතරක් අරන් වෙන මොකුත් නැතුව ආපහු කාර්හෝල්ඩ්වලට යන්ට සිද්දවුනොත් ඒකෙ ඇති වැඩේ මොකක්ද?" රිකාර්ඩ් කාර්ස්ටාර්ක් ඇසීය.

"ඒකනෙ." බ්‍රැකන් උතුමානන් ද කතාවට හවුල් විය. "ග්‍රෙගර් ක්ලිගේන් මගේ ඉඩම්වලට ගිනි තියලා ඒවා මුඩු බිම් කලා. මගේ ගම්මු මරලා දැම්මා. ස්ටෝන්හෙජ් නිකංම දුම් දාන නටඹුන් ගොඩක්කරලා දැම්මා. එතකොට ඔබ කියන්නෙ උන්ව මෙහාට එවුව උන්ගෙ මහ එකාට මම දැන් දණ නමන්ට ඕනයි කියලද? හැම දෙයක්ම ආයිමත් කලින් තිබුන තත්ත්වෙටම ඇදලා දාන්ට යනවානම් අපි මොන මඟුලකට ද යුද්ධ කලේ?"

කැට්ලින් ගේ අතිමහත් විස්මයට මෙන්ම ඇගේ බලවත් කනගාටුවට මෙන් බ්ලැක්වුඩ් උතුමානන් මේ කතාවට එකඟ විය. "අපි ජොෆ්රි රජතුමාත් එක්ක සාම ගිවිසුමක් ගහන්ට යනවානම් එතකොට අපි රෙන්ලි රජතුමාට ද්‍රෝහි වුනා වෙන්නෙ නැද්ද? මොකද වෙන්නෙ සිංහයා පරද්දලා ගෝනා දිනුවොත්? එතකොට අපේ තත්ත්වය වෙන්නෙ මොකක්ද?"

"ඔබලා කවුරු මොනවා තීරණය කලත් මට කමක් නැහැ, මම කවදාවත් ලැනිස්ටර් කාරයෙකුට රජතුමා කියලා කියන්ට යන්නෙ නැහැ." මාර්ක් පයිපර් නිවේදනය කලේය.

"මමත් නෑ." කුඩා ඩැරී කොලුවා මුරගෑවේය. "කවදාවත් නෑ."

නැවතත් කෑ ගැසීම් වටයක් ඇරඹින. කැට්ලින් නශ්ටාපේක්ෂාවන්ගෙන් යුතුව නිහඬව බලා සිටියාය. ඇය ආසන්නයටම පැමිණියාය. ඔවුන් සැවොම ඇයට ඇහුම්කන් දුන්නෝය... ඔවුන් සැවොම ඇයට එකඟවන්නට තිබුනි... එනමුදු අත පත් මොහොත ඉවත ගියේය. සාමයක් ඇති නොවනු ඇත. තුවාල සුවවීමට අවස්ථාවක් නොලැබෙනු ඇත. ආරක්ෂාවක් නැති වනු ඇත. ඇය සිය පුතු දෙස බැලුවාය. සිය යටත් වංශාධිපතීන් වාදවිවාද කරනු, එකිනෙකාට රවාගනු, කලහකාරී ලෙස හැසිරෙනු නරඹමින් ඔවුන් දෙස බලා සිටින සිය පුතු දෙස බැලුවාය. ඔහු ඉත සිතින්ම යුද්ධය හා බැඳී සිටියේය. වෝල්ඩර් ෆ්‍රේ උතුමානන් ගේ දුවක හා විවාහ වීමට පිළිණ දී තිබුනද සත්‍ය වශයෙන්ම ඔහුගේ මනාළිය වනු ඇත්තේ ඉදිරිපස මේසය මත ඇති ඒ දිගු අසිපත වන බැව් ඇය පැහැදිලිවම දුටුවාය.

කැට්ලින් සිය දියණියන් ගැන වදවෙමින්, ඇයට නැවත කවදා ඔවුන් දැකිය හැකිවේදෝයි සිතමින් සිටින අතරේ හදිසියේම ග්‍රේට්ජොන් නැගිට සිටියේය.

"මගේ උතුමනි!" ඔහුගේ හඬ ගිගුම් දෙමින් ශාලාව පුරා පැතිර යන්නට විය. "මෙන්න ඔය රජවරු දෙන්නටම මට කියන්ට තියෙන දේ." ඔහු බිමට කෙල ගැසීය. "රෙන්ලි බරතියන් කියන්නෙ මට බිංදුවකවත් වැඩක් ඇති එකෙක් නෙවෙයි. ස්ටැනිස් ගැනත් එහෙම්මයි. උන් මොකටද මාවයි මගේ යටත් වැසියන්වයි පාලනය කරන්නෙ? හයිගාර්ඩ්න්වල හරි ඩෝර්න්වල හරි තියෙන හරි ලස්සන වැඩ දාපු පුටුවක වාඩි වෙලා මාව පාලනය කරන්නෙ? උන් මොනාද දන්නෙ ප්‍රාකාරය ගැන? එහෙමත් නැත්තම් වෘක වනාන්තරය ගැන, මුල් මිනිස්සුන්ගෙ සොහොන් ගොඩැලි ගැන? උන්ගෙ දෙවියො පවා වැරැදි දෙවිවරු. ලැනිස්ටර්ලාත් අනික් එවුන්ම අරන් ගියාවෙ. මට දැන් උන්ව ඇතිවෙලයි තියෙන්නෙ." සිය දසරුවට ඉහළින් අත යැවූ ඔහු පිටේ එල්ලාගෙන සිටි, දැතින්ම එසවිය යුතු, සිය දැවැන්ත අසිපත ඇද ගත්තේය. "ඇයි ආයෙමත් අපි අපිවම පාලනය කරන්ට පටන්ගන්නෙ නැත්තෙ? අපිව එක්කහු කලේ මකරු. දැන් මකරු ඔක්කොම මැරිලා!" ඔහු සිය අසිපත රොබ් දෙසට එල්ල කලේය. "අන්න ඉන්නවා මම දණ නමන්ට කැමැති, මගේ නියම රජතුමා. මගේ එකම රජතුමා. එතුමන්ට විතරයි මම දණ නමන්ට ඕන මගේ උතුමනි." ඔහු ගිගිරුවේය. "උතුරුකරේ රජතුමා!"

ඊළඟ මොහොතේ දණ නැමූ ඔහු සිය අසිපත රොබ්ගේ දෙපතුල මුල තැබුවේය.

"ඒ කොන්දේසිය යටතේ සාමයකට මමත් කැමැතියි." කාර්ස්ටාර්ක් උතුමානන් කීවේය. "උන්ගෙ රතු බලකොටුවයි, අර මලඉලවූ යකඩ පුටුවයි උන්ම තියා ගත්තාවෙ." ඔහු සිය දිගු අසිපත කොපුවෙන් මෑත් කර ගත්තේය. "උතුරුකරයේ රජතුමා!" ග්‍රේට්ජොන් පසෙකින් දණ නමමින් ඔහු කීවේය.

මේජ් මෝර්මන්ට් නැගිට සිටියාය. "ශීත කාලයේ රජතුමා!" සිය කටු යගදාව අනිකුත් අසිපත් අසලින් තබමින් ඇය නිවේදනය කලාය. ගංගා නිම්නයේ වංශාධිපතිහු පවා නැගිටින්නට වූහ. බ්ලැක්වුඩ් සහ බ්‍රැකන් සහ මැලිස්ටර් පවා. මේ වනාහි ඉතිහාසයේ කවර කලෙකවත් වින්ටර්ෆෙල් වෙතින් පාලනය නොවූ වංශාධිපති පවුල් විය. එනමුදු ඔවුන් එකාවන්ව නැගිට සිය අසිපත් පිටට අදිනු කැට්ලින් බලා සිටියාය. වසර තුන්සියයකින්

මෙපිට මේ රාජධානියේ අසන්නට නොලැබුනු වදන් ශාලාව පුරා ගිගුම් දෙද්දී ඔවුහු එකාවන්ව දණ නැමූහ. ඒ වනාහි ජයග්‍රාහක ඒගන් විසින් රජධානි සත ඒකාබද්ධ කොට තනි රාජධානියක් තැනූ දා පටන් කිසිදා නෑසුනු වදන් විය... එනමුදු දැන් නැවතත් ඒ වදන් ඇගේ පියාගේ ප්‍රධාන ශාලාව පුරා රැවු දෙන්නට විය.

"උතුරුකරයේ රජතුමා!"

"උතුරුකරයේ රජතුමා!!"

"උතුරුකරයේ රජතුමා!!!"

**Catelyn Stark: “Riverrun is free again.”**

ඩැනේරිස් 10

හිරු රැසින් හේබා දැවී ගිය රතුවන් බිමේ දැව සොයා ගැනීම උගහට විය. දැව සෙවීමට ගිය ඇගේ පිරිස රැගෙන ආවේ ගැට සහිත කොට්ට පුළුන් දර, දම් පැහැ පඳුරු සහ දුඹුරුවන් තණපත් පමණි. සොයාගැනීමට තිබුනු සෘජුම ගස් දෙකක පොතු ඉවත් කර අතු ඉති කපා දැමූ ඔවුහු එම කොටන් දෙකට පලා චතුරශ්‍රාකාරව පොළොව මත ඇතිරූහ. ඒ මැද පිදුරු, මිටි බැඳි තණපත්, ගස්වලින් කපා ඉවත් කල පොතු සහ වියළුනු පඳුරු වලින් පුරවා දැමින. රඛාරෝ ඉතිරි වී සිටි අසුන් ස්වල්පය අතුරින් හොඳ සෙන්ධවයෙකු තෝරාගත්තේය. ඌ ඩ්‍රෝගෝගේ රතු සෙන්ධවයා හා සම කල හැක්කෙකු නොවුවද කල හැකි දෙයක් නොවීය. අනිත් අතට ඩ්‍රෝගෝගේ අසු හා සම කල හැක්කන් වේ නම් ඒ අතලොස්සකි. චතුරශ්‍රය මැදට අසු රැගෙන ආ අග්ගෝ ඌට වියලුනු ඇපල් ගෙඩියක් කන්නට දී දෑස මැදටම දුන් පොරෝ පහරකින් ඌව මරා දැමුවේය.

අත පය බඳින ලදුව ධූලි පිරුනු බිම දපා සිටි මිරී මාස් ඩූර් සිය කලුවන් දෑස පුරාවූ නොඉවසිල්ලකින් යුතුව ඒ දෙස බලා සිටියාය. "අස්සයෙක් විතරක් මරලා හරියන්නේ නෑ." ඈ ඩැනීට කීවාය. “නිකංම ලේ කියන්නෙ කිසිම වැඩකට ඇති දෙයක්නෙවෙයි. ඔබ මන්තර දන්නෙත් නෑ, ඒවා හිතාගන්ට ඔබට ඒ ගැන දැනුමකුත් නෑ. ඔබ හිතාගෙන ඉන්නේ ලේ යකැදුරුකම් කියන්නෙ පොඩි දරුවන්ගෙ සෙල්ලමක් කියලද? ඔබ මට යක්දෙස්සි කියන්නෙ හරියට ඒක නිකම් අපහාසයක් වගේ. ඒ වුනත් ඒකේ තේරුම ඥානවන්තකම කියන එකයි. ඔබ තාම පොඩි එකෙක්. කිසිම දෙයක් තේරෙන්නේ නෑ. ඔබ ඔය කරන්ට යන්නෙ මොකක් වුනත් ඒ කිසි දෙයක් හරියන්නෙ නෑ . මේ බැමි ගලවන්ට. මම ඔබට උදවු කරන්නම්."

"මේ යක්දෙස්සිගෙ කරච්චලේ අහලා මට එපා වෙලා." ඩැනි ජෝගෝට කීවාය. ඔහුගේ කසපහර ලැබූ ගැහැනිය නිහඬ වූවාය.

ඔවුන්ට සොයාගත හැකි වූ සියලුම කුඩා ගස් වල සෘජු කඳන් ද, විශාල ගස්වල අතුද යොදාගෙන ඔවුහු අසුගේ මළකුණ මත වේදිකාවක් ගොඩ නැංවූහ. සියළුම දැව කඳන් නැගෙනහිර දිසාවේ සිට බටහිර දිසාවට ඇතිරුනේ හිරු නැගෙන දෙස සිට හිරු බසින දෙසට ඇතිරීම සම්ප්‍රදාය වූ බැවිනි. මේ වේදිකාව මත ඛාල් ඩ්‍රෝගෝගේ සියලු වස්තුව

තැන්පත් කෙරින: ඔහුගේ දැවැන්ත කුඩාරම, වර්ණවත් කෙටි කබා, සැදල හා කටකලියා, වැඩිවිය පැමිණුනු දා ඔහුගේ පියා ගෙන් තෑගී ලද කසය, බාල් ඕගෝ සහ ඔහුගේ පුතාට මරු කැඳවූ අරක් අසිපත, ඔහුගේ සවිමත් මකරාස්ථි දුන්න, මේ සියල්ල එහි තැන්පත් කෙරින. බාල් ඩ්‍රෝගෝගේ රුධිරාරක්ෂකයින් වෙතින් මනාලි තෑගි ලෙසින් ඇය ලද ආයුධ ද එයට එක් කරන්නට අග්ගෝ අදහස් කලද ඩැනී එයට එරෙහි විය. "ඒවා මගේ. මට ඒවා තියාගන්ට ඕනේ." අවසන මේ වස්තුව මත තවත් අතුපතර තට්ටුවක් ද ඊටත් උඩින් තවත් තණපත් තට්ටුවක් ද අතුරනු ලැබින.

හිරු කෙමෙන් ක්ෂිතිජය වෙතට ලඟාවෙද්දී සෙර් ජෝරා මෝර්මන්ට් ඇයව පසෙකට ඇදගත්තේය. "කුමාරි..." ඔහු කතාව ඇරඹීය.

"ඇයි ඔබ මට එහෙම කතා කරන්නෙ?" ඩැනි ඔහුට අභියෝග කලාය . "මගේ අයියා විසේරිස් ඔබේ රජතුමා. එහෙම නෙමෙයිද?"

"ඒක ඇත්ත මගේ ආර්යාවනි."

"විසේරිස් මැරුනා. මම තමා එයාගේ උරුමක්කාරී. මම තමා ටාර්ගේරියන් වංශයේ අන්තිම ලේ උරුමක්කාරි. එයාට අයිති වෙලා තිබ්බ හැම දේම දැන් මගේ."

"මගේ... රැජිනියනි!" සෙර් ජෝරා දණක් නැමුවේය. "එයාට අයිතිව තිබුන මගේ අසිපත දැන් ඔබෙයි ඩනේරිස්. ඒ වගේම මගේ හදවතත්. ඒක කවදාවත් එයාට අයිති වෙලා තිබුනෙ නෑ . මම නිකංම නිකං නයිට්වරයෙක් විතරයි. මට ඔබට පුදකරන්ට තියෙන්නේ පිටුවහල් ජීවිතයක් විතරයි. ඒ වුනත් මම ඔබෙන් අයදිනවා. මම කියනදේ අහන්ට. බාල්ව අමතක කරලා දාන්ට. ඔබට තනිවෙන්ට දෙන්නෙ නෑ, මම ඒක පොරොන්දු වෙනවා. වයෙස් ඩොත්රක්වලට යන්ට ඔබ කැමැති නැත්තං කිසිම මිනිහෙකුට එහෙම ගෙනියන්ට දෙන්නේ නෑ කියල මම පොරොන්දු වෙනවා. ඩොෂ් ඛලීන් මැහැල්ලන්ට එකතුවෙන්ට ඕනේ වෙන්නේ නෑ. මගෙත් එක්ක නැගෙනහිරට යමු. යි ටි, ඛාර්ත්, ජේඩ් මුහුද, අෂයී වල සෙවනැලි දේශය. කිසිම කෙනෙක් දැකල නැති ආශ්චර්යජනක දේවල් අපි බලමු. දෙවියන් අපි පිට දාන ඉරණම මොකක් වුනත් ඒකට මූන දෙමු. අනේ ඛලීසි ඔබ කරගන්ට යන දේ මම දන්නවා. එපා. අනේ එපා."

"මම ඒක කරන්ටම ඕන." ඔහුගේ මුහුණ දුකින් සහ ස්නේහයෙන් යුතුව ස්පර්ශ කරමින් ඩැනි  පිළිතුරු දුන්නාය. "ඔබට තේරෙන්නේ නැහැ."

"ඔබ එයාට ආදරෙන් හිටිය බව මට තේරෙනවා." සෙර් ජෝරා ගේ කටහඬ මනස්තාපයෙන් බර විය. "මමත් කාලයක් මගේ ආර්යාවට ආදරේ කලා. ඒත් එයා එක්ක මම මැරුනෙ නෑ. ඔබ මගේ රැජින. මගේ කඩුව ඔබෙයි. ඒ වුනත් ඔබ ඩ්‍රෝගෝගේ චිතකයේ පිච්චෙනවා බලන්ට මට බෑ. ඒක වෙනකල් මම නිකන් ඉන්නේ නෑ."

"ඔබ බය වුනේ ඒකටද?" ඔහුගේ පුළුල් නළල්තලය මුදුව සිප ගන්නා අතර ඩැනි විමසුවාය. "එහෙම කරගන්ට මම පොඩි ළමයෙක් නෙවෙයි."

"එහෙනම් මට දිවුරලා කියන්ට. ඔබ එයත් එක්ක මැරෙන්නේ නෑ නේද මගේ රැජින?"

"ඔව් මම දිවුරනවා." පිය උරුමයෙන් ඇයට අයත් විය යුතු රාජධානි සප්තකයේ පොදු වහරින් ඇය පිළිතුරු දුන්නාය.

වේදිකාවේ තෙවන ස්ථරය ඇඟිල්ලක් තරම් ගනකම අතු රිකිල්ලෙන් සාදා වියලි තණපතින් වසනු ලැබින. ඒවා හිමේ සිට ගින්දර දක්වා එනම් උතුරේ සිට දකුණු දෙස දක්වා අතුරා ඒ මතුපිට සුමුදු පුළුන් කොට්ට සහ සේද රෙදි වලින් වසා දමා තිබුනි. මළ හිරු අවරගිර දෙසට සමීප වන මොහොත වන විට සියල්ල සූදානම් වී හමාර විය. ඩැනි සිය ඩොත්‍රකියන් එක්රැස් කලාය. ඉතිරිව සිටි සියල්ලෝම සියයකටත් අඩු ප්‍රමාණයක් විය. 'ඒගන් සිය මෙහෙයුම ඇරඹූයේ කී දෙනෙකුගෙන්ද?' ඇය විමතියෙන් කල්පනා කලාය. එය වැදගැම්මකට ඇති දෙයක් නොවේ.

"ඔබලා තමා මගේ බලසාරය වෙන්නෙ." ඇය ඔවුනට පැවසුවාය. "මට මෙතන පේන්ට ඉන්නේ වහල්ලු. මම උඹලාව නිදහස් කරනවා. උඹලාගේ ඔය වහල් කරපටි ගලවපල්ලා. උඹල කැමති නම් යන්ට පුළුවන්. කවුරුත් උඹලට අනතුරන් කරන්නේ නැහැ. උඹල ඉන්නවා නම් ඒ ඉන්නේ සහෝදර-සහෝදරියෝ අඹු-සැමියෝ විදිහට. නිදහසේ." කළුවන් දැස් කිසිදු හැඟීමක් නොමැති, පරීක්ෂාකාරී බැල්මකින් ඇය දෙස බලා සිටියේය. "මට

ජේනවා මෙතන ගැහැණු ඉන්නවා, ළමයි ඉන්නවා, රැලි ගැහුනු මූනු තියනවා. මම ඊයේ කෙල්ලක්, අද ගෑනියක්, හෙට නාකිච්චියක් වෙයි. උඹලා ඔක්කොටමයි මම මේ කියන්නෙ. මට එකතු වෙයල්ලා, උඹලට හැමදාම මගේ ළඟ ඉඩ තියේවි." ඩැනී සිය බාස් එකේ තරුණ රණකාමීන් තිදෙනා වෙත හැරුනාය. "ජෝගෝ, ඔබට මම තෑගි දෙනවා මේ රිදී මිට ගහපු කසය. මේක මගේ මනාලි තෑග්ගක්. මම ඔබව නම් කරනවා කෝ් කෙනෙක් විදියට. මට ඔබේ දිවුරුම ඕන. ඔබ මගේ රුධිරයෙන් උපන් රුධිරය විදියට ජීවත් වෙලා මියයන්ට සූදානම් ද? මගේ පැත්තකින් අශ්වයා විහිදලා මගේ ආරක්ෂාව බලාගන්නට දිවුරනවද?"

ජෝගෝ ඇගේ අතින් කසය ගත් නමුදු ඔහුගේ මුහුණ අවුල්සහගත විය. "ඛලීසි..." ඔහු පැකිලෙමින් පැවසීය. "මේක කරන්ට පුළුවන් දෙයක් නෙවෙයි. ගෑනියෙක්ගෙ රුධිරාරක්ෂකයා වෙන එක මට මහ නින්දාවක්."

"අග්ගෝ," ඔහු නෑසුනා සේ ඩැනී කතා කලාය. දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත. "මගේ මනාලි තෑග්ගක් වුන මේ මකරාස්ථි දුන්න මම ඔබට දෙනවා." එය ඇයටත් වඩා උසැති, වක් දෙකකින් යුක්ත, කළු පැහැයෙන් දිදුලන අඟනා භාණ්ඩයක් විය. "මම ඔබව නම් කරනවා කෝ් කෙනෙක් විදිහට. ඔබ මගේ රුධිරයෙන් උපන් රුධිරය විදියට ජීවත් වෙලා මියයන්ට සූදානම් ද? මගේ පැත්තකින් අශ්වයා විහිදලා මගේ ආරක්ෂාව බලාගන්නට දිවුරනවද?"

අග්ගෝ බිමට නැඹුරු වූ දෑසින් යුතුව තෑග්ග පිළිගත්තේය. "මට මේ වචන කියන්ට බෑ . කෝ් කෙනෙක් නම් කරන්ට පුළුවන්, බලසාරයක් පාලනය කරන්ට පුළුවන් පිරිමියෙකුට විතරයි."

"රඛාරෝ," ඔහුගේ පිළිතුර ගණනකට නොගත් ඩැනී පැවසුවාය. "මගේ මනාලි තෑග්ගක් වුන, මිටයි තලෙයි රන් වැඩ දාපු මේ දැවැන්ත අරඛ් අසිපත මම ඔබට දෙනවා. මම ඔබවත් නම් කරනවා කෝ් කෙනෙක් විදිහට. ඔබ මගේ රුධිරයෙන් උපන් රුධිරය විදියට ජීවත් වෙලා මියයන්ට සූදානම් ද? මගේ පැත්තකින් අශ්වයා විහිදලා මගේ ආරක්ෂාව බලාගන්නට දිවුරනවද?"

"ඔබතුමි බලීසි." අරබ් එක අතට ගනිමින් රබාරෝ තෙපලුවේය. "මම එන්නම් ඔබත් එක්ක කඳුවැටියේ මාතාව පාමුල වයෙස් ඩොත්රැක් වලට. ඔබතුමි ඩොෂ් බලීන්ලාට එකතු වෙනකල් මම ඔබව ආරක්ෂා කරන්නම්. ඊට වඩා දෙයක් මට පොරොන්දු වෙන්ට බෑ."

එම පිළිතුර නෑසුනාක් මෙන් සන්සුන්ව හිස සැලූ ඩැනී සිය අවසන් සටන්කරු වෙත හැරුනාය. "සෙර් ජෝරා මෝර්මන්ට්, මගේ පළවෙනි ඒ වගේම මගේ විශිෂ්ටතම නයිට්වරයා. ඔබට දෙන්ට මට මනාලි තෑග්ගක් නැහැ. ඒ වුනත් මම දිවුරනවා. දවසක මගේ අතින් ඔබට ලැබෙයි ලෝකයා මෙතක් දැකලා නැති විදියෙ, මකර අග්නියෙන් වාත්තු කරලා වැලිරියන් වානේවලින් හදාපු විශිෂ්ට අසිපතක්. මට ඔබෙනුත් දිවුරුමක් උවමනායි."

"මම දිවුරනවා මගේ රැජිනියනි." දණින් වැටුනු සෙර් ජෝරා සිය අසිපත ඇගේ දෙපා මුල තැබීය. "මම ඔබට සේවය කරන්නම්, ඔබේ අණ පිලිපදින්නම්. අවශ්‍ය වුනොත් ඔබ වෙනුවෙන් ජීවිතය දෙන්නම්."

"මොන විපතක් ආවත්?"

"මොන විපතක් ආවත්."

"මම ඒ දිවුරුම රකිනවද කියල බලන්නම්. ඔබට ඒක ගැන පසුතැවිලි වෙන්ට නොලැබෙන්ටයි කියලා මම පතනවා." ඩැනී ඔහුව දෙපයින් සිටෙව්වාය. ඇඟිලි තුඩින් එසැවුනු ඇය ඔහුගේ දෙතොල් මුදුව සිප ගත්තාය. "ඔබ තමා මගේ රැජිනි ආරක්ෂකයන්ගේ පළමුවෙනියා."

සිය කුඩාරමට ඇතුළුවන අතරේ ඇයට තමා පිටුපසින් එල්ල වී ඇති ඩොත්රැකියන්ගේ බැල්ම දැනින. ඔවුහු කටුකුටු ගාමින් ඔවුන්ගේ ආමන්ඩ් හැඩැති කළුවන් දෑස් අගින් ඇය දෙස පුදුමයෙන් බැලුවෝය. තමා උන්මාදයෙන් පෙලෙන බවක් ඔවුන් සිතන බව ඇයට වැටහුනි. සමහරවිට ඇය ඇත්තටම අවසිහියෙන් පෙලෙනවා විය හැක. සියල්ල ඉක්මනින් පැහැදිලි වනු ඇත. දැන් නැවත හැරී බැලුවොත් ඇය සිය සටන පරාද වනු ඇත.

* * *

ඉරීගේ සහාය ඇතුව ස්නානය සඳහා නාන බාල්දියට ගොඩවද්දී ජලය සම දවන තරම් උණුසුම් විය. එනමුදු ඩැනී පැකිලුනේ හෝ කෑ ගැසුවේ හෝ නැත. ඇය උණුසුම ප්‍රිය කලාය. ඉන් ඇයට පිරිසිදු බවක් දැනෙන්නට විය. ජික්වී විසින් වයෙස් ඩොත්රැක් වලින් ගෙන ආ සසන්ධ තෙල් ජාති මුසු කල උණුසුම් ජලය මන්මත් කරවන සුළු වාෂ්ප වාතලයට මුදා හැරියේය. ඩෝරියා ඇගේ හැඩපලු ගෙතුනු හිසකෙස් සෝදා, අවුල් කඩා හොඳින් පීරුවාය. ඉරී ඇගේ පිට අතුල්ලන අතරේ ඩැනී දැස් වසාගෙන සුගන්ධයට සහ උණුසුමට සිය ගත වැළඳගන්නට ඉඩ දුන්නාය. ඇගේ යටිකයේ වූ වේදනාව සනහාලමින් උණුසුම් ජලය ගලා යන අයුරු ඇයට දැනුනි. උණුසුම ඈ තුළට ප්‍රවිශ්ට වූ විට ඇගේ සිරුර වෙවුලා ගියේය. මඳකින් ඇගේ සියලු වේදනාවන් සහ හිරිවැටුම් බොඳ වී ගොස් තමා අතිමහත් සැහැල්ලුවක පාවෙන්නාක් මෙන් ඇයට දැනෙන්නට විය.

පිරිසිදු වී අවසන් වූ පසු ඇයට වතුරෙන් ගොඩ එනු පිණිස පරිවාර සේවිකාවෝ උදව් කලහ. ඉරී සහ ජික්වී ඇයව වියලෙන තුරු පවන් සැලූ අතර ඩෝරියා විසින් පීරනු ලැබූ ඇගේ වරලස රිදී ගඟුලක් මෙන් ගලා හැලෙන්නට විය. ඔවුහු කුරුඳු සහ සුසන්ධවත් ආලේපයන් ඇගේ ගත ගැල්වූයෝය. මැණික්කටු දෙකෙහිත්, කන් පිටුපසත්, කිරෙන් බරවූ පයෝධර පුඩුත් සුවඳවත් කලහ. අවසන් සුසන්ධාලේපය ඇගේ යටිකය වෙනුවෙන් විය. ඉරීගේ ස්පර්ශය ආදරවන්තයෙකුගේ සුමුදු සිසිල් හාදුවක් මෙන් මුදුව ඇගේ දෙතොල් පෙති මත තැවරුනේය.

ඉන්පසු ඔවුන් සියල්ලන් පිටත් කර යැවූ ඩැනී, බාල් ඩ්‍රෝගෝ ඔහුගේ නිශා ලෝකයට යන ගමන සඳහා සූදානම් කලාය. ඔහුගේ සිරුර සෝදා හල ඇය ඒ දිගු කේශ කලාපය පීරා සුවඳ තෙල් ගැල්වූවාය. දිලිසෙන දිගු කෙස් අතරින් ඇඟිලි යවන ඇයට එහි බර දැනුනි. ඔවුන්ගේ මංගල රාත්‍රියේ එය මුල් වරට ස්පර්ශ කල අයුරු ඇයට සිහිවිය. ඔහුගේ හිසකෙස් කිසි දිනක කපා නොමැත. නොකැපූ හිසකෙසින් යුතුව මළවුන් අතරට යාමට හැකි මිනිසුන් කීදෙනෙක් නම් සිටිය හැකිද? මුහුණ කෙස් අතර සඟවා ගත් ඩැනී එහි වූ අපූර්ව සුගන්ධය විඳ ගත්තාය. ඒ සුවඳ තණබිම සහ මහ පොළොව සිහි ගැන්වීය. දුම් සහ පුරුෂ බීජ සහ අසුන් සිහි ගැන්වීය. එය ඩ්‍රෝගෝගේ සුවඳම විය. 'මගේ ජීවිතයේ ඉර මට සමාවෙන්ට!' ඇය සිතුවාය. 'මම කරපු දේවල් වලටයි... මම කරන්ට යන දේටයි හැමදේටම මට සමාවෙන්ට!' ඇය සිතින් ආයාචනා කලාය. 'මම මිල ගෙව්වා මගේ තාරකාව. ඒ වුනත් ඒ මිල බොහොම සැරයි. බොහොම වැඩියි...'

ඔහුගේ හිසකෙස් ගෙතූ ඩැනී ඒ රැවුල රිදී මුදු වලින් සැරසුවාය. රන්, රිදී හා ලෝකඩයෙන් නිම වූ සීනු ඔහුගේ ගෙතූ කොණ්ඩයේ එකින් එක එල්ලුවාය. එතැන සීනු රැසක් විය. ඒ සීනු හඬ ඔහුගේ සතුරන්ට ඔහු එන බව දන්වනු පිණිසත්, ඔවුන් බියෙන් වෙවුලවනු පිණිසත් විය. අස් ලොමින් කල කලිසමක් සහ උස බූට් සපත්තු ඔහුට ඇන්දවූ ඩැනී බරති රන්රිදී පදක්කම් සවිකල බඳපටිය ඔහුගේ ඉණෙහි බැන්දාය. ඔහුගේ බෙහෙවින් ප්‍රිය කල, පරණ, පාට වියැකී ගිය වර්ණවත් කබාය සුව වූ කැළැල් වලින් ගහන පුළුල් උරතලය වසා ඇන්දවූවාය. ඇය තමා වෙනුවෙන් ලිහිල් සේද කලිසමක් ද, දණහිස දක්වා පටි ගෙතිය යුතු සැහැල්ලු පාවහන් යුවලක් සහ ඩ්‍රෝගෝගේ මෙන් වූ කබායක් ද තෝරා ගත්තාය.

ඔහුගේ සිරුර චිතකය වෙත ගෙන යන්නට ඔවුන්ට හඬ ගසන විට ඉරු අවරට යමින් තිබින. අග්ගෝ සහ ජෝගෝ ඔහුව ඔසොවාගෙන එන අයුරු ඩොත්‍රකියෝ නිහඬවම බලා සිටියහ. ඩැනී ඔවුන් පසුපස ගමන් කලාය. ඔහුගේ හිස කඳු මාතාව වැඩසිටින ඊසාන දෙසට සිටින සේ දේහය චිතකයේ සේද රෙදි හා කොට්ටා මත තැන්පත් කෙරුනි.

"තෙල්!" ඇය අණ දුන්නාය. තෙල් බඳුන් ගණනාවක් රැගෙන ආ ඔවුහු චිතකයේ දැව සහ තෘණ පෙඟෙන තුරු, මහපොළවට තෙල් උරාගන්නා තුරු, අවට වාතය තෙල් සුවඳින් සුගන්ධවත් වන තුරු චිතකයට තෙල් දැමුහ. "මගේ බිත්තර ගේන්ට." ඇය සිය පරිවාර සේවිකාවන්ට අණ කලාය. ඇගේ ස්වරයේ තිබුනු යමක් නිසා ඔවුන්ගේ ගමන දිවුමක් බවට පෙරලින.

සෙර් ජෝරා අගේ අතින් අල්ලා ගත්තේය. "නිශා ලෝකෙදි ඩ්‍රෝගෝට බිත්තරවලින් වැඩක් නෑ මගේ රැජිනියනි. අපි ඒවා අෂයිවලට අරන් ගිහින් විකුණමු. එකක් විකුණුවොත් ඔබට නිදහස් නගර වලට යන්ට නැවක් ගන්ට පුළුවන්. තුනම විකුණුවොත් ඔබට ජීවිත කාලයටම සැප පහසුවට ඉන්ට ඒ ඇති."

"මේවා මට දුන්නේ විකුණන්ට නෙවෙයි." ඇය පිළිතුරු දුන්නාය.

චිතකය මතට නැගුනු ඩැනී ඇගේ හිරු හා තරු වටා එම මකර බිජු තැන්පත් කලාය. කළුවන් බිත්තරය ඔහුගේ හදවත අසලින් අත යටින් ද, හරිතවන් බිත්තරය දිගු කෙස්

වැටියෙන් ඔතා හිස අද්දර ද, ක්‍රීම් හා රන් පැහැති බිත්තරය ඔහුගේ දෙපා අතර ද තැන්පත් කලාය. අවසන් වරට ඔහුව සිප ගනිද්දී ඒ දෙතොලෙහි වූ තෙල් වල මිහිරි රසය ඇයට දැනුනි.

තමා චිතකයෙන් බසින දෙස මිරී මාස් ඩූර් බලා සිටින'යුරු ඇය දුටුවාය. "ඔබට පිස්සු." යක්දෙස්සිය බැරෑඞි හඬින් පැවසුවාය.

"පිස්සුවේ ඉඳන් ඥානවන්තකමට ගොඩක් දුරද?" ඩැනී ඇසුවාය. “සෙර් ජෝරා, මේ යක්දෙස්සිව අරන් ගිහින් චිතකයට තියලා බඳින්ට."

"චිතකෙට... මගේ රැජිනියෙනි. එපා. මම කියන දේ අහන්ට..."

"මම කිව්ව විදියට කරන්ට." එනමුදු ඔහු තවමත් පැකිලෙනු දුටු  ඩැනීගේ වියරුව නැග ආයේය. "මොන දෙයක් සිද්ද වුනත් මට කීකරුවෙනවා කියල පොරොන්දු උනා නේද? රබාරෝ එයාට උදව් කරන්ට."

ඛාල් ඩ්‍රෝගෝගේ චිතකයට තබා බැඳ දමද්දී යක්දෙස්සිය කිසිවක් නොදෙඩුවාය, කෑ නොගැසුවාය. ඩැනී සියතින්ම ඇගේ හිස මත තෙල් වත්කලාය. "මට කියා දුන්න පාඩම්වලට බොහොම ස්තුතියි මිරී මාස් ඩූර්!"

"මම කෑගහන හඬ ඔබට අහන්ට ලැබෙන එකක් නෑ." හිසෙන් බේරෙන තෙල්වලින් ඇඳුම් පෙඟෙද්දී මිරි පොරොන්දු වූවාය.

"ඒක මම අහගන්නම්." ඩැනී පිළිතුරු දුන්නාය. "ඒත් මට උවමනා කරලා තියෙන්නෙ උඹේ කෑගැහිල්ල නෙවෙයි. උඹේ ජීවිතේ විතරයි. උඹ කියල දුන්න දේවල් ඔක්කොම මට මතකයි. ජීවිතේට වන්දි ගෙවන්ට පුළුවන් මරණයෙන් විතරයි." මිරී මාස් ඩූර් මුව විවර කලද, පිලිතුරක් නුදුන්නාය. යක්දෙස්සියගේ කළු පැහැ දෑසේ මෙතෙක් වේලා රජයමින් තිබූ අපහාසය වෙනුවට බියක් වැනි යමක් සටහන් වෙනු ඩැනීට දැකගත හැකි විය. ඉන්පසු

හිරු බැස ගොස් පළමු තරුව උදාවන තුරු බලා සිටීම හැර වෙනත් කරන්නට යමක් ඉතුරුව තිබුනේ නැත.

බාල්වරයෙකු මියගිය පසු, නිශා ලෝකය කරා අභිමානයෙන් යුතුව යනු පිණිස ඔහුගේ අසුද මරා දමනු ලැබේ. විවෘත ආකාශය යට දෙදෙනාවම ආදාහනය කල පසු බාල් ඔහුගේ ගින්නෙන් දැවෙන අසු පිට නැගී තරු අතර ඔහුට හිමි ස්ථානය වෙත යනු ඇත. ආදාහන ගින්න දීප්තිමත් වන තරමට ඔහුගේ තාරකාවද දීප්තිමත් වනු ඇත.

එය මුලින්ම දුටුවේ ජෝගෝ විය. "අන්න!" ඔහු පහත් හඬින් පැවසීය. හිස එසවූ ඩැනීද නැගෙනහිර අහසේ පහතින් එල්බ තිබුනු එය දුටුවාය. මුල්ම තරුව දැවෙන රත් පැහැ වල්ගා තරුවක් විය. ලේ රතු පැහැ, ගිනි රතු පැහැ, මකර වල්ගයක් විය. ඊටත් වඩා හොඳ සලකුණක් ඇයට කිසිසේත් බලාපොරොත්තු විය නොහැක.

අග්ගෝ ගේ අතේ තිබු පන්දම ගත් ඩැනී එය ලී කඳන් අතරෙහි එබුවාය. තෙල් වලට එක්වරම ගිනි ඇවිලුනු අතර සුලු මොහොතකින් තණපත් සහ ලී වලට ද ගින්න පැතිරුනි. දුවන රතු මීයන් බඳු වූ කුඩා ගිනිදලු රිකිලි වලින් අතුවලට ද, අතුවලින් කොළවලට ද වශයෙන් ඉහළටම පැතිරුනි. ඉහළ නගින උණුසුම් වායු දහරා ආදරවන්තයෙකුගේ උණුසුම් සුසුම් මෙන් සැනෙකින් ඩැනීගේ මුහුණ සිප ගත්තේය. උණුසුම ඉක්මනින්ම දරාගත නොහැකි තරමට ඉහළ ගියෙන් ඩැනී අඩියක් පසුපසට ගත්තාය. ලී දඬු පුපුරමින් හඬ දෙන්නට පටන් ගති. මිරී මාස් ඩූර් උච්ච උඩුබිරුමක ස්වරයකින් ගයන්නට පටන් ගත්තාය. ගිනි දළු ලෙලදෙමින්, ඇඹරෙමින්, වේදිකාව දිගේ එකිනෙකා පරයමින් ඉහළ නගින්නට විය. සැඳෑ අඳුර දිදුලවමින් ගිනිදලු ඉහළ නගින්නට විය. අවට වාතය මේ ගින්දරෙන් ඉපදුනාක් මෙන් දැනින. ලී බිඳෙන හඬ ඩැනීට ඇසුනි. ගින්න මිරී මාස් ඩූර්ව වෙලා ගති. ඇගේ ගී ස්වරය තවත් උච්ච විය... ඉන්පසු කිහිප වරක් වැරෙන් හුස්ම අල්ලාගන්නට තැත් කල ඇගේ ගීතය වේදනාවෙන් පිරුනු, කන් හිරි වට්ටන, තියුණු අදෝනාවක් බවට පරිවර්තනය විය.

දැන් ගින්දර ඇගේ ඩ්‍රෝගෝ වෙත ලඟා වී තිබුනි. සිරුර වටා රැඟූ ගිනිදලු ඔහුගේ ඇඳුම් දවාලූයේය. එක මොහොතකට ඔහු දිලෙන තැඹිලිවන් සේදයෙන් සහ අළුවන් ධූමයෙන් වැසුනාක් මෙන් විය. ඩැනීගේ දෙතොල් විවර වූ අතර තමා හුස්ම අල්ලාගෙන සිටිනු ඇයට වැටහුනි. සෙර් ජෝරා පෙරදී බියවූවාක් මෙන්, ඔහුගේ චිතකයට පැන ඔහුගෙන් සමාව

අයැදීමට, තවත් වරක් තමන් සමග එක්වන ලෙස ඔහුට ආයාචනා කිරීමට, ඔවුන් දෙදෙනාම එක අයෙකු වන තුරු ගින්නෙන් දැවී යාමට ඇයට උවමනා විය.

ඇයට පිළිස්සෙන මසෙහි පුළුටු ගඳ දැනුනි. පුළුස්සන අශ්ව මසෙහි හා එහි වෙනසක් නොවීය. දැඩිවන අන්ධකාරය මධ්‍යයේ දැවෙන චිතකය දැවැන්ත වන සතෙකු මෙන් ගර්ජනා නැඟූ අතර මිරී මාස් ඩූර්ගේ දුබල හඬ ඊට යටපත් විය. ඉහළින් වූ නුබ ගැබ ලෙවකන්නට තැත් දරන දිගු දිව් මෙන් ගිනිදලු ඉහළ නගින්නට විය. දුම්කඳ කෙමෙන් දැඩි වද්දී ඩොත්රැකියෝ කහිමින් චිතකයෙන් ඈත් වූහ. හමා ආ සුළඟට හසු වූ තැඹිලිවන් සුවිසල් ගිනිදැල් ධජ පතාක දිගහැරෙන්නාක් මෙන් ලෙලදුනි . බිඳවැටෙන ලී කඳන් වලින් උපන් දහස් ගණන් කලාමැදිරියන් බඳු වූ ගිනිපුපුරු වායු ධාරාවන්හි නැගී ඈතට පියාසර කලෝය. දැඩි තාපය විසින් ඩොත්රැකියන් සහ මෝර්මන්ට් පවා පසුබස්වමින් අවට වාතලයට සිය රක්ත වර්ණ පියාපත් වලින් පහර පිට පහර එල්ල කළේය. එනමුදු ඩැනී පමණක් සිටිපිය සිටගෙන සිටියාය. ඇය මකරාගේ රුධිරය විය. මේ වනාහි ඇය තුළ ඇවිලෙමින් තිබුනු ගින්න විය.

තමා මේ සත්‍යය බොහෝ කලෙක පටන්ම දැන සිටි බව ගිනිජාලාව දෙසට එක් පියවරක් තබන අතරේ ඩැනී කල්පනා කලාය. ඇගේ කුඩා ගිනිකබලේ ඇවිලුනු ගින්නෙහි උණුසුම මඳ වුවා පමණි. තාපයෙන් පණ ගැන්වුනු, බියකරු එහෙත් සොඳුරු ගිනිදලු ඇගේ විවා දිනයේ රඟුම් දැක්වූ ගැහැණුන් මෙන් කහ-තැඹිලි පැහැයෙන් ඇය වටා රඟන්නට විය. බැලීමට බියජනක වූ මුත් ගින්නෙන් පණ නැගුනු එය සුන්දර විය. අති සුන්දර විය. ඩැනී ඒ වෙත සිය දෑත් දිගු කලාය. ඇගේ සම රතු පැහැයෙන් දිලෙන්නට විය. 'මේකත් විවාහයක් තමා.' ඇය කල්පනා කලාය. මිරී මාස් ඩූර් අන්තිමේදී නිහඬ වී ඇත. මේ යක්දෙස්සිය ඇය දැරියක කොට සිතුවාය. එනමුදු දරුවෝ වැඩෙති. දරුවෝ ඉගෙන ගනිති.

ඇය තවත් පියවරක් ඉදිරියට තැබූ අතර ගිනියම් වූ වැලිතලයේ උණුසුම පාවහන් හරහා දෙපතුලට දැනුනි. ඇගේ පියයුරු, දෙකලවා සහ පෙර කඳුලින් වැසී තිබුනු දෙකොපුල් තල තෙමමින් දියපහරක් මෙන් දහදිය ගලා ගියේය. සෙර් ජෝරා පසුබිමින් කෑ ගසමින් සිටියේය. එහෙත් දැන් අග්නිය මිස ඔහු එතරම් වැදගත් නොවේ. ගිනිදලු අලංකාර විය. ඇය මෙතෙක් කලෙකට දැක ඇති අලංකාරතම දෙය විය. ඒවා කහ, තැඹිලි සහ රක්තවර්ණයෙන් යුත් ලෝගු ඇඳ, ධූමයෙන් සුසැදුනු සළු වනමින් පැමිණි මායාකරුවන් පිරිසක් බඳු විය. ලේ රත් පැහැ ගිනිසිංහයින් ද, කසාවන් දැවැන්ත සර්පයින් ද, ලා නිල්වන් ගිනි දැල්ලෙන් සෑදුනු කඟවේනුන් ද එහි සැරිසැරූහ. මසුන් ද, සිගාලයන් ද, රකුසන් ද, වෘකයන් ද, දිලෙන සියොතුන් සහ මලින් බර වෘක්ෂයන් ද යන සියල්ල එකිනෙකා පරයන

සුන්දරත්වයෙන් එහි විරාජමානව සිටියහ. අළුවන් ධූමයෙන් නිමවුනු දැවැන්ත සෛන්ධවයෙක් නිල් ගින්නේ ප්‍රභාවෙන් ඇය දුටුවාය. 'ඔවු මගේ වස්තුව. මගේ ඉරයි තරුයි. දැන් ඔබේ ගමනට වෙලාව ඇවිල්ලා. අශ්වයා පිටේ නැගලා පිටවෙලා යන්ට.'

ඇගේ කෙටි කබායෙන් දුම් දමන්නට පටන් ගත් අතර ඩැනී එය උනා බිම දැමුවාය. වර්ණ ගැන්වූ සම් කබාය ක්ෂණයෙන් ගිනිගත් අතර ඇය තවතවත් ඉදිරියට පිය මැන්නාය. ගින්නට නිරාවරණය වූ ඇගේ පයෝධරයන්ගේ ඉදිමුණු රත් පැහැ තනපුඩු වලින් කිරි දහරා ගලා හැලෙන්නට විය. 'දැන්!' ඇය සිතුවාය. 'දැන්!' එක් මොහොතකට තමා ඉදිරියෙන් සිටින බාල් ඩ්‍රෝගෝ ඇගේ නෙත ගැටුනි. ඔහු සිය ධූම සෛන්ධවයා පිට නැගී ගිනිගෙන දැවෙන කසයක් ලෙලවමින් සිටියේය. චිතකය වෙත තද කස පහරක් එල්ල කරන අතර ඔහු ඇය දෙස බලා හිනැහුනේය.

ගලක් කැබලි වී යන්නාක් වැනි තියුණු හඬක් ඇයට ඇසුනි. ලීයෙන් සහ තණපතින් නිම කර තිබුණු වේදිකාව බිඳ වැටෙන්නට පටන් ගෙන තිබුනි. ඩැනීව අළු සහ ගිනි අඟුරු වලින් නහවමින් ලී කඳන් ඇය වෙත ලිස්සා එන්නට ගත්තේය. ඊට අමතරව වටකුරු යමක් ගින්නෙන් මිදී ඉපිලෙමින් විත් ඇගේ දෙපා මුල පතිත විය. රන් පැහැයෙන් වර්ණවත් වූ, ලා පැහැති වටකුරු ගලක් වූ එය බිඳීගොස් දුම් දමමින් තිබුනි. ලොවම වසාගත් ගින්නේ ගෝරනාඩුව අතරින් ළමුන්ගේ විස්මිත කෑ ගැසීමුත් කාන්තාවන්ගේ මුරගෑමත් ඇයට ඇසුනි.

ජීවිතයට වන්දි ගෙවිය හැක්කේ මරණයෙන්ම පමණි.

ඊළඟ මොහොතේ දෙවන පිපුරුමක හඬ ඇසුනි. ඒ හඬ අකුණු නාදයක් තරම්ම පැහැදිලි හා තියුණු විය. චිතකයේ හැඩය නැවත වරක් වෙනස් වෙද්දී දුම් රොටු ඇය වටානැටීය. ගින්න විසින් ඔවුන්ගේ හදවතේ ගැඹුරුම තැන් ස්පර්ශ කරද්දී ලී කොට පුපුරා ගියේය. ලෙලදෙන සුළි නගන දුම් රොටු අතරින් බියපත් අසුන්ගේ ලතෝනියත්, ඩොත්රැකියන්ගේ කෑගැසීමත් අතරින් ඇගේ නම කියමින් සෙර් ජෝරා කෑගසමින් ශාප කරන හඬ ඇයට පැහැදිලිවම ඇසුනි. 'නෑ!' කෑ ගසා ඔහුට පවසන්නට ඇයට උවමනා විය. 'නෑ මගේ හොඳ නයිට්වරයානෙනි. මා ගැන බයවෙන්ට එපා. ගින්දර කියන්නෙ මට අයිති දෙයක්. මම ඩනේරිස් ස්ටෝම්බෝර්න්. මකරුන්ගෙ දියණිය. මකරුන්ගේ මනාලිය. මකරුන්ගේ මව. ඔබට ඒක පේන්නෙ නැද්ද? ඔබට ඒක පේන්නෙ නැද්ද?' අහස් කුස දෙසට අඩි තිහක්

තරම් ඉහළ නැගුනු පිපුරුමක් සමගින් ඇය වටා චිතකය බිඳ වැටුනි. එනමුදු ඩැනී නොබියව, සිය දරුවන්ට හඬගාමින් ගිනි කුණාටුව තුළට පිය මැන්නාය.

තෙවැනි පිපුරුම මුලු ලොවම පිපිරී ගියාක් මෙන් මහත් ගර්ජනා හඬක් නැංවීය.

* * *

අන්තිමේදී ගින්දර නිවී ගොස් ඇවිදීමට තරම් පොළොව සිසිල් වූ පසු සෙර් ජෝරා මෝර්මන්ට් විසින් ඇයව සොයා ගත්තේය. ඇය කළු ගැසී ගිය ලී කොටවලින් ද, තවමත් දැවෙන ගිනි අඟුරෙන් ද දැවී ගිය ඇටකටු - මිනිසා ගේ ගැහැණිය ගේ හා අශ්වයාගේ ඇටකටු - වලින්ද වටවී සිටියාය. ඇය මුලුමනින්ම නිරුවත් විය. ගත මුලුමනින්ම අළුවලින් වැසී ගියේය. ඇගේ ඇඳුම් සියල්ල ගිනිගෙන අළු බවට හැරී තිබුනි. ඒ පියකරු කෙස්වැටිය දැවී ගොස් තිබුනි... එනමුදු ඇයට කිසිදු අනතුරක් සිදු වී නොතිබින.

ක්‍රීම්-රන් පැහැ මකරා ඇගේ වම් පියයුරෙන් කිරි උරා බොමින් සිටියේය. කොළ-ලෝකඩ පැහැ මකරා දකුණු පියයුරේ එල්ලී සිටියේය. ඇගේ දෑත් ඔවුන් දෙදෙනාව තුරුල් කරගනිමින් ඔවුන් වටා වෙලී තිබුනි. කාල-රක්ත වර්ණ මකරා ඇගේ දසරුව මත වැතිර සිටි අතර උගේ දිගු වක් වූ ගෙල ඇගේ නිකට යට දහර ගැසී තිබුනි. සෙර් ජෝරාව දුටු ඌ හිස ඔසවා ගිනිඅඟුරු වැනි දෑසින් ඔහු දෙස බැලීය.

වදනකුදු පවසා ගැනීමට අසමත් වූ නයිට් වරයා දණින් වැටුනි. ඔහුට පිටුපසින් ඇගේ බාස් සෙබළු ඉදිරියට පැමිණියහ. සිය අරඛ් අසිපත ඇගේ පාමුල තැබූ පළමුවැන්නා ජෝගෝ විය. "මගේ රුධිරයෙන් උපන් රුධිරය!" දුම් දමන පොළොව වෙත හිස නමමින් ඔහු මිමිනීය. "මගේ රුධිරයෙන් උපන් රුධිරය!" අග්ගෝ ප්‍රතිරාව නැංවීය. "මගේ රුධිරයෙන් උපන් රුධිරය!" රඛාරෝ කෑගැසීය.

ඔවුන්ට පසුව ඇගේ පරිවාර සේවිකාවෝ පැමිණියහ. ඊටත් පිටුපසින් ඇගේ බලසාරයේ සියල්ලෝ වූහ. පිරිමි ද, ගැහැණු ද, දරුවන් ද ඇතුළු ඩොත්රකියෝ සියලු දෙනම එහි වූහ. ඔවුන්ගේ දෑසේ වූ බැල්ම දුටු ඩැනීට දැන් ඔවුන් තමන්ගේ බැව් වැටහී ගියේය. ඔවුන් අදත්,

හෙටත් හැමදාමත් ඇයගේ විය. ඩ්‍රෝගෝට කෙදිනකවත් අයත් කරගන්නට නොහැකි වූ තරම් දැඩි බැඳීමකින් ඔවුන් ඇය හා බැඳී ගියේය.

ඩනේරිස් ටාර්ගේරියන් සෙමින් දෙපයින් නැගී සිටිද්දී කළු මකරා කටින් සහ නාසයෙන් ලා පැහැ දුම් රොටු පිට කරමින් සැහැසි ලෙස පිම්බේය. අනික් දෙදෙනාද ඇගේ පියයුරුවලින් මුව මෑත් කරගත්තේ සිය හඬ ඊට මුසුකලෝය. ඔවුන්ගේ විනිවිද පෙනෙනසුළු පියාපත් වාතය සසල කරවමින් සැලෙන්නට විය. වසර සිය ගණනකට පසු නැවත වරක් රාත්‍රී අන්ධකාරය අලලවමින් මකරුන්ගේ සංගීතය ඇසෙන්නට විය.

**Daenerys Targaryen: “Viserys is dead. I am his heir, the last blood of House Targaryen. Whatever was his is mine now.”**

**************************